# සිසුවන් සහිත
# පන්සිය පහක්
# පාඨක පොත

1 වෙනි කාණ්ඩය

ප්‍රකාශකයෝ
ශ්‍රීලංකා ප්‍රකාශක සමාගම
කොළඹ 11.

# පන්සිය පණස්

# ජාතක පොත

——:(ෆ):——

## පළමුවෙනි කාණ්ඩය

---


විද්‍යෝදය විශ්වවිද්‍යාලයයේ පූජ්‍යකාලයාධිපති

**පණ්ඩිත වේරගොඩ අමරමොලි**

නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

විසින් සංශෝධිතයි.


තායිවානයේ තායිපේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ ප්‍රධාන අනුශාසක, තායිවානයේ තායිපේ ශ්‍රී රතනජෝති ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති, තායිවානයේ ප්‍රධාන සංඝනායක රත්මලාන ශ්‍රී විජයාරාමවාසී, බණ්ඩාරගම විදාගම ධර්ම චක්‍ර ළමා පදනමේ සහ ලියෙන් සිං ළදරු පාසලේ නිර්මාතෘ, ත්‍රිපිටකවේදී ධර්ම කීර්ති ශ්‍රී බෝදාගම වන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි මෙම දහම් පොත තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම මගින් මුද්‍රණය කරවා ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලදී.


ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම

විදාගම,

බණ්ඩාරගම

ප්‍රථම මුද්‍රණය 1961

සියලු අයිතිවාසිකම් ප්‍රකාශකයන් සතු ය.

Printed for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org.tw
Website: http: //www.budaedu.org.tw
**This book is strictly for free distribution, it is not to be sold.**
නොමිලයේ බෙදාදීම පිණිසයි.

# සංඥප්තිය

"පන්සිය ජාතක පොත්වහන්සේ" යයි සිංහල බෞද්ධ ජනසමූහයාගේ අතිශය ගෞරවයට පාත්‍ර වූ සිංහල ජාතක පොත වනාහි පාළි ජාතකට්ඨ කථාවේ සිංහල පරිවර්තනයකි.

ජාතකට්ඨ කථාවේ සම්පූර්ණ පරිවර්තනය එක කාලයක දී වත් එක් කෙනෙකුත් විසින් වත් කරණ ලද්දක් නො වන බව එහි දැක්වෙන භාෂා විලාසයෙන් මනාව පැහැදිලි වේ. හැම ජාතක කථාවක් ම **නිදානය, වර්තමාන කථාව, අතීත කථාව, ධර්ම ව්‍යාකරණය, සම්බෝධානය** යන කොටස් පහකින් යුක්ත වේ. හැම පරිවර්තකයාම මේ ක්‍රමය දිගට ම ගෙණ ගිය බැව් පෙණේ.

**නිදානය:**

"එක් සමයෙක්හි බුදුහු දෙවිරම් වෙහෙර වැඩවසන සේක් භාවනා කිරීමෙහි හරණ ලද වීර්‍ය්‍ය ඇති භික්ෂු කෙණෙකුත් වහන්සේ අරහයා මේ ජාතකය වදාළ සේක.

**වර්තමානකථාව:**

"බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර වසන කල්හි එම නුවර වසන්නා වූ එක් කුලපුත්‍රයෙක් ජේතවනාරාමයට ගොස් බුදුන්ගෙන් බණ අසා රත්නත්‍රයෙහි ප්‍රසන්න වූ සිත් ඇතිව කාමයෙහි ආදීනව හා ප්‍රව්‍රජ්‍යාවෙහි අනුසස්....."

**අතීත කථාව:**

"යටගිය දවස කසීරට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුත් රාජ්‍යය කරණ කල්හි අපමහබෝසතාණෝ සාත්තු නායක කුලයෙහි පිළිසිඳ ගෙණ....."

**ධර්ම ව්‍යාකරණය:**

"මෙසේ නැවතත් ධර්මදේශනා කොට දුඃඛය සමුදය නිරෝධය මාර්ගයයි කියන ලද චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශ කොට වදාළ සේක."

**සම්බෝධානය:**

"ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ අතීත කථාවත් වර්තමාන කථාවත් දෙක එක්කොට අනුසන්ධි ගළපා එසමයෙහි මරුකතර ගියා වූ සෙෂ්ඨ පිරිස නම් දැන් මේ බුදු පිරිස් වන්නාහ. එසමයෙහි සාත්තූනායක පුත්‍ර නම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක."

හැම ජාතක කථාවක ම මෙම ක්‍රමය නො වෙනස්ව පවතී. එහෙත් ඒ ඒ කොටස්වල පෙණෙන භාෂාවිලාස විසදෘශතාවයෙන් මෙය බොහෝ කතෘ වරුන්ගේ කෘතියක් බව පැහැදිලි වේ.

භාෂාව වනාහි මධුරය, සරලය, අසන්නන් ප්‍රිය කරණ සුලු ය අර්ථ ගාම්භීර්‍යයෙන් තොර ය. හැම ක්‍රියාකාරක සම්බන්ධයකම වාගේ අනන්තර් වාක්‍ය කීපයක් පවත්නේ ය

"ඒ ලොහි වෙළෙඳ තලිය අතින් ගෙණ, 'රන්තලියක් වනැ'යි තලිය පිට ඉදිකටුවෙන් හිරක් ඇඳ රන් බව දැන 'මොවුන්ට කිසිවක් නො දීම මේ තලිය ගෙණ යෙමි' සිතා 'මේ තලිය කුමක් අනි ද? අඩ මදටකුත් පමණ මේ තලියට මිල නැත්තේ ය'යි කියා බිමට දමා උනස්නෙන් නැගී ගියේය."

"ලෝහි වෙළෙඳ නැගී ගියේ ය." යන මේ ප්‍රධාන වාක්‍යය ඇතුලේ අනන්තර්වාක්‍ය කීයක් තිබේදැයි සසඳන්න. ජාතක පොත මුළුල්ල ම මෙ බඳු යෙදුම් වලින් ගහනය.

මුල් ජාතක කථා 50 කින් යුක්ත වූ මෙම කොටස ශ්‍රී ලංකා ප්‍රකාශන පොත්හල අයිතිකරු වූ සද්ගුණවත් ජී. පී. ඩී. ජිනදාස මහත්මයාගේ ආරාධනය පරිදි අපි සකස්කරලීමු. එහෙත් අනවකාශ මධ්‍යයෙහි මෙය නිමකරන්ට සිදු වූ හෙයින් යම්කිසි ප්‍රමාද දෙෂාදියකින් සිදුවූවක් ඇතොත් එහි දී සමාධිය භජනය කරන්වා. මෙය මුද්‍රණද්වාරයෙන් ප්‍රකාශයට පැමිණ වූ ජී. පී ඩී. ජිනදාස මහත්මයාට නිරොග සුවය ලැබේවා.

**වේරගොඩ අමරමොලි නායක ස්ථවිර**

1961, 4, 7 දින
විද්‍යෝදය විශ්වවිද්‍යාලයේදී ය.

# ජාතක කථා සංක්ෂේප

## 1. අපණ්ණක ජාතකය

අනේපිඬු සිටුතුමන්ගේ පන්සියයක් නිවැරදික යහළුවන් උදෙසා සැවැත් නුවර දී බුදුරජානන් වහන්සේ මෙය වදාළ සේක.

අතීත කාලයෙහි බරණැස් නුවර බඹදත් රජතුමන් රජය කරවන කල්හි බෝධිසත්වයෝ සාත්තුනායක කුලයක ඉපද ගැල් පිට බඩුපටවා ගෙණ කතරමඟ ඉක්මවා පිරිවර සමඟ යමින් වෙළඳුම් කළහ. එකල ම නුවණ නැති සාත්තුනායකයෙක් ද පිරිවර සමඟින් කතරමඟ ඉක්මවා ගියේ යකුන්ට බිලි විය. මේ කරුණ මුල් කොට ගෙණ අනේපිඬු සිටුතුමන් ප්‍රමුඛ යහළු පිරිසට අපණ්ණක ප්‍රතිපදාව විස්තර කොට වදාළ සේක.

ඒ පන්සියයක් උපාසකවරු සෝවාන් ඵලයට පැමිණියාහුය.

## 2. වණ්ණුපථ ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම්හි දී හරණලද වීර්‍යය ඇති භික්ෂූකොණ්ඩන් උදෙසා මෙය වදාළ සේක.

යටගිය දවස බෝසතාණෝ සාත්තුනායක කුලයක ඉපද පන්සියයක් ගැල්වල බඩු පටවා ගෙණ මරු කතර ඉක්මවන්නට පටන්ගත්හ. ඉක්බිති ජලය නො ලබන්නා වූ වෙළඳ ජනයෝ පරීක්ෂාකොට ලිඳක් කැනූහ. ඒ ලිඳ පතුලෙහි මහ ගලක් විය. අනික් සියල්ලන් ම වීර්‍යය හළ කල්හි එක් පුරුෂයෙක් මහත් යකුළක් ගෙණ ගල මත්තෙහි පහර කීපයක් හෙලී ය. එයින් ගල බිඳී දියදහරක් පැන නගින්ට විය. එදා නුකුසීව යකුළු පහර දී ගලබිඳ දැමූ පුරුෂයා වනාහි මෙකල වීර්‍යය හළ භික්ෂු තෙමේ ය

මෙහි දී බුදුරජානන් වහන්සේ චතුරාර්‍යසත්‍යය දෙසනා කළ සේක. ඒ මහණ තෙමේ රහත් බවට පැමිණියේ ය.

## 3. සේරිවාණිජ ජාතකය

බුදුරජානන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි දී පසුබට වීර්‍යය ඇති භික්ෂූවක ඇරබ මේ ජාතකය වදාළ සේක.

මේ කල්පයට පස්වැනි කල්පයෙහි මහ බෝසතාණෝ සේරිව ජනපදයෙහි ඉපද කිසිල්ලෙහි බඩු පොදිය තබාගණ වෙළඳුම් කරණ හෙයින් කවඩපුට නමින් ප්‍රසිද්ධව වෙළඳුමෙහි නියුක්ත වූහ

එකල ම සේරිවාණිජ නම් ලොභොබි වෙළෙඳෙක් ද එහි ම වෙළඳුම් කෙළේ ය.

නීල වාහිණී ගඟින් එතරුව අනුපුර නම් නුවර වීථි බෙදාගෙණ දෙදෙනා ම වෙළඳුම් කළහ.

මෙහි දී එක් ගෙදරකට පැමිණි සේරිවාණිජ වෙළඳහුට මළබැඳි තලියක් දී මෙය ගෙණ කිසියම් පලදනාවක් දෙවයි. එ ගෙයි මිත්තනිය කියද්දීත් එය අඩ මදටක්වත් නො වටී යයි දමා ගසා සේරිවාණිජ වෙළඳ තෙමේ නික්ම ගියේ ය.

දෙවනුව එතනට පැමිණි කවඡපුට වෙළඳ තෙමේ එය කහවණු ලක්ෂයක් වටී යයි දන්වා පන්සියයක් කහවණු ද, කහවණු පන්සියයක් වටිනා බඩු ද දී එය ගෙණ ගියේ ය.

බෝධිසත්වයන් කෙරෙහි දෙවිදත්හුගේ පළමු වයිර බැඳීම මෙද පටන් වීය.

ඒ අඤඤ සේරිවාණිජ වෙළඳ තම් දෙවිදත් තෙර ය කවඡපුට වෙළඳ නම් මෙකල බුදුරජාතන් වහන්සේ ය.

## 4. චුල්ලසෙට්ඨි ජාතකය

බුදුරජාතන් වහන්සේ රජගහ නුවර ජීවකයන්ගේ අඹ උයනෙහි දී චුලල පන්ථක තෙරුන් උදෙසා මෙය වදාළ සේක

යටගිය දවස බෝධිසත්වයන් වහන්සේ බරණැස් නුවර ඉපද චුලල සිටානෝ යයි ප්‍රසිද්ධ වූහ. එක් දවසක් විථීමධ්‍යයෙහි ගමන් කරන්නාහු මළ මීයෙකු දැක "නුවණැති කුලපුත්‍රයක්හු විසින් මේ මීයා ඇර ගෙණ පුත්‍ර දාරාවන් පෝෂ්‍යකරගන්ටත් වෙළඳෙළඳුම් කරගන්ටත් හැකිවන්නේ යයි කිවූය. එය අසා සිටි එක් දුගී පුරුෂයෙක් ඒ මීයා හැරගෙණ ගොස් විකුණ ගත් සුලු මිලයෙන් දියුණු දියුණුව අන්තිමයේ දී ඒ නුවර සිටු සැපත ද ලැබී ය.

ඒ දුගී පුරුෂයා නම් මෙකල චුලලපන්ථක සථවිරයන් වහන්සේ ය.

## 5. තණ්ඩුලනාලි ජාතකය

බුදුරජාතන් වහන්සේ දෙව්රම්හි දී ලාලුදායි තෙරුන් ඇරබ මෙය වදාළ සේක.

පෙර කසීරට බරණැස්නුවර බඹදත් රජතුමන් රජය කරවන කල්හි බෝධිසත්වයෝ ඒ රජ්ජුරුවන්ට වන්නකු කම් කළහ. දැහැමි සේ බඩුමිල විසඳන ඒ බෝසතුන් කෙරෙහි පසුකලෙක රජතුමා උරණ විය. පසුව අන් කෙණෙකු ඒ බුරයට පත්කර ගති. ඒ තෙමේ පසුකාලයෙහි ඇතුළුපුර සහිත බරණැස්නුවර එකම සාල් නැළියකට අගය නියම කෙළේ ය.

එකල ඒ අඤඤ පුරුෂයා නම් මෙකල ලාලුදායි සථවිරය. එකල නුවණැති වන්නකු පුරුෂයා නම් මෙකල බුදුරජාතන් වහන්සේ ය.

## 6. දෙවධම්ම ජාතකය

බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර වැඩවෙසෙන කල්හි එක්තරා බහු භාණ්ඩික භික්ෂුවක ඇරබ මෙය දෙසූ සේක.

යටගිය දවස බෝධිසත්වයෝ බරණැස්නුවර බඹදත් රජහුට පුත්ව ඉපද මණිංසාසක කුමරු යයි නමින් පතළවූහ. චඳකුමාරයෝ ය සූයඤකුමාරයෝ යයිසොහොයුරු දෙදෙනෙක් ද වූහ.

මේ කුමාරවරුන් තිදෙනා රජය හැර වලට ගියාහු පැන් පිණිස එක් විලක් අසලට පැමිණියාහු ය. එහි දී උදක රාක්ෂසයකු විසින් අල්වාගණු ලැබූහ. මහිංසාසක කුමාරයෝ ඔහුට දෙවධර්මය ප්‍රකාශ කළහ. එයින් සතුටට පත් උදක රාක්ෂසයා තිදෙනා ම ඔහුගේ ගැණීමෙන් මිදූහ.

එකල උදක රාක්ෂසයා නම් දැන් මේ බහුභාණ්ඩික මහණ ය. සූරඹී කුමාරයෝ නම් ආනන්ද සථවිරයෝ ය. චන්ද්‍රකුමාරයෝ නම් සැරියුත් තෙරණුවෝ ය. මහිංසාසක කුමාරයෝ නම් මෙකල බුදුරජාණන් වහන්සේ ය.

## 7. කටඨහාරි ජාතකය

බුදුරජාණන් වහන්සේ දෙවිරම්හි වැඩවාසය කරණසේක් වාසභක්ෂත්‍රියාවන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බඹදත් රජ්ජුරුවෝ උයනට පැමිණියාහු එහි එක් වන ලැහැබක හුන් සත්‍රියක හා තාපණාසන්ථවය කළහ. එයින් ඇගේ කුසෙහි දරුගැබක් ඇතිවිය. පසුකලෙක ඒ සත්‍රිය දරුවා රැගෙණ ගොස් රජු ඉදිරියෙහි සත්‍යක්‍රියා කොට අහසට වීසිකළා ය. දරුතෙමේ අහසෙහි පලක් බැඳ හුන්නේ රජුට බණ වදාළේ ය.

එකල මැනියෝ දැන් මහමායා දේවියහ. රජහු සුදොවුන් රජතුමෝ ය. දරුතෙමේ මෙකල බුදුරජාණන් වහන්සේ ය.

## 8. ගාමණි ජාතකය

බුදුරජාණන් වහන්සේ දෙවිරම්හි දී පසුබට වියඳී ඇති භික්ෂු කෙණෙකුන් ඇරබ මෙය වදාළ සේක.

මෙහි වර්තමාන අතීත කථාවන් සංවර ජාතකයෙහි පහළ වන්නේ ය.

## 9. මඛාදෙව ජාතකය

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙවිරම්හි වැඩ වසන සේක් මහ බිණුක්මන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස මිථිලු නුවර මඛාදෙව නම් රජකෙණෙක් වූහ.

මේ රජතෙමේ සුවාසූ දහසක් අවුරුදු කුමරකෙළි ද, සුවාසූ දහසක් අවුරුදු උප රජය ද, සුවාසූදහසක් අවුරුදු රජකම ද කොට, හිස නර කෙසක් දැක සසර කලකිරී උයනට ගොස් තපස් කම් කෙළේ ය.

එසමයෙහි නරකෙස පැ කපුවා නම් මෙකල ආනන්ද සථවිරය, රජකම භාරදුන් ප්‍රධාන පුත් කුමර තෙමේ රාහුල සථවිරය, මඛාදෙව රජ නම් මෙකල බුදුරජාණන් වහන්සේ ය.

## 10. සුඛවිහාරි ජාතකය

බුදුරජාණන් වහන්සේ අනුපිය කුවර අනුපිය නම් අඹවනයෙහි වැඩ වසන සේක් භද්දිය තෙරුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙණෙකු රාජ්‍යය කරණ කල්හි බෝධිසත්වයන් වහන්සේ බමුණු කුලයක ඉපද පසුව හිමාලයට ගොස් ඉසි පැවිද්දෙන් පැවිදිව අෂ්ටසමාපත්තීන් උපදවා පිරිවර සහිතව විසූහ වර්ෂා කාලයෙහි බරණැසට පැමිණ රාජෝද්‍යානයෙහි විසූහ.

වස් අවසන් වූ කල්හි ද රජතෙමේ ප්‍රධාන තාපසයන් වහන්සේ උයනෙහි ම නවත්වාගනී. පසු දවසක අතවැසි ප්‍රධාන තාපසයන් වහන්සේ ප්‍රධාන තවුස් උතුමන් දැකීමට පැමිණ එක් පතක් බිම එලා සමීපයෙහි හුන්හ.

එකෙණෙහි ම රජතුමා තවුසානන් දැකීම පිණිස අසපුවට පැමිණියේ ය. රජතුමන් දුටු කෙණෙහි තවුස් තෙමේ නො නැඟි සිටියේ යයි රජහු උරණ වූහ. පසුව එය රජතුමන්ට පහදා දුනි. රජහු එයින් පහන් වූහ.

එකල අතවැසි තවුස් තෙමේ මෙකල හදදිය සථවිර විය.

## 11. ලකඛණමිග ජාතකය

බුදුරජානන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවාසය කරණ සේක් දෙවිදුන් තෙරුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස රජගහනුවර මගධ රජෙකු රජය කරණ කල්හි බෝධිසත්වයන් වහන්සේ මුව රජෙක්ව උපන්හ. ඒ මුව රජුහට ලක්ඛණය කාල යයි පුතුන් දෙදෙනෙක් වූහ. වැඩිවියට පැමිණි මුවරජතෙමේ සිය පුතුන් දෙදෙනාට පන්සීය පන්සීය බැගින් සිය පිරිවර බෙදා දුනි.

ලක්ඛණ මුවාගේ පිරිවරට කිසිම හානියක් නුවූයේ ය. කාල මුවාගේ පිරිවර මදකලකින් ම විනාශ විය. එසමයෙහි කාලමුවා දැන් දෙවිදුන් තෙරය. ලක්ඛණ මුවා දැන් සැරියුත් සථවිරයන් වහන්සේ ය.

## 12. නිග්‍රෝධ මිග ජාතකය

බුදුරජානන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සේක් කුමාර කාශ්‍යප තෙරුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස මහබෝසතාණන් වහන්සේ මිගයෝනියෙහි උපන්හ. නිග්‍රෝධ නමින් ප්‍රසිද්ධ වූ ඒ මුවාගේ පිරිවර පන්සීයකි. එසේ ම එම වෙනෙහි පන්සීයක් පිරිවර ඇති සාඛා නමින් මුවරජෙක් ද වෙසෙයි.

සාඛ මුවාගේ පිරිවරෙහි වූ දැරි ඇති මුවැන්නියකට වරින් වර මරණය පැමිණි කල්හි නිග්‍රෝධ මුවතෙමේ ඇට ජීවිතදානය දී ඇ වෙනුවට දංගෙඩියෙහි හිස තබා ගෙණ හොත්තේ ය. පසුව ඔහුට ද සියලු මෘග පක්ෂීන්ට ම එකල රජතුමාගෙන් අභය ලැබුනේ ය.

එසමයෙහි සාඛමුවා නම් මෙකල දෙවිදුන් තෙරුණුවෝ ය. වධයට නියම වූ මුවැන්නිය මෙකල කුමරකසුප් තෙරුන්ගේ මවුය. එකල අභය දුන් බරණැස් රජතුමා නම් මෙකල ආනන්ද තෙරණුවෝ ය. නිග්‍රෝධමුවා නම් දැන් ලොවුතුරා බුදුරජානන් වහන්සේ ය.

## 13. කණ්ඩින ජාතකය

බුදුරජානන් වහන්සේ සැවැත්නුවර දෙවිරම් වෙහෙර වැඩ වාසය කරණ සේක් පැරණි අඹුවක කෙරෙහි ලොල්වූ භික්ෂුවක අරභයා මෙය වදාළ සේක.

යටගිය දවස මගධරට මගධ නම් රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කෙරෙති. එකල වනයෙහි වසන මුව පොව්වෙක් ගම් අසල වසන මුවැන්තියක් හා මිත්‍රව විසි. වන පව්වෙහි වූ මුවපොව්වා ගම අසල වසන මුවැන්තිය පසුපසු ගම සමීපයට ද එන්ට පුරුදු විය. එක් දවසක් මුවවැද්දෙකුගේ රූපහරින් වන පව්වෙහි වසන ඒ මුවාගේ මරණය සිදුවිය. මූ ගම්බද මුවැන්තියට ලොල්වූ බැවිනි.

එකල වනපව්වෙහි වූ මුවා මෙකල මේ පැරණි අඹුව කෙරෙහි ලොල්වූ මහණය. එකල මුවැන්තිය දැන් මේ පැරණි අඹුව ය. එකල ඔවුන්ට දම් දෙසූ දේවතාවා නම් මෙකල බුදුරජානන් වහන්සේ ය.

## 14. වාතමිග ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම්හි වැඩවසන සේක් චුල්ලපිණ්ඩපාතික තිස්ස තෙරුන් ආරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ට සංජය නම් උයන්පල්ලෙක් සිය. ඉක්බිති එක් වාතමෘගයෙක් එම උයනට පැමිණ උයන්පල්ලා දුටු කෙණෙහි ම දිව යන්නේ ය. පසුව උයන්පල්ලා රජුගේ නියමය පරිදි ඒ වාතමෘගයා රසයෙන් වසඟයට පමුණුවා රජමාලිගාවට ම කැඳවා ගෙණ ආයේ ය.

ඒ කාලයෙහි වූ සංජය නම් උද්‍යානපාලකයා මේ වණ්ඩසිය ය. ඒ වාතමෘගයා නම් මේ චුල්ලපිණ්ඩපාතිකතිස්ස තෙර ය.

## 15. ඛරාදිය ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම්හි වැඩවසන සේක් එක් අකීකරු භික්ෂු කෙණෙකුන් ආරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බඹදත් රජහු රජය කරවන කල්හි අප බෝධිසත්වයන් වහන්සේ මුවරජෙක්ව වෙනෙහි වෙසෙති.

ඒ මුවාගේ සොහොයුරියක් වූ ඛරාදිය නම් මුවැන්තිය සියපුතුට මෑණියම් ඉඟැන්වීම පිණිස බෝධිසත්වයන් වහන්සේට පවරා දුන්නී ය. ඒ අකීකරු මුවපොල්ලා කිසිවක් නුගත්තේ ය. එක් වැදි පුතෙකුගේ දැලට අසුවූයේ මරණයට පැමිණියේ ය.

එකල ඒ අකීකරු මුවා මෙකල අකීකරු මේ මහණතෙමේ ය. මවු මුව දෙන මෙකල උපුල්වන් සථවිරී ය. ඔවා දුන් මුවරජතෙමේ මෙකල බුදුරජානන් වහන්සේ ය.

## 16. නිපල්ලත්ථ මිග ජාතකය

බුදුරජානන් වහන්සේ **තොසඬ්ඨුවර** බදරිකා නම් ආරාමයෙහි වැඩ වාසය **කරණසේක්** රාහුල තෙරුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස රජගහනුවර මගධ රජ්ජුරු **කෙණෙක්** රාජ්‍යය කෙරෙති. එකල්හි මහ බෝසතාණෝ මෘගයෝනියෙහි ඉපද වාසය **කළාහු** ය. **එක්** දවසක් සිය නැගනියෝ සිය පුතුට මුව මායම් උගන්වන්නැයි මුව රජහුට පුතු භාරදුන්නී ය. ඒ මුව පොව්වා ද ඉතා ම **කීකරුව** මනාව මුව මායම් **ඉගෙණ** ගත්තේ ය. දිනක් වැද්දෙකුගේ බැම්මට හසුවූයේ ද එය **වලහා** මවු කරා පැමිණියේ ය.

එකල්හි ඒ මුවපැටියා නම් **මෙකල** රාහුල සථවිරයෝ ය ඒ මුවාගේ මැනියෝ **මෙකල** උපුල්වන් සථවිරී ය.

## 17. මාලුක ජාතකය

බුදුරජානන් වහන්සේ **දෙවිරම්** **වෙහෙර** වැඩවසන සේක් **මහලුකල** මහණ වූ ඒ භික්ෂුවක අරභයා මෙය දේශනා කළ සේක.

යටගිය දවස එක් පව්වක සිංහයෙක් ද **ව්‍යාඝ්‍රයෙක්** ද **යහළුවෝව** විසූහ. බෝධිසත්වයන් වහන්සේ ද **ඉසිපැවිද්දෙන්** පැවිදිව ඒ පර්‍වතප්‍රාන්තයෙහි **වෙසෙති**. එක් දවසක් ඒ දෙ **යහළුවන්** අතර ශීතය නිසා ඇතිවූ වාදයක් බෝධිසත්වයන් වහන්සේ කරුණු දක්වා සමථයකට පත්කළහ.

**ඒ කාලයෙහි** ව්‍යාඝ්‍රයා නම් මෙකල කාල**සථවිරය**. සිංහ තෙම ජූණහ සථවිරය **ප්‍රශ්නය** විසඳූ තවුස් තෙමේ මෙකල බුදුරජානන් වහන්සේ ය.

## 18. මතක භත්ත ජාතකය

බුදුරජානන් වහන්සේ සැවැත්නුවර දෙවිරම් වෙහෙර වැඩවාසය කරණ සේක් මතක බතක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස **බරණැස්නුවර** බ්‍රහ්මදත්ත නම් රජෙකු රාජ්‍යය කරවන **කල්හි** දිසාපාමොක් ඇදුරු වූ **බ්‍රාහ්මණයෙක්** මතක බතක් **දෙමිසි** **මරන්ට** **එළවකු** **නාවා** සූදානම් **කෙළේ** ය. ඒ එළුවා මහත් කොට **සිතාසී** **නැවත** හඬාපී ය. එළුවා එයට කරුණු **සැලකරන්නේ** බ්‍රාහ්මණය මම පෙර එළුවකු මරා පන්සියවරක් හිස් කැපුම් ලදිමි. **මේ** අවසන් ජාතිය හෙයින් එයින් මිදෙන්නෙමියි සිතාසීමි. **මේ** බමුණා ද මා මරා පන්සියයක් ජාතියේ හිස් කැපුම් ලබන්නේ යයි හඬාපීමියි කීය.

එසමයෙහි වෘක්ෂදෙවතාවෙක් ව බෝසතානන් වහන්සේ ඉපද සිටියහ.

## 19. ආයාචිත භත්ත ජාතකය

බුදුරජානන් වහන්සේ සැවැත්නුවර දෙවිරම් වෙහෙර වැඩ වාසය කරණ සේක් බිලිපූජාවක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස කසිරට එක් ගමෙක්හි කෙළෙඹියෙක් අසල නුගරුකක වසන දේවතාවට එළුවන් තිරෙළුවන් මරා පුදා දුකින් මිදෙමියි නුගරුක් මුලට ගියේ ය.

එහි හුන් දේවතාවා වෙළෙප්හි සිට ප්‍රාණවධ කොට දුකින් මිදිය නො හැකියයි අවවාද කෙළේ ය. එතැන් පටන් මනුෂ්‍යයෝ ප්‍රාණවධ කිරීම අත්හළහ.

එකල දේවතාවා මෙකල බුදුරජානන් වහන්සේ ය.

## 20. නළපාන ජාතකය

බුදුරජානන් වහන්සේ නළපාන ගමෙහි දී බටදඬු ඇරබ මේ ජාතකය වදාළ සේක

යටගිය දවස එක් වනලැහැබක විලක් විය. එක් දියරකුසෙක් එහි බට බට මිනිසුන් හා සතුන් කන්නේ ය. අසූදහසක් වදුරන් පිරිවර කොට ඇති වදුරු රජෙක් ඒ වෙනෙහි වෙසෙයි. උදකරාක්ෂසයා පැමිණ විල ලඟට ආ ඔවුන්ට පැන් බොන්ට කියද්දීත් ඔවුහු විලට නො බටහ. බෝසත් වදුරු රජතෙමේ පොකුණ අවට හටගත් සියලු බටදඬු එකවිදුවේවාහි අධිෂ්ඨාන කෙළේ ය. ඉන්පසු වදුරු සමූහයෝ විලට නො බැස බටදඬු කඩාගෙණවුත් එයින් පැන් උරා බීපිහ. අදත් එහි බටදඬු එකවිදුව පවතී.

එසමයෙහි උදකරාක්ෂසයා දෙවිදත් තෙරණුවෝ ය.

## 21. කුරුඬගම්ග ජාතකය

බුදුරජානන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සේක් දෙවිදත් තෙරුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි බෝධිසත්වයන් වහන්සේ කුරුඬගම්ග ජාතියෙහි ඉපිද වෙනෙහි විසූහ.

එක් වැද්දෙක් ඒ මුවා විද මරමිහි ඇද්දෙමට ගසක මැස්සක් බැඳ ගෙණ එහි සැඟවී හුන්නේ ය. මේ බැව් දන් මුවා ගෙඩි කෑමට ඒ ගසමුලට නො ගොස් අවට හැසිරෙමින් සිටියේ ය.

වැද්දා ගස ලඟට නො පැමිණෙන මුවා දැක ගෙඩි කඩා මුවාගේ ඉදිරියට වීසිකෙළේ ය. මුවතෙමේ ගසත් සමග ව්‍යාජයෙන් කථා කරන්නේ "එම්බා ගස, යුෂ්මතා වෘක්ෂධර්මය ඉක්මවූයෙහි ය. එහෙයින් තෙල ගෙඩි මම නො කමි. අන් රුකක් කරා යෙමි"යි කියා ගියේ ය.

එකල වැද්දා නම් දෙවිදත් තෙර ය. කුරුඬමුව තෙමේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ය.

## 22. කුක්කුර ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් නැයන්ට වැඩෙහි හැසිරීමක් අරභයා මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජෙකු රාජ්‍යය කරණ කල්හි බෝසතාණෝ කුක්කුරයෝනියෙහි ඉපද ශුනකයන් පිරිවරා මහ සොහොනෙහි වෙසෙනි.

එකල රජගෙහි හුන් බල්ලෝ රජතුමන්ගේ රියෙහි වරපට කෑවෝ ය. එබැවින් රජතුමා අන් සියලුම බල්ලන් මරා දමන්ට නියම කෙළේ ය. මහසොහොනෙහි හුන් ප්‍රධාන ශුනක තෙමේ පිරිවර සහිතව පැමිණ රජතුමන්ගේ නියමයට විරුද්ධව සටන් කොට "සම්පට කෑවෝ මාලිගාවෙහි වූ කීණබල්ලෝය"යි ඔප්පු කොට රජු ද යහමගෙහි පිහිටවූහ.

එකල රජතුමා ආනන්ද තෙරණුවෝ ය. කුකකුර තෙමේ ලොවුතුරා බුදුරජානන් වහන්සේ ය.

## 23. භොජජානීය ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම්හි වැඩවසන සේක් පසුබට වියයී ඇති මහණකු ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි මහබෝසතානෝ අස් රජෙක්ව උපන්හ. එසමයෙහි සත් රජකෙණෙක් බරණැස් රජය සඳහා යුදට පැමිණියහ. අනතිමේ දී අස්රජ තෙමේ සත් රජුන් අල්වා ගෙණැවිත් රජතුමන්ට හාරදී ඔවුන් නො මරණ ලෙස අවවාද කොට පරලොව හිඳේ ය.

එසමයෙහි රජ්ජුරුවෝ නම් මෙකල ආනන්ද සථවිරයෝ ය. අශ්වාචාර්‍ය තෙමේ සැරියුත් තෙරණුවෝ ය. අස්තෙමේ බුදුරජානන් වහන්සේ වෙති.

## 24. ආජඤ්ඤ ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවාසය කරණ සේක් හළ වියයී ඇති භික්ෂුවක ඇරබ මෙය වදාළ සේක.

රථාචාර්‍යයෙකු අශ්වයන් දෙදෙනෙකු රථයකයොදා ගෙණ ගොස් එතුවර වටලා හුන් සත් රජුන්ගෙන් සදෙනකු ගත් අවස්ථාවෙහි හිපහරක් වැදී එක් අසෙක් දුබලවිය. රියැදුරු ඒ අසු රියෙන් මුදා හැර අන් අසෙකු යොදන්ට පටන් ගති. ඒ දුටු දුබල අස් තෙමේ තමාම රියෙහි යොදවා ගෙණ යුද කරන්නට අණ කොට සත්වැන්නා ද මැඩ ජයගති.

එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද තෙරණුවෝ ය. සත්වැනි රජු ද අල්වා දුන් අශ්වයා නම් තිලෝගුරු බුදුරජානන් වහන්සේ ය.

## 25. තිත්තිර ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් දම්සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේගේ අතවැසි භික්ෂුවක අරභයා මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බඹදත් රජු රජය කරවන කල්හි අප මහ බෝසතානෝ ඒ රජතුමන්ට අනුශාසනා කරණ අමාත්‍යයාව උපන්හ. එක් දිනක් රජතුමන්ගේ මඟුල් අශ්වයා බලුඛක අසෙකු නැහැවූ තොටින් නාන්ට නො කැමති වූයේ දියට නො බසියි.

මෙය අමාත්‍යයාට දැන්වූ කල්හි රජ්ජුරුවන්ට එය පහදා දුන්නේ ය.

එසමයෙහි මංගල අශ්වතෙමේ මේ භික්ෂුව ය. රජ්ජුරුවෝ නම් ආනන්ද තෙරණුවෝ ය. අමාත්‍ය පුත්‍රයා නම් බුදුරජානන් වහන්සේ ය.

## 26. මහිලාමුඛ ජාතකය

තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිදත් තෙරුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බඹදත් රජහු රාජ්‍යය කරවන කල්හි මහබෝසතාණෝ ඒ රජතුමන්ට අමාත්‍යව උපන්හ. එකල ඒ රජතුමන්ට මහිලාමුඛ නම් සිල්වත් අසෙක් විය. උඹ සොරුන්ගේ බස් ඇසීමකින් රළුබවට පැමිණියේ ය. අමාත්‍යතෙමේ නැවත ඒ අසු සිල්වත් බවට පැමිණ්‍ම්‍ය.

එසමයෙහි මහිලාමුඛ හස්තියා මේ විපක්ෂ සේවී භික්ෂු ය. රජ්ජුරුවෝ ආනන්ද ස්ථවිරයෝ ය. අමාත්‍යතෙමේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ය.

## 27. අභිණ්හ ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් එක් උපාසකයෙකු හා මහලු තෙර කෙණෙකුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බඹදත් රජහු බරණැස්නුවර රජය කරවන කල්හි මහබෝසතානන් වහන්සේ ඒ රජුහට අමාත්‍යව උපන්හ. හේ මඟුලෑතු හා සුනඛයෙකු අතර ඇති වූ මිත්‍රකම විසඳා දැන්නේ ය.

එසමයෙහි සුනඛ තෙමේ දැන් මේ උපාසක තෙමේ ය. ඇත් තෙමේ මේ මහලු ස්ථවිර තෙමේ ය. පණ්ඩිත අමාත්‍යපුත්‍රතෙමේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ය.

## 28. නන්දිවිශාල ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම්හි වැඩවසන සේක් සවග භික්ෂූන්ගේ රළු තෙපුලක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස ගන්ධාර රට තක්සලා නුවර ගන්ධාර රජෙකු රාජ්‍යය කරවන කල්හි අප මහබෝසතාණෝ ගවජන්මයෙහි උපන්හ නන්දිවිසාල යයි උගේ නම් විය.

ගොන් හිමි බමුණා පරදු තබා ගැලක් පදවන්නේ යව කුළ අදුව කුළැයි පැවසී ය. නන්දිවිසාල තෙමේ ඒ රළුබසින් අමනාපවූයේ පා නො සොල්වා සිටිවන ම සිටියේ ය. දෙවෙනිවර යව පුතැයි කී පියවදනින් ගැල ඇද ජය ලබා දුන්නේ ය.

එසමයෙහි ඒ බමුණු තෙමේ දැන් ආනන්ද තෙරණුවෝ ය. නන්දිවිසාල තෙමේ තිලෝගුරු බෝධිසත්ත්වයන් වහන්සේ ය.

## 29. කණ්හ ජාතකය

තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් යමක මහා පෙළහර ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජෙකු රාජ්‍යය කරවන කල්හි අප මහ බෝසතාණන් වහන්සේ අඳුන්වන් ගොන් රජෙක්ව උපන්හ. උන් තමන්ට කෑද බත් ආදියෙන් උපස්ථාන කළ දුගී සත්‍රියකට පන්සියයක් කහවණු එකවිටම ලබා දුන්නේ ය.

එසමයෙහි මහලු සත්‍රිය උත්පලවණ්ණාවෝ ය. කාල නම් වෘෂභතෙමේ මෙකල බුදුරජානන් වහන්සේ ය.

## 30. මුනික ජාතකය

තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් ථුල්ලකුමාරිකා පලොභනයක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බඹදත් රජහු රජය කරවන කල්හි අප මහ බෝසතාණෝ එක් ගමක කෙළෙඹි පුතෙකුගේ ගෙහි ගවයෝනියෙහි උපන්හ. ඔහුට මහාලෝහිත යයි නමක් තැබූහ. මලනුවන්ට චුල්ලලෝහිත යයි නම් තැබූහ. ඒ ගෙහි ඇත්තෝ මුනික නම් උභරෙකු ද පෝෂ්‍ය කළහ.

එසමයෙහි මුනික සූකරයා නම් උකටලී මහණ ය. කුමාරිකාව නම් ථුල්ල කුමාරිකා ය. චුල්ලලෝහිත තෙමේ ආනන්ද සථවිරයෝ ය. මහා ලෝහිත තෙමේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ය.

## 31. කුළාවක ජාතකය

තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් පැන් නො පෙරා වැළඳූ භික්ෂූ කෙණෙකුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස මගධරට රජගහනුවර මගධ නම් රජ කෙණෙකු රාජ්‍යය කරණ කල්හි අපගේ මහබෝධිසත්වයෝ මවල ග්‍රාමයෙහි උපන්නාහු මස නමින් ප්‍රකට වූහ.

මසයන් ප්‍රධාන තිසක් දෙනා පිරිවහන මන්ත්‍ර කෙණෙක් වූහ. එනම් ඔවුහු ප්‍රාණවධ නො කරති. සොරකම් නො කරති. රා නො බොති මෛත්‍රිය වඩති. දන් දෙති මං සම කරති. පොකුණු කරති. ශාලා කරවති. යන මොහු වෙත්.

ඒ මසයන්ගේ සුධම්මා, චිත්‍රා, නන්දා, සුජාතා නයි අඹුවෝ සතරදෙනෙක්ද වූහ. හෙතෙමේ:-

"මාතාපෙතති භරං ජනතුං කුලෙ ජෙට්ඨාපචායිනං
සණ්හං සඛිල සම්භාසං පෙසුණෙය්‍යප්පහායිනං
මච්ඡර විනයෙ යුත්තනං සච්චං කොධාභිභුං නරං
තං වෙ දෙවා තාවතිංසා ආහු සප්පුරිසා ඉති"

යන සපනවුත සමාදන් වී විසීය. එයින් චුතවූ මඝතෙමේ සක්දෙව් රජ වී උපන්.

එසමයෙහි මාතලී තෙමේ මෙකල ආනන්ද සථවිරය. සක් තෙමේ බුදුරජානන් වහන්සේ ය.

## 32. නච්ච ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම්හි වැඩවාසය කරණ සේක් බහුභාණ්ඩික භික්ෂු නමක් ඇරබ මෙය වදාළ සේක.

ලජ්ජාසථාන පෙන්වා නැටූ මොනරුගේ නැටීම බැලූ හංසරාජ තෙමේ ලජ්ජාවට පැමිණියේ ය. එහෙයින් හංස පොතිකාව ඔහුට නො ලැබුනේ ය.

එසමයෙහි මොනර තෙමේ බහුභාණ්ඩික භික්ෂු වූයේ ය. හංසරාජයා තිලෝගුරු බුදුරජානන් වහන්සේ ය.

## 33. සමෙමාදමාන ජාතකය

බුදුරජානන් වහන්සේ කිඹුල්වත් පුරයෙහි නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක් ඔබරක් නිසා මේ ජාතකය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි අප මහ බෝසතාණන් වහන්සේ වටු ජන්මයෙහි උපන් සේක

එක් වටු වැද්දෙක් වටුරැල වසන තැනට පැමිණ දැලක් එලී ය. වටුවෝ එක්සත්වී දැලත් ඔසවා ගෙණ පියාඹා ගොස් කටුලැහැබක දැල රඳවා යවින් පැන ගොස් ගැලවුනාහ. දෙවෙනි දිනයෙහි වැදි පැමිණ දැල ලූ කල්හි කලහවූ වටුවෝ දැල ඔසවා ගෙණ නො ගොස් එහි ම රැඳී වැද්දට බත්වූහ.

එසමයෙහි නුවණ නැති වටුවා දෙව්දත් තෙර ය නුවණැති වටු තෙමේ මෙකල බුදුරජානන් වහන්සේ ය.

## 34. මත්ස්‍ය ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් පුරාණ දූනිකා පලොභනයක් අරභයා මෙය වදාළ සේක.

යටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් රජය කරවන කල්හි අප මහ බෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට පුරෙහිතව උපන්හ.

එක් දවසක් කෙවුලන්ගේ දැලට මත්ස්‍යයෙක් හසුවිය. දැලින් ගෙණ වැලි පිට හෙළූ ඒ මත්ස්‍යයා මරණ බියෙන් හඬන කල්හි එතැන්හි නැමට පැමිණි පුරෙහිතයාණෝ ඒ මත්ස්‍යයාගේ බැගෑ හඬ වටහා උඹ කෙවුලාගෙන් ඉල්වා ගෙණ දියට දැමූහ.

එකල මත්ස්‍යධෙනු තොමෝ දැන් මේ පුරාණ දූනිකාව ය මත්ස්‍යයා උකටලී මහණ තෙමේ ය. පුරෝහිත බමුණු තෙමේ මෙකල බුදුරජානන් වහන්සේ ය.

## 35. වට්ටක ජාතකය

බුදුරජානන් වහන්සේ මගධරට සැරිසරණ සේක් ලැවිගිනි නිවීමක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස මගධරට බෝධිසත්වයන් වහන්සේ වටුයෝනියෙහි ඉපද මවුකුසින් බිහිව බිජුවට පලා ගෙණ නික්මුනු මහත් වටුපැටවෙක් වූහ. එකල ඒ වනයෙහි ලැවිගින්නක් හටගෙණ දැ, එන්ට පටන් ගති. බෝසත් වටුපැටවානන් කළ සත්‍යක්‍රියා බලයෙන් කදල්ල ලඟට පැමිණ ගින්න නිවී ගියේ ය.

එසමයෙහි දෙමවුපියෝ නම් දැන් දෙමවුපියෝම ය. වටුපැටවා නම් ලොවුතුරා බුදුරජානන් වහන්සේ ය.

## 36. සකුණ ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් පන්සලක් ඇති භික්ෂු කෙණෙකුන් ඇරබ මේ ජාතකය වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බඹදත් රජහු රාජ්‍යය කරවන කල්හි බෝසතාණෝ පක්ෂි ජන්මයෙහි ඉපද මහත් සමූහ ඇතිසේක් එක් රුකක් ඇසුරු කොට වාසය කළාහු ය. පසු කලෙක ගසට ගිනි ඇවිලෙන ලකුණු දුටු බෝසත් සකුණ තෙමේ ඒ ගස හැර යන ලෙසට අනික් පක්ෂීන්ට ද අවවාද කෙළේ ය. ඒ පක්ෂියා ප්‍රධාන කොට ඇති සියල්ලන් ගස අත හැර දමා ගිය කල්හි විපක්ෂයෙහිවූ පක්ෂීහු එහි නැවතුනහ. ටික දවසකින්ම ඒ ගසට ගිනි ඇවිල වෘක්ෂය දැවී වැටුනේ ය.

එසමයෙහි බෝසතුන්ගේ අවවාදය කළ පක්ෂීහු නම් මෙකල බුදුපිරිස් ය. එහි නුවණැති පක්ෂීතෙමේ බුදුරජානන් වහන්සේ ය.

## 37. තිත්තිර ජාතකය

බුදුරජානන් වහන්සේ සැවැත්නුවරට වඩනා සේක් සැරියුත් මහ තෙරුන් වහන්සේට සෙනසුන් වැළකීමක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස හිමාලය වනයෙහි එක් පෙදෙසක නුගරුකක් ඇසුරු කොට තිත්තිරය, වානරය, හස්තිය යන යහළුවෝ තිදෙනෙක් විසූහ. පසුව ඔවුහු කතිකා කොට වැඩිමහල්ලන් තෝරා ගෙණ වානරයා සහ ඇතු විසින් තිත්වටුවාට ද ඇතුවිසින් වානරයාට ද ගරු සැලකිලි දක්වන අයුරින් ජ්‍යෙෂ්ඨාපචායන කර්මය කරන්ට පටන් ගත්හ.

එසමයෙහි හස්තියා නම් මුගලන් මහ ස්ථවිරයන් වහන්සේ ය. වඳුරා සැරියුත් තෙරුන් වහන්සේ ය. තිත්වටුවා ලොවුතුරා බුදුරජානන් වහන්සේ ය.

## 38. බක ජාතකය

තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් චීවරවඩකී නම් භික්ෂුවක ඇරබ මෙය වදාළ සේක.

ඇටගිය **දඹසක** අපේ බුදුරජානන් වහන්සේ එක් පියුම් විලක් අසල **ලුණුවරණ** ගසක රුක් දෙවිව උපන්හ.

එක් නියංසායක ඒ විලෙහි වසන කුඩමස්සෝ එක් **කොකෙකු** විසින් **කෑ** දමන ලදහ. ඒ **කොකා** ම උපායෙන් කකුළුවෙකු ද **කෑ** දමන්ට සූදානම් විය. ඒ අවසරයෙහි කකුළුතෙමේ කොකාගේ ග්‍රීවය සිඳ දැමීය. මේ දුටු රුක් දෙවිතෙමේ **වනය** එකතින් නාදවන සේ ප්‍රීතිඝෝෂා **කෙළේ** ය.

එසමයෙහි **කොකා** නම් මෙකල චිවර වඩිකී තෙමේ ය කකුළුවා නම් පිරිසර විසූ වංචාබුද්ධි දන්නා මහණ තෙමේ ය. රුක් දෙවියා නම් මෙකල බුදුරජානන් **වහන්සේ** ය.

## 39. නන්ද ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් සද්ධිවිහාරික තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික භික්ෂු කෙණෙකුන් ඇරබ වදාළ සේක.

ඇටගිය දවස බරණැස්නුවර බඹදත් නම් රජ**කෙණෙකුන්** රාජ්‍යය **කරණ** කල්හි අප මහබෝසතාණෝ **කෙළෙඹි** කුලයක **උපන්හ**. ඔහුගේ යහළුවූ එක් පුරුෂයෙක් තමන් සතු ධනය නිදන් කොට තබා නන්ද නම් දැසයෙකුට ඒ බැව් කියා මිය ගියේ ය.

ඒ පුරුෂයාගේ පුත්තෙමේ නිදන් කළ ධනය ගැණීමට කල්පනා කොට දැසයාන් කැඳවා ගෙණ වනයට ගියේ ය. දැසතෙමේ ධනය නිදන් කළ තැන සිට ගෙණ කුමාරයාට ගරහන්ට පටන් ගත්තේ ය. ධනය ගන්නා අයුරක් නො කීය. ඉක්බිති ඒ කුමාරතෙමේ බෝසතුන් කරා එළඹ එයට උපාය අසා ගෙණ විත් ධනය හැර ගත්තේ ය.

එසමයෙහි නන්ද දැසයා සද්ධිවිහාරික මහණතෙමේ ය. නුවණැති කෙළෙඹිපුත් තෙමේ **ලොවුතුරා** බුදුරජානන් **වහන්සේ** ය.

## 40. ඛදිරංගාර ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවාසය **කරණ සේක්** අනේ-පිඬු සිටානන් ඇරබ මෙය වදාළ **සේක**.

ඇටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් රාජ්‍යය **කරවන** කල්හි අප **මහ බෝසතාණෝ එනුවර** සිටුකුලයක **උපන්හ**. පියානන්ගේ ඇවැමෙන් සිටුතනතුර ද ලැබ නුවර සතර වාසල්දොර **දන්හල්කරවා දන්දෙන්ට** පටන් **ගත්හ**.

එක් දිනක් මාරයා පිඬුසිඟා වැඩි පසේ බුදුරජානන් වහන්සේ නමක දැක සිටුවටත් පසේ බුදුරදුන්ටත් අතරෙහි මහත් ගිනිවළක් මැවීය. සිටාණෝ පිඬු **ගෙණ** පැමිණ ගිනිවළ මැදට පැන පසේ බුදුරදුන් වහන්සේට දන් පිළිගැන්වූහ.

එසමයෙහි ඛත්තලිය පිළිගැන්වූ බරණැස් සිටාණෝ නම් මෙකල ලොවුතුරා බුදුරජානන් වහන්සේ ය.

## 41. ලොසක ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් ලෝසකතිස්ස තෙරුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස කාශ්‍යප බුදුරජානන් වහන්සේගේ කාලයෙහි එක්තරා භික්ෂු තමක් ගම් සෙනස්නෙක වෙසෙති. එගම ප්‍රධාන කෙලෙඹියා ගෙදරට පිඬුපිණිස වැඩි රහතන්වහන්සේ කෙණෙකු කෙරෙහි පැහැදී උන්වහන්සේට දන් පිළිගැන් වීය.

පසුදිනයෙහි සියගෙදොරට වැඩි නේවාසික භික්ෂූන් වහන්සේට කෙලෙඹිපුත්‍රයා දන් වළඳවා ආගනතුකව පැමිණි රහතුන් වහන්සේට දන් පිළියෙල කොට යැවීය. ඒ භික්ෂු තෙමේ ඒ දන් පාත්‍රය ගෙණ ගොස් රහතුන් වහන්සේට නො පිළිගන්වා ඉවත දැමීය. ඒ අකුසලයෙන් ඒ භික්ෂුතම මනුෂ්‍යප්‍රෙතව නොබෝ කලක් සිට මැරී නිරයෙහි උපන්නේ ය. නිරයෙන් මිදී අවුත් පන්සියක් ජාතියක යක්ෂව උපන්නේ ය. නැවත පන්සියයක් ජාතියෙහි සුනඛව උපන්නේ ය. නැවත මිනිස්ව උපන් ඔහුට මිත්තවින්දක යයි නමක් විය.

එසමයෙහි මිත්තවින්දකයා මේ ලොසක සථවිර ය. දිසාපාමොක් ඇදුරු තෙමේ බුදුරජානන් වහන්සේ ය.

## 42. කපොත ජාතකය

තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් එක්තරා ලොල් භික්ෂු කෙණෙකුන් ඇරබ වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජහු රාජ්‍යය කරවන කල්හි අප මහ බෝසතාණෝ පාරුපත යෝනියෙහි උපන්හ.

එනුවර සිටුගෙදර අරක්කැමියා විසින් සපයන ලද කුඩුවක ඒ පරෙවියා වෙසෙයි. කවුඩෙක් ද එහි පැමිණ පරෙවියා හා යාළුව විසීය. එක් දවසක් අරක්කැමියා පිසූ මාංස ව්‍යංජනයක ඉව වැටුනු කවුඩා එදා කෑම පිණිස නො ගොස් ගෙදර කුඩුවේම නැවතුනි. කවුඩු තෙමේ අරක්කැමියාගේ ඉඩයක් බලා ගෙට වැදී බදුනෙහි වූ මස අනුභව කරන්ට විය. අරක්කැමියාද එය දැක කපුටා අල්වා ගෙණ පිහාටු සිඳ දමා ඇඟ ලුණු මිරිස් ගා කුඩුවට පිසිකෙළේ ය.

එසමයෙහි කපුටා නම් දැන් ලොල් මහණ ය. පරෙවිව උපන්නේ ලොවුතුරා බුදුරජානන් වහන්සේ ය.

## 43. වේළුක ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් දුවිවභික්ෂුවක ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රාජ්‍යය කරවන කල්හි අප මහ බෝසතාණෝ එනුවර හොඟකුලයෙක ඉපද පසුව වනයට ගොස් පැවිදිව පංචාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ගෙණ විසූහ. එහි වසන අන් තාපසයෙක් සඵීපොතකයෙකු උණ පුරුකක තබා ගෙණ ඇති කෙළේ ය. ඔහුට වේළුක පියා යයි නමක් ද විය. අන්‍යයන් එසේ නො කරණ ලෙසට අවවාද කළ තමුත් හේ එය අන් නො හලේ ය.

පසු දවසක කිපදවසක් කැම දෙන්ට නො හැකි වීමෙන් දරුණු වූ සඕයා විසින් දෂ්ටකොට හේ මරා දමන ලදී.

එසමයෙහි වේළුක පියානෝ නම් මේ දුර්වීව මහණ ය ප්‍රධාන තපස්වීවර තෙමේ මෙකල බුදුරජානෝ ය.

## 44. මකස ජාතකය

බුදුරජානන් වහන්සේ මගධරට සැරිසරණ සේක් එක් ගමක නුවණ නැති මිනිසුන් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රජය කරවන කල්හි අප මහ බෝසතානෝ වෙළඳුමෙන් ජීවත් වෙති.

කසීරට එක් පසල්ගමක වඩුවෝ වෙසෙති. එක් වඩුවෙක් තමන්ගේ හිස විදින මදුරුවා එලවා දමන්ට යයි පුතුට කීය. පුත්තෙමේ පොරොවක් ගෙණ හිසේ හුන් මදුරුවාට ගසා හිස දෙපලු කෙළේ ය.

බෝසතානෝ එතනට පැමිණ අඥානයන් ඇසුරු නො කරණ ලෙසට අවවාද කළහ.

එසමයෙහි වෙළඳුනෝ නම් බුදුරජානන් වහන්සේ ය.

## 45. රොහිණී ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් අනේපිඩු මහ සිටානන්ගේ දැසියක ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි මහ බෝසතානන් වහන්සේ සිටුකුලයක ඉපද සිටියහ. ඒ සිටානන්ගේ රොහිණී නම් දැස්සක් වූවා ය. ඕතොමෝ සිය මවුගේ හිසෙහි හුන් මැස්සා එලවා දමන්නට හිසට මොහොල් පහරක් දුන්නී ය.

එකල මැනියෝ දැනුත් මැනියෝ ය. දුවනියෝ දැනුත් දුවනියෝ ය. සිටුතෙමේ මෙකල බුදුරජානන් වහන්සේ ය.

## 46. ආරාමදූසක ජාතකය

බුදුරජානන් වහන්සේ කොසොල්රට එක්තරා ගමක වසන සේක් උද්‍යානය දූෂ්‍යකිරීමක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බඹදත් රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි එනුවර මිනිස්සු කලෙක නැකැත් කෙළි කෙළිමින් සිසුහ. වානරයෝ උයනෙහි දිය වත්කරන්නාහු ගස් උගුල උගුලා මුල් තරමට දිය වත්කළාහුය. එයින් උයන පාළුවී ගියේ ය.

එසමයෙහි ප්‍රධාන වානරතෙමේ මෙකල ආරාමය දූෂ්‍යකළ ගම් දරුවා ය. එකල ඔවාදුන් පණ්ඩිත පුරුෂතෙමේ බුදුරජානන් වහන්සේ ය.

## 47. වාරුණී ජාතකය

බුදුරජානන් වහන්සේ දෙවිරම්නි වැඩවසන සේක් වාරුණී දූෂ්‍යකිරීමක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි අප මහ බෝසතානෝ සිටුකුලයක ඉපද සිටාන කෙණෙක් වූහ.

ඒ බරණැස් සිටානන් ඇසුණකොට වෙළෙන්දෙක් ජීවත් වූයේ ය හේ අතවැස්සාට රු විකොට මිල ගණුවයි නියම කෙළේ ය අතවැසිතෙමේ රුවලට ලුණු යොදා එය දූෂ්‍ය කෙළේ ය.

එසමයෙහි රු දූෂ්‍ය කළ අතවැසි පුරුෂයා දැනුදු රු දූෂ්‍ය කළ අතවැස්සා ය. සිටුතෙමේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ය.

## 48. වේදබ්භ ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් දුශ්ශීල භික්ෂුවක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි එක් ගමක එක්තරා බමුණෙක් වේදබ්භ මන්ත්‍රයක් දන්නේ ය. මන්ත්‍රය පිරුවා අහස බැලූ කල්හි සත්රුවන් වැසි වස්නේ ය. අප මහ බෝසතානෝ ඒ බමුණාගෙන් ශාස්ත්‍රය උගත්හ.

එක් දවසක් ඒ බමුණා නුසුදුසු සේ සත්රුවන් වැසි වැස්වූ හෙයින් අතරමග සොරුන්ගෙන් විනාශයට පැමිණියේ ය

එසමයෙහි වේදබ්භ බ්‍රාහ්මණයා නම් දැන් නො කීකරු මහණ ය. අනෙනවාසික තෙමේ මෙකල තිලෝගුරු බුදුරජානන් වහන්සේ ය.

## 49. නක්ඛත්ත ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවාසය කරණ කල්හි එක්තරා ආජීවකයෙකු ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි නගරවාසීහු එක් දුවනියකුන් විවාහ කරදෙන්ට නැකැත් යෝගයක් ආජීවකයෙකුගෙන් විචාළාහුය. ඔහු කී නැකැත් යෝගයෙන් කළ ඒ මංගලය විනාශවිය. ඔවුහු ආජීවක හට වෝදනා කළාහු ය.

එසමයෙහි ආජීවක තෙමේ දැනුදු ආජීවකය. එසමයෙහි කුලයෝ දැනුදු කුලයෝය. එකල ඔවුන්ට අවවාද දුන් පණ්ඩිත පුරුෂ තෙමේ ලොවුතුරා බුදුරජානන් වහන්සේ ය.

## 50. දුම්මේධ ජාතකය

බුදුරජානන් වහන්සේ දෙව්රම්හි වැඩවසන සේක් ලෝකාමිෂයාවක් ඇරබ මෙය වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් රාජ්‍යය කරණ කල්හි බෝධිසත්වයන් වහන්සේ අගමෙහෙසියගේ කුසෙහි පිළිසිඳ ගත්හ. ඒ කුමාරයන්ට ද බ්‍රහ්මදත්ත යයි නම් තැබූහ. එසමයෙහි දෙවියන් පිදීම පිණිස එළු එරෙළු ආදි සතුන් නසා බිලිපූජා කළහ. පියරජතුමන් මළ කල්හි පුත් බ්‍රහ්මදත්ත කුමාරයන් රජකම ලැබිය. පෙර පැවැති බලිබිලි සියල්ලම ඒ රජතුමා නතර කෙළේ ය. පස් පවින් හා දස අකුසලෙන් මහජනයා වැළැක්වීය.

එකල පුත්වූ බරණැස් රජතෙමේ මෙකල බුදුරජානන් වහන්සේ ය.

# පටුන


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | අපණ්ණක ජාතකය | ... ... ... | 1 |
| 2. | වණ්ණුපථ ,, | ... ... ... | 9 |
| 3. | සෙරිවාණිජ ,, | ... ... ... | 12 |
| 4. | චුල්ල සෙට්ඨි ,, | ... ... ... | 14 |
| 5. | තණ්ඩුල නාලි ,, | ... ... ... | 22 |
| 6. | දෙවධම්ම ,, | ... ... ... | 25 |
| 7. | කට්ඨහාරි ,, | ... ... ... | 29 |
| 8. | ගාමණ්ඩි ,, | ... ... ... | 31 |
| 9. | මඛාදෙව ,, | ... ... ... | 32 |
| 10. | සුඛවිහාරී ,, | ... ... ... | 34 |
| 11. | ලකඛණමිග ,, | ... ... ... | 36 |
| 12. | නිග්‍රොධමිග ,, | ... ... ... | 38 |
| 13. | කණ්ඩින ,, | ... ... ... | 45 |
| 14. | වාතමිග ,, | ... ... ... | 47 |
| 15. | ඛරාදි ,, | ... ... ... | 50 |
| 16. | නිපල්ලත්ථමිග ,, | ... ... ... | 51 |
| 17. | මාලුක ,, | ... ... ... | 54 |
| 18 | මතකහත්ත ,, | ... ... ... | 55 |
| 19. | ආයාචිත ,, | ... ... ... | 57 |
| 20 | තලපාත ,, | ... ... ... | 58 |
| 21. | කුරුඩධම්ම ,, | ... ... ... | 60 |
| 22. | කුක්කුර ,, | ... ... ... | 61 |
| 23. | හොජාජානීය ,, | ... ... ... | 64 |
| 24. | ආජඤ්ඤ ,, | ... ... ... | 66 |
| 25. | තීණි ,, | ... ... ... | 67 |
| 26. | මඝිලාමුඛ ,, | ... ... ... | 70 |
| 27. | අභිණ්හ ,, | ... ... ... | 74 |
| 28. | නන්දිවිශාල ,, | ... ... ... | 75 |
| 29. | කාණහ ,, | ... ... ... | 77 |
| 30. | මුනික ,, | ... ... ... | 79 |
| 31. | කුලාවක ,, | ... ... ... | 81 |
| 32. | නව්ව ,, | ... ... ... | 86 |
| 33. | සමෙමාදමාන ,, | ... ... ... | 87 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 34. | මත්ස්‍ය | ,, | ... | ... | ... | 89 |
| 35. | වට්ටක | ,, | ... | ... | ... | 90 |
| 36. | සකුණ | ,, | ... | ... | ... | 92 |
| 37. | තිත්තිර | ,, | . . | ... | ... | 94 |
| 38. | බක | ,, | ... | ... | ... | 97 |
| 39. | නන්දි | ,, | ... | ... | ... | 100 |
| 40. | බදිරඞ්ගාර | ,, | ... | ... | ... | 102 |
| 41. | ලොසක | ,, | ... | ... | ... | 109 |
| 43. | කපොත | ,, | ... | ... | ... | 114 |
| 43. | වේළුක | ,, | ... | ... | ... | 116 |
| 44. | මකස | ,, | ... | ... | ... | 118 |
| 45. | රොහිණී | ,, | ... | ... | ... | 119 |
| 46. | ආරාමදූසක | ,, | ... | ... | ... | 120 |
| 47. | වාරුණී | ,, | ... | ... | ... | 121 |
| 48. | වෙදබ්භ | ,, | ... | ... | ... | 122 |
| 49. | නකුලත්තා | ,, | ... | ... | ... | 125 |
| 50 | දුම්මේධ | ,, | ... | ... | ... | 126 |

# බුඩවංශය

හෙවත්,

# බුදුරදුන්ගේ ජීවිත කථාව.

———o)=ः=(o———

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුඩස්ස.

———)o(———

වඳිඩා ඔරසා සම්මා-සම්බුඩං පරමාදරා,
බුඩවංසං පවක්ඛාමි-සංගහෙඩ්ඨාඩ්ඨකථා නයං.

**අසරණ** සරණවූ සරණාගත වප්‍රපඤ්ජරවූ කරුණා නිධානවූ තුන් ලොවට නායකවූ සම්‍යක් සම්බුද්ධ සර්ඹඥ රාජජාත්තනමයාත්තන්වහන්සේට උත්තමාදර ඇතියෙන් භක්තිප්‍රේමානිභාරාවත්තනතොත්තනමාඩිගයෙන් භයලොභ කුලාචාරාදීන් විනා සකසා වැද අර්‍ථකථා නය ගෙණ බුඩවංශය හෙවත් බුදුරජානන් වහන්සේගේ **ජීවිතකථාව** සිංහල භාෂාවෙන් රචනා කරන්නෙමි. හේ මනාව ඇසිය යුතු:-

පූර්‍වයෙහි වූ ඒ ඒ කාරණයන් පිළිබඳ අපණ්ණක ජාතකය ආදීවූ යම් ජාතක ධර්‍ම කෙණෙක් සියල්ල දන්නාවූ සර්ඹඥයන් වහන්සේ විසින් දෙශනා කරණ ලද්දාහුද, සත්ත්වයන් සංසාර සාගරයෙන් එතරකිරීම, අර්‍ථකොට ඇත්තා වූ තුන්ලොවට නායක වූ සර්ඹඥයන් වහන්සේ යම් ජාතකයන්හි අතනතවූ බොධිසම්භාරයන් පරිපාවනය කළසේක්ද? ඒ සියල්ල එකතුකොට සංගායනාවට නගත්තාවූ සංගායනා කතෘන් විසින් යම් ධර්‍මයක් සංගායනා කරණ ලද්දේද: ඒ ධර්‍මය ජාතකධර්‍ම නම් වේ. එහෙයින් කීහ.

**ජාතක අට්ඨවාවෙහි**

"තං තං කාරණමාගම්ම - දෙසිතානි ජුතීමතා
අපණ්ණකාදීනි පුරා - ජාතකානි මහෙසිනා
යානි යෙසු විරං සත්ථා - ලොක නිත්ථරනත්ථිකො
අතනෙන බොධිසම්භාරෙ - පරිපාවෙසි නායකො
තානි සබ්බානි එකජ්ඣං - ආරොපෙනෙතහි සංගහං
ජාතකං නාම සංගීතං - ධම්මසංගාහකෙහි යං"

## සුමෙධපණ්ඩිතයෝ

සර්ඹලොකෙකනායකවූ කකුසඳ, කොණාගමන, කාශ්‍යප, ගෞතම සම්බුද්ධ යන බුඩ දිවාකරයන් පස්දෙනෙකුන් වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිත වෙයින් භද්‍රකල්පය'යි ලද නම් ඇති මේ කල්පයට සාරාසංඛ්‍ය කල්පලක්ෂයකින් මත්තෙහි සාරමණ්ඩ නම් කල්පයෙක් වූයේය. ඒ කල්පයෙහි සතරවන අතුරුකප සවිඤ්ඤුණක අවිඤ්ඤුණක සියලු රත්නාදියට උත්පත්තිස්ථාන වූ ගංගාගිරි තටාකාරණ්‍යාදියෙන් සමලඞ්කෘතවූ ජම්බුද්වීපයෙහි දෙවියන්ගේ

ආලකමන්ද නම්රාජධානිය සේ සදෘ රම්‍යවූ ක්ෂණික මරණ නැතිහෙයින් අමර යයි කියන ලද දෙවියන් වැනි නරනාරි සමූහයාගෙන් සමාකිණ්ණ හෙයින් අමරවතී නුවර යයි ලද නම් ඇති එක්තරා නුවරෙක් වූයේය. එහි සුමේධ නම් බ්‍රාහ්මණොත්තම කෙනෙක් වාසය කෙරෙති. ඔහු විතාහි සත්වන කුලපරම්පරාව දක්වා කුල පිළිබඳ තෙපුලෙන් නොදැමිය හැකිවූ මාතෘ පිතෘ කුලවයයෙන් පිරිසිදුවූ දුටුවන් සිත් ප්‍රිය උපදවන්නාවූ අනඝයෘ පරයන රූපශොභාවෙන් යුක්ත වූ කෘෂි වණිජ්‍යාදිවූ අන් කිසි ක්‍රියාවක ව්‍යාපෘතනොවී බ්‍රාහ්මණයන් විසින් උගතමතා සෘක්යජුඃසාම යන ත්‍රිවෙදයද, අථර්වෙදය, කල්පය, ව්‍යාකරණය, ජ්‍යොතිශ් ශාස්ත්‍රය ආදී ෂඩඞග හා අනිකුදු ලොකයෙහි පැවැති යම් යම් ශාස්ත්‍රයක් ඇද්ද? ඒ සියල්ලෙන්ම කෙළපැමිණියාවූ බ්‍රාහ්මණොත්තම කෙනෙක්වූහ. ඔහුගේ මව්පිය දෙදෙන ඔහු ලදරුකාලයෙහි කාලක්‍රියා කළහුය.

ඔහුගේ වස්තු රක්ෂා කිරීමෙහි නියුක්ත රාශිවඩ්ඪක නම් අමාත්‍යතෙමේ අය පුඤ්ඤකය ගෙණ රන් රිදී මුතුමැණික් ආදියෙන් පිරුණාවූ වස්තු ගබඩාවල දොරහරවා "සවාමීන් වහන්ස, මේ ධනරාශියෙන් මෙපමණක් නුඹවහන්සේගේ මවු සන්තක ධනය ය, මෙපමණෙක් පියසන්තක ධනය; මෙපමණෙක් නුඹ-වහන්සේගේ මුතුන් මිමුතුන් සන්තක ධනයය, නුඹවහන්සේගේ සත්මුතුන් පරම්පරාවපටන් පැවත එන්නාවූ මේ ධනරාශිය ප්‍රතිජග්ගනය කළ මැනව" යි කීහ. එකල්හි සුමේධ පණ්ඩිත තෙමේ මෙසේ සිතුවේක:- "මාගේ මාතෘ පිතෘ ආදීහු මේ ධන රැස්කොට තබා පරලොව යන්නාහු එකම කහවණුවක් පමණවත් කැටුව නොගෙණ ම ගියාහුය. මා විසින් වනාහි මේ ධනසම්පත් දන් දීම් වශයෙන් කැටුව ගෙණ යන්නට වටනේ" යි; සිතා රජහට එපවත් දන්වා ධන ධාන්‍යයෙන් ප්‍රයෝජන ඇති තෙණෙක් සුමේධ බ්‍රාහ්මණයන්ගේ ගෙදොරට එන්නේය'යි සියලු නුවර බෙර හසුරුවා යාචකයන් සිත් ලෙස සත්දවසක් රුවන් පිරු ගබඩාවල දොරහැර නොවසා දන් දුන්සේක.

ඉක්බිත්තෙන් මාගේ සවාමිදරුවූ ඒ සුමේධ බොධිසත්වයෝ දිව්‍ය විමානයක් සෙයින් උතුම්වූ මතුමහල්තලයෙහි රහොගතව පලක්බඳ වැඩහිඳ මෙසේ සිතුවාහුය. කෙසේද? යත්; "එම්බා සුමේධ පණ්ඩිතයෙනි, නැවත නැවත භවයෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කිරීම නම් මහත් දුක්වන්නේය. එසේම උපනුපත් ස්ථානයෙහි ශරීරයාගේ විනාශවීමද දුක්වන්නේය. මමද ජාතිය සවභාව කොට ඇත්තෙමි. ජරාව සවභාව කොට ඇත්තෙමි. ව්‍යාධිය සවභාව-කොට ඇත්තෙමි. මෙසේ ජාති ජරා ව්‍යාධි මරණ ඇති සසරෙහි දුක්විඳිනා මා විසින් ජාති නැත්තාවූ ජරානැත්තාවූ ව්‍යාධිනැත්තාවූ මරණ නැත්තාවූ ඒකාන්ත සැප ඇති රාගාදීන් තැවීමක් නැතිහෙයින් සිසිල්වූ අමෘතමහානිර්ව්‍රාණය සොයන්නට වටනේය. භවයෙන් මිදීම ඇති නිර්වාණ මාගීයකුදු ඒකාන්ත යෙන් ඇතිවිය යුතුය"යි සිතුවේක. එයින් මත්තෙහිද සිතන්සේක් යම්සේ මේ ලෝකයෙහි කාය චිත්ත පීඩා කරන්නාවූ දුකඛය නසන සැපතනම් දෙයක් ඇත්තේද? එපරිද්දෙන්ම භවය ඇතිකල්හි ඒ භවය විනාශයට සුදුසුවූ විභවයකුත් ඇතිවිය යුතුය. යම්සේ මේ ලෝකයෙහි නොඉවසිය හැකි උෂ්ණයක් ඇති කල්හි ඒ නැසියයුතු ජල පවන් ආදී සිහිල් දෙයකුත් ඇත්තේය. එපරිද්දෙන් ම රාගාදී ක්ලෙශාග්නි සංහිදුවන නිර්වාණයකුත්

ඇතිවිය යුතුය යම්සේ ලොකයෙහි පවිටුටු ලාමකවූ පාපධර්මයක් ඇතිකල්හි ඒ නැසිය යුතුවූ කල්‍යාණවූ අනවද්‍යවූ කුසලධර්මයකුදු ඇතිවිය යුතුය. එපරිද්දෙන්ම ඒ ඒ තන්හි උපදවන පවිටුටු ජාතිය ඇතිකල්හි ඒ ජාතිය නසන්නාවූ නිර්‍වාණයකුත් ඇත්තේමය''යි,. නිවන් ඇති බැව් නිශ්චය කොට සිතුසේක.

එහෙයින් කිහ:-

''යථා'පි දුක්ඛා ජිජ්ජනෙන - සුඛනනාම' පි විජ්ජති,
එවං භවෙ විජ්ජමානෙ විභවෝ'පි ඉච්ඡිතබ්බකෙහා''

තවද බුදුන් පසේබුදුන් හැර සෙස්සන් විසින් නොසෙවිය හැකි නිර්‍වාණය ඇති බැව් මෙසේ අනෙකොපමාවෙන් විනිශ්චය කොට සොයා තමා කාමයෙන් නික්ම ගොස් ඒ නිර්‍වාණය සෙවිය යුතු බව නොයෙක් උපමායෙන් තැව තත් සිතුසේක. ඒ කකාසේද?යත්; 'එම්බා, සුමේධ පණ්ඩිතයෙනි, යම්සේ පුරුෂයෙක් මහත් අසුචි වළෙක්හි ගැළී කිළුටු ගාත්‍ර ඇතිව සිටී ද? ඒ පුරුෂයා පස් පියුමෙන් ගැවසීගත් හිසිල් පැහින් පිරි තිබෙන විලක් දැක ඒ විලට බස්නට මග නොසොයා නම් ශරීරයෙහි තැවරී තිබෙන අසුචිමල සෝදා සුද්ධවෙමි'සි'' සිතා විලට බස්නට උත්සාහ නොකෙරේ නම් ඒ අඥාන පුරුෂයාගේ දෙෂයක් මිස විලෙහි දෙෂයෙක් නොවන්නේය. එසේම කෙලෙස් තමැති මල පිරිසිදුකිරීමට සමර්‍ථවූ නිවන් තමැති විලට බැස කෙලෙස්මල පිරිසිදු කිරීමට උත්සාහ නො කෙරේ නම් එම්බා සුමේධ පණ්ඩිතයෙනි, නොපගේම දෙෂය මිස නිර්‍වාණ තමැති විලෙහි දෙෂයෙක් නොවන්නේය.

යම්සේ සොරුන් විසින් පිරිවරණ ලද පුරුෂයෙක් ගැලවී යන්නට සුදුසු මාගීයක් ඇතිව තිබිය දී; ඉදින් ඒ මග නොයේ නම් මාගීයෙහි දෙෂයෙක් නොවෙයි. ඒ පුරුෂයාගේ ම දෙෂයක් වන්නේය. එපරිද්දෙන්ම කෙලෙස් තමැති සොරුන් විසින් පිරිවරණ ලද නෙවත් වටකොට සිසාරා ගන්නාලද පුරුෂයෙක් ඇත්තේ ද? ඒ පුරුෂයා කෙලෙස් සතුරන්ගෙන් විනිර්මුක්තවූ නිර්‍වාණ මාගීය ඇතුව තිබිය දී; ඒ මග නොයේ නම් ඒ පුරුෂයාගේම දෙෂය මිස නිර්‍වාණ මාගීයෙහි දෙෂයෙක් නොවන්නේය.

යම්සේ ව්‍යාධියෙන් පීඩිතවූ පුරුෂයෙක් සර්‍වව්‍යාධ්‍යුපශමනය කිරීමෙහි දක්‍ෂවූ වෛද්‍යවරයකු සමීපයෙහි ඇතුව සිටියදී; ඒ වෛද්‍යවරයා කරා පැමිණ ව්‍යාධියට නිසි පිළියම් නොකරවා නම් ඔහුගේ දෙෂය මිස වෛද්‍යවරයාගේ දෙෂයෙක් නොවන්නේය. එපරිද්දෙන්ම කෙලෙස් තමැති ව්‍යාධියෙන් පීඩිතවූ සත්ත්ව තෙමේ රොග ව්‍යුපසමනයට සමර්‍ථවූ නිවන් තමැති ආචාරීන් සේවනය නො කෙරේ නම් ඒ පුද්ගලයාගේ දෙෂය මිස නිවන් තමැති ආචාරීන්ගේ දෙෂයෙක් නොවන්නේය.

එහෙයින් කිහ.

''යථා ගුථගතො පුරිසො-තළාකං දිස්වාන පූරිතං
න ගවෙසති තං තළාකං-න ඉදමසෝ තළාකස්ස සෝ-පෙ''

තවද වර්ෂස් භූමියෙහි පහකරණලද මලමූත්‍රයෙහි කිසි ආලයක් නො කොට නිහතකොට යන ස්ත්‍රීපුරුෂයෝ එය රෙදිකොත දවටාගෙණ හෝ හිතෙන් හෝ ගෙණ නොයෙදීද? එපරිදිදෙන්ම මා විසිනුත් මේ කුණු ශරීරයෙහි, ආල යක් මැදහත්කමක් නොකොට දමා නිවන්පුර යා යුතුය.

තවද, යම්සේ නාවිකයෝ දිරා දුදුරුව උදකොත්ගතවන ජරා ජීණී නැව් හැරදමා යෙද්ද එසේම මා විසිනුත් නවදොරකින් වැහෙන කුණු ඇති මේ ශරීරය හැර නිවන්පුර යා යුතුය.

තවද යම්සේ පුරුෂයෙක් නොයෙක් රත්නයන් ගෙණ සොරුන් හා සමග යන්නේ තමාගේ රත්නයන් සොරුන් කෙරෙන් නසීදෝ යන භයින් ඔවුන් හා නොගොස් නිරුපද්‍රැතව මාගීයකින් යේද? එසේම මාවිසිනුදු සොරුන් වැනි මේ ශරීරය හැර යා යුතුය. ඉදින් තෘෂ්ණාව කෙළෙම් නම් කුසල් නමැති රුවන් නස්නේය. එබැවින් මා විසිනුදු කුසල් නමැති රුවන් නැසීමට භයින් මේ ශරීරය හැර නිවන් නමැති නගරයට යා යුතු ම'ය''යි සිතුසේක.

එහෙයින් කීහ:-

''යථා'පි කුණපං පුරිසෝ-කණ්ඨේ බධං ජිගුච්ඡය
මොචයිත්වාන ගච්ඡෙය්‍ය-සුඛී සෙරී සයංවසී-පෙ-''

මේ ආදි අතෙකොපමාවෙන් හිතිගෙන් නික්මෙන්නට සුදුසු අපී සිතින් සළකා තමන්ගේ ප්‍රමාණාතික්‍රාන්තවූ ධනරාශිය යට කී ක්‍රමයෙන් ශ්‍රාවකාදීන්ට දන් දී; වස්තුකාම ක්ලෙශය හැර අමර නම් නුවරින් නික්ම හුදකලාව හිමවත ධම්මික නම් පර්වතය නිසා පඤ්චදෙශ විනිර්මුක්ත පන්සලක් හා සක්මන් මළු වක් මවා කාමවිතර්ක දී පඤ්චනීවරණ ධර්මයෙන් වෙන්වූ පඤ්චාභිඥ අෂ්ටසමා පත්ති උපදවනු පිණිස ඒ ආශ්‍රම ප්‍රදෙශයෙහි නවදෙශ සමන්විතවූ සාටක යුගලය හැර වාදශගුණ සමන්විතවූ වාකචීවරය හැඳ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූසේක. මෙසේ පැවිදිවූ තැනැත්තේ අෂ්ටදෙශයකින් සමාකීර්ණවූ ඒ පන්සල හැර දශගුණයකින් සමන්විතවූ වෘක්ෂමූලයට එළඹ ධාන්‍යයෙන් කළාවූ සියළු භොජනය හැර ප්‍රවෘත්ත ඵල භොජනය කොට නිෂද්‍යාස්ථානවං-ක්‍රමණ වශයෙන් වියැති කිරීමෙහි යෙදී සත්දවස ඇතුළෙහිම පඤ්චාභිඥ අෂ්ටසමාපත්තිලාභිවූ සේක.

එයින් කීහ:

''එවා'හං චින්තයිත්වාන-නෙක ඛොවි' සතං ධනං
නාථා 'නාථානං දත්වාන-හිමවන්ත මුපාගමිං-පෙ-

එසමයෙහි අවිද්‍යා නමැති අන්ධකාරය නසන්නාවූ සබ්බී නමැති ප්‍රදීපා ලොකය කරන්නාවූ සර්ලොකයාහව ශාන්තිකරවූ දීපඞ්කර සම්‍යක් සම්බුදුරජා නන් වහන්සේ රජට පූජාභාජනයෙහි අතල්පකල්ප කොටිශතසහස්‍රයෙහි දෘඪාදී සමත්‍රිංශත් පාරමී ධර්මයන් පුරා රම්‍යවතී නම් රාජධානියෙහි සුදෙව නරපතින් නිසා සුමෙධා නම් බිසවුන්කුස ප්‍රතිසන්ධිග්‍රහණය කොට වළාපවලයකින් නික්මුනු පූර්ණචන්ද්‍රමණ්ඩලයක් සෙයින් මවුකුසින් ප්‍රසූතව දසදික් විලෝකනය කොට උත්තරදිශාභිමුඛව සිංහනාද කොට ක්‍රමයෙන් වැඩි හංසය

කොංවය, මයුරය යන නම් ඇති තුන්පායෙහි ලක්ෂණයන් නාවක සත්ත්ව සමඟ රාජ්‍යශ්‍රීසම්පත් අනුභව කරමින් ලක්ෂයක් අවුරුද්දට ආයුෂ ඇතිවන කාලයෙහි දසදහසක් අවුරුදු මුළුල්ලෙහි ගිනිගෙයි වැස පදුමා නම් දේවීන් කුසින් වෘෂභාස්කන්ධ නම් පුත් රුවනක් උපන් කල්හි ජරා ජීණී ව්‍යාධි මෘත සඞ්ඛ්‍යාත දෙවදූතයන් තුන්දෙනා දැක සසර කලකිරී නැවත ප්‍රව්‍රජිතරූපය දැක මේ ලෙස කෙරෙමි''යි සිතා අලඞ්කෘත හස්තිස්කන්ධානිරූඪව එසේහෙයින්ම සුවාසූදහසක් හස්තිස්කන්ධානිරූඪවූ රජදරුවන් පිරිවරණ ලදුව මහත්වූ රාජාලෝකයෙන් මහබිනික්මන් නික්ම පැවිදිව අනුව පැවිදිවූ කෙළක් පමණ නිසඟුන් විසින් පිරිවරණ ලදුව දස මසක් මුළුල්ලෙහි දුෂ්කර ක්‍රියාකොට අන්‍යතර පුරාඛ්‍යානාවක් විසින් පිළිගන්වන ලද දිව්‍යඕජස් ප්‍රක්ෂිප්තකළ ක්ෂීරපායාසය වළඳා සල්වෙනෙහි දිවාවිහරණය කොට සුනන්දාජීවකොපනීත කුශමුෂ්ටි ප්‍රතිග්‍රහණය කොට පුලිල නම් බොධිවෘක්ෂ මූලයෙහිදී සම්‍යක්-සම්බොධිඥානය සම්බිගමයකොට බොධිද්‍රුම සමීපයෙහිම යථා ක්‍රමයෙන් සප්තසප්තාහානික්‍රාන්තකොට සුනන්දාරාමයෙහිදී ධර්මචක්‍රය පවත්වා සූමඞ්ගලය නිස්සය යන නමින් ප්‍රසිඛ අග්‍රශ්‍රාවක දෙදෙනෙකුත් වහන්සේ හා සමඟ හැම්කල්හි චතුරාශ්‍රවයන් ක්ෂයකළ සාරලක්ෂයක් පමණ ක්ෂීණාශ්‍රවයන් විසින් පිරිවරණ ලදුව සාගත නම් මහතෙරකෙණෙකුන් විසින් උපස්ථාන කරණු ලබමින් නන්දාය සුනන්දාය යන අග්‍රශ්‍රාවිකා දෙදෙනකු විසින් සම්ධිගත ශාසනය ඇතිව යථාක්‍රමයෙන් සැරිසරණසේක් රම්‍යනම් නුවරට ප්‍රවිෂ්ටව ක්ලේශාග්නීන් තැවුනාවූ ජනයන් ධර්මකථා නමැති අමෘතරසධාරායෙන් සිහිල් කවට පමුණුවමින් සුදර්ශන මහාවිහාරයෙහි වැඩවඳරණ සේක. මෙසේ ''සම්බුදුයන් වහන්සේ සුදර්ශන මහාවිහාරයෙහි වැඩවසනසේකැ''යි ඇසූ රඞ්ගම් නුවර වාසී ශ්‍රද්ධාවන්ත ජනයෝ ගඳදුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන් කරා එළඹ පසඟ පිනිවුවා වැඳ සුවඳ මල් ආදියෙන් පුදා බණ අසා ගැත්තවුන් කෙරෙහි අනුකම්පාවෙන් සෙට දවසට නිමන්ත්‍රණ ඉවසා වඳුරන්නේ ය''යි ආරාධනාකොට නුවරට ගොස් දෙවෙනි දවස් මහදන් සලසා නුවර අලඞ්කෘත කොට නැවත බුදුන් වඩනා මාර්ගය සරහන්නාහු උදකයෙන් භින්නාස්ථානයෙහි පස් පුරවා සමතලාකරමින් රිදීපවක්සේ වැලි අතුව ලදපස්මල් ඉසිමින් නානා විධ විචිත්‍ර වස්ත්‍රයෙන් ධජ පතාක තන්වමින් කදලිතොරණ පුන්කලස් පංක්ති ආදිය සදමින් සිටියාහුය.

එසමයෙහි සුමේධ තාපසයන් වහන්සේ උන්වහන්සේගේ ආශ්‍රම පදයෙන් උද්ගතව මාර්ගය සරසමින් සිටි ඒ මනුෂ්‍යයන්ගේ උපරිභාගයෙන් ආකාශවීථිය යනසේක් තුවුපහටු සිත්ඇති ඒ මිනිසුන් දැක ''කාරණා කිම්දෝහෝ''යි විමසනු පිණිස ආකාශයෙන් බැස එකත්පසෙක සිටිසේක් ''එම්බා, උපාසකවරුනි, මේ මාර්ගය තොපි කවරක්හට අලංකෘතකොට සරහවු දැ'යි'' ඒ මනුෂ්‍යයන්ගෙන් විවාළසේක. ඇසූ ජනයෝ කියන්නාහු ''සවාමි වූ සුමේධ පණ්ඩිතයන් වහන්ස! තව නොදන් සේක්ද? දීපඞ්කර නම් දශබල ධාරීවූ සම්බුදුයන් වහන්සේ සම්බුදුබෝධ පදප්‍රාප්තව පවත්වනලද උතුම්වූ ධර්මචක්‍රය ඇතිව ලෝකානුවඩිය පිණිස ග්‍රාමනිගමාදියෙහි සැරිසරණසේක් අපගේ නුවර සුදර්ශන මහාවිහාරයෙහි වැඩවැස වඳුරණසේක. අපි ඒ සම්බුදුයන් වහන්සේ ඇතුළුව මහාසංඝයා වහන්සේට දන් දෙනු පිණිස ආරාධනාකොට

වඩනා මාගීය සරහම්හ''යි කීහ. ඒ ඇසූ සුමේධ තාපසයන් වහන්සේ සිතන සේක්; ''කල්පශතසහස්‍ර කිනිදු බුදුනැ''යි යන ශබ්ද මාත්‍රයක් ඇසීම දුර්ලභය. එබඳු සම්‍යක්සම්බුදුවරුන් වහන්සේ ලෝකයෙහි පාදුර්භූතවූසේකැයි ඇසීම් තොඛෝවේලාවකින් දක්නටද ලැබෙයයි ප්‍රීතීන් පිණාගිය සිත් ඇතිව මේ මාගී යෙන් එක් ප්‍රදෙශයක් මා විසිනුත් සැරසිය යුතුය'යි සිතා ''එසේවීනම් උපාසක වරුනි, මවත් මින් ප්‍රදෙශයක් දෙව''යි ඉල්ලුසේක. උපාසකවරුන් සුමේධ තාපසයන් වහන්සේ සෘඩි ඇති සේකැයි දැන තමන් වහන්සේ විසින් වහා සරහාගත තොහැකිවූ සිහිල්දියෙන් පිරුණු ගැඹුරු කඳුරුලියක් දී ''මෙය ඔබවහන්සේ සැරසුව මැනවැ'යි' කීවාහුය. එකල්හි සුමේධ තාපසයන් වහන්සේ බුඩාලඹන ප්‍රීතින් උපදවා සිතනසේක් මෙම සථානය සෘඩියෙන් සරසන්න සමර්ථයෙමි. හෙවත් අමර පුරෙශ්වරවූ ශක්‍රදිව්‍යරාජයාගේ පරසතුරුක සොල්වා මල් ගෙණවුත් සරහන්ට සමර්ථ යෙමි. උරග පුරෙශ්වරවූ නාගරාජයාගේ චිත්තනන්දන කරවත කඩුපුල් මල් ගෙණවුත් සරහන්නට සමර්ථයෙමි. සවණීමෙරු පර්වතරාජයාගේ අඩොඩාගයෙන් සත්රුවන් ගෙණවුත් මේ ගැඹුරු කඳුරුලිය පුරවන්නට සමර්ථයෙමි.

තවද අහස බලා රුවන් වර්ෂා වස්වා මේ කඳුරුලිය පුරවන්නවද සමර්ථ යෙමි. මෙසේ සෘඩ්‍යනුභාවයෙන් සැරහීම වනාහි මගේ සිත සතුටුවන්නාවූ ක්‍රියාවෙක් නොවෙයි. අද මා විසින් ඒ තිලෝගුරු සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ උදෙසා කායවෙය්‍යාවෘත්තී කටයුතුය'යි සිතා එබඳු මහානුභාවසම්පන්න තාපසයන් වහන්සේ බුදුන්කෙරෙහි මහත් ගෞරවයෙන් මෘදුකොමළහස්තයෙන් පස්ගෙණවුත් ඒ කඳුරුලිය පුරවමින් නොනිමි කල්හිම තෛලෝක්‍ය ප්‍රදීපායමානවූ දශබලධාරීවූ ඒ දීපඞ්කර නම් සම්බුදුරජාණන් වහන්සේ මහානුභාවසම්පන්නවූ ෂට්අභිඥා ධරවූ ක්ෂීණාශ්‍රවවූ සංඝසොභනවූ සාරලක්ෂණයක් පමණ නිසුලුන් විසින් පිරිවරණ ලදුව අසදෘශවූ බුබලීලායෙන් වැඩිසේක.

එකල්හි සුමේධ තාපසයන් වහන්සේ අක්ෂි උන්මීලනය කොට අලඞ්කෘත මාගීයෙන් වඩනාවූ දශබලධාරීවූ සම්බුදුරජාණන් වහන්සේගේ සුප්‍රතිෂ්ඨිතපාදාදි දෙතිස් මහා පුරුෂලක්ෂණයෙන් ප්‍රතිමණ්ඩිතවූ අසීති අනුව්‍යඤ්ජනයෙන් අනුබ්‍යඤ්ජිතවූ ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් සම්පරිවාරිතවූ මණී වණී ගගනතලයෙහි දශදික් දිවන අනෙක ශතසහස්‍ර විද්‍යුල්ලතා සෙයින් ආවෙලා වෙල හුනවූ යුගල යුගලවූ නීලපීතලොහිතාවදාත මාංජෙෂ්ඨ ප්‍රභාසවර යන ෂඩ්වණී ඝන බුඩරශ්මි මාලාවන් විහිදුවන්නාවූ ආත්මභාවයෙන් උපලක්ෂිතවූ ඒ ලොකසවාම්වූ සම්බුදුරජාණන් වහන්සේ දැක අද මා විසින් දසබලධාරීවූ මේ උතුමානන් වහන්සේට ජීවිත පරිත්‍යාගකරන්නට වටනේය'යි සිතා භාග්‍යවත්වූ සම්බුදුරජාණන් වහන්සේගේ දෙසිය සොළසක් මංගල ලක්ෂණයෙන් විසිතුරුවූ ශ්‍රීපාද යුග්මය කලල්මතුමත්තෙහි නොතබා මණිපෝරුවෙන් කළ හෙයක් මැඬ වඩනා පරිද්දෙන් සාරලක්ෂණයක් පමණ ක්ෂීණාශ්‍රව භික්ෂුන් හා සමග මාගේ පිට මැඬගෙණ වඩනාසේක්වයි එසේ වැඩීම මට දීර්ඝකාලයකට සිතසැප පිණිස වන්නේය''යි දළමඬුලු හා අඳුන් දිවිසම් වැහැරි සිවුරු කාලවණීවූ කලල්මතුයෙහි අතුට මණිඵලක හෙයක් මෙන් කලල්මත්තෙහි වැදනොත්සේක. මෙසේ මඬකලල් මතුයෙහි වැදනොත්තාවූ සුමේධ තාපසයන් වහන්සේ නිලුපුල්පෙති බඳුවූ නෙත්‍රයුග්මය දල්වා ත්‍රෛලොක්‍යෙක දිවාකරවූ දීපඞ්කර සම්‍යක් සම්බුද්ධ

සම්මාසම්බුද්ධරාජෝත්තමයාණන් වහන්සේගේ අසදෘශ අචින්ත්‍යවූ අනුපම මෙයවූ බුද්ධශ්‍රීන් බලනසේක් සතුටුව මෙසේ සිතුසේක.

කෙසේද? යත්; "ඉදින් මට අභිප්‍රාය වී නම් මේ බුදුන් කෙරෙහි පැවිදිව ලොභචෙෂමෝහ මදමානමාත්සර්‍යාදී සකල ක්ලෙශයන් නසා අග්‍රදක්ෂිණීය බවට පැමිණ සාරලක්ෂණයක් ක්ෂීණාශ්‍රව නිඝ්‍රන්ථ වහන්සේට සංඝනවක ව බුදුන් පිරිවරා රම්‍යතම් නුවරට වඩනට සමර්ථයෙමි. එසේ කිරීම අනිමධුර රස භොජනයක් ලැබ බොහෝ කාලයක් ක්ෂුධාවෙන් පීඩිත සත්ත්වසමූහයා බලා සිටියදී අඳුරුගැබකට වැද තනිව අනුභව කිරීමක් වැන්න. සාපිපාසාගෙන් පෙළෙන ලදරුවන් බලාසිටිය දී අමාරස අනුභවකරණ මවක් වැන්න. ගිනිගෙණ දිලී හෙමින් දරුවන් හඬහඬා සිටියදී තනිව ගැලවී දුවන මව්පියන් වැන්න. එසේ හෙයින් හුදකලාව අප්‍රසිඬව නිවන්පුර යාමෙන් ප්‍රයෝජන නැත. මමද මේ දීපඞ්කර දශබලධාරී සම්බුද්ධයන් වහන්සේ මෙන් සම්‍යක් සම්බොධියට පැමිණ සඬමී නමැති නැවෙහි ලා සංසාර නමැති සාගරයෙන් සත්ත්ව ඛගීයා එතරකොට නිවන් නමැති අමාරසයෙන් සන්තර්පණය කොට නැවත පරිනිර්වාණය කරන්නෙමි. එය මට සුදුසුයයි සිතා අෂ්ට ධර්ම සමොධානයෙන් යුක්තව බුඬත්වයට අභිනීහාර කොට වැදහොත්සේක.

එකල්හි ලොකශිවංකර වූ දීපඞ්කර නම් සම්බුද්ධරාජෝත්තමයාණන් වහන්සේ වැඩ සුමෙධ තාපසයන් වහන්සේගේ යිම්හාගයෙහි සඤ්ඤාඝන-ප්‍රහාරඡාදිත රුවන් මෙරක් සේ සවණක් ඝනරැසින් දිලිහිදිලිනී වැඩසිට කණක ප්‍රාසාදයක ඉන්ද්‍රනීල මාණික්‍යමය සිංහපඤ්ජරයක් විවෘතකරන්නක්හු සෙයින් පඤ්චවණී ප්‍රසාදසම්පන්න නෙත්‍රයුග්මය උන්මීලනය කොට කලල්පිට වැදහොත් සුමෙධ තාපසයන් බලා වදාරා මේ උග්‍රතපස් ඇති තපස්තෙමේ බුඬත්වයට අභිනීහාරකොට වැදහොත්තේය. "මොහුට ඒ ප්‍රාර්ථනාව සමෘද්ධ-වේද්‍යි නොවේද්‍යිහෝ" යි ප්‍රමාණාතික්‍රාන්ත කල්පකොටිශතසහස්‍රයක් අනාගතඥනය මෙහෙයා බලනසේක් "මෙයින් සාරාසඞ්ඛ්‍ය කල්පඤ්ඤයක් අනික්‍රමණවූ කල ගෞතම නම් බුදුවෙති'යි දැක පශ්චිම මධ්‍යයෙහිම වැඩසිට කැටුව වඩනා සාරලක්ෂණයක් නිඝ්‍රන්ථ වහන්සේට ආමන්ත්‍රණය කොට "මහණෙනි, පඤ්චාභිඥ අෂ්ට සමාපත්තිලාභී යෙයින් උඹවූ තේජස් ඇති මේ සුමෙධ තාපසයන් බලව. මෙතෙමේ අවශෙෂ සත්ත්වයෙක් නොවෙයි. මේ කල්පයට සාරාසංඛ්‍ය කප්ලක්ෂයකින් මත්තෙහි උත්තරිමනුෂ්‍ය ධර්මයෙන් අනුත්තරවූ මාගීයෙන් ඉගස් ලොවුතුරා බුදුව පඤ්චමහා ගඞ්ගාවෙහි ජලයෙනුත් නොනිවියහැකි ත්‍රිවිධාග්නි නිවා සත්ත්වයන්ට අමාමහනිවන් බෙදදෙන කෙනෙක.

එසේනෙයින් මෙබඳු උදාරාධ්‍යාශය ඇති සත්ත්වොත්තමයෝ ලෝකයෙහි දුර්ලභවෙති. මුළුලොව සනාථ කරන්නෝත් මෙබඳු එක්කෙනෙක්මය. තමන්මතු සම්බුද්ධත්වයට පැමිණෙන කාලයෙහි අනෙකවර ගර්ජනාකොට විඛාවන්නාවූ මහිඝානනාව අදම වැළඳගෙණ සතුටුකරන්නාවූ තෙල මඬමත්තෙහි මෙදහොත් මහාපුරුෂයානෝ සකල චක්තුවෙක් විපුලවූ කපිලවස්තු නම් පුරයක ඉපිද සතළිස්දහසක් දෙවඟනන් බඳු වරඟනන් විසින් පිරිවරණලදුව ගෘහවාසයෙහි වැස එකොනතිංශත් සංවත්සරයෙහි ගෘහාභි-

නිෂ්ක්‍රමණය කොට ඤාණ පරිපාකවනතුරු සාවුරුද්දක් දුෂ්කර ක්‍රියාකොට අජපාලනම් න්‍යග්‍රොධමූලයෙහිදී ක්ෂීරපායාසය පිළිගෙණ නෙරඤ්ජරා නම් නදීතීරයෙහිදී වළඳා දෙවියන් විසින් අලඞ්කෘත කොට පිළියෙළ කරණලද මාර්ගයෙන් බෝමැඩට එළඹ ප්‍රදක්ෂිණාකොට නිරුත්තරවූ, අශ්වත්ථ නම් බොධි ද්‍රැමමූලයෙහි බුදුවන්නේය''යි යනාදීන් ඒ බුදුවන කාලයෙහි සියළු ප්‍රවෘත්තිය සිව්වණක් පිරිස මැද ප්‍රකාශකොට වදාරා ඉදිරි රාජ්‍යශ්‍රීපදප්‍රාප්ත රජකුමරක්හට ප්‍රසාදදෙවා පිරිස්මැද සතුටුකරවන තරදෙව රජක්හුගේ ප්‍රශංසාකොට විවරණදී දැසමන් අටමිටකින් පුදා ප්‍රදක්ෂිණාකොට වැඩිකල්හි ඒ ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේද ගදමල් ආදියෙන් පුදා ප්‍රදක්ෂිණාකොට වැඩිසේක.

තවද දසදහසක් සක්වළ දෙවියන් හා එතන්හි රැස්වූ මනුෂ්‍යයෝද ගඳදුම්මල් වස්ත්‍රාභරණාදීන් පුදා බෝසතුන් වැඳ ප්‍රදක්ෂිණාකොට ''සවාමීනි, යම්සේ පුරුෂයෙක් සෘජු තොටින් එතරවන්නට උත්සාහකොට වැරදුනහොත් යටිතොටින් එතරවේද? එපරිද්දෙන්ම මේ දීපඞ්කර නම් බුදුරජානන් වහන්සේගේ සස්තෙන් පිරිහුන හොත් ඔබ බුදුවන කාලයෙහි ඔබ කරා පැමිණ නිවන්අමා බුදිමිහ''යි ප්‍රාර්ථනාකොට දීපංකර බුදුන් සමග ගියකල්හි මාගේ සවාමි දරුවූ සුමේධ තාපසයන් වහන්සේ වැදනොත් නැතිත් නැඟී ''පාරමීධර්මයන් සොයමි''යි දෙවිමිනිසුන් පිදූ මල්ගොඩ මතුයෙහි පලක්බැඳ වැඩ උන්සේක. මෙසේ බොධිසත්ත්වයන් වහන්සේ වැඩඋන් කල්හි සකල දශසහස්‍රී ලොකධාතුයෙහි දිව්‍යබ්‍රහ්මාදීහු රැස්ව බොධිසත්ත්වයන් වහන්සේට මෙසේ ස්තුතිකොට කීහ.

පාරමීසම්මසීනය

ඒ කෙසේද? යත්;

''සුමේධ තාපසයන් වහන්ස, පාරමිතාවන් සොයනු පිණිස පලක්බැඳ වැඩඋන් පුළු බොධිසත්ත්වඥානයන්ට සම්බවන යම් පුඤ්ඤනිමිති කෙතෙක් ඇද්ද? ඒ සියල්ලම අද දක්නා ලැබෙති.

ඔහු කවුරුද? යත්;

''පෙර බෝසතුන්ගේ පාරමිතා සෙවීමෙහි අධිකවූ උෂ්ණ උපසමවෙයි. ශීතව්‍යපගතවෙයි. ඒ සියල්ලන් අදත් විද්‍යමානවය. එසෙයින් ඒකාන්තයෙන් බුදුවන්සේක්මය. දශසහස්‍රී ලොකධාතුව නිශ්ශබ්දවෙයි. නිරාකුලවෙයි අදද සියලු ලොකධාතුව නිශ්ශබ්ද විය. නිරාකුල විය. එසේ හෙයිනුත් ඒකාන්ත යෙන් බුදුවන්සේක්මය. සත්ත්වයන්ට අමතොඟවූ මහත් වාහන තොහමයි. ගංගා ඇල කඳුරැලි ආදීහු ස්‍යන්දනය නොකෙරෙති. ඒ සියල්ලම අදත් විද්‍යමාන වූහ. එසේහෙයිනුත් ඒකාන්තයෙන් බුදුවන සේක්මය. ගොඩෙහි දියෙහි හටගෙණ පිපෙන්නාවූ සියලු පුෂ්පජාතීහු පිපෙති. අදත් එසේම විය. එසේ හෙයිනුත් ඒකාන්තයෙන් බුදුවන සේක්මය, සියලු ලතා වෘක්ෂයෝ ඵලයෙන් භරිත වෙති. අදත් එසේම විය. ඒ කාරණයෙනුත් ඒකාන්තයෙන් බුදුවන සේක්මය. තවද ආකාසසථවූද සියලු රත්නයෝ විශෙෂයෙන් දිලිහුනහුවෙති. මානුසිකවූද දිව්‍යමයවූ උභයතුයීයෝ කිසිවක් විසින්

අවාදීතව වාඳාගුවාහු වෙති. අදත් එසේම වීය. ඒ කාරණයෙනුත් ඒකාන්ත-යෙන් බුදුවන සේක් මය. ආකාශයෙහි විවිධ විචිත්‍රවූ පුෂ්පයෝ අනිවර්ධිතය කෙරෙති. අදත් එසේම වීය. ඒකාරණයෙනුත් ඒකාන්තයෙන් බුදුවන සේක්මය. දසදහසක් සක්වළ සියලු තරකවල ගිනි නිවී ගියේ වෙයි. අදත් එසේම වීය. ඒ කාරණයෙනුත් ඒකාන්තයෙන් බුදුවනසේක්මය.'' මේ ආදී වශයෙන් දෙවියන් විසින් කළ අනන්ත ස්තුතියද දීපංකර සම්බුදුරජාණන් වහන්සේ විසින් වදාළ වචනය ද අසා සතුටු වූ සුමේධ තාපසයන් වහන්සේ මෙසේ සිතුසේක.

''සම්බුදුවරයෝ තම් නොසිස් තෙපුල් ඇතියහ. සම්බුදුවරයන්ගේ වචනයෙහි අන්‍යථාත්වයක් නැත්තේය. යම්සේ ආකාශයෙහි දැමූ කැටය භූමියෙහි ම පතිත වේද, එපරිද්දෙන්ම උපන් සත්ත්වයාගේ මරණය නියත මය. එසේම සම්බුදුවරයන්ගේ වචනයන් නියත වන්නේය. එසේහෙයින් මම ඒකාන්තයෙන්ම බුදුවෙමි'යි නියත කොට සිතුසේක. ''මේසේ ඒකාන්ත යෙන් බුදුවෙමි''යි කරණ ලද සනිටුහන් ඇති සුමේධ බොධිසත්ත්වතෙම බුඛ කාරක ධර්මයන් සොයන සේක් උඩැවැදහැර ප්‍රාචීන දක්ෂිණ පශ්චිම උත්තරාදී දශ දිශාවෙන් කවර දිශාවක වනාහි බුඛකාරක ධර්මයෝ වෙසෙද්දෝ හෝ'යි අනෙක ප්‍රකාරයෙන් බලනසේක් කිසි දිශාවකත් නොදැක තමන් වහන්සේගේ චිත්ත සන්තානය බලා සවී බොධිසත්ත්වයන් විසින් ආසෙවිතනිසෙවිත කරුණාව හා උපාය ප්‍රඥාවෙන් පිරිසිඳ ගන්නාලද ආත්මෝපකරණ පරිත්‍යාග චෙතනා නම්වූ පළමුවෙනි දානපාරමිතාව දැක ''සුමේධ පණ්ඩිතයෙනි, මෙතැන් පටන් දානපාරමිතාව පුරන්නාවූ තොප විසින් යටිකුරුකොට තබනලද උදකකුම්භ යෙහි ජලය මදකුත් ඉතිරිනොව යම්සේ වහනය වෙද්ද? එපරිද්දෙන්ම තොප සන්තක ධනයෙක් හෝ තොපගේ පුත්‍රදාරාදීන් හෝ අඟප්‍රත්‍යඟයන් හෝ රාජ්‍යසම්පත්තියක් හෝ ඇද්ද? ඒ සියල්ලෙහි මදකුත් ලොභයක් නො කොට යාචකයන්ට අනිප්‍රායානුකූලවූ පරිද්දෙන් දන්දෙමි යන දානපාරමිතාව පුරා කෘතපුණ්‍යසම්භාර අතිව බොධිද්‍රැමමූලයෙහි හිඳ බුඛත්වයට පැමිණෙව''යි කියා මෙසේ ප්‍රථම දානපාරමිතාව අඩොමූඛිකෘත උදකකුම්භූපමායෙන් මාරශත සහස්‍රයන් විසිනුදු නොවැළකිය හැකි පරිද්දෙන් අධිෂ්ඨාන කළසේක.

ඉක්බිත්තෙන් මෙපමණ බුඛකාරක ධර්මකෙනෙකුන්ගෙන් බුඛත්වයට පැමිණියයුතු නොවෙ'යි සිතා මත්තෙහිදු බුඛකාරක ධර්මයන් බලනසේක් ''යම්සේ චමරීමෘගතෙම ජීවිතය නොබලා තමාගේ වාලධියම රක්ෂාකෙරේද? එපරිද්දෙන්ම 'තොපිත් මෙතැන් පටන් ජීවිතය අපෙක්ෂා නොකොට ශීලයම රක්ෂාකර බුඛත්වයට පැමිණේව''යි මෙසේ දෙවෙනි ශීලපාරමිතාවද,

''යම්සේ බඹුනාගාරයෙහි වසන්නාවූ පුරුෂතෙමේ චිරකාලයක් එහි විසුවද? ස්තෙහ නොකොට උක්කණ්ඨිතව එහි නොවසා මුක්තත්වීමක් කැමැත්තේවේද? එපරිද්දෙන්ම තොපිත් සම්භවයම බඹුනාගාරයක්සේ සිතා නෛෂ්ක්‍රම්‍යාභිමුඛව බුඛත්වයට පැමිණෙව''යි මෙසේ තුන්වැනි තපසට නික්මීම සඛ්‍යාතවූ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව ද,

හීනමධ්‍යමොත්කෘෂ්ට සඛ්‍යාත ත්‍රිවිධ කුලයන් නොතෝරා ගෙපිළි වෙළින් පිඬුසිඟන භික්ෂුකෙනෙකුන්සේ නොපිත් ධනකුල ආදියෙන් ප්‍රඥවන්ත

යන් නොතෝරා කුශලාකුශල විවාරීම් වශයෙන් පුරන්නාවූ සතරවැනි ප්‍රඥාපාරමිතාවද,

ශයනාසනසථානගමන සඛ්‍යාත චතුර්විධ ඊර්‍යාපථයෙහි නොපසු බස්නා වීර්‍යී ඇති සිංහරාජයකු මෙන් නොපිපී සම්භවයෙහිම සම්ඊර්‍යාපථ සෙහි සතර සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙහි නොපසුබැස පුරන්නාවූ පස්වැනි වීර්‍ය පාරමිතාවද,

සුචි අසුචි දෙක බැහැමෙහි සමව පවතින මහපොළොව සේ අනෙකවිධ සත්ත්වයන් විසින් කරණලද සම්මානාවමානයෙහි වෙනසක් නොව ඉවසීම් සවභාවකොට පවත්නා සවැනි ක්ෂානතිපාරමිතාවද,

හිමහිම් ආදි සියලු සෘතුවෙහිම තමන්යන මහ හැර අන්මඟක නොයන්නාවූ ඔසධිතාරකාව මෙන් ජාතුදී සතර අඟතියට පැමිණ කියන මුසාවාදයෙන් පහව සත්‍යයෙහි පිහිටීම සවභාව කොට ඇති සත්වැනි සත්‍යපාරමිතාවද,

සම්දිශාභාගයෙන් පහරණලද වාතයෙන් සුප්‍රතිෂ්ඨිත පර්වතය නොසෙල්වී යථාසථානයෙහිම සිටීද? එපරිද්දෙන්ම තොප විසිනුදු කරණ ලද ආත්මාධිෂ්ඨානයෙහි නිශ්චලව සිටීම සවභාවකොට ඇති අධිෂ්ඨාන පාරමිතාවද,

සිහිල්ජලය කල්‍යාණ පාපජන දෙපක්ෂයටම ඒකාකාර සිහිල්ගුණය දක්වන්නාක් මෙන් තොපිදු හිතාහිත සත්ත්වයන් කෙරෙහි සමමෙත් පැවැත්වීම් සඞඛ්‍යාත තවවැනි මෛත්‍රී පාරමිතාවද,

සුචිඅසුචි නිරපේක්ෂපකරණ ලබන්නාවූ පෘථිවිතොමෝ යම්සේ මධ්‍යසථාකාරයෙන් පවතීද? එපරිද්දෙන්ම තොපිදු සැපදුක් දෙකෙහි මධ්‍යසථාකාර යෙන් පවත්නා සවභාව කොට ඇති දසවැනි උපෙක්ෂාපාරමිතාවද,

යන මේ පාරමී ධර්මයන් පූරණය කොට දශසහස්‍රීලොකධාතුව කම්පාකරවා සතරාමර ලොකයාහට එතගුරු සථානයවූ සම්බුදතාඥානයට පැමිණෙව''යි සිතා මෙකියන ලද දශපාරමීධර්මයන් අධිෂ්ඨාන කළසේක. මෙසේ දශපාරමී ධර්මයන් සන්මශීනය කොට ''මේ ලොකයෙහි බොධිසත්ත්වයන් වහන්සේ විසින් පිරියයුතු බුඞකාරක ධර්මයෝ මෙපමණක්මය, මේ හැර අන් කිසි බුඞකාරක ධර්මකෙනෙක් නැත. මේ ධර්මයෝ ඌඞ්වාදී දශදිශාවෙහිත් නැත්තාහ. මාගේ හෘදයෙහිම පිහිටියහ''යි දැක සියලු පාරමිතාවන්ම දැනිකොට අධිෂ්ඨානකොට නැවත නැවතත් සන්මශීනය කරණසේක්, දානපාර මිතාවෙහි පවත් උපෙක්ෂාපාරමිතාව දක්වාද, උපෙක්ෂාපාරමිතාවෙහි පවත් දාන පාරමිතාව දක්වාද, අනුලොමප්‍රතිලොම වශයෙන් පඤ්චප්‍රකාරයකට සන්මශීනය කළසේක. මෙහි ප්‍රථමකොට දැක්වූ දානපාරමිතාව වනාහි දානපාරමිතාවය දාන උපපාරමිතාවය දානපරමාර්ථපාරමිතාවය'යි කියා ත්‍රිප්‍රකාරයක් වන්නේය. අනි කුදු සිලාදී පාරමිතාවෝද තුන්තුන් ප්‍රකාරයට ප්‍රභෙදවූ කල්හි නිසක් වන්නේය. ශරීර අවයවයන් පරිත්‍යාගකිරීම දානපාරමිතාවය, බාහිරවසතු පිණවදීම දානඋප පාරමිතාවය, ජීවිතපරිත්‍යාගය දානපරමාර්ථ පාරමිතාවය, ශරීර අවයවයන් නිසා ශීලභෙදයකට නොපැමිණ ශීලය රක්ෂාකිරීම ශීලපාරමිතාවය, බාහිර වස්

තුන් නිසා ශීලහෙදයකට නොපැමිණීම ශීලඋපපාරමිතාවය, ජීවිතය නිසා ශීල හෙදයකට නොපැමිණීම ශීලපරමාත්ථ පාරමිතාවය, අනිකුදු නෛෂ්ක්‍රම්‍යාදී පාර මිතාවෝත් මෙසේම ප්‍රවහෙද ත්තාහ.

මෙකියනලද සමන්ත්‍රංශත් පාරමීධර්මියන් සත්මශීතය කරණ සුමෙධ තාපසයන් වහන්සේගේ ධර්මතේජසින් චතුර්නනුතාධිකචියොජනශතසහස්‍ර යොජන ඔතලවූ මේ පෘථිවිතොමෝ කුලාලචක්‍රයක් මෙන් භ්‍රමණයවූවාය. මෙපරිද්දෙන් පොළොව කම්පාවන්නව වන්කල්හි රඹගම් නුවර වාසිහු සිහිඑලවා සිටින්නට අසමර්ථව කල්පාන්තවාතයෙන් මුලිනුදුරා වැටෙන වෘක්ෂයන් මෙන් මූර්ඡිත මූර්ඡිතව සිවිසිටි තැන ප්‍රපතිතවූවාහුය. ඒ දැක මහජනයෝ භයසන්ත්‍රාසයට පැමිණ දීපංකර සම්බුදුරජාණන් වහන්සේ කරා එළඹ ''භාග්‍යවත්වූ සම්බුදුරජාණන් වහන්ස, මේ දෙවතාවතීදියක්ද''?යි නොදනුම්හ, සිඟලු ජනයෝ උපද්‍රැත වූවාහුය. කිමෙක්ද? ලොවට භයෙක් හෝ සැපයෙක් හෝ වේද? තත්වූ පරිද්දෙන් වදාරා අපගේ කුකුස් දුරුකර වදාළ මැනවැ''යි කියා යාච්ඤා කළාහුය. එකල්හි ''උපාසකවරුනි, නොපි නොබව. මේ පෘථිවිකම්පාව නිසා නොපව වන භයෙක් නැත. සුමෙධ බොධිසත්ත්වයන්ගේ පාරමිතා සත්මශීතය කරණ ධර්මතේජසින් පාථිවිය කම්පාවිය''යි වදාළසේක. ඒ අසූ මහජනයෝ බොධිසත්ත්වයන් කරා එළඹ ගන්ධමාලාදීන් පුදා වැද ප්‍රදක්ෂිණාකොට ගිය කල්හි බෝධිසත්ත්වයන් වහන්සේද දෘඪවීර්‍යාධිෂ්ඨාන කොට අනිලපථයට නැගී හිමවත් පෙදෙසට වැඩ ධ්‍යානසුවයෙන් කල්යවා ආයුෂයාගේ කෙළවර බඹලොව උපන්සේක.

---

## විවරණ ගැණීම

සිකල ලොකශිවඛ්කරවූ ඒ දීපංකරතම් බුදුන්ට ඉක්බිතිව අසංඛ්‍යයක් කප ශූන්‍යව තුබූකල්හි සාරමණ්ඩ නම් කල්පයෙක් වූයේය. ඒ කල්පයෙහි කොණ්ඩඤ්ඤ නම් බුදුකෙනෙක් ලොකයෙහි පහළවූසේක. එකල අප මහ බෝසත් විජිත නම් සක්විති රජෙක් ව කොටිශතසහස්‍රයක් රතනන් සමග බුදු පාමොක් මහසඟනට මහදන් දී ඒ බුදුන්කෙරෙන් විවරණ ලැබ සක්විති රාජ්‍යය බුදුන්ව පුදා පැවිදිව පිටකත්‍රයධාරීව පඤ්චාභිඥ අෂ්ටසමාපත්තිලාභීව නොපිරි හුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලොකයෙහි උපන්සේක. ඒ කොණ්ඩඤ්ඤ නම් සම්බුදුරජාණන් වහන්සේට මෑතභාගයෙහි කප් අසංඛ්‍යයක් බුඩශූන්‍යව තිබී හවගත් එකම කල්පයෙහි මඞ්ගලය, සුමනය, රවතය, සොභිතය, කියා සතර බුදු කෙනෙකුන් වහන්සේ ලොව පහළවූසේක. එයින් මඞ්ගල නම් බුදුන් සමයෙහි අප මහ බෝසත් තෙමේ සුරුචි නම් බ්‍රාහ්මණව ඉපිද බුදුන් නිමන්ත්‍රණය කොට සත්දවසක් කෝටි ශතසහස්‍රයක් භික්ෂූන් වහන්සේ හා සමග බුදුන්ව ගවපාන නම් මහත් දානයක් දී ඒ බුදුන් ගෙන් ද විවරණ ලත් සේක.

ඒ මංගල නම් සම්බුදුරජාණන් වහන්සේව මෑතභාගයෙහි එම කල්පයෙහිම දෙවෙනි අතුරුකප සුමන නම් සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළවූසේක. එකල අප මහබෝසතාතෝ මහත් සෘඩ්‍යනුභාව ඇති අතුල නම් නාරපෙක්ව ඉපිද 'බුදුන් ලොව පහළවූසේකැ'යි.අසා ඤාතිසමූහයා පිරිවරා නාගභවනයෙන් නික්ම

කෝටි ශතසහස්‍රයක් නිසැලුන් පිරිවරකොට ඇති සම්බුදුරජාණන් වහන්සේට දිව්‍ය තූර්‍යයෙන් උපහාරකොට මහදන්දී ඒ බුදුන් කෙරෙහුදු විවරණ ලැබුසේක.

**සුමන** නම් සම්බුදුරජාණන් වහන්සේට මෑතභාගයෙහි එම කල්පයෙහි තුන්වන අතුරු කප **රෙවත** නම් සම්බුදුරජාණන් වහන්සේ ලොකයෙහි පහළවූ සේක. එකල අප මහබෝසතාණෝ අනන්ත ගුණඇති **අතිදේව** නම් බ්‍රාහ්මණ යෙක්ව ඉපිද බුදුන් කෙරෙන් බණ අසා සරණයෙහි පිහිටා දෙහොත් මුදුන්දී සිට උත්තරාසංගයෙන් පූජාකොට ඒ සම්බුදුරජාණන් වහන්සේගෙන්ද විවරණශ්‍රී ලැබුසේක.

ඒ **රෙවත නම්** සම්බුදුරජාණන් වහන්සේට මෑතභාගයෙහි එම කල්පයෙහි සතරවෙනි අතුරුකප මාරභීතිකරවූ **සොභිත නම්** සම්බුදුරජාණන් වහන්සේ ලොකයෙහි පහළවිය. ඒ සමයෙහි අප මහබෝසතාණෝ **අජිත** නම් බ්‍රාහ්මණව බුදුන් කෙරෙන් බණ අසා සරණයෙහි පිහිටා බුදුපාමොක් මහසඟහට මහදන්දී ඒ සම්බුදුරජාණන් වහන්සේගෙන්ද විවරණ ලැබුසේක.

ඒ **සොභිත** නම් සම්බුදුරජාණන් වහන්සේගෙන් මෑතභාගයෙහි කල්ප අසංඛ්‍ය -යක් බුඩශූන්‍යව තිබී හටගන්නාලද එකම කල්පයෙහි **අනොමදස්සි**, **පදුමය**, **නාරදය**, කියා තුන් බුදුකෙනෙක් ලොකයෙහි පහළවූවාහුය. එයින් ප්‍රථමකොට ලොව පහළවූ **අනොමදස්සි** නම් සම්බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි අප මහ බෝසත් මහානුභාව ඇති මහත් සෘඩිඇති යක්ෂසේනාධිපතියෙක්ව ඉපිද "බුදුන් උපන්සේකැ"යි යනු අසා බුදුන් කරා එළඹ බුදුපාමොක් මහ සඟහට මහදන් දී ඒ බුදුන් කෙරෙහුදු විවරණ ලත්සේක.

ඒ **අනොමදස්සි** නම් සම්බුදුරජාණන් වහන්සේට මෑතකාලයෙහි **පදුම** නම් සම්බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි පහළවූසේක. එසමයෙහි අප මහබෝසතාණෝ සිංහරාජයෙක්ව ඉපිද නිරොධසමාපත්තියට සමවන් බුදුන් දැක ප්‍රසන්නවූ සිත් ඇතිව වැද ප්‍රදක්ෂිණාකොට ප්‍රීතිසොම්නස් උපදවා තුන්වරක් සිංහනාදකොට බුඩාලම්බන ප්‍රීතින් උපදවා සත්දවසක් මුලුල්ලෙහි එම ප්‍රීතිය නොබිඳ ප්‍රීති සැප යෙන්ම ගොදුරු පිණිස නොගොස් බුදුන්ට දිවි පුදනුවෝ **එහිම** සිටියේය. **පදුම** නම් සම්බුදුරජාණන් වහන්සේ සත්දවස ඇවෑමෙන් නිරෙධ සමාපත්තියෙන් නැගිසේක් සිංහරාජයාගේ අදහස් බලා "අනාගතයෙහි බුදුවෙති"යි, විවරණ දෙවා වදාළසේක.

ඒ **පදුම** නම් සම්බුදුරජාණන් වහන්සේට මෑතභාගයෙහි එම කල්පයෙහි තුන්වන අතුරුකප චතුර් වෛශාරද්‍යයෙන් විශාරද **නාරද** නම් සම්බුදුරජාණන් වහන්සේ ලොකයෙහි පහළවූ සේක එකල අප මහබෝසත් සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්තියෙහි වශීප්‍රාප්තව බුදුපාමොක් මහසඟහට මහදන්දී ලොහිත චන්දනයෙන් පූජා කෙළේය. **නාරද** නම් සම්බුදුරජාණන් වහන්සේද බොධිසත්ත්වයන්ව "මතු බුදුවෙති"යි විවරණ දෙවා වදාළසේක.

ඒ **නාරද** නම් සම්බුදුරජාණන් වහන්සේට අපරභාගයෙහි මේ මහා භද්‍රකල්ප යට ලක්ෂයක්වන කල්පයෙහි **පදුමුත්තර** නම් සම්බුදුරජාණන් වහන්සේ එකලාවම ප්‍රාදුර්භූතවූසේක. එසමයෙහි අප මහබෝසතාණෝ **ජටිල** නම් මහර්ෂිව බුදුන් ප්‍රමුඛකොට ඇති භික්ෂු සංඝයාට දන්දී ඒ බුදුන් කෙරෙහුදු "මතු බුදුවෙති"යි විවරණ ලත් සේක.

**ඒ පදුමුත්තර නම්** බුදුන් උපන් **කල්පයෙහි** ඉතිරිවූ **දසතවයක් පමණ** අතුරු කප්වල උපන් බුදුකෙනෙක් නැත. එ **කපෙහි පටන්** තිස්දහසක් **කප්** බුඩශූන්‍යව **තිබුණාල මේ** කපට **කැත්තෑදහසක්වන කල්පයෙහි සුමේධය, සුජාතය,** කියා බුදුවරයෝ දෙදෙනෙක් ලොව පහළවූසේක. **එයින්** සුමේධ නම් සම්බුදුන් වහන්සේගේ **කාලයෙහි** අප මහබෝසත් **උත්තර** නම් මාන්වකයෙක්ව ඉපිද නිදන්කොට තබනලද අසූකෙළක් පමණ ධන වියදම් කොට බුදුපාමොක් මහසඟනට මහදන් දී බිණ අසා සරණයෙහි පිහිටා ගිහිගෙයින් නික්ම පැවිදිව ඒ බුදුන්ගෙන්ද විවරණ ලත් සේක.

ඒ සුමේධ නම් සම්බුදුන් වහන්සේට මැතභාගයෙහි **එම** කල්පයෙහි දෙවන අතුරුකප ලොවපහළවූ **සුජාත නම්** සම්බුදුන් **වහන්සේගේ** කාලයෙහි **අප** මහපත් වක්‍රවර්ති රජෙක්ව ඉපිද බුදුන් කරා එළඹ බණ අසා බුදුපාමොක් මහසඟනට සප්තවිධ රත්නය හා සතර මහත් දිවයින් රාජ්‍යයපුදා, මහණව ඒ බුදුන්ගෙන්ද විවරණ ලත් සේක.

**ඒ සුජාත** නම් සම්බුදුන් වහන්සේට මැතභාගයෙහි **මේ කල්පයට** අවළොස් දහස් **කල්පයකින්** මත්තෙහි පහළවූ **එක් කපෙක පියදස්සිය, අත්‍ථදස්සිය, ධම්මදස්සිය'යි** තුන් බුදුකෙනෙකුත් ක්‍රමයෙන් **ලොව** පහළවූ **සේක. එයින් පියදස්සි** නම් බුදුන් සමයෙහි අප මහබෝසතාණෝ **ඛේමාශ්‍රය** නම් මානවකයෙක්ව ඉපිද ත්‍රිවේදයෙහි **පරතෙර** දැක බුදුන්ගෙන් බණ අසා කෝටිශතසහස්‍රයක් ධනවියදම්කොට සඞ්ඝාරාමයක් කරවා පිළිගන්වා ශරණගීලාදියෙහි පිහිටා ඒ බුදුන්ගෙන්ද විවරණ ලත් සේක.

**ඒ පියදස්සි** නම් සම්බුදුන් වහන්සේට මැතභාගයෙහි **එම** කප **අත්‍ථදස්සි නම්** සම්බුදුන් **වහන්සේ** ලොකයෙහි ප්‍රාදුර්භූතවූසේක. **එකල** අප මහබෝසතාණෝ සෘඩි ඇති **සුසිම** නම් තාපසයෙක්ව ඉපිද දිව්‍යලොකයෙන් මන්දාරක නම් පුෂ්පවස්ත්‍රයක් ගෙණ බුදුන්ට පුදා ඒ බුදුන්ගෙන්ද විවරණ ලත් සේක.

**ඒ අත්‍ථදස්සි නම්** බුදුරජාණන් වහන්සේට මැතභාගයෙහි **ධම්මදස්සි නම්** බුදුරජාණන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූතවූ සේක. **එකල** අප මහ බෝසතාණෝ **සක්දෙව්** රජව ඉපිද දිව්‍යගන්ධ පුෂ්පයෙන් හා දිව්‍යතූර්‍යරාවයෙන් පූජාකොට ඒ බුදුන්ගෙනුත් විවරණ ලත් සේක.

**ඒ ධම්මදස්සි** නම් බුදුරජාණන් වහන්සේට මැත භාගයෙහි **මේ කල්පයට** අනුසතර වන කප **සිද්ධාර්ථ නම්** සම්බුදුන් වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූතවූ සේක. **එකල** අප මහ බෝසතාණෝ උග්‍රතේජස් ඇති අභිඥ බලසම්පන්න වූ මඞ්ගල නම් තාපසයෙක්ව ඉපද හිමවතින් මහදඹපල ගෙණවුත් බුදුන්ට පුදා ඒ බුදුන්ගෙන්ද විවරණ ලත්සේක.

ඒ **සිද්ධාර්ථ නම්** සම්බුදුන්වහන්සේට මැත භාගයෙහි මේ කපට අනු දෙවන කප **තිස්ස නම්** සම්බුදුන්වහන්සේ ලොව පහළවූසේක. **එකල** අප **මහ** බෝසතාණෝ මහත් හොඟ යශස් ඇති **සුජාත නම් ක්ෂත්‍රිය රජෙක්ව** ඉපද ඒ සියලු සම්පත් හැර ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව මහත් සෘඩි ඇතිව දිවමදුරා

පියුම් ආදිය ගෙණ සිව්පිරිස් මැද වඩනා බුදුන්ව පූජා කොට ඒ නිසා නම් සම්බුදුන් වහන්සේගෙන්ද විවරණ ලැබුසේක.

ඒ බුදුන්ට මෑතභාගයෙහි ඡුස්ස නම් සම්බුදුන් වහන්සේ එම කල්පයෙහි දෙවන අතුරුකප ප්‍රාදුර්භූතවූසේක. එකල අප මහබෝසතාණෝ විජිතාවී නම් ක්ෂත්‍රියරජෙක්ව ඒ බුදුන්ගෙන් බණ අසා රාජ්‍යසම්පත් හැර මහණව පිටකත්‍රයධාරීව මහජනයාට ධර්මදේශනා කෙරෙමින් වැඩවසන සේක් ඡුස්ස නම් බුදුන්ගෙන්ද විවරණ ලත් සේක.

ඒ ඡුස්ස නම් බුදුන්ට මෑතභාගයෙහි මේ කල්පයට අනූඑක්වෙනි කල්පයෙහි විපස්සි නම් සම්බුදුන් වහන්සේ ලෝකයෙහි පහළවූ සේක. එසමයෙහි අප මහබෝසතාණෝ මහත් සෘඩි ඇති අතුල නම් නාගරාජයෙක්ව ඉපිද සප්තරත්නඛචිතසුවණ්ණපීඨයෙන් බුදුන් පුදා ඒ බුදුන්ගෙනුත් විවරණ ලත් සේක.

ඒ විපස්සි නම් සම්බුදුන් වහන්සේට මෑතභාගයෙහි මේ කල්පයට එක්තිස්වන කප සිඛී නම් සම්බුදුන් වහන්සේ ලොව පහළවූ සේක. එකල අප මහබෝසතාණෝ අතිදේවම නම් රජෙක්ව ඉපිද බුදුන් ප්‍රමුඛ කොට ඇති මහ සඞ්ඝයාට සිව්රු සහිතවූ මහදන් පවත්වා සප්තරත්නයෙන් ප්‍රතිමණ්ඩිතවූ හත්ථිරත්නයක් පුදා ඇතුළුසව කප්පිය භාණ්ඩයන් දන් දී ඒ බුදුන් කෙරෙනුදු විවරණ ලත් සේක

ඒ සිඛී නම් සම්බුදුන් වහන්සේට මෑතභාගයෙහි වෙස්සභූ නම් සම්බුදුන් වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. එකල අප මහබෝසතාණෝ සුදස්සන නම් රජෙක්ව ඉපද බුදුපාමොක් මහසඟනට චීවර සහිත මහදන් දී ඒ බුදුන් සමීපයෙහි පැවිදිව ඒ වෙස්සභූ නම් සම්බුදුන් වහන්සේ ගෙන්ද විවරණ ලැබුසේක.

ඒ වෙස්සභූ නම් සම්බුදුන් වහන්සේට මෑතභාගයෙහි මේ මහාභද්‍රකල්පයෙහි කකුසඳ, කොණාගම, කාශ්‍යප කියා බුදුවරයෝ තුන් නමක් පහළවූ සේක. එයින් කකුසඳ නම් සම්බුදුන් වහන්සේගේ කාලයෙහි අප මහබෝසතාණෝ ඛේම නම් රජෙක් ව ඉපද බුදුපාමොක් මහසඟනට මහදන් දී බණ අසා පැවිදි ව ඒ බුදුන්ගෙන්ද විවරණ ලත්සේක.

ඒ කකුසඳ නම් සම්බුදුන් වහන්සේට මෑතභාගයෙහි ලොව පහළවූ කොණාගමන නම් සම්බුදුන් වහන්සේගේ කාලයෙහි අප මහබෝසතාණෝ පබ්බත නම් රජෙක්ව ඉපිද අමාත්‍යගණයා පිරිවරා බුදුන් සමීපයට ගොස් දම් දෙසුන් අසා බුදුපාමොක් මහාසඞ්ඝයා නිමන්ත්‍රණය කොට මහදන් පවත්වා පත්තුණ්ණවිතපණ්ඩරකොසෙය්‍යකම්බලදුකූල සඞ්ඝිමණ්ඩප දන් දී බුදුන් සමීපයෙහි පැවිදි ව ඒ බුදුන් කෙරෙනුදු විවරණ ලත්සේක.

ඒ කොණාගමන නම් බුදුරජානන් වහන්සේට මෑතභාගයෙහි කාශ්‍යප නම් සම්බුදුන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. එසමයෙහි අප මහබෝසතාණෝ ජෝතිපාල නම් මානවක ව ත්‍රිවේදයෙහි පරතෙර දැක සවිකාර නම් කුම්භකාරපුත්‍රයෙකුට මිත්‍රව ඔහු හා සමග බුදුන් කරා එළඹ බණ

අසා පැවිදිව නො පසුබස්නා වීර්‍ය්‍ය ඇතිව පිටකත්‍රය ඉගෙණ වත්පිළිවෙතින් බුදුසසුන් බොබවා ඒ බුදුන් කෙරෙනුත් විවරණ ලත්සේක.

මෙසේ දීපංකරාදි සුවිසි බුදුන්ගේ සමීපයෙහි ලද විවරණ ඇති බෝසතුන් විසින්:-

''මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති-හේතු සත්ථාරදස්සනං
පබ්බජ්ජා ගුණසම්පත්ති-අධිකාරෝ ච ඡන්දතා
අට්ඨධම්මසමොධානා-අභිනීහාරෝ සම්ජායති''

යන මේ අෂ්ටධර්මයෙන් සමන්විතව දීපංකර පාදමූලයෙහි කෘතාභිනීහාර ඇති මහබෝසතාණන්හට එතැන්පටන් වෙස්සන්තරාත්මභාවය දක්වා අවීචිමහා නරකයෙහිද ක්ෂුත්පිපාසයෙන් පීඩිතවන නිජ්ඣාමතණ්හික නම් ප්‍රෙතයොනි යෙහිද කාලකඤ්ජක නම් අසුරයොනියෙහිද තිරිසන්යොනිවල උපන් කාලවල වටුකුරුළුවන්ට කුඩාසතෙක්වද නූපන්සේක.

තවද මනුෂ්‍යව උපන්නේද ජාතියෙන් අඬ නුවූසේක. ජාතියෙන් බිහිරි නුවූසේක. ජාතියෙන් ගොළු නුවූ සේක. ස්ත්‍රීව නොවුපන් සේක. උභතෝ බ්‍යඤ්ජනකව පණ්ඩකව නපුංසකව නොවුපන් සේක. පඤ්චානන්තරික අකුශලකර්මයක් නොකළ සේක. නියතමිත්‍යාදෘෂ්ටි නුවූ සේක. මාරදිව්‍යරාජව නොවුපන් සේක. අසංඥ තලයෙහි නොවුපන් සේක. සුඛාවාසයෙහි නොවුපන් සේක. මේ ආදී අභව්‍යස්ථානයකට නොපැමිණ බොධිසත්ත්වචරිතය නොනැරැ. අකිර්තිබ්‍රාහ්මණකාලයෙහි ශංඛබ්‍රාහ්මණකාලයෙහි ධනඤ්ජය රජ කාලයෙහි මහාසුදර්ශන රජකාලයෙහි මහාගොවින්ද කාලයෙහි නිම්මඟරජ කාලයෙහි විසය්හ සිටුකාලයෙහි සිවිමහරජ කාලයෙහි වෙස්සන්තරකාලයෙහි යයි යන මේ ආදී නොයෙක් ජාතිකොටිශතසහස්‍රයෙහි දානපාරමිතාව පිරූ පරිදි ප්‍රමාණයක් නැත්තේ ම ය.

එසේම ශීලවනාගරාජකාලයෙහි චම්පෙය්‍යනාගරාජකාලයෙහි භූරිදත්ත නාගරාජකාලයෙහි ඡද්දන්තනාගරාජකාලයෙහි අලීනසත්තුකුමාරකාලයෙහි යන මේ ආදී තන්හි ශීලපාරමිතාව පිරූ පරිදි ප්‍රමාණයක් නැත්තේ ම ය.

එසේම සෝමකුමාරකාලයෙහි හත්ථිපාලකුමාරකාලයෙහි අයොඝර පණ්ඩිතකාලයෙහි යයි මේ ආදී තන්හි මහාරාජ්‍යධුර හැර නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පිරූ පරිදි පමණ නැත්තේ ම ය.

එසේම විධුරපණ්ඩිතකාලයෙහි මහාගොවින්දකාලයෙහි කුද්දාලපණ්ඩිත කාලයෙහි බොධිපරිබ්බාජක කාලයෙහි මහෞෂධපණ්ඩිත කාලයෙහි යයි මේ ආදී තන්හි ප්‍රඥාපාරමිතාව පිරූ පරිදි ප්‍රමාණයක් නැත්තේ ය.

වෙසේ දක්වන ලද ක්‍රමයෙන් බොධිසම්භාර ධර්මයන් පුරමින් අවුත් වෙස්සන්තරාත්මභාවයෙහි සිව සිත් පිත් නැති මහාපෘථිවිය සත්වරක් කම්පා කරවා මහදන් දී ආයුෂයාගේ කෙළවර එයින් චුතව තුසිත භවනයෙහි උපන්සේක, තුසිතපුරයෙහි බොධිසත්ත්වයන්වහන්සේ දිවඟැප වළඳමින් සිටිය දීම බුද්ධඝළාඝල නම් වූ කෝලාහලයක් ලෝකයෙහි පහළවිය.

## ත්‍රිවිධ කෝලාහල

ලෝකයෙහි වනාහි කල්ප කෝලාහලය, බුද්ධකෝලාහලය, චක්‍රවර්ති කෝලාහලය යයි; කියා කෝලාහල තුණක් වන්නේය. ඒ ත්‍රිවිධ කෝලාහලයන් අතුරෙන් කල්ප කෝලාහලය නම් මෙයින් අවුරුදු ලක්ෂයක් ඉකුත්වූ කල කල්ප විනාශය වන්නේයයි; ලෝකබ්‍රහ්ම නම් කාමාවචර දේවතාකෙනෙක් හිසකේ මුදු විසුරුවන ලදුව හඬන මුහුණු ඇතිව යුවලතින් කඳුළු පිස රත්පිළි හැඳ පෙරව ඉතා විරූපවූ අවමගුල් වෙසක් ධරා මනුෂ්‍ය පථයෙහි ඇවිදිනාහු "නිදුකානෙනි, නිදුකානෙනි, මෙයින් අවුරුදු ලක්ෂයක් අතික්‍රාන්තවූ කල කල්ප විනාශය වන්නේය. මේ ලෝකය විනාශ වන්නේය. සමුද්‍රය විශලෙන්නේය. මේ මහා පෘථිවිය හා මහාමේරුපර්වතය දවන්නේය; බඹලොව දක්වා ලොව නසන්නේය. එහෙයින් නිදුක්වූ සත්ත්වයෙනි, මෛත්‍රී භාවනා කරව. පින්වත්නි, කරුණාමුදිතා උපෙක්ෂා භාවනා, කරව. මවුන්ට උපස්ථාන කරව. පියන්ට උපස්ථාන කරව. කුලදෙටුවන්ට උපස්ථාන කරව"යි මෙසේ කියා ඇවිදිනි. මේ කල්පකෝලාහල නම් වේ

අවුරුදු දහසක් අතික්‍රාන්තවූ කල සත්ත්වයෙනෙකුත් වහන්සේ ලෝකයෙහි උපදින සේකැ'යි; ලෝකපාල දෙවියෝ "නිදුකානෙනි, මෙයින් අවුරුදු දහසක් අතික්‍රාන්තවූ කල ලොවුතුරා බුදුකෙණෙකුත් වහන්සේ ලෝකයෙහි උපදින සේකැ'යි; හඬගා කියමින් ඇවිදිනි. මේ බුඛකෝලාහල නම් වේ.

"අවුරුදු සියයක් අතික්‍රාන්තවූ කල චක්‍රවර්ති රජ්ජුරුකෙණෙක් උපදිනාහුය"යි; පෙරසේම දෙවතාවෝ උද්ඝොෂණය කොට ඇවිදිති. මේ චක්‍රවර්ති කෝලාහල නම් වේ.

මේ ත්‍රිවිධ කෝලාහල වනාහි ලෝකයෙහි මහත් වෙත්. මේ ත්‍රිවිධ කෝලාහලයන් අතුරෙන් බුඛකෝලාහල ශබ්දය අසා සකල දශසහස්‍රී චක්‍රවාළයෙහි දෙවියෝ එකතැනකට රැස්ව "අසවල් නම් සත්ත්වයෙක් බුදුවන්නේය"යි දැන ඔහුකරා එළඹ යාචඤ්ඤාකරන්නාහුය. එසමයෙහි සියලුම දෙවියෝ එනම් එකී එකී සක්වළෙක චාතුම්මහාරාජික ශක්‍රසුයාම සන්තුසිත සුරනිර්මිත වසවර්ති මහාබ්‍රහ්මයන් හා සමඟ සියළු දෙවියෝ මේ එකම සක්වළට රැස්ව තුසිත භවනයෙහි වසන බෝසතුන් කරා එළඹ "නිදුකානන්වහන්ස: දැනැදී වූ දස පෙරුම් පුරන්නාවූ නුඹවහන්සේ විසින් ශක්‍රසම්පත් හෝ මාරසම්පත් හෝ බ්‍රහ්මසම්පත් හෝ චක්‍රවර්ති සම්පත් හෝ ප්‍රාර්ථනාකරමින් පිරූසේක් නොවෙයි. ලෝසතුන් සසර දුකින් මුදනු පිණිස සම්‍යක්සම්බෝධඥානය ප්‍රාර්ථනා කරමින්ම දශපාරමිධර්මයන් පුරණලදැ"යි දැන්වූකලි නුඹවහන්සේට ඒ පාරමී ධර්මයෝ සම්පූර්ණවූහ. එහෙයින් නිදුකානන්වහන්ස, බුදුවීමට කල් වන්නේය. නිදුකානන්වහන්ස, බුදුවීමට සමය වන්නේය"යි කියා යාචඤ්ඤා කළාහුය.

## පස්මහ බැලුම්

ඉක්බිත්තෙන් මහබොසතා තෝ දෙවියන්ට ප්‍රතිඥාදීම, කාල දීප දෙශ කුල ජනෙත්ති ආයුපරිවේක්ෂද වශයෙන් පඤ්ච-මහාවිලෝකන නම්වූ විලෝකනයන් කළසේක. එයින් කාලවිලෝකනය නම්:- අවුරුදු ලක්ෂයකට වඩා ආයුෂ ඇති කාලය බුදුවීමට කල් නොවෙයි. එසමයෙහි

මනුෂ්‍යයන්ට ජරා මරණ නොපෙණෙන්නේය. සම්බුදුවරයන්වහන්සේගේ දේශනාව නම් අනිත්‍යය දුඃඛය අනාත්මය යන ත්‍රිලක්ෂණයෙන් විනිර්මුක්ත නොවෙයි. දීඝායුෂ ඇති කාලයෙහි මනුෂ්‍යයන්ට අනිත්‍යාදිය නොපෙණෙන්නේය, අනිත්‍යාදිය ප්‍රකාශකොට වදාරන්නාවූ ධර්මය අසන්නටත් නොසිතති. නොකැමැති වෙති. එසේකල්හි මාර්ගාධිගමය නොවන්නේය. මාර්ගාධිගමයකට පැමිණීම නැතිකල්හි බුදුන්ගේ අවවාදානුශාසනයෙන් සත්ත්වයන් නිවණට පැමිණෙන්නේ නැත. එසේකල්හි ශාසනය අනෙයර්ථික වෙයි. මේ කාරණයෙන් ලක්ෂයක් අවුරුද්දෙන් වැඩුනාවූ ආයුෂ ඇති කාලය බුදුන්ට කල් නොවන්නේය. අවුරුදු සියයකින් අඩුවූ ආයුෂ ඇති කාලයත් බුදුවන්ට කල් නම් නොවන්නේය. කුමක්නෙසිත්ද? යත්; එසමයෙහි සත්ත්වයෝ උත්සන්නක්ලෙශයන්ගෙන් යුක්තවන්නාහ. එබදු සත්ත්වයන්ට දෙන ලද අවවාදය චිත්තයෙහි නොපිහිටයි. දණ්ඩකින් දියෙහි ඇදි ඉරක්මෙන් වහා නසින්නේය. ඒ කාරණයෙන් අවුරුදු සියයකින් අඩුවූ ආයුෂ ඇති කාලය බුදුවරයන්ට ඉපදීමට කල් නම් නොවන්නේය. අවුරුදු ලක්ෂයපටන් අවුරුදු සියය දක්වා ඇති මේ කාලය බුදුවන්ට කල්නම් වන්නේය. මේ කාලය සියක් අවුරුද්දට ආයුෂ ඇති කාලය බැවින් මේ බුදුවන්ට කාලයයි මහබෝසතාණෝ කාලවිලෝකනය කළාහුය.

ඉක්බිත්තෙන් දීපවිලෝකනය කරන්නාවූ මහබෝසතාණෝ පිරිවර සහිතවූ සතර දිවයින් බලා තුන්දිවයිනක බුදුවරයෝ නූපදනාහ. 'ජම්බුවීප යෙහි උපදනාහ'යි, ච්පවිලෝකනය කළසේක. ජම්බුවීපය නම් ඉතා මහත. දසදහසක් පමණ යොදුන් ඇත්තේය. එහි කවර ප්‍රදේශයක සම්බුදුවරයෝ උපදනාසේක්ද්‍යැහෝයි බලනසේක් මධ්‍ය දෙශය දුටුසේක. මධ්‍යදෙශය නම් කෙසේද?යත්; බොධි මණ්ඩලයට පූර්වදිශා භාගයෙහි කජඞ්ගලා නම් නියම්ගමය. අග්නිදිග සලලවති නම් ගඟය. දකුණුදිග සෙතකර්ණිකා නම් නියම්ගමය. පශ්චිමදිග ථූන නම් බමුණුගමය. උතුරුදිග උසීරධජ නම් පර්වතය. යන මොවුන්ගේ මධ්‍යයෙහි වූ දෙශය මධ්‍යදෙශ නම් වේ. මෙසේ දක්වනලද මධ්‍යදෙශය දිගින් තුන්සියයක් යොදුන. පුළුලින් දෙසියපණස් යොත්තෙක. වටින් නවසිසියක් යොදුන. මෙසින් පිටත් ප්‍රදෙශයෝ ප්‍රත්‍යන්ත දෙශයෝ නම් වෙති. මධ්‍යදෙශයෙහි වනාහි බුඛ ප්‍රත්‍යෙකබුඛ ආර්‍යශ්‍රාවක අශීතිමහා-ශ්‍රාවක චක්‍රවර්ති රජදරුවන් හා අනිකුත් මහානුභාවසම්පන්න ක්ෂත්‍රිය බ්‍රාහ්මණගෘහපති මහාසලාදීනු උපදනාහ. මේ මද්ධ්‍යමණ්ඩලයෙහි කපිලවස්තු නම් නුවරෙක් වන්නේය. එහි මා විසින් ඉපදිය යුතුය'යි නිශ්චාවට පැමිණිය සේක.

ඉක්බිත්තෙන් ඉපදිය යුතු කුලය බලන්නාවූ මහබෝසතාණෝ සම්බුදුවරයෝ නම් වෙළඳකුලයෙහිත් ගොවිකුලයෙහිත් නූපදනාහ. ලොක-ප්‍රසිද්ධ වූ පූජ්‍ය වූ ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ උපදනාහ. දැනුදු ක්ෂත්‍රිය කුලය ලොකසම්මතය. එහි උපදිමි. "සුදොධාදන මහරජාණෝ මට පිය වන්නාහ"යි; කුලය බැලූසේක.

ඉක්බිත්තෙන් මාතෘවිලොකනය කරන්නාවූ මහාබෝසතාණෝ බුඛමාතාවෝ නම් පුරාණලොලත්වයක් නැත්තාහ. සුරාධූර්ත නොවන්නාහ,

කල්පලක්ෂයක් මුලුල්ලෙහි පුරණලද පාරමිතාවන් ඇත්තාහ. අඛණ්ඩවූ පන්සිල් ඇත්තාහ. සුදොවුන් මහරජුගේ අගමෙහෙසිවූ මහාමායාදේවී වනාහි එබඳු ගුණධර්මයක් ඇත්තිය. එහෙයින් මහාමයාදේවී මට මව් වන්නීය. ඒ දේවීන්ට දසමසක් අධිකවූ සත්දවසක් ආයුෂ ඇති බව දැන "නිදුකාතෙනි, බුදුවීමට කල්වන්නේය"යි දෙවියන්ට ප්‍රතිඥා දී,

## මවුකුස පිළිසිඳ ගැණීම

"තිපි හැමදෙන යව" යි දෙවියන් යවා තුසිත දිව්‍යලොකයෙහි දෙවියන් විසින් පිරිවරණලදුව නන්දන වනයට වැද එහි ඇවිදිමින් සිටියදීම එයින් චුතව මහාමායා දේවීන්ගේ කුක්ෂියෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කළසේක. එහි විස්තර මෙසේ දතයුතු,

එසමයෙහි වනාහි කපිලවාස්තු පුරයෙහි උතුරුසළ නැකත ලද ඇසළමස මැදි පොහොයෙහි කරණලද ඇසළකෙළි නම් මහත්වූ උත්සව-කෙළියෙක් වූයේය. එකල මහාජනයෝ ඉස් සෝදා නහා හැඳ පැලඳ නැකත් කෙළි කෙළිති. මහාමායා දේවිද නැකත් කෙළි සිරි විඳිමින් සත්වන දවසෙහි උදැසන්හි සුවඳ පැනින් ඉස්සෝදා නහා සාරලක්ෂයක් වසතු වියදම්කොට මහදන් දී සර්වාලංකාර විභූෂිතව උතුම් හොජනය අනුභව කොට උපොසථ ශීලය අධිෂ්ඨාන කොට අලඞ්කෘත කොට පිළියෙල කරණ ලද ශ්‍රියහන් ගබඩාවට ප්‍රවිෂ්ටව නිද්‍රොපගත තැනැත්තී මේ සුපිනය දුටුවාය. හේ කෙසේද? යත් සතරවරම්මහරජදරුවෝ බිසවුන් හොත් යහන සමඟ ඔසවා ගෙණ හිමවතට ගෙණ ගොස් සැවොදුන් හිරියල් ගල්තලෙහි මහාසල්රුක් මුල තබා එකත්පසෙක සිටියාහුය.

ඉක්බිත්තෙන් ඒ වරම් රජදරුවන්ගේ අගමෙහෙසිහු ඇවිත් දේවීන් අනෝතත්තවිලට ගෙණ ගොස් මිනිස්ගඳ හරණ පිණිස නහවා දිවපිළි ඳදවා දිවගඳවිලවුන් ගල්වා දිවමල් පලඳවා එයින් නුදුරුතෙන රිදී පර්වතයක් ඇත, එහි පිහිටි රන්පෑයෙක් ඇත, එහි පශ්චිම දිගට සිරසලා සැතපෙන ලෙසට දිවයහනක් පණවා මහාමායා දේවීන් එහි සැතැප්පවූහ. ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ උතුම් ශ්වෙත හස්තිවිලාසයක් ඇතිව එයින් නුදුරුතෙන එක් සුවණ්ණපර්වතයක් ඇත, එහි ඇවිද එයින් බැස රිදී පර්වතයට නැගී උතුරු දෙසින් අවුත් රිදීදමක් වත් සොඬින් ශ්වෙතපද්මයක් ගෙණ කුක්ෂ්‍යාදකොට රන්විමනකට ප්‍රවිෂ්ටව බිසවුන් හොත් යහන වට තුන්යලක් ප්‍රදක්ෂිණාකොට දක්ෂිණපාර්ශ්වයෙන් බිසවුන්ගේ කුක්ෂියට ප්‍රවිෂ්ටවූවාක්මෙන් විය. එකෙණෙහි මහබෝසතුන්ගේ ප්‍රතිසන්ධිග්‍රහණය වූයේය.

මේ සුපිනය දැක පිබිදුනාවූ දේවීතෝමෝ ඒ සුපිනය රජහට දන්වූ කල්හි සුදොවුන් මහරජානෝ වේදයෙහි දක්ෂවූ සිව් සැවක් පමණ උතුම් බමුණන් ගෙන්වා මාහැඟි අසුන් පණවා බමුණන් එහි හිඳුවා සර්පිමධුශර්කරාභිසංස්කෘත පැන් නුමුසු කිරිබත් පිරූ රන්රිදී තලි සිව් සැටක් එසේම රන්රිදී තලි සිව්සැටකින් වසා මාහැඟි වස්ත්‍ර හා කපිලවත් දෙනුන් බමුණන්ට දන් දී

ඔවුන් සතුටු කරවා බිසවුන් දුටු සවප්නය කියා "එහි ඵලවිපාක කිමෙක්ද"යි විවාළාහුය. බ්‍රාහ්මණයෝ කියන්නාහු "මහරජ්ජුරුවන් වහන්ස, තොපගේ දේවීන් කුස දරුගභීයෙක් පිහිටියේය. හෙද වනාහි පුරුෂ ගර්භයෙක, පින්වත් පුත්රුවනෙක, හේ තොමේ ගෘහවාසයෙහි විසුවහොත් සක්විති රජවෙයි. ගිහිගෙන් නික්ම පැවිදිවුවොත් ලොව්තුරා බුදුවෙයි"යි කීවාහුය. මෙසේ බොධිසත්ත්වයන් මව්කුස පිළිසිඳගැන්ම හා සමග දසදහසක් සක්වළ සියලු ප්‍රදීපයන්ගේ සියලු දිව්‍යවිමානයන්ගේ, සියලු තාරකාවන්ගේ, සියලු චන්ද්‍රසූර්‍යයන්ගේ, ශක්‍රාදී සියලු දෙවියන්ගේ, මහා බ්‍රහ්මාදී සියලු බ්‍රහ්මයන්ගේ ආලෝකයෙක් ඇද්ද? ආනුභාවයෙක් ඇද්ද? ඒ සියල්ල හිරුදුටු කණමැදිරි ආලෝකයක් සෙයින් මැඩපවත්වා අප්‍රමාණවූ ආලෝකයෙක් ප්‍රාදුර්භූතවී. එකල්හි ජාත්‍යන්ධයෝ ඇස්ලැබුවාහුය. ජාති බධිරයෝ මිහිරි ගිනිකා ශබ්ද ඇසුවාහුය. ජාතිමූගයෝ සැපසේ කථාකළාහුය. ජාතිපංගුලයෝ සෘජුව ගමන් ගියාහුය. බන්ධනගත සියලු සත්ත්වයෝ එයින් මිදුනාහුය. සියලු නරකවල ගිනි නිවී ගියේය. ප්‍රෙතයන්ගේ සාපිපාසා සංසිඳුනේය. තිරිසනුන්ගේ භය නැතිවිය. සියලු සත්ත්වයන්ගේ රොග සංසිඳුනේය. මේ ආදී දෙතිස් මහාපුරිසනිමිති පහළවීමෙන් දසදහසක් සක්වළ උතුම්වූ ශ්‍රී සෞන්දර්‍යයෙන් අග්‍රප්‍රාප්තවීය.

මෙසේ පිළිසිඳගන්නා ලද බොධිසත්ත්වයන්වද බොධිසත්ත්වමාතා වන්වද වන්නාවූ උපද්‍රව වළක්වනු පිණිස සතරවරම් රජදරුවෝ කඩුගත් අත් ඇතිව රැකවල් ගත්තාහුය. එතැන් පටන් බොධිසත්ත්ව මාතාවෝ පුරවන ලද තෙල්පාත්‍රයක් සේ දශමාසයඇතක් මුලුල්ලෙහි බොධිසත්ත්ව කුමාරයන් කුසින් පරිහරණය කොට පරිපූර්ණවූ ගර්භ ඇතිව දෙව්දහැ නුවරට යනු කැමතිව සුදොවුන් මහරජානන්ට එපවත් දන්වූ කල්හි ඒ ඇසූ සුදොවුන් මහරජානෙනි යහපතැ"සි; සතුටුව කපිලවාස්තුපුරයෙහි පටන් දෙව්දහැනුවර දක්වා මාර්ගය සමකරවා පූර්ණ ඝටධජපතාකාදීන් අලඬකෘතකොට සරහා දේවීන් රන්සිවිගෙයක හිඳුවා අමාත්‍යයන් දහසක් හා සමග මහත් පිරිවරින් දෙව්දහැනුවරට පිටත් කළාහුය. ඒ දෙනුවර අතරෙහි නානාවිධ වෘක්ෂපඬක්තින්ගෙන් සැදුම්ලත් ලුම්බිනී වන නම් වූ මගුල්සල්උයනෙක් ඇත. එසමයෙහි මහාමායාදේවී තොමෝ උයනේ ක්‍රීඩාකරණු කැමැතිවූය. අමාත්‍යයෝ අභිප්‍රායානුකූලවූ ලෙසට මගුල් උයනට දේවීන් වඩාලූහ. මහාමායාදේවී සුපුෂ්පිත සල්රුකක් මූලට ගොස් අත්තක් අල්වනු කැමතිවූ කල්හි එකෙණෙහි වේඩඬ සෙයින් ශාලශාඛාවක් නැමී දේවීන්ගේ හස්තයට උපගතවීය. ඒ ශාලශාඛාව දකුණතින් ගෙණ නැගෙනහිර දිසාව බලා සිටියදීම බොධිසත්ත්වයෝ ප්‍රසූතවූසේක. යම්සේ අන්‍යසත්ත්වයෝ මව් කුසින් ප්‍රසූතවෙත්ද මහබෝසතානෝ එසේ නොවූහ. මහබෝසතානෝවූකලී ධර්මාසනයකින් බස්නා ධර්මකථික කෙනෙකුන් මෙන් දික් කරණලද හස්තාපාද ඇතිව කසීවස්ත්‍රයෙක්හි තබනලද ජාතිරඹ මාණික්‍යයක් මෙන් පිරිසිදුවූ ශරීර ඇතිව ප්‍රසූතවූසේක. බුදුවන ජාතියෙහි මව්කුසින් ප්‍රසූතවන සියලු බොධිසත්ත්වවරයන්ගේ මේ ධර්මතාවකි. ඉක්බිත්තෙන් ප්‍රහීණ කාමරාගයන් ඇති සුඛාවාස බ්‍රහ්මලොකයෙහි වසන්නාවූ මහාබ්‍රහ්මයෝ සතරදෙනෙක් රන්දැලින් බොධිසත්ත්වයන් පිළිගෙණ

මායාදේවීන් ඉදිරියෙහි තබා "දේවීනි; සතුටුසිත් ඇතිවව්. මහානුභාව සම්පන්න පුතනුකෙනකුන් තොපට උපන්නේ වේදැ"යි කීවාහුය. ඒ මහාබ්‍රහ්මයන් අතින් වරම්රජදරුවෝ උතුම්වූ සුවපහස් ඇති අඳුන් දිවි සමින් පිළිගත්තාහුය. ඒ වරම්රජදරුවන් අතින් අමාත්‍යයෝ දිවඳුහුල් සුඹුලකින් පිළිගත්තාහුය. මේ දහම බොධිසත්ත්වයන්ගේ ධර්මතාවකි.

## කුමාරොත්පත්තිය

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ බිසවුන් අතින් බැස පෘථිවිය පලා පැහැනැගි පද්ම මස්තකයෙහි පූර්වදිශානිමුඛව වැඩ සිටිසේක් එකෙණෙහි පිරිසිදු ශරීර ඇති මහාබොධි සත්ත්වයන් මායාදේවීන්ට සත්කාර පිණිස ආකාශයෙන් ස්ඵටික මාණික්‍ය වත් ජලධාරාවෝ දෙදෙනෙක් මාතෘ පුත්‍ර දෙදෙනාගේ ශරීරය සෘතුග්‍රහණය කිරීමෙන් සතුටු කළාහුය. මේ හැම බොධිසත්ත්වයන්ගේ ධර්මතාවකි. මෙපමණක් නොවෙයි; එකෙණෙහි සෙරසේම දෙතිස් මහා පූර්වනිමිති පහළ විය. එකල්හි වාතිංශද්වර මහාපුරුෂලක්ෂණයෙන් විරාජමානවූ සියලු කුශල රාශියට උත්පත්තිස්ථානවූ මහාබොධිසත්ත්වතෙමේ දශදික් බලනුයේ, බැලූ බැලූ දිශාවෙහි දිව්‍යබ්‍රහ්මයන් විසින් "සවාමීනි, මේ දිශාවෙහි ඔබ හා සම කෙනෙකුන් නැතැ"යි යනාදීන් දක්වූ හෙයින් උත්තරදිශානිමුඛව වැඩ සිට මහාබ්‍රහ්මාදී දිව්‍යසමූහයා විසින් නංවනලද ධවලච්ඡත්‍රාදී දිව්‍යොපහාර ලබමින් සියලු ලෝවැස්සන්ට පෙණී පෙණී උතුරුදිගට සත්පියවර පියුම්පිටින්ම වඩිමින්, "අග්ගොහමස්මි ලොකස්ස" යනාදි සියලු සර්ව්ඥවරයන්ගේ චාරිත්‍ර ධර්මයක්වූ අසිත කෙශරසිංහනාද කළ සේක. යම් කලෙක අප මහාබෝසතාණෝ ලුම්බිනි නම් වනයෙහි උපන්සේක්ද, එවේලෙහිම රාහුල මාතාවෝය, ජනන නම් අමාත්‍යයෝය, කාලුදායි නම් අමාත්‍යයෝය, කන්ථක නම් අශ්වරාජයාය, බොධිවෘක්ෂය, සතර මහා නිධානය, යන මේ වස්තූහු පහළවූවාහුය. සිංහනාදකළ ඉක්බිත්තෙන් උභයනගර වාසීහු අපමණවූ පූජාවෙන් ප්‍රමාණතික්‍රාන්ත වූ ශ්‍රී සම්භාරයෙන් බොධිසත්ත්වයන් කිඹුල්වත් පුරයටම ගෙණ ගියාහුය.

එදවස් "කපිලවාස්තුපුරයෙහි සුදොධාදන මහරජහුට පුත්‍රරුවනක් උපත. ඔහු බෝමැඩ හිඳ බුදුවෙති"යි තව්තිසා දිව්‍යභවනයෙහි දිව්‍යසමූහයා තුටුපහටු සිත් ඇතිව මහත්වූ ක්‍රීඩාවක් කරන්නට පවන්ගත්හ. එසමයෙහි සුදොධාදන රජ්ජුරුවන්ගේ කුලුපගවූ අෂ්ටසමාපත්තිලාභීවූ කාලදේවල නම් තපස්වී තෙමේ බත්කිස නිමවා දිවාවිහාරය පිණිස තව්තිසා භවනයට ගොස් එහි දිවාවිහාරය කොට හුන්නැතැත්තේ ඒ ක්‍රීඩාකරණ දෙවියන් දැක "එම්බා දේවතාවෙනි, මෙසේ සතුටුසිත් ඇතිව කුමක් නිසා ක්‍රීඩාකරවුද? මටත් මේ කාරණය නොවළහා කියව"යි විචාළේය. දෙවියෝ කියන්නාහු "පින්වත් වූ තාපසයෙනි, සුදොවුන් මහරජානන්ට පුත්‍රයෙක් උපන්නේය. හේ තෙමේ බෝමැඩ හිඳ බුදුව ධර්මචක්‍ර පවත්වයි. ඔහුගේ අනන්තවූ බුඩලීලාව දක්නටද ධර්මශ්‍රවණය කරන්නටද ලබමිහ"යි මේ කාරණයෙන් සතුටුවූවමිහ"යි කීවාහුය. කාලදේවල තාපසයෝ එපවත් අසා ශිෂ්‍යව දෙව්ලොවින් බැස රජගෙට ප්‍රවිෂ්ටව පණවනලද අස්නෙහි

හුන්නෑනැත්තෝ "මහරජ, තොපට පුත්‍රයෙක් උපන්නේය"යි ඇසීම්. ඔහු දකිනු කැමැත්තෙම්" කියා. රජ්ජුරුවෝ සරහා පිළියෙල කරණලද කුමාරයන් වඩා ඉදිරියට ගෙණවුත් කුමාරයන්ට ඇණවා "පුත තපස්වීන් වැඳ පින් රැස් කරගනුව"යි කියා තපස්වීන් වඳනාලෙස යොමු කළේය. එකල්හි බොධිසත්ත්වයන්ගේ පාදයෝ පරිවර්තිතව තාපසයන්ගේ ජටා-මසතකයෙහි පිහිටියාහුය. ඒ එසේමය. බොධිසත්ත්වයන්ගේ ඒ ආත්ම භාවයෙන් වැළුම් ගතයුතු අන් කිසිවෙක් නැත. ඉදින් වතාහි තොදුන බොධිසත්ත්වයන්ගේ හිස තාපසයන්ගේ පාමුල තැබුනම් ඒ තාපසයාගේ හිස සත් කඩක්ව පැලෙන්නේය ඒ බව දන් තාපසතෙමේ එසේකරණු කැමතිවූ රජහට මා නොනැසුව මැනව"යි හුන්නැතින් නැගී දෙහොත් මුදුන් දී බොධිසත්ත්වයන්ට නමස්කාර කෙළේය. ඒ ආශ්චර්‍යීය දුටු සුද්ධෝදන මහරජාතෝ තමන්ගේ පුතනුවන් වැන්දහ.

ඒ කාලදේවල තාපස්වීන් වහන්සේට අතීතයෙහි සතළිස් කපෙක, අනාගතයෙහි සතළිස් කපෙකැ"යි; අසූකපක් සිහිකරණ ඥානය ඇත්තේය. එසේහෙයින් බොධිසත්ත්වයන්ගේ ලක්ෂණ සම්පත්තිය දැක බුබසය සිඹවේදෝ නොවේදෝහෝ"යි ආවර්ජනාකොට උපධාරණය කරන්නේ සැක නැතිවම "බුදුවෙති"යි; දැන "මේ තෙමේ ආශ්චර්‍ය්‍ය පුද්ගලයෙකැ"යි සිතාසී "නැවත මිට මේ උතුමානන් බුදුවූකල දක්නට ලැබේද? නොලැබේදැ"යි පරීක්ෂා කරන්නේ නොලැබෙයයි දැන මම වතාහි මොහු බුදුවෙන අතුරෙහි කාලක්‍රියාකොට සියක් බුදුවරයන් විසිනුදු දහසක් බුදුවරයන් විසිනුදු ගොස් අවබොධ කරවන්නට නොහැකි වූ අරූපයෙහි උපදින්නෙම්"යි දැක මෙබඳුවූ ආශ්චර්‍ය්‍ය පුද්ගලයා බුදුවූ කල දක්නට නොලබම්"යි; ශොකයෙන් ඇඬුහ. මනුෂ්‍යයෝ ඒ දැක අපගේ තාපසයෝ දැන් සිනාසී නැවත හඬන්නටවන්හ. මේ කාරණය කිමෙක්දැ?"යි සිතා කිමෙක්ද? සවාමීනි, අපගේ මේ උතුමන්ට කිසි අන්තරායෙක් වන්නේදැ"යි විවාලාහ. ඒ අසා තාපයයෝ "මේ කුමාරයන්ට අන්තරායෙක් නැත. සැකනැතිවම බුදුවන්නේය"යි කීහ. "නැවත කුමක් හෙයින් හැඬුසේක්ද"යි විවාලාහ. තාපසයෝ මෙබදු උතුමානන් බුදුවූකල දක්නට නොලැබ මහලු හෙයින් අතරෙහි කාලක්‍රියා කරන්නෙමි. එහෙයින් හැඬිමි"යි කීහ. මෙසේ කියා මේ උතුමානන් බුදුවූ කල්හි දක්නට මාගේ නැයන් අතුරෙහි කිසිවෙක් ඇද්ද? නැද්දෝහෝයි පරීක්ෂාකරන්නේ භාගිණෙය්‍ය නාලක නම් කුමරුවා දැක නැගනියන්ගේ ගෙට ගොස් ඔහු කැඳවා "දරුවෙනි, සුද්ධෝදන මහරජානන්ගේ කුලයෙහි පුත්‍රයෙක් උපන්නේය. ඔහු බුඛාංකුරයෙක. පන්තිස් අවුරුද්දක් අතික්‍රාන්තකොට බුදුවන්නේය. තොපට ඒ බුදුන් දක්නට ලැබෙන්නේය. එහෙයින් අදම පැවිදිවෙව"යි කීහ.

ඒ අසා නාලක කුමාරයෝ මාගේ මයිලනුවෝ මා අනර්‍ථයක නොයොදති. මට වැඩක් පිණිස කිවිමය"යි සිතා කිකරුව සත්අසූකෙළක් ධන ඇති කුලයෙහි උපන් තැනැත්තෝ ඒ සියලු සම්පත් හැර එකොණෙහිම වීථියෙන් කාෂායවස්ත්‍ර හා මැටිපාත්‍රයක් ගෙන්වාගෙණ දැලිහිසකෙස් බා කාෂාය වස්ත්‍ර හැඳ පෙරවා "ලෝකයෙහි යම් පුද්ගලයෙක් උත්තමවී නම්

මාගේ පැවිදිවීම ඔහු උදෙසාය''යි බොධිසත්ත්වයන් දිසාවව අභිමුඛකොට ඇදිලිබැඳ පඤ්ඣ පිහිටුවා වැඳ පාත්‍රය ඵවිකායෙහි බහා අංශකූටයෙහි එල්වාගෙණ හිමවතට ප්‍රවිෂ්වව මහණදම් කෙළේය.

හෙතෙමේ පරමාභිසම්බොධියට පැමිණි බුදුන් කරා එළඹ **නාලඤ්ඣ ප්‍රතිපදා** ඉගෙණ නැවතත් හිමවතට ප්‍රවිෂ්වව රහත්ව උත්කෘෂ්ව ප්‍රතිපත්තියට පිළිපන් තැනැත්තේ සත්මසක් පමණකල් ජීවත්ව එක් සවණි පථිතයක් නිසා වැඩ සිට පිරිණිවි පරිදි නිදනවණ්ණනායෙන් හා සඩ්ඝීරත්නාකාරයෙන් බලා දතයුතු.

බොධිසත්ත්වයන් උපන් පස්වෙනි දවසෙහි සිව්දෑගදින් පිරිඛඩගෙණ ලද පස්මල් ඉස අසමභිඤ්ඤාවූ ඛීරපායාසය පිසවා ත්‍රිවෙදයෙහි පරතෙර පැමිණි අවෝරාසියක් බ්‍රාහ්මණයන්ව ආරාධනාකොට රජගෙයි පණවන ලද අසුන්වල හිඳුවා මහා බොජුන් අනුභව කරවා මහත්සත්කාරකොට 'බ්‍රහ්මණයෙනි, මේ කුමාරයන්ගේ ලඤ්ඣණ බලා තත්වූ පරිද්දෙන් කාරණ කියව''යි විවාළ කල ඔවුන් අතුරෙහි රාමය, ධජීය, යඤදී බ්‍රාහ්මණයෝ අටදෙන කුමාරයන්ගේ ලඤ්ඣණ ප්‍රතිග්‍රාහකයෝ නම් වෙති. ඒ අටදෙනා අතුරෙහි සත්දෙනෙක් 'ඇඟිලි දෙකක් ඔසවා මෙබඳු ලඤ්ඣණයෙන් සමන්විත වූයේ ගිහිගෙයි විසුව– හොත් දෙදහසක් කොදෙවි පිරිවරකොට ඇති සතරමහත් දිවයිනට එකඡත්‍ර නංවා රජසිරි විඳිති. පැවිදිවුවහොත් බුඛත්වයට පැමිණෙති''යි කීවාහුය. ඔවුන් හැමදෙනාගට වයසින් බාලවූ ගොත්‍රයෙන් ඤොණ්ඩඤ්ඤ නම්වූ මානවකයෝ බොධිසත්ත්වයන්ගේ ලඤ්ඣණවරනිෂ්පත්ති බලා මේ පුරුෂයා තන්ගේ ගිහිගෙයි විසීමෙක් නම් නැත. ඒකාන්තයෙන්ම බුදුවන්නේය''යි එකම ඇඟිල්ලක් ඔසවා එකක්ම කීවෝය. ඒ එසේමය. මේ ඤොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණ තෙමේ කල්පලඤ්ඣයක් මුළුල්ලෙහි කෘතාධිකාර ඇත්තාවූ එම ජන්මයෙහි රහත්වන පශ්චිමභවික සත්ත්වයෙක. එහෙයින් ඉතිරි සත්දෙනා පැරද වීමෙන් අභිභවනය කොට සැක නැතිවම බුදුවන්නේමය''යි එකඟිල්ලක් ඔසවා මෙසේ කීයේය.

ඉක්බිත්තෙන් ඉතිරි සත්දෙනා වනාහි තමතමන්ගේ නිවාසසථානවලට පැමිණ තමන්ගේ පුත්‍රයන් ආමන්ත්‍රණය කොට ''දරුවෙනි, අපි මහලුවුම්හ. සුද්ධොවුන් මහරජානන්ගේ පුත් සඞ්ඝතාඤ්ඤයට පැමිණි කල්හි ඔවුන් වහන්සේ කරා පැමිණෙන්ට ලබමෝද? නොලබමෝද? නොදනුම්හ''යි තොප ඒ කුමාරයන් බුදුවූ කල්හි උන්වහන්සේගේ ශාසනයෙහි පැවිදිවෙත්ව''යි කියා ඒ බ්‍රාහ්මණයෝ සත්දෙනම ආයුෂයාගේ කෙළවර කම්වූ පරිද්දෙන් මිය පරලොකප්‍රාප්ත වූහ.

ඤොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණයෝම නීරෝගවූහ. ඒ ඤොණ්ඩඤ්ඤ නම් මානවකයෝ බොධිසත්ත්වයන් වැඩිවිය පැමිණ අනිනිෂ්ක්‍රමණය කොට ක්‍රමයෙන් උරුවෙල් ගොස් ''ඒකාන්තයෙන් මේ භූමිප්‍රදේශය සිත්කළුය''යි එහි මහාවියූහකරමින් වසන සමයෙහි මහා පුරුෂයානෝ පැවිදිවූහ යි අසා යටකී බ්‍රාහ්මණයන් අවදෙනාගේ පුත්‍රයන් කරා එළඹ ''ඒ සිද්ධාර්ථ කුමාර තෙම පැවිදි විය. හෙතෙම ඒකාන්තයෙන්ම බුදුවන්නේය. ඉදින් තොපගේ පිතාවූ බ්‍රාහ්මණයෝ ජීවත්ව සිටියාහුවිනම් අදම නික්ම පැවිදිවෙති. ඉදින්

තොපිත් කැමැත්තාහු නම් මා හා කැටුව එව. මම ඒ මහාපුරුෂයාණන්ට අනුව පැවිදි වෙමි''යි කීවාහුය. ඒ ඇසූ බ්‍රාහ්මණයෝ එකසිත්වන්තව අසමසම්වූහ. එහෙයින් තුන් දෙනෙක් පැවිදිනු වූහ. කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණයන් ජ්‍යෙෂ්ඨකොට අනික් බ්‍රාහ්මණයෝ සතරදෙනම පැවිදිවූහ. ඒ පස්දෙනම පඤ්චවග්ගී භික්ෂූහු නම් වෙති. ඔව්හු ඉසිපතනාරාමයෙහිදී අග්‍රදානම් පිළිගත් පරිදි මතු පහළවෙයි. එසමයෙහි වනාහි සුද්ධොදන මහරජානෝ ''මාගේ පුතනුවෝ කුමක් දැක පැවිදිවෙත් දැ'යි විමසූහ. එකල ''සතර පුබ්බනිමිත්ත දැක පැවිදිවෙති''යි කීහ. ''සතර පුබ්බනිමිත්ත නම් කවරෙක්දැ''යි විමසූ ''ජරාජිණ්ණ, ව්‍යාධි, මෘත, ප්‍රව්‍රජිත, රූපය''යි අසා ''එසේ වුවහොත් මෙතැන් පටන් මෙබඳු වූවන් මපුතනුවන් සමීපයට යන්ට ඉඩ නොදෙව. දක්නට ඉඩ නොදෙව. බුදු වීමෙන් කම් නැත, මපුතනුවන් දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතරමහාවීථියට අධිපති රජකරමින් සතිස් යොදතෙක පැතිර සිටින මහපිරිවරින් පිරිවරණ ලදුව අහස්තලෙහි ඇවිදින්නා දක්නා කැමැත්තම්හ''යි කියා ජරාජිණ්ණ, ව්‍යාධි, මෘත, ප්‍රව්‍රජිතය, යන මොවුන්ගේ රූම වළක්වනු පිණිස සිවුදිගින් ගව්වෙන් ගව්වට ආරක්ෂා කරවූහ. එදවස් වනාහි මගුල් පිණිස එතැන්හි රැස්වූ අසූදහසක් ඤාතිරජ දරුවෝ ''අප හැමගෙන් එක එක කුමරුවා බැගින් දෙම්හ''යි අසූදහසක් කුමරුවන් දුන්හ. සුද්ධොදන මහරජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ට උතුම්වූ රූපසම්පත් ඇති විගතදෙෂවූ කිරිමවුන් සැලැස්වූහ. බොධිසත්ත්වයෝ මහත්වූ යසපිරිවරින් මහත්වූ ශ්‍රීසෞභාග්‍යයෙන් වැඩෙන්ට වන්සේක. එක් දවසක් වප්මඟුලෙහිදී කළ ප්‍රාතිහාර්‍යය දැක ඤාදෙවුන් මහරජානෝ දෙවෙනි වැඳීමෙන් වැන්දහ. තුන්වෙනි වැඳීමෙන් වැන්ද පරිදි මතු පහළවෙයි.

ඉක්බිත්තෙන් අනුක්‍රමයෙන් බොධිසත්ත්වයන් වහන්සේ සොළොස් ඇවිරිදි වයසට පැමිණි කල්හි සුදෙවුන් මහරජානෝ බොධිසත්ත්වයන්ට තුන් සෘතුවට සුදුසු තුන් පහයක් කෙළේය. එකක් නවභූමිකය, එකක් සප්ත භූමිකය, එකක් පඤ්චභූමිකය, ප්‍රාසාද පමණක් නොවෙයි. සතළිස් දහසක් පමණ නාටක ස්ත්‍රීන් එලවූහ. ත්‍රිභුවන තිලකවූ අප මහබෝසතාණෝ දහසක් රූවන් දෙරටුවෙන් හා සප්ත රත්නප්‍රාකාරයෙන් සොභමානවූ කනක රජතාදී විමානමාලායෙන් සම්ලඞ්කෘතවූ රූවන්මෙර මුදුතෙහි පිහිටි ත්‍රයස්ත්‍රිංශත් දෙවිනුවර අඩුතුන්කෙළක් දෙවඟනන් පිරිවරණලදුව රජපැමිණි සක්දෙව් රජහු සේ සතළිස් දහසක් පමණ දෙවඟනන් වැනි වරඟනන් විසින් පිරිවරණ ලදුව ඒ ඒ සෘතුවට සැපවූ පරිද්දෙන් තුන්පාසෙහි රාහුලමාතාවන් අග්‍රමෙහෙසිකා කොට වසනසේක් මෙසේ මහාසම්පත් අනුභවකරන්නාවූ බොධිසත්ත්වයන්ට ඤාතිසමූහයා මධ්‍යයෙහි මෙබඳු කථාවක් පහළ විය. කෙසේද?යත්

## ශිල්ප දැක්වීම

''සිද්ධාර්ථකුමාරයෝ ක්‍රීඩාප්‍රසුතව ඇවිදිනාහ. කිසිම ශිල්පයක් නොදන්නාහ. සංග්‍රාමයක් සම්ප්‍රාප්තවූ කල්හි කුමක් කරන්නාහු දැ''යි යන මේ වචනය පහළ විය. සුදෙවුන් මහරජානෝ එපවත් අසා බොධිසත්ත්වයන්ට ආමන්ත්‍රණය කොට 'පුත තොපගේ නැයෝ ''සිද්ධාර්ථ

කුමාරයෝ කිසි ශිල්පයක නොහික්ම ක්‍රීඩාප්‍රසුතව ඇවිදිති''යි කියන්නාහුය. මෙබදු ක්‍රියාවක් සම්ප්‍රාප්තවූ කල්හි කුමක් සිතවි දැ''යි විචාළාහුය. එපවත් ඇසූ තුන්ලෝ ඔරස ලූ මුදුන්මල්කඩක් වැනිවූ සිද්ධාර්ථකුමාර වූ අප මහබෝසතාණන් ''දෙවයන්වහන්ස, චම්පෙය්‍ය සුමනාමකුමාරී නෙතඛ්‍යාදි සුගන්ධ පුෂ්පයෝ අන්කිසි සුගන්ධ පුෂ්පයන් කරා ගොස් තමන්ට සුවද පිණිස අභ්‍යාසයෙක් නැද්ද? එපරිද්දෙන්ම මේ අත්බැව්හි මගේ ශිල්ප අභ්‍යාසයක් පිණිස අන්කිසිවකු කරා යාමෙක් නැත. යම්සේ චන්දනගන්ධයෝ අභ්‍යාසය පිණිස අන්කිසි ගන්ධයක් කරා නොයෙද්ද? එපරිද්දෙන්ම මේ අත්බැව්හි අන්කිසිවකු කරා ගොස් අභ්‍යාස කරණ ශිල්පයෙක් නැත. මාගේ ශිල්ප දක්නා පිණිස නුවරෙහි බෙරහසුරුවා වදුලමැනව. මෙසින් සත්වෙනි දවසෙහි නැගත්ව ශිල්ප දක්වමි''යි කීසේක. සුද්ධෝදනුන් මහරජානෝ එපරිද්දෙන්ම කළාහුය. බොධිසත්ත්වයෝ අක්ෂණවෙධි වාලවෙධි ධනුර්ග්‍රහයන් රැස්කරවා මනාජනයා මධ්‍යයෙහි සමස්තලොකයෙහි ඇතිතාක් ධනුර්ග්‍රහයන්හා අසාධාරණවාදශශිල්පයක් කැනිනිත්ට දක්වූ සේක. ඒ ශිල්ප දැක්වූ පරිදි ඝරණඩ්ඛ ජාතකයෙහි ආ ක්‍රමයෙන් දතයුතු. ඒ ආශ්චර්‍යභූත වූ කැනීහු බොධිසත්ත්වයන් කෙරෙහි සැක දුරු කළෝය.

## උයන්කෙළි පිවිසීම

ඉක්බිත්තෙන් එක්දවසක් උයන් කෙළියට යනු කැමැත්තාවූ මහබෝසතාණෝ රථාචාරීන්ට ආමන්ත්‍රණය කොට රථය යොදව''යි කියා ඔහු විසින් ''මැනව''යි පිළිගෙණ අතර්‍ධවූ උතුම් රථයක් සණිලඛකාර කොට කුමුදපත්‍ර වණ්ණ මඟුලසුත් සතරදෙනෙක් යොදා බොධිසත්ත්වයන්ට දැන්වූ කල්හි දෙව් විමනක් වැනිවූ ඒ රථයට නැගී බොධිසත්ත්වයන් උයනට අභිමුඛව නික්මුණු කල්හි දෙවියෝ ''සිද්ධාර්ථකුමාරයන් බුදුවනකල් ආසන්න වය, පූර්වනිමිති දක්වම්හ''යි; එක් දිව්‍යපුත්‍රයකු ජරාජර්ජිත වෙස් ගන්වා දැක්වූහ. ඒ රූපය බොධිසත්ත්වයන් හා රථාචාරීන් දුටු කල්හි ''කිමෙක්ද? ඇඟළු රථාචාරීනි, මේ පුරුෂතෙම අන්‍යයන්ගේ යම්සේ නම් එපරිද්දෙන් හිසකෙස් ඇත්තේ නොවෙයි'' යනාදීන් දික්සහියෙනි මහාපදාන සූත්‍රයෙහි මහාවිදර්ශී කුමාරයා විචාළ ක්‍රමයෙන් විචාරා ''ජානිය ඇත්තාහුට ජරාව පෙණෙන්නේය ''යනාදීන් සලකා කළකිරුණාවූ සිත් ඇතිව යෞවන මදය දුරුකොට උයන්කෙළියට නොගොස් එතන සිට පෙරළා නුවරට අවුත් නැවතත් එක්දවසක් උයන් කෙළියට යන්නාහු පඤ්චකාමරතිය නැසීමට කාරණවූ ව්‍යාධිමයන් පීඩිතවූ පුරුෂයෙක් පෙරසේම දැක ආරෝග්‍ය මදය දුරුකොට උයනට නොගොස් පෙරළා නුවරට අවුත් නැවතත් එක් දවසක් උයන්කෙළියට යන්නාහු එසේම දෙවියන් විසින් නිර්මිතකොට දක්වනලද මෘතශරීරයන් දැක ජීවිතමදය හැර විදුරුපළිතයෙක්හි දක්නාලද සිදුරක් සෙයින්ද හිරුවිමනෙක්හි දක්නා ලද අන්ධකාරයක් මෙන්ද දිව්‍යබ්‍රහ්මවිමානයෙහි දක්නාලද මලමූත්‍රයක් මෙන්ද තමන්ගේ ශ්‍රීඝර්ෂයෙහි කළකිරී නැවතත් එක්දවසක් උයන්කෙළියට යන්නාහු පෙරසේම දෙවියන් විසින් දක්වනලද ප්‍රව්‍රජ්‍යා සැපයෙන් සුඛිතවූ ශ්‍රමණ රූපය දැක පැවිදිවීමෙහි අභිප්‍රාය උපදවා උයන්කෙළි කෙළනා පිණිස උයනට ගොස් එහි යුවල් උයන්කෙළි කෙළිමින් දිවසභාගය අතික්‍රාන්ත කොට

සූයශීයා අස්තංගත වූ කල්හි මගුල් ශෛලයපිට හුන්සේක. තමන් වහන්සේ සර්‍වාලංකාරයෙන් සැරසෙනු කැමති වූ සේක. ඉක්බිත්තෙන් පරිවාරජනයෝ අනෙක වණ්ණ වූ නානාප්‍රකාර පිළි හා නානාප්‍රකාර ආභරණවිකාතීන්ද මල්ගද විලවුන්ද ගෙණ හාත්පසින් සිටියාහුය.

එකෙණෙහි සක්දෙව්රජහුගේ පඩුපුල් අස්න හුණු විය. එදත් සක්දෙව් රජතෙමේ "මා මෙතනින් චූත කරවන්නට කවරෙක් කැමැත්තේ ද"යි; උපධාරණය කරන්නේ, බොධිසත්ත්වයන්ගේ අලංකාර කරණකාලය සම්ප්‍රාප්ත විය. එහෙයින් විශ්වකර්‍මී දිව්‍ය පුත්‍රයාට ආමන්ත්‍රණය කොට "එම්බා විශ්වකර්‍මීය, සිද්ධාර්‍ථ කුමාර තෙමේ අද මධ්‍යම රාත්‍රියෙහි මහබිනික්මන් නික්මෙන්නේය, මොහුගේ පශ්චිමාලංකාරය වන්නේය. තොප උයනට ගොස් ඒ මහාපුරුෂයා දිව්‍යාලංකාරයෙන් සරහව"යි කීහ. ඒ අසා විස්කර්‍මි-දෙව්පුත් "මැනවැ"යි පිළිගෙණ, එකෙණෙහිම දිව්‍යානුභාවයෙන් එළඹ බොධිසත්ත්වයන් සරහන්නට සිටි මගුල්කපුවාගේ වෙස්ගෙණ ඔහුඅත තුබූ සළු ගෙණ හිස වෙලා මිණිවොටුනු පලඳවා සක්දෙව් පරිද්දෙන් සරහා පිළියෙල කෙළේය. බොධිසත්ත්වයෝ විශ්වකර්‍මීයාගේ හස්තස්පර්‍ශයෙන් මේ මනුෂ්‍යයෙක් නොවෙයි මේ එක් දිව්‍යපුත්‍රයෙකැ"යි, දත්සේක. මෙසේ විශ්වකර්‍මී දිව්‍යපුත්‍රයා විසින් සරහනලදුව ගරුඩයන්ගේ ජවබලබදු ගමන් ඇති ධවලවූ සෛන්ධවයන් සතරදෙනෙකු යොදනලද උතුම්වූ රන්රිදී මිණිරුව-නින් සැදුම්ලද්දාවූ එල්වනලද නොයෙක් මල්දම් ඇති රථයකට පැනනැඟී අනේකවිධවූ ශ්‍රී සෞන්දර්‍යයෙන් සවස්වේලෙහි කිඹුල්වත්පුරයට වඩනා බොධිසත්ත්වයන් දුටු කිසාගොතමී නම්වූ රාජකන්‍යාව විසින් කියනලද "නිබ්බුත පදය" අසා තමන් වහන්සේගේ කරපැලඳි ලක්ෂයක් වටනා මුත්හර ගලවා ඒ කිසාගොතමී නම්වූ බිසවුන්ට යවා රාජද්වාරය සමීපයට පැමිණ මතු මහල්තලයට පැනනැඟී යනන් මස්තකයෙහි සැතපුනුසේක. එකෙණෙහි සුරයුවතින් බදු රූපශොභා ඇති වරභතන් විසින් මියුරු ගඬ ඇති පසඟතුරු ගෙණ ඒ මහා පුරුෂයා පිරිවරා පඤ්චාංගික තූර්‍යනාද පවත්වන්ට පටන්ගත්තාහුය.

## මහබිනික්මන් නික්මීම

එසමයෙහි මක්කරධවජාකබ්‍යාත අනඹ යාගේ ජයඝොෂයක් බඳුවූ මිහිරි වූ ගීතිකාධ්වනිය සමග පැවැත්නාවූ නාට්‍ය ගීතයක් බලන අසත මහාබොධිසත්ත්ව තෙමේ එහි ඇල්මක් නැති බැවින් මදක් නිදා පිබිද දල්වනලද නෙත්‍රයුගලයෙන් අනෙකප්‍රකාර විප්‍රකාර දුටුසේක. හේ කෙසේද? යත්;

ඒ නාටකස්ත්‍රීහු ගත් ගත් තූර්‍යභාණ්ඩයන් ඒ ඒ තැන දමා නිද්‍රාවට පැමිණියාහු, ඇතැම් කෙණෙක් දත්කුරු කති. ඇතැම් කෙණෙක් විවෘතමුඛ ඇතිව හොවිති. ඇතැම් කෙණෙක් අපගතවස්ත්‍රයෙන් යුක්තව භයානක සෙය්‍යාව දැක කාමවර්‍ධනය ප්‍රහීණවූ හෙයින් ඒ රාජගෘහය අමූසොහොනක් සේ නිඃශ්‍රීක කොට සිතා නැවතත් අතිශයින් කාමයෙහි

කළකිරුණු සේක. ඒ එසේමය. අශුභවශයෙන් ග්‍රහණය කොට සියලු භුවනත්‍රය කල්පානතවග්නියක්සේ සිතා "මේ සංසාරගත සත්ත්වයාට ඉතා උපද්‍රවයෙක් වීය. ඉතා පරිභානියෙක් වීය"යි උදාන පවත්වා කන්ථක නම් අශ්වරාජයා ගෙන්වා ගෙණ ඡන්න නම් අමාත්‍යයා අසුවාලධියගන්වා අසුපිටට පැනනැගී දෙවියන් විසින් හළදෙරින් මධ්‍යම රාත්‍රියෙහි මහබිනික්මන් නික්මෙන්නට වන්සේක. එකෙණෙහි මාරදිව්‍යරාජතෙමේ "බොධිසත්ත්වයන් ඝා නොදී නවත්වමි" කියා ආකාශයෙහි සිටියේ "යහළු සිද්ධාර්ථ කුමාරයෙනි, නොනික්මෙව. මෙයින් සත්වෙනි දිනයෙහි තොපට චක්‍රරත්නය ප්‍රාදුර්භූත වන්නේය. දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සතරමහත් වීපයෙහි රාජ්‍යකරව, මහබිනික්මන් නොනික්මෙව"යි කීයේය. ඒ අසා බොධිසත්ත්වයෝ "නෝ කවරෙක්දැ"යි විවාළහ. ඒ අසා මාරයා "මම වසවත් දෙවිරජය"යි කීය. බොධිසත්ත්වයෝ "මාරය, මමත් දනිමි. සතරමහවීපයෙහි රාජ්‍යයෙන් මට කම්නැත. දශසහස්‍රී ලොකධාතු කම්පාකරවා බුඩත්වයට පැමිණෙමි"යි; වදාළසේක.

ඒ අසා මාරතෙම "එසේ වී නම් මෙතැන් පටන් කාමවිතකී ව්‍යාපාද විතකී විහිංසා විතකීයන් අතුරෙන් යමක් සිතුවිට ඊට කාරණ දනිමි"යි කියා ඡායාවක් මෙන් සිදුරු බල බලා ඇවිද්දේය. ඉක්බිත්තෙන් අනන්‍යසාධාරණොත්තමවූ අපගේ ශ්‍රී මහාබොධිසත්ත්වයෝ සතියෙන් ලැබෙන සක්විති රජ සැපත අළුයම දැමූ කෙලපිඬක් කොට සිතා මහත්වූ සත්කාරයෙන් නුවරින් නික්මුණු සේක. මෙසේ ඇසළමස මැදිපොහෝදා උතුරුසළ නැකතින් මධ්‍යමරාත්‍රියෙහි මහබිනික්මන් නික්මෙනසේක්; නුවර බලනු කැමැති වූ හෙයින් එකෙණෙහි පෘථිවිය කුලාලචක්‍රයක් සෙයින් භ්‍රමණයවූ කල බලා ඒ සථානය කණ්ඨකනිවර්තන චෛත්‍යයක් මතුවන්නේය"යි සලකුණු දක්වා ඉදිරියෙන් සහ පස්සෙන්ද දකුණැලයෙන් සහ වමැලයෙන්ද සැට සැට දහස් මිණිදඹුවැට පහන් ගෙණ නික්මුණු දෙවියන් විසින්ද සක්වළගල දක්වා උරෙන් උර පැහැර මිණිදඹුවැට පහන් ගෙණ සිටි අවශෙෂ දෙවියන් විසින්ද පිරිවරණලදුව දසදහසක් සක්වළ දෙවියන් විසින් කරණලද අපමණ පූජා ලබමින් තුබූ පසලොස්පැය ඇතුළත තිස්යොදුන් මාඝීය ගෙවා අලුයම් වේලෙහි අනොමා නම් ගංතෙරට පැමිණිසේක.

## මහණවීම

ඒ ගංගාවගේ සමීපයට ගොස් "මේ කිතම් ගංගාවක්දැ" යි; ඡන්නයාගෙන් විචාරා "අනොමා නම් ගංගාවය"යි අසා "මාගේ පැවිදිවීමත් අනොමාය, අලාමකය"යි සතුටුව පාර්ෂ්ණියෙන් අසුව සංඥකොට අටසියයක් රියන් පුළුල ඇති ගහින් ඡන්නයා හා සමග අසුපන්වා අසුපිටින් බැස වැලිතලා මතුයෙහි වැඩසිට "ඡන්නයෙනි, මම පැවිදිවෙමි"යි; කීකල්හි ඡන්නයාද "මමත් පැවිදිවෙමි"යි කීහෙයින් "තොපගේ පැවිදිවීම දැන්ම සුදුසු නොවෙයි. තොපි දැන් පැවිදිවුවහොත් මේ ආහරණ හා අසු නස්නේය. එහෙයින් මා පැවිදි වූ බැව් මගේ පිය වූ සුද්ධොදන් මහාරජාතන්ට දන්වන පිණිස මේ ආහරණ හා අසු ගෙණ ගොස් භාරදී පසුව මහණවෙව"යි කියා ආහරණ හා අශ්වයා ඔහුට පාවා දී මෙසේ සිතුසේක. "මේ මාගේ

හිසකෙස් ශ්‍රමණ සාරූප්‍ය නොවන්නේය''යි, බොධිසත්ත්වයන් වහන්සේගේ හිස අල්වා ''හිසකෙස් බාන්ට සුදුසු අන්කිසිවෙක් නැත. එහෙයින් මම්ම ඡේදනකරමි''යි සිතා දකුණතින් කඩුව ගෙණ වම්අතින් කෙස්වැටිය අල්වා ගෙණ ඡේදනය කළ සේක. එකෙණෙහි කෙශයෝ දෑඟුල් පමණට දක්ෂිණාවෘතව නැමී සිරස හා ඇලී ගියහ. ඒ කෙශයෝ ජීවිතාන්තය දක්වා එසේම වූහ. දැළිරැවුළු ද තදනුරූපවිය. නැවත ද පිරිනිවන්පාන තැන් දක්වා දැළි හිසකේ බැමෙන් කම් නැති විය. බොධිසත්ත්වයෝ තමන්ගේ මුහුලස හා සමග කෙස්වැටිය ගෙණ ''ඉදින් මම බුදුවෙම් නම් මේ හිසකේවැටිය අහසම රැදෙව''යි නැහැනොත් භූමියෙහිම පතිතවෙව''යි අනිලපථ සඞ්ඛ්‍යාත නභස්තලයට නිඃක්ෂේප කළසේක. ඒ සිඛාව සහිතවූ කෙශකලාපය යොදනක් පමණ තැන් ගොස් ආකාශයෙහි සිටියේය; එකල සක්දෙව්රජ දිවසින් බලා වහා අවුත් රුවන් කරඬුවකින් පිළිගෙණ තව්තිසා දෙව්ලොව සිළුමිණි සැය නම් චෛත්‍යයක් කොට පුජාකරන්නට පටන්ගත්තේය.

නැවත ත්‍රිභුවන තිලක වූ බොධිසත්ත්වයෝ තමන් හැදි කසීසළු අනඝීය, ශ්‍රමණසාරූප්‍ය නොවන්නේය''යි සිතුසේක. ඒ සිත දුටු පූර්වයෙහි කාශ්‍යප බුදුන් සමයෙහි විශ්වාසවූ සධිකාර නම් මහාබ්‍රහ්ම තෙම අෂ්ටපරිෂ්කාර ගෙණවුත් පිළිගැන්වූයේය. ත්‍රිභුවන චූඩාමණිකය වූ අපූ මහබෝසතානෝ ඒ අර්හත් ධවජය පිළිගෙණ හැඳ පෙරව උතුම් වූ පැවිදිවෙස් ගෙණ ජනනයා දෙසබලා ''යහළු වූ ජනනයෙනි, මාගේ වචනයෙන් මාතා පිතෘන්ට මා නීරෝග බැව් කියව''යි; කියා නික්ම වූසේක. ඔහු බොධිසත්වයන් වැඳ ප්‍රදක්ෂිණා කොට ගියේය. කන්ථක නම් අශ්වරාජ තෙම ජනන නම් අමාත්‍යයන් හා කථාකරන්නාවූ බොධිසත්ත්වයන්ගේ වචනයන් අසමින් සිට ''මතු මාගේ සවාමීන්ගේ දර්ශනයෙක් මව නැතැ''යි සිතන්නේ ඒ ශොකය ඉවසාගත නොහී එකෙණෙහි ම හෘදඵපැලී කාලක්‍රියා කොට තව්තිසා දෙව්නුවර කන්ථක නම් දිව්‍යපුත්‍රව උපන්නේය. ජනන නම් අමාත්‍යයාව ප්‍රියවිප්‍රයොගයෙන් ප්‍රථමයෙන් එක් ශොකයෙක් විය. දෙවෙනිව කන්ථක නම් අශ්වරාජයාගේ කාලක්‍රියාවෙන් හටගත් ශොකයෙන් හඬමින් වැළපෙමින් නුවරට ගියේය.

ත්‍රිභුවන විලොහනීය වූ බොධිසත්ත්වතෙම පැවිදිව ඒ ගංගාව සමීප යෙහි වූ අනුපිය නම් අඹවනයෙහි සත්දවසක් නිරාහාරයෙන් පැවිදි සැප අනුභවකරණසේක් දවස් යවා එක දවසෙහිම නිස්යොදුන් මග ගෙවා පදසාගමනයෙන් ගොස් රාජගෘහ නම් නුවරට ප්‍රවිෂ්ටව ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසුරුණු සේක. එකල සියලු නුවර වාසීහු බොධිසත්ත්වයන්ගේ රූපදර්ශනයෙන් ධනපාලයා විසින් ප්‍රවිෂ්ට වූ රජගහනුවර සේ අනුරන්ද්‍රයා විසින් ප්‍රවිෂ්ටවූ දෙවිනුවර සේ ඇලලී ගියාහ. රාජපුරුෂයෝ බිම්සර රජු කරා ගොස් ''දේවයන් වහන්ස, මෙබඳු රූපශොභාවයෙන් අගපත් උතුමෙක් නුවරෙහි පිඬුසිඟන්නේය, දිව්‍ය මනුෂ්‍ය නාග සුපණ්ණාදීන් අතුරෙහි කවරෙක් බවත් නොදනුම්හ''යි; කීවාහුය. රජතෙම ප්‍රාසාදතලයෙහි සිට බලා මේ ''තෙම ආශ්චර්‍යයී අද්භූත පුරුෂයෙකැ, නොපි ගොස් විමසවු. ඉදින් අමනුෂ්‍යයෙක් වී නම් ආකාශයෙන් යෙයි. නාගයෙක් වී නම් පොළොව

කිම්ද යෙයි. මිනිස්වූ කෙතෙක් තම් ලද ආහාර සුදුසු තෙතෙක්හි හිඳ අනුභව කෙරෙනි'' කියා දූතයන් යැවූසේක.

ත්‍රිභුවනතිලක වූ ඒ මහාපුරුෂයාතෝ නොයෙක් ලෙසින් මිශ්‍රිත බත් ලබනසේක් ප්‍රමාණානුකූල ලෙස ලබාගෙණ අනික් අතට කරකැවී ප්‍රවිෂ්ට-වාරයෙන් නුවරින් නික්ම පාණ්ඩව නම් පර්වතච්ඡායාවෙහි වැඩහිඳ ආහාර වළඳන්ට ආරම්භ කළසේක. ඉක්බිත්තෙන් උපන්දා පටන් මෙබඳුවූ බැගෑපත් ආහාරයක් ඇසිනුත් නුදුටුවිරූ හෙයින් බඹවැල පෙරළී මුඛයට නැගෙන ආකාර ප්‍රතිකූල විය. අනෙකප්‍රකාරයෙන් කෙලෙසුන් තවන ප්‍රඥාව ඇති හෙයින් තමන් වහන්සේට තමන් වහන්සේ විසින්ම අවවාද-කොට වළඳන කල්හි රජහුගේ දූතපුරුෂයෝ එපවත් දැක රජහට දැන්වූහ, බිම්බිසාර නරපති ඒ අසා වහා නුවරින් නික්ම අවුත් ත්‍රෛලෝකෛක සවාමි වූ බෝධිසත්ත්වයන් සමීපයට ගොස් ඊර්ෂ්‍යාපථයෙහි ප්‍රසන්නව තම් ගොත් විචාරා දැන රාජ්‍යයෙන් පැවරූසේක. ''මහරජ්ජුරුවෙනි, මට වස්තුකාමයෙන් ක්ලේශකාමයෙන් හෝ කම් නැත. මම පරමාභිසම්බෝධිය ප්‍රාර්ථනා කෙරෙමින් මහාභිනික්මන් කෙළෙමි.'' කියා රාජ්‍යය ප්‍රතික්ෂේප කළ කල්හි ''සවාමීනි ඔබ ඒකාන්තයෙන්ම බුදුවන සේක් මය. බුදුවූකල ප්‍රථමයෙන් ම මාගේ නුවරට වැඩිය මැනවැ''යි යාච්ඤා කළ හෙයින් ''මැනව මහරජ්ජුරුවෙනි''යි ප්‍රතිඥා දී යථාක්‍රමයෙන් සැරිසරණ සේක්, ආලාරකලාමය, උද්දකරාමපුත්‍රය, යන තාපසවරුන් සමීපයට එළඹ අෂ්ටසමාපත්ති උපදවා මේ ධ්‍යානමාත්‍රයකින් බුදුව ලෝවැඩ කළ නොහැක්කැ''යි එනිත් ලොභය හැර ''දෙවියන් සහිතවූ ලොවට තමන් වහන්සේගේ වීර්‍යබලය දක්වන පිණිස මහත් වූ දුෂ්කරක්‍රියා කෙරෙමි''යි උරුවෙල් නම් දනව්වට ගොස් ''මේ භූමිභාගය තපසට රම්‍ය''යි සිතා එහි ම වාසයට පටන්ගත් සේක. ඉක්බිත්තෙන් යටකියනලද කොණ්ඩඤ්ඤ ය, භද්දි ය, වප්ප ය, මහානාම ය, අස්සජි ය යන පඤ්ච වර්ගික භික්ෂූහු ගම් නියම්ගම් රාජධානියෙහි සැරිසරන්නාහු එතැන්හි පැමිණ බෝධිසත්ත්වයන් දැක ''මහාප්‍රධානය කරන්නාහු දැන්ම බුදුවෙති; දැන්ම බුදුවෙති''යි පිරිවෙණ හැමදීම ආදී වූ, වත්පිළිවෙත් පුරමින් උපස්ථාන කෙරෙමින් සන්තිකාවචර වූවාහුය. ත්‍රිභුවන සුරපූජිත වූ බෝධිසත්ත්වයන් වහන්හි දුෂ්කරක්‍රියාවෙහි කෙළ පැමිණි හෙයින් සඛණීඛණී වූ තමන් වහන්සේගේ ශරීරය කාලඛණීවිය. දෙතිස් මහාපුරුෂලක්ෂණයද ප්‍රතිච්ඡන්න විය.

මෙසේ සංවුරුද්දක් මුළුල්ලෙහි නිදන වර්ණනාවෙහි දැක්වූ පරිද්දෙන් ප්‍රධන්වීර්‍යය කරන්නාවූ මහබෝසතාණන්ගේ අධිකවීර්‍යය වන්හි අහස පොළොව ගැටලෙන්නාසේ විය. මෙසේ දුක්ගෙණ බුදුවිය නොහැක්ක; මේ බුදුබවට යන මගෙක් නොවෙ'යි; සිතා ''ඔලාරිකාහාර සෙවනය කොට කායබල උපදවා ගෙණ වීර්‍යය කොට බුදුවෙමි''යි; සිතා ග්‍රාමනිගමයෙහි පිඬු පිණිස හැසිර මධුර වූ ආහාරය වළඳන්ට පටන්ගත් සේක. එකල්හි දෙතිස් මහාපුරුෂ ලක්ෂණයද ප්‍රකෘතිමත් විය. ශරීරය සඛණීඛණී විය. ඒ දැක පඤ්චවර්ගික භික්ෂූහු ''මේ තෙම සංවුරුද්දක් දුෂ්කරක්‍රියා කොටත් සම්‍යක්ඥානය ප්‍රතිවෙධ කොට ගත නොහැකි වූයේය. දැන් ග්‍රාමාදියෙහි භික්ෂාටනය කොට සියුම්

ආහාර වළඳා කෙසේ නම් බුදුවන්නෙහි ද? මොහුගේ දුක් ගැන්ම "ඇඟ සෝදා තහුනු කැමැත්තෙන් පිණුබිදු අවුලා එක්කොට නහම්"යි සිතන්නක් වැන්න. "මොහු සමීපයෙහි වැස කවරගුණයක් ලබමෝදැ"යි; කියා තම තමන්ගේ පාසිවුරු ගෙණ මහාපුරුෂයන් හැර අටලොස් යොදුන් මඟ ගෙවා ඉසිපතනයට ප්‍රවිෂ්ට වූහ. මෙසේ ත්‍රිභුවනජනශෙඛර වූ බොධිසත්ත්වයෝ දිව්‍ය ලොකයෙහි දිව්‍යාඞ්ගනාවන් විසින් පිරිවරණලද දිව්‍යරාජශ්‍රී සම්පත් අනුභව කරණ ශක්‍රදෙවෙන්ද්‍රයන් පරිදිදෙන් පළමු කිඹුල්වත්පුරයෙහි රාජ්‍යශ්‍රී සැපඅ බොහෝකලක් අනුභව කොට කාමසුඛල්ලිකානුයොගය යි; කියනලද රූපාදී පඤ්චකාම විෂයාස්වාදයෙහි සිතින් ඇලීමෙන් කයින් යෙදීමෙන් නිවන් නැතිබව ලොකයාට ප්‍රකාශ කොට උරුවෙල් දනව්වෙහි දී සාවුරුද්දක් මුළුල්ලෙහි අනස ගැවලෙන්තාක්හු මෙන් කිසිතෙතෙකුත් විසින් නොකොව හැකිවූ නොපැමිණිය හැකිවූ දුෂ්කරක්‍රියා කරමින් අත්තකිලමථානුයොගය'යි කියනලද ශරීර පීඩාවෙහි යෙදීමෙනුත් නිවන් නැතිබව ලොකයාහට ප්‍රකාශ කොට මඛ්‍යමප්‍රතිපදාවය'යි; කියන ලද ආයෂ්ඨාංගික මාගීයෙහි පිළිපදනාහු ඔෘදරික වූ ආහාරපානවර්ගාදිය අනුභව කෙරෙමින් ශරීරසන්තර්පනය කොටගෙණ වෛශාඛමාසයෙහි වූ මැදිපොහෝදිනයෙහි උදයගිරි පර්වතයට ශිඛාමාණික්‍යයක් බඳුවූ පද්මවත ප්‍රබෝධකරවන්නා වූ හිරු නැඟි කල්හි මත්තහංසරාජයක්හුගේ ගමන් බඳුවූ ගමන් විලාස ඇත්තේ උදෑසනම ගොස් භික්ෂාවනය පිණිස වේලාපරිඡ්ඡෙදකරන්නේ අජපාල මූලයෙහි නැගෙනහිර ලොකධාතුව බලමින් ශරීරාලොකයෙන් සියලු වෘක්ෂය සඛණ්ඩවණී කොට නීලවණීවූ මෙඝපටලයෙන් නිෂ්ක්‍රාන්තවූ සූර්‍යමණ්ඩලයක් මෙන් බබලමින් වැඩ උන්සේක.

## කිරිපිඬු පිළිගැන්වීම

බෝධිසත්ත්වයන්ද එසේ උන්කල්හි එම උරුවෙල් නම් දනව්වෙහි සේනානී නම් කෙළෙඹි පුත්‍රයන්ගේ දූ වූ කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇති සුජාතා නම් සිටුදියණිකෙණෙක් වැඩිවිය පැමිණ අජපාල නම් නිග්‍රොධවෘක්ෂ මූලයෙහි එක් ප්‍රාර්ථනාවක් කොට පිරුණාවූ මනදෙළ ඇතිව වෛශාඛමාස යෙහි වූ පෞර්ණමී පොහෝ දිනයෙහි ඒ වෘක්ෂයෙහි අධිගෘහිත දෙවතාවාට තමන් යැදගත් බලි පූජාකරණු පිණිස එදවස් උදෑසනම ඉස්සෝදා තනා නිදන වර්ණනාවෙහි හා මහපූජාවලියෙහි කියනලද ක්‍රමයෙන් වැල්මී වනයෙහි කවතලද පන්සියයක් දෙනුන් පටන් අවදෙනා දක්වා ගත් කිරෙන් දසදහසක් සක්වළ දෙවියන් විසින් බහතලද දිව්‍යඕජසයෙන් යුක්තව පිසතලද අතිමධුරවූ ක්ෂීරපායාසය ලක්ෂයක් වවනා ඝනරන්තලියක බහා එසේම ඝනරන්තලියකින් වසා තමාගේම හිස තබාගෙණ සුවඳමල් හා වස්ත්‍රාභරණයෙන් සැරහී එසේම සැරසෙන ලද තරුණ සත්‍රීන් විසින් පිරිවරණලදුව යන්නාවූ තැනැත්තී, නිග්‍රොධවෘක්ෂමූලයෙහි වැඩහුන් බොධිසත්ත්වයන් දැක 'වෘක්ෂදෙවතාවය'යි සිතා ප්‍රීති සොම්නස් ඇතිව තැම් තැමී ගොස් ලහිරු මඬලක් බඳු රන්තලිය හිසින් බා බොධිසත්ත්වයන් මෘදු මොළොක් අත්ලෙහි රන්තලිය තබා දශනඛසමොඩාකයෙන් හසුනපුටය මස්තකයෙහි තබා වැඳ මාගේ මනදෙළ

යම්සේ සමෘඩ්වීද? එපරිද්දෙන් මනුඹවහන්සේගේ මනෝරථයත් සමෘද්ධි වේව''යි කියා ඉතා සිත්කළු වචන වලින් සතුටි කොට සතුටුවෙමින් ගියාය.

මෙසේ සුජාතාවන් විසින් පිළිගත්වනලද ක්ෂීරපායාසය; මහාබ්‍රහ්මයා පැවිදි වනදු, පිළිගැන්වූ පාත්‍රය සාවුරුද්දක් තිබී එදවස් අතුරුදන් වූ හෙයින් බෝමැඩට එළඹෙන දිනයෙහි ලක්ෂයක් වටතා ඝනරන්තලියෙන් ක්ෂීරපායාසය වැළඳීම හැම බුදුන්ගේම ධර්මතාවක් වූ හෙයින් ද, සුජාතාවන් කැපකොට දුන් තලිය හා සමග ක්ෂීරපායාසය පිළිගෙණ හුන්තැනින් නැගී ඒ වෘක්ෂයට ප්‍රදක්ෂිණා කොට තලිය ගෙණ නෛරඤ්ජරා නම් ගංතෙරට ගොස් නොයෙක් බෝධිසත්ත්වශාසනප්‍රභාවයක් බුදුවන දිනයෙහි බැස නහන සුප්‍රතිෂ්ඨිත නම් තොටෙක් ඇත. ඒ තීරයෙහි රන්තලිය තබා බැස නහා නොයෙක් බුද්ධශාසනප්‍රභාවයන්ගේ නිවාසන වූ අර්හත්ධ්වජය හැඳ පොරොවා පුළී දිග බලා වැඩහිඳ එක් බිජු ඇති තල්ඵල පමණට එකුන් පණස් පිඬක් කොට නිරුදක සියලු ක්ෂීරපායාසය වළඳා වදාළසේක. එදා වැළඳූ කිරිබත ම බෝමැඩ වැඩහුන් සත්සතිය පිළිබඳ එක එක දවසට එක එක පිඬක් බැගින් ආහාර වූයේය. මේපමණ කල් මුළුල්ලෙහි අන්කිසි ආහාරයක් වැළඳුයේ නැත, නහාන මුඛධොවනාදි ක්‍රියාවකුත් කෙළේ නැත. ධ්‍යානසැපයෙන් මාඝී සැපයෙන් ඵලසැපයෙන්ම දවස් ඇවූසේක. ඒ ක්ෂීරපායාසය වළඳා රන්තලිය ගෙණ ''ඉදින් මම අද බුදුවෙන්නට හැකි වී නම් මේ තලිය ප්‍රතිශ්‍රොතසවයේව''යි නොහැකියෙම් නම් අනුශ්‍රොත්‍රයට යේව''යි කියා ඒ තලිය ප්‍රක්ෂෙප කළ සේක.

එකෙණෙහි ඒ තලිය දියකපාගෙණ දිවන නැවක් සේ ගඟමැදට දිව නැවත ජවසම්පන්නවූ සෙක්‍රවයකු සේ අසූරියනක් තැන් ප්‍රතිශ්‍රොතසයයි කියන ලද උඩුඟං බලා ගොස් එක දියසළාවක ගැසී කාල නම් නාගරාජයාගේ භවනයට ගොස් කකුසඳ බොණාගමන, කාශ්‍යප යන තුන් බුදුවරයන්ගේ පරිභොගික රන්තලිවල වැදී 'කිංකිණි' යන රාවය කෙරෙමින් ඒ රන්තලි තුනෙහිම හෙවිසීම භාගයට පැමිණ සිටියේය. ඒ කාල නම් නාගරාජ තෙම ඒ ශබ්දය අසමින් ''පෙරවිදත් බුදුකෙනෙකුත් බුදුවූසේක; ඊයේත් බුදුකෙනෙකුත් බුදුවූසේක; අදත් බුදුකෙනෙක් බුදුවෙති''යි කියා නොයෙක් පදශතයෙන් සතුති කරණුයේ තමන්ගේ නානළුවන් රැස්කොට පූජාසරහා සිටගත. මෙසේ ක්ෂීරපායාසය වළඳා කියනලද ක්‍රමයෙන් තලිය උඩුගංබලා හැර ඒ ගඩාතීරයෙහි සුවඳ මලින් සැදුම්ලද නිල්වූ පැහැයෙන් සිත්කළුවූ සල්වනයෙහි දිවාවිහාරණය කොට සවස්වේලෙහි සවණ්වණ්වූ මනොඥවූ සුගන්ධපුෂ්පයන් නටුවෙන් ගිලිහී වැහෙන්ට පටන්ගත් කල්හි දිව්‍යාසුරයන් විසින් වස්වනලද දිවමල් වර්ෂාවෙන්ද, දිව්‍යාඞ්ගනාවන් විසින් පවත්වනලද සාධුනාදයෙන්ද, කලස් ආදියෙන් සරහා පිළියෙලකරණලද අටඉස්බක් පමණ දුර ඇති මාඝීයට පැමිණ කෙශරසිංහ රාජයක්හු මෙන් බොධිවෘක්ෂය සමීපයට වඩනාසේක. කල්පලක්ෂයක් මුළුල්ලෙහි ප්‍රාර්ථනා කොට ආවාවූ සොත්තිය නම් බ්‍රාහ්මණයෙකු විසින් පිළිගන්වනලද ඊතණ අටමිට ගෙණ මටසිළුටු කඳින් හා ශාඛා මණ්ඩලයෙන් බබලන්නාවූ තමන් වහන්සේ උපදනා දවස්ම උපන්නාවූ හැම බුදුවරයන් බුදුවන ජයභූමියෙහි

භවගත්තාවූ තමන් වහන්සේගේ ලය සේ සිහිල්වූ ඡායා ඇති අශ්වත්ථ නම් බොධිවෘක්ෂරාජයා කරා එළඹ තුන්යලක් බොධිය වට ප්‍රදක්ෂිණා කොට සියළු සම්බුදුවරයන් විසින් අවිජහිත සථානයෙහි තණ අටමිට අක් උඩුකුරු කොට ලා වගුරුවා තුදුස්රියන් බොධිපයඞ්කාරුඇව වැඩහිඳ; මෙසේ සිතුසේක. ‘‘මේ මහාපෘථිවිය පරිවර්ත්තිතාව සියදහස් ගණන් සෙන නෙන කල්හිදු ආකාශ ගර්භය ශූෂ්කගර්ජනාවෙන් පැලෙන කල්හිදු ගිනිගෙණ දිලිහෙන කිහිරහුරු වස්තට වන් කල්හිදු මාගේ මේ ශරීරයෙහි මස් ලේ ඇට නහර වියලී සුණුවිසුණුව යන කල්හිදු සම්‍යක් සම්බොධියට පැමිණ මිස මාගේ වීර්‍යතොහරිම්’යි ඉටා බඳනාලද අපරාජිතපයඞ්ක ඇතිව මටසිළුටු බෝකදට පිවලා නැගෙනහිරට මුහුණ ලා වැඩහුන්සේක.

මෙසේ බොධිපයඞ්කාරුඇව වැඩ උන් කල්හි බොධිසත්ත්වයන්ට අමරපුරෙශ්වරවූ ශක්‍රදෙවෙන්ද්‍ර තෙම එකසිය විසිරියන් පමණ දිග ඇති භුවනොදරයෙහි ව්‍යාප්තවන ධවනි ඇති විජයුත්තර නම් ශංඛය පිඹිමින් සිටියේය. එසේම පඤ්චසිඛ නම් වූ ගාන්ධර්ව දිව්‍යපුත්‍ර තෙමේ තුන් ගව්වක් පමණ දිග ඇති බෙළුවපණ්ඩු වීණාව ගෙණ ගායනා කරමින් සිටියේය. සුයාම නම් දිව්‍යරාජ තෙම ශරත්කාලයෙහි වළාමරිවි සමූහයක් සේ සශ්‍රීකවූ තුන්ගවු දිග ඇති දිව්‍යචාමරය ගෙණ මඳ මඳ පවන් සලමින් සිටියේය. එසේම සන්තුසිත දිව්‍යපුත්‍ර තෙම මැණික් තල්වැට ගෙණ පවන් සලමින් සිටියේය. එසේම චතුර්මුඛොපලක්ෂිත හිරණ්‍යගර්භ සඞ්ඛ්‍යාත මහාබ්‍රහ්ම තෙම යොදුනක් පුළුල ඇති පුන්සඳ මඬලක් බදුවූ ශ්වේතච්ඡත්‍රය බොධිසත්ත්වයන්ගේ මස්තකයට ධරමින් සිටියේය. මහාකාල නම් නාග රාජ තෙම අසූදහසක් පමණ නාගමානවිකාවන් විසින් පිරිවරණලදුව සතුනිවවන සහස්‍රයන් ගායනා කරමින් සිටියේය. ප්‍රජාපත්‍යාදි දෙතිස් දිව්‍ය පුත්‍රයන්ගේ දෙතිස් කුමාරිකාවෝ දිවමලින් සම්පූර්ණවූ අනෙකවිධ රන්කරඬු නෙණ පුදමින් සිටියාහුය. සියලු දශසහස්‍රී ලොකධාතුවෙහි සියලු දෙවියෝ සැණවෙස් ගෙණ හාත්පසින් නංවනලද ධජපතාකාදී මඞ්ගල්‍ය භාණ්ඩයන් ගෙණ පෘථිවියෙහි පටන් අකනිට්ඨ බ්‍රහ්මලොකය දක්වා අතුරක් සිදුරක් නැතිව ගැවසී පූජාකෙරෙමින් බෝමැඩ වැඩහුන් බොධිසත්ත්වයන් පිරිවරා සිටියාහුය.

## මාරයුද්ධය

එසමයෙහි මාරදිව්‍යපුත්‍ර තෙම ‘‘සිද්ධාර්ථ කුමාර තෙමේ මාගේ විෂය අතික්‍රාන්ත කරණු කැමැත්තේය. ඔහුට මාගේ විෂය අතික්‍රාන්ත කොටගත නොදෙමි’’යි මාරසෙනග සමීපයට ගොස් කියා බ්‍රහ්මාණ්ඩය දක්වා ඇති දිව්‍ය බ්‍රහ්මයන් වෙවුල්වන මාරඝෝෂා නම්වූ භෙරිඝෝෂාවක් කරවූසේක. ඒ භෙරි ඝෝෂාව අසා නොයෙක් ආයුධ ගෙණ අවුත් ඔහු පිරිවැරූ මරසෙන් ගෙණ නික්මුනේය. මරහුව ඉදිරිව අටසාළිස් ගව්වෙක මරසෙන් දිවෙති. පශ්චාද්භාගයෙන් මුහුදු සේ වක්‍රවාට පර්‍යන්තය දක්වා දිව එති. උඩින් සතිස් ගව්වෙක දිව එති. ඒ මරසෙනගගේ ඝෝෂාව සාරදහසක් ගව්වෙහි පොළොව පැලියන හඬක් සේ ඇසෙයි. ඉක්බිත්තෙන් මරදෙව්පුත් යෙළසියක් යොදුන් ගිරිමෙඛල නම් හස්තිරාජයා පිටට ආරූඪව අත්

දහසක් මවා අනෙකප්‍රකාර ආයුධගත්තේ, අවශෙෂ මාරපිරිස අතුරෙනුදු දෙදෙනෙක් එකෙක් ගත් ආයුධයක් නොගෙණ විශෙෂ ආයුධ ගත්තාවූ අනෙකප්‍රකාර වණී හා අනෙකප්‍රකාර මුඛ මවාගෙණ ගුරුළුරජක්හු ගන්නට නික්මෙන දියබරණක් සේ ත්‍රෛලොක්‍යෛකප්‍රවර සුරදුෑමවූ බොධිසත්ත්වයන් මැඩපවත්වන්ට නික්මුනාහුය.

මෙසේ මරසෙන් බෝමැඩව එළඹෙත් එළඹෙත් බොධිසත්ත්වයන් පිරිවරා සිටි දෙවියන් අතුරෙහි එකකුදු සිටින්ට අසමර්ථවූහ. අහිමුඛ අහිමුඛ දිසාවෙහි පලාගියාහුය. කාල නම් නාරජ තෙම පොළව කිමිද තමාගේ පන්සියයක් යොදුන් මංඝජ්ජරික නම් නාගභවනයට ගොස් උභය හස්තයෙන් මුහුණ වසාගෙණ වැද නොත්තේය. සක්දෙව්රජ තෙම විජයුත්තර නම් ශංඛය පිට වතුරවාගෙණ සක්වළගල මුදුනට නැගී සිටියේය. මහාබ්‍රහ්ම තෙම තමා අත තුබූ ශෙවතච්ඡත්‍රය සක්වළගල මුවවිටට දමා තමාගේ බ්‍රහ්මලෝකයටම ගියේය. එක් දෙවතාවෙකුදු සිටිනට අසමර්ථවූහ. ධෘතිස්මෘති ත්‍රියත්‍රිංදී ගුණභාරධාර ධරණීධරාදයමානවූ මහාපුරුෂයානන් වහන්සේ හුදකලාවම වැඩඋන්සේක. මෙසේ වැඩඋන්නාවූ ප්‍රඥූනිධිනිකෙත අවලගුණප්‍රදීපායමානවූ මාගේ සවාම්දරුවානන් වහන්සේ යථොක්තප්‍රකාරයෙන් එන මරසෙනඟ දැක ''මෙතෙක් මරසෙනඟ මා එක් කෙනෙකුන් උදෙසා මහත් ව්‍යායාමයක් මහත්වූ උත්සාහයක් කරන්නාහු වෙති. මේ සථානයෙහි මාගේ මාතා පිතා කෙණෙක් හෝ භ්‍රාතා කෙණෙක් හෝ කිසි නැ කෙණෙක් නෝ නැත. මාගේ මේ දශපාරමිතාවෝ වනාහි මා විසින් දීඝිකාලයක් මුළුල්ලෙහි පොෂ්‍යකළ බලසම්පන්න පිරිසක් වන්නේය. එසේහෙයින් පාරමී ධර්මයන් තමැති ශස්ත්‍රයෙන් මා විසින් මේ මරසෙනඟ විධ්වංසනය කරන්ට වටනේය''යි දැනාදී දශපාරමී ධර්මයන් ආවර්ජනා කෙරෙමින් දෙදෙවිලොව දෙවියන් විසින් පිරිවරණලදුව ප්‍රේත සෙනඟට භය නොවන සක්දෙව් රජහු සෙයින් ශෘගාල සෙනඟට භය නොවන කෙශර සිංහරාජයක්හු සෙයින් තමන් වහන්සේගේ තෙජස් තමැති ගිනිකදෙනි මරසෙන් තමැති පලඟැටිහු ගැසී වැටෙනැ සි; සිතා නිර්භීතව වැඩඋන්සේක.

ඉක්බිත්තෙන් මාරදිව්‍යරාජ තෙම ''මෙයින්ම සිද්ධාර්ථ කුමාරයන් පලවම්''යි සිතා කල්පාන්ත වාතයක් වැනිවූ මහත් වාතයක් උපදවා එයින් අඩ යොදුන් සමයොදුන් දෙයොදුන් තුන්යොදුන් පමණ පර්වතකූටයන් ප්‍රදලනය කරන්ටද, වනවෘක්ෂාදීන් උන්මූලනය කරන්ටද, ග්‍රාමනිගමයන් සුණ්ණවිසුණ්ණ කරන්නටද, සමර්ථවූවද, වීරධීර ගුණප්‍රවරාකරවූ මහාපුරුෂයානන් වහන්සේගේ අසදෘශානුභාවයෙන් ඒ වාතය බොධිසත්ත්වයන් කරා පැමිණ සිවුරුකොණක් පමණ සොලවන්ට නොහැකිවිය. ඉක්බිත්තෙන් ''මොනු උදකයෙන් අජ්ඣොත්ථරණය කොට මරම්'යි කියා කල්පාන්ත වර්ෂාවක් වැස්විය. එයින් නැගි ම්හවතුරු අවුත් මාරතිමිරනිකරසිසිරකිරණාදයමානවූ මහාපුරුෂයානන් කරා පැමිණ ඔබගේ චීවරයෙහි පිනිබින්දුවක් පමණ සථානයකුදු තෙමන්ට අසමර්ථවිය. ඉක්බිත්තෙන් පර්වත වර්ෂාවක් වැස්විය. ඒ මහත් පර්වත කූටයෝ ගිනිගෙණ දිලිහෙමින් ගගනතලයෙන් අවුත්

ත්‍රිවිධාග්නි නිර්‍යාපන සඞ්ඛ්‍යාමෙය ඇති බොධිසත්ත්වයන් කරා පැමිණ දිව්‍ය මාලා ගුලසමූහයක් මෙන් වූවාහුය. ඉක්බිත්තෙන් ආයුධවර්‍ෂාවක් වැස්වීය. ඒ කඩු තොමරාදී සූක්ෂ්මවූ ආයුධ සමූහය ගිනිගෙණ දිලිහෙමින් ආකාශයෙන් ඇවිත් වරප්‍රවරප්‍රඥප්තිධනිකෙත වූ බොධිසත්ත්වයන් කරා පැමිණ දිවමල් පූජාවක් මෙන් වූහ. ඉක්බිත්තෙන් මොහු දවා අළුකෙරෙමිසි ගිනිඅඟුරු වර්‍ෂාවක් වස්වාලූහ. කිංශුකවර්ණවූ අඞ්ගාරයෝ ආකාශයෙන් අවුත් ක්ලෙශමක්ෂිකවග්නිස්කන්ධ සමානවූ බොධිසත්ත්වයන් කරා පැමිණ උන්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි පිදූ දිව්‍යමල් පූජාවක් මෙන් වැගිර ගියාහ. ඉක්බිත්තෙන් උනු අළු වර්‍ෂාවක් වැස්වීය. අත්‍යුෂ්ණවූ අග්නිවර්ණවූ ඒ ඡාරිකාරාශිය ආකාශයෙන් අවුත් සර්ෂපලෙශාග්නි නිර්‍යාපන ගඞ්ගාප්‍රවාහවූ බොධිසත්ත්වයන් කරා පැමිණ උන්වහන්සේගේ ශ්‍රීපාදයට පුදනලද වන්දන චුණ්ණයක් මෙන් වැගිර ගියහ.

ඉක්බිත්තෙන් මහත් වැලිවර්‍ෂාවක් වස්වාලූහ එසෙණෙහි අනිසිදුම් වූ ඒ වාලුකා රාශිය ආකාශයෙන් දුවමින් අවුත් සර්ලොකෙක තිලකවූ බොධිසත්ත්වයන් කරා පැමිණ උන්වහන්සේගේ ශ්‍රීපාද යුගලයට පුදනලද සුගන්ධචූර්ණයක් මෙන් ප්‍රපතිත වූහ. ඉක්බිත්තෙන් ගිනි ගෙණ දිලිහෙන කලල් වර්‍ෂාවක් වස්වාලීය. ඒ මඩකලල් දුම්මින් දිලිසෙමින් ආකාශයෙන් අවුත් ත්‍රෛලොකෛකනාථයාණන්වූ බොධිසත්ත්වයන් කරා පැමිණ ශ්‍රීපාදලම්ඵ යෙහි දිවඹුලවුන් මෙන් පතිත වූහ. ඉක්බිත්තෙන් "අදුරෙන් භය ගන්වා සිද්ධාර්‍යා එලවම්"යි ගත අදුරක් එලවීය. ඒ අදුර චතුරඞ්ග සමන්විත වෙමින් සත්ත්වසන්තාන සමෙමාහතිමිරනිකරසහස්‍ර කිරණායමාණවූ බොධිසත්ත්වයන් කරා පැමිණ සූර්‍යප්‍රභාව වැදගත් කලක් මෙන් අතුරුදන් කොට ආලෝකය පැතුරුණේය. මෙසේ මාරදිව්‍යරාජ තෙම චාතුර්මහාරාජ්‍ය පාෂාණප්‍රහරණඞ්ගාරකූක් කුලවාලුකාකලලාන්ධකාරය'යි, කියතලද මේ නවවිධ වර්‍ෂාවෙන් නිශ්චල ගුණගිම ධරණී ධරායමානවූ බොධිසත්ත්වයන් පලවන්නට නොහැකි තැනැත්තේ තමා කළ දෙය බොධිසත්ත්වයන්ට පූජාභාණ්ඩ වනු දැක තමාගේ මරසෙනගව ආමන්ත්‍රණය කොට කිපී "එම්බා තෙපි කුමක් කරවිද?යි; මේ සිද්ධාර්‍යා වහාගණුව; විදුව; ගෙණ එව; යානොදෙව'යි යනාදීන් කියකියා තමාද, යිරිමෙබලා තම් ඇත්රජහුපිව හුන්නේ චක්‍රායුධය ගෙණ ත්‍රිභුවන ජනත්‍රාමරනිසෙවිතපාදාරවින්දෙපලක්ෂිතවූ බොධිසත්ත්වයන් කරා පැමිණ "සිද්ධාර්‍යය," මේ පර්‍යඞ්කය තොප සතු නොවෙයි, මා සතුය. එහෙයින් මාගේ පර්‍යඞ්කයෙහි නොහිඳ නැඟී සිටුව"යි කියා සමුපචිත කුසලබල ඇතිව ක්ෂත්‍රියකුලයෙහි ඉපිද සක්විතිවත් පිරුණාවූ සක්විති රජකු විසින් ලද චක්‍රරත්නය දැක සැඩොලෙක් අවුත් "ක්ෂත්‍රියකුල සම්භූත තොප වැන්නවුන්ට මේ චක්‍රරත්නය අයිති නොවන්නේය. අප වැනි සැඩොලුන්ට මේ චක්‍රරත්නය අයිතිය"යි කියන්නා සේ කිසි භයක් චකිතයක් නැතිව කීයේය. එපවත් ඇසූ ත්‍රිභුවන සඞ්ඝාත්තුපිකවූ පාපියුම් ඇති උතුමා මෙසේ කීයේය. මාරය, තා විසින් පිරූ දශපාරමිතාවකුත් නැත. කළ පඤ්ච මහා පරිත්‍යාගයකුත් නැත. පිරූ ඥාත්‍යර්‍ථ චරියාවකුත් නැත. ලෝකාර්‍ථ චරියාවකුත් නැත. බුද්ධචරියාවකුත් නැත. එහෙයින් තව මේ පර්‍යඞ්කය

තො පැමිණෙයි. මට මේ අස්න පැමිණෙන්නේය''යි වදාළ සේක. එපවත් ඇසූ මාර දිව්‍යරාජ තෙම කිපී ක්‍රොධ ඉවසාගත නොහී සතරාමර ලොක ප්‍රතිවර්තිත නිරුත්තර ධර්මචක්‍ර ප්‍රවර්තනයෙහි සමර්ථවූ මහාපුරුෂයානන් වහන්සේව තමාගේ මහානුභාව සම්පන්නවූ චක්‍රායුධය දමාගැසීය. ඒ චක්‍රායුධය දශපාරමී ධර්මයන් ආවර්ජනාකරන්නාවූ මොහතම ප්‍රබන්ධ විධ්වංසනප්‍රවරාදිත්‍යවූ මහාපුරුෂයානන් වහන්සේගේ මස්තකයෙහි මල් වියනක් මෙන් සැදී සිටගත. ක්ෂුරධාරා සඩ්ඛ්‍යාත කරම්භවහත් ඇති ඒ චක්‍රායුධය වනාහි සෙසු දෙවියෙහි කිපී ඔහු විසින් ගැසී නම් එකඤනමහාමෙර හා ගල්වැඹෙක්හිදු වැදුනහොත් වංශකලීර සඩ්ඛ්‍යාත හුණදලුවක් සේ සිදීයෙයි. මෙහි වනාහි ධාතුගුණ සම්පන්නවූ බොධිසත්ත්වයන් කරා පැමිණ මල්වියනක් සේ සිටගත්තේය. එකල්හි අවශෙෂ මරසෙනග මෙවිට මේ පයෂ්ඩකයෙන් නැගියන්නේය'යි' ගිනිගෙණ දිලිහෙන මහත් පළිතකුට මවා දමා ගැසූහ. ඒ පළිතකුටයෝද, දශපාරමී ධර්මයන් ආවර්ජනය කරන්නාවූ මහා පුරුෂයානන් වහන්සේව පූජා පිණිස මල් වර්ෂාවක් වැස්සාක් මෙන් භූමියෙහි ප්‍රපතිත වූවාහුය.

එකෙණෙහි සෙසු දෙවතාවෝ සක්වළගල මුවවිට සිට කර ඔසවා බල බලා ''පින්වත්නි, අද සිද්ධාර්ථ කුමාරයන්ගේ රූපග්‍රප්‍රාප්ත ආත්ම භාවය නැසුනේය. අහෝ කුමක්කරන්නෙමුද''යි කියා බලත්. ඉක්බිත්තෙන් ''වාදීහ කුම්භ විදාරණ ප්‍රවරසිංහරාජ වික්‍රමාන්විතවූ මහාපුරුෂයානන්ව බුදුවන දවසෙහි පහළවන පයෂ්ඩකය මට පැමිණේ''යි කියා සිවි මාරයාට කථාකොට ''එම්බල මාරය, මේ පයෂ්ඩකය තට පැමිණෙයි; කියයි; මේ පයෂ්ඩකය නිසා පෙරුම්පුරමින් දන්දෙන කල්හි කවරෙක් තට සාක්ෂ්‍යදැ?''යි ඇසූසේක. එපවත් ඇසූ මාර තෙම 'මාගේ මේ මාරපිරිස මට සාක්ෂ්‍ය කියන්නේය'යි කියා මාරසේනාභිමුඛ කොට අතදිගු කෙළේය. එකෙණෙහි මරසෙනග ''මම සාක්ෂ්‍යයෙමි''යි කිය කියා පැවැත්වූ ශබ්දය පොළොව පැළෙන හඬක් සෙයින් බඹලොව දක්වා නැගී දෙව්බඹුන් භයගැන්විය. ඉක්බිත්තෙන් මාරදිව්‍යරාජ තෙම ''එම්බා සිද්ධාර්ථයෙනි, තාගේ දානයෙහි කවරෙක් සාක්ෂ්‍යදැ''යි විචාළේය. එපවත් ඇසූ මහා පුරුෂයානන් වහන්සේ ''පාපීවූ මාරය තාගේ දානයෙහි සාක්ෂ්‍යවූයේ තාගේ සවෙතනික වූ පිරිසමය. මට මේ සථානයෙහි සවෙතනික වූ කිසි කෙණෙක් සාක්ෂ්‍ය කියන්නට නැත. මාගේ පයෂ්ඩකය නිසා සාරාසඩ්ඛ්‍ය කප් සුවහසෙහි දුන් දන් හැර එකම වෙස්සන්තරාත්මභාවයෙහි සිවි දුන් සප්තසතික මහාදානයෙහි ''එම්බා මහපොළොව, නී සාක්ෂ්‍ය ඇද්ද? නැද්දැ?''යි වදාරා මහාපෘථිවියට අභිමුඛ කොට ශ්‍රීහස්තය දිගුකළසේක. එකල මහා පෘථිවිය ''මම ඔබට සාක්ෂ්‍යයෙමි' කියන්නාක් මෙන් ශතවාරයක් සහස්‍රවාරයක් ශතසහස්‍රවාරයෙන් මරසෙනග අවස්තරණය කරන්නියක් මෙන් ගුගුරා නැගුනීය. ඉක්බිත්තෙන් ත්‍රෛලොක්‍යෛශ්වර්‍යාභිවර්ධනවූ මහාපුරුෂයානන් වහන්සේ වෙසතුරු අත්බැව්හි දුන් උතුම්වූ මහාදානය සංකීර්තනය කරණකල්හි කෙළ සියක් යොදුන් උස ඇති ගිරිමෙඛල නම් හස්තිරාජ තෙම බුදුන් දිසාවට දනබිම ඇන වැටී ගියේය. මාරපිරිස ඒ ඒ දිසාවෙහි ගියහ. දෙදෙනෙක් එකමග ගියේ නම් නැත. ශීර්ෂාභරණ උතුරැසළු ආදිය දමා හිස්එළු අත කල්පානන්තවාතය

වැද ගත් හිඹුල් පුලුන් සේ වෙව්ල වෙව්ලා පළාගියාහුය. මෙසේ දුවන්නාවූ පිරිස් සහිත මාරයා දුටු දිව්‍යසමූහයෝ "වසවත් මරතව පරාජයවිය. සිද්ධාර්ථ කුමාරයන්ට ජයවිය. එහෙයින් ජයපූජාකරමිහ"යි නාගයෝ නාගයන්ට, සුපණ්ණියෝ සුපණ්ණියන්ට, දේවතාවෝ දේවතාවන්ට, බ්‍රහ්මයෝ බ්‍රහ්මයන්ට, තිය තියා ගඬ මාලාදීන් ගත් අත් ඇතිව සුරනර මුනිමනුජ වන්දනීයවූ මහාපුරුෂයාතන් වහන්සේගේ සමීපයට හෙවත් බෝමැඩට එලඹියාහුය; මෙසේ ආවුන් අතුරෙහි වනාහි:-

"ජයොහි බුද්ධස්ස සිරීමතෝ අයං
මාරස්ස ච පාපිමතෝ පරාජයෝ,
උපෙච්ච සුඤ්ඤං බොධිමණ්ඩ පමොදිතා-
ජයං තදා නාග ගණා මහෙසිනෝ"යි

දක්වන ලද ක්‍රමයෙන් නාගයෝද, මෙසේම සුපණ්ණියෝද, දිව්‍යසමූහයෝද, බ්‍රහ්මයෝද, අවශෙෂවූ දසදහසක් සක්වළ දිව්‍යසමූහයෝද, මාලාගඬ විලෙපනාදීන් පූජාසෙරෙමින් නානාප්‍රකාර ස්තුති වචන සහස්‍රයෙන් පූජාකරමින් සිටියාහුය.

## බුදුබවයට පැමිණීම

මෙසේ හිරු අස්තයව යන්තව පළමුකොටම සපිරිවාර මාර පරාජය කෙට ප්‍රථමයාමෙහි මාගේද, අනුන්ගේද පෙරවිසූ කඳපිළිවෙළ දක්නට සමර්ථවූ පූර්වේනිවාසානුස්මෘතිඥානය ලදින් මධ්‍යමයාමයෙහි සකල සත්ත්වයන්ගේ චුති උත්පත්‍යාදිය දක්නා දිව්‍යචක්ෂුර්ඥානය ලැබ පශ්චිම යාමයෙහි ප්‍රතීත්‍යසමුත්පාදයෙහි ප්‍රඥව බහා අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සංමර්ශනය කරත් කරත්ම දසදහසක් සක්වළ දෙලොස් දෙලොස් වාරය බැගින් එක්ලක්ෂ විසිදහසක් වර සාධුකාර දෙන්නා සේ මහ පොළොව කම්පාවිය.

මෙසේ දසදහසක් සක්වළ එකපැහැර කම්පාකරවා සෝවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් යන සතරමඟ සතරඵලයට පැමිණ අරූණු තැගෙන වේලෙහි සවාසනා සකල ක්ලෙශයන් නසා ලොව්තුරා බුබත්වයට පැමිණ වදාළසේක. ඒවේලෙහි සියළු දසදහසක් සක්වළ එකම මගුල්-ගෙයක් සේ සියලු අලඞ්කාරයෙන් සැරසීසිටගත්හ. එදැරැස්වූ දෙවියන් විසින් ප්‍රාචීන, පශ්චිම, දක්ෂිණ, උත්තර, යන සතරදිසාවෙහි සක්වළ මුවවිට සිව නැගූ ධජයක් අනිකුදු දිශාවල චක්‍රවාලාන්තයෙහිද, බ්‍රහ්ම ලොකයෙහිද, ගැටී සිටියාහුය. දසදහසක් සක්වළ සියලු වෘක්ෂලතාදියෙහි මල්ඵල අටගෙණ එකම මල්පිබක්සේ විය. අටදහසක් යොදුන් ලොකාන්තරික තරකය සප්තසූර්‍යෝද්ගමනයන් මෙන් මහත් ආලෝකයක් විය. අසූසාර දහසක් යොදුන් ගැඹුර ඇති මහාසමුද්‍රයෙහි ජලය මිහිරිදිය විය. සියලු ගඞ්ගාජලයෝ උඩුඟංබලා ගියහ. ජාතිඅන්ධයෝ රූපයන් දුටුවාහුය. ජාතිබධිරයෝ ශබ්ද ඇසුවාහුය. ජාතිපංගුලයෝ සෘජුගමන් කළාහුය බන්ධනගත සත්ත්වයෝ එයින් මිදුනාහුය. මේ ආදී දෙනිස්

මහා පූජිතේහි හා අතිකුදු ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්‍මයන් පහළ කිරීමෙන් ලොව්තුරා බුදුව සුවාසූදහසක් ධර්‍මස්කන්ධයන්ට පළමු වෙනිවූ සියලු බුදුවරයන් විසින් අත් නොහරිණලද චාරිත්‍ර ධර්‍මයක්වූ

**සන්සතියැවීම**

**"අනෙක ජාති සංසාරං-**
**සන්ධාවිස්සං අනිබ්බිසං**
**ගහකාරකං ගවෙසනෙතා-**
**දුක්ඛාජාති පුනප්පුනං**
**ගහකාරක දිට්ඨොසි-පුනගෙහං න කාහසි**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං**
**විසඞ්ඛාර ගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා'ති':**

යන මේ මඞ්ගල ගාථාවන් කියා අනිශයින් සතුටුවූ ත්‍රෛලොක්‍යෙක චිත්තාමාණික්‍ය සංකාශ වූ සම්බුදරාජොත්තමයානන් වහන්සේ සූර්‍ය්‍ය රශ්මිස්පර්‍ශලත් පද්මයක් සේ අතිශයින් සතුටුවූ චිත්තඝනතාන ඇති සේක් අනන්තවූ කල්පකොටි ශතසහස්‍රයක් මුළුල්ලෙහි මේ බොධිපර්‍ය්‍යඞ්කය නිසා සසර දිව ඇවිද්දෙමි. ඇස් ඉස් මස් ලේ දන් දුනිමි. ජීවිතයද, සම්‍යන පුත්‍රදාරාවන්ද, අහුන්ට දුසකොට දුනිමි. මේ පර්‍ය්‍යඞ්කයෙහි හුන්නාවූ මා විසින් මාරසේනාව විධ්වංසනය කරණ ලද්දේය. "මෙහි හුන්නාවූ මාගේ මනදෙළ පිරිණ. එහෙයින් තව ඒ පර්‍ය්‍යඞ්කයෙන් නො නැගෙමි"යි කියා නො යෙක් කෙළලක්ෂ ගණන් සමාපත්තියට සමවදනාසේක් විමුක්ති සුඛසඞ්ඛ්‍යාත නිවන්සැපයෙන් සතියක් මුළුල්ලෙහි වාසය කොට ඉක්බිත්තෙන් පර්‍ය්‍යඞ්කයෙන් නැගී සම්බුදනාඥත ප්‍රතිලාභය වී ද? නො වීදෝහෝ?යි සැක උපදවා සිටි සමහර දේවතාවන්ගේ සැක දුරු කරණු පිණිස අටවැනි දිනයෙහි ආකාශයට පැනනැගී යමකප්‍රාතිහාර්‍යය දක්වා ආකාශයෙන් බැස මහාබොධිපර්‍ය්‍යඞ්කයට ඉසානකොණ සිට ඒකාන්තයෙන්ම මා විසින් මේ බොධිපර්‍ය්‍යඞ්කයෙහි හිඳ සම්බුදනාඥතය ප්‍රතිවෙධ කරණලදැ'යි; කියා ප්‍රමාණාතික්‍රාන්තකාලයක් මුළුල්ලෙහි රැස්කරණලද පාරමිතාවන්ගේ ඵලයට පැමිණ සථානයද, පර්‍ය්‍යඞ්කයද, බොධිවෘක්ෂයද, පස්වණක් පැයෙන් බබළන්නාවූ ප්‍රීතියෙන් විකසිතවූ අනිමිසලොචනය'යි; කියන ලද නො හෙලනලද ඇස්පිය ඇතිව ප්‍රෙමයෙන් භරිතවූ නෙත්‍රයුගලයෙන් පූජා කෙරෙමින් එතැන්හි සතියක් මුළුල්ලෙහි වැඩසිටි සේක. ඒ සථානය දැන් අනිමිසලොමනවෙත්‍ය නම් වේ.

ඉක්බිත්තෙන් බොධිපර්‍ය්‍යඞ්කයවද වැඩසිටි සථානයවද අතුරෙහි පූර්‍ව සක්වළ මුඛවාටයෙහි පටන් පශ්චිම සක්වළ මුඛවාටය දක්වා දෙවියන් විසින් මවනලද රුවන්සක්මනෙහි සක්මන් කරමින් සතියක් අතික්‍රාන්ත කළසේක. මේ ත්‍රිවිධ සතියෙහි එක දවසෙකාවත් සම්බුදයන් වහන්සේගේ ශරීරයෙන් බුදුරැස් නො නික්මින. බෝමැඩ පශ්චිමානන්තර දිශාභාගයෙහි දෙවියන් විසින් මවනලද රුවන්ගෙයි පලඟ බැඳ වැඩහිඳ පරම ගම්භීරවූ අනන්තනය ඇති අභිධර්‍ම පිටකය සංමර්‍ශනය කරන්නට පටන්ගෙණ පළමුකොට ධර්‍මසංගණිප්‍රකරණය සංමර්‍ශනය කෙළේය. එකල්හිද බුදුරැස් නො නික්මින. නැවත විභඞ්ගප්‍රකරණය, පුද්ගලප්‍රඥප්තිය, කථාවස්තු

ප්‍රකරණය, යමකප්‍රකරණය, සංමෝහනය කෙළේය. ඒ කාලයෙහිද බුදුරජාණන් වහන්සේ නිද්දායිතය. ඉක්බිත්තෙන් මහාප්‍රකරණයට බැස ''හේතුපච්චයෝ, ආරම්මණපච්චයෝ'' යනාදිය සංමෝහනයට පටන් ගෙණ සුවිසි සමන්තපට්ඨානය සංමෝහනයට පවත්ගත් කල්හි කිමිර පිංගල නම් මහාමත්ස්‍යරාජයාට අසූසාර දහසක් යොදුන් ගැඹුර ඇති මහා සමුද්‍රය මෙන් අවකාශ ඇතිවිය. මෙසේ සම්බුදුනාණුනයට අවකාශ ලැබ ඉතා සියුම්වූ පරම ගම්භීරවූ ධර්මයන් සංමෝහනය කරන්නාවූ සම්බුදුයන් වහන්සේගේ ශරීරයෙන් නීල පීත ලෝහිතෝදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වරය යන ෂට්වර්ණ ඝන බුබරස්මි මාලාවෝ නික්මුනාහුය.

මෙසේ සම්බුදුයන් වහන්සේගේ ශරීරයෙහි කෙශාදි නීලස්ථානවලින් නීලවර්ණයද, ත්වග්දී පීතස්ථානවලින් පීතවර්ණයද, මස් ලේ ආදී රක්තස්ථාන වලින් ලෝහිතවර්ණයද, දන්තාදී ශුභ්‍රවර්ණස්ථානවලින් අවදාතවර්ණයද, මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වරයන් ශරීරයෙහි ඒ ඒ වර්ණස්ථානවලින්ද නික්මුනා හුය. මෙකියනලද බුදුරජාණන් මාලාවෝ පෘථිවියෙහි වැද දෙලක්ෂ සතාළිස්දහසක් යොදුන් ඝනවූ මහාපෘථිවිය එකම සුවර්ණ පිණ්ඩියක් මෙන් සුවර්ණවර්ණව නැවත පෘථිවිය කිමිද යටට බැස පඨවිසන්ධාරක නම් ජලපොළවද, එයිනුත් යටට බැස වාපොළවද යන සියල්ල එසේම සුවර්ණවර්ණ කෙරෙමින් එයින් නැගී චාතුර්මහාරාජිකාදී සදිව්‍යලෝකද බ්‍රහ්මපාරිෂද්‍යාදී ඡොඩශවිධ බ්‍රහ්මලෝකයන්ද ආකාසානඤ්චායතනාදී අරූපලද යන සියල්ල ඉක්මවා ගොස් අජටාකාශයෙහි වැද සහශ්‍රී දශසහශ්‍රී සියලු ලොකධාතු සම්බන්ධ වන්දසූර්‍යාදී සියලු ආලෝක වස්තූන්ද බ්‍රහ්මාදී සියලු දෙවියන්ද, හිරුදුටු කණාමැදිරියන් සේ නිෂ්ප්‍රභකොට බුදුරජාණන් මාලාවන්ගෙන්ම එකාලෝකවිය. මේ ප්‍රකාරයෙන් බබළ බබළා සත්දවසක් වැඩ හිඳ සම්මෝහනය කරණලද අභිධම්මය වනාහි වාවොද්ගත කොට කියන සේක්වීනම්, අවුරුදු සියයකුදු දහසකුදු මද වන්නේය. මෙසේ අභිධම්මය සංමෝහනය කරමින් සප්තාහයක් අතික්‍රාන්ත කළසේක. ඒ ස්ථානය දැන් රත්නඝර චෛත්‍යය නම් විය.

මේ ක්‍රමයෙන් ශ්‍රී මහාබොධීන් වහන්සේ සමීපයෙහි සතර සතියක් අතික්‍රාන්තකොට පස්වෙනි සතියෙහි බොධිවෘක්ෂ මූලය කෙරෙන් යම් තැනෙක්හි අජපාල නිග්‍රොධ වෘක්ෂයද එතැන්හි එළඹිසේක. එළඹ වැඩහිඳ රාගවසඟවියට පමුණුවන්නට ආ මාරස්ත්‍රීන්ගේ අභිප්‍රාය සාදුගත නොහී; ඔවුන් සංක්ෂොභනය කොට ''රාගපාසයෙන් බඳිමිහ''යි කියා සතුටුවීම් වශයෙන් ප්‍රබොධවූවත්ගේ මුඛ තමැති අම්බුජවනය දෙශනා තමැති සඳරැසින් මලානික කරවා ත්‍රෛලෝකාග්‍ර සම්බුදු තමැති චන්ද්‍ර දිව්‍යරාජ තෙම ධර්මසංමෝහනය කෙරෙමින් විමුක්ති සුඛසම්ඵාප්ත නිවන්සැප විඳිමින් අජපාල නිග්‍රොධ වෘක්ෂ මූලයෙහි සතියක් අතික්‍රාන්ත කළසේක.

මෙසේ අජපාල නිග්‍රොධ වෘක්ෂ මූලයෙහි පස්වන සතිය අතික්‍රාන්ත කොට එයින් මත්තෙහි සත් දවසක් මූළුල්ලෙහි ධාරානිපාත-යෙන් චාතුර්දීපික ගතව වස්තා වර්ෂාවට මුචලින්ද නම් විලෙහි මහමේදෙල් රුක්මූල මුචලින්ද නම් නාගරාජයාගේ භොග මන්දිරයෙහි හෙවත් දරණ

ගර්භයෙහි සම්මත් සුවවිදිමින් සතියක් අතික්‍රාන්ත කළසේක. එයින් නික්ම ගොස් සත්වන සතියෙහි මහ කිරිපලුවනයට වැඩ කිරිපලු රුක්මුල ගලස්නෙක වැඩහිඳ ධ්‍යානසුවයෙන් සත් දවසක් අතික්‍රාන්ත කළසේක

මෙසේ සත්සතිය'යි කියන ලද එකුන්පණස් දවස මුළුල්ලෙහි ආහාර කෘත්‍යයන් නො කොට නිවන් සැප වළඳා දවස් යවූකල බුදුවූ පණස්වනදා අරුණෝදයයෙහි ශක්‍රදෙවේන්ද්‍රයන් විසින් පිළිගන්වන ලද දිව අමා අරළු පිළිගෙණ වළඳා එම සක්දෙවි රජහු විසින් පිළිගන්වන ලද නාලිය දැවටි වළඳා අනොතත්ත ජලයෙන් මුඛ ධොවනය කොට නැවත වැඩ එම රාජායතන මූලයෙහි වැඩහුන් කල්හි "බුදුකෙනෙකුන්ට අග්‍රභොජනයක් පිළිගන්වමි'යි ප්‍රාර්ථනා කොට ආවාවූ තපස්සු භල්ලුක නම් වෙළඳ දෙබෑයන් විසින් මිපිඩු ගෙණවුත් පිළිගන්වන්ට ආරම්භකළ කල්හි බුහ්මයා දුන් පාත්‍රය ක්ෂීරපායාසය පිළිගත් දවසෙහි අතුරුදන්වූ හෙයිනුත් කිරිපිඩු පිළිගත් තලිය නාගභවනයට ගිය හෙයිනුත් සිව්වරම් රජදරුවන් විසින් පිළිගන්වනලද මුද්ගල්ල ශෛලපාත්‍රයන් සහර ඔවුන්ව අනුග්‍රහ පිණිස මතුමත්තෙහි තබා අධිෂ්ඨාන වශයෙන් මුඛරෙඛා දක්වමින් එකක් කොට ගෙණ ඒ ශෛලමය පාත්‍රයෙන් මිපිඩු පිළිගෙණ වළඳා ඔවුන්ව අනුමොදනා වශයෙන් බණ වදාරා

## මහබඹුගේ ආරාධනය.

එයින් නික්ම නැවත අජපාල් නිග්‍රොධ වෘක්ෂමූලයට වැඩ බුදුන්ගේ සිරිත් හෙයින් ධර්මදෙශනා කිරීමෙහි මනුත්සාහයට පැමිණ "මා විසින් අවබොධ කරණලද මේ නිර්වාණ ධර්මය තෙම මහපොළව පිහිටි උදකකර්දමයක් මෙන් අතිගම්භීර වන්නේය. පඬිතයකින් වසා තුබූ දෙයක් මෙන් කිසිකෙනෙකුන් විසින් නොදක්ක හැකිය. නො දක්ක හැකි බැවින්ම අවබොධය කොටගත නොහැක්කේය. නිවියාවූ සියළු ක්ලේශපරිදාහ ඇති බැවින් ශාන්ත වන්නේය. මධුරරස ඇති ඖජනයක් සේ තෘප්තියකට නො පැමිණෙන කාරණයෙන් ප්‍රණීතය, ආර්‍යාශ්‍රුතයෙන් මිස සෙස්සන්ගේ කල්පනාවෙන් තකීණය කොටගත නොහැකි බැවින් අතර්කාවචරය, සියක්වර පලනලද අස්ලොම් අගක් මෙන් ඉතා සූක්ෂම බැවින් නිපුණය, ධාත්වායතනප්‍රත්‍යය කාරණා සඞ්ඛ්‍යාත චතුර්විධ කෞශල්‍යයෙන් යුක්ත පණ්ඩිතජනයන් විසින් දැනගතහැකි බැවින් පණ්ඩිත වෙදනීය වන්නේය. එසේවූ මේ ධර්මය යාවකයන්ට මිණිවොටුනු ආදීන් සරහා පිළියෙළ කරණ ලද්දාවූ ඉස්කපා දන්දීමෙන්ද, ලෝහිතය දීමෙන්ද, මනාකොට අඳුන් ගා සරහතලද ඇඳ උපුටාදීමෙන්ද, කුලවංශයට ප්‍රදීපයක් වැනිවූ පුත්‍රයන් හා මන වඩන්නාවූ භාර්‍යාවන් දන්දීමෙන්ද නුදුන්නාවූ දානයක් නම් නැත්තේය.

ශාංඛපාල ජාතකාදීවූ ආත්මභාවයන්හි නෘණලවයක් මෙන් කරන්නාවූ ජීවිත පරිත්‍යාගය පොළෝ පෙරළීමක් මෙන් සිතන්නාවූ ශීලව්‍යතික්‍රමණය ඇති මා විසින් නො රක්නා ලද සීලයක් නම් නැත්තේය. චුල්ලසුතසොමාදීවූ ආත්මභාවයන්හි මනොඥවූ සම්පත්තිය පරිත්‍යාග

කරන්නාවූ මා විසින්ද, නුපුරණලද කිසි පාරමිතාවක් නම් නැත්තේය. මෙබඳුවූ මා සවස්වේලෙහි මාරසේනාව විධ්වංසනය කරන්නටත් මනිකම්පාව නොවීය. ප්‍රථමයාමයෙහි පූර්වේනිවාසානුස්මෘතිඥානය ලබන්නහුවද, මධ්‍යමයාමයෙහි දිව්‍යචක්ෂුර්ඥානය උපදවන්නාහවද, පෘථිවි නොමෝ කම්පානොව පශ්චිම යාමයෙහි වනාහි වාදශාඛප්‍රතීත්‍ය සමුත්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ප්‍රතිවෙධ කරන්නාවූ මවම දශදහසක් සක්වළ යදණ්ඩකින් ප්‍රහාරලත් ලෝතලියක් මෙන් දසදහසක් ගණන් ධවනි පවත්වමින් පවනින් පහරණලද පියුම්පතෙක්හි පතිත ජලබින්දුවක් මෙන් කම්පාවිය. මෙසේ තීක්ෂණ ප්‍රඥ ඇත්තාවූ මා විසිනුදු මේ ධර්මය දුකසේ ප්‍රතිවෙධකරණ ලද්දේය. මේ ලෞකික මහජනයෝ ක්ලේශයන්ගෙන් හරිතයහ, ඉතා සංක්ලිෂ්ටයහ, රාගයෙන් රක්තයහ, වෙශයෙන් දුෂ්ටයහ, චතුස්සත්‍යය නො දන්නා අවිද්‍යායෙන් මැඩ මිරිකා පියතලදහ. එසේවූ සත්ත්වයෝ මෙසේ ගැඹුරුවූ ධර්මය කෙසේ නම් ප්‍රතිවෙධ කෙරෙද්ද? එසේවූ ධර්මය දේශනා කිරීමෙන් ප්‍රයෝජන කවරේදැ? යි ධර්මදේශනාවට උපන්නාවූ මහේශාක්‍යාහ ඇතිසේක් ඒ පරිවිතර්කී දුටු සහම්පති මහාබ්‍රහ්මයා විසින් "නස්සති වත භො ලොකො, විනස්සති වත භො ලොකො, යත්‍ර හි නාම තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස අප්පොස්සුක්කතාය චිත්තං නමති නො ධම්මදෙසනාය."

යනුවෙන් දශසහස්‍රී ලෝකධාතුව එකනින් නාදකෙරෙමින් මහත්වූ සවරයක් විහිදුවා දශදහසක් සක්වළ මහාබ්‍රහ්මයන් හා දශදහසක් පරිනිර්මිත දිව්‍ය රාජයන් හා දශදහසක් සුනිර්මිත දිව්‍යරාජයන් හා දශදහසක් තුසිත දිව්‍යරාජයන් හා දශදහසක් සුයාම දිව්‍යරාජයන් හා දශදහසක් ශක්‍රයන් හා සතළිස් දහසක් වරම් රජදරුවන් හා සමග බුදුන්ගේ අභිමුඛයට ප්‍රාදුර්භූතව, උතුරුසළුව එකාංශකොට පෙරවා දකුණු දනමඬල බිම හැන දෙහොත් මුදුනෙහි තබා "දෙසෙතු භගවා ධම්මං" යනාදීන් ධර්මදේශනාවට යාචිඤ්ඤ කෙළේය.

## දම්සක් දෙසීම

ඒසුරුනරමුනිමනුජ වන්දනීයවූ සම්බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මාරාධනාව පිළිගෙණ බුදු ඇසින් ලොව බලා "මම කවරෙක්හට ධර්මදේශනා කෙරෙම්ද? කවරෙක් මාගේ ධර්මය වහා පිළිගන්ට සමර්ථ වේ නෝ?" යි බලා ආලාර කාලාමයන් හා උදක රාමපුත්‍රයන් කළුරිය කළ නියාව දුක කප්පලක්ෂයක් මුළුල්ලෙහි අග්‍රදහම් පිළිගන්නට කරණලද ප්‍රාර්ථනා ඇති කොණ්ඩඤ්ඤාදී පස්වගමහණුන් වහන්සේ දුක කසිපුරයට වඩිනා සේක් අතරමගදී උපක නම් ආජීවකයන්හට වත වැඩ දුක පා ගමනින් වැඩ ඔහුට සුදුසු අනුකම්පා කොට අතරමගදී දුටු සියළු දිව්‍ය මනුෂ්‍යාදීන් සතුටුකරවමින් අටළොස් යොදුන් මග ගෙවා බරණැස ඉසිපතනාරාමයට වැඩිසේක.

දෙවාතිදෙව වූ සම්බුදුයන් වහන්සේ වඩනාබැව් දුටු පස්වග මහණුන් වහන්සේ "ශ්‍රමණභවත්ගෞතමයෝ දුෂ්කරක්‍රියා හැර තමන් රජකුලෙහි

උපන් හෙයින් සුඛිතයන් විසින් දෙනලද රසමසවුලෙන් යුක්තවූ මධුර ආහාර අනුභව කොට ශරීරවර්ණය ලදින් රන්කඳක් සේ දිලිහි දිලිහී බුදුව ගතනොහී අපකරා දැන් එති. රජකුලෙහි උපන් හෙයින් හිදිනා අසුන් පමණක් දෙනබව මුත් වඳනමාතනාදියක් නොකරම්හ''යි කතිකා කළාහ. සතරාමර ලෝකයාගේ සකලාධ්‍යාශය දක්නාවූ බුඩඟුන නමැති කැඩපතින් සර්වාම්දරුවානෝ ඒ නිඝණ්ඨයන්ගේ අධ්‍යාශය දැක සියලු සත්ත්වයන් කෙරෙහි පතළාවූ මහාකරුණාව ඒ පස්වග මහණුන් කෙරෙහි පවත්වා වදාළසේක. එකල්හි බලවත් වතුරෙන් ඉපිලෙන පරඩලාපත් සේ හුනස්නෙහි හිඳගත නොහී ඒ පස්වග මහණුන් වහන්සේ නැගි බුදුන්ගේ ශ්‍රීපාදමූලයෙහි වැඳ පෙරළී පාසිවුරු අතින් ගෙණ සියළු ආගන්තුක වත් සපයා බුදුබැව් නොදැන සමඝමයන් සේ ආවුසො වාදඉයෙන් කථාකෙරෙමින් සිටිකල්හි, ''මා භික්ඛවෙ, තථාගතං නාමෙන ච ආවුසොවාදෙන ච සමුදාචරථ; අරහං භික්ඛවෙ, තථාගතො සම්මාසම්බුද්ධා'' යනුවෙන් තමන් වහන්සේ සර්ඥ පරිදි හඟවා ඇසළ මස පුණුපොහෝදිනයෙහි උතුරුසළ නැකතින් දෙතිස් මහාපුරීතීමිති පහළවෙමින් සිටියදී හැම බුදුන්ගේ චාරිත්‍රධර්මයක්වූ මඩගල දෙශනාව පිණිස වැඩඋන් කල්හි දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයෝ ''අපගේ සවාමි දහම් අමාවතුරෙහි අප හැම ගලා සංසාරදුක් නමැති මහගිම් නිවසි. ඔහුගේ දහම් අමාරස බොන්නට යම්හ''යි කියා දිවමල් ආදිය ගෙණ දිව අවුත් සක්වළගල පර්‍යන්තව අකනිටා බඹලොව දක්වා කලෙක පුරාලූ රන් සුණු සමූහයක් සේ ඉතා සියුම් වෙස් මවාගෙණ අවකාශ නැතිව සිටගත්හ

එකල බුදුන් වැඩඋන් බුඩාසනයෙහි පටන් බ්‍රහ්මාණ්ඩය දක්වා බුදුන් සිරසින් පැතනැගි බුදුරැස්කදවම අවකාශවිය. දෙව්විමනක් වේවා'යි; දෙව්බඹකෙණෙක් වේවා'යි; එදා බුදුහුගේ සිරසින් නැගි බුදුරැස්කදෙහි ස්පර්‍ශානුවූහ. ඉක්බිත්තෙන් බුදුන් සිරසට පිදූ සඳමඩුලු සේ දාඇදුණක් මහාබ්‍රහ්මයෝද, දස දහසක් සේසත් මතුමතුයෙහි තබා සිටගත්හ. දසදහසක් ශක්‍රයෝ බුදුන්ගේ යසරැස් උරා බොන්නවුන් සේ දසදහසක් ජයතුරාසක් තුඩතබාගෙණ එකවිටම පිඹින්ට පටන්ගත්හ. දසදහසක් සුයාම දෙවියෝ දසදහසක් චාමර සලති. දසදහසක් සන්තුෂිත දෙවියෝ දසදහසක් මිනින්තල්වැට සලති. සෙසු දෙවියෝ රන් තොරණ රිදී තොරණ ආදී දිව්‍ය පූජාභාණ්ඩ ගෙණ පූජාකරන්ට පටන් ගත්හ. එකල දෙවියන්ගේ පූජා කෝලාහලයෙන් බ්‍රහ්මාණ්ඩය දක්වා වැදගත් මුහුදු ගිහුමක් සේ එකනින් නාදවිය. එදා දෙවියන්ගේ අරගල සංහිඳුවාලන්ට අන් කිසි සත්ත්වයෙක් නැත. බුදුන් වට සිටි දසදහසක් ශක්‍රයෝ ඒ තමන් කළ මනා ධුරය හෙයින් දසදහසක් දකුණු සක් පිටවතුරුවාගෙන විසිදහසක් අත්ඔසවා එකවිට අත්පොළසන්දී ''හෝ! හෝ! බණ පිරිස සංහිඳුව'යි කියා තුන් ලොව වෙවුල්ලා ඝොෂාකළාහ. ඒ වේලෙහි ඒ ශක්‍ර ඝොෂාව අසා තුන්ලෝ පුරා සිටි දෙවබඹ පිරිස් රැලනැති මුහුදු සේ නිශ්ශබ්ද වූහ. එකෙණෙහි දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහපොළව සාධුකාර දින. ඒ මහීනාදය හා සමඟ තමන් වහන්සේගේ ශ්‍රී මුඛපද්මය විවෘතකොට බැණනැගි බසින් සියලු බණ පිරිස දිව සුවඳ පිඬක් සේ කරවමින්:-

"චෙ මෙ භික්ඛවෙ, අඤ්ඤා පබ්බජිතෙන න සෙවිතබ්බා යොවායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො යො චායං අත්තකිලමථානුයොගො"

යනාදීන් දම්සක් පැවතුම් සූත්‍රදෙශනාව කළසේක. එකෙණෙහි පස්දෙනා වහන්සේට වැඩිමහළු කොණ්ඩඤ්ඤ නම් මහතෙරුන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සොවාන් මාගීයෙන් වැද නිවන්පුර දුටුසේක. තවද තුන් අසඞ්ඛ්‍යයක් දෙවියන් හා අටලොස්කෙළක් බ්‍රහ්මයන් නිවන් දුටුවාහුය. මෙසේ දම්සක් පවත්වා දෙවිබඹුන්ට සමුදී යවා එමදෑ රෑ තරු පිරිවැරූ සඳක්සේ ඒ පස්වග මහණුන් හා සමග එහිම වැස දෙවෙනි දා උදැසන සතරදෙනා වහන්සේ සිඟා යාදී ආදිය නම් මහතෙරුන් වහන්සේට බණ වදාරා සෝවාන්කොට තුන්වෙනිදා උදැසන ඔබ ඇතුළුවූ අනික් සතරදෙනා වහන්සේ සිඟා යවා වප්ප නම් තෙරුන්වහන්සේට බණ වදාරා සෝවාන් කොට සතරවෙනිදා උදැසන ඔබ ඇතුළුවූ සතරදෙණෙකුන් වහන්සේ සිඟා යවා මහානාම නම් තෙරුන් වහන්සේට බණ වදාරා සොවාන් කොට පස්වෙනිදා උදැසන ඔබ ඇතුළුවූ සතරදෙනෙකුන් වහන්සේ සිඟා යවා අස්සජි නම් මහතෙරුන් වහන්සේට බණ වදාරා සොවාන්කොට විශෙනිස දවස පස්දෙනා වහන්සේට අනත් ලකුණු නම් සූත්‍රය දෙශනාකොට එකව්වම රහන්කොවගෙණ එතැන් පටන් පඤ්චමහා ශාඛාවෙන් දිලිහෙන කප්රුකක් සේ පස්වග රහත් හා සමග එම වෙහෙර වාසය කරණ සේක.

## ප්‍රථම ධම්මදූත මෙහෙය

එකල්හි සුජාතා නම් සිටුදුව වැදූ බරණැස යස නම් සිටුපුත්‍රයාතෝ එක් දවසෙක නිදා පිබිද එහි නිදාවට පැමිණි නාවක ස්ත්‍රීන්ගේ විකාර දැක සසරකලකිරි යහනින් නැඟි රුවන් මිරිවැඩි පයින්ගෙණ ප්‍රාසාදයෙන් බැස නුවරින් නික්ම ඉසිපතනාරාමය සමීපයෙන් යෙති. එවේලෙහි සවාම්දරුවෝ ඔහුගේ හේතුසම්පත් දැක ඔහු කරා බුදුරැස්කදක් හැර "මෙහි එව යසය"යි, වදාළසේක. ඒ සිටුපුත් බුදුන්ගේ ශබ්දය අසා සතුටුව බුදුන්කරා දිවගොස් පසඟපිහිටුවා වැඳ එකත්පසෙක හිඳ බුදුන්ගෙන් බණ අසා එකෙණෙහිම සෝවාන්ව දෙවෙනිදා රහත්ව, එහි භික්ෂුභාවයෙන් පැවිදිවූහ. නැවත එම සය නම් සාමීන්ගේ ගිහි යහළුවෝ සූපණස් කොණෙක් යහළුවානත් මහණවූ බැව් අසා බුදුන් කරා ගොස් බුදුන්ගෙන් බණ අසා රහත්ව එහි භික්ෂුභාවයෙන් මහණවූ සේක. මෙසේ ලොකයෙහි බුදුන් හා සමග එක්සැටක් මහරහතුන් පහළවූකල සාම්දරුවෝ වප්පඅ මැදිපොහෝදා වස් පවාරණය කොට සැව මහරහතන් ලහව කැඳවා "චරථ භික්ඛවෙ චාරිකං" යනාදියෙන් අවවාද කොට සත්ත්වයන් බුබදඝීතයෙහි ලොහවඩව"යි වදාරා සැවදෙනා වහන්සේ සැවමාගීයකින් යවා තමන් වහන්සේ එකලාව උරුවෙල් දනව්වට වඩිනා සේක් අතරමග භද්දවග්ගිය නම් වනයෙහි එක්තරා රුකක්මුලට වැඩ උන්සේක.

## ද්විතීය ධම්දූත මෙහෙයට

එකල කොසොල්රට හැදූ වග්ගිය නමින් ප්‍රසිඛවූ රජ-කුමරුවෝ තිස් දෙනෙක් එම වනයෙහි ක්‍රීඩා පිණිස ඇවිදිනාහු සවණක් රැසින් දිලිහිදිලිහි වැඩ උන් බුදුන් දැක එකත්පසෙක හුන්නාහුය. ඒ වේලෙහි බුදුහු ඒ රජකුමරුවන්ට අනුරූපවූ බණ වදාරා සතරමඟ සතර ඵලයෙහි පිහිටුවා එහි භික්ෂුභාවයෙන් මහණකොට "මහණෙනි, තෙපි තිස්දෙන තිස්මාගියකින් ගොස් බුදුරුවන්, දම්රුවන්, සඟරුවන් ලොව පහළවූ බව කියා ලෝවැඩ කරව"යි වදාරා ඒ තිස්දෙනා වහන්සේ තිස්මගකින් යැවූසේක.

## තුන්බෑ ජටිල දමනය

මෙසේ ලොකයෙහි එකානූවක් රහතුන් ඇතිවූකල අප භාග්‍යවතුන් වහන්සේ උරුවෙල් නම් දනවිවර වැඩ නිල්දලා නම් ගඩගාතීරයෙහි වසන උරුවෙලකාශ්‍යපය, ගයාකාශ්‍යපය, නදීකාශ්‍යපය යන තුන්බෑ ජටිලයන් ප්‍රමුඛ කොට ඇති දහසක් ජටිලයන් තුන් දනස් පන්සියයක් ප්‍රාතිහාර්‍යයී දක්වා නැවත ඒ ජටිලයන්ගේ චරිතය බලා බණවදාරා සෝවාන්කරවා එහි භික්ෂුභාවයෙන් මහණකරවා ගයාශීර්ෂයට ගෙණ ගොස් එහිදී ආදිත්තපරියායය සූත්‍රදෙශනාවෙන් බණ කියා ඒ දහසක්දෙනා වහන්සේ අගඵල්ඵලයට පමුණුවා ඒ උරුවෙල කාශ්‍යපාදී දහසක් රහතන් පිරවරා බිම්සර රජහට දුන් ප්‍රතිඥාවෙන් මිදෙනු පිණිස රජගහනුවරට යෂ්ටිවන නම්වූ තල්උයනට වැඩ එක් රුකක්මුල සවණක් රැසින් දිලිහි දිලිහී දහසක් මහරහතන් පිරිවරා වැඩඋන්සේක.

## රජගහනුවරට වැඩම වීම

එකල බිම්සර රජ්ජුරුවෝ දුන් තමන්ගේ උයනට ප්‍රවිෂ්ටව වැඩ උන් බව උයන්ගොවියා අතින් අසා එක්ලක්ෂ විසිදහසක් බ්‍රාහ්මණ ගෘහපතීන් විසින් පිරවරණලදුව දිව අවුත් බුදුන් දැක පස්වණක් ප්‍රීතියෙන් පිණා පසඟපිහිටුවා වැඳ එකත්පස්ව ඉඳගත්හ. ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණ ගෘහපතීහු "කිමෙක්ද? මහණ භවත්ගෞතමයෝ උරුවෙල කාශ්‍යපයන් නිසා වෙසෙද්ද? නොහොත් උරුවෙල කාශ්‍යපයෝ මහණ භවත් ගෞතමයන් නිසා වෙසෙද්ද'යි සැක සිතුවාහුය.

බුදුරජාණන් වහන්සේ ඔවුන් සිතූ සිත් දැන මහතෙරුන් මූහුණ බලා "උරුවෙල කාශ්‍යපය, තෘගේ පිරිස්හි සැක නෝම හරව"යි වදාළසේක. එකෙණෙහි උරුවෙල කාශ්‍යප නම් මහතෙරුන් වහන්සේ හුනස්නෙන් පැන නැගී බුදුන් කරා නොස් ශ්‍රීපාදය වැඳ අවසර ඉල්වාගෙණ චතුර්ඕඝ්‍යානයට සමවැද ආකාශයට පැනනැගී නොයෙක් සෘඩි දක්වා ආකාශයෙන් බැස නැවතත් දෙතලෙක, තුන්තලෙක' යනාදී වශයෙන් සත්තලෙක පමණ ආකාශයට පෙරසේම පැනනැගී එයින් බැස බුදුන් වැඳ සිට "එම්බා අඤ්ඤ සත්ත්වයෙනි, මාගේ සාම්දරුවන් මා හා සමකොට

නොසිතව. මාගේ සාම්දරුවන් නිසා මම සංසාර සාගරයෙන් ගොඩනැංගෙමි. බුදුහු මට මවුසේක, පියසේක, ගුරුසේක, සාමි දරුසේක.'' යනාදීන් අප්‍රමාණ බුදු ගුණ එම සෙතගව ඇසෙන සේ කියා කියා බුදුන් වැඳ එකත්පස්ව වැඩඋන්සේක. එවේලෙහි මහපිරිස ඒ මහතෙරුන් කළ ප්‍රාතිහාර්‍යය දැක සතුටුව ''බුදුහු මනානුභාව ඇතිසේක. මිත්‍යාදෘෂ්ටි ගෙණ 'අපි රහතුම්හ සි කියා බොහෝ කලක් ඇවිද්දුවු උරුවෙල කාශ්‍යපයන්ගේ දෘෂ්ටි බිඳ විසෙෂයෙන්ම දමතය කළදැ''යි ස්තුතිකළහ. එකල සාම්දරුවෝ ''උපාසක වරුනි, මොහු දැන් මතු දැමුයෙමි කොවෙමි. පෙරත් මොහු දමා අපාය මුඛයෙන් ගැලවීමි''යි වදාරා මහමේඝයක් පලා සඳමඩලක් පානා සේ මහානාරදකාශ්‍යප ජාතකය ගෙණහැර දක්වා කෙළවර චතුස්සත්‍යය ප්‍රකාශ කළසේක.

මහානාරද කාශ්‍යප ජාතකය නම් පන්සියපණස් ජාතක ධර්මයන් අතුරෙන් පළමුකොට වදාළ ජාතකය'යි, මේ ජාතකධර්මදෙශනාවගේ කෙළවර බිම්බිසාර රජ්ජුරුවෝ එකොළොස් නහුතයක් බ්‍රාහ්මණ ගෘහපති ඇමතියන් හා සමග සොවාන්ඵලයෙහි පිහිටියාහුය. නහුතයක් බමුණු-ගැහැවියෝ සරණ සීලයෙහි පිහිටියහ. නහුත ශබ්දය බුබදෙශනාවෙහි දසදහසට වැටෙන හෙයින් එක්ලක්ෂ විසිදහසක් පමණ මනුෂ්‍යයෝ මේ ධර්මදෙශනාවෙන් සංසාරසාගරයෙන් ගොඩනැංගාහුය'යි දතයුතුයි.

ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බුදුන් වැඳ සෙව දවසට පවරා ප්‍රදක්ෂිණා කොට නුවරට ගියහ. දෙවෙනිදා උදැසන ඇතුළු නුවර පිටිනුවර බුදුහු දුටු නුදුටු අවලොස් කෙළක් පමණ මනුෂ්‍යයෝ බුදුන් දක්නා පිණිස රජගන නුවරින් නික්ම අලුයම් වේලෙහි පවන් බුදුන් වැඩඋන් උයනට තුන්ගවු පමණ තැන මාගීයෙහි සිදුරක් නැතිව සිටගත්හ උයනද අවසරයක් නැතිවිය. එදා බුදුන් ප්‍රමුඛ සඞ්ඝයාට සිහාවඩනව අවසරයක් නැති හෙයින් බුදුන්ගේ පුණ්‍යානුභාවයෙන් සක්දෙවි රජහුගේ පාණ්ඩු-කම්බල ශෛලාසනය හුණුවිය. එකෙණෙහි ශක්‍රදෙවේන්ද්‍ර තෙම ''මේ කිමෙක්දෝ'යි' පරීක්ෂාකරණුයේ තමන් උපෙක්ෂා වුවහොත් එදා බුදුන් සුන්බත්වෙති''යි දැන තරුණවූ අභියුක්ත වෙසයක් මවාගෙණ සෝළලියක් අතින්ගෙණ තුනුරුවන් ගුණ අරභයා ස්තුතිවචන කියමින් බුදුන් ඉදිරියෙහි සිටගෙණ තමාගේ ශක්‍රානුභාවයෙන් තුන්ගවු පමණ තැන භාත්පසින් පිරි සිටගත් ඒසා මහත් පිරිස දෙබෑකොට පිරිස්පලා නික්මින. එකල මනුෂ්‍යයෝ මේ තරුණ පුරුෂයාගේ වික්‍රමභාර රූපශ්‍රී දැක ''මෙවෙනි තරුණ පුරුෂයකු මෙතෙක් දවස් මේ නුවර නුදුටුවිරුම්හ. නොපි කොයි සිව ආ කෙතෙක්දැ''යි විවාරති. එකල ශක්‍රයා ''යො ධීරෝ සබ්බඛි දණෙනා'' යනාදියෙන් ''මම තුන්ලෝ මුදුන්පත් බුදුන්ගේ එක්තරා අභියුක්තයෙක්මි''යි කීන. එකල බුදුරජානන් වහන්සේ ශක්‍රයා විසින් අවකාශකොට දුන් ඒ මාගීයට පැමිණ දහසක් පමණ රහතන් පිරිවරා රජගහ නුවරට වන්සේක.

## වෙළුවනාරාම පූජාව

රජ්ජුරුවෝ බුදුපාමොක් මහසඟ පිරිසට මහදන්දී "සඛාමීනි, මෙතැන් පටන් ජීවිතාන්තය දක්වා තුණුරුවන් විනා වාසයකළ නොහෙමි. සිතූ යම් විටෙක දැක වැඳගන්නා කැමැත්තෙමි. යෂ්ටිවනොද්භූතය ඉතා දුරය. මගේ වෙළුවනය ඉතා ලඟය. ගමනා-ගමනසම්පන්නය. බුදුන්ට සුදුසු සෙනසුනක් හෙයින් පිළිගත මැනවැ"යි සඛණීහිංකාරයෙන් බුදුන්ගේ ශ්‍රීහස්තයට පැන් වත්කොට ඒ වෙළුවනාරාමය පිළිගැන්වූසේක. එකෙණෙහි බුදුසස්න මුල්බවහ'යි මිහිකත ගුගුරා පැතහැංගේය. දඹදිවිතෙලෙහි පොළොව ගුගුරුවා පිළිගත්තාවූ විහාරයෙක් මේ හැර නැත්මය. මෙම ශ්‍රී ලඞ්කාවිපයෙහි මහමෙව්නා උයන හැර පොළොව ගුගුරුවා පිළිගත් අනික් විහාරයෙක් නැත්මය. බුදුන් වෙළුවනාරාමය පිළිගෙණ රජහට අනුමොදනා කොට හුනස්නෙත් පැතහැනි භික්ෂූසඞ්ඝයා පිරිවරා වෙළුවනාරාමයට වැඩිසේක.

එසමයෙහි වතාහි නිවන් සොයමින් හැසිරෙන්නා වූ ශාරීපුත්‍ර, මෞද්ගල්‍යායන පරිබ්‍රාජකයන් දෙදෙනා අතුරෙන් ශාරීපුත්‍ර නම් පරිබ්‍රාජක තෙම රජගහනුවර පිඬු පිණිස හැසිරෙමින් සිටි අස්සජි නම් තෙරුන් වහන්සේ දැක උන්වහන්සේගේ ඊර්‍යාපථයෙහි ප්‍රසන්නව උන්වහන්සේ කරා ගොස් උන්වහන්සේගෙන් "යෙ ධම්මා හෙතුප්පභවා" යනාදීන් ගාථා වෙන් බණ අසා ශ්‍රොතපත්ති ඵලයෙහි පිහිටා තමාගේ යහළු වූ මෞද්ගල්‍යායන පරිබ්‍රාජකයාහට එම ගාථාවෙන් බණ කී කල්හි ඔහු ද ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටියේය. එකල්හි එම දෙදෙන තමන්ගේ ගුරු වූ සඤ්ජය පරිබ්‍රාජකයා අත්හැර තමන්ගේ පිරිසත් සමඟ බුදුන් සමීපයට ගොස් මහණ වූවානුය. මුගලන් මහරහතන්වහන්සේ මහණවූ සත්දවසින් මගදරව කලලවාල නම් ගමදී බුදුන් විසින් දුන්නාවූ ධාතු කම්මට්ඨානය අසා රහත් වූ සේක. සැරියුත් මහතෙරුන් වහන්සේ ද, මහණ වූ පසළොස් දවසින් ශාරීපුත්‍රයන්ගේ බැතනුවන් වූ දීඝනඛ නම් පරිබ්‍රාජකයන්ට රජගහනුවර ඛුරුඛළ නම් ලෙනෙහිදී බුදුන් විසින් දෙශනාකළ ඔවදනාපරිග්‍රහ නම් සූත්‍රදෙශනාව අසා රහත් වූ සේක. එමද, සවස ශ්‍රාවක ගණයා රැස් කොට එම දෙදෙනා වහන්සේව අගසටු තනතුරු දී දෙසියපණසක් මහ රහතුන් හා සමඟ වැඩහිඳ නවන් මස මැදිපොහෝ දවස්හි සියළු බුදුවරයන්ගේ චාරිත්‍රධර්මයක් වූ "සබ්බපාපස්ස අකරණං" යනාදී ගාථාරත්නයෙන් ධර්මදෙශනා කළසේක.

මෙසේ ත්‍රිභුවන චූඩාමාණික්‍ය වූ බුදුරජානන් වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහි වැඩවාසය කර වදාරණ කල්හි "සුඩොදන රජ්ජුරුවෝ මාගේ පුතනුවෝ සිඛාඪිකුමාරයෝ සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කොට ලොවු තුරා බුදුව පවත්වනලද ධර්මචක්‍ර ඇතිව රජගහනුවර නිසා වෙළුවනාරාම යෙහි වාසයකෙරෙත්ය"යි අසා එක්තරා අමාත්‍යයෙක් කැඳවා' පින්වත්නි, තෙපි දහසක් ඇමතියන් පිරිවරා රජගහනුවර වෙළුවනාරාමයට ගොස් බුදුන් දැක වැඳ මාගේ වචනයෙන් මෙසේ කියව. "සවාමීන්වහන්ස, නුඹවහන්සේගේ පිය වූ සුඩොදන රජතෙම නුඹවහනසේ දකිනු කැමතිය"යි කියා මාගේ පුත්‍රයාහන් වහන්සේ වැඩමවා ගෙණ එව"යි කීවේය.

## කිඹුල්වන්පුරයට වැඩමවීම

එ අමාත්‍යතෙමේ "එසේය දෙවයන්වහන්සැ"යි කියා රජහුගේ වචනය මුදුනෙන් පිළිගෙණ අමාත්‍යයන් දහසක් පිරිවරා සැවයොදුන් මහමග ගෙවා රජගහනුවරට ගොස් වෙළුවනාරාමයෙහි මහපිරිස් පිරිවරා වැඩහිඳ ධර්මදේශනා කරණ බුදුන් දැක රජහුගේ මෙහෙවර අසුන තබා මා බණ අසාගත මැනවැ"යි සිතා පිරිස්කෙළවර සිව බණ අසා සඟපිරිවරින් රහත්ව එහි හික්ෂුභාවයෙන් මහණව ආර්‍ය ජන්මයෙහි උපන්හෙයින් රජ්ජුරුවන් විසින් කියා එවනලද අස්න සැලතොකලේය. රජහුට අසුන් මාත්‍රයක්වත් කියා එන තෙණෙකු නැති හෙයින් රජ්ජුරුවෝ නැවතත් අනික් අමාත්‍යයෙක් කැඳවා දහසක් පුරුෂයන් හා සමග මගුල් වෙස් ගන්වා පෙරසේම උගන්වා යවිවාහුය. ඒ අමාත්‍යයාද, බණ අසා රහත්ව සඟිරිවරින් එහි හික්ෂුභාවයෙන් මහණවිය. මෙසේ ගිය ගිය උන් පෙරලා නො එන හෙයින් නවවාරයක නව මහඅමාත්‍යයකු නව දහසක් පිරිස් දී පෙරසේම යවිවාහුය. මෙසේ ගිය ගිය ඇමතියෝ සහ පිරිවරින් රහත්ව එහිහික්ෂුභාවයෙන් මහණව අසුන් තබා සසුන් වැද සුව විඳිනි. නැවත රජ්ජුරුවෝ බුදුන් හා එකදු උපන් කාළුදායි නම් අගඇමතියානන් කැඳවා "පුත කාළුදායිනි, තොප හා එක කෙළිමඩුල්ලෙහි වැඩුනාවූ තොප හා ඉතා යහළු වූ මපුතනුවන් සිඛාඊකුමාරයන් තෙපි දහසක්දෙනා හා සමග මගුල් වෙසින් ගොස් මා ඇස දක්වාලියහේ දැ?යි විවාළාහුය. කාළුදායි කියන්නේ 'මහරජානෙනි, මම ගියෙම් නම් නුඹ පුතනුවන් ඇස දක්වාලම්. බල එකෙක් ඇත; බුදුන් දිටුවිටම බුදුන් කෙරේ මහණවෙම්, මහණවන්නට අවසර ලදින් නම් දන්ම යෙමි" කිවුය. රජ්ජුරුවෝ කියන්නාහු "පුත තෙපි මහණවේව'යි; නොවේව'යි; මපුතනුවන් ඇස දක්වාලිය පුනම් මට නොකළ උපකාරයක් නැතැයි"යි කිහ. ඉක්බිත්තෙන් කාළුදායි නම් අමාත්‍යයානෝ රජ්ජුරුවන් වැඳ සමූහගණ දහසක් ඇමතියන් හා මගුල් වෙසින් ගොස් පිරිස් කෙළවර සිට බණ අසා රහත්ව එහි හික්ෂුභාවයෙන් මහණවූහ. ඒ උදායි සථවිරයන් වහන්සේ එතනට පැමිණ පැවිදි ලත් සත් අවු දවසක් ඉක්ම ගිය කල මැදින් දින මැදිපොහොය සම්ප්‍රාප්ත විය. එදවස්හි උන්වහන්සේ සිතන සේක් 'දැන් හේමන්තකාලය පැමිණියේය. එහෙයින් දසබලධාරී වූ බුදුන්ගේ ඤාතිසංග්‍රහයට කල්වන්නේයයි දැන භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ පසඟපිහිටුවා වැඳ ශාස්තෘන් වහන්සේට අභිමුඛව දෙහොත් මුදුන් දී හිඳ ගමන වර්ණනා කරණ සේක්:-

"අඛාදිනෝ,දුනි දුමා නදනෙන, එලෙතනෝ ජදනංචිප්පහාය
තෙ අච්චිමතෙනා'ව පභාසයන්ති සමයෝ මහාවීර භගීරථානං"

*මේ ආදී ගාථා සැටකින් වාගීවර්ණනා කළ කල්හි බුදුරජාණන් වහන්සේ* "කිමෙක් ද? උදායිය, කවකාරණයකින් ගමනවර්ණනා කරන්නෙහි දැ?"යි විවාරාවදාළ කල්හි උදායි සථවිරයන් වහන්සේ දන්වනසේක් "සවාම්දරු වූ බුදුරජාණන් වහන්ස, දැන් සුඛොදන රජ්ජුරුවෝ ක්‍රුඹවහන්සේ දක්නා කැමැතිව මා ඇතුළු වූ දසදහසක් අමාත්‍යයන් දසවාරයෙක් දූත මෙහෙවර

පිණිස ම එවා තව දක්වාත් දැකගත නොහී දුකින් පෙළෙමින් හිඳිති. එනෙයින් සුඛොදන රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති හැම බන්ධුසමාගමයට අනුග්‍රහ කොට කිඹුල්වත්පුර නුවරට වැඩ වදුලමනා කාලය''යි ආරාධනා කළසේක එවේලෙහි සවාමිදරුවෝ ''යහපත උදායිය, මම බන්ධුසංග්‍රහයට යෙමි. එබැවින් ගම්කවත් පුරා නික්මෙන සේ භික්ෂුසඞ්ඝයාට තෝම කියා රැස්කරව''යි වදුළ කල්හි උත්වනන්සේ බුදුන් වදුළ බස් මුදුණෙන් පිළි ගෙණ එකෙණෙහි එපවත් භික්ෂුසඞ්ඝයාට දන්වා අඟ මඟඔ දෙරටින් මහණව රහත් වූ දස දහසක්දෙනා වහන්සේ හා කිඹුල්වත් නුවරින් රජ මෙහෙවර නිසා අවුත් මහණව රහත් වූ දසදහසක්දෙනා වහන්සේ ය'යි; මෙසේ විසිදහසක් පමණ මහරහතන් පිරිවරා රජගහ නුවරින් නික්ම රජගහනුවර පටන් කිඹුල්වත දක්වා සැටයොදුන් මාගීය සැටදවසකින් යෙමි; සිතා දවස යොදනක තැන් මහත් ආශ්චර්‍ය්‍ය අපරිමිත බුඩවිලාස යෙන් වඩින්ව පවත්ගත් සේක. ඒ දැක කාළුදායි මහතෙරුන් වහන්සේ බුදුන් නික්මුණු බව රජ්ජුරුවන්ට දන්වමිසි සිතා ආකාශයෙන් වැඩ රජගෙයි පෙණී හිය සේක. එකල්හි සුඛොදන රජ්ජුරුවෝ ඒ මහතෙරුන් වහන්සේ දැක පස්වණක් ප්‍රීතියෙන් පිණා ගොස් පෙරමඟට දිවගොස් තෙරුන්වහන්සේ අතින් පාත්‍රය ගෙණ මහත් අනඤ්ඤ ආසනයක වඩා හිඳුවා ආ හිය තොරතුරු ගැණ පිළිසඳර කථා කොට තමන්ට පිළියෙළ කළ රාජ භොජනයෙන් පාත්‍රය පුරා තෙරුන් වහන්සේට පිළිගැන්වූ සේක.

ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ ආසනයෙන් නැගිට වඩිනාකාර දැන්වූකල්හි රජතෙම 'සවාමීනි, වැඩහිඳ දන් වළඳ වදුළමැනවැ''යි ආරාධනා කෙළේය. තෙරුන් වහන්සේ ''මහරජ, බුදුන් සමීපයට ගොස් වළඳන්නෙමි'යි කීවේය. 'සවාමීනි, දැන්වනාහි මපුතනුවෝ කොතැන්හි වැඩ වාසයකරන්නාහු දැ''යි ඇසූ කල්හි තෙරුන් වහන්සේ වදුරණසේක් මහරජ, බුදුහු තොප දක්නා පිණිස විසිදහසක් භික්ෂූන් පිරිවරා වඩිනසේකැ''යි දැන්වූ කල්හි සුඛොදන රජතෙම ඉතා සතුටුව මෙසේ කීවේය. 'සවාමීනි, මේ ආහාරය නුඹවහන්සේ වළඳ වදුළ මැනවැයි''යි කියා ආරාධනා කොට වළඳවා වළඳ ඉක්බිති ඒ පාත්‍රය සෝදා සුවඳසුන්නෙන් උලා පිරිසිදු කොට පෙර ගිහිව වසන කල අනුභව කොට පුරුදු අග්‍රවූ රාජභෝජනයෙන් පාත්‍රය පුරා 'මපුතනුවන් මා කෙරෙහි ප්‍රේම ඇතහොත් අතික් දුනයක් නොවළඳා මාගෙන්ම යවූ බත් වළඳන්ව වදුළ මැනවැ''යි කියාත් ආරාධනා කොට ''මේ නුවර වඩනාතාක් කල් අතුරුමඟට මගෙන් පිණ්ඩපාත දුනය නුඹවහන්සේම ගෙණ යන සේක්ව''යි කියා පාත්‍රය තෙරුන් වහන්සේ අතම තබා ලූහ. එකල්හි තෙරුන් වහන්සේ ''මෙතන පවත් ආකාශයෙන් මා යන නියාවත් පාත්‍රය බුදුන්ට පිළිගන්වන නියාවත් බුදුන් ඒ බත් වළඳන නියාවත් රජහට පෙනේව''යි අධිෂ්ඨාන කොට හුනස්නෙන් පැන නැගී හැමදෙනා බලබලා සිටියදී පාත්‍රය නීලභාඬගරාජයකු සේ පෙරටුව හැර අහසින්ම වැඩ පාත්‍රය ගෙණ බුදුන්ගේ ශ්‍රීඝසනයෙහි තබාලූසේක. බුදුරජ ද ඒ බත් ම වළඳුවදුළ සේක. මෙම ක්‍රමයෙන් තෙරුන් වහන්සේද, දවස දවස බත්පාත්‍රයක් බැගින් එසේම ගෙණ ගොස් පිළිගන්වන සේක. බුදුහු ඒ බත් වළඳ වදුරණ සේක් ම ය. වළඳ අන්තයෙහි එම තෙරුන් වහන්සේ

දවස දවස රජගෙට ගොස් 'අද බුදුරජතෙම මෙතෙක් තැන් ඉක්මවා වැඩි සේකැ''යි යනාදීන් අතෙකප්‍රකාර වූ බුදුගුණ ප්‍රතිසංයුක්ත ධාර්මික කථාවන් කියා කියා සුඛොදන රජ ප්‍රමුඛ වූ සියලු රජකුලය බුදුන් කෙරෙහි පැහැදවූ සේක.

ඒ කාරණයෙන් බුදුරජානන් වහන්සේ ''එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං භික්ඛුනං කුලූපසාදකානං යදිදං ඛාණ්ඩූ'' යනුවෙන් එතදග්ග පාළිය වදාරා මේ ශාසනයෙහි කුලයන් පහදවන්නාවූන් කෙරෙහි කාළුදායි තෙරුන් වහන්සේ අග තැන්පත් කොට තනතුරු දුන්සේක. මෙසේ සැට දවසක් වැඩ වෙසක් මස මැදිපොහෝදා බුදුරජානන්වහන්සේ කිඹුල්වත් පුරයට පැමිණිසේක. එකල්හි එක්ලක්ෂ සැටදහසක් පමණ වූ ශාක්‍යරජ දරුවෝ ''අපගේ තෑ උතුමානන් දක්නට ලදුම්හ''යි සතුටින් රැස්ව වසිදහසක් රහතුන් වහන්සේ හා අප භාග්‍යවතුන්වහන්සේට වසීමට විවේක ස්ථානයක්ම වියයුතු බැවින් ''කවර තම් තැනක් සුදුසු දෝ හෝ''යි පරීක්ෂා කරන්නාවූ ''නිග්‍රොධ තම් ශාක්‍යරජ්ජුරුවන්ගේ උයන ඉතා රම්‍යය. එහි විහාරයක් කළමනාය''යි මන්ත්‍රණය කොට ඒ හැම ශාක්‍යරජදරුවෝ අභිමානය බලතර හෙයින් මෙසේ වූ කතිකාවක් කළාහුය. ''සිද්ධාර්ථකුමාරයෝ තමන් බුදුබව මිස අප අපගේ බාලමලනුවෝය. බැනුනුවෝය. මුණුබුරා ණෝය. එහෙයින් හැමදෙනම වඳින්ට නොහැකිවම්හ. සෙසු ලෝකයෙහි මහළු රජදරුවෝද දැන් උන් වඳින්මය. මිනිසුන් තබා දෙවියෝ දක්වාත් උන් වඳින්මය. එසේ ඇතිකල අපි නොවැඳ සිටිය හොත් ලොව මහත් අයසකුදු උපදනේය. අනෝ! මෙයට අපි කුමක් කරමෝදැයි කතිකා කරන් නාහුය. ඔවුන් අතුරෙන් සමහර කෙණෙක් කියන්නාහු ''අපි මෙයට උපායක් දනුම්හ. අපගේ සියළු ම ලදරුකුමාරයන් ඉදිරියෙහි සිටුවාඹ හු හැම වඳනාකල්හි අපි ද වඳින්නවුන් මෙන් ඔවුන්ගේ පිටිපස ලස්ව ම හිඳගණුම්හ. එවිට මේ අපගේ සිදුරු කිසිවෙක් නොදක්නේය''යි කිවුල. ඒ අසා හැම ශාක්‍යරජදරුවෝම සමාධිව ''මේ උපාය අතෙකෙක්හට නොහඟවා රැක්ක යුතුය''යි සම්මතකොට ගෙණ බුදුන් වඩනා මග යොදුනක් පමණ තැන් අලංකෘත කරවා වඩනව පෙරගමන් කරන්නාහු සියළු අලංකාර යෙන් ශොභමාන වූ සොළොස් ඇවිරිදි සිටුකුමාරයන් හා සිටුකුමාරිකාවන් ද එසේ ම සොළොස් ඇවිරිදි ශාක්‍යකුමරුවන් හා ශාක්‍ය කුමාරිකාවන් ද පන්සියය පන්සියය බැගින් සුවඳමල් ධජපතාකාදී නානාවිධ පූජාභාණ්ඩ ගත් අත් ඇතිව පෙළින් පෙළ ගත සේ සලස්වා, තුමූ හැමදෙන නිග්‍රොධශාක්‍ය යන්ගේ උයන්හි සියලු ප්‍රාසාද කූටාගාර මණ්ඩපශාලා රාත්‍රිසථාන දිවාසථා නාදීන් සමලංකෘතා කොට විහාරය කරවා සිවුදෑගද සම්මිශ්‍ර නීලවණී ගොමය යෙන් උලා ගදපස්මල් විසුරුවා සුදුවියන් බඳවා සුවඳ මල්දම් ආදියෙන් අලංකෘත කොට ඒ උයනද ශක්‍රයාගේ නන්දනොද්‍යානය සේ සරහා නිමිකල්හි ඒ හැම රජදරුවෝ තමන්ගේ පිරිවර සමඟ බුදුන් වඩනා පෙරමගට ගොස් සම්බුදුරජානන් වහන්සේ වැඩම කරවා ගෙණ නිග්‍රොධාරාමයට පැමිණ, සරහා පිළියෙළ කරණලද ඒ විහාරය පිළිගන්වූවානුය. ලොකසවාමි වූ බුදුරජානන් වහන්සේ එහි විසිදහසක් රහතන් වහන්සේ පිරිවරා බුඩාසන මස්තකයෙහි වැඩ උන් සේක.

ඒ දැක බුදුගුණ නොදත් අභිමානයෙන් ඒ හැම ශාක්‍ය රජදරුවෝ ලදරු කුමරුවන් ලඟට කැඳවා ''දරුවෙනි, තෙපි අපට පෙරට සිට සිද්ධාර්ථ කුමාරයන් වැඩිමවා, අපි තොප හැමට පසුවලා නොහඟවා වඳුම්හ. මේ වග කාටත් නොදන්වව''යි උගන්වාලූහ. එබස් අසා බුදුන්ට බාල වූ රජ කුමරුවෝ පෙරටුව සිට බුදුන් වැඳ මනළු නැයන්ට අවකාශ නොදීම දහස් ගණනෙක් ඉදිරිපිට සිටගත්හ. ඉක්බිතිව 'සුද්ධොදන රජ්ජුරුවන් ප්‍රමුඛ මනළු නැයෝ තමන් වහන්සේ නොවැඳ උන්නෙයින් පස් පෑ දිස්නා නෙත්‍ර උන්මීලනය කොට සකුණිගණයා බලා ඔවුන්ගේ අදහස් දැන මොවුන් මොහ යෙන් වැඩිමහළු හෙයිනුත් බුදුබල නොදත් හෙයිනුත් මා නොවඳනාහුය. පුළු බුදුවරයෝ නැයන්ගෙන් කෙසේ වැඳුම් ලද්දාහුද''යි බලනුවෝ ''ලොව අද්භූත වූ බුදුබල ප්‍රකාශ කොට යමක ප්‍රාතිහාර්‍ය දක්වා මූළුලොව විස්මය පත් කොට නැයන්ගෙන් වැඳුම් ලද්දාහු ය''යි දැන ''ඒ මාගේ වංශවාරිත්‍රය කිරීමෙන් නැයන්ගෙන් වැඳුම් ලබම්''යි සිතා වදුරා; අනිඤ්ජපාදක චතුර්ථ්‍යාන යට සමවැද දසදහසක් සක්වළ පුළුවක්‍රවාලයෙහි පවන් පශ්චිම චක්‍රවාලය දක්වා අනිශයින් ශොභමාන වූ රුවන් සක්මනක් මවා අහස් කුසට පැන නැගී ඝනරත්මෙරක් සේ සවණක් රැසින් දිලිහි දිලිහි ඒ රුවන් සක්මනට නැගී තමන් වහන්සේට අභිමානයෙන් නොවැඳහුන් නැයන්ගේ හිස්මුදුනෙහි පය පස් වගුරුවන්නා සේ එහි සක්මන් කරන්ට පවන් ගෙණ ශරීරයෙහි ඒ ඒ තැනින් ගිනිකඳ දියකඳ හරින්වා පටන්ගත් සේක. මෙහි විස්තර වනාහි මහා පූජාවලියෙන්ද, ශ්‍රී සඞ්ඝමිත්‍රවාද සංග්‍රහයෙන්ද බලා දැනගත යුත්තේයි.

මෙසේ මාගේ සවාමිදරුවෝ ''තමන් නොවඳුම්හ''යි මන්කළ සකුණිගණයා මධ්‍යයෙහි ආකාශයට පැන නැගී ඒ රුවන් සක්මනේදී මහත්වූ යමකප්‍රාතිහාර්‍ය දක්වා දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ ආරාධනාවෙන් බුද්ධවංශය, අනාගත වංශය, යන දෙශනා කොට නිමවා නැයන්ගේ මන්බිඳ ආකාශයෙන් බස්නා පුකුණුදක්සේ බැස පළමුව වැඩ උන් බුබාඝන ඕස්තකයෙහි වැඩඋන් සේක. ඒ ආශ්චර්‍යය දුටු සුඩොදන රජ්ජුරුවෝ පුතනුවන් වහන්සේගේ ශ්‍රී පාද මූලයට ගොස් සැලකළ සේක. ''මම නුඹවහන්සේ උපන්දා කාලදෙවල තම් සෘෂින්ගේ තලල් මැද නුඹගේ තෙල සිරිපතුල් දෙක පෙණ්ගියද, ප්‍රාතිහාර්‍ය දැක සතුටුව, එමදා මේ පතුල් දෙක නලල්මැද තබා වැන්දෙමි. ඒ මාගේ පළමුවෙනි වැඳීමය. නවද නුඹ පස්මැසි කල වප්මගුල් කරණදා දඹගස මූලදී කළාවූ ප්‍රාතිහාර්‍ය දැක සතුටුව එමදාත් මේ ශ්‍රීපතුල් දෙක වැන්දෙමි. ඒ මාගේ දෙවෙනි වැඳීමය. අද මා වැනි සතකු තබා දිව්‍යබ්‍රහ්මයනුත් නුදුටු නො ඇසූ විරූ ප්‍රාතිහාර්‍ය දැක සතුටුව බුදුන්ගේ ශ්‍රීපාදෙක හිස්මුදුනේ තබා ගෙණ මේ තුන්වැනි වැඳීමය''යි කියා කියා ඒ සුඩොදන රජ්ජුරුවෝ සිටගත නොහී මූලින් සිඳ හෙලූ කනක රුපයක් සේ බුදුන්ගේ පාපිට වැඳ පෙරළී හියහ. රජ්ජුරුවන් වැඳිකළ එක්ලක්ෂ සැට දහසක් ශාක්‍යරජ දරුවෝ වැඳ පෙරළී හියහ. එක රජෙකුත් බුදුන් නොවැඳ සිටීමට සමර්ථනොවූයේය. එකෙණෙහි ශක්‍රදෙවෙන්ද්‍රයෝ පොකුරු වැස්සක් වස්වා පූජාකළහ. ඒ පොකුරු වැස්සෙහි තඹවන් දිය පොළොවෙහි දිවෙයි. එයින් තෙමෙනු කැමැත්තෝ

තෙමෙනි. නොතෙමෙනු කැමැත්තෝ නොතෙමෙති. ඒ ආශ්චර්‍යය දැක විසිදහසක් භික්ෂූහු "බුදුන්ගේ බන්ධුසමාගමයෙහි වට පොකුරුවැස්සක මහිමයක් බලව"යි සතුතිපූජා කළහේක.

සාමිදරුවෝ ඒ අනෝත්පත්තියෙහි "මහණෙනි, දැන් මතු නොවෙයි, පෙරත් මාගේ බන්ධුසමාගමයෙහි පොකුරුවැසි වටුයේ ම වේදැ"යි වදාරා දහසක් ගාථාවෙන් ප්‍රතිමණ්ඩිතවූ මහාවෙස්සන්තර ජාතකය ගෙණහැර දක්වා ධර්මදේශනා කොට වදාළහේක. එවේලෙහි බොහෝ ප්‍රාණීහු සොවාන් ආදී මාර්ගඵලයට පැමිණියාහ ඉක්බිත්තෙන් ශාක්‍ය රජදරුවෝ බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට බුදුන්ට ස්තුතිකොට හියාහුය. ඔවුන් අතුරෙන් එක රජෙක්වෙව සි රාජාමාත්‍යයෙක් වෙව සි බුදුන් සෙට දවසට පවරාගිය කෙනෙක් නැත්තාහුය. සාමිදරුවෝ එදා රෑ නිග්‍රොධාරාමයෙහි දවස් යවා අරුණෝද්ගමන වේලෙහි මහා කරුණාසමාපත්තියෙන් නැගිට සුරක්ත වූ දෙපට අඳනා සිවුරු හැඳ මතුපිට පටිය බැඳ නිග්‍රොධඵලසම්වණ්වූ සුගත් මහ පවුල්සඟළ පෙරවා පාත්‍රය අතින් ගෙණ විසිදහසක් මහරහතුන් පිරිවරා අනන්තාපරිමාණ ප්‍රාතිහාර්‍යය දක්වා දක්වා ගෙපිළිවෙළින් පිඬුසිඟන්නට පවත්ගත්හේක. එකල්හි ආරාධනා කිරීමය. පාත්‍රය ගැණීමය යනාදී ව්‍යවහාර දන්නන් නැතිහෙයින් හැම මනුෂ්‍යයෝම බුදුන් දැක විස්මය පත්ව බල බලාම සිටිති. බත් සැන්දක් ගෙණ එතසේත් නොදනිති. ඒ වේලෙහි දෙමහල් තුන්මහල් පස්මහල් සත්මහල් මහාප්‍රාසාදවල බිසෝවරුන් හා කුලස්ත්‍රී සමූහයෝ සීමාදුරුකවුළුවලින් බලන්නට පවත්ගත් නාහ. එකෙණෙහි රාහුල කුමාරයානත් වහන්සේට මුවු වූ යශොධරාදේවි 'බුදුහු දෙර දෙර පිඬුසිහිති"යයි අසා සිඩාර්ථ කුමාරයෝ පෙර මෙම නුවර රථයකට පැනනැඟී සූසැවක් ආභරණ පැලඳ රුවන් රැසින් දිළිහෙන අතසීවූ වොටුන්නක් හිස පැලඳ ලක්ෂයක් අගනා මුතුහරක් උරමඬල පුරා ගෙණ ලක්ෂ ගණන් ඇමැති තළුපිරිස් පිරිවරාගෙණ ශක්‍රදේවෙන්ද්‍රලීලාවෙන් රාජ්‍යශ්‍රී විඳ ඇවිද්දහුය. ඒ මාගේ සස්‍රාමිදරුවානෝ කෙස්වැටි දැලිරැවුලු කපා ශරීරය වසා රත්පවුලක් පෙරව මැටිපාත්‍රයක් අතින් ගෙණ මෙම නුවරම මෙම ජාතියෙහි දෙර දෙර සිඟමින් සිටියෝල, උන් මහණවන්ට ගියදම මා තොමැරී ජීවත්වූ හෙයින් මෙබඳු ලාමකවූ කණව අම්හිරිවූ සිතව අමතොඥවූ හදවත හුණුකරන්නාවූ තෙපුලක්ඇසීම්. කිමෙක්දෝහෝ, ඒ සිඩාර්ථ කුමාරයන් දුටු සම් කෙණෙක් උන්ගේ මහත්වූ ආනුභාවම කියති. උන්ගේ සිඟමනුත් ඉතාම රිසියේ'යි කියති. ඒ වෙය උන්ව ඔබ්දෝ නොනොබ්දෝ, අද මා බැලුව මැනවැ"යි සිතා සත්බුමුපායෙහි සිංහපඤ්ජරයෙහි දෙරහැර කර දිගුකොට බලන්නී, බුදුන්ගේ දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජනයෙන් යුක්තවූ සියලහින් දිවෙන බුදුරැස්කඳින් දිලිහි දිලිහී විසිදහසක් රහතුන් පිරිවරා සිහාවඩනාවූ බුදුරජානන් වහන්සේ දැක දෙහොත් මුදුනේ තබාගෙණ තුන්යලක් සාධුකාරදී ප්‍රීතීන් පිණා මත්ව "අහෝ! සිඩාර්ථ කුමාරයෙනි, එදා මැදිසම් රෑ මා වැනි පක්ෂපාත සන්‍රියකුටත් නොකියා රාහුලයන් වැනි එක්වන් ප්‍රතනුකෙනෙකුන් දැක උන් අතගා සිඹ සතහාගත්

නොපියා සොරාම එකලාව පලාගියේ මෙසේවූ ආශ්චර්‍යවත් ගමනකටද පෙර නුඹගේ එශ්වර්‍ය රාජ්‍යයට වඩා දැන් නුඹගේ සිහන රාජ්‍යයම මට ඉතා රිසිය''යි කීය;-

''සිනිඛ නීල මුදුකුංචිත කෙසෝ - සුරියනිම්මලතලාහිලලාටෝ
දන්තනුඛග මුදුකායතනාසෝ-රංසිජාල විතතෝ නරසීහෝ''

යනාදීන් තරසින ගාථා අටකින් බුදුන්ගේ රූප වර්ණිතා කොට සුඩොදන රජ්ජුරුවන් කරා පැමිණ වැඳ ''සාමීනි, සත් අවුරුද්දකින් මේ නුවරට ආ නුඹ පුතනුවන් සිඩාර්‍ථකුමාරයන්ට එක දවසකුත් නොසිහා ඔත් දීලිය නොහෙන් නේද? දැන් ඔහු දෙරින් දෙර පිඩුසිඟමින් සිටියෝය. නුඹසේවූ දරුවන්ට දැඩි කෙණෙක් නැත. නුඹ ගෙයි හිඳ කුමක් කරන්නෙහිද''යි යනාදීන් මයිල් රජ හට දෙඩූහ එබස් ඇසූ රජ්ජුරුවෝ කඳුළු පිරුණු ඇස් ඇතිව ඉතා මහත්වූ ලජ්ජා ඇතිව බුදුන් කරා දිවගොස් වැඳ ''සාමීන් වහන්ස මට මේසා මහත් පරිභවයෙක් කුමක් නිසා කොට වදළසේක්ද? අද මුළු දඹදිව සියලු සෙනග ආවේ ඒ නමුදු පැන් නොවකා සුවඳ හැල්සහලේ කිරිබත් දෙත් නමුදු පොහොසත්මි. මෙතෙක් රහතන් හා නුඹවහන්සේට ඔත් දීලිය නොහැකිය යි සිතුසේක් දැ''යි කීහ. එවේලෙහි සාමිදරුවෝ වදාරණ සේක් ''මහරජ, මේ මාගේ වංශයෙහි සිරිතක්මය''යි වදාළසේක. එබසට රජ්ජුරුවෝ කියනසේක් පුතනුවන්වහන්ස, නුඹවහන්සේගේ වංශය නම් මහාසම්මතාදී සුඩ සූර්‍යවංශය නම් වන්නේය. ඒ වංශයෙහි තුන්ලක්ෂ සූතිස්දහස්පන්සිය එකානුවක් මා ඇතුළුවූ රජුන් අතුරෙන් නුඹසේ සිහාකැ එක රජෙක් නැත. එනිසින් වංශවාරිත්‍ර යෙකැයි මාගේ වංශයට කුමක් නිසා පරිභව කරන්නේදැ''යි කීහ. එකෙණෙහි සාමිදරුවෝ ''මහරජ ඔබගේ මේ මහාසම්මත වංශය මාගේ දීපඩ්කරාදී බුඩ වංශයෙහි හැම බුදුහුම කුලගම ගෙපිළිවෙළින් සිහුවාහුමය''යි තමන්වහන්සේගේ සඩම් නමැති නිධානයෙන් ''උනතිංඨෙඛ නප්පමජ්ජෙය්‍ය'' යනාදී ගාථාව වදාළසේක. ඒ ගාථාවෙහි කෙළවර රජ්ජුරුවෝ සකෘදාගාමීව බුදුන් අතින් පාත්‍රය ගෙණ විසිදහසක් රහතන් හා බුදුන් රජගෙට වඩාගෙණ ගොස් මධුරවූ ආහාරයෙන් දන්වැළඳවූහ. වළඳා අන්හයෙහි යශොධරාව හැර සෙසු නාටකස්ත්‍රීන් දිව අවුත් බුදුන් වැඳ එකත්පස්ව සිටිකල්හි, සුඩොදන රජ්ජුරුවෝ යෙහෙළියන්ව ''පුතණඩ, පෙපින් බුදුන් දැක වැඳ ශොක සංහිදුවා ගණුව''යි කියා යවූහ.

එකල්හි යශොධරාදේවි සිතනුයේ ''සිඩාර්‍ථකුමාරයෝ ඉතාදැඩිය මට නොකියා තපසට ගියහ. උන් මා කෙරෙහි සැබෑගුණයෙක් ඇතිසේක් නම් ඔහු මාගේ ගෙට එති. ආකල වඳිනෙම්වේදැ''යි කියා නොගියහ. සුඩොදන රජ්ජුරුවෝ එපවත් බුදුන්ට සැලකළ කල්හි බුදුහු බුඩාසනයෙන් නැගිට ''මහරජානෙනි, මම යශොධරාදේවීන්ගේ ගෙට යෙමි. ඔබ පාත්‍රය ගණුව''යි රජ්ජුරුවන් අතට පාත්‍රය දී රජ්ජුරුවන් පළමුකොටලා තමන් වහන්සේ සැරියුත් මුගලන් දෙනම හා සමග පස්සෙහි වඩනාසේක් ''මහණෙනි, රාගාදී කෙලෙස් මුනුදු පිනා ගොඩ දැක සිටියෙමි. යශොධරාව එසේ නොවේ''යි ඇසිත් සේ වැඳ ශොක නිවාගන්නාතුරු කිසිවෙක් නොවළක්වා''යි වදාරා

දේවීන්ගේ ශ්‍රියහත් ගබඩාවට වැඩ පණවනලද බුඩාසනයෙහි වැඩඋන්සේක. යශොධරාදේවී "මුන්වහන්සේ ලොවුතුරා බුදුහුවේදැ"යි සිහි එලවාගතනොහී බුදුන්ගේ ශ්‍රීපාදය අල්වාගෙන හඬ හඬා ශොකාසන්හිදුවා විලි ඇතිව මා කෙළේ කිමෙක්දෝනෝ"යි භය ඇතිව එකත්පස්හි හුන්සේක ඉක්බිත්තෙන් සුඛොදන රජ්ජුරුවෝ කියතසේක් මාගේ යෙහෙළනියෝ මහත්වූ ගුණ ඇතිය. ඉතාසුශික්ෂිතයහ. නුඹවහන්සේ සවහස්තයෙන් හිසකෙස්වැටිය කපාපියහ"යි අසා තොමෝද අඳුන් රැසක් වැනිවූ තමන්ගේ හිසකේ වැටිය තමා සිය අතින්ම කපා දැම්ය. මෙසේම නුඹවහන්සේගේ සවභාවවූ එකිනෙක අසා කසීඃළු නොහැඳ කසාපිළි ම හැන්දය. මේ සත් අවුරුද්ද ඇතුළත රැ කත බතක රස තොදන්නීය. රන්බඳුන් හැර මැටිබඳුන්වල ම ආහාර අනුභව කළාය. උසසුන් මහඅසුන්වල නොසැතපීය. මල් සුවඳ තොපැ-ලැන්දීය. නුඹවහන්සේ මහණවූ බැවි අසා බොහෝ රජදරුවන් විසින් යශොධරාව අපි රකුම්හ"යි කියා බොහෝ පඬුරු එවූකල හිවිස්තා තබා තමාගෙන් තෙපුල් පමණකුත් නොදී නුඹවහන්සේට පක්ෂපාතවම විසූය. මේ ආදී නොයෙක් ගුණයෙන් යුත් මාගේ යෙහෙළනියෝ"යයි කීහ. එවේලෙහි සාමිදරු වදුරණසේක් "ඇ රහත්වන ජාතියෙහි තොප වැනි මයිල්රජක්හු විසින් කරණලද ආරක්ෂා ඇතිව මට පක්ෂපාතීව විසීම ආශ්චය්‍ය නොවෙයි. පෙර මා සඳකිඳුරුව උපන්කල මා කෙරෙහි ප්‍රේමයෙන් මාගේ ජීවිතදානය කෙළේත් මේ යශොධරාදේවීමය"යි කියා චන්දකින්නර ජාතකයෙන් බණ වදුළසේක. එවේලෙහි යශොධරාදේවීන්ගේ ශොකයද සංහිදුනේය. ඉක්බිත්තෙන් සාමිදරුවෝ බුඩාශනයෙන් නැගී නිග්‍රොධාරාමයට වැඩිසේක. දෙවනදා උදැසන තමන් වහන්සේගේ කුඩා මවුවූ මහාප්‍රජාපතී දේවීන්ගේ පුත් නන්දකුමාරයන්ගේ සිරිබඳන මගුල ගෙවදනා මගුල ජනපද කල්‍යාණී නම් රාජකුමාරිකාව සරණගෙණෙන මගුල යන තුන් මගුලම එකදා පැමිණි හෙයින් නන්දකුමාරයන්ගේ මගුල් මාලිගාවට වැඩ පණවතලද බුඩාසන මස්තකයෙහි වැඩහිඳ බණවදුරා නන්දකුමාරයන් මහණ කරවනු කැමතිව ඔහු අතට පාත්‍රය දී හුනස්නෙන් නැගී ඔහුසමග විහාරයට යනු කැමතිව නික්මුණුසේක.

එකල ජනපදකල්‍යාණී නන්දකුමාරයන් යන්තා දැක තමාවසන පායෙහි මතුමහල් තලයෙහි සීමැදුරු කවුළුයෙහි දෙරහැර පුන්සඳ මඩලක් වැනිවූ මුඛමණ්ඩලය සීමැදුරු කවුළුවෙන් පිටතට දමා කුමාරයාගේ මුහුණ බලා "හිමියානෙනි, ඔබ තොරදැ වනා එව"යි කිව. ඒ තෙපුල් අසා කුමාරයන්ගේ ලය කම්පිතව බුදුන් කෙරෙහි ආදරයෙන් "පාත්‍රය ගතමැනවැ"යි කියතොහී නොකමැතිව වෙහෙරවම ගියහ. ඉක්බිත්තෙන් නන්දකුමාරයන් ලඟට කැඳවා "නන්දය සත් දවසින් ලැබෙන චක්‍රවර්ති රාජ්‍යය හැර මා වැනියන් මහණවූ කල, තා වැනියන්ට ගිහිගෙයින් කවර ප්‍රයෝජනයක්ද? දැන්ම මහණවව"යි වදුළසේක. නන්දකුමාරයෝ මුවෙන් තොබැන ජනපදකල්‍යාණීය සිත සිතා සිටියේය. බුදුහු "නන්දයා මුවෙන් නොබැණ සිරිහෙයින් ඉවසුශේය"යි සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ ලවා ඔහු නොකැමතිව සිරියදීම හිසකෙස් බහවා මහණ කරවූසේක. මෙසේ බුදුරජානන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩි තුන්වෙනිදා නන්දකුමාරයන් මහණ කරවා සත්වෙනිදා විසිදහසක් රහතන් පිරිවරා සවණක් රැසින් දිලිහි දිලිහී

පියරජහුගේ ගෙට වළඳන්ට වැඩිසේක. එකල යශොදරාදේවී රාහුල කුමාරයන් ලඟට කැඳවා "පුත රාහුලයෙනි, තොපගේ පියානන් වහන්සේගේ සතරමහා නිධානයෙක් ඇත. උන්වහන්සේ මහණවූ හැන් පටන් ඒ සතරමහනිධානය කොතනක ඔවත් දන්නෝ නැත. තවද ඔබගේ චක්‍රවර්ති රාජ්‍යය හා සත්රුවන්කුත් ඇත. පියන් හිමි සැපත් දරුවන් හිමිවේදැ"යි කියලා "තෝ පියානන්කරාගොස් සතරමහ නිධානය හා චක්‍රවර්ති රාජ්‍යය ඉල්වාගණුව"යි කිහ. එකල රාහුල කුමාරයෝ මුතුන් රජ්ජුරුවන් අදුනන නුමුත් පියන් කවුරුද ඔවත් නොදන්නා හෙයින් "අම්ම, පියානෝ කවිරුදැ"යි ඇසූහ. යශොදරාදේවි, පුතනුවන් වඩාගෙණ සීමැදුරු කවුළුයෙහි දෙරහැර රාජවීථියෙහි කසුන් කඳක් සේ සඬණක් රැසින් දිලිහි දිලිනී වඩතා බුදුන් පුතනුවන්ට අත දිගුකර පෙන්නා "සක්‍යකුමාරවරෝ සුබුමාලෙ" යනාදීන් තරසීහගාථා උගන්වා සත්බුමුපායෙහි සිට මහලව බැස පුතනුවන් යවා නැවත්තුමූ උඩුමහලට නැගී සිංහපඤ්ජරයෙන් බලබලා නොපෙණී සිටියහ. එකල රාහුලකුමාරයෝ "බුදුන්පියාණෙය"යි අසා සතුටුව බුදුන්කරා ගොස් බුදුන්ගේ සිවුරුකොණ අල්වාගෙණ මුහුණබලා "මහණ මම නුඹගේ දරුවෙක් ල, නුඹ මාගේ පියෙක් ල, නුඹ මා උන් දවස් මා දුරදී දැක මා කරා නොවැද සොරාම ගියේ ල, එසේ නුඹ දැඩිවුවත් තොපගේ සතරමහ නිධානය හා චක්‍රවර්ති රාජ්‍යය මට දෙව"යි බොළඳ නෙපුල් කිහ. එකල බුදුහු රාහුල කුමාරයන්ගේ ඇඟිල්ල ශ්‍රීහස්තයෙන් අල්වාගෙණ "වරෝ දරුව, දුයාද දෙන්නමෝ වේදැ"යි රජගෙට වැඩ දන්වළඳ බුඩාසනයෙන් පැහැනැගී නික්මුණුසේක. රාහුල කුමාරයෝ බුදුන්ගේ සිවුරුකොණ ගැවී ගැවීම දුයාද ලොභයෙන් නික්මුනාහ. බුදුන් "රාහුලය, තෝ සිටුව"යි කියාත් නොවදරණසේක. රාහුල කුමාරයෝ නවතාලන කිසිකෙනෙක් නැත්තහුමය. එකල යශොධරාදේවි, බුදුන් හා කැවිව ගත පුතනුවන් සිංහපඤ්ජරයෙන් බලා දැක "කිමෙක්දෝහෝ නන්දකුමරුවා සේම මපුතනුවන් ගෙණ ගොස් මහණ කරවා ගන්නා උපායෙක්දෝනෝ දුයාද තබා මපුතනුවන් ලදින් නම් මැනවැ"යි සිත සිතා හඬමින් සිටියාහුය. බුදුහු රාහුල කුමාරයන් වෙහෙරට ගෙණ ගොස් සැරියුත් මහතෙරුන්වහන්සේ කැඳවා "ශාරිපුත්‍රය, මේ රාහුලයා මා අතින් දුයාදය ඉල්වයි, මෝහට නොහස්තා දුයාද සමපතක් දෙනු කැමැත්තෙමි. දෙනධනයක් මහෙන් ම දීලනු කැමැත්තෙමි මා බෝමැඬදී ලද්දාවූ සප්තවිධ වූ ආයර්‍යධනය මෝහට දුන මැනව. එසේ නෙයින් දැන්ම මොහු මහණ කරවාලව"යි වදාළසේක. එවේලෙහි රාහුල කුමාරයෝ උත්තරයක් නොකියාම මපියානන් වහන්සේ අද මට දුයාදයක් දෙනසේක් වනැ"යි සිත සිතා සතුටු සතුටුව ම සිටිසේක. දම්සෙනෙවී සැරියුත් මහතෙරුන් වහන්සේ රාහුල කුමාරයන්ගේ ඉස කෙස් බහවා මහණ කළසේක.

සුඩොදන රජ්ජුරුවෝ මුනුබුරානන් මහණ කළහ"යි අසා මහත්වූ ශොක ඇතිව බුදුන් කරා දිවගොස් "සම්මැදයන් වහන්ස, නුඹවහන්සේ සොරාම ගොස් මට නොකියා මහණවූසේක. මාගේ කුඩා පුතනුවන් නන්දකුමාරයනුත් උදුරාගෙණ මහණකොට ගත්සේක. මා ම වඩාගත් මාගේ මුණුබුරු රාහුල කුමාරයන් මහණ කළ සේ නොයෙදෙ"යි යනාදීන්

බුදුන්ව මැසිවිලි කීහ. එකල බුදුහු රජගව බණවදාරා ශොකසංහිදුවා වදාළකල්හි රජ්ජුරුවෝ ''මපුතනුවන් වහන්ස, අද මට උපන්නාවූ, දරුශොකය දරුවන් ඇති සියළු දෙමව්පියන්ට තොවනු කැමැත්තෙමි. එසේනෙයින් ''මවුපියන් අනුකොදන්වා මහණ කිරීම නොහැක්කේය''යි යන ශික්ෂාපදයකින් වරක් මට දුතමැනවැ''යි ආරාධතා කළහ. බුදුරජාණන් වහන්සේ එසේ ශික්ෂාපදයක් පණවා වදාරා රජහු සතුටු කොට සඳුදී රජගෙට යවා වදාළසේක.

මෙසේ බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩිය සත්වෙනිදා රාහුල කුමාරයන් මහණකරවා අටවැනිදා භික්ෂුසඞඝයා පිරිවරා රජගෙට වැඩ පණවනලදා බුඛාදන මස්තකයෙහි වැඩලන්සේක. එකල සුඛොදන රජ්ජුරුවෝ ''ස්වාමීනි, නුඹවහන්සේ දුෂ්කරක්‍රියා කරණ සමයෙහි එක්තරා දෙවතා දුවක් රාත්‍රියෙහි අවුදින් මට කියන්නී ''රජ්ජුරුවෙනි, තොප පුතනුවෝ සිඛාඝී කුමාරයෝ බත් තැනිව වියලී සක්මන් කෙළවර වැටී මළහ''යි ඇ කී බස් අසා මම මාගේ පුතනුවෝ ලොවුතුරා බුදුව මුත් නොමියෙනියයි කියෙමි''යි කීහ. බුදුහු ඒ නෙපුල් අසා ''මහරජ, දැන් මා බුදුවන ජාතියෙහි නොප රහත් වන ජාතියෙහි මා මළහ''යි කී බස් නොගිවිස්සේ ආශ්චර්‍යී නොවෙයි. පෙරත් නොගිවිස්සෝම වේදැ''යි මේ අපෝහාත්පත්‍ති කොට ගෙණ මහා ධම්පාල ජාතකයෙන් බණ වදාළසේක. එකල්හි රජ්ජුරුවෝ අනාගාමීඵලයෙහි පිහිටියාහ. සුද්ධොදන රජ්ජුරුවෝ වනාහි පළමුව බුදුහු සිඟා වැඩිදා විටියේදී වදාළ ගාථා දෙක අසා සෝවාන් සෙදගැම්වූහ. මේ ධම්පාල ජාතකය අසා අනගාමී වූහ. පසුව පිරිනිවන්පානදා දළපුඩුසේසතින් යනතේ වැදහෙව අමාමහ නිවන් දුටුවාහුය''යි දතයුතු.

මෙසේ බුදුරජාණන් වහන්සේ පිය මහරජාණන් තුන්මග තුන්ඵලයෙහි පිහිටුවා සඟපිරිස් පිරිවරා කිඹුල්වත් නුවඩින් නික්ම රජගහ නුවරට වැඩ සීතවනයෙහි වසතසේක්, එකල අනාථපිණ්ඩික නම් ගෘහපතිතෙමේ පන්සියයක් බඩු ගැල්ගෙණ රජගහනුවර තමන්ගේ යහළුවූ සිවානන්ගේ ගෙට පැමිණ බුදුන් ලොව පහළ වූ බව අසා ඉතා අළුයම දෙවතානුභාවයෙන් හැරෙණ ලද දොරටුවෙන් බුදුන් කරා පැමිණ බුදුන්ගෙන් බණ අසා ශ්‍රොතාපත්තිඵලයෙහි පිහිටා දෙවෙනිදා බුදුන් ප්‍රධාන මහාසඞඝයාට දන්දී සැවැත්නුවරට වඩිනා ලෙස බුදුන්ගෙන් ප්‍රතිඥ ගෙණ බුදුන් වැඳ අවසර ගෙණ තමන්ගේ නුවරට යන්නාවූ මාර්ගයෙහි පන්සාළිස් යොදනෙහි පන්සාළිස් ලක්ෂයක් ධන වියදම් කොට පන්සාළිස් වෙහෙරක් කරවා සැඹැන්නුවරඹ ගොස් බුදුන්ගේ වාසයට මහවෙහෙරක් කරවා ගන්නා පරිද්දෙන් නුවර භෑමතැනම බිම බලා ඇවිදින්නාහු ජෙත නම් රාජකුමාරයාගේ උයන ඉතා රම්‍යය''යි දැක උන් කරා ගොස් අටලොස් කෙළක් මසුරණින් ඒ උයන බිම වසා ඒ මිල දී බිම ගෙණ අනන්තාපරියන්ත බුදුන්ගේ ශාසනසථානවූ අවිජහිත භූමියෙහි බුදුන්ට විසිතුරුවූ ගඳකිළියක් හා සංඝාරාම රාත්‍රිසථාන දිවසථානාදී සියළු විහාර කම්මන්තාදී අවලොස් කෙළක් මසුරන් වියදම් කොට ම කළාහ. එකල ජෙත නම් රාජකුමාරයෝද සිටානන් කරන්නාවූ උදුරතර ඒ විහාර කම්මන්තයෙහි පැහැද සිටක්හුගේ

සම්පත් රජක්හට ඇයිද, 'ඔහු දුන් මිල ඔහුගේ විහාරයට පරිත්‍යාග කෙරෙමි' යිතා ඒ විහාරයෙහි සතර වාසල්කඩ එක්සිය විසිරියන් අයම්විතර ඇති සත්මහල් ප්‍රාසාද සහරක් වහසල්කොට බිමගත් අටලොස් කෙළක් මසුරන් එම වාසල් කම්මන්තයටම පරිත්‍යාග කළහ. මෙසේ සියළු විහාර කම්මන්තය නිමිකල්හි අනේපිඬු මහසිටානෝ බුදුන් පවරා යවූහ.

එකල්හි බුදුරජාණන් වහන්සේ සියළු භික්ෂු සඞ්ඝයා පිරිවරා යොදතෙන් යොදතෙහි සිටානන් විසින් කරවූ විහාරයන්හි සැතපී සැතපී පන්සාළිස් දවසකින් සිටානන් විසින් පෙරමගට එවතලද මහපෙරහරින් පූජා විඳ විඳ අපරි මෙය්‍ය වූ බුඩශ්‍රියෙන් යුක්තව දෙව්රම් වෙහෙරට වන්සේක. ඉක්බිත්තෙන් අනේපිඬු මහසිටානෝ බුදුන් දැක වැඳ "ස්වාමීනි, මේ වෙහෙර කෙසේ පුදා කෙරෙමිදැ"යි විවාළහ. සාම්දරුවෝ "මහසිට, මේ විහාරය මෙතනට පැමිණි නොපැමිණි සැම භික්ෂූන් උදෙසා සාංඝික කොට පූජාකරව'යි වදාළසේක. එකෙණෙහි අනේපිඬුමහසිටානෝ සඛණිංකාර-යෙන් පැන්ගෙණ "ඉදං ජේතවනවිහාරං ආගතා නාගතස්ස චාතුද්දිසස්ස බුද්ධපමුඛස්ස සඞ්ඝස්සදම්මි" යන මේ වාක්‍යය කියා 'සතරදිගින් වඩිනා බුදුපාමොක් මහසඟනට දින්මි"යි කියා බුදුන්ගේ ශ්‍රීහස්තයෙහි පැන්වත් කළහ. මෙසේ මාගේ සාම්දරුවූ බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර පිළිගෙණ එහි බුඩාසනමස්තකයෙහි වැඩහිඳ "සිතං උණ්හං පටිහන්ති" යනාදීන් ආවාස-දානයෙහි අනුසස් ඒ ශ්‍රුදත්ත නම් ගෘහපතියා ඇතුළු වූ පිරිසට දෙශනාකොට, බොහෝ සතුන් සසරින් මුදා වදාළසේක. විහාර පූජාවකළ දෙවෙනිදා පටන් අනේපිඬු මහසිටානෝ දවස දවස පූජා කරන්නාහු අටලොස් කෙළක් ධන දානපූජාව පිණිස වියදම්කොට නවමසකින් විහාර පූජාව අවසන් කළහ.

මෙසේ බිම ගත් මිලය, විහාරකර්මාන්තය කරවූ මිලය, දානපූජාවට කළ මිල"යි සූපස් කෙළක් ධන බුදුන් උදෙසා එක ජේතවනාරාමයටම වියදම් කළහ. මේ විහාරභූමිය නම් සෙයු සම්මුදයන් හැර මහාවිපඤ්ඤි නම් බුදුන්ට පුනබ්බසුමිතත නම් සිටානකෙනෙකු විසින්ද, සිඛී නම් බුදුන්ට සිරිවඩ්ඪක නම් සිටානකෙනෙකු විසින්ද, වෙස්සභූ නම් බුදුන්ට සමුච්ඡිත නම් සිටානකෙනෙකු විසින්ද, කකුසඳ නම් බුදුන්ට අජිත නම් සිටානකෙනෙකු විසින්ද, කොණාගමන නම් බුදුන්ට උගහ නම් සිටාණකෙනෙකු විසින්ද, කාශ්‍යප නම් බුදුන්ට මඞ්ගල නම් සිටානකෙනෙකු විසින්ද, මෙයට වඩා ශතවර සහස්‍ර වාරයක් උදුර ලෙස විහාරකර්මාන්තකොට පූජාකළාවූ අනන්තාපරියන්තවූ සම්බුදු වරයන් විසින් අත්නොහැර ආවාවූ පුණ්‍යස්ථානයක් වන්නේය. තවද තුන්ලෝ මුදුන්පත් අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බුදුවූ තැන් පටන් පිරිණිවන් පෑම දක්වා යම් යම් ස්ථානයක වාසය කළසේක්ද? ඒ සියල්ල මතු පහළවන්නාවූ පන්සිය පණස් ජාතක ධර්මයන්ගෙන් විස්තරව දැනගත යුතුයි.

මෙතෙකින් මේ බුඬවංශයෙහි ජාතකාට්ඨකථා නයින් සංක්ෂෙපයෙන් ගෙණහැර දක්වන ලද දූරෙනිදාන අවිදූරෙනිදාන කථා සහිතවූ ජේතවනාරාම පූජාකථාව දක්වා ප්‍රකාශිත වූ

## සන්තිකෙ නිදන කථාව නිමි.

## සත්තිසෙ නිදාන ද්විතීය භාගය

මේවදාළ අප භාග්‍යවත් වූ බුදු රජාණන් වහන්සේ ඉතුරු ජීවිතය පසු කළ පරිදි පූජාවලිය ශ්‍රී සඞ්ඝරාජාදී සංග්‍රහය ආදී ධර්මප්‍රකරණයන්හි විස්තරව ආයේ වී නමුදු ඒ සියල්ල මෙයට අන්තර්ගත කිරීමෙන් ග්‍රන්ථබාහුල්‍යවන බැවින් මෙතැන් සිට ඉතා සංක්ෂේපයෙන් දක්වනු ලැබේ.

මෙකපට ලක්ෂයක්වන කපින් මත්තෙහි ලොව පහළවූ සියුමනුරා නම් බුදුන් සමයෙහි එක් උපාසිකාවක් ඒ බුදුන් ප්‍රමුඛ මහසඟහට මහදන් පවත්වා ඒ බුදුන් පාමුල්හි වැද හෙව ''මතු නුඹවහන්සේ වැනි බුදුසෙනෙකුහට අග්‍ර උපස්ථායිකා වෙම්වා'යි ප්‍රාර්ථනා කොට එතැන්පටන් කප්ලක්ෂයක් මුළුල්ලෙහි දෙව්මිනිස් සැප අනුභව කොට අවුත් අප භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි හද්දියනුවර මෙණ්ඩක මහසිටානන්ගේ පුත් ධනඤ්ජය සිටානන් නිසා සුමනාදේවීන් කුස පිළිසිඳ දසඑකඩමස් ඇවැමෙන් මව්කුසින් බිහිවූ කල විශාඛාවෝ ය''යි නම් තැබූහ.

ඒ සිවුකුමාරිකාවෝ සත් ඇවිරිදිකල එම නුවරව බුදුන් වැඩි පවත් අසා බුදුන් දක්නා පිණිස පන්සියයක් කුමාරිකාවන් හා පෙරමගට ගොස් බුදුන් දැක වැඳ බණ අසා සඟපිරිවරින් සෝවාන් ඵලයෙහි පිහිටා එයින් මැතඟාගයෙහි සැවැත්නුවර මිගාරසිටානන්ගේ පුත් පූණ්වඩ්ධන කුමාරයන් හා විවාමගුල් බැඳුනයෙන් බැඳී තමන්සතු සම්පත්දෙනාව මිල්කොට එයින් සත්විසිකෙළක් ධනසම්පත් වියම්කොට සැවැත්නුවරම නැගෙනහිර දික්භාගයෙහි දහසක් ගබඩාවෙන් යුක්තව රන්තොරන් පලඳවා කරවනලද පුබ්බාරාම නම්වූ මහාවිහාරය අසුඹහස්වන් ඇතුළුවූ සතළිස් දහස් පන්සිය අසූඑක් නමක් පමණ බුදුපාමොක් මහසඟහට බුදුන් අතපැන් වත්සොට පූජාකළානුයමෙසේ මාගේ සවාමිදරුවූ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමය හා පූබ්බාරාමය පිළිගෙණ සිවළු දිව්‍ය බ්‍රහ්මාදීන් හා අඟ මගධ දෙරට වාසිවූ සහස්සොළොස් දෙරට වාසිවූද මිනිසුන්ට මෙලෝ පරලෝ වැඩ දක්වා අනුශාසනා කරමින් වැඩවසන සමයෙහි දඹදිව මිනිසුන් අතුරෙන් නොයෙක් සියගණන් පවිටු මිනිසුන් එකතුකොට ගෙණ ''අපි බුදුම්හ'' යි කියා කියා නොයෙක් විරූප දෘෂ්ටි ගෙණ ලාභ සත්කාර පිණිස ලොව මුලා කරමින් ඇවිදිනාවූ පූරණකාශ්‍යපය, මක්ඛලි ගොසාලය, අජිතකෙසකම්බලය, කකුදකාත්‍යායනය, සංජයබෙල්ලට්ඨි පුත්‍රය, නිගණ්ඨනාතපුත්‍රයයි'' කියා පන්සියයක් පිරිස් ඇති මිථ්‍යාදෘෂ්ටිහු සදෙනෙක් විසුවාහුය. ඔවුන් සදෙනා මැඩපැවැත්වීම පිණිස බුදුරජාණන්වහන්සේ බුදුවූ සත්වෙනි අවුරුද්දෙහි ඇසළමස මැදිපොහොයලත් උතුරැසළ නැකතින් අනන්තාපරියන්තවූ බුදුන්ගේ වංශානුගත චාරිත්‍රවූ පරිද්දෙන් පූජාවලියෙහි හා ලෙස යමාමනපෙළහර දක්වා ඒ ප්‍රාතිහාර්‍ය දැකීම පිණිස සතිස් යොදනෙක පැතිර සිට ශ්‍රමණ බ්‍රාහ්මණාදී මහපිරිස් බල බලා සිටියදී තුන් ඉයවරින් තව්තිසා භවනයට වැඩ ශක්‍රයාගේ පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වස් එළඹ එහි රැස්වූ මාතෘදේව්‍ය පුත්‍රයා ප්‍රමුඛවූ දහදහසක් සක්වළ සියළු බ්‍රහ්මයන්ට ''කුසලා ධම්මා අකුසලා ධම්මා

**අව්‍යාකතා ධම්මා**'' යනාදී සප්තප්‍රකරණයකින් යුක්තවූ **ධම්මසංගණිය** හෙළා මනුෂ්‍යගණනායෙන් තුන්මාසයක් මුළුල්ලෙහි අනිධර්මදේශනාව කොට **මාතෘ දිව්‍යපුත්‍රයා** ප්‍රධානකොට ඇති අසූකෙළ දනසක් **පමණ** දිව්‍යබ්‍රහ්මයන් නිවන් දැක්වූසේක. මෙසේ අප බුදුහු ශක්‍රයාගේ **පාණ්ඩුකම්බලශෛලාසනයෙහි** බුදුව සවෙනි වස්හි වස් වසා **මහාපවාරණයට** සත්දවසක් ඉතිරිව තිබියදී යටහි **යාමමහපෙළහර** දක්නට රැස්ව සිටි මහපිරිස බල බලා සිටියදීම **පාණ්ඩුකම්බල ශෛලාසනයෙන්** නැගිට මිනිස්ලොවට වඩිනු **කැමතිව** දෙදෙව්ලොවට **අධිපති ශක්‍රදෙවේන්ද්‍රයාට** ඒ බව **වදාළ කල්හි** ශක්‍රදෙවේන්ද්‍රතෙම සිතනුයේ ''දැන් මාගේ පුරයෙන් මනුෂ්‍යලොකයට වඩනා සම්බුදුන් වහන්සේගේ ගමන දිව්‍යානුභාවයෙන් මහත් පූජාපෙළහරින් වැඩුව මනාමය. එහෙයින් සත්ත්වයන් සිත්සේ දෙව්ලෝ බඹලෝ නිවන්පුර වැදීමට උතුම් සබ්බඤ්ඤුතඤාණ නැමති **සෝපානය** සැදූ මාගේ බුදුරජාණන් වහන්සේට ''මම**ද මේ** දෙව්ලොවට වඩනා **පරිද්දෙන් දිව්‍යසෝපානයක්** සදම්''යි සිතා මහමෙර මුදුනේ පටන් **සක්‍රපුර** දෙර දක්වා විසිතුරු මාණික්‍යමය වූ **සෝපානයක්** හා **එහි** දෙපස යවණීමය වූ **සෝපානචයක්** මැවූසේය.

**එවේලෙහි** මාගේ සහාම්දරුවූ **අප** භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බණ අස **අසා** සිටිය සියලු දිව්‍යබ්‍රහ්ම **සේනාවට** පින්දී ඉන්ද්‍රවාරයක් සේ සියළු මනුෂ්‍යයන්ට දෘශ්‍යමාන වූ **සෝපානත්‍රය** අතරෙන් දෙපසෙහි වූ **සෝපානචය** දිව්‍ය බ්‍රහ්මයන්ට හැර මධ්‍යයෙහිවූ **මාණික්‍යමය** සෝපානයෙන් දසදහසක් සක්වළ සියළු දිව්‍යබ්‍රහ්මයන් විසින් **කරණලද** පූජාවන් විඳ සකස්පුරදෙර සැම බුදුන් විසින් **අවිජහිත** ස්ථානවූ ගල්තලා මස්තකයට බැස එහි සතිස්යොදුනෙක රැස්ව සිටියාවූ මනුෂ්‍ය පිරිස හා **දිව්‍යබ්‍රහ්ම** පිරිසට **බණ** වදාරා බුදුන් ඇසූ **ප්‍රශ්නයන් විසඳූ** ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ සියළු ශ්‍රුතවතුන් කෙරෙහි **අගතැන්පත් කොට** වදාළසේක. මෙසේ **සත්ත්වානුකම්පා** ඇති බුදුරජාණන් **වහන්සේ** තුරිතාතුරිත වාරිකාවශයෙන් දෙව්ලොවද බඹලොවද හැසිරෙමින් **මහාකාශ්‍යප, අංගුලිමාල, ආලවක, මහාකප්පින, බහියදාරුචීරාදීන්** නිසා ඇසිල්ලකින් **තුන්ගවු එක්සිය** විසිගවු සාරම්භිය ගවු දෙදස් අවසියයක් ගවු වඩමින් ඒ උත්තමයන් නිවන් දැක්වූවා **පමණක්** නොව බුදුව වැඩඋන් **පන්සාළිස්** අවුරුද්දෙන් **පළමුවන** අවුරුද්ද බරණැස් නුවර ඉසිපතනාරාම-යෙහිද දෙවන තුන්වන සතරවන **අවුරුදු** පිළිවෙළින්ම රජගහනුවර **වෙළුවනාරාමයෙහිද, පස්වන** අවුරුද්ද වීශාලාමහනුවර කූටාගාරශාලාවෙහිද, සවන අවුරුද්ද කොසඹෑ නුවර කොසම්බිය **නම් ආරාමයෙහිද**, සත්වන අවුරුදු පාණ්ඩුකම්බල ශෛලාසනයෙහිද, **අටවන** අවුරුද්ද සුංසුමාරගිර **නම් නගරයෙහිද**, නවවන අවුරුද්ද කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහිද, දශවන අවුරුද්ද පාරිලෙය්‍ය නම් වනයෙහි සල්රුකමුලද, එකොළොස්වන අවුරුද්ද චේරංජානුවර නලේරු නම් **කොසඹගසමූල** ශාලාවෙකද, තෙළෙස්වන අවුරුද්ද වාලිය නම් පර්වතයෙහිද, තුදුස්වන **අවුරුදු** දෙව්රම්වෙහෙරද, පසළොස්වන **අවුරුද්ද නිග්‍රොධාරාමයෙහිද**, සොළොස්වන අවුරුද්ද **අලවිනුවරද**, සතළොස්වන **අවුරුද්ද** වෙළුවනාරාමයෙහිද, පිට පිට දශනව **අවුරුද්දක් නැවත** දෙව්රම්-වෙහෙරද, **එසේම** පිළිවෙළින් සාවුරුද්දක් පූර්වාරාමයෙහිද, වස්වසාවදාළසේක. **ඉතුරුතුන් අවුරුද්දෙහි අනිබද්ධ වාසව** ඒ ඒ තැන් වැඩ උන් **පන්සාළිස්**

අවුරුද්ද ඇතුළත දවස එකෙක දෙකෙක දසයෙක සියයෙක දහසෙක ලක්ෂයෙක කෝටියක යන ආදී වශයෙන් නොයෙක් දෙශනාවෙන් සසරින් ගොඩනැගූ සත්ත්වයන් හැර සුමනමාලාකාරාදී සුවිසි සමාගමයෙහි සුවිසි තෙනක වැඩහිඳ සුවිසිවාරයක වදාළාවූ සුවිසි ධම්දෙශනාවකින් සුවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් සකෘදාගාමී කොට සුවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් අනාගාමීකොට සුවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් රහත්කොට අමාමහ නිවන් දක්වා වදාළසේක.

මෙසේ ලෝවැඩ කළාවූ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමට දශමාසයක් කල් ඉතිරව තිබියදී යටකියනලද අනිබද්ධවාසවූ අන්තිම තුන් අවුරුද්ද අතුරෙන් කෙළවර පන්සාළිස් වන වස විශාලාමහනුවර සමීපයෙහිවූ බෙලුවගම වස්වසා වැඩ වාසයකරණලද. එහිදී උපන් ආබාධය සමාපත්ති බලයෙන් නවත්වා වස් අන්තයෙහි භික්ෂු සඞ්ඝයා පිරිවරා සැවැත්නුවර ජේතවනාරාමයට වැඩ එහිදී අග්‍රශ්‍රාවක සැරියුන් මුගලන් දෙදෙනා වහන්සේට පිරිනිවන්පෑමට අවසරදී ඒ දෙදෙනා වහන්සේගේ පරිනිර්වාණය පිළිබඳවූ ධම්දෙශනා කොට එයින් නික්ම භික්ෂු සඞ්ඝයා පිරිවරා නැවත විශාලාමහනුවරට ම වැඩ චාපාල චෛත්‍ය තම් විහාරයෙහිදී ආයුසංස්කාරය හැරියක්ෂණයෙහිම මහාපෘථිවිය කම්පාවිය.

එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බුදුන් සමීපයට පැමිණ එකත්පස්ව හිඳ "ස්වාමීන්වහන්ස, දැන් මේ භයානකවූ පෘථිවී කම්පාව වීමට කාරණා කවරේද? ඒ මව වදාළමැනවැ"යි ආරාධනාකළ කල්හි බුදුරජාණන් වහන්සේ "ආනන්දය, ධාතුක්ෂෝභයෙන්ද පින්වතුන්ගේ සෘද්ධානුභාවයෙන්ද මහබොසතාණන්ගේ මව්කුස ඉපදීමෙහිද එයින් නික්මීමෙහිද බුදුවීමෙහිද මඬගල ධම්දෙශනාවෙහිද සප්තඥවරයන්ගේ ආයුසංස්කාරය හැරීමෙහිද සප්තඥවරයන්ගේ පිරිනිවන්පෑමෙහිද"යි යන මේ අවකාරණයෙන් පෘථිවිය කම්පාවන්නේය'යි වදාළ කල්හි එපමණින් ආනන්දස්ථවිරයන් වහන්සේ "බුදුරජාණන් වහන්සේගේ ආයුසංස්කාර හැරීම වනැ'යි මහත් බෙදයට පැමිණ "ස්වාමීන් වහන්ස, ලොකානුකම්පාවෙන් ආයුෂ් කල්පය මුළුල්ලෙහි වැඩසිට වදාළමැනවැ"යි ආරාධනා කළසේක.

එවේලෙහි බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "ආනන්දය, දැන් රට කල්නොවෙය"යි ප්‍රතික්ෂෙපකොට එයින් නික්ම මහාවන කූටාගාර ශාලාවට වැඩ විශාලාමහනුවර වසන සියළු භික්ෂූන් එහි රැස්කරවා පණවන ලද බුබාසනමණ්ඩපය යෙහි වැඩහිඳ "හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි" යනාදියෙන් "මහණෙනි, සියලු සංස්කාරයෝම නස්නා සුභාවය ඇත්තාහ. එහෙයින් නොපි අප්‍රමාද වව්. මෙයින් තුන්මසක් ගියකල තථාගත පරිනිර්වාණය වන්නේය"යි වදාළසේක.

එකල්හි එහි රැස්වූ පෘථග්ජන භික්ෂූහු ඛඩන්ට වත්හ. ශ්‍රෝතාපන්නාදී ආර්යශ්‍රාවයන් වහන්සේලා ධර්මසංවේගයට පැමිණියාහුය. එදවස් සවස්වේලෙහි බුදුරජාණන්

වහන්සේ එයින් නික්ම ඒ නුවර වහසල් දොරටුවට පැමිණ එහි වැඩ සිට නාගාපලොකන වශයෙන් නුවරදෙස බලා ගන්ධමාලයට වැඩ එහිදී බොහෝ භික්ෂූන්ට සඛීනුශාසනා කොට එයින් නික්ම හස්තිග්‍රාමය, අම්බග්‍රාමය, ජම්බුග්‍රාමය යන ග්‍රාමයන් පිළිවෙළින් පසුකොට නැවත භොගග්‍රාමය යම් තැනෙක්හිද එතැන්හි ආනන්ද චෛත්‍යයෙහි කැමති කාලයක් වාසය කොට එයින් නික්ම පාවා නුවරට වැඩ එහදී චුන්ද නම් කම්මාර පුත්‍රයා විසින් බුදුපාමොක් මහසඟනට දෙනලද අන්තිම දානය වළඳා, ධ්‍යාන බලයෙන් නවතාගෙණ සිටි ආබාධය නැවත හටගත් කෙසින් සපිරිවරින් කුසිනාරා-නුවරට වඩනා සේක් අතරමගදී ඉදිරියට පැමිණි ආලාරකාලාමයන්ගේ ශ්‍රාවකවූ පුක්කුස නම් මල්ලපුත්‍රයාට බණවදාරා සරණසීලයෙහි පිහිටුවා ඔහු විසින් පුදනලද ශෘංගිවර්ණවූ වස්ත්‍රයුගලය පිළිගෙණ හැඳ පෙරව කුක්කුට නදියකරා පැමිණ ඒ ගඟින් ජලස්නානය කොට පැන් වළඳා එම ගඟ තීරයෙහි අඹ උයනට වැඩ එහි මදක් සැතපී හුන් සේක.

එකල්හි බුදුන්ගේ ශ්‍රීපාද සමීපයෙහි හුන් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වදාරණසේක් "ආනන්දය, තථාගතයන් වහන්සේ යම් පිණ්ඩපාතයක් වළඳා අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පානසේක්ද? මේ පිණ්ඩපාතයම සම සම වූ ඵලවිපාක ඇත්තාහ. සෙසු පිණ්ඩපාතයන්ට වඩා මහත්ඵල මහානිසංස වන්නාහුය"යි ධර්මදෙශනා කොට එයින් නැගිට පාවා නුවර පවත් කුසිනාරා නුවර දක්වා තුන්ගවු පමණ මාර්ගයෙහි සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය සවභාව දක්වනු පිණිස පස්විසිතෙනක වැඩහිඳ සෘද්ධියෙන් නොවැඩ මහත් උත්සාහයෙන් ශ්‍රීපාදයෙන්ම වැඩ හිරණ්ණවතී නම් ගඟින් එතරව කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උපවර්තන නම් සල්උයනට සන්ධ්‍යාකාලයෙහි ප්‍රවිෂ්ටව එහි යුග්මශාලා වෘක්ෂයන් අතුරෙහි උත්තරසීසකව පණවනලද සයන මඤ්චකයෙහි නැවත නැගී හොසිටින සංඥුවෙන් සිංහසෙය්‍යාවෙන් සැතපුනු සේක.

එකල්හි දසදහසක් සක්වළ සියලු දිව්‍ය බ්‍රහ්ම සමූහයෝ නොයෙක් දිව්‍යමයවූ සුගන්ධ කුසුමාදිය ගෙණ අහස්කුස පිරිසිට බුදුන්ගේ ශ්‍රී ශරීරයෙහි සුගන්ධ කුසුමාදිය වගුරුවාලීමෙන් බුබපූජා කළහ. මෙසේ අනන්තවූ පූජා විද විද යමක ශාලයන් අතුරෙහි වැදහොත් බුදුරජානන් වහන්සේ ඒ සියල්ල දැක වදාරා ආනන්දස්ථවිරයන් කැඳවා "ආනන්දය මෙසේ ආමිස පූජාපැවැත්වූ පමණකින්ම තථාගතවූ බුදුන් පිදුයේ නොවෙයි. යම්කිසි භික්ෂු භික්ෂුණී උපාසක උපාසකාදී කෙණෙක් ධර්මානුධර්ම ප්‍රති-පත්තියෙහි යෙදී වාසයකරද්ද? එසේ වූ තැනැත්තා උතුම් පූජාවෙන් මා පිදුයේ නම්වෙයි. ආනන්දය, මෙසේ උතුම් පූජාවෙන් පුදන්නාහු මාගේ ශාසන නමැති අහස් මුදුනෙහි බබලන පූර්ණ චන්ද්‍ර මණ්ඩලයක් මෙන් දෘශ්‍යමාන වන්නාහ"යි ප්‍රශංසාකොට දක්වා වදාළසේක.

එසමයෙහි බුදුන් දක්නා පිණිස එහි රැස්වූ දෙවසමූහයාගේ අදහස් දුටු බුදු-රජානන් වහන්සේ මහත් ශරීරයකින් යුක්තව පාංශුකූල චීවරයක් ධරා

තමන්වහන්සේ ඉදිරියෙහි පවත් සලසලා සිටි උපවාන සථවිරයන්වහන්සේ එතනින් ඉවත් කරවූ සේක. ඒ දැක අනඳ මහතෙරුන් වහන්සේ ''මේ උපවාන සථවිරතෙම ප්‍රථම බොධියෙහි පවත් උපසථාඅකව සාම්දරුවන් වහන්සේගේ සමීපයෙහිම හැසුරුණු කෙණෙක. දැන් කුමක් පිණිස තමන් වහන්සේගේ අභිමුඛයෙන් දුරුකළසේක්ද'' යි විචාළසේක. එකල්හි බුදුරජාතන් වහන්සේ වදාරණසේක් ''ආනන්දය, අද රාත්‍රියගේ පශ්චිම යාමයෙහි මාගේ පිරිනිවන් පෑම වත නිසා තථාගත වූ මා දක්නා පිණිස දසදහසක් සක්වළින් මේ සක්වළට රැස්වූ දෙවතාවෝ ඉතා බොහෝය. මේ සල්වනයට හාත්පස්හි දෙලොස් යොදුන් පමණ තැනින් මහෙශාක්‍ය දෙවතාවන් විසින් ස්පශී නුවූ ලොම් අගක් අන්තා පමණ තැන සියුම් වෙස් ගෙණ සැට සැත්තෑ ගණන් මහෙශාක්‍ය දෙවතාවෝ පිරී සිටිනාහ. මා අභිමුඛයෙහි සිටි උපවාන සථවිරතෙමේ සමීණාශ්‍රවයෙක්වූ හෙයින් ද පෙර කාශ්‍යප බුදුන්ගේ ධාතු චෛතයය රක්ෂාවෙහි නියුක්ත මහානුභාව සම්පන්න දෙවතාවෙක්වූ හෙයින්ද පෘථග්ජනයන්ගේ ශරීර විනිවිද දක්නා මූන්ගේ ශරීරය විනිවිද මා සින් සේ දකින්ට නුපුළුවන් දෙවසමූහයාට කරුණාවෙන් උපවාන සථවිරයන් මා අභිමුඛයෙන් ඉවත් කෙළෙම්. මාගේ පුත්‍රයාගේ අන් කිසි ප්‍රේෂයක් නැතැ''යි වදාළසේක. ඉක්බිත්තෙන් ආනන්ද සථවිරයන් වහන්සේ අසන්නසේක් ''සවාමීනි බුදුරජාතන්වහන්ස, සමීඥවරයන්ගේ පිරිනිවීමෙන් පසු ඒ තථාගත ශරීරයෙහි අපි කෙසේ පිළිපදිමෝදැ''යි ඇසුසේක. එවේලෙහි බුදුරජාතන්වහන්සේ ''ආනන්දය, චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ ශරීරයෙහි පිළිපදිනා පරිද්දෙන් තථාගත ශරීරයෙහි පිළිපැදිය යුතුය''යි කියා චෛත්‍යය කටයුතුවූ බුදු පසේබුදු මහරහත් ආදී උත්තම පුද්ගලයන්ගේ ධාතු හබා චෛත්‍යය කරණ ආකාරයද ඒ ඒ චෛත්‍යයන්ට මල්පහන් ආදියෙන් පූජාපවත්වන අයට ලැබෙන ආනිසංසයන්ද විස්තරකොට වදාළසේක.

ඉක්බිත්තෙන් ප්‍රථම යාමයෙහි එහි පැමිණි සැවිදහසක් පමණ මල්ල-රජදරුවන්ට අනිත්‍යතා ප්‍රතිසංයුක්තව ධම්දෙශනා කොට අවසර දී යවා නැවත බුදුන් දැකීමට පැමිණි සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට ධම්දෙශනා කොට පැවිදි උපසම්පදා කරවූසේක. පශ්චිම ශ්‍රාවකවූ හෙතෙම එම සල්උයතෙහි එක් පර්ශ්වයක සක්මන් කරමින් විදර්ශනා වඩා එකෙණෙහි සිවුපිළිසිඹියා හා සමග රහත්ඵලයට පැමිණ බුදුන් වැඳ වැඩහුන් සේක. එදසම මධ්‍යම යාමය අතික්‍රාන්තව පශ්චිමයාමය පැමිණි කල්හි භික්ෂුසඝයාට අවවාද කරණසේක් ''ආනන්දය, අභිසම්බොධියෙහි පටන් පිරිනිවන්පෑම දක්වා පන්සාළිස් අවුරුද්දක් ඇතුළත මා විසින් දෙසනලද අසූසාරදහස් ධම්ස්කන්ධය තොපට අනුශාසනා පිණිස සිවනාහුය. මම එකලාව පිරිනිවන් පාම්. මා පිරිණිවි කල්හි ඒ අසූසාර දහසක් ධම්ස්කන්ධයයෝ තොපට අනුශාසනා කරන්නාහුය''යි මෙසේ බුදුරජාතන් වහන්සේ බොහෝ කාරණයන් දක්වා වදාළසේක. ඉක්බිත්තෙන් සදේවලොක පූජ්‍ය පූජනීය වූ මාගේ බුදුරජාතන් වහන්සේ භික්ෂූන්ට අඩගා වදාරා ''හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වෝ වයධම්මා සඛාර අප්පමාදෙන සම්පාදෙථ:: යනු බුදුව වැඩසිටි පන්සාළිස් අවුරුද්ද මුළුල්ලෙහි වදාළ සියලු බුඩාවවාදයන් මේ එකම්

අපපමාද පදයෙහි ඇතුළත්කොට මේ අන්තිම බුඩවවනයෙන් මුළුලෝ වැසියන්ට අවවාදකොට තුෂ්ණීම්භූත වීමෙන් ප්‍රථමඛ්‍යානය, විතීයඛ්‍යානය, තෘතීයඛ්‍යානය, චතුර්ථඛ්‍යානය, ඝන රූපඛ්‍යාන සමාපත්ති සතරට පිළිවෙළින් සමවැද එයින් නැගිට ආකාශානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, අකිඤ්ඤඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය යන අරූපඛ්‍යාන සමාපත්ති සතරට සමවැදුනු සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ ආශ්වාස ප්‍රශ්වාස දෙක සංහිදුනු බැව් දුටු ආනන්ද ස්ථවිරයන් වහන්සේ ශෛක්ෂ්‍ය හෙයින් අනුරුඩ ස්ථවිරයන් වහන්සේගෙන් ''බුදුන් පිරිණිවිසේක්ද'' යි ඇසුසේක. එකල අනුරුද්ධස්ථවිරයන්වහන්සේ ''ඇවැත්වූ ආනන්ද ස්ථවිරය, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑසේක් නොවෙයි. සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්තියට සමවන්සේකැ'' යි දන්වූසේක. අනුරුද්ධස්ථවිරයන් වහන්සේ බුදුන් සේම ප්‍රථමඛ්‍යාන සමාපත්තියෙහි පවත් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය දක්වා සමවැද හිඟහෙයින් දුන් නිරෝධසමාපත්තිය තුළ චිත්තය පවතිමින් සිටිකල්හි කාලක්‍රියා කිරීමක් නැතැ'' යි දැනගත් හෙයින් ද මෙසේ වදාළසේක

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ප්‍රතිලෝම වශයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි පවත් ප්‍රථමඛ්‍යානය දක්වා සමවැද නැවත අනුලෝම වශයෙන් ප්‍රථමඛ්‍යානයෙහි පටන් චතුර්ථඛ්‍යානය දක්වා සමවැද නිවන්පුර වදනාවූ සඩමී චක්‍රවර්තිවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සුවිසි කෙළලක්ෂයක් පමණ සමවත් වැදීමෙන් සියළු සමාපත්ති සැප අනුභව කොට පැමිණ චතුර්ථධ්‍යානයෙන් නැගි ධ්‍යාන සමනන්තරව ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යක්ෂ කොට ඊට අනතුරුව භවාඞ්ගයට පැමිණ දුකඛ සත්‍ය ගත අව්‍යාකෘත චිත්තයෙන් එදවස් අරුණට පළමුව බලවපවිවූසකාලයෙහි පිරිනිවන් පා වදාළසේක.

මෙතෙකින් මේ බුද්ධවංශයෙහි හෙවත් බුදුන්ගේ ජීවිත කථාවෙහි
පූර්වාරාම පූජාකථාවෙහි පටන් පිරිනිවන් පෑම දක්වා
සඳහන් වූ සන්තිකෙ නිදානයෙහි

## දෙවෙනි භාගය නිමි.

---

මෙසේ දෙවාතිදෙවවූ අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ කල්හි මහපොළොව කම්පාවීම් ආදී අනන්තාපරිමාණ ආශ්චර්‍යාද්භූත ධර්මයෝ පහළවූහ. එකෙණෙහි සහම්පති මහාබ්‍රහ්මාදීන් වීසින් ''සබ්බෙව නික්ඛිපිස්සන්ති'' යනාදි ගාථාවෝ කියන ලදහ. තවද අනන්තාපරිමාණ දිව්‍යබ්‍රහ්මයන්වද සෝවාන් සකෘදගාමීන් හා පෘථග්ජන සත්ත්වයන්වද ඝකභාවයෙන් එහි සිටගත නොහැකිව නා නා විරූප වෙස් ගෙණ 'අහෝ! බුදුරජ අති ශීඝ්‍රව පිරිණිවි සේකැ'' යි යනාදී අදෝනා තෙපුල් කියමින් හඬන්නට වන්හ. එකල්හි තුන්ලොවට තැතු පහන් රැකක් වැනිවූ බුදුන්

පිරණ්ණිවි බැව් ඇසූ කුසිනාරා නුවර සැටදහසක් පමණ මල්ල රජදරුවන් හා ඒ නුවර බ්‍රාහ්මණ ගෘහපති ආදී සංඛ්‍යාපථ අතික්‍රාන්ත සේනාවෝ විපිළිසරයට පැමිණ සියළු පූජාවිධි සැදුගෙණ උපවත්තන නම් සල්උයනට පැමිණ සියළු පූජා පැවැත්වීමෙන් ම සත්දවසක් අතික්‍රාන්තකොට සත්වෙනි දින බුදුන්ගේ ශ්‍රී ශරීරය පන්සියයක් සළුපටිය, යන මෙයින් වෙලා, සුවඳතෙල් පිරූ රන්දෙණක වඩා අනික් රන්දෙණකින් වසා දිගින් එකසිය විසිරියන් පමණවූ උසින් සත්විසිරියන් ඇති සමීසුගඬ සම්මිශ්‍රවූ වඳන විතකයක් කරවා මහත් පෙරහරින් එයට වඩා ආදාහන කළාහ.

එකල්හි අප භාග්‍යවතුන් වහන්සේගේ අධිෂ්ඨාන ලෙස සතර දනන ධාතුවය, දෙ අකුධාතුය, ලලාට ධාතුශ'යි යන මේ සත්ධාතූහු විසිර නොගියා හුය. සෙසු ධාතුහු සර්ෂපප්‍රමාණයවද, කඩසහල් ප්‍රමාණයටද, මුන්පියලී ප්‍රමාණ යටද විසිර ගියාහුය. ඉක්බිත්තෙන් මල්ල රජදරුවෝ ධාතු සහිත රන්දෙණ මහත් පෙරහරින් වැඩමවා ගෙණවුන් නුවර මැද සන්ථාගාර ශාලාවෙහි මානැහි පසළීඩසාඝක තබා රැකවල් ලවා ධාතුපූජාවට පවත්ගත්තාහුය.

එවේලෙහි රජගහනුවරය, විශාලාමහනුවරය, කිඹුල්වත්පුර නුවරය, අල්ලකප්ප නුවරය, රාමගම් නුවරය, වෙඨදීප නුවරය, පාවෙය්‍යක නුවරය යන සත් රාජ්‍යයක රජුන් හා මහසෙනග දිව ගොස් කුසිනාරානුවර වට කොට ගෙණ 'ධාතු හෝ අපට දෙව, නැතහොත් යුඩකරන්නෙමු ය''යි ඔවුනොවුන් වහසි කිය කියා සිටියාහුය එබස් ඇසූ මල්ල රජදරුවෝ කියන්නාහු ''අපගේ යම් රුවනෙක් උපන්නේ නම් එය අපට ම හිමිය. තොපි කිරිබොතදු අපි මෝරු නුපුම්හ. අපි ධාතු නොදෙමිහ අපි ධාතු නොදෙම්හයි තෙපි සුඩකරණු කැමති නම් අපිත් කැමතිය''යි මන්වඩන්නා වහසි බස්කියා කලහවැඩුහ. ඉදින් යුඩවීනම් සත්නුවරක් තබා දඹදිව තෙසැට දහසක් රාජධානිවල සියළු රජසෙනඟ ආවේ වී නමුත් මල්ල රජහු ජය ගණිත්මය. එසමයෙහි දඹදිව සියළු රජදරුවන්ට ආචාර්‍යවූ ද්‍රෝණ නම් බමුණුතෙම ''භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ තැනදී කලහ කරගත්තාහු නම් සුදුසු නොවෙ''යි සිතා ද්‍රෝණ ගර්ජනා නම් අවවාදයක් කොට ඒ රජ දරුවන් සමගිකරවා ධාතු බෙදීමට පවත්ගෙණ රජදරුවන්ගේ කිසි ප්‍රමාද යක් බලා දකුණු දළදුවහන්සේ සොරකම් කොට හිස් වෙළුමෙහි සඟවා තුබූහ. ඒ බව දුටු ශක්‍රදෙවේන්ද්‍රතෙම ''දකුණු දළදුවහන්සේට පුදන්නට මොහු සුදුස්සෙක් නොවෙ''යි සිතා සියුම් අතක් මවා එයින් ගෙණ සත් රුවන් කරඬුවක දමා ශක්‍රපුරයට ගෙණ ගොස් සිළුමිණිසෑය නම් වූ ධාතු චෛත්‍යයට වඩා අද දක්වා පූජා කරන්නේය. ඉක්බිත්තෙන් බමුණුතෙම මගධ තැළියෙන් දෙතැළිය බැගින් ධාතු අටකොටසක් කොට රජදරුවන්ට බෙදූ දී පසුව ඉස අතගා බලා දකුණු දළදු නොදැක ශොකයෙන් ධාතු බෙදූ ලාස්ස රජදරුවන් ගෙන් ඉල්වා ගත්තේය. එකල පිප්ඵලි නුවර මෝරිය රජදරුවෝ බුදුන් පිරිණිවි බැව් අසා පසුව අවුත් ආදාහනස්ථානයෙන් අඟුරු ගෙණ ගියාහුය. මෙසේ ධාතු බෙදූ ඉක්බිත්තෙන් අජාසත් රජ්ජුරුවෝ තමන්ගේ ධාතු කොටස ගෙණ කුසිනාරා නුවර පටන් රජගහ නුවර දක්වා පස්විසියොදුන් මාගීයෙහි ඒ ඒ තැන සිට මහත් පුදසිරින් පවත්වා පවත්වා

මහත් පෙරහරින් සත් අවුරුදු සත්මස් සත්දවසකින් රජගහනුවරට පැමිණ එහි මහත්වූ දාගැබක් බඳවා ධාතු නිදන්කොට ශක්තිපමණින් පූජා කළාහුය.

සෙසු රජදරුවෝ තමන් ලත් ලත් ධාතු කොටස්සයන් යථාශක්තීන් පුදපුදා තම තමන්ගේ නුවරවලට ගෙණ ගොස් දාගැබ් බඳවා මහත්වූ පූජා කළාහුය. ද්‍රෝණ නම් බමුණුතෙම තමන් ලත් ලාස්ස ගෙණ තමන්ගේ නුවර කුම්භ නම් චෛත්‍යයක්ද පිප්ඵලි මෝරිය රජදරුවෝ තමන් ලත් අහුරු තබා අඞ්ගාර නම් චෛත්‍යයක්ද බඳවා යථාශක්තීන් පූජා කළාහුය.

මෙසේ දසථූපයන් පිහිටියාසින් පසු මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ ධාතුවලට වන අනතුරුවක් දැක අජාසත් මහරජහට දන්වූ කල්හි ඒ රජහු විසින් ධාතුනිධානයක් කළහ. එහි විභාගද ධර්මාශෝක මහරජ විසින් කළ අසූසාර දහසක් චෛත්‍යයන්ගේ විභාගද දෙවෙනි පැන්සල, දුටුගැමුණු ආදී නරෙන්ද්‍රයන් විසින් කළ මහාචෛත්‍ය ආදී සුවහස් ගණන් චෛත්‍ය යන්ගේ විභාගද ථූපවංශයෙහි ප්‍රකාශ ක්‍රමයෙන් බලා දැනගත යුතුසි.

මෙසේ ලෝවැඩ කළාවූ අප භාග්‍යවත් බුදුරජානන්වහන්සේගේ පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවෙධ යන ත්‍රිවිධ ශාසනය අනන්තඥාන වූවාසින් පසු බුදුන් පිරිණිවී පන්දහසක් වස් ඉකුත්ව ගියකල්හි වෙසක් මස පුර පසළොස්වක් දිනයෙහි මෙම ශ්‍රී ලඞ්කාද්වීපයෙහිවූ මහිඝඞ්ගනාදී සියළු චෛතයන්හි පිහිටි සියළු ධාතු ආකාශයට පැනනැඟී අහසින් වැඩ අනුරාධපුර යෙහි මහාචෛත්‍යයෙහි ධාතුගර්භයට වැඩ එහි පිහිටි සියළු ධාතූන් හා එයිනුත් අහසට පැන නැඟී එක හුයක අමුනාපු මුතුපෙළක් සේ ඔවු නොවුන් පසුපස්සෙහි නික්ම මණිනාග දිවයින දෙමයිල් නාරපුන්ගෙන් පිළිගෙණ අප බුදුන් වැඩහිඳ බණ දෙසූ මිණිපලඟ මතුයෙහි රැස්වනසේක. නැවත ඒ මිණිපලඟ හා සියළු ධාතු ආකාශයෙන් වැඩ අප බුදුන් මරසෙන් බිඳ බුදුවූ අපරාජිත භූමියට බස්නා සේක. එකෙණෙහි දිව්‍යලොක, බ්‍රහ්මලොක, නාග ලොකාදී සියලු තන්හි පිහිටි ධාතූන්වහන්සේද බෝමැඩ එම ධාතූන්වහන්සේ හා සමග එක්ව එයින් ජීවමාන බුදුන් සේ බුදුරුවක් නිර්මිත වෙයි. ඒ නිර්මිත බුදුහු එහි පැමිණ දසදහසක් සක්වළ සියළු දිව්‍යබ්‍රහ්මයන් බල බලා සිටියදී ආකාශයට පැනනැඟී යමකප්‍රාතිහාර්‍යයිකොට බෝමැඩට බැස වැඩහිඳින සේක. ඒ වේලෙහි ඒ ධාතුස්කන්ධයෙන් පැනනැඟි තෙජස්කන්ධය බඹලොව දක්වා පැනනැඟී එයින් ධාතු අනන්තඥානය වන සේක.

මෙතෙකින් මේ බුබවංශයෙහි පරිනිර්වාණ කථාව හා

## ධාතු පරිනිර්වාණ කථාව නිමි.

## පූර්ණක ලේඛන කථාව

මේසේ දක්වනලද ක්‍රම යෙන් බුඩතුමාට පැමිණ පිරිණිවිය වූ ධර්මාධිරාජ වූ අප භාග්‍යවත් බුදුරජානන්වහන්සේ බුදුව වැඩසිටි පන්සාළිස් අවුරුද්දක් ඇතුළත දිව්‍ය මනුෂ්‍යාදීන්ට අනුශාසනා කළාවූ යම් යම් ධර්මයෙක් ඇද්ද? ඒ ධර්මය මහා කාශ්‍යපස්ථවිරාදී සිවුපිළිඹියාපත් මහරහතුන් වහන්සේ විසින් ධර්මසංගායනා කොට චිතයසූත්‍රා නිධර්ම යයි කියා පිටක වශයෙන්ද නිකායාදී වශයෙන්ද බෙදා තුබුවාහුය.

අප බුදුන් පිරිනිවි වර්ෂයෙහි අජාසත් රජතුගෙන් සහාය ලදින් රජගහ නුවරදී කළ මේ පළමුවෙනි ධර්මසංගායනාවෙහිද, එසේම එකසිය දහවෙනි වර්ෂයෙහි යසඃස්ථවිරාදී සත්සියයක් මහරහතුන් විසින් විශාලාමහනුවරදී කළ දෙවෙනි ධර්මසංගායනාවෙහිද, දෙසිය දහඅටවෙනි වර්ෂයෙහි මොග්ගලි පුත්‍ර තිස්ස ස්ථවිර ප්‍රමුඛ දහසක් මහරතුන් විසින් පැලැඳප් නුවරදී කළ තුන්වෙනි ධර්ම සංගායනාවෙහිද, දෙසිය තිස්අටවෙනි වර්ෂයෙහි මෙම සිරිලක අනුරාධපුර නුවරදී අරිට්ඨතෙල්ල මහාමහින්දස්ථවිරාදී අටසැට නමක් පමණ ත්‍රිවිද්‍යාදී ගුණසම්පන්න මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ ප්‍රධානකොට දහසක් භික්ෂූසංඝයා වහන්සේ ථූපාරාම විහාරයට රැස්ව කළ සතරවෙනි ධර්මසංගායනාවෙහිද, විස්තර ශ්‍රීධර්මාවවාදසංග්‍රය ආදී ධර්මප්‍රකරණයන් බලා දැනගත යුතුයි.

මෙහි කියනලද සංගායනාවලට ඇතුළත් පිටකත්‍රයෙන් විනයපිටකය ට පාරාජික, පචිත්‍රි, සුලුවග, මහවග, පරිවාරපාළි කියා පොත් පසක්ද, සූත්‍රපිටකයට- සූතිස් සූත්‍රයකින් ප්‍රතිමණ්ඩිතවූ දීඝනිකායද, එක්සිය පණස් දෙකක් සූත්‍රයන්ගෙන් යුක්තවූ මජ්ඣිමනිකායද, සත්දහස් සත්සිය දෙසැටක් සූත්‍රයන්ගෙන් හෙබියාවූ සංයුත්තනිකායද, නවදහස් පන්සිය සත්පණසක් සූත්‍රයන්ගෙන් සම්පූර්ණතාවූ අංගුත්තරනිකායද, බුද්ධඝෝෂ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු, ප්‍රේතවත්ථු ථේරගාථා, ථේරීගාථා, ජාතක, නිද්දෙස, පටිසම්භිදා, අපදාන බුද්ධවංස, චරියාපිටක යන පසළොස් ප්‍රකරණයකින් යුක්තවූ බුද්දකනිකායද යන සඟිපසක්ද, අභිධම්මපිටකයට ධම්මසඞ්ගණි, විභඞ්ග, ධාතුකථා, පුග්ගල-පඤ්ඤත්ති, කථාවත්ථු, යමක පට්ඨාන යන සප්තප්‍රකරණයක්ද ඇතුළත් වන්නේය. මෙකියනලද පිටකත්‍රය ධර්මයන් අතුරෙන් විනයපිටකයෙහි ධර්මස්කන්ධයෝ විසිඑක්දහසෙක, සූත්‍රපිටකයෙහි ධර්මස්කන්ධයෝ විසිඑක් දහසක, අභිධම්මපිටකයෙහි ධර්මස්කන්ධයෝ සතළිස් දෙදහසෙකැ'යි කියා අසූහාර දහසක් ධර්මස්කන්ධයෝ වන්නාහුය.

මෙසේ දක්වනලද ත්‍රිපිටකධර්මයන් හා සිංහළ අර්ථකථාවන් ත්‍රිපිටක පර්‍යාප්තිධර සිවුපිළිසිඹියාපත් මහරහතුන් විසින් අක්ෂර පදදී කිසිවක් නොපිරිහෙලා මුඛපාඨ වශයෙන් පවත්වාගෙණ අවුත් බුදුන් පිරිනිවි හාරසිය තෙතිස්වන වර්ෂයෙහි මෙම ශ්‍රී ලංකාද්වීපයෙහි රජපැමිණි වලගම් අබා මහ

රජ තුමාගේ ආඥාර ඇතිව එබදු මනොහතම මහරහතුන් විසින් බොහෝ කාලයක් බුඩශාසනය පවත්නා පිණිස මාතලේ දනවිවෙහි අළුලෙන වැඩ හිඳ පොත්වල ලියා අවුරුද්දකින් කෙළවර කරණලදි. එතැන් පටන් පන්සිය සොළොස් වතියක් අතික්‍රාන්තව ගියකල දඹදිව මධ්‍යදේශයෙහි මහබෝමැඩට නුදුරුවූ එක්තරා ගමෙක උතුම්වූ බ්‍රාහ්මණකුලයක උපන් වේදත්‍රයයෙහි කෙළ පැමිණි බ්‍රාහ්මණොත්තම කෙණෙක් බුදුසස්නෙහි පැහැද ආයුෂ්මත් රෙවත තම් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ සමීපයෙහි මහණව සියලු පිටකත්‍රය ධර්මය ඉගෙණ බුඩඝොෂ යයි ප්‍රසිඩව දඹදිවින් මේ ලක්දිවට පැමිණ එකල අනුරාධපුරයෙහි මහාවිහාරවාසී නොයෙක් දහස්ගණන් භික්ෂූන් වහන්සේලාට ප්‍රධානවූ ආයුෂ්මත් සඞ්ඝපාල සථවිරයන් වහන්සේ කරා ගොස් සියළු සිංහල අටුවා කථාවද ථෙරවාදද අසා ධර්මස්වාමි වූ බුදුරජාතන් වහන්සේගේ අභිප්‍රාය මේ ය"යි නියම කොට දැන ඒ විහාරයෙහි සංඝසන්නි පාත කරවා මෙසේ දැන්වූ සේක. "ස්වාමීනි, මහාසංඝයාවහන්ස, පිටකත්‍රය අටුවාකරන්නට මට පොත් දෙවා වදාළ මැනව"යි යාච්ඤා කළසේක. එකල්හි භික්ෂුසංඝයා වහන්සේ ඔවුන්ගේ සම්මතී භාවය විමසනු පිණිස 'සීලෙ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ' යන ආදි ගාථාවයක් දී මෙයට අටුවා කළ මැනව. එයින් තොපගේ සම්මතීභාවය දැන පොත් දෙමිහ"යි කීසේක. එකල්හි ආයුෂ්මත් බුඩඝොෂ සථවිරයන් වහන්සේ පිටකත්‍රය පාළියද අටුවා කථාද, ඒ ගාථාවලියෙහි සංග්‍රහ කොට විශුඩිමාගී නම් ප්‍රකරණය කළ සේක. එකල්හි පෘථිවිය කම්පාවීම් ආදී බොහෝ ආශ්චර්‍යය අද්භූත ධර්මයෝ පහළ වූහ. ඒ දුටු මහාවිහාරවාසී භික්ෂුසංඝයා වහන්සේ සිංහල අටුවා හා පිටකත්‍රය පාළිපොත් දුන්සේක. එකල්හි ආයුෂ්මත් බුඩඝොෂ සාමීන් වහන්සේ මහානාම රජතුමාගෙන් ලබනලද ආඥාර ඇතුව මහාවිහාරයට දකුණ දිශාභාගයෙහි වූ ප්‍රධානඝර නම් වූ ප්‍රාසාදයෙහි වෙසෙමින් සිංහල භාෂාවෙන් තුබූ ත්‍රිවිධ අටුවා මූලභාෂාව වූ මාගධිකභාෂාවට පෙරලා පිටකත්‍රයට අටුවා කළසේක. ඒ සිංහල අටුවා නම් බුදුන්ගේ විස්තර දෙශනාවය. එය වතාහි සංගීති කථාවෙහි ආ නයින් කරණලද ත්‍රිවිධ සඞ්ගායනාවට ඇතුළත් වූ මෙම ශ්‍රී ලංකාද්වීපයෙහි සර්ව්ඥශාසනය ප්‍රථම කොට පිහිටවූ මහා මහින්ද තම් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ ප්‍රමුඛ මහරහතන් විසින් ලංකා ශාස්තාභිවෘඩිය පිණිස සිංහල භාෂාවෙන් කළාවූ මහා අට්ඨාවද කුරුන්දඅ ඝඨාව හා මහාපච්චරි අටුවාවද යන අටුවාත්‍රයෙන් කුරුන්දඨඝකථාව පාළි භාෂාවට පෙරලා කරණලද සත්විසි දහසක් පමණ ග්‍රන්ථයන්ගෙන් යුක්තවූ සමන්තපාසාදිකා නම්වූ විනය මහා අටුවාවද, ඊට අනතුරුව සිංහල භාෂාවෙන් තුබූ මහා අටුවාව පාළිභාෂාවට පෙරලා කරණලද සුමඞගලවිලාසිනී නම් වූ දීඝනිකාය අටුවාව ද එසේම පපඤ්චසූදනී නම් මැදුන්සඟි අටුවාවද සාරාර්ථප්‍රකාශිනී නම්වූ සංයුත්සඟි අටුවාවද, එසේම මනොරථපූරණී නම් වූ අංගුත්තරසඟි අටුවාවද, කුදුගොත් සඟියට ඇතුළත් පඤ්චදශ ප්‍රකරණයන්ට පිළිවෙළින්ම ඛඩ්ගමපජ්ජොතිකා නම් බුද්දකපාඨ අටුවාවද, ඉතිවුත්තක අටුවාවද, සූත්‍රනිපාත අටුවාවද, විමානවත්‍ථු අටුවාවද, ප්‍රෙතවත්‍ථු අටුවාවද, ථෙරගාථා අටුවාවද, ථෙරීගාථා අටුවාවද, නිද්දෙස අටුවාවද, ප්‍රතිසම්භිදා අටුවාවද, අපදාන අටුවාවද, බුඩවංශ අටුවාවද, චරියාපිටකරණ අටුවාවද, ඊට අනතුරුව මහාපච්චරි අටුවාකථාවද, පාළිභාෂාවට පෙරලා

**කරණලද අත්‍ථසාලිනී** නම් ධම්මසංගිනී අට්ඨකථාවද, **එසේම සම්මොහවිනොදනී නම්** විභඞ්ග ප්‍රකරණ අට්ඨකථාවද, **පරමත්‍ථදීපනී** නම් පඤ්චප්‍රකරණ අට්ඨකථාවද **යන** මේ ආදී ත්‍රිපිටක අත්‍ථකථාවන් යථොක්ත ක්‍රමයෙන් පාළියට නගා කළසේක. මෙසේ බුද්ධඝොෂ සාමීන් විසින් සියළු දෙශාන්තර වාසීන්ට හිත වැඩ පිණිස උපදවා ලූ පිටකත්‍රය අට්ඨකථාවන් කෙළවර වූ කල්හි මෙසේම මහා පෘථිවිය කම්පා විය. මේ පිටකත්‍රය අට්ඨකථා කිරීම එක් අවුරුද්දකින් නිම වූ සේක. ඉක්බිත්තෙන් ආයුෂ්මත් බුද්ධඝොෂ සථවිරයන් වහන්සේ ලක්දිව තමන් වහන්සේ විසින් කළමනා කටයුතු නිමවා මද්ධ්‍යමණ්ඩලයෙහි මහාබොධින් වහන්සේ වදිනා කැමැතිව භික්ෂුසංඝයා වැඳ අවසර ගෙණ නැවත දඹදිවට වැඩිසේක.[1]

මෙසේ අට්ඨකථා ලිවූ තැන් පටන් සසියඅසූතුන් වශයක් අතික්‍රාන්තව ගියකල්හි පරාක්‍රමබාහු නම් මහරජානන්ගේ සහාය ලදින් දිඹුලාගල වනවාසී **මහාකාශ්‍යපසථවිර** ප්‍රමුඛ පිටකත්‍රයධර බොහෝ භික්ෂූන් විසින් බුඛඝොෂ සාමීන් කළ අත්‍ථකථාවල ප්‍රකාශ නොවූ සැඟවී තුබූ ලීනාර්ථ **වණ්ණනා**වට පටන්ගෙණ පළමුකොට සමන්තපාසාදිකා නම් අට්ඨවාවට තිස් දහසක් ග්‍රන්ථයන් ගෙන් යුත් **සාරත්‍ථදීපනී නම්** වූ විතය ටීකාවද, සූත්‍රපිටකයෙහි සුමඞ්ගල විලාසිනී නම් අට්ඨවාවට **දුතිය සාරත්‍ථමංජුසා** නම් ටීකාව ද, සාරත්‍ථප්පකාසිනී නම් අට්ඨවාට **තතිය සාරත්‍ථමඤ්ජුසා** නම් ටීකාවද, මනොරථපූරණි නම් අට්ඨවාවට **චතුත්‍ථසාරත්‍ථමංජුසා** නම් ටීකාවද, අභිධම්මපිටකයෙහි අත්‍ථසාලිනී නම් අට්ඨවාවට **ප්‍රථම පරමත්‍ථප්‍රකාශිනී** නම් ටීකාවක්ද, අනුටීකාවක්ද, සම්මොහ විනොදනී නම් අට්ඨවාවට **දුතිය පරමත්‍ථප්‍රකාශිනී** නම් ටීකාවක්ද, අනුටීකාවක්ද, පරමත්‍ථදීපනී නම් අට්ඨවාවට **තතිය පරමත්‍ථප්‍රකාශිනී** නම් මූලටීකාවක්ද, අනුටීකාවක්ද කොට අවුරුද්දකින් නිමකළාහු ය. මෙහි දී ද පෘථිවිය කම්පාවිය.

මින්පසු ධම්මපාල **තෙරුන්** විසින් කරණලද **සාරත්‍ථමංජුසා** නම් විසුඬිමාගීටීකාව ද, අනුරුඬ **නම්** තෙරුන් විසින් කරණලද **අභිධම්මත්‍ථසංග්‍රහයෙහි** ලීනාර්ථයන් ප්‍රකාශ කොට ශාරීපුත්‍රසථවිරයන් වහන්සේගේ ශිෂ්‍ය සාමීන් විසින් කරණලද **අභිධම්මත්‍ථවිභාවිනී නම්** ටීකාවද, **ආනන්දතෙරුන්** විසින් කරණ ලද **සචචසංඛෙපය ද**, බෙම **නම්** තෙරුන් විසින් කරණලද බෙම නම් ප්‍රකරණයද, **කාත්‍යායන තෙරුන්** විසින් කරණලද **සංගහන්දි පවුනතික්කා** නම් ටීකාවද, එසේම **විමලබොධි** ටීකාවද, බුද්ධරක්ඛිත **තෙරුන්** විසින් කරණලද **ජිනාලඞ්කාරය ද**, **සචචසංඛෙප වර්ණනාවද**, එසේම **පරමත්‍ථවිනිශ්චය වර්ණනාවද**, ශාරීපුත්‍රසථවිරයන්ගේ ශිෂ්‍ය සාමීන් විසින් කරණලද **අත්‍ථසාලිනී නම්** සචචසංඛෙප වර්ණනාව හා තොයෙක් ක්ෂුද්‍රප්‍රකරණයන්ද, **කාත්‍යායන තෙරුන්** විසින් කරණලද **නෙත්ති-ප්‍රකරණයද**, ධම්මපාල **තෙරුන්** විසින් කරණලද ථෙරගාථා, ථෙරීගාථා,

අජ්ඣත්තකථා නම්වූ අපර ටීකාවද, එසේම පරමාත්ථදීපනී නම්වූ විමානවස්තු ප්‍රෙතවස්තු වර්ණනාවෘත්තද, ධම්මසිරි තෙරුන් විසින් කරණලද කුදුසික්ඛ, සංඝරක්ඛිත තෙරුන් විසින් කරණලද සුබොධාලංකාර, වෘත්තෝදය, කුදුසික්ඛ ටීකාවය, සම්බුද්ධගුණ වර්ණනාවය යන පොත් සතරද, බුද්ධදත්ත නම් තෙරුන් විසින් කරණලද විනයවිනිශ්චයද, බුද්ධනාම තෙරුන් විසින් කරණලද ඛංඩාවිකරණී ටීකාවද, සාගරමති නම් තෙරුන් විසින් කරණ ලද විනයසංග්‍රහයද, යන මේ ආදී පාළිභාෂාවෙන් කරණලද නොයෙක් ප්‍රකරණයන් ඇත්තේය

තවද බුද්ධදත්ත තෙරුන් විසින් මධුරාත්ථවිලාසිනියද, මහානාම තෙරුන් විසින් ප්‍රතිසම්භිදාත්ථ වර්ණනාවද, උපසේන තෙරුන් විසින් මහානිර්දෙසාත්ථ කථාවද, වජිරබුද්ධි තෙරුන් විසින් වජිරබුද්ධි ටීකාවද, චන්දගොමි විසින් විනයසංග්‍රහය හා අභිධානත්තර ටීකාවද, ශාරිපුත්‍ර තෙරුන් විසින් පංචිකා ප්‍රදීපටීකාවද, කාශ්‍යප තෙරුන් විසින් විමතිවිනොදනියද, රෙවත තෙරුන් විසින් විනයවිනිශ්චයටීකාවද බුද්ධනාග තෙරුන් විසින් විනයාත්ථ මංජුසාවද, වාචිස්සර තෙරුන් විසින් සීමාලංකාර සංග්‍රහයද, නීපෙමාලංකාර තෙරුන් විසින් විනයාලංකාරයද, ඤාණාභිවාස ධම්මසේනාපති සංඝරාජ තෙරුන් විසින් නෙත්තිටීකාව ආදී ප්‍රකරණයන්ද, ආනන්ද තෙරුන් විසින් අභිධම්මූලටීකාවද කාශ්‍යප තෙරුන් විසින් මොහවිච්ඡෙදනියද, විමලබුද්ධි තෙරුන් විසින් අභිධම්මාත්ථ සංග්‍රහ පුරාණ ටීකා යන මේ ආදී ප්‍රකරණයන්ද, වාචිස්සර සාමිපාදයන් විසින් සච්චසංඛෙප පුරාණ ටීකාවද, මහාබොධි තෙරුන් විසින් පරමාත්ථ විනිශ්චය නම් පුරාණ ටීකාවද, සුමංගල තෙරුන් විසින් අභිධම්මාවතාර, අභිධම්මාත්ථ සංග්‍රය යන පුස්තකචයට අභිනව ටීකාවක්ද, මහාස්වාමි තෙරුන් විසින් අභිනව නාමරූප පරිච්ඡෙදයද, මහා ශ්‍රාවකභූත කාත්‍යායන ක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් මහානිරුත්තිය ආදී නිරුත්තිප්‍රකරණයන්ද, ධම්මකිර්ති තෙරුන් විසින් බාලාවතාරයද, අඟඟවංසාචරිය තෙරුන් විසින් සද්දනීතියද, බුද්ධප්පිය තෙරුන් විසින් රූපසිද්ධියද අභිමද්දන පුර ඇමත්‍යයෙකු විසින් න්‍යාය ප්‍රදීප ටීකාවද, දාඨානාග තෙරුන් විසින් නිරුත්තිසාර මංජුසයද, විජිතාවි තෙරුන් විසින් කාත්‍යායන වර්ණනාවද, යමක තෙරුන් විසින් චූලනිරුත්තියද සබ්බගුණ තෙරුන් විසින් සද්දකලිකයද, රතනසිරි තෙරුන් විසින් සද්දත්ථවින්තාවද, ජප්පට තෙරුන් විසින් සංඛෙප වර්ණනාව හා සූත්‍රනිර්දෙශය ආදී ප්‍රකරණයන්ද, නාගිත තෙරුන් විසින් සද්දසාරත්ථ ජාලිනියාදී ප්‍රකරණයන්ද මොග්ගල්ලායන තෙරුන් විසින් මොග්ගල්ලායනය හා අභිධානප්පදීපිකාවද, පියදස්සි තෙරුන් විසින් පදසාධනයද, වනරතන තෙරුන් විසින් පයොග සිද්ධියද, තොටගමුවේ ශ්‍රී රාහුල සංඝරාජ තෙරුන් විසින් පදමඤ්ජරිවද, ධම්මකිර්ති තෙරුන් විසින් දාඨාවංශයද, උපතිස්ස තෙරුන් විසින් සමන්තකූට වර්ණනාව හා රසවාහිණියද කරතලද්දේය.

තවද මෙහි සඳහන් නුවුවාවූ ශබ්දශාස්ත්‍රඥ ධම්මිනඥ දත් පණ්ඩිත යන් විසින් කරණලද්දාවූ නොයෙක් ප්‍රකරණයෝ ඇත්තාහුය. මෙකියන ලද අර්ථ කථා ටීකා වෙය්‍යාකරණාදී පාළිපොත් හැර පරාක්‍රමබාහු නම්

නරපතීන් විසින් කරණලද විසුඛිමාගී සන්නයද, පූර්වෝක්ත චන්දගොමීන් විසින් කරණලද අභිඛම්මාවතාර සංග්‍රහ සන්නයද, පරාක්‍රම නම් අමාත්‍යොත්තමයන් විසින් සිංහල භාෂාවට නගනලද පන්සියපණස් ජාතක පොතද, තවත් ඒ ඒ කාලවලදී නොයෙක් පණ්ඩිතයන් විසින් හෙලු බසින් රචනා කොට ඇස්වූ පූජාවලිය, රත්නාවලිය, සඛීාලඛ්කාරය, බොඛිවංශය, සඛීරත්නාකරය, ප්‍රදීපිකා සාරජී සංග්‍රහ, ශ්‍රී සඛමෝවාද සංග්‍රහ ආදී ප්‍රකරණයෝද ඇත්තාහුය,

තවද ශ්‍රී සඛමෝවාද සංග්‍රහාදී ධම්ප්‍රකරණයන්හි ආ නයින් "බුදුඛඝෝෂ සාමීන් විසින් මේ මේ අටුවා කෙළේය"යි මීට ප්‍රථම දැක්වූයේ වී නමුත් කුදුගොත් සහියට ඇතුළත් පොත්වලින් සමහරකට කරණලද අර්ථවණීනාවෝ "ධම්මපාල තෙරුන් විසින් කරණලද්දේය"යි ඒ ඒ අර්ථකථාදීන්ගේ හා වෙනත් ධම්ප්‍රකරණයන්හි ප්‍රකාශ වන්නේය, එය පණ්ඩිතයන් විසින් විනිශ්චය කටයුතුයි.

මෙතෙකින් මේ බුඛවංශයෙහි ධම්සංගායනා
කථාවන් හා දෙශනාමය කථාදී

පූර්ණක ලේඛන කථාව නිමි.

# පන්සිය පණස්

# ජාතක පොත.

නමොතස්ස භගවතො අරහතො
සම්මා සම්බුධස්ස

---

## 1
## අපණ්ණක ජාතකය

ශාක්‍ය කුලනිලකවූ පරදුකඹ දුකබිහවූ කරුණානිධානවූ අසරණ සරණවූ සමන්තභද්‍රවූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මේ භද්‍රකල්පයට සාරාසඛ්‍ය කල්ප ලක්ෂයකින් යට සාරමණ්ඩ නම් කල්පයෙහි තණ්හඞ්කරය, මෙධඞ්කරය, සරණඞ්කරය, යි තුන් බුදුකෙනෙකුන් වහන්සේට ඉක්බිතිව උපන් තුන්ලොවට ඛෙමඞ්කර වූ මොහදුරට දිවාකරවූ ඹුළු සත්නව ඥානකිරණවූ පින්වත්තට සිවඞ්කර වූ මරසෙනඟට භයඞ්කරවූ දීපඞ්කර නම් සම්බුදුරජාණන් වහන්සේ බුදුව සියලු සත්ත්වයන් අම්මාමහ නිවන් දක්වමින් සුදසුන් විහාරයෙහි වාසය කරණ සමයෙහි රඹගම්නුවර වාසී මනුෂ්‍යයෝ සම්බුදුරජාණන් ප්‍රධානකොට භික්ෂුසඞ්ඝයා වහන්සේ පවරා සම්බුදුරජාණන් වඩනා මාගීය සරහන්නට වන්හ.

එසමයට අප මහබොධිසත්ත්වයෝ සුමේධ නම් තාපසව වාසයකරන්නාහු මං සකස්කොට තබන්නා වූ මනුෂ්‍යයන් දැක "මේ මාගීය කුමකට සරසවිදැ"යි විචාරා එපවත් දැන එසේ වී නම් මා සරහන නියාගෙන් භූම්ප්‍රදේශයක් දෙව"යි කීහ. එවිට මනුෂ්‍යයෝ. දෙන්නාහු දැදුරුව දියබොර ඇති භූම්ප්‍රදෙශයක් දී ලූහ, ඒ භූම්ප්‍රදෙශය සකස්කොට තනා නොනිමවන තුරු සාරලක්ෂණයක් නිමිත්තන් වහන්සේ පිරිවරා ඒ දීපංකර නම් සම්බුදුරජාණන් වහන්සේ වැඩිසේක.

ඒ සම්බුදුරජාණන් වහන්සේ දැක සුමේධ තාපසයෝ මඩ කලලෙහි අදුන්දිවි සම් අතුව බුදුබව පතා වැදහොත්නාහ. සම්බුදුරජාණන් වහන්සේ ඒ තාපසයන්ගේ ඉස්දෙර සිට "මහාපුරුෂයා කුමක් සිතා වැදහොත්තේ ද්‍යෝහෝ?"යි දිවසින් බලා සිතූ සිතිවිලි දැක "මහණෙනි, මේ පුරුෂයාතෝ මෙතනට සාරාසඛ්‍ය කල්පලක්ෂයකින් මත්තෙහි ගෞතම නම් බුදුවෙති"යි විවරණ පතුල් දෙවා වදාළසේක.

ඒ සුමේධ තාපසයෝත් ගාථා මාත්‍රයක් ඇසූ පමණින් නිවන් දකින්නව හෙතු සම්පත් ඇතිව තිබියදීත් ඒ හැර සංසාරයට වැද එතැන් පටන් දශපාරමිතාය, දශ උපපාරමිතාය, දශ පරමාර්ථ පාරමිතාය යන සමත්‍රිංශත් පාරමිතා ධර්මයන් හා අඞ්ගපරිත්‍යාගය, ජීවිතපරිත්‍යාගය යනාදීවූ පඤ්චමහාපරිත්‍යාගයන්,

හා ඉන් මෑත බුදුවූ කොණ්ඩඤ්ඤදී වූ තෙවිසි බුදුකෙනෙකුන් වහන්සේ අතින් ලබනලද විවරණශ්‍රී ද ඇතිව වෙස්සන්තරාත්මභාවයෙහි සිට සත්වරක් මහ පොළොව ගුගුරුවා මහදන් දී එයින් චුතව තුසිත භවනයෙහි ඉපිද බොහෝ කාලයක් එහි වැස දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන්ගේ ආරාධනාවෙන් පස් බැලුම් බලා ඇසළ පුර පසළොස්වක් ලත් උතුරුසළ නැකතින් මාතෘගර්භයෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කොට දසඑකඩ මසක් ඇවැමෙන් මාතෘගර්භයෙන් ප්‍රසූතව එකුන්තිස් අවුරුද්දක් රාජ්‍යය කොට තුන් පූජිතිමිත්‍රත දැක සසර කලකිරී සතර වැනිව දුටු මහණවේශය දැක ප්‍රව්‍රජ්‍යාවෙහි ආලය ඇතිව එදා රාත්‍රියෙහි ඡන්දක නම් අශ්වයා පිට නැගී දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන් පිරිවරා අනෝමා නම් ගංතෙරදී මුහුලස කපා ආකාශයට දමා මහාබ්‍රහ්මයා විසින් දෙන ලද අෂ්ටපරිස්කාර ධරා පැවිදිව සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කොට අජපාල නිග්‍රොධමූලයෙහිදී සුජාතාවන් දුන් ක්ෂීරපායාස වළඳා සල්වෙතෙහි දිවා විහරණය කොට සවස් වේලෙහි ජයශ්‍රීමහා බොධින්වහන්සේ කරා එමින් සිට අතර මගදී සොත්තිය නම් බමුණකු දුන් කුසතණ අටමිටක් ගෙණ ඇසතු බෝමුල්හි සලා ඉන් පැන තැංගාවූ තුදුස්රියන් වප්‍රාසනාරූඪව මාරපරාජය කොට අළුයම් වේලෙහි සියළු කෙලෙසුන් තසා බුදුව සත්සතියක් බොධිද්‍රැම සමීපයෙහි දවස් යවා අටවන සතියෙහිදී මහාබ්‍රහ්මයාගේ ආරාධනාවෙන් බරණැස්නුවර ඉසිපතන නම් විහාරයෙහිදී පස්වග මහහුන් වහන්සේ ප්‍රධානකොට ඇති බොහෝ දිව්‍යබ්‍රහ්මයන්ට ධම්මචක්කප්පවත්තන සූත්‍රදෙශනාව කොට බොහෝ සත්ත්වයන් අමා මහනිවන් දක්වා එතැන්පවත් වෙනෙය ජනයන් සංසාර සාගරයෙන් ගොඩ තගා වාසය කරණසේක්, ඒ ඒ මනුෂ්‍යයන් හා ඒ ඒ භික්ෂු භික්ෂුණීන්ගේ හා නොයෙක් ආපත්ති හා නොයෙක් දෘෂ්ටාන්තවලට හා නොයෙක් කථාන්තරවලට හා මේකී දෙයෙහි සංකා දුරුකරණු පිණිස දිව්‍යබ්‍රහ්ම මනුෂ්‍යාදීන්ට පින් පිණිස වදුරණලද පන්ඛියජාතකය ධම්දෙශනාව එළුවෙන් දක්වන්ට වුවමැන වැ''යි කියා පරාක්‍රම නම් ඇමති සත්පුරුෂයාගේ ආරාධනාවෙන් හා වීරසිංහ ප්‍රතිරාජ නම් අමාත්‍යෝත්තමයාගේ උත්සාහයෙන්ද අටුවාසාමීන් ලී ජාතක නිධාන තෙර වරදවා එළුවෙන් ලියූ ජාතකඤ්ච සත්පුරුෂවූ මනුෂ්‍යයන් විසින් කන් යොමා සිත් එලා ඇසිය යුතු:-

**ඒ කෙසේ ද? යත්,**

**ජි**නාගාවත් වූ නිලෝගුරු සම්‍යක් සම්බුදුරජාතන් වහන්සේ ජේතවන මහාවිහාරයෙහි දිව්‍යබ්‍රහ්ම ආර්‍යාර්ය්‍යාපථ සංඛ්‍යාත විහරණයන් අතුරෙන් එක්තරා විහරණයකින් දවස්යවනසේක්, අනේපිඬු මහසිටාන්ගේ යහලු වූ පන්සියයක් තීර්ථක ශ්‍රාවකයන් අරහයා මේ අපණ්ණක ජාතක ධම්දෙශනාව කොට වදාළසේක.

එක් දවසක් අනේපිඬුමහසිටාතෝ තමන්ගේ යහලු වූ පන්සියයක් තීර්ථක ශ්‍රාවකයන් කැඳවාගෙණ බොහෝ ගඳදුම්මල්පහන් හා ගිතෙල් මී උක් සකුරු හා සිවුරුපිළි ආදිය ගෙන්වා ගෙණ ජේතවනයට ගොස් බුදුරජාතන් වහන්සේට තමස්කාර කොට මල්සුවඳ ආදියෙන් පූජාකොට ගිතෙල් ආදීවූ බෙහෙත් බඳු හා සිවුරුපිළිද භික්ෂුසඞ්ඝයා වහන්සේට පිළිගන්වා ''න පච්ඡතෝ න පුරතෝ'' යනාදී සවැදැරුම් වූ නිෂද්‍යදෝෂ දුරුකොට එකත්පස්ව හුන්නා හුය. ඒ අන්‍ය තීර්ථක ශ්‍රාවකයෝ බුදුන්ට තමස්කාර කොට කොට බුදුන්ගේ පුන්

සඳ මඬලක් බඳුවූ සශ්‍රීක මුඛය හා දෙනිස් මනා පුරුෂලක්ෂණ අශීත්‍යනුව්‍යඤ්ජන බ්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් විරාජමානවූ බුඩශරීරයෙන් කරකැවී යුවල යුවල නික්මෙන්නාවූ ගණ බුඩරශ්මි බල බලා අනේපිඩු මහසිටාතන් සමීපයෙහි උන්නාහුය.

එකල්හි ඔවුන්ට බුදුහු රත්ගල් තලාවෙක ඉඳ සිංහනාද කරන්නාවූ අභීත කෙසර සිංහරාජයෙක් මෙන්ද, මෙඝ කාලයෙහි මහාවර්ෂාවක් වස්නා කලක් මෙන්ද, ආකාශ ගඩගාවක් බාහා කලක් මෙන්ද, රුවන්දමක් ගොතන් නාක්හුමෙන්ද, අෂ්ටාඩගයෙන් සමන්විත වූ ශ්‍රවණීය වූ මනොඥ වූ බ්‍රහ්ම ස්වරයෙන් නානානය නිපුණ විචිත්‍ර වූ මධුර වූ ධර්මදෙශනාව කොට වදාළසේක.

ඒ තීර්ථික ශ්‍රාවකයෝ බුදුන්ගේ ධර්ම අසා ප්‍රසන්නවූ සිත් ඇතිව නැගී සිට දශබලධාරීවූ බුදුන්ට තමස්කාර කොට තීර්ථිකලබ්ධිය හැර බුදුන්ගේ සරණ ගියහ. ඔහු එතැන්පටන් ඇමකලම අනේපිඩුමහසිටාතන් හා සමග සුවඳ මල් ආදිය ගෙණ විහාරයට ගොස් බණ අසති. දන්දෙති. සිල් රකෂා කෙරෙති. පෙහෙවස් වෙසෙති. ඉක්බිත්තෙන් බුදුහු සැවැත් නුවරින් රජගහ නුවරට වැඩිසේක. එකල්හි ඒ තීර්ථික ශ්‍රාවකයෝ බුදුන් රජගහ නුවරට වැඩිකල්හි බුදුන්ගේ සරණ හැර නැවත අන්‍ය තීර්ථිකයන්ගේ සරණ ගෙණ තමන්ගේ මූලසරණයෙහි ම පිහිටියාහ. බුදුරජාතන් වහන්සේත් සත් අවමසක් කල් යවා නැවත ජෙතවනයට වැඩිසේක. අනේපිඩු මහ සිටාතෝත් නැවත ඔවුන් කැඳවා ගෙණ බුදුන් සමීපයට ගොස් සුවඳ මල් ආදියෙන් පූජාකොට බුදුන්ට නමස්කාර කොට එකත්පස්ව හුන්නාහුය. ඒ තීර්ථික ශ්‍රාවකයෝත් බුදුන් වැඳ එකත්පස්ව උන්නාහුය. එකල්හි ඔවුන් බුදුරජාතන් වහන්සේ සැරිසරා වැඩිකල්හි ගන්නාලද සරණ හැර නැවත අන්‍ය තීර්ථිකයන්ගේ සරණ ගෙණ මූලස්ථානයෙහි පිහිටි බව අනේපිඩු මහසිටාතෝ බුදුන්ට දන්වූහ.

එකල්හි සම්බුදයන් වහන්සේ ප්‍රමාණාතික්‍රාන්තවූ කාලයෙහි අතරක් නැතිකොට පවත්වන ලද වාක් සුචරිතානුභාවයෙන් දිවසුවඳින් සුවඳ කැවූ කොයෙක් සුවඳින් පිරුණු රුවන් කරඬුවක් හරිණ කලක් පරිද්දෙන් මුඛ පද්මය විවෘත කොට මධුරස්වර විහිදුවමින් "සැබෑද ? උපාසක වරුණි, තෙපි රත්නත්‍රයෙහි සරණ හැර අන්‍ය තීර්ථිකයන්ගේ සරණ ගියහුදැ"යි විචාරා වදාළසේක. එකල්හි තමන් කළ කාරිය හඟවන්නට අසමර්ථ වූ ඔවුන් විසින් "සැබෑ, සවාමීනී"යි කීකල්හි, බුදුහු උපාසකවරුන්ට ආමන්ත්‍රණය කොට "එම්බා, උපාසකවරුණි, යම්හි අවීචිය හා මත්තෙන් භවාග්‍රය කෙළවර කොට සරසින් අනන්තාපරිමාණ සත්වලෝහි සීල සමාධිප්‍රඥා දී වූ ගුණයෙන් බුදුන් හා සම කෙණෙක් නැත. බුදුන්ට වඩා කෙණෙක්ම නැත. මෙසේ උත්තම ගුණයෙන් සමන්විත වූ රත්නත්‍රය සරණ ගිය උපාසක කෙණෙක් වේව යි උපාසිකා කෙණෙක් වේව යි නරකාදිවූ සතර අපායෙහි උපදිනාහු නොවෙති. අපායොත්පත්තියෙන් මිදී දිව්‍යලෝකයෙහි ඉපද මහාසම්පත් අනුභව කෙරෙති. එසේ නොයිත් නෙපි හැමදෙනා මේබඳු සරණ හැර අන්‍යතීර්ථික යන්ගේ සරණ යන්නවුන් විසින් කළසේ නපුරැ"යි වදාළසේක. තවද "උපාසකවරුණි, බුද්ධානුස්මෘතිං, ධම්මානුස්මෘතිං, සංඝානුස්මෘතිං කම්මස්සකතඤ්ච ශ්‍රොතාපත්ති මාගීය හා ශ්‍රෙතාපත්ති ඵලය දෙන්නේය. සකෘදාගාමී මාගීය හා

සකෘදාගාමී ඵලය දෙන්නේය. අනාගාමී මාගීය හා අනාගාමී ඵලය දෙන් නේය. අර්හත් මාගීය හා අර්හත් ඵලය දෙන්නේය''යි මේ ආදී වූ කාරණ යෙනුත් ධර්මදේශනා කොට ''මෙබඳු රත්නත්‍රය සරණ බිඳපු තොප විසින් නො කළමනා දෙයක් කරණලදැ''යි වදළසේක.

මෙසේ භාග්‍යවත්වූ ත්‍රිලෝගුරු බුදුරජානන්වහන්සේ අනෙකප්‍රකාර යෙන් උපාසකවරුන්ට අවවාදකොට 'උපාසකවරුණි, පළමුත් මනුෂ්‍යයෝ අසරණය සරණය යි විරුඬග්‍රහණය ගෙණ අමනුෂ්‍යයන් පරිගාහිතවූ කාන්තාර යෙහි යක්ෂයන්ට ගොදුරුව මහා විනාශයට පැමිණියෝය සරණය ම සරණ ය'යි ඒකාන්ත කොට අවිරුඬග්‍රහණය ගත්තාවූ මනුෂ්‍යයෝ ඒ කාන්තාරයෙහි සවාසප්‍රයට පැමිණියෝ වේදැ''යි වදරා මුවෙන් නො බැණ වැඩ උන්සේක. එකල්හි අනේපිඩු මහ සිටානෝ හුනස්නෙන් නැගී සිට බුදුන් වැඳ සතුති කොට දෙහොත් මුදුණෙහි තබා ''සවාමීනි, දැන් වූ කලී මේ උපාසකවරුන්ගේ උතුම්වූ රත්නත්‍රය සරණ කැර විරුඬග්‍රහණය අපට ප්‍රකාශය. පූර්වයෙහි යක්ෂාධිගෘහීතවූ කාන්තාර මාර්ගයෙහි විරුඬග්‍රාහීන්ගේ විනාසය හා අවිරුඬ ගෘහීතවූ මනුෂ්‍යයන් සවාසප්‍රයට පැමිණි බව අපට සැඟවී තිබෙන්නේය. නුඹවහන්සේට ම ප්‍රකාශය. සවාමීනි, යාචිඤ්ඤාකරම්හ. පිත්වත්වූ සම්බුදුයන් වහන්ස, ආකාශයෙහි පුන්සඳමඬල නගා පානා කලක් මෙන් මේ කාරණය ප්‍රකාශකොට වදළ මැනව''යි ආරාධනා කළාහුය.

ඉක්බිත්තෙන් බුදුහු ''මා විසින් සිවානෙනි, අප්‍රමාණවූ කාලයක් මුලුල් ලෙහි දශපාරමිතාවන් පුරා ලෝකවාසීන්ගේ සැක දුරු කරණ පිණිසම සම්බුදුනා ඥානය ප්‍රතිවෙදය කරණලද්දේය. සිංහතෙලයෙන් රත්කලක් පුරවන්නාක්මෙන් සකස් කොට කන් නමා අසව''යි සිවානන්ට සිහි උපදවා හිමගර්භයක් පලා පුන් සඳමඬලක් පිටත් කොට පාන්නාක්මෙන් භවාන්තර යෙන් සැඟවුනාවූ කාරණය ප්‍රකාශ කොට වදළ සේක.

අතීතය දවස කසිරට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙක් සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කොට රාජ්‍යය කරන්නා හුය. එසමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතානෝ සාත්තු නායක කුලයක පිළිසිඳගෙණ ක්‍රමයෙන් වැඩිවිය පැමිණ පන්සියයක් ගැලින් වෙළඳුම් කොට ඇවිදිනාහුය. ඒ බොධිසත්ත්වයෝ කලෙක නැගෙනහිරින් බස්නාහිරට යෙති. කලෙක බස්නාහිරින් නැගෙනහිරට යෙති. එකල බරණැස්නුවර අනිකුත් සාත්තුනායක පුත්‍රයෙක් විය. ඒ තෙම අඥාණය අව්‍යක්තය උපායෙහි දක්ෂ නොවෙයි.

එසමයෙහි බොධිසත්ත්වයෝ බරණැස්නුවරින් මාහැඟිවූ බඩු ගෙණ පන් සියයක් ගැල්පුරා ගමනට සරසා සිටුවූහ. ඒ නුවණ නැති සාත්තුනායක පුත්‍රද එසේම පන්සියයක් ගැල් බඩු පුරා ගමනට සරසා සිටුවූයේය. බොධි සත්ත්වයෝ ''ඉදින් මේ නුවණ නැති සාත්තුනායක පුත්‍රතෙම මා හා සමග යේ නම් ගැල් දහසක් එක්මග යන්ට පටන්ගත් කල මග නො සැහෙන්නේය. මනුෂ්‍යයන්ට දර පැන් හා සරකට තණ නොලැබිබ හැක්කේය. මොහුවත් මාවත් පළමුකොට යාම කටයුතුය''යි සිතා බොධිසත්ත්වයෝ ඒ අඥාන වූ සාත්තුනායකයා කැඳවා මෙපවත් කියා ''අප දෙදෙනා එක්ව යන්ට නො පිළිවන කිමෙක්ද? නෙපි ඉදිරියෙහි යවුද? නොහොත් පස්සෙහි යවුද?''යි

විවාළෝය. එවේලෙහි එතෙම මෙසේ සිතී "තමා ඉදිරියේ යන්ට වන්කල්හි බොහෝ අනුසස් වන්නේය. ගැල්සකින් නුබුන් මනින් යෙමින් ගැල් අදිනා ගොන් පළමු සරක් නොකැ තණ කති. මනුෂ්‍යයන්ට පළමු කිසිකෙණෙකුන් විසින් නොකැඩූ පලාකොළ වන්නේය, ප්‍රසන්න වූ පැන් වන්නේය, කැමති පරිද්දෙන් අගය තබා ගෙණ බඩු විකුණමි"යි සිතා එතෙම "මම යහළුව, පළමු කොට යෙමි'යි කීය. මහබෝධිසත්ත්වයෝත් පස්සෙහි යාමෙහි බොහෝ අනුසස් දැක මෙසේ සිතූය. "ඉදිරියෙහි යන්නාවූ සත්ත්වයෝ මඟ විසම තැන සම කෙරෙති. මම ඔවුන් ගිය මගින් යෙමි. පෙරත්තුව ගිය ගොන් මුහුකුරා තදව ගිය තණ කති. මාගේ ගොන් නැවත අවගත් මිහිර වූ ලා තණ අනුභව කෙරෙති. පළමු පලාකොළ කඩා ගත් තැනින් නැගි දළුපලා මනුෂ්‍යයන්ට මිහිරි වන්නේය. පළමු පැන් නැති තැන වළ කැන පැන් උපදවති. මොවුන් කැනවූ වළවලින් අපි පැන් බොමිහ. පළමුකොට අගය නිබියේනම් මනුෂ්‍යයන්ගේ දිවි ගැලවූවාක් වැන්නේය. මම පස්සෙහි ගොස් මොවුන් විසින් තුබූ අගයෙන් බඩු විකුණමි"යි ඒ මහබෝසතාණන් මෙතෙක් අනුසස් දැක "යහළුව, නෙපි පළමුකොට යව"යි කීවාහුය.

එකල්හි නුවණ තැති සාත්තුනායකයා "යහපත, යහළුව"යි කියා ගැල් යොදා ගෙණ නික්ම ක්‍රමයෙන් මනුෂ්‍යවාසය ඉක්ම කාන්තාර භූමියට පැමිණියේය. එතෙම පළමුව හැම ගැල්ම මහසැළ තබ්බවා පැන් පුරවා සැටයොදුන් කාන්තාරමාර්ගයෙහි ගමන් ගත්තේය. ඉක්බිත්තෙන් ඔහු කාන්තාර මධ්‍යයට පැමිණි කල්හි එහි අධිෂ්ඨිත යක්ෂයෙක් "මේ මනුෂ්‍යයන් ගෙණ යන පැන් දම්මවා පියා දුම්ල කොට සියල්ලවුන් කමි" සිතා සඞ්ඛ්‍යයෙහි ධවලවූ ඇළි ගොන් දෙන්නකු යොදනලද සිත්කලුවූ යානාවක් මවා ගෙණ දුනුතියවුරු පලඟ ආයුධ ගත් අත් ඇතිව අමනුෂ්‍යයන් දස දෙලොස් දෙනකු පිරිවරා ගෙණ ඇඹුල උපුල මල් පැලඳ තෙත් ඉසකේ හා තෙත් පිදුරු ඇතිව නායක පුරුෂයකු මෙන් ඒ රථයේ ඉඳ මඟ වැකී හියාවූ රථයකින් යුක්තව පෙරමගට ගියේය. ඔහුගේ පිරිවර අමනුෂ්‍යයෝද ඉදිරියේ පස්සේ වන්නාහු තෙත් ඉසකේ හා තෙත් පිදුරු ඇතිව ඇඹුල උපුල මල් පැලඳ රත්පියුම් හෙලපියුම් මිටි ගෙණ නෙළඹල හා නෙළඹුදැලි කමින් පැන් බින්දු හා මඩ බින්දු වගුරමින් නික්මුනාහුය. යක්ෂයා ඉදිරියේ එන්නාවූ සාත්තුනායකයා දැක තමාගේ යානාව මගින් පහකොට කොසි යවුදැ"යි යනාදීන් ඔහු හා සමඟ සුවදුක් කථා කෙළේය. සාත්තුනායකයාද තමාගේ යානාව මගින් ඉවත් කොට සෙසු ගැල් යන්ට මඟ අවසර හැර එකත්පස්ව සිට ඒ යක්ෂයා මෙසේ කීය. අපි වූකලී බරණැස් නුවර සිට ආමිහ. නෙපි හැමදෙන ඇඹුල උපුල මල් පැලඳ රත්පියුම් හෙලපියුම් ගත් අත් ඇතිව නෙළඹල හා නෙළඹුදැලි කමින් සකල ශරීරයෙහි මඩ වකා ගෙණ පිනි බින්දු වගුරව වගුරවා කොයි සිට අවුදැ යි නෙපි එන මග වැසිවවද ඇඹුල උපුල මල් ආදියෙන් ගැවසීගත් විල් ඇද්දැ"යි විවාළේය.

යක්ෂයා ඔහුගේ බස් අසා "යහළු, නෝ කුමක් කියයිද? නෙල පෙණෙන්නේ නිල්වූ වනරේඛාවය. එතන පටන් සියලු වනය පැණින් ගැවසීගත්තේය. නිබඳ වැසි වස්නේය. කඳුරැලි පුරා දිය දුවන්නේය. ඒ ඒ තැන පියුමෙන් ගැවසීගත් විල් හා පොකුණු වන්නේය" යි කියා පිළිවෙළින් යන්නාවූ ගැල්වල මනුෂ්‍යයන් අතින් "මේ ගැල් ඇරගෙණ කොයි යවුදැ"යි විවාළේය. එකල්හි ඒ මනුෂ්‍යයෝ

"අසවල් ජාතපදයට යම්හ" යි කීහ. "මේ මේ ගුල කිතම් බඩුදැ" යි විමසූයේය. "අසවල් බඩුය'යි කීහ. පස්සේ එන්නාවූ ගැල් ඉතා බරව එන්නේය. ඒ ගැල්වල කුමන බඩුදැ" යි විමසූයේය. "පැන්පිරූ ගැල" යි කීහ. "පළමු මෙතන දක්වා පැන් ගෙණ ආ තොප විසින් කළ සේ ඉතා යහපත් වන්නේය. මෙතැන්පටන් තොප ගෙණ යන පැනින් ප්‍රයෝජන නැත. ඉදිරියෙහි බොහෝ පැන් ඇත. පැන්සැළවල් බිඳ පැන් දමාපියා සැපසේ යව'යි කියේය.

මෙසේ කියා "තෙපි යව. අපට ලැබුවන්නේ ය" යි කියා මඳ තැනක් ගොස් අන්තර්ධානව තමාගේ යක්ෂපුරයටම ගියේය. ඒ අඟුතුවූ සාත්තු කාරයාද තමා නුවණ නැති බැවින් යක්ෂයාගේ බස් ගෙණ සැල්වල් බිඳුවා පැන් උලක්කුවක් විවරකුත් නො තිබා සියලු පැන් දම්මවා ගැල් පමණක් පදවා ගෙණ නික්මුනේය. ඉදිරියේ සුවල්පමාත්‍රයකුත් පැන් නොවීය. මනුෂ්‍යයෝ පැන් නොලැබ මිරිකී ගියාහු සවස් වනතුරු ගොස් ගැල්වලල්ලෙහි සිටුවා ගොන් ගැල් සක බැඳ සිටුවූය. සරකුන්ට බොන්නටවත් මනුෂ්‍යයන්ට බත් පිසන්නට වත් පැනක් නැතිවිය. පැන් නොලැබ මිරිකී ගියාවූ මනුෂ්‍යයෝ ඒ ඒ තැන වැද හෙව නිදන්නට පටන්ගත්තාහුය. රාත්‍රිභාගයෙහි යක්ෂයෝ යක්ෂපුරයෙන් අවුත් සරක් හා මනුෂ්‍යයන් මරා මස් අනුභව කොට ඇට පමණක් තබා ගියා හුය. මෙසේ ඒ නුවණැති සාත්තුකාරයකයා හැර සියලු සත්ත්වයෝ විනාශයට පැමිණියාහුය. අන් ඇට ආදිය ඒ ඒ අත විසිරී ගියේය. පන්සියයක් ගැල් බඩු පිරුවනින්ම තිබුණේය. මහාබෝධිසත්ත්වයෝද නුවණැති සාත්තුකාරයකයන් ගිය මසක් යෙළ මසක් ඉක්මවා පන්සියයක් ගැල්වල බඩුපටවාගෙණ නුවරින් නික්ම ක්‍රමයෙන් පැන් නැති අමනුෂ්‍යාවාසවූ කාන්තාරමුඛයට පැමිණියෝය. මෙසේ පැමිණියාවූ මහබෝධිසත්ත්වයෝ එතැන්හිදී මහසැළවල පැන් පුරවා බොහෝ පැන්ගෙණ තමන් හා කැටිව යන මිනිසුන් කැඳවා කඳවුරු බැඳගෙණ උන්තැන බෙරපියවී කරවා මනුෂ්‍යයන් රැස්කොට මෙසේ කිවූය. "මා තෙ විවාරා පැන් පතක් විවරකුත් ප්‍රයෝජන නොවිදුව, මේ කතරමග විෂවෘක්ෂයෝ ඇත, එහෙයින් පෙර නොකැවිරූ පලාකොළක් මලක් ඵලාඵලයක් මා තෙ විවාරා නොකව" යි මෙසේ මනුෂ්‍යයන්ට අවවාද කොට බඩු පැවූ පන්සියයක් ගැල් හා සමග අමනුෂ්‍යාධිෂ්ඨිතවූ නිරුදක කාන්තාරයට පැමිණියෝය. ඒමහ බෝසතාණන් කාන්තාරමධ්‍යයට පැමිණි කල්හි ඒ යක්ෂතෙම පළමුපරිද්දෙන්ම බොධිසත්ත්වයන් එන පෙරමග තමා දක්වා සිටියේය. බොධිසත්ත්වයෝ ඔහු දැකලාම දැනගත්තාහුය. "මේ කාන්තාරයෙහි පැන් කැති නෙයින් නිරුදක කාන්තාරය යි මේ කාන්තාරයට නමෙක් වන්නේය මේ තෙම නිර්භීතය. රත්වූ ඇස් ඇත්තේය. මොහුගේ ඡායාවත් නොපෙණෙන්නේය. ඒකාන්තයෙන්ම මොහු විසින් පළමුකොට ගිය නුවණැති සාත්තුකාරයකයා ඔහුගේ පෑත් හා සමග ගැල්වල පිරූ පැන් දම්මවා ක්ලාන්තකොට කන ලද්දේ වන්නේය. මාගේ වූකලී නුවණැති බව හා උපායෙහි දක්ෂ බව මොහු නොදනියි සිතමි" යි සිතා ඉක්බිත්තෙන් ඔහට මෙසේ කිවූය. "තෙපි හැමදෙන පලායව අපි හැම වෙළඳු නම් අනික් පැනක් නොදැක ඇරගත් පැන් නොදමම්හ. පැන් දුවූතැනකදී පැන් දමාපියා ගැල් සැහැල්ලුකොට ගෙණ යම්හ" යි කිවූය. යක්ෂයා මඳ තැනක් ගොස් අන්තර්ධානව තමාගේ යක්ෂපුරයටම ගියේය. යක්ෂයා ගිය කල්හි මනුෂ්‍යයෝ බොධිසත්ත්වයන්ට මෙසේ කිවූය. "සවාමීනි, මේ මනුෂ්‍යයෝ මේ නිල්වූ වනරේඛාව පෙණෙන්නේය. එතැන්පටන් නිබඳ වැසිවස්නේ යයි කිය.

උපුල් මල් පැලඳ රත්පියුම් හෙලපියුම් මිටි ගෙණ නෙළුඹල හා නෙළුඹුදුලි කමින් තෙත් පිල් හැඳ තෙත්වූ ඉහකේ හැරගෙණ ආවාහුය. එසේ නෙයින් අපි හැම ගෙණ යන පැන් දම්මාපියා ගැල් සැහැල්ලූකොට ගෙණ වහා පලායම්හ''යි කිවුය. බොධිසත්ත්වයෝ ඒ මිනිසුන් කී බස් අසා ගැල් රදවාලා මනුෂ්‍ය යන් රැස්කොට ''තොප විසින් මේ කාන්තාර මාර්ගයෙන් විලෙක්වත් පොකුණෙක් වත් ඇතැයි කිසිකෙණෙකුන්ගෙන් ඇසුවිරු ඇද්ද''යි විවාළෝය. ''සවාමීනි, ඇසුවිරු නැත. මේ තෙම තිරුදක කාන්තාරය වේදැ''යි ඒ මනුෂ්‍ය යෝ කිවුය. එකල්හි බොධිසත්ත්වයෝ කියන්නාහු, මේ අප දුටු මනුෂ්‍යයන් ගෙන් සමහර කෙණෙක්'' 'මේ තිල්වූ වල්රොදින් එපිට වැසි වස්නේ යයි කිවුය. වැස්සුලඟ නම් කෙතෙක් තැන් හමාදැ''යි විවාළෝය. ''සවාමීනි, යොදුනක් පමණ තැන් හමන්නේ වේදැ''යි කිවුය. කිමෙක්ද? තොප හැමදෙනා අතුරෙන් එක්කෙනෙකුන්ගෙන් ඇඟ වැසිසුලඟෙක් වැද ගත් දැ''යි විවාළෝය. ''නැත, සවාමීනි, යි කීහ. ''මේඝශී නම් කොපමණෙකදී පෙණේ දැ''යි විවාළෝය. ''යොදනක් පමණ තැන් පවත් පෙණෙන්නේ වේද? සවාමීනි''යි කිවුය. ''තොප ඇමහෙන් කිසිකෙනෙකුන් විසිනුත් ''එක වැසිවලාකුළකුත් දුටුවේ ඇද්ද''යි විවාළෝය. ''නැත සවාමීනි'යි කීහ. ''විදුලිය නම් කෙතෙක් තැන පවත් පෙණේදැ''යි විවාළෝය. සතර පස් යොදනක් පවත් පෙණෙන්නේ වේද? සවාමීනි''යි කිවුය. ''තොප ඇමදෙනාගෙන් කිසිකෙනෙකුන් විසින් විදුලිය ආලෝකයක් දක්නාලද්දේදැ''යි විවාළෝය. ''නැත සවාමීනි, විදුලිය ආලෝකයක් නුදුවුම්හ''යි කීහ. ''මෙඝධනිය නම කෙතෙක් තැන් පවත් ඇසේදැ''යි විවාළෝය. එක් යොදනකින් මත්තෙහි පටන් ඇසෙන්නේ වේදැයි සවාමීනි'' කිවුය. ''කිමෙක්ද? තොප ඇමදෙනාගෙන් කිසිකෙනෙකුන් විසින් විදුලිය ආලෝකයක් වැසිගර්ජනාවක් නරන්නා ඇසුවෝ ඇද්ද''යි විවාළෝය. ''නැත, සවාමීනි, අකුනු ගසන හඬක් නොඇසුම්හ''යි කීහ.

එකල්හි මහබෝසතාණෝ කියන්නාහු''එම්බා පින්වත්නි, මොහු මනුෂ්‍ය යෝ නොවෙති, යක්‍ෂයෝය. මොහු අප ඇම ගෙණ යන පැන් දම්මාපියා දුම්ල කොට කම්හ යි ආවාවූ යක්‍ෂකෙණෙක් වෙති ඉදිරියෙහි ගිය නුවණැති සාත්තු කායක පුත්‍රයා උපාය දැන්මෙහි අදක්‍ෂය. ඒකාන්තයෙන් ඒතෙම මොවුන් විසින් පැන් දම්මවා මිරිකා දුම්ල කොට කන ලද්දේ වන්නේය. පන්සියයක් ගැල් බඩු පිරිවනින්ම නිමෙන්නේ වේදැ යි අපි එබඩු පිරූ ගැල් දකුම්හ. එසේ නෙයින් පැන් උලක්කුවක් විවරකුත් නොදමා වහ වහා ගැල් පදුව''යි කියා ගැල් පදවා ගෙණ නික්මුණාහුය.

මහාබොධිසත්ත්වයෝ යම්න් සිට බඩු පිරිවනින්ම නිබූ ගැල් දැක පන්සිය යක් ගැල් හා නොන් හා මිනිසුන්ගේ අත්පා ඇට ආදිය ඒ ඒ තැන විසිර තිබුවා දැක ගැල් මුදවා ගැල් වලල්ලෙන් කඳවුරු බඳවා වේලාපසම මනුෂ්‍යයන් හා ගොන්ද බත් හා තණ කවා මනුෂ්‍යයන් මධ්‍යයෙහි හෙරි කැටිකොට වැද නොවා තුමූ ශක්තිසම්පන්න ප්‍රධාන පුරුෂයන් ගෙණ කඩුගත් අත් ඇතිව තුන්යම් රාත්‍රියෙහි රැකවල් ගෙණ සිටි සේ සිටම අරුණු නැගුය. දෙවෙනි දවස් උදැසනම සියළු කටයුතු සපයා ගෙණ ගොන් තණ ආදිය කවා ගෙණ ඕළුගැල් දමා තර ගැල් ගෙණ මඳ මිල ඇති බඩු දම්මවා බොහෝ මිල ඇති බඩු තංවා ගෙණ මහා බෝසතාණෝ තමන් වෙළඳුම්කරන්ට යන්ට සිතූ තෙතමම ගොස් දියුණුතියුණු මිලයෙන් බඩු විකොට සියලු පෂීත් ගෙණ නැවත තමන්ගේ නුවරටම ආවාහුය.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ කථාව ගෙණහැර දක්වා වදාරා "මහාසිටාණෙනි, මෙසේ පෙර විරුඬග්‍රාහය ගත්තෝ මහා විනාශයට පැමිණියෝය. අවිරුඬග්‍රාහය ගත්තාවූ නුවණැත්තෝ අමනුෂ්‍යයන් අතින් මිදී සැපසේ කැමති තැනට ගොස් අනිමතාර්ථය සිඬකොට ගෙණ පෙරලා තමන් වසන තෙනට සැපසේ පැමිණියෝ වේද"යි පූර්වාපරසන්ධි ගැළපීම් වශයෙන් අතීත කථාවත් වර්තමාන කථාවත් වදාරා මත්තෙහි 'අපණ්ණක ජාතකය' ධර්මදේශනාව කොට වදාරණසේක්:-

"අපණ්ණකං ඨානමේ'තං - දුතියං ආහු තක්කිකා
එතද'ඤ්ඤාය මෙධාවී - තං ගණ්හෙ යද'පණ්ණකං"

මේ ගාථාව වදාළසේක, මෙහි අපණ්ණක පටිපදාව තම රත්නත්‍රය සරණ යාම, පඤ්චශීලය, හා දශශීලය රක්ෂාකිරීමය, ප්‍රාතිමෝක්ෂ සංවරශීලය ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීවපාරිශුඬිශීලය, ප්‍රත්‍යවේක්ෂණාත්මක ශීලය යන සියළුම සිල් පිරිසිදුව සිල් නොකිලිටු කොට රැකීමය, චක්ෂුරාදී පඤ්චේන්ද්‍රියයන් වසඟ කොට වාසනාබවය, භොජනයෙහි පමණ දන්නා බවය, නිද්‍රාවර්ජිත කිරීමය, පඤ්චවිධ ධ්‍යානය ඉපදවීමය, විදර්ශනා භාවනා කිරීමය, පඤ්චානිඤ්ඤඅෂ්ටසමාපත්ති ඉපදවීමය, ශ්‍රෝතාපත්‍යාදීවූ සතර ආර්‍යමාර්ගය හා සතර ආර්‍යඵලය ඉපදවීමය, යන මේ සියල්ල අපණ්ණක පටිපදා නම් වෙයි නිර්වාණගාමීවූ ප්‍රතිපත්තිය නම් වෙයි. ඇතිඳ ශාසනයට් අවිරුඬ ප්‍රතිපත්තිය නම් වෙයි. මෙහි අපණ්ණක පටිපදා' නම් අත්‍යලබ්ධි ගැන්වීමය, දශඅකුශල ධර්මයෙහි හැසිරීමය, නුසුදුසුවූ කායවාක් සමාචාරයෙහි යෙදීමය, යන මේ සියල්ල වන්නේය. මේ විරුඬ ප්‍රතිපදාව සතර අපායෙහි හා පඤ්චවිධ නීවරණයෙහි උපදවා මහත් දුක් දෙන්නේය. තවද මේ අවිරුඬවූ ඒකාන්ත කාරණවූ මේ අවිරුඬ ප්‍රතිපත්තියෙහිම සිටි සර්වඥවරයෝ දැඩවීර්යයෙන් පාරමිතාවන් පුරා බොධිදුම සම්පයෙහි ඉඳ සම්‍යක්සම්බෝධිඥානය සම්ධිගමය කරන්නාහුය. පසේබුදුවරයෝ ප්‍රත්‍යේක බොධිඥානය සම්ධිගමය කෙරෙති. බුඩපුත්‍රවූ ශ්‍රාවකයෝ ශ්‍රාවක පාරමිතාඥානය ප්‍රතිවෙධ කෙරෙති. මෙසේ භාග්‍යවන්වූ බුදුරජානන්වහන්සේ ඒ උපාසක වරුන්ව ත්‍රිවිධ කුශල සම්පත්තීන් හා දිව්‍යබ්‍රහ්ම සම්පත්තීන් දක්වා කෙළවර "මේ 'අපණ්ණක පටිපදාව' අතීත් මාර්ගයට පමුණුවා නිර්වාණසම්පත්තිය සාධාදී ලන්නේ ය'යි කියා අනේපිඬුමහසිටානන් ප්‍රධාන කොට ඇති පන්සියයක් උපාසකවරුන්ව මේ අපණ්ණක ධර්මදේශනාව දක්වා මත්තෙහි චතුරාර්‍යසත්‍යය සොළොස් ආකාරයකින් ප්‍රකාශකොට වදාළසේක.

මේ චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර ඒ සියලු පන්සියයක් උපාසක වරු යෙළු දහසක් කෙලෙසුන් නසා දහසක් නසින් ප්‍රතිමණ්ඩිතවූ සොවාන් පෙළෙහි පිහිටියාහුය. බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ අපණ්ණක ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි අඟුනවූ සාත්තු නායක පුත්‍ර දැන් මේ දෙවදත්තඅවවිරයෝය. ඔහුගේ පරිද තම් දෙවදත්ත පරිද වන්නේය. එසමයෙහි නුවණැති සාත්තුනායකයාගේ පරිද නම් දැන් බුදුපිරිස් වන්නාහුය. එසමයෙහි නුවණැති සාත්තුනායක පුත්‍ර නම් දැන් තිලෝගුරු සම්‍යක්සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

# 2
# වණ්ණුපථ ජාතකය

**ච**මද එක් සමයෙක්හි බුදුහු දෙවිරම් වෙහෙර වැඩවසන සේක් භාවනා කිරීමෙහි හරණලද වීර්‍ය්‍ය ඇති භික්ෂුකොණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක.

**ඒ කෙසේද? යත්**

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වසන කල්හි එම නුවර වසන්නාවූ එක් කුලපුත්‍රයෙක් ජේතවනාරාමයට ගොස් බුදුන්ගේ බණ අසා රත්නත්‍රය යෙහි ප්‍රසන්නවූ සිත් ඇතිව කාමයෙහි ආදීනව හා ප්‍රව්‍රජ්‍යාවෙහි අනුසස් අසා මහණව උපසම්පදා ව පස්වසක් ඇතුළත උභය මාතෘකාව වතපොත් කොට ශික්ෂාපද ඉගෙණ භාවනා මාර්ගයන් ඉගෙණ සම්මසන්සම්පයෙහිදී තමන්වහන්සේට අභිප්‍රායවූ කර්මස්ථානයක් ගෙණ උදකලාව වාසය කැමතිව වලට වැද වතයෙහි සැදුනැ ඇති උපාසකවරුන් විසින් කරවා පිළිගන්වනලද පන්සලක වස් වැස වස් තුන්මසමුළුල්ලෙහි මාර්ගඵල උපදවන්ට උත්සාහකරණ සේක් විදර්ශනා ලෝකයක් වේව යි ප්‍රතිභාග නිමිත්තක් වේව යි උපදවා ගත නොහී මෙසේ සිතුසේක. ''සම්බුදුයන් වහන්සේ විසින් පුද්ගලයෝ සතරදෙනෙක් වදාරණ ලදහ. ඔවුන් සතරදෙනා අතුරෙන් 'මා පදපරම වන්ව කාරණ වන්නේය.මට මේ ආත්මභාවයෙහි මාර්ගඵලයක්වත් ඵලයෙක්වත් නැතැ''යි සිතම්. එසේ හෙයින් මේ වතයෙහි වැස කුමක් කෙරෙම් ද? සම්බුදුයන් වහන්සේ සම්පයට ගොස් රූපාරූප්‍රාප්තවූ බුදුන්ගේ ශරීරය බල බලා මිහිරිවූ බණ අසමින් විසූසෙම් වීම් නම් යහපත්වන්නේය''යි සිතා තැවත ජේතවනාරාමයට වැඩිසේක.

එකල්හි උන්වහන්සේ දැක සතදෘෂ්ට සම්භක්ථා භික්ෂූහු මෙසේ කිවුය. ''ඇවැත්නි, තෙපි ලොව්තුරා බුදුන්හෙත් කමටහන් ගෙණ මහණදම් කෙරෙම්''යි ගිවිස දැන්වූ කලී වලින් අවුත් ගණසඞ්ඝනිකායෙහි ඇලී වාසය කරව කිමෙක්ද? තොපගේ ප්‍රව්‍රජ්‍යාකෘත්‍යය මුදුන් පැමිණියේද? පුනරුත්පත්තියක් නැතිව අනිත්‍යඵලඥානය ප්‍රතිවෙධකළාදැ''යි කීහ. ''ඇවැත්නි, මම මාර්ගයක්වත් නොලැබම අනව්‍ය පුද්ගලයෙක් වියයුතුයයි සිතා වීර්‍ය්‍යය හැර ආම්''යි කිසේක. එකල්හි භික්ෂූන්වහන්සේ කියනසේක්'ඇවැත්නි,දැසවීර්‍ය්‍යඇති සම්බුදුයන් වහන්සේගේ ශාසනයෙහි මහණව භාවනා කොට මාර්ගඵල ඉපදවීමෙහි වීර්‍ය්‍ය අළුව. තොප විසින් අකාරියෙක්ම කරණලදැ, අප හා කැටිව එව, සම්බුදුයන් වහන්සේ සමීපයට යමිහ''යි කියා ඒ භික්ෂුව කැඳවාගෙණ බුදුන් සමීපයට ගියසේක. සම්බුදුයන් වහන්සේ භික්ෂූන් දැක ''මහණෙනි, තෙපි මේ භික්ෂුව නොකමැති පරිද්දෙන් කැඳවා ගෙණ ඇවිත් පිණිස අවුද? මොහු විසින් කවර අපරාදයක් කරණලදැ''යි විචාරා වදාළසේක. එකල්හි භික්ෂූන් වහන්සේ දන්වන සේක් ''සවාමීනී, මේ මහණ මෙබඳු තෙයර්‍ය්‍යාණික ශාසනයෙහි මහණව මහණදම් කරන්නේ වීර්‍ය්‍ය ඇර ආයේය''යි දන්වූසේක. එකල්හි සම්බුදුයන් වහන්සේ 'සැබැද! මහණ තා වීර්‍ය්‍ය හළයෙහිය''යි වදාරා ''සැබෑව, සවාමිනී''යි දන්වූ කල්හි ''කිමෙක්ද? මහණ තෝ මෙබඳු ශාසනයෙහි මහණව අල්පෙච්ඡ සේක, සන්තුෂ්ටසේක, කුලෙහි ගෙණෙහි නොඇලෙන සේක. වඩනලද වීර්‍ය්‍ය ඇතිසේක්''යි මෙසේ තමා ප්‍රසිඩ කොකොට 'මේ මහණ හරණලද වීර්‍ය්‍ය ඇත්

තේය''යි කුමක් පිණිස ප්‍රකාශකරවූයෙහිද? මහණ තෝ පෙර වියදීවන්වූයේ නොවේද? තා එක තැනැත්තවූ කල වියදී නිසා මරුකතර පත්සියයක් ගැල් වල ඒ මිනිසුන් හා නොන් පැන් ලැබ සවාසප්‍යයට පැමිණියෝ නොවෙද? දැන් තෝ කවර කාරණයකින් වියදී ඇරපවූයෙහිවේදැයි'' වදාළසේක. එකල්හි ඒ මහණ මෙපමණ බසකින් උපසම්පාහලද්දේ වීය. ඒ කථාව අසා නිස්සූන්වහන්සේ බුදුන්ට යාච්ඤාකරණසේක් ''සවාමීනි, දැන් මේ නිස්සූහු විසින් වියදී හළ බව අප ඇමව ප්‍රකාශය, අතීතයෙහි මොහු තනි තැනැත්තවුන්ගේ වියදී නිසා මරු කතර ගොන් හා මිනිසුන් පැන් ලැබ සවාසප්‍යයට පැමිණි බව භවයෙන් පටිවි ඡන්න හෙයින් අපට අප්‍රකාශය. නුඹවහන්සේගේ සවීඤ්ඤාණයටම ප්‍රකාශය. අපටත් ඒ කාරණය ප්‍රකාශ කොට වදාළ මැනවැ''යි ආරාධනා කළසේක. එකල්හි සවීඤ්ඤයන් වහන්සේ එසේවීනම් මහණෙනි,අසවු''යයි කියා ඒ නිස්සූන්ට ඉහි උපදවා භවාන්තරයෙන් සැඟවූනාවූ කාරණය ප්‍රකාශකොට වදාළසේක.

යිවගිය දවස කසීරට බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුත් රාජ්‍යය කරණකල්හි අප මහබෝසතාණෝ සාත්තුනායක කුලයෙහි පිළිසිඳ ගෙණ වැඩිවිය පැමිණ පන්සියයක් ගැලින් වෙළඳුම් කොට ඇවිදිනාහුය.මෙසේ වෙළඳුම්කොට ඇවිදිනාවූ මහාබොධිසත්ත්වයෝ එක්කලෙක මරුකතරට පැමිණියානුය. ඒ වාලුකාකාන්තාරයෙහි වැලි ඉතා සියුම් වන්නේය. මිටින් ගත් වැලි මිට නොසිටින්නේය. හිරු තැගිවේලේ පටත් කිහිරහුරු රැසක් මෙන් කකියන්නේය. පයින් වැලි මැඩ ගෙණ යන්ට නොපිළිවන, එසේහෙයින් ඒ වාළුකාකාන්තාරයෙහි යන්නාවූ සත්ත්වයෝ දර පැන් තෙල් සාල් ආදිය ගැලින් ඇර ගෙණ රාත්‍රියෙහි ගොස් අරුණු තැගෙන වේලෙහි ගැල් මුදා ගැල්වට වලල්ලෙහි සිටුවා මුදුනෙහි කොලමඬු ඉදිකොට වේලාපසම කාබී ඇකිල මණ්ඩප ඡායාවෙහි ඉඳ දවස් යවා ඉර බැස ගිය කල්හි රාත්‍රියෙහි හොජන අනුභව කොට බිම සීත ලව ගියකල්හි ගැල් යොදා ගෙණ යන්නාහුය. සමුද්‍ර යාත්‍රාවක් හා සමානවූ ගමන් වන්නේය. ඒ ගැල් පදවාගෙණ යන ප්‍රධාන පුරුෂ තෙමේ ගොඩ නියමුවාය''යි නම් ලබන්ට සුදුසු වන්නේය. එසේහෙයින් තරු සලකුණෙන් ගැල් සාත්තු පදවා ගෙණ යන්නේය. අප මහාබෝසතාණෝද එකල්හි මෙම ක්‍රමයෙන් මරුකතර යන්නාහු එකුන්සැට යොදුනක් ගොස් දැන් එක රාත්‍රියකින් ම මරු කතර ගෙවා සෙමහුමියට පැමිණීම වන්නේය'යි කිය හැකි අවසථායෙහි සවස බත් අනුභව කොට සියලු දර පැන් නිමවා ගැල් යොදා ගෙණ නික්මුනාහුය. නියාමක පුරුෂයාණෝ ඉදිරියේ යන ගැල දික් සඟලා පුටුවක් අතුරවා ගෙණ ආකාශයෙහි තරුසලකුණු බලමින් ගැල් ''මෙසේ පදුව, මෙසේ පදුව'' යි කියකියා වැදහොත් තැනැත්තෝය. බොහෝකලක් නොනිදි බැවින් නින්දෙන් මිරිකී නිදන්ට පවන්ගත්තාහුය. එකල්හි හොන් කරකැවී ආපස්සේ නික්මුනු බව නොදන්නාහු ගැල් අදනා ගොන් සකල රාත්‍රියෙහි අවුත් පළමු දවස් ලැගි තෙතමම පැමිණියාහුය. සාත්තුනායක තෙමේ අරුණු තැගෙන වේලෙහි පිබිද තැකැත්තරු බලා ''ගැල් රදව''යි කීයේය. මෙසේ කියා ගැල් කරකවා පිළිවෙළින් සිටුවමින් සිටියදීම අරුණු නැංගේය. ''මනුෂ්‍යයෝ කියන්නාහු මේ අපගේ කදවුරු බැඳ උන් තෙතය. අපගේ දර පැනුත් නිමා ගියේය. දැන් නටුවමෝදැ''යි කියා ගැල් මුදා ගැල්වට වලල්ලෙහි සිටුවා මුදුනේ මණ්ඩපයක් කොට තම තමන්ගේ ගැල්යට ශොක ගෙණ උන්නාහුය.

එවේලෙහි මහබෝසතාණෝ "මා විසින් ඇරපූවොත් සියල්ලෝම නසිනි'යි සිතා උදැසන සිහිල්වේලේම ඇවිදිනා තැනැත්තෝ එක් ඊතණ පදුරක් දැක මේ තණපදුරට දිය උරමින් නැංගේ වනැ"යි සිතා උදැල්ලක් ගෙන්වා ගෙණ ඒ ඊතණ පදුර තිබූතෙන කනිස්ට පටන් ගෙණ සැව රියනක් පමණ තැන කැනපූය. මෙතෙක් තැන් කැන කැවතත් පල්ලේ-කනුම්හ'යි උදළු ඵලන්නාවූ මනුෂ්‍යයන්ගේ උදළු ශබ්ද ගලතල මත්තේ වැදගන්නට පවත්ගත් කල්හි ඇමදෙනම අවීචිමහානියහ. බොධිසත්ත්වයෝ වනාහි 'මේ ගලතලින් යට පැන් වියයුතුය"යි සිතා ලිදට බැස ගලතල මත්තේ සිට නැමී තමා දිය යන අඬ පරීක්ෂාකරන්නෝ ගලතල යටින් දිය යන අඬ අසා ලිදින් ගොඩනැගී තමන්ගේ අතවැසි පුරුෂයාහට මෙසේ කිවූය, "දරව, තොප අවීචිමහා නියොත් අපි සියල්ලෝම නසුම්හ. එසේ නෙයින් තෙපි අවීචිමහා නොවී පසු බට නොවී වීචිමහා වඩා මෙ යකුළ ගෙණ ලිදට බැස මේ ගලතලමත්තේ කුළු ගණනක් එලාපියව"යි කිවූය.

ඒ අසා අතවැසි පුරුෂයා මහබෝසතාණන්ගේ වචනය පිළිගෙණ ඇම දෙන වීචිමහා තබා පියා සිටිකල්හි තෙමේ වීචිමහා නොහැර ලිදට බැස ගලතල මත්තේ යකුළු ගණනක් එලාපුශේය. එකල්හි ගලතල මධ්‍යයෙන් බිඳී යට වැටී අවිචිමහානව පවත්නාවූ ජලප්‍රවාහය ඇස්වා ගෙණ සිවියේය. නාඹතල්කදක් සා දියකදෙක් උඩ පැනනැංගේය. එකල්හි සියලු මනුෂ්‍යයෝ පැන් බී ජලස්නානය කොට ඉතිරිව තුබූ ගැල්ඹක් ආදිය පලා කැඳ බත් ආදිය පිස අනුභව කොට ගොණුන් පැන් පොවා තණ ආදිය කවාගෙණ ඉරබට වේලේ ලිඳ සමීපයෙහි ධජයක් බැඳ මරුකතර ගෙවා තමන් විසින් කැමතිවන ලද්දාවූ සථානයට ම ගියාහුය.

ඒ මනුෂ්‍යයෝ තමන් අභිප්‍රාය සථානයෙහි දී බඩුවිකුට එක දෙක හා එකව සතර නියාගෙන් දෙදියුණු සතරදියුණු ලාබ ලැබ තමන් පළමු වසන් කාවූ සථානයටම පෙරලා ආවාහුය. ඒ හැම මනුෂ්‍යයෝ එහි වසන්නාහු ආයු පමණින් සිට කම් වූ පරද්දෙන් මිය පරලොව ගියාහුය. මහබෝසතාණෝද දානාදීවූ පින්කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහුය. තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා

තවද මත්තෙහි ඒ භික්ෂූන් වහන්සේට ධර්මදෙශනා කරණසේක් "යම්සේ වෙළඳු නොකුසීතව මරුකතර ලින් බැඳ පැන් ලද්දාහුද? එපරිද්දෙන්ම මේ සර්ව්ඥ ශාසනයෙහි මහණව නුකුසීතව වීර්‍යකරන්නාවූ නුවණැති මහණ තෙමේ ධ්‍යානවිමොක්ෂසමාධීඵලාදීවූ ප්‍රභෙද ඇති ලය සැනසීම ලබන්නේය. මහණ, තෝ පෙර පැන් පමණක් නිසා වීර්‍යකොට දැන් මෙබඳුවූ නෛර්‍යාණික ශාසනයෙහි මහණව මාර්ගඵලයට පැමිණීමෙහි කවර කාරණයකින් වීර්‍ය ආරපූයෙහිදැ"යි මෙසේ නැවතත් ධර්මදෙශනා කොට දුකඛ, සමුදය, නිරොධය මාර්ගය යි කියතලද චතුරාර්‍යසත්‍යය ප්‍රකාශ කොට වදාළසේක.

චතුස්සත්‍යය ධර්මදෙශනාවගේ කෙළවර පසුබට වීර්‍ය ඇති භික්ෂූන් වහන්සේ අර්හත්ඵලයෙහි පිහිටිසේක. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ අතීත කථාවත් වර්තමාන කථාවත් දෙක එක්කොට අනුසන්ධි ගළපා මේ වණ්ණුපථජාතකය නිමවා වදාළසේක. එසමයෙහි නොපසුබට වීර්‍ය ඇති

ගලතල බිඳ මහජනයාව පැන් දුන් අතවැසි පුරුෂයා නම් දැන් මේ පසුබට වියයුතු ඇති මනුෂ්‍ය වන්නේය. එසමයෙහි මරුකතර ගියාවූ සෙසු පණ්ඩිත නම් දැන් මේ බුදුපිරිස් වන්නාහ. එසමයෙහි සාන්තුසාගර පුත්‍ර නම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම් ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 3
## සෙරිවාණිජ ජාතකය

තවද එක් සමයෙක්හි සකලගුණ නිධාන වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවනා රාමයෙහි වැඩවසතසේක් පසුබට වියයුතු ඇති භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළසේක. ඒ කෙසේද? යත් ඒ පසුබට වියයුතු ඇති භික්ෂූන්වහන්සේ පළමු පරිද්දෙන්ම අවශෙෂ භික්ෂූන් වහන්සේ විසින් බුදුන් සමීපයට කැඳවා ගෙණ අවුත් පැකල්හි බුදුහු ඒ භික්ෂූන්වහන්සේට ආමණ්ත්‍රණය කොට ''එම්බල, මහණ, තෝ මෙබඳු මාගීඵලදායක ශාසනයෙහි මහණව වියයුතු හරණෙහි ද? ලාභයක් වවනා ඝනරන් තලියෙන් පිරිහුනාවූ සෙරිවාණිජ වෙළෙන්දු මෙන් බොහෝ කාලයක් සොක කරන්නේවේදැ''යි වදාරා තුෂ්ණීම්භූතව වැඩහුන්සේක.

එකල්හි එතතව රැස්වූ භික්ෂූන්වහන්සේ සකසා හැදපෙරව ඵලභාර යෙන් නැමුනාවූ කදලි වෘක්ෂයක් මෙන් බුදුරජානන් වහන්සේට අභිමුඛව තම්තව බඹසැලිව දැහොත් මුදුතෙහි තබා භක්තිප්‍රේමාතිභාරාවත– තොත්තමාඩහයෙන් නමස්කාර කොට සිට ඒ අර්ථය ප්‍රකාශකරණු පිණිස සවීඥයන් වහන්සේට අරාධනා කළසේක. එවේලෙහි බුදුරජානන් වහන්සේ අන්‍ය භවයෙන් සැඟවුනාවූ කාරණය ප්‍රකාශ කොට ඉකුත්වත් දක්වා වදාළ සේක.

පුරාතන දවස මෙම කල්පයට පස්වැනිවූ කප මහාබොධිසත්ත්වයෝ සේරිව රාජ්‍යයෙහි රන්පහුම්බි පසිය කරලා කිසිල්ලෙහි ගන්වා ගෙණ වෙළඳුම් කරණ හෙයින් කඩපුම වාණිජය යන නම් ඇති වෙළඳව උපන්නාහුය ඒ වෙළඳුනෝ සෙරිවාණිජ නම් එක් ලොහී වෙළඳකු හා සමග නීලවාහිනී නම් වූ ගඟින් එතරව අඹුපුර නම් නුවරට වැද නුවර වීථි බෙදාගෙණ තමන්ට පැමිණි වීථියෙහි බඩු විකුණමින් ඇවිදිති. අන්‍යවූ ලොහී වෙළඳු තමාට පැමිණි වීථියෙහි බඩු විකොට ඇවිදින්නේය. එකල්හි ඒ නුවර එක් සිටුකුලයෙක ඇත්තෝ දුප්පත්වූය. සියළු මල්බැයන් හා දරුවොත් වස්තුවත් නැසීනියෝය. එක් මිනිබිරි කුඩා කෙල්ලක් මුත්තනියන් හා සමග තොතැසී රඳා ගියාය. ඔවුන් දෙදෙනම අනුන්ට බැලමෙහෙ කොට ජීවත්වෙති. මොවුන් දෙදෙනාගේ ගෙයි පළමු මහසිටාතන් බත් අනුභවකළ රන්තලියෙක් වලත් අතුරෙහි තිබී බොහෝ දවසක් ප්‍රයෝජන නුවූ හෙයින් මළහැසී ගියේය. ඒතාක් වනතුරු ඔහු දෙදෙන රන්තලිය බවක් නොදනිති. එකල්හි ඒ ලොහී වෙළඳු ' කදුවලලු ගණුව''යි කියමින් ඇවිදින්නේ ඒ ගේ දොරට පැමිණියේය. ඒ ගෙයි කුමාරිකාවෝ වෙළඳු දැක මුත්තනියන්ට කියන්නී ''මැණියෙනි, මුව එක් පලඳනාවක් ගණුව''යි කියූහ. ඒ අසා මුත්තනියෝ ''අපි දුකඛිතයම්හ. කුමක්දී පලඳනා ගණුමෝදැ''යි

සේරිවානිජ ජාතකය

කිවුය. එවේලෙහි ඒ කුමාරිකා තොම කියන්නී "අපගේ ගේ තලියක් ඇත, ඒ තලියෙන් අපට කිසි ප්‍රයෝජනයකුත් නැත. මේ තලිය දීපියා වලළු ගතමැතවැ"යි කිව, මුත්තනියෝ ඒ කුමාරිකාවගේ ඇවිටිලි බලවත් හෙයින් වෙළඳ කැඳවා අස්තෙක හිඳුවා තලිය දී "සවාමීනි, මේ තලිය ඇරගෙණ නුඹගේ නැගනියන්ට කිසි පලඳනාවක් දුනමැතවැ"යි කිවුය. ඒ ලොභී වෙළෙඳ තලිය අතින් ගෙණ 'රන්තලියක්වනැ'යි තල්යපිට ඉදිකටුවෙන් හිරක් ඇද රන් බව දැන 'මොවුන්ට කිසිවක් නොදීම මේ තලිය ගෙණ යෙමි' සිතා "මේ තලිය කුමක් අසීද? අඹ මදටකුත් පමණ මේ තලියට මිල නැත්තේය"යි කියා බිමට දමා උතස්තෙන් නැගී ගියේය. එක්කෙතෙකුත් වැදූ නික්මුණු වීථියට අනික් තැනැත්තේ වදින්ට නිසිවන්නේය"යි බොධිසත්ත්වයෝ ඒ වීථියට වැද "කදුවලළු ගණුව"යි කියමින් එම ගේ දොරට පැමිණියෝය.

නැවත ඒ කුමාරිකා තොම පළමු පරිද්දෙන්ම මුත්තනියන්ට කියන්නී "මැනියනි, මට වලළු ඇරගෙණ දුනමැතවැ"යි අවිටිලි කිව. එකල්හි මුත්තනියෝ කුමාරිකාවන්ට කියන්නෝ "දුවනියෙනි, පළමු ආ වෙළෙඳුනෝ තමාට දුන් තලිය බිමට දමා ගියෝය. දැන් කුමක්දී ගණුමෝදැ"යි කිවුය. ඒ අසා කුමාරිකා තොම කියන්නී "මැනියෙනි, ඒ වෙළඳතෙම තද පරුෂබස් ඇත්තේය. මේ වෙළෙඳුනෝ වූකලී ප්‍රියවූ දැකුම් ඇත්තෝය. මොලොක් වූ කථා ඇත්තෝය. එසේහෙයින් මේ තලිය ඇරගෙණදී මට පලඳනා ඇරගෙණ දුනමැතවැ"යි වලළු නම් යහපත්වේදැ"යි කිවුය. ඒ කුමාරිකාවගේ බස් අසා මුත්තනියෝ කියන්නෝ "එසේවීනම් කැඳව"යි කියා වෙළෙඳුනන් කැඳවූව. ඉක්බිත්තෙන් ගෙට වැදලා උන්නාවූ බොධිසත්ත්වයන්ට ඒ තලිය දුන්නාහ. බොධිසත්ත්වයෝ ඒ තලිය රන්තලිය නියාව දැන කියන්නාහු "මැනියෙනි, මේ තලිය අගතා බඩු මෑ අත නැතැ"යි කිවුය. ඒ අසා කුමාරිකාවගේ මුත්තනියෝ කියන්නෝ පළමු ආ වෙළෙඳුනෝ "මේ තලිය අඹමදටකුත් නුපුස්නේය"යි කියා බිමට දමා ගියෝය. මේ තලිය වූකලී නුඹගේ කුශලයෙන් සවාමිනි, රත්රන්ව ගියවනැ'යි අපි නුඹට මේ තලිය දෙමිහ, අපට යන්තම් දෙයක් දීපියා මේ තලිය ගෙණගිය මැනවැ"යි කිවුය. බොධිසත්ත්වයෝ එකෙණෙහි අතතුබූ පන්සියයක් කහවණු හා පන්සියයක් අගතා බඩුදී මිල ඇමම දී "මට මේ පලම්දණ්ඩ හා පසුම්බියත් කනවණු අවකුත් දුනමැනවැ"යි කියා මෙපමණක් ඉල්වා ඇරගෙණ පලා ගියාහුය. මහ බෝසතාණෝ වහවහා ගන්තෙරට ගොස් ඔරුපදිනා තොටියාට කහවණු අවක්දී ඔරුවට පැනනැංගා නුහ. ඉක්බිත්තෙන් ඒ ලොභී වෙළඳ තැවතත් ඒ ගෙට ගොස් "පළමු මා බලාපියා ගිය තලිය හෙණෙව. යම්තම් මිලයක් නොපට දෙමි" කියලා ඉල්වීය. ඒ අසා කුමාරිකාවගේ මුත්තනියෝ ඕනට බැණදෙඩා අපගේ ලඤ්ඡයක් වටනා ඝතරත් තලිය අඹමදවක් නුපුස්නා කෙලෙහිය. තව සවාමිදරුවකු වැනි වූ එක් ධර්මිෂ්ඨ වෙළඳුන කෙනෙක් අපට දැසක් මිලදී ඒ තලිය ඇරගෙණ ගියෝවේදැ"යි කිවුය. ඒ අසා එතෙම "ලඤ්ඡයක් වටනා ඝතරත් තලියෙන් පිරිහී ගියෙම්වේදැයි මට වූයේ බලවත් හානියෙකැ"යි උපන්නාවූ බලවත් ශොක ඇතිව සිහි එලවා ගන්ට අසමර්ථව විසංඥව තමා අත තුබූ කනවණුත් බඩුත් ඒ ගෙදරම වගුරුවා හත් පෙරවි පිළි හෙලා පලම්දණ්ඩ මුගුරක් මෙන් අල්වාගෙණ බොධිසත්ත්වයන් පසුපස්සෙහි

ලුහු බදවා ගෙණ යන්නේ ගංතෙරට පැමිණ යන්නාවූ බොධිසත්ත්වයන් දැක එම්බල, තොටිය ඔරුව රඳව, රඳව"යි කියා අඬගසාලීය. ඒ අසා බොධිසත්ත්ව යෝ තොටියාට කියන්නාහු 'ඔරුව ආපස්සේ කරකවා නොපදුව"යි වැළකූය. තමා කී බස් නොගිවිස ඔරුව නොරඳ පදනා ඔරුවෙන් යන්නා බොධිත්ත්ව-යන් බල බලා සිටියා වූ ඒ ලොභී වෙළෙඳාට බලවත්වූ ශෝ උපන්නේය. ලය උණුව ගියේය. මුඛයෙන් හුණුලේ නැගිය, වැවක මැළි වලල්ලක් මෙන් ලය පැලී ගියේය. ඒ ලොභී වෙළෙඳා බොධිසත්ත්වයන් සෙරෙහි ආඝාත බැඳ එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. මෙසේ බොධිසත් යන් කෙරෙහි දෙවදත්තසථවිරයන් වහන්සේගේ පළමුවෙන් වෛර බැඳීම වන්නේය. බොධිසත්ත්වයෝ දානාදීවූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මත්තෙහි ධර්මදේශනා කොට වදාරණසේක් "යම්සේ පෙර සෙරිවාණිජ තම් වෙළෙඳා ලක්ෂයක් වටිනා රත්තලිය නොලැබ ඒ තලිය ගන්ට මියයී නොකොට ඒ තලියෙන් පිරිහී ශෝක කෙළේද? පශ්චාත්තාපයට පැමිණියේද? එපරිද්දෙන්ම මහණ, නොපිත් මේ ශාසනයෙහි සරහා පිළියෙළ කරණලද රත්තලියක් වැනිවූ ආර්යර්මාර්ගයකට පසුබට වියයී ඇති බැවින් නො පැමිණ ඒ මාර්ගඵලයෙනුත් පිරිහී බොහෝ කලක් සොක කරන්නාහුය. ඉදින් තෝ වියයී නොහළුයෙහි වී තම් නුවණ ඇති වෙළෙඳුනන් රත්තලිය ගෙණ ප්‍රයෝජන වින්ද කලක් මෙන් මාගේ ශාසනයෙහි නවවිධ ලෝකොත්තර ධර්මය ලබන්-නෙහිවේදැ"යි මෙසේ ඒ සම්බුදුන් වහන්සේ තැවතත් ඒ භික්ෂූන් වහන්සේට අර්හත්ඵලය කුළුගන්වමින් ධර්මදේශනා දක්වා චතුරාර්යසත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර පසුබට වියයී ඇති භික්ෂූන් වහන්සේ අර්හත්ඵලයෙහි පිහිටිසේක. තවද බුදුහු පූර්වාපරසන්ධි ගළපා මේ සෙරිවාණිජ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි අඟුත වෙළෙඳා තම් දැන් දෙවදත්තසථවිරයෝය. එසමයෙහි නුවණ ඇති වෙළෙඳා තම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 4
## චුල්ලසෙට්ඨි ජාතකය

එවද සූර්යවංශාභිජාතවූ තිලෝ ගුරු බුදුරජාණන් වහන්සේ රජගහ නුවර නිසා ජීවකයන්ගේ අඹ උය-නෙහි වසනසේක් චුල්ලපන්ථක සථවිරයන්වහන්සේ අරභයා මේ ජාතකය ගෙණ හැර දක්වා වදාළසේක.

ඒ කෙසේද?යත්, රජගහ නුවර වසන මහධන සිටුතන්ගේ දූ වූ එක් කුමාරිකාවක් තමාගේ දැසයකු හා සමග මිත්‍රසන්ථවය වාසය කොට වසන දවස් මේ ක්‍රියාව අනික් කෙණෙක් දැකපූ තම් කවයුතු නොවෙයි, සිතා හයින් ත්‍රස්තව ඒ පුරුෂයාට කියන්නී අප දෙදෙනා මෙතන වසන්ට නො පිළිවන් වන්නේය. "ඉදින් මාගේ දෙමව්පියෝ මේ දෙෂය දැකපූ තම් කවයුතු නොවෙයි, අප කඩ කඩ කොට කපා පියෙති සිතා අන්‍ය දෙශයකට ගොස් වසම්හ"යි කියා හස්තසාර වස්තුව හැරගෙණ පළමු කොට හළදෙරෙන් නික්ම "යම්තැනකට ගොස් අනුන් නො දන්නා තෙතකට යම්හ"යි කථාකොට දෙදෙනම ගියාහුය.

මෙසේ ගොස් එක්තෙතක වසන්නාවූ ඔවුන්ගේ සංවාසය නිසා කුමාරිකාවට බඩ දරුගබීයෙක් පිහිටියේය. ඕතොමෝ දරුගැබ් මුහුකුරා ගිය කල්හි වල්ලභයා හා සමග කථාකරන්නී "දරගැබ මුහුකුරා ගියේය. ඤාති බන්ධුන් නැති තෙන දී දරු වැදීම නම් අප දෙදෙනාටම දුක්වන්නේය. එසේහෙයින් දෙමව්පියන්ගේ ගමට යමිහ"යි කිව. ඒ පුරුෂයා "අද යමිහ, සෙට යමිහ"යි කියා බස ඉකුත් කරන්නේය. එකල කුමාරිකාව සිතන්නී "මේ අඥාන පුරුෂයා තමාගේ දෙෂය මහත් බැවින් යන්ට උත්සාහ නො කරයි. දෙමව්පියෝ තම් දරුවන්ට වැඩකැමැත්තෝය. එසේ නෙයින් මොහු යත් කිම? නොයත් කිම? මා යන්ට සුදුසු වන්නේය'යි ඒ පුරුෂයා ගෙයින් බැහැර ගිය කල්හි තමාගේ ගෙයි වලං ඇද පුටු ආදිය සියල්ලම තැන්පත් කොට තබා තමාගේ දෙමව්පියන්ගේ ගමට යන නියාව අසල ගෙවල ඇත්තන්ට කියා මං හි නික්මුනාහ.

එකල්හි සවාමිපුත්‍රයා ගෙව අවුත් කුමාරිකාව නොදැක අසල ගෙවල මිනිසුන්ගෙන් විවාරා දෙමව්පියන්ගේ ගමට ගිය නියාව අසා වහ වහා ලුහුබඳවා ගෙණ ක්‍රමයෙන් ගොස් අතරමගදී දුටුයේය. ඒ දුටුවිට අතරමගදීම දරුවැදීම වූයේය. ඒ වල්ලබ පුරුෂයා "අනේ සොඳුර, කිමෙක්ද"යි විවාළේය. "සවාමිනි, පුතකු වදුපිම්" කිව "දැන් කුමක් කරමෝද"යි පුරුෂයා කී කල්හි "යම් දරු කෙණෙකුන් වැදීම් නිසා මා දෙමව්පියන් ගමට යමෝ නම් ඒ කාරිය අතරමඟ දීම සිඹවියි. නැයන්ගේ ගෙට ගොස් කුමක් කරමෝද"යි කීය. මෙසේ කියා දෙදෙනම නැවත නික්මුනාහ. මෙසේ එක්සිත්ව පෙරලා තමන්ගේ ගෙට ආවා හුය. ඒ උපන්නාවූ කුමාරයාට නම් තබන්නාහු "මඟදී උපන් බැවින් පන්ථක කුමාරයෝය"යි නම් තබා ලුහ.

තවද ඒ සිටුකුමාරිකාවට නොබෝ දවසකින් දරුගබීයෙක් පිහිටියේය. ඒ සිටු දූ පළමු පරිද්දෙන්ම "දෙමව්පියන්ගේ ගමට යෙමි" කියා ගොස් අතරමගදීම දරුවන් වැදූය. ඒ කුමාරයාතවත් "මඟදී උපන් බැවින් පළමු උපන් කුමාරයන්ට මහාපන්ථක කුමාරයෝය. බාලපුතුන්ට චුල්ලපන්ථක කුමාරයෝය"යි නම් තුබූහ. ඔහු දෙදෙනම දරුවන් පොෂ්‍ය කොට ක්‍රමයෙන් වැඩෙන්නාවූ ඔවුන් දෙදෙනාගෙන් මහාපන්ථක නම් කුමාරතෙම සෙසු කුමාරවරුන් හා කෙළනා කල සෙසු කුමාරයෝ "සුළුපියාතෝය මුත්තනුවෝය මුත්තනියෝය"යි කියන්නන්ගේ බස් අසා මැනියන් අතින් විවාරන්නාහු "මැනියන් වහන්ස, සෙසු දරුවෝ "සුළුපියාතෝය මුත්තනුවෝය, මුත්තනියෝය" යි කියති "කිමෙක්ද? අපට නැයෝ නැද්දැ"යි විවාළේය. එකල්හි මැනියෝ කියන්නෝ එසේය පුත, තොපගේ නැයෝ මෙතන නැත, රජගහනුවර මහසිටාතෝය යන කෙණෙක් තොපගේ මුත්තණුවෝය. ඒ නුවර තොපගේ නැයෝ බොහෝ"යි කිවුය.

ඒ අසා කුමාරයෝ කියන්නෝ "කුමක් නිසා ඒ නැයන්ගේ සමීපයට නොයමෝද"යි කිවුය. මැනියෝද තමන් ඔබ නොයන කාරණා කියා දරුවන් නැවතුය. ඒ කුමාරයෝ නැවතත් "මුතුන්මිත්තන් සමීපයට යමිහ"යි කියා ඇවිටිළිව කියන හෙයින් පුරුෂයාට මෙසේ කිවුය. "මේ දරුවෝ හැමවේලෙම මව පීඩා කෙරෙති. කිමෙක්ද? දෙමව්පියෝ අප දැක ඇඟමත් කපා කවද්ද? කැටුව දරුවන් කැඳවාගෙණ ගොස් මුතුන් මිත්තන් දකුමහ"යි කිවුය. ඒ අසා

වල්ලභ පුරුෂයා ''මම තොපගේ දෙමව්පියන්ගේ ඉදිරියෙහි සිටින්ට අසමර්ථ යෙමි''කියා තොපි දෙදරුවන් කැඳවාගෙණගොස් මුතුන් මිත්තන් දක්ව'යි කීය. ''දැක්වීමෙනුත් ප්‍රයෝජන ඇතැ''යි කියා දෙදරුවන් කැඳවා ගෙණ රජගහ නුවරට ගොස් නුවරදොර එක් ශාලාවෙක නවාතැන් ගෙණ දරුවන්ගේ මැතියෝද දෙදරුවන් කැඳවා ගෙණ ආ කියාව දෙමව්පියන්ට කියා යවූය. ඒ අසා සිටු දුවගේ දෙමව්පියෝ සිතන්නාහු ''සසර ඇවිදිනාවූ අපට පුත්නුවූ දූනුවූ කෙණෙක් නැත. ඔහු දෙදෙන අපගේ වංශයට ඖනි කළාහ. එසේහෙයින් මහත්වූ අපරාධ කළාහ. එසේහෙයින් ඔවුන් දෙදෙනා අප ඇස්හමුයෙහි සිටින්නට නොපිළිවන්- නෝය. මේ අප දී ලු වස්තු හැරගෙණ දෙදෙනම තමන් කැමති සැප තෙනකට ගොස් ජීවත්වෙත්ව''යි කිවුය. ඒ අසා සිටුදූ දෙමව්පියන් එවූ වස්තු හැරගෙණ දරුවන් දෙන්නා තමන් සමීපයට ආ දූතයන් අතට පාවාදී යවූය. දෙදරුවෝද මුතුන් මිත්තන්සමීපයේ වැඩි වඩිනය වෙති. ඔවුන් දෙදෙනා අතුරෙන් චුල්ල පන්ථක කුමාරයෝ ඉතා බාලයෝය, මහාපන්ථක කුමාරයෝ මුත්තනුවන් හා සමඟ බුදුන් සමීපයට බණ අසන්නට යෙති. නිරන්තරයෙන් බණ අසන්නාවූ කුමාරයන්ට මහණවීමෙහි සිත නැවුනේය. එකල්හි කුමාරයෝ මුත්තණුවන්ට කියන්නෝ ''ඉදින් නුඹවහන්සේ ගිහිවස්නාසේක් වී නම් මහණවන්නෙම්වේද''යි කිවුය.

එබස් අසා මුත්තනුවෝ කියන්නාහු ''පුත, තෙපි කුමක් කියව්ද? සියලු ලෝවැස්සන්ගේ මහණවීමටත් වඩා තොපගේ මහණවීම යහපත්වන්නේය. ඉදින් තෙපි මහණදම් පුරන්නට සමර්ථයෝ නම් මහණවම් ගණුව''යි කියා කුමාර යන් කිබය ගිවිස සවිඥයන් වහන්සේ සමීපයට ගොස් සවිඥයන් වහන්සේ විසින් ''මේ කිමෙක්ද? මහසිටානෙනි, තෙපි දරුකෙනෙකුන් ලදද''යි විචාළ කල්හි ''එසේය, සවාමීනි, කුමාරයෝ මාගේ මුනුබුරානෝය, උභතුමූ නුඹ වහන්සේ සමීපයෙහි මහණවෙම්''යි කියති;යි දැන්වූහ.එබස් බුදුහු අසා එක්තරා තෙරකෙණෙකුන් වහන්සේට ''මේ කුමාරයන් මහණ කරව''යි නියොග කොට වදාළසේක. ඒ තෙරුන් වහන්සේ කුමාරයන්ට තචපඤ්චක කම්මට්ඨානය දී මහණ කළසේක.

උන්වහන්සේත් බොහෝවූ බුඩවවනයන් ඉගෙණ පිරුණාවූ විසිවයස් ඇතිසේක් උපසම්පදාව ලත්සේක. උපසම්පදාවූ තැන් පටන් නුවණින් සලකා භාවනා මනස්කාර කෙරෙමින් නොබෝ දවසකින් රහත්වූසේක. මහාපන්ථක සථවිරයන් වහන්සේ ධ්‍යාන සුවයෙන් දවස් යවන සේක් 'කිමෙක්ද? මේ සැපය චුල්ලපන්ථකයන්ට දෙන්ට පිළිවන්දෝ'යි සිතූසේක. ඉක්බිත්තෙන් ඒමහා පන්ථක සථවිරයන් වහන්සේ මුතුන් සිවානන්ගේ ගෙට ගොස්''මහසිටානෙනි, ඉදින් තෙපි ගිවිසු නම් මම චුල්ලපන්ථකයන් මහණකරවන්නෙම් වේද''යි වදාළසේක. ඒ අසා සිවානෝ 'යහපත සවාමීනි''යි චුල්ලපන්ථකයන් මහණ කළ මැනවැ''යි කිවුය. තෙරුන් වහන්සේ චුල්ලපන්ථකයන් මහණ කොට දශ ශීලයෙහි පිහිටා වූ සේක. චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේ මහණවෙලා මෑදුප්‍රාඥ වූහ.

''පදුමං යථා කොකනදං සුගන්ධං-පාතෝ සියා ඵුල්ලමවීතගන්ධං
අංගීරසං පස්ස විරොචමානං-තපනතමාදිච්ච මිව'නතලික්ඛෙ''

යන මේ ගාථාව සාරමසකින් වනපොත් කරන්ට අසමර්ථවූයේය. ඒ චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේ ශාශ්‍යප සම්බුදුරජාණන් වහන්සේගේ සම යෙහි මහණව නුවණැතිව එක්තරා නුවණවැඳ භික්ෂුකෙණෙකුත් වහන්සේ පාළි උගන්නා කල්හි සිතාසි නින්දා කොට කෙළිසේක.ඒ නුවණවැඳ භික්ෂූන්වහන්සේ ප්‍රඥාවන්ත භික්ෂූන්වහන්සේගේ නිසැයෙන් පාළිය නුගත්සේක.වනපොත් නොකළසේක. ඒ පූර්වජන්මයේ කරණලද අකුශල කර්මානුභාවයෙන් මේ චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේ මහණවූ ගමනේ නුවණින් මඳවූසේක. පළමු වන, පොත් කළ පදය ඉදිරියෙ වනපොත් කරණකලට නස්නේය. මේ ගාථාව වන පොත් කරන්ට උත්සාහකරන්නාවූ චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේට සාරමසක් ඉකුත්ව ගියේය.

එකල්හි මහාපන්ථක සථවිරයන්වහන්සේ මේසේ වදාළසේක. ''පන්ථක යෙනි, මේ ශාසනයට අයොග්‍යව සාරමසකින් එකගාථාවක් වනපොත් කොට ගන්ට අසමර්ථව ප්‍රව්‍රජ්‍යාකෘත්‍යය වූකලී තෙපි කෙසේ මස්තකප්‍රාප්ත කරවූදැ:'යි මෙතෙකින් පලායව''යි කියා විහාරයෙන් නෙරපූසේක. එසමයෙහි මහාපන්ථක සථවිරයන්වහන්සේ සියලු සඞ්ඝයාවහන්සේට බත් බෙදා දෙනසේක. ජීවකයෝ බොහෝ ගඳ දුම් මල් පහන් ආදිය ගෙන්වා ගෙණ තමන්ගේ අඹ උයනට ගොස් බුදුන්ට පූජාකොට බණ අසා උනස්නෙන් නැගී බුදුන් වැඳ මහාපන්ථකසථවිරයන් වහන්සේ කරා එළඹ ''ස්වාමීනි, බුදුන් සමීපයේ කෙතෙක් භික්ෂූන්වහන්සේදැ''යි විමසා සිටියේය. තෙරුන්වහන්සේ ''පන්සියයක් පමණ භික්ෂූන්වහන්සේය''යි වදාළසේක.

එකල්හි ජීවකයෝ කියන්නෝ ''ස්වාමීනි, සෙට බුදුන් ප්‍රධාන කොට ඇති පන්සියයක් භික්ෂූන්වහන්සේ කැඳවාගෙණ අවුත් මාගේ ගෙයිදී සිහුව මැනවැ''යි කිවුය. ''උපාසකයිනි, චුල්ලපන්ථකයෝ ශාසනයෙහි පිහිටක් නොලද්දේය. උන් හැර සෙසු භික්ෂූන්වහන්සේට තොපගේ ආරාධනාව ඉවසන්ට කියන්නෙම් වේදැ.''යි වදාළසේක ඒ අසා චුල්ලපන්ථක සාමණේරයන් වහන්සේ සිතාසේක් ''මහාපන්ථක සථවිරයන් වහන්සේ මෙතෙක් භික්ෂූන්වහන්සේගේ ආරාධනාව ඉවසනසේක් මා පිටත්කොට ඉවසූසේක. ඒකාන්තයෙන් මාගේ බැනන්වහන්සේ මා කෙරේ බිඳී ගියේය. එසේ කල මව දැන් ශාසනයෙන් ප්‍රයෝජන කිම්ද? ගිහි වෙමි. ගිහිව සිව දැනදීවූ පින් කම් කොට ජීවත්වෙමි''යි සිතා ''දෙවෙනි දවස් උදැසන ගිහි වෙමි''යි සිතා නික්මුනේය.

සම්බුදුරජාණන් වහන්සේ අළුයම් වේලෙහි ලොව බලා වදාරණසේක් මේ කාරණය දැක පළමුකොට ගොස් චුල්ලපන්ථකයන්වහන්සේ යනමග දෙරටුවේ සක්මන් කරණසේක. තමන්වහන්සේ වසනගෙන් නික්මුනුසේක් සම්බුදුරජාණන් වහන්සේ දැක ''ස්වාමීනි''යි කියා එළඹ නමස්කාර කළසේක. ඉක්බිත්තෙන් සම්බුදුරජාණන්වහන්සේ ''චුල්ලපන්ථක, මේ වේලේ කොයි යව්දැ''යි වදාළසේක. ''ස්වාමීනි, මාගේ බැනනුවන්වහන්සේ මා ශාසනයෙන් නෙරපූසේක. එසේ හෙයින් මම ගිහි වන්නෙමි''යි දැන්වූසේක. ඒ අසා සම්බුදුරජාණන්වහන්සේ ''චුල්ල පන්ථකයෙනි, තොපගේ ප්‍රව්‍රජ්‍යාව තම් මා සන්තකය, බැනන්විසින් නෙරණා ලද්දාවූ තොපි කවර කාරණයකින් මා සමීපයට නාවාහුද? මා කැටුව එවයි ගිහිවීමෙන් ප්‍රයෝජන කිම්ද? මා සමීපයේ වාසය කරව''යි කියා වදාළහ.

ඉක්බිති චුල්ලපන්ථකයන්වහන්සේ කැඳවාගෙණ ගොස් ගඳකිළි නිස මත්තෙහි හිඳුවා "චුල්ලපන්ථකයෙනි, නැගෙණිරට අභිමුඛව හිඳ මේ රෙදිද "රජෝහරණං, රජෝහරණං" යී කිය කියා පිරිමැදීමෙන් මෙතන හිඳුව"යි වදාරා සෘඩියෙන් මවනලද පිරිසිදු රෙදිදක් දී වඩනට වේලා දුන්වූ කල්හි භික්ෂු සඞ්ඝයාවහන්සේ පිරිවරා ජීවකයන්ගේ ගෙට ගොස් පණවන ලද බුබාඃඝන මස්තකයෙහි වැඩඋන්සේක. චුල්ලපන්ථකයන් වහන්සේද සූයශ්‍රීරශ්මි බල බලා ඒ රෙදිකඩ "රජෝහරණං, රජෝහරණං" යී කිය කියා පිරිමදිමින් උන්සේක. මෙසේ ඒ චුල්ලපන්ථකයන් වහන්සේ ඒ රෙදිකඩ පිරිමැද මැද සිටියදීම කිලුටුව ගියේය. ඉක්බිති උන්වහන්සේ සිතාසේක් "මේ රෙදිකඩ ඉතා පිරිසිදුය. නිර්මලය. මේ ආත්මභාවය නිසා පූර්ව ප්‍රකෘති හැර මෙසේ කිලුටුව ගියේය. ඒකාන්තයෙන් ප්‍රත්‍යසමුත්පන්නතායෙන් ධර්මයෝ ඉපද නස්නා සුල්ලහ ය"යි කිය කියා ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයන්ගේ ක්ෂණභඞ්ගයෙහි ඉපද නස්නා බව සලකමින් විදර්ශනා වැඩුසේක. සර්ව්ඥයන්වහන්සේද "චුල්ල පන්ථකයන්ගේ සිත විදර්ශනාවට නැගෙන්නේයයි චුල්ලපන්ථකය, රෙදි කැබැල්ල කිලුටුව රජසින් රැඳී ගියේද? එමෙන් තාගේ අභ්‍යන්තරයෙහිද රාගරජාදීහු ඇත. ඔවුන් දුරුකරව"යි කියා ආලෝකයක් හැර ඉදිරියේ උන්නාක් මෙන් පෙණෙන්නාවූ සුවිරූප ඇතිව මේ ගාථාවන් වදාළසේක.

**"රාගෝ රජෝ නව පන රෙණු වුච්චති-රාගස්සේ'තං අධිවචනං රජෝ'ති;**
**එතං රජං විප්පජහිත්ව භික්ඛවෝ-විහරන්ති තේ විගතරජස්ස සාසනේ.**
**දෝසෝ රජෝ නව පන රෙණු වුච්චති-දෝසස්සේ'තං අධිවචනං රජෝ'ති;**
**එතං රජං විප්පජහිත්ව භික්ඛවෝ-විහරන්ති තේ විගතරජස්ස සාසනේ.**
**මෝහෝ රජෝනවපන රෙණු වුච්චති-මෝහස්සේ'තං අධිවචනං රජෝ'ති;**
**එතං රජං විප්පජහිත්ව භික්ඛවෝ-විහරන්ති තේ විගතරජස්ස සාසනේ."**

යන මේ ගාථා වදාළ ඉක්බිති චුල්ලපන්ථක සථවිරයන් වහන්සේ සිව්පිළිසිඹියා හා සමග රහත්වූ සේක. චතුපරිසම්නිදාවට පැමිණීමෙන්ම ත්‍රිපිටකය ප්‍රගුණ විය. ඒ චුල්ලපන්ථක සථවිරයන් වහන්සේ පෙර රජව ඉපද නුවර පැදකුණු කරණසේක් තලළුන් ඩා වැගිරෙන්ට පටන්ගත් කල්හි පිරිසිදු සළුපටින් තලල්කෙළවර පිසපූසේක. සළුව කිලුටුව ගියේය. ඒ රජ්ජු රෑවෝ සිතන්නාහු "මේ ශරීරය නිසා මෙබඳුවූ පිරිසිදු සළුව තමාගේ පිරිසිදු ධවලගුණය හැර කිලිටුව ගියේය. ඒකාන්තයෙන් ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයෝ අනිත්‍යයෝය'යි අනිත්‍ය සංඥාව සිහිකෙළේය. ඒ කාරණයෙන් ඒ තෙරුන් වහන්සේට රජෝහරණයම ප්‍රත්‍යය විය. ජීවකයෝත් සර්ව්ඥයන්වහන්සේව දක්ෂිණොදකය ඵලවූය. බුදුහු එවේලෙහි "ජීවකයෙනි, විහාරයෙහි භික්ෂූහු ඇත්තෝ නොවේදැ"යි කියා අනින් පාත්‍රය වැසූසේක. එවේලෙහි මහාපන්ථක සථවිරයන්වහන්සේ "ස්වාමීනි විහාරයෙහි භික්ෂූහු නැත්තේ වේද්දැ"යි කීසේක. සර්ව්ඥයන්වහන්සේ භික්ෂූන් ඇති නැති නියාව දැන එව"යි කියා පුරුෂයකු යැවූහ.

එකෙණෙහි චුල්ලපන්ථක සථවිරයන්වහන්සේ සිතාසේක් මාගේ බැනන්වහන්සේ "විහාරයෙහි භික්ෂූහු නැතැ"යි සිතූහ. 'විහාරයෙහි භික්ෂූන් ඇති නියා උන්වහන්සේට ප්‍රකාශ කළ මැනවැ"යි සිතා සියලු අඹ උයන

භික්ෂූන්ගෙන්ම පිරුණේක. සමහර භික්ෂූන් වහන්සේ සිවුරු ගෙන්නම් කරණ සේක. සමහර කෙණෙකුත් වහන්සේ සිවුරු රඳනසේක. සමහර කෙනෙකුත් වහන්සේ වනපොත් කරණසේකැ''යි මෙසේ ඔවුනොවුන් වෙනසක් නැතිව එකසුවරුපවූ භික්ෂූන් දහසක් මැවූසේක. බලන්ට ගිය පුරුෂයා විහාරයේ බොහෝ භික්ෂූන්දැක නැවත අවුත් ජීවකයන්ට කියන්නේ ''සියලු අඹ උයන භික්ෂූන්ගෙන් ගැවසී ගත්තේය''යි කීය. ඉක්බිති සර්‍වඥයන් වහන්සේ ඒ පුරුෂයාට වදාරණසේක් ''බුදුහු චුල්ලපන්ථකයන් වහන්සේ කැඳවනසේක''යි කිය ව යි වදළසේක. එබස් අසා පුරුෂයා ගොස් එපරිද්දෙන් කී කල්හි ''මම චුල්ල පන්ථක යෙම්''යි ''මම චුල්ල පන්ථක යෙම්''යි මුඛ දහසක් නැංගේය, එකල්හි ඒ පුරුෂයා නැවත බුදුන් කරා ගොස් ''ස්වාමීනි, ඇමදෙනා වනන්සේ ''අපි චුල්ලපන්ථක යම්හ, ''අපි චුල්ලපන්ථකයම්හ''යි කියනසේකැ''යි දැන්විය. එබස් අසා බුදුහු ''දැන් තෝ ගොස් පළමුකොට යමෙක් ''මම චුල්ලපන්ථක යෙම්'' කිවු නම් ඔහු අත අල්වා ගණුව, අවශෙෂයෝ අනන්‍තර්‍ධානවෙති'' වදාළාහ. එවේලෙහි ඒ පුරුෂයා එපරිද්දෙන්ම කෙළේය. දහසක් පමණ භික්ෂූන් වහන්සේ අනන්‍තර්‍ධානවූසේක. තෙරුන්වහන්සේද කැඳවාගිය පුරුෂයා හා කැටිව වැඩිසේක. සර්‍වඥයන් වහන්සේ ජීවකයන් කැඳවා ''ජීවකයෙනි, චුල්ලපන්ථකයන්ගේ පාත්‍රය ගණුව''යි චුල්ලපන්ථකයෝ තොපට අනුමෙවෙනි ධර්‍මදෙශනා කෙරෙ ති''යි වදළහ. ජීවකයෝ එපරිද්දෙන්ම කළෝය. එවේලෙහි චුල්ලපන්ථක සථවිරයන් වහන්සේ සිංහනාද කරන්නාවූ අජිත කෙසර සිංහරාජයකු පරිද්දෙන් තුන්පිටකය අළලා අනුමෙවෙනි ධර්‍මදෙශනා කළසේක. සර්‍වඥයන් වහන්සේ උතස්තෙන් පැන නැගී භික්ෂුසඞඝයා පිරිවරා විහාරයට වැඩ භික්ෂූන් විසින් වත් දක්වූ කල්හි උතස්තෙන් නැගී ගදකිළි නිස මත්තෙහි සිව භික්ෂු සඞඝයා වහන්සේට සුගතොවාදය දී කමවහන් දී වදාරා භික්ෂුසඞඝයා යවා සිවි දෑ ගදින් සුවද කරණලද ගදකිළියට වැද දකුණැලව සිංහසෙය්‍යාව කොට වදාළ සේක. ඉක්බිත්තෙන් සවස්වේලෙහි ධර්‍මසභාමණ්ඩපයට භික්ෂූන්වහන්සේ නොයෙක් තැනින් රැස්ව රත්පලස් තිරයක් වටකරණ කලක් මෙන් භිඳ බුදුන්ගේ ගුණකථාවට පටන්ගත්සේක.

''ඇවැත්නි, මහාපඤ්ඤසථවිරයෝ චුල්ලපන්ථකසථවිරයන්ගේ අධ්‍යා සය නොදන්නාහු, එක ගාථාව සාරමසකින් වනපොත් කොටගතණුහුණුවෝය. නුවණ මඳයෝය යි කියා විහාරයෙන් නෙරපූය. සර්‍වඥයන් වහන්සේ තමන් වහන්සේ ධර්‍මරාජන් බැවින් එකම අන්තරාභක්තයෙහි සිවුපිළිසිඹියා හා සමඟ අර්‍හත්ඵලය දුන්සේක. චතුපටිසම්භිදාප්‍රාප්ත විය. එමෙන් තුන් පිටකය ප්‍රගුණ විය. සර්‍වඥයන් වහන්සේගේ බලමහිමය නම් ඉතා ආශ්චර්‍යවන්තේය''යි බුදුන් ගේ ගුණ කිය කියා උන්සේක. එකල්හි සර්‍වඥයන් වහන්සේ ධර්‍මසභාමණ්ඩප යෙහි මේ කථාප්‍රවෘත්තිය දැන ''අද මා විසින් එතනට යන්ට වටනේය''යි බුඛ සෙය්‍යාවෙන් නැගී රත්වූ දෙපට අඳනා සිවුර ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනය කිරීම් වශ යෙන් හැඳ විද්‍යුල්ලතා සශ්‍රීකවූ පට්ඨාතුව ර්මත්තේ බැඳ රත්පලසක් හා සමා නවූ පාංශුකූල සුගතමහාචීවරය එකාංශකොට ර්මත්තේ පෙරවා සුගන්ධ ගන්ධ කුටියෙන් නික්ම මත්තභඤ්ඤිරාජයක්හු අල්වන්නට නික්මුනු කෙශර සිංහරාජ යකුගේ විලාසයෙන් අප්‍රමාණ සර්‍වඥලීලාවෙන් ධර්‍මසභාමණ්ඩපයට වැඩ සරහන ලද මණ්ඩපමඩ්‍යයෙහි පණවනලද උතුම්වූ බුඩාසන මඤ්චකයට පැනතැගීඝඩ්වණී බුඩරශ්මි මාලාවන් විහිදුවමින් සාගරකුක්ෂිය බබුළුවමින් යුගදුරු මුදුනෙහි දිලි

සෙන්නාවූ ලක්ෂ්මණ්ඩලක් මෙන් දිලිහි දිලිහි ආසන්නමඩ්ඩයෙහි වැඩඋන්සේක්බුදු. රජතුන් වහන්සේ එතැනට පැමිණි කෙණෙහිම භික්ෂුසඞ්ඝයා වහන්සේ කථා විච්ඡේදනය කොට මුවෙන් නොබැණ වැඩඋන්සේක. සම්මෝදයන් වහන්සේ මොළොක්වූ මෙත්සිනින් භික්ෂු පමිත් බලා "මේ පමිද ඉතා බොහෝ වන්නේය. එකද භික්ෂුවක්හුගේ අතපය සෙලවීමක් වෙව හි කැසපියන කිඹිසපියන ශබ්ද යක් වේවයි නැත. මේ සියලු භික්ෂුහුම බුඩගෞරවයෙන් හා බුඩතේජසින් නැහිඟන්හ. ආයුෂ්කල්පය මුළුල්ලෙහි මා බැණ නොනැගී උන් කල්හිදු පළමු කොට කථාවක් නූපදවති. එහෙයින් මම පළමුකොට කථාවක් උපදවම්"යි සිතා මිහිරිවූ බ්‍රහ්මස්වරයෙන් භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට "මහණෙනි දැන් කවර කථාවකින් යුක්තව උනුද? කවර තම් කථාවක් නොපට අඩාලවීද"යි විචාළ සේක.

එකල්හි ඒ භික්ෂූන්වහන්සේ "අපි මෙතැන්හි උන්නමෝ අන්‍යවූ සඟී මොඤවයඟට බාධකවූ තිරශ්චීන කථාවක් නොකීමිහ. කුඹවහන්සේගේ ගුණ වණීනා කොට කොට උනුම්හ"යි දැන්වූසේක. එකල්හි භික්ෂූන් වහන්සේගේ කථාව අසා මහණෙනි චුල්ලපන්ථකයෝ දැන් මා නිසා ධම්මහත්ථයට පැමිණියෝය, පෙරත් වූකලී මා නිසා හොඟම්හත්ථයට පැමිණියෝය"යි වදාළසේක. එකල්හි එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ ඒ අර්ථය ප්‍රකාශකරණු පිණිස භාග්‍යවත්වූ බුදුරජානන් වහන්සේට ආරාධනා කළසේක. භාග්‍යවතුන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

**අතීතය** දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු සෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතානෝ සිටුකුලයක ඉපද වැඩිවිය පැමිණ සිටුතනතුරු ලැබ 'චුල්ලසිටානෝය'යි යන නමින් ප්‍රසිඩව වසනකල ඒ සිටානෝ කුවණැත්තෝය. ව්‍යක්තයෝය. සියලු නිමිති දනිති. එක් දවසක් ඒ සිටානෝ රාජසේවයට යන තැනැත්තෝ විපිමඩ්ඩයෙහි මළ මියකු දැක කඤ්ඤත්‍රයොඝය පරීක්ෂා කොට මෙසේ කිවුය. "නුවණැති කුලපුත්‍රයක්හු විසින් මේ මියා ඇර ගෙණ පුත්‍රදාරාවන් පොෂ්‍යකරන්ටවත් වෙළඳුම් කරන්ටවත් පුළුවන්වන්නේ වේදැ"යි කිවුය.

එක්තරා දුගීපුරුෂයෙක් සිටානන්ගේ ඒ වචනය අසා සිටානෝ නොදැන නොකියති"යි සිතා මියා ඇරගෙණ එක් සල්පිලෙක බළලකු නිසා දී දෙවිසට සමාරක් රත්රන් ලද්දේය. ඒ කාකණිකමාත්‍රාවෙන් උක්සකුරු ගෙණ එකකළයෙකින් පැන්ගත්තේය. එතෙම වලිත් මල්කඩාගෙණ ලන්නාවූ මාලාකාරීන් දැක උක්සකුරු සුඟක් දී පැන්වත් කෙළේය. ඒ මාලාකාරීහු එකී එකී මල්මිට මිවදුන්නාහ. ඒ තෙමේ මල් විකොට ඒ මල් මිලයෙන් දෙවෙනි දවස් උක් සකුරු හා පැන්කළයක් ගෙණ මල්වත්තට ගියේය. එදවස් ඔහට මාලාකාරීහු මල්හාඟයක් කඩාගෙණ මල්ගස් දී ගියාහ. ඒ තෙමේ නොබෝදවසකින් මේ උපායෙන් අටකහවණුවක් ලද්දේය. නැවත එක් වැසිසුලං දවසක රාජෝද්‍යාන යෙහි බොහෝ වියලී දඬු හා අතුපත් සුලඟින් වැගුරුණේය. උයන් ගොවීවාද තමන්ට උපාය නොදක්නේය, එකල්හි ඒ පුරුෂයා එතනට ගොස් "ඉදින් නොපි, මේ දඬු හා අතුපත් මට දෙව්නම් මම් සියලු දඬුපත් උයනින් පිටින් කරවා පියන්නෙම් වේදැයි උද්‍යානපාලයාට කීය. උද්‍යානපාලයා "යහපත යහළු ඇරගෙණැ"යි ගිවිස්සේය.

චුල්ලන්නෙවාසිකතෙම කුඩා කොල්ලන්ගේ කෙළිමඩුල්ලට ගොස් උක් සකුරු දී ඇසිල්ලකින් ඒ සියලු දඬුපත් කුඩා කොල්ලන් ලවා උයනින් අද්දා පිටත්කරවා උයන් දොරකඩ කැටිකරවූයේය. එකල්හි රජගෙට වලං ලන කුඹලා රජගෙට වලං පලහතු සඳහා දර සොයා ඇවිදින්නේ උයන දොරකඩ තුබූ ඒ දරගොඩ දැක ඔහු අතින් මිල දී විකිණීගත්තේය. එදවස් චුල්ලන්නෙවාසිකතෙම සෙළොස් කහවණුවක් හා සැල ආදීවූ වලං පන්සියයකුත් ලද්දේය. එතෙමේ වෙළඳුම් කිරීමෙන් කහවණු සුවිස්සක්වූ කල්හි "මට මේ උපාය ඇතැ"යි නුවර දොරටුවට නුදුරුතෙනක එක් පැන් සලක් තබාගෙණ පන්සියයක් තණ අදින පුරුෂයන්ට පැන් වත්කෙළේය. ඔහු මෙසේ කිවුය, "යහළු තොපි අපට බොහෝ උපකාර කළහුය, තොපට අපි කුමක් කරමෝ දැ"යි කිවුය, එකල්හි චුල්ලනෙතවාසිකයා කියන්නේ "මාගේ කාරියක් පැමිණි කල්හි කියන්නෙම් වේදැ"යි කියා ඇහා මැත ඇවිදින්නේ ගොඩ වෙළඳුම් කරන්නවුන් හා සමගත් මුහුදු වෙළඳුම් කරන්නවුන් හා සමගත් මිත්‍රව ගත්තේය. එකල්හි ඕහට ගොඩ වෙළඳුම් කරන්නවුන්ගේ ප්‍රධාන පුරුෂතෙම ඉදින් සෙට දවස් මෙනුවරට අස්වෙළෙදෙක් පන්සියයක් අසුන් ගෙණ එන්නේය"යි කීය. එතෙම ඔහුගේ වචනය අසා තණගෙණෙන්නාවූ පන්තයින්ට අද මට එකි එකී තණ මිටියක් දෙව, මා තණ විකුණන්නට පළමුකොට තොපි ඇම තණ තොවිකුණව"යි කීය. එකල ඔහු හැමදෙන "යහපතැ"යි ගිවිස පන්සියයක් තණ මිටිගෙණවුන් ඔහුගේ ගේදොර එලූහ. අස්වෙළෙන්දු සියලු නුවර ඇවිද අසුන්ට තණ නොලැබ ඒ චුල්ලන්නෙවාසිකයාගට කහවණු දහසක් දී තණ ඇරගත්තේය. ඉක්බිත්තෙන් කිපදවසක් ගියකලට සමුද්‍රයාත්‍රාවෙන් වෙළඳුම් කරන්නාවූ යෙහෙවා ඕහට කියන්නේ "තොටට නැව් අවුත් වතැ"යි කීය. එකල චුල්ලනෙත වාසික පුරුෂයා "මට මේ උපායෙන් ප්‍රයෝජන ඇතැ"යි සිතා කහවනු අටක්දී සියලු පිරිවරින් යුක්තව පිරුණු රථයක් ගෙණ මහත්වූ යසපිරිවරින් බටහිර තොට ගමට ගොස් පේරුස් මුද්දක් නැවට අනභිකාරම් කොට දී නුදුරුතෙනක වවකොට තිරයක් බඳවා සමීපවූ වරපුරුෂයන්ට මෙසේ විධාන කෙළේය. පිව තින් වෙළෙන්දු අවු නම් රුකවල් තුනකින් මෙහෙවර කියා මා සමීපයට කැඳවා ගෙණ එව"යි කීය. එකල "පටුනුගමට නැව බට"යි අසා බරණැස් නුවරින් වෙළෙන්දු සියයක් "බඩුගම්හ"යි ආවාහුය. නැවත බඩු වෙළඳුම් කරන්නාවූ මනුෂ්‍යයෝ කියන්නාහු අපගෙන් තොපට බඩු නොලැබෙයි. අසවල්තෙන භිදිනා මහවෙළඳුනන් විසින් අත්තිකාරම් දෙනලදැ"යි කිවුය. එබස් අසා බරණැස් නුවර වෙළෙන්දු ඒ චුල්ලන්නෙවාසිකයා සමීපයට ආවාහුය. ඔහුගේ අත වැසි පුරුෂයෝ පළමුකොට ලූ විධාන තියාවට රුකවල් තුනකින් තුන්විටක් ඔබිනොබ මෙහෙවර කියා අවුත් ඒ වෙළඳුන් ආ බව කියා යැවීවාහුය. වෙළෙන්දු චුල්ලනෙතවාසිකයන්ට එකි එකී දහසක්දී චුල්ලනෙතවාසික පුරුෂයා හා සමග නැවි බඩු ගණුම්හ"යි පත්තුව ගෙණ නැවත එකි එකී දහසක්දී නැවත බඩු අරවා ගෙණ බඩු තමන් සන්තකකළාහ. චුල්ලනෙතවාසිකතෙම දෙලක්ෂයක් වසතු හැර ගෙණ බරණැස්නුවරට අවුත් "සත්පුරුෂයන්ට කෙළෙහිගුණ දැන්ම සුදුසු වේදැ"යි ලක්ෂයක් වසතු ගෙන්වාගෙණ චුල්ලසිටුතන්න් සම්පයට ැහියේය.

එකල්හි සිටුතෝ ඕහට දරුව තොප විසින් කුමක් කොට මේ වස්තුව ලබන ලද්දේදැ" කීය. මළ මියාගේ විකිණීම පවත් සියලු ප්‍රවෘත්තිය කියේය.

චුල්ලසිටාතෝ ඔහුගේ බස් අසා "මෙබඳු පුරුෂයකු අනුන්ට ඇරපියන්නට සුදුසු නොවන්නේය"යි කියා වැඩිවිය පැමිණ සිටි තමන්ගේ දියනියන් ඔහුට පාවාදී සියලු තමන්ගේ වස්තුවට හිමි කළාහ. ඒ පුරුෂයා චුල්ලසිටානන්ගේ ඇවැමෙන් ඒ නුවර සිටුසේසත් ලද්දේය. මහබෝසතානෝ දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහ"යි වදාළසේක. තිලෝගුරු සම්‍යක් සම්බුඩ රාජොත්තමයානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා මත් තෙහින් ධර්මදේශනා කොට "යම්සේ නුවණැති පුරුෂයෙක් මදහින්තක් ක්‍රමයෙන් ගොම සුණු ආදිය ලා මුඛයෙන් පිඹ මහත්වූ චන්නිස්කන්ඩයක් කෙරේද? එපරිද්දෙන්ම නුවණැති සත්ත්වතෙම යම් සුවල්පවූ බඩු මිලයක් ලැබ නොයෙක් උපායෙන් වේළෙදුම් කොට වස්තු යශස් වර්ධනය කරන්නේය"යි මෙසේ භාග්‍ය වත්වූ බුදුරජානන් වහන්සේ 'මහණෙනි, චුල්ලපන්ථක සථවිරයෝ දැන් මෝනිසා ධර්මයේ මහන්තත්වයට පැමිණියෝය. පූර්ව ජන්මයෙහි මහත් හොග මහන්තත්වයට පැමිණියෝය"යි මේ ධර්මදේශනාව වදාරා අතීතකථාවත් වර්තමාන කථාවත් දෙකම එක්කොට පූර්වාපරසන්ධි ගළපාමේ චුල්ලසෙට්ඨිජාතකයනිම්මාවදාළසේක. එසමයෙහි "චුල්ලනෙතාවාසික පුරුෂ තෙම දැන් මේ චුල්ලපන්ථකසථවිරයෝය. එසමයෙහි චුල්ල සිටුව උපන්නෙම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේද"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 5
## තණ්ඩුලනාළි ජාතකය.

මේ වදාළ එක් සමයෙක්හි ශාක්‍යසිංහවූ සම්‍යක් සම්බුදු රජානන් වහන්සේ සැවැත් නුවර නිසා ජෙතවනාරාමයෙහි වාසය කරණසේක් ලාභදායී තම් තෙර කෙණෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළසේක.

ඒ කවරේද? යත් එක් සමයෙක්හි දබ්බමල්ලපුත්‍රසථවිරයන් වහන්සේ සඞ්ඝයාවහන්සේට ලාබත් ආදීවූ බත් පමුණුවනසේක. උන්වහන්සේ උදැසන ලාබත් පමුණුවන්ට වන්කල්හි උදායිසථවිරයන් වහන්සේට කිසිකලෙක යහපත් බතෙක් පැමිණෙන්නේය, කිසිකලෙක නපුරු බතෙක් පැමිණෙන්නේය. උදායිසථවිරයන් වහන්සේ තමන්වහන්සේට නපුරු බත පැමිණි දවස් ලාබත් බෙදන්නාවූ සථානයෙහි ආලොළන කරණසේක "කිම? දබ්බමල්ලපුත්‍රයෝම ලාබත් බෙදන්ට දනිද්ද? අපි නොදනිමෝද්ද"යි කියාත් කියනසේක. උන් වහන්සේ ලාබත් බෙදන තැන ආලොළන කරණහෙයින් "එසේවී නම් දැන් නුඹ වහන්සේම ලාබත් බෙදු දුනමැනව'යි කියා ලාබත් පෙව්වි ඒ තෙරුන් වහන්සේට පාවා දුන්හ.

එතැන් පවත් සංඝයාවහන්සේට ඒ ලාභදායී සථවිරයන්වහන්සේම ලාබත් බෙදු දෙනසේක. දෙන්නාවුන් ඒ තෙරුන්වහන්සේ යහපත් බත වේවයි නපුරු බත වේවයි අසවළුන්ගේ කොටසේ යහපත් බත සිටියේයයි කියාවත් අසවල් කොටසේ නපුරු බත සිටියේයයි කියාවත් නොදන්නා සේක. ඛතිකාව කරණසේකුත් අසවල් ඛතිකාව කොටසේ සලකාගත නොහෙන සේක. භික්ෂූන්වහන්සේ පාළියේ සිටි වේලාවෙහි මෙතන අසවල්

සිතිකාව සිටියායය. මෙතන අයවල් සිතිකාව සිටියා යි බිමවත් හික්ති යේවත් ඉරක් අදිනාසේක. දෙවෙනි දවස් ලාබත් තැන හිඤුන්වහන්සේ මඳ නෝ වනසේක. බොහෝ හෝ වනසේක. හිඤුන්වහන්සේ මඳවූ කල ඇඳලූ ඉර අගට පලා යන්නේය. බොහෝවූ කල්හි මුලට වන්නේය. ඒ උදුයි සථවිරයන්වහන්සේ සිතිකාව දැනගත නොහී රෙඛා සංඥයෙන් ලාබත් දෙනසේක.

එකල්හි අවශෙෂ හිඤුන්වහන්සේ කියනසේක් "ඇවැත්වූ උදුයි සථවිරයෙනි, රෙඛාව නම් පසු නෝ වෙයි, උතුම් බත අසවල් කොවසේ සිටියේය, නපුරු බත අසවල් කොවසේ සිටියේය"යි කීසේක. ඒ අසා උදුයි සථවිරයන් වහන්සේ හිඤුන්වහන්සේ හා විවාද කරණසේක් "එසේ වී නම් මේ ඉර කවර කාරණයකින් මෙසේ සිටියේද? මම නුඹවහන්සේගේ බස් කුමක් පිණිස අදහම්ද? මේ රේඛාවෙන් අදහමි"යි කීසේක. එකල්හි බාල හිඤුන්වහන්සේත් සාමණෙරයන්වහන්සේත් "ඇවැත්වූ ලාළුදුයි සථවිරයන් වහන්ස, නුඹවහන්සේ ලාබත් බෙදා දෙතොත් හිඤුන්වහන්සේ ලාභයෙන් පිරිහෙණ සේක. නුඹවහන්සේ බත් බෙදා දෙන්ට සුදුසු නොවනසේක. මෙතනින් නික්මුණ මැනවැ"යි කියා ලා බත් බෙදාදෙන තැනින් නෙරපූ සේක. එවේලෙහි ලාබත් බෙදා දෙන තැන මහත් කෝලාහල විය. ඒ අසා සමීඳයන් වහන්සේ අනඳ මහතෙරුන්වහන්සේ අතින් විචාරණසේක් "ආනන්දයෙනි, ලාබත් බෙදන තැන මහත් වූ කෝලාහල ඇසෙයි. මේ කවර කෝලාහල ශබ්දයෙක් දැ"යි වදළ සේක. අනඳ මහතෙරුන්වහන්සේ සමීඳ යන් වහන්සේට එපවත් දන්වූසේක.

එකල්හි සමීඳයන්වහන්සේ "එම්බා ආනන්දයෙනි, උදුයි සථවිරයා තමා අඳුන බැවින් අනුන්ට ලාභ හානි කෙළේ දැන්මත්තු නොවෙයි, පළමුත් කෙළේ වේදැ"යි වදළසේක. අනඳ මහතෙරුන්වහන්සේ ඒ අර්ථය ප්‍රකාශ කරණ පිණිස සමීඳයන්වහන්සේට ආරාධනා කළසේක. බුදුරජාතන් වහන්සේ භවාන්තරප්‍රවෘත්ත කාරණය ප්‍රකාශ කොට වදළසේක.

යිවගිය දවස කසීරට බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කරන්නාහුය. එකල අප මහබෝසතානෝ ඒ රජ්ජුරු වන්ට වන්කකුකම් කරන්නාහුය, ඇත් අස් ආදීන් හා රන්රුවන් ආදිය අගය කරවති. ඒ ඇත් අස් ආදීන් අගය කරවා වස්තුසවාමීන්ට වස්තුවට සුදුසුවූ වටිනා මිලම දෙවති. රජ්ජුරුවෝ වූකලී ඉතා ලොභියෝය. ඒ රජ්ජු රුවෝ තමන් ලොභි ප්‍රවෘත්ති ඇති බැවින් මෙසේ සිතූය. "මේ වන්නක්කා මෙසේ වන්නකුකම් කොට අය වැය කෙරේ නම් නොබෝ කලෙකින්ම මාගේ භාණ්ඩාගාරයේ වස්තු නිමා යන්නේය. එසේහෙයින් අනිකකු වන්නකු තනතුරෙහි තබමි"යි සිතූය. මෙසේ සිතා ඒ රජ්ජුරුවෝ සිවුමැදුර කවුළුව හැර රාජාගඞ්ගතය බලන තැනැත්තෝ ලොභිවූ නුවණ නැති එක් ගම්වැසි පුරුෂයකු රාජාඞ්ගතයෙන් යන්නා දැක "මේ තෙමේ මට සියලු වස්තුවේ අගය තබා අයවැය කරන්ට සමර්ථ වන්නේය"යි ඔහු සමීපයට කැඳවා ගෙන්වා ගෙණ දරුව, නෝ අපට වස්තුවෙහි අගය තබා අය වැය කොට වන්නකුකම් කරන්ට සමර්ථයෙහිදැ"යි කිවූය. එබස් අසා ඒ පුරුෂයා "යහපත, සවාමීනි"යි

නිවිසි කල්හි රජ්ජුරුවන්ගේ වස්තුව රක්නා පිණිස ඒ අඥාන පුරුෂයා වන්නකු කමෙහි සැලසුය. එතැන් පටන් ඒ දක්ෂයා ඇත් අස් ආදීන් අගය කරන්නේ අගය පිරිහෙළා මුඛාවෙශවූ යම් මිලයක් අභිප්‍රායවූ පරිද්දෙන් කියයි. ඔහු වන්නකු තතතුරෙහි සිටි බැවින් එතෙම යම් මිලයක් කීතම් ඔහු කී මිලම ඒ වස්තුවට මිල වන්නේය. රාජකීයොගයෙන් සැලසූ තැනැත්තවුන් හෙයින් ඊට විරුඬව උත්තර කියන කෙණෙක් මදවූය. එකල්හි උත්තරාපථයෙහි වසන්නාවූ එක් අස් වෙළෙන්දෙක් පන්සියයක් අසුන් එනුවරට ගෙණයේය. රජ්ජුරුවෝ අසුන් ගෙණ නියාව අසා තමන්ගේ ඒ නුවණ නැති වන්නක්කා කැඳවා අසුන් මිල කරවූයේය. එතෙම අසුන් මිල කරන්නේ පන්සියයක් අසුන්ට එකම සාල්තැළියක් අගය කෙළේය. මෙසේ අගය කොට අස් වෙළඳුන් "එකම සාල් තැළියක් දෙව"යි නිසා සාල්තැළියක් මිලයට දී අසුන් පන්සියයක් දෙනා රජ්ජුරුවන්ගේ අස්සල බැන්ද වූයේය. අස් වෙළෙඳ පළමු අගය කරවන වන්නක්කානන් සමීපයට ගොසින් එපවත් කියා "දැන් කුමක් කරමෝද"යි විචාළේය. ඒ අසා මහබෝසතානෝ කියන්නාහු ඒ පුරුෂයාට අත්ලස් දී මෙසේ විචාරව "අපගේ අස්සු වූකලී එකම සාල්තැළියක් වටිනි'යි අප විසින් දන්නාලද්දෙය, නොප නිසා සාල්තැළියෙහි අගය දන්නා කාමැත්තම්හ. එසේ හෙයින් රජ්ජුරුවන් වහන්සේ සමීපයේ සිට "සාල්තැළිය මෙතෙක් මිල අගනේයයි කිවන්ට නොපිළිවන්ද"යි විචාරව. "ඉදින් සාල්තැළියේ මිල කියන්ට පිළිවනැ'යි කියේ වී නම් ඔහු කැඳවා ගෙණ රජ්ජුරුවන්වහන්සේ සමීපයට යව. මමත් එතනට එන්නෙම් වේද'යි කිවූය.

එකල්හි අස් වෙළෙඳ බොධිසත්ත්වයන් කී බස් යහපතැයි පිළිගෙණ ලොභී වූ වන්නකු පුරුෂයාට අත්ලස් දී ඒ කාරණය කියවූයේය. ඒ වන්නකු පුරුෂයා අත්ලස ලැබලා ම 'සාල්තැළියට මිල කියන්ට මට පිළිවන් වන්නේ ය'යි කීය. එබස් අසා වෙළෙඳ 'එසේ වී නම් රජගෙට යම්හයි කියා ඔහු කැඳවා ගෙණ රජ්ජුරුවන් සමීපයට ගියේය. බොධිසත්ත්වයෝත් අවශෙෂ අමාත්‍යයෝත් ඒ වේලාවට එතනට ආවාහුය. එකල්හි අස් වෙළෙඳ රජ්ජුරුවන් වැඳලා කියන්නේ "සවාමීනි, මම පන්සියයක් අසුන්ට එක සාල්තැළිය අගනා බව දනිමි ඒ සාල්තැළිය කෙතෙක් අගීද'යි වන්නක්කානන් අතින්. විචාළ මැනව රජ්ජුරුවන් වහන්සැ"යි කීය.

රජ්ජුරුවෝ එපවත් කොදුන කියන්නාහු "එම්බල වන්නකු පුරුෂය, පන්සියයක් අස්සු කෙතෙක් මිල වටිද්ද"යි විචාළෝය එබස් ඇසූ වන්නකු පුරුෂයා "සවාමීනි, සාල්තැළියක් වවනේ වේද'යි කීය. "වන්නාට දරුව පන්සියයක් අස්සු වූකලී සාල් තැළියක් අගින්වයි, ඒ සාල්තැළිය කෙතෙක් මිල පුස්නේද'යි විචාළෝය. ඒ අඥාන පුරුෂයා 'සවාමීනි, අන්තඃපුර පිටිපුර සහිතවූ බරණැස්නුවර සාල්තැළිය අගනේ වේද"යි කීය. ඒ අඥාන පුරුෂයා පළමු රජ්ජුරුවන් සිත් ගණිම් සිතා අනුවර්තනය කරන්නේ එකම සාල්තැළියක් අසුන්ට අගය කෙළේය. තැවත ඒ වෙළෙන්ද අතින් අත්ලස් ලැබ එම සාල්තැළියට අන්තඃපුර පිටපුර සහිතව බරණැස්නුවර අගය කෙළේය. එසමයෙහි බරණැස්නුවර පවුරුවලල්ල දෙළොස්යොදුනක් පමණ වන්නේය. මේ නුවර ඇතුළත වන්නේය. පිටත වනාහි තුන්සියයක් යොදුන් පමණ රාජ්‍යය වන්නේය. මේසේ ඒ අඥාන පුරුෂයා දෙළොස් යොදුනක් වට ඇති නුවර

හා තුන්සියයක් යොදුන් වට ඇති මේරා මහත් රාජ්‍යය එකම සාල්නැළියට අගය කෙළේය. ඒ අසා අමාත්‍යයෝ අත්පොළසන් දී සිතාසී කියන්නාහු "අපි පෙර පොළොව හා රාජ්‍යය අතඹී මිල ඇතැ"යි සිතා උනුම්හ. දැන් වූ කලී මේසා මහත් සරාජික වූ බරණැස් නුවර හා රාජ්‍යය සාල්නැළියක් පමණ අගනේය. නුඹවහන්සේ ගේ වන්නකු පුරුෂයාගේ සමර්ථතාවක් ඉතා ආශ්චර්‍යයීයය, මෙතෙක් කල් මුළුල්ලෙහි මේ වන්නකු පුරුෂයා කොයි විසීද? අපගේ රජ්ජුරුවන්වහන්සේටම මෙතෙම සුදුසු වන්නේය"යි හාස කොට නින්දා කළාහුය. එකල්හි රජ්ජුරුවෝ ලජ්ජාවට පැමිණ ඒ නුවණැති පුරුෂයා නුවරින් පිටත් කරවා මහබෝසතාණන්ටම වන්නකු තනතුරු දුන් තාහුය. මහාබෝධිසත්ත්වයෝ එතැන් පටන් දානාදීවූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙන හැර දක්වා වදාරා "ආනන්දස්ථවිරයෙනි, මේ අඥාත වූ උදායි ස්ථවිරයා මෙරමා හට ලාභහානි කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් තමා නුවණ නැති බැවින් කෙළේම වේදැ"යි අතීත කථාවත් වර්තමාන කථාවත් දෙක එක් කොට සන්ධි ගළපා මේ තණ්ඩුලනාළි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ගම්වැසිවූ අඥාත වන්නකු පුරුෂයා නම් දැන් මේ ලාළුදායි ස්ථවිරය, නුවණැති වන්නකු පුරුෂයා තම් ලොකස්වාමි වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 6
## දෙවධර්මී ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යකුල චින්තාමාණික්‍ය වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා ජෙතවන මහාවිහාරයෙහි වාසය කරණසේක් එක්තරා බහුභාණ්ඩික භික්ෂුකෙනෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසීවූ එක් කෙළෙඹි පුත්‍රයෙක් තමාගේ භාර්‍යාව මිය පරලොව ගිය කල්හි ශාසනයෙහි මනණ වූයේය. එතෙමේ මහණවන්නට පූර්වභාගයෙහිම තමා වසනු පිණිස පන්සලකුත් ගිනිහල් ගෙයකුත් බඩුහල් ගෙයකුත් කරවා බඩුහල්ගෙය ගිතෙල් තලතෙල් ආදියෙන් පුරා මහණවූයේය. මහණවූ පසු තමා සන්තක කෙල්ලන් කොල්ලන් කැඳවා ගෙන්වාගෙණ රැව්වූ පරිද්දෙන් බත් මාළු පිසවා ගෙණ අනුභව කරන්නේය. සිවුරු ආදීවූ බොහෝ පිරිකර ඇත්තේය. රාත්‍රියෙහි එක් අඳනයක් හා පොරවනයක් පොරෝණේය. දිවාභාගයෙහි අනික් අඳනය හා අනික් පොරෝණයක් වළඳිනේය. විහාර කෙළවර වාසය කරන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් මේ භික්ෂූන්වහන්සේ සිවුරු හා ඇතිරි ආදිය ඔගන් පිටත් කොට මළුවේ වතා අවුගස්වන කලට බොහෝ දනව්වාසී වූ භික්ෂූන්වහන්සේ සේනාසන චාරිකා වෙහි ඇවිදිනාසේක් ඒ බහුභාණ්ඩික භික්ෂූන්ගේ මළුවට ගොස් සිවුරු ආදිය දැක "මේ කාගේ දැ"යි විවාළසේක ඒ බහුභාණ්ඩික මනණ "ඇවැත්නි, මාගේය"යි කීසේක. "ඇවැත්නි, මේ සිවුරත් මේ අඳනයත් මේ ඇතිරියත් මේ ඇතිරියත් සියල්ලම තොපගේ දැ"යි විවාළසේක. "එසේය

ඇවැත්නි''යි කී කල්හි භික්ෂූන්වහන්සේ කියනසේක් ''ඇවැත්නි බුදුරජානන් වහන්සේ විසින් තුන්සිවුරු අනුදන්නා ලදහ. මෙසේ අල්පෙච්ඡවූ සම්බුදුන් වහන්සේගේ ශාසනයෙහි තොපි මහණවී මෙසේ බොහෝ පිරිකර ඇති කල 'වරෝ යම්හ, තොප සම්බුදුන්වහන්සේ සමීපයට ගෙණයම්හ''යි කියා ඒ භික්ෂූහු කැඳවා ගෙණ බුදුන් සමීපයට ගියසේක. බුදුහු දැකලාම ''කිමෙක්ද? මහණෙනි; මේ භික්ෂූහු තොකැමති පරිද්දෙන්ම කැඳවා ගෙණ අවුදැ''යි වදාළ සේක. එකල්හි භික්ෂූන්වහන්සේ කියනසේක් ''සවාමීනි, මේ මහණ බහු භාණ්ඩිකය, බහුපරිෂ්කාර ඇත්තේය''යි දැන්වූසේක. එබස් අසා බුදුහු ''මහණ තා බහුභාණ්ඩිකවූයේ සැබෑදැ''යි විචාරා වදාළසේක. ''සවාමීනි, සැබෑව''යි ඒ මහණ දැන්විය. ඒ බස් ඇසූ බුදුහු ''මහණ, තෝ කවර කාරණයකින් බහු භාණ්ඩික වූවෙහිද? මම තොයෙක් කාරණයෙන් අල්පෙච්ඡ බව හා සන්තුෂ්ට භාවයෙහිද කායවිවෙක චිත්තවිවෙක හා විදර්ශනා භාවනා කිරීමෙහි වීර්‍ය්‍ය වැඩීමෙහි ගුණ කියෙම් නොවේදැ''යි වදාළසේක. ඒ බහුභාණ්ඩික භික්ෂූන් වහන්සේ බුදුන් වදාළ බස් අසා කිපී ''එසේ කල මේ සැටියේ ඇවිදීම්දැ''යි පොරෝණය දමාපියා හය ලජ්ජා නැතිව පෂිත් මඩ්‍යයෙහි තනි අඳනයෙන්ම සිටිසේක. එකල්හි සම්බුදුන්වහන්සේ ඒ භික්ෂූන්ට පිටිවහල් වනසේක් ''මහණ තෝ පෙර බලවත්වූ හය ලජ්ජා ඇත්තේ නොවේදැ''යි දියරකුස්ව උපන්නාවූ කාලයෙහිත් හය ලජ්ජා දෙක සොයමින් දෙලොස් අවුරුද්දක් විසූයේ නොවේදෝ? එසේවූ තෝ දැන් කවර කාරණයෙකින් මෙබඳු ගරුවූ සම්බුදුශාසනයෙහි මහණව සිව්වණක් පෂිත් මඩ්‍යයෙහි පොරෝණය දමා හය ලජ්ජා හැර සිටියෙහිදැ''යි වදාළසේක.

එබස් ඇසූ මහණ හය ලජ්ජා දෙක එළවාගෙණ දමා පූ සිවුර නැවත පොරවාගෙණ බුදුන් වැඳ එකත්පස්ව උන්නේය. අවශෙෂ භික්ෂූන්වහන්සේ ඒ අර්‍ථය ප්‍රකාශ කරණ පිණිස සම්බුදුන් වහන්සේට ආරාධනා කළසේක. බුදුරජානන් වහන්සේ අන්‍ය භවයෙන් පිළිසන් වූ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

පිටගිය දවස කසීරට බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් ජනරඤ්ජනය කොට රාජ්‍යය කරන්නාහුය. එකල මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව් කුස පිළිසිඳ ගත්තාහුය. උපන්නාවූ කුමාරයන්ට නම් තබන දවස් මහිංසාස කුමාරයෝ යයි නම් තුබූහ, ඒ කුමාරයන් ඇත මැත දිවපැත කෙළ ඇවිදිනා අවස්ථාවෙහි රජ්ජුරුවන්ට අනික් පුතනු කෙනෙක් උපන්නාහුය. ඒ උපන් කුමාරයන්ට නම් තබන්නානු චන්ද්‍රකුමාරයෝය යි නම් තුබූහ. ඒ දෙවෙනි කුමාරයන් ඇත මැත දිවපැත කෙළ ඇවිදිනා අවස්ථාවෙහි බොධිසත්ත්වයන්ගේ මැනියෝ කාලක්‍රියා කළෝය. රජ්ජුරුවෝ අනික් බිසෝ කෙනෙකුත් අගමෙහෙසුන් තනතුරෙහි තුබූහ. ඒ බිසොව රජ්ජුරුවන්ට ඉතා ප්‍රියයෝය. මන වඩති. සිත් කළුව වාසය කෙරෙති. එකල ඔවුන් දෙදෙනාගේ ප්‍රියසංවාසයෙන් ඒ බිසව් එක් පුතනු කෙණෙකුන් වැදූහ. ඒ උපන් කුමාරයන්ට සුයඃකුමාරයෝ යයි නම් තුබූහ. රජ්ජුරුවෝ පුතනුවන් දැක සතුටුවූ සිත් ඇතිව ''සොඳුර; තොපගේ පුතනුවන්ට වරයක් ගණුව''යි කිවුය. බිසවු ''ඒ වරය මා කැමති විටෙක ඇරගණිමි''යි පසුව ගතයුතු කොට තබා තිබූහ. ඒ බිසවු පුතනුවන් වැඩිවිය පැමිණි කල්හි

රජ්ජුරුවන්ට කියන්නේ ''ස්වාමිනි, නුඹවහන්සේ විසින් මාගේ පුතනුවන් උපන් දවස් වරයක් දෙන ලදී. එසේ නෙසින් මාගේ පුතනුවන්ට රාජ්‍යය දුනමැනවැ''යි කිවුය. රජ්ජුරුවෝ ඒ අසා කියන්නේ ''මාගේ දරුවෝ දෙන්න මහත්වූ ගිනිකඳන් මෙන් බබළමින් ඇවිදිති. තොපගේ පුතනුවන්ට රාජ්‍යය දෙන්ට නොපිළිවනැ''යි ප්‍රතික්ෂෙප කොට නැවත නැවතත් ඒ බිසවුන් තමාගේ පුතනුවන්ට රාජ්‍යය ඉල්වන්නා දැක ''මෝ තොමෝ මාගේ දරුවන්ට අනර්‍ථයක් අවැඩක් උපක්‍රමයක් කොට පියා දෝ හෝ යි සිතා, පුතුන් දෙබැයන් සමීපයට කැඳවා මෙසේ කිවුය. ''එම්බා දරුවෙනි, මම සුයඥී කුමාරයන් උපන් ගමනේ උන්ට වරයක් දිනිමි, දැන් උන්ගේ මැනියෝ රාජ්‍යය ඉල්වති, මම උන්ට රාජ්‍යය නොදෙනු කැමැත්තෙමි. සත්‍රිනු නම් පාපියෝය. එසේ හෙයින් තොපට නපුරක් සිතාපු නම් නපුරු වන්නේය. නොපි දැන් වලට වැද මා ඇවැමෙන් අවුත් තොප සතනක මෙනුවර රාජ්‍යය කරව''යි කියා අඩා වැළප ඉස සිඹ සතසා යවුය. ඔවුන් දෙදෙන පිය රජ්ජුරුවන් වැඳ ප්‍රාසාදයෙන් බස්නාවුන් රාජාඞ්ගනයේ කෙළනා සුයඥීකුමාරයෝ දැක ඒ කාරණය දැන ''මමත් දෙබැයන්වහන්සේ හා සමග යෙමි''යි කියා, කැටිවම නික්මුණාහුය. මෙසේ නික්ම ගොස් කුමාරවරු තුන්දෙනම හිමාලය වනයට යන්නාහුය. බොධිසත්ත්වයෝ මාගීයෙන් යන ගමනේ මඟින් ඉවත්ව රුකක් මුල ඉඳ සුයඥී කුමාරයන්ට මෙසේ කීය. ''මල සුයඥී කුමාරයෙනි; තෙල පෙණෙන විලට ගොස් තා පියා පැනුන් බී පියුම්පතින් අපටත් පැන් ගෙණෙව''යි කිවුය.

ඒ විල තෙමේ වෙසවුණු රජ්ජුරුවන්ගෙන් එක් දියරකුස්සකු විසින් ලබන ලද්දේය. වෙසවුණු රජ්ජුරුවෝත් ඕනට කියන්නෝ ''දෙවධර්‍මය දන්නා කෙනෙකුන් තබා යම් අනික් කෙනෙක් මේ විලට බටුවූ නම් ඔවුන් කන්නට ලැබෙන්නෙහිය. විලට නොබට කෙනෙකුන් කන්නට නොලැ-ලෙන්නෙහිය''යි කිවුය. එතැන් පටන් දියරකුසු යම් කෙනෙක් ඒ විලට බටුවූ නම් ඔවුන් අතින් දෙවධර්‍මය විවාරා යම් කෙනෙක් නොදනිත් නම් ඔවුන් කන්නේය. ඉක්බිත්තෙන් සුයඥී කුමාරයෝ ඒ විලට ගොස් පරීක්ෂා නො කොටම බටුවාහුය. එකල්හි උදක රාක්ෂසයා ඒ කුමාරයන් අල්වා ගෙණ ''දෙවධර්‍මය දනුදැ''යි විවාළේය.

එකල්හි සුයඥී කුමාරයෝ කියන්නෝ ''දෙවධර්‍මය නම් වඳු සුයඥී දෙදෙනා වේදැ''යි කිවුය. ඉක්බිත්තෙන් දියරකුසු ඕනට ''තොපි දෙවධර්‍මය නොදනුව''යි කියා දිය යට ගල්වා තමා වසන්නාවූ ස්ථානයෙහි සිටවිය. බොධිසත්ත්වයෝත් සුයඥී කුමාරයන් ලස්වන්නා දැක චන්ද්‍රකුමාරයන් යවුය. දියරකුසු චන්ද්‍රකුමාරයන් අල්වාගෙණ දෙවධර්‍මය දනුදැ''යි විවාළේය. ''දනිමි, දෙවධර්‍මය නම් සතරදිග වේදැ''යි චන්ද්‍රකුමාරයෝ කිවුය. දියරකුසු ''තෙපිත් දෙවධර්‍මය නොදනුව''යි කියා උනුත් අල්වා ගෙණ එසේම දියයට සඟවා සිටවූයේය.

බොධිසත්ත්වයෝ ඒ චන්ද්‍රකුමාරයනුත් කල්‍යවා නොයන හෙයින් ''එක්තරා අනන්තරායෙක් වියයුතුය''යි තුමූ එතනට ගොස් දෙදෙනාම විලට බට පියවර සවහන් දැක ''මේ විල රාක්ෂසයකු අධිෂ්ඨිත විලක් වුවමැනවැ''යි සිතා, කඩුව උරයේ එල්වා ගෙණ දුන්න තඟා දුනුම්ට හියලා ගෙන සිටියාහුය.

දියරකුසු බොධිසත්ත්වයන් දියට නොබස්නා දැක වලදඹු කපා ඇවිදින, පුරුෂයෙකු මෙන් තමාගේ සුවරූපය පාලා බොධිසත්ත්වයන්ට කියන්නේ 'පින්වත්වූ පුරුෂය, තොපි මග ගමන් යාමෙන් මිරිකී ගියව, කුමක් හෙයින් මේ විලට බැස නාපියා පැන් බී නෙළුඹල හා නෙළුඹුලි කා මල් පැලඳ සැපසේ නොයවු දැ''යි කිවුය.

බොධිසත්ත්වයෝ ඔහු දැක සිතන්නාහු මොහු යක්ෂයා විය යුතුය, මොහු විසින් මාගේ මල් දෙන්නා අල්ලා ගන්නා ලද්දේ වනැ''යි සිතා ''තෝ මාගේ මලුන් අල්වා ගත්තෙහිදැ''යි කිවුය. ''එසේය, මම ඇල්වූයෙමි''යි කී කල්හි ''කවර කාරණයකින්ද''යි විචාරා ''මම මේ විලට බට කෙනෙකුන් කන්ට ලබමි''යි කී කල්හි ''කිමෙක්ද? තෝ සියල්ලවුන්ම කන්ට ලබන්නෙහිදැ''යි විචාරා යමෙක් දෙවධම්ය දනීනම් ඔහු හැර සෙස්සවුන් කන්ට ලබමි''යි කී කල්හි ''නට දෙවධම්යෙන් ප්‍රයෝජන ඇද්ද''යි විචාළේය. ''එසේය, දෙවධම් යෙන් ප්‍රයෝජන ඇතැ''යි දියරකුසු කීය. එසේ වී නම් මම තව දෙවධම්ය කියමි''යි කිවුය. එබස් අසා දියරකුසු එසේ වී නම් කිව මැනව, මම දෙව ධම්ය අසමි''යි කීය. බොධිසත්ත්වයෝ ''මම තට දෙවධම්ය කියමි, බල එකෙක් ඇත කිලිටුව සිටි නෙයින් මදක් මැලියෙමි'යි කිවුය. උදක රාක්ෂසයා බොධි සත්ත්වයන් නහවා පැන් පොවා මල් පලඳවා සුවඳ විලවුන් ගල්වා සරහන ලද මණ්ඩපයෙහි උතුම්වූ පර්‍යඞ්කයක් අතුට දුන්නේය. මහබෝසතානෝ ඒ පණවන ලද ආසන මස්තකයෙහි ඉඳ යක්ෂයා පාමුල සිටුවා ගෙණ එසේ වී නම් තෝ කන් යොමා සකස් කොට අසව'යි කියා දෙවධම්ය කියන්නාහු මෙසේ කිවුය. ''මේ ලෝකයෙහි යම් කෙනෙක් භයින් හා ලජ්ජාවෙන් අකුශල ධම්ය නුත් නොකළමනා අවශෙෂ ලොකවාරිත්‍රශතුත් දැන හැකිලෙන හෙයින් භය ලජ්ජා දෙකින් යුක්තව වාසය කෙරෙද්ද? කුශල ධම්යෙහි ඇම කල්හිම බලවත්වූ ඇලුම් ඇත්තෝද? උතුම්වූ සත්පුරුෂ ගුණ ඇත්තෝද? එසේවූ සත්ත්වයන්ගේ ප්‍රවෘත්තිය මේ ලෝකයෙහි දෙවධම් නම් වෙයි'' කියා ධම් දෙශනා කළෝය.

යක්ෂයා මේ ධම්දෙශනාව අසා ප්‍රසන්නවූ සිත් ඇතිව බොධිසත්ත්ව යන්ට කියන්නේ ''මම තොප කෙරෙහි ප්‍රසන්නයෙමි, ප්‍රසන්නවූ මම එක් මලනුකෙණෙකුත් තොපට දෙමි කවුරුන් ගෙණෙම්ද''යි කීය. ඒ අසා බොධිසත්ත්වයෝ බාලමලනුවත් ගෙණෙව''යි කිවුහ. දියරකුසු කියන්නේ ''පණ්ඩිතයෙනි, තොපි උදක් දෙවධම්ය දන්නා පමණෙක්මය එපමණක් විතා ඒ ධම්යෙහි තොප පවත්නේ නැතැ''යි කීය. ''කවර කාරණයකින්ද''යි කී කල්හි ''වැඩිමහළු තැනැත්තන් නඹා බාලතැනැත්තන් ගෙන්වන හෙයින් තොප ජෙට්ඨාපචායන කම්ය නොකරණ හෙයිනැ''යි කීය. එබස් අසා මහ බෝසතානෝ කියන්නෝ ''එම්බල යක්ෂය, මම දෙවධම්යත් දනිමි, දෙවධම් යෙහිත් පවතිමි. අපි මේ වලට වදනමෝ මේ බාල මලනුවන් නිසා වනුම්හ. මුන් පිණිස අපගේ පියානන්වහන්සේගේ අතින් මුන්ගේ මැනියෝ රාජ්‍යය ඉල්වූය, අපගේ පියානන් වහන්සේ ඒ වරය නොදී අප රක්නා නිසා වන යෙහි වසන්ට කී සේක. එබස් ඇසූ බාල මලනුවෝ නොරඳා අප හා සමග මේ වනයට අවුය. ඉදින් අපි ඒ කුමාරයන් වනයෙහි එක් යක්ෂයෙක් අනුභව කොට පියසි කීමෝ නම් අප කී බස් අදහා ගන්නා කෙනෙකු නැත. එසේ

හෙයින් මම නින්දුවට හසීන් බාල මලනුවන් ගෙන්වම්"යි කිවුය. එබස් අසා දියරකුසු සමාධිව "සාධු! සාධු!! පණ්ඩිතයෙනි, තෙපි දෙවධර්මයත් දනුව දෙව ධර්මයෙහිත් පවතුව"යි ප්‍රසන්නවූ සිත් ඇතිව බොධිසත්ත්වයන්ට සාධුකාර දී දෙබැයන්ව ගෙණවුත් පාවා දින.

එකල්හි බොධිසත්ත්වයෝ ඔහුට අවවාද කරන්නෝ "යක්ෂය තෝ පෙර කළ අකුශල කර්මයෙන් අනුන්ගේ වෙර ලේ මස් කන්නාවූ යක්ෂව උපන් හෙයිය; දැන් නැවතත් අකුසල්ම කෙරෙහි නම් තා විසින් කරණ ලද අකුශල කර්මය තරකාදී සතර අපායෙන් තා මුදුලිය නොහෙන්නේය. එසේ හෙයින් මෙතැන් පටන් අකුසල් හැර කුසල් කරව"යි අවවාද කොට යක්ෂයා දමන යෙහි ලන්ට සමර්ථවූය. මහබෝසතාණන් යක්ෂයා දමනයෙහි ලා ගෙණ ඔහු විසින් කරණ ලද ආරක්ෂා ඇතිව එතැන්හිම වසන්නාහු එක් දවසක් නැකැත් තරු බලා පියරජ්ජුරුවන් කාලක්‍රියා කළ නියාව දැන යක්ෂයා කැඳවා ගෙණ බරණැස්නුවරට මහාසත් රාජ්‍යය ගෙණ චන්ද්‍රකුමාරයන්ට යුවරජ තනතුර හා සූර්යීකුමාරයන්ට සෙනවිරත් තනතුර දී යක්ෂයාට සිත්කළ තෙනක දෙවාලයක් කරවා එතැන්හි ඔහු වස්වා නිරන්තරයෙන් බත් හා මල් පැන් සුවඳ විලවුන් ඔනවි පළමුකොට පුදන පරිද්දෙන් සැලසූය. ඒ මහබෝසතාණෝ දැහැමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. මේ චතුස්සත්‍ය ධර්ම දේශනාවගේ කෙළවර ඒ බහුභාණ්ඩික භික්ෂූන්වහන්සේ සෝවාන් පෙළෙහි පිහිටිසේක. බුදුරජාණන් වහන්සේ අතීත කථාවත් වර්තමාන කථාවත් දෙක එක්කොට සන්ධි ගළපා මේ ඉම් දෙවධර්ම ජාතකය වදාළසේක. එසමයෙහි උදක රාක්ෂසයා නම් දැන් මේ බහුභාණ්ඩික මහණය, සූර්යීකුමාරයෝ නම් ආනන්ද ස්ථවිරයෝය, චන්ද්‍රකුමාරයෝ නම් ශාරීපුත්‍ර ස්ථවිරයෝය, මහිංසාස කුමාරයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මවේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 7
## කථහාරි ජාතකය

මේ එක්සමයෙක්හි සකල ලෝකා නුකම්පකවූ බුදුරජාණන්වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවසන සේක් වාසභක්ෂත්‍රියා වන්ගේ කථාව අරභයා මේ ජාතකය වදාළ සේක. මෙහි වර්තමාන කථාව දෙලොස්වැනි නිපාතයෙහි වූ භද්‍රඝාල ජාතකයෙහි මතු පැහැදි වන්නේය. ඒ වාසභක්ෂත්‍රියාවෝ මෙතාහි මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ දුවනියෝය, නාගමුණ්ඩා නම් දාසියගේ කුස පිළිසිඳ ගත්තාය. කොසොල් රජ්ජුරුවන්ට අගමෙහෙසුන් වූවාය. ඕතොමෝ රජහට ප්‍රියවූ පුත්‍රයකු වැදුවාය. කොසොල් රජ වර්තාහි වාසභක්ෂත්‍රියාවන්ගේ දාසිභාවය පහ දුන සථානාන්තරයෙන් පිරිහෙලූයේය. විඩූඩභ නම් පුත්‍රයාගේද සථානාන්තරය පිරිහෙලූයේය. ඔහු දෙදෙනම රජගෙය ඇතුළතම වසන්නාහ.

බුදුරජාණන් වහන්සේ ඒ කාරණය දැන වදුරා පෙරවරු පන්සියයක් භික්ෂූන් පිරිවරා රජගෙට වැඩ පණවන ලද ආසනයෙහි වැඩහිඳ "මහරජ, වාසභක්ෂත්‍රියාවෝ කොසිදැ"යි වදාළසේක. කොසොල් රජ්ජුරුවෝ ඒ කාරණය දන්වූයේය. "මහරජ, වාසභක්ෂත්‍රියාවෝ කවරක්හුගේ දුවනියෝදැ"යි විචාළ කල්හි සවාමීන්වහන්ස, මහානාම නම් රජහුගේය"යි කී සේක. "කවු රක්හු නිසා ආයේ දැ"යි වදාළ කල්හි සවාමීන්වහන්ස, මා නිසා ය"යි කීවෝය "මහරජ වාසභක්ෂත්‍රියාවෝ රජහුගේ දුවනියෝය. රජහු නිසාම අවුය. රජහු නිසාම පුත්‍රයකු ලද්දීය. ඒ පුත්‍ර තෙම කවර කාරණයකින් පියාහන් අයිති රාජ්‍යයට හිමි නොවන්නේ ද? පූර්වකාලයෙහි රජදරුවෝ මොහොතක් කල් එක්ව වාසය කළාවූ දරකැටියගේ බඩෙහි උපන්නාවූ පුත්‍රයකු ලැබ ඒ පුත්‍රයාව රජ්‍යය දුන්නාහුය"යි වදාළ කල්හි කොසොල් රජතෙම ඒ කාරණය පහළ කරණු පිණිස භාග්‍යවතුන් වහන්සේව යාච්ඤා කළේය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසී තිබූ කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

පිටගිය දවස බරණැස්නුවර රාජ්‍යය කරන්නාවූ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් මහත්වූ පිරිවරින් උයනට ගොස් එහි පුෂ්ප ඵල ලොහ යෙන් හැසිරෙණ සේක් උයන් වතලැහැබෙහි ගායනා කොට දර නෙලන් නාවූ එක් ස්ත්‍රියක් දැක පිළිබඳ සිත් ඇතිව තෘෂ්ණාසන්‍නවය කළෝය. එකෙණෙහි ම අප මහාබොධිසත්ත්වයන් වහන්සේ ඒ ස්ත්‍රියගේ බඩෙහිම පිළිසිඳ ගත් සේක. එකෙණෙහිම ඇගේ බඩ විදුරු පුරවන ලද්දක් මෙන් ගරුවූ කුක්ෂිය වූයේය. ඒ ස්ත්‍රිය ගැබ පිහිටි බව දැන "මහරජ, මාගේ ගර්භය පිහිටියේය"යි කීවාය. එකල්හි ඒ රජතෙම අඞ්ගුෂ්ඨමුද්‍රිකාව දී "ඉදින් දුවනි කෙණෙක් වූ නම් මේ අඞ්ගුෂ්ඨ මුද්‍රිකාව විකුව පොෂ්‍ය කරව. ඉදින් පුත්‍රයෙක් වී නම් මුද්‍රිකාව හා සමග මාගේ සමීපයට ගෙණ එව"යි කියා වැහැසේක. ඒ සත්‍රීද ගර්භය මුහුකුරණ ලද්දී බොධිසත්ත්වයන් වහන්සේ වැදුවාය. ඒ අප මහාබොධිසත්ත්වයන් වනන්සේ ඔබ මොබ හැසිරෙණ කල්හි කෙළිමඩුල්ලෙහි ලදරුවෝ උන්වහන්සේට මෙසේ කියන්නාහු "පියාහන් කැත්තහු විසින් පහරණ ලදුම්හ"යි කියන්නාහුය. ඒ අසා බොධිසත්ත්වයන් වහන්සේ මැණියන් සමීපයට ගොස් "මැනියනි මාගේ පියාතෝ කවුරුදැ"යි විචාළසේක. "පුත්‍රය තෙපි බරණැස්රජහුගේ පුත්‍රයෙකැ"යි කීවාය. "මැනියෙනි, කිසි ලකුණක් ඇත්තේදැ"යි විචාළසේක. "පුත්‍රය රජ්ජුරුවෝ මේ මුද්‍රිකාව දී ඉදින් දුවනි කෙනෙක් වී නම් මේ මුද්‍රිකාව විකොට පොෂ්‍ය කරව, ඉදින් පුත්‍රයෙක් වී නම් මේ මුද්‍රිකාව හා සමග ගෙණෙවයි කියා ගියසේකැ"යි කීවාය.

මැනියෙනි එසේ කල්හි කවර කාරණයකින් මා පියාහන්ගේ සමීපයට කැඳවාගෙණ නොයන්නෙහිදැ"යි කී සේක. ඒ සත්‍රී අපමහබෝසතාහන්ගේ අධ්‍යාසය දැන රාජවාසල භවනචාරයට ගොස් රජහට කීවාය. රජහු විසින් කැඳවනු ලබන්නී රජගෙට වැද රජහට වැඳ "මහරජ්ජුරුවන් වහන්ස, මේ තෙම නුඹවහන්සේගේ පුත්‍රයෙකැ"යි කීවාය. රජ්ජුරුවෝත් දන්නාසේක්ම පණිදිමැද ලජ්ජාවෙන් "මාගේ පුත්‍රයෙක් නොවෙ"යි කීසේක. "මහරජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ මේ මුද්‍රිකාවය මේ දැනගණුව"යි කීවාය. "මේද මාගේ මුද්‍රිකාවක් නොවෙ"යි කීසේක "මහරජ්ජුරුවන් වහන්ස, දැන් සත්‍ය ක්‍රියාව හැර මට අනික් සාක්ෂ්‍යයෙක් නැත්තේය. මේ ලදරු තෙම නුඹවහන්සේ

නිසා උපන්නේ ඒ තම් අහස්හි සිටීවයි. ඉදින් එලෙස කොවුගේ විතම් බිම හි මරණයට පැමිණේව"යි කියා බොධිසත්ත්වයන් වහන්සේගේ පාදවන්දය අල්වා ගෙණ අහස්හි දැමුවාය.

අප මහාබොධිසත්ත්වයන් වහන්සේ අහස්හි පලක් බැඳ හුන්සේක් මිහි රිවූ කටහඬින් පිය මහරජහට බැණවදුරණසේක් මෙසේ වදාළසේක. "මහරජ, මම නුඹවහන්සේගේ ආත්මජ පුත්‍රයෙක්මි, ජනප්‍රධානවූ මහරජ, නුඹවහන්සේ මා රක්ෂාකොට වදාළමැනව, මහරජ්ජුරුවන් වහන්ස, හස්තිබන්ධ අශ්වබන්ධාදීවූ මනුෂ්‍යයන්ද, හස්ත්‍යශ්වාදීවූ තිරශ්චින සත්ත්වයන් රක්ෂාකරණසේක් සවකීය පුත්‍රවූ මා රක්ෂා නොකරණසේක්ද"යි නින්ද කිරීමෙන් හා අනුග්‍රහ කිරීමෙන් මෙසේ වදාළසේක. අහස්හි ඉඳ මෙසේ ධර්මදේශනා කරන්නාවූ බොධිසත්ත්වයන් වහන්සේගේ ධර්මය අසා පුත්‍රය, මෙසේ වර මම්ම පොෂ්‍යකෙරෙමි, මම්ම පොෂ්‍යය කෙරෙමි"යි කියා අත දිගුකළසේක. අනිකුත් සත්ත්වයෝ දහස් ගණන් අත්දිගු කළාහුය. බොධිසත්ත්වයන් වහන්සේ අනික් කෙනෙකුන්ගේ අතට නොබැස රජහුගේ අතවම බැස ඇකයෙහි හුන්සේක. රජ්ජුරුවෝ අප මහබොධිසත්ත්වයන් වහන්සේට යුවරාජ්‍යය දෙවූසේක. මැනියන් වහන්සේ අගමෙහෙසි කළසේක.

බොධිසත්ත්වයන් වහන්සේ පියරජහු ඇවැමෙන් කාෂ්ඨවාහන නම් රජව දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ කොසොල් රජහට මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා අතීත කථාව හා වර්තමාන කථාව දක්වා පූර්ණපරසන්ධි ගළපා මේ ඝටිකාරී ජාතකය නිමවා වදාළසේක. "එසමයෙහි මැනියෝ නම් දැන් මහමායා දේවිය, පියානෝ නම් සුදොවුන් මහරජානෝය, කාෂ්ඨවාහන නම් රජව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්මවේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 8
## ගාමණී ජාතකය

මේවද එක්සමයෙක්හි සතරාමරලොක ගරු බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් පසුබට වීර්‍යහීන ඇති භික්ෂු කෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක. මේ ජාතකයෙහි වර්තමාන කථාවත් අතීත කථාවත් එකොළොස්වැනි නිපාතයෙහිවූ සංවර ජාතකයෙහි මිතු පහළවන්නීය. කථාව වනාහි ඒ ජාතකයෙහිද මෙතැන්හිද එකාකාරමය, ගාථාව වනාහි වෙනස් වන්නීය.

ගාමණී කුමාරතෙම බොධිසත්ත්වයන් වහන්සේගේ අවවාදයෙහි පිහිටා ජෙෂ්ඨභ්‍රාතෘවූ කුමාරවරුන් සියයකට බාලව සියයක් පමණ භ්‍රාතෘන් පිරිවරා ධවලච්ඡත්‍රයාගේ යට උතුම් ආසනයෙහි හුන්සේක් තමාගේ ඓශ්වර්‍ය සම්පත්තිය බලා මේ මාගේ ඓශ්වර්‍ය සම්පත්තිය අපගේ ආචාරීන් වහන්සේ සන්තක ය"යි සතුටුවූ ප්‍රීතිවාක්‍ය පවත්වනසේක් නුවණැත්තවුන්ගේ අවවාදයෙහි සිට තූරිත නොව උපාය ක්‍රමයෙන් කර්මාන්තයෙහි ප්‍රයුක්තයන්ට ප්‍රාර්ථිතවූ ප්‍රයෝ

ජනයෙහි ආසාව සමාධ වේම ය. දනාඵී, ප්‍රියවචන, සමාතාත්මතාය'යි කියන ලද බ්‍රහ්මචර්‍යාව මූලිකවූ සමාපත්තීන්ද මුහුකුරා සිටි බැවින් පරිපක්වව බ්‍රහ්ම චර්‍යාව ඇතිවීම ගාමිණීකුමාරයා මෙසේ දැනගනුව"යි කියා තමන් සජීජන ජ්‍යෙෂ්ඨ බැවින් ආත්ම ද්විතීය කොට තමන්ට ආමන්ත්‍රණය කොට ආචාරීන් වහන්සේ නිසා බැයන් සියයක් ඉක්මවා මේ මහාරාජ්‍යයට පැමිණියෙමි"යි ප්‍රීති වාක්‍යය පැවැත්වූසේක.

ගාමිණී කුමාරයන් රාජ්‍යයට පැමිණි සත් අව දවසක් ඇවැමෙන් සියලු භ්‍රාතෘවූ කුමාරවරහු තමන් වසන තැනට ගියාහුය. ගාමිණී මහරජතෙම දැහැමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය. බොධිසත්ත්වයන් වහන්සේ ද දනාදීවූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක. ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍යයාගේ අවසානයෙහි පසුබට වීර්‍යයී ඇති නිස්ශූන් වහන්සේ අර්හත් ඵලයෙහි පිහිටිසේක. අතීත කථාව හා වර්තමාන කථාව ගෙණහැර දක්වා වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ ගාමණී ජාතකය නිමවා වදාළසේක.

---

## 9
## මඛාදෙව ජාතකය

මෙවද එක් සමයෙක්හි සර්ලෝකෙක දීපාගමාන වූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන මහාවිහාරයෙහි වාසයකරණසේක් මහ-බිනික්මන් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි නිස්ශූන් වහන්සේ සර්ඥයන් වහන්සේගේ මහබිනික්මන් වර්ණනා කොට කොට උන්සේක. එකල්හි සර්ඥයන් වහන්සේ දම්සභාමණ්ඩපයට අවුත් බුද්ධාසන මස්තකයෙහි වැඩහුන්සේක් නිස්ශූන් වහන්සේට ආමන්ත්‍රණය කොට "මහණෙනි, දැන් කිතම් කථාවකින් යුක්තව උනුද? කිතම් කථාවක් දැන් තොපට අඩාලවිදැ"යි වදාරා "සාමිනි, අනික් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. නුඹවහන්සේගේ මහබිනික්මන් වර්ණනා කොට කොට උනුම්හ"යි කිකල්හි "මහණෙනි, සර්ඥයන් මහබිනික්මන් නික්මුනේ දැන් මතු නොවෙයි, පළමුත් නික්මුනෝ වේදැ"යි වදාළසේක, නිස්ශූන්වහන්සේ ඒ අර්‍ථය ප්‍රකාශ කරණු සඳහා සර්ඥයන් වහන්සේව ආරාධනා කළසේක. භාග්‍යවත්වූ බුදුරජාතන් වහන්සේ භවාන්තර ප්‍රවර්ත්තවූ කාරණය ප්‍රකාශකොටවදාළසේක.

පෙරකිය දවස විදෙහරාජ්‍යයෙහි මිථිලනුවර මඛාදෙව නම් රජ්ජුරු කෙණෙක් දශරාජධර්මයන් අකොප්‍ය කොට සර්ධර්මිෂ්ඨව රාජ්‍යය කරන්නා හුය. ඒ රජ්ජුරුවෝ සුවාසූදහසක් අවුරුදු කුමාරක්‍රීඩා කොට සුවාසූදහසක් අවුරුදු යුවරජකම් කොට සුවාසූදහසක් අවුරුදු ඒකරාජ්‍යය කොට බොහෝකල් යවා එක්දවසක් කපුවාට බණවා කියන්නාහු "යහළු කපුව, යම් දවසක් මා ඉස නරකෙහෙක් දුටුයේ වී නම් එදවස් මට කියව"යි කිවුය. කපුවාත් බොහෝකලක් යවා එක්දවසක් රජ්ජුරුවන්ගේ අදුන්වත් කෙස් අතුරේතුබූ එකම නරකෙසක් දැක "රජ්ජුරුවන් වහන්ස, කෙස් අතුරේ නරකෙන්දක් පෙණෙන්නේය"යි

මඛාදේව ජාතකය

කීය ''එසේ වී නම් සබඳ කපුව, නරකෙස උදුරා මා අත්ලෙහි තබව''යි කිකල්හි රන් අඩුවෙන් නරකෙස උදුරා රජ්ජුරුවන් අත්ලෙහි තැබීය. එසමයෙහි රජ්ජුරුවන්ට සුවාසුදහසක් අවුරුදු ඉතිරිව සිටියේය. එසේවීනමුත් නරකෙස දැකලාම ''මෘත්‍යුරාජයා ඇවිත් සමීපයෙහි සිටියාක් මෙන්ද තමන් ගිනිගත් පන් සලකව වන්නාක් මෙන්දැ'' සිතමින් සංවේගයට පැමිණ තුමූ තමන්ට අවවාද කරන්නාහු''අඥතවූ මඛාදෙවයෙනි,ඉස නර තැගෙණ තුරුත් කෙලෙසුන් ඇර පිය නුහුනුවාහුද? තොප සේ වූ අඥතයෝ නැතැ යි තමන්ට නින්දාකළාහුය.

මෙසේ රජ්ජුරුවන්ට නරකෙස් පහළවූ හියාව කල්පනා කරත් කරත් අභ්‍යනන්තරයෙහි දැහ වැදගත. සකල ශරීරයෙන් ඩා වැහිරෙන්නට පටන්ගත් තේය. එවේලෙහි රජ්ජුරුවෝ ''අදම නික්ම මහණදම් කරන්ට වටනේය''යි කපුවාට ලක්ෂයක් වසතු උපදිනා ගම්වරක්දී ප්‍රධාන පුත්‍රවූ රාජකුමාරයන් කැඳවා''පුත, මා ඉස නරකෙසක් පහළවිය. එසේනෙයින් මම මහලුව ගියෙමි. මා විසින් මනුෂ්‍යලෝකයෙහි අනුභවකළමනා සම්පතුත් අනුභවකරණලද්දේය. දැන් දිව්‍යසම්පතුත් අනුභවකරන්නා කැමැත්තෙමි, එසේහෙයින් මහණවන්නට දැන්ම මට කල්වන්නේය. තෙපි මේ රාජ්‍යය පාව ගණුව. මම මහණව මඛාදෙව නම් අඹුයනේ වැස මහණදම් කෙරෙමි''යි කිවුය.

මෙසේ මහණවනු කැමැත්තාවූ රජ්ජුරුවන් කරා අමාත්‍යයෝ එළඹ ''සවාමීනි, නුඹවහන්සේ කවර කාරණයකින් මහණ වන සේක්ද''යි විචාළෝය. රජ්ජුරුවෝ නරකෙස අතින් ගෙණ අමාත්‍යයන්ට තමන් මහණවන කාරණය කියන්නාහු ''ප්‍රථමවයසය මධ්‍යම වයසය පශ්චිම වයසය යි කියනලද තුන්වය සම නසන හෙයින් වයස පැහැරගන්නාවූ මේ නරකෙස මාගේහිස අවගත්නේය. හිස නරකෙස් අවගත්විටම මරණය අවුත් නලල්තෙලෙහි සිටියා නම් වෙයි. නරකෙස් නම් යම රජ්ජුරුවන්ගෙන් එවූ දේවදූතයන් වැන්නෝය. එසේ හෙයින් අදම මට මහණවන්ට කල්වන්නේය''යි අමාත්‍යයන්ට කියා එදවස්ම රාජ්‍යය හැර සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව මඛාදෙව නම් අඹ උයනේ වෙසෙමින් සුවාසුදහසක් අවුරුදු මුලුල්ලෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂාය යි කියන ලද චතුර්විධ බ්‍රහ්මවිහාර භාවනා කොට නොපිරිහුනාවූ ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්ම ලෝකයෙහි ඉපිද නැවත එයින් චුතව අවුත් මියුලුනුවර ඉපිද පසුබස්නාවූ තමන්ගේ වංශය ගළපා එම අඹුයන්හිදී මහණවබ්‍රහ්ම විහාර භාවනා කොට නැවත බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මහ ණෙනි, සමීඥයන් මනබිතික්මන් නික්මුනෝ දැන් මතු නොවෙයි, පෙරත් නික් මුනෝම වේදැ' යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්යසත්‍යය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍යධර්මදේශනාවගේ කෙළවර ඒ භික්ෂූන්වහන්සේ අතුරෙන් සමහර කෙනෙකුන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. සම හර කෙනෙකුන් වහන්සේ සකෘදාගාමි ඵලයෙහි පිහිටිසේක. සමහර කෙනෙත කුන් වහන්සේ අනාගාමි ඵලයෙහි පිහිටිසේක. මෙසේ බුදුරජානන් වහන්සේ අතීත කථාවත් වර්තමාන කථාවත් දෙක එක් කොට සඤ්ඣගළපා මේ මඛාදෙව ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි කපුවා නම් දැන් මේ ආනන්දස්ථවිරයෝය, එසමයෙහි ප්‍රධාන පුත්‍ර නම් දැන් මේ රාහුලස්ථවිරයෝය, එසමයෙහි මඛාදෙව රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ, මම්මවේදැ'යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

## 10
## සුඛවිහාරී ජාතකය.

මේ වදන එක් සමයෙක්හි තුන්ලොවට තැගුම් ප්‍රදීපයක් වැනිවූ සම්බුදුරජාණන් වහන්සේ අනුපිය නම් නුවර ආශ්‍රය කොට අනුපිය නම් අඹ වනයෙහි වැඩවසන සේක් සුඛවිහාරී වූ භද්දිය ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක. සුඛවිහාරීවූ භද්දිය ස්ථවිරයන් වහන්සේ ක්ෂත්‍රිය රාජකුමාරවරුන් සදෙනාගේ සමාගමයෙහි උපාලිස්ථවිරයන් වහන්සේ සත්වැනි කොට පැවිදි වූ සේක. ඔවුන් අතුරෙන් භද්දිය ස්ථවිරයන් වහන්සේය, කිම්බිලස්ථවිරයන් වහන්සේය, භගුස්ථවිරයන් වහන්සේය, උපාලිස්ථවිරයන් වහන්සේය, යන සතරදෙනා වහන්සේ රහත්වූ සේක, ආනන්ද ස්ථවිරයන් වහන්සේ සෝවාන්වූසේක. අනුරුඬ ස්ථවිරයන් වහන්සේ දිවස් ලත් සේක. දෙවදත්තස්ථවිරයන් වහන්සේ ධ්‍යානලාභී වූසේක. ක්ෂත්‍රිය රාජකුමාරවරුන් සදෙනාගේ කථාව අනුපිය නුවර දක්ව ඛණ්ඩහාල ජාතකයෙහි මතු ප්‍රකාශවන්නේය.

ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන් වහන්සේ වනාහි රජවූකල්හි තමන් රක්ෂා කරණසේක් රක්ෂාවට විධාන කිරීමටද පළමුකොට බොහෝ ආරක්ෂාවෙන් රක්ෂා කරණ ලදුව මතුමහල්තලයෙහි මහයහන්හි ඔබිනොබ පෙරලෙමින් සයනය කරන්නාවූ තමහට භය පැමිණීමද දැන් අර්හත්ඵලයට පැමිණ අරණ්‍යාදීවූ යම්කිසි තැනෙක්හි හැසිරෙනසේක් තමාට පහවූ භය ඇති බව දක්කාසේක් 'ඉතා සැපය''යි කියා කියා ප්‍රීතිවාක්‍ය පවත්වනසේක ඒ අසා භික්ෂූන්වහන්සේලා ''ආයුෂ්මත්වූ භද්දිය ස්ථවිරයන්වහන්සේ අර්හත්ඵලය ප්‍රකාශ කරණසේකැ''යි කියා සම්බුදුරජාණන්වහන්සේට දැන්වූවාහුය. සම්බුදුරජාණන් වහන්සේ භික්ෂූන්වහන්සේලාට වදාරණසේක් 'මහනෙනි, භද්දිය ස්ථවිරයෝ සැපවිහාරී වූවෝ දැන් මතු නොවෙති. පෙරත් සැප විහාරීවූහ''යි වදාරා භික්ෂූන් විසින් ඒ කාරණය ප්‍රකාශ කරණු පිණිස යාචිතු කළ කල්හි සම්බුදුරජාණන් වහන්සේ භවයෙන් වැසී තුබුනු කාරණය ප්‍රකාශ කොට වදාළ සේක.

පසුකිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝධිසත්ත්වයන් වහන්සේ ප්‍රසිඩවූ බ්‍රාහ්මණ මහාසාර කුලයෙක්හි ඉපද වැඩිවියසට පැමිණ වසනුකාමක්ලෙශකාමයෙහි ආදීනව ද මහ බිනික්මන් නික්මීමෙහි ආනිසංසය ද දැන වසනුකාම ක්ලෙශකාම හැර හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අෂ්ටසමාපත්ති උපදවා වාසය කරණ සේක් උන්වහන්සේට මහත්වූ පිරිවර වූයේය. පන්සියයක් පමණ තාපස්වීහු වූවාහුය. අප මහබෝසතාණන් වහන්සේ වර්ෂා කාලයෙහි හිමාලවනයෙන් නික්ම තාපස්වී සමූහයා විසින් පිරිවරණ ලදුව ගම්නියම්ගම් ආදියෙහි සැරිසරා වඩනාසේක් බරණැස් නුවරට පැමිණ රජහු නිසා රාජෝද්‍යානයෙහි වාසය කළ සේක. එතැන්හි වැසිසාරමස වාසය කොට රජහට දැන්වූසේක. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේට කියනසේක් ''සවාමීන්වහන්ස, නුඹවහන්සේ වැඩසේක. හිමාලය වනයට යාමෙන් නුඹවහන්සේට කවර ප්‍රයෝජන? අතවැස්සන් හිමාලය වනයට ගොස මෙතැන්හිම වාසය කරව''යි කීයේය. බොධිසත්ත්වයන් වහන්සේ ප්‍රධාන අතවැසි තාපස්වීන් වහන්සේට

ඒත්සියයක් තපස්වීවරුන් භාරකොට "තෙපි යව, මේ තපස්වීවරයන් හා සමග හිමාලය වනයෙහි එතැන්හිම වාසය කරව. බොධිසත්ත්වයන් වහන්සේගේ ප්‍රධාන අතැවැසි තපස්වීන්වහන්සේ රාජතපස්වීන්වහන්සේය. මහත් රාජ්‍යයක් හැර පැවිදිව කිසුණු පිරියම් කොට අෂ්ටසමාපත්ති ලාභීව වසන සේක්, සෙසු තපස්වීන් හා සමග හිමාලය වනයෙහි වසනසේක්, එක් දවසක් ආචාරීන් වහන්සේ දක්තා කැමතිව ඒ තපස්වීවරයන්ට ආමන්ත්‍රණය කොට "තෙපි උකටලී නොව මෙතැන්හිම වාසයකරව, මම ආචාරීන්වහන්සේට නමස්කාරකොට එන්නෙමි"යි කියා ආචාරීන්වහන්සේගේ සමීපයට ගොස් නමස්කාර කොට පිළිසඳර කථා කොට එක් මැඬිලිපතක් අතුට ආචාරීන් වහන්සේගේ සමීපයෙහිම උන්සේක. එවේලෙහි බරණැස් රජ්ජුරුවෝ "තපස්වීන්වහන්සේ දකිමි" කියා උයනට ගොස් නමස්කාර කොට එකත් පසෙක්හි හුන්සේක. අතැවැසි තපස්වීන්වහන්සේ රජ්ජුරුවන් දැකත් නොමතැගී සිටිසේක්ම හුන් සේක්ම වනාහි "ඉතා සැපය ඉතා සැපය"යි කියා ප්‍රීතිවාක්‍ය පැවැත්වූසේක.

රජතෙම සිතනුයේ "මේ තපස්වීන්වහන්සේ මා දැකත් නැගී නොසිටි සේකැ"යි අසනොහොඹව බොධිසත්ත්වයන්වහන්සේට කියතසේක් "සවාමීන් වහන්ස, මේ තපස්වීන්වහන්සේ කැමතිපරිද්දෙන් ආහාරය අනුභව කළා සේක්ද? ප්‍රීතිවාක්‍ය පවත්වතසේක් සැප සෙයාවම කරණසේකැ"යි කීසේය. "මහරජ, මේ තපස්වීන්වහන්සේ දැන් මම පෙර ගිහි කල්හි රාජ්‍යශ්‍රී අනුභව කරන්නෙමි ආයුධගත් අත් ඇති බොහෝ සේනාව විසින් රක්ෂාකරණු ලබන් නෙමි මෙබඳු සැපයක් නොලද්දෙමි" කියා තමාගේ ප්‍රව්‍රජ්‍යා සැපය ධ්‍යාන සැපය අරභයා මේ ප්‍රීතිවාක්‍යය පැවැත්වූසේය"යි වදළසේක.

මෙසේද කියා බොධිසත්ත්වයන්වහන්සේ රජහට ධර්මදේශනා කොට වදළසේක. 'යම් පුද්ගලයක්හු සෙසු බොහෝ පුද්ගලයෝ රක්ෂා නොකෙරෙද්ද? යමෙක් සෙසු බොහෝ සත්ත්වයන් රක්ෂා නොකෙරේද? මහරජ, ඒ පුද්ගලයා වස්තුකාම ක්ලේශ කාමයෙහි අපේක්ෂාවක් නැතිව හුදකලාව කාය විවේක චිත්තවිවේක සැපයෙන් යුක්තව සයනය කරන්නේය. හුදෙක් සයනය කරන්නේම නොවෙයි. මෙබඳු පුද්ගලතෙම සැපසේ යන්නේය, සැපසේ සිටින්නේය, සැපසේ හිඳින්නේය, සැපසේ නෝනේය, සියලු ඊර්ය්‍යාපථයෙහි සැපසේ කල් යවන්නේය. මහරජ, තෘෂ්ණාව නැත්තාවූ පුද්ගලතෙම සැපසේ වාසය කරන්නේය"යි වදළසේක. රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්වහන්සේගේ ධර්මදේශනාව අහා තුටුපහටු සිත් ඇතිව නමස්කාර කොට ව්‍යහවතයට ගිය සේක අතැවැසි තපස්වීන්වහන්සේද ආචාරීන්වහන්සේට වැඳ හිමාලය වනයට වැඩිසේක. බොධිසත්ත්වයන්වහන්සේ වනාහි එතැන්හිම වාසය කරණසේක් නොපිරිහුන් ධ්‍යානයෙන් යුක්තව කාලක්‍රියා කොට බ්‍රහ්මලොකයෙහි උපන්සේක. ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මේ දම්දෙසුන් ගෙණ හැර දක්වා අතීත කථාව හා වර්තමාන කථාව වදාරා සුචිපරමත්ථ ගළපා මේ සුචිභෝජී ජාතකය නිමවා වදළසේක. "එසමයෙහි අතැවැසි තපස්වීන් වහන්සේ නම් දැන් භද්දිය ස්ථවිර වූසේක, ශාස්තෘව උපන්නෙම් තිලෝගුරු සම්‍යක්සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදළසේක.

# 11
# ලකඛණමිග ජාතකය

මේ වදාළේ එක් සමයෙක්හි පහකළාවූ කෙලෙස් මල ඇති සම්බුදුරජාණන් වහන්සේ රජගහනුවර නිසා වෙළුවනා රාමයෙහි වැඩවසනසේක් දෙවදත්ත සථවිරයන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

දෙවදත්ත සථවිරයන්වහන්සේගේ කථාව දුනුවායන් හැරීම දක්වා ඛණ්ඩහාල ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. ධනපාල නම් හස්තිරාජයාගේ හැරීම දක්වා චුල්ලහංස ජාතකයෙහි විස්තර වශයෙන් මතු පෙණෙන්නේය. දෙවදත්ත සථවිරයන් පොළොව පලාගෙණ ගිය තැන් දක්වා සොළොස්වැනි නිපාතයෙහි සමුද්දවාණිජ ජාතකයෙහි මතු පහළ වන්නේය.

එක් කලෙක්හි දෙවදත්ත සථවිරයන්වහන්සේ පඤ්ච වස්තුවක් යාචඤ්ඤ කොට නොලත්සේක් සඞ්ඝයා බිඳුවා පන්සියයක් භික්ෂූන් කැඳවාගෙණ ගයා නම් ගංහිස වාසය කරණසේක. එකල්හි ඒ භික්ෂූන්වහන්සේගේ ප්‍රඥව මිහි කිරීමට ගියේය. සම්බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූන්ගේ ප්‍රඥව මුහුකළ බව දැන වදාරා අග්‍රශ්‍රාවකයන් දෙදෙනාවහන්සේට ආමන්ත්‍රණය කොට "ශාරීපුත්‍ර සථවිරයෙනී, තොප ආශ්‍රය කළාවූ පන්සියයක් භික්ෂූහු දෙවදත්ත සථවිරයන්ගේ ලබ්ධිය රුස්වා ඔනු හා සමග ගියාහුය. දැනුදු වතාහි ඒ භික්ෂූන්ගේ ප්‍රඥව මිහිකිරීමට හියේය. තෙපි දෙදෙන බොහෝ භික්ෂූන් හා සමග එතනට ගොස් භික්ෂූන්ට ධම්දෙශනා කොට ඒ භික්ෂූන් මාර්ගඵලයෙන් ප්‍රබොධ කරවා කැඳවාගෙණ එව" යි වදාළසේක.

සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ එපරිද්දෙන් ගොස් ඒ භික්ෂූන්ට ධම්දෙශනා කොට මාර්ගඵලයෙන් පුබුදුවා දෙවැනි දිනයෙහි සූයෝද්ගමන වේලාවේ ඒ පන්සියයක් භික්ෂූන් කැඳවාගෙණ වෙළුවනාරාමයට වැඩියාහුය. ශාරීපුත්‍ර සථවිරයන්වහන්සේ වෙළුවනාරාමයට අවුත් සම්බුදුරජාණන්වහන්සේට නමස්කාර කොට සිටි කල්හි සෙසු භික්ෂූහු සැරියුත් මහතෙරුන්වහන්සේට ප්‍රශංසා කොට භාග්‍යවතුන් වහන්සේට දැන්වූවාහ. "ස්වාමීන්වහන්ස, අපගේ ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘවූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ පන්සියයක් භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදුව වඩනාසේක් ඉතා කොබනාසේක. දෙවදත්ත සථවිරයන්වහන්සේ වතාහි පිරිහුනාවූ පිරිවර ඇතිසේකැ" යි කීවාහුය. සම්බුදුරජාණන්වහන්සේ වදාරණසේක් "මහණෙනී, ශාරීපුත්‍රසථවිරයෝ නැ සමූහයා විසින් පිරිවරණලදුව එනසේක් හෙබියෝ දැන් මතු නොවෙති, පෙරත් ශොභාවත් වූවාහුය. දෙවදත්ත සථවිරයෝද පිරිවරින් පිරිහුණෝ, දැන් මතු නොවෙති, පෙරත් පිරිහුණෝමය" යි වදාළ කල්හි භික්ෂූහු ඒ කාරණය ප්‍රකාශ කරණු පිණිස භාග්‍යවතුන්වහන්සේට යාචඤ්ඤ කළාහුය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසී තුබූත කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

අතීතයිය දවස මගධරට රජගහනුවර එක් මගධ රජෙක් රාජ්‍යය කරණසේක්. එකල්හි බොධිසත්ත්වයන්වහන්සේ මාගජන්මයෙහි පිළිසිඳ ගෙණ වැඩිවයසට පැමිණ මුවන් දහසක පිරිවරා ගෙණ වනයෙහි වසනසේක.

උන්වහන්සේට ලක්ෂණය, කාලයකි කියා පුත්‍රයෝ දෙදෙනෙක් වූවාහුය අප මහ බෝසතාණන්වහන්සේ තමා මහලු වයසට පැමිණි කල්හි "පුත්‍රයෙනි, මම දැන් මහලුයෙමි, නෙපි මේ මෘගසමූහයා පරිහරණය කරව"යි කියා පන්සියය පන්සියය බැගින් එකි එකි පුත්‍රයාට භාරකළ සේක. එතැන් පටන් ඔහු දෙදෙන මෘගසමූහයා පරිහරණය කරන්නාහුය. මහධරට ශස්‍ය සමයෙහි ගොයම්න් අකපටු කල්හි වනාන්තරයෙහි මෘගයන්ට උපද්‍රව වන්නේය. මනුෂ්‍යයෝ ශස්‍යයන් අනුභවකරන්නාවූ මෘගයන් මරණ පිණිස ඒ ඒ තන්හි වල් කතනාහුය, හුල් හිඳුවන්නාහුය, පාසාණ යන්ත්‍රයන් සදන්නාහුය, සොර මල ආදිය අටවන්නාහුය. බොහෝ මෘගයෝ චිතාශයට පැමිණෙන්නාහුය බොධිසත්ත්වයන්වහන්සේ ශස්‍යයන් සම්බාධ සමය දැන පුත්‍රයන් කැඳවා ගෙන්වා අවවාද දෙනසේක් "පුත්‍රයෙනි, මේ තෙම ගොයම්න් යුක්ත කල් වන්නේය. බොහෝ මෘගයෝ චිතාශයට පැමිණෙන්නාහුය, අපි වෘඩ වූම්හ, යම්කිසි උපායකින් එක්තැනෙක්හි කල්යවම්හ. නෙපි නොපගේ මෘගසමූහය ගෙණ අරණ්‍යයෙහි පළිත පාදයකට වැද ගොයම් දැ මැඩිකල්හි එව"යි කියේක. ඔහු 'යහපතැ'යි කියා පියානන්ගේ වචනය අසා පිරිවර සහිතව නික්මුණාහුය.

ඔවුන් යන්නාවූ මානීයෙහි මනුෂ්‍යයෝ "මෙසමයෙහි මෘගයෝ පළිතයට නැගෙන්නාහුය, මෙසමයෙහි බස්නාහු ය"යි දන්නාහුය. ඔහු ඒ ඒ තැන සැඟවී හිඳ බොහෝ මෘගයන් විද මරන්නාහුය. කාල නම් මෘගරාජයාද තමා අඥත බැවින් "මෙතම් වේලෙහි යා යුතුය, මෙනම් වේලෙහි නොයායුතුය"යි නොදන්නේ මෘගසමූහයා ගෙණ පෙරවරුද පස්වරුද පෙරයම්හිද අලුයම්හිද ගම්දෙරින් යන්නේය. මනුෂ්‍යයෝ ඒ ඒ තන්හි සවනාවයෙන් සිටියාහුද සැඟවී සිටියාහුද බොහෝ මෘගයන් විනාශයට පැමිණෙවිවාහුය. මෙසේ කාල නම් මෘගරාජතෙම තමා නුවණ මද බැවින් බොහෝ මෘගයන් විනාශයට පමුණුවා සුළුපටු මෘගයන් පිරිවරණලදුව වනාන්තරයට වන්නේය. ලක්ෂණ නම් මෘගරාජ වනාහි පණ්ඩිතය; ව්‍යක්තය, උපායෙහි දක්ෂය, 'මේ වේලාවෙහි යායුතුය, මේ වේලාවෙහි නොයායුතුය"යි දන්නේය. ඒ මෘගරාජතෙම ගම් දෙරින්ද නොයන්නේ , දුවල්ද නොයන්නේය, පෙරයම්හිද නොයන්නේය, අලුයම්හිද නොයන්නේය, මෘගසමූහයා ගෙණ මධ්‍යම රාත්‍රියෙහිම යන්නේය. ඒ කාරණයෙන් එකම මෘගයකුදු නොනසා වනාන්තරයට වෙහි. ඒ මෘගයෝ එහි සාරමසක් වාසයකොට ගොයම්දැ මිරිකූ කල්හි පළිතයෙන් බැස ආවාහුය.

කාල නම් මෘගරාජතෙම පසුව එතුයේද පූර්වෝක්ත ක්‍රමයෙන් අවශෙෂ මෘගයන් විනාශයට පමුණුවම්න් හුදකලාවම ආයේය. ලක්ෂණ නම් මෘගරාජ වනාහි එකම මෘගයකුදු නොනසා පන්සියයක් මුවන් විසින් පිරිවරණ ලදුව මව්පියන් දෙදෙනාගේ සමීපයට ආයේය. බොධිසත්ත්වයන් වහන්සේ එන්නාවූ පුත්‍රයන් දැක මෘගසමූයා සමග මන්ත්‍රණය කරණසේක් මෙසේ කථාවක් පහළ කළසේක. "අවාර ශීලයෙන් සමන්විතවූ ධර්ම පරිසන්ථාරය ආමිස පරිසන්ථාරය යන විවිධවූ පරිසන්ථාරයම ප්‍රවෘත්ති කොට ඇත්තවුන්ට අභිවෘඩි වන්නේය. ඥති සමූහයා විසින් පිරිවරණ ලදුව එන්නාවූ ලක්ෂණ නම් මෘගරාජයා බලව, ඉක්බිත්තෙන් නැයන්ගෙන් විශෙෂයෙන් පිරිහී එන්නාවූ මේ කාල නම් මෘගරාජයා බලව'යි කියා බොධිසත්ත්වයෝ මෘග

ධෙනුවට නියෝග කළසේක. මෙසේ ලක්‍ෂණ නම් පුත්‍රයාට වනාහි සතෙනාත් වූ බොධිසත්ත්වයන් වහන්සේ ජීවිතාන්තය දක්වා සිට නම්වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ වදාරණසේක් "මහණෙනි, ශාරීපුත්‍ර සථවිරයෝ ඍති සම්පන්නයා විසින් පිරිවරණ ලදුව ශොභාවත් වූවෝ දැන් මතු නොවෙති, පෙරත් ශෝභාවත්වූවාහුමය. දෙවදත්තසථවිරයෝ පිරිවර සහමුයා කෙරෙන් පිරිහුණෝ දැන් මතු නොවෙති, පෙරත් පිරිහුණෝමය"යි වදාරා මේ ධම්දේශනාව ගෙණහැර දක්වා වදාරා අතීත කථාව හා වර්තමාන කථාව ගළපා පූර්වපරසන්ධි යොදා මේ ලක්‍ෂණ මෘග ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි කාල නම මෘගතෙම දැන් දෙවදත්ත සථවිර වූසේක. පණ්ඩිතොම දෙවදත්තසථවිරයන්ගේ පණ්ඩිතවූවාය, ලක්‍ෂණ නම් මෘගරාජතෙම දැන් ශාරීපුත්‍රසථවිර වූසේක. ඔහුගේ පණ්ඩිතොම දැන් බුදුපිරිස් වූවාය, එකල්හි මාතෘවූ මෘගධෙනුව දැන් රාහුල මව් වූවාය, පිතෘවූ මෘගරාජව උපන්නෙම් වනාහි දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 12
## නිග්‍රොධම්ග ජාතකය.

**ඒ** වද එක් සමයෙක්හි අසරණ සරණ වූ තිලෝගුරු සම්‍යක්සම්බුදු රජාණන්වහන්සේ සැවැත්නුවර නිසා දෙවිරම් වෙහෙර වැඩ වසනසේක් කුමාරකාශ්‍යප සථවිරයන් වහන්සේගේ මැනියන් අරභයා මේ ජාතකය වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

ඒ තෙරුන්වහන්සේගේ මැනියෝ නම් රජගහනුවර මහා සම්පත් ඇති සිටාතකෙනෙකුගේ දියනිකෙනෙක, පූර්ජන්මයෙහි රැස්කරණලද බොහෝ කුසල් මුල් ඇත්තෝය, අනිත්‍යාදි වශයෙන් පරීක්‍ෂා කරණලද සංස්කාර ධර්මයන් ඇත්තෝය, පශ්චිමාත්මභාවයෙහි සිටියාහුය. කළතුලෙහි පහණක් මෙන් මුන්ගේ අර්හත් ඵලයට උපනිශ්‍රය බබලන්නේය. ඒ සිටු කුමාරිකා තමා නම දන්නා තැන් පටන් ගිහිගෙයි ඇල්මක් නැතිව මහණවනු කැමැතිව දෙමවුපියන්ට කියන්නී "මැනියනි, පියාතෙනි, මට ගිහිගෙයි විසී මෙහි සිත නැලවෙන්නේය. මම නෛර්‍යාණිකවූ සර්ව්‍ඥ ශාසනයෙහි මහණවනු කැමැත්තෙමි, මා මහණ කරව"යි කිවුය. එබස් ඇසූ දෙමවුපියෝ කියන්නෝ, "දුවනියෙනි, කුමක් කියවිද? අපගේ ගෙයි බොහෝ වස්තු වන්නේය, තොපිත් අපගේ එකම දියනියෝය, එසේහෙයින් තොප මහණවන්ට නොපිළියන්ය"යි කිවූහ. ඒ සිටුකුමාරිකාව නැවත නැවතත් යාචඤ්ඤ කොට දෙමව්පියන්ගෙන් මහණවීමට අවසරයක් නොලැබ සිතන්නී, වන්නාව්, පුරුෂයෙකුට පාවා දුන් කල ඒ පුරුෂයා සිත් ගෙණ මහණවෙමි"යි සිතුය.

ඉක්බිත්තෙන් ඒ සිටුදූ වැඩිවිය පැමිනු තැනැත්තී දෙමවුපියන් විසින් පාවා දෙනලද පුරුෂයාගේ ගෙට ගොස් පති දෙවතාව සවාමිපුරුෂයා දෙවියකු

මෙන් සිතින් සිතන්නී පඤ්චසීලයෙන් හා ආචාරසීලයෙන් යුක්තව දුනාදීවූ පින්කම් කෙරෙමින් ගිහිගෙයි විසූහ. එකල ඔවුන් දෙදෙනාගේ සංවාසයෙන් සිටු කුමාරිකාව බඹ දරු ගැබක් පිහිටියේය. ඕතොමෝ දරුගැබ පිහිටි බව නොදන්නීය. ඉක්බිත්තෙන් එක් දවසක් එනුවර නක්ෂත්‍ර ඝොෂණය කොට සියලු නුවර වාසීහු නකත්කෙළි කෙළින්ව පවත් ගත්තාහ. සැවැත්නුවර මුළුල්ල ශක්‍රපුරයක් මෙන් සරසා පිළියෙල කරණලද්දේ වීය. ඒ කුමාරිකාවද දැන් මහලු නක්ෂත්‍ර ක්‍රීඩාව පවත්නා කල්හි තමාගේ ශරීරය සුවඳ ආදිය ගල් වන්නීත් නොවෙයි, වස්ත්‍රාභරණාදීන් සැරහෙන්නීත් නොවෙයි, තමාගේ පියවි සවභාවයෙන්ම ඇවිදිනීය. ඇගේ වල්ලභයාතෝද මෙසේ කීවාහුය. "සොඳුර, මේ සියලු නුවර නකත්කෙළි කෙළීම් ඇසුරු කොට ඇත්තේය. තොපි කුමක් නිසා ශරීරය පරිජඝනය නොකරවිදැ"යි කීහ. "සවාමිපුත්‍රය, දෙනිස් කුණප කොට්ඨාශයෙන් පිරුණාවූ මාගේ ශරීරය මේ වස්ත්‍රාභරණාදියෙන් සැරහීමෙන් ප්‍රයෝජන කිම්ද? මාගේ ශරීරයද දෙවියන් විසින් නිර්මාණය කරණලද්දේත් නොවෙයි, බ්‍රහ්මයන් විසින් නිර්මාණය කරණලද්දේත් නොවෙයි, සවර්ණයෙන් නිර්මිතත් නොවෙයි, මාණික්‍යයෙන් නිර්මිතත් නොවෙයි, හෙළඳුන් ආදිවූ වන්දනයෙන් නිර්මිතත් නොවෙයි.

රත්පියුම් හෙලපියුම් රක්තොත්පල සෙතොත්පල ගහිගෙන් උපන්නේත් නොවෙයි, දිව්‍යඔෂධයකින් කරණ ලද්දේත් නොවෙයි. වැලි කෙසේ උපන්නේද යත්, කුණපයෙහි අටගත්තේය. මව්පිය දෙදෙනාගේ සම්භවයෙන් ජාතය, අනිත්‍යය, ඉලීම් මැඩීම් බිඳීම් නැසීම් සවභාව කොට ඇත්තේය, සෝතළඟොඹ වඩිනය කරන්නේය, තෘෂ්ණා උපාදාන දෙකින් යුක්තය, ශෝකයට මූලකාරණය, ඇඩීමට වසතුය, සියලු රෝගයට වාසස්ථානය, දෙනිස් කම්කටුල් කරන්නවුන්ට පරශ්‍රය කරණලද්දේය, ඇතුළෙහි කුණුය, පිටත නිරන්තරයෙන් වැහෙන්නාවූ කුණු ඇත්තේය, අසුදහසක් කෘමිකුලයන්ට වාසස්ථානය, අමු සොහොනට ලංව සිටියේය, මරණයාගේ කෙළවර සියලු ලොකවාසීන්ගේ චක්ෂුස් පථයෙහි පවත්නාවූ මේ ශරීරය තුන්සියයක් පමණ ඇටසඟළින්ද නවසියයක් නහරින්ද යෙදුනේය, සමින්ද, නවසියයක් මස් වැදැල්ලෙන්ද, දලබුයෙන්ද යුක්තය. මේ කීවාවූ සියල්ලම මේ සමින් වැසී සිටියේය. එසේහෙයින් තත්වූ පරිද්දෙන් පිටත සිටියවුන්ට නොපෙණෙන්නේය. අතුළෙන්ද පිරී සිටියේය. උදරයෙන්ද පිරී සිටියේය. අක්මාවටද හෘදයමාංශයවද පපුකැතටද වකුගඩුවටද, බඩදිවවද සොටුවවද කෙළවද සෝදියටද ඩිදියටද මේද තෙලවද සඳමිදුලටද පිත්තයවද, වාසස්ථානය; තවද ඒ සත්ත්වයාගේ නව මහදොරින් හැම වේලෙහිම අසූචි වහනය වන්නේය. දැසින් රිල් ව්‍යවහාරයෙන් අක්ෂිගූථයද, දෙකන්සිදුලෙන් කාරදු ව්‍යවහාරයෙන් කර්ණගූථයද, දෙනාසාපුටයෙන් වැහෙන් නාවූ සොටුද, පිත්තයද, සෙලෙස්මාවද සමහර වේලෙහි මුඛයෙන්ද වමනය කරන්නේය, ශරීරයෙන් සේදිය වහනය කරන්නේය, යලිදු ඒ සත්ත්වයාගේ සිදුරුඉස ඉස්මුලින්ද පිරුණේය. අවිද්‍යාව පෙරදැරි කොට ඇත්තාවූ අඥාන සත්ත්වතෙම යථොක්ත කුණපකොට්ඨාශයන්ගෙන් යුක්තවූ ඒ සත්ත්වයා යහපතැ'යි සිතන්නේය, මේ ශරීරය අපමණවූ ආදීනවයෙන්ද යුක්තය, විෂවෘක්ෂයකට බඳුවූ උපමාත් ඇත්තේය. සියලු ව්‍යාධින්ට වාසස්ථානය, උදක් සියලු දුකඛයාගේ මූලයය. ඉදින් මේ කුණප ශරීරයාගේ ඇතුළත පිටත වූයේ චීනම් ඒකාන්තයෙන් දණ්ඩක් ඇරගෙණ කැමට පැමිණි කවුඩු බලු ආදීන් වළකන්

නේය, මේ ශරීරය දුගඳකි වහනය කරන්නේය, එසේ හෙයින් අපවිත්‍රය, කුණප යක් වැනිය, පවකඩකින් වසා තුබූ කසලගොඩකට බදුවූ උපමා ඇත්තේය, ඇතුළ අසුචි පුරා පිවත සිතුයම් කළ මැටිකළයකට බදු උපමාඇත්තේය, තවද මේ ශරීරය නුවණැස් ඇත්තවුන් විසින් නින්දාකරණලද අඥාන සත්ත්වයන් විසින් සතුටුවන ලද්දේය; සවාමිපුත්‍රය, මේ කුණප ශරීරය සරහා කුමක් කෙරෙම්ද? මේ ශරීරයාගේ සැරගීම අසුචි පිරුණාවූ කළයෙහි පිවත සිනියම් කරන්නාක් වැන්නේය''යි කිව, සිටුපුත්‍රයානෝ ඒ කුමාරිකාවන් මෙලෙසින් අනිත්‍ය ප්‍රතිසංයුක්තව කියන්නාවූ බස අසා මෙසේ කීහ.

''සොඳුර, නෙපි මේ ශරීරයෙහි මෙලෙසින් දෙෂ දක්නාහු කවරෙනෙය කින් මහණනොවිදැ''යි කිවූය, සවාමිපුත්‍රයානෙනි, මහණවීමට නොප විසින් සම්මත ලදිමි නම් අදම මහණවෙමි''යි කිව, සිටුපුත්‍රයානෝත් ''යහපත මම නොප මහණකරවමි යි කියා මහදන් පවත්වා මහත්වූ සත්කාර සම්මාන කොට මහත්වූ පෙරහරින් මෙනෙණවරට ගෙණගොස් ඒ කුමාරිකාව මහණ කරවන්නාහු දෙවිදත් මහතෙරුන් වහන්සේට පක්ෂව හිඳිනාවූ භික්ෂුණීන් සමීපයෙහි මහණ කරවූහ.

ඒ කුමාරිකාවද ප්‍රව්‍රජ්‍යාව ලැබ සම්පූර්ණවූ චිත්තසංකල්පනා ඇත්තී සතුටුවූ සිත් ඇතිවූය, ඉක්බිත්තෙන් ඒ කුමාරිකාවන්ගේ දරු ගබීය මිහිරිකිරීමට පැමිණෙන්නේය, චක්ෂුරාදී ඉන්ද්‍රියන්ගේ අන්‍යථාභාවයද, හස්තපාද පාෂ්ණි ඉල්පුන බවද, උදරපටලයාගේ මහත් බවද, දැක භික්ෂුණීහු ''ආර්‍යාව තෙපි දැරි ඇත්නාක් මෙන් පෙණෙසි, මේ කිමෙක්දැ''සි විචාළාහ.

''ආර්‍යාවෙනි, මම මෙතම් කාරණයකැ'යි නොදනිමි, මාගේ ශීලය සම්පූර්ණය''යි කිව, ඉක්බිත්තෙන් ඒ භික්ෂුණිය අවශෙෂ භික්ෂුණීහුද දෙවිදත් මහතෙරුන් සමීපයට කැඳවා ගෙණගොස් ''ආර්‍යාවන් වහන්ස, මේ කුලස්ත්‍රිය දුකසේ වල්ලහයා සිත් ලබා ගෙණ ප්‍රව්‍රජ්‍යාව ලද්දීය, දැන් වනාහි මැගේ දරුගබී යෙක් පෙණෙන්නේය, අප හැම මේ ගබීය ගිහිකළ ලත්බවුත් මහණවූකල ලත් බවුත් නොදනුම්හ, දැන් මීට කුමක් කරමෝදැ''යි විචාළාහුය.

දෙවදත්ත සථවිරයෝද තමන් නුබුදු බැවින්ද අනුන් කෙරේ ක්ෂාන්තියක් මෛත්‍රියක් දයාවක් නැති හෙයින්ද මෙසේ සිතූහ. ''දෙවදත්තසථවිරයන්ගේ පක්ෂයෙහි භික්ෂුණියක් කුසින් දරු ගබීයක් පරිහරණය කරන්නීල, දෙවදත්ත සථවිරයෝද ඒ බල බලා ඉඳිති යි මට නින්දා උපදවන්නේයයි මා විසින් මේ මෙනෙණින්න මෙතනින් නෙරපාපියන්ට සුදුසුය''යි ඒ දෙවදත්ත සථවිරයෝ පරීක්ෂා නොකොටම ''ගල්කැටක් පෙරළෙන කලක් පරිද්දෙන් උඩව පැන නැගී යව, මෑ මෙතනින් නෙරපාපියව''යි කීහ. ඒ භික්ෂුණීද දෙවදත්ත සථවිරයන් කී බස් අසා උන්නෙනින් නැගීසිට වදලා සමීඥයන් වහන්සේගේ පක්ෂයෙහි භික්ෂුණීන් වසන්නාවූ සථානයට ගියාය.

ඉක්බිත්තෙන් ඒ බාලවූ මෙනෙණින්න භික්ෂුණීන්ට කියන්න ''ආර්‍යාවෙනි, දෙවදත්තසථවිරයෝ බුදුනොවෙනි, මට උන්සමීපයෙහි මහණව ඉඳීමෙන් ප්‍රයෝජන නැත. මේ ලෝකයෙහි අග්‍රපුද්ගලවූ සමීඥයන් වහන්සේ සමීපයෙහි මහණවීමට අභිප්‍රාය කොට මා වීසින් දුකසේ ලද්දාවූ මේ ප්‍රව්‍රජ්‍යාවම අනතඛාන නොකරව, මා කැඳවා ගෙණ සමීඥයන් වහන්සේ කරා ජේතවනාරාමයට යව''යි

කිව, ඒ භික්ෂුණීහුද අළුත ගියාවූ භික්ෂුණීය කැඳවාගෙණ රජගහනුවරින් පන් සාළිස් යොදුන්තක් තැන් මගගෙවා අනුක්‍රමයෙන් ජේතවනාරාමයට පැමිණ සරීඳුයන් වහන්සේ වැඳ මේ කාරණය දැන්වූවාහුය. සරීඳුයන් වහන්සේ ''මැණේ දරුගැබ ගිනිකලම පිහිටියේය' යි සිතුසේක එසේ නියමකොට දැනත් ''ශ්‍රමණ භවත් ගෞතමයෝ දෙවදත්තසඵවිරයන් විසින් හරණලද මෙහෙණින්නක ඇර ගෙණ ඇවිතාන'යි නීතීකයන්ට කියන්ට අවසර පෙණෙන්නේය, එහෙයින් මේ උපන් කථාව විචාරා සනිටුහන් කරන්වද සරාජික පෑතින් මධ්‍යයෙහි විනිශ්චය කරන්ටද සුදුසු වන්නේය'යි දෙවෙනි දවස් පසේනදි කොසොල් රජ්ජුරුවන්ද අනේපිඬු මහසිටානන්ද සුළු අනාථපිණ්ඩිකයන්ද විසාඛා මහා උපාසිකාවන්ද අනිකුත් ප්‍රසිඛවූ මහකුලයන්ද කැඳවාලා මේ අධිකරණය විචාරා සනිටුහන් කරන්ට පාවා දුන්සේක. සවස් වේලෙහි සිවුවණක් පෑතින් රැස්වූ කල්හි විනයට අග්‍රකොට තබනලද්දාවූ උපාලි සඵවිරයන් වහන්සේට ''යම සිවුවණක් පෑතින් මධ්‍යයෙහි මේ දහරහිභික්ෂුණීයගේ අධිකරණය විචාරා ශුඛකරව'යි වදාළ සේක.

'යහපත සවාමීනි'යි තෙරුන් වහන්සේ පෑතින් මධ්‍යයට ගොස් තමන් වහන්සේට පැමිණියාවූ ආසනයෙහි වැඩහිඳ රජ්ජුරුවන්ගේ ඉදිරියෙහිදී විසාඛා මහා උපාසිකාවන් කැඳවා 'යව මහා උපාසිකාවෙත මේ ළදරු භික්ෂුණී අසවල් මහා අසවල් දවස් මහණවූව'යි තත්ත්ව නොසින් දැන මේ දරුගබිණිය මහණවන්නාට පෙරාතුවේ නෝ පසුව වේ නෝ'යි නියම දැන කියව'යි විසාඛාවන් අතට පාවා දුන්සේක.

විසාඛා මහාඋපාසිකාවද ''යහපත සවාමීනි''යි පිළිගෙණ වට කොට තිරයක් අද්දා තිරය ඇතුලේදී බාලභික්ෂුණීයගේ හැඳපාදුරිය බඩ කෙළවරකොට බලා මාස් දවස් එක්කොට ගණන් පරීක්ෂාකරවා ගිනිකඳ දරුගැබ ලත් නියාව තත්ත්වනොසින් දැන උපාලි සඵවිරයන් වහන්සේ සමීපයට ගොස් මේ වූ නියාව දැන්වූයේ, තෙරුන් වහන්සේද සිවුවණක් පෑතින් මධ්‍යයෙහිදී ඒ භික්ෂුණිය ශුඛ කළසේක. ඒ භික්ෂුණියද උපන් කිලුටින් ශුඛව භික්ෂුසඞ්ඝයා වහන්සේද සරීඳුයන් වහන්සේද වැද යෙසු භික්ෂුණීන් හා සඟ මෙහෙණින්නන් වඳින්නාවූ සථානයට ගියාය, ඕතොමෝ දරුගබිණිය මිනිකිරීමට පැමිණි කල්හි පියුමතුරා නම් සරීඳුයන් සමයෙහි කරණලද ප්‍රාර්ථනා ඇති මහානුභාවසම්පන්නවූ පුත්‍රයාන කෙණෙකුන් වැදූයේය.

ඉක්බිත්තෙන් එක්දවසක් පසේනදි කොසොල් රජ්ජුරුවෝ මෙතෙණි වර සම්පයෙන් යන්නෝ දරුවන් අඬන අඬ අයා අමාත්‍යයන් අතින් ''මේ කිමෙක්දැ'යි විචාළාහ. අමාත්‍යයෝද ඒ කාරණය දැන 'රජ්ජුරුවන් වහන්ස, ඒ දවස්සිවුවණක් පෑතින් මධ්‍යයෙහිදී අධිකරණය විචාරා සනිටුහන් කළ භික්ෂුණීන් වහන්සේ පුත්‍රයානකෙණකුන් වැදූසේක. ඔවුන්ගේ මේ ශබ්දය,'යි කීවාහුය. 'සඟයෙනි භික්ෂුණීන්ට දරුවන් පරිහරණය කිරීම නම් තපසට ඉතා පලිබොධය, අපි ඒ කුමාරයන් වඩමින'යි කියා ගෙන්වාගෙණ තාටක සත්‍රීන්ට පාවාදෙවා කුමාර පරිහරණයෙන් වැඩුහ. ඒ කුමාරයන්ට නම් තබන දවස කාශ්‍යපය'යි කියා නම් තැබූහ ඉක්බිත්තෙන් ඒ කුමාර පරිහරණයෙන් වැඩුනුබව නෙතුකොටගෙණ කුමාර කාශ්‍යපය'යි කියා නම් තැබුවාහුය, ඒ කුමාරයෝද සත් ඇවිරිදි අවසථාවෙහි සරීඳුයන් සමීපයෙහි මහණව සම්පූණීව විසිවයස් ඇතිව උපසම්පදාව ලැබ කල්හිය පසු බණ කියන්නාවුන් අතු

රෙහි විචිත්‍රකථික වූවාහුය. ඉක්බිත්තෙන් ඔහු සම්බුදුයන් වහන්සේද "මහණෙනි, මාගේ ශාසනයෙහි විසිතුරු කොට බණ කියන්නාවූ ශ්‍රාවකයන් අතුරෙන් යම් යම් කුමාර කාශ්‍යප ස්ථවිරයෙක් ඇද්ද? මේ තෙම අග්‍රය"යි එතදග්ග පාළියෙහි තබා වදාළසේක. උන්වහන්සේද පසුව කල්‍යාමකින් වම්මික සූත්‍රය දෙශකාවෙහිදී බණ අසා අර්හත්ඵලයට පැමිණියසේක. ඒ කුමාරකශ්‍යපස්ථවිරයන්ගේ ඔවු භික්ෂුණීද විදර්ශනා වඩා අර්හත්ඵලයට පැමිණියාය, ඒ කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේද සම්බුදුශාසනයෙහි ආකාශයෙහි චන්ද්‍රයා පරිද්දෙන් ප්‍රකාශ වූසේක.

එක්දවසක් සම්බුදුරජානන්වහන්සේ පසුබත ආහාර පරිභෝජනයෙන් වැළකීසේක්හි වළඳා අනන්තරයෙහි භික්ෂූන්වහන්සේට අවවාද දී ගඳ කිළියට වන්සේක. භික්ෂූන්වහන්සේ අවවාද පිළිගෙණ තම තමන්වහන්සේගේ රාත්‍රිස්ථාන දිවාස්ථානයෙහි දවල් දවස් යවා සවස් වේලෙහි ධර්මසභාමණ්ඩපයට රැස්ව "ඇවැත්නි, දෙවදත්තස්ථවිරයන් තමන් නුබුදු බැවින්ද ක්ෂාන්තිමෛත්‍රියක් නැති බැවින්ද ඔහු විසින් කුමාරකාශ්‍යපස්ථවිරයෝද උන්වහන්සේට මවුවූ ස්ථවිරීහුද තෙරණාලදහ. සම්බුදුයන් වහන්සේ වනාහි තමන්වහන්සේ ධර්මරාජන් බැවින්ද සියලු සත්ත්වයන් කෙරෙහි පතළාවූ කරුණා මෛත්‍රී ආදිය ඇති බැවින්ද ඔවුන් දෙදෙනාට පිහිටවූසේකැ"යි සම්බුදුයන් වහන්සේගේ ගුණ වර්ණනා කෙරෙමින් උන්සේක. බුදුරජානන් වහන්සේද සම්බුලීලාවෙන් දම් සභා මණ්ඩපයට වැඩ පණවනලද බුඩාසන මස්සාකයෙහි වැඩහිඳ "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ'යි විචාරා වදාරා නුඹවහන්සේ කොකියන්ට වදාළාවූ රාජකථා චෝරකථා ආදීවූ දෙනිස්කථාවෙන් යුක්තව උනුමෝ තොවම්හ. දෙවදත්තස්ථවිරයන්ගෙන් පිහිට තොලැබ පලා ඇ කුමාර කාශ්‍යප ස්ථවිරයන් හා මිස් ස්ථවිරාවන් දෙදෙනාට පිහිටවූ නියාව කියා කියා උනුම්හ'යි ආදියෙහි පටන් සියලු ප්‍රවෘත්තිය දන්වූහ. "මහණෙනි, සම්බුදුහෝ මොවුන් දෙදෙනාට දැන් මතු පිහිටවූවෝ තොවෙති පූර්වයෙහිත් ප්‍රත්‍යයත්, පිහිටත් වූවාහු වේදැ"යි වදාළසේක. භික්ෂූන්වහන්සේ ඒ අර්ථය ප්‍රකාශ කරණ පිණිස භාග්‍යවත්වූ බුදුරජහට යාචඤ්ඤා කොට කීසේක. සම්බුදුයන් වහන්සේද අන්‍ය භවයෙන් සැඟවූනාවූ ඉකුත්වත් ප්‍රකාශ කොට වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

පෙරකිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතාණන් මෘගයෝනියෙක්හි පිළිසිඳගත්හ, බෝධිසත්ත්වයෝද මවුකුසින් බිහිවූවාහු රන්වන්වූ ශරීරවර්ණ ඇතිවූහ. ඒ මෘග පොතකයන්ගේ අක්ෂීන් දෙදෙන ඉන්ද්‍රනීල මාණික්‍යයකට බඳුවූ සවහන් හා පැ ඇත්තාහ, අංකුර දෙක රජතවර්ණය, මුහුණ රත් පලස්හූවටක් බඳුවූ පැහැ ඇත්තේය; හස්තපාදයන්ගේ පර්‍යන්තයෝ ලාක්ෂාරසයෙන් පිරියම් කරණ ලද්දා වැනියහ, වාලධිය චමරවාලධියක් වැනිවූයේය, ඒ මෘග පෝතකයාන්ගේ ශරීරයද මහත්වූ අශ්ව පෝතකයක්හු පමණවූයේය, ඒ මුව රජ්ජුරුවෝද පන්සියයක් පමණ මුවන් විසින් පිරිවරණලදුව වනයෙහි වාසය කරන්නාහ. නම්ත් නිග්‍රොධ නම් මුවරජ්ජුරුවෝය, ඒ මුව රජ්ජුරුවන්ට නුදුරුවූ ස්ථානයෙහි පන්සියයක් මුවන් පිරිවරණලදුව ශාඛමෘග නම්වූ අනිකුත් මුව රජ්ජුරු කෙණෙක් ඒ වනයෙහි වසන්නාහ. ඒ මුවරජ්ජුරුවෝද රන්වන්වූ

ශරීරවණ්ණ ඇත්තාහි. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝද මුවන් මැරීමෙහි නියුක්ත වෙයෙති. මාංශ කැතිව බත් අනුභව නොකෙරෙති. මනුෂ්‍යයන්ගේ කම්‍මාන්ත නැති කොට සියලු ගම් නියම්ගම් ජනපදවාසීන් රැස්කරවා දවස් පතා මුවදඩයමට යන්නහ. මනුෂ්‍යයෝ මෙසේ සිතූහ. ''රජ්ජුරුවන්වහන්සේ නිරන්තරයෙන් මුවදඩයමට යාමෙන් අප හැමගේ කම්‍මාන්ත පමා වන්නේය. අප හැම රාජධානියෙහි මුවන්ව ගොදුරට නිසි තණ ආදිය රෝපණය කොට පැන් බොන්නාවූ සථානයක්ද සමෘඩ කරවා බොනෝ මුවන් වලින් ගෙණවුත් උයනෙහි ලා දෙරපැලලි බැඳ රජ්ජුරුවන් වහන්සේට පාවා දුනුමෝ නම් යෙහෙකැ''යි සිතා ඒ සියලු මනුෂ්‍යයෝම එක්ව ගෙණ උද්‍යානයෙහි තණ පැන් සමෘඩ කරවා මුගුරු ආදීවූ නොයෙක් ආයුධ ගත් අත් ඇතිව වලට වැද මුවන් සොයා ඇවිනාහු වන මධ්‍යයෙහි සිටියාවූ මුවන් හා ශාඛා නම් මුවරජ්ජුරුවන් හා නිග්‍රොධ නම් මුවරජ්ජුරුවන් වසන්නාවූ සථානය මධ්‍ය කොට වට කළාහුය.

ඉක්බිති ඒ මෘග සමූහයා දැකලා ගස්වලද වල්පිටද බිමද මුගුරුවලින්ද දඬු ආදියෙන්ද ගසමින් මුවන් භයගන්වා උගුළුවා කඩු අඹයටි දුනු ආදීවූ ආයුධ යන් ඔසවා පෑ මහත්වූ ශබ්ද පවත්වමින් මෘගසමූහයා උයනට වද්දවා දෙර පැලලි වසා රජ්ජුරුවන් කරා ගොස් රජ්ජුරුවන් වහන්ස, දවසක් පාසා මුවදඩයමට ගොස් අප හැමගේ කම්‍මාන්ත නොනැසුව මැනව, අප හැම විසින් වලින් මුවන් ගෙණවුත් නුඹවහන්සේගේ උයනෙහි ලනලද, මෙතැන් පටන් ඔවුන්ගේ මස් අනුභව කළ මැනව'යි රජ්ජුරුවන්ට කියා තමත්ගේ ගම්වලට ගියාහුය. රජ්ජුරුවෝ උන් හැම කී බස් අසා උයනට ගොස් මුවන් බලන්නාහු රන්වන් මුවරජ්ජුරුවන් දෙන්නාදෙනා ඔවුන්දෙන්නාට අභයදෑනය දුන්නාහ. එවක් පටන් කිසි දවසක රජ්ජුරුවෝ තුමූ ගොස් ඉන් එක මුවකු විද ගෙණෙන්නොහ. කිසි දවසක අරක්කැමියා ගොස් මුවකු විද ගෙණෙන්නේය, මුම්වෝ දුනු දැක මරණ භයින් තැතිගත්තාහු ඒ ඒ තැන සැඟවී යන්නාහ. විත් දෙක තුණ ලැබ බොනෝ දෙක පීඩා විඳින්නාහ, තණින් පැනින් දුක් විඳ ලෙඩ වන්නාහුද වෙති, මරණයටද පැමිණෙති. මෘග සමූහයා මෙපවත් බොධිසත්ත්වයන්ට දැන්විය. බොධිසත්ත්වයෝද ශාඛ මෘගරජ්ජුරුවන් කැඳවාලා ''යහලු, බොහෝවූ මුවෝ වළපිති, නසිති, ඒකාන්තයෙන් මළයුතු බව නියමවූ පසු මෙතැන් පටන් ශරයෙන් මුවකු නොවිදින්වයි දම්ගෙඩිය තුබූ සථානයෙන් මුවන්ව වර පැමිණේව'යි එක් දවසක් අපගේ පෂ්ඨට වාරය පැමිණේව'යි එක් දවසක් තොපගේ පෂ්ඨට වාරය පැමිණේව'යි වාරය පැමිණියාවූ මුවෝ ගොස් දම්ගෙඩියෙහි හිස තබාලා වැදහොත්ව'යි එසේ කල්හි මුවෝ ඒ වදයව නොපැමිණෙත්ව'යි සනිටුහන් කොට ඒ සියලු මෘගයෝ ම යහපතැ''යි පිළිගත්හ.

එදවස් පටන් වාරය පැමිණියාවූ මුවා ගොස් දම්ගෙඩිය මත්තෙහි ඉස තබා වැදහෝනේය. අරක්කැමියා අවුත් ඒ දම්ගෙඩිය මත්තෙහි වැද්දහොත් තාවූ මෘගයාම මරා ඇරගෙණ යන්නේය. ඉක්බිත්තෙන් එක් දවසත් ශාඛ මෘග යාගේ පෂ්ඨිහි දැරි ඇතිවූ එක් මුවදෙනකුට වාරය පැමිණියේය. ඒ මුව දෙනද ශාඛ මුවරජ්ජුරුවන් සමීපයට එළඹ ''සවාමිනි, මමත් ගර්භනීමි, දරු කෙනෙකුන් වදා අපි දෙදෙනම දෙවාරයක් යම්හ'යි මාගේ වාරය ඉක්මවාපුව මැනව''යි කිව. ඒ ශාඛ මුවානෝ ''තොපට පැමිණි වාරය අනෙක් කෙනෙකුන්ට පමුණුවන්ව මට නොපිළිවන, තෝම තීගේ පුත්‍රයා දන්නෙහිය, මෙත

නින් පලායව'යි කීවාහුය. ඒ මුවදෙන ශාඛ මෘගයන්ගේ සමීපයෙන් අනුග්‍රහ යක් නොලබන්නී බොධිසත්ත්වයන් කරා එළඹ මේ කාරණය දන්වූහ, බොධි සත්ත්වයෝද ඒ මුවදෙනගේ බස් අසා වන්නාට තෙපි යව, මම තොපගේ වාරය ඉක්මවමි'' තුමූ ගොස් දම්ගෙඩිය මත්තෙහි හිස තබා හොත්තාහ. අරක්කැමි යාද ඒ බොධිසත්ත්වයන් දැක ''ලබනලද අහය ඇති මුවරජ්ජුරුවෝ දම්ගෙඩිය මත්තෙහි ඉස තබාගෙණ වැදහොත්තාහ. මීට කාරණා කිම්දෝ?''යි සිතා යුහුව ගොස් එපවත් රජ්ජුරුවන්ට කීයේය. රජ්ජුරුවෝද එකෙණෙහි රථයකට පැන නැඟී මහත්වූ පෙරහරින් උයනට ගොස් දම්ගෙඩිය මත්තෙහි හිස තබා වැදහොත් බොධිසත්ත්වයන් දැක ''යහළුවූ මුවරජ්ජුරුවෙනි, මා විසින් තොපට අභයදානය දෙනලද්දේ නොවේද? කවර කාරණයකින් තෙපි මෙතන වැද හොත්තාවුදු''යි කීහ. ''මහරජ්ජුරුවෙනි; දැරි ඇති මුවදෙනෙක් මා සමීපයට අවුත් මට පැමිණි වාරය අනෙකෙක්හට පමුණුව මැනවැ'යි කිව, මා විසින් එකක්හට පැමිණි මරණ දුක් අනිසක්හට පමුණුවන්නට මට නොපිළිවන, ඒ මම මාගේ ජීවිතය ඇට දී ඇට පැමිණි වාරය මම ඇරගෙණ මෙතන වැදහොත් නෙමි. අනෙක් සැකයක් නොකරව රජ්ජුරුවෙනි''යි කීවාහුය. ''මාගේ සවාමිවූ මෘගරාජයානෙනි, මා විසින් තොප බදුවූ ක්ෂාන්තිය හා මෛත්‍රිය අනුකම්පා ඇති කෙණෙකුන් මනුෂ්‍යයන් කෙරෙහිදු නොදන්නාලද, ඒ කාරණයෙන් තොප කෙරෙහි ප්‍රසන්නයෙමි. නැගිපිටුව, තොපවත් ඒ මුවදෙනවත් අභයදානය දිනිමි''යි කීහ. අප දෙදෙනා විසින් අභයදානය ලත්කල්හි සෙසු මුවෝ කුමක් කෙරෙද්ද? රජ්ජුරුවෙනි''යි කීහ, ''සෙසු මුවන්ටත් අභයදානයදිනිමි සවාමිනි'යි කීහ. ''මහරජ, උයන වසන මුවන්ට අභය දුනුව. වල වසන සෙසු මුවෝ කුමක් කෙරෙද්ද''යි කීහ. ''ඔවුන්ටත් අභය දිනිමි'යි කීහ. ''මහරජ, වල හා ගම වසන මුවෝ අභයදානය ලත්හ, අවශෙෂවූ චතුෂ්පදික සත්ත්වයෝ කුමක් කෙරෙද්ද? රජ්ජුරුවෙනි'යි කීහ. ඒ ඒ චතුෂ්පදික සත්ත්වයන්ටත් අභයදානය දිනිමි''යි කීහ. ''චතුෂ්පදිකාදීහු අභයදානය ලත්හ. දියෙහි වසන්නාහු මත්ස්‍ය ජාතීහු කුමක් කෙරෙද්දු''යි කීහ. ''ඔවුන්වත් අභයදානය දිනිමි''යි කීහ.

මෙපරිද්දෙන් මහාබොධිසත්ත්වයෝ රජ්ජුරුවන් අතින් මුවන් ආදීවූ සියලු සත්ත්වයන්ට අභයදානය ඉල්වාගෙණ වැදහොත් තැනින් නැගීසිට රජ්ජු රුවන් පන්සිල්හි පිහිටුවා ''රජ්ජුරුවෙනි, දශකුශල ධර්මයෙහි හැසිරෙව, මව් පියන් කෙරෙහිද, දුදරුවන් කෙරෙහිද ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහිද සියලු ජනපදවාසීන් කෙරෙනිද ධර්මයෙන් හැසිරෙව'යි රජ්ජුරුවන්ට අවවාද කොට ''මධ්‍යම ප්‍රතිපදාවෙහි හැසිරෙන්නාවූ සත්ත්වතෙම කරජකායයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාතවූ සවර්ගලොකයට පැමිණේව''යි රජ්ජුරු වන්ට සර්ව්ඥලීලාවෙන් ධර්මදෙශනා කොට කීපදවසක් ඒ උයනේ වාසය කොට රජ්ජුරුවන්ට අවවාද දී මෘගසමූහයා විසින් පිරිවරණලදුව තමන් පෙර විසුවාවූ වනයට පැමිණියාහුය, ඒ මුවදෙන්ද පුෂ්පකර්ණිකාවට බදුවූ පුතකු වැදුව. ඒ මුවපැටියානෝද කෙළනා තැනැත්තෝ ශාඛමෘගරාජයානන් සමීපයෙහි ගොස් කෙළනාහ. ඉක්බිත්තෙන් ඒ මෘගපොතකයානන්ගේ මැනියෝ ඒ ශාඛ මෘග රාජයන් සමීපයෙහි යන්නාහු දැක ''පුත, මේතැන් පටන් ඔහු සමීපයට නොයව, නිග්‍රොධමෘගරාජයන් වහන්සේ සමීපයටම යව''යි පුතනුවන්ට අවවාද කරන්නාවූ මෘගධෙනුව මෙසේ කීහ. ''පුත්‍රය, නොපවේවායි අනෙක් කෙනෙක්

වේවාසි තමහට හිතයක් වැඩක් කැමැත්තේ වී නම් නිග්‍රොධ මෘගරාජයාතන් වහන්සේම සේවනය කරන්නේය. ශාඛ මෘගරාජයාතන් කරා නො එළඹෙන්නේය. සේවනයත් නොකරන්නේය. ඔහු නිසා ජීවිකාවත් නොකරන්නේය. ශාඛ මෘගරාජයාතන්ගේ සමීපයෙහි යම්ජීවිකාවෙක් ඇද්ද? ඒ ජීවිකාවටත් වඩා නිග්‍රොධ මෘගරාජයාතන්වහන්සේගේ පාදමූලයෙහි වැදහෙව මියයාම උතුම්වන්නේය'යි ශාඛමෘගරාජයාතන් සමීපයට නොයතලෙස අවවාද කළහ. රජ්ජුරුවන් විසින් අභයදානය දුන් තැන් පටන් අභය ලද්දාවූ මුවෝ මනුෂ්‍යයන්ගේ ගොයම් කා නසන්නාහ. මනුෂ්‍යයෝ "අයහදානය ලත් මුවෝය"යි ගසන්ටද පලවන්ටද නොහැක්කාහ. ඒ සත්ත්වයෝ රාජාඛ්‍යණයෙහි රැස්ව රජ්ජුරුවන්ට මෙපවත් කිවාහ. රජ්ජුරුවෝ ප්‍රසන්නවූ සිත් ඇති මා විසින් නිග්‍රොධ මෘග නම් උන් තමයාතන්ට වර දෙනලද මම රාජ්‍යය හරින්නේ නමුත් එදවස් දුන් ප්‍රතිඥ නොහරිමි, පලායව, මාගේ ආඥව පවත්නා ස්ථානයෙහි මුවන් මරන්ට කිසින් සත්ත්වයෙක් නොලබන්නේය"යි කිවාහුය.

නිග්‍රොධ මුවරජ්ජුරුවෝද එපවත් අසා මෘගසමූහයා රැස්කරවා "මෙතැන් පටන් අනුන්ගේ ගොයම් කන්ට නොපිළිවනැ"යි මුවන් වළකා "මෙතැන් පටන් ගොයම් කරන්නාවූ මනුෂ්‍යයෝ ගොයම් රක්නා පිණිස වැටක් නොකරත්ව'යි "කුඹුරු වටකොට පන් අදින්ව"යි මනුෂ්‍යයන්ට කියා යැවූවාහුය. එතැන් පටන් කොට ක්ෂේත්‍රවල පන් ඇදීම් සංඥව පහළවිය. එවක්පටන් පත් ඇදි සලකුණ ඉක්මවන්නාවූ එකම මෘගයකුත් නැති. මේ වනාහි ඒ සත්ත්වයන්ට මහබෝසතාණන්ගෙන් ලැබෙනලද අවවාදයි. මෙපරිද්දෙන්ම මෘගසමූහයාට අවවාද කොට නිග්‍රොධ බොධිසත්ත්වයෝ ආයුපමණින් සිව ඒ මුවන් හා සමග කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහුය. ඒ රජ්ජුරුවෝද බොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි සිට දානමානාදීවූ කුසල් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහ.

ලොවුතුරා සම්බුදුරජාණන් වහන්සේද 'මහණෙනි, මේ සැවිරුවන්ටද කුමාර කාශ්‍යප සැවිරියන්වදද මම දැන් මතු පිහිටුවූයෙම් නොවෙම්. පළමුත් පිහිටුවූයෙම් වේදැ"යි මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍ය දෙශනාව පෙරදැරි කොට අතීත කථාවත් වර්තමාන කථාවත් වදාරා දෙක එක්කොට සන්නි ගළපා මේ නිග්‍රොධමිග ජාතකය නිමවා වදාළසේක.

"එකල්හි ශාඛමෘගරාජයානෝ නම් දැන් දෙවදත්ත සැවිරයෝය, ඔවුන්ගේ එදවස් මෘගපර්ෂදා දැනුත් දෙවදත්ත පර්ෂදය, ඒ මුවදෙන නම් දැන් මේ සැවිරාවෝය, එදවස් ඒ මුවපැවැත්තෝ නම් දැන් බණ කියන්නවුන් කෙරෙහි අග්‍රවූ මේ කුමාර කාශ්‍යප සැවිරයෝය. එදවස් බරණැස් රජ්ජුරුවෝ නම් දැන් ධර්ම භාණ්ඩාගාරිකවූ ආනන්දසැවිරයෝය. නිග්‍රොධ මුවරජ්ජුරුවෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 13
## කණ්ඩින ජාතකය.

මේවද තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා දෙවිරම් වෙහෙර වැඩ වසනසේක්, පුරාණ දුර්නිමිත්තකාව කෙරෙහි ලොල්වූ එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක. මෙහි වර්තමාන කථාව අට්ඨක නිපාතයෙහි ඉන්ද්‍රිය ජාතකයෙහි

මතු ප්‍රකාශ වන්නේය, භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේද ඒ භික්ෂූහට් "මහණ' තෝ පූර්වයෙහිත් මේ මාතුගාමය නිසා ජීවිත විනාශයට පැමිණ සහළහුරු රැසෙක්හි පැලහුතෙහිය"යි වදාළසේක් භික්ෂූන්වහන්සේ ඒ කාරණය ප්‍රකාශ කරණ පිණිස සම්බුදයන් වහන්සේට යාචඤ්ඤ කොට දැන් වූසේක. සම්බුදයන් වහන්සේ ද භවාන්තරයෙන් පටිච්ඡන්නවූ ඒ කාරණය ප්‍රකාශ කොට වදාළ සේක.

"මෙයින් මත්තෙහි වනාහි භික්ෂූන් වහන්සේගේ යාචඤ්ඤවද භවාන්තරයෙන් සැඟවූතේය යන එපමණකුත් නොකියා ඉකුත්වත් ගෙණෙන්නැර දැක්වූසේක්'යි මෙපමණක්ම කියමු. මෙපමණක් කී කල්හි යාචඤ්ඤවද වළාගබ්‍රහ්මන් නික් මුනාවූ චන්ද්‍රයා පරිද්දෙන් භවාන්තරයෙන් සැඟවූනාවූ කාරණයද"යි යන මේ සියල්ල යට කියන ලද ක්‍රමයෙන් යොදා දතයුතු.

යි වගිය දවස මගධරට රජගහනුවර මගධනම් රජ්ජුරුකෙතෙක්රාජ්‍ය කෙරෙති, මගධරට වාසීන් ගොයම් කරණ අවදියෙහි මුවන්ට මහත්වූ උපද්‍රව වන්නේය. ඒ මෘගයෝ වනයෙහි පර්‍වත සමීපයෙහි වසන්නාහ. ඒ මුවන් අතු රෙහි එක් වලෙක ඒ පර්‍වතසමීපයෙහි වසන්නාවූ මෘගයෙක් එක් ගමක් සමීප යෙහි වසන්නාවූ මෘගපෝතිකාවක් හා සමඟ මිත්‍රසන්ථවය කොට ඒ මුවන් වසන් නාවූ පර්‍වත සමීපයෙන් බැස නැවත ගම් සමීපයට බස්නා කල්හි මෘගපෝතිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇති බැවින් ඇ හා එක්වම බස්නේය. ඉක්බිත්තෙන් ඒ මෘගපෝතිකා මෙසේ කියා. 'සඛාම්පුත්‍රය, තෙපි වනාහි පර්‍වතයෙහි වසව, ඉතා බාලයහ. ගම් සමීපය නම් ශංකා ප්‍රතිභය සහිතය, අප හා සමඟ වනයෙන් නො බසුව; නොඑව"යි වැළකුව. ඒ මුවාද ඒ මෘගපොතිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇති බැවින් නොවැළක ඇ හා සමඟ ගම් සමීපයට ගියේය. ඉක්බිත්තෙන් ඒ මගධරට වාසීහු "දැන් මුවන් පර්‍වතපාදයෙන් බස්නා වේලය'යි දැන මගසමීප යෙහි මුවාවූ තැන්වල කොටුපත් බැඳගෙණ එහි සිටිනාහ. ඒ මුවාත් මුවදෙනත් එන්නාවූ පෙරමග එක් මුවවැද්දෙක් කොටුපතෙක සැඟවී සිටියේය. ඒ මෘග පොතිකාවද මනුෂ්‍යගන්ධය ආඝ්‍රාණය කොට තමා හා කැටිව එන්නාවූ බාල මෘගයා ඉදිරි කොට ලා නොමෝ පස්සේ එන්නීය. ඉක්බිත්තෙන් ඒ කොටුපත සිටියාවූ වැදිද එකසැරපහරින් මුවා එතනම විද හෙළීය, මෘගපොතිකා මුවාතමා කෙරෙහි පිළිබඳ සිත් ඇතිව එන බව දැන පැන වාතවේගයෙන් පලා ගියාය. වැදිද කොටුපතකින් නික්ම තමා විදි මුවා මස්කොට ගිනිමොලවා සාලඟුරුමත් තෙහි යහපත්වූ මස් වහා පුළුස්සා ගෙණයැපෙන පමණක් කා පැන් බී ඉතිරි මස් ලේ බින්දුවගුරුව වගුරුවා කදෙක බැඳගෙණ තමාගේ අඹුදරුවන් සතුටු කෙරෙමින් ගෙට ගියේය.

එකල්හි මහාබෝධිසත්ත්වයෝ ඒ වනලැහැබ වෘක්ෂදෙවතාව උපන්හ. ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ ඒ කාරණය දැක "මේ අඥානවූ මෘගයාට පැමිණි මරණ මැනියන් නිසා පැමිණිඉයේත් නොවෙයි, පියාහන් නිසා පැමිණියේත් නොවෙයි, වැලි කෙසේ පැමිණියේද? කාමය නිසා පැමිණියේය'යි කාමය නිමිත්ත කොටගෙණ සත්ත්වයෝ සුගතියෙහි අත් පා කැපීම් ආදියවද නරක යෙහි පස්කම්කටුල් ආදීවූ අනෙකප්‍රකාර දුඃඛයටද පැමිණෙති. අනුන්ට මරණ දුක් ඉපදවීම නමුදු මේ ලෝකයෙහි උත්තමයන් විසින් නින්දාකරණ ලදමය, යම් ජනපදයක ස්ත්‍රියක් විධාතකෙරේද? අනුශාසනා කෙරේද? ස්ත්‍රියක්

නායක කොට ඇති ඒ ජනපදය නින්දිතය, සත්ත්වයෝ සත්‍රීන් වසඟයට පැමිණෙද්ද? ඒ සත්ත්වයෝද නින්දිතයහ''යි මෙසේ නින්දිත වසතු තුන් දෙනෙකු දක්වා වත දෙවතාවන් සාධුකාර දී ගඬ පුෂ්පාදින් පූජා කෙරෙමින් සිවියදී මධුරස්වරයෙන් ඒ වන ලැහැබ එක කෝලාහල කෙරෙමින් ධර්ම දෙශනා කරන්නාවූ බොධිසත්ත්වයෝ මෙසේ කිවුය. ''නියුණු මුවහත් ඇති, තරකොට දෙ සිදුරුකොට විදින්ට සමර්ථවූ ශරයත් ඇති පුරුෂයාට ද නින්ද, වේව යි, යම් ජනපදයෙක්හි සත්‍රියක් නායක කම් කෙරේද? එසේ වූ ජනපදය වත් නින්ද, වේව යි, යම් සත්ත්ව කෙනෙක් ස්ත්‍රීන් වසඟත්ත්වයට පැමිණියාහුද ස්ත්‍රීන් කිවාම කෙරෙද්ද? ඒ සත්ත්වයන්ටත් නින්ද, වේව''යි, යනාදීන් ධර්ම දෙශනා කළාහුය. මෙසේ එක ගාථාවෙන් නින්දිත වස්තූන් තුන්දෙනෙකු දක්වා බොධිසත්ත්වයෝ ඒ වනය එකනින්නාද කෙරෙමින් සර්ව්ඥ ලීලාවෙන් ධර්මදෙනා කළාහුය.

තිලොගුරු බුදුරජාතන් වහන්සේද මේ ජාතක ධර්මදෙශනාව ගෙණ හැර දක්වා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළ සේක. චතුස්සත්‍යයාගේ කෙළවර උකටලී මහණ සෝවාන් ඵලයෙහි පිහිටියේය. සර්ව්ඥයන්වහන්සේ ද වර්තමාන කථාව හා අතීත කථාව වදාරා පූර්ණපරසන්ධි ගළපා මේ කණ්ඩින ජාතකය නිමවා වදාළ සේක.

''එකල්හි පණ්ඩිතසථ මෘගයානෝ නම් දැන් මේ ශාසනයෙහි උකටලී වූ භික්ෂූහුය. එකල්හි මෘගයානත් හැර දිවූ මෘගපොතිකා නම් මේ පුරාණ දුතියිකාය. කාමයෙහි දොෂ කියා ධර්මදෙශනා කළ දෙවතාවෝ නම් ලොවුතුරා බුදුවූ මම්මය''යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 14 වාතමිග ජාතකය.

තිවද එක් සමයෙක්හි සර්ව්ඥයන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සේක් චුල්ලපිණ්ඩපාතිකතිස්ස ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේකි.

ශාස්තෘන් වහන්සේ වකාහි රජගහනුවර තිසා වෙළුවනාරාමයෙහි වාසය කරණ කල්හි තිස්සකුමාර නම් වූ මහා සම්පත් ඇති සිටුකුලයක පුත්‍රයෙක් ඇත්තේය. ඒ සිටු පුත්‍ර තෙම එක් දවසක් වෙළුවනාරාමයට ගොස් සර්ව්ඥයන් වහන්සේගේ ධර්මදෙශනාව අසා පැවිදිවනු කැමැතිව පැවිදිවීමට යාචඤ්ඤ කොට දෙමව්පියන් විසින් තෙ අනුදන්නා ලද හෙයින් ප්‍රතික්ෂෙප කරණ ලද්දේ, සත්දවසක් නිරාහාරව ඉඳ රථ්‍යපාල ස්ථවිරයන් මෙන්ම මව්පියන් දෙන්නා අනුදන්වා සර්ව්ඥයන් වහන්සේ සමීපයෙහි පැමිදි වූ සේක.

සර්ව්ඥයන් වහන්සේ ඔහු පැවිදි කරවා අඩ මසක් කල් වෙළුවනාරාමයෙහි වාසය කොට ජෙතවනාරාමයට වැඩිසේක. එතැන්හිදී මේ කුලපුත්‍රයන් වහන්සේ තෙළෙස් ධුතාඞ්ගයන් සමාදන්ව සැවැත්නුවර ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙමින් කල්යවන සේක. චුල්ලපිණ්ඩපාතිකතිස්ස ස්ථවිරයන් වහන්සේ යයි කී කල්හි ආකාශයෙහි චන්ද්‍රයා මෙන් සර්ව්ඥ ශාසනයෙහි ප්‍රකාශව ප්‍රසිඩ වූ සේක. එසමයෙහි රජගහනුවර තකක් කෙළි පවත්නා

කල්හි සථවිරයන් වහන්සේගේ මව්පිය දෙදෙන උන්වහන්සේ ගිහි කල්හි යම් ආභරණ භාණ්ඩයෙක් ඇද්ද? ඒ ආභරණ බඩු රෙදි කරඬුවෙක්හි බහා අභිමුඛයෙහි තබාගෙණ "අනිකුත් නැකැත්කෙළිවල අපගේ පුත්‍රයා මෙනම් මෙනම් අලංකාරයෙන් සැරහී නැකැත්කෙළි කෙළින්නේය. අපගේ ඒ එක පුත්‍රයා ගෙණ ශ්‍රමණ භවත් ගෞතමයාතන් වහන්සේ සැවැත්නුවරට වැඩි සේක අපගේ පුත්‍රයා දැන් කොතැන්හි හුන්සේක් ද? කොතැන්හි සිටිසේක් ද';යි කියා හඬන්නාහුය.

ඉක්බිත්තෙන් එක් වණ්ජුසියක් ඒ සිටු කුලයට ගොස් හඬන්නා වූ සිටු භාර්‍යාව දැක "ආර්‍යාවෙනි, කවරහෙයකින් අඬන්නීද"යි විචාළීය. සිටු භාර්‍යාවෝ ඒ කාරණාව දැක්වූවාහුය. "ආර්‍යාවෙනි, සවාමිපුත්‍රයාතෝ කවර දෙයකට කැමතිවන්නාද"යි කිවුය "අසවල් අසවල් දෙය'යි කිවාය. "ඉදින් නුඹවහන්සේ මේ ගෙයි සියලුදෙයශ්‍වර්‍යය මට දෙවූ නම් මම තොපගේ පුත්‍රයා ගෙණ එන්නෙමි" කිවාය. සිටු භාර්‍යාව ඒ වචනය "යහපතැ'යි පිළිගෙණ වැටුප් දී පිරිවරින් ඒ වණ්ජුසිය යැවිවාය. "යව තමාගේ බලයෙන් මාගේ පුත්‍රයා ගෙණව"යි කිවුය. ඒ වෙශ්‍යාඩහතාව පිළිසන් යානාවෙක්හි ඉඳ සැවැත්නුවරට ගොස් තෙරුන්වහන්සේගේ භික්ෂාව පිණිස හැසිරෙණ වීථියෙහි නවාතැන් ගෙණ සිටුකුලයෙන් ආ මනුෂ්‍යයන් තෙරුන්වහන්සේව නො දක්වා තමාගේම පිරිවරින්ම පිරවණ ලද්දී පිඩු පිණිස හැසිරෙන්නාවූ තෙරුන් වහන්සේට පළමුකොට බත් සැන්දක් පිළිගන්වා ක්‍රමයෙන් බත් මළාවක් පිළිගන්වා තෘෂ්ණාවෙහි බැඳී අනුක්‍රමයෙන් ගෙයි වැඩහිඳිනට සලස්වා ආහාරය දෙන්නී තමාගේ වසඟත්වයට පැමිණි බැව් දැන ගිලන් ආකාරය දක්වා ඇතුළු ගබඩාවෙහි ශයනය කළාය. තෙරුන්වහන්සේද භික්ෂාචාර වේලෙහි හෙපිළිවෙළින් හැසිරෙණ සේක් ගෙයි දොරට පැමිණි සේක. පිරිවර ජනයෝ තෙරුන් වහන්සේගේ පාත්‍රය ගෙණ තෙරුන් වහන්සේ ගෙයි වැඩ හිඳිනට සැලස්සුවාහුය. තෙරුන්වහන්සේ හිඳගෙණම "උපාසිකාවෝ කොයි දැ"යි විචාළසේක. "සවාමීන්වහන්ස ගිලන් වූවාය, නුඹවහන්සේ දක්නට කැමැතිය'යි කිවුය. උන්වහන්සේ රසතෘෂ්ණාවෙහි බැඳුන සේක් තමාගේ ව්‍රතසමාදානය බිඳ වෙශ්‍යාඩහතාව හොත් තැනට වත්සේක. ඒ ස්ත්‍රී තමා ආ කාරණාව කියා උන්වහන්සේ පොළඹා රසතෘෂ්ණාවෙන් බැඳ සිවුරුහරවා තමාගේ වසඟයෙහි තබා යානාවේ හිඳිනට සලස්වා මහත්වූ පිරිවරින් රජගහ නුවරටම ගියාය. ඒ ප්‍රවෘත්තිය හැම තැන්හිම ප්‍රකාශ වූයේය. භික්ෂූන්වහන්සේලා දම්සභා මණ්ඩපයෙහි වටින් රැස්ව හුන්නාහු ඇවැත්නි, චුල්ලපිණ්ඩපාතිකතිස්ස සථවිරයන් වහන්සේ වතාහි එක් වණ්ජුසියක් රසතෘෂ්ණාවෙන් බැඳගෙණ ගියාය"යි කියා කථාවක් පහළ කළාහුය.

සම්‍බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට එළඹ අලංකෘතවූ බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ 'මහණෙනි, මේ දම්සභා මණ්ඩපයෙහි මා එන්නට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නාහුද"යි වදාළ කල්හි ඒ භික්ෂූහු ඒ ප්‍රවෘත්තිය දැන්වූවාහුය. සම්‍බුදුරජාණන් වහන්සේ වදාරණසේක්, "මහණෙනි මේ චුල්ලපිණ්ඩපාතිකතිස්ස සථවිරයෝ රසතෘෂ්ණාවෙහි බැඳී [මේ ස්ත්‍රියට වසඟවූවෝ දැන් මතු නොවෙති, පෙරත් මේ සථවිරයෝ මේ ස්ත්‍රියට වසඟ වූවාහුම යැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

යි කියා දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ සඤ්ජය නම් උද්‍යානපාලකයෙක් උයන රක්ෂාකරන්නේය. ඉක්බිත්තෙන් එක් වාත මෘගයෙක් ඒ උයනට අවුත් සඤ්ජය නම් උද්‍යානපාලයා දැක දිවයන්නේය. සඤ්ජය නම් උද්‍යානපාලයාද ඔහු තැතිගන්වා නොළුලවන්නේය. ඒ මෘගයා නැවත නැවත අවුත් උයතෙහිම හැසිරෙන්නේය. උද්‍යානපාලතෙම උයනේ නොයෙක් මල් ඵල ආදිය ගෙණ දවස්පතා රජහට දක්වන්නේය. ඉක්බිත්තෙන් එක්දවසක් රජ්ජුරුවෝ කියනසේක් "යහළු උද්‍යානපාලය, උයනේ කිසි ආශ්චර්‍යවත් දෙයක් දුටුවා ඇත්තෙහි නම් කියව"යි කීසේක. "මහ රජ්ජුරුවන් වහන්ස, අනිකක්නු නුදුටුයෙම් එක් වාතමෘගයෙක් වනාහි අවුත් උයනෙහි හැසිරෙන්නේය. ඔහු දුටුම්'යි කීයේය. ඔහු අල්වාගන්නට හැකි වන්නෙහිද"යි විමාළසේක. මීපැණි මදක් ලද්දේ නම් මෘගයා රජගේ ඇතුළටම පමුණුවන්නට හැකිවන්නෙම්"යි කීය. රජ්ජුරුවෝ ඔහුට මි දෙව් සේක. උද්‍යානපාලයා මී ගෙණ උයනටී ගොස් වාතමෘගයා ගොදුරු කා ඇවිදිනා තන්හි තණපත්වල මීපැණි ගල්වා සැඟවී සිටියේය. මෘගයා අවුත් මීයෙන් ගල්වන ලද තණ අනුභව කොට රසතෘෂ්ණාවෙහි බැඳුනේය. අන් තැනකට නොගොස් උයනටම එන්නේය. උද්‍යානපාල තෙම ඔහු මී ගල්වන ලද තෘණයෙහි ඇළුනු බැව් දැන ක්‍රමයෙන් තමා පෙණුනේය. මෘගතෙම උද්‍යානපාලයා දැක කීපදවසක් දිවගොස් තැවත තැවත දක්නේ විශ්වාසබවට පැමිණ ක්‍රමයෙන් උද්‍යානපාලයාගේ හස්තයෙහි නිබෙන තණ අනුභව කරන්නේය. සඤ්ජය නම් උද්‍යානපාලතෙම මෘගයා විශ්වාසබවට පැමිණියා දැන රාජ වාසභවනය දක්වා චිපිමාගීය භුණපැදුරු වලින් වටකොට ඒ ඒ තන්හි කොල අතු කඩා හෙලා මී පුරණ ලද ලබු ඵලය ඇකයෙහි එල්වාගෙණ තණමිටිය කිසිල්ලෙහි තබාගෙණ මී ගල්වන ලද තෘණයෙන් මෘගයාගේ අනිමුඛයෙහි විසුරුවමින් රජගේ ඇතුළටම ගෙණ ගියේය. මෘගයා ඇතුළට වන් කල්හි දොර වසුවාය. මෘගයා මනුෂ්‍යයින් දැක කම්පාවෙමින් මරණභයින් බියපත් වූයේ ඇතුළු රාජාඞ්ගනයෙහි ඔබිමොබ ධාවනය කරන්නේය. රජ්ජුරුවෝ මතුමනල් තලයෙන් බැස කම්පාවන්නාවූ මෘගයා දැක "මානමෘගයා නම් මනුෂ්‍යයන් දුටුතැනට සත් දවසක් නොඑන්නේය. තැතිගත් තැනට ජීවිතාන්තය දක්වා නොඑන්නේය. ඒ වාතමෘගයා සඤ්ජය තෙමේ රසතෘෂ්ණාවෙන් බැඳ යටත් කොට ගත්තේය. මෙබඳු ගහණ නිශ්‍රිත වූ වාතමෘග තෙම රසතෘෂ්ණාවෙහි බැඳී දැන් මෙබඳු තැනට ආයේය. ඒකාන්තයෙන් පින්වත්නි, මේ ලෝකයෙහි රසතෘෂ්ණාවට වැඩියෙන් ලාමක දෙයක් නැත්තේය"යි කියා ධර්මදේශනාවට පටන්ගත්සේක. "නිරන්තර වාසසථාන වූ ආවාසයෙහි ද ඡන්දරාග ලාමකය, මිත්‍රසන්ථවයෙහිද ඡන්දරාග ලාමකය. මේ දෙතැන්හි ඇල්මට වඩා මධුරාම්ලාදීවූ ජිහ්වා විඥෙය වූ රසයෙහි ඇලීම පවිටුවන්නේය. කුමක් හෙයින්ද? යත් අරණ්‍යයෙහි ගහන නිශ්‍රිත වූ වාතමෘගයා සඤ්ජය නම් උද්‍යානපාලයා මධුර රසයෙන් තමාගේ වසඟයට පැමිණවූයේය"යි කියා රස තෘෂ්ණාවෙහි ආදීනව වදාරා ඒ මෘගයා ආරණ්‍යයටම යැවූ සේක.

ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ මහණෙනි, ඒ වණ්ඩාසිය මේ මහණ රස තෘෂ්ණාවෙන් බැඳ තමා වසඟ කෙළේ දැන් මතු නොවේ. පෙරත් වසඟ කළාය" වදාරා මේ දම් දෙසුම් ගෙණහැර දක්වා පූර්‍වාපරසන්ධි ගළපා මේ

**වාතමිග ජාතකය නිමවා** වදාළ සේක. "එසමයෙහි **සඤ්ජය** නම් උදාන පාලයා නම් මේ වණ්ඩසි වූවාය. වාතමෘගයා නම් චුල්ලපිණ්ඩපාතිකතිස්ස සථවිරයෝය. ඛරණැස් රජව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වෙදැ"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 15
## ඛරාදිය ජාතකය

**මේ**වද එක් සමයෙක්හි සම්බුදුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක්, **එක්තරා** අකිකරු භික්ෂුකෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ භික්ෂූන්වහන්සේ වනාහි **අකිකරුය**, අවවාදය **නොගන්නාසේක**. ඉක්බිත්-තෙන් සම්බුදුන් වහන්සේ ඒ භික්ෂූන්වහන්සේට වදාරණසේක් "මහණ තෙපි **අකිකරුව** අවවාද නොගන්නේ සැබෑද? කිම්දැ"යි වදාළසේක. "භාග්‍යවතුන් වහන්ස, සැබෑව"යි දැන්වූසේක. සම්බුදුන් වහන්සේ "මහණ, තෝ **පුථුජ්ජනයෙහිත්** අකිකරු බැවින් **ප්‍රඥාවන්තයන්ගේ** අවවාද නොගෙණ මලෙහි බැඳුනේම ජීවිතක්ෂයට පැමිණියෙහිය'යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

**එ**වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහ බෝසහාතන් වහන්සේ මෘගජන්මයෙහි ඉපිද මෘගසමූහයා විසින් පිරිවරණලදුව අරණ්‍යයෙහි වසනසේක.

ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයන් වහන්සේව නැගනිවූ මෘගධෙනුවක් පුත්‍රයකු දක්වා "බෑයන්වහන්ස, මේ තෙම නුඹවහන්සේව බැනා වන්නේය. මෝහට මෘගමාංශම් උගන්වනසේක්ව"යි කියා භාරකළාය. **බෝධිසත්ත්වයන් වහන්සේ** ඒ බැනා වූ මෘගපෝතකයාට "අසවල් වේලාවෙහි අවුත් උගණුව"යි කී සේක. මෘගපෝතක තෙම කියන ලද වේලෙහි නොඑන්නේය. යම්සේ එක්දවසක්ද එසේම සත් දවසක් සත් අවවාදයක් ඉක්මවා ඒ මෘගපෝතකයා යාගේ මෑනිතොමෝ භ්‍රාතෘවූ මෘගයා කරා එළඹ 'භ්‍රාතෘන්වහන්ස, කිමෙක්ද? බැනාවූ මෘගයා මූවමාංශම් උගන්වන ලද්දේදැ'යි විචාළිය. බොධිසත්ත්වයන් වහන්සේ ද "ඒ අනොවාදක මෘගපොතකයාගේ කාරණය **නොසිතව**, තොප ගේ පුත්‍රයා විසින් මූවමාංශම් නොඋගන්නා ලදැ"යි කියා දැනුදු ඕහට අවවාද දෙන්ට **නොකැමැතිව** මෙසේ කී සේකි. බාරාදිය **නම්** තැනැත්තිය එකි එකි පාදයෙහි දෙකක් දෙකක් බැගින් අවකුරයක් ඇති මුලින් වක්ව අගින් ඉතා වක්වූ අං ඇති හෙයින් වංකානිවංක **නම්වූ** සප්ත අවවාද **කළායෙන්** ඉක්මුනු ඒ මෘගයාට අවවාද කරන්ට උත්සාහ සිතක් නැත්තෙම්"යි කීසේක.

ඉක්බිත්තෙන් ඒ **අකිකරු** මෘගයා මලෙහි බැඳුනු කල්හි වැදිපුත්‍රතෙම මරා මාංස ගෙණ ගියේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ වදාරණසේක් "මහණ, තෝ අකිකරු වූයේ දැන් මතු නොවෙයි. **පුථුජ්ජනයෙහිත් අකිකරු** වූයෙහි ය'යි වදාරා මේ ධම්දෙශනාව ගෙණහැර දක්වා පුථුජ්ජරසක්ඛි ගළපා මේ ජාතකය සම්‍යක්ත කොට වදාළ සේක.

එසමයෙහි බෑනා වූ මෘගයා තම් දැන් මේ අකීකරු මනුෂ්‍ය වූයේය, නැගනිවූ මෘගධෙනුව තොමෝ උපුල්වන් මහාසත්වයන් වූවාය, අවවාද දුන් මෘගව උපන්නෙම් වනාහි නිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 16
## සීපල්ලත්ථමිග ජාතකය

**මේ** වදාළ නිලෝගුරු බුදුරජාණන් වහන්සේ කොසඹෑ නුවර නිසා බදිරිකාරාමයෙහි වසනසේක් ශික්ෂාකාමීවූ රාහුල සත්වරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි සම්බුදුරජාණන් වහන්සේ අලවි නුවර නිසා අග්ගාලව නම් දේවාලයයෙහි වසන කල්හි බොහෝ උපාසිකාවරුද භික්ෂුණීහුද විහාරයට බණ අසනු පිණිස එළඹෙති, දුවල් දවස බණ අසති, කල්හිය ගිය සේ උපාසකාවරුද භික්ෂුණීහුද බණ ඇසීමට නොගොස් උන්හ. භික්ෂූන් වහන්සේද, උපාසකාවරුද ඒ පමිද්ධි ඇතිවූහ. එතැන්පටන් රාත්‍රියෙහි බණ ඇසීම සැලසුණේය, බණ අසා අන්නයෙහි වැඩිමහළු භික්ෂූන් වහන්සේ තමන් වහන්සේ වසන්නාවූ සථානවලට ගොස් සැතපෙනසේක. බාල භික්ෂූන් වහන්සේ උපාසකාවරුන් හා සමග භොජන ශාලාවෙහි සැතපෙන සේක ඒ උපාසකාවරුන් හා බාල වහන්දැ නිද්‍රාවට පැමිණි කල්හි ඉන් සමහර කෙණෙක් ''සුරු සුරු'' යන අනුකරණ ඇතිව ප්‍රශ්වාස කරන්නාහුය. දත් කමින් හෝනාහ. සමහරකෙණෙක් මදු ඇසිල්ලක් නිදා නැගී සිටිනාහ. මේ විප්‍රකාර දැක භික්ෂූන් වහන්සේ සම්බුදුරජාණන් වහන්සේට දන්වූ සේක.

බුදුහු ''යම්කිසි මහණෙක් අනුපසම්පන්නයන් හා එක සෙනස්තෙහි සහසෙය්‍යාව කෙළේ නම් පාචිත්තියාපත්ති වන්නේය''යි ශික්ෂාපද පණවා කොසඹෑනුවරට වැඩිසේක. ඒ විහාරයෙහි භික්ෂූන් වහන්සේ අයුෂ්මත්වූ රාහුල සථවිරයන් වහන්සේට ''ඇවැත්වූ රාහුල සථවිරයෙනි, සම්බුදුරජාණන් වහන්සේ විසින් අනුපසම්පන්නයන් හා එකසෙනස්තේ නොසැතපෙන්ට ශික්ෂාපද පණවන ලද. දැන් තොපි තොප වසන්නාවූ සථානයක් දනුව''යි කී සේක. පළමුත් ඒ භික්ෂූන් වහන්සේ සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන්ද ඒ ආයුෂ්මතුන් වහන්සේගේ ශික්ෂාකාමී බව නිසාද තමන්වහන්සේලා වසන්නාවූ සථානයට පැමිණියාවූ ඒ රාහුල සථවිරයන් වහන්සේට අභිශයින් සංග්‍රහ කරණසේක. මිටි ඇදක් පණවා ඉස තබන්ට සිවුරක් දෙන සේක. එදවස් වනාහි ශික්ෂාපද ගනින් වසන්නාවූ සථානයකුත් නුදුන් සේක. රාහුලොත්තමයානෙද ''මගේ පියානන් වහන්සේය'යි සම්බුදුරජාණන්වහන්සේගේද, ''මාගේ උපාද්ධ්‍යයන් වහන්සේ ය''යි සැරියුත් මහතෙරුන් වහන්සේගේද, ''මාගේ ආචාරින් වහන්සේ ය'යි මුගලන් මහතෙරුන් වහන්සේගේද, ''මාගේ සුළුපියානන් වහන්සේ ය''යි අනඳ මහතෙරුන් වහන්සේගේද සමීපයට නොගොස් සම්බුදුරජාණන් වහන්සේ වලංජනය කරන්නාවූ වර්ෂ කුටියට බ්‍රහ්මවිමානයකට වදනක්හු මෙන් වැද රාත්‍රියෙහි වාසය කළසේක.

සම්බුදුරජාණන් වහන්සේ වලංජනාය කරන්නාවූ කුටියෙහි දොර අගුළු මොනවට වසනලද්දේ වෙයි. බිම සුවඳින් පිරිබඳ ගන්නා ලද්දේය. ගන්ධධූම පුෂ්පදාමයන් එල්වන ලද්දේය. සකල රාත්‍රියෙහි පාන් ඇවිලෙන්නේය. රාහුලොත්තමයානන් විසින් ඒ කුටියෙහි මේ යථොක්තාවූ සම්‍යක්සම්බුදු නියාව ඒ රාත්‍රි වාසය කළසේකුත් නොවෙයි, සීඝ්‍රයෙන් වහන්සේ විසින් තොප වසන්නාවූ සථානයක් දනුවයි කියන හෙයින්ද අවවාදයෙහි ගෞරවයෙන්ද ශික්ෂාකාමී බැවින් ද ඒ මහර්ෂි කුටියෙහි රාත්‍රි වාසය කළසේකි. අතරතුරෙහි භික්ෂූන් වහන්සේද ඒ රාහුල සථවිරයන් වහන්සේ දුරදීම එන්නා දැක ඔවුන් වහන්සේ වත් සම්පන්න බව පරීක්ෂාකරණ පිණිස මිටලු මුඛ්‍ය තෝ කසල පෙවිටිය හෝ පිටත දමා "ඇවැත්නි, මේ කවුරුන් විසින් දමනලද්දේදැ"යි කියන්නාහ. "කිසිකෙණෙකුත් විසින් රාහුල සථවිරයෝ මේ මහින් ගියෝ දැ"යි කි කල්හි "සවාමීනි, මේ මම නොදනිමි නොකියා ඒ තොතැන්පත්ව තුබූ මුඛ්‍ය හා කසල පෙවිටිය තැන්පත් කොට තබා "මට ක්ෂමා කොට වදාළ මැනව සවාමීනි'යි භික්ෂූන්වහන්සේ ක්ෂමා කරවා යතසේක. එපරිද්දෙන් ශික්ෂා කාමීවූ රාහුල සථවිරයන් වහන්සේ තමන් වහන්සේගේ ශික්ෂාකාමී බව නීසා ඒ වර්ෂාව කුටියෙහි රාත්‍රිය වාසය කළසේක. ඉක්බිත්තෙන් බුදුරජාණන් වහන්සේ අරුණු නැගෙන්නාට පෙරාතුව වර්ෂාකුටි ද්වාරයෙහි වැඩසිට කැරැ සේක. ඒ රාහුල සථවිරයන් වහන්සේද ඇතුලේ ඉඳ කැරැසේකි. "මේ කවරෙක්දැ"යි බුදුහු විචාළ සේක. "මම රාහුල ය"යි ගෙන් මැත්ව වැඩිසේක. 'රාහුලය, කවර හෙයකින් තෝ මෙතන වැදහොත්තෙහිදැ"යි විචාළසේකි. 'ලගිනා තොනක් නැතිහෙයිනැ"යි කියා "සවාමීනි, භික්ෂූන්වහන්සේ පළමු මා ආ කල්හි සංඝ්‍රහය කරණසේක. දැන් තමන්වහන්සේට ආපත්ති වෙයි යන හයින් වසන තැන් නොදෙන සේක. ඒ මම මේ සථානය අනික් කෙනෙකුත් විසින් සථවනය නොකරන්නාවූ සථානයක් වේදැයි මේ කාරණයෙන් මෙතන සැතපිනිමි"යි දැන්වූසේක.

ඉක්බිත්තෙන් "භික්ෂුහු දැම් ම රාහුලයා හරණාහු සෙසු කුලදරුවන් මහණකරවා කුමක් කෙරෙත් දැ"යි කියා සම්බුදුරජාණන්වහන්සේට ධර්මසංවේග උපන්නේයි. ඉක්බිත්තෙන් උදෑසනක්සේම භික්ෂූන් වහන්සේ රැස්කරවා දම්සෙතෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ අතින් "ශාරිපුත්‍රසථවිරයෙනි, අද රාහුලයා කොතනක ලැබ්ගේද? තෙපි දනු දැ"යි විචාරා වදාළසේකි. "සවාමීනි මම නොදනමි"යි දැන්වූසේක. "ශාරිපුත්‍රසථවිරයෙනි, අද රාහුලයා වර්ෂාව කුටියෙහි ලැබ්ගේය. මෙපරිද්දෙන් රාහුලයා හරණාහු තෙපි හැම සෙසු කුලදරුවන් මහණකරවා කුමක් කරවිද? මෙසේ කළ කල්හි මේ බුඩශාසන යෙහි ප්‍රව්‍රජිතයෝ පිහිටක් නොලබන්නාහු වේදැ"යි ධර්මසංවේගයට පැමිණ මෙතැන්පටන් කොට අනුපසම්පන්නයක්හු දෙදවසක් තමා සමීපයෙහි වස්වා තුන්වැනි දවස් ඔවුන් වසන තොනක් දැන පිටත වස්ව යි කියා මේ අනුප්‍රඥප්තිය වදාරා නැවත ශික්ෂාපද පැණවූසේක.

එකල්හි දම්සභා මණ්ඩපයෙහි වැඩඋන් භික්ෂූන්වහන්සේ රාහුලසථවිර යන් වහන්සේගේ ගුණකථා කියනසේක් "ඇවැත්නි, බලව, රාහුල සථවිරයෝ යම්තාක් ශික්ෂාකාමීහුය. ඒ භික්ෂූන් විසින් තොප වසන තොනක් දනුවයි කියන ලද්දාහු, මම සම්බුදුපුත්‍රයෙමි තෙපි හැම මේ සත්නට කවුරුදැයි තෙපිම

නික්මෙවයි කියා එකද සව්වක්හු හාත් පිළිසඳරයක් නොකොට වර්වස් කුටියෙහි වාසය කළෝ දැ"යි කියා ඒ භික්ෂූන් වහන්සේ කථා කරණ කල්හි සම්බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ සරහන ලද බුඩසාසන මාහාත්මෘයෙහි වැඩහිඳ "මහණෙනි, දැන් මා එන්නාව පූර්වභාගයෙහි කවරතම් කථාවකින් යුක්තව උනුදැ"යි විවාළසේක. "සවාමීනි රාහුල සථවිරයන්ගේ ශික්ෂාකාමී බව කථාකොට කොට උනුම්හ"යි දැන්වූ කල්හි සම්බුදුරජාණන් වහන්සේද "මහණෙනි, රාහුල සථවිරයෝ දැන්මතු ශික්ෂාකාමී නොවෙති, පූර්වයෙහිත් තිරශ්චීන යෝනියෙහි උපන්නෝද ශික්ෂාකාමීව විසුවෝ වේදැ"යි වදාරා ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේකි.

ඒවගිය දවස රජගහ නුවර එක් මගධ රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කෙරෙනි. එකල්හි මහබෝසතාණෝ මෘග යෝනියෙක්හි ඉපද මෘග සමූහයා විසින් පිරිවරණ ලදුව වනයෙහි වාසය කරන්නාහ. ඉක්බිත්තෙන් ඒ බෝධිසත්ත්වයන්ගේ නැගනියෝ තමන්ගේ පුතනුවන් එතනට කැඳවා ගෙණ අවුත් "බෑයන්වහන්ස, නුඹවහන්සේගේ බෑනනුවන්ට මෘග මායම් ඉගැන්නුව මැනවැ"යි කිවුය. මහාබෝධිසත්ත්වයෝ "යහපතැ"යි නැගනියන්ට ප්‍රතිවචන දී යවා "දරුව, අසවල් වේලේ ඇවිත් උගණුවයි'යි කීහ. ඒ මෘගපෝතකයාද මසිලනුවන් විසින් නියමකොට කි වේලා නොඉක්මවා බොධිසත්ත්වයන් කරා එළඹ මෘග මායම් උගන්නේය. මෘගපෝතකයාද එක් දවසක් වනයෙහි ඇවිදිනේ මලෙක්හි බැඳුනේ තමා බැඳුනු නියාව කීයා ඇඬුයේය. මෘගසමූහයාද පලා ගොස් "තොපගේ පුතනුවෝ මලෙක බැඳුනෝ ය"යි ඒ මුවපැටවාගේ මැනියන්ට කීහ. ඒ මෘගධෙනුවද බැයන් සමීපයට ගොස් "බෑයන් වහන්ස, නුඹවහන්සේගේ බෑනනුවෝ මෘග මායම් උගත්තුදැ"යි විවාළීය. මහබෝසතාණෝද තොපගේ පුතනුවන්ට කිසි සැකයක් නෙපි නොකරව යි ඔහු විසින් යහපත් කොට මෘග මායම් උගන්නාලදුයි කියා පිඬාවක් කැත, තොප සතුටු කරමින් දැන් එනි"යි කියන්නාවූ බොධිසත්ත්වයෝ මෙසේ කිවා හුය, 'එම්බා පින්වත, තෘණ භක්ෂණය කොට ශෙය්‍යාව කරන්නාවූ අට කුරුසකින් යුක්තවූ මධ්‍යම රාත්‍රී වේලෙහි පැත් බොන සුලුවූ මට බැනවූ මෘග පෝතකයාතන්ට නොයෙක් මෘගමායම් ඉගැන්වීමි. එසේ හෙයින් නාසාවාත යකින් සුලං රදවා භූමියෙහි වැදනෙව ආශ්වාසය කෙරෙමින් කලා සයකින් යුක්තවූ මෘග මායමින් වැද්දනු වඤ්චාකොට තොපගේ පුත්‍රයාතෝ තොප සතුටු කෙරෙමින් නොබෝ කලකින් එන්නාහ"යි ඒ බොධිසත්ත්වයෝ කිවාහුය.

මෙසේ මහාබොධිසත්ත්වයෝ තමන්ගේ බෑනනුවන්ට මෘග මායම් යහපත්කොට ඉගැන්වූ බව දක්වන්නාහු නැගනියන්ට "ශොක නොකරව"යි අස්වැසූහ. ඒ මුවපැටවාද මලබැඳුනු තැනැත්තෝ නොසෙල්වීම භූමියෙහි නෙව ඉල ඇට පෙණෙන නියායෙන් කකුල් දික්කොට එක ඇලයකින් වැදනොත් නෙනට ආසන්නයෙහි කුර අයින් ගසා පස් ද තණ ද උපුල්වා මලමූත්‍ර පිවත්කොට ඉස එල්ලා දිව දික්කොට සකල ශරීරය කෙළින් කිළිටු කොට සුලන් ගැන්වීමෙන් බඩ උදුම්වාගෙණ ඇස පෙරලා ගෙණ යවූ නාසාපුටයෙන් වාතය සංවරණය කෙරෙමින් මතු නාසාපුටයෙන් පිවත නික්මෙන්නාවූ වාතය රදවා සියලු ශරීරයෙහි තදබව ගන්වා මළාවූ

ආකාර දැක්වූයේම. නිලමැස්සෝද ඔහු වටකොට ගත්හ. ඒ ඒ සථානයෙහි කපුටෝත් සැඟවී උන්හ. මේ නියායෙන් වැදහොත් තෙතට මිල දුන් වැදි වුත් මුවාගේ බඩට අත ගසා 'උදැසතම බැඳුනේ වත කුණුව ගියේ ය''යි ඌ බැඳුනු වරපට මුදා මෙතනදීම මොහු මස්කොට ගෙණ යෙමි සැකයක් නැතිව කොළ අතු කඩන්ට පටන් ගත මුවපැටවාද වැදහොත් තැනින් තැනී සතරපයින් ශරීරයේ සිට කිළිපොළා කර දික්කොට මහවාතයෙන් සිදුනාවූ වලාකඩක් මෙන් යුහුව දුවගෙණ නොස් මැතියන් සමීපයට ගියේය. සමීඥයන් වහන්සේ ද ''මහණෙනි, රාහුලයා දැන් මතු ශික්ෂාකාමී නොවෙයි, පුථුජ්ජනයින් ශික්ෂාකාමී ය''යි වදාරා මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා සන්ධි ගළපා **නිපල්ලඤ්ඤ ජාතකය** නිමවා වදාළසේකි.

''එකල්හි බෑනාවූ මුවපැටියානෝ නම් දැන් රාහුල සථවිරයෝය, ඒ මුවපැටියානන්ගේ මැනියෝ නම් උපුල්වන් මහාසථවිරය, මුවපැටියානන්ට මව්පිල් වූ මුවානෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම ය''යි තවන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 17
## මාලුත ජාතකය

**මි**වද එක් සමයෙක්හි සැවැත්නුවර ගෙවා දන් බුදුරජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වසතසේක් වෘඩ කල ඉහණවූ භික්ෂූන් දෙනමක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ භික්ෂු දෙනම කොසොල් ජනපදයෙහි එක් අරණ්‍ය විහාරයෙක්හි වසතසේක. එක්කෙනෙක් **බාල** සථවිර නම, එක්කෙනෙක් **ජීර්ණ** සථවිර නම. ඉක්බිත්තෙන් එක් දවසක් ජීර්ණ සථවිරයන් වහන්සේ කාලසථවිර යන් වහන්සේ ගෙන් විචාරණසේක් 'සඛාමිනී, කාලසථවිරයන්වහන්ස, ශීත නම් කවර කලෙක්හි වන්නේද''යි විචාළසේක හෙතෙම ''කාල පක්ෂයෙහි වන්නේ ය''යි කීසේක ඉක්බිත්තෙන් එක් දවසක් කාලසථවිරයන්වහන්සේ ජීර්ණසථවිරයන් වහන්සේ අනින් විචාරණසේක් ''සඛාමිනී, ජීර්ණසථවිරයන් වහන්ස, ශීත නම් කවර කලෙක්හි වන්නේ ද''යි විචාළසේක. හෙතෙම ''ජීර්ණ පක්ෂයෙහි වන්නේ ය''යි කීසේක. ඔහු දෙදෙනම තම තමාගේ ශංකා සිදින්ව නොනැකිව සමීඥයන් වහන්සේ සමීපයට ගොස් සමීඥයන් වහන්සේට නමස්කාර කොට ''සඛාමිනී සමීඥයන් වහන්ස, ශීත නම් කවර කලෙක්හි වන්නේද''යි විචාළාහුය. සමීඥයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා වදාරා 'මහණෙනි, මම පුථුජ්ජනයින් නොපවි මේ ප්‍රශ්නය දේශනා කෙළෙමි. භවයෙන් වැසි තුබුනු බැවින් නොසැලකුවාහු''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

**යි**වගිය දවස එක් පළිත ප්‍රාන්තයෙක්හි සිංහයෙක්ද ව්‍යාඝ්‍රයෙක්ද''යි කියා යන්එවෝ දෙදෙනෙක් එකම ගුහායෙක්හි වසන්නාහුය. එකල්හි බෝධි සත්ත්වයන් වහන්සේද සෘඞ්ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ සළිත ප්‍රාන්තයෙහි වාසය කරණ සේක.

ඉක්බිත්තෙන් එක් දවසක් ඒගහළුවන් දෙදෙනාට 'ශීතය' නිසා විවාදයක් උපත. ව්‍යාඝ්‍රයා "කාල පක්ෂයෙහි වන්නේ ය"යි කියේය. සිංහයා "ජුණ්හ පක්ෂයෙහි ශීත වන්නේ ය"යි කීයේය. ඔහු දෙදෙනම තමාගේ ශංකා සිදින්ට නොනැකිව බොධිසත්ත්වයන් වහන්සේ අතින් විමැලැහුය. බොධිසත්ත්වයන් වහන්සේ වදාරණසේක්, "කෘෂ්ණ පක්ෂයෙහි ද නොනොවන් ශුක්ල පක්ෂයෙහි ද යන මේ දෙපක්ෂයෙන් යම් කලෙක්හි පුළුංදී දිගින් යුක්තව මාරුතය හමා ද? එසමයෙහි ශීතවෙයි. ඊට කාරණ කවරේද? ශීතය වාතයෙන් හටගන්නේය, වායු හමන කල්හි ශීතය වන්නේය. කෘෂ්ණ පක්ෂය, ශුක්ල පක්ෂය ම ප්‍රමාණ නොවන්නේය. තොපි දෙදෙන මේ ප්‍රශ්නයෙහි නොපැරදුනාහ. මෙසේ බොධිසත්ත්වයන් වහන්සේ ද ඒ යහළුන් දෙදෙනාට අවබොධ කළසේක.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේද "මහණෙනි, පෙරත් මා විසින් නොපව මේ ප්‍රශ්නය කියනලද්දේය"යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා දුකඛ සමුදය, නිරොධ, මාර්ග යන චතුරාර්ය සත්‍යයන් ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ සථවිරයන් දෙදෙනා වහන්සේම සෝවාන් ඵල යෙහි පිහිටියාහුය. ශාස්තෘන් වහන්සේ පුර්‍වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

"එකල්හි ව්‍යාඝ්‍රතෙම කාලසථවිර වූයේය. සිංහතෙම ජුණ්හසථවිර වූයේය. ප්‍රශ්නය විසඳුජාතය කළාවූ තපස්වී ව උපන්නෙම් නිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 18
## මතකභක්ත ජාතකය

මේ ජාතකය වදාළසේක. එක් සමයෙක්හි බුදුරජානන් වහන්සේ සැවැත් නුවර නිසා ජෙතවනාරාමයෙහි වැඩවසතසේක් මතකභක්ත

එකල්හි මනුෂ්‍යයෝ එළුවන් ආදිවූ බොහෝ සත්ත්වයන් මරා කාලක්‍රියා කළාවූ තමන්ගේ නැයන් උදෙසා මතකභක්ත තම් වූ පරිත්‍යාගයක් කෙරෙති. භික්ෂූහු ඒ මනුෂ්‍යයන් මෙපරිද්දෙන් කරන්නාවුන් දැක සර්ඡුයන් වහන්සේ අතින් "ස්වාමීනි, දැන් මනුෂ්‍යයෝ බොහෝ ප්‍රාණීන් ජීවිතක්ෂයට පමුණුවා මතකභක්ත තම් වූ දෙයක් දෙති. ස්වාමීනි, මෙහි වැඩෙක් ඇද්දැ"යි විමැල සේකි. සර්ඡුයන් වහන්සේ "මහණෙනි, මතකභක්ත දෙම්හ යි කියා කරණ ලද ප්‍රාණඝාතයෙහි කිසිත් වැඩෙක් නම් නැත. පෙරත් නුවණැත්තෝ ආකාශ යෙහි හිද ධර්මදේශනා කොට මේ මතකභක්තයෙහිආදීනවකියා සියලු ජම්බුවිප වාසී සත්ත්වයන් මේ ක්‍රියාවෙන් ඇරවූහ. දැන් වනාහි භවසංක්ෂෙපගත නෙයින් නැවත පහළවී ය"යි වදාරා අතීත කථාව ගෙණහැර දක්වූ සේකි.

ඒටහිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි වෙදත්‍රයයාගේ පාරප්‍රාප්තවූ දිසා ප්‍රධානව එක් ආචාර්‍යවූ බ්‍රාහ්මණයෙක් "මතකභක්තයක් දෙමැ"යි එක් එළුවකු අල්වා ගෙණ තමාගේ නවැස්සන්වි "සගයෙනි, මේ එළුවා ගහට ගෙණ ගොස් නාවා කර මල්වඩම්

බැඳ පසඟුල් දී සරහා ගෙණෙව"යි විධාන කෙළේය. ඒ මනුෂ්‍යයෝද "යහපතැ"යි බමුණාට ප්‍රතිඥ දී එළුවා ඇරගෙණ ගඟට ගොස් නාවා කීසැටියේ සරහා ගැන්තෙර සිටුවූහ. ඒ එළු තමා පුළුයෙහි කරණ ලද අකුශල කර්මය ජාතිස්මරඥානයෙන් දැක "මෙබඳු වූ දුකඛයෙන් අද දවස් මිදෙමි"යි සොම්නසට පැමිණියේ කළයක් බිඳින කලක් පරිද්දෙන් මහත් කොට සිතාසි නැවත මේ බමුණා "මා මරා මා විසින් මෙතෙක් කල් මුලුල්ලෙහි විඳි දුක් ලබන්නේ ය"යි බමුණා කෙරෙහි කරුණා උපදවා මහත්වූ ශබ්දයෙන් හැඬුයේය.

ඉක්බිත්තෙන් ඒ තරුණ පුරුෂයෝ ඔහු අතින් "සබඳ, එළුවාතෙනි, තොපි මහත් කොට සිතාසී ඇඬුවාහුය. කවර කාරණයකින් සිතාසුහුද? කවර කාරණයකින් ඇඬුවාහුද?"යි විවාළාහුය. "තෙපි ඇම මේ කාරණය තොපගේ ආචාරීන් සමීපයෙහිදී මා අතින් විචාරව"යි කීයේය. මනුෂ්‍යයෝ ඒ එළුවා ඇරගෙණ ගොස් මේ කාරණය ආචාර්‍ය්‍ය බ්‍රාහ්මණයාහට කිහ. ඒ ආචාර්‍ය්‍යයා ද මනුෂ්‍යයන් කි බස් අසා එළුවා අතින් ;'එළුවාතෙනි, තෙපි කවර කාරණයකින් සිතාසුහුද? කවර කාරණයකින් හැඬුහුද?"යි විවාළේ සි.

ඒ එළුවා ද තමා පුළුයෙහි කළ අකුශල කර්මය ජාතිස්මරඥානයෙන් සිහිකොට බමුණාට කිය. "බ්‍රාහ්මණයාතෙනි, මම පුළුයෙහි තොප සේම වෙදත්‍රය හදාරා වූ බමුණුව ඉපද "මතකහක්තයක් දෙමි"යි එළුවකු මරා දිනිමි හේ මම ඒ එළුවා මරු අකුශල කර්මයෙන් එකකින් උනු පන්සියයක් ජාතියෙහි ඉස් කැපීම් දුකඛයට පැමිණියෙමි. මේ තෙම මට කොටිප්‍රාප්තිය වූ පිරුණු පන්සියයක් ජාති ඇති ආත්මභාවයය. හේ මම අද දවස් මෙබඳු වූ දුකඛයෙන් මිදෙමියි සොම්නසට පැමිණියෙමි, මේ කාරණයෙන් සිතාසීමි. අඩන්තෙම් වනාහි මම එළුවකු මරා ජාති පන්සියයක් මුළුල්ලෙහි ඉස්කැපීම් දුකඛයට පැමිණ අද ඒ දුකඛයෙන් මිදෙමි. මේ බමුණාද මා මරා මා සේම පන්සියයක් ජාතියෙහි ඉස්කැපීම් දුකඛය ලබන්නේය'යි තොප කෙරෙහි කරුණාවෙක් ඇඬිමි'යි කිය. "එළුවාතෙනි, නොබව මම තොප නොමරමි'යි කිය. "බමුණාතෙනි, කුමක් කියවි ද? තොප නොමැරුවත් මා විසින් අද මරණින් මිදෙන්ට නොපිළිවන'යි කිය. "එළුවාතෙනි, තෙපි නොබව මම තොපට රැකවල් ගෙණ තොප හා සමග ඇවිදිමි"යි කිය. "බමුණාතෙනි, තොපගේ ආරක්ෂාව ඉතා සුවලපය, මා විසින් කරණ ලද අකුශල කර්මය මහත, බලවතැ'යි කිය. බමුණාතෝ එළුවාතන් මුදා "එළුවා කවර කෙතෙකුත් විසිනුත් මැරිය නොදෙමි'හ'යි කියා තමාගේ අතවැස්සන් ඇරගෙණ ගොස් බමුණාතෝ එළුවා තත් හා එක්වම ඇවිදිනාහ. එළුවා බැම්මෙන් හරණ ලද්දේ එක් ගලතලයක් පිට අටහත් තණ කැලයෙක්හි කර ඔසොවා කොළ කන්වය සි පවත්ගත් තේය. එකෙණෙහිම ගලතලපිට සෙතක් ගැසිය. ඉන් ගල්ලැල්ලෙක් ඉපිර ගෙණ ගොස් එළුවා දික්කළාවූ ග්‍රීවයෙහි හී සිස කැපුනේය. ඉක්බිත්තෙන් මහජනයාද එතනට රැස්විය.

එකල්හි මහාබෝධිසත්ත්වයෝ ඒ සථානයෙහි වෘක්ෂදෙවතාව උපන්හ. ඒ බොධිසත්ත්වයෝ ද මහජනයා බල බලා සිටියදී ම දෙවතානුභාවයෙන් නිරාලම්බවූ ආකාශයෙහි උභරුබඩාසනයෙන් උපලක්ෂිතව හිඳ "මේ සත්ත්වයෝ මෙපරිද්දෙන් අකුශලයෙහි විපාක දුන ප්‍රාණඝාත නොකළෝ නම් යෙහෙකැ'යි මියුරු වූ කටහඬින් යුක්තාව ධර්මදෙශනා කරන්නාහු මෙසේ කියත්.

ඒ ඒ භවයෙහි සත්ත්වයාගේ උත්පත්තියත් ජරා ව්‍යාධි මරණ පැමිණීමත් දුක්වන්නේය''යි මෙසේ ලොකයෙහි සත්ත්වයෝ දන්නාහු වී නම් සත්ත්වයෙක් සත්ත්වයකු නොමරන්නේය. ප්‍රාණඝාත කළාවූ පුද්ගලයා වනාහි අවමඟහතරක යෙහිත් සොළොස් ඔසුපත් නරකයෙහිත් අනෙකප්‍රකාරවූ තිරිසන් යෝනි යෙහිත් ඉපිද මහදුක් අනුභව කෙරෙමින් බොහෝකලක් සෝක කරන්නේය. මොහයෙන් මුළාවූ සත්ත්වයෝ අවිජ්ජාවෙන් අන්ධව මේ ආදීනව නොදැක ප්‍රාණඝාත කරන්නාහුය'යි මෙසේ මහබෝසතාණන් වහන්සේ නරක භයින් තැති ගත්වා ධර්ම දෙශනා කළෝය. මනුෂ්‍යයෝ ධර්මදෙශනාව අසා නරක භයින් භයපත්ව ප්‍රාණඝාතයෙන් වැළැක්කාහුය. බොධිසත්ත්වයෝ ධර්මදෙශනා කොට මහජනයා ශීලයෙහි පිහිටුවා කම්වුපරිද්දෙන් මිය පරලොව ගියෝය. මහජනයාත් බොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා දානාදීවූ පින්කම් කොට දිව්‍යලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ මතඤ්ඤක්ත ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි වෘෂභ දෙවතාව ඉපද ධර්මදෙශනා කෙළෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්මවේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 19
## ආයාචිතභත්ත ජාතකය

එවද එක්සමයෙක්හි තුන්ලෝ වාසීන්ට ගෞරවසථානීයවූ සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි සතර ඉරියව්වෙන් යුක්තව වැඩ වාසය කරණසේක්, දෙවතාවන්ට යාචඤ්ඤකොට බිලිපූජාව කිරීමක් අරභයා මේ ජාතකය වදාළ සේක.

ඒ කාලයෙහි වනාහි මනුෂ්‍යයෝ වණික් කර්මාන්තය පිණිස යන්නාහු මෘග ශූකරාදී ප්‍රාණීන් ඝාතනය කොට දෙවතාවන්ට බිලිපූජා කොට ''අපි අන්තරායක් නැතිව අර්ථසිද්ධියට පැමිණ අවුත් නැවත තුඹවහන්සේලාට බලිපූජා කරමිහ'යි කියා ආරාධනා කොට යන්නාහුය. එසේ ගිය තැන්හි අන්තරායක් නැතිව අර්ථසිද්ධියට පැමිණ ආවාහු ''දෙවතානුභාවයෙන් මේ අර්ථසිද්ධිය වූයේය''යි සිතමින් උරන් මුවන් ආදීවූ බොහෝ ප්‍රාණීන් නිසා යාචඤ්ඤවෙන් මිදෙන පිණිස බලිපූජා කරන්නාහුය. එසේ කරන්නාවූ බලිපූජා දැක භික්ෂූන්වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට දන්වන්නාහු ''ස්වාමීන් වහන්ස, මේ ප්‍රාණඝාත කිරීමෙහි වැඩෙක් ඇද්දෝ හෝ නැද්දැ''යි විවාළාහුය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසී තුබුනු කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස කසීරට එක් ගමෙක්හි කෙළෙඹි පුත්‍රයෙක් ගම් දොරෙහි පිහිටියාවූ නුගවෘක්ෂයෙක වාසය කරන්නාවූ දෙවතාවට ''බිලිපූජා කෙරෙම්'යි ප්‍රතිඥා කොට ගොස් අර්ථසිද්ධියට පැමිණ අන්තරායක් නැතිව අවුත් එළුවන් තිරිඑවන් ආදීවූ බොහෝ ප්‍රාණීන් ඝාතනයකොට අයදගැණීමෙන් අන්තරාය යෙන් මිදෙමි''යි සිතා නුගරුක්මූලට ගියේය. නුගවෘක්ෂයෙහි අධිෂ්ඨිත දිව්‍ය

පුත්‍රතෙම කඳවෙලෙප්හි සිට මෙසේ කියේය. "පින්වත් පුරුෂය, තෝ ඉදින් මින් මිදෙනු කැමැත්තෙහි නම් පරලොව මිදෙනු පරිද්දෙන් මිදෙව, ප්‍රාණවධාදීවූ දුශ්චරිත කොට දැන් මිදෙන්නේද? මතු පාප පාශයෙන් බැඳෙන්නේය. ඒ කාරණය දැන මෙසේ නුවණැත්තාවූ පණ්ඩිත පුරුෂයෝ මතු පාප පාශයෙන් නොබැඳෙන පරිද්දෙන් මිදෙත්. ඊට කාරණා කවරේද? මෙබඳු මිදීම් අඥානයා හට බන්ධනයට කාරණය, මෙසේ ප්‍රාණඝාත කොට මිදීම නම් අඥානයාහට බැඳීමට කාරණා වන්නේය" යි කියා ධර්මදේශනා කළසේක.

එතැන්පටන් මනුෂ්‍යයෝ මෙබඳුවූ ප්‍රාණඝාත කිරීමය යි කියනලද අකුශලකර්මයෙන් වැලකෙන දානශීලාදීවූ සුචරිත ක්‍රියාවෙහි හැසිර දිව්‍යලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා පුර්‍වාපර සන්ධි ගළපා මේ ආයාචිතඝත්ත ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි වෘක්ෂදෙවතාව උපන්නෙමි දැන් ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්මවේදැ'යි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

---

## 20
## නලපාන ජාතකය

**අතීත** වස්තුව එක්සමයෙක්හි දෙවිඹුන් මුදුනෙහි කෙළතා පාපියුම් ඇති ලොකඝාතකයන් මිවූ සර්‍වඥයන් වහන්සේ දනව්වෙහි සැරිසරා ඇවිදිනාසේක් නලපාන නම් ගමට පැමිණ නලපාන පොකුණ සමීපයෙහිවූ වැටකේ වනයෙහි වසනසේක් බටදඬු අරභය මේ ජාතකය වදාළසේක.

එසමයෙහි භික්ෂූන් වහන්සේ නලපාන නම් පොකුණෙන් පැන් සතහා ඉදිකටු කුළා නිසා සාමණේරයන් වහන්සේ ලවා බවදඬු කප්පවා ගෙන්වාගෙණ ඒ සියලු බවදඬු ගැට තැනිව එකවර්‍ශීද්‍රව දිගටම සිදුරු නියාව දැක බුදුන් කරා ගොස් "ස්වාමිනි, අපි ඉදිකටු කුළා නිසා බවදඬු ගෙන්වුම්හ. ඒ බවුදඬු මුල පටන් අග දක්වා දිගටම සිදුරුය. මේ කිමෙක්දැ'යි විමසූහ. සර්‍වඥයන් වහන්සේ එබස් අසා "මහණෙනී, මේ මාගේ පුරාතනයෙහි අධිෂ්ඨානයෙකැ'යි වදාරා ඉකුත් වත් දක්වා වදාළසේකි.

යටගිය දවස ඒ වනලැහැබ වල්වූයේය. ඒ පොකුණෙහි එක් දියරකුසෙක් පොකුණට බට මිනිසුන් කන්නේය. එසමයෙහි බොධිසත්ත්වයෝත් තිත්මුවකු හා මනතැනි වඳුරු රජව අසූදහසක් පමණ වඳුරන් විසින් පිරිවරණ ලදුව වඳුරුමුල පරිහරණය කෙරෙමින් ඒ වනයෙහි වසන්නාහුය. ඒ මහ බෝසතාණන් වාතර සමූහයාට අවවාද දෙන්නාහු "දරුවෙනි, මේ වනයෙහි විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහීතවූ පුෂ්කරණීහුත් වෙති. එසේ හෙයින් තොපි හැම නොකැවිරු ඵලාඵලයන් කතොත්වේවා'යි නුපුවිරු පැනක් බොතොත් වේව යි මා විචාරාම කාව බොව" යි විධානකොළෝය. ඒ වානරයෝත් එබස් "යහපතැ" යි පිළිගෙණ එක්දවසක් පෙර නොගියවිරු තැනකට ගොස් එතැන්හි දහවල් දෙවරු ඇවිද පැන් සොයන්නාහු එක් පොකුණක් දැක පැන් නොබීම බොධි

සත්ත්වයන්ගේ ඊම බල බලා උන්නාහුය. එකල්හි බෝධිසත්ත්වයෝ අවුත් ''කිමෙක්ද? දරුවෙනි පැන් නොබොව්ද''යි කිවුය. වානරයෝ කියන්නාහු ''ඌඹවහන්සේ එහතෙක් බලා උනුම්හ''යි කීවුය. ''බෝධිසත්ත්වයෝ දරුවෙනි තොප කළ සේ යහපතැ''යි කියා පොකුණ සිසාරා ඇවිද පියවර පරිභෝගකරන්නාහු දියට බට පියවරම දැක දිසෙන් ගොඛතැනි පියවරක් නොදැක ''ඒකාන්තයෙන් මේ අමනුෂ්‍යපරිගෘහීතවූ පොකුණක් වුවමැනවැ''යි දැක පැන් නොබී උන්නාවූ තොප විසින් කළදෑ ඉතා යහපත් වන්නේය. මේ අමනුෂ්‍යාධිගෘහීත පොකුණෙකැ''යි කිවුය.

උදකරාක්ෂසයාද ඒ වදුරන් දියට නොබස්නවුන් දැක නිල්වූ ඛඩහා බවලවූ මුඛ ඇතිව රත්වූ අතුල්තල පතුල්තල ඇතිව භයඞ්කර වෙශයෙන් දියදෙබෑකොට නික්ම ''කුමක් නිසා උනුද? පොකුණට බැස පැන් බොව''යි කිය. එකල මනබෝසතානෝ ඕනට කියන්නෝ ''මේ පොකුණෙහි උපන් උදකරාක්ෂසයා නම් නෝද''යි විමාලෝය. ''එසේය මමය''යි කී කල්හි ''පොකුණට බටුවන් කන්ට ලැබෙන්නේද''යි කිවුය. ''එසේය, ලබම්, මම මිව බට යටත්පිරිසෙසින් පක්ෂීන් පටන් කිසිකෙණෙකුත් නොහරිම්. තොප ඇමදෙනාත් කන්නෙම්වේද''යි දිය රකුසු කීය. එබස් ඇසූ බොධිසත්ත්වයෝ ''අපි තොප විසින් අප හැමදෙනා කැ නොදෙමිහ''යි කිවුය. ''එසේකල පැනුත් බොන්නෙව්ද''යි දිය රකුසු කීය. ''එසේය, පැනුත් බොමිහ. තොප වසඟයටත් නොපැමිණෙම්හ''යි කිවුය. 'එසේ කල කෙසේ පැන් බොව්ද'යි උදකරාක්ෂසයා කීකල්හි ''කිමෙක්ද? තෝ බැස පැන්බොහි''යි සිතන්නෙහිද''යි බොධිසත්ත්වයෝ කියා ''අපි ඇම අසූදහසක් පමණ වදුරෝ පොකුණට නොබැසම එසොක් බටදණ්ඩක් බැගින් ගෙණ ඇඹුලදණ්ඩන් පැන්බොන්නවුන් මෙන් තාගේ පොකුණෙන් පැන් බොමිහ එසේකල්හි තොපි අප ඇමදෙනා කන්ට අසමර්ථ වන්නෙහිවේද' යි කිවුය. මෙසේ කියා මනබෝසතානෝ එක් බටදණ්ඩක් ඉගන්වා හැරගෙණ පාරමී ධර්මයන් ආවර්ජිතා කෙරෙමින් සත්‍යක්‍රියා කොට මුඛයෙන් පිඹපූහ. බටදණ්ඩ ඇතුළෙන් කිසිම ගැටයක් නැතිව මුල සිට අග දක්වා හැම තැනම සිදුරුවිය, මෙම ක්‍රමයෙන් අනිකුත් අනිකුත් බටදඬු ගෙන්වා පිඹ දුන්නේය. තවද මෙසේ කල්හි පිඹ නිමවන්නට නොපිළිවන්ය යි කියා බොධිසත්ත්වයෝ 'මේ පොකුණ වටකොට අවගත් සියලු බටදඬු එකවිදුරවේව''යි කියා අධිෂ්ඨාන කළෝය.

බෝධිසත්ත්වවරයන්ගේ කුසල්මහත් බැවින් සිතූ දෙය සමෘඩ්වන්නේය. එසේහෙයින් එතැන් පටන් ඒ පොකුණ වටකොට සිටි සියළුම බටදඬු එකවිදුරවිය. ඒකරන්ධ්‍රවිය. මේ කල්පයෙහි කල්පස්ථායිනවූ ප්‍රාතිහාර්‍ය්‍ය සතරෙක් වන්නේය. ඒ සතර කවරේදයත්? චන්ද්‍රයාගේ ශශලාඤ්ජනය මේ කල්පය මුළුල්ලෙහි සිටිනේය. වට්ටක ජාතකයෙහි ගිනිනිවී ගියතැන් මේ කපමුලුල්ලෙහි ගින්නෙන් නොදවන්නේය සට්කාර නම් කුම්භකාරයාගේ ගෙයපිහිට තැන් සියලු මේ කප නොතෙමී තිබෙන්නේය. මේ පොකුණ පිරිවරා සිටි සියලු බටදඬු මේ කප මුලුල්ලෙහි එකරන්ධ්‍රව තිබෙන්නේය'යි මෙසේ කල්පස්ථායිවූ ප්‍රාතිහාර්‍ය්‍ය සතරෙක් වන්නේය. බෝධිසත්ත්වයෝ මෙසේ අධිෂ්ඨානකොට එක බටදණ්ඩක් ගෙණ උන්නාහුය. ඒ අසූදහසක් පමණ වානරයෝත් එකි එකි බට දණ්ඩක් ගෙණ පොකුණ පිරිවරා උන්නාහුය. ඔහු ඇමදෙනෙක් බෝධිසත්ත්වයන් බටදණ්ඩන් උරා පැන් බොන්ට පටන්ගත් කල්හි හැමදෙනම ගොඩහිද

ඔට දණෙකින් උරා පැන් පුවාහුය. මෙසේ ඔවුන් ඇම්දෙනා පැන් පූ කල්හි උදකරාක්ෂයා කිසිවක් නොලැබ තෝ සතුටුවූ සිත් ඇතිව තමා වසන්නාවූ සථානයටම ගියේය. බොධිසත්ත්වයෝත් සහපිරිවරින් බලටම වන්නාහුය. ශාස්තෘවූ සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ "මහණෙනි, මේ බවදඬු සිදුරුවීම මාගේම පුරාතන අධිෂ්ඨානයෙකැ"යි මේ ධර්මදේශනාව ගෙනහැර දක්වා වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ **නාලපාන ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි උදක රාක්ෂසයා නම් දැන් මේ දෙවදත්ත සථවිරයෝය. අසූ දහසක් වානරයෝ නම් දැන් මේ බුදුපිරිස්ය. උපායෙහි දක්ෂවූ වානර රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ'යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 21 කුරුඩධම්ම ජාතකය

**ති**වද එක්සමයෙක්හි ලොවට හිත ඇතිවූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වසනසේක්, දෙවදත්ත සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක්සමයෙක්හි දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන්වහන්සේ "ඇවැත්නි, මේ දෙවදත්ත සථවිරයෝ සර්‍වඥයන්වහන්සේ මරණ පිණිස දුනු වායන් මෙහෙයූහ. හිසට ගල්පෙරලූහ. නාලාගිරියා මෙහෙයූහ. සර්‍වප්‍රකාරයෙන්ම බුදුන්ට වධයට උත්සාහ කෙළේය"යි දෙවදත්ත සථවිරයන්ගේ නුගුණ කියමින් උන්සේක. සර්‍වඥයන්වහන්සේ අවුත් පණවනලද බුබාසන මඤ්ඤකයෙහි වැඩහිඳ "මහණෙනි, දැන් සාවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාළසේක.

"සවාමීනි, දෙවදත්ත සථවිරයෝ නුඹවහන්සේට වධයට උත්සාහ කෙරෙති යි උන්ගේ නුගුණ කිය කියා උනුම්හ"යි කීසේක. "මහණෙනි, දෙවදත්ත සථවිරයන් මා වධයට උත්සාහ කෙළේ දැන් මතු නොවෙයි. පෙරත් උත්සාහ කළෝමය. එහෙතුදුවුවත් මරාගත නුහුනුවෝමය"යි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

**යි**වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි බොධිසත්ත්වයෝ කුරුඩධම්ම යොනියෙහි ඉපද එක් වතයක එලාඵල කමින් වාසය කෙරෙති. ඒ බොධිසත්ත්වයෝ එක්කාලයක එල සමපන්නවූ ඇද්දෙමට වතයක ඇද්දෙමට ගෙඩි කන්නාහුය. එකල්හි මැස්සේ සිව සතුන් මරන්නාවූ ගම්වැසි එක්වැදිපුත්‍රයෙක් එලඟත් ගස්මුල්වලමුවන්ගේ පියවර සවඟන්බලා ගසටඹ මැස්සක් බැඳ එහි එල අනුභවකරන්ට ආවාවූ මුවන් තෙප් දමාලා හැන මරා ඒ මුවන්ගේ මස් විකොට ජීවත් වන්නේය.

එක් දවසක් ඒ ගසමුල බොධිසත්ත්වයන්ගේ පියවර සවහන් දැක ඒඇද්දෙමට ගසටඹ අවිවාලයක් බැඳ උදැසනම බත්කා තෙප් ගෙණ වතයට වැද ඒ වෘක්ෂය උඩට නැගී අවිවාලය පිට උන්නේය. බොධිසත්ත්වයෝ උදැසනම එසන්නාවූ සථානයෙන්නික්ම ඇද්දෙමටකම්"යිඅවුත් ඒගසමුලට වහානොවැද

"කිසිකලෙක අවිවාල වැද්දේ ගස්උඩ අවිවාල බඳිති. එසේ කෙසින් එබඳු උපද්‍රව යෙක් ඇද්දෙනහෝ"යි පරීක්ෂා කෙරෙමින් දුර සිටියාහුය. වැදිපුත්‍රයාත් බොහි සත්ත්වයන් ලඟට නො එන නියාව දැන අවිවාලයෙහිම සිට ඇද්දෙමිගෙඩි කඩ කඩා බොධිසත්ත්වයන් ඉදිරියට දමන්නේය. බොධිසත්ත්වයෝත් මේ ඵල අවුත් මාගේ ඉදිරියෙහිම වැටෙන්නේ "මේහසඋඩ වැද්දෙක් ඇද්දේ"යි නැවත නැවත උඩබලන්නාහුය. වැද්දාහු දැක හුදුටුවෝක් මෙන් "පින්වත්වූ වෘක්ෂය, පෙර තෝ ලඟ එල්වන කලක් මෙන් ඉඳුරාම එල එලන්නේය. දැන්වූ කල්හි තා විසින් වෘක්ෂධර්මය හරණ ලද්දේය. මේසේ තා විසිත් වෘක්ෂධර්මය හළපසු මමත් අන්‍ය වෘක්ෂයක් කරා එළඹ මට ආහාරයක් සොයම් 'යි නික්මුණාහුය.

එකල්හි වැදිපුත්‍රයා අවිවාලයෙහිම හිඳ බොධිසත්ත්වයන්ට තෙප්දමා වැරද ගිය හෙයින් "තොප දැන් පලායව, වැරද ගියේවේදැ"යි කියා බොධි සත්ත්වයෝ කරකැවී සිට කියන්නෝ "එම්බල පුරුෂය, දැන් තා එකානන යෙන්ම මා වැරදවූ බව මුත් අවමහතරකයෙහිත් සෝළොස් ඔසුපත් නරක යෙහින් දෙනිස්කම්කටුල් නො වැරදවූයෙහිම වේදැ 'යි නිවුය. මෙසේ කියා ඒ මහබෝසතානෝ කෑමති පරිද්දෙන් ගියෝය. වැදිපුත්‍රයා ගසින් බැස තමා කෑමති පරිද්දෙන් ගියේය. බුදුරජාණන් වහන්සේ 'මහණෙනි, දෙවදතසඳ විරයන් මා වධයට උත්සාහකළේ දැන් මතු නොවෙයි. පෙරත් උත්සාහකලෝ මය, එතකුදුවුවත් මරාගත නුහුනුවෝය 'යි ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ කුරුඞ්ගමාග ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි අවිවාලවැද්දා නම් දැන් මේ දෙවදතසඳවිරයෝය. කුරුඞ්ග මාගවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 22 කුක්කුර ජාතකය.

තවද එක් සමයෙක්හි නිවණට දෙර හළවාවූ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසනසේක් නැයන්ට වැඩෙහි හැසිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ ඇත්‍යාජීවඝ්‍යාව වාදසනිපාතයෙහි භද්‍රඝාට ජාතකයෙහි මතු පළ වන්නේය. වර්තමාන කථාව පිහිටුවා ඉකුත්වත් දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි බොධිසත්ත්වයෝ එබඳු අකුශල කර්මයක් නිසා බලුයෝනි යෙහි ඉපද නොයෙක් සියදහස් ගණන් බල්ලන් විසින් පිරිවරණලදුව මහ සොහොනෙහි වෙසෙති. ඉක්බිත්තෙන් එක්දවසක් රජ්ජුරුවෝ ඇලි අසුන් යෙදූ සියලු රථාලඞ්කාරයෙන් සරහනලද රථයකට පැනනැඟී උයනට ගොස් එහි දිවාභාගය මුලුල්ලෙහි කෙළ ඉරු අස්තයට ගියකල්හි නුවරට වන්නාහුය. රජ්ජුරුවන්ගේ රථය සැදූ වනම රාජාඞ්ගනයෙහි තිබුයේය. රාත්‍රියෙහි වැසි වසින්ට පටන්ගත් කල්හි ඒ රථයේ සැදූ සම් හා වරපට තෙමී මොලොක්ව

ගියේය. ප්‍රසාදයේ මතුමහලින් කිණිබල්ලෝ බැස රථයේ සම් හා වරපට කෑවා හුය දෙවෙනි දවස් රජ්ජුරුවන්ට කියන්නෝ 'දේවයන්වහන්ස, සොරොව් වෙන් බල්ලෝ ඇතුළට වැද රථයෙහි සම් හා වරපට කෑවාහුය'යි කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ බල්ලන්ට කිපී "දුටු දුටු තැනදීම බල්ලන් මරව"යි විධාන කළෝය.

එතැන්පටන් බල්ලන්ට මහත්වූ භයක් උපන්නේය. ඔහු දුටු දුටු තැනම මරණ හෙයින් භයින් හොඳින් නොනොසිටම බොධිසත්ත්වයන් සමීපයට වන්නාහුය. බොධිසත්ත්වයෝ ඔවුන් දැක "රැස්වූ නියාව බොහෝය. මේට කාරණ කිම්දැ' යි විචාළෝය, ඔහු කියන්නෝ "අන්තඃපුරයෙහි රජ්ජුරුවන් වහන්සේගේ රථයේ සම් හා වරමදු බල්ලන් විසින් කනලදැ' යි කිපියාවූ රජ්ජුරුවන්වහන්සේ බල්ලන් මරන්ට විධාන කළසේක බොහෝ බල්ලෝ නසිති මහත්වූ භය උපනැ' යි කිවුය.

එබස් ඇසූ බොධිසත්ත්වයෝ සිතන්නෝ "රැකවල් ඇතිව නිබෙන තැන හෙයින් පිටත බල්ලන්ට වදින්ට අවසර නැත්තේය. ඇතුළ රජගේ කිණිබල්ලන්ගේම මේ ක්‍රියාවක්වන්නේය 'යි දැන්වූකලි සොරුන්ට කිසිභයක් නැත්තේය. නොසොරුව සිටියෝ මරණයට පැමිණෙති. මම රජ්ජුරුවන්වහන්සේට සොරුන් දක්වා ඥාතීසමූහයාව ජීවිතදානය දුන්නේ වී නම් යහපත්වන්නේය"යි ඒ මහබෝසතානෝ නැගන් අස්වා "තෙපි හැමදෙන නොබව, මම නොපට දිවි ඇරදෙමි. යම්තාක් රජ්ජුරුවන් දකින්නෙම් ද? ඒතාක් තෙපි මෙහි වසව' යි කියා පාරමිධර්මයන් ආවජ්ජා කොට සලකා මෛත්‍රීභාවනා පෙරදැරි කොට "මා ඇඟට කැටයක්වත් මුගුරක්වත් ගසන්ට කිසිවකුත් උන්සාහ නොකෙරේව"යි ඉටාගෙණ තනිවම ඇතුළුනුවරට වන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුන් දැක එක සත්ත්වයෙකුත් කිපී බැළුවෙකුත් නම් නැත්තේය රජ්ජුරුවෝ සුනඛවධය නියෝගකොට තුමූ විනිශ්චය මණ්ඩලයෙහි උන්නාහුය. බොධිසත්ත්වයෝ රජ්ජුරුවන් උන්නාවූ ස්ථානයටම ගොස් වැද රජ්ජුරුවන්ගේ සිංහාසනය යටට වන්නාහුය. එකල්හි බොධිසත්ත්වයන් රාජපුරුෂයෝ සිංහාසනය යටින් ඇද එලියේ ලන්ට පවත්ගන්නාහු, ඒ දැක රජ්ජුරුවෝ වැළකූහ.

මහබෝසතානෝ මේදක් සැතපී සිංහාසනය යටින් මැන්ව රජ්ජුරුවන් වැද "නුඹවහන්සේ බල්ලන් මරවනසේකැ"යි විචාළෝය. "එසේය මම්ය"යි කීකල්හි "බල්ලන්ගේ අපරාධය කවරේ ද? රජ්ජුරුවන් වහන්සැ 'යි කිවුය. "මාගේ රථයේ සැදූ සම් හා වරමදු කෑවාහුය"යි කීකල්හි "යම් කෙනෙක් කෑවූ නම් ඔවුන් දන්නසේක්ද' යි විචාළෝය. "නොදනුම්හ"යි කීකල්හි "සම්කැ සොරු මොහු යයි නත්වූ හෙයින් නොදැනම දුටු දුටු තෙන මේ මැරීම යහපන්ද? රජ්ජුරුවන් වහන්සැ"යි කිවුය. "රථයෙහි සම් බල්ලන් කෑ හෙයින් දුටු දුටු තැනදී හැම බල්ලන්ම මරවයි සුනඛවධය නියෝග කෙළෙමි'යි කිවුය. එබස් ඇසූ බොධිසත්ත්වයෝ කිමෙක්ද? නුඹවහන්සේනේ මනුෂ්‍යයෝ බල්ලන් ඇමම මරද්ද? නොනොත් මරණු නොලබන්නොත් ඇද්දැ යි විචාළෝය. "මරණු නොලබන්නොත් ඇත. අපගේ හෙයි කිණි බල්ලෝ මරණු නොලබති' යි කිවුය.

එබස් ඇසූ මහබෝසතානෝ කියන්නෝ 'මහරජ්ජුරුවන් වහන්ස, දැන්ම නුඹවහන්සේගේ රිය සම් බල්ලන් කෑ හෙයින් දුටු දුටුවන් ඇමම මරවයි සුනඛවධය නියෝග කෙළෙමි යි කීසේක. තැවත දැන්ම අපගේ ගෙයි බල්ලෝ මරණු නොලබති යි කීසේක. එසේ කල්හි නුඹවහන්සේ ඡන්දදී

වශයෙන් අගතියට යනසේක් වේදැ''යි කිවුය. මෙසේ කියා අගතිගමන තම් සුදුසු නොවන්නේය. රාජධර්මයකුත් නොවෙයි. රජ්ජුරුවන් තම් කාරණා කාරණ පරීක්ෂා කොට තරාදියක් මෙන් මධ්‍යස්ථවන්ව වටනේය. දැන් වතාහි කිණ බල්ලෝ මරණු නොලබති. දුර්වලවූ සුනඛයෝ මරණු ලබති. එසේහෙයින් මේ සියලු බල්ලන්ගේ මැරීමක් නොවෙයි. දුර්වලවූ සුනඛයාතය ය''යි කිවුය. මෙසේ කියා මහබෝසතානෝ මධුරස්වර විහිදුවා 'මහරජ්ජුරුවන් වහන්ස, යමක් නුඹවහන්සේ කරණසේක් වී නම් ධර්මයෙක් නොවෙයි'' කියා රජ්ජුරුවන්ට ධර්මදේශනා කළෝය. තවද ''රජ්ජුරුවන් විසින් සොරුන්ට නිග්‍රහ කටයුත්තේය. නිසොරුන්ට නිග්‍රහ නොකාටයුත්තේය. කිසිවකුත් නැති නිසොරු මරණට පැමිණෙති. අනේ! මේ ලෝකයෙහි අයුක්තියක් පවත්නේය''යි කිවුය. රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ගේ බස් අසා කියන්නෝ, ''පණ්ඩිතයෙනි, අසවලුන් විසින් රිය සම් කන ලදැයි කීයේ තෙපි දනුදැ''යි විවාළේය. ''එසේය දනිම්''යි කී කල්හි ''කවුරුන් විසින් කන ලද්දේ දැ?''යි විවාළේය. ''නුඹවහන්සේගේ ගෙයි කිණබල්ලෝ ය'' යි කී කල්හි කිණබල්ලන් විසින් කෑ නියාව දැනගත්තේ කෙසේදැ?''යි විවාළේය. ''මම ඔවුන් විසින් කෑ නියාව දක්වන්නෙම් වේදැ' යි කී කල්හි ''දක්වව පණ්ඩිතයෙනි'' කිවුය.

''එසේ වී නම් නුඹවහන්සේගේ ගෙයි කිණබල්ලන් ගෙන්වා පැන් මෝරු සුඟකුත් ඊතණ සුඟකුත් ගෙන්වුව මැනවැ''යි කිවුය. රජ්ජුරුවෝත් එපරිද්දෙන්ම කළෝය. ඉක්බිත්තෙන් මහබෝසතානෝ ''මේ ඊතණ මෝරෙහි මැඩ බල්ලන්ට පෙව්ව මැනවැ''යි කිවුය. රජ්ජුරුවෝත් එසේම කොට පෙවුය. මෝරු පූ බල්ලෝ සම් හා වර සමග වමනය කළාහුය. ඒ දැක රජ්ජුරුවෝ ''සර්වඥකෙනෙකුන් වහන්සේගේ කීමක් මෙන් වන්නේය''යි සතුටුව ධවලච්ඡත්‍රයෙන් හා රාජ්‍යයෙන් පූජා කළාහුය. මහබෝසතානෝ ''මහරජ්ජුරුවනි, දෙමව්පියන් කෙරේ ධර්මයෙන් හැසිරෙව'' යනාදීන් තෙසකුණ ජාතකයෙහි ආවාවූ දශරාජ ධර්මයෙන් රජ්ජුරුවන්ට ධර්මදේශනා කොට ''මහරජ්ජුරුවෙනි, මේතැන්පටන් ප්‍රමාද නොවව''යි රජ්ජුරුවන් පඤ්චසීලයෙහි පිහිටුවා තවත්ට දැන් ධවලච්ඡත්‍රය හා රාජ්‍යය රජ්ජුරුවන්ටම පෙරලා දුන්නාහුය. රජ්ජුරුවෝ මහබොධිසත්ත්වයන්ගේ ධර්ම කථා අසා සියලු සත්ත්වයන්ට අභය දී බොධිසත්ත්වයන් ප්‍රධාන කොට බල්ලන්ට තමන් මේ නිමවන සැටියේම නිරන්තරයෙන්ම බත් ලත ලෙස සලස්වා බොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි සිට ආයු පමණින් දානදීවූ පින්කම් කොට මරණින් මත්තෙහි ගොස් දිව්‍යලෝකයෙහි උපන්නාහුය.

කුක්කුරොවාදය දසවා දහසක් අවුරුදු මුළුල්ලෙහී පැවත්තේය. බොධිසත්ත්වයෝත් ආයුපමණින් සිට කම්වූ පරිද්දෙන් මිය පරලොව නිගෝය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ''මහණෙනි, සර්වඥයෝ කෑ යන්ව දැන් මතු වැඩෙනි හැසිරෙන්නෝ නොවෙති. පෙරත් වැඩෙහි හැසිරෙන්නෝම වේදැ''යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගලපා මේ කුක්කුර ජාතකය තමවා වදාළසේක

''එසමයෙහි රජ්ජුරුවෝ තම් දැන් ආනන්දස්ථවිරයෝය, අවශෙෂයෝ දැන් බුදුපිරිසය, එසමයෙහි අවවාද දුන් කුක්කුර තම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 23 හොජාජානීය ජාතකය

**ත**වද එක් සමයෙක්හි ජේතවනාරාමයෙහි වැඩ වසන සර්වඥයන් වහන්සේ පසුබව වියහී ඇති එක් මහණකු අරභයා මේ ජාතකය වදාළසේක.

යි වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝධිසත්ත්වයෝ හොජාජානීය නම් සෙකිවයන්ට නායකව අස්රජව උපන්හ. හොජාජානීය නම් කුලෙහි සෙසු අසුන්ට වැඩි තරම් උතුම් වූ ඒ අස්රජහු බරණැස්නුවර රජහට මඟුලස්ව වෙසෙති. ඔවුන් සිටිනා අශ්වශාලාව උඩුවියන් බැඳ හිතැති සිතුයම් කරවා බිම සුදුවැලි අතුරණ ලද්දේහ. මහබෝසතාණෝ එහි හෙළ කුඩයක් යට සිට මධුරවූ නෝජනය අනුභව කොට හැම අසුන්ට උතුම්ව වාසය කෙරෙති.

එසමයෙහි සත්රජ්ජුරුකෙනෙක් ඒ බරණැස් රජ්ජුරුවන් හා යුඬ කොට "රාජ්‍ය ගණුම්හ"යි සවනට අවුත් බොහෝ සේනාව පිරිවරා පඬුවා යුඬයෙන් සන්නද්ධව ඇත්, අස්, රථ ආදී මහත් කායබල සේනාව ගෙණ නුවර වටකොට සැරසී රැසසිටියාහුය.

බරණැස්නුවර රජ්ජුරුවෝ තමන්ගේ අමාත්‍යයන් රැස්කොට එපවත් උන්ට කියා 'කළමනා කිම්දැ"යි කිවුහ. එඛස් අසා අමාත්‍යයෝ කියන්නාහු, දෙවයෙනි, නුඹවහන්සේ පළමු කොට නොවැඩිය මැනව, නුඹවහන්සේගේ මෙනම් රාවුතයාන කෙනෙක් ඇත්නෝ වේද? උන්ට පිරිස් පාවා දී ප්‍රසාද දී උන් ඇවිව මැනව. උන් නොපොහොසත් නම් නුඹවහන්සේ පසුව වැඩිය මැනව' යි කිවුහ.

රජ්ජුරුවෝ එපවත් අසා ඒ රාවුතයාන්ගෙන් වාගෙණ කියන්නාහු, ''දරුව, අපගේ රාජ්‍යය ගණුම්හ යි කියා අප හා සටන් කරන්ට රජදරුවෝ සත්දෙනෙක් මහබලසෙනඟ ගෙණ රාජ්‍යය වට කොට රැක ගත්හ. උන් සත් දෙනා හා කැටුව යුඬකොට ගතනෙයිදැ"යි විවාළේහ. එපවත් අසා රාවුත යානෝ 'සවමීනි, මට පිළිවත, නුඹවහන්සේගේ මතුල් හොජාජානීය නම් අසු ලදිම් නම් යුඬකොට ජය ගෙණ දෙමි' යි කිවුහ. රජ එපවත් අසා 'මාගේ රාජ්‍යය කැසීයාම සුදුසු නොවෙයි සිතා කැමති පිරිස් හා කැමති සෙකිවයකු ගෙණ යව 'යි සතුරනුත් සාදා දෙව"යි කිවුහ.

රාවුතයානෝ සෙකිවයා හා සමඟ පිරිස් ගෙණ නික්ම සතුරන් සිටි තෙනට ආසන්නව සිට හොජාජානීය නම් සෙකිවයාතන් ඇළඟට ගොස් සතනාලා ඇඟ අතගාලා "තොපට ද මට ද සවාමි වූ රජ්ජුරුවන්ට පක්ෂපාතව සටන් කොට සතුරන් සාදා දෙව"යි ඔවා තෙපුල් දී නොයෙක් රසයෙන් යුක්ත හොජනය නවා මධුර පානය පොවා සුවඳ විලවුන් ගල්වා සන්නාහයක් ලා එහි රන්සැත් ලා වසා දැඩි කොට සදලා තෙමේ සැරහිගෙණ සන්නාහ සන්නඬව මඟුල් කඩුව ගෙණ අසුට නමස්කාර කොට ලා පිටට පැන නැගී යුඬයට වන්නාහ.

බෝධිසත්ත්වයෝ සිතන්නාහු ''මේ සත්රජ්ජුරුෂාණකුන් තබා මුළු දඹදිව සෙනඟ අවුත් කම් කිම්ද? උන් නොමරා ඇල්ලූ කල වේද සුරුකමේ"යි

සිතා "සබඳ අශ්වාචාරිය, රජදරුවන් නොමරා යුද්ධය මට බාරය" යි කිවුය. ඒ අශ්වාචාරී තෙමේ සාගසිකව සතුරු සෙනඟ මඩ්ඩයට වන්සඳ අශ්වයා පිනු පිනු තෙනට විදුලියක් මෙන් කඩුව ඇස සිසාරා නොබා හිද පළමු බලකොටුව බිඳ පියා එක් රජ්ජුරුකෙණෙකුන් නොමරා අල්වා ගෙණවුත් නුවරට පාවාදී නැවතත් බිහිසුණු සතුරු සෙනඟ මැදට වැද ඝේනාව බිඳ පරාජය කොට ඒ රජුත් නොමරා ගෙණ සේනාවට පාවා දී මෙසේ ම සදෙනෙකු ගෙණ නැවත සත්වන රජහු අල්වන්ට බොහෝ සෙනඟ එක්ව සිටත් අසු මෙහෙයාලා යුද්ධ යට වන් සඳ අස්හු සතුරන් අතින් කඩු පහරක් ලදින් කඩු පහර කා ඇඟින් ලේ ධාරා ඉසින්නහු අශ්වාචාර්යයා බලා මහත් වූ භයශෝකයෙන් ආයේ ආපසු මෙහෙයාලා රජගෙයි මිදුලට ම ගෙණ ගොස් සන්නාහය ලිහිල් කොට නැවත අනික් අසකු සන්නාහය බඳින්නට වන. අස් තෙමේ කඩු පහර කෑ වේදනාවෙන් වැදහෙව සිතන්නේ "මේ අශ්වාචාර්‍ය තෙමේ මගේ ගුණ නොදන්නේය, සත්වෙනි බලකොටුව බිඳින්ට හා සත්වන රජු ගන්ට නික්මෙයි. අනික් අසකු සදයි. අශ්වාචාර්යයා සත්වන රජු ගන්ට නොපොහොසත. මේ තෙමේද මරණයට යයි, අශ්වයාත් මරන්නේ රටත් නසන්නේය. රජුත් සතුරන්ට අසුවන්නේය එසේවත් මා දිවුණා රජහට කළ වියදී නොපෙණෙයි. දියෙහි ඉරක් ඇන්ද සේ වෙයි. මා ඇර අන් අසෙක් මේ සකල දඹදිව සත්වන රජු ගන්ටද බලකොටුව බිඳින්ටද නොපොහොසතැ"යි සිතා කෙළෙහි ගුණ දන්නාවූ මහබෝසතානන් වහන්සේ මෙසේ සිතුසේක.

"මේ රජ මා තිරිසන් තැනැත්තවුනට බොහෝ උපකාර තබා දී මහුලස් ථානානතරයෙහි තබා මව නොයෙක් පොෂ්‍යය කොට මා රක්ෂා කෙළේ නම් මෙසේ වූ යුද්ධයක් දුටු කලට වේද මා ඇඟින් වැහිරෙන ලේ රජු මව දුන් නොයෙක් රසයෙන් මධුරපානයෙන් අටගත්තා වූ ලේ මුත් අනික් ඇතිවූ ලෙයෙක් නොවෙයි. එබැවින් මාගේ ශරීරයෙහි රජු නිසා අටගත් මාංශය ද ජීවිතයද රජුට දී පක්ෂපාතව ම මළෙම් නම් පරලොව සුවයෙක්ම ලැබෙයි තමන් පිණිස මාගේ ජීවිතය සතුරන්ට දී පක්ෂපාතව මළ කල නිරඝන්ව සිට මට සතුරන් සාදා දී මා නිසා ජීවිතය දුන්හ යි මාගේ රජු කී කල්හි මළාත් නොමළා ය"යි සිතනසේක්, "සබඳ අශ්වාචාර්‍ය, සත්වන බලකොටුව හා එහි බිහිසුණු සතුරන් මැදට වදින්ට අනික් අසෙක් මා මුත් මුළු දඹදිව නැතැ යි හොජ්ජානීය නම් වූ සෙඬිව කුලයෙහි උපන්නාවූ මා මුත් අනික් අස් රජෙක් නැතැයි මා තහා සිටුවාගෙණ සන්නාහ බැඳ සත්වන රජු ගන්ට යව"යි කීසේක.

බොධිසත්ත්වයන්ගේ බස් අසා අශ්වාචාර්‍ය තෙම බොධිසත්ත්වයන් සමීපයට ගොස් තහා සිටුවාගෙණ වණය වසා බෙහෙත් බැඳ පෙර සේ ම සන්නාහය ලා අසුපිට පැනහැඟී කඩුව ගෙණ මහත් බලකාය ගෙණ සතුරු සෙනඟ බිඳ සතුවන රජු අල්වා ගෙණ නොමරා ම ගෙණත් පිරිසට පාවා දී ලූ සේක. සත්වන රජු හා සෙනඟ සාදා සතුරන් බිඳපියා පිරිස් ඇරගෙණ බෝධිසත්ත්වයන් හා සමඟ රජදෙරට අවුත් රජ්ජුරුවන් දුටුසේක. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් කෙටුම් කෑ බව අසා මහත්වූ ශොකයෙන් කම්පිතව සිටියාහ.

බොධිසත්ත්වයෝ තමන්ගේ රජ්ජුරුවන්ට කියන්නාහු "දෙවයෙනි, මේ රජ සත්දෙනා කොමරව සි දිවිරවාපියා මිත්‍රව සිට උන් උන්ගේ රටට

යවව"යි කීහ. "මහරජ තොප මට කිරණ උපකාර නම් තෙල අශ්වාචාර්‍යයාට කළ මැනවැ යි ඍත්කාරකරවා තොපි ද තොපමාව දන්දෙව, පෙනෙවස් රකුව, බණ අසව, ප්‍රාණවධ නොකරව, දශරාජ ධර්මයෙන් රාජ්‍යය කරව'යි අවවාද කොට බොධිසත්ත්වයෝ තුමූ සත්නාහය මුදාපී කල පරලොව ගියහ.

රජ්ජුරුවෝ මහත් ශොකයෙන් හඬා කම්පිතව බොධිසත්ත්වයන් මහත්වූ පෙරහරින් පූජා කොට ආදාහන කරවූහ. බොධිසත්ත්වයන් කී පරිද්දෙන් රජ්ජුරුවෝ සිත තබා අශ්වාචාර්‍යයාහට බොහෝ වස්තුද ගම්බිම්ද තනතුරු ද දී මිත්‍රද්‍රොහි නොවී රක්ෂාස්ථානයෙහි තුබ්බූසේක. නැවත බොධිසත්ත්වයන් කී අවවාද සිත තබා තමන්ට ද්‍රෝහි වූ රජ සත්දෙනා ගෙන්වා ගෙණ තොමරා නාවා ආහාර අනුභව කරවා සත්දෙනා දිවිරවා මිත්‍රව උන් උන්ගේ රටට යවා තුමූ ද බොධිසත්ත්වයන් කී පරිද්දෙන්ම නිබඳව පන්සිල් රැක පොහොය අටසිල් රැක් දශරාජ ධර්මයෙන් රාජ්‍යය කොට තමන් කළ කුශලමූලයෙන් දෙව්ලොව උපන්නාහුය.

ශාස්තෘන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා 'මහණෙනි, පෙර නුවණැත්තාවූ මිහොත්තමයෝ වීර්‍ය්‍ය කරන්නට සුදුසු තන්හි වීර්‍ය්‍ය කළාහුය. මෙබඳු ප්‍රකාර ලැබගෙණ ද වීර්‍ය්‍ය නොහැරියාහුය. නෙපි වනාහී මෙබඳු නෛර්‍යාණික ශාසනයෙහි මහණව කවර කාරණයකින් වීර්‍ය්‍ය හැරියෙහි දැ' යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යයාගේ අවසානයෙහි පසුබට වීර්‍ය්‍ය ඇති මහණතෙම අර්හත්ඵලයෙහි පිහිටිසේක. බුදුරජානන්වහන්සේ පූර්‍වාපරසන්ධි ගළපා මේ හොජාජානීය ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්දස්ථවිර වූසේක. අශ්වාචාර්‍යය තෙම ශාරීපුත්‍රස්ථවිර වූසේක. හොජාජානීය සෛක්ෂාශ්වව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 24 ආජඤ්ඤ ජාතකය

එවද එක් සමයෙක්හි ශ්‍රාවස්තියන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණසේක් හරණලද වීර්‍ය්‍ය ඇති භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සර්‍වඥයන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට "මහණෙනි, පෙර නුවණැත්තෝ වීර්‍ය්‍ය කරන්ට සුදුසු තන්හි ශරප්‍රහාර ලැබ ගෙණ වීර්‍ය්‍ය කළාහු ය' යි වදාරා ඉකුත්එත් කථාව වදාළසේක.

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පූර්‍වජාතකයෙහි කියනලද ක්‍රමයෙන් සත් රජ්ජුරු කෙණෙක් නුවර පිරිවැරුවාහුය.

ඉක්බිත්තෙන් එක් රථවාහ්‍යයෙක් භ්‍රාතෘ වූ අශ්වයන් දෙදෙනෙකු රථයෙක්හි යොදා නුවරින් නික්ම බලකොටු සයක් බිඳ රජදරුවන් සදෙනකු

අල්වාගත්තේය. එකෙණෙහි වැඩිමහළු අශ්වතෙම ශරප්‍රහාරයක් ලද්දේය. රථාචාර්‍යතෙම රථය ගෙණයනුයේ රජගෙයි දොරට අවුත් වැඩිමහළු අශ්වයා රථයෙන් මුදා සන්නාහය ලිහිල්කොට එක් පාර්ශ්වයකින් සයනය කරවා අන් අශ්වයකු සරහන්ට පටන්ගත්තේය.

බොධිසත්ත්වයන් වහන්සේ ඔහු දැක පූර්වයෙහි කියනලද ක්‍රමයෙන් සිතා රථාචාර්‍යයාණන්දෙවා හොත්සේක්ම මෙසේ අවවාද කළසේක. "පුත්‍රයිනි දිවූ යම් යම් කලෙක්හි වේවයි යම් යම් ඝණයෙක්හි වේවයි යම් යම් යුද්ධ මණ්ඩලයෙක්හි වේවයි යම් යම් කලෙක්හි වේවයි ප්‍රහාර ලත් කල්හි හෝ තොලත් කල්හි හෝ අභිප්‍රාය දන්නාසුළු, උතුම් සෛන්ධවයාම ව්‍යායාම කෙරෙයි. වියහි කිරීමට ප්‍රාරම්භ කෙරෙයි. එහි බළංකාශ්වයෝ පිරිහෙන්නා හුය. ඒ කාරණයෙන් මේ රථයෙහි මා යොදව"යි කියසේක.

රථාචාර්‍යයා බොධිසත්ත්වයන් වහන්සේ නඟා සිටුවා රථයෙහි යෙදූ සත්වෙනි බලෙකොටුව බිඳ සත්වෙනි රජහු අල්වාගෙණ රථය පදිනුයේ රාජ වාසභවනද්වාරයට අවුත් අශ්වයා මිදුයේය. බොධිසත්ත්වයන් වහන්සේ එක් ඇලයකින් හොත්සේක් යට කියනලද ක්‍රමයෙන් රජහට අවවාද දී නිරුද්ධවූ සේක. රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේගේ ශරීරය ආදහන කරවා රථාචාර්‍යයාහට ආදර සත්කාර කොට දැහැමෙන් රාජ්‍යය කරවා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ආජඤ්ඤ ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍ය දෙශනාවගේ කෙළවර පසුබට වියහි ඇති භික්ෂූන් වහන්සේ අග්‍රඵලයෙහි පිහිටිසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්දසථවිර වූසේක. ප්‍රහාර ලදින් වියහි කොට සත්වැනි රජහු අල්වා දුන් අශ්වයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 25 තිත්ථ ජාතකය

එවද එක් සමයෙක්හි සර්ව්ඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සේක් දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ සද්ධිවිහාරිකවූ පූර්වයෙහි පරිවය කරණලද සවණ්ණකාර කුලයෙක්හි ම්හණවූ භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ආසයානුසයඤාණය වනාහි සර්ව්ඥයන් වහන්සේලාට ම වන්නේය. අවශෙෂ ශ්‍රාවකයන් වහන්සේලාට නැත්තේය. එහෙයින් දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ තමන්වහන්සේට ආසයානුසයඥානය නැති හෙයින් සබ්බිහාරික භික්ෂූන් වහන්සේගේ අභිප්‍රාය නොදන්නාසේක් අඤ්ඤ කම්මට්ඨානයම වදාළසේක. ඒ භික්ෂූන් වහන්සේට ඒ භාවනාව සත්ප්‍රාය නුවූයේය. කවර හෙයින්ද? යත්, ඒ භික්ෂූන්වහන්සේ වනාහි පවිපාටියෙන් පන්සියයක් ජාතියෙහි සවණ්ණකාර කුලයෙහිම පිළිසිඳගත් සේක.

ඉක්බිත්තෙන් ඒ භික්ෂූන් වහන්සේට බොහෝ කලක් ඒ සමණියාගේ දුක්ම පුරුදු කළ හෙයින් අශුභ කර්මස්ථාන භාවනාව සන්ප්‍රාප්ත නුවූයේය. ඒ භික්ෂූන් වහන්සේ එහි උද්ග්‍රහනිමිත්ත මාත්‍රයකුදු උපදවන්ට නොහැකිව සාර මසක් කල්යැවූ සේක. දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ තමන්ගේ අතැවැසි මහණට අර්හත්ඵලය දෙන්නට නොහැකිව "ඒකාන්තයෙන් මේ තෙමේ බුදුන් විසින් විනයනය කටයුතු වන්නේය යි සඤ්ඤයන් වහන්සේගේ සමීපයට කැඳවාගෙණ යෙමි' යි සිතා අළුයම් වේලෙහිම ඔහු කැඳවාගෙණ සඤ්ඤයන් වහන්සේගේ සමීපයට වැඩිසේක.

එසේ හිය කල්හි සඤ්ඤයන් වහන්සේ වදාරණසේක්, "ශාරීපුත්‍රස්ථවිර යෙනි, කවරනෙයකින් එක් මහණක්හු කැඳවාගෙණ ආයේදැ"යි විමසූසේක. "සවාමීන්වහන්ස, මම මේ මහණහට කර්මස්ථානභාවනාව දුන්නෙම් සාරමසක් මුළුල්ලෙහි උද්ග්‍රහනිමිත්ත මාත්‍රයකුදු නොසිපදවූයේය. ඒ මේ මහණතෙමේ බුදුන් විසින් විනයනය කටයුතුය යි සිතා මේ මහණ නුඹවහන්සේගේ සමීපයට කැදවාගෙණ ආයෙමි"යි කී කල්හි "ශාරීපුත්‍රස්ථවිරය, කවර තම් කර්මවහනක් අතැවැසි මහණහට දුන්නෙහිදැ"යි විමසූසේක. "භාග්‍යවතුන් වහන්ස, අශුභ කර්මවහනැ"යි දැන්වූසේක. "ශාරීපුත්‍රස්ථවිරයෙනි, තොපගේ චිත්තසන්තානයෙහි ආසයානුසයඥානය නැත්තේය. නෙපි යව, සවස්වේලෙහි අවුත් නොපගේ අතැවැසි මහණ කැදවාගෙණ යව"යි වදළසේක.

මෙසේ සඤ්ඤයන් වහන්සේ සැරියුත් මහතෙරුන් වහන්සේ ගමන් කරවා ඒ භික්ෂූන් වහන්සේට මනොඥවූ අදහා සිවුරු දෙවා ඔහු කැදවාගෙණ ම පිඬු පිණිස වැඩ ප්‍රණීතවූ ඛාද්‍යභොජ්‍ය විකෘතිය දෙවා මහත්වූ භික්ෂු සඞ්ඝයා පිරිවරා නැවත විහාරයට අවුත් ගදකිළියෙහි දිවාභාගය ගෙවා සවස් වේලෙහි ඒ භික්ෂුව කැදවාගෙණ විහාරයෙහි සැරිසරා වඛනාසේක් අඛ උපතෙහි එක් පොකුණක් මවා ඒ පොකුණෙහි මහත් පියුම් පදුරක් මවා එහිද මහත් පියුමක් මවා "මහණ, මේ පියුම බලමින් හිඳුව"යි කියා හිඳුවා ගදකිළියට වන්සේක. ඒ මහණ ඒ පියුම නැවත නැවත බලන්නේය. භාග්‍යවතුන් වහන්සේ පියුම ජරාවට පැමිණවූ සේක. ඒ පියුම ඒ මහණ බල බලා සිටියදී ම ජරාවට පැමිණ විවර්ණ වූයේය. ඉක්බිත්තෙන් පිහුම හාත්පසින් පෙති වැවෙමින් මොහොතකින් සියලු පියුම් පෙති වැටුනාහුය. ඉක්බිත්තෙන් රේනු වැගුරුනේය. පියුම් කෙමිය පමණක් අවශෂ වූයේය. ඒ භික්ෂූන් වහන්සේ ඒ පියුම බලමින් සිතනසේක්, "මේ පියුම දැන්ම පිපී අභිරූපව දැකුම් කටයුතු වූයේය, ඉක්බිත්තෙන් ඔහුගේ වර්ණය මුනුකුරා පෙතිද රේණුද හුනු යේය. කර්ණිකා මාත්‍රයක් පමණව සිටියේය මෙබඳු පියුම පවා ජරාවට පැමිණියේය. මාගේ මේ ශරීරයට කෙසේ ජරාව නොපැමිණෙන්නේදැ"යි සිතා "සියලු සංස්කාර ඛණිකෝ අනිත්‍යය"යි කියා විදර්ශනා වැඩූසේක.

සඤ්ඤයන් වහන්සේ "ඔනුගේ සිත විදර්ශනාවට ආරූඪවූයේ ය"යි දැන ගදකිළියෙහි වැඩහුන් සේක්ම ආලෝකයක් පතුරුවා වදාරණසේක් "සරත් කාලයෙහි ඇඹුල් මලක් අතින් කඩාගන්නාක් මෙන් තමාගේ සිත්සතන්හි සෙනහය අර්හත්ඵල මාගීඥන තමැති ශස්ත්‍රයෙන් සිඳ බුදුන් විසින් දෙශනා කරණ ලද නිවණට පමුණුවන්නාවූ අෂ්ටාඞ්ගික මාගීය වඩව"යි වදළසේක. ඒ භික්ෂූන් වහන්සේ මේ ධර්මයාගේ සකළවර අර්හත්ඵලයට පැමිණ "ඒකාන්තයෙන් සියළු භවයෙන් මිදුනෙමි"යි සිතූහ.

**"සෝ වුත්තවාසෝ පරිපුණ්ණමානසෝ-බ්‍රහ්මායුසවෝ අනහිමදෙහධාරී**
**විසුඛසීලෝ සුසමාහිතින්ද්‍රියෝ-වසතු යථා රාහුමුඛා පමුත්තෝ,**
**තථා අහං මෝහ මනඛ්කාරං-විනොදයිං සඛ්ඛමිලං අසෙසං**
**ආලොකමුප්පාත තමෝ පහාකරෝ-ඝනඝ්ඝරංසි විය භානුමා නභෝ"ති**

මේ ආදී ගාථාවලින් ප්‍රීතිවාක්‍යය පැවැත්වූසේක. ප්‍රීතිවාක්‍යය පවත්වා හොස් භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කළසේක. සථවිරයන් වහන්සේද අවුත් ශාස්තෘන්වහන්සේට නමස්කාර තොට තමන්ගේ සඛ්විහාරික භික්ෂූන් වහන්සේ කැඳවාගෙණ වැඩිසේක. මේ ප්‍රවෘත්තිය භික්ෂූන්වහන්සේ අතරෙහි ප්‍රකාශව භික්ෂූන්වහන්සේ දම්සභාවෙහි හිඳ "ඇවැත්නි, ශාරිපුත්‍ර සථවිරයන් වහන්සේ ආසවානුසයඤ්ඤාය නැති හෙයින් තමාගේ අතැවැසි භික්ෂූන්වහන්සේගේ අභිප්‍රාය තොදත්සේක. සර්ඥයන් වහන්සේ වකාහි දැන එකදවස කිත්ම ඕනව සිවුපිළිසිඹියා සමග අර්හත්ඵලය දෙවූසේක. සර්ඥවරයෝ නම් මහානුභාවආශ්චර්‍යසේකැ"යි කියා සර්ඥයන්වහන්සේගේ ගුණවර්ණනා කොට හුන්නාහුය.

බුදුරජානන් වහන්සේ එතනට වැඩ පණවනලද ආසනයෙහි වැඩහිඳ "මහණෙනි, මෙහි මා එන්තාව පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ"යි විවාළසේක, "භාග්‍යවතුන් වහන්ස, අන් කථාවකින් යුක්තව උනුමෝ නොවමින. නුඹවහන්සේම දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ සඛ්විහාරික භික්ෂූන්වහන්සේගේ අභිප්‍රාය දැන වදාළ කථාවය" දැන්වූවාහුය.

සර්ඥයන් වහන්සේ වදාරණසේක් 'මහණෙනි, ඒ මම දැන් බුදුව ඔහුගේ අභිප්‍රාය දැනගත්තා ආශ්චර්‍ය නොවෙයි. පෙරත් මම ඔහුගේ අභිප්‍රාය දැනගත් තෙම්වේදැ"යි වදාරා ඉකුත්වත් කථාව ගෙණ දක්වා වදාළසේක.

යි වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරණසේක. එකල්හි අප මහබෝසතාණන් වහන්සේ ඒ රජහට අවිඳෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ අමාත්‍යයකු වූසේක එකල්හි රජහුගේ මඟුල් අශ්වයා නහනතොට එක්තරා ඛළඬකාශ්වයකු නැහැවුවාහුය. මඟුල් අශ්වයා ඛළඬකාශ්වයා නහවනලද තොටට බස්වනු ලබන්නේ පිළිකුල් කොට බස්නව නොකමැති වූයේය. අස්ශෝව්‍යා හොස් රජහට දැන්වූයේය. "මහරජ්ජුරුවන් වහන්ස, මඟුල් අශ්වයා තොටට බසින්ට නොකමැතිවූයේය"යි කියා.

රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් යවනසේක් "යව, පණ්ඩිතයෙනි, දැන ගණුව, කවර කාරණයකින් අශ්වයා තොටට බස්වනුලබන්නේනොබස්නේදැ"යි විවාළසේක. බොධිසත්ත්වයන් වහන්සේ "යහපත මහරජ"යි කියා ගංතෙරට ගොස් අශ්වයා බලා ඔහු තීරෝනි බැව් දැන කවර කාරණයකින් මේ අශ්වයා තොටට නොබස්නේදැ"යි පරීක්ෂාකරණසේක් පළමුකොට මෙහි අශ්වයකු නහවන ලද්දේවත. එතෙකින් පිළිකුල් කරන්නේය. තොටට නොබස්නේය යි සිතා අස්ශෝව්‍යාගෙන් විවාළසේක. "පින්වත්නි, මේ තොටෙහි කවරක්හු පළමුකොට නහවන ලද්දේදැ"යි විවාළසේක. 'සවාමීන් වහන්ස, අන් ඛළඬකාශ්වයෙකැ"යි කියේය.

බොධිසත්ත්වයන් වහන්සේ සිතනසේක් "මේ අශ්වයා තමා සුචිකාම බැවින් පිළිකුල් තෙරෙමින් මෙනි තනවන්නට නොකමැතිව මොහු අන් තොමෙක්හි තනවන්නට වටනේය"යි ඔහුගේ අභිප්‍රාය දැන "පින්වත් අශ්වාචාර්‍යය, ගිතෙල් මී සකීරායෙන් අභිසංස්කෘත ක්ෂීරපායාසයද වතාහී නැවත නැවත අනුභවකරන්නාහට තෘප්තිය වන්නේය. මේ අශ්වයා බොහෝවර මේ තොමෝහි තනවත ලද්දේය මොහු වතාහි වෙන තොටකට බස්වා තනවා ජලය පොවාලව"යි කියා මෙසේ කීසේක. රථාචාර්‍යයා අශ්වයා අන් තොටකින් තනවා පැන් පොව. "යම්වූ පුරුෂයෙක් සර්පි මධු සකීරායෙන් අභිසංස්කෘත පායාසය අධික කොට කෑමෙන් තෘප්තියට පැමිණේද? එපරිද්දෙන් අතික් අශ්වයකුගේ නැහැමෙන් අපවිත්‍රවූ තොමෙහි තමාගේ ශාඛ්‍යාරත්වය හේතුකොට ගෙණ ස්නානය නොකමැත්තේය. අන් තොටකින් තනවව"යි කීසේක.

අශ්වාචාර්‍යයා බොධිසත්ත්වයන් වහන්සේගේ වචනය අසා අශ්වයා වෙන තොටකට බස්වා පැන් පොවා නැහැවූයේය බොධිසත්ත්වයන් වහන්සේ අශ්වයා තනවා පැන් පොවන කල්හි රජහුගේ සමීපයට ගොස් සිය ලූ ප්‍රවෘත්තිය දන්වූසේක. රජ්ජුරුවෝ මෙබඳු තිරශ්චීනයාගේ අභිප්‍රාය දැනගත්සේකැයි කියා අප මහබෝසතාණන් වහන්සේට මහත් ඒශ්වර්‍යයී දී ජීවිතයාගේ කෙළවර කළවූ පරිද්දෙන් මිය පරලොව ගියසේක. බොධිසත්ත්වයන් වහන්සේද කම්වූ පරිද්දෙන් මිය පරලොව වැඩීසේක.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "මහණෙනි, මම මොහුගේ අභිප්‍රාය දැනගත්තෙම් දැන් මතු නොවෙයි, පෙරත් අභිප්‍රාය දැනගත්තෙම්වී දැ"යි කියා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මඩහල අශ්වයා තම් දැන් මේ භික්ෂූන්වහන්සේ වූසේක. එකල්හි රජ්ජුරුවෝ තම් දැන් ආනන්දස්ථවිර වූසේක. පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් වතාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ" යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 26 මහිලාමුඛ ජාතකය

මේ වදාළ එක්සමයෙක්හි බැළු බැළුවන් ඇස් නොනිම වන මනහර රූ ඇති ශ්‍රෝකස්වාමිවූ බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සේක් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

දෙවදත්තස්ථවිරයන් වහන්සේ අජාසත් කුමාරයන් පහදවා ලාභසත්කාර ඉපදවූසේක. අජාසත් කුමාරයෝ දෙවදත්තස්ථවිරයන් වහන්සේ ඔය හිස විහාරයක් කරවා නොයෙක් රස ඇති තුන් අවුරුදු ගිය සුවඳ ඇල්සාලේ බත් දවසක් පාසා පන්සියයක් වසුන්වලින් එවති ලාභසත්කාර නිසා දෙවදත්තස්ථවිරයන් වහන්සේට පිරිවර මහත්විය. දෙවදත්තස්ථවිරයන් වහන්සේ පිරිවර හා සමඟ විහාරයෙහිම වසනසේක.

එසමයෙහි රජගහනුවර වසන්නාවූ යහළුවෝ දෙදෙනෙක් වෙති ඔවුන් අතුරෙන් එක්කෙනෙක් බුදුන් සමීපයෙහි මහණවූය. එක්කෙනෙක් දෙවදත්ත සථවිරයන් ලහ මහණවූය. ඔහු දෙදෙන ඔවුනොවුන් ඒ ඒ තෙනදීත් දකිති විහාරයට ගොසිනුත් දකිති. ඉක්බිත්තෙන් එක්දවසක් දෙවදත්ත නිශ්‍රිත මහණ අන් භික්ෂූහට කියන්නේ කිමෙක්ද? තෝ දවසක් පාසා ඩා පෙර පෙරා සිඟන්නෙහිය. දෙවදත්තසථවිරයන් වහන්සේ ගයාහිස විහාරයෙහිම හිඳ නොයෙක් අග්‍ර රසයෙන් යුක්තවූ භෝජනය වළඳතසේක. මෙබඳු උපායෙක් ඇත. කුමක් පිණිස තෝ දුක් අනුභව කරන්නෙහිද? කිමෙක්ද? තා විසින් උදැසනම ගයාහිස විහාරයට අවුත් අවුළු සහිත කැඳ වළඳ, අවලොස්වැදුරුම්වූ බාද්‍ය අනුභව කොට නොයෙක් අග්‍රරසයෙන් යුක්තවූ භෝජනය වළඳන්ට නුපුරදැ"යි කීය. ඒ මහණ නැවත නැවත කියන බස් අසා යනු කැමතිව එතැන් පටන් ගයාහිසට ගොස් වළඳ, වේලාපස වෙළුවනයට එන්නේය. ඒ මහණ කැමකල සඟවාගත නුහුනු යේය. ගයාහිසට ගොස් දෙවදත්ත සථවිරයන්ට තබා දෙනලද බත වළඳන්නේය"යි නොබෝකලකින්ම ප්‍රසිඩවිය.

ඉක්බිත්තෙන් ඔහුට සහාය භික්ෂූහු කියන්නාහු "සැබෑද මහණ, තෝ දෙවදත්තසථවිරයන්ගේ බත වළඳන්නෙහිදැ"යි කීකල්හි "සැබව, ඇවැත්නි, මම ගයාශීර්ෂයට ගොස් වළඳමි. මට වූකලී දෙවදත්තයෝ බත් නොදෙති. අන් මනුෂ්‍යයෝ දෙති"කීය. "ඇවැත්නි, දෙවදත්තයෝ සවීඥයන්ට ප්‍රතිපක්ෂයෝය දුශ්ශීලයෝය, අජාසත් රජ්ජුරුවන් පහදවා අධර්මයෙන් තමන් ලාභසත්කාර ඉපදවූහ. තෙපි මෙබඳු නෛයර්‍යාණික ශාසනයෙහි මහණව දෙවදත්තයන්ට අධර්මයෙන් උපන්නාවූ භෝජනය වළඳව. වරෝ යම්හ. බුදුන් සමීපයට ගෙණ යම්හ"යි කියා ඒ භික්ෂුව කැඳවාගෙණ දම්සභා මණ්ඩපයට ආවාහුය. සවීඥයන් වහන්සේ ඒ භික්ෂූන් කැඳවා "කිමෙක්ද? මහණෙනි, තෙපි මොහු නොකමැති පරිද්දෙන් කැඳවාගෙණ අවුදැ"යි වදාළසේක. "එසේය, සවාමීනි මේ මහණ නුඹ වහන්සේ සමීපයෙහි මහණව දෙවදත්තයන්ගේ අධර්මයෙන් උපන් භෝජනය වළඳන්නේය"යි දැන්වූසේක. එබස් අසා බුදුහු "සැබෑද? මහණ, තෝ දෙව දත්තයන්ගේ අධර්මයෙන් උපන් භෝජනය වළඳසි දැ"යි විචාළසේක. එබස් ඇසූ මහණ "දෙවදත්තයෝ මට නොදෙති, මනුෂ්‍යයෝ දෙති. ඒ බත මම වළඳමි"යි දැන්වූසේක.

එබස් ඇසූ සවීඥයන් වහන්සේ වදාරණසේක් "මහණ, තෝ මෙහි මහණව මාගේ ශාසනය හජනය කෙරෙමින් දෙවදත්තයන්ගේ බත කෙසේ නම් අනුභවකෙළෙහිද? හැමකලම දුටු දුටුවන් හජනය කරණ සුළුවූයෙහි වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යවූහ. එකල රජ්ජුරුවන්ගේ මහිලාමුඛ නම් මඟුලැතෙක් වීය. ඒ තෙම සිල්වත ආචාර සම්පන්නය. කිසිකෙණෙකුන්ට හිංසාවක් පීඩාවක් නොකරන්නේය.

ඉක්බිත්තෙන් එක් දවසක් ඒ ඇතු සිවිනා ඇත්හල සමීපයෙහි රාත්‍රි භාගයෙහි සොරු අවුත් ඔහුට නුදුරුතැන හිඳ සොරකම් මන්ත්‍රණය කළාහුය. "මෙසේ උමං බිඳ යුත්තේය. මෙසේ මංපැහැරිස යුත්තේය, උමංබිඳීම හා

මංපැහැරීම් මගක් තොටක් සේ නිරවුල්කොට ඉගෙණගෙණ බඩු සොරකම් කරන්ට වටනේය. සොරකම් කරන්නාහු විසින් වසතුහිමියන් මරා සොරකම් කටයුත්තේය. එසේ කල්හි වසතුව සොරකම් කරන්නාහු විසින් ශීලාචාර ගුණයෙන් යුක්ත නොවිය යුතුය. කර්කශව පරුෂව සාහසිකව පැවැත්විය යුත්තේය"යි මෙසේ කථාකොට ඔවුනොවුන් උගන්වා ගෙණ ගියාහුය. මෙම ක්‍රමයෙන් දෙවැනි දවසය, තුන්වෙනි දවසය යි කියා බොහෝ දවසක්ම එතනට අවුත් මන්ත්‍රණය කළාහුය.

ඒ මහිලාමුඛ නම් හස්තියා ඒ සොරුන්ගේ බස් අසා මා උගන්වති යන සංඥයෙන් දැන් මා විසින් වණ්ඩ පරුෂ රෞද්‍ර ක්‍රියා ඇතිව පැවැත්ත යුත්තේය"යි සිතා එබඳුවූ වණ්ඩගුණ ඇතිවිය. ඉක්බිත්තෙන් උදැසනම ආවාවූ ඇත් ගොව්වා සොඬින්බදා අල්වාගෙණ බිමහසා මැරුයේය, එසේම අනිකාගුත් අනිකාගුත් මැරුයේය මහිලාමුඛ නම් හස්තියාව මදනැංගේය. එසේ හෙයින් දුටු දුටුවන් මරන්නේය"යි රජ්ජුරුවන්ට කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ට කියන්නෝ "පණ්ඩිතයෙනි, සව, කවර කාරණයකින් ඒ ඇතා දුෂ්ටවීද්දෝ යි දැනගෙණ එව"යි කිවුය.

බොධිසත්ත්වයෝ ගොස් ඔහුගේ ශරීරයෙහි රෝග නැති තියාව දැන "කවර කාරණයකින් මේ තෙම දුෂ්ටවීද්දෝ දෝ? යි පරීක්ෂා කරන්නාහු ඒකාන්තයෙන් නුදුරුතෙනක කිසිකෙණෙකුන්ගේ තපුරුවචනයක් අසා 'මොහු මා බස් කම් උගන්වති" යන සංඥාවෙන් දුෂ්ටවීය යි සැකිටුහන් කොට ඇත්ගොව්වන් අතින් විචාරන්නාහු "අත්හල සමීපයේ රාත්‍රිභාගයෙහි කිසිකෙණෙකුන් විසින් කථාවක් කළ නියාවක් දනුදැ"යි විචාළෝය. "සවාමීනි, සොරු අවුත් කථාකළෝය"යි කිවුය. බොධිසත්ත්වයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නෝ "දේවයන් වහන්ස, ඇතුට කිසි රෝගපීඩාවක් නැත. සොරුන්ගේ බස් අසා දුෂ්ටවීය"යි කිවුය. "දැන් කුමක් කළයුතුදැ"යි කිකල්හි "ශිල්වත් මහණ බමුණන් ඇත්හල සමීපයෙහි හිඳුවා ශීලාචාර කථා කියන්ට සුදුසුවන්නේය"යි කිවුය. රජ්ජුරුවන් විසින් "එසේ කරව"යි කිකල්හි බෝධිසත්ත්වයෝ සිල්වත්වූ මහණ බමුණන් ඇත්හල සමීපයෙහි හිඳුවා "සවාමීනි, ශීලනිඃශ්‍රිතවූ කථා කිවමැනවැ"යි කිවුය.

එබස් අසා බමුණෝ ඇතුට නුදුරු තෙනක හිඳ කියන්නෝ "කිසිවක් නොඇල්විය යුත්තේය. කිසිවෙක් නොමැරිය යුත්තේය, ශීලාචාරයෙන් සෂාන්ති මෛත්‍රී කරුණාවෙන් යුක්තවිය යුතුය"යි ශීලනිඃශ්‍රිත කථා කළාහුය. ඒ හස්තියා එබස් අසා "මොහු මා බස්කම් උගන්වති" එසේ හෙයින් "දැන් මෙතැන් පටන් සිල්වන් විය යුතුය"යි සිතා සිල්වත් සෂාන්ති කරුණාවෙන් යුක්තවීය. රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් අතින් විචාරන්නෝ "කිමෙක්ද? දරුව, හස්තියා සිල්වත් වී දැ"යි විචාළෝය. බොධිසත්ත්වයෝ "එසේය, රජ්ජුරුවන් වහන්ස"යි කිහ.

එබස් ඇසූ රජ්ජුරුවෝ කියන්නෝ "මෙබඳු දුෂ්ට වූ හස්තියා නුවණැත්තන් නිසා පෞරාණික ධර්මයෙහි පිහිටියේ වේදැ"යි කියා බෝධිසත්ත්වයන්ට ප්‍රශංසා කළෝය. තවද රජ්ජුරුවෝ "නිරශ්චීනවූ හස්තියාගේ පවා අභිප්‍රාය දැන ගත්තෝ වේදැ"යි කියා බොධිසත්ත්වයන්ට මහත්වූ යශස් දුන්නාහුය. රජ්ජුරුවෝ ආයු පමණින් සිට මහබෝසතානන් හා සමඟ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මහණ, තෝ පෙරත් දුටු දුටුවන් භජනය කෙළෙහිය. සොරුන්ගේ කථා අසා සොරුන් භජනය කෙළෙහිය, ධාර්මිකයන්ගේ බස් අසා ධාර්මිකයන් භජනය කෙළෙහිය"යි ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාරා පූර්වාපර සන්ධිගළපා මේ **මණිලාමුඛ ජාතකය** නිමවා වදාළ සේක.

"එසමයෙහි මණිලාමුඛ හස්තියා තම් දැන් මේ විපක්ෂයෙවී හිඤ්ඤය, රජ්ජුරුවෝ තම් ආනන්දස්ථවිරයෝය, අමාත්‍යවූයෙම් තීලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 27 අහිණ්හක ජාතකය

**එ**වද එක්සමයෙක්හි බුදුරජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩ වසන සේක් එක් උපාසකයෙකු හා මහළු තෙරණෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසයකරන්නාවූ යහළුවෝ දෙදෙනෙක් වූවාහුය. ඔවුන් අතුරෙහි එක්කෙණෙක් පැවිදිව දවසක් දවසක් පාසා උපාසකයාගේ ගෙට වඩනාසේක. උපාසකතෙම තෙරුන්වහන්සේට ආහාර පිළිගන්වා තෙමේද ආහාර අනුභව කොට උන්වහන්සේ හා සමග විහාරයට අවුත් සුශ්‍රූෂයා අසනඩහගතවන තැන් දක්වා ඔබ්නොබ කථාකිරීමෙන් හිඳ නුවරට යන්නේය. තෙරුන් වහන්සේද නුවර වහාත් දෙර දක්වා ඒ උපාසකයා එක්ව ගොස් නවත්තා සේක. ඒ දෙදෙනාගේ විශ්වාස බව ඝීඤ්ඤුන් වහන්සේ අතුරෙහි ප්‍රකාශ වූයේය. ඉක්බිත්තෙන් එක්දවසක් භික්ෂූහු ඔවුන් දෙදෙනාගේ විශ්වාස කථාව කියමින් දම්සභාමණ්ඩපයෙහි උන්නාහුය. සත්ථෘදයන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මේ දම්සභාවෙහි දැන් මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාව කින් යුක්තව උන්නාහුද"යි විචාරා සවාමීන්වහන්ස, මෙතෙම් කථාවකිනැ"යි දැන්වූ කල්හි සත්ථෘදයන් වහන්සේ වදාරණසේක් "මහණෙනී, මොහු දෙදෙන විශ්වාසවූවෝ දැන් මතුනොවෙති, පෙරත් විශ්වාසවූවාහුය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ**වකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් වහන්සේ ඒ රජහට අමාත්‍යයෙක් වූසේක. එකල්හි එක් සුනඛයෙක් මඟුල් ඇත්ඟලට ගොස් මඟුල් ඇතා අනුභව කරණ තන්හි වැටුනාවූ බත්නුළු අනුභව කරන්නේය. ඒ සුනඛතෙම ඒ ආහාර යෙන්මවැඩෙනු ලබන්නේ මඟුලැතාට විශ්වාසවූයේය. සුනඛයා හස්තියාගේ සමීපයෙන්ම අනුභව කරන්නේය. දෙදෙනම වෙන්ව වසන්ට නොහැකිවෙති. සුනඛතෙම හස්තියාගේ සොඬ ගෙණ ඔබ්නොබ කෙරෙමින් කෙළනේය. එසේ කල්හි එක් දවසක් පිටිසර වැසි එක් ග්‍රාමීය මනුෂ්‍යයෙක් ඇත්ගොච්චියට මිළදී ඒ සුනඛයා ගෙණ තමාගේ ගමට ගියේය. එතැන් පටන් ඒ හස්තියා සුනඛයා නොදක්නේ ගොදුරු නොම අනුභව කරන්නේය. පැන් නොබොන්නේය. නොම නහන්නේය. ඒ කාරණය රජහට දැන්වූවාහුය. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් වහන්සේට වදාරණසේක්, "ඇවැ, පණ්ඩිතයානෙනි, දැනගණුව කවර

කාරණයකින් හඤ්ඤිරාජතෙම මේලෙස කරන්නේදැ"යි කියා යැවූසේක. බොධිසත්ත්වයන් වහන්සේ හඤ්ඤිභාලාවට ගොස් හඤ්ඤියාගේ දෙමිතස් බැව් දැන "මොහුගේ ශරීරයෙහි රෝගයක් නොපෙණෙන්නේය. මොහුගේ වතාහි කිසිකෙණකුත් හා සමග මිත්‍රසන්ථවයෙක් විය යුතුය යි ඔහු නොදක්නේ මේ තෙම ශොකයෙන් මඛනා ලද්දේවනැ"යි සිතා හඤ්ඤාවාඛ්‍යා අතින් විවාරණසේක් "මොහුගේ කිසිකෙණකුත් සමග විශ්වාසබවක් ඇද්දෝ? නෝ"යි විවාළසේක. "සාමීන් වහන්ස, එක් සුනඛයකු හා එක්ව බලවත් මිත්‍රකමක් ඇත්තේය"යි කීය. දැන් ඒ සුනඛයා කොයිදැ"යි විවාළසේක. "එක් මනුෂ්‍ය යකු විසින් නෙණ යන ලද්දේය." "ඔහු වාසයකරණ තැන් දන්නේදැ?"යි කීසේක. "සාමීන්වහන්ස නොදනිමි"යි කීය.

බොධිසත්ත්වයන් වහන්සේ රජුගේ සමීපයට ගොස් "මහරජ්ජුරුවන් වහන්ස, හඤ්ඤියාට කියි ආබාධයක් නැත්තේය. ඔහට වතාහි එක් සුනඛයකු හා සමග බලවත් විශ්වාසයක් වූයේය. ඒ සුනඛයා නොදක්නාවූ හඤ්ඤිරාජ තෙම භොජනය අනුභව නොකෙරෙයි සිතමි"යි කියා මෙසේ කීසේක. "මහ රජ, ඔතට පළමු කොට දෙන කටුක භෙෂජ්‍යයෙන් යුක්ත පිඬු ගන්නට නොපොහොසත, පිඬුකොට දෙන භොජනය ගන්නට නොපොහොසත, කුශ තාණද අනුනව කරන්ට නොද පොහොසත, නහන වේලෙහි ශරීරාවනීනය කරන්ටද නොපොහොසත, නිරන්තර දර්‍ශනය හේතුකොට ගෙණ හඤ්ඤිරාජ තෙම සුනඛයා කෙරෙහි සෙනහ කෙළේය යි සිතමි"යි කීසේක.

මෙසේ යමක් යමක් ඒ හඤ්ඤිරාජයා කරන්නට නොනැකිද? ඒ සියල් ලම රජනට දැන්වූසේක. රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේගේ වචනය අසා "පණ්ඩිතයන් වහන්ස, දැන් කවරක් කටයුතුදැ"යි විවාළසේක. "අපගේ මගුලැතාගේ ගනළු සුනඛතෙම එක් ගම්වැසි මනුෂ්‍යයෙක් ගෙණ ගියේය. යමෙක් හුගේ ගෙයි ඒ සුනඛයා දුටුවොත් ඔහට මෙබඳු දඩය යි කියා බෙර ලව මන රජ"යි කීසේක. රජතෙම එලෙස කරවූයේය. ඒ ප්‍රවෘත්තිය අසා ඒ පුරුෂ තෙම සුනඛයා හැරියේය, සුනඛතෙම ශීඝ්‍රයෙන් ගොස් හඤ්ඤියාගේ සමීපයට ම ගියේය. හඤ්ඤිතෙම සුනඛයා සොඬින් ගෙණ කුම්භඝ්ඨලයෙහි තබා හඬාවැලප පියා කුම්භඝ්ඨලයෙන් බස්වා ඔහු විසින් ආහාරය අනුභව කළ කල්හි පසුව තෙමේ අනුභව කෙළේය. "තිරශ්චීනයාගේ අභිප්‍රාය දන්නේය"යි කියා රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේට මහත් ඒශ්වර්‍යය දුන්සේක.

ශාස්තෘන්වහන්සේ වදාරණසේක් "මහණෙනි, මොහු දෙදෙන විශ්වාස වූවෝ දැන් මතු නොවෙති, පෙරත් විශ්වාසවූවාහුය"යි කියා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා චතුඃසත්‍යදේශනාව වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ අහිණ්හ ජාතකය නිමවා වදාළසේක.

(මේ චතුඃසත්‍ය දෙශනාව කිම සියලු ජාතකවලම ඇත්තේය. අපි එනාහි චතුඃසත්‍යය යම් තැනෙක්හි ආනිසංස පෙණේද, එතැන්හි දක්වමු.)
"එසමයෙහි සුනඛතෙම දැන් මේ උපාසකවූයේය. හඤ්ඤිතෙම දැන් මේ මහල් ලක සථවිර වූයේය. පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 28 නන්දිවිශාල ජාතකය

තවද එක් සමයෙක්හි අසමඛුර වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක් ෂඩ්වර්ගික භික්ෂූන්ගේ පරුෂ තෙප්ලක් අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි වනාහි ෂඩ්වර්ගික භික්ෂූහු ඛර කර්කශ ප්‍රියශීලී භික්ෂූන්ට ගර්හාකෙරෙති, අතිවචනශරප්‍රහාර දෙති, දහවිධ ආක්‍රෝශ විසූ වෙන් ආක්‍රෝශ කෙරෙති. භික්ෂූන්වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට දැන්වූවාහුය. භාග්‍යවතුන් වහන්සේ ෂඩ්වර්ගික භික්ෂූන් කැඳවා ගෙන්වා "මහණෙනි, ඛර කර්කශ තේ සැබෑද"යි විචාරා වදාරා "භාග්‍යවතුන් වහන්ස, සැබෑව"යි දැන්වූ කල්හි ගර්හා කොට "මහණෙනි, පරුෂවචනය නම් තිරශ්චීන ගතියන්ටද අමතොඳ වන්නේය. පූර්වයෙහිද එක් තිරශ්චීනගත සත්ත්වයෙක් තමාට පරුෂවචනයෙන් කියන්නහු දසදහසකින් පරාජය කෙළේය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යි වගිය දවස ගන්ධාර රට තක්සලා නුවර ගන්ධාර නම් රජෙක් රාජ්‍යය කෙරෙයි. එකල්හි අප මහබෝධිසත්ත්වයන් වහන්සේ ගව ජන්මයෙහි උපන් සේක. ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයන් වහන්සේ ලදරු වසුපැවිව් කාලයෙහි ම එක් බ්‍රාහ්මණයෙක් ගවයන් දෙන්නාවූ දැයකයන්ගේ සමීපයට ගොස් ගවයෙක් ලැබගෙණ නන්දිවිශාල යයි කියා තමන්ට තොට පුත්‍රස්ථානාන්තර යෙහි තබා බොහෝ ඕනව ප්‍රියවෙමින් කැඳ බත් ආදිය දී පොෂ්‍යය කරන්නේය. අප මහා බෝධිසත්ත්වයන් වහන්සේ වැඩි වයසට පැමිණියේක්, "මම මේ බ්‍රාහ්මණයා විසින් දුකසේ රක්ෂාකරණ ලද්දෙමි, මා හා සමඟ සියලු ජම්බුද්වීපයෙහි මා සදෘශව උපුලන අනික් ගවයෙක් නම් නැත්තේය. එහෙයින් මම තමාගේ බලය දක්වා බ්‍රාහ්මණයාහට මා රක්ෂාකළාට මිල දුන්නෙමි වී නම් ඉතා යෙහෙකැ"යි සිතූසේක.

මෙසේ සිතා බෝධිසත්ත්වයන් වහන්සේ එක් දවසක් බ්‍රාහ්මණයාට කියතසේක් "බ්‍රාහ්මණය, යව, ගවයන් ධන කොට ඇති එක් සිවාන කෙණෙකුන් කරා එළඹ මාගේ ගව තෙම එකව බඳනාලද ගැල් සියයක් අදනේය යි කියා දහසකින් පරදු තබව"යි කියේය. ඒ බ්‍රාහ්මණ තෙම සිවානන්ගේ සමීපයට ගොස් කථාවක් පහළ කෙළේය. "මේ නුවර කවරක්හුගේ ගවයෝ කාය ශක්තියෙන් යුක්තද"යි කියේය. ඉක්බිත්තෙන් ඕනව සිටු පුත්‍ර තෙම කියතුයේ "අසවල්හුගේය, අසවල්හුගේ ය"යි කියා "සියලු නුවර අපගේ ගොන් හා සදෘශ ගවයෝ නැත්තෝය"යි කියේය. බ්‍රාහ්මණ තෙම කියතුයේ "මාගේ එකාබද්ධ කොට බඳනා ලද ගැල් සියයක් අදනව සමර්ථ එක් ගොණෙක් ඇත්තේ ය"යි කියේය. සිවානෝ කියන්නෝ "බ්‍රාහ්මණය, එබදු ගොණෙක් කොහින් දැ"යි කිහ. බ්‍රාහ්මණ තෙම "මාගේ හෙයි ඇත්තේ ය"යි කියේය. "එසේ වී නම් පරදු තබව"යි කිහ. "යහපත, කරන්නෙමි" කියා දහසකින් පරදු කෙළේය. බ්‍රාහ්මණතෙම් ගැල් සියයක් වැලි කැටකැබිලිති ගළින්ම පුරවා පිළිවෙළින් තබා සියල්ල අකුර බඳින යොතින් එකට බැඳ නන්දිවිශාල නම් ගවයා නහවා සුවඳින් පසඟුල් දී ග්‍රීවයෙහි මල් පලඳවා පළමු

ගැල් ධුරයෙහි හුදකලාව ම යොදු තෙමේ ඇල්හි හිඳ කැවිට ඔසවාගෙණ "අදුව, කුළු, උසුලව, කුළ"යි කියේය. බොධිසත්ත්වයන් වහන්සේ "මේ තෙමේ අකුළුවූ මට කුළුවචනයෙන් කියන්නේය"යි කියා සතරපය ටැඹක් මෙන් නිශ්චල කොට සිටිසේක. සිවානෝ එකෙණෙහි ම බ්‍රාහ්මණයාගෙන් වසතු දහස ගෙන්වාගත්තෝය. බ්‍රාහ්මණ තෙමේ දහසෙකින් පැරදුනේය. ගවයා මුදු හැර ගෙට ගොස් ශොකයෙන් මඩනාලදුව හොත්තේය. නන්දිවිශාල නම් ගොණා තණ කා ආයේ ශෝකයෙන් මඩනාලද බ්‍රාහ්මණයා දැක සමීපයට එළඹ 'බ්‍රාහ්මණය, කවර හෙයකින් නිද්‍රාව කරන්නෙහිදැ"යි කියේය. "දහස කින් පැරදුනාවූ මට නිදි කොහින්දැ"යි කිය. "බ්‍රාහ්මණය, මෙපමණ කලක් තොපගේ ගෙයි වසන්නාවූ මා විසින් කිසි භාජනයක් බිඳපීමක් හෝ කිසිවක් මැඩ මිරිකීමක් හෝ නුසුදුසු තැනෙක්හි මළමූත්‍ර බැහීමක් හෝ කලවිරිදැ"යි කියේය "පුත්‍රය, එවැනි දෙයක් නැත්තේය"යි කිය. "එසේ කල්හි මට කවර කාරණයකින් කුළුවාදයෙන් කියෙහිද? මම තොපගේ ඥෂ වන්නේය. මාගේ ඥෂයෙක් නැත්තේය. යව, ඒ සිටාණන් හා සමග වසතු දෙදහසකින් පරදු කොට තබව, හුදෙක් අකුළුවූ මට කුළුවාදයෙන් කථා නොකරව"යි කියේය.

බ්‍රාහ්මණ තෙම මහාබොධිසත්ත්වයන් වහන්සේගේ වචනය අසා ගොස් වසතු දෙදහසකින් ඇපකොට තබා යට කියනලද ක්‍රමයෙන්ම ගැල් සියය එකාබඬ කොට බැඳ නන්දිවිශාල නම් වෘෂභයා සරහා පළමු ඇල්වියෙහි යෙදුයේය. නෙසේ යෙදුයේද? යත්, විය ගැලෙහි නිශ්චල කොට බැඳ එක් කෙළවරක නන්දිවිශාල නම් වෘෂභයා යොදු, එක් කෙළවරක් ඇල්යොතින් වෙළා විය කෙළවර අකුරක ඇණමුල නිසා මුඩුරුක් දණ්ඩක් දී ඒ යොතින් නිශ්චල කොට බැඳ තැබුයේය. එසේ කළ කල්හි විය එයට හෝ මෙයට හෝ නොවන්නේය. එක නොණෙකු විසින් ඇදගන්නට හැකි වන්නේය.

ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණ තෙම ගැලෙහි හිඳ නන්දිවිශාල නම් වෘෂභයාගේ පිට පිරිමැද "මාගේ පුත්‍රවූ යහපත් වෘෂභය, මේ ගැල් යෙහෙන් අදුව, උසුලව, යහපතැ"යි කිය. බොධිසත්ත්වයන් වහන්සේ එකාබඬව බඳනාලද ඇල් සියය එකවේගයෙන්ම ඇද පසුව සිටි ගැල අභිමුඛයෙහි ගැල පිනිවිතැන තිබුන. ගව ධනය කොට ඇති සිවානෝ පැරද බ්‍රාහ්මණයාට වසතු දෙදහසක් දුන්නෝය. අනිකුත් මනුෂ්‍යයෝද බොධිසත්ත්වයන් වහන්සේට බොහෝ වසතු දුන්නාහුය. ඒ සියලු වසතුව බ්‍රාහ්මණයාහටම වූයේය. මෙසේ බෝධිසත්ත්වයන් වහන්සේ නිසා බොහෝ වසතු ලද්දේය.

සථිඥයන් වහන්සේ වදුරණ සේක් "මහණෙනි, පරුෂ වචනය නම් කිසිවක් හවත් මනාප නොවන්නේය"යි ෂඩ්වර්ගික භික්ෂූන්ව ගර්හා කොට ශික්ෂාපද පණවා මෙසේ වදාළසේක. අන්‍යයා හා සමග කථා කරන්නේ චතුර්ථෝෂ විරහිතවූ මිහිරිවූ මවසිළුවූ මොළොක්වූ ප්‍රියවචනයෙන්ම බිණිය යුත්තේය. කිසිකලෙක්හිත් අමනොඥ වචනය නොබිණිය යුත්තේය. කුමක් හෙයින්ද? යත්, නන්දිවිශාල නම් වෘෂභ තෙම අමනාප වචන කියන්නහුගේ බර නොඇද පසුව මනාපවූ ප්‍රියවචනය කියන්නාවූ බ්‍රාහ්මණයාගේ ගරු භාරය ඇද්දේය"යි මෙසේ සථිඥයන් වහන්සේ "මනොඥ වචනය බිණිය යුතුය"යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ නන්දිවිශාල ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙකී බ්‍රාහ්මණ තෙම දැන් මේ කාලයෙනි ආනන්දස්ථවිර වූයේය. නන්දිවිශාල නම් වාෂභව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 29 කණ්හ ජාතකය

එවද එක් සමයෙක්හි තිලෝගුරු බුදු රජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක්, යමක ප්‍රාතිහාර්‍යය් අරභයා මේ ජාතකය වදාළසේක. සර්‍වඥයන් වහන්සේ යමකප්‍රාතිහාර්‍යය් කොට දිව්‍යලෝකයෙහි වැස මහපවුරුණු දිනයෙහි සක්‍රස්පුර දොරට බැස මහත්වූ පිරිවර් සේත වනයට වන් කල්හි භික්‍ෂූන් වහන්සේ ධර්මසභා මණ්ඩපයෙහි රැස්ව හිඳ "ඇවැත්නි, තථාගත නම් වූ සර්‍වඥයන් වහන්සේ නම් අසමධුර සේක. සර්‍වඥයන් වහන්සේ විසින් උසුලන ලද්දාවූ ධුරය උසුලන්ට සමර්‍ථවූ අන්කිසි සත්ත්‍වයෙක් නම් නැත්තේය. මකඛලි ගොසාලාදීවූ ශාස්තෘවරුහු සදෙන අපි යමක ප්‍රාතිහාර්‍යය් කරම්හ. අපි යමක ප්‍රාතිහාර්‍යය් කරම්හ"යි කියා එක ප්‍රාතිහාර්‍යයකුත් නොකළෝය. සර්‍වඥයන්වහන්සේ වූකලී ඉතා ආශ්චර්‍යය්වන්සේකැ"යි බුදුන්ගේ ගුණ කියා කියා උන්සේක.

එකල්හි සර්‍වඥයන් වහන්සේ අවුත් "මහණෙනි, දැන් කවර නම් කථාව කින් යුක්තව උනුදැ"යි විචාරා වදාළසේක. "සවාමීනි, අන් කථාවකින් යුකතව උනුමෝ නොවම්හ. නුඹවහන්සේගේ මෙබඳු ගුණ කථාව කියා කියා උනුම්හ"යි කී කල්හි "මහණෙනි, දැන් ඉසිළු ධුරයක් කවරෙක් උසුලාද? පෙර තිරිසන් යොනියෙහි උපන්නාවූ මම මා හා සම ධුරය ඇති කිසිවක්හු නොලද්දෙම් වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යි වඟිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් ගවයෝනියෙහි උපන්නාහුය. ඉක්බිත්තෙන් ඔහු බාල අවස්ථාවෙහිම ඔහුගේ සවාමිදරුවෝ එක් වැඩවූ සත්‍රියකගේ ගෙයි වැස නවාතැන් කුලියට පිරිසිඳ දුන්නාහුය. ඒ වැඩ සත්‍රී මහබෝසතාණන් කැඳ බත් ආදීන් පොෂ්‍යය කරන්නී පුත් තනතුරෙහි තබා වැඩුවය. ඒ තෙමේ ආර්යකකාළ යයි මේ නම්න් ප්‍රසිද්ධව වැඩිවිය පැමිණියේය. අඤ්ඤාතවණ්ණීව ගම ගොන් හා කැටිව ඇවිදින්නේය. ශීලාචාරයෙන් යුක්තය. ගම් දරුවෝ ඇඟත් කරත් එල්ලීගෙණ ඇවිදිති. වාලධියත් අල්වාගෙණ ඇවිදිති, පිටට නැගීත් ඇවිදිති, ඒ වෘෂභයා එක් දවසක් මෙසේ සිතුයේය. "මාගේ මැනියෝ දුකසිතයෝය, මා පුත් තනතුරෙහි තබා වඩා දුකසේ පොෂ්‍යය කළෝය. එසේ හෙයින් මම බැළමෙහෙකාට මුන් දුප්පත් කම්ත් මිදුයේවී නම් යහපත් වන්නේය"යි සිතා එතැන් පටන් බැළමෙහෙයක් සොයමින් ඇවිදින්නේය.

ඉක්බිත්තෙන් එක්දවසක් සාර්ථවාහකයක දුත්‍රයෙක් පන්සියයක් හැල් හා සමග විසමවූ ගැඹුරු තොටකට බවුයේය, ඔහුගේ ගොන් හැල් ගොඩ ගන්ට අසමර්ථයෝය. පන්සියයක් හැල් ගොනා විසදමූ පරම්පරාගෙන්

යොදන ලද්දහු එක ගැලකුත් ගොඩනගාගත නුහුනුවිය. බෝධිසත්ත්වයෝද නොන් හා සමග ඒ ඒ තැන්හි ඇවිදිති. සාත්තුනායක පුත්‍රයාද ගොන් ලකුණු දත්තේය. එතෙම "මේ ගෙරින් අතුරෙහි මේ ගැල් ගොඩගන්ට සමර්ථවූ වෘෂභජාතියෙක් ඇද්ද්‍යෙහෝ"යි පරීක්ෂා කරන්නේ බෝධිසත්ත්වයන් දැක "මේ ආජානීයයා මාගේ ගැල් ගොඩගන්ට සමර්ථ වන්නේය, මොහුගේ සහෝදරයෝ කවුරුදැ"යි ගොපල්ලන් අතින් විචාළේය. තවද "පින්වත්නි, මොහුගේ සහෝදරයෝ කවුරුද? මම මොහු ගැළ යොදා ගැල් ගොඩනැගූ කල්හි මිළ දෙමි"යි කීය.

එකල්හි ගොපොල්ලා කියන්නේ "අල්වෘෂණ යොදගත මැන, මෙතන මොහුගේ සහෝදරයෙකුත් නැත"යි කීය. ඒ සාත්තුනායකයා එබස් අසා ඔහු ලඟට නැඟැලනුවක් බැඳ අදනේ සිටිතෙනින් සොළවන්ට අසමර්ථ විය. බෝධිසත්ත්වයෝ එතැන්හි 'ගැල් ඇදි කුලී කී කල්හි යෙමි" සිතා නොගියාහුය. සාත්තුනායක පුත්‍ර ඔහුගේ අභිප්‍රාය දැන යාචිඤ්ඤා කරන්නේ "පන්සියයක් ගැල් නොප විසින් ගොඩනැගූ කල්හි එකි එකි ගැලකට කහවණු දෙකක් කුලිකොට දහසක් දෙමි"යි කීය. එකල්හි බෝධිසත්ත්වයෝ තුමූ ම ගියාහුය. ගැල් සමීපයට ගිය බෝධිසත්ත්වයන් දැක වෘෂභයා ගැල්හි යෙදූ යේය. එකල්හි බෝධිසත්ත්වයෝ එක වේගයෙන්ම ඔසවා ගොඩනැගුවාහුය. මෙම ක්‍රමයෙන් සියලු පන්සියයක් ගැල්ම ගොඩනැගුය. සාත්තුනායක පුත්‍ර තෙම එකි එකී ගැලකට එකි එකී කහවණුවක් බැගින් පන්සියයක් කහවණු පොදිබැඳ ඒ මහබෝසතාණන් කර බැන්දේය ඒ බලා බෝධිසත්ත්වයෝ "මේ තෙම මට දෙමි"යි පළමු නියම කළ කුලී නොදෙන්නේය. එසේනෙයින් දැන් මොහු යාඥාදෙමි'යි ගොස් ඇමට පෙරතුව ඉදිරියේ ගැල අසුරාගෙණ සිටියෙය. ඉවත්කරනට උත්සාහ කරන්නාහු ඉවත්කොට නුහුනුවාහුය.

එවේලෙහි සාත්තුනායක පුත්‍ර සිතන්නේ "මේ තෙම තමාට කුලී මිදි නියාව දතවනැ"යි සිතා එක් වසුන්‍රයක දහසින් පොදියක් බැඳ "මෙ තෙම තොප ගැල නැගූ කුලියැ"යි කියා කර බැඳ එල්වූයේය. මහබෝසතාණෝ දහසින් බැඳි පියල්ල ගෙණ මැනියන් සමීපයට ගියාහ. ගම්දරුවෝ ඒ දැක "ආර්යකකාළයන්ගේ කර කිමෙක්දැ"යි බෝධිසත්ත්වයන් සමීපයට එන්නාහුය. බෝධිසත්ත්වයෝ ඒ කුඩා කොල්ලන් පසුපස්සෙහි දිව ලුහුබඳවා යවා මැනියන් සමීපයට ගියේය. පන්සියයක් ගැල් ගොඩනැගූ බැවින් ඇස් රතුව මිරිකී ගියාවූ සවරූප ඇතිවූය වෘඩ උපාසිකාවෝ මහබෝසතාණන් කර දහසින් බඳ පියල්ල දැක "මේ මුන් විසින් කොයිදී ලබන ලදදැ"යි ගොපලු දරුවන් අතින් විචාරා එපවත් අසා "දරුව, කිමෙක්ද? මම නොප ලත් කුලියෙන් ජීවත්වනු කැමැත්තෙමිද? කුමක් සිතා තෙපි මේබඳුවූ දුක් අනුභව කළාහුදැ"යි කියා මහබෝසතාණන් උණුපැනින් නාවා සියලඟ තෙල් ගල්වා පැන් පොවා සප්පාය භෝජනය අනුභව කරවා සන්සිඳුණය කොට ජීවිත පර්‍යන්තයෙහි බෝධිසත්ත්වයන් හා සමග කම්වූ පරිදීදෙන් මිය පරලොව ගියෝය. බුදුරජාණන් වහන්සේ "මහණෙනි, සම්බුදුන් වහන්සේ අසමධුර වූසේක් දැන් මතු නොවෙයි පෙරත් අසමධුර වූවෝ ම වේදැ"යි වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ කණ්හ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි වෘද්ධ සත්‍රී නම් මේ උත්පලවර්ණා මහාසාවිරාය, ආයුෂ්මත් කාල වෘෂභයා නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 30 මුනික ජාතකය

එවද එක් සමයෙක්හි මොහාන්ධකාරය හඳුන කළාවූ තිලෝගුරු බුදු රජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් **චුල්ල කුමාරිකා පලෝභනයක්** අරභයා මේ ජාතකය වදාළසේක. සවීඥයන් වහන්සේ "සැබෑද? මහණ, තෝ සවීඥ ශාසනයෙහි උකටලී වූයෙහිදැ"යි භික්ෂූනු අතින් විචාරා වදාළසේක.

"එසේය, ස්වාමිනි, කිසල්හි කුමක්නිසා දැ"යි විචාරා "චුල්ලකුමාරිකා පලෝභනයක් නිසාය ස්වාමිනි," කිකල්හි බුදුරජාණන්වහන්සේ වදාරණසේක් "මහණ තට මෝතොමෝ අනර්ථකාරිය, පෙරත් මැගේ විවාහ මගුලේදී ජීවිත විනාශයට පැමිණ මහජනයාට මාළුවට පැමිණියෙහි වේදැ"යි ඉකුත්වත් දක්වා වදාළසේක.

යි වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුත් රාජ්‍යය කරණ කල්හි බෝධිසත්ත්වයෝ එක් ගෘහයෙක එක් කෙලෙඹි පුත්‍රයකුගේ ගෙයි ගවයොනියෙහි උපන්නාහුය. බෝධිසත්ත්වයන්ට **මහා ලෝහිතගවයා** යි නම් තුබුවාහුය. මලනුවන්ට **චුල්ලලෝහිතගවයා** යි නම් තුබුන. ඔවුන් දෙබෑයන් නිසාම ගෙයි කම්මුනත සමාඛව පිරිමැසෙන්නේය. ඒ කුලෙහි එක් කුමාරිකාවක් ඇත්තීය. ඒ කුමාරිකාව නුවර වැසි කුලපුත්‍ර යෙක් තමාගේ පුත්‍රයාට විවාළේය. ඇගේ දෙමව්පියෝ කුමාරිකාවගේ විවාහ කාලයෙහි ආවාවූ අමුත්තන්ට අවුළුවන්නේය යි සිතා කැඳ බත් ලා මුනික නම් උඟරකු පොෂ්‍යය කළාහුය. ඔහු දැක චුල්ලලෝහිතයෝ බැන ගොණා නත්ව කියන්නෝ "මේ කුලයෙහි කම්මුනධුරාභිවර්ධනය වන්නේ අප දෙබෑයන් නිසාම වර්ධනයවෙයි. මේ ගෙයි ඇත්තෝ වූකලී අප දෙදෙනාට තණ හා පිදුරු ලති. මේ සූකරයා කැඳ බතින් නිතිපතාම පොෂ්‍යය ලබයි. කවර කාරණයෙන් මේ උඟරා කැඳ බත් ලබන්නේදැ"යි විචාළෝය.

එකල්හි බැන කියන්නේ "මල, චුල්ලලෝහිතයෙනි, තොපි මොහුගේ භෝජනයට ආලය නොකරවු, මේ උඟරා මරණ භෝජනය අනුභව කෙරෙයි. මේ කුමාරිකාවගේ විවාහ කාලයෙහි ආවාවූ අමුත්තන්ට අවුළුවන්නේය යි මේ මනුෂ්‍යයෝ මේ උඟරාපොෂ්‍යය නෙරෙති. මෙයින් කිප දවසක් ගියකල ඒ මනුෂ්‍යයෝ එති. එකල්හි මේ උඟරා දෙකකුල් අල්වා ගෙණ අදනාහු යට ඇදින් මැත්කොට මරා අමුත්තන්ට මාළු පිසන්ට මැරීම දක්නා වේදැ"යි කිවුය.

ඉක්බිත්තෙන් නොබෝ දවසකින් ඒ මනුෂ්‍යයෝ ආවාහුය. ඔවුන් දැක මුනික නම් උඟරා මරා අනෙකප්‍රකාරයෙන් මාළු පිසූය. බෝධිසත්ත්වයෝ චුල්ල ලෝහිතයන්ට කියන්නෝ "දරුව, තොප විසින් මුනිකයා දක්නා ලද්දේදැ"යි විචාළෝය. "දක්නාලද පින්වතුන් වහන්සැ"යි කී කල්හි "උඟරාගේ භෝජන

යෙහි ඵල කවරේද? ඔහුගේ බතට සියක් ගුණයෙන් දහස් ගුණයෙන් අපට තණ හා පිදුරු අනුභව කිරීම උතුම් වන්නේය. නිරවද්‍යය. දීඝායුෂ්ක ලක්ෂණ යෙකැ"යි කිවුය.

බුදුරජාණන් වහන්සේ "මහණ, තෝ පෙර මේ කුමාරිකාව නිසා ජීවිත ක්ෂයට පැමිණ මහජනයාට අවුළු බවට පැමිණියෙහි වේදැ"යි මේ ධර්ම දෙශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍ය ධර්මදෙශකාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් ඵලයෙහි පිහිටියේය. සම්බුදුයන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ මුනික ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මුනික සූකරයා තම් මේ උකටලී මහණය, එසමයෙහි කුමාරිකාව තම් මේ ථුල්ලකුමාරිකාය, චුල්ලලෝහිත ගොණුනෝ තම් ආනන්දස්ථවිරයෝය, මහාලෝහිත ගොණුනෝ තම් තිලෝගුරු සම්මාසම් බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 31 කුලාවක ජාතකය

තවද එක් සමයෙක්හි ධර්මාධිපතිවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් පැන් නොපෙරා වැළඳූ එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

සැමැත්තුවර වාසි යහළුවූ භික්ෂූනු දෙදෙනෙක් දඟව්වකට ගොස් එක් ඵාසු තෙතෙක අදහස්වූ පරිද්දෙන් වැස සම්බුදුයන් වහන්සේ දකුම්හ"යි තැවත එයින් නික්ම ජේතවනයට අභිමුඛව ගියසේක. ඒ දෙදෙනා වහන්සේ අතුරෙන් එක්කෙණෙකුන් වහන්සේ අත පෙරහන්කඩ ඇත, එක්කෙණෙකුන් වහන්සේට නැත. දෙදෙනා වහන්සේම එක පෙරහන්කඩකින් දියපෙරා වළඳනසේක, ඒ දෙදෙනා වහන්සේම එක් දවසක් විවාද කොට පෙරහන්කඩ ඇති භික්ෂූන් වහන්සේ අනික් තැනැත්තන් වහන්සේට පෙරහන්කඩ නොදී තමන් වහන්සේ පැන් පෙරා වැළඳුසේක. අනික් භික්ෂූන්වහන්සේ පෙරහන්කඩ නොලැබ පිපාසා ඉවසා ගත නොහී නොපෙරා පැන් වැළඳුසේක. ඒ දෙදෙනා වහන්සේම ක්‍රමයෙන් ජේතවනයට ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන්සේක. සම්බුදුයන් වහන්සේ සුවදුක් කථාකොට "කොයි සිව් අවුදැ"යි විචාළසේක. "සවාමීනි, අපි කොසොල් දනව්වෙහි එක් ගමෙක වැස එයින් නික්ම නුඹවහන්සේ දක්නා පිණිස ආම්හ"යි කීවෝය. "තෙපි දෙදෙන සමගියාදැ"යි විචාළ කල්හි පෙරහන්කඩ නැති මහණ කියන්නේ "සවාමීනි, මේ මහණ අතර මඟදී මා හා විවාදකොට පෙරහන්කඩ නුදුන්නේය"යි කියේය. අනික් මහණ කියන්නේ "සවාමීනි, මේ මහණ නොපෙරාම දැන දැන ප්‍රාණීන් සහිත ජලය වැළඳුයේ වේදැ"යි කීය.

එවේලෙහි බුදුහු "මහණ, සැබෑද? තෝ දැන දැන පණුවන් ඇති දිය පරිභොග කෙළේදැ"යි විචාළසේක. 'එසේය, සවාමීනි, මා විසින් නොපෙරා දිය වළඳන ලද්දේය"යි කීය. එබස් ඇසූ සම්බුදුයන් වහන්සේ "මහණ පෙර නුවණැත්තෝ දෙදෙව්ලොව අධිපතිව රාජ්‍යය කෙරෙමින් යුද්ධයෙන් පැරද සමුද්‍ර මස්සකයෙන් ගන්නාවූ ඵලශ්‍රේයක් නිසා ප්‍රාණවධයක් නොකරම්හ"යි

ඒසා මහත් යසස් හැර ගරුඩපොතකයන්ට ජීවිතදානය දී රථය වැලකු වෝම වේදැ''යි දදුරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

යිටගිය දවස මඟධරට රජගහනුවර මඟධ රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරන්නාහුය. එසමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ යම්සේ දැන් ශක්‍රදෙවේන්ද්‍රයෝ පූර්ව්‍යත්ම භාවයෙහි මඟධරට මවලග්‍රාමයෙහි උපන්නාහුද? එපරිද්දෙන්ම ඒ මවල ග්‍රාමයෙහි මහාසම්පත් ඇති කුලයක පුත්‍රව උපන්නාහුය. ඔවුන්ට නම් තබන දවස් මඝ කුමාරයෝය යි කියා නම් තුබූය. බොධිසත්ත්වයෝ වැඩිවිය පැමිණ මඝ මානවකයෝ යයි මෙතමින් ප්‍රසිඛවිය.

ඉක්බිත්තෙන් උන්ගේ දෙමව්පියෝ සමජාති ඇති කුලයකින් කුමාරි කාවක් ගෙණවුත් පාවාදුන්නේය. ඒ බොධිසත්ත්වයෝ දූ දරුවන් හා සමග වසිනය වෙමින් දානපතිවූහ. නිරන්තරයෙන් පඤ්චසීලය රක්‍ෂා කෙරෙති. එකල ඒ ගම ගෙවල් තිසෙක් වන්නේය. ඒ තිසක් පමණ මනුෂ්‍යයෝ එක් දවසක් ගම මඛ්‍යයෙහි සිට කම්මාන්ත කරන්නාහුය. බොධිසත්ත්වයෝ සිටි තැන පයින් වැලි පීරා කසල ඉවත් කොට ඒ ප්‍රදෙශය සිත්කළු කොට සිටියාහුය. එකල අනිකෙක් අවුත් එතැන්හි සිටියේය, බොධිසත්ත්වයෝත් අනික් තෙනක් කසල හැර සිත්කළුකොට සිටියාහුය. එතැන්හි අනිකෙක් අවුත් බොධිසත්ත්වයෝ තැවත අන්තැනක තැවත අන්තෙනකය යි සියල්ලවුන්ම සිටිතැන් සිත්කළු කොට මැතභාගයෙහි එතන මණ්ඩපයක් කරවූහ. පසුව මණ්ඩපයත් හැර ශාලාවක්කරවූහ. ඒ ශාලාවෙහි සැතපෙන්ට පෝරු අතුව පින් පැන්සලක් තැබ්බවූහ.

මැතභාගයෙහි ඒ ගම්වැස්සෝ දෙතිස් දෙනෙක් බෝධිසත්ත්වයන් හා එක්වූහ. බොධිසත්ත්වයෝ ඔවුන් තිස්දෙනාත් පංචසීලයෙහි පිහිටුවා එතැන් පටන් ඔවුන් හා සමග කුසල් කෙරෙමින් ඇවිදිති. ඔවුන් හැමදෙනත් බොධි සත්ත්වයන් හා සමග කුසල් කරන්නාහු උදෑසනම නැඟිසිට වැ පෞරෝ මොහොල් ගත් අත් ඇතිව සතරමංසන්ධි ආදියෙහි මෝලින් ගල් ඇන උදුර උදුරා පෙරලත්. රථයක් ආදියේ වැදගන්නාවූ ගල් කපා දමති. විසමතැන් සමකරති. ඒදඬු ලති. පොකුණු කණිති. ශාලාවල් කෙරෙති. දන්දෙති. සිල් රක්‍ෂාකෙරෙති. මෙසේ බොහෝසේ බොධිසත්ත්වයන්ගේ අවවාදයෙහි පිහිටා ශීලසංරක්‍ෂණය කළාහුය.

එකල්හි ඔවුන්ගේ ගම්මුදලි මෙසේ සිතීය;- ''මම පෙර මේ මනුෂ්‍යයන් රා බොන කල්හි ප්‍රාණඝාතාදිය කරණ කල්හි රා සැලකට කනවණුවක් නියා යෙන් දඩමුඩ නොමද අයපඩුරු අරගැණිම් වශයෙන් වසුලබම්. දැන්වූකලී මඝමානවකයෝ සිල් රක්වමි කියා ඔවුන් ප්‍රාණඝාතාදිය කළ නොදෙති. දැන් වතාහි උන්ලවා පන්සිල් රක්වන්නෙම් වේදැ''හි කියා කිපි රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ ''සවාමීනි, බොහෝ හොරු එක්ව ගම් පැහැරීම් ආදිය කෙරෙමින් ඇවිදිති''යි කීය. රජ්ජුරුවෝ ඔහුගේ වචනය අසා ''තෝ ගොස් ඔවුන් හැමදෙනා ගෙණව''යි කිවූය. එතෙම ගොස් සියල්ලවුන්ම බැඳ ගෙණ අවුත් ''රජ්ජුරුවන් වහන්ස, සොරුන් ඇමදෙනාම ගෙණෙනලදැ''යි රජ්ජු රුවන්ට දැන්වීය.

රජ්ජුරුවෝ ඔවුන් කළ කාරිය නොවිචාරා ශුඛ නොකවම මුන් ඇම දෙනාම ඇතුන්ලවා මඩව"යි කිවුය. ඉක්බිත්තෙන් ඒ සියල්ලවුන්ම රාජාඔහණ යෙහි වැදහෙනවා, ඇතු ගෙණවාහු, එකල්හි බොධිසත්ත්වයෝත් තමන්ගේ සියලු පෂීදට අවවාද කරන්නෝ "තොපි සියල්ල සීලයෙන් ආවර්ජනා කරව. කේලාම් කි තැනැත්තහු කෙරෙහිත් රජ්ජුරුවන් කෙරෙහිත් ඇතුන් කෙරෙ හිත් නොප නොපගේ ශරීරයෙහිත් සමකොට මෛත්‍රී කරව"යි කිවුය. ඔවුහුත් එපරිද්දෙන්ම කළානුය, ඉක්බිත්තෙන් ඔවුන් හැමදෙනාම මඩන පිණිස ඇතුන් අකුස්සෙන් කොටා ලඟට මෙහෙයාලූය. ඒ ඇත් ලඟට නොවදනේය. මහඟඩින් ගඩ ගඩා පලායන්නේය. ඒ දැක අනික් ඇතකු ගෙණවාහුය, ඔනුත් එපරිද්දෙන්ම නියේය. රජ්ජුරුවෝ ඒ ඇතුන් මිනිස්සුන් නො මඩනා බැව් දැක මොවුන් අත කිසි ඖෂධයක් වන්ට ඵවමැතව, පරීක්ෂාකරව"යි කිවුය. පරීක්ෂාකරන්නාහු නොදැක "නැත, රජ්ජුරුවන් වහන්ස"යි කිවුය, "එසේවී නම් කිසි මන්ත්‍රයක් ඇත, පරීක්ෂාකරව, නොප පිරිවත මන්ත්‍රයෙක් ඇද්ද"යි ඔවුන් අතින් විචාරව"යි කිවුය එබස් අසා රාජපුරුෂයෝ විචාළාහුය. බොධි සත්ත්වයොත් ඇතැ"යි කිවුය. රාජපුරුෂයෝ "ඔවුන් පිරිවත මන්ත්‍ර ඇතැ"යි රජ්ජුරුවන්ට දන්වූය.

රජ්ජුරුවෝ ඔවුන් හැමදෙනාම සමීපයට කැඳවා නොප, දන්නා මන්ත්‍රය කියව"යි කිවුය. බොධිසත්ත්වයෝ කියන්නෝ "රජ්ජුරුවන් වහන්ස, අනික් අපගේ මන්ත්‍රයෙක් නම් නැත්තේය, අපි නිසක් පමණ දෙන ප්‍රාණවධ නොකරමින, සොරකම් නොකරමිහ, කාමමිථ්‍යාචාර නොකරමිහ, බොරු නොකියමිහ, රා නොබොමිහ, මෛත්‍රී භාවනා කරමිහ, දන් දෙමිහ, මං සම කරමිහ, පොකුණු කරමිහ, ශාලා කරමිහ, මේ අපව මන්ත්‍රවන්නේය පිරිතුත් වන්නේය, වැඩත් වන්නේය යි කිවුය. එබස් ඇසූ රජ්ජුරුවෝ ඔවුන් කෙරෙහි පැහැද කේලාම් කි තැනැත්තහුගේ සියලු වසතුවත් ඔහු තුමූත් ඔවුන්ටම පාවාදුන්නේය. ඔහු ඇමදෙනම එතැන් පටන් කැමති පරිද්දෙන් වඩ වඩා කුශල්කරන්නාහුය. සතර මංසන්සියෙහි මහත්වූ ශාලාවක් කරමිහ යි වඩුවකු කැඳවා ශාලාවක් කරන්ට පටන්ගත්තුය. සත්‍රින් කෙරෙහි ආලය මද බැවින් ඒ ශාලාව කිරීමට සත්‍රින් සමාදන් නොකරවූය.

එසමයෙහි බොධිසත්ත්වයන්ගේ ගෙයි සුධම්මා, චිත්‍රා, නන්දා, සුජා තා යි සත්‍රීනු සතරදෙනෙක් වෙති, ඔවුන් අතුරෙන් සුධම්මාවෝ වඩුවා හා එක්ව බැනති මේ ශාලාවට මා නායක කරව"යි කියා අත්ලස් දුන්නුය. වඩුවා "යහ පතැ" ගිවිස පළමුකොටම කැණීමඩලට දණ්ඩක් නපා වියලා සැහ විත් විද කැණී මඩලකොට නිමවා කඹකින් වසා වෙලා තිබුයේය. ඉක්බිත්තෙන් ශාලාව කොට නිමවා කැණීමඩල උඹ නගන අවසථාවෙහි "අනේ අපි එකක් සිහි නොකළමිහ"යි කියා. "පින්වත, කුමක්ද"යි කී කල්හි "කැණීමඩලක් වුව මනාවේද"යි කියා. වන්නාට, අපි ගෙණයමිහ"යි කී කල්හි "දැන් කැපූ දණ්ඩ කින් කරන්ට නොපිළිවන් වන්නේය"යි පළමුකොට නපා සැස විද තුබූ කැණී මඩලක් ලදමැනව"යි කියා. "දැන් කුමක්කරමෝද"යි කී කල්හි "ඉදින් කිසි කෙණෙකුන්ගේ ගෙයි කමීනන නොට නිමවා තුබූ කැණීමඩලක් ඇත්නම් එසේවූ කැණීමඩලක් සොයව"යි කිවුය. ඔහු ඇමදෙන සොයන්නාහු සුධම්මා වන්ගේ ගෙයි තුබූ කැණීමඩල දැක මිලයට ඉල්වා නොලද්දහ. එකල සුධම්මා වන් විසින් "ඉදින් මා ඒ ශාලාවට එක්කොට ගණුනම් කැණීමඩල දෙන්නෙමි

වේදූ"යි කී කල්හි "අපි සත්‍රීන් සමාදන් කොට නොගණුම්හ"යි කිවුය. එබස් ඇසූ වඩුවා කියන්නේ "අය්‍යිණෙනි, තෙපි ඇම කුමක් කියවුද? බ්‍රහ්මලෝකය හැර සෙසු සත්‍රීන් නැති තෙනක් නම් නැත, කැණිමඩල ඇරගණුව එසේ කල්හි අපගේ කාමිනන වහා සමඟඩවන්නේහ"යි කියා. ඔහු හැමදෙන "යහපතැ"යි කියා කැණිමඩල ගෙණ ශාලාව කොට නිමවා ඉන්නා පෝරු අතුව ඒ ඒ තැන පින් පැන්සල් තබ්බවා නිරන්තරයෙන් දුගී මගී යාචකයන්ට දෙන ලෙස කැඳ බත් තැබ්බවූය.

තවද ඒ ශාලාව වටකොට පවුරක් බඳවා දොරක් ලවා පවුර ඇතුළත වැලි තබ්බවා පවුරෙ පිටත තල්පැල පන්තියක් රෝපනය කරවූය. චිත්‍රා මෙවන් ඒ ශාලාව සමීපයෙහි උයනක් කරවූය. ඒ උයන මල් පලහන්නාවුන් අසවල් ගසෙක් නැතැ සි නොකියඟැකි සියලුම ගස්ම ඇත්තේය, නානාවෝන් එතනම පොකුණක් කරවූය, ඒ පොකුණ පස්වණක් පියුමෙන් සැදින, සිත් කළුය, සුජාතාවෝ වූකලි කිසි පින්කමක් නොඅරවූය.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ මවුන්ට උපස්ථාන කිරීමය, පියන්ව උපස්ථාන කිරීමය, කුලදෙටුවන්ට උපස්ථාන කිරීමය, බොරු නොකීමය, පරුෂ වචන නොකීමය, කේලාම් නොකීමය, මසුරුමල දුරුකිරීමය සි යන සපතවිඩවූ ව්‍රත සමාදානයන් පුරා :-

"මාතාපෙතනි භරං ජනතූ-කුලෙජේට්ඨාපචායිනං
සණහං සඛිල සම්භාසං-පෙසුණෙය්‍යප්පහායිනං
මච්ඡරවිනයෙ යුතතං-සවවං කොඛාභිභූ නරං
තං වෙ දෙවා තාවතිංසා-ආහු සපපුරිසෝ ඉති."

මෙසේ ප්‍රශංසා කටයුතු බවට පැමිණ ජීවිතානන්තයෙහි මහාස් තවිතිසා දිව්‍යලෝකයෙහි ශක්‍රදෙවෙන්ද්‍රව උපන්නාහුය. බෝධිසත්වයන්ගේ සහාය මනුෂ්‍යයෝද ඒ දිව්‍යලෝකයෙහි උපන්නාහුය.

එකල තවිතිසා භවනයෙහි අසුරයෝ වාසය කෙරෙති. ශක්‍රදෙවේන්ද්‍රයෝ "අපට අසාධාරණ රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැ"යි අසුරයන් දිව්‍යසුරාව පොවා මත්වූවන් දෙකකුල ගන්වා මහමෙර පන්ලේ එලුය, ඔහු ඇමදෙන අසුරභවනයට පැමිණියෝය. අසුරභවනය නම් මහමේරයට තවිතිසා දිව්‍යලෝකයෙහි ශක්‍රයපුරය මෙන් දසදහසක් යොදුන් පමණ තැන් ඇත්තේය. එහි දෙවියන්ගේ පරසතුරුකා මෙන් චිත්‍රපාටලී නම් කල්පසථායී වෘක්ෂයක් ඇත. ඒ අසුරයෝ චිත්‍රපාටලී වෘක්ෂය මල් පිපීගිය කල්හි මේ අපගේ දිව්‍යලෝකය නොවෙයි දිව්‍යලෝකයෙහි පරසතුමල් පිපෙන්නේය, එසේහෙයින් මේ දිව්‍ය ලෝකය නොවෙයි, දනිකි. එකල්හි ඔහු ජරා ශක්‍රයා අප සුරාවෙන් මත්කොට මහාසමුද්‍රයට දම්මා අපගේ දිව්‍යලෝකය ගත. එසේ හෙයින් "අපි ඔහු හා සමග යුඬකොට අපගේ දිව්‍යපුරය ගණුම්හ"යි වැඩක් ඔස්සේ නැඟෙන්කාවූ කුහුඹුවන් මෙන් මහමෙර ඔස්සේ වවින් නැංගාහුය. එකල්හි ශක්‍රයෝ අසුරයන් විසින් පරදවනලද්දාහු යෙල සියයක් යොදුන් පමණ ඇති වෛජයන්ත රථයට පැන නැඟී දක්ෂිණ සමුද්‍රයාගේ මතු මත්තෙන් යන්ට පටන් ගත්ත

හුය. එකල්හි ඒ රථය මුහුදු පිටින් වේගයෙන් යන්නේ කොළ ඉඹුල් වනයට පැමිණියේය. ඒ ශක්‍රයන් යන්නාවූ මාගීයෙහි ඉඹුල්වනය තල්වනයක පතු වැගිරෙන කලක් මෙන් කැඩී කැඩී මුහුදුපිට වැගිරෙන්නේය. ගරුඩපෝත කයෝ මුහුදු පිට පෙරළෙමින් මහඟඩින් හැඹුවහුය.

ඒ, අසා ශක්‍රයෝ මාතලී නම් රථාචාර්‍යයා අතින් විචාරන්නේ "සඛද, මාතලිය, ගරුඩ පැටවුන් අඩන අඩ ඇසෙන්නේය, මේ කුමන ශබ්දයක්ද"යි විචාළේය. "සවාමීනි, නුඹවහන්සේගේ රථවේගයෙන් ඉඹුල්වනය කැඩී වැගිරෙන හෙයින් ගරුඩ පෝතකයෝ මරණ භයින් තැතිගෙණ එකකොලහල කොට හඬති"යි කීය. එබස් ඇසූ මහබෝසතාණෝ කියන්නෝ "සඛද මාතලිය අප නිසා මොහු පීඩාවට නො පැමිණෙත්වා"යි අපි ඵෙශ්චයෙන් තිසා ප්‍රාණවධයක් නොකරම්හ, මොවුන් නිසා අපි ජීවිතය පරිත්‍යාග කොට අසුර යන්ට ජය දෙම්හ, මාතලිය, රථය නවත්වව"යි කිවුය. එබස් අසා මාතලී නම් දිව්‍යරථාචාර්‍යයා රථය වලකා අන්‍ය මාර්ගයකින් දිව්‍යලෝකයට අභිමුඛ කෙළේය.

අසුරයෝ වනාහි ඒ රථය කරකැවුනා දැක "ඒකාන්තයෙන් අන් සක් වළකින් ශක්‍රයෝ ආවාහුය. නැවත බලයක් ලදින් රථය වැලැක්කේවිනැ"යි මරණ භයින් භයපත්ව පලා ගොස් අසුරභවනයට වන්නාහුය. ශක්‍රයෝත් දිව්‍ය ලෝකයට ගොස් දෙදෙව්ලොව දෙවියන් පිරිවරණලදුව නුවර මධ්‍යයෙහි සිටියේය. එකෙණහි පොළොව පලාගෙණ දහසක් යොදුන් උස ඇති සූවජයන්ත ප්‍රාසාදය පැන්නැංගේය. ජයගෙණ සිටි පසු පැනනැගි බැවින් වෛජයන්තය යි කියා එම ප්‍රාසාදයට නම් විය. ඉක්බිත්තෙන් ශක්‍රදෙවෙන්ද්‍රයෝ නැවත අසුරයන් නොඑන පිණිස පස්තෙනක රැකවල් ලැවුය, මහාමේරු පර්වතයාගේ ප්‍රථවාලින්දයෙහි නාගයන් සිටුවුය, ත්‍රිතීයාලින්දයෙහි ගරුඩයන් සිටුවුය, තෘතීයාලින්දයෙහි දානව රාක්ෂසයන් සිටුවුය, චතුර්ථාලින්දයෙහි යක්ෂයන් සිටුවුය, පඤ්චමාලින්දයෙහි සතරවරම් මහරජදරුවන් සිටුවුය, මෙසේ පඤ්චස්ථානයක ආරක්ෂාව තබා ශක්‍රදෙවෙන්ද්‍රයෝ දිව්‍යසම්පත් අනුභව කරන්නාහුය.

එකල සුධර්මාවෝ මනුෂ්‍යලෝකයෙන් චුතව අවුත් ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව උපන්නාහුය, කැණිමඩල දුන් කුශලයෙන් ඒ සුධර්මා වන්ට පන්සියයක් යොදුන් උස ඇති සුධර්මා නම් මාණික්‍ය සභාවක් පහළවිය. ඒ දිව්‍ය සභාවෙහි ධවලච්ඡත්‍රාසනයට යොදුනක් පමණ සවණ්ටපයත්ඛකයක හිද ශක්‍රදෙවෙන්ද්‍රයෝ දිව්‍යමනුෂ්‍යයන්ගේ කර්‍යකාර්‍යයි විචාරන්නාහුය. චිත්‍රාවෝත් චුතව ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව උපන්නාහුය, උපන කරවූ කුශලයෙන් ඔවුන්ට චිත්‍රා නම් උයනෙක් පහළවිය. නන්දාවෝත් චුතව අවුත් ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන්ටම පාදපරිචාරිකාව උපන්නාහුය, පොකුණකැණ වූ කුශලයෙන් උන්ට නන්දා නම් පුෂ්කරිණියක් පහළවිය. සුජාතාවෝ වූකලී කුශලයක් නොකළ බැවින් එක්වනයෙක කඳුරැළියෙහි කෙකිණියක්ව උපන්නාහුය, ශක්‍රදෙවෙන්ද්‍රයෝ සුජාතාවන් නොදැක, "කොතනක උපන්නාවූ දෝ හෝයි පරීක්ෂාකරන්නෝ එහි උපන් නියාව දැන එතනට ගොස් ඒ කෙකින්න හැරගෙණ දිව්‍යලෝකයට ගොස් සිත්කළුවූ දිව්‍යපුරයත් සුධර්මා නම් සභාවත්, චිත්‍රලතා වනයත්, නන්දා නම් පුෂ්කරිණියත් ඒ කෙකින්නට දක්වා "මෙහු "හම්දෙනම කුශල්කොට මට පාදපරිචාරිකාව උපන්නාහුය. තෝ වූකලී කුසල්

නොකොට තිරිසන් යෝනියෙහි උපන්නෙහිය. මෙතැන් පටන් ශීලසංරක්ෂණය කරව"යි අවවාද කොට පඤ්ච ශීලයෙහි පිහිටුවා ඒ කදුරැළියට ගෙණ ගොස් අළුවාහුය. ඒ කෙකිනිත් එතැන් පටන් පන්සිල් රක්නීය. ශක්‍රදෙවෙඳුයෝ කිපදවසක් ගියකල මෝදනාමේ් සිල්රක්නට සමර්ථ දෝහෝ?යි විමසන පිණිස එතනට ගොස් මත්ස්‍ය රූපයක් මවාගෙණ බඩපැ ඉදිරියෙහි වැදහොත්සාහුය. ඒ කෙකිනි තොමෝ මළාවූ මත්ස්‍යයෙක් දෝ හෝ? යි සංශයෙන් ඉකවිය බැහැගත මත්ස්‍යයා නගුට සෙලවී. එකල්හි ඒ කෙකිනි "මේ මත්ස්‍යයා ජීවත්වන්නේය"යි ඇරපුව, ශක්‍ර දෙවෙන්ද්‍රයෝ ඒ දැක "යහපත, යහපත සිල්රක්නට තෝ සමර්ථයෙහිය"යි සාධුකාරදී ගියාහුය, ඒ කෙකිනී එයින් චුතව බරණැස්නුවර කුඹල් කුලයක උපත, ශක්‍රදෙවෙන්ද්‍රයෝ "කෙකිනි කොයි උපන්දෝහෝ"යි පරීක්ෂාකරන්නාහු කුඹල්කුලයෙහි උපන් නියාව දැන රන්කැකිරෙන් ගැලක් පුරාගෙණ ගම මඬ්‍යයෙහි මහළු වෙශයකින් ඉඳ "කැකිරි ගණුව"යි අඩගා කියති. මනුෂ්‍යයෝ අවුත් "සවමිනි, දුනමැනව"යි කිහ.

ඒ අසා ශක්‍රයෝ කියන්නෝ මම් ශීලසංරක්ෂණය කරණ තෙනෙකුට දෙමි තෙපි සිල් රකුදැ? යි විචාළෝය. එබස් ඇසූ මනුෂ්‍යයෝ "අපි සිල් රැකිම් නම් කෙසේවූ දෙයකැ"යි කොදනුම්හ. "මිළයට දෙව"යි කිවාහුය. "මට මිළයෙන් ප්‍රයෝජන නැත. සිල් රක්ෂාකරණ සොඬකුන්ටම දෙමි"යි ශක්‍රයෝ කිවුය. "මනුෂ්‍යයෝ මේ තෙමේ යම්කිසි තළුවන්නෙකැ"යි කියා ගියෝය. සුජාතාවෝ එපවත් අසා "මට හෙණ එනලද්දේවනැ"යි ගොස් "සවමිනි, දුනමැනව"යි කීය "මැනියෙනි, සිල්රකුදැ"යි විචාළෝය, "එසේය. රකිමි" කී කල්හි "මා විසින් මේ කැකිරි තොපට ම ගෙණ එනලද්දේය"යි කියා ගැලෙහා සමඟ ඇඟේ ගේ දෙර තබා ගියෝය. ඒ සත්‍රිද දිවිපමණින් සිල් රක්ෂාකොට එයින් චුතව වෙපවිත්තිය නම් අසුරෙන්ද්‍රයාව උපන. සිල්රැකි අනුභසින් ඊශ්ෂාව රූ ඇති වුව.

ඉක්බිත්තෙන් ඒ වෙපවිත්ති නම් අසුරෙන්ද්‍ර තෙමේ අසුරකන්‍යාව වැඩිවිය පැමිණිකල්හි "මාගේ දූ නම්වටම අනිප්‍රාය පුරුෂයකු ගණුව"යි කියා අසුරයන් රැස්කරවිය. එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයෝ "ඒ සුජාතා දූන් කොයි උපනේ දෝහෝයි පරීක්ෂා කරන්නෝ අසුරභවනයෙහි උපන් නියාව දැන "සුජාතාවන් අනිප්‍රායවූ පුරුෂයෙකු ගණිමි"යි කියා අල්වන්නීය"යි අසුරවෙශයක් මවාගෙණ ඒ අසුරයන් රැස්වූ තෙනට ගියෝය. එකල සුජාතාවන් සරහා අසුරියන් සමීපයට ගෙණවුත් "තොපට අනිප්‍රායවූ වල්ලභයෙකු අල්වා ගණුව"යි කිහ. ඕතොමෝ බලන්නී ශක්‍රයන් දැක පූර්ව ස්නෙහ වශයෙන් "මේ මාගේ වල්ලභයාය"යි අත අල්වාගත. ශක්‍රදෙවෙඳුයෝ ඒ සුජාතාවන් ශක්‍ර පුරයට ගෙණ ගොස් අඩුතුන් කෙළස් නාටකසත්‍රින්ට ප්‍රධානකොට තබා සම්පත් අනුභවකරන්නාහු ආයු පමණින් සිට කම්වූ පරිදි දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා "මහණෙනි, පෙර නුවණැත්තෝ දිව්‍යරාජ්‍යය කරන්නාහු තමන්ගේ ජීවිතය පරිත්‍යාග කොට ප්‍රාණඝාත නොකොළෝවේද? තෝ වූසැලී මෙබඳුවූ නෛර්‍යාණික ශාසනයෙහි මහණව ප්‍රාණීන් සහිත නොපෙරූ පැන් අනුභව කෙළෙහි වේදැ"යි ඒ භික්ෂූහට නිදුකොට පූර්වාපර සන්ධි ගළපා මේ කුලාවක ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මාහලි සංග්‍රාහක නම් මෙසමයෙහි ආනන්දසථවිරයෝය, එසමයෙහි ශක්‍රදෙවේන්ද්‍රව උපන්නේනම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදූ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 32 නච්ච ජාතකය

එවද එක්සමයෙක්හි සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසේක් බහුභාණ්ඩික එක් භික්ෂුසොණකුන් අරභයා මේ ජාතකය වදාළ සේක.

මෙහි වර්තමාන කථාව යට කියනලද දෙවධම්ම ජාතකයෙහි කියනලද්ද හා සදෘශය. සම්බුදුයන් වහන්සේ ඒ මහණහට වදාරණසේක් "මහණ, තෝ බහු භාණ්ඩිකවූයේ සැබෑද? කිම්දූ"?යි වදාළසේක, "සවාමීන් වහන්ස, එසේය"යි දැන්වූ කල්හි "කවර කාරණයකින් තෝ බහුභාණ්ඩවූයෙහි දූ"යි වදාළ සේක. ඒ මහණතෙම මෙපමණක් අසා ම කිපුනේ අදහා පොරෝනා සිවුරු දමා "දැන් මේ ආකාරයෙන්ම හැසිරෙමි" කියා සම්බුදුයන් වහන්සේගේ අභිමුඛයෙහි නග්නව සිටියේය. මනුෂ්‍යයෝ "ඕහට නිදුවිව"යි කීවාහුය, එතෙම එයින් දිවගොස් ගිහිවූයේය.

භික්ෂූහු දම්සභායෙහි රැස්ව උන්නාහූ "බුදුරජානන් වහන්සේගේ ඉදිරියේ මේබන්දක් කෙළේය"යි කියා ඔහුගේ නුගුණ කථා කීවාහුය. බුදුරජානන් වහන්සේ එතනට වැඩවදාර, "මහණෙනි, මෙ දම්සභාවෙහි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උන්නාහූදූ"යි භික්ෂූන්ගෙන් විචාරා වදාළසේක. "සවාමීන්වහන්ස, ඒ භික්ෂූන්වහන්සේ තම් නුඹවහන්සේගේ ඉදිරියෙහි සිවිවණක් පෙදී මධ්‍යයෙහි හිරිඔතප් දෙක හැර ගම් ලදරුවෙකු මෙන් නග්නව සිට මනුෂ්‍යයන් විසින් පිළිකුල් කරණු ලබන්නේ ගිහිව ශාසනයෙන් පිරිහුනේය යි කියා ඔහුගේ නුගුණ කථාව කිය කියා උනුම්හ"යි දැන්වූහ.

සම්බුදුයන් වහන්සේ "මහණෙනි, ඒ මහණ හිරිඔතප් නැතිව සම්බුදු ශාසනයෙන් පිරිහුනේ දැන් මතු නොවෙයි, පූර්වයෙහි සප්ත රත්න ප්‍රතිලාභයෙන්ද පිරිහුණේමය"යි වදාරාඉකුත්වත් දක්වා වදාළසේක.

යිතිහාසික දවස ප්‍රථම කල්පයෙහි සිව්පාවෝ සිංහයකු රජ කළාහුය. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යයා රජ කළාහුය. පක්ෂීහු සුවණ්ණහංසයා රජ කළාහුය. ඒ සුවණ්ණහංස රාජයාගේ වනාහි ධීතෘවූ හංසපෝතිකාව විශිෂ්ට රූ ඇත්තීය, හංසරාජ තෙම ඒ හංසපෝතිකාවට වරයක් දුන්නේය. ඕතොමෝ තමාගේ සිතට රුචිවූ සවාමියකු ප්‍රාර්ථනාකළාහුය. හංසරාජතෙම තමාගේ දුවනියන්ට වරය දී හිමාලය වනයෙහි සිසුලූ පක්ෂීන් රැස්කරවූයේය. අනෙක ප්‍රකාරවූ හංස මයුරාදී පක්ෂි සමූහයෝ රැස්ව එක් මහත් වූ පහණ තලෙක්හි රැස්වූවාහුය. හංසරාජතෙම "තමහට සිත්කළු වූ සවාමියකු අවුත් ගන්ව"යි කියා දුවනිය කැඳවූයේ ය.

හංසපෝතිකාව පක්ෂි සමූහයා බලන්නී මැණික්වන් ග්‍රීවය ඇති විසි තුරු පත් ඇති මයුරයෙකු දැක මේ තෙම මවසවාමි දේවා"යි කැමතිවූවාහුය. පක්ෂි සමූහයෝ මයුරයා කරා එලඹ මෙසේ කීවාහුය. "යහළු මයුරය, මේ

හංසරාජයාගේ දුවනියෝ මෙපමණ පක්ෂීන්ගේ මධ්‍යයෙහි සවාමියකු කැමති වන්නී නොප කැමතිවූවාය"යි කීවාහුය. එවේලෙහි මයුරතෙම "දැන්ම වනාහි මාගේ බලය නුදුටුයෙහිද"යි කියා ඉතා සතුටුව හිරි ඔතප් දෙකා බිඳ පළමු කොට මහත්වූ පක්ෂි සමූහයාගේ මැද පක්ෂපද්‍රායන් දිහුකොට නටන්නට පටන් ගත්තේය. නෘත්‍ය කරණුයේ නොසැඟවුනාවූ වර්ච්ස්මාණීය ඇතිවූයේය. සවණීහංසරාජතෙම ලජ්ජාවට පැමිණියේ "මොහුට අධ්‍යාත්මිකව පහළ වන්නාවූ හිරි ද නැත්තේය, බාහ්‍යව පවත්නාවූ භයද නැත්තේය, හිරි ඔතප් දෙකා බිඳුනාවූ මොහුට මාගේ දුවනියන් නොදෙමි"යි කියා පක්ෂි සමූහයා මධ්‍යයෙහි මේසේ කීසේක. "මයුරය, තාගේ ශබ්දය මනොඥය, පිටකා සිත්කළුය, ශ්‍රීවයද වෛඩූර්‍යමණි මාණික්‍යයෙහි වණී හා සදෘශය, තාගේ පිච්ඡ භාරයෝද ව්‍යාම මාත්‍රයහ. මෙසේ රූපී වුවද හිරි ඔතප් දෙකා බිඳ නෘත්‍යකාල හෙයින් මෙබඳු ලජ්ජා නැත්තාවූ තොපට මාගේ දුව නොදෙමි" කියා හංස රජ එම පක්ෂීද් මධ්‍යයෙහිම තමාගේ බැනාවූ හංසපොතකයාහට තමාගේ දුවනිය හංසදේනුව දුන්සේක. මයුරතෙම් හංසපොතිකාව නොලැබ ලජ්ජාවී එසින් පැනනැගී ගියේය. හංසරජද තමා වසන තැනට ම ගියේය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ "මහණෙනි, මේ මහණ හිරිඔතප්පදෙකා බිඳ රත්න ශාසනයෙන් පිරිහුනේ දැන් මතු නොවෙයි. පෙරත් සප්තරත්නය ලැබීමෙන්ද පිරිහුනේම ය"යි වදාරා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්‍ව පර සන්ධි ගළපා මේ නව්ව ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මයුරතෙම දැන් මේ බහුභාණ්ඩික මහණ වූයේය, හංස රජව උපන්නෙම් වනාහි ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වෙමිදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 33 සම්මෝදමාන ජාතකය

තවද එක් සමයෙක්හි ශාක්‍යකුලනිලයා වූ බුදුරජානන් වහන්සේ කිඹුල්වත් පුරය ආශ්‍රය කොට න්‍යග්‍රොධාරාමයෙහි වැඩවාසය කරණසේක් සුඹුළු ඛබරක් අරභයා මේ ජාතකය වදාළසේක. එය කුණාල ජාතකයෙහි මතු ප්‍රකාශ වන්නේය.

ඒ කාලයෙහි වනාහි බුදුරජානන් වහන්සේ තැයන්ට ආමන්ත්‍රණය කොට "මහරජදරුවනි, තැයන්ගේ ඔබමොබ විවාද කිරීම් කම් නුසුදුසුය. කිරශ්චිතගතයෝද පූර්‍වභාගයෙහි සාමග්‍රීව වසන්නාහු පසුතුරන් මැඩපැවත යම් දවසක විවාද කළාහු ද? එකල්හි මහත් විනාශයට පැමිණියාහු ය"යි වදාරා නෑ රජදරුවන් විසින් යාචිතු කාරණලදුව ඉකුත්වත් කථාව දක්වා වදාළසේක.

යම් දිගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් වහන්සේ වටු ජාතියෙහි ඉපද නොයෙක් දහස්ගණන් වටුවන් පිරිවර කොට ඇතිව අරණ්‍යයෙහි වසන සේක.

එකල්හි එක් වටුවැද්දෙක් ඒ වටුවන් වසන තැහට ගොස් වටුවන්ගේ හැඩිම කොට ඔවුන් රැස්වූ බැව් දැන ඔවුන්ගේ මත්තෙහි දැල දමා කෙළ වරෙහි පටන් මඬිමින් සියල්ලවුන් එකතැන් කොට පැසපුරවා ගෙට ගොස් ඒ වටුවන් විකොඩ ඒ මිලයෙන් ජීවිකාව කරන්නේය. ඉක්බිත්තෙන් එක් දවසක් බෝධිසත්ත්වයන් වහන්සේ ඒ වටුවන්ට කියතසේක්, ''මේ පක්ෂි වැදි තෙම අපගේ තැයන් විනාශයට පමුණුවන්නේය, මම එක් උපායෙක් දනිමි, මේ තෙම යමක්හු විසින් අප අල්වාගන්නට නොහැකිවන්නේද, අද මෙතැන් පටන් මේ වැද්දු විසින් නොපෙනේ මත්තෙහි දැල දමූ කල්හි එකෙක් එකෙක් එකෙකි දැල් ඇසෙක් හිස තබා දැල ඔසවා කැමති තැනකට ගෙණ ගොස් එක් කටුලැහැබෙක්හි බහව, එසේ දැමූ කල්හි යව ඒ ඒ තැනින් දිවමිහ''යි කීසේක. ඒ සියල්ලෝ ''යහපතැ''යි කියා පිළිගත්තාහුය.

දෙවෙනි දිනයෙහි මත්තෙහි දැල දැමූ කල්හි බෝධිසත්ත්වයන්වහන්සේ විසින් කියනලද ක්‍රමයෙන්ම දැල ඔසවා එක් කටුලැහැබෙක්හි බහා තුමූ යටි දිසාවෙන් ඒ ඒ තැනින් දිවගියාහුය. ලැහැබින් දැල මුදාගත්තාවූ වටුවැද්දාහට විකාලය වූයේය. ඒ තෙම හිස් අතින්ම ගියේය. දෙවෙනි දිනයෙහි පටන් වටුවෝ එසේම කරන්නාහුය. ඒ වැදිද සූර්‍යයාගේ හස්තාංගමනය දක්වා දැල මුදමින් කිසිවක් නොලැබ සිසතින්ම ගෙට යන්නේය.

ඉක්බිත්තෙන් ඔහුගේ භාර්‍යාව කිපී ''තෙපි දවසක් පාසා සිසතින් එන්නෙහිය, අනිකුදු තොපගේ පිවත රක්ෂාකරණ තැනෙක් ඇතැයි සිතමි''යි කීවාය. වැදිතෙම කියනුයේ ''සුන්දරඛණ්ඩිය, මට අන් රක්ෂාකරණ තැනක් නැත්තේය, වැලිදු වනාහි ඒ වටුවෝ සමගිව හැසිරෙති. මා විසින් දැල දැමූ පමණෙකින්ම දැල ගෙණ කටුලැහැබෙක්හි දමා යන්නාහුය. ඔහු හැම කල්හිම සමගිව වාසය නොකෙරෙති. තෙපි නහමක් සිතව, යම් දවසෙක ඔහු විවාදයට පැමිණියාහුද? එකල්හි ඒ සියල්ලවුන්ම මරු කිරීගේ මුහුණ සතුටු කරවමින් ගෙණ එන්නෙමි කියා භාර්‍යාවට කීසේය. වටු පක්ෂීහු විවාද නොකරන්නාහු දැල ගෙණයති, ඒ පක්ෂීහු යම් කලෙක්හි විවාද කෙරෙද්ද එකල්හි මාගේ වසඟවවට පැමිණෙති, එකල්හි ඔවුන් ගෙණ කිරීගේ මුහුණ සතුටු කරවමින් එම් කියා භාර්‍යාව අස්වැසුවේය. කීප දවසක් ඇවැමෙන් එක් වටුවෙක් ගොදුරුබිමට බස්නේ නොසලකා අනිකක්හුගේ ඉස ඇක්ම විය. අනික් වටුවා ''මාගේ හිස කවරෙක් ඇක්මීදැ''යි කියා කිපුනේය. ''මම නොසලකා ඇක්මවීමි, නොකිපෙව''යි කිකල්හිද කිපුනේමය. ඔහු නැවත නැවත කියන්නාහු ''තෙමිම දැල ඔසවන්නෙහි යයි සිතමි'' කියා ඔවුනොවුන් විවාද කළාහුය. ඔවුනොවුන් විවාද කරණ කල්හි බෝධිසත්ත්වයන් වහන්සේ විවාද කරන්නවුන් කෙරෙහි යහපතෙක් නම් නැත්තේය. දැන්ම ඔහු දැල නොඋසුලන්නාහු එහින් මහත් විනාශයට පැමිණෙති, වැදිතෙම අවසර ලබන්නේය. මා මෙතැන්හි වසන්ට නොහැකිය''යි සිතූසේක. බෝධිසත්ත්වයන් වහන්සේ තමන් පෂීද් ගෙණ අන් තැනකට ගියසේක.

වටුවැදි වනාහි කීපදවසකින් අවුත් වටුහඬින් හඬා රැස්වූවාහු ඔවුන්ගේ මුදුනෙහි දැල බැහුයේය. ඉක්බිත්තෙන් එක් වටුවෙක් ''දැල උසුලන්නාවූ තැනැත්තාගේ වනාහි මස්සාකයෙහි රෝමයෝ පතිතවූවාහුය. දැන් ඔසව''යි කීයේය. අනිකෙක් ''දැල ඔසවන්නාවූ තාගේ වනාහි පක්ෂපත්‍රදෙකෙහි ජත්‍රයෝ පතිත

වූවාහුය. දැන් උසුලව"යි කීයේය. මෙසේ ඔවුනොවුන් "තෝ උසුලව" "තෝ උසුලව"යි කියද්දීම වැදිතෙම දැල ඔසවා සියලු වටුවන් එක්කොට පැස පුරා භාග්‍යාව කාස්‍ය කාරවම්නි ගෙට ගියේය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මෙසේ මහරජ, නැයන්ගේ ඔබර නම් නුසුදුසුය, ඔබරකිරීම විනාශයට කාරණය" මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපරසන්ධි ගළපා මේ **සමෙමාදමාන ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි නුවණ නැති වටුවා නම් දැන් දෙවදත්ත ස්ථවිරයෝය, ප්‍රඥාවන්ත වටුව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වෙම්දැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 34
## මත්ස්‍ය ජාතකය

**ත**වද එක් සමයෙක්හි ලෝකාලෝක දිවා කරවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක්, **පුරාණ දුතියිකා** පලෝ භූතයක් අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි සවීඥයන් වහන්සේ ඒ භික්ෂුහට "සැබෑද? මහණ තෝ උකටලී වී දැ"යි විචාළසේක. "සැබෑව, සවාමීනි"යි දැන්වූ කල්හි "කවුරුන් විසින් උකටලී කරණ ලද්දේ දැ"යි විචාළසේක. "සවාමීනි, මාගේ පුරාණ භාග්‍යාතොමෝ මා කෙරෙහි බලවත්වූ ස්නෙහ ඇත්තීය. එසේ හෙයින් ඇ ඇරපියන්ට අසමර්ථයෙමි"යි කීය. ඉක්බිත්තෙන් සවීඥයන් වහන්සේ ඕහට වදාරණසේක් "මිහණ, ඒ සත්‍රී අනර්ථකාරිණිය, පෙරත් තෝ ඇ නිසාම මරණයට පැමිණ මා කීසා මරණින් මිදුණහි වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහ බෝසතාණෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිතව උපන්නාහුය.

එසමයෙහි කොවුලෝ ගහට දැල් දමූය. ඉක්බිත්තෙන් එක් මහා මත්ස්‍යයෙක් රතික්‍රීඩා වශයෙන් තමාගේ මත්ස්‍යධෙනුව හා සමග කෙළිමින් එන්නේය. ඔහුගේ ඒ මත්ස්‍යධෙනුතොමෝ පෙරත්තුව යන්නී ජාලගන්ධය ආඝ්‍රාණය කොට දැල වළහා ඉවතින් ගියාය. ඒ කාමයෙහි ගිජුවූ ලොල් මත්ස්‍යයා දැල් නුසයටම වන්නේය. කොවුලෝ ඔහු දැලට වන් නියාව දැන දැල ඔසවා මත්ස්‍ය යා ගෙණ නොමරා වැලිමත්තට දමා "මොහු අහුරේම පලහා කම්හ"යි ගිනිකොට අහුරු බසිති, උල් සසිති, මත්ස්‍යයා ඒ අහුරේ පැලහීම් වත් උලින් ඇනීමවත් අනිත් දුකෙක්වත් මට පීඩා නොකරන්නේය. ඒ මත්ස්‍යධෙනුවතොමෝ "මාගේ සවාමිවූ මත්ස්‍යයා අන් මත්ස්‍යධෙනුවක හා සමග ගියේදෝහෝයි යම් දෙම්නාසකට පැමිණේ නම් ඒ මට පීඩාකරන්නේය"යි වැලිමත්තේ වැදහෙව අඬන්නේය. එසමයෙහි පුරෝහිත බමුණාතෝ තමන්ගේ පරිවාර සමූහයා විසින් පිරිවරණලදුව නහන පිණිස ගංතෙරට අවූය. ඒ මහබෝසතාණෝ වූකලී සියලු සත්ත්වයන්ගේ බස් දනිති, එසේ

ගෙයින් ඒ මත්ස්‍යයා අඩන අඩ අසා සිතන්නෝ "මේ මත්ස්‍යයා කාමරති යෙන් අඩන්නේ මෙසේ කෙලුශාතුරවූ සිත්ඇතිව මියන්නාවූ මේ තෙම තාරක ගයහි උපදනේය. එසේ හෙයින් මම ඔහුට පිහිටවෙමි"යි කෙවුලන් සමීපයට ගොස් කියන්නෝ "එම්බා පින්වත්නි, තෙපි අපට එකදවසකුත් ව්‍යංජනය කට මත්ස්‍යයකු නොදෙවිදැ"යි කිවුය. එබස් ඇසූ කෙවුලෝ කියන්නෝ "සවා මීනි, කුමක් කියනසේක්ද? නුඹවහන්සේ කැමති මත්ස්‍යයකු ඇරගෙණ ගිය මැනවැ"යි කිවුය. මහබෝසතානෝ කියන්නෝ "අපට අන් මත්ස්‍යයකු ගෙන් ප්‍රයෝජන නැත, මේ මත්ස්‍යයාම දෙව"යි කිවුය. කෙවුලන් විසින් "ගත මැනවැ යි සවාමිනි" කී කල්හි මහබෝසතාතෝ ඒ මත්ස්‍යයා දැකින් ඔසවා ගෙණ ගංතෙර හිඳ "එම්බල මත්ස්‍යය, ඉදින් මම නා අද නුදුටුයෙම්වී නම් මරණයට පැමිණෙන්නෙහි වේදැයි මෙතැන් පටන් කෙලුශ වසඟ නොවෙව"යි අවවාද කොට ඒ මත්ස්‍යයා දියට හැර නුවරට වන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් පෙලෙහි පිහිටිසේක. සම්බුදුගන් වහන්සේත් පූර්වාපරසන්ධි ගළපා මේ මත්ස්‍ය ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මත්ස්‍යඛේතුව තම් දැන් පුරාණ දුතියිකාගය, මත්ස්‍යයා තම් උකටලී මහණය, පුරෝහිත බ්‍රාහ්මණ තම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ"යි තථාගතවහන්සේ දක්වා වදාළසේක.

---

## 35 වට්ටක ජාතකය

මේ ද එක් සමයෙක්හි සර්වඥකෙතුක ත්‍රිලෝගුරු බුදුරජාතන් වහන්සේ මගධරට සැරිසරා ඇවිදිනාසේක් ලැවුගිනී නිවීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක්හි සර්වඥතන් වහන්සේ මගධරට සැරිසරා ඇවිදිනාසේක් එක්තරා මගධ ග්‍රාමයක පිඬුසිඟා ඇවිද වළඳා ඉක්බිති භික්ෂුසංඝයා පිරිවරා මහට වැළිපන්සේක.

එසමයෙහි මහත්වූ ලැවුගින්නක් නැංගේය. ඉදිරියෙහිත් පස්සෙහිත් බොහෝ භික්ෂූහුය. ඒ ලැවුගිනි එකධූමවැ එකජ්වාලවැ මැඩගෙණ එන්නේය. එතැන්හි සමහර පෘථග්ජන භික්ෂූහු තොපගේ මරණ භය පත්ව "මේ එය ගින්නව අපි ඉදිරියෙහි ගිනිලමිහ, මේ ගින්නෙන් අපි තැන් ලැවුගිනි නොදවන්නේය"යි කියා ගිනිදඬු මැත්තාව ගිනිගා ය. ඒ දැක සමහර භික්ෂූහු තොපගෙන් වහන්සේ මෙසේ කිසේක. 'ඇවැත්නි, තෙපි කුමක් කරවිද? ආකාශ මධ්‍යයෙහි සිට චන්ද්‍රමණ්ඩලයත් ඉගෙණහිරි සත්වළිත් නැගෙන්නාවූ දහසක් රශ්මීන් හෙබියාවූ සූර්‍යමණ්ඩලයත් වෙලාගන්නාරයෙහි සිට සමුද්‍රයත් මහමෙර සමීපයෙහි සිට මහමෙරත් නොදන්නාවුන් මෙන් දෙව්මිනිසුන් සහිතවූ ලොවට අනුපුද්ගල වූ තොප හා සමග යන්නාවූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ නො බලා පටගිධූනය දෙම්හ යි කියව, බුදුබල

නොදනුව, වරතොපි බුදුන් සමීපයට යමිහ''යි කියා ඉදිරියෙහිත් යන්නාවූ ඒ සියලු භික්ෂූන් වහන්සේම එක්ව දශබලධාරී වූ බුදුරජාණන් වහන්සේ සමීපයට ගියසේක. සම්බුදුයන් වහන්සේ මිහත්වූ භික්ෂූ ඍඝයාපිරිවරා එක්තරා ප්‍රදේශයක වැඩසිටි සේක. එකල ලැව්ගිනි මඬනාක් මෙන බුරමින් එන්නේය. මෙසේ එන්නාවූ ලැව්ගිනි බුදුන් සිටි තැනට පැමිණ ඒ ප්‍රදේශයට හාත්පසින් සොළොස්කිරියක් පමණ තැනව පැමිණ දියෙහි ගලා නිවාපු තණසුලක් මෙන් නිවී ගියේය. එකල්හි භික්ෂූන්වහන්සේ බුදුන්ගේ ගුණ කියන්ට පටන් ගත් සේක. ''සම්බුදුයන්වහන්සේගේ ගුණ නම් ඉතා ආශ්චර්‍ය්‍ය ම්සක. නොදත හැක්කේය. මේ සිත් පිත් නැති ගිනි පවා බුදුන් සිටි තැන් මැඩගෙණ එන්ට අසමර්ථ විය. දියෙහි ගලාපු තණසුලක් මෙන් නිවීයේය. සම්බුදුවරයන්ගේ ආනුභාව නම් ඉතා ආශ්චර්‍ය්‍ය ය''යි මෙසේ බුදුගුණ කියන්ට පටන්ගත් සේක. සම්බුදුයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා 'මහණෙනි, මේ මාගේ දැන් බල නොවෙයි, මේ භූමිප්‍රදේශයට පැමිණ මේ ගිනි නිවීමේය නම් මේ වූකලී මාගේ පුරාතනයෙහි සත්‍යක්‍රියා බල වන්නේය මේ ප්‍රදේශය ප්‍රාතිහාර්‍යය්‍යක් වන්නේ ය'යි වදාළසේක. එකල්හි ආයුෂ්මත්වූ අනඳ මහතෙරුන් වහන්සේ බුදුන් වැඩහිඳිනා පිණිස සඟළසිවුර සතරපව කොට පැණවූ සේක. එහි සම්බුදුයන් වහන්සේ පලක් බැඳ වැඩහුන් ම්සක. භික්ෂුසඝයා වහන්සේත් බුදුන් පිරවරා වැඩහුන් සේක. එසමල්හි සම්බුදුයන් වහන්සේ භික්ෂූන් විසින් 'සවාමීනි, මේ වූකලී අපට ප්‍රකාශය. අතීත කථාව භවයෙන් පටිච්ඡන්න හෙයින් අප්‍රකාශය, ඒ අතීත කථාව අපට ප්‍රකාශ කොට වදාළ මැනවැ''යි භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස මහඛරට එම ප්‍රදේශයෙහි බොධිසත්ත්වයෝ වටුයෝනියෙහි පිළිසිඳගෙණ මව්කුසින් බිහිව බිජුවට ගසාගෙණ නික්මුණු කල්හි මනත්වූ පෙදවට සා පමණ වටු පැවෙක් වූයේය. ඉක්බිත්තෙන් ඔහු දෙමව්පියෝ කැදැල්ලේ වැදහොවා මුවතුඩින් ගොදුරු ගෙණවුත් පොෂණයකෙරෙති. ඒ බොධිසත්වයන්ට පක්ෂප්‍රහාර කොට ආකාශයෙන් යන්ට නිසි බලයෙක් වත් දෙපය ඔසවා ගොඩ ගමන් කරන්ට බලයෙක් වත් නැත. ඒ ප්‍රදේශයද අවුරුද්දක් අවුරුද්දක් පාසා ලැවුගිනි ගන්නේය. ඒ ලැවුගිනි එසමයෙහිත් මහ හඬින් බුරමින් ඒ ප්‍රදේශයෙහි ගිනිගත්තේය. ඒ දැක පක්ෂිසමූහයා තම තමන්ගේ කැදැල්ලෙන් නික්ම මරණභයින් භයපත්ව හඬමින් යන්නාහුය. බොධිසත්ත්වයන්ගේ දෙමව්පියෝ මරණභයින් භයපත්ව බොධිසත්ත්වයන් හැරපියා පලාගියාහුය. බොධිසත්ත්වයෝ කැදැල්ලේ වැදහෙවම කර ඔසවා මැඩගෙණ එන්නාවූ ලැව්ගිනි දැක මෙසේ සිතුය. ඉදින් මට පක්ෂප්‍රහාර කොට ආකාශ යන්ට කිසි බලයෙක් වේ නම් ආකාශයට පැන නැගී අනික් තැනක මාගේ දෙමව්පියෝත් මරණභයින් භයපත්ව මා උදෙසා කොට හැර තමන් රැකෙමින් ගියෝය. දැන් මට අන පිළිසරණෙක් නැත. සරණයක් පිහිටක් නැත්තෙම් මා විසින් අද කුමක් කටයුතුදෝ''යි සිතුය. තවද බොධිසත්ත්වයන්ට එකල මෙසේවූ සිතිවිල්ලෙක් වූයේය. මේ ලොකයෙහි ශීලගුණ නම්වූ දෙයක් ඇත. සත්‍යගුණ නාම්වූ දෙයක් ඇත. යටගිය දවස පාරමීධර්මයන් පුරා බෝමැඩ හිඳ සම්‍යක් සම්බොධිඥානසමධිගමනය කළාවූ ශීලසමාධිප්‍රඥා විමුක්ති ඥානදර්‍ශනයෙන් යුක්තවූ ඔයල්ලන් කෙරෙහි පතළාවූ

මෛත්‍රී කරුණා ක්‍ෂාන්තියෙන් යුක්තවූ සිඟලු සත්ත්වයන් කෙරෙහි සමව පැවැත්තාවූ මෛත්‍රීභාවනාව ඇති සම්බුදුරජාණෝ නම් ඇත. ඔවුන් විසින් ප්‍රතිවෙධ කරණලද ගුණධර්ම නම් දෙයක් ඇත, මා කෙරෙහිත් එක් සත්‍යයෙක් ඇත. එසේ හෙයින් අතීතයෙහි උපන්නාවූ සම්බුදුරජාන් හා ඔවුන් විසින් ප්‍රතිවෙධ කරණලද ගුණධර්මය ආවර්ජනා කොට මා කෙරෙහි විද්‍යමාන වූ සත්‍යය සත්‍යක්‍රියා කොට ගිනි වලකා අද මා විසින් ඔටත් සෙසු පක්ෂීන්ටත් සවාසස්ථානයක් කිරීම වටනේ'යි සිතුය.

ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයෝ අතීතයෙහි පිරිනිවියා වූ සම්බුදුගුන් වහන්සේගේ ගුණ සලකා තමන් කෙරෙහි විද්‍යමාන වූ සත්‍යසවභාවය උදෙසා සත්‍යක්‍රියා කරන්නාහු මෙසේ කිවුය, "ඉදින් මාගේ පක්ෂපත්‍රයන් විදු ආකාශයෙහි නොයාහැකි බවත්, කුසපාදයන් ඇති බවත්, ඔසවා නොයාහැකි බවත්, දෙමව්පියන් මා කැදැල්ලේම දමා ගිය බවත්, සත්‍යයද; ඒ සත්‍යයෙන් ජාතවෙදය ඉවත්ව යව්"යි කියා කැදැල්ලෙහි වැදහෙව් සත්‍යක්‍රියා කළෝය. ඒ බෝධිසත්ත්වයන්ගේ සත්‍යක්‍රියා හා සමග සොළොස්කිරියක් පමණ තැන් ගිනි ඉවත්ව ගියේය. ගිනී පසුබස්නේත් දවාගෙණ වනයට නොගියේය. වැලි කුමක් කළෝද? යත්, දියෙහි ගලාපු තණසුලක් මෙන් එතැන්හිම නිවී ගියේය. ඒ මහාබෝධිසත්ත්වයන් විසූ වාසස්ථානය මේ සිඟලුම කප මුලුල්ලෙහි ගින්නක් වැද නොගන්නා බැවින් කල්පස්ථායිවූ ප්‍රාතිහාර්‍යී නම් විය. මෙසේ මහබෝසතාණෝ සත්‍යක්‍රියා කොට ජීවිතාන්තයෙහි කළුවූ පරිද්දෙන් මිය පරලොව ගියේය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මේ වතය ගින්නෙන් නොදුනේ දැන් මාගේ බලයෙක් නොවෙයි පුරාතනයෙහි වටුව උපන්කල මාගේ සත්‍යක්‍රියා බලයෙකැ"යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර සමහර තෙණකුන් වහන්සේ සෝවාන්වූ සේක. සමහර තෙණෙකුන් වහන්සේ සකෘදාගාමී වූසේක සමහර කෙණෙකුන් වහන්සේ අනාගාමී වූසේක. සමහර කෙණෙකුන්වහන්සේ රහත්වූ සේක. බුදුරජාණන් වහන්සේ පූර්වාපරසන්ධි ගළපා මේ වට්ටක ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි දෙමව්පියෝ නම් දැන් මේ දෙමව්පියෝමය. එසමයෙහි වටු රජ්ජුරුවෝ නම් නිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

---

## 36 සකුණ ජාතකය

එකල්හිද එක් සමයෙක්හි ජේතවනාරාමයෙහි වැඩවසන බුදුරජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් දහතයවූ පන්සලක් ඇති භික්ෂුතෙණෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් භික්ෂුතෙනෙකුන් වහන්සේ වනාහි සම්බුදුගුන් වහන්සේගේ සමීප යෙන් කමටහන් ගෙණ දෙවිරම් වෙහෙරින් නික්ම කොසොල් දනවියෙහි එක් පසල්ගමක් නිසා එක් අරණ්‍යයෙක්හි සෙනස්තෙන වසනසේක. ඉක්බිත්

තෙන් පළමුවැනි මෙසෙඟි ම උන්වහන්සේගේ පන්සල දහනය වූයේය. ඒ නිසාම්න් වහන්සේ ''මාගේ පන්සල දහනය වූයේය, දුකින්ම වසමි' කියා මනුෂ්‍යයන්ට කීසේක. මනුෂ්‍යයෝ ''දැන් අපගේ කෙත වියළුනේය, කෙතට දිය හෙලා කොට දෙමහ. දිය හෙලූ කල්හි බිජු වපුට කොට දෙමහ. බිජු වපුළ කල්හි වැට කොට, වැව සළ කල්හි නෙලා ගසි කියාද, දුසඳ යසි කියාද මැඩ යසි කියාද, මෙසේ මේ ක්‍රියාව දක්වමින්ම තුන්මසක් කල්යවූවාහුය. ඒ නිසාම්න් වහන්සේ තුන්මසක් අභ්‍යවකාශයෙහි දුකින් වසනසේක් කම්ටහන් වඩා විශෙෂයක් උපදවාගන්ට නොහැකිවූසේක. පවුරුණුකොට වහාම සම්මැදුරන් වහන්සේගේ සම්පයට ගොස් නමස්කාර කොට එකාන්තපසෙක හුන් සේක. සම්මැදුරන් වහන්සේ ඒ නිසාම්න් හා පිළිසඳර කථාකොට ''කිමෙක්ද? මහණ සැපසේ වස් විසූයෙහිද? තොපගේ කම්ටහන් මස්තකප්‍රාප්ත වූයේදැ''යි විචාළසේක. ඒ නිසාම්න්වහන්සේ ඒ ප්‍රවෘත්තිය කියා ''මට සෙනසුන් සප්‍රාය නැති කෙයින් කම්ටහන් මස්තකප්‍රාප්ත නුවූයේ ය''යි දැන්වූසේක. සම්මැදුරන් වහන්සේ වදාරණසේක් 'මහණෙනි' පෙර තිරශ්චීනගතයෝත් තමහට සප්‍රායඃසප්‍රාය දැනගත්තාහුය. තොපි කවර කාරණයෙකින් නොදත්තාහුද'යි වදරා ඉකුත්වත් කථාව වදාළසේක.

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් තිරශ්චීන පක්ෂි ජන්මයෙහි ඉපිද පක්ෂි සමූහයා විසින් පිරිවරණ ලදුව අරණ්‍ය ප්‍රදෙශයෙක්හි ශාඛා වෙලපින් සමූහීවූ මහත් වෘක්ෂයක් ආශ්‍රය කොට වාසයකරණ සේක.

ඉක්බිත්තෙන් එක්දවසක් ඒ වෘක්ෂයාගේ ශාඛාවන් ඔබ්මොබ හැරෙන කල්හි සුණු වැගිරෙන්නේය, දුම් නැගෙන්නේය, ඒ දැක බෙඩිසත්වයන් වහන්සේ සිතනසේක් ''මේ ශාඛාවෝ දෙදෙන මෙසේ ඝර්ෂණයවඝර්ෂණයවගිනි පහළ වන්නේය, ගිනි පරඛුල්පත් ගන්නේය, එතැන්පවන් මේ වෘක්ෂයද දවන්නේය, මෙතැන්හි අප විසින් වසන්නට නොහැකිය, මෙයින් දිවගොස් අන්තැනකට යන්ට වටනේ ය' යි සිතූසේක. මෙසේ සිතා බෙඩිසත්වයන් වහන්සේ පක්ෂිසමූහයාට මෙසේ කීසේක් ''යම් වෘක්ෂයක් පක්ෂීහු ආශ්‍රය කලෝද? ඒ වෘක්ෂය ගිනිහරණේය, වක්‍රවූ ග්‍රීවය හා පක්ෂපත්‍ර ඇති හෙයින් වක්කඬග නම්වූ පක්ෂිණී ඒ ඒ දිගුන් සේවනය කරව, අපට පිහිටවූ වෘක්ෂ යෙන්ම ගිනි වැද භය උපන්නේය. එහෙයින් වරෙවු, අන්තැනකට යම්හ'යි කීසේක.

බෙඩිසත්වයන් වහන්සේගේ වචනය කළාවූ නුවණැත්තාවූ පක්ෂීහු උන්වහන්සේ හා සමග එක්වීමට අභිමුඛවම් පැතැනැගී අන්තැනකට යියාහුය. යම් කෙණෙක් නුවණ නැත්තෝද? මෙපරිද්දෙන්ම ''බ්‍රහ්මදත්ත පමණ දියෙහි මෙතෙම කිඹුලන් දක්නේ යැ''යි කියා බෙඩිසත්වයන් වහන්සේගේ වචනය නොගෙණ එතැන්හි විසූවාහුය. ඉක්බිත්තෙන් නොබෝ කලකින් බෝසතාණන් වීසින් සිතූ ආකාරයෙන්ම ගිනි පහළව ඒ වෘක්ෂය ගිනිගත්තේය. දුම්ද ගිනිදැල්ලද නැගි කල්හි දුම්න් අන්ධවූ පක්ෂීහු අන් තැනකට යන්ට නොහැකිවූවාහු ගින්නෙන් වැටි වැටීම විනාශයට පැමිණියාහුය. බුදුරජාණන් වහන්සේ මේසේ වදරා ''මහණ, පෙර තිරශ්චීනයෝත්

දහන වෘක්ෂාග්‍රවල වහන්නාහු තමන්ට සප්‍රායාසප්‍රාය දැනගත්තාහුය. **තෙමේ කවරහෙයකින් නොදත්තෙහිදැ**"යි කියා ධර්මදේශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍ය දෙශනාවගේ **කෙළවර** ඒ භික්ෂූන් වහන්සේ **සෝවාන්** ඵලයෙහි පිහිටිසේක. බුදුරජාණන් වහන්සේද පූර්වාපරසන්ධි ගළපා මේ **සකුණ ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි බෝසතානන්ගේ අවවාදය කළාවූ පක්ෂීහු දැන් බුදුපිරිස් වූවාහුය. නුවණැති පක්ෂිව උපන්නෙම් **වනාහි තිලෝගුරු** සම්‍යක් සම්බුදු රජවූ මම්ම **වේදැ**"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 37
## තිත්තිර ජාතකය

**ත**වද එක් සමයෙක්හි සහර කතරින් එතරකරණ හෙයින් හැල් සාත්තුවාහකයන්හු වැනිවූ සම්බුදුන් වහන්සේ සැවැත්නුවරට වඩනාසක් සැරියුත් මහතෙරුන් වහන්සේට සෙන සුන් වැළකීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

අනේපිඩු මහසිටාතන් විසින් විහාරය කරවා දූතයන් යැවූ **කල්හි** ශාස්තෘන් වහන්සේ රජගහනුවරින් **නික්ම** විශාලා මහනුවරට පැමිණ එහි කැමති පරිද්දෙන් වාසයකොට "සැවැත්නුවරට එමි" කියා මගට පිළිපන්සේක. එසමයෙහි විහාරහි ෂඩ්වර්ගික භික්ෂූන්ගේ අතැවැසි භික්ෂුහු අසිමුඛව ගොස් සථවිරයන් වහන්සේලා සෙනසුන් නොගත් කල්හිම "මේ **සෙනස්න අපගේ** උපාධ්‍යයන් වහන්සේටය, මේ **සෙනස්න** ආචාරීන් වහන්සේටය, මේ **සෙනස්න** අපටම වන්නේ ය"යි කියා සෙනසුන් බලකත්, පසුව ආවාවූ සථවිරයන් වහන්සේලා සෙනසුන් නොලබන්නාහුය. සැරියුත් මහතෙරුන් වහන්සේගේද අතවැසි භික්ෂුහු සථවිරයන් වහන්සේව **සෙනස්න** සොයන්නාහු තොලැද්දාහුය. සැරියුත් මහතෙරුන් වහන්සේ **සෙනස්නක්** නොලබමින් සම්බුදුන් වහන්සේගේ **සෙනස්නට** නුදුරු තැන්හි එක් වෘක්ෂමූලයෙක්හි හිඳිමේන්ද සක්මන් කිරීමේන්ද කල් යවුසේක. සම්බුදුන් වහන්සේ අලුයම් වෙලෙහි උවතව නික්ම කැසපිසේක. තෙරුන්වහන්සේද කැසපිසේක. "මේ තෙම **කවරෙක්** ද?" "සවාමීන් වහන්ස, මම **ශාරිපුත්‍රයෙමි**" කීසේක. "ශාරිපුත්‍රසථවිරය, මේ වේලාවෙහි මෙතැන්දී **කවරක්** කරන්නෙහිදැ"යි වදාළසේක. සැරියුත් මහතෙරුන් වහන්සේ මේ ප්‍රවෘත්තිය දැන්වූසේක ශාස්තෘන් වහන්සේ සථවිරයන් වහන්සේගේ බස් අසා දැන් වනාහි මා ජීවත්ව ඉඳදී භික්ෂුහු ඔවුනොවුන් ගෞරව නැත්තෝය, ආදර නැත්තෝය, පිරිනිවන් පෑ **කල්හි කවරක්** කරන්නාහුදෝ යි ආවර්ජනා කරන්නාහට ධර්මසංවේගය පහළවූයේය.

සම්බුදුන් වහන්සේ රාත්‍රිය පහන්වූ කල්හි භික්ෂුසඞ්ඝයා රැස්කරවා භික්ෂූන්ට වදාරණසේක් 'මහණෙනි, ෂඩ්වර්ගික භික්ෂුහු පෙරටු පෙරටුව ගොස් සථවිර භික්ෂූන් වහන්සේලාව සෙනසුන් වැළකුවෝ සැබෑ දැ? යි විචාරා වදාළසේක. භාග්‍යවතුන් වහන්ස, සැබෑව"යි කීවාහුය. ඉක්බිත්තෙන් ෂඩ්වර්ගික භික්ෂූන්ට ගර්හාකොට ධර්මකථාව වදාරා භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට 'මහණෙනි, අග්‍ර ආඝන අග්‍ර උදක අග්‍රපිඩු කවරුන්හට ලබන්නට සුදුසුදැ"යි විචාරා වදාළසේක. "සමහර භික්ෂූහු ක්ෂත්‍රිය කුලයෙන් පැවිදිවූවෝය. සමහර

නොණක් බ්‍රාහ්මණ කුලයෙන් මහණවූවෝය, ගෘහපති කුලයෙන් මහණවූවෝය, ඔවුන්ට සුදුසුය යි කීවාහුය. සමහර කෙනෙක් "විනයධර භික්ෂූහුය, ධර්මකථික භික්ෂුහුය, ප්‍රථමධ්‍යානලාභීය, තෘතීයධ්‍යානලාභීය, තෘතීයධ්‍යානලාභීය" චතුර්ථධ්‍යානලාභීය"යි කීවාහුය. සමහර කෙනෙක් "සෝවාන්ය, සකෘදාගාමිය, අනාගාමිය අර්හත්ය, ත්‍රිවිද්‍යාවට පැමිණියාහ. ෂඩභිඥාවට පැමිණියෙහුය" යි කීවාහුය.

මෙසේ ඒ භික්ෂූන් විසින් තම තමාගේ අභිප්‍රාය වශයෙන් අග්‍ර ආසනාදියට සුදුසු භික්ෂූන් කීකල්හි සර්වඥයන් වහන්සේ වදාරණසේක්, "මහණෙනි, මාගේ ඝාසනාදියෙහි අග්‍රආසනයට පැමිණ ක්ෂත්‍රිය කුලයෙන් පැවිදිවූයේ පමණ නොවෙයි, බ්‍රාහ්මණ කුලයෙන් පැවිදිවූයේ පමණ නොවෙයි, ගෘහපති කුලයෙන් පැවිදිවූයේ පමණ නොවෙයි, විනයධර තැනැත්තේ ද පමණ නොවෙයි සූත්‍රාන්තික තැනැත්තේද පමණ නොවෙයි, අභිධර්මී දන්නා තැනැත්තේද පමණ නොවන්නේය. ප්‍රථමධ්‍යානාදී වූ ධ්‍යානලාභීහුද පමණ නොවන්නේය. ශ්‍රෝතාපත්‍යාදිවූ මාර්ඵල ලාභීහුද පමණ නොවන්නේය. වැලිදු වනාහි 'මහණෙනි, මේ ශාසනයෙහි පටිපාටියවූ පරිද්දෙන් වැඳීමද ඝුනස්තෙන් හැඟීමද, අඤ්ජලි කර්මය. ආදර ක්‍රියාද, කවුයුත්තේය, අග්‍ර ආසනය අග්‍ර උදකය අග්‍ර පිණ්ඩය ලැබ යුත්තේය. මෙහි මේ ප්‍රමාණය ඒ කාරණයෙන් වැඩිමහලු භික්ෂූන් වහන්සේ මෙහි දෙය ලැබීමට සුදුසුය. දැනුදු වනාහි මහණෙනි, ශාරිපුත්‍රස්ථවිර තෙම මාගේ අග්‍ර ශ්‍රාවකය, මා අනුව ධර්මචක්‍රය පවත්නේය, මට අනතුරුව සෙනස්සන ලබන්ට සුදුසුය. ඒ ශාරිපුත්‍රස්ථවිර තෙම මේ රාත්‍රියෙහි සෙනස්සනක් නොලබන සේක් වෘක්ෂ මූලයෙක්හි කල්යවූහ. තෙපි දැන්ම මෙසේ ගෞරව නැතිව ආදර නැතිවූවාහුය. කල් යත් යත් කවරක් හෙතාව වහන්නාහුදැ යි කිය. ඉක්බිත්තෙන් ඒ භික්ෂූන්ට අවවාද දෙනු පිණිස "මහණෙනි, පෙර තිරශ්චීනගත යෝද මෙසේ විසීම අපව සුදුසු නොවන්නේය. අපි ඔවුන් ගරු නොකොට ආදර නොකොට අභාජනීයවෘත්තීව වාසය කරම්හ. අප අතුරන් මහලු යමක්හු දැනගෙණ ඔහට අභිවාදනාදිය කරම්හ" යි කියා යහපත්සේ පරීක්ෂාකොට මේ තෙම අපට මහළුය 'යි දැන ඔහුව අභිවාදනාදිය කොට දිව්‍යලෝක මාර්ගය පුරමින් යියාහුය' යි වදාරා ඉකුත්වත් කථාව වදාළසේක.

යි වගිය දවස හිමාලවනයාගේ පාර්ශ්වයෙක්හි එක් මහා න්‍යග්‍රෝධ වෘක්ෂයක් අශ්‍රය කොට නිත්තිරය, වානරය, හස්තිය යි කියා යහළුවෝ තුන් දෙනෙක් වාසය කළාහුය. ඔවුන් තුන්දෙන ඔවුනොවුන් ගරු නොකොට ආදර නොකොට සහාගවෘත්තියෙන් යුක්තවූවාහුය. ඉක්බිත්තෙන් ඔවුන්ට මෙබඳුවූ සිතෙක් වූසේය. කෙබඳු සිතෙක් ද? "අපට මේසේ වාසය කරන්නට නුසුදුසුය. අපි අපගෙන් යමෙක් මහළුද? ඔහුව වන්දන මානනාදිය කෙරෙමින් වාසය කළමෝ නම් ඉතා යෙහෙක' යි සිතුවාහුය 'අපගෙන් කවරෙක් වැඩිමහළුදැ" යි සිතා එක්දවසක් මෙයට උපායෙක් ඇතැ යි සිතා නිත්තිරය, වානරය හස්තිය යන තුන්දෙනම නුගරුකක් මුල්හි හිඳ නිත්තිරය වානර යන දෙදෙන හස්තියා සමීපයෙන් විවාළාහුය. "යහළු හස්තිය, තෙපි මේ නුගරුක කවරක් ප්‍රමාණ කල් තැන්පටන් දන්නහිදැ 'යි විවාළාහ. හස්තිතෙම කියනුයේ "සඛදිනි, මම ලා පැල කල්හි මේ නුගගස බඩයට කොට ගියෙමි. යටකොට සිටි කල්හි වතාහි මේ වෘක්ෂයාගේ මුදුන් ශාඛාව මාගේ නාභිය ගැවෙන්නේය. මෙසේ මම මේ වෘක්ෂය පැලකල් පටන් දන්නෙමි' කිය.

නැවත තිත්තිරය හස්තියා දෙදෙන පූජාකෙරෙන බවත් ක්‍රමයෙන්ම වෘත රයාගෙන් විචාළාහුය. වානරතෙම කියතුයේ "යහළුවෙනි, මම වානර පැවිදු වූයෙන් බිම හිඳ ග්‍රීවය නොඔසුවාම මේ නුගපැලැටියගේ අක්දළු කැයෙමි. මෙසේ මම මේ නුගවෘක්ෂය කුඩාකල් තැන් පටන් දන්නෙමි' කීයේය

ඉක්බිත්තෙන් වානරයාය හස්තියාය යන දෙදෙන පූජාකෙරෙන බවත් ක්‍රමයෙන්ම තිත්තිර පණ්ඩිතයන්ගෙන් විචාළාහුය තිත්තිර පණ්ඩිතයෝද කී සේක. "යහළුවෙනි, පූජාකෙරෙන අසවල් තම් තැන මහත් නුගවෘක්ෂයක් වූයේය. මම වෘක්ෂයාගේ ඵලයක් අනුභව කොට මෙතැන්හි වර්ෂ්ස් ඵලුයෙමි. එයින් මේ වෘක්ෂය හටගත්තේය, මෙසේ මම මේ වෘක්ෂය හටගත් කල් තැන් පටන් දන්නෙමි. එසේ හෙයින් මම තොපට වැඩියෙන් ජාතියෙන් වැඩතරයෙමි" කීසේක. මෙසේ කී කල්හි වානරයාද හස්තියාද තිත්තිර පණ්ඩිතයන්ට කියන්නාහු "නුඹවහන්සේ අපට වැඩියෙන් වැඩතරය. අද මෙතැන් පටන් අපි නුඹ වහන්සේට සත්කාර ගරුකාර වන්දනමානනාදී වූ පූජාවෙන් ද දැදීමය. නුනස් නෙන් නැගීමය. අඤ්ජලිකර්මය සාමීචිකර්මයන්ද කරම්හ. නුඹවහන්සේගේ අවවාදයෙහිද සිටුම්හ. නුඹවහන්සේ වනාහි මෙතැන් පටන් අපට අවවාද අනු ශාසනා දෙව"යි කිවුය. එතැන් පටන් තිත්තිර පණ්ඩිතයන් වහන්සේ ඔවුන්ට අවවාද දුන්සේක. ශීලයෙහි පිහිටවූසේක. තෙමේත් පඤ්චශීලය සමාදන්ව රක්ෂාකළසේක. ඔහු තුන්දෙනම පඤ්චශීලයෙහි පිහිටුවා ඔවුනොවුන් ගෞරව ඇතිව සදෘශවූ ප්‍රවෘත්ති ඇතිව ජීවිතයාගේ කෙළවර දිව්‍යලෝකයෙහි උපන් නාහුය. ඔවුන් තුන්දෙනාගේ සිල්සමාදන්වීම් තිත්තිර බ්‍රහ්මචර්‍ය්‍ය නම් වූයේය. "මහණෙනි, තිරශ්චීනගත වූ ඔහු වනාහි ඔවුනොවුන් ගෞරව සහිතව සත්කාර සහිතව වාසයකළාහුය තෙපි මේසේ යහපත් කොට දෙසන ලද ධර්මය ඇති මාගේ ශාසනයෙහි පැවිදිව කවරහෙයකින් ඔවුනොවුන් ගෞරව නැතිව ආදර නැතිව වාසයකරන්නාහුද? මහණෙනි, මෙතැන්පටන් සඟ මහළු පිළිවෙළින් වැඳීමය, නුනස්නෙන් නැගීමය, අඤ්ජලිකර්මය සාමීචිකර්මය, මහණ වූ පිළිවෙළින් අග්‍ර ආසනය, අග්‍රඋදකය, අග්‍රපිණ්ඩය යන මේ සියල්ල මෙතැන් පටන් තොපට අනුදනිමි. අනිතව මහණ වූවාහු විසින් වැඩතරයාහට සෙනසුන් නොවැලැක්විය යුත්තේය. යමෙක් වැලැක්වූයේ ඒතාම් දුක්කටාපත්තියඤ"යි වදාරා මේසේ සම්බුදුන් වහන්සේ මේ ධර්ම දෙශනාව ගෙණහැර දක්වා මෙසේ වදාළසේක.

වෘද්ධාපචායන ධර්මයෙහි දක්ෂවූ යමෙක් කුලවෘද්ධ, ගුණවෘද්ධ, වයොවෘද්ධ තුන්දෙනා කෙරෙන් ගුණවෘද්ධ වයොවෘද්ධ යන දෙදෙනාගට පූජාකෙරේද? ඔහු ඉහත්මහාවයෙහි ප්‍රශංසාහීවෙති. මෙලොව කැර යායුතු පරලොවෙහි සුගතිය ට යන්නාහු වෙති. මහණෙනි, ක්ෂත්‍රියයෝ වෙත්වයි බ්‍රාහ්මණයෝ වෙත්වයි වෛශ්‍යයෝ වෙත්වයි ශූද්‍රයෝ වෙත්වයි ගෘහස්ථයෝ වෙත්වයි ප්‍රව්‍රජිතයෝ වෙත්වයි තිරශ්චීනගතයෝ වෙත්වයි යම්කිසි සත්ත්වකෙනෙක් ජ්‍යෙෂ්ඨාප චායන කර්මයෙහි දක්ෂවූවාහු ගුණයෙන් යුක්තවූ වයොවෘද්ධයන්ට ආදර කෙරෙත්ද? ඔහු මේ ආත්මභාවයෙහි ද ජ්‍යෙෂ්ඨාපචායන ක්‍රියාව කළාහුය යි ප්‍රශංසා ලබන්නාහුය. කාරජකායයාගේ භෙදයෙන් සුගතිලෝකයෙහි උපදනා හුය"යි වදාළසේක. මේසේ ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ජ්‍යෙෂ්ඨාපචායන කර්මයාගේ ගුණ වදාරා පූජාපරසත්ති ගළපා මේ තිත්තිර ජාතකය නිමා වදාළ සේක.

"එසමයෙහි හස්තියා නම් දැන් මහාමෞද්ගල්‍යායන ස්ථවිරවූසේක. වඳුරා නම් ශාරිපුත්‍රස්ථවිරවූසේක. තිත්තිර පණ්ඩිතව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ බම්ම වේදැ' යි තමන්වහන්සේ දක්වා වදළසේක.

---

## 38 ඛක ජාතකය

**ත**වද ලෝසවාම්වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩවසන සමයෙහි ථිවරවඩ්ඪකී නම් භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාරණලදී.

ඒ කෙසේද? යත්

දෙව්රම් වෙහෙර වැඩවසන එක්කෙණෙකුන් වහන්සේ කඩ කැපීම් ගෙත්තම් කිරීම් ආදියෙහි දක්ෂසේකි. එසේ හෙයින් උන්වහන්සේට ථිවර වඩ්ඪකීය යි නම්විය. දිරාගිය රෙදිකැබලි ගෙණ හසනකම්නත දක්වා සිවුරු ගෙත්තම් කොට රදා සුරුකිව තබනසේක.

සිවුරු ගෙත්තම් කරන්ට නොදන්නා භික්ෂූන්වහන්සේ අලුත් අලුත් පිළි උන්වහන්සේ සමීපයට ගෙණ ගොස් "මේ කඩ කපා දුනමැනවැ"යි කියන සේක. එකල ඒ මහණ කඩ කපා ගෙත්තම් කරණසේක්, කල් යවන්නේය. "මා පළමු තනාතුබූ සිවුරු ඇතැයි කියා අලුත් පිළි ගෙණ ජීර්ණවූ සිවුරු දෙන සේක්. ඒ සිවුරු වැලඳ මදක් කිළුටුවූකල උනුපැනෙහි ලා සෝදනසේක. එසමයෙහි ඒ ඒ තැන දිරුණු තැන් පෙණෙන්නේය. උන්වහන්සේලා බොහෝසේ කලකිරෙණසේක. මෙසේ අා අා භික්ෂූන්වහන්සේගෙන් අලුත් පිළි ගෙණ දිරාගිය සිවුරු දී වංවා කරණසේක් බොහෝ තැන ප්‍රකාශවූසේක. මුන් වහන්සේ පරිද්දෙන් පිටිසරත් එක් මහණෙක් වූසේය. ඒ මහණ දෙව්රම් වෙහෙර තමාසේම වංවා දන්නා එක්කෙණෙකුන් වහන්සේ ඇතැ යි යනු අසා සිතනුයේ නුවරවාසීහු "ඒ භික්ෂූහු රවටන්ට වුවමැනවැ"යි සිතා ඉතා නොතර රෙදි සිවුරක් කොට ගහපත්කොට රදා ඒ සිවුර වැළඳගණ දෙව්රම් වෙහෙරට ගිය සේක, අනික් මහණ ඒ භික්ෂූහුගේ සිවුර දැක ලොභ උපදවා තමන් රවටන්නට අා බව නොදැන කියනසේක් "සාමීනි, මේ සිවුර නුඹවහන්සේ විසින් කරණලද්දේදැ' යි විචාළේය. "එසේය අප විසිනැ' යි කී කල්හි එසේවී නම් මේ සිවුර මට දුනමැනැව "යි කීසේක. "කුමක් කියවිද? පැවිද්දෙනි, අප ඉන්නේ පිටිසරය, චීවරාදී ප්‍රත්‍යය දුර්ලභය, නොපව මේ සිවුරදි කුමක් පොර වම්දැ 'යි කීසේක. "සාමීනි, අපගේ අළුත් පිළි ඇත' ඒ ඇරගෙණ සිවුරු කොට ගෙණ ගතමැනවැ"යි සිවුර මට දුනමැනවැ"යි කීසේක. "එසේ නොප ඉල්වන කල සිවුර ගණුව"යි කියා අළුත් පිළි ගෙණ සිවුර දී වංවාකොට හියාහ. උන් වහන්සේ සිවුර වැළඳ කිපදවසකින් උනුපැනෙහි ලා සෝදනසේක් නොයෙක් තැන ඉරී රෙදි බව දැන "පිටිසර මහණ මා වංවා ඇකලේය"යි ලජ්ජාවූසේක.

ඉක්බිත්තෙන් "පිටිසර වංවාදන්නා මහණෙක් දෙව්රම්වෙහෙර වංවා දන්නා මහණකු රවටනලදැ"යි භික්ෂූන් මධ්‍යයෙහි ප්‍රකාශවිය, මේ කථාව එක් දවසක් දම්සභාමණ්ඩපයේ වැඩහුන් භික්ෂූන්වහන්සේ කිය කියා උන්තැනට

බුදුරජානන් වහන්සේ තුන්තරා ගමනින් එක්තරා ගමකට වැඩ වදරා පණවනලද බුඩාසන මසකයෙහි සවණක් සතරසින් දිලිහි දිලිහි වැඩහිඳ මිහිරි වූ කවහඬින් බ්‍රහ්මස්වරා විහිදුවමින් "මහණෙනි, මා එන්නාට පළමු වෙන් කවර කථාවකින් යුක්තව උනුදැ"යි විවාරා "සවාමීනි මෙතම් කථාව කින් යුක්තව උනුම් හ"යි දැන්වූ කල්හි "මහණෙනි, දැන් මිතු නොවෙයි, පිටි සර මහණ දෙවිරම් වෙහෙර මහණහු පෙරත් රුවටුයේ වේදැ"යි වදරා ඒ භික්ෂූන් විසින් ආරාධිත වූ සේක් අතීත කථාව දක්වා වදාළසේක්.

යි වගිය දවස අප ශ්‍රී මහාබොධිසත්ත්වයෝ එක්තරා වනප්‍රදෙශයක පියුම් විලක් ඇසුරුකොට සිටි ලුණුවරණගසෙක රුක්දෙවිව උපන්හ, එසම යෙහි එක්තරා කුඩා විලෙක නියං සමයෙහි දිය මදවූයේය. එහි කුඩමස්සෝ බොහෝය එක් කොකෙක් ඒ කුඩමස්සන් දැක "එක් උපායකින් මුන් රවටා ගෙණ ගොස් මස්කන්ව උවමැනවැ"යි සිතා ඒ විලට ගොස් දියතෙලවර කරබා ගෙණ බකපපස් අගමා සිතිවිල්ලක් සිතා උන්නේය. කුඩමස්සෝ ඔහු දැක ලහව ගොස් "සවාමීනි, කුමක් සිතා ඉඳින්නේදැ"යි විවාළාහුය. කොකා කියනුයේ "තොපට වූ විපත සිතමින් ඉන්නෙමි" කීය. "සවාමීනි අපට වූ විපත කුමක් දැ"යි කී කල්හි කොකා කියනුයේ "මේ විල දියත් මදය, තොපට ගොදුරුත් මදය, නියඟත් මඟත් බැවින් කුඩමස්සන්ට වූයේ මහත් දුකකැ"යි සිතා ඉඳිමි, තොපි මා කීවා සරවූ නම් තොප හැම එකින් එකා තුඩින් බැහැගෙණ ගොස් පස්පියුමෙන් සැදි මඟවිලකට අරින්නෙමි වේදැ"යි කීයේය. එවිට කුඩමස්සෝ කියන්නෝ "සවාමීනි කොකාතෙනි, කප අටගත්දු පටන් කුඩවස්සන්ට වැඩ කට කාරියක් සිතූ කෙණෙක් නම් නැත. දැනුදු තෙපි එනාහි කුඩමස්සන් වංචාකාට එකින් එකා කනු කැමතිව කළ උපායෙකැ සි සිතමිහ"යි කීහ. කොකා කියනුයේ "තොපි එසේ නොකියව, මාගේ බස නොඅදහව් නම් එක කුඩමස්සකු එවා විල ඇති බව ඔහු අකින් විචාරා දැනගණුව"යි කීයේය. එවිට කුඩමස්සෝ ඔහුගේ වංචා නොදැන "මේ කොකා ධර්මිෂ්ට එකෙකැ සි එක්සිත්ව විල බලා එන පිණිස එක් කනපද්දකු දුන්හ. කොකාද ඒ කනපද්දා තුඩින් බැහැගෙණ ගොස් ඒ විලට හැර සියලු විල ඉසුරු දක්වා නැවත ගෙණ කුඩමස්සන් සමීපයට හැරියේය. ඒ කනපද්දු විලෙහි මහිම කුඩමස්සන්ට විසතරකොට කීයේය. ඒ සියලු මත්ස්‍යයෝම ඒ කොකාට කියන්නාහු "සවාමීනි, අප හැම ඒ විල ලුව මැනපිැ"යි කීහ.

"කොකාද යහපතැ"යි කියා පළමුකොට කනපද්දම බැහැගෙණ ගොස් විල දක්වා විල ඉවුර පිට සිටි ලුණුවරණ ගසෙහි සැඟවී ඉඳ තුඩින් ඇත කන පද්දු මරා මස්කා ඇට ගසමුල එළා නැවත විලට ගොස් "ඔහු එන්නා විලව ඇර පිම්, වෙන එකෙක් එව"යි කියා ඔහුද ගෙණ ගොස් මස් කා මෙමී නියායෙන් එකින් එකා ගෙණ ගොස් මස්කා සියලු කුඩමස්සන් නිමාවට ගියසේ දැන නැවත විලට ආයේ එක් කකුළුවකු ඉතිරිවූයේ දැක ඔහුද තනු කැමතිව කකුළුවාට කියන්නේ "එම්බා පින්වත් වූ කකුළුව මා විසින් සියලු මත්ස්‍යයෝම පස්දියු මෙන් සැදි මඟ විලෙක්හි හරණ ලද්දේය. තෙපි මෙතන තනිව කුමිකට ඉඳුද? ඉදින් තෝ කැමැත්තෙහිනම් තාත් ගෙණගොස් විලට අරින්නෙමි වේදැ"යිකීය.

එවිට කකුළුවා කියන්නේ ''එම්බා කොකානෙනි, ඒ විලට ගෙණයන්නේ කෙසේද''යි විවාළේය. ''තුඹින් බැහැගෙණ යෙම්'' කීයේය. ''එසේ ගෙණ යෙතොත් තොපි මා බිම් ඵලව, එබැවින් නොප ගෙණයන්නාට බම්'යි කීය. කොකා එවිට කියන්නේ ''නෙපි එසේ නොබව, යහපත්කොව අල්වාගෙණ යම්'' කිවුය. එවිට කකුළුවා සිතන්නේ ''මේ කොකා විසින් එක කුඩමස්සකුත් විලට හැරියේ නැත. හැම මස් කෑයේය. ඉදින් මාත් විලට ගෙණ ගොස් විල ලුවොත් ලූ නියාමය, විලට නොහැරියේ නම් මොහුගේ බොටුව කපා දිවි තොර කෙරෙම් යි සිතා කොකාට කියන්නේ ''යහලු කොකානෙනි, නොප යහපත් කොට අල්වාගත නොහෙයි. අපගේ යහපත් ඇල්වීමෙක් ඇත. ඉදින් තාගේ බොටුව අපගේ නලින් අල්වන්ට ලැබේ නම් නොප හා සමග යන්නෙම් වේදැ''යි කිවුය. එවිට කොකා තුමූ රවටන්ට කී බව නොදැනී 'යහපතැ' යි පිළිගත. කකුළුවාද තමාගේ නලින් අඩුවකින් ඇල්ලුවාක් මෙන් ඒ කොකාගේ බොටුව තරව අල්වාගෙණ 'දැන් නෙපි යව''යි කීය. කොකාද කකුළුවා ගෙණ ගොස් විල දක්වා ලුණුවරණ ගස දිසාවට යන්ට පවන් ගත. එවිට කකුළුවා කියන්නේ ''ඇයි මා විලට නොහැර කොයිගෙණ යවූදැයි කීකල්හි ''කිමෙක්ද? කකුළුව,නෝ මට මාහම් කියයිද? නෝ මගේ නගකගේ බුහුනනියකගේ පුනෙක්ද? නෝ මා තා උසුලා ඇවිදිනා කොල්ලකු යි සිතයි ද? නෙල ලුණුවරණගසමූල නිබෙන කටුගොඩ බල, මත්ස්‍යයන් යම්සේ අනුභවකෙළෙම් ද? තාත් එසේම අනුභව කෙරෙම්''යි කීය, එවිට කකුළුවා කියන්නේ ''එම්බා කොක, ඒ කුඩමස්සෝ තමන් නුවණ මඳ හෙයින් තට ගොදුරුවූහ. එසේ අප රවටන්ට නොපිළිවන, තාම විනාශයට පමුණුවම්, නෝ නුවණ නැති හෙයින් කැවිලි කෑ පමණක් මුත් තා රැවටුනු බව නොදන්නෙහිය මියගොත් දෙන්නාම මියම්හ. දැන් තාගේ බෙල්ල කපා බිම හෙලම්' කියා අඩුවකින් ඇල්ලුවාක් මෙන් තමා නලින් තරව ඔහුගේ බොටුව ඇල්විය. එකල කොකා කරකැවී බෙල්ල නමා කට දල්වා ඇස් උඩ ඉඳුවා කඳුළුවම්මා මරණ හයින් තැතිගෙණ''සවාමීනි කකුළුවානෙනි, නුඹට කිසි අවැඩක් නොසිතම්,නොකරම්, මට ජීවිතදානය දුන්නමැනැවැ''යි කීය. ''එසේ වී නම් සෙමෙන් අනසෙන් බැස මා නෙල විලට ඇරපියවයි' කීය. එවිට කොකා ද නැවත කරකැවී ගොස් විලට බැස විල කෙළවර මඩපිට කකුළුවා තුබූයේය. කකුළුවා කතුරකින් පියුම්දණ්ඩක් කපන්නාක් මෙන් කොකාගේ බොටුව කපා දියට වන්නේය. ඒ ආශ්චර්‍ය්‍ය දුටු ලුණුවරණ ගසෙහි වසන දේව තාවා සාධුකාරදී සියලු වනය උන්නාදකොව මිහිරි කවහඬින් මෙසේ කීයේ යි. ''මේ ලෝකයෙහි අතිශයින්ම වඤ්චාබුඩි ඇති තැනැත්තේ හැමතැනම ඒ වඤ්චා වෙන් සැපසේ පිහිටන්ට නොපිළිවන හෙවත් එකතැනකදී දෙතැනකදී වඤ්චා වෙන් ජයගත නොහැක්කේය. ඒ සොරසිත් ඇති පාපී සත්ත්වයා තමාට අවැඩක් ලබන්නේය. කැමති දෙය නොලබන්නේය. කුමක් මෙන්ද යතහොත් කකුළුවාගෙන් ශ්‍රීවෙජ්දයට පැමිණි කොකා මෙහි. හෙවත් යම්සේ කකුළුවා කොකාගේ බොටුව කැපීද? එපරිද්දෙන් ම වන්නේය'යි මේ අර්‍ථය ප්‍රකාශ කොට බොධිසත්ත්වයෝ වනය එකනින්නාද කොට ධර්‍මදේශනා කළසේක. සුරාසුරවර වක්‍රවාරු චූඩාමණිමරීචිසඤ්චය පරිචුම්බිත වරණතල මඤ්ජුබාෂාලා ඇති බුදුරජානන් වහන්සේ වදාරණසේක් ''එම්බා මහණෙනි, දැන් මතු නොවෙයි,පෙරත් වඤ්චාදන්නවුන් වඤ්චාකෙළේම වේදැ''යි වදාරා මේ ධර්‍මදේශනාව පුන්‍යාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි කොසඹ තම් දැන් දෙවිරම් වෙහෙර වසන කෙරෙහිත සවහාවේ ඇති චිවරවඩුකී මහණ වන්නේය. එකල්හි කකුළුවා තම් දැන් මේ පිටිසර වසන වඤ්චාබුඩි දන්නා මහණ වන්නේය. එකල ලුණුවරණගසෙහි අධිගෘහීත දිව්‍යපුත්‍රයා තම් ලෝකදිවාකරවූ මම් ම වේදැ"යි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

---

## 39
## නන්ද ජාතකය

තිවද එක්සමයෙක්හි බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන-සේක් සැරියුත් මහතෙරුන් වහන්සේගේ සඬිවිහාරික භික්ෂුකෙනෙකුත් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ භික්ෂූන් වහන්සේ වනාහි කිකරුය, වචනයන් ඉවසනසේක, සැරියුත් මහතෙරුන් වහන්සේට මහත් ව්‍යායාමයෙන් උපකාර කරණ සේක.

ඉක්බිත්තෙන් එක්සමයෙක්හි සැරියුත් මහතෙරුන් වහන්සේ බුදුරජා-නන් වහන්සේට සැළකොට දනවු සැරිසරා වඩනාසේක් දක්ෂිණගිරි ජනපදයට වැඩිසේක. කිකරු ඒ භික්ෂූන් වහන්සේ ඒ ජනපදයට වැඩි කල්හි දැඩි මන් ඇතිව තෙරුන්වහන්සේගේ වචනය නොකරණසේක. "ඇවැත්නි මෙනම් දෙය කරව යි කී කල්හි වනාහි තෙරුන්වහන්සේට ප්‍රතිපක්ෂ වූයේය. සථවිර යන් වහන්සේ ඔහුගේ අදහස් නොදන්නාසේක., තෙරුන්වහන්සේ ඒ ජනපද යෙහි සැරිසරා කැවත ජේතවනාරාමයට වැඩිසේක.ඒ භික්ෂුන්වහන්සේ තෙරුන් වහන්සේට ජෙතවන විහාරයව ආ කල් තැන් පටන් කැවත එබඳු ගුණයෙන් යුක්තවූසේක. තෙරුන්වහන්සේ සම්‍යක්ෂයන් වහන්සේට දැන් වූසේක. "සවාමීන් වහන්ස, මගේ එක් සඬිවිහාරික භික්ෂූ කෙනෙක් එක් තැනෙක්හි සියයක් දී ගත් දැසයකු මෙන් වන්නේය. එක් තැනෙක්හි දැඩිමන් ඇතිව මෙනම් දෙයක් කරව යි කියනු ලබන්නේ ප්‍රතිපක්ෂ වන්නේය" යි දැන්වූසේක.

සම්‍යක්ෂයන් වහන්සේ වදාරණසේක් "ශාරිපුත්‍රස්ථවිරයෙනි, මේ මහණ තෙම මෙබඳු ශීලීවූයේ දැන්මතු නොවෙයි, පෙරත් මේ තෙම එක් තෙනකට ගියේ සියයක්දී ගත් දැසයකු මෙන් වන්නේය. එක් තෙනකට ගියේ ප්‍රතිපක්ෂව පිළිසතුරු වන්නේය" යි වදාරා තෙරුන්වහන්සේ විසින් යාචඤ්ඤාකරණ ලදුව ඉකුත් වත් ගෙණහැර දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝධිසත්ත්වයන් වහන්සේ එක් කෙළෙඹිකුල යෙක්හි පිළිසිඳ ගත්සේක. අප මහබෝසතාණන් වහන්සේගේ යහළු වූ එක් කෙළෙඹි පුත්‍රයෙක් ඇත්තේය. හෙතෙම වැඩිය, ඔහුගේ භාර්‍යාව වනාහි ලද රැස, ඒ තරුණ ස්ත්‍රී නොමෝ වැඩ පුරුෂයා නිසා පුත්‍රයකු ලැබීය. ඒ පුරුෂ තෙම සිතනුයේ "මේ ස්ත්‍රී තරුණ බැවින් මගේ ඇවැමෙන් කිසියම් පුරුෂයකු ගෙණ මේ වසතුව නසන්නීය, මාගේ පුත්‍රයාහට නොදෙන්නීය, මම මේ ධනය පෘථිවිගත කෙළෙම් නම් යෙහෙකැ"යි සිතා ගෙයි නන්ද නම් දැසයා කැඳවාගෙණ

වනයට ගොස් එක් තැනෙක්හි ඒ වස්තුව නිධානගත කොට ඔහට කියා "පින්වත් නන්ද නම් දැසය, මේ වස්තුව මගේ ඇවැමෙන් මගේ පුත්‍රයාහට කියව, ඒ වස්තුව පරිත්‍යාග නොකරවය' යි කියා ඕනට අවවාද දී කාලක්‍රියා කෙළේය. ඔහුගේ පුත්‍රයාද අනුක්‍රමයෙන් වැඩිවියට පැමිණියේය. ඉක්බිත්තෙන් ඔහට මැනියෝ මෙසේ කිවුය. "පුත්‍රය, තොපගේ පියානෝ නන්ද නම් දැසයා කැඳවා ගෙණ වස්තුව නිධාන කෙළේය. ඒ වස්තුව ගෙන්වාගෙණ කුටුම්බ සංඛ්‍යාපනය කරව"යි කිවුය. ඒ පුත්‍රතෙම එක්දවසක් නන්ද නම් දැසයාහට කියනුයේ "මලනු වෙනි, මගේ පියානන් විසින් කිසි වස්තුවක් නිධාන කරණ ලද්දේ ඇද්ද" යි කියේය. එසේය, සවාමීන් වහන්ස"යි කීයේය. "ඒ වස්තුව කොතැන්හි නිධානකරණලද්දේද"යි විචාළේය. "ස්වාමීන්වහන්ස, වනයෙහිය"යි කියේය. "එසේ වී නම් යම්හ"යි කියා උදැල්ලක් හා කූඩයක් ගෙණ නිධානය තිබෙන තැනට ගොස් "මල, වස්තුව කොතැන්හිද?" යි කියේය, නන්ද නම් දැසයා තැගී වස්තුව මත්තෙහි සිට වස්තු නිසා මානය උපදවා "කොල දැසි පුත්‍රය, මෙහෙකරුව, තොපව මෙතැන්හි වස්තු කොයින්ද"යි කුමාරයාහට ආක්‍රොශ කෙළේය. කුමාරතෙම ඔහුගේ පරුෂ වචන අසා නොඇසුනාක් මෙන්ම "එසේ වීනම් යම්හ"යි කියා ඔහු කැඳවාගෙණ ආපසු අවුත් තැවත දෙතුන් දවසක් ඉක්මවා ගියේය. නන්ද නම් දැසතෙම එලෙසම ආක්‍රොශ කරන්නේය. කුමාරයා ඔහු හා සමග පරුෂවචන නොකියාම ආපසු අවුත්"මේ දැසතෙම මෙතැන් පටන් වස්තුව කියන්නෙම් කිය කියා යන්නේය. හොස් වනාහි ආක්‍රොශ කරන්නේය. එහි කාරණා නොදන්නෙම්. මාගේ පියානන්ගේ යහළුවූ කෙළෙඹි පුත්‍රයෙක් ඇත්තේය. ඔහු අතින් විචාරා දැනගණිමි"යි කියා බොධිසත්ත්වයන් වහන්සේගේ සමීපයට ගොස් ඒ සියලු ප්‍රවෘත්තිය කියා "පියානෙනි, කවර කාරණාවක් දැ"යි විචාළේය, බොධිසත්ත්වයන් වහන්සේ කියනසේක් "පුත්‍රය යම් තැනෙක්හි සිට නන්ද නම් දැසතෙම ආක්‍රොශ කරන්නේද? තොපගේ පියානන් සන්තක වස්තුව එතැන්හිමය. ඒ කාරණයෙන් යම් තැනෙක්හිදී තොපව නන්ද නම් දැසතෙම ආක්‍රොශ කරන්නේ ද? එතැන්හිදීම ඔහු කොල දැසය, වරෙව සි කියා ඇද දමා උදැල්ලක් ගෙණ එතන බිඳ කුලසන්තක වස්තුව නිකුත්කොට දැසයා ලවා ඔසවා වස්තුව ගණුව' යි කියා මෙසේ කීසේක.

කුලජාත දැසියගේ පුත්‍ර වූ නන්ද නම් දැසතෙම යම් තෙතෙක්හි සිවියේ පරුෂකොට ගර්හාකෙරේ ද? බෙණේද? ශොභනවණී, සාමාන්‍යයෙන් ස්වර්ණී රජතමණී මුක්තාප්‍රවාලාදීන් නිවාත්ත වූ රාශියද ස්වර්ණීමාලා ද, යම් තැනෙක්හි ඔහු සිටී ද? එතැන්හිය"යි සිතමි" කියා බොධිසත්ත්වයන් වහන්සේ කුමාරයාහට වස්තු ගන්නා උපාය වදාළසේක. කුමාරතෙම බොධිසත්ත්වයන් වහන්සේට වැඳ ගෙට ගොස් නන්ද නම් දැසයා කැඳවාගෙණ නිධාන තිබෙන තැනට ගොස් අවවාද කී පරිද්දෙන් පිළිපැද ඒ වස්තුව ගෙණ කුටුම්බ සංඛ්‍යාපනය කොට බොධිසත්ත්වයන් වහන්සේගේ අවවාදයෙහි සිටියේ දැනශීලාදීවූ පින්කම් කොට ජීවිතයාගේ කෙළවර කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියසේක.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ වදාරණසේක් "මේ මහණ පෙරත් මෙබඳු ශීලීවූයේය"යි වදාරා මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ නන්ද ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි නන්ද නම් දැසෙහෙම මේ සැරියුත් මහතෙරුන් වහන්සේගේ සඬිවිහාරිකවූ භික්ෂූහුය, නුවණැත්තා වූ කෙළෙඹි පුත්‍රව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 40
## ඛදිරඛාර ජාතකය.

තවද එක්සමයෙක්හි මෛත්‍රී නැමැති ජලයෙන් නිමවන ලද කොපාන්නි ඇති තිලෝගුරු බුදුරජාන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩ වසන සේක් අනේ පිඬු මහසිටානන් අරහයා මේ ජාතකය වදාළසේක.

අනේපිඬු මහසිටානෝ විහාරයම උදෙසා සුපණස් කෙළක් ධන සම්‍පත්තියෙහි විසුරුවා රත්නත්‍රයෙහි සරණ හාර අන් තැනෙක්හි රත්න සංඥවක් නූපදවා සම්‍පදයන් වහන්සේ දෙවිරම් වෙහෙර වසන කල්හි දවසක් පාසා තුන්විටකම උපස්ථානයට යන්නාහුය. උදැසනම එක්වරෙක යෙති. දවල් බත් අනුභව කොට ඉක්බිති එක්වරෙක යෙති. සවස් වේලෙහි එක්වරෙක යෙති. තවත් අතරතුරෙහි උපස්ථානයට යෙති.

මෙසේ යන්නාවූ අනේපිඬු මහසිටානෝ "කුමක් ඇරගෙණ අවුදෝහෝයි සාමණේරයන් වහන්සේ හා ලදරු භික්ෂූන් වහන්සේ මාගේ අත බලනසේක් වේදැ යි කියා සිස් වූ අතින් එක දවසකුත් නොයිය විරැය, උදැසන යෙත් නම් කැඳ අවුළුපත් ගෙන්වා ගෙණ යෙති. වළඳා අනන්තරයෙහි යෙත් නම් ගිතෙල් මී උක්සකුරු ආදිය ගෙන්වා ගෙණ යෙති. සවස් වේලෙහි යෙත් නම් සුවඳ මල් හා සිවුරු පිළි ආදිය ගෙන්වාගෙණ යෙති. මෙසේ දවසක් පාසා කරන්නා වූ වස්තු පරිත්‍යාගයෙහි ප්‍රමාණයෙක් නැත්තේය. වෙළඳුම් කරන්නා වූ බොහෝ දෙනෙක් ඒ සිටානන්ට පත් ලා අටලොස් කෙළක් වස්තු නය ගත්තාහුය. ඒ වස්තු මහසිටානොත් නො එලවති. අනික් මුතුන් මිත්තන් ආදීන් සන්තක අටලොස් කෙළක් වස්තු භාණ්ඩාගාරයෙහි නිධානකොට තබන ලද්දේය. ඒ වස්තු වරින් වර ගඟ මහවතුර ඊමෙන් ගංඉවුර බුන්කල්හි මහා සමුද්‍රයට වැද අස් ඔබන ලද පරිද්දෙන්ම සැලවිල් මහාසමුද්‍රය ඇතුළෙහි පෙරලී පෙරලී ඇවිදිනාහ. සිටානන්ගේ ගෙයි පන්සියයක් භික්ෂූන් වහන්සේට නිරන්තරයෙන් බත් තබා දෙන ලද්දේය. ඒ සිටානන්ගේ ගෙය පන්සියයක් භික්ෂු සඞ්ඝයා වහන්සේට සතර මංසන්ධියක කරණ ලද පොකුණක් හා සමාන වන්නේය සියලු භික්ෂූන් වහන්සේට මව්පිය තනතුරෙහි පිහිටියෝය. එසේ හෙයින් ඒ සිටානන්ගේ ගෙට බුදු රජානන් වහන්සේත් වඩිනාසේක. අසූමහ සව්වන් වහන්සේත් වඩනාසේක. සෙසු යන එන භික්ෂූන් වහන්සේගෙන් පමණක් නම් නැත්තේය. ඒ සිටානන්ගේ ගෙය සත්මහලක් ඇත්තේය, දෙරටු සතකින් හෙබියේය.

ඒ සිටානන්ගේ සතරවෙනි දෙරටුවෙහි එක් මිථ්‍යාදෘෂ්ටි දෙවිදුවක් වසන්නීය. සම්‍පදයන් වහන්සේ සිටානන්ගේ ගෙට වදනා කල්හිත් පිටතට වඩනා කල්හිත් තමාගේ විමන සිටිනට අසම්ඵිව දරුවන් වඩාගෙණ බැස බිම සිටිනීය. අසූමහ සව්වන් වහන්සේ හා අවශෙෂ සප්තවිරයන් වහන්සේ වදනා කල්හිත් විමනින් බැස බිම සිටිනීය. ඕතොමෝ මෙසේ සිතුවාය. "ශ්‍රමණ භවත් ගෞතම

යානන් වහන්සේත් ශ්‍රාවකයන් වහන්සේත් මේ ගෙට වදනා කල්හිත් නික්මෙන කල්හිත් මට සැපයෙක් නැත්තේය හැම කල්ම බැස බිම සිටින්ට නොපිළිවන්වන්නේය. යම්සේ මොහු මේ ගෙට නොවදිත් නම් මා විසින් එපරිද්දෙන් කරන්ට වටනේය''යි සිතා ඉක්බිත්තෙන් එක් දවසක් සිවානන්ගේ සියලු කාරියෙහි නියුක්ත පුරුෂයා වැදහොත් හැනට ගොස් ආලෝකයක් පතුරුවා සිටියාය. ''මේ තෙම කවුරුදැ''යි කී කල්හි ''මම සතර වන දෙරටුවේ අධිගෘහිත දේවතා දූය''යි කිවුය. ''කුමක් පිණිස අවුදැ?''යි විමාළ කල්හි තොපගේ සිවානන්ගේ ක්‍රියාවක් නුදුටුවුද? හවන්ගේ අන්තිම අවසථාව නො බලා වස්තුව පිටත් කොට ශ්‍රමණ භවත් ගෞතමයන්ම පුදනි. වෙළඳුමක් නොකරති. පොලියක් පිට නොලති. අවශෙෂ වූ සිව්පස් ආදී කිසි කම්මානතයකුත් නොකරවති. එසේ හෙයින් සිවානෝ තමන්ගේ කාර්යය යම්සේ කරවත් නම් ශ්‍රමණ භවත් ගෞතමයෝ යම්සේ ශ්‍රාවකයන් හා සමග මේ ගෙට නොවදිත් නම් එපරිද්දෙන්ම හොප සිවානන්ව අවවාද කරවයි'' කිවුය.

ඉක්බිත්තෙන් ඒ දේවතාදුවව සිවානන්ගේ කාරිය කරන්නාවූ පුරුෂයා කියන්නේ ''නුවණැත්තාවූ දිව්‍යසත්‍රිය සිවානන් වහන්සේ වස්තු වියදම් කරණසේක් නෛයර්‍යාණික වූ සබුදු ශාසනයෙහි වියදම් කළසේක. ඉදින් ඒ සිවානන් වහන්සේ මාගේ කෙස් වැටිය අල්වා ඇදගෙන ගොස් විකුණනසේක් වී නම් මම ඊට උත්තරයක් නොකියමි එසේ හෙයින් තෝ මෙතැන නොසිට පලායව''යි භයගැන්විය. නැවත එක්දවසක් සිවානන්ගේ වැඩිමහලු පුත්‍රයන් සමීපයට ගොස් එසේම අවවාද කළාය. ඒ ප්‍රධාන පුත්‍රතෙමේත් පළමු පරිද්දෙන්ම භය ගැන්වූයේය. සිවානන් හා සමග කථා කරන්ට අසමර්ථ වන්නීය, සිවානන්ට නිරන්තරයෙන් දන්දීමෙන් හා වෙළඳුම් නොකිරීමෙන් අය මද වූ කල්හි වස්තුව නිමා ගියේය. ඉක්බිත්තෙන් ඒ සිවානන් ක්‍රමයෙන් දිළිඳු බවට පැමිණි කල්හි අදිනා පිළිත් නෝනා හිඳිනා දැත් හෝජනයත් පෙරසේ නොවන්නේය. මෙසේ දුප්පත් බවට පැමිණෙන් නිසැකයෙන් වහන්සේට දන්දෙනි, ඉඩ්‍රා කොට දන් දෙන්ට අසමර්ථයෝය.

ඉක්බිත්තෙන් එක් දවසක් නමස්කාර කොට උන්නාවූ සිවානන්ට සම්බුදු යන් වහන්සේ වදුරණසේක් ''සිවානෙනි තව දක්වා තොපගේ ගෙයි දන් පවතී දැ'' යි විමාළසේක. එබස් ඇසූ සිවානෝ කියන්නෝ සවාමීනි, තව දක්වාත් දෙමින් සිටියෙමි. දෙන පමණක් විනා සකස්කොට දිය නො නෙමි. කාඩි දෙවනු කොට නිවුඩුසාලේ බත් දෙමින් සිටියෙමි.'' කිවුය එකල්හි සම්බුදුයන් වහන්සේ වදුරණසේක් ''සිටානෙනි, තොපි රුක්ෂවූ භොජනය දෙමි යි සිතා නාකුළුවවයි සිතා ප්‍රසන්න කල්හි බුඩ ප්‍රත්‍යෙක බුඩ ආර්‍යශ්‍රාවකයන්ට දුන්නාවූ දානය රුක්ෂ නම් නොවෙයි. කුමක් හෙයින්ද? යත් විපාක මහත් බැවිනැ''යි වදාළසේක. සිත ප්‍රසන්න කරන්ට සමර්ථ නැනැත්තහුගේ දානය රුක්ෂ නම් නොවෙයි, එ මෙසේ දතයුත්තේය,

''නාසේ චිත්තෙන පසන්නනමහි-අපපිඩා නාම දකිණා
තථාගතෙ වා සඞ්ඝඩෙ-අථවා තසස සාවකෙ
න කිරසේ අනොමදසසි-සුපාරිචරියා බුඩඩසු අප්පිඩා
සුඛඩාය ආලොණිඩායව-පසස එලං සුමමාස සිඞඩියා''

තවද සිටානන්ට සජීඥයන් වහන්සේ වදුරණසේක් සිටානෙහි, නොපි වූකලී රූඤවූ දූනය දෙන්නාහු අෂ්ටාඃඝ්‍ය පුද්ගලයන්ට දෙව මම වේලාම තම් බ්‍රාහමණ කාලයෙහි සියලු දඹදිව තගුල් උඩ බදවා සියලු යාචකයන්ට සත් රුවන් දෙන්නෙම් පඤ්චමහා ගංගාවෙහි ජලය එක ගංගාවකට වැද මහ වතුරු මඩනා කලක් මෙන් මහදන් පවත්වන්නෙම් සරණගත වූ පන්සිල් රක්නා වූ කිසිවක්හු නොලදිමි. දකබිණෙය්‍ය පුද්ගලයෝ නම් ේසේ දුර්ලභ වන්නාහුය. එසේ හෙයින් තෙපි කවර කාරණයකින් මාගේ දූනය රූඤය සකස් නොවෙයි කියා සිත අකුළුවවුදූ?"යි වදුළසේක. මෙසේම කියා නැවත වේලාම සූත්‍රය වදුළසේක.

ඉක්බිත්තෙන් ඒ දේවතා දූ ඉසුරුමත් කල ඒ සිටානන් හා සමග කථාකරන්ට අසමර්ථවූ තැනැත්නී දැන් දුක්පත්ව ගිය බැවින් "තමාගේ බස් ගන්නේ වේදූ"යි සිතමින් මද්ධ්‍යම රාත්‍රි වේලෙහි ශ්‍රී යහන් ගබඩාවට වැද ආලෝක පතුරුවා ඇඤාශයෙහි සිටියාඃ. සිවානෝ දූක 'මේ කවරෙක්දූ'යි විවාලෝය. "සිටානන්වහන්ස, මම සතරවෙනි දෙරටුවේ අධිගෘහිත දේවතා දූ ය"යි කිවුය "කුමක් පිණිස අවුදූ?"යි විවාළ කල්හි "නුඹ වහන්සේට අවවාද කියනු කැමතිය"යි කිවුය. "එසේ වී නම් කියව"යි කී කල්හි "මහසිටානන් වහන්ස, නුඹවහන්සේ අන්තිම අවස්ථාවත් නොසිතන සේක. දූ දරුවන් බුහුනන් නොබලන සේක. ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශාසනයෙහි බොහෝ සමපත් විසුරුවන ලද. නුඹවහන්සේ බොහෝ කලක් වස්තු වියදම් කිරීමෙනුත් කෘෂිවණිජ් ආදී වූ කර්මාන්තයන් නොකිරීමෙනුත් ශ්‍රමණ භවත් ගෞතමයන් නිසා දුක්පත්ව ගියසේක් එසේ වුවත් නුඹවහන්සේ ශ්‍රමණ භවත් ගෞතමයන් හැර නොපියන සේක. අද දක්වාත් ශ්‍රමණයෝ නුඹවහන් සේගේ ගෙට වදින්මය. ඒ ශ්‍රමණයන් විසින් යම් වස්තුවෙක් පළමු ගෙණයන ලද්දේ වී නම් ඒ වස්තුව නැවත පෙරලා ගෙන්වාගන්ට නොපිළිවන් වන්නේය, ගත් දෙයක් ගත්තේමය. මෙතැන් පටන් නුඹවහන්සේත් ශ්‍රමණ භවත් ගෞතමයන් කරා නොගිය මැනව. ඒ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයනුත් ගෙට වැද්ද නුදුන මැනව, ශ්‍රමණ භවත් ගෞතමයන් කරකැවී සිටත් නොබලා නුඹවහන්සේගේ ගොයිතැනුත් වෙළඳමුත් කොට කුටුම්බ සණ්ඨාපනය කළ මැනැවැ"යි කිවුය.

එකල්හි සිවානෝ ඒ දෙවිදූවට කියන්නෝ "මේ තොප මට දෙන්නාවූ අවවාද දූ"යි කිවුය. "එසේය, මේ මා දෙන අවවාද ය"යි කී කල්හි "තොප බඳුවූ සියයකිනුත් දෙවිදූන් දහසකිනුත් ලක්ෂයකිනුත් සොලවාලිය නොහැකි කොට දශබලධාරීවූ බුදුරජානන් වහන්සේ විසින් නිශ්චය කරණ ලද්දෙම් වීමි. මාගේ ශ්‍රද්ධාව වනාහී මෙරමෙන් නිශ්චලව පිහිටියාය. මා විසින් නෛය්‍යාණික වූ රත්න ශාසනයෙහි, නිමීල වූ ශාසනයෙහි වස්තුව වියදම් කරණලද. එසේ හෙයින් තී විසින් නොකිය යුත්තක් කියන ලද. සජීඥ ශාසනයට ප්‍රහාරයෙන් නිඝූවක් දෙන ලද. මෙබඳු අනාචාර වූ දුස්සීල වූ කාලකන්නි වූ තී හා සමග මා එක ගෙයි වසන්ට සුදුසු නොවෙයි. වහා මාගේ ගෙයින් නික්ම අනික් තැනකට යව"යි කිවුය. ඒ දෙවතා දූ සෝවාන් ඵලයෙහි පිහිටි ආර්‍ය්‍ය ශ්‍රාවක වූ සිවානන්ගේ වචනය අසා එතන සිටින්ට අසමර්ථව තමා වසන තැනට ගොස් දරුවන් අත අල්වාගෙණ නික්ම අනික් තැනක වසන්ට අව සරයක් නොලැබ සිවානන් ක්ෂමා කරවා "එහිම වෙසෙම්"යි නුවර රැකවල්

ගත් දිව්‍යපුත්‍රයා සමීපයට ගොස් නමස්කාරකොට සිටියාය. ''කවර කාරණය කින් ද?''යි කී කල්හි ''සවාමීනි, මම තොසලකා අනේපිඬු මහසිටානන් හා සමඟ කථාවක් කෙළෙමි. ඒ සිටානෝ මට කිපී වසන තැනින් නෙරපූහ. මා සිටානන් සමීපයට ගෙණගොස් ක්‍ෂමාකරවා වසන තැනක් මට දෙව''යි කිව. ''නී විසින් සිටානන්හට කුමක් කරණ ලද ද?''යි විචාළ කල්හි ''මෙතැන් පටන් බුඩොපසථානය නොකරව, ශ්‍රමණ භවත් ගෞතමයන් මේ ගෙට වැඳිද නොදෙවයි කිමි සවාමීනි''යි කිවුය. ඔබස් ඇසූ දිව්‍යපුත්‍රයා කියන්නේ ''නී විසින් නොකියයුත්තෙක් කියනලද. ශාසනයට නින්ද කරණ ලද. දෙෂාරෝපනය කරණ ලද. මම නී කැඳවාගෙණ සිටානන් සමීපයට යන්ට උත්සාහ නොකෙරෙමි''යි කිය.

ඒ දෙවිදුව ඔහු සමීපයෙන් සංග්‍රහයක් නොලැබ සතරවරම් රජ දරුවන් සමීපයට ගියාය. ඔවුන් විසිනුත් එසේම ප්‍රතික්‍ෂෙප කරණ ලද්දී, ශක්‍රදෙවේන්ද්‍රන් සමීපයට ගොස් එපවත් කියා 'සවාමීනි, මම වසන තෙනක් නොලැබ දරුවන් අත අල්වා ගෙණ පිහිටක් නොලැබ ඇවිදිමි, නුඹවහන්සේගේ ශ්‍රී සමෘඩියෙන් මා වසන තැනක් දුන මැනවැයි'' තරකොට යාචඤ්ඤ කළාය. එබස් අසා ශක්‍රදෙවේන්ද්‍රයෝ කියන්නෝ ''නී විසින් අයුක්තියක් කියන ලද, සඒඥ ශාසනයට පහර දෙතලද, මිමත් නී නිසා සිටානන් හා සමඟ කථා කරන්ට අසමර්ථයෙමි. බල එකක් කියමි. සිටානන්වහන්සේ සමාකරවා ගන්ව එක් උපායක් කියමි''යි කිවුය. ''යහපත සවාමීනි, කිවමැන වැ''යි කී කල්හි ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නෝ ''දිව්‍යසත්‍රිය, මේ මහසිටානන් අතින් මනුෂ්‍යයෝ පත්ලා අවලොස් කෙළක් වස්තු නය ඇරගත්තුය. ඒ වස්තුව නෝ සිටානන්ගේ නියුක්ත පුරුෂයන්ගේ වේශය ගෙණ කිසි කෙණෙකුත් නොදන්වා ඒ පත් ඇරගෙණ තරුණ යක්‍ෂයන් කිපදෙනෙකුන් විසින් පිරිවරණ ලදුව එක් අතකින් පත් හා එක් අතකින් පන්හිඳක් ගෙණ ඒ නය වැඳිදන්ගේ ගෙට ගොස් ගේ මධ්‍යයෙහි සිට නීගේ යක්‍ෂානුභාවයෙන් ඒ නය වැඳිදන් තැති ගන්වා ''මේ තොප ලූ නයපත අපගේ සිටාණන් වහන්සේ තමන්වහන්සේ ඉසුරුමත් කළ වස්තු ඇති තෙසින් තොප අතින් නය නොඑලවූ සේක. දැන් දුප්පත්ව ගියසේක එසේ හෙයින් තොප ගත් නය දෙව''යි තොපගේ යක්‍ෂානුභාවයෙන් දක්වා ඒ අවලොස් කෙළක් වස්තු එළවා ගෙණ සිටාණන්ගේ සිස්වූ භාණ්ඩාගාරයේ පුරා, අනිකුත් අචිරවතී නම් ගං තෙර නිධාන කළ වස්තුවකුත් ගඟ ඉවුර බිඳිගිය කල්හි සමුද්‍රයට වන්නා ඇත. එයින් තොපගේ ආනුභාවයෙන් දක්වා ඒ ගෙණවුත් කොටුගුළු පුරා අනිකුත් අසවල් තැන අසවාමිකවූ අවලොස් කෙළක් වස්තු ඇත. ඒත් ගෙණවුත් සිස්වූ කොටුගුළු පුරා ලව. මේ සිවුපණස් කෙළක් පමණ වස්තුවෙන් සිස්වූ කොටුගුළු පුරාලීම තොපට දඬුවම. මෙසේ දඬුවම් කොට මහසිටානන් ක්‍ෂමාකරගනැ''යි ශක්‍රදේවේන්ද්‍රයෝ කිවුය.

එබස් ඇසූ දේවතා දූ ''යහපතැයි සවාමීනි'' කියා ශක්‍රදේවේන්ද්‍රයන්ගේ වචනය පිළිගෙණ කියන ලද ක්‍රමයෙන්ම සියලු වස්තුව ගෙණවුත් කොටු ගෙවල් පුරා ලා මධ්‍යම රාත්‍රිවේලෙහි සිටානන්ගේ ශ්‍රී යහන් ඔබඩාවට වැද ආලෝකය පතුරුවා ආකාශයෙහි සිටියාය. ''තොප කවරෙක්ද''යි කී කල්හි ''සවාමීනි, මහසිටානන් වහන්ස, මම නුඹවහන්සේගේ සතරවෙනි දෙරටුවේ

වසන්නාවූ අඥානවූ දිව්‍යඝන්‍රිය, මොහයෙන් මූඪව මා විසින් බුදුන්ගේ ගුණ නොදැන පළමු දවසෙක නුඹවහන්සේ හා සමග කළ කථාවෙක් ඇත. ඒ අපේක්ෂයට මව ක්ෂමා කොට වදාළ මැනව. තවද ශක්‍රදේවේන්ද්‍රයන් වහන්සේ ගේ වචනයෙන් නුඹවහන්සේගේම නය එළවා අටලොස් කෙළක් වස්තූන් සමුද්‍රයට වත් අටලොස් කෙළක් වස්තූන් ඒ ඒ තැන අසවාමිකවූ අටලොස් කෙළක් වස්තූන් එන්කොට දූපණස් කෙළක් පමණ වස්තූන් ගෙණවුත් නුඹ වහන්සේගේ සිස්වූ කොටුගුළු පිරීමෙන් දඬුවම් කරණ ලද. ජේතවන මහා විහාරය නිසා ඔයදම් කළ සියලු වස්තුව මා විසින් එක්කොට තබනලද. වසන තැනත් නොලැබ දුක්විඳ ඇවිදිමි. මා නුවණ නැතිව කළ දෙය සිත නොතබා සිටානන්වහන්ස, මට ක්ෂමා කොට වදාළ මැනවැ''යි කිවුය.

එකල්හි අනේපිඬු මහසිටාණෝ ඇගේ වචනය අසා මෙසේ සිතුය. ''මේ දෙවිදූ දඬුවම් කෙළෙමි කියාත් කියයි, තමාගේ අපේක්ෂයත් ගිවිස සිටිනීය. සම්බුදුරජාණන් වහන්සේ මැ විනය නය කොට තමත්වහන්සේගේ ගුණ දක්වන සේක. එසේ හෙයින් බුදුරජාණන් වහන්සේට දක්වමි' සිතා ඒ දිව්‍යඝන්‍රියට මෙසේ කිවුය. ''දෙවතාදූව, ඉදින් මා ක්ෂමාකරවනු කැමැත්තෙහි විනම් සම්බුදුරජාණන් වහන්සේ සමීපයෙහිදී මා ක්ෂමාකරව''යි කිවුය. එබස් ඇසූ දෙවිදූ කියන්නී ''යහපත එසේ කෙරෙමි''යි සම්බුදුරජාණන් වහන්සේ සමීපයෙදී ''මා කැඳවාගෙණ ගොස් ක්ෂමාකළ මැනවැ''යි කිවුය. සිටානෝ ''යහපතැ''යි කියා පාන්ව ගිය කල්හි උදැසනම ඒ දිව්‍යස්ත්‍රී කැඳවා ගෙණ සම්බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් ඇ කළ කාරිය සියල්ලම් සම්බුදුරජාණන් වහන්සේට දැන්වූය. බුදුරජාණන් වහන්සේ එබස් අසා සිටානෙති, මේ ලෝකයෙහි පාපී පුද්ගලයාත් යම්තාක් පාපය විපාක නොදේ නම් ඒ තාක් කල් යහපතක් දක්නේය. යම් කලෙක ඔහුට අකුශල කර්මය විපාක දේ නම් එකල අකුශල කර්මයාගේ විපාකයම දක්නේය. කුසල් කළාවූ සත්ත්වයෝත් යම්තාක් කුශල කර්මය විපාක නොදේ නම් ඒ තාක් අකුශල කර්මය දක්නේය. යම් කලෙක ඔහුට කුශලකර්මය විපාක දේ නම් ඒ කුශලකර්ම විපාකයම දක්නේ යයි කියා මේ දම්පියාගෙහි ගාථා දෙකක් වදාළ සේක.

''පාපොපි පස්සති භද්‍රං-යාව පාපං න පච්චති,
යදා ච පච්චති පාපං අථ පාපෝ පාපානි පස්සති.

භද්‍රාපි පස්සති පාපං-යාව භද්‍රං න පච්චති,
යදා ච පච්චති භද්‍රං-අථ භද්‍රෝ භද්‍රානි පස්සති.''

යන මේ ගාථාවන් දෙදෙනා වදාළහ. ඉක්බිති ඒ දිව්‍යස්ත්‍රී සෝවාන් ඵලයෙහි පිහිටා සම්බුදුරජාණන් වහන්සේගේ චක්‍ර ලක්ෂණයෙන් විභූතිවූ ශ්‍රීපාද යෙහි වැටී 'සවාමීනි, රාගයෙන් රත්ව වෙෂයෙන් දූෂිත වූ මොහයෙන් මූඪ වූ අවිද්‍යාවෙන් අන්ධ වූ නුඹවහන්සේගේ ගුණ නොදන්නාවූ මා විසින් කොකිය යුක්තක් කියනලද, ඊට මට ක්ෂමාකොට වදාළ මැනැවැ''යි කියා සම්බුදුරජාණන් වහන්සේ ක්ෂමාකරවා අනේපිඬු මහසිටාණන් ක්ෂමාකරවූය.

එකල්හි අනේපිඬු මහසිටාණෝ සම්බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි සිට තමන්ගේ ගුණ කියන්නෝ ''සවාමීනි, දේවතාවූ 'බුද්ධොපස්ථානාදිය නොකර ව'යි වළකන්නාවූ තැනැත්තී මා වළකාගත නුහුනුවාහුය. 'දන් නොදෙව'යි

මා වළකමින් සිටියදීත් මම දන් දිනිමියෙ. සැමිනි, මේ මාගේ විශෙෂගුණ නොවේදැ''යි දැන්වූ කල්හි, එබස් ඇසූ සර්ඥයන් වහන්සේ සිවානන්ට වදාරණ සේක් ''සිවානෙනි, තොප වූකලී ශ්‍රොතාපන්නවූ ආර්‍යශ්‍රාවකව අවල ශ්‍රද්ධාවෙහි පිහිටියව, නිර්මලවූ සම්‍යක් දෘෂ්ටි ඇත්තාවූ එසේ හෙයින් තොප මේ අල්පෙ ශාක්‍යවූ දිව්‍යසත්‍රිය වළකමින් සිටියදී නොවැළකි බව ආශ්චර්‍ය්‍ය නොවන්නේය. පෙර නුවණැත්තෝ අබුද්ධොත්පාද කාලයෙහි නුවණ ලැබූ අවස්ථාවෙහි කාමාවචර ඓශ්වර්‍යවිව අධිපතිවූ වසවර්ත්තිමාරයා විසින් ආකාශයෙහි සිට ''ඉදින් තෙපි දන්දෙවු නම් මේ නරකයෙහි පැසෙනවාදැ''යි අසුරියනක් පමණ ගැඹුර ඇති කිහිරහුරු වලක් දක්වා 'දන් නොදෙව'යි වළකන ලද්දාහු පොළව පලාගෙණ පැන නැගි පියුම් කෙමිය මත්තෙහි සිට දන් දුන්නාහුය. මේ ආශ්චර්‍යය''යි වදාරා අනේපිඩු මහසිටානන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යි වනාහි දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙතෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද බොධිසම්භාර ඇති අප මහ බෝසතාණන් බරණැස් නුවට සිටුකුලයක ඉපිද අනේකප්‍රකාරවූ සැපයෙන් දිව්‍යකුමාරයකු මෙන් වැඩෙමින් ක්‍රමයෙන් විඥ බවට පැමිණ සොළොස් ඇවිරිදි කලම සියලු ශිල්පයෙහි කෙළවර පැමිණියාය. ඒ කුමාරයෝ පියාණන්ගේ ඇවැමෙන් සිටු තනතුර ලැබ නුවර සතරවාසල් දොර දන්හල් සතරෙක, නුවරමැද එකෙක, තමාගේ ගෙදොර එකෙකැයි සදහන්හල් කරවා මහදන් දෙති, පන් සිල් රකිති, පෙනෙවස් වෙසෙති, ඉක්බිත්තෙන් එක්දවසක් පෙරවරු වේලෙහි බොධිසත්ත්වයන්ට නොයෙක් අග්‍ර රසයෙන් යුක්තවූ භොජනය එලවූ කල්හි එක් පසේබුදු කෙණකුන් වහන්සේ සතියක් ඇවැමෙන් නිරොධසමාපත්තියෙන්නැගිපිඩු සිහනවේලාව සලකා ''අද මාවිසින් බරණැස්නුවර සිවානන්ගේ ගෙදොරව යන්ව වටනේය''යි සිතා නාලිය දැවටු වළඳ අනවතප්ත විලින් මුව සෝදා රත් ගල්තලා මුදුනෙහි සිට අදහස ඇඳ ඊමන්තෙහි පටිය බැඳ සඟළ සිවුරෙන් ගැවටූ ගන්වා සෘඞ්ධියෙන් උපන්නාවූ මැටිපාත්‍රයක් ගෙණ ආකාශයෙන් ගොස් බොධිසත්ත්වයන් අනුභවකරන්ට තලියේ බත්ලූ ඇසිල්ලෙහිම ගෙදොර වැඩසිටි සේක.

බොධිසත්ත්වයෝ ඒ පසේබුදුන් වහන්සේ දැකලාම අස්නෙන් නැගී සිට ආදර දක්වා අතවැස්සා මුණ බැලූය. ඔහු විසින් කුමක් කෙරෙම් ද? සැමිනි' කී කල්හි 'පසේබුදුන් වහන්සේගේ පාත්‍රය ගෙණෙව''යි කිවූය. එකෙණෙහිම පාපිවූ වසවර්තිමාරයා සම්පිනවෙමින් නැගීසිට ''මේ පසේබුදුන් වහන්සේ අදට සත්වෙනි දවස් බත් නොලත්සේක. එසේ හෙයින් අද බත් නොලත් සේක් වීනම් නස්නාසේක. උන්වහන්සේ නසම්, සිටානන්ගේ දානයටත් අන්තරායක් කෙරෙම්'යි සිතා එකෙණෙහිම අවුත් මිදුල මධ්‍යයෙහි අසූ රියනක් පමණ අඟුරුවළක් මැවීය. ඒ අඟුරු වල කිහිරහුරෙන් පිරුණේය. හාත්පසින් දිලිහෙන්නාවූ ගිනිදැල් ඇත්තේය, ඒකජ්වාලව ඇවිලෙන්නේය, අවීචිමහ නරකය මෙන් බලන්නාවූ සත්ත්වයන්ට වැටහෙන්නේය. ඒ කිහිරහුරු වළ මවා තෙමේ ආකාශයෙහි සිටියේය. පාත්‍රය හත්ට ගියාවූ පුරුෂයා ඒ කිහිරහුරුවළ දැක මහත්වූ හඬින් භයපත්ව වැළැක්කේය. මහ බෝසතාණෝ ඔහු දැක ''දරුව, තෝ කුමක් නිසා වැළැක්කෙහි දැ''යි විචාළේය.

ඒ පුරුෂයා කියන්නේ "ස්වාමිනි, මේ මිදුලමඩ්‍යයේ මහත් වූ අඟුරු වළෙක් ගිනිගෙණ දිලියෙන්නේය, ඒකජ්වාලව ඇවිලෙන්නේ ය"යි කීය. තවද අනිකෙක් අනිකෙකැයි එනු එන්නෝ සියල්ලෝම භයින් ත්‍රස්තව වේගයෙන් පලාගියහ. එකල බොධිසත්ත්වයෝ මෙසේ සිතූය. අද මාගේ දැනයට අන්තරායක් කරණු කැමති ව වසවර්තිමාරයා ඉපිළ නැංගේ වත. ඒ මාරයා තමාසේ වූ මාරයන් සියයකිනුත් මාරයන් දහසකිනුත් මා සොලවාලිය නොහැකි බව නොදන්වත. අද දැන් මාරයාගේවත් මාගේවත් බල මහත් බව හා ආනුභාව මහත් බව දනිමි"යි සිතා සැරසූ සැටියේම බත්තලිය තුමූම ඇරගෙණ ගෙන් නික්ම අඟුරු වළ මුවවිට සිට ආකාශය බලා මාරයා දැක "තෝ කවරෙක්හිදැ"යි විවාළේය. "මම වසවර්තිමාරයා ය"යි කී කල්හි "මේ අඟුරු වළ තා විසින් මවනලද්දේ දැ?"යි කිවූය. "එසේය මා විසිනැ"යි කී කල්හි "කුමක් පිණිසදැ"යි විවාරා "තොපගේ දැනයට අන්තරාය කරණු පිණිසත් පසේබුදුන් වහන්සේගේ ජීවිතාන්තරාය කරණු පිණිසත් කෙළෙමි"යි කීය.

ඒ අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු "මාරය තා විසින් මාගේ අනතුරායක් වත් පසේබුදුන් වහන්සේගේ ජීවිතයට අන්තරායක් වත් මම කොටලිය නොදෙමි. අද දැන් මගේවත් තාගේවත් බල මහත් නියාව දකිමි"යි කියා මහබෝසතාණෝ දැඩිවූ සුමාදුනයෙන් බත්තලිය ගෙණ අඟුරු වළ මත්තට පැනපූය. එකෙණෙහිම අසූරියනක් පමණ ගැඹුර ඇති අඟුරු වළ මත්තෙහි ඊ ඊ පිට අටගත්තාවූ සත්බුමු මහපියුමෙක් උඩුනැගී බොධිසත්ත්වයන්ගේ දෙපය පිළිගත්තේය. ඒ පියුමෙන් තිඹක් පමණ රේණු ආකාශයට කරකැවී කැවී නැගී මහබෝසතාණන් වහන්සේගේ ඉස්මුදුනෙහි පටන් සකල ශරීරය රන්සුන්නෙන් තැවරුවාක් මෙන් කෙළේය. එකෙණෙහි මහබෝසතාණෝ පියුම්කොමිය මත්තෙහි සිට නොයෙක් අග්‍ර රසයෙන් යුක්තවූ භොජනය පසේබුදුන් වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වූය. පසේබුදුන් වහන්සේ ආහාරය පිළිගෙණ අනුමෙවෙනි ධර්මදේශනා කොට පාත්‍රය ආකාශයට හැර මහ ජනයා බල බලා සිටියදීම ආකාශයට පැනනැගී පස්වණක් වලා මඩිමින් හිමාලය වනයට වැඩිසේක. වසවර්ති මාරයාත් පැරද දෙමිනසට පැමිණ තමන් වසන් නාවූ සථානයටම ගියේය. බොධිසත්ත්වයෝ පියුම්කොමිය මත්තෙහි සිට මහ ජනයාට දන්දීම හා සිල්රැකුම් කිරීමෙහි ගුණවර්ණනා කිරීමෙන් ධර්මදේශනා කොට මහජනයා විසින් පිරිවරණලදුව තමන්ගේ ගෙට ම වැද දිවිපමණින් දැනදීවූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහ.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ "සිවානෙනි, යම් බඳුවූ තෙපි ප්‍රථම මාගී ලැබ දෙව්දුම් විසින් දැන් සොලවාලන්ට අසමර්ථවූවාහුය යන යමෙක් ඇත්නම් ඒ තෙමේ ආශ්චර්‍ය්‍ය නොවන්නේය. පෙර නුවණැත්තන් විසින් කළ දෙයම ආශ්චර්‍ය්‍ය වන්නේය"යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්‍වාපරසන්ධි ගළපා මේ බදිරඛාර ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි පසේබුදුහු එහිම පරිනිර්‍වාණ කළෝය. වසවර්තිමාරයා පරදවා පියුම්කොමිය මත්තෙහි සිට පසේබුදුන්ට බත්තලිය පිළිගැන්වූ බරණැස්නුවර සිවානෝ නම් සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# 41
## ලොසක ජාතකය

**තීවද එක් සමයෙක්හි මොහදුරට** ශරත් සූයයීයා වැතිවූ සමීදයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වස තා සේක්, **ලොසකතිසස** ස්ථවිර තම් තෙරකෙණ-

කුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මේ ලොසකතිසස සථවිරයන්වහන්සේ නම් කවරේද? යත්, කොසොල් රට තමාගේ කුලය නැසුවාවූ එක් කෙවුල් පුත්‍රයෙක, සිවුපසය නොලැබෙන භික්ෂුකෙනෙක, උන්වහන්සේ වනාහි උන්නැතින් චුතව කොසොල්රට එක් කුල දහසක්දෙන වසන්නාවූ කෙවුල්ගමෙක්හි එක් කෙවුල් සත්‍රියකගේ කුස පිළිසිඳ ගත්සේක. උන්වහන්සේ පිළිසිඳගත් දිනයෙහි ඒ කුල දහසක් ගෙවල් වල ඇත්තෝ දැල් ගත් අත් ඇතිව ගංගාවෙහිද, තඹාගයෙහිද මත්සයයන් සොයන්නාහු එක් කුඩා මත්සයයකුදු නොලද්දාහුය. එතැන් පටන් ඒ කෙවුලෝ පිරිහෙන්නාහුය. ඔහු මවුකුස උපන් කල්හිම ඔවුන්ගේ ගම සත් වරක් ගින්නෙන් දැහැගේ සත්වරක් රජහු වෙසින් දඩ ගන්නාලද්දේය. මෙසේ අනුක්‍රමයෙන් දුඃඛිතවූ ඔහු මෙසේ සිතුවාහ. 'පූර්වයෙහි අපට මෙබඳුවූ පිරිහීමෙක් නැත්තේය. දැන් වනාහි පිරිහෙමිහ. අපගේ අතරෙහි එක් කාලකන්නියෙක් වියයුතුය. දෙකොටසකයි' කියා පන්සියය පන්සියය බැගින් එක්වූවාහුය. එයින් යම් කොටසෙක්හි ඔහුගේ මව්පියෝද එකොටස පිරිහෙන්නේය. අනික් කොටස වැඩෙන්නේය. එකොටසද දෙකොටසක්ව බෙදී ඒ කොටසද දෙකොටසක්ව බෙදී මෙසේ යම්තාක් ඒ කුලය එකක්වූයේයද? ඒතාක් විහාගෙකොට ඔවුන්ගේ කාලකන්නි බව දැන තලා නිකුත්කළාහුය.

ඉක්බිත්තෙන් ඔහුගේ මෑනියෝ දුකින් ජීවත්වන්නී ගර්භය මුහුකළ කල්හි එක්තැනෙක්හි වැදුවාය. ඒ පශ්චිම භවික සත්ත්වයා නසන්නට නො හැකිය. කළය ඇතුළත තීබෙන ප්‍රදීපයක් මෙන් ඔහුගේ හෘදයෙහි අර්හත් ඵලයට උපනිශ්‍රය සම්පත් දිලිහෙන්නේය. ඒ ස්ත්‍රිය ඒ ලදරුවා රක්ෂාකොට පියවර ඔසවා ඔබිමොබ හැසිරෙණ කල්හි ඒ ලදරුවාට එක් කබලක් අතට දී "පුත්‍රය, මේ ගෙට වදුව"යි කියා කියා දිවගියාය. ඒ ලදරු එතැන් පටන් හුදකලාව ඒ ඒ තන්හි නිදෑහා සොයා එක්තැනෙක්හි සයනය කරන්නේය. නොම නහන්නේය, ශරීරය නො සරන්නේය, පාංසු පිසාචයකු මෙන් දුකින් ජීවත්වන්නේය. එතෙම අනුක්‍රමයෙන් සත්අවුරිදිව එක් ගෙදොර කඩෙක්හි බදුන්දෝනා ජලය දැමූ තැන්හි කපුටුවකු මෙන් එහි එහි හුල අවුල මින් අනුභව කරන්නේය.

ඉක්බිත්තෙන් ඔහු දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ සැවැත්නුවර පිඬු පිණිස හැසිරෙණසේක් දැක "මේ සත්ත්වතෙම ඉතා බැගැපත් වන්නේය, කවර ගමෙක්හි වසන්නේදෝ"යි කියා ඔහු කෙරෙහි මෛත්‍රී සිත වඩා "කොල, වරවු"යි වදාළසේක. ඒ ලදරුතෙම ගොස් තෙරුන් වහන්සේට වැඳ සිටියේය. ඉක්බිත්තෙන් ඕහට තෙරුන්වහන්සේ "කවර ගමෙක්හි වසන්නෙහිද? තමාගේ මව්පිය දෙදෙන කොහිදැ?"යි විමසාළසේක. "සවාමීන්වහන්ස, මම කිසි පිහිටක් නැත්තෙමි. මගේ මව්පිය දෙදෙන මා නිසා ක්ලාන්තනවූම්හ'යි කියා මා හැර ගියාහුය. වැලිදු වනාහි 'පැවිදි වන්නෙහිදැ"යි විමාළසේක. සවාමීන්වහන්ස, මම වනාහි පැවිදිවන්නෙමි මා වැනි බැගැපත්හු කවරෙක් පැවිදි කරවන්නේදැ'යි කීය. "මම පැවිදිකරවන්නෙමි'යි වදාළසේක."යහපත පැවිදි කළමැනවැ"යි කීය. තෙරුන්වහන්සේ ඕහට බාහ්‍ය හොජ්‍යාදිය දී ඔහු විහාරයට ගෙණගොස් සවාසනයෙන්ම තහවා පැවිදි කරවා විසිවයස් පිරුණු කල්හි උපසම්පදා කරවූසේක. එතෙම මහළු වයසට පැමිණි කල්හි ලොසකතිසස සථවිරයයි කියා ප්‍රසිඛවූයේය. නුවණැත්තේය. සවල්ප

ලාභ ඇත්තේය. උන්වහන්සේ විසින් වතාහි අසදෘශ දානයෙහි කුක්ෂිය පුරා ආහාර නොලත්විරුසේක. ජීවිතය යැපෙන පමණක්ම ලබනසේක. උන්වහන්සේගේ පාත්‍රයෙහි වතාහි එක් වරක්ම කැද කෙතෙස්සක් පිළිගැන්වූ කල්හි පාත්‍රය මුවවිට දක්වා පිරුණාක් මෙන් පෙණෙන්නේය. ඉක්බිත්තෙන් මනුෂ්‍යයෝ ''මුන්වහන්සේගේ පාත්‍රය පිරුණේය''යි සිතා යටිදිසාවෙහි පාත්‍රවලට කැද පිළිගන්වති. ඔහුගේ පාත්‍රයට කැද පිළිගන්වන කල්හි මනුෂ්‍යයන්ගේ භාජනවල කැද අනන්තඛ්‍යානවෙයි කියාද කියත්. ඛාද්‍ය හොජ්‍යාදියෙහිදු මෙම ක්‍රමයයි. ඒ ලොසකතිස්ස සථවිරයන්වහන්සේ එයින් මෑතභාගයෙහි විදර්‍ශනා වඩා අර්හත්ඵලයෙහි පිහිටිසේක්ද? සවල්ප ලාභීමවූසේක

ඉක්බිත්තෙන් අනුක්‍රමයෙන් ආයුසංස්කාරය පිරිහුණු කල්හි උන්වහන්සේගේ පිරිනිවන් පානා දිනය පැමිණියේය. දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ ආවර්ජනා කොට වදුරණසේක් උන්වහන්සේ පිරිනිවන් පානා බැව් දැන ''මේ ලොසකතිස්ස සථවිරයන් වහන්සේ අද පිරිනිවන් පානා සේක අද මා විසින් මෝහව යපෙන පමණක් ආහාර දෙන්නට වටනේය'යි සිතා ඔහු කැදවාගෙණ සැවැත්නුවරට පිඬුපිණිස වන්සේක. සැරියුත් මහතෙරුන් වහන්සේ ඒ මහණ නිසා පළමු බොහෝ මනුෂ්‍යයන් ඇති සැවැත්නුවරින් අත දිගුකොට වැදීම් පමණක්ද නොලත්සේක. ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ ''ඇවැත්නි, යව ආසනසාලාවෙහි හිඳුව''යි කියා ඔහු යවා 'මේ අහර ලොසකතිස්ස සථවිරයන්හට දෙව''යි කියා ලත් අහර යවූසේක. ඒ ආහාර ගෙණගියාහු ලොසකතිස්ස සථවිරයන් සිහිකොට තෙමේම අනුභව කළාහුය. ඉක්බිත්තෙන් තෙරුන් වහන්සේ නැගී සිට විහාරයට වඩනා කල්හි ලොසකතිස්ස සථවිරයන් වහන්සේ ගොස් සථවිරයන් වහන්සේට නමස්කාර කළසේක. සථවිරයන් වහන්සේ ආපසු බලා සිටිසේක්ම ''ඇවැත්නි, තොප විසින් ආහාර ලද්දේදැ?''යි විමසූසේක. ''සුවාමීන්වහන්ස, මම නොලබම්''යි කීසේක. තෙරුන්වහන්සේ කලකිරීමට පැමිණ කල්වේලා බැලූසේක. ''කල් ඉක්මුනේය''යි දැන තෙරුන්වහන්සේ ''මෙහි එවයි ඇවැත්නි, මෙතැන්හිම හිඳුව''යි කියා ලොසකතිස්ස සථවිරයන් ආසන ශාලාවේ හිඳුවා කොසොල් රජුගේ මාලිගාවට වැඩිසේක. රජ්ජුරුවෝ තෙරුන්වහන්සේගේ පාත්‍රය ගෙන්වා ආහාරය පිළිගන්වන්ට විකාලයයි සිතා පාත්‍රය පුරා වතුමධුර පිළිගැන්වූසේක තෙරුන්වහන්සේ ඒ වතුමධුර ගෙණගොස් ''ඇවැත්නි,එව''යි කියා ඕහට 'මේ වතුමධුරය වළඳව'යි කියා පාත්‍රය ගෙණම වැඩසිටිසේක. හෙතෙම තෙරුන්වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ලජ්ජාවෙන් නොවළඳන සේක. ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ ඕහට ''ඇවැත්නි, එව, මම පාත්‍රය ගෙණම සිටිනෙමි, තෙපි හිඳ වළඳව, ඉදින් මේ පාත්‍රය අතින් මුක්ත කෙළෙම් නම් කිසිවකුත් නොවන්නේය''යි වදුලසේක. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ ලොසකතිස්ස සථවිරයන් වහන්සේ අග්‍ර ඊශ්වරවූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේ පාත්‍රය ගෙණ සිටියදීම වතුමධුරය වැළඳුසේක. ඒ වතුමධුරය තෙරුන් වහන්සේගේ ආයුෂ්‍ය ඉර්ඩි බලයෙන් ක්ෂය බවට නොගියේය. එකල්හි ලොසකතිස්ස සථවිරයන් වහන්සේ කැමැති පමණක් බඩපුරා වැළඳුසේක. එදිනයෙහි අනුපාදිශෙෂ නිර්‍වාණ ධාතුවෙන් පිරිනිවන් පැසේක. සර්‍වඥයන් වහන්සේ සමීපයෙහි සිට ශරීරය ආදාහන කරවූසේක. ධාතූන් වහන්සේ ගෙණ චෛත්‍යයක් කළාහුය. එකල්හි භික්ෂූහු දම්සභාවෙහි රැස්ව හිඳ ''ඇවැත්නි, ලොසකතිස්ස සථවිරයන් වහන්සේ පින් නැත්තේය, අල්ප

ලාභීය, මෙබදු පින් කැත්තාවූ අල්පලාභීහු විසින් කෙසේ ආර්‍ය්‍ය ධර්‍මය ලත්හේක්ද''යි කියමින් හුන්නාහුය, සර්‍වඥයන් වහන්සේ දර්‍මසභාවට වැඩ වදාරා ''මහණෙනි, දැන් මේ දර්‍මසභාවෙහි මා එන්කාට පෙර කවර නම් කථාවකින් යුක්තව උනුද''යි විචාරා වදාළ කල්හි ''සුවාමීන් වහන්ස, මෙතෙම් කථාවකිනැ''යි දන්වූවා හුය. සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් ''මහණෙනි, මේ මහණෙතෙම තමහට ලාභ නොලබන බවද ආර්‍ය්‍ය ධර්‍මය ලබන බවද තෙමේම කෙළේය. මේ මහණ වනාහි පෙර අනර්‍යඥාන ලාභාන්තරාය කොට ස්වල්ප ලාභීවූයේය, අනිත්‍යය දුඃඛය, අනාත්මය යි කියා විදර්‍ශනාවට සුදුසු භාවනාවගේ ඵලයෙන් ආර්‍ය්‍යධර්‍ම ලාභීවූයේය'' වදාරා ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

යිටගිය දවස කාශ්‍යප සර්‍වඥයන් වහන්සේගේ කාලයෙහි එක්තරා භික්ෂුකණෙකුත් වහන්සේ එක් කෙළෙඹි පුත්‍රයකු නිසා ගමෙක්හිවූ සෙනස් තෙක්හි වසනසේක. පියවි සවහාව ශීලයෙන් යුක්තව විදර්‍ශනාවෙහි යෙදී වසන සේක.

ඉක්බිත්තෙන් එක් ක්ෂීණාශ්‍රව තෙරකෙණෙකුත් වහන්සේ හැම වත් කොහැර වසනසේක්, අනුක්‍රමයෙන් ඒ භික්ෂූන්වහන්සේට උපස්ථාන කරන්නාවූ කෙළෙඹි පුත්‍රයාගේ වසන ගමට පැමිණිසේක. කෙළෙඹි පුත්‍රතෙම තෙරුන් වහන්සේගේ ර්‍යාපථයෙහිම ප්‍රසන්නව පාත්‍රය ගෙණ ගෙට වැඩමකරවා සක්කාර කොට වළඳවා මදක් ධර්‍මකථාව අසා තෙරුන් වහන්සේට වැඳ ''සුවාමීන්වහන්ස අපගේ සමීප විහාරයටම වැඩිය මැනව, අපි සවස්වේලෙහි අවුත් දකුම්හ''යි කියේය. තෙරුන් වහන්සේ විහාරයට ගොස් නේවාසික තෙරුන් වහන්සේට වැඳ ආපුච්ඡාකොට එකත්පසෙක්හි හුන්සේක. නේවාසික තෙරුන්වහන්සේ උන්වහන්සේ හා සමග පිළිසඳර කථාකොට ''ඇවැත්නි, නුඹවහන්සේ විසින් භික්ෂාහාර්‍ය ලබන ලදදැ''යි විචාළසේක. ''එසේය, ලදිමි''යි වදාළසේක. ''කොත නින් ලත්හේක්ද''යි විචාළසේක. ''නුඹවහන්සේගේ ආසන්න ගම කෙළෙඹි පුත්‍රයාගේ ගෙයිනැ'යි කියේක. මෙසේ ද කියා තමනට සෙනස්තක් විචාරා පටිජාගරණය කොට පා සිවුරු තැන්පත් කොට තබා ධ්‍යාන සැපයෙන් ඵල සැප යෙන් කල්යවමින් වැඩහුන්සේක. ඒ කෙළෙඹි පුත්‍රයාද සවස්වේලෙහි සුවඳ මල් හා පහන් තෙල්ද ගෙන්වාගෙණ විහාරයට ගොස් නේවාසික තෙරුන් වහන්සේට වැඳ ''සුවාමීන්වහන්ස, එක් ආගන්තුක තෙරකෙනෙකුත් වහන්සේ ඇත. වැඩසේක් දෝ''යි විචාළලේය, ''එසේය, වැඩියසේක'' දැන් කොතැන්හි ද''යි කියේය, ''අසවල් සෙනස්තෙහිය.'' කෙළෙඹිපුත්‍රතෙම උන්වහන්සේගේ සමීපයට ගොස් වැඳ එකත්පසෙක්හි හුන්නේ ධර්‍මකථාව අසා ශීතල වේලෙහි වෛ ර්‍යාසවද බොධින් වහන්සේවද සුවඳ මල් පුදා පහන් අවුලුවා දෙදෙනා වහන් සේට ආරාධනා කොට හියේය. නේවාසික තෙරුන් වහන්සේ වනාහි මේ කෙළෙඹි පුත්‍රතෙම බිඳින්නේය. ''ඉදින් මේ භික්ෂූන්වහන්සේ මේ විහාරයෙහි වසනසේක් වී නම් මා මේ තෙම කිසිවකටත් නොහන්නේය යි කියා තෙරුන් වහන්සේ කෙරෙහි අසන්තොෂ බවට පැමිණ මේ විහාරයෙහි මුන්වහන්සේ නොවසන ආකාර මා විසින් කරන්ටවටනේය''යි සිතූසේක. එහෙයින් උපස්ථාන වේලෙහි ආවාහු හා සමග කිසිවක් නොකීසේක' ක්ෂීණාශ්‍රව තෙරුන්වහන්සේ ඒ භික්ෂුහුගේ අභිප්‍රාය දැන මේ ''සප්තවිරතෙම මාගේ කුලයෙහි හෝ ගණයා කෙරෙහි හෝ නො ඇලුනු බව නොදන්නේය''යි සිතා තමා වසන තැනට ගොස් ධ්‍යාන

සැපයෙන් ඵලසැපයෙන් කල්යැවූසේක. නේවාසික තෙරුන් වහන්සේද දෙවෙනි දිනයෙහි නීරපිටින් ගෙඩිය ගසා නීරපිටින් දොරට ආකොටනය කොට කෙළෙඹි පුත්‍රයාගේ ගෙට ගියසේක. කෙළෙඹි පුත්‍රතෙම උන්වහන්සේගේ පාත්‍රයඟගණ පණවනලද ආසනයෙහි වැඩහිඳිනට සලස්වා ''සඞ්ඝමීන්වහන්ස, ආගන්තුක සථවිරයන් වහන්සේ කොතැන්හිදැ''යි විචාළේය. ''මම තොපගේ කුළුපග සථවිරයන්ගේ ප්‍රවෘත්තිය නොදන්නෙමි යි ගෙඩිය ගැසුයෙමි, දොරට ආකොටනය කරණුයෙමි පුබුදුවාගන්නට නොහැකිවූයෙමි ඊයේ දවස තොපගේ ගෙයිදී ප්‍රණීත භොජන වළඳා දිරවාගන්නට නොහැකි වූයේ දැන් නිද්‍රාවට පැමිණියේ වන්නේය. තෙපි පහදින්නාහු මෙබඳු තැන්හිම පහදනාහුය''යි කීසේක

ක්ෂීණාශ්‍රව තෙරුන්වහන්සේ පිබිද තමාට නිසසාවාර වේලාව සලකා ශරීරය ප්‍රතිජඟහනය කොට පාත්‍රා සිවුරු නෙණ අසයට පැනනැඟී අන් තැනකට වැඩිසේක ඒ කෙළෙඹි පුත්‍රතෙම තේවාසික තෙරුන් දහන්සේට ගිතෙල් මී සකීරායෙන් අභිසංසකෘත පායාසය වළඳවා පාත්‍රය සුවඳ සුණුයෙන් උලා නැවත පුරවා ''සඞ්ඝමීන්වහන්ස, ඒ ආගන්තුක සථවිරයන් වහන්සේ මාගීක්ලාන්තවූසේක් වත. උන්වහන්සේට මේ ආහාර ගෙණවා''යි කියා පිළිගැන්වූසේය. තේවාසික සථවිරයන් වහන්සේ ප්‍රතිසේෂප තෝ කොටම ගෙණ යනසේක් ඉදින් ඒ භික්ෂූන් වහන්සේ මේ ක්ෂීරපායාසය වැළඳුසේක් වී නම් ශ්‍රීවය ගෙණ නිකුත්කළේ නමුදු නොයනසේක. ඉදින් වතාහි මම මේ ක්ෂීරපායාසය මනුෂ්‍යයන්හට දුන්නෙම් නම් මාගේ ක්‍රියාව ප්‍රකාශවන්නේය. ඉදින් දියෙහි දැම්මිනම් දියපිට ගිතෙල් පෙණෙන්නේය. ඉදින් භූමියෙහි දැමුයේ විනම් කපුටුවන්ගේ රැස්වීමෙන් පෙණෙන්නේය. මේ ක්ෂීරපායාසය කොතැන්හි දමම්දෝනෝ?''යි පරීක්ෂාකරණුයේ මැල පුලුස්සන්නාවූ එක් කෙතක් දැක අහුරු දෙබෙකොට එහි බහා මත්තෙහි අහුරෙන් වසා විහාරයට ගියසේක. විහාරයෙහි ඒ භික්ෂූන් වහන්සේ නොදැක සිතනසේක් ''ඒකාන්තයෙන් ඒ භික්ෂූන්වහන්සේ ක්ෂීණාශ්‍රව කෙණෙක, මා අභිප්‍රාය දැන අන්තැනකට වැඩිසේක් වත. මා විසින් බඩ හේතු කොට ඉතා නුසුදුස්සක් කරණ ලදැ''යි සිතූසේක. ඒ ක්ෂණයෙහිම ඒ භික්ෂූන් වහන්සේට මහත් දෙම්නසක් පහළවූයේය. එතැන්පටන් කොවම මනුෂ්‍ය ප්‍රෙතව නොබෝකලකින්ම කාලක්‍රියා කොට නරකයෙහිඋපන්නේය. ඒ තෙම බොහෝ වසී ශතසහශ්‍රයක් නරකයෙහි පැසීගියේය. නිරයෙහි පැසී අවශිෂ්ට කර්මයෙන් පිළිවෙළින් පන්සියයක් ජාතියෙහි යක්ෂව ඉපද එක දවසකුදු බඩපුරා ආහාරයක් නොලද්දේය. එක් දවසක් වතාහි ගබමල බඩපුරාලද්දේය, නැවත පන්සියයක් ජාතියෙහි සුනඛව උපන්නේය. එකල්හිද එකදවසක් උදිගාරය කරණලද ආහාරයක් බඩපුරා ලද්දේය. සෙසු කල්හි ඔහු විසින් බඩපුරා ආහාරයක් නම් නොලත් විරිය. සුනඛ ජන්මයෙන් චුතව වතාහි කසීරට එක්ගමෙක දුක්පත් කුලයෙක්හි උපන්නේය. ඔහුගේ උත්පත්තියෙහි පටන් ඒ කුලය අතිශයින් දුක්පත්වූසේය. නාහිශෙන් මත්තට දියකැද පමණකුදු නොලද්දේය. ඕනට වතාහි මිතනවින්දකයයි කියා නමෙක් වූසේය. ඔහුගේ මව්පිය දෙදෙන ක්ෂුධාදුකඛය ඉවසන්නට නොහැකිව ''කාලකන්නිය යව''යි කියා තලා ඔහු නිකුත්කළාහුය. මිතනවින්දකතෙම පිටිවහලක් නැතිව හැසිරෙණුයේ බරණැස් නුවරට ගියේය,

එසමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ බරණැස් නුවර දිසාපාමොක් ආචාරීව පන්සියයක් මාතවකයන්ට ශිල්ප උගන්වන සේක. එකල්හි බරණැස්

නුවර වාසිහු දුකඛිතයන්ට වැටුප් දී ශිල්ප ඉක්මවන්නාහුය. මේ මිත්තවින්දක තාපස බොධිසත්ත්වයන් වහන්සේගේ සමීපයෙහි කුශලව ශිල්පය, පුරුදු කරන්නේය. හෙතෙම පුරුෂ අවවාද නොගන්නේය. ඔවුනොවුන්ට ප්‍රහාරදෙමින් හැසිරෙන්නේය. බොධිසත්ත්වයන් වහන්සේ විසින් අවවාද දෙනුලබන්නේද අවවාද නොගන්නේය. ඔහු නිසා උන්වහන්සේට අය මදවූයේය. ඉක්බිත්තෙන් මිත්තවින්දක තෙම මාතවකයන් හා සමග ඔබරකොට අවවාද නොගණිමින් එතනින් ගොස් ඒ ඒ තැන්හි ඇවිදින්නේ එක්පසල් ගම්කට ගොස් බැලමෙහෙකොට ජීවත් වන්නේය. හෙතෙම එතැන්හි එක් දිළිඳු ස්ත්‍රියක හා සමග තෘෂ්ණාසන්ථවය කෙළේය. ඒ ස්ත්‍රිහු නිසා ලදරුවන් දෙදෙනෙකු වැදුවාය. ගම්වැස්සෝ ''අපට කවයුතු නොකටයුතු කියව''යි කියා මිත්තවින්දකයාහට බලයදී ඔහු ගම් දෙර කිළියක විසීම කරවූවාය. ඒ මිත්තවින්දකයා නිසා ඒ පසල්ගම්වැස්සෝ සත්වරක් රජහට දඩදුන්නාහුය.සත්වරක් ඔවුන්ගේ ගෙවල් දහනවූවාහුය. සත්වරක් තඩාගයෙහි දිය සිදුනේය. ඔහු සිතන්නාහු ''අපට පළමු මේ මිත්තවින්දකයා නො ආ කල්හි මෙබන්දෙක් නැත්තේය දැන් වහාහි මොහු ආකල් නැන් පවන් පිරිහෙම්හ''යි කියා ඔහු තලා නිකුත්කළාහුය, හෙතෙම තමාගේ ලදරුවන් ගෙණ අත්තැනකට යනුයේ අමනුෂ්‍යයන් පරිගෘහීත එක් අරණ්‍යයකට පැමිණියේය. එතැන්හි අමනුෂ්‍යයෝ ඔහුගේ දරුවන්ද භාර්‍යාවද මරා මාංශ අනුභව කළාහුය. මිත්තවින්දකයා එතනින් දිවගොස් ඒ ඒ තැන්හි හැසිරෙමින් ගම්සීර තම් එක් පටුන් ගමකට නැව් හරණා දිනයෙහිම පැමිණියේ කම් කරුවෙක්ව නැවට නැගුනේය. ඔහු නැගුනු නැව මුහුදු පිටින් සත්දවසක් ගොස් සත්වන දිනයෙහි සමුද්‍ර මධ්‍යයෙහි ඇනතිබුවාක් මෙන් සිටියේය. ඔහු පවිටු කුසපත් ලූවාහුය, සත්වරක් මිත්තවින්දකයාහට පැමිණියේය. නැවෙහි මනුෂ්‍යයෝ ඕහට එක් උණදඬු කලඛක් දී හස්තය අල්වාගෙණ සමුද්‍රයෙහි බැහ වූවාහුය. ඔහු දැමූ පමණකින්ම නැව ගියේය. මිත්තවින්දකතෙම හුණ කලප්හි හෙව සමුද්‍රපිටින් යනුයේ කාශ්‍යප සම්බුදුන් වහන්සේගේ කාලයෙහි මහණව රක්ෂාකළ ශීලඵලයෙන් මුහුදුපිට එක් ස්ඵටික විමානයෙක්හි දිව්‍ය ස්ත්‍රීන් සතර දෙනෙකු ලාබ ඔවුන්ගේ සමීපයෙහි දිවසැප විඳිමින් සත්දවසක් වාසයකෙළේය. ඒ විමාන ප්‍රේතයෝ වනාහි සත් දවසක් සැප අනුභවකෙරෙති. සත්දවසක් දුක් අනුභව කරන්නට යන්නාහුය. ''යම්තාක් කලකින් අපි එමු ද? ඒතාක්කල් මෙතැන්හි වසව''යි කියා ගියාහුය. මිත්තවින්දකයා ඔවුන් ගියකල්හි හුණ කලප්හි හිඳ මත්තෙහි යනුයේ රිදීවිමනෙක්හි දිව්‍යස්ත්‍රීන් අටදෙනෙකු ලද්දේය. එයින් මත්තෙහිදු යනුයේ මැණික්මය විමනෙක්හි දිව්‍යස්ත්‍රීන් සොළොස්දෙන කුදසවණ්මය විමනෙක්හි දිවසත්‍රීන් දෙනිස්දෙනෙකු ලද්දේය, ඔවුන්ගේද වචන නොකොට මත්තෙහි යනුයේ අතුරුදිවයිනෙක එක් යක්ෂ පුරයක්දුටුවේය. එහි එක් යක්ෂණියක් එළරූපයෙන් හැසිරෙන්නීය, මිත්තවින්දකයා ඇ යක්ෂණි බව නොදන්නේ එළුමස් අනුභව කෙරෙමි යි සිතා ඇගේ පය අල්වා ගත්තේය. ඕ තොමෝ යක්ෂානුභාවයෙන් ඔහුඔසවාදැමුවාහුය, මිත්තවින්දකතෙම යක්ෂණිය විසින් දමනලද්දේ මුද පිටින් ගොස් බරණැස්නුවර පවුරපිට එක් කටුලැහැබක් මත්තෙහි වැටී පෙරලමින් භූමියෙහි සිටියේය.

එසමයෙහි වනාහි ඒ පවුර පිට රජහුගේ එළුවන් තණකා ඇවිදින්නවුන් සොරු ගෙණයන්නාහුය. එළුගොව්වෝත් ''සොරුන් ගණුම්හ''යි කියා එකත් පස්ව සැඟවී සිටියාහුය, මිත්තවින්දකයා පෙරලී භූමියෙහි සිටියේ ඒ එළුදෙනුන් දැක මම සවුදුරුයෙහි එක් දිවසිනෙක එළුදෙනක පස අල්වාගෙණ ඇ විසින් දමන

ලද්දෙම් මෙතැන්හි වැටුනෙම් ඉදින් වනාහි දැන් එක් එළුදෙනකගේ පය අල්වා ගනිම් නම් ඒ එළුදෙන මා මතු සමුද්‍ර මත්තෙහි විමාන දිව්‍යස්ත්‍රීන්ගේ සම්පයෙහි දමන්නේය යි සිතූයේය, හෙතෙම මේසේවූ නුවණෙහි මෙනෙහිකොට එළුදෙනගේ පය අල්වාගත්තේය, ඒ එළුදෙන ගත් පමණින් ඇඬුවාය. එළුගොව්වෝ ඔබිනාබින් අවුත් ඔහු ගෙණ "මෙපමණ කලක් රජුගේ එළුවන් අනුභව කළාවූ මේතෙම නොරෙකැ"යි කියා ඔහු බැඳ ඇත රජහුගේ සම්පයට ගෙණ යන්නාහුය. එකෙණෙහි බොධිසත්ත්වයන් වහන්සේ පන්සියයක් මානවකයන් පිරිවරාගෙණ නුවරින් නික්ම නහන්නට වඩිනාසේක් මිත්‍රාවින්දකයා දැක හැඳින ඒ මනුෂ්‍යයන්ට කියනසේක් "යහළෙනි, මේ තෙම අපගේ අතවැස්සෙක කවර හෙයකින් මොහු ගත්තාහුදැ යි කී සේක. 'ස්වාමීන්වහන්ස, මේ එළුවන් නොරෙක එක් එළියකගේ පය අල්වාගත්තේය. එහෙයින් ගත්තා ලද්දේය'යි කීවුය "එසේවීනම් මොහු අපට දුස කොට දෙව අප නිසා ජීවත්වන්නේය'යි කීසේක. ඔහු "යහපත, ස්වාමීන්වහන්ස"යි කියා ඔහු හැරගියාහුය. ඉක්බිත්තෙන් ඕහට බොධිසත්ත්වයන් වහන්සේ 'මිත්‍රාවින්දකය තෝ මෙතෙක්කල් කොතැන්හි විසීදැ'යි විචාළසේක. එතෙම සියලු තමා විසින් කරණලද ක්‍රියාව දන්වූයේය. බොධිත්ත්වයන් වහන්සේ "වැඩකැමැත්තවුන්ගේ වචනය නොකරණ තැනැත්තේ මෙබඳු දුකට පැමිණෙන්නේය"යි වදාරා "වැඩකැමතිව හිත චිත්තයෙන් අනුකම්පා කරන්නාහුගේ අනුශාසනාව අවවාදය යමෙක් නොකෙරේ් එසේවූ පුරුෂතෙම එළුවන්ගේ පය අල්වාගෙණ ශොකකරන්නාවූ මිත්‍රාවින්දකයා මෙන් නිරන්තරයෙන් මිරිකෙන්නේය. ශොකකරන්නේය'යි කියා බණ වදාළසේක. මෙසේ තෙරුන්වහන්සේ විසින් මෙපමණ කලක් මුලුල් ලෙහි ත්‍රිවිධ ආත්මයෙක්හි කුසිය පුරා ආහාර නොලත්විරිසේක, යසෂව උපන් කල්හි එක් දවසක් ගබමල ලද්දේය. සුතබව උපන්කල එක්දවසක් උද්ගාරය කළ ආහාරයක් ලද්දේය. පිරිනිවන් පානාදිනයෙහි දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේගේ ආනුභාවයෙන් චතුමධුරය ලත්සේක. මෙසේ 'අන්‍යයන් හට ලාභාන්තරාය කිරීම මහාදොෂය'යි දතයුත්තේය. ඒ කාලයෙහි ඒ ආචාරීන් වහන්සේද මිත්‍රාවින්දකයා ද කම්වූ පරිද්දෙන් මියපරලොව ගියාහුය සම්බුදුන් වහන්සේ 'මහණෙනි, මෙසේ මේ මහණ තෙමේම සුවල්ප ලාභී බවද තෙමේම ආයුෂ්මතුම ලත්බවද කෙළේය"යි කියා මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වාවදාරා පූර්වාපර සන්ධි ගලපා මේ ලොසක ජාතකය නිමවා වදාළසේක. "එසමයෙහි මිත්‍රාවින්දකයා නම් දැන් ලොසක තිස්ස සථවිරවූසේක. දිසාපාමොක් ආචාරීව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 42
## කපොත ජාතකය

මේ කථාව එක්සමයෙක්හි අවයවෘදී වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසතසේක් එක්තරා ලොල්වූ භික්ෂූ කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක. උන්වහන්සේගේ ලොල්බව නම් තවැනි නිපාතයෙහි ඛපි ජාතකයෙහි මතු පහළවන්නේය.

එසමයෙහි භික්ෂූන්වහන්සේ "ස්වාමීනි, මේ මහණ ඉතා ලොල් මහණ කැ"යි සම්බුදුන් වහන්සේට දන්වූසේක. එකල සම්බුදුන්වහන්සේ සැබෑද? මහණ තෝ ඉතා ලෝභියෙහි දැ'යි වදාළසේක. "එසේය ස්වාමීනි," කී කල්හි මහණ තෝ පෙරත් ලොභියෙහිය, ලොභී බැවින් ජීවිතක්ෂයට පැමිණියෙහිය, නුඹවහන්සේ තා නිසා තමන් වසන තැනින් පිරිහුනෝවේදැ"යි වදාරා ඉකුත් වත් දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජුපුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් පාරාපතයෝනියෙහි උපන්නාහුය. එකල බරණැස්නුවර වැස්සෝ කුසල් කැමති බැවින් ඒ ඒ තැන පක්ෂීන්ගේ සැපසේ විසීම නිසා තොපෙව්වි එල්වා තිබෙති. බරණැස්නුවර සිටාතන්ගේ අරක්කැමියා තමාගේ මුළුතැන්ගෙයි තොපෙව්වියක් එල්වා තුබුයේය. බොධිසත්ත්වයෝ එහි වාසයකෙරෙති. එකල ඒ මහබෝසතාණෝ උදැසනම නික්ම ගොදුරු සොයා අනුහව කොට සවස්වේලේ අවුත් වාසය කෙරෙමින් දවස් යවති. ඉක්බිත්තෙන් එක් දවසක් එක් කපුටුවෙක් මුළුතැන්ගේ මත්තෙන් යන්නේ ඇඹුල් නියඹලා මත්ස්‍යමාංශ දවා සුවඳ කැවූ ගඤ්ඡය ආඝ්‍රාණය කොට එහි ලොභ උපදවා ''කවරක්හු නිසා මේ මත්ස්‍යමාංශ ලබම්දෝහෝ?''යි මුළුතැන් ගෙට නුදුරු තැනක හිඳ පරීක්ෂාකරන්නේ සවස බොධිසත්ත්වයන් අවුත් මුළුතැන්ගෙට වදනා දැක ''මේ පරෙවියා නිසා මත්ස්‍යමාංශ ලබම්''යි දෙවෙනි දවස් උදැසනම අවුත් බොධිසත්ත්වයන්ගේ පෙව්වියෙන් නික්ම ගොදුරු පිණිස යන වේලෙහි පසුපස්සේ නික්මුනේය. එකල මහබෝසතාණෝ ඕනට කවරකාරණයකින් අප හා සමග ''සබඳ, තෝ ඇවිදිනෙහිදැ''යි කිවුය. ''සුවාමීනි, නුඹවහන්සේගේ ක්‍රියාව මට ඉතා රිසියෙයි. එසේ හෙයින් මම මෙතැන්පටන් නුඹවහන්සේට උපසථාන කෙරෙමි''යි කීය. එබස් ඇසූ මහබෝසතාණෝ කියන්නේ ''යහළු, තෙපි අන් ගොවරයක් අනුභව කරව, අපි අන් ගොවරක් අනුභවකරම්හ. තොප විසින් අපට උපසථාන කරන්නට නොපිළිවන් වන්නේ වේදැ''යි කිවුය. ''සුවාමීනි, නුඹවහන්සේ ගොදුරු කන කල මමත් ගොදුරු කා නුඹවහන්සේ හා සමග යන්නෙමි වේදැ''යි කීය. ''යහපත, උදක් තොප විසින් අප්‍රමාදවියයුතු ය''යි මේසේ මහබෝසතාණෝ කපුටුවාව අවවාද කොට ගොදුරුකන්නාහු තණ්හිපු අනුභව කෙරෙති. බොධිසත්ත්වයන් ගොදුරු අනුභව කරණ වේලෙහි කපුටුවා ගොස් ගොම පිඬක් පෙරලා පණුවන් අවුලා කා බඹපුරාගෙණ බොධිසත්ත්වයන් සමීපයට අවුත් ''සුවාමීනි, නුඹවහන්සේ ඉතා බොහෝ වේලක් ගොදුරු අනුභව කරණ සේක. බොහෝකොට කැමි යහපත් නොවන්නේ වේදැ''යි කියා බෝධිසත්ත්වයන් හා සමග ඇවිද ගොදුරු අනුභවකොට සවස්වේලේ අවුත් මුළුතැන්ගෙයි වෙසෙයි.

ඉක්බිත්තෙන් එක්දවසක් සිටාතන්ට බොහෝ මත්ස්‍යමාංශ ගෙණාවා හුය. අරක්කැමියා ඒ මත්ස්‍යමාංශ ඇරගෙණ මුළුතැන්ගෙයි ඒ ඒ තැන එල්වා තිබුයේ කපුටුවා ඒ දැක ලොභ උපදවා ''සෙට ගොදුරු බිමට නොගොස් මා විසින් මේ මත්ස්‍යමාංශ කෑ යුතුය''යි රාත්‍රියෙහි තතන තතනා කෙඳිරිගාමින් වැදහොත්තේය. දෙවෙනි දවස් බොධිසත්ත්වයෝ ගොදුරු පිණිස යන තැනැත්තේ ''වර යහළු කපුටුව''යි කිවුය. ''සුවාමීනි, නුඹවහන්සේ ගිය මැනව, මට බඹරුජාවෙක් වීය''යි කීය. එබස් ඇසූ මහබොධිසත්ත්වයෝ කියන්නෝ ''සබඳ, කපුටුවන්ට බඹරුජාවෙක් නම් කිසිකලෙකත් නුවූවිරූය. රාත්‍රියේ තුන් යම්න් එකි එකි යමෙක මූර්ඡා වෙති. ගිතෙල ගැලූ පහන් කඩක් ගිලූ කල ඒ කපුටුවන්ට මද ඇසිල්ලෙක තාප්ති නිවාරණය වෙයි. බඹපිරෙයි. තෝ මත්ස්‍යමාංශ කනු කැමැත්තෙහි වන, මනුෂ්‍යයන් විසින් අනුභව කවයුත්ත නොපව ගොවර නොවෙයි, නොපට අනුභව කරන්ට නුසුදුසුය. මෙබන්දක් නොකර මා හා සමග ගොදුරු පිණිස වරැ''යි කිවුය. ''යා නොහෙමි සුවාමීනි'' කිකල්හි ''එසේ වී නම් තා කළ නොකටයුත් තෙත් තෝම ප්‍රකාශ වන්නෙහිවේද? ලෝභවසඟයට නොපැමිණ අප්‍රමාදව

වාසයකරව"යි කපුටුවාට අවවාද කොට බෝධිසත්ත්වයෝ ගොදුරු කන්ට ගියෝය. එකල අරක්කැමියා අනේකප්‍රකාරවූ මත්ස්‍යමාංශ විකෘතිය පිස තබා උසුණුම් නික්මෙන පිණිස බදුන් මදක් ඇර මස්රස වහන්නාවූ මුඛම බදුන් මත්තේ තබා ගෙන් නික්ම ඇඟ බා පිසිමින් සිටියේය.

එකෙණෙහි කපුටුවා පැසින් හිස ඔසවා මුළුහැන්ගෙය ඇත මැත බලන්නේ අරක්කැමියා ගෙන් නික්මුණු නියා දැන මේ වූකලී දැන් මාගේ මහදෙල පුරා මස් අනුභව කරන්ට කල, කිමෙක්ද? මම මහත් මසක් අනුභව කරම්ද? නොහොත් සුණුවූ මසක් අනුභවකරම්දැ"යි සිතා සුණුවූ මසකින් නම් වහා කුස පුරවා ගත නොහැක්කේය, මහත් මස් කැටියක් ගෙණවුත් පැස තබාගෙණ කකා වැදහෝම් පැසින් උඩ තැගී මස්රස වහන මුඛම මත්තෙම උන්නේය. ඔහුගේ හිදීමෙන් ඒ මුඛම කිලි කිලී යන අනුකරණයෙන් ශබ්ද පැවැත්තේය. අරක්කැමියා ඒ මුඛම අඩාගිය අඩ අසා 'මේ කිමෙක්දෝහෝ යි ගෙට වත් තැනැත්තේ කපුටුවා දැක "මේ දුෂ්ට කපුටුවා මා විසින් සිටානන්වහන්සේට සකස්කොට පිස තුබූ මස් අනුභව කරණු කැමැත්තේය. මම වූකලී සිටානන්වහන්සේ නිසා ජීවත්වෙමි, මේ අඥතයා නිසා ජීවත් නොවෙමි. එසේ හෙයින් මව මොහුගෙන් ප්‍රයෝජන කිම්දැ"යි දෙර වසා කපුටුවා අල්වා ගෙණ සකල ශරීරය පත් උදුරා අළුත් ඉඟුරු ලුණු දුරු මිරිස් ආදීවූ කුළුබඩු අඹරා ඇඹුල්මෝරේ කලාන්දු කොට ඔහුගේ සකල ශරීරයෙහි ගල්වා ඒ කපුටුවා පැසට දැමුයේය. කපුටුවා මහත්වූ දුකඛවේදනාවෙන් මඩනාලදුව තතනමින් කෙඳිරිගගා වැදහොත්තේය. බෝධිසත්ත්වයෝ සවස්වේලේ අවුත් ඒ ව්‍යසනයට පැමිණි තැනැත්තවුන් දැක "ලොල්වූ කපුටුව, මා කිවා නොකොට තෘගේ ලොභය නිසා මහත්වූ දුකට පැමිණියෙහි වේදැ"යි කියා "දැන් මෘත් මෙතන වසන්ට නොපිළිවනැ"යි මහබෝසතාණෝ අනික් තැනකට ගියෝය. කපුටුවා එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. එකල්හි අරක්කැමියා ඔහු පැසින් ගෙණ කසල ගොඩට දැමීය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ "මහණ, තෝ ලොල්වූයේ දැන් මතු නොවෙයි, පෙරත් ලොල් වූයෙහිය. තෘගේ ලොල් බව නිසා නුවණැත්තෝ තමන් වසන තැනින් පිරිහී ගියෝ වේදැ"යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍යසත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ඒ ලොල් මහණ අනාගාමි පෙලෙහි පිහිටියේය. සම්බුදුන් වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ ඝටපොත ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි කපුටුවා නම් දැන් මේ ලොල්වූ භික්ෂුහුය, එසමයෙහි පරෙව්ව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

---

## 43 වෙළුක ජාතකය.

**ඒ**වද එක් සමයෙක්හි සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරණ සේක්, එක්තරා දුර්වවූ භික්ෂුවක් අරභයා මේ ජාතකය වදාළසේක. සම්බුදුන් වහන්සේ ඕ භව වනාහි වදාරණසේක් "මහණ, තෝ දුර්වවූයේ සැබෑදැ" යි විචාරා "සවාමීන්වහන්ස, සැබෑව"යි දැන්වූ කල්හි "මහණ, තෝ දුර්වවූයේ දැන්මතු නොවයි පෙරත් දුර්වවූයෙහිය. දුර්වවූ බැවින්ම නුවණැත්තන්ගේ වචනය නොකොට සම්මුඛයෙන් ජීවිතක්ෂයට පැමිණියෙහිය"යි වදාරා ඉකුත් කථාව වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි බෝධිසත්ත්වයන් වහන්සේ මහාභෝගකුලයෙක්හි ඉපිද වැඩි වයසට පැමිණ පඤ්චකාමයෙහි ආදීනව හා මනාබිනික්මන් කිරීමෙහි ආනිශාංස දැක වස්තුකාමයන් හැර හිමාලයවනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කිසිණුපරියම් කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් කල් යවන සේක් මැතභාගයෙහි මහත් පිරිවර ඇතිව පන්සියයක් තපස්වීවරයන් විසින් පිරිවරණලදුව ගණශාස්තෘව වාසයකරණසේක.

ඉක්බිත්තෙන් එක් සඳිපොතකයෙක් තමාගේ සභාවයෙන් ගොදුරු කා ඇවිදිනේ එක්තරා තපස්වියක්හුගේ ආශ්‍රමයට පැමිණියේය. තපස්වීන් වහන්සේ ඒ සඳියා කෙරෙහි පුත්‍රස්නෙහ උපදවා ඔහු එක් වෙළපලීයෙක්හි නොවා රක්ෂා කරත්නේය ඕනට වෙළ පලීයෙහි හෝනා නෙයින් වෙළකය යි කියා නමක් කළාහුය. ඔහු පුත්‍රස්නෙහයෙන් රක්ෂාකරන්නාහු තපස්වීහට වෙළක පියා යයි කියාම නමක් කළාහුය. එකල්හි බෝධිසත්ත්වයන් වහන්සේ "එක් තපස්වියෙක් එනාහි සඳියකු රක්ෂා කරන්නේය"යි අසා ඔහු කැඳවා "තොපි ආශීවිෂයකු රක්ෂා කරන්නේ සැබෑද? කිම්දැ"යි විවාරා "සැබෑ"යි කී කල්හි ආශීවිෂයා හා සමග විශ්වාසයෙක් නම් නැත්නේය, මෙසේ රක්ෂා නොකවර"යි කියසේක. තාපසතෙම කියනුයේ "ආචාරීන්වහන්ස, අශීවිෂයා මාගේ පුත්‍රවන්නේය, මම ඔහුගෙන් වෙන්ව වසන්ට නොහැකි වන්නෙමි"යි කියේය. "එසේ වීනම් මොහුගේ සම්පයෙන් ජීවිතක්ෂයට පැමිණෙන්නේය"යි කියසේක. තපස්වීන් වහන්සේ බොධිසත්ත්වයන් වහන්සේගේ වචනය නොගත්තේය. ආශීවිෂයාද හරතට නෙහැකිවූයේය. ඉක්බිත්තෙන් කීපදවසක් ඇවැමෙන්. සියලු තපස්වීවරයෝ ඵලඵල පිණිස ගොස් ගිය තැන්හි ඵලාඵලයාගේ සුලභ බැවි දැක දෙතුන් දවසක් එතැන්හිම වාසය කළාහුය. වෙළක පියානෝද ඒ තපස්වීන් වහන්සේලා හා එක්ව යනුයේ ආශීවිෂයා හුණ පුරුකෙහි හොවා පිඹාත කොට වසා ගියේය. ඒ තාපසතෙම නැවත යෙසු තපස්වීවරයන් හා දෙතුන් දවසක් ඇවැමෙන් අවුත් 'වෙළකයාහට ගොදුරු දෙමි'යි කියා හුණ පුරුක පියත හැර "පුත්‍රය, ක්ෂුධායෙහිය, එව" යි කියා හස්තය දිගු කෙළේය. ආශීවිෂතෙම දෙතුන් දවසක් නිරාහාර බැවින්කිපී දිගුකරණලද හස්තය. ඩැහැ තපස්වියා එතැන්හිම ජීතක්ෂයට පමුණුවා වතයට වත්නේය. තපස්වීවරහු ඒ දැක බොධිසත්ත්වයන් වහන්සේට දන්වූවාහුය. බෝධිසත්ත්වයන් වහන්සේ ඔහුගේ ශරීරය ආදාහනය කරවා ඍෂි සමූහයාගේ මැද ඉඳ ඍෂීන්ට අවවාද වශයෙන් මෙසේ වදාළසේක. "වැඩකැමැත්තාවූ හිතවිත්තයෙන් අනුකම්පා කරන්නාහුගේ අනුශාසනාව අවවාදය යමෙක් නොඉක්මිනිද? එසේවූ පුරුෂතෙම වෙළකතම් යළියාගේ පියාතෝ යමසේ හෝනානුද? එපරිදි දෙන්ම නැතලදුව හෝනේ ය"යි වදාළසේක. මෙසේ බොධිසත්ත්වයන් වහන්සේ ඍෂි සමූහයාට අවවාද දී සතරබ්‍රහ්මවිහාරයන් වඩා ආයුෂයාගේ කෙළවර බ්‍රහ්මලෝකයෙහි උපන්සේක.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ වදාරණසේක් 'මහණ, තෝ දුර්වවූයේ දන්මතු නොවෙයි, පුරීයෙහිද අකීකරු බැවින් සඳිමුඛයෙන් පූතිභාවයට පැමිණියෙහිය"යි කියා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපරසන්ධි ගළපා "මේ වෙළක ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි වෙළන සඳියාගේ පියානෝ නම් දැන් මේ දුර්වව මහණ වූයේය. අවශෙෂ පර්ෂද් දැන් බුදුපිරිස් වූවාහුය ගණශාස්තෘව උපන්තෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තථාගතයන් වහන්සේ දක්වා වදාළසේක.

## 44
## මකඵස ජාතකය

**එ**වද එක් සමයෙක්හි ඥානගුණ ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මගධරට සැරිසරා වඩනාසේක්, එක්තරා ගමෙක නුවණ නැති ගම් වැසි මනුෂ්‍යයන් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් සමයෙක බුදුරජාණන් වහන්සේ සැවැත්නුවරින් නික්ම මගධ රාජ්‍යයට ගොස් එහි චාරිකා කොට ඇවිදිනාසේක් එක්තරා ගමකට පැමිණි සේක. ඒ ගමතෙමේත් බොහෝසේ අඥාත මනුෂ්‍යයන් විසින් ගැවසීගත් තේය. එක් දවසක් ඒ ගම් අඥාත මනුෂ්‍යයෝ රැස්ව කියන්නෝ 'පින්වත්නි, අප වනයට වැද කම්‍මාන්ත කරණ කල්හි මදුරුවෝ කති. උන්ගේ කැම නිසා අපගේ කම්‍මාන්තයට බාධා වන්නේය. අපි හැමදෙනම දුනු හා ආයුධ ඇර ගෙණ ඇ ස් මදුරුවන් හා යුඬ කොට සියලු මදුරුවන් විද කොටා මරම්හ"යි මන්ත්‍රණය කොට වනයට ගොස් "මදුරුවන් මරම්හ"යි ඔවුනොවුන් විද කොටා මහ දුකට පැමිණ අවුත් ඇතුළු ගමත් ගම් මඬයෙහිත් ගම්දොරත් වැදහොත්තාහුය එකල සම්‍බුදුහු බහන්සේ භික්ෂූන්ඩහයා පිරිවරා ඒ ගමට පිඬුසිහා වන්සේක. අවශෙෂ මනුෂ්‍යයෝ බුදුන් දැක ගම්දොර මණ්ඩපයක් කොට බුදුපාමොක් මහසඟ පිරිසට මහදන් දී බුදුන් වැඳ එකත්පස්ව උන්නාහුය.

සම්‍බුදුහු වහන්සේ ඒ ඒ තැන විත් කෙටීමෙන් ව්‍රණවූ ශරීර ඇති මනුෂ්‍යයන් දැක උපාසකවරුන් අතින් විමාළසේක. "බොහෝ මනුෂ්‍යයෝ ගිලන්ව වැදහොවිති, මොවුන් විසින් කුමක් කරණ ලද්දේදැ"යි විමාළසේක. "සඟාමීනි, මේ මනුෂ්‍යයෝ මදුරුවන් හා යුඬ කරම්හ යි ගොස් ඔවුනොවුන් විද තුමූ ගිලන් බවට පැමිණියෝය"යි දැන්වූය. සම්‍බුදුහු වහන්සේ "ඒම්බා නුවණැති මනුෂ්‍යයෙනි, මේ අඥාත මනුෂ්‍යයන් මදුරුවන් මරම්හ යි කියා තමන් මැරුවේ දැන් මතු නොවෙයි, පෙරත් මදුරුවන් ගසම්හ යි කියා අනුන් ගැසූ මනුෂ්‍ය කෙණෙක් වේදැ"යි වදාරා ඒ ප්‍රාඥ මනුෂ්‍යයන් විසින් ආරාධිතවූ බුදුරජුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

**යි**වකඟිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහාබෝසතාණන් වෙළඳුමෙන් ජීවත්වෙති. එසම යෙහි කසීරට එක් පසල් ගමෙක බොහෝ වඩුවෝ වෙසෙති. ඒ ගම එක්ඉසකේ වැඟිරීනිය වඩුවෙක් දණ්ඩක් සස්නේය. එකල එක මදුරුවෙක් ඔහුගේ තඹ තැවි පිටක් වැනිවූ ඉසෙහිද අඬයවියෙන් පහරණාක් මෙන් ඉසම්මුවතුඬින් විදි නේය. එතෙම තමා සමීපයෙහි සිටි පුතුට කියන්නේ "පුත, මා හිස එක් මදුරු වෙක් තෙබකින් අනින්නාක් මෙන් විදින්නේය, ඔහු නවතාපියව"යි කීය. එබස් ඇසූ පුත්‍රයා කියන්නේ "පියාණන්වහන්ස, ඉවසුවමැනව යි එක පහරින් ඒ මදුරුවා මරාපියම්"යි කීය. එසමයෙහි බොධිසත්ත්වයෝත් තමන්ට බඩු සොය මින් එගමට පැමිණ ඒ වඩුවන්ගේ දඹුනල සිටියාහ. ඒ වඩුකි පුත්‍රයා මදුරුවා දුරුකෙරෙමි යි සියුම් මූවහත් ඇති මහ පොරොවක් ගෙණ පියාගේ පිටිපස් සේ සිට මදුරුවා ගසම් යි පියාගේ හිස දෙකක්කොට පැලූයේය. වඩුවා එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. බොධිසත්ත්වයෝ ඔහුගේ ක්‍රියාව දැක "සතුරා වුවත් නුවණැති තැනැත්තේ උත්තමය. ඒ නුවණැත්තාවූ සතුරා අනුන් තමා මරතත් දඬ ගණිතත් ඒ දණ්ඩනාදියෙහි හසින් මනුෂ්‍යයන් නොමරන්නේය"යි සිතා මෙසේ කිවුය. "නුවණින් යුක්තවූ සතුරා උතුම් නුවණ නැත්තාවූ මිත්‍රයා උතුම් නොවෙයි. කුමක් හෙයින්ද? යත් මේ කොළ තොළුවූනු වණ නැති පුත්‍රයා මදුරුවා මරම් යි තමාගේ පියාගේ ඔළුව පලාපිය එසේහෙයින් අඥතවූ මිත්‍රයාහට වඩා ප්‍රාඥවූ අමිත්‍රයාම උතුමැ"යි මෙසේ මහ

බෝසතාතෝ එතතව පැමිණි සත්ත්වයන්ට ධර්මදේශනා කොට හුනස්තෙන් නැඟී ගොස් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය, වඩුවාගේ නැයෝත් ඔහු දවාපූය. ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ උපාසකවරුනි, පෙරත් මදුරුවා ගසම්න''යි අනුත් ගසා මැරූ මනුෂ්‍යයෝම ඇත්තෝම වේදැ''යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරාන්තයන්ධි ගළපා මේ මඝදේව ජාතකය නිමවා වදාළ සේක. ''එසමයෙහි එතතව පැමිණි සත්ත්වයන්ට අවවාද කොට ගියාවූ නුවණැති වෙළෙඳුනෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 45
## රොහිණී ජාතකය.

මේවද එක්සමයෙක්හි බුදුරජාතන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසතසේක් අනේපිඬු මහසිටාතන්ගේ දුසියක් අරභයා මේ ජාතකය වදාළ සේක. අනේපිඬු මහසිටාතන්ගේ වතාහි රොහිණී නම්වූ දුසියක් වූවාය, ඒ දුසියගේ වී පහරණ තැනට අවුත් මැහැලිවූ මැනියෝ නොත්තීය ඒ මැහැලි ස්ත්‍රිය, මැස්සෝ පිරිවරා හිඳියෙන් විදිනාක් මෙන් කන්නාහුය. ඕ තොමෝ දුවනියන්ට කියන්නී ''දියනියෙනි, මක්ෂිකාවෝ මා කනි මොවුන් වළක්ව''යි කීව. ඕ තොමෝ ''මැනියෙනි, වළක්වමි''යි කියා මෙහොල ඔසවා මැනියන්ගේ ශරීරයෙහි මක්ෂිකාවන් මරා විනාශයට පමුණුවන්නෙමි සිතා මැනියන්ට මොහොලින් ප්‍රහාර දී ජීවිතක්ෂයට පැමිණවූව, ඒ දුක ''මගේ මැනියෝ මළාය''යි කියා අඬන්ට පටන්ගත්තීය. ඒ ප්‍රවෘත්තිය අනේපිඬු මහසිටාතන්ට දැන්වූවාහු ය, සිටාතෝ ඒ දුසියගේ ශරීරය ආදාහන කරවා විහාරයට ගොස් සිහලු ප්‍රවෘත්තිය සම්බුදුන් වහන්සේට දැන්වූහ. සම්බුදුන් වහන්සේ ''ගෘහපතිනි, මේ දුසිය මැනියන්ගේ ශරීරයෙහි මක්ෂිකාවන් මරමි සිතා මොහොලින් ප්‍රහාර දී මැනියන් මැරුවා දැන් මතු නොවෙයි, පූර්වයෙහිත් මැරුවාමය''යි වදාරා අනේපිඬු මහසිටාතන් විසින් ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි බොධිසත්ත්වයන් වහන්සේ සිටුකුලයෙක්හි ඉපිද පිය මහ සිටුහුගේ ඇවෑමෙන් සිටුතනතුරට පැමිණිසේක. ඒ සිටාතන්ගේ ද රොහිණී නම් දුසියක් වූවාය. ඒ දුසිද තමාගේ වී පහරණ තැනට අවුත් හොත්තාවූ මැනියන් විසින් ''දුවනියෙනි, මාගේ හිඟ මක්ෂිකාවන් වළක්ව''යි කියනු ලබන්නී මෙම ක්‍රමයෙන් මොහොලින් ප්‍රහාර දී මැනියන් ජීවිතක්ෂයට පමුණුවා හඬන්ට පටන්ගත්තීය. බොධිසත්ත්වයන් වහන්සේ ඒ ප්‍රවෘත්තිය අසා අම්තුදවනාහි මේ ලෝකයෙහි ප්‍රඥාවන්ත තැනැත්තේම උතුම්යැයි සිතා මෙසේ කීසේක. ''කරුණා ඇත්තාවූ යම්බදු බාලයෙක් ඇද්ද? ඌට වඩා නුවණැත්තාවූ අම්තුදයාම උතුම්වන්නේය, කුමක් මෙන්ද? යත් රොහිණී නම්වූ නුවණ නැත්තී මව මැස්සන් මරම්හි මුසල ප්‍රහාරයෙන් මරා ශොක කෙරෙයි. මේ කාරණයෙන් මේ ලෝකයෙහි අම්තුද ප්‍රඥාවත් තැනැත්තේ උතුම්වන්නේය''යි බෝධිසත්ත්වයන් වහන්සේ පණ්ඩිතයාගට ප්‍රශංසා කෙරෙමින් බණ වදාළසේක. ශාස්තෘන් වහන්සේ 'ගෘහපතිය මෝතොමෝ මැස්සන් මරමි යි සිතා මව නැසුවා දැන් මතු නොවෙයි පෙරත් මැරුවාමය'යි වදාරා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්ව පරසන්ධි ගළපා මේ රොහිණී ජාතකය නිමවා වදාළසේක. ''එකල්හි මැනියන් දැනුත් මැනියෝමවූය , දුවනියෝ දැනුත් දුවනියෝ වූය. මහසිටුව උපන්නෙමි වතාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වෙදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 46
## ආරාමදූසක ජාතකය.

තීවද එක්සමයෙක්හි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ කොසොල් රට එක්තරා ගමෙක්හි වසනසේක් උද්‍යානයක් දූෂ්‍යකිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක. සවීඥයන් වහන්සේ වතාහි කොසොල්රට සැරිසරා වඩනාසේක් එක්තරා ගමකට පැමිණිසේක. ඒ ගමෙහි වසන එක් කෙළෙඹි පුත්‍රයෙක් සවීඥයන් වහන්සේට ආරාධනාකොට තමාගේ උයනෙහි වැඩහිඳිනට සලස්වා බුදුපාමොක් මහා සඞ්ඝයාවනන්සේට දන්දී "ස්වාමීන් වහන්සේලා කැමති පරිද්දෙන් මේ උයනෙහි හැසිරෙණ සේක්ව' යි කියේය.

භික්ෂූන්වහන්සේලා උන්තැනින් නැගී සිව් උයන්ගොවිවා ගෙණ උයනෙහි හැසිරෙන්නාහු 'එක් එලිවූ තැනක් ඝනවූ ඡායාව ඇත්තේය. මෙතැන්හි වෘක්ෂයක් හෝ ගසක් හෝ නැත්තේය. කවර කාරණයෙක්ද"යි විවාළහ. "ස්වාමීන් වහන්ස, මේ උද්‍යානය ගස් රොපණය කරණ කල්හි ගම්දරුවෙක් දිය ඉස්නේ මෙතැන්හි පැල මුල් උදුරා මුල් පමණින් දිය ඉස්සේය ඒ රුක්පැල මලානිකව මළේය. මේ කාරණයෙන් මේ සථානය එලිවූයේය"යි කීය, භික්ෂූන් වහන්සේලා සවීඥයන් වහන්සේ කරා එලඹ මේ කාරණාව දැන්වූවාහුය. සවීඥයන් වහන්සේ "මහණෙනි, ඒගාමදූරකතෙමේ ආරාමය දූෂ්‍යකෙළේ දැන් මතු නොවයි, පූර්වයෙහිත් ආරාමය දූෂ්‍යකෙළේමය'යි වදාරා ඉකුත්වත් කථාව වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙතෙකුන් රාජ්‍යය කරණ කල්හි බරණැස්නුවර නකත්කෙළියට සෙෝභාකළාහුය. නක්ෂත්‍ර හෙරිශබ්දය ඇසූ තැන්පටන් සියලු නුවර වැස්සෝ නකත්කෙළි ආශ්‍රය කොට හැසිරෙන්නාහුය, එකල්හි රජහුගේ උයනෙහි බොහෝ වානරයෝ වසන්නාහුය. උද්‍යානපාලතෙම සිතනුයේ "නක්ෂත්‍ර ක්‍රීඩාවට බෙරලැවූයේය, මේ වානරයන්ට දිය ඉසුව සි කියා නක්ෂත්‍ර ක්‍රීඩා කෙරෙම්"යි සිතා ජේෂ්ඨ වානරයා කරා එළඹ "ඉහළ වානර ජේෂ්ඨය, මේ උද්‍යානය නුඹවහන්සේලාටද බොහෝ උපකාරය, එහෙයින් නුඹවහන්සේලා මේ උයනෙහි පුෂ්පඵල ඵලලයන් අනුභවකරව'යි නක්ෂත්‍ර ක්‍රීඩාවට සෙෝභණය කෙළේය, මම නක්ෂත්‍ර ක්‍රීඩාකරන්නෙමි, යම් කලකින් මම එමිද? ඒ තාක්කල් මේ උයනේ රුක්පැල ගස්වලට දිය වත්කරන්ට හැකිවන්නාහුදැ"යි විවාළේය. "යහපත හැකිවන්නෙමි"යි කීයේය. "එසේ වීනම් අප්‍රමාදව"යි කියා දිය වත්කරණු පිණිස ඔවුන්ට සම්පයිද කාෂ්ඨමය කළද දී හිඳේය, වානරයෝ සම්පයිද දඬුකළද ගෙණ පැල ගස්හි දිය වත්කරන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුන්ට වානර රජතෙම කියනුයේ "පින්වත්වූ වානරයෙනි, ජලය නම් රක්ෂා කවයුත්තේය. තෙපි පැල ගස්හි ජලය වත්කරන්නාහු ගස් උපුටා උපුවා මුල් බලා ගැඹුරු ගිය මුල්හි බොහෝ ජලය වත්කරව ගැඹුරුව නොගිය මුල්හි සුවල්පයක් වත්කරව පසුව අපට ජලය ලැබගත නොහැක්කේය"යි කීයේය. ඔහු වානර රජහුගේ වචනය "යහපතැ"යි පිළිගෙණ එලෙස කළාහුය.

එසමයෙහි පණ්ඩිත පුරුෂයෙක් රාජ්‍යෝද්‍යානයෙහි එලෙස කරන්නාවූ ඒ වානරයන් දැක මෙසේ කීයේය. පින්වත් වානරයෙනි, කවර කාරණයකින් තෙපි අලුත රොපනය කරණලද පැලගස් උපුට උපුවා මුල් පමණින් ජලය වත් කරන්නාහුදැ"යි කීයේය. ඒ වානරයෝ "අපගේ වානර රජතෙම මෙසේ අවවාද දුන්සේය'යි කීවාහුය. නුවණැත්තාවූ පුරුෂතෙම ඒ වචනය අසා 'පින්වත්නි ඒ කාන්තයෙන් පිරිහීමෙක් වූයේය, අඥතවූ නුවණ නැත්තෝ වැඩක්කරම්හ"යි

කියා අවැඩක් කරන්නාහුය"යි සිතා මෙසේ කීයේය. "අනර්ථයෙහි දක්ෂයා විසින් අර්ථයෙහි හැසිරීම සුව ඵලවන්නේ නොවෙයි. නුවණ නැති තැනැත්තේ වැඩ පිරිහෙලන්නේය. කවරෙක්හු මෙන්ද කීවොත් උත්තනයෙහි නියුක්ත වානරයා වැඩකෙරෙමිසි සිතා අවැඩ කෙළේය,'යි කියා මෙසේ ඒ නුවණැති පුරුෂතෙම වානර රජහට නින්දුකොට තමාගේ පමිදී ගෙණ උයනින් නික්මුනේය. සම්බුදුන් වහන්සේ "මහණෙනි මේ ගම් ලදරුවා උයන දූෂ්‍ය කෙළේ දැන් මතු නොවෙයි, පෙරත් උයන දූෂ්‍යකෙළේමය"යි වදාරා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ ආරාම දූෂක ජාතකය නිමවා වදාළ සේක. "එසමයෙහි ප්‍රධාන වානරතෙම දැන් ආරාම දූෂ්‍යයකළ ගම්ලදරුවූයේය. පණ්ඩිත පුරුෂව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ'යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 47
## වාරුණී ජාතකය

මේ වද එක්සමයෙක්හි බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසතසේක් ආරාම දූෂ්‍යය කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක. අනේපිඩු මහසිටාතන්ගේ වනාහි යහළුවූ එක්තරා වෙළෙන්දෙක් තියුණුවූ රා යොදා භිරණ්‍ය සුවණ්ණාදිය ගෙණ විකුට වසනුයේ මහජනයා රැස්වූකල්හි "සගය, තෙපි මිළගෙණ රා දෙව'යි කියා අතවැස්සකුට ඇණවා තෙමේ නානනු පිණිස ගියේය. අතවැසි පුරුෂතෙම මහජනයාහට රා දෙනුයේ මනුෂ්‍යයන් අතරතුර ලුණුකැට ගෙන්වාගෙණ අනුභවකරන්නවුන් දැක රා ලුණු නැත්තේවත ලුණු මෙහි බහන්නෙම් සිතා රා සැලෙහි නැළියක් පමණ ලුණු බහා ඔවුන්ට රා දෙන්නේය. ඔහු මුඛය පුරපුරාගත් රා දමා "තොප විසින් කවරක් කරණ ලද්දේදැ'යි විවාළා නුය. "තෙපි රා බී ලුණු ගෙන්වන්නවුන් දැක ලුණුයෙන් යෙදුයෙමි" කීයේය. "මෙබදු මනාප වූ රා නාසුයෙහිය, අඤ්ඤයෙහිය 'යි ඕනට නින්දු කොට නැගීසිට ගියාහ. රා වෙළඳතෙම අවුත් එක් සත්ත්වයකුත් නොදැක 'රාපීවාහු කොතැන්හි ගියාහුදැ"යි විවාළේය. "අඤ්ඤය මෙබදු මනොඥ රා තා විසින් නසනලදැදේදැ"යි නින්දුකොට මේ කාරණාව අනේපිඩු මහසිටාතන්ට දන්වූයේය. අනේපිඩු මහසිවාතෝ "අපට මේ තෙපුල් පඬුරක් ඇතැ'යි සිතා ජේතවනාරාමයට ගොස් බුදුරජාතන් වහන්සේට නමස්කාර කොට එකත්පස්ව ඉඳ මේ කාරණාව දන්වූයේය. බුදුරජාතන් වහන්සේ වදාරණසේක් "ගෘහපතිය, මේතෙම රා දූෂ්‍යය කෙළේ දැන් මතු නොවෙයි, පූර්වයෙහිත් රා දූෂ්‍යය කෙළේමය"යි වදාරා අනේපිඩු මහසිටාතන් විසින් ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් කථාව දක්වා වදාළසේක.

යි යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණකල්හි අප මහබෝධිසත්ත්වයන් වහන්සේ බරණැස් නුවර සිටුකුලයක ඉපිද වැඩිවයසට පැමිණ සිටු සථානාන්තරයට පැමිණිසේක. ඒ බරණැස් සිටාතන් නිසා එක්තරා වෙළෙන්දෙක් ජීවත්වන්නේය. ඒ වෙළඳපුත්‍රතෙම "තියුණු වූ රා යොදා මේ රා විකුණා මිළගණුව"යි කියා අතවැස්සාට කියා නහන පිණිස ගංගාවට ගියේය. අතවැසි පුරුෂතෙම අප මහබොසතාණන් වහන්සේ ආශ්‍රය කොට සිටි වෙළෙන්දු ගිය පමණකින්ම රා සැලවල්හි ලුණුබහා මෙම ක්‍රමයෙන් රා නසුයේය. ඉක්බිත්තෙන් ඔහුගේ ආචාරිතෙම අවුත් ඒ කාරණාව දැන සිටාණන්ට දන්වූයේය. සිටාතෝ "අනර්ථයෙහි දක්ෂ වූ අඤ්ඤයෝ වැඩ

කරම්හයි කියා අවැඩකරන්නාහුය''යි කීසේක. ''අතථියෙහි දෝෂයා විසින් කරණලද අකීර්තියකි තොමෝ සුව එලවන්නී නොවෙයි. නුවණ නැති තැනැත්තේ තමාහට වැඩ පිරිහෙළන්නේය. කවරක්හු මෙන්ද? යන් රාසැලවල ලුණු ලා නැසූ කොණ්ඩඤ්ඤ තම් අතවැස්සා යම්සේ සුරාව යහපත් කෙරෙමියි ලුණු ලා නැසීද? එපරිද්දෙන් නුවණ නැති තැනැත්තේ යහපත් කෙරෙමි යි නපුරක්ම කරන්නේය''යි කියා බොධිසත්ත්වයන් වහන්සේ බණ වදාළසේක. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ද ගාථාපතිය, මේ අතවැසි පුරුෂතෙම රා දූෂ්‍යය කෙළේ දැන් මතු නොවෙයි, පෙරත් සුරා දූෂ්‍යය කෙළේමය'යි වදාරා පූර්වාපරසන්ධිගළපා මේ වාරුණී ජාතකය නිමවා වදාළසේක, ''එසමයෙහි රා දූෂ්‍යයකළ අතවැසි පුරුෂතෙම දැනුදු සුරා දූෂ්‍යයකළ අතවැසි පුරුෂවූයේය. බරණැස් සිටුව උපන් තෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක

---

## 48
## වෙදබ්භ ජාතකය

තිවද එක්සමයෙක්හි මහමෙර සේ නිශ්චලවූ ගුණ ඇති බුදුරජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වසතසේක්, දුර්වවූ භික්ෂූ කෙණෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළසේක. සම්බුදුයන් වහන්සේ ඒ භික්ෂූහට ''මහණ තා දුර්වවූයේ දැන් මතු නොවෙයි, පෙරත් දුර්වවූයෙහිමය, ඒ දුර්වවූ කාරණයෙන්ම නුවණැත්තන්ගේ බස් නොගෙණ සියුම් මුවහත් ඇති බඩිග-යෙන් දෙකඩ කොට නසන ලදුව මගවැටී ඔත්තෙහිවේද? තා එක තැනැත්තවූ නිසා දහසක් පුරුෂයෝ ජීවිතක්ෂයට පැමිණියෝ වේදැ''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි එක්ගමෙක එක්තරා බමුණෙක් වෙදබ්භ නම් මන්ත්‍රයක් දන්නේය. ඒ මන්ත්‍රය වූකලී අනර්ඝය, මහාඝය, නැකැත් යොගයක් ලත් කල්හි ඒ මන්ත්‍රය පිරුවා ආකාශය බැලූකල ආකාශයෙන් සත්රුවන් වැස්සා වස්නේය. එකල පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණන් ඒ බ්‍රාහ්මණයා සමීපයෙහි ශිල්ප උගන්නාහුය. ඉක්බිත්තෙන් එක් දවසක් බ්‍රාහ්මණයා බොධිසත්ත්වයන් කැඳවා ගෙණ කිසි කටයුත්තක් නිසා තමාගේ ගමින් නික්ම වේතිය රාජ්‍යයට ගියේය. අතරමග එක්වලෙක පන්සියයක් පමණ පෙසනකචොර තම්වූ සොරකෙණෙක් මන්පහරණුවෝය, ඒ පෙසනකචෝරයෝ බොධිසත්ත්වයන් හා වෙදබ්භ නම් බමුණා අල්වාගත්තාය. ඔහු ඇමදෙන කවරකාරණයකින් පෙසනකචෝරයයි නම් ලද්දාහුද?යත්, ඔහු ඇමදෙනම දෙදෙනෙකු අල්වාගත් කල එකෙකු වස්තුගෙණයන්ට යවා එකෙකු සමීපයෙහි රඳවා ගණිති. එසේ හෙයින් ඔහු පෙසනක චොර නම් වෙති. ඔහු ඇමදෙනද දෙපුතු පිය කෙනෙකුන් අල්වාගෙණ පියානන්ට කියනකල ''තෙපි අපව වස්තුගෙණවුත් පුතනුවන් ගලවාගෙණ යව''යි කියති. මෙම ක්‍රමයෙන් දෙපුතු මෑනිකෙණෙකුන් අල්වාගෙණ මෑනියන් වස්තුගෙණයන්ට යවති. දෙබෑකෙණෙකුන් අල්වා ගෙණ බෑනන් වස්තු ගෙණයන්ට යවති. ආචාරිය අන්තෙවාසික දෙදෙනෙකු අල්වාගෙණ අන්තෙවාසිකයා වස්තු ගෙණයන්ට යවති, ඒ සොරුන් පන්සියයක් දෙන එකල වෙදබ්භ නම් බමුණා අල්වාගෙණ බොධිසත්ත්වයන් වස්තු ගෙණෙන්ට යවූය. බොධිසත්ත්වයෝ ආචාරීන් වැඳ කියන්නෝ ''මම් දෙතුන්

දවසක් ගියකල එම්. නුඹවහන්සේ නොබාමැනව, තවද එකක් කියම්. මා කීවා කළමැනවැ, අද සත්රුවන් වස්වන්නාවූ නක්ෂත්‍ර යොගය, වර්‍ෂා නොවැස්සුව මැනව, ඉදින් නුඹවහන්සේ වැස්සුවසේක් වීනම් නුඹවහන්සේත් විනාශයට පැමිණෙනසේක. මේ පන්සියයක් සොරුන් විනාශයට පැමිණෙති'යි මෙසේ ආචාරීන්ට අවවාද කොට වස්තුගෙණෙන්ට ගියෝය, සොරුන් භිරු හසුනයට ගිය කල්හි බමුණා බැඳ හොවාලූය.

එකෙණෙහිම නැගෙණහිර සක්වලින් සම්පූර්‍ණව චන්ද්‍රමණ්ඩලය නැංගේය. එකල බමුණා නක්ෂත්‍ර යෝගය බලන්නේ ''සම්පත් වර්‍ෂා වුස්සන්නාවූ නක්ෂත්‍ර යෝගය ලබනලද, එසේ හෙයින් බඹුනයෙහි වැදහෙව දුක් අනුභව කිරීමෙන් මට ප්‍රයෝජන කිම්ද? මන්ත්‍රය පිරුවා සත්රුවන් වර්‍ෂා වස්වා සොරුන්ට වස්තූදී සැපසේ යෙමි'යි සිතා සොරුන්ට බැණවූයේය ''පින්වත්වූ සොරුනි, තොපි ඇම මා කුමක් නිසා ඇල්වූයෙහිදැ'යි කීයේය. ''ආචාරීනි, වස්තු පිණිසය''යි කීකල්හි ඉදින් තොපට වස්තුවෙන් ප්‍රයෝජන ඇත්නම් මා බඹුනයෙන් මුදවා වහා නහවා අලුත් පිළි අඳවා සුවඳ විලවුන් ගල්වා මල්පලඳවා සිටුවව''යි කීයේය. ඒ සොරු ඇමදෙනම ඔහුගේ කථාව අසා එපරිද්දෙන් කළහ.

එකල බමුණා නක්ෂත්‍ර යෝගය දැන මන්ත්‍රය පිරුවා ආකාශයඋඩ බැලීය. එකෙණෙහිම ආකාශයෙන් සත්රුවන් වර්‍ෂා වූයේය. සොරු ඒ ධනය එකතැන් කොට උතුරු සළුවල පොදි බැඳගෙණ නික්මුනාහුය. බමුණාත් ඔවුන් පසු පස් සෙහි ම ගියේය. ඉක්බිත්තෙන් ඒ සොරුන් පන්සියයක් දෙනා අන්‍ය වූ සොරුන් පන්සියයක් අල්වාගත්තාය, ''කුමක් පිණිස ඇල්වූදැ''යි කී කල්හි ''වස්තුව පිණිස ඇල්ලුම්හ'යි කිවූය ''ඉදින් තොපට ධනයෙන් ප්‍රයෝජන ඇත්නම් මේ බමුණා අල්වාගණුව මේ බමුණා ආකාශය උඩ බලා ධනවර්‍ෂාව වැස්වූයේය. අපට මේ වස්තුව මොහු විසින් ම දෙනලද්දේය''යි කිවූය.

එකල්හි සොරු වස්තුව ඇති සොරුන් හැර''අපටත් වස්තු දෙව''යි කියා බමුණා අල්වාගත්තාය. බමුණා කියන්නේ ''මම තොපට වස්තු දෙමි''යි සත්රුවන් වැසි වසින්නාවූ නක්ෂත්‍ර යෝගයවූසැලී මෙතනට අවුරුද්දකින් මත්තෙහි වන්නේය. ඉදින් තොපට වස්තුවෙන් ප්‍රයෝජන ඇත්නම් කලක් ඉවසව, ධන වර්‍ෂා වස්වන්නෙමි වේදැ''යි කීවූය. එබස් අසා සොරු කිපී ''එම්බල දුෂ්ට වූ බමුණ, සෙස්සන්ට දැන්ම ධනවර්‍ෂා වස්වා අපට අනික් අවුරුද්දක් ඉවසන්ට කියන්නෙහිදැ''යි කියා තියුණුවූ මුවහත් ඇති කඩුවකින් බමුණා දෙකඩ කොට ගසා මඟහෙලා වේගයෙන් පසුපස්සේ ලුහුබඳවාගණගොස් ඒ සොරුන් හා සමග යුඬකොට පන්සියයක් පුරුෂයන් මරා වස්තුගෙණ නැවත දෙකොටසක්ව ඔවු තොවුන් හා යුඬකොට දෙසියපණසක් පුරුෂයන් මරා මෙම ක්‍රමයෙන් බෙදී ඔවු තොවුන් මැරීමෙන් දෙදෙනෙක් පමණ ශෙෂවූහ. ඒතාක්වනතුරු ඔවුනොවුන් මැරුවාහුය. මෙසේ ඒ පුරුෂයෝ දහසක්දෙන විනාශයට පැමිණියෝය. ඔහු දෙදෙන උපායෙන් ඒ වස්තුව ගෙණගොස් එක් ගමක් සමීපයෙහි කැලයක වස්තුව සඟවා එකෙක් කඩුවක් ගෙණ වස්තුව රැක උන්නේය. එකෙක් සාල් ගෙණ බත්පිසන්ට ගමට වන්නේය, ලොභය නම් මෙසේ විනාශයට මුල්කොට ඇත්තේමය. ඉක්බිත්තෙන් ඒ වස්තුව සමීපයෙහි උන් තැනැත්තේ මෙසේ සිතීය. ''ඒ පුරුෂයා ආකල්හි මේ වස්තුව දෙකොටසක් වන්නේය. එසේ නොයින් මම ආ ඇසිල්ලෙහි කඩුවෙන් ගසා මැරුයෙම් වීනම් යහපත් වන්නේය''යි ඒ තෙම කඩුව කොපුවෙන් හයා ඔසවාගෙණ ඔහු එන පෙරමග බල බලා උන්නේය. අන්‍ය වූ බත් පිසන්ට ගිය පුරුෂයාත් සිතන්නේ ඒ ධනය දෙකොටසක් වන්නේය. ''එසේ හෙයින් මම මේ බතෙහි විෂයක්ලා ඒ පුරුෂයා

කළා මරා තනිවම වස්තුව ගන්නෙමි වී නම් යහපතැ''යි සිතීය. ඉක්බිත්තෙන් ඒ බත් පිසන්නාහු පුරුෂයා බත්පිස අන්නයේ තෙමේත් බත් අනුභව කොට ඉතිරි බතෙහි විෂලා ඒ බත් ගෙණ වස්තු තුබූ තැනට ගියේය. ඔහු බත් බා තබාලා සිටි මද ඇසිල්ලකින් ම වස්තුව රැක සිටි තැනැත්තේ කඩුවෙන් ඔහු දෙකඩකොට ගසා මුවාතැනකටදමා ඒ බත් අනුභවකොට තෙමේත් එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. මෙසේ වස්තුව නිසා සොරුන් දහසක්දෙනා විනාශ යට පැමිණියෝය. බොධිසත්ත්වයෝත් එක් දෙවසක් ගියකල ආචාරීන් ගල වනුනිසා වස්තුව ඇරගෙණ එන තැනැත්තෝ පළමු තමන් කථාකොට ගියතැන ආචාරීන් නොදැක විසිර තිබෙන්නාවූ වස්තුවත් දැක ''ආචාරීන් විසින් මා කීවා නොකොට ධනවතීා වස්වත ලද්දේවනැ''යි සියල්ලවුන් විනාශයට පැමිණි නියා වනැ''යි මහවනින් නික්මුණාහුය. යන්නාහු මහබෝසතාණෝ ආචාරීන් මධ්‍ය යෙන් දෙකැබිලිව වැදහොත්තා දැක ''මා කීවා නොකෙරුට මලෝය'යයි දර ගෙණවුත් දරසැයක් බැඳ ආචාරීන් දවා වනපස්මලින් පූජාකොට ඉදිරියේ යන තැනැත්තෝ ජීවිතක්ෂයට පැමිණියාවූ පන්සියයක් දෙනා හා එයින් මත්තෙහි දෙසියපණස් දෙනෙකැ'යි මෙම ක්‍රමයෙන් කෙළවර දෙදෙනෙකු ජීවිතක්ෂ යට පැමිණියවුන් දැක මෙයේ සිතුය. මේ දෙදෙනෙකුගෙන් උතුරු පුරුෂයෝ දහසක් විනාශයට පැමිණියෝය. අනිකුත් සොරු දෙදෙනෙකු ව්‍යයුතුය ඔහු දෙදෙනත් වස්තුවෙන් හැම්මිගත නොහෙති. දැන් උන් කොයි ගියෝදෝහෝයි කියා ඉදිරියේ යන්නාවූ මහබෝසතාණෝ ඔවුන් දෙදෙනා ධනය ඇරගෙණ කැලේට වත් මග දැක පාදඋසාරයෙන් ගිය තැනැත්තෝ පොදිබැඳ තිබූ වස්තු රාශිය දැක එකක්හු බත්තලිය මත්තේ වැටී මළ තැනැත්තහු දැක ඉක්බිත් තෙන් මොවුන් විසින් මෙනම් දෙයක් කරණලදැ යි සියල්ල නුවණින් දැක ඒ පුරුෂයන් දැන් කොයි ගියේවේදෝහෝ යි පරීක්ෂාකොට සොයන තැනැත්තෝ ඔවුන් මුවාතැනක දමනලද්දාහු දැක අපගේ ආචාරීහු මා කීවා නොකොට තමන් නො කීකරු බැවින් තුමූත් විනාශයට පැමිණියෝය. උන් විසින් අන්‍යවූ දහසක් පුරුෂයෝ විනාශයට පමුණුවන ලද්දාහුය. එසේ හෙයින් ඒකාන්ත යෙන් උපායක් නැතිව නිස්කාරණයෙහි තමන්ව අභිවෘඩියක් ප්‍රාර්ථනාකරන් නාවූ සත්ත්වයෝ ආචාරීන් මෙන් මහත්වූ විනාශයට පැමිණෙනි යි සිතා, තවද මෙසේ මහබෝසතාණෝ යම්සේ අපගේ ආචාරීන් උපායක් නැතිවම අසථානයේ උපායක් නැති වියයුතු කෙරෙමින් ධනවතීා වස්වා තුමූත් ජීවිතක්ෂයට පැමිණි යෝද අනුන්ටත් ජීවිත විනාශයට ප්‍රත්‍යයවූද එපරිද්දෙන්ම යම් අනිකුත් සත්ත්වයෙක් උපායක් නැතිව තමාට වස්තු කැමතිව වියයුතු කෙරෙත් නම් සෙ ප්‍රකාරයෙන් තෙමේත් නස්නේය. අනුන්ටත් විනාශයට ප්‍රත්‍යව වන්නේය'යි චනය එකනින් නාදකොට දෙවියන් සාධුකාර දෙමින් සිටියදී ධර්මදේශනා කොට උපායෙන් ඒ වස්තුව තමන්වහන්සේගේ ගෙට ගෙන්වා ගෙණ දුනාදීවූ පින්කම් කෙරෙමින් ආයු පමණින් සිට ජීවිතාන්තයෙහි සවර්ගලෝකයට ගියාහුය ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේ ''මහණ තා දුර්වවූයේ දැන් මතු නොවෙයි, පෙරත් දුර්වවූ බැවින් මහත්වූ විනාශයට පැමිණියෙයි වේදැයි වදාරා මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මේ වෙදබ්භ ජාතකය නිමවා වදාළසේක. ''එසමයෙහි වෙදබ්භ බ්‍රාහ්මණයා තම් දැන් මේ නොකීකරු මහණය, අනෙන වාසිකවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 49
## නක්ඛත්ත ජාතකය.

මේ වදාළ එක්සමයෙක්හි ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක් එක්තරා ආජීවකයකු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වතාහි එක් කුලගෙක දුවනිකෙනෙකුන් ජනපදයෙහි වාසයකරන්නාවූ එක් කුලපුත්‍රයෙක් තමාගේ පුත්‍රයාහට වළක්වා "අසවල් දින යෙහි කැඳවාගෙණ යන්නෙමි" කියා දවස නියමකොට තබා ඒ දිනය පැමිණි කල්හි තමාගේ කුළුපගවූ ආජීවකයක්හුගෙන් විචාළේය. "සඞ්ගමින්වහන්ස, අද අප එක් මඟුලක් කරමිහ. නක්ෂත්‍ර යහපත්දෝ හෝ අයහපත්දෝ? හෝ"යි විචාළේය. ඒ ආජීවකතෙම සිතනුයේ "මේ තෙම මා අතින් පළමුවෙන් තොවිචාරා දවස් තබා දැන් විචාරන්නේය. වන්නාට මොහු භික්මවන්නෙමියි කිපී අද නක්ෂත්‍ර යහපත් නොවන්නේය. දැන් මඟුල් නොකරව, ඉදින් කලාහු නම් මහත් විනාශවන්නේය"යි කියේය. ඒ කුලයෙහි මනුෂ්‍යයෝ ඔහුගේ වචනය අදහාගෙණ එදවස නො ගියාහුය. නුවරවාසීහු සියලු මඟුල ක්‍රියාව කොට ඔවුන්ගේ නො රිම දැක ජනපදවාසීන් විසින් අද දවස තබන ලද්දේය. නොම ආවාහුය. අපගේ ද බොහෝ වස්තුව විනාශයට ගියේය. අපට ඔවුන්ගෙන් කවර ප්‍රයෝජනද? අපගේ දුවනියන් අනික්කෙනාට දෙමිහ"යි කියා කරණ ලද මඟුලෙන්ම දුවනියන් අනික්කෙනාට දුන්නාහුය. අනිකුත් ජනපදවැසි කුලයෙහි ඇත්තෝ දෙවෙනි දිනයෙහි අවුත් "අපට කුමාරිකාව දෙව"යි කීවාහුය. ඉක්බිත්තෙන් ඔවුන්ට සැවැත්නුවරවාසීහු කියන්නාහු "ජනපදවාසීනු නෙපි ගෘහපතියෝය, පවිටු මනුෂ්‍යයෝය, දවස් තබා අනාදරයෙන් නො ආවාහුය, ආවාවූ මහින්ම නැවත යව, අප විසින් අන්‍යයන්ට කුමාරිකාව දෙන ලද්දීය"යි කියා පරිභව බැන්නාහුය. ඔහු ඔවුන් හා සමඟ ඛරකොට ආවාවූ මහින් ම ගියාහුය. ඒ ආජීවකයා විසින් ඒ මනුෂ්‍යයන්ගේ මඟුලට අන්තරාය කළ බව භික්ෂූන්ගේ අතුරෙහි ප්‍රකාශ වූයේය. ඒ භික්ෂු දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාහු "ඇවැත්නි ආජීවකයා විසින් කුලයාගේ මඟුලට අන්තරාය කරණලදැ"යි කියමින් හුන්නාහුය. ශාස්තෘන් වහන්සේ වුන් "මහණෙනි, මේ දම්සභාමණ්ඩපයෙහි මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාළ කල්හි "මෙනම් කථාවකිනැ"යි දැන්වූවාහුය. "මහණෙනි, අජීවකයා විසින් කුලයාගේ මඟුලට අන්තරාය කෙළේ දැන්මතු නොවෙයි, පූර්වයෙහිද මේ ආජීවකතෙම ඔවුන්ට කිපී මඟුලට අන්තරාය කෙළේය"යි වදාරා ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි නුවරවාසීහු ජනපදවාසීන්ගේ දුවනි කෙණෙකුන් රැස්වා දවස් නිමකොට තබා තමාගේ කුළුපගවූ ආජීවකයකුගෙන් විචාළාහු 'සඞ්ගමින් වහන්ස, අද අපගේ එක් මඟුල ක්‍රියාවෙක් ඇත. නක්ෂත්‍රය යහපත්දෝහෝ අයහපත්දෝ?හෝ යයි විචාළාහුය, ඒ ආජීවකතෙම සිතනුයේ මොහු තමාගේ අභිප්‍රායෙන් දවස නියම කොට තබා දැන් මාගෙන් විචාරන්නාහුය සි කියා කිපී අද මොවුන්ගේ මඟුලට අන්තරාය කෙරෙමියි සිතා "අද නක්ෂත්‍රය යහපත් නොවන්නේය. ඉදින් මහුල් කළොතම් මහත් විනාශයට පැමිණෙන්නාහුය'යි කීයේය. ඒ නුවර වාසීහු ඔහුගේ වචනය අදහාගෙණ නො ආවාහුය. ජනපදවාසීහු ඔවුන්ගේ නො රිම දැන නුවරවාසීහු අද දවස තබා නො ආවාහුය. අපට ඔවුන්ගෙන් ප්‍රයෝජන කවරේදැ'යි කියා අන්‍යයන්හට දුවනියන් දුන්නාහුය. නුවරවාසීහු දෙවෙනි දිනයෙහි අවුත් කුමාරිකාව ඉල්වූවාහුය, ජනපදවාසීහු කියන්නෝ "නෙපි නුවරවාසීනු නම් නසනලද ලජ්ජා ඇති බැවින් ගැහැවියහ. දවස තබා කුමාරිකාව නො ගත්තාහ, අප නොපගේ ගමන් නැති බැවින් අන්‍ය

යන්ට දුනුම්හ''යි කීවාහුය. ''අපි ආජීවකයන්හුගෙන් විචාරා නක්ෂත්‍රය යහපත් නොවන බැවින් නො ආම්හ. අපව කුමාරිකාව දෙව''යි කීවාහුය. ''අප විසින් නොප නො එන බැවින් අන්‍යයන්ට දෙනලද්දේය, දැන් දෙනලද කුමාරිකාව කෙසේ නැවත ගෙණ එමෝදැ'යි කියා මෙසේ ඔවුන් ඔබිනොබ ඛබර කරණ කල්හි එක් නුවර වැසි ප්‍රඥාවන් පුරුෂයෙක් එක් කම්මාන්තයක් නිසා ජනපදයට ගියේය, ''අපි ආජීවකයාගෙන් විචාරා නක්ෂත්‍රය යහපත් නොවන බැවින් නො ආම්හ''යි කියන්නා වූ ඒ නුවරවාසීන්ගේ වචනය අසා ''නක්ෂත්‍රයෙන් කවර ප්‍රයෝජනද? කුමාරිකාවගේ ලැබීම නක්ෂත්‍රය නොවේදැ''යි කියා මෙසේ කීසේක ''නක්ෂත්‍රය බලන්නාවූ අඥානයාගේ අධිප්‍රාය ඉක්මෙන්නේය. අජීවයට අභිෂවාජී ප්‍රතිලාභය ම නක්ෂත්‍ර නම්. තාරකා රූපයෝ කවර නම් අජීවයක් සාදද්දැ''යි කීසේක නුවරවාසීන් ඛබරකොට කුමාරිකා ව නොලැබ ගියාහුය. ශාස්තෘන් වහන්සේද ''මහණෙනි, මේ ආජීවකතෙම මේ කුලයාගේ මගුලට අන්තරාය කෙළේ දැන් මතු නොවෙයි, පුර්‍වයෙහිත් අන්තරාය කෙළේමය''යි කියා මේ ධම්දෙශනාව ගෙණහැර දක්වා වදාරා පූර්‍වාපර සන්ධි ගළපා මේ නක්ෂත්‍ර ජාතකය නිමවා වදාළසේක. ''එසමයෙහි ආජීවකතෙම දැනුදු ආජීවක වූයේය. එසමයෙහි ඒ කුලයෝ දැනුදු මේ කුලයෝ වූවාහුය. ඔවුන්ට අවවාද කියා සිටියාවූ පණ්ඩිත පුරුෂයා වූයේ වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූමම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 50
## දුමෙමඛ ජාතකය

**මි**වද එක්සමයෙක්හි දිව්‍යබ්‍රහ්මයන්ගේ මස්තකයෙහි කෙළෙනා ශ්‍රීපාද ඇති බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවාසය කරණසේක් ලොකාර්‍ථචයශීලීවක් අරභයා මේ ජාතකය වදාළසේක. මෙහි වර්‍තමාන කථාව දෙලොස්වැනි නිපාතයෙහි වූ මහා කණ්හ ජාතකයෙහි මතු ප්‍රකාශවන්නේය.

**යි**ටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහ බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජහුගේ අග්‍ර මහෙසිකාවන්ගේ කුක්ෂියෙහි පිළිසිඳගත්සේක. මව්කුසින් නික්මුනාවූ අප මහ බොධිසත්ත්වයන් වහන්සේට නම් තබන්නා වූ දිනයෙහි බ්‍රහ්මදත්ත කුමාරයා'යි කියා නම් කළාහුය. ඒ බ්‍රහ්මදත්ත නම් කුමාරතෙම සොළොස් ඇවිරිදි වයසට පැමිණ තක්ෂලා නුවරට ගොස් ශිල්පය ඉගෙණ වෙදත්‍රයාගේ පරතෙර පැමිණ අවලොස් විද්‍යාස්ථානයන්ගේත් නිෂ්පත්තියට පැමිණිසේක.

ඉක්බිත්තෙන් අප මහබෝසතාණන් වහන්සේට පිය මහරජ්ජුරුවෝ යුවරජ තනතුරු දුන්සේක. එසමයෙහි බරණැස්නුවර වාසීහු දෙවතාවන් මගුල් කොට පවත්නාහ. දෙවියන්ට තවස්කාර කරන්නාහු, බබාළු නිරුළු ඵලෙළු වන් කුකුළන් ඌරන් ආදීවූ ප්‍රාණීන් ඝාතනය කොට අනෙකප්‍රකාරවූ පුෂ්පයෙන් හා සුගන්ධයෙන්ද මාංශයෙන් හා රුධිරයෙන්ද බිලි පූජාකරන්නාහු බොධිසත්ත්වයන් වහන්සේ සිතනසේක්, ''දැන් සත්ත්වයෝ දෙවියන් මගුල්කොට පවත්වන්නාහු බොහෝ ප්‍රාණවධ කෙරෙති. මහජනතෙම බොහෝසේ අධර්‍මයෙහි පිහිටියේය. මම පිය රජහුගේ ඇවැමෙන් රාජ්‍යය ලැබ එකකුදු ක්ලාන්ත නොකොට උපායෙන්ම ප්‍රාණවධකරන්ට නො දෙන්නෙමි'' සිතුසේක. මෙසේ සිතා අප මහබෝසතාණන් වහන්සේ එක් දවසක් රථයකට නැගී නුවරින් නික්මුනුසේක් එක් මහත් නුගවෘක්ෂ මූලයෙක්හි මහජනයා රැස්ව නුගවෘක්ෂයෙහි අධිගෘහිත වූ දිව්‍යපුත්‍රයාගේ සමීපයෙන් පුත්‍රයන් හා දුහිතෘ යසස් ධනාදීන් යමක් යමක් කැමති ද ඒ ඒ කැමති දෙය ප්‍රාර්‍ථනා කරන්නාවුන් දුටුසේක. ඒ අප මහ බෝසතාණන් වහන්සේ රථයෙන් බැස ඒ නුගවෘක්ෂය කරා එළඹ සුගන්ධ පුෂ්පයෙන් පූජා කොට ජලයෙන් අභිෂෙක කොට වෘක්ෂය ප්‍රදක්ෂිණා කොට

දෙවතාමඬගලිකයක්හු මෙන් දෙවතාවාට නමස්කාර කොට රථයට නැඟී නුවරටම වැඩිසේක. එතැන්පටන් මෙම ක්‍රමයෙන් අතරතුරෙහි එහෙට ගොස් දෙවතාමඬගලිකයක්හු මෙන් පූජාකරණසේක්, ඒ අප මහබෝසතාණන් වහන්සේ විසින් මැතභාගයෙහි පියරජහුගේ ඇවෑමෙන් රාජ්‍යයෙහි පිහිටා සතර අගති දුරුකොට දශරාජධර්මයන් කෙපෙරෙමින් දහමෙන් රාජ්‍යය කෙරෙමින් මෙසේ සිතූසේක. ''මාගේ මනෝරථය මස්තකප්‍රාප්ත වූයේය. රාජ්‍යයෙහි පිහිටියෙමි. එබඳුවූ මම පූජාවෙන් යම් එක් කාරණයක් සිතූයෙමිද? දැන් ඒ කාරණාව මස්තකප්‍රාප්ත කරන්නෙමි'' සිතා අමාත්‍යයන්ද බ්‍රාහ්මණ ගෘහපති ආදීන්ද රැස්කරවා මෙසේ ආමන්ත්‍රණය කළසේක.. ''පින්වත්නි, මා විසින් කවර කාරණයකින් රාජ්‍යයට පැමිණෙන ලදදැයි දන්නාහුදැ'' යි විචාළසේක. ''මහරජ්ජුරුවන් වහන්ස, නොදනුම්හ''යි කීවාහුය, වැලිදු වනාහී ''මා අසවල් නම් නුගවෘක්ෂයට සුගන්ධාදීන් පූජාකොට බඩාඤ්ජලිව සිට නමස්කාර කිරීම දුටුවිරිදැ''යි වදාළසේක. ''එසේය මහරජ'යි කීවාහුය. ''එකල්හි මම ප්‍රාර්ථනා වක් කෙළෙමි ඉදින් මම රාජ්‍යයට පැමිණියෙමි නම් නුඹවහන්සේට බිලිපූජා කරන්නෙමි'යි කියෙමි. එසේ නෙයින් මා විසින් ඒ දේවතාවාගේ ආනුභාව යෙන් මේ රාජ්‍යය ලබනලද්දේය. දැන් ඒ දෙවතාවාට බිලි පූජා කරන්නෙමි. තෙපි ප්‍රමාද නොකොට සීඝ්‍රව දේවතාවාට බිලිපූජා සදව''යි කීසේක. ''මහ රජ, කවර කවර දෙයක් ගණුමේදැ''යි කීවාහුය. ''පින්වත්නි, මම දෙවතාවාට යාචඤ්ඤාකරන්නේ යමෙක් මගේරාජ්‍යයෙහි ප්‍රාණඝාතාදී පඤ්ච දුසස්ීල කර්මයන්ද දශඅකුශල කර්මපථයන්ද සමාදන්ව පවතිද්ද? ඔවුන් ඝාතනය කොට අතුනු බහන් මාංශරුධිරාදියෙන් බිලිපූජා කෙරෙමැ යි කියා ආරාධනා කෙළෙමි. තෙපි මෙසේ බෙර හසුරුවව, අපගේ රජ්ජුරුවෝ යුවරජ කල්හි මෙසේ යාචඤ්ඤා වක් කළසේක. ඉදින් මම රාජ්‍යයට පැමිණියෙම්වීම් නම් යමෙක් මාගේ රාජ්‍යයෙහි දුස්සීලව වෙසේද? ඒ සියල්ලවුන් ඝාතනය කොට බිලිපූජා කරන්නෙමි කියාය, දැන් ඒ රජතෙම පඤ්ච පාපයද දශ අකුශල් දැසි කියතලද දුස්සීල කර්මය සමාදන්ව පවත්නාවූ දුස්සීලයන් දහඅක් නසා ඔවුන්ගේ හෘදයමාංශා දිය ගෙණ දේවතාවාට බිලිපූජා කරණු කැමැතිසේක. මෙලෙස නුවරවාසීහු දූතගණිත්ව''යි කීසේක. මෙසේද කියා ''යමෙක් දැන් මෙතැන්පටන් දුස්සීල ක්‍රියාවෙහි පවතිද්ද? ඔවුන් දහඅක් නසා යාගකොට. ආරාධනාවෙන් මිදෙම්''යි කියා මේ කාරණය ප්‍රකාශ කරණු පිණිස මෙසේ කීසේක. මේ ක්‍රියාව කරන්නට සුදුසු යයි මෙය නොකරන්නට සුදුසු යයි කියා නොදන්නාවූ දුමේධයන් ප්‍රාණඝාතාදීන් කරන්නාවූ අඥාන පුද්ගලයන් දහඅකින් යාගකරන්නට යාචඤ්ඤා කරණ ලද්දේය. ඒ මම දැන් ඒ ආරාධනාවෙන් රාජ්‍යය ලදිමි. දැන් යාග කරන්නෙමි. කාරණා කවරේද? දැන් අධාර්මික ජනයෝ බොහෝය, ඔවුන් ගෙණ බිලිපූජා කරන්නෙමි කීසේක. අමාත්‍යයෝ බෝසතාණන් වහන්සේගේ වචනය අසා ''මහරජ, යහපතැ''යි කියා දෙළොස් යොදුන් බරණැස්නුවර බෙරලැවූවාහුය. ආඥාහෙරිය අසා එකද දුස්සීල ක්‍රියාවක් සමාදන්ව සිටියාවූ එකපුරුෂයකුදු නුවූයේය. මෙසේ බොධිසත්ත්වයන් වහන්සේ යම්තාක්කල් රාජ්‍යය කළසේක්ද? ඒතාක්කල් එක පුද්ගලයකුදු පඤ්චපාප දශ අකුශලය යන කර්මයන් කෙරෙන් එකද අකුශල ක්‍රියාවක් කරන්නකු නොපෙණුනේය. මෙසේ බොධිසත්ත්වයන් වහන්සේ එක පුද්ගලයකු ක්ලාන්ත නොකරවා සියලු රටවැස්සන් ලවා සිල් රක්ෂා කරවා තමන්වහන්සේද දානාදීවූ පින්කම් කොට ජීවිතයාගේ කෙළවර තමාගේ පෂ්ඨිද් ගෙණ දිව්‍යලෝකය පුරමින් වැඩි සේක.

ශාස්තෘන්වහන්සේද ''මහණෙනි, තථාගතත්වාදි කාරණයෙන් යුක්ත සර්ඥයන් වහන්සේ ලොකයාහට වැඩෙහි හැසුරුණේ දැන්මතු නොවෙයි, පෙරත් හැසුරුණුසේක්මය''යි කියා මේ දම්දෙසුම් ගෙණහැර දක්වා පූර්වපර

සත්ධි ගළපා මේ දුම්මඛ ජාතකය නිමවා වදාළසේක. "එකල්හි පණ්ඩිතොම දැන් බුදුපිරිස්වූවාය, බරණැස්රජව උපන්නෙම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 51
## මහාශීලව ජාතකය

එවද එක්සමයෙක්හි මහපොළොව සේ විපුල ගුණ ඇති තිලෝගුරු බුදුරජාතන් වහන්සේ දෙවිරම් වෙහෙර වසතසේක් පසුබට වියයුතු ඇති එක් නිස්ත්‍රකෙණෙකුන් වහන්සේ උදෙසා මේ ජාතකය වදාළසේක. සමීඥයන් වහන්සේ ඕනව "සැබෑද? මහණ, තෝ පසුබට වියයුතු ඇත්තෙහිදැ"යි විචාරා "එසේය සවාමීනි' කී කල්හී 'මහණ, තෝ කවර කාරණයකින් මෙබඳු නෛයර්‍යාණික ශාසනයෙහි මනණව වියයුතු හැරපියෙහිද?පෙර නුවණැත්තෝ රාජ්‍යයෙන්පිරිහීත් තමන්ගේ වියයුතෙහි සිට නටුවාවුන් යසස ඉපදවූවෝම වේ"යි වදාරා ඉකුන්වත් දක්වා වදාළසේක.

අතීතයිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාතෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් කුසැ පිළිසිඳ ගත්තුය. ඒ බොධිසත්ව යන්ට නම් තබන දවස් ශීලවකුමාරයෝ යයි නම් තුබුය. සොළොස් ඇවිරිදි වයසෙඞ්දීම සියලු ශිල්පයෙහි කෙළ පැමිණ මැතභාගයෙහි පියාතන් ඇවැමෙන් රාජ්‍යයෙහි පිහිටා මහාශීලව රජ්ජුරුවෝයයි මෙනමින් ප්‍රසිඩවූය. ධර්මිෂ්ඨයෝය, ධර්මයෙන් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවෝ නුවර සතරවාසල් දෙරය,නුවර මධ්‍යයෙහිය,තමන්ගේ මාලිගාව සමීපයෙහි ඇයි දන්හල් කරවා දුගී මගී යාචකයන්ට දන්දෙති. නිරන්තරයෙන් පන්සිල් රකිති. පොහොය පෙහෙවස් වෙසෙති. ක්ෂාන්ති මෛත්‍රී කරුණාවෙන් යුක්තව ඇකයෙහි උන් දරුකෙණෙකුන් තළවා සතුටුකරන්නාක් මෙන් සියලු සත්ත්වයන් සතුටු කරවමින් දහමෙන් රාජ්‍යය කෙරෙති.

එකල රජ්ජුරුවන්ගේ එක් අමාත්‍යයෙක් අන්තඃපුරයට වැද මැතභාග යෙහි තමා කළ කාර්‍යයෙන් ප්‍රසිඩවිය. අමාත්‍යයෝ රජ්ජුරුවන්ට එපවත් දන්වූය. රජ්ජුරුවෝ පරීක්ෂාකරන්නාහු තුමූම ප්‍රත්‍යක්ෂ කොට ගෙණ ඒ අමාත්‍යයා කැඳවා කියන්නේ "නුවණැති තා විසින් නොකළමනා දෙයක් කරණලද, නෝ මාගේ විජිතයෙහි වසන්ට නුසුදුසුයෙහිය. තාගේ වස්තුවත් පුත්‍රදාරාවනුත් හැරගෙණ අනික් තෙනකට පලායයි කියා රටින් නෙරපූය. ඒ අමාත්‍යයා කසී රටින් නික්ම ගොස් කොසොල් රජ්ජුරුවන්ට සේවය කරන්නේ ක්‍රමයෙන් රජ්ජුරුවන්ට අබ්භන්තරව විශ්වාසවිය. එතෙම එක් දවසක් කොසොල් රජ්ජුරුවන්ට කියන්නේ "රජ්ජුරුවන් වහන්ස, බරණැස්නුවර රාජ්‍යය තම් නිමැසි මිවදයක් හා සමානය. රජ්ජුරුවන් වහන්සේ ඉතා මොළොක්සේක. සවල්පවූ සේනාවකින් බරණැස්නුවර රාජ්‍ය හැරගන්නට පිළිවන් වන්නේය"යි කිය. රජ්ජුරුවෝ ඔහුගේ බස් අසා බරණැස්නුවර රාජ්‍ය ය තම් මහත් වන්නේය. මේ තෙමේත් සවල්පවූ බලවාහනයකින්ම රාජ්‍යය ගන්ට පිළිවනැ"යි කිය. "කිමෙක්ද?මේ රජ්ජුරුවන්හෙන් එවූ වරපුරුෂයෙක් නෙව්ද?"යි "තෝ වරපුරුෂයෙක්දැ"යි කිවුය. "රජ්ජුරුවන්වහන්ස, මම වර පුරුෂයෙක් නොවෙමි. ඇත්තම කියමි. ඉදින් මාගේ බස් නොඅදහනසේක්වී නම් මනුෂ්‍යයන් යවා පසල්දනවූවෙන් ගමක් නසාපුව මැනව, ඒ ගම් පහරණ මනුෂ්‍යයන් අල්වාගෙණ තමන්වහන්සේ සමීපයට ගෙණගිය කල්හි වස්තු දීලා හැරපියනසේකැ"යි කිය. එබස් ඇසූ රජ්ජුරුවෝ මේ තෙම ඉතා නිර්භීතව කියන්නේය. වන්නාට පරීක්ෂාකෙරෙමියි සිතා තමන් පුරුෂයන් යවා පසල් දනවිවෙන් ගමෙක් මිනීමරවා කොල්ලකැවූය. ඒ පසල් දනවිවේ මනුෂ්‍යයෝ

මිනීමැරු සොරුන් දැක "දරුවෙනි, කවර කාරණයකින් ගම් පැහැරුදැ"යි විමසූහ. "සාමීනි, ජීවත්ව ගතනොහී ගම් පැහැරුම්හ"යි කී කල්හි එසේ කල කුමක් නිසා මෙතක්කල් මා සමීපයට නො ආවා ද? දැන් මෙවක් පටන් මෙබන්දක් නොකරව'යි කියා ඔවුන්ට සම්පත් දී අළුවාහුය. ඒ මනුෂ්‍යයෝ ගොස් කොසොල් රජ්ජුරුවන්ට එපවත් දන්වූහ. ඒ රජ්ජුරුවෝ මෙපමණ කිනුත් යා නොහී නැවත මධ්‍යයේ ජනපදයක් පැහැරවූය. ඒ සොරුන්ටත් බරණැස් රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම සම්පත් යැවූහ. කොසොල් රජ්ජුරුවෝ මෙ පමණකිනුත් නොගොස් නැවත පුරුෂයන් යවා වීථි මධ්‍යයෙහි මිනීමරවා කොල්ලකැවූය. රජ්ජුරුවෝ ඒ සොරුන්වත් සම්පත් දී යවිවාහුය. එකල්හි කොසෙල් රජ්ජුරුවෝ ඉතා ධර්මිෂ්ඨ රජ්ජුරු කෙණෙකැයි දැන "බරණැස් රාජ්‍යය ගණිමි"යි සේනාවාහන ගෙණ නික්මුනාහුය.

එසමයෙහි වතාහි බරණැස් රජ්ජුරුවන්ගේ මත්තාහස්තිරාජයනුදු අභිමුඛව එනකල්හි පිටිපෑ පලා නොයන්නාවූ ස්වභාව ඇති සියදනස්ගණන් අකුණු ගසන කල්හිත් නැති නොගන්නාවූ ස්වභාව ඇති ශීලව මහරජ්ජුරුවන්ගේ අභිප්‍රායක් ඇති කල්හි සියලු දඹදිව රාජ්‍ය ඇරගන්ට සමර්ථවූ දහසක් පමණ ඔවුනොවුන් හැර වෙන්ව පලා නොයන්නාවූ උත්තම මහා යෝධයෝ ඇත. ඔහු හැමදෙනම "කොසොල් රජ්ජුරුවෝ යුඛයට යෙති" අසා තමන්ගේ රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නෝ "කොසොල් රජ්ජුරුවන් වහන්සේ බරණැස්නුවර රාජ්‍යය ගණිමි"යි එනසේක. 'ස්වාමීනි, යම්හ, උන් වහන්සේ අපගේ රාජ්‍ය සීමාවට බැස්ස නොදීම තලාපියා අල්වාගණුම්හ"යි කීය. ඒ අසා රජ්ජුරුවෝ "මා නිසා දරුවනි, අනුන්ට පීඩා කිරීමෙන් ප්‍රයෝජන නැත. රාජ්‍ය කැමති කෙනෙක් ගණිත්ව ි එසේ හෙයින් නෙපි ඇම නොයවයි වැළකූය. කොසොල්රජ්ජුරුවෝ සීමාව ඉක්ම දනව් මඩ්‍යයට වන්නාහුය. අමාත්‍යයෝ නැවතත් රජ්ජුරුවන් කරා ගොස් එසේම කීවාහුය. රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම වැළකූය. කොසොල් රජ්ජුරුවෝ පිටිනුවර සිට රාජ්‍යය හෝ දෙවත්ව යි යුඛ හෝ කෙරෙත්ව"යි කියා ශීල මහරජ්ජුරුවන්ට අසුන් යවූය. රජ්ජුරුවෝ ඒ අසා "මා හා සමග කරන්නාවූ යුඛයක් නැත. රාජ්‍යය ගන්නාශේක්ව'යි කියා පෙරලා අසුන් යැවූය. කැවතත් අමාත්‍යයෝ රජ්ජුරුවන් කරා ගොස් කියන්නෝ "රජ්ජුරුවන් වහන්ස, අපි කොසොල් රජ්ජුරුවන් නුවරට වැද්ද නොදෙම්හ යි පිටිනුවරදී තලාපියා අල්වාගණුම්හ"යි කීවූය. රජ්ජුරුවන් පළමු පරිද්දෙන්ම වළකා නුවර වාසල් දොර හරවා අමාත්‍යයන් දහසක්දෙනා හා සමග ප්‍රාසාදයේ මතු මහල්තලයෙහි සිංහාසන මස්තකයෙහි උන්නාහුය. කොසොල් රජ්ජුරුවෝ මහත්වූ සේනාවාහන හා සමග බරණැස් නුවරට වන්නාහු ඒකොසොල් රජ්ජුරුවෝ තමන්ගේ සතුරු වූ එක සත්ත්වයෙකුත් නොදැක රජ්ජුරුවන්ගේ මාලිගා දොර සමීපයට ගොස් අමාත්‍ය සමූහයා විසින් පිරිවරණ ලදුව නො වසනලද දොර ඇති මාලිගාවෙහි සරහා පිළියෙල කරණලද මතුමහල්තලයට නැගී උන්නාවූ නිරපරාධව ශීලව මහරජ්ජුරුවන් අමාත්‍යයන් දහසක්දෙනා හා සමග අල්වා යවා "මේ රජ්ජුරුවන් අමාත්‍යයන් දහසක් දෙනා හා සමග පිටිතලහයා බැඳ අමුඅයොහොතයට ගෙණගොස් කරවටක් පමණ වළ කැන යම්සේ එකෙකුත් අනක් ඔසවන්ටත් අසමර්ථ පරිද්දෙන් පස්ලා වළලා ලව, රාත්‍රියෙහි සිවල්ලු අවුත් මොවුන්ට කළමනාදෙය කරන්නෝ වේදැ"යි කිවූය. මනුෂ්‍යයෝ සතුරු රජ්ජුරුවන්ගේ බස් අසා රජ්ජුරුවන් හා සමග අමාත්‍යයන් දහසක්දෙනා පිටතලහයා බැඳ පිටත් කළාහ. එකල්හි ශීලව මහරජ්ජුරුවෝ සතුරු රජ්ජුරුවන් කෙරෙහි ආඝාත පමණකුත් නොකළෝය. ඒ අමාත්‍යයන් දහසක් දෙනා මෙසේ බැඳලා ගෙණ යන කල්හි රජ්ජුරුවන්ගේ

වචනය ඉක්ම පවත්වන්ව අසමජීවිකෙනෙක් නම් නුවූයේය. මෙසේ ඒ මහ බෝසතානන්ගේ පණිදි ඉතා විනීත පණිදි වන්නේය. ඉක්බිත්තෙන් ඒ සතුරු රජ්ජුරුවන්ගේ රාජපුරුෂයෝ අමාත්‍යයන් සහිතවූ ශීලව රජ්ජුරුවන් අමු සොහොනට ගෙණ ගොස් කරවටක් පමණ වළකැන ශීලව මහ රජ්ජුරුවන් මධ්‍යයෙහි අවෂෂ අමාත්‍යයන් දැලයෙහියි දහඅක් දෙනාම වළට බා පස්ලා ඝනකොට පස් තලා ගියාහුය. එකල්හි ශීලව රජ්ජුරුවෝ අමාත්‍ය යන් බණවා කියන්නෝ ''සතුරු රජ්ජුරුවන් කෙරෙහි කෝපයක් නොකොට මෛත්‍රී කරව''යි අවවාද කළෝය. එකල මධ්‍යම රාත්‍රී වේලේ ''මනුෂ්‍යමාංශ කමිහ''යි කැනහිල්ලු ආවාහුය. ඔවුන් දැක රජ්ජුරුවන් හා අමාත්‍යයෝ එක පැහැරම හඬගැසූය. කැනහිල්ලු හඬින් ත්‍රස්තව පලාගියාහුය. නැවත ඔහු පෙරලා සිට බලන්නාහු පස්සෙයි එන කෙනෙකුත් නැති නියාව දැන නැවත ආපසු ගියෝය. වළ තුළ මනුෂ්‍යයෝත් පළමුපරිද්දෙන්ම අඬගැසූය. මෙසේ තුන්වාරයක් පලා ගොස් නැවත පෙරලා සිට බලන්නාහු ඔවුන් අතුරෙන් එකොකුවත් නොඑන නියාව දැන ''මොහු වධයට පැමිණියෝ වනැ''යි බුහුටිව පෙරලා අවුත් නැවත දහඅක්දෙනා අඩනසමින් සිටියදීත් පලා නොගියාහුය. ප්‍රධන කැනහිලා රජ්ජුරුවන් කරා ගියේය. අවශෂයෝ සෙසු අමාත්‍යයන් සමීපයට ගියෝය. උපායෙහි දක්ෂවූ රජ්ජුරුවෝ ඔහු තමන් සමීපයට එන නියාව දැන ඔහන්ට අවසර දෙන්නාක් මෙන් කර ඔසවා ඔහු යට උගුර බැහැ ගත්තාහ. නිකටින් ඇදයන කල මිරිකා ගන්නාක් මෙන් තරකොට මිරිකා ගත්තුය. ඇත් බල ඇති රජ්ජුරුවන් විසින් නිකටින් ඇද ග්‍රීවයෙන් තර කොට මිරිකාගන්නාලද කැනහිලා තමා ගලවාගන්ට අසමජීව මරණභයින් භයපත්ව මහහඬින් හැඬුයේ ය. සෙසු කැනහිල්හු ඔහුගේ බැගෑ හඬ අසා ''එක් පුරුෂයක්හු විසින් අල්වාගන්නා ලද්දේ වනැ''යි අමාත්‍යයන් සමීපයට වදනට අසමජීව මරණභයින් භයපත්ව ඇවිදෙනම පලාගියහ. රජ්ජුරු වන්ගේ නිකටින් තරකොට ගත්නාලද කැනහිලා ඇතමැත ගැසෙන්නට වන් කල්හි පස් සිවිලව ගියේය. ඒ කැනහිලාත් මරණභයින් භයපත්ව සතර කකුලෙන් රජ්ජුරුවන්ගේ ලය ලභ ශරීරයේ පස් පසුරු ගා ඉවත් කෙළේය. රජ්ජුරුවෝ සිවිලවූ නියාව දැක කනහිලා හැර ඇත්බල ඇති ශක්තිසම්පන්න තැනැත්තෝ ඔබිමොබ කැරකැවී දෙපිටට නැමී දැත ඔසවා මුවවිට එල්ල සුලහින් කඩා දැමූ වලාකුළක් මෙන් වලින් ගොඩ නැගී සිට අමාත්‍යයන් අස් වසා පස් පිරා සිටියල්ලවුන් ගොඩනගා අමාත්‍යයන් විසින් පිරිවරණලදුව අමු සොහොනෙහි සිටියාහුය. එසමයෙහි මනුෂ්‍යයෝ මළමිනියක් අමුසොහොනට ගෙණ ගොස් දමන්නාහු යක්ෂයන් දෙදෙනෙකුගේ සීමාමඩයට දැමූහ. ඒ යක්ෂයෝ දෙදෙන මිනිය බෙදා ගත නොහී ''අපි මේ මිනිය බෙදා ගත නොහෙමිහ. මේ ශීලව රජ්ජුරුවන් වහන්සේ ධර්මිෂ්ට සේක. උන්වහන්සේ අපට බෙදා දෙනසේක. ඒ රජ්ජුරුවන් වහන්සේ සමීපයට යමුහ' යි ඒ මළමිනිය දෙකකුල අල්වාගෙණ රජ්ජුරුවන් සමීපයට ගොස් ''රජ්ජුරුවන්වහන්ස අපට මේ මිනිය බෙදාදුනමැනවැ ''යි කිහ. එකල බෝධිසත්වයෝ කියන්නෝ පින් වත්වූ යක්ෂයිනි, මම තොපට මේ මිනිය බෙදාදෙමි. මම වූකලී පිරිසිදු නොවෙමි. එසේ හෙයින් පළමුකොට නාමි''යි කිවුය. යක්ෂයෝ සතුරු රජ්ජුරු වන්ට නිබු සුවඳ කැවූ පැන් තමන්ගේ ආනුභාවයෙන් ගෙණවුත් රජ්ජුරු වන් නාන පිණිස දුන්නුය. ස්නානය කොට සිව රජ්ජුරුවන්ට සතුරු

රජ්ජුරුවන්ගේ පත්කොට තුබූ සළුගෙණවුත් දුන්හ. ඒ සළු ඇඳගෙණ සිටි යාවූ රජ්ජුරුවන්ට සිවිදෑගද කරඬුවක් ගෙණ දුන්හ. සුවඳ විලවුන් ගල්වා සිටි රජ්ජුරුවන්ට රන්කරඬුවේ ලා මැණික් තල්වැට මත්තේ තුබූ නොයෙක් මල් ගෙණවුත් දුන්හ. මල් පැලඳ සිටි රජ්ජුරුවන්ට "අනික් කුමක් කරමෝදැ"යි විවාළෝය.

රජ්ජුරුවෝ තමන්ට සය ඇනි නියාව ඇඟවූහ. යක්ෂයෝ ගොස් සතුරු රජ්ජුරුවන්ට පිස තබන ලද නොයෙක් අග්‍රාසයෙන් යුක්ත වූ භෝජන ගෙණවුත් දුන්හ. රජ්ජුරුවෝ තහා සුවඳ විලවුන් ගල්වා සැරහී සැදී පැහැදී සිටි තැනැත්තෝ අනෙකප්‍රකාරවූ අග්‍රාසයෙන් යුක්තවූ භෝජනය අනුභව කළෝය. යක්ෂයෝ සතුරු රජ්ජුරුවන්ට තුබූ සුවඳසැවූ පැන් සවණිනිංකාරයෙන් රන් තැටිය හා සමග ගෙණාවාහුය.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ පැන් බී මුඛය සෝදා අත සේදූ කල්හි සතුරු රජ්ජුරුවන්ට සපයනලද පස්පලවනින් යුක්තවූ බුලත් ගෙණවුත් දුන්හ. බුලත් කා සිටිකල්හි "අනික් කුමක් කරමෝදැ'යි විවාළෝය. නැවත ගොස් සතුරු රජ්ජුරුවන්ගේ ඉස්දෙර තුබූ 'මඟුල්කඩුව ගෙණෙව"යි කිවූය. ඒ මඟුල්කඩුවත් ගෙනාවාහුය. රජ්ජුරුවෝ කඩුව ගෙණ එම මිනිය කෙළින් සිටුවා ඉස්මුදු තෙහි කඩුවෙන් ගසා දෙකක් කොට පලා යක්ෂයන් දෙදෙනාව සම්බෙත්මෙන් බෙදා දුන්නාහුය. ඒ කඩුව සෝදා කොපුවේ ලා උරසේ බැඳ එල්වාගෙණ සිටියාහුය.

ඉක්බිත්තෙන් ඒ යක්ෂයෝ මනුෂ්‍ය මාංශ කා බඩපුරාගෙණ සතුටුවූ සිත් ඇතිව සිටියාහු "රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේට අනික් කුමක් කරමෝදැ"?යි විවාළෝය. "එසේවී තම් තොපි තොපගේ ආනුභාවයෙන් මා ගෙණ ගොස් සතුරු රජ්ජුරුවන්ගේ ශ්‍රියනන් ගබඩාවේ බා සිටුවාලව, මේ අමාත්‍යයන් ගෙණ ගොස් තම තමන්ගේ ගෙයි සිටුවාලව'යි කිවූය. ඒ යක්ෂයෝ දෙදෙනා "යහපත, සවාමීනි," කියා හිඳිස එපරිද්දෙන්ම කළාහුය.

එසමයෙහි සතුරු රජ්ජුරුවෝ සරණකලද ශ්‍රියනන් ගබඩාවේ ශ්‍රියනන් මස්තකයෙහි වැදහෙව නිදන්නාහුය. රජ්ජුරුවෝ සතුරු රජ්ජුරුවන් නිදි මත්ව නිදන තැනැත්තාගේ බඳිව කඩුපතින් ඇසූය, ඒ රජ්ජුරුවෝ හඟින් ත්‍රස්තව පිබිද ප්‍රදීපාලෝකයෙන් සිලව මහරජ්ජුරුවන් හැඳින යහනින් තැගී ධෛර්‍යයෙන් උපදවාගෙණ සිව රජ්ජුරුවන්ට මෙසේ කිවූය. "මහරජ්ජුරුවෙනි, මෙබඳුවූ රාත්‍රියෙහි ගත්තාලද රැකවල් ඇතිව වසනලද දොරඇති මේ ප්‍රාසාදයේ රැකවල් මනුෂ්‍යයන්ගෙන් අවසරයක් නැත්තාවූ සැතයෙහි කඩුව අල්වාගෙණ සවීහරණයෙන් සැරහී තෙසේ තම් තෙපි මේ යහන්මත්තට අවුදැ"යි කීහ. එබස් ඇසූ සිලව මහරජ්ජුරුවෝ තමන් ආ සැටිය විස්තරකොට කිවාහුය. එබස් ඇසූ සතුරුරජ්ජුරුවෝ "කලකිරුණාවූ සිත් ඇතිව මහරජ්ජුරුවෙනි, මම මනුෂ්‍යව සිටත් තොපගේ ගුණය නොදත්මි. අනුන් ඇඟ වෙර ලේ මස් කන්නාවූ වණඩ පරුෂවූ යක්ෂයන් විසින් නොපගේ ගුණ දන්නාලද, රජ්ජුරුවෙනි, දැන් මම මෙබඳුවූ සිලගුණයෙන් යුක්තවූ තොප කෙරෙහි ද්‍රොහයක් නොකරමි"යි කඩුව ගෙණ සපථකොට රජ්ජුරුවන් ඉක්මාකරවා මහයානේ සතපවා තුමූ කුරු යහනෙක වැදහෙව පාන්ව ගිය කල හිරුනැඟි කල්හි බෙරලවා සියලු සේනාව හා අමාත්‍ය බ්‍රාහ්මණ ගෘහපතීන් රැස්කරවා ඉදිරියේ ආකාශයෙහි පුන්

සද මණ්ඩප ඔසොවා පාන්නාක් මෙන් සිලව රජ්ජුරුවන්ගේ ගුණ කියා පෑත් මඩ්‍යයෙහිදීම නැවත රජ්ජුරුවන් ක්‍ෂමාකරවා රාජ්‍ය පාවාදී "මෙතැන්පටන් නුඹවහන්සේට උපන්නාවූ සතුරන්ගෙන් උපද්‍රවයෙක් ඇත්තම් මට භාරවන්නේය. මා ගත් රැකවලින් නුඹවහන්සේගේ රාජ්‍යශ්‍රී අනුභව කොට වදාළ මැනවැ"යි කියා කේලාම් කී තැනැත්තවුන්ට රාජාඥ කොට තමන්ගේ සේනා වාහන ගෙණ සවකියවූ රාජ්‍යයට ම ගියේය. සිලව රජ්ජුරුවෝත් සම්භාරණ යෙන් සැරසී ධවලච්ඡත්‍රය යට සරහන සරහ මාගධයන්ගේ කකුල් බදුවූ පා ඇති සවණ් පය්‍යඞ්කයේ හිඳ තමන්ගේ සම්පත්තිය බලා "මේබදු සම්පත්තියත් අමාත්‍යයන් දහසක්දෙනාගේ ජීවිත ප්‍රතිලාභයත් මා විසින්නොකළ කල්හි කිසි වෙක් සිද්ධනොවන්නේ වේදැ"යි විය්‍යීබලයෙන්ම මම නටුවාවූ යසසත් ලදිමි, අමාත්‍යයන් දහසක්දෙනාට ජීවිත දානයත් දිනිමි. ඒකාන්තයෙන් ප්‍රාර්ථනාකළ වස්තුවෙහි ආලය නොහැර විය්‍යී කවයුත්තේය. කළාවූ විය්‍යී ඇති සත්ත්වයා හට විපාක නම් මෙසේ සමෘද්ධවන්නේය"යි සිතා, තවද ඒ මහබෝසතානෝ "පින්වත්නි, සිල්වතුන්හේ විය්‍යීයෙහි ඵල නම් මෙසේ සමෘද්ධවන්නේය"යි උදන් අනා දිවිපමණින් කුසල්කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියේය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදෙශනාව හෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර පසුබට විය්‍යී ඇති භික්ෂූන්වහන්සේ අර්හත්ඵලයෙහි පිහිටිසේක. සම්බුදුන්වහන්සේ පූර්වාපර සන්ධි ගළපා මේ මහාසීලව ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි දුෂ්ටවූ අමාත්‍යයා තම් දැන් දෙවදත්තභික්ෂුවරයෝය, දහසක් අමාත්‍යයෝ තම් දැන් බුදුපිරිසය, මහාසීලව රජ්ජුරුවෝ තම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 52
## චූල්ලජනක ජාතකය.

තවද එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරණ සේක් පසුබටවිය්‍යීඇති භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එහි වර්තමානකථාව නා අතීත කථාව මහාජනක ජාතකයෙහි විස්තර වශයෙන් මතු ප්‍රකාශවන්නේය, මේ ජාතකයෙහි චූලජනක රජ්ජුරුවෝ වනාහි ධවලච්ඡත්‍රයාගේ යට පණවනලද සිංහාසනමස්තකයෙහි හුන් සේක් මෙසේ පණිදට කීසේක.

පුරුෂතෙම නිෂ්ඵවව පැමිණෙම් යි ආශාව කරන්නේය, ප්‍රාඥ පුරුෂතෙම මේ තම් සාදෘගතභැකිදැ"හි උකටලී නොවන්නේය, ඒ එසේමැයි දියෙන් ගොඩට නැංඟාවූ මම මාගේ ඓශ්වර්‍යය් බලම්. යම් පුරුෂයෙක් විය්‍යීකළේ තම් ඒ විය්‍යී ඵලය සිද්ධවන්නේය, සාගරයෙන් පිනා විය්‍යීයෙන් ගොඩ දුටුවා මෙනැ"හි දැක්වූසේක.

මේ ජාතකයෙහිද පසුබට විය්‍යී ඇති භික්ෂූන්වහන්සේ අර්හත්ඵලයට පැමිණිසේක. ජනක තම් රජව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 53
## පුණ්ණපාති ජාතකය

තිවදඑක් සමයෙක්හි අෂ්ටපෂීද්හි අකම්පාවූ ඥන ඇති සම්බුදුයන් වහන්සේ දෙවිරම්වෙහෙර වැඩවසන සේක් විෂ යොදනලද සුරාවක් අරභයා මෙ ජාතකය වදාළසේක. එක් සමයෙක්හි සැවැත්නුවර වාසය කරන්නාවූ සුරාධූර්තයෝ එකතැනකට රැස්ව කියන්නාහු ''අපගේ සුරා මිළ ක්ෂයවූයේය. කෙසේ මිළ ලබමෝදැ''යි කියා මන්ත්‍රණය කළාහුය. ඉක්බිත්තෙන් එක් කර්‍කශධූර්තයෙක් කියන්නේ ''තෙපි නානමක් නොසිතව, එක් උපායෙක් ඇත්තේ ය''යි කියය. ''කවරනම් උපායෙක් දැ''යි කී කල්හි අනේපිඬු මහසිටාණන් අංගුෂ්ඨමුද්‍රිකාව පැලඳ මවසිලුටු වස්ත්‍ර හැඳ පෙරවරු රජහට උපස්ථානයට යනසේක. අපි සුරාපාත්‍රවල්හි විසංඥ කරණ පිණිස බෙහෙත් බහා සුරාපාන ශාලාව සදා හිඳ අනේපිඬු මහසිටාණන් එනකල 'මහසිටාණනි, මෙසේ එව''යි කියා කැඳවා ගෙන්වා ඔහු සුරාපානය කරවා විසංඥවූවහුගේ අංගුෂ්ඨමුද්‍රිකාව ද වස්ත්‍රයන්ද ගෙණ රු මිළ කරමින''යි කියේය. ඒ අසා සුරාධූර්තයෝ ''ඔහුගේ වචන යහපතැ'යි පිළිගෙණ එලෙස කොට සිටානන් එනකල්හි පෙරමගට ගොස් ''සවාමීන්වහන්ස, මෙතැනට අවමැනව, මෙතන අපගේ සමීපයෙහි ඉතා මනොඥවූ සුරා තිබෙන්නේය. ඉන් මදක් පානය කොට යව''යි කිවාහුය. සොවාන්ඵලයට පැමිණියාවූ ආර්‍යශ්‍රාවකවූ අනේපිඬු මහසිටාණෝ ''කවර හෙයකින් සුරාපානය අනුභව කරණසේක්ද? නොකමැතිවූසේක් වනාහි මේ ධූර්තයන් පරීක්ෂාකරන්නෙමි''යි සිතා ඔවුන්ගේ සුරාපාන භූමියට ගොස් ඔවුන් ගේ ක්‍රියාව බලා ''මේ රහ මොවුන් විසින් මෙනම් කාරණයකින් යොදන ලදැ''යි දැන ''අද මෙතැන් පටන් මේ ධූර්තයන් මෙතනින් එලවන්නෙමි''යි සිතා කියනසේක් ''කොල දුෂ්ටවූ ධූර්තයෙනි නෙපි සුරාපාත්‍රවල්හි බෙහෙත් බහා ආ ආවවුන් පානය කරවා විසංඥකරවා කොල්ලකම්හ''යි සිතා සුරාපාන මණ්ඩලය සරහා හුන්නාහුද? උදක් මේ සුරා වණීතා කරවුද? තොප අතුරෙන් එකෙක්ද ඔසොවා පානයකරන්ට උත්සාහ නොකරන්නේය, ඉදින්, මේ සුරා විෂ නොයොදනලද්දේ වීනම් තොපි පානය කරව''යි කියා ඒ ධූර්තයන් භයගන්වා එතනින් එලවා තමාගේ ගෙට ගොස් ධූර්තයන් විසින් කරණලද කාරණාව සම්බුදුයන්වහන්සේට දන්වම් සිතා ජේතවනාරාමයට ගොස් දැන්වූසේක. සම්බුදුයන් වහන්සේ වදාරණසේක් ''ගෘහපතිය, දැන් වනාහි ඒ ධූර්තයෝ තොප වංචා කරණු කැමැති හුවුවාහුය. පෙරත් නුවණැත්තවුන් වංචාකරණු කැමති වූවාහුම ය''යි වදාරා අනේපිඬු මහසිටාණන් විසින් යාචඤ්ඤාකරණලද්දාහු ඉකුත් වත් කථාව දක්වා වදාළසේක.

ඊට අනන්තර දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් වහන්සේ බරණැස සිටාණ කෙනෙක් වූසේක. එකල්හිද මේ ධූර්තයෝ මෙම ක්‍රමයෙන් මන්ත්‍රණය කොට සුරාවෙහි විෂ යොදා බරණැස් සිටාණන් එන කල්හි පෙරමගට ගොස් මෙපරිද්දෙන්ම කීවාහුය. බරණැස් සිටාණෝ නොකමැතිව ඒ ධූර්තයන් පරීක්ෂාකරණු කැමතිව ගොස් ඔවුන්ගේ ක්‍රියාව බලා ''මෙනම් දෙයක් කරණු කැමැත්තාහ. ඔවුන් මෙතනින් එලවන්නෙමි''යි සිතා කියනසේක්, ''පින්වත් ධූර්තයෙනි,

සුරාපානය කොට රාජවැසභවනයට යන්ට නුසුදුසුය, රජ්ජුරුවන් දැක නැවත එනකල්හි දැන ගණිමි, තෙපි මෙතැන්හිම හිඳුව''යි කියා රාජසේවයට ගොස් නැවත ආසේක.

ධූතීයෝ එන්නාවූ සිටානන් දැක සවාමීන්වහන්ස, මෙතැනට එව''යි කීවාහුය. ඔවුන්ගේ වචනය අසා එතනට ගොස් විෂ යොදා තිබෙන රා පාත්‍රයන් බලා මෙසේ කීසේක. ''පින්වත්වූ ධූතීයෙනි, තොපගේ ක්‍රියාව මට නොරුචි වන්නේය, තොපගේ සුරා භාජනවල් පිරූ පරිද්දෙන්ම තිබෙන් නේය, තෙපි හුදෙක් සුරා වර්ණනාකරහු නොම පානය කරන්නාහුය. ඉදින් මේ සුරා මනාප වූයේ වීනම් තෙපිත් පානය කරන්නාහුය, මේ සුරාව වනාහි විෂ යොදවනලද්දේවනෑ''යි කියා ඔවුන්ගේ මනොරථය බිඳවනසේක් මෙසේ වදාළසේක. ''සුරා පෑනුවල් මා යනකල මෙන් පිරීතිබෙන්නේය, යම් මේ සුරා වර්ණනා කථාවක් පවතීද? නෙද අනිකක්මය, ඉදින් මේ සුරා මනාප වීනම් තෙපි පානය කරන්නාහ. පානය කළොත් අඩු පාත්‍ර තිබෙන්නේය. තොප ගෙන් එක්කෙනෙකුත් විසිනුදු සුරාපානය නොකරණලද්දේය, එසේහෙයින් මේ සුරාපානය යහපත් නොවන්නේය, විෂ යොදවනලද්දේය වනෑ''යි කියා ධූතීයන් හඬගන්වා ''තැවත මෙබන්දක් නොකරව''යි කියා තැති ගන්වා එහනින් එලවූසේක.

අප මහබෝසතාණන් වහන්සේ ජීවිතාන්තය දක්වා දානාදී පින්කම් කොට කළුවූ පරිද්දෙන් මිය පරලොව ගියසේක.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්ව වදාරා ජාතක ධර්මය නිවරා වදාළසේක.

''එසමයෙහි ධූතීයෝ දැනුදු ධූතීයෝ වූවාහුය, බරණැස් සිටුව උපන් තෙම් එතැනි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 54
## ඵල ජාතකය

එවද එක් සමයෙක්හි සම්බුද්ධශ්‍රීයන් සත්කාරයෙන් කරතලාමක ක්‍රමයෙන් අවබොධ කළාවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරණ සේක් ඵලයෙහි දක්ෂවූ එක් උපාසකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසය කරන්නාවූ එක් කෙළෙඹිපුත්‍රයෙක් වනාහි බුදු පාමොක් භික්ෂුසඞ්ඝයා වහන්සේට ආරාධනා කොට තමාගේ උයනෙහි වැඩ හිඳිනට සලස්වා කැඳ අවුලුපත් වළඳවා උයන්ගොවිවාට ආමන්ත්‍රණය කොට ''භික්ෂුසඞ්ඝයා වහන්සේ හා සමග උයනෙහි හැසිර ආර්‍යවූ භික්ෂුසඞ්ඝයා වහන්සේට අඹ දඹ ආදීවූ නොයෙක් ඵලාඵලජාති පිළිගන්වා''යි කීයේය. උද්‍යානපාලතෙම ඔහුගේ වචනය පිළිගෙණ භික්ෂුසඞ්ඝයා කැඳවා ගෙණ උද්‍යාන යෙහි හැසිරෙන්නේ වෘක්ෂය දිසාව බැලුපමණකින්ම ''මේ ඵලය අමුය, මේ ඵලය යහපත්ව නොපැසුනේය, මේ ඵල යහපත්ව පැසුනේය''යි දැනගන් නේය. කෙතෙම යමක් කීයේද? ඔහුගේ වචනය එලෙසම වන්නේය යි කියා

භික්ෂුසඞ්ඝයා ගොස් සම්මෝදයන්වහන්සේට දැන්වූවාහුය. **සවාමීන්වහන්ස, මේ** උදුම්බරපාලතෙම ඵලයෙහි දෝෂය, භූමියෙහි සිටම වෘක්ෂ බලා ''මේ ඵලය අමුය, මේ ඵලය යහපත්ව නොපැසුනේ ය, මේ ඵලය යහපත්ව පැසුනේය'' යි දන් නේය. මෙතෙම යමක් කීයේද? ඒ ඵලෙසම වන්නේය''යි දැන්වූවාහුය. සම්මෝදයන් වහන්සේ වදාරණසේක් ''මහණෙනි, මේ උදුම්බරපාලකයාම ඵලයෙහි දෝෂ වූයේ නොවෙයි, පෙරත් නුවණැත්තෝ ඵලයෙහි දෝෂ වූවාහුමය''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

**පි**වහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍ය කරණ කල්හි අප මහාබොධිසත්ත්වයන් වහන්සේ සිටුකුලයෙක්හි ඉපිද වැඩිවයසට පැමිණ පන්සියයක් ගැල් කරණකොට ගෙණ වණික්කම්හ්ත කරණ සේක්, එක් දවසෙක මහමග අරණ්‍යයකට පැමිණ වන අභිමුඛයෙහි සිට සියළු මනුෂ්‍යයන් රැස්කරවා ''මේ වනයෙහි විෂ වෘක්ෂයෝ නම් වන්නාහුය. එහි විෂ පත්‍රයෝය, විෂ පුෂ්පයෝය, විෂ ඵලය, විෂ මධුය , යන මොහු වන්නාහුමය. පෙර නොපවිසින් පරිභොග නොකරණලද යම්කිසි පත්‍රයක් වත් පුෂ්පයක්වත් ඵලයක්වත් මා අතින් නොවිචාරා අනුභව නොකරව''යි කීසේක.

ඔවුන් උන්වහන්සේගේ වචනය පිළිගෙණ වනයට වන්නාහුය. වන අභිමුඛයෙහි එක් ගම්දෙරෙක කිංඵල වෘක්ෂයෙක් ඇත්තේය, ඒ වෘක්ෂයාගේ ස්කන්ධ ශාඛා පුෂ්ප ඵල යන සියල්ලද අඹ හා සදෘශ වන්නාහුය. හුදෙක් එම නොවෙනස් වණ්ණ සවනකින්ද සුගන්ධයෙන්ද රසයෙන්ද ආම පක්ව ඵලයෝද අඹඵල හා සදෘශය, අනුභව කළ කල්හි හලාහල විෂයක් මෙන් ජීවිතක්ෂයට පමුණුවන්නේය. පළමුවෙන් ගිය සමහර ලොල්වූ පුරුෂයෝ ''මේ අඹ වෘක්ෂ යකැ''යි යන සංඥයෙන් ඵලයක් අනුභව කළාහුය. සමහර කෙනෙක් ''ගැල් සාත්තුවාහයන් අතින් විචාරා අනුභව කරම්හ''යි කියා අතින් ගෙණ සිටියාහුය. ඔහු ගැල්සාත්තුවාහයන් ආ කල්හි ''සවාමීන්වහන්ස, මේ ඵල අනුභව කරමෝදැ''යි විචාළාහුය.

බොධිසත්ත්වයන්වහන්සේ ''මේ අඹවෘක්ෂයෙක් නොවෙයි දැන, වෘක්ෂය කිංඵල වෘක්ෂයක්ය, අනුභව නොකරව''යි වළක්වා යමෙක් අනුභව කළාහුද? උත්ගාරය කරවා වතුරංගුලම පානය කරවා නීරෝග කළසේක.

පූර්වයෙහි මේ වෘක්ෂමූලයෙහි මනුෂ්‍යයෝ නවාතැන් ගෙණ 'අඹඵලය'යි සිතා මේ විෂඵලයන් අනුභව කොට ජීවිතක්ෂයට පැමුණුනාහුය. දෙවෙනිදින මෙහි ගම්වැස්සෝ ඇවිත් මළ මනුෂ්‍යයන් දැක පාදයන් අල්වාගෙණ ප්‍රතිච්ඡන්න ස්ථානයෙහිම දමා ගැල් හා සමග ඔවුන් අයිති සියළු බඩු ගෙණයන්නාහුය. ඔවුන් ඒ දිනයෙහිද අරුණෝද්ගමන වේලාවෙහිම ''මව ගවයෝය, මට ගැල්ය, මට බඩුය''යි කියා ශීඝ්‍රව ඒ වෘක්ෂමූලයට ගොස් නීරෝගව සිටි මනුෂ්‍යයන් දැක ''කෙසේ තොප මේ වෘක්ෂය අඹ වෘක්ෂය නොවන්නේ යයි දැනගත්තාහු ද?''යි විචාළාහුය, ''අප නොදනුම්හ යි ගැල්සාත්තුවාහ ශ්‍රේෂ්ඨයාතන් වහන්සේ දන්සේකැ''යි කිවුය.

එවිට මනුෂ්‍යයෝ බොධිසත්ත්වයන් අතින් විචාරත්තාහු ''පණ්ඩිතයන් වහන්ස, නුඹවහන්සේ මේ වෘක්ෂය අඹවෘක්ෂය නොවන බව කෙසේ දන්සේක් ද''යි විචාළාහුය. අප මහබෝසතාණන්වහන්සේ ''කාරණා දෙකකින් දැන

ගතිම්"යි වදාළසේක. "මේ වෘක්ෂය දුකින් නැගෙන පරිද්දෙන් වැඩියේ නොවෙයි, ඔසවා තබනලද හිතිපෙළක් සෙයින් සුවසේ නැගෙන පරිද්දෙන් වැඩියේය, ගමින් දුරසිටියේද නොවෙයි, ගම්දෙර සිටියේය. ඉදින් මේ තෙම මධුර ඵල ඇති වෘක්ෂයෙක් වීනම් මෙහි එකඵලයකුදු නොහිබෙන්නේය. මනුෂ්‍යයන් විසින් නිරන්තරයෙන් පිරිවරණ ලද්දේ වෙයි, එහෙයින් මේ වෘක්ෂය විෂ වෘක්ෂය බව දැනගතිම්"යි කියා මහජනයාට ධර්මදේශනා කොට යහපත් ගමනක් වැඩිසේක.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මහණෙනි, පෙරත් නුවණැත්තෝ ඵලයෙහි දෝෂ වූවාහුමය"යි කියා මේ දම්දෙසුන් ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ගැල්සාත්තුවාහයන්ගේ පණ්ඩිතොම දැන් බුදුපිරිස් වූවා හුය, ගැල්සාත්තුවාහ ජ්‍යෙෂ්ඨව උපන්නේ නම් ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 55 පඤ්චායුධ ජාතකය

මේවද එක් සමයෙක්හි ජම්බෝනද සුවර්ණයට බඳුවූ ශරීරප්‍රභා ඇති සම්බුදුරජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සමයෙහි පසුබට වීර්‍යය ඇති භික්ෂූකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

සම්බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූනට ආමන්ත්‍රණයකොට "සැබෑද? මහණ, නෝ පසුබට වීර්‍යී ඇත්තෙහිදැ"යි වදාළසේක. "සැබවැ, ස්වාමිනි, කී කල්හි 'මහණ, පෙර නුවණැත්තාවූ මහොත්තමයෝ වීර්‍යී කරන්ට සුදුසු තැන්හි වීර්‍යී කළෝවේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

එවකිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ සමයෙහි අප මහ බෝසතාණෝ රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකාව බිසවුන්කුස පිළිසඳගත්තුය. ඒ බෝධිසත්ත්වයන්ට නම් තබන දවස අවොරුසියක් බමුණන් ගෙන්වා සියළු සත්ත්වයන් වස්තුවෙන් පිණවා ලක්ෂණ විවාළෝය. එකල ලක්ෂණ කීමෙහි දක්ෂවූ බමුණෝ ලක්ෂණ සම්පත්තිය බලා "මහ පිණැති රාජකුමාරකෙනෙකුන් වහන්සේය, නුඹවහන්සේගේ අවැමෙහි රාජ්‍යයව පැමිණ දහරාජධර්මයෙන් රාජ්‍යය කරණසේකැ"යි කීහ. "පඤ්චායුධ ශිල්පයෙහි දක්ෂව ජම්බුද්වීපයෙහි සත්ත්වයන්ට අග්‍රපුරුෂ වනසේකැ"යි කිවුය. බමුණන්ගේ බස් අසා කුමාරයන්ට නම් තබන්නාහු පඤ්චායුධ කුමාරයෝ යයි නම් තුබූහ.

ඉක්බිත්තෙන් ඒ කුමාරයන් වැඩිවිය පැමිණි කල්හි රජ්ජුරුවෝ සමීපයට කැඳවා "ශිල්පයක් ශාස්ත්‍රයක් නිමවා නොගෙණ රාජ්‍යය කළ නොහැක්කේය, එසේහෙයින් ශිල්ප උගණුව යි කීහ "ස්වාමිනි කවුරුන් සමීපයෙහි උගණිම්දැ"යි කී කල්හි පුත, ගන්ධාරදේශයෙහි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙහියැ"යි කී කල්හි එහි ගොස් ශාස්ත්‍ර ඉගෙණ නිමාවට

පැමිණ ඉක්බිති ආචාරීන් වැද තක්සලා නුවරින් නික්ම පඤ්චායුධ සන්නඬව බරණැස් නුවරට යන්නාහු වනාන්තරගත ව මාඝීයට අභිමුඛවූ කල්හි එසේ පැමිණෙන්නාවූ කුමාරයෝ අතරමග සිලේසලෝම නම් යක්ෂයකු වසන්නා වූ එක් වනයකට පැමිණියෝය.

එකල කුමාරයන් වනයට අභිමුඛවූ කල්හි මනුෂ්‍යයෝ දැක "පින්වත්වූ පුරුෂය, නුපි මේ වනාන්තරයට නොවදුව යි මේ වනාන්තරයෙහි සිලේස ලෝම නම් යක්ෂයෙක් ඉඳ දුටුදුටුවුන් අල්වා අනුභවකරන්නේය. එසේහෙයින් නුපි නොයව" යි වැළකූය.

බොධිසත්ත්වයන් තමන්ගේ සමඵීකම තුමූම වළකා නිර්භීතව කෙශර සිංහ රාජයකු සේ වනයට සාහසිකව පැමිණි කල්හි කැනහිල්මල් කැකුළු සා දළ ඇතිව කබර පත් වූ මුඛ හා බඬ ඇතිව නිල්වූ හස්තපාද ඇතිවූ ඕනට බොධිසත්ත්වයෝ කියන්නාහු "එම්බල යක්ෂය, මම මාගේ සමඵීකම් සලකා, මෙතනව වන්නෙමි, නෝ අප්‍රමාදව මා සමීපයට වර, විෂපොවතලද ශරය කින් විද මෙතනම එලමි" යි ඔහු තැති ගන්වා දරුණුවූ විෂ පොවතලද ශරය දුනුපිට ලා ගෙණ ඇද අත හළවාහුය. ඒ සැරය ගොස් යක්ෂයාගේ රෝම යෙහි ඇලී ගියේය.

ඉක්බිත්තෙන් අනික් ශරයකැයි මෙසේ හීදඬු පණසක් විද්දේය. ඒ සියළුම හීදඬු යක්ෂයාගේ රෝමයෙහිම ඇලීගියේය. තවද යක්ෂයා ඒ සියළු හීදඬු කිලිපොලා තමාගේ පාමුල වගුරුවා බොධිසත්ත්වයන් සමීපයට ගියේය. එකල බොධිසත්ත්වයෝ නැවතත් තැති ගන්වා කඩුව කොපුවෙන් හයාගෙණ ගැසුවේය. දෙතිස් අඟලක් දිග ඇති කඩුව රෝමයෙහි ඇලී ගියේය. එවිට මුගුරෙන් ගැසුවේක. එයත් රෝමයෙහි ඇලී ගියේය ඒ මුගුරු ඇලී ගියා දැක බෝසතාණෝ කියන්නාහු "පින්වත්වූ යක්ෂය, මම පඤ්චායුධ කුමාරයෝය, මාගේ තම් ඇසූකෙනෙක් නැත, මම තා විසින් අධිගෘහීතවූ වනාන්තරයට වදනෙම් දුනු ආදීවූ ආයුධයන් සලකා වන්නෙම් නොවෙමි. මාගේ සමඵීකම සලකා වන්නෙමි. එසේහෙයින් තා සුණු විසුණු කරමි" යි අධිෂ්ඨාන දක්වා ගර්ජනා කොට දකුණතින් යක්ෂයාව පැහැරියේක. එයිදු රෝමයෙහි ඇලී ගියේය. වමතින් පහළසේක. එයිත් රෝමයෙහි ඇලී ගියේය, දකුණුපයින් පහළසේක. එයිත් රෝමයෙහි ඇලී ගියේය, වම් පයින් පහළසේක. එයිත් රෝමයෙහි ඇලී ගියේය. "ඇන සුණු විසුණු කරමි" යි ඉසින්ද පහළන. මහබෝසතාණෝ පස්තෙනකින් බැඳී එල්ලෙමින් සිටත් නිර්භීතව කථා කෙරෙති.

එකල යක්ෂයා මෙසේ සිතීය, "පුරුෂ සිංහයෙක පුරුෂ ශ්‍රේෂ්ඨයෙක, මේ කෙසේවූ පුරුෂයෙක්දෝ" යි කියා සිතන්නේ "එම්බල පුරුෂය, නෝ මට හොදුරුව සිව මෙසේවූ බුනුවි කථා කරන්නට කාරණා කවරේද?" යි විවාළේය.

එකල්හි බොධිසත්ත්වයන් වහන්සේ "නෝ මා කැයෙහි විතම් මාගේ කුක්ෂියෙහි වජ්‍රායුධයක් ඇත්තේය, ලයෙන් ඇනී පිටින් නැගෙන්නේය, තාගේ අතුනුබහන් කඩ කඩ කොව සිදී ජීවිතක්ෂයට පමුණුවන්නේය. එසේ කල්හි අපි දෙදෙනම නැසෙමිහ, මේ කාරණයෙන් මම නොබාමි" යි කීවාහුය. මේ වචනය වූකලී බොධිසත්ත්වයන් තමන්ගේ අභ්‍යන්තරයෙහි ඥානායුධය සඳහා කීය.

එබස් අසා යක්ෂයා මෙසේ සිතීය, "මේ මාණවකයා සත්‍යයෙක්ම කියන්නේය, පුරුෂ සිංහයාගේ ශරීරයෙන් මුත් ඇවයක් පමණ අනුභව කෙළෙම් වීම් නම් මාගේ බඩ දිරවාගත නොහෙමි, එසේහෙයින් මොහු ඇරපියමි"යි සිතා මරණ භයින් ත්‍රස්තව බොධිසත්ත්වයන් හැරපියන්නේ "මානවකය, තෝ සිංහපුරුෂයෙක, තාගේ මස් නොකමි, තෝ රාහු මුඛයෙන් මිදුනාවූ චන්ද්‍රයා පරිද්දෙන් මා අතින් මිදී මිත්‍රසම්මතයා සතුටුකරවමින් පලායව"යි කීය. එකල්හි බොධිසත්ත්වයන්වහන්සේ ඔහුට මෙසේ කිවුය. 'යක්ෂය මම වූකලී යෙමි, තෝ වනාහි පෙර අකුසල් කොට රෞද්‍රවූ කර්මයෙන් ලේ රැදීගියාවූ අත් ඇතිව අනුන්ගේ ශරීරමාංශය භක්ෂණය කරන්නාවූ යක්ෂව උපන්නෙහිය, ඉදින් මේ යක්ෂාත්මභාවයේ සිට අකුසල් කරන්නේ චිතම් අදුරෙන් අදුරට යන්නෙහිය. මා දුටු තැන් පටන් තා විසින් අකුසල් කරන්ට නොපිළිවන, ප්‍රාණඝාත නම් නරක තිරිසන් ප්‍රේත අසුරකාය යන සතර අපායෙහි උපදවන්නේය. නැවත මනුෂ්‍ය ලෝකයෙහි උපනුපන් තෙත මන්දායුෂ්ක බව ලබන්නේය. මේ ආදීවූ නොයෙක් කාරණයෙන් පඤ්ච දුස්සීලයෙහි ආදීනව හා පඤ්චසීලයෙහි අනුසස් කියා අනේකප්‍රකාරයෙන් යක්ෂයා තැති ගන්වා ධර්ම දෙශනා කොට ඔහු දමනයේ ලා ඔහුගේ සන්තානයෙහි කෙලෙස් නමැති සතුරන් නසා පඤ්චසීලයෙහි පිහිටුවා චතාන්තරයෙහි සත්ත්වයන් විසින් දෙන ලද භෝජනය බිලියම් පිණිස ලැබ අප්‍රමාදව වාසයකරව'යි අවවාද කොට වනයෙන් නික්ම මහවන සමීපයෙහි මනුෂ්‍යයන්ට කියා පඤ්චායුධ සන්නඬව බරණැස්නුවරට ගොස් දෙමව්පියන් දැක මෑතභාගයෙහි රාජ්‍යයෙහි පිහිටා දැහැමෙන් රාජ්‍යය කෙරෙමින් දුනාදීවූ කුසල් කොට නම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

මෙසේ ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා තවද භික්ෂූන්ට මත්තෙහි අවවාද කරණසේක් නොපසුබටවූවාවූ වීර්‍යය ඇති සිතින් නිරවද්‍යවූ අර්ථයෙන් කුසලයයි කියනලද සප්තත්‍රිංශත් බොධිපාක්ෂික ධර්මයන් වඩාද සියළු සංස්කාර ධර්මයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යි මෙසේ ත්‍රිලක්ෂණ මෙනෙහි කොට විදර්ශනාවෙහි පටන් බොධිපාක්ෂික ධර්මයන් වඩන්නාවූ යොගාවචර තෙම සියළු සංයෝජන ක්ෂය කරන්නාවූ සතරවැනි ආර්‍යපුද්ගලයාගේ ඵලවර උපන් බැවින් ධර්මදෙශනාවෙහි කුළඟන්වා මත්තෙහි චතුරාර්‍යසත්‍යය ධර්මයන් ප්‍රකාශකොට වදාළසේක.

චතුරාර්‍යසත්‍යයන්ගේ අවසානයෙහි පසුබට වීර්‍ය ඇති භික්ෂූහු අර්හත් ඵලයෙහි පිහිටිසේක. සම්බුදුරජාන් වහන්සේ පූර්වාපරසන්ධි ගළපා මේ පඤ්චායුධ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි යක්ෂයා නම් අඞ්ගුලිමාල සථවිරයෝය, පංචායුධ කුමාර යෝ නම් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

---

## 56
## කාවනස්ඛණ්ඩ ජාතකය

මේ වදාළ එක් සමයෙක්හි අසරණයන්ට සරණ වූ සම්බුදුරජාන් වහන්සේ සැවැත්නුවර වැඩවසන සේක් එක් තරා භික්ෂුකෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසය කරන්නාවූ එක් කුලපුත්‍රයෙක් සම්බුදුරජාණන් වහන්සේගේ ධර්මදේශනාව අසා සම්බුදුසසුනෙහි පැහැදී පැවිදි වූයේය. ඉක්බිත්තෙන් ඒ භික්ෂූන්වහන්සේව අවවාද දෙන්නාහු "ඇවැත්නි, සීලය, ඒකවිධ වන්නේය, ත්‍රිවිධවන්නේය, යනාදීන් බහුප්‍රකාරවන්නේය. මේ චුල්ල සීල තම, මේ මඩ්‍යමසීල තම, මේ මහාසීලතම, මේ ප්‍රාතිමොක්ෂසංවරසීලතම, මේ ඉන්ද්‍රිය සංවරසීලතම, මේ ආජීවපාරිසුද්ධිසීලතම, මේ ප්‍රත්‍යයසන්නිශ්‍රිතසීල නමැ යි කියා සීලය ප්‍රභෙදවන්නාහු වෙති"යි කීහ. එකල ඒ භික්ෂූන්වහන්සේ මෙසේ සිතූසේක. මේ සීලය තම් ඉතා බොහෝය, මම මේ පමණක් සමාදන්ව පවත්වන්ට නොහැකිවන්නෙමි, සිල්පුරන්නට නොහැකිවන්නාහට ප්‍රව්‍රජ්‍යාවෙන් කවර ප්‍රයෝජනද? මම ගිහිව දානාදීවූ කුසල් කරන්නෙමි, පුත්‍රදාරාවන්ද රක්ෂා කරන්නෙමි"යි සිතූසේක.

මෙසේද සිතා "සවාමීන් වහන්ස, මම සිල්රක්ෂාකරන්ට නොහැකි වන්නෙමි. සිල්රකින්ට නොහැක්කාහට ප්‍රව්‍රජ්‍යාවෙන් කවර ප්‍රයෝජනද? මම සිවුරු හරිනෙමි නුඹවහන්සේලාගේ පාසිවුරු ගණුව"යි කීයේය. එසේ කී මහණහට ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේ වදාරණසේක් ඇවැත්නි, එසේ කල්හි බුදුන් වැඳ යව"යි කියා උන්වහන්සේලා ඒ මහණ කැඳවාගෙණ සම්බුදුරජාණන් වහන්සේගේ සමීපයට දම්සභාමණ්ඩපයට ගියාහුය. සම්බුදුරජාණන් වහන්සේ දැක "මහණෙනි, කවර කාරණයකින් නොකමැති කරවා මහණක්හු කැඳවාගෙණ ආවාහු දැ"යි වදාළසේක. සවාමීන්වහන්ස, මේ භික්ෂූන්වහන්සේ මට සිල් රක්නට නොහැකි වන්නෙමි, කියා පාත්‍රා සිවුරු භාරකොට දුන්නේය. ඉක්බිත්තෙන් ඒ මහණ අපි කැඳවාගෙණ ආම්හ"යි දැන්වූවාහුය. "මහණෙනි, තෙපි වනාහි මේ මහණහට කවර කාරණයකින් සීලය බොහෝකොට කීවාහුද? යම් පමණක් තෙමේම රක්නට හැකිවේද? වත්නෙමි" කියා පාත්‍රා සිවුරු භාරකොට දුන්නේය. ඉක්බිත්තෙන් "ඒ මහණ අපි කැඳවාගෙණ ආම්හ"යි දැන්වූවාහුය. "මහණෙනි, තෙපි වනාහි මේ මහණහට කවර කාරණයකින් සීලය බොහෝකොට කීවාහුද? යම් පමණක් තෙමේම රක්නට හැකිවේද? එපමණක්ම රක්ෂාකෙරේවා; මෙතැන් පටන් තෙපි එසේ කිසිවක් නොකියව, මීට කටයුතු මම දනිමි" කියා "මහණෙනි, තෙපි මෙසේ එව, තොපට බොහෝ සීලයෙන් කවර ප්‍රයෝජනද? ත්‍රිවිධ සීලයම රක්ෂාකරන්ට හැකිවන්නේදැ"යි විවාරා වදාළසේක.

"සවාමීන්වහන්ස, හැකිවන්නෙමි" කීය. එසේ වී නම් තෙපි මෙතැන් පටන් කායද්වාරය, වාක්ද්වාරය, මනොද්වාරය යි යන ත්‍රිවිධ ද්වාරයන්ම රක්ෂාකරව කායද්වාරයෙන් අකුසලධර්මය නොකරව, වාග්ද්වාරයෙන් අකුසල් නොකරව, මනොද්වාරයෙන් අකුසල් නොකරව, ගිහි නොව මේ ත්‍රිවිධ සීලයම රක්ෂාකරව"යි වදාළ සේක.

මෙපමණකින් ඒ භික්ෂූන්වහන්සේ තුටුපහටු සිත් ඇතිව "යහපත, සවාමීන් වහන්ස, මේ ත්‍රිවිධසීලය රක්ෂාකෙරෙමි" කියා සම්බුදුරජාණන් වහන්සේව නමස්කාර කොට ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේ හා කැටිව ගියසේක. ඒ භික්ෂූන් වහන්සේ ඒ ත්‍රිවිධසීලය පුරමින් ම දිවිගත්සේක. "ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් විසින් මට කියන්නේද සීලයද මෙපමණෙක් මූ ය. උන්වහන්සේලා වනාහි තමන් සුවනේගෙවා නොදත් බැවින් මට අවබොධකරන්ට නොහැකි වූවාහුය. බුදුරජාණන් වහන්සේ වනාහි තමන් සිවිනේ ගෙවා දත් බැවින් නිරුත්තිවූ

ධම්මරාජන්වූ බැවින් මෙපමණ සීලය චාරිත්‍රයෙහි ම බහා මට දැන්වූසේක. එකාන් තයෙන් ම සම්බුදුයන් වහන්සේ මට පිහිටවූසේකැ''යි කියා විදගීතා වඩා කිප දවසෙකින් ම අග්‍රඵලයෙහි පිහිටිසේක.

ඒ ප්‍රවෘත්තිය දැන දම්සභාමණ්ඩපයෙහි රැස්ව හුන්නාවූ භික්ෂූන් වහන් සේලා කියන්නාහු ''ඇවැත්නි, අසවල් මහණ සිල්රකුණා කරන්නට නොහැකි වන්නෙමි'' කියා ගිහි බවට පැමිණෙන්නහු සිය සීලයන් තුන් කොටසෙක්හි පිහිටුවා ග්‍රහණය කරවා ශාස්තෘන් වහන්සේ අර්හත්ඵලයට පැමිණ වූසේක. සම්බුදුරජාණන් වහන්සේ ඉතා ආශ්චර්යවත් සේකැ''යි බුදුගුණ කියමින් හුන්නාහුය.

සම්බුදුරජාණන් වහන්සේ එතනට වැඩ වදාරා ''මහණෙනි' මේ දම්සභාවෙහි කවර නම් කථාවකින් යුක්තව හුන්නුද''යි වදාරා ' මේ නම් කථාවකින්ය''යි දැන්වූ කල්හි ''මහණෙනි, ඉතා බැරුරුම් බර කොට්ඨාස වශයෙන්බෙදන ලද්දේ සැහැල්ලුවාක් මෙන් වන්නේය, පෙර තුවණැති මහොත්තමයෝ මහත් රත් රන් කඳක් ලැබ ඔසොවා ගන්ට නොහැකිව විභාග කොට ඔසොවා ගෙණ ගියා හුය''යි වදාරා අතීත කථාව ගෙණහැර දක්වා වදාළසේක.

පසිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් වහන්සේ එක් ගමෙක කෂීකවැ උපන්සේක. බොධිසත්ත්වයන් වහන්සේ එක් දවසක් එක්තරා හරණලද ගමෙක්හි කෙතක් කෂීණය කරණසේක. පූර්වයෙහි ඒ ගම සම්පත්තියෙන් යුක්තවූ එක් සිටාන කෙණෙක් කලවයක් හා පමණ වට ඇති සතර රියන් දිග ඇති රන්කඳක් නිධාන කොට කළුරිය කෙළේය.

ඒ රන්කඳෙහි බොධිසත්ත්වයන් වහන්සේගේ කගුල ලග්නව සිටියේය, බොධිසත්ත්වයන් වහන්සේ ''මුල් සමූහයෙක් වනැ''යි සිතා පස් පිරමින් ඒ මුල දූක පාංශුවෙන් වසා දුවල් කෂීණය කොට සූර්‍යයා අස්තංගතවූ කල්හි වියදඬු කගුල් ආදිය එක් පසෙක්හි බහා තබා ''සවණීස්කඤ්ඨය ගෙණ යන්නෙමි'' සිතා ඒ රන්කඳ ඔසොවා ගන්නට නොහැකි වූසේක් හිද ''මෙපමණ කුසී රජා පිණිස වන්නේය, මෙපමණෙක් නිධාන කොට තබන්නෙමි, මේ පමණකින් කෘෂිවණක් කම්කරුවන්ට යොදන්නෙමි, මෙපමණ දානාදී කුසල් කිරීමට වන්නේය,යි කියා සතර කොට්ඨාසයක් කළසේක.

මෙසේ කොට්ඨාස කළ කල්හි අප මහබෝසතාණන් වහන්සේට ඒ සවණීස්කඤ්ඨය සැහැල්ලුවාක් මෙන් වූයේය. අප මහබෝසතාණන් වහන්සේ ඒ සවණීස්කඤ්ඨය ඔසොවා ගෙට ගොස් සතර කොට්ඨාසයකට බෙදා ''දානාදීවූ පින් කම් කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියසේකැ''යි වදාරා සම්බුදුරජාණන් වහන්සේ බුදුව වැඩ ඉඳ මෙසේ වදාළසේක.

''යෝගියන්ගේ ක්ෂෙමයට හෙවත් නිර්වාණයට පැමිණෙන පිණිස දුරු කළ නීවරණයන් ඇති චිත්තයෙන් එසේ විගත නීවරණ වශයෙන් දවා සොභා කළ සවණීයක් සේ නිමිලවූ සිත් ඇති යම් සත්ත්වයෙක් නිරාමයාර්ථයෙන් කුසල් තම් වූ බොධිපාක්ෂිකධර්මයන් වඩාද? ඒ තෙම සියළු සංයෝජනයන්ගේ විනාශයට පිළිවෙළින් පැමිණෙන්නේය''යි මෙසේ සම්බුදුරජාණන් වහන්සේ අර්හත් ඵලය කුළුගන්වා දෙශනාව නිමාකොට පූර්වාපරසන්ධි ගළපා මේ කාසඤ්ඤ නජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ස්වණ්ණසකණ්ඩය ලද්දාවූ කාශික පුරුෂ වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 57
## වානරින්ද ජාතකය

මේවද එක් සමයෙක්හි චතුර්වෛශ්‍යා රාද්‍යඥානයෙන් යුක්තවූ බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක්, දෙවදත්තසථවිරයන්ගේ වධය පිණිස උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි බුදුරජාණන් වහන්සේ දෙවදත්තසථවිරයන් වහන්සේ "වධය පිණිස උත්සාහ කෙරෙහි" අසා "මහණෙනි, දෙවදත්තසථවිරතෙම වධය පිණිස උත්සාහ කරන්නේ දැන් මතු නොවෙයි, පෙරත් උත්සාහ කෙළේමය. එලෙස උත්සාහ කොට නැතිගැන්වීම් පමණකුදු කරන්ට නොහැකිවූයේය'යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටනියම දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බොධිසත්වයන් වහන්සේ වදුරු ජන්මයෙහි ඉපද වැඩිවයසට පැමිණ අස්පැටවකු පමණ කායශක්තියෙන් යුක්තව එකවරව ගඞ්ගානදීරයෙක්හි වාසය කරණ සේක. ඒ ගඞ්ගාවගේ මැද අනෙකප්‍රකාර වූ ආම්‍රඵණසාදි ඵලවෘක්ෂයෙන් යුක්තවූ එක් දිවයිතෙක් වන්නේය. හස්තිබල හා සමාන කායශක්තියක් ඇති බොධිසත්වයන් වහන්සේ ගඞ්ගාවගේ මෙතරින් පැන නැගී දිවයින මෙතර ගඟමැද එක් අතල ගලෙක් ඇත්තේය. එහි හෙන සේක. එතැනින් පැනනැගී ඒ දිවයිතෙහි හෙනසේක. එතැන්හිදී අනෙක ප්‍රකාර ඵලාඵලයන් අනුභව කොට සවස ඒ උපායෙන් ම නැවත අවුත් තමා වසන තැන්හි විසීම කොට දෙවෙනි දිනයෙහිද එලෙසම කරණසේක. මෙම ක්‍රමයෙන් එතැන්හි වාසය කරණසේක.

එසමයෙහි වනාහි ප්‍රජාපතීන් සහිතවූ එක් කුම්භීලයෙක් ඒ ගඞ්ගාවෙහි විසීම කරන්නේය. ඔහුගේ භාර්‍යාවවූ කිඹුල්ධෙනු තොමෝ ඔබිනොබ වඩනාවූ බොධිසත්වයන් වහන්සේ දැක බොධිසත්වයන් වහන්සේගේ හෘදයමාංශයෙහි දෙළ උපදවා කිඹුලාට කියනුයේ "ස්වාමීන්වහන්ස, මට වනාහි මේ වානරෙන්ද්‍රයාගේ හෘදයමාංශයෙහි දෙළක් උපන්නේය"යි කීවාය. කුම්භීල තෙම "යහපත පින්වත්නි, ලබන්නෙහිය"යි කියා "අද සවස දිවයිතෙන් එන්නාවූ වානරෙන්ද්‍රයා අල්වා ගණිමි" කියා ගොස් ගල් අතලෙහි හොත්තේය.

බොධිසත්වයන් වහන්සේ දහවල් ගොදුරු කා සවස් වේලෙහි දිව යිතෙහි සිටි සේක්ම පහණ බලා "මේ පහණ දැන් උස්ව පෙණෙන්නේය, ඊට කාරණා කවරේදැ?"යි සිතුසේක.

උන්වහන්සේට වනාහි ජල ප්‍රමාණයද පාෂාණ ප්‍රමාණයද යහපත්ව වැටහී නිබෙන්නේය. ඒ කාරණයෙන් ඕහට මෙබඳු සිතෙක් වූයේය. "අද මේගංගා වගේ ජලය අඩුවූයේත් නොවෙයි, වැඩි වූයේත් නැත, එසේ වූයේද මේ පහණ මහත්ව පෙණෙන්නේය, කිමෙක්ද? මෙතැන්හි මා ගන්නා පිණිස කුම්භීලතෙම

හුන්නේද"යි බොධිසත්ත්වයන් වහන්සේ පළමුකොට ඔහු පරීක්ෂාකරන්නෙමි" සිතා එතැන්හිම සිට පහණ හා සමග කථාකරන්නාක් මෙන්" පින්වත් පහණැ"යි කියා ප්‍රතිවචනයක් නො ලබන සේක්, තුන්වැනිවර දක්වා "පින්වත් පහණැ"යි කීසේක.

එකල්හි පහණතෙම "කවරහෙයකින් ප්‍රතිවචනයක් නොදෙන්නේද?"යි කියා තැවත ඕහට කියන්නාවූ වානරතෙම "කිමෙක්ද? පින්වත් පහණ අද මට ප්‍රතිවචන නොදෙන්නේදැ?"යි කීසේක.

එකල්හි කුම්භීලතෙම සිතනුයේ "ඒකාන්තයෙන් සෙසු දිනවල්හි මේ පහණ වානරෙන්ද්‍රයාහට ප්‍රතිවචන දෙන්නේය. මෝහට දැන් ප්‍රතිවචන දෙන්නෙමි, සිතා "කිමෙක්ද? පින්වත් වානරෙන්ද්‍රය"යි කීයේය.

එවිට බොධිසත්ත්වයෝ තෝ කවරෙහිදැ?"යි විවාළසේක. "මම කුම්භීලයෙකිමි" කීයේය. "කුමක් පිණිස මෙතැන්හි නොන්තෙහිදැ?"යි විවාළසේක.

එවිට කිඹුල්තෙම "නුඹවහන්සේගේ හෘදයමාංශය පතාය"යි කීයේය. බොධිසත්ත්වයන් වහන්සේ සිතාසේක් "මට යායුතු මහක් නැත්තේය. අද මා විසින් මේ කුම්භීලයා වඤ්චාකවියුතුය"යි සිතා ඉක්බිත්තෙන් ඕහට මෙසේ කීසේක "යහලු කුම්භීලය, මම ආත්මභාවය තොපට පරිත්‍යාග කරන්නෙමි තෝ මුඛය හයා මා තාගේ සමීපයට ආකල්හි ගණුව"යි කීසේක.

කිඹුලුන්ගේ වනාහි මුඛය විවෘතවූ කල්හි ඇස් දෙක පියෙන්නේය. නෙතෙම ඒ කාරණය නොසලකා මුඛය විවෘත කෙළේය. ඉක්බිත්තෙන් ඔහුගේ ඇස්දෙක පිහිතවූයේය. නෙතෙම මුඛය විවෘත කොට ඇස්දෙක නිමීලනය කොට හොත්තේය.

බොධිසත්ත්වයන් වහන්සේ එලෙසවූ බව දැන දිවයිනෙන් අහසට පැන නැඟී ගොස් කිඹුලාගේ මස්තකය ආක්‍රාන්ත කොට එතනින් පැනනැඟී විජ්ජුල්ලතාවක් මෙන් බබලමින් එතර සිටිසේක. කිඹුලා ඒ ආශ්චර්‍යය දැක "මේ වානරෙන්ද්‍රයා විසින් ඉතා ආශ්චර්‍යයෙක් කරණලදැ"යි සිතා "පින්වත් වානරෙන්ද්‍රය, මේ ලෝකයෙහි චතුර්විධ කාරණයකින් සමන්විතවූ පුද්ගලතෙම පඤ්ඤවන්ත් මැඩපවත් වන්නේය, ඒ සියළු කාරණාවෝ ම තොපගේ අභ්‍යන්තරයෙහි ඇතැයි සිතමි" කියා මෙසේ කීයේය.

කෙසේද යත්? වානරෙන්ද්‍රය, වාක්සත්‍යයද පරිඤ්ඤාඥතයද අනුත්ථධෙර්‍යයද නිස්සංගත්‍යාගයද යන මේ සතර ගුණයෝ නුඹවහන්සේට මෙන් යමක්හට ඇද්ද? ඒ තෙම පඤ්ඤවන්තේය, මෙසේ කුම්භීලතෙම බොධිසත්ත්වයන් වහන්සේට ප්‍රශංසා කොට තමා වසන තැනට ගියේය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ වදාරණසේක් "මහණෙනි, දෙවදත්ත සථවිරතෙම මට වධ පිණිස උත්සාහකෙළේ දැන්මතු නොවෙයි, පෙරත් උත්සාහ කෙළේමය"යි මේ දම්දෙසුන් ගෙණහැර දක්වා පූර්‍වාපරසන්ධි ගළපා මේ වානරින්ද ජාතකය නිමවා වදාළසේක,

"එසමයෙහි කිඹුලා තම් දැන් දෙවදත්තසථවිරයෝය, ඔහුගේ භාර්‍යාවවූ කිඹුල්ඩෙනුව නම් චිඤ්චිමාණවිකාවෝය, වානරෙන්ද්‍රව උපන්තෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම් ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 58 තයොධම්ම ජාතකය

මේ වදු එක් සමයෙක්හි රාගාදිසඞ්ගරහිතවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක්, දෙවදත්ත සථවිරයන් වහන්සේගේ වධයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ කල්හි දෙවදත්තසථවිරයෝ වානරයෝනියෙහි ඉපිද හිමාලය වනප්‍රදේශයෙහි වානරසමූහයා පරිහරණය කරන්නාහු තමන් නිසා උපන්නාවූ වානර පොතකයන් ''මොහු වැඩී ගිය කල වානරසමූහයා පරිහරණය කෙරෙති'' යන හඟින් දතින් බෑ ඔවුන්ගේ බිජෝත්පාටනය කරන්නාහුය.

එසමයෙහි බොධිසත්ත්වයෝත් එම වානරයා නිසා එක් වැඳිරියෙක කුස පිළිසිඳ ගත්තාහුය. එකල වැඳිරිතොමෝ දරුගැබ පිහිටි තියාව දැන තමාගේ දරුගැබ රකිමින් අනික් පළුත ප්‍රාන්තයකට ගියාය. ඕතොමෝ ගැබ මුහුකුරා ගිය කල්හි බොධිසත්ත්වයන් වැදූහ.

බොධිසත්ත්වයෝ වැඩී විඤ්ඤුබවට පැමිණ ශක්තිසම්පන්නවූය, ඒ බොධිසත්ත්වයෝ එක්දවසක් මැනියන් අතින් ''මාගේ පියාතන් වහන්සේ මැනියෙනි කොයිදැ?''යි විමසූහ. ''පුත, අසවල් පළුතප්‍රාන්තයෙහි වදුරුමුල රකිමින් වෙසෙති'' කිව. ''මැනියෙනි, ඒ වානර රජ්ජුරුවන් සමීපයට මා ගෙණයව''යි කිවූය. ''පුත, තොප විසින් පියාතන් සමීපයට යන්ට තොපිළිවන, තොපගේ පියානෝ තමන් නිසා උපන්නාවූ වානරපෝතකයන්ගේ ''වදුරුමුල පරහරණය කෙරෙත් යන හඟින් දතින් බෑ බිජෝත්පාටනය කෙරෙති''යි කිවූය' ''මැනියෙනි, මා එතනට ගෙණයව මම ඊට කටයුතු දන්නෙමි වේදැ'යි කී කල්හි ඒ වැඳිරි තොමෝ පුත්‍රයා වඩාගෙණ ඒ වානරයා සමීපයට ගියාය. එකල වානරයා තමාගේ පුත්‍රයා දැකලාම ''මේතෙම වැඩිගියේ වී නම් වදුරුමුල පරිහරණය කළ නොදෙති, එසේනොයින් දැන්ම මොහු දුරුකොට පියයුතු''යි ඔහු වැළඳගන්නාක් මෙන් තරකොට මැඬ ජීවිතක්ෂයට පමුණුවම්''යි ''පුත, මෙසේ එව, මෙතෙක්කල් කොයිනියාදැ?''යි බොධිසත්ත්වයන් වැළදගන්නාක් මෙන් අල්වා ගෙණ තරකොට මැඬලුයේය. බොධිසත්ත්වයෝ වූකලී ඇත් බල හා සමානවූ බල ඇත්තෝය. එසේහෙයින් බොධිසත්ත්වයෝත් පිය වදුරු අල්වා තරකොට මැඬලුය. ඔහුගේ ඇඟ ඇට බිඳියන්නාක් මෙන් විය. ඉක්බිත්තෙන් ඒ වානරයාට මෙසේ සිතිවිල්ලෙක්විය. ''මේතෙම වැඩිනියේ වී නම් මා මරන්නේය, කවර උපායකින් පළමු කොට මොහුමරාපියම්දෝ''යි සිතීය තවද මෙසේ සිතීය. ''මීට නුදුරුතෙක රාජාධිගාහිතවූ විලෙක් ඇත. ඒ විල රාජඝසයා ලවා මොහු කවම්''යි සිතා ඉක්බිත්තෙන් ඔනව කියන්නේ ''මම මහළු වයසට යෙමි මේ වදුරුමුල තොපට පාවා දෙමි. අදම තොප රජකෙරෙමි, අසවල් තැන විලෙක් ඇත, ඒ විල ඇඹුල වත දෙකකුත් උපුලවත තුනකුත් නෙළුම්වත පස කුත් පිපෙන්නේය. එයින් මල් ගෙණෙව යි කීය.

මහබෝසතානෝ ''යහපත, පියාතන්වහන්ස, ගෙණෙමි' කියා ගොස් වනා විලට නොබැස භාත්පසින් පියවරසවක් පරීක්ෂාකරන්නෝ ඔට පියවරම

දුටුය. විලින් ගොඩතැගී පියවර නුදුටුය. බොධිසත්ත්වයෝ "මේ විල රාක්ෂසාධිෂ්ඨිත වියයුතුය, මාගේ පියානන්වහන්සේ මා මරණු කැමැතිව තමන්වහන්සේ මරාගත නොහී රාක්ෂයා ලවා මරවනු කැමති සේවනැ"යි සිතා "මම මේ විලට බොබස්මී මළුත් කඩා ගණිමි"යි පැන් තැති තෙතට ගොස් වේග දක්වා උඩ පැන එපිට යන තැනැත්තෝ පැන් තැති ආකාශයෙහිම සිටියාවූ මල් දෙකක් කඩා ගෙණ එපිට වැටී ගියෝය. නැවත එතරින් මෙතර පැන එන තැනැත්තෝ ඒ උපායෙන්ම මල්දෙකක් කඩාගත්තුය, මෙසේ විල්දෙතෙර රැස්කරන්නාවූ බොධිසත්ත්වයෝ මළුත් කඩාගත්තුය, රාක්ෂසයාගේ ආඥාව පවත්නා තැනටත් නොඑවුය. ඉක්බිත්තෙන් "මෙතෙකින් වඩා ඔසොවා ගත නොහැක්කේය"යි සිතා ඒ කැඩූ මල් එක්තෙනෙක රැස්කරමින් සිටිකලට ඒ රාක්ෂසයා සිතන්නේ "මා විසින් මෙතෙක් කල් මුළුල්ලෙහි මෙබඳුවූ නුවණැති ආශ්චර්‍යවත් පුරුෂයෙක් දුටුවිරුනැත, මලුත් තමා කැමති පමණක් කඩාගෙණ මාගේ ආඥාව පවත්නා තෙතටත් නොබවුයේය"යි දියදෙබැ කොට දියෙන් ගොඩතැගී බොධිසත්ත්වයන් සමීපයට ගොස් කියන්නේ වාතරෙන්ද්‍රය, මේ ලෝකයෙහි සම්ප්‍රාප්තවූ භය දුරුකිරීම දන්නාවූ ප්‍රඥාසම්ප්‍රයුක්තවූ උත්තමවූ වීර්‍යය නිර්ඝීත බවය උපාය ප්‍රඥය, යන මේ ධර්‍මයෝ තුන්දෙන යමක්හට ඇත්තාහු වී නම් ඒ සත්ත්ව තෙමේ පසම්තුරන් මැඩපවත්වන්නේය. ඒ ධර්‍මයෝ තුන්දෙනම තොපගේ අභ්‍යන්තරයෙහි විද්‍යමානයෝය ය සිතමි"යි මෙසේ උදකරාක්ෂසයා බොධිසත්ත්වයන්ට ස්තුති කොට "මේ මල් කුමක් පිණිස ගෙණයවුදැ"යි විවාළේය. මපියා තන්වහන්සේ මා රජකරණු කැමැතිසේක. ඒ කාරණයෙන් ගෙණ යෙමි' කී කල්හි රාක්ෂසයා "මෙබඳු උත්තම පුරුෂයක්හු විසින් මල් ඔසොවාගෙණ යන්ට නොපිළිවන, මම ගෙණයෙමි." තෙමේ මේ මල්මිටිය ඔසොවාගෙණ බොධිසත්ත්වයන් පසුපස්සෙහි ගියේය.

ඉක්බිත්තෙන් බොධිසත්වයන්ගේ පිය වඳුරා එන්නාවූ බොධිසත්ත්වයන් දුරදීම දැක "මම මොහු රකුසුවන් කන්නේය"යි යැවීම්, ඒ තෙමේ දැන් රාක්ෂසයා ලවා මල් ගෙන්වාගෙණ එන්නේය, දැන්වූකලි නවුයෙමි වේදැ'යි සිතමින් සත්කඩක් කොට ලය පලාගෙණ එතැන්හිම ජීවිතක්ෂයට පැමිණියේය. එකල්හි අවශෙෂ වානරයෝ එක්ව බොධිසත්ත්වයන් රජකළාහුය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්‍මදෙශනාව ගෙණහැර දක්වා වඳුරා පූර්‍වාපරසන්ධි ගළපා මේ තයොධර්‍ම ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි යූථපති නම් දැන් දෙවදත්තස්ථවිරය; එසමයෙහි යූථපති පුත්‍ර වූයෙමි ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මවේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 59 හෙරිවාද ජාතකය

ත්‍රිවද එක් සමයෙක්හි සතරාමර ලෝකගුරුවූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසතසේක්, එක්තරා දුර්‍විනීත භික්ෂුවක්හු අරහයා මේ ජාතකය වදාළසේක. සර්‍වඥයන් වහන්සේ ඒ මහණහට වනාහී වදාරණසේක් මහණ තෝ අකීකරුවූයේ සැබෑදැ"යි විචාරා

වදාළකල්හි "භාග්‍යවතුන් වහන්ස, සැබැවැ"යි දැන්වූකල්හි "මහණ තෝ අකිකරුවූයේ දැන් මතු නොවෙයි, පෙරත් අකිකරුවූයෙහියැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යිටහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතාණන් වහන්සේ හෙරිවාදක කුලයෙක්හි ඉපද වැඩිවිය පැමිණ එක් ගමෙක්හි වාසයකරණසේක.

ඒ අප බෝසතාණන් වහන්සේ බරණැස්නුවර නකත්තකෙළියට බෙර ලැවූ ශබ්දය අසා "කාත්‍යමණ්ඩලයෙහි හෙරිවාද්‍යය කොට වස්තුව ගෙණ එන්නෙම්' සිතා පුත්‍රයාද කැඳවාගෙණ කාත්‍යමණ්ඩපයට ගොස් හෙරිවාදකොට බොහෝ වස්තුව ලැබ ඒ වස්තුව ඇරගෙණ තමාගේ ගමට එනසේක්, අතරමග සොරුන් විසින් අධිගෘහීතවූ ආරණ්‍යයකට පැමිණ නිරන්තරයෙන් හෙරිවාද්‍යය කරන්නාවූ පුත්‍රයා වැළැක්වූසේක් "පින්වත්වූ පුත්‍රය, නිරන්තයෙන් හෙරිවාද්‍යය නොකොට මඟට පිළිපන්නාහු විසින් ප්‍රධානීන්ට වයන්නාවූ හෙරිශබ්දය මෙන් අතරතුරෙහි වයව"යි කීසේක. පියානන් විසින් වළක්වන්නාවූ ඒ පුත්‍රතෙම "හෙරිශබ්දයෙන්ම සොරුන්ලුහුබදවමි"යි සිතා අතුරු නැතිවම බෙර වැයුයේය.

සොරහු පළමුවෙන්ම හෙරිශබ්දය අසා "ඊශ්වර හෙරිශබ්දයකැ"යි දිව ගොස් අතිශයින් ඒකාබඩව ශබ්දය අසා "මේ ඊශ්වර හෙරිශබ්දයෙක් නොවන්නේය"යි සිතා අවුත් පරීක්ෂාකොට දෙදෙනාම දැක තළා වස්තුව පැහැර ගත්නාහුය, අප මහබෝසතාණන් වහන්සේ "ඒකාන්තයෙන් දුකසේ ලබනලද වස්තුව ඒකාබඩකොට හෙරිවාද්‍යය කරන්නාවූ පුත්‍රයා විසින් නසනලද්දේය"යි පුත්‍රයාට මෙසේ කීසේක, "හෙරිවාද්‍යය කරන්නේය, හෙරිවාද්‍යය ප්‍රමාණය ඉක්මවා නොම කරන්නේය,නිරතුරු වාද්‍යය නොකරන්නේය, ප්‍රමාණාතික්‍රමණය කොට නිරතුරුවම හෙරිවාද්‍යය කිරීම වනාහි පවිටු වන්නේය, හේ කුමක් හෙයින්ද? යත් හෙරිප්‍රහරණය කරන්නාහු විසින් කාමෝපණ සියයක් ලබන ලද්දේය, ඒ ලබනලද දෙය නිරන්තරයෙන් නොකිකරුව වාද්‍යය කරන්නාහු විසින් නසනලද්දේය යි කීසේක. ශාස්තෘවූ බුදුරාජයන් වහන්සේ මේ ජාතක ධර්ම දෙශනාව ගෙණහැර දක්වා වදාරා පූර්ව්‍යාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

"එසමයෙහි පුත්‍රතෙම අකිකරු මහණවූයේය, පියානෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

---

## 60
## සංඛධම්ම ජාතකය

මේවද එක්සමයෙක්හි තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසනසේක් දුර්ව භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

යිටහිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරණ කල්හි අපමහබෝසතාණන්වහන්සේ සක්පිඹිකා කුලයෙක්හි ඉපිද වැඩිවියසට පැමිණ වසත කල්හි බරණැස්නුවර නැකත්කෙළියට බෙරලැවූහ.

එකල්හි බෝසතාණෝ මපියාතන් කැඳවා ගෙණ "සක්පිඹිමෙන් වස්තුව ලබමි" සිතා නොස් සක්පිඹිමෙන් වස්තුව ලැබ ගමට එතකල්හි සොරුන් වසන අරණ්‍යයකට පැමිණ සක්බිඹිතාවූ පියාතන් වැළකුසේක. ඒ පියතෙම "සක් හඬින් සොරුන් ලුහුබදවයි"යි කියා අතුරු නැතුවම සක්පිම්බේය. ඒ සොරහු පෙර කියතලද ක්‍රමයෙන්ම අවුත් වස්තුව පැහැර ගත්තාහුය. බොධිසත්ත්වයන් වහන්සේත් පූර්වයෙහි කියතලද ක්‍රමයෙන් මෙසේ කීසේක. "සක්පිඹිනේය, නොම සක් නොපිඹිනේය, අධික කොට ප්‍රමාණය ඉක්මවා නොපිඹිනේය, ප්‍රමාණය ඉක්මවා අධික කොට පිඹීම වනාහි ඉතා ලාමක වන්නේය කුමක් හෙයින්ද? යත් සක් පිඹීමෙන් ලබතලද වස්තුව නැවත නැවත සක් පිඹිනාවූ අපගේ පියාතන් විසින් නසනලද්දේය"යි කීසේක.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මෙසේ මේ දම්දෙසුම් ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි පියාතෝ තම් දැන් අකිකරු මහණ වූයේය, පුත්‍රව උපන් තෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 61
## අසාතමන්ත්‍ර ජාතකය

මේවද එක් සමයෙක්හි සම්බුද්ධ ශාසනයෙහි අප්‍රතිහතවූ ඥානාචාර ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිරම්වෙහෙර වසතසේක්, උකටලීවූ භික්ෂූවක්හු අරභයා මේ ජාතකය වදාළ සේක. මෙහි වර්තමාන කථාව උම්මදන්තී ජාතකයෙහි මතු පහළ වන්නේය. සම්බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූන්ට "මහණ, මේ ලෝකයෙහි සත්ත්‍වයෝ තම් දුකඛයට වැටෙනුයේ, අසත්පුරුෂයෝය, ලාමකයෝය, අන්තිමයෝය, නෝ එබඳු ලාමක ස්ත්‍රියක නිසා කවර කාරණයකින් උකටලී වූයෙහි දැ?"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

පසුගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණෝ ගන්ධාර රට තක්සලා නුවර බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද නුවණැති බවට පැමිණ වේදත්‍රයෙහිත් සියලු ශිල්පයෙහිත් නිමාවට පැමිණ දිසාපාමොක් ආචාරී වූහ.

එසමයෙහි බරණැස්නුවර බ්‍රාහ්මණ කුලයක පුත්‍රයකු උපන්දවස්ම ගිනිගෙණ නොනිවා තිබුහ. ඉක්බිත්තෙන් ඒ බ්‍රාහ්මණ කුමාරයා සොළොස් ඇවිරිදි වයසට පැමිණි කල්හි දෙමව්පියෝ මෙසේ කිවුහ, "පුත, අපි තොප උපන් දවස්ම ගිනිගෙණ තිබුම්හ, ඉදින් තෙපි බ්‍රාහ්මලෝකයෙහි උපදනා කැමැත්තාහු වී නම් ගිනිගෙණ වලට වැද ගිනිදෙවියාට නමස්කාර කෙරෙමින් බ්‍රහ්මලෝකපරායන වව, ඉදින් ගිහිව වසනු කැමැත්තාහු වී නම් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් අචාරීන් සමීපයෙහි ශිල්ප ඉගෙණ කුටුම්බසණ්ඨා පතය කරව"යි කිවුහ. මාණවකයා කියන්නේ "මම වල ගිනි පරිහරණය

කරන්ට අසමර්ථයෙමි, කුටුම්බඅණ්ඩාපනය කෙරෙමි''යි කියා දෙමව්පියන් වැඳ ''ආචාර්යයී කොටස්සය'යි කියතලද මස්සෙන් දහසක් ගෙණ තක්සලානුවරට ගොස් ශිල්ප ඉගෙණ පෙරලා ආයේය. ඔහුගේ දෙමව්පියෝ ගිහිගෙයි විසීමට නොකැමැත්තාහුය, වනයේ හිඳ ගිණිදෙවියාට පූජාකරණු කැමැත්තාහුය. එසේනෙයින් එකල මාණවකයාගේ මව්තොමෝ ස්ත්‍රීන්ගේ දෙෂ දක්වා වලව යවනු කැමැත්තී ''දිසාපාමොක් ආචාරීන්වහන්සේ නුවණැතිසේක, ව්‍යක්ත සේක, මගේ පුතනුවන්ට ස්ත්‍රීන්ගේ දෙෂ කියන්නට සමර්ථසේකැ''යි සිතා ''පුත, තොප විසින් ශිල්ප උගන්නා ලදදු''යි කිවුය. ''එසේය, මැනියන්වහන්සැ''යි කිකල්හි ''තොප විසින් අසාතමන්ත්‍රයෝත් උගන්නාලද්දාහුදැ''යි කිවුය. ''නැත, මැනියන්වහන්සැ''යි කී කල්හි ඉදින් තොප විසින් අසාතමන්ත්‍ර නොඋගන්නා ලද්දේ වී නම් තොප විසින් කවර නම් ශිල්පයෙක් උගන්නා ලද්දේද? යව, අසාතමන්ත්‍රයත් ඉගෙණ එව''යි කිවුය.

ඒ මාණවකයා මැනියන් කී බස් ''යහපතැ''යි පිළිගෙණ නැවත තක්සලානුවරව අභිමුඛව ගියේය. ඒ ආචාරීන්ගේත් මැනියෝ ඉතා වෘධ යෝය, අවුරුදු එක්සියවිස්සක් වයස් ඇත්තාහුය. ඒ දිසාපාමොක් ආචාරීහු තමන්ගේ මැනියන් සියඅතින් නහවා කවා පොවා පෝෂ්‍යය කෙරෙති, අවශෙෂ මනුෂ්‍යයෝ බොධිසත්ත්වයන් මෙසේ කරන්නා දැක පිළිකුල් වන්නාහුය.

එකල මහබෝසතානෝ මෙසේ සිතුය ''මම වලට වැද ඒ වනයෙහිදී මැනියන්වහන්සේ පෝෂ්‍යය කෙරෙමින් විසුයේ වී නම් යහපතැ''යි සිතුය. ඉක්බිත්තෙන් මහබෝසතානෝ මෙසේ සිතා එක් විවෙකවූ වනයෙක්හි පැන් පාසු තැනක පන්සලක් කොට ගිතෙල් ම උක්සකුරු උඳු මුන් සාල් ආදීවූ දෙය ගෙන්වා ගෙණ මැනියන් උසුළුවා ගෙණ ඒ වනයට ගොස් මැණියන් පෝෂ්‍යය කෙරෙමින් වාසයකළෝය.

ඒ අසාතමන්ත්‍රය උගන්නා කැමති මාණවකයාත් තක්සලානුවරව ගොස් ආචාරීන් තොදක්නේ ''ආචාරීන්වහන්සේ කොයිදැ''යි විචාරා එපවත් අසා වනයට ගොස් නමස්කාර කොට සිටියේය. එකල ඔහුට ආචාරීහු කියන්නෝ ''කිමෙක්ද? දරුව, ඉතා වහා අවුනැ''යි කිවුය.

එබස් ඇසූ මාණවකයා කියන්නේ ''නුඹවහන්සේ මා අසාතමන්ත්‍රය නොඉගැන්වූසේක් නොවේදැ''යි කීය. මහබෝසතානෝ ''තොපට අසාත මන්ත්‍රය උගන්නට කීවෝ කවුරුදැ'යි විචාළෝය. ''ආචාරීන්වහන්ස, මගේ මැනියන්වහන්සේ කීසේකැ''යි කීය. එකල බොධිසත්ත්වයෝ සිතන්නෝ ''මේ ලෝකයෙහි අසාතමන්ත්‍ර නම් දෙයෙක් නැත, මේ මාණවකයාගේ මැනියෝ මෝහට ස්ත්‍රීන්ගේ දෙෂ දක්වනු කැමැත්තෝවතැ''යි සිතුය.

ඉක්බිති ඔහුට මහබෝසතානෝ කියන්නෝ දරුව, යහපත, තොපට අසාතමන්ත්‍රය දෙමි, අද පටන් කොට මාගේ නහතුරෙහි සිට මාගේ මැනියන් වහන්සේ සියඅතින් නහවා කවා පොවා පෝෂ්‍යය කරව, අත පය හිස පිරි මැඹීම් පිවමැඹීම් ආදිය කරන්නාවූ තෙපි ''ආර්යියන්වහන්ස, නුඹවහන්සේ ජරාවට පැමිණි කල්හිත් නුඹවහන්සේගේ මෙබඳු යහපත්වූ ශරීරය වන් නේය, ලදරු අවස්ථාවෙහි වී නම් කෙබඳුවේදැ''යි කියව, අතපය මිඩතා අවස්ථා වෙහිත් හස්තපාදාදීන්ගේ ගුණ කියව, තොපට මාගේ මැනියන්වහන්සේ

යමක් කියේ වී නම් එකී දෙය තෙපි ලජ්ජා නොව මට කියව, එසේ කළා නම් අසාතමන්ත්‍රය ලබව, නොකළා නම් නොලබත්නවාදැ''යි කිවුය. ඒ මාණවකයා ''යහපත, ආචාරීන්වහන්සැ''යි කියා මහබෝසතානන්ගේ වචනය පිළිගෙණ එතැන්පටන් කියතලද්දුවූ සියලු කාරිය කෙළේය.

ඉක්බිත්තෙන් ඒ බොධිසත්ත්වයන්ගේ මැනියන්වි ඒ මාණවකයා නැවත නැවත ශරීර වර්ණනා කරත් කරත් ''මේ තෙම මා හා සමග අභිරමණය කරණු කැමැත්තේවනැ''යි සිතා අඹවූ ජරාවෙන් ජීර්ණවූ බොධිසත්ත්ව මාතාවන්ගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයෝ උපන්හ. ඒ බොධිසත්ත්ව මාතාවෝ එක්දවසක් තමන්ගේ ශරීර වර්ණනාව කරණ කල්හි ඒ මාණවකයාට කියන්නෝ ''මා හා සමග අභිරමණය කරණු කැමැත්තෙහිදැ''යි කිවුය. ''ආර්‍යීන්වහන්ස, මම වූකලී කැමැත්තෙම් ආචාරීන්වහන්සේ ගුරුසේක් වී දැ''යි කීය.

''ඉදින් තෝ මා කැමැත්තෙහි වී නම් මාගේ පුතනුවන් මරාපියව''යි කිවුය. මෙසේ කී කල්හි මාණවකයා කියන්නේ ''මම ආචාරීන්වහන්සේ සමීපයෙහි මෙතෙක් ශිල්ප ඉගෙණ ක්ලෙශමාත්‍රයක් නිසා කුමකැ යි කියා ආචාරීන්වහන්සේ මරම්දැ''යි කීය. ''එසේ වී නම් ඉදින් තෙපි මා නොහරු නම් මම්ම ඒ දරුවන් මරම්''යි කිවුය.

මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් අසත්පුරුෂයෝය, දුඃඛයට වස්තුභූය, ලාමකයෝය, පශ්චිමයෝය, එබඳුවූ වයසෙහි සිට පවා රාගසිත් උපදවා ක්ලෙශ වසඟ වන්නී මෙසේ උපකාරී වූ පුත්‍රයා මරණකැමති වුව. එසේහෙයින් ස්ත්‍රීහු නම් අසත්පුරුෂයෝමය.

ඉක්බිත්තෙන් මාණකවකයා ඒ සියළු කථා බොධිසත්ත්වයන්ට කියේය. එබස් ඇසූ මහබෝසතානෝ ''මාණකවය, ඒ සියළු ප්‍රවෘත්තිය මට කියන්නාවූ තා විසින් කළදැ ඉතා යහපත්වන්නේය''යි කියා මැනියන්ගේ ආයු සංස්කාරය බලන තැනැත්තෝ ''අදම මියෙති''යි දැන ''මාණවකය, මෙසේ උන්වහන්සේගේ අභිප්‍රාය පරික්ෂාකරම්හ''යි එක් දිඹුල්දණ්ඩක්ගෙන්වා ගෙණ සැස මහබෝසතානෝ තමන්ගේ ප්‍රමාණයෙන් කාෂ්වරුපයක් කොට ඉස හා සමග පොරව තමන් වැදහොත් තැන උන්තැනි කොට නොවා රැනක් බැඳ අතවැස්සාට කියන්නාහු ''දරුව, පොරොවක් ගෙණ ගොස් මාගේ මැනියන් වහන්සේව මා මෙතන වැදහොත් නියාව හඟවාලව''යි කිවුය. එබස් ඇසූ මාණවකයා ගොස් ''ආර්‍යීයන්වහන්ස, ආචාරීන්වහන්සේ පන්සලෑ තමන් වහන්සේ වැදහෝනා තැන වැදහොත්සේක, මා විසින් වැදහොත් තැන දැනගන්නා සඳහා රැනක් බැඳ තදනලද, මේ පොරව ඇරගෙණ රැනසහින් ගොස් ඉදින් පිළිවන් වී නම් පුතනුවන්වහන්සේ මරාපුවා මැනවැ''යි කීය. එබස් ඇසූ බොධිසත්ත්ව මාතාවෝ ''මා නොහරණවාදැ''යි කිවුය. කවර කාරණයකින් මම නුඹවහන්සේ හැරපියම්දැ''යි කීය.

එකල බොධිසත්ත්ව මාතාවෝ පොරව ඇරගෙණ වෙවුල වෙවුලා නැගී සිට රැන සංඥාවෙන් ගොස් අතින්අල්වා බලා ''මේතෙම මාගේ පුතනුවෝය''යි යන සංඥාවෙන් කාෂ්ටරුපයෙහි මුහුණින් වස්ත්‍රය ඉවත් කොට පොරොව ඇරගෙණ ''එකපහරින්ම මරම්''යිතා බොටුවෙහිම පොරොව හෙලා ''වැකැ''යි යන අනුකරණ ශබ්දය උපන් කල්හි ''දඹුරුවකැ''යි දත්තුය.

ඉක්බිත්තෙන් මහබෝසතාණන් විසින් ඉවත සිට "මැනියන්වහන්ස, කුමක් කරණසේක්ද"යි කී කල්හි "වඤ්චාකරණ ලද්දෙම් වෙමි"යි සිතා එතැන්හිම මිය වැටී ගියේය. තමන්ගේ පන්සල වැදහොත් තමුත් ඒ වේලාවට උන් විසින් මළයුතුමය. එසේහෙයින් මහබෝසතාණෝ මැනියන් මළ නියාව දැන ආදාහන කොට සොහොනෙහි ගිනි නිවා වනපස මලින් පූජා කොට මාණවකයා කැඳවා ගෙණ පන්සල් දොර හිඳ කියන්නෝ "දරුව, වෙන අසාතමන්ත්‍ර නම් දෙයෙක් නැත. ස්ත්‍රිහු නම් අසත්පුරුෂයෝය, අසාධයෝය, තොපගේ මැනියෝ "අසාතමන්ත්‍රය ඉගෙණගෙණ එව"යි මා සමීපයට එවන නැනැත්තෝ ස්ත්‍රීන්ගේ දෙෂ දැනගන්නා පිණිස එවූය. දැන් වූකලී තොප විසින් ප්‍රත්‍යක්ෂයෙන්ම මාගේ මැනියන්වහන්සේගේම දෙෂ දක්නා වේද? මේ කාරණයෙන් ස්ත්‍රිහු නම් සැප දුරු කොට දුක් එලවන හෙයින් අසාතයෝය, දුඃඛ වස්තුහුය, අසත්පුරුෂයෝය, ලාමකයෝය, අන්තිමයෝ යි දැනගණු'යි ඒ මාණවකයාට අවවාද කොට යැවූය. ඒ මාණවකයනි ආචාරීන් වැඳ දෙමව්පියන් සමීපයට ගියේය. එකල්හි මැනියෝ කියන්නෝ "පුත, තෙපි අසාතමන්ත්‍රය ඉගෙණ ගතුදැ?"යි ඔහු අතින් විචාළෝය. "එසේය, මැනියන්වහන්සැ"යි කී කල්හි "දැන් කුමක් කරවුදැ?යි මහණව ගිහිදෙවියාට පූජාකරවූද? නොහොත් ගිහිගෙයි වසවූදැ"යි කිවුය. එබස් ඇසූ මාණවකයා කියන්නේ "මැනියන්වහන්ස මා විසින් ප්‍රත්‍යක්ෂකොට ස්ත්‍රීන්ගේ දෙෂ දක්නාලද, එසේහෙයින් මට ගිහිගෙයින් ප්‍රයෝජන නැත, මම තාපස ප්‍රව්‍රජ්‍යා වෙන් පැවිදිවෙමි"යි තමන්ගේ අභිප්‍රාය ප්‍රකාශ කෙරෙමින් මෙසේ කිවුය. "මේ ලෝකයෙහි ස්ත්‍රිහු නම් දුඃඛයට වස්තු හෙයින් අසාත නම් වෙති, අසත් පුරුෂ නම් වෙති, ඔවුන් ක්ලෙශ වසඟවීමට හිමෙක් නම් මරියාදුවෙක් නම් නැත්තේය. යම්සේ වත්නිය තමා කෙරෙහි ලූ යම් යම් කාෂ්වයෙක් ඇත්නම් ඒ මුළුල්ලෙම දවා හස්මකරත් මුත් මෙතෙක් සැහෙයි යන තෘප්තිවාරණයෙක් නැත්තේද? එපරිද්දෙන්ම ස්ත්‍රිහු නම් කෙතෙක් දවස් කෙලෙස් වසඟවූ නමුත් මෙතෙක් සැහෙයි යන තෘප්තියක් ඔවුන්ට නැත්තේය. එසේහෙයින් ගර්හිතවූ කෙලෙස් වසඟවන්නාවූ ස්ත්‍රීන් හැර කායවිවේක චිත්තවිවේක වර්ණිතය කෙරෙමින් මහණවෙමි, පැවිදිව කිසුණු පිරියම් කොට බ්‍රහ්මලෝක පරායණ වෙමි"යි කීය.

තවද මෙසේ කීයා "තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කිසුණුපිරියම් කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා, ගණයාකෙරෙන් කාය හා, කෙලෙසුන් කෙරෙන් චිත්තවිවේක කොට, මේ ද්විවිධ විවේකය වඩවමින් බ්‍රහ්මලෝකෝත් පත්තිය කෙරෙමි, මට ගිහිගෙන් ප්‍රයෝජන නැතැ"යි මෙසේ ස්ත්‍රීන්ට නින්දා කොට දෙමව්පියන් වැඳ පැවිදිව කියනලද ප්‍රකාර ඇති විවේකය වඩමින් බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ "මහණෙනි, ස්ත්‍රිහු නම් දුකට වස්තුහුය. අසත්පුරුෂයෝය, ලාමකයෝය, දුක්දෙන්නාහුය"යි මෙසේ සත්‍රීන්ගේ 'නුගුණ කියා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර ඒ ශාසනයෙහි උකටලීව ඇලුම් නැතිවූ භික්ෂූන්වහන්සේ සෝවාන් පෙලෙහි පිහිටිසේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ පූර්වාපරසන්ධි ගළපා මේ අසාතමන්ත්‍ර ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මැනියෝ නම් දැන් භද්‍රකාපිලානීය, පියාතෝ නම් මහා කාශ්‍යප සථවිරයෝය. අන්තෙවාසික නම් දැන් ආනන්දසථවිරයෝය, එසමයෙහි දිසාපාමොක් ආචාරී වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 62
## අඞ්ඛත ජාතකය

තිවද එක් සමයෙක්හි සම්‍යක්සම්බුද්ධත්වයට පැමිණි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසතසේක් උකටලීවූ භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක. සම්බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂුහට "සැබෑද? මහණ, තෝ උකටලීවූයෙහිදැ"යි වදාර "සැබෑව සවාමීනි!" කී කල්හි "මහණ ස්ත්‍රීහු නම් රැක්ක නොහැක්කාහුය. පෙර නුවණැත්තෝ ස්ත්‍රියක ගර්භයෙහි පවත් රක්නාහු රැකගත නුහුනුවෝම වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණකල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ වැඩිවිය පැමිණ සියලු ශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණ පියරජ්ජුරුවන්ගේ ඇවැමෙන් රාජ්‍යයෙහි පිහිටා දැහැමෙන් රාජ්‍යය කරන්නාහුය. ඒ බොධිසත්ත්වයෝ පුරෝහිත බ්‍රාහ්මණයා හා සමග වූකෙළනාහුය. කෙළෙමින් හිඳ.

"සබ්බානදී වංකගතා-සබ්බෙ කටඨමයා වනා,
සබ්බිත්ථියො කරෙ පාපං-ලහමානා නිවාතඝෙ."

යන මේ දූත ගීතිකාව කියමින් රිදීපෝරුවෙහි රන්පසඇට දමන්නාහුය. මේසේ කෙළෙනාවූ ඒ රජ්ජුරුවෝ නිරන්තරයෙන් දිනති. පුරෝහිතයා පරදන්නේය. ඒ පුරෝහිත බ්‍රාහ්මණයා ක්‍රමයෙන් තමාගේ ගෙයි සම්පත් නිමන්ට පටන්ගත් කල්හි මෙසේ සිතුයේය. මෙසේ නිරතුරුව පැරදීම ඇති කල්හි මාගේ මේ ගෙයි සියලු ධනය ක්ෂය වන්නේය, පුරුෂාන්තරයව නොගියාවූ එක් ස්ත්‍රියක සොයා ගෙයි වාසයකරන්නෙමි"යි සිතිය. තවද ඔහට මෙසේවූ සිතිවිල්ලෙක් විය. අන් පුරුෂයකු දුටුවාවූ ස්ත්‍රියෙක රක්නට නොපිළිවන, ගර්භයෙහි පවත් එක් ස්ත්‍රියක රැක ඇ වැඩිවිය පැමිණිකල්හි මගේ වසඟයෙහි තබා එක් පුරුෂයෙක්හටම නියත කොට තරකොට රැකවල් ලවා රජ්ජුරුවන්වහන්සේගෙන් වස්තු ගෙණගියෙමි වී නම් යහපතැ"යි සිතිය. ඒ බ්‍රාහ්මණතෙමේත් අගපසඟ ලකුණු දන්මෙහි සමර්ථය. ඉක්බිත්තෙන් ඒ තෙමේ දුක්පත්වූ ස්ත්‍රියක ගර්භිණී නියා ව දුක දුවක වදන්නීය සිදූන ඇ කැඳවා සම්පයට ගෙන්වා ගෙණ වැටුප් වියදත් දී ගෙහිම වස්වා වැදූ කල්හි ඇව වස්තු දී යවා ඒ කුමාරිකාව අන්පුරුෂයකු දුක්කනොදී සත්‍රීන් අතවම දී පෝෂ්‍යය කරවා වැඩිවිය පැමිණිකල්හි ඒ කුමාරිකාව තමා වසඟයෙහි තුබූයේය.

ରାବଣର ପରାଜୟ

යම්පමණ කලෙකින් ඒ කුමාරිකාව වැඩේ තම් ඒ තෑක් කල් මුලුල් ලෙහි රජ්ජුරුවන් හා සමග දූ නොකෙළියේය ඒ ස්ත්‍රිය තමා වසඟයෙහි තබා පසුව "මහරජ්ජුරුවන්වහන්ස, දූකෙළුමිහ"යි කියේය. රජ්ජුරුමෝ "යහපතැ"යි කියා පළමු පරිද්දෙන්ම දූ කෙළියාහුය.

පුරෝහිත බ්‍රාහ්මණයා රජ්ජුරුවන් ගායනා කොට පසඇට දමන කල්හි "මාගේ ස්ත්‍රිය ඇර ගායනා කළමැනව"යි කීය. එතැන්පටන් පුරෝහිත බ්‍රහ්මණයා දිනන්නේය, රජ්ජුරුවෝ පරදිති. බෝධිසත්ත්වයෝ "මොහුගේ ගෙයි පතිවූතා ධර්මය රක්ෂාකරන්නාවූ එක් ස්ත්‍රියක් වියයුතුයි"යි පරීක්ෂාකරණ තැනැත්තෝ ඇති නියාව දැන "ඇගේ පතිවූතාධර්ම සංඛ්‍යාතවූ සීලය බිඳුවම්"යි සිතා එස් ධූතීයෙක් කැඳවා ගෙන්වා ගෙණ "පුරෝහිතයන්ගේ ස්ත්‍රියගේ පතිවූතාධර්මය බිඳපියන්ට පිළිවන්දැ"යි කිවුය. "පිළිවන සාමීනි," කියකල්හි ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ ඕහට වස්තු දී "එසේ වී නම් වහා ඒ කාර්‍ය්‍ය නිෂ්ඨාකරව"යි කියා ඒ ධූතීයා යැවුය. ඒ ධූතීතෙමේ රජ්ජුරුවන් සමීපයෙන් වස්තු ඇරගෙණ සුවඳ සුණු කපුරු තකුල් ආදීවූ සුවඳ බඩු ගෙණ ඒ පුරෝහිත බ්‍රාහ්මණයාගේ ගෙට නුදුරු තැන සියළු සුවඳබඩුයෙන් සල්පිලක් සැදුයේය. පුරෝහිත බ්‍රාහ්මණයාගේත් හෙය සත්මාලක් සත් දෙරටුවක් ඇත්තේය. හැමදෙරටුවලම සත්‍රීන්ගෙන් රැකවල් වන්නේය. පුරෝහිත බ්‍රාහ්මණයා හැර අන් පුරුෂයෙක් ගෙට වදනට අසමර්ථ වන්නේය. කසල දමන්නාවූ පෙට්ටියත් බලා පරීක්ෂා කොටම ඇතුල් ගෙට ගන්නාහුය. ඒ මාණවිකාව පුරෝහිතයාම දක්නේය, අන්පුරුෂයෙක් නොදක්නේය. එකල ඒ ස්ත්‍රියගේ එක් පරිවාරිකා ස්ත්‍රියක් සුවඳ මල් ආදියට මිළ ඇරගෙණ යන්නී එම ධූතීයාගේ සල්පිල සමීපයෙන් යන්නීය.

එකල ඒ ධූතීයා "මෝතොමෝ පතිවූතා ධර්මය රක්ෂා කරන්නාවූ ස්ත්‍රියගේ පරිවාරිකා ස්ත්‍රියෙකැ"යි නියමයෙන් දැන එක් දවසක් ඒ පරිවාරිකා ස්ත්‍රිය එන්නවුන් දැකලා ම සල්පිලින් නැගී සිට ගොස් ඇ පාමුල වැටී හී දැතින් දෙපය තර කොට අල්වාගෙණ "මැනියෙනි, මෙතක්දු මුළුල්ලෙහි කොයි හියෝදැ"යි කියා ඇඬුයේය. එකල අවශෙෂවූ ඕහට සහායවූ ධූතීයෝත් එක් පසෙක සිට "අතපය මුව සවහනිනුත් ගමනාගමන ආදීවූ ආකල්පයෙනුත් මැනියන් හා පුතනුවෝ එකසැටියෝමය"යි කීවාහුය. ඒ ස්ත්‍රී ඒ ඒ බොහෝ දෙනා මෙසේ කියන්ට වන් කල්හි තොමෝත් අඬන්ට පටන්ගත. ඔහු දෙදෙනම අඬා වැලප ඔවුනොවුන් වැළඳ සිටියාහුය.

ඉක්බිත්තෙන් ඒ ධූතීතෙම "මැනියෙනි, දැන් තෙපි කොයි යවු දැ?"යි කීයේය. පරිවාරිකා ස්ත්‍රී කියන්නී, 'කිත්නරාඩඹකාවකගේ විලස බඳුවූ විලස් ඇති රූපයෙන් අග්‍රප්‍රාප්තවූ පුරෝහිත බ්‍රාහ්මණයානන්ගේ ලදරු ස්ත්‍රියට උපස්ථාන කෙරෙමින් වෙසෙමි"යි කිවුය. "දැන් මැනියෙනි, කොයි යවුදැ?"යි ධූතීයා විවාළේය. "ඒ කුමාරිකාවන්ට සුවඳ මල් ආදිය ගන්නා පිණිස යෙමි"යි කී කල්හි "මැනියෙනි, අනික් තැනකට යාමෙන් ප්‍රයෝජන කිම්ද? මෙතැන් සිට මා සමීපයෙන්ම සුවඳ මල් ගෙණයව"යි කියා මිළ නොගෙණ බොහෝ බුලත් තකුල් කපුරු ආදිය හා නොයෙක් සුවඳ මල් ආදිය දුන්නේය. ඒ සුවඳ මල් ආදිය ඇරගෙණ පරිවාරිකා ස්ත්‍රිය ගෙට ආ කල්හි මාණවිකාතොමෝ

බොහෝ සුවඳ මල් ආදිය දැක කිමෙක්ද? ''මැනියෙනි, අද අපගේ බමුණානෝ අපගෙකරෙහි ප්‍රසන්නාවූදැ?''යි කිව. ''කවර කාරණයකින් මෙසේ කියනසේක් ද?''යි පරිවාරිකා ස්ත්‍රිය කී කල්හි ''මේ සුවඳ මල් ආදිය බොහෝ නියා දැක ය''යි කිවුය. එකල පරිවාරිකා ස්ත්‍රී කියන්නී ''පුරෝහිතයාහන්වහන්සේ සුවඳ මල් ආදියට බොහෝ මිළ නුදුන්සේක. මා විසින් වනාහි මේ සුවඳ මල් ආදිය මාගේ පුතනුවන් සමීපයෙන් ගෙණෙන ලදැ''යි කිව.

මෙසේ කියා එතැන් පටන් බමුණානන් දුන් මිළ නොමෝ ඇරගෙණ ඒ ධූතීයාගෙන්ම සුවඳමල් ආදිය ගෙණෙන්නීය, ඒ ධූතීයා කීප දවසක් ගියකල ගිලන් ආකාරයක් දක්වා වැදහොත්තේය. ඒ පරිවාරිකා ස්ත්‍රී නොමෝ ඔහුගේ සල්පිලට ගොස් ඒ ධූතීයා නොදැක ''මාගේ පුතනුවෝ කොයිදැ''යි විචාළීය. ගෙයි මනුෂ්‍යයෝ කියන්නෝ ''නොපගේ පුතනුවන් ඇඟට අඵාසුවෙක් බලවතැ''යි කිවුය. එබස් ඇසූ පරිවාරිකා ස්ත්‍රී ඔහු වැදහොත් තෙනට තෙනට හිඳ පිට පිරිමදින්නී ''පුත තොපට අඵාසු කවරේදැ?''යි විචාළීය. ගොස් මූවෙන් නොබැණ වැදහොත්තේය. ''පුත බැණ නොනැගෙන්ට කාරණා කිම දැ?''යි විචාළ කල්හි ''මැනියෙනි, මියෙතත් තොපට කියන්ට නොපිළිවතැ''යි කීය. ''මට නොකියා පුත කවුරුන්ට කියවිදැ?''යි කී කල්හි මැනියෙනි, මට අනික් අඵාසුවෙක් නැත, ඒ තරුණ මාණවිකාවගේ වණීසෞන්දර්‍ය්‍ය අසා පිළිබඳ සිත් ඇති වීම්. ඒ මාණවිකාව ලද්දෙම් වීම්නම් ජීවිතය තිබෙයි. නොලද්දෙම් වීම් නම් මෙතැන්හිම මියන්නෙම් වේදැ''යි කීහ. පරිවාරිකා ස්ත්‍රී කියන්නී ''පුත මට ඒ භාරය, තෙපි ඒ මාණවිකාව නිසා සිතිවිලි නොකරව''යි කියා ඔහු අස් වසා බොහෝ සුවඳ ආදිය ගෙණ මාණවිකාව සමීපයට ගොස් කියන්නී ''මැනියෙනි, මාගේ පුත්‍ර මාගෙන් තොපගේ ගුණ අසා පිළිබඳවූ සිත් ඇතිවිය. කුමක් කටයුතුදැ''යි කිව. ඉදින් කැඳවා ගෙණ එන්ට සමර්ථයෝ වී නම් අප ගෙන් අමුතු කවරේදැ''යි කිව. පරිවාරිකා ස්ත්‍රී මාණවිකාවගේ බස් අසා එතැන් පටන් ඒ ගෙයි කොන් කොන්වලින් බොහෝ කසල එක්කොට මල් ගෙණෙන පෙට්ටියේ ලාගෙණ යන්නී පෙර්ටිය පරීක්ෂාකරණ වේලෙහි රූකවල් සිටි ස්ත්‍රියගේ ඉසට දමන්නීය. ඒ රූකවල් සිටි ස්ත්‍රී ඇඟට කසල දැමීමෙන් පිළිකුල්ව ඉවත්වන්නීය. ඒ පරිවාරිකා ස්ත්‍රීතොමෝ මෙම ක්‍රමයෙන් යමක් යමක් කිසි වක් කියා නම් ඒ ඒ ස්ත්‍රිය ඉසමත්තාව කසල දමන්නීය. එතැන් පටන් පරිවාරිකා ස්ත්‍රිය යමක් ඇතුලෙන් ගෙණෙතත් පිටතින් ඇතුළට ගෙණෙතත් කිසි ස්ත්‍රියක් ඒ ගෙණෙන දෙය පරීක්ෂාකරන්ට උත්සාහ නොකරන්නීය.

එකල්හි ඒ ස්ත්‍රීධූතීයා මල් ගෙණෙන පැස ඇතුලේ ලාගෙණ මාණවිකා සමීපයට ගෙණ ගියාය. ධූතීයා මාණවිකාවගේ ශීල භෙදය කොට එක් දවසක් ප්‍රාසාදයෙහි විසූයේය. පුරෝහිත බ්‍රාහ්මණයා ගෙන් බැහැර ගිය කල් දෙදෙ තම අභිරමණය කෙරෙති. ඔහු ආ කල්හි ධූතීයා සැඟවෙන්නේය.

ඉක්බිත්තෙන් ඒ මාණවිකාතොමෝ එක් දෙදෙවසක් ගිය කල්හි ''පුරුෂය තොප දැන් යන්ට වටනේය''යි කිව. එබස් ඇසූ ධූතීයා කියන්නේ ''මම බමුණානන්ට පහරක් හසා යනු කැමැත්තෙමි'' කීය. මාණවිකා තොමෝ ''එසේ වී නම් වන්නාටය''යි ධූතීයා සඟවා හිදුවා බමුණා ගෙට ආ කල්හි මෙසේ කිව; ''සවාමිනි, මම නුඹවහන්සේ වීණාගායනා කරණ කල්හි නවතු කැමැත්තෙමි'' කිව, 'යහපත සොඳුර, නවව''යි කියා බමුණා වීණාගායනා කරන්ට

පවත් ගත්තේය. එකල මාණවිකා කියන්නී ''නුඹවහන්සේ බලා හින්දදී තටන්නට ලජ්ජා ඇත්තෙමි. එසේහෙයින් නුඹවහන්සේගේ මූණ කඩකින් වසා බැඳ නටමි'' කිව, එබස් ඇසූ බමුණා ඉදින් තෙපි ලජ්ජාවවු නම් එසේ කරව''යි කියය. එකෙණෙහි මාණවිකා ඝනවූවස්ත්‍රයක් ගෙණ ඒ බමුණාගේ ඇස්දෙක වසා මුහුණ බැන්දීය, මුනුණු කඩින් මුහුණ බඳවාගෙණ වීණා ගායනා කරන්ට පවත් ගත, ඒ මාණවිකාතොමෝ මද ඇසිල්ලක් නටාපියා කියන්නී ''ස්වාමිනි, මම නුඹවහන්සේගේ හිසට එක්විටක් ඇතපියන්නා කැමැත්තෙමි'' කිව, සත්‍රිය කෙරෙහි ලොල්වූ බමුණා කිසි කාරණයක් නොදැන ''පැහැර පිය''යි කියය. එකෙණෙහි මාණවිකා ධූතීයාට ඉඟි කළාය. ධූතීතතමේ සෙමෙන් සෙමෙන් අවුත් බමුණාගේ පිටිපස්සෙහි සිට ඉස වැලමිටින් ඇන්නේය, එකෙණෙහි ඇස් පිට පලායන්නාක් මෙන් විය. හිස ගැටක් පැහනැංගේය, ඒ බමුණා වේදනාවෙන් පීඩිතව ''තිගේ අත මෙසේ ගෙණෙව''යි කීය. මාණවිකා තමාගේ අත ඔසවා බමුණාගේ අත් මත්තෙහි තිබුය, බමුණා කියන්නේ තිගේ අත මොලොක පහර වූකලී ඉතා තදය''යි කීය, ධූතීයා බමුණාට ඇතපියා සැඟවුනේය, මාන විකා ඔහු සැඟවී ගිය කල්හි බමුණා මූහුණින් වස්ත්‍රය මුදා හෙලා තෙල් ගෙණ වුත් හිස ගැට නැගුතෙන ගා මැඬ සන්නපිණය කළාය, බමුණා ගෙන් බැහැර ගිය කල්හි නැවතා ඒ පරිවාරිකා ස්ත්‍රී ධූතීයා පැස ලාගෙන පිටත් කළාය.

ඉක්බිත්තෙන් ඒ ධූතීයා රජ්ජුරුවන් සමීපයට ගොස් ඒ සියලු පවත් කියේය. රජ්ජුරුවෝ තමන්ට සේවයට ආවාවූ පුරෝහිත බ්‍රාහ්මණයා දැක ''බමුණාතෙනි, දූ කෙළිමෝදැ?'' කිවුය. ''යහපත, රජ්ජුරුවන් වහන්ස''යි කිකල්හි රජ්ජුරුවෝ දූතශාලාව සරහා පළමු පරිද්දෙන්ම දූත ගිහිකාවන් කියා පසඇට දැමුය, බමුණා මාණවිකාවගේ තපස් බිඳීගිය බව නොදැන මාගේ මාණ විකාව හැර ගායනා කළමැනවැ''යි කීය. මෙසේ කියන්නාවුන් බමුණා පැරැද්දේය.

එකල්හි රජ්ජුරුවෝ ධූතීයාගෙන් තමා මාණවිකාව පවත් අසා දත් හෙයින් කියන්නෝ ''බමුණ, මාණවිකාව තබන්නට කුමට කියයිද? තාගේ මාණවිකාවගේ තපස් බිඳීගියේය. නෝ මාගම ගහීයෙහි පවත් රැකගත්තැනක රැකවල් ලා රැකගතහෙමි''යි සිතුයෙහිය. ස්ත්‍රීන් තම ඔඩ ඇතුළේ ලාගෙණ ඇවිද්දත් රක්නට නොපිළිවන, මේ ලෝකයෙහි එකපුරුෂයකුම පතා පතිව්‍රතා ධර්මය රක්ෂාකරන්නාවූ ස්ත්‍රියක් නැත, තාගේ මාණවිකාව තටනු කැමැත්තෙමි කියා වීණා ගායනා කරන්නාවූ තාගේ මූහුණ වස්ත්‍රයකින් වසා බැඳ තමාගේ වෙඟර පුරුෂයා ලවා තාගේ හිස වැලමිටින් අන්නවා යවුය, දැන් තෝ දූකෙළි මින් හිඳ ''මාගේ ස්ත්‍රිය තබා දූතගිහිකාව ගායනා කළ මැනවැ''යි කුමක් පිණිස කියන්නෙහි දැ?''යි මෙසේ මහබෝසතානෝ බමුණාට ධර්මදේශනා කළෝය.

එකල්හි බමුණා බොධිසත්ත්වයන්ගේ ධර්මදේශනාව අසා ගෙට ගොස් ඒ මාණවිකාවට කියන්නේ ති විසින් මෙබදු පාපකර්මයක් කරණලදදැ''? කීය. ''ස්වාමිනි, ඒ කීවෝ කවුරුද? නොකෙළෙමි' මම මා අතින් ඇන්නෙමි' අනික් නුඹවහන්සේගේ හිසට ඇනි කෙනෙක් නැත, ඉදින් නුඹවහන්සේ මා කීවා නොඅදහනසේක් වී නම් මම නුඹවහන්සේ ඇර අන් පුරුෂයකුගේ මා අතැ ඇල්ලීම් පමණකුත් නොදනිමි''යි සත්‍යක්‍රියා කොට ගිනිවැද නුඹවහන්සේ අදහවමි''යි කිව.

බමුණා එබස් අසා ''එසේ වී නම් වත්නාවය''යි මහත්වූ දරගොඩක් කරවා ගිනි දල්වා ඒ ස්ත්‍රිය කැඳවා කියන්නේ ''ඉදින් තමා අදහනු කැමැත්තේ වී නම් මේ ගින්නට පැනපියව''යි කීය. මාණවිකාව තමාගේ පරිචාරිකාස්ත්‍රියට උගන්වන්නී ''මැනියෙනි, තොපගේ පුතනුවන් එතනට ගොස් මා ගිනිවදනා වේලෙහි අත අල්වාගන්ට කියව''යි පළමුකොටම උගන්වා තුබූය. ඒ පරිචාරිකා ස්ත්‍රී ගොස් ධුතීයාට එපවත් එපරිද්දෙන්ම කීව. එබස් ඇසූ ධුතීයා අවුත් පෙරත් මධ්‍යයෙහි සිටියේය. ඒ මාණවිකා බමුණා වඤ්චා කරණු කැමැතිව මහජනයා මධ්‍යයෙහි සිට කියන්නී ''බමුණාතෙනි, තොප හැර අන් පුරුෂයකුගේ මා අත ඇල්ලීම් පමණකුත් නොදනිමි''යි මේ සත්‍යක්‍රියාවෙන් මේ ගිනි මා නොදව''යි කීයා ගිනි වදින්ට ගත. එකෙණෙහි ධුතීයා කියන්නේ ''පින්වත්නි පුරෝහිත බ්‍රාහ්මණයානන්ගේ කටයුතු දැන් බලව, මෙබඳුවූ ස්ත්‍රියක් ගිනිවැද මරවති'' කියා ගොස් මාණවිකාව අත අල්වා ගත්තේය. ඔතොමෝ ධුතීයාගේ අත අරවා පියා පුරෝහිතයාට කියන්නී ''සඟමීනි, මා සත්‍යක්‍රියාව බිඳී ගියේය. එසේහෙයින් මා ගිනි වදින්ට නිර්භීතව නො පිළිවතැ''යි කීව. ''කවර කාරණයකින්ද''යි බමුණා කී කල්හි ''අද මා විසින් අන් පුරුෂයකු මා අත ඇල්ලීම් පමණකුත් නො දනිමියි මෙසේ සත්‍යක්‍රියා කරණලද, දැන් වූකලී මේ පුරුෂයා අවුත් මාගේ අත අල්වාගත, එසේහෙයින් මා ගිනිවදින්ට නොපිළිවතැ''යි කීව. එබස් ඇසූ බමුණා මෑ විසින් මා වඤ්චා කරණ ලද්දෙමි''යි දැන ගෙන් තෙරපුයේය.

එසේහෙයින් මේ ලෝකයෙහි ස්ත්‍රීහු නම් මෙසේවූ අධර්මයෙන් සමන්විත යෝය' කොපමණවූ පාපයක් කොවත් තමන්ගේ පුරුෂයන්ට වඤ්චා කරණු කැමතිව'' ''මම මෙබන්දක් නොකෙළෙමි'' කියා දවස මුලුල්ලෙහිත් සපථ කෙරෙත් නම් නොයෙක් වඤ්චා ප්‍රයෝගයෙන්ම සපථ කොට ගිවිස්වන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මෙසේ ස්ත්‍රීහු නම් රැකලිය නොහැකි සත්ත්ව කෙනෙකැ''යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍යසත්‍යය ප්‍රකාශකොට වදාළසේක. චතුස්සත්‍යය ධර්මදේශනාවගේ කෙළවර උකටලීවූ භික්ෂූන් වහන්සේ සෝවාන්පෙළෙහි පිහිටිසේක. සමිඳුයන් වහන්සේ පුර්‍ව පරසන්ධි ගළපා මේ අතීතාහරණ ජාතකය නිමවා වදාළසේක. ''එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ තම තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 63
## තක්ක ජාතකය

එවද එක් සමයෙක්හි කරුණාවට පිහිටවූ සමිඳුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක්, ශාසනයෙහි උකටලී භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සමිඳුයන් වහන්සේ ඒ මහණහට වනාහි වදාරණසේක් ''මහණ තෝ උකටලීවූයෙහි සැබෑදැ? කිම්දැ''යි විචාරා වදාරා ''සඟමීන් වහන්ස, සැබවැ''යි දැන්වූ කල්හි ස්ත්‍රීහු නම් කළ උපකාර නොදන්නාහුය, මිත්‍රද්‍රෝහිය, කවර කාරණයකින් ඔවුන් නිසා උකටලීවූයෙහිදැ''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙතෙකුත් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් වහන්සේ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ගඞ්ගානදීතීරයෙක්හි අසපුවක් කොට ගෙණ අෂ්ටසමාපත්තීන්ද පඤ්චාභිඥාවන් ද උපදවා ධ්‍යානක්‍රීඩා සැපයෙන් යුක්තව වාසය කරණසේක.

එසමයෙහි බරණැස් සිටාණන්ගේ දූ වූ දුශ්චකුමාරිකාවක් ඇත්තීය. ඕ තොමෝ වණ්ඩය, පරුෂය, දැසිදස් කම්කරුවන්ට ආක්‍රොශ කරන්නීය, ප්‍රහාර දෙන්නීය, ඉක්බිත්තෙන් එක්දවසක් ඒ කුමාරිකාව කැඳවා ගෙණ "ගඞ්ගා වෙහි දිය කෙළිමහ"යි කියා ගියාහුය. ඔවුන් ජලක්‍රීඩා කරද්දීම සවස් වූයේය. චණ්ඩාව පවත්ගත්තේය, මනුෂ්‍යයෝ චණ්ඩාව දැක ඔබිනොබ යිසුව දිවගියාහුය. සිටු දුවගේ දැසිදනස් කම්කරුවෝ 'අද අප විසින් මේ කුමාරිකාව පිටුදකින්ට වටනේය'යි සිතා ඒ කුමාරිකාව ජලාභ්‍යන්තරයෙහිම දමා ගොඩ නැංගාහුය, චණ්ඩාව චණ්ඩිණිය කෙළේය. සූර්‍යයාද හස්තඩගත වූයේය, අන්ධකාරවූයේය, ඔවුහු ඒ කුමාරිකාවගෙන් වෙන්ව ගෙට ගොස් "කුමාරිකාව කොයිදැ"යි කී කල්හි ගඞ්ගා වෙන් පළමුව ගොඩ නැංගාය. ඉක්බිත්තෙන් ඒ කුමාරිකාව කොතැන්හි ගිය බවක් නොදනුම්හ"යි කිවාහුය. නැයෝද පරික්ෂාකොට නොදැක්කාහුය, මහත්වූ බැගැපත් ශබ්දයෙන් හඬන්නාවූ ඒ කුමාරිකාතොම ජලශ්‍රොතයෙන් ගෙණ යනු ලබන්නී මධ්‍යම රාත්‍රියෙහි බොධිසත්ත්වයන්ගේ පන්සල සමීපයව පැමිණියාය.

අප මහබෝසතාණන් වහන්සේ ඒ ස්ත්‍රියගේ ශබ්දය අසා "මාගමකගේ ශබ්දයෙක් වන්නේය, මැට පිහිටව ආරක්ෂාවක් කරන්නෙමි" සිතා තණසුලක් ගෙණ ගංතෙරට ගොස් ඒ ස්ත්‍රිය දැක "තෝ භය නොගණුව තෝ භය නොගණුව"යි කියා අස්වසා හස්තිබල දරන්නාවූ කාය ශක්තියක් ඇති මහබෝසතාණන් වහන්සේ ගඟින් පිනමින් ගොස් ඒ ස්ත්‍රිය ඔසොවා ගෙණ අසපුවට ගෙණ ගොස් ගිනි දල්වා දුන්සේක. සිත පහවූ කල්හි මිහිරිවූ ඵලාඵලයන් ඵලවූසේක. ඒ ඵලාඵල අනුභව කොට සිටියාවූ ඒ ස්ත්‍රියඅනින් "කොතැන්හි වාසයකරන්නීද? කෙසේ ගඞ්ගාවෙහි හුනුවාහුදැ?"යි විචාළසේක. ඒ සත්‍රිතොමෝ ඒ ප්‍රවෘත්තියවූ පරිද්දෙන් දැන්වූවාය, ඉක්බිත්තෙන් බොධිසත්ත්වයන් වහන්සේ ඒ ස්ත්‍රියට "මෙතැන්හිම වාසය කරව"යි කියා පන්සලෙහි වාසයකරවා දෙතුන් දවසක් බොධිසත්ත්වයන් වහන්සේ අභ්‍යවකාශයෙහි වාසය කොට "දැන් තෙපි යව"යි වදුළසේක.

ඒ ස්ත්‍රිතොම සිතන්නී 'මේ තපස්වීන් වහන්සේ ශීලභෙදයට පමුණුවා ගෙණ යන්නෙමි"යි සිතා නොයන්නීය, ඉක්බිත්තෙන් කල් යත් යත් ස්ත්‍රි ගුප්තය ස්ත්‍රිලීලාව දක්වා බොධිසත්ත්වයන් වහන්සේගේ ශීලාභෙද කරවා ධ්‍යානය අන්තර්ධාන කළාය. අප මහබෝසතාණන්වහන්සේඒස්ත්‍රිය කැඳවාගෙණ අරණ්‍යයෙහිම වාසය කළසේක. ඉක්බිත්තෙන් ඒ ස්ත්‍රිතොම අප මහබෝසතාණන් වහන්සේට කියන්නී, "සවාමීන්වහන්ස, අපව අරණ්‍යවාසයෙන් කාරිය කිම්ද? මනුෂ්‍යපථයට යම්හ"යි කිවාය.

බොධිසත්ත්වයන් වහන්සේ ඒ ස්ත්‍රිය කැඳවාගෙණ එක් පසල්ගමකට ගොස් මෝරුබැල මෙහෙයක් ලබා ජීවිකාව කොට ඒ ස්ත්‍රිය රක්ෂාකරණසේක. අප මහබෝසතාණන් වහන්සේට මෝරු විකුණා ජීවත්වන හෙයින් "තක්‍ර පණ්ඩිතයෝය"යි කියා නමක් කළාය, එසේ වාසය කරන්නාවූ අප මහ

බෝසතානන් වහන්සේට ඒ ගම්වැස්සෝ වැටුප්දී ''අපට කටයුතු නොකටයුතු කියමින් මෙහි වාසය කරව''යි කියා ''ගම් දෙරෙහි කුටියෙක වාසය කරව''යි කියා ගම් දෙරෙහි කුටියෙක වාසය කරවූවාහුය.

එසමයෙහි වෙඑරගෝ පඨිතයෙන් බැස පසල්දනව්ව පහරන්නාහුය, ඒ සොරහු එක් දවසක් ඒ ගම පැහැර ගම්වැස්සන් ලවා බඩුපොදි ඔසොවාගෙණ යන්නාහු, ඒ සිටුදුවද අල්වාගෙණ තමන් වසන තෙනට ගොස් සෙසු ජනයා හැරියාහුය' සොරදෙවු වතාහි සිටුදියනියන්ගේ රූපයෙහි ඇලී ඔවුන් තමහට භාර්‍යා කොට ගත්තේය. බොධිසත්ත්වයන් වහන්සේ ''මෙනම් ස්ත්‍රිය කොයි දැ?'' විචාළ සේක. ''සොරදෙවුවා විසින් අල්වාගෙණ ගොස් තමාට භාර්‍යා කරණලදැ''යි අසාත් ''ඒ ස්ත්‍රිතොම මාගෙන් වෙන්ව නොවසන්නීය, දිව අවුත් මා සමීපයට එන්නීය''යි සිතා ඇගේ ඊම බලමින් ගම්හි වාසයකළසේක. සිටු දූද සිතන්නී ''මෙතැන්හි සැපසේ වසන්නෙම්, කලෙක මා තක්‍රපණ්ඩිතයන් වහන්සේ කිසි දෙයක් නිසා අවුත් මෙයින් කැඳවාගෙණ වඩනාසේක. එසේ කල්හි මම මේ සැපයෙන් පිරිහෙන්නෙම්, එසේහෙයින් මම ඕහට ප්‍රිය කෙනෙකු මෙන් තක්‍ර පණ්ඩිතයන් කැඳවා ගෙන්වා නැසවූයේ වීම් තම් ඉතා යෙහෙකැ''යි සිතුවාය' ඒ ස්ත්‍රිතොම එක් මනුෂ්‍යයෙක් කැඳවා 'මම මෙතන දුකින් ජීවත්වන්නෙම්, තක්‍රපණ්ඩිතයන් වහන්සේ අවුත් මා ගෙණයනසේක්ව''යි කියා හස්නක් යවූවාය.

අප මහබෝසතානන් වහන්සේ ඒ හස්න අසා අදහා එතැන්හි ගොස් ගම්දෙර සිට අස්නක් යවූසේක. ඒ ස්ත්‍රිතොම ගෙන් නික්ම අවුත් උන් වහන්සේ දැක ''සවාමීන්වහන්ස, ඉදින් අප දෙදෙනා දැන් ගියමෝ නම් සොර දෙවුතෙම ලුහුබැඳ එලවා අපි දෙදෙනාම නසන්නේය. රාත්‍රිභාගයෙහි යම්හ''යි කියා තක්‍රපණ්ඩිතයන් වහන්සේ කැඳවාගෙණ අවුත් ආහාර අනුභව කරවා කොටුයෙහි හිඳුවා සවස් වේලෙහි සොරදෙවුවා අවුත් සුරාපානය කොට මත්වූ කල්හි ''සවාම්පුරුෂය, ඉදින් මේ වේලෙහි නොපගේ සතුරා දුටුයේ වී තම් ඕහට කවරක් කරන්නෙහිදැ?''යි කීවාය. ඒතෙම ''මෙනම්මෙනම් දෙයක් කරන්නෙම්'' කීයේය. ''කිමෙක්ද? ඒ තෙම දූරසථානයෙහි නොවේදැ?''යි කීයේය ''ඔහු කොටුයෙහි උන්නේය''යි කීවාය' ඒ වේලෙහි සොරදෙවු තෙම හුළක් ගෙණ එතැන්හි ගොස් අප මහබෝසතානන් වහන්සේ දැක අල්වාගෙණ ගේ මැද හෙළා වැලමිටි ආදියෙන් අභිප්‍රායවූ පරිද්දෙන් තැළුයේය. අප මහබෝසතා නන් වහන්සේ තැළුම් ලබනසේක්, අන් කිසිවක් නොකියා ''කොධනා අඤ්ඤතඤ්ඤු ව පිසුතාමිත්ත දුබ්භිකා''යි කියා මෙපමණක් වදාරණසේක. සොරදෙවු තෙම උන්වහන්සේව තළා පිවිතල හයා බැඳ සයනය කරවා සවස් වේලෙහි ආහාරය අනුභව කොට සයනය කොට පිබිදුනේ රාමද සුන් කල්හි නැවතත් තළන්ට පවත්ගත්තේය, බොධිසත්ත්වයන් වහන්සේ එම ''කොධනා අඤ්ඤතඤ්ඤුව''යනාදී පද සතර වදාළසේක. සොරදෙවුතෙම සිතන්නේ ''මේ පුරුෂ තෙම මෙසේ තළනුලබන්නේද? අන්කිසිවක් නොකියා මේ සතර පදයම කියන්නේය'' මොහු අතින් විවාරන්නෙම්'' සිතා ඒ ස්ත්‍රිය නිදිවත් බව දැන තක්‍ර පණ්ඩිතයන් අතින් විවාළේය පින්වත් පුරුෂය, තෙපි මෙයේ තාඩනය ලබන්නේද? කවර කාරණයකින් මේ සතර පදයම කියවුදැ?''යි විවාළේය.

ඉක්බිත්තෙන් තක්‍රපණ්ඩිතයන් වහන්සේ ''එසේවීනම් අසව''යි කියා ඒ කාරණය ආදියෙහි පටන් වදාළසේක. ''මම පෙර වතාන්තරයෙහි වාසය

කරන්නාවූ එක් තපස්වියෙක්ව ධ්‍යානලාභියෙක් වූයෙමි, හේ මම මේ සත්‍රිය ගඩොගාවෙනි ජලශ්‍රෝතසින් ගෙණයනවා දැක ගොඩතගා ප්‍රතිජග්ගතය කෙළෙමි, එසේ ප්‍රතිජග්ගතය කළාවූ මා මේ ස්ත්‍රී පොළඹා ධ්‍යානයෙන් පිරිහෙළුවාය, ඒ මම අරණ්‍යය හැර මේ ස්ත්‍රිය පොෂ්‍යය කෙරෙමින් පසල්ගමෙක වාසයකෙළෙමි ඉක්බිත්තෙන්''මේ ස්ත්‍රී සොරුන් විසින් මෙතැන්හි ගෙණ එන ලද්දී මම දුකින් වාසය කරන්නෙමි, අවුත් මා කැඳවාගෙණ යව''යි කියා මට හසුන් යවා දැන් තොපගේ අතට පැමිණවූවාය, මේ කාරණයෙන් මම මෙසේ කීවෙමි'' වදාළ සේක.

වෙණතෙම සිතනුයේ ''යම් බඳුවූ මේ ස්ත්‍රීතොම මෙබඳු ගුණයෙන් යුක්ත වූ උපකාර කළාවූන් කෙරෙහි මෙසේ විපිළිපත් බවට පැමිණියාය, මෝතොම මට කවර නම් උපද්‍රවයක් නොකරන්නීද? මෝතොමෝ හැරිය යුතුය'යි කියා සිතුයේය.

සොරදෙවුතෙම තක්‍රපණ්ඩිතයන් අස්වසා ඒ ස්ත්‍රිය ප්‍රබෝධකරවා කඩුව ගෙණ නික්ම ''මේ පුරුෂයා ගම්දොරෙහිදී ඝාතනය කරන්නෙමි'' කියා ඒ ස්ත්‍රිය හා සමග ගම්න් පිටතට ගොස්''මොහුගේ අත අල්වාගණුව''යි කියාබොධිසත්ත්වයන් වහන්සේ අල්වා ග්‍රහණය කරවා කඩුව ගෙණ තක්‍රපණ්ඩිතයන්ට ප්‍රහාර දෙන්නාක් මෙන්ම ඒ ස්ත්‍රිය දෙකඩක් කොට සිඳ දමා ශීර්ෂස්නානය කොට තක්‍රපණ්ඩිතයන් කිපදවසක් ප්‍රණීතාහාරයෙන් සන්තර්පණය කරවා ''දැන් කොතැන්හි වඩනාසේක්ද''යි කීයේය.

තක්‍රපණ්ඩිතයන් වහන්සේ ගිහිගෙන් මට ප්‍රයෝජනයක් නැත ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ අරණ්‍යයෙහිම වසන්නෙමි'' කීයේය. ''එසේ වී නම් මමත් පැවිදිවන්නෙමි'' කියා දෙදෙනම පැවිදිව අරණ්‍ය ප්‍රදේශයට ගොස් පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ජීවිතාවසානයෙහි බ්‍රහ්මලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ අතීත චතීමාන කථාවස්තු දෙක වදාරා පූර්‍වාපර සන්ධි ගළපා වදාළසේක. ''මහණ, මේ ස්ත්‍රීහු නම් ක්‍රෝධියහ, උපන් ක්‍රෝධ වළකාගන්ට නොපොහොසත්ය, කෘතඥයෝද නොවෙති, කරණලද ඉතා මහත් උපකාරයකුදු නොදනිති, ප්‍රියශූන්‍යකථා කෙරෙති, මිත්‍රයන් බිඳුවන්ට සුදුසු කථාකිරීම සවභාවය කොට ඇත්තාහ. එසේහෙයින් මෛත්‍රීභාවනා විරහිතසංඛ්‍යාත බ්‍රහ්මවයස්සීවෙහි හැසිරෙව, එසේ හැසිරෙන්නාවූ තොප ධ්‍යානසැපය, මාගී සැපය, ඵලසැපය, යන ත්‍රිවිධ සැපයෙන් නොපිරිහෙන්නාහුය''යි වදාරා ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ දම්දෙසුම් ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක.

චතුස්සත්‍යය දෙශනාවගේ අවසානයෙහි උකටලීවූ මහණතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ තක්ක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සොරදෙවුතෙම දැන් ආනන්දස්ථවිරවූසේක. තක්‍රපණ්ඩිතව උපන්නෙම් වනාහි කිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 64
## දුරාජාන ජාතකය

මේවදී එක් සමයෙක්හි තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසන සේක් උපාසකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක. සැවැත්නුවර වාසය කරන්නාවූ එක් උපාසකයෙක් වනාහි තිසරණයෙහි හා පඤ්චශීලයෙහිද පිහිටියේය, බුදුන් කෙරෙහි මමත්වය නැත්තේය, ධර්මය කෙරෙහි මමත්වය කරන්නේය, සඞ්ඝයා කෙරෙහි මමත්වය කරන්නේය, ඔහුගේ භාර්යාව වනාහි දුස්සීලය, පාප කර්මයෙහි හැසිරෙන්නීය, යම් දවසෙක මිථ්‍යාචාරයෙහි හැසුරුණාද? එදවස් සියයක් වස්තු දී ගත් දැසියක මෙන් වන්නීය, මිථ්‍යාචාරය නොකළාවූ දිනයෙහි වනාහි සැමියාවක් මෙන් වන්නීය, චණ්ඩය, පුරුෂය, ඒ උපාසකතෙම ඒ ස්ත්‍රියගේ සභාවය දැනගන්ට නොහැකි වන්නේය, ඉක්බිත්තෙන් ඒ ස්ත්‍රී විසින් පෙළනලද්දේ බුදුන්ට උපස්ථානයට නොයන්නේය, ඉක්බිත්තෙන් එක් දවසක් සුවඳමල් ආදිය ගෙණවුත් නමස්කාර කොට එකත්පස්ව උන්නාවූ උපාසකයාහට සම්බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "උපාසකය, තෙපි කවර කාරණයකින් සත් අට දවසක් බුදු උපස්ථානයට නොආයෙහිදැ"යි වදාළසේක.

"ස්වාමීන් වහන්ස, මාගේ ස්ත්‍රීතොමෝ එක් දවසක සියයක් වස්තූදී ගත් දැසියක් මෙන් වන්නීය, එක් දිනයක සැමියාවක් මෙන් වන්නීය, චණ්ඩය, පරුෂය මම ඒ ස්ත්‍රියගේ සභාවය දැනගන්ට නොහැකිවන්නෙමි; මම ඒ ස්ත්‍රිය විසින් පීඩාවට පැමිණියෙමි සම්බුදු උපස්ථානයට නොයෙමි"යි දැන්වූයේය. ඉක්බිත්තෙන් ඒ උපාසකයාගේ වචනය අසා සම්බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "උපාසකය, මාගමුන්ගේ සභාවය නම් දැනගත නොහැක්කේය"යි වදාරා "පූර්ව කාලයෙහිද නුවණැත්තෝ තොපට ස්ත්‍රීන්ගේ සභාවය ප්‍රකාශකළාහුය. තෙපි වනාහි ඒ කාරණය භවයෙන් වැසී තිබෙන හෙයින් සලකාගන්ට නොහැකි වූවාහු"යයි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යළිගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහබෝසතාණන් වහන්සේ දිසාපාමොක් ආචාරීව පන්සියයක් පමණ මාණවකයන්ට ශිල්ප උගන්වන්නාහුය. එකල අන්‍ය රාජ්‍යවාසීවූ එක් බ්‍රාහ්මණ මාණවකයෙක් අවුත් බොධිසත්ත්වයන් සමීපයෙහි ශිල්ප උගන්නේය, එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇතිව ඇ භාර්යා කොට එම බරණැස් නුවර වසන්නේ දෙතුන් වේලක් ආචාරීන්ට උපස්ථානයට නොගියේය, ඔහුගේ භාර්යාතොමෝ දුස්සීලය, පවිටුවූ සභාවය ඇත්තේය, මිථ්‍යාචාර කළාවූ දිනයෙහි දැසියක් මෙන් වන්නීය, නොකළ දිනයෙහි සැමියාවක් මෙන් වන්නීය, චණ්ඩය' පරුෂය, ඒ බ්‍රාහ්මණ මාණවකයා ඇගේ අභිප්‍රාය දැනගත නොහෙන තැනැත්තේ ඇ විසින් පීඩිතවූ විසවුල් සිත් ඇත්තේ ආචාරීන්ට උපස්ථානයට නොයන්නේය.

ඉක්බිත්තෙන් සත්අට දවසක් ඉකුත්කොට ආවාවූ මාණවකයා දැක "මාණවකයා, මෙතෙක් දවස් තොප නුදුටුයේ කුමක් නිසාදැ?"යි ආචාර්‍යතෙම විචාළේය. එඛස් ඇසූ මාණවකයා කියන්නේ "ආචාරීන්වහන්ස, මගේ භාර්යා

තොමෝ මාම කැමති වන්නීය, එක් දවසක් දුසියක් මෙන් නිහතමානී වන්නීය, එක්දවසක් සවාමිදුවක් මෙන් තදය, රූෂය, මම ඇගේ අභිප්‍රාය දැනගත නොහෙමි, ඇ විසින් පිඬිතව වියවුල් සිත් අත්තෙම් නුඹවහන්සේට උපසථානයට නොඇයෙමි'' කීය.

එකල ආචාරීහු කියන්නෝ ''මාණවකය, එසේමය ස්ත්‍රීහු නම් අනාචාර යෙහි හැසිරුණු දවස් පුරුෂයා අනුව පවතිත්, දුසියක් මෙන් නිහතමානී වෙති, අනාචාරයෙහි නොහැසුරුණු දවස් තමන් ඇතිවූ වල්ලභයා කිසිවකු කොවත් නොසිතති. මෙසේ මේ ස්ත්‍රීහු නම් පරුෂයහ, දුස්සීලයහ, ඔවුන්ගේ සවභාවය දැනගතනොහැක්කේය, උන් කැමති කල්හිත් මධ්‍යසථව විසියයුතු ය''යි කියා ඒ මාණකයාට මෙසේ අවවාද කළාහුය. ''එම්බල මාණවකය, මේ ස්ත්‍රී මා කැමතිවන්නීය, පතන්නීය, මා කෙරෙහි ස්නේහ කරන්නීය යි සතුටුනොව, මේතොමෝ මා නොකැමතිවන්නීය යි ස්නෙහ නොකරන්නී යයි කියා ශොක නොකරත්' කැමති කල්හි සතුටක්වත් නොකැමති කල්හි ශොකයක්වත් නොකොට මධ්‍යසථවම වාසයකරව, ස්ත්‍රීන්ගේ අභිප්‍රාය තම් ස්ත්‍රී මායාවෙන් සැඟවුනු හෙයින් නොදත හැක්කේය, ඊට කාරණා කවරේද යත්? යම්සේ මත්ස්‍යයා ගමනාදියෙන් සැඟවුනු බැවින් නොදතහැක්කේ වේද? එසේහෙයින්ම ඒ මත්ස්‍යයා කෙවිලන් තමා අම්මනට ආ කල්හි දියෙන් තමාගේ ගමන සඟවාලා යේද? තමා අල්වාගත නොදේද? එපරිදිදෙන් ස්ත්‍රීහු තම් මහත්වූ දුස්සීලකම් කොට ''අපි මෙබන්දක් නොකළම්හ''යි තමන් කළාවූ කාරිය ස්ත්‍රී මායාවෙන් සඟවා පුරුෂයන් වඤ්චා කෙරෙති, එසේහෙයින් මේ සත්‍රීහු නම් පාපකම්යහ, දුරාචාරයහ, එසේවූ ස්ත්‍රීන් කෙරෙහි මධ්‍යසථව වසන්නාවූ සත්ත්වතෙමේ සුවපත් වන්නේය''යි මෙසේ මහ බෝසතානෝ අනෙත වාසිකයාව අවවාද කළාහුය.

එතැන්පටන් අනෙතවාසිකයා ඒ ස්ත්‍රියද කෙරෙහි මධ්‍යසථ විය. ඔහුගේ භාර්‍යාවත් ''ආචාරීන් විසින් මාගේ දුස්සීල භාවයද දන්නා ලද්දේය''යි එතැන් පටන් අනාචාරයක් නොකළාය. ඒ උපාසකයාගේ ස්ත්‍රීත් ''බුදුරජානන්වහන්සේ විසින් මාගේ දුරාචාර බව දැනගන්නා ලද්දේය''යි එතැන් පටන් පාපකම්ය නොකළාය.

ශාසන්‍යාවූ බුදුරජානන්වහන්සේ මේ ධම්දෙශනාව ගෙණහැර දක්වා චතුරාර්‍යසත්‍යය ප්‍රකාශ කොට වදළසේක. චතුස්සත්‍යය ධම්දේශනාවගේ කෙළවර උපාසකයා සොවාන්පෙලෙහි පිහිටියේය, සම්බුදුරජන්වහන්සේ පූර්‍වාපරසන්ධි ගළපා මේ දුරාජාන ජාතකය නිමවා වදළසේක.

''එසමයෙහි ස්ත්‍රී පුරුෂයෝ දෙදෙන තම් දැන් ස්ත්‍රී පුරුෂයෝ දෙදෙනය, දිසාපාමොක් ආචාරීවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදළසේක.

## 65
## අනභිරති ජාතකය

තීවද එක් සමයෙක්හි ප්‍රතිපූද්ගලවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් එබදුවූම එක් උපාසකයක්හු අරභයා මේ ජාතකය වදළසේක.

ඒ උපාසකයා වනාහි පරීක්ෂාකරන්නේ ඒ තමාගේ ස්ත්‍රිය දුස්සීල නියාව දැන කලහකරණුදේදේ වියවුල් සිත් ඇති බැවින් සත් අට දවසක් සම්බුදුයන් වහන්සේට උපස්ථානයට නොගියේය. ඒ තෙම එක් දවසක් විහාරයට ගොස් සම්බුදුයන් වහන්සේට නමස්කාර කොට උන්නේය. "උපාසකය, සත් අට දවසක් මුළුල්ලෙහි කුමක් නිසා නොආයෙහිදැ?"යි විචාළ කල්හි "ස්වාමීනි, මාගේ භාර්‍යාතොමෝ දුස්සීලය, පාපධර්මය, එසේ හෙයින් මම ඇ හා කලහකොට වියවුල් සිත් ඇති බැවින් නො ආයෙමි"යි කීය.

එබස් අසා සම්බුදුයන්වහන්සේ ඔහට වදාරණසේක් "උපාසකය, ස්ත්‍රීන් අනාචාර කළ කල්හි ඔවුන් කෙරෙහි කෝපයක් නොකොට මධ්‍යස්ථ වියයුත්තේ ය යි පෙරත් තට නුවණැත්තෝ කීවාහුය, තෝ වූකලී භවයෙන් සැඟවුණු බැවින් ඒ කාරණය සලකාගත නුහුණුයෙහිවේදැ"යි වදාරා උපාසකයා විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් පළමු පරිද්දෙන්ම දිසාපාමොක් ආචාර්‍යවූවාහුය. ඉක්බිත්තෙන් ඒ දිසාපාමොක් ආචාර්‍යන්ගේ අන්තෙවාසිකයා භාර්‍යාවගේ දොෂයක් දැක ව්‍යාකුලවූ සිත් ඇති බැවින් කිපදවසක් නො අවුත් එක් දවසක් ආචාර්‍යන් විසින් විචාරණලද්දේ ඒ කාරණය කියේය. එකල ආචාර්‍ය ඔහට කියන්නේ "දරුව, ස්ත්‍රීහු නම් සම්භාධාරණයෝය, දුස්සීලයෝය, එසේවූ ස්ත්‍රීන් කෙරෙහි නුවණැත්තෝ කෝප නොකරන්නාහුය"යි කියා මහබෝසතාණෝ අවවාද කරන්නාහු මෙසේ කිවුය; "එම්බල මාණවකය, යම්සේ නොයෙක් තොට ඇති ගඟභාව ජලස්නානය කරණ පිණිස පැමිණියාවූ වණ්ඩාලාදීන්ටත් ක්ෂත්‍රියාදීන්ටත් සාධාරණම වේද? එහි නොනාත කෙනෙක් නැද්ද? යම්සේ මහවත යන එන්නාවූ හීනොත්කෘෂ්ටවූ සියළු සත්ත්වයන්ට සාධාරණවේද? ඒ මඟින් නොයන කෙනෙක් නැද්ද? යම්සේ සුරාපාන මණ්ඩලය සියල්ලවුන්ට සාධාරණ වේද? යමෙක් යමෙක් සුරාපාන මණ්ඩලයට වදනා කැමැත්තේ වීනම් ඒ ඒ සියළු සත්ත්වතෙමේ වදනේම වේද? එතැන්හිම මනුෂ්‍යයන්ගේ විසීම පිණිස කරණලද සභාශාලා දියත් සියලු සත්ත්වයන්ට සාධාරණම වේද? ඒ ශාලා ආදියට නොවදින්ට නිසි එකෙක් නම් නැද්ද? මහමාවත පින් පැන්සලවල් තබා කරණලද පින් පැන් මඩුවත් සියල්ලවුන්ට සාධාරණ වේද? එහි පැන් නොබොන එකෙක් නැද්ද? එපරිද්දෙන්ම දරුව මාණවක, මේ ලොකයෙහි ස්ත්‍රීහුත් සියළුම හීනෝත්කෘෂ්ට සත්ත්වයන්ට සාධාරණයෝය, එසේහෙයින් නුවණැත්තෝ මේ ස්ත්‍රීහු නම් ලාමකයෝය, අනාචාරයෝය, දුස්සීලයෝය, සම්භාධාරණයෝයයි සිතා තමන් බලවත්වූ බුද්ධිසම්පන්න බැවින් නොකිපෙන්නාහුය"යි මෙසේ මහබෝ සතාණෝ අන්තෙවාසිකයාට අවවාද කළාහුය.

අන්තෙවාසිකයා බෝධිසත්ත්වයන් කී අවවාද අසා මධ්‍යස්ථව පැවැත්තේය. ඔහුගේ භාර්‍යාවත් "ආචාර්‍යන් වහන්සේ විසින් මාගේ නුගුණ දැනපියන ලදැ"යි එතැන්පටන් පාපකර්මයක් නොකළාය. වර්තමාන කාලයෙහි උපාසක යාගේ භාර්‍යාතොමෝ "සම්බුදුයන් වහන්සේ විසින් මාගේ කාර්‍ය දැනපියන ලද්දේය"යි එතැන්පටන් පාපකර්මයක් නොකළාය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උපාසකයා සෝවාන් පෙලෙහි පිහිටියේය. සම්බුදුන්වහන්සේ පූර්වාපරසන්ධි ගළපා මේ අනාගිරනි ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ස්ත්‍රී පුරුෂ දෙදෙන දැන් ස්ත්‍රී පුරුෂ දෙදෙනමය, දිසාපා මොක් ආචාර්වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 66 මුදුලක්ඛණ ජාතකය

මේ වද එක් සමයෙක්හි ලෝකොත්තර මවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩවසතසේක් සංක්ලේශයක් අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසිවූ එක් කුලපුත්‍රයෙක් සම්බුදුන්වහන්සේගේ ධර්මදේශනාව අසා පැහැදී ශාස්තෘශාසනයෙහි මහණව සියළු ප්‍රතිපත්තියෙහි පිළිපදින්නේය. ඒ යෝගාවචරයන් වහන්සේ ඇමතිලෙහි සිතින් නොහරණලද කමටහන් ඇතිව එක්දවසක් සැවත්නුවර පිඬුසිඟා ඇවිදිනසේක් සම්භරණ යෙන් සැරහුනාවූ ස්ත්‍රියක් දැක ශුභවශයෙන් ඉන්ද්‍රියයන් බිඳ බැලුසේක. ඒ භික්ෂූන්වහන්සේගේ අභ්‍යන්තරයෙහි ක්ලේශයෝ වලිත වූහ. වැයෙන් කොටත ලද කිරි ඇති ගවයක් මෙන් විය. භික්ෂූන්වහන්සේ එතැන් පටන් ක්ලේශවසගව කායඃසඛාදයක්වත් චිත්තඃසඛාදයක්වත් නොලබනසේක්, භය පත්ව වෙවුලන්නාවූ මුවෙකු හා සමාන සේක. ශාසනයෙහි ඇළුම් නැති බැවින් දික්ව ගියාවූ කෙස් ලෝම නිය හා කිලිටුවූ සිවුරු ඇතිසේක.

ඉක්බිත්තෙන් ඒ භික්ෂූන්වහන්සේගේ ඉන්ද්‍රිය විකාරය දැක සහය භික්ෂූන්වහන්සේ කියනසේක් "ඇවැත්නි, නොපගේ චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ පෙරසේ නොවෙති, ඊට කාරණා කවරේදැ"යි විචාළසේක්, "ඇවැත්නි, ශාසනයෙහි ඇළුම් නැතිවීම්"යි කීසේක.

එබස් ඇසූ සහාය භික්ෂූන්වහන්සේ බුදුන් සමීපයට කැඳවාගෙණ ගිය සේක. සම්බුදුන්වහන්සේ "මහණෙනි, මේ භික්ෂුහු නොකැමැති පරිද්දෙන් කුමක් පිණිස කැඳවාගෙණ අවුදැ"යි විචාළසේක් "සවාමීනි, මේ මහණ ශාසනයෙහි ඇලුම් නැත්තේ ය"යි දැන්වූසේක. "සැබෑද? මහණ"යි විචාළ කල්හි "සැබෑව, සවාමීනි"යි දැන්වූසේක, "තා උකටලී කරවූවෝ කවුරුදැ?"යි විචාළ කල්හි "සවාමීනි, මම පිඬුපිණ ඇවිදිනෙම් එක් ස්ත්‍රියක් ඉදුරන් බිඳ බැලීම් එකල මට ක්ලේශයෝ වලිත වූහ, ඒ ක්ලේශයන්ගේ වලිත වීමෙන් ශාසනයෙහි ඇලුම් නැතිවීම්"ය දැන්වූසේක.

ඉක්බිත්තෙන් සම්බුදුන් වහන්සේ ඒ භික්ෂුවට වදාරණසේක් 'මහණ, තෝ ඉන්ද්‍රියයන් බිඳ විඡනාගාලම්බණය ශුභවශයෙන් ලබන්නෙහි ක්ලේශයන් විසින් කම්පා කරණලද්දෙහිය, යන යමෙක් ඇත්නම් ඒ තෙමේ ආශ්වයෝ

නොවන්නේය, පෙර පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති ලාභීව ධ්‍යාන බලයෙන් ක්ලේශයන් විෂ්කම්භණය කොට පිරිසිදුවූ නිර්මල සිත් ඇතිව ආකාශයෙන් යන්නාවූ බෝධිසත්ත්වයෝ පවා ඉන්ද්‍රියයන් විෂයාගාලම්බණ බැල්මෙන් ධ්‍යාන යෙන් පිරිහී ක්ලේශයන් කම්පිතව මනදුක් අනුභව කළාහුය''යි මහමේර උපුටා එලන්ට නිසිවූ මාරුතය ඇතකු සෘ පමණ ඇති ක්ෂුද්‍ර පර්වතයෙක්හි පැකිලියේද? සියක් යොදුන් උස ඇති මහ දඹගස මුලින් උදුරන්ට නිසිවූ මාරුතය ඉවුරු බුන් ගංතෙර හවගත් ක්ෂුද්‍ර වෘක්ෂයෙක පැකිලියේද? මහා සමුද්‍රය වියලාපියන්ට සමර්ථවූ මාරුතයකුදු වැගොන්නක දිය වියලා නොපියාද? එසේ හෙයින් මෙසේවූ බුඩි ඇති පිරිසිදු චිත්තසන්තාන ඇති බෝධිසත්ත්වයන් අඥාන කරවන්නාවූ ක්ලේශයෝ තා කෙරෙහි කුමක් පිණිස ලජ්ජා වෙද්ද? පිරිසිදු සත්ත්වයෝත් ක්ලේශයන් නිසා කිලුටුව යෙති, උත්තමවූ යසසින් යුක්තවූ සත්ත්වයෝ අයසට පැමිණෙති''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝතාණෝ කසීරට එක් මහා සම්පත් ඇති බ්‍රාහ්මණ කුලයක ඉපිද විඤ්ඤුබවට පැමිණි තැනැත්තෝ සියලු ශිල්පයෙහි පරතෙරට පැමිණ පඤ්චකාමය හැර ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කිසුණුපිරිය‍ම් කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් දවස් යවමින් හිමාලය වනප්‍රදේශයෙහි වාසයකරන්නාහුය.

ඒ බෝධිසත්ත්වයෝ එක් කලෙක ලුණු ඇඹුල් සෙවුනා සඳහා හිමාලය වනයෙන් බැස බරණැස්නුවරට පැමිණ රාජෝද්‍යානයෙහි වැස දෙවෙනි දවස් සිවුරු පිළිදැග රත්වූ වැහැරි සිවුරමයවූ අඳනය පොරෝණය දෙක මතාකොට හැඳ පොරොව අදුන්දිවිසම් ඒකාංශකොට බහා දළමඩුලු බැඳ කෙණ්ඩියක් ගෙණ බරණැස්නුවර පිඩුසිහමින් රජ්ජුරුවන්ගේ මාලිගා දොරකඩට පැමිණියෝය. රජ්ජුරුවෝ ඒ තාපස්වීන්ගේ ඊර්යාපථයෙහි පැහැද සමීපයට කැඳවා ගෙන්වාගෙණ මහානර්හවූ ඛාද්‍ය භෝජ්‍යයෙහි පිණවා කරණ ලද අනුමෝදනා ඇති බෝධිසත්ත්වයන් රාජෝද්‍යානයෙහි වසනු පිණිස ආරාධනා කළෝය.

ඒ බෝධිසත්ත්වයෝ ආරාධනය පිළිගෙණ රජගෙයිදී වළඳා රාජකුලයට අවවාද කෙරෙම්න් උද්‍යානයෙහි සොළොස් හවුරුද්දක් විසුවාහුය.

ඉක්බිත්තෙන් එක්දවසක් රජ්ජුරුවෝ සෙසාහවූ ප්‍රත්‍යන්ත ජනපදයක් සන්හිඳුවනු පිණිස යන තැනැත්තෝ මුදුලක්ඛණ නම්වූ අගමෙහෙසිකාවන්ට ''මාගේ තාපස්වීන්වහන්සේට අප්‍රමාදව උපස්ථාන කරව''යි කියා ගියෝය.

මහබෝසතාණෝ රජ්ජුරුවන් ගියතැන් පටන් තමන් කැමති විවේක රජගෙට යෙති ඉක්බිත්තෙන් එක් දවසක් මුදුලක්ඛණාවෝ බෝධිසත්ත්ව යන්ට ආහාර පිස සමාධි කොට ලා ''අද තාපස්වීන්වහන්සේ කල් යවා එන සේකැ''යි සුවඳ පැනින් නහා සියළු බිසෝපලඳනාවෙන් සැරසී මතුමහල් තලයෙහි කුරු සඟනක් පණවා බෝධිසත්ත්වයන්ගේ ඊම බල බලා වැද හොත්තාහුය.

බෝධිසත්ත්වයෝත් එතනට වලඳන්ට වේලාව සලකා ධ්‍යානයෙන් නැගී ආකාශයෙන්ම රජගෙට ගියෝය. මුදුලක්ඛණාවෝ බෝධිසත්ත්වයන්ගේ

වැහැරී සිටුරේ පවත්ගත්තා අඩ අසාම ''තපස්වීන් වහන්සේ වැඩසේක්වනැ''යි වැදහොත් තැනින් වහා නැගිසිටියාහුය. වේගයෙන් නැගිසිටියාවූ ඒ බිසවුන්ගේ මටසිළුටුවූ සළුවවැටී ගියේය. තාපසයෝ සිව්මැදුරු කවුළුවෙන් වදනා තැනැත්තෝ බිසවුන්ගේ විෂභාග රූපාලම්බනය ඉඳුරන් බිඳ ශුභවශයෙන් බැලූහ.

එකල බොධිසත්ත්වයන්ගේ අභ්‍යන්තරයෙහි ක්ලෙශයෝ වලිතවූහ. කිරි ඇති ගසකට කොටුවාක් මෙන් විය. එකෙණෙහිම බොධිසත්ත්වයන්ගේ ධ්‍යානය අනතර්හිතවිය. පියාබුන් කපුටුවකු මෙන් විය. බොධිසත්ත්වයෝ සිටම ආහාර පිළිගෙණ නොවළඳුම ක්ලෙශයන් කම්පිතව ප්‍රාසාදයෙන් බැස උශනට ගොස් පන්සලට වැද පෝරුමැස්ස යට ආහාරය තබා විෂභාගලම්බණයෙහි බැඳී කෙලෙස් ගින්නෙන් දැවෙමින් නිරාහාර බැවින් වියලෙන්නාහු සත්දවසක් මුළුල්ලෙහි පෝරුමැස්සෙහි වැදහොත්තාහුය. සත්වෙනි දවස රජ්ජුරුවෝ පසල් දනව්ව ජයගෙණ අවුත් නුවර පැදකුණුකොට මාලිගාවට නොගොස්ම ''තපස්වීන් වහන්සේ දකිම්හ''යි උශනට ගොස් පන්සලට වැද තපස්වී වැදහොත් තැන් දැක ''එක් අඵාසුවෙක් වතැ''යි පන්සල කසල හරවා පය මඬිමින් හිඳ සිටිමිනි, අඵාසුව කිමෙක්දැ?''යි විචාළේය.

එබස් ඇසූ බොධිසත්ත්වයන් වහන්සේ කියන සේක් ''මහරජ්ජුරුවෙනි, මව අනික් අඵාසුවෙක් නැත. ක්ලෙශ වසඟයෙන් පිළිබඳ සිත් ඇත්තෙමි''යි කිවුය. ''ආශ්චර්යවහන්ස, නුඹවහන්සේගේ සිත කවුරුන් කෙරෙහි පිළිබඳවී දැ''යි විචාළේය, ''මහරජ්ජුරුවෙනි, මුදුලකඛණාවන් කෙරෙහි පිළිබඳවිය''යි කිවුය. රජ්ජුරුවෝ ''යහපත සිටිමිනි''යි මම ''මුදුලකඛණාවන් නුඹවහන්සේට දෙමි''යි කියා තාපසයන් කැඳවාගෙණ මාලිගාවට වැද බිසවුන් සමීහරණයෙන් සරහා තපස්වීන්ට පාවාදුන්නාහුය. දෙමින් සිව රජ්ජුරුවෝ මුදුලකඛණාවන්ට කියන්නෝ''තොප විසින් තොපගේ බලයෙන් මේ තපස්වීන් රැකපිය යුතුය'යි කිවුය. ''යහපත සිටිමිනි, තපස්වීන් රැකපියමිහ''යි ගිවිස්සේය.

තාපසයෝ බිසවුන් ඇරගෙණ මාලිගාවෙන් බටුවාහුය, ඉක්බිත්තෙත් මුදුලකඛණාවෝ මහ වාසල්දොරින් නික්මුණු වේලෙහිම තපස්වීන්ට කියන්නෝ ''සිටිමිනි, අපට එක් ගෙයක් ලදමැනව, එසේහෙයින් නුඹවහන්සේ ගොස් රජ්ජුරුවන් වහන්සේගෙන් ගෙයක් ඉල්වාගත මැනවැ''යි කිවුය. තාපසයෝ එබස් අසා ගොස් රජ්ජුරුවන් අතින් ගෙයක් ඉල්ලූය. රජ්ජුරුවෝ මනුෂ්‍යයන් ශරීරකෘත්‍යය සපයන වැසිකිළියක් හා සමානවූ එක් ගෙයක් දෙවූය. තාපසයෝ බිසවුන් කැඳවාගෙණ ගෙට ගියෝය, බිසව ගෙට වදින්ට මැලිව සිටියාහුය. ''කවර කාරණයකින් ගෙට වදින්ට මැලිදැ''යි කීකල්හි අපවිත්‍ර බැවින්, වදිනට මැලියෙමි''යි කිවුය. ''දැන් කුමක් කෙරෙම්දැ?''යි කීකල්හි ''ඒ ගෙය කසල හැර පිරිසිදු කරව''යි කියා රජ්ජුරුවන් සමීපයට යවා ''උදල්ලක් ගෙණව, පෙට්ටියක් ගෙණව''යි ගෙන්වාගෙණ ''අපවිත්‍රය හා කසල දම්මව ගොමගැව මැනව,'' නැවතත්''යව ඇදක් ගෙණෙව,පුටුවක් ගෙණෙව, පහනක් ගෙණෙව, ඇතිරියක් ගෙණෙව, සැලක් ගෙණෙව, කලයක් ගෙණෙව''යි කියා එකි එකී විටෙක ගෙන්වා නැවත පැන් ආදිය ගෙණෙන පිණිස විධාන කළාය.

එවේලෙහි බොධිසත්ත්වයෝ කලයක් හැරගෙණ පැන් ගෙණවුත් සැල පුරා තබන පැන් සරහා තබා යහනක් අතුළේය. එකල යහනේ එක්ව ලඟින්ට

පටන්ගත් බොධිසත්ත්වයන් දැනිත් රවුළුපත්දෙක මිරිකා අල්වාගෙණ ''තොප මේ ශ්‍රමණ බවත් බ්‍රාහ්මණ බවත් නොදනුදැ?''යි කියා තමා තමන් අනිමුඛයව ගසාදැ, ඇලළුය, බෝසතාණෝ ඒ වේලෙහි සිහිලද්දුහුව මෙතෙක්කල් මුළුල් ලෙහි කාමචෙඡන්දයෙන් අඤ්ඤවූය, මෙසේ ක්ලෙශයෝ නම් අඤ්ඤයට මූලාකාර ණයෝය, මහබෝසතාණෝ සිහි ලැබගෙණ සිතන්නාහු මේ තෘෂ්ණාව මතුමත් තෙහි වඩාගෙණ යේ නම් සතර අපායෙන්ම ඉස ඔසවාලිය නොදෙන්නේය, එසේහෙයින් ''අදම මා විසින් මේ මුදුලකඛණාවන් රජ්ජුරුවන්ට පාවාදී හිමාලය වනයට වදින්ට වටනේය''යි බොධිසත්ත්වයෝ මුදුලකඛණාවන් කැඳවා ගෙණ රජ්ජුරුවන් කරා ගොස් ''මහරජ්ජුරුවෙනි තොපගේ බිසව් නොපවම සුදුස්සෝය. මට උන්ගෙන් ප්‍රයෝජන නැත, උදක් මුන් නිසා මාගේ තෘෂ්ණාව වැඩුනු පමණකැ''යි කියා බිසවුන් රජ්ජුරුවන්වම පාවාදුන්නුය. තවද ''මහ රජාතෙනි, තොපගේ මුදුලකඛණා නම් බිසවුන් නොලැබ පෙර මව මුන් ලද්දේ වීමනම් යහපතැ''යි එකම තෘෂ්ණාවක් උපත, යම්වේලෙක මා විසින් මේ දිගු පුළුල්වූ නුවන් ඇති මුදුලකඛණාවන් ලබනලද්දීද? ඒ වේලෙහි පටන්ගෙණ ගෘහ තෘෂ්ණාවය' උපකරණ තෘෂ්ණාවය, උපභොග තෘෂ්ණාවය යි මෙසේ අතෙක ප්‍රකාරවූ තෘෂ්ණාව මතුමත්තෙහිම වඩාගෙණ ගියේය, ඒ තෘෂ්ණාව මතුමත්තෙහිත් මෙසේම වැඩීගෙණ යේනම් සතර අපායෙන් මා ඉස ඔසවාලූය නොහෙන්නේය. එසේහෙයින් මට බිසවුන්ගෙන් ප්‍රයෝජන නැත. තොපගේ බිසවුන් තෙපිම පාවාගණුව යි මම්වූකලී හිමාලය වනයට වදිමි''කියා එකෙණෙහිම නටුවාවූ ධ්‍යානය උපදවාගෙණ ආකාශයෙහි හිඳ ධර්මදෙශනා කොට රජ්ජුරුවන්ට අවවාද දී ආකාශයෙන්ම හිමාලය වනයට ගොස් නැවත මනුෂ්‍ය පථයක් දිශාවට නොඇවාහුය, මතුමත්තෙහිත් මෙත්තා කරුණා මුදිතා උපෙක්ෂා යන සතර බ්‍රහ්මවිහාර භාවනා කොට නොපිරිහුණු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේමේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍යසත්‍යය ප්‍රකාශ කොට වදාළසේක. චතුස්සත්‍ය ධර්මදෙශනාවගේ කෙළවර උකටලී මහණ සෝවාන් පෙලෙහි පිහිටියේය. සච්ඡයන් වහන්සේ පූර්ව පරසන්ධි ගළපා මේ මුදුලකඛණ ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්දස්ථවිරයෝය, මුදුලකඛණාවෝ නම් උත්පලවණ්ණා මහාස්ථවිරාවෝය, එසමයෙහි තවුස්වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 67
## උච්ඡඞ්ග ජාතකය

මේවද එක්සමයෙක්හි සංසාර චක්‍ර මථනය කළාවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වඩවසතසේක් එක්තරා දනව්වැසි ස්ත්‍රියක් අරභයා මේ ජාතකය වදාළසේක.

එක්සමයෙක්හි කොසොල්රට තුන්දෙනෙක් එක්තරා වනයක් සමීපයෙහි සිසාරාහුය. එකල ඒ වනය ඇතුලේ වසන්නාවූ සොරු මනුෂ්‍යයන් අල්වා කොල්ලකාගෙණ ගියෝය. රාජපුරුෂයෝ ඒ සොරුන් සොයා නොදැක ඒ

තුන්දෙනා සීසානා තැනට අවුත් ''තෙපි වනයෙහි හිඳ කොල්ලකාපියා දුන් සීසා ඇවිදුදැ?''යි කියා ''ගම් කොල්ලකෑ සොරු නම් මොහුය''යි බැඳගෙණ අවුත් කොසොල් රජ්ජුරුවන්ට පාවාදුන්නුය.

එකල්හි එක් ස්ත්‍රියක් අවුත් ''මට වස්ත්‍රයක් දෙව''යි කියා හඬමින් නැවත නැවත මාලිගාව වට ඇවිදින්නීය, රජ්ජුරුවෝ ඒ ස්ත්‍රියගේ ශබ්දය අසා ''මැට වස්ත්‍රයක් දෙව''යි කිවුය එබස් අසා රාජපුරුෂයෝ වස්ත්‍රයක් ගෙණ ඒ ස්ත්‍රී සමීපයට ගියෝය, ඒ ස්ත්‍රී වස්ත්‍රය දැක ''මම් මේ වස්ත්‍රය නොඉල්වීම්, ඒ පුරුෂ වස්ත්‍රය ඉල්වීම්''යි කිව. මනුෂ්‍යයෝ ගොස් රජ්ජුරුවන්ට කියන්නෝ ''සවාමීනි, මේ ස්ත්‍රී වස්ත්‍රයක් වුවමැනවැ යි නොකියයි, පුරුෂ වස්ත්‍රයක් උවමැනවැ යි කියයි'' කියා රජ්ජුරුවන්ට දැන්වුය.

එකල්හි රජ්ජුරුවෝ ස්ත්‍රී සමීපයට කැඳවාගෙණ ''තෝ පුරුෂ වස්ත්‍රය වුවමැනවැ යි යාචඤ්ඤා කරන්නෙහිදැ?''යි විවාළෝය.'' එසේය: ස්වාමීනි, ස්ත්‍රියට වල්ලභයා නම් වස්ත්‍රයක් හා සමානය, පුරුෂයා නැති කල්හි දහසක් මිළ වටිනා වත් වස්ත්‍රයක් හැඳගෙණ සිටින්නාවූ ස්ත්‍රී නොමෝ නග්නවූවාහු නම් වෙයි''කිව. රජ්ජුරුවෝ ස්ත්‍රියගේ බස් අසා ප්‍රසන්නවූ සිත් ඇතිව ''මොහු තුන්දෙන නිට කවුරුවෙද්දැ''යි විවාළෝය, ස්වාමීනි, මුත් තුන්දෙනාගෙන් එක්කෙනෙක් මාගේ වල්ලභයාය, එක්කෙනෙක් මාගේ මළනුවෝය, එක්කෙනෙක් මාගේ පුතනුවෝය'' යි කීය. රජ්ජුරුවෝ එබස් අසා ''මම නිට සතුටුවීම්. සතුටුවූ මම මුත්.තුන්දෙනාගෙන් එක්කෙනෙකුත් දෙම්, කවුරුන් කැමැත්තෙහිදැ''?යි විවාළේය.

ස්ත්‍රී කියන්නී ''සවාමීනි, මම ජීවත් උන්නෙම් වීමිනම් එක් වල්ලභයකු ලැබෙම්' පුතනුකෙනෙකුත් ලැබෙම්මය, මාගේ දෙමව්පියන් මළ බැවින් මළනු කෙනෙක් දුර්ලභයෝය, එසේ හෙයින් සවාමීනි, මට මළනුවන් දුනමැනවැ''යි කිවුය. රජ්ජුරුවෝ සතුටුව තුන්දෙනාම ස්ත්‍රියට පාවාදුන්නුය, මෙසේ ස්ත්‍රිය නිසා තුන්දෙනෙක් දුකින් මිදුනාය. මේ කාරණය හික්ෂුසඞ්ඝයා කෙරෙහි ප්‍රකාශවිය.

ඉක්බිත්තෙන් එක්දවසක් හික්ෂු සඞ්ඝයා වහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්වහිද ''ඇවැත්නි, එක් ස්ත්‍රියක නිසා තුන්දෙනෙක් මිදුනෝවේදැ?''යි ඒ ස්ත්‍රියගේ ගුණ කිය කියා උන්සේක.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ දම්සභාමණ්ඩපයට අවුත් පණවන ලද බුඩාසන මස්තකයෙහි වැඩහිද ''මහණෙනි, මා එන්කාට පුථිභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා ''මෙනම් කථාවකින් යුක්තව උනුම්හ''යි කී කල්හි ''මහණෙනි, මේ ස්ත්‍රී මුත් තුන්දෙන, ගැලවූවා දැන්මතු නොවෙයි, පෙරත් ගැලවූමය''යි දක්වා වදාළසේක.

ඉක්බිතිහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම්රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි ''තුන්දෙනෙක් මහාවන සම්පයෙහි සීසානි'' යන සියල් ලම යවකියන ලද්ද හා සමාන වන්නේය.

එසමයෙහි වනාහි රජ්ජුරුවන් විසින් ''තුන්දෙනාගෙන් කවුරුන් කැමැත්තෙහිදැ?''යි විවාළකල්හි ස්ත්‍රිය කියන්නී ''සවාමීනි, තුන්දෙනාම දෙන්ට

නොපිළිවන්ද?"යි කිවූය. එසේය, තුන්දෙනම දෙන්ට නොපිළිවනැ"යි කී කල්හි "ඉදින් තුන්දෙනාම දෙන්ට නුඹවහන්සේට නොපිළිවන් වීම්නම් මාගේ මළනුවන් මට දුන මැනවැ"යි කිවූය. රජ්ජුරුවන් විසින් "පුත්‍රයාවත් වල්ලභයාවත්, හැරගණුව නිට මළුන්ගෙන් ප්‍රයෝජන කිම්ද,,යි කී කල්හි "සුමිනී, වල්ලභයන් හා පුත්තු නම් සුලභයෝය, මල්වූකලී ලැබගත නොහැක්කාහුය"යි කියන්නී මෙසේ කිවූය, "රජ්ජුරුවන් වහන්ස, යම්සේ වලට වැද ඉනවට කෑට දෙත්ම ස්ත්‍රීන්ට පුත්‍රයෝ නම් සුලභවන්නාහුය, ඉනතුබු පලා හා සමානයෝය, මහට බැස උදකලාව යන්නාවූ ස්ත්‍රියට වල්ලභයෝ නම් සුලභයෝය, දුටු කෙනෙක්ම වල්ලභවෙති. යම්හෙයකින් මට දෙමව්පියෝ නැද්ද එසේහෙයින් මම දැන් එක කුසින් ඔත් සහෝදරවූ මළනු කෙනෙකුන් යම් තෙනකින් ගෙණෙම් නම් ඒ මාතෘකුක්ෂි සංඛ්‍යාතවූ අන්‍යදෙශයක් නොදකිමි. එසේහෙයින් මා මළනුවන්ම දුනමැනවැ"යි කිවූය.

රජ්ජුරුවෝ "මේ ස්ත්‍රිය සැබවක්ම කියන්නීය"යි සතුටුවූ සිත් ඇතිව තුන්දෙනාම සිරගෙන් ගෙන්වා පාවාදුන්නුය, ඒ ස්ත්‍රී තුන්දෙනම කැදවාගෙණ තමා වසන්නාවූ සථානයටම ගියාය. ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ "මහණෙනි, මේ ස්ත්‍රිය මුන්තුන්දෙනා දුකින් ගැලවූවා දැන්මතු නොවෙයි' පෙරත් ගැලවූමය'යි මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ උච්ඡඛ ජාතකය නිමවා වදාළසේක.

අතීතයෙහි සතරදෙනම දැන් මේ සතරදෙනමය "එසමයෙහි රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 68
## සාකේත ජාතකය

මේවද එක් සමයෙක්හි උපමාවිෂයාතික්‍රාන්තවූ රූපකාය ඇති තිලෝගුරු බුදුරජාතන් වහන්සේ සාකේත නුවර නිසා අඤ්ජනවනයෙහි වසතසේක් එක් බ්‍රාහ්මණයකු අරභයා මේ ජාතකය වදාළසේක.

භාග්‍යවත්වූ බුදුරජාතන් වහන්සේ භික්ෂුසඞ්ඝයා පිරිවරා සාකේත නුවරට පිඬුසිඟා වඩනා කල්හි සාකේත නුවර වසන්නාවූ එක් මහළු බමුණෙක් නුවරින් පිටත්ව යන්නේ වාසල් අතුරෙහිදී සම්මුඛයන් වහන්සේ දැක දෙපයවැටී ගොප් මස තරයේ ගෙණ අල්වා "සුත, දරුවන් විසින් වෘඩ අවස්ථාවෙහි දෙමව්පියෝ නම් රැකයුත්තෝ නොවෙත්ද? කවර කාරණයකින් මෙතෙක්කල් මුළුල් ලෙහි මට නොදක්වූද? මමවූකලී තොප දිටිමි, තොපගේ මැනියන් දක්නා පිණිස එව"යි කියා සම්මුඛයන් වහන්සේ කැදවාගෙණ තමන්වහන්සේගේ ගෙට ගියේය.

සම්මුඛයන් වහන්සේ ඔහුගේ ගෙට ගොස් භික්ෂුසඞ්ඝයා වහන්සේ හා සමඟ පණවනලද ආසනවශ්තකයෙහි වැඩහුන්සේක. බැමිණිත් අවුත් සම්මුඛයන් වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි වැටී "ප්‍රභූ, මෙතෙක්කල් මුලුල්ලෙහි කොයි ගියාද? දෙමව්පියෝ වෘඩ අවස්ථාවෙහි උපස්ථාන කටයුත්තෝ නොවෙත්ද"යි

කියා ඇඹුය. දූදරුවනුත් කැඳවාගෙණ අවුත් ''තොපගේ බැනන්වහන්සේ වඳුව''යි කියා වැඳවූය. ඔහු දෙදෙනා සතුටු සිත් ඇතිව බුදුන් ප්‍රධාන කොට ඇති භික්ෂුසඞ්ඝයා වහන්සේට මහදන් දුන්නාහුය.

සම්බුදුයන් වහන්සේ වළඳා ඉක්බිති ඔවුන් දෙදෙනාටම ජරාධම්මසූත්‍රය වදාළසේක. සූත්‍රදේශනාවගේ කෙළවර දෙදෙනම අනාගාම්ඵලයෙහි පිහිටියාහුය. සම්බුදුයන් වහන්සේ ශ්‍රුතස්තෙන් නැගී අඤ්ඤත වනයට වැඩියේය. භික්ෂූන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි වැඩහිඳ 'ඇවැත්නි' මේ බ්‍රහ්මණයා සම්බුදුයන් වහන්සේගේ පියාණෝ සුඩොදන රජ්ජුරුවෝය, මැනියෝ මහමායාදේවී ය''යි දන්නේය. එසේ දැන දැනත් බැමිණිය හා සමග 'සම්බුදුයන් වහන්සේ මාගේ පුතනුවෝය'යි කියයි, සම්බුදුයන් වහන්සේත් බමුණා කියනදෙය ඉවසා සේක. මීට කාරණා කවරේදැ?''යි මෙසේවූ කථාවක් උපදවා උන්සේක.

සම්බුදුයන් වහන්සේ ඒ භික්ෂූන්ගේ කථාව අසා මහණෙනි, ඔහු දෙදෙන තමන්ගේ පුතනුවන්ට පුතනුවෝය''යි කියනි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

මහණෙනි, මේ බමුණා යටගිය දවස අතුරක් නැතුව පටිපාටියෙන් පන්සියයක්ජාති මුළුල්ලෙහි මට පියවීය. පන්සියයක් ජාති මුළුල්ලෙහි මට සුළුපිය වීය, පන්සියයක් ජාති මුළුල්ලෙහි මහළුපිය වීය. මේ බැමිණිත් අතුරක් නැතිව පිළිවෙළින්ම පන්සියයක් ජාතිමුළුල්ලෙහි මට මවු විය. පන්සියයක් ජාති මුළුල්ලෙහි කුඩා මව් වූය. පන්සියයක් ජාති මුළුල්ලෙහි මැහැලිමව් වූය, මෙසේ යෙළදහසක් ජාති මුළුල්ලෙහි බමුණාඅතවැනිනිම්, යෙළදහසක් ජාතිමුළුල්ලෙහි බැමිණිය අතවැනිනිම්, මෙසේ යෙළදහසක් ජාති මුළුල්ලෙහි මොහු දෙදෙන මව්පියවූහ''යි වදාරා ධම්දේශනා කොට වදාළසේක. ''යම් පුද්ගලයක්හු දුටු පමණක් ඇති කල්හිම ඔහු කෙරෙහි සිත පිහිටාද? යම් පුද්ගලයක්හු දුටු පමණකින්ම කෙරෙහි සිත පහදීද? මොලොක්වේද? ස්වභාවයෙන් ඒ උපන් ජන්මයෙහිපෙර නුදුටුවිරුත් ඒ පුද්ගලයා කෙරෙහි අනුභූත පූර්ව්වතෙහ වශයෙන්ම ඒකාන්තයෙන්ම සත්ත්වතෙමේ විශ්වාසයට පැමිණෙන්නේය''යි මෙසේ ධම් දේශනා කොට වදාළසේක.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධම්දේශනාව ගෙණහැර දක්වා පූර්ව්වාපරසන්ධි ගලපා මේ සාඛෙත ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි බමුණා හා බැමිණි නම් දැන් මේ බමුණා හා බැමිණියය, එස මයෙහි පුත්‍ර වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 69
## විසවන්න ජාතකය

මේවද එක්සමයෙක්හි නිමිල වූ පස්පෑ දිස්නා නෙත්‍ර යුගලයක් ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩ වසනසේක්, දම් සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක. තෙරුන්වහන්සේ පිටි කන දෙයක් වළඳන වේලෙහි මනුෂ්‍යයෝ සඞ්ඝයාට පිටකන් දෙය ඇරගෙණ විහාරයට ආවාහුය. භික්ෂූන්

ගත්පසු බොහෝ ඉතිරිවිය. මනුෂ්‍යයෝ කියන්නාහු ස්වාමීනි, ඇතුළුගමට වත් භික්ෂූන්වහන්සේටත් අවුළුපත් පළිගත මැනවැ"යි කීහ, එකෙණෙහි තෙරුන්වහන්සේගේ සඬිවිහාරික භික්ෂූන්වහන්සේ ඇතුළුගම වූසේක. උන්වහන්සේගේ කොටස ගෙණ, ඒ භික්ෂූන්වහන්සේ නොආහෙයින් "ඉතා දහවල් වන්නේය"යි සැරියුත් මහතෙරුන්වහන්සේට පිළිගැන්වූය.

ඒ තෙරුන්වහන්සේ අවුළුපත් වැළඳු නොබෝකලකින්ම සඬිවිහාරික භික්ෂූන්වහන්සේ ගමින් විහාරයට වැඩිසේක.

එකල තෙරුන් වහන්සේ වදුරණසේක් "ඇවැත්නි, අප නොපව තුබූ පිටිකහදැ වළඳුපුමෝදැ"යි වදුළසේක. එබස් ඇසූ සඬිවිහාරිකයන් වහන්සේ "ස්වාමීනි, මිහිරෙක් නම් කවුරුන්ට අප්‍රියදැ"යි කීසේක, එකෙණෙහි සැරියුත් මහතෙරුන් වහන්සේට සංවේග උපත, උන්වහන්සේ "මම මෙතැන් පටන් පිටිකහ දෙයක් නොවළඳිමි"යි ඉටාගත් සේක.

එතැන් පටන් සැරියුත් මහතෙරුන් වහන්සේ පිටිකහ දෙයක් නොවැළඳූ විරුසේක. උන්වහන්සේ පිටිකහදැ නොවළඳන නියාව භික්ෂු සංඝයා කෙරෙහි ප්‍රසිඛ වීය භික්ෂූන්වහන්සේ ඒ කථාව කියමින් දම්සභා මණ්ඩපයෙහි වැඩඋන්සේක, එසැල ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ 'මහණෙනි, දැන් මා එන්නාට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව හුනුදැ"යි විචාරා "මෙතම් කථාවකින් යුත්තවඋනුම්හ"යි දැන්වූකල්හි "මහණෙනි, සාරිපුත්ත සථවිරයෝ එක් වරෙක හැරපු දෙය ජීවිත පරිත්‍යාග කෙරෙත් නමුත් දෙවනුව නොගණිත්ය"යි වදුරා ඉකුත්වත් දක්වා වදුළසේක.

පසිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහබෝසතාණෝ විෂවිද්‍යා කුලයක ඉපිද වෙදකමින් ජීවත්වන්නාහුය. එකල එක් ජනපදවාසීවූ මනුෂ්‍යයකු සර්පයෙක් දෂ්ටකොට පූයේය. ඔහුගේ නැයෝ ප්‍රමාද නොකොට වහා වෛද්‍යවරයා කැඳවාගෙණ ආවාහුය. එකල වෛද්‍යවරයා කියන්නේ "කිමෙක්ද? ඖෂධ ගල්වා විෂ දවා ගණිම්ද? දෂ්ටකළ සර්පයා ගෙන්වා ගෙණ දෂ්ටකළ තෙනින් ඔහු ලවාම විෂය දවා ගණිම් දැ?"යි කීයේය.

සර්පයා ගෙන්වා විෂය අද්දා ගණ"යි මනුෂ්‍යයෝ කීවාහුය. ඒ විෂවිද්‍යා වායීයා මන්ත්‍රෞෂධයෙන් සර්පයා ගෙන්වාගෙණ "නා විසින් මේ පුරුෂයා දෂ්ටකරණ ලදැදේදැ"යි කීය. "එසේය මා විසිනැ"යි කී කල්හි "නා දෂ්ට කළ තැනින් නෝ විෂ මුඛයෙන් ඇදගණැ"යි කීයේය. සර්පයා කියන්නේ "එක්වාරයෙක ඇරපුදෙය නැවත ගත්විරුනැත, මම මා විසින් හරණලද විෂය නැවත ඇදනොගණිම්"යි කීය. සර්පයාගේ බස් අසා විෂවිද්‍යාවායීනෙම දර ගෙන්වාගෙණ ගිනිමොලවා "ඉදින් නාගේ විෂ නෝ නො අදනෙහිවිනම් මේ ගින්නට වැද යෑ"යයි කීය. සර්පයා 'ඉදින් මම ගිනි වදිම් නමුත් මා විසින් එක වරෙක හැරපු විෂය උරා ඇර නොගණිම්"යි කීයේය.තවද යම් විටක මා හරණ ලද විෂයක් මාගේ ජීවත්වීම කරණකොටගෙණ පෙරලා උරා ඇදගන්නෙම් වී නම් ඒ විෂයට නිත්දු වේයයි ඒ විෂය නැවත උරා ඇදගැන්ම නිසා ගිනිවැද යම් මරණෙක් වේනම් ජීවත්වීමටත් වඩා ඒ මරණය උතුම්ය"යි කීයේය. මෙසේද කියා ගිනිවදින්ට නික්මුනේය.

එකල වෙදුනෝ ඒ සර්පයා වළකා ගිනිවැද්ද නොදී ඒ සර්පයා දෂ්ටකළාවූ පුරුෂයා ඖෂධයෙන් හා මන්ත්‍රයෙන් විෂ නැතිකොට නීරෝග කොට සර්පයාට පන්සිල් දී "මෙතැන් පටන් දෂ්ට කොට කිසි කෙණෙකුන්ට පීඩාවක් නොකරව"යි කියා අවවාද කොට ඇරපුවාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, ශාරීපුත්‍ර සථවිරයෝ එක වරෙක හැරපුදෙය ජීවිතපරිත්‍යාග කරහත් නැවත නොගණිත්"යයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්‍වාපරසන්ධි ගළපා මේ විසඛනන ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි සර්පයා තම් දැන් ශාරීපුත්‍රසථවිරයෝය, එසමයෙහි විෂවිද්‍යාචාරීවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදූ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 70 කුද්දාල ජාතකය

තිවද එක් සමයෙක්හි ප්‍රඥාවිෂයාතික්‍රාන්තවූ ධර්මකාය ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙවිරම්වෙහෙර වැඩවසතසේක්, චිත්තභස්ත ශාරීපුත්‍රසථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ තෙරුන් වහන්සේ නම් සැවැත්නුවර එක් කුලපුත්‍රයාන කෙනෙක ඉක්බිත්තෙන් එක් දවසක් ඒ කුලපුත්‍රතෙම සිසා පියා එන තැනැත්තේ විහාරයට වැද එක් තෙරකෙනකුන් වහන්සේගේ සිනිදුවූ මිහිරිවූ ප්‍රණීත භෝජනයක් ලැබ මෙසේ සිතුයේය, "අපි රෑ දුවල් මුළුල්ලෙහි සිය අතින් නොයෙක් කර්‍මාන්ත කොටත් මේබඳුවූ මධුරාහාරයක් නො ලබම්හ. මාත් මහණවූවොත් යහපතැ"යි සිතීය.

මෙසේ සිතා ඒ කුලපුත්‍ර මහණව මසක් යෙළ මසක් ඇවැමෙන් නුවණින් සිහි නොකොට ක්ලෙශ වසඟව ගිහිව නැවත ඔත් නොලැබ මිරිකී අවුත් මහණව අභිධර්‍මය උගත් සේක. මෙම ක්‍රමයෙන් සවාරයෙක ගිහිව සත්වෙනි වාරයෙහි මහණව සප්තප්‍රකරණය හදාරා බොහෝ භික්ෂූන් වහන්සේ අභිධර්‍මය උගන්වා විදර්‍ශනා වඩා රහත්වූසේක.

එකල උන්වහන්සේගේ සහාය භික්ෂූහු "අවැත්වූ චිත්තයෙනි, කිමෙක්ද? තොපව පෙරපරිද්දෙන් දැන් ක්ලෙශයෝ නොවසිද්දැ"යි නින්දා කළසේක. එකල උන්වහන්සේ වදාරණසේක් 'ඇවැත්නි, මම දැන් මෙතැන් පටන් ගිහිවන්ට අයොග්‍ය වෙමි"යි කීසේක. මෙසේ උන්වහන්සේ අර්හත්ඵලයට පැමිණි කල්හි ධර්මසභා මණ්ඩපයෙහි මෙසේවූ කථාවෙක් පහළ වූයේය. "ඇවැත්නි, මෙබඳුවූ අර්හත්ඵලයට උපනිශ්‍රය ඇතුව තිබියදී ආයුෂ්මත්වූ චිත්තභස්ත ශාරීපුත්‍රසථවිරයෝ සවාරයෙක ගිහිවූහ. එසේහෙයින් පෘථග්ජන බව තම් ඉතා මහත්වූ දෙෂ ඇති දෙයකැ"යි මෙසේවූකථාවක් උපදවා උන්සේක.

එකල සර්‍වඥයන් වහන්සේ අවුත් "මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව උනුද?"යි විචාරා "මෙතම් කථාවකින් යුක්තව උනුම්හ"යි දැන්වූ කල්හි "මහණෙනි, පෘථග්ජන චිත්තය තම් ලඝුය 'නිග්‍රහ නොකොට හැක්කේය, ආලම්

බණ වශයෙන් ගොස් ඇලීයන්නේය. එක්වරෙක ඇලීගිය සිත වහා මුදුලන්ට නොපිළිවන. එබඳු චිත්තයාගේ දමනය යහපත් වන්නේය, දමනයෙහි ලත ලද්දාවූම චිත්තය සැප ඵලවන්නේය. මෙබඳුවූ චිත්තයකට නිග්‍රහ කොට ගත නුහුනු බැවින් පෙර නුවණැත්තෝ එක් උදලුකෙටියක් නිසාම ඒ උදලු හැරපිය නොනී ලොභ වශයෙන් සවාරයෙක ගිහිව සත්වෙනි වාරයෙහි පැවිදිව ධ්‍යාන උපදවා ලොභයට නිග්‍රහ කළෝම වේදැ''යි වදුරා ඉකුත්වත් දක්වා වදාළසේක.

ධීවරගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහ බෝසතාණෝ ඵලාදිය විකුණන්නාවූ කුලයක ඉපිද වික්ඛුබවට පැමිණියෝය. කුද්දාල පණ්ඩිතයෝය යි ඔවුන්ට නම් තුබුයේය. ඒ බොධිසත්ත්වයෝ උදැල්ලෙන් බිම කොටා ඵල හා ලබු කොමඩු කැකිරි ආදිය රොපණය කොට ඒ ඵලාදිය විකුණමින් දුකා ජීවිකාවෙන් ජීවත්වෙති. ඒ බොධිසත්වයන්ට උදලුකෙටිය හැර අනික් වස්තුවෙක් නැත්තේය.

ඒ කුද්දාල පණ්ඩිතයෝ එක් දවසක් මෙසේ සිතූහ. ''මට ගිහිගෙයි වීසී මෙන් ප්‍රයෝජන කිමිද? මේ ගිහිගෙන් නික්ම මහණවෙමි''යි සිතූහ. ඉක්බිත් තෙන් එක් දවසක් උදලුකෙටිය සඟවා තබා සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව උදලු කෙටිය සිහිකොට ලොභය සිඳගත නොනී කෙටි උදැල්ල නිසා නැවත නැවත ගිහිවූයේය. මෙසේ දෙවෙනිවාරය තුන්වෙනි වාරය යි මෙසේ සවාරයෙක උදලු කෙටිය සඟවා තබා මහණත් වූහ. ගිහිත් වූහ. සත්වෙනිවාරයෙහි මහාබොධි සත්ත්වයෝ සිතන්නාහු ''මම මේ කෙටිඋදැල්ල නිසා නැවත නැවත ගිහිවීමි, දැන් ඒ උදලු කෙටිය මහාඝඩහාවට දමාපියාමහණවෙමි, ගංතෙරට ගොස් ඉදින්උදලු කෙටිය හුනු තැන් දුටුයේ වීම් නම් නැවත අවුත් ගොඩතඟාගන්ට සිතිවිලි උප දනේය''යි උදලුකෙටිය මිට අල්වා ගෙණ ඇත් බල හා සමාන බල ඇති බොධි සත්ත්වයෝ ඉසවට තුන්විටක් සිසාරා ඇසපියා ගෙණ ගඩහාව මඩ්‍යයට දමා ''ජයගතිමි, ජයගතිමි'' කියා තුන්වරක් සිංහනාද කළෝය.

එකෙණෙහි බරණැස් රජ්ජුරුවෝ පසල් දනවිව සෙමෙහි තබා එත නැතැත්තෝ ගංගාවෙහිදී ඉස හා සමග ජලස්නානය කොට සීහාභරණයෙන් සැරහී ඇත්කඳක් මත්තෙන් යමින් හිඳ බොධිසත්ත්වයන්ගේ ජයශබ්දය අසා ''මේ පුරුෂයා ''ජයගතිමි'' කියන්නේ මොහු විසින් කවරෙක් ජයගන්නා ලද්දේ දැ''යි ඔහු කැඳවා විචාරව යි බොධිසත්ත්වයන් කැඳවා ගෙන්වා ගෙණ ''පින්වත්වූ පුරුෂය, මම වූකලී විජිත සංග්‍රාම ඇත්තෙමි, දැන් ජය ගෙණ එමි. තා විසින් ජයගන්නා ලද්දේ කවරෙක්දැ?''යි විචාළෝය.

එසේ ඇසූ බොධිසත්ත්වයෝ කියන්නාහු ''මහරජ්ජුරුවෙනි, යුද්ධදක්ෂ කුත් යුබලඤ්ඤයකුත් ජයගත්තාවූ තොප විසින් කෙලෙසුන් ජයනොගත් බැවින් ජය නොගන්නා ලද්දේය. මම වූකලී මාගේ අභ්‍යන්තරයෙහි ලොභයට නිග්‍රහ කොට කෙලෙසුන් ජයගතිමි''යි කියමින් සිටම මහත්වූ ගංගාව බලා ආපොකසිණය අරමුණු කොට ඇති ධ්‍යානය උපදවා පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ආකාශයෙහි හිඳ රජ්ජුරුවන්ට ධම්දෙශනා කරන්නාහු මෙසේ කිවුය ''පසමිතුරන් පරාජය කොට රාජ්‍යය ලැබ නැවත ඒ සතුරන් විසින් ජයගතයුතු

හෙයින් ඒ යුඩයෙන් ලබන්නාවූ ජය අඟපත්වූ ජයක් නම් නොවෙයි, කුමක් හෙයින් ද? යන් නැවත සතුරන් විසින් ජයගතයුතු හෙයින් කෙලෙස් තමැති පසම්තුරන් පරාජය කොට මැඩ ජයගන්නාවූ ජය යඟපත් වන්නේය. කුමක් හෙයින් ද? යන් නැවත ජයගැන්මක් නැති හෙයිනැ යි. එසේ හෙයින් මහ රජ්ජුරුවෙනි, තෙපි දහසක් වර ලක්ෂයක්වරත් යුඩය ජයගෙණ තෙපි සංග්‍රාම යෝධයෝ නම් නොවව්, කුමක්හෙයින් ද? තොපගේ ක්ලෙශයන් ජය නොගත් හෙයිනි. යමෙක් වනාහි තමාගේ අභ්‍යන්තරයෙහි ක්ලෙශයන් ජයගණ්නම් ඒ තෙමේ උත්තමවූ සංග්‍රාම ශීර්ෂයෙහි යෝධ නම් වන්නේය'යි ආකාශයෙහි හිඳ මෙසේ සවිඥවිලාශයෙන් ධර්මදෙශනා කළෝය. මෙසේ රජ්ජුරුවෝ ධර්මය අසමින් සිටියදීම තදඞ්ගප්‍රහාණ වශයෙන් ක්ලෙශයෝ ප්‍රහීණවූහ. ප්‍රවූ ජ්‍යාවට සිත නැමුනේය. රජ සෙනඟවත් එසේම ක්ලෙශයෝ ප්‍රහීණවූහ. මහ රජ්ජුරුවෝ"දැන් නුඹවහන්සේ කොයි යනසේක්ද?"යි බොධිසත්ත්වයන් විවාලෝය, හිමාලයවනයට වැද සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවෙමි. මහරජ්ජුරුවෙනි," කිවුය. "එසේවී නම් මමත් මහණවෙමි" කියා බොධිසත්ත්වයන් සමඟ නික්මුනාහුය.

සේනාව, බ්‍රාහ්මණ ගෘහපතීහුය, ඇත් නායකවරුය. යන සියල්ලෝම ඒ ස්ථානයෙහි රැස්වූය. ජනසමූහයෝ රජ්ජුරුවන් සමඟ නික්මුනාහුය. බරනැස් නුවරවාසී මනුෂ්‍යයෝ"අපගේ රජ්ජුරුවන් වහන්සේ කුද්දාල පණ්ඩිත යන්ගේ ධර්මදෙශනාව අසා මහණවනු කැමැතිව සේනාව හා සමඟ නික්මුනු සේක. එසේ හෙයින් අපි මෙතන කුමක් කරමෝදැ"යි දෙලොස් යොදුනක් පමණ ඇති බරණැස්නුවර සියලු නුවරවාසී සත්ත්වයෝ නික්මුනාහුය. දෙලොස් යොදුනක් පමණ පළිදවූයේය. ඒ පළින් ගෙණ බොධිසත්වයෝ හිමාලය වනයට වන්නාහුය.

ශක්‍රදෙවේන්ද්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය බොධිසත්වයන්ගේ ආනුභාවයෙන් උෂ්ණාකාර දක්වූයේය. ඒ ශක්‍රදෙවේන්ද්‍රයෝ කිමෙක්දෝ හෝ?"යි පරීක්ෂා කරන්නාහු "කුද්දාල පණ්ඩිතයෝ මහබිනික්මන් නික්මුනාහුය"යි දැක 'මහත් ජයසමාගමක් වන්නේය, එසේ හෙයින් උන්ට වඩන තැනක් උවමැනවැ"යි සිතා විශ්වකර්මියා කැඳවා "දරුව, කුද්දාල පණ්ඩිතයෝ මහබිනික්මන් නික්මුනාහුය. වසන තැනක් ලබන්ට වටනේය, තෙපි හිමාලය වනයට ගොස් සමවූ භූමිප්‍රදෙශයක දිගින් තිස්යොදුනක් හා පුළුලින් පසළොස් යොදුනක් හා පමණ ඇති ආශ්‍රම ප්‍රදෙශයක් මව"යි කීවාහුය.

ඒ ඇසූ විශ්වකර්මී දිව්‍යපුත්‍රයා "යහපත, සවාමීනි"යි ගිවිස එහි ගොස් එපරිද්දෙන්ම කෙළේය. තවද ඒ විශ්වකර්මී දිව්‍යපුත්‍රයාත් ආශ්‍රම ප්‍රදෙශයෙහි පන්සල මවා හයජාතක ශබ්ද පවත්නාවූ දුශ්චරිතගණන් පක්ෂීන් අමනුෂ්‍යයන් දුරුකොට ඒ ඒ දිසාභාගයෙන් එක්පියවරක් ඇති මාලියක් දක්වා තමන් වසන්නාවූ ස්ථානයටම ගියේය. කුද්දාල පණ්ඩිතයෝ ඒ පළින් ඇරගෙණ හිමාලය වනයට වැද ශක්‍රදෙවේන්ද්‍රයන් විසින් දෙනලද ආශ්‍රම ප්‍රදෙශයට ගොස් විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් මවනලද තවුස්පිරිකර ගෙණ පළමු තුමූ පැවිදිව පසුව පළින් පැවිදි කොට ආශ්‍රම ප්‍රදෙශය බෙදා දුන්නාහුය.

සත්රාජ්‍යයක රජදරුවෝ තමන්ගේ රාජ්‍ය හැර බොධිසත්ත්වයන් සමීපයට අවුත් තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූහ. තිස්යොදුනක් පමණ අසපු

පිරිහියේය. කුද්දාල පණ්ඩිතයෝ අවශෙෂ කසිණයෙහිත් පරිකර්ම භාවනා කොට බ්‍රහ්මවිහාරයන් වඩා පළමුවන ධ්‍යානය හැමවිට කමටහන් කිවහුය. හැම්දෙනම පළමුවනි අෂ්ටසමාපත්තිලාභීව බ්‍රහ්මවිහාරයන් වඩා බ්‍රහ්මලෝකයෙහි උපන් නහුය. යම් සත්ත්වයෙකුත් ඒ තපස්වීවරයන්ට අත්පා මෙනෙවර උපස්ථාන කළහු නම් ඔහු හැම්දෙනම දිව්‍යලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මෙසේ මා චිත්තය ක්ලෙශ වශයෙන් ඇලීගියේ නම් මුදුලිය නොහැක්කේය. උපන්නාවූ ලොභධර්මයෝ දුරු කොටලිය නොහැක්කාහුය. මේබඳු නුවණැත්තන් පවා ඒ ලොභධර්මයෝ අඥාන කොට පූවෝ වවුදැ"යි මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍ය සත්‍යය ප්‍රකාශ කළසේක. චතුරාර්‍යසත්‍යයාගේ කෙළවර සමහර කෙනෙකුන් වහන්සේ සෝවාන් පලෙහි පිහිටිසේක. සමහර කෙනෙකුන් වහන්සේ සකෘදාගාමී පලෙහි පිහිටිසේක. සමහර කෙනෙකුන් වහන්සේ අනාගාමී පලෙහි පිහිටිසේක. සමහර කෙනෙකුන් වහන්සේ අර්හත්ඵලයෙහි පිහිටිසේක. සර්ව්ඥ යන් වහන්සේත් පූර්‍වාපරසන්ධි ගළපා මේ කුද්දාල ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද ස්ථවිරයෝය, එසමයෙහි පණ්ඩිත නම් දැන් බුදුපිරිසය, එසමයෙහි කුද්දාල පණ්ඩිතයෝනම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 71
## වරණ ජාතකය.

**මිවද** එක්සමයෙක්හි චක්‍රලක්ෂණයෙන් චිහ්නිතවූ ශ්‍රීපාදපත්ම ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් කුටුම්බියපුත්ත තිස්ස ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක්දවසක් සැවැත්නුවර වාසීවූ අන්‍යොන්‍ය සහායවූ තිසක් පමණ කුල පුත්‍රයෝ සුවඳ මල් හා සුවඳදිය ගෙණ සර්ව්ඥයන් වහන්සේගෙන් ධර්මදෙශනා අසම්හ"යි මහජනයා විසින් පිරිවරණ ලදුව ජෙතවනයට ගොස් නාගමාස කසාල මාලකාදියෙහි මදක් හිඳ සවස්වේලෙහි සර්ව්ඥයන් වහන්සේ සුගන්ධගන්ධවාසිතවූ ගන්ධකුටියෙන් නික්ම ධර්මසභාමණ්ඩපයට ගොස් අලංකෘතවූ බුද්ධාසන මස්තක යෙහි වැඩහුන් කල්හි කුල පුත්‍රයෝ සහපිරිවරින් ධර්මසභාමණ්ඩපයට ගොස් සර්ව්ඥයන් වහන්සේට සුවඳ මල් ආදියෙන් පූජාකොට චක්‍රලක්ෂණයෙන් චිහ්නිතවූ පතුල්තල ඇති සුපුෂ්පිත පද්මයක් මෙන් ශ්‍රී සහිතවූ ශ්‍රීපාදවන්දයෙහි වැඳ එකත්පස්ව හිඳ ධර්මය ඇසුවාහුය.

එකල ඒ කුලපුත්‍රයන්ට මෙසේවූ සිතිවිල්ලක් වූයේය. "අපි බුදුරජාණන් වහන්සේ විසින් දෙසනලද ධර්මය යම් පරිද්දෙන් දනුමෝ නම් එපරිද්දෙන්ම මහණවම්හ"යි කියා ඔහු හැම්දෙනම සර්ව්ඥයන්වහන්සේ ධර්මසභාමණ්ඩපයෙන් නික්මුණු කල්හි බුදුන් කරා එළඹ නමස්කාර කොට මහණවීමට යාචඤ්ඤ කළාහුය. ඔවුන්ට සර්ව්ඥයන්වහන්සේ ප්‍රව්‍රජ්‍යාව දුන්සේක, ඔහු හැම්දෙනම ආචාර්‍ය උපාධ්‍යායන්වහන්සේ සිත්ගෙණ සමීපයෙහිවැස උභය ඕතෘකාවන් ප්‍රගුණ කොට

කැප අකැප දැන ත්‍රිවිධවූ අනුමෝදනාවන් ඉගෙණ සිවුරු ගෙත්තම් කොට රදෑ මහණදම් කරම්හ''යි ආචාර්‍යයී උපාධ්‍යායන්වහන්සේ පිළිවිස සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ කරා එළඹ නමස්කාර කොට එකත්පස්ව හිඳ ''ස්වාමීනි, අපි භවයෙන් කලකිරී ගියමිහ. ජාති ජරා ව්‍යාධි මරණභයින් භයපත්වූම්හ. අපගේ සංසාරයෙන් මිදීම පිණිස කමටහන් වදාළමැනැවැ''යි ආරාධනා කළසේක. සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූන්ට කර්මස්ථානයන් අටතිස්දෙනා අතුරෙන් සැපවූ කර්මස්ථාන තෝරා පරීක්ෂාකොට කමටහන් වදාළසේක. ඒ භික්ෂූන්වහන්සේ සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ සමීපයෙන් කමටහන් ගෙණ බුදුන් වැඳ පැදකුණු කොට විහාරයට ගොස් ආචාර්‍යී උපාධ්‍යායයන්වහන්සේ දැක පාසිවුරු ගෙණ ''මහණදම් කරම්හ''යි නික්මුනුසේක.

ඉක්බිත්තෙන් ඒ හැමදෙනාවහන්සේ අතුරෙන් කුටුම්බිය පුත්තතිස්ස සථවිර නම්වූ එක් භික්ෂුකෙනෙකුන්වහන්සේ කුසීතසේක. හීනවීර්‍යසේක, රසයෙහි ගිජුසේක. උන්වහන්සේ මෙසේ සිතුසේක. ''මම වල්හි වසන්වත් වීර්‍යකරන්ට වත් පිඬුසිඟායන්ට වත් අසමර්ථයෙමි. එසේහෙයින් මට ගමනින් කවර ප්‍රයෝජනයෙක්ද? නොගොස් රදම්, පසුබට වීර්‍යී ඇති භික්ෂූන්වහන්සේ පසු පස්සේ මද තෙනක් ගොස් රැඳුනුසේක. අවශෙෂවූ භික්ෂූන්වහන්සේත් කොසොල් දනව්වෙහි චාරිකා කෙරෙමින් පසල්දනව්වෙහි එක්තරා ගමකට ගොස් ඒ ගම් නිසා එක් වනයක වස්වැස වස්තුන්මස ඇතුළත වීර්‍යී කෙරෙමින් විදර්‍ශනා වඩා ඛැබගන්වා මනිකමපාව කෙරෙමින් අර්හත්ඵලයට පැමිණ වස්අනන යෙහි පවරා ''වඩතලද ගුණධර්‍මය සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේට කියම්හ''යි ඒ වනයෙන් නික්ම අවුත් ක්‍රමයෙන් ජෙතවනයට පැමිණිසේක. පාසිවුරු තැන්පත් කොට තබා ආචාර්‍යී උපාධ්‍යායයන්වහන්සේ දැක නැවත සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ දක්නා කැමතිව බුදුරජාණන්වහන්සේ සමීපයට ගොස් නමස්කාර කොට උන්සේක.

සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූන්වහන්සේ හා සමග මිහිරිවූ පිළිසඳර කථා කළසේක. ඒ භික්ෂූන්වහන්සේ කරණ ලද සුවදුක් කථා ඇතිසේක් තමන් වහන්සේ විසින් ලබතලද ගුණධර්‍මයන් සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේට දන්වූසේක. බුදුරජාණන්වහන්සේත් ඒ භික්ෂූන්වහන්සේට ප්‍රශංසා කළසේක.

එකල ඒ කුටුම්බිය පුත්තතිස්ස සථවිරයන්වහන්සේ සම්‍යක්සම්බුදුරජාණන්සේට ඒ භික්ෂූන්වහන්සේගේ ගුණ කථාව කියන්නා අසා තමන්වහන්සේත් මහණදම් කරණු කැමතිසේක. ඒ අවශෙෂ භික්ෂූන්වහන්සේ ''ස්වාමීනි, අපි ඇම වනයට ගොස් වසමෝදැ'යි සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ අනුන් විවාළසේක සම්‍යක්සම්බුදුරජාණන්සේ ''යහපතැ''යි අනුදත් කල්හි ඒ භික්ෂූන්වහන්සේ බුදුරජාණන්වහන්සේට නමස්කාර කොට තමන්වහන්සේගේ පිරිවෙන්වලට ගියසේක.

ඉක්බිත්තෙන් ඒ කුටුම්බිය පුත්තතිස්ස සථවිරයන්වහන්සේ රාත්‍රි භාග යෙහි අධික කොට වඩනාලද වීර්‍යී ඇතිව මහත්වූ වේගයෙන් මහණදම් කරණ සේක් මධ්‍යම යාමයෙහි ආලඹනඵලකයෙහි වැතිර සිටම නිදමින් පෙරලී වැටී කලවේ ඇට බිඳගත් වේදනා බලවත්විය. අවශෙෂ භික්ෂූන්වහන්සේ උන් වහන්සේට බෙහෙත් ආදිය බැඳ පරිහරණය කිරීමෙන් යා නුහුනු සේක.

ඉක්බිත්තෙන් උපස්ථාන වේලාවට ඒ භික්ෂූන්වහන්සේත් ආකල්හි සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ ''මහණෙනි, තෙපි සෙට යම්හ''යි කියා රෑයේ අපට කිවා

නොවේදැ''යි විවාළසේක. ''එසේය, සවාමීනි, යම්හ''යි කීම්හ. ''එතකුදුවුවත් අපව සහායවූ කුටුම්බිය පුත්තනිසස සථවිරයෝ නොවේලේ අධිකවේගයෙන් මහණදම් කෙරෙමින් නිද්‍රාවෙන් මඩනාලදුව පෙරලී වැටී හුනුමුව, උන්ගේ කලවේ ඇට බිඳුනේය. උන් නිසා අපගේ ගමන් බාධාවීය''යි දැන්වූ සේක. එකල්හි සම්‍බුදුරජාණන්වහන්සේ ''මහණෙනි, මොහු තමන්ගේ නීතවීර්‍යය කමින් නොකල්හි අධික වේගයෙන් වීර්‍යය කොට නොපගේ ගමනට අන්තරාය කෙළේ දැන් මතු නොවෙයි, පෙරත් මේතෙම නොපගේ ගමනට අන්තරාය කෙළේ වේදැ'යි වදාරා ඒ භික්‍ෂූන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

රිටගිය දවස ගන්ධාරරට තක්සලා නුවර බොධිසත්ත්වයෝ දිසාපාමොක් ආචාරීව පන්සියයක් මාණවකයන්ට ශිල්ප උගන්නාහුය.

ඉක්බිත්තෙන් එක් දවසක් මාණවකයෝ දර ගෙණෙන පිණිස වලට ගොස් දර කඩන්නාහුය. ඔවුන් අතුරෙන් කුසිත මාණවකයෙක් මහත්වූ ලුණුවරණ ගසක් දැක ''මේ මළ ගසෙකැ''යි යන සංඥාවෙන් මද ඇසිල්ලක් වැද හෙව පසුව ගසට නැගී ''දරකඩලා ඇරගෙණ යෙමි''යි උතුරුසළුව අතුවූ වැද හෙව තාසා හඬවමින් නිදන්නේය. සෙසු මාණවකයෝ දර මිටිබැඳ ඇරගෙණ යන්නාහු, ඒ නිදන්නාවූ මාණවකයාට පිටිපල්ලෙන් ගසා පොබයා ගියාහුය. ඒ කුසීත මාණවකයා නැගිසිට ඇස නිදි පිස පිස නිදි පලායා නොදීම ලුණුවරණ ගසට නැගී අත්තක් අල්වාගෙණ තමා දිසාවට ඇද බිඳිනේ බිඳී නැගි අතු කෙළවරින් තමාගේ ඇස සිල්කොටගෙණ එක් අතකින් ඇස වසා අනික් අතින් නොමළ දර කඩා ගසින් බැස දරම්පියක් බැඳ ඔසවාගෙණ වහා ගොස් ඒ මාණවකයන් විසින් එලතලද දරම්පි මත්තේ එළෑයේය.

එදවස්ම දනව් ගමෙක එක් කුලයෙක මනුෂ්‍යයෝ බමුණන් ලවා ශාන්ති කරවා දනුත් දී දක්‍ෂිණාවත් දෙම්හ යි ආචාරීන් පැවරූහ.

එකල්හි ආචාරීහු මාණවකයන්ට කියන්නාහු ''දරුවෙනි, සෙට එක් ගමකට යායුතුය. එසේහෙයින් තෙපි හැම නිරාහාරව යන්ට අසමර්‍ථවේදැ''යි උදැසනම කෑද පිසවා අනුභවකොට ගොස් ''නොප ලබන කොටසුත් අපට පැමිණි කොටසුත් එක්කොට ඇරගෙණ එව''යි කීවාහුය. එබස් ඇසූ මාණවකයෝ කෑද පිසනු පිණිස කෙල්ල පුබුදුවා නගාසිටුවා ''වහා අපට කෑද පිසව''යි කීවාහුය.

ඒ කෙලී කෑද පිසනුපිණිස දර ගණිමින් මත්තේ තුබූ අමු ලුනුවරණ දඬු ගෙණ ගින්නේ ලා නැවත නැවත පිඹත් ගිනිදල්වාගත නොහී ඉරතැංහාය. මාණවකයෝ ''ඉතා දහවල්ව ගියේය. දැන් යන්ව නොපිළිවනැ'යි කියා ආචාරීන් සමීපයට ගියෝය. ආචාරීන් වහන්සේ කියනසේක් ''දරුවෙනි, කුමක් පිණිස නොයාදැ''යි විවාළෝය. ''එසේය, ආචාරීන්වහන්ස නොගියමිහ''යි කී කල්හි ''කවර කාරණයකින් නොගියාහුදැ''යි කිවුය.

''සවාමීනි, අසවල් කුසීත මාණවකයා අප හා සමග දරට ගොස් ලුණුවරණ ගසක් මූල වැදහෙව නිදුපියා පසුව වහ වහා ගසට නැගී ඇසත් සිල්කොට ගෙණ අමු ලුණුවරණ දර ඇරගෙණ අප විසින් පලමුකොට ගෙණවිත් එලතලද දර මත්තෙහි එලීය. කෑද පිසන තැනැත්තී ඒ දියලි දරයයි යන

සංඥවෙන් හින්නේ ලා පිඹින්නී භිරු තැගෙණතුරු ගිනි මොලවා ගත නුහුනුව, මේ කාරණයෙන් අපගේ ගමනට බාධා වීය''යි කීහ. ආචාරී මාණවකයා තළ කාරිය අසා අඥත සත්ත්වයන්ගේ කාරිය නිසා මෙබදු ලාබ හානියෙක් වීය' යි කියා මාණවකයන්ට ''මෙසේ යම්කිසි පුද්ගලයෙක් මේ පළමුකොට කළමනාදෙය, මේ පසුව කළමනාදෙය යි මෙසේ පරීක්ෂා නො කොට පළමුකොට කළමනා කවයුතු පසුව කෙරේද? ඒ අඥත පුද්ගලතෙමේ අමු ලුණුවරණ දරකඩා ගෙණාවාවූ අපගේ මාණවකයා මෙන් පශ්චාත්තාපයට පැමිණ ශෝක කොට හඬන්නේය''යි මෙසේ මහබෝසතාතෝ අතවැස්සතව මේ කාරණය කියා දුනාදීවූ පින්කම් කොට ජීවිතාන්තයෙහි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ ''මහණෙනි, මොහු තොපගේ ගමනට අන්තරාය කෙළේ දැන් මතු නොවෙයි, පෙරත් කෙළේමය''යි මේ ධම්දෙශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ වරණ ජාතකය නිමවා වදළසේක.

''එසමයෙහි අක්ෂිහෙදයට පැමිණි මාණවකයා නම් දැන් මේ උඹරු හෙදයට පැමිණියාවූ මහණය. සෙසු මාණවකයෝ නම් දැන් මේ බුදුපිරිසය, ආචාර්ය බ්‍රාහ්මණ වූයේ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදළසේක.

## 72 සිලව නාගරාජ ජාතකය

එවද ශාන්තවූ වෘතනි ඇති අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සේක්, දෙවදත්තසථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදළසේක.

දම්සභාමණ්ඩපයට රැස්වූ භික්ෂූන්වහන්සේ ''ඇවැත්නි, දෙවදත්ත සථවිරයෝ අකෘතඥයෝය, සර්වඥයන් වහන්සේගේ ගුණ නොදනිති'' යි කියමින් උන්සේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ ''මහණෙනි, මා එන්නාව පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තාව හුනුදැ?''යි විචාරා ''මෙනම් කථාවකින් යුක්තාව උනුම්හ''යි කී කල්හි ''මහණෙනි, දෙව දත්තසථවිරයෝ අකෘතඥවූවෝ දැන්මතු නොවෙයි, පෙරත් අකෘතඥයෝ යයි කිසිකලෙකත් මාගේ ගුණ නොදන්නෝමය''යි වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදළසේක.

එකියගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාතෝ හිමාලය වනයෙහි ඇත් යෝනියෙහි උපන්නාහුය. ඒ බොධිසත්ත්වයෝ මව්කුසින් බිහිවන තැනැත්තෝ සර්වාඞ්ගයෙන් ධවලවූය. රිදී පිඬැල්ලක් හා සමානයෝය, ඒ බොධිසත්ත්වයන්ගේ ඇස් ඉදුනිල්මණිවට දෙකක් මෙන් ප්‍රකාශව පෙණෙන්නාවූ පඤ්ච ප්‍රසාදයෙන් හොබනේය, මුඛය රත්පලසක් හා සමාන වන්නේය, සොඬ

සුණ්ණීබින්දුයෙන් හෙබියාවූ රජතදැමියක් හා සමාන වන්නේය, සතරපය ලාක්ෂාරසයෙන් පිරියම් කරණලද්දක් වැන්නේය. මෙසේ ඒ මහබෝසතා තන්ගේ දසපාරමිතාවෙන් අලංකෘතවූ රූපාග්‍රප්‍රාප්තවූ ආත්මභාවය විය.

ඉක්බිත්තෙන් විසඳුසු බවට පැමිණියාවූ ඒ බොධිසත්ත්වයන්ට ඒ සියලු හිමාලය වනයෙහි හැසිරෙනු රුස්ව උපස්ථාන කෙරෙමින් ඇවිදිනාහුය. මෙසේ ඒ මහබෝසතානෝ අසූදහසක් ඇතුන් පිරිවරා හිමාලය වනප්‍රදෙශයෙහි වසන්නාහුය. මැතහාගයෙහි ගෙණෙහි දෝෂ දැක ගණයා කෙරෙන් කාය විවේක කොට උදකළාව වල්හි වාසයකළාහුය.

ඒ බොධිසත්ත්වයන් වහන්සේ සිල්වත් බැවින් සීලව නාගරාජ ය යි කියා මේ නමින් ප්‍රසිඩ විය. එකල බරණැස්නුවර වැසි එක් වනචරයෙක් හිමාලය වනයට වැද තමා ජීවිකාප්‍රවෘත්තිය කරන්ට නිසි භාණ්ඩයන් සොයන්නේ දික් නියම කොව ගත නොහී මංමුළාව වල්මත්ව හයින් භය පත්ව දෝත හිසතබා අඬමින් ඇවිදින්නේය. මහබෝසතානෝ ඔහුගේ ඒ බලවත්වූ බැගෑහඬ අසා මේ පුරුෂයා සමීපයට එළඹි කල ඒ පුරුෂතෙම බොධිසත්ත්වයන් දැකලා හයින් පලාගියේය. බොධිසත්ත්වයෝ ඔහු යන්නා දැක සිටිතෙනම සිටපුව, ඒ පුරුෂයා බොධිසත්ත්වයන් සිටියා දැක තෙමේත් සිටියේය. බොධිසත්ත්වයෝ නැවත නික්මුනාහුය. ඒ පුරුෂයා නැවත පලා ගොස් බොධිසත්ත්වයන් සිටිවේලේම සිට මෙසේ සිතුයේය. "මේ හස්තිරාජයා මට අවැඩක් කැමති එකෙක් නොවෙයි, මේ දුකින් මුදනු කැමැත්තේවනැ" යි නිර්භීතව සැකයක් නැතිව සිටියේය. බොධිසත්ත්වයෝ ඔහු කරා ගොස් "පින්වත් පුරුෂය, තෝ කවර කාරණයකින් හඬමින් ඇවිදින්නේදැ?"යි විචාලෝය. "සවාමිනි, දික්නියම කොවගත නොහී මංමුලාව මරණභයින් භය පත්ව ඇවිදිමි"යි කීය.

ඉක්බිත්තෙන් ඕහට බෝධිසත්ත්වයෝ තමන් වසතතැනට ගොස් කීපදවසක් එලාඵලයෙන් සතපා "පින්වත්වූ පුරුෂය, තෝ නොබව, මම තා මනුෂ්‍යපථයට ගෙණයෙමි"යි කියා තමන් පිට හිඳුවාගෙණ මනුෂ්‍යපථයට නික්මුණාහුය.

ඉක්බිත්තෙන් ඒ මිත්‍රද්‍රොහී පුරුෂයා කිසිවෙක් විවාළේ නම් කියයුතු වන්නේය යි බොධිසත්ත්වයන් පිට ඉඳුවා යන වේලෙහි වෘක්ෂනිමිත්ත පර්‍වත නිමිත්ත සලකමින් යන්නේය.

ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ අසත්පුරුෂයා වනයෙන් පිටත්කොට බරණැස්නුවරට යන්නාවූ මහමාවත සිටුවා "පින්වත් පුරුෂය, මේ මහින් යව, මා විවාළකෙනෙකුන්ට නොකියව"යි ඔහු යවා මහ බෝසතානෝ පෙරලා තමන්වහන්සේ වසන්නාවූ සථානයට යියේය.

ඉක්බිත්තෙන් ඒ පුරුෂයා බරණැස්නුවරට ගොස් ඒ නුවරට ඇවිදිනේ දන්තකාර වීථියට පැමිණ දන්ත විකෘති කරන්නා දැක කිමෙක්ද? පින්වත්නි ජීවදන්ත ලද්දෙත් ගණුදැ"යි විවාළේය. එබස් ඇසූ දළ වඩුවෝ කියන්නෝ "පින්වත තෝ කුමක් කියයිද? ජීවදන්ත නම් මළ ඇතුන්ගේ දළට වඩා ඉතා මහැඟි වේදැ"යි කිවුය. "එසේ නම් මම තොපට ජීවදන්ත ගෙණෙමි" කියා මාගෝපකරණ ගෙණ කකීශවූ කියතක් ගෙණ බොධිසත්ත්ව

යන් වසන්නාවූ සථාතයට ගියේය. බොධිසත්ත්වයෝත් ඔහු දැක ''කුමක්නිසා අවුදැ?''යි විචාළෝය. ''සවාමීනි, මම දුකඛිතයෙමි. කෘපණයෙමි, ජීවත්ව ඟත නොහෙමි, නුඹවහන්සේහෙත් දළ කැබැල්ලක් ඉදින් දුන්සේක් වී නම් දළ කැබෙල්ල ඇරහෙණ ගොස් විකොට ඒ මිළයෙන් ජීවත්වෙමි සිතා ආමි'' කීය.

එබස් ඇසූ මහබෝසතාතෙනි පින්වත, වන්නාවය, තව දළ දෙමි, දළ කපන්ට කියතෙක් ඇද්ද?'' යි විචාළෝය. ''කියත ඇරහෙණ ආමි'' කීය.''එසේ වී නම් කියතින් දළ කපා හෙණෙව''යි කියා බොධිසත්ත්වයෝ පා හකුළුවා උරව් ලා වැදහුන්නුය. ඒ අසත්පුරුෂයා බොධිසත්ත්වයන්ගේ දළ අක් දෙකම කපා ගත්තේය. බොධිසත්ත්වයෝ ඒ දළ කැබලි දෙක සොඬින් ගෙණ ''පින්වත්වූ පුරුෂය, මට මේ දළ දෙක අප්‍රියය, අමනාපය යි නොදෙමි, මාගේ මේ දළදෙක මීව වඩා දහසක් ගුණයෙන් ලක්ෂයක් ගුණයෙන් සවී ධමීයන් සවීකාරයෙන් ප්‍රතිවෙධ කරන්ට සමර්ථවූ සවීඥතාඥනය තමැති දනනයෝ අතිශයින් මට ප්‍රියවන්නාහුය, මේ මාගේ දන්තදූතය සවීඥතා ඥන ප්‍රතිවෙධයට ප්‍රත්‍යය වේවා''යි කියා සවීඥතාඥනය ඇපකොට දළසඟළ දුන්නාහුය.

ඒ අසත්පුරුෂවූ පාපියා දළසඟළ ගෙණගොස් විකුට ඒ මිළ නිමාගිය කල්හි නැවතත් බොධිසත්ත්වයන් සමීපයට අවුත් 'සවාමීනි, නුඹවහන්සේගේ දළ විකොට ලබනලද මිළ මාගේ ණය ගෙවෙන්ට පමණක් සැහිතැ. එසේ හෙයින් ඉතිරී දළ දුන මැනවැ' යි කීය. බොධිසත්ත්වයෝ ''යහපතැ''යි ගිවිස පළමු පරිද්දෙන් කප්පවා ඉතිරි දළ දුන්නාහුය. ඒ පුරුෂයා ඒ දළත් විකොට නැවත අවුත් ''සවාමීනි, ජීවත්වගත නොහෙමි, මුල්දළ දුනමැනවැ''යි කීය. බොධිසත්ත්වයෝ ''යහපතැ'' යි ගිවිස පළමු පරිද්දෙන්ම දුන්නාහුය. ඒ පාපී පුරුෂයා මහබෝසතානන්ගේ රිදීදමක් හා සමානවූ සොඬ මඬිමින් කෙලාස කූටය හා සදෘශවූ කුඹමත්තට නැගී දෙදළ විළඹින් ඇන මස්පිරා රළු කියතින් මුල්දළ කපාගත නොහී වෙහෙසෙන රහ බලා සොඬගින් කියත කොන අල්වා දළ කපා මුල්සිදුවා හෙණ ගියේය. ඒ පාපීවූ පුරුෂයා මහබෝසතානන්ගේ දෘෂ්ටිපථයෙන් ඉවත්ව ගියෙන් මදකින්ම දෙලක්ෂ සතළිස්දහසක් ඝනඝඩ මහබොල් පොළොව සිනේරු යුගන්ධරාදීවූ භාරයන් හා දුගීඤ්ඣි පිළිකුල් මලමූත්‍රාදිය ධරන්ට සමර්ථවන්නේ වී නමුත් මහ බෝසතානන්ගේ ගුණ රාශිය ධරාගත නොහෙන්නිය මෙන් පැළී විවරවූව, එකෙණෙහිම අවීචිමහ නරකයෙන් වහ්නිජ්වාලා නික්ම ඒ මිත්‍රද්‍රොහී පුරුෂයා කුලසන්තකව රතු පලසකින් පොරවන්නාක් මෙන් වසාගෙණ අවීචි මහ නරකයට ගෙණ ගියේය.

මෙසේ පාපීවූ පුද්ගලයා පොළවට වන්කල්හි ඒ වනලැහැබ වසන්නාවූ වෘක්ෂදේවතාවා ''අකෘතඥ මිත්‍රද්‍රොහි පුද්ගලයාට චක්‍රවර්ති රාජ්‍යශ්‍රිය දීත් සතුටුකරවන්ට නොපිළිවනැ''යි වනලැහැබ එකනින්නාද කොට මෙසේ ධමී දෙශනා කෙළේය. බොධිසත්ත්වයෝ ආයුපමණින් සිට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ 'මහණෙනි, දෙවදත්තසථවිරයෝ අකෘතඥ වූවෝ දැන් මතු නොවෙති, පෙරත් අකෘතඥ වූවෝම වේදැ''යි මේ ධමීදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ සීලව නාගරාජ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මිත්‍රද්‍රෝහී පුරුෂයා තම් දැන් දෙවදත්තසථවිරයෝය, වෘක්ෂදේවතාවා තම් ශාරීපුත්‍රසථවිරයෝය, එසමයෙහි සීලව නාගරාජ වූ යෙම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තථාගතයන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 73 සච්චංකිර ජාතකය

මේවද එක් සමයෙක්හි ශාක්‍යකුලප්‍රදීපවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසතසේක්; වඩයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

භික්ෂුසඞ්ඝයාවහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්ව හිඳ "ඇවැත්නි, දෙවදත්තසථවිරයෝ සර්ව්ඥයන්වහන්සේගේ ගුණ නොදනිති, වඩයට උත්සාහ කෙරෙති"යි දෙවදත්තසථවිරයන්ගේ නුගුණ කියමින් උන් කල්හි ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ "මහණෙනි, මා එන්නාට පුථම භාගයෙහි කවරතම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, දෙවදත්තසථවිරයෝ දැන් මතු නොවෙති මව වඩයට උත්සාහකළෝ, පෙරත් උත්සාහකළෝම වේදැ"යි වදරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යම්කිසි දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි ඒ රජ්ජුරුවන්ගේ දුෂ්ටකුමාර නම් පුත්‍රයෙක් විය. ඔහු කකීශය එරුෂය ප්‍රහටාශීවිෂයක්හු සමානය, නොබැන නොගසා කිසි කෙනෙකුන් හා කථා නොකරන්නේය, ඒ කුමාරතෙම ඇතුළෙහි ජනයාවත් පිටත ජනයාටත් ඇස හුනු රජසක් මෙන්ද කන්ට ආ යකෙකු මෙන්ද අප්‍රිය වන්නේය, උද්වේග උපදවන්නේය. ඒ කුමාරතෙම එක් දවසක් ගඩොඇවෙහි ජල ක්‍රීඩා කරණු පිණිස මහපිරිවරින් ගංතෙරට ගියේය. එකෙණෙහි මහත්වූ මේඝයක් නැංගේය, සියලුදිග අන්ධකාර විය. ඒ කුමාරතෙමේ දූසකමීකාරා දීන්ට කියන්නේ "සගයෙනි, මෙසේ එව, මා කැඳවාගෙණ ගඩොඇ මධ්‍යයට ගෙණ ගොස් නහවා ගෙණෙව"යි කීයේය.

එබස් ඇසූ දූසකමීකාරාදීහු ඒ කුමාරයා ගඩොඇ මධ්‍යයට ගෙණ ගොස් "රජ්ජුරුවන්වහන්සේ අපට කුමක් කරණසේක්ද? මේ පාපීවූ පුරුෂයා මෙතැන්හිම මරම්හ"යි මන්ත්‍රණයකොට "කාලකන්නිය, මෙසේ එව"යි කියා ඔහු දියේ ලා ගොඩනැගී ගංතෙර සිටියාහුය. "කුමාරයෝ කොයිදැ"යි විවාළ කල්හි අපි කුමාරයන් නුදුටුම්හ, වැසි නැගුවා දැක දිය කිමිද ඉදිරියෙහි ආයේවනැ"යි කියා අමාත්‍යයෝ රජ්ජුරුවන් සමීපයට ගියාහුය. "රජ්ජුරුවෝ කුමාරයා කොයිදැ'යි විචාළෝය. "සවාමීනි, නොදනුම්හ, වැසිනැගු කල්හි ඉදිරියේ ආසේක්වනැ"යි සිතා ආම්හ"යි කීහ.

එබස් ඇසූ රජ්ජුරුවෝ "වාසල්දොර හරවා ගංතෙරට ගොස් පරීක්ෂා කරව"යි ඒ ඒ තැන බැළුවේය. මෙසේ බලා කිසිවෙක් කුමාරයා නුදුටුවේය.

ඒ කුමාරයෝ මෙසයෙන් අන්ධකාරව වැසිවසින්ට පළන්ගත් කල්හි දියෙන් යන්නාවූ එක් දඬුකඩක් දැක එහි හිඳ මරණ භයින් තැතිගෙණ අඩ අඩා

යෙහි. එක්ල බරණැස්නුවර වාසිවූ එක් සිටුපුත්‍රයෙක් ගංතෙර සතළිස් කෙළක් ධන නිධාන කොට වසතුලොභයෙන් ඒ නිධානය සමීපයෙහි සජීව උපන්නේය. අනික් සිටුපුත්‍රයෙක් ඒ මහාගඞ්ගාප්‍රවාහ දේසයෙහි තිස්කෙළක් ධන නිධාන කොට ධන තෘෂ්ණාවෙන් එහිම මූසිකව උපන්නේය. ඔවුන් දෙදෙනා වසන් නාවූ සථානයට වතුරු වන්නේය. ඔහු දෙදෙන දිය වන් මගින් නිමක් ගඟ සරස පිනාගෙණ ගොස් ඒ රාජකුමාරයන් එල්බගෙණ යන්නාවූ දඹුකඩ සමීපයට පැමිණ දෙන්නාම දෙකෙළවරට නැගී කඳපිට හොත්තාහුය, තවද එම ගංතෙර එක් දිඹුල්රුකෙක් ඇත, එහි ගිරාපෝතකයෙක් වසන්නේය, ඒ වෘක්ෂයත් දියෙන් මුල්සේදී ගඟ මත්තෙ හිය. ගිරාපෝතකයා වැසිවසින්ට පටන්ගත් කල්හි තැගී පලා යානොහී එම දඹුකඩෙහි එක්පසක උන්නේය. මෙසේ සතර දෙන එක්ව ගඟවතුරෙන් යන්නාහුය. එකල්හි අප මහබෝසතානෝ කසීරට ප්‍රසිඩවූ බ්‍රාහ්මණවංශයෙහි ඉපිද වැඩිවිය පැමිණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ ගඟ වක්කලමක පන්සලක් කොටගෙණ වාසය කරන්නාහුය. ඒ මහබෝසතානෝ මඛ්‍යම රාත්‍රිවේලෙහි සක්මන්කරන්නාහු ඒ රාජකුමාරයන්ගේ බලවත් වූ බැගෑපත් අඩ අසා මෙසේ සිතුය. මෙබදුවූ මෛත්‍රී කරුණාවෙන් යුක්තවූ තාපසයෙකු බලා සිටියදී මේ පුරුෂයාගේ මරණය සුදුසු නොවෙයි, දියෙන් ගොඩතඟා ඔහුව ජීවිතදානය දෙමි'' සිතා මහබෝසතානෝ ඕනව ''තොබව''යි කියා අස්වසා ගඟට බැස දියසරස පිනාගෙණ ගොස් ඒ දඹුකඩ එක් කෙළවරක් අල්වාගෙණ අදිනාහු නාගබල ඇති ශක්තිසම්පන්නවූ මහබෝසතානෝ එකවේග යෙන්ම ගංතෙරට පැමිණ කුමාරයන් ඔසවා ගෙණ ගොස් ගොඩ සිටුවා ඒනාග සජීවීනුත් ගොඩනංවා පන්සලට ගෙණගොස් ගිනිමොලවා ''මේ සජීවීහු තිරි සත් හෙයින් දුර්ලභවෙද්දැ''යි පළමුකොට ගිනිතැපවා සිත සන්සිඳුවා ආහාර දෙන්නාහු පළමුකොට සර්පාදීන්ටම දී පසුව රාජකුමාරයන්ට ඵලාඵල දුන්නා හුය, එකල රාජකුමාරයෝ ''මේ කුට තාපසයා මා රාජකුමාරය යි නොසිතා තිරිසනුන්ට සත්කාර සම්මාන කොට සම්භාවනා කරන්නේය''යි බෝධිසත්ත්ව යන් කෙරෙහි ආඝාත බැන්දේය.

ඉක්බිත්තෙන් කීපදවසක් ගියකල්හි ඇමදෙනම ඇඟබල ඉදි ඝන වතු රත් බටකල්හි සර්පයා තාපසයන් වැඳ කියන්නේ ''ස්වාමීනි, නුඹවහන්සේ විසින් මට බොහෝ උපකාරකරණලද, මම වූකලී දිළිඳුවූ එකෙකිමුත් නොවෙමි, අසවල්තැන මාගේ සතළිස් කෙළක් ධන නිධානකොට තිබෙන්නේය. නුඹ වහන්සේට වත්තුවෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි ඒ සියළු ධනය නුඹවහන් සේට දෙන්ව සමඵීයෙමි. ඒ සථානයට නුඹවහන්සේ අවුත් ''දීඝීය''යි කියා ''හඬගාළුව මැනවැ'' යි කියා ගියේය.

මීයාත් එසේම තාපසයන්ට වත්තුවෙන් පවරා ''අසවල්තැන සිව මූසික ය''යි කියා කැඳවුව මැනවැ යි කියා ගියේය. ගිරවා වූකලී තාපසයන්ට වැඳ කියන්නේ ස්වාමීනි නුඹබවහන්සේ විසින් බොහෝ උපකාර කරණලද්දේය,මට වස්තු තැන; නුඹවහන්සේට රත්අැල් සාලෙන් ප්‍රයෝජනයක් ඇතිකල්හි අස වල්තැන මා වසන්නාවූ තැනට අවුත් ''සුවපෝතකය''යි කියා අඬගාලුව මැනව, එකල මම මාගේ නැයන්ට කියා නොයෙක් සියගණන් ගැල්පුරණ පමණ රත් හැල් ගෙණදෙන්ට සමඵීයෙමි'' කියා ගියේය. රාජකුමාරයෝ වනාහි මිත්‍ර

ද්‍රෝණී බැවින් කිසිවක් නොකියාම ඒ බොධිසත්ත්වයන් තමන් සමීපයට ආකල මරමී, සිතාගෙණ ''සාමීනි, මා රාජ්‍යයෙහි පිහිටි කල්හි වැනියමැනවැ යි මම නුඹවහන්සේට සිවුපසයෙන් උපස්ථාන කෙරෙමි''යි කියා හියෝය.

ඒ රාජකුමාරයෝත් නුවරට ගොස් නොබෝ කලෙකින්ම රාජ්‍යයෙහි පිහිටියේය. බොධිසත්ත්වයෝ රාජකුමාරාදීන්ගේ සිත් පරීක්ෂාකෙරෙමි සිතා පළමුකොට සර්පයා සමීපයට ගොස් නුදුරුතැනක සිට ''දිඝීය'' යි කියා බැනවූ සේක. දීඝීයා එකවචනයෙන්ම නික්මඅවුත් බොධිසත්ත්වයන්ට වැඳ''කිමෙක්ද? සාමීනි, මෙතන සතළිස් කෙළක් ධන ඇත, ඒ සියළු වස්තුවම මැත්කරවා ගෙණ ගියමැනවැ''යි කීය. බොධිසත්ත්වයෝ ''එසේවීනම් වන්නාටය, මවකාරියක් පැමිණිකල ගන්නෙම්වේදැ''යි වදුරා සර්පයා රඳවාපියා මියා සමීපයටගොස් අඩගැවානුය. ඒ මූසිකයාත් එපරිද්දෙන්ම පිළිපන්නේය. බොධිසත්ත්වයෝ ඔවුන් නවතා ගිරාපෝතකයා සමීපයට ගොස් ''සුවපෝතකය''යි බැණවූය. ඒ ගිරවාත් එකවචතයෙන්ම ගස අතුඅගින් බැස බොධිසත්ත්වයන් වැඳ ''සාමීනි කිමෙක්ද? මාගේ තැයන්ට කියා හිමාලය වනප්‍රදෙශයෙන් නුඹවහන්සේට සයං ජාත හැල් හැරගෙන්වම්දැ යි විවාළෝය. බොධිසත්ත්වයෝ ප්‍රයෝජනයක් ඇති කල්හි දන්නෙම් වේදැ'' යි ඔහුද වලකා දැන් රජ්ජුරුවන් පරීක්ෂා කෙරෙමි ගොස් රාජෝද්‍යානයෙහි වැස දෙවෙනි දවස් ආකල්පිත සමාධි ඇතිව පිඬුසිඟන් නාවූ වනින් නුවරට වන්නාහුය.

එකෙණෙහි ඒ මිත්‍රද්‍රෝහී රජ්ජුරුවන් සරහා පිළියෙළකරණලද ඇත් කඳ මත්තට නැගී මහත්වූ පෙළහරින් නුවර පැදකුණු කෙරෙමින් ඒ රජ්ජුරුවෝ ඇත්කඳ මත්තේ හිඳ බොධිසත්ත්වයන් දුරදීම දැක මේ කුට තපසයා මා සමීපයේ වළඳ වළඳ, වසනු කැමතිව ආයේය. ඒකාලකන්නි යම්තාක් පණිත් මධ්‍යයෙහි තමා මට කළ ගුණ ප්‍රකාශකෙරේ නම් නපුර, ඊට පළමුකොටම ඔහුගේ හිස කප්පවමි යි සිතා රාජපුරුෂයන් මුණ බැලූයේය. රාජපුරුෂයෝ ''සාමීනි, කුමක් කරමෝදැ යි කීකල්හි ''මේ කුට තාපසයා මාගෙන් කිසිවක් ඉල්වනු කැමතිව ආයේය''යි සිතම්. ඒ කාලකන්නි තාපසයා මා දැක්ක නොදී ඔහු අල්වාගෙණ පිටිතල හයා බැඳ සතරමං සන්ධියක් පාසා මර මරා නුවරින් පිටත්කොට දන්ගෙඩියෙහිදී ඔහුගේ හිස කපා මිනිය ගෙණ ගොස් ඇනපිය ව''යි විධාන කළෝය. ඒ රාජපුරුෂයෝ ''රජ්ජුරුවන් කී බස් යහපතැ''යි පිළිගෙණ ගොස් නිරපරාධවූ මහබෝසතානන් බැඳගෙණ සතරමං සන්ධියේදී මරමින් දන්ගෙඩියට ගෙණයන්ට පටන්ගත්තාහුය. බොධිසත්ත්වයෝ මැරූ මැරූ තැන්හිදී ''මැනියෙනි, පියානෙනි'' නොකියාම නොහඬා නිර්භීතකාරීව මෙසේ කියන්නාහුය. මේ ලෝකයෙහි සමහර නුවණැති සත්ත්වයෙනෙක් දියෙන් යන්නාවූ විසලි දණ්ඩක් දියෙන් ගොඩනගාලීම යහපතැයි උතුමැයි කියන්නාහු වීනම් ඒ උත්තම ප්‍රාඥ පුරුෂයෝ සැබවක්ම නියති. කවර කාරණයකින්ද? ඒ දියෙන් තැගූ දඬුකඩ බත් ආදිය පිසීමටත් සීතයෙන් පීඩිතවූ සත්ත්වයන්ට සීත දුරුකරන්ටත් අන්‍යවූ සර්පාදීන්ගෙන් වන්නාවූ උපද්‍රව දුරුකරන්ටත් උපකාර වන්නේය, සමහර මිත්‍රද්‍රෝහීවූ අකෘතඥවූ පාපීවූ පුරුෂයා දියෙන් යන කල්හි අත අල්වා දියෙන් ගොඩනගාලීම යහපත් නොවන්නේය. ඒ එසේවේද? මේ පාපීවූ පුරුෂයා දියෙන් ගොඩනගා ගොඩලා මම්ම මට දුක්පමුණුවා ගත්

තෙම් වේදැ''යි මෙසේ ගෑසූ ගැසූ තැනදී මේ කාරණය කියන්නාහුය. එබස් අසා එතැනට රැස්වූ මනුෂ්‍යයන්ගෙන් යම්කෙණෙක් නුවණැත්තෝ වූ නම් ඔහු මෙසේ කීවාහුය.

''කිමෙක්ද? පින්වත්වූ තාපසයෙනි, තොප විසින් අපගේ රජ්ජුරුවන් වහන්සේට කළ කිසිගුණයෙක් ඇද්දැ''යි විවාළෝය. බෝධිසත්ත්වයෝ එපවත් අසා කියන්නාහු ''මම මොහු මිහවතුරෙන් යන්නාහු ගොඩනගා මම්ම මට දුක් කෙළෙමි, ඒකාන්තයෙන් පුරාතනයෙහි නුවණැත්තන් කීවා නොකෙළෙමි සිතා මෙසේ කියමි'' කීවාහුය.

එබස් අසා ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් හා නුවරවාසීහු මේ මිත්‍රද්‍රෝහීවූ රජ්ජුරුවෝ මෙබඳු ගුණසම්පන්නවූ තමන්ට ජීවිතදායය දුන්නාවූ තපස්වීන්ගේ ගුණ පමණකුත් නොදනිති, මුත් නිසා අපට වන වැඩෙක් නම් කොයින්ද? එසේ හෙයින් මොහු ගණුව''යි කිපි වචින් එක්ව කැට මුගුරු අඬයට ආදී පහරින් ඇත්කඳ මසනකයෙහිම රජ්ජුරුවන් මරා ජීවිතක්ෂයට පමුණුවා දෙකකුල් අල්වා ඇදගෙණ ගොස් අගලපිට දමා මහබෝසතානන් අභිෂෙක කොට රාජ්‍ය යෙහි පිහිටවූයය.

ඒ මහබෝසතාණෝ දැහැමෙන් රාජ්‍ය කරන්නාහු එක් දවසක් සක්‍රාදීන් පරීක්ෂාකරණු කැමතිව මනපිරිවරින් සජ්ජිය වසන තැනට ගොස් ''දීක්ෂිය''යි කියා බැණවූය, එවිට සජ්ජිය අවුත් වැඳ සවාමීනි නුඹවහන්සේ මේ වසතුව ගත මැනවැ''යි කීය. රජ්ජුරුවෝ සතළිස් කෙළක් වස්තුව අමාත්‍යයන්ට පාවාදී මීයා සමීපයට ගොස් ''මූසිකය''යි කියා බැණවූසේක. ඒ මීයාත් එබස් අසා අවුත් නිස්කෙළක් වස්තුව පාවාදුන්නේය. රජ්ජුරුවෝ ඒ වස්තුව අමාත්‍යයන්ට පාවාදී ගිරවා වසනතැනට ගොස් ''සුවපෝතකය''යි අඬගැසූය. ගිරවාත් ඒ අසා අවුත් දෙපය වැඳ ''කිමෙක්ද? සවාමීනි, රත්හැල් ගෙණෙම්දැ''යි කීය. රජ්ජුරුවෝ''ඇල්සාලෙන් ප්‍රයෝජනයක් ඇති කල්හි ගෙන්වාගණිමි''යි ''වරෝ යම් හ''යි කියා සැත්තෑ කෙළක් වස්තුව හා සමග තුන්දෙනාම කැඳවාගෙණ නුවරට ගොස් ප්‍රාසාදයෙහි මතුමහල්තලයට නැඟී වස්තු සංග්‍රහ කොට තබා සජ්ජියාට වසනු පිණිස රන් තලයක් කරවා මීයාට වසනු පිණිස ස්ඵටිකමාණික්‍යමයවූ ගුහාවක් කරවා ගිරවාට වසනු පිණිස රන්මැදිරියක් කරවා සජ්ජියාට හා ගිරවාට ගොදුරු පිණිස දවසක් පාසා රන්තට්ටුවේ මී හා විලඳ ලවා මීයාට ගොදුරුපිණිස සුවඳ ඇල්සහල් රන්තට්ටුවේ මී ලවා දී ඔවුන් තුන්දෙනාට සංග්‍රහකොට දානාදීවූ පින්කම් කළාහුය. මෙසේ සතරදෙනම දිවි පමණින් සමගි සතුටුව වැස ජීවි තාන්තයෙහි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහුය.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ ''මහණෙනි, දෙවදත්තසථවිරයෝ දැන් මතු මට වධකළෝ නොවෙයි, පෙරත් වධයට උත්සාහ කළෝම වේදැ''යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගලපා මේ සංචරකිර ජාතකය නිමවා වදාළසේක.

'එසමයෙහි දුෂ්ටවූ රජ්ජුරුවෝ තම් දැන් දෙවදත්තසථවිරයෝය, සජ්ජිය තම් ශාරීපුත්‍රසථවිරයෝය, මියා තම් මෞද්ගල්‍යාන සථවිරයෝය, ගිරවා තම් ආනන්දසථවිරයෝය. පසුව රාජ්‍යය කළ ධාර්මික රජ්ජුරුවෝ තම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ්ජුවූ මම්ම වේදැයි'යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 74
## රුක්ඛධම්ම ජාතකය

තවද අසරණසරණවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක්, දියදබරය නිසා තමන්ගේ නෑයන් මහත්වූ විනාසයට පැමිණෙන නියාව දුන ආකාශයෙන් ගොස් රෝහිණී නම් වූ ගංගාමස්තකයෙහි ආකාශයෙහි පලක් බැඳ වැඩහිඳ නිල්රැස් විහිදුවා ඒකාන්තිකාර කොට නෑයන් භයගන්වා ආකාශයෙන් බැස ගංතෙර වැඩහිඳ ඒ කලහය අරභයා මේ ජාතකය වදාළසේක.

මේ මෙහි සංක්ෂේපය විස්තරය වූකලී කුණාල ජාතකයෙහි මතු පහළ වන්නේය.

එසමයෙහි සම්බුදුරජාණන්වහන්සේ නෑයන්ට ආමන්ත්‍රණය කොට "මහරජ්ජුරුවෙනි, තොප ඔවුනොවුන්ගේ නෑයෝය, නෑයන් විසින් සමගි සතුටුව වසන්ට වටනේය යි නෑයන්ගේ සමගි බවක් ඇති කල්හි පසම්තුරෝ අවකාශ නොලබති, මනුෂ්‍යයන්ට තබා සිත්පිත් නැත්තාවූ වෘක්ෂයන්ගේ සමගිබව වන් නේය"යි "අතීතයෙහි හිමාලය වනප්‍රදේශයෙහි මහපවතෙක් සල්වනයෙක තරකොට හැමීය, ඒ සල්වනය ඔවුනොවුන් හා මහරුක් පැලැටිගස් කැලෑ ලතා ආදියෙන් වැළඳගත් බැවින් එක රුකකුත් එලවන්ට අසමර්ථව මුදුනෙන් මුදු නෙන්ම මහත් පවන් හමාගියේය. ලතා ආදියෙන් වැළඳගැන්මක් නැතිව එලි යෙහි සිටියාවූ අතුපතර වෙලෙප් ආදියෙන් විශාලවූ එක් මහරුකක් සෙසු රුක් සේ එකාබඳ නොවූ බැවින් ඒ රුක් මූලිනුදුරා එලාපුයේය. මේ කාරණයෙන් තොප හැමදෙනා විසිනුත් සමගිව සතුටුව වසන්නට වටනේයයි වදාරා ඒ නෑයන් විසින් ආරාධිතවූ බුදුනු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණකල්හි පළමුකොට උපන්නාවූ වෙසවුණු රජ්ජුරුවෝ චුතවූය. ශක්‍ර දෙවේන්ද්‍රයෝ අන් වෙසවුණු රජ්ජුරුකෙනෙකුන් නායකත්වයෙහි තුබ්බහ. ඒ වෙසවුණු රජ්ජුරුවන් ඉකුත්වූ කල්හි පසුව උපන් වෙසවුණු රජ්ජුරුවෝ "මහ රුක් ගස් කැලැලිය ආදීන් අතුරෙන් තමන් කැමති කැමති තෙනක විමන් ගණිත්වයි කියා අසුන් යවූය.

එසමයෙහි අප මහබෝසතාණන් හිමාලය වනප්‍රදෙශයෙහි එක් සල්වන යක වෘක්ෂදෙවතාව උපන්නාහු හ. ඒ බොධිසත්ත්වයෝ නෑයන්ට කියන්නාහු "තෙපි හැම විමන් ගන්නාහු එලියේ සිටි වෘක්ෂවල විමන් නොගණුව. තෙපි මේ සල් වනයෙහි මා විසින් ගන්නාලද විමානය පිරිවරා විමන්ගණුව"යි කිවූය. ඒ බොධිසත්ත්වයන් කීවා කරන්නාවූ නුවනැති දේවතාවෝ බොධිසත්ත්වයන්ගේ විමානය පිරිවරා වටසිට සල්ගස්වල විමන්ගත්තාහුය. "නුවණැත්තාවූ දේව තාවෝ අපට වනයෙහි විමානයෙන් ප්‍රයෝජන කිම්දැ"යි මනුෂ්‍යපථයෙහි ගම් නියම්ගම් රාජධානිවල විමන් ගණුම්හ. ගම් ආදිය නිසා වසන්නාවූ දෙවතාවෝ ලාභයෙන් හා යසසින් අග්‍රබවට පැමිණෙති"කියා මනුෂ්‍යපථයෙහිම මගළුවල අවගත්තා වූ මහරුක්වල විමන් ගත්තාහුය.

ඉක්බිත්තෙන් එක් දවසක් මහත්වූ වැසිසුලහෙක් උපන්නේය. පවන් ඉතා තද බැවින් ගැඹුර බට මහමුල් ඇති වනස්පතිවෘක්ෂයෝ බිඳිසිදිගිය අතු හා

වෙලෙප් ඇතිව මුලිනුපුටා වැටී ගියාහුය. ඒ මාරුතය ඉතා වණ්ඩවූයේය. එසේ හෙයින් ඔවුන් හා එක්ව බැඳිසිටියාවූ සල්වතයට පැමිණ ඇත මැත බලා පහර මින් එක රුකකුත් එලන්ට අසමර්ථවිය. භග්නවිමානයන් ඇති දෙවියෝ අන් පිළිසරණක් නැතිව දරුවන් ගෙණ හිමාලවතයට ගොස් තමන්ගේ පවත් සල් වතල්යෙහි දෙවියන්ට කීවාහුය.

ඒ සල්වතයෙහි දේවියෝ මනෂ්‍යපථයෙහි දෙවියන් ආ නියාව බෝධි සත්ත්වයන්ට කීවාහුය. එබස් ඇසූ බෝසතානෝ "නුවණැත්තන්ගේ බස් නොගෙණ පිහිටක් නැති තෙනට ගියාවූ සත්ත්වයෝ නම් මෙබඳුම වන්නෝ වේ දැ"යි කියා ධර්මදෙශනා කළාහුය.

පින්වත්වූ දෙවතාවෙනි, ඔවුනොවුන් හා එක්ව බැඳී නොසිටි, වතයෙහි අවගත්තාවූ වෘක්ෂයා මහපවනින් මුලිනිපුටා හෙලන්නේය. එසේහෙයින් අවෙ තස්කවූද සවෙතස්කවූද සියල්ලටම සමගිබව උතුම් වන්නේය"යි මෙසේ මහ බෝසතානෝ මේ කාරණය කියා වෘක්ෂදෙවතාවන්ට අවවාද කොට යවා ආයුස යාගේ කෙළවර කම්වූපරද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජානන් වහස්සේ මෙසේ "මහරජදරුවෙනි, නැයන්ගේ සමගිවීම යහපත් වන්නේය. එසේහෙයින් සමගි සතුටුව ප්‍රියසංවාසයෙන් වස ව"යි මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ රුක්ඛධම්මජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි දෙවතාවෝ නම් දැන් බුදුපිරිසය, නුවණැති වෘක්ෂදෙවතා වූයෙම් ත්‍රිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මවේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 75 මච්ඡජාතකය

**ත්‍රි**වද එක්සමයෙක්හි සශ්‍රීකවූ මුඛපද්මයක් ඇති ත්‍රිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසනසේක් තමන්වහන්සේ විසින් වස්වන ලද වර්ෂාවක් අරභයා මේ ජාතකය වදාළසේක.

එසමයෙහි කොසොල්රට වැසි නොවැසීමෙන් ගොයම් ආදිය මියන් නේය. ඒ ඒ තැන වැව් පොකුණු විල් ආදිය වියළී ගියේය. ජේතවන දෙරටුව සමීපයෙහිවූ ජේතවන පොකුණෙහිත් පැන් සිදීගියේය. කලල්යට වැදහොත් තාවූ මස්කැස්බන් කපුටුවන් හා උකුස්සන් ආදීවූ පක්ෂීහු හුල් හා සමානවූ තුඩින් ඇන මැන් මැන්කොට සල්ව සල්වා අනුභවකරන්නාහුය.

සර්ව්‍වඥයන්වහන්සේ මස් කැස්බන්ට පැමිණියාවූ ව්‍යසනය දැක මහා කරු ණාවෙන් මෙහෙයනලද සිත් ඇතිව "අද මා විසින් වැසි වස්වන්ට වටනේය"යි පාන්වූකල්හි සිවුරු පිළිදෑහ පිඬු සිඟන වේලාව සලකා මහත්වූ භික්ෂුසඞ්ඝයා වහන්සේ විසින් පිරිවරණලදුව මහත්වූ බුඩවිලාසයෙන් සැවැත්නුවරට පිඬුසිඟා වැඩ වළඳා අන්තයෙහි සැවැත්නුවරින් විහාරයට වඩනාසේක් ජේතවන පොකු ණෙහි පියගැටමත්තේ වැඩසිට අනඳමහතෙරුන් වහන්සේට වදාරණසේක් "ආනන්දස්ථවිරයෙනි, ජලසාටිකාව ගෙණෙව, ජේතවනපොකුණෙන් පැන් සන හම්"යි වදාළසේක. "ස්වාමීනි, ජේතවන පොකුණේ පැන් සිදීගියේය. කලල්

මඩ පමණක්ම තිබුයේ නොවෙයි'' දැන්වූ සේක. ''ආනන්දස්ථවිරයෙනි, සම්බුදුයන්ගේ ආනුභාව තම් ඉතා මහත, එසේහෙයින් තෙපි ජලසාටිකාව ගෙණෙව''යි වදළසේක.

එඛස් ඇසූ අනදමහ තෙරුන්වහන්සේ ''යහපත සවාමීනි,'' කියා ජලසාටිකාව ගෙණවුත් දුන්සේක. සම්බුදුයන්වහන්සේ ජලසාටිකාව එක් කෙළවරක් ඇඳ එක්කෙළවරකින් ශරීරය වසා ''ජේතවන පොකුණෙන් ජලස්නානය කෙරෙමි''යි පියගැටමත්තේ වැඩසිටි සේක.

එකෙණෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උනුවිය. ඒ ශක්‍රදෙවේන්ද්‍රයෝ ''කිමෙක්ද්‍යේනෝසි'' පරීක්ෂාකරන්නාහු ඒ කාරණාව දැන වස්සවලාහක දිව්‍යපුත්‍රයා කැඳවා ''දරුව, 'සම්බුදුයන්වහන්සේ ජේතවන පොකුණෙන් පැන්සනහමි''යි මුදුන් පියගැටමත්තේ වැඩසිටි සේක. වහා සියලු කොසොල්රට එක මෙඝය කොට වර්ෂාව වස්ව''යි විධාන කොළෝය.

ඒ වස්සවලාහක දිව්‍යපුත්‍රයා ''යහපතැ''යි ගිවිස එක්වලාවක් ඇඳ එක්වලාවක් පෙරව මෙඝගීතිකා ගායනා කෙරෙමින් නැගෙනහිර සක්වලට අභිමුඛව නික්මුනේය. එකෙණෙහි නැගෙණහිර දිසාභාගයෙහි කළවිටිමඬලක් පමණ එක් මෙඝමණ්ඩලයක් නැගී ක්‍රමයෙන් ශතපවල සහස්‍රපටල ගර්ජනා කෙරෙමින් විදුලිය ගස්වමින් කිබිසිනි කොට තබනලද පැන්කලයක් මෙන් වසිමින් සියලු කොසොල්රට මහවතුරෙන් සලා දිවන්නාක් මෙන් වැටුනේය. වර්ෂා ධාරා නිපාතයෙන් වස්නට පටන්ගත්කල්හි මද ඇසිල්ලකින්ම ජේතවන පොකුණ පිරී ගියේය. මුදුන්පියගැට වසා පොකුණේ පැන් පිරී ගියේය. එකෙණෙහිම සම්බුදුයවහන්සේ ජලස්නානය කොට රත්වූදෙපට අඳනසිවුරු ඇඳ ඊමත්තේ පටිඛාතුව බැඳ සුගත මහචීවරය එකාංශකොට පෙරව භික්ෂුසඞ්ඝයා වහන්සේ පිරිවරා ගොස් ගඳකිළිමලුයේ පණවනලද බුඛාසන මස්තකයෙහි වැඩහිඳ භික්ෂු සඞ්ඝයාවහන්සේ විසින් වත්දැක්වූ කල්හි නැගීසිට මැණික්මයවූ සඳකඩපාණ මත්තෙහි වැඩසිට භික්ෂුසඞ්ඝයාවහන්සේට අවවාද දී යවා සුගන්ධගන්ධකුටියට වැද දකුණැලයෙන් සිංහසෙය්‍යාවෙන් සැතපී වදළ සේක.

සවස්වේලෙහි දම්සභාමණ්ඩපයෙහි රැස්ව හුන්නාවූ භික්ෂූන්වහන්සේ ''ඇවැත්නි, දසබලධාරීවූ බුදුරජානන්වහන්සේගේ ක්ෂාන්තිකරුණා සම්පත්තියක් බලව, නොයෙක් සත්ත්වයන් මියන්ට පටන්ගත් කල්හි නොයෙක් විල් පොකුණු ආදිය වියලෙන්නව පටන්ගත් කල්හි මස්කැස්බන් මහදුකට පැමිණෙන්ව පටන්ගත් කල්හි කරුණාව නිසා ''මහජනයා දුකින් මුදම්'' ජලසාටිකාව හැඳ ජේතවන පොකුණෙහි පියගැටමත්තේ සිට මද ඇසිල්ලකින් සියළු කොසොල්රට මහවතුරෙන් උල්පවා පියන්නාක් මෙන් වැසිවස්වා මහජනයා කායික චෛතසික දුකඛයෙන් මුදා විහාරයට වන්සේක් වේද''යි කථාකෙරෙමින් සිටිකල්හි ගඳකිළියෙන් නික්ම දම්සභාමණ්ඩපයට වැඩ ''මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුද''යි විචාරා වදාරා මෙතම් කථාවකින් යුක්තව උනුම්හ''යි කීකල්හි ''මහණෙනි, සම්බුදුවරයෝ මහජනයා දුකින් පීඩිතවන්ට පවන්ගත් කල්හි දැන් මතු නොවෙයි, පෙරත් තිරිසන් යෝනියෙහි ඉපිද මත්ස්‍යරාජ කාලයෙහිත් වැසි වැස්වූවෝම වේද''යි වදාරා ඉකුත්වත් දක්වා වදළ සේක.

යි වගිය දවස මෙම කොසොල්රට මෙම සැවැත්නුවර මෙම ජෙතවන පොකුණ පිහිටිතැන වැල්කැලයෙන් ගැවසීගත්තාවූ එක් කඳුරැලියක් විය. එසමයෙහි මහබෝසතාණෝ මත්ස්‍යයෝනියෙහි ඉපිද මත්ස්‍ය සමූහයා විසින් පිරිවරණලදුව ඒ කඳුරැලියෙහි වසන්නාහුය. "දැන් යම්සේද? එපරිද්දෙන්ම එසමයෙහිත් ඒ රට වැසි නොවටුයේය. මනුෂ්‍යයන්ගේ ගොයම් මියගියේය. වැව් ආදිය සිදී ගියේය. මස්කැස්බෝ කලල්යට වත්තහුය, මේ කඳුරැලියෙහිත් මත්ස්‍යයෝ කලල්යට වැද ඒ ඒ තැන සැඟවුනාහුය. කපුටු ආදීහුත් තුඹින් ඇන මැත්කොට කන්නාහුය.

මහබෝසතාණෝ ඤාතිසමූහයාට පැමිණියාවූ ඒ ව්‍යසනය දැක මොවුන්ට උපන්නාවූ මේ දුකඛය මා හැර අනික් මුදන්ට සමර්ථ එකෙක් නැතැ"යි සත්‍ය ක්‍රියා කොට වැසිවස්වා කැයන් මරණදුකින් මුදනුපිණිස කලුවූ මඩ දෙබැකොට පීරා නික්ම අහුරු කැටයක් වැනිවූ මහාමත්ස්‍යයාණෝ මකාකොට ගානලදලෝහි තංක මාණික්‍යයක් හා සමානවූ ඇස්දෙක දල්වා ආකාශය බලා වස්සවලාහක දිව්‍යපුත්‍රයාට අඬගා කියන්නාහු 'පින්වත්වූ වස්සවලාහක මම නැයන් නිසා දුකට පැමිණියෙමි, සිල්වත්වූ මා දුක්විඳිමින් සිටියදී තෝ කවර කාරණයකින් වැසි නොවස්වන්නෙහිද? මා විසින් සවජාතිමාංසය කන්නාවූ මත්ස්‍යයෝනියෙහි ඉපිද සාලවක් සා පමණවූත් මත්ස්‍යයෙක් කැවිරූ නැත්තේය, මා විසින් අන් ප්‍රාණියකුත් ජීවිතයෙන් තොරකළවිරුත් නැත්තේය, මේ සත්‍යයෙන් වැසිවස්වා මාගේ ඤාතිසමූහයා දුකින් මුදව"යි කියා පරිවාරික කෙල්ලෙකුට විධාන කරන්නාක්හු මෙන් වස්සවලාහක දිව්‍යපුත්‍රයාට විධාන කරන්නාවූ මහබෝසතාණෝ මෙසේ කිවුය.

"පින්වත්වූ වස්සවලාහක දිව්‍යපුත්‍රය තෝ ගර්ජනා කොට විදුලිය ගසා වර්ෂාව වස්වා කපුටුසමූහයා කලල්යට වැදසිටියාවූ මත්ස්‍යයන් තුඹින්හැන මැත් කොට කන්නවුන් දියෙන් සඟවා ඒ කපුටුවන්ගේ මත්ස්‍යනිධානය නසාපියව. තවද කපුටු සමූහයා මේ කඳුරැලිය දියෙන් පිරීගියකල්හි මත්ස්‍යයන් නොලැබ ශෝකකරන්නේය. ඒ කපුටු සමූහයා තෝ මේ කඳුරැලිය පුරමින් සෝකාග්නියෙන් දවාපියව, මාත් මාගේ නැයනුත් සියල්ලවුන්ම මේ මරණ සෝකයෙන් ගලවාපිය" කියා මෙසේ මහබෝසතාණෝ පරිවාරක සේවකයක්හට ආඥාකරන්නාක් මෙන් වස්සවලාහක දිව්‍යපුත්‍රයාට විධානකොට මහවැසි වස්වාමහජනයා මරණ දුකින් මුදා ජීවිතානන්තයෙහි කම්වූ පරිද්දෙන් මියපරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මහණෙනි, සම්බුදුයන් වහන්සේ දැන් මතු වැසි වැස්වූවෝ නොවෙති, පෙරත් මත්ස්‍යයෝනියෙහි ඉපිදත් වැසි වැස්වූවෝ වේදැ" යි වදාරා මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ මත්ස්‍ය ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි මත්ස්‍ය සමූහයා නම් දැන් බුදුපිරිසය. වස්සවලාහක දිව්‍ය පුත්‍රයා නම් ආනන්දස්ථවිරයෝය එසමයෙහි මත්ස්‍ය රජ්ජුරුවෝ නම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

## 76 අසංකිය ජාතකය

තවද එක්සමයෙක්හි අපොතානතර ශත මඩගල ලක්ඛණයෙන් විරාජමානවූ ශ්‍රීපාද ඇති තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසතසේක්. සැවැත්නුවර වාසිවූ එක් උපාසකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ උපාසකයානන් ශ්‍රොතාපන්නවූ ආර්‍ය්‍ය ශ්‍රාවකය, ඒතෙම කිසිකටයුත්තක් නිසා ගැල්සාත්තුනායකයකු හා සමග මාර්ගයෙහි යන්නේ එක් වල්කඩක ගැල්මුදු කඳවුරු බැඳිකල්හි සාත්තුනායකයාට නුදුරුතැනෙක එක්කරගසක් මූල සක්මන් කරන්නේය. එකල්හි පන්සියයක් සොරු තමන් සොරකම් කරන්ට කල් පරීක්ෂා කොට ඒ කඳවුර කොල්ලකමිහ' යි දුනුමුගුරු ආදිය ගෙණ ඒ ස්ථානය පිරිවරා ගත්තාහුය.

එකල්හි උපාසකයෝ සක්මන් කෙරෙත්මය, සොරහු ඒ උපාසකයා දැක ඒකාන්තයෙන් මෙතෙමේ මේ සභාණ්ඩාගාරය රක්ෂාකරන්නාවූ පුරුෂයෙක්වන, එසේ හෙයින් මොහු නිදන්ට වන්කල්හි පැහැරපියා ගම්හ''යි සිතා බලාත්කාරයෙන්ම මැඩගෙන වැදගතනොහී ඒ ඒ තැනම සිටියාහුය. ඒ උපාසකයෝත් ප්‍රථමයාමෙහිත් මධ්‍යමයාමෙහිත් පශ්චිමයාමෙහිත් සක්මන් කෙරෙමින්ම සිටියාහුය. අළුයම් වේලා වූ කල්හි සොරු අවසරයක් නොලැබ ගන්නාලද කැටමුගුරු ආදිය දමා ගියාහුය.

උපාසකයෝත් තමන් ගිය කළමනා කාරිය නිම්වා කොටගෙණ අවුත් බුදුරජානන්වහන්සේට නමස්කාර කොට ''සවාමීනි තමා රක්නා කෙණෙක් අනුන් රක්නාහු නම් වෙද්ද?''යි විමසූහ. ''එසේය උපාසකය තමා රක්නා එකෙක් අනුන් රක්නේය. අනුන් රක්නා එකෙක් තමා රක්නේය''යි වදාළසේක.

එබස් ඇසූ උපාසකයා ''සවාමීනි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ විසින් මේ කාරණය වදාළ නියාව ඉතා යහපත් වන්නේය, මම එසේ එක සාත්තුනායකයකු හා සමග මගට පිළිපැද රැකක්මුල සක්මන් කරන්නෙමි මා රකිම්''යි සියළු සාත්තුවන් රැකෙම් යි කිහ. සර්වඥයන් වහන්සේ ''උපාසකය, පෙර නුවණැත්තෝ තමන් රක්නෝ අනුන් රැක්කෝම් වේද''යි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළ සේක.

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතාණෝ බ්‍රාහ්මණකුලයෙක්හි ඉපිද වැඩිවිය පැමිණ කාමයෙහි ආදීනව දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලය වනයෙහි වසන්නාහු ලුණුඇඹුල් සෙවුනා පිණිස ජනපදයට අවුත් ජනපද චාරිකා කෙරෙමින් එක් සාත්තුනායකයකු හා සමග මගට පිළිපැද එක් වනප්‍රදේශයක සාත්තුව විසූකල්හි සාත්තුවට නුදුරුතැන ධ්‍යානසැපයෙන් දවස් යවමින් එක්තරා රුක්මුල සක්මන් කෙරෙමින් සිටියාහුය.

එකල්හි පන්සියයක් සොරු සවස බත් අනුභවකළ කල්හි ඒ ගැල් සාත්තුනායකයා පැහැරපියා උදුරා ගණුම්හ යි අවුත් වටලාගත්තාහුය. ඒ සොරු සැමදෙන තාපසයන් දැක ඉදින් මේ තාපසයෝ අප දුටුහු නම් සාත්තු

වෑසීන්ට කියති, එසේනෙයින් මුන් නිදන්වවන් කල්හි පැහැරපියමිහ''යි කියා එතැන්හිම සිටියාහුය. මහබෝසතානෝ ඒ වේලෙහි පවත් සකල රාත්‍රියෙහි සක්මන් කළාහුය. සොරු අවසර නොලැබ ගත්තාවූ කැටමුගුරු ආදිය දමා ගැල්සාත්තුවෙහි වසන්නාවූ සත්ත්වයන්ට කවහඬ පෑ ''පින්වත් සාත්තුවාසීනි ඉදින් මේ ගසමූල සක්මන් කරන්නාවූ තාපසයෝ අද නුවූවෝනම් තොපි හැම දෙනම මහත් විනාශයට පැමිණෙන්නාහුමය. එසේනෙයින් සෙට මේ තාපස යන්ට මහත්වූ සත්කාර සම්මානකරව''යි කියා ගියාහ. ඒ සාත්තුවාසීවූ සත්ත්වයෝ පාන්ව ගිය කල්හි සොරුන් දැමූ කැටමුගුරු ආදිය දැක භයපත්ව බොධිසත්ත්වයන් සමීපයට ගොස් වැඳ ''ස්වාමීනි, නුඹවහන්සේ විසින් සොරු දක්නාලද්දාහුදැ''යි විවාළෝය, ''එසේය, පින්වත්නි, දක්නාලද්දාහ''යි කී කල්හි ''ස්වාමීනි, මෙතෙක් සොරුන් දැක භයෙක්වත් තැතිගැන්මෙක් නූපදිනිදැ''යි විවාළෝය.

මහබෝසතානෝ කියන්නෝ ''පින්වත්නි, සොරුන් දැක භය තම් වස්තු ඇති කෙණෙකුන්ට වන්නේය, මම වූකලී නිඃධනයෙමි, එසේවූ මම කුමක්පිණිස බිම්දැ''යි කිවුය. තවද ''ගමත් වලත් වසන්නාවූ මට භයෙක්වත් තැතිගැන්මෙක්වත් නැතැ''යි කියා ධර්මදේශනා කරන්නාවූ මහබෝසතානෝ මෙසේ කිවුය. ''පින්වත්නි, මම ගම්හි වසන්නේ මුත් ග්‍රාමෝපචාරයෙන් විනිර්මුක්ත වව වසන්නේ මුත් සංකාවෙක නොසිටි බැවින් සංකාවක් භයක් නැත්තෙමි, පිරිසිදු සිල් ඇති බැවින් කායවචී මනොවංක විරහිත වූයෙමි සෘජුව දිව්‍යලෝක මාර්ගයටත් නැගෙමි. එයින් මත්තේ මෙත්තා කරුණා දෙක්හි පිහිටි බැවින් සෘජුව බ්‍රහ්මලෝක මාර්ගයටත් නැගෙමි''යි මෙසේ මහබෝසතානෝ ධර්මදේශනා කොට සතුටුවූ සිත් ඇති මනුෂ්‍යයන් විසින් කරණලද පූජාසත්කාර ඇත්තාහු දිවිපමණින් සතරබ්‍රහ්මවිහාර භාවනා කොට බ්‍රහ්මලොකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වාවදාරා පූර්වාපරසන්ධි ගළපා **මේ අසංකිය ජාතකය** නිමවා වදාළසේක.

''එසමයෙහි සාත්තුනායකවාසී මනුෂ්‍යයෝ නම් දැන් බුදුපිරිසය, එසමයෙහි තපස්වී වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මවේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 77 මහාසුපින ජාතකය

එවද එක්සමයෙක්හි දිගුපුළුල් නිල්නුවන් ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවරම්වෙහෙර වසතසේක් සොළොස් මහසුපිනයක් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් දවසක් කොසොල් මහරජ්ජුරුවෝ රාත්‍රියෙහි නිද්‍රාවව පැමිණි පශ්චිම යාමෙහි සොළොස් සුපිනයක් දැක භයින් ත්‍රස්තව පිබිද ''මේ සුපිනයන් දුටු බැවින් මට කුමක් වේදෝහෝ''යි මරණභයින් භයපත්ව යහන්පිට හිඳම පාන්කොටූයය.

ඉක්බිත්තෙන් පාන්වූ කල්හි ශානති බ්‍රාහ්මණයන් හා පුරෝහිත බ්‍රාහ්ම
ණයෝ රජ්ජුරුවන් කරා පැමිණ ''සිවාමිනි, රජ්ජුරුවන් වහන්ස, රාත්‍රියෙහි
සැපයේ විසූසේක්ද''යි විචාළෝය. ''ආචාරිවරයිනි, මට සැපයෙක් නම්
කොයින්ද? අද මම අළුයම් වේලෙහි සොළොස් සුපිනයක් දුටිමි. මම ඒසුප්
නයන් දුටු වේලේ පටන් භයපත්වීමි; ආචාරිවරයිනි, එහි දෝෂය කියව''යි
කිවුය. ''සුපිනයන් අසා දන්නමෝවේද''යි කී කල්හි බමුණන්ට රජ්ජුරුවෝ
දුටුවාවූ සුපිනය කියා ''කිමෙක්ද? මට මේ සුපිනය දුටු කාරණයෙන් කුමක්
වේද''යි විචාළෝය. එබස් ඇසූ බමුණෝ අතසැලුය. රජ්ජුරුවන් විසින්
''කවර කාරණයකින් නොපි අත්සලව්ද''යි විචාළ කල්හි ''මහරජ්ජුරුවන්
වහන්ස, ඒ සුපිනය ඉතා කකීශවූ භයංකාරවූ ''සුපිනයකැ''යි කිහ. ''ඒසුප්
නයෙහි විපාක කවරේදැ?''යි විචාළ කල්හි රාජාණනාරාශය, භොගාණනාරාශය,
ජීවිතාණතරාශය යන මේ ත්‍රිවිධවූ අණතරාශයන් අතුරෙන් එක්තරා අන්තරා
යෙක් වන්නේය''යි කිවුය. ''ඒ සුපිනයට ප්‍රතික්‍රියා කළහැකිද''යි විචාළේය.
''ඒකාණතයෙන් මේ සුපිනය ඉතා තද බැවින් ප්‍රතික්‍රියා කළ නොහැක්කේය,
අපි වූකලී ඒ සුපිනයට පිළියම් කරම්හ'' යි ''ඒ සුපිනයෙහි දෙෂ පහකොට
පියන්ට අසමර්ථවූ අපගේ ශාස්ත්‍රය ඉගැන්මෙන් ප්‍රයෝජන කිම්ද?''යි කිවුය.
''කුමක් කොට් ඒ දෙෂ දුරුකරවිද''යි විචාළේය. ''මහ රජ්ජුරුවන්වහන්ස,
සියල්ලෙන් සතරක් සතරක් නියායෙන් සර්වචතුෂ්ක නම්වූ යාගයක් කරම්හ''යි
කිවුය. රජ්ජුරුවෝ භයින් ත්‍රස්තව ''එසේ වී නම් ආචාරිවරයිනි, මාගේ ජීවිතය
තොප ඇම අතය, මට වහා සුසථයක් කරව''යි කිවුය.

එබස් ඇසූ බමුණෝ ''බොහෝ වස්තූන් ලබම්හ, බොහෝ කනබොන දැන්
ගෙන්වාගණුම්හ''යි බලවත් සන්තෝෂයෙන් යුක්තව ''මහරජ්ජුරුවන්වහන්ස
නුඹවහන්සේ නොබා වදාළ මැනවැ''යි කියා රජ්ජුරුවන් අස්වසා මාලිගාවෙන්
නික්ම නුවරින් පිටතට යාගාවාටයක් කොට බොහෝ චතුෂ්පාද ජාතීන්
යාගසථම්භයේ බැඳ බොහෝ පක්ෂි සමූහයාත් ගෙණවුත් ''මේ මේ දැ ලද මැන
වැ''යි නැවත නැවත ඔබිනොබ ඇවිදිනාහුය.

එකල්හි මල්ලිකාදේවි ඒ කාරණය දැන රජ්ජුරුවන් කරා ගොස් ''මහ
රජ්ජුරුවන් වහන්ස, බමුණෝ නැවත නැවත ඇතමැත ඇවිදිති, කිමෙක්ද?''යි
විචාළිය, එබස් අසා රජ්ජුරුවෝ කියන්නෝ ''පෝසත්ව ඇවිදිනා තෙපි අපගේ
කම්මුල සර්පයන් ඇවිදිනා නියාව නොදන්නවාදැ?''යි කිවුය. ''මහරජ්ජුරුවන්
වහන්ස, මේ කුමක් කී නියාදැ?''යි විචාළ කල්හි මා විසින් මෙබඳු සුපිනයක්
දක්නාලද සුපිනයෙහි විපාක බමුණන් අතින් විචාළ කල්හි බමුණෝ ''ත්‍රිවිධ
අන්තරායන් අතුරෙන් එක්තරා අන්තරායෙක් පෙණෙයි කියා ඒ අන්තරාය වල
කන පිණිස යාගකරම්හ''යි කියා නැවත නැවත ඇවිදිති''යි කිවුය. ''කිමෙක්ද?
මහරජ්ජුරුවන් වහන්ස, දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූ ලෝකයෙහි අග්‍ර බ්‍රහ්මණයා
නන් අතින් නුඹවහන්සේ විසින් දක්නා ලද්දාවූ සුපිනයට ප්‍රතික්‍රියා විචාරණ
ලදදැ?''යි කිවුය. ''සොඳුර, ඒ දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූ ලෝකයෙහි අග්‍ර බ්‍රාහ්ම
ණවූවෝ කවුරුදැ?''යි විචාළෝය. ''සිවාමිනි, දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූ ලෝක
යෙහි අග්‍රපුද්ගලවූ සර්වඛමීශයන් සර්වාකාරයෙන් විශෙෂයෙන් දන්නාවූ පිරිසිදු
විත්තාසනනාන ඇති නික්ලේශීවූ මහාබ්‍රහ්මයානන් වහන්සේ නාඳුනන සේක්ද?
ඒහාග්‍යවත් බුදුරජානන්වහන්සේ වනාහි සුපිනයෙහි තොරතුරු දක්නාසේක.

වැඩියමැතව, මහරජ්ජුරුවන්වහන්ස, ඒ සම්බුදුරජාණන්වහන්සේ අතින් වචාළ මැත වැ"යි කිවුය. "රජ්ජුරුවෝ යහපත දේවීනි" කියා විහාරයට ගොස් බුදුරජාණන්වහන්සේට තමස්කාර කොට උන්නාහුය.

සම්බුදුරජාණන්වහන්සේ මධුරස්වර විහිදුවා "කිමෙක්ද? මහරජ්ජුරුවෙනි, ඉතා උදැසනම අවුදැ?"යි වදාළසේක. "ස්වාමීනි, මම අළුයම්වේලෙහි සොළොස් සුපිනයක් දැක භයින් ත්‍රස්තව බමුණන්ට කීමි. බමුණෝ ඒ අසා "මහරජ්ජුරුවන්වහන්ස, ඒ සුපිනය නම් ඉතා තද රුක්ෂවූ සුපිනයක, ඒ දුටු සුපිනය විනාශ කරණු පිණිස චතුෂ්කයෙන් යාගයක් කරමිහ"යි කියා යාගය සරහති, එසේහෙයින් බොහෝ ප්‍රාණීහු මරණභයින් භයපත්ව සිටියාහ. නුඹවහන්සේ වූකලී දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූ ලෝකයෙහි අග්‍රපුද්ගලසේක, යමක් නුඹවහන්සේගේ ඥානමුඛයට හමුනොවේ නම් එසේවූ අතීතානාගත වර්තමානයෙහි උපන්නාවූ කිසිම පදාර්ථයෙක් නම් නැත්තේය. එසේහෙයින් ස්වාමීනි, බුදුරජාණන්වහන්ස, මේ සුපිනයෙහි විපාක වදාළ මැනව"යි කිවුය. 'මහරජ්ජුරුවෙනි, ඒ එසේමය, දිව්‍ය මනුෂ්‍යයන් සහිතවූ ලෝකයෙහි මේ සුපිනයන්ගේ තොරතුරු විපාක දක්නට මා හැර අන් සමර්ථ කෙණෙක් නම් නැත්තාහුය, එසේහෙයින් මම තොපට කියම්, එතකුදුවුවත් තොප දුටුසැටියේම සුපිනය කියව"යි වදාළ සේක. "යහපත ස්වාමීනි" කියා රජ්ජුරුවෝ දුටුසැටියේම සුපිනය කියන් නාහු.

**"උසභා රුක්ඛාගාවියො ගවාව අස්සා සංසො**
**සිගාලිච කුම්භිලා පොක්ඛරණිච අපාඛ චඳනං**

**ලාපුනි සීදන්ති සිලාපලවන්ති මණ්ඩූකියො කණ්හසප්පෙ ගිලන්ති,**
**කණ්හාසුමණ්ණා පරිවාරයන්ති තස්සාවකා ඵලකානං භායනීති"**

යන මේ මාතෘකාව සිත තබා සුපිනය කීවාහුය. කෙසේ කිවුද; යත්; "ස්වාමීනි, මම එක් සුපිනයක් මෙසේ දිටිමි:- අසූදහසක් වූ කාලවෘෂභයෝ සතරදෙනෙක් යුධ කරම්හ"යි සතරදිගින් රාජාංගනයට අවුත් වෘෂභ යුධය බලව්හ"යි මහජනයා රැස්වූ කල්හි යුධකරන්නාවූ ආකාර දක්වා ගර්ජනා කොට ඒ ඒ අත පලායන්නාහ. මේ පළමුවන සුපිනය දිටිමි. "මේ සුපිනයට විපාක කවරේද?"යි විචාළෝය. "මහරජ්ජුරුවෙනි, මීට විපාක තොප සමයේත් අප සමයේත් නොවන්නේය. අනාගතයෙහි අධර්මිෂ්ඨවූ කෘපණ රජදරුවන් හා අධර්මිෂ්ඨ මනුෂ්‍යයන් සමයෙහි ලොව යහපත පෙරළන්නට පටන්ගත් කල්හි කුසලය පසුබැස අකුසලය උත්සන්නව කුසලයට අකුසලය මතුව ලොව පිරිහෙන්නාවූ කාලයෙහි වර්ෂාව යහපත්ව ඉඳුරා නොවස්නේය, මෙඝපාදයෝ සිදෙන්නාහුය, සශ්‍යයෝ මලානික වන්නාහුය, එසේහෙයින් දුර්භික්ෂවන්නේය, මෙඝයෝ වස්නාක් මෙන් සතරදිගින් නගා ස්ත්‍රීන් "අව්වෙහි වැනූ වී ආදිය තෙමෙයි"යන භයින් අතුළු කොට ගත්කල්හි පුරුෂයන් උදළු හා පෙට්ටි ගෙණ ඇල අමුනු නියර බඳින්ට නික්මුණු කල්හි වස්තා ආකාර දක්වා ගර්ජනා කොට කොට විදුලිය හස හසා අදුන්වන් කළුගොන් සතරදෙනා රාජාංගනයට අවුත් පොර අරහයා බොහෝදෙනා ගොන්පොර දකුම්හ'යි රැස්වූකල්හි පොර අන්නාවූ ආකාර දක්වා තප්ලා ගර්ජනා කොට පොර නැනම ඒ ඒ අත පලායාම මෙන් මෙඝයෝ නොවැසම පලායන්නාහුය. මේ තෙමේම මේ සුපිනයෙහි විපාක වන්නේය, නොපට වූකලී මේ සුපිනය දුටු කාරණයෙන් කිසි අන්තරායෙක්

නැත, අනාගතය අරභයා දක්නා ලද්දාවූ මේ සිහිනය වන්නේය, බමුණෙ වනාහි 'තමන්ගේ ජීවිකාවාත්තිය නිසා යාගකිරීමෙන් සත්තිදෙ'යි කිවුය'යි මෙසේ සම්භාවනාවහන්සේ සිහිනයට නිමිත්ත වදාරා 'මහරජ්ජුරුවෙනි, දෙවෙනිවූ සිහිනය කියවයි''යි වදාළසේක.

''සිහිමීනි, දෙවෙනි සිහිනය මෙසේ දිවිමි; කුඩාරුක් හා ගස් පොළොව පලා වියනක් පමණත් රියනක් පමණත් උඩ නොනැඟීම මල් පිපෙන්නේත් පලගන්නේත් වෙයි, මේ දෙවෙනි සිහිනය දිවිමි, මීට විපාක කවරේදැ'යි විචාළෝය, මහරජ්ජුරුවෙනි, මීටත් විපාක ලොව පිරිහෙන්නට වන්කල්හි මනුෂ්‍යයන් මහායුෂ්කවූ කල්හි වන්නේය, අනාගතයෙහි සත්ත්වයෝ අධිකවූ රාග ඇති වන්නාහු වෙති. වයසට නොපැමිණියාවූ කුමාරිකාවෝ පුරුෂාන්තරයට ගොස් සෘතුමතීව ගර්භිනීව දූදරුවන් හා සමග වෙසෙති පැලඟස්වල මල් මෙන් ඔවු නොවුන්ගේ සෘතුමති බව හා ඵල මෙන් දූදරුවෝ වන්නාහුය. මේ කාරණයෙනුත් නොපට භයෙක් නැත. තුන්වැනි සිහිනය කියව මහරජ්ජුරුවෙනි''යි වදාළසේක.

එකල රජ්ජුරුවෝ තුන්වෙනි සිහිනය කියන්නාහු මෙසේ කිවුය:– 'සිහිමීනි, එදවස්ම උපන්නාවූ වස්සන්ගෙන් දෙනුන් කිරි බොන්නා දිවිමි, මේ තුන්වෙනි සිහිනයය, මීට විපාක කවරේදැ?''යි විචාළෝය.

මීටත් විපාක මතු එන්නාවූ කාලයෙහි මනුෂ්‍යයන්ගේ ජ්‍යෙෂ්ඨාපචායික කම්ය නට කල්හි වන්නේය, අනාගතයෙහි සත්ත්වයෝ මවුපියන් කෙරෙහිවත් නැදිමයිලන් කෙරෙහිවත් ලජ්ජාවක් නූපදවා තුමූම කුටුම්බය විචාරා තුමූම තමන්ට සලසා ගණිති, බත්පිළිය කුත් වෘද්ධයන්ට දෙනු කැමති කෙනෙක් දෙති නොදෙනු කැමති කෙනෙක් නොදෙති, ඒ වෘද්ධයෝ අනාථ අසරණව තුමූ තමන් නිසා ජීවත්වගත නොහී එදවස උපන්නාවූ වස්සන්ගෙන් කිරි බොන්නාවූ මහ දෙනුන් මෙන් දරුවන් සිත්ගෙණ උන් නිසා ජීවත්වෙති, මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, සතරවෙනි සිහිනය කියව මහරජ්ජුරුවෙනි''යි කී සේක.

''සිහිමීනි, ආරෝහ පරිනාහසම්පන්නවූ මහගොන් යුග පරම්පරා අග යොදා තරුණවූ ගොන්නාඹුන් රථසකටාදීවූ භාරයන් අදනා සඳහා මුල්ගැල්හිස යොදන්නවුන් දිවිමි, ඒ නාඹුගොන් මුල යොදන ලද්දාහු භාරය ඇදගතනොහී කරින් විය දමා සිටියාහුය. එසේහෙයින් ගැල් කැමති තැනකට ගොස් වෙළඳුම් ආදීවූ කාරිය සමෘද්ධ කොටගන්ට නුවූයේය. මේ මාගේ සතරවැනිවූ සිහිනයය මීට විපාක කවරේදැ''යි විචාළෝය.

''මහරජ්ජුරුවෙනි, මීට විපාක අනාගත කාලයෙහි අධර්මිෂ්ඨවූ රජදරුවන් සමයෙහි වන්නේය. අනාගතයෙහි අධර්මිෂ්ඨවූ කෘපණවූ රජදරුවෝ භුවණැත්තාවූ පරම්පරාව දැන් මෙහි සමෘද්ධවූ ඒ ඒ කායීය සමෘද්ධකොට දීලන්ට නිසිවූ මහා අමාත්‍යයන්ට යසපිරිවර නොදෙති, ධම්මාධිකරණයෙහිත් රාජකාර්‍යයි විචාරන්නාවූ සථානයෙහිත් නුවණැත්තාවූ විනිශ්චයෙහි දක්ෂවූ පරම්පරාවෙන් පැවත ආවාවූ වයොවෘද්ධ අමාත්‍යයන් නොසලස්වති. ඔවුන්ට විරුද්ධවූ තරුණවූ බාල අමාත්‍යයන්ට යසපිරිවර දෙති. එබඳුවූවන්ම විනිශ්චයෙහි සලසති. ඒ තරුණ අමාත්‍යයෝ රාජකාර්‍යුතු හා යුක්තායුක්ති නොදන්නාහු ඒ තමන්ට දුන් යස

සත් ධරාගත නොහෙති. මහලුවූ නුවණැති අමාත්‍යයෝද යසස් නොබලන්නාහූ රාජකටයුතු සමෘද්ධ කොට දීලන්ට සමර්ථයෝ වී නමුත් අපට මේ රාජකටයුත්තෙන් ප්‍රයෝජන කිම්ද? අපි දැන් පිටත්ව ගියමෝවේද? අභ්‍යන්තරවූ බාල අමාත්‍යයෝම ඒ රාජකාරිය දන්නෝවේදැ'යි උපන්නාවූ රාජකාරියක් නොකෙරෙති. එසේ කල්හි සර්ව්‍යකාරයෙන්ම ගැල්හිස උසුලන්ට අසමර්ථවූ නාඹු ගොන් ගැල්හිස වියයෙහි යෙදූ කලක් මෙන්ද ගැල්හිස උසුලන්ට අදින්ට අසමර්ථවූ මහගොන් වියදඬු පරම්පරාවෙන් අහයෙදුකලක් මෙන්ද ඒ රජදරුවන්ට මහත් වූ පරිහානියම වන්නේය, මහරජ මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, පස්වෙනි සුවප්නය කියව''යි වදාළසේක.

'සුවාමීනි, දෙදිසාවෙන් මුඛදෙකක් ඇති අශ්වයකු දිටිමි, ඔහුට දෙපිටිම්ම කැහැකිය, ඒ තෙමේ දෙපිටින්ම කන්නේය,මේ මාවිසින් දක්නාලද පස්වැනි සුවප්නයය, මීට විපාක කවරේදැ?''යි විචාළේය.

''මහරජ, මේ සුවප්නයටත් අනාගතයෙහි අධර්මිෂ්ඨවූ රජදරුවන් සමයෙහි විපාකවන්නේය, අනාගතයෙහි අධර්මිෂ්ඨවූ අඥාන රජදරුවෝ අධර්මිෂ්ඨ වූ කල අධර්මිෂ්ඨ මනුෂ්‍යයෝත් විනිශ්චයෙහි සලසති, කුසලාකුසලයෙහි ආදරයක් නැත්තාවූ ඒ අඥාන මනුෂ්‍යයෝ සභායෙහි හිඳ විනිශ්චය කරන්නාහු හිමි නොහිමි දෙදෙනා අතින්ම අල්ලස් ගෙණ මුඛ දෙකින් කන්නාවූ අශ්වයා මෙන් අත්ලස් කන්නාහුය. මේ සුවප්නය නිසාත් තොපට භයෙක් නැත, සුවෙනි සුවප්නය කියව''යි වදාළසේක.

''සුවාමීනී, මනාජනයෝ ලක්ෂයක් වචනා රත්තලියක් මැද ''මෙහි මූත්‍ර කරව''යි එක් ජරා සිඟාලයන්හට ඵලවා තිබූහ. ඒ මහලු කැනහිලා ඝන රත්තලියෙහි මූත්‍රකෘත්‍යය කරන්නා දිටිමි, මේ මා විසින් දක්නාලද සුවෙනි සුවප්නයය, මීට කවර විපාකයෙක්ද''යි විචාළෝය.

''මීට විපාක අනාගතයෙහිම වන්නේය, මහරජ, අනාගතයෙහි ජාති සම්පන්න නොවූ අධර්මිෂ්ඨ රජදරුවෝ ජාති සම්පන්න කුලපුත්‍රයින්ට මොහු අපව කිසි අන්තරායක් කොට පියද්දෝනෝ?යි සංකාවෙන් යසස් නොදෙති, අකුලීනයන් ඇතිකොට වඩින වෙති, එසේ කල්හි මහාසම්පත් ඇති ජාතිසම්පන්න මනුෂයෝ ජීවත්ව ගත නොහී 'මොවුන් නිසා ජීවත් වම්හ'යි අකුලීනයන්ට දූදරුවන් දෙති, මෙසේ ඒ කුලදූන්ගේ අකුලීනයන් සමග සංවාසය මහලු කැණහිලාගේ රත්තලියෙහි මූත්‍රකෘත්‍යය කිරීමක් හා සමාන වන්නේය, මේ සුවප්නයෙනුත් තොපට භයෙක් නැත, සත්වැනිවූ සුවප්නය කියව''යි වදාළසේක.

''සුවාමීනි, ඒක් පුරුෂයෙක් ලනුවක් අඹර අඹරා පාමුල තබන්නේය, ඒ පුරුෂයා උන් පුටුව යට හොත්තාවූ සාකුස් ඇති එක් කැණහිල් ධෙනුවක් ඒ පුරුෂයා නොදන්නා පරිද්දෙන් ඒ වරම්හද කන්නීය, මම මෙසේ දිටිමි, මේ මාගේ සත්වැනිවූ සුවප්නයය, මීට විපාක කවරේදැ?''යි විචාළෝය.

''මීට විපාක අනාගතයෙහිම වන්නේය, තවද අනාගතයෙහි ස්ත්‍රීහු පුරුෂයන් කෙරෙහි ලොල්වෙති, අලංකාරයෙහි ලොල්වෙති, වීපිවල ඇවිදීමෙහි ලොල්වෙති, ආමිසයෙහි ලොල්වෙති, දුශ්ශීල වෙති, දුරාචාර වෙති,

එසේවූ සත්‍රිනු තමන්ගේ පුරුෂයන් කෘෂිවණික් ආදීවූ කර්මාන්තකොට දුකින් ආයාසයෙන් රැස්කරණලද්දාවූ සම්පත් වෙහර පුරුෂයන් හා එක්ව රා බී මල් පැලදීම් සුවඳවිලවුන් ගැල්වීම් ආදිය කොට තමන්ගේ ගෙයි අත්‍යායිකවූ කාර්‍යයන් නොබලා ගෙයි බලල්ලාව සිදුරෙණුත් වෙහර පුරුෂයන්ගේ ඊර්ෂ්‍යා කෙරෙමින් සෙට දවස් වැපිරියයුතු වූවත් බිජුවට පැර කැඳ බත් අවුළුපත් ආදිය සපයාත් අඹර අඹරා පාමුල නඛනලද වරමන්ද කන්නාවූ පුටුව යට වැදහොත් කැණහිල් ධෙනුව මෙන් ඒ වෙහර පුරුෂයා හා එක්ව වස්තුව කා නසන්නාහුය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත, අට වැනි සුපින කියව''යි වදාළසේක.

'සුවාමීනි, මාලිගාදෙරකඩ බොහෝ හිස්වූ කල පිරිවරා නඛනලද ඒත් මහත් පැන්පිරුණු කලයක් දිටිමි, ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍රය යන සතර පක්ෂයෙහි සත්ත්වයෝ සතරදිගින් හා සතර අනුදිගින් කළවලින් පැන් ගෙණවුත් පැන් පිරීතිබෙන්නාවූ පූර්ණකුම්භ සතම පුරවති, පුර පුරා වත්කළ පැන් ඉතිරි ඉතිරි පලායන්නේය. එසේද වී නමුත් නැවත නැවතත් පිරුණු කළයෙහිම පැන් වත්කරන්නානුය. සිස්කල බලන්නාවූ කෙනෙකුත් නැත. මේ මාගේ අවවැනි සුපින්‍යය, මීට කවර විපාකයෙක්ද?''යි විචාළෝය.

''මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහිම විපාක වන්නේය, අනාගත යෙහි වනාහි ලොව පිරිහෙන්නේය. රට නීරෝජජ්ක වන්නේය, රජදරුවෝ දුක්පත්ව කෘපණ වෙති, යම් රජ්ජුරුකෙනෙක් ඉසුරුමත්ව වෙසෙත් තම් උන් භාණ්ඩාගාරයෙහි ලක්ෂයක් පමණ කහවණු වන්නේය, ඒ රජ්ජුරුවෝ මෙසේ දුක්පත්වූවාහු සියළු දනව්වාසී සත්ත්වයන් ලවා තමන්ගේම කර්මාන්ත කරවති, රාජකාරියෙන් පීඩිතවූ මනුෂ්‍යයෝ තමන්ගේ කර්මාන්ත හැර රජ දරුවන් පිණිසම ඇල්වී මහවී ආදීවූ පුබ්බණ්ණ හා උදු මුං තල කලත් ආදීවූ අපරණ්ණ වපුරති, රක්ෂාකෙරෙති, කපති, මඩිති, ගෙට ගෙණෙති, උක්සතික් පැණිමැඩ උක්පැණි කකාරති, පුෂ්පාරාම ඵලාරාම කෙරෙති, ඒ ඒ තැන දැමැඩ තඛනලද වී සාල් උදු මුං තල කලත් ආදිය ගෙණවුත් රජ්ජුරුවන්ගේ කොටුගුල්ම පුරවති, තමන් ගෙයි සිස්වූ කොටුගුළු බලන්නොත් නැත. මෙසේ කිරීම සිස්වූ කළ නොබලා පැන්පිරූ කළයම පුරන්නා හා සමාන වන්නේය. මේ සුපින්‍යයෙනුත් තොපට භයෙක් නැත, නුවණැති සුපින්‍යය කියව''යි වදාළසේක.

''සුවාමීනි, පස්පියුමෙන් ගැවසීගත්තාවූ වටින්ම තොට ඇත්තාවූ එක් පොකුණක් දිටිමි, හාත්පසින් විපාද වතුෂ්පාදදීහු බැස එහි පැන් බොති. ඒ පොකුණ මධ්‍යයේ ගැඹුරුතැන පැන් කැලඹී තිබෙන්නේය පොකුණ අස විපාද වතුෂ්පාදයින් මිරිකන තැන පැන් ප්‍රසන්නව තිබෙයි, නොකැලඹුනේය. මෙසේ මම දිටිමි, මේ මාගේ නුවැනි සුපින්‍යය. මීට විපාක කවරේද''යි විචාළෝය.

''මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහිම විපාක වන්නේය. අනාගත කාලයෙහි රජදරුවෝ අධාර්මික වන්නාහුය. ඡන්දයෙන් ද්වේෂයෙන් මොහ යෙන් භයින් අගතියට යෙමින් රාජ්‍යය කරන්නාහුය. ධර්මිෂ්ඨ විනිශ්චය නොකෙරෙති; අත්ලස්ම වස්තුකොට ඇත්තාහු වෙති, සම්පත්තියෙහි ලොල්

වෙති, රටවැස්සන් කෙරෙහි ඒ රජදරුවන්ට ක්ෂාන්ති මෛත්‍රී කරුණාවෙක් නම් නැත්තේය, වණ්ඩයන, පරුෂයන, උක්කයතෙක ලූ උක්ගැටයක් මෙන් පෙළ පෙළා අනේප්‍රකාරවූ අයපඬුරු උපදවා වස්තු ගන්නාහුය, මනුෂ්‍යයෝ අයපඬුරින් පීඩිතව කිසිවක් දීගත නොහී ගම් නියම්ගම් ආදිය හැර ප්‍රත්‍යන්ත ජනපදයට ගොස් වාසයකෙරෙති, මධ්‍යම ජනපදය ශූන්‍යවන්නේය, ප්‍රත්‍යන්තය මනුෂ්‍යයන්ගෙන් ගහනවන්නේය. යම්සේ පොකුණ මධ්‍යයේ පැන් කැලඹී තිබේද? පොකුණ කෙළවර පැන් විශෙෂයෙන් ප්‍රසන්නව තිබේද? එපරිද්දෙන්ම වන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත. දශ වැනිවූ සවප්නය කියව''සි වදාළසේක.

''සවාමීනි, එකම සැළ පැසෙන්නාවූ බත් අපාක වන්නා දිටිමි, අපාක නම් පලා බෙදූ තැබූවාක් මෙන් තුන් ආකාරයකින්ම පැසීමය, එක් භාගයෙක බත් ඉතා කොළුය, එක්භාගයක බත් සාල්ය, එක්භාගයක මදකොට පැසුනේය. මේ මාගේ දශවැනිවූ සවප්නයය, මීට විපාක කවරේදැ?''සි විමාළෝය.

''මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහි විපාක වන්නේය, තවද අනාගතයෙහි රජදරුවෝ අධර්මිෂ්ඨ වෙති, ඒ රජ්ජුරුවන් අධර්මිෂ්ඨවූ කල්හි රාජපුරුෂයෝය, බ්‍රාහ්මණ ගෘහපතීහුය නියම්ගම්වාසීන් හා දනවිවාසී සත්ත්වයෝය යි මෙසේ ශ්‍රමණ බ්‍රාහ්මණයන් පවත් සියළු සත්ත්වයෝම අධර්මිෂ්ඨ වන්නාහුය. ඉක්බිත්තෙන් ඔවුන්ට අරක්ගත් දෙවියෝය, වෘක්ෂදේවතාවෝය, ආකාසසථ දේවතාවෝය යි මෙසේ සියළු දේවතාවෝම අධර්මිෂ්ඨ වන්නාහුය; අධර්මිෂ්ඨ රජදරුවන්ගේ රාජ්‍යයෙහි මහපවන් තදව හමනේය, එසේ තදව හමන්නාවූ පවන් ආකාසසථ විමන් කම්පාකරන්නේය, ඒ විමන් කම්පිතවූ කල්හි දේවතාවෝ කිපී වැසි වැස්විය නොදෙති, වස්තාවුන් වැසි සියළුරට එකපැහැර නොවස්නේය. තවද වස්තාවූ වර්ෂාව සී සෑමටවත් වැපිරීමටවත් උපකාරීව නොවන්නේය, රාජ්‍යයෙහි යම්සේද? එපරිද්දෙන්ම දනවිවෙහිත් වැවි පොකුණු විල් ආදියෙහිත් එකපැහැර නොවස්නේය, වැවි උඩත්තට වසී නම් වැට යටිමියරට නොවස්නේය, යටිමියර වසී නම් උඩත්තට නොවස්නේය, එක්භාගයෙක ගොයම් අධිකවර්ෂාවෙන් නස්නේය, එක්භාගයක ගොයම් වැසි නොවැසීමෙන් මැරෙන්නේය, එක්භාගයක ගොයම් සම්වර්ෂාව වස්වා මනාව පැසවන්නේය. මේ එකම රජ්ජුරුවන්ගේ රාජ්‍යයෙහි වපුරණලද ගොයම් එක්සැළ පැසෙන්නාවූ බත් තුන්කොටසක් වූවාක් මෙන් තුන්පරිද්දකින් පැසෙන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත. එකොළොස්වන සවප්නය කියවයි'' වදාළසේක.

''සවාමීනි, ලක්ෂයක් වටිනා සඳුන්හරයක් කුණුමොරට විකුණන්නා දිටිමි, කවර විපාකදැ?''සි විමාළෝය.

''මීටත් අනාගතයෙහිම, මාගේ ශාසනය පිරිහෙන්ට වන්කල්හි විපාක වන්නේය; තවද අනාගතයෙහි ප්‍රත්‍යයෙහි ලොල්වූ භික්ෂූහු බොහෝ වන්නාහ; ඔවුන් මා විසින් බොහෝ ප්‍රත්‍යයෙහි ලොල්බව මැඩ කියනලද ධර්ම දේශනාව චිරාදී චතුර්විධ ප්‍රත්‍යය නිසා අනුන්ට දෙශනාකෙරෙති ප්‍රත්‍යය ලෝභයෙන් මිදී නිස්සරණ පක්ෂයෙහි සිට නිර්වාණාභිමුඛව දෙසන්ට අසමර්ථ වෙති. 'හුදෙක් මාගේ ව්‍යංජන සම්පත්තිය හා මධුරස්වරය අසා මාහැඟිවූ

සිවුරු ආදිය දෙති, දෙනුකැමැත්තාහුද වෙති''යි කියාම දෙශනා කරති. සමහර කෙනෙක් වීපිමඩ්‍යය, සතරමන්සන්ධියය, මාලිගාවේ වාසල්දොරකඩය, යනාදීවූ සථානවල හිඳ මදටක් කහවණුවක් නිසාත් දෙශනා කෙරෙති. මෙසේ මා විසින් නිර්වාණය අගයකොට දෙසනලද ධර්මය චීවරපිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන චතුර්විධ ප්‍රත්‍යය හා මදටක් කහවණුවක් නිසා විකිණීකොට දෙන්නාහුය. ලජ්ජයක් අගනා සඳුන්හරක් කුණුමොරට විකුණන්නා වුන් වැන්නෝය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත්තේය. දෙලොස් වෙනි සවප්නය කියව''යි වදාළසේක.

''සවාමීනි, සිස්වූ වියලි ලබු දියෙහි ගැලෙන්නා දිටිමි. මීට විපාක කවරේදැ?''යි විවාලෝය.

''මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහි යහපත පෙරළෙන්ට වත් කල්හිම විපාක වන්නේය. එසමයෙහි රජදරුවෝ ජාතිසම්පන්න කුලපුත්‍ර යන්ට යශස් නොදෙති. කුලගැත්තන්ටම යශස් දෙති. ඒ කුලීනයෝ ඉසුරුමත් වෙති; කුලපුත්‍රයෝ දිළිඳු වෙති, දජ්දරුවෝ සම්මුඛයෙහිත් රාජචාර යෙහිත් අමාත්‍යයන් සම්මුඛයෙහිත් විනිශ්චයමණ්ඩලයෙහිත් සිස් ලබු හා සමාන අකුලීනයන්ගේම කථාවල ගැලීසිටියා මෙන් නිශ්චලව සුප්‍රතිෂ්ඨිත වන්නාහුය; සඞ්ඝකමී ගණකමීයෙහිත් පාත්‍ර චීවරාදිය හා විහාරාදීන්ගේ විනිශ්චයසථානයෙහිත් දුශ්ශීලවූ පාපී පුද්ගලයන්ගේම කථාව නෛයග්‍යික වන්නීය. ඔවුන්ගේ බස් ග්‍රාහ්‍ය වන්නේය; ලජ්ජී භික්ෂූන්ගේ බස් අග්‍රාහ්‍ය වන්නේය යි මෙසේ සර්වප්‍රකාරයෙන්ම සිස් ලබු ගිලෙන කලක් මෙන් වන්නේය. මේ කාරණයෙනුත් තොපව භයෙක් නැත; තෙළෙස්වැනිවූ සවප්නය කියව''යි වදාළසේක.

''සවාමීනි, මහත්වූ කුළුගෙවල් පමණවූ ඝන ශෛල නැව් මෙන් දියෙහි හිල් පෙන්නා දිටිමි. මීට විපාක කවරේදැ?'' යි විවාලෝය.

''මහරජ්ජුරුවෙනි, මීටත් එබදු කාලයෙහිම විපාක වන්නේය. එසමයෙහි අධර්මිෂ්ඨ රජදරුවෝ අකුලීනයන්ට යසස් දෙති, ඔවුහු සම්පත් ලැබ ඉසුරුමත් වෙති; කුලීනයෝ දුක්පත් වෙති; ඔවුන් කෙරෙහි කිසිවකුත් ආදර ගෞරව නොකෙරෙති, අන්‍යවූ අකුලීනයන් කෙරෙහිම ආදර ගෞරව කෙරෙති. රජ්ජුරුවන් සම්මුඛයෙහිත් අමාත්‍යයන් සම්මුඛයෙහිත් විනිශ්චය මණ්ඩලයෙහි විනිශ්චයෙහි දක්ෂවූ බරගල් හා සමානවූ කුලපුත්‍රයන් බස් පිහිටා නොසිටිනේය. ඒ කුලපුත්‍රයන් කථාකරන්ට වන්කල්හි මුන් කියන්නේ කිම් දැ?යි අන්‍යවූ අකුලීනයෝ අපභාසකොට නින්ද කෙරෙති; භික්ෂූන්වහන්සේගේ සන්නිපාතයෙහිත් උක්තප්‍රකාරවූ සථානයන්හි ලජ්ජිපෙසල භික්ෂූන්වහන්සේ ගරුකොට නොසිතති. ඒ ලජ්ජී භික්ෂූන්ගේ කථාවත් සඞ්ඝසන්නිපාතාදියෙහි නිශ්චලව නොසිටිනේය; ගල හිල්පෙන කලක් මෙන් හිල්පෙන්නේය; ග්‍රාහ්‍ය නොවන්නේය. මේ කාරණයෙනුත් තොපට භයෙක් නැත; තුදුස්වැනිවූ සවප්නය කියව''යි වදාළසේක.

''සවාමීනි, මීපුප් සා මැඩියන් මහත්වූ කෘෂ්ණ සර්පයන් පසුපස්සෙහි වේගයෙන් ලුහුබඳවා ගෙණ ගොස් ඇඹුලදඹු මෙන් කඩ කඩා මුරු මුරු යන අනුකරණ ශබ්ද පවත්වමින් මස් කා ගලන්නවුන් දිටිමි. මීට විපාක කවරේදැ?''යි විවාලෝය.

"මීටත් නොපිරිහෙන්ට වන්කල්හි අනාගතයෙහි විපාකවන්නේය, එසම යෙහි මනුෂ්‍යයෝ අධිකරාගීව ක්ලෙශවසඟව ලදරු ලදරුවූ තම තමන්ගේ භාර්‍යාවන් වසඟයෙහි පවතී; ඔවුන්ගේ ගෙයි දැසකම්කරුවන්ද හා ගවමහිසාදී රන්රුවන් ආදියත් ඒ ස්ත්‍රීන් සන්තකම වන්නේය. අසවල් රන්රුවන් මුතු මැණික් ආදිය හා වස්ත්‍රාභරණ සියළු වස්තූන් කොයිදැ?යි විචාළ කල්හි ඒ වස්තුව කොයි තිබෙයි තමුන් තට මේ විචාරා ආයාසගැන්මේ ප්‍රයෝජන කිම්ද? තෝ මාගෙයි ඇත්ත නැත්ත විචාරන්නා කැමැත්තෙහිදැ?යි කියා අනෙකප්‍රකාර යෙන් ආක්‍රොශ පරිභව බණමුඛ තමැති අඩයටියෙන් ඇණ දැසයකුමෙන් තමා වසඟයෙහි පවත්වා තමන් ඉසුරුමත්කම් පවත්වන්නාහුය. එසේ කල්හි මිපුප් පමණ මැඩියන් කෘෂ්ණ සර්පයන් ගළනා කලක් මෙන් වන්නේය; මේ කාරණ යෙනුත් නොපව භයෙක් නැත. පසළොස්වැනිවූ සුවප්තය කියව"යි වදාළ සේක.

"සුභාමිනි දශවිධවූ අධර්මයෙන් යුක්තවූ ගම් පහරන්නාවූ කපුටුවෝ රන් වන්වූ පැහැ ඇති බැවින් සුවර්ණයයි ලබනලද නම් ඇති සුවර්ණහංසරාජයන් පිරිවරා ඇවිදිනාවුන් දිටිම්. මීට විපාක කවරේදැ?"යි විචාළෝය.

"මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහි දුර්ශීල රජදරුවන් සමීපයෙහිම විපාකවන්නේය. මහරජ්ජුරුවෙනි, අනාගතයෙහි රජදරුවෝ හස්තශිල්පාදි යෙහිත් යුධයෙහිත් බුහුටි නොවෙති; සමර්ථ නොවෙති; ඒ රජදරුවෝ තමන්ම රාජ්‍යවිපත්තියෙහි ශංකා කෙරෙමින් සමාහර්තා ඇත්තාවූ කුලපුත්‍රයන්ට ඓශ්වර්‍යය නොදී තමන්ට මෙහෙකරණ කරණවැමියන් ආදීවූ සත්ත්වයන්ට ඓශ්වර්‍යය දෙති. ජාතිගොත්‍රයෙන් යුක්තවූ කුලපුත්‍රයෝ රජදරුවන් පිහිටක් ලැබගතනොහී ජීවත්වන්ට අසමර්ථව ඓශ්වර්‍යයෙහි පිහිටියාවූජාතිගොත්‍රයෙන් හීනවූ අකුලීනයන්ට සේවය කෙරෙති, ඇවිදිති, මෙසේ කල්හි සුවර්ණහංස රාජයෝ කපුටුවන් පිරිවරා ඇවිදිනා කලක් මෙන් වන්නේය. මේ කාරණ යෙනුත් නොපව භයෙක් නැත; සොළොස්වැනිවූ සුවප්තය කියව"යි වදාළ සේක.

"සුභාමිනි, පෙර දිවියෝ එළුවන් කති; මම්වූ කලී දැන් දිවියන් පසුපස් සෙහි ලුහුබඳවා ගෙණ ගොස් මුරුමුරු යන අනුකරණ කොට කන්නා දිටිම්. එකල්හි අන්‍යවූ දිවියෝ එළුවන් දුරින්ම එන්නා දැක භයින් ත්‍රස්තව පලාගොස් කැලයට වැද සැඟවෙන්නාහුය. මම මෙසේ දිටිම්. මීට විපාක කවරේදැ"යි විචාළෝය.

"මහරජ්ජුරුවෙනි, මීටත් අනාගතයෙහි අධර්මිෂ්ඨ රජදරුවන් සමයෙහි විපාක වන්නේය. එසමයෙහි අකුලීනයෝ රාජ්‍යවල්ලභ වෙති; ඉසුරුමත්වෙති; කුලපුත්‍රයෝ අප්‍රසිඩවෙති, ඒ රාජ්‍යවල්ලභවූ කුලහීනයෝ තමන්ගේ බස් රජදරු වන්ට කියා ගිය තම් මා විනිශ්චය ශාලාදියෙහි බලව භිද ජාතිසම්පන්නවූ ප්‍රවේණි යෙන් ආවාවූ සත්ත්වයන්ගේ කෙත්වත් ආරාමාදියට මේ අප සන්තකවූ කෙත් වත් ආදිය යුක්තිබැන ඒ ඒ කුලයන් විසින් "තොපගේද? අපගේදැ?"යි කියා විනිශ්චය සථානාදියෙහි විවාද කරණ කල්හි වේවැල් ආදියෙන් ගස්වා බොටුව අල්වා ඉවත දම්මවා තොපගේ පමණ නොදනුදැ? අප හා සමග විවාදකරවුද? දැන් රජ්ජුරුවන් වහන්සේට දන්වාලා භෂාපාදුදිය කප්පවාපියම්. ඒ කුල පුත්‍රයා භයගන්වනු. ඒ කුලපුත්‍රයෝ රාජ්‍යවල්ලභවූ කුලහීනයන්ට භයින් තමන්

සන්තකවූ ක්ෂෙත්‍ර වස්තු ආරාමාදිය නොපිම ඇරගණුව නොපවමයයි පාවාදී තමන් ගෙට යහපත්ව වැදහෝනාහුය. පාපීවූ භික්ෂූහු ලජ්ජීවූ භික්ෂූන්ටකැමති පරිද්දෙන්පිඩා කරන්නාහු ඒ ලජ්ජි ප්‍රියශීලීවූ භික්ෂූන්වහන්සේ කිසිපිහිටක්නො ලැබ වනයට වැද කැලෑදියෙහි සැඟවී හිඳිනාසේක. මෙසේ කල්හි හීන ජාතීන් හා පාපභික්ෂූන් විසින් පීඩිතවූ ජාතිමත් කුලපුත්‍රයන් හා ලජ්ජීභික්ෂූන් එළවන්ට යවින් දිවියත් සැඟවී භයගෙණ පලායන කලක් මෙන් වන්නේය. මේකාරණයෙනුත් තොපට භයෙක් නැත. මේ සුවප්නය අනාගතයම උදෙසා තොපවිසින් දක්නා ලද්දේය. බමුණෝ වනාහී තමන් අධර්මිෂ්ඨ වන බැවිනුත් ධර්මයෙහි නත්තිය නොදන්නා බැවිනුත් තොප කෙරෙහි ස්නෙහයෙනුත් කිහ.

බොහෝ වසතු ලබම්හ යි තමන් වසතුවෙහි ලොභොබි බැවිනුත් ජීවත් වනු නිසා නුඹවහන්සේ දුටු මේ සුවප්න විතාශය පිණිස සර්වතුෂ්ක යාගය කරම්හ යි කිවෝද?"යි මෙසේ සර්වඥයන් වහන්සේ සොළොස් සුවප්නයෙහි විපාක වදාරා "මහරජ්ජුරුවෙනි, දැන් මේ සුවප්නය දුටුවෝ තොපි මතුතොවෙයි පුරාතනයෙහි රජදරුවෝත් දුටුවාහුමය. බ්‍රාහ්මණයෝ ඒ රජදරුවන්ටත් මෙපරිද්දෙන්ම කියා මේ සුවප්න යාග මත්තට දැමූය. ඉක්බිත්තෙන් නුවණැත්තන් විසින් දෙසනලද න්‍යායයෙහි සිට බොධිසත්ත්වයන් අතින් විවාලෝය, පුරාතන යෙහි නුවණැත්තෝ ඔවුන්ට මේ සුවප්නය කියන්නෝමෙම ක්‍රමයෙන්ම කීවෝ වේදැ"යි වදාරා ඒ කොසොල් රජ්ජුරුවන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත් වත් දක්වා වදාළසේක.

එවිටඝිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙතෙක්රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතානෝ ප්‍රසිඩවූ බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද වැඩිවිය පැමිණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා හිමාලයවන ප්‍රදෙශයෙහි ධ්‍යානක්‍රීඩාවෙන් යුක්තව වාසය කරන්නාහුශ. එසමයෙහි බරණැස්නුවර බ්‍රහ්මදත්තරජ්ජුරුවෝ මෙම ක්‍රමයෙන් සුවප්නය දැක බමුණන් අතින් විවාලෝය. බමුණෝමෙපරිද්දෙන්ම යාග කරන්නට ගත්හ, බමුණන් අතුරෙන් පුරෝහිත බ්‍රාහ්මණයාගේ අතවැසි මානවකය සංඥසම්පන්නය ව්‍යක්තය, ඒ තෙමේ ආචාරීන්ට කියන්නේ "ආචාරීන්වහන්ස, නුඹවහන්සේ විසින් අපි වේදත්‍රය උගන්වන ලදුම්හ යි ඒ වේදත්‍රයෙහි එකකු මරා එකක්හට සඝාතයක් කිරීමක් නැත්තේ වේදැ"යි කීය. එබස් ඇසූ ආචාරී කියන්නෝ "දරුව, මේ උපායෙන් අපට බොහෝ වස්තු උපදවන්නේය, නෝ වූකලී රජ්ජුරුවන්ගේ වස්තු රක්නා කැමැත්තේ වනැ"යි කිවුය.

එබස් ඇසූ මානවකයා "එසේ වී නම් ආචාරීන්වහන්ස, නුඹවහන්සේගේ යාගකාරිය කළමැනවයි මම නුඹවහන්සේ සම්පයෙහි කුමක් කරම්දැ?"යි කියා ගොස් ඉවත ඇවිදිනේ රජ්ජුරුවන්ගේ උයනට ගියේය. එදවස් මහබෝසතානෝත් ඒ කාරණය දැන "අද මා විසින් මනුෂ්‍යපථයට ගිය කල්හි මහජනයාගේ බන්ධනයෙන් මිදීම වන්නේය"යි ආකාශයෙන් ගොස් උයනේ බැස රන් පිළිමයක් මෙන් මගුල්සලවට මත්තේ උන්නාහුය. ඒ මානවකයාද බොධිසත්ත්වයන් කරා ගොස් එකත්පස්ව හිද සුවදුක් කථාකෙළේය. මහබෝසතානෝත් ඒ මානවකයා හා සමග මිහිරිවූ පිළිසඳර කථා කොට "කිමෙක්ද? මානවකය, රජ්ජුරුවෝ දැනැමින් රාජ්‍යය කෙරෙද්දැ"යි විවාලෝය. සවාමීනි, රජ්ජුරුවන්වහන්සේ වූකලී ධර්මිෂ්ඨසේක. එතකුදුවුවත් බමුණෝ උන්වහන්සේ

අපායමාර්ගයෙහි පවත්වති, රජ්ජුරුවන්වහන්සේ සොළොස් සුපිනයක්දැක බමුණන්ට කීසේක. බමුණෝ ''යාගකරමින''යි පටන් ගත්හ ''කිමෙක්ද?සුවාමීනි මේ සුපිනයන්ගේ විපාක මෙය යි රජ්ජුරුවන් වහන්සේ ගිවිස්වා මහජනයා හයින් මුදන්ට නුඹවහන්සේට කොවරීද''යි කීය. ''මාන කය අපි වූකලී රජ්ජුරුවන් නාදුනම්හ, රජ්ජුරුවන් වහන්සේ අප නාදුනති. ඉදින් මෙතනට අවුත් විවාළෝ නම් අපි ඔවුන්ට කියනමෝ වේද?'' කිවුය.

මානවකයා ''සුවාමීනි, මම රජ්ජුරුවන් වහන්සේ කැඳවාගෙණ එමි නුඹ වහන්සේ මාගේ ඊම බලමින් ඇසිල්ලක් පමා වුවමැනවැ''යි කියා බෝධිසත්ත්වයන්ට ප්‍රතිඥා දී රජ්ජුරුවන් සමීපයට ගොස් ''මහරජ්ජුරුවන්වහන්ස, එක් ආචාරී තාපස කෙණෙකුන්වහන්සේ නුඹවහන්සේගේ උයනේ බැස නුඹ වහන්සේ විසින් දුටු සුපිනයෙහි විපාක කියමි යි කැඳවනසේකැ''යි කීය.

රජ්ජුරුවෝ ඔහුගේ කථා අසා මහජනයා පිරිවරා එකණෙහිම උයනට ගොස් තාපසයන් වැඳ එකත්පස්ව හිඳ ''සුවාමීනි, නුඹවහන්සේ මා දුටු සුපිනයෙහි විපාකදන්නා සේක්ද?''යි විවාළෝය. ''එසේය, මහරජ්ජුරුවෙනි, කී කල්හි ''එසේ වී නම් කිවමැන වැ''සිකිවුය. ''මහරජ්ජුරුවෙනි: කියම් තොප දුටු සැටියේ සුපිනය මට කියව''යි කිවුය. ''යහපත, සුවාමීනි'' කියා රජ්ජුරුවෝ,

''උසභා රුක්ඛාගාවියෝ ගවාච
අජෙඑා කංසෝ සිගාලිව කුම්භෙඑා
පොක්ඛරණී අපාක චන්දනං,
ලාපූනි සීදන්ති සිලා පලවන්ති,
මණ්ඩූකියෝ කණ්හසප්පෙහි ලුත්ති,
කාකං සුවණ්ණා පරිවාරයන්ති
තඑාවක්කා එලකාමා භයාහි''න්ති,

යන මේ ගාථාව කියා පසේකදී කොසොල් රජ්ජුරුවන් විසින් කියනලද ක්‍රමයෙන්ම සොළොස් සුපිනය කිවුය, මහබොධිසත්ත්වයෝත් ඒ සොළොස් සුපිනය දැන් සර්වඥයන්වහන්සේ වදාළසැටියේම විස්තර හෙයින් විපාකයන් කියා කෙළවර මෙසේ කිවුය. ''මහරජ්ජුරුවෙනි, මෙතෙම සුපිනයෙහි නිමිත්තක් පත්තිවන්නේය, ඒ සුපිනයෙහි දෙව නසන පිණිස යාග ක්‍රියාවක් පවතී නම් ඒ යාගවිපරීත හෙයින් පවත්නේය. කවර කාරණයකින්ද යත්; මේ සොළොස් සුපිනයෙහි විපාක නම් ලෝකයෙහි සත්ත්වයන්ගේ ගුණ පෙර ලෙන්ට වත් කල්හි අකාරණ කාරණය යි කියාගන්නා කල්හි කාරණය අකාරණයයිගන්නා කල්හි අභූත භූතය යි කියා ගන්නා කල්හි භූතය අභූතය ගන්නා කල්හි අලජ්ජීන් උත්සන්නවන කල්හි ලජ්ජීන් පිරිහෙන කල්හි වන්නේය, දැන් තොපගේවත් මේ පුරුෂයුග්මය පවත්නා කල්හි මේ සොළොස් සුපිනයෙන් වන විපාකයෙක් නැත; එසේහෙයින් ඒ සුපින විපාක විනාශය පිණිස පවත්නාවූ යාගක්‍රියා විපරියාස හෙයින් පවත්නේය. ඒ යාගයෙන් ප්‍රයෝජන නැත. තොපට මේ සොළොස් සුපිනය දුටු කාරණයෙන් භයෙක් වත් නැතිගැන්මෙක්වත් නැතැ''යි මහබෝසතාණෝ රජ්ජුරුවන් අස්වසාලා මහජනයා බන්ධනයෙන් මුදා නැවත ආකාශයෙහි සිට රජ්ජුරුවන්ට අවවාදකියා පඤ්චසීලයෙහි පිහිටුවා ''මෙතැන් පටන් මහරජ්ජුරුවෙනි, බමුණන් හා එක්ව කරන්නාවූ පශු ඝාත නම් යාගය අැරපියව''යි ධර්මදේශනා කොට ආකාශයෙන්ම තමන් වසන්නාවූ සථානයටම ගියෝය.

රජ්ජුරුවෝත් මහබෝසතාන්ගේ අවවාදයෙහි පිහිටා දානාදීවූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා "මහරජ්ජුරුවෙනි, සවජන දුටු කාරණයෙන් තොපට භයෙක් නැත, මේ යාගය හැරපියව"යි යාග හරවා මහජනයාට ජීවිතදානය දී පූර්වාපර සන්ධි ගළපා මේ මහාසුපින ජාතකය නිමවා වදළසේක

"එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් මේ ආනන්දස්ථවිරයෝය, මානවකයා නම් ශාරිපුත්‍රස්ථවිරයෝය, එසමයෙහි තපස්වී වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මවේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 78 ඉල්ලීස ජාතකය

**මේ**වද එක් සමයෙක්හි ලොකත්‍රයට ප්‍රදීපයක් බඳුවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් **මච්ඡරිය කොසිය** සිටානන් අරභයා මේ ජාතකය වදාළසේක

රජගහනුවරට නුදුරුතෙනෙක **සක්කර** නම්වූ නියම්ගමෙක් වූයේය. එහි අසූකෙළක් පමණ ධනසම්පත් ඇති **මච්ඡරිය කොසිය** නම් සිටුපුත්‍රයෙක් වසන්නේය. ඒ සිටුපුත්‍රතෙම තණකෙන්දක් තෙල්ගාලා එයිත් තෙල්බින්දුවකුත් අනුන්ට නොදෙන්නේය. තෙමේත් අනුභව නොකරන්නේය. මෙසේ ඔවුන්ගේ වස්තු සම්භාය **පුත්‍රදාරාදීන්ටවත් ශ්‍රමණ** බ්‍රාහ්මණාදීන්ටවත් ප්‍රයෝජනයකට නොපැමිණෙන්නේය. රාක්ෂසාධිගෘහීතවූ පුෂ්කරිණියක් මෙන් අපරිභොගව සිටින්නේය.

**එක්දවසක් සර්වඥයන්වහන්සේ** අලුයම්වේලේ මහාකරුණා සමාපත්තියෙන් නැගී සියළු සක්වළ වතුස්සත්‍යාවබෝධයට සුදුසු බැඳුන් බලාවදරණසේක් **පන්සාලිස්** යොදනකින් **මත්තේ** වසන්නාවූ භාග්‍යාව සහිතවූ සිටා තන්ගේ ශ්‍රොතාපත්තිඵලයට උපනිශ්‍රය දුටුසේක **සර්වඥයන්වහන්සේ** මහාකරුණාසමාපත්තියෙන් නැගී බලන්නෝ, පළමු දවසෙක රාජසේවයට රජගෙට ගොස් රජ්ජුරුවන්ට සේවය කොට එන්නාවූ සිටානෝ **සාකුස්** ඇතිව දනව්වැසි මනුෂ්‍යයකු කොමුයෙන් පිරුණාවූ කබල්ලක් කන්නා දැක එහි තෘෂ්ණාව උපදවා තමන්ගේ ගෙට ගොස් මෙසේ සිතූසේ:- ඉදින් කබල්ලක් කනුකැමැත්තෙම් කියෙම් නම් මා හා සමග බොහෝදෙන කනු කැමති වෙති එසේ කල්හි මාගේ බොහෝ සාල් ගිතෙල් මී උක්සකුරු ආදිය නිමවන්නේය එසේහෙයින් කිසි වක්නට නොකියමි යි තෘෂ්ණාව ඉවසාගෙණ ඇවිදිනාහුය. ඒ සිටානෝ කල්යත් යත් සුදුමැලිව ගිය ශරීර ඇතිව ඉපිලතිබෙන්නාවූ නහරබහනින් වළඳිනා ලද ශරීර ඇතිවූය. ඉක්බිත්තෙන් තෘෂ්ණාව ඉවසාගත නොහී ගබඩාවට වැද ඇඳ වැළඳ ගෙණ වැදහොත්තානුයා මෙසේ දුර්වලබවට පැමිණත් වස්තු විනාශවෙයි යන භයින් කවුරුන්ටත් කිසිවක් නොකීවාහුය. එකල්හි සිටානන්ගේ භාර්‍යාව සමීපයට ගොස් පිට පිරිමැද "ස්වාමීනි, නුඹවහන්සේට අප්‍රසු කුමක් ද?"යි විවාළීය. 'මට කිසි අප්‍රසුවෙක් නැතැ"යි කීකල්හි "කිමෙක්ද? යි සිටානන්වහන්ස, රජ්ජුරුවන් වහන්සේ කිපීසේක්ද? යි විවාළීය.

"රජ්ජුරුවන්වහන්සේ මට කළ කෝපයෙක් නැතැයි"යි කීකල්හි 'එසේ කල නුඹවහන්සේගේ දූ දරුවන් විසින්වත් දාසකම්කාරාදීන් විසින්වත් කරණ ලද කිසි අමනාපයෙක් ඇද්ද?'යි විචාළේය. "එබන්දකුත් නැතැයි"යි කීකල්හි "නුඹවහන්සේට කිසි තෘෂ්ණාවෙක් ඇද්දැ?'යි විචාළේය, එසේකල්හි වස්තු විනාශ භයින් කිසිවක් නොකියා නිශ්ශබ්දවම වැද නොත්තාය.

ඉක්බිත්තෙන් සිටානන්ගේ භාර්‍යාතොමෝ "ස්වාමිනි, කිවමැනව කිසි වක් ගැන නුඹවහන්සේට තෘෂ්ණා ඇද්දැ?'යි විචාළේය. එබස් ඇසූ සිටානෝ බය ගැළපියන්නාක් මෙන් "එක් තෘෂ්ණාවෙක් ඇතැ"යි කිවූය. 'ස්වාමිනි, කවර තෘෂ්ණාවෙක්දැ? යි විචාළ කල්හි "කබල්ලක් කනු සැමැත්තෙමි" යි කිවූය, "එසේකල නුඹවහන්සේ මෙතෙක් දවස් කුමක් පිණිස නොකීසේක්ද? නුඹවහන්සේ දිළිඳු සේක්ද? සියළු සකුරා තම් නියම්ගම් වැස්සන්ට සැහෙන පරිද්දෙන් කබළු පිසම්දැ?"යි කිවූය. නිට ඔවුන්ගෙන් ප්‍රයෝජන කිම්ද? ඌ තුමූ තමන්ව උපස්ථාගෙණ කති"යි කිවූය. "එසේවීනම් එක වීපියෙක වසන්න වුන්ට සැහෙන පරිද්දෙන් පිසම්දැ?"යි කිවූය, "තොපි මනසම්පත් ඇති නියාව දන්නමෝවේදැ"යි කිවූය. "එසේවීනම් මේ ගෙයි පමණක් සියල්ලවුන්ට සැහෙනුකොට පිසම්දැ?යි කිවූය. "මම තොප මහත්වූ අදහස් ඇති නියාව දන්නේවේදැ"යි කිවූය "එසේවීනම් නුඹවහන්සේගේ දූ දරුවන් පමණට සැහෙන නියයෙන් පිසම්දැ?"යි විචාළේය. "ඔවුන්ගෙන් නිට ප්‍රයෝජන කිම් දැ?"යි කීකල්හි "එසේවීනම් නුඹවහන්සේටත් මටත් සැහෙන පරිද්දෙන් පිසම් දැ?"යි කිවූය. "නෝ මට කුමක්කරන්නෙහිදැ"? කී කල්හි "එසේ වීනම් තනිව නුඹවහන්සේටම සැහෙන නියාවෙන් පිසම්දැ"යි විචාළේය. එකල සිටානෝ කියන්නෝ "මෙතනදී පිසනකල බොහෝදෙනා කනුකැමති වෙති. නොකඩ සාල් හැර කඹසාලත් උලුන හා කබල් ආදියත් ගෙණයන්නෙම් යම්තම් කිරි තෙල් මී උක්සකුරු ආදියත් ගෙණ සත්මාලක් ඇති ප්‍රාසාදයාගේ මතුමහල්තල යට නැගී පිසවා එතැන්හිම උදකලාව හිඳ කම්"යි කිවූය ඒ සිටු දූ සිටානන් කීබස් යහපතැ යි පිළිගෙණ ගතයුත්ත ගෙන්වාගෙණ ප්‍රාසාදයට නැගී කෙල් ලන් යවා සිටානන් කැඳවූය. ඒ සිටානෝ ආදිපටන් දෙරවල් පියමින් හැම දෙරවල්වලම අගුල්ලා සත්වෙනි මාලට නැගී ඒ සත්වෙනි මාලෙහි දෙරපියා උන්නාහුය. සිටානන්ගේ භාර්‍යාවන් උලුනෙහි ගිනිමාලවා කබල ලිපතබා කබළු පිසන්ට පටන්ගත්තීය.

එකල සම්බුදයන්වහන්සේ මුගලන් මහතෙරුන්වහන්සේට උදැසනම මෙසේ වදාළසේක. "මහාමොග්ගල්ලාන සථවිරයෙනි, රජගහනුවර සකුරා තම් නියම්ගම මවජරියකොසිය නම් සිටුපුත්‍රයෙක් කබලු කම් සිතා අනුන්ගේ දුක්මට හයින් සත්මාලක් ඇති ප්‍රාසාදයේ මතුමහල්තලයෙහි කබලු පිසන් දේය. තෙපි එතනට ගොස් ඒ සිටුපුත්‍රයා දමනෙහිලා ඔහුගේ සන්තාන ගතවූ කෙලෙස් නමැති විෂ විනාශ කොට සිටුපුත්‍රයා හා සිටුදූ ලවා කබලු කිරිතෙල් මී සකුරු ආදීවූ දෙය ගෙන්වා තොපගේ බලයෙන් ජේතවනයට එව. මම අද පන්සියයක් භික්ෂූන් හා සමග විහාරයෙහිම හිඳිමි. ඒ කබල්ලක පූපයෙන් ආහාර කෘත්‍යය කෙරෙමි"යි වදාළසේක. තෙරුන්වහන්සේ "යහපත, ස්වාමිනි" කියා සම්බුදයන්වහන්සේගේ වචනය පිළිගෙණ එකෙණෙහි සෘද්ධබලයෙන් ඒ නියම්ගමට ගොස් ඔහුගේ ප්‍රාසාදයෙහි සිවුමැදුරු කවුළුවට සමීපයෙහි මනාකොට හැඳ පොරවා ආකාශයෙහි ඉඳුනිල්මිණිරුවනක් මෙන් සිටිසේක.

මහසිටාතන්ට තෙරුන්වහන්සේ දැකලාම ලය කම්පිතව ගියේය. ඒ සිටාතෝ "මම බෙදුවූ ශ්‍රමණයන්ට හසින්ම මේ සථානයට ආම්. මේ ශ්‍රමණයෝ වනාහි අවුත් කවුළුදොර සමීපයෙහි සිටියෝය"යි අනිකක් කියා කොට ගත හැකි දෙයක් නොදැක ගින්නට දැමූ ලුණුකැටයක් මෙන් රොෂයෙන් "තව තව" යන අනුකරණ ශබ්ද පවත්වමින් මෙසේ කීය

"ශ්‍රමණයෙනි, තෙපි ආකාශයෙහි සිට කුමක් ලබවිද? ආකාශයෙහි ආ පදයෙහි පද දක්වා සක්මන්කළමුත් කිසිවක් නොලබන්නා වේදැ?"යි කිවුය. තෙරුන් වහන්සේ එම තෙත ආකාශයෙහි සිට ඇත මැත සක්මන් කළසේක, සිටාතෝ ඒ දැක "ශ්‍රමණයෙනි, සක්මන් කොට කුමක් ලබවිද? ආකාශයෙහි පලක්බැඳගෙණ උන්නේවී නමුත් කිසිවක් නොලබන්නාවේදැ?"යි කිවුය. තෙරුන්වහන්සේ ආකාශයෙහි පලක්බැඳ හුන්සේක.

ඉක්බිත්තෙන් සිටාතෝ ඒ දැක 'ආකාශයෙහි හිඳ කුමක් ලබවිද? කවුළු දොර එලිපත්තේ සිටියේ වී නමුත් කිසිවක් නොලබන්නා වේදැ"යි කිවුය. තෙරුන්වහන්සේ එලිපත මත්තේ අවුත් සිටිසේක.

ඉක්බිත්තෙන් ඒ දැක එලිපත මත්තේ සිට කුමක් ලබන සේක්ද? දුම්ගියා නමුත් කිසිවක් නොලබන්නාවේදැ"යි කිවුය. තෙරුන්වහන්සේ එබස් අසා දුම්ගියසේක, සියළු ප්‍රාසාදය ධූමයෙන් එකාන්ධකාරවිය. සිටාතන්ගේ ඇස් ඉදිකටුවෙන් විදිනා කලක් මෙන් විය. "ගෙය දුඳෙනෝ"යි යන භයින් "ඉදින් දිලිහී ගියා නමුත් කිසිවක් නොලබන්නාවේදැ"යි නොකියා මෙසේ සිතුයේය. "මේ මහණ ඉතා ලැජ්ජාය, ඒකාන්තයෙන් නොලැබ නොයන්නේය. එ ස්හෙයින් මෝහට එක් පූපයක් දෙමි"යි භාර්‍යාවට කියන්නෝ "සොඳුර, මෝහට කුඩා පූපයක් පිස දී යවා පියවයි"යි කීහ.

ඕනොමෝ සැඳිඅහින්ම පිටිසුහක් කබලේ වත්කොටපූය, එකෙණෙහි මහත්වූ පූපයක්ව සියළු කබල පුරා ගෙනවිත් නැගීසිටියේය. සිටාතෝ ඒ දැක "නී විසින් බොහෝ කොට පිටි උකාගන්නා ලදැ"යි කියා තුමූම සැඳි අහින් පිටි පොඩියක් උකාගෙණ කබලේ වත්ඔොවපූය. පළමු වත්කොට පිසූ පූපයට වඩා මහත්විය. මෙසේ යම් යම් පූපයක් පිසන්නේ නම් ඒ පූපය මහත්ව ගෙණයන්නේය. සිටාතෝ ඒ දැක කලකිරී භාර්‍යාවට කියන්නේ 'සොඳුර, මෝහට එක් පූපයක් දී යවාපියව"යි කිවුය.

එබස් අසා සිටුදූ පෙට්ටියෙන් එක් පූපයක් ගන්ට වත්කල්හි සියල්ලම ඒකාබඩව ඇලීගියේය. ඒ සිටුදූ සිටාතන්ට කියන්නී "ස්වාමීනි, සියළු පූපයන් ඒකාබඩව ඇලීගියේය. වෙන්කොට ගත නොහෙමි"යි කිව. "මම වෙන් කෙරෙමි"යි කියා සිටාතෝත් වෙන් කොට ගත නුහුවෝය. දෙදෙනම දෙකෙළවර අල්වා ඇද වෙන් කොට ගතනුහුනුවාහුය.

ඉක්බිත්තෙන් ඒ සිටාතන් පූපයන් හා වෑයම් කරන්නවු තැනැත්ත හුගේ සකල ශරීරයෙන් බාබිඳගත්තේය. කබලෙහි තෘෂ්ණාව සිඳී ගියේය. එකල්හි සිටාතෝ භාර්‍යාවට කියන්නෝ "සොඳුර, මට පූපයෙන් කම්නැත. පෙට්ටිය පිටින්ම මේ භික්ෂූවට දීපියව"යි කිවුය. ඒ සිටුදූ පෙට්ටියපිටිම්ම ඇර ගෙණ තෙරුන්වහන්සේ සමීපයට ගියාය. එකල තෙරුන්වහන්සේ දෙදෙනා

ටම ධර්මදේශනා කොට රත්නත්‍රයෙහි ගුණ වදාළසේක. ''දෙනලද දානයෙහි විපාකා ඇත. අමුතු පඬුරු වශයෙන් දෙනලද දක්ෂිණායෙහිත් විපාකඇතැ'' යි දානාදීන්ගේ විපාක ආකාශයෙහි පුන්සඳමඬලක් මෙන් ප්‍රකාශ කොට දැක්වූ සේක.

ඒ අසා ප්‍රසන්නවූ සිත් ඇතිව ''ස්වාමීනි, අවුත් මේ පයස්සීඛකයෙහි වැඩ හිඳ මේ පූජාවත් වැළඳුව මැනවැ''යි ආරාධනා කළෝය. තෙරුන්වහන්සේ වදාරණසේක් ''සිටානෙනි, සම්‍යක් සම්බුදු රජානන්වහන්සේ පූජාවන් වළඳි මි''යි පන්සියයක් භික්ෂූන්වහන්සේ හා සමග විහාරයෙහි වැඩහුන් සේක. තොපගේ අභිප්‍රාය ඇත්නම් සිටුදුව ලවා පූජාවන් හා ක්ෂීරාදිය ගෙන්වාගෙණ සර්වඥයන්වහන්සේ සමීපයට යව''යි වදාළසේක.

සිටානෝ කියන්නෝ ''ස්වාමීනි, සර්වඥයන්වහන්සේ කොයි වසනසේක් ද''යි විවාළෝය. ''සිටානෙනි, මීට පන්සාළිස් යොදනකින් මත්තෙහි ජේතවන විහාරයෙහිය''යි වදාළසේක. ''ස්වාමීනි, වේලා නූගුළුවා මෙතෙක්දුර කෙසේ යමෝද''යි කිවුය. ''පින්වත්වූ සිටානෙනි, තොපගේ යන්ට අභිප්‍රායෙක් ඇත්නම් මම තොප සෘද්ධිබලයෙන් ගෙණැ යෙම්, තොපගේ ප්‍රාසාදයෙහි ඉණිහිසතිබූ තැනම තිබෙන්නේය. ඉණිපාමුල වතාහි ජේතවන දොරටුවෙහිම වන්නේය. උඩුමාලෙන් යටිමාලට බස්නා දුතුරෙහිම තොප දෙදෙනා ජේතවනයට ගෙණ යෙම්''යි වදාළසේක.

සිටානෝ ''යහපත ස්වාමීනි''යි පිළිගත්තුය. එකල තෙරුන්වහන්සේ හිණිහිස ඒ ප්‍රාසාදයේහිම කොට ''ඒ හිණිපාමුල ඒ ජේතවන දොරටුව වේව''යි ඉටුසේක. එසේ වූයේය. තෙරුන්වහන්සේ සිටානනුත් සිටුදුවත් උඩුමාලෙන් යටිමාලට බස්නාට පළමුකොට ජේතවනයට පැමිණවූසේක.

ඔහු දෙදෙන සර්වඥයන්වහන්සේ කරා එළඹ ''වළඳින්ට වේලාය''යි දැන් වූහ. සර්වඥයන්වහන්සේ එබස් අසා හොජන ශාලාවට වැද භික්ෂූ සංඝයා වහන්සේ හා සමග පණවනලද බුද්ධාසනමඤ්ඤකයෙහි වැඩහුන්සේක. මහ සිටානෝ බුදුන් ප්‍රධාන කොට ඇති පන්සියයක් භික්ෂුසංඝයාවහන්සේට දක්ෂිණෝදකය දුන්නුය. සිටුදු සර්වඥයන් වහන්සේගේ පාත්‍රයට පූප පිළිගැන්වූය. සර්වඥයන්වහන්සේ තමන්වහන්සේට යැපෙන පමණක් පිළිගත්සේක. පන්සියයක් භික්ෂූන්වහන්සේත් එසේම පිළිගත්සේක. සිටානෝ දිගටම කිරි තෙල් මී සකුරු පිළිගන්වාගෙණ ගියෝය. සර්වඥයන්වහන්සේ පන්සියයක් භික්ෂූන් වහන්සේ හා සමග පූජාවන්ම ආහාර කෘත්‍යය සැපවූසේක.

මහසිටානෝ භාර්‍යාව හා සමග සැහෙන පමණ පූප අනුභව කළාහු මය. එතෙකුදුවුවත් පූපයෙහි කෙළවර නොපෙණුනේය, සියළු විහාරයෙහි භික්ෂූන්වහන්සේටත් සිඟන්නන් හා යාචකයන්ටත් දුන්කල්හිත් පූජාවන් කෙළවරක් නොපෙණුනේය. එසේකල සිටානෝ ''ස්වාමීනි, පූජාවෝ නොනි මන්නෝය''යි බුදුරජානන්වහන්සේට දැන්වූවෝය ''එසේ වී නම් සිටානෙනි, ජේතවන දොරටුව සමීපයෙහි ලාපියව''යි වදාළසේක.

ඉක්බිත්තෙන් ඔහු දෙදෙන දොරටුවට නුදුරුතෙන ප්‍රාග්භාරයක් සමීප යෙහි පෙවිටියෙන්ම සලාපූය. අද දක්වාත් ඒ ස්ථානය කබල්ලක නම් පූව ප්‍රාග්භාරය යි කියාම ප්‍රසිද්ධවිය. මහසිටානෝ භාර්‍යාව හා සමග සර්වඥයන් වහන්සේ සමීපයට ගොස් එකත්පස්ව සිටියාහුය.

බුදුරජානන්වහන්සේ අනුමෙවෙනි ධම්දෙශනා කළසේක. අනුමෝදනා වගේ කෙළවර මේ දෙදෙනා සෝවාන්ඵලයෙහි පිහිටා බුදුරජානන් වහන්සේට තමස්කාර කොට ජෙතවන දෙරටුවෙහිදී හිණට නැඟි තමන් ප්‍රාසාදයෙහිම ගොස් පිහිටියාහුය, එතැන්පටන් මහසිවානෝ අසූකෙළක් ධන බුඩශාසන යෙහි දන පරිත්‍යාග වශයෙන් විසුරුවූය.

දෙවෙනි දවස් සමූහක් සම්බුදුරජානන් වහන්සේ සැවැත් නුවර පිඬු සිඟා ජෙතවනයට අවුත් භික්ෂූන්වහන්සේට සුගතොවාද දී ගඳකිළියට වැද සැතපුනු කල්හි සවස්වේලේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන් වහන්සේ "ඇවැත්නි, මහාමෞද්ගල්‍යායන සථවිරයන්වහන්සේගේ ආනුභාව යක් බලව මසුරු සිවානන් ඇසිල්ලකින්ම දමනයෙහි ලා සන්තානගතවූ ක්ලෙශ තමැති විෂ විනාශ කොට පූජය ගෙන්වාගෙණ ජෙතවනයට අවුත් සර්වඥයන්වහන්සේට සම්මුඛ කොට සෝවාන්පෙළෙහි පිහිටවූය. ඒ මහා මෞද්ගල්‍යායන සථවිරයෝ ඉතා මහත්වූ ආනුභාව ඇත්තෝය"යි තෙරුන් වහන්සේගේ ගුණ කිය කියා උන්සේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ දම් සභාමණ්ඩපයට වැඩ "මහණෙනි, දැන් මා එන්නාට පූර්වභාගයෙහි කවරකථාව කින් යුක්තව උනුදැ"යි විචාරා "මෙතම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, කුලයන් දමනයෙහි ලන්නාවූ භික්ෂූන් විසින් කුලයන්ට පිඩා නොකොට නොමිරිකා නොතලා මලින් රොන් ගන්නාවූ බඹරක්හු මෙන් කුලයන් කරා එළඹ බුදුගුණ දැන්වීය යුත්තේය"යි වදාරා තෙරුන්වහන්සේට ප්‍රශංසා කරණසේක.

"යථාපි භමරෝ පුපඵං-වණ්ණගන්ධං අහෙඨයං
පලෙති රසමාදාය-එවං ගාමෙ මුනී චරෙ"ති

යන මේ ධම්පියාවෙහි ගාථාව වදාරා මත්තෙහිත් තෙරුන්වහන්සේගේ ගුණ ප්‍රකාශ කරණ්නු පිණිස "මහණෙනි, මෞද්ගල්‍යායන සථවිරයන් විසින් මසුරු සිවානන් දමනෙහි ලැවේ දැන් මතු නොවෙයි, පෙරත් ඔහු දමනෙහි ලා කර්ඵල සම්බන්ධය දැන්වූවෝම වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි බරණැස්නුවර ඉල්ලිස නම් සිවාන කෙනෙක් වූය. ඒ සිටානෝ අසූකෙළක් සමපත් ඇත්තෝය. පුරුෂදොෂයෙන් සමන්විතයෝය, බුන් සිහිල් කකුල් ඇත්තෝය, වක් හස්තපාදාදිය ඇත්තෝය, වපරුස් ඇත් තෝය, රත්නත්‍රයෙහි අප්‍රසන්නයෝය, සැදුහැනැත්තෝය, මසුරුගුණ ඇත් තෝය. තමන් සන්තක වස්තුව අනික් කෙනෙකුට නොදෙති, තුමූත් අනුභව නොකරති, උන්ගේ සම්පත රාක්ෂසාධිගෘහීතවූ පොකුණක් මෙන් වූය, ඒ සිවා නන්ගේ දෙමව්පියෝ වූකලී සත්වැනි කුලපරම්පරාව දක්වා දුගතහ. දන පතියහ. මූතුමූ සිටුහතුරු ලැබලාම වංශය නසා දන්හල් දවා යාවකයන් තලා පිටත්කොට වස්තුවම රැස්කරවූය. ඒ සිටානෝ එක් දවසක් රජ්ජුරු වන්ට රාජසේවයට ගොස් තමන් ගෙට එන තැනැත්තෝ හමන් ආයාසයෙන් මිරිකුණාවූ එක් දනවුවැසි මනුෂයෙක් එක රා කළයක් ගෙණ පුටුවක් මත්තේ හිද ඇඹුල්රායෙන් ඔඩමක් පුරපුරා කුණුමස් අවුළු හා සමග බොන්නා වුන් දැක රාබොනු කැමතිව මෙසේ සිතූය. "ඉදින් මම රා බොත් නම් මා

බොන්නට වත් කල්හි බොහෝදෙන බොනු කැමති වෙති. එසේ කල්හි මාගේ වසතුව නැසියන්නේය''යි ඒ සිටානෝ තෘෂ්ණාව ඉවසමින් ඇවිද කල්යාමක් ගිය කල්හි තෘෂ්ණාව ඉවසාගත නොහී පොළා නැගූ පුළුනක් මෙන් සුදුමැලිවූ ශරීර ඇතිවූය. ඉල්පව තිබෙන්නාවූ නහරබඳනින් වළඳනාලද ශරීර ඇත්තේය.

ඉක්බිත්තෙන් එක් දවසක් ඒ සිටානෝ ගබඩාවට වැද ඇඳ වැළඳ ගෙණ හොත්නාහුය. සිටානන්ගේ භාර්‍යාී නොමෝ සමීපයට ගොස් පිට පිරිමැද ''ස්වාමීනි, නුඹවහන්සේට අඵාසු කිම්ද?''යි විචාළීය, මෙතැන්හි කියයුතු සියල්ල ඇට කියනලද ක්‍රමයෙන්ම දතයුත්තේය. ''එසේ වී නම් තනිවූ නුඹ වහන්සේටම සැහෙන නියායෙන් ඉදිකෙරෙම්ද?''යි විචාළ කල්හි ගෙයිදී සුරාව ඉදිකළ කල බොහෝදෙන ඒ සුරාව බොන්ට ප්‍රාර්‍ථනා කෙරෙති. අංගානි යෙන් ගෙන්වාත් මෙතන හිඳ බොන්ට නො පිළිවන්වන්නේය''යි මදවක් පමණ රන් දී අංගානියෙන් රාකලයක් කුඩා කොල්ලකු ලවා ගෙන්වා ගෙණ නුවරින් නික්ම ගංතෙරට ගොස් මහාවන සමීපයේ එක් කැලයකට වැද රාකලය තබ්බවා ගෙණ ''තෝ පලාය''යි කියා කොල්ලා දුර යවා ඔඩමක් පුරාගෙණ රා බොන්නට පටන්ගත්තාහුය.

ඒ සිටානන්ගේ පියානෝ වහාගී දෘතාදී පින්කම් කළ බැවින් දිව්‍ය ලෝකයෙහි ශක්‍රව උපන්නාහුය. ඒ ශක්‍රදෙවේන්‍රයා එකෙණෙහිම ''මාගේ දන්වට පවතීද්‍යෝහෝ''යි ''නොපවතීද්‍යෝහෝ''යි පරීක්ෂාකරන්නාහු ඒ දන්වැට නොපවත්නා බවත් පුත්‍රයා කුලවංශය නසා දන්හල් දවා යාචකයන් මරා තෙරපා මසුරුබව පිහිටා අනික් කෙනෙකුන්ට දියයුතු වන්නේය යන භයින් වතලැහැබකට වැද උදකලාව රාබොන නියාව දැක ''දැන් යෙම් ඔහු අල්ලා දමනයෙහි ලා කර්‍මඵල සම්බන්ධයත් දක්වා දන් දෙවා දිව්‍යලෝකයෙහි උපදනා ලෙසත් කෙරෙම්''යි මනුෂ්‍යපථයට බැස ඉල්ලීස සිටානන් හා නොවෙනස්වූ කොරපිළුවම රැස්වූ වෙනින් ආත්මභාවයක් මවාගෙණ රජගහනුවරට වැද රජ්ජුරුවන්ගේ මාලිගාදොරකඩ සිට තමන් ආ නියාව කියා යවා 'අවුත් වදින්ව''යි කී කල්හි මාලිගාවට වැද රජ්ජුරුවන් වැඳ එකත්පසෙක සිටියාහුය. රජ්ජුරුවෝ ''කිමෙක්ද? මහසිටානෙනි, නොවේලේ අවුනැ'යි කිවුය. ''ආම්, ස්වාමීනි, මාගේ ගෙයි අසුකෙළක් පමණ වස්තු ඇත, ඒ වස්තුව නුඹවහන්සේ ගෙන්වා භාණ්ඩාර ගේ පුරවා ගතමැනවැ''යි කිවුය. 'මහසිටානෙනි, තොපගේ වස්තුව අපට ප්‍රයෝජන නැත. තොපගේ වස්තුවට වඩා අපගේ වස්තුව ඉතා බොහෝය''යි කිවුය.

එබස් ඇසූ සිටානෝ කියන්නෝ''ඉදින් රජ්ජුරුවන්වහන්ස, නුඹවහන්සේට ප්‍රයෝජනයක් නැත්නම් කැමති පරිද්දෙන් ගෙණ දන් දෙම්''යි කිවුය. ''දෙව මහසිටානෙනි,'' කීකල්හි 'යහපත, මහරජ්ජුවන් වහන්සැ''යි කියා ඒ සිටානෝ රජ්ජුරුවන් වැඳ නික්ම ඉල්ලීස සිටානන්ගේ ගෙට ගියෝය. එකල්හි සියළු පරිවාර මනුෂ්‍යයෝ අවුත් පිරිවරාගත්තාය, ''කිසිඑකකුත් ඉල්ලීස සිටානෝ නොවෙති'' කියා දැනගන්ට සමර්‍ථවූ කෙනෙක් නම් නැත. එකල්හි සිටානෝ ගෙට වැද එලිපත ඇතුලේ සිට දෙරටුපාලයා කැඳවා 'එම්බල, කොල, මා හා සමාන සවරූප ඇති යම් අනිකෙක් අවුත් ''මාගේ ගෙයය''යි වදින්ට ආ නම් ඔහු පිටිකරගසා පිවත්කරව'යි කියා දෙරටුපාලයාට විධාන

කොට තුමූ ප්‍රාසාදයේ මතුමහල්තලයට නැඟී මහානසීවූ අස්නක හිඳ සිටුදූ සමීපයට කැඳවා සතුටුඅාකාර දක්වා ''සොඳුර දන්දෙමෝදැ''යි කිවුය. ඒ වව නය අසාලාම සිටුදූත් දූදරුවෝත් දැසකම්කාරාදීහුත් ''මෙතෙක්කල් මුළුල් ලෙහිත් මුන්වහන්සේට දන්දෙන්ට සිතිවිල්ලකුත් නූපන්නේය. අද වූකලී රා බී මොලොක්වූ සින් ඇතිව දෙනුකැමතිසේක් වනැ''යි කිහ.

ඉක්බිත්තෙන් සිටු දූ ඒ සිවානන්ට''ස්වාමීනි, කැමති පරිද්දෙකින් දන් දුන මැනවැ''යි කිව. ''එසේ වී නම් නුවර බෙරලවන තැනැත්තහු කැඳවා ගෙන්වා ගෙණ රත්රිදී මුතුමැණික් ආදියෙන් ප්‍රයෝජන ඇති කෙණෙක් ඉල්ලීස සිවානන්ගේ ගෙට එව''යි කියා සියළු නුවර බෙරලව''යි කිවුය.

ඒ සිටුදූත් එපරිද්දෙන්ම කළාය. මහජනයෝ පැස්පෙව්ටි පයි ආදිය ගෙණ දොරකඩට රැස්වූවාහුය. එකෙණෙහි ශක්‍රයෝ සත්රුවන් පිරුණු ගබඩාවල දොර හරවා ''මේ සියළු වස්තු තොප හැමට දෙමි. සැනෙන පමණක් ගෙණ යව'යි කිවාහුය.

එකල මහජනයෝ ගබඩාවලින් වස්තු මැත්කොට රාජාඔහනයෙහි රැස් කොට තම තමන් ගෙනා භාජන පුරාගෙණ යන්නාහුය. එක්තරා දනව්වැසි මනුෂ්‍යයෙක් ඉල්ලීස සිවානන්ගේ ගොන් උන්ගේම රථයෙහි යොදාගෙණ සත්රුවනින් පුරා නුවරින් නික්ම මාවතට පැමිණ ඉල්ලීස සිටානන් වැද ඉඳ රාබොන්නාවූ කැලයට වැද නුදුරු තැනකින් රථය පදනේ 'ස්වාමීනි, ඉල්ලීස සිවානන්වහන්ස, අවුරුදු සියයක් ජීවත්වුවමැනව, නුඹවහන්සේ නිසා දැන් මා විසින් සිය අනින් කමීන්න නොකොට දිවිපමණින් රැකෙන පමණ සම්පත් ලබන ලද්දේය. නුඹවහන්සේගේම රථය නුඹවහන්සේගේම ගොන්ය නුඹවහන්ගේගේම ගෙයි සත්රුවනය, දැන් මේ වස්තු මැනියන් විසින් දුන් දෙයකුත් නොවෙයි, පියානන්වහන්සේ විසින් දුන් දෙයකුත් නොවෙයි සවාමීනි, නුඹවහන්සේම නිසා ලත් සම්පත්ය''යි සිවානන්ගේ ගුණ කිය කියා යන්නේය.

සිවානෝ එබස් අසා හයින් ත්‍රාසනව මෙසේ සිතුය. ''මේ තෙම මාගේ නම කියා යෙයි කිමෙක්ද? රජ්ජුරුවන්වහන්සේ විසින් මාගේ ධනය ලෝවැස්සන්ට දෙනලද්දේවනැ'යි කැලයෙන් නික්ම ගොන්ගෙය හා රථය ඇඳින ගෙණ ''එම්බල දුෂ්ටවූ කොල්ල, මාගේ ගොණා මාගේ රථය''යි කියා ගොස් ගොන්ගේ ලනුව අල්වාගත්තේය. එකල්හි ඒ දනව්වැසි පුරුෂයා රථයෙන් බැස 'එම්බා දුෂ්ට කොල්ල, ඉල්ලීස සිටානෝ සියළු නුවරවාසීන්ට දන්දෙති, තෝ උන්ට කුමක් වත්නෙහිදැ''යි ඇන සෙණ ගසන්නාක් මෙන් පිටිකර ගසා ඒ රථය ඇරගෙණ ගියේය. මේ ඉල්ලීස සිටානෝ තමන් වෙව්ලමින් නැඟී සිට ඇඟවැලි පිස පිස වහ වහා ගොස් රථයේ එල්ලීගත්තාය, එකල්හි ඒ දනව්වැසි පුරුෂයා රථයෙන් බැස ඉසකේ අල්වා නමාගෙණ වැලිමිටි දෙකකින් ඇන තලා බොටුව අල්වා ආවාවූ මාඝීයටම අභිමුඛ කොට දමා ගියේය.

මෙපමණකින් ඒ සිටානන්ගේ රා මද සිදී ගියේය. ඒ සිවානෝ වෙව්ල වෙව්ලා වේගයෙන් තමන්ගේ ගේදොරව ගොස් සම්පත් ඇරගණ යන්නා වූන්ට ''එම්බා පින්වත්නි, මේ කිමෙක්ද? රජ්ජුරුවන්වහන්සේ මාගේ සම් පත් කොල්ලකන සේක්ද?''යි කියා ගොස් ඒ ඒ වස්තු අල්වාගණිති, ඇල්වූ

ඇල්වූ මනුෂ්‍යයෝ ගස ගසා පාමුල එලනි, ඒ සිවාතෝ වේදනාවෙන් පීඩිතව ගෙවවදින්ට පටන්ගත්තුය. එකල්හි දෙරටුපාලයා එම්බල දුෂ්ටවූ ගොවිය, කොයි වදනෙහිදැ?"යි උනපත්තෙන් දෙපත්ත හසුකොට මත්තෙ පොත්ත පත්තව යන්නාක් මෙන් තළා බොටුව අල්වාගෙණ පිටත්කළාහුය. එවේලෙහි සිවානෝ "දැන් මට රජ්ජුරුවන්වහන්සේ හැර අන්කිසි පිළිසරණක්නැතැ"යි රජ්ජුරුවන්වහන්සේ සමීපයට ගොස් "දෙවයන්වහන්ස, මාගේ ගෙය නුඹ වහන්සේ කොල්ලකන සේක්ද?"යි කිවුය.

එබස් ඇසූ රජ්ජුරුවෝ "සිවානෙනි, මම කොල්ල නොකම්. තොපම අවුදින් නුඹවහන්සේ නොගන්නාසේක් වී නම් මන්ම මාගේ වසතුව දන්දෙම්, නුවර බෙරලවා දන්දුන්නෝවේදැ"යි කිවුය.

එකල්හි සිවානෝ කියන්නෝ "දේවයන්වහන්ස; මම නුඹවහන්සේ සමීපයට නාම්, කිමෙක්ද? නුඹවහන්සේ මා මසුරුනියාව නොදන්නාසේක්ද? මම තණකොන්දක් ගලා තෙල්බින්දුවකුත් කිසිකෙනෙකුන්ට නුදුන්විරීම්, යම් සිවාන කෙනෙක් දන්දෙන්නේද? උන් කැඳවා ගෙන්වාගෙණ පරීක්ෂාකරවුව මැනව රජ්ජුරුවන් වහන්සැ"යි කිවුය.

එබස් ඇසූ රජ්ජුරුවෝ ශක්‍රදෙවේන්ද්‍රයන් කැඳවා ගෙන්වාගෙණ දෙදෙනාගේ වෙනස් රජ්ජුරුවෝ නොදනි, අමාත්‍යයෝත් නොදනිති. මසුරු සිවානෝ "කිමෙක්ද? රජ්ජුරුවන්වහන්ස, මූ සිටානෝද මම් සිටාණෝද?"යි කිවුය. අපනාදුනම්හ. "එසේ දෙදෙනා අඳුනන්නාවූ කිසිකෙනෙක් ඇද්දැ?" යි විවාළෝය. "සාමීනි, මාගේ භාය්‍යාව අඳුනන්නී වේදැ?" යි මසුරු සිටානෝ කිහ. එකල්හි ඒ සිවානන්ගේ භාය්‍යා කැඳවා "තොපගේ ස්වාමිපුත්‍රයානෝ කවුරුදැ?"යි විවාළසේක.

ඒ සිටුදූතොමෝ "මූවේදැ?"යි කියා ශක්‍රයන් සමීපයෙහි සිටියාය, දූදරුව නුත් දාසකම්කාරාදීනුත් කැඳවා විවාළාහුය. හැමදෙනම ගොස් ශක්‍රයන් සමීපයෙහි සිටියාහුය. නැවත සිවානෝ මෙසේ සිතුය. "මාගේ හිස පිළිකාවෙක් ඇත, කෙසින් වැසී නිබෙන බැවින් ඒ පිළිකාව කපුවාම දන්නේය, අනික් කෙනෙක් නොදනිති, ඔහු කැඳවුම මැනවැ"යි කිවුය.

එසමයෙහි වනාහි බෝධිසත්ත්වයෝ ඉල්ලීස සිවානන්ට කපුව උපන්නාහුය. රජ්ජුරුවෝ ඒ කපුවා කැඳවා "ඉල්ලීස සිවානන් අඳුනන්නෙහිදැ?"යි විවාළෝය. ඉස බලා "ඇඳිනගණිම් ස්වාමීනි"යි කියා. එසේ වී නම් දෙදෙනාගේම "ඉස බලව" යි කිවුය.

එකෙණෙහි ශක්‍රයෝ ඉස පිළිකාවක් මවාගත්තුය, බොධිසත්ත්වයෝ දෙදෙනාගේම ඉස පිළිකා බලා පිළිකා දැක "මහරජ්ජුරුවන්වහන්ස, දෙදෙනා ඉසම පිළිකා ඇත්තේය, මම මොවුන් දෙදෙනාගෙන් එක්කෙනෙකුන් ඉල්ලීස බව දැනගත නොහෙමි"යි කියා මෙසේ කිවුය. දෙදෙනම කොරවූය, දෙදෙනම පිලුවූය, වපරුස් ඇත්තෝය, දෙදෙනම පිළිකා ඇත්තෝය, එසේ හෙයින් ඉල්ලීසයන් අසවල්වුය සි මම නොදනිමි"යි කිවුය. බොධිසත්ත්වයන්ගේ වචනය අසා මසුරු සිටානෝ කම්පිතවූ සිත් ඇතිව ශෝකයෙන් සිහිඑලවාගත නොහී එතනම වැටිහුන්නාහු ය.

එකෙණෙහි ශක්‍රදෙවේන්ද්‍රයෝ "මහරජ්ජුරුවන් වහන්ස, මම ඉල්ලීස යෙක් නොවෙමි. ශක්‍රදෙවේන්ද්‍රයෙමි" කියා මහත්වූ ශක්‍රදෙවේන්ද්‍ර ලීලාවෙන් ආකාශයෙහි සිටියාහුය. ඉල්ලීසයන් මූණ බාපිස පැන් ඉස සන්තර්පණයකළෝය ඒ සිවාතෝ නැගී සිට ශක්‍රදෙවේන්ද්‍රයන්ට නමස්කාර කොට සිටියාහුය. එකල ශක්‍රදෙවේන්ද්‍රයෝ සිවානන්ට කියන්නෝ "ඉල්ලීසයෙනි, මේ වස්තුව මාංසතුය නා සන්තක නොවෙති. මම තොපගේ පියානෝය, තෙපි මාගේ පුතනුවෝය, මම දුනාදීවූ පින්කම්කොට ශක්‍රාත්මභාවයට පැමිණියෙමි, තොප වනාහී මාගේ වංශයෙහි අයත සිලිව මසුරුබවෙහි පිහිටා දන්හල්දවා යාවකයන් පිටත්කොට වස්තුව රැස් කෙළෙහිය ඒ වස්තුව තොපිත් අනුභව නොකරන්නෙහිය, අනික් කෙනෙකුන්ටත් ප්‍රයෝජන නැත්තේය, රාක්ෂසාධිගෘහීතවූ පොකුණක් මෙන් සිටින්නේය. ඉදින් මාගේ දන්හල් කරවා පෙරපරිද්දෙන්ම දන්දුන්නෙහි වී නම් යහපත ඉදින් නොදෙන්නෙහි වී නම් තාගේ සියළු ධනධාන්‍යයන් අනතඩාන කොට මේ වජ්‍රායුධයෙන් තාගේ ඔළුවත් පලා ජීවිතක්ෂයට පමුණුවම්" යි කිවුය.

එබස් අසා ඉල්ලීස සිවානෝ මරණභයින් තැතිගෙණ "මෙතැන් පටන් දන්දෙමි" යි ප්‍රතිඥාදුන්නුය, ශක්‍රයෝ සිවානන්ගේ ප්‍රතිඥා ලැබ ආකාශයෙහිඳ ධර්මදේශනා කොට ඒ සිවානන් පඤ්චශීලයෙහි පිහිටුවා ශක්‍රභවනයට ගියෝය. ඉල්ලීස සිවානෝත් දානාදී පින්කම් කොට ස්වර්ගලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ "මහණෙනි, මහාමෞද්ගල්‍යායන සථවිරයෝ මසුරුසිවානන් දමනයෙහි ලුවෝ දැන් මතු නොවෙයි, පෙරත් දමන යෙහිලුවෝවේදැ" යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපරසන්ධි ගළපා මේ ඉල්ලීස ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සිවානෝ නම් දැන් මසුරුසිවානෝය, ශක්‍රදෙවේන්ද්‍රයෝ නම් මහාමෞද්ගල්‍යාන සථවිරයෝය, රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරයෝය, එසම යෙහි කපුව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මවේදැ" යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 79 ඛරස්සර ජාතකය

තිවද එක්සමයෙක්හි ශාක්‍යකුල චින්තා මාණික්‍යවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිරම්වෙහෙර වසනසේක් එක්තරා අමාත්‍ය-යකු අරභයා මේ ජාතකය වදාළසේක.

කෝසල රජ්ජුරුවන්ගේ එක්තරා අමාත්‍යයෙක් රජ්ජුරුවන් සිත්ගෙණ පසල්දනවිවේ ගමෙක අයපඬුරු ආදිය ලැබගෙණ සොරුන් හා එක්වගෙණ ඒ සොරුන්ට කියන්නේ "මම මනුෂ්‍යයන් ඇරගෙණ වනයට වදිමි, තොපි ගම් කොල්ලකා එයින් ලබනලද වස්තුවෙන් මටත් භාගයක් දෙව" යි කියා පළමු කොට මිනිසුන් රැස්කරවා තෙමේ වනයට ගොස් එහි ඉඳ සොරුන් අවුත් සරක් මරා මස් කා ගම පැහැර ගිය කල්හි සවස් වේලේ මහජනයා විසින් පිරිවරණ ලදුව ගමට එන්නේය.

ඔහුගේ ඒ ක්‍රියාව නොබෝ දවසකින්ම ප්‍රසිද්ධවිය. මනුෂ්‍යයෝ එපවත් රජ්ජුරුවන්ට දන්නුහ, රජ්ජුරුවෝ ඒ අමාත්‍යයා කැඳවා ගෙන්වාගෙණ දෙර

හිඳුවා තරයේ නිග්‍රහ කොට අනික් ගම්මුදලියකු ඒ පසල්දනව්වට යවා ජේත වනයට ගොස් සමීඥයන්වහන්සේට නමස්කාර කොට එකත්පස්ව හිඳ එපවත් දන්වූය.

බුදුරජාතන්වහන්සේ "මහරජ්ජුරුවෙනි, මොහු මෙසේ කෙළේ දැන්මතු නොවෙයි, පෙරත් මෙසේම කරණසුළුය"යි වදාරා ඒ රජ්ජුරුවන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ කල්හි ඒබරණැස් රජ්ජුරුවෝ එක් අමාත්‍යයක්හට ප්‍රත්‍යන්ත ජනපද යෙහිගමක් දුන්නුය. මෙතැන්හි කියයුතුවූ සියල්ල පළමු කියනලද්ද හා සමානවන්නේය.

එසමයෙහි බොධිසත්ත්වයෝ වෙළඳුම් කොට ප්‍රත්‍යන්ත දනව්වෙහි වාසය කරන්නාහු ඒ අමාත්‍යයාලත් ගම වාසය කරන්නාහුය. ඒ මහබෝසතානෝ ඒ ග්‍රාමභොජකයා සවස් වේලෙහි මනජනයා පිරිවරා තදවූ ශබ්ද ඇති පටාහෙරියක් ගස්වා ගෙණ එන කල්හි "මේ දුෂ්ට වූ ග්‍රාමභොජකයා සොරුන් හා එක්ව ගෙණ ගම් පහරවා කොල්ලකවා සොරුන් පලාගොස් වනයට වන්කල්හි දැන් තෙමේ ශාන්තදන්ත එකක්හු මෙන් නිවී සැනහී බෙරගස්වාගෙණ එන්නේය"යි නින්දාකළාහුය. නොබෝ කලකින් ඔහුගේ ඒ ක්‍රියාව ප්‍රකාශවිය. රජ්ජුරුවෝ දෙසාතුරුපව නිග්‍රහ කළාහුය.

ශාස්තෘවූබුදුරජාතන් වහන්සේ "මහරජ්ජුරුවෙනී, මොහු මෙබඳුවූ සභාව ඇත්තේ දැන් මතු නොවෙයි,පෙරත් මෙබඳු සභාව ඇත්තේවේදැ"යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ ධරස්සර ජාතකයනිමවා වදාළසේක.

"එසමයෙහි අමාත්‍යයා නම් දැන් මේ අමාත්‍යයාමය" එසමයෙහි අමාත්‍යයාව නින්දාකළාවූ ප්‍රාඥ පුරුෂවූයෙම් සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 80 භීමසෙන ජාතකය.

තවද එක් සමයෙක්හි ලොකත්‍රයෙහි පතළාවූ කීර්තිඝොෂා ඇති නිලෝගුරු බුදුරජාතන් වහන්සේ දෙවිරම් වෙහෙර වසනසේක් තමහට ස්තුති කරන්නාවූ එක්තරා භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

එක් භික්ෂුකෙණෙකුත් වහන්සේ "ඇවැත්නි, අපගේ ජාතිය හා සමානවූ ජාතියෙක් නම් නැත, අපගේ ගොත්‍රය හා සමානවූ ගොත්‍රයෙක් නම් නැත, අපගේ දුසකම්කාරාදීහුත් ඇල්සාලේ බත් හා මත්ස්‍යමාංස අනුභව කෙරෙති කසිරට සුවදවිලවුන් ගල්වති, අපි මහණවූ බැවින් දැන් මෙබඳුවූ රූසෙභොජනය අනුභව කරම්හ; රූසෙවූ සිවුරු වළඳිම්හ"යි සථවිර නවක මධ්‍යම භික්ෂූන් සමීපයෙහිදී තමන්වහන්සේගේ මහත්වය කියමින් ජාත්‍යාදී පදයෙන් මෙරමාහට නින්ද කෙරෙමින් ඇවිදිනාසේක.

ඉක්බිත්තෙන් එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ මේ භික්ෂූහුගේ කුල ප්‍රදෙශය හා ජාතිගොත්‍රය පරීක්ෂා කොට මොහු තමාගේ ප්‍රතාප කියන බව භික්ෂූන්වහන්සේ ධම්මසභාමණ්ඩපයෙහි රැස්ව හිඳ ''ඇවැත්නි, අසවල් මහණ මෙබඳුවූ නෛශ්‍රේණික ශාසනයෙහි මහණව තෙමේ තමාහට ස්තුති කොට මෙර මාහට නින්දාකෙරෙමින් ඇවිදිනේය''යි ඒ භික්ෂුවගේ නුගුණ කිය කියා උන් සේක.

එකල්හි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ ''මහණෙනි, දැන් මා එන්නාට පළමුව කවර කථාවකින් යුතුව උනුදැ?''යි විචාරා ''මෙනම් කථාවකින් යුක්තව උනුම්න''යි කී කල්හි ''මහණෙනි, ඒ මහණ දැන් තමාට ස්තුති කොට ඇවිදින්නේ වෙයි. පෙරත් තමාට ස්තුති කොට අනුන්ට නින්දාකරමින් ඇවිද්දේම වේදැ''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතාණෝ එක් නියම්ගමෙක ප්‍රසිඩවූ බ්‍රාහ්මණවංශ යෙහි ඉපද වැඩිවිය පැමිණ තක්සලානුවර දිසාමොක් ආචාරීන් සමීපයෙහි හිඳ වෙදත්‍රය හා අෂ්ටාදශ විද්‍යාස්ථානය ඉගෙණ සියලු ශිල්පයෙහි මුදුන් පැමිණියෝ චුල්ලධනුග්‍රහ පණ්ඩිතයෝය යි මේ නමින් ප්‍රසිඩවූය.

ඒ අප මහබෝසතාණෝ තක්සලානුවරින් නික්ම සියළු සමයාන්තර ශිල්පයෙහි පරීක්ෂාකෙරෙමින් මහිංසක රාජ්‍යයට ගියෝය. මේ ජාතකයෙහි වූකලී අප මහබෝසතාණෝ මදක් මිටියෝය, තැමුනාවූ ආකාර ඇත්නෝය, එසේහෙයින් ඒ බොධිසත්ත්වයෝ මෙසේ සිතූය, ''ඉදින් මම කිසි රජ්ජුරු කෙනෙකුන් කරා ගියෙම් නම් ඒ රජ්ජුරුවන් වහන්සේ මෙසේ ලකුණ්ඨවූ ශරීර ඇත්තෝ අපට කුමක් කරන්නෝදැ''යි කියනසේක. එසේ හෙයින් මම ආරොහ පරිනාහයෙන් යුක්තවූ එක්පුරුෂයකු ඉදිරිකොටගෙණ ඔහු නිසා ජීවත්වීම්නම් යහපත්වන්නේය''යි සිතා බොධිසත්ත්වයෝ එබඳුවූ පුරුෂයකු සොයන්නාහු භීමසේන නමවූ එක් වියතක්හුගේ පිළිවියත තැනට ගොස් ඔහු හා සමග පිළිසඳර කථා කොට ''සබඳ, තෝ කිනම්හුදැ?''යි විචාළෝය. ''මම භීමසේන නම් වෙමි''යි කී කල්හි 'කීමෙක්ද? තෝ මෙසේ විශිෂ්ටවූ රූපයෙන් හා ආරොහ පරිනාහයෙන් යුක්තව මේ හීන ක්‍රියාව කුමක් පිණිස කරන්නෙහිදැ?''යි විචාළෝය, ''ජීවත්වගත නොහී කෙරෙමි'' කියකල්හි ''සබඳ, තෝ මෙසේ ක්‍රියා නොකොට සියළු දඹදිව මා හා සමානවූ දුනුවායෙක් නැත. ඉදින් මම කිසි රජ්ජුරු කෙණෙකුන් වහන්සේ දුටුයෙම් වීම්නම් උන්වහන්සේ මේ ලකුණ්ඨයා අපට කුමක් කෙරේදැයි''යි මට කීපෙනසේක. එසේහෙයින් තෝ රජ්ජුරුවන් වහන්සේ දැක ''මම දුනුවායෙමි,'' කීයෙහි වී නම් රජ්ජුරුවන් වහන්සේ තට වියදම් දී නිරන්තරයෙන් වෘත්ත තබා දෙනසේක. මම තව උපන්නාවූ කායශී යෙක් ඇත්නම් කෙරෙමින් තාගේ සෙවන ජීවත්වෙමි, එසේකල්හි අප දෙදෙ නම සුඛිතවම්හ. මා කීවා කරව''යි බොධිසත්ත්වයෝ කිවුය. ඒ පුරුෂයාත් මහබෝසතාණන්ගේ බස ''යහපතැ''යි පිළිගත්තේය.

ඉක්බිත්තෙන් බෝධිසත්ත්වයෝ ඒ භීමසේන නම් පුරුෂයා කැඳවා ගෙණ බරණැස්නුවරට ගොස් තුමූ ඕනට උපස්ථායකව ඒ පුරුෂයා ඉදිරිකොට ගොස් මාලිගා දොරකඩ සිට රජ්ජුරුවන්ට දන්වා යවූය. රජ්ජුරුවන් වහන්සේ

විසින් ''එන්ව''යි කී කල්හි දෙදෙනම මාලිගාවට වැද රජ්ජුරුවන් වැද සිටියානුය. ''කවර කාරණයක් නිසා තෙපි මෙහි අවුදැ?''යි කී කල්හි භීම සේනයා 'මම දුනුවායෙකිමි, මා හා සමානවූ දුනුවායෙක් මේ සියළු දඹදිව නැත්තේය''යි කියා. ''කුමක් ලදින් නම් මට උපස්ථාන කරන්නෙහිදැ?''යි කී කී කල්හි දෙපෝයක් පාසා දහසක් ලබන්නේ වීම් නම් උපස්ථාන කරන්නේ වේද? රජ්ජුරුවන් වහන්සැයි''යි කිවුය. 'මේ පුරුෂයා තට කුමක් වේදැ?''යි මේ මාගේ සුලු උවටැන්කරුයයි කී කල්හි, එසේනම් යහපත උවටැන් කරවයි රජු කී කල්හි එතැන් පටන් භීමසේන නම් පුරුෂයා රජ්ජුරුවන්ට සේවය කරන්නේය. ඕහට පැමිණි කාර්‍යයක් බෝධිසත්ත්වයෝම සමඟ කරති.

එසමයෙහි කසිරට එක් වනයක බොහෝ මනුෂ්‍යයන් යන එන්නාවූ මාර්ගයක ව්‍යාඝ්‍රයෙක් සඤ්චාරය කරමින් බොහෝ මනුෂ්‍යයන් අල්ව අල්වා කන්නේය. එපවත් රජ්ජුරුවන්ට දැන්වූවාහුය, රජ්ජුරුවෝ භීමසේනයා කැඳවාගෙණ ''දරුව, ඒ ව්‍යාඝ්‍රයා අල්වන්ට පිළිවන්දැ?''යි විචාළේය ''රජ්ජුරුවන් වහන්ස, මම දුනුවායා, කුමක් නිසා බම්දැ? ව්‍යාඝ්‍රයා අල්වන්ට අසමර්ථ වෙම්දැ?''යි කීය. එබස් ඇසූ රජ්ජුරුවෝ ඕහට වැටුප් විසදන්දී යවූය. ඒ භීමසේනයා ගෙට ගොස් බොධිසත්ත්වයන්ට එපවත් කීයේය. බොධිසත්ත්වයෝ 'යහපත යාලුව''යි කිවුය. ''තොප නොයවිදැ?''යි කී කල්හි ''එසේය මම නොයම්, තොපට උපාය වූකලී කියම්''යි කිවුය. ''සබඳ උපාය කියව''යි කී කල්හි ව්‍යාඝ්‍රයා වසන තැනට හුදකලාව නොයව දුනු හී රැගෙණ දනව් මිනිසුන් සමඟ ගොස් ''තෙපි ව්‍යාඝ්‍රයා ඉඟිලඟිය නියාව දැන පලාගොස් එක් කැලයකට වැද බඹින් තලව්ව වැදහෙව. දනව්වැසි මනුෂ්‍යයෝ ඒ ව්‍යාඝ්‍රයා තළා අල්වා ගණිති. ඔවුන් විසින් ව්‍යාඝ්‍රයා අල්වාගත් කල්හි තෙපි දැනින් වැලක් කපා වැල් කෙළවර අල්වාගෙණ මළාවූ ව්‍යාඝ්‍රයා සමීපයට ගොස් ''පින්වත්නි, මේ ව්‍යාඝ්‍රයා මැරුවෝ කවුරුදැ?''යි කියා මම මේ ව්‍යාඝ්‍රයා ගොණෙකු මෙන් බැඳ රජ්ජුරුවන් සමීපයට ගෙණයෙමි, වැල්නිසා කැලයට ගොස් මා වැල් කඩා ගෙණ එන්නාට පළමුකොටම මේ ව්‍යාඝ්‍රයා මැරුවෝ කවුරුදැ?'' යි කියව.

එකල්හි දනව්වැසි මනුෂ්‍යයෝ භයින් ත්‍රස්තව ''ස්වාමීනි, රජ්ජුරුවන් වහන්සේට නොකියව''යි කියා තොපට බොහෝ වස්තු දෙති. ''ව්‍යාඝ්‍රයා තොප විසින් අල්වාගන්නා ලද්දේය''යි රජ්ජුරුවන් සමීපයෙන් බොහෝ වස්තු ලබන්නා වේදැ?''යි කිවුය.

ඒ භීමසේන නම් පුරුෂයා ''යහපතැ''යි ගොස් බොධිසත්ත්වයන් කී පරිද්දෙන්ම ව්‍යාඝ්‍රයා අල්වාගෙණ වනය නිර්භය කොට මහජනයා විසින් පිරිවරණලදුව බරණැස්නුවරට වැද රජ්ජුරුවන් දැක ''මා විසින් ව්‍යාඝ්‍රයා අල්වා ගන්නාලද වනයත් නිර්භය කරණලදැ''යි කීය. රජ්ජුරුවෝ සතුටුව බොහෝ වස්තු දුන්නාහුය.

නැවත එක්දවසක් මාගීයෙක මීමෙක් මිනිසුන්ට ඇන මග යා නොදෙන්නේයයි රජ්ජුරුවන්ට කීය. රජ්ජුරුවෝ පළමු පරිද්දෙන්ම භීමසේනයා යවූය. ඒ භීමසේනයාත් බොධිසත්ත්වයන් කී උපායෙන් ව්‍යාඝ්‍රයාමෙන් ඒ මීමත් අල්වාගෙණ අවුය. රජ්ජුරුවෝ නැවතත් ඕහට සතුටුව වස්තු

බොහෝසේ දුන්නුය, ඔහු මහත්වූ ඵලවයෙන්මදයෙන් මත්ව බොධිසත්ත්වයන් කෙරෙහි අවඥකොට උන්ගේ බස් නොගෙන "තොප නිසා ජීවත් නොවෙමි, කිමෙක්ද? පුරුෂයෝ නම් තෙපිමදැ"යි ආදිවූ පරුෂ වචනයන් කියන්නේය.

ඉක්බිත්තෙන් කිපදවසක් ගියකල්හි සතුරු රජ්ජුරුකෙනෙක් අවුත් බරණැස්නුවර වටලාගෙණ "රාජ්‍යය හෝ දෙව, යුඩ නෝ කරව" යි රජහට හසුන් යවූය. රජ්ජුරුවෝත් හසුන් අසා "යුඩ කරව"යි භීමසේනයා යවූය. ඒ තෙමේ සියළු සන්‍යාහයෙන් සන්නඬව යුඩ වෙසක් ගෙණ හස්ති සන්නාහයෙන් සන්නඬවූ හස්තියකු පිටට පැන නැගී උන්නේය. බොධිසත්ත්වයෝත් ඔවුන්ගේ මරණ හඟින් සියළු සන්නාහයෙන් සන්නඬව භීමසේනයාගේ පශ්චිමාසනයෙහි උන්නාහුය. හස්තියා මහජනයා විසින් පිරිවරණලදුව නුවර දෙරින් නික්ම යුඩභූමියට පැමිණියේය. එකල්හි භීමසේනයා සටන් බෙරහඬ අසාලාම වෙව්ලන්ට පවන්ගත. බෝධිසත්ත්වයෝ "දැන් මූ වැටීම මියන්නේය"යි සිතා ඇතුපිටින් නොවැටෙන පිණිස භීමසේනයා යුඩභූමිය දැක මරණ හඟින් තැතිගෙණ මලමූත්‍රයෙන් ඇතුපිට කෙළ ගැසුයේය. එකල බෝධිසත්ත්වයෝ කියන්නෝ "භීමසේනය, පළමු කී කාරිය නියාවට පසුව කළ කාරිය සමවන්නේ නොවේද? තෝ පළමු යුඩ භටයෙක් මෙන් වූයේය, දැන් ඇතුපිට කෙළසන්නෙහිය"යි කියා බොධිසත්ත්වයෝ ඔහට නින්දා කළෝය.

තවද භීමසේනය, තා විසින් පළමු කීවේ කිමෙක්ද? පුරුෂයෝ නම් තෝමද? මම පුරුෂ නොවෙම්ද? මමත් යෝධ භටය"යි නින්දා වචනයෙන් කිය මේ වූකලී එකෙක, ඉක්බිත්තෙන් පළමු තා කී නින්දා වචනයෙන් මෑත භාගයෙන් දැන් මේ යුඩ භූමියෙහිදී සන්නාහයෙන් සන්නඬවූ ඇතුගේ පිටකෙළසා නාගෙන්ම මලමූත්‍ර ධාරාවෝ වැහෙති. මේ එකෙක, එසේ හෙයින් භීමසේනය, පළමු කී යුඩකර්‍මය ඇතුපිට කෙළ ඟසා විඳින්නාවූ ආයාසය යන මේ දෙක සමනොවන්නේවේදැ?"යි මෙසේ මහබෝසතානෝ ඔහට නින්දා කොට "සබඳ තෝ නොබව, මා සිටියදී කුමක් නිසා තෝ ආයාස විඳිදැ"යි භීමසේනයා ඇතුපිටින් බාවාගෙණ "පලාය"යි කියා යවා "අද මා විසින් ප්‍රසිඩවන්ට වවනේය"යි යුඩයට වැද සිංහනාද කොට බලකොටුව බිඳ සතුරු රජ්ජුරුවන් ජීවග්‍රාහයෙන් අල්වාගෙණ බරණැස් රජු සමීපයට ගියෝය.

රජ්ජුරුවෝ සතුටුව බෝධිසත්ත්වයන්ට මහත් වූ යසපිරිවර දුන්නාහුය. එතැන්පටන් බොධිසත්ත්වයෝ චුල්ලධනුග්ගහ පණ්ඩිතයෝය'යි සියළු දඹදිව ප්‍රසිඩ විය. ඒ මහබෝසතානෝ භීමසේනයාට වැටුප් වියදම් දී ඔහු පළමු විසුවාවූ සථානයට යවා දුනාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ "මහණෙනි, මේ භික්ෂූහු තමාට සතුරු කොට අනුන්ට නින්දා කෙළේ දැන් මතු නොවෙයි, පෙරත් නින්දා කළෝම වේදැ"යි මේ ධර්‍මදේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්‍වාපරසන්ධි ගළපා මේ භීම සේන ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි භීමසේන තම් දැන් අනුන්ට නින්දාකොට තමාට ස්තුති කරන්නාවූ මහණය, එසමයෙහි චුල්ලධනුග්ගහ පණ්ඩිතයෝ තම් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 81 සුරාපාන ජාතකය

මේ වදන එක් සමයෙක්හි පසළු මාරයන් ජයගත්තාවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ කොසඹෑනුවර නිසා ඝෝෂිතාරාමයෙහි වැඩ වසනසේක් සාගත සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර වස්වැස චාරිකා ගමනින් භද්දවතිකා නම් නියම්ගමට පැමිණි කල්හි ගොපොල්ලන් අජපාලයන් ගොවින් මහින් ආදීවූ සත්ත්වයෝ සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ දැක වැඳ 'සවාමීනි බුදුරජාණන් වහන්ස, අඹතිත්ථියට නොවැඩිය මැනව, අඹතිත්ථියෙහි ජටිලයාගේ ආශ්‍රමයෙහි අඹතිත්ථී නම් නාගරාජයෙක් ආශීවිෂය, ඝොරවිෂය, ඒ නාගරාජයා සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේට පිඩා කරන්නේය"යි කියා වැලකූය. සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේද ඔවුන්ගේ කථාව නොඇසුවාක්හු මෙන් ඔවුන් තුන්යලක් දක්වා වළකමින් සිටියදීම වැඩි සේක.

සාගත සථවිරයන් වහන්සේ විසින් නාගරාජයා දමනයෙහිලූ නියාව සිඟළු ජනපදයෙහි පතළ ලෙස කොසඹෑනුවර වාසීවූ සත්ත්වයෝ සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේට පෙරගමන් කොට නමස්කාර කොට සාගත සථවිරයන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්ව සිට මෙසේ කීවාහුය. "සවාමීනි, යමෙක් නුඹවහන්සේට දුලීහ වීනම් ඒ වදාළ මැනව, අපි එය සමෘද්ධ කරමිහ"යි කීවූය. එබස් ඇසූ තෙරුන් වහන්සේ මූවෙන් නොබිණුසේක. සමහර භික්ෂූන්වහන්සේ වහාම 'උපාසකවරුනි, ප්‍රව්‍රජිතයන් වහන්සේට කාපෝතිකා නම් සුරාව දුර්ලභද වෙයි, ඉදින් පොපි තෙරුන්වහන්සේට ප්‍රසන්නවූවාහු නම් කාපෝතිකා සුරාව පිළියෙල කරව"යි කීසේක. ඒ උපාසකවරු "සවාමීන්වහන්ස, යහපතැ"යි පිළිගෙණ සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේට සෙව දවසට ආරාධනා කොට නුවරට වැද තම තමන්ගේ ගෙයිදී "තෙරුන් වහන්සේට දෙමහ"යි කාපෝතිකා නම් සුරාව පිළියෙල කර තෙරුන් වහන්සේට පවරා තමන්ගේ ගෙයිදී සුරාව පිළිගැන්වූය, තෙරුන් වහන්සේ ඒ සුරාව වළඳා මදයෙන් මත්ව නුවරින් නික්මෙනසේක් වාසල්දොර වැටී නන්දෙඩවමින් වැදහොත්සේක.

සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ වළඳා ඉක්බිති නුවරින් නික්මෙනසේක් ඒ තෙරුන් වහන්සේ ඒ ආකාරයෙන් වැදහොත්තා දැක "මහණෙනි, සාගත සථවිරයන් ඇරගණුව"යි කියා ගෙන්වාගෙණ විහාරයට වැඩිසේක. ඒ භික්ෂූන්වහන්සේ තෙරුන් වහන්සේගේ හිස සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාද මූලයට කොට වැද හොවාලූසේක. තෙරුන් වහන්සේ පෙරළී තමන්වහන්සේගේ දෙපය ශ්‍රීපාද මූලයට කොට වැදහොත් සේක.

සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ අතින් විචාරණසේක් කිමෙක්ද? මහණෙනි, පෙර සාගත සථවිරයන්ගේ මා කෙරෙහි යම් ගෞරවය ඇත්තම් ඒ ගෞරවය දැන් ඇද්ද?"යි විචාළසේක. "සවාමීනි, සාගත සථවිරයන්වහන්සේය"යි කී කල්හි "කිමෙක්ද? මහණෙනි, දැන් සාගත සථවිරයෝ දියබරණය කුත් දමනයෙහි ලන්ට සමර්ථයෝද?"යි වදාළසේක. "සවාමීනි ඒ නැතැ"යි කී

කල්හි "කිමෙක්ද? මහණෙනි, "යමක් බී මෙසේ විසංඥව වැදහොත් නම් එසේවූ සුරාව බොන්නට සුදුසුදැ?"යි විචාළසේක. "සුදුසු නොවෙයි" දැන්වූසේක.

ඉක්බිත්තෙන් භාග්‍යවත්වූ බුදුරජානන් වහන්සේ සාගත සථවිරයන් වහන්සේට නින්දුකොට භික්ෂූන්වහන්සේට ආමන්ත්‍රණය කොට 'රාමෙර බීම නිමිත්ත කොට පාචිත්තියාපත්ති වේ'යි කියා ශික්ෂාපද පණවා හුනස්තෙන් නැගිසිට ගඳ කිළියට වන්සේක.

දම්සභා මණ්ඩපයට රැස්වූ භික්ෂූන්වහන්සේ සුරාපානයෙහි නුගුණ කීසේක "ඇවැත්නි, මේ සුරාපානය නම් මහත්වූ දෙෂ ඇත්තේය, මහත්වූ ශ්‍රඛාවත්වූ සාගත සථවිරයෝ යම්සේ බුදුන්ගේ ගුණ නොදනිත් නම් එපරිද්දෙන් කළෝ ය"යි සුරායෙහි නුගුණ කීසේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ 'මහණෙනි කවර කථාවකින් යුක්තව උනුදැ'යි විචාරා වදාරා 'මෙකම් කථාවකින් යුක්තව උනුම්හ'යි කී කල්හි ප්‍රව්‍රජිතයන් රා බී මත්ව විසංඥවූයේ දැන් මතු නොවෙයි, පෙරත් විසංඥවූවෝම වේදැ'යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

පසිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණෝ කසීරට ප්‍රසිඛවූ බ්‍රාහ්මණ වංශයක ඉපිද වැඩිවිය පැමිණ ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන ක්‍රීඩා කෙරෙමින් හිමාලය වනප්‍රදෙශයෙහි වාසයකරන්නාහුය, පන්සිය යක් අනෙනවාසික තාපසයෝ මහබෝසතාණන් නිරන්තරයෙන් පිරිවරා ඇවිදිනාහුය.

ඉක්බිත්තෙන් ඒ මහාබොධිසත්ත්වයන්ට වස්සාන කාලය පැමිණි කල්හි අනෙනවාසිකයෝ කියන්නෝ 'අවාරීන් වහන්ස, මනුෂ්‍යපථයට ගොස් ලුණු ඇඹුල් සෙවෙනිය අනුභවකොට එම්හ'යි කීහ. ඒ ඇසූ මහබෝසතාණෝ "අනෙනවාසිකයෙනි, මම මෙහිම වෙසෙම්, තෙපි හැම ගොස් ශරීර සතප්පා ගෙණ වර්ෂාකාලය ඉකුත්කොට එව"යි කිවුය. ඔහු හැමදෙන "යහපතැ'යි ආචාරීන් වැඳ බරණැස්නුවරට ගොස් රාජෝද්‍යානයෙහි වැස දෙවෙනි දවස් පිටත වාසල්දොර සමීපයෙහිවූ ගම සිඟා වළඳ, සම්පූර්ණව දෙවෙනි දවස් නුවරට වන්නා හුය.

මනුෂ්‍යයෝ දැක ප්‍රසන්නව භික්ෂාව දුන්නාහුය, කිප දවසකින් රජ්ජුරුවන් එත් දැන්වූය. "දෙවයන්වහන්ස, හිමාලය වනයෙන් පන්සියයක් ඍෂිවරයෝ අවුත් උයනේ වෙසෙති, ඔහු හැමදෙන ඝොරවූ තපස් ඇත්තෝය, දමතයෙහි ලන පඤ්චෙන්ද්‍රියන් ඇත්තාහ, උතුම්වූ සීලසංවරණය ඇත්තාහ'යි දැන්වූහ.

රජ්ජුරුවෝ ඔවුන්ගේ ගුණ අසා උයනට ගොස් වැඳ සුව දුක් කථාකොට වස් සාරමස එහිම වසන පිණිස ප්‍රතිඥ ගෙන ආරාධනා කළෝය. ඍෂිවරයෝ එතැන් පටන් රජ ගෙයිදී වළඳ උයන වෙසෙති. ඉක්බිත්තෙන් එක්දවසක් නුවර මහත්වූ සුරාපානයෙක් විය. රජ්ජුරුවෝ 'තපස්වීවරයන්ට සුරාපාන නම් දුර්ලභවෙයි සිතා උතුම්වූ බොහෝ සුරා යවූය. ඍෂිවරයෝ රා බී උයනට ගොස් රා මදයෙන් මත්ව සමහර කෙණෙක් පැන පැන නවති, සමහර

කෙණෙක් ගී කියති, නවා ගී කියා කෙණ්ඩිය හා එක්ව බිම ගසාගෙණ වැටී හී නිදා රාමද සුන් කල්හි පිබිද තමන්ගේ විප්‍රකාරය දැක 'අප විසින් ප්‍රව්‍රජිතයනට නොසරුප් දෙයක් කරණලදැ'යි හඬා වැලප අප ආචාරීන් වහන්සේ සමීපයෙන් වෙන්වූ බැවින් මෙබඳුවූ ලාමක ක්‍රියාව කළෝවමිහ'යි එකෙණෙහිම උයන හැර හිමාලය වනයට ගොස් තවුස් පිරිකර තැන්පත්කොට තබා ආචාරීන් වැඳ එකත්පස්ව හිඳ 'කිමෙක්ද? තපස්වීවරයිනි, මනුෂ්‍යපථයේ ආහාරයෙන් නොමිරිකී සැපසේ විසූදැ? සමගිවත් වාසයකළාදැ''යි බොධිසත්ත්වයන් විසින් විචාරණලද්දහු ආචාරීන් වහන්ස, සැපසේ විසුම්හ. එතකුදුවුවත් අපි හැම දෙන නොපියයුත්තක් බී විසංඥව සිහි එලවා ගතනොහී නැටුම්හ. ගී කීම්හ. නැවත සිහි එලවාගෙණ අප සාළසේ තපුරු යි ඇඬුම්හ''යි කියා මෙබඳු සිහිපත් නැතිකරන්නාවූ සුරාපානයටත් වඩා මා වානරවූවෝ නම් යහපත් වන්නේය'යි මෙසේ තාපස්වීවරයෝ තමන්ගේ නුගුණ බොධිසත්ත්වයන්ට කීවාහුය.

එපවත් ඇසූ මහබෝසතාණෝ 'ගුරුවරයන් හා එක්ව නොවසන්නාවූ තාපස්වීවරයන්ට මෙබන්දක් වන්නේම වේදැ'යි ඒ තාපසවරුන්ට නින්දාකොට මෙබඳුක් මතු නොකරව''යි ඔවුන්ට අවවාදදී නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ **සුරාපාන ජාතකය** නිමවා වදාළසේක.

'එසමයෙහි සෘෂිසමූහයා තම් දැන් බුදුපිරිසය. ගණ ශාස්තෘවූගේ තම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 82
## කාලකන්නි ජාතකය.

**ති**වද එක්සමයෙක්හි සංසාර සාගරයට නැවක් බඳුවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් අනේපිඬු මහසිටාණන්ගේ මිත්‍රයකු අරහයා මේ ජාතකය වදාළසේක.

ඒ මිත්‍රයා වනාහි අනේපිඬු මහසිටාණන් හා එක්ව වැලි කෙළියේය. එක් කලෙක ආචාරීන් සමීපයෙහි ශිල්ප උගත්තේය. නමින් කාලකන්නිය, ඒ නෙමේ කල්යාමකින් දුක්පත්ව ජීවත්වගතනොහී අනේපිඬු මහසිටාණන් සමීප යට හියේය. එකල සිටාණෝ ඔහු අස්වසාලා වැටුප් වියදම්දී තමන් සන්තක සියල්ල ඔහට පාවාදුන්නාහුය, එතෙමේ සිටාණන්ට උපකාරීව සියළු කටයුතු කරන්නේය. එකල එක් යාළුවෙක් සිටාණන් සමීපයට ගොස් මෙසේ කිවුය. ''මහසිටාණෙනි, මොහු තොප සමීපයෙහි විසිය නොදෙව, සිටු කාලකන්නිය, හිදු කාලකන්නිය අනුභව කරව කාලකන්නිය, යන මේ ශබ්දයෙන් වත් පලා යන්නේය, මොහු වූකලී තොප හා සමාන කෙනෙක් නොවෙයි, දුකඹිතය, විරූපීය. තොපට මුගෙන් ප්‍රයෝජන කිම්ද?''යි කිවුය.

එබස් අසා අනේපිඬු මහසිටාණෝ නාමය නම් ව්‍යවහාර මාත්‍රයක, නුවණැත්තෝ ඒ නාමමාත්‍රය ප්‍රමාණ නොකරති, සුතමඛගලිකාවන්ට සුදුසු නොවන්

නේය, මා විසින් නාමමාත්‍රයක් එක්ව වැලිකෙළි තැනැත්තහු හැරපියන්ට නොපිළිවනැ''යි ඒ යාලු විශ්වාසයන්ගේ බස් නොගෙණ එක්දවසක් තමන්ගේ හොඟග්‍රාමයට යන තැනැත්තෝ ඒ කාලකන්නි නම් පුරුෂයා රැකවලට රඳවා ගියෝය. එකල සොරු 'සිටානන් ගමට ගියෝය. එසේනෙයින් උන්ගේ ගෙය පැහැරපියම්හ'යි තොයෙක් ආවුධ හැරගෙණ රාත්‍රිභාගයෙහි අවුත් ගේ වටලා ගත්තාය, ඒ කාලකන්නි නම් පුරුෂයාත් 'සොරු එති' යන සැකයෙන් නොනිදම උන්නේය.

එතෙමේ සොරුන් ආ නියාව දැන මනුෂ්‍යයන් පුබුදුවා 'තෝ සක් පිඹුව තෝ බෙර ගසව'යි කියා මහත්ව රහමඬලක් සරහන්නා සේ මෙන් සියළු ප්‍රාසාදය එකඝොෂා කෙළේය, එකල සොරු 'ගෙය සිස්වා නිබුයේය'යි අප විසින් වරදවා අසනලද ''මහසිටානෙනි, මෙගෙයි මැ''යි කැටමුගුරු ආදිය දමාපියා හියා හුය. දෙවෙනි දවස් එතන දමනලද කැටමුගුරු ආදිය දැක භයපත්ව 'ඉදින් අද මෙබඳුවූ බුඬිසම්පන්නවූ ගේ බලන්නෙක් නුවූයේවීනම් කැමති පරිද්දෙන් වැද සියළු ගෙය පැහැරපියන්නාහුය. මිත්‍රයා නිසා සිටානන්වහන්සේට වැඩක්ම වීය'යි ප්‍රශංසාකොට අනේපිඩු සිටානන් හොඟග්‍රාමයෙන් ආ කල්හි ඒ සියළු ප්‍රවෘත්තිය කීවාහුය.

එකල්හි සිටානෝ ඒ මනුෂ්‍යයන්ට මෙසේ කිවුය ''තොපි හැම මාගේ මෙබඳු ගේ බලන්නාවූ මිත්‍රයා මෙතනින් නෙරපියන්නට උත්සාහ කළෝවේදැ යි ඉදින් මම තොප හැමගේ බසින් මොහු නෙරපුයේ වීමතම් අද මාගේ වස්තු වෙන් කිසිවකුත් නොනිබෙන්නේ වේද, නාමය නම් අප්‍රමාණය, හිතමිත්‍රයාම ප්‍රමාණය''යි කියා ඕනට වඩාලා වැටුප් දී සංග්‍රහ කළෝය.

ඉක්බිත්තෙන් ඒ සිටානෝ ''දැන් මම සම්බුදුරජාණන් වහන්සේට දන්වම්. මේ කාරණා තමැති පඬුරෙක් ඇත්තේය'' සම්බුදුරජාණන්වහන්සේ සමීපයට ගොස් ආදියෙහි පටන් සියළු පවත් දැන්වූය, සම්බුදුරජාණන් වහන්සේ 'සිටානෙනි, කාලකන්නි මිත්‍රයා තමාගේ ගෘහ වස්තුව රැක්කේ දැන්මතු නොවෙයි. පෙරත් රැක්කෝ වේදැ''යි වදාරා සිටානන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

එකල්හි සිටානෝ ''දැන් මම සම්බුදුරජාණන් වහන්සේට දන්වම්. මේ කාරණා තමැති පඬුරෙක් ඇත්තේය'' සම්බුදුරජාණන්වහන්සේ සමීපයට ගොස් ආදියෙහි පටන් සියළු පවත් දැන්වූය, සම්බුදුරජාණන් වහන්සේ 'සිටානෙනි, කාලකන්නි මිත්‍රයා තමාගේ ගෘහ වස්තුව රැක්කේ දැන්මතු නොවෙයි. පෙරත් රැක්කෝ වේදැ''යි වදාරා සිටානන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

එකල්හි සිටානෝ ඒ මනුෂ්‍යයන්ට මෙසේ කිවුය ''තොපි හැම මාගේ මෙබඳු ගේ බලන්නාවූ මිත්‍රයා මෙතනින් නෙරපියන්නට උත්සාහ කළෝවේදැ යි ඉදින් මම තොප හැමගේ බසින් මොහු නෙරපුයේ වීමතම් අද මාගේ වස්තු වෙන් කිසිවකුත් නොනිබෙන්නේ වේද, නාමය නම් අප්‍රමාණය, හිතමිත්‍රයාම ප්‍රමාණය''යි කියා ඕනට වඩාලා වැටුප් දී සංග්‍රහ කළෝය.

ඉක්බිත්තෙන් ඒ සිටානෝ ''දැන් මම සම්බුදුරජාණන් වහන්සේට දන්වම්. මේ කාරණා තමැති පඬුරෙක් ඇත්තේය'' සම්බුදුරජාණන්වහන්සේ සමීපයට ගොස් ආදියෙහි පටන් සියළු පවත් දැන්වූය, සම්බුදුරජාණන් වහන්සේ 'සිටානෙනි, කාලකන්නි මිත්‍රයා තමාගේ ගෘහ වස්තුව රැක්කේ දැන්මතු නොවෙයි. පෙරත් රැක්කෝ වේදැ''යි වදාරා සිටානන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ සිටානන්ගේ කාලකන්නි නම් මිත්‍රයෙක් විය, යනාදී සියල්ල වර්තමාන කථාව හා සදෘශවන්නේය, බොධිසත්ත්වයෝ තමන්ගේ හොඟග්‍රාමයෙන් ආ තැනැත්තෝ එපවත් අසා 'ඉදින් මම තොප ඇමගේ බසින් මෙබඳුවූ මිත්‍රයා නෙරපියම් නම් අද මාගේ ගෙයි කිසි වස්තුවක් නොනිබෙන්නේවේදැ''යි කියා මිත්‍රයාගේ ගුණ කීවාහුය.

තවද සත්පියවරක් එක්ව යාමෙන් මිත්‍ර නම් වන්නේය, දෙළොස් දවසක් එක්ව විසීමෙන් සහාය නම් වන්නේය, මසකින් යෙළමසකින් ඥාතිසමාන වන්නේය, එයින් මත්තේ එක්ව විසීමෙන් ආත්ම සමාන වන්නේය, එසේනෙයින් සත්පුරුෂ ගුණ ඇත්තාවූ මම ආත්ම සැපය නිසා බොහෝ දවසක් විශ්වාසවූ මේ කාලකන්නි නම් වූ පුරුෂයා කෙසේ නම් හැරපියම්දැ''යි මිත්‍රරසයෙහි ගුණ

කිවෘහුය. එතැන් පටන් නැවත කිසිවෙක් මේ කාලකන්නි නම් පුරුෂයා පිළිබඳ බසක් නොකියේය, ශාස්තෘවූ බුදුරාජාණන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ කාලකන්නි ජාතකය නිමවා වදාළසේක.

'එසමයෙහි කාලකන්නි පුරුෂයා නම් දැන් ආනන්ද ස්ථවිරයෝය, එසමයෙහි බරණැස් නුවර සිටානෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ'යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 83 අත්ථසඤ්ඤාර ජාතකය.

තවද එක්සමයෙක්හි සංසාර සාගරයට පසුරක් බඳුවූ තිලෝගුරු බුදු රජාණන්වහන්සේ දෙව්රම්වෙහෙර වසන සේක් කාරණා දැනීමෙහි සමර්ථවූ එක් කුලපුත්‍රයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර එක් මහ සම්පත් ඇති සිටානකෙනකු ගේ පුත්‍රයෙක් සත්ඇවිරිද්දෙහිම නුවනැත්තේය; කාරණා කාරණා දැන්මෙහි සමර්ථය, එක් දවසක් ඒ කුලපුත්‍රයා පියාගන් සමීපයට ගොස් අභිවාඩියට උපායවූ ප්‍රශ්නය විවාළේය, ඒ සිටානෝ ඒ ප්‍රශ්න දැයගත නුහුනුවාහුය.

ඉක්බිත්තෙන් ඒ සිටානන්ට මෙසේවූ සිතිවිල්ලෙක් විය. 'මේ ප්‍රශ්නය ඉතා සූක්ෂ්මය සර්ඥයන් වහන්සේ හැර අනික් කෙණෙක් උඩින් භවාග්‍රය හා යටින් අවීචියෙන් පිරිහුනාවූ මේ ලෝකයෙහි මේ ප්‍රශ්නය කියන්ට සමර්ථ කෙනෙක් නැතැ''යි සිටානෝ පුත්‍රයා කැඳවාගෙණ බොහෝ සුවඳ මල් ආදිය ගෙන්වාගෙණ ජේතවනයට ගොස් සර්ඥයන්වහන්සේට පූජාකොට වැඳ එකත්පස්ව හිඳ බුදුරජාණන්වහන්සේට මෙසේ දැන්වූය. ''ස්වාමීනි, මේ කුමාරයා නුවණැත්තේය, කාරණා කාරණා දැන්මෙහි සමර්ථය, මේ තෙමේ මා අතින් අභිවාඩියට කාරණාවූ ප්‍රශ්නයක් විවාළේය, මම ඒ ප්‍රශ්නය දැනගත නොහී බුදුරජාණන්වහන්සේ සමීපයට ආමි, ස්වාමීනි, බුදුරජාණන්වහන්ස, මට ඒ ප්‍රශ්නය වදාළසේක් වී නම් යහපත් වන්නේය''යි කියේය.

එකල්හි සර්ඥයන්වහන්සේ වදාරණසේක් ''උපාසකය, පෙරත් මේ කුමාරයා මා අතින් මේ ප්‍රශ්නය විවාළේය, මමත් ඕහට කීමි, එසමයෙහි මේ තෙමේ ඒ ප්‍රශ්නය දන්නේය, දැන් වූකලී අන්‍යභවයෙනුත් සැඟවුනු බැවින් නොසලකන්නේය''යි වදාරා ඔහු විසින් ආරාධිතවූ සර්ඥයන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

එවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ මහා සම්පත් ඇති සිටාන කෙණෙක් වූය, එකල ඒ සිටානන්ගේ පුත්‍රයෙක් සත්හැවිරිදි වයසේදීම ප්‍රඥාවෙන් වැඩ අවැඩ දැන්මෙහි සමර්ථය, ඒ කුමාර තෙමේ එක් දවසක් පියානන් සමීපයට ගොස් ''පියානන් වහන්ස, වැඩ අවැඩ උපාය නම් කවරේදැ?''යි විචාළේය. එකල ඕහට පියානෝ ප්‍රශ්නයක් කියන්නාහු මෙසේ කිවූය.

ශරීර ව්‍යාධියෙන් පීඩිත කල්හි නොලද්දාවූ ලාභයක් උපදවන්වත් ලද්දාවූ ලාභයක් ප්‍රයෝජන විදින්වත් අසමර්ථ වන්නේය, නිරොගි තැනැත්තේම නූපන්නාවූ ලාභ උපදවන්වත් උපන්නාවූ ලාභයක් ප්‍රයෝජනය විදින්වත් සමර්ථ වන්නේය, චිත්තක්ලේශයෙන් පීඩිතවූ කල්හි නූපන්නාවූ ධ්‍යානාදි ලාභයක් උපදවන්වත් උපන්නාවූ ධ්‍යානාදි ලාභ නැවත නැවත සමාපත්ති වශයෙන් ප්‍රයෝජන විදින්වත් අසමර්ථ වන්නේය, ඒ අනාරොග්‍යය ඇති කල්හි නොලැබන ලද්දාවූ ලාභය නොලබන්නේය ලබන ලද්දාවූ ලාභය නිරර්ථක වන්නේය, නිරෝගි බව ඇති කල්හි නොලබන ලද්දාවූත් ලාභය ලැබෙන්නේය, ලබනලද්දාවූ ලාභය සාර්ථකවන්නේය යි නිරෝගිබවම උත්කෘෂ්ට වූ ලාභයෙක් නම් වන්නේය, එසේහෙයින් පළමුකොට නිරෝගි බව වෘද්ධියට උපායක; මහාආචාර ශීලයෙන් යුක්තව ලෝක චාරිත්‍ර දන්මද දෙවෙනිවූ අභිවෘද්ධියටකාරණයක, ඤාණවෘද්ධ, වයෝවෘද්ධ, තපෝවෘද්ධවූ, ගුරුන් ගෙන් අවවාද ඇසීම් තුන්වෙනිවූ අභිවෘද්ධියට කාරණයක, මේ ලෝකයෙහි කාරණා නිඃශ්‍රිතවූ බහුශ්‍රැතවූ බව සතරවෙනිවූ ලෝවැඩ උපායක, ත්‍රිවිධ දුශ්චරිත ධර්මය දුරුකොට ත්‍රිවිධවූ සුචරිත ධර්මයන්ව අනුව පැවැත්ම පස්වැනිවූ අභිවෘද්ධියට මූලය; චිත්තයාගේ මලින නොවන බව සවැනිවූ අභිවෘද්ධියට කාරණයක, එසේහෙයින් මොහු සදෙන ලෞකික ලෝකෝත්තර සංඛ්‍යාත අභිවෘද්ධියම සාදාදීලන්ට සමර්ථහෙයින් උතුම්වූ අභිවෘද්ධි කාරණාවෝය යි මෙසේ මහබෝසතාණෝ පුත්‍රයාට අභිවෘද්ධියට උපායවූ ප්‍රශ්නය සි කිවාහුය. ඒ කුමාරතෙම එතැන් පටන් ඒ සැවැදෑරුම්වූ අභිවෘද්ධිකර ධර්මයෙහි පැවැත්තේය, බොධිසත්ත්වයෝ දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා අෂ්ටසාලාර ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි පුත්‍රයා නම් දැන් මේ පුත්‍රයාය, එසමයෙහි ප්‍රශ්න විස්සජ්ජනය කළාවූ මහසිටාණෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 84
## කිම්පක්ක ජාතකය.

තවද එක්සමයෙක්හි සියළු ලෝවැඩ කිරීමෙහි සමර්ථවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වසනසේක් උකට ලීවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක

එක්තරා කුලපුත්‍රයෙක් බුද්ධශාසනයෙහි ලැදිව මහණව එක්දවසක් සැවැත් නුවර පිඬුසිඟා ඇවිදිනේ සඤ්ඤාභරණයෙන් සැරහුනාවූ එක් ස්ත්‍රියක් දැක ක්ලේශ වසඟව ශාසනයෙහි ඇළුම් නැතිවූයේය.

ඉක්බිත්තෙන් ඒ භික්ෂුව ආචාර්ය උපාධ්‍යයන්වහන්සේ සමීපයට කැඳවා ගෙණ ගියේය. සම්‍බුදුරජාණන්වහන්සේ "සැබෑද? මහණ තෝ ශාසනයෙහි උකටලීවූයෙහිදැ"යි විචාරා "සැබෑව, සවාමීනි"යි කී කල්හි "මහණ මේ පඤ්ච

කාම ගුණයෝ නම් පරිභොග කාලයෙහි සිත්කළු වන්නාහ, ඒ පඤ්චකාම කොට්ඨාසයන්ගේ අනුභව කිරීම නරකාදි සතර අපායෙහි ඉපිද මහදුක් දෙන බැවින් කිම්ඵල නම් විෂ ඵල අනුභව කිරීම හා සමාන වන්නේය, කිම්ඵල නම් වණ්ණයෙන් ගන්ධයෙන් රසයෙන් සමුඛිය, අනුභව කළ කල්හි වනාහි අතුනුබහන් සිඳ ජීවිතක්ෂයට පමුණුවන්නේය, පෙරත් බොහෝදෙන ඒ ඵල යෙහි සභාවය නොදැන වණ්ණ ගන්ධ රසයෙහි බැඳී ඒ ඵලය අනුභව කොට ජීවිතක්ෂයට පැමිණියෝ වේදැ''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

ඊටඅනතුරු දවස් බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණකුත් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණෝ සාත්තුකායකව පන්සියයක් ගැලින් බඩු ගෙන්වාගෙණ නැගෙනහිරින් බස්නාහිරට යන්නාහු මහවන සමීපයට පැමිණ මනුෂ්‍යයන් රැස්කරවා ''මේ වනයෙහි විෂ වෘක්ෂයෙක් ඇත, එසේහෙයින් මා නොවිචාරා තොපි හැම පෙර නොකෑ විරූ ඵලයක් නොකව''යි අවවාද කළාහුය.

මනුෂ්‍යයෝ වනය ඉක්ම ආරණ්‍ය මුඛයෙහි එක් කිම්පක්ක නම් විෂ වෘක්ෂයෙක් ඵලභාරයෙන් නැමී තිබෙන්නා දුටුය. වෘක්ෂයාගේ කද අතුපත් ඵල සටහනින් හා වණ්ණ ගන්ධ රසයෙන් අඹ ඵල හා සමානවන්නේය, ඒ යන් නාවූ සත්ත්වයන් අතුරෙන් සමහර කෙනෙක් වණ්ණ ගන්ධ රසයෙහි බැඳී අඹ ඵලය යන සංඥාවෙන් අනුභව කළාහුය. සමහර කෙනෙක් සාත්තු නායකයා විචාරා කම්හ''යි අතින් අල්වාගෙණ සිටියාහුය.

මහබෝසතාණෝ ඒ සථානයට පැමිණ අල්වාගෙණ සිටි ඵල දම්මවා යම් කෙනෙක් කමින් සිටියෝ නම් ඔවුන් වමනය කරවා බෙහෙත් දුන්නාය. ඒ සත්ත්වයන්ගෙන් සමහර කෙනෙක් නීරෝගිවූහ. පළමුකොට අනුභව කොට සිටියාවූ සත්ත්වයෝ ජීවිතක්ෂයට පැමිණියාහුය.

බොධිසත්ත්වයෝ තමන් කැමති තැනට සැපසේ ගොස් වෙළඳුම් කිරීමෙන් ලාභ ලැබ ගෙණ නැවත තමන් වසන්නාවූ සථානයට අවුත් දැනදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ ''මහණෙනි, යම් සත්ත්වයෙක් මත්තෙහි වන්නාවූ දෙව තොදැන පචකාමය අනුභව කෙරේද? ඒ සත්ත්වයා කිම්පක්ක නම් විෂ ඵලය අනුභව කළාවූ සත්ත්වයන් මරණයට පැමිණියාක් මෙන් නරකාදී සතර අපායෙහි ඉපිද මහදුක් අනුභව කරන්නේ''ය යි වදාරා චතුරාර්‍යසත්‍යය ප්‍රකාශ කළසේක.

උකටලීවූ මහණ සෝවාන්ඵලයට පැමිණියේය, අවශෙෂ පණිවිදින් සමහර කෙණෙක් සෝවාන් ඵලයෙහි පිහිටියහ, සමහර කෙනෙක් සකෘදාගාමි ඵල යෙහි පිහිටියහ, සමහර කෙනෙක් අනාගාමි ඵලයෙහි පිහිටියහ, සමහර කෙනෙක් රහත්වූහ.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ කිම්පක්ක ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි පණිවිත් නම් දැන් බුදුපිරිසය, එසමයෙහි සාත්තුනායක වූයෙම් තිලෝගුරු සම්‍යක්සම්බුදුරජවූ මම්මවේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 85
## සීලවිමංස ජාතකය.

මේ වදන එක් සමයෙක්හි සීල සමාධි ප්‍රඥාවෙන් යුක්තවූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ දෙවිරම්වෙහෙර වැඩවසන සේක්, සිල් පරීක්ෂා කරන්නාවූ බ්‍රාහ්මණයකු අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ බ්‍රාහ්මණතෙමේ කොසොල් රජ්ජුරුවන් නිසා ජීවත්වන්නේය, නිසරණගතය, අඛණ්ඩ පඤ්චසීලය රක්ෂාකරන්නේය, වෙදත්‍රයෙහි පරතෙරට පැමිණියේය, රජ්ජුරුවෝ මේ තෙමේ සිල්වතැ''යි ඔහුට අධිකවූ සත්කාර සම්මාන කෙරෙති. ඉතා ගරුකොට සලකති.

එකල බ්‍රාහ්මණයා මෙසේ සිතීය, ''කිමෙක් ද? මේ රජ්ජුරුවෝ මාගේ ජාතිකුල ප්‍රදෙශ සම්‍යද්ධිය නිසා මට සත්කාර සම්මාන කරණසේක් දෝහෝයි නොහොත් සීලසම්‍යද්ධිය නිසා සම්භාවනා කරණසේක් ද්‍යෙහෝ? යි එසේ හෙයින් මා පළමුකොට පරීක්ෂාකොට පුව මනාවේදැ?''යි සිතා ඒ බ්‍රාහ්මණයා එක් දවසක් රජ්ජුරුවන්ට සේවයට ගෙට යන්නේ එක්වන්නකු පුරුෂයකුගේ පෝරුවෙන් නොකියා එක්කහවණුවක් ඇරගෙණ ගියේය. ඒ දැක වන්නක්කා බ්‍රාහ්මණයා කෙරෙහි ගරුත්වයෙන් කිසිවක් නොකියා උන්නේය, නැවත එක්දවසක් කහවණු දෙකක් ගත්තේය, ඒ වන්නකු පුරුෂයා ඒ දවසුත් එසේම ඉවසුයේය, බමුණා තුන්වෙනි දවස් කහවණු මිටක් හැරගත්තේය

ඉක්බිත්තෙන් වන්නකු පුරුෂයා ඔහුට කියන්නේ ''එම්බල බ්‍රාහ්මණය, රජ්ජුරුවන් වහන්සේගේ රාජභාණ්ඩාගාරය සොරකම් කරන්නේ අදට තුන් දවසක් නොවේදැ''යි කිය, මෙසේ කියා තමා විසින් ''රාජභාණ්ඩාගාරය සොරකම් කරන්නාවූ සොරා අල්වා ගන්නාලදැ'යි තුන්විටෙක අඬගැසුයේය.

එකල ඔහු සමීපයට මනුෂ්‍යයෝ ඇතින් මැතින් අවුත් 'බොහෝ දවසක් සිල්වත් එකකුමෙන් ඇවිදිනේ නොවේ ද? දැන් තා කළේ කිම්දැ'යි පහර කීපයක් ගසාපියා බැඳගෙණ රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ ඔහු දැක කලකිරී 'බමුණ, කවර කාරණයකින් මෙබඳුවූ දුස්සීල ක්‍රියාවක් කෙළෙහිදැ'යි කියා 'ඇරගෙණ යව මෝහට රාජාඥකරව''යි කිවුය, බමුණා ''රජ්ජුරුවන් වහන්ස, මා රාජභාණ්ඩාගාරය සොරකම් කෙළේ නැතැ''යි කිය, ''එසේ කල කුමක් නිසා වන්නක්කාගේ සල්පිල පෝරුවෙන් කහවණු ගතිදැ''යි ඇසුය. ''රජ්ජුරුවන්වහන්ස, එසේ කෙළේ නුඹවහන්සේ මට අධික කොට සත්කාර සම්මාන කොට සම්භවනා කරණ හෙයින් කිමෙක් ද? මේ රජ්ජුරුවන් වහන්සේ මාගේ ජාත්‍යාදිය නිසා මට අධිකකොට සම්භාවනා කරණසේක් ද්‍යෙහෝ යි නොහොත් සීලය නිසා සම්භාවනා කරණසේක් දෝහෝ යි පරීක්ෂා කරණ පිණිස කෙළෙම්, දැන් වූකලී මා විසින් ඒකාන්තයෙන් රජ්ජුරුවන් වහන්සේ මට සම්භාවනා කෙළේ සීලය නිසාමය, ජාත්‍යාදියක් නිසා නොවෙයි දන්නාලද, එතකුදු වුවත් දැන් නුඹවහන්සේ මට රාජාඥකරමින් සිටිසේක. එහෙයින් මම ඒකාන්තයෙන් මේ ලෝකයෙහි සීලයම උත්තමය, සීලයම ප්‍රධානය යි නිෂ්ඨාවට ගියෙමි, මම මේ සීලයම සුදුසු කාරියක්

කෙරෙමි තම් ගිහිගෙහි සිට පඤ්චකාමය අනුභව කෙරෙමින් කොවගත නො හෙමි, අදම පෙතවනයට ගොස් සම්බුදුන් වහන්සේ සමීපයෙහි මහණවෙමි, සවාමීනි, මට මහණවීමට අවසර දුනමැනවැ'යි කියා රජ්ජුරුවන් අනු දන්වා ජෙතවනයට අභිමුඛව ගියේය.

ඉක්බිත්තෙන් ඔහුගේ ඤාතිමිත්‍රයන් හා බන්ධුන් රැස්ව මහණවීමට යාම වළකා ගතනොහී නැවත ගියෝය, ඒබමුණා බුදුරජාණන්වහන්සේ සමීපයට ගොස් ප්‍රව්‍රජ්‍යාව ඉල්වා ප්‍රව්‍රජ්‍යාවත් උපසම්පදාවත් ලැබ කමටහන් මෙනෙහි කොට විදර්ශනා වඩා රහත්ව සම්බුදුන්වහන්සේ කරා ගොස් ''සවාමීනි, මාගේ ප්‍රව්‍රජ්‍යාව මඤ්ඤකප්‍රාප්තවීය''යි තමන්වහන්සේ අගීත්ඵලයලත් නියාව ප්‍රකාශ කළසේක.

උන්වහන්සේගේ අර්හත්වය ප්‍රකාශ කිරීම නිසා සඞ්ඝයා කෙරෙහි ප්‍රසිඩ විය. ඉක්බිත්තෙන් එක්දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන්වහන්සේ ''ඇවැත්නි අසවල් කොසොල් රජ්ජුරුවන්ගේ උපස්ථායකවූ බමුණා තමාගේ සීලය පරීක්ෂාකොට රජ්ජුරුවන් අනුදන්වා මහණව අර්හත් ඵලයෙහි පිහිටියේ ය''යි ඒ භික්ෂූන් වහන්සේගේ ගුණ කියමින් උන්සේක.

සම්බුදුන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ වදාරා ''මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා ''මෙනම් කථාවකින් යුක්තව උනුම් හ''යි කිකල්හි''මහණෙනි, තමාගේ සීලය පරීක්ෂාකොට පැවිදිව තමන්ට පිහිටක් කළෝය''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

පසුවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණකල්හි අප මහබෝසතාණන් ඒ රජ්ජුරුවන්ට පුරෝහිතවූන. දන් දීමෙහි බලවත්වූ ඇළුම් ඇත්තෝය, සිල්රැකීම් කිරීමෙහිද බලවත්වූ ඇළුම් ඇත්තෝම අඛණ්ඩ පඤ්චසීලය රක්ෂාකෙරෙති, රජ්ජුරුවෝ සෙසු බමුණන්ට වඩා උතුරුතර කෙරෙති යන සියල්ලම පළමු කියතලද්ද හා සදෘශ වන්නේය, මහ බෝසතාණෝ සොරකම් කළෝයයි බැඳගෙණ රජ්ජුරුවන් සමීපයට ගෙණයන කල්හි අභිගුණ්ඩිකයෝ වීථිමධ්‍යයෙහි සජීවීන් කෙළවන්නාහුය, නගුට අල්වති බොටුව අල්වති, සජීයා අල්වාගෙණ තමන්ගේ කරවට වෙළති, එකල බොධි සත්ත්වයෝ ඔවුන් දැක ''දරුවෙනි, මේ සජීයාගේ නගුට නාල්ලව, බොටුවෙහි නොවෙළව, මේ සජීයා දෂ්ටකළේ වී නම් තොප ජීවිතක්ෂයට පමුණුවන්නේ ය''යි කිවුය.

අභිගුණ්ඩිකයෝ කියන්නෝ ''බමුණ මේ සජීයා සිල්වත ආචාරසම්පන්න යය, නාසේ දුස්සීල නොවෙයි, තෝ වූකලී නාගේ දුස්සීල බැවින් අනාචාරයෙන් රාජභාණ්ඩාගාර සොරකම් කොට සොරාය යි දැන් බැඳගෙණ යන ලද්දේය''යි කිවුය.

එකෙණෙහි බොධිසත්ත්වයෝ මෙසේ සිතූහ. ''සජීයෝ පවා දෂ්ට නොකිරීමෙන් අනුන්ට හිංසා පීඩා නොකිරීමෙන් සිල්වත්හ''යි නම් ලබති. මනුෂ්‍යයන් කෙරෙහි එවැනි ගුණවිශෙෂයක් පිහිටියේ වීනම් කියනු කිමෙක්ද? මේ ලෝකයෙහි සත්පුරුෂයන් විසින් රක්ෂා කරණ ලද දශශීල අෂ්ටාඞ්ගශීල ආදී සියල්ලම උතුම් වන්නේය. ඒ ශීලයට වඩා ශ්‍රේෂ්ඨතර වසතුවෙක් ලෝක යෙහි නැත්තේය''යි සිතූහ.

එකෙණෙහි ඒ රාජපුරුෂයෝ ඒ බ්‍රාහ්මණයා ගෙණගොස් රජ්ජුරුවන්ට දැක්වූහ. ඉක්බිත්තෙන් රජ්ජුරුවන් විසින් "කොල මේ කිමෙක්දැ"?යි විචාරණ ලද රාජපුරුෂයෝ මෙසේ දැන්වූහ."දෙවයන්වහන්ස, මේ බ්‍රාහ්මණ තෙමේ රාජ භාණ්ඩාගාර සොරකම් කරණලද සොරෙකැ'යි කියා දැන්වූ කල්හි රජ්ජුරුවෝ අමාත්‍යයන්ට නියෝග කරන්නාහු 'කොල මේ බ්‍රාහ්මණයා විසින් රෑ දවල් මෙසේම සොරකමෙහි ලා යෙදී වාසය කරන්නේ වී නම් ඔහුට රාජාඥ කරව"යි නියෝග කළ කල්හි බ්‍රාහ්මණ තෙමේ රජ්ජුරුවන්ට කියන්නේ "රජ්ජුරුවන් වහන්ස, මා කළ සොරකමෙක් නැතැයි"යි කියා දැන්වීය. "එසේකල කුමක් හෙයින් වස්තු හැරගත්තෙහිදැ?"යි විචාළ කල්හි බ්‍රාහ්මණතෙම පළමුකී පරිද්දෙන්ම තමා සොරකම් කළ කාරණා රජ්ජුරුවන්ට දන්වන්නේ ඒ කාරණයෙන් මම මේ ලෝකයෙහි ලා ශීලය ශ්‍රේෂ්ඨය යි නියමය යි යනාදීන් සීලය ගුණයම ප්‍රශංසා කරන්නේ සිටියමැනවැ යි "දෙවයන්වහන්ස, ලෝකයෙහි ලාභය මෙවැනි ආශීවිෂයෝ පවා අනුන් දෂ්ට නොකිරීමෙන් සිල්වන්ය යි බොහෝදෙනා විසින් ප්‍රශංසා කටයුතු වන්නාහුය. මේ කාරණයෙනුත් සීලයම උතුම් වන්නේය, ශීලයමශ්‍රේෂ්ඨවන්නේය"යි ශීලාදී ගුණයට ප්‍රශංසා කරන්නේ මෙසේ කියා.

"මහරජ මේ ලෝකයෙහි කයින් වචනින් මනසින් අව්‍යතික්‍රම සංඛ්‍යාතවූ ආචාර සීලයම ශ්‍රේෂ්ඨ වන්නේය. තවද මහරජ අඛණ්ඩාදී භාවයෙන් රක්ෂා කරණලද්දාවූ පඤ්චසීල අෂ්ටාඞ්ගසීල දශශීලාදීවූ සීලයම නිරුත්තර වන්නේය. ශ්‍රේෂ්ඨවන්නේය. සොරවිෂ තෙජස් ඇත්තාවූ ආශීවිෂයෝ පවා සිල්වත්තු ය"යි සත්පුරුෂයන් විසින් ප්‍රශංසාවට පැමිණියෝය"යි අතරමගදී තමා දුටු කාරණා අභිමුඛ කොට දක්වා රජ්ජුරුවන්ට මෙසේ ධර්මදේශනා කොට වස්තු කාම ක්ලේශකාමයන් හැර සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් මහණව හිමාලයවනයට වැද පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා චුතිප්‍රතිසන්ධි වශයෙන් බ්‍රහ්මලෝකය පරම ප්‍රතිෂ්ඨා කළේය යි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාවගෙණහැර දක්වා වදාරා පූර්වාපර කථාව ගළපා මේ ශීලවිමංස ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජපිරිස් නම් දැන් බුදුපිරිස්වූවාය. එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා තම් දැන් බුදුවූ මම්මය යි දක්වා වදාළසේකි.

---

## 86 මඛාදේව ජාතකය

මේවද එක් සමයෙක්හි සඞ්ඝ චක්‍රවර්ති වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසතසේක්, එක් වස්ත්‍ර ලක්ෂණ දන්නා බ්‍රාහ්මණයකු අරභයා මේ ජාතකය වදාළසේක.

**හේ කෙසේද? යත්;**

රජගහනුවර වසන්නාවූ එක්තරා බමුණෙක් දුටුදෙය ඇසුදෙය මගුලැයි ගන්නා ලද ලබ්ධි ඇත්තේ බුබාදී රත්නත්‍රයෙහිලා අප්‍රසන්නය, දෘඝම්ථ්‍යාලබ්ධි ඇත්තේය. ඒ තෙම රාජපාක්ෂිකය. බොහෝ සම්පත් ඇත්තේය, බොහෝසේ උපභොග පරිභොග ඇත්තේය. තවද ඒ බ්‍රාහ්මණයාගේ සුමුඛක නිබුනු

අනඹිවූ පිළිඝඝළක් මියන් විසින් කත ලද්දේවිය, නැවත එක් දවසක් ඒ බ්‍රාහ්ම ණයා ඉස් සෝදු නහා ''අදින පිළිගෙණෙව''යි කී කල්හි ඔහුගේ අතවැසියෝ අදිනා පිළිඝඝළ මියන් කැ නියාව ඔහට කීහ. බ්‍රාහ්මණ තෙම එකල මෙසේසිතු යේය. ''මියන් කාපු මේ පිළිඝඝළක් ගෙයි තිබුයේ වී නම් මහත්වූ විනාශයට පැමිණෙන්නේය මේ පිළිඝඝළක් ගෙයි තිබීම අවලක්ෂණය අශ්‍රීකය. තවද මේ පිළිඝඝළ මාගේ ගැණු පිරිමි දරුකෙනෙකුන්ට යොගය නොවන්නේය දැසි දස් මෙහෙකරුවන්ට දෙන්වත් නොහිසිවන්නේය, කුමක්නිසාද? යත්; යම් කිසි කෙනෙකුන්ට මේපිළිඝඝළ දුනහොත් උන්ට මහාවිනාශ වන්නේය එවැනි පිළිඝඝළ අමුසොහොනෙක ලවාපියවමි''යි සිතා නැවත මෙසේ සිතීය, ''දැසිදස් මෙහෙකරු කෙනෙකුන් අත යැවූයේ වී නම් ඔහු මේ වස්ත්‍රයෙහිලා ලොභ උපදවා ගෙණ ඇරගත්තෝවූ නම් මහත්වූ විනාශයට පැමිණෙන්නාහුමය. එබැවින් පුතු අත යවා මේ වස්ත්‍රය දමවාපියමි. පුතු කැඳවා ''මේ වස්ත්‍රය අනින් නොඅල්වා දණ්ඩකින් ඇරගෙණ අමුසොනොනට ගෙණ ගොස් දමාපියා ඉස් සෝදු නහා පිරිසිදුව එව''යි කියා යවුයේය.

තුන්ලොවට සිත ඇතිවූ කරුණා නිධානවූ සරණගත වජ්‍රපඤ්ජරවූ නිලෝගුරු සම්මා සම්බුදුරජානන් වහන්සේ අළුයම් වේලෙහි මහාකරුණා සම පත්තියට සමවැද අද දවස්හි කවර කෙනෙකුන් සවනීමොක්ෂ සම්පතෙහි පිහිටුවා පියම්දෝ යි පුථු සඵීඤයන් වහන්සේ විෂයයෙහි කෘතාධිකාරවූ මහපින් ඇතිවන්නාවූ බන්ධුන් බලා වදුරණසේක් මේ බමුණා හා දෙපුතුපියන් තමන් වහන්සේගේ අනාවරණඥන ජාලයට ඇතුළත්වූ නියාව දැක ''මේ දෙදෙනාටඅද කවර අනිවාඩියෙක් වේදෝ හෝ යි බලා වදුරණසේක්, ශ්‍රොතාපත්ති මාගීයට පැමිණීමට හේතුසම්පත් ඇති නියාව දැක වදුරා මුවන් යන්නාවූ හසර තොහැර සිටිනාවූ මුවවැද්දකු පරිද්දෙන් අමුසොහොන් දෙරට ගොසින් සවණක් සතරැස් විහිදුවමින් එක්තරා සථානයෙක්හි වැඩහුන්සේක. ඉක්බිති මාණවක තෙමේ පියාගේ බස් මුදුනෙන් පිළිගෙණ ගරවිල්කුණක් දණ්ඩකින් ඔසවාගෙණ යන පරිද්දෙන් ඒ පිළිඝඝළ දඹුකෙළවරින් ඔසවාගෙණ අමුසොහොන් දෙරට ගෙණ ගොස් දමන්ට සිවියේය.

ඉක්බිති සඵීඤ රාජෝත්තමයානන් වහන්සේ ඔහුගේ ඒ ක්‍රියාව දැක වදුරා මාණවකය තෝ කුමක් කරන්නෙහිදැ?''යි විචාරා වදුළසේක. ඒ වේලෙහි මාණවකයා බුදුන්ට දන්වන්නේ ''භවත් ගෞතමයෙනි, මේ පිළිඝඝළ මියන් විසින් කඤලද, එසේ හෙයින් නිඃශ්‍රීකය, හලාහල විෂයක් හා සමානය, එසේ හෙයින් මපියාතෝ මේ වස්ත්‍රයන් අමුසොහොනට දමන්නෝ අනිකක්හු අත යවිවෝතින් ඔහු මෙහි ලොභ උපදවාගෙණ ඇරගණිති සිතා මා අත එව්වෝ ය''යි කියා දන්විය. ''එබැවින් මේ වස්ත්‍රය දමා ඉස් සෝදු නහා ගෙට යෙමි''යි කියේය. ඔහු කී බස් අසා බුදුහු වදුරණසේක් ''එබැවින් බ්‍රාහ්මණ මාණවකය තෙල පිළිඝඝළ දමාපියව''යි වදුළසේක. මාණවකද ඒ පිළිඝඝළ අමුසොහොතෙහි දැමුයේය.

එකල්හි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ ''මෙබදු දෙය අපට වවනේය'' යි ඔහු බල බලා සිටියදීම ගෙණ වදුළසේක. මාණවකතෙම යුහුව ගොසින්

"භවත් ගෞතමයෙනි, මේ පිළිඝඝළ තොපට සුදුසු නොවෙයි, බොහෝ දෙනා විසින් අවලක්ඛණය"යි කියනලද ඒ අශ්‍රීකය, නොගණුව"යි වළක්ව වළක්වාම සිටියදීම පිළිඝැරගෙණ වේළුවන මහාවිහාරයට වැඩ වදාළසේක.

මාණවකතෙම යුහුව ගොසින් තමාගේ පියාහට එපවත් කීයේය. එකල්හි බ්‍රාහ්මණතෙම මෙසේ සිතීය. "ඒ වස්ත්‍රය වනාහි අවමඞ්ගල සම්මතය, අශ්‍රීකය, ඉදින් ශ්‍රමණ භවත් ගෞතමයෝ ඒ පිළිඝයෙන් සිවුරු කොටගෙණ පෙරවියෝ නම් මහත්වූ විහාරයට පැමිණෙන්නාහුය. උන් උන්නාවූ වේළුවනාරාමයත් නසින්නේය, එබැවින් අපට බොහෝ අයස් උපදින්නාහ"යි ශ්‍රමණ භවත් ගෞතමයන්ට අනිකුත් බොහෝ පිළිඝ ගෙන්වාගෙණ ගොසින් සිවුරු පිණිස පිළිගන්වා උන් ඇරගත් අවලක්ඛණ වස්ත්‍රය උන්ලවා දම්මවාපියත් නම් යහපතැ"යි බොහෝ සිවුරු පිළිඝගන්වාගෙණ පුතා හා සමඟ වෙළුවනාරාමයට ගොස් ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ දැක නමස්කාර මාත්‍රයකුත් නොකොට එකත්පස්ව සිටි මෙසේ විවාළේය.

"සැබෑද භවත් ගෞතමයෙනි, අමුසොහොනට දමාපියනලද අශ්‍රීකවූ පිළිඝඝ ළෙක් තොප විසින් ගෙණෙන ලදදැ?"යි විවාළේය. "සැබෑය බමුණැ"යි වදාළ සේක. බමුණු කියන්නේ "භවත් ගෞතමයිනි, ඒ පිළිඝඝළ අවමඟුලැ"යි බොහෝදෙනා විසින් දන්නා ලදහ. ඉදින් තොපට ප්‍රයෝජනයක් වුනු නම් තොපට මහත්වූ විහාර පැමිණෙයි සිතමි, තොප උන් වෙළුවනාරාමයත් නස්නේය, ඉදින් තොපට අදනා පොරෝනා සිවුරු මාත්‍රාවකුදු නොසැහෙන්නේ වී නම් මා විසින් මේ දෙතලද බොහෝ වස්ත්‍රයන් ඇරගෙණ නපුරු වස්ත්‍රයන්දමා පුව මැනවැ"යි කියේය. එසේ කී බමුණාට බුදුහු වදාරණසේක් "බමුණා අපවැනි තපස්වීවරයන්ට අමුසොහොනකටවත් ඇතුළු වීථියටවත් කසළගොඩටවත් නහනතොටටවත් මහමගටවත් මෙසේ මෙසේවූ ස්ථානයෙහි හුනුදෙයක් වත් දමාපුදෙයක්වත් ජීර්ණ වස්ත්‍රවත් වටනේය"යි වදාළසේක.

"එම්බල බ්‍රාහ්මණය තා මෙබඳු මිථ්‍යාදෘෂ්ටියෙහි පිහිටියේ දැන්මතුතෙ, වෙයි. යවගිය දවසත් තෝ මෙබඳු ලබ්ධි ඇත්තේමය'යි වදාරා ජාතක දෙශනා වට මුඛමාත්‍රයක් දක්වා නිශ්ශබ්දව වැඩ උන්සේක. එකල්හි ඒ බ්‍රාහ්මණයා විසින් ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළ සේක. ඒ කෙසේද? යතහොත්;

යවගිය දවස මගධරට රජගහනුවර ධාර්මිකනම් මහරජ්ජුරුකෙනෙක් දැන, ප්‍රියවචන, අජ්ජවියා, සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කෙරෙමින් රාජ්‍යය පරිපාලනය කරන්නාහුය. එසමයෙහි පුරණ ලද පාරමිතා ධර්මයන් ඇත්තාවූ අපමහබෝසතාණන් එක්තරා ප්‍රසිද්ධවූ බ්‍රාහ්මණ මහාසාරකුලයක ඉපිද වැඩිවිය පැමිණ පඤ්චකාමයෙහිලා ආදීනව දැක තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ගෙණ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා හිමාලය වන යෙහි වාසයකරන්නෝ එක්සමයෙක්හි හිමාලය වනයෙන් නික්ම රජගහනුවර රජ්ජුරුවන්ගේ මගුල් උයනට පැමිණ එහි වාසය කොටදෙවනි දවස් භික්ෂා චර්‍යාය සඳහා ශාන්තාචාර ප්‍රවෘත්තියෙන් නුවරට සිඟාවන්හ.

මතුමහල්තලයෙහි සිටියාවූ රජ්ජුරුවෝ තාපසයන් දැක ප්‍රසන්නව මතු මහල්තලයට ගෙන්වාගෙණ මාහැඟි අස්නක්හි වඩා හිඳුවා චතුමධුරයෙන්

වළඳවා තාපසයන් මධුර වූ බණ අසා සතුටුවූ සිත් ඇත්තාවූ රජ්ජුරුවෝ මඟුල්උයන තාපසයන් වසනතියාගෙන් ප්‍රතිඥ ඇරගෙණ මහත්වූ උපසථාන කරන්නාහුය.

තාපසයෝද දවස දවස රජගෙයිදී වළඳ, රජ්ජුරුවන්ගේ මඟුල් උයනෙහි ලා වාසය කෙරෙති, එසමයෙහි රජ්ජුරුවන්ගේ රජගහනුවර දූෂ්‍ය ලක්ෂණ නම් බ්‍රාහ්මණයෙක් විය. ඔහු සුමුහුක තුබු පිළිසඟළක් මියන්විසින් කපතලද්දේදැයි යනාදීන් සියල්ලම පළමු දක්වනලද කථාන්තරය හා සමාන වන්නේය.

එකල මහබෝසතාණෝ පළමුව ගොස් සොහොන්දෙර එක්තරාසථාන යෙක්හිලා හිඳ ඒ බ්‍රාහ්මණයා විසින් දමනලද පිළිසඟළ ඇරගෙණ තමන් වසන්නාවූ උසුනහුමියට නැඟී ගියහ, බ්‍රාහ්මණ මාණවකයාද ගොසින් එපවත් පියාහට කීයේය, ඔවුන්ගේ පියවූ මහබමුණු මෙසේ සිතුයේය, 'මේ රාජකුළු පගවූ තාපසයෝ මෙබඳු කාරණයකින් නැසීනියෝ නම් නපුරුය"යි සිතා මහ බෝසතානන් කරා එළඹ "තාපසයෙනි, තොප ඇරගත්තාවූ තෙල අශ්‍රීකවූ පිළිසඟළක් ඇද්ද? ඒ දමා පියව"යි කීහ.

එකල්හි ඒ තාපසයෝ කියන්නාහු "එම්බල බමුණ සුසානභූමියක්හි දමනලද්දාවූද මෙසින් අන්‍යසථානයෙක්හි දමාපු දෙයෙක්ද අපවැනි තාපස යන්හට චීවරයන්ට යොග්‍යය"යි කීහ. "එම්බල බ්‍රාහ්මණය, දුටු දෙය ඇසූ දෙයම ගන්‍රස ප්‍රෂ්ටව්‍ය වශයෙන් දන්නේය. අපි මඟුලයි ගන්නමෝ නොවම්හ, මෙබඳු ලබ්ධිය බුඩ ප්‍රත්‍යෙකබුඩාදි උත්තමයන් විසින් ප්‍රශංසා කරණ ලද්දේ නොවෙයි. එබැවින් නුවණැත්තවුන් විසින් මෙබඳු ලබ්ධි ගත යුතු නොවන්නේය'යි බමුණාට මිහිරිවූ ධර්මදෙශනා කොට අවවාද කළාහ.

බ්‍රාහ්මණතෙම තාපසයන් විසින් කියනලද ධර්මය අසා සතුටු සිත් ඇත්තේ තමාගේ මිථ්‍යාදෘෂ්ටිය හැර මහබෝසතානන්ගේ සරණයෙහි ලා පිහිටියේය, මහබෝසතාණෝද නොපිරිහුණාවූ ධ්‍යාන ඇතිව චුතිප්‍රතිසන්ධි වශයෙන් බ්‍රහ්මලොකයෙහි පිළිසරණකොට උපන්නාහුය.

දෙවාතිදෙවවූ ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ඉකුත්වත් කථා ගෙණහැර දක්වා වදාරා බුදුව වැඩහිඳ බමුණාට "යස්ස මඞ්ගලං සමොහතායා යන ගාථාවකින් වදාරණසේක් 'එම්බල බ්‍රාහ්මණය ක්ෂීණාශ්‍රවයෝ දෘෂ්ට මඞ්ගල ශ්‍රැතමංගලය යනාදීවූ චන්ද්‍රග්‍රහණ සූර්‍යග්‍රහණ අසනීපාත උල්කාපාත වස්ත්‍රලක්ෂණ ආයුධලක්ෂණ යනාදීවූ ඉෂ්ටානිෂ්ට දෙක්හි මඞ්ගසථාකාරයෙන් පවත්නාහ"යි යනාදීන් මෙසේ තිලෝගුරු බුදුරජානන්වහන්සේ නැවත චතුස්සත්‍යය ප්‍රකාශ කොට ධර්මදෙශනා පවත්වා වදාළසේක.

ධර්මදෙශනාවගේ කෙළවර මහබමුණු තමාගේ පුත්‍රයා හා සමග දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ ශ්‍රොතාපත්තිඵලයට පැමිණ නිවන් දුටුසේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ජාතකය පූර්වකථාව හා අපරකථාව හා එක්ව සන්ධි ගළපා නිමවා වදාළසේක.

එසමයෙහි ඒ බ්‍රාහ්මණයා හා දෙපුතුපියෝ දැන් මෙකලත් මේ බ්‍රාහ්ම ණයා හා දෙපුතුපියෝය, එසමයෙහි ඔවුන් සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටෙව්වාවූ තාපසයෝ නම් දැන් සර්‍වඥපදප්‍රාප්තවූ මම්මවේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 87 සාරම්භ ජාතකය.

තිවද එක්සමයෙක්හි ත්‍රෛලෝක්‍ය ප්‍රදීපයමානවූ ගෝතම ගොත්‍රයෙහි උපන්නාවූ තිලෝගුරු සම්‍යක්සම්බුදුරජාතන් වහන්සේ එක්සමයෙක්හි සැවැත්නුවර නිසා ජේතවන මහාවිහාරයෙහි වැඩවසනසේක් මුසාවාද ශික්ෂා පදය අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ කෙසේද? යතහොත්; නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ එක්තරා භික්ෂූ කෙනෙකුන්වහන්සේ ලජ්ජා ප්‍රියසීලීවූ සෙසු භික්ෂූන්වහන්සේට ජාතිකුල ප්‍රදෙශාදීන් ඝට්ටා ආක්‍රොශ දෙඛනසේක. බණිනසේක. එසේ උන්වහන්සේ කියන්නාවූ වචනය සෙසු සබ්‍රහ්මචාරීන්වහන්සේ අසා එපවත් බුදුන්ට දැන්වූ සේක. බුදුහු ඒ භික්ෂූන්වහන්සේ ගෙන්වා "සැබෑද මහණ ලජ්ජා ප්‍රියසීලී භික්ෂූන්ට ආක්‍රොශ පරිභව බණින්නෙහිදැ"යි විචාරා වදාළසේක. ඉක්බිති භික්ෂූන්වහන්සේ විසින්ම "සැබෑ සවාමීනි"යි දැන්වූකල්හි "එම්බල මහණ පරුෂවචනය නම් මනුෂ්‍යයන්ට තබා තිරිසනුන්ටත් අප්‍රිය දෙයකැ'යි වදාරා මේ ජාතක ධර්මදේශනාව දක්වා වදාළසේක.

මෙහි පූර්වකථාව හා අපර කථාව නන්දිවිශාල ජාතකයෙහි කී පරිද්දෙන් දන්නේය. මේ ජාතකයෙහි වනාහි අපමහබෝසතාණන් ගන්ධාර දෙශයෙහි තක්සලානුවර එක්තරා බමුණෙකුගේ නමින් සාරම්භ නම් වෘෂභ රාජයෙක්ව උපන්හ යි සර්ව්ඥයන්වහන්සේ මෙසේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාරා ඒ භික්ෂූන්වහන්සේට ධර්මදෙශනාකොට වදාරණසේක. "එම්බල මහණ, ප්‍රිය වචනයන් සියල්ලන්ටම කියයුතුය. මුසාවාද පිසුනාවාව පරුෂාවාව සම්ඵප්‍රලාපාදීවූ දුර්භාෂිත වචනය සියල්ලන්ටම නොකියයුතු වන්නේය, මුසාවාදාදීවූ දුර්භාෂිත තෙපුල් කියන්නාවූ සත්ත්වයෝ ඉහලෝකයෙහිත් පර ලෝකයෙහිත් දෙකින්ම පශ්චාත්තාපයට පැමිණ බොහෝ අනර්ථවෘඩියට පැමිණෙන්නාහ"යි වදාරා අනේකාරයෙන් දුර්භාෂිත වචනයෙහි ආදීනව දක්වා ධර්මදෙශනාකොට වදාළසේක.

"එසමයෙහි බ්‍රාහ්මණයා නම් දැන් මේ ධර්මභාණ්ඩාගාරික ආනන්ද ස්ථවිර යෝය. එසමයෙහි බැමිණි නම් දැන් මෙකල්හි උපුල්වන් මෙහෙණය, නමින් සාරම්භ නම් වූ වෘෂභරාජ නම් දැන් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 88 කුහක ජාතකය.

තිවද එක් සමයෙක්හි තුන්ලොවට චින්තාමාණික්‍යයක් බඳුවූ අප තිලෝගුරු බුදුරජාතන්වහන්සේ සැවැත්නුවර නිසා ජේතවන මහාවිහාරයෙහි වැඩවසනසේක් කොහොන් තපස් රකිනාවූ එක්තරා භික්ෂූන්වහන්සේ කෙනෙක් අරභයා මේ ජාතකය වදාළසේක. මෙහිලා කුහක වස්තුව උද්දාල ජාතකයෙහි කියනලද්ද හා සමාන වන්නේය.

**හේ කෙසේද? යනහොත්?**

**අතීතයෙහි** දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරණ කල්හි එක්තරා කුඩාගමක් නිසා කොහොන්තපස් රකිනා, එක්තරා ජටාධර තාපසයෙක් වසන්නේය, එක්තරා කෙළෙඹි පුත්‍රයෙක්ද ඔහු කෙරේ ප්‍රසන්නව වනයෙහි ඔහට පන්සලක් කරවා දී මධුරවූ අන්නපානාදියෙන් නිරන්තරයෙන් උපස්ථාන කරන්නේය.

එකල්හි ඒ කෙළෙඹි පුත්‍රයා "ඔහු සිල්වතැ"යි සිතා සොරුන් කෙරෙහි භයින් රත්රන් මැණික් සියයක් ඔහු වසන පන්සලට ගෙණගොස් එක්තැනක නිධානකොට "ස්වාමීනි මේ බැළුව මැනවැ"යි කියා තාපසයන්ට භාරකොට ගියේය, එකල්හි තාපසයෝ තුමූ "උපාසකයෙනි, භණ්ඩපටිසාම නම් තපස්වී වරයින්ට කැප සරුප් නොවන්නේය, අනුන්සන්තක වස්තුවෙහි අපට තමා ලත් ලාභය නූපදින්නේය"යි කීහ. කෙළෙඹි පුත්‍රයාද "යහපත ස්වාමීනි"යි තාපසයන්ගේ ගුණයට ප්‍රශංසාකොට ඔහුගේ බස් අදහාගෙණ නැගී ගියේයි.

දුෂ්ට තාපසයෝද "මෙපමණ වස්තුවක් ලදහොත් රැකිම්ගතහැක්කැ"යි සිතා කීපදවසක් ඉක්මවාලා ඒ නිධානකොට තුබූ වස්තු ඇරගෙණ අතරමග එක්තරා ස්ථානයෙක්හි තබා නැවත අවුත් තමා වසන්නාවූ පන්සලම වාසය කොට දෙවෙනි දවස් කෙළෙඹි පුත්‍රයාගේ ගෙයි ආහාර කෘත්‍යය සපයා මෙසේ කීහ. "උපාසකයෙනි, තොප නිසා අපි බොහෝ දවසක් මෙහි වාසයකළෝ වම්හ. එසේ හෙයින් බොහෝ දවසක් නික්මුනෝය. එකතැන බොහෝකලක් වසන්නාවූ තපස්විවරයන්ට මනුෂ්‍යයන් හා සංසර්ග දෙෂ වන්නේය, ඒ සංසර්ගය වූකලී තපස්විවරයන්ට කිළුටක් හා සමානය, එබැවින් උපාසකයෙනි, අපි අන්‍යස්ථානයකට යම්හ"යි කීයේය.

එකල්හි කෙළෙඹි පුත්‍රයා විසින් "ස්වාමීනි කිසිවකින් ප්‍රයෝජනයෙක් ඇත්නම් මට වදාළමැනව නොවැඩියමැනවැ"යි කියා වළකන ලද්දාව තාපසතෙම උපාසකයන්ගේ බස් නොපිළිගත්තේය. කෙළෙඹි පුත්‍රයාද "ස්වාමීනි, නොනවත්ව වඩනාබැවින් ගොසින් වහ වහා වැඩියමැනවැ"යි කියා ගම්දෙර දක්වා පසුගමන් කොට ගොසින් වැළැක්කේය.

ජටාධර තාපසයෝද "මේ කෙළෙඹි පුත්‍රයාට වංචාවක් කෙළෙම්නම් යහපතැ"යි සිතා ජටා අතුරෙහි තණපතක් තබාගෙණ ගොසින්ලා නැවත වැළැක්කාහුය. ඉක්බිති කෙළෙඹි පුත්‍රයාද ජටාධරයන් දැක "කිමෙක් ද? ස්වාමීනි ගිය ඇසිල්ලෙහිම වැඩිසේක්මැ"යි විවාළේය. "උපාසකයෙනි, තොපගේ ගෙන් පිටත්වෙන වේලෙහි අපගේ මේ ජටාවෙහි තණපතක් වැදගණ රැඳිගියේය. එසේහෙයින් අදත්තාදානය නම් තපස්විවරයන්ට නොවටනේය. ඒ තණපත ඇරගෙණ තොපගේ ගෙයි ලාපියන පිණිස ආමි" කියා කීයේය.

කෙළෙඹි පුත්‍රයාද "ස්වාමීනි, මෙවිතරකින් නුඹවහන්සේට කවර දෙෂයෙක්ද? ඒ ඇරදමාපියා වැඩියමැනවැ"යි කියා අතේ මාගේ තාපසයෝ ඉතා කුකුස්පර කෙණෙක, අනුන්සන්තක වස්තුවකිනුත් තණපතක් විවරකුත් ඇරගන්ට සිතන කෙණෙක් නොවෙති," කියා තාපසයන්ගේ ගුණෙහි

අනිශයින් ප්‍රසන්නව වැඳලා ''වැඩිය මැනවැ යි **සඞ්ඝ**ස්වාමිනි''යි කීයේය. එකල්හි බඩු නිසා පසල්දනව්වට යන්නාවූ බොධිසත්ත්වයන් විසින් එම්ගෙයි නවාතැන් ගත්තාලද්දේවිය, කෙළෙඹි පුත්‍රයා අතින් තාපසයන්ගේ බස් බොධිසත්ත්වයෝ අසාලාම ''ඒකාන්තයෙන්ම මේ දුෂ්ටතාපසයන් විසින් මේ අඥාන කෙළෙඹි පුත්‍රයාගේ යම්කිසි ධනයෙක් වංචාවෙන් හැරගත්තේ වනැ''යි අනුමානයෙන් සිතා කෙළෙඹි පුත්‍රයා අතින් බොධිසත්ත්වයෝ විචාරන්නෝ ''සඬැද මේ තාපසයන් කෙරෙහි තොප තුබූ වස්තුවෙක් ඇද්ද''යි මෙවාලෝය. ''සැබව යන්තම් වස්තුවක් තිබීමි''කිහ. ''කොපමණ ධනයෙක්ද''යි විචාළකල්හි ''සඬද රත්‍රණින් මැණික් සියයක් පමණය''යි කීය. ''එසේවීනම් ගොසින් පන්සල තුබූ වස්තුව ඇන්ත නැත්ත බලව''යි කියා කීයේය.

කෙළෙඹිපුත්‍රයා ගොසින් තමා තුබූ ධනය පරීක්ෂාකොට ''සඬද මා තුබූ තැන්හි නුදුටිමි''යි කිහ. බොධිසත්ත්වයෝ කියන්නෝ ''යහළු තා තබාලූ වස්තුව ඇරගත් කෙනෙක් නැත. ඒ සොරතවිසා විසින් ඇරගන්නාලද වන්නේය, වරෝ දෙදෙනම අපි ගොසින් ඔහු අල්වාගෙණ ඌ අත තුබූ වස්තුව ඇරගණුම්හ''යි කියා කීහ. ''යනපතැ''යි දෙදෙනම එක්ව ඔහුකරා ගෙණ ගොස් සොරකම්කළ තාපසයන් අල්වාගෙණ අතින් පයින් තලා මරා ගනට කොට ජවාඛරයා අතතුබූ වස්තුව ඇරගත්තාහුය. බොධිසත්ත්වයෝද ඒ මැණික් සියයක රත්රන් දැක ''මෙතෙක් වස්තුවෙහි කුකුස්නොකළ තොපි ජටාවෙහි වැදගත් තණපතෙහි කෙසේ කුකුස්ද''යි නින්දා කොට 'එම්බල අඥාතය, මෙතැන් පටන්ගෙණ එබන්දක් නොකරව''යි අවවාදකොට දිවි පමණින් දුනාදී පින්කම් කෙරෙමින් තමන් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැරදක්වා වදාරා මේ ජාතකය පූර්ණපරසඤ්ඤාගළපා නිමවා වදාළසේක.

''එසමයෙහි කුටජවාඛරයා නම් මේ කොහොන් තාපස් රකිතා භික්ෂූහුය. එසමයෙහි ප්‍රඥාසම්පන්නවූ සිටුපුත්‍රයා නම් දැන් සම්‍යක්සම්බුදුපදප්‍රාප්තවූ මම්මවේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 89
## අකතඤ්ඤු ජාතකය

**මේ**වද ශාක්‍යකුලකල්පදාම වූ තිලෝගුරු සම්මාසම්බුදුරජානන් වහන්සේ සැවැත් නුවර නිසා ජේතවනාරාමයෙහි වැඩවසතසේක් මේ ජාතකය අනේපිඬු මහසිටානන් අරභයා වදාළසේක.

**හේ කෙසේද? යතහොත්;**

අනේපිඬු මහසිටාණන්ට පසල්දනව්වැසි එක්තරා සිටානකෙණෙක් අදෘෂ්ටමිත්‍ර ව වාසය කරන්නාහුය. එකල්හි ඒ පසල්දනව්වෙහි උපදනා බඩු යෙන් ගැල්පන්සියයක් බඩුපුරා තමන්ගේ කාරියෙහි නියුක්තා පුරුෂයන් කැඳවා ''දරුවනි, තොපි හැම දනම මේ ගැල්පන්සියයෙහි බඩු ගෙන්වාගෙණ ගොස් සැවැත් නුවර අපගේ යාළුවූ අනේපිඬු මහසිටානන් සම්මුඛයෙහි ගෙන

ගියාවූ බඩු විකුව ඒ රටින් අපට උවමනා බඩුවක් ගෙණඑව"යි විඛාන කළාහ ඒ පුරුෂයෝ සිටානන්ගේ බස් ගිවිස ගෙණ බඩු ගෙන්වාගෙණ සැවැත් නුවර අනේපිඬුමහසිටානන් දැක ඒ බඩු හා පඬුරුත් දක්වා දී තමන් ආ පවතුත් සිටානන්ට කීවාහුය.

මහසිටානෝද ඔවුන් දැක "අපලඟට තොප හැම ආයේ ඉතා යහපතැ"යි කියා භිදිනා නවානැන් බත් වැටුප් ආදියද දෙවෙව්වාහුය, "අපගේ මිතුවූ මහසිටානන්ට සුවදුක් කිමදැ"යි විවාරා සමීපයට එවූ බඩු පඬුරු විකුණවා මිල පුරුෂයන්ව දෙව්වාහුය තමන්ගේ පසල්දනව්වට ගොසින් ඒ කාරණය තමන්ගේ සිටානන්ට කීවාහුය.

තවද මැතභාගයෙහි එක්සමයෙක්හි අනේපිඬු මහසිටානෝ බඩුපිරු පන්සියයක් ගැල් පසල්දනව්වට යව්වාහුය. සිටානන්ගේ මිනිස්සු පසල් දනව්වට ගොසින් තමන් ගෙණගිය පඬුරු පසල්දනව්වැසි සිටානන්ට පැදුවහ.

සිටානෝද "තොපි හැම කොයි සිට අවුද?"යි විවාරා 'සැවැත්නුවර නුඹවහන්සේගේ යහළුවූ අනේපිඬුමහසිටානන්වහන්සේ ලඟ සිට ආමිහ"යි කීකල්හි "අනේපිඬුමහසිටානෝය යි යන තමකුත් මිනිසුන්ට ඇද්දැ?"යි අප හා සරි කොට කියා තමන් යවූ පඬුරුත් අැරගෙණ "යහපත තොපි නික්මෙව"යි කීහ. ගිය පුරුෂයන්ට භිදිනා තැනක්වත් බත් වැටුප් ආදියක් වත් විවාරා නුදුන්හ.

එකල්හි ගිය පුරුෂයෝ තමන් ගෙණගිය පඬුරු තුමූම විකුව ඒ රටින් උවමනා පඬුරු අැරගෙණ සැවැත්නුවරට ගොසින් අනේපිඬුමහසිටානන්ට එපවත් කීවාහුය. නැවත කලාතුරකින් පසල්දනව්වාසි සිටානෝ ගැල් පන්සියයක් බඩුපුරවා සැවැත්නුවරට යව්වාහුය, ඒ පුරුෂයෝ තමන් ගෙණගිය පඬුරු අැරගෙණ අනේපිඬු මහසිටානන් දුටහ. එකල්හි අනේපිඬු මහසිටානන්ගේ මිනිස්සු මෙසේ කීහ. "ස්වාමීනි, මේ ආ සියල්ලවුන්ට භිදිනා ගෙවල් බත් වැටුප් දීමත් අපට භාරය"යි කියා ඔවුන්ගේ ගැල් පිටිනුවර එක්තරා ස්ථානයක මුදවා "තෙපි හැමදෙනම මෙතැන්හි ඉඳුව"යි "තොපි හැමදෙනටම බත් බුලත් ආදීවූ සියල්ලම අපගෙන් ලැබන්නේය"යි කියා ඔවුන් විවරක් නොහැර උදුරගෙණ රථ අදිනා ගොන් ඒ ඒ තැන ලුහුබඳවා ගැලින් රථයක් ගලවා ගැල්පිට තබා ගැලසක් හැරගෙණ ගියාහුය. ඒ පසල් දනව් වැස්සෝ තමතමන් හැඳිපෙරවි පිළිවිවරක් අහිමිව මහත්වූ භයින් තැති ගෙණ නොරඳා යුහුව නික්මුණාහුය.

අනේ පිඬුමහසිටානන්ගේ මිනිස්සු තමන් ඒ කළාවූ පවත් සිටානන්ට කීවාහුය. සිටානෝද එපවත් අසා "සම්මැයන්වහන්සේට දන්වන්ට සුදුසුවූ බස් පඬුරෙකැ"යි සිතාගෙණ සම්මැයන්වහන්සේ සමීපයට ගොසින් ආදියෙහි පවත් ගෙණ තමන්කළ කටයුතු සහ පසල්දනව්වැසි සිටානන් කළ දෙයත් සම්මැයන් වහන්සේට දැන්වූවාහුය.

ඒ වේලෙහි බුදුහු වදාරණසේක් "එම්බල ගහපතිය, පසල්දනව්වැසි සිටානන් කෙලෙහිගුණ උපකාර නොදන්නේ දැන්මතු නොවෙයි. යටගිය දවසත් කෙලෙහිගුණ උපකාර නොදත්තෝමය"යි වදාරා සිටානන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

හේ කෙසේද? යතහොත්,

ශිවගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණන් වහන්සේ බරණැස මහාසම්පත් ඇත්තාවූ සිටුකුලයක උපන්නාහ.

ඒ බොධිසත්ත්වයන්ට අදෘෂ්ටමිත්‍රව වාසයකරන්නාවූ පසල්දනව්වැසි අනික් සිටාතකෙතෙක්ද වූවාහ සි කියා ඒ සියළු ඉකුත්වත් කථාව වර්තමාන කථාව හා සදෘශවන්නේය. බොධිසත්ත්වයෝ වනාහි තමාගේ මිතිසුන් "අද මේ කවයුත්තක් අප විසින් කරණලදැ"යි කියා අවුත් තමන්ට කිකල්හි "පළමුව අනුන් විසින් තමාට කළාවූ උපකාරයෙක් නොදන්නාවූ යම් සත්ත්ව කෙනෙක් ඇත්තම් මෙබදු විකාරයට පැමිණෙන්නාහුය"යි කියා සම්ප්‍රාප්තවූ පණ්ඩිත ධර්මදේශනා කරන්නාවූ බොධිසත්ත්වයෝ "මේ ලෝකයෙහි ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීවූ යම්කිසි පුරුෂයෙක් අනුන් විසින් පළමුකොට තමා කරණලද්දාවූ උපකාරයක් නොදන්නාවූ අඥානපුරුෂතෙම කුදු මහත් යම්කිසි කවයුත්තක් තමාට පැමිණියාවූ යම්කාලයෙක් ඇද්ද? එබදු කාලයෙහි ඊට ප්‍රතිබලව සිවියාවූ අනික් සහයක්වත් නොලබන්නේය"යි යනාදී ධර්මදේශනාකොට තුමූ දිවිපමණින් දැනාදී පින්කම්කොට තමාගේ කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා ජාතකය පූර්‍යාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

"එකල්හි පසල්දනව්වැසි සිටානෝ නම් දැන් මේ පසල්දනව්වැසි සිටා නෝය, බරණැස්නුවර සිටානෝ නම් මේ සම්බුදපදප්‍රාප්තවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 90 ලිතත ජාතක

තීවද එක්සමයෙක්හි ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ අපගේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ සැවැත්නුවර නිසා දෙවිරම්වෙහෙර වැඩ වසනසේක් මේ ජාතකය වීවරාදීවූ චතුර්විධ ප්‍රත්‍යය ලදින් නොපස්විකා වළඳන්නාවූ පෘථක්ජන භික්ෂූන්වහන්සේ අරභයා වදාළසේක.

ඒ කෙසේද? යතහොත්,

එක්සමයෙක්හි බොහෝ භික්ෂූන්වහන්සේ බොහෝ වීවරාදී චතුර්විධ ප්‍රත්‍යය ලදින් බොහෝසේම නොපස්විකා වළඳනසේක. එසේ නොපස්විකා වීවරාදී ප්‍රත්‍යය ප්‍රයෝජන විදිනා බොහෝ භික්ෂූන්වහන්සේ බොහෝ නිරා දුකින් හෝ තිරිසන් අපායෙහි හෝ ප්‍රේතාත්මභාවයෙහි හෝ ඉපිද නොම්දෙන සේක.

ශාස්තෘවූ සම්මාසම්බුදුරජානන් වහන්සේ මේ කාරණය දිවැසින් දැක වදාරා භික්ෂූන්වහන්සේට අනේකාකාරයෙන් නොපස්විකා වැළදීමෙහි ආදීනව දක්වා වදාරා බණ වදාරණසේක් "මහණෙනි, මේ ප්‍රියසීලි භික්ෂූන් විසින් චර්විධ ප්‍රත්‍යය ලදින් නොපස්විකා වැළදීම නොකටයුතු වන්නේය, එසේ

නෙයින් මෙතැන්පටන්ගෙණ මහණෙනි පස්විකා වළඳව''යි වදුරා ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ ක්‍රම දක්වනසේක් ''මහණෙනි, මාගේ ශාසනයෙහි යම් භික්ෂූ කෙනෙක්තෙම ''සීතස්සපටිඝාතාය'' යනාදීන් ඒ ඒ ප්‍රත්‍යයට සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යවෙක්ෂා පාලිය වදුරා ''මහණෙනි, මෙපරිද්දෙන් චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය ලදින් පස්විකා වැළඳීම සුදුසු වන්නේය''යි වදුරා ''එම්බා මහණෙනි, මේ පස්විකා වැළඳීම නම් උග්‍රවිෂයක් අනුභවකරන්නා හා සමාන වන්නේය, විෂ අනුභවකිරීමෙහි ආදීනව නොදන්නාවූ පුරාතනයෙහි කිසි සත්ත්වයෙකුත් විෂඅනුභව කොට අවසන්හි බොහෝ දුකට පැමිණියාහ''යි වදුරා ආරාධිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**එහේ කෙසේද? යනහොත්,**

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යකරණ සමයෙහි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතාණන් එක් තරා මහාසම්පත් ඇති කුලයක ඉපද වැඩිවිය පැමිණ දූ කෙළියෙහි ලොභ ඇතිව අක්ෂධූතීව වසන්නාහුය.

තවද එසමයෙහි වඤ්චාවෙන් දූකෙළ අනුන් පරදවන්නාවූ අක්ෂධූතී යෙක්ද විය. එකල්හි සොරහු අක්ෂධූතීනොව බොධිසත්ත්වයන් හා සමග දූකෙළුනේ තමා දිනනකල්හි කෙළිමඩුල්ල නොබිඳිනේය. තමා පරදින කල්හි පසඇට මුඛයට දමා පසඇට අපවත්තගියේය යි කෙළිමඩුල්ලත් බිඳ නැගී යන්නේය. බොධිසත්ත්වයෝ ඔහුගේ කාරණය දැන ''යහපත ඊට සුදුස්සක් කෙරෙමි'' සිතාගෙණ පසඇට ඇරගෙණ තමන්ගේ ගෙයිදී විෂයෙන් පසඇට දෙතුන්වැනිව රැඳගෙණ නැවත නැවත විෂපෙවූ පසඇට ගෙණ ධූතීයා සම්පයට ගොසින් ''සබඳ දූකෙළිමෙහ යි කියා කීහ. ධූතීයා යහපතැ''යි කියා කෙළිමඩුල්ල සරහා ඔහු හා සමග කෙළිනේ තමා පරදින අවස්ථාවෙහි එයින් එක් පසඇටක් ඇරගෙණ මුඛයට දැමුයේය.

ඉක්බිති මහබෝසතාණෝ ඌ එසේ පසඇට ඇරගෙන මුඛයට දමන නියාව ''දැක යහපත යහළු තෙපි ගැලපියව මතු මින් මෙසේවූ දෙයක් වෙයි කියාදැනගණුව''යි මතුවන ආදීනව දක්වන්නේය,''යහළු තෙපිදැන් වඤ්චාවෙන් පසඇට ගිලිතත් උග්‍රවිෂයෙන් රැඳුබව හේතුකොටගෙණ අවසන්හි බලවත්වූ දුක්වේදනාවට පැමිණෙන්නෙහිය''යි බොධිසත්ත්වයන් මෙසේ කියා උන් කලට ධූතීයා තම විෂයෙන් මූර්ජාවෙමින් ඇස්දෙක පෙරලා කරමිය නමා ගෙණ වැටිහුනුයේය.

බොධිසත්ත්වයෝ වනාහි මා නිදුක්හු නිසා මෙවැනි අඥානයකු නැසියාම සුදුසු නොවන්නේය, මෝහට මා ජීවිතදානය දීම වටනේය''යි සිතා ඖෂධයෙන් පරිභාවිතකරණලද බෙහෙත් යොගයන් ඔහු අනුභව කරවා විෂය වමනය කරවා එළඟිතෙල් මී සකීරා ආදීවූ සිනි සහ හොජනයක් අනුභව කරවා ඔහු නිරෝගි කොට මතු මෙබන්දක් නොකරව''යි අවවාද කියා දිවි පමණින් දන්දී පින්කම් කෙරෙමින් තමන්ගේ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදුරා ''එම්බා මහණෙනි, නොපස්විකා වළඳන චතුර්විධ ප්‍රත්‍යය නම් විෂ

අනුභවකිරීමක් හා සදෘශය''යි වදුරා මේ ජාතකය පූර්ණපරසන්ධිගලපෘ වදුළ සේක. ''එකල්හි ප්‍රඥාසම්පන්න අක්ෂුද්‍රතීයානෝ නම් දැන් බුදුවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදුළසේක.

---

## 91
## මහාසාර ජාතකය

තීවද එක්සමයෙක්හි මුළු ලොවට උතුම්වූ රූපකාය සම්පත්තියෙන් හා ධර්මකාය සම්පත්තියෙන් යුක්තවූ දසබල වතුවේශාරද්‍යාදීවූ ගුණයෙන් විරාජමානවූ අප තිලෝගුරු සම්මාසම්බුදු රජානන් වහන්සේ සැවැත්නුවර නිසා දෙවිරම්වෙහෙර වැඩවසන සේක් මේ මහාසාර ජාතකය ආයුෂ්මත්වූ අනඳමහ තෙරුන්වහන්සේ අරභයා වදුළසේක.

**හේ කෙසේද? යත්‌හෙයින්,**

එක්සමයෙක්හි කොසොල් රජ්ජුරුවන්ගේ පුරස්ත්‍රීහු මෙසේ සිතුවාහ. ''බුඩොත්පාදකාලය නම් ඉතා නොලද හැක්කේය. මනුෂ්‍යත්වභාවයද එසේ ලද නොහැක්කේය. වක්ෂුරාදි පඤ්චෙන්ද්‍රියන්ගේ සම්පූර්ණතාව ලැබ ගැන්මත් එසේම දුර්ලභ වන්නේය, අපිද මෙබඳුවූ බුඩොත්පාද හා ක්ෂණ සම්පත්තියත් ලැබගෙණ අපගේ අභිප්‍රායෙන් දෙවිරම්වෙහෙරට ගොස් බුදුන්ගේ මධුරවූ ධර්මදේශනා අසන්ට හෝ වේව යි දන්දෙන්ට හෝ වේව යි නොලබම්හ, මැදිරියක ලූවන් මෙන් වාසයකරම්හ, මහරජ්ජුරුවන් වහන්සේට දන්වා අපට බණ කියන්ට සුදුසු භික්ෂූකෙණෙකුන් වහන්සේ ගෙන්වා ගෙණ උන්වහන්සේ සමීපයෙහි ධර්මය අසාම ඒ පාලිධර්මයෙන් යම් යම් චීවරක් ඉගෙණගතුමෝ නම් එබදු ධර්මයකුත් ඉගෙණගණුම්හ, දානාදීවූ පින්කමුත් කොට ගණුම්හ, එසේකල්හි මේ ක්ෂණසම්පත්තිය අපට සඵලවන්නේය''යි ඔහු හැමදෙනම රජ්ජුරුවන් සමීපයට ගොසින් තමන් හැම සිතූ කාරණය රජ්ජුරුවන්ට දන්වාහුය.

රජ්ජුරුවෝ එබස් අසා ''යහපතැ''යි ගිවිස්වාහුය. නැවත එක්දවසක් රජ්ජුරුවෝ උයන් කෙළිනා කැමැත්තෝ උද්‍යානපාලකයා හෙන්වා ''උයනෙහි මිනිස්කෙතෙකුන් ඇත්ත නැත්ත පරීක්ෂාකොට එව''යි නියෝග කළ කල්හි උද්‍යානපාලකයා තෙමේ උයනේ මිනිසුන් ඇත්ත නැත්ත පරීක්ෂා කොට ඇවිදිනේ එක්තරා රුකක්මුල සම්බුදුන් වහන්සේ වැඩඋන් නියාව දැක රජ්ජුරුවන් සමීපයට උද්‍යානපාල තෙමේ ගොස් ''දේවයන්වහන්ස, උයනේ අන්කිසිවෙකුත් නැත. තවද සම්මාසම්බුදුරජානන් වහන්සේ එක්තරා රුකක් මුල වැඩඋන්සේකැ''යි කීයේය,

''යහපතැ''යි කෝසලරජ්ජුරුවෝ ''සම්බුදුන් වහන්සේ සමීපයෙහිදී බණත් අසාගණුම්හ''යි සරහා පිළියෙල කරණලද උතුම්වූ රථවාහනයකට නැගී සම්බුදුන් වහන්සේ සමීපයට ගියාහ.

එසමයෙහි ඡත්තපාණි නම් අනාගාමි උපාසකයෙක් සම්බුදුන්වහන්සේ සමීපයෙහි බණ අසමින් උන්නාහුය, එසේ බණ අසමින් උන් උපාසකයන් රජ්ජුරුවෝ දැක ''කිමෙක්දෝහෝ''යි සංකාවෙන් මදවේලාවක් බලා සිට

නැවත මෙසේ සිතුහ. ඉදින් මේ ලාමක පුරුෂයෙක් වී නම් සම්බුදුරජාණන් වහන්සේ සමීපයෙහි ඉඳ බණ නොඅසන්නේය. ''මොහු අලාමක පුරුෂයක්හුම විය යුතුය''යි සිතින් සිතා සම්බුදුරජාණන් වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව උන්හ.

උපාසකයෝද බුඩ ගෞරවයෙන් රජ්ජුරුවන් දැක නැගී සිටීමක්වත් වැඳීමක්වත් නොකළාහ. ඒ කාරණයෙන් රජ්ජුරුවෝ ඔහු කෙරෙහි තොසතුටු සිත් ඇතිවූහ. ශාස්තෘවූ සම්මාසම්බුදු රජාණන්වහන්සේ රජ්ජුරුවන්ගේ සිත අසන්තුෂ්ට නියාව දැන වදාරා උපාසකයන්ගේ ගුණ රජ්ජුරුවන්ට වදාළසේක. මේ උපාසකයෝ බොහෝ ඇසුපිරුහැන් ඇත්තෝය අනාගාමී මාගීඵලයෙහි පිහිටි කෙනෙක. වස්තුකාම ක්ලේශකාමයෙහි අලග්න සිත් ඇතිවූ බලවත්වූ උපාසක කෙනෙකැ''යි වදාළසේක.

රජ්ජුරුවෝ සිතන්නෝ ''මේ පුරුෂතෙම ලාමක එකෙක් නොවන්නේය. මොහුගේ ගුණ බුදුහු පවා වණ්ණා කළසේකැ''යි සිතින් සිත උපාසකයන්ට මෙසේ කීහ. ''උපාසකයෙනි, නොපව යම්කිසි වස්තුවකින් ප්‍රයෝජනයක් ඇත්තේ වී නම් ඒ අපට කියව''යි කියා කීහ.

උපාසකයෝද ''යහපත සවාමීනි''යි පිළිගත්තාහුය. රජ්ජුරුවෝද සම්බුදුරජාණන් වහන්සේගේ මධුරවූ ධර්මදේශනාව අසා වැඳ තුන්යලක් පැදකුණු කොට රජගෙට නැගී ගියහ.

තවද එක්දවසක් කොසොල් රජ්ජුරුවෝ තමන් වසන මතුමහල්තල යෙහි සිවුමැදුරු කවුළුව හැර ඇතුළුවීථිය බලා සිටියෝ පෙරවරු බත් අනුභව කොට පත්කුඩයක් ඉසට කොට ගෙණ රජ්ජුරුවන්ගේ මාලිගාව සමීපයෙන් දෙව්රම්වෙහෙරට යන්නාවූ ඡත්තපාණි නම් උපාසකයා දැක රාජපුරුෂයන් යවා ගෙන්වා ගෙණ මෙසේ කීහ. ''උපාසකයෙනි, තෙපි බොහෝ ඇසුපිරු තැන් ඇති හෙයින් බහුශ්‍රුතය,අපගේ පුරස්ත්‍රීහු බණ අසන්නා කැමැත්තෝය පාලිධර්මයෙන් කිසිවක් ප්‍රගුණකොට ගන්නා කැමැත්තාහු වෙති. ඉදින් තෙපි පුරස්ත්‍රීන්ට බණ කියා පාලිධර්මයන් ප්‍රගුණ කරවා ලියා එවූ නම් යහපතැ''යි කීහ. උපාසකයෝ කියන්නාහු ''මහරජ ගිහිගෙයි සිටි කෙනෙකුත් විසින් පුර ගෙවල බණ කියන්ට හෝ වේවයි, බණ උගන්වන්ට හෝ වේවයි සුදුසු නොවන්නේය. භික්ෂූන්වහන්සේවම ඒ කටයුත්ත සුදුසුය''යි කීහ. එකල්හි රජ්ජුරුවෝද උපාසකයන් කී බස් ගිවිස ''යහපත තෙපි යව''යි උපාසකයන් නික්මවා පුරස්ත්‍රීන් ගෙන්වාගෙණ ''භද්‍රාවෙනි, නොපි හැමදෙනාටම බණ කියනු පිණිස ධර්මය උගන්වනු පිණිස සම්බුදුරජාණන් වහන්සේ සමීපයට ගොසින් එක් භික්ෂූ කෙනෙකුත් වහන්සේ ඉල්වම්, අසූමහ සව්වන්වහන්සේගෙන් කවර කෙනෙකුත්වහන්සේට ආරාධනා කෙරෙම්ද''යි කියා විචාළාහ,

ඔහු හැමදෙන එක්ව කථාකොට ''ධර්මභාණ්ඩාගාරික ආනන්ද මහතෙරුන් වහන්සේ කැමතිය''යි කීහ. රජ්ජුරුවෝ සම්බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස්ව උන්නාවූ බුදුන්ට මෙසේ දැන්වූහ. ''සවාමීනි, අපගේ පුරස්ත්‍රීහු ආනන්ද මහතෙරුන්වහන්සේ සමීපයෙහි ධර්මය අසන්ටද උගන්

වන්වද කැමති වන්නාහුය. ඉදින් අනද මහතෙරුන් වහන්සේ දවස දවස රජ ගෙට වැඩ අපගේ අන්තඃපුර වාසීන්ට බණ වදුරා උන්ගේ ශක්ති පමණින්පාලි ධර්මයත් වතපොත් කරවා වඩිනාසේක් වී නම් යහපතැ''යි කියා දැන්වූහ.

බුදුහු ''යහපත මහරජ''යි රජ්ජුරුවන් කී බස් පිළිගෙණ එපරිද්දෙන්ම අනද මහතෙරුන් වහන්සේට නියෝග කොට වදාළසේක.

එතැන් පටන් ගෙණ රජ්ජුරුවන්ගේ පුරසත්‍රිහු අනද මහතෙරුන් වහන්සේ සමීපයෙහි බණ අසන්නාහුද, වතපොත් කරන්නාහුද වෙත්.

එසමයෙහි එක්දවසක් රජ්ජුරුවන් පලඳනාවූ චූඩාමාණික්‍යය සොරුන් විසින් ගන්නාලද්දේ වන්නේය. රජ්ජුරුවෝ ඒ මැණික සොරුන් විසින් ගත් බව අසා අමාත්‍යයන්ට මෙසේ නියෝග කළහ. ''රජගෙට සියළු අභ්‍යන්තර ජනයාම අල්වාගෙණ තොප දන්නා නියායකින් මැණික පවත්කරවා දෙව''යි විධාන කළහ.

එබස් ඇසූ අමාත්‍යයෝ රාජභවනයෙහි අභ්‍යන්තර ස්ත්‍රීන් ආදිකොට ඇති සියල්ලන් අතින් මැණික නොප ගතුදැ?''යි විචාරා බොහෝ ජනයාහට පීඩා කරන්නාහුය. එදවස් අනද මහතෙරුන් වහන්සේ යම් මේ ස්ත්‍රීහු පළමු තෙරුන් වහන්සේ දැක තුටුපහටුව බණ අසන්නාහු වෙද්ද? පාලිධර්මය පුහුණු කරන්නාහු වෙද්ද? එලෙස නොව වික්ෂෝපයට පැමිණියාවූ සියල්ලවුන්ම දැක මෙසේ විචාරා වදාළසේක. ''අද කවර කාරණයකින් තෙපි හැමදෙනම මෙබදු වික්ෂෝපයට පැමිණියාදැ?''යි විචාරා වදාළසේක. එකල්හි ස්ත්‍රීහු මහතෙරුන් වහන්සේට මෙසේ කීහ. ''සවාමීනි, රජ්ජුරුවන් වහන්සේගේ චූඩාමාණික්‍යය අපවත්ව ගිය හෙයින් පවත් කරම්හ''යි කියා අමාත්‍යයෝ වල්ලභ ස්ත්‍රීන් පටන් ඇතුළුහැමයි බොහෝ ජනයා පීඩාකරන්නාහුය. කාට කුමක් යන බවත් නෙ දන්නා හෙයින් වික්ෂෝපව සිටිම්හ''යි කීහ.

මහතෙරුන් වහන්සේද ''තෙපි හැම ඊර්ෂ්‍ය ශෝක නොකරව''යි ඒ පුර සත්‍රීන්හැමදෙනම අස්වසා රජ්ජුරුවන් සමීපයටවැඩ පණවනලද ආසනයෙහිලා වැඩඋන්සේක. ''මහරජ තොපගේ චූඩාමාණික්‍යය සොරුන් විසින් ගන්නාලද දැ''යි විචාළසේක. ''එසේය සවාමීනි'' කියා කීය.

ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ වදාරණසේක් ''මහරජ මැණික පවත් කරවාගන්ට නොපොහොසත්තුදැ?''යි වදාළසේක. ''සවාමීනි රජගෙයි අභ්‍යන්තරව හිඳිනා ස්ත්‍රීන් පටන් සියල්ලවුන්ම අල්වාගෙණ ගහට කොට විචාරත් මැණික පවත් කරවා ගන්ට නොපිළිවන් වීය''යි කීහ. තෙරුන්වහන්සේ වදාරණසේක් ''මහරජ,බොහෝදෙනාව පීඩා නොකොට මැණික ඇරගන්ටඋපායෙක් ඇත''යි වදාළසේක. ''සවාමීනි, කවර උපායෙක්දැ''යි විචාළහ. ''පිදුරු ඇදීමෙන මහරජ''යි වදාළසේක. ''සවාමීනි, කවර පිදුරු ඇදීමෙක්දැ?''යි විචාළහ. ''මහරජ යම් පමණ ජනයා කෙරේ සැක ඇත්නම් ඒ ඇමදෙනම ගණන් කොට එකි එකී කෙනෙකුන් අතට එකි එකි පිදුරු කැටියක් හෝ මැටිපිඬක්දී මේ උදෑසන්හිම අසෝතැන ලාපියව''යි කියයුතු වන්නේය. යමක්හු විසින් මැණික හන්නා ලද්දේ වීනම් ඒ තමා ඇරගත් මැණික පිදුරු මැටි ආදියෙහි නොපෙණෙන පරිද්දෙන් වසාගෙණ අවුත් දමාපියන්නේය, මහරජ මෙසේ

කළ කල්හි ඉදින් පළමු දවස්ම මැණික ලාපු නම් යහපත්මය. ඉදින් නුළුවෝ නම් දෙවෙනි දවසුත් තුන්වෙනි දවසුත් එසේම කරවිය යුතුවන්නේය, එසේ කල්හි බොහෝදෙනාට පිඬා නොවන්නේය. මැණිකද පවත්වන්නේය"යි වදාළසේක.

තෙරුවන් වහන්සේ රජ්ජුරුවන්ට මෙසේ කියා විහාරයට වැඩිසේක. රජ්ජුරුවෝද තෙරුවන් වහන්සේ වදාළ පරිද්දෙන්ම තුන්දවසක් මෙම ක්‍රමයෙන්ම කරවූවාහුය. රජ්ජුරුවන් මෙසේ නොයෙක් සැටියෙන් උත්සාහ කළෝ තමුත් සොරු තමන් ඇරගත් මැණික නුදුන්නාහුය.

තෙරුවන් වහන්සේ තුන්වෙනි දවස් රජගෙට වැව 'කිමෙක්ද? මහරජ මැණික ලදුදැ"යි විචාළසේක. "සාමීනි, සොරා මැණික අපට නුලුහ"යි කීහ. "එසේවී නම් මහරජ මතුමහතල්යෙහි පිළිඝන්තන්හි දියසැළක් තබ්බා වට තිරයක් මූවාකරවා රජගෙයි අභ්‍යන්තරයෙහි සියළු සත්‍රීන්වද කුදුන් කුරින් රැකවලුන්ද ආදීවූ සියළු පුරුෂයන් උතුරුසළුවක් පෙරවාගෙණ අවුත් ඒ දිය සැල බලා එන්ව නියෝග කරව"යි කීසේය. ඒ භාණ්ඩාගාරික ආනන්දමහතෙරුන් වහන්සේම මේ අධිකරණය තමන්වහන්සේට භාරකොට ගත්සේක. ඒකාන්තයෙන් මැණික පවත්කරවා විනා නොවළකිනාසේක. ඒ තමා ගෙණ හිඳීම කාරණා නොවන්නේය, මෙවිට මේ මැණික ගෙණ ගොස් රජගෙයි ලා පියව යි සිතා සොරු දියසැලෙහි මැණික ලූයේය. මැණික ලබන ලදැ යි සතුටුවූ රජගෙයි සියළු සත්‍රී පුරුෂයෝද තෙරුන් වහන්සේ නිසා මෙවෙනි මහදුකින් මිදීගියෙම්හ"යි කියා සතුටුවූහ. තෙරුන් වහන්සේගේ ආනුභාවයෙන් රජ්ජුරුවන් වහන්සේගේ චූඩාමාණික්‍යය පැවැත්වූයේය"යි කියා තෙරුන්වහන්සේගේ ප්‍රඥානුභාවය සියළු නුවරද භික්ෂු සඞ්ඝයාවහන්සේ කෙරෙහිද ප්‍රසිඩවූයේය.

එකල්හි දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නාවූ සිලඝම්ධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන දර්ශනාදියෙන් යුක්තවූ මහාකාශ්‍යප සථවිරයන් ප්‍රධානවූ භික්ෂු සංඝයා වහන්සේ තෙරුන්වහන්සේගේ ගුණ කථාය කෙරෙමින් වැඩඋන්සේක "ඇවැත්නි ආනන්දමහතෙරහු තමන්ගේ බහුශ්‍රැතභාවය හේතුකොට ගෙණ පණ්ඩිත සභාවයෙන් උපායෙහි තමන් දක්ෂ හෙයින් බොහෝදෙනාට පිඬා නොකොට්ම උපාය ශක්තියෙන් රජ්ජුරුවන්ටමැණික ඇරගෙණ දෙවි හ යි කියා මෙවෙනි කථාවෙන් උපලක්ෂිතව වැඩහුන්කල්හි සුරාසුරවර චක්‍රවාරු චූඩාමාණික්‍ය මරීචිඝඩාය පරිචුම්බිත වරණතල මයුඛ ඇති තිලෝක සභාමීවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ ශ්‍රී ගන්ධකුටියෙහි වැඩහිඳ දිව්‍යශ්‍රොත ධාතුයෙන් ඒ භික්ෂූන්වහන්සේ කියමින් උන් කථාප්‍රබන්ධය අසා වදාරා "මේ භික්ෂුහු ආනන්දසථවිරයන්ගේ ගුණකථනය කෙරෙමින් උන්නාහ. එතනට ගිය කල්හි තමන් කියමින් උන් කථා මට කියන්නාහුය. මෙය අච්ඡරියත්තති කොට ගෙණ සම්ප්‍රාප්ත පිරිසටද ධර්මදෙශනා කෙරෙමින් ඒ මාගේ දෙශනාව ඇසූ සත්වයන්ට සවඟීමොක්ෂ දෙකට කාරණා වන්නේය"යි සිතා වදාරා තුන්තරා ගමනින් එක්තරා ගමනකින් දම්සභා මණ්ඩපයකට වැඩ පණවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ සශ්‍රීකවූ ශ්‍රීමුඛපද්මය විවෘතකොට් සියළු දම්සභා මණ්ඩපය එකපැහැර සුවඳකරම්න් අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ මධුරඝොෂා පවත්වා "මහණෙනි, මාඑන්නාට පූර්වභාගයෙහි කවර තම් කථාවකින් උපලක්ෂිතව උනුදැයි?"යි විචාරා වදාළසේක. එකල්හි අසුමනසවිවන් වහන්සේගෙන්

එක්කෙනෙකුත් වහන්සේ නැගීසිට සතස් කොට හැඳ පෙරවාගෙණ බඩංජලීව දෙනොත් මුදුනෙහි තබාගෙණ එලඟත් රැකක් මෙන් නැමීසිට මෙසේ දැන්වූසේක.

"සඟම්දරුවන්වහන්සේ නොකිඳන්ට වදුළ රාජකථා චොරකථා ඉත්ථිකථා ධූතීතථා පානකථා යනාදීවූ දෙතිස් කථාවෙන් උපලක්ෂිතව උනුමෝතොවම්හ. අනන්දසථවිරයන්ගේ ගුණකථණය කෙරෙමින් මෙතෙකින් උපලක්ෂිතව උනුම්හ"යි කියා දැන්වූ කල්හි එම්බා මහණෙනි අනුන් හැරගත් ව ඉතුව ආනන්දසථවිරයෝම දැන් ඇර දුන්නාහු නොවෙති, පුරාතනයෙහි නුවනැත්තෝද බොහෝ ජනයාට පිඹා නොකොට තමන්ගේ ප්‍රඥානුභාවයෙන් නිරිසනුන් අතට පැමිණියාවූ වස්තුව පවා ගෙණහැර දෙව්වෝවේදැ"යි වදාරා ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා කථාව ගෙණහැර දක්වා වදාළසේක.

හේ කෙසේදැයි යතහොත්;

යියවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රජ්ජය කරණ කල්හි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතාණෝ සියළු අෂ්ටාදශ විද්‍යා ඉගෙණ කෙළපැමිණියාවූ අමාත්‍යයෙක්ව රජ්ජුරුවන්ට අසීයෙන් අනුශාසනා කරන්නාහු වෙති.

එසමයෙහි එක්දවසක් බ්‍රහ්මදත්ත නම් රජ්ජුවෝ මහත්වූ පෙළහරින් උයන් කෙළියට ගොසින් වනක්‍රීඩාකොට දියකෙළිනා කැමැතිව මහරජ්ජුරුවෝ මගුල් පොකුණට බැස අන්තඃපුර වාසී සියළු සත්‍රී සමූහයාද දියකෙළියට ගෙන් වූවාහ.

ඉක්බිති-පුරසත්‍රීහු ඉස පලඳනාවූද කරපලඳනවූද පාදාංගුලි පාදාභරණ පාසළඹ කිංකිණි කඡාලා ජංඝාපාන උරුජාලා කටිසූත්‍ර උදරබන්ධන අවුල්හර මුත්හර තෝඩු සිරෝජාලා මේ ආදීවූ ආභරණ විශෙෂයෙන් ගලවා උතුරු සළු වෙක්හි බහා උතුරුසළුව සුමුගෙක බහා වසතුරකිනා පරිද්දෙන් දැසින් අතට පාවාදී ජලක්‍රීඩාවට බටුවාහුය.

එසමයෙහි එක් වැදිරියෙක් උයනෙ එක්තරා ගසෙක සාඛාවෙහි බලා ගෙණ උන්නීය, එකල්හි බිසවු සියළු පලඳනා ගලවා උතුරුසළුවෙක්හි බහා ඇතුලෙහි තබන්නාවුන් දැක ඒ මුත්හරගෙණ තොමෝද පලඳනා කැමැත්තී රැකවල උන්නාවූ දැසයාගේ ප්‍රමාදභාවයක් බල බලා උන්නීද එකල්හි ඒ දැසිද පලඳනා සුමුගෙක තබාගෙණ ඇත්මැත් බල බලා උන් තැනැත්තීද නිදුලන්නී වුව. එකල්හි වැදිරිතොමෝ දැසියගේ ප්‍රමාදභාවය දැක පවතට බඳුවූ වේගයෙන් යුහුව දිවගෙණ ගොස් මහමුත්හර තමා කරපැලඳගෙණ පවනට බඳුවූ වෙගයෙන්ම යුහුව දිවගෙණ ගොස් රැකට නැගී කොල අතුරෙහි ලා සැඟවී හිඳ සෙසු වැදිරියෝ දකිති යන භයෙන් එක්තරා ගස්සිදුරෙක්හි සඟවා අතිශයින්ම සන්සුන් කෙනෙක් මෙන් ඒ | මුත්හරකිමින් උන්නාවුව. ඒ බිසෝ පලඳනා රැක උන්නාවූ දැසිද මුත්හර නොදක්නා තැනැත්තී භයින් වෙවුලන සිරුර ඇති තැනැත්ති තමා ගැලවී ගන්නා අනික් උපායක් සොයන තැනැත්තී

"පුරුෂයෙක් බිසවුන්වහන්සේගේ මුත්හර හැරගෙණ දිවපිහ"යි මහත්කොව අඬලූය. ආරක්ෂාවෙහි සිටි පුරුෂයෝ ඒ සථානයෙන් රැස්ව ඒ දැසියගේ බස් අසා රජ්ජුරුවන්ට දැන්වූවාහුය. එකෙණෙහි රජ්ජුරුවෝ සොරුන් වහා අල්වයි කියමින් අමාත්‍යයන් ගෙන්වාගෙණ සොරුන් අල්වන පරිද්දෙන් වෙන වෙන නියෝග කළහ.

රාජපුරුෂයෝද උයනින් පිටත්ව "සොරුන් අල්ව"යි කියමින් ඇත මැත සොරුන් පරීක්ෂාකරමින් ඇවිදිනාහුය. එකල්හි දනව්වාසී අයපඹුරු පසිඳ යන දුක්පත් මිනිසෙක් බොනෝදෙනාගෙන් "සොරුන් අල්ලව" යන ඝොෂාව අසා තමාකෙරෙහිලා භයින් භයපත්ව යුහුව දිවන්ට වන. එසේ දිවන්නාවූ පුරුෂයා දැක "සොරකම්කළ මේ පුරුෂයා වනැ"යි සිතා ඔහු ලුහු බඳවා ගෙණ ගොස් අල්වාගෙණ අතින් මරා තලා "එම්බල, දුෂ්ටවූ සොර මහාසාර නම් පලඳනාව හැරගත්තෙහිදැ?"යි විචාළහ.

එකල්හි ඒ පුරුෂයා මෙසේ සිතීය- "ඉදින් මම නොඉනිම් කිම් නම් අද මාගේ ජීවිතය නැත, මෙතනදීම තලා මරා ජීවිතය හැරගන්නාහුය, නැතැ යි නොකියා උන් කී දෙයම ගිවිසිම්" සිතා "සවාමීනි, මම හැරගනිම්"යි කීය.

ඉක්බිත්තෙන් රාජපුරුෂයෝ ඔහු පිටිතල හයා බැඳ රජ්ජුරුවන් සමීපයට ගෙණගියහ. රජ්ජුරුවෝද ඔහු අතින් මෙසේ විචාළහ, "කොළ තා විසින් මහාසාර නම්වූ පලඳනාව ගන්නාලද දැ"යි විචාළහ. "එසේය, දේවයන්වහන්ස, ඇරගනිම්"යි කීහ "ඒ වස්තුව කොයිදැ?යි විචාළ කල්හි "දෙවයන්වහන්ස, මාවිසින් මහාසාර නම් ඇඳෙක් පුටුවකුත් නොදක්නාලද විය, සිවානන්ගේ කීමෙන් පලඳනාව ඇරගෙණ උන්ට දිනිම්"යි කීය. රජ්ජුරුවෝ ඒ සිවානන් ගෙන්වා ඔහු අතින් "මහාසාර නම් පලඳනාවෙක් සිවානෙනි, තොප විසින් ගන්නාලද දැ?"යි විචාළහ. සිටානෝ නොදනිති නොකියා "දේවයිනි, මහාසාර නම් පලඳනාව මොහු අතින්ම මම ඇරගෙණ පුරෝහිතයන්ට දිනිම්"යි කීය. රජ්ජුරුවෝ පුරෝහිත බමුණා ගෙන්වා "කිමෙක්ද? පුරෝහිතයෙනි, තොප විසින් මහාසාර නම් පලඳනාව ගන්නා ලද දැ?"යි විචාළ කල්හි "එසේය, දෙවයෙනි, මම හැරගෙණ ගාඛ්‍රීයාහට දිනිම්"යි කීය. ඒ ගාඛ්‍රීයා ගෙන්වා "කොළ ගාඛ්‍රීයෙනි, පුරෝහිතයන් අතින් මහාසාර නම් පලඳනාව ගන්නාලද්දේ දැ?"යි විචාළහ. ගාඛ්‍රීයා නැතැ යි නොකියා "එසේය දෙවයිනි, මම ඇරගෙණ ඒ පලඳනාව ක්ලේශ වසඟයෙන් මේ නුවර වෙශ්‍යාවට දිනිම්"යි කීය. රජ්ජුරුවෝ ඒ වෙශ්‍යාවද ගෙන්වා "නී විසින් මහාසාර නම් පලඳනාව ගන්නාලද දැ?"යි විචාළ කල්හි ඒ වේලෙහි වෙශ්‍යාදූව කියන්නී "දෙවයිනි, මහාසාර නම් පලඳනාවක් මා පැලැන්දේ නැත, ඔබබකින් ලද්දේත් නැතැ"යි කියා කිව, මෙසේ පස්දෙනා අතින් විවාරණ කල්හි හිරු අස්තයට ගියේය, එකෙණෙහි රජ්ජුරුවෝද "දැන් වේලා නොවෙයි සෙට විවාරාගණිම්හ"යි ඒ පස්දෙනාම අමාත්‍යයන් අතට පාවාදී ඇතුළු නුවරට වදනාහ.

එකල්හි බොධිසත්ත්වයෝ මෙසේ සිතූහ, මේ මහාසාර නම් පලඳනාව අභ්‍යන්තරයෙහි අපවත්වූයේය. මේ පලඳනාව ඇරගෙණැයි යන් පුරුෂතෙමේ පිටත සඤ්චාරණය කරණ එකෙක, උයන් දොරකඩ ආරක්ෂාවෙහි පුරුෂයෝ

සිටියාහ, එහෙයින් පිටත එකෙක් තබා අභ්‍යන්තර එකෙකුත් වස්තුව හැර ගෙණ පලායන්ට අවකාශයෙක් නම් නැත්තේය. එසේහෙයින් පිටතින් ආ කෙනෙකුත්වත් ඇතුළේ සිටි කෙනෙකුත්වත් ඇරගන්වත් කාරණයෙක් නොපෙණෙන්නේය, මේ දුක්පත් මිනිසා විසින් "සිටානන්ට දෙනලදැ"යි කියා කියන්නම් තමා ගැලවෙනු පිණිස කියයුතු වන්නේය. පුරෝහිතයන්ට මා විසින් දෙන ලදැයි කියන්නාවූ සිටානන් විසිනුත් පුරුෂයෝ රාජාඩ්‍යාශ යෝය, "උඹ ගැලවෙත් නම් මමත් ගැලවෙමි" සිතා කිවාහු වන, "ගාන්ධිඒයාට මා විසින් දෙනලදැ"යි කියන පුරෝහිතයන් විසිනුත් ගාන්ධිඒයා නිසා සැපසේ ඔවුන් හා කථාකොට ඉඳුම්හ යි කියා කියේවත, වෙශ්‍යාවට මා විසිනුත් දෙන ලදැ යි යන ගාන්ධිඒයන් විසිනුත් උකටලියක් නැතිව වෙශ්‍යාව හා කථාකරමින් ඉඳුම්හ යි සිතා කියේවත. මුන් පස්දෙනාම නොසොර වියයුතුය. මගුල් උයනෙහි වඳුරෝ බොහෝකොට ඇත්තාහුය. "මේ පලඳනාව එක්තරා වැදිරියකගේ අතට පැමිණෙන්ට කාරණය"යි සිතා එකල්හි බෝධිසත්වයෝ රජ්ජුරුවන් කරා එළඹ "මහරජ තෙල සොරුන් අපට භාරකළ මැනව අපි ඒ විචාරා සුබ කොට දෙම්හ"යි කියා.

රජ්ජුරුවෝද "යහපත පණ්ඩිතයෙනි, ඒ තොපට භාරය, විචාරා පවත් කරවාදෙව"යි කියා පස්දෙනාම පණ්ඩිතයන්ට ඇවා දුන්හ.

එකල්හි බෝධිසත්වයෝ තමන්ගේ අතවැසි පුරුෂයන් ගෙන්වා පස්දෙනම එකසිරයක ලවා වටකොට රැකවල් ලවා "මොහු පස්දෙන ඔවු නොවුන් හා යම් යම් කථාවෙක් කෙරෙත් නම් කන්දී අසාගණ සිට ඇසූදෙය මට අවුත් කියව"යි කියා කීහ. පණ්ඩිතයන්ගේ පුරුෂයෝ එපරිද්දෙන්ම කළාහුය.

ඉක්බිති මනුෂ්‍යයන් කා බී ඇකුළුනුවේලෙහි සිටානෝ ගොවියාට මෙසේ කීහ. "එම්බල දුෂ්ටවූ කොළ, ගැහැවිය තෝ කවරදවසෙක්හි මා දුටු විරුද? මම කවරදවසක දිටිම්ද? කවර දවසෙක්හි තෝ මට දිනීදැ"යි විවාළහ

එකල්හි ගැහැවිතෙමේ කියන්නේ "සවාමීනි, මහසිටානෙනි මට නො කිපෙවමැනවැ මහාසාර නම් පලඳනාවක් තබා මහාසාරය යි යන නම් ඇති ඇඳක් පුටුවකුත් මා දුටුවිරැ නැත, සිටානන්වහන්සේ රාජවල්ලභසේක, ගැල වීමක් වේනම් දෙන්නම එක්ව ගැලවියම්හ"යි කියා ජීවිත ආසාවෙන් කීම්"යි කීහ.

එකල්හි බමුණානෝද සිටානන්ට මෙසේ කීහ, "මහසිටානෙනි, තොපට තුලුනුදුන් පලඳනාව තෙපි මට දිනිම් යි, කුමක් නිසා කිවූදැ?"යි විවාළහ. එකල්හි සිටානෝ කියන්නාහු අපි දෙදෙනම ඉසුරුමත්ව ප්‍රධානව සිටියම්හ, එසේවූ අප දෙදෙනා එක්ව සිරි කල්හි කාරිය සිද්ධිය වහා පැමිණෙන්නේ ය යි සිතා කීම්"යි කීහ.

එකල්හි ගාන්ධිඒයාද පුරෝහිතයාට මෙසේ කීහ. "බුමුණ, තොප විසින් කවර දවසෙක පළඳනාව මට දෙනලද්දේ දැ?"යි විවාළහ. එකල්හි පුරෝහිත බ්‍රාහ්මණතෙම කියන්නේ "එම්බල ගාන්ධිඒය, තට දුන් හෙයින් කියෙම් නො වෙමි, අපි හැම තා නිසා සැපසේ ඉඳුම්හ"යි සිතා කීම්"යි කීහ.

එකල්හි වෙශ්‍යාතොමෝ ගාඛ්‍රීයන් අතින් මෙසේ විවාළීය, "කොළ දුෂ්ටවූ ගාඛ්‍රීය, මම කවරදවසෙක තා ලඟට ගියෙම්ද? තෝ මා ලඟට කවර දවසෙක්හි ආ විරු එකෙක් දැ?"යි විවාළීය. "නග, තෙපි මට නොකිපෙව. අපි පස්දෙන එක්ව වසන කල්හි ගෘහවාසයක් හා සමාන වන්නේය, කිසි උකටලීයක් නැතිව සැපසේ වැදහිදුම්හ"යි කියා කීහ.

බොධිසත්ත්වයෝ තමන්ගේ චරපුරුෂයන් අතින් නියම දැන මුත් පස් දෙනා කී කථා අසා නියම දැන මුත් පස්දෙනා තොසොර නියාව තත්ත්ව හෙයින් දැන වැදිරිය අතින් ඇරගත් පලඳනාව ඇරගණිමි" සිතා රත්පලස් හුයෙන් බොහෝ පලඳනා කරවා උයනේ වැදිරියන් අල්වාගෙණ අනපයද කරද පලස්හුයෙන් කළ බොහෝ පලඳනා පලඳවා උයනේම අළුවාහුය. දලහර පලඳනාව ගත් වැදිරිතොමෝ තමා ඇරගත් පලඳනාව රකිමින් උයනෙහි උන්නිය. බොධිසත්ත්වයෝ මනුෂ්‍යයන්ට මෙසේ විධාන කළාහ, "තොපි හැම ගොසින් උයන වැදිරියන් හැමදෙනාම පරීක්ෂාකරව. යම් වැදිරියක අත මුත් හර දුටු නම් ඇ භයගන්වා පලඳනාව හැරගණුව"යි කියා.

එකල්හි වැදිරියෝ "අප විසින් පලඳනා ලබන ලදැ"යි තුටුපහටු සිත් ඇතියාවූ උයනෙහි ඇවිදිනාහුය. කිසිකෙනෙක් පලස්හු පලඳනා ලදින් පලඳනා නොලත් වැදිරියන් ලඟට ගොසින් "අපගේ අත කර පලඳනා බලව, තොපි නොලද්දේ වවුදැ"යි කියා කීහ.

එකල්හි පලස් පලඳනාව නොලත් වැදිරිතොමෝ එක් සෙර වැදිරියක් කියන්නාවූ බස් සහනයකොටගතනොනී ගුණමකුව සෙසු වැදිරියන්ට මෙලෙස කිව, "තෙල සේවූ පලස්හු පලඳනාවෙන් මට ප්‍රයෝජන කිම්ද?"යි තමා සඟවා ගෙණ උන් මනාසාර නම් පලඳනාව තමාගේ කරේලාගෙණ නික්මුනාය, එසේ ඇ මුත්හර කරලා ගෙණ නික්මුණු කල්හි පණ්ඩිතයන්ගේ චරපුරුෂයෝද දැක වැදිරිය භයගන්වා පලඳනාව එලවාගෙණ අවුත් බොධිසත්ත්වයන්ට දුන්හ.

එකල්හි බොධිසත්ත්වයෝද මුත්හර ගෙන්වාගෙණ ගොස් රජ්ජුරු වන්ට පැහ. "මහරජ්ජුරුවෙනි, මේ නුඹවහන්සේගේ මුත්හරය නුඹවහන්සේ සිරගෙයි ලැවූ පස්දෙනම සොරකම් නොකළාහුය, මගුල්උයනේ වැදිරියක් විසින් මේ මුත්හරය ගෙණයනලදැ"යි කී කල්හි "පණ්ඩිතයෙනි, ඒ මුත්හරය වැදිරි ඇරගත්තා කෙසේ දතු ද? ඇරගත් දෙය කෙසේ ගෙන්වාගතුදැ?"යි විවාළාහ ආදියෙහි පටන් සියළු ප්‍රවෘත්තිය මහරජ්ජුරුවන්ට බොධිසත්ත්වයෝ විස්තර වශයෙන් කිවාහුය.

රජ්ජුරුවෝ සතුටු සිත් ඇතියානු මෙසේ සිතුවාහුය, "සටනක් පැමිණි අවස්ථාවෙහි සටන ජයගන්ට නිසි සූර වීර යෝධයෝ වියයුත්තාහුය, කාරිය චින්තාවක් පැමිණි කල්හි එබඳු කාරිය - මෙම කවයුතු කළ හැකිවැයි නියමකරන්ට නිසි අමාත්‍යයෝද සෙවියයුතු වන්නාහ, මධුරවූ අන්නපානාදියක් ලත්කල්හි ප්‍රියවූ බන්ධුමිත්‍රාදීහු සිහිකටයුතුවන්නේය, අතීගාම්භීර ධර්මගාම්භීර යෙන් යුක්තවූ ප්‍රතිභාගයක් දුටුකල්හි නුවණැති පණ්ඩිතවරහු සෙවියයුත්තා හුය"යි මෙසේ රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ට ස්තුතිකොට ඝනවර්ෂාවක් වස් වන්නාවූ මහාමෙඝයක් පරිද්දෙන් සත්රුවන් පූජාකොට ඒ බොධිසත්ත්ව යන්ගේ අවවාදයෙහි සිට දිවිපමණින් දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

මහබෝසතාණන්ද දිවි පමණින් දුනාදී පින්කම් කොට තමන්ගේ කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා අනඳමහතෙරුන්වහන්සේගේ ගුණ වර්ණනාකොට වදාරා ජාතකය පූර්ණපරසන්ධිගළපා නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් දැන් මේ භාණ්ඩාගාරික අනඳ මහතෙරහුය, ප්‍රඥාසම්පන්නවූ අමාත්‍යයෝ නම් දෙවාතිදෙවවූ සම්බුදුපදප්‍රාප්තවූ දැන් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ වදාළසේක.

## 92
## විශ්වාසභොජන ජාතකය.

තිවද එක්සමයෙක්හි අවිඅසාධාරණ ප්‍රඥයෙන් යුක්තවූ තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර නිසා දෙවිරම්වෙහෙර වැඩවසන සේක් විශ්වාස භොජනයක් අරභයා මේ ජාතකය වදාළසේක.

**හේ කෙසේද? යනහොත්;**

එසමයෙහි වනාහි බොහෝ භික්ෂූන්වහන්සේ 'අපගේ දෙමව්පියන් ගෙන් එවාලූ භොජනය යි කියාද අපගේ නගුන් බුහුතන්ගෙන් එවාලූ භොජනය යි කියාද අපගේ මයිලනුවන්ගෙන් නැන්දනියන්ගෙන් එවාලූ භොජනය යි කියාද අපමණවූවත් මෙකියන බන්ධූහු අපට භොජනය දෙන්ට නිස්සහ. අපි ඔවුන්ගෙන් ලැබගෙණ වළඳන්ට නිස්සම්හ"යි නැයන් විසින් දෙනලද චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය දුන් කල්හි සක නැතිව නොපස්විකා වළඳන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ ඒ කාරණය දිවසින් දැක වදාරා නොපස්විකා වැළඳීමෙහි ආදීනව දක්වා භික්ෂූන්ට මා විසින් ධර්මදේශනා කෙළේම් නම් යහපතැ යි සිතා භික්ෂූන්වහන්සේ රැස්කරවා "මහණෙනි, භික්ෂූන් විසින් නැයන් විසින් දෙනලද චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය පස්විකා අනුභව කවයුත් තේය, එසේ නොපස්විකා සතරපසය අනුභවකොට කළුරියකරන්නාවූ භික්ෂූහු යක්ෂාත්මභාවයෙන් ප්‍රේතාත්මභාවයෙන් නොමිදෙන්නාහුය. මහණෙනි, මෙසේ නොපස්විකා වළඳනලද චීවරාදී චතුර්විධ ප්‍රත්‍යය තම් විෂ අනුභව කිරීමක් හා සදෘශවන්නේය, මහණෙනි මේ විෂ නම්වූ දෙය විශ්වාස ඇත්තවුන් දුන්දෙයත් විශ්වාස නැත්තවුන් දුන්දෙයත් අනුභව කළ කල්හි ප්‍රාණහානි කරන්නේමය, පුරාතනයෙහි විශ්වාසයෙන් විෂ අනුභවකළෝ ජීවිත විනාශයට පැමිණියාහ"යි වදාරා නිශ්චලව වැඩ උන්සේක.

එකල්හි භික්ෂූන්වහන්සේ විසින් ආරාධනාකරණලද සම්බුදුන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේදැ යි යනහොත්;**

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ

මහාවිභවී සිටුකුලයක උපන්නාහුය, මහබෝසතාණන්ගේ ගෙරි රකිනා එක් ගොපල්ලෙක් වෙල ගොයම් කොට වැට බැඳි සමයෙක්හි ගෙරින් හැරගෙණ ගොසින් වලව වැද එහි ගාලක් ගසා ගෙරි රකිමින් ඒ වල වසන්නේය, සිටා නන්ට කලින්කලට තෙල් දීකිරි ගෙණැවිත් දෙන්නාහුය.

එකල්හි ගෙරි සිටිනා ගාලට නුදුරු තැන්හි වසන්නාවූ සිංහයකුට භයින් ගෙරි දුම්ලවීමෙන් කිරි මදවූයේය.

එක්දවසක් ගොපල්ලා කිරි තෙල් හැරගෙණ සිටානන් දකින්ට ආකල්හි සිටානෝ ඔහු අතින් මෙසේ විචාළාහ. "කිමෙක්ද? ගොපල්ල, කිරි තෙල් ඉතා මදව ගියේවනැ"යි විචාළාහ.

එකල්හි ගොපළු තෙමේ කිරිතෙල් මදව ගිය කාරණාව සිටානන්ට කීහ. "සබඳ ගොපල්ල සිංහයා හා සමග සම්බන්ධ ඇතිව වසන අන් සත්ත්ව කොතෙක් ඇද්ද? නැද්ද?"යි විචාළාහ. සවාමීනි, සිටානන් වහන්ස, එක්තරා මිහිවින් තෙක් සිංහයා හා සංවාසය කොට වෙසෙයි"කීහ. "කොළු ඒ මිහිවින්නා තා විසින් අල්ලන්ට පුළුවන්ද"යි විචාළාහ. "සවාමීනි, මිහිවින්නා විවරක් අල්වා ගැන්ම පිළිවනැ"යි කියේය.

"එසේවීනම් තා ඒ මිහිවින්නා අල්වාගෙණ නලළ පවන්ගෙණ සියලු ශරීරය ලොමිහි විෂ ගල්වා නැවත කිපවාරයක විෂ ඇඟ ගා වියලා දෙතුන් දව සක් ඉකුත්කොට ඒ මිහිවින්නා ඇල්ලු තෙනටම හැරපියව"යි විධාන කෙළේය.

එකල්හි සිංහයාද මිහිවින්නා කෙරෙහි සෙනෙහසින් සියළු ශරීරය දිවෙන් ලෙව ජීවිත විනාශයට පැමිණෙන්නේය. එසේ සිංහයා මළ කල්හි ඔහුගේ සමද නියපඳුරද දළද සිංහතෙල්ද හැරගෙණ අප ලඟට එව'යි කියා විධාන කොට ගොපල්ලා යැවූහ. එසේ යන්නාවූ ගොපළු ඊට නිසි විෂයකුත් සිටානන්ට කියා හැරගෙණ ගොසින් මිහිවින්නා වසන තෙන ගොපළු දැලක් බැඳ උපායෙන් ඒ මිහිවින්නා අල්වාගෙණ සිටානන් කී පරිද්දෙන් විෂය මිහි වින්නා ඇඟ ගල්වා හැරියේය, සිංහතෙම මිහිවින්නා දැක බලවත්වූ සෙනෙ හසින් ඇගේ සියළු ශරීරය දිවින් ලෙව තෙමේ ජීවිත විනාශයට පැමිණියේය. ගොපළුද නියසම් වසා තෙල් ආදිය හැරගෙණ මහබෝසතාණන් සමීපයට ගියේය.

බොධිසත්ත්වයෝ ඒ කාරණය දැන "මෙරමා කෙරෙහි ස්නෙහ කිරීම නොකටයුතු වන්නේය, මෙසේ බලපරාක්‍රමයෙන් යුක්ත ශක්ති සම්පන්නවූ සිංහරාජයා පවා ක්ලෙශසංඝයී මිහිවින්නා ඇඟ ලෙවීමෙන් විෂය අනුභවකොට ජීවිතක්ෂයට පැමිණියේය"යි කියා එතනට සම්ප්‍රාප්තවූ පඤ්චව බණ දෙසන්නාවූ බොධිසත්ත්වයෝ "විශ්වාස අත්තාවුන් කෙරෙහිද නැත්තාවුන් කෙරෙහිද විශ්වා සය තම් නොකටයුතු වන්නේය, කුමක් මෙන්ද?යත් ඒ ස්නෙහකිරීම හේතු කොටගෙණ භය කාරණා උපදවන්නේය, මිහිවින්නාගේ මිත්‍රසංවාසයෙන් සිංහ තෙම ජීවිත විනාශයට යම්සේ පැමිණියේක්ද? එ ස් හෙයින් කිසිකෙනෙකුන් කෙරෙහි විශ්වාස කොකටයුතුය"යි මෙසේ මහබෝසතාණෝ සම්ප්‍රාප්තවූ පඤ්චව ධම්දෙශනා කොට දිවි පමණින් දුනාදී පිංකම් කොට තමන්ගේ කුසල්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

ශාස්තෘවූ සම්මාසම්බුදුරජාතන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව නිමවා වදාළසේක.

"එකල්හි මහසිවිරාජෝ නම් දැන් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 93
## ලොමහංස ජාතකය

**තා**වද එක් සමයෙක්හි ත්‍රෛලෝක්‍ය නායකවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ විසාලාමහනුවර නිසා පාටිකාරාම නම් වූ වෙහෙරෙහි වැඩවසතසේක් සුනකඛත්ත නම්වූ නිගණ්ඨ පරිබ්‍රාජකයක්හු අරභයා මේ ජාතකය වදාළසේක.

**හේ කෙසේද? යත්;**

එක්සමයෙක්හි සුනකඛත්ත නම් නිගණ්ඨ පරිබ්‍රාජක තෙමේ සම්බුදුයන් වහන්සේව උපස්ථායකයව බුදුන්ගේ පා සිවුරු ගෙණ බුදුන් හා සමග ඇවිදින්නේය කොරක්ෂත්‍රිය නම් නිගණ්ඨයාගේ බණ අසනු කැමතිවූයේ දශබලධාරීවූ සම්බුදුන්වහන්සේගේපාසිවුරු ඔබට පාවාදී කොරක්ෂත්‍රිය නම් නිවටා නිසා වාසය කරන්නේ ඔහු මිය කාලකංජ නම් වූ අසුරයෝනියෙහි උපන් කල්හි තමාගේ තපස් ඇර ගිහිභාවයට ගොසින් මෙසේ කියා ඇවිදින්නේය. ශ්‍රමණභවත් ගෞතමයන් කෙරෙහි ධ්‍යානවිමොක්ෂාදිවූ උත්තරි මනුෂ්‍යධර්මයෙක් නම් නැත. ක්ලේශ ප්‍රහාණය කරන්නාවූ ඥානදර්ශන විශෙෂයකුත් නැත, විරක්තයෙන් මඛනාලදුව ශ්‍රමණ භවත් ගෞතමයෝ ධර්මය කියන්නාහ. විසිම අනුව ධර්මදේශනාව කරන්නාහුය, ආචාරිකෙනෙකුත් නැතිව සුබුද්ධියෙන්ම සිතාගෙණ කියන්නාහුය, යමෙක්හට ධර්මදේශනා කෙරෙත් නම් ඒ ධර්මයවූ පරදේදෙන් පිළිපදිනාවූ සත්ත්වයන්ට නරකාදී සතර අපාය දුකඛයෙන් ගැලවීම පිණිස නොවන්නේය"යි විශාලාමහනුවර තුන්පවුර ඇතුළෙහි සම්බුදුයන් වහන්සේගේ ගුණ බොහෝ දෙනාට කියා ඇවිදින්නේය.

එකල්හි ආයුෂ්මත්වූ සැරියුත්මහතෙරුන් වහන්සේ පිඬුසිඟා වඩනා සේක් බුදුන්ගේ අගුණකියන්නාවූ සුනකඛත්ත නම් නිගණ්ඨ පරිබ්‍රාජකයන්ගේ බස් අසා පසු බත ආහාරකෘත්‍යයෙන් වැළකීසේක. ඒ කාරණය භාග්‍යවත්වූ බුදුරජාතන් වහන්සේට දැන්වූසේක. සැරියුත්මහතෙරුන් වහන්සේද වදාළ බස් අසා බුදුහු වදාරණසේක් 'එම්බල ශාරිපුත්‍රස්ථවිරය, සුනකඛත්ත නම්වූ ඒ තුච්ඡපුරුෂ තෙමේ ක්‍රොධ බහුලවූ සවරූප ඇත්තේය, මගේ ධර්මය තෛර්‍යථිනික නොවන්නේය යි තමන්ගේ ක්‍රොධ බහුල භාවයෙන්ම කියන්නේය, ඒ සුනකඛත්ත තෙමේ නොදැන එලෙස කියන නමුත් මාගේ ගුණ කීවාම වන්නේය, තවද ඒ තුච්ඡවූ පුරුෂතෙමේ මාගේ ගුණ නොදන්නෝ නොවෙති, එම්බල ශාරිපුත්‍රස්ථවිරය, ඡව්අභිඥවෝද මා කෙරෙහි ලා පිහිටියාහ. එසේහෙයින් මේ මාගේ උත්තරිමනුෂ්‍ය ධර්ම වන්නේය, තවද ශාරිපුත්‍රස්ථවිරය, දසබල චතුවෛශාරද්‍යාදී විශාරද ඥානයද මා කෙරෙහි ඇත, එසේහෙයින් මේද මාගේ උත්තරිමනුෂ්‍ය ධර්ම නම් වන්නේය, අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික

යන පරිච්ඡේද ඥානයද මා කෙරෙහි ඇත. දිව්‍යගති මනුෂ්‍යගති ප්‍රේතගති අසුර ගති තිරිසන් ගති සඞ්ඛ්‍යාතවූ පඤ්චගතියම පිරිසිඳ දන්නා ඥානද මා කෙරෙහි ඇත, එසේහෙයින් මේද මාගේ උත්තරීමනුෂ්‍ය ධර්මය නම් වන්නේය.

මෙසේ යථොක්තවූ උත්තරීමනුෂ්‍ය ධර්ම ගුණයෙන් යුක්තවූ මම යම් පුද්ගලයෙක් දැනැදීවූ උතුරු මිනිස්දම් මා කෙරෙහි කැතැ යි කියන්නේ වීනම් එසේ තමා ගත්තාවූ දුර්ලබ්ධිය හේතුකොටගෙණ අතඅල්වාගෙණතරකයෙහිඇරසිටුවාක්මෙන් වන්නේය. එසේ තමන්වහන්සේ කෙරෙහි විද්‍යමානවූ උත්තරී මනුෂ්‍ය ධර්මයෙහි ගුණ වදුරා එම්බල ශාරීපුත්‍රස්ථවිරය ඒ සුතඤ්ඤත්ත නම් පරිබ්‍රාජක තෙමේ කොරක්ෂත්‍රිය නම් නිවටාගේ ධර්මය අසා ඔහුගේ දුෂ්කර ක්‍රියා ප්‍රසන්නව ඔහුගේ කොහොන් තපස්හි විශ්වාසීවූයේ මාගේ ගුණ ගන්ට ඒ තෙමේ අයොග්‍යය"යි වදුරා "එම්බල ශාරීපුත්‍රස්ථවිරය මම මේ භද්‍රකල්පයට ඒකානූවන කපින් මත්තෙහි සසරෙහි සැරිසරන්නෙම් මේ අවලවූ ව්‍රතයෙහි හරයෙක් ඇද්දෝහෝ යි බාහිරයන්ගේ මිථ්‍යාතපස් විමසන්නෙම් චතුරඞ්ගයෙන් යුක්තවූ ඛඞ්සරවස් රකින්නෙම් අවලව්‍රත සමාදානය කෙරෙමින් වාසය කරන්නෙම් අවව්‍රලතයට සුදුසුවූ සීලසංරක්ෂණය කරන්නෙම් වේදැ යි සියළු තපස්වීවරයන්ට අග්‍රවූ පරම තපස්වීව වාසයකෙරෙමි රූක්ෂප්‍රතිපත්තිය පුරන්නෙම්ද අතිශයින් විශිෂ්ඨවූ රූක්ෂප්‍රතිපත්තිපුරන්නෙම්වීමි' පාපයෙහිලජ්ජාඇතිව වසන්නේමුත් උත්කෘෂ්ට ජනවිවික්ත වාසයෙන් වසන්නේ නැම්වීමි"සි වදුරා නිශ්ශබ්දව වැඩ උන්සේක.

එකල්හි අනදමඛතෙරුන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

**හේ කෙසේද? යනහොත්,**

පිටගිය දවස මේ භද්‍රකල්පයට ඒකානූවන කපින් මත්තෙහි එක්තරා කපෙක්හි පුරණලද පාරමිතා ධර්මයන් ඇති මහබෝසතානෝ බුදුසස්තෙන් පිටත් බාහ්‍ය ශාසනයෙහි තපස්රක්ෂාකෙරෙමියි ආජීවක ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ගෙණ අවෙලක පරිබ්‍රාජකව ගෙණ තපස් රක්ෂාකරන්නාහුය, සියලහින් රජස් දූලි උසුලන්නාහ, හුදකලාව වාසයකරන්නාහ, මිනිසුන් දැක භයපත්ව මුවන් පරිද්දෙන් වනයට වදිනාහ, මහාවිකෘතභොජනයෙන් සන්තුෂ්ට වන්නාහ, වසුන්ලාපු ආදිය අනුභව කරන්නාහ, නොපමාව තපස් රක්ෂාකරණ පිණිස මහ වනයෙහි හුදකලාව වාසය කරන්නාහ, බොල්පිණිබාත සමයෙහි බොල්පිණිද අධිකවූ සුලඟම පවත්නා සමයෙහිද මෙබඳු අන්තරාෂ්ට කඅකාලවනප්‍රදේශයෙන් නික්ම අබවස්හි වාසය කොට ඉරු නැගිකල්හි මහවනයට වදිනාහුය, ඒ බොධිසත්ත්වයෝ යම්සේ රාත්‍රියෙහි අබවස ඉද බොල්පින්නෙහි තෙමුනාහුවෙද්ද? දිවා භාගයෙහිත් වලට වැද වනලැහැබින් වැහෙන පිණිබින්දුයෙන් තෙමෙන ලද ශරීර ඇතිව දහවල් ශරීර පීඩාවෙන් දුක්විදිනාවූ ග්‍රීෂ්ම සෘතුවෙහිද දවල් අබවස්හි වාසය කෙරෙමින් ලවන ප්‍රදේශයෙන් නික්ම අබවස්හි වාසය කොට ඉර නැගිකල මහවනයට වදිනාහුය. ඒ බොධිසත්ත්වයෝ යම්සේ රාත්‍රියෙහි අබවස ඉද බොල්පින්නෙහි තෙමුනාහුවේද? දිවාභාගයෙහිත් වලට වැද වන ලැහැබෙන් වැහෙන පිණිබින්දුයෙන් තෙමෙන ලද ශරීර ඇතිව රූ දුවල් සීත පීඩා

වෙන් දුක්විඳිනාහු ග්‍රීෂ්ම සෘතුවෙහි දවල අබවස වාසයකෙරෙමින් රාත්‍රියෙහි වතලැහැබටම වදිනානුයය, ඒ බොධිසත්ත්වයෝ යම්සේ දිවාභාගයෙහි අබවසෙහි අවිවෙහි වාසය කළාහු රාත්‍රියෙහි එපරිද්දෙන් පවන් නැති වතලැහැබ පිඬාවට පැමිණෙන්නාහුය.

එකල්හි බොධිසත්ත්වයන්ගේ ශරීරයෙන් ග්‍රීෂ්ම කාලයෙහි නිවාසස්ථාන යෙහිලා ඉදීම හේතුකොටගෙණ සියලු ශරීරයෙන් සෙදජලධාරාව වැහෙන්නේ ය'යි මෙබඳු දුෂ්ප්‍රතිපත්තීන් බඹලොව පිළිවෙතට සිතා පිළිවෙත් පුරන්නෝ බොහෝ කලක් මා විසින් මෙසේ අවෙලවුත සමාදානකොට වාසයකරණ ලද, එසේ වාසයකරන්නාවූ බොධිසත්ත්වයන්ට ආයුකෙළවර නරකයෙහි උපදින්ව සුදුසුගති නිමිත්ත දැක මෙතෙල්කල් මුළුල්ලෙහි මා කරණලද වුතසමාදානය ව්‍යර්ථව ගියේවනැ යි සිතා එකොණෙහිම තමන්ගත් මිත්‍යාදෘෂ්ටියෙහි පිහිටා ගෙණ චුතිප්‍රතිසන්ධි වශයෙන් තව්තිසාභවනයෙහි උපන්නානුය යි ශාස්තෘවූ බුදු රජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව මෙපරිද්දෙන් ගෙණහැර දක්වා වදාරා පූර්වපරසන්ධිගළපා වදාළසේක.

"එසමයෙහි අවෙලවුත සමාදානය කොට එහි දෙම දැක සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිහිටා සඛීයෙහි උපන්නෙම් දැන් සම්බුදපදප්‍රාප්තවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 94 මහාසුදස්සන ජාතකය

මේ මුළුලොවට පතළවූ අඟ ඇති තිලෝගුරු සම්මාසම්බුදුරජානන් වහන්සේ කුසිනාරානුවර මල්ල රාජේන්‍රයන්ගේ ශාලාවනෝද්‍යානයෙහි යුග්ම ශාලා භ්‍යන්තරයෙහි පරිනිර්වාණ මංචකයෙහි සැතපුනුසේක් අනදමහතෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ දෙව්රම්වෙතෙර වසනසේක් සාරියුත් මහතෙරුන් වහන්සේ ඉල්මස මැදිපොහොයෙහි නාලක නම් ගම තමන් වහන්සේ උපන් ගර්භයෙහිම පිරිනිවන් පෑ වදාළසේක. මුගලන් මහතෙරුන් වහන්සේද ඉල්මස කළුවර පොහොයෙහි පිරිනිවන් පෑසේක. බුදුහු කුසිනාරා නුවරට ගොස් "මම පිරිනිවන් පාම්"යි අනුක්‍රමයෙන් දනව්සැරිසරා වඩනාසේක. කුසිනාරානුවරට වැඩ මල්ලරජ්ජුරුවන්ගේ මගුල්උයන මැද යුග්මශාලාන්තර යෙහි උතුරුදිගට ඉසලා ඇතුළුයහතෙහි නැගිනොසිටිනා සෙය්‍යාවෙන් සැතපුණු සේක. ඉක්බිති ඒ සැතපුණු සමීඥයන් වහන්සේට අනදමහතෙරුන් වහන්සේ දන්වනසේක් "භාග්‍යවතුන් වහන්ස මේ නුවර පිරිනිවන් පෑ නොවදාළ මැනව, ජලාශ්‍රයක් නැති හෙයින් නිරුදකවූ රළුනුවර පිරිනිවන් නොපෑව මැනව, රජ ගහනුවර සැවැත්නුවර ආදීවූ එක්තරා මහානුවරක පිරිනිවන්පෑව මැනවැ"යි ආරාධනා කළ සේක.

සමීඥයන් වහන්සේද අනදමහතෙරුන් වහන්සේව වදාරණසේක් "ආනන්ද සථවිරයිනි, එසේ නොකියව කුඩා නුවරෙහි කියාද අතු නුවරය යි

කියාද මේ කුසිනාරානුවරට කියන්ට සුදුසු නොවන්නේය, ආනන්දස්ථවිරයන් වහන්සේ දවස මහාසුදර්ශන නම් සක්විතිරජව උපන් සමයෙහි මෙම නුවර මම වාසයකළෙමි, එම්බා ආනන්දස්ථවිරයෙනි, පෙර මෙම නුවර දොළොස් යොදුන් රුවන් පවුරෙන් පිළිකොවිකරණලදවීය''යි වදාරා නිශ්ශබ්දවූසේක.

එකල්හි අනඳමහතෙරුන්වහන්සේ විසින් ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාරණසේක් මහාසුදර්ශන සූත්‍රදෙශනාව ගෙණහැර දක්වා වදාළසේක.

හේ කෙසේද? යනහොත්,

එහි විස්තර මහාසුදර්ශන සූත්‍රයෙන් දතයුතු වන්නේය. එකල්හි මහා සුදර්ශන නම් සක්විතිරජව තමන් වසන ධර්ම නම් ප්‍රාසාදයෙන් පැන බැස ප්‍රාසාදයට නුදුරුව සත්රුවන්මයවූ තල්වනයෙහි පණවනලද කැප අස්නෙක්හි ඉඳ දකුණුලයෙන් නැගී නොසිටිනා සෙය්‍යාවෙන් මරණමඤ්චකයෙහි වැද හොත්තාවූ සක්විති රජ්ජුරුවන්ට අගමෙහෙසුන්වූ සුභද්‍රා නම් බිසව කියන්නී ''දේවයිනි සුවාසූ දහසක් නුවරින් පිරිවරණලදුව මේ කුසාවති නම් රාජධානියෙහි අැළුම්කොට වදාළමැනවැ''යි ඒ සුභද්‍රා නම් බිසවුන් කිකල්හි මහා සුදසුන් සක්විතිරජතෙමේ බිසවුන්ට මෙසේ කීය. ''දේවීනි, එසේ නො කියව තවද මේ සියලු රජ ඉසුරෙහි අපෙක්ෂාවක් නොකළමැනව, ඇල්මක් නොකළ මැනවැ''යි ''මෙසේ අනුශාසනා කරව''යි කියා කීහ. ''දේවයිනි, කවර කාරණා වක් නිසාද? එසේ වදාළේය''යි කී කල්හි මහරජ්ජුරුවෝ කියන්නාහු ''එම්බා සුභද්‍රා නම් දේවීනි, අද දවස්ම කාලක්‍රියා කෙරෙමි, එසේනෙයින් කිසිවෙක අපෙක්ෂාවක් කරන්ට නොකිය''යි කීහ. එබස් අසා බිසව්ද සුවාසූදහසක් පමණ ස්ත්‍රීහුද හඬාවැලපිහ, එබස් ඇසූ අමාත්‍යයෝද සියළුනුවර වැස්සෝද රජ්ජු රුවන් කී බස් අසා සහනයකොට ගතනොහී අඬාවැලපිහ සුදසුන් නම් මහ රජ්ජුරුවෝද බොහෝදෙනාගේ අරගල අසා ''කිසිකෙණෙකුන් හඬා අරගල නොකරව''යි සියල්ලවුන් නවතා සුභද්‍රා නම් බිසවුන් කැඳවා ''එම්බා දේවීනි, නොහඬව, නොහඬව, තල බීජ මාත්‍රාවකුත් සියළු සංස්කාර ධර්මයන්ගේ එකාකාර පැවැත්මක් නැතිහෙයින් නිත්‍යදෙයක් නැතැ''යි කියා ''අනිච්චා වත සංඛාරා'' යනාදී ගාථාවෙන් බිසවුන්ට බණ කියා ඒ මහාසුදසුන් රජ්ජු රුවන් අමෘතමහා නිර්වාණය දැක්වීමෙන් දෙශනාව කුළුගන්වා සෙසු බොහෝ ජනයාවද ''දන්දෙවයි, සිල්රක්ෂාකරවයි, පෙහෙවස් රක්ෂාකරව''යි අවවාද කොට චුතිප්‍රතිසන්ධි වශයෙන් දිව්‍යලොකයෙහි උපන්නාහ.

ශාස්තෘවූ සම්මාසම්බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව ගෙණ හැර දක්වා වදාරා ජාතකය පූර්ණපරසන්ධි ගළපා වදාළසේක.

''එසමයෙහි සුවාසූදහසක් සත්‍රීන්ට නායකවූ සුභද්‍රාදෙවීහු නම් දැන් මෙකල්හි රාහුලමාතාවෝය. එකල්හි පරිනායක රත්නය නම් මෙකල්හි රාහුල සථවිරයෝය, සෙසු පිරිස් නම් මෙකල්හි බුදුපිරිස් වන්නාහ,

එසමයෙහි මහාසුදසුන් සක්විතිරජ නම් බුදුවූ මම්ම වේදැ''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 95 තෙලපත්ත ජාතකය

මේ වදන එක්සමයෙක්හි කරුණාවට වාසස්ථානවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ සුම්භ නම් රට දෙසක නම් නියම්ගමක් නිසා එක්තරා වන ප්‍රදේශයෙක්හි වාසයකරණසේක් මේ ජාතකය ජනපදකල්‍යාණී සූත්‍ර දෙශනා අරභයා වදාළසේක.

**හේ කෙසේද? යතහොත්,**

එක්සමයෙක්හි භික්ෂූන්වහන්සේ කම්මට්ඨාන දෙවා වදාරා උපමාවක් දක්වා භික්ෂූන්වහන්සේට "අප්‍රමාදව මහණදම් පුරව"යි අවවාදකරණ බුදුහු මෙසේ වදාරණසේක.

"මහණෙනි, ජනපදකල්‍යාණී නම් උතුම්වූ රූ දරන්නාවූ නමා උන් දනවිවට කල්‍යාණවූ එක් ස්ත්‍රියෙක, කෙසකල්‍යාණය, මංසකල්‍යාණය, අස්ථි කල්‍යාණය, ත්වක්කල්‍යාණය, වයඃකල්‍යාණය යන පඤ්චකල්‍යාණයෙන් යුක්තය. තවද ඒ නාටකඝන්ත්‍රියොමෝ උතුම්වූ රූපයෙන්ද උතුම්වූ කෘත්‍යයෙන්ද උතුම්වූ ගීතයෙන්ද උතුම්වූ වැයීමෙන්ද බොහෝ ජනයාට සිත්කළුවන්නීය. එබඳුවූ නාටකඝන්ත්‍රිය ඒ නෘත්‍යමණ්ඩලයට බැස නෘත්‍ය ගීත වාද්‍යාදිය පවත්වන්ට පටන්ගත් කල්හි බොහෝ ගම් නියම්ගම් රාජධානියෙහි මනුෂ්‍යයෝ "ඇගේ රූපය දකුම්හ, මධුරශබ්දය අසම්හ, නෘත්‍ය ගීත වාද්‍යාදිය දකුම්හ"යි බොහෝදෙනා රැස්වන්නාහු වේද්ද? මහණෙනි යම්සේ රජ්ජුරුකෙණෙක් සිරගෙයි උන් පුරුෂයකු ගෙන්වාගෙණ මෝචිටි ගසා පිරුණ තෙල්පාත්‍රයක් ඔහු අතවදී එම්බල පුරුෂය තාගේ ජීවිතයෙහිලා අපෙක්ෂා ඇත්නම් වී නම් මේ තෙල් පිරුණාවූ තෙල්පාත්‍රය දැනින් ඔසවාගෙණ තෙල්බින්දුවක් විවරත් බිම නොවගුරුවා ඇලි නොගස්වා බිම නොහෙලා ජනපදකල්‍යාණී නම්වූ තෙල නාටකඝන්ත්‍රිය නටන්නාවූ රඟමණ්ඩල මධ්‍යයෙන් නෘත්‍ය ගීතාදීන් නොබලා නොඅසා බොහෝ ජනයාගේ ඇඟත් නොපැහැර පලාගියේ වී නම් තාගේ ජීවිතය ලබන්නේය යි නියෝග කොට රජ්ජුරුවන් තැවත අනික් පුරුෂයකු ගෙන්වා තියුණු මුවහත් ඇති කඩුවක් ඔහු අතවදී තෙල්පාත්‍රය ගෙණයන පුරුෂයා තෙමේ තෙලෙන් බින්දුවක් වගුරුවා හෝ නම් වේව යි නියෝග කෙළේ වී නම් නියෝග ඇසූ පුරුෂතෙමේ තෙල්පාත්‍රය ගෙණයන පුරුෂයා පෙරටුකොට ඔහු භයගන්වමින් තැතිගන්වමින් පසුපස්සෙහිලා යනුවේද? තෙල්පාත්‍රය ගෙණයන්නාවූ පුරුෂයාද තමාගේ ජීවිත ආසාවෙන් පිරූ තෙල් පාත්‍රයෙන් තෙල් පොදකුත් බිම වගුරුවා ඇලිත් නොගස්වා බිම නොහෙලා ජනපදකල්‍යාණී නම්වූ නාටකස්ත්‍රිය නටන්නාවූ බොහෝදෙනා රැස්ව රඟ මඩුල්ල මධ්‍යයෙන් ගැලවී පලාගියේ නම් ඒ බැරිදෙයක් නොවෙයි; කුමක් නිසාදැ?යි යතහොත් කඩුගත් අත්ඇති පුරුෂයකු ඔහු පසුපස්සෙහි භය ගන්වමින් ගියසෙයිනි, එම්බා මහණෙනි, මාගේ ශාසනයෙහි කමටහන් ඇර ගෙණ මහණදම් පූරන්නාවූ යොගාවචරයා විසින් ජීවිත ආසාවෙන් තෙල් පාත්‍රය නොවගුරුවා ගෙණයන පුරුෂයා පරිද්දෙන් රූප ශබ්ද ගන්ධ රස ප්‍රෂ්ටව්‍යයෙහි අලග්නව මහණදම් පිරියයුතුය"යි "මෙසේ ජනපදකල්‍යාණී නම්

එබදු නාටකස්ත්‍රිය නටන රඟමඩුල්ල මඩ්‍යයෙන් යම් පුරුෂයෙක් පිරුණ තෙල්පාත්‍රයක් නො හෙලා නො වගුරුවා ඉදින් ගෙණගියේ වීනම් සවාමිනි ඉතා ආශ්චය්‍යීවන්නේය''යි වදාළසේක.

එසේ වදාළ භික්‍ෂූන්වහන්සේට සම්‍බුදයන්වහන්සේ වදාරණසේක් ''එම්බා මහණෙනි, ඒ ආශ්චය්‍යී නොවෙයි, පුරාතනයෙහි නුවණැත්තෝ තමන්ගේ අප්‍රමාද සිහිය හේතුකොටගෙණ අමනුෂ්‍යයන් විසින් නිර්මිතකරණ ලද දිව්‍යරූපයෙහිද ඉදුරන් බිඳ ඇස් දල්වා බැලීම මාත්‍රාවකුත් නොකොට අමනුෂ්‍ය පරිගෘහීතවූ ස්ථානයෙන් ගෘලව්ගෙණ ගොසින් රාජශ්‍රීයට පැමිණියා හුය. එම්බා මහණෙනි, ඒ ආශ්චය්‍යීය''යි ජාතකදෙශනාවට මුඛමාත්‍රයක් දක්වා නිශ්ශබ්දව වැඩහුන්සේක. එකල්හි ඒ භික්‍ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ සම්‍බුදයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුත් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතාණෝ ඒ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුත්‍රයන් සියක්දෙනා අතුරෙන් හැමටම බාලව ඉපිද අනුක්‍රමයෙන් විඥඛවට පැමිණියේය.

එකල්හි රජ්ජුරුවන්ගේ රජගෙයි පසේබුදුවරයන් වහන්සේ නිබඳ වළඳනසේක. බොධිසත්ත්වයෝ පසේබුදුවරයන්වහන්සේට වතාවත් කරන්නාහ.

එක්දවසක් බොධිසත්ත්වයෝ මාගේ මල්බෑයෝ බොහෝය, මේ නුවර කුලඝන්නකවූ රාජ්‍යය ලබම්දෝහෝ යි සිතූහ.

ඉක්බිත්තෙන් ඔහුට පසේබුදුවරයන් වහන්සේ අතින් විවාරා නියම දනිම්ය, මෙසේ සිතිවිල්ලෙක්වීය; ඒ මහබෝසතාණෝ දෙවෙනි දවස් පසේ බුදුවරයන් වහන්සේ වැඩසැල්හි ඛරාව හැරගෙණ පැන් පෙරාගෙණවුත් පය සෝදා තෙල් ගල්වා ඉක්බිත්තෙන් පසේබුදුරජාණන් වහන්සේ අන්තර ඛජ්ජකය වළඳවා වැඩහුන් කල්හි වැඳ එකත්පස්ව උන්නාහුය. සවාමිනි, මාගේ බොහෝ මල්බෑයෝ ඇත්තාහ. කුලඝන්නකවූ රාජ්‍යයට මම පැමිණෙම් දෝහෝ''යි කියා විවාළාහුය, ඉක්බිත්තෙන් පසේබුදුරජාණන්වහන්සේ වදාරණ සේක් ''කුමාරයෙනි, තෙපි මෙනුවර ඉඳ රාජ්‍යය ලබන්නාහු නොවෙත්. මීට එක්සිය විසියොත්තකින් මත්තෙහි ගඞ්ගාරරට තක්සලානුවරෙක් ඇත්තේය; ඒ නුවරට යන්ට සමර්ථවූ තෙපි මෙයින් සත්වනදවස් රාජ්‍යය ලබහු, අතර මගවූ මහාමාවතක් ඇත, වනයෙහි උපද්‍රවයෙක් ඇත, ඒ වනය ඉකුත්කොට යන්නාහට යොදුන්සියයක් පමණ මාගීය වන්නේය, එල්ලයට යතොත් පණස්යොදුනෙක, ඒ මාගීය වනාහි අමනුෂ්‍ය කාන්තාරනම, එහි යක්ෂිණිහු අතරමග ගම්නියම්ගම් ශාලාවන් මත්තෙහි එල්වනලද රත්තරු රිදීතරුයෙන් විසිතුරු වියන් ඇති මහයහන් පණවා රත් නිල් ඇඟැයෙන් නොයෙක් පැහැ ඇති පව කඩනිර වටකොට ඇඳ දිව්‍යාභරණයෙන් ආත්මභාවය සරසා ශාලා වෙහි හිඳ යන එන්නාවූ පුරුෂයන් මිහිරිවූ වචනයෙන් පොළඹවාගෙණ මිහිරි ගී කියා සවරූප ඇත්තව මෙතන ඇවිත්හිඳ පැන් බීපියව යි කැඳවා සමීපයට පැමිණියාවූ පුරුෂන්ට අසුන් පණවාදී තමන්ගේ රූපශොභාවෙන් හා හාව

භාව ලීලා කටාක්ෂමන්දස්මිතයෙන් පොළඹා ක්ලෙශ වසඟකොට තණ්හා ව්‍යතික්‍රම කළකල්හි එතතමදීම ලේ වගුරුව වගුරුවා කා ජීවිතක්ෂයට පමුණුවන්නාහ.

රූපයෙහි ඇළුම් ඇති සත්ත්වයා රූපයේ සිත්ගන්නාහ, ශබ්දයෙහි ඇළුම් ඇති සත්ත්වයා මිහිරිවූ ශබ්දයෙන් සිත්ගන්නාහ. ගන්ධයෙහි ඇළුම් ඇති සත්ත්වයා දිව්‍යගන්ධයෙහි පොළඹවන්නාහ, රසවිෂයකොට ඇති සත්ත්වයා දිව්‍යමයවූ නොයෙක් අග්‍රාසභොජනයෙන් පොළඹන්නාහ; ස්පර්ශයෙහි ඇළුම් ඇති සත්ත්වයා ඉස්දෙර පාමුල ලනලද රත්කන්වයින් ඇති මනාවූ ඇතිරිලි අතුරණලද දිවයහනින් පොළඹන්නාහ, ඉන්ද්‍රියන් බිඳ ඒ යක්ෂිණීන් නොබලා සිහි එලවාගෙණ ගියේ වීනම් ඒ තක්සලානුවර රාජ්‍යය ලබනවාය''යි පසේ බුදුරජානන්වහන්සේ වදාළසේක.

බොධිසත්ත්වයෝ ''ස්වාමීනි, වන්නාටය, නුඹවහන්සේගේ අවවාද ගෙණයන්නාවූ මම යක්ෂිණීන් කුමක් නිසා ඉන්ද්‍රියයන් බිඳ බලම්දැ''යි කියා ප්‍රතිඥදී පසේබුදුවරයන්වහන්සේ ලවා පිරිත්කරවා පිරිත්වැලි හා පිරිත් හුය ගෙණ පසේබුදුවරයන්වහන්සේ හා දෙමව්පියන් වැඳ තමන්ගේ මාලිගාව ගොස් තමන්ගේ සේවකයන්ට කියන්නාහු මම තක්සලානුවර රාජ්‍යය ගත්ත යම්, තෙපි සිටුව''යි කීහ.

එසඳ පස්දෙනෙක් ''අපිත් නුඹවහන්සේ හා සමග එම්හ''යි කීහ.

බොධිසත්ත්වයෝ තොප විසින් එබඳුව යන්ට නොපිළිවන, අතරමග යක්ෂිණීහු රූපාදියෙහි ඇළුම් ඇතිව මනුෂ්‍යයින් එබඳු රූප ශබ්දාදියෙන් පොළඹාගණිති, මහත්වූ උපද්‍රව ඇත, මම්වූකලී මාගේ සමථවිදර්ශය සිතාලා යෙමි'' කිවුය, ''කිමෙක්ද දෙවයන්වහන්ස, අපි නුඹවහන්සේ හා සමග යන්නමෝ අපව ප්‍රියරූපයක් බලමෝද? අපි නුඹවහන්සේ මෙන් ධෛර්‍යවත්ව යම්හ''යි කිවුය. බොධිසත්ත්වයෝ ''එසේ වී නම් අප්‍රමාදව''යි කියා ඒ පස්දෙනා ගෙණ මාගීයට පිළිපත්හ.

ඒ යක්ෂිණීහු ග්‍රාමාදින් මවා හුන්හ. ඒ පුරුෂයන් පස්දෙනා අතුරෙන් රූපයෙහි ඇලුම් ඇති පුරුෂයා ඒ යක්ෂිණී බලා රූපාලම්බණ ප්‍රීතිබඳව මදක් පසුබැසෙන්ට වත. බොධිසත්ත්වයෝ ''කිමෙක්ද? පින්වත, මදක් පසුබැසුනේ ඇයිදැ?''යි කීහ. එසඳ ඒ පුරුෂයා කියන්නේ ''දෙවයන්වහන්ස මාගේ පා රිදෙයි මදක් ශාලාවේ හිඳ එමි''කියය.

බොධිසත්ත්වයෝ ''එම්බල පුරුෂය, මොහු යක්ෂිණීය, මොවුන් ප්‍රාර්ථනා නොකරව''යි කිවුය; ඒ පුරුෂයා ''වන්නාටය කුමක්වේවයි දුටුදෙයක් දකිම් දෙවයන්වහන්ස නො යෙමියි''කීය.

බොධිසත්ත්වයෝ ''එසේ වීනම් තාගේ නොකිකරුකමින් වනදෙය තෝම දක්නේවේදැ''යි කියා අන්පුරුෂයන් සතරදෙනා ගෙණ ගියාහ. ඒ රූපයෙහි ඇළුම් ඇති පුරුෂයාත් යක්ෂිණීන් සමීපයට ගියේය. ඔහු තමන් හා සමග ව්‍යතික්‍රමණය කළකල්හි ඒ පුරුෂයා එතතදීම ජීවිතක්ෂයට පමුණුවා ඉදිරි ඉදිරියෙහි ගොස් අනික් ශාලාවක් මවා ආතත විතතාදිවූ නොයෙක් තූර්‍යශබ්දයන් ගෙණ ගී කියා උන්හ. එතැන්හිදී ශබ්දයෙහි ඇළුම් ඇති

තෙලපතන ජාතකය

පුරුෂයා රඳා ගියේය, ඔහුත් අනුභවකොට ඉදිරියේ ගොස් අනෙකප්‍රකාර සුවඳ කරඬු පුරා සල්පිල් හදාගෙණ සිටියාහුය. එතැන්හි ගන්ධයෙහි ඇළුම් ඇති පුරුෂයා රැඳුනේය. ඔහුත් අනුභවකොට ඉදිරියේ ගොස් නොයෙක් අග්‍ර රස ඇති දිව්‍යභොජනය පුරාගෙණ බනින් අභාජනීය සඳහගෙණ උන්හ, එතැන්හි රසයෙහි ගිජුවූ පුරුෂයා රැඳුනේය. ඔහු අනුභවකොට ඉදිරියෙහි ගොස් අනෙකප්‍රකාර දිවයහන් පතවා උන්හ, එතැන්හි ස්ප්‍රෂ්ටව්‍යයෙහි ලොල්වූ පුරුෂයා රැඳුනේය, ඔහුත් අනුභව කළාහ. බොධිසත්ත්වයෝ උදකළාවූය.

ඉක්බිත්තෙන් ඒ යක්ෂිණී සිතන්නී "ඒකාන්තයෙන් මේ පුරුෂයා ඉතාම මෘදුය, මම මොහු කාමුත් නොරඳම්"යි බොධිසත්ත්වයන් පසුපස්සෙහි ගියාය, වනකම්නත්ත නිසා දඬුපත කපන්ට ගිය සත්ත්වයෝ යක්ෂිණිය දැක "නී ඉදිරියෙහි යන්නාවූ මේ පුරුෂයා නිට කවරෙක්වේදැ"යි විචාළාහ. සවාමි දරුවෙනි මා බාල අවස්ථාවෙහි පටන් වල්ලනවූ පුරුෂයාතෝය"යි කිව.

එසඳ පුරුෂයෝ "පින්වත මෙබඳුවූ සිව්මැලි මල්දමක් සේ රන්වන්වූ කුමාරිකාව තමාගේ දෙමව්පියන්ටත් පසුපස්සෙහි නික්මයෙහි කුමක් නිසා නොපි මෑ නොමිරිකා ඇරගෙණ නොයවිදැ"?යි කිහ.

එසඳ බොධිසත්ත්වයෝ "එම්බා පින්වත්නි, මෝතොමෝ මාගේ ස්ත්‍රියක් නොවෙයි, යක්ෂිණිය, මෝ මාගේ මනුෂ්‍යයන් පස්දෙනෙකු අනුභව කොටපුව"යි කිවුය. බොධිසත්ත්වයෝ මෙසේ කියතුදු යක්ෂිණී කියන්නී "පින්වත්නි, පුරුෂයෝ තම් කිපිකල තමන්ගේ ස්ත්‍රීන් යක්ෂිණීන් හා ප්‍රේතදූන් හා සදෘශ කෙරෙති" කියා යම්න්සිටම ගර්භිණී සවරූපයක් දක්වා නැවත එක්දරු කෙණෙකුන් ලත් රූපයක් දක්වා පුතකු ඇකයෙන් වඩාගෙණ බොධිසත්ත්ව යන් පසුපස්සෙහි නික්මුනා දුටු මනුෂ්‍යයෝ පළමු සේ විචාරති. බොධිසත්ත්ව යෝත් අෑ යකින්නී නියාව කිය කියා ගොස් තක්සලානුවරට පැමිණියාහ.

ඒ යක්ෂිණී පුතු අන්නඬාන කොට තනියම පසුපස්සෙහි ගියාහ. බොධි සත්ත්වයෝ මෙනුවර වාසල්දොරට පැමිණ එක් ශාලාවක උන්නාහ. යක්ෂිණී බොධිසත්ත්වයන්ගේ තේජසින් ඇතුළට වදින්ට අසමර්ථව දිව්‍යරූප මවාගෙණ ශාලාවාරයෙහි සිටියාහ.

එකෙණෙහි තක්සලා නුවරින් කොසොල් රජ්ජුරුවෝ උයනට වත තැනැත්තෝ අෑ දැක පිළිඛඳ සිත් ඇතිව "දරුව මෑ අසවාමික නියාව දැනගෙණ එව"යි කියා පුරුෂයකු යවූහ. ඒ පුරුෂයා අෑ කරා පැමිණ "සසවාමිකදැ?"යි විචාළේය; යකින්නී කියන්නී "එසේය පුරුෂයෙනෙනි මේ ශාලාවේ ඉන්නා පුරුෂයානෙනෝ තම් මට බාල අවස්ථාවෙහි පටන් බත් පිළිදී සවාමීව සිටි තැනත් තෝය'යි කීය. බොධිසත්ත්වයෝ එසඳ කියන්නාහු "මෝතොමෝ මාගේ ස්ත්‍රියක් නොවෙයි. මෑ යක්ෂිණිය මෑ විසින් මාගේ මනුෂ්‍යයෝ පස්දෙනෙක් අනුභව කොට පියනලදහ"යි කිවුය.

යක්ෂිණී කියන්නී "සවාමිපුරුෂයෝ තම් පින්වත, කිපී කල යම්ක් මුඛා වේස වීනම් එම කියති" කිව. මෙහෙවර ගිය පුරුෂයා දෙ දෙනාගේ බස් අසා රජ්ජුරුවන්ට ගොස් කීය. රජ්ජුරුවෝ "අසවාමික භාණ්ඩය තම් රජ්ජුරුවන් සන්තකය"යි කියා යක්ෂිණිය කැඳවා ගෙන්වාගෙණ ඇතුපිට තබා නුවර පැද කුණු කොට ප්‍රාසාදයට නැගී අෑ අගමෙසුන් තනතුරෙහි තිබ්බහ. ඒ රජ්ජු

රුවෝ ඉස්සෝදු නහා සුවඳවිලවුන් ගන්වා සවස මෙහෙ නිමවා ශ්‍රියහන්මසතක යට නැගී සැතපුනේය. ඒ යක්ෂිණී තමන්ට සුදුසු ආහාරයක් අනුභව කොට සවීහරණයෙන් සැරහී සුවඳවිලවුන් ගන්වා ශ්‍රියහන් මස්තකයෙහි රජ්ජුරුවන් හා සමග වැදහෙව රජ්ජුරුවන් රතිසුවයෙන් සැපවිඳ සැතපුනු කල්හි එක් ඇලයකට පෙරලී ඇඹුය.

එසඳ රජ්ජුරුවෝ ඇට "සොඳුර, තෝ කුමක් පිණිස අඬන්නෙහිදැ"යි විවාළහ. "දෙවයන් වහන්ස, මම නුඹවහන්සේ විසින් මගදී දැක ගෙණ එන ලද්දෙමි, නුඹවහන්සේ අන්තඃපුරයෙහි බොහෝ ස්ත්‍රීහු ඇත, මා වූකලී සම්පත් තීන් අතුරේ වසන්නෙමි බසක් උපන් විට තිගේ මව්පිය ජාතිගොත්‍ර දන්නෝ කවිරුද? අතරමගදී දැක ගෙණෙනලද්දී නොවේදැ?"යි කියා ඉස බොල් කෙළ හෙව පිඬාකරන්නියක් මෙන් මතු කරබා ගණිමි, ඉදින් නුඹවහන්සේ සියළු රාජඵෙශ්වයශ්‍රියත් ආඥුවත් මට දුන්සේක් වී නම් මාගේ සිත අලලා බසක් කියන්ට කවර නම් සත්ත්වයෙක් සමර්ථවේදැ?"යි කිව.

එසඳ රජ්ජුරුවෝ කියන්නාහු "සොඳුර මට සියළු රාජ්‍යවාසීන් නොතැමෙති, මම උන්ට නායක නොවෙමි. යම්කෙණෙක් රාජාඥව මරුත්තු කොට නොකළමනා දෙයක් කෙරෙද්ද? ඔවුන්ටම නායකවෙමි, මේ කාරණයෙන් නොපව සියළු රාජ්‍යඵෙශ්වශ්‍රීයත් ආඥුවත් දෙන්ට නොපිළිවනැ"යි කිහ.

එබැවින් "දෙවයන්වහන්ස ඉදින් රට නුවර ආඥුව දෙන්ට නුපුළුවන්වී නම් මේ ඇතුළු මාලිගාවෙහිත් අන්තඃපුරයෙහිත් වසන්නාවූ සත්ත්වයන් කෙරෙහිත් මගේ ඉසුරු පවත්නා ලෙස ආඥුව දුනමැනව"යි කිව.

රජ්ජුරුවෝ දිවපහස් බැඳී ඇගේ බස මිරිකා ගතනොහී 'යහපත සොඳුර මේ අන්තඃපුරයෙහි වසන්නාවූ සත්ත්වයන් කෙරෙහි තිගේ ඉසුරු පවත්නා ලෙස ආඥුව දෙමි, තෝ ඔවුන් තිගේ වසඟයෙහි පවත්වාගැණැ'යි කිහ. යක්ෂිණිය 'යහපත සවාමිනි' යි පිළිගෙන රජ්ජුරුවන් නිදිපරමත්ව නිදන කල්හි යක්ෂපුරයට ගොස් යක්ෂිණියන් කැඳවාගණ අවුත් තොමෝ රජ්ජුරුවන් ජීවිතක්ෂයට පමුණුවා ඇට පමණක් ශෙෂ කොට සියළු සම් මස් නහර ලේ අනුභව කොට අවශෙෂ යක්ෂයෝ අන්තඃපුරය ඇතුලේ මහවාසල් දොර පටන් අංගනියේ කුකුළන් බල්ලන් ආදීකොට සියල්ලවුන් නොඉැර කා ඇට පමණක් ශෙෂ කළාහ.

දෙවෙනි දවස් දෙරපියුවනම් තිබෙනු දැක මනුෂ්‍යයෝ පොරවෙන් දෙර පලා ඇතුළට වැද සියළු මාලිගාව ඇවින් පිරු තිබුවා දැක ඒකාන්තයෙන් ශාලාවේ හොත් පුරුෂයා "මේ මාගේ ස්ත්‍රිය නොවෙයි, යක්ෂිණිය"යි කී බස් සැබෑමය යි රජ්ජුරුවෝ වූකලී තමන් කිසිවක් නොදන්නා හෙයින් තමන්ට බිසෝතනතුරෙහි තිබූහ. ඕතොමෝ යක්ෂයන් කැඳවාගෙණ අවුත් සියළු ජනයා කා ගියාය"යි කිහ.

බොධිසත්ත්වයෝත් එදවස් ශාලාවෙහින් පිරිත්වැලි ඉසලාගෙණ පිරිත්හූ වවකොට කඩුව අතින් ගෙණ සිටම අරුණු නැගුහ. මනුෂ්‍යයෝ සියළු රාජාඞ්ගනය හා මාලිගාවේ ඇට අද්දවා දම්මවා කසල හැර ශුඛකොට ගොමගාවා ඊ මතු පිට සිවුදෑගදින් පිරිබඬ කොටගෙණ සුවඳ මල් විසුරුවා සුවඳමීල් තැන තැන එල්වා සුවඳ දුන් දී පුන්කලස් තබා ධජ පතාකයෙන් හා කෙසෙල්හස් ආදී

යෙන් බැඳ දිව්‍යවිමානයක් මෙන් සරහා කථාකරන්නාහු "පින්වත්නි, යම් පුරුෂයෙක් දිව්‍යරූපය මවාගෙණ පසුපස්සෙහි යන්නාවූ යක්ෂිණි ඇදින ඉන්ද්‍රි යන් බිඳ බැලීම පමණකුත් නොකළේද? ඒ තෙම උදාරතර මනුෂ්‍යයෙක, ධෛර්‍යසම්පන්නය, මහනුවණැත්තේය, එබඳු පුරුෂයකු අනුශාසනාව කරණ කල්හි සියළු රාජ්‍යය සුඛිතවන්තේය. ඔහු රජ කරම්හ"යි කීහ.

ඉක්බිත්තෙන් සියළු අමාත්‍යයන් හා නුවර වාසින්ද ඒ කවිඡඳව බොධි සත්ත්වයන් කරා පැමිණ "දෙවයන් වහන්ස, නුඹවහන්සේ මේ රාජ්‍යයෙහි රාජ්‍යශ්‍රී අනුභවකොට වදාළ මැනවැ"යි කියා නුවරට කැඳවාගෙණ ගොස්රුවන් රැසක් මත්තෙහි සිටුවා අභිෂෙක කොට තක්සලා නුවර රජ කළාහුය.

ඒ රජ්ජුරුවෝ ඡන්දයෙන්ද, වෙෂයෙන්ද, මෝහයෙන්ද, භයින්ද නොකළ මනා කාරියක් නො කරණ හෙයින් සතරවැදෑරුම්වූ අගතිගමනය දුරුකොට දශරාජධර්මයන් අකොප්‍යව දැහැමෙන් රාජ්‍යය කෙරෙමින් දානාදීවූ පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ අතීතකථාව ගෙණහැර දක්වා වදාරා භික්ෂූන්වහන්සේව අවවාද වදාරණ සේක් මෙසේ වදාළසේකි, "මහණෙනි, ඇතුළුවූ මුවවිට රෙඛාව සමව පිරුණාවූ තෙල් පාත්‍රය එක තෙල්බින්දුවකුත් නො වගුරුවා යම්සේ පුරුෂයෙක් ගෙණ ගියේද? එපරිද්දෙන්ම තමාගේ සිත කායගතාසතියෙහි බහා යම්සේ ඇසිල්ල කුත් බහිඩාලම්බණයෙහි වික්ෂෙපයට නොපැමිණේ නම් එපරිද්දෙන්ම නුවණැත් තාවූ යොගාවචර තෙමේ සඛකියවූ චිත්තය රක්නේය. කුමක් පිණිසද? යත්; අනවරාග්‍ර සංසාරයෙහි කිසි බාල පෘථජග්න කෙනෙකුන් විසින් සඵල්‍යතයෙනුත් නොගියවිරූ නිර්‍වාණ නැමැති දයාව ප්‍රාර්‍ථනා කරන්නහු විසින් කර්‍මස්ථානයෙහි ඇමවේලෙනිම අභ්‍යාසකටයුතුද, එසේ හෙයින් යම් පුද්ගලයෙක් නිවන් දකිනා කැමැත්තේ වීනම් ඒ සත්ත්වයා විසින් තෙල්පාත්‍රය ගෙණයන්නාවූ සත්ත්වයා හැම වේලෙහිම සිහිඇතිව තෙල්බින්දුවකුත් නොවගුරවා ගෙණයන්නාක්මෙන් හැමවේලෙහිම කායගතාසති කර්‍මස්ථානයෙන් යුක්තව නානාලම්බණයෙහි සිත යානොදී චිත්තෛකාග්‍රතා කොට තමාගේ සිත රැක අමෘත මහානිර්‍වාණය සාක්ෂාත් කටයුත්තේය"යි මෙසේ ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ නිර්‍වාණධර්මයෙන්දෙශ නාව කුළඟන්වා මේ තෙලපතන ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි රජපිරිස නම් දැන් බුදුපිරිසය, එසමයෙහි රාජ්‍යයට පැමිණියාවූ කුමාරයෝ නම් තිලෝගුරු සම්මාසම්බුදු රජවූ මම්මවේදූ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 96 නාමසිද්ධි ජාතකය

මේවද එක්සමයෙක්හි අසමසමවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙවිරම් වෙහෙර වැඩ වසනසේක් නාමසිද්ධික භික්ෂූන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

එක් කුලපුත්‍රයෙක් නම්න් පාපක නම, ඒ තෙම ශාසනයෙහි ලැදිව මහණව භික්ෂූන්වහන්සේ විසින් ඇවැත්වූ පාපකයෙනි, මෙසේ එව මෙසේ සිටුව"යි කියන්නාහු එබස් අසා මෙසේ සිතුසේක. "ලෝකයෙහි පාපක නම් ලාමකය

කාලකන්නියක් හා සමානය අන්‍යවූ මංගල ප්‍රතිසංයුක්තවූ නමක් කියවා ගණිමි''යි ඒ මහණ ආචාර්‍යවූ උපාධ්‍යායන් වහන්සේ කරා ගොස්''සාමීනි, මාගේ නම අවමඞ්ගලය අනික් නමක් මට කළමැනවැ''යි කියේක.

ඉක්බිත්තෙන් භික්ෂූන් වහන්සේ කියනසේක් ''ඇවැත්නි, නාමය නම් ප්‍රඥප්ති මාත්‍රයක, නමින් කිසි අර්‍ථසිද්ධියක් නැත්නැත, තොපගේ නමින්ම සතුටුව''යි කියේක. ඒ මහණ නැවත නැවත ශාක්‍යකුලේලමය, තවද භික්ෂූන් වහන්සේ නාමසිද්ධික බව සඞ්ඝයා වහන්සේ කෙරෙහි ප්‍රසිද්ධවිය.

ඉක්බිත්තෙන් එක්දවසක් ධර්මසභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන් වහන්සේ ''ඇවැත්නි, අසවල් මහණ නම් සිද්ධකරන්නේය. අනිවාර්‍ය කරණ නාමයක් ඉල්වන්නේය''යි මෙසේවූ කථාවක් උපදවා හුන්සේක.

සර්‍වඥයන් වහන්සේ ධර්මසභාමණ්ඩපයට වැඩ ''මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව හුනුදැ''යි විචාරා මෙනම් කථාවකින් යුක්තව හුනුම්හ''යි කී කල්හි ''මහණෙනි, ඒ භික්ෂූහු නාමසිද්ධිකවූයේ දැන්මතු නොවෙයි, පෙරත් නාමසිද්ධිකමය''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

පෙරගිය දවස තක්සලා නුවර මහබෝසතානෝ දිසාපාමොක් ආචාර්‍ය පන්සියයක් මාණවකයන්ට මන්ත්‍ර හදාරන්නාහුය, ඒ බොධිසත්ත්වයන්ගෙන් එක් මාණවකයෙක් නමින් පාපක නම, ඒ තෙමේ සෙසු මාණවකයන් විසින් ඒ පාපකයාට 'මෙසේ සිටු පාපකය, මෙසේ යව පාපකය'යි කියන්නාවූ බස් අසා සිතන්නේ ''මාගේ නාමය අවමඞ්ගලය, අන්‍ය නාමයක් ඉල්වාගණිමි''යි සිතා ආචාර්‍යන් කරා ගොස් ''ආචාර්‍යන් වහන්ස, මාගේ නම අවමඞ්ගලය, එසේ හෙයින් මට අනික් නමක් තබව''යි කිවුය.

එකල්හි ආචාර්‍ය ඔහට කියන්නෝ ''දරුව, ජනපදචාරිකා කොට තොප සිතට අභිප්‍රායවූ එක් අභිවාර්‍ය නාමයක් ගෙණ එව. ඒ නාමය හැරගෙණ ආකල්හි ඒ නම් පෙරලා අනික් නමක් තොපට තබමි'යි කිවුය. එබස් ඇසූ මාණවකයා ''යහපත ආචාර්‍යන් වහන්ස''යි කියා මාගෝපකරණ ගෙණ නික්ම ගමින් ගමට ඇවිදිනේ එක්නුවරකට පැමිණියේය.

එනුවර ජීවක නම් එක් පුරුෂයෙක් බන්ධුවර්‍ගීයා විසින් දවන්ට ගෙණ යන්නා දැක ''මේ කිතම් පුරුෂයෙක්දැ?''යි විචාළේය. ''ජීවකතමැ''යි ''ජීවක යාත් මියේදැ''යි විචාළ කල්හි ජීවකයාත් අජීවකයාත් මියන්නේ වේද? නාමය වූකලී ප්‍රඥප්තිමාත්‍රයක, තා අඥාන එකෙකුය සිතම්හ''යි කිවුය.

එකල්හි ඒ පාපක නම් පුරුෂයා ඒ කථාව අසා නාමයෙහි මධ්‍යස්ථව ඇතුළුනුවරට වන්නේය, එකල්හි දාසියක් බැලමෙහෙ නොකරන්නා දැක සවාමිදරුවෝ බැඳ භිදුවා වැලක් ගෙණ ගසන්නාහුය. ඇගේ නම ධනපාලි නම් වන්නේය, ඒ පාපකයා නම් පුරුෂයා ඊර්‍ෂ්‍යාමධ්‍යයෙන් යන්නේ ඇට තලන්නා දැක ''කුමක් නිසා මැට තලවිදැ''යි විචාළේය. ''බැලමෙහෙ නොකරණ හෙයින් තලම්හ''යි කී කල්හි ''මැගේ නම කිම්දැ?''යි විචාළේය. ''ධනපාලි නමැයි''යි කී කල්හි ධනපාල නම් ඇත්තෝ බැලමෙහෙ පමණක් දීගත නොහෙද්දැ''යි විචාළේය. ධනපාලනුත් අධනපාලනුත් දුක්පත්වෙති, නාමය වූකලී ප්‍රඥප්ති මාත්‍රයක, එසේ හෙයින් ''තෝ අඥානව විචාරහි සිතම්''යි කිය.

එබස් ඇසූ පාපක නම් මානවකයා නාමයෙන් අතිශයින් මඩ්‍යසථව නුවරින් පිටත්ව මගට පිළිපන්නේ අතරමග මංමුලාවූ පුරුෂයෙකු දැක "දරුව කුමක්කොට ඇවිදිදැ?"යි විමසූයේය. "සවාමීනි, මංමුලාවීමි"යි කීකල්හි "තාගේ නම කුමක්ද?"යි විමසූයේය. "පන්ථක නම් ඇත්තෙමි"යි කී යේය, "පන්ථක යෝත් මංමුලාවෙද්දැ?"යි විමසූයේය, පන්ථකයෝත් අපන්ථකයෝත් මංමුලා වෙති, නාමය වූකලී ප්‍රඥප්ති මාත්‍රයක "තෝ අඥානව විචාරති' සිතාම කීය.

එබස් ඇසූ පාපක නම් මානවකයා නාමයෙහි අතිශයින් මඩ්‍යසථව බොධිසත්ත්වයන් සමීපයට ගොස් "කිමෙක්ද? දරුව නමක් අභිප්‍රාය කොට ගෙණ අසිදැ?"යි විමසූයේය, එකල්හි "ආචාරීන්වහන්ස, අජීවකයෝත් ජීවක යෝත් මියති, ධනපාලීත් අධනපාලීත් දුක්පත්වෙති,පන්ථකයෝත් අපන්ථක යෝත් මංමුලා වෙති, එසේ හෙයින් නාමය නම් ප්‍රඥප්තිමාත්‍රයක, නාමයෙන් අර්ථසිද්ධියක් නැත, මේ කර්මයෙන්ම අර්ථසිද්ධිය වන්නේය. එසේහෙයින් මට අනික් නමකින් කම්නැත, පළමු මාගේ නමම මට නම්වෙ"යි කීය.

එබස් ඇසූ මහබොසතාණෝ "ඔහු විසින් දුටුදෙයක් කළදෙයක් එක් කොට ගළපා කියන්නාහ, ජීවකයා මළාදැක ධනපාලයා දුක්පත්නියාව දැක පන්ථකයෝ මංමුලාවූ නියාව දැක පාපක නම් මානවකයා අභිවෘද්ධිනාමයෙන් ප්‍රයෝජනයක් නැත කියා නැවත තමා වසන්නාවූ සථානයට ආයේවේදැ"යි කිවුය.

ශාසතෘවූ බුදුරජානන්වහන්සේ මේ අතීත කථාව ගෙණහැර දක්වා වදාරා "මහණෙනි මේ පාපක නම් පුරුෂයා අභිවෘද්ධකරණ නාමයක් උවමැන වැයි නම් සිඹසොට ඇවිද්දේම වේදැ"යි වදාරා මේ නාමසිද්ධි ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි නාමසිද්ධි මානවකයා නම් දැන් මේ නාමසිද්ධික මහණය, එසමයෙහි ආචාරීන්ගේ පිතීන් නම් දැන් බුදුපිරිසය; දිසාපාමොක් ආචාරී නම් වූයේම තිලෝගුරු සමයක්සම්බුදුරජවූ මම්මවේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 97 කූටවාණිජ ජාතකය

තිවද එක්සමයෙක්හි අප්‍රතිවාදී වූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවරම් වෙහෙර වසනසේක් එක් සොර වෙළඳක්හු අරභයා මේ ජාතකය වදාළ සේක.

සැවැත්නුවර වෙළෙන්දෝ දෙදෙනෙක් එක්ව වෙළඳම් කරන්නාහු ගැලින් බඩු ගෙණ ජනපදවාරිකාවට ගොස් වෙළඳම් කොට ලාභ ලැබගෙණ පෙරලා ආවාහුය, ඔහුන් දෙදෙනා අතරෙන් සොරවෙළඳු මෙසේ සිතූය. "මේ වෙළෙඳුනෝ බොහෝ දවස ත් දුර්භොජනයෙන් හා දුකසෙය්‍යාවෙන් මිරිකුණෝය. දැන් තාගේ ගෙයි අනේකප්‍රකාරවූ අග්‍රාසයෙන් යුක්තවූ භොජනය අනුභව කොට දිරවාගත නොහී අජීණීව යන්නේය, එකල්හි මම මේ භාණ්ඩය තුන් කොටසක් කොට එක් කොටසක් ඔහුගේ දරුවන්ට දෙමි; දෙකොටසක් මම ගණිමි"යි සිතා ඒ සොරවෙළෙඳු "අද බෙදමි, සෙට බෙදමි" කියා බෙදන්ට

මැලිව හිඳිනේය. ඉක්බිත්තෙන් නුවණැති වෙළඳු ඔහු නොකමැති වුවත් බලාත් කාරයෙන් බඩු බෙදවා විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේට නමස්කාර කොට සුවදුන් කථාකොට උන් කල්හි සම්මෝදයන්වහන්සේ විසින් "උපාසකය මෙසේ දවස් ලස්ව ගියේ කුමක්නිසාදැ?"යි නුවරට අවුදිනුත් කල්යවා බුඩො පසථානයට නො ආයේය. "කවර කාරණයකින්ද?" යි විචාළ කල්හි එපවත් බුදුරජාණන් වහන්සේට දැන්වීය. සර්වඥයන් වහන්සේ උපාසකය මොහු සොර වෙළෙඳවූයේ දැන්මතු නොවෙයි, පෙරත් සොරවෙළෙඳුමය. දැන්වූකලී තොප වඤචා කරණු කැමතිය, පෙරනුවණැත්තාන් වඤචාකරන්ට උත්සාහ කළේ වේදැයි වදාරා ඒ උපාසකයා විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත්දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණෝ බරණැස්නුවර වෙළඳ කුලයෙක උපන්නාහුය.

ඒ බොධිසත්ත්වයන්ට නම් තබන දවස් පණ්ඩිතයෝයයි නම් තැබුහ. ඒ මහබෝසතාණෝ වැඩිවිය පැමිණ අන් වෙළෙඳකු හා සමග එක්වගෙණ වෙළඳුම් කෙරෙති, ඔහුට අතිපණ්ඩිතය යි නමෙක් විය. ඔහු දෙදෙන බරණැස්නුවරින් පන්සියයක් ගැලින් බඩු පටවාගෙණ ජනපදයට ගොස් වෙළඳුම් කොට ලාභ ලැබගෙණ නැවත බරණැස්නුවරටම ආවාහුය.

ඉක්බිත්තෙන් ඔහු දෙදෙන බඩු බෙදන කල්හි අතිපණ්ඩිතයෝ "මා විසින් දෙකොටසක් ලැබියයුතුය"යි කිවුය. "කුමක් නිසාදැ"යි කී කල්හි "තෙපි පණ්ඩිතයෝය, මම අතිපණ්ඩිතයෙමි, එසේහෙයින් පණ්ඩිතයෝ එක් කොටසක් ලබන්ට නිස්සෝය, මම අතිපණ්ඩිත හෙයින් දෙකොටසක් ලබන්ට නිස්සෙමි" කීය.

එබස් අසා මහ බෝසතාණෝ කියන්නෝ "අප දෙදෙනාගේ බඩු මිලත් හොනුත් සරිසරිම නොවේදැ"යි "එසේකල දෙකොටසක් ලබන්ට කාරණා කවරේදැ?"යි විචාළෝය. "මා අතිපණ්ඩිත බැවිනැ"යි කීය. මෙසේ ඔහු දෙදෙන බසින් බස කලහ කළාහුය,

ඉක්බිත්තෙන් අතිපණ්ඩිතයෝ එක් උපායෙක් ඇත සිතා තමන්ගේ පියානන් ගස්සිදුරෙක්හි හිඳුවා කියන්නේ "තොපි අප හැමදෙනම මෙතනට ආකල අතිපණ්ඩිතයෝ දෙකොටසක් ලබන්ට නිස්සෝය යි කියාලව"යි කියා බොධිසත්ත්වයන් සමීපයට ගොස් "සබඳ මට දෙකොටසක් ලබන්ට නිසි නියාවත් මේ වෘක්ෂදේවතාවා දන්නේය, වරෝ යම්හ, ඔහු අතින් විවාරම්හ"යි කියා මහබෝසතානන් එතනට කැඳවාගෙණ ගොස් "සවාමීනි, වෘක්ෂදේවතා වුන් වහන්ස, අපගේ යුක්ති පසිඳින මැනවැ"යි කිවුය. ඉක්බිත්තෙන් ඕහට අතිපණ්ඩිතයෝ කියන්නාහු "මූ පණ්ඩිතයෝය, මම අතිපණ්ඩිතයෝය, අප දෙදෙනා විසින් එක්ව වෙළඳම් කරණලද, අප දෙදෙනාගෙන් කවුරුන් විසින් දෙකොටසක් ලැබිබයුතුදැ"යි විචාළ කල්හී "පණ්ඩිතයන් විසින් එක් කොට සක් ලැබිබයුතුය, අතිපණ්ඩිතයන් විසින් දෙකොටසක් ලැබිබයුතුය"යි කීය.

එකල්හි මහබෝසතාණන්ගේ මෙසේ විනිශ්චයකරණලද යුක්තිය අසා දැන් තා දේවතාවා නියාවත් දේවතා නොවන නියාවත් දන්නෙම්වේදැ"යි කියා පිදුරුගෙණ ගස් සිදුර පුරවා ගිනි මෙලවූය. එකල්හි අතිපණ්ඩිතයන්ගේ පියා ගිනිදැල් ඇඟ ගැසෙන්ට පටන්ගත් කල්හි ශරීරයෙන් අඩියක් දක්වාගෙණ උඩට පැනනැගී අත්තක් අල්වාගෙණ එල්ලමින් ධරාගතනොහී බිමට වැටී අඬමින් කියන්නේ "මේ ලෝකයෙහි කාරණා දන්නාවූ පණ්ඩිතභාග්‍යයෙන් යුක්තවූ උත්තම පුද්ගලයාම යහපත් වන්නේය, අතිපණ්ඩිතයා යන නාම මාත්‍රයකින් වඤ්චාසභාවය ඇති කුට පුරුෂයා යහපත් නොවන්නේය. කුමක් නිසාද යත්, වඤ්චාසභාවය ඇති පණ්ඩිතයන්ට පියව මදන් දැහියමෝ වේදැ"යි මෙසේ බැගෑපත්ව හැඬුයේය.

ඉක්බිත්තෙන් ඒ පණ්ඩිත අතිපණ්ඩිත දෙදෙන මධ්‍යයෙන් දෙකක් කොව වස්තු සරිකොටස් ගසා ඇරගෙණ කම්වූ පරිදිදෙන් මිය පරලොව ගියෝය.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ පෙරත් මේ සොර වෙළඳුමය යි මේ අතීත කථාව ගෙණහැර දක්වා වදාරා මේ කුටවාණිජ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි සොරවෙළඳු නම් දැනුත් සොරවෙළඳුමය, නුවණැති වෙළඳවූයෙම් තිලෝගුරු සම්‍යක්සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 98 පරොසහස්‍ස ජාතකය

තවද එක්සමයෙක්හි වීතරාගීවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවරම් වෙහෙර වසනසේක් පෘථග්ජනක ප්‍රශ්නය අරභයා මේ ජාතකය වදාළසේක. මෙහි වර්තමානකථාව සරභඞ්ග ජාතකයෙහි විස්තර වශයෙන් වන්නේය, එක්සමයෙක්හි නිසැකවහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්ව 'ඇවැත්නි, දසබලධාරීවූ බුදුරජානන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් විවාරණලද්දාවූ ප්‍රශ්නය ශාරීපුත්‍රස්ථවිරයන්වහන්සේ විස්තරහෙයින් විස්සර්ජනය කළසේක් වේදැ"යි තෙරුන් වහන්සේ ගුණ කථාව කියා කියා උන්සේක,

සර්වඥයන්වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩ "මහණෙනි, දැන් කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විවාරා "මෙනම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි "මහණෙනි, ශාරීපුත්‍රස්ථවිරයෝ මා විසින් සංක්ෂේපයෙන් කියනලද ප්‍රශ්න විස්තරහෙයින් දැන් මතු විසර්ජනා කළෝ නොවෙති, පෙරත් මෙසේ විස්සර්ජනා කළෝම වේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

පසිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් ප්‍රසිද්ධ බ්‍රාහ්මණ වංශයෙක ඉපිද තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් සියළු ශිල්ප ඉගෙණ

**පඤ්චකාමය** හැර සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව **පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති** උපදවා හිමාලය වනයෙහි වසුවාහුය.

ඒ මහබෝසතාණන්ට **පන්සියයක්** අතවැසි වූවාහුය. ඉක්බිත්තෙන් බොධිසත්ත්වයන්ගේ ප්‍රධාන ශිෂ්‍යවූ තාපසයෝ වර්ෂා **කාලයෙහි** දෙසියපණසක් තපස්වීවරයන් ගෙණ ලුණු සෙවුනා සඳහා මනුෂ්‍යපථයට ගියෝය.

එසමයෙහි බොධිසත්ත්වයන්ට කාලක්‍රියාවට කල් පැමිණියේය. සමීප යෙහි සිටි අනෙතවාසිකයා "ආචාරීන්වහන්ස, නුඹවහන්සේ විසින් කවර ගුණධර්මයක් ලබනලදැ"යි අධිගමය විමසූයේය. මහබෝසතාණෝ ඔවුන්ට "නත්ථිකිඤ්චි"යි කියා මියගොස් ආභස්සර බ්‍රහ්මලොකයෙහි උපන්නාහුය. බොධිසත්ත්වයෝ වූකලී අරූපසම්පත්ති ලාභීව සිටත් අරූපී බ්‍රහ්මලොකයෙහි නූපදනාහුය.

ඉක්බිත්තෙන් අවන්තවාසිකයෝ "ආචාරීන්වහන්සේට අධිගමයෙක් නැතැයි සුසානභූමියෙහි සත්කාර නොකළාහුය. එනිසා ප්‍රධාන ශිෂ්‍ය යාණෝ ඇවිත් "ආචාරීන්වහන්සේ කොයිදැ?"යි විමසා කාලක්‍රියා කළාහ යි යනු අසා "කිමෙක්ද? ආචාරීන්වහන්සේ අධිගමයක් විමසුහුදැ'යි කිවුය. "එසේය, විමසුම්හ'යි කී කල්හි 'කුමක් කියසේක්ද?"යි විමසූහ. උන් වහන්සේ විසින් "නත්ථිකිඤ්චි"යි කියා මිය ගොස් මෙපමණක් කියන ලද. එසේහෙයින් "අපි උන්වහන්සේට කිසි සත්කාරයක් නොකළුම්හ"යි කීහ.

එබස් ඇසූ ප්‍රධාන ශිෂ්‍යයාණෝ කියන්නෝ "තෙපි ආචාරීන්ගේ වචනාර්ථය නොදන්නෝය, ආචාරීන්වහන්සේ ආකිඤ්චඤ්ඤායතන ලාභී සේකැ'යි කිවුය. අනෙතවාසිකයෝ ප්‍රධාන ශිෂ්‍යයන් නැවත නැවත කියමින් සිටියදීත් අදහා නොගත්තෝය. මහබෝසතාණෝද ඒ කාරණය දැන නුව ණැත්තාවූ අතවැස්සෝ මාගේ ප්‍රධාන ශිෂ්‍යයාගේ බස් අදහා නොගණිති, ඒ අතවැස්සන්ට මේ කාරණය ප්‍රකාශ කෙරෙමි යි සිතා බ්‍රහ්මලොකයෙන් අවුත් ආශ්‍රමප්‍රදෙශමස්තකයෙහි මනත්වූ ආනුභාවයෙන් ආකාශයෙහි සිට ප්‍රධාන ශිෂ්‍යයන්ගේ ප්‍රඥානුභාව වර්ණනා කරන්නාහු මෙසේ කිවුය. "කියනලද වචන යෙහි අර්ථ දැනගත නොහෙන්නාවූ අඥානවූ දහසක්දෙන රැස්ව මේ නුවණැති තාපසවරුන්මෙන් අවුරුදු සියයකුත් අඩාවලප්නාහුය. කිසිම අර්ථයක්වත් කාරණයක්වත් දැනගත නොහෙති. මෙබඳුවූ දහසක්දෙනාට වඩා ප්‍රධාන ශිෂ්‍යයා මෙන් කියනලද වචනයෙහි අර්ථය දැනගන්නේ වීනම් මෙබඳුවූ එකම නුවණැති පුරුෂයාම උතුම්වන්නේය"යි මෙසේ මහබෝසතාණෝ ආකාශ යෙහි සිටම ධර්මදෙශනාකොට තපස්වී සමූහයාට තමන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිලාභී නියාව ප්‍රකාශකොට බ්‍රහ්මලොකයට ගියාහුය. ඒ තාපසයෝත් කිසුණුපිරියම් කොට ධ්‍යානලාභීව බ්‍රහ්මලොකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ **පරොසහස්ස ජාතකය** නිමවා වදාළ සේක.

"එසමයෙහි ප්‍රධාන ශිෂ්‍යයා නම් දැන් ශාරීපුත්‍ර ස්ථවිරයෝය, මහාබ්‍රහ්මව උපන්නෙම් තිලෝගුරු බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළ සේකි.

## 99
## අසාතරූප ජාතකය

**තී**වද එක්සමයෙක්හි වීතවෙමිවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ **කොධන නම්** නුවර නිසා කුඩධාන වනයෙහි වසන **සේක් කෝලිය** රජ්ජුරුවන්ගේ දුවූ සුප්පවාසා නම් උපාසිකාව අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ සුප්පවාසා **නම්** උපාසිකාතොමෝ එසමයෙහි **සත්** අවුරුද්දක් මුළුල් **ලෙහි කුසින්** දරාගැබ **පරිහරණය** කොට සතියක් මුළුල්ලෙහි ගර්භයෙන් මුසුව ඉතා **මහත්වූ වේදනා** උපන්නේය. ඒ **උපාසිකාව මෙසේ** අධික ප්‍රමාණවූ වේදනාවෙන් පීඩිතවත් බුදුගුණ **කියන්නී** 'යම් සම්බුදුකෙනෙකුන් වහන්සේ මෙබඳුවූ **දුක්** තරණය පිණිස ධර්මදේශනා කරණසේක් වීතම් ඒ භාග්‍යවත්වූ **බුදුරජාතන්** වහන්සේ ඒකාන්තයෙන් සම්බුදුමයන් සම්මාසම්බෝධියෙන් **පරොපදෙශ** රහිතව දන්සේක. යම් **අෂ්ටාර්යපුද්ගල** භික්ෂු සමූහයෙක් මෙබඳුවූ **දුක් දුරු කරණ පිණිස** පිළිපන්නේ **වීනම්** භාග්‍යවත්වූ බුදුරජාතන් වහන්සේගේ **ශ්‍රාවක** සඞ්ඝයා ඒකාන්තයෙන් **මොහවට** පිළිපන්නේය, යම් **නිර්වාණ** ධර්මයෙක්හි **මෙබඳු** දුකඛයෙක් නැත්තේ **වීනම්** ඒකාන්තයෙන් ඒ **නිර්වාණධර්මය** සැපවන් **නේය**" **යන** මේ ත්‍රිවිධානුස්මෘතියෙන් යුක්තව ඉවසූය.

ඒ **සුප්පවාසා නම්** උපාසිකා තොමෝ **තමාගේ සවාමිපුරුෂයා** ලඟට **කැඳවා** තමාගේ පවතුන් මේ **නමස්කාර** අස්නත් කියන **පිණිස** සම්බුදුරජාතන් වහන්සේ **සමීපයට** යවූහ. සම්බුදුරජාතන් **වහන්සේ නමස්කාර** අසුන් අසා "**සුප්ප වාසා නම්** කෝලිය රජදු **සුවපත්වේවයි; නීරෝගවේවයි, පුතකු වඳුව**"යි **කීසේක.**

සම්බුදුරජාතන් වහන්සේගේ ඒ වචනය හා සමගම සුප්පවාසා නම්වූ **කෝලිය** රජදුව **සුවපත්ව නීරෝගව පුතකු** වැදූහ.

ඉක්බිත්තෙන් ඒ උපාසිකාවගේ වල්ලභයා ගෙට ගොස් ඒ **උපාසිකාව** වැදූ **නියාව** දැක "**පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්යයියෙකැ**"යි අතිශයින් බුද්ධානුභාවයෙහි ආශ්චර්‍ය අද්භූතවූ සින් ඇතිව **සුප්පවාසා නම්** උපාසිකාවත් **පුතකු** වඳ සතියක් මුළුල්ලෙහි බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂුසංඝයාවහන්සේට දන්දෙනු කැමතිව **නැවත** ආරාධනා කරණු සඳහා තමාගේ **සවාමිපුරුෂයා** යවූහ

එසමයෙහි මුගලන් මහතෙරුන්වහන්සේගේ **උපාසකයන්හු** විසින් බුදුන් ප්‍රධානකොට **ඇති** භික්ෂුසංඝයා වහන්සේ **පවරණලදසේක.** සම්බුදුරජාතන් **වහන්සේ** සුප්පවාසාවන්ගේ දනට අවසර දෙන පිණිස මුගලන් මහතෙරුන් **වහන්සේ** ඒ **උපාසකයා** සමීපයට යවා ඔහු ගිවිස්වා සතියක් මුළුල්ලෙහි භික්ෂූන් **වහන්සේ** හා **සමග** ඒ සුප්පවාසාවන්ගේ දන් පිළිගත්සේක. **සත්වෙනි** දවස් **සුප්පවාසාවෝ** පුතනුවන් සීවලිකුමාරයන් සරහා භික්ෂුසංඝයාවහන්සේ වැන්දවූය. ඒ **කුමාරයන්** පිළිවෙළින් සැරියුත් මහතෙරුන්වහන්සේ සමීපයට ගෙණ **ගිය කල්හි** තෙරුන් වහන්සේ ඒ **කුමාරයන්** සමග "**කිමෙක්ද? සීවලීනි,** තොපට **සැපදැ**"යි සුවදුක් කථාකළසේක.

**එවිට** කුමාරයෝ කියන්නෝ "**සවාමීනි, මට සැපයෙක් නම් කොයින්ද? මම සත් අවුරුද්දක් මුළුල්ලෙහි ලොහෝකුඹු නිරයක් වැනිවූ මව්කුස විසුයෙමි**

වේදැ?'' තෙරුන් වහන්සේ හා සමග මෙබඳු කථාවක් කළෝය සුප්පවාසාවෝ ඒ කුමාරයන්ගේ බස් අසා උපන් සතියෙන්ම මාගේ පුතනුවෝ අනුබුද්ධවූ දම් සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ හා සමග කථාකෙරෙයි'' සොම්නසට පැමිණියෝය.

සම්බුදුරජාණන් වහන්සේ සුප්පවාසාව අභිමුව ''මෙබඳුවූ දරුවන් කැමැත්තේ දැ?''යි විචාළසේක. ''සවාමීනි, ඉදින් මෙබඳුවූ සෙසුත් දරුවන් සත්දෙනෙකු ලද්දේවිමි නම් මම කැමැත්තෙමි වේදැ?''යි කීවේය. සම්බුදුරජාණන් වහන්සේ උදම්අතා අනුමෙවෙනි ධර්මදේශනාකොට වැඩහිඳුවා සේක.

සිවලි කුමරුවෝත් සත් ඇවිරිදිකලම ශාසනයෙහි ලැදිව මහණව විසි වයස පිරුණ කල්හි උපසම්පදාව ලැබ පිණැතිව ලාභයෙන් අග්‍රප්‍රාප්තව මහී කම්පාකරවා අර්හත්ඵලයට පැමිණ පිණැත්තවුන් අතුරෙන් ඒහාදගහ තනතුරට පැමිණියේසේක.

ඉක්බිත්තෙන් එක්දවසක් නිසැලූන් වහන්සේ ධර්මසභාමණ්ඩපයට රැස්ව ඇවැත්නි, සිවලී සථවිරයන් වහන්සේ සත් අවුරුද්දක් මුළුල්ලෙහි මව්කුසෙහි වැස සත් දවසක් ගර්භමූඝ බවට පැමිණියේසේක. අනේ දෙපුතු මව් මහා දුක් අනුභව කළානුය. කෙබඳු කර්මයක් කළෝදැ''යි කථාවක් උපදවා උන්සේක.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ එතනටම වැඩවදුරා ''මහණෙනි, දැන් කවර නම් කථාවකින් යුක්තව හුනුදැ?''යි විචාරා ''මෙනම් කථාවකින් යුක්තව උනුම්හ''යි කී කල්හි ''මහණෙනි, මහපිණැත්තාවූ සිවලී සථවිරයන්ට සත් අවුරුද්දක් මුළුල්ලෙහි ලෝකුඹුනරකාදිය හා සමාන මව්කුස වාසයද සතියක් මුළුල්ලෙහි ගර්භමූඝ බවට පැමිණීමත් ඔවුන් විසින්ම කළ කර්මය මුල් කොට ඇත්තේ සුප්පවාසාවන්ට සත් අවුරුද්දක් මුළුල්ලෙහි කුසින් දරාගැබ පරිහරණය කරන්නාවූ දුකුත් සතියක් මුළුල්ලෙහි ගර්භමූඝවූ දුකුත් තමන් කර්මය මුල්කොට ඇත්තේය'යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුකෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි අප මහබෝසතානෝ රජ්ජුරුවන්ගේ අග්‍රමහේසිකාවන්ගේ කුස පිළිසඳගෙණ වැඩිවිය පැමිණ තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙන් ශිල්ප ඉගෙණ පියානන් ඇවැමෙන් දූහැමෙන් රාජ්‍යය කළෝය.

එසමයෙහි කොසොල් රජ්ජුරුවෝ මහසෙනඟ පිරිවරා බරණැස්නුවර රාජ්‍යය ගෙණ රජ්ජුරුවන් ජීවිතක්ෂයට පමුණුවා රජ්ජුරුවන්ගේම අගමෙහෙසුන් බිසවුන් තමන්ට අගමෙහෙසුන් කළෝය. බරණැස්නුවර රජ්ජුරුවන්ගේ පුතනුවෝ පියානන් මළ කල්හි වාරිමාර්ගයෙන් පලාගොස් සේනාව රැස්කරවා බරණැස්නුවරට අවුත් නුදුරුතෙනෙක හිඳ රජ්ජුරුවන්ට ''රාජ්‍යය හෝ දුන මැනව, යුධය හෝ කළමැනවැ'යි පත් යවූහ.

එකල කෝසල රජ්ජුරුවෝ ''යුද්ධ කෙරෙමි''යි පෙරළා පත්යවූහ, රාජ කුමාරයන්ගේ මෑණියෝ ඒ අසුන් අසා ''යුධයෙන් කම් නැත, හැමදිගම සඤ්ඤා රය සිඳ බරණැස්රජය වටලාගණුව, ඉක්බිත්තෙන් දර පැන් ඕත් ආදිය නිමාගිය කල්හි ආහාරයෙන් පිඬිතවූ මනුෂ්‍යයන් ඇති නුවර යුධයක් නැතිවම ගත්

තමෝදැ"යි පතක් යවූහ, ඒ රාජකුමාරයෝ මැනියන්ගෙන් එවූ අසුන් අසා සත් දවසක් මුළුල්ලෙහි සඤ්ඣාරය සිඳ නුවර වටලාගත්තාය. නුවර ඇතුළට පැමිණියාවූ සත්තුයෝ මැදිරිය හසුවූ පක්ෂීන් පරිද්දෙන් විය. සත්වෙනි දවස් ඒ කොසොල් රජ්ජුරුවන්ගේ හිස ගෙණවූත් කුමාරයන්ට දුන්නාහුය. කුමාරයෝ නුවරට වැදැ රාජ්‍යය ගෙණ රාජ්‍යශ්‍රී අනුභව කොට කෙළවර කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ. ඒ කුමාරයෝ සතුරු රජ්ජුරුවන්ගේ සේනාවට පීඩාකළාවූ අකුසල කර්මවිපාකයෙන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි මව්කුස වැස සතියක් මුළුල්ලෙහි ගර්භමූඪ බවට පැමිණියෝය. තවද ඒ කුමාරයෝ පියුම තුරා නම් සම්බුදුන් වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහිදී ලාභීන් අතුහේ අග්‍රවේම්ව"යි කියා මහ දන් දී යම් ප්‍රාර්ථනාවක් කළෝද? විපස්සී සම්බුදුන් සමයෙහි නුවරවාසීන් සමග දහසක් වස්තු අගතාවූ දී උක්සකුරු දන් දී යම් ප්‍රාර්ථනාවක් කළෝද? එහි ආනුභාවයෙන් ලාභීන් කෙරෙහි අග්‍රවූහ.

සුප්පවාසාවෝත් නුවර වටලාගෙණ නිස්සඤ්ඣාරය කොට බත් පැන් වැද්ද නොදී නුවර අරගණුව සි පුතානුවන්ට කියා යවූ බැවින් සත් අවුරුද්දක් මුළුල්ලෙහි කුසින් දරගැබ පරිහරණය කොට සතියක් මුළුල්ලෙහි ගර්භමූඪ වූහ. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ "මහණෙනි, දෙපුතු මවුන් මේ ගහී පරිහරණය ගර්භවාස සංඛ්‍යාතවූ දුඃඛයෙන් පීඩිතවූවන් පෙර තමන් විසින් නුවර වටලා නිස්සඤ්ඣාර කොට මහජනයාට දුක්දීමෙන් කළ අකුශලකර්මයෙනැ"යි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා අෂ්ටාතරූප ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි නුවර වටලා රාජ්‍යයට පැමිණි කුමාරයෝ නම් සීවලී සථවිරයෝය, මැනියෝ නම් සුප්පවාසාවෝය, පියවූ බරණැස් රජ්ජුරුවෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජ වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 100 පරොසත ජාතකය

මේවද එක්සමයෙක්හි විතමෝහිවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩ වසතසේක් පෘථග්ජන ප්‍රශ්නය අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාවත් අතීත කථාවත් ප්‍රශ්න ව්‍යාකරණයෙන් යට කියන ලද පරොසහස්‍ර ජාතකය හා සමානවන්නේය. හුදෙක් මෙහි නුවණැත්තාවූ සත්තුයෝ අවුරුදු සියයක් කියන ලද වචනයේ අර්ථපරීක්ෂාකරන්නාහු විතම් එසේ බලා පරීක්ෂා කරන්නාවුත් සත්තුයෝ අර්ථයක්වත් දැනගත නොහෙන්නාහුය. එසේ හෙයින් යම් සත්තුයෙක් කියන ලද වචනයෙහි අර්ථ දන්නේවී නම් ඒ එකම නුවණැති පුද්ගලයා උතුම් වන්නේය. මෙසේ මහ බෝසතාණෝ ආකාශයෙහි සිට ධර්මදේශනා කොට තපස්වී සමූහයාට ප්‍රශ්නය අවබොධ කොට බ්‍රහ්මලෝකයටම ගියෝය. ඒ තපස්වීවරයෝත් කිසුණු පිරියම් කොට ධ්‍යානලාභීව ජීවිතපර්‍යවසානයෙහි ගොස් බ්‍රහ්මලෝකයෙහි උපන්සේක. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා මේ පරොසත ජාතකය නිමවා වදාළසේක.

---

## 101 පණ්ණික ජාතකය

තිවද එක් සමයෙක්හි අසිතාඤ්ජන ව්‍යඤ්ජනයෙන් යුක්ත වූ තිලෝගුරු බුදු රජාණන් වහන්සේ දෙව්රම්වෙහෙර වැඩ වසතසේක් එක් පණ්ණික උපාසකයක්හු අභයා මේ ජාතකය වදාළසේක.

ඒ පණ්ණිකතම් උපාසකයා සැවැත්නුවර වැසි සැදැහැති රත්නත්‍රයෙහි ප්‍රසන්න වූ එක් උපාසකයෙක. ඒතෙම අනෙකප්‍රකාරයෙන් ඉඟුරු කසා ආදී යද තම්පලා ආදීවූ පලාකොල හා ලබු පුසුල් ආදිය විකොට ජීවත්වන්නේය. ඒ උපාසකයාගේ එක් දුවක් ඉතා විශෙෂ රූ ඇත්තීය, බැලුබැලුවන්ට ප්‍රසාද ඵලවන්නීය, ආචාරශීලයෙන් යුක්තය, භය ලජ්ජා දෙකින් සමන්විතය, හුදක් සැමවේලෙහි සිතාමුසු මුහුණු ඇත්තීය. ඒ කුමාරිකා සමානජාති ඇත්තාවූ කුලයකින් පුරුෂයන් අවුත් විවාහ නිසා විවාල කල්හි කුමාරිකාවගේ පියානෝ මෙසේ සිතූහ. "මේ කුමාරිකාව ඔබ්බෙත් පුරුෂයෝ ඇවිත් විවාහ ගියෝය, මෝතොමෝත් හැමවේලෙහිම සතුටුවූ මුහුණු ඇත්තීය, කුමාරිකාධර්මය නැති බැවින් කුමාරිකාවන් අන් කුලයකට ගිය කල්හි දෙමව්පියන්ට නිදුවන්නේය. එසේහෙයින් "මේ කුමාරිකාවට කුමාරිකා ධර්මය ඇද්දෝ හෝ? සි නැද්දෝහෝ?සි පරීක්ෂා කෙරෙම්"සි සිතා ඒ උපාසකයා එක්දවසක් දුවලවා පෙට්ටියක් ගෙන්වා ගෙණ වලින් පලා කඩනු සඳහා වලට ගොස් පරීක්ෂා කිරීම් වශයෙන් ක්ලෙශ නිශ්‍රිතවූවාක්හු මෙන් රහස් කියා ඒ කුමාරිකාවගේ අත අල්වාගත්තාය. ඒ කුමාරිකාව අත අල්වාගත් පමණකින් අඩමින් වලපමින් කියන්නී "පියානන්වහන්ස, මේ නුඹවහන්සේට සුදුසු නොවෙයි, දියෙන් හිනි නැංගා හා සමානය, එසේහෙයින් නුඹවහන්සේ මෙබන්දක් නොකළමැනවැ"සි කිව,

එබස් ඇසූ පියානෝ "මැනියෙනි මා විසින් තොප පරීක්ෂා කරණු පිණිස තොප අල්වා ගත්තා ලද, දැන්වූකලී යව සි, කිමෙක් ද? තොපට කුමාරිකා ධර්මය ඇද්ද? නැද්ද? සි විචාළේය.

එසේහෙයින් පියානන් වහන්ස, මට කුමාරිකාධර්මය ඇත, මම ලොභ වශයෙන් පුරුෂයකුගේ මුනුණ පමණකුත් නොබැලුවිරුමැ"සි කිවුය. එබස් ඇසූ පියානෝ දුවනියන් අස්වසාලා ගෙට ගොස් මගුල් කොට අන්පුරුෂයකුට පාවාදී සම්‍යුද්ධයන් වහන්සේට තමස්කාර කරම් කියා ගඳ දුම් මල්පහන් ආදිය ගත් අත් ඇතිව ජෙතවනයට ගොස් බුදුරජාණන් වහන්සේට වැඳ පුදා එකත් පස්ව උන්නාහුය.

එකල්හි සම්‍යුද්ධයන් වහන්සේ විසින් "උපාසකයිනි, තොප කල්යවා ආයේ කුමක් නිසාදැ?සි කී කල්හි එපවත් සම්‍යුද්ධයන් වහන්සේට දැන්විය. සම්‍යුද්ධයන් වහන්සේ 'උපාසකය මේ කුමාරිකාව බොහෝ කලක පටන් ආචාරශීලයෙන් යුක්තය, නෝ වූකලී මේ කුමාරිකාව දැන් මතු පරීක්ෂාකලෝ නොවෙයි, පෙරත් පරීක්ෂාකෙළෙහිම වේදැ"සි වදාරා උපාසකයා විසින් ආරාධිතවූ බුදුහු ඉක්බිත්තෙහි දක්වා වදාළසේක.

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ සමයෙහි අප මහ බෝසතාණන් වනයෙහි වෘක්ෂදේවතාව උපන්

සේක. එකල්හි බරණැස්නුවර පණ්ණික නම් උපාසකයෝය යනාදීවූ සියල්ල වර්තමාන කථාව හා සමානවන්නේය. ඒ උපාසකයා විසින් පරීක්ෂාකරණ පිණිස අත අල්වාගන්නා ලදුව අඩමීන් වලපමින් කියන්නී "යම් පියාත කෙනෙක් කායික චෛතසික දුඃඛයෙන් පීඩිතවූ තැනැත්තීව පිහිටවෙද්ද, එසේවූ මාගේ පියානන් වහන්සේ දැන් මේ වතමඛ්‍යයෙහිදී මෙබදු මිත්‍රද්‍රොහී වූ කර්මයක් කරණ සේක. එසේහෙයින් මේ වතමඛ්‍යයෙහිදීම කවුරුන්ට අඩම්ද? යම් පියාතකෙතෙකුන් වහන්සේ මට පිහිටවන්ට රක්ෂාස්ථානවන්ට සුදුසුසේක් වීනම් එසේවූ පියානන්වහන්සේද දැන් සානසිකවූ රෞද්‍ර ක්‍රියාවක් කරණසේක. එසේනෙයින් මම දැන් කවුරුන්ගේ නම කියා අඩම්ද"?යි දෙවතොපජ්ඣායන යක් කරන්නාක් මෙන් මුරගා ඇඬුය.

එකල්හි ඒ කුමාරිකාවගේ පියානෝ කුමාරිකාව අස්වසාලා "මැනියෙනි, තොපි කුමාරිකා ධර්මය රැක්කෝවේදැයි"යි විවාළේය. "එසේය පියානන්වහන්ස මමරැක්කෙමි' කී කල්හි ඒ කුමාරිකාව ගෙට කැඳවාගෙණ ගොස් මගුල් කොට අන් කුලයෙක පුරුෂයකුට පාවාදුන්නුය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්ය්‍යසත්‍යය ප්‍රකාශකොට වදාරා මේ පණ්ණික ජාතකය නිමවා වදාළ සේක.

චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උපාසකයා සෝවාන්පෙළෙහි පිහිටියේය. එසමයෙහි දූ තම් දැන් දූමය, ඒ කාරණය ප්‍රත්‍යක්ෂ කොට දුටුවාවූ වෘක්ෂදෙවතා වූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ?"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 102 වෙරි ජාතකය.

එවද එක්සමයෙක්හි ශාක්‍යකුල සිඛාමාණික්‍යවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙවරම්වෙහෙර වසනසේක් අනේ පිඬු මනසිවානන් අරහයා මේ ජාතකය වදාළසේක.

අනේපිඬුමහසිටානෝ තමන්ගේ ගොවිතැන් කරන්නාවූ ගමට ගොස් එක තැනැත්තෝ අතරමගදී "අතරමග වසන්ට සුදුසු නොවෙයි, සැවැත් නුවරවම යෙමි" සිතා වහ වහා ගැල්පදවාගෙණ සැවැත්නුවරටම අවුත් දෙවෙනි දවස් විහාරයට ගොස් බුදුරජානන් වහන්සේට එපවත් දන්වූය.

සම්බුදුයන් වහන්සේ "සිටානෙනි, පෙරත් නුවණැත්තෝ අතරමග සොරුන් දැක අතරමග ලස්නොවී තමන් වසන්නාවූ සථානයටම වහා වහාම ගියෝවේදැ"යි වදාරා සිටානන් විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළ සේක.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අපමණබෝසතානෝ මහ සම්පත් ඇති සිටුපුත්‍රව ඉපිද එකගමක ඇත්තන් කළ යාච්ඤාවක් නිසා අමුතු

වත් අනුභවකරන්ට ගොස් පෙරළා ගමට එන්නාහු ''අහරමගදී සොරුන් දැක අතර නොවැස වහ වහා ගැල් පදවාගෙණ තමන්ගේ ගෙටම අවුත් අනේක ප්‍රකාරවූ අග්‍රාසයෙන් යුක්තවූ භොජනය අනුභවකොට මහා අනර්ඝවූ ශ්‍රීයහන් මසාකගේ නිදා සොරුන් අතින් මිදී නිර්භයස්ථානවූ මාගේ ගෙටම ආයෙමි වේදැ''යි ප්‍රීතිවාක්‍ය වශයෙන් උදන් අතන්නාහු මෙසේ කිවුය.

''යම්බඳුවූ ස්ථානයෙක්හි වෙර සිත් ඇති පුද්ගලයෙක් වසන්නේවීනම් එබඳු ස්ථානයෙක්හි කාරණා දන්නාවූ පුද්ගලයෙක් කිසියම් කාරියක් නිසා එකදවසක් වසන්නේ වීනමුත් සිතට සැපයකින් වැසපිය නොදෙන්නේය. හැමවේලෙහිම බලවත්වූ චිත්තඛෙදයක් හා දෙම්නසින් යුක්තාව වසන්නේය''යි මෙසේ මහබෝසතානෝ උදන්අනා දුනාදීවූ පින්කම්කොට නම්වූ පරිද්දෙන් මිය පරලොව හියෝය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මෙසේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ වෙලි ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි බරණැස්නුවර සිටියානෝ නම් තිලෝගුරු සම්‍යක්සම්බුදු රජවූ මම්ම වේදැ''යි තථාගතවහන්සේ දක්වා වදාළසේකි.

## 103
## මිත්තාවින්දක ජාතකය.

මේවද එක්සමයෙක්හි පරහිත නිරතවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිරම්වෙහෙර වසනසේක් එක් දුර්ව නිසුකෙනෙකුන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව මිත්තාවින්දක ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලද්දේය. මේ ජාතකය චූකලී කාශ්‍යප සම්බුදුරජාණන්වහන්සේ සමයෙහි වන්නේය. එසමයෙහි උරවක්‍රමාලාව උපදා නරකයෙහි පැසෙන්නාවූ එක් නාරකික සත්ත්වයෙක් 'සවාමීනි, කෙබඳුවූ අකුසල කර්මයෙක් කෙළෙම්ද''?යි බෝසතානන් අනින් විචාළේය. බොධිසත්ත්වයෝ ''තා විසින් මේ අකුසල කර්මය කරණලදැ'යි මෙසේ කිවුය.

සමුද්‍ර මධ්‍යයෙහි දිවයිනක වෙමානිකප්‍රේතිවූ දිව්‍යාඞගනාවන් සතර දෙනෙකුන් දැක එපමණකින් සතුටුනොව ''මේ යහපත්දෝ?නෝ යි අයහපත්දෝ නෝ''යි කියා ''ඒ ඒ තැන අධික තෘෂ්ණාවෙන් මතුමත්තේ හොස් දිව්‍යාඞගනා වන් අවදෙනෙකු ලද්දෙහිය, එපමණකිනුත් සතුටු නොව ඉදිරියෙහි යන්නාවූ තෝ දිව්‍යාංගනාවන් සොළොස්දෙනෙකුත් ලද්දෙහිය. තවද එපමණකිනුත් සතුටු නොවන්නාවූ තෝ දිව්‍යාංගනාවන් දෙතිස්දෙනෙකුත් ලද්දෙහිය, ඉතුත් සතුටුනොව අත්‍රිවර්ෂතායෙන් යන්නේ උරවක්‍රමාලාවට පැමිණියේ වෙහිය. මෙසේ සඛකියවූ ලාභයෙන් සතුටුනොව ඒ ඒ තැන්හි ඉර්ෂ්‍යායෙන් ලාභය ප්‍රතීඝාත කරන්නාවූ තෝ දැන් මේ උරවක්‍රමාලාවට පැමිණියේ වෙහිය. මෙසේ තෘෂ්ණා වසඟවූ තාගේ මසාකයෙහි නැවත නැවත මේ උරවක්‍රමාලාව වැටී හිස කපමින් මහා දුක් දෙන්නේය''යි ඔහුගේ කර්මවිපාකය ප්‍රකාශකොට කිවුය.

මෙසේ කියා මහබෝසතාණෝ තමන් වසන්නාවූ දිව්‍යලොකයටම ගියෝ යි නාරකික සත්ත්වයා තමා කළ අකුසල් ගෙවීගිය කල්හි කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියේය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව නෙණහැර දක්වා වදාරා මිත්තවින්දකය තම් දුර්වව මහණය, එසමයෙහි දිව්‍යපුත්‍රවූයේ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ?"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 104 දුබ්බල කාජට ජාතකය

තිවද එක්සමයෙක්හි මහත්වූ බෙයියී අති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ දෙවිරම් වෙහෙර වැඩවසතසේක් මරණභීරුකවූ එක් භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසිවූ එක් කුලපුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේ වදාරන්නාවූ ධර්මදේශනාව අසා ශාසනයෙහි මරණභීරුක විය. රාත්‍රිස්ථාන දිවාස්ථාන යෙහි පවත් අමනාප ශබ්දයක් වේවයි අසා මරණ භයින් තැතිගෙණ මහහඬින් හඬමින් පලා ගියේය. ඒ භික්ෂූන් වහන්සේට "මියම්" යන සිතිවිලි පමණකුත් නැත්තේය, ඉදින් ඒ මහණ 'මම මියමී' දන්නේ වීනම් මරණට නොබත්නේය. මරණානුස්මෘති කර්මස්ථානය නොවැඩූ බැවින් මරණට භයවන්නේය. ඒ භික්ෂූන්ගේ මරණ භීරුක බව භික්ෂුසඞ්ඝයා වහන්සේ කෙරෙහි ප්‍රකාශ විය.

ඉක්බිත්තෙන් ධර්මසභා මණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන්වහන්සේ මෙසේවූ කථාවක් ඉපදවූසේක. ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ ධර්මසභාමණ්ඩපයට වැඩ "මහණෙනි, මා එන්නාට පළමු කිතම් කථාවකින් යුක්තව උන්නුදැ"යි විචාරා "මෙනම් කථාවකින් යුක්තව උන්නමහ"යි කීකල්හි ඒ භික්ෂූහු කැඳවා "මහණ තා මරණභීරුකවූයේ සැබෑදැ?"යි විචාරා "සැබව සවාමීනි" දැන්වූකල්හි "මහණෙනි මේ භික්ෂුවට නොසතුටු නොවව් මේ මහණ දැන්මතු මරණභීරුක වූයේ නොවෙයි, පෙරත් මරණභීරුකය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

තිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ හිමාලය වනයෙහි වාක්ෂදෙවතාව උපන්හ.

එසමයෙහි බරණැස්නුවර රජ්ජුරුවෝ තමන්ගේ මගුලැතු යුධඤ්ඤම කොට හස්තිශික්ෂාව කරණු නිසා හස්ත්‍යාචාරීන්ට ඇතු පාවාදුන්නුය. එකල්හි හස්තියාට ඉවසාගත නොහී තමා බැඳි කඹය බිඳගෙණ මනුෂ්‍යයන් පැහැබදවා දිවගෙණ ගොස් හිමාලය වනයට වන්නේය, මනුෂ්‍යයෝ ඔහු අල්වාගත නොහී පසුපස්සෙහි ගොස් නැවත ආපසු ගියාහුය.

ඒ හස්තිරාජයා එතැන්පටන් මරණභීරුක විය, පවන් හැඬූ හඬ අසා වෙව්ලමින් මරණ භයින් භයපත්ව සොඬ කෙළව කෙළවා මහත්වූ වේගයෙන් දිවන්නේය, අත්කඹුයෙන් බැඳ කොළින් දුක් කම්කටුල් කරණ කලක් මෙන් ඕනට මනත් භය උපන්නේය. කායසඛාදයෙක් වේවහි චිත්තාසඛාදයෙක් වේවයි තොලැබ වෙව්ල වෙව්ලා ඇවිදින්නේය, වෘක්ෂදෙවතාවානෝ ඔහු දැක වෙලෙප් අතුරෙහි සිට මෙසේ කිවුය. ''යම්දුර්වලවූ කාෂ්ටය පූජිදික්ආදියෙන්ම හමන්නාවූ මහපවනින් බිඳහෙලාද එසේ කාෂ්ටය මේ වනයෙහි බොහෝය. සුල භය, ඒ ඒ තැන ඇත, ඉදින් තෝ ඒ පවනින් බිදී වැවෙන දරදඬු ආදියව භය වන්නේ වීනම් එසේ කල්හි නිරන්තරයෙහි තණ පැන් අනුභව කොට සැපසේ ජීවත්ව''යි කියා මෙසේ වෘක්ෂදෙවතානෝ හස්තියාට අවවාද දුන්නාහුය. ඒ හස්තියාන් එතැන් පටන් නිර්භීතවිය.

ශාස්තෘවූ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍යසත්‍ය ප්‍රකාශකොට මේ දුර්ලභාෂ්ට ජාතකය නිමවා වදාළසේක.

චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර මරණභීරුක මහණ සෝවාන් පෙලෙහි පිහිටියේය.

''එසමයෙහි හස්තියා නම් දැන් මේ මරණභීරුක මහණය, එසමයෙහි වෘක්ෂදෙවතාවූයෙම් තිලෝගුරු සම්‍යක්සම්බුදුවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 105 උදංචනි ජාතකය

තීවද එක්සමයෙක්හි කරුණාශ්‍රේෂ්ඨවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වසනසේක් ථුල්ලකුමාරිකාපලෝභනයක් අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්‍තමාන කථාව තෙරස නිපාතයෙහි චුල්ලනාරදකාශ්‍යප ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. සර්වඥයන්වහන්සේ භික්ෂූන්ට මහණ තා උකටලීවූයේ සැබෑදැ?''යි විචාරා ''ඇඛව සවාමීනි'' කීකල්හි 'මහණ තාගේ සිත කා කෙරෙහි පිළිබඳවීදැ?''යි විචාළසේක. ''සවාමීනි පුරුෂ සමාගමකට තොපැමිණියාවූ බාලවයස ඉක්මව සිටි ඒ කුමාරිකාව කෙරෙහි සිත් පිළිබඳවීය'යි දන්වූ සේක.

එකල්හි සර්වඥයන්වහන්සේ ඒ භික්ෂූහට වදාරණසේක් ''මහණ තට මේ සත්‍රිය අනර්‍ථකාරිය. පෙරත් තෝ මේ සත්‍රිය නිසා ශීලවිපත්තියට පැමිණ වෙව්ලමින් ඇවිදිනේ නුවණැත්තන් නිසා සැපලද්දේ වේදැ''යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙතෙකුන් රාජ්‍යකරණ කල්හි යහාදී අතීතකථාවත් චුල්ලනාරද කාශ්‍යප ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

එසමයෙහි වනාහි අප මහබෝසතාණෝ සවස් වේලෙහි ඵලාඵල ඇර ගෙණ අවුත් පන්සලට වැද දොරහැර පුතනුවන් චුල්ලතාපසයන්ට කියන්නේ පුත, තෙපි මෙතෙක් දවස් දර ගෙණව නහන බොන පැන් ගෙණෙව, ගිණි දල්වව, අදවූකලී කිසිවකුත් නොකොටම කුමක් නිසා දුර්මුඛව සිටිවිලි ගෙණ හුන්නාදැ?සි' විචාළේය. එබස් අසූ චුල්ලතාපසයෝ කියන්නෝ "පියාණන් වහන්ස, නුඹවහන්සේ ඵලාඵල ගෙණෙන්ට ගිය කල්හි එක් ස්ත්‍රියක් ඇවිත් පොළඹවා හැරෙණයන්ට පටන්ගත. මම නුඹවහන්සේගෙන් අවසර ගෙණ යෙමි සිතා නොගියෙමි. අසවල්තැන ඒ ස්ත්‍රී හිඳුවා ආමි, පියාණන් වහන්ස මම දැන් යමි' කිවුය.

එබස් අසා මහබෝසතාණෝ "මොහු නවතන්ට නොපිළිවනැ"සි සිතා "එසේවිනම් දරුව යව, මේ ස්ත්‍රිය තොප ගෙණගොස් යම් දවසෙක මත්ස්‍ය මාංස කනු කැමති හෝ වේදැ සි තෙල් තලතෙල් ලුණු සාල් ආදියෙන් හෝ ඇට ප්‍රයෝජනයක්වේද? එදවස් මේ මේ දෙය ගෙණෙව"සි කියා නොපට පිඬා කෙරේද? එකල මාගේ ගුණ සිහිකොටලා අවුත් මෙතනම වාසය කරව"සි කියා අවසරදී යවූහ. චුල්ලතාපසයෝ ඇ හා සමග මනුෂ්‍යපථයට ගියෝය.

එකල ඒ ස්ත්‍රී ඒ තාපසයන් තමා වසඟයට පමුණුවා "මිස් ගෙණව'සි කියා යමකින් යමක් ප්‍රයෝජන ඇත්නම් ඒ මත්ස්‍යමාංසාදිය ගෙන්වන්නීය. එකල්හි චුල්ලතාපසයෝ මෝතොමෝ තමාගේ කොල්ලකු ලවා බැලමෙහෙකර වන්නෙක් මෙන් නොයෙක් දෙය ගෙන්වා පිඬා කරන්නීය සි එතනින් නික්ම පියාණන් සමීපයට ගොස් නමස්කාර කොට සිටිපලම් සිට මෙසේ කිවුය. 'පියාණන් වහන්ස නුඹවහන්සේ සමීපයෙහි හිඳ සැපසේ ජීවත්වන්නාවූ මා වසඟයෙහි පමුණුවා සිතව තැවුල් කරමින් තමා හා කැටිව කැදවාගෙණ ගොස් නැවත මට පිඬා කරන්නියක් මෙන් යමක් යමක් කැමතිවිනම් ඒ මත්ස්‍යමංසාදිය මා ලවා ගෙන්වමින් ලිදෙන් පැන් උකාගන්නාවූ තුලාවක් මෙන්ද සැලින් පැන් උකාගන්නාවූ දුලුවක් මෙන්ද කැමති කැමති ඒ වස්තු මාලවා අද්දවන්නීය තවද මෙසේවූ ස්ත්‍රී මා කෙරෙහි ස්නෙහ ඇත්තීය, කාමයෙන් මිහුරුවූ වචනයෙන් පොළඹවාගෙණ තමා වසන තෙනට ගොස් තෙල් හා ලුණු ඇඹුල් සහල් ආදීවූ පසු යමක් යමක් කැමතිවිනම් ඒ සියල්ලම මා අතින් අල්ලා කොල්ලෙකු මෙන් බාලයකු මෙන් කොට මා ලවා ඒ සියල්ලම ගෙන්වන්නීය"සි ඒ ස්ත්‍රියගේ නුගුණ කීවාහුය.

එකල්හි මහබෝසතාණෝ චුල්ලතාපසයන් අස්වසාලා "වන්නාට පුත මෙසේ එව තෙපි මෙතැන් පටන් මෛත්‍රී වඩව, කරුණා වඩව"සි සතර විහාර භාවනාවන් කීවාහුය.

චුල්ලතාපසයෝ නොබෝ දවසකින්ම පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා චතුර්විධ බ්‍රහ්මවිහාර භාවනාවන් කොට පියාණන් හා සමග ගොස් බ්‍රහ්මලොකයෙහි උපන්නාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා දුඃඛසත්‍යය, සමුදයසත්‍යය, නිරෝධසත්‍යය, මාර්ගසත්‍යය සි කියනලද චතුරාර්ය සත්‍යය ප්‍රකාශකොට මේ උදංචනි ජාතකය නිමවා වදාළසේක.

චතුස්සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර ඒ මහණ සොවාන්පෙලෙහි පිහිටියේය.

"එසමයෙහි ථුල්ලකුමාරිකා නම් දැන් ථුල්ලකුමාරිකායය, චුල්ලතාපසයෝ නම් උකටලී මහණය. එසමයෙහි චුල්ලතාපසයන්ගේ පියවූ තාපසයෝ නම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

## 106 සාලික ජාතකය.

තිවද එක්සමයෙක්හි සුබාස්පදවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර වසනසේක් අතකුරු ගැසීමෙහි දක්ෂ කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වාසී එක් කුලපුත්‍රයෙක් අතකුරු ගැසීමෙහි දක්ෂවිය. ඒ තෙම එක්දවසක් බුදුරජානන් වහන්සේ වදාරන්නාවූ ධම්දෙසනාව අසා ශාසන යෙහි ලැදිව මහණව උපසම්පදාව ලද්දේය, උපසම්පදාව ලත්බව විනා ශික්ෂා කාම් නොවනසේක් ප්‍රතිපත්ති සාරයක් නොවනසේක.

ඒ භික්ෂූන්වහන්සේ එක්දවසක් ලදරු භික්ෂූන් වහන්සේ කැඳවාගෙණ අවිරවතී නම් ගංඟාවට ගොස් පැන් සනහා ගංතෙර සිටිසේක.

එසමයෙහි ශ්වේතහංසයෝ දෙදෙනෙක් ආකාශයෙන් යන්නාහුය, ආකාශයෙන් යන්නාවූ හංසරාජයන් දෙදෙනා දැක වැඩිමහලු භික්ෂූන්වහන්සේ බාලභික්ෂූන්ට කියනසේක් "මේ පස්සෙහි යන්නාවූ හංසයා අතකුරකින් ඇස ගසා පාමුල එලම්දැ"යි කිසේක.

අන්‍යවූ බාලමහණ කියනසේක් "කෙසේ ගසා එලනසේක්ද? ගසා එලන්ට නුඹවහන්සේට නොපිළිවතැ"යි කිසේක. අන්‍යවූ වැඩිමහලු භික්ෂූන් වහන්සේ එබස් අසා කියනසේක් "ඇවැත්නි ඒ හංසයාගේ මෙපිට ඇසතිට තිබියදී දෙවෙනි එපිට ඇසින් ගසා මෙපිට ඇසින් පලවම්" කිසේක.

බාල භික්ෂූන්වහන්සේද "මේ කියන්නේ නැත්තය"යි කී කල්හි "එසේ වීනම් පරීක්ෂාකොට බලා වදාළමැනවැ"යි කියා එක් තුනස් අකුරක් ගෙණ අහා කුරෙන් පැහැර හංසයාගේ පෙදගොල්ල දිශාවට ගැසුසේක ඒ ගැසූ අකුර රූ රූ යන අනුකරණධ්වනි පවත්වමින් බුරාගෙණ අවුත් පෙදගොල්ල සමීප වූයේය.

එකල්හි හංසයා "උපද්‍රවයක් වියයුතුය යි සිතා කරකැවී අතකුර ගලේ ශබ්දය අසන්ට පටන්ගත. එසොණෙහි ඒ භික්ෂූන්වහන්සේ එක් වට අකුරක් ගෙණ හංසයා කරකැවී බලන තැනැත්තහුගේ ඒ පිට ඇසට ගැසුසේය. ගසන ලද අකුර පිට ඇසින් වැදගෙණ මෙපිට ඇසින් බඳ පලා ගියේය. හංසයා අඬ මින් පාමුල වැටී ගියේය.

එකල්හි ඒ ඒ තැනින් භික්ෂූන්වහන්සේ අවුත් නිහඬකොට "නොප විසින් කළසේ නපුරැ"යි කිය කියා සම්බුදුන් වහන්සේ සමීපයට කැඳවාගෙණ ගොස් 'ස්වාමීනි, මේ භික්ෂූහු විසින් මෙතම් දෙයක් කරණලදැ"යි එපවත් දැන්වූසේක.

එකල්හි සර්වඥයන් වහන්සේ ඒ භික්ෂූන්ට නින්දාකොට "මහණෙනි, මොහු අතකුරු ගැසීම් ශිල්පයෙහි දක්ෂවූයේ දැන්මතු නොවෙයි පෙරත් දක්ෂ වීය"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහබෝසතාණන් ඒ රජ්ජුරුවන්ට අමාත්‍යවූහ.

එසමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රහ්මණයා ඉතා මුඛරිය, බහු භාණ්ඩිය, ඔහු කථාකරන්ට පටන්ගත්කල්හි අවශෙෂයන්ට කථාවට අවසරයක් නොලැබේ. එකල රජ්ජුරුවෝ සිතන්නෝ "මොහුගේ කථාවිච්ඡදඝකරන්ට නිසිවූ කවරක්හු කවර දවසක ලැබෙම්දෝහෝ' සිතා එතැන්පටන් එබඳු එකක්හු පරීක්ෂාකරමින් ඇවිදිති.

එසමයෙහි බරණැස්නුවර එක් පිළුවූ පුරුෂයෙක් අතුරු ගැසීමෙහි දක්ෂ වීය. එනුවර කුඩා කොල්ලෝ ඒ පිළුම්නිසා රථයක ලාගෙණ ඇවිදිමින් බර ණැස්නුවර වාසල්දොර සමීපයෙහිවූ සාඛාවිටප සම්පන්නවූ මහත් නිග්‍රොධ වෘක්ෂයෙක් ඇත. එතනට ගෙණවුත් ඔහු පිරිවරා සිටිති. දෙවියට සමාරක අඛමදව යනාදී රන් මිලදී "ඇත්රුවක් කරව, අස්රුවක් කරව"යි කියති. ඒ පිළා අතකුරු ගස ගසා නුගපත්වලට ගසති සිංහ සවරූප මෘගසවරූප පක්ෂි සවරූපාදීවූ අනෙකප්‍රකාර රූපයන් දක්වන්නේය. ඒ නිග්‍රොධ වෘක්ෂයෙහි සියලු පත්‍රයෝ ඡිද්‍රව පෙණෙන්නාහුය.

එකල්හි රජ්ජුරුවෝ උද්‍යානක්‍රීඩාවට යන්නාහු ඒ සථානයට පැමිණි යෝය. ඒ පිළුපුරුෂයා වවලාගෙණ සිටි කුඩා කොල්ලෝ රැකවලුන් ගසා ඉවත්කරන්නාහු හයින් හැමදෙනම ඒ ඒ තැන පලාගියෝය. පිළුපුරුෂයා නුගගසමූල වැදහොත්තේය. රජ්ජුරුවෝ නුගගස මූලට ගොස් රථයේ හිඳම පත්සිදුරු බැවින් ඡායාව විරල විරලව තිබෙන්නා දැක උඩබැලු තැනැත්තෝ සියලු පත්ම සිදුරු සිදුරුව තිබෙන්නා දැක "මෙසේ කළෝ කවුරුදැ?"යි විවා ළෝය. ඒක පරීක්ෂාකරන්නාවූ රාජපුරුෂයෝ "දෙවයන් වහන්ස, පිළකු විසි නැ"යි කීකල්හි මේ පිළා නිසා පුරෝහිත බ්‍රාහ්මණයාගේ මුඛරි බව හා බහු භාණ්ඩික බව ඔබවාපියන්ට පිළිවන් වන්නේය"යි සිතා "පිළා කොයිදැ?"යි විවාළෝය.

එකල පරීක්ෂාකරන්නාවූ රාජපුරුෂයෝ මුල්හස්සේ වැදහොත් තැනැත් තහු දැක "දෙවයන්වහන්ස, පිළා මේ වෙදැ"යි කිවුය. රජ්ජුරුවෝ ඔහු සමීප යට ගෙන්වා පසිත් ඉවත් කරවා විචාරන්නෝ "අප සමීපයෙහි මුඛරිබමුණෙක් ඇත, ඔහු නිශ්ශබ්ද කරන්ට පිළිවන්දැ?" යි විවාළෝය. "සවාමීනි, එළුබෙටි නැලියක් ලද්දෙම් වීනම් නිශ්ශබ්ද කරන්ට පිළිවන. දෙවඟන්වහන්සැ'යි කිවුය.

රජ්ජුරුවෝ පිළා මාලිගාවට කැඳවාගෙණ ගොස් තිරයක් ඇතුළෙහි හිඳුවා තිරය සිදුරුකොට බමුණා තිරය අභිමුඛකොට හස්සක් පතවානාලියක් පමණ වියලි එළුබෙටි පිළා සමීපයේ තබ්බවා පුරෝහිත බ්‍රාහ්මණයා රාජසේව යට ආ තැනැත්තහු ඒ අස්නේ හිඳුවා කථා ඉපදවූය

බම්මණු අනික්කෙනෙකුන්ට අවසරයෙක් නොදී රජ්ජුරුවන්සමග කථා කරන්ට පටන්ගත්තේය. එකල්හි පිළා හිරය සිදුරෙන් එකි එකි එළබෙට් ගසා ඇම නිමගියේය. බම්මණුගේ බඩට වත්නාවූ නැලියක් පමණ එළබෙට් ගලනතුරුත් කිසිවකුත් නොදැනම දැන් මෙයින් මත්තෙහි එළබෙට් ගැල දිරවා ගත්ට අසමර්ථවේය. එසේ නෙයින් "ගෙට පලාගොස් පුවහු ගෙන්වාගෙණ කොටා යුෂ මැඩ පැන් හා කලන්දු කොට බී වමකය කොට නොපගේ ශරීරය නීරොගකොට සවසථකොව ගණුව"යි කිවුය.

බම්මණු එහැන් පටන් මුඛය වසාගත්තාක් මෙන්ම කථාකරන්නාවුන් සමගත් කථාකරණුයේ. රජ්ජුරුවෝ "මොහු විසින් මව කණී සැපය කරණ ලදැ"යි පිළාට අවුරුද්දකට ලක්ෂයක් නිබවන්නාවූ සතරදිගින් ගම් සතරක් දුන්නාහුය.

එකල්හි මහබෝසතාණෝ රජ්ජුරුවන් කරා එළඹ "දෙවයන් වහන්ස, ශිල්ප නම් ලෝකයෙහි නුවණැත්තන් විසින් උගනයුත්තේය. පිළා විසින් අතකුරු ගැසීමෙහි දක්ෂවීමෙනුත් මෙතෙක් සම්පත් ලබනලද්දේය"යි කියා "මේ ලෝකයෙහිකවරක්වී නමුත් යම් යම් ශිල්පයක් ඉගැන්ම යහපත්වන්නේ ය"යි "මහරජ්ජුරුවන් වහන්ස, බලා වදාළ මැනව, මේ කොරපිළුවූ පුරුෂයා විසින් එළබෙට් අතකුරෙන් ගැසීමෙන් සතරදිගින් ගම්වට සතරක් ලබන ලද්දේවේද? එසේ නෙයින් සෙසු ශිල්පයෙහි අනුසස් කෙළවරක් ඇද්ද?" යි කියා ශිල්පයෙහි ගුණ කීවාහුය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධම්දෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ සාලිකා ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි පිළා නම් දැන් මේ හංශ සාතක මහණය, රජ්ජුරුවෝ නම් ආනන්ද සථවිරයෝය, නුවණැති අමාත්‍යවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ'යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 107
## බාහ්‍ය ජාතකය

තවද එක්සමයෙක්හි සුරාසුරවර වක්‍ර වාරුචූඩාමණිමරීචිසංචය පරිචුම්බිත චරණ නඛ මයූඛ ඇති ලොකසවාම්වූ තිලෝගුරු සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ විසාලාමහනුවර නිසා මහාවනයේ කූටාගාර ශාලාවෙහි වැඩ වසනසේක් එක් ලිච්ඡවි රජ්ජුරු කෙනෙකුන් අරභයා මේ ජාතකය වදාළසේක.

ඒ ලිච්ඡවී රජ්ජුරුවෝ ශ්‍රද්ධාසම්පන්නයෝය. රත්නත්‍රයෙහි ප්‍රසන්න යෝය. බුද්ධමාමකය, ධම්මමාමකය, සඞ්ඝමාමකය නිරන්තරයෙන් අඛණ්ඩවූ පඤ්චශීලය රක්ෂාකෙරෙති, පොහොය නොවරදවා පෙහෙවස් රක්ෂාකෙරෙති, ඒ රජ්ජුරුවෝ එක් දවසක් බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂුසඞ්ඝයා වහන්සේට ආරාධනා කොට මහදන් සරහා තමන්ගේ මාලිගාවත් විශෙෂකොට සරහා මාලිගාවේදී බුදුපාමොක් මහසඟ පිරිසට මහදන් දුන්නාහුය.

ඒ රජ්ජුරුවන්ගේ බිසව් ස්ථූල අඞ්ගප්‍රත්‍යඞ්ග ඇත්තෝය; උඩුමාතක අසුභ නිමිත්තක් මෙන් ආකල්ප සමාධියක් නැත්තෝය. ස්ථූල ශරීර හා මහත්වූ උස මහා ඇත්තෝය, බුදුරජානන් වහන්සේ අනුමෙවෙනි ධර්මදේශනා කොට විහාරයට ගොස් භික්ෂුසඞ්ඝයා වහන්සේට අවවාදදී ගදකිළියට වන්සේක. දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන්වහන්සේ කථාවක් උපදවනසේක් "ඇවැත්නි, එබඳු සැදුහැ ඇති විශිෂ්ට රූ ඇති රජ්ජුරුවන්ගේ බිසව් බැලූ බැලූ වන්ට ප්‍රසාදඵලන්නාවූ රූපශ්‍රියක් නැත්තෝය. ස්ථූලවූ ශරීර ඇත්තෝය, ආකල්ප සමාධියක් නැත්තෝය; රූවක් පිණක් නැත්තෝය, එසේවූ බිසවුන් හා සමග කෙසේ නම් මේ රජ්ජුරුවෝ අභිරමණය කෙරෙද්දැ?"යි මෙසේවූ කථාවක් ඉපදවා උන්සේක.

එකල්හි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ තුන්තරාගමනින් එක්තරා ගමනකින් දම්සභාමණ්ඩපයට වැඩවදුරා පණවන ලද බුද්ධාසනමස්තකයෙහි යුගදුරු මුදුනෙහි දිලිහෙන්නාවූ ලහිරුමඬලක් මෙන් දිලිහි දිලිහී වැඩහිඳ "මහණෙනි, දැන් මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදැ"?යි කවර නම් කථාවක් නොපට අඩාලද?"යි විචාරා "ස්වාමීනි, නුඹවහන්සේ විසින් නොකියන්ට වදාළාවූ රාජකථා චොරකථා යනාදී දෙතිස්කථා අතුරෙන් එක් තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, ශ්‍රද්ධාසම්පන්නවූ බුදුහු මාගේ මය, ධර්මය මාගේමය, සඞ්ඝයා මාගේමය,යි කියා රත්නත්‍රයෙහි මමත්වය කොට වසන්නාවූ ඉතා රූපත්වූ මේ ලිච්ඡවිරජ්ජුරුවෝ රූපශ්‍රියක් නැත්තාවූ ආකල්ප සමාධියක් නැති මේ ස්ථූලවූ ශරීර ඇති බිසවුන් හා සමග කෙසේ නම් සංවාසයක් කෙරෙද්දැ?"යි මෙසේවූ කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි 'මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් මේ ලිච්ඡවිරජ්ජුරුවෝ ස්ථූලවූ ශරීර ඇති ස්ත්‍රියක් හා සමග අභිරමණය කළෝ නොවේදැ?"යි වදාරා මුවෙන් නොබැණ වැඩහුන් කල්හි ඉක්බිත්තෙන් එතනට රැස්වූ ඇමදෙනාවහන්සේ අතුරෙන් එක්කෙනෙකුන් වහන්සේ නැගිසිට සුපිළිසන්ව මහා කොට දස නඛසමෝධානයෙන් බද්ධාඤ්ජලීව දෙහොත්මුදුනේ තබාගෙණ ඵලහාර යෙන් නැමුනාවූ කදලිවෘක්ෂයක් මෙන් නමිනව බුදුරජානන් වහන්සේ අෂ්ටොත්තර ශතමඞ්ගලයෙන් සල්ලක්ෂණව විරාජමානවූ ශ්‍රීපාද ද්වන්දය වැඳ එකත්පස්ව සිට දන්වනසේක් "ස්වාමීනි, දැන් මෙසේ සැදුහැ ඇති රූපත්වූ ලිච්ඡවි රාජකුමාරයන් ස්ථූලවූ ශරීර ඇති ප්‍රසාදවූ මේ බිසවුන් හා සමග සංවාසය කරණ නියාව සියල්ලන්ට ප්‍රකාශය. අතීතයෙහි විරූපවූ ස්ථූල ශරීර ඇති ස්ත්‍රීන් හා සමග අභිරමණය කළ නියාව හස්මයෙන් ප්‍රච්ඡන්නවූ ජාත වේදයක් මෙන් වලාකුළෙන් සැඟවී තිබූ පුන්සඳමඬලක් මෙන්ද පාංශුවෙන් ප්‍රච්ඡන්නවූ ජාතිරඞ්ගමාණික්‍යයක් මෙන්ද භවයෙන් ප්‍රච්ඡන්න හෙයින් අප ඇමදෙනා වහන්සේට අප්‍රකාශය, ඒසේහෙයින් ඒ කථාසවරූපය හිමගර්භයක් පලා පුන්සඳමඬලක් ගෙණහැර පානා කලක් මෙන් ඒ අතීතකථාව ගෙණහැර දක්වා වදාළොත් යහපතැ"යි ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුන් ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍ය කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතානෝ බරණැස් රජ්ජුරුවන්ට අමාත්‍යවූය. එකල්හි ජනපද වාසීවූ එක් ස්ත්‍රියක් ස්ථූලවූ

ශරීර ඇත්තීය, ආකල්ප සමෘධියෙක් නැත්තීය. අනුන්ට බැලමෙහෙ කොට ඇවිදිනීය, රාජාඞ්ගනය සමීපයෙන් යමින් සිට ශරීරවලංජනයෙන් පීඩිතව අත් කඩින් ශරීරය වසාගෙණ මලමූත්‍ර බාහ්‍යකොට තැගී සිටියාය, එකෙණෙහි බර ණැස් රජ්ජුරුවෝ සිවුමැදුරුකවුළුව හැර රාජාඞ්ගනය බලන තැනැත්තෝ ඒ ස්ත්‍රිය කළාවූ ක්‍රියා දැක මෙසේ සිතූහ.

"මේ ස්ත්‍රී මෙබඳුවූ එලිපිට අඞ්ගනසථානයෙහි ශරීරවලංජනය කරන්නී භය ලජ්ජා දෙකට නොහැර අත්කඩින් ශරීරය වසාගෙණ හිඳ මලමූත්‍ර බාහ්‍ය කොට වහා නැගී සිටියාය. එසේහෙයින් මෑ නීරොග වියයුතුය, මැගේ වස්තු විසඳ බව වන්නේය, විසඳවූ වස්තුවෙහි වූකලී එක්පුත්‍රයෙක් උපන්නේ වීතම් විසඳව පිණැතිවන්නේය, එසේහෙයින් මේ ස්ත්‍රිය මා විසින් අගමෙහෙසුන් තන තුරෙහි තබන්ට වටනේය"යි සිතා ඒ රජ්ජුරුවෝ ඇ අසඞ්ඛ්‍යාමික නියාව දූන සමීපයට කැඳවා ගෙන්වාගෙණ රුවන් රැසක් මත්තේ සිටුවා මස්තකයෙහි අභි ෂෙක ජලය වත්කොට අගමෙහෙසුන් තනතුරෙහි තිබුවාහුය.

ඒ බිසව් රජ්ජුරුවන්ට අතිශයින් ප්‍රියව සිත්කළුව මනවඞ්මින් නොබෝ කලකින්ම එක් කුමාර කෙනෙකුන් වැදූය. ඒ බිසවුන් වැදූ ඒ රාජකුමාරයෝ පිය රජ්ජුරුවන්ගේ ඇවැමෙන් චක්‍රරත්නාදිවූ සප්තරත්නයෙන් සමන්විතවූ මුලු සක්වළ එකාත්‍රපත්‍රකොට චක්‍රවර්ති රාජ්‍යශ්‍රී අනුභව කළාහුය.

එකල්හි මහබෝසතාණෝ ඒ බරණැස් රජ්ජුරුවන්ගේ බාහිය තම්වූ දනව්වැසි බිසවුන්ගේ යශ සමෘධිය දැක එබඳුවූ කථාවක් කරන්ට සුදුසු අවසර යක් ලදින් රජ්ජුරුවන් දැක වැඳ එකත්පස්ව සිට "දෙවයන් වහන්ස, උගත මනා ශිල්පය තම් කුමක්නිසා නුගතයුතුද? මම් මේ පිටත දනව්වැසි බිසවුන්ගේ මහත් කුසල් ඇත්තාවූ භය ලජ්ජා සහිතව අත්කඩින් සකල ශරීරය වසාගෙණ පිළිසන් ආකාරයෙන් ශරීර කෘත්‍යය කොට මෙබඳු කුසල් ඇත්තාවූ දෙවඟනන් බඳු වරඟනන් සොළොස් දහසකට නායකව චක්‍රවර්ති රාජ්‍යශ්‍රී අනුභවකරන්ට පුතනු කෙනෙකුන් වඟන්සේ ලැබ ප්‍රමාණාතික්‍රාන්තවූ යසපිරිවරින් හා ශ්‍රී සමෘධියෙන් යුක්තව අග්‍රමහෙසිකාසථානයට පැමිණියේක.

උන්වහන්ස් මේසා මහත්වූ ඓශ්වර්‍යයකට පැමිණියේක් වේද, එසේ හෙයින් ලෝකයෙහි උගතමනා ශිල්පයෙක් ඇත්තම් උගතමනා යුතුමයයි ශිල්පශාස්ත්‍ර උගන්නාවූ සත්ත්වයන්ට වර්ණනාකරන්නාහු මෙසේ කිවුය. "රජ් ජුරුවන් වහන්ස, මේ ලෝකයෙහි අක්ෂර ලිඛිත ගණිත ගාන්ධර්ව නක්ෂත්‍ර ඡන්දස් නිගණ්ඩු අලංකාර යනාදීවූ ඒ ඒ ශිල්පයෙහි විපාකය හා සවච්ඡදිකවූ ශිල්ප ඉගැන්මෙහි බලවත්වූ අභිප්‍රාය ඇති මනුෂ්‍යයෝ බොහෝ ඇත්තාහුමය, එත කුදුවූවත් මා තමාට සුදුසු සවල්පමාත්‍රවුවත් ආචාර ශීලය විවරකුත් ඉගෙණීම් කළමනා දෙය යි එහි ඇදහිල්ලක් ඇතුව නොපිරිහෙළා කරන්නාවූ සත්ත්ව කෙනෙක් ඇත්නම් එසේවූ සත්ත්වයන්ට ඉහාත්ම භාවයෙන්ම ඉෂ්ටවිපාක වන් නේය. ඒ එසේම වේදැ යි පිටත දනව්වෙහි වැඩී වඩිනවූ බිසවුන්වන්සේ භය ලජ්ජා සහිතව ආචාරශීලය නොපිරිහෙළා කරන්නාවූ ක්‍රියාවෙන් නුඹවහන් සේගේ සිත් මෙසේ මහත්වූ සමෘධියකට පැමිණියේක් වේදැ"යි කියා මහ බෝසතාණෝ උගතමනා ශිල්පයෙහි ඉෂ්ටවිපාක හා ගුණ විශෙෂයෙන් ප්‍රකාශ කොට කීවාහුය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා දුඃඛ සත්‍යය සමුදය සත්‍යය නිරෝධසත්‍යය මාර්ගසත්‍යය යි කියනලද චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශකොට පූර්වාපරසන්ධි ගළපා මේ බාහිර ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවන් හා බිසවුන් මෙසමයෙහි රජ්ජුරුවන් හා බිසවුය. එසමයෙහි රජ්ජුරුවන්ට අර්‍ථයෙන් ධර්‍මයෙන් අනුශාසනා කොට සියලු ලෝකවාසීන්ට කර්‍තව්‍යාකර්‍තව්‍ය කුසල් අකුසල් ප්‍රකාශකොට ලෝවැඩ සාදා දී නුවණින් යෙදී වාසය කළාවූ නුවණැති අමාත්‍යවූයෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ?"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 108 කුඩ්ඩකපූව ජාතකය

තිවද එක්සමයෙක්හි භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැවැත්නුවර වාසීන් එක්ව බුදුපාමොක් මහසංඝයා වහන්සේ පවරා දනක් දෙන ගමනේ නුවර වසන මහාදුගී තම් එකෙක් තමා ඒ දානයෙහි මුසුවන පිණිස තමාට සැපවූනු කුඩු පූවක් සකසා ඉදිකොට බුදුන්ටම පිළිගන්වමි යි සිතා සිටිකලට උපාසකවරුන් කැඳ පිළිගන්වා අවුළුපත් පිළිගන්ව යි කී බස හා සමග පෙරතුයෙන් තමා ගෙණ ගිය කුඩුපූව බුදුන්ට පිළිගැන්වීය.

බුදුහුත් සෙසු මිහිරි අවුළුපත් පිළිගැන්වූවත් නොපිළිගෙණ දුගියා කෙරේ කරුණාවෙන් එම වළඳා වදාරා ජෙතවනාරාමයට වැඩවදාළසේක.

එපවත් රජ යුවරජ සෙනෙවිරත් ආදීවූ ප්‍රජාව අසා මහදුගියා කරාගොස් මිල අරගෙණ පින්දෙවයි පින් ඉල්වූන. එවිට මහදුගියා සිතන්නේ 'මා දුකින් කොටගත් කුසලය බුදුන් විචාරා දෙමි" සිතා බුදුන් කරා එළඹ "මිලගෙණවත් නොගෙණ වත් පින්දීම යහපතැ"යි වදාළ බස් අසා එනුවර වාසීන්ට මිලගෙණ පින්දීමෙන් නවකෙළක් වස්තුව ලද. ඒ නියාව අසා කොසොල් රජ්ජුරුවෝ ඕනව සිටුසේසත් නැංගවූය. එදවස් ධර්මසභාමණ්ඩපයෙහි වැඩ උන් සංඝයා වහන්සේ දුගියා කුඩුපූ පිළිගන්වා සිටුසේසත් ලත් නියාව කිය කියා උන්සේක. එතනට තුන්තරා ගමනින් එක්තරාගමනකින්සර්වඥයන් වහන්සේ වැඩවදාරා පණවනලද බුද්ධාසනයේ වැඩහිඳ "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාළ කල්හි "කොකියන්ට වදාළ දෙතිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ. නුඹවහන්සේට දන් දී මහදුගියා මනාසම්පත් ලත් නියාව කිය කියා උනුම්හ"යි දැන්වූ කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් කුඩුපූවක්දී මහාසම්පත් ලද්දේවේදැ"යි වදාරා ජාතකයට මුඛමාත්‍රයක් දක්වා තුෂ්ණීම්භූතව වැඩඋන් කල්හි හැමදෙනා වහන්සේගේ අනුමැතියෙන් එක් නමක් නැගිසිට සුපිළිසන්ව හැඳපෙරව භක්ති ප්‍රේමයෙන් බුදුන්ට බඩාඤ්ජලිව දොහොත් මුදුනේ තබා වැඳසිට "ස්වාමිනි, දැන්

වනාහී මොහු සම්පත් ලත් නියාව අප හැම දෙනාට ප්‍රකාශව දනෙයි, පළමු කුඩු පුවක් දී මහසම්පත් ලත් නියාව නෙකල් දන් බුදුන්ට මිසක් අපට නොදනෙයි, දක්වා වදාළොත් යහපතැ''යි ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් දහැමෙන් රාජ්‍යය කරණ සමයෙහි බරණැස්නුවර වාසීන් ඒ ඒ වෘක්ෂ දෙවතාවන්ට පූජාකොට දවස් හරණා කල්හි එනුවර දුක්පත් පුරුෂයෙක් එඩරාගසක් වට කසල හැර ඒ රුක්දෙවියන්ට ගඳදුම් මල්පහන් බාද්‍යභොජ්‍යාදිවූ දෙය හැරගෙණ යන්නවුන් දැක තමාගේ එඩරාගස දෙවියාට අනික් පුදන්ට නිසි උපකරණයක් නැති හෙයින් තමාට සැපවූනු කුඩුපුවක් දෙවියාට පුදම් යි ගෙණ ගොස් ගස මුලදී සිතන්නේ ''දෙවියෝ නම් දිව්‍යාහාරය අනුභව කෙරෙති. එසේ හෙයින් මෙසේවූ කුඩුපු මාගේ දෙවතාවා අනුභව නොකරන්නේය''යි සිතා ''කවරකාරණයකින් ගෙණයෙම්ද''යි සිතා ''මම්ම ප්‍රයෝජන විදිම්'' සිතා ආපස්සේනික් මූණු කල්හි ඒ ගස වසන දෙවතාවා කියන්නේ තමාගේ අඹී ශරීරයක් දක්වා සිට ''පුරුෂය, තා ලබන්නේ යම් දෙයෙක්වේද? තාගේ දෙවියාත් ලබන්නේත් එයම ය''යි කිය. දෙවෙනිව ඒ කුඩුපුව දෙවතාවාවම පිදීය.

එවිට දෙවතාවා කියන්නේ ''තොප මා ආශ්‍රයකෙළේ කුමක්නිසා ද?'' යි කිකල්හි ''සවාමීනි, මා දුප්පත් විසිනැ' යි කිකල්හි ''එසේවීනම් මේ එඩරුගස වටකොට කරින්කර ගසා නිධාන සැලවල් තිබෙන්නේය. ඒ නිධාන සැලවල් භාරාගෙණ රජ්ජුරුවන්ට පාවා, අද තව සිටුසේසත් ලැබෙයි'' කියා අනුශාසිනා විය.

ඒ පුරුෂයා දෙවතාවා කිලෙස සම්පත් උල්පවාගෙණ රජ්ජුරුවන්ට පැකල්හි ''මෙතෙක් සම්පත් ඇති තැනැත්තෙකුට සේසත් දිය යුතුය''යි කියා සිටුසේසත් දුන්හ. එසඳ මහාසම්පත් ලදින් දැනදීවූ කුසල් කොට කම්වූ පරිදි දෙන් මිය පරලොව ගියෝය. සර්වඥයන් වහන්සේත් දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි දුඃඛිත පුරුෂයා නම් මෙසමයෙහි දුඃඛිත පුරුෂයාමය, එඩරුගස දෙවතාව උපන්නෙම් ලොව්තුරු බුදුවූ මම්මය''යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

---

## 109
## සිහාල ජාතකය

මේ එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ රජගහනුවර නිසා වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තසථවිරයන් වහන්සේ විසින් අලුත මහණවූ පන්සියයක් භික්ෂූන්වහන්සේ ඇරගෙණ ගයා නම් ගඩොඋවෙහි විහාරයක් කොටගෙණ ''සර්වඥයන්වහන්සේ කරන්නේ ප්‍රතිපත්ති නොවෙයි, මා කරන්නේ ප්‍රතිපත්තිමැ''යි කියා සංඝයා වහන්සේ හැරගෙණ වෙනම පොහොය කොට වසන සමයෙහි එක්දවසක් සංඝයාවහන්සේ රාත්‍රිමුඛයෙහි දම්සභා මණ්ඩපයෙහි වැඩහිඳ ''ඇවැත්නි,

දෙවදත්තසථවිරයෝ නැත්තෙන් බොරුගුණ අහවා වාසය කෙරෙති''යි මේ කථාව කිය කියා උන්නැල්හි බුදුරජාණන් වහන්සේ දම්සභාමණ්ඩපයට වැඩවදුරා පණවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ 'මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදාළ කල්හි ''දෙවදත්තසථවිරයන් සංඝභෙද කළ නියාව කිය කියා උනුම්හ''යි සැලකළ කල්හි ''මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් මුසාවාද කීවෝවේදැ''යි වදාරා භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

පිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බරණැස්නුවර නැකත්කෙළි කෙළින්නේය යි විධාන ඇසූ නුවර වාසීන් විසින් දෙවතාවන්ට බලි පිණිස රා මස් ආදීවූ දෙය වීපියේ කෝවකොට තිබුකල්හි එදවස් රැ මත්ස්‍යමාංසගන්ධයෙන් කැණහිල් බල්ලෙක් නුවරට වැද රා මස් කා මත්ව රැ යානොනී පාන්වූකල්හි මේ වේලෙහි පිටත් වීම්නම් බොහෝදෙන කැටමුගුරු ගෙණ මරති සිතා ඝනකාලයක සැඟවී මග බල බලා ඉඳ බොහෝ බොත්තම් යන්තවුන් හා කථාකොට තනිව යන බමුණකු දැක ''බමුණෙ තම් ඉතා ලොහොබි අයෙකැ''යි සිතා බමුණා ලඟට අවුත් ''තොප මා නුවරින් පිටත ගෙණගියේනම් මසුරන් දෙසියයක් නිබුතැන් පාම්'' කියන්නාහු බමුණු 'සැබෑ' යි සිතා තමාගේ උතුරුසළුවෙන් වසා කිසිල්ල අස්සේ සඟවාගෙණ නුවරින් පිටත ගොස් ''සම්පත් පාව''යි කියන්නා කැණහිල් කියන්නේ ''ඇත යන්නා සාමි'' කියා හැරගෙණ ගොස් සුසානභූමියට ගොස් ''මෙතන නිධානය''යි කිය කියා බිමට බැස ''සම්පත් ලබනව තාගේ උතුරුසළුව පාත්කොට බාල''යි තබ්බවා ''තෙල ගසමුල නිධානය කණුව'යි කියා උන් බිමකණුද්දී තෙමේ කඩව නැගී සතරකොණ හා මධ්‍යය හා වර්වස් කොට නැගී ගියේය.

එතන වෘක්ෂදෙවතාවා කියන්නේ ''බමුණ බෙල්ලන් සියයකටවත් මන් නැති කැණහිලා අතින් සම්පත් ගන්ට අවුත් ඉනකඩ වර්වස්කරව ගත් විවරක් වේද? එසේ හෙයින් අඥන බ්‍රාහ්මනය, තොපගේ කඩන් සෝදු ඉස්සෝදු නා තා කළමනා බමුණු කෘත්‍යය කරවයි'' කීකල්හි එලෙසම කොට නුවරට ගියේය යි වදාරා දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි කැණහිල් බල්ලා නම් දෙවදත්තසථවිරයෝය, එසමයෙහි මේ යුක්තිය බලා සිටි වෘක්ෂදෙවතාවා නම් බුදුවූ මම්ම වේදැ''යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 110
## මිතවින්දි ජාතකය

නවද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වඤ්චනාරම්භ තෙර දෙදෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේකි.

ඒ තෙර දෙදෙනා වහන්සේ පිටිසර ජනපදයෙහි ගමක වස්වසන්ට වැඩ උපාසකවරුන් විසින් එලවූ සිවුපසය පිළිගෙණ වස් තුන්මස රඳා ඒ ගම් සැප බැවින් දෙවන අවුරුදු වසුත් ඒ විහාරයේ වැස අන්තයේ සැවැත්නුවරට වැඩි සේක.

ඒ දෙදෙනාවහන්සේ දුටු සංඝයාවහන්සේ "ඇවැත්නි, බුඩුපසථානයට පමාවූයේ ඇයිදැ?"යි කියන්නා "හියතැන පාසු විසින් රැඳුනම්හ"යි වදාළසේක. එදවස් සවස දම්සභාමණ්ඩපයට වැඩි වැඩිමහලු වරුන්වහන්සේ විසින් මේ කථාව කියමින් උන්සේක.

එතැනට බුදුහු වැඩ පණවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ "මහණෙනි, මා එන්නාට පළමු කිතම් කථාවකින් යුක්තව උනුදැ?"යි වදාරා "හිඤුන් වහන්සේ විසින් අසවල් මහලු තෙර දෙදෙතෙකුන් වහන්සේගේ කුසිතභාවය කියමින් උනුම්හ'යි කී කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් ඔහු දෙදෙන කුසිතවූවෝම වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බාරාණසි ගංඉස් වන ප්‍රදේශසථානයෙහි වසන බහුචින්තිය, අල්පචිනතිය, මිතවින්තිය යන මත්ස්‍යයන් තුන්දෙනෙක් මනුෂ්‍යපථ ආසන්නව ගඟ වසන කල්හි ඉන් මිතවිනති නම් මත්ස්‍යයා කියන්නේ "මනුෂ්‍ය යන්ට ආසන්නව විසීමතම් උපද්‍රවයට කාරණය'යි කියන්නා අනික් මත්ස්‍යයෝ දෙදෙන තෘෂ්ණාවෙන් ලෝභීව "අද යම්හ, සෙට යම්හ"යි කිය කියා තුන් මසක් දවස් යැවූ කල්හි එක් දවසක කෙවුලෝ ගඟ අහුරා දැල් එලූහ.

බහුචිනති අල්පචිනතිය යි කියන මත්ස්‍යයෝ දෙදෙන ඉදිරිව යන්නාහු දැල ආඝ්‍රාණය කොකොට ගොසින් දැලෙහි බැඳුනුවුය. පස්සේ යන මිතතවිනති නම්වූ මත්ස්‍යයා දැල ආඝ්‍රාණය කොට දැල ඇතුළට නොවැද දැල ඇසින් අනික් පිටට ගොස් සිතන්නේ 'මා කියමන් නොගෙණ මත්ස්‍යයෝ දෙදෙන අසුවුය. උන් ගලවන්ට උවමැනවැ"යි සිතා ඇතුළේ සිට පිටව පැන්නා සේ අඟවා පැන පිටත සිට ඇතුළවත් මේ සැටියෙම්ම පැන දිය පලාගෙණ කවා ගියකල්හි "මහමසුන් බැඳුනු හෙයින් දැල ඉරුනේවනැ"යි සිතා දැල එකපිටකින් එසෙව් කල්හි මත්ස්‍යයෝ දෙදෙන දැලින් ගැළවුනාහ"යි වදාරා දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාරා චතුසසත්‍යය ප්‍රකාශකොට බණ වදාළ කල්හි මහතෙර දෙදෙනාම දහසක් නසින් ප්‍රතිමණ්ඩිතව සෝවාන් පෙලෙහි පිහිටිසේක.

"එසමයෙහි බහුචින්තිය අල්පචින්තිය යන මත්ස්‍යයෝ නම් මේ තෙර දෙදෙනාය, මිතවින්ති නම් මත්ස්‍යව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 111
## සකුණ ජාතකය

තිවද සැවැත්නුවර සර්වඥයන් වහන්සේ වැඩවසන සමයෙහි එක්තරා කුලසත්‍රියක් නිඝණ්ඨ ශාසනයෙහි මෙනෙණිව තෘෂ්ණාවෙහි ගිජුව වසනසේක්

මෙහෙණිතැන් නොකැඩී වීපියක සිඟාවැඩ එහි උපාසකවරුන් විසින් මහිරි ආහාර වළඳා දවස්හරණසේක් "මේ වීපියට අනික් මෙහෙණිකෙනෙකුත් වහන්සේ වැඩිසේක් නම් මට ආහාරය මෙබඳු නොලැබෙයි. එසේහෙයින් ඊට මහාකුලක් කෙරෙමි සිතා මෙහෙණිවරට ගොස් අසවල් තැන වීපියේ වණ්ඩවූ ඇතුන් අසුන් කඩා කන බල්ලන් ආදී වූවන්ගෙන් උපද්‍රව ඇත, ඒ වීපියේ කවුරුන්වහන්සේත් නොයන බවය"යි කියන්නා එබස් ඇසූ මෙහෙණින් වහන්සේලා 'කිවේ ඇත්තෙකැ"යි සිතා වීපියෙන් යන්නා තබා කරකැවී බලන්නකුත් නොකළසේක.

එසමයෙහි ඒ කියන මෙහෙණින්වහන්සේ තනිව සිඟා වළඳා ඇවිදිනා කල්හි එක්දවසක් එක්ගෙයකට සිඟාවඩනා ගමනේ බැවළුවෙක් දිව අවුත් ඇන කලවය ඇටබිඳ එලූකල්හි එතන සිටි උපාසකවරු අල්වා කැඩිගිය ඇට සන්ධි ගන්වා බැඳගෙණ ඇදක ලා ගෙණගොස් මෙහෙණිවරළුහ.

මේ කථාව නිසූන්වහන්සේ කෙරෙහි ප්‍රකාශවිය. එදවස් දම්සභා මණ්ඩපයෙහි වැඩඋන් සංඝයාවහන්සේ "අසවල් මෙහෙණි අනුන්ට අවවාද කියා තමන්ගේ පය බිඳවාගතැ"යි කිය කියා උන්තෙනට සමීඥයන්වහන්සේ වැඩමවා "මා එන්නාට පළමු කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා "මෙහෙණින්නගේ කථාව කිය කියා උනුම්හ"යි දැන්වූ කල්හි "දැන්මතු නොවෙයි පෙරත් අනුන්ට අවවාද කිය කියා තුමූ මළහ"යි වදාරා ආරාධිතවූ බුදුහු ඉකුත්වත් දක්වා වදාළසේක.

පීවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ පක්ෂීන්ට රජව උපන්සේක. ඉන් එක්තරා පක්ෂිධෙනුවක් ගොදුරු බොහෝව ලැබෙයි. මාවනක ගොදුරු කා ඇවිදිනී එක්දවසක් "මේ මගට අන්‍ය පක්ෂිකෙනෙකුත් වැද්ද නොදෙමි" සිතා පක්ෂීන්ට පලාගොස් "අසවල් මාවත ඇතුන් අසුන් රථ අදින ගොන් ආදීන්ගෙන් උපද්‍රව බොහෝය"යි කියන්නීය.

ඒ ඇසූ පක්ෂිහු ඒ දිසාවට නොගියවිරුහ. තමා ඉච්ඡාපරව ඇවිදිනී එක්දවසක් පවතවබඳු වේගයෙන් රථයක් පදිනවා දැක කරකැවී බලා තවදුර ය යි සිතා කරබාගෙණ ගොදුරු කමින් සිටිකලට වහා අවුත් රථය පැමිණි කලට පියාසරකරන්ට අසමර්ථව දෙකක්ව තෙරපී මළහ. බොධිසත්ත්වයෝ පක්ෂිගණයා පරිවරා ආකාශයෙන් යන්නාහු පක්ෂීන් සමන්වා මෙකීයන පක්ෂි ධෙනුව නොදැක අසවල් අවවාද කියන පක්ෂිධෙනුව බලා මහමාවත මියපියා වැදහොත්හී දැක "අනුන්ට අවවාද කියා තෘෂ්ණාවට වසඟව මළාය"යි වදාරා වනයට වැඩිසේක.

"එසමයෙහි අවවාද දෙන පක්ෂිණී නම් මේ කියන මෙනෙණිය, එසම යෙහි පක්ෂිව උපන්නෙමි වනාහි බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 112 දුබ්බච ජාතකය.

එවද එක්සමයෙක්හි සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් නොකීකරු භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදාළ සේක. මේ ජාතකය නවවැනි නිපාතයෙහි ගිජ්ඣ ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. සම්බුදුරජාණන්වහන්සේ ඒ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට "මේ මහණ දැන් මතු නොවෙයි නොකීකරු වූයේ, පෙරත් නොකීකරුමය"යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පච්චුප්පන්න දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ කරණම්පනින විද්‍යාත් කුලයක ඉපිද වැඩිවිය පැමිණ කරණම් නිමවා ඉගෙණ ගුරුන් හා සමග ඒ ඒ තැන ඇවිදිනාසේක් එක්තරා ගමකට පැමිණ ආචාරීන් විසින් ශිල්ප දක්වන්නට ආයුධ පසක් බිම හිඳුවා පනින්ට සරා "මෙතෙක් දවස් අභ්‍යාසය පනින්නේ ආයුධ සතරය, පසක් කෙළේ ඇයිදැ?"යි "එකක් හළමැනවැ"යි කියන්නා රාමදයෙන් මත්ව ඒ ආචාරී "තෙපි මාගේ පමණ නොදන්නවාදැ"යි කියා ආයුධ සතර පැන පස්වන ආයුධය ඇනී මළාහ.

ඒ දුටු ශිෂ්‍යයා "මා කියමන් නොගෙණ ආචාරීහු මළහ"යි ආයුධයෙන් ගලවා ආදහන කරවූහ යි දෙකල් ගලපා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ආචාරී නම් නොකීකරු මහණය, ශිෂ්‍යව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 113 තිත්තිර ජාතකය.

එවද ජේතවනාරාමයෙහි සම්බුදුරජාණන් වහන්සේ වැඩවසන සමයෙහි දෙවදත්ත සථවිරයන්ගේ දක්ෂිණ ශ්‍රාවකවූ කෝකාලික සථවිරයන් නිසා මේ ජාතකය දක්වන ලදී. එහි වර්තමාන කථාව තෙරස නිපාතයෙහි විස්තර වශයෙන් එයි. සම්බුදුරජාණන්වහන්සේ 'මහාකෝකාලික සථවිරයෝ බොහෝ කොට බස් කීමෙන් පෙරත් ජීවිතක්ෂයට පැමිණියෝම වේදැ"යි ඉකුත්වත් දක්වා වදාළසේක.

පච්චුප්පන්න දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ ප්‍රසිද්ධ බ්‍රාහ්මණකුලයක ඉපද වැඩිවිය පැමිණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට ගණ නායකව හිමාලය වනයෙහි වසනසේක.

එසමයෙහි පාඞ්ගුරෝග ඇති තාපසකෙනෙක් ගිනිතපිනා නිසා පොරවක් ඇරගෙණ වලව ගොස් දරපලන්නාහ. එතනට තාපසකෙනෙක් ගොසින් "මෙතනට පලව සි මෙතන පලව"යි යනාදීන් නොයෙක් පරිද්දෙන් කියන්නා කිපී දරපැලුම් උගන්වන්ට ආචාරීකෙනෙක්ද?"යි තියුණු මුවහත් ඇති පොර වින් පලා එකපහරින්ම ජීවිතක්ෂයට පැමිණවූහ.

බොධිසත්ත්වයෝ ඒ තාපසයන් කළ පවත් අසා මළ තාපසයන්ට කළ මනා කෘත්‍යය කරවූහ. තවද බොධිසත්ත්වයන් වසන පන්සල කෙරේ ආසන් නවූ තුඹඟස තිත්වටුවෙක් දවස්පතා මහත්කොට අඩසි ලිහිණිවැද්දෙක් උනේ අඩ අසා අල්වා මරා හැරගෙණ කියේය. බොධිසත්ත්වයන් වහන්සේ උගේ හඬ නාසා 'මෙතෙක්දු අඩන තිත්වටුවා කොයිදැ?"යි විචාරා එපවත් අසා තිත්වටු වාගේ කථාව හා තාපසයන්ගේ කථාව එක්කොට ගාථාව ගළපා ඒ ගාථාවෙන් ඒ තාපසයන්ට අවවාදකොට සතරබ්‍රහ්මවිහාර භාවනාකොට තාපසවරුන් හා සමඟ නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකප්‍රාප්තවූහ"යි ජාතකය නිමවා වදාරා 'එසමයෙහි බොහෝ කොට බස් කීමෙන් හිස පලවාගත් තාපසයෝ තම් කෝකාලික සථවිරයෝය, ගණශ්‍රේෂ්ඨව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදළසේක.

## 114 වට්ටක ජාතකය.

තවද සවීඥයන්වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවසත සමයෙහි උත්තරසෙටුහි පුත්‍රයන් අරභයා මේ ජාතකය වදළසේක.

සැවැත්නුවර වසත මහාසම්පත් ඇති උත්තර සිටානන්ගේ ගෙයි මහා පින් ඇති බ්‍රාහ්මණ කුමාරයෙක් ඇවිත් උන්ගේ භාර්‍යාවන්ගේ කුස පිළිසඳ දස එකඛමසක් ඇවැමෙන් බිහිව වැඩිවිය පැමිණියේය.

එසමයෙහි එනුවර කාර්තික උත්සවය. බොහෝ සිටුකුමාරවරු තමන්ගේ ගෙයි භාර්‍යාවන් හා සමඟ උත්සව සත්දවසක් කෙළනාහු උත්තර කුමාරයෝත් "ස්ත්‍රීන් හා සමඟ උත්සව කෙළිත්ට වුවමැනවැ"යි සිතා උන් කරා ගොස් එප වත් කීහ.

උත්තර කුමාරයන් බ්‍රහ්මලෝකයෙන් ආ නියායෙන් එබස් නොගිවිස් සෝය. එසේ නොගිවිස්සත් සිටුකුමාරවරු එක්ව ඒ ගම වෙශ්‍යා ස්ත්‍රියක් ගෙණ අවුත් සවීඥරණ පලඳවා සරහා ගෙයිලූහ. උන් දැක කර නඟා බලන් තක්වත් බසක් කියන්නක්වත් නොකියා ඉන්නා විසින් "හාව භාවයක් දක්වා වුවත් ලබවා ගතහැකිදෝ නෝ"යි සිතා මන්දස්මිතවූ දෙශක් දැක්වූහ.

එසඳ සිටුකුමාරයෝ අසුභ වශයෙන් බලා ඇගේ ශරීරය ඇටකැල්ලක් කොට සිතා පිළිකුල්ව "ආගමන් සිස්ව යන්නේ ඇයිදැ?"යි සිතා ඇවි උවමනා සම්පත්දී යවූහ. එසේහෙයින් පිටත්ව වීථියෙන් යන්නීය. පොහොසත් අමාත්‍ය යෙක් දැක තමාගේ ගෙට කැඳවාගෙණ ගියේය. උත්සව කෙළි කෙළ ඉක්

බිහි පසුවූ වෛශ්‍යා ස්ත්‍රියගේ මවු තමාගේ දූ නොදක්නී සිටුකුමාරවරුන් කරා ගොස් ''තොපි හැම මාගේ දුව ගෙණගියාහුය, පාව''යි කියන්නා උත්තර කුමාරයන්ට එදෑම පාවා දීපුම්හ''යි උන් කරා ඔව''යි කියන්නා උන් කරා ගොස් ''මාගේ දුව පාවාදුනමැනවැ''යි කියන්නා 'එදෑම උන් යවාපීම්, කොයිහිය බවත් නොදනිමි'' කියන්නා උත්තර කුමාරයනුත් හැරගෙණ රජ්ජුරුවන් කරාගොස් එපවත් කියා මුරගාන්නා රජ්ජුරුවන් විසින් ආද්‍යන්ත විචාරණා කොට ''තොපගේ ගෙට වන්පසු පාවාදුන මනාමය යි කියන්නා ''කොයි වන් බව නොදනිමි'' කියන්නා එසේ වීම් නම් ආඥාකරව'යි විධාන කළාහ.

විධාන ඇසූ අමාත්‍යයන් විසින් පිටිතල හයා බැඳගෙණ වදබෙර ගස්වා ගෙණ වීථියෙන් පිටත්වූහ. ඒ ඇසූ බොහෝ මනුෂයෝ අඩමින් වැලපෙමින් එතනට අවුත් ''නුඹසේවූ ව්‍යවසථයන්ටත් මෙසේවූ දෙය පැමිණියේය''යි වැල පෙමින් යන්නවුන් දැක ඒ සිටුකුමාරයා සිතන්නේ 'මේ දුකින් යමසේ ගැලවී යෙම් නම් ගෞතම බුදුන්ගේ ශාසනයෙහි මහණවෙමි''යි සිත සිතා යමින් සිටි කළ වෛශ්‍යාස්ත්‍රිය තමා නිසා සිටුපුත්‍රයා මරණ නියාව අසා මහාප්‍රාසාදයෙන් බැස වධකරණ පුරුෂයා කරා ගොස් තමා දැක්කවිය. ඈ දුටු පුරුෂයෝ ඇටම පාවාදී සිටුපුත්‍රයා ගැලවුනාහ.

මරණින් මිදුනාවූ සිටුපුත්‍රයා වැවට ගොස් ඉස් සෝදා නහා බත් කා දෙමවුපියන් වැඳ අවසර ඉල්ලාගෙණ මහත්වූ පෙරහරින් වතයට ගොස් මහණව උපසම්පදා ලදින් නොබෝ දවසකින් විදර්‍ශනා වඩා රහත්වූසේක.

එදවස් දම්සභාමණ්ඩපයට රැස්වූ මහළුවරුන් වහන්සේ මේ කථාව කියා කියා උන්තෙනට සමීඳයන් වහන්සේ වැඩ වදරා ''මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව හුනුදැ?''යි විචාරා වදරා ''අසවල් සිටු කුමාරයා මරණදුකින් ගැලවී රහත්වූ නියාව කියකියා උනුම්හ''යි දන්වූ කල්හි ''මහණෙනි නුවණැත්තෝ පළමුත් මරණ පැමිණි කල උපායෙන් ගැලවුනෝ වේදැ''යි වදරා ආරාධිතවූ සමීඳයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඨිතකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ වටු ජාතියෙහි උපන්සේක. එසමයෙහි බරණැස්නුවර ලිහිණිවැද්දෙක් වලව ගොස් වටුවන් බදුගෙණ ගෙයි තිබා ගොදුරු ලා අනුන්ට මිලයට දෙන්නේය.

එක්දවසක් බොධිසත්ත්වයන් වහන්සේ වැද්දහු දැමූ දැලට අසුව උගේ ගෙට අවුත් උගෙන් ලූ ගොදුරු දැක 'ඇඟ මහත්වී නම් නපුරු''යි සිතා ගොදුරු නොකා ඇඟ දුර්‍බලකොට ඒ වැදින් ''බොධිසත්ත්වයන් ගොදුරු නොකන්නේ කුමක්නිසාදෝ''යි සිතා අල්ලෙනි තබාගෙණ බලමින් සිටි කලට උගේ ප්‍රමාදයක් බලා පවනව බදුවූ වේගයෙන් වනයට පලාගියාහ.

බැඳුවූ වටුවන් විසින් ''මෙතෙක් දෙ පමාවූයේ ඇයිදැ?යි'' විචාරන්නා ''වැද්දකුට අසුව ඇඟලවුනු මෑන කීවාහුය''යි වදරා දෙකල් ගළපා මේ වට්ටමක ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි වටුව උපන්නෙම් තිලෝගුරු බුදුවූ මම්ම''යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 115 අකාලරාවි ජාතකය

තිවද සමීඥයන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා වහන්දෑ දෙනමක් කළමනා වත් පිළිවෙත් කළමනා වේලාවට නොකොට රාත්‍රියෙහි නිදිවූ කලත් යෙහෙන් පිබිදීමක් නැතිව පිබිදිනා කල මහත්කොට ඝොෂාව පවත්වා පුබුදිනා හෙයින් සමීපයෙහි වැදහොත් වඳින්දෑ රාත්‍රියෙහි නිදිනැතිව හිඳිනාසේක.

මේ කථාව දම්සභා මණ්ඩපයෙහි රැස් වූ මහළුවරුන් වහන්සේ විසින් කියමින් උන් කල්හි සමීඥයන් වහන්සේ වැඩවදුරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදෑ"යි විචාරා වදාළ කල්හි 'අසුවල් නම අකාලරාවිවූ නියාව කිය කියා උනුම්හ"යි දැන්වූ කල්හි "මහණෙනි, මොහු දැන් මතු නොවෙයි පළමුත් අකාලරාවි වූවෝ වේදෑ"යි වදාරා ආරාධිතවූ සමීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ප්‍රසිද්ධවූ බ්‍රාහ්මණ කුලයක ඉපිද උගතමනා ශිල්පශාස්ත්‍ර නිමවා දිසාපාමොක් ආචාරිව පන්සියක් අතවැස්සන්ට ආචාරිව වසන්නාහ.

එසමයෙහි අතවැස්සන්ගේ කල් නොවරදවා හඬන කුකුළෙක් ඇතිවූ නිසා ශිල්ප ශාස්ත්‍ර වේලාවට පිරුවති. ශාස්ත්‍ර නොපිරිහෙලා ඉන්නා අවදියෙහි ඒ කුකුළා කල්යාමකින් නැසීගියහ. එක් ශිෂ්‍යයෙක් සුසානභූමිය කෙරේ බැද්දක දරකඩා ගියේ එක් කුකුළුකු අල්වා ගෙණවුත් මැදිරියක ලා පොෂ්‍යය කෙරෙති.

එසමයෙහි ඒ කුකුළා හඬන කල මධ්‍යම රාත්‍රියෙහි ඇඬුකල්හි ශිෂ්‍යයෝ පිබිද ශිල්ප ශාස්ත්‍ර පිරිවන්නට නැගි සිටි කලට වේලා බෝ විසින් නිද නිදා පිර වීමෙන් වනපොත් කළ දෙයත් පිරිහෙයි. අළුයම් වේලේ හැඬූ කල වේලා මද විසින් තිබෙයි. මේ දෙකාරණයෙන්ම ශිල්පය පසුබසිනා බව දැක සිතන්නාහු "මේ කුකුළා ඇඬීමෙන් අමුතුම ශිල්ප උගන්නා තබා පළමු කළ දෙයත් අපවත් වෙයි" සිතා උඹ මරා එපවත් ආචාරීන්ට කීහ.

ආචාර්‍ය්‍ය මවුපියන් නැතිව ආචාර්‍ය්‍ය ගුරුකෙනෙක් නැතිව ව්‍යවස්ථිත වෙත කෙනෙකුන්ගේ පණත මේ කුකුළා සේමයයි කියා ශිෂ්‍යයන්ට අවවාද දී කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදාරා දෙකල් ගළපා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි කල්වරත් නොදැන අඬන කුකුළා නම් පිබිදීම ව්‍යවස්ථිත නොවන මහණය. ශිෂ්‍යයෝ නම් දැන් මේ බුදුපිරිසය, ආචාරිව උපන්නෙම් බුදුවූ මම්ම වේදෑ"යි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක.

## 116 බඹුනමොක්ඛ ජාතකය

මේ වදාළ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි චිඤ්චාමාණවිකාව නිසා මේ ජාතකය වදාරණලදී. එහි වත්මාන කථාව වාදශ නිපාතයෙහි මහාපදුම ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

අතීතයෙහි දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ට ප්‍රියවූ බෝධිසත්ත්වයන් වහන්සේ පුරෝහිතව උපන්සේක.

ඒ රජහට පියව අගමෙහෙසුන් බිසෝකෙනෙක් ඇත්තාහ. රජ්ජුරුවෝ ඒ බිසවුන් කෙරෙහි අධිකවූ ප්‍රේම ඇති හෙයින් "තොප කැමති වරයක් ගණුව"යි කියන්නා එවිට බිසව් කියන්නේ "තෙල කුමක් අඩු නෙයින් ඉල්වම්ද අන්‍ය ස්ත්‍රියක රාගචිත්තයෙන් නොබැලුව හොත් ඒ මට වරය"යි කියන්නා රජ්ජුරුවන් වහන්සේ විසින් "සොළොස් දහසක් පුරාඬගනාවන්ද ඉන්දදී එබදු වරයක් දෙන්ට බැරිය"යි කීවත් බිසවුන් තත්පරව නැවතත් ඉල්වන හෙයින් බිසවුන් බස ඉක්මවා යා නොහෙන රජ්රුවන් වහන්සේ විසින් වරදී එතැන් පටන් අන්‍ය ස්ත්‍රියක රාගමිශ්‍රව නොබලා දවස් යවන කල්හි පසල්ගමක සතුරන් හෙන් භයක් පැමිණ ඒ රට උන් අමාත්‍යයා විසින් කීපවරෙක සටන් කොටත් ජයගතනොහී එපවත් රජ්ජුරුවන්ට කියා සැවීය. රජ්ජුරුවෝ ඒ අසා සිව්රඟ සෙනග රැස්කරවා සටනට නික්මෙමින් සිව් අග්‍ර මෙහෙසිකා බිසවුන් හෙන්වා "සටන් තම් චපල, භයක් පැමිණියත්, ස්ත්‍රීන් ජාතිය හැරහෙණ වහා හැළවීගත නොහැක්ක. එසේහෙයින් තෙපි රදව"යි කියන්නා 'නොපිළිවන එමි" කීය. තත්පරවත් රජ්ජුරුවන් විසින් රැඳුමනාමඋ'යි කියන විසින් "එසේවිනම් යොත්තෙන් යොත්න මා විචාරා එවන්ට උවමැනවැ"යි කියන්නා "යහපතැ"යි කියා බිසවුන් රඳවා නුවර රැකවල් ලවා පුරෝහිත බමුණන්ට පාවාදී නික්ම යොත්තෙන් යොත්න එකෙක නියායෙන් මෙහෙවර කරන්නන් ආ කල තොපි ආවෝ ඇයිදැ"යි බිසව් විචාරා "සුවදුක් විචාරන්ට ආම්හ"යි කියන්නා "එසේ වීනම් මෙසේ එව"යි කියා උන්හා සමග ලොකසාරදර්ශියෙන් යෙදී යවන්නාහ. මෙම නියායෙන් දෙතිස් යොදුන් මාර්ගයට රජ්ජුරුවන් විසින් එවන ලද දෙතිස් දෙනාද යුද්ධයෙහි ජයගෙණ එන ගමනේ එවනලද දෙතිස්දෙනාදැ යි කියා මෙසේ වූ සැටදෙනා හා සමග සංවාසය කළහ.

එකල්හි රජ්ජුරුවෝ නුවර සමීපයට අවුත් ජය කදවුරු සථානයෙහි හිඳ තමන් ආ පවත් බෝධිසත්ත්වයන් වහන්සේට කියා යවූ කල්හි පිටිනුවර සරහා අන්තඃපුරයට ගොස් එපවත් බිසවුන්ට කියන්ට බිසෝ ගෙට ගියාහ. බිසව් බෝධිසත්ත්වයන්ගේ යහපත් රූපශ්‍රිය දැක පිළිබඳ සිතින් "මේසේ අවුත් යහන පිට ඉඳුව"යි කීහ. එබසට බෝධිසත්ත්වයන් වහන්සේ විසින් "ඇයි දේවීන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේ ඉතා රූපත්සේක. පරලොවටත් බයිමි" කියන්නා රජ්ජුරුවන් විසින් එවනලද සුසැවදෙනා නියාවට තොපිම රජ්ජුරුවන්ටත් පරලොවටත් බාහිය දැයි කියන්නා "මේසා මනුත්වනතුරු පරස්ත්‍රියක

මූහුණත් රාග වශයෙන් නොබැලීම්. මෙබස් මා කණ එලන්ට එපා''යි කියන්නා ''එසේවීතම් රජ්ජුරුවන්ට කියා තාගේ හිස කප්පම්'' කියන්නා ''එක ජාතියක තබා දහසක් ජාතියේ හිස්කප්පතත් එසේවූ දෙයක් නොකරම්''කික්මුණුසේක.

බිසව් ඇඟ නබ ගෙණ තෙල්වැකුණු ශරීරයෙන් කිළුටුව වස්ත්‍රයක් ඇඳ ලෙඛ වේසයක් මවාගෙණ ශ්‍රියාත් ගබඩාවෙහි වැදහොත්සේක. ස්ත්‍රීන්ට කියන්නාහු ''රජ්ජුරුවන් වහන්සේ ඇවිත් මා විවාලොත් ලෙඛ නියා කියව''යි කියා වැදහොත්තාහ.

බොධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට පෙරගමන් කොට රජ්ජුරුවන් දුටුසේක. රජ්ජුරුවෝ මහාපෙරහරින් නුවර පැදකුණුකොට රජගෙට අවුත් බිසවුන් නොදැක ''කොයිදැ''යි විචාරා ලෙඛ නියාව අසා ශ්‍රියාහන් ගබඩාවට ගොස් බිසවුන්ගේ පිට පිරිමැද ''සුවදුක් කිම්දැ''යි දෙතුන්වැනිව විචාරන්නා කරකැවී බලා නොනැසී ''නුඹවහන්සේත් ආ නියාවේද? අපිත් සස්‍යාමික නියා වේදැ''යි කියන්නා රජ්ජුරුවනුත් ''ඒ කිම්දැ''යි විචාරණ ලදුව පුරෝහිත බමුණන් විසින් තමා කීවා නොකළ විසින් මට කළ දුස යි කියන්නා රජ්ජුරුවෝ වහා උදහස්ව මාලිගාවෙන් පාතට බැස එතැන සිටි සේවකයන්ට පුරෝහිත බමුණා පිටිතලහයා බැඳ ගෙණ ගොස් මරාපියව''යි මේවර කීහ.

එපවත් ඇසූ රාජපුරුෂයෝ බොධිසත්ත්වයන් පිටිතලහයා බැඳගෙණ වද බෙරගස්වාගෙණ මරන්ට නික්මුණාහ. එවිට බොධිසත්ත්වයෝ සිතන්නාහු බිසවුන් විසින් වූදෙයක, ප්‍රඥව නම් මෙසේවූ දුකක් පැමිණිවේලේ ගැලවෙන්ටයයි සිතා ''රජ්ජුරුවන්ට පාවා මිසක් නොමරව''යි කියන්නා මරන්ට ගෙණ යන තොප කිම්ද පාතෙය යි කියන්නා රජ්ජුරුවන්වහන්සේගෙන් මා නිසා නිධාන කරණලද බොහෝ සම්පත් ඇත; එසේ විසින් මා මැරුවොත් රජ්ජුරුවන් වහන්සේට බොහෝ අලාභවන්තාහ. ගෙණ ගොස් රජ්ජුරුවන්ට පෑහ. රජ්ජුරුවෝ දැක ''බමුණ, භයලජ්ජා නැතිව තා කෙළේ කුමක්දැ''යි කියන්නා ''දෙවයන් වහන්ස, එසේවූ දෙයක් මම නොකෙළෙම්. තවම තම දන්නාතැන් පටන් ඉකිනියක සා ප්‍රාණඝාතයකුත් නොකෙළෙමි. අනුන්ගේ වස්තුවකින් තණ කෙන්දක් සාත් අදන්නාදුනයක් නොගත්තෙමි පරස්ත්‍රීන් රාගචිත්තයෙන්කර ඔසවාත් නොබැලිවිරීම්, කෙළි පිණිසත් බොරුවක් නොකිවිරීම්, තණ කෙන්ද කින් ගලාලාත් රූපෙනක් නොබිවිරීම්, ද්‍රෝහකොළෝ මෙහෙවර එව් සූසැට දෙනාමය; මාත් එතනට අල්ලන්නාම එලෙස නොකළෙමි''යි කී විසින් මේ මට කරවූදෙය''යි දැන්වූහ.

එපවත් අසා රජ්ජුරුවෝ සූසැවදෙනා ගෙන්වා බිසවුනුත් ගෙන්වා බිසවුන් අතින් ''සැබෑද''යි විචාරා ''සැබව''යි කී විසින් ''හැමදෙනාම වරව''යි කියන්නා බොධිසත්ත්වයන් වහන්සේ කියනසේක් ''බිසවුන් කී විසින් කළෝය''යි කියා උනුන් ගලවා උන් උන්ගේ සථානානතරවල සලස්වා ස්ත්‍රීන්ට නම් නිබීම ආදෙයකැයි බිසවුනුත් ගලවා ගිහිගෙයි සිටියෙම් වේද මේසා අවුලක් වූයේය යි සිතා තැයත් විසින් හැඩියදී බොහෝ සම්පත් හැර හිමාලයවනයෙහි මහණව පඤ්චාභිඤ්ඤ අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියාහ''යි වදාරා ''එසමයෙහි බිසව් නම් විඤ්ඤාණඤ්චායය, එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරයෝය, පුරෝහිත බ්‍රාහ්මණව උපන්නේ නම් ලොව්තුරා බුදුවූ මම්මවේදැ''යි වදාරා මේ බණනමොකබ ජාතකය නිමවා වදාළසේක.

## 117
## කුසනාලි ජාතකය

තිවද එක්සමයෙක්හි සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අනේපිඬු මහ සිටානන්ගේ මිත්‍රයකු නිසා මේ ජාතකය වදාරණ ලද, ඝටකියන ලද කාලකන්නි ජාතකයෙහි කියනලද ක්‍රමයෙන්මය යි දත යුතුයි.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ මගුල්උයන මගුල් සල්ගස වනදෙවතාවා හා සමග විශ්වාසව වැලුප්පදුරෙක වාසය කරණසේක.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ එකසප්ම්භ මහා මාලිගාවෙක වාසය කරණසේක. එසමයෙහි වැඹ සෙලවින, ඒ රජ්ජුරුවෝ වඩු ආචාරීන්ගෙන්වා "එකසප්ම්භ මාලිගාවෙහි පළමු කප උදුරවා ඇර කපක් අමුතුව ඉදුව"යි කී විසින් ආචාරිවරු ගසක් බලා නොදැක උයනට ගොස් උයන මගුල් සල්ගස මිසක් අනික් ගසක් නොදැක ඒ ගොසින් රජ්ජුරුවන් වහන්සේට කීහ.

රජ්ජුරුවෝ "එසේ වුවත් කපා එව ඉදුව"යි කී විසින් වඩු ආචාරීවරු ගස ලඟට ගොස් බලිපූජා කොට "සෙට ගස කපම්හ"යි කියා දෙවතාවන්ත් අනික් ගසකට පලායන්ට ආරාධනා කළහ. දෙවතාවාතෝත් තමන් ඉන්ට අනික් ගසක් නොදැක තමන්ගේ දරුමල්ලන් වැළඳගෙණ හඬන්ට වන්නාහ එසමයෙහි දුක්සුව විවාරන්නට ආවාවූ වනදෙවතාවෝත් අඬන්ට වන්න, එසමයෙහි වැලුප්පදුරෙහි වසන දෙවතාවත් එතනට අවුත් අඬන කාරණා විචාරා "ගසට සෝක නොකොට වදාළ මැනව. නුඹවහන්සේගේ වාසය මම ගලවම්" කියා අස්වසා දෙවෙනි දවස් ගස කපන්ට වඩුවන් ආවේලේ කටුසු වෙසක් මවා ගෙණ බල බලා සිටියදී ගස මුල් අස්සට වැදී අස්සෙන් යන්නාක් බඳුව ශාඛාග්‍රයෙන් පෙණුනාහ. එසේවූ අරතරවූ ගස බොධිසත්ත්වයන්ගේ උපායෙන් නිස්සාරණයට පැමිණියේය. වඩුවෝත් ඒ දැක "අරඝ ඇති ගසෙකැ"යි උනුම්හ. මෙසේ නිස්සාරවූ ගසින් කම්කිම්දැයි පලාගියහ. ඒ ගසවසන වනෂ්පතිවූ දෙවතාවා තමාගේ උපවෙනෙහි දෙවතාවන්ට කියන්නේ "මම මහෙශාක්‍යව සිටත් මගේ ගස ගලවාගන්නා උපාය කොදන්නෙමි, වැලුප්වනයේ වසන දෙවතාවා විසින් වාසය රකිනා නුවණ දන්නාවනැ"යි එසේහෙයින් ප්‍රඥාවන්තයන් විනා නීව උත්තමයන්ගෙන් කම්කිම්දැ"යි බණකියා තමන් හා වැලුප්වනයේ දෙවතාවානන් හා විශ්වාසව භිද කම්වූපරිද්දෙන් මියපරලොව ගියාහ. එසමයෙහි වනදෙවතා නම් ආනන්දසථවිරයෝය, වැලුප්වනයේ දෙවතාව උපන්නෙම් බුදුවූ මම්මවේදැ"යි වදාරා මේ කුසනාලි ජාතකය නිමවා වදාළසේක.

---

## 118
## දුමෙමඛ ජාතකය

තිවද රජගහනුවර නිසා වෙළුවනාරාමයෙහි සම්බුදුරජාණන් වහන්සේ වැඩ වසන සමයෙහි එක් දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්ව වැඩඋන්නාවූ මහළු වරුන්වහන්සේ "ඇවැත්නි

දෙවදත්ත සථවිරයෝ බුදුන්ගේ දෙතිස්මහාපුරුෂ ලක්ෂණ අසූ අනුව්‍යංජන හ්‍යාම ප්‍රභා ආදීවූ රූපශ්‍රී දැකත් බුදුන් කෙරෙහි මෛත්‍රී යක් නැතිව මෙබඳුවූ රූපයෙක් මට ඇතනුයේය යි සිතා බුදුන් කෙරෙහි ඊෂ්‍යාවෙන් බුදුන් නසන්ට සිතති කිය කියා කථාකොට උන්සේක.

එතනට සම්ඥයන්වහන්සේ වැඩ බුඩාසන මඤ්ඤකයෙහි 'වැඩහිඳ මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරාවදුරා ''දෙවදත්තසථවිරයෝ බුදුන්කෙරේ ඊෂ්‍යා නියාව කිය කියා උනුම් හ''යි දැන්වූකල්හි ''මහණෙනි, දැන් මතුනොවෙයි, පළමුත් මාකෙරෙහි ඊෂ්‍යාව ඇත්තෝමවේදැ''යි වදුරා ආරබ්ධවූ සම්ඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටිවනියදවස රජගහනුවර මගධ නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ ඇත්කුලයක ඉපිද සම්ඵඝධවලව විසිතුරුවූ රූපශ්‍රියෙන් අලඞ්කෘතව මගධ නම් රජ්ජුරුකෙනෙකුන්වහන්සේට වාහනව සිටිනාසේක.

එසමයෙහි එක්දවසක් මගධ රජ්ජුරුවෝ සම්පූලඞ්කාරයෙන් සරසන ලද මගුලැතාව ආරුඪව මහත් පෙරහරින් නික්මුණාහ. එවිට රාජ්‍යවාසීන් මගුලැතු දැක ඇතුගේ ආරෝහ පරිනාහ රූපශ්‍රියක් හා මෙසේවූ ඇතෙකු චක්‍රවර්ති රජ්ජුරුකෙනෙකුන්ට විනා මෙවැනි රජ්ජුරුකෙනෙකුන්ට ඇතෙක් නොවෙයි කියා ඇතුම වණ්නා කළහ. වණ්නාව රජ්ජුරුවන් විසින් අසා ''නිරිසන් ඇතු වණ්නාකළෝය; මාවණ්නා නොකොළෝය''යි ඇතුකෙරෙහි ඊෂ්‍යාකොට ඇතුකසන්ට සිතා රජගෙට ගොස් ඇත්තලයා ගෙන්වා ''තොප විසින් මගුලැතා ඉදින් කම්බස් ඇතිව ව්‍යවස්ථිතකරතලදදැ''යි විචාර හස්ත්‍යාරොහයා විසින්ම ඇතු නාවා කම්බස්කරණලදැ''යි කීකල්හි ''එසේවීනම් වෙඵුල්ල පඤ්චයට ඇතු නඟව''යි කීකල්හි රජ්ජුරුවෝත් අමාත්‍යමණ්ඩලයා පිරිවරා පඤ්ච මුදුනට නැංගාහ. 'ප්‍රපාත ආසන්නව ඇතු සිටුවාබල''යි කීය. ඒ මානට ඇත්තලයා සන්කොට තුන්පයින් සිටිවිය. එවිට රජ්ජුරුවෝ ''පෙරවා අත්දෙක ඔසවා පස්සා පා දෙක ඔසවව''යි කියන්නා එලෙස ඇතු නොවැමෙන්නා නැවත රජ්ජුරුවන් විසින් ''පෙරවා අත්දෙක ඔසවා සිටුව ව''යි කියන්නා එලෙසත් සිටිවිය. පසුව ''එකපයකින් සිටුවා බලව''යි කියන්නා එලෙසටත් සිටිවිය, මෙලෙසකොටත් ඇතු නොවැමෙන්නා එවිට රජ්ජුරුවෝ කියන්නෝ ''ඇතුන්ගේ සතර කකුලම ඔසවා ප්‍රපාතදිසාවට මෙහෙයාලව''යි කීහ.

එවිට ඇත්තලයා සිතන්නේ රජ්ජුරුවන්වහන්සේ විසින් ඇතු නසන්ට ප්‍රයෝගයක් වනැයි සිතා ඇතු කන්තල දිසාවට කරතමා කියන්නේ 'පින්වත් ඇත්රජ්ජුරුවෙනි, තොප නසන්ට උත්සාහ කරණසේක. එසේ හෙයින් තව පිළිවන්වීනම් ආකාශයට නැගී බරණැස්නුවරව පලායව''යි කීහ. ඒක්ෂණයෙහිම පෙරකරණලද පින්බලයෙන් පහළවනලද සෘඞ්යෙන් පුළුන් පෙදක් ආකාශයට පැනනැංගාක්මෙන් පැන නැංගේය. එවිට ඇත්තලයා ඇතුපිටට පැනහිඳ කියන්නේ, නුඹවහන්සේ වැනි පින්මද රජ්ජුරුකෙණෙ

කුත්ට පහළවන ඇතෙක් නොවෙයි, එසේහෙයින් නුඹවහන්සේ වැනි නිවට රජ්ජුරුකෙනෙකුත්ට වාහනයට නොනිසිය, නුඹවහන්සේම සිටනේය යි කියා බරණැස්නුවරට නැගීගොස් රජ්ජුරුවන්ගේ රාජාඩම්බණ සමීපයෙහි සිටි යේය, ඒ දුටු නගරවාසීහු මහත් සන්තෝෂයට පැමිණ ඔබගොස් රජ්ජුරු වන්ට කීහ. රජ්ජුරුවෝත් වහා එතනට ගොස් ඇතු දැක මහත් සන්තෝෂ යෙන් "මා නිසා මට පිටදෙන්ට ආ ඇතෙක්වීනම් බිමට බසීව"යි ආරාධනා කළාහ. එවිට ඇතු බිමට බටුයේය.

ඒ වේලෙහි ඇත්තලයා ඇතුපිරින් බැස රජ්ජුරුවන් විසින් "දරුව ඇතු ඇරගෙණ කුමක් නිසා අවුදැ"යි විචාරන්නා තමා ආ ඝිය ලෙස තත්වූ පරිද්දෙන් කීකල්හි "නා කළසේ යහපතැ"යි කියා සමාධිව නුවර සරහා ඇතු මහත්වූ පෙරහරින් මඩගල හස්තිවාහනයට පමුණුවා බරණැස්නුවර රාජ්‍යය තුන්කොටසක කොට ඇතුට එක් කොටසයක් ඇත්තලයාට එක් කොටසයක් රජ්ජුරුවන්ටත් එක්කොටසයක් සලස්වා දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදුරා-

එසමයෙහි බරණැස්රජ්ජුරුවෝ තම් සාරිපුත්‍රසථවිරයෝය, ඇත් තලයා තම් ආනන්දසථවිරයෝ ය, එසමයෙහි මගධ රජ්ජුරුවෝ තම් දෙවදත්ත සථවිරයෝය; එසමයෙහි ඇත්ව උපන්නෙම් බුදුවූ මම්මවේදැ"යි වදුරා මේ දුමෙමඛ ජාතකය නිමවා වදාළසේක.

---

## 119 නංගුලීස ජාතකය

තීවද සම්බුදුරජාණන්වහන්සේ ජෙතවනාරාම යෙහි වැඩවසන සමයෙහි කාළදැයි තෙරුන් වහන්සේ උපාසකවරුන්ට බණවදුරා ප්‍රස්තාව බලා වදුරන්ට නොදන්නා විසින් මගුල්පැමිණි තැනදී බණවදුරන්ට ආරාධනා කළකල අව මගුලට සුදුසු බණ වදුරණසේක. අවමඩගල සථානයකදී බණ වදුරන්ට ආරාධනාකළ කල්හි මඩගලසූත්‍රාදි බණ වදුරණසේක. මේ වූ නියා යෙන් ප්‍රසථාවට නොනිසිසේකාට කාළදැයි තෙරුන්වහන්සේ බණවදුරණ නියාව දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ සංඝයාවහන්සේ කිය කියා උන්සේක.

එතනට බුදුරජානන්වහන්සේ වැඩවදුරා "මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාළකල්හි "කාළදැයි තෙරුන්වහන්සේ නුවණ මද නියාව කිය කියා උනුම්හ'යි දැන්වූහ. "මහණෙනි දැන් මතු නොවෙයි. පළමුත් නුවණ නැත්තෝම වේදැ"යි වදුරා ආරාදිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්,**

ඵිවඝිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ දිසාපාමොක්ඛාචාරීව සියළු මනුෂ්‍යයන්ට ශිල්පදෙමින් වාසයකරන්නාහ.

එසමයෙහි පොහොසත් කෙනෙක් දහසින් බැඳි පියලි තබා ශාස්ත්‍ර උගන්නාහ. දුඃඛිත කෙනෙක් බැලමෙහෙ කොට ශාස්ත්‍ර උගන්නාහ. එසමයෙහි නුවණ නැති දුඃඛිත පුරුෂ යෙක් දිසාමොක් ආචාරීන්ට බැලමෙහෙ කොට ශාස්ත්‍ර උගන්නේය. ඒතෙම එක්දවසක් ආචාරීන්ගේ පය මැඩ මැඩ උන්කල්හි ආචාරීන් 'පාමුල් කකුල්දෙක රුකුල්ලව''සි කියන්නා ''ඝනපතැ''සි කියා එකපයකට පත්ලා අනිත් පයට රුකුල් නැත්තෙන් තමාගේ කලවය මත්තේ ඇඳකකුල තබා තුන්යම් රාත්‍රි යෙහි ඉඳ පාන්කෙළේය. උදැසනක්සේ ආචාරීන් නැගීසිට උන්ලෙස බලා කම්පාවූවාහු වාලක් පරිද්දෙන් මෙබඳු දුක්ගෙණත් ශාස්ත්‍රයක් ඉගෙණගත නොහෙයි, එසේහෙයින් පණ්ඩිතකරවාගන්ට වුවමැනවැ යි සිතා මූ අතින් දවස් පතා දුටු දුටු දෙය තමන්වහන්සේට සලස්වා එ කී කල මීට උපමා කෙසේදැ යි විචාරා කාරණා නොවරදවා උපමා කිපයක් නොවරදවා කී නම් නුවණැතිකර ගණිමි සිතා ඔහු ලඟට කැඳවා තොප විසින් දරපළාගෙණන්ට ගියතැන දුටු දෙයක් ඇත්නම් කියව යි කීහ.

එසඳ 'ඝනපතැ''සි කියා එක්දවසක් බැඳ්දට ගියේය. එක්තරා සජියකු දැක එපවත් ආචාරීන්ට කීහ. ආචාරී ඒ අසා ''සජියා කුමක් වැන්නදැ''සි විචාළහ. එවිට කියන්නේ ''නගුලිසක් වැන්නේය''සි කීය. ඒ අසා ආචාරී සජියාත් දිගය නගුලිසත් දිගය එසේහෙයින් ඒ කාරණය සරිය යි සතුටුවූහ. පසු දවසක් බැඳ්දට ගියේය. ඇතකු දැක අවුත් ආචාරීන්ට කීහ ''ඒ ඇතුට උපමා කියව''සි කියන්නා ''නගුලිසක් වැන්නැ''සි කීහ. ඒ අසා ආචාරී සොඬ උපමා කොට කීවනැ යි සතුටුවූහ. පසු දවසක් උක්දණ්ඩක් ලදින් ඒ නියාව ආචාරීන්ට කීහ. ඊට උපමා කියව යි කියන්නා නගුලිසක් වැන්නයි කීහ. එවිට ආචාරී උක්දණ්ඩත් දිගය නගුලිසත් දිගය ඒ කාරණය යි සිතුහ. පසුදවස් දන් දෙන සථානයට ගිය ගමනේ දී කිරි හා සමග බත්එහ. ඒ බත් කා ඇවිත් ඒ සැවිය කීහ. එවිට ආචාරී ''තා කැ කිරි හා බත් හා කුමක් වැන්නදැ''සි විචාළාහ. ''නගුලිසක් වැන්නය යි කීහ. ආචාරීන් විසින් පළමු කාරණා තුන වන්නා සරි වේය යි මෙසේ සරිවේව යි සිතා කෙසේ උත්සාහ කළත් නුවණනැත්තාහු ඇති කරවාගන්ට බැරිය යි කියා හළහ යි වදාරා එසමයෙහි නුවණ නැති අතවැස්සා නම් කාළුදායි සථවිරයෝය, දිසාපාමොක් ආචාරීව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මවේදැ''සි වදාරා මේ නංගුලිස ජාතකය නිමවා වදළසේක.

## 120 අඹ ජාතකය.

එවද සවීඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා කුලපුත්‍රයෙක් ලැදිව මහණවූ දවස් පවන් කලමනා වත්පිළිවෙත් මහත් පිළිවෙත් සතළිස් හා සූක්ෂ්ම පිළිවෙත් අසූවක් පුරාගෙණ හැමදීම් මළු හැමදීම් පෙත්මන් හැමදීම්, ධර්මශාලා හැමදීම්, සංඝාරාම හැමදීම් හා පින්පැන් තැබීම් යනාදීන් නොකුසීතව කරණසේක. උන්වහන්සේ වත්පිළිවෙත් කිරීමෙහි ප්‍රසන්නව උපාසකවරුන් විසින් පන්සියයක් පමණ පාත්‍ර දවස්පතා උන්වහන්සේට තිබුහ. ඒ පාත්‍ර පන්සියයෙන් බොහෝදෙනාවහන්සේට ලාභවිය. මේ

කථාව දම්සභාමණ්ඩපයෙහි රැස්ව වැඩඋන් මහලුවරුන් වහන්සේ කිය කියා උන්තෙනට සම්බුදුයන් වහන්සේ වැඩ වදුරා "මහණෙනි, මා එන්නාට පූර්වභාග යෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදුරා 'අසවල් තම නිසා ලාභ සත්කාර පැමිණි නියාව කිය කියා උනුම්හ"යි දැන්වූ කල්හි "මහණෙනි, දැන් මතු නොවෙයි, පළමුත් මුන් පිළිපන් වතාවත් නිසා බොහෝ ලාභසත්කාර පැමිණියේ වේදැ"යි වදුරා ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදුළසේක.

**හේ කෙසේද? යත්,**

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ප්‍රසිඛ බ්‍රාහ්මණකුලයක ඉපද පසුව කාමයෙහි ආදීනව දැක පන්සියයක් තාපසවරුන් ඇතිව හිමාලයවනයෙහි ගණ ජ්‍යෙෂ්ඨව වාසය කරණසේක.

එසමයෙහි හිමාලයවනයෙහි වැසි නොවැස ලිං පොකුණුවල පැන් සිදි සිවුපාවෝත් පැන් නොලැබ විඛාපත්ව දුක්විඳිනාහ. එසමයෙහි පන්සියයක් තාපසවරුන් අතුරෙන් එක් තාපසකෙනෙක් ගසක් කපා ඔරුවක් කැන සිවුපා වුන්ට පැන්ඇද වත්කරන්නාහ. සිවුපාවුන් ආ ආසේ පැන් ඇද වත්කරන්නහු විසින් ඵලාඵල කඩාගන්ට කල්නැතිව විඳිනා ආයාස සිවුපාවෝ දැන උනුනුන් හා කථාකරන්නෝ තාපසයන්ගෙන් පැන් ගන්ට යම්හ යි සිවුපාකෙනෙක් තම තමන්ට පිළිවන් යම් යම් විවර අඹ කොස් ආදීවූ දෙය ගෙණ එන්ව"යි උනුන්ට විඛානකොට ඒ නියාවට ගෙණ දසඅටක් ගැල් පුරාගන විවර දවස්පතා රැස් කරන්නාහ. ඒ රැස්කළදෙය පන්සියයක් තාපසවරුන් බෙදා වළඳන්නාහ. ඉතුරුවූදෙය වලදමන්නාහ. මෙපමණින් දැන බොධිසත්ත්වයෝ තාපසවරුන්ට අවවාද කියන්නාහු "අසවල් තාපසයන්ගේ වීර්‍යයෙන් අපි පන්සියයක්දෙනම ඵලාඵල පිණිස වනයට නොගොස් උන්පලම ඉදම මිහිරි ඵලාඵල ප්‍රයෝජන විඳිම්හ"යි වදුරා "එසේහෙයින් ගෘහසථවුවත් ප්‍රව්‍රජ්ජිතවුවත් වීර්‍යකළයුතුම'යි වදුරා "එසමයෙහි පැන් ඇද වත්කළ තාපසයෝ නම් මෙසමයෙහි වතාවත් ව්‍යවසිතව කරණලද්දුවූ භික්ෂූහුය. ගණජ්‍යෙෂ්ඨවූ තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැ"යි වදුරා මේ අඛිඥානඥාය නිමවා වදුළසේක.

## 121
## කටාහක ජාතකය.

තිවද සම්බුදුයන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවසන සමයෙහි පින්තූ කියන නමක් නිසා මේ ජාතකය දක්වනලද. එහි වර්තමාන කථාව යට කියනලද විකන්ථන ජාතකයෙන් දැක්ක යුතුය.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ එනුවර මහාසම්පත් ඇති සිටුව උපන්සේක. එසමයෙහි බොධිසත්ත්වයන්ගේ ගෙයි පුතනුකෙනෙක්

උපන්නාහුය. ඔහු උපන් දවස්ම ගෙයි කෙල්ලකගේ පුතෙක් උපත, සිටුකුමාර යෝත් කෙල්ලකගේ පුතාත් එක්ව වැඩිවිය පැමිණියාහ. සිටුකුමාරයන් අකුරු කරන්ට යන කල තමුන් කැටුවම ගොස් ලිවීම් ගිණුම් ආදීවූ නොයෙක් ශාස්ත්‍ර ඉගෙණගත. තෙමේ තමින් කටාහක නම්විය. වෙළෙඳුම් ආදීවූ දෙයෙහි දක්ෂය. කිමෙහි බිණිමෙහි සපත, එසේහෙයින් උන් භාණ්ඩාගාර ගේ බැලීමෙහි සිටානෝ සලස්වාගත්හ.

එක් දවසක් කටාහක නම් කොලු සිතන්නේ ඇමදුම මට ගේ බැලීම් තිරනොවන්නේය; යම්සේ මාගේ වැරැද්දක් දැක සඟාමිදරුවෝ ලෙහිසන්ගසා වහල් මෙහෙවරට ඇරගත්තු නම් මට බොහෝ දුකැ යි සිතා ඊට උපායක් කරන්ට උවමැනවැ යි සිතන්නේ අපගේ සිටානන් වහන්සේට යහළුව හිඳිනා පිටිසර සිටානකෙනෙක් ඇත, උන්කරා ගොස් සිටානන්ගේ පුතනුවෝය යි කියා උන්ගේ දුවනියන් ලවා පිසවාකැත් නම් යහපතැ යි සිතා සිටානන්ගෙන් ලී පතක්කොට පතක් ලියන්නේ-මාගේ කටාහක නම් පුත්‍රයා තමන් දැ කරා යවම්, තමන්දැ අප හා සමාන කුල විසින් අපගේ පුතනුවට තමන්ගේ දුවනියන් පවාදෙන්ට අමුතු නැති නියාවත් ඒ නියාව දැන තමන්දැ දුවනියනුත් පාවාදී බොහෝ සම්පත් දී රැක්කයුතු නියාවත් මමත් මෙතන කටයුතුබොහෝ විසින් නොගිය නියාවත් පසුව මා එන නියාවත් කියා සිටානන් ලියාගෙණ සිටානන්ගේ අස්මුන්දෙන් අසුන් ඔබාගෙණ සිටානන්ගේ ගේ බලන විසින් සඳුන් සුවඳ ආදීවූ දෙයත් සිහින් පිළිත් ඇරගෙණ පසල් සිටානන්ගේ ගමට ගොස් සිටානන් වැඳලා සිටියේය. සිටානන් විසින් 'කොයිසිට අවිදැ'යි විචාළ කල්හි "බරණැස්නුවර සිට ආම්" කී විසින් "කාගේ දරුකෙනෙක්දැ"යි විචාරන්නා "බරණැස් සිටානන්ගේ පුතනුවෙම්" කී විසින් 'කුමක්නිසා අවුදැ"යි විචාරන්නා "මා ආ කටයුතු පහින් දැක්කහැකැ"යි කියා පත අතට දුන්නාහ. සිටානෝ පත කියවා පතෙහි අසුන්අසා සතුටුව තමන්ගේ දුවනියන් පාවාදී බොහෝ සම්පත් දුන්නාහ. එද, සිටු දූ විසින් තමාට එවූ බාඳ්‍ය භොජ්‍ය මල්සුවඳ ආදීවූ දෙය එලවූ කල්හි ඒ දැක මෙසේවූ බත්කම්ද මෙසේවූපිළි අදිම්ද මේසේවූ මල්සුවඳ පලදිම්දැ යි පිටිසර ඇත්තන්ගේ කොලකම මෙසේ වනැ යි කියා වෙහෙසයි.

එසමයෙහි බරණැස්නුවර සිටානෝ තමන්ගේ කටාහක නම් කොල්ලා නොදැක ඒ ඒ තැන මිනිසුන් යවා පිටිසර සිටානන්ගේ ගම උන් නියාව අසා රජ්ජුරුවන් වහන්සේට දන්වා අවසර ඇරගෙණ පිටිසරට නික්මුණාහ. සිටානන් පිටිසර යන නියාව ඒ ඒ තැන ප්‍රසිඛවිය. කටාහක නම් කොලුත් එපවත් අසා සිටානන් එන්නේ අනික් දෙයක් නිසා නොවෙයි මාලඟවය යි සිතා සැඟවී ගියේ නම් ඒ කටයුතු නොවෙයි, සිතා මෙතැන්හිම ඉඳ සිටානන්වහන්සේආ කල උන්වහන්සේට මෙහෙවර කොට සිත ලබාගණිම් සිතා එතැන් පවත් තමාගේ ගෙයි මිනිසුන් ආදීවූ ඇමදෙනාට කියනකල සෙස්සන්සේ නොවෙයි, අපිඅපගේ දෙමව්පියන් දුටු කල භය ලජ්ජා ඇත්තම්හ. එකසරියේ හිඳන් බත්නොකම්හ මඬ සෝධා තිබීම්, පැන් පෙරා තිබීම්, විල් තිබීම්, පලට පැන්නිබීම් පවන් වාල් කළමනාදෙය අපි කරන්නෙමු'යි කිය කියා ඉන්නා කලට ඒ සිටානෝ අවුත් ලඟ ගමෙක උන්නාහ.

එවිට තෙමේ මසිල්නුවන් ලඟට ගොස් ''අපගේ පියානන්වහන්සේ මෙහ මට වඩිනාසේක. නුඹවහන්සේ විසින් ආගන්තුක සත්කාර කළමැනවැ යි සිවානන් විසින් කරණලද සුවදුක් කථා ඇතිව සිවානන් බත්කා ඉක්බිති පයට පැන් ඇරගෙණ ගොස් තබා ඉක්බිතිව සිවානන්ට බිම බැස වැඳ ''සවාමීනි කළ මනා යම් මෙනෙයක් කෙරෙමි, මාගේ සම්පත්තීන් පිරිනොහෙලුව මැනවැ යි යාචඤ්ඤකෙළේය. එවිට සිවතෝත් උන්ගේ උඩත්කම් නැති නියාව දැන මා නිසා ''තොපගේ සමපත් පිරිනොහෙලම්'' කියා උන් හා සමඟ ගමට අවුත් පිටිසර සිවානන් විසින් කරණලද ආගන්තුක සත්කාර විද කා බී අනතෙහි ප්‍රියවූකථා කොට උන්නාහ. එවිට ආගන්තුක සිවානෝ කියන්නෝ නුඹවහන්සේගේ පුතනුවන් අත පත එවූ වේලේම ඒ නියාවට මම් මාගේ දුවනියන් පාවාදී කළ මනා කවයුත්තෙන් අඩුවක් නොකෙළෙමි'' කිහ. එපවත් සිවතෝ අසා ''යහ පතැ''යි කියා එක්දවසක් තමන්ගේ යෙහෙළියන්ගෙන් ''ඉස උකුණන් හරු ව''යි කියා උකුණන් හරවා හිඳ කියන්නාහු 'කුමක්ද තොපගේ සවාමිපුත්‍රයා ප්‍රියවාසය කෙරේදැ''යි කියා විචාළාහ.

එවිට ඕතොමෝ කියන්නී ''කිසිවකුටත් අමුත්තක් නැත, කළ මෙහෙය කුත් ඇත්නම් කසලිය යි කියා නින්ද කියන පමණක් විනා සෙසු අමුත්තෙක් නැතැ''යි කියන්නාවූ ආදිත් එසේමය. මෙයින් මතු බසක් කීවොත් මේ මන්ත්‍රය උගන්නා උන්ගේ මුඛය මැඩියේය යි කියා මේ මන්ත්‍රය උගත්වා කිප දවසක් ඇතුළතම එම ගම රදු නික්මුණාහ. ඒ කොලුත් ඊ ඉන්න දැමතෙක් අනික් කෙනෙකුන්ට අවකාශයන් නොදී මෙහෙකොට නික්මුණු ගමනේත් පසු ගමන් කොට නැවත ගමට අවුත් පළමු කී නියාවටම වඩා උඩතව වාසය කරන්නාහ. එක්දවසක් සිටුදුව විසින් එලවනලද බත් දුක ''මෙසේවූ බ ද ලබන්නේය''යි කියන්නා එවිට සිටුදූ ඉදිරියේ සිට සිවානන් කී මේ ගාථාව කීහ.

**ඒ කෙසේද? යන්,**

''බහුම්පි සෝ විකත්ථෙය්‍ය-අඤ්ඤං ජනපදං ගතෝ;
අන්වාගන්ත්වාන දුසෙය්‍ය-භුංජ භොගෙ කවාහක''

මේ ගාථාවෙහි අභිප්‍රාය සිටුදූ නොදනීය. කවාහකයා ගාථාවෙහි අභිප්‍රාය දැන එතැන් පවත් බැණනොනැගී ඉඳින්නේය; ගාථාවෙහි අභිප්‍රාය නම් කෙසේද යතහොත්-තෝ අනික් දෙශයක සිට මීට ආවයි කියා තෝ තාගේ තරම් තොදනීද මේ මුරයට සිවානන්වහසේ නිකම් පලාගිය සේකැ''යි කියා ''පසුව මුරයේ ආසේක් වී නම් තා ලෙහිසංගසා ඇරගෙණ යන සේක්දැ යි කියව''යි වදරා 'එසමයෙහි කවාහකයා නම් මේ පින්තූ කියන භික්ෂූහුය, එසමයෙහි බර ණැස් නුවර සිටුවූයෙම් බුදුවූ මම්මය''යි වදරා කවාහක ජාතකය නිමවා වදාළසේක.

---

## 122
## අසිලක්ඛණ ජාතකය.

තිවද සවීඥයන් වහන්සේ ජෙත වනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ මඟුල් කඩුව ඉඹීමින් ලක්ෂණ කියන බමුණෙක් ඇත, අත්ලස් දුන්න වැමියන්ගේ කඩු ගෙණවිත් පැකල ''යහපතැ''යි කියයි, අත්

ලස් නුදුන්න වැමියන්ගේ කඩු පැ කල තපුරු කියයි, අන්ලස් කා ලක්ෂණකියන නියාව එක් වැමියෙක් දැක ඒ නියාවට සහ පන් කඩුවක් ලක්ෂණ යුක්ත කොට තුන්සත ගහා කොපුවක් ඉදිකොට කොපුව ඇතුළත මිරිස් සුණුකොට පුරා කඩුව ඊලා ගොසින් රජ්ජුරුවන්ට පැහ.

රජ්ජුරුවන් විසින් බමුණා ගෙන්වා කඩුව පැ ලක්ෂණ කියයි, කී වීසින් "ගනපතැ"යි කඩුව කොපුවෙන් ඇද නාසය කෙරේ තබා කඩුව ඉඹලීය. ඒක්ෂණයෙහි කඩුව ඇලි තුබූ මිරිස්සුනු නාසයට වැද කිඹිසීය, කඩුව නාසයෙන් ඇත්කොට කිඹිසින්ට පමා සෙයින් කඩුව පිටම කිඹිස කප්පවාගත. ඒ කථාව භික්ෂු සංඝයා වහන්සේ කෙරෙහි සැලවීය. ඒ කථාව ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන්වහන්සේ කිය කියා වැඩඋන් ඉනට සම්බුදුයන් වහන්සේ වැඩවදුරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදු"යි විචාරා වදුරා 'කඩුවේ ලකුණු කියන බමුණාගේ නාසය කැපුනු නියාව කියකියා උනුම්හ"යි දැන්වූකල්හි "මහණෙනි, දැන් මතු නොවෙයි, පළමුන් නාසය කප්පවාගතැ"යි වදුරා ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක

හේ කෙසේද? යන්,

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ කඩුවේ ලක්ෂණ කියන බමුණකු ඇති වීමද, කඩුව ඉඹ ලක්ෂණ කීමද, කිඹිස නාසය කපාගැණීමද, මෙකී සියල්ලම වර්තමාන කථාව කී පරිද්දෙන්ම යි දතයුතු.

ඒ නියායෙන් නාසා කප්පවාගත් බමුණන් දැක රජ්ජුරුවන් විසින් ඉටියෙන් නාසයක් ලවා පළමුසේම උන්ගේ ස්ථානාන්තරයේ සිටුවා තමන්ට සේවය කරණ පිණිස සලස්වා ගත්හ.

එසමයෙහි රජ්ජුරුවන්ගේ බෑන රාජකුමාරයෙක්ද රජ්ජුරුවන්ගේ දූ වන රාජකුමාරිකා කෙනෙක්ද බාල ද, පටන් එක්ව කෙළ එක්ව වැඩි උනුන් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව වසන සමයෙහි බරණැස් රජ්ජුරුවන් විසින් අමාත්‍ය මණ්ඩලය එක්වහිඳ කථාකරන්නාහු "මාගේ දුවනියන් ඔබ්බේරජ්ජුරු කෙනෙකුන්ට පාවා දෙන්නාසින් මව භාරය, එසේ නොසින් රජ්ජුරුවන් දෙන් නෙකු මට සහයවන්නේය"යි සිතා රාජකුමාරිකාවන් රාජකුමාරයන්ට නොපෑ වාසය කරන්නාහ. දෙන්නාම උනුන් කෙරෙහි පිළිබඳ සිත් ඇති විසිනුත් වය සුත් මුහුකුරා සිටි විසිනුත් එක් දවසක් රාජකුමාරයෝ රාජකුමාරිකාවගේ කිරි මව් දැක මසුරන් දහසක් දී රාජකුමාරයෝ කියන්නෝ "නොප විසින් රාජ කුමාරිකාවන් රජගෙන් මැත්කරණ උපායක් කරව"යි කී විසින් "ඒ මට භාර ය"යි කියා රජ්ජුරුවන් කරා ගොස් "දේවයන් වහන්ස, නුඹවහන්සේගේ දුවනි යන් වහන්සේගේ ශරීරයෙහි කාලකන්නියක් වෙසෙයි, එසේ නොසින් ඒ කාල කන්නි ප්‍රවාහ කරන්ට උවමැතවැ'යි "එසේහෙයින් අසවල්තැන ශ්වසාන භූමි යෙහිදී පිලක් බැඳ පිලපිට මිනියක් තබා මිනිය පිට ඇඳක් තබා ඇඳපිට රාජ කුමාරිකාවන් ඉඳුවා ඉස් සොඩා නහවාගෙණ ආයුතුයයි"කීහ.

රජ්ජුරුවෝත් ඒ අසා "එසේම කරවයි උන්ටම භාරකළහ. එමවිට ගොස් ශ්වසාන භූමියට මිරිස්සුනු පොට්ටනියක් ඇරගෙණ ගොස් එක්ව ගිය මිනි සුන් ඒ ඒ තැන සහවාපියා මියගිය මිනියක් සේ මුනින් වැදහෙව මා විසිනුත්

නුඹලාට අඩක් ගසාපියා මා කැටිව රැකවලව් ගිය සේවායනුත් ඇරගෙණ දුව පියන්නා එවිට 'නුඹවහන්සේ රාජකුමාරිකාව ඇරගෙණ ඉස්සෝදෑ නහාගෙටම පලාගිය මැනවැ''මි කියා එපවත් ගොස් රාජකුමාරිකාවන්ටත් කියා රජකුමාරයන් විසින් එකී දවසට එකී සැටියේ ගොසින් ශ්වසාත භූමියෙහි වැදහොත් කලට රාජකුමාරිකාවන් හැරගෙණ සේනාව විසින් රැකවල් ලවාගෙණ නික්ම පෙරමගදී සේනාව ඇත්තන්ටත් කියන්නී ''ශ්වසාත භූමියෙහි වැදහොත් පුරුෂයා කීපවාරයක් කිඹිසපියා නැගිසිට පළමුව දුටු කෙනෙකුත් අල්වාගෙණ මරා පියයි, එසේහෙයින් නොප හැමදෙන බියපත්ව'යි මගදීම කියා සෝන්පලට ගොස් කීලෙසම රාජකුමාරයන් කිඹිසපියන්නා තෙමේ හයින් මහඅඬින් හඬා ගෙණ ඇමටම පළමුව දිවපුව. ඒ දුටු පිරිස් ආවුද එලා මහහඬින් හඬා දිවපුව වාහ.

එවිට රාජකුමාරයෝ රාජකුමාරිකාවන් ඇරගෙණ ඉස්සෝදෑ නහා තමාගේ ගෙට ගියහ. එපවත් රජ්ජුරුවෝ අසා සතුටුව සිතා උන් නා පැමිණි ය යි වහා මගුල් කොට සරණපාවාදී රාජ්‍යයත් පාවා දුන්හ.

එසමයෙහි කඩුලක්ෂණ කියන බමුණා රජ්ජුරුවන් නැගෙනහිරට පිටලා උන් විසින් නැගෙණහිරට මූණලාසිටි බමුණාගේ මුහුණ අව්ව ගැසෙත් ගැසෙත් ඉටිවිරී නාසය වැටී ගියවිට බමුණා ලජ්ජාවෙන් කරබාගත. එවිට රාජකුමාරයෝ කියන්නෝ ''ආචාරීනි, ලජ්ජා නොවෙව කිඹිසීම් නිසා තොපට මේසා අලාභයක් විය. ඒ කිඹිසීම් නිසා මට මෙසේ වූ ලාභයක්විය යි කියව'යි වදාරා එසමයෙහි කඩු ලක්ෂණ කියන මෙසමයෙහි කඩු ලක්ෂණ කියන බමුණාමය, බරණැස් රජ්ජුරුවන්ට බෑනාවූ රාජ්‍යයත් ලත් රජකුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැ''යි වදාරා මේ අසිලක්ඛණ ජාතකය නිමවා වදාළසේක.

---

## 123 කලණ්ඩුක ජාතකය

තවද සවීඥයන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවසන සමයෙහි කලණ්ඩුක ජාතකය දක්වනලද. එහි වර්තමාන කථාවද බරණැස් සිටාතන්ගේ පුතනුවන් හා කෙල්ලගේ පුතා එක්ව අකුරු කළ නියාවද, සිටාතන්ගේ ගේ බැලූ නියාවද සිටාතන් ලිවිවා බඳු බොරුපතක් ලියූ නියාවද, ඒ පත ගෙණ ගොස් පසල් සිටාතන්ගේ දුවට දුන් නියාවද, යන සියල්ල පළමු කියනලද කටාහක ජාතකයෙහි පණතමය යි දත යුතු.

මේ ජාතකයෙහි වෙනස නම් කටාහක නම් කොළු සිටුදුව පාවාගෙණ වාසය කරණ සමයෙහි බරණැස්නුවර සිටාතෝ තමන්ගේ කොල්ලා අපවත්ව ගිය හෙයින් තමන් ගේ වසන ගිරවාට කියන්නාහු ''ගිරාපොතකයෙනී, තොප විසින් කලණ්ඩුකයා උන් තෙනින් බලා ඇවිත් කියව''යි කියන්නා 'යහ පතැ''යි අවුත් පැමිණියේය.

ගිරාපෝතකයා පැමිණි දවසම කලණ්ඩුකයා ස්නානය කරන්නටය යි ගඟට ගියේය. ගිරාපොතකයාත් ගඟ සමීපයෙහි දිඹුල් ගසක කොලතුරේසැඟවී

ගෙණ උන්නේය. කලණ්ඩුකයන් ජලක්‍රීඩාව කරණ හෙයින් සිත තොවදින්ට සිටුදුව විසින් කුළුබඩු කකාරණලද කිරි අතට දුන්කල්හි කලණ්ඩුක කිරිකවක් ඇරගෙණ කවසෝදා සිටුදුවගේ ඉස වත්කරන්නා දුටු ගිරාපෝතකයා කියන්නේ 'ඇයි කලණ්ඩුකයෙනි, අප බැද්දේ වසන පක්ෂීන් පමණ මිසක් තොප අප හා එකගෙයි වාසයකළෝය, තොපි තොපගේ තරම් නොදනුදැ? එසේවිසින් මෙසේවූ ජාතිසම්පන්න සිටුදුවගේ ඉසට කිරි වත්කරන්නේය. කවට ඇරගත් කිරි බිපියහ පමණක් විනා නොදනිමි"යි කීහ.

එබස් ඇසූ කලණ්ඩුක සිතන්නේ "ගිරවානන් දැන් මාගේ තත්ත්වය එලියේ ක්වීවොත් නපුරැ"යි සිතා 'ගිරවානෙනි, මෙසේ ඇවිත් සාමීචි කථා කොට හිඳුව"යි කීහ. එබස් ඇසූ ගිරවා තමාගේ තත්ත්වය කී හෙයින් මාගේ බොටුව මඬින්ටය, මූ කැන්දන්නේය"යි සිතා ආකාශයට නැගී බරණැස් නුවරටම ගොසින් සිවානන්ට මේ තත්ත්වය කීයේය. ඒ ඇසූ සිවානෝද 'එකියන කලණ්ඩුකයා ගෙන්වාගෙණ ආවොත් මෙසේ සලසාගහාහැකිය"යි වදාරා "එසමයෙහි කලණ්ඩුක නම් මේ පින්තූ කියන භික්ෂුහුය, බරණැස් සිටානෝ නම් බුදුවූ මම්මවේදැ'යි වදාරා කලණ්ඩුක ජාතකය නිමවා වදළසේක.

## 124 බිළාර ජාතකය

තවද සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝගදන්නා භික්ෂූකෙනෙකුන්වහන්සේ ගෙණවුත් පැකල්හි "මහණෙනි, දැන් මතු තොවෙයි පෙරත් වඤ්චා ප්‍රයෝගයෙන්ම දන්නෝවේදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ විසින් ඉකුත්වත් දක්වා වදළසේක.

**හේ කෙසේද? යත්;**

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ මූසිකව උපන්සේක. මහතින් උඟරු පැටියකුගේ ප්‍රමාණය, සියදහස්ගණන් මියන්ට නායකව තුඹසක වසනසේක. එසමයෙහි එක් කැනහිලෙක් ගොදුරු සොයා ඒ ඒ තැන ඇවිදිනේ මියන් සමූහයා දැක 'යම් උපායකින් මේ මියන් කන්ට ඵවුවමැනව"යි සිතා බොධිසත්ත්වයන් ගොදුරු කන්ට යන මග තැගෙණහිරට මුහුන ලා කට දල්වා ගෙණ තුන්පයක් ඔසවාගෙණ එක කකුලක් බිමගසාගෙණ කැණහිලා සිටියේය. බොධිසත්ත්වයෝ ගොදුරු සොයා යන තැනැත්තවුන්වහන්සේ ඔහු දැක "තොපි කවුරැදැ'යි විමැරා උන් විසින් "මා ධම්මිකයෝය"යි කී කල්හි "එක පයින් සිටිනේ ඇයිදැ'යි කී විසින් "තුන්පයින් සිටියෙම් නම් පොළොව ධරා ලිය තොහෙයි" කීහ. "කවදල්වාගෙණ සිටිනේ ඇයිදැ"යි කී විසින් 'සුලන් අනුභවකරන්වය"යි කීහ. "තැගෙණහිරට මුහුන ලා සිටින්නේ ඇයිදැ"යි කී විසින් සූයශ්‍රීදිව්‍යපුත්‍රයාට සේවයකරම්" කී විසින් බොධිසත්ත්වයෝ "මූ කියන්නේ ඇත්තොකැ"යි සිතා "මුන් ලෙහි යහපත් ගුණයක් ඇතැයි" සිතා දවසට දෙවිටක් ඇවිත් සේවය කරන්නාහ.

එසමයෙහි කැණහිල් මියන් තමාට සේවය කොට යන්නවුන් බලා හැමට පස්සේ යන මියකු අල්වාගෙණ කා කව ලේ පිස පළමු සිටි නියාවටම සිටිනේය. මෙම නියායෙන් දවස්පතා මියන් කන විසින් කල්යාමෙන් මියෝ අඩුවී ගියාහ. එවිට මියෝ ගොස් බොධිසත්වයන්ට කියන්නාහු "පෙර අපි මේ තුඹස ඉදිනේ ගැටි ගැටිය, දැන් ඉතා තුනීව ගියම්හ, ඒ කුමන කාරණාවක් ඔවක් නොදනුම්හ, ඒ ඔව දතොත් යහපතැ"යි කීහ.

ඒ ඔව බොධිසත්වයෝ අසා එසේ වී නම් කැණහිලාගෙන් වන උපද්‍රවයෙක් නිසාය යි සිතා එදවස් කැණහිලාට සේවයට ගොස් එනගමනේ පරීක්ෂා කරන්ට උවමැනවැ"යි සිතා මියන් ඇමෝම යවා පසුව බොධිසත්වයෝ නික්මුණාහ. බොධිසත්වයන් නික්මෙන්නා දැක මෙතෙක්දු මියන්ට පනින්නා සේම පැන්නේය. බොධිසත්වයෝ ඔහු අතින් ගැලවී ඉවත පැකිල යන්නාහු බලලුන් කරණ තපස් වැන්නේය"යි සිතා කරණ තපසැ යි කියා තපස් කරම්හ යි මෙසේවූ වඤ්චා කෙරෙද්දැ යි කියා බොටුවට පැන කූලල කඩා කා මරාපුවාහ.

ඒ දුටුවාවූ මියෝ එතනට අවුත් කැණහිල් බල්ලාගේ මාංස එකසීම ලියා කාපුවාහ, පසුව ඇ මියෝ මොත්තමට මාංස සම්භනුයේය, ඔහු මරා සැපසේ වාසයකොට කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදාරා "එසමයෙහි මියන්ට නායකව උපන්නොම් බුදුවූ මම්මය යි වදාරා බිළාර ජාතකය නිමවා වදාළසේක.

## 125
## අග්ගිදත්ත ජාතකය.

මේවද සවීඥයන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වංචා ප්‍රයොග දන්නා භික්ෂූ කෙනෙකුන්වහන්සේ අරභයා මේ ජාතකය වදාරණ ලදී.

යිවගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයන්වහන්සේ මූසිකව උපන්සේක. එසමයෙහි එක්කැනහිලෙක් ගිත්තෙන් දැ ඉස ලොම් පමණක් තිබියදී සම්ඛගයෙහි ලොම් දැ ගියේය. එවිට හිස පමණක් රැකගත්තාවූ කැණහිල් ඡායාවෙන් තමා හිස් කුඩිඹිය පමණක් දැක කුඩිඹිය ඇති පසු ජීවත් විය හැක්කැ යි සිතා බොධිසත්වයන් ඇතුළුවූ බොහෝ මියන් වසන තැනට ගොස් පළමු කී ජාතකය පරිද්දෙන් වැදසිටි ව්‍යවසථාවට බොධිසත්වයෝ එතනට අවුත් "තොපි කවුරුදැ"යි වදාරන්නාහු අගහිස භාවරාජයෝය යි කියන්නා "කුමක් නිසා අව්දැ"යි විචාරා "තොපහැම රකින්ට ඇම්" කී විසින් 'අප රකින්නේ කෙසේදැ"යි විචාරන්නා "උදැසන සවස ගොදුරට යන්නවුන් හා දෙවනුව බිලයට වදින්නවුන් ගැණ නියමය දනිමි"යි කී විසින් "යහපත මයිලනුවනි, එලෙසකරව"යි කී විසින් එතැන් පටන් යන එන මියන්ගේ ගණන පසාරයෙන් කන විසින් මියෝ තමන්ගේ මියන් අඩු නියාව බොධිසත්වයන්ට කීහ.

බොධිසත්ත්වයෝ එපවත් අසා එදවස් හැමව පස්සේ නික්මුණාහ. මෙතෙක්දෑ සේම කැණහිල්බළු බොධිසත්ත්වයන් වහන්සේට පැන්නේය. බොධිසත්ත්වයෝ වළහා ඉවත පැන තොප විසින් මියන් රකිමි කියා මියන්නැසූ පමණක්මය යි බොටුවට පැන කුලල සපා කා මැරුහ''යි වදාරා ''එසමයෙහි කැණහිලා නම් දැන් මේ කුහක භික්ෂූහුය, මියන්ට රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ''යි වදාරා මේ අග්ගිදන්ත ජාතකය නිමවා වදාළසේක.

---

## 126
## කොසිය ජාතකය

තිවද සවීඥයන් වහන්සේ ජේත වනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයෙක් උපාසකව තුනුරුවන් මනාසේ ඇතව වාසය කෙරෙයි.

එසමයෙහි ඔහුගේ ගෙයි වසන බැමිණි දුරාචාරව වාසය කරණ විසින් රාත්‍රි මානයෙහි නිදි නොලැබ දහවල් ගෙයි කළමනා කිසි කම්කටයුත්තක් නොකොට වැදහෙව නිදන්නීය.

බමුණා අවුත් ''ඇයි තොප වැදහෙව නිදන්නේ කුමක්නිසාදැ''යි විවාළේය. එවිට ''ලෙඩවීම'' කියන්නා ''කුමක් ලෙඩදැ''යි විචාරන්නා ''රුජාවෙක කී විසින් ''කළමනා කවරේදැ''යි බමුණා විවිරන්නා ''ප්‍රණීත ආහාරය ලබන්නා යහපතැ''යි කී විසින් දවස්පතා සිහා සොයා ගෙණෙන්නේය. මේ නියායෙන් තමාගේ දවස්පතා ලත් රුජාව සන්සිඳීමක් නැති විසින් ඒ බව බුදුන්ට දන්වන නියාත් කිප දවසක් නොගිය විසින් ගද දුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන් කරා ගොස් බුදුන් වැඳ පුදා එකත්පස්ව උන්නේය.

බුදුහු බමුණා දැක ''මෙතෙක් දවස් නො ආයේ ඇයිදැ''යි විවාළසේක බමුණු එවිට කියන්නේ ''තමාගේ ගෙයි බිරින්ද රුජාවක් විසින් බෙහෙත් සප යන නිසා පමාවීමි''යිකියා නැවත කියන්නේ ''රුජාව පමණක් මිසක් සර්වාඞ්ග යෙන් වැහැරගිය කෙනෙක් වත් ශරීරවණීයෙන් අඩුවක් වූයේත් නැත, එසේ පමණක් මිසක් කෙතෙක් ප්‍රණීත ආහාර දුන්නත් රුජාවෙන් අඩුවක් නැත. ඊට කළමනා කුමක්දැ''යි සර්වඥයන් වහන්සේගෙන් විවාලෝය.

සවීඥයන් වහන්සේ වදාරණසේක් ''භවයෙන් ප්‍රතිච්ඡන්නව තිබෙන හෙයින් තට කොදුනෙන්නේ පමණක් මිසක් පළමුත් ඊට බෙහෙත් කීවෝ වේදැ''යි වදාරා බමුණා විසින් ආරාධිතවූ සවීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

තිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ දිසාපාමොක් ආචාරීව එසිය යක් නුවර කුමාරවරුන්ට හා බ්‍රාහ්මණ කුමාරවරුන් ආදීවූ බොහෝ දෙනාට ශිල්ප දී වාසය කරණසේක. එක් බමුණෙක් දිසාපාමොක් ආචාරීන් අතින් ත්‍රිවේදය හා අක්ෂර ලිඛිත ගණිත තර්ක ව්‍යාකරණාදීවූ අෂ්ටාදශ ශිල්පයෙහි පාර ප්‍රාප්තවිය. ඒ බමුණාද දවස තුන්විටක් ආචාරීන්ට සේවයකොට ශිල්ප ශාස්ත්‍ර යෙහි අඩුවැඩිය අරවාගෙණයෙයි. එසමයෙහි ඒබමුණාගේ බිරිඳ දුශ්ශීල නියාව පළමුව වතීමාන කථාවෙහි පණතසේම බමුණා අවුත් ආචාරීන්ට කී කල්හි

ආචාරී එපවත් අසා ප්‍රණීත ආහාර කැවීමෙහි කම්තැන ගොමුදියෙහි පස්පලා කකාරා ඇරගත් පැන් හා තිකුළු තිපල් කකාළ කෂාය ඉදිකොට තඹ භාජන යෙහි වත්කොට කීපදවසක් තබා තඹ ගඳ වෙඩරුවූ කල්හි ඒ කෂාය ගෙණ ගොස් වැලක්වත් ලනුවක්වත් ඉපලක්වත් ඇරගෙණ සිට මේ බෙත් බී රැජාව සංහිදුවා ගණුව එසේ නැත්නම් මාගෙන් දෙන ප්‍රණීත ආහාරය කන බොන නියාවට ගෙයි මේවර හෝ කරවයි කියව, මෙකීදෙයකට කම්මැලිවූ නම් ඉසකේ පත අල්වාගෙණ අත තුබූ ඉපලවූවත් වේවැලවූවත් ලනුවවූවත් තුනින් එක කින් යහපත්කොට ඇන මේ නියාගෙයන් කරන්නා ලෙඩ සුවවෙයි කියා ආචාරී කීහ. බමුණා ගෙට ගොසින් එලෙස කරන්ටවූ දින උපාය කීවේ කවුරුදැයි විචාරන්නා ආචාරීන්වහන්සේ කීසේකැයි බමුණා කී විසින් ආචාරීන් මාගේ තත්ත්වය දත් නියාව වේදැයි සිතා එවිට මේ වධ මා විඳින්නේ ඇයිදැයි සිතා ඇඳින් නැගීසිට කළමනා මෙහෙවර කළහ. එතැන් පටන් කරණ දුස්සීලය හැර පතිව්‍රතා ධර්මය රැක්කාහ, වර්තමාන කථාවෙහිත් බුදුන් ඇසූ නියාව දැන මෙකියන බැමිණිත් තමා කරණලද දුස්සීලය හරණලද්දීය. එසමයෙහි දෙම හල්ලෝ නම් මෙසමයෙහිත් දෙමහල්ලෝමය, දිසාපාමොක් ආචාරීව උපත්තෙම් බුදුවූ මම්මයයි වදාරා දෙකල් ගළපා මේ ඛොඝිය ජාතකය නිමවා වදාළසේක.

---

## 127
## අසම්පදාන ජාතකය

එවද සර්වඥයන් වහන්සේ රජගහනුවර නිසා වෙළුවනාරාම යෙහි වැඩ වසන සමයෙහි එක් දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්ව වැඩඋන්නාවූ මහළු වරුන්වහන්සේ "ඇවැත්නි, දෙවදත්ත සථවිරයෝ කෙළෙහිගුණ නොදනිති" කිය කියා වැඩඋන්සේක.

එතනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාළ කල්හි "දෙවදත්ත සථවිරයන් කෙළෙහිගුණ නොදන්නා නියාව කිය කියා උනුම්හ"යි දැන්වූ කල්හි "මහණෙනි, දැන් මතු නොවෙයි, පෙරත් කෙළෙහිගුණ නොදන්නෝම වේදැ"යි වදාරා ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්,**

යිටගිය දවස මගධ රට රජගහනුවර මගධ නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ එනුවර අසූකෙළක් සම්පත් ඇති සංඛ සිටුව උපන්සේක.

එසමයෙහි බරණැස්නුවර මහසම්පත් ඇති පිළිය නම් සිටානකෙනෙක් ඇත්තාහ. එනුවර සිටුවරු දෙදෙන උනුන්කෙරේ විශ්වාසව දවසරනාහ.

එසමයෙහි බරණැස්නුවර පිළිය සිටානන්ගේ ගෙයි සම්පත් පිරිහීගොස් දුකඳිතව සිතන්නානු මාගේ යහළු සංඛ සිටානන්කරා ගොස් සම්පත් ඇරගෙණ අවුත් රැකෙමි සිතා තමන් හා සිටුදුවනියන් පමණක් බරණැස් නුවරින් නික්ම නැගීයන්ට වාහනයක් පමණ නැතිව පයින්ම රජගහනුවරට අවුත් සංඛ සිටා

තන්ගේ ගෙට වැද දුටු කල්හි සිවානෝ "කුමක්නිසා අවුදු"සි විචාරන්නා දුකඹි තව රැකෙන මානක් නැතිව නුඹකරා ආමි" කී විසින් එවිට සංඛසිටානන් විසින් 'ආයේ යහපතැ"සි කියා තමන්ගෙන් සතළිස් කෙළක් සම්පත්දී දැසිදස් පරිවාර සම්පත් සියල්ලන් දෙකොටසක් කොට බෙදූ කොටසක් දී සත්කාර සම්මාන කොට යවූහ.

කල්යාමකින් සංඛසිවානෝත් දුකඹිතව සිතන්නාහු "මෙසේ දුක්විඳිනා බලත් මාගේ බොහෝ සම්පතුත් ඇරගෙණ ගිය පිළිය සිවානන් කරා යන්නා මටත් ප්‍රත්‍යුපකාර කරන්නෝ වේදැ' යි සිතා සිටුදුවනියන් හා සමග බරණැස් නුවරට ගොස් සිටුදුව ශාලාවක රඳවා තුමූ පිළිය සිවානන්ගේ ගෙදරට ගියාහ. එවිට පිළිය සිටානෝ සංඛසිවානන් ආගසි අසා ගෙට කැඳවා යවූහ. සංඛ සිවානෝ ගෙට අවුත් දැක උනස්තෙන් නැගී සිටින්නක්වත් ඉන්නා අසුන් පැන වීම් සාමීචිකාමක්වත් නොකොට "කුමක්නිසා අවුදු"සි විචාළහ.

එවිට සංඛසිටානෝ කියන්නෝ "නුඹ දකිනා පිණිස ආමි' කියන්නා "නවාතැන් අළෙ කොසිදු"සි කියන්නා "නවාතැන් අළතැනක් නැතැ"සි කියන්නා එදවස් තමන්ගේ ගෙදරට දැසක් යාල රත්හැල් වැද තිබෙද්දී කෙළෙහිගුණ නොදන්නා හෙයින් තමන්ගේ ගෙයි කොල්ලකු කැන්දුලා කියන්නෝ "මුන් ආගමන සිස් නොකොට බොල් තිඹක් මුන්ගේ එකතුරුපවට මැනලව"සි කියා සම්මතකොට සිටානන්ට කියන්නාහු "තෙපිත් තෙල ඇර ගෙණ ගොස් නවාතැනකදී පිස කාපියා මා කරා නොවුත් නොපගේ රටවම පලායව"සි කීහ.

එබස් අසා සංඛසිටානෝ සිතන්නාහු "මේ බොල්තිඹ ඇරනොගණිම් දෝ හෝ යි සිතා නැවත සිතන්නාහු "මා විසින් මිත්‍රධර්මය නොබිඳිතා ඒ කුමක් වේව යි සිතා බොල්තිඹ හිතලවාගෙණ ශාලාවට ගොස් එපවත් සිටුදුවට කීහ. ඒ සිටුදුව කියන්නී "නුඹවහන්සේ විසේෂපව සතළිස් කෙළක් සම්පතුත් පරිවාරත් දී බොල්තිඹ ලවාගෙණ ආයේ කිමදු"සි කී විසින් "උන් විසින් ලූ බොල්තිඹ ඇරනොගණිම් නම් මාගේ මිත්‍රකම් බිඳිනා හා සරිය, එසේ විසින් ගෙණාම්," ඊට තොපි කනස්සළු නොව"සි කීවත් සිටුදූ හඬන්නීමය, පළමු සංඛ සිවානන් විසින් පිළිය සිවානන්ට පාවා දුන් ගම් ධුරයෙක් ශාලාව සමීපයෙන් යන්නේ ශාලාව ඇතුළට වැද සිවානන් හා සිටුදුවනියන් දැක දෙන්නා පයගෙණ හඬා "සාමිදුවනියනි, කුමකට හඬවුදු"සි විචාරන්නා "සතළිස් කෙළක් සම්පත් දී බොල්තිඹක් දුන් විසිනැ"සි කිවූය. එවිට කියන්නා නුඹ වහන්සේ විසේෂප නුවූව මැනවැ"සි කියා තමන්ගේ ගෙට දෙන්නාම කැඳවාගෙණ ගොස් ඉස් සෝධා නහවා බත්කවා තමාගෙනුත් බොහෝ සත්කාර කොට තමා හා එක්ව ආ පරිවාරයන්වත් කියා උන් ලවාත් බොහෝ සත්කාරකරවා ඒ කියන කොටු තමාගේ රැස පරිවාරත් හැරගෙණ වාසල සිට මොරහැය. එවිට රජ්ජුරුවෝ තමන්ගේ සිටානන් හා රජගනුහනුවර සිට ආ සංඛ සිටානන් දෙන්නා ගෙන්වා බරණැස්නුවර රජ්ජුරුවෝ සංඛ සිවානන් අතින් විචාරන්නා "නොපගේ ලඟට මුන් ගිය ගමනේ මුන්ට කුමක් දුනුදු"සි විචාරන්නා "සතළිස් කෙළක් සම්පත් හා බොහෝ පරිවාර දුනිමි" කී විසින් පිළිය සිවානන් අතින් "සැබෑ දැ"සි විචාරන්නා "සැබව'සි කී විසින් නොප කරා මුන් ආ ගමනේ නොප දුන්නේ කුමක්දු"සි පිළිය සිවාණන් අතින් විචාරන්නා කරබාගත්හ.

එවිට රජ්ජුරුවන් විසින් "බොල්තිඹක් දුන්නැයි කියන්නා ඇසුම්හ"යි කී විසින් කරබාගත්තාහ.

එසමයෙහි රජ්ජුරුවන් හා අමාත්‍යමණ්ඩලයා හා බොහෝ නිත්දැ කළාහ. එවිට රජ්ජුරුවෝ සංඛසිටානන්ට කියන්නෝ "මුන්ගේ ගෙයි සම්පත් එකතීම ඇරගෙණ යව"යි කියන්නා "දෙවයන්වහන්ස, අනුන්ගේ සම්පත්තින් මට කාරිය කිම්ද? මා දුන් සතළිස් කෙළක් සම්පත් හා මාගේ පරිවාර ඇම්මේ"යි කියා ඇමම ඇරගෙණ රජගහනුවරට ගොස් දානාදී පින්කම් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ'යි මදුරා "එසමයෙහි පිළිය සිටානෝ නම් දෙවදත්ත සථවිරයෝය, එසමයෙහි සංඛසිටානෝ නම් බුදුවූ මම්ම වේදැ"යි දෙකල් ගළපා අසම්පදාන ජාතකය නිමවා වදාළසේක.

## 128 පංචගරු ජාතකය.

මේ වදාළ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහිදී අජපාල නිග්‍රෝධ මූලයෙහිදී අප බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩහිඳ කථාකරණසේක් 'ඇවැත්නි, සම්බුදුරජාණන්වහන්සේ විසින් අජපාල නිග්‍රෝධ මූලයෙහිදී තණ්හාය, අරතීය, රගාය යන මාරසන්‍යන් තුන්දෙනා විශිෂ්ට රූ මවා ගෙණ බුදුන් පොළඹවන්ට ආ ගමනේ බුදුන් විසින් කර ඔසවාත් නොබලන ලද එසේ විසින් මේ නියා රූපශ්‍රියක් දැක වැඩහුන් නියාව යහපතැ"යි කියා කථා කොට වැඩහුන් නෙතට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදාරා "මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "දැන් මහණෙනි, මා විසින් සියලු ක්ලේශයන් නසා ලොවිතුරා බුදුවූ ජාතියෙහි සත්‍රීවසඟවූවා කුමක්ද? අපූර්ව්‍යද? අබුඩොත්පාදයෙහි බොධිසත්ත්වයන් නුමූකළ නුවනින් දවස අරණ සමයෙහි පවා ස්ත්‍රීවසඟව නූපමෝදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

පෙරගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ට රාජකුමාරවරුන් පන්සියයක් ඇතිවූ නියාවද බොධිසත්ත්වයන් ඇමට බාලව ඉපද පසේබුදුන් අතින් "කවරදැ මට රාජ්‍යය ලැබේදැ"යි විචාළ නියාවද පසේබුදුන් විසින් "සත් දවසකින් තක්සලා නුවරට ගියා නම් රාජ්‍යය ලබයි කී නියාවද අමාත්‍යයන් පස්දෙනෙකු එක්ව ගොස් පඤ්චකාම තෘෂ්ණාවෙන් යකින්නට ගොදුරුවූ නියාවද බොධිසත්ත්වයන් පස්සේ යකින්න ඵලවාගෙණ ඊම ආදී ගන්ධාරනුවර ශාලාවකට වන් නියාවද ගන්ධාර නුවර රජ්ජුරුවන් නුවරට ඇතුපිටින් වඩිමින් සිව බොධිසත්ත්වයන් එපයි කියව කියවා යකින්න අරගෙණ රජගෙට ගිය නියාවද එදවස් රැ තමාගේ යක්ෂවිමානයව ගොස් යකින්නන් ඇරගෙණ රජ්ජුරුවන් හා සියලු වාසල පවන් ඇතුළු අය ජීවිතක්ෂයට පමුණුවා ඇට තිබියදී භක්ෂණය කළ නියාවද යන සියල්ලම පළමු කියනලද ගන්ධාර ජාතකය සමයයි දතයුතුයි.

යකුන් පලාගිය කල පසුදවස් ගම්මුදලිවරුන් විසින් දෙරවල් බිඳ ඇතුළට අවුත් රජගෙයි තුබූ කසල දමා ශුද්ධකොට නුවර දිව්‍යපුරයක් මෙන්සරහා රජගෙය සුධර්මා නම් දිව්‍ය සභාවක් මෙන් සරහා අමාත්‍ය මණ්ඩලය රැස්කර වන්නාහු අසවල් ශාලාවේ උන් පුරුෂයා රාජ්‍යය කරන්ට නිස්සෝය යි කියා ඔබ කරා ගොස් එපවත් කිහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නෝ "රජ්ජුරුවන්ගේ පුතනුකෙනෙකුන් නැද්ද" යි විචාරන්නා "නැත" යි කී හෙයින් ඔටුනුපැළඳ මහත්වූ පෙරහරින් නුවරට වැද දළපුඩුසේසත් නැඟ සිංහාසනාරූඪ යුවරජ සෙනෙවිරත් ඇතුළුවූ අමාත්‍යමණ්ඩලයා පිරිවරා බ්‍රාහ්මණපතීන් ගෘහපතිපතීන් සමන්විතවූ සොළොස් දහසක් නාටක සත්‍රීන් නැටීම් ගීකිම් බෙරගැසීම් ආදීවූ දෙයින් මෙඝ ගර්ජිතාවක් කරන්නට වන්නාහ. පඤ්චාංගික තූර්‍යනාදයෙන් එකතින් නාදකෙරෙමින් ඒ ඒ තැන ඝොෂාකරවන්ට වන්නාහ. මේ නියායෙන් බොහෝ රාජානුභාවයෙන් ඉඳ සිතන්නාහු පසේබුදුන්වහන්සේ කී පණතට හා වීර්‍ය ධෛර්‍යයෙන් මෙසේ ප්‍රතාපයක් ලද්දේය යි සිතා එතැන්පටන් දැනාදීවූ කුසල්කොට දැනමෙන් සෙමෙන් රාජ්‍යයකොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදරා "එසමයෙහි ගන්ධාර දෙශයෙහි රාජ්‍යය කළ රාජකුමාරයෝ තම් බුදුවූ මම්මය" යිවදාරා මේ පඤ්චගරු ජාතකය නිමවා වදාළසේක.

---

## 129
## සිරිකාළකණ්ණි ජාතකය

තිවද සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. එක්තරා භික්ෂූකෙනෙකුන් වහන්සේ පිටිසර ගමෙක වස්වසන්ට පළමු තුන්මස පන්සල ගිනිවැද දැගිය විසින් උපාසකවරුන්ට එපවත් කියා උපාසකවරුන් විසින් "ස්වාමීනි, වැටබඳිමහ" යනාදී කී කී දවස්ම අවුත් කිය කියා තුන්මසම ගණය නොතැගුහ, විහාර ඵාසු මඳ හෙයින් අධිගමයක් වන්නා තබා ආලෝකයක් පමණකුත් උපදවා ගත නුහුනුවාහුය, මේ නියායෙන් දවස් ඇර වස් ඉක්බිති බුදුන් කරා අවුත් බුදුන් වැඳ එකත්පස්ව වැඩඋන්සේක.

සර්‍වඥයන් වහන්සේ සුවදුක් විචාරා "ඇයි මහණෙනි, ඔය කාරිය මුදුන් පැමිණියේදැ" යි විචාරන්නෝ විහාර අඵාසු හෙයින් භාවනාකරන්ට නුවූයේ" යි දන්වන්නා "ඵාසු තෙනකට ගොසින් වුවත් භාවනාකරන්ට එපාදැ" යි පෙර පක්ෂීහු පවා තමන් උන්තෙන අඵාසු හෙයින් ඔබ්බට හොසින් වාසය කළෝ වේදැ" යි වදාරා ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ පක්ෂීව බොහෝ පක්ෂීන්ට රජව ඉපද ගඟක් සමීපයෙහි වාසය කරණසේක.

එසමයෙහි බොහෝ පක්ෂීන් ගඟට නැමී තිබෙන අත්තක ඉඳ වර්ෂ කරන්නාහ. එසමයෙහි ගඟ වසන්නාවූ නාගරාජයෙක් තමා වසන දියෙහි

වර්ෂස් කරන්නාහ, "උන් වසන ගස ගින්නෙන් දවන්ට උවමැනවැ"යි සිතා රාත්‍රියෙහි පක්ෂීන් එකසිම ගසට රැස්ව උන් වේලාවට පළමුකොට විෂධූමයක් අළේයැ, ඉන් ඒ ගඟ පැන් උණුකරවා පීය, දෙවෙනිව ගිනිකඳ අළේය. ඉන් දුම් කඳ පැනනැංගේය, තුන්වෙනිව අළු ගිනිකඳින් නාඹතල්කඳ සා ගිනිකඳ පැන නැංගේය. ඒ දුටු බෝධිසත්ත්වයෝ "ගින්නට විරුඬවූ දියෙන් ගිනිකඳ පැන නැගි අවස්ථාවෙහි අපි මෙතන ඉඳීම කාරණා නොවෙයි, කීවා කරණ පක්ෂීන් ගණනක් ඇරගෙණ ඔබ්බට ගියේ වේදැ"යි වදාරා "එසමයෙහි පක්ෂීව උපන් නෙම් බුදුවූ මම්මය"යි වදාරා ෂඩන්න ජාතකය නිමවා වදාළසේක.

---

## 130
## පුෂ්පරත්න ජාතකය

තිවද සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සම්බුදුරජාණන් වහන්සේ සකස්පුරදොරට බට දවස් සැරියුත් සවාමීන් වහන්සේ ප්‍රශ්න විසඳීනය කළ නියාව යහපතැයි යන මේ කථාව නිසා මේ ජාතකය කියනලදී.

**ඒ කෙසේද? යත්,**

ජේතවනයෙහි දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ හිමාලයවනයෙහි බොහෝ තාපස වරුන්ට නායකව වසන්නාහුය.

එසමයෙහි බෝධිසත්ත්වයන්ගේ ප්‍රධාන අතවැස්සා නම් ඔබ්බේ ගමකට වස්වසන්ට යාමේදී බෝධිසත්ත්වයන් වහන්සේගේ මරණ කාලය පැමිණියේය. එවිට අතවැසි තාපසවරු විසින් ලඟට අවුත් "කුමක්ද ධ්‍යානයක් උපදවාගත් සේක්ද"යි විචාරන්නා "ආකිංචනං නත්ථිකිංචි"යි වදාරා ප්‍රාණය නිරුඬව ගොස් බඹලොව ගොසින් පෙණුනුසේක.

එවිට තාපසවරුන් විසින් "ආකිංචනං නත්ථිකිංචි" යන බසෙහි අර්ථ දැනගතනොහී "මිථ්‍යාදෘෂ්ටීන් උපදනා බඹලොව උපන් නියා නොවේදැ"යි සිතා ආදරය පූජාව මානැගිකොට නොකළාහ.

එවිට ප්‍රධාන අතවැසි තාපසයෝ එතනට අවුත් තාපසවරුන් අතින් "ආචාරීන් වහන්සේගේ ප්‍රාණය නිරුඬව යන ගමනේ කීයේ කිම්දැ"යි විචාරා එපවත් අසා "එසේවීනම් ආභස්සර නම් බඹලොව උපන්නේය"යි කීහ. බොහෝ තාපසවරුන් ඒ කීයේ බොරුය යි යන විසින් මහාබ්‍රහ්මතෙමේම එන තවම අවුත් මාගේ "ප්‍රධාන තාපසයා කීයේ ඇත්තමය"යි කියා පෙරලා බඹ ලොව ගියාහ යි වදාරා "එසමයෙහි ප්‍රධාන තාපසයෝනම් සැරියුත් මහා සථවිර යෝය, මහාබ්‍රහ්මව උපන්නේ නම් බුදුවූ මම්මය"යි වදාරාපුෂ්පරත්න ජාතකය වදාළසේක.

---

## 131 චන්ද්‍රාභාස ජාතකය

තිවද සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සකස්පුරනුවර සැරියුත් සාමීන්ගේ ප්‍රශ්න නිසා මේ ජාතකය දක්වනලදී.

**ඒ කෙසේද? යත්,**

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ හිමාලයවනයෙහි බොහෝ තාපසවරුන්ට නායකව ඉඳ පිරිනිවන් පානදවස් තාපසවරුන් විසින් ලඟට අවුත් "කුමන සෑයෙක් පැමිණියේදැ"යි විචාරන්නා "චන්ද්‍රභාසං සුරියභාසං" කියා පරලොව ගියාහ. එවිට ජ්‍යෙෂ්ඨ තාපසයන් විසින් "අපගේ තාපසයන් වහන්සේ ආභස්සර නම් බඹලොව උපන්සේකැ"යි කී විසින් තාපසවරුන් නොගිවිස්නා හෙයින් මහාබ්‍රහ්මයා එතනට අවුත් "ජ්‍යෙෂ්ඨ තාපසයන් කියේ සැබෑමය"යි කියා බඹලොව ගියාහයි වදාරා, "එසමයෙහි ජ්‍යෙෂ්ඨ තාපසයෝ නම් සැරියුත් මහාස්ථවිරයෝය, මහාබ්‍රහ්මව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ"යි වදාරා **චන්ද්‍රභාස ජාතකය** නිමවා වදාළසේක.

---

## 132 සුවණ්ණහංස ජාතකය

තිවද සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා උපාසකයෙක් ලූනුවත්තක් කොට භික්ෂූන් වහන්සේ බොහෝ දෙනාට ලූනුකඩා දෙන්නේය. "මෙවිවරටත් කඩාගණුව" යි කියා උන් ලවාම කඩවාත් යවන්නේය. භික්ෂූණීන්වහන්සේ ඔහුට කියා ඔහු කිවිවරක් කපා කොටා තමන්වහන්සේ හෝ කඩාගෙණ යනසේක. උපාසකයා හෝ කඩා දෙන්නේය.

මේ නියාමයෙන් දවස්හරණා සමයෙහි එක්දවසක් උත්සවයක් නිසා බොහෝදෙනා ගෙට අවුත් ලූනු කඩාගෙණ ගියහ. ඒ වේලාවට තන්දෑ නම් භික්ෂූණී කෙනෙකුන්වහන්සේ ඔහුගේ ගෙට එදවස් අවුත් "උපාසකයෙනි, ලූනු දෙව"යි කී සෙයින් උපාසකතැනත් ලූනු දීපියා සිටි ප්‍රසංගවට ඉල්වූ නෙයින් "නුඹවහන්සේ මේ ලූනුවත්තට ගොසින් ලූනු තුනක් කඩාගත මැනවැ"යි කීහ.

එබස් අසා තමන්වහන්සේගේ මෙහෙණින්තන් හා සමඟ වත්තට ගොස් ලූනු එකසීම කඩාගෙණ ගියසේක. එවිට උයන්ගොවිවාත් නොකියන් ඉන්දදී "මෙසේ අත්‍යාකෙරෙද්දැ"යි කියා මුරගෑහ. උපාසකයාගේ සිතිවිල්ලට කළකිරුණ ඒ ඇසූ බොහෝ මෙහෙණින්තන් වහන්සේත් උස්කෝට තා කොට වදාළසේක. භික්ෂූණීන්වහන්සේත් උස්කොට තාකෝට එපවත් සම්බුදුරජාණන්වහන්සේට දැන්වූසේක.

සථිඥයන් වහන්සේ එපවත් අසා ''මහණුන් විසින් නම් දුන්දෙයක් විනා නුදුන් දෙයක් ඇරගත යුතුද?''යි ''බොහෝ තෘෂ්ණාවෙන් අත සිටි දෙයක් නැසියන්නේ ඔබ්බෙන් ලබනලද දෙයත් නැත, ලත්දෙයෙහි සතුටු වීමෙන් ඔබ්බෙනුත් සම්භවෙයි, අත සිටි දෙයත් නාවුරුවෙයි'' කියා බෝහෝ කොට භික්ෂූන්වහන්සේ මෙහෙණින්නන්ට නින්දාකොට ''මහණෙනි, පෙරත් මේ මෙහෙණින්න බහුවිත්ත ඇත්තී වේදැ''යි වදාරා ආරාධිතවූ සථිඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේදැයි යතහොත්,**

ඥිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ බමුණුකුලයක ඉපද දුන් තුන්දෙනා ගෙන් එකෙක් තන්දය එකෙක් තත්තිය, එකෙක් සුන්දරීනන්දනීයයි දුන්තුන් දෙනෙකු ලදින් ඔබ්බේ පරකුලයෙක ලන්ට විවාහ කරන්නාට පළමු මපියවූ බොධිසත්ත්වයන්වහන්සේ මියගොස් සුවණ්ණහංසව ඉපද ජාතිස්මරණඥානයෙන් මේ හංසජාතියට පළමුවෙනි ජාතියෙහි බ්‍රාහ්මණ කුලයෙහි උපන් නියාවත් බැමිණිය හා දුන් තුන්දෙනා අනුන්ට බැලමෙහෙකොට රැකෙන නියාව දැක ''මාගේ පියාපත් රන්පියාපත් විසින් කැපීම් තැලීම් ආදීවූ කම්මන්තයට නිසිව නිබෙයි, එසේහෙයින් මාගේ අඹුදරුවන්ට සංග්‍රහ පිණිස මවිසින් දෙමසින් එතනට ගොස් පියාපත් එල එලා ආම්තම් යහපත''යි සිතා දවසක් තමන්ගේ ගෙට අවුත් පළයපිට උන්කල්හි දුන් තුන්දෙන විසින් ''තොපි කවුරුදැ''යි විචාරන්නා ''තොප ඇමට පියවූ බ්‍රාහ්මණයානෝ නම් මමය, තොපට හා තොපගේ මැනියන්වත් සංග්‍රහ පිණිස ආමි'' කියා රන්පතක එලාගියහ. මෙම නියායෙන් කිපවාරයෙක රන්පත් එලා සිටිකල්හි එක්දවසක් බැමිණි සිතන්නී තිරිසනා නම් එකසිතක් නොවන්නාහ, ඉදිරියේ මෙතනට නොයෙමි සිතුවොත් අපට බොහෝ අලාභය යි සිතා දුන් කැඳවා කියන්නී ''තොපගේ පියානන් දවසෙක අල්වාගෙණ ඇඟ පියාපත් උදුරාගණුව''යි කිහ.

එපවත් අසා උන්ගේ දුන්තුන්දෙන කියන්නාහු ''අපගේ පියානන් වහන්සේගේ සවිඤඤය රිදෙයි අපි එලෙස නුදුරම්හ''යි කිහ. මේ නියායෙන් කිය කියා උන්කලව හංසයා ඒ ගෙට ආවේය. එකල්හි බැමිණි කියන්නී ''සවාමිපුත්‍රයා මාකරා එව''යි කියා කැඳවූකල්හි බොධිසත්ත්වයන් වහා උන් කරා එන්නාම අල්වාගෙණ සවිඤඤයේ රෝමයන් උදුරා ගත්තාහ.

බොධිසත්ත්වයන් තොමනා අභිප්‍රායෙන් උදුරාගත් හෙයින් සියළු රන් පත් නිස්ප්‍රභව ගියේය. බොධිසත්ත්වයෝ පියාපත් නැතිහෙයින් යානොහී එමහෙයිම උන්නාහ. දෙවෙනිව ඇවිත් වතලොම් සුදුපා ඇතිවන්නා බොධි සත්ත්වයන් ඇරපුවාහ. එතැන්පටන් ''බොධිසත්ත්වයෝ ගෙට නොආවිරුහයි'' වදාරා ''මහණෙනි තෘෂ්ණාවගේ අධිකත්වය නිසා යෙහෙන් සෙමෙන් ලැබ ගන්නා රන්පත් ලැබගන්ට නුවූයේ වේදැ''යි වදාරා ''එසමයෙහි බැමිණි නම් මේ නන්ද, නම් මෙහෙණින්නය, එසමයෙහි දුන් තුන්දෙනා නම් මෙසමයෙහි දුන් තුන්දෙනාමය සුවණ්ණහංසව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මය''යි වදාරා **සුවණ්ණහංස ජාතකය** නිමවා වදාළසේක.

---

## 133 බබ්බු ජාතකය.

තවද සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කාණමාතාව නම් වූ ආර්‍යශ්‍රාවක උපාසිකාවක් ඇත්තීය. එකියන උපාසිකාවට කාණමාතාවයයි කියන්ට කාරණා කිම්දැ යි යතහොත්, කාණ නම් දුවක් ඇත්තීය, ඇට මව් විසින් කාණමාතාවය යි නම් කෙළේ, කාණමාතා නම් දුවට කාණ යයි කියන්නේ ඇස කණ හෙයින් නොවෙයි, විශෙෂව රූ ඇතිහෙයින් ය දුටු පුරුෂයෙක් ඇගේ රූවෙහිම තෘෂ්ණාව බැඳි අනික් ස්ත්‍රියක කෙරේ දෘෂ්ටියක් නොහෙලන විසින් කාණවූවා හා සමානයෝය යි කියා කාණාවෝය යි නම් තිබූහ.

කාණ නම් දුව ඔබ්බට ඇගේ මැනියෝ පාවාදුන්හ. ඔබ්බේ කුලයක වැද ඉඳ බොහෝ දවසකින් මැනියන් දකින්ට මැනියන් කරා අවුත් දැක උන් ලඟ වැද ඉඳ නොඑන විසින් උන්ගේ සවාමිපුත්‍රයා කියා යවන්නේ 'කාණාවන් දකිනා බොහෝ අනිප්‍රාය ඇත්තෙම් වහා එන්නේය'යි කියා යවූහ. එපවත් අසා කාණාවෝ තමන්ගේ මැනියන්ට එපවත් කිවාහ. එපවත් කාණාමතාවෝ අසා සවාමිපුත්‍රයා දකින්ට යන ගමන සිසතින් යාම නපුරුය යි කැවුම් ආදීවූ දෙය පැසවා ගෙණ යායුතුය යි පණත් කළාහ. ඒ අවසථාවට වහන්දැ තමක් සිඟා වැඩියේක. සෝවාන් උපාසිකාවන් විසින් ගෙයි කැවුම් නිබෙද්දී නැතැයි කියන්ට කාරණා නොවන හෙයින් පාත්‍රය පුරා කැවුම් පිළිගැන්වූහ. ඒ භික්ෂූන් වහන්සේත් අනික් සිඟායෙන නික්ෂූකෙනෙකුත් වහන්සේ දැක උන්වහන්සේට කියනසේක් "කාණමාතාවන්ගේ ගෙයි කැවුම් ඇත ඔබ්බට යව"යි කියේක.

එපවත් අසා ඒ ගෙට ගොස් පාත්‍රය පුරා කැවුම් ලබාගෙණ අනික් තම කට කියේක. ඒ තම අනික් තමකට කියේකැ යි කියා මේ නියායෙන් සතර තමකට පාත්‍ර පුරා දීමෙන් කැවුම් නිමා ගියේය.

එසේ හෙයින් කාණාව ඒ මුරයේ යන ගමන් තබා දෙවෙනි වලියේත් සවාමිපුත්‍රයා අවමැනවැ යි කියා යවන්නා මුරයේත් ගමනට පිසූ කැවුම් එම භික්ෂූන් වහන්සේම පිළිගත් හෙයින් ගමනට බාධාවූ හෙයින් ඔබ්බෙන් කුල ස්ත්‍රියක් ගෙණාහ. එපවත් කාණාවෝ අසා බොහෝ වික්ෂෙපව අඬන්ට වන්නාහ. කණාමාතාවෝත් වික්ෂෙපවූහ. එපවත් සම්බුදුරජාණන් වහන්සේ දැක කාණමාතාවන්ගේ ගෙට අවුත් උන්විසින් පණවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ "උපාසිකාවෙනි, තොපගේ දුව අඬන්නේ ඇයිදැ"යි විචාරා එපවත් අසා ඊට සුදුසු බණ වදාරා උන්ගේ සෝක නිවා ජේතවනාරාමයට වැඩියේක.

එදවස් සවස දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ "අවසල් භික්ෂූන් සතරදෙනා නිසා කාණාවන්ගේ ගමනටත් බාධාවීය,යි "ආර්‍යා උපාසිකාවන්ටත් බොහෝ වික්ෂෙපය"යි කිය කියා උන්තෙනට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදාරා 'මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනු

දැ'යි විචාරා වදුරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් මෙකී යත හික්ෂූහු සතරදෙනා විසින් කාණමාතාවන්ගේ ලාභය උදුරා ගෙණෙනලදැ'යි වදුරා ආරාධිතවූ සර්ඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදුරණලදී.

**ඒ කෙසේද? යත්,**

**ධි**වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ගල්වඩු කුලයක ඉපිද ගල් වඩුවන්ට ආචාරීව දවසරිණාසේක.

එසමයෙහි සතළිස් කෙළක් සම්පත් නිධානගතව තිබෙන්නාවූ පිටිසර සිටානකෙනෙක් තැසීගියාහ. උන්ගේ බැදැනියෝ මිය ගොස් සම්පතෙහි ගත් තාවූ ආසාවෙන් නිධාන භූමියෙහි තුඹසෙක මූසිකා ඛෙනු ව උපන්නාහ.

ඒ අවසථාවට බොධිසත්ත්වයෝ ඒ පාලුගමට අවුත් ගල් පලා ඉන් කම්නාන්තකොට ජීවත්වන්නාහ. එදවසට විටක් බොධිසත්ත්වයන් ඒ ගමට එන හෙයින් මූසිකාඛෙනුව බොධිසත්ත්වයන් කෙරෙහි ස්නෙහ උපදවාගෙණ මාගේ සතළිස් කෙළක් සම්පත් ඇත, ඒ සම්පත් ඒ සත්පුරුෂයාට දී මමත් ප්‍රයෝජන විඳිමි සිතා එක් දවසක් කෂීරපණයක් කටින් ඩැහැගෙණ අවුත් බොධිසත්ත්ව යන්ගේ පාමුල එලාලුව. බොධිසත්ත්වයෝ "මේ කිමෙක්ද"යි කීහ. මූසිකාව විසින් 'මේ රත්රන් නුඹවහන්සේ විසින් ඇරගෙණ මට රත්රන් සතර විය ටෙක දඹමස් ඇරගෙණලා ඉතිරිවා ප්‍රයෝජනගත මැනවැ"යි කීහ.

**ඒ** නිසාවට දවස්පතා කෂීරපණයක් දෙන්නීය, බොධිසත්ත්වයෝ රත් රන් සතර වියවෙක දඹමස් ඇරගෙණ ලා මේ නියාගෙන් දවස් අරණා සමයෙහි එක් බළලෙක් ගොදුරු සොයා ඇවිදිනේ මූසිකඛෙනුව දැක අල්වාගත, එවිට මූසිකාව කියන්නී 'මා ඇරපියව"යි කීහ. ඊට බළල් කියන්නේ 'ගොදුරු සොයන්නෙමි, කී විසින් මා ඇල්ලුවේ කුමවදැ"යි විචාරා "මාංස කන්ට"යි කී විසින් "එකදා කන මාංසය යහපත්ද? ඇමදා කන මාංසය යහපත්දැ"යි විචා රන්නා, හැමදා කන මාංසය ලැබේ නම් යහපත්වෙයි" බළලා කියන්නා 'එසේ වීනම් මා ඇරපියන්න, දවස්පතා මාංස ලබම් මූසිකාව කී විසින් අසා බළලා කියන්නේ "යහපත ඒ නියාවට මස්දෙව"යි "පමාවූ දවසෙක දන්නෙමි වේදැ'යි භයගන්වා අලහ.

එතැන් පටන් මූසිකඛෙනුව තමා ලත් මාංස දෙකොටසක් බළලාට දී කොටසක් කන්නීය. මේ නියාගෙන් අනික් බළලෙක් ඇල්විය, උන්ටත් මාංස කොට්ඨාසයක් දෙන නියාගෙන් කියා ගැලවූනාහ. මේ නියාගෙන් බළලුන් සතරදෙනෙකු ඇල්වූ ගමනේ සතරදෙනාම මේ නියාගෙන් ගිවිස තමා එක තැනැත්තිය, බඩපුරා කන මාංස පස්කොටසක් කොට සතර කොටසක් බළ ලුන්ටදී තමා කොටසක් කන හෙයින් බඩපුරා කන්ට නොලත්තීය, දවසින් දවස දුර්ලභාවයට පැමිණියාහ.

එපවත් බොධිසත්ත්වයෝ දැන "මෙසේ වන්ට හේතු කවරේදැ"යි විචාරා එපවත් අසා "මෙතෙක් දවස් මට නොකිවේ ඇයිදැ"යි කියා විචාරා ඒ නියාවට දැවාන ගුහාවක් ඉදිකොට ඉන්ට සලස්වා "නී විසින් මස් ඉල්ලා ආ බළලුන්ට පරිභව බෙණෙව"යි සලස්වාලූහ. ඒ නියාවට මූසිකාව දැවාන කරඹුවේ උන්කලව

පළමුකොට බළලෙක් ඇවිත් නී විසින් මට දෙන මස් කොයිදැ''යි විචාරන්න ''ඇයි? තොපට මස් දෙන්ට උන් එකෙක්ද, තොපට මස් වූවමනාවී නම් තොපගේ දරුවන්ගේ මාංසකව''යි කියා කිපෙන ලෙස බස්කිව. බළල් කෝපව ''තොපිත් මෙසේවූදැ'යි දැවාන කරඬුවට පැන ලයතලාගෙණ ඉවත හොස් බැද්දේ ලැඟ මිය ගියේය.

මෙම නියාගෙයෙන් අනික් බළලුන් තුන්දෙනත් මූසිකාවගේ බසට කෝප යෙන් දැවාන කරඬුවට පැන ලය පලාගෙණ මළාහ. එතැන් පටන් මූසිකාව බොධිසත්ත්වයන් කෙරේ සමාධියෙන් පැහැද කෂ්ාපණ දෙකක් දවසකට දෙන් නීය. මේ නියාගෙයෙන් තමාගේ සතළිස් කෙළක් සම්පත් දුන්නීය යි වදාරා බළලුන් සතදෙන මස්කැමෙන් මූසිකාවට වූ අලාභයසේම උපාසිකාවන්ටත්වූ අලාභය''යි වදාරා ''අදවක් පටන් පවරා දුන් දනක් විනා නොපවරා දුන් දනක් ගෙට ගොස් ඇරගැණීම අකැපය''යි සිකෂාපද පණවා වදාළසේක. ''එසමයෙහි බළලුන් සතරදෙනා නම් මේ භික්ෂූ සතරදෙනය, මූසිකා ඛෙනුව නම් කාණමාතාවූ උපාසිකාවෝය. එසමයෙහි ගල්වඩුව උපන්නෙම් ලොවිතුරා බුදුවූ මම්මය'යි දෙකල් ගළපා මේ ඛබ්බු ජාතකය නිමවා වදාළසේක.

## 134 ගොධ ජාතකය.

තාවද සම්බුදුයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද, එහි වතීමාන කථාව යටකියනලද නුහක ජාතකයෙහි සැලැස්ම සේය''යි දතයුතු.

අවනිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ගොයි යෝනියක ඉපිද පිටිසර ගමක බැද්දේ තුඹසෙක වාසය කරන්නාහ.

එසමයෙහි සිල්වත් ගුණවත් තාපසකෙනෙක් එකියන පිටිසරගම මනුෂ්‍යයන්ගෙන් සිවුපසය අනුභව කරන්නාහ. බොධිසත්ත්වයෝ ඒ තාපසයන්ගේ මියුරු ධර්මදෙශනාව අසනනිසා දවසකදෙවිටක් අවුත් තාපසයන් දැක වැඳ යන්නාහ. කල්යාමකින් උපාසකවරුන්ව කියාගෙණ ඒ තාපසයන්වහන්සේ හිමාලය වනයට වැඩිසේක. පසුව කුට තාපස් කරන්නාවූ තාපසකෙනෙක් එම ගමට අවුත් උහුත් උපාසකවරුන් විසින් දෙන දන් ලබන්නාහු එම පන්සල වසන්නාහ.

එසමයෙහි ගොයාගෙනෝ ''පළමු තාපසයන්සේම මුහුත් යහපත් කෙනෙකැ''යි සිතා දවසකට දෙවිටක් අවුත් දකිනාහ. එසමයෙහි එක්දවසක් නොකල් වැස්සෙක් වට විසින් මෙරැ පැනනැංගාහ. මෙරැන් කත නිසා බොහෝ ගොයි ඒ ඒ තුඹස්වලින් එලිඹටහ. ඒ දැන මනුෂ්‍යයෝ බැද්දට අවුත් බොහෝ ගොයින් මරාගෙණ යන්නාහු ගොයිමාලු යහපත්කොට පිසගෙණ ගියාහ. තාපසයෝත් ගොයිමාලු කා ''කුමන මාංසදැ''යි විචාරා ගොයිමස නියාව කියන්නා එහි තෘෂ්ණාව බැඳ මා කරා එන මහාගොයෙක් ඇත, ඔහු මරා මස් කමියි සිතා උපා

සකවරුන්ට කියා ලුණු මිරිස් ආදීවූ දෙයත් අත්පල්ලයකුත් ගෙන්වා පන්සල ඇතුලේ සඟවා තබා යහපත් පොල්ලකුත් ඉදිකොට ඒ පොල්ල වැහැරි සිටුවූ රෙන් සඟවාගෙණ සක්මන් කෙළවර ගල අස්නපිට කරනමාගෙණ ගොස් ගොයානන් එනමග යවැසින් බල බලා අපිස්භාවයක් අඟවා උන්නාහ. ගොයා නෝත් තුඹසින් පිටත්ව එන්නානුමය. මෙතෙක්දුසේ ලඟට නොඅවුත් කොව කොවා තාපසයන් ඉන්නා සැලැස්මෙන් සැකව උඩුසුලඟට ගොස් තාපසයන් ගොයිමස්කැ නියාව නාසයෙන් ආඝ්‍රාණය කොට දුන දුන ලංනොවී දුරුව දුරුව ඇවිදිනාහ. ඒ තාපසයෝ තමන් කරා ගොයානන් නොඑන විසින් කොවපුව සිසිතා පොල්ල බලා දමාලා ගසාමරම් සිතා දැමුවාහ. දැමූ පොල්ල වල්ගය අගට වැද ගත, දෙවෙනිව ලුහුබඳ පොල්ල ඇරගෙණ ගඝනතුරු බොධිසත්ත්වයෝ වහා ගොසින් තුඹසට වැද අනික් තොතැනින් මුණ එලියට ලා 'තා යහපත් තාපස කෙතෙකැ''යි සිතා උනිම් තාසේවූවන්ට කාෂාය වස්ත්‍රයෙන් හා දිවිසම් ජටා ආදීවූ දෙය තරම් නොවෙයි'' කියා බැන තුඹසට වැදගියාහ.

ඒ තාපසයෝ 'මෙවක් පවන් මෙතන උනිතම් ගොයානෝ මාගේ තතු උපාසකවරුන්ට කියයි' සිතා එදවස්ම හිමාලයවනයට නික්මුණාහයි වදරා ''එසමයෙහි කුටතාපසයෝ නම් වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූහුය, යහපත් තාපසයෝ නම් ශාරීපුත්‍රසථවිරයෝය, ගොසිව උපන්නෙම් බුදුවූ මම්මය''යි වදරා ගොධ ජාතකය නිමවා වදාළසේක.

## 135
## උභයභ්‍රෂ්ට ජාතකය.

ශ්‍රීවදසම්බුදුරජාණන්වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්ව මහළුවරුන් වහන්සේලා කථාවක් උපදවන සේක්. දෙවදත්තසථවිරයෝ බුදුන් වදාළ ප්‍රතිපත්ති නුපුරා ඉන්න විසින් භික්ෂූහු නොවන්නාහ. වේසය ඇරගෙණ ඇවිදිනා හෙයින් ගිහිත් නොවන්නාහ. ගිහිව සිට ලබන්නලද ලාභයෙනුත් පිරිහුනාහ, මහණව සිව ලබන්නාවූ අධිගම ආදීවූ ලාභයෙනුත් පිරිහුනාහ, එසේහෙයින් දෙකෙළවර ගිහිවැද ගෙණ මධ්‍යයේ අසුචි ගෑවුනු දණ්ඩක් හෙයින් අභව්‍යය, දෙවදත්තසථවිරයෝ උභයභ්‍රෂ්ටවූහ යි මේ කථාව කිය කියා වැඩඋන්න් තෙනට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදරා ''මහණෙනි මා එන්නාව පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව හුනුදැ'යි විචාරා වදරා එපවත් අසා ''මහණෙනි දැන් මතු නොවෙයි, දෙවත්තසථවිරයෝ පළමුත් උභයභ්‍රෂ්ටයෝ වේදැ''යි වදරා ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඉටිගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙතෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ පිටිසර ගමක බැද්දේ විලක් ගාවා ගසක වෘක්ෂදෙවතාව උපන්සේක.

එසමයෙහි එක්තරා බිළිවැද්දෙක් තමාගේ පුතු කැඳවාගෙණ ඒ විල සමීපයට අවුත් ඒ විල බොහෝ මසුන් ඇති හෙයින් බිළිය දමාලීය. ඒ බිළිය

ගොස් මහාකණුවක ඇවිල ගෙණ ඇදගත නොහැකි විසින් කෙවුළු සිතන්නේ මහා කුඩමැස්සෙකැ යි සිතා පුතා අත ගෙට කියා යවන්නේ තොපගේ මැනියන් අසල ගෙයි ඇත්තන්ලා ඩබරකරන්ට කියාලව''යි කියා යවා තෙමේ බිළිකටු ඇදගත නොහැකි විසින් කැඩෙයි යන භයින් ඉනකඩ ගොඩතබා මිසු අල්වම් යි දියව බැස දියෙහි අතපතගා ඇවිදිනා කල දියෙහි තිබූ කණු දෙකක් දැස ඇනී ඇස්දෙක කැඹින. ගොඩතිබූ ඉනකඩ මග යන හොරෙක් ඇරගත. පුතාගේ බස් අසා මව් දඩර උපදවාගන්නා උපායක් උවමනා විසින් එක් කණෙක තල් පතක් තබාගෙණ එක් ඇසෙක බදුන් කබල්ලේ දැලිගෙණ පිරිමැද ගාගෙණ පිරිය ඇති පුතෙකුසේ බලුකුක්කකු වඩාගෙණ වියරුඋනු නොනෙකුන් මෙන් අවුනැයි කියන්නා වියරු උනෙන් නොප විනා මා වියරුඋනේ නැතැ යි බසින් බසට දඩර බෝවනමෝ ගම්මුදලියාට කියා දඩර එලවම් කියා ඇරගෙණ ගොස් ගම්මුදලින්ට පැමිණියාය. ගම්මුදලි යුක්ති විචාරා ඇටම වරදය යි කියා දඩ සලස්වා මරා තළා දඩ ඇරගත්තාහ.

එවිට කෙවුල් දියෙන් ගොඩටනැගී අතින් ඇස වසාගෙණ කඩ සොයා ගොඩ නොදැක සිටියේය. ඒ වේලාවට බෝධිසත්ත්වයෝ වෘක්ෂයෙන් පිටත්ව කියන්නාහු ''කෙවුල තාගේ අඟුනකම්න් දිය කළමනා කවයුත්තෙනුත් දියට බැස ඇස්දෙකත් නසාගෙණ ගොඩ තිබුන ඉනකඩත් නොවූයේය''යි අවවාද කි යුක්තියෙන් දඩරකොට තොපගේ බිරින්ද මරා ගෙයි තිබූ සම්පතනියෙනුත් ප්‍රයෝජන නුවූයේය. එසේහෙයින් දියෙන් කළමනා කවයුත්තෙනුත් ප්‍රයෝජන නුවූයේ යයි අවවාද කියා අනනඬිනවූහ''යි වදාරා ''එසමයෙයි ඇස නසාගත් කෙවුලා නම් දෙවදත්තසථවිරයෝය. වෘක්ෂදෙවතාව උපත්තෙම් ලොවිතුරා බුදුවූ මම්ම ය''යි වදාරා උභයඉම්ම ජාතකය නිමවා වදාළසේක.

---

## 136 කාක ජාතකය

තිවද සම්බුදයන් වහන්සේ ජෙතවනාරාම යෙහි වැඩවසන සමයෙහි බන්ධු සංග්‍රහයක් නිසා මේ ජාතකය දක්වනලද, එහි වර්තමාන කථාව දසවැනි නිපාතයෙහි භද්‍රසාල ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය.

ඉටිගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරණ සමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයෙක් වීපියේ යම්න් සිටියේය. එවේලාවට කවුඩෝ දෙන්නෙක් තොරණයක් පිට උන්නාහ. ඉන් එක් කවුඩෙක් කියන්නේ ''මේ බමුණාගේ ඉස වර්වස්කරන්ට මට අභිප්‍රාය''යි කියන්නා එවිට අනික් කවුඩු කියන්නේ මහඝම්පත් ඇති වුවමනා බමුණාය එසේවූ බමුණා හා කැටිව වෛරවීමෙන් කවුඩුරැස එකසීව නසා ලන්ටත් සපත. එසේවූ දෙයක් නොකරව''යි කිහ. ඊට කවුඩු කියන්නේ ''බමුණා ඉස. වර්වස් නොකොව ඉන්ට බැරිය, කුමක් වේව'යි වර්වස් කරමි' කී විසින් අනික් කවුඩු 'තා කළදැ තොමෝ දකුව''යි කියා ඔබ්බකට ගියේය. එවිට බමුණාත් තොරණ කෙළවරට ලන්වන්නාම කවුඩු ඉස වර්වස් කොට පීය. එවිට බමුණුත් කවුඩන් කෙරේ වෛරබැන්දේය. ඒ අවධියට

අනුන්ට බැලමෙහෙ කොට ජීවත්වන ගැහැණියක් වී සිහිත්තක් අව්වේ වනා ලූය. පීඩාම්ලොම් ඇති එළුවෙක් ඒ වී කන්ටවන. එවිට ස්ත්‍රිය විසින් පොල් ලක් ලා මරා ලුහුබදවාපුව, තවත් ඇගේ ප්‍රමාදයක් බලා වී කන්ට ආය. දෙවෙනි වත් එසේම ගැසූය. එවිවත් පලාගියේය. පසුව මැහැලි සිතන්නී තවත් මූ විටින්විටම වී කත්තම් මාගේ බැලමෙහෙය පහරින්ට ගෙණ වී නිමායෙයි සිතා ගිනිපෙණෙල්ලක් අතින් ඇරගෙණ නිදා වැටී වැටී වැදහොත්තීය. එවේලාවට ඒ එළුවා වී කන්ට ආ විසින් ගිනිපෙණෙල්ලෙන් බල පහරක් ගැසුව. සැඩ ඇනිව එළුවා විසින් ඇඟ ගිනිවැදගත. ඒ ගිනි නිවන්ට එළුවා වහා ගොසින් ඇත්හල තුබූ ඉලුප්ගොඩක වැටී වැද හොත්තේය. ඒ ඉලුප් ගේත් ගිනිගත්හ. ඇත්හල ද ඇතුන් පිට වැටී ඇතුගේ පිට බොහෝ වණව ගියේය. ඇත්හල වෙදවරුන් පිළියම් කොට බැරි සෙයින් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ එපවත් අසා පුරෝහිත බමුණා ගෙන්වා "ඇතුන්ට පිළියම් කරන්ට බැරිය යි වෙද වරු කීහ. ඊට ආචාරීනි, කළමනා කිම්දැ"යි විවාළාහ.

එපවත් බමුණු අසා 'කවුඩන්ගේ තෙල් ලදෙත් පිළියම් කරන්ට භාර ය"යි කීන. එපවත් රජ්ජුරුවෝ අසා "කවුඩන් මරව"යි කීහ. ඒ නියාවට මෙහෙවර අසාගත් නුවර වාසී කවුඩන් සියදහස් ගණන් මරා ගොඩකොට පුවාහ.

එසමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ සුසානයක් සමීපයෙහි සුවාසූදහසක් කවුඩන් පිරිවරා කවුඩන්ට නායක රජව ඉන්නාහ, එපවත් රජ්ජුරුවෝ අසා කවුඩන්ටවූ විපත්තිය කවුඩකු අතින් අසා මාගේ බන්ධුන්ටවූ ආපදාය මාම හොසින් ගළවතොත් විනා අනික් කෙනෙකුන්ට බැරිය යි සිතා දශපාරමිතාව පෙරදැරිකොට සියලු සත්ත්වයන් කෙරේ මෛත්‍රී පතුරුවා "මා විසින් මාගේ බන්ධුන්වූ කවුඩු සමූහයා ගළවන නියාමයෙන් මා යන්නේය, ඒ ගැලවීම සත්‍යය තම් මට කිසි අන්තරායක් නොවේව"යි කියා අධිෂ්ඨානකොට පවනට බඳුවූ වේග යෙන් අවුත් ඇරලා තිබූ කවුළු දොරින් රජගෙට වැද රජ්ජුරුවන්ගේ සිංහාසනයට වන්හ.

එවිට එතන සිටි මිනිසුන්ගෙන් එකෙක් කවුඩා අල්ලන්ට ලඟට ආයේය එවිට රජ්ජුරුවන්ට කියන්නාහු "රජ්ජුරුවෙනි පරීක්ෂාකර විනා කිවන්ගේ බසට මෙසේ අනාර්යයක් කෙරෙද්දැ"යි කීහ.

"රජ්ජුරුවන් විසින් තම් පරීක්ෂාකාරීව මිසක් වෛරයෙන් කී කී බස් පස්සේ ගොසින් මෙසේ කෙරෙද්දැ"යි අවවාද කීහ. එවිට රජ්ජුරුවෝ සතුටුව ශතපාක සහස්‍රපාක තෙලින් දෙපියා එවමැඩ තමන්ට ඉදිකළ අන්නපාන ආදී දෙය බඩපුරා කවා රන්බිස්සක් පිට හිඳුවා "කවුඩන්ට තෙල් නැත්තේ කුමක් නිසා දැ"යි විවාළාහ.

එවිට රජගෙය මුළුල්ලේ එකනාදකොට මිණියක නාදයක් සේ මිහිරිකට හඬින් කියන්නාහු "දෙවයිනි, කවුඩෝ ඝටත්පිරිසෙයින් කුඩා කොල්ලකුත් පමණ මනුෂ්‍යයකුත් දකිනා කලත් මහ භයවකින ඇත්තාහ. එසේහෙයින් උන්ගේ ලෙහි දැන්වත් ඉයදවසවත් අනාගතයෙහිවත් ඇඟ තෙල් නැත්තේ මය"යි කියා බමුණා විසින් කවුඩන් නසන නිසා කියයි කියා මිහිරි කටහඬින්

කියත් කියත් රජ්ජුරුවන්ගේ ලඝමොලොක්ව කියන්නාහු "මාගේ රාජ්‍යයෙන් තොපට පූජාකෙරෙමි රාජ්‍යය පිළිගණුව"යි කියන්නා "ඉන් මට ප්‍රයෝජන කිම්ද? මාගේ බන්ධුන් ගැලවෙන්නා පමණය"යි කීහ.

රජ්ජුරුවෝ සතුටුව සියලු ප්‍රාණීන්වම අභයදී "කවුඩන් මරන්ව එපා ය"යි කියා එතැන් පටන් සාල් අමුණක බත් පිසවා ඊට නිසි මාළු ආදීවූ දෙය ඇතිව දවස් පතා කාවනුවේ බත් ලන්නාහ. බොධිසත්ත්වයෝ දවස්පතා තමන් මේ නිමවන බත් ලබන්නාහ. මේ නියායෙන් දවස්ඇර කම්වූපරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා "එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්දසථවිර යෝය, කවුඩන්ට රජව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්ම"යි වදාරා කාක ජාතකය නිමවා වදාළසේක.

---

## 137
## ගොධ ජාතකය

තිවද සඒඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි තොකිකරු භික්ෂූකෙනෙකුන් වහන්සේ නිසා මේ ජාතකය දක්වන ලදී. මෙහි වර්තමාන කථාව මහිලාමුඛ ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බෝධිසත්ත්වයෝ ගෝ යොනියෙක ඉපිද ගොයින් දහස්ගණන් පිරිවරා මහත්වූ තුඹසෙක වාසය කරන්නාහ.

එසමයෙහි බොධිසත්ත්වයන්ගේ ගෝපැටියෙක් කටුස්සකු හා විසවාසව ගෙණ වසන්නේය. එසමයෙහි බොහෝ ගොයි එපවත් ගොසින් බොධිසත්ත්වයන්ට කීහ. බොධිසත්ත්වයෝ තමන්ගේ ගෝපැටවා ගෙන්වාගෙණ අද පටන් තෝ නීවවූ ජාති ඇති කටුස්සා හා විශ්වාසය නිසා මතු ගෝ රැසට අනඥාවෙයි. තමන්ගේ සථානොචිත ප්‍රඥාවෙන් දැන කීවාහ. එසේ කීවත් ඒ ගෝ පැටවා කිවා නොකොට කටුස්සාගේ ඇඟ වැතිර කෙළිනේය. මේ නියායෙන් කල් යත් යත් ගොයා ඉතා මහත්විය. ඒ මහත්වූ කය ඇරගෙණත් කටුස්සා ඇඟ වැතිර කෙළිනේය. මේ නියායෙන් ඒ වේලාවට කටුස්සු තමා කය කුඩා හෙයින් මහත්වූ ශරීර ඇඟ වැතිරගන්නා මහත් පඊතයක් ඇඟ වතුරුවා ලූවාසේ තමාට දැනෙන විසින් ගොයින් කෙරේ වෛර බැන්දේය.

ගෝ රජ්ජුරුවොත් කටුස්සා නිසා යම් දවසෙක භය පැමිණෙයි නියම දැන ඒ නියාවට සොර උමඟක් කැන තිබුවාහ. ඒ අවධියට තොකල් වැස්සක් වට බොහෝ මෙරු පැතනැංගාහ. ඒ දැක එක් වැද්දෙක් මෙරු කන්ට ගොයින් බස්නා කලැයි සිතා ගොයින් මරන්නට බැඳ්දව ගියේය. ඔහු බැඳ්දේ ඇවිදිනා කලට ගොයින් කෙරේ වෛර බැඳි කටුස්සු ඒ කියන වැද්දහු දැක "කුමක් නිසා බැඳ්දේ ඇවිදිදැ"යි විවාරා "ගොයින් සොයා ඇවිදිමි" කී විසින් "ගොයින් සොයා තා දුක්ගන්ට එප"යි පිදුරු හා ගිනි ගෙණ ගොසින් "මමවේද පාමි" කියන්නා ඒ නියාවට වැදි ගොසින් පිදුරු හා ගිනි ගෙණයා.

එවිට කටුසු කියන්නේ "මෙකියන තුඹස්කටැ"යි පිදුරු ගන්වා ලා ගිනි ඇනපියව. එවිට දුම් කැලැ ගොයින් තුමූම පිටත්වන්නාහ. පිටත්වූ වේලාවව නොප අත තුබූ පොල්ල බලාවත් බල්ලන් පැලවාත් කැමති ගොයි මරාගණුව"යි කිය. එසේම වැදි කෙළේය.

බොධිසත්ත්වයෝ "මෙතෙක් අපේ බන්ධුන්ට භයවූයේ අසත්පුරුෂවූ කටුස්සා නිසාය"යි සිතා සාරා තුබූ සොර උමඟින් පලාගියාහ යි වදාරා "එසම යෙහි කටුස්සා නම් දෙවදත්තසථවිරයෝය, නොකිකරු ගෝපැටියා නම් නොකිකරු භික්ෂුය, එසමයෙහි ගෝ රජව උපන්නෙම් ලොවිතුරා බුදුවූ මම්ම ය"යි වදාරා **ගොධ ජාතකය** නිමවා වදාළසේක.

---

## 138 සිඟාල ජාතකය

**මී**වද සම්බුදුන්වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් මහළුතෙරුන්වහන්සේ දම්සභාමණ්ඩපයට රැස්ව "දෙවදත්ත සථවිරයෝ සම්බුදුන්වහන්සේ නසන්ට නාලාගිරියා මෙහෙයා ගිජ්ඣකූට පර්වතයෙහි සිට ගල් පෙරලා විදින්ට දුනුවායන් යවාත් නසන්ට නොයෙක් ප්‍රයෝග කොටත් නසාගතනුහුනුවේ වේදැ"යි **කිස කියා** උන් තෙනට සම්බුදුන්වහන්සේ වැඩ වදාරා "මහණෙනි මා එන්නාව පූර්වභාග යෙහි **කිනම්** කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාළ **කල්හි එපවත්** අසා "දැන්මතු **නොවෙයි** මහණෙනි, පෙරත් දෙවදත්තසථවිරයෝ මා නසන්ට සිතා නසාගත නුහුනුවෝ වේදැ"යි වදාරා ආරාධිතාවූ සම්බුදුන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**අ**තීතයිය දවස **බරණැස්නුවර** බ්‍රහ්මදත්ත **නම්** රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය **කරණ** සමයෙහි බොධිසත්ත්වයෝ කැනහිල් යෝනියෙහි ඉපිද දහස් **ගණන් කැණහිලුන්** පිරිවරා අමුසොහොනෙක වාසය කරන්නාහ.

එසමයෙහි බරණැස්නුවර **උත්සව** කෙළියක් නිසා රා මස් ඒ ඒ තැන බොහෝ කොට නිබා දුවලුන් කෙළ රැවූ දවස පසලොස් පැයකුත් කෙළි විසින් මස් නිමාගොසින් රා පමණක් තිබුයේය. එවිට එක් පුරුෂයෙක් "රා මස් දෙව"යි කිය. එවිට බොහෝ මනුෂ්‍යයෝ "මස් නැතැ"යි කිහ, එවිට එක්තරා මිනිහෙක් කියන්නේ "මා ඉන්දදී මස් අමාරුදැ"යි කියා පොල්ලක් ඇරගෙණ වාසල් අගුළු ලූ විසින් දිය යන සොරොව්ව අස්සෙන් පිටත්ව සොහොන්පලකට ගොස් උඩුබැල්ලෙන් මළමිනියක් සේ වැදහොත්තේය. ඒ වේලාවව බොධිසත්ත්වයෝ මිනී කන්ට ගොස් මිනිසා වැදහොත් නියාව දැක මේ නොමේ **නොමළ** එකෙකැ යි සිතා **එසේවුවත්** පරීක්ෂා කරන්ට උවමැනවැයි යටිසුලඟට ගොස් ඉවකොට නොමළ නියාව දැන මූ රවටා පලායන්ට උව මැනවැ යි සිතා ලඟට අවුත් පොල්ල ඩැ ලඟට ඇද්දුක මිනිසත් පොල්ල ලඟට ඇද්දේය. එවිට කැනහිල් ඇත ගොසින් කියන්නේ "වැදහොත් පමණකින් මළ **නොමළ** නියාව දැනගත නොහැක්ක. නමුත් පොල්ල ඩැ ලඟට ඇද්දුකාම නොමළ නියාව දැන කුමන නින්දක්ද"යි කීවාහ.

එවිට ඒ පුරුෂයා තැගීසිට පොල්ල බලා ගසා වැදහොත් බැවින් තෝ මා විසින් ගැලවීගියාවේදැ යි කියා කැණහිල් කියන්නේ "තා අතින් මම ගැලවී ගියෙමි. නොපි සතර අපායෙහි නොගැලවුනෝදැ"යි කීහ. එවිට ඒ පුරුෂයා කරබාගෙණ තමා ආලෙස ඇතුළු නුවරට අවුත් අගලින් ඉස්සෝදැ නහා තමාගේ ගෙවම ගියේය යි වදුරා, "එසමයෙහි කැණහිලුව මරන්ට ගිය පුරුෂයා නම් දෙවදත්ත සථවිරයෝය, එසමයෙහි කැණහිලුන්ට රජව උපන් නෙම් ලොව්තුරා බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 139 විරොචන ජාතකය

මෙවද එක්සමයෙක්හි සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්තසථවිරයන් විසින් බුදුන් අතින් "සියලු භික්ෂූන් වහන්සේ පාංශුකූල චීවර පොරවනා නියායෙන් සොසා නිකාඛය පුරණ ලෙසද වෘක්ෂමූලයෙහි හිද හාවිනාකරණ ලෙසද මච්ඡමංස කොකන ලෙසද වලවාසයෙහි විනා ගම්වාසයේ සඞ්ඝයාවහන්සේ නොවසන ලෙසද කියා මේ ප්‍රශ්නයද බුදුන් අතින් ඉල්වා බුදුහු "මාගේ ශාසනයෙහි සුඛිත මුදිතයෝ බොහෝදෙන මහණවෙති. එසේ හෙයින් කීදෙය පිළිවන් කෙනෙක් පුරති, බැරිකෙනෙක් නුපුරති. මා විසින් එසේ එකසි පුරන්ට වුවමැනවැ"යි ආපතති නොපණවම්" වදාරන්නා ඊට දෙවදත්තසථවිරයෝ බුදුහු මා කීවා නොකළසේකැ යි කිපී සැරියුත් සාමීන්ගේ ගණයෙන් අලුත සිවුරු පෙරවූ විනය නොදන්නා භික්ෂූන් පන්සියයක් ඇරගෙණ බුදුන්ගෙන් ලබනලද උපසම්පදා සෘඩි ආදීවූ දෙය ඇතිව නිබ්බදීත් බුදුන් කෙරෙන් තණ අගක් ගලා ඇරගත්නා විවරක් මා ඔවුන් ප්‍රයෝජනයක් නැතැ යි කියා එකසි මසින් මස පොහොා දෙකක් කොට සංඝ භෙද කරවා ගෙණ ගයා තම් ගඟ ඉස පන්සලක "මමත් බුදුය" යි කියා බුඩකෘත්‍යය කරමින් දවස් අරණසේක.

එසමයෙහි සම්බුදුන් වහන්සේ එක් දවසක් දෙවදත්තසථවිරයන් වහන්සේ භික්ෂූන් පන්සියයක්දෙනාට අධිගමය හේතුනියාව දැන සැරියුත්මුගලන් දැගසව්වන් ලඟට කැඳවා "තෙපි දෙන්න දෙවදත්තසථවිරයන් සමීපයට ගොස් උන්ගේ පරිවාර භික්ෂූන් පන්සියයක් දෙනාට බණ කියා කැඳවාගෙණ එව"යි වදාළසේක. එපවත් අසා දැගසව්වන් වහන්සේ දෙවදත්තසථවිරයන්ගේ ගණයට වැඩිසේක. දෙවදත්තසථවිරයෝත් දැගසව්වන් වහන්සේ දැක "තමන් කරා පලා ආහ"යි සිතා ඒ වේලාවට තමන් බණ කිය කියා උන් විසින් බුදුරජානන් වහන්සේ වදාරණ ලෙස දෙවදත්තසථවිරයන් වහන්සේ වදාරණ සේක් "ශාරීපුත්‍රසථවිරයෙනි, "මාගේ වසට රිදෙයි, තෙපි බණ කියව"යි කියා තමන් වහන්සේ බණ අස්න ගාවා බිම සැතපුනුසේක. ඒ වේලාවට සැරියුත් සාමි බණ කියා පන්සියයක් දෙනාම රහත්කොටගෙණ වෙළුවනාරාමයට වැඩිසේක.

එවිට කෝකාලිකසථවිරයෝ දෙවදත්තයන්ගේ ගණයට අවුත් ගණය ශූන්‍යව තිබුනු නියාව දැක දෙවදත්තසථවිරයන්ට කියන්නාහු "තොපගේ

වහන්දැ එකසීම දැගසව්වන් ඇරගෙණ යාදී කුමන මරනිදි නිදන්නේය"යි කියා විලුඹ බලා සිවුර ඇත්කොට ලා කුලකින් ගැසුවාසේ විලුඹෙන් ලැමැද්දට ඇන ලේ තුන්කටක් නත්වාපිය, සැරියුත් සාමින් රහතුන් පන්සියයක් ඇරගෙණ බුදුන් දුටුසේක.

එවිට සම්බුදුයන්වහන්සේ "ශාරිපුත්‍රස්ථවිරයෙනි, දෙවදත්තස්ථවිරයෝ තොප යන කලට කෙසේ උනුදැ"යි විචාරා වදාරන්නා සැරියුත්සාමි කියනසේක් "සුභාමිනි දෙවදත්තස්ථවිරයෝ සම්බුදුයන් වහන්සේගේ විලාසයෙන් උන්නේය"යි වදාරා කෝකාලික ස්ථවිරයන් කළදැත් දැන්වූසේක. එපවත් සම්බුදුන් වහන්සේ අසා වදාරා "ශාරිපුත්‍රස්ථවිරයෙනි, දැන්මතු නොවෙයි, පළමුත් දෙව දත්තස්ථවිරයෝ මා සේ ක්‍රියාකරන්ව වැද බොහෝ විනාසයට පැමිණියෝ වේදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**එකෙසේද? යත්;**

ධිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ සිවුපාවුන්ට උතුම්වූ කේසරසිංහව ඉපිද පර්වතයක් මුදුනේ රන්ගල්ගුහාවක වාසය කරණසේක.

එසමයෙහි එක් දවසක් කේසරසිංහ රාජතෙම පර්වතයෙන් පැන මිමෙකු අල්වාගෙණ මාංස අනුභවකොට වැවට ගොසින් පැන්බී පෙරළා පර්වතයට එන ප්‍රස්තාවට එක් කැනහිලෙක් සිංහයාට ලන්ව ගිය හෙයින් තමා ගැලවී යන උපායක් කැනිහෙයින් සිංහයාගේ පය වැඳලා සිටියේය. එවිට සිංහයා කියන්නේ "ඇයි ජම්බුකය කුමකට සිටියේදැ"යි විචාරා "නුඹවහන්සේට සේවාකම්කරන්ට සිටියෙමි"යි කී විසින් බොධිසත්ත්වයෝත් ඒ කැණහිලා කැන්දගෙණ පර්වතයට නැගී උන් ඉන්ට එක් කැනක් සලස්වා "තොප විසින් පර්වතමුදුනේ සිට සිවුපාවන් බලා මා කරා අවුත් අසවල් සිවුපාවා ඇල්ලුවමැනවැ"යි කියාද පැළඹී වදාළ මැනවැ යි කියන්නා තොපට කැමති මාංසමරා තොපටත් ලා මමත් කා ජීවත් වෙම්හ"යි කීසේක.

එතැන්පටත් කැනහිල් එලෙසම පැ මස් ගෙණ තෙමේත් කා කැණහිලාටත් ලන්නේය, මේ නියායෙන් සිංහයා මරාලූ මස්කන හෙයින් දවසින් දවස ඇඟ පුෂ්ටිමත්ව මනත්වූ හෙයින් උඩතව සිතන්නේ සිංහයෝත් සිවුපාගතයෝය, මමත් සිවුපාගතයෙමි, එසේ විසින් එකෙකු මරාලන මස් කන්නේ කිම්ද? මව මස් මම්ම මරාගණිමියි සිතා සිංහයාකරා ගොසින්කියන්නේ "නුඹවහන්සේ මරාලන මස් මම මෙතෙක්දා කැමි. ඉනිබ්බේ මරාලන මස් නුඹවහන්සේම කැවමැනවැ"යි කියන්නා සිංහයා කියන්නේ "හස්තිවිදුරණයට අපව විනා තොපට බැරිම"යි කීපවාරයක කියද්දීත් වුවමැනවැ යි සිතත් මෙපමණක් ඇති වන්නාහ. හස්තිවිදුරණය මට පිළිවනැ යි කියන්නා යහපතැ'යි එසේවී නම් අදරැට නුඹවහන්සේ වැදකෝනා සථානයෙහිම වැදකෝනව උවවැනව උදැසනක් සේම මා නික්මෙන වේලාවට පැළඹ කැණහිලාය යි කියන්ට උවමැනව මෙප මණක් ඇතිවන්නා හස්තිවිදුරණය මට පිළිවනැ යි කියන්නා යහපතැයි එලෙස සිංහයා කෙළේය.

කැණහිල් රන්ගල්ගුහාවෙන් නික්ම පර්වත මුදුනට නැගී ඇඟ තුන් ඇව රක් කිළිපොළා තුන්විටෙක කැණහිල් අඩ අඩා සතරදිසා බලා මහත්වූ ඇතු

දක ඇතු පිටව පැනපීය. ඇතුපිටට පිනු ගමනේ කැණහිල් ඇතු පාමුල වැටී ඇතු විසින් පසින් මැඩ සුණුවිසුණුකොට පෙරළා සුණුකළ ඇට එක්තැන්කොට ඊපිට වර්චස්කොට හා මූත්‍රකොට කුඤ්චනාද කොට ගියේය. ඒදුටු සිංහයා "කැණහිලා පැළඹුනු නියාව සොඳය ඉස ලය තලාගත් දෙයත් සොඳසැටිය පැළඹුනු නියාවත් ඔබ්මය යි කියා ගල්ගුහාවටම ගියෝය"යි වදාරා 'එසමයෙහි සිංහයා කරණ ක්‍රියාවම කෙරෙම් යි කියා ලය තලාගත් කැණහිලා නම් බුදුන් කරණ ක්‍රියා කෙරෙම් යි ලයතලාගත් දෙවදත්තසථවිරයෝය, එසමයෙහි කේසර සිංහව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාරා විරොචන ජාතකය නිමවා වදාළ සේක.

## 140 නංගුට්ඨ ජාතකය.

තිවද සවීඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ජෙතවනාරාමය පිටිපස්සේ නිගණ්ඨතාපසයෝ මොත්තමෙක භිඳ තපස්කරන්ට දුක්දී කළමැනවැ යි කියා සමහරු එක්පයක් බිම්ඔසවා ගෙණ අනික් පය ඇඟිලි අගින් සිට මෙසේවූ තපස්කරන්නා සමහරු ඉරමූදුන් වේලේ සතරකොණ ගිනි මැල සතරක් බැඳ ඊ මධ්‍යයේ ඉඳ පඤ්චතාප නම් ව්‍රතයක් කරන්නාහ. බොහෝ මහළුවරුන් වහන්සේ බුදුන් කරා අවුත් "සවාමීනි, නිගණ්ඨයන් විසින් මෙසේ ව්‍රතයක් කරන්නාහ. ඒ නිසා උන්ට ඉදිරියේ පැමිණෙනු ලාභ ඇද්දැ"යි විචාරා සවීඥයන් විසින් "මහණෙනි, ඉන් කුමන ලාභයද පළමුඵත්තමයෝ පවා මෙයින් යහපත් දෙයෙකැ යි සිතා ජාතාග්නි ඇරගෙණ වලට ගොස් ගිනිදෙවියාව පූජා කොට ඉන් පැමිණෙන්නාවූ ලාභයක් නැති හෙයින් පෙරලා ඒ ගිනි නිවා නිසුණුපිරියම් භාවනාකොට බඹලොව ගියෝවේදැ"යි වදාරා ඒ කෙසේදැයි යන හොත්,

යවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ප්‍රසිද්ධ වූ බ්‍රාහ්මණ කුලයක උපන්හ. එදවස් පවන් දෙමව්පියන් විසින් ගිනි නොනිවා තිබා දෙලොස් ඇවිරිදි වයස් පැමිණි අවසථාවේ දෙමව්පියෝ කියන්නාහු "පුත තොපි උපන් දවස් පටන් ජාතාග්නිය තබාගෙණ උනුම්හ'යි ඒ අග්නිය ඇරගෙණ වලට ගොස් ගිනිදෙවියාට පූජාකොට බඹලොව යවුනම් එසේවත එසේ නැත්නම් කුටුම්බ සණ්ඨාපනය කොට ගිහිගෙයි වාසය කරව"යි කියා කිහ. එපවත් බොධිසත්ත්වයෝ අසා ගිහිගෙයින් මට ප්‍රයෝජන කිම්ද? ජාතාග්නිය ඇරගෙණ වලට ගොස් ගිනිදෙවියාට පූජාකරන්නාහ.

එසමයෙහි එක්දවසක් පිටිසර ගමකට සිඟාගියකල ගෝදුනයෙන් ගොකෙකු ලැබ ඒ ගොතා ඇරගෙණ අවුත් ගිනිදෙවියාට පුදම් සිතා ඒ කියන ගොනා අත්තේ බැඳ ලුණු ඇඹුල් සොයා ගමට ගියාය. ඒ ඇදී වල්වැද්දෝ ගොනා මරාගෙන ගෝ කකුල් සතර හා සම හා වල්ගය එතනට දමා සෙසු මස් කන්නන් කා ඉතිරිදෙය ඇරගෙණ ගියාහ.

බොධිසත්ත්වයෝත් ලුනු ඇඹුල් ඇරගෙණ එතනට අවුත් සම හා කකුල් හා වල්ගය නිබුවා දැක ''නමා කන්ට තුබූ දෙය රැකගතනුහුනු දෙවතාවා රැක්කේ කුමක්ද''සි සිතා එකී ගොනාගේ කකුල් හා සම හා වල්ගය ගින්නට දමමින් සිට කියන්නාහු ''තොපසේවූ අසත්පුරුෂයන්ට මෙපමණක් මහාදෙය කෑ සි සිතාද සී සී බලව, තොප නිසා මටවත් ලාභයෙක් නැතෙ''යි කියා පැන් වත්කොට ගිනි නිවා සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව කිප්‍රඤ්ඤාපිරියම් භාවනා කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙණ තොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියා හ''යි වදරා 'එසමයෙහි තාපසව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම'යි වදරා නංගුට්ඨ ජාතකය නිමවා වදළසේක.

## 141 රාධා ජාතකය.

මෙවද සඕඥයන් වහන්සේ ජෙතවනාරාම යෙහි වැඩවසන සමයෙහි පුරාණ දූතිකාවක් කෙරෙහි ලොභ කළාවූ භික්ෂූකෙනෙකුන් වහන්සේ නිසා මේ ජාතකය දක්වනලද. මෙහි වර්තමාන කථාව මතුකියන ඉන්ද්‍රිය ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි උකටලීවූ භික්ෂූන් වහන්සේ පැ ගමනේ සඕඥයන් වහන්සේ විසින් ''පළමුත් තොපි මුන්ගේ ආකාරාර වලකා ගතනුහුනු කල දැන්නම් පිළිවන්දැ සි තමාගේ ඉඟියෙහි ලාභත නොහෙන ස්ත්‍රීන්ට නා උකටලීවනු කාරණා නොවෙසි'' කියා ආරාධිතවූ සඕඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

**ඒ කෙසේද? යත්,**

අතීතය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ගිරායෝනියෙක උපන්නාහුය.

එසමයෙහි එක්තරා බමුණෙක් බොධිසත්ත්වයන්ගේ මල්වූ ගිරාපැටියෙ කුත් බොධිසත්ත්වයනුත් වඩාගෙණ ගමට අවුත් බොධිසත්ත්වයන් වහන්සේට පොටුපාදය සි කියාත් මිලනුවන්ට රාධය සි කියාත් නම් තිබා දරුකොට වඩන්නාහ.

එසමයෙහි බමුණා වෙළඳුමක් නිසා ඔබ්බට යන්නේ තමාගේ ගිරා දරුවන් දෙන්නා ලඟ ඉදුවා කියන්නාහු ''තොප මව් බැමිණිය විසින් තොකට යුත් තක් කරතොත් තොපි අවවාද කරව''යි කියන්නා ''අවවාද කියා නවත්වනු හැක්කේ වීතම් කියම්, බැරියේ වීතම් බැනනොනැග ඉඳිම්'' කියා කීහ. බමුණාත් තමා යන වෙළඳුමට ගියේය. එවක් පටන් බැමිණියගේ ගෙව එන්නන් යන්නන්ගේ අවසරයක් නැතිවිය. එවිට බොධිසත්ත්වයන්ගේ මල නුවෝ බොධිසත්ත්වයන් ලඟට අවුත් කියන්නාහු පියානන් වහන්සේ යන ගමනේ අවවාද කියන්නට වේදැ සි කියාලා ගියේය. 'අවවාද කියා බලම්හ''යි කියන්නා එවිට බොධිසත්ත්වයෝ කියන්නෝ ''මලඬ, තොප බාල විසින් නොදැන කියන බස්ය, පෙරයම් දසපැයට මේ ගෙට වන්නාවූ ගණන් නැත, අනික්

විසිපැයේ ගෙට වදනවුන් ගණන් නොදැනෙයි, එසේවූ සථානයෙහි කුමන අවවාද කියන්නේද? බැණ නොතැගී ඉඳුව''යි මලනුවන්ට අවවාද කියා උන්නාහ. එසේ සිටි නොබෝ දවසකින් බමුණු ආයේය.

බමුණු ඇවින් බොධිසත්ත්වයන් අතින් 'බැමිණිගේ දුරාචාර කුමක්දැ''යි විචාරන්නා ගිරවානෝ කියන්නා ''දුරාචාර අප්‍රමාණය, මෙසේවූ දුරාචාර කරන්නේ නුඹවහන්සේ කෙරේ අභිප්‍රාය නැත්තෙන් නොවේද? එසේවූ නැනැත්තිය ගෙයි තිබාගෙණ ඉන්නේ කිම්දැ''යි කියා නැවත කියන්නාහු ''මේ දෙඡය කී වේලේ පටන් අප මෙතන ඉඳීම කාරණා නොවෙයි'' සිතා මලනුවනුත් ඇරගෙණ පිය බ්‍රාහ්මණයාගේ දෙපතුල් වැඳ ආකාශයට වැද වනයට ගියෝය යි වදුරා, එසමයෙහි බැමිණි නම් පුරාණ දූතිසිකාය, බමුණා නම් මේ කියන භික්ෂුය, රාධ ගිරවානෝ නම් ආනන්දසථවිරයෝය, පොට්ඨපාද ගිරවානෝ නම් ලොවුතුරා බුදුවූ මම්මය''යි වදුරා රාධ ජාතකය නිමවා වදාළසේක.

## 142 කාක ජාතකය.

තිවද එක්සමයෙක්හි සමීඳුයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහළු උපාසකවරු මොත්තමක්ව පින්කොට ඇවිදිනාහු එක් දවසක් සමගව හිඳ සිතන්නාහු මහළුව ගිහිගෙයි සිටිනා බලාන් තපස්කොට රහත්ව කෙලෙසුන් නසාපුවොත් යහපතැ'යි සිතා බුදුන් කරා අවුත් ''සවාමිනි මහණකරවා වදරන්නේ යහපතැ''යි කියා මහණකරවා මහණවූ ගමනෙත් ජෙතවනාරාමයෙහි කෙළවර එක්තැනක පන්සල් ඉදිකොටගෙණ වාසය කරන්නාහ.

මහළුව මහණවූ විසින් අකුරක් කොටගතත් නොහෙනසේක. බුදුන් වදාළ බණ භාවනාකොටත් රහත්ව ගතනොහෙනසේක. ථිථියේ සිහා වඩනා කලත් තමන් වහන්සේ අඹුදරුවන්ගේ ගෙටම සිහා වඩනාසේක. මෙසේ ඉන්නා අවදියට ඒ උපාසිකාවෝ එක්තරා ව්‍යාධියකින් නැසීගියාහ. එපවත් ඒ මහළුවරුන් වහන්සේත් අසා ''හසනකමීනනයෙහි සපත් ස්ත්‍රී නැසීගියාහ''යි උනුන් කරා අත්වැල බැඳ අඩන්ට වන්නාහ

එපවත් සඞඝයාවහන්සේ අසා එතනට අවුත් අඩන කාරණා විචාරා ''යහපත්කොට බත්මාළු පිසන ස්ත්‍රිය මළ හෙයින් අඩම්හ''යි කී විසින් එපවත් ඇසූ මහළුවරුන් වහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව හිඳ මේ කථාව කියා කියා උන්තෙනට සමීඳුයන් වහන්සේ වැඩවදරා 'මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි වදරා එපවත් අසා පළමුන් මූ අඹුවන් මළඝමනේ අඩා මහමුහුදු පැන් ඉසින්ට බැරිහෙයින් අඩා මියන්ට වන් ගමනේ උත්තමයන්ගේ සහායෙන් ගැළවුනේ වේදැ'යි වදරා ආරාධිතවූ සමීඳු යන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

ඉතිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ සමුද්‍රයෙහි දෙවතාව ඉපද වාසය කරණසේක.

එසමයෙහි බොහෝ මනුෂ්‍යයෝ රැස්ව සමුද්‍රයේ වසන දෙවතාවන්ට හා නයින්ට බලි පිණිස බොහෝ රා මස් බත් මුදුවැල්ලේ තිබුවාහ. ඒ අවස්ථාවෙහි කැවිඩියක් හා කපුටුවෙක් මුදුවැල්ලේ ඇවිදිනාහු ඒ බත් හා රා මස් කා රාමතින් මත්ව "මුනුදු නාම්හ"යි කියා රලඟසන සමීපයෙහි නාමින් සිටි කල මහත්වූ රල ඇවින් කැවිඩිය රලෙන් අරගණ ගියකලට වහා මත්ස්‍යයෙක් කාපීය, ඒ දැක කපුටුවා තමාගේ බිරිඳ රැලින් අරගෙණ ගියහෙයින් හැඬීය. ඒ අඩ අසා එතනට රැස්වූ කපුටුවෝ දුක්ඛ කිම්දැ"යි විචාරා "තොප ඇමගේ යෙහෙලිය මහ මුහුදු ඇරගෙන ගියේය"යි කී කලට බොහෝ කපුටුවෝ ඒ අසා වික්‍ෂෙපව 'අප මෙතෙක්දෙනා එක්වූ කල මහමුනුදු පැන් ඉසපීය නොහැක්කදැ"යි සිතා මහ මුහුදුව පැන් කටින් උක උකා දමන්ට වන්නාහ. මේ නියායෙන් බොහෝ වේලාවක් උන්සාහකොට සැතපී ඉන්නාහු යම්තම් අඩුවකුත් නුදුටු හෙයින් ලුණු දිය කටින් හයන විසින් උගුර වියලින හුඹුක්ක පුප්පා පැන් ගෙණෙන හෙයින් හනුවත් ඉගිලින, බොහෝවිට පැනේ ගැලෙන හෙයින් දැසුත් රතුව බොහෝ ආයාසයට පැමිණ පැන් ඇදීම් නබා රැකීය යි කියා අඬන්නාහු "ගිරා කටක්සේ කටක් ඇති මොණර කටක් සේ පෑය ඇති පුරවිකෙවිල්ලක හඬ බඳු කටහඬ ඇති අපගේ යෙහෙලි වන කැවිඩිධෙනුව සොරහු මුහුදු ඇරගෙණ ගියේවේදැ'යි කිය කියා එක රාවයෙන් බොහෝ කපුටුවෝ අඬන්ට වන්නාහ. එවිට බොධිසත්ත්වයෝ එපවත් දැන භයංකාර වේශයක් පෑ උන්ගේ සෝක නිවූහ යි වදාරා එසමයෙහි කැවිඩි නම් මෙසමයෙහි යහපත් මාළු පිසූ උපාසිකාය. ඒ ඇඹු කපුටුවෝ මොහොතම නම් මේ මහළු නිඝ්‍ඝු මොහොතමය, උන් ඇමට භයගන්වා සෝක සංසිඳවූ සමුද්‍ර දෙවතා නම් ලොව්තුරා බුදුවූ මම්මය"යි වදාරා **ඛාණ ජාතකය** නිමවා වදාළසේක.

## 143 පුෂ්පරත්න ජාතකය.

**කි**වද සඒඥයන් වහන්සේ ජෙත වනාරාමයෙහි වැඩවසන සමයෙහි උකවලිවූ වහන්දැ නමක් දැක වදාරා "මහණ කුමක්නිසා උකවලීදැ"යි විචාර පිසමන් ආදියෙහි දැකුවූ මාගේ පුරාණ දුතිකාව නිසා උකවලීවීමි' දන්වන්න "පළමුත් මහණ ඇ නිසා උල ඉදුවා අවීචිමහනරකයට නියෝවේදැ"යි වදාරා ආරාධිතවූ සඒඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්,**

**කි**වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ආකාශසථ දෙවතාව උපන්සේක.

එසමයෙහි කාර්තිකඋත්සව දවසෙක දුකඛිත පුරුෂයෙක් තමාගේ ඇති රෙදිකඩ පොළු දෙකක් යහපත්කොට අපුල්ලා සියයක් දෙසියයක් විවරපට බිඳ ගෙයි තබා උත්සව දවස් අඹුවන් විසින් ලඟට අවුත් වනුක්මලෙහි පෑය ඇති කඩක් ඇදගෙණ "තොප හා මා හා සිපගෙණ වීථියේ කෙළින්ට වුවමැනවැ'යි කිහ. එවිට පුරුෂයා කියන්නේ මා දුකඛිතවූව, මට වනුක්මලේ පෑය ඇති පිළි

කොයින්ද සි මාගේ අපුල්ලා තිබූ සුදුකඩක් ඇත. ඒ ඉතකඩ ඇඳගෙණ කෙළ ව'සි කිහ. එසේ කීවත් ඕතොමෝ කියන්නී "වනුක්මලේ පෑය ඇති ඉතකඩක් ලදෙත් විනා මා කෙළිනා කෙළිතැන සුදුකඩ ඇඳගෙණ කෙළින්ට අභිප්‍රාය ඇත්නම් අනික් බිරින්දක් ඇරගෙණ කෙළව"සි කීය.

එපවත් පුරුෂයා අසා නැවත යාවඤ්ඤකොටත් ස්ත්‍රිය විසින් කියන්නී "පිරිමින් විසින් සිතුකල කුමක් බැරිද? රජ්ජුරුවන්ගේ වනුක් මල්වත්තට ගොසින් මල් කඩාගෙණ එව"සි කියන්නා ඊට පුරුෂයා කියන්නේ "රජ්ජුරුවන්ගේ වනුක් මල් වත්තට ගොසින් මල්කඩාගෙණ එන්නා තබා කර ඔසවා බලන්ටත් මට බැරිය"සි කියන්නා "රාත්‍රියෙහි ගොසින් කරණ සොරකම් බැරිද"සි කියා තත්ප්‍රවිසින් ස්ත්‍රියගේ අභිප්‍රාය මැඩගත නොහෙන පුරුෂයා විසින් 'යහපතැ"සි ගිවිස නුවරින් පිටත ගොස් වැව පැත වත්තට වන්නාහ. වත්ත බලන මනුෂ්‍යයෝ ඔහු වැටපැනි නියාව අසා ගොස් සොරෙක් වනැ සි යුහුව එතනට ගොස් ඔහු අල්වා පිටිතලහයා බැඳ රැ උයනේ රඳවා පාන්වූ ගමනේ රජ්ජුරුවන්ට පැකල්හි රජ්ජුරුවෝ උයනේදී අල්වාගත්කල මට පානේ කිම්ද සි දිවස්උල ඉදුව සි කී හෙයින් වදබෙර ගස්වා ගෙණගොසින් දිවස්උල ඉඳවූහ. දිවස්උල ඉඳවූ වේදනාද කවුඩන් විසින් කියුණු මුවහත් ඇති තුඩින් ඇස සාරණ වේදනා හා මේ එකක්කොට නොසිතා මාගේ සොඳ බිරින්ද වනුක් මලින් රැඳුනු කඩක් ඇඳගෙණ කාර්තික උත්සව කෙළියට සිතුවා නුවූයේවේද සි විඤ්ඤපය උපන් අවසථාවව ප්‍රාණය නිරුද්ධව අවීචිමහනරකාදියෙහි උපන්හ සි වදුරා එසමයෙහි දෙමහල්ලෝ නම් මේ සමයෙහි දෙමහල්ලෝ මය, ඒ කාරණය ප්‍රත්‍යක්ෂව දුටු ආකාසසථ දෙවතාවා නම් ලොව්තුරා බුදුවූ මම්ම ය"සි වදුරා මේ පුප්පරත්න ජාතකය නිමවා වදාළසේක.

---

## 144
## සිහාල ජාතකය

තවද සවීඥයන් වහන්සේ ජෙතවනා රාමයෙහි වැඩවසන සමයෙහි අළුත මහණවූ පන්සියයක් දෙනා වහන්සේ මධ්‍යම රාත්‍රියෙහි කාමරාගයක් ඉපදවූසේක.

ඒ වේලාවේ සවීඥයන් වහන්සේ මේ වේලාවට මාගේ භික්ෂූහු කුමනසිති විලි සිතත්දෝ හෝ සි මහාකරුණා සමාපත්තියෙන් බලා වදුරණසේක් ඒ පන්සියයක් භික්ෂූන්ට රාගවිතකීයක් උපන් නියාව දැක චක්‍රවර්ති රජ්ජුරුකෙතෙ කුන්ගේ නුවරට සතුරු කෙතෙකුන් වන්නාසේ මා ඉන්නා ජෙතවනාරාමයෙහි ඉන්නා වහන්දූට විතකීය මා විසින් බණ කියා රාගචිත්තය දුරුකොටපියන්ට වුවමැනවැ"සි සිතා "ආනඤ්ජය"සි වදාළසේක. ආනඤ්ජසාමි බුදුන්ට අත්පා මෙහෙවර කරණ පස්විසි අවුරුද්ද මුළුල්ලෙහි බුදුන් කෙරේ මෛත්‍රී රැකවල් පිණිස අහෝ රාත්‍රියෙහි අත්වැට පහන්ගත් අත් ඇත්ව ඇවිදිනාසේක. එසේහෙයින් බුදුන් අඩගැ නඩ අසා "ඇයිද සාමිනි" කියා ලඟට ආසේක. සවීඥයන් වහන්සේ සිතා වදුරණසේක් "රාගවිතකය උපන් පන්සියයක්දෙනා වහන්සේ ගෙන්වාගෙණ බණ කිම් නම් අපට උපන් සිතිවිල්ල සවීඥයන්වහන්

සේව දැනිතැ යි සිතා භයපත්වන්නාහ. භයපත්වූකල සිතහෙලා බණ නොඅසන්නාහ. සිතහෙලා බණ නොඇසීමෙන් අධිගමයට නොපැමිණෙයි" සිතා වදුරා සාමාන්‍යයෙන් ඇමට බණ කියමි සිතා "ජේතවනාරාමයෙහි වසන භික්ෂූන් එක්කරව"යි කියා වදාළසේක.

එපවත් ඇසූ ආනන්දසාමි යතුරු කෙසි මුදු ඇරගෙණ ගෙයක් ගෙයක් පාසා ගොස් දෙර දෙර ඇර ඇර එපවත් කීසේක. එපවත් ඇසූ මනුෂ්‍යවරුන් වහන්සේ ජේතවනාරාමයට වැඩිසේක. භික්ෂූන්වහන්සේ රන්පළිතයක් රන් පලඟකින් වඩනකලක් පරිද්දෙන් වත්පිළිවෙත් දක්වා වැඩඋන්සේක.

සබ්බඤ්ඤුයෝත් නීල පීත ලෝහිත අවදාත මාංජෙෂ්ට ප්‍රභාස්වරය යි යන සවණක් ඝන බුදුරැස් ආකාශයෙහි විහිදුවා භිරුදහස් සඳදහස් තැංගාසේ ඒකාලෝක කොට වැඩහිඳ බණවදාරණසේක් "මහණෙනි, භික්ෂූන් විසින් කාමවිතකී ව්‍යාපාදවිතකී විහිංසාවිතකී නොසිතියයුතුය, ස්ත්‍රීන්විෂයෙන් සිතිවිලි යම්තමක් සිතුවත් බොහෝ අකුසල් පිරෙයි, කාරණා කිම්ද? සීයෙක් කඩා කෑ මුඛය යම්තම් වනයක් වූවත් සියළු සඊඔඝයම විෂමූර්ඡාවෙන් නසා පියන්නේය, ගිත්තක් යම්තම් වූවත් බොහෝදෙය දවා භස්මකොට පියන්නේය, එකසෙතක් ගැසූතෙතක බෙහෝ ගස්කොලන් දවා භස්මකොට පියන්නේය, පඤ්චකාමයෙහි සිතිවිල්ලත් එවැන්න. මෙහි ඇල්මක් කිරීම ඇත්මසෙහි ඇල්ම කොට කැණහිලාට වූ දුක්වැන්නේය"යි වදාරා ආරාධිත වූ සබ්බඤ්ඤුවහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

රිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයෝ සිඟාල යෝනියෙහි උපන්සේක. එසමයෙහි එක් ඇත්මිනියක් බෝධිසත්ත්වයෝ දැක මාගේ දිවිහිමියෙන් කන්ට ඇතැ යි සිතා කැණහිල් ගොස් ඇතු සොඬ ඩැලිය තගුලිසක් ඩැකලක් මෙන් වූයේය. දළ ඩැලිය හරයක් ඩැවාසේ තුබුයේය. බඹ ඩැලිය අටු පලලක් ඩැවාසේ තුබුයේය, ගුදය ඩැයේය, තෙල්කැවුමක් සේ තුබුයේය. එසේ තිබෙන්නාවූ තැනින් මොලොක් මසක් ලදිමි යි සතුටුව කකා බඩවැද සැපසේ මාංසත් කැහැක්ක, පැනට මාරුව ලේත් පියහැක්ක, අක්මා පපු ඉසට ලාගෙණ ඇත්සමපිට වැදහෝනවත් හැකිය.

එසේගෙයින් ඔබ්බට ගොසින් ජීවත්වීමෙන් ප්‍රයෝජන කිම්ද? මෙතන ඉඳ ජීවත්වෙමි යි සිතා එලෙසම කා බී දවස්හරින්ට වත. ඒ අවදියට නියඟ යක් කොට ඇත්සම වියලෙත් වියලෙත් වලිමග ඇසිරගියේය. ඇත්සම් විය ලෙන්න මාංශත් තදව ගියේය. ලේත් සිදීගිය ලොකාන්තරික නරකය මෙන් මහා අන්ධකාර වීය. මහත්වූ උෂ්ණ පවතින්ට වන, කැණහිල් මහත්වූ භයට පැමිණ ගැලවී යන උපායක් ඇද්දෝ හෝ යි වටම දිව ඒ ඒ තැන හිස ඇන ගැලවී යන මඟක් නොදැක මහත්වූ භයින් තැව් තැව් ඉදිය, එක්තරා වැස්සෙක් වැස වලිමග තෙමී තරුවක් සේ එලිය පෙණින, ඒ වේලාවෙහි කුම්භස්ථලය දක්වා පසුබැස මහත් වේගයෙන් පිටතට දිවෙමි යි පිනූහ.

එකල්හි කැණහිලුගේ සඬිංගය ඉදී තිබූ හෙයින් සියලු ලොම්ම වලිමග ඇලිත. කැණහිලා ලොම් ඇරී තල්කඳක් මෙන් මැන්ව බිය තැකැත්තේ සිතන්නේ මාගේ තෘෂ්ණාවේ අධිකයෙන් මෙසේ විනාශයට පැමිණියෙමි, මෙයින් මතු ඇත්කුණු නොකම් යි අධිෂ්ඨානකොට එතැන් පටන් සොටඇත් කුණක් නොකෑයේය යි වදාරා චතුස්සත්‍යය වදාළසේක.

ජාතකය අවසානයෙහිදී පන්සියයක් භික්ෂූන් වහන්සේ සියලු කෙලෙසුන් නසා අර්හත් මාගීයට පැමිණියසේක. සෙසු බොහෝ භික්ෂූන්වහන්සේ සෝවාන් සැදැගැම් අනාගාම් තුන්මග තුන්ඵලයට පැමිණියේසේක. බොහෝ දෙනාට ධර්මය අභිසමබුද්ධ විය. "එසමයෙහි කැණහිල්ව උපන්නේ ලොව්තුරා බුදුවූ මම්මය" යි වදාරා මේ සිගාල ජාතකය නිමවා වදාළසේක.

---

## 145 එකපණ්ණජාතකය

තවද සම්බුදුන් වහන්සේ විශාලා මහනුවර මහවනයේ කූටාගාර ශාලාදෙහි වැඩවසන සමයෙහි විශාලාමහනුවර ගව්වෙන් ගව්ව නියාවට පවුරුතුනක් හා අට්ටාල ගෝපුරයෙන් සමලංකෘතව තිබෙන්නේය.

තවද ඒ නුවර සත්දහස් සත්සිය සත්දෙනෙක් රජදරුවෝ ඔටුනු පැලඳ රජකරෙති. එපමණම යුවරජදරුවෝත් ඇත්තාහ. එපමණ සෙනෙවිරත්වරුත් ඇත්තාහ, එපමණ භාණ්ඩාගාරික නායකවරුත් ඇත්තාහ. මේ නියායෙන් අමාත්‍යමණ්ඩලයා හා සෙනා සමූහය ඇතිව ඉන්නා අවදියේ සත්දහස් සත්සිය සත්දෙනෙකු රාජකුමාරවරු අතුරෙන් දුවිඨ නම් ලිච්ඡවි කුමාරයෙකුනෙක් ඇත්තාහ, වර්ණය, පරාශය, බලය නම් ගඟාලා බැණලා විනා නොකියන්නේය; ඇමදුම දණ්ඩෙන් ගසා කුප්පවනලද සර්පයකු වැන්නේය. කෝපයෙන් දිලිහී කොපාග්නියෙන්ම දිලිහී ඇවිදින්නේය. ඒ රාජකුමාරයන් දැක්කදී බස් එකක් දෙකක් කියාගන්නටත් නොපිළිවන් වන්නේය. දෙමව්පියන් පවත්තුන් මල් බැවුන් ආදීවූ එක්කුසෙහි බන්ධුත්‍රය සුත ප්‍රේමයෙන් වදාගත් දරුවෝද ඉච්ඡා පරව ඉඳිනාහ. බිරින්දද යාළු විශ්වාසයෝද යන සිල්ලෝම තද පරුෂ කෝපී මනුෂ්‍යයන් දුටු කළ කඩාකන්ට ආ සර්පයකු මෙන්ද සොරුන් ඇති වතයකට වන්නාක් මෙන්ද මස්කන්ට ආ යකෙකු දුටුවාක් මෙන්ද ඔහු කෙරේ භය ඇතිව දවස් හරණාහ.

මේ නියායෙන් ඉහලොකයෙහි දවස් ඇර පරලෝ සතර අපායෙහි වැටී බොහෝ දුක්විඳිනාහ. කෝපී මනුෂ්‍යයෝ කෝපී විසින් පූර්ණචන්ද්‍රයාගේ මුහුණක් උවත් හිනිදුම් වැදගත් පියුමක් සේ අශෝභාවත් වන්නේය; මලගැසුනු රන්කැඩපතක් සේ වන්නේය, කෝපයාගේ අධිකත්වය ඉවසාගතනොහී තම තමාට ඇතගන්නේය, ඒ තැත්තම් හලාහල විෂ අනුභව කරන්නේය; කරවැල් ලාගෙණ මියන්නේය, මහත්වූ ප්‍රතාපයෙන් වැටී හෝ මියන්නේය; මෙසේ එක් උපායෙකින් මළකල දෙවෙනි ජාතියෙහි නරකයට වැටී බොහෝ දුක්විඳ මනුෂ්‍යත්වභාවයක් ලත් කල්හි උපන්දු පටන් චක්ෂු රෝග ශ්‍රෝත රෝගාදීවූ රෝගයෙන් එක්තරා ව්‍යාධියකින් මෙසේ අපරිමිත ව්‍යාධි ඇතිව බොහෝ දුක් විඳිනේය.

සියළු සත්ත්වයන් කෙරේ මෛත්‍රී මුදිතා දයාකරුණා ඇතිවීමෙන්මෙකී දුක් ඔහට නොවී සියළු සම්පත් විඳිනේය යි වදාළසේක.

මේ එකවාරේ වදාළ අවවාදයෙන්ම ඒ කුමාරයා තමාගේ මාතාය හැර එතැන් පටන් දළ උදුරාපු තඹින්සේද නල උදුරාපු කකුළුවන්සේද අඟ කපාපු ගෝනුන්සේද ශාන්තදාන්තව දවසරිනේය. යම් කෙනෙක් මැරූ තැළූ තමුන්ත් බැන්නෝ තමුන් මට බැන්නෝ මැරූ තැළුවෝ කවුරුදැ යි කියා ආපස්සපමණකුත් නොබලන්නේය. මේ නියායෙන් දවස් අරණේය.

එක් දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ "ඇවැත්නි සර්‍වඥයන් වහන්සේ විසින් දෙමව්පියන්ට පවා අවවාද කියා භික්මවාගතානුහුනු රාජකුමාරයන් ඇතෙකු හස්ත්‍යාචාරියෙක් දමනයලූවාසේ එක අවවාදයෙන්ම දමනේ ලවනලදැ"යි කියන්න ඊට අනික් නමෙක් "එසේමය, ඇත්දම් සැරි ඇවැත්නි තැගෙණහිර බස්නාහිර උතුරු දකුණුදිගය යන සතර දිගට තමා සිතු තෙනට ගොස් අසුන් ගොන් දමනයේලාද එසේම පුරිසදමම සාරථිවූ තිලෝගුරු සර්‍වඥයන් වහන්සේත් රූපාරූපාදිවසයෙන් සිතූදිසාවට වැඩ මනුෂ්‍යයනුත් භික්මවීම සර්‍වඥයන් වහන්සේට මිසක් අනික් කාට පුළුවන්ද"යි කියා මේ කථාව කිය කියා උන්තැනට සර්‍වඥයන් වහන්සේ වැඩවදාරා "මහණෙනි මා එන්නාට පූර්‍වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ"යි වදාරා එපවත්අසා "මහණෙනි, දැන් මතු නොවෙයි පළමුත් ඒ රාජකුමාරයන් දමනේ ලනලදැ"යි වදාරා ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**එසෙසේද? යත්,**

පිටගියදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක්රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ප්‍රසිද්ධවූ බ්‍රාහ්මණකුලයක ඉපිද දෙමව්පියන්ගේ ඇවැමෙන් පිරුණු සම්පත්හැර හිමාලයවනයට ගොස් මහණවූණු ඇඹුල් සොයා බරණැස්නුවරට අවුත් පිඬු පිණිස වීථියේ වඩිනාසේක.

එකල්හි රජ්ජුරුවෝ තාපසයන් වහන්සේ දැක එක්තරා අමාත්‍යයෙක් කැඳවා "අර වඩිනා තාපසයන් වහන්සේ කැඳවාගෙණ එව"යි කීසේක. අමාත්‍ය තෙම එහි ගොස් ඒ බව දැන්වූ කල්හි තාපසයන්වහන්සේ ඔහට මෙසේ කීසේක, "පින්වත, රජ්ජුරුවන් හා පළමු පුරුදු කෙමකුත් නැත; අපි හිමාලයවැසි තාපසවරුවම්හ, මම රජ්ජුරුවන්ගේ කුළුපග තාපසකෙනෙකුත් නොවෙමි, එහෙයින් අප රජ්ජුරුවෝ කුමට කැඳවද්ද"යි කීසේක.

එපවත් අසා අමාත්‍යයා ගොස් උන්වහන්සේ නොවඩිනාසේකැ"යි රජ්ජුරුවන්ට දැන්විය, රජ්ජුරුවෝ එපවත් අසා "අපගේ කුළුපගවූ තාපසකෙනෙකුත් නැත, තමන්වහන්සේ විනා අනික් තාපසකෙනෙකුත් අපි දුටුයේත්නැත; එසේහෙයින් වඩිනට වුවමැනවැ"යි දෙවෙනිවත් ආරාධනා කළාහුය.

එපවත් තාපසයන් වහන්සේ අසා රජගෙට වැඩිසේක, රජ්ජුරුවෝ තාපසයන් වැඳ "වැඩහිඳිනේ වඩිනේ කොයිදැ"යි විචාළහ.

එවිට තාපසයෝ කියන්නාහු "මහරජ හිමාලයවනයෙහි වාසයකොට වර්‍ෂාකාලය පැමිණි කල්හි වස්වසන තැනක් සොයා ඇවිදිම්හ"යි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා "මාගේ මිගුල්උයනේ වස්වසන්නේ යහපතැ"යි කියා තුමූබත්කා

ඉක්බිති තාපසයන්වහන්සේ කැඳවාගෙණ උයනට ගොස් උයනේ වැඩ ඉන්ට සලස්වා උයන්ගොව්වා මුන්වහන්සේගේ අත්පා මෙහෙවර කරන්ට තොපට භාරය''යි භාරකොට රජගෙට අවුත් එතැන් පටන් දවසකට කීපවිටක් තාපසයන් දකින්ට යන්නාහ. මේ නියායෙන් දවසරිත සමයෙහි රජ්ජුරුවන්ගේ දුෂ්ටකුමාරයෝය යි කුමාරකෙනෙක් ඇත්තාහ. ඒ තෙම චණ්ඩය, පරුෂය, දණ්ඩන් ගසනලද සර්පයකු මෙන් කෝපයෙන් දවසරිනේය. ඒ අවදියේ දෙමව්පියන් බන්ධු සහාය ආදීවූවන් කි දෙයක් නොඅසන්නේය. එපවත් රජ්ජුරුවෝ දැන කුමාරයන් ඇරගෙණ තාපසයන් වහන්සේ ලඟට ගොස් ''ස්වාමීනි, මේ කුමාරයා චණ්ඩය, පරුෂය, ඔහු හික්මවා වදාළ මැනවැ''යි කියා තාපසයන් වහන්සේට පාවාදී රජ්ජුරුවෝ ගියාහ.

තාපසයෝත් කුමාරයන් අත අල්වාගෙණ උයනේ ඇවිදිනාහු දෙපෙති කොහොඹගසක් පැ ''කුමාරයෙනි, මින් එකපතක් සපා කාපියව''යි කීහ. 'යහ පතැ''යි කියා කුමාරයෝ ඉන් එකපතක් සපාකා නිත්ත හෙයින් කෙළ හා සමග බිමට දමා ''දෙපෙති අවස්ථාවේ මේසේ තම් මහත්වීතම් බොහෝදෙනා තසා පිය''යි කියා ඒ ගස උදුරා අතින් සටා දමාපුවාහ. එවිට තාපසයෝ කියන්නාහු ''දුටුවාද? කොහොඹගස තිත්ත විසින් කඩා දමතලද. ඒ නියායෙන් මේ අමාත්‍යයෝ මේ කුමාරයෝත් දැන්ම මෙසේවූ චණ්ඩභාව,පරුෂභාව, රාජ්‍යයට පැමිණියහොත් බොහෝ අනර්ථ කරන්නේය''යි කියා තොපත් නසාපියන්නාහ. එසේහෙයින් තොප විසින් චණ්ඩ පරුෂ නොව දැහැමෙන් දවස් හරුව''යි අවවාද කිසේක.

අවවාද ඇසූ කුමාරයෝ එතැන්පටන් චණ්ඩ පරුෂ නොවී දවස් ඇරියාහ. රජ්ජුරුවන්ගේ ඇවැමෙන් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ''යි වදාරා එසමයෙහි දුෂ්ට රාජකුමාරයෝ නම් මෙසමයෙහි දුෂ්ට රාජකුමාරයාය, එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්මය''යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 146 සංජීවක ජාතකය.

තිවද සම්බුදුයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අජාසත් රජ්ජුරුවෝ දුස්සීලවූ පාපීවූ දෙවදත්ත ස්ථවිරයන් කෙරෙහි පැහැද ගයා නම් ගඟතීර පන්සලක් කරවා උපස්ථාන කරන්නාවූ උන්ගේ බසින් බුදුන්ට නාලාගිරියා මෙහෙයීමෙන් විදින්ට දුනුවායන් යවීම් ආදීවූ බුදුන්ට බොහෝ අනර්ථකරවා නෝවාන්වූ ධර්මිෂ්ඨවූ පිය මහ රජ්ජුරුවනුත් දෙවදත්තස්ථවිරයන්ගේ බසට මරවා දෙවදත්ත ස්ථවිරයන් පොළොව පලා ගිලුම්නයි ඇසූ දවස් පටන් දෙවදත්තස්ථවිරයන් පොළොව ගිලුකල් උන්ගේ බස් නියාවට පිළිපන් මටත් එසේ පැමිණේය යි සිතා රෑ දුවල් භයට පැමිණ දිවාමානයේ සැපසේ දවසැර රාත්‍රිමානයේ සැපවේදෝ හෝ යි සිතා වැදහොත් කලත් පොළොව පලාගෙණ

යන්නාසේ නරකයෙහි ගිනිදැල් ඇඟට වැදගන්නාසේ සිහිනයෙන් දක්නා විසින් බොහෝ භයට පැමිණ බෙල්ල කරකවා අවිවට දැමූ කුකුළෙකු සේ රෑ දවල් භයට පැමිණ රාජ ඓශ්වර්‍යය කෙතෙක් ඇතත් සැපයක් කොට නොවිඳ දුක්ම විඳිනාහුය.

සම්බුදුරජාණන් වහන්සේගෙන් දුටු සිහින විවරණට තද සිතිවිලි ඇතිව බුදුන් දකින්ට යෙමි යි එදවස් ජීවකයන්ට ලැජ්ජා ඇතිව ව්‍යාජයෙන් කියන්නාහු "අමාත්‍යයෙනි, සඳපහන දැවලක්සේ දුනු පන්සාළියෙක එපිට තුබූ කල විද්දනැකි මේ සඳපහන ඉතා ප්‍රභාත්වය. ඉතා නිශ්කලංකය. ඉතා මනොඥ ය, ඉතා රම්‍යය. මෙසේවූ වේලෙහි නිකම් මෙහන ඉඳ කරන්නේ කිම්ද? යහපත්වූ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙකුන් කරා ගොස් බණදහම් අසන්ට යන්ට අහිප්‍රාය ඇත. කවුරුන් කරා යමෝදැ"යි විචාළහ. ඒ ඇසූ අමාත්‍යයෝත් තමන් භක්තිගත් සැලැස්ම කියන්නාහු නිවටුන්ගේ ගුණ කියන්ට වන්නාහ. ඉන් එකෙක් කියන්නේ "පුරාණ කාශ්‍යප නම් මකඛලිගෝසාල නම් බුදුන් කරා ගියොත් යහපතැ"යි කිහ. අනිකෙක් කියන්නේ "උන්නියාවට අජිතකෙස කම්බලතම් බුදුන්කරා ගියොත් යහපතැ"යි කිව, අනිකෙක් කියන්නේ කකුධකාත්‍යායන බුදුන්කරා ගියොත් යහපතැ"යි කිය. අනිකෙක් කියන්නේ සඤ්ජයබෙල්ලට්ඨිපුත්‍ර නම් බුදුන්කරා ගියොත් යහපතැ' කිහ. අනිකෙක් කියන්නේ "මෙකී බුදුන් ඇමදෙනා නියාවට නිගණ්ඨනාථපුත්‍ර නම් බුදුන් කරා අපගේ යාම යහපතැ"යි කිහ.

මේ නියායෙන් නිවටුන් වැනි කොල්ලන් ඇරගෙන තම තමන්ට කවට ආවක්ම කීවාහ. රජ්ජුරුවෝ උන් කියන බස් නොඅසා ඉඳ ජීවකයන් විසිනුත් මා නිසා යම් කථාවක් උපන්නේයයි දැනගෙනත් බැණනොනැගී උන්නාහ. එපවත් රජ්ජුරුවෝ දැන "ඇයි කුමාර භාණ්ඩකවූ ජීවකයෙනි, මෙතෙක්දෙන තම තමන් භක්තිගත් බුදුවරුන් කියේය, තොප බැණනොනැගී ඉඳිනේ තොප භක්තිගත් බුදුකෙනෙක් නැද්දැ'යි කිය.

එවිට ජීවකයෝ ඒ අසා උනස්නෙන් නැගිට බුදුන් වසන දිසාවට වැඳ බුදුණ්ගේ නවඅරහාදී ගුණ කියා මෙසේ ගුණ ඇති සම්බුදුරජාණන් වහන්සේ මාගේ අඹුදරුවන්ගේ එක්දහස් අවසියයක් නිසුළුන්වහන්සේ පිරිවරාගෙණ වැඩහිඳිනා සේක් දකින්නට වැඩියොත් යහපතැ"යි කීන ඒපවත් රජ්ජුරුවෝ අසා ඉතාම තොදය, ඒ නියාවට ඇත්වාහන හා සේනා සමාධිය කරව"යි කියා ඒ නියාවට සේනා සමාධිය කරවාගෙණ මහත්වූ රාජඓශ්වර්‍යයෙන් බුදුන්කරා ගොස් ඇතුපිටින් බැස ගණයට අවුත් සකස්ව හැඳ පෙරව මනා ඉඳුරන් ඇතිව අතක පයක සැලීමක්වත් මෙතෙක්දෙනා වහන්සේ ඉදිනාතෙන කැසපියන කිඹිසපියන පමණක්වත් නැතිව මනාව වැඩ උන්නා දැක සතුටුව සංඝයාවහන්සේ පළමුව වැඳ පසුව බුදුන් වැඳ එකත්පස්ව හිඳ 'ප්‍රශ්න විචාරන්නා කැමැත්තෙමි"යි දැන්විය. "යහපත මහරජ, ප්‍රශ්න විචාරව"යි වදාළකල්හි රජ්ජුරුවන් විසින් කියන්නාහු "ස්වාමීනි, මහණදම් පිරීමෙන් ලැබෙන ආනිසංස කුමක්දැ"යි විචාරන්නා දෙබණවරකින් හා පන්සියයක් ග්‍රන්ථසංඛ්‍යාවෙන් යුත් සාමාන්‍යඵලසූත්‍රය වදාරා රජ්ජුරුවන් විසින් බුදුන් වැඳ "ස්වාමීනි මා නොදැන කළ දොහ ඉවසා වදාරන්නේ යහපතැ'යි ක්ෂමාකාරවා

ගෙණ ගියාහ. සම්බුදයන් වහන්සේ භික්ෂූන්වහන්සේට 'මහණෙනි, අජාසත් රජ පිතෘඝාත කර්මයකොට අසත්පුරුෂයා හා එක්වීමෙන් තමන් හාමාම නසා ගත් හෙයින් මිය නැත්නම් අදම සෝවාන්වන්නේය''යි වදාළසේක්

දෙවෙනි දවස් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ ''අජාසත් රජ අසත්පුරුෂයා නිසා ලාභයකින් පිරිහී ගියේවේදැ''යි වදාරා වැඩ උන් තෙනට සම්බුදයන් වහන්සේ වැඩවදාරා ''මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදාරා එපවත් අසා ''මහණෙනි, දැන් මතු නොවෙයි, පළමුත් අසත්පුරුෂයන්ට සහායව අනර්ථය සලස්වා ගත්තේවේදැ''යි වදාරා ආරාධිතවූ සම්බුදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**හේ කෙසේද? යත්,**

**ජීවකිය දව්‍ය** බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ බරණැස්නුවර බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් හාවට ඇවිත් ශිල්ප ශාස්ත්‍ර ඉගෙණගෙණ අවුත් බරණැස්නුවර දිසාපාමොක් ආචාරීන්ගේ පන්සිය යක් අතවැස්සන්ට අකුරු කරවා වාසයකරන්නාහු ඉන් එක් සංජීවක නම් මානවකයකුට මළමිනි මන්ත්‍රය පිරුවා දෙවතානුභාවයෙන් උපද්දු කිප අඩියක් ඇවිදිනා පමණට මන්ත්‍රණය ඉගැන්වූහ ලඟට ආකල නවතන මන්ත්‍රය නීගැන්වූහ.

එසමයෙහි ඒ ශිෂ්‍යයා ඇතුළුවූ පන්සියයක් ශිෂ්‍යයෝ වලට දරාසඬා ගියාහ. එවිට ව්‍යාඝ්‍රයකු මියපියා වැදහොත්තා දැක සෙසු අතවැස්සන්ට කියන්නේ ''මළ ව්‍යාඝ්‍රයා උපද්දු දෙම්හ''යි කිහ, අතවැස්සන් 'එනම් දෙයක් කවරකලෙසත් බැරිය''යි කියන්නා ''එසේවීනම් බලව''යි කියා. මන්ත්‍ර පිරුවන්ව පටන්ගත්හ. සෙසු අතවැස්සෝ ''කවුරු දනිද්දැ''යි කියා ගස්ලඬට පැනනැන්ගාහ. ඒතෙමේ මන්ත්‍රය පිරුව පිරුවා ගල්දැම්හ. එවිට ව්‍යාඝ්‍රයා නැගීසිට මන්ත්‍රය පිරූ තෙනැත්තහුගේ බෙල්ල කඩා මරා තෙමේත් එතනම වැටීසියේය. සෙසු අතවැස්සෝ දරකඩාගෙණවුත් ආචාරීන්ට කීහ. එපවත් ඇසූ ආචාරීන් ශිෂ්‍යයන් ලඟට කැඳවා ''අසත්පුරුෂයාට සංග්‍රහකිරීමෙහි විපාක ලද්දේවේදැ''යි දැනැමෙන් සෙමෙන් දැනාදී සුචරිත පින්කම් කොට කම්වූ පරිදි දෙන් මිය පරලොව ගියේවේදැ''යි වදාරා එසමයෙහි සංජීවක මානවකයා නම් අජාතශත්‍රු රජ, එසමයෙහි බරණැස් නුවර දිසාපාමොක් ආචාරීව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්ම යි වදාරා **සංජීවක ජාතකය** නිමවා වදාළසේක.

ගද්‍රභ ජාතකය, ඡන්නුපථ ජාතකය, අමරාදෙවි ජාතකය, සිරිකාල කන්නි ජාතකය, කකන්ට ජාතකය ආදීවූ උමන්දුවෙහි ගාථා ඇති ප්‍රශ්න අනනාවූ ජාතකයන් මහාඋම්මග්ග ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

**එකනිපාත වණ්ණනා නිමි.**

## 147 රාජෝවාද ජාතකය

මේ වදු දුකනිපාතයෙහි ජාතක දක් වම්හ කෙසේද? යත් සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි රජ්ජුරුකෙනෙකුන්ට කී අවවාදයක් නිසා මේ ජාතකය දක්වනලද මෙහි වත්තීමාන කථාව තෙසකුණ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය.

මෙහි කොසොල් රජ්ජුරුවෝ එක් දවසක බරණැස්නුවර යුක්තියක් විචාරණ නිසා බුදුන් දකින්ට උදය යා නුහුනු හෙයින් දවල් බත් කා ඉක්බිති අත පැන් නොසිඳෙනතුරුම වහා රථයකින් ගොස් බුදුන් වැඳ එකත්පස්ව හුන්නාහුය.

සම්බුදුරජාණන් වහන්සේ 'මහරජ අද වුකලී දෙවෙනි දවල් දවස කුමක්නිසා අවූ දැ"මි විචාරන්නා "දැහැමෙන් සෙමෙන් විචාරා පසිඳුවන නිසා නොආයෙමි, "දැන් වතාහි රජදරුවන් දැහැමෙන් සෙමෙන් යුක්ති විචාරීම් යහපත්වෙයි, මාසේවූ සම්මාසම්බුදු කෙනෙකුන්ගේ අවවාදවූ නියාගෙන්වේද යුක්ති විචාරන්නේ. පළමු උත්තමයෝ කිසිකෙනෙකුන්ගේ අවවාදයක් නැතිව ඡන්දගතිය, ලෙඟා ගතිය, භයාගතිය, මොහගතිය, යන සතර අගතියට නොගොස් දැහැමෙන් රජ්ජය කළෝවේද'යි වදාරා රජ්ජුරුවන් විසින් ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසඳ දසඑකඩමසකින් බිහිවූසේක.

ඒ කුමාරයන්ට නම් තබන්නාහු බ්‍රහ්මදත්ත කුමාරයෝය යි නම් තුබූහ. ඒ කුමාරයන් වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් කරා ගොස් ශිල්ප ඉගෙණ නිමවා බරණැස්නුවරට අවුත් පියාතන්ගේ අවැමෙන් රාජ්‍යයට පැමිණ සතර අගනියට නොගොස් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරන්නාහ. උන්ගේ බර්ඉෂ්ඨ කුමින් අභ්‍යාගෙකැ යි යන දෙයක් නැතිවිය. අධිකරණ ශාලා හිස්විය. අමාත්‍යයෝ සවස්වෙනතුරුත් අධිකරණ ශාලාවේ හිඳ යුක්ති විචාරන්නට එන්නන් නැතිහෙයින් ගෙවලට පලායන්නාහ.

මේ නියාගෙන් කිසි අයුක්තියක් නැතිව දවස් අරණා හෙයින් රජ්ජුරුවෝ සිතන්නාහු යම්සේ මාගේ නුගුණයක් කියන්නෝ ඇද්දෝ හෝ යි සිතා රු නිවාසයේ පරීක්ෂාකොටත් තමන්ගේ නුගුණයක් කියන කෙනෙක් නැතිව අපගේ රජ්ජුරුවන් වහන්සේ සුබි සුවපත් වෙනසේක්වා යි දීඝායුෂ්කව ඉඳිනා සේක්ව යි යන බස විතා අන්‍යයන් අයුක්තියක් කළසේකැ යි යන බසක් නොඅසා දෙවෙනිව සිතනසේක් මොහු මා සමීපයෙහි වාසය කරණ හෙයින් නුගුණ නොකියන්නෝය යි සිතා ඇතුළුනුවර පිටිනුවර අප්‍රසිඛ වේශයෙන් ගෙයක් ගෙයක් පාසා පරීක්ෂාකොටත් තමන්ගේ නුගුණය ක් කියන කෙනෙක් නොඅසා මා කෙරේ හසින් උනුත් නොකියන්නෝමය යි සිතා මාගේ ආඥව වැටෙන පිටි සර ගම් නියම්ගම් බලන්ට යෙමි සිතා රාජ්‍යය අමාත්‍යයන්ට පාවා දී රථයකට පැනනැඟී නික්ම ඒ ගම්වල තමන්වනන්සේගේ යාපත්කම් විතා නපුරක් කියන කෙනෙකුන් නොඅසා දෙවෙනිව නුවරට එනසඳ සැවැත්නුවර මල්ලිකා නම් රජ්ජුරුවෝත් තමන්ගේ නුගුණ කියන්නෝ ඇද්දෝ හෝ යි පරීක්ෂාකරන්ට පිටත්ව ආ නැනැත්තෝත් සැවැත්නුවර රජ්ජුරුවන්ගේ රථවාරී කියන්නේ "අපගේ රජ්ජුරුවන්ගේ ගුණ කියමි"යි සිතා නුගුණම කියන්නේ "එම්බල රථා

චායෂීය, අපගේ රජ්ජුරුවෝ දුෂ්ටයාට දුෂ්ටයෙන්ම ජයගන්නාහ, සත්පුරුෂයාට සත්පුරුෂකමින්ම ජයගන්නාහ, බොරු කියන තැනැත්තහුට බොරුවෙන් ජයගන්නාහ, සැබෑව කියන්නවුන්ට සැබෑව කියා ජයගන්නාහ, ලෝභී තැනැත්තවුට ලෝභයෙන් ජයගන්නාහ, තැගි තැනැත්තවුට ත්‍යාගයෙන්ම ජයගන්නාහ, මේ අපගේ රජ්ජුරුවන්වහන්සේගේ ගුණය, එසේහෙයින් මග අරුව''යි කිහ.

ඒ බරණැස් නුවර රථාචාරියා අසා ''තොපගේ රජ්ජුරුවන්ගේ ගුණ කියම් කියා තොප කීවා ගුණවුව නුගුණයට ගියකල ගුණ කොයිදැ''යි කියා අපගේ රජ්ජුරුවන්ගේ ගුණ අසවයි කියන්නෝ ''කෝපී මනුෂ්‍යයන්ට කෝප නොකිරීමෙන් ජයගන්නා සේක, ලෝභී තැනැත්තවුට ත්‍යාගයෙන් ජයගන්නා සේක. බොරුකියන තැනැත්තවුට සැබෑ කීමෙන් ජයගන්නාසේකැයි කියා මේ අපගේ රජ්ජුරුවන්වහන්සේගේ ගුණය, රථාචාරිය මග අරුව''යි කිහ. එබස් අසා මල්ලිකා රජ්ජුරුවෝ බිමට බැස ගොන් මුදා රථය ඉවත් කොට රජ්ජුරුවන්වහන්සේගේ රථය පදුව සි කියා එවිට බරණැස් රජ්ජුරුවෝ සැවැත්නුවර රජ්ජුරුවන්ට කියන්නාහු ''තොපි මා සේ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරව''යි අවවාද කියා තමන්ගේ නුවරටම ගොස් දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට කම්වූ පරිදිදෙන් මිය පරලොව ගියාහ''යි වදුරා එසමයෙහි මල්ලිකා රජ්ජුරුවන්ගේ රථාචාර්‍යයා නම් දැන් මේ මෞද්ගල්‍යායන ස්ථවිරය, මල්ලිකා රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය, බරණැස් රජ්ජුරුවන්ගේ රථාචාර්‍යයා නම් ශාරිපුත්‍රස්ථවිරයෝය, බරණැස් රජ්ජුව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ සි වදුරා **රාජෝවාද ජාතකය** නිමවා වදළසේක.

---

## 148 සිඟාල ජාතකය

**මි**වද ඇසීඳුයන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩවසන සමයෙහි එනුවර එක්තරා කරතැමියෙක් රාජවල්ලභව රජ්ජුරුවන් බිසෝවරුන් ආදීන්ගේ ඉසකේවැඩීම් දැළිවැඩීම් අඳුන් තිබුම් ආදීවූ කාමාභිනන්දනයට රාජවල්ලභව ඉඳින්නේය, මෙතෙක් දැනොව උපාසකව තිසරණයෙහි පිහිටා පන්සිල් දවස්පතා රැක බුඩවල්ලභව ඉඳිනේය.

එසමයෙහි එක්දවසක් කරතැමියා තමාගේ පුතෙක් ඇරගෙණ රජගෙට මේවර කරන්ට ගියේය. ඒ වේලාවට ලිච්ඡවි කුමාරියක් එතනට ඇවිත් සිටියාය, ඒ කුමාරිකාවන්ගේ විශිෂ්ඨවූ රූ දැක කරතැමියාගේ පුතා පිළිබඳවූ සිත් ඇතිව ගෙට ගොසින් අඳ වැලඳගෙණ නොකා නොබී වැදහොත්තේය. එවේලෙහි කරතැමියා කියන්නේ ''නා කරතැමිව නොසන්දුරු කුලයෙහි උපන්නියාව නෝ නොදනීද? උභයකුල පරිශුඛවූ රාජවංශයෙහි උපන් රාජකන්‍යාවන් තොපට ලැබේද? එසේහෙයින් තොපි ඒ අසා සෝක නොකරව, ඔබ්බේ කරතැමි කුලයකින් යහපත් සත්‍රියක පාවා දියහැක්ක, සෝක නොකරව''යි කිහ.

එකි අවවාදත් නොඅසා දෙමව්පියන් නහුන් බුහුන් යාලුවිශ්වාසයන් ආදීවූවන්ගේ අවවාදයත් නොගිවිස සෝකයෙන්ම නොකා නොබී ශුෂ්කව වියලී නැසීගියේය, පියාත් ඌට කළමනා ආදහන කෘත්‍යය කොට පින් පෙත් දී

සෝකයෙන් බුදුන් දකින්ට නොගොස් සෝක සන්හිඳුනු පසු ගඳදුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන් දකින්ට ගොස් සම්බුදයන් වහන්සේ ''ඇයි උපාසකය මෙතෙක්දු නොආයේ ඇයිදැ''යි විචාරන්නා එවිට කරතැමියා කියන්නේ ''මාගේ පුතා මෙසේවූ සිතක් සිතා මළ හෙයින් නොආයෙමි'' දැක්වීය. එපවත් සම්බුදයන්වහන්සේ අසා ''පළමුත් මේ තෙමේ නීචව සිට උත්තම ජාතියට සිතිවිලි සිතා මළේ වේදැ?''යි වදුරා ආරාධිතවූ සම්බුදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

**පි**ටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජුරුජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ සිංහරාජව උපන්සේක. බොධිසත්ත්වයන්ට සහෝදර මල් සිංහයෝ සදෙනෙක් ඇත්තාහ. ඇමට බාල වූ තෙවූ සිංහධෙනුවක් ඇත්තිය. මේ කියන සිංහයෝ ඇම රන් පර්වතයෙහි රන් ගල්ගුහාවෙක වාසයකරන්නාහ. එතනට නුදුරුවූ රිදීපර්වතයේ දැවාන ගුහායෙක කැණහිලෙක් වසන්නේය. එවකට බොධිසත්ත්වයන්ගේ දෙමව් පියෝ දෙන්න නැසිගියහ. එවක්පවත් බොධිසත්ත්වයන් වහන්සේ ඇතුළුවූ සත්බෑයෝ නැගනියන් ගල්ගුහාවේ ඉඳුවාලා සත්බෑයෝ මාංස මරා තමුන් කා නැගනියන්ට දී මේ නියාමයෙන් දවසරිනාහ.

එකල රිදීපර්වතයේ වසන කැණහිල් සිතන්නේ ''දෙමව්පියොත් නැත, බෑයොත් ගොදුරු සොයා යන්නාහ, මම් මේ අවසරයේ ගොස් සිංහධෙනුව හා කැටුව සංවාසය යෙදුනේ වීනම් යහපතැ''යි සිතා රිදීපර්වතයෙන් බැස රන් පර්වතයට සිංහධෙනුව යන ගුහාව සමීපයට අවුත් සිංහධෙනුවට කියන්නේ ''තොපිත් සතරපයක්ව මමත් සතරපයක්ව ඇත්තෙමි, එසේහෙයින් තොප හා මා හා සමග වමින, තොපි මට ප්‍රජාපතිවවූ මම තොපට සවාමි වෙමි'' කියා රාගනිශ්‍රිත බස් කිය. එබස් සිංහධෙනුව අසා ''මේ තෙමේ සිව්පාවන්ට අධම ජාතියෙහි උපන, මම් සිව්පාවුන්ට උතුම් ජාතියෙහි උපතිම්, මූ හා මා හා කුමන විශ්වාසයෙක්දැ''යි සිතා නැවත සිතන්නාහු කැණහිල් අතින් රාගනිශ්‍රිත බස් ඇසූකල මා ඉදත් කිම්ද ශ්වාසය අල්වා ජීවිතය අරිමි සිතා සොරා අරනේ ඇයිදැ''යි සත්බෑයන් හා කල උන්ටත් කියා අරිමි සිතා උන්නීය.

ඒ වේලාවට සත්බෑයන්ගෙන් එක් සිංහයෙක් මස් මරාගෙණ සිංහ ධෙනුව ලඟට අවුත් ''නඟ මේ මස් කව''යි කීහ. සිංහධෙනුව තොසතුටුවිය. එවිට සිංහයා ''ඇයි දැ''යි විචාරා එපවත් අසා ''කැණහිලා කොයිදැ''යි කියා කීහ. ''අරවේද රිදීපර්වතය මුදුනේ ආසනයේ ඉඳිනේය''යි කිව. එබස් සිංහයා අසා මහත්වූ කෝපයෙන් දැවාන ගුහාවට පැන ලය තලාගෙණ පර්වත පාර්ශ්ව යෙහි වැටී මළේය. මෙම නියාමයෙන් සදෙනෙක් කැණහිලා ගණුම්හ යි පැනලා ලය තලාගෙණ මිය වැටී උන්නාහ. සත්වෙනිව ආ බොධිසත්ත්වයෝ එපවත් අසා කැණහිලුන්ගේ අකාශයෙහි ඉඳීමෙක් නැත, මේ පෙණෙන්නේ දැවානගුහාවය යි සිතා කැණහිලා ගොදුරු කන්ට බස්නා මග පරීක්ෂා කොට පොළොව පැලෙන කලක් මෙන් ආකාශ ගර්ජනාවක් මෙන් දැ යි සිංහනාදය කෙළේය. සිංහනාද ඇසූ කැණහිල් හයින් තැතිගෙණ ලය තලා පැළී මළේය. ඒ කාරණය දක්වන සම්බුදයන්වහන්සේ ''මහණෙනි

සිංහධෙනුව කැණහිල්ලෝ භය කොට සිංහනාදයෙන්ම මළෝය"යි වදාළසේක. "සිංහයාත් කැණහිලා මරා පෙරලා ගල්ගුහාවට අවුත් බැයන් මළ නියාවත් අසා සොකපත්වූ නැගනියන්ගේ සෝකත් අරවා දැහැමෙන් සෙමෙන් වාසය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ"යි වදාරා "එසමයෙහි කැණහිලා නම් මේ කරතැවැමියාගේ පුතාය, සිංහධෙනුව නම් ලිච්ඡවි කුමාරිකාය, මල් වූ සිංහයෝ සදෙන නම් මහතෙරුන් වහන්සේය, එසමයෙහි කෙසරසිංහව උපන් තෙම් ලොවුතුරා බුදුවූ මම්මය"යි වදාරා **සිගාල ජාතකය** නිමවා වදාළසේක.

---

## 149 සූකර ජාතකය

**එ**වද සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් දවසක් සවස ගඳකිළියෙහි දොර වැඩ සිට මහළුවරුන් වහන්සේට අවවාද කොට සමුදී වදාළ සේක.

සැරියුත් මහසාමීන් හා මුගලන් මහසාමීන් බුදුන් වැඳ තම තමන්වහන්සේගේ විහාරවලට වැඩිසේක. ඉන් මුගලන් සාමීන් වහන්සේගේ ගණයේ යම් තමක් සැතපී සැරියුත්සාමීන්ගේ ගණයට ගොස් ප්‍රශ්න විචාරමි සිතා සැරියුත් සාමීන් කරා අවුත් ප්‍රශ්න විචාළසේක. උන්වහන්සේත් බණපලඟට නැඟී විජිනි පත්‍රයක් ගත් අත් ඇතිව වැඩහුන් සේක් මුගලන්සාමීන් විචාළ ප්‍රශ්නය ආකාශයේ පුන්සඳමඬල ඔසවාපාන්නාක් මෙන් විසතර කොට වදාරණසේක, උන් වහන්සේගේ ප්‍රශ්න විචාරීම් හා උන්වහන්සේගේ ප්‍රශ්න කීම් ඇසීම් බොහෝ භික්ෂූ භික්ෂුණීන් උපාසක උපාසිකා යන සිව්වණක් පමිත් දෙදෙනාවහන්සේම වදාරණ බණ කථා අසා උන්නාහ.

ඒ වේලාවට මාලුතෙරුන්වහන්සේ සිතනසේක් "මෙසේවූ වේලේ මමත් කවට ආවාක් කියා ප්‍රශ්නයක් කොට විචාරා "උන්වහන්සේට කියාගත නුනුනු කල මෙතන සිට බොහෝ මනුෂ්‍යයෝත් මුන්වහන්සේ විනය නොදන්නා නුවණැති නමෙකැ"යි සිතා මට සත්කාර කරන්නාහ"යි සිතා සැරියුත් සාමීන්ලඟට ගොස් "ඇවැත්නි, ශාරීපුත්‍රස්ථවිරයෙනි, අපිත් ප්‍රශ්නයක් විචාරන්ට අවසර දෙ"යි කියනසේක්, "අවෙධිකායවා නිබෙබධිකායවා නිග්ගහෙත්වා විසෙසෙත්වා පටිසෙසෙත්වා ආහ"යි, කියා මේ කාරණය කීසේක.

එබස් සැරියුත්සාමි අසා මේ මාලුනිඝණ්ඨු තමන් කවට ආ දෙයක් කිවුය, මුන් සේ වූවන් ප්‍රශ්න විචාරන්නේ "අප ඉදිනේ ඇසිදැ"යි සිතා විජිනිපත්‍රය දණ්ඩාසනයෙහි තබා වැඩහිඳිනා ගණය ඇතුළට වැඩපුසේක. මුගලන් සාමීන් තමන්වහන්සේගේ වැඩහිඳිනා ගණයට වැඩපුසේක.

එවිට එතනට එක්වූ බොහෝ උපාසකවරුන් ඒ දෙදෙනා වහන්සේගේ මිහිරිබණ මුන්වහන්සේ නිසා බණඩවිය යි පොළමුගුරු ගෙණ ලුහුබඳවා ගත්හ. උන්වහන්සේත් භයින් දිවනසේක් පෝරු දිරාගිය පරණ නාන ගෙයක වැටී අසුචි වැකුණු ශරීර ඇතිව පිළිකුල් බවට පැමිණිසේක. එපවත් දැක උපාසක වරු මධ්‍යම රාත්‍රිකාලයෙහි බුදුන් කරා ගියාහ.

සම්බුදුරජාණන් වහන්සේ "උපාසකවරුනි තොපේලේ ආයේදැ"යි විචාරා එපුවත් අසා "පළමුත් උතුමයන් හා සරිවන හිසා අසුචි ගැවසුනු ශරීරඇතිවූයේ වේදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

පසුගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ සිංහව ඉපිද වනයේ වාසය කරන්නාහ.

එසමයෙහි උභරු සමූහයක් විලක් සමීපයෙහි ගොදුරු කා වසන්නාහ. එතනම තාපසවරුන් වහන්සේ වාසය කරණසේක. එසමයෙහි බොධිසත්ත්වයෝ සිංහව ඉපිද වනයේ වාසය කරණ සේක. එසමයෙහි සිංහයෝ ගොදුරු කා පැන් බොන හිසා උභරන් වසන විලට බව, ඒ විලාවට මහත් උභරෙකු ගොදුරු කා විල සමීපයෙන් යන්කාවූ දැක සුවසේ මූ කම් සිතා අද මූට නොපෙණී යන්ට මැනව මා අද දුටු නම් පසුව දවසෙක නො පැණෙන්නේය යි සිතා උභරාට නොපෙණී අනික් නොටකින් ගොඩනැඟී සිටී කල ඒ උභරා සිංහයා දැක තමාට භයින් යෙති සිතා කියන්නේ "යාලුව මමත් සතර පයක් ඇත් තෙක් වෙමි. තෝත් සතර පයක් ඇත්තෙහිය. එසේහෙයින් නොප මා දැක නොගොසින් මා කරා එව"යි වාසි කියා පරදවා බස් කිය.

එබස් සිංහයා අසා "අද මට බැරිය, අදට සත්වෙනිදා තොප හා මාහා යුඬයක් කරම්හ"යි කියා ගියේය. එවිව උභරා තමාගේ උභරු රැසට කියා උභරෝ එවිව කියන්නෝ තාගේ බල නොදැන සිංහයන් හා කැටුව යුඬ කෙරෙමි යි කියා තා සලසාගත් හෙයින් ඉදිරියේ මේ උභරන්ට විනාසය තා නිසාය" උභරෝ අසා භයින් තැතිගෙණ මේ ඇමදෙනම එක්ව මට උපායක් කියව යි කීහ. එවිව එසේ වීනම් මේ සත්දා මුළුල්ලේම තාපසවරුන්ගේ නාන ගෙවලට ගොසින් අසුචි ශරීරය මුළුල්ලේ තවරා වියලාගෙණ ඇමදෙන එක්ව උඩු සුලඟේ සිටිනා අසුචිගඤ්ඡය අසා සිංහයෝ පැරැද. පලායෙයි කියා උභරෝ එක්ව මේ උපාය කිවුය. උභරාත් එලෙසම කොට සත්වෙනි දවස් ඇවිත් උඩුසුලඟේ සිටියේය. සිංහයා එතනව අවුත් උභරු සිටිනා නියාව දැක "තා විසින් සිතූ උපාය යහපත, නැත්නම් තා මරා පියන්නෙම්වේද? මෙවිව තා අතින් අල්ලන්ට හා පයින් අල්ලන්ට හා කටින් අල්ලන්ට හා කැතවුව, එසේ හෙයින් ජය තොපටමය"යි කියා සිංහයා පලාගියේය. "උභරුත් තමාජයගත්තියාව තමාගේ රැලට කියා රිඳ සතුටුව "සිංහයන් අප කෙරේ කිපුනේය, අපට මෙතන ඉන්ට නපුරැ'යි කියා ඔබ්බට ගියාහ"යි වදාරා "එසමයෙහි උභරා නම් නිඝණ්ඨය, සිංහව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාරා මේ සූකර ජාතකය නිමවා වදාළසේක.

---

## 150 උරග ජාතකය

**තිවද** සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයෝ දෙන්නෙක් උනුනුන් කෙරෙහි වෛරව වාසය කරන්නාහ. එපවත් රජ්ජුරුවෝ දැන නොයෙක් අවවාද කියාත් උනුන් කෙරෙහි වෛර හරවාගත නුහුනුවාහ.

උන්ගේ බන්ධුහුත් අවවාද කියා අරවා ගතනුහුනුවාහ. එපවත් සම්බුදුයන් වහන්සේ අසා එක් දවසක් අලුයම් වේලෙහි මහාකරුණාසමාපත්තියට සමවැද බලා වදුරණ සේක් ඒ කියන අමාත්‍යයන් දෙන්නා සෝවාන් වන්ට හේතු ඇති නියාව වදුරා ඉන් එකකුගේ ගෙවී උදු සහක්සේ වැඩවදුරා ඔහු විසින් පාත්‍රයගෙණ සම්බුදුයන් වහන්සේ ඇතුළු ගෙට වඩා කෑද අවුළුපත් ආදීවූ දෙය වළඳවා අනතයෙහි ඔහට මෛත්‍රියෙහි අනුසස් වදුරා ඔහු සෝවාන් කොට දුවල් බත්වළඳන වේලාවට ඔහු ලවා පාත්‍රය ගෙන්වා ගෙණ අනිත් අමාත්‍යයාගේ ගෙට ගොස් ඔහු විසින් සම්බුදුයන් වහන්සේ වඩා ගෙට ගෙන්වා මධුරවූ ආහාරපානයන් සම්බුදුයන් වහන්සේට වැළඳ විය.

සම්බුදුයෝන් වළඳ අනතයෙහි ඔහටත් මෛත්‍රියෙහි අනුසස් වදුරා ඔහුත් සෝවාන් කරවාගත, කා විසිනුත් එක්කරවා ගත නුහුනුවා සම්බුදුයන්වහන්සේ එක්කරවා වෛර අරවා වදළසේක. එදවස් දම්සභා මණ්ඩපයට රැස්වූ මාළු වරුන් වහන්සේ'ඇවැත්නි උනුන් කෙරේ වෛරවූ අමාත්‍යයන් දෙන්නා කා විසිනුත් එක්කරවා ගත නුහුනුගය. සම්බුදුයන් වහන්සේ එක්කරවා වෛරඅරවා වදළසේක. ඉතා අපූර්ව්‍ය"යි වදළ සේක. එතනට සම්බුදුයන් වහන්සේ වැඩ වදුරා ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

**ඒ කෙසේද? යත්,**

යම්වනිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ තාපසව ගඩහාවක් සමීප යෙහි පන්සලක වාසය කරණ සේක.

එසමයෙහි බරණැස් නුවර මහත්වූ උත්සවයක් විය. ඒ උත්සවය බලන්ට දිව්‍ය නයකු හා ගරුඩයකුත් ඇවින් මනුෂ්‍ය වේශයෙන් කොළඹ බලා අනතයේ ගරුඩයා නයා දැක ලුහුබඳවා ගත, එවිට නයාත් නාගවේශය ගෙණ වහ වහා දුවන්නේය. ඒ වේලාවට තාපසයෝ කාෂාය වස්ත්‍රය ගොඩ තිබා නාන කඩක් ඇදගෙණ දිය නාන්ට බටහ. ඒ වේලාවට නයා එමින් සිට සිහන්නේ තාපසයන්ගේ වැහැරීමය වූ සිවුර යට වනින් නම් මා ගැලවිය හැක්කේය යි සිතා ඉන්ද්‍රනීල මාණික්‍යයක් ලෙසට රූපය මවාගෙණ වල්කලා සිවුරට වැද ගියේය. ඒ වේලාවට ගුරුළුත් පසුපස්සේ ආයේ තාපසයන්ගේ වල්කලා සිවුරු වන් නියාව දැක තාපසයන් කෙරේ ගත් ආදරයෙන් සිවුරු ඔසවා නයා ඩැහැ නොගෙණ තාපසයන් කරා ගොස් කියන්නේ, ''ස්වාමීනි, සුඛවෙන් පීඩනව නයා ලුහුබඳවා ගත ආ මම නුඹවහන්සේ කෙරෙහි ගත් ආදයෙන් සිවුරු ඇතුළට වැදගිය නයා නොඇල්වීමි, එසේ හෙයින් සිවුරු ඇරගෙණ නයා මට දුනමැනවැ''යි කිය. එපවත් බොධිසත්ත්වයෝ අසා 'ගුරුළු තා කළදු ඉතා යහපත, තොපට දෙවියෝ ආයුබෝ කෙරෙත්ව යි දෙවියන්ගේ හොජනය තොපට ලැබේව'යි යනාදී ආශීර්වාද කොට ගොඩට අවුත් නයා එක අතකින් ඇරගෙණ සිවුරු ඇදපෙරව ගෙණ නයා හා ගුරුළු ඇරගෙණ පන්සලට ගොස් දෙන්නාට බණ කියා ජාති වෛරී ගුරුළා හා නයා සමගිකරවා ඒ උපත් ආත්ම භාවයට ඔවුනොවුන් කෙරේ වෛර නොවන පණතට සලස්වා යවූහ''යි වදුරා 'එසමයෙහි ගුරුළා හා නයා නම් මේ අමාත්‍යයෝ දෙන්නාය, තාපසව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදුරා උරග ජාතකය නිමවා වදළ සේක.

## 151 ගඟග ජාතකය.

තිවද සවීඥයන් වහන්සේ ජෙතවනා රාමයෙහි වැඩවසන සමයෙහි පසේනදි කොසොල් රජ්ජුරුවන් විසින් කරවා පිළිගන්වනලද රාජකාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් සිවිවණක් පෂිත් මඩ්‍යයෙහි වැඩහිඳ බණ වදාරණ සවීඥයන් වහන්සේ කිඹිස වදාළසේක. එවේලෙහි බොහෝ භික්‍ෂූන් වහන්සේ "භාග්‍යවත් වූ බුදුරජානන් වහන්සේ බොහෝ කලක් ජීවත්වන සේක් ව"යි සුසැදරවූ බුදුරජානන් වහන්සේ බොහෝ කලක් ජීවත්වන සේක්ව'යියනාදීන් ආවැඩුහ. මේ නියායෙන් බොහෝදෙනා වහන්සේ ආ වැඩීමෙන් අරගල මහත්ව බණ එදවස් කඩවිය.

එපවත් අසා සවීඥයන් වහන්සේ "මහණෙනි, ආ වැඩීම් පමණකින් ආයුෂ බොහෝවේද? ආ නොවැඩුවෝ ආයුෂ මද වේද"යි වදාරා "ස්වාමීනි, එසේ වූ දෙයක් ඇද්ද"යි දන්වන්නා "මහණෙනි, එසේ වීනම් අදවක් පටන් අනුන්ට ආ වැඩුවාව පෙරලා ආ වැඩීමක්වත් කළෝ ද ආපත්ති වන්නේය"යි ශික්‍ෂාපද පණවා වදාළ සේක.

එතැන් පටන් මහළුවරුන් වහන්සේ කිඹිසිකල උපාසකවරුන් ආවඩන්නාහ. තමන් අතින් ආ වැඩුම් අසාගෙණ මහළුවරුන් වහන්සේ ආ නොවඩන හෙයින් "ශාක්‍යපුත්‍රවූ සවීඥයන් වහන්සේගේ ශ්‍රාවකයෝ අප ආ වැඩූ කල අපට ආ නොවඩන්නාහ"යි උජ්ඣා කළාහ. එපවත් සඞ්ඝයාවහන්සේ දැන සවීඥයන් වහන්සේට දන්නුසේක. සවීඥයෝ ආ වඩන්නා අභිප්‍රාය ඇත්තේ වේද යි වදාරා ශික්‍ෂාපද අරවා වදාළසේක. එවිට භික්‍ෂූන් වහන්සේ දන්වන සේක්, "ආ වැඩීමත් පෙරලා ආ වැඩීමත් කොතැන් පටන් සිට සවාමීනි, ඇතිවී දැ යි විචාරන්නා 'මහණෙනි පූර්වයෙහිදී ඇතිවී යැ'යි වදාරා ආරාධිතවූ සවීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්,**

පෙරගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක්තරා සෙට්ඨියකුට පුත්ව උපන්නාහ, ඒ වෙළඳ තමාගේ පුතා අත කදුවළලු ආදීවූ බඩු පොදියක් දී ඒ ඒ තෙන වෙළඳුම් කොටගෙණ එන්නේය.

එක් දවසෙක සවස් වේලෙහි බරණැස් නුවරට අවුත් තමන් රැ ලඟින තැනක් නැති හෙයින් ඒ නුවර මනුෂ්‍යයන් අතින් "ආගන්තුක මනුෂ්‍යයන් ලඟින්නේ කොතන ද"යි විචාළ කල්හි මනුෂ්‍යයෝ කියන්නෝ "නුවරින් පිටත ශාලාවෙක් ඇත, ඊ යක්‍ෂයෙක් වාසය කෙරෙයි ඊ ලඟිතොත් යව"යි කිවුය, එවිට සෙට්ඨියාගේ පුත්‍රයා කියන්නේ "පියානන්වහන්ස, ඔබම ලඟුම්හ, යක්‍ෂයා දමනේලන්ට මට භාරය"යි කීහ. "යහපතැ'යි ගිවිස දෙන්නම ගොස් ශාලාවේ ලැග්ගාහ.

එවේලෙහි බොධිසත්ත්වයෝ පියානන්වහන්සේ වැදහොත්තද පය මැඩ මැඩ උන්සේක. ඒ වේලාවව ඒ ශාලාවේ වසන යක්‍ෂයාත් දෙලොස්

අවුරුද්දක් වෙසමුනිරජ්ජුරුවන්ට පැන් ඇද ඔවුන් විසින් අසවල් ශාලාව වැදහොත්තවුන්ගෙන් ''කිඹිසි කල ආ වැඩුවන්, පෙරලා ආ වැඩුවන් හැර සෙස්සන් කව''යි වර ලැබ ඒ ඉඳ ආ නොවැඩුවන් කන්නේයයි එදවස් රැ දෙපුතු පියන් කන නිසාත් වස්කප උපන් යක්ෂයා සියුම් ධූලි සිහිත්තක් වැද හෝනා සෙට්ඨියාගේ නාසේ එලාලීය, එවිට වැදහොත් සෙට්ඨියා කිඹිසපියා, පය මැඩ මැඩ සෙට්ඨියා ආ නොවැඩීය. එවිට යක්ෂයා වස් කපින් බැස ඔහු කරා ගියේය. එවිට බොධිසත්ත්වයෝ ''එසේ නම් මේ යක්ෂයා කිඹිසපු කල ආ නොවැඩුවන් කන්ට එන යක්ෂයෙකැ''යි සිතා ආ වඛත බෝධිසත්ත්වයෝත් ''අවුරුදු විස්සක් ඉතිරි සියක් අවුරුද්දක් ඉඳිනා සේක්ව''යි ''මෙසේ ආ වැඩි මෙන් ප්‍රෙතයෝ මා ලඟට නොඑන්ව''යි කියා කිහ. මේ නියායෙන් පුතනුවන්ගේ ආ වැඩීම් අසා පියානන් කරා ගියේය. එවිට පියානෝත් ''ආ වැඩුවන්ට පෙරලා ආ නොවැඩුවන් කන්නාවූ යක්ෂයෙක් වනැ''යි සිතා ''පුත තෙපිත් අවුරුදු විස්සක් ඉතුරු සියක් අවුරුදු ආයු බොහෝ වේව යි, තොපට මා ආ වැඩීමෙන් ප්‍රේතයෝ මා කරා නොඑන්ව'යි කියා කිය. එවිට යක්ෂයා දෙන්නාම ආ වැඩු හෙයින් බැණ නොනැගී සිටියේය.

බොධිසත්ත්වයෝ කියන්නාහු ''යක්ෂය තෝ ආදීන් බොහෝ පව් කොට යක්ෂව උපන, දැනුත් ප්‍රාණඝාත කොට පෙරලාත් බොහෝ දුක් විඳින්නෙහිය. එසේ හෙයින් තෝ අදුරෙන් අදුරට ගියා සරිය''යි කියා ඔහට බොහෝ අවවාද කියා පන්සිල් දී යක්ෂයා දමනේ ලූහ. එපවත් බොහෝදෙනාට කිහ. එවිට රජ්ජුරුවෝත් එපවත් අසා සතුටුව මෙසේ වූ පුරුෂයෝ සියලු කටයුත්තෙහි සපන්නුයයි සිතා සෙනෙවිරත් ධුරයට තබා ගත්හ. බොධිසත්ත්වයන්ගේ පියානන්ටත් බොහෝ සම්මාන දුන්නාහ, යක්ෂයාටත් දෙවාලයක් සලස්වා බලි පිදේනි දෙන නියායෙන් පණතක් කොට බොධිසත්ත්වයන්ගේ අවවාදයෙන් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදුරා, ''එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ධම්මභණ්ඩාගාරික වූ ආනන්ද ස්ථවිරයෝය, බොධිසත්ත්වයන්ට පියව උපන් සෙට්ඨියානෝ නම් ධුතාඞ්ග ධරයන් කෙරෙහි අග්‍රතැන් පත්වූ මහාකාශ්‍යප ස්ථවිරයෝ ය, එසමයෙහි යක්ෂයා දමනය කළා වූ සෙට්ඨියානෝ නම් ලොව්තුරා බුදුවූ මම්මය''යි වදුරා **ගග්ග ජාතකය** නිමවා වදාළසේක.

---

## 152 අලීනචිත්ත ජාතකය

**මේ** වද සඳහන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වියැති අඩු කළ භික්ෂූකෙනෙකුන් නිසා මේ ජාතකය දක්වතලද. මෙහි වර්තමාන කථාව ඒකාදශ නිපාතයෙහි සීවලි ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි සඳහන්වහන්සේ ''මහණ දැන් තොපගේ වියැති අඩු පමණක් විනා ආදි තොපගේ වියැති බලයෙන් දෙලොස් යොදුන් බරණැස්නුවර වටලාගත් සේනාව බිඳුවා රාජ්‍යය ගෙණදුන්නේ වේදැ''යි වදුරා ඒ කෙසේදැයි ආරාධිතවූ සඳහන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි වඩුවෝ පන්සියයක් ඒ නුවර මණ්ඩපාදි දේසවලට ගොස් දඬුපත් කපා ගෙණවුත් කම්මාන්ත කරන්නාහ. එසමයෙහි වඩුවෝ සිතන්නාහු දඬුපත් කපාදැහන මෙතනට එන්නා බලාත් එතනම ඉඳ කම්මාන්ත කරම්හ යි සිතා උඩුගම් බලා ගොස් දඬුපත් සුලභව ලබන තෙන ගෙවල් කොටගෙන වසන්නාහ.

එසමයෙහි එක් මහා ඇතෙක් ගොදුරු සොයා ඒ ඒ තැන ඇවිදින්නේ දිරාගිය කිහිරි ගසෙක පය උල ඇනී මහත්වූ වේදනාවෙන් තුන් පයක් ඇත වඩුවන් උන් තෙනට අවුත් වැටී පියා වැදහොත්තේය. ඒ වේලාවට වඩුවෝ එතනට අවුත් ඇතු පය ඇනුනු උල දැක වටින් අවුළුවා උල ඇද බෙහෙත් කොට වණය සුව කළාහ. එවිට ඇතු තමාට කළ උපකාරය දැක "ප්‍රත්‍යුපකාර කරන්ට වුව මැනවැ"යි සිතා අතා එතැන් පටන් මෙහෙ කරන්ට පටන්ගත. මේ නියායෙන් දවස් පතා දඬු ඇදීම් දඬු පෙරලීම් ආදි මෙහෙවර කොට වඩුවන් විසින් දවස්පතා ලබන බත්පිඬ් පන්සියය කා දවස් ඇර තමා දුම්ල වන්නා සිතන්නේ මෙහෙ කොටගන්ට ශක්ති මදව, එසේ හෙයින් තමන්ගේ පුත් වන ආජානීය ඇත් පැටවා මෙහෙයට් ලා යෙම් සිතා ඇත් පැටවා වඩුවන් ලඟට ගෙනවුත් "පුත මා කළ මෙහෙ ලෙස වඩුවන් සිත්ගෙණ මෙහෙ කරව"යි කියා වඩුවන්ට පාවාදී ගියේය.

ඒ ඇත් පැටවාත් වඩුවන් සිත්ගෙණ මෙහෙ කොට වඩු කුඩා කොල්ලන් හා සමග දියකෙළි ආදීවූ කෙළිත් කෙළිනේය. ආජානීය ඇත් ගොඩ මිස දියෙහි මලමූත්‍ර නොකරන්නේය, එක් දවසක් වට වැස්සකින් ඉලත්තියෙක් දියේ වැටී ගස්බිලක අස්සේ වැටී ගියේය. බරණැස්නුවර ඇත්තලයෝ ඇතුන් නාවන්ට ගොස් ගඟට බැස ඇත් ඉලත්තිය ආඝ්‍රාණය කොට දියට නොබසිනාහ. එවිට ඇත්තලයෝ "කුමන කාරණයක්දෝ හෝ යි පරීක්ෂා කොට ඒ ඉලත්තිය කලන්දු කොට, ඇතුන්ගේ ඇඟ ඉස්සාහ. සුවඳ ඇති ඉලත්තිය ඇඟ වැදගත්තා හා සමාන කොට සිතා සතුටුව දියට බැස දිය කෙළියාහ.

ඇත්තලයෝ වඩු ගම ආජානීය හස්තියා ඇති තියාව දැන රජ්ජුරුවන්ට එපවත් කියා "මගුලැත්තකමට නිසි ඒ ඇතා ගෙන්වා ගතහොත් යහපතැ"යි දැන්වූහ රජ්ජුරුවෝ එපවත් අසා සතුටුව ඔරු පාරු පණත් කොට වඩුවන් ඉන්නා උඩුගං බලා ගියාහ.

ඒ වේලාවට ඇත් පැටවාත් දිය කෙළිමින් සිටි පඤ්චාංගික තූර්‍යනාද අසා ගොඩ අවුත් වඩුවන් ලඟ සිටියේය. ඒ වේලාවට රජ්ජුරුවන්ට වඩුවෝ පෙරගමන් කොට රජ්ජුරුවන්වහන්සේ දැක වැඳ බලා "ගැත්තවුන්ගෙන් දඬු පතින් ප්‍රයෝජන ඇත්නම් මිනිස් කෙනෙකුන් අත කියා එවන්නමෝ වේදැ යි වැඩියේ ඇයිදැ"යි විචාළාහ. එවිට රජ්ජුරුවෝ 'තොප ඇමගෙන් දඬුපත් ඉල්වා නො ආම්හ මේ ඇත් පෙව්වා ඉල්වා ආම්හ"යි කීහ. එවිට වඩුවෝ කියන්නෝ "යහපත ඇර ගෙණ වඩිනා බව යහපතැ"යි කීහ. රජ්ජුරුවෝ ඒ ඇතා ගෙණයන්ට

යොමු කළහ. ඒ ඇත් යන්ව මැලි විය. එවිට රජ්ජුරුවන් විසින් "මේ කුමන නිසා දැ"යි විචාරන්නා, එවිට වඩුවෝ කියන්නෝ "තමා රුකි මිල දී යන අනිප්‍රාය ඇතිව ය"යි කියන්නා රජ්ජුරුවෝ ඇතු මිල කොට සොඩ ලක්ෂයක් අගනා කොට සතර පය සාරලක්ෂයක් වටිනා කොට වල්ගය ලක්ෂ යක් වටිනා කොටත් මේ නියායෙන් ඇතුට සලක්ෂයක් මිල කොට වඩුවන්ට එපමණ මිල දී ඇතා ගෙණයන්ට උත්සාහ කළත් ඇතා යන්ට මැලි විය. එවිට රජ්ජුරුවන් විසින් "මැලිවන්ට කාරණා කිම් දැ"යි විචාරන්නා වඩුවන් පන්සියයට පිළී දෙන නියා ය"යි කියන්නාහ. එවිට රජ්ජුරුවෝ වඩුවන්ට පිළී දී එසේත් මැලිවන හෙයින් වඩුවන් පන්සියයගේ බිරින්දන් පන්සියය වත් පිළී දීත් එසේත් පමා වන හෙයින් වඩුවන්ගේ දරුවන් ආදීන්වත් වැලවලළු ආදී කම්මාන්ත දී ඉක්බිති කිසි කෙනෙකු හන් නොකොට ඉන්දදී ම තෙමේම නික්මින.

එවිට බරණැස් රජ්ජුරුවෝ ඇතා ඇරගෙණ නුවර ඇත්තල දිව්‍ය පුරයක් මෙන් සරහා ඇතා නුවරට ගෙණවුත් තමන්ට මඟුල් යහන කොට සලස්වා තමන්ව ඇති යම්ම පෙරහරක් ඇත්රජ්ජුරුවන්වත් සලස්වාලා විශ්වාසව දවසරිනා සමයෙහි ඇත්රජ්ජුරුවන්ගේ ආනුභාවයෙන් ඒ රජ්ජු රුවෝ සිත් ගෙණ වාසය කරන්නාහ. එසමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකා බිසවුන් කුස පිළිසිඳ දසළුකඩ මසක් පුරා වදන අවසථාවට එක්තරා ව්‍යාධියකින් බරණැස් රජ්ජුරුවෝ හැසී හියහ. එවිට අමාත්‍යයෝ රජ්ජුරුවන් මළ පවත් ඇත්රජ්ජුරුවන්ට කීවොත් ඇත්රජ්ජුරුවෝ නැසි යෙති සිතා නොකීවාහ. ඒ අවසථාවට කෝසලරජ්ජුරුවෝ "කාත් නැති රාජ්‍යය හෙයින් මා සන්තකය" කියා ඇවිත් නුවර වටකොට ගෙණ "රාජ්‍යය හෝ දෙව යුඩ හෝ කරව"යි කියා පත් යවිවාහ.

එබස් ඇසූ බරණැස්නුවර අමාත්‍යයෝ කියා යවන්නාහු "ශාමුද්‍රික දන්තා බමුණෝ බිසවුන්වහන්සේගේ ඔඩ පිරිමි කුමාරකෙනෙක් සත් දවස කින් බිහි වෙති කිහ, එබස් නියම දත් කල රාජ්‍යය දෙතත් යුඩ කරතත් එවිට ය"යි කියා කැඩපත් යවූහ. එබස් ඇසූ කොසොල් රජ්ජුරුවෝ "යහපතැ"යි කියා ගිවිස්සාහ. මේ නියායෙන් සත් දා ගිය පසු බොධිසත්ත්වයෝ උපන්නාහ. උපන් පසු සේනාව තල්ලු පසු යුඩ කරවන්ට වැද පිටපල නැති හෙයින් සේනාව බිදී බිදී අනිලන්නාහ. එපවත් අමාත්‍යයෝ බිසවුන්ට පලා ගොස් කියන්නාහු පිට බල නැති හෙයින් යුඩ කළ නොහැක්ක එසේහෙයින් "රජ්ජුරුවන්වහන්සේ මළ නියාවත් රාජකුමාරයන්වහන්සේ උපන් නියා ඇත්රජ්ජුරුවන්ට කියා ඇත්රජ්ජුරුවන් පිටිවහල් කොටගෙණ යුඩ කරම් හ"යි කිහ. එබස් බිසව් අසා "යහපතැ'යි බොධිසත්ත්වයන් දුහුලක වැද හොවාගෙණ ඇතා කරා ගොස් කියන්නාහු "නුඹවහන්සේගේ යාලු වූ රජ්ජු රුවන්වහන්සේ නැසුනු නියාව නුඹවහන්සේ සෝකයෙන් පැලෙති යි සිතා නොකීම්හ. ඒ අවසරයෙන් කෝසල රජ්ජුරුවෝ අවුත් නුවර වටකොට ගත්තාහ. එසේ හෙයින් නුඹවහන්සේගේ යාලු රජ්ජුරුවන්ගේ පුතනුවන් මරතත් නුඹවහන්සේ ම මැරුව මැනව, නැවත රාජ්‍යය ගෙණ දෙතත් දුන මැනවැ"යි කියා ඇතා පාමුල රාජකුමාරයන් ඉඳවූහ.

එවිට ඇත්රාජයන් කුමාරයන් වඩා ඉස නිබාගෙණ අඩා මැනියන් වහන්සේට පාවාදී සේවාකමට නික්මුනේය. එවිට ආමාත්‍යයෝ ඇත්රජ්ජු රුවන් සන්නාහයෙන් සන්නාඩ කරවා සරහා සතර වාසල් දෙර අලහ. එවිට ඇත් සේනාව සමාධියෙන් නුවරින් පිටත්ව කුඤ්චනාද කොට ඒ ඒ සත්ත්ව යන් නොයෙක් තැන ලුහුබඳවා පළමුව රජ්ජුරුවන්ගේ බලකොටුව බිඳ රජ්ජු රුවන් ජීවග්‍රහයෙන් ඉසකේ පත්ගසා අල්වාගෙණ අවුත් රාජකුමාරයන් දක්වා බොහෝ දෙන ම මරන්ට කී ගමනේ මැරිය නොදී ඉනිබ්බේ මෙසේ වූ දෙයක් නොකරව"යි අවවාද කියා උන්ගේ රටට යවූහ.

බොධිසත්ත්වයන්වත් සියල්ලන්ගේ සිත් සනෙහාෂ කරවා උන් විසින් අලීනචිත්තය යි නම් තුබූ කල්හි සත් ඇවිරිදි අවසථාවේ අභිෂෙක කොට එක්සියයක් රාජධානිවල රජදරුවන්ට නායකව දැහැමෙන් රාජ්‍යය කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදාරා "මහණෙනි ඒ ඇතුන්ගේ වීර්‍යබලයෙන් බිලිඳු කුමාරයන්ව පවා රාජ්‍යය දුන්නු ය. එසේ හෙයින් මහණෙනි වීර්‍ය ම කළමනා ය"යි වදාළ සේක.

මේ දෙශනාවගේ අවසානයෙහිදී වීර්‍ය අඩු වූ භික්ෂූන්වහන්සේ සියලු කෙලෙසුන් නසා අර්හද් භාවයට පැමිණි සේක. "එසමයෙහි ඒ රාජකුමාර යන්ගේ මැනියෝ නම් මහාමායා දේවීන්වහන්සේය, පියරජ්ජුරුවෝ නම් සුඩොදන රජ්ජුරුවෝය. ඒ අජානීය හස්තියා නම් මේ වීර්‍ය අඩු වූ භික්ෂු හු ය, ඒ ඇතුට පිය වූ මහ ඇත් නම් සාරිපුත්‍රස්ථවිරය, අලීනචිත්ත කුමාරව උපන්නෙම් දැන් බුදු වූ මම්ම ය"යි වදාරා **අලීනචිත්ත ජාතකය** නිමවා වදාළ සේක.

## 153 ගුණ ජාතකය

**මේ** වදාළ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාම යෙහි වැඩවසන සමයෙහි ආනන්ද සාමීන් විසින් එක් දවසක් ලබන පිළිසඟළ දානයක් නිසා මේ ජාතකය දක්වන ලදී.

**හේ කෙසේද? යත්,**

ආනන්ද සාමීන් කෝසල රජ්ජුරුවන්ගේ අන්තඃපුර සත්‍රින්ට බණ කියන සමයෙහි එක් දවසක් කෝසල රජ්ජුරුවන්ට දුස් දුස් මිල වටිනා පිළිසඟළ දුසක් පාක්කුඩම් පිණිස පැහැ. ඉන් රජ්ජුරුවෝ පිළී පන්සියක් අනඳ සාමීන්ගෙන් බණ අසන බිසෝවරුන්ට දුන්හ, ඒ බිසෝවරු පන්සියය නොඇඳ නිබාගෙණ ඉඳ සාමීන් බණ කියන්ට ආවේලේ පන්සියක් දෙනම තම තමන් ලත් පිළී පන්සියය ම පිළිගැන්වූහ.

අනඳ සාමීන් ඒ පිළිගෙණ ගණයට වැඩසේක. පසුව දවස් මේ නිම වන වේලාවට බිසෝවරු පන්සියයක් දෙන ම පරණ පිළී ඇඳගෙණ රජ්ජුරු වන් කරා එන්නාහ. එවිට රජ්ජුරුවෝ "ඊයේ මා දුන් පිළී කොයිදැ?"යි විචාරන්නාහ. "සවාමීනි ඒ පිළීසඟළ පන්සියය ම අනඳ සාමීන්ට පිළිගැන් වූහ"යි කියන්නාහ. එවිට රජ්ජුරුවෝ "අනඳ සාමීන් ම පිළිගත් සේක් ද"යි

විචාරා බිසෝවරුන් විසින් ''එසේය පිළිගත් සේකැ''යි කියන්නා ''සම්බුදුයන් වහන්සේ වදාළේ තුන්සිවුරක් වුව මෙතෙක් පිළිගත්තේ පිළී වෙළඳුම් කරණ සේක් දැ''යි සිතා රජ්ජුරුවෝ කිපී අනඳ සාමීන්ගේ ගණයට ගොස් ''සාමිනි, අනතඃපුර වාසීන්ට බණ කියා වදාරන්නේ ඇයිද්දැ''යි විචාරන්නා, ''එසේය මහරජ කියම්හ''යි වදාරන්නා ''කියන පමණක්ද? උයිත් බණඅසා උගණිද්දැ''යි විචාරන්නා ''එසේය මහරජ, අසති පිළිවන් පිළිවන් දෙයක් වණපොත් කෙරෙති' කියන්නා ''නුඹවහන්සේ අතින් අසන පමණක් විනා යම් සත් කාරත් කෙරෙද්දැ''යි විචාරන්නා, ''එසේය මහරජ ඊයේ බණ අසා පිළිසඟළ පන්සියයක් දුන්නුහ''යි වදාරන්නා ඇසී ''සම්බුදුයන්වහන්සේ තුන්සිවුරක් අනුදත් සේක. මෙතෙක් පිළී පිළිගත්තේ ඇයි දැ?''යි විචාරන්නා ''මහරජ සම්බුදුයන්වහන්සේ විසින් ප්‍රයෝජන විඳීමට තුන්සිවුරක් මිසක් පිළිගැන්වීමට මෙතොක් අෂ නැතැ''යි සම්බුදුයන්වහන්සේ වදාළසේක. එසේ හෙයින් මා ලත් පිළී දුම්ල සිවුරු ඇති තෙනට දෙමි'' කියන්නා ''පළමු සඟළසිවුරු කරන්නේ කිම්ද?''යි කියන්නා, ''ඒ සිවුරු පොරෝණ සිවුරට අරගන්නා සේකැ''යි වදාළසේක.

එවිට රජ්ජුරුවෝ කියන්නේ ''පොරෝණ සිවුරු කුමක් කෙරේද්දැ?''යි විචාරන්නා ''මාළුනැනක් කපා හැර අඳනා සිවුරට අරගන්නා සේකැ''යි වදාළ සේක. ''පළමු අඳනා කුමක් කෙරේදැ?''යි විචාරන්නා ''ඒ සිවුරු සැතපෙන ඇඳ අතුරණ ලෙස ඇරගන්නා සේකැ''යි වදාරන්නා පළමු ඇඳ ඇතිරිලි කුමක් කරණ සේක්දැ?''යි විචාරන්නා ''යහපත් ඔප්ලු බුමුතුරුණු කොට අතුරණ සේකැ''යි වදාළසේක. ''පළමු බුමුතුරුණු කුමක් කරණ සේක්දැ?''යි විචාරන්නා ''බිස්ස කොට අකුලා පය පිසින්ට ගන්නා සේකැ''යි කීසේක. ''පළමු තිබූ බිසි කුමක් කරණ සේක් දැ?''යි රජ්ජුරුවෝ විචාළාහ. මහරජ සැදැ ඇත්තන් දුන් දෙය ම අපවත් නොකරණ හෙයින් සියුම් මුවහත් ඇති කරයෙන් රල සීන් කොට කපා මැටි හා හිත්තියෙහි අතා ගානා සේකැ''යි ''එසේවූ අවස්ථාවේ සැදැහැ ඇත්තන් දුන් දෙය මහරජ අපවත් නොකරණ සේකැ''යි වදාළසේක. එබස් ඇසූ රජ්ජුරුවෝ සතුටුව තමන් ලඟ තිබූ පිළී සඟළ පන්සියයත් අනඳ සාමීන්ට දී ගියාහ. අනඳසාම් පළමුත් පන්සියයක් පිළිසඟළ දුම්ල සිවුරු ඇති තැනට දී, රජ්ජුරුවන්ගෙන් ලත් පන්සියයක් සඟළට සිතනසේක් ''මාගේ භික්ෂු පන්සියයක් ඇත, ඉන් ඇමටම බාල භික්ෂු කෙනෙකුන් මට අත පය මැඬීම් මලු ඇමදීම් ආදීවූ නා නා හෙවල් ගොමගැම් ''අදීවූ වත් පිළිවෙත් සුවව කිකරුව කෙරෙත්, එසේ නෙයින් මුත්ට සංග්‍රහ කළමනාවේද්දැ''යි සිතා අනඳසාම් ඒ තම කෙරේ පැහැද පිළී පන්සියයක් දුන්සේක.

ඒ බාල භික්ෂූන්වහන්සේ තමන්වහන්සේ ලත් පිළී අනඳසාමීන්ගේ ගනේ පන්සියයක් භික්ෂූන් වහන්සේට පිළිගැන්වූසේක. ඒ පන්සියයක් දෙනා වහන්සේත් සිවුරු කොට කිනිහිරි මලෙහි පැහැය හා සමාන කොට පැය ලා ඒ අළුත් සිවුරු පොරවාගෙණ සම්බුදුයන් වහන්සේ දකින්නට වැඩිය සේක. ''සාමිනි සෞවාන්වූ ආර්‍යශ්‍රාවකයන් වහන්සේගේත් මුණ බැලීම් ඇද්දැ''යි විචාළසේක, එවිට සම්බුදුයන්වහන්සේ ''භික්ෂුණී ආර්‍යශ්‍රාවකයන්වහන්සේගේ එසේවූ දෙයක් නැතැ''යි වදාරන්නා ''එසේ කල අපගේ උපාධ්‍යයන්වහන්සේ

විසින් බාල භික්ෂුනමකට පිළි පන්සියයක් දෙනලද්දේ නොවේදැ"යි දන්නා "භික්ෂූණි, ආතෙදයින් විසින් මූණබලා දුන් දෙයක් නොවෙයි, තමන්ට බොහෝ උපකාරීව සිටි භික්ෂූන් හෙයින් ප්‍රත්‍යුපකාරී නිසා දුන්නුය. උන් තබා පළමු උත්තමයෝත් උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කළෝවේදැ"යි යතහොත්, ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්**

රජටහිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ සිංහව ඉපිද පර්වතයක වාසය කරණසේක. ඒ කියන පර්වතයට නුදුරු තෙන විලක් සමීපයෙහි මඩව ඉවුරු බිඳී ඒ පිට මොළොක් තණ ඇතිව තිබෙන පලෙක් ඇත, ඊට ලඟු සැහැල්ලු සාවුන් මුවන් යා හැක. මහත් සත්ත්වයා යා නොහැක්කේය එක් දවසක් එක් මුවෙක් ඒ පල සමීපයේ තණ කමින් සිටියේය.

බොධිසත්ත්වයෝත් ගොදුරු නිසා පර්වතය මුදුනට නැඟී ගියේ ඒ දෙස බලා පලෙයි තණ කන මුවා දැක, මුවාට පනිමි සිතා සිංහනාද කොට පැන්නේය, මුවාත් සිංහනාද අසා භයපත්ව වහා ගැලවී පලාගියේය. සිංහයාත් පැමිණි වේග රදවාගත නොහී පලට පැන තණ කැඩී පා සතර මඩෙහි ගැලී වැම් සතරක් සේ නිශ්චලව ඇනී ගියේය. මඩින් ගැලවීගත නොහී, සිංහයාත් සත් දවසකින් නිරාහාරව සිටියේය. එකල්හි කැනහිලෙක් එන්නට අවුත් සිංහයා දැක හයින් දුවන්ට වන.

එවිට සිංහයා කියන්නේ "පා සතර මඩෙහි එරීපියා සිටියෙමි, මා කෙරේ තෝ නොබා මා කරා අවුත් මාගේ ජීවිතය ගලවාදෙව"යි කීහ. එවිට කැනහිල් නොබා අවුත් "සිංහ රජ්ජුරුවෙනි, නුඹවහන්සේ මා දන්නා උපායකින් ගලවමි, 'හලවාපු වේලේ පෙරලාම මා මරති'යි භය ඇත්තෙමි, ජීවිත දානය දුන්නොත් යහපතැ"යි කීය.

එබස් අසා සිංහයා "කැනහිල තෝ භය නොගෙණ මට උපකාරව සිටි තොපට විනාශයක් නොකෙරෙයි, තොපගේ ජීවිතය ඇතිතෙක්මානයේ රකිමි. දන්නා යම් උපායකින් ගලව"යි කීහ.

එබස් අසා කැනහිල් සිංහයාගේ පය කෙරෙන් පසුරුගාමින් ඇලක් කැන්නේ විල දක්වා කැන ඒ කැන්නාවූ ඇලින් පැන් ගෙණවුත් සතර පයට ඇරීය, විශලී තුබූ මඩ සිහිල් විය. එවිට කැනහිල් සිංහයාගේ බඩ කෙළවරව ගොස් තමාගේ ඉසින් සිංහයාගේ යටිබඩ ඔසවා "සවාමීනි වීර්‍ය්‍ය කළමැනව"යි කියා සිංහයා එවිට ආරාලා පිනුයේය, ගොඩ පැන සිට යන් තම් වේලාවක් සැතපී එතන ලඟ සෙමින් සිටි මියකු මරා පළමුකොට කැන හිලාව මස්ලා පසුව තුමූ මස්කැහ.

කැනහිල් තමාට වූ මස් කොටස්xයෙන් සමහරක් කා සමහරක් ඩැහැණයන්ට වන, මේ මස් ගෙණයන්නේ කාටදැ"යි විචාරන්නාහු "නුඹ වහන්සේගේ බැලිමිණිසවය"යි කියන්නා එවිව සිංහයා "යහපත" ඇ සම්පයට ගොස් ඇව මස්දී එකියන කැනහිල්දෙන හා කැනහිලා ඇතුළුව ඇරගෙණ

ගුහාව සමීපයෙහි ගුහාවක වාසය කරවා දවස්පතා සිංහරජ්ජුරුවන් හා කැනහිල් ගොදුරට යන්නාහුය. සිංහධෙනුව හා කැනහිල් දෙනුව ගුහාවේ හිඳිනීය. සිංහ රජ්ජුරුවෝ මස් ඔරා කැනහිලාට දී සිංහධෙනුවට හා කැනහිල් ධෙනුවට මස්කැටි දෙකක් ඩැහැණවුත් දෙන්නාහ, මේ නියායෙන් දවස් අරණ සමයෙහි සිංහධෙනුව පුතුන් දෙන්නකු වැදූහ. මේ නියායෙන් සිංහ පැටවුන් කැනහිල් පැටවුන් එක්ව දවස් හරණාහ. සිංහයාත් කැනහිලාගේ දරුවන්ට ස්නෙහ ඇත්තේය. එවිට සිංහධෙනුව සිතන්නී සිංහයා කැනහිල් ධෙනුවගේ දරුවන්ට ස්නෙහ ඇත්තේය. කැනහිල්ධෙනුව හා කැටිව සංවාසය ඇත්තේය යි සිතා සිංහ කැනහිල් ගොදුරට ගිය තැන සිංහධෙනුව කැනහිල් ධෙනුවට භයගන්වන්නී "මෙතන ඉඳිනේ ඇයි ද? පලායයි" කියන්නීය, සිංහපැටවුන් කැනහිල් පැටවුන්ට භයගන්වන්නාහ.

මේ නියායෙන් ඉඳිනා කල්හි කැනහිල්ධෙනුව කැනහිලාට කියන්නී "සිංහ ධෙනුන්වහන්සේ මෙසේ භයගන්වනසේකැ යි සිංහ රජ්ජුරුවන්වහන්සේගේ සම්මත බවත් නොදැනෙයි එසේ නෙයින් අපි මෙතන ඉන්ට නොපිළිවතැ"යි කීහ. එපවත් කැනහිල් අසා සිංහ රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ "සවාමීනි නැතැන් දවස් එකතැන වාසය කරන්නේය, එසේ හෙයින් අප්‍රිය වන්නේය, නුඹවහන්සේගේ සිංහධෙනුන්වහන්සේ අපගේ අඹුදරුවන් භය ගන්වන සේක. අපසේවූ දුර්ලභයන්ට පලායන්ට කියන්නා පලායන පමණක් විනා භයගන්වන්ට වුවමනා ද? එසේම පෝසතුන් ලභ දුප්පතුන් උන් කල පහකිරීම කාරණා නොවන්නේය. එසේ හෙයින් අපට අවකාශ දුන මැනව ඔබ්බකට ගොහින් වාසය කරම්හ"යි කැනහිල් කීහ.

එබස් සිංහයා අසා තමාගේ සිංහධෙනුවට කියන්නේ "එම්බල සිංහ ධෙනුව මේ කැනහිලා මා විශ්වාස වූ කාරණය දනීද්ද"යි විචාරා විශ්වාස වූ කාරණය නොදනිමි"යි කී විසින් එසේ නම් එක් සමයෙක ගොදුරු සොයා ගොස් සත් දවසක් මා මෙතන නොඇා කාරණා දනීද්ද"යි "විචාරා නොදනිමි"යි කී විසින් "එම්බල මම මුවෙකු පැන මුවා වැරදගොස් මඩ කලලෙක සත් දවසක් නිරාහාරව උන් ගමනේ මූ නිසා ප්‍රාණය ලද්දේය. එසේ හෙයින් මාගේ ඉෂ්ටමිත්‍ර යාළුවා බන්ධුවූය යි කියාත් ඇත. ඉෂ්ට මිත්‍රයායි කියාත් ඇත. එසේවූ කැනහිලාට තොප විසින් වෛරවීම කාරණා නොවෙයි, අදවක් පටන් මට යම්ම සැවියෙක සිතනවා නම් ඒ සැවිම මේ කැනහිලාට සිතව"යි කියා එතැන් පටන් සිංහධෙනුවත් කැනහිල්ධෙනුවත් විශ්වාසව දවස් අරණාහ, සිංහපැටවුන් කැනහිල් පැටවුන් විශ්වාසව එක්ව කෙළනාහ, මේ නියායෙන් දවස් අරණකල්හි සිංහ පවවුන්ගේ දෙමව්පියනුත් කැනහිල් පැටවුන්ගේ දෙමව්පියනුත් මළ පසුත් උනුනුන් කෙරෙහි විශ්වාසව දවස් කළහ. මේ නියායෙන් සත්පරම්පරාවෙක දවස් කළහ යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට වදාළ සේක.

චතුසත්‍යය ධර්මදේශනාවගේ අවසානයෙහි එමතෙක්දෙනාවහන්සේ සෝවාන්වූ සේක. එමතෙක්දෙනාවහන්සේ ශකෘදාගාමි වූ සේක, එමතෙක් දෙනා වහන්සේ අනාගාම්වූසේක, එමතෙක්දෙනාවහන්සේ සියලු කෙලෙසුන්

නසා රහත්වූ සේක, එසේ හෙයින් මේ ධර්මය බොහෝදෙනාට වැඩ පිණිස වදුරා මේ ගුණ ජාතකය තීමවා වදාළසේක. "එසමයෙහි කැනහිලා නම් ආනන්දස්ථවිරයෝය, සිංහව උපන්නේ නම් ලොවුතුරා බුදු වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 154
## සුහනු ජාතකය.

මේ වද සවීඥයන්වහන්සේ ජේත වනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝපි භික්ෂු දෙදෙනෙකුන්වහන්සේ නිසා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්**

සැවැත්නුවර වාසය කරණ භික්ෂුකෙනෙකුන් වහන්සේ කෝපව වණ්ඩ පරුෂව වසය කරණසේක. පිටිසර එසේම එක් නමෙක් වණ්ඩපරුෂව වාසය කෙරෙති, මෙකියන දෙනම වණ්ඩපරුෂ නියාව ප්‍රකාශව තිබෙයි, එසමයෙහි පිටිසර නම සැවැත්නුවරට වැනිසේක. සාමණේර දහර භික්ෂූන් වහන්සේ සිතන සේක් "තොපි දෙනම එක තැනට සැලසුනු කල කුමක් කරත්දෝහෝයි" සිතා "ඇවැත්නි නුවර කෝපි නම වසන ගෙයි පිටිසර කෝපි නම ලූ සේක. කෝපි දෙනම ඔවුනොවුන්වහන්සේ දැක ආචාර සමාචාර කොට උන්වහන්සේගේ අත් පා මැඩ මේ නියායෙන් විශ්වාසව උන් සේකැ"යි මේ කාරණය ධර්මසභාමණ්ඩපයෙහි රැස්වවුන් මාලුවරුන්වහන්සේ කියා කියා වැඩඋන්සේක.

එතනට සවීඥයන්වහන්සේ වැඩවදුරා "මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදුරා එපවත් අසා "මහණෙනි දැන් මතු නොවෙයි යටගිය දවසත් මේ භික්ෂූහු දෙදෙනම ඔවුනොවුන්වහන්සේ දැකපු වේලෙහි සමගිවූවෝවේදැ"යි ආරාධිත සවීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයන්වහන්සේ ඒ රජ්ජුරුවන්වහන්සේට කළමනා සියළු කටයුත්තෙහි තමන් යුක්තව රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයට වදිනා අය වියදම් ආදීවූ දෙයත් අසුන් වීකිණීමෙන් දසෙව මැදහත්ව වෙළඳුම් කරණ අමාත්‍යව උපන්සේක.

ඒ අවදියට අසුන් ගෙණ වෙළඳුම් කරණ ලෙස අසුන් පන්සියයක් ඒ නුවරට ගෙණාවාහුය. බරණැස් රජ්ජුරුවෝ ලොභීව එසේ හෙයින් බෝධිසත්ව යන් දැහැමින් සෙමින් කරණවෙළඳුම්වලව මැලිව අනිත් අමාත්‍යයකුට අසුන් වෙළඳුම් කරණ ලෙස සලස්වා ඒ අමාත්‍යයාට කියන්නාහු "අපගේ සොන නම්වූ වණ්ඩවූ අසෙක් ඇත, ඒ අසු වෙළඳුමට ගෙණා අසුන් මධ්‍යයේ ලා පියව, ඒ අසුන් මේ අශ්වයා කඩා කා වණය කොට පියයි, වණය කොටපූ කල මිල අඩුවෙයි, මිල අඩුවූ කල සම්පත් දී අරගනැ'යි කියා මේවර කීහ.

අමාත්‍යයෝත් එලෙස කළෝය, ඒ අයුක්ති විදහත් අස් වෙළෙඳ බොධි සත්ත්වයන් වහන්සේ කරා ගොස් එපවත් කීහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "ඇයි තොප ඇම ලඟ වණ්ඩ පරුෂ අශ්වයෙක් නැද්ද"යි විචාළාහ එබස් ඇසූ අස්වෙළෙඳෝ කියන්නෝ 'අප ලඟත් සුභ නම් වණ්ඩ පරුෂ අශ්වයෙක් ඇතැ"යි කීහ. එපවත් බොධිසත්ත්වයෝ අසා "එසේ වී නම් දෙවෙනිව එන කල ඒ අශ්වයාත් ඇරගෙණ එව"යි කීහ. එපවත් අස් වෙළෙන්දෝ යහපතැ"යි ගිවිස පසුව වලියේ එන්නාවූ ඒ අසුත් අරගෙණ ආවාහුය. එවිට රජ්ජුරුවෝ අසුන් ඒ නුවරට ආ නියාව අසා රජ්ජුරුවෝ සිවුමැදුරු කවුළුවේ මතුමාලේ බලා සිටියාහු සොන නම් අසුන් අසුන් මඩ්‍යයට මුදුපූහ. එවිට අස් වෙළඳුන් තමන්ගේ සුභ නම් අසු උනාපූහ, එවිට වණ්ඩ පරුෂ අසුන් දෙන්න උනුන් කරා ගොස් උනුන් පිටිතොල තබාගෙණ කම්පස් අසුන් මෙන් සිටියාහ. එවිට රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ගේ මූණ බලා "මේ කිමෙක්ද? කම්පස් අසුන් දෙන්නෙකුමෙන් උනුන් මූණ බලා සිටියාහ"යි බොධිසත්ත්වයන් අතින් විචාළාහ. බොධිසත්ත්වයෝ ඊට කියන්නාහු "කෙතෙක් දුර වුවත් අසත් පුරුෂයා අසත්පුරුෂයා දුටු කල එක් වන්නේය. සත්පුරුෂයා සත්පුරුෂයා දුටු කල එක්වන්නේමය, එසේ හෙයින් නීවවූ අසා නීවවූ අසා හා එක්වූය"යි කියා නැවත කියන්නාහු "රජ්ජුරුවන් විසින් අධික ලොභ නුව මැනව, මනුෂ්‍ය යන්ගෙන් අයුක්ති සම්පත්ති ගැණීම දොෂය"යි කීහ. එබස් රජ්ජුරුවෝ අසා ඔවුන්ගේ වෙළඳුම් කිරීම බොධිසත්ත්වයන්ට ම භාර කළාහ.

බොධිසත්ත්වයෝත් අගය වූ නියාවට ඒ වෙළඳුම් කොට අස්වෙළඳුන්ට සම්පත් දුන්නාහ. අස්වෙළඳුන් සම්පත් ලැබ සතොසයෙන් ගියාහ. රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන්ගේ අවවාද වූ නියාවට දැහැමින් සෙමෙන් රාජ්‍යය කොට කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදාරා "මහණෙනි, එසමයෙහි වණ්ඩ පරුෂ අසුන්දෙන්නා නම් මෙසමයෙහි කෝපි වූ භික්ෂූහු දෙදෙනය, රජ්ජුරුවෝ නම් ආනන්ද සථවිරයෝය, පණ්ඩිත අමාත්‍ය නම් බුදුවූ මම්මය"යි වදාරා සුභනු ජාතකය නිමවා වදාළ සේක.

## 155 සුවණ්ණමයුර ජාතකය.

තිවද කරුණානිධානවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ශාසනයෙහි උකටලීවූ භික්ෂූ කෙතෙකුන් වහන්සේ සම්බුදුරජාණන් වහන්සේට පැවාහ. සම්බුදුරජාණෝ "සැබෑද මහණ, උකටලීවූයෙහි දැ"යි වදාරා "සැබෑව, සවාමීනි," කියන්නා "කුමක් නිසාදැ"යි විචාරා වදාරන්නා "සරහන ලද ස්ත්‍රියක දැක ඇ කෙරෙහි පිළිබඳ සිතින් ශාසනයෙහි උකටලී වූයෙහි ය"යි කියන්නා එවිට සම්බුදුරජාණෝ "මහණෙනි, මුන්සේ වූ අහෙතුක ප්‍රඥ ඇති සත්ත්වයා තබා මහොත්තමයෝ ස්ත්‍රී වසඟයට පැමිණියෝවේදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙතෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ මයුරව උපන්සේක. උපදිනා කිජු

වටින්ම රන්වන් පැ ඇතිව ඉපිද බිජුවට ගසාපු කල රන්වන් පැයෙව ඉපිද වැඩි විය පැමිණ පියාපත් අසු අඩසේ රතු රෙඛාවලින් සමලංකෘතව බැලුවන්ට ප්‍රසාද එලවන තරම් විශෙෂවූ රූපශ්‍රියෙන් යුක්තව ඉන්නා සේක් මෙසේවූ සිතක් සිතුසේක. මගේ රූපශ්‍රිය අතෂී හෙයින් මනුෂ්‍යයන් ලඟ දවස් හැරී මෙන් යම්සේ උපද්‍රවයක් වෙයි සිතා හිමාලයවනයට ගොස් පළිත වලලු තුනක් ඉක්ම ගොස් සතරවන පළිත වලල්ලෙහිවූ දණ්ඩකාරඤ්ඤ නම් පළිත වලල්ලෙහි වාසය කරන්නෙමිය. ඒ මයුර රජ දවස්පතා ගොදුරු භූමියට බස්නා කල තමාට ආරක්ෂාව පිණිස නැගෙන්නාවූ සූයය් දිව්‍යපුත්‍රයන් බලා මෙසේවූ බ්‍රහ්ම මන්ත්‍රයක් කිය යි, ඒ කෙසේද? **"උදෙතයං චක්ඛුමා එකරාජා හරිස්ස වණ්ණො පඨවිප්පභාසො තංතං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං තයජ්ජගුත්තා විහරෙමු දිවසං"** යන මේ මන්ත්‍රය කියා පළිතයෙන් බිමට බස්නේ ය.

**එහි අභිප්‍රාය කෙසේද? යත්**

සකල චක්‍රවාල ගභීරාසීවූ සියලු සත්ත්වයාහට රාත්‍රිභාගයෙහිවූ අන්ධකාරය විධ්වංශනය කොට රූප දර්ශනයට හේතුවූ ආලෝක පතුරුවන්නා වූ ඒ සූයය්පුත්‍රයාහට නමස්කාර කෙරෙමි යි අද දවස් ඒ සූයය්දෙවතාවා විසින් රක්නා ලදුව නිර්භයව වාසය කෙරෙම්, කියා සූයය්යාට නමස්කාර කොට දෙව නුව අතීතවූ සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර කරණ මයුරයා මෙලෙස කියා **"යෙ බ්‍රාහ්මණාවෙදගූ සබ්බධම්මෙ තෙ මෙ නමො තෙව මං පාලයන්තු නමත්ථු බුධානං නමත්ථු බොධියා නමො විමුත්තා නං නමො විමුත්තියා ඉමං සො පරිත්තං කත්වා මෙරෝ චරති එසනා"**

**මෙහි අභිප්‍රාය කෙසේද? යත්**

තවද දුරුකරණ ලද පාපයන් ඇති ස්කන්ධධාතු ආයතනාදී සියළු පදාර්ථයන් සම්ප්‍රකාරයෙන් පිරිසිඳ දන්නාවූ යම් සම්බුදුහෙනෙක් ඇද්ද? මාගේ නමස්කාරය උන්වහන්සේට වේව යි ඒ අතීතකාලයෙහි අපමණවූ අචින්ත්‍යවූ ආඛ්‍ය ගුණගණාඩ්‍යයෙන් යුක්තවූ සම්බුදුරජාණන්ට ද නමස්කාර වේව යි ඒ සම්බුදුරජාණන් විසින් ප්‍රතිවෙධ කරණලද සම්‍යක්සම්බුද්ධ ඥානයට ද නමස්කාර වේව යි ඒ සම්බුදුරජාණන් විසින් වදුරණලද සැඩම්වූ පරිද්දෙන් පිළිපදිනාවූ සංසාර සාගරයෙන් ගොඩනැගී අමාමහ නිවන් දුටුවාවූ සංඝරත්නයට ද නමස්කාර වේව යි ඒ සම්බුදුරජාණන් විසින් ද, ඒ ආයය්සංඝයා වහන්සේ විසින් ප්‍රතිවෙධ කරණලද සතර මග සතරඵල සංඛ්‍යාතවූ විමුක්තියට ද නමස්කාර වේව යි කියා ඒ මයුර රජ්ජු රුවෝ මේ පිරිත් ආරක්ෂා කොට ගොදුරු පිණිස හැසිරෙන්නාහ"යි වදාළසේක.

ඒ මයුර තෙම මේ පිරිත් ආනුභාවයෙන් දැවල් දවස සැපසේ කිසි අන්ත රායක් නැතිව සැපසේ ඇවිද රාත්‍රිභාගයෙහි පළිතයට නැගිබස්නාහු සූයය්යා දැක ඒ පරිත්තය පිරිවන්නාහු, **"අපෙතයං චක්ඛුමා එකරාජා හරිස්සවණ්ණ පඨවිප්පභාසො තතං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං තයජ්ජ ගුත්තා විහරෙමුරත්තිං, යෙ බ්‍රාහ්මණා වෙදගූසබ්බ ධම්මෙ තෙ මෙ නමො තෙව මං පාලයන්තු නමත්ථු බුධානං නමත්ථු බොධියා නමොවිමුත්තා නං නමො විමුත්තියා ඉමං සො පරිත්තං කත්වා මොරොවාසමකප්පයි"** කියන මේ පරිත්තානුභාවයෙන් රාත්‍රියෙහිත් සැපසේ වාසය කරන්නාහ.

මේ නියායෙන් පරිත්‍යානුභාවයෙන් දවස්පතා වාසයකරණ කල්හි එසමයෙහි එක් වැද්දෙක් වනවරකව හිමාලවනයෙහි ඒ ඒ තැන ඇවිදිනේ ය. බොධිසත්ත්වයන් වාසය කරණ පළිත සමීපයට ගොස් බොධිසත්ත්වයන් දැක දෙවෙනිව තමාගේ ගමට අවුත් තමාගේ පුතාට තමා මියන අවස්ථාවේ "එම් වල අසවල් දණ්ඩකාරණ්‍යයෙහි පළිත මුදුනේ රන්වන් මයුරයෙක් ඉඳිනේය, යම් දවසක රජ්ජුරුවන් වහන්සේ රන්වන් මොනරකුගෙන් ප්‍රයෝජන ඇතැ යි කිසේක් නම් තෝ ඒ මොනරා අල්වා දෙව"යි කීහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ අග්‍රමහෙෂිකා වූ බෙමා නම් බිසව රාත්‍රියෙහි සුවප්තයෙන් රන්වන් මොනරකු අතින් බණ අසන්නා දැක පිබිද උදැසන රජ්ජුරුවන්ට කියන්නී "රන්වන් මොනරකු මට අවශ්‍යයෙන් දුටොත් විනා මාගේ ජීවිතය නැතැ"යි කියා දෙළගත්තාහ. ඒ බව රජ්ජුරුවෝ දැන අමාත්‍යයන්ගෙන් "රන්වන් මොනරකු ඇද්ද"යි විචාළාහ. අමාත්‍යයෝ "රන් වන් මොනරකු ඇති නියාව නැති නියාව දන්නෝ බමුණෝය"යි කීවාහ. රජ්ජු රුවෝ "යහපත"යි බමුණන් අතින් විචාළාහ. බමුණෝ ශාස්ත්‍ර බලා "රන්වන් මොනරු ඇත, ඒ දන්නෝ වැද්දෙය"යි කීහ, එවිට රජ්ජුරුවෝ වැද්දන් ගෙන්වා "රන්වන් මොනරුන් ඇතිතැන් දන්නෝ ඇද්ද"යි විචාළාහ.

ඉන් එක වැද්දෙක් කියන්නේ 'සාමිනි, හිමාලයවනයෙහි පළිත වලලු තුනකින් එවිට දණ්ඩකාරණ්‍යයෙහි නම් පළියෙහි ඇතැ"යි කීහ. එවිට රජ්ජු රුවෝ 'එසේ වී නම් තොප ගොසින් ගෙණෙව"යි කීහ. එවිට වැදි තෙමේ "යහපතැ"යි ගිවිස තමාගේ පුතාට එපවත් කියා තෙමේ වලට ගොස් පියා කී සලකුණු නියාවට දණ්ඩකාරණ්‍යයෙහි නම් පළිතයේ මොනරා වාසය කරණ නියාව දැක මොනරා ගෙදුරු සොයා බස්නා මාවත දැක එම මාවත මල ඉදුවා බොධි සත්ත්වයන් බඳින්ට බොහෝ උත්සාහ කෙළේය. බොධිසත්ත්වයන්ගේ මන්ත්‍රා නුභාවයෙන් මල ඇතුළේ පය ලුවත් මල නොනැහිරෙන්නේය. මේ නියායෙන් ඒ වැදි තමාගේ දිවිහිමියෙන් උත්සාහ කොටත් බැරි හෙයින් ඒ හිමාලය වනයෙහි ම නිදා මළේය. බෙමා නම් බිසවුන් මොනරා ලබම් යන දෙළ නොළත් හෙයින් මළාහ. රජ්ජුරුවෝ මොනරා නිසා බිසවුනුත් මළේය"යි සිතා මොනරා කෙරෙහි වෛර බැඳ රන්පොතක ලියවන්නාහු අසවල් හිමාලයවන පළිතයෙහි පළිත වලලු තුනකින් ඇතුළේ දණ්ඩකාරණ්‍යයෙහි නම් පළිතයෙහි සුවණ්ණමයූරයෙක් වෙසෙයි. ඒ මයූරයාගේ මස් කෑ කෙනෙක් අජරාමර වෙතියි රන්පත ලියවා භාණ්ඩාගාරයේ රක්ෂා කොට තබා මළහ.

උන්ට ඉක්බිති රාජ්‍යයට පැමිණි රජ්ජුරුවෝ ඒ රන්පත දැක එසේ වී නම් "මොනරා මස් කා අජරාමර වන්ට වුව මැනවැ"යි සිතා වැද්දකු යවූහ. ඒ වැදිත් බොහෝ උත්සාහ කොට මන්ත්‍රානුභාවයෙන් බැරි හෙයින් ඒ වතයේම මළේය. මේ නියායෙන් රජදරුවෝ සදෙනෙක් යැවූ වැද්දෝ සදෙනම බැඳදේ මළ පමණ විනා මොනරා අල්වා ගත නුහුනුවාහුය. සත්වැනි රාජ්‍යයට පැමිණි රජ්ජරුවෝත් රන් පත බලා එලෙස වැද්දෙකු යවූහ. ඒ වැදිත් වලට ගොස් බොධිසත්ත්වයන්ට මල ඉදුවා බොහෝ උත්සාහ කොට බැරි හෙයින් සිතන්නේ "මේ මොනරා මලෙහි පයලාත් නොබැඳෙන්නේය, කුමන කාරණයකින්දෝ" හෝ යි සිතා පරීක්ෂා කරන්නේ බොධිසත්ත්වයන් උදැසනක් සේ සූයශ්‍යාව

කරණ නමස්කාරය හා බ්‍රහ්ම මන්ත්‍රය පිරවීම් ආදිය වූ කාරණා දැක එසේ නම් මන්ත්‍රය ආකුල කෙරෙමි සිතා පිටිසර ගමකට පෙරලා අවුත් මොනර සෙබඩක අල්වාගෙණ ඒ මොනරසෙබඩ සිටි තැනට අසුරුසත් ගැසූ වේලේ නටා හා රාව ප්‍රතිරාව කරන්ට හා මෙකී දෙය මොනරසෙබඩ කරණ ලෙස සලස්වාගෙණ මොනර සෙබඩ ඇරගෙන පෙරලා හිමාලය වනයට ගොස් බොධිසත්ත්වයන් හොදුරු භූමියට බස්නා තෙක මල ඉදුවා එතන සෙබඩ සිටුවා බොධිසත්වයන් ඉරු බලා මන්ත්‍රය පිරුවන්ට පළමුකොට මොනරසෙබඩ ලවා රාගනිශ්‍රිත කොට ඇඬවීය, බොධිසත්වයෝත් නැතක් දවස තො ඇසූ රාගනිශ්‍රිත අඬ සෙයින් ඊ බැදි යක්‍ෂයන් ආවේශ වූ කල කිසිවක් තො දන්නා මෙන් රාගයෙහි බැඳී පිරිවහන මන්ත්‍රය සඳහන් නැතිව සෙබඩ සිටි තෙනට බට තෙනත්තෝ මල බැඳින. එවිට වැදි මොනර අල්වා ගෙණ ගොස් රජ්ජුරුවන්ට පැහ. රජ්ජුරුවෝත් මොනරා දැක සතුටු වූහ.

එවිට මයුර රජ්ජුරුවෝ රජුගෙන් විචාරන්නේ "මා ගෙන්වූයේ කුමකට දැ"යි විවාළාහ. රජ්ජුරුවෝ කියන්නේ "තොපගේ මස් කෑවන් අජරාමර වෙති අසා තොප මරා මස් කන්ට ගෙන්වීමි" කී සේක.

එවිට මයුර රජ්ජුරුවෝ කියන්නාහු "මාගේ මස් කා අජරාමර වෙතොත් යහපතැයි මා මියන කල මාගේ මස් කෑවුන් අජරාමර වෙන්නේ කෙසේදැ"යි කීහ. එබස් රජ්ජුරුවෝ අසා "එසේ තො කියව, රන්වන් මොනරා වේදැ"යි කීහ. එබස් මයුර රජ්ජුරුවෝ අසා "එසේ වී නම් රන්වන් වූ කාරණාව අසව, මම යටගිය දවස බරණැස්නුවර චක්‍රවර්ති රජව ඉපිද පන්සිල් රැක දැහැමින් සෙමින් රාජ්‍යය කොට ඉන් මිය ගොස් දිව්‍යලෝකයෙහි ඉපිද එයින් චුතවූ කල අකුසල් බලයෙන් මේ තිරිසන් යෝනියෙහි උපනිමි. මා රැක්ක වූ පඤ්චශීල යෙහි බලයෙන් මෙසේ වූ රූපශ්‍රීයකට පැමිණියෙමි" කීහ. ඒ තො අදහන රජහට මයුර රජ්ජුරුවෝ කියන්නාහු "මම යටගිය දවස චක්‍රවර්ති රාජ්‍යය කරණ සමයෙහි මම ද ආකාශාවාරීව ඒ ඒ තැන ඇවිද්දා වූ රන්රුවන් රථයෙක් ඇත. ඒ රථය තොපගේ මහුල් පොකුනේ දිය ඉස්සා රථය ඇරගෙණ මාගේ බස් සැක අරුව"යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ එලෙස පැන් ඉස්සවා රථය ගොඩ ලා ගත්තාහ. රජ්ජුරුවෝ සතුටුව බොධිසත්ත්වයන් මුදා හළහ. බොධිසත්ත්වයෝත් එවිට රජ්ජුරුවන්ට පන්සිල් දී අවවාද කොට පඤ්චප්‍රහාර කෙරෙමින් දණ්ඩකාරණ්‍යයෙහි තම් පළිතයට ම ගියාහ සි වදාරා ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ සච්චමයුර ජාතකය නිමවා වදාළ සේක. ජාතකාවසානයෙහිදී ඒ භික්ෂූන්වහන්සේත් සියළු කෙලෙසුන් නසා රහත් වූ සේක. "එසමයෙහි රජ්ජුරුවෝ තම් ආනන්දසථවිරයෝය, මයුර රජ්ජුරුවෝ තම් ලොවුතුරා බුදු වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 156 චිනීලක ජාතකය

මේ වදාළ ශාස්තෘ වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්තසථවිරයන්ගේ සිඳුණු විලාසය දැක්වීමක් නිසා මේ ජාතකය දක්වන ලදි.

**හේ කෙසේද? යත්,**

සම්බුදුරජාණන් වහන්සේ දැගැස්සවීමත් වහන්සේට වදාරණසේක් "දෙව දත්තසථවිරයන්ගේ පන්සියයක් දෙනාවහන්සේ රහත්කරවාගෙණ එන සේක් දැ"යි කියා ඒ දෙදෙනා වහන්සේ ගයාශීර්ෂ නම් දෙවදත්තසථවිරයන් හිඳිනා විහාරයට ගිය සේක. එවිට දෙවදත්තසථවිරයෝ සම්බුදු විලාසයක් දක්වන්නෝ "ශාරිපුත්‍රසථවිරයනි, මාගේ වසට රිදෙයි, පොපි බණ කියව"යි කියා ධර්මාසනය පිටිපස්සේ වැදහොත්තාහ. සැරියුත් සාමීන් බණ කියා පන්සියයක් දෙනා වහන්සේ රහත් කරවා අරගණ පලාගිය සේක. එවිට දෙවදත්තසථවිරයන්ගේ ලඟට කොකාලිකසථවිරයෝ පැමිණ පයින් ඇණ ලේ තුන් කවක් ගන්වාපූහ.

සැරියුත් මුගලන් දැගැස්සවීමත් දෙදෙනාවහන්සේත් සම්බුදුරජාණන් කරා වැඩි සේක. සම්බුදුරජාණෝද එවිට "දැගැස්සවීමෙනි, තොප දැක දෙවදත්තසථවිරයෝ කුමත කෘත්‍යයක් කළ සේක් ද"යි විමාළසේක. දැගැස්සවීමත් වහන්සේ වදාරණ සේක් "සවාමීනි, දෙවදත්තසථවිරයෝ සම්බුදු කෘත්‍ය කොට ලය තලාගෙන ලේ තුන් කටක් තගාපුවෝ වේදැ"යි වදාළසේක. එවිට සම්බුදුරජාණන් වහන්සේ "දැන් මතු නොවෙයි, පළමුත් දෙවදත්තසථවිරයෝ මාගේ කෘත්‍යය කොට හීනවූවෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්,**

**පෙ**රටගිය දවස විදේහරට මියුළුනුවර විදේහ නම් රජ්ජුරුකොනෙකුන් රාජ්‍ය කරණ සමයෙහි හංසයෙක් කැවිඩියක හා සමග සංවාස විය. ඒ සංවාසයෙන් කැවිඩිබෙනුව පුතකු වැදූහ. ඒ කියන පුත්‍රයා මව සේ කලු පැහැයන් නොවෙයි, පිය වූ හංසයාගේ රන්වන් පැහැයත් නොවෙයි, දෙපැයම තොව නීලවන් පැහැය ම විය. ඒ උන්ගේ දෙමව්පියෝ උන්ට නම් තබන්නාවූ විනීලයෝය යි නම් තැබූහ.

හංසයාතන්ගේ හිමාලයෙහි පැවටුන් දෙන්නෙක් ඇත්තාහ. එසේ නෙයින් හංසයා අතරතුරේ මියුළුනුවරට ඇවිත් යන්නේය. ඒ දැක හංසපැවිවි දෙන්න කියන්නෝ "පියාතන්වහන්ස, නුඹවහන්සේ මනුෂ්‍යපථයට නිතර යාමෙන් උපද්‍රව වන්නේය, අපි ගොසින් ඒ පැටවුන් ගෙණෙම්හ"යි කීහ, "එසේ වී නම් මියුළුනුවර වාසල කෙරේ තල් ගසෙක කවුඩු කැදැල්ලක වෂති, පොපි දෙන්න ගොසින් හැරගෙණ එව"යි යැවූහ. එවිට හංසපෝතකයෝ දෙන්න විනීල නම් කපුටුවා ලඟට ඇවිත් ඔහු ලීයක හිඳුවා හංසයෝ දෙන්න ලීය දෙපිටින් බැගෙණ විනීලයා මැද්දෙහි හිඳුවාගෙණ මියුළුනුවර මඩ්‍යයෙන් නික්මුණාහ. ඒ වේලාවට වේදේහ රජ්ජුරුවෝ යහපත් කොට සැරහී ඇලිඅසුන් සතරදෙනකු යෙදූ රථයකට නැගී නුවර මහත් ප්‍රදක්ෂිණාවෙන් නික්මුනාහ. ඒ වෙලාවට විනීලකයාත් ආකාසයෙන් යමින් සිටියේ රථයෙන් යමින් සිටි රජ්ජුරුවන් දැක කියන්නේ "මියුළු නුවර ගෙයක් කොට ඇති වේදේහරජ්ජුරුවෝත් අසුන් සතරදෙනෙකු යොදන ලද රථයකින් නික්මුණාහුය. මමත් සඛීනංසයෝ දෙන්නෙකු යොදනලද රථයෙන් ආකාශයෙන් නික්මුණෙමි"යි කියා.

එබස් අසා හංසයෝ කෝපව "මූ මෙතතදී මරාපියමිහ"යි සිතා නාවත සිතන්නාහු "එසේ කළමෝ නම් පියානන් වහන්සේ ඊෂ්‍යාවෙන් මරාපියා ගිය හ යි සිහින සේක"යි සිතා එසේ නොකොට හැරගෙණ ගියා වූ හංසයානන්ට එපවත් කීයේය. හංසයා කිපී "තෝ තාගේ තරම් නොදනීද? තොප සේ වූවන්ට නිසි මලමූත්‍ර ඇති සථානයෙක වීනා මෙසේ වූ තෙන තොපට අසථාන ය"යි කියා හංසපැවවුන්ට කියන්නාහු "මොහු ඇරගෙණ මුගේ මවලඟ ලා පියා එව"යි කීහ. හංසයෝත් එලෙසම කළෝය යි වදාරා දෙකල් ගලපා මේ විනිල ජාතකය නිමවා වදාළසේක. "එසමයෙහි විනීල නම් දෙවදතතසථවිරයෝ ය, හංසපැවි නම් දැගසථවියෝය, පියානෝ නම් ආනන්ද සථවිරයෝ ය, වේදේහ රජව උපන්නෙම් ලොවිතුරා බුදුවූ මම්මය"යි වදාළ සේකි.

---

## 157 ඉන්දගොතක ජාතකය

**එවද** ශාකාසිංහවූ සම්‍බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසත සමයෙහි තොකිකරු භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

එක් තොකිකරු භික්ෂුකෙනෙකුන් වහන්සේ සම්‍බුදුයන් වහන්සේට දන් වන්නා "මහණ නො කිකරුවූයේ සැබෑදැ"යි විචාරා "සැබෑ"යි දන්වන්නා "මහණ තාගේ නො කිකරුකම් පිණිස පළමුත් ඇතු පයින් මැඩුම්කෑයෙහි වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිත වූ සම්‍බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**පිටහිය** දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ පන්සියයක් තපස්වරුන් පිරිවරා ගෙණ ගණනායකව හිමාලයවනයෙහි වසන්නාහ.

එසමයෙහි ඉන්දගොත්ත නම් තාපසකෙනෙක් ඇත් පැටවකු වඩාගත්තාහ. බොධිසත්ත්වයෝත් "මේ ඇතා වැඩීමෙන් ඇතා නිසා උපද්‍රව පැමිණෙයි. ඒ නො වඩව"යි කීහ. ඒ තාපසයෝ කීවා නොකොට ඇතා මුහුකුරුවා වැඩී. එයින් වැඩිවිය පැමිණ මදසෙල්වී ගිය අවසථාවට තාපසයෝ තාපසවරුන් හා සමඟ ඔබ්බේ ගමකට ගොස් එන කල ඇත් මදයෙන් සිටි හෙයින් ඒ තාපස යන්ගේ පන්සල විද පැන්සලවල් ආදීවූ දෙයත් බිඳ තාපසයන් හිඳිනා ගල්පුව රුවත් උදුරා දමා සක්මන් කෙළවර වැතිර සිටිනා පුවරුවත් උදුරා දමා තාපස යන් මරා යෙමි සිතා වත සමීපයෙහි සිටියේ ය.

එවේලාවට තාපසයෝ එතනට අවුත් සැක නැතිව ලඟට ගියාහ. එවිට ඇත් තමා ලඟට ආ තාපසයන් දැක තමාගේ දළින් ඇන මරා වලට ගියේ ය. ඒ දුටු තාපසවරු එපවත් බොධිසත්ත්වයන්ට කීවාහුය. බොධිසත්ත්වයෝත් එවිට තාපසයන්ට කලමතා ආදහන කෘත්‍යය කොට තාපසවරුන් සමීපයට කැඳවා කියන්නාහු "අසත්පුරුෂ නීවූ සත්ත්වයා ලං කිරීමෙන් දෙෂ නියාව මේ ඉන්ද

ගොත්ත තාපසයන් කිව්‍ය නො කිරීමෙන් අසත්පුරුෂ ඇතා වඩා මරවාගත්ත වැන්නේය. එසේ හෙයින් සත්පුරුෂ සත්ත්වයා ලං කිරීමෙන් හා උන් කී අව වාද ලෙසට පිළිපැදීමෙන් බොහෝ ඉෂ්ටාර්ථයට පැමිණෙන්නේය''යි යනාදීන් තාපසවරුන්ට අවවාද කියා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියානසිවදරා මේ ඉන්දගොත්ත ජාතකය නිමවා වදාළ සේක.

''එසමයෙහි ඉන්දගොත්ත තාපසයෝ නම් මේ නොකීකරු භික්ෂූහුය, එසම යෙහි කීකරු තාපසයෝ නම් බුදුපිරිසය, එසමයෙහි තාපසයන්ට අවවාද කළාවූ නායක තාපසයෝ නම් මම්ම වේදැ''යි සම්මාසම්බුදුරජාතන් වහන්සේ දක්වා වදාළ සේක.

---

## 158 සන්ථව ජාතකය

අසරණ සරණවූ සර්ව්ඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසත සමයෙහි ගිනි දෙවියාට පූජාකරණ නිගණ්ඨයන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්**

මෙහි වර්තමාන කථාව තංගුට්ඨ ජාතකයෙහි විස්තර වශයෙන් දක්වන ලද. භික්ෂූන් වහන්සේ ''ස්වාමීනි, මුන් කරණ ගිනිදෙවියාගෙන් මතු වන වැඩෙක් ඇද්දැ'යි විමාලසේක. ඊට සර්ව්ඥයන් වහන්සේ ''මනණෙනි, පෙර උත්තමයෝත් මෙහි වැඩෙක් ඇද්දෝ හෝ යි බලා වැඩක් නැති හෙයින් ඇර පුවෝ වේදැ'' යි වදාරා ''ඒ කෙසේදැ''යි ආරාධිතවූ සර්ව්ඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යට්ටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ බමුණුකුලයක ඉපිදදෙමව් පියන් විසින් උපන් දවස් තිබූ ගිනි තොනිවා තබා බොධිසත්ත්වයන්ගේ වයස් සොළොස් ඇවිරිද්දට පැමිණි කල්හි බොධිසත්ත්වයන්ට කියන්නාහු 'පුත, මේ ගිනි ඇරගෙණ ගොස් වහ්නිදේවතාවාට පූජාකොට වනයේ තපස් කරවූ නම් එසේ කරව, නැත්නම් ශාස්ත්‍රය ඉගෙණ කුටුඹසණ්ඨාපනය කොට වාසය කරව''යි කීහ.

එවිට බොධිසත්ත්වයෝ ''මට ගිහිගෙයින් කම් නැතැ''යි කියා ගිනි දෙවියා ඇරගෙණ ගොස් වහ්නිදේවතාවාට පූජා කොට වලට ගොස් පන්සලක් ඉදි කොට ගිනිදෙවියාට පූජා කරන්නාහ.

එසමයෙහි එක් දවසක් දන්දෙන ගෙයකින් එලඟිතෙල් මුසු කිරිබතක් ලැබ ''මාගේ ගිනිදෙවියාට පූජා කෙරෙමි''යි සිතා ගෙණවුත් ගිනිමොලවාතෙල් මුසු කිරිබත් ගින්නට දැමූහ. එවිට තෙල් අධික හෙයින් ගිනි මහත්ව ඇවිල පන්සල දවන්ට වත. ඒ වේලාවට බ්‍රාහ්මණ පන්සලින් පිටත්ව තමාගේපන්සල දන්නා බලා කියන්නේ අසත්පුරුෂවූ නීවයා හා එක්වීමෙන්ම මා බොහෝ දුක් විඳ ඉදි කොට ගත් පන්සල දවන පමණකැයි කියා ගිනි නිවා හිමාලය වනයට නික්මිණ.

එවිට අතරමඟ සිංහයකු හා ව්‍යාඝ්‍රයකු හා දිවියකු හා තුන්දෙනාගේ මුණ ලෙව ලෙව සිටි රිලවකු දැක සිංහ ව්‍යාඝ්‍ර දෙදෙනා හා දිවියා ඇතුළුවූ තුන් දෙනා විශ්වාස නිසාත් අසත්පුරුෂයා විසිනුත් මුන්ට අනර්ථ නොකරති කියා හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ආයු කෙළවර බ්‍රහ්ම ලෝකයෙහි උපන්හ යි වදාරා සන්ථව ජාතකය නිමවා වදාළ සේක "එසමයෙහි තාපසව උපන්නෙම් බුදු වූ මම්ම වේදැ"යි වදාළ සේක.

---

## 159 සුසීම ජාතකය

තිවද සරණගත වප්‍රපඤ්ඤර වූ සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ඡන්දදානයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

**හේ කෙසේද? යත්**

සැවැත්නුවරවාසීහු එක් සමයෙක තනි තනිව සම්බුදුන්ට දන් දෙන්නාහ. සමහර දා පස්දෙනා එක්ව දන් දෙන්නාහ. සමහර දවස් වීටියක මනුෂ්‍යයෝ එක්ව දන් දෙන්නාහ, සමහර දවස් නුවරවාසීහු එක්ව දන් දෙන්නාහ. මේ නියාවෙන් දන් දෙන සම යහි එක් දවසක් නුවරවාසීහු එක්ව දනක් සරහා ගත්තාහ. එවිට නීඡීකහක්තික ඇත්තෝ "නිගණ්ඨනාථපුත්‍ර මක්ඛලිගොශාලාදි වූ සත්සමයේ ඇත්තන්ට දන් දෙම්හ"යි එකහක්ති ගත් උපාසකවරු කියති. සම්‍යක් හක්ති ගත්තෝ "සම්බුදුන් වහන්සේ ප්‍රධාන භික්ෂු සඞ්ඝයා වහන්සේට දන් දෙම්හ"යි කියති. මේ නියායෙන් උනුන් හිවිස්වා ගත නොහී දවස් අරණ සමයෙහි එක් නුවණැති මනුෂ්‍යයෙක් කියන්නේ "මේ දෙපක්ෂයෙන් බොහෝ මිනිසුන් ඇති පක්ෂයේ කෙනෙකුන්ට දන් දෙම්හ" යි කියා කීහ. ඒ වේලේ "බොහෝ මනුෂ්‍යයන් ඇත්තේ බුද්ධශාසනයේ නෙයින් බුඩශාසනයට ම දන් දෙම්හ"යි කියා ඒ නියාවට දන් සපයා දුන්නාහ.

එසමයෙහි සම්බුදුන්ගේ දන් කඩන්නට සිතුවත් කඩ නොකොට දන් දීපුවාහ. සම්බුදුයෝත් අනුමෙවෙනි බණ වදාරා ජේතවනාරාමයට වැඩි සේක. භික්ෂූන් වහන්සේත් තමන්වහන්සේගේ ගණවලට වැඩ රාත්‍රි මානයෙහිදම්සභා මණ්ඩපයට රැස්ව "ඇවැත්නි, නීඡීකයන් විසින් සම්බුදුන් ලබන්නාවූ ලාභ සත්කාරයට අන්තරායක් කරන්ට උත්සාහ කොටත් අන්තරායක් කොට ගත නුහුනුවෝ වේදැ"යි මේ කථාව කිය කියා වැඩඋන් තැනට සම්බුදුන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විමාරා එපවත් අසා "මහණෙනි, දැන් මතු නොවෙයි, පළමුත් මාගේ ලාභසත්කාරයට අන්තරාය කරන්ට වැදත් අන්තරාය කොට ගත නුහුනුවෝ වේදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

පිවගිය දවස බරණැස් නුවර සුසීම නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණාන කෙනෙක් ඇත්තාහ.

ත්‍රිවේදයෙහි පාරප්‍රාප්තව ඇත්වේද හා ඇත් ලක්ෂණ දැන අවුරුදු පතා හස්ති යාග කොට කෙළ ගණන් සම්පත් ලබන්නාහ, ඒ අවදියේ බෝධිසත්ත්වයෝ ඒ බමුණාගේ ගෙයි බැමිණිය බඩ පිළිසිඳ ඉපද සත් අට අවුරුදු පැමිණි කල බොධිසත්ත්වයන් වහන්සේගේ පියානෝ නැසී ගියාහ.

එසමයෙහි හස්තියාගය පැමිණියේය. එවිට බමුණෝ එක්ව හස්ති යාගය කරණ කල් පැමිණියේය. ''සවාමිනි මෙතෙක් දවස් හස්තියාග කොට සිවි පුරෝහිත බමුණා වැටී හුනු හෙයිනුත් උන්ගේ පුතානෝ කිසිම්ශාස්ත්‍රයක් නොදනිති; එසේ හෙයින් අපි හස්තියාග කරම්හ''යි කීවාහුය. එවිට රජ්ජුරු වෝත් ''යහපතැ''යි ගිවිස්සෝය. බමුණෝ ''අදින් සතර වෙනිදා හස්තියාගය කරම්හ, එසේ හෙයින් බොහෝ ලාභ ලබම්හ''යි ඇවිදිනාහ. ඒ දුටු බොධිසත්ත්වයන්ගේ මෑනියෝ ''සත්මුත්තක ප්‍රවෙණිව පැවත ආ හස්තියාගයත් ඔබ්බකට සැලසී ගියේය. අප බොහෝ ලබන සම්පතුත් හානි වීය''යි කියා හඬන්ට වන්හ. එසේ අඩ අඩා උන්නාවූ මෑනියන් උන්තෙනට බොධිසත්ත්වයෝත් ඇවිත් ''මෑනියන්වහන්ස, අඬන්නේ ඇයි දැ''යි විචාරා එපවත් අසා ''අදට යාග කරන්නේ කී දවසෙක්දැ''යි විචාරා ''සතරදවසෙකැ'' යි අසා ''මේ හස්තියාගය හා ත්‍රිවේදය දන්නෝ කවුරුදැ''යි විචාරා ''මෙතනට එක් සිය විසිගොදුන් ඇති තක්සලානුවර දිසාපාමොක් ශිල්ප දනිති කී විසින් ''එසේ වීනම් සෙට දවස් තක්සලානුවරට යෙමි''යි රැ දෙවරු ශාස්ත්‍ර උගෙණ පසුදවස් අවුත් සතරවෙනි දිනයෙහි යාගය කෙරෙම්. එසේ හෙයින් නුඹවහන්සේ වක්ඛෙප නුව මැනවැ''යි මෑනියන් අස්වසා මෑනියන් උදැසනක්සේ ලූ බත් කා ආචාරිභාගය හැරගෙණ උදැසනක්සේ නික්ම සඤ්ඤා වේලාවට එක්සිය විසි ගොදුන් මග ගෙවා තක්සලානුවරට පැමිණ දිසාපාමොක් ආචාරීන් දුටහ. ඒ ආචාරීන් කුමක්නිසා අවුදැ''යි විචාරා ''ත්‍රිවේදය හා හස්තිශාස්ත්‍රය උගන්වනුම්, මව වහා උගන්ට උවමැනවැ''යි කී විසින් ''මෙතෙක් ශාස්ත්‍ර කෙසේ උගන්වන්නෙහිදැ''යි කියන්නා ''එසේ නොවෙයි, අදින් තුන්වෙනි දවස් හස්තියාග වෙයි, එසේ හෙයින් එකසියවිසි ගොදුන් කතර ගෙවා මමත් ආයේ වෙමි යි, එසේ හෙයින් අදට පරක්කුවක් නොවී නුඹවහන්සේ විසින් පාලිය පමණක් පිරිවව මම ආද්‍යන්ත වශයෙන් අඳුන් විදහා දැනගණ්මි'' කියා ඒ නියාවට ආචාරීන් ගිවිස රැ බත් කා ඉක්බිති බොධිසත්ත්වයෝත් බත්කා ආචාරීන් පයසෝදා ආචාරීන් වැඳ ආචාරිභාගයේ මසුරන් දහස පාමුල තිබා උන්නාහ,

ආචාරීන් ද තමන් දන්නා ශාස්ත්‍රය පිරිවා පාන් කොට පූවාහ. බොධිසත්ත්වයෝත් ආචාරීන් විසින් වහ වහා සඟවා කියාපුවා එකශ්‍රැති හෙයින් ධරා ''ආචාරීන් වහන්ස, තව ඇද්දැ?'' යි විචාළ සේක. ආචාරී ''එතෙකැ''යිකීවිසින් ''එසේ වීනම් අසවල් තැන අසවල් වැරදිය අසවල්තෙන මෙසේ හරිය, එසේ හෙයින් මෙවක් පටන් ශිල්ප උගන්වන කල මෙසේ උගැන්විය මැනවැ'' යි ගුරුදීන් ආචාරීන්ට කියා උදැසනක්සේ පිටත්ව බරණැස් නුවරට අවුත් මැනි යන්ට ශාස්ත්‍ර උගත් පුවත කියා උන්නාහ. පසු දවස් රජ්ජුරුවන්ගේ සීයක් ඇතුන් රන්සන්නාහයෙන් සරහා රන් ධජ රිදී ධජ ආදීවූ දෙය තන්වා මහත්වූ අලඞ්කාර කොට ''අපි යාග කරම්හ'' යි සැරහී බමුණෝ සිටියාහ. ඒ වේලාවට රජ්ජුරුවෝත් මහත්වූ අලංකාරයෙන් සැරහී යාගයට වුවමනා පිළිපලඳනාවූ දෙයත් ගෙන්වාගෙණ යාගශාලාවට ආහ

ඒ වේලාවට බොධිසත්ත්වයෝත් කුමාර අලංකාරයෙන් සැරසී මහත් පිරිවර පිරිවරණ ලදුව එතනට අවුත් රජ්ජුරුවන් දැක කියන්නාහු "කළුපැහැති සුදුදළ ඇති රන්සන්නාහයෙන් සරහන ලද සියක් ඇතුන්ගේ යාගය අපව පැවත අා යාගය ඔබ්බකට සලස්වා වදාළ සි කියන්නා ඇසීමි. ඒ සැබෑදැ"සි කීය.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "කළුපැහැ ඇති සුදුදළ ඇති රන්සන්නාහ යෙන් සරසනලද සියක් ඇතුන්ගේ යාගය හෝ ශාස්ත්‍ර නොදනිව කී විසින් ඔබ්බකට සැලසුවා සැබව" සි කීහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "නුඹ වහන්සේගේ සත්මුත්තන් පරම්පරා හා මාගේ සත්මුත්තන් පරම්පරාවේඅපිම යාගය කොට අා පමණක් විනා කළ කෙනෙක් නැත්තාහ. එසේ හෙයින් මේ බමුණන් තිබා දඹදිව බමුණන් එක එකසී එ ත්වත් මා කී බසට උත්තරයක් කියන්ට සපන් එකද බමුණෙක් නැත ත්‍රිවෙදය හා හස්ති ශිල්පය මට වඩා දන්නෝ නැතැ"සි කීහ. එතන සිටි බමුණෝ බොධිසත්ත්වයන් කළ සිංහනාදය අසා උත්තරයක් කියන්ට අසමර්ථවූහ. එවිට බොධිසත්ත්වයෝ යාගකොට ලද මහා සම්පත් ලබාගෙණ ගෙට ගියෝ වේදැ සි වදාරා සුසීම ජාතකය තිමවා වදාළ සේක.

"එසමයෙහි බැමිණියෝ නම් මහාමායා දේවිය, පියානෝ නම් සුඩොදන රජ්ජුරුවෝය, බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය, දිසාපාමොක් ආචාරී නම් ශාරිපුත්‍රස්ථවිරය, බ්‍රාහ්මණ කුමාරව උපන්නෙම් ලොවුතුරා බුදුවූ මම්මය"සි වදාළසේක.

මේ ජාතකය අවසානයෙහි බොහෝ දෙනා සෝවාන්වූහ. එමතෙක්දෙනා අනාගාමිවූහ. එමතෙක්දෙනා සකෘදාගාමිවූහ. එමතෙක්දෙනා සියළු කෙලෙසුන් නසා රහත්වූහ. එසේ හෙයින් මේ ධර්මය බොහෝ දෙනාට සාර්ථකවිය.

---

## 160 ගිජ්ඣ ජාතකය

තිවද සමන්තභද්‍ර වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙමව්පියන්ට උපස්ථාන කරණ භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී. මෙහි වර්තමාන කථාව සාම ජාතකයෙහි විස්තර වශයෙන් දක්වන ලදි. දෙමව්පියන්ට උපස්ථාන කරණ භික්ෂුවක් භික්ෂූන් දක්වන්නා "මහණ, ගිහීන්ට උපස්ථාන කරන්නේ සැබෑදැ"සි විචාරන්නා "සැබෑව දෙමව්පියන්ට උපස්ථාන කෙරෙමි" කී විසින් ඒ භික්ෂූන් වහන්සේට උපස්ථාන වදාරණ සම්බුදුරජාණන් වහන්සේ "සාධු සාධු මහණ තා කළ දය යහපත, පෙරත් උත්තමයන් ගිය මගය" සි වදාරා "ඒ කෙසේදැ"සි ආරාධිත වූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ගිජ්ඣකූට පර්වතයෙහි ගිජුලිහිණිව ඉපිද වැඩ වූ දෙමව්පියන්ට උපස්ථාන කරණ සේක.

එසමයෙහි වැසි සුලන් කාලය පැමිණියේය. ගිජුලිහිණියෝ එකසිම පව්තයෙහි ඉදගත නොහී අවුත් බරණැස්නුවර සමීපයෙහි පියාපත් තෙමී බරව වැටී ගියහ. බරණැස්සිවානෝත් වැවට නාන්ට ගොස් තෙමී වැටී වැදහොත් ගිජුලිහිණියන් දැක ගිනි ගෙන්වාගත ගිජුලිහිණියන් පියාපත් තවා මළ මීවුන් දවන තැන මිනිසුන් යවා එතන තිබූ ගෝමස් ගෙන්වා ගිජුලිහිණියන් සතප්ප වූහ.

ඒ ගිජුලිහිණියෝත් හිමකාලයෙහි සිටානන්ගේ අනුග්‍රහයෙන් සැපසේ වාසය කොට වැසි සුලන් පසු වූ කල්හි සැපසේ ගිජ්ඣකූට පව්තයට ගොස් උනුන් හා කැවිව සාකච්ඡා කරන්නාහු "බරණැස්නුවර සිටානන් විසින් අපට බොහෝ සංග්‍රහ කරණ ලද, එහෙයින් අපිත් ඊට ප්‍රත්‍යුපකාර කරන්ට වුව මැනවැ"යි සිතා "අපි පලඳනාවක් පිළියක් ලදමෝ නම් සිටානන්ගේ ගෙයි එලම්හ"යි කියා කථාවක් කොට වීථියේ අබරණක් රත්රනක් පිළියක් දුටුහු නම් වහා ඔහැගෙණ ගොස් සිටානන්ගේ සඳල්ලේ එලන්නාහ. ඒ සිටා නෝත් මේ වස්තුව එලන්නේ ගිජුලිහිණියෝ යයි සිතා තමන්ගේ ගෙයි ඒ ඒ තැන දමන්නාහ. එවිට බොහෝදෙන තම තමන්ගේ වස්තුව ගිජුලිහිණියන් කොල්ලකන හෙයින් එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් එසේ වී නම් ඉන් ගිජුලිහිණියකු අල්ව"යි කීහ. එවිව "යහපතැ"යි කියා මල ආදිවූදෙයින් අල්වන්ට උපාය කළහ. එවිව දෙමව්පියන්ට උපස්ථාන කරන්නා වූ ගිජු ලිහිණියා මළෙහි බැඳින, එවිට ඒ පුරුෂයා ගිජුලිහිණියා අල්වාගෙණ රජ්ජු රුවන් කරා ගියේය. ඒ වේලාවට බරණැස් සිටානෝත් ගිජුලිහිණියන් ගෙණයන්නා දැක "යම්සේ මුන් මරාපු නම් නපුරු' යි සිතා එක්කම රජගෙට අවුත් වන්හ.

එවිට රජ්ජුරුවෝත් "ඇයි තොප සම්පත් කොල්ලකන්නෝ ඇයිදැ"යි විවාළහ. එවිට "සැබව සවාමීනි" කී විසින් "කවුරුන්ට දෙන්වදැ යි සම්පත් ඇරගන්නොය"යි විවාරන්නා "අපට බොහෝ උපකාර කළ විසින්ප්‍රත්‍යුපකාර කරණ නිසා මේ සිටානන්වහන්සේට සම්පත් දෙම්මැ"යි කියන්නා, එබසට සතුටුව "තොපි ඇම සියක් යොත්තක් ඔබ්බේ තුබූ කුණු දකින තොපට මේ මල දැකගත නුහුනුවෝ ඇයිදැ"යි විවාළහ. එවිව බොධිසත්ත්වයෝ කියන්නාහු "රජ්ජුරුවෙනි, ගිජුලිහිණියන් සියක් යොත්තකින් ඔබ්බේ තුබූ කුණු දකින්නේ සැබව, පැමිණෙන්නාවූ විපත්තියට තුබූ මල හෙයින් දැනගත නොහෙන්නාහ"යි කීහ. එවිව රජ්ජුරුවෝ 'සිටානෙනි, ගිජුලිහිණියෝ තොපට සම්පත් දුන්නෝ සැබෑ දැ"යි පිවාළසේක. "සැබව දේවයන්වහන්ස, ලිහිණියා ඇර වදුළ මැනව, මම උන් උන්ගේ සම්පත් උන් උන්ටම දුන්හ"යි වදුරා දෙකල් ගලපා ගිජ්ඣ ජාතකය නිමවා වදුළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ තම් ආනන්දස්ථවිරයෝය, බරණැස් සිටානෝ තම් ශාරිපුත්‍රස්ථවිරයෝය, දෙමව්පියන්ට උපස්ථාන කළා වූ ගිජු ලිහිණියා තම් බුදු වූ මම්මය"යි වදුළසේක.

මේ බණ අවසානයෙහිදී ඒ භික්ෂූන්වහන්සේ දහසක් නැසින් ප්‍රති මණ්ඩිත වූ සෝවාන් ඵලයට පැමිණි සේක.

## 161
## නකුල ජාතකය

තවද පරදුකඩ දුකකිත වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ සේනා නායක මහා අමාත්‍යයන් දෙන්නෙකුගේ කෝපයක් නිසා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්තමාන කථාව යට කියන ලද උරග ජාතකයෙහි විස්තර වසයෙන් බස්නේය. "මහණෙනි, මේ මහා අමාත්‍යයන් දෙන්නාගේ කෝප වෛරය පළමුත් ඇරවූවෙම් වේදැ"යි වදාරා ආරාධිත වූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්,**

යිවඟිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ බ්‍රාහ්මණකුලයක උපන් සේක. පඤ්චකාමයෙහි ආදීනව දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පන්සලක වාසය කරණ සේක.

එසමයෙහි පන්සල සමීපයෙහි සක්මන් කෙළවර තුඹසෙක මුගටියෙක් "වාසය කෙරෙනි, එතනට සමීපයෙහි ගන්බිල යකසණියෙක් වාසය කෙරෙයි. එසමයෙහි එකියන නාගයා හා මුගටියා දවස්පතා උනුන් කඩා කා උනුන් කන්නාහ. එසමයෙහි තාපසයෝ සිතනුයේ මා සේ වූ තාපස කෙනෙකුන් සමීපයෙහි ඉන්නා මුන් දෙන්නා උනුන් කෙරේ වෛරව ඉඳින්ට සුදුසු නොවෙයි සිතා අවවාද කියා සමගි කළහ. එසමයෙහි එක් දවසක් සණියා ගොදුරට යාදී මුගටියා තුඹසින් කර මැත්කොට දත් පෙණෙතුරු කට දක්වාගෙණ වැදහෙව නිදමින් සිටියේය. ඒ වේලාවට තාපසයෝ එතනට අවුත් ඌ දැක "ඇයි තා ඉතා භයංකාර කොටපියා ඉන්ට තාගේ අසත්පුරුෂ වූ සණියාත් සත්පුරුෂව ගියාවුව, කුමක් නිසාදැ"යි විවාළහ. එවිට මුගටියා කියන්නේ "අම්තුයා කෙරෙහිත් සංකා කළයුතුමය, මිත්‍රයා කෙරෙහිත් සංකා කළයුතුමය, එසේ හෙයින් පසම්තුරා කෙසේ විශ්වාස වූවත් සංකා කළයුතුය"යි කීහ. එබස් අසා බොධිසත්ත්වයෝ "තොප සේ වූ සිතක් සණියා කෙරේ නොසිතව"යි කියා භාවනා කොට නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහ. මුගටියා හා නයාත් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදාරා මේ නකුල ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි මුගටියා හා නාගයා නම් මෙසමයෙහි වෛරී වූ මහා අමාත්‍යයෝ දෙන්නාය, තාපසව උපන්නෙම් ලොවිතුරා බුදු වූ මම්ම ය"යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

## 162 උපසාළ්හක ජාතකය

තිවද කරුණා නිධානවූ සම්බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපසාළ්හක නම් බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රාහ්මණයාගේ පුතනුවෝ දවසෙක "මා මළහොත් චණ්ඩාලාදීන් නොදවාපු සුචිපවිත්‍රස්ථානයක දවව"යි කීහ.

එබස් අසා බමුණාගේ පුතා කියන්නේ "මම එසේවූ ස්ථානයක් නොදනිමි, නුඹවහන්සේ ම එසේ වූ ස්ථානයක් පැවොත් යහපතැ"යි කීය. එබස් අසා බමුණා කීයේ කාරණය යි කියා පුතා හා සමග ගිජ්ඣකූට පර්වතයටගොස් ගල්කුළු තුණක් මඬ්‍යයේ "මෙතන යහපතැ"යි පුතාට කියා පුතා හා තමා දෙන්නා පාතට බස්නා අවස්ථාවට එදවස් සම්බුදුරජාණන්වහන්සේ මහාකරුණාසමාපත්තීන් ලොවබලා වදාරණසේක්. බමුණා හා පුතාගේ හේතුසම්පත් දැක ගිජ්ඣකූට පර්වතයට නැගී වදාළ සේක.

එවේලාවට බමුණා හා පුතා බස්නාවුන් දැක "ඇයි කොතනට ගොසින් බසුදැ යි විචාරා වදාළ සේක. එවිට පිය බමුණා නො බැණ නො නැගී සිටියේය. පුතා කියන්නේ "සඩාමීනි මේ අපගේ පියාණන් වහන්සේ හානිවූ දවසක යහපත් තෙතක තමන් වහන්සේ දවන්ට කියා පණිත මුදුනේකුළු තුණක්මඬ්‍යයේ දවන්ට කී සේක, ඒ බලන්ට ගියමහ"යි කීහ. එවිට සම්බුදුරජාණෝ "ඒ ස්ථානය බලන්ට අපිත් යමහ"යි බමුණා සමග පර්වතයට නැගී ස්ථානය දැක "තාගේ පියා හා තොපි නොඉඳුල් තෙතක් සොයා ඇවිද්දෝවේදැ'යි වදාරා බමුණා විසින් ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

යිවගිය දවස රජගහනුවර උපසාළ්හක නම් බමුණෙක් ඇත, ඒ තමාත් තමාගේ පුත හා සමග කාත් නොදුවූ ස්ථානයක දවන්ට වුවමැනවැ යි කියා ගිජ්ඣකූට පර්වතයට නැංගේය. බොධිසත්ත්වයෝ මගධරට බමුණුකුලයක ඉපිද දිසාපාමොක් ආචාරීන් අතුරෙන් ශිල්ප නිමවා ඉගෙණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වාසය කරන්නේ බමුණා හා පුතා ගිජ්ඣකූට පර්වතයට අවුත් බස්නා වේලාවට උන් හා සමග පර්වතයට නැගී "මේ තොප කරන්නේ කිම්දැ?" යි විචාරා එපවත් අසා තාපසයෝ පරසිත් දන්නා විසින් "එම්බල බ්‍රාහ්මණය සුචි පවිත්‍රයට අවගත්තාවූ ස්ථානයේ ඒ ඒ ජාතියේ සත්ත්වයන් මෙතන දැවූජාති හා තාත් ඒ ඒ කුලයෙහි ඉපදවූ ජාති හැර මෙම නුවර උපසාළ්හක නම්බ්‍රාහ්මණව ඉපිද මේ තමාගේ පුතා හා සමග එතනට අවුත් දැවූ ජාති තුදුස්දහක් වෙයි. එසේ හෙයින් මිනියක් නොදැවූ ස්ථානයක් මිනියක් නොතිබෙන ස්ථානයක්එක තැනකත් නැත්තේ වේදැ?"යි කියා සතරවිහාර භාවනා සෙසාට බඹලොව ගිය හ යි වදාරා උපසාළ්හක ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි දෙපුතුපියෝ නම් දැන් මේ දෙපුතුපියෝමය, තාපසවැපත් තෙම් ශාස්තෘවූ බුදුවූ මම්මය"යි වදාළසේක. මේ ජාතකාවසානයෙහිදී ඒ බ්‍රාහ්මණ දෙපුතුපියෝ දහසක් තයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටියාහ.

---

## 163
## සම්බි ජාතකය

තවද ලෝකදිවාකර වූ සම්බුදුහු වහන්සේ රජගහනුවර තපොදාරාම විහාරයෙහි වැඩවසන සමයෙහි සම්බි තෙරුන්වහන්සේ අරභයා මේ ජාතකය වදාළ සේක.

සම්බි තෙරුන්වහන්සේයයි යන නම කුමක් නිසාද යි යතහොත්, එක් දවසක් ජලස්නානය කොට අදහස ඇඳගෙණ සිවුර අත ලා ගෙණ ඇඟ පැන් වියළෙනතුරු සිටි සේක. එවිට බොහෝ භික්ෂූන් වහන්සේ උන්වහන්සේගේ රූපශ්‍රීය දැක රූපශ්‍රීයෙන් අඩුවක් නැති හෙයින් සම්බි තෙරුන් වහන්සේය යි නම් ලත් සේක.

එක්තරා දිව්‍යස්ත්‍රියක් උන්වහන්සේගේ රූපශ්‍රීය දැක පිළිබඳ සිත් ඇතිව එක් දවසක් උන්වහන්සේ කරා ගොස් කියන්නී "මේ නියා රූපශ්‍රීයාවක් ඇතුව පංචකාම සැපය අනුභව නොකොට මහණව ඉදීමෙන් කාරණය කිම්ද? වෘද්ධ අවස්ථාවට පැමිණිකල තපස් රක්ක මැනවැ"යි කිව. මේ අවස්ථාවෙහි ගිහිගෙයි උන්න මැනව යි කී එබස් අසා තෙරුන්වහන්සේ කියන සේක් "එම්බල මරණ නම් කවර අවස්ථාවෙහි පැමිණෙන බවත් නොදනෙහි, එසේ හෙයින් සිවුරු නොහරිමි"යි කී සේක. එවිට දෙව් දූ තම අභිප්‍රායට බස් නොකී හෙයින් අන්තර්ධානව ගියාහ. තෙරුන් වහන්සේ එපවත් ගොසින් සම්බුදුන්වහන්සේට කී සේක.

සම්බුදුරජාණන්වහන්සේ "පළමුත් දෙවතා දූ තොප තබා උත්තමයන්ටත් මේ බස් කීවා වේදැ"යි වදාළ සේක.

**ඒ කෙසේද? යත්,**

ඊට පසුගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ හිමාලවනයෙහි වාසය කරණ සේක.

එක් දවසක් ජලස්නානය කොට රිවිසුඹුලක් අතලා ගෙණ ශරීරයේ පැන් වියළෙනතුරු වැඩසිටි සේක.

එක්තරා දිව්‍යස්ත්‍රියක් උන්වහන්සේගේ රූපශ්‍රීය දැක පිළිබඳ සිත් ඇතුව "යෞවන අවස්ථාවෙහි පංචකාම සැප අනුභව නොකොට මහණව ඉදීමෙන් කාරිය කිම්ද? වෘද්ධ අවස්ථාවට පැමිණි කල තපස් රක්ක මැනව. මේ අවස්ථාවෙහි ගිහිගෙයි වුව මැනව"යි කිව. එබස් අසා තාපසයෝ කියන්නෝ "එම්බල මරණ නම් කවර අවස්ථාවේ පැමිණෙන බවත් නොදනෙහි, එසේ හෙයින් තාපස ප්‍රව්‍රජ්‍යා නොහරිමි"යි කී සේක. එවිට දිව්‍යස්ත්‍රී අන්තර්ධාන වියයි කියා සම්බි ජාතකය නිමවා වදාළ සේකි.

"එසමයෙහි තාපසව උපන්නේ බුදු වූ මම්මි ය" යි වදාළ සේකි.

---

## 164 සකුනග්ඝි ජාතකය.

තිවද තෙලොක්‍ය චූඩාමණිභූත වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් දවසක් භික්ෂූන් වහන්සේට අවවාද කරණ සේක් "මහණෙනි භික්ෂූන් විසින් දෙමව්පියන් ගොදුරු සොයා ගියමග යා යුතුය. අසථානයේ ගොදුරු සොයා යාම විනාශයට කාරණය"යි යනාදී සකුන සූත්‍රය වදාළ සේකි. ඒ විස්තර වශයෙන් මහවගයෙහි බස්නේය. "මහණෙනි පක්ෂි පව්ා අසථානයේ ගොදුරු සොයා යාමෙන් විනාශයට පැමිණියෝ වේද?"යි ආරාධිත වූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ කැටකිරිලිව උපන්සේක. කැටකිරිලිව ඉපද සී කැට අස්සේ ගොදුරු කා නැගන් හා සමග වසන්නාවූ කැටකිරිලි තොමෝ එක් සමයෙක අන්‍ය භූමියෙක ගොදුරු සොයා කම් සිතා ඔබ්බකට ගොස් නැනිබිමෙක ගොදුරු සොයා කමින් සිටියේය. එවේලාවට එක් උකුස්සෙක් කැටකිරිල්ලට නො අඟවා අවුත් ගසාගත. කැටකිරිලි උකුස්සා ගසාගෙණ යමින් සිටියදී හඬ හඬා කියන්නී "මාගේ විෂයනොවූ පර විෂයට අවුත් මේසා දුක් පැමිණියේය. මාගේ විෂය වීනම් මට කුමක් කොට පියන්නෝ ඇද්ද"යි කීය. එබස් ඇසූ උකුස්සා "එසේ වීනම් නාගේ විෂයට නොගොස් හිඳු, තාගේ විෂය මම ගසාගත නොහෙම්දැ"යි කියා කැටකිරිල්ල අත අළහ. එවිට කැට කිරිල්ල ඇවිත් සීකැට මඩ්‍යයේ හිඳ "මෙවිට මා ගසාගතා"යි කීය. එබස් උකුසු අසා මහ වේගයෙන් ගසන්ට අවුත් ලඟට දැන් දැන් ගසම් කී අවස්ථාවට සී කැටයෙන් බිමට බැස සැඟවිත, උකුසුන් ආ වේගය රදවාගත නොහී සී කැටෙහි ලය තලාගෙණ දැස් උඩහිදුවා මළේය.

ඒ දක්වන්නාවූ සම්බුදුරජාණන් වහන්සේ "මහණෙනි, යම්සේ දෙමව්පියන් ඉන්නාවූ සථානයෙන් ඔබ්බට ගියාවූ කැටකිරිලි යම්සේ දුකට පැමිණියේද? පියා තන් නැවිදුනාවූ මග ඇවිදුනාවූ භික්ෂූන්ට එසේම වන්නේය. භික්ෂූන්ට පියා නෝ කවුරුදැයි යතහොත්, සම්බුදුරජාණන් වහන්සේය, උන්වහන්සේ වදාළමාගීය නියාවට පිළිපැදීම උතුම, යම්සේ කැටකිරිලි සීකැට ඇති තැන් ගොදුරු නොකා නැනිබිම ගොදුරු කන්ට ගොස් උකුස්සාට අසුවීද, එම නියායෙන්ම මහණෙනි, රූපශ්‍රියක් දැක ඊටම චක්ෂූරින්ද්‍රිය එලීමෙන්ද යමෙක් තෘෂ්ණාවට වාල්වීමෙන්ම ඉන්ද්‍රිය එලීමය යනාදී සඛාලම්බනයෙහි ඇල්ම කොට මෘත්‍යුමාරයාට අසුවන නියාව යනපත් තෙනට ගොදුරට නො ගොසින් උකුස්සාට අසුවූවාක් මෙන් එසේවූ සඛාලම්බනයෙහි සිත නො එලවා සම්බුදුරජාණන් වදාළ ප්‍රතිපත්තිනියාවට දවස් හැර සංසාර සාගරයෙන් ගැලවියාම නම් තමාගේ සවකීය සථානයට ඇවිත් ගැලවී ගියාවූ කැටකිරිල්ල වැන්නේය යි මහණෙනි, ඒ කැටකිරිල්ලත්

මළාවූ උකුස්සා පිටට පැනනැඟී මාගේ සථානයට පැමිණි නෙයිත්පසම්තුරා පිට දක්වන ලදැ''යි වදාරා සකුනග්ඝි ජාතකය නිමවා වදාළ සේකි. ජාතකාවසානයෙහි බොහෝ සත්ත්වයෝ සෝවාන් වූහ.

''එසමයෙහි උකුස්සා නම් දෙවදත්තසථවිරයෝය, කැටකිරිලිව උපන් තෙම් බුදුවූ මම්මය''යි වදාළසේකි.

---

## 165 අරක ජාතකය

මේවද ශාක්‍යසිංහවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මෙත්තා සූත්‍රය නිසා මේ ජාතකය දක්වන ලදැ.

**ඒ කෙසේද? යත්,**

''මහණෙනි, පුරාදු කරණලද්දාවූ වඩනලද්දාවූ මෙතෙහි කරණලද්දාවූ මෛත්‍රී සිතින් උපලක්ෂිතවූ සත්ත්වයන්හට එකොළොස් වැදෑරුම්වූ ඉෂ්ට විපාක ඇත්තේය. ඒකවරේද? යත් ඒ සත්ත්වතෙමේ යෙහෙන් නිදන්නේය, යෙහෙන්පුබුදින්නේය, හයංකාර සවප්නාදියක් නොදක්නේය, සියලු සත්ත්වයන්ට ප්‍රියකරුවන්නේය, යක්ෂ රාක්ෂසාදින්ටත් ප්‍රියකරුවන්නේය, දෙවියන් විසින් රක්නා ලබන්නේය, ඔහුට ගින්නෙන් හෝ විෂයෙන් හෝ ආයුධයෙන් හෝ උපද්‍රවයක් නැත්තේය, කිපියාවුත් ඔහුගේ සිත වහාම තැනෙන්නේමය, ඔහුගේ මුඛය ප්‍රසන්න ශ්‍රීවර්ණී ඇත්තේය, සිහිමුළාව නොමියන්නේය, මරණින්මත්තෙහිත් නොපිරිහුණු මෛත්‍රී ඇත්තේය, බ්‍රහ්මලෝකයෙහි උපදින්නේය''යි මෙත්තානිශංස ගෙණහැර දක්වා වදාරා ''මහණෙනි, භික්ෂූන් විසින් තමා සියළු සත්ත්වයා කෙරෙහි පිරිසිඳ හෝ සාමාන්‍යයෙන් හෝ සියළු සත්ත්වයෝ නිදුක් නීරොග සුවපත් වෙත්වයි කියා මෛත්‍රී භාවනාවදදුකඛිත සත්ත්වයෝ දුකින් මිදෙත්වයි කියා කරුණා භාවනාවද, සුවපත් සත්ත්වයන් දැක සත්ත්වයෝ සුඛිත මුදිත වෙත්වයි කියා මුදිතා භාවනාවද, සියලු සත්ත්වයන් කෙරෙහි උත්කර්ෂීවක් නොකොට සම සිතින් දැකීමෙන් උපෙක්ෂා භාවනාවද යි චතුර්විධ බ්‍රහ්ම විහාර භාවනායෙහි අභියොග කළ යුත්තේය''යි සම්ප්‍රාප්ත පර්ෂදට ධර්මදේශනා කොට වදාරා ''මහණෙනි, පෙරත් උත්තමයෝ මෛත්‍රී භාවනා කොට සංවර්තවිවර්තසථායී කල්ප සතක් වතුරු බ්‍රහ්මසම්පත්තියෙන් නොපිරිහුනෝ වේදැ''යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්,**

පෙරගියදවස එක්තරා කපෙක බ්‍රාහ්මණකුලයෙකඉපිද පඤ්චකාමයෙහි ආදීනව දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට නායකව අරක මහාශ්‍රාවකභාව වාසය කරණ සේක. තුමුත් මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා යන සතර බ්‍රහ්මවිහාර භාවනා කොට තමන්ගේ තාපසවරුන්ටත් අවවාද කරන්නෝ මෙසේ කියත්. ''තාපසවරු නම් යම්සේ සත්ත්වයෙක් සතර දිගය සතර අනුදිගය උඩය යටය යන දශ දිශාවෙහි ඇත්තාවූ සත්ත්වයා කෙරෙහි මෙත් සිත් පතුරුවාද? ඒ සත්ත්වයාගේ සන්තානයෙහි ඉන් අවශත්

අකුශලධර්ම කෙනෙක් ඇත්නම් අධික වූ මෛත්‍රී ආනුභාවයෙන් යුක්ත වූ හෙයින් විපාක දායක නොවී ඒ අකුශලයෝ වන්නාහුය"යි බොධිසත්ත්වයෝ ඒ සාෂිභණයාට ධර්මදෙශනා කොට සතර බ්‍රහ්ම විහාර භාවනා කොට එයින් චුතව බ්‍රහ්ම ලෝකයෙහි ඉපිද සංවර්ත විවර්තසථායි කප් සතක් බ්‍රහ්මසම්පත් විඳ්දහ යි කකණ්ටක ජාතකය උගන්වා දක්ක යුතුය යි වදාරා එසම යෙහි අරක තම් ශාස්තෘ වූයෙම් ලොවුතුරා බුදුවූ මම්මය යි වදාරා අරඤ්ඤ ජාතකය නිමවා වදාළ සේක.

---

## 166
## කල්‍යාණ ධම්ම ජාතකය

**ත්‍රිවිද** ශාක්‍යකුලනායක වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසනයෙහි ප්‍රසන්නවූ එක් උපාසකයෙක් සම්බුදුරජාණන් වහන්සේගෙන් බණ අසන්ට ගඳදුම් මල් පහන් ගත්අත් ඇතිව සම්බුදුරජාණන් කරා දකින්ට ගියේය.

උන් යාදී උන්ගේ නැන්දා ගෙවවුන් තමාගේ දුව අතින් විචාරන්නී "තොපගේ සැමියා තොපට ප්‍රියකරුව වාසය කෙරේ දැ"යි විචාළීය. එපවත් අසා කියන්නී "අපගේ සැමියා දවස්අරණ මනා භික්ෂුකෙනෙකුන් දවස් අරණ වැන්න"යි කීව. මවගේ කණ මහලු සෙයින් ඇව ඇසෙන්නේ "සැමියා ගියා ය"යි කීවාසේ ඇසිනි. "එසේද තොපගේ සැමියා මහණවෙන්ට ගිය"යි කියා අඬන්ට වන. ඇගේ අඬ අසා ගෙයි දැසි දස් සියල්ලෝ අඬන්ට වන්හ. බොහෝ ස්ත්‍රී පුරුෂයෝ ඒ ගෙට එන්නෝ "කිමෙක් දැ?"යි විචාරා එපවත් ඇසූහ.

ඒ වේලාවට උපාසක පෙරලා ගෙට එන්ට විදියට බැසපියා ඒ වේලාවට එක් මිනිසෙක් ගොසින් එපවත් මගදී දැක කෙළෙඹි පුත්‍රයාට කියන්නේ "තොපගේ ගෙයි තොප මහණ වුව යි කියා එනි අඬති"කීහ එපවත්කෙළෙඹි පුත්‍රයා අසා මව උපන්නාවූ කීර්තිඝොෂාව නො නසම් සිතා ගණයට ගොස් සම්බුදුරජාණන්වහන්සේගේ සමීපයට ගියේය. සම්බුදුරජාණෝත් "ඇයි උපාසකය දැන් නොවේද තෝ බුද්ධුපසථානය කොට ගියෝය, පෙරළා කුමක් නිසා අවුදැ?"යි විචාරා "සැමිනි, මහණ නොවී ඉන්දදී මහණ වූව යි ඇසිනි. ඇසුනු කීර්ති ඝොෂාව නො නසම් සිතා මහණවන්ට ආම්, එසේ හෙයින් මා මහණ කර වදාළොත් යහපතැ" යි කීය. එබස් අසා සම්බුදුරජාණෝත් "යහපතැ"යි කියා මහණකර වදාරා උපසම්පදාව දෙවා වදාළ සේක. ඒ භික්ෂූන් වහන්සේත් නොබෝ දවසකින් විදර්ශනා වඩා රහත් වූ සේක.

එක්දවසක් භික්ෂූන්වහන්සේ ධර්මසභාමණ්ඩපයෙහි රැස්ව කථා කරණ සේක් "ඇවැත්නි, අසමිල් කෙළෙඹි පුත්‍රයා තමාට උපන් කීර්තිඝොෂාව නො නසා මහණව සියලු කෙලෙසුන් නසා රහත් වූවෝ වේදැ"යි කියා කියා වැඩහුන් තැනට සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාව පුම් භාගයෙහි

කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, පෙර උත්තමයෝත් උපන්නාවූ කීර්ති ඝොෂාව නොකැසුවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

යම්වකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක්රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ නුවර සිටා නන්ගේ ගෙයි ඉපිද වැඩිවිය පැමිණ ඒ සිටානන්ගේ ඇවැමෙන් සිවුසේසත් ලැබ රාජසේවය කරණ සමයෙහි එක් දවසක් රාජසේවය කරන්ට යාදී වතීමාන කථාව සේම "සිටානන් මහණ වූහ"යි හඬන්ට වන්නාහ.

ඒ වේලාවට බොධිසත්ත්වයන් වහන්සේත් රාජසේවය කොට පෙරලා ගෙට යන්නාවූ මග යන මිනිසෙකුගෙන් එපවත් අසා කීර්තිඝොෂානොනසම්සිතා පෙරලා රජගෙට අවුත් රජ්ජුරුවන් දුටහ, රජ්ජුරුවෝත් "සිටානනි, ගියවර නොමකා ආයේ කුමටදැ"යි විචාරන්නා "දෙවයන් වහන්ස, මා මහණ නොවී ඉඳදී මහණ වූහයි කීර්තිඝොෂාව පැතිරිණ. ඒ උපන්නාවූ කීර්ති ඝොෂාව නොනසා මහණ වන්නා කැමැත්තෙමි." එසේ හෙයින් ඒ අර්‍ථය ප්‍රකාශ කොට දක්වන පිණිස මහසිටානෝ මෙසේ කියත්. "ජනප්‍රධානවූ දේවයන් වහන්ස, යම්සේ කල්‍යාණවූ කීර්තිඝොෂාවක් ප්‍රකාශවූ කල කීර්තිඝොෂාව නසාපීම කාරණා නොවෙයි, හිරිඔතප් ඇති සත්ත්වයන් තමාට පැමිණි ධුරය හැරපීම කාරණා නොවෙයි, කියා තවද කියන්නාහු "ජන ප්‍රධානවූ දෙවයන් වහන්ස, එසේ හෙයින් මට පැමිණියාවූ කල්‍යාණගුණය අරණේ යුතු නැත, එසේ හෙයින් සවාමීනි, මම මහණදම් පුරමි. පඤ්චකාමයෙහි තෘෂ්ණාව නැතැ"යි කියා රජ්ජුරුවන් අනින් අවකාශ ඉල්වාගෙණ හිමාලයවනයටගොස් තාපසව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙණ නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බඹලොව උපන්නාහ යි වදාරා කල්‍යාණ ධම්ම ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද සථවිරයෝය, තාපසව උපන්නෙම් දැන් බුදුවූ මම්මය" යි වදාළ සේකි.

---

## 167 දද්දර ජාතකය

එවද ශාක්‍යකුලතිලකවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොකාලික සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

සැවැත්නුවර බොහෝ භික්ෂූන් වහන්සේ ඒ ඒ තැන බුදුන්ගේ පාළි ධර්මය පිරිවහන සේක. ඒ කොකාලික තෙරුන්නාන්සේ බණ කියන්නා අසා තමන්වහන්සේ බණ කියාගත නොහෙතත් බණ කියන නියාවට "අපි බණ නොකියමෝද? එසේ කල බණ අසන්නෝ ඇත්නම් කියන්නමෝ වේදැ"යි කියාගෙන ඇවිදිනා සේක.

එපවත් සංඝයාවහන්සේ අසා එසේ වී නම් "කෝකාලිකයනි, අද දවස් තෙපි බ කියව"යි කීසේක. එබස් අසා "යහපත බණ කියමි" විගස යහපත් කොට කෑද අවුළුපත් ආදී දෙය වළඳා කටුකරඹු මලේ පැහැය ඇති සිවුරකුත් යහපත් තැඹිලිවන් සිවුරකුත් ඇඳ පෙරව බණ කියන්ට උන්සේක. "ධම්මසභාමණ්ඩපයං භදන්තා" කියා බණට අඩගා ඒ අඩ අසා බොහෝ භික්ෂූන්වහන්සේ ධම්මසභාමණ්ඩපයට රැස්වූ සේක. එතනට තමන් වහන්සේත් වැඩ වැඩ භික්ෂූන්වහන්සේව නමස්කාර කොට විසිතුරු කමීනත්ත කළ විජිනිපත්‍රයක් අතට ගෙණ ධම්මාසනාරූඪව බණ කියන්ට වැද පළමු කොට කියන ගාථාවෙන් පදයත් කියා අනිකුත් පදය දූකගත නොහී තූෂ්ණීම්භූතව සිටියාඩහය මුළුල්ල ඩාදිය සෙල්වී තමන්වහන්සේ කී වාසියව බණ කියාගත නුහුනු හෙයින් හයලජ්ජාවට පැමිණ ධම්මාසනයෙන් බැස කරබාගෙණ පලාගිය සේක. ඒ වේලේ අනික් භික්ෂූ කෙනෙකුත්වහන්සේ පලඟ නැගී බණ කී සේක.

එක්දවසක් ධම්මසභාමණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන්වහන්සේ කොකාලික සථවිරයන් බණ කියන්ට සපනා ය යි උනුම්හ; දැන් උන් බණ නොදන්න නියාවත් නුවණැති නියාවත් දතුම්හ යි කිය කියා මේ කථාවෙන් යුක්තව උන්සේක. එතනට සම්බුදයන්වහන්සේ වැඩවදුරා එපවත් අසා ආරාධිතවූ සම්බුදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යි වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ සිංහයන්ට රජවඉපිද ගල්ගුහාවක වාසය කරන්නාහ. එතන සමීපයෙහි ගල්ගුහාවෙක කැනහිලෙක් වාසය කරන්නේය. එසමයෙහි එක්දවසක් මහවැස්සෙක් වට, එවිට බොහෝසිංහයෝ බොධිසත්ත්වයන් ලඟට අවුත් බොධිසත්ත්වයන් හා සිංහනාද කොට කෙළනට වන්හ. ඒ වේලාවට කැනහිලාත් තමාගේ ගල් ගුහාවෙන් එලියට අවුත් අඩගසා කෙළිනට වන, කැනහිලාගේ අඩ ඇසූ සිංහයෝ ලජ්ජාව මුවෙන් නොබැණ සිටියාහ. ඒ වේලාවට බොධිසත්ත්වයන්ගේ පුත්වන සිංහපැටවෙක් බොධි සත්ත්වයන්ට කියන්නේ "පියානන්වහන්ස, මේ සිංහ සමූහයා අඩගසා කෙළිමින් සිටියව නිබුගේ ඇයිදැ?"යි විමසේය. එපවත් සිංහ රජ්ජුරුවෝ අසා "එම්බල පුත, අපි නම් සිවුපාවුන්ට රජ කුලේ උපනුම්හ, එසේ වූ අපි හැම කෙළිනා වේලාවට සිවිපාවුන්ව නීව වූ සිඟාලයා අප හා සමග අඩු හෙයින් ලජ්ජාවෙන් සිංහයෝ බැණ නො නැගී උනුම්හ"යි වදුරා මේ දද්දර ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි සිඟාලයෝ නම් කෝකාලික සථවිරයෝය, සිංහපෝතකයෝ නම් රාහුලසථවිරයෝය, සිංහරාජව උපන්නෙම් ලොවිතුරා බුදුවූ මම ය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

## 168 මකීට ජාතකය.

තිවද ශාක්‍යසිංහවූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝගදන්නා භික්ෂූ කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්තමාන කථාව පකිණ්ණක නිපාතයෙහි උද්දාල ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි "මහණෙනි, පළමුත් මේ භික්ෂූහු වඤ්චා වෙන් ගිනිතපින්ට වන්නේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිත වූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

පුරාතනය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ එක්තරා කෙළෙඹිපුත්‍රයෙක්ව උපන්නාහ.

එසමයෙහි බොධිසත්ත්වයන්ගේ බිරින්ද පුතෙකු වැදූහ. ඒ පුතා වැඩිවිය පැමිණෙන අවස්ථාවට බොධිසත්ත්වයන්ගේ බිරින්ද නැතිවිය. එවිට බොධිසත්ත්වයන්ගේ පුතානුවන් කැන්දගෙණ බොහෝ නැයන් අඩම්බිසියදීගේ පිරුණු සම්පත් හැර හිමාලය වනයට ගොස් පන්සලක් කොට වාසය කරන්නාහ.

එසමයෙහි එක් දවසක් මහා වැස්සෙක් වසින්ට වන. ඒ වේලාවට බොධිසත්ත්වයෝ පන්සල මැස්සෙක වැදහොත්තාහ. බොධිසත්වයන්ගේ පුතානුවෝ බොධිසත්ත්වයන්ගේ පය මැඩ මැඩ උන්නාහ. ඒ වේලාවට එක් වදුරෙක් සීතයෙන් පීඩිතව පියා සිතන්නේ "මම තාපසයන්ගේ පන්සලට ගියෙම් නම් වැද්ද නොදෙති තාපස වේසයක් ලාගෙණ යෙම්" සිතා මළා වූ තාපස කෙනෙකුන්ගේ වල්කලා ඇඳගෙණ තාපසයන්ගේ පන්සල ගාවා තල්ගස මූල කරබාගෙණ සිටියේය. ඒ වේලාවට බොධිසත්ත්වයන්ගේ පුතානුවෝ ගෙයිසිට දොරට ගිය තැනැත්තේ වදුරු දැක "තාපසකෙනෙකුන් වහන්සේ ඇවිත් සිටින සේකැ"යි සිතා ගෙට අවුත් 'පියාණන් වහන්ස තාපස කෙනෙකුන් වහන්සේ ඇවිත් දොර සිටිනාහ, උන් ගෙට ගෙන්වා ගිනි තප්පවන්ට වුවමැනවැ"යි කීහ. එබස් අසා මැස්සෙන් බැස දොරට අවුත් වදුරා දැක "එඹුලු පුත තාපසකෙනෙකුන්ට මෙසේ වූ මූහුණෙක් නැත එසේ හෙයින් මේ වදුරාය මුන් සේ වූවන් ගිනිතපින්ට ගෙන් වූ කල තැප යන කල පන්සල ගිනි ලා පියා යන්ට හපන්නුය, එසේ හෙයින් තා මෙතන සිටින්නේ ඇයිදැ"යි කියා ගිනිපෙනෙල්ලක් බලා ගැසූහ. එවිට තමාගේ වල්කලා දමා ගසට පැන නැංගේය. බෝධිසත්ත්වයෝත් සතර බ්‍රහ්ම විහාර භාවනා කොට නොපිරිහුනු ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලොකප්‍රාප්ත වූහයි වදාරා මකීට ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි වදුරා තම් වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූහුය, එසමයෙහි තාපස කුමාරයෝ නම් රාහුල සථවිරයෝය තාපසව උපන්නෙම් ලොව්තුරා බුදු වූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 169
## දුතියමක්කට ජාතකය.

තවද ශාක්‍යකුල චූඩාමාණික්‍ය වූ සම්බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත මහතෙරුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

එක් දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන්වහන්සේ ''දෙවදත්ත සථවිරයෝ අකෘතඥයෝය, කෙලෙහිගුණ නොදනිති' යනාදීන් මේ කථාව කොට උන් කල්හි සම්බුදුරජාණන් වහන්සේ එතනට වැඩවදාරා ''මා එන්කාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදාරා ''අනික් කථාවකින් යුක්තව නුනුම්හ, දෙවදත්තසථවිරයන් වහන්සේගේ කෙලෙහිගුණ නොදන්නා බව කිය කියා උනුම්හ''යි කී කල්හි ''මහණෙනි, දැන් මතු නොවෙයි දෙව දත්තසථවිරයෝ කෙලෙහිගුණ නො දන්නෝය''යි වදාරා ආරාධිත වූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්;**

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ කසීරට බමුණුකුලයක ඉපිද පඤ්චකාමය හැර තාපසව වසන්නාහ.

එසමයෙහි එක්තරා මාවතක නියඟෙක් කෙළේය. බොහෝ පක්ෂීහු පැන් නො ලබන්නාහ, මග යන මනුෂ්‍යයන් ඇති කාලයෙහි පැන් ලබන්නාහ, නැති කලෙහි නො ලබන්නාහ, එසමයෙහි මනුෂ්‍යයන්ගේ සඤ්ඤාරය තැනක් කාලයක් ඒ මග නුවූයේ ය, එසමයෙහි බොහෝ පක්ෂීහු පැන් නො ලබන්නාහ. එක් වදුරෙකුත් පැන් වළක් සම්පයෙහි පැන් වත්කරණ කෙනෙකුන් නැත්තෙන් බල බලා ඉදීය. එසමයෙහි බෝධිසත්වයෝ කිසියම් කටයුත්තක් නිසා ඒ මග යන්නාහු ඒ විල සමීපයට ආවාහු පැන් උකා බී නහා එතන සිටි විසින් උන්ට පැන් වත් කළාහ. වදුරාත් ඒ පැන් බී බඩ පුරවාගෙණ ගසට නැඟි බොධිසත්ත්වයන්ව උසුළුපාන්ට වත, එවිට බොධිසත්ත්වයෝ ''යහපත තොප සේ වූවන්ට පැන් වත්කළ හෙයින් උසුළු පානේ වේදැ යි නීවයාට කළ දෙයෙහි ප්‍රත්‍යුපකාර නැත්තේ වේදැ''යි කීහ, එපවත් වදුරා අසා ''අපගේ ජාතියෙහි සත්ත්වයන් උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කළ කෙනෙක් කොයි ඇද්ද? තව මා කරන්නේ මෙතෙක් ද? තොපගේ හිස වර්වස් කොවිද මා යන්නේ ය''යි කීහ. එබස් අසා බොධිසත්ත්වයෝ ''මෙසේ නීවයා එසේ කරන්නේ සැබව''යි කියා නික්මුණාහ. වදුරා තමා කරා එන්නා අත්ත උඩ ඉඳ බොධිසත්ත්වයන් හිස්මුදුවන් වර්වස් එළා ගියේය. බොධිසත්ත්වයෝ වදුරා කෙරේ අමෛත්‍රියක් නො සිතා ගොස් ඉස් සෝදා නහා ගියෝ වේදැ යි වදුරා මේ ද්විතීය මක්කට ජාතකය නිමවා වදාළ සේක.

''එසමයෙහි වදුරා නම් දේවදත්තසථවිරයෝ ය, තාපසව උපන්තෙම් බුදුවූ මම්ම ය''යි වදාළ සේක.

## 160
## ආදිච්චුපට්ඨාන ජාතකය

තිවද ශාක්‍යකුලප්‍රසාද වූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වඤ්චා ප්‍රයෝගදන්නා භික්ෂුකෙනෙකුත් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්,**

වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂුකෙනෙකුන්වහන්සේ සම්බුදුරජාණන්වහන්සේව දක්වන්නා "මහණෙනි, දැන් මතු තො වෙයි පළමුත් වඤ්චාප්‍රයෝග දන්නේ වේදැ"යි වදාරා "ඒ කෙසේ දැ"යි ආරාධිත වූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ කසිගම බ්‍රාහ්මණකුලයක ඉපිද පසුකාමයෙහි ඇලුම් හැර සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් මහණව හිමාලය වනයෙහි බොහෝ තාපසවරුන්ට නායකව වාසය කරන්නාහ.

එසමයෙහි වස් සාරමස ලුණු ඇඹුල් සපයන නිසා හිමාලය වනයෙන් බරණැස් නුවරට අවුත් ඒ ගම උපාසකවරුන්ගේ ආරාධනාවෙන් නන්වා දුන්නාවූ පන්සල වාසය කරන්නාහ.

එසමයෙහි එක්තරා වඳුරෙක් තාපසවරුන් වීටියෙහි සිඟායාදී මේ තාපසවරුන්ගේ පන්සල විදැ පැන්වලත් ආදීවූ දෙයත් බිඳ ඛබරාවල පැනුත් තමා පන්සලෙත් වර්වස්කර මේ නියාගෙන් කරන්නේය. එසමයෙහිත් තාපසවරුන් වස් තුන් මස වස්වැස අන්තයේ "උපාසකවරුනි, අපි යම්හ"යි කීහ. එවිට උපාසකවරුන් "සෙව දවස අපගෙන් දෙන දන් වළඳ යන්නේ ය"යි කීහ. තාපසවරුන් "යහපතැ"යි ගිවිස්සාහ. උපාසකවරුත් බාඳ්‍යභෝජ්‍ය ඇතිව බත්මාළු තාපසවරුන් ඉන්නා තෙනට ගෙණ ගියාහ. ඒ වේලාවට වඳුරුත් සිතන්නේ මා ශාන්තදන්ත වෙශයක් දක්වාගෙණ මේ ගෙණා මධුර කැවිල්ලෙන් මාත් කන්ට වුවමැනවැ"යි සිතා මෙතෙක් ශාන්තදන්ත වෙශයක්ව ඉර බලාගෙණ සිටියේය. ඒ වේලාවට තාපසවරුන්ට දන් ගෙණා උපාසකවරු වඳුරා සිටි මානේ දැක "යහපතුන් ලඟ විසීගත් ගුණයෙන් මේසේ වනැ"යි කියා සතුතිකරන්ට වන්නාහ. එවිට තාපසයෝත් "මේ වඳුරාගේ යහපත් ගුණයක් කැත, මූව කුමට සතුතිකරන්නෙහි දැ"යි කීහ. "මුන් විසින් අපගේ පන්සල විදැ ඝනීදල්වා ගෙයි වර්වස් කොට කළ ඛබරා ආදීවූ දේත් බිඳ බොහෝ අනර්ථ කරණ ලදැ"යි කීහ. එපවත් අසා උපාසකවරු කැවිමුගුරු ගත් අත් ඇතිව වඳුරා ලුහුබඳවා ගත්හ. තාපසවරුන් හිමාලය වනයට ගොස් තපස් රැක බඹලොව ගියාහයි වදාරා මේ ආදිච්චුපට්ඨාන ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි වඳුරා නම් වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂුහුය, තාපසවරු නම් බුදුපිරිසය, ගණශාස්තෘව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මය"යි දක්වා වදාළ සේක.

## 171 කලහසමුඛී ජාතකය.

තිවද ශාක්‍යකුලප්‍රසාද වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්,**

එක් සමයෙක්හි කෝසල රජ්ජුරුවන්ගේ පසල් දනවියේ එක් ගමකට සතුරන්ගෙන් භයක් පැමිණියේය. එබස් අසා අජ්ජුරුවෝ වර්ෂා කාලය තිබියදී යුඩ පිළිබඳවූ කටයුතු හෙයින් අකාලයව තිබියදී නික්ම චතුරංගිණී සේනාව ඇරගෙණ ජේතවනාරාමය සමීපයේ දවස් ගතව කඳවුරු බැඳ උන්හ. ඒ ඉද සිතන්නාහු "මම අකාලයෙහි නික්මනිමි, එසේ හෙයින් සම්බුදුරජාණන් වහන්සේ දකිමි; සම්බුදුරජාණන් මා අතින් "මහරජ කොයි යවුදැ"යි විචාරණ සේක. එවිට මම මේ බව කියම් සම්බුදුරජාණන් මට මෙලොවිනුත් පරලොවිනුත් සංග්‍රහ කරණ සේක. එසේ හෙයින් නොයායුතු වීනම් "මහරජ කොයි යවුද? අකාලය"යි කියා වදාරණ සේක. යායුතු වීනම් මුවෙන් නොබැණ වැඩහිඳිනා සේකැ යි බුදුන් දකින්ට ගියාහ.

සම්බුදුරජාණන් "මහරජ, මධ්‍යාහ්නවේලේ කුමකට අවුදැ"යි විචාරා "ස්වාමීනි පසල්රට සතුරන් විසින් සේවාකමට යන ගමනේ ස්වාමීන් දැක වැඳ යන නිසා ආම්" කීහ. එබස් සම්බුදුරජාණන් අසා "මහරජ අකාලයෙහි යාම යහපත් නොවේ"යි වදාරා "පළමුත් අකාලයෙහි නික්මුනාවූ රජදරුවෝ උත්තමයන්ගේ කාරණා අසා නැවැත්තෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්,**

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයන් ඒ රජ්ජුරුවන්ට සියළු කටයුතු රාජ කාරියට ප්‍රධානවූ අමාත්‍යව උපන්සේක.

එසමයෙහි "පසල්රට සතුරන්ගෙන් භයක් උපනැ"යි කියා අසා රජ්ජුරුවෝ සේවාකමට යන ලෙස මගුල් උයනට දවස් ගතුවූහ. බෝධිසත්ත්වයන් රජ්ජුරුවන් හා මගුල් උයනේ කථා කොට කොට උන් කල අසුන්ට කානම් ගෙණවුත් නිවත නිසා කානම් ඔරුවෙක ලැවූහ. ඒ වේලාවට එක් වඳුරෙක් එතනට අවුත් කටිනුත් අතිනුත් උකාගෙණ ගසට නැගී කමින් සිටියේය. කමින් සිටියා වූ මුවින්ම ඇටෙක් බිම හින, එ කන්ට සිතා අතකට තිබූ කානම් දමාපියා බිමට බැස වැටුනු මුන්ඇටය ඇත මැත සොයා ඇවිද නොදැක ගසට නැගී සෝකයෙන් දහසකට ගැහිසිහිති නියා පැරදගිය එකකුසේ උන්නේය' ඒ වේලාවට රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන් අතින් "මේ වඳුරා කළ දෑ දුටුවදැ?"යි කියන්නාවූ "වානර තෙම අල්පවූ මුගටක් නිසා බොහෝ කොට කන කැවිල්ල අපවත් කළේය. එසේවූ අල්ප කටයුත්තක් නිසා මහත් කටයුත්තක් යම් පුරුෂයෙක්

නසාපියාද? එසේමය අප හැම ඇතුළුවූ ඇමදෙනාගේ කටයුත්තේ සැලැස්මය මුහුට සඳහා බොහෝ මුහුට දමාපු වදුරා වැන්නේය"යි කියා යන ගමන වැළකූහ.

සම්බුදුයන් වහන්සේගේ බස් අසා කෝසල රජ්ජුරුවෝ තමන්ගේ නුවර ටම ගියාහයි වදුරා **කලහසමුඛී ජාතකය** නිමවා වදාළ සේක.

"එසමයෙහි බඹදත් රජ්ජුරුවෝ තම් ආනන්දසථවිරයෝය, අමාත්‍යව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 172 තින්දුක ජාතකය.

**මේ**වද ශාක්‍යකුල ලොවන වූ සම්බුදුයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

බොධි ජාතකය, උම්මඟ්ග ජාතකය ආදීවූ දෙයෙහි ප්‍රඥාපාරමිතාව **වර්ණනා කරන්නාක් මෙන්** මේ ජාතකයෙහිත් සම්බුදුයන්ගේ ප්‍රඥාපාරමිතා වර්ණනාව කිය කියා වැඩඋන් තැනට සම්බුදුයන් වහන්සේ වැඩවදාරා "මහණෙනි මා **එන්නාට** පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා **එපවත් අසා** "මහණෙනි, **දැන් තිබෘ** තිරිසන්ව උපන් සමයෙහිත් තමන්ගේ ප්‍රඥා බලයෙන් **බොහෝදෙනා** ගොඩ ලැවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ **සම්බුදු**යන් වහන්සේ **ඉකුත්වත්** දක්වා වදාළ සේක.

**එ**තගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ අසූදහසක් **පමණ** වදුරන්ට **නායකව** හිමාලය වනයෙහි වසන්නාහ. සමහර **කලෙක්** මනුෂ්‍යපථයට අවුත් වන සමීපයෙහි පිටිසර **ගමෙක වසන්නාහ**. යහ**පත්** ඵල **පල්ලවයෙන් සම්පූර්ණවූ** තිඹිරිගසෙක් ඇත. මනුෂ්‍යයෝත් ඒ වනසමීපයෙහි **ගම්න් පලා යන්නාහ**. ඒ හිය අවසථාවට වදුරෝ ගම්ට **අවුත්** තිඹිරි කා ඒ ගම වාසය කොට මනුෂ්‍යයන් එන අවසථාවට පෙරලා හිමාලය වනයට පලායන්නාහ.

**එක්** සමයෙක මනුෂ්‍යයෝ ඒ ගමට බැස **උණපත්තෙන්** ගෙවල් සොයා **උණපත්තෙන්** ගෙවල් බිත්ති බැඳ දෙරලී දෙරබාලා ඒ ගම වාසය කරන්නාහ. **එසමයෙහි** ගම මද්ධ්‍යයේ තිඹිරි **ගසක්** ඵලපල්ලවයෙන් අතු කැඩියන්නාසේ ඵලගෙණ සිටිනේය. **එසමයෙහි** වදුරෝ සිතන්නාහු "තිඹිරි ගසෙහි ඵලපල්ලවයෝ **කිමෙක්ද**ෝ? මනුෂ්‍යයෝ **ඇද්ද** නැද්ද්ෝහෝ"යි සිතා **පරීක්ෂා කරණ පිණිස** තමන් **ඇම එක** වදුරෙකු යවූහ. ඒ වදුරා ගොස් බලා **එපවත්** වදුරන්ට **කීය**. වදුරෝ **එපවත්** අසා නායක වදුරු රජ්ජුරුවන් **කරා** ගොස් "දේවයන් වහන්ස, අපගේ තිඹිරිගස ඵලපල්ලවයෙන් සම්පූර්ණය එසේ හෙයින් එතනට යායුතුය"යි කීහ.

එබස් වානර රජ්ජුරුවෝ අසා "ඒ ගම මිනිස්සු ඇද්ද? නැද්ද"සි විචාරා මිනිස්සු ඇතැ"සි කියන්නා "එසේ නම් තිඹිරිගස නිසා යන ගමන නොයම්හ"සි කීහ. ඒ එසේ තමන්කීවත් වදුරෝ එකසීම එක්ව "දේවයන් වහන්ස, ගමසමීප යෙහි බැද්දේවල ඉඳ රෑ මඩ්‍යම වේලාවට අපි ගොස් තිඹිරි කා එම්හ"සි කීහ. බොහෝසේ කාරණා කියා වානර රජ්ජුරුවන් කැඳවාගෙණ හිමාලය වනයෙන් නික්ම ඒ ගම සමීපයේ ගල්පොත්තෙක රෑ පසළොස් පැය වනතුරු වැදහොත් තාහු නිදා මඩ්‍යම රාත්‍රිවේලේ ගසට නැංගාහ. ඒ වේලාවට එක් මිනිසෙක් ශරීරකෘත්‍යය කරණු සඳහා පිටත්ව යමින් සිටියේ තිඹිරිගස බොහෝ වදුරන් උන් නියාව දැක ගම මද්ධ්‍යයෙහි සිට ගම ඇත්තන්ට ඇසෙන නියාවෙන් අඬගැසීය. ඒ අඬ අසා බොහෝ දෙන ආයුධ හා කැවි මුගුරු ගත් අත් ඇතිව අවුත් ගසමූල වටකොටගෙණ "පාන්වූ විට වදුරන් මරම්හ"සි සන්නද්ධව ගෙණ සිටියාහ.

ඒ වේලාවට වදුරෝ මනුෂ්‍යයන් දැක භයින් ත්‍රාසනව "අපවපැමිණියාවූ භය වානරරජ්ජුරුවන්ට කියම්හ"සි කියා "රජ්ජුරුවන්ගේ ප්‍රතිෂ්ඨාවිතාඅනික් ප්‍රතිෂ්ඨාවෙක් නැතැ"සි සිතා වානරරජ්ජුරුවන් ලඟවගොස් "දේවයන්වහන්ස බොහෝ මනුෂ්‍යයෝ ආයුධ හා කැවි මුගුරු ගත් අත් ඇතිව අප මරන්ට වට කොට ගත්තාහ. අප ගැලවීගන්ට නුඹවහන්සේගේ ප්‍රතිෂ්ඨාවක් කිව මැන වැ"සි වදුරෝ එක්ව කීහ. එබස් බොධිසත්ත්වයෝ අසා "තොපි හැම නොබව මනුෂ්‍යයෝ ඔබ්බේ භයක් පැමිණි නැතකව පලායෙති, තොප හැමනොබව"සි කියා මිනිසුන් ඉදිනා විදේසේ ගිනි මොලවා කපු කටිනා මැහැල්ලක සම්පයට එකියන වදුරා කුඩා කොල්ලකුසේ අවුත් ගිනිපෙනෙල්ලක් ඇරගෙණහොසින් වීපි ගිනි ලා පියා.

ඒ වේලාවට ගිනි නිවන්ට මනුෂ්‍යයන් යාදී වදුරෝ ගසින් බස්නාහු සේනක නම් වදුරා එක තිඹිරිගෙඩියක් කඩාගෙණ බවහසි වදුරා මේ තින්දුක ජාතකය නිමවා වදාළ සේක.

"එමසයෙහි වානර රජ්ජුරුවන්ට බැනව උපන් සේනක නම් වදුරා නම් මෙසමයෙහි මහානාම ශාක්‍ය රජ්ජුරුවෝය, වානර සමූහයා නම් බුදු පිරිසය. වානර රජව උපන්නෙම් බුදුවූ මම්මය"සි වදාළ සේක.

---

## 173 කච්ඡප ජාතකය.

එවද ශාක්‍යකුල තිලකවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අභිවාතක රෝගය නිසා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්;

සැවැත්නුවර සිටු කුලයක අභිවාතක රෝගය උපන. ඒ රෝගය උපන් කල ගෙයි කුකුළන් බල්ලන් ආදීවූවන් පවත් නසිති. ඒ අවස්ථාවෙහි සිවානෝ

තමන්ගේ පුතනුවන්ට කියන්නාහු "තොප විසින් භිතුනි බිඳගෙණ ගියොත් ව්‍යාධිය සත්සිදෙයි, ඒ නිසා වලට පලා ගොස් ව්‍යාධිය සත්සිදුනු කලමෙතනට අවුත් අසවල්තැන තිබූ සම්පත් ඇරගෙණ කුටුම්බසණ්ඨාපනය කොට ජීවත් වවු" කීහ. "යාපතැ" යි කියා ඒ සිටු කුමාරයා ගිවිස භිත්තිය බිඳගණ ගිය තැනැත්තේ සමීඤයන් වහන්සේ දිව.

සමීඤයෝත් "කොයි සිට ආවාදැ?"යි විචාරන්නාහු "අසවල් හෙයි අභිවාතක රෝගය උපන් හෙයින් මාගේ ප්‍රාණය ගලවාගෙණ බන්ධුන් ඇරපියා ආමි" කීහ. සමීඤයෝත් එබස් අසා "තා කළ දේම සොඳය, පළමුත් තමන්ගේ වාසස්ථානයෙහි නොසිට විපතුනි දැක ගැලවී ගියෝ සුවවූවෝ වේදැ?"යි "තමා වාසස්ථානය යි සිතා උන්නෝ දුක්වුනෝ වේදැ"යි වදාරා "තා ගැලවී ගියේ යහපතැ"යි වදාළ සේක. එබස් අසා සිටුකුමාර "ඒ කෙසේදැ?"යි ආරාධනා කෙළේය. එකල්හි සමීඤයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකි.

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ කුම්භකාරව ඉපිද කුඹල්කමින් අඹු දරුවන් පොෂ්‍යය කරණ සේක.

එසමයෙහි බරණැස් ගඩොඟා සමීපයෙහි එක් විලක් ඇත, ඒ විලවතුරු ආකලට විල ගඩොඟා හා එක්වන්නේය. එසමයෙහි මත්ස්‍යයෝ "මේ අවුරුද්දේ නියං කෙරෙයි, මේ අවුරුද්දේ වැසි වතුර ඇතැ"යි දන්නාහු "එනඅවුරුද්දේ නියං කෙරෙනි" දැන "විල හා ගඟ එක්වනතුරු ගලාපු ගමනේ පසුවට නියං කෙරෙයි, මේ අවසථාවේ පලා ගියොත් යහපතැ"යි සිතාබොහෝ මස්කැස්බෝ දියෙන් ගඟට පලාගියහ. එසමයෙහි එක් ඉබිබෙක් "මාගේ දෙමවුපියන්පවත් උන්නෙත් මෙතන. මාත් වැඩිවිය පැමිණියේත් මෙතනය"යි සිතා "නොයමි"යි ඒ විලම උන්නේය. ඒ ප්‍රස්තාවට වතුර බැස නියං කොට දිය සිදී මඩ හා කලල් අසථාවව තුබුයේය. ඒ අවසථාවව බොධිසත්ත්වයෝ වලන් උකන්ට පස් අරගන්න නිසා ඒ විල සමීපයේ පස් කොටන්ට වන්නාහ. ඒ වේලාවට ඉදුබි පස් පිරාගෙණ යන්නේ පස් කොටන වලව පැමිණියේය. බොධිසත්ත්වයන් එලාලූ උදැල්ලෙන් කැපින. බොධිසත්ත්වයෝත් පස්පිඬැල්ලකැ යි සිතා උදැල්ලෙන් ගොඩලූහ. එවිට ඉදුබි මහත්වූ වේදනාපත්ව කියන්නේ "බොහෝ බන්ධුන් යාදී මා ඉපිද වැඩිගත් සථානය යි ඉද උන්නායේ එල ලදිමි. එසේ හෙයින් භාග්‍යව කුලයෙහි උපන් කුඹලානෙනි, තමා උපන් වැනි තෙනය යි කියාම ඇලීම කරන්ට දෙෂය"යි කියා කුඹලානන්ට අවවාද කිය කියා ජීවිතක්ෂයට පැමිණියේය. කුඹලානෝත් ඉදිබුවා අතට ගෙණ ඒ ගම්වැසි මනුෂ්‍යයන් මඩ්‍ය කොට කියන්නේ "යම්සේ මේ ඉදිබුවා තමාගේ බන්ධුන් යාදීන් තමා සථානය යි කියා උන්නායේ එල ලදිමි කියා මට ගාථා දෙකකින් කීය. එසේ හෙයින් කවුරුත් මේ මාගේ ප්‍රියවූ රසඥය, මේ මාගේ ප්‍රෂ්ටව්‍යය, මේ මාගේ දරුවෝය, මේ මාගේ භාය්‍යාවෝය, මේ මාගේ බන්ධුය, මේ මාගේ ධනධාන්‍යය, මේ මාගේ ගේදොර යයි තෘෂ්ණා කොළෝ නම් වන්නාවූ දෙෂය ඉදිබුවාවූ හානිය හා සමානය"යි

බුද්ධලීලාවෙන් අවවාද කීවාහ. දස දහසක් යොදුන් දඹදිව ප්‍රකාශ විය. ඒ කුම්භකාර කී අවවාදය සද් දහසක් අවුරුදු අවවාද නියාවට පැවැත්තේය සි වදුරා කවඡප ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි ඉදිබුවා නම් ආනන්දස්ථවිරය, කුම්භකාරව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මය"සි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 174 සත්තධම්ම ජාතකය

මේවද ශාක්‍යකුල හද්‍රඝටවූ සමීඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්විස්සක් අන්වේසනයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්,**

එක් අවධියක භික්ෂූන් වහන්සේ බුදුන් නොකරන්ට කී පිළියම් කොට ජීවත්වීම, භාතා වපුරණ තැනට ගොස් උපාසකවරුන් කී මෙහෙවර කිරීමෙන් උනුන්ගේ ගෙට ගොස් උන් කීවා කිරීම් යනාදීන් බුදුන් තොකරන්ට කී කාරණා එක් විස්සක් කොට චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය ආදී වූ සතර පසය උපදවාගෙණ වාසය කරණ සේක.

එසමයෙහි සමීඥයන් වහන්සේ එපවත් අසා ඉදිරියේ පැමිණෙන තරක තිරිසන් ප්‍රෙත අසුරකාය යන සතර අපාය දැක බොහෝ භික්ෂූන් වහන්සේ රැස්කරවා වදාරණසේක් "මහණෙනි, මා තොකරන්වකී එක්විසි අන්වෙසන කිරියෙන් පසය උපදවාගෙණ කැනම් ගිහිවට හා විෂ හා තොසන්දුරුවන්ගේ ඉදුල් හා කැවා හා සමානය"සි ආරාධනා නැතිවම ජාතකය දක්වන සමීඥයන් වහන්සේ "මහණෙනි, යම්සේ සප්තධමී නම් මානවකයා වණ්ඩාලයාගේ ඉදුල් බත් කා ප්‍රාණය තසාගද්ද? එසේමය"සි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

එවකිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙතෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ වණ්ඩාලකුලයෙක ඉපිද ඔබ්බේ ගමකට යන ගමනේ බත් ගැටශක් හා සාල් තැළියක් අරගෙණ නික්මුනාහ. ප්‍රසිද්ධ බ්‍රාහ්මණ කුලයක උපන් සප්තධමී නම් බ්‍රාහ්මණ මානවකයෙකුත් මඟට උපකරණයක් සපයා නොගෙණ වණ්ඩාලයා නික් මුනාවූ මාවතින් නික්මින. බමුණු වණ්ඩාලයා අතින් "තෝ කවරේදැ?"සි විවාළේය. බොධිසත්ත්වයෝ එක් ජාතියකුත් බොරු නොකී විරූ හෙයින් තමන් වණ්ඩාල නියාව නොහඟවා කීය. බෙරවායත් එවිට 'නුඹ කවුරු දැ"සි විවාරන්නා "මම අසම් නිහන නම් බ්‍රාහ්මණයෙමි" කීහ.

එවිට වණ්ඩාලයා එසේ නම් නුඹවහන්සේලා කැවිව යෙම් සිතා නික්ම අතරමඟ පැන් ඵාසු තැනකදී බමුණා හා වණ්ඩාලයා වැවට බැස තා ඉක්බිත් තෙන් වණ්ඩාලයාත් ගෙණා බත්මුලින් "බමුණාතන් වහන්ස, නුඹවහන්සේ

පළමුවෙන් බත් කැවොත් වේද?' මා කන්නේය''යි කීය. එබස් ඇසූ බමුණා චණ්ඩාලයා, තාගේ ගෙන් ගෙණා බත්ද මා කන්නේය''යි කියාද එවිට චණ්ඩාල තමා ගෙණා බතින් එක් කොටසක් සවස කන්ට තිබා අනික් කොටස කා නික්මිත බමුණාත් නික්මිත. සවස්වනතුරු ගමන් ගොසින් සවස්වේලේ ගඟකදී දෙන්නම තා බෙරවායා බල බලා සිටියදී ''දහවල් කන්ට කී ගමනේ තොකැ හෙයින් දැනුත් නොකනී'' සිතා කන්නට වත. ඒ වේලාවට බමුණු බඩ සා ඉවසා ගතනොහී චණ්ඩාලයා මටත් බත් නොදීම කන්නට වත. එසේ හෙයින් මුගේ ඉදුල් වුවත් උදුරාගෙණ කන්ට වුවමැනවැ''යි සිතා චණ්ඩාලයා ලඟට ගොසින් ඉදුල්පත උදුරාගෙණ ඊ තුබූ බත් කා අත කට සෝදා නැවත සිතන්නේ ''මා කෙළේ කිම්දැ''යි උතුම් බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද බඩසායක් නිසා චණ්ඩාලයාගේ ඉදුල්බත් නොකන්ට නුයේය, ඉදුල්බත් කන දෙයත් චණ්ඩාලයා ගිවිස්වාගන්ට නුවූයේය. උදුරාගන කන දෙයත් බඩපුරා කන්ටත් නුවූයේය. කෑ දෙයත් බඩ රඳාගත නුවූයේය''යි සිතා බොහෝ විඥපයට පැමිණ ''මෙසේම ඉඳ මාගේ ප්‍රාණය තිබාගෙණ ඉදීමෙන් ප්‍රයෝජන නැතැ''යි වලට වැද අභ්‍යාවකාශයෙහි නැසී ගියේය යි වදාරා ''මහණෙනි, භික්ෂූහු තම් අනුන්ගෙන් බත් නොකැ සැවියේ කැයින් මෙන් බුදුන් කීවා නොකළම්හ යි තමා සිතව විඥපය පසුව තරකාදි සතර අපායෙන් නොගැලවෙන්නාහ. එසේ හෙයින් සත්තධම්මී බ්‍රාහ්මණයාව වූවාසේ වන්නේය''යි වදාරා මේ සත්තධම්මී ජාතකය නිමවා වදාළ සේක.

''එසමයෙහි චණ්ඩාලව උපන්නෙම් බුදුවූ මම්මය''යි වදාළ සේක.

---

## 175
## දුද්ද ජාතකය.

තිවද ශාක්‍යකුලකිරීට වූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපාසකවරුන් කීපදෙනෙකු සමඟව දුන් දානයක් අරභයා මේ ජාතකය දක්වන ලද. ''ඒ කෙසේදැ''යි ආරාධිත වූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපිද වැඩිවිය පැමිණ පඤ්චකාමයෙහි ආදීනව දැක ප්‍රව්‍රජ්‍යාවෙහි අනුසස් දැක පැවිදිව බොහෝ තාපසවරුන් පිරිවරා හිමාලය වනයෙහි වාසය කරණ සේක. වස් වසන අවධියට ලුණු ඇඹුල් නිසා බරණැස් නුවරට තාපසවරුන් පිරිවරා වැඩි සේක. ඒ අවධියට බරණැස්නුවර එක් උපාසකයෙක් බොහෝදෙනා ලබාගෙණ සත් දවසක් බොහෝ තාපසවරුන්ට දන් දිත දන් දී අවසානයෙහිදී නායකව දන් දෙන උපාසක කියන්නේ ''ස්වාමීනි, යන්තමක දන් දුන්නොත් ඇත, බොහෝව දන් දුන්නොත් ඇත, පින් එක සරිසේ වේදැ?''යි කීහ. තාපසයෝ කියන්නේ ''ඒ එසේමය, සුළප වූවත් බොහෝ වූවත් දුන්නාවූ දානයෙහි විපාක බුදු පසේබුදු මහරහතුන් විසින් ප්‍රශංසා කරණ ලද. එසේ විසින් දාන

යෙනි විපාක කියාගත නොහැක්කේය. දුන විෂයෙහි මද දෙයක් දුන්නත් දිව්‍යලෝක සම්පත් විඳිනාහ. ''මේ මනාවූ දානය දීමෙන් කිම්දැ?''යි සිතා දන් නුදුන්නොත් නරකාදී වූ දුක් විඳිනාහ''යි කියා වස් සාරමස ඒ ගම රඳා වස් අනතරයෙහි හිමාලය වනයට වැඩ සතර බ්‍රහ්මවිහාරයෙන් දවස් යවා තෙ පිරිහුනාවූ ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකප්‍රාප්ත වූන යි වදාරා **බුද්දද ජාතකය** නිමවා වදාළ සේක.

''එසමයෙහි තාපසවරු නම් දැන් බුදුපිරිසය, ගණජ්‍යෙෂ්ඨව උපන් තෙම් බුදුවූ මම්ම ය''යි වදාළසේක

---

## 176
## අසදෘශ ජාතකය

**මේ**වද ශාක්‍යකුල මහානිධාන වූ සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන්වහන්සේ ''ඇවැත්නි, සම්බුදුන් වහන්සේ මේ නියා රාජ්‍යයක් හැර මහබිනික්මන් කළෝවේදැ''යි කිය කියා වැඩඵුන් තැනට සම්බුදුන් වහන්සේ වැඩවදාරා ''මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදාරා එ පවත් අසා ''දැන් සම්බුදු කාලය පැමිණි කාලයෙහි තිබා නුමුහු කළ නුවණ ඇති අවස්ථාවෙහි තමන්ට පැමිණෙන රාජ්‍ය ශ්‍රී හැර මහබිනික්මන් කළෝවේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සම්බුදුන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

ඉකිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අග්‍ර මහෙසිකා බිසවුන් බඩ පිළිසඳ දස එකඩ මසකින් බිහි වූහ. ඒ කුමාරයන් බිහි වූ ගමනේ නම් තබන්නාහු අසදෘශ කුමාරයෝ ය යි නම් තුබ්බහ. ඒ කුමාරයන් වැඩිවිය පැමිණෙන අවස්ථාවට අනිකුත් පින්වත් කුමාරයෙක් බඩ පිළිසිඳ දසඑකඩ මසකින් බිහිව ඒ කුමාරයන්ට නම් තබන්නාහු බ්‍රහ්මදත්ත කුමාරයෝය යි නම් තුබ්බහ. අසදෘශ කුමාරයෝත් වැඩී දිසාපාමොක් ආචාරීන් කරා ගොස් උගතමතා ශිල්ප ඉගෙණ රජ්ජුරුවන් කරා අවුත් උන් කලට පියරජ්ජුරුවන්ට මරණ කාලය පැමිණි හෙයින් රජ්ජුරුවෝ කියන්නාහු ''අමාත්‍යයෙනි, අසදෘශ කුමාරයන්ට රාජ්‍යය දෙව, බ්‍රහ්මදත්ත කුමාරයන්ට යුවරජ තනතුරු දෙව''යි කියා සඟගීසථ වූහ.

එවිට අමාත්‍යයෝත් අසදෘශ කුමාරයන්ට රාජ්‍යය පමුණුවන්ට උත්සාහ කළහ. ඒ අසා අසදෘශ කුමාරයෝ රාජ්‍යය නොගිවිස්සාහ. අමාත්‍යයෝ බ්‍රහ්මදත්ත

කුමාරයන්ට රාජ්‍යය පමුණුවා බොධිසත්ත්වයන්ට යුවරජ තනතුරු දුන්නාහ. එවිටත් නොගිවිස නිකම්ම කුමාර සැලැස්මේම උන් අවසථාවට එක්තරා අමාත්‍යයෙක් රජ්ජුරුවන් කරා ගොස් "නුඹවහන්සේගේ බෑනන්වහන්සේ නුඹවහන්සේ නසා රාජ්‍යය ගන්ට උන්සාහ කරණ සේකැ"යි කියා බිඳවූ ය. රජ්ජුරුවෝත් එබස් අසා බිදී "බෑනන්වහන්සේ අල්ව"යි කීහ.

එවිට බොධිසත්ත්වයෝ වැඩපසස්නා අමාත්‍යයකු අතින් අසා බරණැස් නුවරින් පිටත්ව සාමන්ත රජ්ජුරු කෙණෙකුන්ගේ නුවරට ගියාහ. ඒ නුවරට ගොස් වාසල් දොර සිට "ධනුර්ධරයෙක් ආය"යි කියා රජ්ජුරුවන්ට දන්වා යවන්නාහු රජ්ජුරුවන් විසින් "එන්නේ ය"යි කියා යවන්නා රජ්ජුරුවන් විසින් "කොතෙක් පඬි තොපට වුවමනා දැ?"යි විචාරන්නා "මසුරන් ලක්ෂයක් පඬි වුව මැනවැ"යි කියන්නා රජ්ජුරුවෝත් පිරිස් අඩුකරන්ට වුවමනා හෙයින් "යහපත ලක්ෂයක් නියාගෙන් පඬි දෙව" යි කියා සැලැස්වූය. මේසේ පඬිකන අවසථාවෙහි දුනුවායෝ එකසීම "අපව වඩා මූ පඬි කන්නේය"යි කියා ඊර්ෂ්‍යාවෙන් ඉඳිනාහ.

එ සමයෙහි එක් දවසක් රජ්ජුරුවෝ මගුල් උයනට ගොස් අඹගස් මූල යානක් ලවාගෙණ වටහිරයක් අද්දා උත්තානිව වැදහොත් රජ්ජුරුවෝ "අඹ ගස අග අත්තේ තුබූ අඹ කැන දැක මිනිස් කෙනෙකුන් නැගී කඩා කන්ට බැරි සෙයින් දුනුවායන් ලවා විද්දවා ගණිමි" සිතා දුනුවායන් රැස් කොට අඹ කැන විදින්ට කීහ. "සාමීනි අපගේ විදමන් දැන වදුළේ ඇත. ලක්ෂයක් පඬිකන අළුත් ධනුර්ධරයානත් ලවා විද්දවන බව ය"යි කීහ. එවිට රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් ගෙන්වා "අඹකැනට විදුව"යි කීය. බොධිසත්ත්වයෝත්"නුඹවහන්සේ වැදහොත් තැනට අරින්ට වුව මැනවැයි "එතන යාන ඉවත් කරවා එතන සිටියාහ. සෙසු දුනුවායෝ බොධිසත්ත්වයන් අත දුනු ඊතල නැති හෙයින් දුනුවායෝ කථාකරන්නාහු "අප අත දුනු ඊතල ඉල්වූවත් කවුරුවත් දුනු ඊතල නො දෙව"යි කථා කළාහ. බොධිසත්ත්වයෝත් වට කොට තිරයක් බන්දා ඇතුළේ වැඩසිට ඉන තුබූ සුදුකඩ ඉවත තිබා රන් සේලයක් ඇඳ බුලත්පසිය ඇතුළේ තිබූ කඩුව උරේ එල්වාගෙණ බඩ අවුරා රන් ඔලි යලක් බැඳ හිසවුරපිට බැඳ රන් සන්නාවකුත් ලාගෙණ රන්පටක් තලළ බැඳ සන්ධි වක්කළ හඟුදුන්න අතින් ගෙණ පබලුවැලක් හා සමාන දුනුදියක් ලාගෙණ ඊදණ්ඩක් අතින් ගෙණ පොළොව පලාගෙණ නැංගාවූ නාග මානවකයකු සේ තිරයෙන් මැත්ව, විදිනා වූ සථානයෙහි සිට රජ්ජුරුවන්ට කියන්නාහු "දෙවයන්වහන්ස, අඹකැන යන හීයෙන් විදිම්ද? එන හීයෙන් විදිම්ද"යි විචාළාහ.

රජ්ජුරුවෝ කියන්නාහු "යන හීයෙන් විදිනවා දුටුවිරු ඇත, එන හීයෙන් විදීම් අපූර්‍ය"යි කියන්නා "එසේ විදුය"යි කීහ.

බොධිසත්ත්වයෝ නැවත කියන්නාහු "මාගේ හීය චාතුම්මහාරාජිකය දක්වා යෙයි, එසේ හෙයින් මදක්වේලා වැඩසිටිනේ යාපන බලාවදුළ මැන ව"යි කියා වේග දක්වා ඊදඹු විදපූහ. ඒ හීය අඹකැනින් කැබැල්ලක් කපා ගෙණ චාතුම්මහාරාජිකයට පැන නැංගේය. බොධිසත්ත්වයෝත් ඒ හීය චාතුම්මහාරාජිකයට පැනනැගි බව දැන අනික් හීයක් වේග දක්වා විද්දාහ. ඒ

හිය පළමු විදි හීයේ පහිලියේ වැදගෙණ උඩ ගියේය. ඉන් එක හීයක් දේවතාවෝ ඇරගත්තාහ. අනික් හිය පවනින් ගුගුර ගුගුරා බසින්නට වත. එවිට බොහෝදෙන 'මේ කිමෙක් ද?"යි බලන්නට වන්නාහ. බොධිසත්ත්වයෝ "ඊදණෙඩන් පවන් ගෙණ බස්නා බව ය"යි කියන්නා බොහෝදෙන "තමන්ගේ ශරීරයෙහි වැටෙනි'යි සැකවන්ට වන්නාහ. එවිට හිය ඇවිත් අඹකැන කැපුනු සථානයෙන්ම කැපී වැටෙන්ට වත. බොධි සත්ත්වයෝ එක් අතකින් අඹකැන හා එක් අතකින් ඊදඬු අල්වාගත්තාහ. මේ දුටු සමාධියෙන් දහස්ගණන් ඔල්වර හඬ හා දහස් ගණන් අසුරු සත් හා දහස් ගණන් පිළී හිස හිස සිසාරමින් නැටූහ. රජ්ජුරුවෝත් කෙළගණන් සම්පත් දුන්නාහ.

එ සමයෙහි බරණැස්නුවර අසදෘශ කුමාරයෝ තැනි නියාව අසා සත් රජ්ජුරු කෙනෙකුන් හා සේනාව අවුත් නුවර වටකොට ගෙණ "රාජ්‍යය හෝ දෙන්නේය, යුඬ හෝ කරන්නේ ය"යි කියා යවූහ.

එ බස් බරණැස් රජ්ජුවෝ අසා භයින් ත්‍රසනාව "බැනන්වහන්සේ කොයිදෝ හෝ" යි සිතා සාමන්න රජ්ජුරවන් ලඟ සිටිනා නියාව අසා එක් අමාත්‍යයකු කැඳවා "තොප, මිා වැන්දා කොට වැඳ, මාගේ බැනන්වහන්සේ කැඳවාගෙණ එව"යි කියා යැවූහ.

ඒ අමාත්‍යයෝ ගොසින් ඒ සැටියේ කීයේ ය. බොධිසත්ත්වයෝ තමන්ගේ රජ්ජුරුවන්ට කියා අවසර ඉල්වාගෙණ බරණැස්නුවරට අවුත් අට්වාලය පිට සිට ඊදණඩක පත් ලියා බඳනාහු "අසදෘශ කුමාරයෝ මෙ ගමය, පළමුකොට මා විදි හීයෙන්ම පලායව, දෙවෙනි හීයට සිටියා තම් තොප ඇම ජීවිතක්ෂයට පමුණුවම්" කියා පත්කඩවල් ලියා ඊදණඩක් විද්දාහ. ඒ ඊදණඩ ගොසින් සත් රජ්ජුරුවන් බත් කන තලිය පිට වැටී හිත. එවිට රජදරුවෝත් "දෙවෙනි හීය විද්දොත් ඒ නියා වන්නේ නියමය"යි කියා බිදී තමන්ගේ නුවරවලට පලා හියාහ.

බොධිසත්ත්වයෝ පිනිබිඳක් සා ලේ පෙතක් නොසොල්වා සත් රජ්ජුරු කෙනෙකුන් ජය ගත්තාහ. එවිට බ්‍රහ්මදත්ත කුමාරයෝ "බැනන් වහන්ස පළමුන් මුඹවහන්සේ සන්තක රාජ්‍යය 'නුඹවහන්සේ එපා'යි කී නිසා මම රජ්ය කෙළෙම්, දැනුත් නුඹවහන්සේ රාජ්ය කළ මැනවැ"යි කී සේක.

එබස් අසදෘශ කුමාරයානන්වහන්සේ අසා "මාගෙන් නොපට දුන් රාජ්‍ය දැනැමින් සෙමින් කරව"යි කියා පාවා දී හිමාලය වනයට ගොස් සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා බඹලොව ගියාහ. ඒ අර්‍ථය ප්‍රකාශ කරන්නාවූ සම්බුදයන්වහන්සේ "මහණෙනි, ඒ ධනුර්ධර වූ අක්ෂාරවෙධි වාලවෙධි ශරවෙධි ශබ්දවෙධි යනාදි වූ විදමන් ද වැලිබිසි පිදුරු බිසි ගැල් තඹපත් යපත් ආදි වූ දෙයෙහි විදමන් ද යනාදීන් සූසැට කලාවේ දක්ෂ වූ ඒ අසදෘශ කුමාරයන්ගේ මලනුවන්ට පැමිණි භය ඵලවා ඉක්බිති මහබ්‍රහ්මන් කොළෝ වේදැ යි වදාරා අසදෘශ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ ආනන්දසථවිරයෝය, අසදෘශ රජව උපන්නෙම් බුදු වූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

## 177
## සඬ්ගාමාවචර ජාතකය.

**මේ**වද ශාක්‍යකුල සඤ්ජාත වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි **වැඩවසන** සමයෙහි නන්දසාමි අරහයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්,**

නන්දසාමීන් වහන්සේ මහණ වන දවස් ජනපදකල්‍යාණිය විසින් "වහා එව නන්දය"යි කවුළුදොර සිට කී බස් සිහිකර්නාහු නන්දසාමි මහණදමෙහි උසුළු ලීව පඬුවන්වූ පැහැයෙන් හා නියම කෙස් වැඩි ශාසනයෙහි උසුළුලීව වාසය කරණ සේක.

එපවත් සම්බුදුරජාණන් දුන නන්දසාමි ඉන්නා තැනට ගියසේක. උන් වහන්සේ සම්බුදුරජාණන් වහන්සේට අසුන් පණවා වැඳලසේක. සම්බුදුරජාණන් වහන්සේ පැණවූ අසුන්පිට වැඩඋන්සේක. වැඩහිඳ "නන්දයෙනි, ශාසනයට ඇලුම් ඇද්ද?"යි විචාරන්නා "සවාමීනි, ජනපදකල්‍යාණිය කෙරේ තෘෂ්ණාව ඇති හෙයින් ශාසනයෙහි ඇළුම් මඳව වාසය කෙරෙමි"යි කීහ.

එවිට සම්බුදුරජාණන් වහන්සේ නන්දයෙනි, හිමාලය වනය අදුනනවාදැ"යි විචාරන්නා "සවාමීනි, නොදුනමි"කී හෙයින් "එසේ වී නම් හිමාලය වනය දකින්ට යමහ"යි වදාළසේක. එවිට නන්දසාමි කියනසේක් "මාගේ සෘඩියක් නැතිව කෙසේ යම්දැ"යි කී සේක. එබස් අසා සම්බුදුරජාණෝ "තොපි මාගේ සෘඩියෙන් එව"යි කියා අත අල්වාගෙණ ආකාශයට පැනනැඟී වැඩිසේක් අතරමග දුගිය හේනක් මවා ඒ සේන දුගිය කනුවක් මවා එහි කන් නාසා වල්ගය දුගිය වැදිරියෙක මවා "නන්දය තෙල දුගිය වැදිරිය දුටුදැ"යි විචාරන්නා "දිටිමි" කී විසින් මේ වැදිරිය සිත තබාගණුව"යි හිමාලය වනයට ගොස් හිමාලය වනයේ අනොතත්තවිල ආදී මහ විල් සතරක් හා පඤ්ච මහා ගඩගාව හා දහස් ගණන් පව්ත හා හිමාලය වනයෙහි නොයෙක් අපූරු දක්වා චාතුම්හාරාජිකය අදුනනවාදැ"යි විචාරා "නොදුනමි" කී විසින් 'එසේනම් දක්නට එව"යි කියා නන්දසාමීන් ඇරගෙණ චාතුම්හාරාජික දිව්‍යලෝකයට ගොස් පඬුපුල්සලස්නේ වැඩහුන් සේක.

එවේලෙහි ශක්‍රදේවෙන්ද්‍රයෝ තමන්ගේ දෙදෙව්ලොවට දේවතාවන් පිරිවරා බුදුන් දැක එකත්පස්ව සිටියාහ. එවේලාවට ශක්‍රයාගේ දෙකෙළ පණස් ලක්ෂයක් දිව්‍ය ස්ත්‍රිහු දකින්ට ගියාහ. පන්සියයක් කකුටපාදිනිවූ දිව්‍යස්ත්‍රීන් සම්බුදුරජාණන් දකින්ට ගියාහ. එවිට සම්බුදුරජාණෝ කියන්නාහු "නන්දයෙනි, ජනපදකල්‍යාණි නියාවට මුන් වඩිද්දැ"යි විචාළහ. එපවත් අසා නන්දකුමාරයෝ කියන්නාහු සවාමීනි, ජනපදකල්‍යාණි නම් අතරමග දුටු වැදිරිය වැන්නීය. එසේ හෙයින් ජනපද කල්‍යාණිය කෙරේ ඇති සිතිවිලි ඇරිණ. මේ දිව්‍යාඞ්ගනාවන් මා ලබන්නේ කෙසේදැ?"යි විචාළාහ. එවිට සම්බුදුරජාණෝ 'ඉදුරා මහණදම් පිරුවොත් දිව්‍යාඞ්ගනාවන් දක්ක හැක්කැ"යි වදාළ සේක.

එබස් අසා "එසේනම් ගුණදහම්පුරමි සවාමීනි, දිව්‍යස්ත්‍රීන් ලබන නියාවට ඇපවන්ට උවමැනවැ"යි කීහ.

සම්බුදුරජාණන්ත් යහපත නන්දයෙනි, මම ඇපවෙමි"යි වදාළසේක, එවිට නන්දසාමි "මහණදම් වහා පුරන්ට වුවමැනවැ"යි කියා දිව්‍යලෝකයෙන් සම්බුදු

යන් හා සමග ජේතවනාරාමයට වැඩ එතැන් පටන් දිව්‍යස්ත්‍රීන් පහා මහණදම් පුරන්නාහ. සම්බුදුයන් වහන්සේ සැරියුත් සාමීන්ට වදාරණසේක් "සාරිපුත්‍ර සථවිරයෙනි, නන්දයෝ දිව්‍යස්ත්‍රීන් ලබනොත් මහණදම් පුරමි යි මා අතින් ඇප ලවා ගත්තෝ වේදැ?"යි වදාළ සේක. එවිට නන්දසාමීන්ටත් එලෙස වදාළ සේක. කාශ්‍යප සාමීන්ටත් එලෙස වදාළසේක. අනුරුද්ධසාමීන්ටත් එලෙස වදාළ සේක. ආනන්දසාමීන්වත් එලෙස වදාරා අසූමහ සව්වන් වහන්සේ ඇතුළුවූ බුඩ වල්ලභ බොහෝ නිඝූන් වහන්සේට එපවත් වදාළසේක.

සැරයුත් සාමීන් තන්දසාමීන් කරා ගොස් "නන්දයෙනි, දිව්‍යලෝකයෙහි දෙවියන් මධ්‍යයෙහි බුදුන් ඇප ලවාගෙණ ස්ත්‍රීන් තකා මහණදම් පුරවාද? තොපගේ මහණදම් පිරීම තම් කුලියට බැලමෙහෙ කරන්නා වැන්නැ"යි වදාළ සේක. මේ නියායෙන් නන්ද සාමීන් දුටු හැම තැනකදීම "කුලියට බැලමෙහේ කරන්නා වැන්නේය"යි කියා බොහෝ මාලුවරුන් වහන්සේ ලජ්ජා කරවන සේක. බොහෝදෙනා වහන්සේ කියන බසට ලජ්ජාව නන්දසාමීන් එකඟව ස්ත්‍රීන් කෙරෙහි සිතිවිල්ල හැර විදර්‍ශීනා වඩා රහත්වූ සේක. රහත්ව බුදුන් කරා ගොස් "ස්වාමීන් වහන්ස, ඊට ඇපවූ ඇපය ඉනී කියේ වේදැ"යි කී සේක. සම්බුදුයෝත් "නන්දයෙනි, තොප රහත්වූ ගමනේ ඇප යෙන් මිදීගියය, ගමනයෙමියි වදාළ සේක.

එදවස් වැස රැස්ව මාලුවරුන්වහන්සේ "නන්දයෝ අවවාදක්ෂමයෝය" යන කථාව කියකියා වැඩහුන් තැනට සම්බුදුයන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්‍වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදුයි විචාරා වදාරා එපවත් අසා "නන්දයෝ පෙරත් අවවාදක්ෂමයෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැ?"යි ආරධිත වූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකි.

**ඒ කෙසේද? යත්,**

ඔටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත තම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පසම්තුරුවූ රජ්ජුරු කෙනෙකුන්ට හස්තාචාරීව දවස් හරණාහ. බොධිසත්ත්වයන් විසින් කම් පස් කරණ ලද මගුලැතාත් යුද්ධයොග්‍යව සිටිනේය එකියන පසල් රජ්ජුරු වෝත් සේනාවන් පිරිවරා බරණැස් නුවරට අවුත් නුවර වටකොටගෙණ "රට හෝ දෙන්නේය. යුඩ හෝ කරන්නේය'යි පත් යවූහ.

එබස් බරණැස් රජ්ජුරුවෝ අසා රාජ්‍ය කුමට දෙමි ද? යුඩ කෙරෙමි"යි කියා අට්වාල වෙට්ටම් ආදීවූ දෙයෙහි සේනාව සලස්වා යුද කරන්ට වන්නාහ. එ වේලාවට අට්වාලවලසිට දමන්නාවූ බොහෝවූ ශරවර්‍ෂාව දැක ඉවසාගතනොහී ඇත් පසුබැස ගියේය. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "යුඩයට යෝග්‍යය"යි කියා ඉන්නාවූ හස්තිරාජය ශරවර්‍ෂාව නැත්තාවූ යුඩයෙක් නම් යුද්ධ නොවෙයි. එසේ හෙයින් ශරවර්‍ෂාව ඇඟට වැදගතැයි පසුබසින්නේ ඇයිදැ"යි නාගෙන්ද්‍රය වහා ගෙනගොස් කණයම් බිඳ ඉන්ද්‍රබිලය උපුටා දමා පවුරු වටලා එලා නුවරට වැද බරණැස් රජ්ජුරුවන් අල්වාගෙණ අපගේ රජ්ජුරුවන්ට පාවාදෙව"යි කීහ.

එබස් අසා පෙරළා කරකැවී දිවගෙණ ගොස් ඉන්ද්‍රබිලය සතු උදුරා දමන්නාක්මෙන් දමා පවුරු පදනම් ඇන බිඳ නුවරට වැද බරණැස් රජ්ජුරු වන් අල්වා දුන්නාහයි වදාරා සංග්‍රාමවර ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි ඇතා නම් ආනන්දසථවිරය, හස්ත්‍යාචාරීව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළ සේකි.

---

## 178
## වාලොදක ජාතකය

තවද ශාක්‍යකුලනිලකවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි විසාඛාදයන් අරභයා මේ ජාතකය දක්වනලදී.

ඒ කෙසේද? යත්,

පන්සියක් උපාසකවරුන් තමන්ගේ ඇති ගම්බිම්වල සරණා තම තමන් අඹුදරුවන්ට පාවාදී බුදුන්ගෙන් බණ අසා එක්කම හිඳිනාහ. එකී පන් සියයක් දෙනාගෙන් සමහරු සෝවාන් වූහ. සමහරු අනාගාමී වූහ. සමහරු සකෘදාගාමී වූහ. මෙසේ තුන්මග තුන්ඵලයට පැමිණි උපාසකවරුන් සසර සිටි එක් උපාසක කෙනෙක් නැත.

එසමයෙහි දන්දෙන යම්කෙනෙක් ඇත්නම් උපාසකවරුන්වත් සමග දන් දෙන්නාහ. ඒ උපාසකවරුන්ගේ දැහැවිදඬු ආදීවූ දෙය පණත්කොට දෙන්නාවූ පන්සියක් අනවැස්සෝ ඇත්තාහ. උපාසකවරුන්ගේ ඉදුල්පත් කන හෙයින් විසාඛාදය යි යන නම් ලද්දාහ.

එක් දවසක් එකියන විසාඛාදකයෝ පන්සියයක් දෙන දනපී ගොස් උනුන් කැවිව මල්ලව යුද්ධයක් සලසාගෙණ ඒ ඒ තැන පැන බැසගෙන බොහෝ අරගල කරන්ට වන්නාහ. පන්සියයක් උපාසකවරුන් බැණ නොනැගී තමන් ගෙවල්වලම උන්නාහ.

සම්බුදුයෝ අනඳසාමීන් ගෙන්වා "ආනන්දය මේ කුමන අරගලදැයි බලා පියා එව"යි කියා යවූසේක. ආනන්දසාමීන් ඒ බලා එපවත් සම්බුදුයන්ට දන්වූ සේක. සම්බුදුයෝ එපවත් අසා "ආනන්දයෙනි පෙරත් මෙකියන උපසකවරු බැණ නොනැගි ඉන්දදීම මෙකියන කොල්ලෝ දුවපැන ඇවිද්දෝ වේදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට වැඩ පසස්නා අමාත්‍යව උපන්සේක.

එසමයෙහි පසල් රට "සතුරන්ගෙන් භයක් පැමිණියැ"යි අසා පසල්රට ගොසින් යුඬකොට උන් හැමදෙන පරදවා පෙරළා නුවරට අවුත් රජගෙට වදිනා රජ්ජුරුවෝ අමාත්‍යයන්ට කියන්නාහු "මේ එක්ව දුක්ගෙන ආ පන්සිය යක් අසුන්ට මුද්දිරප්පලන් පැන් නුමුසුකොට මිරිකා ඒ රස පොවා"යි කීහ. "යහපතැ"යි ඒ නියාවට මුද්දිරප්පලන් පැන් අසුන් පොවා ඉතිරිපැන් මිරිකා කසව පිපී ගිය වසල බොහෝව තුබූ වසින් අමාත්‍යයෝ රජ්ජුරුවන් අභිත්"මීට

කුමක් කරමෝදැ?''යි විචාරා 'අසුන් පන්සියයකට කානම් ඇදගෙණ ඒ ආ කොටළුවන්ට ඒ කසට පිපීගිය වසළු බොහෝව තිබූ හෙයින් පැනෙහි ලා මිරිකා පොව''යි කීහ. ඒ මානයට පෙවූ යාපත් රසය බීපු අස් පන්සියය කිසිම අරගල යක් නැතිව තම හමන්ගේ අස්සල බැණ නොනැගී සිටියාහ. කසටපැන් බීපු වාවූ කොටළුවෝ රජගෙයි ඒ ඒ තැන පැන නටන්ට වන්හ. රජ්ජුරුවෝ ඒ දැක ලඟ සිටි බොධිසත්ත්වයන් විචාරන්නාහු ''එම්බල යහපත් රසය බීපු අශ්වයෝ උඩත කමක් නැතිව වාසය කරන්නාහ. අසුන් බී ඉතිරිවූ කසට පිපී දමාපු මුද්දිරප්පලන් පැන් බී උඩතව ඇවිනාහ. මෙයට කාරණය කිම්දැ?''යි විචාළහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු ''ජනප්‍රධානවූ දේවයන්වහන්ස, අශ්වයෝ උත්තමජාති හෙයින් ඒ පැන් බීත් උත්තම නොව දවසරිනාහ. නීවයන් විසින් තමන් ලත් යම් යම් තාක් දෙයකට උත්තම වන්නාහ. එසේ හෙයින් මේ කොටළුවෝත් තමන් නූපුවිරූ මුද්දිරප්පලන් රසය බීපු හෙයින් උඩතව දවසරිනාහ''යි කීහ. රජ්ජුරුවෝත් ඒ කොටළුවන් මරා වාසලින් පිටත ලූහ යි වදාරා මේ වාලොදක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කොටළුවෝ නම් දැන් මේ විසාඝාදයෝය, අශ්වයෝ පන්සියය නම් උපාසකවරු පන්සියය, එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි අමාත්‍යයව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මය''යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

---

## 179 ගිරිදන්ත ජාතකය.

මේවද ශාක්‍යකුල ප්‍රදීපවූ සම්බුදුයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සම්බුදුයන්ට විපක්ෂවූ දෙවදත්ත ස්ථවිරයන්ට පක්ෂවූ භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී. හේ කෙසේද? යත්, වනීමාන කථාව මහිලාමුඛ ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය.

යටගිය දවස බරණැස් නුවර සාම නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් ආමාත්‍ය කුලයක ඉපිද වැඩිවිය පැමිණ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කොට ඉඳින සේක.

එසමයෙහි පාණ්ඩව නම් අශ්වයෙක් ඇත. අශ්වයා බලන්නාවූ ගිරිදන්ත නම් අස්සලයෙක් ඇත. ඒ අස්සලයාගේ පය සිඟින්තකට කොරය. ඒ කොරවූ අස්සලයා අසූ ගෙණ කඩියාලම අල්වාගෙණ කොර පය ඇත ඇත ඉදිරියේ යන්නේ අසුන් මා උගන්වන දෙයක සිතා ඒ මානයට ගොසින් පය කොර කොට ම ඔබ ඔබා යන්නේය.

එපවත් රජ්ජුරුවෝ අසා බොධිසත්ත්වයන්ට කියන්නා ''මිගුලසා පය කොර කොට ඔබත් කියන්නා ඇසීම්. උඹට කවර ව්‍යාධියෙක්දෝ හෝ''යි ගොසින් බලා එව''යි රජ්ජුරුවෝ කීහ.

බොධිසත්ත්වයෝ ගොසින් අසු බලා ව්‍යාධියක් නොදැක සිතන්නාහු අස්සලයාගේ පය කොර කොට ඔබන නිසා මූත් ඒ නිසාම උග්‍ර පමණක් චිතා ව්‍යාධියක් නැතැ යි රජ්ජුරුවන්ට කියන්නාහු "සාම නම් රජ්ජුරුවන් වහන්ස, නුඹ වහන්සේගේ පාණ්ඩව නම අශ්වයා ගිරිදත්ත නම් අස්සලයාගේ දෙඟයෙන් පය කොර කොට ඔබන පමණක් මිසක් අසුගේ ව්‍යාධියක් නැත. එසේ හෙයින් යහපත් නිර්ව්‍යාධි අස්සලයකු අසු බලන්ට සලස්වන්නා අසුගේ පය කොර ඇරෙයි" කියන්නා ඒ නියාවට නිර්ව්‍යාධි අස්සලයකු සැලැස්සූ ගමනේ අසුගේ පය කොර පලාගියේය යි වදාරා මේ ගිරිදත්ත ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි ගිරිදත්ත අස්සලයා නම් දෙවදත්තස්ථවිරයෝය, පාණ්ඩව නම් අශ්වයා මාකෙරේ වෛරී පක්ෂයේ අත්හත් භික්ෂූහුය, රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය, අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

## 180 අනාගිරත ජාතකය.

තිවද ත්‍රිභුවනතිලකවූ සම්බුදයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්,**

සැවැත්නුවර එක් බ්‍රාහ්මණ මානවකයෙක් ත්‍රිවේදය පාරප්‍රාප්තව බොහෝ රාජකුමාරවරුන් නම් මන්ත්‍ර හදාරත්වයි. ඒ තෙමේ කල්‍යාමකින් අඹුදරුවන් වහල් සරක් ආදීවූ බොහෝ ගිහිකටුලේ යෙදී තෙමේ තමාගේ මන්ත්‍ර මණ්ඩලයෙහි අනතයෙහිත් ආදියෙහිත් සිත කැලඹි සිහිනැති වන්නට වන.

එසමයෙහි එක් දවසක් ඒ බ්‍රාහ්මණ ගඳදුම් මල් පහන් ගත් අත් ඇතිව බුදුන් දකින්ට ගොසින් බුදුන් දිට. සම්බුදයෝ 'ඇයි බ්‍රාහ්මණය, බොහෝ දෙනාට මන්ත්‍ර උගන්වයි. දැනට ම වනපොත් ඇද්දැ?"යි විචාරා වදාළ සේක.

එද කියන්නේ "ස්වාමීනි, පඤ්චකාම විසයෙහි හා ගිහි කම්කටුලේ සිත වැටී ඇදී යනපත්ව දන්නා දෙය දැන් සඳහන් නැතිවෙන්ට වනැ"යි කීය. එබස් සම්බුදයෝ අසා "පළමුත් තට එසේම වූයේ වේදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්,**

ඒවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ බරණැස් නුවර දිසාපාමොක් ආචාරිව ඉපිද බොහෝ ශිෂ්‍යයන් අකුරු කියවා වාසය කරණසේක. එසමයෙහි අතවැස්සන්ට ප්‍රධානව බොධිසත්වයන්ට ඉක්බිතිව ඉන්නා බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රාහ්මණයා පඤ්චකාමයෙහි හා ගිහිකම්කටුල්ලෙහි වන. එවක් පවන් ශිල්ප වනපොත් නැතිවන්ට වන. බොධිසත්ත්වයෝ "ඇයි මාන වකය, තාගේ ශිල්ප වනපොත් නැද්දැ"යි විමසා. 'එසේය, පඤ්චකාමයෙහි හා ගිහිකම්කටුලුවලට සැලවුනු ගමනේ වනපොත් නැතිවන්ට වන්නාහ"යි කීය.

එබස් අසා "එඹල කැලඹුනාවූ ජලයෙහි සිප්පි මස්කැස්බෝ නොපෙණෙත්ද? එමෙන් කැලඹුනාවූ සිතිවිල්ලෙන් ශාස්ත්‍රය නොපෙණෙන්නේය. ප්‍රසන්නවූ ජලයෙහි සිප්පි මස්කැස්බන් පෙණෙන්නාසේ ප්‍රසන්නවූසිතිවිල්ලේ බොහෝ ශාස්ත්‍ර සිත තිබෙයි" වදාරා **අනාගිරත ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි බ්‍රාහ්මණ මාණවකයා නම් මෙසමයෙහි බ්‍රාහ්මණ මාණවකයා මය, දිසාපාමොක් ආචාරී නම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

---

## 181 දධිවාහන ජාතකය

තිවද ත්‍රිභුවනාධිපතිවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්ත සථවිරයන් වහන්සේ භජනය කරණ භික්ෂූ කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

මෙහි වර්තමාන කථාව යට කී ජාතකය හා සමානය, මෙහිදී සම්බුදුරජාණන් වහන්සේ "මහණෙනි, අසත්පුරුෂයන් භජනය කිරීමෙන් සත්පුරුෂයෝත් නපුරු වන්නාහ. කාරණා කිම්ද? යන් කොසඹ ගස් හා අහුල්වැල් එක්වීමෙන් නික්තවූ අඹගස වැන්නේය"යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බමුණෝ සතර දෙනෙක් හිමිගෙය හැර හිමාලය වන යට වැඩ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පෙළපාළියෙන් පන්සල් ඉදිකොට ගෙණ වාසය කරන්නාහ.

එසමයෙහි හැමට වැඩිමාලු තාපසයෝ කළුරිය කොව දෙදෙව්ලොව දෙවියන්ට නායකව ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. ඉපිද තාපසකම් කොට ශක්‍රභවන යට ආ නියාවත් තමන් මලනු තුන්බැයන් තාපසකම් කරණ නියාවත් දැක ඒ තුන්බැයන් කරා ශක්‍රයෝ අවුත් දැක යන්නාහ.

එක් දවසක් වැඩිමාලු තාපසයා කරා අවුත් "සවාමීනි, ඵාසු අඵාසු කිම් දැ?"යි විචාළාහ. එවිට තාපසයෝ කියන්නාහු "පාණ්ඩු රෝගය ඇතිහෙයින් ගින්නෙන් ප්‍රයෝජන ඇත. ඊට උපාකාර වවු"යි කීහ.

එබස් ශක්‍රයෝ අසා වාසිඵරසුවය යි යන දෙයක් දී එක්පිටකින් පෙරලා ගන්නා පොරවය යි කියා තෙලෙන් කැමති ප්‍රයෝජනයක් විදුව යි කියා ශක්‍රයෝ තාපසයන්ට දුන්නාහ. තාපසයෝ කියන්නාහු "ශක්‍රයෙනි මේ වැපොරව ඇරගෙණ මට දර ගෙණෙන්නෝ කවුරුදැ?"යි කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු "නුඹවහන්සේ අත පිය හිත්දදීම දර පලාගෙණ එව"යි කියන්නා "තෙමේම ගොස් පෙරලා දර පලාගෙණවිත් ගිනි මොලවන්නේය"යි කියා වාසිඵරසුව දී අනික් මැදිබැ තාපසයන් කරා ගියේය. ඒ තාපසයන්

සමීපයට ගොසින් ශක්‍රයෝ කියන්නාහු "තාපසයන් වහන්ස, නුඹවහන්සේට ඵාසු අඵාසු කිම්ද?"යි විමසූහ. ඒ තාපසයෝ කියන්නාහු "ඇතුන්ගෙන් පන්සල ඇලගැමෙන් බොහෝ අඵාසුය, එසේ හෙයින් ඇතුන් පහකරණ උපායක් කියව"යි කීහ.

ශක්‍රයෝ එබස් අසා බෙරයක් දී "මේ බෙරය එක් ඇසක් ගසාලන්නා චතුරංගිණී සේනාව වුවත් බිඳෙන්නාහ. එක් ඇසක් ගසාලන්නා එකනීම මිතුරුව සිටිනාහ"යි කියා බෙරය දී බාල තාපසයන් කරා ගොස් ඵාසු අඵාසු විචාරා ඒ තාපසයෝත් තමන්ට පාණ්ඩුරෝගයක් ඇතිනියාව කියාදී ඊට සැහෙන ගමක් ඇතොත් යහපතැ යි කීය. එවිට ශක්‍රයෝ දී කලයක් දී මේ එක තෙනක නමා පියන්නා මහත්වූ ගඩගාවක් වෙයි කියාදී ශක්‍රයෝ ගියාහ.

එසමයෙහි එක්තරා නුවරෙක් පාලුවගිය ගමක සාරා කා ඇවිදින්නේ අනකී මැණිකක් දැක ඒ මැණික කටින් දැගෙණ ඒ මැණිකේ ආනුභාවයෙන් ආකාශයෙන් නික්ම සමුදු මධ්‍යයෙන් දිවයිනකට බැස සිතන්නේ ඒ ඒ තැන ගොදුරු සොයා ඇවිදින්ට කාරණා කිමද? මෙතනම ඉඳිමි සිතා දිඹුල් ගසක් සමීපයට ගොසින් ගසමුල මැණික තිබා එහි වැදහොත්තේය.

එකලට එක් ගමෙක දෙමව්පියන් විසින් හරණලද එක්තරා පුරුෂයෙක් පටුන්ගමකට ගොස් කුලියට පඩිවිවකට නැඟී යාත්‍රාකරන්නේය. මුදුමඩ්‍යයේදී පඩිවිව නැසින. එවිට පුරුෂයා ලැල්ලක් බඳ තිබාගෙණ පිහන්නාහු උඹරා වැදහොත් දිවයිනට පාව ගියේය. එතනට පාව උඹරා වැදහොත් නියාවත් මැණික තිබූ නියාවත් දැක උඹරා මෙතනට ආවේ මැණිකේ ආනුභාවයෙන්මය යි සිතා උඹරා කරා යෙමින් සිට සොල්මන් නොකොට අවුත් මැණික ඇරගෙණ ආකාශයෙන් දිඹුල්ගසට නැඟී සිතන්නේ උඹරා මරා මස්කාපියා ඔබ්බකට යෙමි සිතා දිඹුල්දණ්ඩක් කඩා උඹරා ඇඟට දමී. එවිට උඹරා පිබිද මැණික ඇසින් නොදැක ඒ ඒ තැන ඇවිද විලරුවැටුනු සේ සොයන්ට වන. ඒ වේලාවට ගස උඩ උන් පුරුෂයා භිතාසීපිය. එවිට උඹරු උඩ බලා මිනිසා දැක දිඹුල්ගස එලාපියා මිනිසා එලෑගෙණ නසමි සිතා දිඹුල් ගසට වේගවත්ව ඉසින් අන්නට වන. ඒ නියාවෙන් දිඹුල්ගසට ඇන තමන්ගේ ඔළුව පලාගෙණ තෙමේම මළේය.

පුරුෂයා උරා මළ බව දැන ගසින් බැස ගිනිගා උඹරා පුළුස්සා කා එත නම සිට මැණිකෙහි ආනුභාවයෙන් හිමාලයවනය බලා ආකාශයෙන් යන්ට වැද අතරමග උන් තාපසවරුන් තුන්දෙනා දැක ඉන් පළමුවන තාපසයන්ගේ පන්සල කෙරේ බැස ඒ තාපසයන් දැක එතන කිප දවසක් රඳා තාපසයන්ගේ වාසිඵරසුවේ ආනුභාව දැක "මේ මැණික ඇරගන්ට වුවමැනවැයි"යි කියා තමන්ගේ මැණිකේ ආනුභාව කියා තාපසයෝ ඵපවත් අසා "ආකාශයෙන් මාත් ඒ ඒ තැන යන්ට වුවමැනවැ"යි සිතා වාසිඵරසුව දී මැණික ඇරගත්තාහ. ඒ වාසිඵරසුව ගත්තාවූ පුරුෂයා වාසිඵරසුව අත පා යවා "තාපසයන්ගේ ඉස කපාගෙණ ඵව"යි යැවීය. වාසිඵරසුව එලෙසම ගොස් තාපසයන්ගේ ඉසකපා ගෙණ ආය.

මැණිකත් ඇරගෙණ එවිට ඒ පුරුෂයා වාසිඵරසුව එක්තෙනක සඟවා තිබා අනික් තාපසයන් කරා ගොස් මැණික ඇරගෙණ උන් හා කිප දවසක් රඳා

බෙරෙහි ආනුභාව දැක "මේ බෙරය මා ඇරගන්ට වුවමැතැවැ"යි සිතා තමන්ගේ මැණිකේ ආනුභාව කියා තාපසයන් විසින් මැණික ඇරගෙණ බෙරය දුන්පසු ඒ තාපසයන්ටත් ඒ නියායෙන් වාසි එරසුව අතපා යවා තාපසයන්ගේ ඉස කප්පවා ගෙන්වාගෙණ මැණිකත් ඇරගෙණ අනික් තාපසඋන් කරාගොස් උන්ගේ දී කළයෙහි ආනුභාව දැක දී කළය ගන්නා පිණිස මැණිකේ ආනුභාව කියා මැණික දී දී කළය ඇරගෙණ වාසි එරසුව අතපා යවා තාපසයන්ගේ හිස කප්පා ගෙන්වාගෙණ මැණිකත් ඇරගෙණ ආකාශයෙන් බරණැස්නුවර කරා ගොස් බරණැස්නුවර සමීපයේ සිට රජ්ජුරුවන්ට කියා යවන්නේ "මට රාජ්‍යය හෝ දෙව යුඩ හෝ කරව"යි කියා මිනිසකු අත කියා යැවීය.

එබස් රජ්ජුරුවෝ රසා චතුරඞ්ගිණී සේනාව ඇරගෙණ මොහුඅල්වමි"යි නික්මුණාහ. නික්ම පුරුෂයා කරා අවුත් යුඩයට වන්නාහ. එවිට පුරුෂයන් සියල්ලවුන්ම තමාට මිතුරුවන්නාවූ බෙරඇස ගසාලීය, එවේලේ සේනාව අවුත් ඒ පුරුෂයා වටකොට ගත්තාහ. එවිට රජ්ජුරුවෝ එසේ වූවත් රාජ ඩෙයිසියෙන් කිපදෙනෙකු ඇර ගෙණ බැණගෙණ නික්මුණාහ. ඒවේලාවට තමාගේ දී කළය නමාපිය එවිට ගඩහාවක්සේ දී වතුර ඇරගෙණ නික්මුණේය. එවිට සතුරුව ඉන්නාවූ බොහෝ දෙනා ඉගුළුනාහ, එවිට අනික් බෙර ඇස ගසා සතුරන් ඒ ඒ තෙත යවා වාසි එරසුව අතපා යවා රජ්ජුරුවන්ගේ ඉස නෙන්වාගත්තාය. මේතෙක් සේනාවෙන් එකකුත් ආයුධයක් සරස්කොට ලම්හ යි නො සිතූහ. එවිට බොහෝ දෙන එක්ව ඒ පුරුෂයාට දධිවාහන රජ්ජුරුවෝය යි නම් තබා මහත්කොට පෙරහරින් නුවරට ගෙණවුත් ඔටුනු පලන්දා රාජ්‍යයට සලස්සාගත්හ. ඒ දධිවාහන රජ්ජුරුවෝ දැහැමෙන් රාජ්‍යය කරන්නාහ.

එසමයෙහි දධිවාහන රජ්ජුරුවන් එක් ගඟක ලෝදැල් එලා නාමින් සිටියේක. හිමාලය වනයෙන් කණිමුඩනම් විලින් දේවතාවන් අනුභව කරන්නාවූ අඹගසින් අඹයෙක් අවුත් ඒ ලෝදැල්වල බැඳින. ඒ දුටු කෙවුලෝ රජ්ජුරුවන්ට ගෙණගොස් පෑහ. රජ්ජුරුවෝත් වැඳදන් අතින් විවාරා අඹ රසය අනුභවකොට එකියන අඹඇටය උයනේ රෝපණය කරවා ඒ ගසවට බොහෝ සුවඳගස් ඇතිකරවා දවස්පතා සුවඳපැන් කිරිපැන් සඳුන්පැන් වත් කරවා ගස නොයෙක් මල්දම් එල්වා සුවඳ දුම් හා ලවා වටකොට පටකඩ තිර ජවනිකා බන්දවා මේ නියායෙන් බොහෝ පෙරහර අඹගසට කරවූහ.

අඹගස තුන් අවුරුද්දකින් රන්වන්ව මී අඹ ඵලගෙණ මී හා සමාන රස ඇති විය. රජ්ජුරුවෝ ඒ ගස ඵල අනුභවකොට මේ ඵල ඒ ඒ රජදරුවන්ට පඬුරු කොට යවම් සිතා නැවත සිතන්නාහු "මේ ඵල රජදරුවෝ කා ඒ ඇට ඉඳුවා ඇතිකලෝ නම් මේ ගස නිස්සාර වෙයි" සිතා අඹගෙඩියේ පැලවෙන සථානයෙහි මඩුකටු ගසා යවූහ. ඒ ඒ රජදරුවෝත් අඹ ඇට ඉඳුවා නැස්පෙන හෙයින් "මීට කාරණා කිම්දෝ හෝ යි"යි සිතා පරීක්ෂාකොට මඩු කටු ගසා යවතලද නියාව දැන ඉන් එක් රජ්ජුරුකෙනෙකුන්ගේ උයන් ගොවීවාත් බරණැස්නුවරට ගොස් දධිවාහන රජ්ජුරුවන්ට තමන් ආපවත් කියා යවා රජ්ජුරුවන් විසින් ගෙන්වා "තෝ උයන්ගොවිවෙක්ද"යි විවාරන්නා "එසේය, රජ්ජුරුවන් වහන්ස අකාලයට ඵල ඇතිකිරීම්, මල් ඇතිකිරීම් ආදීවූ දෙය දනිමි" කියා එබස් රජ්ජුරුවෝ අසා තමන් උයන්ගොවීවා හා කැටිව

උයන් බලන ලෙස සැලැස්සූහ. එකියන උයන්ගොවිවාත් නොකලට මල් හා ඵලදා ඇතිකොට රජ්ජුරුවන්ට පෑය. රජ්ජුරුවෝ සතුටුව පළමු සිටි උයන් ගොවිවා හැර අමුතුව ආ උයන්ගොවිවාට උයන භාරකොට දුන්නාහුය.

එවිට උයන්ගොවිවා උයන තමා තතුවූ පසු අඹගස තිත්තකෙරෙමි සිතා අඹ ගසයට කොසඹගස් හා අහුල්වැල් වට ඉදුවිය. ඒ වැඩී අඹගස මුල් බැඳී අඹගස ශාඛා හා එක්ව බැඳි අහුල්වැල් ගසවැළඳ කල්යාමකින් අඹගස කොසඹගස මෙන් තික්තව හිඳේය. තමා ආ කාරිය සිඳුව හිය හෙයින් උයන් ගොවිවා තමා නුවරට පලාහිඳේය.

එවිව රජ්ජුරුවෝ එක්දවසක් මගුල්උයනට ගොස් අඹ කමී සිතා අඹ කා කොසඹ කොල සැපුවාසේ තික්ත විසින් රජ්ජුරුවෝ කාරා බිමට දැමූහ. බෝධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට අජ්ජියෙන් ධම්මයෙන් අනුශාසනා කරන්නාවූ අමාත්‍යව ඉපිද රජ්ජුරුවන් ලඟ සිටියාහ. රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ට කියන්නාහු "අමාතවූ අඹගසට කළමනා ප්‍රතිකාරයෙන් අඩුවක් නැතිව තිබියදී තික්තවන්ට කාරණා කිම්ද"යි විවාළීය.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "දඩිවාහන රජ්ජුරුවන්වහන්ස, කොසඹගස් අහුල්වැල් නිසා මෙසේ වනැ"යි කීය. එවිට රජ්ජුරුවෝ කොසඹ ගස් අහුල්වැල් කපපවා දම්මවා තික්තවූ පස්ද අද්දවා දම්මවා මිහිරි පස් ලවා කිරිපැන් සඳුන්පැන් වත්කොට පෙරසේ පණත් කළාහ. පළමු උයන්ගොවිවාට උයන පාවාදුන්නාහ. අඹගස පෙර මිහිරිරස ඇතිවීයයි වදාරා දඩිවාහන ජාතකය නිමවා වදාළසේක. "එසමයෙහි අමාත්‍යව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි දක්වා වදාළසේක.

---

## 182
## චතුමට්ට ජාතකය

තවද ත්‍රිභුවන ඊශ්වර වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මාලු නිසා කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

එ කෙසේද? යත්,

එක් දවසක් සැරියුත් මුගලන් දෙගසව්වන් වහන්සේ උන්වහන්සේ කැටිව ප්‍රශ්න විසඳීම ආදීවූ ධම්මකථාවෙන් යුක්තව සිවුවණක් පමණ මධ්‍යයෙහි වැඩ උන්සේක.

එතනට මාලුතෙරකෙනෙකුන්වහන්සේ අවුත් තුන්වෙනිව ඉඳ "සැරියුත් සාමිනි, නුඹවහන්සේව නොදැනෙන දෙයක් ඇත්නම් මට වදාළ මැනව, මම කියම්, මට නොදැනෙන දෙයෙක් ඇත්නම් නුඹවහන්සේ කියනු මැනවැ"යි කීසේක. එබස් දෙගසව්වන්වහන්සේ අසා මේ නිකම්ම තුවජ පුරුෂයා අප හා සමග ඉඳ කථා කෙරෙයි කියා ලජ්ජාව එතනින් පලාගියසේක. එවිට බොහෝ උපාසකවරු ඒ නම එතනින් පහකොට ලූ පවත් සම්බුදුන්ට සැලකළාහ.

සම්බුදුයෝ "උපාසකවරුනි, දැන් මතු නොවෙයි, පෙරත් දෙගසව්වන් කථාකොට උන්කලව මෙකියන භික්ෂූහු නිසා කථාව ඉගුළුනේ වේදැ"යි වදාරා "ඒ කෙසේද?"යි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

**යම්** වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ හිමාලයවනයෙහි හංසෙක වෘක්ෂදෙවතාව ඉපිද වාසය කරණ සේක.

එසමයෙහි චිත්‍රකූට පර්වතයෙහි වසන්නාවූ සුවණ්ණහංසයෝ දෙන්නෙක් ගොවරභූමියට යන එන කල බොධිසත්ත්වයන් වාසයකරන්නාවූ වෘක්ෂයේ සැතපී යන්නාහ. මෙසේ යාමෙන් බොධිසත්ත්වයන් හා හංසයෝ දෙන්නා විශ්වාසව මෙලොවින් පරලොවින් යුක්ත කථා කිය කියා යන්නාහ.

එසමයෙහි එක් දවසක් බොධිසත්ත්වයන් හා සුවණ්ණහංසයෝ දෙන්නා හා කථාකොට උන්නෙනට කැනහිලෙක් ඇවිත් ගසමුල හිඳ හංසයන්ට කියා 'හංසයිනි, උඹම හිඳ රහස් කථාකරවුනැ යි සිවුපාවුන්ට නායකවූ මා හා සමග කථා නොකොට උඹ ඉඳිනේ ඇයි ද?"යි කීහ. එඛස් හංසයෝ අසා "මම් නීවයා අප හා කැටිව කථා කෙරෙති කියා ලජ්ජාව චිත්‍රකූටපර්වතයට නැගී ගියහ. බොධිසත්ත්වයෝ එවිට කැනහිලාට පෙණී 'හංසයන් හා හංසයෝ කථා කෙරෙති හංසයන් හා දෙවියෝ කථාකෙරෙති. තෝ වනාහි ජාතියෙන් වණ්ණයෙන් රූපයෙන් ශබ්දයෙන් යන සතර කාරණයෙන් අඩු වූනා හා සමග කුමන කථා ද"යි කියා අහංකාර වේශ පෑ කැනහිලා ලුහුපන්දුපුව යි වදුරා මම් චතුමඩිට ජාතකය නිමවා වදාළ සේක.

---

## 180 සීහචම්ම ජාතකය.

**මේ** වද තිබුවන නායකවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොකාලිකස්ථවිරයන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

කොකාලික ස්ථවිරයන්වහන්සේ බොහෝ ත්‍රිපිටකය හදාරණ මාලු වරුන් වහන්සේ දැක "අපිත් කියමෝද"යි කියා එක්දවසක් බණකියන්ට වැද බණ කියාගත නොහී ඛාදිය සෙලවී බිමට බැසපුය. බොහෝ භික්ෂූන් වහන්සේත් බුදුන් කරා ගොස් "ආදි මුත් බණදහම් දනිති යි උනුම්හ. තමන් කිසිවකුත් නොදන්නා නියාව තුමූම ප්‍රකාශකළේය"යි වදාළසේක. එඛස් අසා සම්බුදුයෝ "පළමුත් තමන් කිසිවකුත් නොදන්නා නියාව තමන්ම ප්‍රකාශ කළෝ වේද"යි වදාරා ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ ගොවිකුලයක ඉපිද සිය‍ා ජීවත් වන්නාහ.

එසමයෙහි එක්තරා බෙලෙදෙක් කොටළුවකු පිටින් බඩු අරගෙණ ගොසින් ඒ ඒ තැන් ජීවත්වන්නේය. කොටළුවා තෘණ භූමියට අරණ කල සිංහයකුගේ සමක් පොරවා යවන්නේය. මේ නියායෙන් කොටළුවා තණ කවා බොධිසත්ත්වයන් වසන්නාවූ ගමට පැමිණියාවූ වෙලෙඳ පළමු පරිද්දෙන් සිංහ සමක් පොරවා යවූවාහු වපුළ කුඹුර කන්ට හළ, එකියන කොටළුවාත් තණ කන්ට වන, එවිට කුඹුර මනුෂ්‍යයෝ සිංහයෙක් අවුත් තණ කතී සිතා මරන්ට භයින් ගමට ගොස් බොහෝදෙනා එක්කොට ගෙණ ආයුධ හා ගැස්සීම් පිඹීම් ඇතිකොට කුඹුර වටකොට ගෙණ අඩගසා හඝගන්වන්නාහ.

එවිට කොටළුවා භයින් තමාගේ රාවයෙන් ඇඹුහෙලින් ගද්‍රභයා මරා තළා ඇට සුණුවිසුණුකොටපුවාහ ඒ වේලේ වෙලෙඳ එතනට අවුත් "තාගේ ව්‍යවසථාව සේ බැණ නොනැගී හිඳ ඇඹේමෙන් තළවාගත්තේවේදැ"යි අවවාද කොට වදාරා සිංහවම්ම ජාතකය නිමවා වදාළසේක. "එසමයෙහි ගද්‍රභයා නම් කෝකාලිකසථවිරය, එසමයෙහි ගොවියාව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

---

## 184 ශීලානිශංස ජාතකය

තිවද ත්‍රිභුවන චූඩාමණිභූත වූ සම්බුදුරජාණන්වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි උපාසකකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්,**

එක්තරා උපාසකයෙක් බුදුන් දක්නා පිණිස ජේතවනාරාමයට එමින් සිට අතරමග අවිරවතී නම් ගඞ්ගාවක් දැක ගඞ්ගාවේ ඔරු පාරු පදිනා තොටියා නොදැක එවිට සිතන්නාහු "ඔරු පාරු නැතැ යි කිම්ද? බුඩාලම්බන ප්‍රීතියෙමි"යි සිතා දියට බැස ගල්පොත්තක යන්නාසේ නික්මුණාහ. ගඞ්ගාව මඩ්‍යයට ගියකල ගඟදැලයෙන් බඳිනා රල දැක බුඩාලම්බන ප්‍රීතිය යම්තමෙක් අඩුවිය. එවේලාවව පැතෙහි පය ගැලෙන්ට වත. නැවත බුඩාලම්බන ප්‍රීතිය උපදවා දියපිටින් ගොසින් බුදුන් දකින්ට යියාහ.

එවිට සම්බුදුරජාණෝ "උපාසකය. යෙහන් සෙමෙන් අවුදැ"යි විචාරන්නා "එසේය, සවාමීන්වහන්ස, බුඩාලම්බන ප්‍රීතියෙන් අවිරවතී නම් ගඞ්ගාවෙන් ගල්තලක්පිට එන්නාසේ ආමි සවාමීනි" කීය.

එබස් සම්බුදුරජාණෝ අසා "උපාසකය, පළමුත් උපාසකවරු බුඩාලම්බන ප්‍රීතියෙන් ජීවිතය රැකගත්තෝ වේදැ"යි වදාරා "ඒ කෙසේ දැ"යි ආරාධිත වූ සම්බුදුරජාණන්යන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරණ සමයෙහි කාශ්‍යප බුදුන්ගේ අනාගාමී උපාසකයකු පඬුවී නැගෙන්ට යන අවස්ථාවෙ එක්තරා කරණැමියෙකුත් පඬුවී නැංගේය. ඒ කරතැමියාගේ භාය්‍යාවද උපාසකයන්ට කරනැමියා පාවාදී "පැමිණි දුකක් සුවයෙක බැඳෙව"යි කියා කිව. "යහපතැ"යි ගිවිස දෙන්නම පඬුවී නැගී සත් දවසක් සමුද්‍ර යාත්‍රාකොට සත්වෙනි දවසේ පඬුවී බුන්කල්හි ලෑල්ලක් පිට උපාසකයන් හා කරණැමියන් හා දෙන්න ලෑල්ල බඩනියාගෙණ පිනාගෙණ ගොස් දිවයිනකට පාව ගියහ. එවිට කරණැමියා දිවයිනක බොහෝ පක්ෂීන් මරා කා උපාසකයාවත් දෙයි, උපාසකයා සිතන්නාහු "මෙතන අපට සරණෙක් නම් බුඩය, ධම්මය, සංඝය යන ත්‍රිරත්නය විනා අනික් සරණයෙක් නැතැ'යි කියා සිතා ඉන්නාහ.

එවේලාවට මහාසමුද්‍රයෙ වසන්නාවූ නාගරාජයෙක් තමා කය සත් රුවන් පිරූ නැවක්මෙන් මවාගෙණ. ඒ සමුද්‍රයේ වසන්නා වූ දේවතාවා මාලනී වෙසක් මවාගෙණ උපාසකයන් වසන සථානයට ගොස් බරණැස් නුවරව යන්නෝ ඇද්දැ"යි අඬගැසීය. එවිට උපාසක "අපි බරණැස් නුවරට යම්හු"යි කියා එවිට "යහපත" තොප නිසා ගෙණා නැවය තොප නැගෙව"යි කීහ. උපාසකයා කරණැමියාට නැගෙන්ව අඬගැසීය. එවිට දේවතාවා කියන්නේ "තොපවිනා උන් නැගෙන්ව අවසර නැතැ"යි කීය. "ඇයි උන් නැගෙන්ව බැරි කවර කාරණයක් නිසාදැ"යි විචාරන්නා තිසරණ පිහිටි කෙනෙන් විනා තිසරණ නොපිහිටියන් නැංග නතැ"යි කීහ.

එවිට උපාසකයෝ "මා ගත්තා වූ යම් සීලයෙක් ඇත්නම් තොපිත් අනුමෝදන් වෙව"යි කීහ. එවිට කරණැමියාත් "ස්වාමීනී, මාගේ අතින් පිණක් කොටගත නුහුනුවත් නුඹවහන්සේ දුන් පිං අනුමෝදන් වෙමි කියා සිත සුඛකොට පිං අනුමෝවගත. එවිට කරණැමියාත් නැවට නංවාගෙණ දෙන්නා මූදින් ගඟට බාගෙණ ගඟ ඔස්සේ ගොසින් බරණැස් නුවරට බා දෙන්නාගේ ගෙවලට වෙන වෙනම සම්පත් සලස්වා ආකාසේ සිට කියන දිව්‍යපුත්‍ර, බරණැස් සත්ත්වයනට ඇසෙන සැටියේ "යම් කෙනෙක් සත්පුරුෂවූ වාසයෙන් හා තුනුරුවන් කෙරෙහිම මාන ඇතිව වෙසෙත් නම් එසේවූ සත්ත්වයාව සමුද්‍ර මඩ්‍යයේදී ප්‍රතිෂ්ඨාව පෙණෙන්නේ වේදැ"යි කියා නැවත කියන්නාහු "සම්සේ සත්පුරුෂයන් හා සමාගම්වීමෙහි ආනුභාවයෙක් කිසි ගුණයක් නැති කරණැමියාත් ප්‍රතිෂ්ඨාවක් ලද්දේ වේදැ"යි කීහ යි වදාරා **ශීලානිශංස ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි උපාසකයෝ නිවන් දැකපූහ. එසමයෙහි නාගරාජයා තම් ශාරීපුත්‍ර මහාසථවිරය, දේවතාව උපන්නෙම් බුදු වූ මම්ම වේදැ"යි තමන් වහන්සේ දක්වා වදාළසේක. මේ බණ අවසානයේදී මේ උපාසක සකෘදාගාමී මාගීයට පැමිණියේය.

## 158 රුහක ජාතකය.

තිවද ත්‍රිභුවන විනතාමාණික්‍ය වූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා පුරාණ දුතියිකා කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූන්වහන්සේ කෙනෙකුන් නිසා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

මෙහි වර්තමාන කථාව අට්ඨකනිපාතයෙහි ඉන්ද්‍රිය ජාතකයෙහි විස්තර වශයෙන් එන්නේය. මෙහි ''මහණ, තෝ වනාහි පුරාණ දුතියිකාව නිසා සිවුවණක් පමණ් මඩ්‍යයෙහි ලජ්ජාවවපැමිණියේ වේදැ''යි වදාරා ''ඒ කෙසේ දැ?''යි ආරාධිත වූ සම්බුදුයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ගේ අග්‍ර මෙහෙසිකා බිසවුන් කුස පිළිසඳ ඉපද වැඩිවිය පැමිණ පියරජ්ජුරුවන්ගේ ඇවැමෙන් රාජ්‍ය කරන්නාහ.

ඒ රජ්ජුරුවන්ගේ රුහක නම් පුරෝහිත බ්‍රාහ්මණයෙක් ඇත. ඒ රජ්ජුරුවෝ සන්නාන සන්නඩයෙන් සරහනලද අශ්වයකු බමුණන්ට දී ''බමුණානන් මා දකින්ට එනකල මේ අසු නැඟි එව''යි කියා සැලැස්සූහ. ඒ නියාවට පුරෝහිතයාත් අසු නැඟී එන්නේය, බොහෝදෙනා අශ්වයාට ස්තුති කරන්නාහ. ඊට බ්‍රාහ්මණ තමාගේ පුරාණ ස්ත්‍රියට කියන්නේ ''එම්බල සොඳුර, අපගේ අශ්වයාට බොහෝසේ ස්තුතිකරන්නාහ''යි කීහ. එවිට ස්ත්‍රිය කියන්නී ''මාගේ බමුණා වෙහෙසාපියන්ට වුවමැනවැ''යි සිතා කියන්නී බමුණානන් වහන්ස, අසුට කවුරුන් ස්තුති කරන්නේ සන්නාහය ලාගෙන යන නිසාය, එසේ හෙයින් නුඹවහන්සේ සන්නාහය ලාගෙණ සතර කකුලෙන් ගියමැනවැ''යි කිව. එබස් බ්‍රාහ්මණයා අසා මුන් කිවේ ඇත්තකැයි සිතා මොහොයෙන් අන්ධ වූ බ්‍රාහ්මණයා පසු දවස සන්නාහය ලාගෙණ වීථියේ නික්මිණ. එවිට බොහෝදෙන සිතාසී බමුණානන්වහන්ස, ඉතාම රිසියෙමි'' කීහ. රජ්ජුරුවෝ දැක ''ඇයි බ්‍රාහ්මණය, තට පිත් කිපිනිදැයි, නැතහොත් උන්මාදයක් සැලසුනු වේ දැ'' කීහ.

එවිට බ්‍රාහ්මණයා ලජ්ජාවට පැමිණ සිතන්නේ බොහෝදෙනාගෙන් ලජ්ජාවට හා නින්දාවට පැමිණියා වේදැයි කොපයෙන් බැමිණියට කියමි කියා ගෙට නික්මිණ. බැමිණියත් බමුණා කොපව ගෙට එන නියාව දැන පැලඳෙරින් පලාගොස් රජගෙට වත. රජ්ජුරුවොත් කීපදවසක් පලායන්නා බමුණාට කියන්නාහ. ''බ්‍රහ්මණය දුනුදිය කැඩිගිය කල පෙරලා ගැවගසා දුන්නේ ලාගණිද් ද? එමෙන් තොපගේ බ්‍රාහ්මණිය ඉඹමාකොට පාවාගණුව''යි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ ''දේවයන්වහන්ස, දුනුදිය කැඩිගියකල ඔබ්බෙන්නියද සලස්වා දුනුදිය සලස්වා ගණිද්ද? එමෙන් ඔබ්බෙන් ස්ත්‍රියක්

ಪ್ರಭಾವತಿ ಮತ್ತು ಕುಮುದ

සල්ස්වා ගනිතොත් විතා මෙතෙක් ලජ්ජාවට පමුණුවාපු තැනැත්තිය එපාය"යි කියා හැර ඔබ්බෙන් ස්ත්‍රියක් ගෙනාහ යි වදුරා මේ **රුහක ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි පුරාණ ස්ත්‍රිය නම් මෙසමයෙහිත් **පුරාණ දුතියිකාය**, පුරෝහිත බමුණා නම් ශාසනයෙහි ඇලුම් මද භික්ෂුහුය, බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 186
## සිරිකාලකන්නි ජාතකය

**සිරිකාලකන්නි** ජාතකය උමඟු යෙහි විස්තර වශයෙන් බස්නේය.

---

## 187
## චුල්ලපදුම ජාතකය

**තිවද** ත්‍රිභුවන ප්‍රදීප වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ස්ත්‍රීන්කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලදි. මෙහි වර්තමාන කථාව උම්මදන්ති ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි වර්තමාන සම්බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට "ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව උරග පලා ලේ බොන්ට දුන්නේවේදැ"යි වදාරා "ඒ කෙසේද?"යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

**යි**වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ අග්‍ර මහෙසිකා බිසවුන් බඩ පිළිසඳ දසඑකඛමසකින් උපන් කුමාරයාට නම් තබන්නාහු පදුම කුමාරයෝය යි නම් තුබූහ.

ඒ කුමාරයන්ට ඉක්බිති රාජකුමාරයෝ සදෙනෙක් උපන්නාහු මේ නියායෙන් රාජකුමරුවන් සත්දෙන වැඩිවිය පැමිණ ගේදොර රැක පියාතන් වහන්සේට ඉතා ලෙන්ගතුව වාසය කොට රාජ සේවය කරන්නාහ.

එක් දවසක් රජ්ජුරුවෝ සිව්මැදුරු කවුළුවෙන් වීථිය බලන්නාහු පුතුන් සත්බැයන් මහත්වූ සේනා සමෘද්ධියෙන් රාජසේවයට එන්නාවුන් දැක රජ්ජුරුවෝ සිතන්නාහු මේ දරුවෝ සත්දෙන මාගේ රාජ්‍යය උදුරා ගනිති සිතා පුතුන් සත්බැයන් තමන්කරා කැඳවා කියන්නාහු "දරුවෙනි, තොප කෙරේ සැක ඇත්තෙමි, එසේ හෙයින් මාගේ තුවර නොයිඳ ඉසලූ යම් අතෙක පලා ගොස් මාගේ අයාමෙන් අවුත් නොපගේ කුලසන්තක වස්තුව හා රාජ්‍යය හිමි කරගණුව"යි කීහ.

එවිට සත්බැයෝ පියානන්වහන්සේගෙන් වියෝවන සෝකයෙන් අඬා වැලප රජ්ජුරුවන්ගේ ආඥාව ඉක්මගත නොහෙන්නාවූ තමන්ගේ භාග්‍යීවවූ බිසෝවරු සත්දෙනාම අත අල්වා නික්මුනාහ. නික්ම ක්‍රමයෙන් ගොස් මහත්වූ

වාලුකා කාන්තාරයකට පැමිණ ඒ කාන්තාරයේ ඇවිදින්නාහු කතඛොත දැයක් නැතිව සාපිපාසයෙන් පීඩිතවූවාහු අඹුවන් කෙරේ තෘෂ්ණාව හැර පළමු දවස් බාල මලනුවන්ගේ අඹුව මරා මස් බෙදා කෑහ. බොධිසත්ත්වයෝ තමන් ලත් දෙකොටසින් කොටසක් දෙන්නා බෙදා කා මේ නියාමයෙන් මලුන් සයදෙනාගේ බිරින්දන්ගේ මස් කා සත්වෙනි දවස් බොධිසත්ත්වයන්ගේ භාර්‍යාවන් මරන්නට වන්නාහ.

එවිට බොධිසත්ත්වයෝ "මරන්නේ ඇයිද? අද දවස කන්ට මස් දෙමි" කියා පළමු තිබූ මස් කොටස් දී "මේ මස් කොටස් අදට කව, සෙට දවසට පුළුවන්වේදැ?" අස්වසා රෑ මලුන් සදෙනා නින්දට වන් වේලේ "මෙවිට මාගේ භාර්‍යාව ගලවාගණිමි" සිතා භාර්‍යාව අත අල්වාගෙණ නික්මුණාහ. ඒ කියන ස්ත්‍රියත් "යා නොහෙමි" කී හෙයින් කර ඉදුවාගෙණ නික්මුණාහ. මේ නියාමයෙන් රාත්‍රිය මුළුල්ලේ ගමන්කොට උදැසන නික්මෙන්ට වන් වේලාවට හිරු රැස් ශරීරයේ වැදගෙණ පැන් පිපාස අධිකව "පැන්බොමි" කියන්නා "මෙතන පැන් කොයින්දැ?" යි කිවත් "පැන්බොමි" කියා තත්පර හෙයින් දකුණුඋරය පලා "ඉන් වැහෙන්නාවූ ලේඛාරා බොව" යි සලස්වා ඒ නියාමයෙන් ලේබී සහතර් පිතවූ බිසවුන් ඇරගෙණ ගඟක් සමීපයට පැමිණ ඒ ගඟින් පැන්බී නාසන්තර් පිතව වනයට වැද පන්සල කොටගෙණ ඵලාඵල කා පැවිදිව දවස් අරණාහ.

එසමයෙහි ඒ ගංතෙර ඉස නුවරෙක රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ට රාජද්‍රෝහකළ එක් සොරෙකු අත පය කන් නාසා කපා ඔරුවක් පිටලා යටිගං බලා අලහ. ඒ කොටා දියේ මුරගාගණ යන්නේ බොධිසත්ත්වයන් වසන්නාවූ පන්සල සමීපයට පැමිණියේය. බොධිසත්ත්වයෝත් මොරගාගෙණ දියෙහි යන්නාවුන් දැක ඔහු කෙරේ කරුණාවෙන් ඔහු කරා අවුත් දියෙන් ගොඩලා පන්සලට ගෙණ ගොස් මැස්සක් බැඳ එහි ඔහුලා අත පය ආදීවූ දෙය කසට පැහින් සෝධා බෙහෙත් කරන්නාහ.

බොධිසත්ත්වයන්ගේ බිසව් "මේ කොටා ගෙණාගේ කුමටදැ?" යි බොධිසත්ත්වයන්ට දෙඩා කොටා කෙරේ පිළිකුල්ව දඟවිටම කෙළගසා දමා ඉඳිනාහ එසේ දම්හිඳත් බොධිසත්ත්වයෝ කළමනා පිළියමින් අඩුවක් නොකොට නොබෝ දවසකින්ම වණය සුවකළහ. වණ ගුණකොට ඒ කොටා හා බිසවුන් පන්සල සතප්පවා බොධිසත්ත්වයෝ ඵලාඵල කඩාගෙණවිත් දෙන්නාම රක්නාහ. මේ නියාමයෙන් කල්යාමක් යත් කොටා කෙරේ බිසවුන් පිළිබඳ සිත් ඇතිව ලෝකසඟාදරතියෙන් යෙදී දවස් අරනාහු බොධිසත්ත්වයන් කෙරේ පිළිබඳ සිත් මදව බොධිසත්ත්වයන් මරන්ට උත්සාහ සිතා එක් දවසක් බොධිසත්ත්වයන් ආ වේලාවට සොරලෙඩක් ගෙණ වකුටුගසාගෙණ නිදා කියන්නාහු "සඟාමීනි, නුඹවහන්සේ හා වැලිකතර එමින් සිව මේ පර්වතය දැක සැපසේ අපි වාසයකරමෝ නම් පිදේනියක් පුදමි" කියා ආරාධනා කෙළෙමි. ඒ දෙවතාවා රෑ සීනෙන් පෙණී බොහෝ භයගන්වයි, එසේ හෙයින් ඒ දේවතාවාට බලිපූජාවක් කළොත් යහපතැ" යි කීහ.

එබස් බොධිසත්ත්වයෝ අසා "සැබෑදෙයෙකැ" යි සිතා ඒ නියාවට පිදේනි සපයාගෙණ බිසවුන් සමඟ පර්වතයට නැංගාහ. එවිට බිසවුන් කියන්නාහු "සඟාමීනි, මේ දේවතාවන් වහන්සේ එසේ මෙසේ දේවතාන කෙනෙකුන් වහන්සේ නොවෙයි. එසේ හෙයින් නුඹවහන්සේ පළමුකොට වනමලින් පූජා

කොට තුන්විටක් ප්‍රදක්ෂිණා කොට වැද සිව ආරාධනා කොට ඉක්බිති බත් පූජා කරම්හ''යි කියා ඒ නියාවට බොධිසත්ත්වයෝ ''යහපතැ''යි හිවිස වතමල් පුදා තුන්විටෙක ප්‍රදක්ෂිණා කොට සෙල සමීපයට අකාල ඕතොමෝ බොධිසත්ත්ව යන් පස්සෙහි සිට බොධිසත්ත්වයන්ගේ අවසර බලා පිටිකර ගසා බොධිසත්ත්ව යන් සෙලින් පහත එලූහ.

බොධිසත්ත්වයෝ වැටෙන්නාහුම කටු කැත්තාවූ කැලයෙන් ගැවසීගත් තාවූ මහ දිඹුල්ගසෙක වැටුනාහ. බොධිසත්ත්වයෝ දිඹුල්ගස මහත් හෙයින් බසින්ට බැරිව දිඹුල්කා ඒ ගසම උන්නාහ. එසමයෙහි මහත්වූ ශරීරයක් ඇති ගොයෙක් බොධිසත්ත්වයන් උන් ගස සමීපයට අවුත් දිඹුල් කන්නේය. බොධි සත්ත්වයන් දැක භයින් පලාගොසින් දෙවෙනි දවස් සැකවී ගොදුරු කා පසුව සැක ඇරී බොධිසත්ත්වයන් හා පුරුදුව කියන්නේ ''සත්දවස එකතැන කොයින් නොගොසින් ගසම ඉන්නේ කුමක්නිසාදැ?''යි විචාරන්නා තමන් ප්‍රවෘත්ති කියා ගොයානන් විසින් ''තොපි නොබව''යි අස්වසා ගසට නැගී ''මා පිට හිඳුව''යි සලස්වා ගසින් බස්වා බිම සිටුවා වලට වන්නාහ.

බොධිසත්ත්වයෝත් මග ඔස්සේ ගොසින් එක්පියවර ගමකට පැමිණ ඒ ගම වාසයකරන්නාහු පියානන් වහන්සේ මළ පවත් අසා රාජ්‍යයට අවුත් රාජ්‍යයට පැමිණ දවස සලකුණක් වස්තු වියදම්කොට දන්හල් කරවා දන්දී දැහැමින් සෙමෙන් රාජ්‍යය කරන්නාහ.

එසමයෙහි බිසව් හා කොටත් පිටිසර අවුත් කොටුත් ඉස තබාගෙණ සිහා කන්නාහ. බොහෝදෙන බිසවුන් දැක ''මූ නුඹට කුමක්වේදැ?''යි විවාළ කල මාගේ නැදිමයිල් සරණයෙන් පාවාදී බාලදා පවත් ප්‍රියකරු සවාමිපුත්‍රයාය. එසේනෙයින් මුන් දුකට පැමිණියත් අත්හරින්නේ කෙසේ දැ?'' අත්නොහැර ඇවිදිමි කියන්නාහු.

එබස් ඇසූ බොහෝදෙන ''මුන් කියන්නේ ඇත්තකැ''යි සිතා උන්ට කැඳබත් ආදීවූ දෙය බෝහෝකොට දුන්නාහ. එකියන බිසව් දුටු බොහෝ මනුෂ්‍යයෝ ''තොප මෙසේ දුක්විඳින්නේ ඇයිද? මහාපදුම රජ්ජුරුවන් වහන්සේ දන්හල් කරවා බොහෝ යාචකයන්ට දන් දෙන්නාහ, උන්වහන් සේගේ දන්හලට ගොස් දන් කා දවසරුව''යි කිහ.

එබස් අසා ''යහපතැ''යි ගිවිස බරණැස්නුවර අවුත් දන්හල් දක්නට වන්නාහ. බොධිසත්ත්වයෝත් එක්දවසක් දන්හල් බලා ගොස් කීපදෙනෙකුට තමන් අතින් දන් දී ''සෙස්සන්ට මෙලෙසම දන් දෙව''යි කියා ඇතුපිටට පැනනැගී නික්මුනාහ. බිසව් කොටා ඉස තබාගෙණ දන් කා යන්නාවුන් හා කැටිව නික්මුනාහ. රජ්ජුරුවෝ බිසවුන් හා කොටු දැක ඇදිනගෙණ ලඟට ගෙන්වා කොටු බිම බා තබා ''තොප කවුරු දැ''යි විවාළහ. බිසෝ සැක නැතුව කියන්නාහු ''මාගේ නැදිමයිල් සරණ සමන ය''යි කිව.

එබස් රජ්ජුරුවෝ අසා ''ඇත්තම දැ?''යි විචාරන්නා ''එසේයි'' නිර්භීතව කිහෙයින් බොහෝදෙනා ඊට සතුටුවූහ. රජ්ජුරුවෝ කියන්නාහු ''තොපගේ පියානන් අසවල් රජ්ජුරුවන්වූව, තොපගේ මැනියන් අසවල්වූව, තොපි අසවල් රාජකුමාරිවූව තොපි පිස කැවූ මහාපදුම කුමාරයානන් මම් වුව. මෙසේවූ කොටා තොපට කෙසේවූ නැදිමයිල් සරන සමනෝද? ඇයි තොප මා මළැයි සිතා මරණ

තලළුත් තිබාගෙණ අවුදැ"යි කියා අමාත්‍යයන්ට කියන්නාහු "අමාත්‍යයෙනි, මා විසින් නොප ඇමට කියනලද්දේ පළමුවෙන් නොවෙද? අප සත්බෑයන් වැලි කතර පැමිණි නියාවත් සබෑයන් උන්ගේ අඹුදරුවන් මරා මස්කැඳීම මුන් ගලවාගෙණ උරය පලා ලේ දී පැන්පිපාස නිවා මුන් සතප්පවූ නියාවත් කොටා දියෙහි අත්පා කපා දමාපු ගමනේ මුරහාගෙණ යන තැනැත්තහු මා විසින් ගොඩලාගෙණ දැක බෙත්කොට රැකි නියාවත් මේ බිසවුන් කොටා කෙරේ සිත්බැඳී පළිතයෙන් මා එලූ නියාවත් මා දිඹුල්ගසට වැටී ගොයානන් විසින් බිමට බා අවුත් රාජ්‍යයට පැමිණි නියාවත් යන සියල්ලම නොපි ඇමට මා විසින් පළමු කියන ලද්දේ වේද? එකියන බිසව් නම් මෙබිසවිය, එකියන කොටා නම් මේ කොටාය' ඒ ගලින් එලූ පදුම කුමාරයෝ නම් මම්මය එසේහෙයින් මළ මිනියක් හා සමාන මේ කොටාත් පෙලුමුගුරු බා තලා සුණුවිසුණු කොට පියව මැත් කන්නාසා කපාපියව"යි කෝපයෙන් කියා නැවත කෝප සන්සිඳී යාපත් පැසක කොටා ලා බිසවුන්ගේ ඉස හා එක් අයා බන්දැ "මේ නුවර ඉන්දනොදී පිටිනුවර ලවව යි යවූන"යි වදාර මේ චුල්ලපදුම ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මල්ලූ සත්දෙන නම් බුඩ වල්ලභ වූ මහතෙරවරුය. බිසව් නම් විඤ්ඣාමාතවිකාය, කොටා නම් දෙවත්ත සථවිරයෝය, ගොයා නම් ආනන්ද සථවිරය, පදුමකුමාරව උපන්නෙම් බුදුවූ මම් ය"යි වදාළසේකි.

---

## 188 මණිචොර ජාතකය

මේවද ත්‍රිභුවන තිලකාකාරවූ සම්බුදුයන් වහන්සේ වෙළුවාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තසථවිරයන් වහන්සේ බුදුන්ව පැමිණි වධයක් අරභයා මේ ජාතකය දක්වනලදී.

ඒ කෙසේද? යත්,

එක්දවසක් ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන්වහන්සේ විසින් දෙවදත්තසථවිරයෝ "වධයොදැ, උත්සාහ කළ පමණක් මිසක් කිංචිමාත්‍රාවකුත් කොටගත නුහුනුවා"යි යන මේ කථාව කිය කියා උන්තැනට සම්බුදුන්වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුද?"යි වදාරා වදාරා එපවත් අසා 'මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් දෙවදත්තසථවිරයෝ මට වධයොදැ කිංචිමාත්‍රාවකුත් කොටගත නොහැක්කේ වේ"දැයි වදාරා ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යේ කෙසේද? යත්;

පසුගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ පිටිසරගමක ඉපිද බරණැස් නුවරින් කුලස්ත්‍රියක පිසවාගෙණ කන්ට සලස්වා ගත්සේක. එකියන ස්ත්‍රී විශිෂ්ටවූ රූ ඇත්තිය, පඤ්චකල්‍යාණයෙන් යුක්තය, දිව්‍යස්ත්‍රියක් හා සමානය කින්නරාඞ්ගනාවන්ගේ ශොභා ධරන්නිය, බැලූවන් ප්‍රසාදවන්නිය, සඞ්ගම්

පුත්‍රයාට පතිවුතාධර්මය රක්නීය, සවාමිපුත්‍රයාගේ දෙමව්පියන්ට වත්පිළිවෙත් කරන්නීය, එසේහෙයින් සවාමිපුත්‍රයාත් ප්‍රියව දවස් අරනේය, එකියන ස්ත්‍රී නම් සුජාතා නම් වන්නීය.

එකියන සුජාතා නම් ස්ත්‍රී තමාගේ සවාමිපුත්‍රයාට කියන්නී "මාගේ දෙමව්පියන් දක්නා නියාගෙන් බරණැස්නුවරට යන්ට වුව මැනවැ"යි කිවුය. බොධිසත්ත්වයෝත් "යහපතැ"යි කියා ගිවිස දෙමව්පියන් දකින්ට නිසි කැවුම් ආදී දෙය පිසවාගෙණ බොධිසත්ත්වයෝ රථය ඉදිරියේ පදිනාහුය. බොධිසත්ත්වයන්ගේ භාය්‍යාව වූ සුජාතාවෝ විසිතුරුව සැරසී යහපත් මනාවූ වස්ත්‍රයක් හැඳ රථයේ උන්නාහ.

මේ නියාගෙන් නුවරට වැද නුවර මධ්‍යයෙන් රථය පැද යන්නාහ. ඒ වේලාවට බරණැස් රජ්ජුරුවෝ මහත්වූ පෙරහරින් ඇත්කදට පැනනැගී නුවර ප්‍රදක්ෂිණා කොට යන්නාහුය ඒ වේලාවට බොධිසත්ත්වයන්ගේ බිසවුන් රථයෙන් බැස හංසලීලායෙන් රථය පසුපස්සේ ගමන්කරන්ට වන්නාහ. රජ්ජුරුවෝ ඒ විසිතුරු රූපශ්‍රීය දැක පිළිබඳ සිත් ඇතිව අමාත්‍යයකු ලඟට කැඳවා කියන්නාහු තෙල යන්නාවූ ස්ත්‍රිය අසවාමිකද? සසවාමිකද"යි විචාරා එව යි කියා අමාත්‍යයා යවූහ. ඒ අමාත්‍යයා ඒ ස්ත්‍රිය අතින් විචාරා ගෙණ ගොස් රජ්ජුරුවන්ට කියන්නේ "දෙවයෙනි, රථයේ ඉන්නා පුරුෂයා තෙල ස්ත්‍රියගේ පුරුෂයා ය"යි කීහ. එබස් රජ්ජුරුවෝ අසා පිළිබඳ සිත ඇරගත නොහෙන්නාහු යම්සේ මේ පුරුෂයා උපායකින් නසාවූවත් මැ ඇරගත මැනවැ යි සිතා එතන සිටි අමාත්‍යයකුට කියන්නාහු "හෝ චූඩාමාණික්‍යය ඇරගෙණ ගොස් අරු පදිනා රථයෙහි ලා එව"යි කියා යවූහ. පුරුෂයාත් එලෙසම කොට රජ්ජුරුවන්ට එපවත් කියා රජ්ජුරුවෝත් එපවත් අසා "මාගේ චූඩාමාණික්‍යය අපවත්ව ගියේය"යි අමාත්‍යයන්ට ඇසෙන සැටියේ කීහ. අමාත්‍යයෝ ඒ අසා ඒ ඒ වාසල් රැකවල් ලවා නුවර මුළුල්ල ඇලලී ඒ ඒ තැන දිවපනින්ට වන්නාහ, ඒ වේලාවට මැණික රථයේ ලූ පුරුෂ තෙමේත් මිනිස් මොත්තමක් ඇරගෙණ පුරුෂයාගේ රථය බලන්ට වුවමැනවැයි කියා රථයේ තුබූ මැණික ඇරගෙණ 'මේ මැණික් සොරා ය"යි කියා මරාතලා පිටිතොල හයා බැඳ ගෙණ ගොස් "සවාමීනි, මේ වේද' මැණික් සොරාය"යි කීහ.

එවිට රජ්ජුරුවොත් නොවිචාරාම "ඉස කපාපියව"යි කීහ. එපවත් ඇසූ රාජපුරුෂයෝ බොධිසත්ත්වයන් කෝපයෙන් කෝපයට ගෙණගොස් දහස් ගණන් හෙණි ගසා දකුණුවාසල් දොරකඩින් ඇරගෙණ ගොස් බොධිසත්ත්වයන් උඩුබල්වා වැදහොවා ඉස කපන්ට වන්නාහ. ඒ දුටු බොධිසත්ත්වයන්ගේ භාය්‍යාවෝ පසුපස්සේ අඩාගෙණ ගොස් බොධිසත්ත්වයන්ගේ ඉස කපන්ට ඔසවාගත් පොරොව දැක කියන්නාහු "අනේ! සවාමීනි, මා නිසා නුඹවහන්සේට මෙබඳු දුකෙක් පැමිණියේවේද? නුඹවහන්සේ වැනිවූ නිරපරාධින්ටත් මෙවෙනි පාවොව සැලසෙන්ටත්, මම ඒකාන්තයෙන් නුඹවහන්සේට පතිවුතාධර්මය රැක්කේ නම් යම්සේ මෙලෝ රක්නා දේවතාකෙනෙක් ඇත්නම් ලෝක නිර්මාණය කළාවූ බ්‍රහ්මයා මේ සක්වළ ඇත්නම් රජ්ජුරුවන් කරන්නාවූ නොකට යුක්ත වළක්වා ගණුව යි දෙවතාකෙනෙකුත් නැති හෙයින් වේද නොවැළකුනේ වේද"යි සිතුහ.

එවිට පනිවුතාවන් සුජාතාවන් සිතූ සිතිවිල්ලෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය. එවිට ශක්‍රයෝ දහසක් නුවණැසින් "මාගේ ශක්‍රඍද්ධි උදුරාගන්නා කෙනෙක් ඇද්දෝ නෝ"යි සිතා බැලූහ. ශක්‍රදේවේන්ද්‍රයෝ මේ කාරණය දැක "මා එතනට යායුතු ය"යි සිතා අප්‍රසිඩ වේශයෙන් එතනට අවුත් දන්ගෙඩියට පැමිණි බොධිසත්ත්වයන් සම්පාලංකාරයෙන් සරහා ඇතුපිට වඩාහිඳුවා ඇතුපිට උන් රජ්ජුරුවන් ඝාතනයකින් දන්ගෙඩියේ වැදහොත් බොධිසත්ත්වයන් ඔසවා ගත්තාවූ පොරව රජ්ජුරුවන්ගේ ඉස කපා වෙන් කළ පසු බරණැස් රජ්ජුරුවනැයි දන්හ.

ශක්‍රයෝ තමන්ගේ ශක්‍රානුභාවයෙන් ආකාශයෙහි සිටියාහ. බ්‍රාහ්මණ ගෘහපති ආදීවූ බොහෝ මනුෂ්‍යයෝ "ශක්‍රයන් විසින් අසත්පුරුෂ රජ්ජුරුවන් මරා ධර්මිෂ්ඨ රජ්ජුරු කෙනෙකුන් අපට සලස්වනලදැ"යි සතුටුවූහ. ශක්‍රයෝ ආකාශයෙහි සිට ඒ පුරුෂයාට ඔටුනු පලඳවා සුජාතාවන්ට අග්‍රමහෙසිකා පට බන්ද, ශක්‍රයෝ කියන්නාහු "අසත්පුරුෂ රජ්ජුරුවන් රාජ්‍යය කරණසමයෙහි නොකල වැසි වසින්නේය. කලට වැසි නොවසින්නේ දුර්භික්ෂභය වොරභය ආදීවූ භය උපදින්නේය, එසේවූ රජදරුවෝ ඉන්නදැ අයස හා අපකීර්ති අසන්නාහ. මළකලත් සතර අපායේ දුක්විඳිනාහ"යි කියා ශක්‍රදේවේන්ද්‍රයෝ දිව්‍ය ලෝකයට ගියෝය. බොධිසත්ත්වයෝ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ"යි වදාරා මේ මණිචොර ජාතකය නිමවා වදාළසේක.

---

## 189
## පඤ්චත්තර ජාතක

**එ**වද කරුණානිධානවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**එ කෙසේද? යත්,**

කොසොල් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට අමාත්‍යයන් දොනකෙළේ යයි රජ්ජුරුවෝ අසා තුමූත් ඒ නියාවට පරීක්ෂාකොට ඇත්ත බව නියම කොටත් "බුදුන් විවාරා මුත්ට ආඥා කෙරෙමි" සිතා බුදුන් කරා ගොස් හිඳන්නාහු "සවාමීනි, අන්තඃපුරයට එක්තරා අමාත්‍යයෙක් ද්‍රෝහ කෙළේය. එහට කළමනා කිම්දැ"යි බුදුන් විවාළහ.

සම්බුදුරජාණන්වහන්සේ "ඒ අමාත්‍යයෝ තොපට වැඩපසන්නා අමාත්‍යයෙක්ද? ස්ත්‍රියන් තොපට ප්‍රියවූ ස්ත්‍රියක්දැ"යි විවාරා රජ්ජුරුවන් විසින් "සවාමීනි, අමාත්‍යයෝ මාගේ සිරුරු කළමනා කටයුත්තට මට පක්ෂපාතව දුග්ගන්නා අමාත්‍යයෝය. එකියන ස්ත්‍රීන් මට ප්‍රියකරු ස්ත්‍රිය"යි කිහ. එබස් සම්බුදුරජාණන්වහන්සේ අසා "අමාත්‍යයන්ත් වැඩපසන්නා කල ස්ත්‍රියන් ප්‍රියකරු ස්ත්‍රිය කල ක්ෂමාකිරීම යනපනැ"යි කියා වදාරා "පෙරත් මෙසේම පුරද්‍රෝහ කළවුන්ගේ සැලැස්ම නුවණැත්තන් විසින් විවාරන්නා ඊට කාරණා කීවෝවේදැ"යි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට අඹු යෙන් ධර්මයෙන් අනුශාසනා කරණ ලද අමාත්‍යව උපන්සේක. බරණැස් රජ්ජුරුවන්ගේ එක්තරා අමාත්‍යයෙක් "අන්තඃපුරයට ද්‍රොහ කෙළේ ය"යි අසා තුමූත් ප්‍රත්‍යක්ෂව දැක "අමාත්‍යයන් මට වල්ලභය යි සියළු කටයුත්තෙහි නියුක්තවූ අමාත්‍යයා, ස්ත්‍රී මා පියකරු ඉස්ත්‍රිය, එසේ හෙයින් මේ කටයුත්ත මාගේ පණ්ඩිත අමාත්‍යයා අතින් ප්‍රශ්නයක් කොට විචාරා ආඥව කරමි" සිතා අමාත්‍යයන් ගෙන්වා ආසනයක හිඳුවා කියන්නාහු "ප්‍රශ්නයක් කියම් විසඳ ව"යි කීහ. යහපත දෙවයන්වහන්ස යයි කියන්නා විසඳමි" කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "යම් පර්වතපාර්ශ්වයෙක පස්පියුමෙන් සැදුනු විලක් සමීපයෙහි සිංහයෙක් වාසය කෙරෙයි, සිංහයාගෙන් ආරක්ෂාව තිබූ විල පැන් කැනහිලෙක් ඉඳුල් කෙළේය. එපැන් දමාපියයුතුද? නොදමා පිය යුතුදැ"යි කීහ. එබස් බොධිසත්ත්වයන් ඇසූ ගමනේම බොධිසත්ත්වයෝ අන්තඃපුරයට වැදුනෑ"යි සිතා කියන්නාහු "මහරජ්ජුරුවන් වහන්ස, නොයෙක් සිව්පාවුන් ගඩගාවට බැස පැන් බොති. ඒ පැන් ඉඳුලෙක් නැත්තේය. එමෙන් රජ්ජුරුවන් වහන්ස, බිසවුන් වහන්සේ හළ නොහැක්ක. එසේ හෙයින් "අමාත්‍යයා හා බිසවුන් වහන්සේට ප්‍රියවී නම් ආඥ නොකළමැනවැ"යි කීහ. රජ්ජුරුවෝත් කෝප සංසිඳී අමාත්‍යයා හා බිසවුන්ට "ඉනිබ්බේ මෙසේ නොකටයුත්තක් කළා නම් දන්නමෝ වේදැ"යි භයගන්වා කීහ. එතැන් පටන් එසේවූ නොකටයුත්තක් නොකළාහ යි වදාරා **පඤ්චපඨර ජාතකය** නිමවා වදාළසේකි. කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයත් හා බිසවුන් හා දෙදෙනා සම්බුදුන්වහන්සේ ඇසූතැන් පටන් එසේවූ නොකටයුත්තක් නොකළාහ.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරයෝය, පණ්ඩිත අමාත්‍යයෝ නම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 190 වලාහක ජාතකය

තිවද කරුණානිධානවූ සම්බුදුන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා ස්ත්‍රියක් කෙරෙහි පිළිබඳ සිත් ඇති භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

හේ කෙසේද? යත්,

එක් භික්ෂු කෙනෙකුන්වහන්සේ ස්ත්‍රියක් කෙරෙහි පිළිබඳ සිත් ඇතිව වාසය. කෙරෙහි සම්බුදුන්වහන්සේ ඒ අසා "සැබෑද මහණ, ස්ත්‍රිය කෙරෙහි නා පිළිබඳ සිත් ඇත්තේ දැ"යි විචාළසේක. "සැබව සුගතයන් වහන්ස" කියන්නා "මහණ, ස්ත්‍රීන් කෙරේ පිළිබඳවීමෙන් යකින්නන් අතව පැමිණි වෙළෙඳුන් පන්සියය මෙන් දුකට පැමිණෙන්නේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස තාම්බපර්ණී වීපයෙහි තම්මැන්නාතුවර යක්ෂපුරයක් මවාගෙන බොහෝ යකින්නෝ වාසය කරන්නාහ.

එසමයෙහි ඒ යකින්නෝ තමන්ගේ තාම්මැන්නාවට පඬුවි පාරු නැගී මනුෂ්‍යයන් ආකල උන් හා සමග වාසයකොට අනික් වෙළඳ කෙනෙකුන් නැවි නැගී ආකලට පළමු සිටියවුන් ඇසිල්ලෙකින්ම නසා සිරගෙයි ලා උන් කන් නාහ. තම්මැන්නා ඉද්දව නැවෙක් නෝ ආ නම් නාගදිවයින පවන් කැලණිය දක්වා මෙ අන්තරා කඩයේ කඩක්කරේ ඇවිද දුටු නැවෙක් ඇත් නම් අල්වා කන්නාහ. මේ නියායෙන් දවස් හරණා සමයෙහි වෙළෙන්දෝ පන්සියයෙක් නැවි නැගී යන්නාහු තාම්බපර්ණී දිවයිනට පාවගියහ, එවිට යකින්නෝ තම තමන්ගේ වාසස්ථානයට මනුෂ්‍යයන් ඇති සථානයක් මෙන් වප් වැපිරීම් සීසැම් හා බල්ලන් කුකුළන් ආදීවූවන්ගේ නොයෙක් වෙස් මවාපෑහ. මනුෂ්‍යයන් ඇති ගමෙකැ යි සිතා ගොඩබැසපු කල්හි ඒ යකින්නෝ එතනට අවුත් ඒ වෙළඳුන්ට කන බොන කැවිලි සලස්වා කා බී අන්තයෙහි කියන්නාහු "නොප හැම කොයි සිට අවුදැ?"යි විචාරා ඉක්බිති "සවාමිපුත්‍රයෝ වෙළඳුමට ගියාහ. දැන් තුන් අවුරුද්දක් නොඅහ. එසේ හෙයින් නොප ඇමත් වෙළඳුන් හෙයින් අප ඇමට සවාමිපුත්‍රව ඉඳුව"යි කීහ. ඒ නියාවටම ඒ යකින්නෝ තමන් භාවභාව දක්වා තමන් හැමට ලබාගෙන පන්සියයක් වෙළඳුන් තමන් ඇමට සලස්වා ගත්තාහ.

නායක වෙළෙඳුගේ භාය්‍යාවද රෑ පලාගොස් මිනී කා ඇවිදින් සවාමි පුත්‍රයා ලඟම හොත් වේලාවට යකින්න ඇඟ සිසිලය තිබූ හෙයින් වෙළෙන්දු "මේ කිමෙක්දෝ හෝ"යි පරීක්ෂාකොට මිනී කන නියාව දැන පසුව දවස් උදැසන වෙළඳුන් පන්සියය හා සමග ශරීරකෘත්‍යය කරන්ට ගොසින් නායක වෙළෙන්දු කියන්නේ "එම්බල මුත් ඇම නම් යකින්නෝය, පළමු උන් පුරුෂයන් අප දැක කාපුහ. ඉනිබ්බේ ආ කෙනෙක් ඇත්නම් අපසේ තිබාගෙන අප කති" කීහ. එසේහෙයින් "අප වහා පලාගියුතුය"යි කීහ.

එවිට ඉන් දෙසිය පණසෙක් "මේ කුමන බසෙක්ද? මෙසේවූ දිව්‍යාඛග නාවන් හා සමාන ස්ත්‍රීන් ඇරපියා අපි යා නොහෙමැ"යි කියා රැඳුනාහ. දෙසිය පණසෙක් "අපි ගැලවියන්නේ කෙසේදැ?"යි සිත සිතා මුදු වැල්ලේ ඇවිදිනාහ. එකලට බොධිසත්ත්වයන් වහන්සේ හිමාලය වනයෙහි ආජානීය සෙන්ඛව ඉපිද කවුඩුවන්ගේ පැහැය හා සමානවූ මුහුණක් හා ඉන්ද්‍රනීල මාණික්‍යමයවූ කෙස්වැටියක් හා පෙළාපු පුළුන් හා සමානවූ ධවලවූ පැමක් ඇතිව ආකාශයෙන් යන්නාවූ සෘඩි ඇතිව දවස් පතා තම්මැන්නාව සමීප යෙහි විලෙක සයඤ්ඣාන ඇල් කා යන විටෙක "මා හා දඹදිවට යන්නෝ ඇද්දැ?"යි අඬගා යන්නාහ.

එසේ අඬගැකලට ඒ මිනිස් දෙසියපණස එතනට අවුත් "අපි යම්හ"යි දෙහොත් මුදුනේ තබාගෙන කීවාහ. එවිට බොධිසත්ත්වයෝ බිමට බැස පිට හිඳුවාගෙණ වල්ගයේ එල්ලනුන් වල්ගයේ එල්වාගෙණ සෙස්සන් ඔහුගේ ආනුභාවයෙන් ඇරගෙණ ආකාශයට නැගී දඹදිවට ගොස් උන් උන්ගේ වාසස්ථානයට සලස්වා බොධිසත්ත්වයෝ තමන්ගේ හිමාලය වනයට ගියාහ.

සම්බුදුරජාණන්වහන්සේ "මහණෙනි, යම් භික්ෂුණියකගෙනුත් උපාසක උපාසිකා කෙනෙකුත් සිවුවණක් පැහැදෙන් යම්කෙනෙක් ස්ත්‍රීවිෂයෙහි ලෝභ වූ නම් පඤ්චවිධවූ වධ වේදනාහ. පඤ්චවිධවූ වධය නම් කවරේද? යත් අත් කැපී එකෙක, කන් නාසා කැපීම එකෙක, මෙපට ඇඟිලි කැපීම එකෙක, උරයකැපීම එකෙක, ඉස කැපීම එකෙක යන පඤ්චවිධවූ වධ විඳිනාහුය. නරකාදිවූ සතර අපායෙත් බොහෝ දුක් විඳිනාහ"යි වදාරා නැවත වදාරණ සම්බුදුරජාණන්වහන්සේ "මහණෙනි, යම් කෙනෙක් සම්බුදුරජාණන්වහන්සේගේ බස් නොඅසා ස්ත්‍රීවිෂයෙහි 'තමන් සිතූසැටියේ වාසය කෙරෙත් නම් නායක වෙලෙන්දගේ බස් නොඅස යකින්නන්ට ගොදුරුවූ වෙළෙඳුන් දෙසියපණස හා සමවන්නාහ. යම්කෙනෙක් සම්බුදුරජාණන්වහන්සේගේ බස් ගිවිස එසේවූ කටයුත්ත ඇරපු නම් අස්වැනායක වෙළෙඳුන්ගේ බස් ගිවිස ගැලවීගිය වෙළෙඳුන් දෙසියපණස හා සමවන්නාහ. දිව්‍යලෝකයෙහි හා සොළොස් බඹලොවත් විඳුම්නා සම්පත් විඳිනාහ"යි කියා අමාමහනිවන් දැක්වීමෙන් මේ ධර්මදේශනාව කුළුගන්වා මේ ජාතකය චතුස්සත්‍යය ප්‍රකාශකිරීමෙන් මේ ධර්මදේශනාව නිමවා වදාළසේක.

මේ ජාතකාවසානයෙහි ඒ භික්ෂුන්වහන්සේ දහසක්නයින් ප්‍රතිමණ්ඩිතවූ සොවාන් ඵලයෙහි පිහිටිසේක.

"එසමයෙහි බොධිසත්ත්වයන් වහන්සේගේ අවවාද ගිවිසි වෙළඳපුත්‍රයෝ දෙසියපණස තම් බුදු පිරිසය, අඟවව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 191 මිත්‍රාමිත්‍ර ජාතකය

තවද කරුණාප්‍රවාහවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් උපාධ්‍යායයන්වහන්සේ කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්,**

එක් බාලතමෙක් තමන්වහන්සේගේ උපාධ්‍යායයන්වහන්සේ කෙරේ විශ්වාසී සේක. "මා කළ දෙයට උරණ නොවන සේකැයි"යි වැන් ලත ලෙස පයිගක් විදිනට රෙදිදක් ඇරගත් පසු එපවත් උපාධ්‍යායන් වහන්සේටකීසේක. උපාධ්‍යායන්වහන්සේ "මාගේ කඩ කුමකට ඇරගත්තුදැ"යි විචාරන්නා "නුඹ වහන්සේ මා හා විසවාසය නැකා ඇරගතිමි" කියන්නා "තොප හා මා හා කුමන විශ්වාස ද"යි කියා අත්ලෙන් පාරකීපයක් ගැසුසේක.

මේ කථාව ධර්මසභාමණ්ඩපයෙහි ප්‍රකාශ විය. එබස් සම්බුදුරජාණන්වහන්සේ අසා "මහණෙනි, පළමුත් ඒ භික්ෂූහු කෝපිවූවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේ දැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

**හේ කෙසේ ද? යත්,**

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ සසිරවි බ්‍රාහ්මණ කුලයක

ඉපිද වැඩිවිය පැමිණ ගිහිගෙයි ඇලය හැර හිමාලයවනයට වැද සෘෂිප්‍රව්‍රජ්‍යා වෙන් පැවිදිව බොහෝ තාපසවරන්ට ගණශාස්තෘව වාසයකරන්නාහ.

එසමයෙහි එක්තරා තාපසකෙනෙක් ඇත. ඒ තාපසයෝ කුඩා ඇතෙක් වඩති. බොධිසත්ත්වයෝ ඒ ඇතා වැඩීමෙන් බොහෝ උපද්‍රව සැලසෙයි ඇරපිය ව"යි කීවත් ඇරපියා නොහී පුත්‍රප්‍රේමයෙන් වඩා මුහුකෙරෙවීවාහ. එකියන ඇත් නිමිද ගලිත වූ තැනැත්තේ තාපසයන් ඵලාපල ගෙණෙන්ට ගිය කිප දවසකින් ආ තැනැත්තන් දැක අල්වාගෙණ මරා තළාපියා පලාගියේය. බොහෝ තාපසවරු ඒ තාපසයන්ට කළමනා ආදහනකොට එපවත් බොධිසත්ත්වයන්ට කීහ. තැවත කියන්නාහු "ස්වාමීනි, වෛර මිත්‍රයන් දැනගන්නේ කෙසේ ද"යි කීහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "යම් අහිත මනුෂ්‍යකෙනෙකුන් දුටුවේලේ පිළිසඳර කථා නොකෙරේද? සිනාවක් නොයේද? ඇස් දල්වා ප්‍රියව නොබලාද? දැක සතුටු නොවේද? යන මෙකී කාරණයෙන් යුක්තවූ තැනැත්තේ වෛරිය, මෙකී කාරණා නොව ඉන්නා තැනැත්තේ ප්‍රියකරුය"යි බොහෝ තාපසවරුන්ට අවවාද කියා සතරබ්‍රහ්ම විහරණයෙන් බඹලොව ගියාහයි වදාරා මේ මිත්‍රතා මිත්‍රත ජාතකය නිමවා වදාළසේකි.

"එසමයෙහි ඇතා වැඩූ තාපසයෝ නම් අතවැසි භික්ෂූහුය, ඇතා නම් උපාඛ්‍යායයෝය, ගණශාස්තෘව උපන්නෙම් බුදුවූ මම්ය"යි වදාළසේකි.

---

## 192
## රාධ ජාතකය

තිවද කරුණා ගබඟා නිධානවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියකකෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූ කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වතලදී.

**ඒ කෙසේද? යත්,**

එක්තරා භික්ෂූකෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක කෙරේ පිළිබඳ සිත් ඇතිව වාසයකරණ සේක. භික්ෂූන්වහන්සේ සම්බුදුයන් වහන්සේට දන්වූ කල්හි "මහණ තොප විසින් ස්ත්‍රීන්ට පිළිබඳවූව සි කියා ලැබගතහැකිද? පළමු රුක වල් සලස්වාගත් රුකගත නුනුනුවෝ වේද"යි වදාරා"ඒ කෙසේද"යි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ගිරාව උපන්සේක. ඒ උපන්නාවූ බොධිසත්ත්වයන්ට රාධයයි නම්වූ ගිරානෝය. බොධිසත්ත්වයන්ට පොඩිපාද නම් මල්වූ ගිරවාත කෙනෙකුන් ඇත්තාහ. මෙකියන ගිරවුන් දෙන්නා වැද් දෙක් අල්වාගෙණ බ්‍රාහ්මණයකුට දින. ඒ බ්‍රාහ්මණ දරුකොට වඩා බ්‍රාහ්මණ

ඔබ්බකට යන්නේ තමන්ගේ දරුවන් දෙන්නාට කියන්නේ "යම්සේ තොපගේ මව් බැමිණි වැරැද්දක් කෙරේ නම් වැරැද්ද වලකාලව, උන්ගේ දුක් සුවයෙන් බැඳෙව"යි කියා ගියාහ. බමුණු ගියවක් පටන් බැමිණි අනාචාරයේ යෙදෙන්ට වත. දවසකට ගෙට එන යන මනුෂ්‍යයන්ගේ ගණනෙක් නැත. එවිට පොටඨපාද තම් බොධිසත්ත්වයන්ගේ මලනුවෝ බොධිසත්ත්වයන්ට කියන්නාහු "බැනන්වහන්ස, අපගේ පියානන්වහන්සේ කියා ගියේ මැනියන්වහන්සේගේ වැරැද්දක් ඇතිනම් වලකන්ව කියා ගියාවේද? එසේ හෙයින් මෙසේවූ වැරදි බලා නොකියන්නේ කෙසේද? ඊට අවවාද කියව"යි කීහ.

එවිට බොධිසත්ත්වයෝ ඒ "තොපට ඇයිදැ"යි කීවන් පොටඨපාද තම් ගිරවා බැමිණියකරා ගොස් "මැනියන්වහන්සේ මෙසේ නොකටයුතු කරන්නේ කෙසේද? ඇයි, ඉනිබ්බේ මෙසේ නොකටයුතු නොකළමැනව"යි කීහ. එබස මැනියෝ අසා "යහපත පුත, ඉනිබ්බේ තොප කී බස් නොකටයුතු නොකරමි" කියා සතුටුයෙන් ඇති කෙනෙකුන් මෙන් ලඟට ගොස් කැඳවාගෙන බොටුව කර කවා ගින්නේලා පුළුස්සා කාපූන. කල්‍යාණකින් බමුණා අවුත් ගෙයි ඉඳ රාධනම් පුතනුවන් අතින් විවාරන්නාහු "නොපගේ මැනියන්ගේ දෙෂයෙක් ඇද්දැ"යි විවාළාහ. එවිට රාධ තම් ගිරවානෝ කියන්නෝ "පියානන් වහන්ස නුවණැත්තෝ යම් කෙනෙකුන්ගේ වැරදි දුටත් නොකටයුතු අවස්ථාවේ නොකියන්නාහ. එසේවූ අවස්ථාවේ කීමෙන් පොටඨපාදයාටවූ වධ පැමිණෙන්නේ වේදැ?"යි කියා "මේවේලේපටන් මා මෙතන ඉඳීමෙන් මැනියන් වනන්සේ මා කෙරෙහි උරණවේකැ"යි කියා බමුණා අතින් අවසර ඉල්වා ගෙණ වනානතරයට ගියාහ යි වදාරා **රාධ ජාතකය** නිමවා වදාළසේකි.

එසමයෙහි පොටඨපාදව උපන් ගිරවානෝ තම් ආනන්ද සථවිරයෝය එසමයෙහි රාධ ගිරවානෝ නම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේකි.

---

## 193
## ගෘහපති ජාතකය

**ජේ**තවන කරුණාවට වාසස්ථානවූ සවීඥයන්වහන්සේ උකටලීවූ භික්ෂූවක් දුක්වූ කල්හි "මහණ, ස්ත්‍රීන් කෙරේ පිළිබඳවීම යහපත් නොවෙයි. පෙරත් ස්ත්‍රීන් කෙරේ පිළිබඳව දුක් වූයේ නොවේදැ?"යි වදාරා ආරාධිතවූ සවීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්**

**කි**වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ පිටිසර ගමෙක ගොවිව උපන්සේක.

ගම්මුදලියා බොධිසත්ත්වයන්ගේ භාර්‍යාව කෙරේ පිළිබඳව දවස් අරණිය. බොධිසත්ත්වයෝ ඒ ශංකාව දුන අල්වන්ට උත්සාහ කරන්නාහ. එසම

යෙහි සීසානා කාලය පැමිණ බොහෝ ගොවි තමන් බිජුවට වපුළාහ. වපු බත් සායව කටුසර කා දවසරිනාහු ගොයම්බඩ අවදියෙහි ගොවීන් එක්ව ගම් මුදලින් කරා ගොස් කියන්නාහු "ගම්මුදලිනි දෙමසක් විතර ගියකළ ගොයම්ද, මඩුම්හ. ඒ දැ මැඩිකල නුඹවහන්සේට වී දෙම්හ. දැන් අපට කන්ට මාලු ගොනෙකු දෙන්ට උවමැතව" යි කියා ඇරගෙණ මරා කාපූහ. එවිට කීප දවසක් ගම්මුදලියා බොධිසත්ත්වයන් ගෙයින් ගිය නියාව දැන ගෙට අවුත් වැද ඉන්නා වේලාවට බොධිසත්ත්වයෝත් පෙරළා ගෙට එන්නට වන්නාහ.

බොධිසත්ත්වයන්ගේ භාර්‍යාවත් ඒ දැක ගැලවී යන උපායක්නොදැක ගම්මුදලියාට කියන්නාහු නුඹවහන්සේ ගේ මඩ්‍යයේ සිට වී දෙව යි කියමැතව, මම අටුවේ සිට වී නැතැ යි කියමි" කියා සිටි වේලාවට බොධිසත්ත්වයෝ ගෙට අවුත් දෙන්නාගේ කාරණා දැක කියන්නාහු "මේ මා වඤ්චාකරණ ප්‍රයෝගය කැ" යි සිතා බොධිසත්ත්වයෝ "ඇයි ගම්මුදලිය, තොප විසින් ගොනාදුන්නේ දෙමසකින් වී දෙන්වවුව, දෙපෝයකුත් නොගොසින් ඉන්දදී දැන් කුමන වීද ඉල්ලන්නේය" යි කිය කියා "නීත් කොටුවේ වී නැති නියාව දැන දැන තොප කියන්නේ කුමන වියක්දැ" යි කියා "ඇයි ගම්මුදලිනි, තොප ගම්මුදලිකම කරමැ යි කියා අනුන්ගේ භාර්‍යාව හා කථාකරන්ට කාරණා කිම්දැ?" යි ඉසකේ පත අල්වා හෙළා යහපත්කොට ඇන පිටිකරතලා බොටුව අල්වා දමාපීහ.

ඒ ස්ත්‍රියද කොටුවෙන් බාගෙණ ඇගේ ඉසකේපත අල්වා බිම හෙළා ගෙණ ඇණ මරා තලා "ඉනිබ්බේ මෙසේවූ වැරැද්දක් නොකරව" යි කියා භය ගැන්වූහ. "එවක් පටන් ගම්මුදලියා ඒ ගේ දිසාව බලන්නාක් නොකළේය. ස්ත්‍රීන් එසේවූ අතිරභස චිත්තයෙක් නොසිතූහ" යි වදාරා මේ ගෘහපති ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ගොවිව උපන්නෙම් බුදුවූ මම්මය" යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 194 සාධුසීල ජාතකය.

තවද කරුණාසමුද්‍රවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩි වසන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයකු අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

එක්තරා බ්‍රාහ්මණයකුගේ දූ සතර දෙනෙක් ඇත්තාහ. දූන් සතරදෙනා ප්‍රාර්‍ථනා කරන්නාවූ පුරුෂයෝ සතරදෙනෙක් ඇත්තාහ. ඒ පුරුෂයන් සතර දෙනාගෙන් එකෙක් රූපත්ව ඉදියි. එකෙක් වයොවෘද්ධව ඉදියි. එකෙක් ජාති සම්පන්නව ඉදියි. එකෙක් සිල්වත් ගුණවත්ව ඉදියි. බ්‍රාහ්මණයාත් මෙකියන සතරදෙනාගෙන් "කාට මාගේ දූන් දෙන්දැ" යි සිතා තමන්ට නොදැනෙන පමණක් විනා පෙර නුවණැත්තෝ "ඒ කාරණය තව කීවෝවේදැ" යි වදාරා බ්‍රාහ්මණයා විසින් ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත්තු දක්වා වදාළසේක.

යියවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ එම නුවර බ්‍රාහ්මණකුලයක ඉපිද දිසාපාමොක් ආචාරී දවස් අරණ සේක.

එසමයෙහි එක්තරා බ්‍රහ්මණයකුගේ දූ සතරදෙනෙක් ඇත්තාහ. ඒ දූන් සතරදෙනා ප්‍රාර්ථනා කරන්නාවූ පුරුෂයෝ සතර දෙනෙක් ඇත්තාහ. ඒ පුරුෂයන් සතරදෙනාගෙන් එකෙක් රූපත්ව හිදිනේය, එකෙක් වයෝවෘඩව හිඳනේය, එකෙක් ජාතිසම්පන්නව ඉඳිනේය, එකෙක් සිල්වත් ගුණවත් වන්නේය. මෙකියන සතරදෙනා බ්‍රාහ්මණයා විසින් ගෙන්වා "කාට දෙන්දෝහෝ"යි සිතා තමන් නොදන්නා හෙයින් බ්‍රාහ්මණයා දිසාපාමොක් ආචාරීන් ලඟට ගොස් එපවත් කීය.

එවිට දිසාපාමොක් ආචාරි කියන්නානු "බ්‍රාහ්මණය, රූඇත්තාවුන්ට දීම යහපත, වයෝවෘඩයන්ට දීමත් යහපත, වංශවතුන්ට දීමත් යහපත, එසේ වූවත් සිල්වතුන්ට දිම උත්තම ය"යි කීහ. බ්‍රාහ්මණය, සිල්වත් පුරුෂයාට තමන් දූන් සතරදෙනාම දුන්නමැනව"යි වදාරා සාධුසීල ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බ්‍රාහ්මණයා නම් මෙසමයෙහිත් බ්‍රාහ්මණයාය, දිසාපාමොක් ආචාරී නම් බුදුවූ මම්මය"යි වදාළසේක.

ඒ බණ අවසානයෙහි බ්‍රාහ්මණයා දහසක්නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් මාර්ගයට පැමිණියේය.

---

## 195
## බන්ධනාගාර ජාතකය.

එවද කරුණාපූජාර්හවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බන්ධනයක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

හේ කෙසේද? යත්,

එක් සමයෙක්හි උමන්පැහැර මංපහරණ සොරුන්ද මිනීමරණ සොරුන්ද මෙකියන සොරුන් අල්වා රජ්ජුරුවන්ට පෑහ රජ්ජුරුවෝත් ඒ සොරුන් දඬුකන්තලයේ ලීම් පිටිතොල හයා බැඳීම් දම් ලා මැසීම් ආදී වූ බොහෝ බන්ධනයට පමුණුවා හිරගෙයි ලැව්වාය.

එකල පිටිසර සිට වහන්දැ තමක් සැවැත් නුවර වැසියේක්, මේ බන්ධනාගාරයට පැමිණියාවූ මනුෂ්‍යයන් දැක එපවත් සම්බුදුරජාණන්වහන්සේට වැඳ සැලකොට ඉක්බිති "සවාමීනි, බන්ධනයට පැමිණි මනුෂ්‍යයන් දුටුම්හ. උන් ඒ බන්ධනයෙන් ගැළවීගෙන නොඑන්නා සේ තිබෙයි. සවාමීනි, මෙසේවූ බන්ධයට වඩා අනික් බන්ධනයෙක් පවා ඇද්දැ?"යි විවාළසේක. මහණෙනි, මේ කුමන බන්ධනයක්ද? පඤ්චකාමවිෂය නමැත්තාවූ බන්ධන වේද බන්ධන නම්, එසේවූ

බඹ්නයෙන් ගැලවී යන්ට වේද බැරිය. එසේ වූ බඹ්නයෙන් පවා උත්තමයෝ ගැලවී ගියෝවීද?''යි වදාරා ''ඒ කෙසේද''යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්,**

යම්කිසිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයන්වහන්සේ දුප්පත් කුලයක ගොවීව ඉපිද වැඩිවිය පැමිණ කතවැදුම් මැනියන්ට අත් පා මැඩීම් උනුපැන් සිහිල් පැන් තිබීම ආදී වතාවත් තමන්වහන්සේ තනිවම කරණසේක.

බෝධිසත්ත්වයන්ගේ මැනියෝත් තමන් පුතනුවන් තනිවම දුක්ගන්නා හෙයින් බොධිසත්ත්වයන් නොකියා ඔබ්බෙන් කුලස්ත්‍රියක් ගෙන්වා සරණ පාවා දුන්හ.

මේ නියාගෙන් දවස්අරණ සමයෙහි බෝධිසත්ත්වයන්ගේ මැනියෝ එක්තරා ව්‍යාධියකින් තවහ. එසමයට බොධිසත්ත්වයන්ගේ භාය්‍යාවන් බඹ දරුගැබක් පිහිටියේය, ඒ දරුගැබ පිහිටි නියාව බෝධිසත්ත්වයෝ නොදුන ''භද්‍රාව, ගිහිගෙන් මට කම්නැත, තපසට යෙමි අවසර දෙව''යි කිය. එවිට බොධිසත්ත්වයන්ගේ සත්‍රී ''සවාමීනි, මා බඹ ගර්භයෙක, ඒ ගර්භය ප්‍රසූත කළ කල වඩිනේ ගනපතැ''යි කිහ. ''ගහපතැ''යි රඳ කිරි වරුපු පසු තපසට යන්නව සිතන අවසථාවට අනික් දරුගැබෙක් බඹ පිළිසිඳගත, එවිට බොධි සත්ත්වයෝ සිතන්නාහු ''මුන්ව කියා අවකාශ ඉල්වාගෙණ යෙම් නම් මූ යා නොදෙති, මුන්ට මා නොකියා යායුතු''යි සිතා මධ්‍යමරාත්‍රීවේලේ ගෙයින් විපියට බවහ. එවේලාවට ගම්රුකවල්ලු දුක අල්වා ගත්හ. එවිට බොධි සත්ත්වයෝ කියන්නාහු ඔවුන්ට උපසථාකකරන්නාවූ ''මම අනික් නොකට යුත්තක් නිසා පිටත්වූයෙම් නොවෙමි, හිමාලවනයට ගොස් තපඃකරන්ට යෙමි යි සිතා ආමි''කියන්නාහු එවිට ගම්රුකවල්ලු ඇරපුවාහ.

එවිට බොධිසත්ත්වයෝ එතනින් ගැලවී සිතන්නාහු ''මේවේලේ නික් මීනොතින් අනික්තෙනකදීත් ඇල්ලූ නම් නපුරැ''යි ඔබ්බේ ගෙයක රැ ලැග පාන්වූ ගමනේ නික්මුනාහු හිමාලවනයට වැදසෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ගිහිබඹ්නයෙන් ගැලවී ගියෙමි යි උපන්නාවූ ප්‍රීතිවේගයෙන් උදන් අනන්නාහු ''යම්සේ සිරදඬුකම් ලැබ මැසීම් බැඳුම් ආදිවූ බඹ්නයෙන් ගැලවීගත හැකත්, මතු පුත්‍රදාරාදීවූ පඤ්චකාම විෂබඹ්නයෙන් ධෛර්‍යවන්තකෙනෙකුන් මිසක් ගැලවිගත නොහැක්කාවූ ගිහිබඹ්නයෙන් මිදී මෙසේවූ සැපයක් ලදිමි'' උදන් අතා පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝක යෙහි උපන්නාහ යි වදාරා බඹ්නාගාර ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි පියානෝ නම් සුඛොදන රජ්ජුරුවෝය, එසමයෙහි මැනියෝ නම් මහාමායාදේවීය. එසමයෙහි බොධිසත්ත්වයන්ගේ භාය්‍යාවෝ නම් යසොධරා දේවීය, පුතනුවෝ නම් බුදුවූ මම්මි''යි වදාළසේක.

මේ බණ අවසානයේදී බොහෝදෙනා සෝවාන් සෙදගැමි අනාගාමී අර්හත් යන සතරමඟ සතරඵලයට පැමිණියාහ.

## 196 කෙළිසීල ජාතකය

තවද කරුණාසවාමීවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලකුණ්ටකභද්දිය තෙරුවන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

ලකුණ්ටකභද්දිය සවාමීන්වහන්සේ මහා ශ්‍රද්ධාවන්තසේක, මධුරවූ ධර්ම කථිකසේක, අවශෙෂ රහත්භාවයක් නොවී සිව්පිළිසිඹියාපත් රහත්සේක ලකුණ්ටකභද්දිය මහතෙරසවාමීන් දැක මිටිව සාමණේර තමක් සේ සිටිනා හෙයින් තිස්ස නම උන්වහන්සේට "ඇයි සාමණේරයෙනි, කොයි ගියාදැ"යි සිවුර ඇද ඉස අතගා මේ නියායෙන් උන්වහන්සේ ඇරගෙන කෙළ ජේතවනාරාමයට වැද සිවුරු ඒ ඒ තැන තැන්පත්කොට තබා සම්බුදුන් විසින් සුවදුක් විචාරා අන්තයෙහි "සවාමීනි, මිහිරිකොට බණ කියන්නාවූ ලකුණ්ටකභද්දිය තෙරුන්වහන්සේ කොයිදැ?"යි විචාළසේක. 'ඇයි මහණෙනි, තොප කන්පොත්ත අල්වා ගෙණ කෙළපියා ආයේ ලකුණ්ටකභද්දිය තෙරුන්වහන්සේ වේදැ"යි වදාළසේක. එඔස් අසා භික්ෂූන්වහන්සේ "ඇයි ඊතියා ආනුභාව ඇති මුන්වහන්සේ ලකුණ්ටක කෙළිනා රුවක් සේ වන්ට කාරණා කිම්දැ"යි විචාළසේක.

සම්බුදුන්වහන්සේ "මහණෙනි, තුමූ තමන්ට කොවගත් දෙයකැ"යි වදාරා ඒ කෙසේදැ"යි ආරාධිත වූ සම්බුදුන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ ශක්‍රදේවේන්ද්‍රව උපන් සේක.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ ක්‍රීඩාපරව දවස් අරණහු මාලු අසුන් මාලු රථ ඇත මැත ලී බන්දැ කඩා වඩා සිතාසී කෙළිනාහ. මැලි ගැණුන් හෙන්වා බඹපිට ගසා යථා ඵලිමාහ මාලු මිනිසුන් හා එත යවාපිහ. මේ නියායෙන් රජ්ජුරුවන් ගහවකරන්නා දැක බොහෝ මනුෂ්‍යයෝ තමතමන්ගේ දෙමව් පියන්ට කරන්නාවූ මාතෘ උපස්ථානය පිතෘ උපස්ථානය හැර දෙමිපියන් ඒ ඒ තැනගවාපිහ. මේ නියායෙන් ඒ රජ්ජුරුවන් වෘඩයන් හැරගෙණ කෙළිනාහෙයින් අමාත්‍යයෝත් එලෙසම කොළෝය. ඒ නියායෙන් බොහෝ පව් පිරී මනුෂ්‍යයෝ දිව්‍යලෝකයට නොගොස් නරකයෙහිම උපන්නාහ. එවකට ශක්‍රදේවේන්ද්‍රයෝත් තමන්ගේ දිව්‍යභවතෙහි අමුතුව උපදනා දිව්‍ය පුත්‍රයන් නොදැක 'කුමණ කාරණයක් දැ"යි මනුෂ්‍යලෝකය බලන්නාහු බරණැස්රජ්ජුරුවන් කරන්නාවූ අසඳෘශ්‍ය නිසා නුවරවාසිනුත් එලෙස කොට නරකයෙහි උපදිනි කියා දැක මා ගොසින් රජ්ජුරුවන්ට අවවාද කිවමැනව'යි සිතා මාලු වේසයක් මවාගෙණ මාලු රථයට නැගී මාලු ගොන් දෙන්නෙකු

අදිනාලෙස සලසාගෙණ කිලාන් දෙසැලක් රථයේ තිබාගෙණ, මා රජ්ජුරු වන්ට විනා කාටත් නොපෙන්වා'සි සිතා අධිෂ්ඨාන කොට ලා වීථියට බටහ

එවෙලාවට රජ්ජුරුවෝත් මහත්වූ අලංකාරයෙන් සැරසී ඇතු පිටට පැනනැගී වීථියේ නික්ම තමන් ඉදිරියට එන්නාවූ මාලු රථයේ ශක්‍රයන් දැක "මේ මාල්ලා ඉවත ලව"සි අමාත්‍යයන්ට කිහ. අමාත්‍යයෝත් තමන්ට නොපෙණෙන හෙයින් "කොයිද? සාමිනි" කියා විචාරන්නාහ. ඒ වේලාවට ශක්‍රයෝ තමන් පදනා රථය ඇතුපිට උන් රජ්ජුරුවන්ගේ ඉස්මුදුනෙන් රථය පැද ඉස සමීපයට ආකල්හි කිලාන් සැලක් ඉසගසා බිඳපුවාහ. නැවතත් එන අත අනිත් කිලාන් සැල ඉසගසා බිඳපුවාහ. එවිට රජ්ජුරුවෝ විපිළිසරලෙසට පැමිණියාහ.

එවේලෙහි ශක්‍රයෝ ශක්‍රාත්මභාවය මවාගෙණ වජ්‍රායුධය ගත් අත් ඇතිව අවකාශයෙහි සිට "ඇයි රජ්ජුරුව තොපට මාලුවෙෂය තොපෙණෙන්නා සේ සිතාගෙණ බොහෝ මාලු මිනිසුන් ගහ කොට කෙළින්ට කාරණා කිම්දැයි තොප එක තැනැත්තන් නිසා බොහෝදෙන මාතෘ උපස්ථාන පිතෘඋපස්ථාන හැර තොපම වැඩිමහල්න්ට කරණ ගහටයෙන් බොහෝදෙනා කරකාදි සතර අපායෙහි දුක්විඳින්නාහ. මෙවක්පටන් එසේ මෙසේ ආචාර කළා නම් මේ වාගේ වජ්‍රායුධයෙන් තොපගේ ඉස සත්කඩක් කොට ගසම්"සි භයගන්වා ගියහ.

රජ්ජුරුවෝත් එවක්පටන් ශක්‍රයන් කී පරද්දෙන්ම තමන් මාළු මිනිසුන් හා කැටිව කෙළිනාවූ කෙළි නොකෙළිහ යි වදාරා "මහණෙනි, යම්සේ හංසයන් කොස්ලිහිණියන් ආදිවූ පක්ෂීන්ද, ඇතුන් අසුන් ආදිවූ සිව්පාවුන් ඇතුළුවූ සියල්ලෝම සිංහයා සෙකරෙහි භය ඇතිව වාසයකෙරෙද්ද? එපරිද්දෙන්ම මහණෙනි, ලකුන්ටකහද්දිය මහතෙරුවන්වහන්සේ කුඩාවුවත් උන්ගේ ගුණමහිමවේද බැළුවමැනවැ"සි වදාරා කෙළිසීල ජාතකය නිමවා වදාළසේක්.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ලකුණ්ටකහද්දියහ. ශක්‍ර දේවේන්ද්‍රව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැ'සි වදාළසේක.

---

## 197 ඛණ්ඩකවතී ජාතකය

මේ ජාතකය දක්වනලද.

එවද කරුණානාථවූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සද්ධිවිහාරික භික්ෂුකෙනෙකුන්වහන්සේ අරභයා

එක් භික්ෂුකෙනෙකුන්වහන්සේ විහාරසමීපයෙහි දර පලමින් සිටි කල එක් වෘක්ෂයක වසන්නාවූ සර්පයෙක් අවුත් ඒ භික්ෂුන්වහන්සේ දෂ්ට කෙළේය. එකල ඒ භික්ෂූන්වහන්සේ විෂමූර්ඡාවෙන් මළසේක.

ඒ කථාව භික්ෂූන්වහන්සේ දම්සභාමණ්ඩපයෙහි කිය කියා උන්තෙනට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා ඒන්නාට පූර්වභාගයෙහි කිහම් කථාවකින් යුක්තව උනුද්"සි විචාරා එපවත් අසා "අභිරාජකුලයට මෛත්‍රී

කලොත් මෙසේ නොවන්නේ වේදැ?''යි පළමු අභිරාජකුලයට මෛත්‍රී කොට කිසිම අත්තරායකට නොපැමිණියේ වේද යි වදාරා ඒ කෙසේ දැ?''යි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

**අ**තීතයදවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ බ්‍රාහ්මණව ඉපිද පඤ්ච කාමය හැර හිමාලය වනයෙහි ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපස වරුන්ට ගණශාස්තෘව වාසය කරණසේක.

එසමයෙහි බොහෝ සත්ත්වයින්ගෙන් තාපසවරුන්වහන්සේට භය පැමිණෙයි. එපවත් බොහෝ තාපසවරුන්වහන්සේට කීසේක. උන්වහන්සේලා එපවත් අසා සතරකුලෙහි සත්ත්වයින්ට මෛත්‍රී කරවයි කියන බොධිසත්ත්වයෝ මේ ජාතකයේ පළමුවෙනි ගාථාව කියනසේක්-

**''විරූපක්ඛෙහි මේ මෙත්තං-මෙත්තං එරාපථේහි මේ**
**ඡබ්බ්‍යාපුත්තේහි මේ මෙත්තං-මෙත්තං කණ්හා ගොතමකේහි ච.''**

යන මේ ගාථාව කීහ. මෙහි අර්ථ- මේ මෙත්තං, මාගේ මෛත්‍රිය; විරූපක්ඛෙහි, විරූපාක්ෂක නම් නාගකුලයන්හා ය; මේ මෙත්තං, මාගේ මෛත්‍රිය; ඡබ්බ්‍යාපුත්තේහි, ඡබ්බ්‍යා පුත්‍රයන් නම් නාගකුලයන් හා ය; මේ මෙත්තං, මාගේ මෛත්‍රිය; කණ්හා ගොතමකේහි ච, කණ්හා ගොතමක නම් අභිරාජ කුලයන් හා යි ''මෙසේ සතර කුලයන්ය, ඉදින් තොප මොවුන් කෙරෙහි මෛත්‍රී කළාහු වී නම් සර්ව සම්පත්ති නොවන්නේය''යි වදාරා දැන් සාමාන්‍ය යෙන් මෛත්‍රී භාවනා දක්වන්නාහු-

**''අපාදකේහි මේ මෙත්තං-මෙත්තං දිපාදකේහි ච**
**චතුප්පදේහි මේ මෙත්තං-මෙත්තං බහුප්පදේහි මේ.''**

යන මේ ගාථාව කීහ. මෙත්තං, මාගේ මෛත්‍රිය; අපාදකෙහි, අපාදක දීඝීජාතීන් කෙරෙහිය; මේ මෙත්තං, මාගේ මෛත්‍රිය; දිපාදකෙහි, දිපාදක වූ මනුෂ්‍යයන් හා පක්ෂීන් හා ය; මේ මෙත්තං, මාගේ මෛත්‍රිය; චතුප්පදෙහි, චතුප්පාද වූ හස්ත්‍යශ්වාදීන් හා ය; මේ මෙත්තං, මාගේ මෛත්‍රිය; බහුප්පදෙහි, ගෝනුසු ආදීවූ බොහෝ පා ඇත්තවුන් කෙරෙනිය. මෙසේ මෛත්‍රීභාවනාවෙහි සවරූප දක්වා දැන් යාචඤ්ඤාවශයෙන් ආරක්ෂා දක්වන්නාහු-

**''මා මං අපාදකෝ හිංසි-මා මං හිංසි දිපාදකෝ**
**මා මං චතුප්පදෝ හිංසි-මා මං හිංසි බහුප්පදෝ.''**

යන මේ ගාථාව කීහ. අපාදකෝ, අපාද සත්ත්වයෙක්; මා මං හිංසි, මා නහමක් පෙළාවා; දිපාදකෝ, දිපාද සත්ත්වයෙක්; මා මං හිංසි, මා නහමක් පෙළාවා; චතුප්පදෝ, සිවුපා සතෙක්; මා මං හිංසි, මා නහමක් පෙළාවා; බහුප්පදෝ, බොහෝ පා ඇති සතෙක්; මා මං හිංසි, මා නහමක් පෙළාවා, දැන් අකොදිස්සක හෙයින් මෛත්‍රිය දක්වන්නාහු-

**සබ්බේ සත්තා සබ්බේ පාණා - සබ්බේ භූතා ච කේවලා**
**සබ්බභද්‍රානි පස්සන්තු - මා කඤ්චිපාපමාගමා**

යන මේ ගාථාව කීහු. සබ්බසත්තා, ඇමසත්හුද; සබ්බපාණා හැම ප්‍රාණීහුද; සබ්බභූතා ච කෙවලා, හැම භූතකයෝද, සබ්බ, හැමදෙනම; භද්‍රාණි, කල්‍යාණයන්; පස්සන්තු, දකිත්වා; කිඤ්චි, මොවුන් කෙරෙහි කිසි සත්ත්ව්‍යකරා; පාපං, පාප දුකක්, මා ආගමී, නහමක් පැමිණේවා; මෙසේ හැමසතුන් කෙරෙහි අනොදිස්සක නෙයින් මෛත්‍රී දක්වා දැන් තුනුරුවන් ගුණ සිහිකරණ පිණිස-අප්පමාණෝ බුද්ධෝ, අප්පමාණෝ ධම්මෝ, අප්පමාණෝ සඞ්ඝෝ යනු කීහු. බුද්ධෝ, බුද්ධරත්නයද; අප්පමාණෝ, අප්‍රමාණය. බරවූ ක්ලේශයන් නැතිහෙයින්ද (ගුණයන්ගේ ප්‍රමාණ නැතිනෙයින්ද) අප්‍රමාණයි; ධම්මෝ, ධම්මරත්නයද; උක්ත ප්‍රකාර හෙයින් ප්‍රමාණ නොකොට හැකි හෙයින්; අප්පමාණෝ, ප්‍රමාණයක් නැත්තේය; සඞ්ඝෝ, සඞ්ඝරත්නය; අප්පමාණෝ, අප්‍රමාණය; ධර්මය සමාන යොගයෙන් අප්පමාණය යි මෙසේ රත්නත්‍රයෙහි ගුණ සිහිකරව යි වදාරා ප්‍රමාණ සත්ත්වයන් දක්වන්ට- ''පමාණවන්තානි සිරිංසපානි අහිවිච්ඡිකා සතපදී උන්නානාභී සරබූ මූසිකා'' යනු කීහු. සිරිංසපානි, දීඝීජාතීහු; පමාණවන්තානි, ප්‍රමාණකර ක්ලේශ සංයොගයෙන්ද; අප්‍රමාණකර ගුණයන් නැතිහෙයින්ද ප්‍රමාණවත්හුයි. දැන් අහිංසා යනාදීන්ට උත් සවරූපයෙන් දක්වත්. අහි, සර්පයා; විච්ඡිකා, ගෝනුසුයා, සතපදි, පත්තැයහ; උන්නානාභි, මකුළුවහ; සරබූ, සිකනැලහ; මූසිකා, මීයහ යන මොහුයි. දැන් මත්තෙහි කටයුතු දක්වන්නාහු-

''කතා මෙ රක්ඛා කතා මෙ පරිත්තා-පටික්කමන්තු භූතානි
සොහං නමෝ භගවතෝ-නමොසත්තන්නං සම්මාසම්බුද්ධානන්ති.''

යන මේ ගාථාව කියත්. රත්නත්‍රයෙහි ගුණානුස්මරණය කරන්නාවූ මේ, මාවිසින්; රක්ඛා, රක්ෂාතොමෝ; කතා, කරණලදැ; මෙ, මාවිසින් පරිත්තා, පරිත්තානඥෝ; කතා, කරණලදැ; භූතානි, සත්ත්වයෝ; මෙ, මාකෙරෙහි; අභිත, අදහස් ඇති; භූතානි, සත්ත්වයෝ; පටික්කමන්තු; පහවෙත්වා; සොහං, ඒ මම, භගවතෝ, අතීතවූ භාග්‍යවත් බුදුන්ට; නමෝ, නමස්කාර කෙරෙමි; සත්තන්නං සම්බුද්ධානං, අතීතවූ විපස්සී ආදීවූ සත්බුදුන්ට; නමෝ, නමස්කාර කෙරෙමි. යනාදීන් බණපරිත්තය තපස්වරුන්ට ඉගැන්වූහ. එතැන්පටන් තාපසවරුන්ට සර්පයින්ගෙන් කිසි භයෙක් නුවූයේය යි වදාරා ඛන්ධකවතී ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි තාපසවරු නම් බුදුපිරිසය, ගණනායකව උපන්නෙම් බුදුවූ මම්ම ය''යි වදාළසේක.

## 198
## වීරක ජාතකය.

මේවද සවයම්බුබ වූ සම්ඵයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සම්ඵ කෘත්‍යයක් අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේද? යත්;

දෙවදත්තසථවිරයන්වහන්සේගේ පන්සියයක් භික්ෂූන්වහන්සේ දැහ සව්වන්වහන්සේ ගොසින් බණ කියා ඇරඹෙන බුදුන්කරා වැඩිසේක.

සඞ්ඝයෝ දැගසව්වන්වහන්සේ දැක "තොප ඇම එන වේලාවට දෙව දතසථවිරයෝ කෙසේ උනු දැ?"යි විචාරා සඞ්ඝවිලාසයෙන් ඉඳ බොහෝ විනාශයට පැමිණියෝය යි වදාළසේක.

එබස් සඞ්ඝයෝ අසා "පළමුත් දෙවදතසථවිරයෝ මාගේ ක්‍රියාව කරන්ට වැද බොහෝ විනාශයට පැමිණියෝ වේදැ"යි වදාරා ආරාධිත වූ සඞ්ඝ යන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදතත නම් රජ්ජුරුකෙනෙකුත් රාජ්‍ය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ එක් විලක දියකාව උපන් සේක. නමින් වීරක නම්ව වසන සමයෙහි බරණැස්නුවර සායගසා බොහෝ දෙනාද ආහාර කැනි හෙයින් කවුඩුවන්ට තබාදෙන කාවණු සේ බත් නොල බන්ව වන්නාහ.

සවිටඨක නම් එක් කපුටුවෙක් තමාගේ කවුඩුඛෙනුව හා සමග බොධි සත්ත්වයන් වසන්නාවූ විලටගොස් බොධිසත්ත්වයන්ට ආදරය දක්වා සිටියේය. බොධිසත්ත්වයෝත් "ඇයි සබඳ කුමක් නිසා අවුදැ?"යි විචාරා "නුඹවහන්සේට සේවය කරන්ට ආමි" කියන්නා "යහපතැ"යි කියා එතැන්පටන් තුමූ ගොදුරු කා කවුඩාට දෙන්නාහ. කවුඩුත් බඩපුරා ගොදුරු කා තමාගේ කැවිබිඛෙනු වටත් දෙන්නේය. මේ නියායෙන් දවස්හරණා සමයෙහි එක්දවසක් කවුලී කියන්නේ "මුයිත් කළුපැහැය, මුයිත් දෙපා ඇත්තාහ, මමත් දෙපා ඇත්තෙමි. මුන් මැරූ ගොදුරු කන්නේ කවුද? මම ගොදුරු මරා කමි" සිතා දවසක් දිය කාවා ලඟට ගොස් කියන්නේ 'සබඳ, තොප මරාළු ගොදුරු කන්නේ කවුද? මම ගොදුරු මරා කමි" කීහ. එබස් අසා දියකාවා කියන්නේ 'දියෙහි කිමිද කන මසුන් හෙයින් අපට මිසක් තොපට බැරිය"යි කීවත් ඒ කපුටු ගොසින් මසුන් මරා කමිසි දියට බැස සෙබෙල් අස්සේ බැඳී පැන් බී මළාහ. එකියන කවුඩාගේ කැවිබිදෙන් කවුඩා නා හෙයින් බොධිසත්ත්වයන් කරා ගොස් කියන්නී "මිහිරි කටනඩක් ඇති මොහරුන්ගේ කරට බදුවූ නිල්වූ ග්‍රීවයක් ඇති සවිටඨක නම් කවුඩා දැන් කොයිද? වීරක නම් පක්ෂියානන්වහන්සේ කියන්නේ "මා කීවා නොඅසා මානය උපදවා ගොදුරු කන්ට දියට බැස සෙවෙල් පය බැඳී මළේ"යි කීහ. එබස් කැවිබි අසා අඩා වැලප පෙරළා බරණැස්නුවරට ගියාහ යි වදාරා **වීරක ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි මාගේ ක්‍රියාව කෙරෙමි කියා ගිය මළ කවුඩා නම් දෙවදතත සථවිරය, දියකාව උපන්තෙම් ලොව්තුරා බුදුවූ මම්ම ය"යි වදාළසේක.

---

**ගඩ්ගානම් ජාතකය**
**199**

වද දශබලධාරීවූ සඞ්ඝයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සම යෙහි බාල භික්ෂුදෙදෙනෙකුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්;**

සැවැත්නුවර වාසිවූ කුලපුත්‍රයෝ දෙදෙනෙක් බුද්ධශාසනයෙහි මහණව අසුභ භාවනාදිය කොට රැවට බැඳී මමද රූ ඇත්තෙමි, නොපි රූ ඇත්තේ නොවෙයි, උනුන් හා වාදකොට එක් මාළු භික්ෂූකෙනෙකුන්වහන්සේ ලඟට ගොස් "ස්වාමීනි, අප දෙන්නාගෙන් රූ ඇත්තේ කාටදැ?"යි විවාළසේක.

ඒ භික්ෂූන්වහන්සේ කියනසේක් 'තොප දෙන්නා නියාවට මගේ රූව යහපතැ"යි කීසේක. එබස් අසා භික්ෂූන්වහන්සේ "අප විවාළේ එකෙක, මුන්වහන්සේ කීයේ එකෙකැ"යි රොස්ගසාගෙණ නික්මුණුසේක.

මේ කථාව ධම්මසභාමණ්ඩපයේ රැස්ව උන් භික්ෂූන්වහන්සේ කීය කියා උන්හෙනට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදාරා 'මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ?යි විචාරා වදාරා එපවත් අසා සම්බුදුරජාණන්වහන්සේ දැන් මතු නොවෙයි, පළමුත් මේ භික්ෂූන්දෙන්නා රූවට බැඳී ඇවිද්දෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

**පි**ටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ගඩගා නම් ගඩගාව සමීප යෙහි වෘක්ෂයක දෙවතාව උපන්සේක.

එසමයෙහි එක් ගඩගා නම් මත්ස්‍යයකු හා යමුනා නම් මත්ස්‍යයකු හා මත්ස්‍යයෝ දෙන්නෙක් උනුන් දැක "මාගේ රූ ඇත. තොපගේ රූ නැතැ"යි යනාදීන් තර්කකොට ගොඩ සමීපයේ උන්නාවූ ඉදිබුවකු සමීපයට අවුත් කියන්නෝ "ගඩගා නම් මත්ස්‍යයාගේ රූව වැඩිද ? යමුනා නම් මත්ස්‍යයාගේ රූව වැඩිදැ?"යි විවාළාහ.

එවිට ඉදිබුවා කියන්නේ 'ගඩගා නම් මත්ස්‍යයාගේත් රූව වැඩිය, යමුනා නම් මත්ස්‍යයාගේත් රූව වැඩිය, උන් දෙන්නා නියාවට රූවින් නිග්‍රෝධ වෘක්ෂයේ වටවූ කබලක් ඇති රිය ඉසක් සේ ඉස ඇති සතරගාතයක් ඇති මාගේ රූවම වැඩිය"යි කීය.

එබස් අසා ඒ මත්ස්‍යයෝ දෙන්නා "නට එක්කාරණයක් කියන්ටත් නොයෙක් කාරණා කියයි, ක්ෂිප්‍ර වරල්පතින් පැන් ඉස කියාහ යි වදාරා ගඩගා නම් ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මත්ස්‍යයෝ දෙන්නා නම් මේ ලදරූ භික්ෂූහුය, එසමයෙහි වෘක්ෂදේවතාව උපන්නෙමි බුදුවූ මම්මය"යි වදාළසේක.

---

## 200
## කුරුඩධම්ම ජාතකය.

**ත**වද ශාස්තෘවූ සම්බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තාදී විරයන් සම්බුදුරජාණන් තසන්නට කළ උත්සාහයක් නිසා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේ ද? යත්,**

එක් දවසක් ධර්මසභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ දෙවදත්ත සථවිරයන් බුදුන් නසන්ට කළ උත්සාහය කිය කියා වැඩහුන්සේක. එතනට සම්බුදුරජාණන් වහන්සේ වැඩ "මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිතම්කථාව කින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "පළමුත් දෙවදත්ත සථවිරයෝ මහත්වූ උත්සාහකළෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේ ද? යත්;**

පිටහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ කුරුඹමාඟ ජාතියෙහි ඉපිද වියත් සමීපයෙහි ගසක්මුල වාසයකරණසේක.

ඒ වීල වසන්නාවූ ඉදිබ්බාකු හා ගසෙක වාසයකරන්නාවූ කැරලයකු හා බොධිසත්ත්වයෝ මිත්‍රව වසන්නාහු එසමයෙහි එක් වැද්දෙක් බොධිසත්ත්වයන් වසන්නාවූ ගස සමීපයෙහි වරමන්දෙන් ඉදිකරණලද උගුලක් සලස්වාලීය. බොධිසත්ත්වයෝ උගුලෙහි පෙරයම බැඳුනාහ. වරපටින් එමළ වරපට කඩාගත නොහී මරණප්‍රාප්ත රාග වශයෙන් ඇඬුහ. ඒ අඩ අසා කැරලා හා ඉදිබ්බා එතනට අවුත් යාළුවාට දුකඋය පැමිණ කල ගලවාගන්ට උවමනා වේදැ යි සිතා කැරලා ඉදිබ්බාට කියන්නේ "සබඳ ඉදිබ්බාතෙනි, නුඹගේ කට දත් ඇත, එසේ හෙයින් නුඹ වරමන්ද කපන්න, මම වැද්දු මෙතනට ආ නො දෙමි" කියා ඉදිබ්බා වරමන්ද කපන්නට සලස්වා තෙමේ වැද්දුගේ ගෙට ගොස් වැද්දුගේ ඉදිරිරියේ දෙරපලය පිට උන්නේය.

වැදි ඉරපාන්වන්නට නැකත්වේලා තබා නැගිට තෙබගත් අත් ඇතිව යන්ට වත, ඒ වේලාවට කැරලා කැරල්ශබ්දය අඩා පියාපත්තබා මුණට ගැසිය. එවිට වැදි"කාලකන්නි පක්ෂියා ඇඟ ගැසිතැ"යි කියා පෙරලා ගෙට වැද ගියේය. එවිට කැරලා සිතන්නේ "දෙවෙනි ආවර නික්මෙන්නේ පැලදෙරෙනැ"යි සිතා පැලදෙර පලය පිට උන්නේය.

ඒ වේලාවට වැදිත් ඉදිරියේ දෙරින් නික්මුනු හෙයින් කැරලා ඇඟ ගැසින. "පැලදෙරින්යෙමි" සිතා පැලදෙර බලානික්මිණ. එවිටත් කැරලා ඇඟ ගැසින. ඒ වේලාවටත් "කාලකණ්ණි පක්ෂි ඇඟ ගැසිතැ"යි කියාත් වැළක මා නික්මුණුවේලේ පක්ෂියා ඇඟ ගැසිනැ යි කියා රෑ නොගොස් උදැසනක්සේ යෙමි සිතා රෑ වැද නිදු පනන්වූ දෙරින් පැහක් ගිය වේලේ නික්මිණ, උෂ නික් මුණු පවත් කැරලා වහා ගොසින් මුවාව කිය. ඒ වේලාවට ඉදිබ්බාත් තමාගේ කුඩා දත්වලින් වරපට කඩාගෙණ තුන්පටකින් දෙපටක් කපාහළ, දත් ටැම් හෙන්නාසේ මහත් වේදනාවට පැමිණ කටින් ලේ ගොසින් අසේනිව වැද හොත්තේය.

ඒ මුවා එවිට වැද්දු තෙබ ඇතිව එන්නවුන් දැක අරා පිනුයේය. වරපට කඩාගෙණ වහා බැද්දට වත. කැරලා ගසව නැංගේය. ඉදිබ්බා දිහට යානොහී එතනම වැදහොත්තේය. එතනට වැදි අවුත් ඉදිබ්බා රැගෙණ පසුම්බියේ ලාලා කනුවක්පිට එල්වාලීය. එවිට බෝධිසත්ත්වයෝ ඉදිබ්බාට වූ වද දුක වැද්දුට ලංනොව නුදුරුව පෙණුනාවුය. වැදි මුවා පසුපස්සේ

නුදුරුව පෙණුනාවුය. වැදි මුවා පසුපස්සේ නික්මිණ. මුවා අතට අසුවන්නාසේ ගැවිගැවී නික්ම වැද්දවු මහ වනයේ ලා මුවා ලංවූ මඟින් ඉදුබුවා උන්නැකට වහා අවුත් අඟබාලා පසුඹිය ඉරා ඉදුබුවා මැත්කොට කියන්නේ "ඉදුබ තොයිත් දියට වැද යව, කැරලා තොයිත් වෘක්ෂයට පැනනැඟේව"යි කියා ඒ අර්ථය ප්‍රකාශකොට දක්වන සම්බුදුරජාණන්වහන්සේ "මහණෙනි, ඒ මුවා කිනියෙන්ම ඉදුබුන් දියටබට, කැරල ඔබ්බකට ගියේය, මුවාත් වනයට වත, වැදි දෙවනිව එතනට අවුත් ඉදුබා නොදැක සිස්වූ පසුඹිය හැරගෙණ තමා ගෙවම ගියේය"යි වදාරා **කුරුම්ඹගමිග ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි වැදිනම් දෙවදත්තසථවිරය, ඉදුබා නම් මෞද්ගල්‍යායන සථවිරය, කැරලා නම් ශාරිපුත්‍ර සථවිරය, කුරුඹගමිගව උපන්නෙම් බුදුවූ මම්ම ය'යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 201 අසඝක ජාතකය

**එ**වද දිපදෙත්තම වූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පුරාණ දුතියිකාවක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්;**

එක් සත්‍රියක් නිසා උකවලිවූ භික්ෂුකෙනෙකුන්වහන්සේ දක්වන්නා "මහණ, තෘගේ අභිප්‍රාය මිසක් තා කෙරේ ඇගේ අභිප්‍රායක් නැත, එසේවුවත් තෝ ඇ කෙරේ ආලයෙන් පළමුත් බොහෝ දුක්වූයේ නොවේදැ"යි වදාරා 'ඒ කෙසේ දැ?"යි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

**ක්‍රි**වගිය දවස පොතලිනුවර අසඝක නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි උන්ගේ උබබරී නම් බිසෝකෙනෙකුන් ඇත්තාහ, පඤ්ච කල්‍යාණයෙන් යුක්තවූ විශිෂ්ඨ වූ රූ ඇත්තීය. මනුෂ්‍යරූපය ඉක්මසිටියාහ, දිව්‍යාඞගනාවකගේ රූපයට ආසන්නාව සිටියහ.

මේ රූ ඇත්තාවූ අග්‍රමහෙසිකා බිසව් එක්තරා ව්‍යාධියකින් මළහ. රජ්ජුරුවෝ ඒ බිසව් කෙරේ බොහෝ සෝකයෙන් බිසවුන් දෙනක ලා කුණු නොවන්ට තෙල්පුරා වත්කොට තමන් වැදහෝනා යානයට ලා නොකා නොබී උන්හ. අමාත්‍යයන් ආදී අය 'සවාමීනි, සම්‍භාවනීය සංස්කාරයම අනිත්‍යයහ, එසේ හෙයින් විශේෂ නූවමැනවැ"යි කීවත් රජ්ජුරුවෝ තමන්ගේ විශේෂය ඇර ගතලිය නොහී සත්දවසක් නොකා නොබී දවස් අරින්ට වන්නාහ.

එසමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණෝ හිමාලය වනයෙහි පැවිදිව ධ්‍යාන ක්‍රීඩාවෙන් දවස් අරණසේක් එක් දවසක් ලෝකය දිවැසින් බලා වදාරණසේක් අසඝක නම් රජ්ජුරුවන්ගේ දුකඛය බලා "මම හොසින් උන්ගේ දුකඛය හරින්ට උවමැනවැ"යි සිතා ආකාශයෙන් ඒ නුවරට

අවුත් ඒ රජ්ජුරුවන්ගේ මහුල්උයනේ සල්වට මත්තේ රන් පිළිමයක් සේ වැඩවුන්සේක. එතනට එක් බ්‍රාහ්මණ මානවකයෙක් ආය. එවිට තාපසයෝ කියන්නෝ "තොපගේ රජ්ජුරුවෝ දශරාජධර්මයෙන් රාජ්‍යය කෙරෙන්දැ?"යි විචාළහ. එවිට බ්‍රාහ්මණ මානවකයා කියන්නේ "ස්වාමීනි, ඉන් අඩුවෙක් නැත. උන්වහන්සේගේ අග්‍රමහෙසිකා බිසවුන්වහන්සේ තැසීගියසේක. එසේහෙයින් ශෝකාතුරසේක. නුඹවහන්සේ වැනි ස්වාමීන් විසින් ඒ ශෝකය හළමැන වැ"යි කීය. එබස තාපසයෝ අසා "ඒ කියන රජ්ජුරුවන් අපි නාඳුනම්හ, අඳුනමෝ නම් එකියන බිසවුන්ගේ උත්පත්තියත් කියා බිසවුනුත් පා ශෝක තුනී කරන්නමෝ වේද"කිහ.

එබස් බ්‍රාහ්මණ මානවකයා අසා "රජ්ජුරුවන්වහන්සේ කැන්දගෙණ එම්, නුඹවහන්සේ මෙතන වැඩඋන මැනවැ"යි කියා රජ්ජුරුවන් කරා ගොස් එපවත් කිහ. රජ්ජුරුවෝ දිවැස් ඇති තාපසකෙනෙකුන් ආ නියාව අසා "ඒ තාපසයෝ මාගේ බිසවුන්ගේ උත්පත්තිය දනිති, එසේහෙයින් උන්කරා යෙම්" සිතා අමාත්‍යමණ්ඩලයා පිරිවරා උයනට ගොස් තාපසයන් දැක "තාපසයන්වහන්ස, මාගේ බිසවුන්ගේ උත්පත්තිය දන්නාසේක් දැ"යි විචාළාහ. "එසේය මහරජ, දනිමි, කියන්නා "එසේවීනම් උපන් සථානය කියමැනවැ"යි කියන්නා "මහරජ, ගොම්පැණිව උපන්නාන"යි කීහ. එවිට රජ්ජුරුවෝ "මේ නියා රූපශ්‍රියක් ඇති තැනැත්තෝ ගොම්පැණිව උපදිද්ද? ඒ අදහා නොගණිම්"යි කීහ. "එසේවීනම් රජ්ජුරුවෙනි, උන් මෙනට ගෙන්වා පාම්දැ"යි කීහ. "යහපත ස්වාමීනි" කීහ.

එවිට තාපසයෝ 'ගොම්පැණියා හා උන්ගේ වල්ලභ ගොම්පණුවා හා දෙදෙන ගොම්උන්ඩි දෙකත් පෙරල පෙරලා එත්ව"යි අදිෂ්ඨාන කළහ. එම නියාගෙන් ගොම්පණුවා ඉදිරිකොට ලා ගොම්පැණි ගොම්උන්ඩියත් පෙරල පෙරලා එතනට ආවාය. එවිට තාපසයෝ 'එන්නාවූ ගොම්පැණි නම් උබබරී නම් බිසවි ය"යි කීහ. එවිට තාපසයෝ කියන්නාහු 'මහරජ්ජුරුවෙනි, මුන් විසින් පූර්ජාතියෙහි තමන්ගේ රූපමදයෙන් මත්ව කිසි පිණක් කරන්ට නුවූය. එසේහෙයින් මෙසේ උපන්නාහ. මුන්ලවා කථාකරවම්දැ"යි කීහ. එබස් අසා "යහපතැ"යි කී විසින් උබබරී නම් බිසවුන් ලවා "උබබරීණි, තොපගේ ජාති ගොත්‍ර කියවී, තොපගේ රජ්ජුරුවන්ට ප්‍රිය ඇද්ද"යි විචාළාහ.

එවිට ගොම්පැණියා "තාපසයන්වහන්ස රජ්ජුරුවන්වහන්සේ හා මා හා ආදි මේ උදහනයෙහි බොහෝ කෙළි කෙළපියා වාසය කරණලද. දැන් ජාතියෙන් වෙන්වූ හෙයින් රජ්ජුරුවන් හා මා හා කුමන විශ්වාස දැ"යි කීව. එබස් අසා රජ්ජුරුවෝ බිසවු කෙරේ තෘෂ්ණාව ඇර රජ්ජුරුවෝ මිනිය ගෙන් පිටත් කරවා ඉස්සෝදා නහා සෝක තුනීකොට තාපසයන් කී අවවාද නියාමට දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදාරා අසඝන ජාතකය නිමවා වදාළසේකි.

"එසමයෙහි අසඝක රජ්ජුරුවෝ නම් මේ කියන ශාසනයෙහි උකටලීවූ භික්ෂුහුය, උබබරී බිසව නම් මේ උකටලී කළාවූ ස්ත්‍රීහුය, එසමයෙහි මේ කාරණය තාපසයන්ට කී බ්‍රාහ්මණ මානවකයා නම් ශාරිපුත්‍ර සථවිරය, තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේකි.

# 202
# සුංසුමාර ජාතකය

තවද මුනීන්ද්‍ර වූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තසථවිරයන්ගේ වධයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒකෙසේද? යත්;**

එක්දවසක් සඞ්ඝයාවහන්සේ ධම්සභාමණ්ඩපයෙහි රැස්ව දෙවදත්ත සථවිරයෝ සම්බුදුයන්වහන්සේට වධයට උත්සාහකෙරෙති" කිය කියා උන් තැනට සම්බුදුයන්වහන්සේ වැඩවදුරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි වදාරා එපවත් අසා "පළමුත් දෙවදත්ත සථවිරයෝ මා තසන්ට උත්සාහකොට භයක් විවරත් උපදවාගත නුහුනුවෝ වේදැ"යි වදාරා 'ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකී.

යවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයන්වහන්සේ ගංගාවක් සමීපයෙහි බැද්දක වානරව ඉපිද දවස්හරණා සේක.

එසමයෙහි එක් කිඹුල්දෙනෙක් බොධිසත්වයන්ගේ හෘදයමාංශය කන්ට දෙළෙක් ඇතිව එපවත් තමාගේ කිඹුලාට කියත්නී "සවාමිපුත්‍රයානෙනි, ඇත් සමාන බල ඇති වානර රජ්ජුරුවන්ගේ හෘදයමාංශ කන්ට මට දෙළෙක් උපනැ"යි කියන්නා ඊට කිඹුලා කියන්නේ "අපි ජලයෙහි වාසයකරන්නෝය, ඔහු වනාහි ගොඩ වාසයකරන්නේය. එසේහෙයින් උන්ගේ හෘදයමාංශය ගෙණෙන්ට මට පිළිවන්දැ"යි කීහ.

එබස් අසා කිඹුල්දෙන කියන්නී "සවාමීනි, නුඹ දන්නා යම් උපායකින් හෘදයමාංශය ගෙණෙන්න, නොගෙණාවොත් මාගේ ජීවිතය නොතිබෙයි කිව. එබස් අසා කිඹුලා "යහපතැ"යි කියා වදාරා වානර රජ්ජුරුවන් වසන ගස සමීපයට ගොස් 'වානර රජ්ජුරුවෙනි, ඇයි නොප කසට ඵලාපල කා මෙතන ඉන්නේ බලාත් එගොඩ අඹ දඹ දෙල් බෙලි කිතුල් තල් ආදීවූ මිහිරි ඵලාපල ඇති වනයේ වාසය කළොත් නපුරැදැ"යි විවාළාහ.

එබස් අසා වානර රජ්ජුරුවෝ කියන්නාහු "කිඹුලානෙනි, දෙබිත්තියේ ගසා වතුර යෙමින් සිටියදී ගඟ මෙගොඩ සිට එගොඩට පැනපියා නොහැක්ක, කුමක් කෙරෙම්දැ?"යි කීහ.

එවිට කිඹුල් කියන්නේ "තොපගේ අභිප්‍රාය ඇත්නම් මාගේ පිට ඉඳුවා ගෙණ ගොඩලාගණිමි" කීය.

එබස් වානර රජ්ජුරුවෝ අසා "යහපත පිට පැලව"යි කීය. කිඹුලා පිටට පැන නැංගාහ. එවිට කිඹුල් වදුරානන් පිට හිඳුවා ගඟ මධ්‍යයට ගොස් දියෙහි ගිලෙන්නට වන. එවිට බොධිසත්වයෝ "මේ කිම්ද සබඳ, මා ඇරගෙණ

දියෙහි හිලෙව්කැ''යි කීය. එබස් අසා කිඹුලා කියන්නේ ''තොපට ඵලාපල දෙන්ට උන් එකෙක් ද? මාගේ කිඹුල්දෙන් තොපගේ හෘදයමාංශය උවමැන වැයි මාහට කී සෙයින් තොප මරා හෘදයමාංශය ගන්ට ගෙණාවෙමි'' කීහ.

එබස් අසා වානර රජ්ජුරුවෝ කියන්නාහු ''එසේ සිතන්නේ යහපත වදුරන්ගේ හෘදයමාංශය ලෙයි තිබේ නම් ඒ ඒ තෙන පිනීමෙන් සුණුවිසුණු නොවේදැ?''යි කීය. එබස් අසා කිඹුල් ''තොපගේ හෘදයමාංශය කොයි තිබේදැ?''යි කීය. බෝධිසත්ත්වයෝ එතනට ලන්වූ විලිකිණිවූ දිඹුල්ගෙඩි ඇති ගසක් දැක 'තෙල දිඹුල්ගසෙහි එල්ලෙන්නේ මාගේ හෘදයමංසය'යි කීහ.

එවිට කිඹුල් ''එසේවී නම් තොප නොමරම් හෘදමාංසය මට දෙව''යි කීයෙ වදුරා ගොඩලීය. වදුරු ගසටනැඟී ''තාගේ එගොඩතිබූ අඹ දඹයෙන් මට කිසි ප්‍රයෝජනයක් නැත. එම්ඔල අඥානවූ කිඹුල, වදුරන්ගේ අක්මාත් ඔබ්බේ තිබේද? තා මහත් පමණ මිසක් තාගේ ලෙයි කිසිම නුවණෙක් නැත්තේවේද; තා වඤ්චාකළ නියාව තෝ නොදන්නේය. එසේ හෙයින් තෝ තාගේ විමාන ඝට පලායව''යි කීහ.

කිඹුල් දුසින් පැරදගිය එකකුසේ විසෙපයට පැමිණ තමා ඉන්න වාසස්ථානයටම ගියේය යි වදුරා සුංසුමාර ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි කිඹුල්දෙන නම් විඤ්ඤමානවිකාය, කිඹුලා නම් දෙවදත්ත සථවිරයෝය, වදුරුව උපන්නෙම් මම්ම''යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

## 203. කක්කර ජාතකය

එවද භාග්‍යවත්වූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සැරියුත් සාමීන්ගේ විහාරයෙහි බාල භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්;**

සැරියුත් සාමීන්ගේ අතවැසි භික්ෂුකෙනෙකුන් වහන්සේ කය ආරක්ෂා පිණිස උෂ්ණ බත් කැවොත් පිත්තය කුපිත වෙයි, කියා උෂ්ණවේලාවෙහි තමන් වහන්සේගේ කයට කිසි දුකක් වැදීදනොදී රකිනාසේක.

මේ නියාව ධම්මසභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ කිය කියා උන්තෙනට සම්බුදුරජාණන්වහන්සේ වැඩ වදාරා 'මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි පෙරත් මූ තමන් ශරීරයට කිසි දුකක් වැදීද නුදුන්නෝවේදැ''යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

යම්කිසිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ වෘක්ෂදෙවතාව උපන් සේක.

එසමයෙහි ලිහිණිවැදිදෙක් පක්ෂිඛෙනුවක් ඇරගෙණ කොරවකුන් බඳන්නේය. පළමුත් මැදිරියෙක අසුව ගැලවී ගිය කොරවකකු ඒ වැදි බඳන්ට උත්සාහ කෙළේය. පළමුත් තමා අසුවූ හෙයින් ඒ වැද්දහුට අසු නොවී වැද්දහු ලාඵූ මළ වල පය නොතිබෙන්නේය. වැදිත් අවශ්‍යයෙන් උව මැනැවැයි සිතා උත්සාහ කොට ඇවිදින්නේ පළමුත් තමා බැඳුනු හෙයින් මළට අසුනොවී ගැලවී දවස් අරණේය.

එවිට වැදි සිතන්නේ මළ ඉදුවා බැරිමය යි සිතා තමා උස නියාවට කුඩු වක් ඉදිකොට ඊ අතු බේරා තුමූ ගසක් හැරියට නික්මුනාහ. එවිට කොරවකා වැද්දවූ නියාව දැන සිතන්නේ "මූ සිහිකරන්ට උවමැනවැ යි මෙකල වනාන්තර යෙහි ඇවිදින්නෙම් බොෂහෝ අඹ දඹ දෙල් බෙලි කිතුල් දුටුවිරීම්, මෙසේ ඇවි දිනා ගසක් දුටුවිරැද්ද? තාගේ වඤ්චාවට මා අසුවන්නේ නැතැ"යි කියා පියා අඩාගෙණ පලාගියහ.

වැදිත් පක්ෂියා පලාගිය පසු කියන්නෝ එසේ වී නම් පක්ෂියා මැදිරිය කඩාගෙණ ගියවනැ යි එසේ හෙයින් මූ සොරකම් දන්නේය යි ඔබ්බට ගොසින් පක්ෂීන් බැඳගෙණ තමාගේ වාසස්ථානයට ගියේය යි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ලිහිණි වැදි නම් දෙවදත්තස්ථවිරය, කොරවකා නම් ශරීරය රක්ෂාකරන්නාවූ නිස්සූහුය, මේ කාරණය ප්‍රත්‍යක්ෂකොට දුටුවාවූ වෘක්ෂදෙවතාවා නම් බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

---

## 204. කන්දගලක ජාතකය

තවද ලෝකනායකවූ සම්බුදුන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සුහතාලය අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්;**

එක් දවසක් ධම්මසභාමණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන්වහන්සේ දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ සම්බුදු විලාසය කළ නියාව කිය කියා වැඩ උන් තෙකට සම්බුදුන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි පෙරත් මූ මාගේ විලාසය ධරා බොහෝ දුකඛයට පැමිණියෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකි.

**ඒ කෙසේද? යත්;**

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ නමින් බදිරව නම් කැරලව ඉපිද කිහිරිවනයෙහි දවස් අරණ සේක.

එසමයෙහි බොධිසත්ත්වයන්ට යාළුව එරබදු ඉඹුල් ආදීවූ සථානයෙහි වාසය කරන්නාවූ කඳගලක නම් කැරලෙක් බොධිසත්ත්වයන් කරා ආය. බොධිසත්ත්වයෝ තමන්ගේ කිහිරිවනයෙහි කිහිරිගස් විද පණුවන් කැරලාට ලූහ.

කැරලා බොධිසත්ත්වයන් ලූ පණුවන් කැවුම් කන්නා සේ කා කිපදවස කින් මොහු සිතන්නේ "මොහුත් ගස්විද කන්නෝය, මුන් විදිනා ගස් මම්ම විද නොහෙන් දැ"යි කියා එක් දවසක් කියන්නේ "යහළු, තොප විදිනා ගස් මම විද පණුවන් කම්, තොපි ගස්ම්ද ආයාස නොගණුව"යි කිය.

බොධිසත්ත්වයෝ කියන්නාහු "තොපට පිළිවන් එරබදු ඉඹුල් ආදී ගස් විද පණුවන් කනොත් වීනා මේ හරඇති කිහිරිගස් විදින්නට බැරිය"යි කියන්නා "ඒ කිම්දැ?"යි මහාවේගයෙන් ගොස් කිහිරිගසෙහි හොට ඇන හොට කඩා ගෙණ ඔළුවත් පලාගෙණ දැස් උඩ ඉඳුවා මහත්වූ වේදනාවට පැමිණ ගස එලී ගෙණ ඉන්ද නොනී මූර්ඡාව බිමවැටී කුමක් බවත් නොදැන නන්දෙඩන්නේ "සිහින්වූ පත් ඇති යකඩසේ තදවූ ගස කුමන ගසෙක් දැ?"යි විවාළේය,

බොධිසත්ත්වයෝ කියන්නාහු "තොප විද අභ්‍යාස ගස් නොවිද මා කිය මන් නොගෙණ බොහෝ ආයාසයට පැමිණියව, මේ ගස් නම් කිහිරිගසැ"යි කීහ. එකියන පක්ෂියා එතන ම මළහ යි වදුරා කඳගලක ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි කඳගලක කැරලා නම් දෙවදත්තසථවිරය, ඛදිරවන නම් කැරලව උපන්නෙම් බුදුවූ මම්ම"යි වදාළ සේක.

---

## 205. සෝමදත්ත ජාතකය.

තිවද විනායකවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලාලුදායි සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්;**

ලාලුදායි සථවිරයන් වහන්සේ සඛයක ඉඳ බස්පස් කියන්ට වන්සේක් නම් කියන බස තබා නොකියන බසම කියනසේක. මුත් වහන්සේගේ අඥත කම් ධම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සම්බුදුයන් වහන්සේ වැඩවදුරා "මහණෙනි මා එන්නාට පූර්වාහ්නයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදුරා එපවත් අසා "පළමුත් ලාලුදායියෝ එසේමය"යි වදුරා "ඒ කෙසේද?"යි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්;**

පුරාණය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ කසීරට බමුණුගමක ඉපිද වැඩිවිය පැමිණ සොමදත්ත නම් බ්‍රාහ්මණව තක්සළා නුවරට ගොස් දිසාපා

මොක් ආචාරින් ලඟ ශාස්ත්‍ර ඉගෙණ පෙරලා දෙමව්පියන් කරා අවුත් දුක්පත් හෙයින් රජ්ජුරුවන් වහන්සේට සේවයකොට දෙමව්පියන් රකිමි සිතා බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට රාජවල්ලභව දවස් අරණා සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේගේ පිය වූ බ්‍රාහ්මණයාතන්ගේ සාතා නොන් ගෙයක් ඇත. ඒ ගොන්තෙයෙන් එක් ගොතෙක් නැසිත. එපවත් පුතනුවන්ට කියම් සිතා බරණැස් නුවරට ගොස් "සොමදත්ත තම් පුතානුවෙනි, මාගේ ගොන් තෙයෙන් ගොතෙක් නැසිත. ඊට ගොතෙකු රජ්ජුරුවන්ට කියා මට ඉල්වා දෙව"යි කිය.

එසේ බොධිසත්ත්වයෝ අසා "පියාණන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේට වල්ලභවූ ගමනේදී ගොතෙකු දුන මැනවැ"යි කියන්ට මට යෝග්‍ය නොවෙයි. නුඹවහන්සේම රජ්ජුරුවන් වහන්සේට කියා ඉල්වා ගත මැනවැ"යි කිහ. එවිට පියාණන් වහන්සේ කිතසේක් "පුත දෙන්නෙකු සිටියදී යම්ම දෙයක් මට කියන්ට බැරිය, මම කන්තලව් කියන්නෙම් සිටින ගොනාත් ඇරගන්ට කියතොත් විනා කන්තලව් කියාගෙන ගෙනෙකු ඇරගත නොහෙම්" කිහ. "එසේ ගොනා දෙතත් ගෙතෙකු ඇරගතත් නුඹවහන්සේම කිවමැනව, මම ඊට උපායක් කියාලම්" කියන්නාහු රජ්ජුරුවන්වහන්සේ දුටුවිට "ජයතු භවං මහාරාජ" කියා ආශීර්වාද කොට ගාථාවක් කිය මැනවැ"යි කියන්නාහු-

"වෙ මෙ ගොණා මහාරාජ-යෙහි බෙත්තං කසාමසෙ
තෙසු එකො මතො දෙව-දුතියං දෙහි බතනියා"

යන මේ ගාථාව කිවමැතැවැ යි කිහ.

මෙහි අනිප්‍රාය මහරජ්ජුරුවන් වහන්ස, මාගේ සිසානා ගොන්නු දෙන් නෙක් ඇත්තාහ. ඉන් එක් ගොතෙක් මළ, අනික් ගොතෙකු ක්ෂත්‍රියෙසව රජ්ජුරුවන් වහන්ස, දෙවා වදුළ මැනවැ යි කියා මේ ගාථාව අවුරුද්දකින් උගන්වා අවුරුද්ද මුළුල්ලේ සුවදගස් ඇත්තාවූ සුසානයෙක පිදුරුකැරලි රැසක්සේ සිටුවා මූ රජ්ජුරුවෝය, මූ සෙනෙවිරද්දුයයි කියා මේ නියායෙන් අසථාන කෝල අරවා ඉක්බිති බොධිසත්ත්වයන්ගේ පියාතෝ "පුත ගාථාව වනපොත්ව ගියේය"යි කියන්නා "යහපතැ"යි පඬුරක් ගෙන්වාගෙණ පියනුත් කැඳවාගෙණ රජ්ජුරුවන් දැක සිටියාහ.

එවිට බොධිසත්ත්වයන්ගේ පියාතෝ රජ්ජුරුවන් දැක "ජයතු භවං මහාරාජ" කියා තමන් ගෙණගිය පඬුරුත් දී රජ්ජුරුවන් දැක සිටියාහ. එවිට රජ්ජුරුවන් විසින් "සොමදත්තයෙනි, මූ තොපගේ පියාතෝදැ"යි විචාරන්නා "එසේය, සවාමීනි" කී අවසථාවෙහි බෝධිසත්ත්වයන්ගේ පියාතෝ කියන්නාහු

"වෙ මෙ ගොණා මහාරාජ-යෙහි බෙත්තං කසාමසෙ
තෙසු එකො මතො දෙව-දුතියං ගණහ බතනියා"යි

කී හෙයින් බොධිසත්ත්වයන් "දේහි" කියා ඉගන්වා නිඹියදී "ගණහ"යි කියා කී හෙයින් රජ්ජුරුවෝ ගාථාව වරදවා කී නියාව දැනම සිතාසී "ඇයි සොමදත්තයෙනි, තොපගේ ගෙයි මෙසේම ගොන් බොහෝදැ?"යි කියා බෝධිසත්ත්වයන් විසින් "ගොන් දුනොත් ඇත්තේවේදැ"යි කී බසට වල්ලභව සිට තුමූ කන්තලව් නොකියා තමන්ගේ පියාතන් හා කන්තලව් කියෙවීමට සතුටුව ගොන් දසදෙනෙකු දී බ්‍රාහ්මණයා උන් ගමත් පටුනුකොට ලියාදී යවූහ.

එවිට බොධිසත්ත්වයන් හා පියාතෝ රථයකට නැගී යමින් සිටි බොධිසත්වයෝ කියන්නාහු "මේ කිම්ද? අවුරුද්දක් මුළුල්ලේ සුවඳගස් ඇන්තාවූ ශ්මසානයෙහිදී ගාථා වනපොත් කරවා වරදවා කියේ ඇයිදැ?යි කීහ.

"පුත, සහායෙහිදී බස් කියා යහපත අසන්නොත් ඇත, නපුර අසන් නොත් ඇත, මා විසින් වරද්දා කියාත් මෙතෙක් දේ ලද්දෙමි වේදැ"යි කීහයි වදාරා මේ සෝමදත්ත ජාතකය නිමවා වදාළසේකි.

"එසමයෙහි සෝමදත්තයන්ගේ පියාතෝ නම් ලාලුදායි ස්ථවිරයෝය, පුතනුවෝ නම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

---

## 206
## උදඤ්චිඨහත්ථ ජාතකය

තවද සුගතෙන්ද්‍ර වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සත්‍රියක් නිසා උකටලී වූ භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වතලද.

**ඒ කෙසේද? යත්;**

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයන්වහන්සේ එක් දුප්පත්වූ කිසිවක් නැත්තාවූ විජ්ජත්කුලයක ඉපිද සිහාකා ජීවත්වන සමයෙහි එක්තරා බ්‍රාහ්මණයකුගේ භාර්‍යාව දුරාචාරව දවස් අරිණියේය.

බොධිසත්වයෝත් ඒ බ්‍රාහ්මණයාගේ ගෙට සිහා ගියහ. ඒ බ්‍රාහ්මණයා ඔබ්බේ ගමකට ගියේය. උත් ඇදී ඒ බැමිණිද තමාගේ අන්‍යවූ වෙනර පුරුෂයකු ගෙන්වාගෙණ ලෝකාස්වාදරතියෙහි යෙදී ඉක්බිති "බත් කා යව"යි බ්‍රාහ්මණයාහට කීය ඉක්මන්ව බත්පිය වෙනර පුරුෂයාට බත් ලා ඇතොමෝ මඟ බලා සිටියාහ බෝධිසත්වයෝත් යම්තම් දෙයක් ලැබේ දැයි සිතා දොරකඩ සිටියාහ. ඒ වේලාවට ගෙය ඇති බ්‍රාහ්මණයා ගෙට එන්ට වත, එවිට බැමිණි ගෙට එන්නාවූත් දැක සොරසැමියා බත්කමින් උන් තැනැත්තාහු කොටුව ඇතුලේ ලුව, ගෙව ආ සැමියා බත් කන පෝරුව ඇදලා අතට පැන් දී සොර සැමියා බත්කමින් සිව මණ්ඩයේ ගෙයිසැමියාට උනුබත් ලා ලා අතට දී ලුව. එවිට බ්‍රාහ්මණ බතෙහි අත ඔබා "උඩ බත් උනුය, යට බත් සීතලය බත් නිවෙනම් උඩ බත් විතා යට බත් නිවෙන්වි කාරණා කිම්ද?යි ඒ කවර කාරණා නිසාද? ඒ කාරණය මට කියවයි" කීහ, බ්‍රාහ්මණ කිපවරක් විචාරත් බ්‍රාහ්මණී තමා කළ සොරකම සැලවෙයි සිතා බැණනොනැගී සිටියාහ.

එවිට බොධිසත්වයෝ සිතන්නාහු "පළමු ආයේ සොරසැමියාය යි සිතා සොරසැමියා කොටුවේ උත් නියාව මා කියන්ට උවමැනවැ"යි සිතා කියන්නේ 'බ්‍රාහ්මණයානන්වහන්ස නුඹවහන්සේගේ වෙනර පුරුෂයා බත්කවා කොටුවේ ඉඳුවා උන් කැ මණ්ඩයේ ඉඳුල් බත් නුඹවහන්සේට කිබුයේය, අපිනම් විජ්ජත්

කුලයෙහි උපන් හෙයින් ඇසින් දුටු දෙයක් යාපත්වත් නපුරමත් කියම්ම, එසේහෙයින් ඉතිබ්බේ නපුරු නොකරණ නියායෙන් භික්ෂුවාගත මැනවැ''යි කියා ගියහ. බමුණුත් දෙන්නාම අල්වාගෙණ පාවකොට ''ඉතිබ්බේ මෙසේවූ දෙයක් නොකරව''යි කිව යි වදුරා මේ උච්චිට්ඨභන්ත ජාතකය තිමවා වදාළ සේක. ජාතකාවසානයෙහිදී ඒ භික්ෂූන්වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටිසේක.

එසමයෙහි බ්‍රාහ්මණයා නම් මෙහියන භික්ෂුහුය, එසමයෙහි බ්‍රාහ්මණී නම් මෙසමයෙහි ස්ත්‍රිය, දුක්පත් විජ්ජත්ව උපන්නෙම් බුදුවූ මම්මය''යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

---

## 207
## භරු ජාතකය

තවද කරුණානිධාන වූ මාගේ සවාම්දරු වූ සර්ඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වනලද.

**ඒ කෙසේද? යත්;**

සර්ඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලාභයෙන් යසසින් වැඩී දවසරිත සේක.

එසමයෙහි තීර්ථකයෝ ලාභසත්කාරයෙන් පිරිහී සිතන්නාහු ශ්‍රමණ භවත් ගෞතමයන් හා ශ්‍රාවකයන්ගේ ලාභසත්කාර මහත, අපව නැත, ''ලාභ සත්කාර මහත්වන්නේ ජේතවනාරාමයෙහි භූමිවිශෙෂයනැ''යි කියා සිතා ගෙණ ''අපටත් එතන තීර්ථකාරාමයක් ඉදිකොට ගෙණ වාසය කරන්ට උව මැනවැ''යි සිතා ''රජ්ජුරුවන්ට නොකියා කළ මෝ නම් භික්ෂූහු කළ නොදෙති'' සිතා රජ්ජුරුවන්ට අත්ලසක් දී ලබ්බවාගත තනම්හ''යි සිතා තීර්ථකයෝ එක්ව මසුරන් ලක්ෂයක් දී කියන්නාහු ''මහරජ්ජුරුවෙනි, ජේතවනාරාමය කෙරේ තීර්ථකාරාමයක් කරවන්නා අභිප්‍රාය ඇත්තම්හ භික්ෂූ ඇවිත් රජ්ජුරුවන්ට කිකල රජ්ජුරුවන් ඊට අවුලක් නොකියන්නේ යහපතැ''ති කියන්නා ගිවිස්සාහ.

තීර්ථකයෝ බොහෝ වඩුවන් ඇරගෙණ ජේතවනාරාමයට පිටිපස්සේ කරණ බොහෝ අරගල අසා ''ආනන්දය'' මේ කුමන අරගලයෙක් දැ''යි විචාර එපවත් අසා ''ආනන්දය, භික්ෂූසඞ්ඝයා රැස්කරව''යි කියා සඞ්ඝයාවහන්සේ රැස්කරවා'' භික්ෂූනි, තොප ගොස් රජ්ජුරුවන්ට කියව''යි කියන්නා ''යහපතැ''යි කියා භික්ෂූන්වහන්සේ රැස්ව රජ්ජුරුවන් කරා ගොස් රජ්ජුරුවන්ගේ වාසල සිට එපවත් කියා යවූසේක.

රජ්ජුරුවෝ තමන් කියන්ට උත්තරයක් නැතිහෙයින් ''ගෙයි නැතැ''යි කිවූහ. භික්ෂූන්වහන්සේ විහාරයට ගොස් එපවත් සර්ඥයන්වහන්සේට සැල කළසේක. සර්ඥයන්වහන්සේ රජ්ජුරුවෝ අත්ලස් හා මෙසේ කරති සිතා ''පසුව දවස් දෑගසවිවන් යව''යි වදාළසේක.

දැගසව්වන්වහන්සේ දෙරකඩ සිට රජ්ජුරුවන්ට කියාගයවන්නා එවිට රජ්ජුරුවෝ ''ගෙයි නැතැ''යි කියා යවූහ.

පසුව දවස් සම්බුදුයන්වහන්සේ පන්සියයක් රහතුන්වහන්සේ පිරිවරා රජගෙට වැඩිසේක. එවිට රජ්ජුරුවෝ උඩුමාලෙන් බැස සම්බුදුන් වැඳ පාත්‍රය අතට ගෙණ බුදුන් රජගෙට වඩාගෙණ ගොස් වළඳවා අනතුයෙහි එකත්පස්ව උන්නාහ. එවිට සම්බුදුයන්වහන්සේ වදාරණසේක් ''මහරජ, අත්ලස් බලඉයන් තාපසවරුන් දෙපසක් ගස්වා පෙරත් රජදරුවෝ බොහෝ විනාශයට පැමිණි යෝවේදැයි වදාරා ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් වදාළ සේක.

**ඒ කෙසේද? යන්,**

යිවඟිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ හිමාලය වනයෙහි තාපසව පන්සියයක් තාපසවරුන්ට නායකව වාසයකරණසේක්, වස්කාලයෙහි ඒ ඒ තැන සැරිසරා වඩිනාසේක්, බරණැස්නුවරට වැඩ නුවර සිහා උතුරුදිග වෘසලින් පිටත්ව ඒ වාසල සමීපයේ නුගගසක්මුල වාසය කරන්නාහ.

එසමයෙහි අනිකුත් පන්සියයක් තාපසවරු ලුණුඇඹුල් සොයනා පිණිස බරණැස්නුවරට අවුත් ඒ තාපසවරු මොත්තමක් නුවර සිහා දකුණු වාසල සමීපයේ නුගගසක්මුල වාසයකරන්නාහ.

මේ නියාගයෙන් තාපසවරු වස්සාන කාලයෙහි එහි වැස හිමාලයවනයට ගියාග. දෙවනු අවුරුදුත් එම නුවරට එන අවසථාවව දකුණුදෙර වාසල සිටි නුගගස වැටින දකුණුදෙර වාසල පළමු අවුරුද්දේ උන්නාවූ තාපසවරු තමන් උන් නුගගස වැටුනු හෙයින් උතුරුදිග වාසල නුගගස මුල ඉන්ව වන්නාහ.

එසමයව උතුරුවාසල නුගගසමුල උන්නාවූ තාපසවරු ඒ නුවරව අවුත් තමන් පළමු උන් නුගගස කෙරේ ගියාහ. මේ කියන තාපසවරුන් යන්නාව පළමු අනිත් තාපසවරු මොත්තමත් උන්නු හෙයින් ''අප පළමු මුරගේ උන් නුගගසමුල උන්නේ කවරනිසාදැ?''යි කියා උන් හා දබරකළාහ. මෙකියන තාපසවරුන් ''අපි පළමුකොට උන්නමෝ එසේහෙයින් අපි නුගගසමුල නාරිම්හ''යි කියා දබරකරන්නව වන්නාහ. මේ නියාගයෙන් දෙපක්ෂයෙ ඇත්තෝම දබරකොට එපවත් රජ්ජුරුවන්ට කිහ.

රජ්ජුරුවෝ එපවත් අසා ''පළමුකොට උන් තාපසවරුන්වමග''යි කිහ. එබස් අසා අනික් තාපසවරු මොත්තම ඉර්ඛියෙන් පළමු චක්‍රවර්ති රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කළාවූ රණ මැදිරියෙක් රජ්ජුරුවන්ට අල්ලස්කොට දී ''රජ්ජුරුවෙනි, අපගේ වාසසථානය අපට සලස්ව''යි කිහ. ඊවත් රජ්ජුරුවෝ හිවිස්සාහ. එවිට තාපසවරු උනුන්ලා බොහෝ අඩදබරකොට අනතුයෙහි සිතන්නාහු අපි හිහිගෙය හැර මහණවූවන් විසින් කළසේ නපුරුයි සිතා එතනින් වහා හිමාලයවනයට ගියාහ. දෙවතාවෝ ''මෙතෙක් තාපසවරුන්ට උක්කොටතා කලෝ මේ රජ්ජුරුවෝ වේද; මේ රජ්ජුරුවන්ගේ නුවර නසම්ව''යි සිතා මහමුහුදු අලලා වතුරක් එවා තුන්සියයක් යොදුන් නුවරගලා

නැසූහ යි වදාරා ''රජ්ජුරුවෙනි, එක රජ්ජුරුවන් කළාවූ අධර්ම නිසා කැතක් මනුෂ්‍යයෝ නසින ලද්දාහුය.

එසේහෙයින් ජානුදිවහයෙන් අගතියට යාම යහපත් නොවෙයි කියා රජ්ජුරුවන්ට සම්බුදුවහන්සේ අවවාද වදාරා දෙවැ ජාතකය නිමවා වදාළ සේක. කෝසල රජ්ජුරුවෝ මේ ධර්මදේශනාව අසා තිවැටකයන්ගේ ආරාම බිඳවා අලහ.

''එසමයෙහි ගණිකාවන්ය උපන්නෙම් බුදුවූ මම්ම ය''යි වදාළසේක.

---

## 208
## පුණ්ණනදී ජාතකය

මේ වදාළේ විහාරමාණික්‍ය වූ සම්බුදුවහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

එක්දවසක් ධර්මසභාමණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන්වහන්සේ ''ඇවැත්නි සම්බුදුවහන්සේ මහාපඤ්ඤා, මහත්වූ අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභානාදි මහත්වූ ප්‍රඥාවෙන් යුක්තසේක. පුථුපඤ්ඤා ආකාශය සේ පෘථුලවූ, ප්‍රඥාවෙන් යුක්තසේක. හාසුපඤ්ඤා, හාසු බහුලවූ, තුෂ්ටි බහුලවූ ප්‍රමෝද්‍ය ප්‍රඥා බහුලවූ ප්‍රඥාවෙන් යුක්තසේක. ජවනපඤ්ඤා, ජවනහංසගතියක් පරිද්දෙන් ශීඝ්‍ර වූ පරිද්දෙන් පවත්නා ප්‍රඥාවෙන් යුක්තසේක. තික්ඛපඤ්ඤා, සියුම්වූ ප්‍රඥාවෙන් යුක්තසේක. නිබ්බෙධිකපඤ්ඤා, විනිවිද පවත්නාවූ ප්‍රඥාවෙන් යුක්තසේක. උපායකුසලෝ, ඒ ඒ කවයුත්තෙහි උපායකෞශල්‍ය ඥානයන් ඇතිසේකැ''යි යනාදීන් ප්‍රඥාපාරමිතාව වර්ණනාකොට වැඩඋන් තෙනට සම්බුදුවහන්සේ වැඩවදාරා ''මහණෙනි, මා එන්නාව පුවීහාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැසි විචාරා වදාරා එපවත් අසා ''දැන් සම්බුදුප්‍රාප්තව ඉඳ දී නුවණවිශෙෂ වර්ණනාකරන්නේ කිමිද? පෙරත් බොධිසත්ත්වයෝ නුවණින් අග්‍රප්‍රාප්තයෝ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ''යි ආරාධිතවූ සම්බුදුවහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයාට පුත්ව ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරි සම්පයට ගොස් සියළු ශාස්ත්‍ර ඉගෙණගෙණ අවුත් පියාහන්ගේ ඇවැමෙන් පුරෝහිත ධුරයට පැමිණ රජ්ජුරුවන්ට සේවය කරන්නාහ.

රජ්ජුරුවෝ දුර්ජනයන්ගේ බසින් බොධිසත්ත්වයන් තමන් ඉන්නා නුවරින් නෙරපුවාහ. බොධිසත්ත්වයෝ තමන්ගේ අඹුදරුවන් ඇරගෙණ ගොසින් පිටිසර කිසිගමෙක වාසය කරන්නාහ. රජ්ජුරුවෝත් කල්යාමකින් බොධිසත්ත්වයන්ගේ ගුණ සිහිකොට ''දුර්ජනයන්ගේ බස් නිසා නුවරින්

නෙරපීම්, උන් මා ගෙන්වාගන්ට උවමැනවැ''යි සිතා මිනිසකු අත කැන්දා යවීම් තම් ඒ තරම් නොවෙයි, එසේ නෙයින් ප්‍රශ්නයක් යවා ඒ ප්‍රශ්නයෙන්ම ගෙන්වා ගණිමි සිතා මේ ජාතකයෙහි පළමුවෙනි ගාථාව බැඳ යවූහ.

ඒ කෙසේද? යත්;

**''පුණ්ණං නදිං යෙනව පෙයාමාහු-ජාතං යවං යෙනව ගූයහමාහු**
**දූරංගතං යෙනව අවහය නති-සෝ තාහගතෝ හඤ්ඤව භූඤ්ජ බ්‍රහ්මණා''ති**

කියන ගාථාව යවූහ. මෙකියන ගාථාව හා කවුඩුමස් තමන්ගේ අත පේරුස් මුද්දෙන් අස් ඔසවා රජ්ජුරුවෝ බොධිසත්ත්වයන්ට යවූහ. මෙහි අනිප්‍රාය තම් එකපැතිර යන්නාවූ මහවතුරෙහි පැන් බොන්නෝ කවුරුද? ගෙයම් කුඹුරු ආදීවූ දෙයෙහි සැඟවී ඉන්නෝ කවුරුද? දුරහියාවූ මනුෂ්‍යයන් එන නියාව කියන්නෝ කවුරුද? බ්‍රාහ්මණයා මේ අනිප්‍රාය හා මෙකියන මස් දනුවයි කීහ. බොධිසත්ත්වයෝ කියා යවූ ප්‍රශ්නය විසඳූ වැසිවතුර දියෙහි පැන්බොන්නා හුත් කවුඩෝය, ගොයම් ආදී දෙයෙහිත් ඉන්නෝත් කවුඩුවෝය. දුරහියාවූ මනුෂ්‍යයන් එන නියාව කියන්නෝත් කවුඩෝය. එසේ හෙයින් මේ කවුඩුමස් නියාය, නැවත ඒ ප්‍රශ්නය විසඳූ බලන්නාහු රජ්ජුරුවන් වහන්සේ විසින් වැසි වතුර හා ගොයම් කුඹුරු ආදීවූ දෙයෙහිත් සම්‍යක්‌සම්බුද්ධ ඒ ඒ තෙතට ගියාවූ මනුෂ්‍යයෝ නුවරට රැස්වූව එසේ හෙයින් බ්‍රාහ්මණය නොයිත් නුවරට එව''යි කියා සිතා කවුඩුමස් එව්වාට සතුටුව ''සාමීනි, මා කෙරේ කරුණා ඇති සේකැ''යි සිතා ගාථාව කියන්නාහු-

**යතෝ මං සං රහි රාජා-වාසයමපි පහෙතවෙ**
**හංසං කොඤ්චා මයූරාච-අඝතියෙව පාපියා-සි**

කියා ගාථාව යවූහ. එහි අනිප්‍රාය 'දේවයන්වහන්ස, මා කෙරේ කරුණාව ඇති නියාව දනිමි. කවුඩුමස් එවූ ගමනින්ම අනික් හංස කොස්ලිහිණි මයුරයන් ආදීවූ පක්‍ෂීන්ගේ මිහිරිමාංසය ලත් කලත් මා සිතා වදුරන්නේ ඇත්තේවේදැ''යි කියා මනාවූ රථයකට නැගී නුවරට වන්නාහ.

රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් දැක සතුටුව පෙර පරිද්දෙන්ම පුරෝහිත සථානාන්තර දී රක්නාහ යි වදාරා මේ පුණ්ණනදී ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්මය''යි වදාළසේක.

---

## 209
## කච්ඡප ජාතකය

**මේ** වදාළ මාගේ කල්පද්‍රැමවූ සර්ව්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝකාලික සථවිරයන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්තමාන කථාව තත්කාලි ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි ''මහණෙනි, කෝකාලිකසථවිරයෝ වසනු රැක්කනොහී බොහෝ විනාශයට පැමිණියෝ වේ?''යි වදාරා ආරාධිත වූ සර්ව්‍වඥයන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

**පි**ටතින් දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව දවස් අරිනාහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ බහුභාණ්ඩව ඉන්නාහ. බොධිසත්ත්වයෝ මේ රජ්ජුරුවන්ගේ බොහෝකොට දෙඩීම කවරදෑ, අරවාපියම්දෝනෝ යි සිත සිතා ඉඳිනාහ. ඒ අවධියට එක් හංසයෝ දෙන්නෙක් ඉදිබුවකු හා හාදව ඉඳිනාහු "ඉදුබාතෙනි, අපි හිමාලයවනයෙහි රන්ගුහායෙහි වාසය කරම්හ. එතන ඉතා සිත්කළුය, එතන දකින්ට එවුදැ"යි කීහ.

එවිට ඉදුබා කියන්නේ "තොපි නම් පියඅඹාය යි, මා කෙසේ යෙම්දැ?"යි කිව. එපවත් අසා හංසයෝ කියන්නාහු "තොපගේ කටරුකගත එවූතම් ගෙණයෙම්මය"යි කියා ලියක්කඩාගෙණ දෙන්න දෙකෙළවර ඩැගෙණ ඉදිබුවා ලීය මැද්දෙන් ඩැගත්තා ලෙස සලස්වා පිය අඹාගෙණ නික්මෙන්ට වන්නාහ. ඒ වේලාවට කුඩා කොල්ලෝ මොත්තමෙක් ඒ හංසයන් දෙන්නා අල්වාගෙණ යන ඉදුබා දැක "එම්බල හංසයෝ දෙන්නෙක් ඉදිබුවකු ඩැගෙණ ආකාශයෙන් යන්නාහ"යි අඩගා කීහ. ඒ ඉදිබු ඒ අසා 'අපගේ යාළුවෝ අප කෙසේ ගෙණ යෙත්ව යි තොපට මේ දෙකම ඇයි දැ?"යි සිතා කියන්ට කට දල්වන දැතුරේ බරණැස් නුවර වීථිය සමීපයට ආ අවස්ථාවට ඉදුබු කවදල්වා බිම වැටී දෙකබැල්ලක්ව පැලී මළහ. නුවරවාසී "ඉබිබෙක් ආකාශයෙන් වැටී මළේය"යි එකකොලාහල කොළෝය.

රජ්ජුරුවෝ එපවත් අසා බොධිසත්ත්වයන් ඇතුළුවූ අමාත්‍යමණ්ඩලයා පිරිවරා එතන හොස් බොධිසත්වයන් අහින් "හංසයන් දෙන්නෙකු ඩැගෙණ යමින් සිටියදී හුනුයේ කුමන කාරණයකින්ද?"යි විවාළාහ.

බොධිසත්ත්වයෝ එවිට සිතන්නාහු හංසයන් දෙන්න ඩැගෙණ යමින් සිටියදී යම් කෙනෙකුන් කී බසක් නිසා වුන්ට ප්‍රතිවචන කියන්ට සිතා කව දල්වා උනුවයි සිතා රජ්ජුරුවෝ සවාමීන්ගේ බොහෝ කොට බස් කීම අරවන්ට මට උපායෙක් සම්භවිය යි සිතා කියන්නාහු "දේවයන්වහන්ස, මේ ඉදිබු තමාගේ වචනය රැකගත නොහී බස් කියා මේ අසථානයේ වැටින. එසේම යම් කෙනෙක් ජනෝත්තමවූ රජ්ජුරුවන් වහන්ස, යම්කෙනෙක් වාවාල බස් බිණු නම් උන්ටත් මෙසේම විනාශය පැමිණෙන්නේ වේදැ"යි කීහ.

එබස් රජ්ජුරුවෝ අසා "මේ කියේ මවදැ"යි කීහ. "දේවයන්වහන්ස, නුඹවහන්සේවත් සරිය"යි කීහ. එතැන් පටන් රජ්ජුරුවෝ වාවාල කම් හළ හ යි වදාරා මේ **කණ්ඩජප ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි හංසයෝ දෙන්න නම් දැගසව්වෝය, ඉදුබා නම් කෝකාලික සථවිරයෝය. රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරයෝය, අමාත්‍යව උපන්නෙම් නිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 210
## මචඡක ජාතකය

තිවද කරුණාකථවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උකටලිවූ භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්;**

එක් උකටලී භික්ෂුකෙනෙකුන් වහන්සේ දැක "මහණ තා ශාසනයෙහි උකටලිවූයේ සැබෑදැ"යි විචාරා "එසේය ස්වාමීනි" කී කල්හි "පළමුත් මහණ හෝ මේ සත්‍රිය නිසා තොපට පැමිණි වධ තොදැන අසුවූයේවේදැ?"යි වදාරා "ඒ කෙසේ දැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

පෙරටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට පුරෝහිත තනතුරෙහි සිටිනාසේක.

එසමයෙහි එක්දවසක් කෙවුලෝ දැල්දමා මත්ස්‍යයකු බදාගෙණ හුණු වැල්ලේ ලා මේ කියන මත්ස්‍යයා පුළුස්සා කම්මැයි හිනිමොලවා උල් සසිමින් සිටියාහ. එවිට මත්ස්‍යයාගේ මත්ස්‍යධෙනුව කුමක් සිතාදෝ අඩන්නෝ "මා මේ උණුවැල්ලේ ලාපු දුකකියට සසිතා උල් ආදීවූ හිනිමොලවා කරණ දුකකිය සියල්ලම මව දුක් නොවෙයි, සිතන්නේය. මාගේ මත්ස්‍යධෙනුව අනික් මසින් නක ලා කැටිව එක්ව ගියයි සිතා වික්ෂිපවේදෝ යි සිතා කියන සෝකය මට සෝකය යි සිතා එසේ විසින් මැරිය නොදී යම් පුරුෂයෙක් ඇත්නම් මා දුකින් ගලවයි කියා මහහඬින් හැඬුය. ඒ වේලාවට බොධිසත්ත්වයෝ තාන්ටය යි කියා ගඟ අසලට ගියාහු මත්ස්‍යයාගේ අඩ අසා කෙවිලන්ට කියා ඇරගෙණ මත්ස්‍යයා ගඟට හළහ යි වදාරා මේ මත්ස්‍ය ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි ඒ මසින්න හා මත්ස්‍යයා නම් උකටලීවූ භික්ෂු හා පුරාණ දූතියිකාය, බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන්වහසේ දක්වා වදාළ සේක.

---

## 211
## සෙග්ගු ජාතකය

තිවද මාගේ සවාමිදරුවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පණ්ණක නම් උපාසකයකු අරභයා මේ ජාතකය දක්වන ලදී. මෙහි වර්තමාන කථාව එකාදස නිපාතයෙහිවූ පණ්ඩිත ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. මෙහි පණ්ණක නම් උපාසකයෝ කීප දවසක් බුදුන් කරා ගොස් බුදුන් දක්නට ගියහ. සවාමීන් "ඇයි තා මෙතෙක්දා පමාවූයේ ඇයිදැ"යි විචාළසේක. "සවාමීනි මගේ දුව විමසා නිදෙස් නියාව දැන ඔබ්බකට විවාහ මඟුල් කරවා මඟුල් කෙරෙමි ඒ නිසා පමාවීමි" කීහ.

සවීඥයෝත් "තොප පළමුත් නිර්දෝෂ තැනැත්තිය විමසුයේ වේද"යි වදාරා ඒ කෙසේදැ"යි අරාධිතවූ සවීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකි.

**ඒ කෙසේද? යත්;**

යිවගිය දවස බරණැස් භූවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙතෙකුත් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ වෘක්ෂදෙවතාව ඉපිද වනයේ වාසය කරණසේක.

එක්තරා කෙළෙඹිපුත්‍රයෙක් තමාගේ දුව විශිෂ්ඨවූ රූ ඇති සඳහාත් භාවභාවලීලාකටාක්ෂයෙන් තමාව සැකළුපත් හෙයින් මේ කන්‍යාසත්‍රිය නොවේදෝ යි පරීක්ෂාකරන්ට උවමැනවැයි සිතා දුව අත අල්වාගෙණ වනාන්තරයට ගොස් කෙළෙස් වසඟව අත ඇල්ලුවා සේ ඇඟවිය. එම්ව දූ හයින්ම අඬන්ට වත. එවිට පියා මේ වක්ද්වාවෙන් අඬති සිතා "කුමක්ද? පක්ද්වකාම විෂය නම් කාටත් සරිය, එසේහෙයින් තෙපි කන්‍යාසත්‍රිය නොවුනම් අඬන්නේ ඇයිදැ"යි කීහ.

එබස් අසා "පියාතන්වහන්ස, මම එසේවූ පක්ද්වකාම රස විදිනා සැවියක අනභ්‍යාසයෙමි. අඬන්නී මම දුකඛයක් පැමිණිවේලේ ප්‍රතිෂ්ඨාව සිටිනාවූ දෙමව්පියන් විසින් පැමිණි දුකඛය කාව කියම්ද? කියා ඇඹුහ. එවිට පියාත් තමාගේ දුව නිර්දෝෂ නියාව දැන ඒ නියාවට සුදුසු මගුල්කොට ඔබ්බේ සරණ පාවා දුන්නාහ යි වදාරා මේ **සෙග්ගු ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ දූ නම් මේ දූමය, කෙළෙඹිපුත්‍රයා නම් පණ්ණක නම් උපාසකය, වෘක්ෂදෙවතාව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 212
## කූටවාණිජ ජාතකය

තවද මුළුලොවට ගුරුවූ සවීඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සොර වෙළඳුම් දන්නා උපාසකයකු අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්;**

සැවැත්නුවර වාසය කරන්නාවූ පණ්ඩිත වෙළඳුය සොර වෙළඳුය යි ව්‍යාපාරයෝ දෙදෙනෙක් පන්සියයක් ගැල්වලින් බඩු පුරාගෙණ නැගෙනඉරට බස්නාඉරට වෙළඳුම්ට ගොස් වෙළඳුම්කොට දෙවෙනි සැවැත්නුවරව අවුත් පණ්ඩිත වෙළඳු වෙළඳුම් කොට ගෙණ ආ බඩු සරියේ බෙදාගණිමිහ යි, කියා එවිට සොර වෙළඳු සිතන්නේ මෙතෙක්දු කටුක ආහාර කෑමෙන් දුකඛවූ සයන ආදීවූ දෙයෙහි සැනපී රූපාන නිදිමරා බොහෝ දුක්විඳිනා ලද. එසේ හෙයින් මිහිරිවූ භොජනය කා යානපත්වූ යහන්වල සැනපුණු කලව අජීණීවූ ආහාරය හෙයින් දිරවාගත නොහී මියන්නේය. මූ මළකල මුගේ සම්පත් ඇර

ගණිම් සිතා දවස් පසුකරන්ට වත. එපවත් පණ්ඩිත වෙළඳු දැන දසවිටක සන් කොට බඩුසරියේ බෙදාගත. පසුව දවස් ගදදුම් මල් පහන් අත් ඇතිව බුදුන් දකින්ට ගියේය.

එවිට සථීඥයෝ "ඇයිද? උපාසකය, කවරදා ඇයිදැ"යි විචාරා "සවාමීනි, මා ආයේ පසළොස් දවසකට ඇතැ"යි කියන්නා "උපාසක මෙතෙක් දවස් කළ බුදුඩාපසථානයට නායේ ඇයිදැ?"යි විචාරා එපවත් අසා එකියන වාාපාර පලමුත් වඤචාප්‍රයෝග දන්නෝ වේදැ යි වදාරා ආරාධිතවූ සථීඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්;

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජුරුවෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ රජුරුවන්ගේ අධිකරණ නායක අමාත්‍යව උපන්සේක.

එසමයෙහි පිටිසර ගමෙක වාසයකරන්නාවූ එක් වාාපාරයෙක් බරණැස් නුවර වසන්නාවූ සොර වෙළඳුම් කරණ වාාපාරයෙක් ඇත. උභ ලඟට අවුත් යපළු පන්සියයක් තිබෙන ලෙස කියා පාවාදී ගියේය. ඒ වාාපාරයත් තමා අනිප්‍රාය නියාවට වියදම් කොට මියන්ගේ මේබෙටි පළු යපළු තිබූ ගෙයි විසුරුවාලීය. කල්යාමකින් පිටිසර වෙළඳු බරණැස්නුවර වෙළඳු සමීපයට අවුත් "මා නොපට දුන් යපළු පන්සියය දෙව"යි කීය. එකියන වෙළඳු කියන්නේ "යපළු පන්සියය මියෝ කාපුය"යි කියා මේබෙටි ගෙණවුත් පැය.

එවිට පිටිසර වෙළඳු අසා 'එසේද? මියෝ යපළු කැවුදැ"යි කියා කිසි දෙයකුත් නොකියා බරණැස් නුවර වෙළඳු හා කැටිව ප්‍රිය කථාකොට උභගේ පුතා කැඳවාගෙණ ජලස්නානයට යෙම් ඇරගෙණ ගොස් අනික් ගෙයක සඟවා තිබා තුමූ ඉස්සෝධා නහා ගෙට ගියේය.

එවිට බරණැස්නුවර වාාපාරයා පිටිසර වෙළඳු අතින් "තොප හා කැටිව නැන්ට ගිය මාගේ පුතා කොයිදැ?"යි විචාළේය. එවිට කියන්නේ "තොපගේ පුතා ගොඩසිටුවලා මා නැන්ට බටදී උන් උකුස්සෙක් ගසාගෙණ ගියේය. මමත් අත්පිඬිගා බොහෝ උත්සාහකොට ඵලවාගත නුහුනුයෙමි" කීහ.

එවිට බරණැස් නුවර වෙළඳු කියන්නේ "උකුස්සෝ කුඩා කොල්ලන් ගසාගෙණ යෙද්දැ"යි කීහ. එවිට පිටිසර වෙළඳු කියන්නේ 'ඒ කියෙත් කාරණා මය. මම කුමක් කරම්දැ"යි කීහ එවිට බරණැස්නුවර වෙළඳු කියන්නේ "තෝ මාගේ දරුවන් කොයිබලේ සඟවාපියා අවුත් උකුස්සා ගසාගෙණ ගියේය"යි බොරු කියයි දැ යි කියා අධිකරණ නායකයන්ට කියම්හ යි කියා වෙළඳු බොධිසත්ත්වයන්ට කියන්නේ "සවාමීනි, මේ කියන වාාපාර මාගේ පුතා නැත්තට ය යි තමා කැටිව කැන්දාගෙණ ගොස් මේ කොයිබලේ සඟවාපියා උකුස්සා ගසාගෙණ ගියයි කියයි, මේ යුක්තිය නුඹවහන්සේ මැදහත්ව විචාළ මැනවැ"යි කීහ.

එබස් අසා බොසඹිත්තියෝ පිටිසර වෙළඳ අතින් මූ කියන්නේ ඇත්තදැ?යි විචාළහ.

"එකියන විඤ්ඤාරය කියන්නේ ඇත්තමයි; මා කියන්නකුත් අසන්නේ යහපතැ"යි කියා සවාමීනි' මාගෙන් තිබූ ඔපළු පන්සියය මියන් කැකල කුඩා කොල්ලා උකුස්සා ගසාගෙණ යෑම අරුමය කිම්ද? මාගේ ඔපළු පන්සියය මියන් කැකල නියාව සැබෑව බොරුව මටත් විචාරා කිවමැනවැ"යි කීය. එබස් අසා බොධිසත්ත්වයෝ 'එසේවීනම් මූ කළාවූ වඤ්චාවට ප්‍රතිවඤ්චාවක් කළ නියාව යහපතැ"යි කියා උදන් අහන්නාවූ "ඒ එසේමය මියන් යපළු කැකල උකුස්සා කුඩා කොල්ලා ගසාගෙණ යාමි අපූරු කිමදැ;යි එසේ හෙයින් තා කළ වඤ්චාවට ප්‍රතිවඤ්චාව කළ නියාව "යහපතැ යි" නැවත කියන්නාහු 'තොප මුන්ගෙන් තිබූ යපළු පන්සියය දීපියන්නා තොපගේ පුතා මූ පාවාදෙති" කියන්නා එවිට "යහපතැ"යි කියා "මම යපළුපන්සියය දෙමි, මාගේ පුතා පාවාදෙව"යි කියා ඒ නියාවට උන්ගේ යපළු පන්සියය උන්ට පාවාදී උන්ගේ පුතා උන්ට පාවාදුන්නා සි වදාරා මේ කුටවාණිජ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි සොර වෙළඳ නම් දැන් සොර වෙළඳුමය, එසමයෙහි පණ්ඩිත වෙළඳ නම් දැන් පණ්ඩිත වෙළඳුමය යි එසමයෙහි අධිකරණ නායකව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

---

## 213 ගරහිත ජාතකය

තවද මුළුලොවට මවු වූ සර්ව්ඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පඤ්චකාමයෙහි ඇලීමෙන් උකටලී භික්ෂු කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

ඒ කෙසේද? යත්;

එසමයෙහි එක්තරා භික්ෂුකෙනෙකුන් වහන්සේ පඤ්චකාමයෙහි ඇල්ම ඇතිව වාසයකරණ සේක.

එවත් භික්ෂූන්වහන්සේ දැන සර්ව්ඥයන් වහන්සේට ගොසින් දන්වූ සේක. සර්ව්ඥයන් වහන්සේ "සැබෑද මහණ, තා ශාසනයෙහි උකටලීවූයැ"යි විචාරා වදාරන්නා "සැබව සවාමීනි, කුමක් කියන්නා කුමක් නිසාදැ"යි විචාරා "සවාමීනි, පඤ්චකාමයෙහි ඇල්ම ඇත්තෙමි,ඒ නිසා කියන්නා "මහණ පළමුත් නිරිසන්හු, පවා පඤ්චකාමයට නින්දාකළෝ වේදැ"යි වදාරා කෙසේදැ"යි ආරාධිතවූ සර්ව්ඥයන් වහන්සේ ඉකුන්වත් දක්වා වදාළසේකි.

ඒ කෙසේද? යත්;

පසිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ වඳුරුව උපන්සේක. වඳුරුව උපන් ගමනේ බොධිසත්ත්වයන් වහන්සේ එක් වැද්දෙක් වඩාගෙණ ගොස්

බරණැස් නුවර රජ්ජුරුවන් වහන්සේට දින. රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන් වහන්සේ ක්‍රීඩාවාරකොට සලස්වාගත්තාහ. බොධිසත්ත්වයන් වහන්සේත් මනුෂ්‍යයන්ගේ සත්ගුණය ඉගෙණගෙණ ව්‍යවසිතව වාසය කරන්නාහ.

රජ්ජුරුවෝත් වානරයාගේ ව්‍යවසිතකම් දැන බොධිසත්ත්වයන් අල්වා ගෙණ වැද්දවුට කියන්නා "සොඳුරා ගෙණගොස් මේ වඳුරා ඇල්ලූ වතයෙහිම ලා පියව"යි කියා යවූහ. එකියන වැදීත් කී ලෙසම හිමාලවනයට ගෙණ ගොස් අළහ. බොහෝ වඳුරෝ බොධිසත්ත්වයන් අළ පවත් අසා ගල්තලයක් පිටට එක්ව බොධිසත්ත්වයන් හා කථාකරන්නාහු "ඇයි කිමෙක්ද? මෙතෙක් දවස් කොයි ගියේදැ"යි විචාළාහ.

බොධිසත්ත්වයෝ කියන්නාහු 'එක් වැද්දෙක් මා අල්වා ගෙණ ගොස් බරණැස් රජ්ජුරුවන්ට පැළැ. රජ්ජුරුවෝත් මාගේ ගුණක්‍රියාව දැක මා මෙතනට අරවාපුව"යි කීහ. වානරයෝ එපවත් අසා විචාරන්නාහු "මනුෂ්‍යයන්ගේ ක්‍රියාව කිමෙක්දැ"යි විචාළාහ.

බොධිසත්ත්වයෝ කියන්නාහු "මා කියන්නේ කිම්දැ"යි කිප ඇවරක් කිවත් දෙවෙනිව තුන්වෙනිවත් විචාරන්නා බොධිසත්ත්වයෝ කියන්නාහු "මනුෂ්‍යයන්ගේ අනිත්‍යය, දුකඛය, අනාත්මය යි කියන තිලකුණු නොදැන මමය යන ග්‍රහණින් දවස් අරනාහු මේ මාගේ රත්රන්, අමුරන්, මේ මාගේ අඹු දරුවෝ ආදී දෙය"යි කියා ඇල්මකොට දවසරිකාහ. සත්‍රී පුරුෂ දෙපක්ෂය එක්ව දැළිරැවූළු ඇති සත්ත්වයන් පුරුෂයනැ යි කියාත් තන හා කන්විදීම් හා මේවර ආදීවූ දෙය ලා ඉන්නාවුන් සත්‍රියනැ යි කියාත් මෙසේ දෙපක්ෂයක් ඇතිවුනුන්ට විවාහ මගුල් ආදීවූ දෙයකොට සත්‍රී පුරුෂයන් එක ගෙයි වාසය කොට සත්‍රියගේ ආධිපත්‍යය ඇතිව දවස් අරණාන යි තත්වූ පරිද්දෙන් බොධිසත්ත්වයෝ කීහ.

එඛස් වානරයෝ අසා "නැසියයුත්තක් ඇසුම්හ, නොකියව මැනව නොකියව මැනවැ"යි කියා දෙකණ කණ අත වසාගෙණ නැසියයුතු බස් ඇසූ ගල් පොත්ත සථානයට ගර්ඝිත ශෛලය යි තම් තබා ඒ වනයේ නොයිද අනික් වනයකට ගියහ යි වදුරා මේ ගර්ඝිත ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි වානරාධිපතිව වඳුරුව උපන්නෙමි බුදුවූ මම්මය"යි වදාළ සේකි.

---

## 214
## ධම්මජ ජාතකය

මේවද මුළුලොවට ප්‍රියවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්තසථවිරයන් නිමිත්තයන් වහන්සේට වධයට උත්සාහ කෙරෙනි යන මේ කථාව කියා කියා උන්කලට සම්බුදුරජාණන්වහන්සේ එතනට වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු

නොවෙයි, දෙවදත්ත සථවිරයෝ පළමුත් මට වඩයට උත්සාහ කොවත් භයක් වකිතයක් පමිණකුත් උගුළුවාගත නුහුනුවෝ වේදැ''යි වදුරා ඒ කෙසේදැ''යි ආරාධිතවූ සත්ථෘයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද? යත්;

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ කාල නම් සෙනෙවිරත් කෙනෙක් ඇත්තාහ. ජනපාණී නම් මගුල්කපුවෙකුත් ඇත්තාහ. පුරණලද පාරමිතා ඇති බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිත තනතුරෙහි සිටිනාහ. නමින් ධම්මධජ පණ්ඩිතයහ.

එසමයෙහි කාල නම් සෙනෙවිරදුදු අධිකරණ විචාරන්නාහු ඇල්ලස් කා හිමියන් අහිමියන් කොට අයුක්ති කරන්නාහ.

එසමයෙහි එක් බලි අයුක්තියක් විදහත්තාවූ පුරුෂයෝ අධිකරණ යෙන් පැරද ඉසතිබූ අතින් මොරගහගෙණ යන්නාහු රාජසේවයට එන්නාවූ බොධිසත්ත්වයන් පය කඩාගණනී අඩාගෙණ ''ඇයි සවාමීනි, කාල නම් සෙනෙවි රදුන් වහන්සේ යුක්ති අයුක්තිකොට අත්ලස් කා බොහෝ අතපිඩි කරණසේක. නුඹවහන්සේ වැනි ධර්මිෂ්ඨ අමාත්‍යයෙක් ඇතිව ඉන්දදී අපගේ අත්‍යාය විවාළ කළ නපුරුදැ''යි කිහ.

බොධිසත්ත්වයෝ එපවත් අසා කරුණාපුරසරව සිතින් යාපත විවා රම්, කියා මා හා කැටිව එව''යි කියා කැඳවාගෙණ අධිකරණ ශාලාවට ගොස් යුක්තියවූ පරිදිදෙන්ම විචාරා නිමියන්ට නිමිකළහ. ඒ යුක්තිය දැනැමෙන් සෙමෙන් විවාළ නියාව දැනගත් මනුෂ්‍යයෝ බොහෝ සාධුකාරදී ගහපත යුක්තිය විවාළ නියාව යි ඝොෂා කළාහ.

රජ්ජුරුවෝ එපවත් අසා කුමන ඝොෂායෙක්දැ''යි විචාළාහ. සිරි අමාත්‍යයන් විසින් ''කාල නම් සෙනෙවිරදුන් විසින් වරදිදු කී යුක්තියක් ධම්ධ්වජ පණ්ඩිතයෝ මැදහත්ව විචාළාහ. ඊට බොහෝදෙනා විසින් කරණ ලද සාධුකාර ශබ්දය''යි කීහ.

එපවත් රජ්ජුරුවෝ අසා බොධිසත්ත්වයන් ලඟට කැඳවා ''ආචාරීනි, යුක්තියක් යහපත්ව ඇසුනැ යි යන්න ඇසුම්හ, සැබෑදැ?''යි විචාරා ''එසේය සුංමීනි'' කී කල්හි එවිට රජ්ජුරුවෝ කියන්නාහු 'ආචරීනි, අදවක් පවත් තෙපිම අධිකරණයේ ඉඳ යුක්ති විචාරව''යි කිහ. බොධිසත්ත්වයෝත් තොගි විස්සාහ. රජ්ජුරුවෝ ඊ ඊ පිටම ''අධිකරණ විචාරව''යි කී විසින් ''යහපතැ''යි ගිවිස එතැන් පටන් නිමියන් නිමිකොට අහිමියන් අහිමිකොට මැදහත්ව යුක්ති විචාරන්නාහ. බොධිසත්ත්වයෝත් යුක්ති විචාරන්ට වන්පසු කාල නම් සෙනෙවි රදුන් කත අත්ලස් නැතිව ගියේය. ඊට කාංසිව සිතන්නාහු ''යම්සේ මුන් රජ්ජුරුවන් කෙරේ බිඳුවා මරවාපියන්ට උවමැනවැ''යි සිතා රජ්ජුරුවන් කරා ගොස් කියන්නාහු ''රජ්ජුරුවන් වහන්ස, ධම්ධවජ පණ්ඩිතයෝ නුඹවහන්සේගේ රාජ්‍යය ප්‍රාර්ථනා කෙරෙති'' කීහ. ''ආචාරීණි, මට එසේ නොසිතෙ''යි

නොගිවිස්සාහ. "ඉදින් දේවයන් වහන්ස, මා කීවා නොගිවිස්නා සේක් වීනම් සෙව රාජසේවයට එන වේලාවට සිවුමැදුරු කවුළුවෙන් බලා වැඩසිටිනා සේක් උන් එන්නාවූ ප්‍රතාප දැක මා කී බස් අදහාගත මැනවැ"යි කීහ.

රජ්ජුරුවෝත් දෙවෙනි දවස් කී ලෙස ම සිවුමැදුරු කවුළුවෙන් බලා සිටියාහ. බොධිසත්ත්වයන් එක වේලාවට බොහෝදෙනා තමන්ගේ යුක්තිය අයුක්තිය කියන නිසා බොහෝදෙනා වටකොට ගත්හ. රජ්ජුරුවෝත් මහත්වූ පිරිවර ඇතිව එනතාවූ බොධිසත්ත්වයන් දැක කාල නම් සෙනෙවිරදුන්ට කියන්නාහු "මෙවිට කුමක් කරමෝදැ"යි කීහ. එවිට කාල නම් සෙනෙවිරද්දු කියන්නේ 'මරවා දම්මවා පියමෝය"යි කීහ.

රජ්ජුරුවෝත් කියන්නාහු "වැරැද්දක් පමුණුවා මිස මරන්ට බැරිය"යි කීහ. එබස් අසා සෙනෙවිරද්දු කියන්නාහු ඊට උපායෙක් ඇත. උන් විසින් කොරගත නොහැක්කාවූ මෙහෙයක් කියා ඒ මෙහෙය කොටගත නුහුනුකල මරවාපියම්හ යි කීහ. එවිට රජ්ජුරුවන් "කුමක්සේ වූ මෙහෙයක් කියමෝදැ"යි විචාරන්නා "දේවයන් වහන්ස, උයනක් කරණ කල තුන්සතර අවුරුද්ද කින් මිසක් මවාගත නොහැක්ක. එසේවූවා එක්දවසකින් උයනක් මවාපැල යි කියන්නා ඒ කොටගත නොහැක. ඒ වේලාවට මරවා දමන්නේ යහපතැ"යි කීහ. එබස් රජ්ජුරුවෝ අසා බොධිසත්ත්වයන් කැඳවා කියන්නාහු "ධම්මධජ පණ්ඩිතය, සෙව උයන් කෙළියක් කෙළනා කැමැත්තම්හ. පළමු උයන පරණව ගියේය. අපට අළුත් උයනක් කරවා පාවාදෙව. සෙව අප එන වේලාවට කරවාගත නුහුනුවෝ තොපගේ ජීවිතය හානිවෙයි" කීහ.

බොධිසත්ත්වයෝත් කාල නම් සෙනෙවිරදුන් කී නියා දෙගෙක්වතැ යි සිතා "යහපත දෙවයන් වහන්ස, පිළිවන්වීනම් කරන්නෙම් වේදැ"යි කියා ගෙව ගොස් ඉස්සෝධා නහා බත් කා ඉක්බිත්තෙහි යානපිට වික්ෂෙපයෙන් උන්නාහ. එවිට බොධිසත්ත්වයන් වහන්සේගේ ගුණානුභාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බලශෛලාසනය හුණුවිය. ශක්‍රයෝ "මාගේ සමපත් උදුරාගන්නෝ කවුරුදෝ හෝ"යි දහසක් නුවණැසින් මිනිස්ලොව බලන්නාහු බොධිසත්ත්වයන් වහන්සේ වික්ෂෙපව උන් නියාව දැක "එසේ වීනම් මා එතනට ගොස් උන්ගේ වික්ෂෙපය අරවන්ට උවමැනවැ"යි සිතා බොධිසත්ත්වයන් වහන්සේ ගෙය සමීපයේ ආකාශයෙහි සිටියාහ.

බොධිසත්ත්වයෝ "තොපි කවුරුදැ?"යි විචාරා "මම දෙදෙව්ලොව දෙවියන්ට නායකවූ ශක්‍රදෙවෙන්ද්‍රයාය"යි කියා "ඔබගේ ගුණානුභාවයෙන් ආමි. තොප විසින් වික්ෂෙපව ඉඳිනා කාරණා කියව"යි කීහ. බොධිසත්ත්වයෝ කියන්නාහු "සෙව දවස් සවාමීන් උයන් කෙළියට වඩිනාවේලාවට උයන් කරවන්ට කීසේක. උයන් තම් තුන්හතර අවුරුද්ද කින් මිස කරවාගත නොහැකි කල එක දවසකින් කෙසේ කරවම්දැ යි වික්ෂෙපව උනිමි" කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු 'මහාපුරුෂය, වික්ෂෙප නොව නදු නම් චිත්‍රලතා නම් උයන්සේ උදැසනම නිර්මිත කොවලම්. කොතන උයනක් කරවම්දැ"යි කීහ.

බොධිසත්ත්වයෝ අසවල්තෙන අපගේ රජ්ජුරුවන් වහන්සේට වෘසභ සුය, එතන උයන ඉදිකරව"යි ලකුණු කිහ. ශක්‍රයෝත් එම නියායෙන් අට ලොස්රියන් උස ඇති මහා සීමා පවුරක් වට සලස්වා ඊ ඇතුලේ අඹ දඹ ආදීවූ ඵලපල්ලවයෙන් යුක්තවූ උයනක් මවා හියේය. බොධිසත්ත්වයෝත් පෙරවරු බත් කා ඉක්බිත්තෙන් ශක්‍රයා නිර්මිත කළාවූ උයන් බලා රජ්ජුරුවන් කරා ගොස් දෙවයන් වහන්ස, උයන්කොට නිමියේය. උයන් කෙළියට වැඩිය මැන වැ"යි කිහ. රජ්ජුරුවෝත් උයනට ගොස් උයන දැක සතුටුව කාල නම් සෙනෙවිරදුන් අතින් විචාරන්නාහු අනිප්‍රාය නියාවට උයනකොට නිමියේය. "කුමක් කරමෝදැ"යි කිහ. එවිට සෙනෙවිරද්දු කියන්නාහු ධම්ද්වජ පණ්ඩිත යන් සිතු ඇසිල්ලෙහිම උයනකොට නිමවනලද, පතසක් මවාලන්ට බැරි දැ යි කියා සෙට දවස් වඩිනා වේලාවට පස්පියුමෙන් සැදූ සත්රුවන්මයවූ පොකුණක් මවන්ට මෙහෙවර වදාළ මැනවැ"යි කිහ.

රජ්ජුරුවෝත් "යහපතැ"යි බොධිසත්ත්වයන් කැඳවා "පණ්ඩියෙනි උයන වනාහි අනිප්‍රාය නියාවට කොට නිමියේය. ඒ නියාවට පස්පියුමෙන් සැදුනු සත්රුවන් පොකුණක් සවසට නිමවාලව, නොකරවූ නම් තොපගේ ජීවිතය නැත්තේවේදැ"යි කිහ.

බොධිසත්ත්වයෝත් "යහපත දෙවයන් වහන්ස, පිළිවන්වී නම් කරවන් නෙම්වේදැ"යි කිහ. එයින් පළමු පරිද්දෙන්ම දූසක් වක් ඇති සියක් තොට ඇති සත්රුවන්මයවූ රළපාන ඇති පස්පියුමෙන් සැදුනු පොකුණක් මැවීය.

බොධිසත්ත්වයෝ උදුසනක්සේ ශක්‍රයන් මැවූ පොකුණ බලා රජ්ජුරුවන් ලඟට ගොස් දෙවයන් වහන්ස, පොකුණ කොට නිමියේය. බලා වදාරන්නේ යහපතැ"යි කී සේක.

රජ්ජුරුවෝ "යහපතැ"යි පොකුණට ගොස් පොකුණ බලා සතුටුව කාල නම් සෙනෙවිරදුන් අතින් විචාරන්නාහු "සෙනෙවිරදුනි, පතසත් අනිප්‍රාය නියාවට නිමවනලද, මෙවිට කුමක් කරන්නමෝදැ"යි විචාළාහ. එවිට සෙනෙවිරද්දු කියන්නාහු උයනටත් පතසටත් සුදුසු නියායෙන් සඳිදනනමයවූ මාලිගාවක් කරවන්ට කියන්නේ යහපතැ යි කිහ. රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන් කැඳවා "පණ්ඩිතයෙනි පතසට සුදුසුකොට සඳිදනනමය ප්‍රාසාදයක්කරවු, ඒ නොකළා නම් තොපගේ ජීවිතය නැතැ"යි කිහ.

බොධිසත්ත්වයෝ "යහපතැ"යි "පිළිවන්වී නම් කරවන්නෙම් වේදැ"යි කිහ. එයින් ශක්‍රදෙවෙන්ද්‍රයෝ සඳිදනනමයින් විසිතුරු කොට මාලිගාවක් ඉදි කළාහ. බොධිසත්ත්වයෝත් ශක්‍රයන් මැවූ මාලිගාව බලා රජ්ජුරුවන් ලඟට ගොස් 'දෙවයන් වහන්ස, මාලිගාවක් කොට නිමවනලද, බලන්ට වඩින්නේ යහපතැ"යි කිහ. රජ්ජුරුවෝත් ගොසින් මාලිගාව බලා කාල නම් සෙනෙවිරදුන් අතින් විචාරන්නාහු "ඇයි ඉතින් කුමක් කරමෝදැ? යි සෙනෙවිරදුනි" කිහ. එවිට සෙනෙවිරද්දු කියන්නාහු "මාලිගාවේ පාන්තොලා මාණික්‍යාලෝකයෙන් බබලන නියායෙන් යාපත් මැණික් මවන්ට කියනනියා යහපතැ"යි කිහ.

රජ්ජුරුවෝත් බෝධිසත්ත්වයන් කැඳවා කියන්නාහු "මාලිගාවට සුදුසු කොට ප්‍රදීපාලෝකයක් නැතිව මාණික්‍යාලෝකයෙන්ම ඉදිකා නියායෙන් මැණි

කක් මව''යි කිහ. එයින් ශක්‍රයෝ නිර්මිත කළහ. බොධිසත්ත්වයෝ එයින් දැක රජ්ජුරුවන්ට ''දෙවයන් වහන්ස මැණික නිර්මිත කරණ ලදැ''යි කිහ. රජ්ජුරුවෝ ඇවිත් බලා සතුටුව ''මෙවිට කුමක් කරමෝදැ''යි කාල නම් සෙනෙවිරදුන් විචාළාහ.

කාල නම් සෙනෙවිරද්දු ''දෙවයන් වහන්ස, මුන් සිතුදෙයක්ම මෙසේ නිර්මිතවන්නේ දෙවානුභාවයෙන, එසේ හෙයින් දෙවයන් වහන්ස, දෙවියන්ටත් බැරිදෙයක්ම කියම්මය''යි කියා කියන්නාහු ''චතුරඞ්ගයෙන් යුක්ත වූ උදුම්බරපාලයකු මවන්නේ යහපතැ''යි කිහ.

රජ්ජුරුවෝ එපවත් අසා ''යහපතැයි කියා බොධිසත්ත්වයන් කැඳවා ''උයන හා පතැස හා මාළිගාව හා මැණික මැවූ නියාව යහපත, ඒ ඇමව රකුෂාවට චතුරඞ්ගයෙන් යුක්තවූ උදුම්බර පාලකයකු සලස්වාලව''යි කිහ.

බොධිසත්ත්වයන් වහන්සේ ''යහපත සවාමිනි, පිළිවන්වී නම් කරවන්නෙම් වේදැ''යි කියා ඉස්සෝධා නහා බත් කා ඉක්බිති සිතන්නාහු ''සෙස්ස නම් ශක්‍රයෝ තමන්ට පිළිවන් හෙයින් නිර්මිත කළාහ. චතුරඞ්ගයෙන් යුක්තවූ පරුෂයෙකු නිර්මිත කරන්ට දෙවියන්ට බැරිය. එසේ හෙයින් අනාථයේ අනුන් අත මියයන්නා බලා වලට ගොස් අසරණව මියයන්නේ යහපත''යි සිතා කාටවත් නාඟවා ප්‍රාසාදයෙන් බිමට බැස අලදෙරින් නික්ම වලට ගොස් ගසක්මුල වැඩහිඳ,

''ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච
නින්දා පසංසා ච සුඛං ච දුක්ඛං''

යන මේ අෂ්ටලෝකධර්මය සිහිකෙරෙමින් උන්නාහ. ඒ වේලාවට ශක්‍ර දෙවෙන්ද්‍රයෝත් එපවත් දැන වැදිපුත්‍රයකුගේ වෙශයක් ගෙණ බොධිසත්ත්වයන් ලඟට අවුත් කියන්නේ ''බ්‍රාහ්මණයානන් වහන්ස, සැපසේ ගේදොරව උන්සේක් වේද? දැන් මෙසේ උදකලාව උන්නේ වේදැ''යි විචාළාහ.

බොධිසත්ත්වයෝ කියන්නාහු ''සැබෑය වැදිපුත්‍රය, ගේදොරව උන්නේත් සැබව, උදකලා වනාන්තරයේ උන්නමෝ වේදැ''යි කියන්නා ''ඊට කාරණා කිම්දැ''යි ශක්‍රයෝ විචාළාහ. බොධිසත්ත්වයෝ රජ්ජුරුවන් තමන්ට කීදෙයක් තමන් කළ දෙයත් ඇමම කියා ''දැන් රජ්ජුරුවන් වහන්සේ චතුරඞ්ගයෙන් යුක්තවූ මිනිසකු මවන්ට කියා කියනසේක. ඒක මා තබා දෙවියන්ටත් බැරිය. එසේ හෙයින් අනාථයේ මියයන්නා බලාත් මෙසේ ඉඳ මියන්නේ යහපතැ යි උන්නෙමි'' කිහ.

එපවත් ශක්‍රයෝ අසා ''ඇයි බොධිසත්ත්වයන් වහන්ස, මා වැද්දෙකැ යි කියා උන්සේක්ද? නුඹවහන්සේ සිතූ සිතූ යම්ම දෙයක් නිර්මිත කළාවූ ශක්‍ර දෙවෙන්ද්‍රයෝ නම් මමය, එසේවූ නුඹ වහන්සේ කීවා කරන්නාවූ මාසේ එකකු ඉන්දදි නුඹ වහන්සේ විසෙෂපව ඉන්නා කාරණාකිම්දැ?යි චතුරඞ්ගයෙන්යුක්තවූ මිනිසකු මවන්ට බැරි බවත් සැබව ඊට මම උපායක් කියමි, ඒ රජ්ජුරුවන්ගේ ඡත්තපාණි නම් මඟුල් කපුවා චතුරඞ්ගයෙන් යුක්තය. ඔහු රජ්ජුරුවන්ට පා උයන්ගොවිකමට සලසා පියව''යි කිහ.

බොධිසත්ත්වයෝත් ''යහපතැ''යි පෙරලා ගෙට අවුත් ගෙයි සැතපී පසුව දවස් රජගෙට එන්නාහු අතරමගදී ඡත්තපාණි නම් කපුවා දැක කියන්

නාහු ''එම්බල ජත්තපාණිය, තොප චතුරඞ්ගයෙන් යුක්තවූ දැ''යි ඇසීය. එවිට කියන්නාහු ''මා චතුරඞ්ගයෙන් යුක්ත නියා තොපට කිවේ කවිරුදැ''යි කිහ. ''මට කිවේ ශක්‍රදෙවෙන්ද්‍රයෝය''යි කිහ. 'ශක්‍රදෙවෙන්ද්‍රයෝත් කොයිදී දුටු දැ''යි කියන්නා තමන්වහන්සේ වනයට ගිය නියාව හා සියල්ලම තත්වූ පරිද්දෙන් කිහ. එවිට ජත්තපාණිත් ''එසේමය, මම චතුරඞ්ගයෙන් යුක්තයෙමි'' කිහ.

එවිට බොධිසත්ත්වයෝත් ජත්තපාණින්ගේ අත අල්වාගෙණ රජගෙට ගෙණගොස් 'දෙවයන්වහන්ස, මූ චතුරඞ්ගයෙන් යුක්තයහ. මුන් උයන්ගොවි කමට සලස්වා වදුරන්නේ යහහතැයි''යි කිහ. රජ්ජුරුවෝත් ''සැබෑද ජත්ත පාණිය තෝ චතුරඞ්ගයෙන් යුක්තදැ''යි විචාළාහ.

''එසේය, දෙවියන් වහන්ස, මම චතුරඞ්ගයෙන් යුක්තයෙමි' කිහ. ''තොපගේ චතුරඞ්ගයන් යුක්ත පරිදි කියවයි' කියන්නා ජත්තපාණි කියන් නාහු ''දෙවයන්වහන්ස, අනුන්කෙරේ වෛරයක් වෙෂයක් නොකිරීමය, මද්‍ය පාන නොකිරීමය. අවිඤ්ඤණක සවිඤ්ඤණක සියල්ලන් කෙරෙහි ඇල්ම නොකිරීමය, මෛත්‍රී භාවනා කිරීමය යි යන මේ මාගේ චතුරඞ්ගය''යි කිහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු ''සියල්ලෝම යම් යම් දේසට උනුන් කෙරේ වෛරවන්නාහ, තොප එසේ වෛර නොකරන්ව කවර අරමුණක් නිසා දැ''යි විචාළාහ. ජත්තපාණි තම් මගුල් කපුවා කියන්නේ ''මම පෙර රජව ඉපිද බිසවුන්ගේ බස් අසා පුරෝහිත බමුණා බන්ධනයට පැමිණවීමි. එතැන් පටන් මා වෙෂය හළේය''යි කිහ.

**ඒ කෙසේද? යත්;**

එක් සමයෙක මම මේ රට බ්‍රහ්මදත්ත නම් රජව ඉපිද එක් ගමනක් යන් නෙම් බිසවුන් සැප පහසු විචාරා සුසැවවරක් මෙහෙකරන්නන් යවීමි. උන් ඇමලා කැටුවම බිසවුන් අතාචාරයේ යෙදී අන්තයෙහි පුරෝහිත බමුණා අත අල්ලාපු විසින් මම එසේවූ දෙයක් නොකරමි කියා පලාගියහ. බිසව් ඔහු කෙරේ වෛර බැඳගෙණ මට බමුණා වරදින්ව උතයි කිහ. රජ්ජුරුවෝත් ඒ ඇත්තය''යි කියා අදහාගෙණ බ්‍රාහ්මණයා පිටිතලහයා බැඳ ලඟටගෙන්ව ගත්තාහ. එවිට බ්‍රාහ්මණ ''දෙවයන් වහන්ස, මම එසේවූ නොකට යුත්තක් නොකෙළෙමි. මේ නොකටයුතු කළෝ මේවර ඇසූ මනුෂ්‍යයෝ සැමදෙනා ය''යි කිහ.

රජ්ජුරුවෝත් තත්වූ පරිද්දෙන් නියම දැන බිසවුන් කෙරේ කිපුනාහ. පුරෝහිත බමුණාත් ''දෙවයන් වහන්ස, දේවීන්වහන්සේට නොකිපුන මැනව. සත්‍රීන්ව තිබි ආ සවහායෙක, යම්සේ තමාගේ ඇඟින් වැගිරෙන්නාවූ පිළිකුල් ආදීවූ දෙයට යම්සේ කැත නොවෙත් නම් තමාගේ මලමූත්‍ර ආදීවූ දෙයට ඇයි මා විසින් යහපත්වූ අන්නපානය කන බොන ලද දැයි මේ අසුචි භාවයට පැමිණියේ ඇයිදැ යි නොකිපෙත් නම් එම ස්ත්‍රීන් විෂයෙහි එමෙන් තොප නොකිපුන මැනවැ' යි කිහ. එබස් ඇසූ මමත් ඒ ජාතියෙහි බමුණාතන් කී බස් අදහා ගෙණ මේ ජාතියේ පටන් නිවන් දකිනා ජාති දක්වා කවුරුන් කෙරේත් කෝප යක් නොකරමි, අධිෂ්ඨාන කෙළෙමියි ඒ නිසා මම මේ ජාතියෙහි කා කෙරෙහිත් වෛෂයක් නැත්තෙමි කිහ,

එබස් රජ්ජුරුවෝ අසා ඒවන්නා ඒ සඳහාය. මද්‍යපාන නොකරන්නේ කුමන කාරණයක් නිසාදැ''යි විචාළාහ. එවිට ඡත්තපාණි නම් කපුවා කියන්නේ ''පෙර මම රජව ඉපද ප්‍රිය පුත්‍ර මාංශය රා මදයෙන් කෑමි, එවක් පටන් මා රා පෙවිලි අළේය''යි කිහ.

**ඒ කෙසේද? යත්;**

පෙර මම මේ රටම ඡත්තපාණි නම් රජව ඉපිද මවිඡමාංශ ඇතිව මිසක් බත් නොකන්නා, ඒ රජ්ජුරුවන්ට එක් දවසක් අරක්කැමියා ''සෙට දවස් පෝදු පණිවාකම් කරන්ට බැරිය''යි කියා පළමුවෙනිදාම මස් ඇර තබාගත, එම මස් බල්ලා කාපුවාහ. එවිට අරක්කැමියා රජ්ජුරුවන්ට බත් වඩන්ට භයින් බිසවුන් වහන්සේට කියන්නේ ''දේවීන්වහන්ස, රජ්ජුරුවන් වහන්සේව මේ නිමවන්ට තුබූ මස් බල්ලා කාපුව, රජ්ජුරුවන්වහන්සේ මස් ඇතිව මිසක් මේ නොනිමවන සේක. එසේ විසින් නිසම් බත් අතලන්ට බම්'' කිහ.

එවිට බිසව් කියන්නාහු ''තොපි ඊට නොබව, ඊට උපායක් ඇත. රජ්ජුරුවෝ මාගේ පුතනුවන් කෙරේ බලවත්වූ ස්නෙහ ඇත්තාහ. එසේ හෙයින් මම බත්කන වේලාව බලා මගේ පුත්නුවන් සරහාලා ඔක්කේ තබාලම්. රජ්ජුරුවෝ පුතනුවන් සතනා උන්නාහු දඩමස් ලුවෝ නුලුවෝ නොදැන බත්කන්නා හ''යි කිහ.

අරක්කැමියා ''යහපතැ''යි කියා ගියේය. රජ්ජුරුවෝත් රා බී මත්ව පියා බත්කන්ට උන්නාහ. බිසවුන් රාජකුමාරයන් ඔක්කේ ඉන්දවූහ. එවිට රජ්ජුරුවෝත් බත්කමින් සිට දඩමස් නොදැක 'ඇයි කොල දඩමස් නැත්තේ ඇයිදැ''යි විචාරා ''සවාමීනි අද දවස් පෝය නිසා ඊයේ මස් අරන් තිබීම්. ඒමස් බල්ලෝ කැවාහ. අද පෝය බැවින් වීපියේ මස් නොලද්දෙම්'' කිහ. රජ්ජුරුවෝ තොපට මස් සාය පමණක් මිසක් මවත් මස් සායදැ''යි ඔක්කේ උන් රාජකුමාරයන්ගේ බොටුව මිරිකා 'මේ මස් ගෙණ පිසපියා ගෙණෙව''යි කිහ.

අරක්කැමියාත් ඊට උත්තර නොකියා ''යහපත රජ්ජුරුවන්වහන්සැ''යි කියා ගොස් මාළු පිස මේ වැනිය. රජ්ජුරුවෝ ප්‍රියපුත්‍රමාංශය කැවාහ. එතන සිටියාවූ බොහෝ දෙන රජ්ජුරුවන් කෙරේ භයින් අඩන්නක්වත් නොකටයුතුය සි යන බසක්වත් කියන්ට අසමර්ථවූහ. රජ්ජුරුවෝත් බත් කා අත කට සෝධා වැදහෙව නිදා පිබිදුනාහ. එවේලාව රා මදය සිදින එවිට රජ්ජුරුවෝ ''මාගේ පුතනුවත් මෙසේ ගෙණෙව''යි කිහ.

එවිට බිසව් රජ්ජුරුවන්ගේ පාමුල අඩාහුන, එවිට රජ්ජුරුවෝ ''මේ කිමෙක්ද''යි විචාරා ''ඇයි සවාමීනි, නුඹවහන්සේ දවල් මේ නිමවූයේ ප්‍රිය පුත්‍ර මාංශය නොවේදැ''යි කිහ. එවිටම ''රා පෙව්ල්ලේ දෙෂයෙන් වේද? ප්‍රිය මාංශය කෑයේය''යි කියා බොහෝ විලෙපයට පැමිණ ''මේ ජාතියෙහි පවන් නිවන් දකිනා ජාති දක්වා රා නොබොම් යි කළ අධිෂ්ඨාන බලයෙන් දැනුත් මා රා බොන්නේ නැතැ''යි කිහ.

ඒ අසා රජ්ජුරුවෝ ''ඒ වන්නාට ඒ සඳහාය, කා කෙරෙන් තොප අල්මක් නැත්තේ කවර කාරණයක් නිසාදැ''යි විචාළාහ.

එවිට ඡත්තපාණි නම් කපුවා කියන්නේ "පසේබුදුන්ගේ පාත්‍රය බිඳ අවීචි මහනරකයෙහි වැටුනාවූ කෙනෙකුන්ට පිය රජව සිටි මම බොහෝ දුක් වුනෙමි. එසේ විසින් එවක් පටන් මේ දක්වා එක්කෙනෙකුත් කෙරෙහි ඇල්මක්නො කරන්නේ ඒ කාරණයනැ"යි කිහ.

**ඒ කෙසේද? යත්;**

යටගිය දවස මෙම නුවර කිතවාස නම් රජව උපන්මි, ඒ රජ්ජුරුවන්ට එක් පුත්‍රයෙක් උපත නිවිති දන්නා බ්‍රාහ්මණයෝ "දෙවයන්වහන්ස, මේ රාජ කුමාරයෝ යම් දවසක මියයන්නේ පැන් නොලැබය"යි කිහ. රජ්ජුරුවෝ ඒ අසා සතරවාසල මහාවැව් සතරක් බන්දා, ඇතුළු නුවර ඒ ඒ තැන බොහෝ පතැස් පොකුණු බිඳුවා අම්බලන් නන්වා ඒ ඒ තැන පැන් තබ්බවා මේ නියා යෙන් දවස් අරණාහ.

රාජකුමාරයෝත් වැඩී යුවරජ තනතුරු ලැබ දුෂ්ට රාජකුමාරයෝ යි යන නමින් ප්‍රසිද්ධවූවාහ. රජ්ජුරුවෝත් තමන්ගේ අඹුදරුවන් ඕයාව මෙන් කැටුවම යන යම් තැනකට කැඳවාගෙණ යන්නාහ. එක් දවසක දුෂ්ට රාජකුමාරයෝ තනිව පියානත් කැටිව එක් නොවී ඇන්කඳ පිටට නැගී චතුරංගිණී සේනාව පිරිවරා නුවර ඇවිදින්ට වන්නාහ. ඒ වේලාවට සිල්වත් ගුණවත් දැමුනාවූ ඉඳුරන් ඇති එක් පසේබුදු කෙනෙකුත් වහන්සේ බත්පාත්‍රයක් සිඟා ගෙණ වීථියේ වඩිමින් සිටිසේක. ඒ වේලේ රජ්ජුරුවන්ලා කැටිව එන්නාවූ බොහෝ පෂීන් පසේබුදුන් වදින්ට හා ගුණ කියන්ට වන්නාහ. එවිට යුවරජ් ජුරුවෝ "මා බැනි රාජ කුමාරයෙක් දැක්කදී මේ හිස මුඩු හිඤ්ඡුන් දකින්ට වන් නාහ"යි පසේ බුදුන්ට කිපී ඇතුපිටින් බැස පසේබුදුන්කරා ගොස් පාත්‍රයටබත් ලද්දේ ඇද්දැ"යි විචාරා "එසේය කුමාරයෙනි, වදුරන්නා "එවිට යාපත පාත්‍රය බලම්ම"යි පාත්‍රය අතට ගෙණ බිම එලා පයින් මිරිකා සුණු විසුණු කළාහ.

පසේබුදුහු "නිකන් නිෂ්කාරණයේ මේ මාගේ පාත්‍රය බිඳ බොහෝ අකුසල් පුරාගතැ'යි මූණ බැලූහ. ඒ කුමාර තමන් කෙරේ උරණින් මූණ බැලූවයි සිතා "කිතවාස නම් රජ්ජුරුවන්ගේ පුත්වූ දුෂ්ට කුමාරයෝ නම් මම, නුඹ වහන්සේ මට උරණව කරන්නේ කිම්දැ"යි කිහ. පසේබුදුරජානන් වහන්සේ සුන්බත්ව උත්තරපථවූ නන්දමූලපබ්භාරයට වැඩිසේක.

ඒ වේලාවට අවීචිමහා නරකයෙන් ගිනිදැල් ඇවිත් රාජකුමාරයන්ගේ ඇඟ වැදගත, රාජකුමාරයෝත් බොහෝ දුකට පැමිණ පැන් පිපාසයෙන් "පැන්ගෙණෙව"යි කිහ, ඒ වේලාවට ඒ ඒ තැන තිබූ වැව් පොකුණු පතැස් ආදීවූ තැන තිබූ පැන් එකෙණෙහිම හිඳිගියේය. පොළොව පලාගෙණ රාජ කුමාරයන් අවීචිමහ නරකයට අරගණගියේය. කිතවාස නම් රජව උපන්නාවූ මම බොහෝ විඤ්ඤපයට පැමිණ සිතන්නේ "යමකට ඇල්ම කිරීමෙන් පව්ද විඤ්ඤපයද උපදනේය. එසේ විසින් මේ ජාතියෙහි පවන් නිවන් දකිනා ජාති දක්වා කිසිම වසතුවක ඇල්ම නොකෙරෙමි" කියා අධිෂ්ඨාන කෙළෙමි. එසේ නිසා මේ ජාතියෙහි කිසිදෙයකත් ඇල්ම නොකෙරෙමි" කිහ.

එබස් රජ්ජුරුවෝ අසා "ඒ වන්නා එසේය, සියලු සත්ත්වයන් කෙරේ මෛත්‍රී කරන්නේ කවර කාරණයකින් දැ"යි කිහ. ඒ කාරණය කියන්නාවූ ඡත්තපාණි නම් කපුවා "පෙර තාපසව ඉපද කළාවූ මෛත්‍රීභාවනාගෙණ අභ්‍යාස යෙන් මේ ජාතියේ මෛත්‍රිය ඇත්තේය"යි කිහ.

**ඒ කෙසේද? යත්;**

"පෙර මෙම නුවර අරක තම් තාපසව ඉපද මෛත්‍රී භාවනාකොට බඹලොව ඉපද සංවනී විවනී ආදීවූ සත්කපක් මෛත්‍රී භාවනා කොට බඹලොව ඉපද ඒ අභ්‍යාසයෙන් දැනුත් මා මෛත්‍රී ආනුභා ඇත්තේය යි කීහ.

එබස් රජ්ජුරුවෝ අසා කිසිම අපරාධයක් නැති ධර්මධවජ පණ්ඩිතයන් කෙරේ මේ කාල නම් සෙනෙවිරද්දු අන්‍යායෙන් කන අත්ලස් නිසා උන් මා කෙරේ කනස්සළුය යි සිතා සෙනෙවිරදුන් කෙරේ කෝපව අමාත්‍යයන් මූණ බැලූහ. අමාත්‍යයෝ රජ්ජුරුවන් අභිප්‍රාය දැන දුෂ්ටවූ අත්ලස් සොර තා කන අත්ලස් තිබිනියේය"යි කියා නිරපරාධ ධර්මධවජ පණ්ඩිතයන් නසන්ට උන්සාහකළ නියාවදැ"යි ඇමදෙනම් උනස්තෙන් කැගසිව කාල නම් සෙනෙවිරදුන් ඇද බිමහෙලාගෙණ බොහෝදෙන තමා අතව සම්භවූ කැට මුගුරු ආදීවූ දෙයින් තලා අල්වාගෙණ නුවරින් පිටත කසලගොඩට ඇදපුව යි වදාරා මේ ධර්මධවජ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි කාල නම් සෙනෙවිරද්දු දෙවදත්තසථවිරයෝය, ධර්මධවජ පණ්ඩිතව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේකි.

## 215
## කාසාව ජාතකය

**ත්**වද මුළුලොවට පිහිටවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්තසථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද. මේ කථා උත්පත්තිය වේළුවනාරාමයෙහි දීය.

**ඒ කෙසේද? යත්;**

එක් සමයෙක්හි සැරියුත් සාමීන් වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි ඒ ගම උපාසකවරු සැරියුත් සාමින්වත් දෙවදත්තසථවිරයන්වත් එක් දන යක් දෙන්ට යන්නාහ.

එසමයෙහි එක් ව්‍යාපාරයෙක් ලක්ෂයක්වටිනා සළුවක් උපාසකවරුන්ටදී "මාත් මේ දානයට මුසුවන්ට උවමැතැවැ"යි සිතා මුසුවිය. එකියන උපාසකවරු දන්දී අන්තයෙහි "මේ ලක්ෂයක් වටිනා සළුව සැරියුත් සාමින්ට දෙමෝද? දෙවදත්තසථවිරයන් වහන්සේට දෙමෝදෝ"හෝ යි කියා කථා කළාහ. ඉන් සමහරු "සැරියුත් සාමින්ට දෙම්හ"යි කීහ. සමහරු "සැරියුත් සාමින් තම් දවසක් දෙවසක් රඳලා වැඩපියන සේක. අපගේ දුකෙහි සුවෙහි නෙබැඳෙන සේක. දෙවදත්තසථවිරයන් වහන්සේ වන්නා මේ ගමේම නිධානයක් සේ වැඩහිඳ අපගේ දුකෙහි සුවහි බැඳෙනාසේක. එසේහෙයින් ඔබවහන්සේට දෙම්මැ"යි කියා උන්වහන්සේට පිළිගැන්වූහ. දෙවදත්තසථවිරයන් වහන්සේ දවල් ඉරා යහපත්ව ගෙත්තම් කොට කිනිහිරි මල්පෙත්තත් මෙන් යහපත්කොට රඳා සිවුර පොරවාගත්සේක.

වේළුවනාරාමයෙහි සිටි වහන්දැ හිස්දෙතෙකුන් වහන්සේ ජේතවනාරාමයට වැඩ සම්බුදුරජාණන් දැක "සවාමීනි, දෙවදත්තසථවිරයෝ තමන්ව නුසුදුසුවූ රහතුන්ව සුදුසුවූ සිවුරක් පෙරෙවියෝ වේදැ"යි කීසේක. සම්බුදුරජාණෝ එපවත් අසා

"මහණෙනි, දැන් මතු නොවෙයි. දෙවදත්තසථවිරයෝ තමන්ට නුසුදුසුවූ අහිත්ධවජය පෙරෙවියෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉතුත්වත් දක්වා වදාළ සේකි.

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ අසූදහසක් ඇතුන්ට නායකව ඇත් රජව ඉපද ඇත්සමූහයා පිරිවරා ඒ ඒ තැන ඇවිදිනාහ.

ඒ සමයෙහි එක්තරා දුකබිත මනුෂ්‍යයෙක් දළකඩ ලියා ජීවත්වන්නාවූ මනුෂ්‍යයන් ඉන්නා වීථියට ගොස් කියන්නේ 'තොප ඇමට දළකඩ සම්භව නම් යහපතැ''යි විචාළේය. එවිට දළකඩ කම්මාන්ත කරන්නාවූ මනුෂ්‍යයෝ කියන්නාහු "දළකඩ සම්භව නම් ඉතා යහපතැ'යි කීහ, එවිට ඒ පුරුෂයාත් නිකත් ගියෙම් නම් ඇත්තු මා මරති, පසේබුදු විලාශයෙන් යෙම්, සිතා මනාවූ කාසායවස්ත්‍රයක් ඇඳ පෙරව තෙබක් කාසායවස්ත්‍රය ඇට සඟවාගෙණ බොධිසත්ත්වයන් ආදිවූ ඇතුන් වසන්නාවූ වනාන්තරයට ගොස් ඇතුන් යන්නාවූ මාවත වැද සිටියේය. ඇත්තු මොහු දැක පසේබුදුකෙනෙකුය යි සිතා ආදර කොට ගියාහ. ඒ වැදි ඇමට පස්සෙන් යන්නාවූ ඇතා බලා තෙබ දමාලා ඇතු මරා දළ ගෙණ ගොස් විකුණයි, මේ නියායෙන් දවස්පතා ඇතුන් මැරීමෙන් බොධිසත්ත්වයන්ගේ ඇත්තු කල්යාමකින් අඩාපුවාහ. එපවත් දත්තාවූ ඇත්තු බොධිසත්ත්වයන් ලඟට ගොස් එපවත් කීහ, බොධිසත්ත්වයෝ එසේවීනම් පසේබුදු විලාසය ඇරගෙණ සිටිනා තැනැත්තාවුන් ඇතුන් මරණ වැද්දකු නියා වේදැ යි සිතා ඒ මා පරීක්ෂාකරන්ට උවමැනවැ යි සිතා පසුව දවස් ඇතුන් සැම වම පස්සේ එන්ට වන්නාහ, එදවසුත් එකියන පසේබුදු විලාසය ගත්තාවූ වැදි බොධිසත්ත්වයන් දැක තමාගේ තෙබ දැමීය, ඌ තුමූ තෙබ බලා වැද්ද මරම් අත බිම ගසා දිවගෙණ අවුත් සිතන්නාහු 'මූ කුමක් වේවා කාසායවස්ත්‍රය ඇඳ ගෙණ සිටියේය. එසේ හෙයින් මූ මරන්ට නොයෙදෙව'යි සිතා කියන්නාහු "තොපසේවූ පාපිෂ්ඨයන්ට මෙබදු අහිත්ධවජයවූ කාසායවස්ත්‍රය නොහොබියි. තා විසින් මෙතන වැදහිඳ මාගේ ඇතුන් නසන්ට කාරණා නොවෙයි, ඉදින් බොහෝ දවසක් තා දිටිමිනම් දන්නෙමි වේදැ"යි කියා භයගන්වා යවිහයි වදාරා මේ කාසාවජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි වැදි නම් මේ දෙවදත්තසථවිරයෝය, ඇත්සමූහයාට නායකව උපන්නාවූ ඇත්රජ නම් බුදුවූ මම්මය'යි වදාළසේකි.

---

## 216
## චුල්ලනන්ද ජාතකය

තිවද මුළුලොවට ආධාරවූ සම්බුදුන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තසථවිරයන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වාලද.

ඒ කෙසේද? යත්;

එක් දවසක් ධර්මසභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ දෙව දත්තසථවිරයෝ සම්බුදුන්වහන්සේට දුනුවායම් මෙහෙයීම් ආදීවූ බුදුන්

තසන්ට බොහෝ උත්සාහ කළාහ. සම්බුදුන්ගේ සීල සමාධි කරුණා ආදී බොහෝවූ ගුණ දැක දැකත් බුදුන්කෙරේ දයාවක් කරුණාවක් නූපත. එසේවී නම් දෙවදත්තසථවිරයෝ මහාතදයෝය යි යන කථාව කිය කියා උන් තෙතට සම්බුදුන් වහන්සේ වැඩවදුරා 'මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදුරා එපවත් අසා ''මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් දෙවදත්තසථවිරයෝ තදයෝමවේදැ''යි වදුරා ''ඒ කෙසේ දැ?''යි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදුළසේක.

**ඒ කෙසේද? යත්;**

කිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ හිමාලය වනයෙහි අසූදහස් වානරයින්ට නායකව හඳු නම් වානරාධිපතිව දවස් අරණාහ.

බොධිසත්ත්වයන්ගේ මල්වූ චුල්ලනන්ද නම් වානරයකුත් ඇත්තාහ. මේ කියන දෙබෑයෝ අඹවූ මැනියන් රකිනාහ. බොධිසත්ත්වයෝත් වානරයන් සමග ඵලාඵල සෙවා කන්නාහු ඵලාඵල තමනුත් කා වදුරන් අත ඵලාඵල මාගේ මැනියන් වහන්සේට දෙව'යි කියා එවන්නාහ. ඒ ගෙණගියාවූ වදුරෝ තමනුත් කා බොධිසත්ත්වයන් වහන්සේගේ මැනියන්ට නොදෙන්නාහ. බොධිසත්ත්වයන් වහන්සේගේ මැනියෝ ඵලාඵල නොලැබ ඉතා දුර්ලභභාවයට පැමිණියාහ. බොධිසත්ත්වයෝ දවසක් මැනියන්ට කියන්නාහු ''ඇයි මාගෙන් යවන්නාවූ ඵලාඵල ඇත්තවූව දුර්ලභවන්ට කාරණා කිම්ද?''යි කිහ. බොධිසත්ත්වයන්ගේ මැනියෝ කියන්නාහු ''පුත, තොප එවන පමණක් මිසක් මට නොදෙන්නාහ''යි කිහ. එබස් බොධිසත්ත්වයෝ අසා ''මම මේ වදුරන්ට රාජ්‍යය කරන්නෙන් මාගේ ''මැනියන් වහන්සේ රැකගන්ට නොපිළිවනැ''යි සිතා තමාගේ බාල මලනුවන්ට කියන්නාහු ''මල තොප විසින් වදුරුමුලට රාජ්‍යය කොට වාසය කරව, මම මාගේ මැනියන් වහන්සේ රකිමි' කීහ. ඒ අසා බොධිසත්ත්වයන්ගේ මලනුවෝ කියන්නාහු ''මටත් වානරයන්ට රාජ්‍යය කරන්ට බැරිය. මමත් මාගේ මැනියන් වහන්සේ රකිමි'' බොධිසත්ත්වයන් හා දෙන්නම මැනියන්ද අරගෙණ බරණැස් නුවර අවුත් බරණැස් නුවරට කෙළවර මහත්වූ නුගගසක වාසය කරන්නාහ.

එසමයෙහි එක්තරා මනුෂ්‍යයෙක් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් ලඟ අකුරු කරන්ට වන. දිසාපාමොක් ආචාරී ''මේ ඒ කාල පුරුෂයාය, මුව ශාස්ත්‍ර උගන්නා කිම්ද''යි සිතා නැවතත් ''මුගේ උත්සාහ බලවත, කුමක්වේවා; අකුරු කරවමි' සිතා ඔහුව බොහෝ ශාස්ත්‍ර උගත්වා යවන්නාහු යම්සේ 'තොපි සාහසික ක්‍රියාවක් එක්කෙනෙකුන්ට හිංසාවක්වත් නොකර ව''යි කියා අවවාද කියා යවූහ. එකී පුරුෂයාත් ''යහපතැ''යි ගිවිස බරණැස් නුවර කරා ගොස් දුනුගත් අත් ඇතිව දඩයම් කොට මස්මරා විකුට ජීවත් වන්නේ එක්දවසක් කිසිම දඩයමක් සම්භනොවී ගෙට යන තැනැත්තේ නුවර කෙළවර මහත් නුගගසක් දැක 'මේ ගස යම් ඇත්තෙක් ඇද්දෝහෝ''යි ගස මුලට ගොස් උඩබැලිය. ඒ වෙලාවට බොධිසත්ත්වයන් මැනියන් ඉදිරියේ ඉදුවා

ගෙණ බොධිසත්ත්වයන් හා බොධිසත්ත්වයන්ගේ මලනුවෝ පස්සේ උන්නාහු දුනුගත් අත්ඇති වැද්දහු දැක බොධිසත්ත්වයෝ සිතන්නාහු මාගේ මැනියන් වහන්සේ මැලී විසින් හා කය දුර්බල විසින් හා නොමරන්නාහ යි සිතූහ.

වැදිත් එකියන මැහැලිවැදිරිය දැක සිතන්නේ "මාගේ ගෙයි කොල්ලෝ වත් කාපියව" යි සිතා විදින්ට දුන්න නගාගත, ඒ දැක බොධිසත්ත්වයෝ සිතන්නාහු "මේ වැදි මාගේ මැනියන් විදින්ට උත්සාහ කෙරෙති. එසේ හෙයින් මාගේ මැනියන් වහන්සේට මාගේ ජීවිතය දෙන්ව උවමැනැවැ" යි සිතා මලනුවන්ට කියන්නාහු "මම මාගේ මැනියන් වහන්සේට ජීවිතය පරිත්‍යාගය දෙමි. තොපි මාගේ මැනියන් වහන්සේ රකුව" යි කියා වැද්දහුගේ දුනුපසට අවුත් කියන්නාහු "මාගේ මැනියන් වහන්සේව ජීවිතදානය දී මා මරා මස් කව" යි කීහ. "යහපත තොපගේ මැනියන් වහන්සේට ජීවිතදානය දෙමි" කියා බොධිසත්ත්වයන් විද මරා ළඟාගත. තවත් මැනියන්ව මරන්ට දුන්න ඇදගත. එවිට බොධිසත්ත්වයන්ගේ මලනුවෝ "මේ වැදි මාගේ මැනියන් මරන්ට උත්සාහ කෙරෙයි, එසේහෙයින් පළමුකොට මම මැනියන් වහන්සේට ජීවිතදානය දෙමි. එක දවසක් වී නමුත් රැකෙනසේක් වේදැ" යි සිතා වැද්දහුගේ දුනුපසට අවුත් කියන්නාහු "මාගේ බැයන් වහන්සේත් මරාපුව, මාත් මරාගණුව, අප දෙන්නාගේ මස් අදට තොපට ජීවත්වෙන්ට ඇත, මැනියන් වහන්සේට ජීවිතදානය දෙව" යි කීහ.

වැදිත් "යහපතැ" යි කියා බොධිසත්ත්වයන්ගේ මලනුවන් විද මරා ඉක්බිත්තෙහි මාගේගෙයි කොල්ලෝවත් කාපියති සිතා බොධිසත්ත්වයන්ගේ මව් වැදිරිත් විද මරා ළඟාගෙණ තුන්දෙනම කදබැඳගෙණ නික්මින. ඒ වේලාවට උගේ ගෙට හෙතක් ගසා දරුවන් දෙන්නත් මැනියනුත් මැරිණ. තමන් ඒ අසා අතතුබූ දුනුදඹු දමා දඩමස් කදත් දමා කඩඉරා කරලාගෙණ ගෙට ගොස් ගෙයි තුබූ දැගිය කනුවක් ඉස වැටින, ඒ වේලාවට පොළවත් වීවරවී අවීචිමහ නරකයෙන් ගිනිදැල් ඇවිත් ඇඟ ඉසවසාගත. එවිට නරකයට යමින් සිට කියන්නේ "යම්සේ මාගේ දිසාපාමොක් ආචාරීන් වහන්සේ විසින් කා කෙරේවත් වෙෂයක් නොකරව" යි කියනලද අවවාදයේ විපාක අදම ලදිමි. ඒ එසේමය, යම්සේ කල්‍යාණ ධර්මයක් කළ කෙනෙක් ඇත්නම් කල්‍යාණධර්මය දකිති, යම් අකුශලයක් කළ කෙනෙක් ඇත්නම් අකුශලයක්ම දකිති. ඒ එසේමය, තමා වපුලාවූ බිජුවටින් නැගෙන්නාවූ ඵලයත් එසේමවේදැ යි යනාදීන් කියා ගොසින් අවීචිමහනරකයෙහි වැටුනාහ යි වදාරා මේ චුල්ලනන්දා ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි එකියන වැදිනම් දෙවදත්තසථවිරයෝය, දිසාපාමොක් ආචාරී නම් ශාරිපුත්‍රසථවිරය, එසමයෙහි බොධිසත්ත්වයන්ගේ මව්වැදිරි නම් ප්‍රජාපතී ගොතමීසථවිරාවන් වහන්සේය, බොධිසත්ත්වයන්ගේ මල්වූ චුල්ලනන්දා වදුරු නම් ආනන්දසථවිරයෝය, එසමයෙහි වදුරන්ට රජව උපන්නාවූ වානර රජ නම් බුදුවූ මම්මය" යි නමන් වහන්සේ දක්වා වදාළසේකි.

## 217
## පුටහත්ත ජාතකය

මේ ද මුළුලොවට කල්‍යාණමිත්‍ර වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කෙළෙඹි පුත්‍රයකු නිසා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේද? යත්,

එක්තරා කෙළෙඹිපුත්‍රයෙක් පසල්ගම්වාසි එක්තරා මනුෂ්‍යයකුට නයක් දී පෙරලා ඒ ණය ඵලවන්වය යි සැවැත්නුවර සිට පසල්ගමට තමන්ගේ නය නොදෙන හෙයින් ඒ නය ඉල්වා ආ කෙළෙඹිපුත්‍රයා හා ඔහුගේ බිරිඳ නය දරන්නන් හා කැටිව දබර කොටගෙණ දෙමහල්ලන් බත්කන්ට කියද්දී බතුත් නොකා නික්මුණාහ.

අතරමග යනකලට එක්තරා මනුෂ්‍යයෙක් දෙමහල්ලන්ගේ මුහුණ වැහැරී තිබූ හෙයින් බත්මුල පුරුෂයා අතට දුන්නාහ.

ඒ පුරුෂයාත් ඒ බත් ස්ත්‍රීට නොදී කනුකැමතිව භයස්‍ථානයට කියන්නේ 'මේ වල සොරු ඇත. එසේහෙයින් තෙපි ඉදිරියේ යව'යි කියන්නා ඒ ස්ත්‍රීත් ඇත්තකැ යි සිතා ඉදිරියෙන් නික්මුණාහ.

එවිට ඒ පුරුෂයා බත්මුල උතා බත් කා පියා ස්ත්‍රියට කියන්නේ එම්බල තුමූ ඇම බත්කාපියා තුබූ සිස්මුලස අපව දුන්නේය'යි කිවුය. ඒ අයා ස්ත්‍රිය ''මා දැක්කදී දුන් බත්මුල මට නොදී තෙමේම කා දැන් මට සිස් බත්මුල පැය''යි විශේෂව දෙන්නම එක්ව සැවැත්නුවරට එන්නාවූ ජේතවනාරාමයෙහි පොකුණෙන් නා බුදුන් දැක යම්මැයි සිතා සැපසේ පොකුණෙන් නා සම්‍ඹදයන් වහන්සේ දකින්ට හියහ.

සම්‍ඹදයෝත් ඒ දෙමහල්ලන් දැක ''ඇයි උපාසිකාවෙනි, උපාසකයන් කෙරේ ස්නෙහ ඇත්තේදැ''යි විවාළාහ. එවිට උපාසිකා කියන්නී ''සාමීනි, මා මුන්ට ස්නෙහ ඇති පමණක් මියක් මූ මා කෙරෙහි සෙනෙහදස නැත්තාහ. අද අතර මගදී එමින් සිටියදී දුන් බත්මුල මා සිටියදී තෙමේ කාපියා මේ මා කෙරේ ඇති සෙනෙහදස යි කියා සම්‍ඹදයන්ට දැන්වූය. සම්‍ඹදයෝත් ''උපාසිකායෙනි, දැන්මතු නොවෙයි, පෙරත් තොපි මුන් කෙරෙහි සෙනෙහදස ඇත් තෝමය. මූ නොපි කෙරෙහි සෙනෙහදස නැත්තෝමය. මහ නුවණැත්තන්ගේ බසින් පෙරලා උනුන් කෙරේ සෙනෙහදස වූවෝ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සම්‍ඹදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්;

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ පුතනුකෙනෙකුන් ඇත්තාහ. ඒ පුතනුවෝ වැඩිවිය පැමිණ රජ්ජුරුවන්ට යුවරජතනතුරෙහි සිටිනාහ. එකියන බාරාණසී කුමාරයන් කෙරෙහි සැකව කියන්නාහු ''තොපි පලාගොසින් පසල් නුවරක ඉඳ ඉක්බිති රාජ්‍යය කරන්ට එවයි කීහ. ''යහපතැ''යි කියා ඒ රාජ කුමාරයෝ තමන්ගේ අගමෙහෙසුන් බිසවු අත අල්වාගෙණ පසල්රටකට පලා ගොස් වාසයකොට උන්කලට පියරජ්ජුරුවන් මළපවත් අසා රාජ්‍යයට නික් මුණාහ.

අතරමග යනකලට එක්තරා මනුෂ්‍යයෙක් දෙමහල්ලන්ගේ මුහුණු වැහැරතිබූ හෙයින් බත්මුල කුමාරයන් අතට දුන්නාහ. ඒ රාජකුමාරයෝත්

තමන්ගේ බිසවුන්ට තොදී කනු කැමැත්තේ බිසවුන්ට කියන්නේ "මේ වල සොරු ඇත, එසේහෙයින් තෙපි ඉදිරියේ යව"යි කියන්නා ඒ බිසවුනුත් ඇත්ත කැයි සිතා ඉදිරියේ නික්මුනාහ.

එවිට රාජකුමාරයෝ බත්මුල උතා බත් කාපියා බිසවුන්ට කියන්නේ "එම්බල හෑම බත් කාපිය, බත් නොතිබු සිස්මුල අපට දුන්නේය"යි කිය. ඒ අසා බිසවි මා දැක්කදී දුන් බත්මුල මට තොදී තෙමේ කා සිස්බත්මුලක් පෑයේ ය යි විශ්වාසව දෙන්තම සමඟව බරණැස් නුවරට අවුත් රාජකුමාරයෝත් රාජ්‍යයට පැමිණ බිසවුන්ට අගමෙහෙසුන් තනතුර දුන්නාහ. ඒ දුන් පමණක් මිසක් කරුණාවක් බිසවුන්ගේ දුක්සුව විචාරන්නක් නැත්තාහ,

එසමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නාහ. එක් දවසක් බිසවු ලඟට ගොස් කියන්නාහු 'ඇයි දේවීන්වහන්ස, අපසේවූ වයොවෘඩයන්ට බත්කඩ ආදීවූ දෙයදී සැදුක් විචාරන්ට එපාදැ"යි කීහ.

එබස් බිසවි අසා "පියාතෙනි, මාගේ පොහොසත් කම් විවරකවවේද ? මාත් සංග්‍රහකරන්නේය"යි කියන්නා 'ඇයිද නුඹවහන්සේ අගමෙහෙසුන් බිසවුන් වහන්සේ නොවේදැ"යි කියන්නාම "අගමෙහෙසුන් බිසවූ මිසක් සාමි මා ඇති නියාවත් නොදන්නාසේක. දැන් රාජ්‍යය පුරුදුවපියා සිතන්නේ කෙසේද? පෙර දුප්පත් ගමනේ රාජ්‍යය ලබන්ට එන ගමනේ පවා අතරමගදී බත්මුලක් ලත් ගමනේ මට නොදී කාපුසේක. එසෙවුද, එසේකල දැන් තමාම වේදැ"යිකිහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "රජ්ජුරුවන් දැක්කදීත් මා විචාළ කල එවිටත් මේ මානේ කියනසේක්ද?"යි විචාළසේක. "යහපත කියම්"කිහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "එසේවීනම් දැන්ම හොසින් රජ්ජුරුවන් ලඟ සිටිමි. නුඹවහන්සේ එතනට අවමැනවැ"යි කියා බොධිසත්ත්වයෝ රජ්ජුරුවන් ලඟ කථා කොට සිටියාහ. ඒ වේලාවට බිසවුන් රජ්ජුරුවන් ලඟට ගොස් රජ්ජුරුවන් වැඳ සිටියාහ. එවිට බොධිසත්ත්වයෝ බිසවුන් අතින් විචාරන්නාහු "ඇයි දේවීන්වහන්ස, නුඹවහන්සේ අපසේවූ වයොවෘඩයන්ට බත් කඩ ආදීවූ දෙය දී දුක් සැප විචාරන්ට එපාදැ"යි කීහ. එබස් බිසවි අසා "පියා තනි, මාගේ පෝසත්කම් විවරටවේද? මාත් සංග්‍රහකරන්නේය'යි කියන්නා එසේ කියන්නේ ඇයිද ? නුඹවහන්සේ අගමෙහෙසුන් බිසවුන් වහන්සේ නොවේ"යි කියන්නා මා අගමෙහෙසුන් පමණක් මිසක් මා සාමි ඇති නියාවත් නොදන්නාසේක. දැන් රාජ්‍යය පුරුදුවපියා සිතන්නේ කෙසේද? පෙර දුප්පත් සමයේ රාජ්‍යය ලබන්ට එන ගමනේ පවා අතරමගදී බත්මුලක් ලත් ගමනේ මට නොදී කාපුසේක. එසේ කල දැන් තමාම වේදැ"යි කීහ.

එබස් අසා බොධිසත්ත්වයෝ කියන්නාහු "දෙවයන් වහන්ස, කීවේ ඇත්තදැ"යි විචාළාහ. එවිට රජ්ජුරුවෝ මුවෙන් නොබැණ ඉවසූහ. ඒ පවත් දැක බොධිසත්ත්වයන් වහන්සේ බිසවුන්ට කියනසේක් "දේවීන්වහන්ස, නුඹවහන්සේ කෙසේ කරුණාව ඇතත් රජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේ කෙරේ ඇල්ම නැතුව වාසය කෙරෙමින් සිටියදී ලඟ විසීම රජ්ජුරුවන් වහන්සේගේ සිතට සැපයෙක් නැත. එසේහෙයින් නුඹවහන්සේට මෙතනමය යි කියා ඇද්ද? සෙසු අනික් ස්ථානයකට ගොසින් ජීවත්වන්නාසේක්ද?"යි කීහ. එබස් රජ්ජුරුවෝ අසා තමන්ගේ රාජ්‍යශ්‍රී බිසවුන්වදී එතැන් පටන් ප්‍රියවාසය කළාහ යි වදාරා පුටහත්ත ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ දෙමහල්ලෝ නම් තෙපි දෙමහල්ලෝමය, ඒ අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළ සේක්.

## 218
## ඛතාතයවණ්ණ ජාතකය

තවද කුඹිල ජාතකය පළමු කියන ජාතකවලින්ම විසතර වශයෙන් පෙණෙන් නේය.

තවද මුළුලොවට එකඛක්‍ඛුවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්,

කෝසල රජ්ජුරුවන්ට වැඩපසස්නා එක් අමාත්‍යයෙක් අන්තඃපුරයට එක් ද්‍රොණයක් කෙළේය. රජ්ජුරුවෝ උන්කෙරේ කෝපකොට එපවත් සර්‍වඥයන් වහන්සේට සැලකළාහ. සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පෙරකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි උන්ගේ එක්තරා වැඩපසස්නා අමාත්‍යයෙක් අන්තඃපුරයට ද්‍රොණයක් කෙළේය. ඒ අමාත්‍යයාගේ ගෙට උගේ ගෙයි එක් මිනිසෙක් වැද ද්‍රොණකෙළේය. එකියන අමාත්‍යයා තමාගේ ගෙයි ද්‍රෙහකළ තැනැත්තහු අල්ලාගෙණ රජ්ජුරුවන්ට පෑ කියන්නේ 'දෙවයන්වහන්ස, මට වැඩ පසස්නා මාගේ ගෙයි එක් මිනිහෙක් මා ගෙට වැරදිත. උඹට කුමක්කරම්ද"යි විචාළාහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "එම්බල මාගේ ගෙයින් එක්වැඩපසස්නා අමාත්‍යයෙක් ද්‍රොණකළේය. එසේහෙයින් උන් කෙරේ තොප විසින් මෛත්‍රීකර ව"යි කීහ. එබස් අමාත්‍යයෝ අසා "ස්වාමීනී' මාත් සිතාය මේ කීවේය"යි සිතා එවක් පටන් අන්තඃපුරයට ද්‍රොණකරණට නොසිතීය යි වදාරා ඛතාතියවණ්ණ ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි රජව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 219
## කොසිය ජාතකය

තවද මුළුලොවට තිලකවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද. මෙහි වර්‍තමාන කථාව ඉකුත්වතසේමය යි දතයුතු,

ඒ කෙසේද? යත්;

එක් රජ්ජුරු කෙනෙක් නොකාලයෙහි යුඛයට නික්ම මහුල් උයන කද වුර බැඳගෙණ උන්නාහ. ඒ වේලාවට එක් බකමූණෙක් උණපදුරක් මඛ්‍යයෙහි

සැතපුනේය. කවුඩෝ උණපදුර වටකොටගෙණ උන්නාහ. බකමූණු තමාට බල ඇතිව රූපීවත් නොවී දහවල්ම පිටත්වීය, එවිට වටකොටගෙණ උන් කවුඩෝ ඔළුවේ ඇන එතන එලාපුවාහ. රජ්ජුරුවෝත් ඒ දැක තමන්ට අමාත්‍ය කම් කරමින් සිටියාවූ බොධිසත්ත්වයන් අතින් "මේ කිමෙක්ද"යි විවාළාහ.

බොධිසත්ත්වයෝ කියන්නාහු "රජ්ජුරුවන්ි වහන්ස, මේ බකමූණා තමාට නොකාලයෙහි පිටත්වූ හෙයින් බොහෝ විනාශයට පැමිණේයේය. ඉදින් දේවයන්වහන්ස බකමූණා සෙසු බකමූණන් පිවත්වෙන රැට මෙයින් පිටත්වී නම් අනතුරායක් නොවී සැපසේම පලාගන්නේය'යි යනාදීන් වදාළසේකි. රජ්ජුරුවෝ ඒ අසා "යහපතැ"යි සිතා පෙරලා රජගෙට කියහ යි වදාරා කොසිය ජාතකය නිමවා වදාළසේකි.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරයෝය, එසමයෙහි අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේකි.

## 220
## ගුථපාණී ජාතකය

මේවද මුළුලොවට අමාවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්;

සැවැත්නුවර ගව්වක් දෙගව්වක් විවරකදී උපාසකවරුන් දන්නා ගමක් ඇත්තේය. එසේවූ උපාසකවරු බොහෝ භික්ෂූන් වහන්සේලාට ලාබත් පොහෝබත් ආදීවූ බොහෝ බත් දානය දෙන්නාහ.

එසමයෙහි ඒ ගම ඉන්නා ප්‍රශ්න ගුණ්ඩිකයෙක් ඇත. ඒ තෙම සෑම ඉරේ මාලු භික්ෂූන් වහන්සේ ඇා කල ප්‍රශ්නගුණ්ඩිකයා විසින් දක්නා ලදසේ "දන්, කාපුවාසේ විපාක කිම්ද?"යි යනාදීන් ප්‍රශ්න විවාරයි. එවිට භික්ෂූන් වහන්සේ කියාගත නුහුනුවේලේ තෙමේ බණ කියන්නේය. එසේ හෙයින් මූ කරණ අලොභල නිසා බොහෝ මාලුවරුන් වහන්සේ ලාබත් පොහොබත් නිසා යන්ව මැලිවූහ.

එසමයෙහි පිටිසර සිට භික්ෂූකෙනෙකුන් වහන්සේ ජේතවනාරාමයට වැඩිසේක. ජේතවනාරාමයෙහි භික්ෂූන් වහන්සේ අතින් 'ලාබත් පොහෝබත් කොයිදී දෙන්නේද"යි විචාරා "අසවල් ගමදීය, ඒ ගමට ප්‍රශ්නගුණ්ඩිකයෙක් බොහෝ භික්ෂූන් වහන්සේ ගියවේලේ නොයෙක් ප්‍රශ්න විචාරා ගැහැට කරන්නේය. එසේහෙයින් ඔබබට යන්නේ කුමටද?"කීහ.

එවිට භික්ෂූන් වහන්සේ "අද දවස ලාබත් මට පමුණුවන්නාහ මම ඉනිබ්බේ තකීයක් වාදයක් නොකරණ ලෙස සලසවාලමි" කීහ. "යහපතැ"යි කියා එදවස් උන්වහන්සේට පොහෝබත් සැලැස්වූසේක. උන්වහන්සේත්

යහපතැ යි ගමට ගොස් ගම කෙළවර සිට සිටුර ගැටගන්වන්ට වන්සේක. ඒ වෙලාවට එකියන ප්‍රශ්නගුණ්ඩිකයා අන්ට දිවන්නාවූ බැටළුවකු මෙන් එතනට අවුත් "කුමක්ද දන් වළඳන්ට අවුද? මේ ගමට වන්නේ, එසේගෙයින් දන් කෑ විපාක කිම්දැ"යි විවාළේය. "යහපත දන්වළඳ, ඉක්බිති ප්‍රශ්න කියම්මය" යි කීසේක. "යහපත" කියා ගමට ගොස් කැඳ වැළඳුසේක. ඒ වේලේ බත් වළඳ, ඉක්බිත්තෙන් කියම්මය යි කියා ඉක්බිති බත් වළඳ, අනතයෙහි ඌ විසින් ප්‍රශ්න විචාරන්නා "යහපත මෙතනදී බැරිය, ගමින් කෙළවර වලදී කියම්" කිය ඌ හා සමඟ ගමින් කෙළවරට ගොස් පාසිවුරු එක්තැනක තිබා යාපත්කොට අතින් ඇටකැඩෙන සැටියේ ඇන 'මේ මාගේ ඇන්න බැන්දයින් කුමන විපාක යෙක් ඇද්දැයි කියා "අදවක් පටන් මේ ගමට ආ මාලු වරුන් වහන්සේ කෙරේ ඉනිබ්බේ ප්‍රශ්න විවාළා නම් දන්නමෝදැ"යි කියා භයගන්වාලා ගියසේක.

එතැන් පටන් ඒ භික්ෂූන් වහන්සේලාට ඒ වරපුරුෂයාගෙන් භයතුවූ යේය. මේ කථාව එක්දවසක් ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන්වහන්සේ කිස කියා වැඩඋන්තැනට සම්බුදුන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභවයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විවාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් ඒ භික්ෂූන් විසින් උන්ව නිග්‍රහ කරණ ලද්දේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

පසිවගිය දවස අහුරට හා මගඩරට වාසී සත්ත්වයෝ උනුන් හා සමඟ වෙළඳුම් ආදීවූ දෙය කරණ පිණිස උනුන්ගේ රටට යන්නාහු එක්දවසක් දෙරට වාසී මනුෂ්‍යයෝ මගඩරට සීමාවකෙරේ ගඟක් සමීපයට අවුත් එහිහිඳ නොයෙක් රා මස් කා බී උන්නාහ.

ඒ වේලාවට එක් ගු කුරුම්ණියෙක් එතනට අවුත් මනුෂ්‍යයන් බී ඉතිරිව දමාලූ ගොටුවල තිබූ රා බී මත්ව අසූචි ගොඩක්පිට ඉද යන්තමක් අසූචි මුගේ බරින් සැලියන්නා පොලොවටබරින් ධරාගත නොගෙයි කියා මහත්වූ අහඞ්කාර යෙන් උන්වෙලාවට ත්‍රිමදගලිත හස්තිරාජයෙක් එතනට අවුත් අසූචි දුර්ගන්ධය අඝා පෙරලා කරකැවී නික්මෙන්ට වන්වෙලාවට ගු කුරුම්ණියා කියන්නේ "ඇයි හස්තිරාජය, සපන්වූ සේවායෝ උනුන් දුටුකල බිදීයෙද්ද? එසේකල හස්තිරාජයා මා හා යුඬනොකොට යෙද්දැ"යි කියා කීය.

එබස් ඇත් අඝා කරකැවී සිට කියන්නේ 'තා හා මා හා කුම න යුඬ කරන්නේද? මාගේ පිරිසිදු වූ පයින් තා නොමඬින්වුව, දළින් නොහනුත්වුව, මාගේ සොඬින් තා නොගසත් වුව, තා උන්නේ අසූචිපිටය, එසේගෙයින් තව අසූචියෙන් නිග්‍රහකෙරෙම් කියා කුරුම්ණියා ලඟට අවුත් වර්චස්පිඬක් ඌ පිට හෙළා මුත්‍රකොට කුසඳුකාදකොට නික්මිණ. ඒ කුරුම්ණියාත් එතතම ජීවි තක්ෂයට පැමිණියේය යි වදාරා ගුථපාණී ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි කුරුම්ණියා නම් ප්‍රශ්නගුණ්ඩිකතම් පුරුෂයාය, එසමයෙහි හස්තිරාජයා නම් නිග්‍රහකළ භික්ෂුහුය, මේ කාරණය ප්‍රත්‍යක්ෂම් දුටු වතදෙව තාවා නම් බුදුවූ මමමය"යි වදාළසේක.

---

# 221
# කාමනීය ජාතකය

මේ මුළුලොවට රසායන වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසතදීක් කාමනීය නම් බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදී, මෙහි වර්තමාන කථාවත් දසවෙනි නිපාතයෙහි විස්තර වශයෙන් දක්නේය.

මෙහි බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බැනෑවත බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ''එපා''යි කියා ඇරපු රාජ්‍යය පෙරලා අවුත් ඇරගෙණ ලොභ, වෙෂ, මෝහ ඇතිව රාජ්‍යය කරන්නාහ.

ලොභයෙන් රාජ්‍යය කරණ නිසා ශක්‍රදෙවෙන්ද්‍රයෝ දැන ''මම ගොසින් මේ රජ්ජුරුවන් රවටාපියා අසින්නම් යහපතැ''යි සිතා බ්‍රාහ්මණ වෙශයෙන් අවුත් කියන්නා ''දෙවයන් වහන්ස, බොහෝ ඇත් අස්, රථ, පාබල සෙනගින් සමෘද්ධවූ මුතු මැණික් සංඛශිලාප්‍රවාලාදී අනන්ත රත්නයෙන් සමෘද්ධවූ මදඝේතාව කින් ජයගත හැක්කාවූ උත්තර පඤ්චාලනුවරඅ ඉඳිපත් නුවරය කොඤ්ච නම් රාජධානිය යන තුන්රටක් දැක නුඹවහන්සේට කියන්ට සිතා ආමි. එසේ හෙයින් ප්‍රපඤ්චකොකොට සෙව උදැසනක්සේ චතුරංගිණීසේනා සමෘද්ධකොට නික්මෙන්ව උවමැනවැ''යි කීහ.

රජ්ජුරුවෝත් ඒ අසා සතුටුව ''උදැසනක්සේ මාකරා එව''යි කියා යවූහ ශක්‍රදෙවෙන්ද්‍රයෝත් තමන්ගේ ශක්‍රභවනයට නැගිගියාහ. රජ්ජුරුවෝත් පසු දවස් චතුරංගිනී සේනාව සමුඛිකොටගෙණ 'ඊයේ අපට රාජ්‍යතුනක් දෙම්මැ''යි කී බ්‍රාහ්මණමානවකයා කොයිදැ''යි කියා අමාත්‍යයන්අතින්විචාළාහ. අමාත්‍යයෝ කියන්නාහු ''අප විසින් උන්ට බත්බුලතක් දෙන්ට සැලස්සුවේ නැත, සවාමීන් විසින් සලස්සා වදුළේදැ''යි විචාළාහ. රජ්ජුරුවෝ ''මා එසේ කළ දෙයත්නැත එසේවුවත් එක්තෙනක ඉඳිම ගොසින් බලව''යි කීහ. ''යහපතැ''යි අමාත්‍යයෝ ඒ ඒ තැන බලා නුදුටුවාහ. රජ්ජුරුවෝත් ''එසේවීනම් අපගේ කිසි සංග්‍රහයක් නොකළ විසින් ඉනිබ්බේ රටකට ගියාවන''යි සිතා බොහෝ වික්ෂෙපයට පැමිණ මා විසින් බොහෝ ලාභයෙන් පිරිහෙනලදැ''යි කලකිරී ඒ නිසාම ලය හුණුව රක්තපිත්තආතීසාරයට පැමිණියාහ. බොහෝ වෙදවරුන් විසින් පිළියම් කරණ ලදුවත් සහනයක් නුදුටුවාහ.

එපවත් ශක්‍රයෝ දැන මාවිසින් එතනට ගොසින් රජ්ජුරුවන්ගේ සෝක යත් අරවලා ලෙඩෙත් සුවකොට රජ්ජුරුවන්ගේ ලොභිසිතත් අරවා එම්'' සිතා බ්‍රාහ්මණවෙශයක් ඇරගෙණ රජ්ජුරුවන්ගේ මාලිගාව දොරකඩ සම්පයෙහි සිට ''වෙදකම් දන්නා වෙදෙක් රජ්ජුරුවන්ගේ රක්තාතීසාරය සුවකරන්ට ආමි' කීහ. රජ්ජුරුවෝ එපවත් අසා ''මහවෙදවරුන් පිළියම් කරණලදුව සුවකොට ගතනුහුනු ව්‍යාධිය සුවකරන්ට මුන්ට පිළිවන්ද? යම්ලාභයක් කොටපියා යව පියව''යි කීහ,

එපවත් ශක්‍රයෝ අසා ''මම ලාභයක් නකා ආවෙමි නොවෙමි, රජ්ජුරුවන් වහන්සේගේ ලෙඩ සුවකරණ පිණිස ආමි'' කීහ. එබස් රජ්ජුරුවෝ අසා ''එසේවීනම් කැදව''යි කියා තමන් ලඟට ගෙන්වාගත්තාහ. ශක්‍රයෝත් රජ්ජුරු

වන් ලඟට අවුත් රජ්ජුරුවන්ට කියනන්හු "දෙවයන්වහන්ස, රක්තපිත්ත අතීසාරය ඇතිවනකල භයින් සෝකයෙන් හා ආදීවූ දෙයින් ඇතිවන්නේය. නුඹවහන්සේට ඇතිවූයේ කුමන කාරණයක් මුල්වද? ඒ කිවොත්වේද නිදන් දැන පිළියම් කරන්නේය"යි කීහ.

එබස් රජ්ජුරුවෝ අසා "එම්බල බ්‍රාහ්මණය, එක්තරා බ්‍රාහ්මණ මානවක යෙක් මාකරා එළඹ පඤ්චාලරට හා ඉදිපත් නුවර හා කෙකයා නම් රට යතරට තුනක් මට සාදාදෙමි" කියා කීය. මමත් ඔහුට කිසි සංග්‍රහයක් නොකෙළෙමි. ඒ තෙම ඒ නිසා කටයුත්තක් කිමට සංග්‍රහයක් නොකළ සේකැ යි සිතා ඔබ්බේ රටකට ගියේවතැ යි සිතා මා විසින් අපරීක්ෂාකාරීවීමෙන් මේ නිසා ලාභයකින් පිරිහී ගියෙමි සිතා උපන්නාවූ සෝකය මුල්කොටගෙණ මේ ව්‍යාධිය ඇතිවිය"යි කීහ.

එබස් ශක්‍රයෝ අසා "රජ්ජුරුවෙනි, බරණැස් නුවරට හා ප්‍රාජීනා කරන් නාවූ නුවර තුන ඇතුළුව රාජ්‍ය සතරකට තොපි රාජ්‍යය කරවා නමුත් සතර නුවරින් පිළිසතරක් අදුද? සතර නුවරක රජ්‍යය කෙරෙමි යි කියා මණ්ඩා සතරකින් බත් කවුද? යාන් සතරක සැතපෙවිද? වාහන සතරකට නැගී යවිද? එසේ නොයන විසින් තමා කෙරේ පැමිණි රාජ්‍යයට ලොභකිරීමෙන් පැමිණිනාවූ ආයාස දුටු සේක්වේද? එසේ විසින් නුඹවහන්සේගේ ව්‍යාධියට මා හැර දඹදිව අනික් වෛද්‍යවරයෙක් පිළියම් කළ නොහේ"යි කීහ.

එවිට රජ්ජුරුවෝ "යහපත වෛද්‍යයානෙනි, තොප විසින් දන්නා යම් උපායකින් මාගේ සෝක සන්හිඳුවා ව්‍යාධි සුවකරව"යි කීහ.

එවිට ශක්‍රයෝ "යහපතැ යි" කියා රජ්ජුරුවන්ට අවවාද කියන්නාහු "මහරජ්ජුරුවෙනි, යම්සේ ලොභ, වෙෂ, මොහාදීවූ දෙය නුවණැත්තන් විසින් ප්‍රසංසා කරණු නොලැබෙයි. ඉදුරාම එයත් අකුසලට හාජනව තිබෙයි, කියා 'නරකාදීවූ දුකට පමුණුවාලව"යි කියා නරක දක්වා රජ්ජුරුවන් භයගැන්වූහ. ඉක්බිති "රජ්ජුරුවෙනි, ඉනිබ්බේ තොප විසින් රාග, වෙෂ, මොහාදී පාපයන් දුරුකොට දශරාජධර්මයෙන් අකොපාය්‍ය රාජ්‍යය කොට ශක්‍ර සම්පත් අත්පත් කරව"යි කීහ. රජ්ජුරුවෝත් ශක්‍රයන්ගේ බස් අසා තමන් සිත ලොභය අළහ. ඒක්ෂණයෙහි ව්‍යාධියත් සන්හිඳින, ශක්‍රයෝත් තමන්ගේ දිව්‍ය භවනයටම ගියහ. රජ්ජුරුවෝත් දැහැමෙන් සෙමෙන් රාජ්‍යයකොට මිය පරලොව ගියා හ යි වදාරා කාමනීය ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ තම් මෙසමයෙහි කාමනීය බ්‍රාහ්මණ යාය, ශක්‍රදෙවෙන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

---

## 222
## පලාස ජාතකය

තවද මුළුලොවට නිවන්සුව දෙන්නාවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පලාස පරිබ්‍රාජකයන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

පලාස තම් එක් පරිබ්‍රාජක කෙනෙක් මුළු දඹදිව තමන් හා සරිව වාද කරණ කෙනෙක් නැතිව සැවැත්නුවරට අවුත් "මා හා සමග තර්‍කීකරන්නේ දැ?" යි කිහ. එවිට නුවරවාසී පරවාද මර්දනය කරණ සම්‍බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි "තා සේවූ පරිබ්‍රාජකයෝ සියෙක් දහ සෙකුත් ඔබ වහන්සේ දැක්කදී එක බසකුත් කියාගත නොහෙන්නාහ" යි කිහ.

එබස් පරිබ්‍රාජකයෝ අසා "එසේ නම් මාත් ශ්‍රමණ භවත් ගෞතමයන්ලා කැටිව කථාබුදක් කොටපියන්ට උවමැතවැ" යි සිතා බොහෝදෙනා පිරිවරා ගොස් ජේතවනාරාමයෙහි සත්වන දෙරටුව දැක මේ සම්බුදුරජාණන් වසන්නාවූ ශ්‍රීගන්ධකුටියද" යි විවාළේය. එපවත් අසා මනුෂ්‍යයෝ කියන්නාහු "පරිබ්‍රාජකය, සම්බුදුරජාණන් වසන්නාවූ ගන්ධකිළි වෛජයන්ත ප්‍රාසාදය මෙන් තුබුයේය. මේ වනාහි සත්වන දෙරටුවය" යි කිහ. එබස් පරිබ්‍රාජකයා අසා සත්වන දෙරටුව මෙසේ වන කල ඉන්නා ගණය කෙසේ තිබේද? එසේවූ තෙන ඉන්නා සම්බුදුරජාණන්ගේ නුවණ කෙබඳුදැ" යි තර්‍කීකරන්ට හසින්ම බිඳී පලා ගියේය.

බොහෝ උපාසකවරුන් ඔල්වරහඬ ගසා සම්බුදුරජාණන් සමීපයට ආහ. සම්බුදුරජාණෝත් "ඇයි උපාසකයෙනි, නොකල් වේලේ ආවතැ" යි විවාරා එපවත් අසා "මේ පරිබ්‍රාජක දැන්මතු නොවෙයි. පළමුත් මා කරා අවුත් සත්වන දෙරටුව දැක බිඳී පලාගියේවේදැ" යි වදාරා "ඒ කෙසේදැ" යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ දක්වා වදාළසේකි.

ඒ කෙසේද? යත්,

පෙරකල්හි දවස ගන්ධාරරට තක්සලානුවර බොධිසත්ත්වයන් රාජ්‍යය කරණ සමයෙහි බරණැස්නුවර බ්‍රහ්මදත්ත තම් රජ්ජුරුකෙනෙකුන් තක්සලා නුවර ගණුමහ යි චතුරංගිනී සේනාව පිරිවරා නුවරට අවුත් "මාගේ ත්‍රිමදගලිත යුබ යොග්‍ය හස්තිසේනාව මෙලෙස මෙහෙයත්ව" යි ඒ නියායෙන් සන්නාහසන්නඬවූ අශ්වසේනාව මෙලෙසමෙහෙයවත්ව යි රථාලඬකාරයෙන් සරහතලද රථ සමූහය මෙලෙස මෙහෙයත්ව යි පාබලසෙන් මෙසේ දිවෙත්ව යි දුනුගත්තාවූ සේනාව මෙලෙස දිවෙත්ව යි ශරවර්‍ෂීවක් මෙන් ශරවර්‍ෂී යවත්ව යි කඩුගත්තාවූ යෝධයෝ ඒ ඒ තැනින් පැනනැඟී මනුෂ්‍යයන් පොළඟසත්ව යි යනාදීවූ සේනාවට විධාන කෙරෙමින් නුවරට අවුත් සත්වන දෙරටුව දැක "මේ රජ්ජුරුවන් ඉන්නා මාලිගාවද?" යි විවාරා මනුෂ්‍යයන් විසින් මේ මාලිගාව නොවෙයි, සත්වන දෙරටුවය" යි අසා දෙරටුව මෙසේ කල රජ්ජුරුවන් ඉන්නා මාලිගාව කෙසේදැ යි සිතා බිඳී ගියහ යි වදාරා මේ පලාස ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ තම් පලාස පරිබ්‍රාජකය, තක්සලා නුවර රජව උපන්නෙම් බුදුවූ මම්මය" වදාළසේකි.

## 223
## චිතිය පලාස ජාතකය

මේවද මාගේ සවාමිදරු වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පලාස පරිබ්‍රාජක තම් එකෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේ ද? යත්,

පලාස නම් පරිබ්‍රාජකයෙක් බොහෝ මනුෂ්‍යයන් පිරවරා ජෙතවනාරාම යට සම්‌බුදුයන් හා තර්‌කයට හොස් සම්‌බුදුයන්ගේ චන්‌ද්‍රමණ්‌ඩලය මෙන් සශ්‍රීකවූ මුඛශ්‍රීය දැක 'මා මුන් හා කැටිව තර්‌කකරන්‌ට බැරිය''යි සිතා පිරිස් මැඩයේ සිව බිඳී පලා ගියේය. බොහෝ උපාසකවරු කුල්මත්ව ඔල්වරහඬ පවත්වා සිටියාහ.

සම්‌බුදුයෝත් ''උපාසකවරුනි, දැන් මතු නොවෙයි. පෙරත් මාගේ මුඛ මණ්‌ඩලය දැක බිදුනේවේදැ'යි වදාරා 'ඒ කෙසේදැ''යි ආරාධිතවූ සම්‌බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්,

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නමින් බොධිසත්ත්වයන් වහන්සේ රාජ්‍යය කරණ සමයෙහි තක්සලානුවර රාජ්‍යය කරන්නාවූ රජ්‌ජුරු කෙනෙක් චතුරංගිනී සේනාව පිරිවරා බරණැස්නුවර වටකොට ගත්හ. එවිට ගඞ්‌කාර නම් රජ්‌ජුරුවෝ තමන්ගේ සේනාවගේ බලය කියන්නාහු ''රථවල කඟන්නාවූ බොහෝ ධජවලින් සම්‌පන්නවූ මාගේ චතුරංගිනී සේනාව ඉක්මවා බ්‍රහ්මදත්ත රජ්‌ජුරුවෝ කෙසේ පලායෙද්ද? මහාසමුද්‍රයෙහි යම්සේ පක්‍ෂියෙක් පිය අඹා නීරණයක් දැක්ක නොහෙද්ද? යම්සේ මහත්වූ සර්‌පයක් පුළුන් රළ කින් සොලවාලිය නොහෙද්ද? එමෙන් මාගේ චතුරංගිනී සේනාව තොප විසින් බිඳුවාපිය නොහැකැ''යි කියා කීහ.

එසේ අසා බරණැස් රජ්‌ජුරුවෝ අට්‌ටාලයෙහි සිටි තැනැත්තෝ ගඞ්‌කාර රජ්‌ජුරුවන්ට කියන්නාහු ''එබඳ තොප විසින් නිකම් ප්‍රලාපකිමෙන් කම් කිම්ද? තොපගේ සේනාව විසින් මාගේ සේනාව මැඩපියන්ට බැරිය'' කියා කීහ. එසේ අසා ගඞ්‌කාර රජ්‌ජුරුවෝ බරණැස් රජ්‌ජුරුවන්ගේ පුන්සඳක් සමානවූ මුඛශ්‍රීයක් ඇති රජ්‌ජුරුවන්ට මා විසින් යුඬකරන්‌ට බැරිය යි සිතා තමන්ගේ රටට ගියාහ යි වදාරා ඒතීය පලාස ජාතකය නිමවා වදාළ සේක,

''එසමයෙහි ගඞ්‌කාර රජ්‌ජුරුවෝ නම් පලාස පරිබ්‍රාජකය. බරණැස් රජ් ජුරුවෝ නම් බුදුවූ මම්මය''යි වදාළ සේක.

---

## 224
## උපාහන ජාතකය.

මේවද සඞ්‌ඝමිවර චක්‍රවර්‌තිවූ සම්‌බුදුයන් වහන්සේ වෙළුවනාරාම යෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත සථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේ ද? යත්,

එක් දවසක් ධර්‌මසභාමණ්‌ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ ''දෙව දත්තසථවිරයෝ ගුරුව සිටිය සම්‌බුදුයන් වහන්සේ කෙරෙහි වැරද බොහෝ විනාසයට පැමිණියෝවේදැ''යි යන කථාව කිය කියා උන්තෙනට සම්‌බුදුයන්

වහන්සේ වැඩවදරා 'මහණෙනි මා එන්නාට පුථිභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදරා එපවත් අසා ''පළමුන් දෙවදත්තසථවිරයෝ මා හා කැටිව සරිගස්වා බොහෝ විනාශයට පැමිණියෝ වේදැ''යි වදරා ආරාධිතවූ සථිඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

ඒවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ හස්ත්‍යාචාරීකුලයෙක උපන්සේක.

එසමයෙහි කසීරටින් එක්තරා මාණවකයෙක් බරණැස්නුවරට අවුත් බොධිසත්ත්වයන් අතින් හස්තිශිල්පය උගත, බොධිසත්ත්වයෝත් හස්තිශිල්පය තමන් දන්නා පරිදෙන් ආචාරිභාගයක් නොතබා නිමවාම ශිල්ප දුන්නාහ. එකියන මාණවක තමා විසින් ශිල්ප නිමවා උගත් නියාව දැන ආචාරීන්ට කියන්නේ ''ආචාරීන් වහන්ස මා රජ්ජුරුවන්ට පැමට තරමක් තිබා වදළ මැනවැ''යි කීහ. ''යහපතැ''යි කියා බොධිසත්ත්වයෝත් රජ්ජුරුවන් කරා ගොස් ''දෙවයන් වහන්ස, මාගේ එක් අන්තෙවාසිකයෙක් නුඹවහන්සේට සේවය කරන්නෝ කැමතිය. එසේ විසින් ඔහුට තරමක් පදමක් සලස්වා සේවය ගන්නේ යහපතැ''යි කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා ''එසේ වීනම් තොපගේ තරමින් බාගයක් උන්ට සලස්වාලම්. ඒ මාණවකයාට සේවාකරන්ට කියව''යි කීහ. ''යහපතැ''යි බොධිසත්ත්වයෝ එපවත් තමන්ගේ අත වැස්සාට කීහ. එබස් අසා අතවැසි කියන්නේ ''ඇයි මාන් ශාස්ත්‍ර නිමවා උගත්වුව, නුඹ වහන්සේගේ තරම් නොබලා භාග ලබන්ට කාරණා කිම්දැ''යි කීහ. එපවත් බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ ''එසේකල තොපසරියේ ශිල්ප ශාස්ත්‍ර ඨානාන්තර සරියේ ලැබ ගණිනි'' කීහ. බොධිසත්ත්වයෝත් එපවත් තමන්ගේ අතවැස්සන්ට කීහ. අතවැසි ''යහපතැ''යි ''තකීකෙරෙමි'' කීහ.

එබස් අරජ්ජුරුවෝ අසා ''හස්ත්‍යාචාරීන් හා උන්ගේ ශිෂ්‍යයාගේ තකී වෙයි, නුවර මුළුල්ලට සැලකළාහ. බොධිසත්ත්වයෝත් ''මුන් හා තකීකරන්ට උවමැනවැ''යි සිතා උපායෙක් සලසන්නාහු ඇතා යන්ට කී වේලේසිටින්ට හා සිටින්ට කී වේලේ යන්ට හා දෙන්ට කී වේලේ නැගීසිටින්ට හා නැගී සිටින්ට කී වේලේ වදෙන්ට හා යමක් දෙන්ට කී වේලේ නොදෙන්ට හා නොදෙන්ට කී වේලේ දෙන්ට හා යනාදී විපරීත ග්‍රහකොට එක රැයින්ම ඇතකු කම්පස්කළහ බොධිසත්ත්වයෝත් ඇතකු පිට නැගී රාජාඞ්ගනයට ගියාහ. ශිෂ්‍යයාත් ඇතකු පිට නැගී රාජාඞ්ගනයට ගියේය. බොහෝදෙන දෙන්නාගේ වාද බලන්නට එක් වූහ. ඒ හස්ත්‍යාචාරීහු දෙන්නාත් සමසමට ශිල්ප දක්වන්නට වන්නාහ.

එවිටි බොධිසත්ත්වයෝ විපරීත ශිල්ප දක්වන්නට වන්නාහ. එවිට ඒ අතවැස්සවුව ඒ බැරිවිය. එවිට බොහෝ මනුෂ්‍යයෝ ''මේ තෙමේ මේ ආචාරීන් වහන්සේ හා සමග තකී කරණලදැ''යි කියා බොහෝ දෙන කැටමුගුරු දමා ඔහු එතනම ජීවිතක්ෂයට පැමිණවූහ. බොධිසත්ත්වයෝත් ඇතුපිටින් බැස රජ්ජුරුවන් දැක කියන්නාහු දෙවයන්වහන්ස, යම්සේ සුව පිණිස වීදියෙන් වහන් ඇර ගන්නාහ. ඒ වනාහී නොවිතර සෙයින් වත් අසම ජයවීමෙන් පයසෙල්ලී බොහෝ විනාශයට පැමිණෙන්නේය යි එමෙන් ශාස්ත්‍රයක් සැප පිණිස ඉගෙණ

තමා නීව හෙයින් අසැපයටත් පැමිණෙන්නාහ. සත්පුරුෂයෙකු උගත් ශාස්ත්‍රඥයක් වීනම් යහපතටත් වන්නේ වේදැයි කිහ. එබස් රජ්ජුරුවෝ අසා බොධිසත්ත්වයන්ට බොහෝතරම් පදම් දුන්නාහ යි වදාරා මේ උපාහන ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි අතවැසි නම් දෙවදත්තඝට්වරයෝය, හස්ත්‍යාචාරී තම් බුදුවූ මම්මය"යි වදාළසේක.

---

## 225 වෙණ්ණුථුන ජාතකය

තිවද සඛම් මඝවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් කුමාරිකාවක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්,**

බරණැස් නුවර සිවාණකෙනෙකුන්ගේ දුවක් ඇත, ඒ සිටානන්ගේ ගෙයි වෘෂභරාජයෙක් ඇත. උඹට එගෙයි ඇත්තෝ දෙවතා සථානයෙහි තබා රකිනාහ. ඒ දුටු කුමාරිකා තමාගේ කෙල්ලක අනින් "ඇයි මෙ සෙසු ගොන් නියාවට මුන්ව ආදර සත්කාර කරන්ව බලි ඇයිදැ?"යි විවාළාහ. එවිට ඒ කෙළී කියන්නී "සෙසු ගොන් නියාවට මේ ගොනාගේ පිට මෝල්ලිය මහත්ව තිබෙන හෙයින් මේ වෘෂභරාජයාය. එසේහෙයින් පූජාසත්කාර කෙරෙති කිහ.

එබස් ඇසූ සිටුකුමාරිකා එක් දවසක් මතුමෝල්තලයේ සිට වීථියේ යන පිට ගැවියක් ඇති මිනිසකු දැක එසේ නම් මේ පුරුෂයා මනුෂ්‍යයන්ගෙන් උතුම් එකෙක් වනැයි සිතා එසේ හෙයින් මම උතුම් කුලයක උපනිම් මම මුන් ලහ උනිම් නම් යහපතැ යි සිතා තමන්ගේ ගෙයි කෙල්ලක් ඇරගෙණ අළුදෙරින් නික්ම එකියන කුදා හා සමඟ නික්මුනාහ.

මේ කථාව සඛ්‍යයාවහන්සේ අතර ප්‍රසිඛවිය. සඛ්‍යයාවහන්සේ ධම්සභා මණ්ඩපයෙහි මේ කථාව කිය කියා වැඩඋන් සේක. සම්බුදුරජාණන් වහන්සේ ඒ තෙතව වැඩ මහණෙනි,මා එන්නාව පූර්වාභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු තොවෙයි, පෙරත් මේ කුමාරිකා මේ කුදා කෙරේ ඇල්මවූවෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැයි අරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේ ද? යත්,**

යිවකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ පසල්ගමෙක සිටු කුලයෙක ඉපද පුත් දරුවන්ගෙන් වඩිනයට පැමිණියාය. බරණැස් නුවර සිවාන කෙනෙක් ඇත්තාහ. ඒ සිවානන්ගේ දුවනියන් තමන්වහන්සේගේ පුතනුවන්ට පාවා දෙන්ට කථාකොට උන් අවසථාවට බරණැස් නුවර සිවානන්ගේ දුවක් ඇත. ඒ සිවානන්ගේ වෘෂභරාජයෙක් ඇත. උඹට ඒ ගෙයි ඇත්තෝ දෙවසථානයෙහි තබා රකිනාහ.

ඒ වුදු සිටුකුමාරිකා තමන්ගේ කෙල්ලක අතින් "ඇයි මෙසේ සෙසු ගොන් නියාවට මුන්ට ආදරසත්කාර බලි ඇයිද?"යි විචාළාහ. එවිට ඒ කෙලී කියන්නී සෙසු ගොන් නියාවට මේ ගොනාගේ පිට මොල්ලිය මහත්ව තිබෙන හේයින් මේ වෘෂභරාජයා, එසේහෙයින් ආදරසත්කාර කෙරෙති" කිහ.

එබස් ඇසූ සිටුකුමාරිකා එක්දවසක් මතුමාල් තලයෙහි සිට වීථියෙහියන පිට ගැවියක් ඇති මිනිසකු දැක එසේවී නම් මේ පුරුෂ මනුෂ්‍යයන්ගෙන් උතුම් එකෙක්වතැ යි සිතා එසේ නෙයින් මේ උතුම් කුලයෙහි උපතිම්. මමත් මුන් ලඟ උනිමිතම් යහපතැ යි සිතා තමන්ගේ ගෙයි කෙල්ලට කියන්නාහු "අසවල් පුරුෂයා අසවල්තෙන සිටින්ට කියව"යි කියා යවූහ. ඒ පුරුෂයාත් එලෙසම සිටියේය. එකියන සිටුකුමාරිකාත් උදැසනක්සේ අප්‍රසිඩ වේශයෙන් අනඤ්ඤ සම් පතුත් ඇරගෙණ ඇළදෙරින්ම එකියන කුදු හා සමග නික්මුනාහ. නික්ම අතරමඟට ගොස් එකියන කුදු අතරමඟදී රුජාවක් අල්වාගෙණ වකගසාගෙණ හොත්තේය. එවේලාවට කියන්නාවූ සිටුදූ පාමුල උන්නීය. ඒ වේලාවට බොධිසත්ත්වයෝ තමන්ගේ පුතනුවන්ට මඟුල් නිසා බරණැස් නුවරට යන්නාහු අතරමඟ සිටියාවූ සිටුදූ දැක ඇඳිනගෙණ එසේවී නම් මුන් විසින් තමන්ම සිතා ගෙණ මුන් පස්සේ ආවනැයි සිතා එවිට සිටුදුවට කියන්නාහු "ඇයි තොපි උතුම් වංශයෙහි ඉපිද මේ කුදු පස්සේ ආයේ ඇයිදැයි විචාළාහ.

එවිට සිටුදූ කියන්නී වෘෂභරාජයා මොල්ලිය නිසා දෙවතා තනතුරෙහි තබා ආදර කරණ හෙයින් මමත් මේ කුදු මනුෂ්‍යයන්ගෙන් උතුම් එකෙකැයි සිතා මූ පස්සේ ආමි කීහ. එබස් අසා බොධිසත්ත්වයෝ තමන්ගේ රථයට එසිටුදුව ඉස්සෝදු නහවා නංවාගෙණ තමන්ගේ ගමට ගොස් පුතනුවන්ට පාවා දුන් නාහයි වදුරා මේ වෙණ්ණුථුන ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි එකියන සිටුදූනම් මේ සිටුදූමය, පසල්ගම සිටුව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

---

## 226
## විකණ්ණව ජාතකය.

තිවද ප්‍රදීපායමානවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ශාසනයෙහි උකටලීවූ භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්;

භික්ෂුකෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා ශාසනයෙහි උකටලීව උන් කෙනෙකුන් වහන්සේ සම්බුදුයන් වහන්සේ දක්වන්නා මහණ පළමුත් තෘෂ්ණා වසඟවීම නිසා කිඹුලා යම්සේ මුණ ඇන්නාවූ ඊදණේඩන් යම්සේ මළේද එමෙන් විනාශයට පැමිණෙයි වදුරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකි.

**ඒ කෙසේද? යත්;**

**රා**ජගහය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නමින් බොධිසත්ත්වයන් වහන්සේ රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ එක්දවසක් මහල් පහසට ගොස් මහත්වූ නැච්නැගී බොහෝ නාට්‍ය ගීත වාද්‍ය කෙරෙමින් නැවින් ඒ ඒ තැන සෙවණැපරව ඇවිදිනාහ. මත්ස්‍යයෝත් රජ්ජුරුවන්ට කියන්නාහු නාට්‍ය ගීත වාදිත අසා තමුන් රජ්ජුරුවන්ගේ නැව පසුපස්සේ තාලස්ඛන්ධප්‍රමාණ මස් කැලය පසුපස්සේ නික්මුණාහ.

රජ්ජුරුවෝත් පසුපස්සෙහි නික්මුණු මත්ස්‍යයන් දැක "මේතෙක් මත්ස්‍යයෝ පසුපස්සේ එන්නේ කිම්ද"යි විචාරා අමාත්‍යයන් විසින් "සේවය කරන්ට පසුපස්සේ එන නියාවය"යි කියන්නාහ. එසේකල අපට කරණසේවය තරමක් පදමක් උවමැතැවැ"යි සිතා අදවක් පටන් මෙ මත්සත්‍යයන්ට සාල් අමුණක බත් ලවයි එක්තරා අමාත්‍යයකුට භාරකළේය. ඒ අමාත්‍යයාත් එලෙසම බත් ලන්නේය. ඒ බත්කන වේලාවට එක්කිඹුලෙක් නිසා මත්සයෝ ප්‍රමාවන්නාහ. බත් ඉතිරිවන්නාහ. එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් කියන්නාහු ඔරුවක්පිට නැඟී ගොසින් කිඹුලා මත්ස්‍යයන් කනවේලාවට උල්පිහියකින් විද මරාපියවයි කී සේක. ඒ අමාත්‍යයෝත් ඒ නියායෙන් කිඹුලාත් මත්ස්‍යයන් කන වේලාවට ඔරුවකට නැඟීගොස් බඩින් පිටවන ලෙස අත්තාපුවාහ. කිඹුලාත් බොහෝ වේදනාවට පැමිණ තමා වාසසථාන යට යන්ට නික්මිණ. එවිට අමාත්‍යයා කිඹුලා නොරැකෙන නියාව දැන කියන්නේ "එම්බල කිඹුල තාගේ තෘෂ්ණාව නිසා ප්‍රාණය නොරවන්නේයයි කීහ. කිඹුලත් තමා වසන ලෙනටම ගොසින් ජීවිතක්ෂයට පැමිණියේ යයි සිඟිදැයන් වහන්සේ "මහණෙනි, යම්සේ තෘෂ්ණා විසඟව විනාශයට පැමිණි කිඹුලා හා සමානය"යි වදාරා විඛණ්ණව ජාතකය නිමවා වදාළසේක

"එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

---

## 227 අහිතාබු ජාතකය.

**මි**වද සඬම් මහාගඬහාවූ සිඟිදැයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් කුලස්ත්‍රියක් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

එක්තරා කුලස්ත්‍රියක් ඔබ්බකට පාවාදුන්නාහ. පාවාගත්තාවූ කෙළෙඹි පුත්‍ර එකියන කුමාරිකාව කෙරේ ආදර නැතිව ඉවසාපරව ඇවිදින්නේය. ඒ ස්ත්‍රීන් දැහසව්වන් වහන්සේගේ උපාසිකා කුලයෙහි උපන් හෙයින් ඊට තමුත් අපෙක්ෂාව තමා දෙන්නාවූ දන්ආදිය දිදී දවසරිති ඔයිත් දෙදෙනා වහන්සේගේ අවවාදයෙන් සොවාන්පලයෙහි පිහිටා මහණවන්ට අභිප්‍රාය ඇතිව දෙමව්පියන්

ගෙන් අවකාශ ඉල්වාගණ්ණ ගොසින් මෙහෙණිසත්තෙකි මහණව විදර්‍ශනා වඩා රහත්වූසේක. මේ කථාව ධම්මසභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ අස වල් කුලස්ත්‍රිය තමා ගලවාගෙණ නිවන් දක්වාපුවාදැයි යන මේ කථාව කියනියා උන්සේක.

සර්‍වඥයන් වහන්සේත් එතනට වැඩ වදාරා "මාණෙනි, මා එන්නාට පූර්‍ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි පෙරත් මූ තමන් ගලවාගෙණ ගියෝවේදැ"යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්‍වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

පසිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපද හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානලාභීව වාසය කරණ සේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ වැඩිවිය පැමිණියාවූ රාජකුමාර කෙනෙක් ඇත්තාහ. ඒ රාජකුමාරයාත් තමන්ගේ අභිතාප නම් බිසවුන් ඇර ගෙණ හිමාලය වනයට ගොස් බෝධිසත්වයන් වහන්සේ වසන්නාවූ පන්සල සමීපයේ ගොස් ඉන්නාහ. එසමයෙහි එක්තරා ලියකින්නරාවක් රජ්ජුරුවන් ඉදිරියෙහි නික්මෙන්ට වත. රජ්ජුරුවෝ ඇ කෙරේ පිළිබඳ සිත්ඇති බිසවුන් කෙරේ අපෙක්ෂාව ලියකින්නරාව අල්වමි සිතා පසුපස්සේ නික්මුණාහ.

එවිට බිසවි සිතන්නාහු මේ රජ්ජුරුවන් කැටිව එක්ව දුක්ගෙණ ආ මා කෙරේ අපෙක්ෂාව මේ පක්ෂියක පස්සේ නික්මුණාහ. රජ්ජුරුවන්ගෙන් මට කාරණා කිම්දැ"යි තාපසයන් කරා ගොස් "සවාමීනි, මා තාපසකරන්නේ යහ පතැ"යි කීහ. යහපතැයි කියා තාපසකළාහ. ඒ කියන බිසවුන් කිසුණුපිරියම් භාවනාකොට පඤ්චඉර්ද්ධි අෂ්ටසමාපත්ති උපදවාගෙණ තාපසයන්ලඟ සිටියාහ ඒ වේලාවට ඒ බාරාණසී කුමාරයෝත් කිඳුරු පක්ෂියා සොයා ගොස් නොදැක තාපසයන් උන්තෙනට අවුත් සිටියාහ.

එවිට බිසවි කියන්නාහු "රජ්ජුරුවෙනි, තොප මා ඇර පක්ෂිධෙනුව බලා ගිය විසින් මම්ම ධ්‍යානලාභීව හිඳෙමි. එසේ හෙයින් නුඹවහන්සේ නිසා මට බොහෝ ලාභීවූයේය. ඉනිබ්බේ මේ ජාතියේ නුඹවහන්සේ හා මා හා සංවාස යෙක් නැතැයි කියා ආකාශයට නැඟී ඉර්ධියෙන් ඔබ්බට ගියාහ"යි රජ්ජුරු වෝත් බොහෝ විලාපයට පැමිණ කියන්නාහු 'යම් පුරුෂකෙනෙක් බොහෝ තෘෂ්ණාවට පැමිණ බොහෝ දුකට පැමිණෙද්ද? ඒ කාරණය මාගෙන්ම දිවිමි. යම්සේ මම අභිතාප නම් බිසවුන්ගෙන් වියෝවූ මා වැන්නැ"යි කීහ. ඒ කියා ඒ රාජකුමාරයෝ තමන්ගේ පියානන් මළපවත් අසා බරණැස් නුවරට ගොස් රාජ්‍යය කළහයි වදාරා අභිතාබ්‍ර ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි බිසවු නම් මෙසමයෙහි මේ භික්ෂුණීහුය, එසමයෙහි රාජ කුමාරයෝ නම් මෙසමයෙහි කෙළෙඹි පුත්‍රයාය, තාපසව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

## 228
## වඤ්ඡනක ජාතකය.

තවද සඩම්මවර චක්‍රවර්ති වූ සම්බුදුයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ආනන්දසාමීන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්,**

ආනන්දසාමින්ගේ යාළු රොජමල්ල නම් යාළුවෙක් ඇත, ඒ තෙම ආනන්දසාමින් දකිනා අභිප්‍රාය ඇතිව කියා යැවිය. ආනන්දසාමීන් සම්බුදුයන් වහන්සේට දන්වා ඒ රොජමල්ල නම් යාළුවාගේ ගෙට වැඩිසේක. එකියන යාළුවා ආනන්දසාමීන් බත් මිහිරිකොට වළඳවා අන්තයෙහි කියන්නේ "ස්වාමිනි, මහණව සිටිනා බලාත් සිවුරු ඇරපියා ආවොත් මා හා සමව බොහෝ මුතු මැණික් ආදීවූ සම්පත් විඳිනාසේක් වේදැ"යි කියා ගිහිගෙයි සම්පත් වර්ණනා කළාහ. ආනන්දසාමීන් ගිහිගෙයි ආදීනව හා මහණවීමෙහි විපාක හා කියා ජේතවනාරාමයට වැඩිසේක.

සම්බුදුයෝත් ඒ පවත් අසා "රොජමල්ලවයෝ පළමුත් එලෙසම කිවෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ එක්තරා බ්‍රාහ්මණකුලයක ඉපද හිමාලය වනයට ගොස් තාපසව වාසය කරණසේක් ලුණු ඇඹුල් සෙවුන පිණිස බරණැස්නුවරට ආසේක. බරණැස්නුවර සිටානෝ බෝධිසත්ත්වයන්ගේ ඉරියාපථයෙහි පැහැද සතුටුව බොධිසත්ත්වයන්ට දන් දෙන්නාහ. මේ නියාසේ දවස් යාමෙන් බොධිසත්ත්වයන් හා සිවානෝ උනුන්කෙරෙහි විශ්වාස වූහ. එවිට සිවානෝ සිතන්නාහු මේ වඤ්ඡනක තාපසයන් ගිහිකරවාගෙණ පඤ්චකාම සැප අනුභවකරම්හයි සිතා බොධිසත්ත්වයන්ට දවසක් දන්දී අන්තයෙහි කියන්නාහු වඤ්ඡනක තාපසයන්වහන්ස මේ තාපස ක්‍රියාවෙන් බොහෝ දුක. එබැවින් එපමණ එසේවූ තාපසක්‍රියාව ඇර සැපවූ පඤ්චකාම සැපය මා හා කැටිව අනුභවකරන්නේ යහපතැයි කීහ. ඒ අසා බෝධිසත්ත්වයෝ කියන්නාහු පඤ්චකාම සැපය නම් අඥතයන්ට සැපයෙක් සේ සිතන පමණක් මිස බඹුනයක් හා සමානය, එසේහෙයින් මේ දුකය මේ ඇර සැපසේ තාපස ක්‍රියාවෙන් වනමුල් පලාඵල කා සැපසේ දවසරනේමය යාපතැයි කියා තමන් වසන්නාවූ හිමාලවනයට ගියාහයි වදාරා මේ වඤ්ඡනක ජාතකය නිමවා වදාළසේකි.

"එසමයෙහි සිටානෝ නම් මේ කියන රොජමල්ලවයෝය, එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 229
## බක ජාතකය.

තිවද මහාසමුද්දවූ සම්බුදුයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂුකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේ ද? යත්;**

එක් වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂුකෙනෙකුන් වහන්සේ මාලු සිවුරක් සකස්කොට ගෙනගම්කොවගෙන ජේතවනාරාමයට ආසේක. ජේතවනාරාමයෙහි වහන්දැ සිවුර දැක "මේ සිවුර අපට දුනමැනව"යි කියන්නාහු අප දුකසේ ලබාගත් සිවුරදෙන්නේ කෙසේදැ යි කියන්නා එසේවීනම් අපගේ අළුත් පිළි ඇරගෙන සිවුර අපව දුනමැනවැයි කියා පිළි ඇරගෙණ සිවුර දුන්නාහ. ඒ කිළිටි සිවුර සෝදාපුගමනේ රෙදිසිවුර නියාව දැන ඒ වඤ්චා කළ භික්ෂූන්වහන්සේ ඇරගෙණ බුදුරජාණන්වහන්සේ කරා ගොස් සම්බුදුයන්ව පැහ. සම්බුදුහු පළමුත් මේ භික්ෂුහු වඤ්චාප්‍රයෝග දනිනියි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්;**

ඊටඅයිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ මත්ස්‍යව ඉපිද බොහෝ මත්ස්‍යයන්ව රජකම් කරන්නාහ.

එසමයෙහි කොකෙක් ඒ වැව සමීපයෙහි පියාපත්දෙක විදා කර නමා ගෙණ බඤතපස් කෙරෙමින් සිටියේය. ඒ වේලාවට බොධිසත්ත්වයෝ බොහෝ මත්ස්‍යයන් පිරිවරා කොකා උන්සථානයට ආහ. ඒ වේලාවට මත්ස්‍යයෝ කොකා දැක එලනෙළුම්මලෙක පැහැ සමානවූ යහපත් තාපසකෙනෙකැයි සිතා කියන්නාහු මූ වනාහි පියාපත් විදාගෙණ කරබාගෙණ සිටිනාහ. එසේ හෙයින් මූ මහසිල්වත් කෙනෙකැයි කීහ. එබස් බොධිසත්ත්වයෝ අසා කරකැවී බලා කොකා නියාව දැන කියන්නාහු "එම්බලමත්ස්‍යයෙනි, මුන් මෙසේ ඉන්නේ තාපසයන් නිසා නොවෙයි අපගේ අවකාශයක් බලාය. මූගේ කුමන සීලයෙක්දැයි කීහ. එවිට මත්ස්‍යයෝ දිය කළඹා උඟ එතනින් යවාපුවාහ"යි වදාරා බක ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි කොකා නම් වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂුහුය, මත්ස්‍යව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

---

## 230
## සාකෙත ජාතකය.

තිවද සඩමී චූඩාමාණික්‍යවූ සම්බුදුයන් වහන්සේ සාකෙත නුවර වැඩ වසන සමයෙහි සාකෙත නම් බ්‍රහ්මණයා සම්බුදුයන්ව ප්‍රිය නැකම් කී හෙයින් මේ ජාතකය දක්වන ලද. මෙහි ඉකුත් වත්මාන කථාවක් ඒකක නිපාතයෙහි බස්නේය.

මෙහි පළමුත් තමන්වම පුත්ව උපන් හෙයින් ජාතිවාසනා හේතුකොට කියන්නාහයි වදාළ කල්හි එවිට භික්ෂූන්වහන්සේ දක්වතසේක් "ස්වාමීනි පුර්‍ව වාසනා ඇතැයි කියා පසුව ජාතියේ විශ්වාසය වේදැ"යි වදාළසේක.

සම්මැදයන්වහන්සේ වදාරණසේක් "මහණෙනි' යම්සේ දියෙහි අව ගන්නා තෙළුම් අල කෙතෙක් දවසින් වුවත් දිය හා මඩ එක්වූද එදවස් ඇති වේද එමෙන් කොතෙක් දවසින් උවත් අනුන් දුටුවේලේ පූර්‍වවාසනා බලයෙන් වුව ඒ තැත්තම් උන් නිසා තමාට පැමිණි ලාභයක් නිසා වුවත් නවත්නාහ යි වදාරා "මට මවුපියව උපන්නෝ මේ බමුණා හා බැමිණිමය, උන්ට පුත්ව උපන්නෙම් බුදුවූ මම්මය" යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 231 එකපාද ජාතකය.

**තිවද** සබඹ කිරිව වූ සම්මැදයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය වදාරණ ලද.

**ඒ කෙසේ ද? යත්;**

එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් තම්ගේ පුත්‍රයෙකු ඇකයේ ඉඳුවාගෙණ උන්නේය. ඒ පුත්‍රයා පියාව කියන්නේ එකපාදයයින් යුක්තවූ බොහෝ වූතය ඇති එකද්වාර ප්‍රාසාදය මට කියවයි කීහ. එවිට ඒ පුරුෂයාත් මේ ප්‍රශ්නය සම්මැදයන්වහන්සේට මිසක් අපට නොදනෙයි සිතා සම්මැදයන් කරා තමාගේ පුතත් ඇරගෙන ගොස් කියන්නේ "ස්වාමීනි, මේ පුත්‍රතෙම එකද්වාර නම් ප්‍රශ්නයක් මා අතින් විචාරයි ඒ මට නොදනෙයි වදාලොත් යහපතැ"යි කීය.

සම්මැදයෝත් "උපාසකයෙනි මේ කුමාර මේ ප්‍රශ්නය පළමුත් විවාළේය නුවණැත්තෝ මූව ප්‍රශ්නය විසඳුහ' මේ වනාහි හවයෙන් සැඟවුනු විසින් නොදනෙයි" වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්මැදයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක,

**ඒ කෙසේ ද? යත්;**

**ඒ**වකිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ සිටුකුලයක උපන්සේක. එක්දවසක් බොධිසත්ත්වයෝ තමන්ගේ පුත්‍රකෙනෙකුන් ඔක්කෝ වඩාගෙණ උන්නාහ. එවිට ඒ කුමාර කියන්නේ "එකපාදයෙන් යුක්ත බොහෝ අර්‍ථ ඇත්තාවූ එකද්වාර ප්‍රශ්නය කිවමැනවැ"යි කීහ. එවිට බොධිසත්ත්වයන් කියන්නාහු "එම්බල දරුව බොහෝකොට කිමෙන් කායර්‍යය කිම්ද එකසීල රැකිනම් බොහෝ කෙලෙසුන් නැසීමට හා බොහෝ සතුන් නැසීමට කාරණා වෙයි කීහ"යි වදාරා මේ **ඒකපාදජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි පුත්‍රයා නම් මෙසමයෙහි මේ කුමාරයාය, බරණැස් සිටුව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේකි. මේ බණ අවසානයෙහි දී දෙපුතුපියෝ දෘඝත්නයින් ප්‍රතිමණ්ඩිතවූ සොවාන්පෙළෙහි පිහිටියාහ.

---

## 232
## අරිතමෘත ජාතකය

තවද සඩමී මහාතිලක වූ සම්බුදුරජාණන්වහන්සේ වෙළුවනාරාම යෙහි වැඩවසන සමයෙහි අජාසත් රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලද.

කෝසල රජ්ජුරුවන්ගේ නැගනියෝ බිම්සර රජ්ජුරුවන්ට පාවාදෙන් නාහ. ඒ පාවාදෙන ගමනේ තමන්ගේ නැගනියන් නානාපිණ්ඩයයි ලක්ෂයක් වටිනා කසිගමක් දුන්නාහ. පසුව අජාසත් රජ්ජුරුවන් විසින් පියානන් මැරූ පසු මැනියෝත් රජ්ජුරුවන්කෙරේ සොකයෙන්ම මළහ.

එවිට කෝසල රජජුරුවෝත් පියා මරාපු සොරාව මාගේ නැගනියන්ට දුයාදදුන් ගම නොදෙම් කියා උන්නාහ. මේ ගම නිසා දෙමයිලෝ උනුන් හා දවස්පතා සටන් කරන්නාහ. සමහර දවස් කෝසල රජ්ජුරුවෝ බිඳී පලා යන්නාහ, සමහර දවස් අජාසත් රජ්ජුරුවෝ බිඳී පලායන්නාහ.

අජාසත් රජ්ජුරුවෝ දිනාපියා නුවරට එන කල බොහෝ ගැස්සුම් පිමබුම් ඇතිව එන්නාහ. පැරද එතවිට ඒ ප්‍රසිඩ කාටවත් නාඟවා එන්නාහ. මේ පතත සඩඝයාවහන්සේ එදවස් කථාකොට කොට උන්කලට සම්බුදුන් වහන්සේ එතනට වැඩ වදුරා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදුරා එපවත් අසා "මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් තමන්ට පරාජයක් වූ වේලේ විකෘපව වූවෝවේදැයි වදුරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

යම්වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ එක්වැවෙක නීලමණ්ඩුකව උපන්නාහ. එසමයෙහි එක් කෙවුලෙක් වැවට කෙමනක් එබීය. ඒ කෙමනට බොහෝ මත්ස්‍යයෝ වන්නාහ. එක් උදක සම්පියෙක් මසුන් කන්ටයයි මසුන් ලා කැටිව කෙමනට වන. එවිට බොහෝ මත්ස්‍යයෝ ඒ සම්පියා කඩා කා ලේමුසුකොටපුවාහ ඒ සම්පියාන් කෙමනින් මැත්විය. ඒ වේලාවට නීල මණ්ඩුකයාත් එනන සිටියෝය. නීලමණ්ඩුකයා දැක සම්පියා කියන්නේ එම්බල නීලමණ්ඩුකය මත්ස්‍යයන් විසින් අත්‍යාය කරණ නියාව තොපටත් හැඟීදැයි කීහ. එවිට මණ්ඩුකයා කියන්නේ "ඇයි තොප විසින් මත්ස්‍ය යන්ට අත්‍යාය කරණා කළ මුයිත් තමුන්ට විෂයවූ වේලේ අත්‍යාය කරන්නේවේදැයි කීහ. මත්ස්‍යයෝ ඇවිත් සම්පියා කා මරාපුවාහ"යි වදාරා අරිතමෘත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ජල සම්පියා නම් අජාතශත්‍රු රජ්ජුරුවෝය, නීලමණ්ඩුකව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මය"යි වදාළසේකි.

---

## 233
## මහා පිඬඟල ජාතකය.

තිවද සඹමී මහාකේතුවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තසථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්;**

දෙවදත්තසථවිරයෝ නවමසක් ව්‍යාධියට පැමිණ බුදුන් දකින්ට ජේතවනාරාමයෙහි වාසල සමීපයට ආ ගමනේ පොළොව පැලී තරකයට වැටුනාහ. ඒ දුටු ඇසූ බොහෝ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීහු අග්‍ර මහාඝතුටුවූහ. සඞ්ඝයාවහන්සේත් මේ කථාව කියා කියා වැඩ උන් තෙනව සම්බුදුරජාණන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා" එපවත් අසා "දැන්මතු නොවෙයි, පෙරත් දෙවදත්තසථවිරයන් මළපවත් අසා බොහෝ මනුෂ්‍යයෝ සතුටුවූවෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

**ඒ කෙසේද? යත්;**

ඉටගිය දවස බරණැස්නුවර පිඬඟල නම් රජෙක් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවෝ අසද්ධර්මයෙහි පිහිටා බොහෝ මනුෂ්‍යයන්ට වධබන්ධනාදීවූ නිග්‍රහ කරන්නේය. බොහෝ මනුෂ්‍යයන් මැඩ අයුක්තියෙන් රාජ්‍යය කරන්නේය. තමාගේ පුත්‍ර මිත්‍ර බන්ධුවර්ගීයා අමාත්‍ය ගෘහපති සේනා ආදීවූ බොහෝ සත්ත්වයන් කෙරෙහි කිසි දයාවක් නැත්තේය. බොහෝ මනුෂ්‍යයෝත් රජ්ජුරුවන් කෙරෙහි කිසි දයාවක් නැතිව තම තමන්ගේ ඇඟ ගැසූ කටුවක්සේ රජ්ජුරුවන් කෙරෙහි වෛරීව ඉන්නාහ.

බොධිසත්ත්වයෝත් රජ්ජුරුවන්ට පුත්ව උපන්හ. පිඬඟල රජ්ජුරුවෝත් බොහෝ දවසකින් මළාහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ සතුටුව සියගණන් ගැල්වලින් දරපවවා ආදාහන භූමියෙහිලා ආදාහන කළාහ. සියගණන් පැන්කල ගෙන්වාගෙණ සුසාන භූමියෙම් වත්කොට ආදාහනය නිවා බොධිසත්ත්වයන්ට ඔටුනු පළඳවා බොහෝ ශ්‍රමණ ගෘහපති ආදීහු සත්ත්වයෝ අධර්මිෂ්ඨවූ රජ්ජුරුවන් නැසීගොස් ධර්මිෂ්ඨ රජ්ජුරුවන් ලදුම්හයි සතුටුව රජ්ජුරුවන් වටකොට සිටිනා වෙලාවට එක්තරා දෙරටුපාලයෙක් ඒ වේලාවට ආශ්වාස ප්‍රශ්වාස නැතිව අඬන්ට වන.

එවිට ඒ දුටු බෝධිසත්ත්වයෝ කියන්නාහු මපියාණන් වහන්සේ බොහෝ දෙනාට උක්දණ්ඩක් මිරිකා වසල්ලක් ඇරගන්නාසේ බොහෝ දෙනාට අන්‍යාය කළ විසින් පිහුවන් ඇස් ඇන්නාවූ රජ්ජුරුවන් මළා යහපතැයි බොහෝදෙනා සතුටුව ඉන්දදී නා ආශ්වාස ප්‍රශ්වාස නැතිව අඬන්ට තොපට රජ්ජුරුවන් වහන්සේ කුමන යහපතක් කළ හෙයින්දැයි විචාළාහ.

ඒ අසා දෙරටුපාලයා කියන්නේ "උන්වහන්සේ මට කළාවූ යහපත සිතා අඬන්නේ නොවෙයි, පිහුවන් ඇස් ඇති ඒ පිඬඟල රජ්ජුරුවන් වහන්සේ උඩුමාලයට යන වේලේත් බස්නාවේලේත් නැවම්යෙකු කුලක් ඇරගෙණ

ඛානාක් මෙන් වොකු අටක් බැගින් අන්නාහ. ඒ ඇත ඇත අෘ අභ්‍යාසයවම යමයන්ගේ ඔලුවේ ඇනිසේක් නම් උසිත් වොකු කාපියා පෙරලාත් මෙතනට එවාපු නම් තවත් මට වොකු ඇත්තෙම වේදැයි අඬමි'' කීහ.

එබස් රජ්ජුරුවෝ අසා මූ අස්වසන්ට උවමැතවැයි සිතා කියන්නාහු 'ඒ කිම්දැයි සියඟණන් ගැල්වලින් දරපටවා දවතලද සියදහස් ගණන් පැන්කල වත්කොට සුසාන භූමියේ ගිනි නිවාපියතලද වවකොට පවුර බඳනාලද එසේ හෙයින් මළාවූ සත්ත්ව කෙනෙක් අනික් ජාතියක උපදිතොත් මිසක් මෙම සැටියේ එම කයින් නූපදනාහයි වදරා දෙරටුපාලයා අස්වැසූහ.

''එසමයෙහි පිඹුල රජ්ජුරුවෝ නම් දෙවදත්තසථවිරය, පිඹුල රජ්ජුරුවන්ට පුත්ව උපන් ධර්මිෂ්ඨරජ්ජුරුවෝ නම් බුදුවූ මම්මය''යි වදළසේකි.

---

## 234
## සඞ්ඛඩ්ඪක ජාතකය

මේවද සඞ්ඝ මහානිධානවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකයවදළසේකි.

**ඒ කෙසේද? යත්;**

එක්දවසක් ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ දෙවදත්ත සථවිරයෝ තමන්ට තිබි ලාභසත්කාර නාලාගිරියා මෙහෙයිමෙන් ලාභසත්කාර පිරිහෙළා ගත්තාහයි යන කථාව කියා කියා උන්තෙනට සම්බුදුයන් වහන්සේ වැඩ වදරා ''මහණෙනි මා එන්නාට පුම්භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි දිවාරා වදරා එපවත් අසා ''මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් දෙවදත්තසථවිරයෝ තමන්ට පැමිණි ලාභසත්කාරය පිරිහෙලා ගත්තෝ වේදැ''යි වදරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේකි.

**ඒ කෙසේද? යත්,**

අතීතයිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෙකුනුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ පුරෝහිත බ්‍රාහ්මණව උපන්නාහ. බොධිසත්ත්වයෝ පෘථිවි මන්ත්‍රයක් දන්නාහ. එ මන්ත්‍රය නම් සියල්ලවුන්ම ලබ්බා ගන්නාවූ ආඥාවක් ඇත්තේය. එසේ වීසින් බොධිසත්ත්වයෝ ඒ මන්ත්‍රය කාත් දක්කදී නොපිරිවන්නාහ, එක්දවසක් සිස්වූ එලියක හිඳගෙණ මන්ත්‍රය පරිවන්නාහ.

ඒ වේලාවට එක් කැතහිලෙක් මන්ත්‍රය පිරිවනු අසාගෙණ උන් තැනැත්තේ මන්ත්‍රය ඉගෙණගත. එකජවනේම ඉගෙණගන්ට කාරණා කිම් දැයි යතහොත් පෙර ඔහු බ්‍රාහ්මණව ඉපද මේ මන්ත්‍රය දන්නේය. ඒ අභ්‍යාසය ඇති හෙයින් මන්ත්‍රය එකවරින්ම ඉගෙණගත. එවිට බ්‍රාහ්මණ මට ඒ මන්ත්‍රය නිපුණැයි කියා නික්මින. එවිට සිඟාලයාත් මටත් මන්ත්‍රය නිපුනැයි කියා නික්මින.

මේ කැනහිලා නිසා බෝ විනාසවෙයි සිතා කැනහිලා අල්වයි කීහ. ඒ කැණහිලාත් වනා දිවගෙණ ගොස් වනයට වැද එක්තරා කැණහිල්දෙනක බැලීය. එදට කැණහිල්දෙන් 'ඇයිද සවාමිනි, කිව. එවිට කැනහිල් ඇයි තෝ නාදුනෙයිද මම සිව්පාවුන්ට රදවීම් කියා ඒ මන්ත්‍රය කීය. ඒ වේලේත් බොහෝ කැණහිලුන් පළමුකොට එක්වූවාහ.

ඉක්බිති සිංහ, ව්‍යාඝ්‍ර, ඇත්, අස්, දිවි, වලස්, මුවන්, ගෝණන් උෂරන්, සාවුන් ආදීවූ බොහෝ සිව්පාවෝ පිරිවරා ගත්තාහ. ඒ සිඟාලත් එක්තරා සිඟාල ධෙනුවක් අගමෙහෙසුන් කොට සමීදෘඨව තම් රජව මා විසින් මනුෂ්‍යයන්ට රාජ්‍යය කරන්ට උවමැනවැයි සිතා ඇතුන් දෙන්නකුපිට සිංහයකු සිටුවා සිංහයාපිට තමන් හා තමන්ගේ අග්‍රමහෙසිකා සිඟාලධෙනුව හා දෙන්න සිංහයා පිටට නැගී දෙළොස් යොත්තක් ගැවසී සිටි සිව්පා සේනාව පිරිවරා බරණැස් නුවර වටකොටගෙණ සිට බරණැස් රජ්ජුරුවන්ට කියා යවන්නාහු· ''රාජ්‍යය නෝ දෙන්නේය. යුඩ හෝ කරන්නේයයි කියා යවූහ. බොහෝ නුවරවාසී සිංහයන් ආදිවූවන් දැක භයින් ත්‍රාසටව වාසල් අගුළුලූහ. එවිට බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු දෙවයෙනි නොබවමැනව මේ සබබදෘඨක තම් කැණහිලා සමග කැවිව කරණ යුඩය මට භාරයයි කියා අවිටාලයට නැගී සබබදෘඨක තම් කැණහිලා දැක කියන්නාහු ''එම්බල සබබදෘඨක තම් කැණහිල, තා නුවර ගත්තේ කා කා ඇරගෙණදැ''යි විවාළාහ. එවිට කැණහිල් කියන්නේ ''මාගේ සිඟාලයන් ඇරගෙණ ඔවුන් ලවා නාදකරවා ඒ නාදයෙන් බියගත්තාවූ නුවර හඬින් භයගන්වා නුවර ගණිමි'' කීහ. එබස් අසා බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බල සිඟාලය තා මෙනුවර ගත්තේ කවුරුන් ලවාදැයි විවාළාහ. එවිට කැණහිල් කියන්නේ ''මාගේ කේසරසිංහයන් ලවා නාදකරවා ඒ නාදයෙන් බියගත්තාවූ නුවර සිංහඬින් භයගන්වා නුවර ගණිමි''යි කීහ. එබස් බොධිසත්ත්වයෝ අසා අවිටාලයෙන් බිමට බැස මූළුනුවර බෙරලවා නුවරවාසීන් කණ උදුපිටි ඛහාගෙණ ඉදිරිගේ බෙරලවා නුවරවාසී ඒ නියායෙන්ම යටිත්පිරිසෙයින් ගෙයි වඩනා පක්ෂීන් කණත් උදුපිටි ලූවාහ. ඒ නියාවට උදුපිටි ලූපසු බොධිසත්ත්වයෝ අවිටාලයට නැගී කැණහිලාට කියන්නාහු තාසේවූ නීච කැණහිලෙකු කිවා අසා උත්තමජාති කේසර සිංහයෝ නාද කෙරෙද්දැ''යි කීහ.

එබස් අසා කැණහිල් කියන්නේ බ්‍රාහ්මණය මාගේ සෙසු සිංහයන්තබා මේ සිංහයා අඩගස්සන්නදැ''යි කීහ. එබස් අසා යහපතැයි අඩගස්සයි කීහ. එවිට කැණහිලා නැගීවුන් සිංහයාට අඩගසන ලෙස සන්කෙළේය. එවිටසිංහයා ඇතාගේ කුම්භස්ථලයට ඩෑ මහත්කොට සිංහනාද කෙළේය. එවිට ඇතු භයින් දිවන්නාහු කැණහිලා පයින්ගසා සුනුවිසුනු කළාහ. ඇත්තු උනුන් ඇන බිඳ ගෙණ එනතම මළහ. දෙළොස් යොදුන් සිටියාවූ සිව්පා සේනාව සිංහයන් ඇර සෙස්සෝ මළහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ කණ තුබු උදුපිටි ඇර නුවරින් පිටත තුබූ බොහෝ සිව්පා සත්ත්ව සමූහයා දැක කන්න කා බොහෝ විසින් කපා වියලාගත්තාහ. එතැන් පවත් වැලඉරා ඇතිවීයයි දතයුතු.

සබ්බදෘඨක ජාතකය නිමවා වදාරා බුදුව වැඩහිඳ වදාරණසේක් ''මහණෙනි, යම්සේ සබබදෘඨක තම් සිඟාලයා තමාලද්දාවූ රාජ්‍යසම්පත් සථාවරකොට

ගතනොගී යම්සේ විතාශයට පැමිණියේද එමෙන්ම යම්සැමපතක් ලද්දාවූ පුරුෂයෙක් උඩහුව වාසය කෙරේනම් මෙසේ විනාශයට පැමිණෙන්නේ වේදැ''යි වදාරා මේ සබඛදායක කැණහිලා නම් දෙවදන්තසථවිරය බරණැස් රජ්ජුරුවෝ නම් ශාරිපුත්‍රසථවිරයෝය, බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්මය''යි වදාරා සඛඛ දායක නම් ජාතකය නිමවා වදාළ සේකි.

---

## 235
## සුනඛ ජාතකය

තවද සංසාර සේතුවූ සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි අඹ තම් සථානයෙහි පිහිටියාවූ හොජන ශාලාවෙක් ඇත. ඊට හෙන්නාවූ පැන්නාතයන් විසින් ගෙණවුත් මෙතන බත්කා වැඩෙති කියා එක්තරා බළු කුකුරු වකු එහා. එද භික්ෂූන් වහන්සේ විසින් ලබන ලද බත් කා වැඩි ස්ථූලකය ඇතිවිය. එක්තරා පිටිසරවාසී මනුෂ්‍යයෙක් ඒ සාලාවට අවුත් එතන සිට පැන්නානයන්ව යම්තම් රණක් කඩක් දී බල්ලා බළුකඩකින් බැඳලා ඇරගෙණ නික්මිණ. එවිට බළුන් බුරන්නවත් ඇවිටිකමක් කරන්නවත් උන් දුන් ගොදුරු කා උන්ද කම්පස් එකකු මෙන් උන.

ඒ පුරුෂයාන් බළු මා කෙරේ පුරුදුවියයි සිතා බැමම මිදීය. එවිට ඒ සුනඛ වහා අවුත් පළමු තමා සිටිතැනටම ගියේය. මේ කථාව ධම්සභාමණ්ඩපයෙහි භික්ෂූන් වහන්සේ කියා කියා වැඩඋන් තෙනට සම්බුදුරජාණන් වහන්සේ වැඩ වදාරා ''මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනු දැයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් සුනඛ සොරකම් දන්නේවේදැ''යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

**ඒ කෙසේද? යත්;**

යම්කිසිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක්තරා කෙළෙඹි පුත්‍රයෙක් වඩන්නාවූ බළුකුක්කෙක් ඇත. ඒ බළුකුකු ඔහු විසින් ලබනලද්දාවූ බත් කා ස්ථූලවූ කය ඇතිවිය. එක්තරා පිටිසරවැසි මනුෂ්‍යයෙක් බල්ලා දැක ඒ කෙළෙඹිපුත්‍රයාට මසුරන් දහයක් හා කඩක් දී ඒ බල්ලා බැඳගෙණ ගියේය. එවිට ඒ බළුන් බුරන්නක්වත් නොකොට උන් දුන් ගොදුරු කා උන් කම්පස් එකකුමෙන් උන්නේය. ඒ පුරුෂයාන් බල්ලා ඇරගෙණ ගොස් වනාන්තරයෙහි බල්ලා කරපටින් බැඳ ඒ පුරුෂ වැදහෝ නින්දට වන. එවිට බොධිසත්ත්වයෝත් එතනට කටයුත්තක් නිසා ආවාහු බල්ලා දැක කියන්නාහු ''වරපට සපාකා කඩාපියන්ට පුළුවන්වත් බැමිකඩාගෙණ නොගොස් ඉඳීය. මෙසේවූ අනඳමනඳයෝ ඇද්දැ''යි කිහ. එබස් ඇසූ සුනඛ කියන්නේ ''පණ්ඩිතයෙනි, නොප කීවාම මාගේ සිතට නහා ගතිමි. නැත්නම් බැඳගන්නේවේද එසේ හෙයින් අවසරයක් බලා යෙමි කියා ඒ පුරුෂයා නිදුපු කල්හිතෙමේ බැඳුම් කඩාගෙණ තමා වසන තෙනට ගියේයයි වදාරා මේ සුනඛ ජාතකය නිමවා වදාළසේක.

ಚಿತ್ರ ೨೦ ಗಂಧರ್ವರು

"එසමයෙහි ඒ සුනඛයා නම් මෙසමයෙහි සුනඛය. ඒ පණ්ඩිතයෝ නම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 236
## ගුත්තිල ජාතකය.

තිවද සංසාර නෙෂකා වූ සම්බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්;

එක් දවසක් සඞ්ඝයාවහන්සේ දෙවදත්තස්ථවිරයන්ව කියතසේක් "ඇවැත්නි සම්බුදුරජාණන්වහන්සේගෙන් තෙපි ත්‍රිපිටකයත් දරණ ලද, සම්බුදුරජාණන් වහන්සේ නිසා චතුර්ථධ්‍යානයත් ලබනලද, එසේවූ බොහෝ උපකාරීව තොපට ආචාරි පදවියෙහි සිටි සම්බුදුරජාණන්වහන්සේට තෙපි සමව සිතා විපරීතව කුමට ඉඳුදැ"යි කියා කීසේක.

ඒ අසා දෙවදත්තසථවිරයන්වහන්සේ කියතසේක් "ඇවැත්නි සම්බුදුරජාණන්වහන්සේ මට කුමන ලාභසත්කාර කළෝද? මම්ම ත්‍රිපිටකය දරිම්, මම්ම ධ්‍යාන උපදවාගනිම්, සම්බුදුරජාණෝ මට කුමක් කළෝදැ"යි කීහ. මේ කථාව ධර්ම සභා මණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන්වහන්සේ කිය කියා වැඩවුන් තැනට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්වයෙහි කවර නම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි පෙරත් දෙවදත්තසථවිරයෝ ගුරුන්ව අපකඛ්‍යාතකම් කළෝවේදැ"යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

ඒ කෙසේද? යත්;

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ගාන්ධී නම් විද්දත් කුලයක ඉපද වැඩිවිය පැමිණ ගාන්ධී නම් සිල්පය නිමවා ඉගෙණගෙණ ගුත්තිල නම් ගාන්ධීයයි යන නමින් දඹදිව ප්‍රසිඛවූහ. අනිවූ දෙමව්පියන් රක්නාහ.

එසමයෙහි බරණැස්නුවර සිව වෙළෙන්දු උදේනි රටට ආවාහු එක් දවසක් ඉස්සෝධා නහා කා බී සැපසේ උන්නාහු අපව ගී කියන්ට විණාගායනා දන්නා විද්දතෙකු ගෙණෙවයි කීහ. යහපතැයි කියා එගම ගාන්ධීයන්ට නායකවූ මූසිල නම් ගාන්ධීයෙක් එහනට අවුත් එකියන වෙළඳුන්ව නවා ගී කීය. ඒ අසා ව්‍යාපාරයෝ සතුටුවන්නාක් නුවූහ. එවිට මූසිලයෝත් මද්දම කොට විණාගාන්ට වන, එවිටත් මදකුත් සතුටු නුවූහ. උත්තමකොට විණාගාන්ට වන, එවිටත් කිසිකෙනෙක් සතුටු නුවූහ. එවිට මූසිල නම් ගාන්ධී සිතන්නේ එසේවිනම් මුන් හැම විශෙෂයෙක් නොදන්නා කෙනෙකුන් වනැයි සිතා එසේනම් මමත් මුන්හැම නොදන්නා මිනිසුන්ට නපුරුකොට ගායනා කරන්ට වන. එවේලේත් කිසිකෙනෙක් සතුටක් නුවූහ.

එවිට මූසිල නම් ගාන්ධර්වයා කියන්නේ "ඇයි තොපි හැම මා මේසේ ගායනාකරද්දීත් බැණනොනැගී ඉන්නේ කිසි විශෙෂයක් නොදන්නා හෙයින්ද? නැත්නම් මට වඩා ගාන්ධර්වකරන්නා ගාන්ධර්වයෙකු දුටුවිරු ඇද්ද"යි විවාළේය. එඛස් අසා මනුෂ්‍යයෝ කියන්නාහු 'එම්බල මූසිල නම් ගාන්ධර්වය ගුත්තිල නම් ගාන්ධර්වයන්ගේ වීණානාදය ඇසුවාවූ අපට තොපගේ වීනානාදය උණපත්තෙක ගාන්නාක්මෙන් අපට සිතෙයි" කීහ. එඛස් ඇසූ මූසිල ගාන්ධර්වයන්නේ "එසේවීනම් තොපහැම බරණැස්නුවරට යනකල මාත් කැන්දගෙණ යව"යි කීය. 'යහපතැ'යි එකියන ව්‍යාපාරයෝත් තමන් බරණැස් නුවරට යන ගමනේ එකියන මූසිල නම් ගාන්ධර්වයාත් කැඳවාගෙණ ගොස් බරණැස් ගුත්තිල ගාන්ධර්වයන්ගේ ගෙය පැහ. තමන් තමන්ගේ වාසස්ථානයට ගියාහ.

එකියන මූසිල නම් ගාන්ධර්වයන් ගෙට වත, ඒ වේලාවට බොධිසත්ත්වයෝ ගෙයි නැත්තාහ. එවිට මූසිල නම් ගාන්ධර්ව බොධිසත්ත්වයන්ගේ ඉද්දෙර තිබූ ජාතිවීණාව ගාන්වවත. අඹුවූ බොධිසත්ත්වයන්ගේ දෙමවුපියෝ කියන්නාහු අපගේ දරුවන්ගේ වීණාවක් මියන් එක්වපියා කපනසැටියයි කිහ. ගාන්ධර්ව බොධිසත්ත්වයන්ගේ දෙමවුපියන් වැඳලා නුඹවහන්සේගේ පුතානුවන් නොයි දැ"යි විවාළාහ. එවිට බොධිසත්ත්වයන්ගේ දෙමව්පියෝ කියන්නාහු "දැන් දරුවෝ එති මෙතන ඉඳුව"යි කියා උන් අවස්ථාවට බොධිසත්ත්වයෝත් එතනට ආහ.

එවිට මූසිල නම් ගාන්ධර්ව බොධිසත්ත්වයන් වැඳ තමාට සිලප උගන්වන්ට කීහ. එවිට බොධිසත්ත්වයෝත් සාමුද්‍රිකා ලක්ෂණ දන්නා හෙයින් මේ අසත් පුරුෂයායි කියා දැන තොපට මා දෙන විද්‍යා නැත, පලායව"යි කීහ. එකියන මූසිලයාත් බොධිසත්ත්වයින් නොකැමැතිවූවත් බොධිසත්ත්වයන්ගේ දෙමව් පියන්ගේ සිත්ගෙණ 'නුඹවහන්සේගේ පුතානුවන්වහන්සේට කියා මට සිල්පදෙන්ට කිවමැනවැ"යි කියා යාචඤ්ඤාකළේය. බොධිසත්ත්වයන්ගේ දෙමව් පියෝත් බොධිසත්ත්වයන්ට කියන්නාහු "මොහුට සිල්ප උගන්ව"යි කීහ. බොධිසත්ත්වයෝත් දෙමව්පියන් කීවා අපත්වන්ට බැරිහෙයින් යාපතැයි කියා ආචාරිභාග නොනිබාම සිල්ප නිමාවට විද්‍යාව ඉගැන්වූහ.

බොධිසත්ත්වයෝත් රජ්ජුරුවන් දකින්ට යනවිටෙක අතාවැස්සනුත් ඇරගෙණ යන්නාහ. රජ්ජුරුවෝ මූ කවුරුදැයි විවාරන්නා දෙවයන්වහන්ස මාගේ අන්තේවාසිකයෙක්යයි කී සේක. රජ්ජුරුවෝත් උභ හා සමග කල් යාමෙන් විශ්වාසවූහ. බොධිසත්ත්වයෝත් 'දරුව තොපට වඩා මම විද්‍යාව නිමවා දනිමි' කීහ. එක්දවසක් මූසිල ගාන්ධර්වයා සිතන්නේ 'මම ඔබ්බේ නුවරකට ගොස් ජීවත්වන්නා බලා ඇමවම ප්‍රධානවූ බරණැස්නුවර ඉඳිමි'යි 'ආචාරීන් වයොවෘද්ධයහ, එසේහෙයින් මෙතනම ඉඳිමි'යි සිතා බොධිසත්ත්වයන්ට කියන්නේ "ආචාරීන්වහන්ස රජ්ජුරුවන්වහන්සේට සේවයකරන්නා කැමැත්තෙමි එසේහෙයින් මට පඬියක් සලස්වන්නා කැමැත්තෙමි" කීහ. බෝධිසත්ත්වයෝත් රජ්ජුරුවන්ට ගොසින් කියමි කියා රජ්ජුරුවන් සම්පයව ගොස් කියන්නාහු "දෙවයන්වහන්ස මාගේ අන්තේවාසිකයා නුඹවහන්සේට සේවයකරන්නා කැමැත්තේය උභට පඬියක් සලස්වන්ට උවමැනවැ"යි කීහ. රජ්ජුරුවෝත් "එසේවීනම් තොපගේ පඬිනියාව භාගයක් සලස්වාලමි" කීහ.

එපවත් ගොස් ශිෂ්‍යයන්ට කීහ, ශිෂ්‍යයෝ කියන්නාහු "ඇයි මාත් ශාස්ත්‍ර සරියේ දනිත්වුව මට පඬි අඩුවන්ට කාරණා කවරේදැ"යි කීහ. එපවත් බෝධි සත්ත්වයෝ ගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ "තොප සරියටවිද්‍යා පැතම් එතරම් නියාවට පඬිත්වෙයි"කීහ.

බෝධිසත්ත්වයෝ එපවත් ශිෂ්‍යයන්ට කීහ. ශිෂ්‍යයෝ "යහපතැයි විද්‍යා නියාවට යාම්" කීහ. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයෝත් ශිෂ්‍යයාත් ලඟවගෙන්වා ගිෂ්‍යයාට කියන්නාහු "එම්බල තොප විසින් ගුත්තිල නම් ගාඬ්ඛීයන් හා කැටිව වාදකරන්ට පිළිවන්දැ"යි විවාළාහ. එවිට මූසිල කියන්නේ ශාස්ත්‍ර මාත් විශෙෂකොට දනුත් උව අදට සත්වෙනිදා උඹ හා මා හා වාදකරම්හයි කීහ. රජ්ජුරුවෝත් ගුත්තිල ගාඬ්ඛීයා හා ශිෂ්‍යයා හා දෙන්නා අදට සත් වෙනිදා වාදකෙරෙනි නුවර සැළකළහ. බොධිසත්ත්වයෝ සිතන්නාහු මේ කාරණය එසේහෙයින් මොහුගේ විද්‍යාව සහයට යෙදෙයි. මා වයොවෘඛහෙයින් සහයට නොයෙදෙයි. එසේහෙයින් මා සරිවුවත් පැරැද්දුහාම සරිය. පැරැද්දත් පැරදිනිශාමයයි සිතා එසේහෙයින් මූව පරදිනා බලාත් ප්‍රාණය නසා ගන්ට සහපතැයි සිතා වලට වදිමි සිතා ලජ්ජාවෙන් නික්මෙන්නාහ. මරණ භයින් ගෙට එන්නාහ. මේ නියායෙන් සත්දවසක් අවිච්ඡින්නව යාමෙන් ඒ මෙන්ම තනතලද මාවත්ව ගියේය. මේ නියායෙන් බොධිසත්ත්වයන් සත්වනදවස් වනාන්තරයට ප්‍රාණයනසාගන්ට ගියකල්හි ශක්‍රයන්ගේ පාඬු කම්බලශෛලාසනය උණුවිය. ශක්‍රයෝ මාගේ සම්පත් උදුරාගන්නේ කවුරුදැයි සිතා දිවසින් බැලුගමනේ බොධිසත්ත්වයන්ගේ වික්ෂෙපය දැක එතනට අවුත් "ඇයි අවාරීනි මෙතන අවුත් සිටියා වත"යි විවාළාහ. එවිට බොධි සත්ත්වයෝ තොපි කවුරුදැයි විචාරා "මම දෙදෙව්ලොවට අධිපතිවූ ශක්‍රයෝ ය"යි කීහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "සත් සත් තතක් ඇති වීණාවාද තමැන්නාවූ විද්‍යාව සෙට මා හා මාගේ ශිෂ්‍යයා හා දෙන්න රජ්ජුරුවන්ට පාමිහ. කෝසියගෝත්‍රයෙහි උපන්නාවූ ශක්‍රදේවේන්ද්‍රය මට පිටිවහල් වෙව"යි කීහ.

එවිට ශක්‍රයෝ කියන්නාහු "යහපත ආචාරීනි තොපට මම පිටිවහල් වෙමි. තොප හා උන් හා සරියේ විද්‍යාව පාන්න, එකල්හි මා සංඥකළ වේලෙහි සත් තත කඩාපියව, තොප විසින් වීනාදණ්ඩ අතගසන්ටවන් වේලාව පළමු නියාවට නාද වඩිනේය, උගේ තත් සතෙහි නාද අඩුවෙයි. ඒ අවසථාවට තොප විසින් මේ පසඇට තුණ ආකාශයට දමන්නාම නවසියයක් දිව්‍යස්ත්‍රීන් නටන්නාහ, මමත් එතනට එන්නෙම්වේදැ"යි කියා ගියහ. මනුෂ්‍යයෝත් සෙට දවස් ගුත්තිල ගාඬ්ඛීයා හා මූසිල නම් අතවැස්සා හා දෙන්නාගේ සෙට තඹීවන්නේයයි කියා මැසිපිට මැසිබැඳ රථපිට රථ තබාගෙණ හිවී ගැවසී සිටගත්හ.

බොධිසත්ත්වයෝත් තමන්ගේ ජානිවීණාව ඇරගෙණ අවුත් තමන්ට පැනවූ අස්නපිට උන්නාහ. මූසිල නම් අතවැසිත් තමාට පැනවූ අස්නපිට උන්නේය, බොහෝ මනුෂ්‍යයෝත් බලාසිටියාහ, රජ්ජුරුවෝත් රාජාසනයෙහි උන්නාහ, ශක්‍රදෙවෙන්ද්‍රයෝත් ආකාශයෙහි අදෘශ්‍යමානව සිටියාහ. ශක්‍රයන් ආ නියාව බොධිසත්ත්වයෝ පමණක් දන්නාහ. එවිට බොධිසත්ත්වයන් හා අතවැසි විද්‍යාව සමව පැහ. බොහෝදෙන විද්‍යාව පැනියාව යහපතැයි බොහෝ

සතුටුවූහ. එවිට ශක්‍රයන්ගේ සංඥාවෙන් බොධිසත්ත්වයෝ පළමුවන තන කඩාපුවාහ. එවිට ඒ තත් සිදුරෙන් පළමු නාදනියාවට මහත්ව නාදපවනින්ට වන. ඒ දැක මූසිල ගාන්ධර්ව්‍යන් තත් කැඩිය, ඒ අඩ ආදි නියාවට අඩුවිය. මේ නියායෙන් බොධිසත්ත්වයෝ දෙවන තතය, තුන්වන තතය, සතරවන තතය, පස්වන තතය, සවන තතය, සත්වන තතයයි මේ නියායෙන් තත් සතම කඩා වීණාදණ්ඩ වීණාගාන්ට වන්නාහ. බරණැස්නුවර එකනින් නාදව ඇසෙන්ටවන. මූසිලයාන් මේ නියාවට තත් සතම කඩා නාදකරන්ට වන් වේලාවට උනපත්තෙක අතගාන කලක්මෙන් නිශ්ශබ්ද වීය.

ඒ වේලාවට බොධිසත්ත්වයෝ ශක්‍රයන් දුන් පස ඇට තුනින් එකක් ආකාශයට දැමූහ. තුන්සියයක් දිව්‍යස්ත්‍රීන් නවන්ට වන්නාහ, දෙවෙනි පස ඇට දැමූහ, එවිට තුන්සියයක් දිව්‍යස්ත්‍රීන් නටන්ට වන්නාහ. තුන්වෙනි පස ඇට දැමූකල්හි තුන්සියයක් දිව්‍යස්ත්‍රීන් නටන්ට වන්නාහ, මේ නියායෙන් නව සියයක් දිව්‍ය ස්ත්‍රීන් නවන්ට වන්නාහ, බොධිසත්ත්වයෝ මියුරුවූ ගීතිකා කිය කියා වීණානාද කරන්නාහ. ඒ දුටු රජ්ජුරුවන් හා නුවරවාසි බොහෝ සතුටු වූහ. රජ්ජුරුවෝ මූසිලයා කෙරේ කිපී අමාත්‍යයන්ගේ මූනබැලුහ අමාත්‍යයෝ රජ්ජුරුවන්ගේ අභිප්‍රාය දන්නාහුවිසින් ආචාරීන් කැටිව ගුරුද්‍රෝහ කරණ ලදුයි තමන් තමන්ගේ අත තිබූ කැටමුගුරු බාලා මරා තලා පස අල්වා ඉවත දැමූහ.

රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන් කෙරෙහි සතුටුවූහ. එකපැතිර වස්ත්‍ර, මනාවශීවක්මෙන් බොහෝ සත්රුවන් ආදීවූ ප්‍රසාද දුන්නාහ. නුවරවාසි බොහෝ සම්පත් දුන්නාහ. ශක්‍රයෝත් "මා විසින් තොපගේ ගෙට වෛජයන්ත රථය එවමි, තොපි ඒ රථයට නැගී මාකරා එව"යි කියා දිව්‍යලෝකයට ගියහ. දිව්‍යස්ත්‍රීන් 'ඇයි දෙවයන්වහන්ස යම්තම්වේලක් පමාවූයේද"යි විචාරා 'ගුත්තිල ගාන්ධර්වයන්ගේ වීණානාදය අසන්ට ගියෙමි'කීකල්හි එවිට දිව්‍යස්ත්‍රීන් 'අපිත් වීණානාදය අසන්නා කැමැත්තම්හ'යි කියන්නා ශක්‍රයන් විසින් මාතලී නම් දිව්‍යපුත්‍රයා අත වෛජයන්ත නම් රථය යවූහ.

බොධිසත්ත්වයෝත් ඒ රථයට නැගී ශක්‍රයන් ලඟට අවුත් සිටියාහ. ශක්‍රයෝ "ආචාරීනි වීණාගායනාකරව"යි කීහ. බොධිසත්ත්වයෝ කියන්නාහු "විජ්ජත්තු නම් මිලයක් ඇතිව මිසක් විද්‍යුතොපානාහ, එසේවීනම් මා විද්‍යු පෑ කල දෙන්නේ කිම්දැ"යි කීහ. ශක්‍රයෝ විද්‍යු පෑකල බොහෝ සම්පත් දෙම්මැයි කියන්නා සම්පතින් මට කාර්‍යය නැත, මම නුඹවහන්සේගේ දෙතිස් දිව්‍යස්ත්‍රීන්ගේ පින් අසන්නා පමණකැයි කීහ. එවිට දිව්‍යස්ත්‍රීන් වීණානාද කරන්නා ආචාරීනි අප කළ පින් කියම්හයි කීහ. එවිට බොධිසත්ත්වයෝත් යහපතැයි කියා දිව්‍යගාන්ධර්වියන් මෙන් ගායනාකොට පෑ පළමුවන දිව්‍යස්ත්‍රිය අතින් විවාරන්නාහු "තොපි ඔසධිතාරකාවන් මෙන් විශිෂ්ටවූ රූවින් දසදිග බබුලුවා දහස්ගණන් දිව්‍යස්ත්‍රීන් විසින් පිරිවරණලදුව සිටිනීය, එසේහෙයින් තොප දැක මට සන්තොෂකරවයි මනුෂ්‍යත්වභාවයෙහිදී කෙසේවූ පිණක් කොට මේ දිව්‍ය භවතයෙහි උපන්දැයි ඒ මට කියවයි කීහ. ඔයිත් කියන්නී "ගාන්ධර්වියානෙනි මනුෂ්‍යත්වභාවයෙහි සිටි මා විසින් කාශ්‍යප සම්මාසම්බුදු රජානන්වහන්සේගේ ශාසනයෙහි රහත්තමකට පිළිසඟලක් දිනිමි. ඒ විපාකයෙන් මේ නියා ආනුභාවයක් ඇතිව උපනිමි"යි කීහ. බොධිසත්ත්වයෝ සෙස්සන් අතිනුත් විවාළාහ, සෙස්සෝත් තමන් කළ කුසල් කීහ.

**ඒ කෙසේද? යත්,**

එකෙක් කියන්නී 'මල්තලඔක් පුදා දිව්‍යලෝකයෙහි උපනිමි' කීහ. එකෙක් එක් දැගැබකට සුවඳ පසඟුල්දී ඒ පින්කමින් දිව්‍යලෝකයෙහි උපනිමි කීහ. එකෙක් සුවඳ බඩුවක් දන්දී උපනිමි කීහ. එකෙක් මිහිරි ඵලාඵල දන්දී දිව්‍යලෝකයෙහි උපනිමි කීහ. එකෙක් මිහිරි ඵලාඵලයක්ම දන්දී උපනිමි කීහ. එකෙක් මිහිරිරස නිඝණ්ඨන් වහන්සේට දන්දී උපනිමි කීහ. එකෙක් කාශ්‍යප බුදුන්ගේ දැගොබකට සිය අතින් පසඟුල් දී උපනිමි කිව, එකෙක් මන්මුළාගෙන් ආ නිඝණ්ඨන් වහන්සේට දන්දී බණ අසා දිව්‍යලෝකයෙහි උපනිමි කිව. එකෙක් නැවින් යන වහන්දැ කෙනෙකුන්ට පැන් පිළිගන්වා උපනිමි කිව. එකෙක් නැදි මයිලන් ආක්‍රොශ බිණිුයදී බැණනොනැගී මෛත්‍රීකොට උපනිමි කිව. එකෙක් තමා ලත් බත් කොටස බෙදා දන්දී උපනිමි කිව, එකෙක් අනුන්ව වාල්ව ඉපද තමා ලද දෙය දන්දී උපනිමි කිව, මේ නියායෙන් දෙනිස් දිව්‍යස්ත්‍රීන් තමන් කළ පින් බොධිසත්ත්වයන්ට කීහ.

බෝධිසත්ත්වයෝත් තමන්ගේ ජීවිතය ලද්දාවූ පල ලදිමි' කියා සතුටුව මනුෂ්‍යලෝකයට අවුත් එපවත් බොහෝ දෙනාහට කියා බොහෝදෙනා පින් කමෙහි ඇසුරුවා වදාරා මේ **ගුත්තිල ජාතකය** නිමවා වදාළසේකි.

එසමයෙහි මූසිල ගාන්ධීයා නම් දෙවදත්තසථවිරය, බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරය, ශක්‍රයෝ නම් අනුරුඬසථවිරය, ගුත්තිල ගාන්ධීව උපන්නෙම් බුදුවූ මම්ය"යි වදාළසේකි.

---

## 237
## විතිචඡ ජාතකය

**එවද** සංසාර සාගරපාරගතවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පලාසපරිබ්‍රාජකයන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්;**

පලාස පරිබ්‍රාජක කෙනෙක් මුළුරට තමන්ට වඩිනා කෙනෙකුන් නොදැක සැවැත්නුවරට අවුත් "මා හා සමග තර්ක කරන්ට සමර්ථයෝ ඇද්ද"යි විචාරා මනුෂ්‍යයන් විසින් සම්මාසම්බුදුරජාණන්වහන්සේ තොපසේවූ පරවාදීන් හා වාදකරන්ඩ සමර්ථයෝය එසේ හෙයින් සම්මාසම්බුදුරජාණන් කරා යවයි කීහ. යහපතැයි කියා ඒ කියන පරිබ්‍රාජකයා බුදුන් හා සමග තර්ක කරන්ට සිතා ජෙතවනාරාමයට ගියේය. සම්මාසම්බුදුරජාණන් හා තර්ක කළේය.

සම්මාසම්බුදුරජාණන්වහන්සේ ඌ කී ප්‍රශ්න "තොපි කී ප්‍රශ්න අපි විසඳුම්ම, අප කී ප්‍රශ්න විසඳවයි වදාරා එකෙක් තම් කිම්දැ"යි විචාළසේක. ඒ තෙම කුමක් බවත් නොදන්නේය. පැරද පලාගියේය. බොහෝ භික්ෂූන්වහන්සේ මේ කථාව කිය කියා උන්නෙනට සම්මාසම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා 'මහණෙනි, මා එන්නාට පූර්වභාග යෙහි කීනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි, පෙරත් මා එකබසින් පැරද පලාගියෝවේදැ"යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්මාසම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකි.

**ඒ කෙසේ ද? යත්;**

යි වකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණව ඉපිද පසුවකාම යෙහි ආදීනව දැක වනයට වැද සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වාසය කරණසේක. එසමයෙහි තක්‍කීකරන්නාවූ එක්තරා පරිබ්‍රාජකයෙක් බොධිසත්ත්වයන් වසන ගමකට ගියේය ඒ ගම්වාසීන් ලඟට ගොසින් "මා හා සමග තක්‍කීකරන්ට සමර්ථයෝ ඇද්ද"යි විචාරා මනුෂ්‍යයන් විසින් "තෙවනයේ ඉදිනා තාපසයෝ තොපසේවූ වාදීන් හා වාදකරන්ට සමර්ථයෝය. එසේහෙයින් තාපසයන් කරායව"යි කියා ඇරගෙණ බොහෝ මනුෂ්‍යයෝ බොධිසත්ත්වයන් වසන පන්සල සමීපයට ගියාහ.

බොධිසත්ත්වයෝ පරිබ්‍රාජකය මේ ගඩගාවෙන් ගෙණා සිහිල් පැන් බී ඉඳුවයි කීහ. එවිට පරිබ්‍රාජකයෝ පළමුකොට කි බස්ම අල්වාගෙණ හැකිතෙරෙම් සිතා කියන්නේ ගඩගාව නම් එගොඩද මෙහොඩද මැද්දේද දියෙන් යන්නාවූ තුන් සථානයෙන් ගඩගාව කියන්නේ කොතනටදැයි විචාළේය. ඒ අසා බොධිසත්ත්වයෝ කියන්නාහු එතරත් ගඩගාව නොවන කල මෙතරත් ගඩගාව නොවනකල දිය යන්නාවූ සථානයත් ගඩගාව නොවනකල ගඩගාව නම් කොයිදැයි විචාළාහ. එකියන පරිබ්‍රාජකයෝ මා කි බස්ම දෙවෙනිව මටම කියා පැරදුවයි ඉතා ලජ්ජාව පලාගියෝය යි වදාරා **චිකිච්ඡ ජාතකය** නිමවා වදාළසේක. "එසමයෙහි පරිබ්‍රාජකයෝ නම් මෙසමයෙහි පලාගිය පරිබ්‍රාජකයෝය' එසමයෙහි තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේකි.

---

## 238
## මූලපරියාය ජාතකය.

තිවද සංසාර ප්‍රතිෂ්ඨාධාරවූ සර්ව්ඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසත සමයෙහි පන්සියයක් බ්‍රාහ්මණ භික්ෂූන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේ ද? යත්;**

ත්‍රිවේදයෙන් පාරප්‍රාප්තවූ බ්‍රාහ්මණයෝ පන්සියයක් බුඩශාසනයෙහි මහණව බුදුන්ගේ ත්‍රිපිටකය හදාරා ඒ බ්‍රාහ්මණ භික්ෂූන්වහන්සේ විසින් සර්ව්ඥයන් දන්නා ත්‍රිපිටකය අප විසිනුත් දන්නාලදැයි ඉනිකින් සර්ව්ඥයන්වහන්සේට උපස්ථාන කිරීමෙන් කිම්දැයි සිතා මානයක් උපදවා ආලිස්සම්වූ සේක. සර්ව්ඥයෝත් ඒ දැන බ්‍රාහ්මණ භික්ෂූන්පන්සියයක් දෙනාවහන්සේට මූලපරියාය සූත්‍රයෙන් බණවදාරා පන්සියයක් දෙනාවහන්සේගේ මානගර්වය අරවා වදාළසේක.

මේ කථාව ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන්වහන්සේ කථාකොට කොට උන්තෙනට සර්ව්ඥයන්වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි, පෙරත් මේ පන්සියයක් දෙනාගේ මානය බින්දෙම්වේදැ"යි වදාරා ආරාධිතවූ සර්ව්ඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

ඒ කෙසේද? යත්;

පෙරටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යකරණ සමයෙහි බොධිසත්ත්වයෝ දිසාපාමොක් ආචාරිව පන්සියයක් බ්‍රාහ්මණ මානවකයන් ඇරගෙණ අකුරුකරවා ත්‍රිවෙදයෙහි පාරප්‍රාප්ත කළහ. තමන් දන්නා ශාස්ත්‍ර ඇමම නිපුණ කෙරෙව්වාහ. එකියත බ්‍රාහ්මණ මානවකයෝ ඉනිකින් දිසාපාමොක් ආචාරීන්ට උපසථාන කිරීමෙන් කම්කිම්දැයි සිතා මානයක් උපදවාගෙණ ආලිස්සම්ව ඉන්නා සමයට දිසාපාමොක් ආචාරි දෙබර ගසක් වැතිර ගෙණ උන්නාහ. අතවැස්සෝත් ඇවිත් දෙබරගස නියෙන් ගසා මේ කිඹිරිගසේ අරය කැපැයි කියා කීහ. දිසාපාමොක් ආචාරි මේ කියේ මවයයි දැන කියන්නාහු ප්‍රශ්නයක් කොට කියම් සිතා ගාථාවක් කීහ.

ගාථාවේ අඤ්ඤ, කාලෝ, අතීතානාගත වර්තමාන සඛ්‍යාතවූ කාලය මෙන් අත්තනා සහ එව, තමා හා සමග; සබ්බානි එවභූතානි, සියළුම සත්ත්වයන් තමා, ඝසති, අනුභවකරන්නේය; කාලඝසෝ, කාලය අනුභව කළාවූ, යොභූතෝ, යම් සත්ත්වයෙක් ඇද්ද; සෝ, ඒකඛිණාශ්‍රවතෙමේ; භූතපචනිං, සත්ත්වයා පචනය කරන්නාවූ හෙවත් සියළු සත්ත්වයන් නසන්නාවූ කාලය; පචි, පාක කෙළෙයි හෙවත් නැසුයේය; යම් කාලයෙක් සියළු සත්ත්වයන් තමා හා සමග නසානම් ඒ කාලය ඛණිකාශ්‍රවයන් වහන්සේ මත්තෙහි නැවත උත්පත්තියක් නැති හෙයින් නැසුවා නම් වනසේක. රහතන්වහන්සේ සකල ක්ලේශයන් නසා රහත්වූ හෙයින් සත්ත්වයන් විනාශය කළාවූ කාලය ක්ෂයකළා නම් වනසේකැයි කියා මේ ගාථාවේ අඤ්ඤ මව සත්වෙනි දවසකින් කියවයි කීහ. එකියත ශිෂ්‍යයෝ "යහපතැයි ආචාරීනි" කියා වැඳ තමන්ගේ ගෙදරට ගොස් සත් දවසක් මුළුල්ලෙහි උත්සාහකොට එහි අඤ්ඤ නොදැක ආචාරීන් කරා අවුත් "අපට ඒ අඤ්ඤය නොයෙදෙයි කීහ. එවිට දිසාපාමොක් ආචාරීන් "තොප හැම තල්ගෙඩි සේ ඉස් තබා ගෙණ මා කිසිවකුත් නොදනිති කියා තොප කියන පමණක්විනා මෙපමණකුත් නොදනිති කියා නින්දා කළාහ. එකියත ශිෂ්‍යයෝ ආචාරීන් සමාකරවාගතැයි වදරා මූලපරියාය ජාතකය නිමවා වදාළසේක්.

එසමයෙහි එකියත අතවැස්සෝ තම් මේ බ්‍රාහ්මණ භික්ෂූහුය, එසමයෙහි දිසාපාමොක් ආචාරි තම් බුදුවූ මම්මය" යි තමන්වහන්සේ දක්වා වදාළසේක්.

---

## 239
## තෙලෝවාද ජාතකය.

නුවද සංසාර පාරගතවූ සම්බුදුරජාණන් වහන්සේ විසාලාමහනුවර කූටාගාර සාලාවෙහි වැඩවසන සමයෙහි සිංහ නම් සෙනෙවිරදුන් අරභයා මේ ජාතකය දත්වන ලදී.

ඒ කෙසේද? යත්,

සම්බුදුරජාණන් වහන්සේ සිංහ නම් සෙනෙවිරදුන්ට බණ කියා උන් සෝවාන් කළ දවස් උන් විසින් බොහෝ මත්ස්‍යමාංස ඇතිව රසමසවුලෙන් යුක්තව

ආහාරය සම්බුදුයන් වහන්සේ ඇතුළුව සඞ්ඝයා වහන්සේට දන්දුන්හ. ඒ දුටු නිගණ්ඨනාථපුත්‍ර බුදුන් කෙරේ කාංසිව උක්කොටනාකොට කියන්නේ ශ්‍රමණ භවත් ගෞතමයන් තමන් නිසා මැරූ මස් තමන් වළඳනලදැයි උක්කොටනා කළහ. සම්බුදුයෝත් එපවත් භික්ෂුසඞ්ඝයා වහන්සේ අතින් අසා "පෙරත් නිගණ්ඨනාථපුත්‍රයෝ උච්චිඨමාංශය කැව යි පෙරත් උක්කොටනා කළෝ වේද"යි වදාරා ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම්රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ බ්‍රාහ්මණ කුලයෙහි ඉපද සෘෂිප්‍රව්‍රජ්‍යා වෙන් පැවිදිව බරණැස් නුවරට ලුණු ඇඹුල් සෙවුනා පිණිස ආහ.

එසමයෙහි බරණැස් නුවර කෙළෙඹිපුත්‍රයෙක් බෝධිසත්ත්වයන් දැක බොධිසත්ත්වයන් වෙහෙසන පිණිස තමා ගෙට පවරා ගෙන්වාගෙණ රසමස වූලෙන් යුක්ත ආහාරය දන්දී අනන්තයෙහි කියන්නේ "නුඹවහන්සේ නිසා මම වධකොට මස්මරා දන් දිනිමි. එසේ හෙයින් ඒ පව් නුඹවහන්සේට හා මට හා සරිය"යි කීය. බොධිසත්ත්වයෝත් "තොප විසින් තොපගේ අඹු දරුවන් මරා මස් මට ලුවත් මා විසින් මෛත්‍රීපුරඃශ්‍ර විසින් වළඳන්නමෝය"යි කියා බොධි සත්ත්වයෝ හිමාලය වනයට යියාහ"යි වදාරා තෙලෝවාද ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි කෙළෙඹිපුත්‍රයා නම් මෙසමයෙහි නිගණ්ඨනාථපුත්‍රය, එසම යෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේකි.

---

## 240
## පාදඤ්ජලි ජාතකය

තිවද සංසාරවහවූ සම්බුදුයන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලාලුදායි සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේ ද? යත්;**

එක් දවසක් සැරියුත් මුගලන් දෙගසව්වන් වහන්සේ බොහෝ සඞ්ඝයා වහන්සේ විසින් විවාළ ප්‍රශ්න විසඳවිසඳ උන්සේක. ඒ වේලාවට භික්ෂූන්වහන්සේ සතුටුව අස අසා වැඩඋන් කලට ලාලුදායි සථවිරයන් වහන්සේ ඇයි දෙගසව්වන් වහන්සේ කියෙත් අප දන්නා දෙයකැයි කීසේක. එබස් අසා දෙගසව්වන් වහන්සේ එතනින් වැඩපුසේක. සම්බුදුයෝ එබස් අසා "දැන් මතු තොවෙයි, පෙරත් තොල පෙරලා කටට ආ දෙයක් කියන පමණක්වීනා කුමකුත් නො දන්නේ වේද"යි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේකි.

**ඒ කෙසේද? යත්;**

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට වැඩපසස්නා

අමාත්‍යව උපන්සේක. රජ්ජුරුවන්ගේ පාදංජලී නම් රාජකුමාර කෙණෙක් ඇත්තාහ. රජ්ජුරුවෝ කාලක්‍රියා කළාහ. අමාත්‍යයෝ ඒ රජ්ජුරුවන්ට ආදාහන කෘත්‍යකොට ඒ පාදංජලී නම් රාජකුමාරයන් රාජ්ජයට පමුණුවන්ව සිතා නුවණ පරීක්ෂාකරම්නයි සිතා එක්දවසක් ඒ කුමාරයන් සභායේ ඉඳුවා යුක්තියක් අයුක්තියක් කොට විචාරා ඒ කුමාරයන් අතින් විචාළ යුක්තියද අයුක්තියදැ යි විචාළාහ.

එවිට කුමාර තොළ පමණක් පෙරලාලීය. එවිව අමාත්‍යයෝ අප විචාළ යුක්තිය අයුක්තිය නියාව දැන තොළ පෙරළාපුවතැයි සිතා අමත්‍යයෝ එදවස් රාජකුමාරයෝ නුවණැත්තෝවතැ යි සිතූහ. දෙවන දවසුත් ඒ කුමාරයන් සභායේ ඉඳුවා යුක්තිය ඇතිසැටියේම විචාරා මේ යුක්තිය යහපත්ද නපුරුදැ යි විචාළාහ. එදවසුත් ඒ කුමාර තොළ පෙරළාලීය. එවිව අමාත්‍යයෝ පළමු යුක්තිය අයුක්තිය නිසා තොළ පෙරළාවත් මේ යුක්තිය නියාවට කියදීත් තොළ පෙරළන්නේ යුක්තියක් නොදන්නා හෙයිනැයි කියා ඒ කුමාරයා බැහැරකර බොධිසත්ත්වයන් රාජ්ජයට තබාගත්හයි වදාරා **පාදංජලි ජාතකය** නිමවා වදාළසේකි. "එසමයෙහි රාජකුමාරයෝ නම් ලාලුදායි සථවිරයෝය, එසමයෙහි අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකි.

---

## 241
## කිංසුකොපම ජාතකය.

තිවද සංසාර පාරගතවූ සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙ කිංසුකොපම සූත්‍රය අරභයා මේ ජාතකය වදාළසේක.

**ඒ කෙසේ ද? යත්;**

භික්ෂූන් සතරදෙනෙකුන්වහන්සේ සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේගෙන් කමව හන් ඉගෙණගෙණ ඒ සතරදෙනාවහන්සේගෙන් එක්කෙණෙකුන්වහන්සේ ඡඵස්සායතනයන් භාවනාකොට රහත්වූසේක එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ පඤ්චස්කන්ධ භාවනාකොට රහත්වූසේක. එක්කෙනෙකුන් වහන්සේ මහාභූත භාවනාකොට රහත්වූසේක. එක්කෙණෙකුන්වහන්සේ අසුභ භාවනා කොට රහත්වූසේක. සතරදෙනාවහන්සේ සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ දකින්ට ගොස් කියන්නේ "අපි සතරදෙනම රහත්වූම්හ, රහත්වීම් එක් කලෙක භාවනා සතරක්වන්ට කාරණා කවරේදැ"යි විචාළසේක. සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ කැළමල් විචාළ සතරබැයන් වැන්නා යි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

ඔටහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු සතරදෙනෙක් ඇත්තාහ, ඒ සතරදෙනා කැළමල් කෙසේදැයි විචරා රථාචාරියා ගෙන්වා කැළමල් ගෙන්වා අපට පාවයි කීහ. රථාචාරියා සතරදෙනාට එකවිට නොපෑ පළමුකොට එක්රාජකුමාරකෙණෙකුන්ට වේළීගිය අරටු කැළඟසක් දක්වාලීය.

අනික් කුමාරකෙණෙකුන්ට පත්‍රාංකුරයෙන් යුක්ත ගසක් දක්වාලීය, අනික් කුමාරකෙනෙකුන්ට මල්පිපුනු ගසක් දක්වාලීය, අනික් කුමාරකෙනෙකුන්ට විලිසුනු ගසක් පැලීය.

ඒ කුමාරවරුන් සතරදෙන එක් දවසක් ඉඳ කථාකරන්නාහු කැළ ගස් නම් දැගිය කනුවක්මයයි කීහ. එක්කෙණෙක් කියන්නාහු නුගගසක් සේමයයි කීහ. එක්කෙණෙක් මස්කැවි එල්වූවාසේමය යි කීහ. එක් කෙණෙක් විලිස්සපියාතිබෙන පත් ඇති රුක්මෙනැයි කීහ. මෙසේ කියා සතරදෙන උනුන්ගේ කථා නොගිවිස පියරජහු සමීපයට ගොස් "දෙවයන් වහන්ස කැළගස් නම් කෙසේ තිබේදැ"යි කීහ. රජහු විසින් තොප කියේ කෙසේදැයි කීකල්හි ඒ කුමාරවරු සතරදෙන තමන් කීවාවූක්‍රම පළමු පරිද් දෙන්ම කීවාහුය. එබසට රජ්ජුරුවෝ කියන්නාහු දරුවෙනි තොප සතර දෙනා වීසින්ම කැළගසක් දක්නාලද්දේය. එතකුදුවුවත් රථාචාරියා විසින් නොපට කැලගසක් දක්වනකල්හි මේ ගස ඇමකල්ම මෙලෙස තිබේද නොහොත් කලින්කලට වෙන වෙන ආකාරයෙන් පවතිදැයි විභාගකොට නොවිමැළ හෙයින් සැක උපන්නේය. ඒ වෘක්ෂයේ කොලගිය කාලයෙහි කනු වක්මෙන් තිබෙන්නේය, පත්‍රාංකුරයෙන් යුත්තවූ කල ගසක්මෙන් තිබෙන්නේය මල්ගත්කල මස්කැවි එල්වූවාක්මෙන් තිබෙන්නේය. කොල විලිස්සුනු කල්හි රන්වන් මහරිගසක්මෙන් තිබෙන්නේය. ඒ අවස්ථාවෙහි කාලවිශෙෂයෙන් ආකාරභෙදවූ පමණක් මුත් එකකාලගස වන්නේයයි කියා සැක දුරුකළාහුය.

සම්‍බුදුරජාණන්වහන්සේද මේ කථාව දෘෂ්ටාන්තය ගෙණහැර දක්වා වදාරා මහණෙනි ඒ සතරබෑයෝ කැළ විභාගකොට නොවිමැළෙන් යම්සේ සැක උපදවාපු හුදු එපරිද්දෙන් සියළු විදර්‍ශනාඥානයන් ස්කන්ධායතනභූත ධාතු ප්‍රභෙදවූ ධර්‍මයන්ගේ විභාග දැන සොතාපත්තිමාර්‍ගයට නොපැමිණිහෙයින් එක්රහත්වීමට භාවනා සතරක්වීමට කාරණා කිම්දැයි තොපට සැකඋපන් පමණක්වුත් ඒ භාවනා සතරින්ම පැමිණෙන්නේ එක්නිර්‍වාණයයි වදාරා මේ කිංසුකොපම ජාතකය නිමවා වදාළසේක. "එසමයෙහි බරණැස් රජ් ජුරුවෝ නම් දැන් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 242 සාලක ජාතකය

මේවද ශාක්‍යකුල කල්පදුම්වූ සම්‍බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා මහතෙරකෙනෙකුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

එක් මහතෙරකෙණෙකුන්වහන්සේ ඔහු සමීපයට ගොස් තොපගේ පාසිවුරු තොපසන්නකය, මාගේ තුන්සිවුරු පාත්‍රය ආදීවූ පිරිකරත් තොප සන්තක වන්නේයයි පොළඹාගෙණ නැවතත් මහණකරවූසේක. ඒ මහණ

කරවූ තැන්පවන් පළමුවේම තදවන්ට පටන්ගත්සේක. ඒ තෙම නැවතත් සිවුරු ඇර මහතෙරුන් වහන්සේ යාචකුකළත් නැවත සිවුරු නොපෙරවියේය. එක්දවසක් භික්ෂූන්වහන්සේ ධම්මසභාමණ්ඩපයෙහි රැස්වහිද ඇවැත්නි ඒ සාමණේරතෙම මොළොක්වූ සිත් ඇත්තේමය. මහතෙරුන්වහන්සේගේ කෝපිකම්හි පහවූයේයයි කිය කියා වැඩඋන්සේක.

සර්ශ්‍රයන්වහන්සේ ධම්මසභාමණ්ඩපයට වැඩ වදරා "මහණෙනි මා එන් නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදරා මේ ප්‍රවෘත්තිය දැන්වූකල්හි මහණෙනි මේ ලදරුවෝ දැන්මතු මොළොක් සිත් ඇත්තෝ නොවෙයි. පළමුත් එක් වරෙක මොහුගේ රොස දැක නැවත නොආයේය"යි වදරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්ශ්‍රයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්;

අතීතයෙහි දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජුජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ කෙළෙඹි කුලයක ඉපද වැඩිවිය පැමිණ වී වෙළඳුම් කිරීමෙන් ජීවිකාව කරන්නේය.

එකල එක්තරා අභිගුණ්ඩිකයෙක් වඳුරකු ඇතිකොට භික්මවා ඔහු අතට බෙහෙත්දී ඔහු ලවා තයින් කෙළවමින් රැකී ඇවිදිනේ බරණැස්නුවර උත්සවකෙළි කෙළනා පිණිස ඒ වඳුරා වී වෙළඳුනන් අතට භාරකොටදී උත්සවකෙළ ඉක්බිත්තෙහි වී වෙළඳුනන් සමීපයට ගොස් මාගේ වානරයා කොයිදැයි විචාළේය. එවිට එකියන වානරත් තමාගේ සහාම්පුත්‍රයා ආහෙයින් සන්තෝෂයෙන් ලඟට ආහ. එවිට අභිගුණ්ඩිකයා තමාගේ අතතුබූ උණ පත්තක් බලා වානරයාට පහරක් ගසා බැඳගෙණ ගොස් එක් අඹගසක්මුල වැදහොත්තේය. එකියන වානරත් බැඳුන් කඩාගෙණ අඹගසට නැගී අඹ කා අභිගුණ්ඩිකයා ඇඟට අඹ ඇට ගැසීය. එවිට අභිගුණ්ඩිකයාත් පිබිද වානර යාත් නොදැක ගසඋඩ බලා වානරයා දැක තලවා බාගන්ව උවමැනවයි සිතා මට ඇත්තා නම් තොප එකපුතාම වූව, එසේහෙයින් මාගේ ඇතියම් සමපෙතක් ඇත්නම් තොපගේම වූව, පුත මෙසේ එව'යි කිහ. එවිට වානර කියන්නේ "මා තොපකෙරේ මෛත්‍රියෙන් ආවෙමි. තොප එසින් කිපී උණපත්තෙන් ගැසූහෙයින් තොපකෙරේ මම කිපිනිමි. එසේ හෙයින් මා එන්සේ නැතැ"යි කියා වානර ඔබ්බකව පලාගියේය. ඒ පුරාෂයාත් විස්මිතව ගෙවගියේයයි වදරා සාලික ජාතකය නිමවා වදාළසේක. "එසමයෙහි වානර නම් මෙකියන කෙළෙඹිපුත්‍රයාය, එසමයෙහි අභිගුණ්ඩිකයා නම් මෙකියන මහතෙරය, එසම යෙහි වී විකුණන වෙළඳව උපන්තෙම් බුදුවූ මම්මය"යි වදාළසේකි.

---

## 243 කපි ජාතකය

එවද සංසාර ඵලකවූ සර්ශ්‍රයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්,

වඤ්චාප්‍රයොග දන්නා භික්ෂුකෙණෙකුන්වහන්සේ සමීඳයන්වහන්සේට දක්වන්නා මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් මූ වඤ්චාප්‍රයොගකොට ගිනි තපින්ට උත්සාහකළෝවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සමීඳයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යිවකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ එක්තරා කෙළෙඹිපුත්‍රව ඉපද තමන්ගේ බිරින්ද මළපසු දරුවන් වඩාගෙණ වනාන්තරයට ගොස් ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව තමන්ගේ පුතනුවන් මහණකොටගෙණ වාසයකරන්නාහ. එසමයෙහි වැස්සක් වසින්ටවත. එවිට එක්තරා වානරයෙක් වැස්සේ තෙමී තමාට සීත පීඩාව බලවත්හෙයින් තාපසයන්ගේ පන්සලට ගොස් නිනිතැප ගණිමි"යි සිතා මා නිකම්ගියොත් වැද්දකොදෙනි සිතා තාපස වේශයක් හැරගෙණයෙමි" සිතා පුරාතන මළ තාපසකෙනෙකුන්ගේ අඳුන් දිවිසම් ජටා ආදීවූ දෙය ඇඳ පෙරව දඬුගත් අත්ඇතිව පන්සල සමීපයෙහි සිටියේය.

ඒ වේලාවව බොධිසත්ත්වයෝ මැස්සපිට වැදහොත්තාහ. බොධිසත්ත්වයන්ගේ පය මැඬ මැඬ උන්තාවූ පුත්‍රයා තාපසවෙශයෙන් සිටි වදුරා දැක මූ තාපසකෙණෙකැයි සිතා පියානන්ට කියන්නාහු පියානන්වහන්ස ඉදුරන් දමුනු තාපසකෙණෙක් වැස්සේ තෙමී තෙමී ශීත පීඩා ඇතිව සිටිනාහ. එසේවූ තාපසයන්වහන්සේ පන්සලවගෙණ ගිනිතප්පවූකල නපුරුදැයි කිහ. බොධිසත්ත්වයෝ තාපසකෙනෙකුන්වහන්සේ වැඩි නියාවනැයි බිමට බැස බලා වදුරුනියාව දැන පුතනුවන්ට කියන්නාහු මූ තුමූ ඉදුරන්දැමූ තාපස කෙණෙක් නොවේය. මේ තෙම වදුරුය එසේහෙයින් මූ කෙරේ කරුණුයෙන් මෙතනට ගෙන්වා ගිනිතැප්පවූවෝ නම් මේ තෙමේ පන්සල ගිනිලායන්ටත් සපනැයි සිතා එතන තුබූ ගිනිපෙනෙල්ලක් බාලා උණ හයගන්වා එතනින් පහ කොටපුවාහ. එකියන වානරයාත් එතැන් පටන් නො ආයේය.

බොධිසත්ත්වයෝත් පඤ්චඝාඩි අෂ්ටසමාපත්ති උපදවාගෙණ තමන් වහන්සේගේ පුතුන්දැටත් කිසුනු පිරියම් භාවනා උගන්වා නොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියාහ"යි වදාරා කපි ජාතකය නිවවා වදාළසේක. "එසමයෙහි එකියන වදුරා නම් මේ වඤ්චාප්‍රයොග දන්නා භික්ෂුහුය, තාපස කුමාරයෝ නම් රාහුලකුමාරයෝය, තාපසව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මවේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 244
## සංකප්ප ජාතකය

මේවද නිකනිපාතයෙහි ජාතකවලින් සංකප්ප ජාතකය දක්වන ලද.

**ඒ කෙසේ ද? යත්,**

සංසාරදීපවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියක නිසා ශාසනයෙහි උකටලීවූ භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේ ද? යත්,**

එක්තරා භික්ෂුකෙනෙකුන් වහන්සේ ස්ත්‍රියක නිසා උකටලීවූ නියාව සඞ්ඝයාවහන්සේ දැන මහණ සම්බුදුයන් වහන්සේ විසින් ස්ත්‍රීන් කෙරේ පිළිබඳ සිතීම ආදීනවයයි කියා වදාළ නියාව දැන එසේවූ පව්පිරෙන්නාවූ ස්ත්‍රීන් කෙරේ ශොකව තොප සිවුරු අරින්ට කාරණා කිම්දැයි කියා මහණ තොකැමති පරිද්දෙන් බුදුන් කරා ගෙණගොස් බුදුන්ට පැහැ. සම්බුදුයෝත් ඒ තම දූක "ඇයි මහණෙනි, මේ තම තොකැමති පරිද්දෙන් ගෙණාගේ කුමක් පිණිසදැයි විචාරා වදාරා එපවත් අසා සැබෑද? මහණ තා ස්ත්‍රියක් නිසා උකටලීවූයේ යයි විචාරන්නා සැබෑය සුදොවුනි කී කල්හි මහණෙනි, මේ භික්ෂූන්ට වරද කොව ගෙණා පමණක් විනා මුන් තිබා පෙර උත්තමයන්ගේ පවා සිතිවිල්ල කලඹාපු ස්ත්‍රීහු මුන්සේ වූවන් බලද්දැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

පසිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ බ්‍රාහ්මණකුලයක ඉපද ගෙදොරව දෙමව්පියන්ගේ ඇවැමෙන් බොහෝ සම්පත් දූක සිතන්නාවූ මාගේ දෙමව්පියෝ මේ සම්පත් තිබා තුමූ පරලොව ගියාහ. එසේ හෙයින් මට සම්පත්තියෙන් කාර්‍ය්‍ය කිම්දැයි සිතා ගේ පිරුණු සම්පත් දැනමුඛයෙහි විසුරුවා බොහෝබඹුන් කඳුළුඑගත් මුහුණු ඇතිව සිවියදී ගිහිගෙය හැර හිමාලය වනයට ගොස් සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඤ්ඤා අෂ්ටසමාපත්ති උපදවාගෙණ වාසයකරන්නාහු ලුණු ඇඹුල් නිසා බරණැස් නුවරට ආහ. රජ්ජුරුවෝත් මතුමාලෙහි සිටියාහු බොධිසත්ත්වයන්ගේ ඉරියාපථයෙහි පැහැද තමන් ලඟ සිටි අමාත්‍යයෙකුට කියන්නාහු අර වඩනා සිල්වත් තාපසයන්වහන්සේගේ භික්ෂාපාත්‍රය ඇරගෙණ එව"යි කියා යවූහ.

එකියන අමාත්‍යයාත් ගොසින් බොධිසත්ත්වයන්ගේ භික්ෂාපාත්‍රය ඉල්විය. බොධිසත්ත්වයෝත් රජ්ජුරුවන් අප හා පුරුදුකම්විශ්වාසකම් නැතිවුව රජ්ජුරුවෝ අප කුමට කැඳවද්දැයි කියා යවූහ. ඒ අමාත්‍යයෝ එපවත් රජ්ජුරුවන් වහන්සේට කියා මා එතතුරු සිටියමැනවයි කියා රජ්ජුරුවන් කරාගොස් එපවත් කියා රජ්ජුරුවෝ එපවත් අසා ඒ අමාත්‍යයා අත කියා එවන්නාහු මගේ කුළුපඟ තාපස කෙනෙක් නැත්තාහ. එසේ හෙයින් වඩිනේ යහපතැයි කියා යවා රජ්ජුරුවෝ තුමූත් මතුමාලේ සිට සිව්මැදුරු කවුළුවෙන් අතපොවා තාපසයන් වැඳ වඩිනේ යහපතැයි ආරාධනා කළහ. බොධිසත්ත්වයෝත් රජ්ජුරුවන් කළ ආරාධනාව ඉවසා රාජපුරුෂයා අතව භික්ෂාපාත්‍රය දී අමාත්‍යයා හා සමග රජගෙට වන්හ. රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන්ට අසුන්පණවා වඩාහිඳුවා මිහිරි ආහාරපාන වළඳවා බණ අසා බොධිසත්ත්වයන්

තමන්ගේ මඬහලොඳුනයෙහි වසන නියායෙන් ප්‍රතිඥ ඇර ගෙණ බොධිසත්ත්වයන් හා සමග උයනට ගොස් බොධිසත්වයන්ට රාත්‍රිසථාන දිවාසථාන චංක්‍රමණ ආදීවූ දෙයකරවා තාපසවරුන්ට කැපවූ ශ්‍රමණ පරිසකාර සලස්වා උෂ්ණතපාලකයාට තාපසයන් වහන්සේගේ දුකෙහි සැපෙහි බැඳෙන නියාවෙන් ඕහට භාරකොට රජගෙට ගියාහ.

එවක් පවන් දෙලොස් අවුරුද්දක් තාපසයන්ට සිවුපසයෙන් නිරන්තර යෙන් පොෂ්‍යය කරන්නාහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ පසල්දනව්වට සතුරන්ගෙන් භයෙක්වීය. එපවත් දත් රජ්ජුරුවෝ අග්‍රමහෙසිකාවන්ට කියන්නාහු ප්‍රත්‍යන් තයේ සතුරන්ගෙන් භයෙක්වීය. එය සන්සිඳවන්ට යන්නා කැමැත්තෙමි, මෙනුවරත් තොප හෝ මා හෝ දෙන්නාගෙන් එක්කෙනෙකුන් ඉන්දමනායයි කීහ, අග්‍රමහෙසිකාවෝත් එපවත් අසා ඇයි කාරණා කිමිදැයි විචාරා සිල්වත් තාපසයන් වහන්සේට දන්දෙන පිණිසයයි කීහ. අග්‍රමහෙසිකාවෝත් "යහ පතැයි දෙවයන් වහන්ස නුඹවහන්සේ වඩිනාතුරු තාපසයන් වහන්සේගේ කායක්‍රීමට භාරයි නුඹවහන්සේ කිසි සැකයක් නොසිතා වැඩිය මැනවැ" කීහ. රජ්ජුරුවෝ යහපතැයි චතුරංගිනී සේනාව ඇරගෙණ යුඩයට ගියාහ. එතැන් පවන් බොධිසත්ත්වයෝ ආකාශයෙන්ම රජ්ජුරුවන්ගේ මාළිගාවටවැඩ බිසවුන් පණවාදෙන අස්නපිට හිඳ බිසවුන් දෙනලද ආනාරපාන වළඳා ආකාශයෙන් නැවත උයනට යන්නාහ. මේ නියායෙන් දවස්පතා රජගෙයින් වළඳා එන්නාහ. එක් දවසක් බිසවුන් දන්සපයා බොධිසත්ත්වයන් එන පෙරමග බල බලා උන් නාහු සිහිත්තක් ප්‍රමාදව හෙයින් නහා සිහින් කසාවන්වස්ත්‍රයක් ඇඳ සර්‍වාලංකා රයෙන් සැරහී කුරුයාතකට වැදහෙව නිදන්නාහ. බෝධිසත්ත්වයෝ වේලා බලා භික්ෂාපාත්‍රය ඇගෙණ පත්වණක් වළඳමින් රජ්ජුරුවන්ගේ මතුමාලට වැඩිසේක.

එවිට බිසවු වල්කලා සිවුරෙන් සුලන් වැදගත් අඩ අසා තාපසයන් වහන්සේ වැඩිවනැයි සිතා වහා නැඟී සිටිනාහු ලිහිල්ව තුබූ සළුව කටියෙන් ගැලවී වැටින. "බොධිසත්ත්වයෝත් ඒ දැක සුභ නීමිත්ත වශයෙන් බලන්නාහු දෘෂ්ටිජාලයෙන් බිඳ බැළුහ. එවේලෙහි බොධිසත්ත්වයන්ගේ ධ්‍යානය පිරිහිණ. පියාසුණු කවුඩකුමෙන් සැදුල්ලේ පයින් බැස සිටියාහ. බිසවුන්ගේ රූපශ්‍රීය යහපත් නියාය අතුල් පතුල් කලවා කෙඩ ආදීවූ අවයව වෙන වෙන බලන බොධි සත්ත්වයන්ට බලවත්වූ සෝක උපන. එවිට අමාත්‍යයෝ අසුන් පණවා ඉන්ට කීවත් නොයින්නාහ. බිසවුන් තමන් නිසා බොධිසත්ත්වයන්ට සෝක උපන් බව දැන තමන් අන්නපානය බොධිතසත්වයන්ගේ භික්ෂාපාත්‍රයෙහි ලූහ.

බොධිසත්ත්වයෝ ආකාශයෙන් යා නොහී ඉනිමගින් බිමට බැස තමන් වසන්නාවූ පත්සලට ගොස් බත්පාත්‍රයත් නොවළඳා තිබා මැස්සට නැඟී සද් දවසක් නිරාහාරව වැදහොත්තාහ.

රජ්ජුරුවෝත් සතුරන් සන්සිඳුවා නුවරට අවුත් ප්‍රදක්ෂිණා කොට බැස තමන් වසන්නාවූ රජගෙට් වැද තාපසයන් වහන්සේ දකින්ටය සි කියා උය නට ගියාහ. තාපසයන් වහන්සේ මළුව කසළව තුබූ නියාව දැක එසේ වීනම් තාපසයන් වහන්සේ හිමාලය වනයට වැඩපු නියාවේදැයි සිතා දෙර අඩවල්

කොව් තිබූ හෙයින් ගෙට වැද තාපසයන් වහන්සේ දැක එසේනම් තාපසයන් වහන්සේ ලෙඩ නියාය යි සිතා මළුවේ කසළත් ඉරවා පිළිනිව නිලමැස්සන් ඇසිරෙමින් සිටි පාත්‍රයේ බතුත් දම්මවා තාපසයන් වහන්සේ කරා ගොස් "සවාමීනි, ඇති එයුු අඵාසු කිම්ද" යි විචාරා, එවිට තාපසයෝ කියන්නාහු "රජ්ජුරුවෙනි ඊපාරක් ලදුම්හ" යි කීහ.

රජ්ජුරුවෝ සිතන්නාහු "සතුරෝ මට කුමකුත් කොටගත නොහී තාපසයන් වහන්සේට දුකඛයක් කළ නියාවනැ" යි සිතා සවාමීන් වහන්සේගේ ඊපාර වැදගත්තේ කොතනදෝ කියා ශරීරයේ වට බලා නොදැක තාපසයන් අතින් විචාරන්නාහු "කොතනක ඊය වැදගත්තේද ?" යි විචාළාහ.

එවිට බොධිත්වයෝ කියන්නාහු සතුරන්ගෙන් වැදගත් ඊයෙක් නොවෙයි, කියා තමන් වැදගත් ඊය කියන්නාහු 'මහරජ්ජුරුවෙනි, මම අත්‍යවූ පසමිතුරන් විසින් විදිනලද්දෙම් නොවෙම්, වැලි කවුරුන් විසින් විදිනාදැදේද? යත් මම් මාගේ හෘදයෙහි ඊය විදිනා ලද්දෙම්. කුමක් විදිනා ලද්දෙම්ද යත්? – සංකපපරාගඛෙතෙන' – සංකපපරාග දැහතයෙන්; විතකක නිස්සිතෙනව, විතකීයෙන් යුක්තවූ රාගයෙන් කොරොස්සනක ගාන ලද්දුවූ චිත්තයෙන් හස්තයෝ ශොභනය පාදයෝ ශොභනය මුඛය ශොඛනය යනාදීවූ හසන පාදාදී අවයවයන් යඛපතැයි ගත්නාලද විතකී නමැති සිළු සතගන්නලද්දුවූ; නාලංකතහද්දෙන, –ඉඟුලින්ලා බැඳ සරහා යඛපත්කොට නොකරණ ලද්දුවූ ඇස් කෙළවරින් බලාඇද මැඩ නොසිටුවනලද්දුවූ නඋසුකාරෙනව, – සණීකාර යෙන්ම ඊවඩුවකු විසින් නොකරණ ලද්දුවූ බව දැන; නකණණයතමූඝත්තන,– දකුණු කන්මුල දක්වා උරපුරා ඇද අසුර නොගලවන ලද්දුවූ නපිමොරුපසෙ විනා, – මොතරුන්ගේ තඹවන්වූ ගිජුලිහිණියන්ගේ ලොහො තුඩුවන් පතින් නොසඳන ලද්දුවූ, සබබඛගපරිදුහිතො, – සණීඛග පරිදුහවිතාඝකළ සකල ශරීර යෙහි ගිනිසු ගසන්නාක් මෙන් දුහ උපදවන්ට සමර්ථවූ; තෙන, – ඒ කාමරාග නමැති ක්ලේශ සැරයෙන්; විඩො අම්හි, – විදිනලද්දෙම්වීම්, මහරජ්ජුරුවෙනි ඒ කාමරාග නමැති ඊයෙන් විදි වේලෙහි පටන් මාගේ සකල ශරීරය ගින්නෙන් තැවෙන කලක්මෙන් දුහ වැදගෙණ දන්නේය. රුධිර මිස්සවො, – මාගේ ලෙහි වැදගෙණ යම් ශරප්‍රහාර මුඛයකින් ලේ වැගිරේ නම්; අවෙධඤ්චන පස්සාම්, එබදු ලේ වැගිරෙන මුඛයකුත් නොදකිම්; –යාව අයොනිසොවිතෙනා මාගේ සිත ඉතා තරකොට නුනුවණින් වඩනා ලද්දේය. එසේ හෙයින් මා විසින් මෙ, – මව, දුකඛසමාගතා, – අසුභාලම්බන වශයෙන් ගැණීමෙන් රාගචිත්තය උපදවා දුක් ඵලවනලදැ" යි ධර්මදේශනාකොට රජ්ජුරුවන් ඇත "පලායව" යි කියා පන්සල ඉද පඤ්චසඃඬි අෂ්ටසමාපත්ති උපදවාගෙණ රජ්ජුරුවන් උන් තෙනට ගොස් ආකාශයෙහි පලක්බැඳ වැඩහිඳ ඛණකියා "රජ්ජුවෙනි, මම හිමාලය වනයට යම්හ" යි වදළසේක. රජ්ජුරුවෝ "මාගේ දිවිහිමින් නුඹවහන්සේව ආරක්ෂා කෙරෙම්, නොගිය මැනවැ" යි කියද්දීත් "රජ්ජුරුවෙනි, මනුෂ්‍ය භවතයෙහි ඉදීමෙහි බොහෝ ආදීනව ඇතැ" යි කියා හිමාලය වනයට ගියහ යි වදාරා සංඛජ්පජාතකය නිමවා වදළසේක. "එසමයෙහි තාපසව උපන් නෙම් බුදුවූ මම්මය" යි තමන්වහන්සේ දක්වා වදළ සේක.

## 245
## නීලමුටසි ජාතකය

තීවද මාගේ ශිරොමාණික්‍යවූ සම්බුදුයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කොපිවූ භික්ෂූකෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**හේ කෙසේ ද? යත්,**

එක්තරා භික්ෂූකෙනෙකුන් වහන්සේ යම්තම් බසකට කෝපවතසේක. සෙසු භික්ෂූන් වහන්සේ එතම දැක "කෝප නොවන්නාවූ බුඩශාසනයෙහි මහණව තොප කෝපවීමෙන් දවස් යවන්නේ කටයුතු නොවන්නේ වේදැ"යි කීය, ඒ භික්ෂූන් වහන්සේ සම්බුදුයන් වහන්සේ කරා ගෙණ ගොස් දැක්වූසේක.

සම්බුදුයන් වහන්සේත් "සැබෑද? තා කෝපවීමෙන් දවස් යවන්නේදැ"යි විවාළ කල්හි "සැබව සවාමීනි," දැන්වූ කල්හි සම්බුදුරජාණන් වහන්සේ "මහණෙනි, දැන්මතු තොවෙයි පෙරත් මේ භික්ෂූහු කොපිවේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ බ්‍රහ්මදත්ත නම් රාජකුමාර කෙනෙක් ඇත්තාහ. ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝත් තමන්ගේ පුනනුවන්ට මස් සෙත් දහසක් හා පිළිසඟළක් හා පත්කුඩයක් හා වහ සඟළක් හා බත්මුළක් ආදීවූ දෙය දී දිසාපාමොක් ආචාරීන් කරා ගොස් ශිල්පශාස්ත්‍ර ඉගෙණගෙණ එව යි යවූහ.

එකියන කුමාරයාත් තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරී දකින්ටගිය වේලාවට දිසාපාමොක් ආචාරීන් ශිෂ්‍යයන් ශිල්පශාස්ත්‍ර උගන්නා මිදුලෙහි සක්මන් කොට සිටියාහ. ඒ වේලාවට රාජකුමාරයන් ලඟ එන්නා දැක "ඇයි තොපි කුමට අවුදැ?"යි විවාරා "ශිල්ප උගන්ව ආමි" කීකල්හි ආචාරීන්ව වස්තු දී "ශිල්ප දක උගණුදැ? කුලියට ශිල්ප උගණුදැ?යි විවාළ කල්හි එවිට රාජකුමාරයාත් ආචාරී භාගයක් පළමුකොට තබා වැදහොත්තාය. එවිට දිසාපාමොක් ආචාරීන් රාජකුමාරවරුන් නම් කල්යවා ශිල්ප උගන්ව බැරිය, වනා ශිල්ප උගතවැතැවැ"යි කියා සාමාන්‍ය නකත් සලස්වා ශිල්ප උගන්ට පටන් ගැන්වූහ. එක් දවසක් රාජකුමාරයන් පිටිපස්සේ ලාගෙණ නාන්ව වැවට ගමන් සිටියාහ. ඒ වේලාවට එක්තරා මැලි සත්‍රියක් එලකරපු තල අව්වේ වනා වියලමින් සිටියාහ. ඒ වේලාවට දිසාපාමොක් ආචාරී පස්සේ යමින් සිටි රාජකුමාරයෝත් එකියන එලතල දැක කන්නා අභිප්‍රාය ඇතිව ගාණක් අතට ගෙණ කාපූහ. එකියන මැලිසත්‍රීන් ඒ දැක කුඩා කොල්ලා හෙයින් බඩසයින් කාපුව මැනවැයි සිතා බැණ නොනැගී සිටියාහ.

දෙවන දවසුත් එපරිද්දෙන්ම රාජකුමාරයෝත් එලතල ගාණක් ඇර ගෙණ ගියාහ. තුන්වන දවසුත් එපරිද්දෙන්ම ඇරගත්තාහ.

එවිට සත්‍රී සිතන්නී "මේ නියාගෙන් දවස්පතා කන්නම් මාගේ කල නිමා යෙයි" සිතා කියන්නී "දිසාපාමොක් ආචාරීන් වහන්ස, තමන්වහන්සේගේ

නිලමුටසි ජාතකය

අතවැස්සන් ලවා මාගේ තල ගන්නාසේකැ''යි මොරගැව. එවිට දිසාපාමොක් ආචාරී ''ඇයි මැනියෙනි, මම කුමන අසාධ්‍යාවක් කෙළෙම්ද''යි කිහ. එවිට සත්‍රී කියන්නී ''නුඹවහන්සේ පස්සේ යන අතවැසි තුන්වාරයක් මාගේ තල ඇර ගෙණ ඉනිබ්බේත් තල ගණිත්තම් මාගේ තල නිමන්නේය''යි කියා මොරගා කීය. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු ''ඊට තොප විඤ්ඤප නොව තොප ගෙන් කැ තලවලව මම මිල දෙමි කිහ.

එවිට සත්‍රී කියන්නේ ''කැ තලයට මිල එපයි ඉනිබ්බේ මාගේ තල නොකන ලෙස අවවාද කියව''යි කිහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු ''ඉදිරි ශේදී පාටව කෙරෙමි''යි කියා අතවැස්සන් දෙන්නකු ලවා දැන්කර අල්වා උණ පත්තෙන් පාර ගණනක් ගස්වා පාටව කරවූහ.

එවිට රාජකුමරාත් දැස් රත්කොට උරණව මුහුණ බලා වෙරබැන්දේය, දිසාපාමොක් ආචාරීන් තමන්ගෙරේ වෛර බැඳි නියාව දන්හ. දැන දැනත් සියළු ශාස්ත්‍ර උගන්වා නිපුන කරවූහ. ඒ රාජකුමාරයාත් දිසාපාමොක් ආචාරීන් වැඳ නුවරට යන්නාහු ''ආචරීන් වහන්ස, මම සැපසේ රාජ්‍යයට පැමිණි යෙම් වීම් තම් නුඹ වහන්සේ කැඳවා එවම්, එවිට අවමැනවැ''යි කියා තමන්ගේ රටට ගොස් තමන්ගේ පිය රජ්ජුරුවන්ට ශිල්ප දැක්වූහ.

එවිට රජ්ජුරුවෝ සමාධිව මා ඇස්සමුයේ මොහුගේ රාජ්‍යශ්‍රීය දකිම් සිතා රාජ්‍යශ්‍රීය දුන්නාහ. එකියන රාජකුමාරයාත් රාජ්‍යයට පැමිණ දිසාපාමොක් ආචාරීන්ට පාටව කරන්නා කැමතිව ''ආචාරීන් වහන්සේ මා කෙරේ සැක නොසිතා විහා එන්නේ යහපතැ'යි කියා යවූහ. එපවත් දිසාපාමොක් ආචාරීන් වහන්සේ අසා රජ්ජුරුවන් වහන්සේ මා කැඳවා එන්නේ මට ස්නෙහයෙන් කොවෙයි, මා ගැසූ පාරට නිග්‍රහකරන්වය සි සිතා දැන කුමාරයෝ බාලයෝය. එසේනෙයින් මා කියන අවවාද දැන් අසන්නේ නොවෙති. පසුව වැඩිමහලු වය සට පැමිණිකල යෙම් සිතා නොගොස් කල්යාමක් කොට රජ්ජුරුවන් වැඩි මහලුව ගියපසු දිසාපාමොක් ආචාරීන් නොකැඳවාම තුමූ ගියහ. ගොස් වාසල සිට තමන් ආ පවත් කියා යවූහ. එපවත් අසා රජ්ජුරුවෝ ''යහපත ආචාරීන් වහන්සේ කැඳව''යි කියා කැඳවා කියන්නාහු ''ඇයි ආචාරීනි, තොපි මරණ තලලේ තබා අවුද? එදවස් තොප විසින් මා තල කැව යි කියා දෙන්නකු ලවා අත්දෙක දල්වා උණපත්තෙන් තැලවූ පාර තව දක්වා මගේ පිටේ රිදෙන්නේ ය''යි කියා 'අමාත්‍යයෙනි, මේ දිසාපාමොක් මරව''යි කිහ. එවිට දිසාපාමොක් ආචාරී කියන්නාහු ''රජ්ජුරුවෙනි, එදවස් තොප කැ තලයට පාරක් නොගැසී තම් දෙවෙනි දවස් අනික් සොරකමක් කරණසේක. එවිට යම්කෙනෙක් මරා දමාපු නම් දැන් මේ රාජ්‍යශ්‍රීය ලබන්ට කැත්තේවේද? එසේහෙයින් භික්මවීම පිණිස කළ පාටවයට උත්තමයෝ වෛර නොබඳිති'' කියා කිහ.

එපවත් අසා බොහෝ අමාත්‍යයෝත් ''එසේමය, දේවයන් වහන්සැ''යි දිසාපාමොක් ආචාරීන් වහන්සේ නිසා රජ්‍යශ්‍රී නුඹවහන්සේ ලද්දේය යි අමාත්‍යයෝ කිහ. රජ්ජුරුවෝ ඒ කාරණය සිතාගෙණ ආචාරීන්ගේ බොහෝ ගුණ සඳහන් කොට කියන්නාහු ''දිසාපාමොක් ආචාරීනි, රාජ්‍යයට පැමිණියේ තොප නිසාය, එසේනෙයින් රාජ්‍යය පිළිගණුව''යි කිහ. එපවත් අසා දිසාපා මොක් ආචාරීන් රාජ්‍යය නොගිවිස්සාහ. රජ්ජුරුවෝත් තමන්ගේ මිනිසුන්

යවා ආචාරීන්ගේ අඹුදරුවන් ගෙන්වාගෙණ තමන්ගේ නුවර ලා ආචාරීන්ට බොහෝ තරම්පදම් සලස්වා තමන්ට පුරෝහිත තනතුරෙහි තිබුවේදැ යි වදාරා මේ නිදානයෙහි ජාතකය නිමවා වදාළ සේක.

මේ ජාතකය අවසානයෙහි එකියන භික්ෂූන් වහන්සේ අනාගාමී ඵලයෙහි පිහිටිසේක. "එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් මේ කෝපී භික්ෂුහුය, දිසා පාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 246
## මණිකණ්ඨ ජාතකය

මේවද මාගේ සවාමිදරුවන් වහන්සේ අලවිනුවර නිසා අගහාල චෛත්‍ය භූමියෙහි වැඩවසන සමයෙහි කුටිකාර ශික්ෂාපදයන් දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

අලවිනුවරවාසී භික්ෂූන් වහන්සේ බොහෝ මනුෂ්‍යයන්ට අපට ගෙවල් ඉදිකරන්ට කැති දෙව, පොරෝ දෙව යි කියා නොයෙක්දේ ඉල්වා ආයාසකරණ සේක. එසේ හෙයින් මනුෂ්‍යයෝ සඞ්ඝයා වහන්සේ දකිනා අභිප්‍රාය මදව වාසය කරන්නාහ.

එසමයෙහි කාශ්‍යප සවාමීන් අලවිනුවර සිඟාවැඩිසේක් තමන්වහන්සේගේ මනුෂ්‍යයන් සැඟවුනු හෙයින් උන්වහන්සේ දුකසේ සිඟා වළඳා සඞ්ඝයන් වහන්සේ වසන්නාවූ අගහාලක නම් චෛත්‍යභූමියට ගොස් සඞ්ඝයන්වහන්සේට දන්වනසේක් "සවාමීනි, ආදී අලවිනුවර සිඟා ගියකල සතරපසය සැපසේ ලැබෙයි, දැන් අප දුක මනුෂ්‍යයෝ සැඟවෙති" කී සේක.

සඞ්ඝයෝත් ඒ සැඟවෙන්නාවූ කාරණය දැන අලවිනුවරවාසී භික්ෂූන් වහන්සේ කැන්දා "තොප හැම විසින් අලවිනුවර මනුෂ්‍යයන්ට බොහෝ ගැණ සිඟිතිකොව නොයෙක්දෙය ඉල්වති යන්නක් ඇසීම්, ඒ සැබෑදැ"යි විවාළසේක. ඒ භික්ෂූන් වහන්සේ "සැබෑව සවාමීනි" දන්වන්නා 'මහණෙනි, ඉල්වීම් නම් කවුරුන්ටත් නොකන්කලු දෙයක, යටත්පිරිසෙයින් බොහෝ සම්පත් ඇත්තවුන්ට පවා ඉල්වීම විශේෂවේදැ"යි කියා 'ඒ කෙසේදැ"යි ආරාධිතවූ සඞ්ඝයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේ ද? යත්,**

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ එක්තරා බ්‍රාහ්මණකුලයක ඉපද වාසය කරණසේක. බොධිසත්ත්වයන් වහන්සේගේ මැනියන්වහන්සේ පසුවත් එක් බ්‍රාහ්මණ කෙනෙකුන් වැදූහ. ඉක්බිත්තෙන් බොධිසත්ත්වයන් වහන්සේගේ මැනියන්වහන්සේ පසුව කාලක්‍රියා කළහ. බොධිසත්ත්වයන් හා මලනුවෝ ගිහිගෙයි සම්පත් හැර හිමාලයවනයට ගොස් ගඟක් සමීපයෙහි දෙබෑයෝ ගඟ දෙනිත්තියෙහි පන්සල් කොටගෙණ වාසය කරන්නාහ.

බොධිසත්ත්වයන්ගේ මලනුවෝ වසන්නාවූ පන්සල සමීපයෙහි ගඟ වසන් නාවූ මණිකණ්ඨ නම් නාගරාජයෙක් ඇත, ඒ නාපසයන්ගේ පන්සල සමීපයේ මනුෂ්‍ය වෙශයෙන් සක්මන්කොට ඇවිදින්නේය. තාපසයන් දැක තාපසයන් හා පිළිබඳ සිත් ඇතිව කථාකොට යන වේලේ තාපසයන් නාගවෙශයෙන් සිප ගෙණ තාපසයන් ඉස්මත්තේ පෙණය නිබා යම්තම් වේලාවක් සනෙනාෂව නිවාගෙණ පෙරළා දරණවැලය ඇර තාපසයන් වැඳ නාගභවනයට යන්නේය. මෙම නියායෙන් දවස්පතා ඇවිත් යාමෙන් තාපසයන් ඇඟ ගැවෙත් ගැවෙත් හයින් තාපසයෝ වැරිනාහ. මේ නියායෙන් ඉතා දුබිලව පඬුවූ ශරීර ඇතිවූහ,

එක් දවසක් තාපසයෝ තමන්ගේ බෑයන්වහන්සේ දකින්ට පන්සලට ගියාහ. බොධිසත්ත්වයෝ මල් තාපසයන් දැක "ඇයි තොපගේ ශරීරය මෙලෙස දුබිලවන්ට කාරණා කිම්දැ"යි විචාළාහ. එවිට බොධිසත්ත්වයන්ගේ මලනුවෝ කියන්නාහු "මණිකණ්ඨ නම් නාගරාජයෙක් දවස්පතා අවුත් මා සිපගන්නේය. එසේ කෙයින් මා වැරිනේය"යි කීහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "ඒ නයා තොප සමීපයට නො ඒ නම් සමාධිදැ"යි විචාළාහ. එවිව බොධි සත්ත්වයන්ගේ මලනුවෝ "එසේවීනම් යහපතැ"යි කීහ. "ඒ නාරජ්ජුරුවන් පැලඳගෙණ එන්නේ කුමන ආභරණදැ"යි විචාළාහ. තාපසයෝ කියන්නෝ "කරපලදිනා කණ්ඨමාණික්‍යය"යි කීහ. "එසේවීනම් ඒ නාගරාජයා තොප සමීපයට ආකල උන් පැලඳගෙණ ආවාවූ කණ්ඨමාණික්‍යය ඉල්වව, එදා පලා ගොස් පසුව දවස් ඒ මලුව සමීපයට ආකල මාණික්‍යය ඉල්වව, පසුව දවස් දියෙන් ගොඩනැගෙන කලව මාණික්‍යය ඉල්වව, මේ නියායෙන් ඉල්වන්ට වදිනාකල තෙමේම නොයෙ,,යි කීහ.

මේ නියාවට එකියන තාපසයෝත් පළමු දවස් නාගරාජයා ගෙව ඉදින වේලාවටම "තොපගේ ශ්‍රීවයේ තිබූ කණ්ඨමාණික්‍ය මට දෙව"යි කීහ. එවිට නයා ගෙට නොවැදම පලාගියේය. දෙවෙනි දවස් මලුවේ කෙළවර සිට ආවේලා වටම මැණික ඉල්වන්නා එතනසිට පලාගියේය. තුන්වෙනි දවස් නයා දියෙන් ගොඩනැගෙන වේලාවටම තාපසයෝ මැණික ඉල්වූහ. එවිට නයාදියෙන් කිම්ද දිය මඩ්‍යයෙන් ඉසඔසවා කියන්නෝ "මට අන්නපානාදීවූ බොහෝ ලාභ සත්කාර උපදවන්නාවූ කණ්ඨමාණික්‍ය තොපට මම කෙසේ දෙම්ද? එසේ හෙයින් තොපගේ පන්සලට නේනා පමණක්වේදැ"යි කියා නැවත කියන්නාහු "මාගේ බොහෝ සම්පත් ඇතිදෙය නොයිල්වා කණ්ඨමාණික්‍යය ඉල්වූ හෙයින් තොප ලඟට නොඑන පමණෙක්වේදැ"යි කියා නාගරාජයා දියේ කිම්ද නාග ලොවට ගියේය. එතැන් පටන් තාපසයන් සමීපයට නොආ විරුයේය. තාපස යෝත් නයා නොඑන දවස් පටන් පළමු නියාවටත් වඩා සොකී පවත්ව දුබිලව ගියෝය. බොධිසත්ත්වයෝ මලනුවන් විචාරණ පිණිස ආවාහු මලනුවන් ඉතා දුබිල හෙයින් "දුබිලවූයේ කුමක්නිසාදැ?"යි විචාළාහ.

එවිට තාපසයෝ කියන්නාහු "නයා නොදැකීමෙන් දුබිලව ගියෙමි කීහ. බොධිසත්ත්වයෝත් "මූ නයා කෙරෙහි මහත් ස්නෙහ ඇත්තාහ. එසේහෙයින් නයා කෙරේ සෝකයෙන් මළෝ නම් නපුරැ"යි සිතා "සෝක අරවන්ට උවමැත වැ"යි සිතාකියන්නාහු 'මල නොඉල්වීය යුතුදෙය ඉල්වීමෙන් ඊට සෝක උපද වූ"යි කීහ. "ඉතිකින් සෝක අරව"යි කියා තමන් පළමු වසන්නාවූ පන්සලටම

ගියාහ. එකියන තාපසයා සෝක අළුයේය. බොධිසත්ත්වයන්ගේ මලනුවන් හා දෙන්නා පළඳ සෘඩි අෂ්ට සමාපත්ති උපදවා නොපිරිහුනාවූ ධ්‍යානයෙන් බඹ ලොව ගියාහ යි වදුරා මණ්ඩකණ්ඩ ජාතකය නිමවා වදුළ සේක.

එසමයෙහි බොධිසත්ත්වයන්ගේ මලනුවෝ තම් ආනන්දසථවිරයෝය, එසමයෙහි අවවාද කී තාපසයෝ තම් බුදුවූ මම්මය''යි තමන්වහන්සේ දක්වා වදුළසේකි.

---

## 247
## කුණ්ඩකකුජ්ඣිසිඤ්ඣව ජාතකය.

තවද මා ගේ ශිරෝමාණික්‍යවූ සම්බුදුහන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සැරියුත් සවාමීන් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්;**

සම්බුදුයෝ සැවැත්නුවර ඉඳ ජනපදවාරිකාවේ සැරිසරා වැඩ පෙරලා සැවැත්නුවරට වැඩිසේක. සැවැත්නුවර වාසී බොහෝ මනුෂ්‍යයෝ සම්බුදුයන්ව ආගන්තුක සත්කාර කරම් හයි සිතා උපාසකවරු ධම්මඝොසක නම් නිකෂු කෙනෙකුන් වහන්සේ අතින් තම තමන්ට උවමනා විවර පන්සිය සසිය දුසය යි මේ නියායෙන් පාත්‍ර ඇරගත්තාහ. එක්තරා දුක්පත් මැහැලි උපාසිකාවක් එකම එක නමකට දන් සපයා විධානකරවන වහන්දැ සම්පඝට ගොස් ''මටත් දන්දෙන නියායෙන් එක නමක් සලස්වන්ට උවමැනවැ''යි කියන්නා ''එසේවීනම් සැරියුත් සවාමීන්ගේ පාත්‍රය ගණුව''යි කිය. ''යහපතැ''යි කියා එකියන මැලි උපාසිකා සැරියුත් සවාමීන් වඩාගෙණවුත් යහපත්කොට වැළඳ වූහ.

ඒ ගම අනේපිඬුමහසිටානන් විශාඛා මහාඋපාසිකාවන් කොසල රජ්ජුරුවන් ඇතුළුවූ බොහෝ උපාසිකාවරුත් එකී උපාසිකාවට බොහෝ රත්රන් මුතුමැණික් දුන්නාහ. එකියන උපාසිකාවත් බලිව පොහොසත්වූව. මේ කථාව ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සම්බුදුයන් වහන්සේ වැඩවදුරා ''මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදුරා එපවත් අසා මේසේ වදුළසේක.

පෙරගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ උත්තරපථයෙහි අස්වෙළඳව උපන්නාහ.

එසමයෙහි බරණැස් නුවරටත් උත්තරාපථයවත් අතුරේ එක්තරානියම් හමෙක් ඇත. ඒ ගම ඉන්නා මැලි සත්‍රියක් ඇත්තාහ. එසමයෙහි අස්වෙළෙන්දු අසුන් පන්සියයක් ඇරගෙණ බරණැස්නුවරට යන්නාහු මැලි සත්‍රියකගේ ගෙයි කීප දවසක් රැඳුනාහ. එතන රැඳුනු ගමනේ වෙළඹක් ආජානීය සෙන්ධව යකු වැදුව, එකියන සෙන්ධවයා එකියන මැලි තමාට දරුකොට වඩවන්ටවත, එකියන අස්වෙළෙන්දු කීප දවසක් සැතපීලා බරණැස් නුවරට අසුන් ඇරගෙණ යන්නට වන්නාහ. එවිට එකියන ස්ත්‍රී කියන්නී ''මෙතෙක් දවස් මාගේ

ගෙයිදී කා බී යනකලට මට කුලියක් නොදී යන්නේය"යි කීය. එවිට අස් වෙළෙන්දු "යනපත මැනියෙනි, කුලියක් දෙම්මැ"යි කිවුය. එවිව ස්ත්‍රී කියන්නී "කුලියෙන් මට කාරිය නැත, මගේ ගෙයිදී උපන්නාවූ අස්පැටවා මට දෙන්නා පමණැ"යි කීය. "යනපතැ"යි කියා එකියන අස්වෙළෙන්දු අස්පැටවා දී ගියාහ.

එකියන මැලී ඒ අස්පැටවා කුඩු හා තණ හා බන්පෙරූ කැඳ ආදිවූ දෙය කවා වඩන්නීය. මේ නියායෙන් කවා මුකුරුවූ අවසථාවට බොධිසත්ත්ව යෝත් උත්තරාපථයේ සිට අසුන් පන්සියක් ඇරගෙණ බරණැස් නුවරට එන්නාවූ ඒ අජානීය අශ්වයා වඩන මැහැල්ලගේ ගෙට නවාතැනට ආවාහ. ඒ වේලාවව ආජානීය අශ්වයා තණකන්ට ගියේය, බොධිසත්ත්වයන් ගෙණා අසුන් පන්සියයක් එකියන ආජානීය අශ්වයාගේ ඉලන්නියේ සුවඳ අසමින් හයින් ගෙට නොවැද දෙරම සිටියාහ. බොධිසත්ත්වයෝ ගෙට වැද "අම්ම මේ ගෙයි අස්සු ඇද්දැ?"යි විවාළාහ. එවිට මැලී කියන්නී "පුත මා දරුකොට වැඩූ අසකු විනා වඩා අස්සු නැතැ"යි කීය. බොධිසත්ත්වයෝ "අශ්වයා කොසිදැ?"යි විවාළාහ. මැලි කියන්නී 'තණකන්ට ගියේය, දැන් දැක්කහැකි" යි කීය. ඒ කියන අශ්වයාත් තණ කා ගෙට අවුත් තමා සිටින සථාන යට ගියේය. එවිට සෙසු අස්සු ගෙට වන්නාහ. බොධිසත්ත්වයෝත් එකියන අශ්වයා දැක මේ අශ්වයා අජානීය අශ්වය යි කියා තමා දන්හ. බොධිසත්ත්වයෝත් ඒ ගෙයි කීපදවසක් වාසයකොට බරණැස්නුවරට යනු කැමතිව මැහැල්ලට කියන්නාහු "අම්ම බරණැස්නුවරවියෙමි, මෙකියන අශ්වපොතකයා මාගෙන් මිල ඇරගෙණ මව දෙව"යි කීහ. "කුමක් කියන්නේද? පුත, දරුවනුත් මිල ඇරගෙණ විකුණද්දැ?"යි කීහ. එවිට බොධි සත්ත්වයෝ කියන්නාහු "අම්ම, මෙතන ඉඳ දුක්විදිනා බලාත් මාලඟවීතම් බොහෝ සුවවිදිනේ වේද? එසේනෙයින් මට දෙන්නේය"යි කීහ. ඒ ස්ත්‍රී මාගේ දරුවන් සුව විදිනා වේද? යනපතැ"යි කියා අජානීය අශ්වයා බොධිසත්ත්වයන්ට දුන. බොධිසත්ත්වයෝත් ඒ අශ්වයා මිලකොට සතර පයට සාරදහසක් හා මුඛයට දහසක් වලිගයට දහසක් ඇතුළුව සදසක් වසතුව හා ඒ ස්ත්‍රී සමීහරණයෙන් සරසා යහපත් වස්ත්‍රයක් ඇන්දූහ. එවිට ඒ ආජානීය අශ්වයාත් තමා වසතුවට විකුටපු නෙයින් "මාගේ මැනියෝ මා මේ තොක් දවස් වඩා වසතු නිසා මා විකුටපුව"යි අශ්වයා ඇඬුහ. එවිට මැලි ස්ත්‍රී "පුත විඤෂප නොවන්න, තොප නිසා බොහෝ වසතු ලදිමි. එසේනෙයින් මේකියන වෙළඳුනන් කැටිව යව"යි කියා යවූහ.

බොධිසත්ත්වයෝත් එකියන අශ්වයා ඇරගෙණ සිතන්නාහු මේ අශ්වයා තමා ආජානීය නියාව දනීදෝ නොදනීදෝනෝයි සිතා එම ස්ත්‍රී ලන්නාවූ තණ හා කුඩු හා බතින් පෙරූ උළකැන්ම ලූහ. එවිට අශ්වයා නොකැයේය. "ඇයි තොප පළමු කණ දෙය දැන් නොකැයේ ඇයි දැ?"යි කියන්නා එවිට අශ්වයා කියන්නේ "තමාගේ තරම් පදම් නොදන්නා කෙනෙකුන් සමීපයේදී උන් කුමක් කලත් ඉවසෙයි, තමාගේ තරම් පදම් දන්නාවූ බ්‍රාහ්මණය තොප දැක්කදීත් මා කුඩු කන්ට යෝගයදැ?"යි කීහ. එවිව බොධිසත්ත්වයෝ තෙපා පරීක්ෂාකරන්ට කෙළෙම් කියා ඒ අශ්වයාව මිහිරි අන්නපාන ලා එකියන

අශ්වයා ඇතුළුවූ පන්සියයක් අසුන් ඇරගෙණ බරණැස්නුවරට වැදී අවශෙෂ අසුන් පන්සියය එක්ඇලයෙක සිටුවා ආජානීය අශ්වයාට බුමුතුරුණුලා වියන් බැඳ එක්ඇලයෙක සිටුවූවාහ. එවිට රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් අතින් විචාරන්නාහු "ඇයි මේ අසුන් පන්සියය එක් ඇලයක සිටියදී මූ එක්තෙනක සිටී තෙමේ අසුන් පන්සියය නියාවට මේවඬදැ?"යි කීහ. "එසේය, දේවයන් වහන්ස, මේ අසුන් පන්සියය නියාවට මේවඬිය. මේ අශ්වයාගේ ජවවේග බල වදුළ මැනව"යි කියා මිනිසුන් පහකොට අශ්වයාපිටට නැගී පාරේ අළහ අසාගේ වේගයෙන් අසුන්කරින්කර ගසා සිටෙව්වාසේ එක අස්වලල්ලක් මෙන් විය. නැවත "බලාවදුළමැනව"යි කියා දුවන වේග දන්වා අසා දිවන්ට වත. එවිට පිට උන් බොධිසත්ත්වයනුත් අසාත් නොපෙණෙන්ට වත. එවිට බොධිසත්ත්වයෝ අසා ඇරගෙණ සෘද්ධිවූවාක් මෙන් වැටහේ ඈ හෝ යි සිතා බඩ අවුරා රතු කඩක් බැඳගත්තාහ.

ඒ වේලේ අශ්වයා පාරේ අරින්ට වන් වේලාවට රතු කඩක් වට ඇද්දාක් මෙන් විය. නැවත බොධිසත්ත්වයෝ බලාවදුරන්නේ "යහපතැ"යි කියා මගුල්පතසට ගොස් දියපිට නෙළුම්පතෙහි පාරේ අරින්ටවන්හ එවිට අශ්වයාගේ කුරය තෙමෙන්නේත් නොවී නෙළුම්පත ඉරෙන්නේත් නොවී පාරේ අල. නැවත බොධිසත්ත්වයෝ අශ්වයාගේ ලඝුත්වය පානහු අසාපිටින් බැස අතින් අතගසා අල්ල පැහ, එවිට අශ්වයා තමාගේ සතරකුරයම අල්ලපිට නිබීය. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "සාමීනි, මේ අශ්වයාගේ වේගය සමුද්‍රය කෙළවර කොට නිබෙනමුත් මුගේ වේගයෙහි අන්තයෙක් නොපෙණෙයි" කීහ.

එවිට රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් කෙරේ සතුටුව මේ නියා අශ්වයකු දුන් තැනැත්තවුට රාජ්‍යයෙන් කැබැල්ලක් දෙම් කලුහු ගසාදී අශ්වයා සිටින තෙන තමන්ගේ රජමැදිරිය මෙන් සරහා තමන්ට ඇතියම්ම පෙළහරක් දී රක්කැ යි වදාරා කුණ්ඩකකුච්ඡිසිඤ්ඣව ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මැහැලි නම් මෙසමයෙහි මැහැලිමය, එසමයෙහි අජානීය අශ්වයා නම් ශාරිපුත්‍රස්ථවිරය, එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දස්ථවිරය, එසමයෙහි අස්වෙළඳව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

---

## 248
## සුව ජාතකය

මේවද මාගේ මුදුන්මල්කඩවූ සර්ව්ඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කැවැවූ අන්‍යාපාතාදිය දිරවාගතනොහී මළාවූ භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්;

එක්තරා භික්ෂුකෙනෙකුන් වහන්සේ සය දින නොවළඳා අජීර්ණකොට වළඳා මළසේක. මේ කථාව ධම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාලුවරුන්වහන්සේ කිය කියා වැඩ උන්තෙනට සර්ව්ඥයන්වහන්සේ වැඩවදුරා "මහණෙනි, මා

එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනු දෑ"?යි විචාරා වදාරා එපවත් අසා 'මහණෙනි, දැන් මතු නොවෙයි, පෙරත් තෘෂ්ණාවසඟව මළෝ වේදැ"යි වදාරා "ඒ කෙසේ දැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයන්වහන්සේ හිමාලය වනයෙහි ගිරාව ඉපද වයොවැඩව දැස් නැතිව වාසය කරන්නාහ. බොධිසත්වයන්ගේ පුතනුබෑනෙක් ඇත්තාහ. ඒ පුතනුබෑවෝ දෙමවුපියන්ට ඵලාඵල ගෙණවිත්ලා රකිනාහ. එසමයෙහි ඒ ගිරා පොතකයෝ සමුද්‍රමධ්‍යයෙහි මී අඹ ඇති තියාව දැන පසුදවස් සමුද්‍රමධ්‍යයෙහි දිවයිනට ගොස් අඹ කා දෙමවුපියන්ට අඹ ගෙණවුත් දුන්නුය. බොධිසත්වයෝත් එකියන අඹ කා "මේ අඹ අසවල් දිවයිනේ අඹගසේමය"යි කිවුය.

එවිට බොධිසත්වයන්ගේ පුතනුබෑවෝත් ඒ අඹය යි කිවුය. ඊට බොධිසත්වයෝ කියන්නෝ "පුත ඒ දිවයිනින් අඹ ගෙණිමෙන් ඉදිරියේ බොහෝ උපද්‍රව පැමිණෙයි. එසේහෙයින් එතනට නොඟව"යි කිහ. එසේ කීවත් එකියන ගිරාපෝතකයා එකියන දිවයිනට ගොස් අඹ කන්නේමය. එක් දවසක් අඹ කා මත්වපියා නිදිකන ඇතිව පියා අඩන්නේ මංහසර දැකගත නොහී මහමුහුදු මැද පියාසරකොට දියේ වැටී මළහ. ඒ මළාවූ ගිරාපෝතකයා මත්ස්‍යයෝ ගසා කෑවාහ.

බොධිසත්වයෝ තමන්ගේ පුතනුවන් නො ආහෙයින් මා කීවා නො අසා මළවනැ යි සිතා තමන්ට ගොදුරු ලන කෙනෙකුන් නැති හෙයින් තල්ල වියලී මළාහ යි වදාරා බුදුව වැඩහිඳ වදාරණසේක් "යම්සේ කීවා නො අසා තෘෂ්ණාවසඟව ඒ ගිරවා මළද එමෙන් යම්කෙනෙක් තෘෂ්ණාවසඟව අන්‍යපාන බොහෝ කොට කත් තම් උන්ට එසේම වන්නේය යි තමන්ගේ අග්නි විවරට අන්‍යපාන කත් නම් දෙලොවින් සුවඵලව"යි වදාරා මේ සුව ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි එකියන ගිරාපෝතකයා නම් මෙකියන භික්ෂුහුය, ගිරවාව පියව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක

---

## 249
## ජරුදපාන ජාතකය.

තිවද සංසාරවාහවූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පන්සියයක් වෙළඳුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

තිවද සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පන්සියයක් වෙළඳුන් අරභයා මේ ජාතකය දක්වනලද.

ඒ කෙසේද? යත්;

පන්සියයක් උපාසක වෙළෙන්දෝ වෙළඳුම් පිණිස යන්නාහු සම්බුදුරජාණන් වහන්සේ දැක පන්සිල් ඇරගෙණ යම්හ යි සිතා ආම්හ යි කියා සම්බුදුරජාණන් වහන්සේ අතින් පන්සිල් ඇරගෙණ නික්මුණාහ.

නික්ම අතරමගදී පුරාතන ලිඳක් දැක ඒ ලිඳ පැත් ඇදිල්ලේ හෝ සිතා බලා පැත් නොදැක පැත් උතනතුරු කනුම්හ සි සිතා කතින්තාහු පළමුකොට යකඩ ලෝකඩ තඹ රත්රන් මුතු මැණික් ආදීවූ බොහෝ සම්පත් දැක තමන්ගේ පන්සියයක් ගැල්පුරාගෙණ සැවැත්නුවරට ආවාහුය.

ඇවිත් ''සම්බුදුයන් නිසාය අප සැපසේ යාත්‍රාකොට ගත්තේය''යි කියා සම්බුදුයන්වහන්සේට දන්දී තමන් ලිඳින් සම්පත් ලත් නියාව කිහ. සම්බුදුයන් වහන්සේ එපවත් අසා ''පෙරත් ඒ ලිඳින් වෙළෙන්දු සම්පත් ඇරගන්ට සිතා බොහෝ විනාශයට පැමිණියෝවේදැ''යි වදාරා ''ඒ කෙසේදැ''යි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයෝ වෙළඳකුලයෙහි සාත්තුනායකව උපන්නාහ. පන්සියයක් වෙළඳුන් ඇරගෙණ වෙළඳුම් පිණිස නික්ම මෙම ලිඳ සමීපයට අවුත් බොහෝ සම්පත්කැන ගොඩනැගුහ. බොධිසත්ත්වයන් ඉතිකින් පමණ නොකරණුව සි කිය කියා කතින්ට වහන්හ. එකියන ලිඳ පාත වසන්නාවූ දිව්‍යතයෙක් ඇත, ඒ නයාගේ ඉස උළුපස් වැටෙන්ට වත, එවිට නයා කිපී පණ්ඩිත වෙළඳු එප යි කියව කියවා ''වෙළෙන්දු මේ මාගේ විමානය බිඳිති, එසේ නොයින් පණ්ඩිතවෙළඳු හැර සෙසු වෙළෙන්දු මියෙත්ව''යි සිතා නාසාපුටයෙන් විෂධූමයක් ඇර පන්සියයක් වෙළඳුන් ජීවිතක්ෂයට පමුණුවා පන්සියයක් ගැල්පද්දවා බොධිසත්ත්වයන්ට පාවාදී තමන්ගේ නාග මෙණෙවියන් ලවා ගැල්පද්දවා බෝධිසත්ත්වයන්ගේ ගෙයි ලැවූහ.

බොධිසත්ත්වයෝත් බෙහෝ යාවකයන්ට දන්දී කුසල්කොට පසුව සීලය රැක පෙහෙවස් රැක කම්වූපරිද්දෙන් මිය පරලොව හියාහ. ඒ අතීය දක්වන සම්බුදුයන්වහන්සේ 'මහණෙනි, යම්සේ ඒ වෙළෙන්දු යකඩ තඹ ලෝකඩ රත්රන් මුතු මැණික් ආදීවූ සම්පත් දැක පණ්ඩිත වෙළඳු ඇඹෙයි කියදී විනාශයට පැමිණියාහ. තොප ඇම වනාහි තොප ඇමට විවර සම්පත් ගෙණාකෙයින් විනාශයට නොපැමිණිය''යි වදාරා ජරුදපාන ජාතකය නිමවා වදාළසේකි. එසමයෙහි පණ්ඩිත වෙළඳු තමි මම්මය යි වදාළසේකි.

---

## 250
## ගාමණීචණ්ඩ ජාතකය.

තවද ලෝකවාරිවූ සම්බුදුයන්වහන්සේ සැවැත්නුවර වාසයකරණ සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

සම්බුදුයන්වහන්සේ ප්‍රඥාවිශෙෂයක් යහපත් නියාව කියනසේක් ''ඇවැත්නි, මහපඤ්ඤ,-මහත්වූ අර්ථ ධර්ම නිරුක්ති ප්‍රතිභානාදී ගුණෙන් යුක්තවූහෙයින් මහත්වූප්‍රඥ ඇතිසේක; පුථුපඤ්ඤ,-දෙලක්ෂ සතළිස්දහසක් යොදුන් ඝණකඩ බොල් මහපොළවසේ පැතිර පවත්නාවූ පෘථුලවූ ප්‍රඥාවෙන්

යුක්තසේක; හාසුපඤ්ඤ – හාසු බහුලවූ, තුෂ්ටි බහුලවූ, ප්‍රමෝද්‍ය බහුලවූ, ප්‍රඥාවෙන් යුක්තසේක; ජවනපඤ්ඤ- ජවින ඣංසගතියක් පරිද්දෙන්; සිඝ්‍රව පවත්නාවූ ප්‍රඥාවෙන් යුක්තසේක; තික්ඛපඤ්ඤ– තීක්ෂණවූ ප්‍රඥාවෙන් යුක්තසේක; නිබ්බෙධිකපඤ්ඤ– නිර්භේදනප්‍රඥාවෙන් යුක්තසේක; ද්වීහිපුඩපත්‍රයෙක්හි දිවයන සයංතප්ත අස්ඛලිත අයස්සූලයක් පරිද්දෙන් සංඝකාර ඔකාර ලක්ෂණ නිර්භේදන ප්‍රඥප්තිය යන පඤ්චවිධ ප්‍රකාරවූ ඥෙයම්ණඩ්ඩයෙහි අස්ඛලිතව විනිවිද පවත්නාවූ ප්‍රඥාවෙන් යුක්තසේකැයි ප්‍රඥා විශෙෂය වර්ණනාකොට හුන්නාහුය.

සර්ඥයන් වහන්සේ එතැනට වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්භාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ?යි" විචාරා වදාරා එපවත් අසා 'මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් සර්ඥයෝ නුවණ ඇත්තෝවේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සර්ඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස් නුවර ජනසන්ධව නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒරජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකා බිස වුන් කුස පිළිසිඳ දසඑකඩ මසකින් බිහිවූහ.

ඒ කුමාරයන්ගේ මෑදපු කැඩපතක් මෙන් ශෝභාපත්වූ මුඛශ්‍රියක් ඇති හෙයින් ආදර්සමුඛ කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයන් සත්ඇවිරිදි අවස්ථා වෙනිම ඉගැන්වුවමනා සියළු ශාස්ත්‍රම උගන්වා නිපුණකරවා යුවරජ තනතුරු සලස්වා ජනසන්ධව නම් රජ්ජුරුවෝ සවඉසටවූහ.

ඉක්බිති අමාත්‍යයෝ සිතන්නාහු "මේ ආදර්සමුඛ නම් රාජකුමාරයා බාලය, මුන්වහන්සේගේ නුවණ පරීක්ෂාකරන්ට වුවමැනවැ"යි කියා එක්දවස සක් සභායෙහි ඉඳුවා දෙපයින් ගමන්කරන්ට දන්නා කම්පස් වඳුරකු පිළිඅන්දා ඉස තලකඩුප්පුවක් බැඳ රියන්දණ්ඩක් අතවදී වානරයා රජ්ජුරුවන් වහන්සේ දක්වා 'දේවඅන්වහන්ස, මේ නුඹවන්සේගේ පියාණන්වහන්සේට ආචාරී ධුරයෙහි සිට වසනු විද්‍යා ආදී කටයුතු කාරියෙහි පවන් නුවණින් ඉතා වැඩිතරම් එකෙකැ"යි කීහ. ඒසේ හෙයින් 'මූ රකිණා බව යහපතැ"යි කීහ.

රජ්ජුරුවෝ එකියන වානරයා බලා මූ වනාහි මනුෂ්‍යයෙක් නොවෙයි මේ වනාහි වඳුරාය යි සිතා අමාත්‍යයන්ට කියන්නාහු "මුන්සේවූ වඳුරෝ තමන්ගේ නකුට සඟවා ඉඳතොහී ඉන්නෝ වස්තු විද්‍යා කෙසේ දනිද්ද?"යි මේකා වඳුරාය, මූ ඇරපියව"යි කීහ. අමාත්‍යයෝත් "සැබව, දේවයන්වහන්ස නුඹවහන්සේ පරීක්ෂාකරණ නිසා කළමිහ"යි කියා ඒ වානරයා ඇරගෙණ පලා ගොස් කීපදවසක් අපොකොවලා දෙවැනිව එම වානරයා පිළිඅන්දා සැට්ට මෙලක්කවිවුලා පොතක් අතව දී ඔහු ඇරගෙණ ගොස් රජ්ජුරුවන්ට දක්වා "දෙවයෙනි, නුඹවහන්සේගේ පියාණන්වහන්සේගේ අවධියේ අධිකරණ කායකර්මට නියුක්තවසිටි අමාත්‍යයාය, මොහු රැක්කමැනවැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ ඔහු වඳුරා නියාව දැන අමාත්‍යයන්ට කියන්නාහු "සත්පුරුෂයන් සේ නොවෙයි, ලොම් දික්ව ලොම් තදව තිබෙන මුහේ ලෙයි කුමන ගුණයක් ඇද්ද මුන් සේ වූවන් ජනසන්ධව රජ්ජුරුවන්වහන්සේ අධිකරණ කායකර්මට නොස ලන්වනසේක. එසේහෙයින් මේ වඳුරාය, මූ එපිටලවයි"යි කීහ. එවිට අමාත්‍යයෝ කියන්නාහු "සැබැව දේවයන්වහන්ස, නුඹවන්සේ විමසන පිණිස කළමිහ"යි

කියා ඔහු එපිටලා පෙරලා කිපදවසකින් ඔහු අනික් වෙසක් ගන්වා රජ්ජුරුවන් වහන්සේ කරා ගෙණගොස් 'නුඹවහන්සේගේ පියානන් වහන්සේ සමීපයෙහි දෙමව්පියන්ට උපස්ථාන කරන්ට සපන් බර්මිණ්ඨවූ පුරුෂයෙකැ''යි කියා ''මූ රැක්කමැතැවැ''යි කීහ. එවිටත් රජ්ජුරුවෝ උණ වදුරා නියාව දැන කියන්නාහු ''මූන්සේවූවන් තමන්ගේ දෙමව්පියන් මල්බැ ආදීවූවන් රකින්ට අසමර්ථය, මේ වනාහී වදුරාය මූ අරව''යි කීහ. එවිට අමාත්යයෝ වදුරා ඇර රජ්ජුරුවන් වහන්සේ මහා නුවණැතිසේකැ''යි කියා රාජ්යයට තිබා ඔවුනුපලන්දු ආදාසමූඛ රජ්ජුරුවන් වහන්සේගේ ආඥාවය යි කියා නුවර බෙරලැවූහ. එකියන රජ්ජුරුවෝත් දැහැමෙන් සෙමෙන් රාජ්යය කොට දශරාජධර්මයට අකොප්ය නොව රාජ්යය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ යසස් හා කීර්තිය දශදිශාවෙහි පැතිරිණ, ඒ රජ්ජුරුවන් මත්තෙහි විමසූ ප්‍රශ්න මෙසේ දතයුතු. ඒ කෙසේද? යත්;

ගොණෝ පුතෝනාහයෝ වෙවන ලකාරෙ ගාම හොජකෝ ගණිකාතරුණී සපෙපා මිගෝ තිතතිර දෙවතා නාගෝ තපසසිතෝ වෙව අථෝ බ්‍රාහ්මණ මානවා' යි යනාදීන් ප්‍රශ්න දසසතරක් විසදුසේක. ඒ කෙසේද යත් ? එකියන ආදාසමූඛ නම් රජ්ජුරුවන් වහන්සේගේ පියානන් වහන්සේට දුක්ගත් ගාමණී චණ්ඩ නම් එක්පුරුෂයෙක් සිතන්නේ ''මූන්වහන්සේ බාලසේක. මම් වනාහි වයොවෘද්ධයෙමි. එසේ හෙයින් බාල රජ්ජුරුවන්ට දුක්ගැණි යහපත් නොවෙයි'' සිතා එතනින් පලාගොස් දෙයොත්නක් විවරකින් ඔබ්බේ එක්ගමෙක වාසය කරන්නේය. වැසිවට කල්හි සීසාන්වය යි කියා වෙන අයකුගෙන් ගොන්ගෙයක් ඇරගෙණ ගොසින් සීසා අනතයෙහි ඒ ගොන්ගේ පාවාදෙන්ට සිතා ඔහුගේ ගෙට ගියේය. ඒ වේලාවට ඒ ගෙයි දෙමහල්ලන් බත්කන හෙයින් තෙමේ මම් ගෙට ගියේ නම් මා බත් කන්ට කියති සිතා ගොන්ගෙය ගෙවම දක්වාලීය. ඒ වේලාවට සත්‍රී සහ පුරුෂයා බත්කම්න් සිට මණ්ඩය අතට ඇරගෙණ නැගිසිට ගොන්ගෙය දුටහ. එකියන පුරුෂයාත් ගොන්ගෙය දුටු නියාව දැන ගොන්ගෙය පාවාතොදීම පලාගියේය. එකියන ගොන්ගෙය තමන් සිටිනා පවිටියෙහිම සිටියාහ.

එදා රෑ සොරු ඇවිත් එකියන ගොන්ගෙය ඇරගෙණ ගියාහ. ඒ පුරුෂයෝත් තමන්ගේ ගොන්ගෙය නොදැක ගාමණීචණ්ඩයන් කරා අවුත් ''ඇයි තොප සාන්ව අපගෙන් ගෙණගිය ගොන්ගෙය දෙව''යි කීහ. ගාමණීචණ්ඩයෝ කියන්නෝ ''තොප බත්කමින් සිටියදී නොවේද? මා ගොන්ගෙය ගෙට බාල ආයේය''යි කිවත් ''ගොන්ගෙය දෙන්ට උවමැතැවැ''යි කියා නොයන හෙයින් රජ්ජුරුවන් කරා යන්ට නික්මිණ. දෙන්නා රජ්ජුරුවන් දකින්ට යනකලට ගාමණීචණ්ඩයෝ අතරමග තමන් අඳුනන ගෙයක් දැක මේ ගෙට ගොස් බත්කා යෙමි සිතා ගෙට වන්හ. ඒ වේලාවට ඒ ගෙයි පුරුෂයා ගෙයි නැත එවිට ඒ ගෙයි ඉන්නා සත්‍රී ගාමණීචණ්ඩයන් දැක මුන්ට බත් උයන්ට කොටුවට නැගෙ මියි සිතා සත්මැසි බඩින් ඉඳ ඉනක් වතුරුවා නැගෙන්ට වන් වේලාවට බිම පතින වූවාය. එකෙණෙහි ගැබඳ වැටුණි. ඒ ගෙයි පුරුෂයා ගෙට අවුත් ''ඇයි ගාමණීචණ්ඩයෙනි, මාගේ බිරින්ද මරා දරු ගැබ කුමක්නිසා එලාපුදු ?''යි කියා කැටක් නගා මොනු රාජදූතය යි කියා ඇරගෙණ ගාමණීචණ්ඩයන් මඩ්‍යඝේලාගෙණ දෙන්න දැලයෙන් නික්මුණාහ.

ඒ වේලාවට එක් අස්ගොව්වෙක් තමාගේ අසාගේ බැඳුන් කඩාගෙණ ගාමණීවණ්ඩයන් කරා දිවන හෙයින් ''මලනුවෙනි, ගාමණීවණ්ඩයෙනි, අසුට කැටක්ගසාලා රදවා ලව''යි කීහ. ''යහපතැ''යි ගාමණීවණ්ඩයෝත් අසා රදවන පිණිස කැටක් ගැසූහ. ඒ ගැසූ කැටින් අසාගේ කකුල උනකිලිල්ලක්සේ බිඳින එකියන අස්ගොව්වාත් ''අසා ඉක්මවන්ට කී පමණක් විතා මාගේ අසාගේ කකුල ගසා කඩන්ට කිම්ද?''යි කියා කැටක් නගාලා පා මොහු රාජදූතයෝ ය යි කියා ගාමණීවණ්ඩයන් මඩුකොට තුන්දෙනා නික්මුණාහ. එවිට ගාමණීවණ්ඩයෝ කියන්නේ ''මම ශරීරකෘත්‍යයට යෙමි. තෙපි සැම මෙසේ සිටුව''යි කියා වලට වැද ගලකට නැගී මියන්වය යි කියා ගලින්පාත පැනපිහ, එකියන ගලපාත කුළුපොතු දෙපුතු පියකෙනෙක් උනදඬු කපමින් සිටියාහ. එකියන ගාමණීවණ්ඩයෝ පනින්නාහු මාළුකුළුපොත්තා පිටට පැනපූහ. ඒ කුළු පොත්තා එකපිම්මෙන්ම මළේය. ගාමණීවණ්ඩයන් නොම්රුණු හෙයින් එකියන කුළුපොත්තාගේ පුතා මගේ පියා මරාපු පිතෘඝාතක සොරාය යි කියා කැවක් නගා මොහු රාජදූතයෝය යි කියා ගාමණීවණ්ඩයන් ඇරගෙණ තුන්දෙනා සිටිතැනට ආය, එකියන තුන්දෙනා ''මේ කිම්ද?''යි විවාළාහ. කුළු පොත්තා විසින් ''මාගේ පියා මැරූ සොරාය''යි ''එසේ හෙයින් ගෙණාම්'' කීහ. සතරදෙන වටකොටගෙණ නික්මුණාහ. ඒ වේලාවව එක් ගම්මුදලියෙක් ගාමණීවණ්ඩයන් දැක ''එඹල රජ්ජුරුවන් වහන්සේ මහානුවණැතිසේක. එනෙයින් මා කී අස්න ගොසින් කියව''යි කියන්නේ ''ආදී මම මහත්වූ උපභොග පරිභොග ලැබුවෙමි මමත් නිරෝගිවීමි. දැන් වනාහි මම ඔබ්බෙන් සම්භවන්නාවූ සම්පතුත් නැත. පාඩුරෝගත් මට ඇතිව දුක්විඳිමි. මීට කාරණා කිම්ද? යි රජ්ජුරුවන් වහන්සේ අතින් විචාරව''යි කීහ. දෙවෙනිව එක් වෙශ්‍යා ස්ත්‍රියක් ගාමණීවණ්ඩයන් දැක කියන්නී රජ්ජුරුවන් වහන්සේ මහානුවණැති සේක. මා කී අස්නක් කියාලවයි කියන්නී ''ආදී මම් බොහෝ ලාභලැබීම්, පුරුෂයෝ මා කරා එළඹෙන්නාහ. දැන් වනාහි බුලත්පතක් විවර නොලබම්. ඊට කාරණා කිම්දැයි විචාරව''යි කීහ.

ඉක්බිති ''යහපතැ''යි කියා ඔබ්බට යන කලට එක්තරා ස්ත්‍රියක් ගාමණීවණ්ඩයන් දැක කියන්නී රජ්ජුරුවන් වහන්සේ මහාණුවණැතිසේක. එසේ හෙයින් මා කී අස්නක් රජ්ජුරුවන් වහන්සේට කියවයි කියන්නී ''මම් සවාම් පුත්‍රයා ලහත් ඉන්දනොහෙමි. දෙමව්පියන් ලහත් ඉන්නොහෙමි, මීට කාරණා කිම්දැ? යි රජ්ජුරුවන් අතින් විචාරව''යි කීහ.

ඉක්බිති ''යහපතැ''යි කියා නික්මුනු වේලාවට එක් සපිරාජයෙක් ගාමණීවණ්ඩයන් දැක කියන්නේ ''තොපගේ රජ්ජුරුවෝ මහානුවණැත්තෝල, මා කියන යුක්තියක් කියව''යි කියා කියන්නේ ''මම තුඹසින් නික්මෙන වේලේ ගැහැටි ගැහැටි නික්මෙමි. ගොදුරු කා තුඹසට වහා වැදයෙමි, මේ කාරණාව රජ්ජුරුවන් වහන්සේගෙන් විචාරව''යි කීහ.

''යහපතැ''යි කියා ගිවිස ඔබ්බට නික්මුණු කලට එක්මුවෙක් ගාමණීවණ්ඩයන් දැක කියන්නේ ''රජ්ජුරුවන් වහන්සේ මහත් නුවණැතිසේක්ල, එසේහෙයින් මා කී අස්නක් කියව''යි කියා කියන්නේ ''මා සිටිතා ගස සමීපයේ තණකන්වත් මට අනිප්‍රාය, ඔබ්බේ තණකන්ට මට අනිප්‍රාය නැත, ඊට කාරණා කිම්ද? යි රජ්ජුරුවන් වහන්සේගෙන් විචාරව''යි කීහ.

"යහපතැ" කියා නික්මුණුකලට ඔබ්බේ තිත්වටුවෙක් ගාමණීචණ්ඩයන් දැක කියන්නේ "රජ්ජුරුවන් වහන්සේ මහානුවණැතිසේක්ල. එසේහෙයින් මා කී අස්ත කියව"යි කියා කියන්නේ "මම් තුඹසපිට හිඳ නාදකරණවේලේ යහපත්කොට නාදකරමි, අනිත්තෙනක ඉඳ නාද කරණ වේලේ යහපත්ව නාද නොවෙයි මේ කවර කාරණයක් නිසාද? යි විචාරව"යි කීහ.

"යහපත" කියා නික්මුණු වේලාවට එක් වෘක්ෂදෙවතාවෙක් ගාමණීචණ්ඩයන් දැක කියන්නේ "තොපගේ රජ්ජුරුවෝ මහා නුවණැතිසේක්ල, මා කී විත්තියක් රජ්ජුරුවන්ට කියව"යි කියා කියන්නේ "මාගේ වෘක්ෂයට පළමු බොහෝ බලිපූජා ඇත, දැන් බලිපූජා නැත, ඊට කාරණා කිම්ද?යි රජහු අතින් විචාරව"යි කීහ.

"යහපතැ"යි නික්මුණු වේලාවට දියෙහි වසන නයෙක් කියන්නේ මාගේ විල පැන් පළමු ප්‍රසන්නව තිබෙයි, දැන් කැළඹී තිබෙයි, ඒ කවර කාරණාවක් නිසා ද?යි විචාරව"යි කීහ.

"යහපතැයි කියා ඔබ්බට නික්මුණු කලට තාපසවරු කියන්නාහු රජ්ජුරුවෝ මහා නුවණැත්තෝල, පළමු අප වසන්නාවූ පන්සල අඹ කොස් ආදීවූ වෘක්ෂවල ඵලාඵල ඉතා මධුරය දැන් එම ඵලාඵල නික්තරසය, ඒ කවර කාරණයක් නිසාද යි විචාරව"යි කීහ.

මේ නියායෙන් ගාමණීචණ්ඩයෝ එකී ප්‍රශ්න දසය සිත තබාගෙණ ඒ යුත්තිය කියන සතරදෙනා ඇරගෙණ රජ්ජුරුවන් අධිකරණයෙහි උන් වේලාවට අවුත් රජ්ජුරුවන් දුටහ.

රජ්ජුරුවෝත් ඇයි ගාමණීචණ්ඩයෙනි, මෙතෙක් දවස් කොයි උන්නාද? නැතැක් දවස් තොපගේ උකුලේ උනුම්හ. මෙතෙක් දවස් නුදුටුම්හ. කුමක්නිසාද"යි විචාළාහ. එවිට ගාමණීචණ්ඩයෝ කියන්නාහු "මේ සතර යුක්තියක් කියන නිසා මා ඇරගෙණ ආහ"යි කීහ.

එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු "යුක්තියක් නිසා වුවත් තොප අප දුටුසේ යහපත"යි සතුටුව යුක්ති කියන්ට ආ අය අතින් රජ්ජුරුවන් විචාරන්නාහු මුන් තොප ඇමව කිලු අන්‍යාය අයුක්තිය කියව"යි කීහ.

පළමුකොට ගොන් යුක්ති එකා කියන්නේ "දෙවයන් වහන්ස, සිසාන්ට උවමැනවැ"යි කියන්නා ගොන්ගෙයක් දිලීම්, මොනු වනාහි පසුව ගොන් ඉල්ලූ කල නුදුන්නේය. ඒ ගොන් මට දෙවාවදුරන්නේ යහපතැයි"යි කීහ.

එවිට රජ්ජුරුවෝ සැබෑද ගාමණීචන්ඩයෙනි, විචාරා සැබව දෙවයන් වහන්ස, සිසාන්ටය යි ගොන්ගෙයක් ඇරගෙණ සීසා අන්නයෙහි මුන් බත් කමින් සිටියදී ගෙට වනිනම් මාත් බත්කන්ට කියත්දෝ හෝයි සිතා ගොන් ගෙටම දක්කාලීම්. ඒ වේලාවට මුන් ගොන්ගෙය දුටහ. ගොනුත් පවිටියේම සිටියදී සොරුන් ඇරගත්තාව මූ මට නය කියයි කීහ. එබස් රජ්ජුරුවෝ අසා එකියන පුරුෂයා අතින් විචාරන්නාහු "තා විසින් ගොන්ගෙය දක්න ලදැ"යි විචාළාහ.

එවිට පුරුෂයා කියන්නේ මම ගොන්ගෙය නුදුටුම්හ"යි කීහ. රජ්ජුරුවෝ "ඇයි නොප මා ආදසමුඛ රජ්ජුරුවන් නියාව නොදනීද? මා දැක්කදී ඇත්ත විතා බොරු නොකියව"යි කීහ.

එවිට ඒ පුරුෂයා කියන්නේ "සැබව දෙවයන්වහන්ස, ගොන්ගෙය දිවිමි කීහ.

එවිට රජ්ජුරුවෝ ගාමණිවණ්ඩයන්ට කියන්නාහු "ගාමණිවණ්ඩ, මාගෙන් මසුරන් සොළොස්කලදක් හැරගෙණ ගොන්ගෙයත් දීපියා මූ මා දැක්කදී බොරුකීවාට ඇස්දෙක උදුරාපියව"යි කීහ.

එවිට ගොන්යුක්තිය කියන්ට ආ පුරුෂයා එබස් අසා කියන්නේ "ගාමණිවණ්ඩයෙනි මව ගොන්ගෙයි මිලත් එපයි, මාගේ ඇස්දෙක උදුරත් එත් එපයි, මා ගලවාපුවමැනවැ"යි කීහ. "යහපතැ" කියා ගාමණිවණ්ඩයෝ. උන් ගළවා යවාපූහ.

ඉක්බිති දරුයුක්ති කියනඑකා රජ්ජුරුවන්ලඟට අවුත් "දෙවඇන් වහන්ස, මූ වතාහි මාගේ අඹුවත් මරා දරුඟර්භය එළීය. එසේහෙයින් මට දරුවන් දුනමැනවැ"යි කීහ එවිට රජ්ජුරුවෝ "සැබෑද ගාමණිවණ්ඩය"යි විවාරා එසේය දෙවයන්වහන්ස, මම බත්කන්වය යි මූගේ ගෙට වනිමි, ඒ වේලාවට මූගේ බිරින්ද මට බත් පිසන්ට සාල්බාන්වය යි අටුවට ඉනලා නෙණ පැහැනැඟි කලට පයපලා කඩාගෙණ වැටුනු ගමනේ දරුඟර්භය වැටිනැ"යි කීහ.

එවිට රජ්ජුරුවෝ එකියන පුරුෂයා අතින් "මෙවිට කරන්නේ කිම් දැ?"යි විවාළාහ. "දෙවයන්වහන්ස, කෙසේවූවත් දරුවන් ලබන්ට උව මැනවැ"යි කියන්නා එයට රජ්ජුරුවෝ කියන්නාහු "ගාමණිවණ්ඩයෙනි, මූන් දරුවන් උවමැනවැ යි කියන පසු මළ දරුවන් උපද්දවාදෙන්ට බැරිවූවත් එසේහෙයින් මූන්ගේ බිරිඳ නොපගේ ගෙයි තිබාගෙණ දරු කෙනෙකුන් ලත්කල අඹුවනුත් දරුවනුත් පාවාදෙවාලව"යි කීහ.

එවිට ඒ පුරුෂයා "මා සත්ඇවිරිදි කාලයෙහි පවත් පිසවා කෑ බිරින්ද දැන් මා වියෝනොකළමැනව, මට දරුවනුත් එප"යි කියා ගාමණිවණ්ඩයන්ගේ පයගෙණ අඩා කන්නලවී කීහ. "යහපතැ"යි කියා ගාමණිවණ්ඩයෝ ඔනු අලන.

එවිට අස්සලයා රජ්ජුරුවන් කරා ගොස් කියන්නේ "මොහු විසින් මාගේ අනඹී වූ අශ්වයාගේ පය බිඳිනාලද මට අස්මිල දුනමැනවැ"යි කීහ.

එවිට රජ්ජුරුවන් විසින් 'සැබෑද ගාමණිවණ්ඩය, තාවිසින් අශ්වයාගේ පය බිඳිනාලදැ?"යි විවාළාහ. "එසේය දෙවයන්වහන්ස, මොහු විසින් මට මයිලනුවෙනි, කැවක් ගසා අසා රදවාලව යි කී විසින් කැවක් ගැසීමි, එවිට අසාගේ පයබිඳුනේ සැබව"යි කීහ.

එවිට රජ්ජුරුවෝ "අස්සලය තාවිසින් එසේ කියන ලදදැ"?යි විවාළාහ. අස්සලයා "ස්වාමීනි නොකීමි," කියන්නා "ඇයි මා අදසමුඛ රජ්ජුරුවන් නියාව නොදනීද? මා දැක්කදී ඇත්තක් විතා බොරු නොකිව"යි කීහ

එවිට අස්සලයා කියන්නේ ''සැබවට දෙවයන්වහන්ස, කැටක්ගසා රදව''යි කීහ. රජ්ජුරුවෝ ගාමණීචණ්ඩයාට කියන්නාහු ''අසාගේ පය බිඳුනාට මිලදියයුතුය, මාගෙන් මසුරන් දහසක් ඇරගෙණ මුන්ට දීපියව, අසා කැටක් ගසා රදවන්ට කියාලා මා මැද තොකීම් කියා බොරු කීහෙයින් මුගේ දිව කපව''යි කීහ. එවිට අස්සලයා ''මට දිය යුතු මසුරන් දහසනුඹ වහන්සේ ඇරගෙණ මාගේ අසාගේ පය බිඳුනාටත් මව පලිනැත, මාගේ දිව ගලවාපුව මැනවැ''යි ගාමණීචණ්ඩයන්ට මුරගා කියා ගැලවී පලාගියේය.

ඉක්බිති කුළුපොත්තා ඇවිත් කියන්නේ ''මූ විසින් මාගේ පියා මරණලද, ඒ මට විචාරන්නේ යහපතැ''යි කියා එවිට රජ්ජුරුවෝ ''සැබෑද ගාමණීචණ්ඩය''යි කියා විචාරා ''එසේය දෙවයන්වහන්ස, මුත් තුන්දෙනා විසින් මා වටකොට ගෙණාහෙයින් මම සිතන්නේම ගොන්ගෙය තය ගෙවාගත නොහෙන දරුවන්ගේ නය හා අසාගේ නය කෙසේ දී ගැලවෙම් ද යි සිතා මාගේ ප්‍රාණය තසාගනිමි සිතා පළිතයට නැඟී පනින්නෙමි මුගේ පියාගේ ඇඟට පැනපිම්, මාගේ පිනූ වේගයෙන් උඹ මියගියේය''යි කීහ.

එවිට රජ්ජුරුවෝ කුළුපොත්තාට කියන්නාහු ''අන්‍යායෙන් මැරූ ගමනක් නොවෙත්, නොදැන කළ වරදට කරන්නේ කිම්දැ''යි කීහ. ''ඒ කෙසේ වුවත් දෙවයන්වහන්ස, මාගේ පියාතන් ලදමැනවැ''යි කීහ. එවිට රජ්ජුරුවෝ ගාමණීචණ්ඩයන්ට කියන්නාහු ''මළාවූ පියා උපද්දාගන්ට බැරිවුව, එසේ හෙයින් මුගේ මවගෙණ තොප පියසවාකන්නා තොප පියාය''යි කීහ.

එවිට කුළුපොතු කියන්නේ ''මාගේ මව නුඹවහන්සේට කෙසේ දෙම්ද? මාගේ පියාත් මට එපයි, මාගේ මවත් දෙන්නේනැතැ''යි කන්නලව් කියා ගැලවීගියේය.

ගාමණීචණ්ඩයෝ යුක්තියෙන් දිනා සිටිනාහු අතරමගදී රජ්ජුරුවන් වහන්සේට කියන්ට කී සොරුප කියම් සිතා කියන්නාහු අගසිව මුලට විචාළාහ.

**ඒ කෙසේද? යන්;**

''දෙවයන්වහන්ස බ්‍රාහ්මණමානවක මොත්තමක් මට කියන්නාහු ''ආදි අපි ශිල්ප වණපොත් කළදේ යහපත්කොට සිත තිබෙයි, දැන් සිත නොති බෙන්නේ කුමන කාරණයක් නිසාදැ''යි විචාරන්ට කිවුය. ''කුමක්නිසාදැ? යි වදාළමැනවැ''යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු ''ආදිවූවන්ගේ හෙදරවල නොවරදී, අඩන කුකුළෙක් ඇත, එසේහෙයින් ශිල්පශාස්ත්‍රය සිත තිබෙයි, දැන් වතාහි මධ්‍යම රාත්‍රිවේලේ හෝ පාන්වන්ට සිටියදී හෝ අඩන කුකුළෙක් ඇත, එසේනෙයින් ශිල්පශාස්ත්‍ර නිදිමත හෙයින් සිත නොතිබෙයි, අනික් කුකුළෙකු වෙලාදැන අඩනලෙස සලස්ව''යි වදාළසේක.

''දෙවයන්වහන්ස, තාපසවරු මොත්තමෙක් මට කියන්නාහු ''ආදි අපවඝන පන්සල අඹ කොස් ආදි ඵලාඵල මධුරය, දැන් එම ඵලාඵල තික්තරසය, ඊට කාරණය විචාරාගෙණ එව''යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ආදී ඒ තාපසවරුන් යහපත්කොට තපස්රකිනාගෙයින් ඵලාඵල මිහිරිය, දැන් තපස් නපුරුකොට රකිනාගෙයින් තිත්තරසය, ඉනිබ්බේ මාගේ ආඥුකියා ඉදුරා තපස් රකින්ට කියව"යි කීහ.

නැවත තුන්වෙනි පැනය කියන්නේ "පළමු මාගේ විල පැන් ප්‍රසන්නව තිබෙයි, දැන් කැලඹී තිබෙයි, ඒ කාරණය විචාරාගෙණ එව"යි කීහ. "ඊට කාරණා කවරේදැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු 'ආදී ඒ තයා මෛත්‍රීකෙරෙයි, දැන් නොයෙක් අඩ දබර කරණගෙයින් පැන් කැලඹී තිබෙයි, පළමු සේ මෛත්‍රී කොට වාසය කරන්නා පැන් නොකැලඹී තිබෙයි, ඒ නියාවට වාසය කරන්ට කියව"යි කීහ.

සතරවෙනි පැනය කියන්නේ වෘක්ෂදෙවතාවෙක් කියන්නේ "තම පළමු නොයෙක් බලිබිලිපවන් සියල්ල ඇත. දැන් නොලැබෙයි, ඒ කුමක් නිසාදැ?යි විචාරන්ට කීය. "ඊට කාරණා කාරණා කියව" යි කීහ. ඊට රජ්ජුරුවෝ කියන්නාහු "වෘක්ෂදෙවතාවා විසින් පළමු මනුෂ්‍යයන් සිතුදෙය සිඛකරණගෙයින් බලි පුජා කරන්නාහ. දැන් සිතුදෙය සිඛනොකරණ හෙයින් බලිපූජා සිඛනොකරත්නාහු ඉනිබ්බේ මාගේ ආඥුකියා මනුෂ්‍යයන්ගේ සිඛාඵිය සිඛකරන්ට කියව"යි කීහ.

එවිට පස්වෙනි ප්‍රශ්නය කියන්නේ තිත්වටුවකු තුඹසක්පිට ඉඳ නාද කරන්නාවූ වේලෙහි යහපත්ව නාදකෙරෙමි අනික්තැනක ඉඳ නාදකරණ වේලේ නාදය යහපත්නොවෙයි, ඒ කාරණය විචාරාගෙණයන්ට කීය. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඒ තුඹසයට යහපත්ව නිධානයෙක් ඇත, එසේහෙයින් නාදය යහපත්වෙයි, ඒ තුඹස බිඳපියා නිධානය තොප ඇර ගණුව"යි කීහ.

සවන ප්‍රශ්නය කියන්නේ එක්මූවෙක් තමා වාසයකරන්නාවූ ගසමූල තණ කන්නා මිහිරිය, අනික්තෙනක තණකන්ට නොමිහිරිය, මේ කාරණය විචාරා ගෙණ එව යි කීය, එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඒ මූවා වසන්නාවූ ගස අග මහත්වූ බඹරමීයෙක් ඇත, ඒ මීබින්දු වට වැගිරීමෙන් තණ මිහිරි වන්නේය. ඒ ගස මීය සලාගෙණ නොපිත් ඇරගෙන අපටත් මී එවාලව"යි කීහ.

"යහපතැ"යි කියා සත්වන ප්‍රශ්නය කියන්නේ එක්තැනෙක් තමා වසන්නාවූ තුඹසින් පිටත්වනවේලේ ගැටි ගැටි පිටත්වෙමි, ගොදුරු කා තුඹසට වදිනාවේලේ යුහුව වැදගෙමි මේ කාරණය විචාරාගෙණ යන්ට කියව"යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු ඒ තයා වසන තුඹස මහත්වූ නිධාන යෙක් ඇත. ඒ නිධානයෙහි ගත් ආසාවෙන් නික්මෙන වේලාවේ ගැහැටි ගැහැටි නික්මෙයි, තුඹසට වදිනාවේලේ එහි ගත් ලෝභයෙන් වහා වැදගෙහි එසේ හෙයින් ඒ තුඹස බිඳපියා නිධානය ඇරගණුව"යි කීහ.

"යහපතැ"යි කියා අටවෙනි පැනය කියන්නාහු එක් ස්ත්‍රියක් "දෙමව් පියන්ගේ ගෙයින් ඉන්දනොහෙමි, සවාමිපුත්‍රයාගේ ගෙයින් ඉන්දනොහෙමි, මීට කාරණාකින්දැ?යි විචාරන්ට කියව යි කියන්නා රජ්ජුරුවෝ කියන්නාහු

"එසේවීනම් ඒ සත්‍රියගේ අතරමග ඉන්නා වරපුරුෂයකු ඇත, නොපි ගොසින් ඉනිබ්බේ ඒ සත්‍රියට හා පුරුෂයාට මාගේ ආඥා කියා එසේවූ නොකවයුත්තක් නොකරන්ට කියව"යි කීහ. "යහපතැ"යි කියා තැවත ප්‍රශ්නයක් කියන්නේ "දෙවයන්වහන්ස, එක්තරා වෛශ්‍යාස්ත්‍රියක් කියන්නී "පළමු මට බොහෝ සම්පත් ලැබෙයි, දැන් එතැනි මට මස්සක් විවරක් දෙනකෙනෙක් නැත, ඒ කුමක්නිසාදැ?යි විචාරන්ට කිවුය, ඊට කාරණා කින්දැ"යි විචාළාහ.

රජ්ජුරුවෝ කියන්නාහු "ආදී තමාගේ වෛශ්‍යාධර්මය නොවරදවා රකිනයෙයින් කවුරුත් සම්පත් දෙන්නාහ, දැන් වෛශ්‍යාධර්මය නොරකිනා හෙයින් කවුරුත් වුවමැනවැ යි නොසිතති ඉනිබ්බේ වෛශ්‍යාධර්මය රකින්නා කවුරුත් වුවමැනැව යි නොසිතති" කීහ

නැවත දසවෙනි ප්‍රශ්නය කියන්නේ ගම්මුදලියා පළමු තමාට බොහෝ සම්පත් ලැබෙයි, දැන් කිසිවකුත් නොලැබෙයි පාණ්ඩුරෝගයක් ඇත, මීට කාරණා කින්දැ?"යි විචාරන්ට කිය. "ඊට කාරණා වදාරන්නේ යහපත"යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "පළමු මොහු විසින් අන්‍යාය නොවී යුක්තායුක්ති විචාරණ හෙයින් කවුරුත් බොහෝ සම්පත් දෙන්නාහ. දැන් වනාහි අයුක්තිකරණවිසින් කවුරුත් සම්පත් නොදෙන්නාහ. තෙමේත් රෝගීය, එසේහෙයින් ඉනිබ්බේ තමාගේ ආඥා කියා යුක්ති ඉඳුරා විචාරන්ට කියවයි කීහ.

මේ නියායෙන් ගාමණ්ඩිවණ්ඩයන් කී ප්‍රශ්න දසයම බුදුකෙනෙකුන් වහන්සේගේ ප්‍රශ්න විසඳීමක්මෙන් විසඳ, වදාරා ගාමණ්ඩිවණ්ඩයන්ට කිසි කෙනෙකුගෙනුත් අවුලක් නොවන නියාවට ගමකුත් සලස්වා යවූහ.

ගාමණ්ඩිවණ්ඩයෝත් රජ්ජුරුවන් කී මෙනෙවර බමුණන්ට හා තපස් වරුන්ට හා නයාට හා වෘක්ෂදෙවතාවාට හා ස්ත්‍රියට හා ගම්මුදලියාට කියා නයාගේ හා නිත්වටුවාගේ හා නිධාන දෙකත් උඳුරා ඇරගෙණ මුවා වසන් තාවූ ගලුඋඩතුබු බඹරමීයත් සලාගෙණ ඉන් අග්‍ර මී රජ්ජුරුවන්කරා යවා තමන්ගේ ගමට ගොස් දැහැමෙන් සෙමෙන් දවස් යවා කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ.

එකියත අදැසමුඛ රජ්ජුරුවන්වහන්සේ දැහැමෙන් සෙමෙන් රාජ්ජය කොට කම්වූපරිද්දෙන් මිය පරලොව ගියාහ යි වදාරා මේ ගාමණ්ඩිවණ්ඩ ජාතකය නිමවා වදාළසේක. "එසමයෙහි ගාමණ්ඩිවණ්ඩයෝ තම් මෙසමයෙහි ආනන්දස්ථවිරයන්, ආදැසමුඛ රජව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක

---

## 251
## මහාමණ්ඩාතු ජාතකය

තවද කරුණානිධාන වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උකටලිවූ භික්ෂූ කෙනෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්,

එක්තරා භික්ෂූකෙණෙකුන්වහන්සේ තෘෂ්ණා වසඟව සිවුරු හරනව උත්සාහකරණ තමක් දැක ඒ තම ඇරගෙණ ගොස් සම්බුදුයන්වහන්සේට දන් වන්නා "ඇයි මේ මහණ කොකමැති පරිද්දෙන් ගෙණයේ කුමකටද?" යි විචාරා, එපවත් අසා මහණ තා විසින් සිවුරුහැර ගිහිගෙයි සිටත් තාගේ තෘෂ්ණාව් පුරාගත හෙයිද? රහත්ව තෘෂ්ණාව ක්ෂයකරතොත් මිසක් ගිහිගෙයි සිට තෘෂ්ණාව පුරාගත එයිද? තා නිබා සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් චක්‍රවාට ගර්භයට එකාධිපත්‍ය රාජ්‍යය හා තාරකා දිව්‍යලෝකයේ රාජ්‍යය හා තව්තිසා නවතෙයෙහි අර්ධරාජ්‍යයත් ඇතුළුවූ රාජ්‍යතුණක් සතිස්ශක්‍ර කෙණෙකුත්නේ ආයුෂය නිමවතතුරු රාජ්‍යයකොට තමන්ගේ තෘෂ්ණාව පුරා ගත නුහුකුවෝ වේදැ"යි වදුරා "ඒ කෙසේදැ?" යි ආරාධිත වූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටවකියදවස ප්‍රථමකල්පයෙහි සූයශීපුත්‍රවූ මහාසම්මත නම් රජ්ජුරු කෙණෙකුන් ඇතිවූන. ඔවුන්ගේ පුත් වරරොජ නම් රජ්ජුරුකෙණෙක් ඇති වූවාහ ඔවුන්පුත් කල්‍යාණ නම් රජ්ජුරුකෙණෙක් ඇතිවූහ. ඔවුන් පුත් වර කල්‍යාණ නම් රජ්ජුරුකෙණෙක් ඇතිවූහ. ඔවුන්පුත් උපෝසථ නම් රජ්ජුරු කෙණෙක් ඇතිවූහ. ඒ රජ්ජුරුවන්ට පුත්වූ මහාමක්ඛාතු නම් රජ්ජුරු කෙණෙක් ඇතිවූහ. ඒ රජ්ජුරුවන් ආඥාවෙන් චක්‍රරත්නය හස්තිරත්නය අශ්වරත්නය ගෘහපතිරත්නය පරිණායකරත්නය මාණික්‍යරත්නය පුත්‍ර රත්නය ආදීවූ සප්ත රත්නයන් පහළ විය. සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස්යොදුන් චක්‍රවාට ගර්භයව එකාධිපත්‍යව රාජ්‍යකරන්නාවූ මහත්වූ ආඥාතෙජස් ඇත්තාහ. වමත භකුළුවා දකුණතින් අත්පොළසන් කරන්නා සත්රුවන්වැයි වස්නේය. මෙසේවූ ආඥාසම්පන්න රජ්ජුරුවෝ ආයුෂ බොහෝ සෙයින් සුවාසූදහසක් අවුරුදු කුමාරකෙළි කෙළියාහ. සුවසූදහසක් අවුරුදු යුවරජ කනතුරෙහි සිටියාහ. සුවාසූහසක් අවුරුදු රාජ්‍යය කොට, චක්‍රවර්ති රාජ්‍යයෙහි කනස්සළුව උන්නාහ.

එපවත් අමාත්‍යයෝ දැන "රජ්ජුරුවන්වහන්සේ වික්ෂෙපව උන්නේ ඇයිදැ"යි විචාරන්නා, "කුමක්ද? මේ නියාවට සම්පත් හා ආශ්වර්‍ය ඇති නොනසා ගොස් රාජ්‍යය කරන්නා කැමැත්තෙමි. එසේවූ සථානයක් මට කියව"යි කිහ.

"යහපතැ" යි කියා අමාත්‍යයෝ කියන්නාහු "මේ නියාවට සම්පත්හි හා පඤ්චකාමයෙන් තාරකා දිව්‍යලොකයෙහි වඩනේය" යි කිහ.

එවිට රජ්ජුරුවෝ "යහපතැ"යි කියා චක්‍රරත්නයට පැන් ඉස නැඟී අමාත්‍යමණ්ඩලයා පිරිවරා චාතුම්මහාරාජිකයට ගියාහ. ඊ වසන්නාවූ සතර වරන් දෙවියෝත් රජ්ජුරුවන්ගේ ආඥාවෙන් ඉදිරියව අවුත් රජ්ජුරුවන් වහන්සේ කැන්දාගෙණ තමන් වාසස්ථානයට ඇරගෙණ ගියාහ. එවිට රජ්ජුරුවෝ චතුර්මහාරාජික දිව්‍යලෝකයෙහි නැහැක් කාලයක් වාසය කොට එහි මදක්කල් වික්ෂෙපව සතරවරම් දෙවිඟන් අතින් විවාරන්නාහු "මේ නියාවට සම්පත්තියෙන් හා පවකාමසැපයෙන් කොයි වැඩදැයි විචාරන්නා,

සතරවරම් දෙවියෝ කියන්නාහු "අපි නම් ශක්‍රදේවේන්ද්‍රයන්ගේ සේවක යෝය, ශක්‍රදේවේන්ද්‍රයන් වසන තව්තිසා දිව්‍යලෝකයෙහි සම්පත්තීන් හා පඤ්චකාමයෙන් වැඩිය"යි කිහ.

මහාමඛාතු රජ්ජුරුවෝ ඒ අසා චක්‍රරත්නයෙහි පැන්නිස සප්ත රත්නය හා සමග තව්තිසා දිව්‍යලෝකයට ගියාහ. එවිට ශක්‍රයෝත් තමන්ගේ දිව්‍යසේනාව ඇරගෙණ රජ්ජුරුවන් කරා අවුත් රජ්ජුරුවන් ඇරගෙණ තමන්ගේ ශක්‍රභවනයට ගියාහ. ශක්‍රයෝත් තමන්ගේ තව්තිසා දිව්‍යලෝකය සරියේ බෙදූ අඩිරාජ්‍යයක් දුන්හ. ඒ දෙවියන්ගේ ආනුභාවයෙන් ඔහුගේ උස මහත හා දෙවියන්ගේ උස මහත හා දෙවියන්ගේ ආත්මභාව නියාවට නිර්මිත විය. ශක්‍රයන් හා මහාමඛාතු රජ්ජුරුවන් එකතැන උන්කලට වෙනස නම් ඇසිපිය එලීම විනා සෙස්ස එකසරිය. මේ නියායෙන් සතිස් ශක්‍රකෙනෙකුන්ගේ ආයුෂය යනතුරු රාජ්‍යය කොට තව තාෂ්ණාව අධික සෙයින් විතතී සිතක් සිතන්නාහු "කිමෙක්ද අඩිරාජ්‍යය කිම්දැ? ශක්‍රයන් මරා රාජ්‍යය කෙරෙමි" සිතා එම ක්ෂණයෙහිම සතත් වයෝවෘඩව දිව්‍යාත්මභාවය නැතිවී මනුෂ්‍යාත්මභාවය පහළවිය.

එවිට මහාමඛාතු රජ්ජුරුවෝ දිව්‍යලෝකයෙන් බැස තමන්ගේ මගුල් උයනට බවහ. ඒ වේලේ එකියන මගුල්උයනේ උයන්ගොව්වාත් මහා මඛාතු රජ්ජුරුවන්වහන්සේ නියාව දැන ආසනයක් පණවා නුවරට පලාගොස් නුවර රජකම් කරණ රජ්ජුරුවන් හා අමාත්‍යයෝ එතනට අවුත් රජ්ජුරුවන් වහන්සේ දැක "නුඹවහන්සේ සවශීසඵවූකාල කුමක් කියමෝදැ" යි කියන්නා, එවිට කියනසේක් "සතිස් ශක්‍රකෙනෙකුන්ගේ ආයුෂ වළඳූ මනුෂ්‍යභවනයට අවුත් මළ මහාමඛාතු රජ්ජුරුවෝ තෘෂ්ණාවසඟවීම නිසා ආයුෂය පිරිනි මළහ"යි වදාරා මහාමඛාතු ජාතකය නිමවා වදාළසේක.

මේ බණ අවසානයෙහි එකියන භික්ෂූන්වහන්සේ දහසක්නයින් ප්‍රති මණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. "එසමයෙහි මහාමඛාතුව උපන් නෙම් බුදුවූ මම්ම ය"යි වදාළසේක.

---

## 252
## කිරීටවච්ඡ ජාතකය

මේ අසාධාරණවූ සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනදසාමීන් කෝසල රජ්ජුරුවන්ගෙන් පිළිදහසක් ලත් කථාව අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වතිමාන කථාව එකසානිපාතයෙහි සිඟාල ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය.

මෙහි බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයෝ බ්‍රාහ්මණ ගමෙක කිරීටවච්ඡ නම් බමුණුව උපන්නාහ. එවිට පඤ්චකාමයෙහි ආදීනව දැක තාපසව වනයෙහි වාසය කරන්නාහ. එසමයෙහි කෝසල රජ්ජුරුවන් හා කැටිව සේවාකම් කරන්ට යයි කියා බරණැස් රජ්ජුරුවෝ නික්ම සේවාකමෙහි බිඳී ඉස් ලූලූ අත සේනාව බිඳී වල්වන්හ.

රජ්ජුරුවෝ එකලාව ඇතුපිටින් වල්වන්නාහු කිරීවටඹ තම් තාපස යන් වසන්නාවූ පන්සලට වන්හ. ඒ තාපසයෝත් ඒ වේලාවට එලාඵල සොයා ගියහ. රජ්ජුරුවෝත් පන්සලට වැද පැන්පිපාස ඉවසාගතනොහී පැනක් බලන්නාහු තාපසයන් බොන පැන් ලිද දුවහ. ඒ ලිද පැන් උකා ගන්ට රණක් කළයක් නොදැක ඇතා බැඳි පොරොද්ද උකාලා ඇතා පශ්චාද ලිදව බැස ලිඳ ගැඹුරු හෙයින් පෙරලා ගොඩට අවුත් තමන්ගේ උතුරුසළුව ගැටගසා බැස තව ගැඹුරසෙයින් සිහන්නාහු පැන් තත්තයෙක් මියන්නා බලාත් පැන් බී මියයාම යහපතැ යි සිතා අතහැර ලිදට පැන පැන් බී පිපාස නිවාගෙණ උඩට ගොඩනැග නොහී ලිදම සිටියාහ. ඒ වේලාවට තාපසයෝ එතනට අවුත් සන්නාහ සන්නඩව සිටිනා ඇතා දැක රජ්ජුරුවන්වහන්සේ මෙතන ආනියා වේදැ යි සිතා නැවත සිතන්නාහු ඇතා සිටියේ රජ්ජුරුවන් වහන්සේ කොයිදෝනෝ යි සිතා බලන්නාහු ඇතා සමීපයට අවුත් ඇතා කම් පස් හෙයින් රජ්ජුරුවන්වනන්සේ බල බලා ලිඳගාවාම සිටියෝය. තාපසයෝ රජ්ජුරුවන් නොදක්නාහු ලිද සමීපයට අවුත් ලිද ඇතුළෙහි සිටි රජ්ජුරුවන් දැක "නොඛව මැනව රජ්ජුරුවන්වනන්සැ" යි කියා ඉණඤ්චතුරුවා රජ්ජු රුවන් ගොඩනැගූහ. ගොඩනගා රජ්ජුරුවන්ට ඵලාඵලදී ඇතා සන්නාහ මුදා රජ්ජුරුවන් ඇඟ තෙල් කිරී ගා දෙතුන්දවසක් රජ්ජුරුවන් සතපා යවූහ

නුවරවාසීන් රජ්ජුරුවන්වහන්සේ මළඛවත් නොදනුම්හ. නියමයක් දැක විනා නුවරට නොවදුම්හ යි කඳවුරු බැඳ නුවරින් පිටත උන්නාහ. රජ් ජුරුවෝ තාපසයන් වැද "මාගේ නුවරට වැඩියමැනවැ"යි කියා තමන්ගේ නුවරට ගියාහ. ඒ තාපසයෝත් මසක් පෝයකින් බරණැස්නුවරව ගොස් රජ්ජුරුවන්ගේ මහුල්උයනේ සැතපී දෙවෙනි දවස් වීටියේ හෙපිළිවෙළින් සිඟා රාජාඞ්ගනයට පැමිණියදු රජ්ජුරුවෝ තාපසයන් වැඳ ඇදිනගෙණ සතර පසයෙන් සංග්‍රහකරන්නට වන්හ. ඒ දැක බොහෝ අමාත්‍යයෝත් "රජ්ජුරුවන් වහන්සේ විසින් මේ තාපසයන්ට කරණ සංග්‍රහ සේවකයකුට කරණසේක් වීනම් කොතෙක් රාජ්‍යය කවයුතුකොට නොකියද්දැ"යි කියා එක් දවසක් යුව රජ්ජුරුවන් හා මුදලිවරුත් රජ්වරුවන්වහන්සේට අවුත් කියන්නාහු "මේ කිරීටවඹ තම් තාපසයන්වහන්සේට මෙලෙස උපස්ථාන කරන්ට ගුරුකමක් නැත, යහළුකමක් නැත, මිත්‍රකමක් නැත, බන්ධුකමක් නැත, උන්වහන්සේ අතින් උගත් ශාස්ත්‍රයකුත් නැත, කුමක් නිසා උපස්ථාන කරණසේක් දැ" යි කීහ. එවිට රජ්ජුරුවෝ "පුත යුවරජ්ජුරුවෙනි, මා බිඳි වල්වැද ගියදු මේ තාපසයන්ගේ ලිදහුනුගමනේ මේ තාපසයන් නිසා මාගේ ජීවිතය රැකුනේය. මා මේ රාජ්‍යයට පැමිණියේත් ඒ නිසාමය, ඒසේ හෙයින් මේ තාපසයෝ මට මහාඋපකාරිය, මුන් මට කළ උපකාරයට රාජ්‍යය දුන්නත් ඒ උපකාරයට සමනොවෙයි. එසේවිසින් තොප ඇමත් මා ලද්දේ මේ තාපසයන් නිසාය, තොප ඇම විසිනුත් තාපසයන්ට සංග්‍රහකරන්ට උවමැනවැ" යි කියා කීහ.

එකියත අමාත්‍යයෝත් එවක්පටන් තාපසයන්ට බොහෝ සංග්‍රහ කළහ. ඒ තාපසයෝත් රජ්ජුරුවන්ගෙන් සිව්පසය ලැබ එහිම වාසය කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා උපන්නාවූ ධ්‍යානයෙන් බඹලොව ගියහ. එකියත රජ්ජුරුවෝත් දානාදී කුසල්කොට දෙව්ලොව ගියහ යි වදුරා මේ කිරීටවඹ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දසේනවිරය, නිරිවචඡ තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි දක්වා වදාළසේකි.

---

## 253 දූත ජාතකය

මේවද අසාධාරණවූ සම්බුදුයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි තෘෂ්ණාවසඟවූ භික්ෂූකෙනෙකුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වර්තමාන කථාව තවවෙනි නිපාතයෙහි කාක ජාතකයෙහි විස්තරවශයෙන් බස්නේය.

මෙහි වතාහි සම්බුදුයන් වහන්සේ "මහණෙනි, මේ භික්ෂූහු තෘෂ්ණාවෙහි අධිකත්වයෙන් ඉස්කැපීමට පැමිණියෝ වේදැ"යි වදාරා "ඒ කෙසේ දැ"යි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

පසිවතිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. අන්තපාන යනපත්කොට අනුභවකරණනෙයින් පාජිනසුඛ රජ්ජුරුවෝය යි කියා නම් තුබූහ. ඒ රජ්ජුරුවෝ අන්තපාන කනලද බොහෝ මනුෂ්‍යයන් මඛ්‍යයේ දළපුඩුසේසත් යට සිංහාසනයෙහි ඉද රන්තලියෙහි ලාලු රසමසවු ලෙස් යුක්තවූ ආහාර බොහෝදෙනා මඛ්‍යයෙහි අනුභවකරන්නාහ.

එවිට එක්තරා පිටිසර මනුෂ්‍යයෙක් රජ්ජුරුවන් බත් මේනිමන තෙනට ආයේ රජ්ජුරුවන් මේනිමවන්නාවූ බොහෝ බාද්‍ය භොජ්‍ය දැක තෘෂ්ණා ඉවසාගත නොහෙන්නේ අතක් උඩතගා "මම දූතය"යි කියා අඩගැසීය. ඒ අවධියේ යම්කෙනෙක් "මම දූතය"යි කියා අඩගැසී නම් උන්ට අවකාශ ඇර රජ්ජුරුවන්කරා ගෙණයන්නාහ.

එසේහෙයින් ඔහු දූතය යි කියා කිනෙයින් මනුෂ්‍යයන් දෙපලට බෙදී උඹට අවකාස අලුහ.

ඔහු වහා අවුත් රජ්ජුරුවන් මේ නිමන්නාවූ රන්තලියෙන් බත්පිඬක් උකාගෙණ කාපිය. එතන සිටි පුරුෂයෙක් තමා අතතුබූ කඩුව කොපුවෙන් ඇද අයා ඉස කපන්ට වන. රජ්ජුරුවෝ "උඹේ ඉස කොකපව"යි රජ්ජුරුවෝ තලියෙන් අත අයා ඔහට බත්කන්ට හැර කා ඉක්බිති මිහිරි පැතුන් පොවා අත කට සෝධවා කපුරු හා බුලතුත් කවා අන්තයෙහි "ඇයි තෝ කවර රජ්ජුරුකෙනෙකුත් ලඟ සිට අවුදැ"යි විචාරන්නා කියන්නේ "දෙවයෙනි, මම තෘෂ්ණාවගේ දූතයාය, මාගේ තෘෂ්ණාවෙන්-තෘෂ්ණාවගේ කීමෙන් මම ඇවින් නුඹවහන්සේගේ තලියෙන් බත්කැම්මය, එසේහෙයින් යථොක්තවූ රජ්ජුරුවන්වහන්ස තෘෂ්ණාවසඟව ආවාවූ මට කෝප නොකළමැනවැ"යි කීය. රජ්ජුරුවෝත් උඹ කී බසට සතුටුව "එම්බල, ඒ එසේමය, යම් මනුෂ්‍ය කෙණෙක් දුක්ඛත්තෝ තෘෂ්ණාව මූලිකවමය, එසේහෙයින් මමත් තෘෂ්ණා වසඟව ඉන්නා එකෙකිමි, එසේහෙයින් නොයින් තෘෂ්ණාවසඟව ආහෙයින් දූතයන්ට සංග්‍රහ කළමනාවේදැ"යි එළගෙරින් සියයක්ද ගම්වර පසක්ද ආදීවූ බොහෝ සංග්‍රහ කළහ යි වදාරා මේ දූත ජාතකය නිමවා වදාළසේක.

මේ බණ අවසානයෙහි භික්ෂූන්වහන්සේ අනාගාම්ඵලයෙහි පිහිටි සේකැයි වදාරා මේ ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි තෘෂ්ණාවසඟවූ පුරුෂයා තම් මෙසමයෙහි මේ භික්ෂූහුය. එසමයෙහි පාපීතසුඛ රජ්ජුරුවෝ නම් දැන් බුදුවූ මම්මය"යි වදාළසේක.

---

## 254 පදුම ජාතකය

මේවද ලොකෙශ්වරවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආනන්ද බොධින්වහන්සේට පූජාකළ නිෂ්ක්‍රමණකුමාර වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

ආනන්ද බොධිකථාව කාලිඞ්ගබොධි ජාතකයෙහි පෙණෙන්නේමය. මේ වනාහි ආනන්ද බොධින් වහන්සේට පූජාකරණ පිණිස පිටිසර සිව එක් නමක් සැවැත්නුවරට වැඩිසේක. මාලාකාර ජීවියේ මල් සොයාගිය සේක් ජීවිමුළුල්ලේ ඇවිදත් මල් නොලැබ පෙරලා අනඳ සාමීන් කරා අවුත් "මල් නොලදුම්හ"යි කීසේක. ආනන්දසාමීන් "යහපත, දැන් මල් ගෙණෙක නියා බැළුව මැනවැ"යි කියා ජීවියට ගොස් බොහෝ ඇරගෙණ ගොස් ඒ පිටිසර සිව ආ තමට දුන් සේක. ඒ නමත් ආනන්දබොධින් පූජාකළ සේක. ආනන්ද සාමීන් මල් ලත් කථාව ධර්මසභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ කියා කියා වැඩ උන් තෙනට සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාව පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන් මතු නොවෙයි, පෙරත් නුවණැත්තෝ මල් ලද්දේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

පෙ' සෙසේද? යන්,

පසිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ සිටුකුලයක සිටුකුමාරව උපන්සේක. ඒ නුවර මල්වතු බලන්නාවූ පුරුෂයෙක් තාසා හිනය. එක් දවසක් මානෙල් මලින් ප්‍රයෝජනයක් ඇත්තාවූ සිටුකුමාරවරු තුන්දෙනෙක් එකියන තාසා හින මල්කරුවා කරා ගොස් මල් ඉල්ලන්නා ඉන් එක සිටුපුත්‍රයෙක් අර උයන් ගොවිවා සිත්ගෙණ කියමි යි මෙසේ කීය. "දැලි අඳන් කපාපුවා දෙවනුව අව ගණිද? එමෙන් තාගේ තාසය අවඟන්නා නියායෙන් අපව මල් දෙව"යි කීය. ඌ ඊට කැන්සිව මල් නොදී ඉන්නා අනික් සිටුකුමාර කියන්නේය. "මාසේ කපාගත් ගොයම් අවඟණිද? එසේම තාගේ තාසය අවඟන්නා නියායෙන් අපව මල් දෙව"යි කීහ. ඊව ඌ විසින් වික්ෂේපව මල් නොදෙන විසින් අනික් සිටු කුමාර කියන්නේ "මුන්දෙන්නාම කියේ බොරුය. කපාපු තාසය නම් ඇති නොවෙයි, මේ මා කියේ සත්‍යය, යාළු මට මල් දෙව"යි කීහ. එවිට ඒ පුරුෂ "මුන් කියේ ඇත්තැ"යි සිතා ඔහු මල් මිටියක් ඇරගෙණ ගොස් ඒ සිටුකුමාර යන්ට දිනැ යි වදාරා මේ පදුම ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි මල් ලත් සිටුකුමාර නම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේක.

---

## 255 මුදුපාණි ජාතකය

මේ අතෙකෙශ්වරවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂු-කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්;**

එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂුකෙණෙකුන් වහන්සේට සම්බුදුරජාණන් වහන්සේ දක්වන්නා "මහණ තා ස්ත්‍රීන් කෙරේ පිළිබඳව ස්ත්‍රීන් රැකගත නෙදී? පෙර දෙම්පියන් විසින් රැකගත නුහුනු ස්ත්‍රීහුය"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පසුගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව ඉපිද වැඩි විය පැමිණ යුවරජ තනතුරෙහි සිට රජ්ජුරුවන් ඇවැමෙන් රාජ්‍යයට පැමිණ දුවනි කෙණෙකුත් හා බෑනනුකෙණෙක් ඇත්තාහ. ඒ රාජකුමාරවරු දෙන්නම රජගෙයි වැඩෙන්නාහ. උන් දෙන්නම උනුන් කෙරේ පිළිබඳ සිත් ඇත්තාහ. රජ්ජුරුවෝ එක් දවසක් අමාත්‍යයන් කැඳවා කියන්නාහු "මාගේ බෑනන්ට මාගේ දුවනියන් පාවාදී රාජ්‍යය දෙම්මැ"යි කියා නැවත කියන්නාහු "එසේ නොවෙයි, මාගේ බෑනනුවන්ට අනික් රාජකුමාරිකාවක් පාවා දෙමි, මාගේ දුවනියනුත් වෙන රාජකුමාරයකුට පාවා දෙමි. එසේ කළ මට බොහෝ සහාය වන්නේය"යි කියා තමන්ගේ බෑනරාජකුමාරයන්ට වෙන රාජගෙවල් තන්වා රාජාඩම්බරයෙන් වෙන් කළහ.

ඒ කුමාරයෝත් එකියන කුමාරිකාව කෙරේ පිළිබඳ සිත් ඇතිව ඒ කුමාරිකාවගේ කිරිමව දැක කියන්නාහු "කුමාරිකාව රජගෙන් පිටත්කොට ගත්ට උවමැතව, ඊට මව උපායක් කියමැතවැ"යි කීහ. එවිට කිරිමව් කියන්නී "මම කුමාරිකාවන් වහන්සේ විවාරා අභිප්‍රාය දැන වදාළ දෙයක් කියම්"කියා රාජකුමාරියන් සමීපයට ගොස් "දුවනියෙනි, ඉස උකුණත් අරිමි කියා තුමූ උස් පුටුවේ හිඳ කුමාරිකාවන් මිටි අස්නෙක හිඳුවා තමා දෙකලවයෙන් හිස මැඩ ගෙණ හිඳ උකුණත් අරිනා ආකාරයෙන් ඉසතියක් ඇතලුව, එවිට මෙකියන කුමාරිකා රාජකුමාරයන් වහන්සේ මා එපිට කොට ගත්නාතියා මැ අත කියා එවූ නියාවේදැ"යි සිතා ගාථාවක් සඟවා කියා යවිව, ඒ රාජකුමාරයන් එපවත් දැන ඒ නියාවට ඝනාන්ධකාරවූ මහත් වර්ෂාකාලයක අත මොළක ඇති එක් පුරුෂයෙකුත් ඇරගෙණ කම්පස් ඇතෙකුත් ඇරගෙණ රජ්ජුරුවන්ගේ පාත මාල සමීපයෙහි ඇතා සිටුවා වැස්සේ තෙමී තෙමී සිටියාහ.

ඒ වේලාවට රජ්ජුරුවන් වහන්සේත් තමන් වහන්සේගේ රාජකුමාරි කාවට රැකවල් පිණිස තමන් වහන්සේගේ යානගාව කුරු ඇදක් ලා වැද හෝනා සැටියේ සලස්වා රකිනා සේක.

එකියන කුමාරිකා එදවස් එකියන රාජකුමාරයෝත් අද එති සිතා පියා-නන් වහන්සේට කියන්නාහු "පියානන් වහන්ස, මා අද නාන්ට උවමැතවැ"යි කීහ.

එවිට රජ්ජුරුවෝ "යහපත දුවනියෙනි, නාව"යි කියා දුවනියන් වඩා ගෙණ ගොස් සිව්මැදුරු කවුළුවෙන් පිටින සිටුවා එක අතක් අල්වාගෙණ නාව"යි කීහ

ඒ වේලෙහි එකියන කුමාරිකාන් රාජකුමාරයන්ගේ ඇඟ අල්වා රාජ කුමාරයන් විසින් ඒ අත තිබූ ආභරණ එකියන ලද්දාවූ අතවැස්සා අත ලා ඒ අත රාජකුමාරිකාවෝ පියාතක් අතට දී තමන්ගේ අත්දෙකම ගලවාගෙණ අනික් අනතුබූ ආභරණ ඔහු අතික් අතලා තුමූ ගොසින් ඇතු පිටට නැගී ගියාහ.

රජ්ජුරුවෝත් අතවැස්සා වඩාගෙණ තමන් දූ වතැ යි සිතා වඩාගෙණ ගොස් ගෙයිලා සැතපෙව යි කියා තුමූ වැදහෙව නිදියන. රජ්ජුරුවෝත් උදැසන නැගිසිට එයියන පුරුෂයා දැක 'මේ කිම්දැයි?"යි විචාරා ඌ විසින් ඒ තත්ත්වය කියන්නා රජ්ජුරුවෝ විස්මව කියන්නාහු "මුන්සේ වූ බාලදරුවන් පවා මා වැනි පියෙකු අත අල්වා සිටියදී මාගේ අත උපායෙන් ගලවාගෙණ ඇතුපිටට නැගී ගියාහ. මූත් මෙසේ කල සෙස්සන් තමා කියනුම කිම්දැ"යි කියා එසේ නොයින් ස්ත්‍රීන් නම් රැකගත නොහැක්කේමය"යි කියා තමන්ගේ දුවනියන්ව බොහෝ මගුල්කොට බැනතුවන්ට සරණ පාවාදී තමන් යුවරජතනතුරෙහි පිහිටුවූහ. එකියන යුවරජ්ජුරුවෝත් රජ්ජුරුවන්ගේ අයාමෙන් රාජ්‍යයට පැමිණ දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගිය හ යි වදුරා මේ මුදුපාණී ජාතකය නිමවා වදාළ සේක.

'එසමයෙහි රජව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළ සේක.

---

## 256 සංකප්ප ජාතකය

එවද ලොකනාථවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියක් කෙරේ පිළිබඳ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

**ඒ කෙසේද? යත්**

එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ පිළිබඳව හිඳිනා දැක සම්බුදුරජාණන් වහන්සේට දක්වන්නා "එබඳු මහණ, පෙර උත්තමයෝ පවා මේ පඤ්චකාමය නිසා මිනීමරා පෙරලා තපස්රුක්කෝ වේදැ"යි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉඛුත්වත් දක්වා වදාළසේකි.

**ඒ කෙසේද? යත්**

පසිවසිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි රජ්ජුරුවන්ට දරුකෙණෙක් නැත්තාහ. ඒ රජ්ජුරුවෝ තමන්ගේ අන්තඃපුරවාසීන්ට කියන්නාහු "දරුවන් ප්‍රාර්ථනා කරව"යි කීහ. එකියන අන්තඃපුරවාසී ඒ නියාවට දරුවන්පතා නැතැක්කල් ගියකල බොධිසත්ත්වයෝ බඹලොවින් චුතව අවුත් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳගත්හ. දසඑකඛම්සකින් උපන්හ. උපන් දවස් තාවාපියා එක් කිරිමවක් අතට දුන්හ. ඒ කිරිමව අතට යන්නාවූ බොධිසත්ත්වයෝ

අඩන්ට වන්නාහ. එවිට අනික් ගැනියක අතව වැඩුහ. එවිව කුමාරයෝ අඩන්ට වන්හ. මේ නියාගෙන් ගැනුන් අත වැඩූ වැඩූ සේ අඩන හෙයින් පිරිමින් අතව වැඩූහ. එවිට නාඩන්නාහ. එතැන් පටන් පිරිමින් විනා ගැනුන් වැඩූ කලම අඩනාහ. එසේ හෙයින් පිරිමි වඩනාහ. කිරි පොවන තැටියේ වත්කොට පොවන්නාහ. තැත්තම් මැනියන් වහන්සේ තිරයෙන් පිට සිට හණපුඩුව මැත්කොට කිරි පොවන්නාහ. මේ නියාගෙන් වැඩිවිය පැමිණි පසුත් ස්ත්‍රීන් නොදක්නාහ. එබැවින් රජ්ජුරුවෝත් වෙන මාලිගාවක් කරවා වෙනම සයනය කරණ නියාගෙන් සැලැස්සූහ.

ඒ කුමාරයන්ට වයස සොළොස් ඇවිරිදි පිරුණුකල රජ්ජුරුවෝ සිතන්නාහු මාගේ ඇත්තේ එකම පුතනුවෝය. ඔහු වනාහි මා ඉක්බිති රාජ්‍යය කරන්ට උවමැනව. රාජ්‍යය කළ තම් ස්ත්‍රීන් සමග පඤ්චකාම විෂය අනුභව කරන්ට උවමැනව. එසේ හෙයින් මාගේ පුතනුවන් ස්ත්‍රීන් නොදකිනා හෙයින් රාජ්‍යය කරන්ට බැරිය, කරන්නේ කිම්දැ"යි කියා විස්තරව උන්සේක.

ඒ වේලාවව එක් ගී කීමෙහි දක්ෂවූ ස්ත්‍රියක් රජ්ජුරුවන් කරා අවුත් කියන්නී දෙවයන්වහන්ස, විස්තරව උන්නේ ඇයිදැ'යි විචාරා "එඹල මාගේ පුතනුවන් අසනීඝාත කුමාරයන් ස්ත්‍රීන් වර්ණනාවන හෙයින් විස්තරව ඉඳිමි"යි කියා. එවිව ස්ත්‍රී "දෙවයන්වහන්ස, මේ නිසා නුඹවහන්සේ විස්තර වන්ට එපයි මම ගී කියා වීණා ගා ලබබවා ගණිමි" යිතා ඒ ස්ත්‍රී කුමාරයන් ලඟ සිටි පුරුෂයන්ට කියන්නී "මම සෙට ගී කියා වීණා ගායනා කෙරෙමි' එවිට කුමාරයන් වහන්සේ කී දෙයක් ඇත්තම් මට කියව"යි කියා කියන්නා 'යහපතැ"යි ඒ පුරුෂයෝ ගිවිස්සාහ.

එකියන ස්ත්‍රීත් පසුව දවස් දුර සිට ගී කී නියාවව වීණා නාදකරවන්ට වන. එක්ෂණයෙහි රාජකුමාරයාත් කන්දී අසාගෙණ වැදහොත්තේය. කන්දී අසාගෙණ වැදහොත් පවත් ඒ ස්ත්‍රී අසා දෙවන දවස් ලඟ සිට ගායනා කොළේය. එවිට බොධිසත්ත්වයෝ එකියන ස්ත්‍රිය මාගේ ගෙට කැන්දා ගෙයි ඇතුලේ සිට ගී කියා වීණා නාදකරන්ට කියව'යි කීහ.

"යහපතැ"යි කියා ලඟට කැඳවා හී අස අසා ඇ හා සමග ලොකසාරදරනි යෙහි යෙදී පඤ්චකාමයෙහි තත්පරව "පඤ්චකාම විෂය මා මිසක් අනික් කෙණෙකුන් අනුභව කරන්නේ නම් කිම්දැ"යි කඩුව කොපුවෙන් අයාගෙණ වීථියට බැස මිනිසුන් පොළඟසන්ට වන්හ. මේ නියාගෙන් මිනිසුන් පොළ ගසාගෙණ වීථියේ නික්මුණු නියාව රජ්ජුරුවන් අසා තමන්ගේ මිනිසුන් යවා ඒ කුමාරයන් අල්වා එකියන ස්ත්‍රී ඒ කුමාරයාත් දෙන්නාම නුවරින් නෙරපූහ.

එකියන ස්ත්‍රීත් කුමාරයෝත් දෙන්නම හිමාලය වනයව ගොස් ඒකන්ත කිම් සමුද්‍රය හා ඒකන්තකිම් ගඟක් ඇති එක්සථානයක පන්සලක්කොව වාසය කරන්නාහ. එකියන ස්ත්‍රිය පන්සල ඉඳුවා බොධිසත්ත්වයෝ ඵලාඵල ගෙණවුත් දෙන්නාහ. ඒ ස්ත්‍රීත් පිසලාලා ඉස්නීය. මේ නිසා දවස් අරණ කල්හි මුදමැද්දේ දිවයිනක වසන්නාවූ තාපසයෙණෙක් ඵලාඵල නිසා ආකාශ යෙන් වනාන්තරයව යන්නාවූ බොධිසත්ත්වයන්ගේ ගෙයි දුම් පෙණෙන්නා දැක ඒ ගෙයකරා බවහ.

ඒ වේලාවට බොධිසත්ත්වයෝ එලාඵල කඩා වනාන්තරයට ගියාහ. ඒ වෙලාවට ඒ තාපහයෝ ඒ පන්සලට බටහ. ඒ ස්ත්‍රී ඒ තාපසයන් පන්සලට වඩා වළඳවා ඉක්බිති "වඩිනේ යහපතැ"යි කියාත් රදවා තමාගේ භාවභාව දක්වා තාපහයන් ලබ්බාගණ උන්හා කැවිව ලෝකසම්භාදරහියෙහි යෙදුනාහ." ඒ වේලාවට බොධිසත්ත්වයෝ ඵලාඵල කඩාගෙණ පන්සලට වන්නාහ. ඒ තාපසයෝ බොධිසත්ත්වයන් දැක පන්සලින් නික්ම සමුද්‍රය ලඟව ගොස් ධ්‍යාන ඇතැයි ආකාශයට නැගෙමියි උත්සාහකොට සමුද්‍රයෙහි වැටී හුන. බොධිසත්ත්වයෝත් මරන්ට කඩුව ඇරගෙණ පස්සේ ලුහුබන්දා ගොස් තාපසයන් දැක මේ තාපසයන් පළමු සෘර්ධි ඇති කෙනෙකුත් නියාවේද? දැන් මුන්ගේ සෘර්ධි පිරිහුන, මුන්ට සෘර්ධි උපදවන්ට උවමැතැ සි සිතා කියන්නාහු "තාපසයෙනි ස්ත්‍රීන් කෙරේ පිළිබඳවීමෙන් ධ්‍යානයෙන් පිරිහුන, ස්ත්‍රීහු නම් සියල්ල දවන්නා වූ ලැවිනිත්තක් මෙන් අවැඩකරණ සුල්ලහ. ආශීවිෂයකු මෙන් දෂ්ටකරණ සුල්ලහ. යම්සේ කඩුව ගෙණ මරණයට සිටි පුරුෂයකු හා සමග කරන්නාවූ කථාව යහපතට යෙයි, ස්ත්‍රීන් හා කරණ කථාව වැඩකට නොසැලසෙයි" කියා බොධිසත්ත්වයන් කියන්නාවූ බණ අසා තාපසයෝ සමුද්‍රයෙහි සිටම ධ්‍යාන උපදවා තමන් වසන්නාවූ දිවයිනට ගියාහ.

එවිට බොධිසත්ත්වයෝත් මෙසේවූ බරාබැරිහැර ධ්‍යාන උපදවා ආකාස යෙන් යෙම් සිතා එකියන ස්ත්‍රිය ගෙණ ගොස් මග සිටවා කැමති තෙනකට යවයි කියා බොධිසත්ත්වයෝ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා මිය පරලොව ගියාහ යි වදාරා මේ චුල්ලපලෝභන ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි අසනීඝාත කුමාරයෝ නම් බුදුවූ මම්ම ය' යි වදාළසේක.

---

## 257
## මහාපනාද ජාතකය

**මේ** වද අප්‍රතිමාඨවූ සම්බුදුන්වහන්සේ කොටිග්‍රාමයෙහි වැඩවසන සමයෙහි භද්දිය මහතෙර සාමීන් අරභයා මේ ජාතකය දක්වතලද.

ඒ කෙසේද? යත්.

එකියන කොටිග්‍රාමයෙහි භද්දිය සිටානන්ගේ භද්දිය නම් සිටුකුමාර කෙනෙක් ඇත්තාහ. උන් වාසය කරන්නාවූ තුන් සෘතුවට තුන් ප්‍රාසාදයෙක් ඇත. ඉන් එකි එකී ප්‍රාසාදයෙහි සාරසාරමස වාසයකරන්නාහ. ඌත් එක් ප්‍රාසාදයෙක වාසය කොට එක් ප්‍රාසාදයකට නික්මෙන වේලේ උන්ගේ ආශ්චර්‍යය බලන්ට බොහෝ මනුෂ්‍යයෝ මැසි බැඳසිට ආශ්චර්‍යය බලන්නාහ.

මේ නියාමයෙන් වාසය කරණ කල්හි එක්දවසක් කොටිග්‍රාමයෙහි මනුෂ්‍යයෝ දනක් දෙන්ටයසි බුදුන් ප්‍රධාන මහාසඞ්ඝයා පවරාගෙණ මහත්වූ ශාලාවෙක වඩාහිඳුවා දන්දෙන්නාහ. ඒ වේලාවට එකියන භද්දිය කුමාර තමා ලත් ප්‍රාසාදය ඇර අනික් ප්‍රාසාදයකට යමින් සිටි කලට සම්බුදුන්වහන්සේ බොහෝ මනුෂ්‍යයන් පිරිවරා ධර්මදෙශනා කරමින් වැඩඋන්තෙනට තමාගේ පිරිවර හා සමග සම්භාවසත්කාරයෙන් සැරහී ගොස් සිටිපලසිටම සියලු කෙලෙසුන් නසා රහත්වූහ.

සම්බුදුරජාණන් වහන්සේ භද්දිය සිටුතුමන්ට කියන්නාහු "තොපගේ පුතණුවෝ භද්දිය කුමාරයෝ රහත්වූහ. එසේහෙයින් අද උන් පිරිනිවන් පාන්නක් හෝ මහණ වන්නක් හෝ වුවමැනවැ" යි වදාළසේක. එවිට භද්දිය සිටාණෝ කියන්නෝ "මාගේ පුතණුවෝ මියන්නේ ඇයිද? මහණවෙති" යි කියා. "යහපතැ" යි කියා සම්බුදුරජාණන් වහන්සේ ඒ කුමාරයන් මහණකරවාගත්තාහ. එකියන භද්දිය සටුවිරයෝත් තමන්වහන්සේට පැමිණියාවූ නිවන් සැපත අනුභව කරණසේක් ධ්‍යාන භාවනාදීවූ දෙය කොට සැපවූ සටහනයක උන්සේක.

ඒ වෙලාවට බොහෝ භික්ෂූන් උන්වහන්සේකරා ආසේක. උන්වහන්සේත් තමන්වහන්සේගේ ධ්‍යානභාවනායෙන් උන්හෙයින් කවුරුන් වහන්සේ ආවත් නැගිනොසිට උන්සේක.

එවිට බොහෝ පෘථග්ජන භික්ෂූන්වහන්සේ "ඇයි භද්දිය සටුවිරයන් මහණවූයේ නොබෝ දවසෙක, වැඩිමහලු වහන්දූ දූක මනතෙරකෙනෙකුන් මෙන් ඉන්ට කාරණා කින්දැ?" යි උද්ඝොෂණය කළසේක.

සම්බුදුරජාණන් එපවත් දැන ඒ වහන්දූගේ සිතිවිල්ල ශුඛතරණ පිණිස උපාසකවරුන්ට කියා "අපි මේ ගංගාවෙන් එගොඩයන්නා කැමැත්තම්හ" යි වදාළසේක. "යහපතැ" යි කියා නැව ඔරු පාරු ඉදිකොට සම්බුදුරජාණන් වහන්සේ හා සඞ්ඝයාවහන්සේ වඩින නියාමයෙන් සැලැස්සූහ.

සම්බුදුරජාණන්වහන්සේ ලඟට කැඳවා "භද්දිය සටුවිරයෙනි, තොප මහා පනාද කාලයෙහි තොප විසූ පස්විසි යොදුන් දිග හා සත්යොදුන් පුළුල සත් රුවන් ප්‍රාසාදය කොයිදැ?" යි විචාළසේක.

එවිට භද්දිය තෙරුන්වහන්සේ කියනසේක් "සවාමීනි, ඒ ප්‍රාසාදය මේ ගඞ්ගාවෙහිය" යි වදාළසේක. ඒ අසා බොහෝ භික්ෂූන්වහන්සේ සිතනසේක් මේ භද්දිය තෙරුන් කියන්නේ කින්දැ? යි සිතූසේක. එපවත් සම්බුදුරජාණන් දැන "භද්දිය සටුවිරයෙනි, තොපගේ සබ්‍රහ්මචාරීන්ගේ සාංකාවන් දුරුකරව" යි වදාළසේක.

එවිට භද්දිය තෙරුන්වහන්සේ "යහපතැ" යි කියා තමන්වහන්සේ පළමු සිටි ප්‍රාසාදයෙහි කෙවින්න මාපටගිල්ලෙන් ඔසවාගෙණ ප්‍රාසාදය උඩ ඔසවාගත්සේක. ඒ වේලේ බොහෝ මනුෂ්‍යයෝ ප්‍රාසාදය ගව්වක් එසවින දෙහව්වක් එසවිනැයි යනාදීන් කියා බල බලා සිටියාහ.

එවිට මහාපනාද කාලයෙහි නැයෝ එකියන මාලිගාවකෙරේ ගත් ලෝභයෙන් එහිම මස්කැසුප්ව උපන්නාහ.

ඒ උපන්නාවූ බන්ධුහු ප්‍රාසාදය උඩට ඔසවත්ම පෙරලි පෙරලි දියෙහිම වැටෙන්නාවුන් බලා සම්බුදුරජාණන්වහන්සේ "භද්දිය සටුවිරයෙනි, තොපගේ පූර්වයෙහි නැයෝ බොහෝ ව්‍යසනයට පැමිණෙති වදාරා ප්‍රාසාදය හරුව" යි වදාළසේක. "යහපතැ" යි කියා භද්දිය තෙරුන්වහන්සේ මාලිගාව අලසේක. මාලිගාව පළමුතුබූ සටහනයෙහිම පිහිටුවාහ. සම්බුදුරජාණන් එකියන ගංගාගෙන් එගොඩව පණවනලද බුඩසනයෙහි වැඩහුන්සේක.

එවිට බොහෝ භික්ෂූන්වහන්සේ "මේ භද්දිය තෙරුන්නාන්සේ මහා පනාද කාලයෙහි මෙහි විසූ කාරණය ශ්‍රීබුද්ධියට මිසක් අපට නොදනෙයි. එහි පිළිවෙළකටාව දක්වා වදාලොත් යහපතැ" යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද යත්?** මෙහි ජාතක කථාව පකිණ්ණක නිපාතයෙහි සුරුචි ජාතකයෙහි විස්තරවසයෙන් පෙණෙන්නේය. මෙහි වර්තමාන යවගිය දවස වේදේහරට මියුළුනුවර සුරුචි නම් රජ්ජුරුකෙනෙක් වූහ. ඒ රජ්ජුරුවන්ගේ සුරුචි කුමාරයෙක් වූහ. සුරුචි නම් රජ්ජුරුවන්ට මහාපනාද නම් රාජකුමාරයෙක් ඇතිවූහ.

ඒ කුමාරයන් ශක්‍රයන් විසින් මවනලද පස්විසියොදුන් මාලිගාවෙහි වාසයකොට දෙව්ලොව ගියෝය. ඔහුගේ අයාමෙන් මාලිගාව දියෙහි නිබුයේ යයි වදාරා බුදුවූ වැඩහිඳ වදාරණසේක් "මහාපනාද නම් රජ්ජුරුවන්ගේ පස්විසි යොදුන් සියක් මාල් ඇති නගතලද ධජයෙන් අලංකෘතවූ ඉන්ද්‍රනීල මාණික්‍ය මයවූ දෙරලී දෙරබාවෙන් යුක්තව සැටදහසක් නාටකයන් විසින් දක්වන ලද ආතත, විතත, විතතාතත, ඝනය, සුසිරය යන පඤ්චාඞ්ගික තූර්‍යනාදයෙන් ඒකනාද වූ අලංකෘත වූ මාලිගාවෙහි චක්‍රවර්ති රජකෙනෙකු මෙන් රාජ්‍යය කොට පරලොව ගියහයි වදාරා මේ මහාපනාද ජාතකය නිමවා වදාළ සේක.

"එසමයෙහි මහාපනාද රජ්ජුරුවෝ නම් හද්දිය සථවිරයෝය, එසමයෙහි ශක්‍රව උපන්නේ නම් බුදුවූ මම්මය"යි තමන්වහන්සේ දක්වා වදාළසේක

---

## 258
## කුරඟ්ග ජාතකය

**මේ**වද ලෝකසඞ්ගීවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි විශ්‍රී අඩු භික්ෂුකෙනෙකු කුරු වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

එක්තරා විශ්‍රී අඩු නමක් සම්බුදුරජාණන්වහන්සේට දක්වන්නා "මහණ මේනියා සැපතෙහි සිට විශ්‍රී වඩතොත් විනා අඩුවන්ට කාරණා කින්ද? පෙර උත්තමයෝ පවා තනිව සිටත් විශ්‍රීකළෝ වේ දැ" යි වදාරා "ඒ කෙසේ දැ?" යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**යි**වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුගේ රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ වනයක් සමීපයේ ගමෙක සේවායන් පන්සියයක් ඇරගෙණ යන එන්නාවූ මනුෂ්‍යයන් ඒ වනයෙන් ඇත ලා ඉන් ලත් දෙයක් ඇරගෙණ ජීවත්වන්නාහ.

එසමයෙහි පන්සියයක් ගැල් ඇරගෙණ සාත්තුකාරයක ව්‍යාපාරයෙක් එකියන බොධිසත්ත්වයන් වසන්නාවූ සථානයට ආය. බොධිසත්ත්වයෝත් ඔහු දුන් කුලී ඇරගෙණ මොවුන් මා විසින් ගලවා හරින්ට උවමැනවැ යි සිතා තමන්ගේ සේවා පන්සියයත් ඇරගෙණ ඒ ගැලුත් පදවාගෙණ වනාන්තරයට නික්මුණාහ.

ඒ වනාන්තරය මධ්‍යයේදී සොරුන් පන්සියයෙක් ඒ ගැල් කොල්ල කන්ට ආහ. ඒ වේලාවට බොධිසත්ත්වයන් හා කැටිව ආ සේවායන් පන්සියය හයින් සැඟවී ගියාහ. එවිට බොධිසත්ත්වයෝ තනිව සිට ඇත මැත පැහැ

භයගන්වා සතුරන් පලවා ගැල් පන්සියය ගලවා වනාන්තරයෙන් එතර කළහ. එවිට ගැල් සාත්තුකාරයා බොධිසත්වයන් රසමසවුලෙන් යුක්තවූ ආහාරය කවා කියන්නේ "ආයුධ සන්නඬ සොරුන් දැක තොපට භයෙක්වත් නැති ගැන්මෙක් වත් නුවේ වේදැ"ල කියා විමසූහ.

'එසේය' පඤ්චායුධ සන්නඬ ව ආ සොරුන් දැක භයක්වත් නැතිගැන්මක්වත් නැත. උන් දැක මට මහාඝන්තොෂ උපත, තොප හැම කළාවූ උපකාරය සිතා සතුරන් බිඳීම යන සිතින් නිර්භීතව සිට සතුරන් සැදීමී' වදාරා කුරඟ ජාතකය නිමවා වදාළ සේක.

බණ අවසානයෙහිදී ථියෂී අඩු නිකුඵ ථියෂීවඩා රහත්වූහ යි වදාරා එසමයෙහි එකියන වෙළඳුන් ගැළවූ පුරුෂයා තම් බුදුවූ මම්ම ය යි වදාළ සේක.

---

## 259
## වාතසෙනිව ජාතකය

තිවද එකසඬමිවූ සම්බුදුන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කෙළෙඹි පුත්‍රයකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්,

එක්තරා රූපශ්‍රීයෙන් යුක්තවූ ස්ත්‍රියක් තමන්සේ රූපශ්‍රීයෙන් යුක්තවූ පුරුෂයකු දැක පිළිබඳ සිත් ඇතිව එ නිසා සෝකාග්නියෙන් තැවිතැවී තමාගේ ඇඳ වැළඳ සිපගෙණ නොසෑ නොබී වැදහොත්තීය. ඒ දැන උනගේ යෙහෙළි ශෝද පරිවාර ස්ත්‍රීහුද ලඟට අවුත් "ඇයි තොපට කුමන ආයාසයෙක්ද?" යි දෙතුන් ඇවැරක් විචාරන්නා එපවත් කී කල්හි එවිට එකියන ගැනුත් "අපට ඒ භාරය, තොපි සෝක නොඉඟුව" යි කියා එකියන පුරුෂයා සමීපයට ගොස් එපවත් කිවුය.

ඒ පුරුෂයාත් කිපවරක් කියනතුරු නොඉවිස පසුව "යහ තැ"යි "අස වල්දැ එම් කියා යවූහ.

ඒ ගැනුත් ගොසින් එපවත් සෝකයෙන් උන් ස්ත්‍රියට කියා තෝ විඥප්ත කොව "අසවල්දැ එති" කීහ "යහපතැ" යි කියා ඒ ස්ත්‍රීත් ඒ නියාවට තමාගේ ගෙයත් සරහා තොමෝත් සැරහීගණ යහනාවේ වැදහොත්තීය. ඒ වේලාවට ඒ පුරුෂයාත් ඒ ගෙට අවුත් ඇඳ පාර්ශවයක ඉඳ ස්ත්‍රියගේ අත අල්වන්ට වන. ස්ත්‍රී සිතන්නී ස්ත්‍රීන් නම් පළමුකොට පුරුෂයා අත ඇල්ලුවිට ලැගී නම් නිස්සාරය යි සිතති. එසේනෙයින් පළමුකොට මා නොකමැත්තා මෙන් අඟවා දෙවනු ආ දවසක අවකාස දෙමි සිතා අත ගසාදමාපුවාහ. ඒ පුරුෂයත් ලජ්ජාව එතනින් පලා ගියේය. ඒ ස්ත්‍රිය ලඟට ගැනු අවුත් "ඇයි නී ලඟට ආ පුරුෂයාට තොපිකළේ කිම්දැ"යි විචාරන්නා "ස්ත්‍රීන් නම් පළමුකොට ලැගී නම් නපුරුයි සිතා නොලැගුනෙමි" කීහ.

ඒ අසා ගැනු කියන්නාහු "අප බොහෝ උත්සාහයෙන් ඒ පුරුෂා මෙත තට ගෙණාවේය. තොපි උන්ට ප්‍රියවූ බසක් විවරකුත් නොකියා යවූවාහ උන් යවාපූයේ විපාක දන්නවාදැ?" යි කියා කීහ. එකියන පුරුෂයත් ලජ්ජාවෙන් එකියන ස්ත්‍රියගේ මුහුණත් නොබැලූයේය. ඒ ස්ත්‍රීත් සෝකයෙන් වියලී

වියලීම්ලේය. එකියන පුරුෂයාත් ''ඒ ස්ත්‍රිය මළේ මා නිසාය''යි දන්නේය. සත්‍රිය මළ පසු මල්සුවඳ ආදීවූ දෙය ඇරගෙණ සමීඥයන් කරා ගොස් පූජාකොට සිටියේය.

සමීඥයෝත් ''ඇයි උපාසකය. මෙතෙක් දවස් නො ආයේ කිම්දැ?''යි විචාරන්නා උපාසකයා විසින් එපවත් නොවළහා දැන්විය. සමීඥයෝ ඒ අසා පළමුත් ස්ත්‍රී උත්තමයන් පවා නොමෝම කැඳවා රවටා යවූවාය යි වදුරා ''කෙසේදැ''යි ආරාධිත වූ සමීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්:**

ඔටිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ වාතසසෙඛව නම් අශ්වව ඉපද බරණැස් රජ්ජුරුවන්ට මගුල් අශ්වවාහනව සිටිනාහ.

එක් දවසක් බොධිසත්ත්වයන් ඇරගෙණ නාවන්ට ගොස් නාවාපියා ඇරගෙණ එන්නාවූ බොධිසත්ත්වයන් දුටු තුන්නාලි නම් කොටළු ධෙනුවක් තෘෂ්ණාව වැටී සොකයෙන් තණ පැන් නොකා නොබී වාසය කරන්නීය.

එකියන කොටළු ධෙනුවගේ පුතෙක් තමාගේ මව අතින් ''ඇයි ශොකව තණ පැන් නොකා නොබී ඉන්ට කාරණා කිම්දැ?''යි විචාරන්නා එපවත් කීප විටක් විචාරන්නා ඒ කාරණා පුතාට කිව, ඒ පිත් ''යහපත අශ්වයාව කියලා ලබ්බන්ට මට භාරය''යි කියා අශ්වයා නාවන්ට වැවට ගෙනා වේලේ ඒ කොට එවා අශ්වයා ලඟට අවුත් ''පියානන් වහන්ස, මාගේ මව් වූ කොටළුදෙන් නුඹ වහන්සේ කෙරෙහි තෘෂ්ණාව වැටී මියන්ට ඉඳිති. එසේ හෙයින් උන්ගේ ජීවිත දුනය දුනමැනවැ''යි කීහ.

එවිට එකියන අශ්වයාත් ''මාගේ අස්සලයා මෙතන සිටිනා හෙයින් බැරිය. අස්සලසා මා නාවාපියා පිටියේ තණ කත්ට හරනේය. එවේලාවට නොපගේ මව කැඳවාගෙණ එව''යි කීය.

එකියන කොටළුවාත් ඒ නියාවට තමාගේ මව කැන්දාගෙණ අවුත් එලියේ සිටුවා තෙමේ බැද්දේ සැඟවී සිටියේය.

අස්සලයා බොධිසත්ත්වයන් නාවා පිටියට අළහ. බොධිසත්ත්වයෝත් ඒ කියන කොටළුදෙන් සමීපයට අවුත් පිට මූණ තිබා චුඹනයකොට සිටියේය.

ඒ වේලාවට කොටළුදෙන සිතන්නී ''ස්ත්‍රීහු නම් පුරුෂයන් ආවේලේ පළමුකොට ලැගී නම් යහපත් නොවෙයි. එසේකල නොතකති සිතා තමා නොකැමැති සැටියේ අඟවන්ට උවමැනවැ''යි සිතා පලාගියහ. එකියන කොටළු ධෙනුවගේ පුතාත් තමාගේ මව්ලඟට අවුත් කියන්නේ ''මෙතෙක්දා විඤ්ඤව උන් නිසා මාගේ පියානන් නුඹවහන්සේ සමීපයට ලන්වූ කල්හි ඇයි නොලැග ගෙන්නට කාරණා කුමක් නිසාදැ''යි විචාළේය. එවිට කොටළු ධෙනුව කියන්නී ''පුත ස්ත්‍රීහු නම් පළමුකොට නොලැගෙති. පසුව ලැග්ග යුතුය. ඒ නිසා පලා ආමි'' කීහ.

ඒ අර්ථය දක්වන සමීඥයන් වහන්සේ ''යම් ස්ත්‍රියක් ලඟට ප්‍රාප්තවූ පුරුෂයාට අවකාශ නොදෙත් නම් වාතසෙඛව නම් අශ්වයාට ආලය ඇතිව

පළමුකොට තදකම්පෑ එකියන අශ්වයා විසෙපකරවූ කුන්තාලි නව කොවළු ධෙනුව වැනිය''යි වදාරා මේ වාතභෙසඞ්ඛව ජාතකය නිමවා වදාළසේක.

''එසමයෙහි කොටළුදෙන් තම් මේ ස්ත්‍රියය, අශ්වව උපන්නෙම් බුදුවූ මම්ම''යි වදාළසේක.

---

## 260
## කකීටක ජාතකය

මේවද මාගේ සවාමිදරුවූ සමීඳුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා ස්ත්‍රියක් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්;

එක් කෙළෙඹි පුත්‍රයකු හා උන්ගේ භාය්‍යාවන් හා දෙන්නා සැවැත් නුවර එන්නාහු අතරමඟ සොරුන් ඇති සථානයට පැමිණියාහු ඒ වනාන්තරයේ වසන්නාවූ සොරදෙවුවා එකියන ස්ත්‍රියගේ විශිෂ්ඨවූ රූපය දැක ඈ කෙරෙහි පිළිබඳ සිතින් මෙකියන පුරුෂයා මරා මෙකියන ස්ත්‍රිය ඇරගණිමි යි සිතා පුරුෂයා මරන්ට කොපුවෙන් කඩුව අයාගත. එවිට ස්ත්‍රිය පතිව්‍රතා ධර්මය රැක තමාගේ සවාමිපුත්‍රයා දෙවතාසථානයෙහි තබා වාසය කරණ හෙයින් සොරදෙවුවා පයගෙණ අඩා ''මා නිසාවේද? මාගේ සවාමිපුත්‍රයා මරන්ට සිතන්නේ මාගේ සවාමිපුත්‍රයා රැකගත නුහුනුවත් මාගේ ප්‍රාණය සිරිගිකාවුවත් ශවාසය රඳවා වුවත් නසා ගණිමි''යි කීහ.

එවිට එකියන සොරා ඒ දෙමහල්ලන් තොමරා අළහ. ඒ දෙමහල්ලෝත් සැවැත්නුවරට එන්නාහු ''ජේතවනාරාමයට අවුත් 'සමීඳුයන් දැක යම්හ''යි සිතා ජේතවනාරාමයට අවුත් සමීඳුයන් දැක සිටියාහ.

සමීඳුයෝත් ''කෙළෙඹි පුත්‍රය, මග සැපසේ පලා ආවාදැ''යි විචාරා වදාරන්නා ''ස්වාමීනි, අපට කුමන සැපයෙක් ඇද්ද? අතරමගදී සොරුන් අප අල්වාගත් ගමනේ මාගේ ස්ත්‍රිය නිසා ජීවිතය ලදුයේය''යි දැන්විය.

සමීඳුයෝ වදාරණසේක් ''පෙරත් මේ ස්ත්‍රී නුවණැත්තන්ගේ ජීවිතය රැකදුන්නේය''යි වදාරා ''ඒ කෙසේදැ''යි ආරාධිතවූ සමීඳුයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද? යත්;

පුරාතන දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක්විලෙක මහත්වූ කලවිටක් සා මහත ඇති රන්වන් කකුළුවෙක් ඇත. එකියන කකුළුවා වසන්නාවූ විලවද එකියන කකුළුවාගේ නමින් විලවද නම් විය. එකියන කකුළුවාගේ විල සමීපයෙහි ඇත් රජ්ජුරුකෙනෙක් නිබඳම ඇත්මුලක් ගෙණ වාසය කරන්නා.

ඒ ඇත්මුල විලට බැස පොකුරු මී තෙළඹුදැලි කන්ට බට වේලාවට ඒ විල වසන්නාවූ කකුළුවා එක් ඇතෙකුගේ කකුල බැගෙණ ගොස් කන්නේය. මේ නියාසෙයින් ඇතුන්ට බොහෝ ගැහැට කරණ හෙයින් ඇත්තු ඒ විලට නොබසිතාහ.

එසමයෙහි ඒ විල සමීපයෙහි වාසයකරන්නාවූ ඇන්රජ්ජුරුවන්ගේ ඇතිනීගේ බඩ බෝධිසත්ත්වයෝ පිළිසිඳගත්හ. එකියන ඇතින්නිත් තමාගේ දරුගර්භය රක්නා නිසා ඔබ්බකට ගොස් බෝධිසත්ත්වයන් වැදූහ.

බෝධිසත්ත්වයෝ වැඩිවිය පැමිණ අසූඅඟුල කුටයක්සේ මහත්වූ ශරීරයක් ඇතිව ඇතින්නක් තමන්ට පාදපරිවාරිකා කොට සලස්වාගෙණ බෝධිසත්ත්වයෝ තමන්ගේ මැනියනුත් ඇතින්නත් ඇරගෙණ පියානන්ට දකිඤ්ට ඒ විල සමීපයට අවුත් පියානන් දැක ඒ විලට බට ඇතුන් කඳුළුවෙකු විසින් අල්වා කන නියාව අසා බෝධිසත්ත්වයෝ තමන්ගේ පියානන්ට කියන්නාහු "පියානන්වහන්ස, මේ කඳුළුවා මරන්ට මට භාරය"යි කියන්නා බෝධිසත්ත්වයන්ගේ පියානෝත් කියන්නාහු "පුත ඒ කඳුළුවා බොහෝ ඇතුන් කා මරාපිය. එසේ හෙයින් තොපි ඒ විලට නො යව"යි කීහ.

ඒ මාන කියව කියවාත් "මා විලට යන්ට උවමැනවැ"යි කියා බොහෝ ඇතුන් පිරිවරා එකියන විල සමීපයට ගොස් ඇතුන්ගෙන් විචාරන්නේ "මේ විලවසන කඳුළුවා ඇතුන් අල්වන්නේ විලට බස්නාවේලේද? ගොදුරු කන වේලේද? විලින් ගොඩනගින වේලේද"යි විචාළෝය.

එකියන ඇත්තු කියන්නෝ "දියට බැස ගොදුරු කා ගොඩනගින වේලේ ඇමට පස්සේ එන ඇතා පය අල්වන්නේය"යි කීහ.

එබස් අසා බෝධිසත්ත්වයෝ "යහපතැ"යි කියා ඇතුමුල හා ඇතින්න පිරිවරා දියවබැස ගොදුරු කා ගොඩනගින වේලේ බෝධිසත්ත්වයෝ හැම ඇතුන් පළමු කොට එවා තමන්වහන්සේ පස්සේ එමින් සිටි කලට එකියන කඳුළුවන් ලෝකුරුවකු අඬුවකින් දිලිහී ගිය ලෝවටක් අල්වන්නාක් මෙන් ඇතුන්ගේ පය අඬුවෙන් අල්වාගෙණ තමාගේ වාසස්ථානයට අදින්ට වත් කල්හි බෝධිසත්ත්වයෝත් තමන් සිටි තැනින් පා ඇද යානොහී මරණ භයින් භයපත්ව මහත් කොට මරණ ප්‍රතිරාවයෙන් ඇඬුහ.

ඒ අඬ ඇසූ බොහෝ ඇත්තු තමන් කෙරේ භයින් කුණුඛනාද කොට ඉලන්හි මුත්‍ර වත්කොට ඒ ඒ අත දිවූහ.

බෝධිසත්ත්වයන්ට බිරින්දවන ඇතින්නීත් කාටවූ භයක්වත් නොදැන දිවන්ට වත. බෝධිසත්ත්වයෝ තමන් ඇර නික්මුණු ඇතින්නට කියන්නාහු 'පින්වත්වූ මා කෙරෙහි ප්‍රියවූ ඇතින්න, අඬු ඇත්තාවූ උස්ව විසරදව නිබෙන්නාවූ ඇස් ඇති මේ විල වසන්නාවූ කඳුළුවෙක් මාගේ පස්සාපය බැඟත. එසේ හෙයින් නී විසින් මා ඇරපියා යන්නේ ඇයිදැ?"යි කීහ.

එබස් අසා එකියන ඇතින්නියෝ "නොබව මැනව, නුඹවහන්සේ ඇර මම කොයියෙම්ද? ඉදින් මේ දැසදහසක් යොදුන් දඹදිව මට ලැබෙනමුත් නුඹවහන්සේ ඇර කොයි යෙම්දැ"යි කියා ලඟට අවුත් සිතන්නී කඳුළුවාට යාචඤ්ඤ කොට ගලවාගන්ට උවමැනවැ යි සිතා කියන්නාහු "රන්වන් පැයක් ඇති ඉතා මහත්වූ කඳුළුවන්ට තායකවූ කඨිටක රාජය, නුඹට අයදිමි, මාගේ සවාමිපුත්‍රවූ හඤ්ඤිරාජයා ඇරව"යි කියා යාචඤ්ඤ කළහ.

එයකින කඳුළුවා සත්‍රියගේ යාචඤ්ඤ අසා නාරින්ට කාරණා නොවෙයි සිතා තමන්ට වන්නාවූ හානිය නොදැන අළුයේය. බෝධිසත්ත්වයෝත් තමන්ගේ පයගෙණ කඳුළුවාගේ පිට පය තබා මැණ්ඩහ. ඒ වේලෙහිම කඳුළුවාගේ

ප්‍රාණය පලාගියේය බොධිසත්ත්වයෝත් සතුටුවිය කුසඳුනාද කළහ. ඒ කුසඳුව නාදය ඇසූ ඇත්තු පෙරළා දියව අවුත් කකුළුවා ඇද ගොඩලාගෙන සුණුවිසුණු කොට මඩවා පූහ.

ඒ කකුළුවාගේ තලදෙක වනාහි දියෙහි තිබුවාය. ගංඟා නම් ගඟත් එකි යන කකුළුවා වසන්නාවූ විලත් සමීප හෙයින් වතුර ආකල ගඟින් ඒ විලට ඇා විලින් ගඟට ඇා පැන් වදිනා ගෙයින් වතුරෙන් ගොසින් ඒ තලදෙක දියෙහි වැටී ගංඟානම් ගඟට වැටී ඉන් එක් තලයෙක් දියෙන් ගොසින් මුදව වැටින. ඒ වනාහි අසුරයෝ දැක තමන්ට උත්සවයට මිහිගුබෙරයක් කොට සලසා ගත්තාහ.

ශක්‍රයොත් අසුරයන් පැරද යන ගමනේ දමාපුවා ශක්‍රයොත් තමන්ගේ උත්සවයට ගසන්වි සලසාගත්තාහ.

එක්තලයෙක් වනාහි දසබෑරජ්ජුරුවන් ලෝදුල් එලනා ගංගාවේ ඇා නළ ලෝදුලෙ බැඳුනා ඇරගෙණ තමන්ගේ උත්සවයට ගසන්ට මිහිගු බෙරයක්කොට සලස්වාගත්තාහ සි වදුරා මේ කකීටක ජාතකය නිමවා වදුළසේක,

එසමයෙහි එකියන ඇතිනි නම් මෙ කියන ස්ත්‍රියය, එසමයෙහි ඇත් රජව උපන්නෙම් බුදුවූ මම්මය"යි දක්වා වදුළසේකි.

---

## 261
## ආරාම දූසක ජාතකය

තිවද මාගේ ගුරුවූ සම්බුදුයන් වහන්සේ දක්ෂිණාපථයෙහි උන් ගොව්වකු අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්;

සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසයකොට වස් අනතයේ දක්ෂිණ ජනපදයට වැඩිසේක.

දක්ෂිණාජනපදයෙහි එක්තරා උපාසකයෙක් සතරපසයෙන් සම්බුදුයන් පවරා දන්දී උයන පිළිගැන්විය. පිළිගන්වා "මේ උයනේ ඒ ඒ තැනවඩිනේ යහපතැ"යි කීය. එවිට භික්ෂූන්වහන්සේ උයන්ගොව්වා අත අල්වාගෙණ ඒ ඒ තැන ඇවිදිනා සේක. එක් සිස්වූ ප්‍රදේශයක් දැක මේ සථානයේ මෙසේ වූයේ ඇයිදැ"යි විචාරා "බලා උයන්ගොව්වෙකු විසින් මුල්බව නියාවට බලබලා පැන්වත්කරන්ට උවමැනවැ යි ගස්පැල උදුර උදුරා පැන්වත් කෙළේය, එසේ හෙයින් මේ ප්‍රදෙශය මේ නියාවට වීය"යි කීහ. ඒ කථාව සඞ්ඝයා වහන්සේ සම්බුදුයන්ට දැන්වූසේක. සම්බුදුහු "එකියන උදෘනපාලයා පෙරත් උයන්නැසුවෝ වේදැ?යි වදුරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදුළ සේක.

පිටහිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුත් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ උයන රකිනා උයන්ගොව්වා

එතනට අවුත් නුවර උත්සවයක් විසින් තෙමේත් උත්සවයට යනු කැමැතිව උයන ඉදිනා වදුරන්ට කියන්නේ "තොප ඇමටත් මේ උයන නිසා බොහෝ ලාභය, එසේ විසින් මම නුවර උත්සවකෙළපියා එතදුතුරෙන් උයනේ පැලෑටි ගස්වලට පැන්වත්කරව"යි කීහ. එකියන වදුරෝ "යහපතැ"යි ගිවිස උයන්ගොවු විසින් දෙතලද රැණි හා දඬු කළ ඇරගෙණ ලිදින් පැන් උකා පැලෑටි ගස්වලට පැන්වත්කරන්නාහ. මේ නියායෙන් පැන්වත්කරණ කලට එකියන වදුරන්ට නායක වූ වදුරා එතනට අවුත් මේ නියායෙන් පැන්වත් කරණකල පැනට හානිවෙයි. ඒ නියායෙන් මුල් බොහෝකොට බව ගසට බොහෝකොට පැන්වත්කරත්ට උවමැනවැ යි මදකොට බව ගසට මදකොට පැන් උවමැනවැ"යි ගස් උදුරා බල බලා පැන්වත් කරන්නා පැනට හානි නො වෙයි, මේ නියාවට බල බලා පැන්වත්කරන්නා යහපතැ යි එකියන වදුරෝත් මුන් කියේ ඇත්තම යි ගිවිස සමහර පැල උදුරා බලා සමහර පැල ඉඳුවා සම හරට පැන්වත් කොට යන්නාහ.

මේ නියායෙන් දවස් අරණ කලට නුවණැති බ්‍රාහ්මණයෙක් එතනට අවුත් වදුරන් කරන්නාවූ ක්‍රියාව දැක කියන්නේ "නොපි ඇම මේ නියායෙන් පැල උදුරා පැන්වන් කරණ කල ගස් නොමියේද? මේ උපාය නොපි ඇමට කීවෝ කවුරුදැ"යි කීහ. එවිට වදුරෝ කියන්නාහු "අපගේ අධිපති වානරයන් කීවාට කරම්හ"යි කිවුහ. බොධිසත්ත්වයෝ "තොපගේ යූථපතියානන්ගේ නුවණ මෙසේකල තොප ඇමගේ නුවණ තමාම කියනුම් කිම්දැ?"යි කියා කීහ. ඒ අසා එකියන වදුරෝ කියන්නාහු "බමුණානන්වහන්සේ කියන්නේ කිම්ද? අප කළේ නුවණැතිවකළ දෙයක් නොවෙයි, ගස්කොල නම් ප්‍රමාණය දැන පැන් වත් කළ මනාවේදැ යි සිතා ඒ නියාවට පැන් වත්කළම්මැ"යි කීහ. "බමුණානන් වහන්ස, අපට නින්දා කරන්නේ ඇයිදැ?"යි කියා කීහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "තොප හා තොපගේ වදුරුමුලට මා කියන්නේ කිම්දැ යි තොප ලවා පැන්වත් කරන්නාවූ උන්ව නායකවූ රජ්ජුරු වන් වහන්සේටය, මා නින්දාකරන්නේය යි කීහ යි වදාරා මේ ආරාම දූෂක ජාතකය නිමවා වදාළ සේක.

එකියන උයන්නැසූ වදුරා නම් මෙකියන උයන්ගොව්වාය, ඒ කාරණය ප්‍රත්‍යක්ෂව කීවාවූ බ්‍රාහ්මණයා නම් නිලෝගුරු සම්‍යගක් සම්බුදුරජවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 262 සුජාත ජාතකය

මේ වද මාගේ මවුවූ සඒඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සුමනා නම් සිටුදුවනියන් අරභයා මේ ජාතකය දක්වන්නලද.

**ඒ කෙසේද යත්?**

ධනංජය සිටානන්ගේ දුවූ විශාඛා මහාඋපාසිකාවන්ගේ නන්වූ සුජාතා නම් සිටුදියනියන් අනේපිඬු මහසිටානන්ගේ පුතනුවන්ව විවාහ මගුල්කොට ගෙණාහ. එකියන සුජාතාවෝත් ගෙට ආවක් පටන් ගෙයි වහල් හා කැටිවත්

සවාමිපුත්‍රයා කැටිවත් අඩදබර කරන්නාහ. මේ නියායෙන් දවස් අරණා සම් යෙහි සවීඥයෝත් එක් දවසක් අනේපිඩු මහසිටානන්ගේ ගෙට වළඳන්ට වැඩි සේක. අනේපිඩු මහසිටානෝත් සවීඥයන් දන්වළඳමින් සිටි කලට එකියන සුජාතාවෝ ගෙයි වහල් හා කැටිව දබරකරන්ට වන්හ.

සවීඥයෝ දබරකරණ අඩ අසා "මේ කිමෙක්දැ?යි සිටානෙනි" වදාළ සේකි. "සවාමිනි, මාගේ ගෙයි කලහකාරිය දන්නා ලෙහෙළියක් ඇත, ඕතොමෝ තමාගේ සවාමිපුත්‍රයා කැටිවත් ගෙයි වහල් හා කැටිවත් කළහකාරී කෙරෙයි, ඇ දබර කරණ අඩය සවාමිනි" කීහ. එසේ අසා සවීඥයන්වහන්සේ සුජාතාවන් ලඟට කැඳවා "නී විසින් තොපගේ සවාමිපුත්‍රයාට වාසය කරණ මාත වධකරන්නා මෙන, එඹල සවාමිපුත්‍රයාට අඹුවෝ සත්දෙනෙක් ඇත්තාහ. ඉන් හෝ කුමන අඹුදැ"යි විචාරා වදාළ සේක.

එවිට සුජාතාවෝ කියන්නෝ "සවාමිනි, මම නොදනිමි" කීහ. එවිට සවීඥයෝ කියන්නාහු "යම් ස්ත්‍රියක් තමාගේ සවාමිපුත්‍රයා හා ගෙයි දැසිදස යන්ට දසවිට බැණදෙඩා වාසය කෙරේ නම් ඒ ස්ත්‍රිය වධකභාර්‍යා නම් වෙයි.

යම් ස්ත්‍රියක් සවාමිපුත්‍රයා ඉපද වූ සම්පත් අනියමින් තමා සිත සැටියේ වියදම් කෙරේ නම් ඒ ස්ත්‍රී නම් චොරභාර්‍යා නම් වෙයි.

යම් ස්ත්‍රියක් සවාමිපුත්‍රයා නියාවට තොමෝ වැඩිතරම් සිට සවාමිපුත්‍රයා කිවා නොඅසා තොමෝ වාසයකෙරේ නම් ඒ ස්ත්‍රිය අරියභාර්‍යා නම් වෙයි.

යම් ස්ත්‍රියක් තමාගේ සවාමිපුරුෂයාගේ අන්නපානාදීවූ දෙය දැන වැදූ ඒ නියාවට වාසය කරණ ස්ත්‍රී මාතුභාර්‍යා නම් වෙයි.

යම් ස්ත්‍රියක් තමාගේ සවාමිපුරුෂයාට යම්සේ භය ලජ්ජා ඇතිව කැගනි බුනති කෙනෙකුත් මෙන් වාසය කෙරේ නම් ඒ ස්ත්‍රී භගිනීභාර්‍යා නම් වෙයි.

යම් ස්ත්‍රියක් සවාමිපුරුෂයා දැක සතුටුවූවා කලකින් පැමිණ යහළුවෙකුට යහළුවෙකු මෙන් සතුටුවන්නීද කුලයට අයත් ශීලවත ඇත්තී යම් හිමියෙකුගේ බිරිඳක් වේද ඕතොමෝ සඛී භාර්‍යා නම් වෙයි.

යම් ස්ත්‍රියක් තමාගේ සවාමිපුත්‍රයා තමා මරතත් බණතත් දෙඩතත් ඒ ඉවසා වාසය කෙරේද? ඒ ස්ත්‍රිය දැසිභාර්‍යා නම් වෙයි යතාදීන් අඹුවන් සත් දෙනාගේ කථාව සවීඥයන් වහන්සේ වදාරන්නාම එකියන ගාථා සත අවසානයෙහිදී එකියන සුජාතාවෝ දැසක් නසින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටියාහ.

එවිට සවීඥයෝ වදාරණසේක් "එඹල සුජාතාව පුරුෂයන්ට යම් ස්ත්‍රියක් වධක භාර්‍යාව, චොරභාර්‍යාව, අරියභාර්‍යාව වාසය කළානම් නරකාදිවල ඉපිදී බොහෝ දුක්විඳිනාහ.

යම් ස්ත්‍රියක් මාතුභාර්‍යා ව, භගිනීභාර්‍යා ව, සඛිභාර්‍යා ව, දැසිභාර්‍යා ව වාසය කෙරේ නම් ඔහු වනාහි සදිව්‍යලෝකයෙහි සම්පත් විඳිනාහ. තෙපි වනාහි මෙකියන උතුම් භාර්‍යාවන් සතරදෙනාගෙන් කොයි භාර්‍යාවන්ගේ ගුණයෙන් වාසයකරව්දැ"යි විචාරා වදාළ සේක.

එවිට සුජාතාවෝ කියන්නාහු "මාගේ සවාමිපුත්‍රයාට දැසිභාර්‍යාව සිට වාසය කෙරෙමි" කීහ.

එවිට සවීඥයන්වහන්සේ 'යහපතැ'යි කියා ජේතවනාරාමයට වැඩිසේක. එක් දවසක් සඞ්ඝයාවහන්සේ දම්සභා මණ්ඩපයෙහි රැස්ව කථාකරණසේක් "යම්සේ සුජාතාවෝ සවීඥයන්වහන්සේ වදාළ එක බසින්ම සියළු අවගුණයන්

හැර නැමුනාහ. සම්බුදුරජාණන් වහන්සේ එකබසින්ම සුජාතාවන් සිටුවූ නියාව යහපතැ"යි කියා මේ කථාව කිය කියා උන්නැතට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදාරා "මහණෙනී, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා එපවත් අසා "පෙරත් එකබසින්ම තිබුයෙම් වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේකි.

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව ඉපිද ඒ රජ්ජුරුවන්ගේ අයාමෙන් රාජ්‍යයට පැමිණියාහ.

බොධිසත්ත්වයන්ගේ මැනියෝ කෝපිව වාසයකරන්නාහ. රජ්ජුරුවෝ මාගේ මැනියන්ගේ කෝපය කෙසේ සන්හිඳුවා ගණිම්දෝ හෝ යි සිත සිතා හිඳිනාහු යම් කාරණයක් දැක විනා නිකම් කාරණා කියන්ට බැරිය යි සිතා කාරණයක් පරීක්ෂාකෙරෙමින් උන්හ. එක් දවසක් රජ්ජුරුවෝ තමන්ගේ මැනියන් ඇරගෙණ උයන්කෙළියට නික්මුණාහ.

ඒ වේලාවට එක්කැරලෙක් උයනේ හිඳ ඇඬිය. ඒ අඬ අසා බොහෝ මනුෂ්‍යයෝ "අවලක්ෂණ පක්ෂියා ඇඬිය"යි කියා දෙකන් වසා ගත්තාහ. ඉන් ඔබ්බට ගියකලට කෙවිල්ලක ඇඹු ශබ්දය අසා යහපත් නියා ශබ්දයකැයි කියා සතුටු වූහ.

මේ අඬිය දැන රජ්ජුරුවෝ මැනියන්ට කියන්ට කාරණයක් දිවිම කියා කියන්නාහු "මැනියන් වහන්ස, නපුරු ශබ්දය අසා සියල්ලවුන්වම අප්‍රියවිය, යහපත් පක්ෂියාගේ ශබ්දය අසා සියල්ලවුන්වම සන්තොෂවිය. එසේහෙයින් මැනියන්වහන්ස, තද පරුෂවූ බස් ඇර මධුරවූ බස් කිව මැනවැ"යි කියා ඒ බරණැස් රජ්ජුරුවෝ මැනියන්ට අවවාද කිහ. එකියත මව්බිසවුන් පුතනුවන් කී එක අවවාදය අසා තමන්ගේ තදපරුෂකම් අළහ යි වදාරා මේ සුජාත ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි ඒ රජ්ජුරුවන්ගේ මව්බිසවු නම් මෙසමයෙහි මේකියන සුජාතා නම් සිටුකුමාරිකාය, එසමයෙහි බරණැස් රජව උපන්නෙම් ලොව්තුරා බුදුවූ මම්මය"යි වදාළ සේකි.

---

## 263
## කාකොලූක ජාතකය

තවද මාගේ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කවුඩන්ගේ හා බකමූණන්ගේ කථාව අරභයා මේ ජාතකය දක්වන ලද

**ඒ කෙසේද? යත්**

ජේතවනාරාමයෙහි පිටිපස්සේ හිඳිනා භික්ෂුකෙනෙකුන් වහන්සේ දවස්පතා උදැසන මළුව අමදිනකල කවුඩන්ගේ ඉස් කැලිය දෙකැලිය ඇමද දමන සේක. මේ නියායෙන් දවස්පතා උකාදමන හෙයින් එක් දවසක් භික්ෂූන් වහන්සේට එපවත් කීසේක. ඒ කථාව කිය කියා වැඩඋන්නෙහිව සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා "මහණෙනී, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා ඒ භික්ෂූන්වහන්සේ "ස්වාමීනි, කවුඩන් හා බක

මූණත් කවරකලක පවත් උනුන් හා වෛරවූයේදැ"යි කියා විවාළසේක. "මහ ණෙනි, ප්‍රථම කල්පයෙහියැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්**

**අතීතයෙහි** දවස ප්‍රථම කල්පයෙහි මනුෂ්‍යයෝ තමන්ට රූපත්වූ පුරුෂයන් රජකමට තෝරාගත්තාහ. සිවුපාවෝ සිංහයන් රජකමට තෝරාගත්තාහ. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යා රජකමට තෝරාගත්තාහ. පක්ෂි එකෙණෙහිම ගලතලක් මත්තේ රැස්වගෙණ කියත්නාහු මනුෂ්‍යයෝ තමන්ට රජකමට තෝරාගත්තාහ. සිවුපාවෝ සිංහයන් රජකමට තෝරාගත්තාහ. මත්ස්‍යයෝ ආනන්ද නම් මත්ස්‍යයා රජකමට තෝරාගත්තාහ. එසේ වීසින් අපවත් රජ්ජුරුකෙනෙකුත් උවමැනවැයි සිතා සෑම පක්ෂීන් එක්ව බෝකමූණකු රජකමට තෝරාගත්තාහ. තෝරාගෙණ එකෙණෙහිම ගිවිස්සන්ට උවමැතවැයි උවමනා නිසා එක් පක්ෂියෙක් තැගී සිට "බෝකමූණාට රාජ්‍යය පැමිණිම එකෙණෙහිම ගිවිස්සේ ඇද්දැ යි ගිවිස්සේ ඇද්දැ?"යි තුන්විටක් විවාළේය. දෙවිටක් විවාරණ තුරු එකෙකුත් මුවෙන් නොබැණලන්හ. එවිට එක් කවුඩෙක් සිතන්නේ "මුන් රාජ්‍යශ්‍රීලත් සන්තෝෂයෙන් ඉදිනාවූ මුගේ මූණ මෙසේ කල ඉදින් කෝපයක් වූ වේලේ මූණ මෙසේ බැලිය ඇද්දැ?"යි කියා සිතා පක්ෂීන්ට කියන්නේ "සිය ගොත්‍රයෙහි උපන් පක්ෂිනි, මා කියන්නක් ඇම්දෙතම නොකිපී අසතොත් කියමි"කීහ. එබස් අසා පක්ෂි කියන්නාහු "ඉදින් බාල පක්ෂියෙක් වීතමුත් කටයුක්ත කියයි නම් එම්වේද? කවියුතු, තොපදත් දෙයක් ඇත්නම් කියව"යි කීහ.

එවිට කවුඩු කියන්නේ "මේ බෝකමූණා රාජ්‍යය ලද්දාවූ සන්තෝෂයෙන් ඉදිනාවූ මුන්ගේ මූණ මෙසේකල ඉදින් කෝපවූයමක් වූනම් කකියාගිය කබලේ ලූ තලසේ පක්ෂී ඒ ඒ තෙන ඉසිර පලායන්නාහ"යි කියා මුන්කෙරේ ඇලෙන්නේ නැත. එසේහෙයින් බෝකමූණන් රාජ්‍යයට තැකීමට මා ගිවිස්සේ නැතැයි කියා ආකාශයට නැඟී පලාගියේය.

එකියන බෝකමූණන් කවුඩු පස්සේම දිවගත. මේ නියායෙන් උන් දෙන්න පලාගියපසු සෙසු පක්ෂි එක්ව "කවුඩා කියේ ඇත්නමය"යි කියා බෝකමූණන් ඇර ශෝර්ණනංස පොතකයෙකු රාජ්‍යයට තෝරාගත්තාහ යි වදාරා මේ **කාකොලුහ ජාතකය** නිමවා වදාළසේක. "එසමයෙහි හංසපොතකව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

## 264
## උදපාන ජාතකය

**තීවද** මාගේම කරුණානිධානවූ සම්බුදුරජාණන්වහන්සේ බරණැස්නුවර ඉසිපතනාරාමයෙහි වැඩවසතසේක් බොහෝ පැන් ලිඳක් කසළ කරණ කැණහිලකු අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

එක්තරා කැණහිලෙක් බොහෝ භික්ෂූන්වහන්සේ බොහෝපැන් වළඳන්, නාවූ ලිඳක් දැක ඒ ලිඳින් දවස්පතාම් පැන් බී ඒ ලිඳ කසළ කරන්නේය.

එක්දවසක් එකියන කැනහිල් බල්ලා දැක සාමණේර මහළුවරුන්වහන්සේ කැටකැබිලිති දමාගසා එතනින් පහකළසේක. එයින් එවක්පවත් එතනට නාවිරිය.

එපවත් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ කථාකොව කොට උන්තෙතට සම්බුදයන්වහන්සේ වැඩවදරා "මහණෙනි, මා එන්නාට පූර්භාගයෙහි කීනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, දැන් මතු නොවෙයි, පෙරත් මෙකියන කැණහිල් මේ බොන පැන් ලිදම කසළ කළේවේදැ"යි වදරා "ඒ කෙසේදැ"යි ආරාධිනවූ සම්බුදයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදළ සේක.

**හේ කෙසේද? යන්,**

ඒටඉය දවස බරණැස් නුවර බොධිසත්ත්වයෝ එක්තරා කුලයක ඉපිද තාපසව එම බරණැස් නුවර ඉසිපතනාරාමයේ බොහෝ තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ. එසමයෙහි මෙම කියන ලිද මෙම කියන කැණහිල් පැනුත් බී කසළත් කරන්නේය.

එවිට තාපසවරු මළබාන්ලා කැණහිලා අල්වාගෙණ ගොස් බොධිසත්ත්වයන්ට පැහ. බොධිසත්ත්වයෝත් එකියන කැණහිලා දැක කියන්නාහු "තා විසින් තාපසවරුන් පැන් බොන්නාවූ ලිද කසළ කරන්නේ ඇයිදැ"යි කීහ. එබස් අසා කැණහිල් කියන්නේ "තාපසයන් වහන්ස, මට කෝප නොකළ මැනව, අපගේ සත්මුත්තන් පරම්පරාවේ යම් තෙතකින් යමක් අනුභව කළමෝ නම් එතත කසළ කිරීම අපට තිබී ආ ජාතිධම්මයක. එසේ හෙයින් කෙළෙම්. මට කෝපනොකළ මැනවැ"යි කීහ.

එවිට බොධිසත්ත්වයෝ "තොප ඇමගේ යාපතට ඇරගත්දේ මෙසේකල නපුර තමාම වේදැ"යි කියා "අද පටන් තොපි මේ ලිද කසළ කළ නම් දන් නවාදැ"යි කියා අළහ.

එකියන කැණහිලා එතතව එන්නක් නොකෙළේය යි වදරා මේ උදෑ පාන ජාතකය නිමවා වදළ සේක.

එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්මය යි වදළ සේකි.

---

## 365 වාඤ්ඡ ජාතකය

**මීවද** මාගේ මව්වූ සම්බුදයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසත සමයෙහි කෝකාලිකසථවිරයන් අරභයා මේ ජාතකය දක්වතලද.

**ඒ කෙසේ ද? යන්,**

මෙහි වර්තමාන කථාව තෙළෙස්වෙනි නිපාතයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේයි. මෙහි වතාහි කෝකාලිකසථවිරයන් වහන්සේ වාසයකරන්නාවූ කෝකාලිකගම දැගසව්වන්වහන්සේ කාටත් නොකියා වස්වැස සැවැත් නුවරට වැඩපුසේක. ඒ කෝකාලික ගම වසන්නාවූ මනුෂ්‍යයෝ කෝකාලික තෙරුන් වහන්සේට කියන්නාහු "දැගසව්වන් වහන්සේ මේගම වස්වැස වැඩි නියාව අපට නොකියේ ඇයිද? එසේහෙයින් නුඹවහන්සේ ගොසින් දැගසව් වන් වහන්සේ කැදවාගෙණ වඩිනේ යහපතැ"යි කීහ.

"යහපතැ"යි කියා කෝකාලිකඝට්ටිරයන් වහන්සේ සැවැත්නුවරට ගොස් දැගඝව්වන්වහන්සේ කෝකාලික ගමට වඩිනා නියාවට ආරාධන කළසේක. දැගඝව්වන්වහන්සේ "අප එන්නේ නැත, තොපි යව"යි නොගිවිසි සේක.

මේ කථාව දම්සභාවට රැස්වූ මාළුවරුන්වහන්සේ "කෝකාලික ඝට්ටිරයෝ දැගඝව්වන්වහන්සේ එක්වත් ඉන්ද නොදෙති ඇරපියාත් ඉන්ද නොදෙති" කිය කියා උන්තෙතට සම්මුඛයන්වහන්සේ වැඩවදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "දැන් මතු නොවෙයි මහණෙනි, පෙරත් ඔහු එසේම වේදැ?"යි ආරාධිතවූ සම්මුඛයන්වහන්සේ ඉකුත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ වෘක්ෂදේවතාව උපන්නාහ.

ඒ ගාව එක්වනයෙක සිංහයෙකු හා ව්‍යාඝ්‍රයෙක් වාසයකරන්නේය. ඔවුන් දෙදෙනා නිසා මනුෂ්‍යයෝ ඒ වනය නොකපා ඉන්නාහ. සිංහයා හා ව්‍යාඝ්‍රයාත් ඒ වනයෙහි ඉඳිනා සිව්පාවුන් කා ඒ ඒ තැන කැබලි එලා තබන්නාහ. එසේහෙයින් ඒ වනය කුණුමසින් ගඳව වනය මුලුල්ලම දුගීකිවිය. ඒ වනය වසන්නාවූ වෘක්ෂදෙවතාවා බොධිසත්ත්වයන්කරා ගොස් එපවත් කියා "සිංහයා හා ව්‍යාඝ්‍රයා මෙතෙනින් පහකොටපුවෝත් යහපත, ඒ නියාවට පහකරන්වදැ"යි විචාළේය.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු සිංහයා හා ව්‍යාඝ්‍රයත් වනාන්තරයේ ඉඳිනා නිසා මනුෂ්‍යයන් මෙකියන වනාන්තරය නොකපන්නේය. එසේ නැත්නම් සිංහයන් හා ව්‍යාඝ්‍රයන් මෙකියන වනාන්තරයෙහි කැති නියාව දත්තු නම් මෙකියන වනාන්තරය කොටපියා සේත්කොට ගන්නාහ. එසේ විසින් සිංහයා හා ව්‍යාඝ්‍රයත් පහනොකරව යි කීහ. එසේ කීවත් ඒ දිව්‍යපුත්‍රයා බොධිසත්ත්වයන් කීවා නොඅසා හඝංකාර ශබ්දපවත්වා සිංහයා හා ව්‍යාඝ්‍රයත් පහකොටපීහ. මනුෂ්‍යයෝ සිංහ ව්‍යාඝ්‍රයන්ගේ පියවර නොදැක සිංහ ව්‍යාඝ්‍රයන් ඔබ්බේ වනාන්තරයකට ගියනියාවේදැ යි සිතා ඒ වනාන්තරය එක්භාගය කින් කපා හෙළිකරන්ව වන්හ. එවිට එකියන දිව්‍යපුත්‍රයා බොධිසත්ත්වයන් කරා ගොස් "සබඳ තොප කීවා නොඅසා මම සිංහ ව්‍යාඝ්‍රයන් පහකෙළෙම්, සිංහ ව්‍යාඝ්‍රයන් වනාන්තරයේ නැතිනියා දත්තාවූ මනුෂ්‍යයෝ වනාන්තරය එලිකරන්ව වන්නාහ. මෙවිට කුමක් කරම්දැ"යි කියා කීහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "සිංහ ව්‍යාඝ්‍රයන් ගියාවූ වනාන්තරයට නොපි ගොසින් පිළිවන්වීනම් ඔවුන් දෙදෙනාට ආරාධනාකොට කැන්දගෙණ එව"යි කියා දිව්‍යපුත්‍රයාත් ඔවුන් ගියාවූ වනාන්තරයට ගොස් දෙගොත් මුදුනේ තබා ඔවුන් දෙදෙනාට ආරාධනාකොට "මේ මම නොදැන තොප හැම භයගන්වා එලවාපීමි, ඒ මම නොදැන කළෙමි, මට ක්ෂමාකොට මා වසන්නාවූ වනයට එව"යි කීහ.

එවිට ඔවුහුත් එබස් අසා "නොප වසන්නාවූ වනාන්තරයට අපි නේම් මැ"යි කියා නාවාහුය. එකියන මනුෂ්‍යයෝත් ඒ බැද්ද කොටා එලිකොට සේත්කොටගත්හ යි වදාරා මේ වාහ්‍ර ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි සිංහයා නම් සැරියුත් මහසඵවිරයන්ය, ව්‍යාඝ්‍රයා නම් මුගලන් මහසඵවිරයන්ය, එකියන වනස්පති දේවතා නම් කොකාලිකසඵවිරය, වෘක්ෂදේවතාවා උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

---

## 266 කච්ඡප ජාතකය

මේවද මාගේ බුදුරජාතන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ අමාත්‍යයන් දෙන් නෙතු අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වර්තමාන කථාව එකක නිපාතයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

පෙරකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ කසීගමික බමුණුව ඉපද පඤ්චකාම යෙහි ආදීනව දැක හිමාලවනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ගඟක් සමීපයක ධ්‍යානලාභීව උපෙක්ෂා පාරමිතාව පුරන්නාහ.

එවිට එක් දුශ්ශීල වානරයෙක් බෝධිසත්ත්වයන්ගේ උරපිට ඉඳ ශ්‍රෝතයට දුශ්චරිත ක්‍රියාකරන්නේය, මේ නියාගෙන් දවස අරන්නේය. බොධිසත්ත්වයෝ උපෙක්ෂා පාරමිතාව පුරණගෙයින් එහි උපෙක්ෂාව ඉදිරිනාහ. ඒ අභ්‍යාසයට එක් දවසක් දියෙන් ගොඩතැගී අව්ව තැප කටදල්වාගෙණ වැද නෝනා ඉඹිබෙකු දැක තාපසයන්ට කළාවූ ක්‍රියාවසේ කෙරෙමි කියා ඉඹිබාගේ කවට දුශ්ශීල කෙළේය. එකල්හි ඉදිබුවා යහපත් කොට ඬැහැත. එවිට වඳුරු තමා බලවත් වේදනා වැදහත් හෙයින් ඉදුබා දැනින් අල්වාගෙණ "මේ මාගේ දුකඛය කවුරුන්ලඟට ගොස් අරවාගණිම්ද"යි සිතා අනික් කාටත් බැරිය, උපෙක්ෂා පාරමිතාව පුරන්නාවූ තාපසයන් කරා යෙමි සිතා ඉදුබා දැනින් වඩා ගෙණ බොධිසත්ත්වයන් කරා ගියේය.

බොධිසත්ත්වයෝ ඒ වඳුරා දැක "මේ කිම්ද? භික්ෂා පාත්‍රයක් වඩාගෙණ එන්නාවූ තාපසකෙනෙකුන් මෙන් කින්ද?"යි විචාළාහ. එවිට එකියන වානරයා කියන්නේ "තාපසයන්වහන්ස, මා විසින් යහපත් දෙයක්දෝ හෝ සිතා මේ ඉඹිබාගේ කටට දුශ්චරිත කෙරෙමි සිතා මෙහෙයීමි. ඒ වනාහි ඬැහැත මට වනාහි බලවත් වේදනා පත්වී ඒ වේදනාවෙන් මා මිදුවොත් යහපතැ"යි කීය.

එවිට තාපසයා ඉදුබාට කියන්නේ "මෙකිනා වඳුරු මෙවැනි ක්‍රියාවෙහි තෘෂ්ණාව බලවත්හෙයින් මොහු සිත සිතා දුෂ්‍යකම් කෙළේය. තොසිත් ඌ සේම අඥානයෙක්ද? ඇරපියව"යි කීහ. එවිට ඉදුබාත් බෝධිසත්ත්වයන් කී නියාගෙන්ම ඇරපීහ. එකියන වඳුරාත් තමාට පැමිණි දුකඛය තාපසයන් නිසා මිදුනු හෙයින් එවක්පවත් එසේවූ අධර්මයක් නොකළේය යි වදාරා මේ කච්ඡප ජාතකය නිමා වදාළ සේක.

"එසමයෙහි ඉදුබා හා වඳුරු නම් මෙකියන අමාත්‍ය දෙදෙනය, උපෙක්ෂා පාරමිතාව පිරූ තාපසයෝ නම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

## 267 ලොල ජාතකය

මේවද මහපොළොව සේ විසාරදවූ ගුණ ඇති සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලෝභී භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්,**

සිව්පසයෙහි ලෝභීවූ භික්ෂුකෙනකුන්වහන්සේ සම්බුදුරජාණන්වහන්සේ කරා ගෙණගොස් දැක්වූසේක.

එවිට සම්බුදුරජාණෝ "සැබෑද මහණ තා සිව්පස ලෝභිය"යි විචාරා වදාරා "සැබවෙ සඟනි" දන්වන්නා "මහණෙනි, මෙකියන භික්ෂුහු පළමුත් ලොභිකම නිසා උත්තමව තමන්වසන්තාවූ සථානයෙන් ඉන්ද නුහුනුවෝවේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ? ඉකුත්වත් දක්වා වදාළසේක.

පසුගිය දවස බරණැස්නුවර සිවිරජතුමාගේ ගෙයි අරක්කැමියා පින් පිණිස පක්ෂීන්ට ඇවිත් ඉදිතා නියාගෙන් පෙට්ටිය එල්වන්නේයා. බොධිසත්වයෝත් පරවිව ඉපිද එකියන අරක්කැමියා විසින් එල්වනලද පෙට්ටියක වාසයකරණසේක.

එක්දවසක් කපුටුවෙක් මුළුතැන්ගෙයි උඩින් පියාඹන්නේය; මච්ඡ මාංස ගන්ධය ඉවසාගතනොහී මුළුතැන්ගෙට කෙසේ වැදහෙම්දෝ හෝයි සිතා උන. බොධිසත්වයෝත් ගොදුරු කන්වය යි පිටත් උනාහ.

එකියන කපුටුවා බොධිසත්වයන් පස්සේ පියඹා යන්ට වන. බොධිසත්වයෝත් "ඇයි සබඳ කපුටුවානෙනි, තොප හා එක්ව ගොදුරු කැවිලි හා වාසය මටත් අභිප්‍රාය, එසේහෙයින් නුඹවහන්සේ සේවාකම්කරන්ට ආමි" කීහ.

එබස් අසා පරවියානෝ "යහපතැ"යි කියා උන හා සමග ගොදුරු කන්ට ගියාහ. පරවියානන් ගොදුරුකාදී නෙමේ ගොසින් ගොමටිම්බක් තුඩින් ඉරා පණුවන් කා බඩපුරාගෙණ පරවියානන් ලඟට අවුත් යහපත්ව තව දැක්වා ගොදුරු කන නියාවද තමාගේ සඟ ඇදිත කන්ට අවුදැ යි කියා පරවියානන් කැටිව ගොදුරු කා කැටිවම වාසසථානයට ගියේය. එවිට අරක්කැමියාත් අපගේ පරවියානෝ තමන් සහයාවූ ක්වුඩෙකු ඇරගෙණ ආව යි කියා එකියන කවුඩාට ඉන්ටත් එක් පෙට්ටියක් විශලා බැඳලීය. ඒ පෙට්ටියේ කවුඩා වාසය කෙරෙයි. මේ නියාගෙන් කීපදවසක් වාසයකළ කල එක්දවසක් එකියන සිවා නන්ගේ ගෙට බොහෝ දඩමස් ගෙණාවාහුය.

එදවස් එකියන කවුඩාත් මෑත් එමින් යම්සේ මාංශයක් කන්ට උවමැන වැ යි සිතා උන්හ. පරවියානෝ ගොදුරට යෙමින් සිට "ඇයි කවුඩානෙනි, ගොදුරු කන්ට එව" යි කියන්නා "සඟමිනි, රිදේ මා කැවූවූ ගොදුරු නොදී රුණ, අජීණිව බඩරුජා ගන්ටවන. මම් අද නේමි"යි කීහ. එවිට පරවියානෝ කියන්නෝ "නොපි කුමක් කියවිද? කවුඩන් නම් එළඟිතෙලින් ඇඹරු පාන් ක ඉක් කැවීමට බඩසුහක් තිබී දිරණ පමණක් සෙසු යම් ගොදුරක් උරෙන්පාත

ගියවිටම කොදිරා තිබේද? කවුඩන්වත් අජීණියෙක් ඇතිව බඩරුජාගණ්ඩද"යි කීහ. ඒ එසේමය, "එසේදවුවත් මට රුජා දැඩිය, මම අද නේමි" කීහ.

එවිට පරවියාතෝ "නා මේ මච්ඡමාංශ නිසාය කියන්නේ සිටානන් වහන්සේගේ මච්ඡමාංශ ඉදුල් නොකරව, ඉදුල් කෙළෙහි නම් තට බොහෝ විනාශ පැමිණෙන්නේය"යි කීහ. මෙසේ අවවාද කියා පරවියාතෝ ගොදුරු කන්ට ගියහ. එවිට අරක්කැමියාත් මච්ඡමාංශ පිස පණත් කොට තිබා ඇඟඩා නිවන්ට පිසත ගෙන් පිටතට ගොස් සිටියේය. ඒ වේලාවට කවුඩා මේ මච්ඡ මාංශ කන්ට අවකාශය සි මාළුපිස වසා තුබූ බඳුනක් මත්තේ උන්නේය. ඌ ඉඳිනා වස්ත "ක්‍රිං" යන ශබ්ද විය. එවිගස අරක්කැමියා අසා ගෙට අවුත් කවුඩා අල්වාගෙණ ඇඟ පියාපත් සිද කුඩිඹියක් තබා ලුනු මිරිස් අඹරා කාඩිගා ඇඹුල්දියෙන් අතා ඇඟ ගල්වා කපුටුවා ඉඳිනා පෙට්ටියට දැමූහ. පරවියාතෝ ගොදුරු කා එතනට අවුත් කවුඩා දැක වෙහෙසා කියන්නාහු "කෙකින්න අපගේ සබඳ කවුඩා ඉන්නා මැදිරියේ තොප උන්කල තොපට නොදෙඩා ඌ එන්නාට පළමුකොට වහා පලාගව සි කීහ. එබස් අසා කවුඩා කියන්නේ "සාමීනි, මම කෙකින්නක් නොවෙමි, නුඹවහන්සේ වදුළ අවවාද නොගිවිස මච්ඡමාංශයෙහි තෘෂ්ණාව උපදවා ලෝභයෙන් මච්ඡමාංශ කන්ට ගොසින් අරක්කැමියා මා අල්වාගෙණ මට කළ ගහටය"යි කීහ.

එවිට පරවියාතෝ "මා කීවා නොගිවිස මේසා දුකඛයට පැමිණියේය. ඉතිබ්බේ මින් මිය පරලොව ගියකලත් නරකාදී දුකඛයට පැමිණෙන්නේවේදැ"යි කියා මමත් මෙතන උන්කල අරක්කැමියා මා කෙරෙහි සැක උපදව සි කියා එතනින් පියාසරකොට ඔබ්බකට නැඟී ගියහ සි වදුළසේක.

මේ බණ අවසානයෙහි නිඝණ්ටභන්සේ අනාගාම්ඵලයෙහි පිහිටිසේක. පූර්‍වාපරසන්ධි ගළපා මේ **ලෝල ජාතකය** නිමවා වදුළසේක. එසමයෙහි ලොභී කවුඩා නම් මේ ලොභී භික්ෂුහුය, පරවිව උපන්නේ බුදුවූ මම්මය සි වදුළසේක.

## 268 දුලුසිරාජ රාතකය

**තී**වද මහමුහුදු සේ ගැඹුරුවූ ගුණ ඇති සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් ලොභී භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය කථාවත් අතීත කථාවත් දෙකම පළමු කී දක්වනලද. මේහි වර්තමාන ජාතකය **මෙහි**.

## 269 කුරුධම්ම ජාතකය

**තී**වද මහමෙර සේ සිරිවූ සාරගුණ ඇති සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් අකුරක් ගසා හංසයකු මැරූ භික්ෂුවක්හු අරභයා මේ ජාතකය වදුළ සේක.

**හේ කෙසේද? යත්**

එම සැවැත්නුවර ශාළවෝ දෙදෙනෙක් ශාසනයෙහි මහණව උපසම්පදාව ලදින් බොහෝසේ උනුන් නොඇර එක්වම ඇවිදිනාහු අවිරවතී නම් ගංගාවට ගියාහු තාපියා අවිව තැප තැප පුරාතන කථාවන් කිය කියා වැල්ලේ සිටියාහ. ඒ ඇසිල්ලෙහි ආකාශයෙන් යන්නාවූ හංසයන් දෙන්නෙකු දැක දෙන්නාගෙන් කුඩා මහණ කියන්නේ "තෙල හංසයන් දෙන්නාගෙන් එකෙකු ඇසකට අකුර කින් ගසමි" කීහ. අනික් මහණ කියන්නේ "තොපට බැරිය"යි කීහ. 'එසේ

වීතම් බැලුවමැන, මා දසාවේ ඇසට ගහන්ට ආශ්වයා කිම්ද? ඇත ඇලයේ ඇසට ගසම්'' කිහ. අනික් මහණ 'තොපට බැරිය''යි කිහ. නැවතත් එසේවී නම් ''බැලුව මැනවැ''යි කියාලා තුණැස් අකුරක් අල්වාගෙණ හංසයාගේ පශ්චාද් භාගයට ගසාලීය. යන්නාවූ හංසයා අකුර බුරාගෙණ යන අඩ අසා නැවත පෙරලා බැලීය. ඒක්ෂණයෙහි වවඅකුරක් ගසාලීය. ඒ අකුර ගොස් ඇලයේ ඇසින් වැද තමා දසාවේ ඇසින් නගාපීය.

හංසයාද අඩාගෙණ පාපිට වැටී ගියේය. ඒ සථානයෙහි සිටි භික්ෂූහු දැක ඔහු සමීපයට අවුත් ''කිමෙක්ද? ඇවත මේ නියාවූ බුදුස්තෙහි මහණව තොකළමනා ප්‍රාණවධ කෙළේ යුත්තෙක් නොවෙ''යි කියා ඔහු නොකමැති කරවා ගෙණ ගොස් බුදුහුට දැන්වූහ. ඒ අසා බුදුහු වදාරණසේක් ''මහණ තා ප්‍රාණ ඝාත කළේ සැබෑදැ'යි විවාරා වදාළසේක.

ඒ භික්ෂූන් විසින් ''සැබව සවාමීනි'' කීකල්හි ''මේ නියා නෛයාණික බුඛශාසනයෙහි මහණව සිව කිසි භයක් නැතිව මෙබඳු ප්‍රාණවධ කෙළේ සුදුසු නොවෙයි'' වදාරණ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේකි. ''පුරාතනයෙහි නුවණැත්තාහු අබුඩොත්පාද කාලයෙහි පවා ගිහිගෙයි වසන්නාහු ඉතා සුළුපවූ නොකළමනා සැප උපදවා විසුවෝවේදැ''යි වදාරා ''දැන් හෝ වූකලී කිසිභයක් නොකළේ වේදැ''යි වදාරා ''එඹල මහණ, පැවිදිවූවහු විසින් කාය වාක් මනඃ යන වාරත්‍රයෙන්ම සිහි ඇතිව විසුවෝ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ''යි ආරාධිතවූ සවීඥයන් වහන්සේ භවයෙන් ප්‍රතිචඡන්නවූ ඉකුත්වත් කථාව හෙණහැර දක්වා වදාළසේකි.

**ඒ කෙසේද? යත්**

පිටතිය දවස කුරුරට ඉඳිපත් නුවර ධනංජය නම් රජ්ජුරුවන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන්කුස පිළිබඳගත් සේක.

දසමස් පිරී මව්කුසින් බිහිව සඳමණ්ඩලයේ වැඩී සත් ඇවිරිදි වයසට පැමිණ තක්සලානුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් කෙරෙහි නුවණැතිව සියළු ශිල්ප ඉගෙණ නිමවා අවුත් පිය රජහු විසින් යුවරජතනතුරෙහි සිටුවන සේක් කල්යාමෙකින් පිය රජහු අභාමෙන් රාජ්‍යයට පැමිණිසේක් දශධර්මයෙන් යුක්තව (කුරුධම්ම ජාතකයෙහිදී) වාසය කරණසේක.

එසේ වසන්නාවූ බොධිසත්ත්වයන් වහන්සේ අඛණ්ඩකොට පඤ්චසීලය රක්නාහු බොධිසත්ත්වයෝ මතු නොවන්නාහුය ''ඔනු කවුරුදැ'' යි යත් රජ්ජුරුවෝය රජ්ජුරුවන්ගේ මෑනියෝය, අගමෙහෙසුන් බිසවිය, යුවරජ්ජුරුවෝය, පුරොහිත බමුණාය, යටුවම්කරණ අමාත්‍යයාය, රථාචාරියාය, සිටානෝය, ඔඩ සැල මනත අමාත්‍යයාය, දෙරටුපාලයාය, ඒ නුවර රූපශ්‍රීන් හොඹවා ඇවිදිනා වෙශ්‍යාය, මේසේ කියත එකොළොස්දෙන කුරුධර්මයයි කියනලද පඤ්චසීලය අඛණ්ඩකොට රක්නාහ. රජ්ජුරුවෝද නුවර වාසල්දොරය නුවර මධ්‍යයෙහිය රජ ගෙය දොරකඩය යන මේ සථානයෙහි සඳහන් කරවා දවස සලකුණයක් බැඟින් ධනවියදම් කොට දඹදිව සියළු සත්ත්වයන්ගේ නගුල් උඩබදවා සියළු යාචක යන්ට දන්දෙන්නාහුය. මෙසේ දන්දෙන ඒ රජ්ජුරුවන්ගේ දානාධ්‍යාශයත් දන්දෙන නිසාත් අඛණ්ඩකොට සිල් රක්නා නිසාත් සියළු දඹදිව පැතිර ගියේය.

එසමයෙහි කලිඟුරට දනනපුර නුවර කලිඟු රජ්ජුරුවන් රාජ්‍යය කරණ සමයෙහි උන්ගේ රට බදමානයෙහි වැසි නොවැස දුර්භික්ෂභය උපන. නුවර විපත්තිය නිසා මනුෂ්‍යයන්ට රොගභය උපන. දුර්භික්ෂ භයින් මළාවූ සත්ත්ව යන් නිසා අමනුෂ්‍යභය උපන. මේ තුන්භය නිසා මනුෂ්‍යයෝ දුකඛිතව ගොස් රැකි ගන්නා කිසිම උපායක් නොලදින් දරු බිලිදුන් අත් අල්වාගෙණ ප්‍රෙත යන් සේ ඇත මැත ඇවිදිනාහ. මෙසේ සියළු නුවරවාසීහුද එක්ව සඳවක් රාජාඔතයෙහි රැස්ව ශබ්ද පවත්වා කොලාහල කළාහ.

සිව්මැදුරු කවිළුව සමීපයෙ සිටියාවූ රජ්ජුරුවෝ ඒ කෝලාහල අසා කුමන කෝලාහලයෙක්ද"යි විචාළාහ. ඒ අසා සිටියාවූ අමාත්‍යයෝ කියන්නාහු "මහරජ්ජුරුවෙනි, මේ ජනපදයෙහි තුන් භයෙක් උපනැ"යි රටවූ විපත්තිය තත්වූ පරිද්දෙන් කීවාහ. රජ්ජුරුවෝ එපවත් අසා "ඊට මා විසින් කුමන කට යුතුද"යි අමාත්‍යයන් අතින් විචාළහ. "මහරජ වැසිවස්වා දුර්භික්ෂභය සංසිඳුවා මැනවැ"යි කීහ. මෙසේ භය පැමිණිකල පුරාතනයෙහි රජදරුවෝ කෙසේවැසි වස්වද්දැ"යි කීහ. "මහරජ දන් දී සිල්රැක ගර්හ ගෙවල හිතන ඇතිරියෙහි සත්දවසක් සැතපී වැසිවස්වති" කීහ.

රජ්ජුරුවෝ "යහපතැ"යි හිවිස කී ලෙසම පේවස් වැසත් වැසි වස්වා ගත නුනුනුවාහ. රජ්ජුරුවෝද දෙවනුවත් අමාත්‍යයන්ට කියන්නාහු "මම කල මනායෙක් පරිත්‍යාග කොට සිල්සමාදන්ව පේවසවැසත් වැසිවස්වා ගත නුහුනු යෙමි. නැවත කුමක් කෙරෙම්දැ"යි කීහ.

අමාත්‍යයෝ කියන්නාහු "මහරජ්ජුරුවෙනි, ඉදිපත් නුවරට යවා ධනං ජය කොරවය රජ්ජුරුවන්ගේ අංජනොපමවූ මඩහල හස්තියෙක් ඇත. ඒ ඇතුන් ගෙන්වා ගන්නාහැම වැසිවසිනි" කීහ. "රජ්ජුරුවෝ චතුරංගිනිසේනා වෙන් හා පඤ්චප්‍රකාර බලයෙන් යුක්ත මහබල ඇති රජ්ජුරුවෝය. උන්ගේ ඇතු කෙසේ හෙන්වමෝදැ"යි කීහ. "ඒ මහරජ්ජුරුවන් හා යුඩකළ මැනවැයි නැත. ඒ රජ්ජුරුවෝ දන්දීමෙහි ඇලුම් ඇති කෙනෙක; ඉඳින් යමක් ඉල්ලූ කෙනෙක් ඇත්නම් තමන්ගේ හිස වී නමුත් කපාදෙන්නාහ. මෙසේ තමන්ගේ පස්පෑ දිස්නා ඇස් උපුටා දන්දෙන්නාහ. තමන්ගේ රාජ්‍යය ඉල්ලුවත් දෙන්නාහ. ඒ ඇතුගේ දෑ කියනුම කිම්දැ?" යි කීහ. "එසේකල ඇතුඉල්වා ගෙණෙන්ට සමර්ථයෝ කව්රුදැ"යි කීහ. ඉල්වන්නට සුරවූවෝ නම් බමුණෝය බමුණන් යවා හෙන්වාගත මැනවැ"යි කීහ.

එසේවී නම් "යහපතැ"යි කියා රජ්ජුරුවෝ බමුණන් අවදෙනෙකු ගෙන්වාගෙණ උන්ට නොයෙක් සම්පත් දී සිත් ප්‍රීතිකරවා "ඇතු ඉල්වාගෙණ එව"යි කියා බමුණන් යවූහ. ඔහු අවදෙන සියළු ප්‍රසාද ලදින් තුටුපහටු සිත් ඇත්තාහු බැගෑපත් බමුණන්ගේ දුගීවෙස්මවාගෙණ දෙපයක් තෙතකතොලැග ඉදිපත්නුවරට පැමිණ වාසල්දොර දන්සැලින් කීපදවසක් දන් කා සැතපී මාගී පිඩාව සන්හිඳුවාගෙණ "රජ්ජුරුවන් දන්හලට එන්නේ කවරදාදැ"යි විචාළාහ. මනුෂ්‍යයෝ කියන්නාහු "මසකට තුන්වාරයෙක වඩතා සේක. පුරපසළොස්වකය, තුදුස්වකය, අටවකය, ඉනුත් සෙට පුරපසළොස්වකය, දන්හල බලන්ට වඩතාසේකැ"යි කීහ. බමුණෝ දෙවැනිදා උදැසන ගොසින් තැගෙණහිර වාසල් දොර සිටියාහ.

බොධිසත්නියන් වහන්සේ උදැසනම සුවඳපැන් සොළොස් කලයකින් ඉස්සොධා නහා නොයෙක් රසයෙන් අග්‍රවූ භොජන අනුභවකොට සඳුන් සුවඳ ආදීවූ නොයෙක් ආභරණයෙන් හා ඔවුනු සහිත සුසැට ආභරණයෙන් ශක්‍ර දෙවෙන්ද්‍ර විලාසයෙන් සැරගී රන්සැත් පොරොවූ ආදීවූ සියලු හස්ත්‍යලංකාර යෙන් සරහතලද සම්පූර්ණ සම්පත්තවූ හස්තිරාජයා පිටට පැනනැගී චතුරංගිණී සේනාවෙන් හා ආතත, විතතාදීවූ නොයෙක් ඝෝෂාවෙන් නුවර එකතින් නාදකරමින් තැගෙණහිර වාසල්දොරටවැඩ ඇතුපිටින් බැස දන්හල්වැද නායක බමුණන් කීපදෙනෙකුට තමන්වහන්සේ අතින් දන්දීලා "මේ මා දුන්ලෙසට දන් දෙව"යි කියාලා ඇතුපිටට නැගී දකුණු වාසල්දොරට වැඩසේක. බමුණෝ නැගෙණහිර වාසල්දොර රැකවල් බලවත් හෙයින් රජ්ජුරුවන් දැක ගතනොහී දකුණුවාසල් දොරට ගියාහු එන්නාවූ රජ්ජුරුවන් බල බලා නුදුරුතෙනක සිටියාහු ආසන්නවූ මහතාතන්ට බමුණෝ අටදෙන අත් ඔසවාලා 'ආයුරස්තු, බල මස්තු, සමෘධිරස්තු, නිර්‍ව්‍යාධිරස්තු, භගවාන් ප්‍රියදර්‍ශීතමස්තු" යනාදීන් ආශීර්වාද කොට සිටියාහ.

රජ්ජුරුවන් වහන්සේත් ඔවුන් දැක වළඳාංකුශයෙන් ඇතු නවතා උන් සමීපට ගොසින් ''පින්වත්වූ බමුණනි, කුමක්නිසා කුමක් සොයා අවුදැ''යි විචාරා වදාළ සේක.

බ්‍රාහ්මණයෝ බොධිසත්ත්වයන්ගේ ගුණවර්ණනා කරන්නාහු මේ කුරුධම්ම ජාතකයෙහි පළමුවන ගාථාවෙන් මෙසේ කියන්නාහු ''මහරජ්ජුරුවෙනි, නුඹ වහන්සේ අඛණ්ඩකොට රක්ෂාකරණ කුරුධම්ම නමැති පඤ්චසීලය දහම් දුකපත් යාචකයෙකු ඉල්වත් නොදෙනසේක් දෝ හෝ යි සැකකොට ඉල්වූ යම් සම් පතක් නැත, නොදෙමි කියා දෙතියි කියන කිර්තිඝෝෂාවද දසදහසක් යොදුන් දඹදිව මුදුපිට ඉසළු තෙලින්තක්සේ සියළුදිග පැතිර ගියාසේ ප්‍රසිද්ධව ගියේය එහෙයින් නුඹවහන්සේගේ ඇතු ඉල්වාගෙණ ආම්හ''යි කීහ. ''අපගේ කලිඟු රජ්ජුරුවන්ගෙන් බොහෝ වස්තු ලදුම්හ. එබැවින් අප ලත් සම්පත් අපට නාවුරුවන ලෙස තෙල ඇතු අපට දෙවාවදාළමැනවැ''යි කීහ.ඒඅසා මහතානෝ වදාරණසේක්''තෙපි ඉඳින් මේ ඇතු නිසාම වස්තු ලදුනම් ඒලත්දෙයම යහපත මා විසින් පෙර පවත් නතැ යි කියා ආ කෙනෙකුන්ට ඇතැයි කියා දෙනලදද නොදෙති නොසිතුව, මේ සත්රුවනින් විසිතුරුකොට සරඹතලද සියළු හස්ත්‍යලංකාරයෙන් සැරහුවන්ම දෙමි'' කියා බමුණන් අස්වසාලා වදාරණසේක් ''රාජවාහනයට යොග්‍යවූ මේ මාගේ හස්තිරාජයා නතිකොට මා දෙති නොසිතුව,මේ ඇතු පළමු පිරිමසාසිටි ඇත්වෙදුන් ඇත්ගොව්වන් පන්නයන් ආලත්ති බාන්නවුන් මුල්වේරියන් මේ ආදී සියළු කම්කාරයන්ද ඕනට පළමුකොට තබා දුන් වුත්ති යනසියළු සතුමානයෙන් කිසිවකුත් අඩුනොකොට නොයෙක් කුලයෙන් සියගණන් මිනිසුන් සමුළුල්ල පාවාදෙමි, ඒ සියල්ලනුත් හස්තිරාජයාත් ඇර ගෙණ නොපව කැමති නෙනකව යව''යි ඇතුපිටම ඉඳ කියාලා ඇතුපිටින් බැස පියා ඇතුගේ නොසැරහු තෙතක් ඇත්නම් සරහාලා දෙමැ යි සිතා ඇතුවට තුන් විටක් පැදකුණුකොට බලනසේක් නොසැරහු තෙතක් නොදැක ඇතුසොඬ ගෙණ බමුණන් අතපිට තබා සුවඳපැන් පිරුණු සුවර්ණභිංකාරය ගෙන්වාගෙණ බමුණන් අත පැන්වත්කොට ඇතු දන්දී වදාළ සේක.

ඒ ඇතු දන්දුන් නියාවට උපමා කියන්ත් මතු වෙස්සන්තර කල පුලස්ති නම් හස්තිරාජයා මෙසේම ආ බමුණන්ට දන්දීමට පූර්වනිමිත්ත පාතාක් වැන්නා යි සිතම්. බමුණෝ පිරිවර හා සමග ඇතු දන්ලදින් ඇතුපිට හිඳ දන්ත පුරයට ගොසින් තමන්ගේ රජ්ජුරුවන්ට ඇතු පාවාදුන්හ. ඇතු නුවරට ගෙණ ගියත් වැසි නොවටුයේමය. ඒ වේලෙහි රජ්ජුරුවෝ ''ඊට කාරණා කිම්දැ?''යි විචාළහ. අමාත්‍යයෝ කියන්නාහු ධනංජය කොරව්‍ය රජ්ජුරුවෝ කුරුධම්මය කියති එසේහෙයින් උන්ගේ රටට වැසිවස්නේය. වැලිත් සෙස්සකින් නොවෙයි, රජ්ජුරුවන් රකිනා කුරුධම්මයෙහි ආනුභාවයෙන් ඇතුගේ බල මතු නොවෙයි'' කීහ.

එවේලෙහි රජ්ජුරුවෝ එබස් අසා ''එසේවී නම් තෙල ඇතු සැරහුන්ම උගේ පිරිවර හා සමග වනාගෙණ ගොස් රජ්ජුරුවන්ට ඇතු පාවාදීලා ඒ රජ්ජුරුවන් රක්ෂා කරණ කුරුධම්මය තෙල රන්පත ලියවාගෙණ එව''යි බමුණන් හා අමාත්‍යයන් යවූහ.

ඔහු ගොස් රජ්ජුරුවන්ට ඇතු පවාදෙවාලා නැවත කියන්නාහු ''දෙව යන්වහන්ස, මේ ඇතු ගෙණගොසිනුත් අපගේ රටට වැසි නොවටුවේමය නුඹවහන්සේ කුරුධම්මය රක්නාසේක්ල, අපගේ රජ්ජුරුවෝත් ඒ කුරුධම්මය රකිනේ සැබෑය, දැන් මට ඒ සැක කෙරෙයි'' කීහ. එසේහෙයින් ලියාදෙන්ට නොපිළිවහැයි කීහ. රජ්ජුරුවන් එහි සැක උපදවන්නට කාරණකිම්ද? යත් එසමයෙහි රජ්ජුරුවෝ අවුරුද්දක් අවුරුද්දක් පාසා කාර්තික නැකතඟ යි යන මහ සැණකෙළියක් ඇත, එදවස් රජ්ජුරුවෝ සියලු අලඞ්කාරයෙන් සැරහී දිව්‍යරාජ වෙශයෙන් චිත්‍රරාජයාඇයි යන තමැති යක්ෂයකු සමීපයෙහි සිට සුවඳ මලින් විසිතුරුකොට සරඹතලද මල්හී සතරක් සතරදිග විදිනාහ.

එකල්හි බොහෝ කලක් රජදරුවන් විසින් කොට එන චාරිත්‍රයෙක් මේ රජ්ජුරුවන් වහන්සේත් එසේම සැණකෙළි කෙළිනා දවසෙක පොකුණු තෙරක චිත්‍රරාජයා සමීපයෙහි සිව සතර දිග මල්නී සතරක් විදපිසේක.

එ සතර නීයෙන් තුන්නීයෙක් දුවහ. දියපිට විදපි නීය තොදුක සිතන සේක් කිම්දෝ මා විසින් විදිනා නීය දියෙහි විදුනා මසකු ඇඟ වැදගත්දෝ හෝ යි සැක උපදවා ගත්සේක.

එසේ හෙයින් ප්‍රාණවධය නිසා සීලය හෙදවී නමුත් මව සැක කෙරෙයි. එබැවින් මාගේ සිත ඇටුනේයි කියා "දරුවෙනි, පළමු අඩඩකොට මා කුරුධර්මය රක්නේ සැබව, දැන් මට එක් සැකයෙක් ඇතැයි පිළිවෙළ වූ පරිද්දෙන් දූතයන්ට කියාලා යව, අපගේ මැනියන්වහන්සේ කුරුධර්මය මතාකොට රක්ෂා කරණසේක, ඔබ සමීපයෙන් ලියවාගෙණ යව"යි වදාළසේක.

එබසට දූතයෝ කියන්නාහු "මහරජ, නුඹවහන්සේ සතෙකු මැරුව මැතවැයි යන සිතක් නැතිවූව, එසේ කල නුඹවහන්සේට ප්‍රාණාතිපාතය සිඩ නොවෙයි. අපට කුරුධර්මය ලියාදුනමැනවැ"යි රන්පත ලියවා ගත්හ. කුමක් සේ ලියවා ගත්තුදැයි යත්? "පාණෙ න හනිතබ්බෝ, අදින්නං නාදයිතබ්බං, කාමෙසුමිච්ඡා න චරිතබ්බා, මුසාත භණිතබ්බා, මජ්ජං න පාතබ්බනති" යි මෙසේ ලියවාලා සිට වදාරණසේක් "තවද මා පිට සැක මඟත, අපගේ මැනියන්වහන්සේ අතිනුත් ලියවාගණුව"යි කියා යවූසේක.

නැවත බොධිසත්ත්වයන් වහන්සේ වැඳ බිසවුන් වහන්සේ සමීපයට ගොසින් "දේවීන් වහන්ස, නුඹවහන්සේ කුරුධර්මය රක්ෂාකරණසේක්ල, අපට දුනමැනවැ"යි කීහ. "දරුවෙනි, මා කුරුධර්මය රක්නේ සැබව, දැන් මට එහි සැකයෙක් උපත, එබැවින් මව ඒ දෙන්ට නොපිළිවතැ'යි කීහ. කුමක් පිණිසද? යත්,

බිසවුන්ගේ පුත්තු දෙන්නෙක් ඇත්තාහ. ඉදින් වැඩිමහලු පුතනුවෝ නායක රජ්ජුරුවෝය. කුඩා පුතනුවෝ යුවරජ්ජුරුවෝය. අනික් රටකින් රජ්ජුරුකෙනෙක් බොධිසත්ත්වයන් ලක්ෂයක් වටනා හඳුන්හරකුත් දහසක් වටනා රන්මාලාවකුත් පාක්කුඩම් පිණිස එවූහ. බොධිසත්ත්වයන් වහන්සේ ඒ වස්තුදෙක තමන්වහන්සේගේ මැනියන් වහන්සේට පූජාකරමිසි කියා ඔහුව දෙවාපිසේක. එද බිසවුන් වහන්සේ මෙසේ සිතුසේක, "මම සඳුනුත් නොගාම්, මාලාවත් නොපලඳිම්, මාගේ යෙහෙළින් දෙන්නාට දෙම් සිතාලා නැවත මට මෙසේවූ අදහසක් වූයේය. මාගේ වැඩිමහල් යෙහෙළනියෝ සොළොස්දහසක් බිසෝවරුන්ට නායකව රජ්ජුරුවන්ට අගමෙහෙසුන්ව මා ඓශ්වර්‍යයෙහි පිහිටා සිටියාහ. උන්ට දහසක් වටිනා මාලාව දීපියම්, කුඩා යෙහෙළනියෝ වනාහි අරුන්සේ ඌ සුවපත් නොවෙයි, උන්ට ලක්ෂයක් වටනා සඳුන්හරය දීපියම් සිතා දීපියා සිට නැවත සිතන්නාහු මම කුරුධර්මය රක්ෂාකෙරෙම්, උන් දෙන්නා දුක්පත් කිම් සුවපත් කිම් වයසින් උන් උන්ගේ තරම්ලෙස වේද? සංග්‍රහ මැනවැයි සිතා වැඩිමහළු යෙහෙළනියන්ට දහසක් වටිනා රත්මාලාව දී කුඩා යෙහෙළනියන්ට ලක්ෂයක් වටනා සඳුන්හරය දුන්සේය, අයුක්තිය කුමක්දෝ හෝ මගේ කුරුධර්මයට අනතුරුයක් වී දෝ හෝ යි සැක උපදවා ගත්සේක. එසේ හෙයින් කුරුධර්මය දරුවෙනි, ලියා දෙන්ට සැක කෙරෙම්" කීහ.

ඒ අසා දූතයෝ කියන්නාහු "තමා සන්තක වස්තු තමා කැමැති තෙනකට දෙති, එපමනිකින් සීලය හෙද නොවෙයි, නුඹවහන්සේ මෙපමණක පවා සැක ඇතිසේක. අනික් කුමක් නම් කරණසේක් ද? නුඹවහන්සේගේ සීලය ඉතා පිරිසිදුය, ඉතා නිර්මලය එබැවින් අපට නුඹවහන්සේත් කුරුධර්මය ලියාදුනමැනවැ"යි කීහ. ඔබගෙනුත් ලියවා ගත්හ.

ඉක්බිති බිසවුන්වහන්සේ කියනසේක් "දරුවෙනි, මා සිත සැක ඇත, මගේ යෙහෙලනියෝ යහපත් කොට කුරුධම්ම රකිති. ඔබගොසින් ලියවාගණුව"යි කීහ.

දූතයෝ බිසව් සමීපයට ගොසින් පළමු පරිද්දෙන්ම ඉල්ලුවාසේ කුරුධම්ම ඉල්ලුවාහ. එ අසා බිසව් කියන්නාහු "මා පළමු කොට කුරුධම්ම රක්නේ සැබෑය දැන් මට එහි සැකයෙක් ඇත, එසේ හෙයින් දෙන්ට නොපිළිවනැ"යි කීහ. "ඒ කවරේදැ?"යි යතහොත්, "එක් දවසක් බිසව් සිව්මැදුරු කවිළුව සමීප යෙහි සිටියාහු ඒ නුවර පැදකුණු කොට යන රජ්ජුරුවන් පසුකුඹයේ උන් යුව රජ්ජුරුවන් දැක පිළිබඳ සිත් ඇතිව සිතන්නාහු මම ඉදින් සහවාසයෙන් එක් සිත්ව විසිම්නම් මතු රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසුන් තනතුරේ තබා රකි"යි සිතූහ. "එසේහෙයින් මම කුරුධම්ම රකිම්න් සිව සස්වාමිකව කෙලෙසුන් වසඟව අනුන් සන්තක පුරුෂයා මූණ බැලීම්, එසේ නෙයින් මාගේ සීලයනට අන්තරාය වී දෝ හෝ යි සැක කෙරෙම් යි එබැවින් ලියාදෙන්ට නො පිළිවනැ"යි කීහ.

ඒ අසා දූතයෝ කියන්නාහු "ස්වාමිදියෙනියනි, අනාචාර තම් සිතින් සිතූ පමණකින් සිඹ නොවෙයි, නුඹවහන්සේ මෙපමණෙක පවා සැක උපදවන දැද මෙපමණකින් සීලභෙදය නොවෙයි, ලියා දුනමැනවැ"යි උන්දැගෙනුත් කුරුධම්ම රන්පත ලියවා ගත්හ.

ලියාදිසිට කියන්නාහු "කුඩාවරුනි මා සිත සැක ඇත, යුවරජ්ජුරුවෝ යහපත්කොට කුරුධම්ම රකෂාකෙරෙති, උන්දැ සමීපයට ගොස් කුරුධම්ම ලියවා ගණුව"යි කීහ. දූතයෝ උන් සමීපයට ගොස් "කුරුධම්ම අපට ලියවා දුන මැනවැ"යි කීහ. යුවරජ්ජුරුවෝ කියන්නාහු "එක්දවසක් පෙරවරු රාජසේවයට යන්නාහු රථයකින් ගොසින් රාජාංගනයට පැමිණ රජගෙයිදී කා රජගෙයි ලඟින් තම් රථයට දෙන බාන් ආදීවූ රථෝපකරණ රථය ඇතුළේ ලවා පියා රජුගෙට වදනාහ ඒ සලකුණෙන් සේනාව සිතන්නෝ යුවරජ්ජුරුවෝ අද රජගෙයින් කා බී එහිම ලඟිනාහ යි කියා සියළු සේනාව තම තමන්ගේ ගෙවල් ලාග පාන්වූ කල අවුත් රජගෙයින් ඒ රජ්ජුරුවන් පිටත්වන්ට කවර විටදෝ හෝ යි පෙරමග බලබලා සිටිනාහ.

රථාවාරියා දෙවන දවස් රථය සරහා ගෙණ පෙරමග බලබලා සිටිනේය. ඉදින් රජ්ජුරුවන්වහන්සේ දැන් දැකපියා එම් සිතා රජගෙට වදිනාසේක්වී තම් ඒ කැට බාන් ආදීවූ රථෝපකරණ පිටත තබා වඩනාසේක. ඒ සලකුණෙන් සියලු සේනාව දැන් දැන් වඩිනාසේකැයි රථය සරහා රාජාංගනයෙහි එකසිම සිටිනාහ. එක්දවසක් රථයෙන් මෙම ලෙස ගොසින් රාජාංගනයට බැස දැන්ම එම් යන සිතින් මෙතෙක් දවස්කර සංඥුව සේනාවට නොහඟවා රජගෙට වැඩියෑහ. ඒ ඇසිල්ලෙහි මහාමේඝයක් නඟා වසින්ට පටන්ගත. රජ්ජුරුවෝ වැසි වස්නා දැක නොයවසි කියා යුවරජ්ජුරුවන්ව සමුදුන්හ. ඒ වේලෙහි රජ්ජුරුවෝ රජගෙයිදීම කා බී රජගෙයිම සැතපුනාහ. කැටිව ගිය සේනාව දැන් එනසේකැයි පෙරමග බලබලා සිටියාහු තුන්යම් රාත්‍රියෙහි සිටි වතම සිව පහන්කළහ. ඒ රජ්ජුරුවෝ දෙවෙනිදවස් පානිවූකල රජගෙන් පිටත්වූවාහු සේනාව තෙම් තෙම් සිටියා දැක මා කුරුධම්ම රක්නාහු විසින් මෙතෙක්දෙනට දුක්පිඬා දෙනලද කිම්ද? මාගේ සීලයට අන්තරායවූ සැටිය යි සිතින් සැක උපදවා ගත්හ. එසේහෙයින් දූතයන්ට කියන්නාහු මා පළමු කුරුධම්ම රක්නේ සැබව, දැන් එය වනාහි සැකයෙක් ඇත, නොපට ලියා දෙන්ව නොපිළිවනැ"යි මේ කාරණය වූ පරිද්දෙන් කීහ.

ඒ අසා දූතයෝ කියන්නාහු "දේවයන්වහන්ස, නුඹවහන්සේ මේ සේනාව මෙසේවූ පීඩාවකට පැමිණෙත්වයි සිතා කළදෙයක් නොවන පසු නුඹ වහන්සේගේ සීලයට අන්තරාය නොවෙයි. මෙපමණෙක පවා සැක උපදවා

කල අනික් පවෙක් නුඹවහන්සේට කවරකලෙක සිඩවේද? නුඹවහන්සේ රක්නා සීලය ඉතා පිරිසිදුය, අපව කුරුධම්ම ලියාදුන මැනවැ''යි කියා උන් හෙනුත් කුරුධම්ම රන්පත ලියවා ගත්තාහ. ලියාදී කියන්නාහු ''මා සිත සැකයෙක් ඇත්මය, පුරෝහිත බමුණානෝ යහපත් කොට කුරුධම්ම රක්ෂා කෙරෙති, උන්ගෙන් ලියවාගණුව''යි කීහ.

දූතයෝ උන් සමීපයට ගොසින් කුරුධම්ම උන්ගෙනුත් ඉල්වූහ. උයිත් තමන්ටම උපත් සැකය කියන්නාහු ''මම එක්දවසක් රාජසේවයට යන්නේම අනික් රටකින් අපගේ රජ්ජුරුවන් වහන්සේට පාක්කුඩම් පිණිස එවතලද ලහිරුමඩලක් සේ ඉතා සොභමානවූ රථවාහනයක් අතරමගදී දැක මේ රථය කාගේදැ?යි විචාරා රජ්ජුරුවන් වහන්සේට ගෙණා රථයකැයි අසා සිතන්නාහු, මම වයෝවෘඩයෙමි අපගේ රජ්ජුරුවෝ රථය මට දීපුනම් සුවසේ රථයට නැගීගණ ඇවිදිනෙම් වේදැයි සිත සිතා ගොසින් රජ්ජුරුවන්වහන්සේ ලඟ සිටියාහ. එපමණකින් රථය එවිටම ගෙණවුත් රජ්ජුරුවන්ට දක්වූහ. රජ්ජුරුවෝත් ''රථය ආචාරීන්ට දෙව''යි කියා කීහ පුරෝහිතයානෝ නොසිව සුහ. නැවතත් අරගණුවයි කීවත් නොගිවිස්සේමය, කුමක්හෙයින්ද? යත්,

මා කුරුධම්ම රක්නා තැනැත්තාහු අනුන්සන්තක වස්තුවෙහි ලොභය ඉපදවූයේ ඉතා නපුර, මාගේ සීලය බිඳුනු සැටියයි මෙපමණක් සඳහන්කොට පියා ''කුඛාවරුනි, මාගේ සීලයෙහි මෙබඳු සැකයෙක් ඇත, එබැවින් දෙන්ට නුපුළුවනැ''යි කීහ. එබසට දූතයෝ කියන්නාහු ''යම්කට ලොභකළ පමණ නන් සිල් බිඳෙන්නේ නොවෙයි. නුඹවහන්සේ මෙපමණක් පවා සැක කරණසේක් අනික් පවක් කරණසේක්ද''යි කියා උන්ගෙනුත් කුරුධම්ම රන්පත ලියවාගත්හ. ''කෙසේවිනමුත් මට සැක ඇත්තාවූ යටුවම්කරණ අමාත්‍යයාත් යහපත්කොට කුරුධම්ම රක්ෂාකරන්නේය. ඔහුගෙනුත් කුරුධම්ම ලියවා ගණුව'' කියා යවූහ. උයිත් තමන් සිත උපන් සැකයක් කියන්නාහු ''එක් දවසක් තමන්ගේ ජනපදයේ කෙත් යටුවම් කරන්නාහ, කෙත මතන්නාවූ රැත කෙළවර කුඹුර ඇති තැනැත්තවුට දීලා අනික් කෙළවර තුමූ අල්වාගෙණ තමන් දිසාවේ රැත කෙළවර බැඳළු දඬ එක් කකුළුවෙකුගේ බිලමඩයට පැමිණ සිටියේය. ඒ වේලෙහි තුමූ සිතන්නාහු ඉදින් මේ දඬ කෙළවර කකුළුවාගේ බිලයට බහාලීම්නම් ඒ බිලයේ කකුළුවා මියන්නේය. මේ රැතෙන් කෙළවර මදක් ඉවත්කොට එලාලීම්නම් රජ්ජුරුවන් සන්තක බිම අඩුවන්නේය, නැවත ඇතුළුවිට එලාලීම්නම් කුඹුරහිමි නැනැත්තහුට අඩුවන්නේය, කුමක්කෙරෙම්දෝ හෝයි සිත සිතා මේ බිලයේ කකුළුවා ඇත්නම් නියම දැන පුව මනාවේදැයි සිතා ඒ අඹුකෙලවර බිලයට බහාළහ. ඒවේලේ කකුළුවා ''ක්‍රිං'' යන ශබ්ද පවත්වා අඩාළිය, එවේලෙහි උන්වි මෙසේවූ අදහසක්වූයේය. දණ්ඩි කෙළවර කකුළුවා ඇඟ ඇනී මියගියේ වී නම් මා රක්නාවූ කුරුධම්ම බිඳීගියේ යයි සිතමි. මෙපමණක් නිසා මාගේ කුරුධම්මයෙහි සැක ඉපදවීම්. එබැවින් දෙන්ට නොපිළිවනැ''යි කීහ.

ඒ අසා දූතයෝ කියන්නාහු ''තොපගේ සිත් කකුළුවා මරම් සිතා කළ දෙයක් නොවන බැවින් එපමණකින් ප්‍රාණවධය සිඩ නොවෙයි. මෙපමණක පවා සැකකරන්නා තෙපි අනික් පවක් නම් කවර කලෙක කරවුද? තොපගේ සීලය ඉතා පිරිසිදුය, තොපගේ කුරුධම්ම අපව දෙව''යි උන්ගෙනුත් කුරුධම්ම රන් පතක ලියවා ගත්හ.

''සැවද මට එහි සැක කෙරෙතියි එඹුල රථාචාරියානෝත් කුරුධම්ම රක්ෂාකරන්නේයයි උන් ලඟට ගොසිනුත් ලියවා ගණුත් යහපතැ''යි කීහ. ඒ දූතයෝ ගොසින් ඔහු අතින් ''කුරුධම්ම අපව ලියවා දූතමැනවැ''යි ඉල්වූහ:

උයින් කියන්නාහු "කුරුඛමිය මා රක්ෂාකරන්නේ සැබව, මෙයිදු සැකයෙක් ඇතැයි කියා ඒ සැකය කියන්නාහු එක්දවසක් පෙරවරු රජ්ජුරුවන් රථයෙන් උයනට වඩාගෙණ ගියෙමි රජ්ජුරුවෝත් දවල් දවස උයන්කෙළි කෙළපියා සවස නික්ම රථයට නැන්ගාහ. රථයෙන් අවුත් නුවරට නොවදනා තුරු හිරු ඔස්තයට ගියේය. ඇසිල්ලෙහි වැස්සෙක් නැගිය. රජ්ජුරුවන් වහන්සේ තෙමෙනසේක් දෝ හෝ යි හයින් රථය අදනා හසුන්ව තරව කැවුවු සන් දී භයගන්වා ලුහුබඳවාලීමි. ඵාශ්වයෝ කුමක්බවත් නොදන්නාහු වහ වහා දිවයත්හ. එතැන්පවත් උයනට යතකලත් එතනට පැමිණිකලත් කැවුවුසන් දුන්නත් නුදුන්නත් වහවහා දිවන්නාහ.

ඒ තිරිසන් සත්වයෝ කුමක්නිසා මෙලෙස දිවන්නේදැයි යතහොත්, ඒකාන්තයෙන් එතන භයකටයුතු නිසිකාරණයක් ඇතැයි සිතා අසු දිවන්නාහ. මම හසුන් භයගන්වත පිණිස කළ දෙයක් නොවෙයි. එදවස් රජ්ජුරුවන් තෙමුතැ යි මට වරදක් නැත. මම අස්ථානයෙහිදී ඉතා සුසිඝ්ඝින අසුන්ට තරව කැවිටිසන් දී භයගන්වා කොටලු නොදුන්ම නිසා එතනට ආ යම්විටකම ඒ ස්ථානයෙහිම කුමක් නිසා වූ භයෙක් දෝ හෝ වහ වහා දිවෙමින් පිඩාවට පැමිණෙනි. මම කුරුඛමිය රක්නා නැනැත්තෙම් මේ කාරණය නිසා මාගේ කුරුඛමිය නමැති සීලය බිඳිනැයි සිතමි. එඹා කුඩාවරුනි, මෙපමණකින් සලකා මාගේ කුරුඛමිය නමැති සීලය දෙන්ට බැරිය"යි කීහ.

ඔහට දූතයෝ කියන්නාහු "මෙපමණකට පවා මෙසේ සැකකරන්නාහු අනික් පවක් කෙසේ කරවිද"යි උන්ගෙනුත් කුරුඛමිය රන්පත ලියවාගත්හ. එසේවීතවුත් තව සැක ඇත, මෙනුවර සිවානෝ අඛඩකොට කුරුඛමිය රකිති. උන්ගෙනුත් ලියවාගණුව"යි කීහ. දූතයෝ සිවානන් ලඟට ගොස් "නුඹ රක්නා කුරුඛමිය අපට දුනමැනවැ"යි ඉල්ලූහ.

සිවානෝ කියන්නාහු "එක්දවසක් මම අැල්කෙත උඩුදරා බිමි යන්නේ මාගේ කෙත්වත් බලාපියා කැවත ගෙට එන්නෙමි මේ අැල්කරලින් මාලාවක් සේ ගොතා බදවාගණිමැයි සිතා එකම කරල්මිටියක් ගෙන්වාගෙණ ඒ දවස් පටන් මෙසේවූ අදහසක් මට වූයේ ඒ අැල්කෙත රජ්ජුරුවන්ට මවත් අදයට කළ දෙය එසේ වූ තැනින් අනුන්සන්තක කරල්මිටක් මා ගෙන්වාගන්න ලද හෙවත් මම කුරුඛමිය රක්ෂාකෙරෙමි, එබැවින් මාගේ සීලයට අනතරාය වීදෝ හෝයි කියා මාගේ කුරුඛමිය මට දෙන්ට කොපිළිවනැ"යි කීහ. දූතයෝ කියන්නාහු "සිවානෙනි, නුඹ සොරසිනින් කළදෙයක් කොවත හෙයින් මෙපමණක් නිසා අදින්නාදනය සිඛ නොවන්නේය. මෙපමණෙක සැක උපද වන්නාවූ නුඹවහන්සේ අනික් පවක් නම් කෙසේ කරණසේක්ද? නුඹවහන්සේගේ සීලය ඉතා පිරිසිදු ය"යි කියා උන්ගෙනුත් කුරුඛමිය රන්පත ලියවා ගත්හ. "එසේ වී නමුත් මට සැක ඇත, බඩසැල් මතන්නාවූ අමාත්‍යයෝ යහපත් කොව කුරුඛමිය රක්ෂාකෙරෙයි, ඔහු ලඟට ගොස් කුරුඛමිය ලියවා ගණුව"යි කීහ.

දූතයෝ ඔහු සමීපයට ගොස් "නුඹ රක්නා කුරුඛමිය අපට දුනමැන වැ"යි කීහ. ඒ මතන්තෝද තමන් සිතට උපන් සැක කියන්නාහු "එක්දවසක් කොටගෙයි දෙර ඉඳ රජ්ජුරුවන්ගේ භාණ්ඩාගාරයට වී මතන්නාහු නොමිනි වීත්ගෙණ සන් දුවාහ, වී මැත නොනිමෙනතුරු වැස්සෙක් වසින්ට පටන්ගත. අමාත්‍යයා මිනු වියෙහි සන්ගැන මෙතෙකැයි කියා මා සන්ලු වී අසවල් වී යයි සලකුනක් කොකොව වියෙහි එක්කොව සිහිනැතිව වෙරයතුරාලා පියා වහා දිවගෙණ ගොසින් හිඳ සිතන්නාහු සන්දී මිනු වියෙහි එක්කෙළෙම්තම් කොමිනු වියෙහි එක්කෙළෙම්දෝහෝයි සිතා මිනු වියෙහි එක්කෙළෙම්තම් රජ්

ජූරුවන් වහන්සේගේ වී වඩනේය. සිටානන්ගේ වී නස්නේය. වැලිත් මම කුරුධර්මය රකිමි මාගේ ගුණධර්මය බිඳිනී නේ හෝ''යි සිතා ''මේ පමණක් නිසා මම කුරුධර්මය දෙන්ට බැරිය යි කියෙමි''යි කිය,

ඔහට දූතයෝ කියන්නාහු ''තොපගේ සොරසිතක් නැත. මේ පමණකින් අදින්නාදූතය සිඩ තොවෙයි. මෙපමණකට මෙසේ සිතත නුඹට අනික් කවර දවසෙක පාපයක් කරණදැ''යි කියා උන්ගෙනුත් කුරුධර්මය ලියවා ගත්හ. ''එසේ වී නමුත් මට සැක ඇත. මේ නුවර වාසල බලන දෙරටුපාලයා සහපත් කොට කුරුධර්මය රක්ෂා කෙරෙයි, ඔහුගෙනුත් ලියවා ගණුව''යි කීහ.

අමාත්‍යයෝ ගොසින් ඔහුගෙනුත් ''කුරුධර්මය දූතමැනවැ''යි ඉල්වූහ. ඒ තෙමේ එක්දවසක් වාසල්දොර වසන්නේ මෙතෙක් දවස් සේම තුන්වීටක් අඩගා කියා දොර වසන්ට සිටි කලව ඒ නුවර එක් දිළිඳු මිනිසෙක් තමාගේ බාල නහක් කැඳවාගෙණ වල දර පළා සොයා ගියාහු නැවත අවුත් හඬගැ ශබ්දය අසා නැඟනියන් කැඳවාගෙණ වහා අවුත් වාසල් දොරට පැමිණ ''දොර ඇරපියව''යි කිව. උන්ව දෙරටුපාලයා කියන්නේ ''තෝ තමා මේ නුවර රජ්ජුරු කෙනෙකුන් ඇති නියා නොදනුද? කල් තබා වාසල අගුල ලන නියාව දැන දැන තාගේ අඹුව ඇරගෙණ වල කෙළ ඇවිද පියා දැන් ඉද කුමට අයිදැ!''යි කිය.

ඒ දුගියා කියන්නේ ''සවාමීනි, එසේ නොකිව මැනව, මාගේ බිරින්දක් කොවෙයි. මාගේ නැඟනියෝය''යි කීහ. දෙරටුපාලයාද එවේලෙහි සිතන්නේ ''තමා අකාරණයෙක මෙලෙස කිව යි සිතා මා විසින් නොකිවමතා බසක් කියාපිමි. එහුගේ නඟා ඔහුගේ අඹුවය යි නොදැන කිමි. මම වූකලී කුරුධර්මය රකිමි. මේ කාරණය නිසා මගේ කුරුධර්මය බිඳිනැ යි මට සැක ඇත, ලියා දෙන්ට නොපිළිවනැ''යි කීහ.

දූතයෝ කියන්නාහු ''තොපි උන්ගේ නඟා නියාව දැන දැන කී දෙයෙක් නොවන නෙයින් තොපගේ සීලය හෙද නොවෙයි. මෙපමණක පවා සැක කරන්නාහු අනික් වරදක් කෙසේ නම් කරවිද? ඉන් අපව දැනුනු වරදෙක් නැතැ''යි කියා උන්ගෙනුත් කුරුධර්මය රන්පත ලියවාගත්හ. ''එසේවීනමුත් මාගේ සිත සැක ඇත. මෙනුවර වසන්නාවූ වෙශ්‍යා දූ යහපත් කොට කුරු ධර්මය රකිනීය. ඔබ ගොසින් උන්ගෙනුත් ලියවා ගණුව''යි කීහ. උන් ලඟට ගොසින් ''කුරුධර්මය අපව දූන මැනවැ''යි කියා ඉල්වූහ.

ඒ වෙශ්‍යා දුව තමා සිතව උපත් සැකයක් කියන්නී ''මටත් සැක යෙක් ඇත. දෙන්ට නොපිළිවනැ''යි කීහ. ඒ කවරේදැ යි යතහොත්: මේ වෙශ්‍යාදුව යහපත් කොට කුරුධර්මය රක්නා නියාව ශක්‍රයෝ දැන තමන් ඉදුරා පරීක්ෂා කොට පියන පිණිස ඇ සමීපයට ලදරු වූ පුරුෂ වේශයක් මවාගෙණ මසුරන් දහසක් දීලා තමාගේ දිව්‍යලොකයටම පලා ගියෝය. ඌ ගිය නැඟැත්තෝ තුන් අවුරුද්දක්ම නො ආවාහුය. ඒ වෙශ්‍යා දූ තමාගේ සීලයට අනතරාය වේදෝ යන භයින් තුන් අවුරුද්දක් මුලුල්ලෙහි අනික් පුරුෂයකු අතින් මස්සක් අකක් තබා බුලත්පතක් පමණකුත් නොගත්තීය. ඕතොමෝ දවසින් දවස අය මූණිනක් නැතිව, ඇති දෙය වියදම්වීමෙන් තමාගේ ඇති සම් පත්තිය වියදම්වීමෙන් පිරිහී දුක්පත්ව ගොස් සිතන්නී ''මව දහස දීලා ගිය

පුරුෂයා දැන් තුන් අවුරුද්දක්ම නො ආයේය. එසේ හෙයින් මම ඉතා දුක් පත්ව දැන් මාගේ බඩ පමණකුත් පැදගත නොහෙමි. මෙසේ ඉඳ තත්තට නො පිළිවත අධිකරණ නායකයන් ලඟට ගොස් මේ බව කියා දවස හැරගැන්ම යහපතැ"යි සිතා අධිකරණයට ගොස් "මුදලිවරිනි, මට මසුරන් දහසක් දීලා පුරුෂයෙක් ගියේය. මෙවකට තුන් අවුරුද්දක් උන් මළ බවත් උන්බවත් නොදනිමි. එබැවින් බැහැරින් මා ලැබගන්නා දෙයක් නැති බැවින් දැන් බඩ පමණකුත් පැදගත නොහෙමි. කුමක් කෙරෙම්දැ"යි කීහ.

"උන් තුන් අවුරුද්දක් නො ආ කල තුමක් කරවුද? මෙතැන් පටන් ලත් දෙයක් ඇරගෙණ රැකව"යි කීහ. අධිකරණයෙන් වර ලදින් නික්ම යන තැනැත්තියට එක් පුරුෂයෙක් දහසින් බැඳි පියල්ලක් දික්කොට ලීය. ඒ ඇරගන්ටයයි අත දික්කරන්නාහාම ශක්‍රයෝ අවුත් ඉදිරියෙහි සිටියාහ.

එවේලෙහි වෙශ්‍යා දූ කියන්නී "මෙතනට යමගිය දවස තුන් අවුරුද්ද කින් ඔබ්බේ මට දහසක් දීලා ගිය පුරුෂයා අවුත් සිටිනේය. තාගේ රණින් මට ප්‍රයෝජන කිම්දැ"යි කියා දික්කළ අත අයාගත්හ. එවේලෙහි ශක්‍රයෝ තමන්ගේ දිව්‍යාත්මභාවයෙන් සමීහරණයෙන් සැදී පැහැදී ලහිරුමඩලක් මෙන් බබලා ආකාශයෙහි සිටියාහුය. එවේලෙහි නුවරවාසීහු රැස්ව ගියාහ. ශක්‍රයෝ ජනසමාගමෙහි කියන්නාහු "මම මෑ විමසන පිණිස තුන්අවුරුද්දකින් ඔබ්බේ මෑට මසුරන් දහක් දීලා ගියෙමි. මෙදැතුරෙහි මෑ රක්නා කුරුධම්යෙහි මා දුටු කිසි අඩුවෙක් නැත, එබැවින් සිල් රක්නවුන් විසින් මෙලෙස රැක්ක යුතුය"යි කියා සියල්ලවුන්ට අවවාද දීලා ඇගේ ගෙය සත්රුවනින් පුරා "මෙවක් පවත් නොපමාව සීලය රක්ෂාකරව"යි උන්ට අවවාද කියා තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ.

ඔතොමෝ මේ කාරණය නිසා "එකෙකුගෙන් ගත් අත්ලස් නොවරදවා අනිකකු දික්කළ වත්තුවට අත දික්කෙළෙමි. මේ කාරණය නිසා මා රක්නා සීලය නැසී ගියා දෝ හෝ යි සිතා නොදෙමි"යි කීහ.

එවේලෙහි ඇට දූනයෝ කියන්නාහු "අත දික්කළ පමණින් සිල් බිඳී නොයෙයි, නොපගේ සීලය ඉතා පිරිසිදුය"යි ඔවුන්ගෙනුත් කුරුධම්ය රන්පත ලියවා ගත්හ. මෙසේ එකොළොස්දෙනා රක්නාවූ සීලය රන්පත ලියවාගෙණ දන්නපුරයට ගොසින් කලිඟුරජහට ඒ රන්පත දීලා එපවත් වූ පරිද්දෙන් කීය.

එතැන්පටන් රජ්ජුරුවෝත් ඒ කුරුධම්යෙහි ඇදහිලි ඇතිව අඛණ්ඩ කොට පඤ්චසීලය රක්නාහ. ඒ සීලයෙහි ආනුභාවයෙන් කලිඟුරට දනව් බෑ මානයෙහි වැසි වැසීය. ඒ රට උපන්නාවූ තුන්භයක් සන්සිදී සියලු රට කිසි භයක් නැතිව ඉතා නිරාකුල්ව බත් බුලත් ආදීවූ සියලු සම්පත්තීන් සමෘද්ධ විය.

බොධිසත්ත්වයන් වහන්සේ දිවිපවත්නා කල් මුළුල්ලෙහි දන් පින් සිල් රක්ෂාකිරීම් ආදීවූ සියලු සුචරිතයෙහි යෙදී ජීවිතාවසානයෙහි දෙව්ලොව ගියහ යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට කුරුධම් දෙශනාව නිමවා වදාළසේක. ඒ බණ අවසානයෙහි බොහෝදෙන සතරමග සතරඵලයට පැමිණියාහ. එසම යෙහි කුරුධම්ය රැකි එකලොස්දෙන මූ මූ ය යි වදාරණ සමීඥයෝ:-

"ගණිකා උප්පලවණ්ණා ච, පුණ්ණා දෙවාරිකෝ තදා,
රජ්ජුගාහෝ ච කවිවාහෝ, දෙණමාතා ච ඛොළිතෝ.

සාරිපුත්තෙනා තදුසෙට්ඨි, අනුරුද්ධා ච සාරථි,
බ්‍රාහ්මණෝ කස්සපෝ ථෙරෝ, උපරාජා නන්ද පණ්ඩිතෝ

මහෙසි රාහුල මාතා, මායාදෙවී ජනෙතතියා,
කුරුරාජා බොධිසත්තෝ, එවං ධාරෙථ ජාතකං.”

“එම්බා මහණෙනි, එසමයෙහි ගණිකා නම් වෙශ්‍යා වූ මෙසමයෙහි වමත්සවූ වූ උපුල්වන් මහාසථවිරයා, එසමයෙහි දෙරවුපාලයා නම් දැන් පූණ්‍ණ භද්‍ර නම් මහාසථවිරයා, එසමයෙහි යටුවම කළ අමාත්‍යයා නම් දැන් කසසීන් මහාසථවිරයෝය, බඩසැල අමාත්‍යයා නම් දැන් මුගලන් මහසථවිරයෝය, එසමයෙහි සිටුනෝ නම් දැන් ශාරීපුත්‍ර සථවිරය, එසමයෙහි රථාචාර්‍යයා නම් දැන් අනුරුඬ මහාසථවිරය, එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් දැන් මහා කාශ්‍යප සථවිරය, එසමයෙහි යුවරජ්ජුරුවෝ නම් දැන් නන්ද මහාසථවිරය, එසමයෙහි අගමෙහෙසුන් නම් දැන් රාහුල මාතා වූ යසෝධරා මහාසථවිරාය, එසමයෙහි රජ්ජුරුවන් වහන්සේගේ මැනියන් වහන්සේ නම් දැන් මහාමායා දේවිය, එසමයෙහි කුරුරජ්ජුරුවෝ නම් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

---

## 270 රොම ජාතකය.

තිවද ආකාශය සේ අප්‍රමාණ ගුණ ඇති සම්බුදුරජාණන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වතීමාන කථාව බොහෝ ජාතකවල පෙණෙන්නේය.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ බොහෝ පරෙවියන්ට නායකව පරෙවිව උපන්සේක. ඒ පරෙවියන් වසන්නාවූ වත සමීපයෙහි තාපස කෙනෙකු වාසය කරන්නාහ. ඒ තාපසයන් කරා බොධිසත්ත්වයෝ පරෙවියන් පිරිවරා ගොසින් තාපසයන් දැක වැඳ පුදා යන්නාහ.

ඉක්බිති තාපසයෝ ඔබ්බකට ගියාහ. ඒ පන්සල අසික් කුට තාපස කෙනෙක් වාසය කරන්නාහ. බොධිසත්ත්වයෝත් ඒ තාපසයන් කරා ගොස් තාපසයන් වැඳ පුදා බණ අසා ඒ පන්සල් මළුයෙහි ගොදුරු කා යන්නාහ. මේ නියායෙන් පණස් අවුරුද්දක් ගියේය. එක් දවසක් උපාසකවරු පරෙවි මස් රසයක් තාපසයන්ට පිළිගැන්වූහ. තාපසයෝ පරෙවි මසෙහි තෘෂ්ණාව ඇතිව “මේ කුමන මස් දැ”යි විචාරා “පරෙවි මසැ”යි කී පසු “එසේ වී නම් තොප ඇම විසින් මට සාල් ලුණු මිරිස් ආදීවූ දෙය ගෙන්වා දෙව”යි කියා ගෙන්වා ගෙණ පොල්ලකුත් සැස වල්කලා අස්සේ තබා ගෙණ පරෙවියන් එන පෙරමඟ බල බලා උන්නාහ. ඒ වේලාවට බොධිසත්ත්වයෝ බොහෝ පරෙවියන් පිරිවරා තාපසයන් කරා ආහ.

තාපසයන් උන්නාවූ විලාසයෙන්ම බොධිසත්ත්වයෝ අද තාපසයන් ඉදින නියාව අමුත්තක් ඇත මැනව. කුමක් දෝ හෝ යි සිතා යටිසුලඟට ගොස් ආශ්‍රාණය කොට තාපසයන් පරෙව්මස් කෑ නියාව දැන තාපසයෝ පරෙව්මස් කා අප මරන්ට උත්සාහ කොට ඉදිති සිතා පන්සලව දුරුව දුරුව ගොදුරු කන්ට වන්නාහ. තාපසයෝ ඒ දැක මේ පරෙවියෝ මා කරා නො එති. කටයුතු කාරිය කියා ලන් කොට ගෙණ මරම් සිතා කියන්නාහු "ඇයි? තොප ඇම මෙතෙක් දවස් මා කරා අවුත් ලඟම ගොදුරු කන්නාහ. දැන් පණස් අවුරුද්දක් වාසය කරණුවෝද අද කවර සැකයක් නොප ඇමව දැනුනු සඳහා මා ලඟට නො එවුද? නැතහොත් මා අනික් තාපස කෙනෙකැයි සිතා නො එවුද? නැත, නොපි අනික් පරෙවි මොත්තමෙක්ද"යි කීහ.

එබස් අසා බොධිසත්ත්වයෝ කියන්නාහු "නොප අනික් තාපසකෙනෙ, කුත් සන්දුත් නොවෙයි, අනික් පරෙවි මොත්තමෙක් නිසාත් නොවෙයි, ත ඉදිනා ආකාතිය අපව සැක කෙරෙයි, එසේ හෙයින් ලඟට නේන්නේ ය යි කියන්නෝ මා ඉදිරි සැලැස්ම මුත් ඇම දැනගත් නියා වේදැ යි සිතා දුර තබා පොල්ල දමාලා ගැසීය. ඒ දමාලූ පොල්ල වැරද ගිය. එවිට තාපස කියන්නේ "නොපි මාගෙන් වැරදුනවා දැ"යි කීය. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "තමා ගහාම වැරද ගියාහු පමණක් විනා තාපසයෙනි, නොපි සතර අපායෙන් නොවැරදුනවා දැ"යි කියා "එම්බල තාපසය, ඉනිබ්බේ තෝ මෙතන උන්නෙහි නම් උපාසක වරුන්ටත් තාගේ නුගුණ බොහෝ කොට කියම්, තෝ මෙතනින් පලායව"යි කියන්නාහු ඒ තාපසයා එවිට එතනින් පලාගියේය යි වදුරා මේ රෝම ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි එකියන තාපසයෝ නම් දෙවදත්ත සථවිරයෝය, පළමු විසූ සිල්වත් තාපසයෝ නම් ශාරිපුත්‍ර සථවිරය, පරෙවිව උපන්නෙම් බුදුවූ මම වේදැ"යි වදාළසේක.

---

## 271 මහිස ජාතකය

මේවද අනාතපිටා බඹලොව සේ උස් වූ ගුණ ඇති සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ක්‍රීඩා වදුරකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

**හේ කෙසේ ද? යත්,**

එක් ක්‍රීඩා වදුරෙක් එක් කම්පස් ඇතෙකුගේ කුම්භස්ථලයට නැඟී කෙළනේය. එකියන ඇතාත් එකියන වදුරු කෙරේ නොකිපී ඒ කෙළි ඉවසා ඉදින්නේය. පසුව එක් දවසෙක ඒ ඇතා ඔබ්බෙක බැඳ අනික් තෙනකින් අකම්පස් ඇතකු පළමු ඇතා සිටියාවූ නිලයේ බැන්දාහ. එකියන වදුරාත් පළමු ඇතා මෙනැයි සිතා "මේ ඇතා පිටට නැගෙම්" සිතා ඇතු පිටට නැගී කුම්භස්ථලය මත්තේ උන්නේය. එකියන ඇතා තමාගේ කුම්භස්ථලයෙන් වදුරා අල්වාගෙණ දළින් ඇන පයින් මිරිකා මරා දමාපිය.

මේ කථාව දම්සභාවෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ කිය කියා වැඩ උන් තෙනව සම්බුදුන්වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා

"දැන් මතු නොවෙයි. පෙරත් එකියන වදුරා එලෙසම කෙළේ වේදැ"යි වදුරා "ඒ කෙසේ දැ"යි ආරාධිතවූ සම්බුදුහන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයෙහි දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ වනාන්තරයට නුදුරු තෙනෙක මිගොන්ව උපන්නාහු ඇලි දුගී බොහෝ වූ සත්ථානයක ගසක් මුල වාසය කරන්නාහ.

ඒ ගස වසන්නාවූ එක් වදුරෙක් ඒ කියන බෝධිසත්ත්වයන්ගේ පිට වර්වස් කරන්නේය. අඟ අල්වා කෙළිනේය, වල්ලා අල්වාගෙණ ඔත්සිල්ලා කෙළිනේය, බොධිසත්ත්වයෝත් ඊට තොසකිපීම වාසය කරන්නාහ. ඒ අවස්ථාවේ ඒ ගස වසන්නාවූ දේවතාවා බොධිසත්ත්වයන්ට කියන්නේ "මිමාතෙනි, තොප ඇඟපත දුශ්‍යකොට කෙළිනාවූ වදුරාට තොප බැණ නොනැගී ඉදිනේ ඇයිද? අඟවැලා ඇතපියා පයින් මිරිකා දමව'යි කිහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු ඒ කියන වදුරා මාගේ ඇඟපත එලිගෙණ කුමක් කරතත් මා මුත්ව කරණ දෙයක් නැත, උඹ මැරීම තම් මට ප්‍රණඝාතය සිඹවන්නේ වේදැ"යි කියා මා එසේ කරන්නේ නැත, අනික් මිමෙක් මෙතනට ආනම් ඒ නිහඬ කියා ගණුව යි කියා මා මුව කරණ දෙයක් නැතැ"යි කියා බොධිසත්ත්වයෝ කිපදවසකින්ම ඔබ්බට ගියාහ. අනික් මිමෙක් ඒ ගසමුල වාසයකරන්ට ආහ. ඒ කියන වදුරුන් පළමු මිමා සේම ය යි සිතා පිටට පැන කෙළින්ට වත. එවිට ඒ කියන මිමා වදුරා බිම්හෙලා ගෙණ අහින් ඇන ලය පලා මැරී ය යි වදාරා මේ මනුෂ්‍ය ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ඒ කියන වදුරා තම් මේ කියන වදුරාමය, මිමා තම් මෙකියන ඇතා මය, ඒ වදුරාගේ ක්‍රීඩාව ඉවසූ මිමා තම් බුදුවූ මම්ම යයි වදාළසේකි.

---

## 272 ශතපත්‍ර ජාතකය

තිවද සක්වළ අන්ත වූවා සේ අපරියන්ත ගුණ ඇති සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වහන්දැ දෙනමක් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

පඬුකය, ලෝහිතකය යන සවගවහන්දැගෙන් දෙනමක් බොහෝ භික්ෂූන්වහන්සේට "නුඹවහන්සේ අසවලුන්වහන්සේ නියාවට ගුණ නුවණ නැද්ද? නුඹවහන්සේ අඩුව ඉදිනේ ඇයිද? යනාදීන් චෙෂ උපදන්ව නිසි බස් කියා කුප්පවා තමන්වහන්සේගේ ලාපනක ක්‍රියාවට කරවන සේක.

මෙපවත් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන්වහන්සේ කිය කියා වැඩඋන් තෙතට සම්බුදුන්වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පුම් භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුද"යි විචාරා එපවත් අසා "ඕ කිවා නොගිවිස සවගවහන්දැගේ බස් අසන වහන්දැ තම් ශතපත්‍ර පක්ෂියාගේ බස් අසා සන්තෝෂවූ මිතවකයා මෙනැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

**පිටිවගිය** දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක් වතාන්තරයක පන්සියයක් සොරුන්ට නායකව සොරදෙවුව වාසය කරන්නාහ.

එසමයෙහි එක් පුරුෂයෙක් දහසක් ඔබ්බකට නයදී ඒ නය ඵලවාගත නොහී මළ. ඔහුගේ බිරින්දද නය ඵලවාගත නොහී මිය යන අවස්ථාවෙහි තමාගේ වැඩී සිටියාවූ පුතා කැන්දා කියන්නී "පුත, දැසක් ඔබ්බෙන් ණය ඇරගත් කෙනෙක් ඇත, මා මළ කල ඒ ණය තොපට නොදෙති, මා ඉන්දදී ඒ නය ඵලවාගෙණ එව"යි පුතා නය ඵලවා යැවීය.

උඹ දෙන්නා අතින් නය ඵලවාගෙණ එතකලව මැනියෝ මියගොසින් පුතා කෙරේ ස්නෙහයෙන් පුතා එන ඉදිරියේ කැනහිල් බැලිව ඉපද ගියාය. පුතාත් මස්සෙන් දැස ඇරගෙණ සොරුන් ඉඳිනා වතාන්තරය සමීපයට පැමිණියේය. එවිට ඒ කියන කැනහිල් දෙන් තමාගේ පුතා සොරුන් මරණ කෙයින් මග අවුරා යා නොදී වැදහොත්තී, එකියන පුරුෂයා අවලක්ෂණ සීපාවා දැක පිම්" කියා කැව මුගුරු ආදියෙන් ගසා වතාන්තරයට ගියේය. ඒ වේලාවට එක්තරා කැරලෙක් සොරුන්ව අසවල් පුරුෂයෙක් දැසක් ඇරගෙණ එයි කියා කැරල් ශබ්දයෙන් ඇඬිය, එවිට එකියන පුරුෂයා තමාව යහපත් කොට ඇඹු අඬෙකැයි සිතා කැරලා වැද "තවත් අඬව තවත් අඬව"යි කීහ.

බොධිසත්ත්වයෝ මේ කැනහිල් ධෙනුව කළ දෙයත් කැරලා කළ දෙයත් දෙකම බලා හිටියාහ. බලා සිට මෙකියන කැනහිල් ධෙනුව පූර්ව ජාතියෙහි මූට මව්ව උපන් කෙනෙකුන් උවමැතව, එසේ නිසා තමන්ගේ පුතා කෙරේ ස්නෙහයෙන් අප ලඟට ආකලට මරාපියති සිතා මිග අවුරා වැදහොත්තීය. මෙකියන පුරුෂයා තමා වැඩ සිතා කැනහිල් ධෙනුව කළදෙය නොදැන උන් මරා පහකොට පියව යි අපට හිතව තමාට විපක්ෂව ඇඹු කැරලාට සමාධිව වැන්දෝය යි සිත සිතා උන් කලට සොරුන් මධ්‍යයට එකියන පුරුෂයා ඇවිත් වැදහිඳියේය. බොධිසත්ත්වයෝ තුළු අල්වවයි කියා අල්වා ගත්තාහ. අල්වාගෙණ බෝධිසත්ත්වයෝ විචාරන්නාහු "තොප මෙතනට ආයේ කුමක් සන්දැ"යි විචාළහ. එවිට ඒ කියන්නේ "තමා මවගේ නය දුන්නැන් ඵලවාගෙණ එන්ට කී නිසා නය ඵලවාගෙණ යෙමි" කියන්නා 'ඇයි? මසුරන් දැස තොප අතැ"යි විචාරන්නා "ගෙණාම්" කීහ.

එවිට බොධිසත්ත්වයෝ "තොපගේ මැනියන්ගේ තත්ත්වය දනුදැ"යි විචාරන්නා "මම නොදනිමි"යි කීහ. "තොපගේ මැනියෝ මිය ගොසින් කැනහිල්ව ඉපද අතරමගදී තොප වැලකුවෝ උඹය"යි කියා "ඒ තොපි නොදැන අවැඩට කළ දෙයෙකැ යි සිතා උන්ව පහකොටපුව. තොපව අවැඩට අපව පක්ෂව ඇඹු කැරලාගේ ශබ්දය අසා තොපි සතුටුවුව. එසේහෙයින් තොපසේවූ අඥානයෝ නැත, එසේ වූ තොප මා නසන්නේ කිමිදැ යි කියා තොපව ජීවිත හානියත් අඹු හානියත් කොකෙරෙමි යි අලඟ"යි වදුරා බුදුව වැඩ ඉඳ වදුරණසේක් "යම්සේ ඒ පුරුෂයාව වැඩ කී කැනහිල්ධෙනුව අවැඩකොට අවැඩ කී කැරලා ශබ්දය වැඩ කොට සිතා විනාශයට පැමිණෙන්ව ගියේ ද? එලෙස යම් කෙනෙක් මා කීවා නොගිවිස මේ අඥාන භික්ෂූන් කීවා ගිවිසි

කෙනෙක් ඇත්නම් මේ කැරලා කීවා කොට විනාශයට පැමිණි පුරුෂයා මෙනෑ"යි වදාරා මේ **ශතපත්‍ර ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි සොරුන් පන්සියයට නායකව උපන්නෙම් බුදුවූ මම්මය"යි වදාළසේක.

---

## 273 කූටසාක ජාතකය

**ති**තදසත්ත්වලෝකයාගේ අවිඥාතවූ ගුණ ඇති සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා උපාසකයෙක් තමාගේ වාසස්ථානයට සම්බුදුරජාණන්වහන්සේ හා සඞ්ඝයාවහන්සේ වඩාගෙණ ගොස් දන්දී තමන්ගේ උයනේ දුවල් භික්ෂූන්වහන්සේ සෙවණපරයේ ඇවිදිනාසේක්ව සි කියා "යහපතැ"යි කියා භික්ෂූන්වහන්සේ ඒ ඒ තෙන ඇවිදිනා කලට එක්තරා උයන්ගොවිවෙක් මල් පලාපල කඩාගෙණ එන්වාය සි පත්කොල කඩා ගොටු විද බිම එලන්නේය. උන්ගේ පිත් එලාලූ ගොටු බිම ඉඳ ඉරා දමන්නේය. ඒ දැක සම්බුදුරජාණන්වහන්සේට භික්ෂූන්වහන්සේ ගොසින් දන්වූසේක.

සම්බුදුරජාණන්වහන්සේ "දැන් මතු නොවෙයි මහණෙනි, පෙරත් ඒ එසේම ගොටු ඉරාදැමුයේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

**පි**වගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක්තරා උයන්ගොවිවෙක් ගසකට නැගී උඩ ඉඳ ගොටු විද එලන්නේය, ඒ එලූ එලූවා එක්තරා වඳුරෙක් ඉරා අරිනේය. ඒ වේලාවට එක්තරා පුරුෂයෙක් එතනට ආයේය. ඒ දැක වඳුරා අතින් විවාරන්නේ "ඇයි? එලූ ගොටු තා විසින් ඉරා අරිනේ යහපත් කොට ඉදිකරන්වදැ"යි විචාළේය. ඒ අසා වානර කියන්නේ "මුතුන් මිමුතුන් සමගේ පවන් අවැඩව නිසිදෙයක් විනා වැඩව නිස්සක් නොකරණුලද, එසේහෙයින් මම කුමකට ගොටු විදවාදැ යි මාගේ සඩහාවධම් හෙයින් විදදම්මි" කීය.

එවිට ඒ පුරුෂ කියන්නේ "නොප ඇමගේ ධර්මය මෙසේ කල අධර්මය තමා කියනුම කිම්දැයි"යි කියා වානරයාව නින්දාකොට ඔබ්බකට ගියේය"යි වදාරා **කූටසාක ජාතකය** නිමවා වදාළසේක.

"එසමයෙහි ඒ කියන මක්කට තම් මෙකියන උයන්පාලයාය, දැවූ ගොටු කැසුවේ ඔහුගේ පුත්‍රයාය, එසමයෙහි වඳුරා ලඟට ගිය පුරුෂයා තම් බුදුවූ මම්ම ය"යි වදාළසේකි.

---

## 274 අභ්‍යන්තර ජාතකය

**ති**වද සංස්කාර ලෝකය සේ කල්පනාවට අවිෂයවූ ගුණ ඇති සර්වඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි යසොධරා සථවිරාවන් වහන්සේව අඹ දුන් සැරියුත් සඞ්ඝමින් අරහයා මේ ජාතකය දක්වන ලදි.

හේ කෙසේද? යත්

සවීඥයන්වහන්සේ විසාලා මහනුවර කූටාගාර ශාලාවෙහි වැඩවසත සමයෙහි ප්‍රජාපතිගොතමීන් වහන්සේ ගැහුන් පන්සියයක් පිරිවරා කූටාගාර ශාලාවට අවුත් බුදුන් අතින් භික්ෂුණී ශාසනයව අනුදුන, භික්ෂුණී කරවා ගත් පසු උන්වහන්සේ උපසම්පදාව ලදින් සෝවාන්ව භාවනා උපදවා රහත්වූ පසු යසොධරා සථවිරාවයන්වහන්සේ සිතනසේක්, "රාහුල සඟමින්වහන්සේත් මහණවූ පසු සුඛොදන රජ්ජුරුවන්වහන්සේත් අතිතවූ පසු ඉතිකින් මා ඉඳිනේ කිම්දැ"යි සිතා සැවැත්නුවරට අවුත් ජෙතවනාරාමයේ වැඩ උන් සවීඥයන් වහන්සේ අතින් පැවිදි ඉල්වාගෙණ මහණව උපසම්පදාව ලදින් යසොධරා සථවිරාවන්වහන්සේ ය යි ප්‍රසිඛව ඉන්නා සමයේ දවස විටක් යසොධරා සථවිරාවන් වහන්සේ තමන්වහන්සේගේ පුත් වූ රාහුල සඟමින් දකින්ට රාහුල සඟමින් වසන්නාවූ විහාරයට වඩනා සේක.

එක්දවසක් යසොධරා සථවිරාවන්වහන්සේට ඛඩරුජාවක් ඇතිව රාහුල සඟමින් දකින්ට නොඇසේක. උන්වහන්සේගේ අතවැසි භික්ෂුණී කෙනෙකුන් වහන්සේ එපවත් රාහුල සඟමින්ට කිසේක. රාහුල සඟමින් තමන් වහන්සේගේ මැනියන්වහන්සේ යසොධරා සථවිරාවන්වහන්සේ දකින්වය යි ගණයට ගියසේක.

ගණයට ගොස් යසොධරා සථවිරයන්ගෙන් "අඵාසු කිම්දැ"යි විචාරා පුතනුවන්වහන්ස, ඛඩරුජාවක් ඇත, එසේ හෙයින් මට බොහෝ ආයාසය"යි වදාළසේක. "ආදිත් ලමන්දුනි, මෙසේවූ අවසථාවෙක කරන්නේ කිම්දැ"යි විචාළසේක. පැනි අඹ හා සකීරා කැ කල පළමුත් මේ රුජාව සමනය වෙයි" කිහ:

රාහුල සඟමීන් "යහපතැ"යි කියා තමන්වහන්සේව පියවූ සවීඥයන් වහන්සේ කරා නොගෙසින් සුළුපිය වූ ආනන්ද සඟමින් කරාන් නොගොසින් උපාධ්‍යායවූ මුගලන් සඟමින් කරාත් නොගොසින් ගුරුවූ සැරියුත් සාමීන් ලඟට ගොසිත් සඟමීනි, යසොධරා සථවිරාවන්ට ඛඩරුජාවක් ඇත, පෙරත් සකීරා හා අඹ කැ කල ඛඩරුජා සන්හිදෙයි. එය ලබන්නේ කෙසේදැ"යි විචාළසේක. සැරියුත් සඟමීන් "යහපත, ලද්දමෝ නම් දෙන්නමෝ වේදැ"යි වදාරා රාහුල සඟමීනුත් පස්සේලා පසේනදි කෝසල රජ්ජුරුවන්ගේ රජගෙට ගොස් රාහුල සාමණේරයන් වහන්සේ රාජාඔහනයෙහි සිටුවා තමන්වහන්සේ රජ ගෙට ගොස් රජ්ජුරුවන් ලඟ සිහා සිටිසේක.

එවේලාවටම එක්තරා උයන්ගොවියෙක් විලිස්සිගිය අඹපැකක් ගෙණැවිත් රජ්ජුරුවන් අතට දින. රජ්ජුරුවෝ තමන්ගේ සඛසනයෙන් අඹලොලා ශකීරා හා අඹ පාත්‍රය පුරා දුන්හ. සැරියුත් සඟමීන් අඹ පාත්‍රය ගෙණ මෙය තොපගේ මැනියන්ට දෙව"යි කියා රාහුල සඟමින් අතට දුන්සේක.

රාහුල සඟමින්වහන්සේත් ඒ අඹ ගෙණ ගොස් යසොධරා සථවිරාවන් වහන්සේ අතට දුන්සේක. යසොධරා සථවිරාවන්වහන්සේත් අඹ වැළඳුසේක. අඹ වැළඳු ගමනේ ඛඩරුජාව ගුණ විය. කෝසල රජ්ජුරුවෝත් "සැරියුත් සඟමීන් අඹ මා ලඟදී නොවළඳ ගෙණ ගිය සේක. කාට දෙන්ට ගෙණගිය සේක් දෝ හෝ යි බලව"යි පස්සේ මිනිසුන් යවා රාහුල සඟමින්ට දුන් නියාව හා රාහුල සඟමින් තමන්වහන්සේගේ මැනියන්වහන්සේට දුන් පවත් අසා

කෝසල රජ්ජුරුවෝ සිතන්නාහු ඉඳින් සමිඳයන් වහන්සේ බුදුවූ හෙයින් අපගෙන් සිහා වළඳා ඉන්නා පමණක් මිසක් නැත්තම් චක්‍රවර්ති රාජ්‍යය කරණසේක් නම් අපි ඇමතිම උන්වහන්සේගේ පරිවාර වේද? චක්‍රවර්ති රාජ්‍යය කරණ දවසට පරිනායක රත්නව රාහුල සාමීන් වහන්සේ තමන්වහන්සේගේ මැනියන් වහන්සේට බඩරුජාව නිසා අඹ සිහා වැඩිසේක. අපි හැම උපාසකව ඉඳ යසොධරා සථවිරාවන් වහන්සේට ඇඟි නොදත්තම්හ. එසේ හෙයින් අප කළ සේ නොයෙදෙයි කියා යසොධරා සථවිරාවන් වහන්සේට අඹ හා සකීරා ඇම දවස්ම යවූහ.

සැරියුත් සාමීන් නිසා යසොධරා සථවිරාවන්ට අඹ රෝග නිසා බඩරුජා පහවූ බව දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ කියා කියා උන් තීනට සමිඳයන් වහන්සේ වැඩවදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උනුදැ"යි විවාරා වදරා එපවත් අසා "දැන් මතු නොවෙයි, පෙරත් ශාරිපුත්‍රසථවිරයෝ රාහුල මාතාවන්ට අඹ දුන්නේ වේදැ"යි වදරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සමිඳයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයෝ එක්තරා බමුණුගමෙක බමුණුව ඉපිද වැඩිවිය පැමිණ පඤ්චකාමයෙහි ආදීනව දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන් පිරිවරා බරණැස් රජ්ජුරුවන්ගේ මහුල් උයනෙහි වාසය කරන්නාහ.

එසමයෙහි එකියන තාපසවරුන්ගේ ගුණ තේජසින් ශක්‍රයන්ගේ පාඬු කම්බලශෛලාසනය හුණුවිය. ශක්‍රයෝ මා නොකැමැති පරිද්දෙන් උණුවන්ට කාරණා කිම්දැයි තමන්ගේ දිවසින් බලා එපවත් දැක ඒ තාපසවරුන් මෙකි යන උයනේ නොසිඳිනා ඕතයක් කෙරෙමි යි ඉඳිතා, තැනින් උගුළුවාපු කල්ල තැනඉඳ එකඟව භාවනාකිරීම තැතිව ඒ නියාවට අද මම ගොසින් රජ්ජුරුවන්ගේ අග්‍රමෙහෙසිකාවන්ට අභ්‍යන්තර නම් අඹ කැවාහුවූනම් චක්‍රවර්ති රාජ්‍යය කරන්ට පින් ඇත්තාවූ පුතනුකෙනෙකුන් උපදියි කියමි. එබිසවි යහපතැයි කියා රජ්ජුරුවන්ට කියති. රජ්ජුරුවෝ "යහපතැ"යි උයන අඹගස්වල අඹ බලවති, එවේලාවට මම උයනෙ අඹගස්වල අඹ අන්තර්ධාන කරවා පියම්, රජ්ජුරුවෝ එවිට "මෙකියන උයනේ අඹ කැවෝ කවුරුදැ"යි උයන්ගොව්වා විවාරති. එවිට උයන්ගොව්වා "තාපසවරු අඹ කැවෝය"යි කියා රජ්ජුරුවන්ට කියන්නාහ. රජ්ජුරුවෝ එවිට එසේ වීනම් තාපසවරු මෙතැනින් පනකරව යි පනකරන්නාහු වෙති. එවිට තාපසවරු එකතැන විසීම නොලබන්නා සිල් රකුණා කිරීමෙහි පමාවන්නාහ. තාපසරුන් සීල භෙදකරන්ට මේ කාරණාවන්නේය"යි සිතා එදවස් මධ්‍යම රාත්‍රි වේලාවේ රජ්ජුරුවන්ගේ බිසවුන්ගේ ශ්‍රියහන් ගබඩාවට ගොසින් කියන්නාහු "අභ්‍යන්තර නම් අඹගසෙක අඹ තොපගේ රජ්ජුරුවන්ට කියා ගෙන්වූ නම් චක්‍රවර්ති රාජ්‍යය කරන්ට පින්ඇති පුතනු කෙනෙක් උපදිති" කියා දෙව්ලොවට ගියාහ.

බිසවුන් එදවස් පසුව බොරු ලෙඩක් ගෙණ තමන්ගේ පරිවාර සත්‍රීන්ට රජ්ජුරුවෝ මා කොයිදැ?යි විවාළෝ නම් මා ලෙඩ නියාව කියව"යි කියා වැද හොත්තාහ. රජ්ජුරුවෝ සිංහාසනාරූඪව සොළොස් දහසක් බිසෝවරුන්

පිරිවරා උන්නාහු අග්‍රමහෙසිකාවන් වහන්සේ ලෙඩව වැදහොත් සේකැ යි කියන්නා ලෙඩ කිම්දැයි විචාරන්ට රජ්ජුරුවෝ ගෙට ගියාහ. ගෙට ගොසින් බිසවුන්ගේ යහනෙ එක් පාශීවයෙක ඉඳගෙණ බිසවුන්ගේ පිට පිරිමැද "බිසවුනි, ඇති ආපසු කිම්දැ?යි විචාළාහ.

බිසවු කියන්නාහු "දෙවයන් වහන්ස, මට වෙන අපාසු නැත. අභ්‍යන්තර නම් අඹ කන්ට දෙළෙක් උපත. මේ අඹ ලදින් නම් විනා මගේ ප්‍රාණය නැතැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ අමාත්‍යයන් අතින් විචාරා ලදිම් නම් ගෙණෙන්නෙම් වේදැ"යි කියා අමාත්‍යයන් ලඟට ගොසින් අමාත්‍යයන් කැඳවා කියන්නාහු "අභ්‍යන්තර අඹ නම් කිම්ද? තොපි ඇම දනුදැ"යි විචාළාහ.

එවිට අමාත්‍යයෝ කියන්නාහු "අභ්‍යන්තර අඹ නම් අඹ ගස් දෙකව මඛ්‍යයේ සිටිනා අඹගස් වන්නේය. නුඹවහන්සේගේ උයනට මිනිසුන් යවා ගස්දෙකට මඛ්‍යයෙහි සිටියාවූ අඹගස ඵල කඩා ගෙන්වාගත මැනවැයි කීහ.

රජ්ජුරුවෝ එවිට උයන බලන්ට මිනිසුන් යැවුවාහ. මිනිසුන් යන කලව ශක්‍රයන්ගේ ආනුභාවයෙන් එක ගසකත් අඹ නැත්තහ. එපවත් රජ්ජුරුවෝ අසා "ඇයි මේ කාලයව අඹ නැතිවෙන්ට කාරණා කිම්දැ"යි උයන්ගොව්වා විචාරා උයන්ගොව්වා විසින් "තාපසවරු කැවාය"යි කියන්නා රජ්ජුරුවෝ තාපසවරුන් එතනින් පහකරවූහ. රජ්ජුරුවෝ අභ්‍යන්තර නම් අඹ කොලැබ අමාත්‍යයන් අතින් "පෙරලා අභ්‍යන්තර අඹ කොයිදැ"යි විමසූහ.

එවිට බමුණෝ කියන්නාහු "හිමාලය වනයෙහි පර්වත වලලු සතකින් ඇතුළත සඵණ පර්වතයක් සමීපයෙහි ලෝදැල් සතකින් වසා තබනලද වෙසවුණු රජ්ජුරුවන්ගේ අභ්‍යන්තර නම් අඹ ගසෙක් ඇතැ යි අසා දනුම්හ. දුටුදැ නැතැ"යි කීහ. රජ්ජුරුවෝ එවිට මිනිසුන් එතනට යන්ට නොපිළිවනැ යි කියා තමන් වඳන්නාවූ මහන්වූ ශරීරක් ඇත්තාවූ ගිරාපෝතකයා රන්මැදිරියෙන් මැත්කොට ලඟ තබා ඉඳ කියන්නාහු "සඵඳ තොපට අප විසින් බොහෝ උපකාර කරණලද. ඊවත් උපකාරයට අප කි කවයුත්තක් සාදු දීලුවොත් යහපතැ"යි කීහ. එවිට ගිරවා "යහපත, දෙවන්වහන්ස, කීවක් කරම්.' කියන්නා රජ්ජුරුවෝ ගිරවාට "යහපතැ"යි කියා මී හා විළඳ කවා මී පැන් පොවා ශතපාක සහස්‍රපාක තෙලයෙන් දෙපියා මැද "සඵඳ" හිමාලය වනයෙහි සත්වත පර්වත වලල්ලෙන් ඇතුළෙහි සඵණී පර්වතයක් ලඟ අභ්‍යන්තර නම් අඹ ගසෙක් ඇත්ල, ඒ අඹගසින් අඹ ගෙණවුත් දී බිසවුන්ගේ දෙළ සන්සිඳව"යි කියා ගිරාපොතකයානන් දැනින් අල්වා ගෙණ සිවුමැදුරු කවුළුව සමීපයෙහි සිට අළහ.

එකියන ගිරවාත් රජ්ජුරුවන්ට ආදර දක්වා පියාඅඹාගෙණ රාජ්‍ය සීමා ගෙවාගෙණ වතාත්තරයව වැද හිමාලය වනයෙහි පළමුවන පර්වත වලල්ලට ගොසින් එහි වසන්නාවූ ගිරවුන් අතින් "අභ්‍යන්තර නම් අඹගස දනුදැ"යි "අපි නොදනුම්හ." දෙවන වලල්ලෙහි ගිරවුන් අතින් විචාරන්නේ "යහපතැ"යි කියන්නාවූ ඔවුනුන් විචාරා මෙම නියායෙන් දෙවන වලල්ලය, තුන්වන වලල්ලය, සතරවන වලල්ලය, පස්වන වලල්ලය, සවන වලල්ලය යි කියා සවන වලල්ලට ගොස් එහි උන් ගිරවුන් අතින් විචාළාහ. ගිරවි කියන්නෝ "සැබව, සඵණී පර්වත සමීපයෙහි අභ්‍යයන්තර නම් අඹගසෙක් ඇත"යි කීහ.

එවිට ගිරවා කියන්නේ "ඒ අඹගසෙන් මට ප්‍රයෝජනයෙක් ඇත. ඉන් මට අඹගෙඩි කීපයක් ගෙණවිත් දීලව"යි කීය. එවිට කියන්නාහු "අඹගස තම් වෙසවුණු රජ්ජුරුවන් වහන්සේ ප්‍රයෝජන විඳිනා අඹගසය. ලෝදැලින් වසා තිබෙයි, කුම්භාණ්ඩයන්ගෙන් රැකවල් ලද, ඒ අඹ කඩා ගන්නා තබා ඒ අඹගස ලඟටත් යන්ට නොපිළිවනැ"යි කීහ.

එවිට ගිරවා කියන්නේ "කෙසේවුවත් මම අඹ කඩාගණිමි. මට සල කුණු කියව"යි සලකුණු විචාරාගෙණ රෑ කුම්භාණ්ඩයන් නිදාපු වේලෙහි එකි යන අඹගස මූල සමීපයෙන් ලෝදැල යටින් ගස සමීපයට හොස් ගසට වන. ඒ වේලාවට ලෝදැල් ක්‍රිං යන ශබ්දය පවත්වා ලෝදැල් ඇඹුහ එවිට කුම්භාණ්ඩයෝ පිබිදී ගිරවා අල්වාගෙණ "මේ ගිරවා ගැලපියම්හ යි කියාද කඩකොට පලා කාපියම්හයි කියාද පුලුස්සා කාපියම්හ යි කියාද යනාදීන් ගිරවා භය ගන්වා බස් කීහ.

එකියන ගිරවාත් එවිට නිර්භීතව කියන්නේ "දෙමව්පියන් කී මේවරත් බත්ලන් සාමියා කී මේවරත් කොට ප්‍රාණයගියේ නම් දිව්‍යලොකය ලැබෙන්නේ වේද"යි එසේ හෙයින් "තගේ රජ්ජුරුවන් වහන්සේ කී මේවර නිසා බිසවුන් වහන්සේගේ දෙළ සන්සිඳවනු නිසා අඹ ගෙණයන්ට මේවර මා ආශේය. ඒ නිසා මාගේ ප්‍රාණය ගියෙහි වී නමුත් යහපතැ"යි කියා කීහ.

එබස් අසා කුම්භාණ්ඩයෝ සතුටුව "යහපත, තොප කී බස් අප සිත්ගත තොප නොමරා අරුම්හ"යි කීවාහ. එවිට ගිරවා කියන්නේ "මා ආ කාරියමුදුන් පත් නොවූ කල මා ගොසින් කම් කිම්ද"යි කියන්නාහු "තොපට මේ ගසින්අඹ ගෙඩියකුත් දෙන්ට බැරි නොවෙයි, රජ්ජුරුවන් වහන්සේගෙන් ඇතිව තිබෙන අඹය ඒ නිසා දෙන්ට බැරිය, දුන්නොත් අපට බොහෝ නිග්‍රහ පැමිණෙයි. තොපව උපායෙක් කියම්හ"යි "අඤ්ජන ගුහාවෙහි වසන ජෝතිය තාපසයන්ට දවස දවස අඹගෙඩි සතරක් දෙති. උන් අතින් අඹගෙඩියක් ඉල්වා ගණුව"යි ඒ තාපසයන් කරා යවූහ.

ඒ ගිරවාත් තාපසයන්ට එපවත් කියා තාපසයෝත් "යහපතැ"යි කියා දෙකක් කුමූ කා එකක් ගිරවා කවා එක අඹගෙඩියක් ඉල්වා සාල්ලෙක ලා ගිරවා කර බැඳ රජ්ජුරුවන් කරා යවූහ. ඒ ගිරවා අඹගෙඩිය රජ්ජුරුවන් අතව දින, රජ්ජුරුවෝ බිසවුන්ට දුන්හ. "ඒ අඹ කාත් දරුවෝ ඇති නුවූහ"යි වදුරා මේ අනන්තර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසව් නම් යසොධරාසථවිරියය, ගිරා පොතකයා නම් ආනන්දසථවිරයෝය, හිමාලය වනයෙහි තාපසයෝ නම් ශාරිපුත්‍රසථවිරය, බරණැස් නුවර උයනේ විසූ තාපසයෝ නම් බුදුවූ මම්මය යි දක්වා වදාළසේකි.

---

## 275 සෙය්‍යංස ජාතකය

**ත**වද සෘඩිවිෂයෙහි සූක්ෂ්මවූ ගුණ ඇති සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා අමාත්‍යයකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

**හේ කෙසේ ද? යත්,**

**කෝසල** රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙක් ඇත, ඒ අමාත්‍යයා කෙරෙහි සෙසු අමාත්‍යයෝ දෙම කියා රජ්ජුරුවන් බිඳවූහ. රජ්ජුරුවෝත් "ඇත්තෙ කැ"යි කියා අමාත්‍යයා තමන්ගේ රාජ්‍ය ආඥාවෙන් සිරගෙයි වැස්සූහ. ඒ අමාත්‍යයා සිරගෙයි ඉදම බුබාලම්බන ප්‍රීතියෙන් භාවනා කොට සෝවාන්වූහ, රජ්ජුරුවෝත් ඔහු නොවැරදි නියාවත් දුර්ජනයන්ගේ බස් නිසා ගැහැට පැමිණි නියාවත් දැන දම් කපා පළමුව් සිවියාවූ සථානාන්තරයෙහි පිහිටුවා බොහෝ තරම් පදම් දී රැක්කාහ.

එකියන අමාත්‍යයා සමීඳයන් වහන්සේ දකින්ට ගියේය. සමීඳයන් වහන්සේ එකියන අමාත්‍යයා දැක "උපාසකයෙනි, තොපට දුඃඛයක් පැමිණි ය යි කියන්නා ඇසුම්හ"යි වදාළ සේක. "සැබව සවාමීනි දුඃඛයක් පැමිණියේය. "පැමිණි දුඃඛයෙන් වැඩකට පැමිණියෙමි' කියන්නා සමීඳයන් වහන්සේ වදාරණසේක් "කුමන සැපයෙක් ලද්දේදැ"යි විචාරන්නා "බුද්ධාලම්බන ප්‍රීතියෙන් සෝවාන්වීමි" කියන්නා "පළමුත් උත්තමයෝ දුඃඛයට පැමිණ සැපයකට පැමිණියෝ වේදැ"යි වදාරන්නා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සමීඳයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

**යටගිය** දවස **බරණැස්** නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි දශධර්මය කොප්‍යය නොකොට රාජ්‍යය කරන්නාහ දවස් පතා පඤ්චශීලය රකින්නාහ. පොහොයෙන් පොහොය අවසිල් රකින්නාහ. මේ නියායෙන් ධර්මිෂ්ඨව රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ අභ්‍යන්තර අමාත්‍යයෙක් රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට වැ න. රජ්ජුරුවෝ එපවත් අසා තුමූම පරීක්ෂා කොට නියම දැන "තෝ මාගේ විජිතයෙන් එපිට නොරඳ පලා යව"යි අළහ.

මේ කථාව යටකියන ලද සීලව ජාතකයෙහි පෙණෙන්නේය. මෙය වනාහි එකියන ලද අමාත්‍යයා කොසොල් රජ්ජුරුවන් කරා ගොස් "දෙවයන් වහන්ස, යම්තම් සේනාවක් ලබන්නා බරණැස් නුවර රාජ්‍යය සාධාගත හැකැ"යි කීහ.

රජ්ජුරුවෝත් "මූ කියන්නේ කිම්දැ"යි කියා මිනිසුන් යවා එක් ගමක් කොල්ලකැවූහ. ඒ කොල්ලකැ ගම මිනිසුන් අල්වාගෙණ රජ්ජුරුවන්ට පාතා රජ්ජුරුවෝ "ඇයි? තොප ඇම මාගේ රාජ්‍යය කොල්ලකැයේ" විචාරන්නා 'සම්පත් නැත්තොම් කොල්ලකැම්හ"යි කීකල්හි "එසේ කල මා කරා අවුත් සම්පත් ඉල්වා නොගෙණ මෙලෙස කෙලේ ඇයිදැ?"යි කියා උන්ට බොහෝ සම්පත් දී යැවූහ.

එපවත් කෝසල රජ්ජුරුවෝ අසා "එසේවීනම් බරණැස් නුවර ගත හැකැ'යි කියා මනත්වූ සේනාව ඇරගෙණ බරණැස් නුවරට ආහ. බරණැස් නුවර යොධයෝ රජ්ජුරුවන් කරා ගොස් කියන්නාහු "කෝසල රජ්ජුරුවන් උන් හා කැටිව යුඬයට යන නියායෙන් අවසර දුනමැනවැ"යි කීහ.

ඒ අසා බරණැස් රජ්ජුරුවෝ "යුඬ කරන්ට කාරණා කිම්ද? යුඬයට කොයව"යි කියා අමාත්‍යයන් පිරිවරා මතුමාලේ ඉඳ "වාසල් දොර අරුව"යි

කියා දෙර ඇරවූහ. කෝසල රජ්ජුරුවෝ සේනාව ඇරගෙණ කිසි සැකයක් නැතිව තමන්ගේ රාජ්‍යයට වදිනාසේ වැද මතුමාලයට නැගී රජ්ජුරුවනුත් බිසවුනුත් අල්වා සිරගෙයි වැස්සූහ. බොධිසත්ත්වයෝ සිරගෙයි හිඳ මෛත්‍රී භාවනා කොට ධ්‍යාන උපදවා ගත්තාහ. එකියන රජ්ජුරුවන්ගේත් බිසවුන් ගේත් මෛත්‍රී භාවනාගේ ආනුභාවයෙන් රජ්ජුරුවන්ගේ ශරීරගේ දාහ වැද ගත. කෝසල රජ්ජුරුවෝ "මේ කිමෙක් දැ?"යි විචාරන්නා අමාත්‍යයෝ කියන්නාහු "මෛත්‍රී කරණ රජ්ජුරුවන් වහන්සේගේ රාජ්‍යය ඇරගත් හෙයින් උන්වහන්සේ කරණ මෛත්‍රී ආනුභාවයෙන් ශරීරගේ දාහ වැදෙනතැ"යි කියන්නා රජ්ජුරුවෝ සිරගෙයි උන් රජහුගේ දම් කැප්පවා "නුඹවහන්සේගේ රාජ්‍යය නුඹවහන්සේම පිළිපැද්ද මැනවැ"යි කියා පාවාදී එකියන කේලාම් කී අමාත්‍යයා මරවා තමන්ගේ නුවරටම නැඟී හියහ.

බොධිසත්ත්වයෝත් පණවතලද සිංහාසනාරූඪව අමාත්‍ය මණ්ඩලයා පිරිවරා උන්නාහු "අමාත්‍යයෙනි, මා විසින් එක රජ්ජුරුවන්ට කළාවූ මෛත්‍රී ආනුභාවයෙන් මමත් ගැලවී තොප ඇමතත් ගලවාගතිමි. එසේනෙයින් මට රාජ්‍යයෙන් කම් නැතැ"යි කියා මහණවූහයි වදාරා බුදුව වැඩ ඉද වදාරණසේක් එකියන බරණැස් රජ්ජුරුවෝ මෛත්‍රී ආනුභාවයෙන් ගැලවී ගියෝවේදැයි වදාරා සෙය්‍යංස ජාතකය නිමවා වදාළසේකි.

එසමයෙහි කෝසල රජ්ජුරුවෝ නම් දැන් ආනන්ද සථවිරය, නොකට යුතු කියා බිදුවූ අමාත්‍යයා නම් දෙවදත්ත සථවිරය, බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 276 වඩ්ඪකිසූකර ජාතකය

මේ වදාළ බුබවිෂය සේ අනුන් විසින් නොසිතිය හැක්කාවූ ගුණ ඇති සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ධනුග්ගහතිස්ස තෙරුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

**ඒ කෙසේ ද? යත්,**

බිම්බිසාර රජ්ජුරුවන්ට කෝසල රජ්ජුරුවන් විසින් තමන්ගේ නැඟ නියනුත් පාවා දී නැඟනියන් තානුමුරයටය කියා ලක්ෂයක් වටිනා කසීගමක් දුන්හ.

ඉක්බිති අජාසත් රජ්ජුරුවන් විසින් පියාතන් මරාපු හෙයින් කෝසල රජ්ජුරුවෝ තමන්ගේ නැඟනියන්ට දුන් කසීගම උදුරා ගත්තාහ. ඒ නිසා දසවිටම උනුන් හා කැටිව සවන් ඇතිව නිබෙන්නේය.

එක් දවසක් කෝසල රජ්ජුරුවෝ සිතන්නාහු, "සඞ්ඝයාවහන්සේ නම් බොහෝ නුවණැති සේක. එසේහෙයින් විහාරයක් පාසා ඇවිද කියන බස් අසව"යි කියා චරපුරුෂයන් සැලැස්වූහ. එකියන චරපුරුෂයෝ ගණයක් පාසා පරීක්ෂාකොට ඇවිද්දූහ.

එවිට ඒ විහාරයේ වැඩ හිඳිනා උපතිස්ස තෙරුන්වහන්සේ ධනුග්ගහ තිස්ස තෙරුන්වහන්සේ ය යි දෙදෙනාවහන්සේ වාසය කරණසේක් මධ්‍යම

රාත්‍රියෙහි පිබිද ධනුග්ගහනිස්ස තෙරුන්වහන්සේ උපතිස්ස තෙරුන්වහන්සේව කියනසේක්, කෝසල රජ්ජුරුවෝ බත් බොහෝ කන්ට සුරු පමණක් විතා තමාගේ බෑවූ අජාසත් රජ්ජුරුවන් අල්වාගත නොඑන්නාහ''යි කියන් නාහු උන්වහන්සේ කියනසේක්, ''ඇවැත්නි, සේවාකම් නම් පදුමබ්‍රැහය, චක්‍රබ්‍රැහය, සටකබ්‍රැහය යි යන තුන් උපායක් ඇත, සටකබ්‍රැහ නම් දැලයෙන් පිරිස් සලසා සේවාකම් කොට පසුබැස මරුබට සේ පිරිස් මඩ්‍යයේ සටන් වන් කල අල්වා ගැන්ම එක් උපායෙක. ඒ නියායෙන් අසවල් පවිත සම්පයෙහිදී යුඩකරන්නා අල්වා ගතහැක.'' ඒ ඇසූ වරපුරුෂයෝ මේ උපාය රජ්ජුරුවන්ට කිවුය. ඒ ඇසූ රජ්ජුරුවෝ සේතා වාහන සන්නඩ නික්ම කී නියාවට පිරිස් සලසා යුඩකොට අජාසත් රජ්ජුරුවන් අල්වාගෙණ තමන්ගේ නුවරටම ගෙණවුත් තමන්ගේ දුවනියන්වූ ජීරකුමාරිකාවන් පාවාදී පළමු දුන් ගම්වරත් දී උන්ගේ නුවරටම යවූහ. මේ කථාව ධම්සභාවේ රැස්වූ මාළුවරුන්වහන්සේ කියනසේක් ''මේ යුඩප්‍රයෝගය කරවූසේක් ධනුග්ගහනිස්ස තෙරුන්වහන් සේම ය''යි කියා වැඩඋන් තෙනව සම්මුයන්වහන්සේ වැඩ වදාරා මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා වදාරා එපවත් අසා ''දැන් මතු නොවෙයි, පෙරත් ධනුග්ගහනිස්සයෝ යුඩප්‍රයෝග යෙහි දක්ෂයෝ වේදැ''යි වදාරා ''ඒ කෙසේ දැ''යි ආරාධිතවූ සම්මුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙකෙකුන් රාජ්‍යය කරණ සමයෙහි වඩුගමෙක උපන්නාවූ වඩුවෙක් දඹු සොයා වලට ගියේය. එක් උෂරු පැටවකු දැක අල්වාගෙණ වඩන්ටය යි කියා ගෙට ගෙණ ගොස් වැඩිය. එකියන උෂරුන් වැඩි දළවලල්ල වැටී මහත්වූ කය ඇතිවිය. එකියන උෂරා වඩුවන් වැඩූ හෙයින් වඪ්ඪසූකර ය යි කියා නම් තැබීය. එකියන උෂරාත් වඩුවාට වැ නියන් දීලයි, කපන කළ දඹුපෙරලා පැලයි; කලුහුය කටින් ඩැගෙණ කලුහුය ගසා මේ නියාසෙන් කීකරුව වසන්නේය.

වඩුවා දවසක් සිතන්නේ, මාගේ උෂරා වැඩිවිය පැමිණියේය. එසේ හෙයින් යම් කෙනෙක් මරාපු නම නපුරුයි සිතා එකියන උෂරා වඩාගෙණ වලට ගොස් උෂරා වලට අළහ. ඒ උෂරාත් වලට වැද තමාගේ රැස උෂරන් හා එක්වූයේය. පැන් හා කැවිලිපෙවිලි පාසුතෙනක බොහෝ උෂරන් දැක එතනට ගියේය. ඒ වල උෂරෝත් මේ උරා කරා අවුත් සිටියාහ. එවිට වල වසන උෂරන්ට කියන්නේ ''කුමක්ද? පලාපල සම්බවූ පසු උෂරනුත් බොහෝවූ තෙකට පැමිණිය යි කියන්නා එවිට උෂරෝ කියන්නාහු ''ඉන් අඩුවෙක් නැත. එසේ වුවත් අපට මහත්වූ භයෙක් ඇතැ''යි කිහ. වඪ්ඪසූකර කියන්නේ තොප දුටු ගමනේ මේනියා කැවිලි ඇති තෙන දුම්ලව ඉඳිනේ භයෙක් ඇති නිසාය යි දනිමි යි කියා ''තොප ඇමට ඇති භය කිම්දැ?''යි විචාළාහ.

එවිට එකියන උෂරෝ කියන්නාහු ''එක ව්‍යාඝ්‍රයෙක් අප කරා ඇවිත් දුටු දුටුවන් කයි'' කිහ. එසේහෙයින් අපි උෂ කෙරේ භයින් වැරදගියමිහ''යි උෂරෝ කිවුය. වඪ්ඪසූකර එවිට කියන්නේ ''එකියන ව්‍යාඝ්‍රයා දවස්පතා ඒ ද? අතරතුරෙක එද්දැ''යි විචාරන්නා උෂරෝ කියන්නාහු ''දවස්පතා,

නෝ එයි, අතතුරෙක එන්නේ ය''යි කියන්නා ''එසේ වී නම් මා කිවක් කරවූ නම් ව්‍යාඝ්‍රයා මම අල්වා දෙමි'' කිහ. ඌරෝ ''යහපතැ''යි ගිවිස්සාහ.

එවිට එකියත වඩාසූකර ඌරුත් යුඩයට සලස්වන්නේ කුඩා ඌරන් වටකොට සලස්වා ඊට ඇතුළු පිට ඊරියන් සලස්වා ඊට ඇතුළුපිට තාඹු ඌරන් සලස්වා ඊට ඇතුළුපිට දළවලල්ල වැටුනු ඌරන් සලස්වා ඊට ඇතුළුපිට යුඩ යොගය ඌරන් සලස්වා සතරදිසාවේ ඌරන් දසය විස්සය නියාගෙන් ඇණි සලස්වා මධ්‍යයේ ගොඩක්කොට තිබා ඔරුවක් සේ වළක් ඉදිකොට ඒ වල නම්නව තිබෙන නියාගෙන් සලස්වා තමන් ගැලවීගත නියාගෙන් උමඟක් සේ වල කැන මේ නියාගෙන් සලස්වාගෙණ වට රැකවල් ලා සිටි ඌරන්ට ''තොපි ඇම නොබව''යි කියා විධානකොට ඇවිදිනාකලම ඉරු උදුව පාන්වන්තට වත. ඒ වේලාවට ව්‍යාඝ්‍රයා පළිත මුදුනෙන් පෙණිත. එවිට ඌරෝ ''සවාමීනි, පසමිතුරා ආ ය''යි කිහ.

එවිට ඌරු කියන්නේ ''ව්‍යාඝ්‍රයාද කළ යම් ක්‍රියාවක් නොපි ඇමත් කරව''යි කිහ, එවිට ව්‍යාඝ්‍රයා කිළිපොලන්නා ඌරෝ කිළිපෙලූහ. ව්‍යාඝ්‍රයා ගජිනා කරන්නා, ඌරොත් ගජිනා කළහ. ව්‍යාඝ්‍රයා මළමුත්‍ර කරන්නා, ඌරෝ මළමුත්‍ර කළහ. එවිට ව්‍යාඝ්‍රයා සිතන්නේ මෙතෙක් දවස් සේ නොවෙයි, අද යම් අමුත්තෙක් ඇතැයි සිතා තමා මස් මරාලන තාපසයන් කරා ව්‍යාඝ්‍රයා ගියේය. එවිට තාපසයෝ කියන්නෝ ''ඇයි? මෙතෙක්දා ඌරුමස් ගෙණෙත තැනැත්තවු අද ඌරුමස් නොගෙණියේ ඇයිද? තාගේ ඇඟ ශක්ති නැද්ද? ඌරෝ නිමාගියෝ දැ''යි විවාළෝය. එවිට ව්‍යාඝ්‍රයා කියන්නේ ''තාපසයන් වහන්ස, මා ඇඟ ශක්ති ඇත, ඌරෝත් ඇත, මෙතෙක් වූසේ නොවෙයි, අද අහංකාරව සිටියෝය. එහෙයින් නොගියෙමි කියන්නා'' තාපසයෝ කියන්නාහු ''ඌරන් කෙසේ ශක්ති ඇතත් නොප ඇමටම භය ඇත්තෝය. එසේ හෙයි නොබා වහා ඌරන් ගෙණව''යි කිහ.

එබසට ''යහපතැ''යි කියා ව්‍යාඝ්‍රයා අවුත් තමා පළමුත් ඌරන්ට පනින්නාවූ පළිත මුදුනට පැන නැගී සිටියාවුන් ඌරන් දැක තෙමේත් වළ මැඩ්‍යයෙහි සිටියේය. එවිට ව්‍යාඝ්‍රයා ඌරා සිටියාවූ දැක වේගයෙන් පිනුකලට ඌරු තමා ගැලවීගන්ට සාරාතුබූ උමඟින් පලාගියේය. ව්‍යාඝ්‍ර පිනූ වේගය රදවාගතනොහී එවලව පැන ඔරුවෙහා ලූවාසේ සිටියේය. එවිට වඩාසූකර තමා සිටි තෙනින් ගොඩනැඟී ව්‍යාඝ්‍රයා දුටුයේය. මහත් වේගයෙන් දිවගෙණ ගොස් ව්‍යාඝ්‍රයා මරා උගේ පඤ්චම්බුර මාංශය අනුභවකොට ගොඩනැඟී ඌරන්ට කියන්නාහු ''තොපගේ සතුරා මරාපිම්'' කියන්නා, පළමුවෙන් දිවගෙණ ආ ඌරෝ උගේ මාංශය අනුභව කළහ. පස්සෙ ආ ඌරෝ මස් කෑ ඌරන්ගේ හොට ඉඹ සිටියාහ. වඩාසූකර කියන්නේ ''තොපගේ සතුරා මළේය. ඉදිරියේ කිසි භයෙක් නොවී වාසය කරව්'' කිහ. එසේ කිවත් ඌරෝ දුර්මුඛව සිටියාහ. එවිට ''තොපි දුර්මුඛව ඇයිදැ?''යි කියන්නා ''සවාමීනි, ව්‍යාඝ්‍රයා මැරීමෙන් කම් කිම්ද? තව මුන්සේ ව්‍යාඝ්‍රයන් දසදෙනෙකු උගන්වා එවන්ට නිසි තාපසකෙනෙක් ඇත, ඌ මැරුවොත් විනා අපට භය සන් නොසිදෙයි'' කියන්නා ''තාපසයෝ කොයිදැ?''යි විවාරන්නා ''අසවල්තෙන වාසය කෙරෙති'' කියන්නා ''යහපතැ''යි කියා ඌරන් ඇරගෙණ තාපසයන් උන්තෙනව දිවූහ.

එවිට තාපසයෝ ව්‍යාඝ්‍රයා තව දක්වා නොඑන්නේ ඇයිදැ යි සිතා බලන් තව යයි එතකලට උඟරෝ තාපසයන් දැක ලුහුබදවා ගත්හ. එවිට තාපසයෝ තමාගේ අඟපරිෂ්කාර දමා වහා දිවගෙණ ගොස් දිඹුල් ගසකට පැනකැං ගේය. එවිට උඟරෝ අප නටුවෝද තාපසයා ගැලවී ගියේය යි කියන්නා "ඊට මම උපායක් දනිමි" කියා ඊරියන්ට කියා පැන් අද්දවා ගසමුල වත්කරවා පැටිති උඟරන් සිහින් මුල් කඩන්ට හා මහ උඟරන් මහමුල් කඩන්ට සලස්වා මේ නියායෙන් දිඹුල් ගසවට මුල් කප්පවා මැද්දේ තුබූ මහමුල තුමූ පොරවක් බාලා කපන්නාක්මෙන් කපා හළහ. එවිට දිඹුල්ගස වැටිත, උඟරෝ තාපසයන් යා නොදී ඇට පමණක් තිබා මස් ලියා කෑවාහ. එකියත දිඹුල් ගස පිට වඩා සූකරයනුත් යහපත් ඊරියකුත් ඉඳුවා තාපසයන්ගේ සකින් අභිෂේක ජලය වත්කොට තමන් ඇමවම රජකොට ගත්තාහ. එතැන්පටන් රජදරුවන්ට දිඹුල් ගස භද්‍රපීඨයට ගත්තාහ. එතත වනයේ වෘක්ෂයක වාසය කරන්නාවූ වෘක්ෂ දේවතාවා මේ කාරණය දුටුහ යි වදුරා වඩ්ඪසූකර ජාතකය නිමවා වදාළසේක.

"එසමයෙහි වඩ්ඪසූකරයා නම් ඔනුග්ගහ සථවිරය, එසමයෙහි වෘක්ෂ දේවතාව උපන්නෙම් බුදුවූ මම්ම ය"යි තමන්වහන්සේ දක්වා වදාළ සේක.

---

## 277 සිරි ජාතකය

**ති**වද යුගඞ්කර සාගරය සේ අනන්ත වූ ගුණ මුහුදව ගලා සන්නාවූ සියුම් නුවණ ඇති සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ශ්‍රී දන්නාවූ බ්‍රාහ්මණයකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්තමාන කථාව දුකනිපාතයෙහි ඛදිරඞ්ගාර ජාතකයෙහි විස්තර වසයෙන් පෙණෙන්නේය.

අනේපිඬු මහසිටාණන්ගේ සතරවන දෙරටුවේ වාසය කරණ මිථ්‍යා දෘෂ්ටි ගත් දෙවතා දුවෙක් ඇවිත් අනේපිඬු මහසිටාණන්ව කියන්නේ "තොපි පොහොසත්ද, සිවිපණස් කෙළක් ධන වියදම්කොට බොහෝ දන් පින් කළහ. දැන් සම්පත් වියදම්ව ගියහ. එහෙයින් දැන් පින් කරන්ට දුක්පත්ව සිඟාහ. එසේ හෙයින් දන් පින් නොකරව"යි දේවතා දූ කියන්නී, අනේපිඬු මහ සිටාතෝ, 'නී මාගේ දෙරටුවේ වාසය කරන්ට බැරිය"යි තෙරපුවාහ. එවිට දේවතා දූ නුවර අරක්ගත් දේවතාවාට සහ සතරවරම් දෙවියන්ට හා ශක්‍ර යන්ට කිව. එකියත දෙවියෝ "අපට බැරිය"යි කියන්නා නොමෝ අනේපිඬු මහසිටාතන්ව සිවුපණස් කෙළක් සම්පත් දී බුදුන් මැදගේ අනේපිඬු මහ සිටානන් සමා කරවාගෙණ සෝවාන් ඵලයට පැමිණියාහ.

ඉක්බිති අනේපිඬු මහ සිටානන් පොහොසත්ව මහ සම්පත් ඇතිව ඉන්නා අවසථාවට ශ්‍රී දන්නා බමුණෙක් "අනේපිඬු මහ සිටානන් ශ්‍රී ඇරගන්ට උවමැනව"යි සිතා ගෙට ගියේය. එවිට අනේපිඬු මහ සිටානෝ ඒ බමුණා දැක දන් දී ඉඳ "ඇයි? බමුණ ආයේ ය"යි විචාරන්නා බමුණා කථා කරමින් සිතන්නේ මේ සිටානන්ගේ ශ්‍රී කොයි දැ යි පරීක්ෂාකරන්නේ සිටානන්ගේ ගෙයි ඇලී කුකුළකු දැක සිතන්නේ සිටානන්ගේ ශ්‍රී මේ ඇලි කුකුළාගේ

කර මල්යෙ යි සිතා "සිවාතෙනී, මා ලඟ අකුරු කරණ අතවැස්සෝ පන්සිය යෙක් ඇත. ඒ අතවැස්සන් ශාස්ත්‍ර පිරුවන්ට වේලා වරද්දා අඩන යම් කුකු ලෙක් ඇත. එසේ හෙයින් ශාස්ත්‍ර පිරිහෙයි, වේලා නොවරද්දා අඩ නගන නියෑයෙන් තෙල ඇලි කුකුළා මට දෙව"යි කියා ඉල්වූහ. "යහපතැ"යි කියා ඇලි කුකුළා දුන්නාහ.

ඒ වේලෙහි ශ්‍රී ගොසින් සිටානන්ගේ සිරෝමාණික්‍යයෙහි පිහිටියේය. එවිට බමුණා සිරෝමාණික්‍යය ඉල්වීය සිටානෝ සිරෝමාණික්‍යය දුන්නාහ. එවිට ශ්‍රී ගොසින් අනන්තරයෂ්ටියෙහි පිහිටියේය. එයින් අන්තරයෂ්ටිය ඇරගත. එවිට ශ්‍රී ගොසින් සිවානන්ගේ අග්‍රමහෙසිකා සිටුදියනියන්ගේ ශරීරයෙහි පිහිටියාහ.

එවිට බමුණා කියන්නේ "සිවානන්වහන්ස, නුඹවහන්සේගේ ශ්‍රිය ඇර ගන්ට ය යි කියා ඇවිත් කුකුළා ඉල්වීම්, ඇලි කුකුළා ගන්නා සිරෝමාණික්‍ය යෙහි පිහිටියාහ. එසේ හෙයින් සිරෝමාණික්‍යයත් ඇරගතිමි. සිරෝමාණික්‍ය ගොස් අන්තරයෂ්ටියෙහි පිහිටියාය. එවිට අන්තරයෂ්ටියත් ඇරගතිමි. අන්තරයෂ්ටියෙන් ගොස් තොපගේ අග්‍රමහෙසිකා සිටුදුවගේ ශරීරයෙහි පිහිටියාය" එවිට බමුණා සිවානන්ට කියන්නේ "සිවානෙනී, තොපගේ ශ්‍රී ඇරගන්ටය යි කියා ආමි. තොපගේ ශ්‍රී මා තිබා කවුරුන් විසිනුත් ඇරගත නො හැක්ක, එසේ හෙයින් එකියන ශ්‍රීත් සියළු සම්පතුත් නුඹවහන්සේම වින්ද මැනැවැ යි කියා ගියේය. එවිට සිවානෝ මේ බමුණා කී නියෑව සම්‍යුද්ධයන් වහන්සේට කියන්ට උවමැනවැ යි සිතා සම්‍යුද්ධයන් වහන්සේට ගොසින් මේ නියෑව සිවානෝ දුන්වූහ.

සම්‍යුද්ධයන්වහන්සේ වදාරණසේක් "තමාගේ පිණින් සම්භව වූ සම්පත් කවුරුන් විසිනුත් හැරගත නොහැක්ක. පෙරත් උත්තමයන්ගේ පිණින් සම්භවූ සම්පත් උත්තමයන් නිසා තාවුරුවූයේ වේදැ යි වදාරා "ඒ කෙසේ දැ"යි ආරාධිත වූ සම්‍යුද්ධයන් වහන්සේ ඉකුත්විත් දක්වා වදාළ සේක.

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙතෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයෝ තාපසව ඉපිද බරණැස් නුවර වාසය කරන්නාහු එනුවර වාසය කරන්නාවූ ඝණ්‍යාවාසීයෙක් බොධිසත්ත්ව යන්ට සතරපසයෙන් සංග්‍රහ කරන්නේය.

එසමයට එනුවර දරකැටියෙක් වළව ගොස් දරපළාගෙණ එන්නේ නුවරට වදින්නට රැවගිය නෙසින් එක්දෙවාලයක සැතපුනේය. ඒ දේවාලය සමීපයේ ගසෙක කුකුළෝ දෙන්නෙක් උඩතැඟී වැදහොත්තාහ, අළුයම්වේලේ අගඅත්තේ වැදහොත් කුකුළු අඩනගා වර්වස් කරන්නේ. පාතඅත්තේ වැදහොත් කුකුළාගේ ඉස වර්වස් කෙළේයි. එවිට පාත අත්තේ වැදහොත් කුකුළු කියන්නේ, කවුරුද මාගේ හිස වර්වස් කළෝය යි කියන්නා අග අත්තේ වැදනොත් කුකුළු කියන්නේ "මම නොදුන වර්වස් කෙළෙමි යි කියා දෙවෙනිව එකියන කුකුළුගේ ඉස වර්වස් කළේය. එවිට පාත වැදහොත් කුකුළා කියන්නේ "පළමු නොදුන වර්වස් කෙළෙහිය. දෙවනුව වර්වස්කෙළේ ඇයි දැ"යි කියා උනුන් හා කලහ කළහ. "ඇයි මාගේ තත්ත්වය නොදනුදැ? යමකෙනෙක් මා කැවූතම් ම රන් දහසක් ලබති කියා. උඩ අත්තේ වැද

හොත් කුකුළු කියන්නේ "තාගේ මාංශ විපාක මෙතෙක් වේද? යම් කෙතෙක් මාගේ මාංශ කැවූ නම් රජවෙති, ලඹු මාංශය කැවූනම් සෙනෙවිරත් වෙති, ඇවමුසු මාංශය තාපස කෙනෙක් කැවූ නම් කුලුපග වෙති. යම් ස්ත්‍රියෙක් කැවූ නම් අග්‍රමහේසිකා වෙති" කීය.

එබස් දරකැටියා අසා ඒ කුකුළා ගසට නැගී අල්වාගෙණ තමාගේ ගෙට ගෙණගොස් කුකුළා මරා මස්කොට අඹුවට දී තෙල කුකුළා මාලු පිස බතුත් පිසවා "මේ කුකුළු නම් ආලිස්සම් දෙයෙක් නොවෙයි, මේ කුකුළු මස් කෑ කෙනෙක් රාජ්‍යයට පැමිණෙති. එසේවූ මාංසය ඉස්සෝධා තහා කන්ට උවමැතවැ"යි අඹුවත් කැන්දාගෙණ බත් හා කුකුළු මසුත් ඇරගෙණ ගඟට ගොස් බත් මාලු වැල්ලේ තබා ගඟට බටහ. ඒ වේලාවට උඩුගඟින් වතුර ඇවිත් බත් සැළ හා මාලු ගඟ වතුරේ ගෙණ යන්නේ ගඟ පාතා ඇත්හලට නායකවූ අමාත්‍යයා හා ඇත්හල ඇතුත් නාවන තැනට පැමිණියේය. එය දැක ඇත්හලයෙක් අමාත්‍යයාට ගෙණගොස් දින. අමාත්‍යයාත් ඒ කුකුළු මාලු හා බත් දැක "තෙල අලෙවි නොකොට තබන්ට කියව"යි කියා ගෙට යවූහ. ඒ දරකැටියා වැලි මිටක් හා මාලුවට පැන් කටක් බී ගොඩ නැංගේය. ඒ අමාත්‍යයාගේ කුලුපග තාපසකෙනෙක් ඇත්තාහ. ඒ තාපසයන්ට දිවස් ඇත්තේය. ඒ කුකුළුමස් දිවසින් දැක මා එතනට ගොස් මෑගේ මේ අමාත්‍යය කුකුළුමස් කෑවා රාජ්‍යයට පමුණුවා මා ඔවුන්ට කුලුපග තාපස උවමැතැවයි අමාත්‍යයා එන්නට පළමු තාපසයා ගොස් ඇත්හලට නායක අමාත්‍යයාගේ ගෙයි ගොසින් උන්නාහ.

ඒ වේලාවට අමාත්‍යයා ගෙට අවුත් තාපසයන්ට බත් පිළිගන්වා කුකුළු මාලු පිළිගන්වන්නට වන. එවි තාපසයෝ කියන්නාහු "මා විධාන කළ කල මාලු පිළිගන්වන්නේය"යි කියා උත්තම මාංසය ඇත්හල නායකයන්ට කන්ට සලස්වා මධ්‍යම මාංසය උන්ගේ ඇඹෙනියන්ට අනුභව කරණ නියායෙන් සලස්වා තුමූ ඇට මාංසය අනුභවකොට "උපාසකය අදට තුන්වෙනිදා නොපට රාජ්‍යය පැමිණෙයි සුවපත්ව"යි කියා ගියහ.

ඉක්බිති කෝසල රජ්ජුරුවෝ බරණැස්නුවර ගන්නා පිණිසයයි සටනට අවුත් නුවර වටකොට ගත්හ. එවිට බරණැස් රජ්ජුරුවෝ තුමූ සේනාවට විධානකොට සේවකම් කරන්ට උවමැනවැයි කියා ඇත්හල නායකයන්ට සේසත් තන්වා ඇතුපිට ඉඳුවා තුමූ සේනාව මධ්‍යයෙහි සිටියාහ. ඒ වේලාවට පරසතුරන්ගෙන් එකෙකු විදි ඊදණ්ඩකින් රජ්ජුරුවෝ විත් කා ජීවිත විනාසයට පැමිණියාහ. එවිට සේනාව රජ්ජුරුවන් නැසුනු නියාව දැන පසු බසින්ට වන්හ.

එවිට ඇත්හල නායකයා "මම වසතු දෙමි, තොප සටන් කරව"යි කීහ. එවිට සේනාව සවන් කොට පරසතුරන් සිඳුවා තමන්ගේ මළාවූ රජ්ජුරුවන් ආදාහනය කරවා "රාජ්‍යයට කවුරුන් තබමෝදැ"යි කථාකොට රජ්ජුරුවන් වහන්සේ ජීවත්ව ඉඳම ඇත්හල නායකයාට රාජ්‍යය පමුණුවන ලදහ. උන් වහන්සේ මළ පසුත් සේනාව හා සටන් කොට සතුරන් පරාජයට පමුණුවා අපට වැඩ කරණලද. එසේ හෙයින් මෝහටම රාජ්‍යය පමුණුවමින"යි රාජ්‍යයට තබා උන්ගේ බිරින්ද අග්‍රමහෙසිකා කොට සලස්වා තාපසයෝ රාජකුලුපගව තාපසකමට සැරසුනාහයි වදාරා බුදුව වැඩ ඉඳ වදාරණසේක් "ගෘහපති පුත්‍රය,

මේ ලෝකයෙහි සත්ත්වයන්ට කුසලය හා සදෘශවූ **ආකාරයෙක්** නම් නැත, **පිණැතිවුන්ට** අනාකරයේ රත්නයන් උපදිති. එසේ හෙයින් මේ කුසලය නම් **දෙවමනුස්සානං,** දිව්‍යමනුෂ්‍යයන්ට; **සබ්බකාමදදෙ,** ඉෂ්ටාර්ථය ඉෂ්ටකරන්නාවූ; **නිධි,** නිධානයක් හා සමාන වන්නේය; **යං යං එව,** යමක් යමක්ම; **අභිපත්ථෙති,** සිතින් ප්‍රාර්ථනා කළාහු වීතම්; **සබ්බං,** ඒ සියල්ල; **එතෙන,** මේ කුසලය කරණකොට ගෙණ; **ලබ්භති,** ලැබෙන්නේය; **සුවණ්ණතා,** මනාවූ ශරීර ඇති බවද, **සුස්සරතා,** මනාවූ මධුරස්වර ඇති බවද; **සුසණ්ඨානතා,** මනාවූ **වණ්ණ සංස්ථාන** ඇති බවද; **සුරූපිතා,** මනාවූ රූපසම්පත්ති ඇති බවද; **ආධිපච්චපරිවාරෝ,** සියල්ලෙන් **මැඩපවත්නා** ආකාරයෙන් පවත්නාවූ අධිපතිභාවය හා පිරිවර; **ලබ්භති,** ලැබෙන්නේය; **මානුසිකාව සම්පත්ති,** මනුෂ්‍යලෝකයේ ඉපද අනුභව කටයුතුවූ සම්පත්තියක් ඇද්ද; **දෙවලොකෙව යාරහි,** දිව්‍යලෝකයෙහි ඉපිද සම්පත් අනුභව **කරන්ට** හේතු යම් ඇල්මෙක් ඇද්ද; **යා චනිබ්බානූ සම්පත්ති,** කෙළවර **අරහත්** ඵලාවසාන යෙහි වින්දයුතුවූ යම් නිර්‍වාන සම්පතෙක් ඇද්ද; **සබ්බං** ඒ සියල්ල; **එතෙන,** මේ කුසල බලය හේතුකොට ගෙණ; **ලබ්භති,** ලැබෙන්නේය.

**මිත්තසම්පදමාගම්ම,** කල්‍යාණමිත්‍රයන්ගේ සම්පත්තියට පැමිණ හෙවත් සත්පුරුෂ සමාගමයට පැමිණ; වෙ ඒකාන්තයෙන්; **යොනිසො පයුඤ්ජිතො,** නුවණින් යෙදී වාසය කරන්නාවූ පුද්ගලයාහට: **විජ්ජා,** පූර්‍ව නිවාසානුස්මෘති; දිව්‍යචක්ෂූරභිඤ්ඤ, ආශ්‍රවක්ෂයකරඤ්ඤය සඞ්ඛ්‍යාතවූ ත්‍රිවිද්‍යාවන් හා **විමුක්ති** අර්හත්ඵල විමුක්තිහුගේ බසින් හා; **වසිභාවො,** ප්‍රාප්තබවය යන; **සබ්බං,** සියල්ල; **එතෙන,** මේ කුසලය හෙතුකොටගෙණ; **ලබ්භති,** ලැබෙන්නේය; **පටිසම්භිදා,** අර්‍ථපටිසම්භිදාය ධර්‍මපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදාය **පටිභාණ** පටිසම්භිදාය කියනලද චතුපටිසම්භිදාද; **විමොක්ඛාච,** සුඤ්ඤත විමොක්ෂ අනිමිත්ත විමොක්ෂය අප්‍රණිහිත විමොක්ෂයයි කියනලද ත්‍රිවිධ විමොක්ෂයන්ද; **යාච සාවක පාරමී,** යම් සාවක පාරමිතා ඥානයෙක් ඇද්ද; **පචෙචකබොධි** ඥානයෙක් ඇද්ද; **බුද්ධභූමි,** සම්‍යක් සම්බෝධිඥානයෙක් ඇද්ද; **සබ්බං,** ඒ සියල්ල මේ කුසලය **කරණකොට** ගෙණ; **ලබ්භති,** ලැබෙන්නේය.

**යදිදං පුඤ්ඤසම්පදා,** යම් මේ කුසල සම්‍යඤ්ඤයෙක් ඇද්ද; **එසා,** මේ කුසල සම්පත්තිය; **එවං,** මේසේ; යථොක්තවූ **කාරණයෙන්; මහිද්ධිමා,** මහත් සෘද්ධි ඇත්තේය; **තස්මා,** එසේ හෙයින්: **ධීරා,** අෂ්ටලෝක ධර්‍මයෙහි අකම්පණ සවරූප ඇත්තාවූ; **පණ්ඩිතා,** නුවණැත්තාවූ; **සුකතපුඤ්ඤතං,** සීලාදි වශයෙන් බොහෝකොට **කරණලද** කුසල් ඇතිබව; **පසංසන්ති,** ප්‍රශංසාකෙරෙතියි වදාරා **සිරි ජාතකය** නිමවා වදාළසේක. ඇත්හලට **නායක** අමාත්‍යයා රාජ්‍යයට පැමිණියේය. රජ්ජුරුවන්ට කුලූපග තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ සි වදාළසේකි.

---

## 278 මණිසූකර ජාතකය

**තිවද** ඉරුවෙ වඩා තෙජෝ ගුණ ඇති සම්බුදුරජාණන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සුන්දරී පරිබ්‍රාජිකාව අරභයා මේ ජාතක දක්වන ලදි.

සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සම්බුදුරජාණන් වහන්සේට ලාභසත්කාර මහත'යි තීර්තකයන්ට ලාභ සත්කාර මද, එසේ හෙයින් තීර්තකයෝ එක්ව ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිලුටක් උපද්දවා ලාභයෙන් පිරිහෙලමහ යි සිතා අනික් කෙනෙකුන්ට බැරිය,සුන්දරී පරිබ්‍රාජිකාව රූපයෙන් යෞවනයෙන් යහපත්ව ඉඳිනීය, ඇ විෂයෙහි ශ්‍රමණ භවත් ගෞතමයන්ට කිලුටක් උපද්දවම්හ යි සිතා උන්කලට සුන්දරී පරිබ්‍රාජිකාවෝ නිගණ්ඨනාථ පුත්‍රයන් දකින්ට ගොසින් වැඳලා සිටියහ. නිගණ්ඨයෝ උන්ට ඛෘකුත් බැණ නොනැගී උන්නාහ.

එවිට සුන්දරී පරිබ්‍රාජිකා කියන්නී "ඇයි? සවාමීනි, බැණ නොනැගී වැඩ ඉඳිනේ, සිතට කුමන විශේෂයෙක්ද"යි විචාළීය. එවි නිගණ්ඨයෝ කියන්නෝ "ඇයි නොපව නොදනේද? ශ්‍රමණ භවත් ගෞතමයන් අපට වන ලාභ සත්කාරත් විය නොදී අප මූණ දැලි ගා අපට කරණ නිසරු නොපි නොදනුදැ"යි කියා ඒ ශ්‍රමණ භමත් ගෞතමයන්ට කිලුවක් උපදවා පියනොත් නොප විනා අනික් කෙනෙකුන්ට බැරිය යි ඒ නියාවට නොපි යහපත් රූපශ්‍රී ඇත්තී දන්නා යම් උපායක් කොට උන්ට කිලුටක් උපදව"යි කියන්නා "ඔයින් යහපත සවාමිනි" කියා එදවස් පවන් උපාසකවරුන් ජේතවනාරාමයට ගොස් බණ අසා රැ එනකලව නොමෝත් ගද දුම්මල් පහන් ගෙණ බුලත් පුවක් ගෙණ කඩක් ගෙණ ඇතිරි කොවිවත් ඇර ගෙණ ජේතවනාරාමයට යන්නාක්මෙන් අඟවා යන්නීය. ඇ දැක උපාසකවරු "ඇයි? තෝ මේවේලේ කොයි යෙහි දැ"යි විචාරති. ඕද "ජේතවනාරාමයේ ගදකිළියේ මාත් වාසයකරන්නේය"ය කියයි, නිදුනැගිත් උපාසකවරුන් එන්නාව පළමු ඉවත නිගණ්ඨයන් වාසය කරණ තෙනක ලැඟ ගමට බැස "කොයි සිට එවුදැ"යි විවළ කලට "ජේතවනාරාමයේ ගදකිළියෙහි ලැඟ එමි"යි කියයි, මේ නියායෙන් බොහෝදෙනා දකිනා නියායෙන් ඇවිද කල්යවා බොහෝ දෙනා සෑක උපන්පසු නිගණ්ඨයෝත් සොරුන්ට අල්ලස් දී ඒ සුන්දරී පරබ්‍රාජිකාව අල්වා මරා සම්බුදුරජාණන්ගේ ශ්‍රාවකයන් මැරුව කොට අඟවා ජේතවනාරාමයේ ගදකිළියේ මල් දමන කසළගොඩ පිරා ලවා නිගණ්ඨයෝ රජ්ජුරුවන්ට කියන්නාහු "සුන්දරී පරිබ්‍රාජිකාව දැන් දකින්නේ නැත යම් යම් කෙනෙකුන් මරාපු බවත් නොදනෙයි" රජ්ජුරුවන්ට කියා අමාත්‍යයන් ගෙණ නුවර මූළුල්ල බලා ජේතවනාරාමයට ගොස් පරීක්ෂා කොට මල්කසළ යට තිබුනු මිනිය ඇද එලියේලා ඇඳක ලාගෙණ රජ්ජුරුවන්ට ගොසින් පෑහ. රජ්ජුරුවෝත් "ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන් කළ නොකටයුත්ත බොහෝදෙනා දකිනා නියායෙන් සුසාන භූමියේ තබව"යි කියා මුලුනුවර ආරියශ්‍රාවකයන් හැර සෙසු බොහෝදෙන එතනට රැස්ව "ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන් කළදැ බලව"යි ඒ ඒ තැන සිට බණින්නාහ.

එපවත් භික්ෂූන්වහන්සේ සම්බුදුරජාණන්වහන්සේට දැන්වූවාහ. සම්බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "වැරැද්ද කළ කෙනෙකුන්ට ආක්‍රොශය කියන පමණ විනා නිවරදී සත්ත්වයන්ට කවරක් කිවත් තමාට ප්‍රයෝජන කිම්දැ යි කිවය"යී වදාළසේක.

කෝසල රජ්ජුරුවෝ කියන්නාහු "සම්බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි ශ්‍රාවකයන් වහන්සේ මිනියක් නොමරණ සේක. මිනිය මැරුවන් විචාරා නියම කරන්ට උවමැනව"යි වදාළ කල්හි අමාත්‍යයන් මිනිය මැරුවන් පරීක්ෂාකරන්ට

නියෝග කළ කල්හි නිඝණ්ඨයන්ගෙන් මසුරන් පන්සියයක් අත්ලස් ඇර ගෙණ මිනිය මැරූ සොරුන්ගෙන් සමහර කෙනෙකුන් එකියන රන් දීලා රා මස් ආදිය ගන්නාහ. රන් නොලත් සොරු කියන්නාහු එක් මිනියක් මරා ලත් රනින් අපවත් සරියේ නොදී තුමූම ප්‍රයෝජන ගන්නාහ යි සියල්ලවුන්ට ඇසෙන නියාසෙන් කී බස් අමාත්‍යයෝද අසා මෙකියන සොරුන් ගෙණ ගොස් රජ්ජුරුවන්වහන්සේට පෑ කල්හි ''මෙකියන මිනිය කවුරුන් කියමනකින් මැරුදැ''යි විචාළ කල්හි ''නිඝණ්ඨයන්ගෙන් අත්ලස් ඇරගෙණ මිනිය මැරුම් හ''යි කී කල්හි එකියන නිඝණ්ඨයන් ගෙන්වා විචාරා ''සැබෑව''යි නිඝණ්ඨයන් කී කල්හි එබස් අසා රජ්ජුරුවන් වහන්සේ එකියන මිනිය ගෙන්වාගෙණ මිනිය නිඝණ්ඨයාගේ ඉස තබා එනුවර වීථියක් පාසා කියා ඇවිදින්නාහු ''මේ මිනිය සමීඳු ශාසනයේ ශ්‍රාවකයන් වහන්සේ නොමැරුසේක, ඔබවහන්සේගේ සමීඳුයන් වහන්සේ නිෂ්ප්‍රභ කරණ පිණිස අපිය මැරුමෝය යි කියව'' කියා වීථියක් පාසා ඇවිදුව යි කියා යවූ නියාව සියලු සත්ත්වයෝ අසා සමීඳු ශාසනය බොහෝ ශ්‍රාවකයන් වහන්සේ නිෂ්ප්‍රභා කරන්ට සිතා නිගණ්ඨයෝ තුමූම නිෂ්ප්‍රභ වූවෝ වේදැ යි ශ්‍රාවකයන් වහන්සේ කිය කියා වැඩඵන් තෙනට සමීඳුයන් වහන්සේ වැඩවදුරා ''මහණෙනි, මා එන්නාව පූජිතාගමයෙහි කිතම් කථාව කින් යුක්තව උනුදැ''යි විචාරා වදුරා එපවත් අසා ''මහණෙනි, යම්සේ සිංහයාගේ ඡායාව නොපෙණෙන පරිද්දෙන් උන් ගුහාව කිලුටුකරන්ට වැද කිලුටු කොටගත නුහුනුවාක් මෙන් සමීඳුයන් කිලුටුකොටගත නුහුනුවෝ වේදැ''යි වදුරා ඒ භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදුළසේක.

පිටතිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක්තරා බමුණු කුලයක ඉපද පසුව කාමයෙහි ආදීනව දැක ගිහිභාවය හැර හිමාලය වනයට වැද සත්පඵිත වලල්ලක් ඇතුළපිට තාපසව වාසය කරන්නාහ.

බොධිසත්ත්වයන් වසන්නාවූ සථානයට නුදුරුතෙනක වෛඩූර්‍යමාණික්‍ය මය ගුහායෙහි උපන්නාවූ උභරෝ නිස්දෙනෙක් වාසය කරන්නාහ. ඊට ඔබ්බේ ගුහායෙක සිංහයෙක් වාසය කෙරෙයි. ඒ සිංහයාගේ ඡායාව වෛඩූර්‍ය ගුහා යෙන් පෙනෙන්නේය. උභරෝ සිංහයාගේ ඡායාව දැකිම්න් දවස්පතා භයට පැමිණෙන්නාහ. එවිට උභරෝ සිතන්නාහු 'මේ ඡායාව මකන්ට උවමැනවැ''යි සිතා මඩෙහි ගැලී ඇවිත් ඒ ගුහායේ ඇඟ උලන්නාහ.

මේ නියාසෙන් මඩ හා උභරන්ගේ ලොම් වැද ගැණිමෙන් මැණිකේ ඡායාව ආදී නියාවටත් දියුණුව බබලන්ට වත. උභරෝ මේ නියාසෙන් උත් සාහ කොට ඒ පඵිතය කිළුටු කොට ගතනොහී එන්නාහු තාපසයන් කරා ගොස් ''මිට උපායක් විචාරම්හ''යි සිතා තාපසයන්වහන්සේ ලඟට ගොස් ''තාපසයන් වහන්ස, අපි මේ වෛඩූර්‍ය ගුහායේ සත් අවුරුද්දක් විතර වාසය කළම්හ. අප වසන්නාවූ ගුහාවට නුදුරු තෙනක සිංහයකු වාසය කරන්නේය. සිංහයාගේ ඡායාව පඵිතයේ වැටී අපව දවස්පතා භය උපදවයි. එසේ බැවින් පඵිතය කිලුටු කරන්වයයි කියා ඔඩගා උලාත් පඵිතය කිලුටු කොටගත නුහුනුවම්හ. ඒව අපව උපායක් කියන්නේ යහපතැ''යි සිතා තාපසයන් වහන්සේ අනින් උපායක් විචාළහ.

තාපසයෝ කියන්නාහු "උඉරු ලොම් හා මඩ වැද ගැණීමෙන් පවිත්‍ර ඔපය යහපත් වන පමණක් විනා කිළිටු කොට ගත නොහැක. මේ උපායෙක් නොවෙයි. තොපි ඇම මේ ගුහාව ඇරපියා හය ඇත්නම් ඔබ්බකට පලායව"යි කීහ. "යහපතැ"යි උඉරෝ ඔබ්බට ගියාහ.

බොධිසත්ත්වයෝත් නොපිරිහුනු ධ්‍යානයෙන් පඤ්චාභිඥා අෂ්ටසමාපත්තී උපදවා බඹලොව ගියාහ යි වදාරා මේ මණිසූකර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසව උපන්නෙම් ලොවිතුරා බුදුවූ මම්මවේදැ යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 279
## සාලොහිත ජාතකය

තිවද සඳුට වඩා සෞම්‍යවූ ගුණ ඇති සමිඳුයන් වහන්සේ ජේතවනාරාම යෙහි වැඩවසන සමයෙහි චුල්ල කුමාරිකා පලොභනයක් අරභයා මේ ජාතකය දක්වනලද.

**හේ කෙසේද? යත්**

එක් නිසැඹූ කෙනෙකුන් වහන්සේ චුල්ලකුමාරිකා යන ස්ත්‍රියට ආලය ඇති නියාව නිසැඹුන් වහන්සේ සමිඳුයන් වහන්සේට දැන්වූසේක් සමිඳුයන් වහන්සේ "සැබෑද මහණ"යි විචාරා වදාරන්නා "සැබෑව, සවාමීනි," කී කල්හි "පෙරත් තොපි මුන් නිසා අමුත්තන්ට බල්ලන්ට මස්වූයේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සමිඳුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

පිවතිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක්තරා ගෙයක ගොන්ව උපන්නාහ. බොධිසත්ත්වයන්ට මහාලොහිතය යි නම් තුබූහ. බොධිසත්ත්වයන්ගේ මලනුවන්ට චුල්ලලොහිතය යි නම් තුබූහ.

එකියත ගොන් දෙන්නා ඒ ගෙයි කළමනා යම්තාක් මෙහෙවරක් කොට සිටිනාහ. සෙලක නම් එක් උඉරෙකු ඒ ගෙයි ඇත්තෝ වඩා තමන් කන්නාසේ බොන්නාසේ කවා පොවා වඩිනය කරන්නාහ. එවිට චුල්ලලොහිතයෝ කියන්නාහු "මේ ගෙයි කළමනා යම්ම දෙයක් කරන්නාහු අපය, අපට තණ හා කුඩු ලති. නිකම් ඉදිනාවූ උඉරාට නිරන්තරයෙන් සියලු කනදැ කවා උඉ පොෂ්‍ය කරන්නාහ. අපව එලෙස නොකරන්ට කාරණා කිම්දැ"යි කීහ.

එවිට මහාලොහිතයෝ කියන්නාහු "එම්බා මලඬ, උඉට සියළු කන බොනදැ ලන්නේ උඉගේ මාංශ වඩිනයවත නිසාය. මේ ගෙයි වැඩෙන කුමාරිකාව දුටුවාද? ඇ සරණ පාවාදෙන මහුලේ බත්කන්ට ආ අමුත්තන්ට මාළු පිණිස කීපදවසකින් මූ මරන්නාහ. අපව ඒ කැවිල්ලෙන් කම්නැත, අපට දීඝායුවට තණ හා කුඩු පමණකැ"යි කීහ.

ඊට කීප දවසකින් ඒ කුමාරිකාව සරණපාවා ගන්නා පිණිස ආවාවූ මනුෂ්‍යයන්ට ඒ කියන උඉරා කඩ කඩ කොට කපා මාළුකොව ආ අමුත්තන්ට අමුතු බතට දුන්නාහ. ඒ දැක ඒ ගොන් දෙන්නා "දුටුවාද සැපසේ කවාපොවා

උඹරාවවූ දැය? අපට අපගේ තණ හා කුඩුම යහපත්වීය යි උන්ට කීහ''යි විදුර බුදුවූ වැඩහිඳ වදුරණ සේක් 'එකියත ගොන් දෙන්නා ඒ උඹරාගේ කැවිල්ලවා පළමුකොට නොසතුටුවූවෝ පසුව සමාධිවූවෝ වේදැ''යි වදුරා සාලොහිත ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි කුමාරිකාව නම් මේ භික්ෂූහුය, චුල්ලලොහිතයෝ නම් ධම්මභණ්ඩාගාරිකවූ ආනන්දස්ථවිරය, මහා ලොහිතයෝ නම් බුදුවූ මම්මය යි වදාළසේක.

## 280 ලාභගරු ජාතකය

මේවද මාගේම දෙවිවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සැරියුත් සවාමීන්ගේ ගණයේ ලාභගරුවූ භික්ෂූ කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදදේය.

**ඒ කෙසේද? යත්**

සැරියුත් සාමීන්ගේ ගණයේ එක්තරා භික්ෂූ කෙනෙකුන් වහන්සේ සැරියුත් සාමීන් අතින් ''ලාභ, කුමන කාරණයකින් උපදවා ගතහැකිදැ?''යි විවාළ සේක.

සැරියුත් සවාමීන් කියන සේක් ''යම් කෙනෙක් උමතුව වාසයකෙරෙද්ද යම් කෙනෙක් කේලාම් කියා වාසය කෙරෙද්ද? යම් කෙනෙක් නවා ගී කියා වාසය කෙරෙද්ද? යම් කෙනෙක් කවට ආවාක් කියා දවස අරිද්ද? එසේවූ මේ සතර පක්ෂයේ ඇත්තෝ ලාභය ලබති'' කීහ.

එබස් අසා ''මෙසේ ලබන්නාවූ ලාභයෙන් මට ප්‍රයෝජන කිම්දැ''යි නින්දා කොට කියා හියාහ. මේ කථාව සම්බුදුයන් වහන්සේට සැරියුත් සවාමීන් දන්වූසේක. මේ බස් අසා සම්බුදුයන් වහන්සේ ''පළමුත් මේ ලාභයට නින්දා කොටම ගියෝවේදැ''යි වදාරා ''ඒ කෙසේදැ''යි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

අතීතයිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ දිසාපාමොක් ආචාරිව ඉපිද පන්සිය යක් අතවැසිඇතන්ට ශිල්ප උගන්වා ඉන්නා අවස්ථාවෙහි ඉන් එක් අතවැස්සෙක් දිසාපාමොක් ආචාරින් අතින් විවාරන්නේ ''සවාමීනි, ලාභය උපදවා ගන්නේ කෙසේදැ''යි විවාළේය.

ආචාරිහු කියන්නෝ ''යම් කෙනෙක් උමතුව වාසය කෙරෙද්ද, මේ ආදීවූ සතර පක්ෂයේ ඇත්තෝ ලාභය ලබති'' කීහ. අතවැසි කියන්නේ ''ජනාපවාදය නිසා ලබන්නාවූ ලාභය නින්දාවෙයි. එසේවූ ලාභය අපට එපයි, මෙසේවූ බස් අපට නොකියව මැනවැ යි කියා කීව''යි වදාරා ලාභගරු ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ඒ ලාභයට නින්දා කළ අතවැස්සා තම් මේ භික්ෂුහුය, එසමයෙහි දිසාපාමොක් ආචාරීව උපන්නේ තම් බුදුවූ මම්මය යි වදාළ සේකි.

## 281 මච්ඡචාර ජාතකය

මේ වදාළ මාගේ කල්‍යාණ මිත්‍රවූ සවීඳුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් සොර වෙළඳම් දන්නා ව්‍යාපාරිකයකු අරභයා මේ ජාතකය වදාරණ ලදි.

මෙහි වර්තමාන කථාව යටකිය ජාතකවල පෙණෙන්නේ යි.

මෙහි වත්තානි බරණැස් නුවර බ්‍රහ්මදත්ත තම් රජ්ජුරු කෙතෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ කෙළෙඹි කුලයෙහි ඉපිද තමන්ගේ මලනුවන් හා සමග වෙළඳුම් කොට මස්සෙන් දහසක් උපදවාගෙණ දෙබෑයෝ ගමට එන්නාහු සැඩ ගඟක් සමීපයෙහි වැල්ලේ ඉද බොධිසත්ත්වයෝ බත් කා මසුන්ට බත්ලා දෙවියන්ට පින්දුන්නාහ.

ඒ ගංගාවේ වාසය කරන්නාවූ දෙවතාවා පින්අනුමෝදන්විය. ඒ විපාකයෙන් එම වීටම බොහෝ සම්පත් ලැබ බොධිසත්ත්වයන් කෙරේ සතුටුවිය. ඒ අවසථාවට බොධිසත්ත්වයෝත් බත් කා වැල්ලේ නිදන්ට වන්නාහ. එවේලේ බොධිසත්ත්වයන්ගේ මලනුවෝ වඤ්චා ප්‍රයොග දන්නාහ. එසේ හෙයින් "මාගේ බෑනනුවන් වඤ්චාකොට මසුරන් දුස ඇරගන්ට උවමැනවැ"යි සිතා බොරළු පයියක් මසුරන් දුස නියාවට බැඳ බොධිසත්ත්වයන් ලඟ තබා බොධිසත්ත්වයන් පිබිද යන්නාවුන් හා සමග ඔරුවට නැගෙන ගමනේ රන් පයියත් බොරලු පයියත් ඇරගෙණ නික්මුනාහ.

බොධිසත්ත්වයන්ගේ මලනුවෝ බොරළු පයිය දමා රන් පයිය ගණිමියි සිතා දමන තැනැත්තෝ බොරළු පයිය තිබාගෙණ රන් පයිය දැමූහ. "බොරළු පයිය දමම් සිතා රන් පයිය වැටිනැයි"යි කීහ. එවිට බෝධිසත්ත්වයෝ "යහ පතැ යි කියන්නාවය" කියා උන්නාහ.

ගඟ වසන්නාවූ දෙවතාවා "ලාභයක් කළ තෙනැත්තවුට මා උපකාර කරන්ට උවමැනවැ"යි සිතා වැටුනු මසුරන්දහස මත්ස්‍යයෙකු ගිලින්ට සලස්වා තෙමේත් ඒ මත්ස්‍යයාට ආරක්ෂා ගත්තේය.

එකියත දෙබෑයෝ ඔරුවෙන් ගොඩතැගී තමන්ගේ ගමට ගියාහ. බොධිසත්ත්වයන්ගේ මලනුවෝ රන්පයියයයි සිතා බොරළුපයිය මුදු බලා සිතන්නේ රන් මවත් නුවූයේය. මාගේ බෑනන්ටත් නුවූයේය. බොහෝ විකෘපව වැද හොත්තාහ.

එවේලාවට කෙවුලෝ මාදැල්ළලා කුඩමැස්සන් අල්ලන්ට ගියාහ. දෙවතාවාගේ ආනුභාවයෙන් මසුරන් දහස ගිලුනු මත්ස්‍යයා මාදැලට අසුව ගියේය. එවිට කෙවුලෝ කුඩමැස්සන් මරාගෙණ අවුත් සෙසු මත්ස්‍යයන් විකොව රන් දුස ගිලූ මත්ස්‍යයා ගෙයක්පාසා ඇරගෙණ "මසුරන් එක්දුස් සත් කලඳකට ඇරගණුව"යි කියා ඇවිද ඇරගත්තත් තැති හෙයින් බොධිසත්ත්වයන්ගේ

ගෙදරට ගෙණ ගියාහ. බොධිසත්ත්වයෝ "කොතෙකට විකුණන්නේය"යි විචාරන්නා "එක්දස් සත්කලඳකටය"යි කියන්නා "සත්කලඳකට දෙව"යි කියා ඉල්ලූ ගමනේ "යහපත, නුඹවහන්සේ ඇරගණිතොත් ඒ නියාවට දෙම්හ"යි කියා රන් සත්කලඳක් ඇරගෙණ මත්ස්‍යයා දුන්නාහ. ඇ මත්ස්‍යයා ගෙණ ගොසින් මාලු කරණ කලට මත්ස්‍යයා බඩතුබූ මසුරන් දහස දැක බොධිසත්ත්වයන්ට ගෙණ ගොසින් දුන්හ බොධිසත්ත්වයෝ දැසින්බැඳි පියල්ල දැක තමන්ගේ අස් නියාව දැන "කවුරුදෝ මාගේ මේ ලාභය මට පවත්කොට දුන්නේය"යි සිතා උන්කලවි දෙවතාවා ආකාශයෙහි සිට "මමය මේ මත්ස්‍යයා අතින් කෙණෙකුත් ඇරගත නොදී තොපට ගෙණැවිත් දුන්නෙම් මමය"යි කියාත් "තොපගේ මලනුවන් කෙළේ මේලෙසය"යි කියාත් "උන්ට මින් මස්සකුත් නොදෙව"යි කියාත් දෙවතාවාහුත් යම් කෙනෙකුන්ට ප්‍රශංසා වන්නේ යහපත් කෙණෙකුන්ට විනා මුන්සේවූ ලොභීන්ට ප්‍රශංසා නොවෙයි කියා "මස්සකුත් නොදෙව"යි කීහ. එසේ වූවත් බොධිසත්ත්වයෝ මසුරන් පන්සියයක් දුන්නාන යි වදාරා **මච්ඡමාර ජාතකය** නිමවා වදාළසේක.

එසමයෙහි කුටවාණිජ වෙළඳ නම් මෙසමයෙහි සොරවෙළඳුය. එසමයෙහි කෙළෙඹි පුත්‍රව උපන්නේ නම් බුදුවූ මම්මය යි තමන් වහන්සේ දක්වා වදාළ සේක.

---

## 282 නානච්ඡන්ද ජාතකය

තවද මවම සරණවූ සමීඳුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආනන්ද සඞ්ඝරත්නය ලත් වර අවක් අරභයා මේ ජාතකය දක්වනලදි. මෙහි වර්තමාන කථාව එකක නිපාතයේ පුණ්ණක ජාතකයෙහි බස්නේය.

**ඒ කෙසේද? යත්,**

පිටහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝත් ඒ රජ්ජුරුවන්ට පුත්ව ඉපද පියා නන්ගේ ඇවැමෙන් රාජ්‍යයට පැමිණ පියානන් සමයේ පුරෝහිතව සිටි බමුණා හැර අනික් බමුණකු පුරෝහිත සථානාන්තරයට ගත්හ. ඒ බමුණුත් එක් මාගී සන්න ගෙයක වාසය කරන්නේය.

එක් දවසක් බරණැස් රජ්ජුරුවෝත් නගර ශෝධන දිනයේ තනිව ඇවිදිනාහ. එකල පන්සියයක් රා බී මත්ව යන්නාවූ සොරු රජ්ජුරුවන් දැක කවුරුන් බවත් නොදැන තළා උතුරුසළුවත් උදුරාගෙණ රා කළයත් ඉස තබා ගෙණ යන්නාහු රජ්ජුරුවෝත් තනි විසින් කුමකුත් කියාගත නොහී සොරුන් පස්සේම නික්මුණාහ.

එවේලාවට දුක්පත්පුරෝහිතයා තමාගේ මිදුලේසිට ආකාශය බලන්නේ ආකාශයේ තාරකා විශෙෂයක් දැක තමාගේ බැමිණිය කැන්දා "එම්බල බැමිණිය, අපගේ රජ්ජුරුවන් වහන්සේ පසමිතුරන්ට අසුව ගිය සේකැ"යි කිය. බැමිණිත් "නුඹ කෙසේ දනුසේක්ද"යි කියන්නා තාරකා විශෙෂයකින් දනිමි"

කීහ. රජ්ජුරුවෝ බමුණා කී කථාව ඇසුවාහ. රජ්ජුරුවෝත් සොරුන්ට කියන්නාහු 'සාමිවරුනි, මම නිකම් දුකකිතයෙකිමි, මා නිකම් ගෙණ ගොස් තොපට ප්‍රයෝජන කිම්ද? මාගේ උතුරුසළුව පමණක් ඇරගෙණ මා ඇරපිය ව''යි දුප්පත් නිසා කී කල්හි සොරුන් ''සැබව, මේ නිකම් දුකකිනයාගෙන් කම් කිම්දැ''යි කියා දයාවෙන් ඇරපීහ. එවිට බමුණා ''එම්බල පින්වත, අපගේ රජ්ජුරුවන් වහන්සේ දැන් ගැලවී ගිය සේකැ''යි කීය. ඒත් රජ්ජුරුවෝ අසා රජගෙට ගොස් උදැසනක්සේම පුරෝහිත බ්‍රාහ්මණයා ඇතුළුවූ බොහෝ බමුණන් රැස්කරවා විචාරන්නාහු ''කිමෙක්ද? ඊයේ අපවූ ලාභ අලාභයක්වත් අපවූ දුකක්වත් ඇද්දැ?''යි විචාළාහ.

බමුණෝ කියන්නෝ ''සවාමීන්ටවූ ලාභයකුත් නැත, අන්තරායකුත් නැත, ග්‍රහයෝත් හොඳින් සිටිහ යි කිසිම අමුත්තෙක් නැතැ''යි කීහ.

එවිට රජ්ජුරුවෝ ''අසවල් මාලුගෙයි පුරාතන පුරෝහිත බමුණා ගෙන් ව''යි කියා ගෙන්වා තමා විසින් දුටු කාරණයකින් මවවූ අන්තරායක් ඇත් නම් කියව''යි කියා කීහ. ''එසේය, දේවයන්වහන්ස, කාරකා විශෙෂයකින් නුඹවහන්සේ සොරුන්ට අසුව එවිට ගැලවී ගිය නියාව දිටිමි'' කීහ.

එවිට රජ්ජුරුවෝ ''මෙකියන කොල්ලෝ මෙපමණෙක් නුදුටුවෝය. ශාස්ත්‍ර උගණිතොත් මෙසේ උගන්ට එපාද? තෙල කොල්ලන් පිටත ලවයි පුරෝහිත බමුණා ඇතුළව බමුණන් පිවත් කරවා පරණ පුරෝහිත බමුණා පුරෝහිත ධුරයෙහි සලස්වා තොප කී ශාස්ත්‍රයෙහි ඉතා සතුටුවූමිහ. තොප කැමති වරයක් ගණුව''යි කීහ.

එවිට බමුණු කියන්නෝ ''මා කැමති වරයක් මා ගත්කල මාගේ බිරින්ද දරුවන් යෙහෙලියන් කොල්ලන් කෙල්ලන්ගේ අභිප්‍රාව නොදනෙයි, ගෙට ගොස් විචාරා ඇවිත් කියමි'' කීහ. එවිට රජ්ජුරුවෝත් ''යහපත''යි විචාරා එව'යි කීකල්හි බමුණු ගෙට ගොස් අඹුදරුවන් යෙහෙලියන් කෙල්ලන් කොල්ලන් එක්කරවා විචාරන්නේ ''රජ්ජුරුවන් වහන්සේ මට කැමති වරයක් ගණුව''යි වදාළසේක. මම තොප ඇම විචාරම් යි තොපට කැමැත්තක් කියව''යි කී කල්හි ඔහු ගේ අඹුව කියන්නී ''මට කිරිදෙනුන් සියයක් ඉල්වා දෙව''යි කීහ. ජත්තපාණි නම් පුත්‍ර කියන්නේ ''යහපත් සවිඤයන් යෙදූ රථයක් ඉල්වා දෙව''යි කීය. යෙහෙලි කියන්නේ ''මට යහපත් මැණික් කුණ්ඩලාභරණ දෙකක් ඉල්වා දෙව''යි කීය. කෙලි කියන්නී ''මව යහපත් වනක් මෝලක් කුල්ලක් ඉල්වා දෙව''යි කීය. එකියන බ්‍රාහ්මණතෙම සිතන්නේ මට ගමක් උවමැනවැ යි සිතාරජ්ජුරුවන් කරා ගොස් කියන්නේ ''අප ඇමගේ සිතිවිල්ලම එකඟ නොවෙයි. නානාච්ඡන්දය යි' කියන්නේ ''මම ගමක් ලබන්නා කැමැත්තෙමි. මාගේ ගෙයි බිරින්ද කිරිදෙනුන් සියයක් කැමැත්තීය, මාගේ ජත්ත පාණි නම් පුත් අසුන් දෙදෙනෙකු යොදනලද රථයක් ලබන්නා කැමැත්තේය මාගේ යෙහෙලි මැණික්මය කුණ්ඩලාභරණ දෙකක් කැමැත්තීය. මාගේ පුණ්‍යා නම් දැසී වනක් මෝලක් ලබන්ට කැමැත්තීය''යි කීය.

එවිට රජ්ජුරුවෝ පුරෝහිත බමුණාට ගමක් දෙවා ඌගේ අඹුවට කිරි දෙනුන් සියයක් දෙවා ඌගේ පුතාට අසුන් දෙන්නෙකු යොදනලද රථයක් දෙවා යෙහෙලියට කුණ්ඩලාභරණ දෙවා පුණ්‍යා නම් දැසියව වනක් මෝලක්

කුල්ලක් දෙවයි යන මේ සියල්ලම දී බොහෝ සම්පත් රජ්ජුරුවෝ දුන්හ යි වදාරා මේ **නානාච්ඡන්ද ජාතකය** නිමවා වදාළ සේක. එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් ආනන්දසථවිරය, රජව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේකි.

---

## 283 සීලවිමංස ජාතකය

**නි**වද මටම පිහිවූ සම්බුදුයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි බ්‍රාහ්මණයකු අරභයා මේ ජාතකය දක්වන ලද මෙහි **වතීමාන කථාවත්** ඒකක නිපාත යෙහි සීලවිමංස ජාතකයෙහි දක්වනලද,

**ඊ**ටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ බ්‍රාහ්මණව ඉපද සීලය වැඩිදෝ හෝයි ජාතිය වැඩිදෝ හෝ යි විමසන පිණිස වීපියේ පිළිත් **රන් තුන්මස්සක්** සොරකම් කොට ඇරගත්තාහ.

වීපියේ වෙළෙඳුන් "බමුණා රන් සොරා අරගතැ"යි අල්ලාගෙණ රජ්ජුරුවන්වපාන්ට යයි ගෙණෙන කලව අතරමග පම්බව්වියෙක් තයෙකු ඇරගෙණ, කෙළවන්ව වන. ඒ වේලාවට බොධිසත්ත්වයෝත් "සර්පයාහම් විෂඝෝරය එසේවූ සර්පයා අල්වාගෙණ කෙළින්ව යහපත් නොවෙයි ඇරපියව"යි කිහ. එකියන පාම්බව්වියා කියන්නේ "මේ සර්පයා සිල්වත, කඩා නොකති" කිහ.

එවිට බොධිසත්ත්වයෝ සිතන්නාහු සර්පයා පවා කඩා නොකන්නේ සිල්, වතැ යි අසාගතැ ය සිත සිතා රජගෙට ගියාහ.

රජ්ජුරුවෝත් "ආචාරිනි, මේ කෙළේ කිම්ද?"යි කියන්නා "දෙවයන් වහන්ස, මා සොරකමට කළ දෙයක් නොවෙයි, සීලය වැඩිදෝ ජාතිය වැඩිදෝ හෝ යි සිතා පරීක්ෂාකරන්ව කෙළෙම්"යි කියන්නාහු, සීලං, ආචාරසීලය; කල්‍යාණං කිරෙව, යහපත් වන්නේය; ලොකෙ, ලොකයෙහි; සීලං, සීලය; අනුත්තරං, නිරුත්තරය; පස්ස, බලව; සොරවිසො නාගො, සොරවූ දරුණු විෂ ඇති ඇර්පයා; සීලවා ඉති, සිල්වතැයි කියා; නහඤඤති, හිංසනය නොකෙරෙයි; සීලවා, සිල්වත්වූ පුරුෂ තෙම; යෙන, යම් සීලාභරණයක් හේතු කොවගෙණ; සීලවා, සිල්වත්වූයේ; අරියවුතති සමාචරෝ, බුද්ධාදීවූ ආර්‍යයන්ගේ ප්‍රතිපත්තිය හැසිරෙන්නේයයි; වුචචති, කියනු ලැබේ. ලොසෙ, ලෝකයෙහි; සිවං නිරුපද්‍රවයි; අනුමතං, දන්නාලද බවද එසේවූ; සීලං සීලය; සො අහං, ඒ මම; සමාදිස්සං, සමාදන්වෙමි; සීලවා, අඛණ්ඩාදීන් යුක්තකොට රක්ෂාකරණ සීලය ගුණයෙන් යුක්තවූයේ; ඤාතීනඤ්ච, නැයන්ට ද, පියො, ප්‍රියවූයේ; හොති, වන්නේය; මිත්තෙසුව, මිත්‍රයන් කෙරෙහිද; විරොචති, බබලන්නේය; කායස්සභෙදා, ශරීරයාගේ භෙදයෙන්; චුති, චුති චිත්තයෙන් මත්තෙහි; සුගතිං, සුගතියෙහි; උපපජ්ජති, උපදනේ යි කියා "දෙවයන්වහන්ස මට කිහිගෙයින් ප්‍රයෝජන නැතැ"යි කියා අවසරගෙණ හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චඝාඬි අෂටසම්පත්ති උපදවා බ්‍රහ්මලෝකයෙහි උපන්නේය යි වදාරා **සීලවිමංස ජාතකය** නිමවා වදාළ සේක. එසමයෙහි බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්මය යි වදාළසේකි.

## 284
## භද්දඝට ජාතකය

තීවද මා නිසා බුදුවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනේපිඬු මහසිටාතන් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

අනේපිඬු මහසිටාතන්ගේ එක් පිතෙක් අඤ්ඤතී සුරාඤතී ස්ත්‍රීඤතීවූ නොයෙක් දෙයෙහි වාසය කොට ඇති සම්පත් නසා දුක්පත්ව තමන්ගේ පියා තන් කරා අවුත් "දුක්ඛිතයෙමි" කියන්නා පියාතෝ මසුරන් පන්සියයක් දුන්නාහ.

ඒ මසුරන් පන්සියයක් වෙළඳුම් ආදීවූ දෙය කොට සම්පත් උපදවා නොගෙණ එයින් ඛූතීකම්න් නසා පෙරලා අවුත් පියාතන් අතින් සම්පත් ඉල්වූහ. පියාතෝ පෙරලා සම්පත් දී ඒ බව සම්බුදුයන් වහන්සේට දැන්වූහ.

සම්බුදුයන් වහන්සේ පළමුත් මුත්ට උත්තමයෝ සම්පත්දීම ගියාහ. මේ සම්පත් නිසාම ගියෝවේදැ"සි වදාරා "ඒ කෙසේදැ"සි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි,

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එනුවර සිටුවූ ඉපද සදන්හල් කරවා මහත්වූ දන්දී මියගොස් දෙදෙව්ලොවට නායකවූ ශක්‍රදේවෙන්ද්‍රව තෙමේ තමාගේ පුත්‍රයා කුමක්කොට වාසය කෙරේදෝ හෝයි බලා දුක්ඛිතව සිඟාකා වාසය කරණ නියාව දැක දයාවෙන් "මොහුට මා විසින් සම්පතක් දෙන්ව උවමැතැවැ'සි සිතා භද්‍රඝටයක්දී කියන්නානු "මේ පූර්ණඝටය ඉදුරා තිබාගෙණ උන්නු නම් තොපට කිසි සම්පතකිනුත් අඩුවෙක් නැතැ"සි කියා පූර්ණඝටය දී දෙව්ලොවටම ගියේය.

ඒ තෙම පූර්ණඝටයෙන් උපන් සම්පත් ඇරගෙණ සුරාව අනුභව කොට උන්කලව එක්දවසක් තෙමේ පූර්ණඝටය රා බී මත්ව ආකාශයට දම දමා උන් කලට පූර්ණඝටය බිමවැටී බිඳුන. එතැන් පටන් තමන් දුක්ඛිතවිය. ඒ අර්ථය දක්වන සම්බුදුයෝ සඞ්ඛඤාමදං, සියලුකැමති දෙයක්දෙන්ට සමර්ථවූ; කුම්භං කුම්භ සඞ්ඛ්‍යාතවූ ඝටය; ඛූතීකොට ඒ ඛූතීයා යම් පමණ කාලයක් රක්ෂා කෙරේද? කාව, ඒ තාක්; සුඛං, සුව වඩඤති, වඩා; යදා, එකල්හි, පමාදං; ප්‍රමාදයෙන්; කුම්භං, පූර්ණඝටය; අබ්භිදා, බින්දේද; තතෝ, ඉක්බිත්තෙන්, නග්ගොව, තග්නවූයේද; පොතොව, කැතිරිකඩ අදනාලද්දුවූද; බාලෝ, අඥතයා; පච්ඡා, පසුව; විහඤඤති, පශ්චාත්තාපයෙන් තැවෙන්නේහි; යො, යමෙක් තෙම; ඉමං, මේ; ධනං, ධනය; එවමේවං, එපරිද්දෙන්මු; අමන්තා, පමණ නොදැන; පපෙපානි, ප්‍රයෝජන විදීද; සො දුමෙමඛෙ, ඒ අඥත සත්ත්ව තෙම; කුම්භංභින්නා ඛූත්තඤ, භද්‍රඝටය බිඳ විඤෂපයට පැමිණියාවූ ඛූතීයා පරිද්දෙන්; පච්ඡානපති, පසුතැවිලි බවට පැමිණෙන්නේය සි වදාරා භද්දඝට ජාතකය නිමවා වදාළසේකි,

එසමයෙහි පූණ්ණවය බිඳි සිටුපුත්‍රයා නම් මෙකියනා සිටුපුත්‍රයාහ, එසමයෙහි ශක්‍රව උපන්නෙම් මම්මය යි වදළසේකි.

---

## 285 සුපත්ත ජාතකය

මේ මනිසා මා මේ සඞ්ඝයා දෙශනා කොට නඟාලූ සවීඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සැරියුත් සාමීන් යසෝධරා සථවිරාවන් වන්සේට දුන් රේමස් මුසු ඇල්සාලේ බතක් අරභයා මේ ජාතකය දක්වනලද.

**ඒ කෙසේද? යත්,**

අබභ්‍යනතර ජාතකයෙහි අඹ ලද්දාමෙන් රාහුල සථවිරයන් වහන්සේ සැරියුත් සාමීන්ට කියා කොසොල රජ්ජුරුවන්ගෙන් රේමස් මුසු ඇල්සාලේ බතක්ගෙණ ගොසින් යසොධරා සථවිරාවන්ට දෙවයි කියා රාහුල සථවිරයන්ට දුන්සේක. එපවත් රජ්ජුරුවෝ අසා එවක්පටන් රේමස් මුසු ඇල්සාලේ බත් යසොධරා සථවිරාවන්ට දුන්නාහ.

මේ කථාව ධම්සභාවේ රැස්වූ මාලුවරුන්වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සවීඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සවීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

යේටගිය දවස බරණැස් සුචර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ අසූදහසක් කවුඩන්ට නායකවූ සුපත්ත නම් රජ්ජුරුවෝය, සුමුඛ නම් සෙනෙවිරද්දුය, සුඵස්ස නම් බිසවය යනාදීන් තුන්දෙන බරණැස්නුවර වාසය කරන්නාහුය.

එක්දවසක් බොධිසත්ත්වයන් හා අග්‍රමහෙසිකාවන් හා දෙන්න මුළු තැන් ගෙය මුදුනෙන් ආකාශයෙන් යන්නාහුය. එකල අරක්කැමියා මාළු උෂ්ණ නිවන්නට ය සි කියා අත්පතලාවල මලා ඇර තිබූහ. ඒ වේලාවට බොධිසත්ත්වයන්ගේ බිරින්ද මත්ස්‍ය මාංසයෙහි ගඤ්ඡය අසා ඒ නිසා දෙල ගත්හ. පසුව දවස් බොධිසත්ත්වයෝ ගොදුරට යන්නාහු භාර්‍යාවන් කැඳවූහ.

එවිට සුඵස්සාවෝ කියන්නාහු "සාමිනි මට දෙලෙක් උපත එසේ නොයින් නුඹවහන්සේ ගොදුරට කිය මැනව, මම යා නොහෙමි"යි කීහ. බොධිසත්ත්වයෝ "කෙබදු දෙලෙක් දැ?"යි විචාරන්නා රජ්ජුරුවන්ගේ අග්‍රභෝජනය ලබන්නා කැමැත්තෙමි, එය මට ලැබෙන්නේ නැත. එසේ නොයින් මාගේ ප්‍රාණය යන පමණෙකැ'යි කියා වැදහොත්තාහ.

බොධිසත්ත්වයෝත් විශෙෂව උන් කලව සුමුඛ නම් සෙනෙවිරද්දු බොධිසත්ත්වයන් ලඟට අවුත් "ඇයි? මූණ මලානිකව මුසුප්පුව ඉන්නේ කිම් දැ"යි විචාරා එපවත් අසා 'සහපත, සාමිනි, මට භාරය නුඹවහන්සේලා දෙදෙනා වහන්සේ ගොදුරට නොවඩින්නමෝ ය"යි කියා කවුඩන් එකෙණෙහිම එක්කරවා ගෙණ බරණැස්නුවරට ගොස් කවුඩන් මොත්තන් නියා ගෙන් රැකවල් සලස්වා ශක්තිසම්පන්න කවුඩන් වදෙනෙකු ඇරගෙණ රජ්

ජූරුවන්ගේ මූළුතැන් ගෙයි පලය පිට ඉඳ කියන්නාහු ''රජ්ජුරුවන්වහන්ස්ේව මේ වඩන්ට ගෙණ යන වේලාවට මම ගොසින් වස්ත එලාපියම්, තොපි සතරදෙනෙක් ගොසින් බත් උකාගණුව, මම අසුවයෙම්, මා අසුවූ නියාව නොකියා, මා අසුවූ නියාව ඇසුවෝත් බත් මේ නො නිමන ස්ේක. පසුපස්ස්ේ එන නියාව කියව, සවාමීනුත් අග්‍රමහෙසිකාවත් වහන්සේත් බත් කව''යි කියා උන් කලට අරක්කැමියන් වසුන්කද කරතබා ගෙණ මේ වඩා ගෙණෙන කලට කවුඩු සෙනෙවිරද ගොසින් ලැමද්දේ ඉඳ නාසය ඩැහැගෙණ පියාපත් දෙකින් දැස වසාගත, ඒ වේලාවට රජ්ජුරුවෝ මතුමාලේ සිටියාහු මේ ක්‍රියාව දැක ''අරක්කැමිය, වස්තෙන් අපට කම් නැත. ඒ දමා පියා කවුඩා තොහැර අල්ව''යි කීහ.

''යහපතැ''යි කියා වස්ත දමා කවුඩා තොහැර අල්වාගත. එවිට කවුඩෝ අවදෙන තමන්ගේ බඩ පුරා කන්නක් කා තමන්ගේ රජ්ජුරුවන්ට හා බිසවුන්ට බත් හැර ගෙණ ගියහ. බිරින්දත් කවුඩු රජ්ජුරුවෝත් බඩ පුරා කැහ. රජ්ජුරුවන්ට ඒ සුමුඛ නම් සෙනෙවිරදුන් පාන්නා ''ඇයි තොපගේ ප්‍රමාණයටත් නොසිතා රජ්ජුරුවන් වහන්සේට ගෙණෙන වසුනැයි කියාත් නොසිතා අරක්කැමියාගේ තාහගත් ඩෑ වණකලේ කුමක් නිසාද''යි විචාළාහ. ''දෙවයන්වහන්ස, නුඹවහන්සේගේ මේ නුවරම අපගේ අසූදහසක් කවුඩන්ට රජව ඉන්නාවූ සුපත්ත නම් කවුඩු රජ්ජුරුකෙණෙක් ඇත, ඒ රජ්ජුරුවන්ගේ සුපත්තා නම් බිසෝ කෙණෙකුත්වහන්සේ නුඹවහන්සේගේ හොජනයට දෙළ ඇතිව ආයාසය විඳිනා මාගේ රජ්ජුරුවන් වහන්සේට ජීවිතය පුදා උන්වහන්සේට බත්දෙන නිසා මාගේ ප්‍රාණය නොසිතා කෙළෙමි'' කීහ.

එසේ කෙයින් යම්කෙණෙක් තමන්ගේද දෙමව්පියන්ගේද සවාමිපුත්‍රයා ගේද යම් මනොරථයක් නිසා ප්‍රාණය දුන්නත් මෙලොවත් පරලොවත් යහපතක් විනා නපුරෙක් නැත, නුඹවහන්සේගේ වස්තත් බිඳ මෙසේවූ ද්‍රොහයක් කෙළෙමි, කැමැති නම් ආඥාවක් කරවා වදාරණ බවය''යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු ''එම්බල, මාගේ බොහෝ සත්කාර සම්මාන විඳ ඉඳිනා අමාත්‍ය ආදීවූ අය අපට මෙසේවූ පක්ෂපාතකමක් කරණ කෙණෙක් නැත, තොප මෙකළ පක්ෂපාතකම ඒ කවුඩු රජ්ජුරුවන්ට කළ දෙයෙක් නොවෙයි, මට කළ පක්ෂපාතකමය, එසේ හෙයින් තොපට අඥාවක් නොකරවම්, තොපට මාගේ රාජ්‍යයෙන් පූජාකෙරෙම්'' කියා රාජ්‍යය පූජා කළහ.

එවිට 'සුමුඛ නම් සෙනෙවිරද්දු කියන්නාහු ''දේවයන්වහන්ස, අප තිරිසන්නුය, අපට සේසතින් ප්‍රයෝජන නැතැ''යි කියා තමන්ගේ සුපත්තා කවුඩු රජ්ජුරුවන්ගේ ගුණ විස්තර වශයෙන් රජ්ජුරුවන්ට කීහ. රජ්ජු රුවෝ කියන්නාහු ''තොපගේ කවුඩු රජ්ජුරුවනුත් උන්ගේ බිරින්දත් අප දකින්ව උවමැනවැ''යි කියන්නාහු සුමුඛ නම් සෙනෙවිරද්දු තමන්ගේ රජ්ජුරු වනුත් බිසවුනුත් රජ්ජුරුවන්ට පැහ.

එවිට රජ්ජුරුවෝ බොධිසත්ත්වයනුත් බිසවුනුත් දැක මහාසමාධිව තමන්ගේ මේ නිමන බතින් සුපත්ත නම් කවුඩු රජ්ජුරුවන්ට හා සුඵස්සා නම් බිසවුන්ට හා සුමුඛ නම් සෙනෙවිරදුන්ට හා තුන්දෙනාට බත්දෙවා සෙසු කවුඩන්ට සාල්තුනමුතෙක බත්දෙන්ව සලස්වාලූහ. කවුඩු රජ්ජුරුවන්ට

කවුඩුව කී බණ සත්සියයක් අවුරුදු තොනැසී පැවැත්තේයයි වදාරා සුපත්ත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවෝ තම් ආනන්දස්ථවිරයන්, සුමුඛ තම් සෙනෙවිරද්දු තම් ශාරිපුත්‍රස්ථවිරයන්, සුඵස්සා තම් බිසව් තම් යසෝධරා ස්ථවිරයන්, සුපත්ත තම් කවුඩු රජ්ජුරුවෝ තම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 286 කායවිචඡන්ද ජාතකය

මේවද මාගේ සවාමි වූ තිලෝගුරු බුදුරජාතන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පාණ්ඩුරෝග ඇති පුරුෂයකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

**හේ කෙසේ ද? යත්,**

පාණ්ඩුරෝග ඇති මනුෂ්‍යයෙකුට වෙදවරු බෙත්කොට අසාඛ්‍යය යයි කියා අළහ. නැසියොත් ලෙඩ අසාඛ්‍යයයි ආලිස්සන් වූහ. ඒ පුරුෂයා සිතන්නේ "ඉදින් මේ ලෙඩින් සම්නයෙක් වී නම් බුඩශාසනයෙහි මහණ වෙමි" සිතීය. ඒ සිතු ආනුභාවයෙන්ම ඒ ව්‍යාධිය නොබෝ දවසකින් සමන විය. එකියන පුරුෂයා මහණව උපසම්පදාව භාවනාකොට රහත්ව පිරිනිවන් පෑසේක.

එක්දවසක් භික්ෂූන්වහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්ව හිඳ "අසවල් තම් පාණ්ඩුරෝග ඇතිව මියන්ට උන් තැනැත්තේ "බුඩශාසනයෙහි මහණ වෙමි"යි යන සිතිවිල්ලෙන් මහණව භාවනාකොට රහත්ව නිවන් දුටුවෝදැ"යි කියා කියා වැඩ උන් තෙනට සම්ඵයන්වහන්සේත් වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "දැන් මතු නොවෙයි, පළමුත් නුවණැත්තෝ බුඩශාසනයේ මහණවෙමි යන සිතිවිල්ලෙන් රෝගය සන්සිඳුවා මහණවූවෝ වේදැ"යි එපවත් අසා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්ඵයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

**ඒ කෙසේ ද? යත්,**

පසිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ බ්‍රාහ්මණව ඉපිද වාසය කරණ කල්හි පාණ්ඩුරෝගයක් ඇතිව උපන් අවස්ථාවෙහි ගෙයි අඹුදරුවෝ නැසියෝ වෙදවරු අසාඛ්‍යව්‍යාධියයි කියා අළහ.

බොධිසත්ත්වයෝ සිතන්නාහු "මේ රෝගයෙන් මිදෙම්නම් මහණ වෙමි"යි යන සිතිවිල්ලක් සිතුනු නොබෝ දවසකින් ව්‍යාධිය සන්සිඳින. හිමාලය වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගෙණ උදන් අනන්නාහු; අඤ්ඤතරෙන, අට අනුවක් රෝගයන් අතුරෙන් එක්තරා; රොගෙන, ඛ්‍යඤ්ජන සවරූපයන් අතරන් රෝග තම්වූ; ව්‍යාධිනා, පාණ්ඩුරෝග සවරූප සංඛ්‍යාත රෝගයෙන්; බාලහං, දැඩිකොට, ඵුඨස්ස, පහරණලද; දුක්ඛ, දුකඩිතවූ; රූප්පතො, ව්‍යාධියෙන් පීඩිතවූ; මෙ,

මාගේ; **ඉදං කලෙබරං**, මේ කලේබරය; **ආතපෙ, ආතප** ඇති හෙවත් අවු පහරණ; **පංසුනි**, පාංසුවෙහි; **ඨත්ව, කරණලද**; **සඳුමං යථා, පද්මයක් මෙන්** වූයේය; **අජඤ්ඤං**, අපවිත්‍රවූ නොදතනැකිවූ මේ ආත්මය; **ජඤ්ඤසංඛාතං**, අඥාන සත්ත්වයන් විසින් පවිත්‍රයයි; **අසුචිං**, අපවිත්‍රවූ මේ ශරීරය; **සුචිසම්මතං** සුචියයි **දන්නාලදද**; **නානාකුණපපරිපූරං**, නොයෙක් කුණපයෙන් පරිපූර්ණවූ මේ ශරීරය; **අපස්සතො**, සුණවයුතුයින් බලන්නාහට; **ජඤ්ඤරූපං**, දත හැකිවූ **සවරූප** ඇත්තේයි; **යත්ථ**, යම් ශරීරයෙක්හි; **අසමුච්ඡිතා, ක්ලේශ** මූර්ඡාවෙන් අනිශයින් මූර්ඡාවූ; **පජා, සත්ත්වයෝ**; **සුභතුප්පතිතියා**, සප්ත කාම **සවගීයෙහි**; **මඤ්ඤං**, මාගීය; **හාපෙන්ති**, පිරිහෙද්ද; (එසේවූ සත්ත්වයන් ඇත්එවූ) **පේගුවසීයං**, ප්‍රතිකූලවූ; **අසුචිං, සුචිනොවූ**; **වාධිධම්මං, වාධිප්‍රකෘති ඇති**; **ඉමංපූතිකායං**, මේ කුණප ශරීරයට; **ධිරත්ථු**, නින්දාවෙයි **කියා** වදාරා **කායවිච්ඡන්ද ජාතකය නිමවා** වදාළසේකි.

**එසමයෙහි** බ්‍රාහ්මණ තාපසව **උපන්නෙම්** බුදුවූ මම්මය යි වදාළසේකි.

---

## 287 ජම්බුඛාද ජාතකය

**තී**වද හුදුකරුණාවෙන් මවාලූ රුවක් **වැනි සම්බුදයන්වහන්සේ** වෙළු **චාරිකාමයෙහි** වැඩවසන **සමයෙහි දෙවදත්ත සථවිරයන්වහන්සේ හා කොකාලික සථවිර** යන්වහන්සේ අරභයා මේ ජාතකය **දක්වන ලදි**.

**ඒ කෙසේ ද? යත්,**

**කොකාලික සථවිරයෝ** තැනින්තැන ගොස් **උපාසකවරුන්ට** දෙවදත්ත සථවිරයන්ගේ ගුණ **කියන්නාහු** "දෙවදත්තසථවිරයෝ **නම් කෝලිය වංශයේ උපන්නාහ**. ධුතඞ්ගධරයන, ධ්‍යානලාභියන, ධම්කථිකයන"යි **කියා නොයෙක් ලාභසත්කාර උපදවන්නාහ**.

**දෙවදත්තසථවිරයන්වහන්සේත් කොකාලිකසථවිරයන්ගේ ගුණ කියන්** නාහු "**කෝකාලිකසථවිරයෝ** නම් බ්‍රාහ්මණකුලයෙහි උන්නාහ. ත්‍රිපිටක ධරයන, ධුතඞ්ගධරයන, ධ්‍යානලාභීන"යි යනාදීන් **ඔවුන්ගේ** ගුණ **කියා උපාසකවරුන්ගෙන් ලාභ උපදවන්නාහ** යි කීහ.

**මේ කථාව කියා කියා භික්ෂූන්වහන්සේ ධම්සභාවේ රැස්ව උන් තෙතව සම්බුදයන්වහන්සේ** වැඩ වදාරා "මහණෙනි, මා එන්නාවූ පුවීහාගයෙහි **කවර** කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා **එපවත් අසා දැන් මතු නොවෙයි පෙරත් කෝකාලිකසථවිරයන් හා දෙවදත්තසථවිරයෝ උනුනුන්ගේ ගුණ කියා උන්කෝවේදැ**"යි වදාරා "ඒ කෙසේදැ?"යි **ආරාධිතවූ සම්බුදයන්වහන්සේ** ඉකුන්වත් **දක්වා** වදාළසේක.

**පුරාතන** දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය **කරණ** සමයෙහි දඹගසක් උඩ ඉද කවුඩෙක් **දඹ කකා උන්නේය**. **එතනට කැණහිලෙක්** ඇවිත් ගසඋඩ උන් **කපුටුවා** දැක **මේ කපුටුවාගේ නැති ගුණ කියා** මොහු සිත්ගෙණ දඹ **කාමි සිහා** මොහුගේ ගුණ **කියන්නේ "මිහිරි**

කවහඬක් ඇති මොණරෙකුගේ පැහැයට බඳුවූ නිල්වූ යහපත් පැහැයක් ඇති පක්ෂීන්ට උතුම්වූ සපුටුවාතෙනි, දඹ අත්තඋඩ ඉඳ කුමක් කරණසේක්ද?"යි විචාළේය.

එවිට කපුටුවා කියන්නේ "ව්‍යාඝ්‍රපොතකයෙකු හා සමාන කැණහිලා තෙනි, උත්තමයන්ගේ ගුණ දන්නෝ උත්තමයෝය යි කියා පට දඹ දෙමි දඹ අනුභවකරව"යි කියා දඹ සලා එලීහ. ඒ දඹවනයෙහි වසන්නාවූ වෘක්ෂදෙවතා වෙක් බොරුකියන්නාවූ නීචක්‍රියා ඇති දෙන්නෙකු දුටු නියායයි කියා භයංකාර වේසයක් පා භයගන්වා උන් දෙන්නා එතනින් පහකළේයයි කියා වදුරා මේ ඡඛ්ඩාද ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි කවුඩා නම් දෙවදත්තසථවිරය, කැණහිලා නම් කෝකාලික සථවිරය, වෘක්ෂදෙවතාවා උපන්තෙම් බුදුවූ මම්මය යි වදාළසේකි.

---

## 288 අනන ජාතකය

තිවද මුදිතාවෙන් මවාලූ රුවක් වැනිවූ සවීඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කෝකාලිකසථවිරයන් වහන්සේ හා දෙවදත්තසථවිරයන් අරභයා මේ ජාතකය දක්වනලදි. මෙහි වර්තමාන කථාව පළමු කී ජාතකයෙහි පෙණෙන්නේය.

එවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ එඩරුවනයක දෙවතාව උපන්හ. එනුවර මීමෙකු මළ ගමනේ නුවරින් පිටතට එඩරුවනය ගාවා ඇදපූහ, ඒ කුණු කන්ට කැණහිලෙකු ඇවින් කමින් සිටිතැනට කපුටුවෙක් ඇවින් සිතන්නේ "මේ කැණහිලාව ප්‍රශංසා කොටම මුන් අතින් මස් ඉල්ලා ගන්ට වුවමැනවැ"යි සිතා ප්‍රශංසාකරන්නේ "වෘෂභරාජයකුසේ බඳුවූ කණක් ඇති සිංහරාජයෙකුට බඳුවූ ගාත්‍රයක් ඇති කැණහිලාතෙනි, කිසිවක් දෙවුදැ"යි කියේය.

එවිට කැණහිලා කියන්නේ "මිහිරි කඩහඬක් ඇති කපුටුවාතෙනි, උත්තමයන්ගේ ගුණ දන්නෝ උත්තමයෝය"යි කියා තමා කන කුණින් කැබැල්ලක් දුන්නේය.

ඒ වනයේ වසන්නාවූ දෙවතාවා "කැණහිලා සිවුපාවුන්ට අධමය, කපුටුවා පක්ෂීන්ට අධමය, එඩරුගස් වෘක්ෂජාතීන්ට අධමය, මේ තුන්දෙනා එක තැන්වූ නියා යහපතැ"යි වදුරා මේ අනන ජාතකය නිමවා වදාළසේක

එසමයෙහි කැණහිලා නම් දෙවදත්තසථවිරයන් වහන්සේය, කපුටුවා කෝකාලිකසථවිරය, වෘක්ෂදෙවතාව උපන්තෙම් බුදුවූ මම්මය යි වදුරා මේ අනන ජාතකය නිමවා වදාළසේකි.

---

## 289 සමුද්‍ර ජාතක

**ති**වද මෛත්‍රියෙන් මවාලූ රූපක් වැනිවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපනන්ද නම් ස්ථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වතලද.

**ඒ කෙසේ ද? යත්,**

ඒ උපනන්ද නම් ස්ථවිරයන් වහන්සේ "ඉතා ලොභීසේක. එක් ගෙයක සිවුරු හා එක්ගෙයක සැරවිය හා එක් ගෙයක පාත්‍රය තබා ඒ ගෙවල් තුතම මාගේ යයි ලාභ ගන්නාසේක. මහාලොභීසේක. අනුන්ට "ලොභ නොකරව"යි බණ කියනසේක. තමන්වහන්සේ ගරු භාණ්ඩ ආදිය පිළිගන්නසේක.

යම් තෙනකට යන සේක් නම් ගැල්පවිවාගෙණ යන්කාසේ නොයෙක් ගරු භාණ්ඩ පටවාගෙණ යනසේක. අනුන්ට ගරුභාණ්ඩ නොගනු"යි බණ කියන සේකැ"යි යන කථාව භික්ෂූන් වහන්සේ ධර්මසභාවේ රැස්ව කියා කියා වැඩ උන්තෙනට සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුද"යි විචාරා වදාරා මෙපවත් අසා "මහණෙනි, තමන් මෙසේ කොට අනුන්ට අවවාද කිම යහපත් නොවන්නේවේද"යි නින්දා කොට වදාරා "දැන් මතු නොවෙයි. මහණෙනි, පෙරත් මූ මහාලෝභීව සමුද්‍රයේ පැන් බොහෝ අනුන්ට බොන්නට නපුරුයි අවවාද කළ කෙණෙක් වේද"යි වදාරා "ඒ කෙසේදැයි?" ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**පි**ටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ආකාශයෙන් යන දියකාවෙක් කියන්නේ "දැනි මෝරුන් කුඩම්මැස්සන් ආදීවූ මත්ස්‍යයෙනි මුදපැන් විතරක්සේ බොව, පැන් බොහෝ කොට බීවොත් තෝ නසීය"යි කියා ඇවිදින්නේය. සමුද්‍රයේ වසන දෙවතාවා කියන්නේ "මේ කොයි පක්ෂියෙක්ද? සමුද්‍රයේ වසන මත්ස්‍යයන්ට පැන් නොබොන්නට කියාගෙණ යන්නේය"යි විචාළේය.

දියකාවා කියන්නේ "මම දියෙහි වසන්නාවූ දියකාවෙකි. සමුද්‍රයේ පැන් නැසෙති කීමී" කීහ. එවිට දෙවතාවා කියන්නේ "නීවවූ සමුද්‍රකාකය, මේ සමුද්‍රයේ දිය එක්තොතෙකුන් විසින් බී අඩුකොට ගතහැක්ද"යි කියා උඩව හයංකාර වේශයක් දක්වා එතනින් පහකොට පුව සි වදාරා මේ සමුද්‍ර ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි සමුද්‍ර කපුටුවා නම් උපනන්ද භික්ෂුහුය, සමුද්‍ර දෙවතාව උපන් නෙම් බුදුවූ මම්ම වේද යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 290 කාමවිලොපන ජාතකය

**මේ** වදන හුදුසිලයෙන් මවාලූ රුවක් වැනි සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පුරාණ දුතියිකාව අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

මෙහි වර්තමාන කථාව යටකී **පුෂ්පජාතකයෙහි පෙණෙන්නේය.** මෙහි වණ්ණක්මල් කඩාගිය පුරුෂයා උලපිට උන්නේය. තමා විඳිනා දුකඛ වෙදනාවට වඩා "මා මෙසේවූ නියා නොදැන කොයි හියේදෝ හෝයි සිතා මාගේ සත්‍රී විසෙෂප දෝ හෝ යි යන දුකඛය මට වේදනාය යි සිත සිතා උන් තැනට **එක් කවුඩුවෙක්** ආකාශයෙන් යන්නාහු දැක කියන්නේ "සබඳ පක්ෂිය, දුක් වේදනා නොදැන ඔබ්බට හිය යි මා කෙරේ විසෙෂපව සිටියි යන සෝකය මට මේ වේදනාවටත් වඩා වේදනාය. එසේහෙයින් තොපි **හොස්** මා දුකඛයට පැමිණි නියාවත් කියාලා මා ගෙයි ඇඳ ඉස්දෙර උපුල්මලව බඳු පැහැ ඇති සන්නාහයකුත් රන් පසළොස් කළඳකින් කරණ ලද පේරැස් මුද්දකුත් ශුභ්‍රවූ කසිසළුවකුත් තුබූයේ මේ වස්තු තුණ ඇරගෙණ දුටුවාසේ ශොක නොගෙණ ප්‍රයෝජන විඳිනව කියව"යි කියා යවා එම උලපිට ඉදම කාලක්‍රියාකොට නරක යෙහි උපනැ යි වදාරා මේ **කාමවිලොපන ජාතකය** නිමවා වදාළසේකි.

එසඔයෙහි **මේ** කාරණය ප්‍රත්‍යක්ෂප කොට දුටු නාගරාජ දෙවතාවා නම් බුදුවූ **මම්මය** යි වදාළසේකි.

---

## 291 උදුම්බර ජාතකය

**මේ** වදන හුදු ක්ෂාන්තියෙන් මවාලූ රුවක් වැනි සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි **එක්තරා** භික්ෂුකෙනෙකුන් වහන්සේ වාසය කරණ සේක.

උන්වහන්සේ වාසයකරන්නාවූ විහාරය **සිත්කලුය,** ඡායාසම්පන්නය, පැන් ඵාසුය, උපසකවරුන් ආවේනිකව පස දෙන්නාහ. මෙසේ බොහෝ දව සක් ඒ විහාරයේ වාසය කරණ කල්හි එක් ආගන්තුක භික්ෂුකෙනෙකුන් වහන්සේ විහාරයට වැඩිසේක. උන්වහන්සේට ආගන්තුක සාදකකම් කොට උපාසකවරුන් ලවා පසුගත් දෙවා කිපදවසක් විහාරයෙහි වාසය කොට ආගන්තුක තම සිතසේක් "මේ විහාරය ඵාසුය, මේ භික්ෂූහු පහකොට මා මෙතන වාසරය කරන්ට උවමැනවැ"යි සිතා "ඇයි ඇවැත්නි, බුදොපසථානයට නොයෙදුද? බුදුන් නොදැක වාසයකරන්ට සුදුසුදැ?"යි වදාළසේක.

උන්වහන්සේ වදාරණසේක් "බුදුන් දකින්ට අභිප්‍රාය ඇත්තෙමි. මාගේ විහාරය පාලු වේ දෝ හෝ යි සිතා විහාරය බලනකෙනෙකුන් නැති හෙයින් නොයන්නෙමි"යි වදාළසේක. එවිට ආගන්තුක භික්ෂූන්වහන්සේ වදාරණ සේක් "තමන්වහන්සේ එනතෙක් විහාරය බලමි. තොපි ගොසින් බුදුන් දැක එන්නේ යහපතැ"යි කියසේක.

උන්වහන්සේත් ආගන්තුක භික්ෂූන්වහන්සේට විහාරය පාවාදී උපාසක වරුන්ට උපසථාන කරන්ට සලස්වා බුදුන් දකිනා නියා ජේතවනාරාමයට වැඩි සේක. උන්වහන්සේ ජේතවනාරාමයට ගොස් එතකලට ආගන්තුක භික්ෂුතෙම විහාරයත් ගම උන් උපාසකවරුනුත් අත්හෙණ උන්වහන්සේට වැඩඉදිනා තෙනක් විවරකුත් අවසරයක් නුදුන්සේක.

උන්වහන්සේ වෙන විහාරයක සැතපී "මුන්වහන්සේ කුමක් උවත් මා බොහෝදවසක් වාසයකළ ගම උපාසකවරු මට ආවේනිකව තොසිතන්දැ?"යි උදෑසනක්සේම උන්වහන්සේ ගමට සිනාවැඩිසේක. උපාසකවරුත් දන් දෙන්නා තබා සාමීචිකථා පමණකුත් නොකළෝය. උන්වහන්සේ උන් ඇම කෙරේ විපරීත නොව මෙතන වාසයකරන්නේ කිම්දැ යි නැවතත් ජේතවනා රාමයට වැඩිසේක.

මේ කථාව දම්සභාවේ රැස්වූ මාලුවරුන් වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සම්බුදුයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු කොවෙයි පෙරත් මුන්ගේ වාසස්ථානය උදුරාගත්තේවේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පෙරගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රජ්ජය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ වනානන්තරයෙහි වෘක්ෂදෙවතාව උපන් සේක, එතනට නුදුරු ගල්ගුහායෙක රත්වූ මුඛඇති කුඩා වඳුරෙක් වාසය කරන්නේය. සත් රැ සත්දිවලක් නොහැර ඝනවර්ෂාවක් වසින්ට වත.

එවිට එක් කෘෂ්ණ මුඛ නම් මහත් වානරයෙක් වැස්සේ තෙමී ඒ ගල් ගුහාව සමීපයට අවුත් සිතන්නේ "බොරුවක් කියා මේ වඳුරා මෙතනින් පහ කොට මේ ගුහාව ගණිමි" සිතා ඒ ඵලාඵල කෑ එකෙකුමෙන් බඩපුප්පා කියන්නේ "වඳුර, මේවනයේ අඹදඹනුග ආදීවූ යහපත් ඵලාඵලඇති ඒ අනුභව කොට පියා එව"යි කියා ඒ වඳුරා එතනින් පහකොට තෙමේ ගල්ගුහාවට වැද උන්නේය. ඒ කුඩා වඳුරාද ඒ වනය මුළුල්ල ඇවිද නුගගෙඩියක් විවරකුත් නොදැක ගල්ගුහාව සමීපයට අවුත් මේ වඳුරා මා වඤ්චනාකොට මෙතනින් පහ කොට පියමි සිතන්නේ "තොප කී සැටියේ වනාන්තරයට වැද අඹ දඹ ආදීවූ ඵලාඵල අනුභවකොට ආමි. තොපිත් ගොසින් ඵලඵල අනුභව කොට එව"යි කීහ.

එවිට ඒ මහවඳුරා කියන්නේ "මේ වනයේ ඵලාඵලයෙක් කොතනක ඇද්ද? යටත්පිරිසෙයෙන් අඹදඹ තබා කුඹුක්ගෙඩියක් පමණකුත් මේ වනයේ ඇද්දැ?"යි කියා ඒ ගුහායෙන් නොගියේ වේදැ"යි වදාරා මේ උදුම්බර ජාතකය නිමවා වදාළසේකි.

එසමයෙහි කුඩා වානරයා නම් නෙවාසික භික්ෂූහුය, මහාවානරයා නම් විහාරය තැර උන් ආගන්තුක භික්ෂුහුය, වෘක්ෂදේවතාවා උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

# 292
# කුමාරපඤ්ඤ ජාතකය

තීවද හුදුප්‍රඥාවෙන් මවාලූ රූවක් වැනිවූ සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර උත්තරාරාමයේ වැඩවසන සමයෙහි ක්‍රීඩාශීලීවූ සාමණේර වහන්දැ අරභයා මේ ජාතකය දක්වතලද.

**ඒ කෙසේද? යත්**

සම්බුදුරජාණන් වහන්සේ උඩුමාලේ ඉන්දදී යටමාලේ ඉඳිනා සාමණේරයන් වහන්දැ බොහෝසේ අරගල කොට උනුන් හා මහත්කොට දෙඩා කෝලාහල කළසේක.

සම්බුදුරජාණෝ එපවත් අසා සැරියුත් සාමින්ට "ශාරීපුත්‍රස්ථවිරය මේ යට මාලේ හිඳිනා භික්ෂූහු බොහෝ කොට අරගල කරන්නාහ. උන් හයගන්වා මතු අරගල නොකරණ ලෙස භික්මව"යි වදාළ සේක.

එවිට ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ එගෙයි කොත්කැරැල්ල පයින් අල්ව ගෙණ සොලවාලූසේක. එවිට යටමාලේ උන් සාමණේරයන් වහන්දැ උනුන් ඇඟහැසී හයින් තැතිගෙණ දෙරට ගොස් මලුවේ සිටිසේක එතකට ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ වැඩ "අරගල නොකරව"යි හැඟැන්වූ සේක.

මේ කථාව දම්සභාවේ රැස්වූ මාලුවරුන්වහන්සේ කිය කියා උන්තෙනට සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා එපවත් අසා "මහණෙනි, මේ සාමණේරයෝ දැන්මතු නොවෙයි, පෙරත් ක්‍රීඩාවෙහි තත්පරයෝ වෙත්දැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සඳහන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ කුමාරපණ්ඩිත නමින් යුක්තව බ්‍රාහ්මණ කුලයක ඉපිද පඤ්චකාමයෙහි ආදීනව දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඒ වනාන්තරයට වන්නාහ.

ඒ වනානන්තරයෙහි පන්සියයක් තාපසවරු එක් පන්සලෙක වාසය කරන්නාහ. උන් හැම කෙළිතා ක්‍රීඩා වානරයෙකුත් ඇත. ඒ තාපසවරු ලූණු ඇඹුල් නිසා මනුෂ්‍යපථයට ගියාහු එකල බොධිසත්ත්වයෝ ගොස් ඒ පන්සල උන්නාහ. ක්‍රීඩාවානරයා පළමු තාපසවරු සේම වනැයි සිතා ඒ තාපසයන්ට මුඛවිකාර දැක්විය. එවිට බොධිසත්ත්වයෝ "එඹුල වානරය, තාපසවරුන් ලඟ වසන්නාහු සුශික්ෂිත උවමැනවැ"යි ආචාරසීලයෙන් යුක්තව උවමැනවැ"යි වානරයා භික්මවූ සේක.

එතැන්පවත් වානරයා භික්ම ආචාරසීලයෙන් දවස අරින්නේය. ඒ තාපසයෝත් පන්සලින් ඔබ්බටකට ගියසේක. එතන වාසය කළ තාපසවරු ලූණු ඇඹුල් සපයාගෙණ තමන් වාසය කළාවූ පන්සලට ආවාහ. එවිට ඒ වානරයා පළමු පරිද්දෙන් නොකළ බැණනොනැගී උන්නේය. එවිට තාපසවරු කියන්නාහු "ඇයි? වානරය, තෝ පළමු අප හා හසුනවිකාර මුඛවිකාර පෑ කෙළනෙහි වෙද්ද? දැන් නොකෙළින්නේ ඇයිදැ"යි විචාළහ.

එවිට වානරය කියන්නේ "එම්බා තාපසවරුනි, කුමාරපත්තතම් තාපසයන් වහන්සේ මට අවවාද කළසේක. එසේහෙයින් උන්වහන්සේ කී අවවාද මා සිත ඇත. පෙරසේ නොකෙළෙමි" කිය. "එසේ නම් අපට අවවාද කියා ගිය නියාවේදැ"යි වදුරා මේ කුමාරපත්ත ජාතකය තිමවා වදුළසේකි.

## 293
## බක ජාතකය

මේවද හුදු සබඹයෙන් මවාලූ රුවක් වැනිවූ සම්බුදුගුණයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උපසේන නම් මහතෙර කෙනෙකුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලදි.

මෙහි වර්තමාන කථාව සූත්‍රපිටකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

උපසේන ස්ථවිරයන් වහන්සේ බාලවහන්දැ එක්කොටගෙණ දුස්සීලව වාසය කරණසේක, සම්බුදුගුණයන් වහන්සේ එපවත් දැන කෝපකොට වදුළසේක උපසේන මහතෙරුන් වහන්සේ භාවනාකොට ධ්‍යාන උපදවා රහත්ව තෙළෙස් ධුතාඞ්ගධරව වාසය කරණ කල්හි එක් දෙදෙනෙකුන් වහන්සේ විවාදය නිසා බුදුහු පාටලීවනයට වැඩ වාසය කරණ සේක්, එසමයෙහි උපසේන නම් මහතෙරුන්වහන්සේ ධුතාඞ්ගධරව වහන්දැ ඇරගෙණ සම්බුදුගුණයන් වහන්සේ කරා පාවලීවනයට වැඩිසේක.

සම්බුදුගුණයන් වහන්සේ 'ධුතාඞ්ගධර වහන්දැ විතා නොවන වහන්දැ මා දකින්ට නොඑත්ව"යි වදුළ සේක. එවිට ධුතාඞ්ගධර නොවන වහන්දැ පාංශුකූලචීවර පෙරවා ධුතාඞ්ගධරව සම්බුදුගුණයන් දුටුසේක.

භික්ෂූන්වහන්සේ බුදුන් ජේතවනාරාමයට වැඩිය පසු පාංශුකූල චීවර යන් හැර තෙළෙස් ධුතාඞ්ගයන් හළසේක. එවිට බුදුහු වදාරණ සේක් "මුන් හැමගේ සිල්රක්ෂා කිරීම බක තම් සිව්පාවා රැක්කාවූ සීලය මෙන"යි වදුළ සේක. "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුගුණයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදුළ සේක.

### ඒ කෙසේද? යත්

අතීතය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ.

එසමයෙහි බක නම් සිව්පාවෙක් ගඟක් අසලක පිටුපනණෙක වාසය කරන්නේය. ඒ ගඟ වතුර ඇවිත් ගල්පොත්ත වටකොට මහවතුර ගලාගෙණ එනවිට බක නම් සිව්පාවා සිතන්නේ "මෙතනින් මා ඔබ්බකට යානොහැක්ක පෙහෙවස් රක්ෂාකෙරෙමි"යි කරබාගෙණ බැණනොනැගී උන්නේය. එවිට ශක්‍රයෝ "මුගේ සීලය පරීක්ෂාකරන්ට උවමැනවැ"යි සිතා එළුවෙසක් මවා ගෙණ ලඟට ආවාහ. එවිට බක නම් සිව්පාවා "එළුවා කම්" සිතා පිටට පැනපීය. ශක්‍රයෝ අන්තර්ධානවූ සේක. දෙවනුවත් ගල්ලැල්ලව නැගී "මට ප්‍රාණඝාතය සිඳනුවූ හෙයින් මාගේ සීලය බණ්ඩනූයේය"යි සිතා උන්නේය. එවිට ශක්‍රයෝ දිව්‍යාත්මභාවයෙන් සිට මේ තෝ සිල්රක්ෂා කරණ මානදැ?"යි කියා දෙව්ලොව ගියාහ.

ඒ අර්ථය දක්වන සමීඥයන් වහන්සේ වදාරණසේක් "භික්ෂූහු මා එළඹ සිටිනාතුරු ධුතාඞ්ගධර යමෙහ"යි කියා අඟවා මා ජේතවනාරාමයට වැදුනාම පාංශුකූල චීවරය හැර ධුතාඞ්ගයන් අළහ මුත් රැකි සීලය නම් බක නම් සිව් පාවා එළුවා පිටට පැන වැරදගිය කල්හි මට ප්‍රාණඝාතය සිඳනුවූයේය. මාගේ සීලය බණඩනුවූයේයයි සිතා උන් බක නම් සිව්පාවා මෙන"යි බොහෝ භික්ෂූන් වහන්සේට බණ වදාරා "සීලය රක්ෂාකරණ කල නම් සිල්රකින්නා පරිද්දෙන් සුශික්ෂිතව සීලය රක්ෂා කළ මැනවැ"යි අවවාද වදාරා මේ බක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ශක්‍රදේවේන්ද්‍රව උපන්නෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැ යි තමන්වහන්සේ දක්වා වදාළ සේකි.

---

# තිකනිපාත වණ්ණනාව නිමි

---

## 294 චූල්ලකාලිඞ්ග ජාතකය

තිවද එක්සමයෙක්හි පරහිත නිරතවූ සකල ජනමන නයකානන්ද කරවූ ශාස්තෘවූ අප තිලෝගුරු බුදු රජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් සතර පරිබ්‍රාජිකා කෙනෙකුන්ගේ පැවිදිවීමක් අරභයා මේ ධර්ම දෙශනාව ප්‍රකාශකොට වදාළ සේක.

**ඒ කෙසේද? යත්**

විශාලාමහනුවරෙහි වතාහි සත්දහස් සත්සිය සත්දෙනෙක් ලිච්ඡවීරජහු වෙසෙති. ඒ සියළු රජදරුවෝ ඔවුනොවුන් හා සාකච්ඡාකිරීමෙන් කල්පනාවක් කරන්නාහු ඊට ඉක්බිතිව පන්සියයක් වාදබිණීමෙහි නිපුණවූ එක් නිඝණ්ඨපුත්‍රයෙක් මෙම විශාලාමහනුවරට පැමිණියේම ඒ රජදරුවෝ ඔහුට සුදුසු සංග්‍රහ කළාහුය.

අනිකුදු පන්සියයක් වාද බිණීමෙහි නිපුණවූ නිගණ්ඨ පරිබ්‍රාජිකාවක් එම නුවරට පැමිණියාය. ලිච්ඡවි රජදරුවෝ ඔවුන් දෙදෙනා වාද කරවූවාහුය. ඒ කිරීමෙන් ඔවුන් දෙදෙනා සදෘශවූවාහුය. ඉක්බිති ලිච්ඡවි රජදරුවන්ට මෙබඳුවූ සිතිවිල්ලෙක් වූයේය. "මොවුන් නිසා උපන් පුත්‍රයෙක් ව්‍යක්තවන්නේය'යි සිතා ඔවුන් දෙදෙනා විවාහකරවා සමග වාසය කෙරෙව්වාහුය. ඔවුන්ගේ සංවාසය නිසා පිළිවෙළින් දූන් සතරදෙනෙකු හා එකම පුත්‍රයෙක් වැදුවාය. ඒ දූන් සතරදෙනාට ක්‍රමයෙන් සච්චාය, ලෝලාය, අවවාදකාය, පවාවාරු ය යි නම් කළහ. පුත්‍රයාට සච්චකය යි නම් කළාහුය. ඔවුන් පස්දෙන වියතුන් බවට පැමිණිකල මැනියන්ගෙන් පන්සියයෙක පියානන්ගෙන් පන්සියයෙකැයි වාද දහසක් උගත්නාහුය. මව්පිය දෙදෙන දූන් සතරදෙනාහට මෙසේ අවවාද කළාහුය.

"ඉදින් ගෘහස්ථ පුරුෂයෙක් නොපගේ වාදය බින්දේ නම් ඔහට පාද පරිචාරිකා වවු, පැවිදිකෙනෙක් නොපගේ වාද බින්දේ නම් සමීපයෙහි ඔහුගේ පැවිදිවේවා"යි කීවාහුය.

එයින් මෑතභාගයෙහි මව්පිය දෙදෙන කාලක්‍රියා කළෝය. ඔවුන් කලක්‍රියා කළ කල්හි සව්වක නම් නිගණ්ඨපුත්‍රයා ඒ විශාලා නුවරෙහි ලිච්ඡවි රජදරුවන් අක්ෂර ලිඛිතාදි ශිල්ප උගන්වමින් වාසය කෙරෙයි, ඔහු සතර දෙන දඹ අත්තක් නෙණ වාදය පිණිස නුවරින් නුවර ඇවිදිනාහු ක්‍රමයෙන් සැවැත්නුවර වාසල්දොර සමීපයෙහි දඹ අත්ත හිටුවා "යම්කිසි ශ්‍රමණයෙක් හෝ පරිබ්‍රාජකයෙක් හෝ අපට වදුරොපණය කරන්ට හැකිවී නම් ඒ පුරුෂ තෙම මේ පාංශුරාසිය පයින් විසුරුවා පයින් දඹඅත්ත මිරිකාපියත්ව"යි කියා ගම්දරුවන්ට කියා පිඩු පිණිස නුවරට වත්තාහුය.

ඉක්බිති ආයුෂ්මත්වූ දම්සෙතෙව් සැරියුත් මහතෙරුන් වහන්සේ තොහැමදිතැන් හැමද සිස්භාජනය දියපුරවා ගිලන් භික්ෂූන්ට පිළිදගුම් කරවා ඉතා දහවල්හි සැවැත්නුවරට වඩනාසේක් ඒ පස්රැස පිහිටුවූ දඹ අත්ත දැක විචාරා ගම්දරුවන් ලවා නොලවා මිරිකවා "යම්කෙනෙකුන් විසින් මේ ශාඛාව පිහිටුවන ලද්දීද? ඔහු ආහාර කෘත්‍යයකොට අවුත් දෙව්රම්වෙහෙර දොරටුවෙහිදී මා දකිත්ව"යි ගම්දරුවන්ට කියා නුවරට වැද කරණලද ආහාරකෘත්‍ය ඇතිසේක් දෙව්රම් වෙහෙර දොරටුවෙහි වැඩසිටිසේක.

ඒ පරිබ්‍රාජිකාවෝ සතරදෙන පිඩු පිණිස හැසිර ආහාර කිස සපයා ආවාහු මිරිකා හෙළූ ශාඛාව දැක "කවරක්නු විසින් මේ ශාඛාව මර්දනයකරණ ලද්දාහු වෙද්දැයි" විචාළෝය. "ශාරිපුත්‍රස්ථවිරයන් විසිනැ"යි අසා "ඉදින් තොපි වාදය කරණු කැමැත්තාහු විනම් දෙව්රම්වෙහෙර වාසල් දොරටුවට ගියමැනවැ"යි කියනලද්දාහු නැවත නුවරට ගොස් මනජනයා රැස්කරවා වෙහෙර වාසල් දොරටුවට ගොස් තෙරුන්වහන්සේ අතින් වාදදහසක් විචාළාහුය. තෙරුන්වහන්සේ ඒ සියළු වාදයන් විසඳූ "අන්කිසි වාදයක් දනුදැ"යි විචාළසේක. "ස්වාමීනි, අපි නොදනුම්හ"යි කීවාහුය. "මම වතාහි අන්කිසි ප්‍රශ්නයක් විචාරම්දැ"යි කීසේක. ස්වාමීනි විචාළ මැනවැ"යි දනිතොත් කියන් නමෝ වේදැ"යි කිවුය.

තෙරුන්වහන්සේ "එසෙක් නම් කිම්දැ"යි විචාළසේක. ඒ පරිබ්‍රාජිකාවෝ සභාවවූ පරිද්දෙන් නොදන්නාහුය. එවිට තෙරුන්වහන්සේ විසඳූ වදාළසේක. ඔහු "ස්වාමීන්වහන්ස, අපට පරාජයය, නුඹවහන්සේට ජයවීය"යි කීවාහුය. "දැන් තොප කුමක් කරවිද්ද"යි විචාළසේක. අපගේ දෙමව්පියන් විසින් මෙබඳු අවවාදයක් දෙනලද ඉදින් තොපගේ වාදය ශ්‍රමණයෙක් බින්දේ වීනම් ඔහුට පාදපරිචාරිකා වවු, ඉදින් පැවිදි කෙනෙක් බින්දේ වීනම් ඔවුන්ගේ සස්නේ පැවිදිවවුයයි කීවාහුය. එබැවින් අපට පැවිදිවීම දුතමැන වැ"යි කිවුය.

තෙරුන්වහන්සේ "යහපතැ"යි වදාරා ඒ පරිබ්‍රාජිකාවන් සතරදෙනා උත්පලවණී මහාසුථවිරාවන් වහන්සේගේ සමීපයෙහි පැවිදි කරවූසේක. ඒ සියලු මෙහෙණින්නෝ පැවිදි කරවූ නොබෝ කලකින් රහත් බවට පැමිණියා හුය.

ඉක්බිති එක් දවසක මේ ආශ්චර්‍යත්‍ව කථාශ්‍රවණයෙහි කෝතූහල භික්ෂූන්වහන්සේ ධර්මසභාමණ්ඩපයෙහි රැස්ව ඉඳ "ඇවැත්නි, ශාරිපුත්‍රස්ථවිරයෝ පරිබ්‍රාජිකාවන් සතරදෙනාට මාඝඵල ප්‍රදානය කිරීමෙන් අත්වැසූසේක් වේදැ"යි උන්වහන්සේගේ ප්‍රඥා විශෙෂගුණය ප්‍රකාශකොට කීමෙන් වැඩ

උන්සේක් එකල්හි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ එතැන්හි වැඩවදරා "මහ ණෙනි, දැන් මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාළ සේක. "සවාමීනි, බුදුරජානන් වහන්ස, රාජාකථා ආදීවූ අන් කථාව කින් යුක්තව උනුමෝ නොවම්හ. ශාරිපුත්‍රස්ථවිරයන් කරණලද ආශ්චර්‍යත්වූ මෙතම් කථාවක් කිය කියා උනුම්හ"යි දැන්වූ කල්හි "මහණෙනි, ශාරිපුත්‍රස්ථ විරයෝ මේ පරිබ්‍රාජකාවන්ට අවශ්‍යවූයේ දැන් මතු නොවෙයි. පෙරත් වැඩෙහි යෙදීමෙන් අවශ්‍යවූය, දැන් ප්‍රව්‍රජ්‍යානිසේක දීමෙන් අවශ්‍යවූසේක. පෙරත් රාජ මහෙසිකානිසේක සථානයෙහි පිහිටවීමෙන් අවශ්‍යවූය"යි වදරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

පිවගිය දවස කලිඟුරට දන්තපුර නුවර කලිඟු නම් රජක්හු රජකරණ සමයෙහි අස්සක නම් රට පොතලිනුවර අස්සක නම් රජෙක් රාජ්‍යය කෙරෙයි ඔවුන් දෙදෙනා අතුරෙන් කලිඟුරජ සමෘද්ධවූ හස්ත්‍යශ්වරථානාදී බලසෙනග ඇතිව තෙමේද ඇත් බලු ඇත්තේ තමා හා යුඬකරන්නක්හු නොදැක යුඬ කරණු කැමතිව ඒ රජ "මා හා යුඬකරණ කෙණෙකුන් නොදක්තෙම්. කවර ප්‍රයෝගයකින් යුඬයක් යොදම්දැ?"යි කියා අමාත්‍යයන් අතින් විචාළේය.

එවිට අමාත්‍යයෝ කියන්නාහු "මහ රජ්ජුරුවන් වහන්ස, එක් උපා යෙක් ඇත, නුඹවහන්සේගේ දූවූ කුමාරිකාවෝ සතරදෙන උත්තම රූපශ්‍රීදරන් නාහ. ඔවුන් සියළු ස්ත්‍රී ආභරණයෙන් සරහා පිළිසන්වූ ආසනයෙහි වඩාහිඳුවා බළසෙනග පිරිවරණ ලද්දුවූ ඔවුන් ගම් නියම්හම් රාජධානියෙහි ඇවිදුවා යම් කිසි රජෙක් ඔවුන් තමන්ගේ ගෙයි ඇතුළත් කොට වාසයකරණු කැමැත්තේ වීනම් ඔහු හා සමග යුඬකරම්හ"යි කීවාහුය. ඒ කලිඟුරජ අමාත්‍යයන් කී පරිද්දෙන්ම කෙළේය. ඔවුන් ගිය ගිය තැන්හි රජදරුවෝද කලිඟුරජහට හසින් තමන් නුවරවලට වදින්ට අවසර නොදී අන්තපාතාදීවූ පඬුරු ගමන් කරවා පිටි නුවරදීම යපිමකොට වාසයකරත්. මෙපරිද්දෙන්ම සියළු දඹදිව මුළුල්ලෙහි ඇවිද අස්සක පොතලිනුවරට පැමිණියාහුය. එනුවරෙහි අස්සක රජ නුවර වාසල්දොර වස්වා පඬුරු ගමන් කරවූයේය. ඒ රජහුගේ නුවණැති කාශ්‍යපී, කාශ්‍යපී පරිඥතයෙහි ව්‍යක්තවූ උපාය ඥතයෙහි දක්ෂවූ තන්දිසේන නම් අමාත්‍ය යෙක් ඇත, ඒ තෙමේ මෙබඳු සිතිවිල්ලක් සිතීය. "මේ රාජකුමාරිකාවෝ වනාහි සියලු දඹදිව්තෙලෙහි සැරිසරා ඇවිද ප්‍රතියුඬ කරණ කෙනෙකුන් නොලද්දාහුය. එසේ කල්හි සියලු ජම්බුවීපය හිස්වූයේ නම් වන්නේය. මම කලිඟු රජ හා සමග යුඬකෙරෙමි"යි කියා නුවර වාසල්දොරට ගොස් දොරටුපාලයා කැඳවා ඒ රාජකන්‍යාවන් නුවරට වදනා පිණිස කියනුයේ "කලිඟුරටට ප්‍රධානවූ රජහට කලිඟුරජය යි කියා යම්සේ ව්‍යවහාරවීද? එපරිද්දෙන්ම අරුණ කුමාර යන් වහසේ අපගේ මේ අස්සක නුවරට අධිපතිවූ හෙයින් අස්සකය යි නම් ලත් රජහු පුරුෂශ්‍රේෂ්ඨවූ ගුරුවරයන් විසින් මොනවට අනශාසනා කරණ ලද් දුවූ තන්දිසේන නමැවූ මා විසින් සුරක්ෂිතවූ වාසල්දොර මේ රාජකන්‍යාවන් ගෙණ ඝර ප්‍රවේශය පිණිස කරණලදැ යි අමාත්‍යයන් විසින් මෙසේ කියා දොර හරවා ඔවුන් ගෙණ ගොස් අස්සක රජහට දක්වා "රජ්ජුරුවන් වහන්ස, භය නොඟත මැනව. යුඬ ඇති කල්හි ඊට සුදුසු කාරිය මම දනිමි"යි "මේ උත්තම රූපශ්‍රී ධරවූ රාජකන්‍යාවන් අගමෙහෙසුන් කරව"යි කියා ඔවුන්ට අභිෂෙකදී ඔවුන්

සමග ආවාවූ රාජපුරුෂයන්ට "සගයෙනි, තොප තොපගේ නුවරට පලාගව"යි "රාජ කන්‍යාවන් අස්සක රජහු විසින් අගමෙහෙසුන් තනතුරෙහි තුබූ බව තොපගේ රජහට කියව"යි කියා ගමන් කර වූයේය.

ඒ රාජපුරුෂයෝ ගොස් එපවත් කලිඟුරජහට කීවාහුය. එබස් ඇසූ කලිඟුරජ "අස්සක මාගේ බලපරාක්‍රම නොදන්නේදැ"යි කියා එකෙණෙහිම මහත් සිවුරඟ සෙනඟ හා සමග යුද්ධයට සැරසී නික්මුනේය.

එපවත් ඇසූ නන්දිසේන අමාත්‍යයා කලිඟුරජහු යුඹයට සැරසී එන බව දැක තමන්ගේ රාජ්‍යසීමාවෙහි වෙසෙන්ව යි අපගේ රාජසීමාවට නොබසින්ව යි දෙරට සීමා මඩ්‍යයෙහි යුඹ වන්නේ"ය කියා අසුන් ලියා ගමන් කර වූයේය.

ඒ රජ අස්න අසා තමාගේ රාජ්‍යසීමාවෙහි සිටියේය. අස්සක රජ බළ සෙනඟ පිරිවරා තමාගේ රාජ්‍යසීමාවෙහි සිටියේය. එකල්හි පුරණලද බොධි සම්භාර ඇති අප මහබෝසතාණන් වහන්සේ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව දෙරට අතුරෙහිවූ එක් පන්සලෙක වාසය කරණ සේක.

කලිඟුරජතෙම "ශ්‍රමණයෝ නම් යම්කිසිවක් දනිති. යුද්ධයෙහි ජය පරාජය නම් කවරක් විසිනුදු නොදත හැක්කේය. එසේ හෙයින් එපවත් තාපසයන් වහන්සේ අතින් විචාරමි" සිතා අප්‍රසිද්ධ වෙශයකින් මහබෝසතාණන් කරා ගොස් නමස්කාර කොට එකත්පස්ව හිඳ පිළිසඳර කථාකොට "සවාමීනි, කලිඟුරජද අස්සකරජද ඔවුනොවුන් හා යුඹකරණු කැමැත්තාහු තමතමන්ගේ රාජ්‍යසීමාවෙහිම සිටියාවූ මොවුන් දෙදෙනා අතුරෙහි කවරක්හට ජය පරාජය වන්නේදැ"යි විවාළේය. "මහපින්වත්වූ පුරුෂය, මම අසවල් රජහට ජයය, අසවල් රජහට පරාජය වන්නේය යි නොදනිමි ශක්‍රදේවේන්ද්‍රයෝ වනාහි මෙතනට එන්නෝය. මම ඔහුගෙන් විචාරා කියමි. සෙට දවස මෙතනට එව"යි කීසේක. ශක්‍රදේවේන්ද්‍රයෝ මහබෝසතාණන් වහන්සේට උපසථාගතයව අවුත් උන්නෝය. ඉක්බිති මහබෝසතාණන් වහන්සේ ඔහු අතින් එම කාරණය විචාළසේක.

"සවාමීනි, තාපසයන් වහන්ස, කලිඟුරජහට ජයවන්නේය. අස්සක රජහට පරාජය වන්නේය. මෙබඳුවූ පූර්‍වනිමිත්තක් පෙණෙන්නේය"යි කීසේය. කලිඟුරජ දෙවෙනි දවස් ඇවිත් විචාළේය, මහබෝසතාණන් වහන්සේද ඔහට ඒ කාරණය කීසේක. ඒ රජ "කවර පූර්වනිමිත්තක් වන්නේදැ"යි නොවිචාරා "මම වනාහි දිනිමි." යන සන්තෝෂ චිත්තයෙන් ගියේය. ඒ කථාප්‍රවෘත්තිය රට පැතිර ගියේය. එබස් ඇසූ අස්සක රජ තන්දිසේන නම් අමාත්‍යයා කැඳවා "කලිඟුරජහට වනාහි ජයවන්නේය. අපි පැරදුනම්හ. මෙයට කවියුතු කිම් දැ?"යි කීයේය.

එබස් ඇසූ අමාත්‍යයා "මහරජාණන් වහන්ස, මේ යුද්ධ කිරීමෙන් කවර රජක්හටම ජය පරාජය වේදැ යි කවරෙක් දනීද? නුඹවහන්සේ එසේ නොසිතව මැනව"යි රජහු අස්වසාලා බෝසතාණන් කරා එළඹ නමස්කාර කොට එකත්පස්ව හිඳ "සවාමීනි, මේ යුඹයෙහි කවර රජෙක් ජය පරාජය වේදැ"යි විවාළේය. "නන්දිසේනය කලිඟු රජ දිනන්නේය. අස්සක රජ පරදින්නේය"යි කීයේය. "සවාමීනි, දිනන්නාට කවර පූර්‍වනිමිත්තක් පෙණෙන්නේද? පරදින්නාට කවර පූර්‍වනිමිත්තක් පෙණෙන්නේ දැ"යි විවාළේය.

"මහපිණෑති නන්දිසේනය, දිනන්නාහුගේ ආරක්ෂා දිව්‍යපුත්‍රයා සර්ව්ඛගධව ලවූවාඟහ වේසයෙන් පෙණෙන්නේය. පරදින්නාහුගේ ආරක්ෂා දිව්‍යපුත්‍රයා ලඟ කෘෂ්ණවණීවූ වාඟහයක් මෙන් පෙණෙන්නේය. ඔවුන් දෙදෙනාගේ ආරක්ෂාකොට දෙන දිව්‍යපුත්‍රයෝම යුද්ධකොට ජයපරාජය කෙරෙති කීයේය. එබස් ඇසූ නන්දිසේන නම් අමාත්‍යයා නැගීසිට ගොස් රජුගේ සඟයවූ දඟසක් පමණ මහා යෝධයො ඇත, ඔවුන් ගෙණ එතනට නුදුරු තන්හි එක්පළිතයක නැඟී "පින්වත්නි, අපගේ රජ්ජුරුවන් වහන්සේගේ ජීවිතය රක්ෂා කොට දෙන්ට හැකිදැ"යි විචාළේය. ඒ තෙපුල් ඇසූ යෝධයෝ "එසේය, ජීවිතය රක්ෂකරන්ට හැකිවමිහ"යි කීවාහුය. "එසේ වීනම් මේ ප්‍රපාතසථානයෙහි වැටෙවු ද"යි විචාළේය. එබස් ඇසූ දඟසක් පමණ ඒ යෝධයෝ ප්‍රපාතසථාන යෙහි වැටෙන්ට පටන්ගත්තාහුය. ඒ වේලෙහි ඔවුන් වලක්වා "ප්‍රපාතසථාන යෙහි වැටී මියගියාගින් ප්‍රයෝජන කිම්ද? අපගේ රජ්ජුරුවන් වහන්සේට සඟ යව නොපසුබැස යුඩකරව"යි කීයේය. ඔහු එබස් පිළිගත්තාහුය.

ඉක්බිති යුඩය පැමිණි කල්හි කලිඟු රජ "මම දිනමි"යි හිත වියයීයට පැමිණ සන්නාඟ සන්නඩව ගොළු ගොළුවූවාහුය. තම තමන්ගේ අනිප්‍රායසථාන වලට ගියාහු, යුඩකිරීමට සුදුසු කල්හි වීරිය නොකළාහුය. රජදරුවෝ දෙදෙනාද අශ්වයාඟාවට පැනනැඟී යුඩ කරම් කියා ඔවුනොවුන් කරා එළඹියාහුය.

එකල්හි රජදරුවන් දෙදෙනාගේ ආරක්ෂා දිව්‍යපුත්‍රයෝ පෙරටුව ගොස් කලිඟු රජහුගේ ආරක්ෂා දිව්‍යපුත්‍රයාට සර්ව්ඛගධවලවූ වාඟහ වේශයක් වූයේය. අසසක රජහුගේආරක්ෂා දිව්‍යපුත්‍රයා සියලඟකෘෂ්ණවණී වාඟහවේශයක්වූයේය. ඔහු දෙදෙනද ඔවුනොවුන් හා යුඩාකාර දක්වා එලඹියාහුය. වාඟහයෝ වතාහි ඒ රජදරුවන් දෙන්නාටම පෙණෙති. අන් සත්ත්වයන්ට නොපෙණෙති. තන්හි සේන නම් අමාත්‍යතෙම "මහරජ්ජුරුවන්වහන්ස, නුඹවහන්සේට ආරක්ෂාදිව්‍ය පුත්‍රයෝ පෙණෙන්නේදැ"යි කියා අස්සකනම් රජවිවාළේය. එසේයමට පෙණෙන් නේය"යි කීයේය. "කවර රූපයක් පෙණේදැ"යි විචාළේය. කලිඟු රජහුගේ ආරක්ෂාදිව්‍යපුත්‍රයා සර්ව්ඛගධවලව වාඟහයක්ව පෙණෙන්නේය. අපගේ ආරක්ෂා දිව්‍යපුත්‍රතෙම සියලඟ කෘෂ්ණවණීව මිරිකුණු ශරීරව පෙණෙන්නේය." මහරජ් ජුරුවන් වහන්ස, නුඹවන්සේ නොබව මැනව, අපි ජය ගණුම්හ. කලිඟු රජ පරදනේය. එසේ හෙයින් නුඹවහන්සේ අසුපිටින් බිමට බැස මෙතෙප්ගෙණ මොනවට හික්මුනු සෙඤ්ඣවයා උදරපාර්ශවයෙහි වාමපාර්ශවයෙන් උන්මීල නය කොට මේ දඟසක් පමණ යෝධයන් හා සමඟ වේගයෙන් ගොස් කලිඟු රජහුගේ දිව්‍යපුත්‍රයාහට තෙප්පහරින් පහරව"යි කීයේය.

"ඉක්බිති අපි දඟසක් පමණ ඇත්තෝ දඟසක් තෙප්වලින් පහරුම්හ. එසේ කල්හි කලිඟු රජගේ ආරක්ෂා දිව්‍යපුත්‍ර නැසෙන්නේය. ඉක්බිති කලිඟු රජ පරදිනේය. අපි දිනම්හ"යි කියා අස්සක රජ "එසේ වීනම් යඟපතැ"යි ගිවිස තන්දිසේනයා විසින් දුන් සලකුණෙන් ගොස් තෙබින් පහරක් දුන්නේය. දඟසක් පමණ යෝධයෝ තෙප් දඟසක් පහළාහුය. ආරක්ෂා දිව්‍යපුත්‍රයා එතැන් හිම ජීවිතක්ෂයට පැමිණියේය. එකෙණෙහි කලිඟු රජ පැරද ගියේය. පැරද යන කලිඟු රජහු දැක දඟසක් පමණ යෝධයෝ "කලිඟු රජ පැරද යන්නේ ය"යි මහා ශබ්ද පැවැත්වූවාහුය. මරණ භයින් භයගෙණ යන කලිඟු රජ තාපසයන් වහන්සේව ආක්‍රොශ කියා බණන්නේය. "එම්බල කොල කුට

තාපසයා, අන් සත්ත්වයන් විසින් සහනය කළ නොහැකි බුඩප්‍රයෝගාදිය සහනය කරන්නාවූ කලිඟු රජහට ජයයි කියාද අස්සක රජහට අවැඩව පරාජය වෙයි කියාද කියන ලද්දාවූ තාපස විසින් අත්ලස් ගෙණ පරදින රජහු දිනති කියා දිනන රජහු පරදිති තාපස විසින් කියනලද විරුද්ධවචනය කායවාරාදීන් සෑදුවූ උත්තම සත්ත්වයෝ මෙබඳුවූසා නොකියා"යි කියා කලිඟුරජ තාපසයන්ට වෙනෙසා ආක්‍රෝශ පරිභව බෙණෙමින් ගොස් තමාගේ නුවරටම ගියේය. නැවත පසු බලන්ටද අසමර්ථවිය.

ඉක්බිත්තෙක් කිප දවසක්හුගේ ඇවැමෙන් සක්දෙවිරජ තාපසයන් වහන්සේට උපස්ථානයට ආයේය. උන්වහන්සේ ඒ සක්දෙව් මහරජහු හා සමග කථාකරණසේක් "දෙදෙව් ලෝවැසි දෙවියන්ට රජවූ පෘථිවිනිශ්‍රිත දෙවියන්ට ප්‍රධානවූ මඝමානවක යන පූර්ණාමධෙයක් ඇති ශක්‍රදෙවේන්ද්‍රයානනි, තාප වැනි මහේශාක්‍ය දෙවියෝ මුසාවාදයෙන් වැලැක්කාහ. සඛවසෙහි කියනලද උතුම් දනය ඒ දෙවියන් කෙරෙහි පිහිටියේය. තාප විසින් යම් වචනයක් කියන ලදද? ඒ අනර්ථවිනාශකරවූ මුසාවාදයයි කියන්නාවූ එබඳුවූ අවිද්‍යමාන වචනයක් කවර කාරණයක් පිණිස කියනලදදැ"යි කීයේය.

එබස් ඇසූ ශක්‍රදේවේන්ද්‍රයෝ කියනුයේ "රාගාදී ක්ලේශයන් තමාගේ චිත්තසන්තානයෙන් බැහැරකරණ ලද හෙයින් බ්‍රාහ්මණ නම්වූ තාපසයන් වහන්ස, දෙව්යෝ පුරුෂයන්ගේ බලපරාක්‍රමය ඊර්ෂ්‍යාවසඟ නොකෙරෙමි සිතා එතැන්හි ආගම ශාස්ත්‍රවල කියන බස් නුඹවහන්දැස් විසින් අසනලද්දේ නොවේද? ආත්මදූතයට පැමිණි සියලු සෙනග සමගිවීමෙන් නොපසුබැස යුඩයට එන කල්හි දුඃඛීයයි බලපරාක්‍රම ඇති අස්සක රජහට ජයවිය යි කියා ශක්‍ර දෙවේන්ද්‍රයා තාපසයන් වහන්සේට කීයේය. ඉක්බිති කලිඟු රජ්ජුරුවන් පැරදිය කල්හි අස්සක රජ්ජුරුවෝ පර සෙනග දමාගිය වස්තු ගෙණ තමාගේ නුවරටම ගියේය.

ඉක්බි නන්දිසේන නම් අමාත්‍යයා කලිඟු රජහට අසුන් ලියවා ගමන් කරවන්නේ ඉදින් "මේ රාජකන්‍යාවන් සතර්දෙනාව දැයාද කොටස් එව්ව මැනව, නොඑව්වහොත් මෙතැන්හි කටයුතු කාරියාකාරය දනිමි." ලියා ගමන් කරවූයේය. එබස් ඇසූ කලිඟු රජ හයින් තැනිගෙණ ඒ රාජකන්‍යාවන් විසින් ලැබියුතු දැයාද ගමන් කරවූයේය. එතැන් පටන් සමගිව වාසය කළාහුය.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධම්දෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ චුල්ලකාලිඟ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කලිඟු රජදූ සහර භික්ෂුණීයෝ වන්නාහුය. එකල්හි නන්දිසේන අමාත්‍යයා නම් දැන් ශාරීපුත්‍රස්ථවිරයෝය. එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම්මවේදැ යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 295
## මහා අශ්වාරෝහක ජාතකය

මේවද එක්සමයෙක්හි ධම් සභාමිවූ බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් අනඳමනතෙරුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

වර්තමාන කථාව යටකියන ලද ජාතකය හා සදෘශමය. "පෙර නුව නැත්තෝ තමාව කළ උපකාර වශයෙන් අනුන්වත් ප්‍රත්‍යුපකාර කළාහුම වේද"යි වදාරා මෙතැන්හි ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

**එ**වගිය දවස පුරණලද බෝධිසම්භාර ඇති අප මහබෝසතාණන් වහන්සේ බරණැස් රජව දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරණ සමයෙහි දන්දෙන සේක. සිල් රක්ෂා කරණසේක, ඒ රජතෙමේ පසළ්දනව්වක් කිපුනු බව අසා "ඒ පසළ් දනව්ව සන්සිඳවම්"යි බලසෙනඟ පිරිවරා ගොස් යුඩයෙහි පැරදුන ඒ රජ්ජුරුවෝ අසුපිට පැනනැඟී යුඩයටම සැරහුනු ඇමතියන් සිටි ගම්දෙරින් ඇතුළුහමට වන්නේය. ඔවුන් තිස්දෙන "මේ කිමෙක්ද"යි භයින් නැතිගෙණ ගොස් තම තමන්ගේ ගෙවලට වන්හ. එයින් එක් පුරුෂයෙක් තමාගේ ගෙට නොගොස් රජහට පසු ගමන්කොට "අපගේ රජ්ජුරුවන් වහන්සේ යුඩයක් පිණිස ප්‍රත්‍යන්ත ජනපදයකට වැඩිසේක් වේද? නෙපි කවුරුද? රාජපුරුෂ යෙක්ද? චොරපුරුෂයෙක් දැ"යි විචාළේය.

"යහළු මම රාජපුරුෂයෙක්මි" කියේය. "එසේ වීනම් මා හා සමග ආව මැනවැ"යි කියා රජහු ගෙට කැඳවාගෙණ ගොස් තමා හිඳුනා අස්නේ හිඳුවා "සොඳුර මෙසේ එව මිත්‍රයාතන්ගේ පයසෝඛව"යි භාර්‍යාවන් ලවා පයසෝඛවා තමන්ගේ ශක්ති පමණින් ආහාර දී "මොහොතක් කල් සැතපුන මැනවැ"යි කියා සැතපෙන ගෙය ඇතුළේය. එහි රජ සැතපුනේය.

ඉක්බිති ගම්වැස්සෝ අශ්වයාගේ සන්නාහ මුදා සක්මන් කරවා දියපොවා පිව තෙල්ගල්වා ඔහු කැයුතු තණ දුන්නේය. මෙසේ තුන් සතර දවසක් රජ්ජුරුවන් රක්ෂා කොට "යහළු මම නුවරට යෙමි" කී කල්හි නැවත රජ්ජුරුවන් වහන්සේවද අසුවද කළමනා සියළු වතාවත් කෙළේය. ඔහු විසින් කළ සත්කාර විඳ යන ඒ රජ කියනුයේ "යහළු මම අශ්වාරොහක යෙමි. අපගේ නුවර මැද වන්නේය. ඉදින් යම්කිසි කාරියක් කරණකොටගෙණ නුවරට එන්නෙහි වීනම් දකුණුදෙස මහවාසල්දොර සිට "මහා අශ්වාරෝහකයා කවර ගෙයක් වාසය කෙරේදැ"යි විචාරව, 'දොරටුපාලයා ඔහු කැඳවාගෙණ අපගේ ගෙට එව"යි කියා තමාගේ නුවරටම හිඳේය. බලසෙනඟද රජ්ජුරුවන් නොදැක පිටිනුවර කඳවුරුබැඳ සිටියාහු රජහු දැක පෙරගමන් කොට පිරිවැරුවාහුය. නුවරට වදනා රජ්ජුරුවෝ දොරකඩ ඇතුළෙහි සිටිනා නගරපාලකයා ලඟට කැඳවා මහජනයා එතනින් පහකරවා "කොල එක් පිටිසරගම්වැසි පුරුෂයෙක් මා දක්නා කැමතිව ඇවින් මහා අශ්වාරෝහකයාගේ ගෙය කොතැන්හි දැයි විචාළේ නම් නොපි ඔහුගේ අත අල්වාගෙණ ආයෙහි වීනම් එකල්හි තෙපි දහ සක් ලබන්නෙහිය'යි කියා හිඳේය. ඒ ගම්වැසි පුරුෂයා කලක් නුවරට නොආයේය. ඔහු නොආ කල්හි රජ්ජුරුවෝ ඔහු වසන ගම කරවූවර වැඩුහ. කරවූවර මැණි කල්හිත් නොඑන්නේය. මෙලෙස දෙතුන්වරෙක කරවූවර වැඩිවිය. එසේද නොඑන්නේය

ඉක්බිති ගම්වැසි මනුෂ්‍යයෝ රැස්ව ඔහට කියන්නාහු "ආර්‍යයන් වහන්ස, නුඹවහන්සේ මහා අශ්වාරොහකයන් ගෙට ආකල් තැන් පටන් වැඩි කරවූවර දීමෙන් පීඩාවිඳිමෝ ඉවසාගත නොවෙම්හ. එසේහෙයින් නුඹවහන්සේ

නුවරට ගියමැතවැයි මහා අශ්වාරෝහකයාට අපගේ වැසි කරවූවර හැරවුව මැණවැ''යි කීවාහුය. ''යහපත, එසේ වී නම් යෙමි'' කියා ''මාගේ මිත්‍රයා ලඟට සිස් අතින් යාම සුදුසු නොවන්නේය, උන්ගේ දරුවෝ දෙදෙනෙක් ඇත, ඒ දෙදෙනාටද මාගේ මිත්‍රයානන්ටද ඔවුන්ගේ භාර්‍යාවන්ටද හඳිනා පොරොනා දෑ හා ආභරණද මාගේ ගමනට පිළියෙළ කරව''යි කීයේය.

''යහපත, පිළියෙළ කරම්හ''යි කියා ඒ ගම්වැසි පුරුෂයෝ ඒ සියළු උපකරණ සැරහුය. එකියන උපකරණ හා තමාගේ ගෙයි පිසූ අසුරුලහළු ගෙණ ගොස් දකුණු දෙස මනවාසල් දොරට පැමිණ ''යහළුව, මේ නුවර මහා අශ්වාරෝහකයන්ගේ ගෙය කොතැන්හිදැ?''යි දොරටුපාලයා අතින් විචාළේය.

ඒ තෙම ''මා හා සමග එව, තොපව මහා අශ්වාරොහකයන් දක්වම්'' කියා ඔහු අත අල්වාගෙණ රාජභවනයෙහි දොරකඩව ගොස් දොරටුපාලයා ''පසල් ගම්වැසි පුරුෂයා කැඳවාගෙණ ආයෙමි''යි කියා යැවීය.

රජ එපවත් අසා උන්තෙනින් නැගීසිට ''මාගේ මිත්‍රයානන් ඔහු හා සමග ආ කෙතෙකුන් එත්ව''යි කියා යැවීය. රජ පෙරගමන් කොට ඔහු දැකම ඔවුනොවුන් වැලඳ ''මට උපසථාන කළ යෙහෙලි ස්ත්‍රිද ඕ දරුවෝ නිරෝගි දැ''?යි විචාරා අත අල්වාගෙණ මතුමහල්තලයට ගෙණ ගොසින් ඒ ගම්වැසි පුරුෂයා දළපුඩුසේසත් යට රාජාසන මස්තකයෙහි ඉඳුවා අග්‍රමහෙසිකා බිසවුන් කැඳවා ''සොඳුර, අපගේ මිත්‍රයානන් පය සෝධව''යි කීහ. එබිසවද ඔහුගේ පය සේදුවාය. රජ සවණිනිංකාරයෙන් දිය වත්කෙළේය. බිසවූ පය සෝධවා සුවඳ තෙල් ගැල්වුවාහුය. රජද ''යහළු අප කැයුතු කිසිදෙයක් ඇද්දැ?''යි විචාළේය. ඒ ගම්වැසි පුරුෂතෙම ''කැයුතුදෑ ඇතැ''යි කියා පසුබිම් යෙන් අසුරුලහළු නිකුත් කෙළේය.

රජ රන්තළියෙන් ගෙණ ඔහුට සංග්‍රහකරන්නේ ''මාගේ මිත්‍රයා විසින් ගෙණ ආ දෑ අනුභව කරව''යි කියා බිසවුන්වද අමාත්‍යයන්වද දෙවා තෙමේත් අනුභව කෙළේය. නැවත අන් පඬුරු දක්වුයේය, නැවත රජ ඔහු සිත් ගන්නා පිණිස හත්පෙරවී කසීසළුව හැර ඔහු ගෙණා වස්ත්‍රයක්ම හැන්දේය. බිසවුද අමුතුව ගෙණා වස්ත්‍රාභරණයෙන් හැඳ පැලඳ ඉක්බිති ඔහු රාජභොජනය අනුභවකරවා ''මෝහු කැඳවාගෙණ ගොස් මව මෙහෙකරණ පරිද්දෙන්ම කරකම් කරවා සුවඳ දියෙන් නවා ලක්ෂයක් අගනා කසීසළුවක් හඳවා රාජාභරණයෙන් සරහා ගෙණෙව''යි කියා එක්තරා අමාත්‍යයකුට නියෝග කෙළේය.

ඒ අමාත්‍යයාද එපරිද්දෙන්ම සරහාගෙණ ආයේය. ඉක්බිති රජ්ජුරුවෝ නුවර බෙරහසුරුවා ඇමතිගණයා රැස්කරවා ධවලාතපත්‍රයාගේ මැද්දෙහි හිඳ හිගුල්මය සූත්‍රයක් හෙලා අඩරාජ්‍යය දුන්නේය. ඔහු දෙදෙන එතැන් පටන් අන්තපානාදිය අනුභවකිරීම් වශයෙන් යන එන ක්‍රියාවන් එක්ව පවත්වන්නාහ. කවරක්හු විසින් හෙදකොටගත නොහැක්කාවූ විශ්වාසය ස්ථිරවිය.

ඉක්බිති ඔහුගේ අඹුදරුවන්ද නුවරට ගෙන්වා ඇතුළු නුවරෙහි ගෙවල් තනවා දුන්නේය. ඔහු දෙදෙන සමගි සතුටුව රාජ්‍යය කෙරෙති. ඉක්බිති අමාත්‍යයෝ කිපී රාරකුමාරයන්ට කියන්නාහු ''කුමාරයන්වහන්ස, අපගේ රජ්ජුරුවන්වහන්සේ එක් පිටිසර වැසි ගොවියෙකුට රාජ්‍යයෙන් අඩියක් දී ඔහු හා සමග අන්තපානාදිය එක්ව පවත්වත සේක, රජකුමරුවන් ලවා

නමස්කාර කරවනසේක. මේ ගෞරියාතන් විසින් රජ්ජුරුවන්වහන්සේව, ගියදවස කළ කෙළෙහි ගුණයක් අපි නොදනුම්හ''යි රජ්ජුරුවන්වහන්සේ කුමකින් කුමක් කරණ බවත් නොදැන ඉදිරියේ සිට කිවුය. එබස් රාජකුමරයෝ ''යහපතැ''යි කියා පිළිගෙණ ඒ සියළු කථාප්‍රවෘත්ති රජ්ජුරුවන්ව දක්වා ''මහරජ්ජුරුවන්වහන්ස, මතු මෙබඳු දෙයක් නොකළ මැනවැ''යි කීයේය.

එබස් ඇසූ රජ 'පුතනුවනි, මම යුබයෙහි පැරදුනේ නම් කොතැන්හි වාසය කෙරෙම්ද?ඒ විසූ තැන් තෙපි දනුදැ?''යි විචාළේය. ''දේවයන්වහන්ස, අපි නොදනුම්හ''යි කී බස් අසා කියනුයේ ''මම මොහුගේ ගෙයි වාසය කරන්නෙම් නිරොගිව අවුත් දැන් මේ බරණැසෙහි රාජ්‍යය කෙළෙමි. මෙසේ මට උපකාර වූවන්හට ප්‍රත්‍යුපකාර වශයෙන් කවර සැපතෙක් නොදෙමි ද?'' මෙසේද කියා වනාහි මහබෝසතාණන්වහන්සේ යම්කිසි සත්ත්වකෙණෙක් පෙර තමාට අනුපකාරී සත්ත්වයන් කෙරෙහි දියයුතු වස්තුවක් දේද? කෘතොපකාරී සත්ත්වයන් කෙරෙහිත් දියයුතු වස්තු නොදෙද්ද? එබඳුවූ සත්ත්වතෙම ආපදාවී දුකට පැමිණියේ තමුදු මිත්‍රයන් විසින් කළයුතු සහායකට නොපැමිණෙන්නේ''යි මෙයින් නොදියයුතු සත්ත්වයන්ගේ ගුණ ප්‍රකාශකොට කියන සේක් ''යම් සත්ත්වයෙක් පළමු තමාව උපකාර නොකළ සත්ත්වයන් කෙරෙහි දියයුතු වස්තුව නොදේද? කෘතොපකාරී සත්ත්වයන් කෙරෙහි දියයුතු වස්තුව දේද? එතෙම ආපදාවීයෙහි දුකව පැමිණියේ මිත්‍රයන් විසින් කළයුතුවූ සහාය කව පැමිණෙන්නේය. නොපිරිසිදු කාය වාක් සමාචාර ඇති ශඨප්‍රයෝග දන්න මනුෂ්‍යයන් කෙරෙහි දියයුතු දානසීලාදී සුචරිත ධර්මයෙහි එක්වූයෙදීමද පඤ්ච කාම සම්පත්තිය සමඟ අනුභොග කිරීම මොහු විසින් මට විශෙෂයෙන් උපකාර කෙළේය. යන මේ සියල්ල නසින්නේහයි පිරිසිදු කායවාක් සමාචාර ඇති සෘජුවූ සිත් ඇති සත්ත්වයන් කෙරෙහි කරණ දෙය සුළුපටු උපකාරයන් නමුදු මහත්ඵල මහානිසංස වන්නේය''යි දක්වන ආචාර්‍යවරයෝ–

> ''යථා බීජං අග්ගිස්මිං ඩය්හති න විරූහති,
> එවං කතං අසප්පුරිසෙ ඩය්හති න විරූහති
> කතඤ්ඤුම්හිව පොසම්හි සීලවන්තෙ අරියවුත්තිකෙ,
> සුඛෙත්තෙ විය බීජානි කතං තම්හි න නස්සති.''

යම් සත්ත්වයෙක් මේ ලෝකයෙහි පළමු කල්‍යාණ සුචරිත ධර්මයක් කෙළේද? එබඳු සත්ත්වයන්ගේ ලැබීම අතිශයින් දුෂ්කරය, පසුව අන්කිසි උපකාරයෙක් කෙළේ හෝ වෙයි පළමු කළ ගුණයෙන්ම අතිශයින් සියලු සත්කාර සම්මානාදී පූජාවට සුදුසු වන්නේය යි කියා රාජකුමාරයාහට කීහ. මෙබස් කාරණයෙන් ඇසූ රාජපුත්‍රයා වනාහි අමාත්‍ය ජනයාහට කීසිබසක් නොකීයේය. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ මහා අශ්වාරොහක ජාතකය නිමවා වදාළසේක.

එකල්හි පසල් දනව්වැසි පුරුෂයා තම් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි බරණැස් රජ තම් දැන් තිලෝගුරු බුදුවූ මම්මය යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 296
## සීලවීමංස ජාතකය

තිවද එක්සමයෙක්හි ශාක්‍යකුල තිලකවූ සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක් ක්ලේශ නිග්‍රහයක් අරභයා මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාළසේක.

මෙහි වර්තමාන කථාවස්තුව යට ප්‍රඥා ජාතකයෙහි ප්‍රකාශවූයේය. මේ කථාවෙහි මතු දක්වන්නේ සංක්ෂේපමාත්‍රයෙක. පන්සියයක් පමණ භික්ෂූහු දෙව්රම් වෙහෙර අඛ්තුරෙහි වාසය කරන්නාහු මධ්‍යමයාමයට අනතුරුකොට කාමවිතර්කයක් කල්පනා කළාහුය. සම්බුදුරජාණන්වහන්සේ රෑ දැවල් දශ දශ බැගින් සකොටසෙක්හි දිවසින් බලනසේක් ඇසක් ඇති පුරුෂයා යම්සේ එක ඇස රක්ෂාකෙරේද? එක පුත්‍රයෙක් ඇති පුරුෂයෙක් යම්සේ ඒ පුත්‍රයා රක්ෂාකෙරේද? වාලධිය රක්ෂා කරන්නාවූ සෙමර ධේනුවක් යම්සේ අප්‍රමාදව රක්ෂාකෙරේද? එපරිද්දෙන්ම හැමකල්හි බුදුහු භික්ෂූන් බලාවදාරණසේක.

මුනීන්ද්‍රවූ අප බුදුරජාණන්වහන්සේ රාත්‍රිභාගයෙහි දිවසින් සියළු දෙව්රම් වෙහෙර වැසි භික්ෂූන් බලා පරීක්ෂාකරණසේක් සක්විති රජක්හුගේ රාජභවනය ඇතුළෙහි පහළවූ සොරුන් මෙන් ඒ පන්සියයක් පමණ භික්ෂූන් දැක ශ්‍රී ගන්ධකුටිවාරය විවරකොට ආනන්දස්ථවිරයන් කැඳවා "ආනන්දය, තෙපි අතුළු විහාර කෙළවර සන්නිපාත ශාලාවෙහි භික්ෂූන් රැස්කරවා ගදකිළි දෙර සමීපයෙහි අස්නක් පණවයි"යි වදාළසේක.

එබස් ඇසූ ආනන්දස්ථවිරයන් වහන්සේ එලෙස කොට දන්වූ සේක ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ පණවනලද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ සම්මුඛීභාව වශයෙන් ආමන්ත්‍රණය කොට වදාරා "මහණෙනි, පුරාතනයෙහි නුවණැත්තෝ පව් කිරීමෙහි රහසෙක් නම් නැත්තේ යි කියා පව් නොකළාහුම ය"යි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි මහබෝසතාණන්වහන්සේ බමුණුකුලයෙහි ඉපිද උවමනා වයසට පැමිණ ඒ බරණැස්හි දිසාපාමොක් ආචාරීන්ගේ සම්පයෙහි පන්සියයක් පමණ මාණවකයන්ට ප්‍රධානව ශිල්ප උගන්නේය. දිසාපොමොක් ආචාරීන්ගේ දියනිකෙනෙක් උවමනා වයසට පැමිණියේය. ඒ ආචාරිතෙම මෙසේ සිතුයේය. "මාණවකයන්ගේ සිල් රක්ෂාකොට ගුණයෙන් සමෘද්ධවූවක් හට මාගේ දියනියන් විවාහකොට දෙමි" සිතා ඒ ආචාරිතෙමේ එක් දින යෙක්හි අතවැසි මාණවකයන් කැඳවා "සගයෙනි, මාගේ දියනියෝ උවමනා වයසට පැමිණියෝය. මැට විවාහයක් කරණු කැමැත්තෙම්, එසේනෙයින් වස්ත්‍රාභරණ ලැබියයුතු වන්නේය. තොප නොපගේ නැයන් නොදක්වා සොරා ගෙණවුත් වස්ත්‍රාභරණ ගෙන්වා කිසිවක්හු විසින් නුදුටුදේම හැර ගණිම්, පෙණී ගෙනා දෙය ඇරනොගණිමි" කියා.

ඒ මාණවකයෝ ඔහු කී බස් ''යහපතැ''යි පිළිගෙණ එතැන් පටන් නැයන්ව නොදන්වා සොරා ගෙණ වස්ත්‍රාභරණාදිය ගෙණහැර දෙන්නාහ. ආචාරිතෙම ඔවුන් විසින් ගෙණ ගෙණා දෙය වෙන්ව තිබුයේ මිහබෝසතාණෝ කිසිදෙයක් නොගෙණා සේක.

ඉක්බිති ආචාරී කියන්නෝ ''සගයෙනි, තොපි කිසිවක් නොගෙණාහු වේදැ''යි කීයේය. ''එසේය ආචාරීන් වහන්ස, නොගෙණාමි''යි කීයේය. ''සගයෙනි, තොපි කවර කාරණයකින් නොගෙනාහුදැ''යි විවාළේය. ''නුඹවහන්සේ වනාහි පෙණී ගෙණාදෙය ඇර නොගන්නාසේක් වේද? මම වනාහි පව්කිරීමෙහි රහසෙක් නොදන්නෙමි''යි ප්‍රකාශකොට කියනසේක් ''ආචාරීන් වහන්ස, මේ ලෝකයෙහි ප්‍රාණඝාතාදී පාපකර්මයන් කරන්නාවූ සත්ත්වයන්ට රහසක් නම් නැත, වනදෙවියෝද ඒ පාපකර්මයන් දකිති, ඒ පාපකර්මය අඥාන සත්ත්වයෝ රහසෙකැ යි සිතති. මම ඒ පාපකර්මයට රහස්‍යස්ථානයක් නොදන්නෙමි. ජනශූන්‍යස්ථානයකුදු නැත්තේය. යම් තෙනෙක්හි ජනශූන්‍යස්ථායක් නොදක්නෙමි'' කීවේය.

''මාගේ දියනියන් නුඹවහන්සේටම සුදුසුය''යි වස්ත්‍රාභරණයෙන් සරහා බොධිසත්ත්වයන් වහන්සේට පාවාදුන්නේය. සෙසු මානවකයන්ට ආචාරී කියන්නෝ ''තොප විසින් ගෙණා ගෙණා වස්ත්‍රාභරණාදිය තොප තොපගේ ගෙවලටම ගෙණ යව''යි කීයේය.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ ''මහනෙනි, අඥාන දුශ්ශීල මානවකයා තමා දුශ්ශීල බැවින් ඒ කුමාරිකාවන් නොලද්දාහුය. නුවණැති අන් මානවකයාන් නම් සිල්වත් බැවින් විවාහයෙන් ඒ ස්ත්‍රිය ලද්දේය''යි වදාරා සම්‍යක් සම්බොධිඥානය ප්‍රතිවෙධ කළාවූ බුදුහු වදාරණසේක් ''දුජ්ජීවය, අජ්ජවය, නින්දය, සුඛවජීනය, වෙජ්ජය, අඩිවලිය යන නම් ලත් සදෙනා ප්‍රධානකොට ඇති සියළු මානවකයෝ ස්ත්‍රීප්‍රතිලාභය කැමැත්තාහුද? තමන්ගේ දුශ්ශීල භාවය හේතුකොටගෙණ ඒ ස්ත්‍රීප්‍රතිලාභයෙන් පිරිහුනාහුය. පඤ්චශීලය, දසශීලය, ත්‍රිවිධ සුචරිතයන් යන ගුණධර්මයන් පිරීමෙන් පරතෙරට පැමිණියාවූ නුවණැත්තාවූ සවහාවවූ යථොක්ත ගුණධර්මයන් රක්ෂාකිරීමෙහි වීර්‍යවන් ඇත්තාවූ මම පාපකර්මයට ප්‍රතිවිඛන්නස්ථානයක් නොදකිමි. යම්තැනක මහජනයන් විසින් ශූන්‍යද එබඳු ස්ථානයක්ද නැත්තේය. යම් තෙනෙක්හි ජනයන් විසින් අශූන්‍යවූ අන්කිසි තෙනෙක් ඇද්ද? එබඳු ස්ථානයක්ද නොදක්නාලද, යමෙක් පඤ්ච සීලය, දසශීලය ත්‍රිවිධ සුචරිතය යන ගුණධර්මයන් පිරීමෙන් පරතෙරට පැමිණියාවූ සීලසංරක්ෂණය ශ්‍රුතයෙන් සමෘද්ධවූ සවභාවවූ යථොක්ත ගුණධර්මයන් රක්ෂා කිරීමෙහි වීර්‍යවන් ඇත්තාවූ යම්බ්‍රාහ්මණයෙක් සීලාදී ගුණධර්මයන් රක්ෂාකෙරේද? එබඳුවූ බ්‍රාහ්මණයාම කවර කාරණයකින් ස්ත්‍රී ප්‍රතිලාභය හරණේදැ''යි වදාළ සේකි. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍ය සත්‍යයන් ප්‍රකාශකොට සීලවිමංස ජාතකය නිමවා වදාළසේක.

චතුස්සත්‍යය ධර්මදේශනාවගේ කෙළවර ඒ පන්සියයක් පමණ භික්ෂූහු රහත් ඵලයෙහි පිහිටියාහුය. එකල්හි දිසාපාමොක් ආචාරී තම් දැන් ශාරිපුත්‍ර සථවිරය, එකල්හි නුවණැති බ්‍රාහ්මණ කුමාරයෝ තම් දැන් බුදුවූ මම වේදැ යි වදාරා තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 297 සුජාතා ජාතකය

**තී**වද එක් සමයෙක්හි ශාක්‍යකුල තිලකවූ බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසතසේක් මල්ලිකා දේවීන් අරභයා මේ ධර්මදේශනාව දෙසා වදාළසේක.

එක් දවසක් කොසොල් රජ තමාගේ මල්ලිකා දේවීන් සමග සයන කළහයෙක් වූයේය. ඒ රජ කිපී ඇති බව ඒ බිසව නොදන්නීය. මල්ලිකා දේවි තොමෝ ''කොසොල් රජ තමා කෙරේ කිපුනු බව සම්බුදුයන් වහන්සේ නොදනිති'' සිතුවාය.

බුදුරජානන් වහන්සේද එපවත් දැන වදාරා ''මොවුන් දෙදෙනාගේ සමගි භාවය කෙරෙමි''යි සිතා වදාරා පෙරවරු එක්ෂණයක් මුළුල්ලෙහි හදනා සිවුරු හැඳ කයින් සිවුර හා අතින් පාත්‍රය ගෙණ පන්සියයක් භික්ෂූන් පිරිවරණ ලද සේක් සැවැත් නුවරට ප්‍රවිෂ්ටව රාජද්වාරයට වැඩිසේක.

කොසොල් රජ තථාගතයන්වහන්සේගේ පාත්‍රය ගෙණ තමාගේ වාසභවනයට වැඩම කරවාගෙණ පණවන ලද බුබාසනමණ්ඩපයෙහි වඩා හිඳුවා බුදුපාමොක් මහසඟනට දක්ෂිණෝදකය දී කෑද අවුළු ගෙන්වූයේය. බුදුහු පාත්‍රය ශ්‍රී හස්තයෙන් වසා ''මහරජානෙනි, මල්ලිකා දේවීන් කොතැන්හිදැ''යි විචාළසේක. ''සවාමීනි, බුදුරජානන් වහන්ස, ඇගෙන් ප්‍රයෝජන කවරේදැ?''යි ''ඕ තොමෝ තමාගේ යසසින් මහත්වූය''යි දැන්විය. ''මහරජානෙනි, තොපිම යසපිරිවර සම්පත් දී මාතුගාමයන් උසස් කොට උන් විසින් කරණලද අපරාධ සහනය නොකිරීම නම් සුදුසු නොවන්නේය''යි වදාළසේක.

ඒ කොසොල් රජ බුදුරජානන් වහන්සේගේ වචනය අසා බිසවුන් ගෙන් වූයේය. ඒ බිසවු අවුත් බුදුරජහු වැළඳවූවාය. සම්බුදුයන් වහන්සේද ඔවු-නොවුන් සමගිවන්ව සුදුසුය යි සාමග්‍රිකාභ්‍යයාගේ ගුණවර්ණනාකොට වැඩි සේක.

එතැන් පටන් ඔවුන් දෙදෙන සමගිව විසීමෙන් වාසය කළාහුය, ඊට අනතුරුකොට භික්ෂූන්වහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්ව වැඩහිඳ 'ඇවැත්නි ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ එකවචතයෙන්ම එවුන් දෙදෙනා සමගිකොට වදාළසේකැ''යි කිය කියා කථාවක් පහළ කළාහුය.

ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ එතැන්හි වැඩ වදාරා ''මහණෙනි, දැන් මා එන්නාට පුම්හාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදාරා ''මෙතම් කථාවකින් යුක්තව උනුම්හ''යි දැන්වූ කල්හි 'මහණෙනි, දැන්මතු නොවෙයි, පූර්වයෙහි මම මොවුන් දෙදෙන එකම අවවාද වචනයකින් සමගි කෙළෙමි වේදැ''යි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

'ඒ කෙසේද? යත්;

**පි**වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි මහබෝසතාණන් වහන්සේ ඒ රජහට අඹියෙන් ධර්මයෙන් අනුශාසනා කරණ අමාත්‍ය වූසේක.

ඉක්බිති එක් දිනයෙක්හි බ්‍රහ්මදත්ත නම් රජ සිවිමැදුරු කවිඑව හැර රාජාඞ්ගනය බලමින් සිටියේය. එකෙණෙහි විසිතුරුවූ රූ ඇතිව ප්‍රථම වයසෙහි සිටියාවූ ඩෙබරඵල වෙළඳක්හුගේ එක් දුවක් ඩෙබර පැසක් හිස තබාගෙණ "ඩෙබරඵල ගණුව"යි කියා කියා රාජභවනයෙන් යන්නීය.

ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ඇගේ ශබ්දය අසා ඇය කෙරෙහි පිළිබඳ සිත් ඇතිව හිමියන් නැති බව දැන කැඳවමින් රාජාඞ්ගනයට ගෙන්නා ඒ ස්ත්‍රිය අග මෙහෙසුන් තනතුරෙහි තබා මහත් යසපිරිවර සැපත් දුන්නේය. ඕතොමෝ රජහට ප්‍රියවන්නීය. මනවඩවන්නීය.

ඉක්බිති එක් දිනයෙක්හි රන්තලියෙහි බහතලද ඩෙබරඵල අනුභවකර මින් හුන්නේය. සුජාතාදේවී තොමෝ ඩෙබරඵල අනුභව කරන්නහු දැක "මහ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ කවර නම් ඵලයක් අනුභව කරණසේක්ද" යි කියන්නී "දෙවඟන් වහන්ස, රන්තලියෙහි බහතලද්දූවූ ලෙහෙවන් පැහැ ඇති නිමිලවූ කවර ඵලයෙක් වන්නේද" යි විචාළාවූ මට එපරිදි තොවළහා කිය ව" යි කීවාය. එබස් ඇසූ බරණැස් රජ කිපී කියන්නේ "පැසුනු ඩෙබරඵල වෙළඳුම් කරණ ගෘහපතියන්ගේ දූවූ කෙල්ල තිගේ වංශයට අයිතිවූ ඩෙබරඵල යන් නොදනීද?" යි නිහඬව කියන්නෝ "දෙවිනි, තෙපි හිස පැස තිබීමෙන් මොවූ හිසක් ඇතිව දිරුණුරෙදි ඇඳ වලට වැද දෙහෙවිල්ලෙන් අතු නමා කැඩූ වැඩූ ඵල අනින් එකතුරුපවට අවුලා වෙළඳුම් කරන්නීය. එසේ හෙයින් මා අනුභව කරන්නාවූ මේ ඩෙබරඵල තිගේ අයිතිවන්නේය. මේ කාලකණ්ණි ස්ත්‍රිය ලෝකුඹුනිරයෙහි වෙසෙන්නියක මෙන් අපගේ මේ රාජභවනයෙහි සිත් අලවා වාසය කරන්නීය. අශ්‍රීකවූ මේ ස්ත්‍රිය මේ රාජසම්පත හැරියාහුය" යි කියා ඒ රජ "යම්තෙනෙක්හි ඩෙබරඵල රැස්කිරීමෙන් විකිණීගෙණ ජීවත්වන්නීද? එතැන්හිම ගෙණ ගොස් හැරලව" යි කියේය.

එබස් ඇසූ මහබෝසතාණන් වහන්සේ "මා හැර අන් සත්ත්වකෙණෙක් ඔවුන් සමඟි කරවන්ට නොහැකි වන්නාහුය" යි සිතා රජහු අනුදන්වා "මේ බිස වුන් පිටතලීමට අවසර නොදෙමි" සිතා රජහව කියනසේක් "මහරජ්ජුරුවන් වහන්ස, උසස්වූ බිසෝතනතුරට පැමිණි ස්ත්‍රීන්ගේ මෙබඳුවූ ප්‍රමාදදෙෂ නොවන්නේ නොවෙයි. එසේ හෙයින් නරශ්‍රේෂ්ඨවූ දෙවඟන් වහන්ස, මේ සුජාතා වන්ගේ සුවල්පවූ මෙබඳුවූ අපරාධයට නොකිපී සමාකළ මැනවැ" යි කීසේක.

ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ අමාත්‍යයාගේ වචනයෙන් සුජාතා නම් බිස වගේ ඒ අපරාධය ක්ෂමාකොට ඇ බිසෝතනතුරෙහි පිහිට වූයේය. එතැන් පටන් ඔහු දෙදෙන සමඟිව වාසයකොට විසූහ.

ශාස්තෘවූ සම්බුදුරජාණන් වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ සුජාතා ජාතකය නිමවා වදාළසේක.

එකල්හි බරණැස් රජ නම් දැන් කොසල මහරජය, එකල්හි සුජාතාවෝ නම් දැන් මල්ලිකාදේවිය, එකල්හි අමාත්‍යවූයේ නම් දැන් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේම දක්වා වදාළ සේක.

## 208 පලාස ජාතකය

**ති**වද එක්සමයෙක්හි විජිත පඤ්චමාරවූ සම්බුදුරජාණන් වහන්සේ **පරිනිබ්බාණ** ශයනයෙහි සැතපුනුසේක් ආනන්දස්ථවිරයන් අරභයා මේ ධම්මදේශනාව වදාළසේක.

ආයුෂ්මත්වූ ආනන්දස්ථවිරයන්වහන්සේ අදරැ අලුයම් වේලෙහි ශාස්තෘවූ තථාගතයාණන් වහන්සේ පිරිනිවන්පානසේකැ යි දැන මාගේ ශාස්තෘන් වහන්සේට කළ උපස්ථානය නිෂ්ඵලවන්නේය යි කියා සෝකයෙන් පීඩිතවූසේක් උදැනතයෙහිවූ නිවාසගෘහාභ්‍යන්තරවූ අගුළුබාවෙහි එල්ල සිට හැඬුසේක.

සම්බුදුරජාණන් වහන්සේ **ආනන්ද** මහතෙරුන් වහන්සේ **නොදක්නා** සේක් "**මහණෙනි, ආනන්දයෝ කොතැන්හිදැ**"යි විචාරා වදාරා ඒවූ **කරුණු** අසා කැඳවා "**කරණලද** පින් ඇත්තෙහිය, **පඬන්** වියයීයෙහි යෙදෙව, **එසේවූ** තෙපි චතුරාශ්‍රවයන් දුරුකොට රහත්වන්නෝ වේද? මව කළ උපස්ථාන නිෂ්ඵලය යි නොසිතව, දැන් නොපවසින් මව කළ උපස්ථාන කවර කාරණයකින් නිෂ්ඵලවන්නේද? පෙර යමක්හට රාගදෙෂාදී කාලයෙහි **කළ** උපස්ථාන නිෂ්ඵල නුවූයේය"යි වදාරා ඉකුත්වත් කථාවස්තුව ගෙණහැර දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

**පි**වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි මහබෝසතානන් වහන්සේ බරණැසට නුදුරු තැන්හි කැලගසෙක්හි දෙවපුත්‍රයෙක්ව උපන්සේක.

එකල්හි බරණැස් නුවර වාසිහු දෙවියන්ට කළයුතු මහුල් නිරන්තරයෙන් බිලියම් කිරීම් ආදියෙහි යෙදුනාහුය. ඉක්බිති දුගී එක් බමුණෙක් "මමද එක් දෙවපුත්‍රයෙකු පිළිදගිම්" කියා උසස්වූ භූමිප්‍රදෙශයෙක් හිපිහිටියාවූ මහත්වූ එක් කැලරුකක් මුල බිම සමතලාකොට තණ දුරුකොට වට පරික්ෂෙපකොට සුදුවැලි විසුරුවා හැමද ඒ වෘක්ෂයෙහි සුවඳසඳුනෙන් පසඟුල්දී ගඳදුම් මල් පහන් ආදියෙන් පූජාකොට පහන් දල්වා සැපසේ සැතපෙව"යි කියා වෘක්ෂය පැදකුණු කොට යන්නේය. දෙවෙනි දිනයෙහි උදැසන්හිම අවුත් සැපයත් විචාරන්නේය.

**ඉක්බිති** එක් දිනයෙක්හි වෘක්ෂදෙවතාවා මෙසේ සිතුයේය. "මේ බමුණු අනිශයින් මා පිළිදැග හියේය. මේ බ්‍රාහ්මණයා යම් කාරණයකින් මා පිළිදගීද? ඔහට තමා දක්වමි" සිතා ඒ බ්‍රාහ්මණයා එතැන්හි අවුත් රුක්මුල **හමදිනා කල්හි** මහලු බමුණු වේශයකින් ඔහුගේ සමීපයෙහි සිට කියන්නේ "**එම්බා** බ්‍රාහ්මණයාතෙනි, තෝ පරචෙතනා රහිතවූ නොඇසන්නවූ කිසිවක් දැනගත නොහෙන්නාවූ මේ කැලගසයයි දැන පවත්ගන්නා ලද වියදී ඇතිව නිරන්තරයෙන් ප්‍රමාද නොවීම කවරකාරණයක් හේතුකොටගෙණ සැපසයනය විචාරන්නෙහි ද"යි විවාළේය.

එබස් ඇසූ බ්‍රාහ්මණතෙම කියන්නේ "බ්‍රාහ්මණයාතෙනි, මේ වෘක්ෂය දුර සිටියවුන්ට පැහැදී පෙණෙන්නේය. ආසන්නසෙහිවූ අයට අප්‍රකාශය, මහන්ද

වෙයි. ඒකාන්තයෙන් මහෙශාක්‍ය දෙවියන්ගේ විසීමට සුදුසු වෘක්‍ෂයෙක් වන් නේය. එසේහෙයින් මේ කැලවෘක්‍ෂයට නමස්කාර කෙරෙම්. මේ වෘක්‍ෂයෙක්හි යම් දෙවි කෙණෙක් වාසය කෙරෙද්ද? ඔවුන්ට නිස්කාරණ නොවී ධනප්‍රතිලාභය කරණකොටගෙණ නමස්කාර කෙරෙම්" කියේය.

එබස් ඇසූ දෙවපුත්‍රයානෝ ඒ දුගී බ්‍රාහ්මණයාට ප්‍රසන්නවූයේ තමාගේ විමාන වාරයෙහි මහත් දිව්‍යානුභාවයෙන් උපලක්ෂිතව අහසෙහි සිට "එම්බ බ්‍රාහ්මණයාතෙනි, මම මේ වෘක්‍ෂයෙහි නිපත් දෙවපුත්‍රයෙකි. භයතොගණ්ණුව; තොපට ධනයක් දෙමි" කියා ඔහු අස්වසා කියන්නේ එම්බා බ්‍රාහ්මණයාතෙනි, මා වැනි සත්පුරුෂයන්ගේ සමීපයෙහි අවුත් සැප සයනය විචාරීම් ආදීවූ වාග් වාරයෙන් කළ ව්‍යායාමද හැමදීම් සුවඳ මල් පහන් පූජාකිරීම් ආදීවූ කායවාර යෙන් කළ ව්‍යායාමද, මෙසේ නිෂ්ඵලවේද? එසේහෙයින් තොප විසින් කරණ ලද කෙළෙහිගුණ දන්නාවූ මම මාගේ දිව්‍යානුභාවවූ පරිද්දෙන් තොපට උපකාර යක් කෙරෙම්" සිතා කියා විමාන වාරයෙහි සිටියාවූ දිව්‍යපුත්‍රතෙම අත දිගු කොට කියන්නේ "මේ තිඛිරිරුක ඇත පෙණෙන ලද පුලීලවෘක්‍ෂය පිරිවරා ශ්‍රීවයෙන් ශ්‍රීවය හැර මහත් රැසක්ව සිටියාවූ පූජිවස්තු සඞ්ගමූහු විසින් යාගකොට තබනලද. දැන් මේ අසවාමිකවූ ඒ නිදානයන් ගොස් උගුළුවාගණ්ණුව"යි මෙසේද කියා නැවත ඒ දෙවපුත්‍රයා කියන්නේ "බ්‍රාහ්මණයාතෙනි, තෙපි මේ නිදානයන් උගුළුවාගන්නේ ක්ලාන්තවෙයි. තෙපි නික්මෙව, මම තොපගේ වාසස්ථානයට ගෙණගොස් අසවල්තෙන නිධානකෙරෙම්, තොපි ජීවිතාන්තය දක්වා පරිභොග කරමින් දන්දෙව, සිල්රකුව'යි කියා ඒ බ්‍රාහ්මණයාට අවවාදදී ධනයන් තමාගේ දිව්‍යානුභාවයෙන් ඒ බමුණානන්ගේ ගෙයි පිරවූයේය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ පලාස ජාතකය නිමවා වදාළසේක.

එකල්හි බ්‍රාහ්මණයා නම් දැන් ආනන්දස්ථවිරය, එකල්හි වෘක්‍ෂදෙවතාවා නම් බුදුවූ මම්ම වේදැ යි තමන්වහන්සේ දක්වා වදාළ සේකි.

---

## 299 ජවනසකුන ජාතකය

තිවද එක් සමයෙක්හි ෂට්අසාධාරණ ඥානාදියෙන් උපලක්ෂිතවූ ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ දෙවිරම්වෙහෙර වැඩවසනසේක්, දෙවිදත් තෙරුන් වහන්සේ කෙළෙහිගුණ නොදන්නාහුමය යි වදාරා ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

ඨිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම්රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතානන් වහන්සේ නානාවිධ කුසුමභාරා වතත වෘක්‍ෂමණ්ඩිත හිමාලයවන ප්‍රදෙශයෙක්හි කැරල පක්ෂියාව උපන්සේක. ඉක්බිති මාංශ අනුභවකරන්නාවූ එක් සිංහයක්හුගේ ශ්‍රීවයෙහි ඇටයක් ලග්නව ඉදිමී ගොස් ගොදුරු අනුභව කිරීම කොහැක් වූයේය. කර්කශවූ වේදනාවෝ පවත්නාහ, නැවත ගොදුරු සොයා දුක එක් අතුපතරක් අතුරෙහි සැඟවී උන්

නේය "යහළු සිංහය, තොපගේ දුකෙක් ඇද්දැ"යි විමසූයේය. එබස් ඇසූ සිංහයා ඒවූ කාරණය කියේය. "යහළුව, මම තොපගේ මේ ශ්‍රීවයෙහි ලග්නවූ ඇටය පහකරන්ට හැකිවෙමි. එසේද වුවත් මා අනුභව කෙරෙති යන සිතගත් හයින් වනාහි තොපගේ මුඛයට වදින්නට නොහැකිවෙමි" කියේය.

"යහපත, තොප මම අනුභව නොකරමි. එබැවින් මාගේ ජීවිතය රක්ෂා කොට දෙව"යි කීයේය. ඒ කැරල් පක්ෂියාට "යහපතැ"යි ගිවිස සිංහයා ඇලය කින් සතප්පවා සිංහයා කවර ඉෂ්ටානිෂ්ට ක්‍රියාවක් මට කරණ බව කවරෙකුටත් දැනගත නොහෙයි සිතා යම්සේ මුඛය වහන්ට නොහැකි වේද? එපරිද්දෙන් ඔහු දෙතල්ලෙහි දඹුකෝටුවක් තබා මූවට වැද හෙලෙහි ලැගුනු ඇටකෙළවර තුඩින් පහ කෙළේය. ඇටය ගිලිහි වැටිනියේය. ඒ පක්ෂියා ඇටය හෙලා සිංහයාගේ මුඛයෙන් නික්මෙන්නේ දඹුකඩ තුඩින් පැහැර හෙලන්නේමනික්ම ගියේ ශාඛාග්‍රයෙහි සැඟවුනේය.

නැවත එක්දිනයෙක්හි එක් වන මනිෂ්‍යයෙකුගේ ජීවිතය නසා අනුභව කරන්නේය. ඒ කැරල් පක්ෂියා "ඔහු පරීක්ෂාකෙරෙමි" සිතා ඔහුගේ හිස උඩ සාඛාවක සැඟවී ඉඳ සිංහයා හා සමග කථාකරන්නේ "පින්වත්වූ සිංහයානෙනි, තොපට නමස්කාරවේවා යි මා විසින් කළයුතුවූ තොපගේ යම් කෘත්‍යයක් ඇද්ද? ඒ කෘත්‍යය මාගේ ශුභ ශක්තියෙන් කිසිවක් නොනසා කෙළෙමි. එසේ කළාවූ මම මෙයින් මාංශකොටසක් ලබම්ද කිම්දැ"යි විමසූයේය. එබස් ඇසූ සිංහයා කියන්නේ "ලේ මිශ්‍රමාංශ අනුභව කරන්නාවූ නිරන්තරයෙන් දරුණු කම් කරන්නාවූ මාගේ දත් අතුරට පැමිණියාවූ තොපගේ බහුලවූ යම් ජීවිකාවෙක් ඇත්නම් ඉන් ජීවත්ව"යි කී කල්හි ඒ ඇසූ පක්ෂියා කියන්නේ "යම් සත්ත්වයක්හු කෙරෙහි කෙළෙහිගුණ දැන්මෙක් නැද්ද? තමා විසින් අන් සත්ත්වයන්ට කරන්නාවූ කිසි ගුණයෙක් ඇද්ද? කළාවූ ගුණයට නැවත ගුණ කිරීමෙක් නැද්ද? එබදු සත්ත්වයන් සේවනය කිරීම නිෂ්ප්‍රයෝජන වන්නේයි. තවද යම් සත්ත්වයක්හුගේ අභිමුඛයෙහි කරණලද ගුණය කරණකොට ගෙණ මිත්‍රධර්මය නොලැබේද? ඕහට රැහැනි නොවී ආක්‍රොශපරිභව නොබෑත යුනුසුලු නොවීමෙන් ඔහු කෙරෙන් පහවිය යුත්තේය"යි මෙසේද කියා ඒ කැරල පක්ෂියා ගියේය.

ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා **මේ ජවනසකුණ ජාතකය නිමවා වදාළ සේක.**

එකල්හි සිංහයා නම් දැන් දෙවදත්තසථවිරය, එකල්හි කැරල පක්ෂියා වනාහි දැන් බුදුවූ මම්ම වේදැ යි තමන්වහන්සේ දක්වා වදාළ සේකි.

---

## 300
## ජවක ජාතකය

**මේ**වද එක් සමයෙක්හි ශ්‍රී අසාධාරණ ඥානාදියෙන් උපලක්ෂිතවූ ශාස්තෘවූ සර්ව්ඥයන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසතසේක්; සවගයෙහි භික්ෂූන් අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාවස්තුව විනය පිටකයෙහි විස්තර වශයෙන් ආයේය. මෙතැන්දී මතු කියන්නේ සංක්ෂෙප කථාවය.

ශාස්තෘවූ තථාගතයන් වහන්සේ සවෙහි භික්ෂූන් කැඳවා 'මහණෙනි, තෙපි මිටි අස්තෙහි හිඳ උස් අස්තෙහි උන්තක්හව ධර්මදෙශනා කරන්තේ සැබෑදැ?''යි විචාරා වදාළ සේක.

''සවාමීනි, භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්ස, අප දෙශනා කරන්තේ සැබෑය''යි දැන්වූ කල්හි ඒ භික්ෂූන් වහන්සේට නිහතකොට වදාරා ''මහණෙනි, මාගේ ධර්මයෙහි තොපගේ ගරු නොකිරීම යුතු නොවන්නේය''යි වදාරා ''පුරාතන නුවණැත්තෝ වතාහි මිටි අස්නේ හිඳ මේ දෙශනාවෙන් පිටත් මන්ත්‍රයන් යක් හදුරන්නාවුන්ට නින්දා කළාහුය''යි වදාරා ඉකුත්වත් ගෙණහාර දක්වා වදාළ සේක.

**ඒ කෙසේ ද? යත්,**

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණෘද බොධිසම්භාර ඇති අප මහබෝසතානන් වහන්සේ සැඩොල් කුලයෙක්හි ඉපිද උවමනා වයසට පැමිණි සේක් උන්වහන්සේගේ භාර්‍යාවෝ අඹ අනුභව කරන්ට දෙළෙක් ඇතිව ''ස්වාමියාණන් වහන්ස, මම අඹ අනුභව කරන්ට කැමැත්තෙමි''යි උන්වහන්සේට කීවාය. ''සොඳුර, මෙකල්හි අඹඵල නැත්තේය. අනික් කිසි ඵලයත් ගෙණ දෙම්දැ යි විචාළේය. ''ස්වාමියාණෙනි, මම අඹඵල ලබන්නේ ජීවත්වෙමි. තෝ බලන්නාවූ මාගේ ජීවිතය නැතැ''යි කීවාය. ඈ සෙරෙහි පිළිබඳ සිත් ඇත්තාවූ ඒ පුරුෂයා කවර තැනෙක්හි අඹඵල ලබම්දෝ හෝයි සිතීය.

එසමයෙහි බරණැස් රජුගේ උයනෙහි අඹ වෘක්ෂයෙක්හි නිරන්තරයෙන් ඵලගෙණ සිටින්නේ ඒ සැඩොල් පුරුෂයාතෝ ''ඒ වෘක්ෂයෙන් විලිකුත් අඹඵල යක් ගෙණවුත් මෑගේ දෙළ සන්හිදුවමි'' සිතා රාත්‍රි භාගයෙහි බරණැස් රජුගේ උයනට ගොස් අඹගසට නැගී ශාඛාවෙන් ශාඛාවට සැඟවී අඹඵල බලමින් ඇවිදින සේක. එසේ අඹ සොයන උන්වහන්සේට රාත්‍රිය පහන් වූයේය. ඒ පුරුෂයාතෝ මෙසේ සිතූහ. ''දැන් මේ වෘක්ෂයෙන් බැස ගියේ විතම් මා සොරහුය යි අල්වාගණිති''යි සිතා ''රාත්‍රි භාගයෙහි ගසින් බැසයෙම්'' සිතා එක් ශාඛාවකට නැගී සැඟවී හුන් සේක.

එකල්හි බරණැස් රජ පුරෝහිත බ්‍රාහ්මණයාගේ සමීපයෙහි මන්ත්‍රයන්ත්‍ර උගන්නේය. ඒ බරණැස්රජ උයනට ගොස් අඹරුකමුල උස් ආසනයෙක්හි ඉඳ ආචාරීවූ පුරෝහිත බ්‍රාහ්මණයා මිටි අස්නක හිඳුවා මන්ත්‍රයක් උගන්නේය. වෘක්ෂ මස්තකයෙහි උන් පුරුෂයා සිතන්නේ ''මේ රජ උස්තෙහි හිඳ යම් තාක් කල් මන්ත්‍රයන් උගණීද? ඒ තාක්කල් මේ රජ්ජුරුවෝ අධාර්මිකය. යම් බ්‍රාහ්මණයෙක් තෙමේ නීවාසනයේ හිඳ යම්තාක් කල් මන්ත්‍රයක් හදාරවාද? ඒ තාක්කල් ඔහුද අධාර්මිකය, යම් බඳුවූ මාගේ භාර්‍යාව කරණකොටගෙණ ජීවිතය ගරු නොකොට සොරකමින් අඹඵල ගෙණ හැරයෙම්ද? ඒ මමද අධාර්මිකයෙමි'' කියා ගසින් බසිනාවූ පුරුෂයා එල්ලෙන්නාවූ එක් ශාඛාවක් අල්වාගෙණ ඔවුන්ගේ දෑතුරෙහි සිට කියනසේක් ''මහරජ්ජුරුවන් වහන්ස, මම තෂ්ණවීමි. නුඹවහන්සේ ස්ථූලවූ ක්‍රියා ඇතිසේක. පුරෝහිත බමුණාතෝ සූක්ෂ්මක්‍රියා නැසුහෙයින් මෙලේ නම්වෙයි'' කියේය. ''කවර කාරණයකිම්දැ?''යි විචාරණලද්දාවූ

ඒ පුරුෂතෙම රජහට කියන්නේ "මහරජ්ජුරුවන් වහන්ස, අප තුන්දෙනා විසින් කරණ ලද්දාවූ ක්‍රියාවෝ සත්පුරුෂයන්ගේ ආචාර සීමාව ඉක්මුණු හෙයින් අධාර්මිකය, යමෙක් නීවාසනයෙහි හිඳ මන්ත්‍රය උගන්වාද? යමෙක් උසස්තේ හිඳ මන්ත්‍රයන් උගණිද? මොහු දෙදෙන පෙර පියවිද නමින්ම වුන වූවාහ. එසේනෙයින් තුඹ දෙදෙනා වහන්සේ ගරු කළයුතු පූජා ධර්මයන් නුදුටු සේක්ය"යි කියේය.

එබස් ඇසූ පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ "පින්වත්වූ පුරුෂයාණෙනි තොයෙක් මාංශ ව්‍යඤ්ජන කිරියෙන් වනතලද සුදුවූ පැහැ ඇත්තාවූ හැල් සාලෙන් නිපන්නාවූ ආහාරය අනුභව කිරීමෙන් උදර පොෂ්‍යයෙහි ඔජුවූ මම සෘෂින් විසින් සෙවුනාලද මේ පුරාතන ධර්මය සේවනය කෙරෙමි" කියේය. එබස් ඇසූ සැඩොල් පුරුෂයාතෝ කියන්නේ "මේ රජ හැර මේ දඹදිවිතෙලෙහි අන් සත්ත්වයෝත් මෙපරිද්දෙන් ආහාරය පිසති. එසේහෙයින් මේ සත්ත්ව ලෝකය මඟත, මෙතැන් හැර අන් තැනකට පලායව, තොපි අධර්මයෙහි නොහැසිරෙව්, යම්බදුවූ තෙපි අන් තැනෙක්හි නොගොස් මෙතැන්හි වෙසෙත් නම් අධර්මයෙහි නොහැසිරපියා පාසාණ කුම්භයක මෙන් පුරාතන වෘත්තිය කොඹිද වන්වය, බ්‍රාහ්මණයානෙනි, තොපගේ පුරෝහිත තනතුරව පැමිණීමෙන් ලබන ලද යසපිරිවර සැපයව හා ධනයව නිත්දා කරම්හ. අපායේ ඉපදීමට හේතුවූ තොපගේ ජීවිකා වෘත්තියෙක් ඇද්ද? අධර්මයෙහි හැසිරෙමින් ප්‍රතිලබ්ධ යම් වෘත්තියෙක් ඇද්ද? ඊට නින්දා කෙරෙමි කියේය.

ඉක්බිති ධාර්මික බැවින් ඒ සැඩොල් පුරුෂයාහට පැහැදී "පින්වත්වූ පුරුෂය, තෝ කවර ජාති ඇත්තෙක්දැ"යි විවාළේය. රජ්ජුරුවන් වහන්ස, මම චණ්ඩාලයෙක්මි" කියේය. 'පින්වත, ඉදින් තොපි ජාති සම්පන්න වූයේ වීනම් තොපට රාජ්‍යය දෙමි. මෙතැන් පටන් වනාහි මම දහවල් රජ කෙරෙමි. තොපි රාත්‍රියෙහි රජ කරව"යි කියා තමාගේ ග්‍රීවයෙහි පැලඳි මල්දම් ඒ සැඩොල් පුරුෂයාණන්ගේ ගෙලෙහි පලඳවා ඔහු නුවරට ගෙණ රැකවල්හි නියුක්ත කෙළේය. නුවර රැකවල්ලුගේ ග්‍රීවයෙහි රක්තපුෂ්ප මාලාවන් ලබන මේ වංශය විය.

එතැන් පටන් වනාහි ඒ බරණැස් රජ්ජුරුවෝ ඒ පුරුෂයාණන්ගේ අව වාදයෙහි පිහිටා ආචාරි පුරෝහිත බ්‍රාහ්මණයන් කෙරෙහි ගෞරව උපදවා මිටි අස්නෙහි හිඳිනේය. මන්ත්‍රයන් උගන්නේය. ශාස්තෘවූ සම්බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැරදක්වා වදාරා මේ ජවකජාතකය නිමවා වදාළසේක.

එකල්හි බරණැස් රජ නම් දැන් ආනන්ද සථවිරයෝය, එකල්හි චණ්ඩාල පුත්‍රයා වනාහි දැන් බුදුවූ මම්මය යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 301 සය්හ ජාතකය

මේවද එක් සමයෙක්හි සංසාර වෘත්තියෙහි අවිද්‍යාදී ක්ලේශයන් විසින් භ්‍රමණය වන සත්ත්වයන් සඛම්මෘත පානය කරවා සුවශීපවශී සම්පත්ති ප්‍රතිලාභය කළාවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවසන සමයෙහි ශාස්තෘයෙහි උකටලීවූ භික්ෂුකණකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළ සේක.

එක් භික්ෂූන්වහන්සේ කෙණෙක් වතාහි සැවැත්නුවරෙහි පිඬුසිඟා වඩනා සේක් විශිෂ්ට වූ රූපශ්‍රීසම්පත් ඇති එක් ස්ත්‍රියක් දැක උකටලී වූසේක්, ශාසන යෙහි සිත් නො ඇලෙන සේක.

ඉක්බිති භික්ෂූන්වහන්සේ තොකමැති කරවාගෙණ ගොස් සම්බුදුරජාණන් වහන්සේට දැක්වූවාහ. ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ "මහණ තෝ උකටලී වූයේ සැබෑදැ"යි විචාරණලද, "සැබෑ ස්වාමීනි' කීසේක

එතෙපුල් ඇසූ සම්බුදුරජාණන් වහන්සේ විසින් "මහණ තොප කවරෙක් උකටලී කරවූයේදැ"යි විචාරා වදාළ කල්හි එපරිදි දන්වූසේක. එසවත් ඇසූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "මහණෙනි, තෙපි මෙබඳුවූ නෛයාණික ශාසනයෙහි පැවිදිව කවර කාරණයකින් උකටලීවූයෙහිද? පෙර නුවණැත්තෝ පුරෝහිත තනතුරු ලබන්නා ඒ සම්පත්තිය නිරපෙක්ෂව හැර පැවිදිවූවාහු වේදැ"යි කාලත්‍රයවර්තිවූ සකල කාමරූප ධර්මයන්ගේ පරම්පර නුස්සරියඤාණ යෙහි අවිපරීතයෙන් දක්නාවූ සබඹු චක්‍රවර්තිවූ සම්බුදු රජාණන්වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

ශිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහ බෝසතාණන් වහන්සේ පුරෝහිත බ්‍රාහ්මණයාණන්ගේ භාර්‍යාවූ බැමිණියකුස පිළිසඳ රජ්ජුරුවන්ගේ පුත්‍රයා බිහිවන දවස්හිම ජාතවූසේක.

එකල්හි පුරෝහිතයෝ "මාගේ පුත්‍රයෙක් ඇතැ"යි කීවාහුය. ඒතෙපුල් ඇසූ රජ්ජුරුවෝ ඒ බ්‍රාහ්මණ කුමාරයා ගෙන්වා කිරිමවුන්ට භාරකොට දී රජ කුමරුවා හා කැටුවම පිළිදුගුම් කරවූයේය. එතැන් පටන් කුමරුන් දෙදෙනා වම පලඳනා ආහරණ හා ඛාද්‍ය භොජ්‍යාදී සියල්ලම එකාසදෘශ වන්නේය. ඔහු දෙදෙනා වැඩිවිය පැමිණි එක්වම තක්සලානුවරට ගොස් අක්ෂර ලිඛිතාදී සියළු උගතමනා ශිල්ප නොවළහා ඉගෙණ ආවාහුය.

එකල්හි රජ්ජුරුවෝ තමාගේ පුත්‍රයාට යුවරජ තනතුරු දුන්නෝය. රාජකුමාරයා මහත් යසපිරිවර සම්පත් ඇතියේය. එතැන් පටන් බොධිසත්ත්වයන් වහන්සේ යුවරජ්ජුරුවන් හා එක්වම ආහාර අනුභව කරන්නෝය. පානීය යනාදියත් මෙම ක්‍රමයෙන් වන්නේය. මෙසේ ඔවුනොවුන්ගේ විශ්වාස ධර්මය ස්ථිරවූයේය. එයින් මැන භාගයෙහි යුවරජ්ජුරුවෝ පිය මහරජහුගේ අයාමෙන් රාජ්‍ය සම්පත්තියෙහි පිහිටා මහත්වූ රාජ්‍යශ්‍රී සම්පත්තිය අනුභව කරන්නේය.

ඉක්බිති ඒ විශුද්ධශීලසමාධ්‍යාදී ගුණයන්ට වාසස්ථානවූ අප මහබෝසතාණන් වහන්සේ සිතනසේක් "මාගේ මිත්‍රයා රාජ්‍යානුශාසනය කරන්නේය. සිතුනු ඇසිල්ලෙහි මට වනාහි පුරෝහිත තනතුරු දෙනසේක. පඤ්චකාම සම්පත්තියෙන් යුක්තවූ ගෘහවාසයෙන් මට ප්‍රයෝජන කිම්දැ"යි "සෘෂිප්‍රව්‍රජ්‍යා වෙන් පැවිදිව කායචිත්තෙකග්ගතා දෙක වඩනය කෙරෙමි" සිතා බොධිසත්ත්වයන් වහන්සේ දෙමව්පියන් වැඳ පැවිදිවීමට අනුදන්වා මහත්වූ භවභොගසම්පත්තිය නිරපෙක්ෂව දමා අසහායවාරීවූ මෘගෙන්ද්‍රයකු පරිද්දෙන් උදකලාවූ

සඛියවූ වාසභවනයෙන් නික්ම ප්‍රසිඩ සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින් භයානකවූ හිමාලය වනයට වැද සිත්කළුවූ එක් භූමිප්‍රදේශයෙක්හි පන්සලක් මවා ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා චිත්තානුකූලව ධ්‍යාන ක්‍රීඩා කෙළිමින් වාසය කරණ සේක.

එකල්හි රජ්ජුරුවෝ තමහට මිත්‍රවූ බොධිසත්ත්වයන් සිහිකොට "මාගේ මිත්‍රයාතන් මේ ස්ථානයෙහි දකින්න නැත්තේය. ඔහු කවර තෙනෙක්හි දැන් වාසය කරන්නේ ද"යි විමාලේය. එතෙපුල් ඇසූ අමාත්‍යයෝ බොධිසත්ත්වයන් වහන්සේ පැවිදිවූ බව කීහ. "එසව් ගොස් මාගේ මිත්‍රයාතන් කැඳවාගෙණ එව"යි ඔහුට පුරෝහිත තනතුර දෙනු කැමතිවෙමි" කීහ.

එබසට සඒහ නමිවූ අමාත්‍යයා, 'යහපත, ගොස් කැඳවාගෙණ එමි"යි ගිවිස බරණැස් නුවරින් නික්ම අනුපිළිවෙළින් එක් ප්‍රත්‍යන්ත ගමකට පැමිණ එගමහි උන්වහන්සේ එතකල ලැගුම් පිණිස කැඳවුරක් කරවා වැදිපුරුෂයන් හා කැටිව බොධිසත්ත්වයන් වහන්සේ වාසය කරන්නාවූ පන්සල සමීපයට ගොස් පන්සල් දොරකඩෙහි සකල කමලාසනා නිමිස ගරුඩ මනුෂ්‍ය විෂ ධරීන්ද්‍රයන්ගේ හෘදය තොත්‍රතන්දකරවූ සවණීප්‍රතිබිම්බයක් සේ වැඩහුන් බුබාං කුරයන් වහන්සේ දැක දෙහොත් මුදුනෙහි තබා වැද එකත්පස්ව හිඳ පිළිසඳර කථා කෙරෙමින් ඉක්බිති සවාමීන්වහන්ස, අපගේ රජ්ජුරුවෝ නුඹවහන්සේට පුරෝහිත තනතුරු දෙනු කැමතියෙන් නුවරට එනු කැමතිසේක්දැ"යි කීහ.

එබසට බෝසතාතන් වහන්සේ කියනසේක් "මම පුරෝහිත තනතුරු තබා කාසි කොසලාදී සියලු ජම්බුවිප රාජ්‍යය හෝ චක්‍රවර්ති රාජ්‍යශ්‍රී සම්පත්තිය ලබතෝතිනුත් නොයෙමි. නුවණැත්තෝ වරක් දමනලද ක්ලේශයක් නැවත ග්‍රහණය නොකරති. වරක් හරණලද දෙය වනාහි උද්ගාරකොට දැමූ කෙළපිඬක් හා සමාන වන්නේය"යි කියා ප්‍රකාශකරණසේක් "එම්බා සඒහ නම්වූ අමාත්‍යය, මම වනාහි චක්‍රවාටපර්වතය විසින් පිරිවැරූ සාගරයට කණීාව තංසයක් වැනිවූ මේ පෘථිවිසංඛ්‍යාත චක්‍රවර්ති රාජ්‍යශ්‍රීසම්පත්තිය, ධ්‍යාන සැපයෙන් යුක්තවූ ප්‍රව්‍රජ්‍යාව හැර පඤ්චකාම සම්පත්තියෙන් යුක්තවූ ඓශ්වර්‍ය්‍ය ඇරගතැ යි යන මේ ලෝක නින්දෘයෙන් යුක්තව නොකමැතියෙමි, මෙබඳුවූ නින්ද්‍ය ස්වභාවයෙන් දනුව'යි කියා "ශ්‍රේෂ්ඨ අමාත්‍ය ධ්‍යානයෙන් ආත්මය පිරිනෙලා නෝ අධර්මයෙහි හැසිරීමෙන් නෝ යම් යසලාභ වෘත්තියෙක් ඇත්නම් ඒ සියලු සම්පත්තිය නින්දිත වන්නේය" කියාද යම් අධර්මයකින් වස්තු රැස්කිරීමෙක් ඇත්නම් එයින් ජීවත්වීමට වඩා ඉදින් ගෘහවාසය හැර භික්ෂා භාජනය අතින් ගෙණ අන් කුලයෙක්හි පිඬුපිණිස හැසිරෙමි, එම ජීවත්වීම මට උත්කෘෂ්ට වන්නේය"යි කියා "මම වනාහි ඉදින් ගෘහවාසය හැර සත්ත්වලෝකයෙහි සත්ත්වයන්ට හිංසා පීඩා නොකොට භික්ෂාභාජනය අතින් ගෙණ අන්කුලයෙක්හි පිඬුපිණිස හැසිරෙමි. එබඳු ජීවිකාව රාජ්‍යශ්‍රීසම්පත්තියටත් වඩා උත්කෘෂ්ටය"යි කීසේක.

බොධිසත්ත්වයන් වහන්සේ අමාත්‍යයා විසින් කැවත යාවඤ්චකරද්දීත් පුරෝහිත තනතුරු මේ ආකාරයෙන් ප්‍රතික්ෂේප කළසේක. එවිට සඒහ නම්වූ අමාත්‍යයා බොධිසත්ත්වයන් වහන්සේගේ සිත් ලැබ ගතනොහී වැද අවසර ඉල්වාගෙණ නුවරට නොස් 'බොධිසත්ත්වයන් වහන්සේ නොඑන බව" රජ්ජුරුවන්ට දැන්වූයේය.

අජරාමර සංඛ්‍යාත නිර්වාණක්ෂේමභූමිය ප්‍රණිධානය කළාවූ සත්ත්වයන්ගේ අභිමතාර්ථය සිද්ධකර අප තිලෝගුරු බුදුරජාතන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා චතුරාර්යසත්‍යය ප්‍රකාශකොට වදාරා මේ සස්හ ජාතකය නිමවා වදාළසේක.

චතුරාර්ය සත්‍ය ධර්මදේශනාවගේ කෙළවර උකටලී භික්ෂූන්වහන්සේද දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටිසේක. අවශෙෂ පිරිසත් මෙවැනි ශ්‍රොතාපත්ති ඵලාදිය ලාභාත්ලාභාත් කළාහුය.

එසමයෙහි රජ්ජුරුවෝ නම් දැන් බුද්ධොපස්ථානයකවූ ආනන්දස්ථවිර යෝය. එසමයෙහි සස්හ අමාත්‍යයා නම් දැන් ඥානාග්‍රප්‍රාප්තවූ ශාරීපුත්‍රස්ථවිර යෝය. එසමයෙහි පුරෝහිතයා නම් සමස්ත සත්ත්වයන් කෙරෙහි පතළ කරුණාවෙන් සමත්‍රිංශත් පාරමිතා ධර්මයන් පූරණය කොට අසඞ්ඛ්‍යමූලයෙහිදී ප්‍රාදුර්භූතවූ වජ්‍රාසනාරූඪව සකලඥෙය ධර්මයන් කරතලාමලක්‍රමයෙන් ප්‍රතිවෙධකළාවූ මම්ම වේදැ යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

# වීරවග්ගො පඨමො

---

## 302 පුච්මන්දි ජාතකය

තවද එක්සමයෙක්හි සුරාසුර බ්‍රහ්ම මනුජවන්දනීය ශාස්තෘවූ අප තිලෝගුරු බුදු රජාතන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක්, ආයුෂ්මත්වූ මහමුගලන් තෙරුන්වහන්සේ අරභයා මේ දෙශනාව වදාළසේක. මුගලන් මහ තෙරුන්වහන්සේ වනාහි රජගහනුවර නිසා වත කැලයෙක්හි වසන කල එක් සොරෙක් නගරචාර නම් ගම්හි උම්මන් බිඳගෙණ හස්තාභාර බඳු ගෙණගොස් තෙරුන්වහන්සේ කළ ආකාරයෙන් පිරිවෙණට වැද මට ආරක්ෂා වන්නේය යි සිතා තෙරුන්වහන්සේගේ පන්සල නිසමත්තෙහි සැතපුනේය. තෙරුන් වහන්සේ ඔහු නිසමත්තෙහි සැතපුනු බව දැන සිතා පන්සලින් නික්ම ගොසින් "මෙතැන්හි තොප නොසැතපේව" යි නිකුත් කළ සේක.

ඒ සොරා එතනින් නික්ම නොපෙණෙන ලෙස පියවළහා ගියේය. එගම් වැසි මනුෂ්‍යයෝ හිනිසුළු ඇරගෙණ සොරහුගේ පියවර සටහන් ඒ ඒ තැන්හි පරීක්ෂා කොට ගොස් ඒ සොරහු ආවාවූ තැන්ද සැතපුනු තැන්ද යන මෙකී තැන් දැක සොරුන් මෙතැන්හි ආයේය. මෙතැන්හි සිටියේය. මෙතැන්හි හුන්නේය. මේ සථානයෙන් නික්ම ගියේය, අප විසින් සොරහු නොදක්නා ලද්දේය යි ඔබිනොබ ඇවිද නොදැක ගියාහුය.

දෙවෙනි දවස්හි මුගලන් මහතෙරුන් වහන්සේ පෙරවරු වේලෙහි රජගහනුවර පිඬුපිණිස හැසිර ආහාර කෘත්‍යයෙන් වැළකුන සේක් වේළුවනාරාමයට ගොස් එපවත් බුදුන්ට දන්වූසේක. "මොග්ගල්ලානයෙනි සැක කළ යුතු

තැන් සැක කෙලේ නොපි දැන් මතු නොවෙයි. පුරාතන නුවණැත්තෝද සැක කළයුතු දෙයෙහි සැක කළානුවේදැ"යි වදාරා සථවිරයන් විසින් ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්**

**රිවගිය** දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකු රජකරණ සමයෙහි අප මහ බෝසතාණන් වහන්සේ බරණැස් නුවර සුසාන වනයෙහි කොසඹ ගසෙක්හි වෘක්ෂදේවතාව උපන් සේක.

ඉක්බිති එක් දිනෙක නුවර දෙර සමීප ගෙමක්හි කරණලද සොරකම් ඇති පුරුෂයෙක් ඒ සුසාන වනයට ප්‍රවිෂ්ටවිය. එකල්හි වනාහි ඒ සුසානවනයෙහි කොසඹය, ඇසතුය යන වනස්පති වෘක්ෂයෝ දෙදෙනෙක් වූහ කරණලද සොරකම් ඇති පුරුෂයා කොසඹ ගසමූල බඩුපොදිය තබා සැතපුනේය.

එකල්හි වනාහි මනුෂ්‍යයෝ සොරුන් ගෙණ කොසඹ හුල්හි අමුණති. ඉක්බිති ඒ දෙවපුත්‍රයා සිතනුයේ "ඉදින් මනුෂ්‍යයෝ අවුත් මේ සොරහු අල්වා ගෙණ මේ කොසඹ ගසෙහි ශාඛාවන් ඡේදනය කොට හුලක් තනා මොහු කොසඹ හුල්හි අමුණවන්නාහුය. එකල්හි අපගේ මේ විමානවෘක්ෂයත් නස්නේය. එබැවින් ඔහු මෙතනින් නිකුත්කෙරෙමි"යි ඔහු හා සමග කථාකරන්නේ "කොල සොරු නැගී සිටුව, කවර කාරණයකින් සිතා සයනය කරන්නෙහිදැ"යි මෙතැන්හි තාගේ සයනය කිරීමෙන් කවර අර්ථයෙක් සිඛවේද? ගමෙහි දරුණු සාහසික වොරක්‍රියා කළාවූ සොරා යම්සේ රාජපුරුෂයෝ අල්වා නොගණිද්ද? එපරිද්දෙන් නැගී සිට නික්මෙව"යි කියේය. ඒ දෙවපුත්‍රයා ඔහුට මේ උක්ත ප්‍රකාර වචනයෙන් භයගන්වා ගමන් කර වූයේය.

ඒ සොරහු එතනින් ගිය කල්හි ඇසතුරුක්හි වසන දෙවපුත්‍රයා කියනුයේ "ගමට ප්‍රවිෂ්ටකළ යම් සොරෙකු රාජපුරුෂයෝ අල්වාගෙණ වතයෙහි ගෙණගියාවූ කොසඹ වෘක්ෂයෙන් ශාඛාවක් කපා උල්හිදුවති. එකල්හි පුවිමඳ දෙවපුත්‍රයානව කවර හානියෙක් වේදැ?"යි කී කල්හි එබස් ඇසූ කොසඹ රුක්හි වසන දෙවපුත්‍රයා කියන්නේ "අන්වඳී දෙවපුත්‍රය, තෙපි මාගේද, සොරහුගේද, එක්ව නොවසන බව නොදනුව් ගම්හි සොරකම් කළ පුරුෂයා කොසඹ හුල්හි අමුනති එසේකල්හි මාගේ විමාන වෘක්ෂය නස්නේය. නොකොත් ශාඛා යෙක්හි බැඳ එල්වූ නම් මාගේ විමානය කුපණ ගන්ධයෙන් හමන්නේය. එහි මාගේ සිත සැක කරව"යි කියේය.

එපරිද්දෙන් ඒ දෙවපුත්‍රයන්ට ඔවුන් ඇථකරමින් සිටියදී වස්තු සවාමීහු සියළු කොලගත් අත් ඇතිව පියවර අනුසාරයෙන් අවුත් සොරහු සැතපුණු තැන් දැක 'පින්වත්නි, දැන් මේ සොරු නැගිසිට ගියෝය. ඉදින් සොරුන් ලදමෝ නම් ඔහු මේ කොසඹ හුල්හි හෝ අමුනා ශාඛාවෙක්හි හෝ බැඳ එල්වා යන්නමෝ වේදැ'යි කියා ඔබමොබ දිව ඇවිද සොරුන් නොදැකම ගියාහුය. ඔවුන්ගේ බය ඇසූ අඥවඳී දේවපුත්‍ර කියන්නේ "එම්බා නිම්බවෘක්ෂ දෙවපුත්‍රය, සැකකළයුතු දෙයෙහි සැකකළ යුත්තේය. පාපමිත්‍ර සංසර්ගය දුරු කිරීමෙන් මෙලෙවිහි තමා රක්ෂා කෙරෙති. ත්‍රිවිධ දුශ්චරිතය දුරුකිරීමෙන් පරලොවින් වන අපායාදීවූ භයින් තමා රක්ෂා කෙරෙයි. එසේහෙයින් අනාගත භය කරණකොට ගෙණ නුවණැති සත්ත්වයෝ මේලොව පරලොව දෙකින් වන වැඩ දක්නාහුය"යි කියේය.

ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ මේ ධර්මදේශනාව ශ්‍රෙණිහැර දක්වා වදාරා මේ පුවම්මඳ ජාතකය නිමවා වදාළසේක. එකල්හි අශ්වජිත් වෘක්ෂයෙහි නිපන් දෙවපුත්‍රයා නම් ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේය. එකල්හි නිම්බවෘක්ෂයෙහි නිපන් දෙවපුත්‍රයා නම් දැන් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 303
## කුසසපමන්දිය ජාතකය

**එ**වද එක් සමයෙක්හි ෂඩ්-භිඥද්‍යුතෙක ගුණරත්නාලඞ්කෘත ශාස්තෘවූ බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරණසේක්, එක් මහලු භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දෙශනා කළ සේක.

සැවැත්නුවර වැසි එක් කුලපුත්‍රයෙක් වස්තුකාම ක්ලෙශකාමයෙහි ආදීනව දැක සර්ව්ඥයන් වහන්සේ සමීපයෙහි පැවිදිව කමටහන් ගෙදී වාසය කරන්නේය. නොබෝ කලකින්ම රහත් බවට පැමිණියේය.

ඊට මෑත භාගයෙහි උන්වහන්සේගේ මැනියෝ කළුරිය කළහ. ඒ රහතන් වහන්සේ මැනියන්ගේ ඇවැමෙන් දෙපුතුපියන් පැවිදිකරවා දෙව්රම් වෙහෙරෙහි වැස වස් එලඹෙන කල්හි චීවර ප්‍රත්‍යයන්ගේ සුලභ බව අසා එක් ගමක විසීමට ගොස් එතැන්හි තුන්දෙනා වහන්සේම වස් එළඹ නිමවනලද වස් ඇතිසේක් ජේතවනාරාමයට ආ සේක.

රහත්වූ දහර භික්ෂූන් වහන්සේ කියනසේක් ජේතවන විහාරසථානසන්තයෙහි සිට සාමණේර නෙපි, මහලු තෙරුන්වහන්සේ සතප්පා කැන්දගෙණ එව, මම පෙරටුව ගොස් පිරිවෙණ පිළිදහිමි''යි කියා ජේතවනාරාමයට ගිය සේක.

මහලු තෙරුන් වහන්සේ සෙමින් සෙමින් සිව යන සේක. සාමණේරයෝ නැවත නැවත හිසින් පීඩා කරන්නාහු මෙන් ''සාමිනී, ගිය මැනවැ''යි කියා ඒ මහලු තෙරුන් බලාත්කාරයෙන් ගෙණ එන්නේය. මහළු තෙරුන් වහන්සේ කියනසේක් ''තොපි අප හා ගමන නොකැමති කරවාගෙණ යවිදැ'යි කියා නැවත වැලකී ආපස්සෙහි යනසේක. ඔවුනොවුන් හා විවාද කරන්නාවුම ඔවුන්ට හිරු හස්තාඝතවිය. අන් විතරාගී භික්ෂූන්වහන්සේ පිරිවෙණ හැමද දිය සපයා තබා ඔවුන් දෙදෙනාගේ ඊම නොදන්නා සේක් ගිණිසිළු ගෙණ පෙර ගමන්කොට එන්නාවූ ඔවුන් දැක ''කල්ගියේ කිම්දැ''යි විචාළසේක.

මහලු භික්ෂුතෙම ඒවූ කාරණය කී සේක් ඒ රහත් භික්ෂූන් වහන්සේ ඒ දෙදෙනා සතප්පවා සෙමින් කැඳවා ආ සේක. එ දවස්හි බුදුන්ට කළයුතු උපස්ථානාදියට අවසර නොලත් සේක. නැවත බුදුරජාතන් වහන්සේ දෙවැනි දවස්හි බුඩොපසථානයට අවුත් තමස්කාර කොට අන් භික්ෂූන් වහන්සේට බුදුහු ''තෙපි කවර කල්හි අවුදැ?''යි විචාළසේක. ''සවාමිනි, ඊයේ ආයෙමි'' දැන්වූසේක. ''තොපි ඊයේ වැනි දවස අවුත් අද බුඩොපසථාන කරවිදැ?''යි වදාළසේක. ''සව මිනි, බුදුරජානන් වහන්ස, එසේය''යි කියා ඒවූ කාරණය දැන්වූසේක.

ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මහලු තෙරුන්වහන්සේට නින්දුකොට වදුරා ''මෙතෙම මෙබඳු ක්‍රියා කෙළේ දැන්මතු නොවෙයි' පෙරත් නින්දු කෙළේම වේදැ''යි වදුරා ''දැන්මතු වනාහි ඒ මහලු භික්ෂූන් ක්ලාන්තකරවනලද්දේ නොවෙයි, පෙර නුවණැත්තන් ක්ලාන්ත කරවීය''යි වදුරා ඒ රහත් භික්ෂූන් විසින් ආරාධිතවූසේක් ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණන්වහන්සේ කසී නම් නියම්ගම්හි බ්‍රාහ්මණ කුලයෙක්හි උපන්සේක. උවමනා වයසට පැමිණි බ්‍රාහ්මණ කුමාරයන්ගේ මැනියෝ කළුරිය කෙළේය. ඒ බ්‍රාහ්මණ කුමාරයා මැනියන්ගේ අවමඟුල් කෘත්‍යයකොට මසක් අඩමසක් ඇවැමෙන් ගෙයි විද්‍යමාන වස්තූන් දන්දී පියා පියානන්ද මලනුවන්ද ගෙණ හිමාලයවන ප්‍රදේශයෙහි දෙවියන් දුන් රිට්සුඹුළුගෙණ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව අලමුල් වනමුල් ඵලාහාරයෙන් යැපෙන සේක් සිත්කළුවූ වනලැහැබෙක වාසය කළසේක.

හිමාලය වනයෙහි වර්ෂාකාලයෙහි නො සිඳෙන ලද ජලධාරාවන් ඇතිව වැසි වස්නා කල්හි අලමුල් සාරන්වද නොහැකි වන්නේය, ඵලාඵල පණිවෝ පතිත නොවෙති. එසේ හෙයින් තාපසවරයෝ බොහෝසේ හිමවතින් බැස මනුෂ්‍යපථයෙහි වෙසෙති.

එකල්හි මහබෝසතාණන් වහන්සේද පියාණන් හා සමග මලනුවනුත් ගෙණ මනුෂ්‍යපථයෙහි වැස නැවත හිමාලය වනය මල්පිපී ඵලගත් කල්හි ඔවුන් දෙදෙනා ගෙණ හිමාලයවන ප්‍රදේශයෙහි පෙර විසූ තමාගේ ආශ්‍රමපථයට එන සේක්, පන්සලට නුදුරු තැන්හිදී හිරුඅස්තයට ගතවූ කල්හි ''තොපි ලැසි ගම නින් එව. මම පෙරටුව ගොස් පන්සල පිළිදහිමි'' කියා ඔවුන් දෙදෙනා හැර ගියසේක.

බාල තාපසයෝ පිය මහලු තාපසයන් හා සමග ලැසි ගමනින් යන්නේ ඒ මහලු තාපසයන්ගේ කටිප්‍රදේශයෙහිත් පිඬාකෙරෙමින් යන්නේය. මහලු තාපසයෝ තොපි මාගේ අභිප්‍රායෙන් ගෙණ යන්නේය''යි කියා නැවත වැළකී ආපස්සෙහි එන්නේය. මෙපරිද්දෙන්ම කලහ කරන්නාවූ ඔවුන්ට අඞ්කාරවීය.

මහබෝසතාණන් වහන්සේද පන්සල හැමදියපෙරා තබා හිනිසුළුගෙණ පෙරමගට එනසේක් ඔවුන් දෙදෙනා දැක ''මෙතෙක් කල් කුමක් කළයුතුදැ''යි කීසේකි. බාලතාපසයෝ පියතාපසයන් විසින් කළමනා කාරණා කීශේය. මහබෝසතාණන් වහන්සේ ඔවුන් දෙදෙනා ලැසිගමනින් ගෙණගොස් තාපස පරිෂ්කාරයන් තැන්පත්කොට තබාපියා තාපසයන් ජලස්නානය කරවා පය මැදීම් තෙල්ගැවීම් පිව මිරිකීම් මෙකී වත්කොට එක් හිනිකබලක් සමීපයෙහි තබා සන්සිඳුවනලද සීත ඇති ''පියතාපසයාණන් වහන්ස, ලදරුවෝ නම් මැටි බඳුනක් හා සම සදෘශය හ මදකින්ම බිඳෙති. වරෙක බිඳුනුකල් තැන් පටන් නැවත ගළපන්ට නොහැකි වන්නේය. ඔවුන් ආක්‍රොශ කරණ කල්හිද මහලුසත්ත්වතෙම ඉවසිය යුත්තේය''යි කියා පියතාපසයන්ට අවවාද කරණ සේක් ''අඥන භාවයෙන් තරුනවූ කාශ්‍යප නම් පියතාපසයාණන් වහන්ස, නුව නැති සත්ත්වතෙම බාලදරුවෝ ආක්‍රොශ වචන හා පීඩා කෙරෙත්මුත් සියළු

තොකමැති ක්‍රීඩාවන් ක්ෂමා කෙරෙති. ඉදින් අනුවන සත්ත්වයෝ ආක්‍රෝශ පරිභව බෙණෙති. නමුදු පහරිත් නමුදු බාලදරකයන් විසින් කළාවූ සියළු අපරාධයන් සත්පුරුෂවූ වැඩිමහළු නුවණැති සත්ත්වයෝ යුහුව මිත්‍ර භාවයෙන් සමගිවෙති. වැලිදු අඥාන සත්ත්වයෝ මැටිභාජනයක් මෙන් බිඳෙති. ඒ නුවණැති සත්ත්වතෙම සුවල්පමාත්‍රවූ විවාදයක් කෙළේද? වෛරයන් සන්සිඳීම් වශයෙන් සමගි භාවයට නොපැමිණෙන්නේය. මෙලෙව්හි යම් සත්ත්වයෙක් තමා විසින් ඉක්මවා පැවති දෝෂ දනී නම්, යම් සත්ත්වයෙක් තමා කළ දෝෂ වරදනියාගෙන් පිළිගන්ට දනීද? ඔහු දෙදෙන මිත්‍රභාවයෙන් සමගිවෙති. එසේ හෙයින් ඔවුන් දෙදෙනාගේ මිත්‍රසම්බන්ධය නොනස්නේය. තවද මේ වේලෙහි යම් සත්ත්වයෙක් චෙෂයෙන් මැඩපවත්නාවූ අපරාධකාරීවූ අන්‍යසත්ත්වයන්ගේ ව්‍යතික්‍රමයෙන් ඔවුන් ක්ෂමා නොකළ කල්හිද තමා විසින් "භද්‍රමුඛයානෙනි, තොපි මෙසේ එව පාලිවචනයන් උගනුව. අර්‍හකථාවන් අසව භාවනා යෙහි යෙදී වාසය කරව. කවර කාරණයක් නිසා බැහැර වාසය කරව්ද"සි කියා තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ අපරාධ දරා මෛත්‍රී භාවනාවට ප්‍රයත්න කෙරේද? මිත්‍රයන්ගේ අක්‍රියාභරය උසුලාද? මිත්‍රයාසින් කළයුතු ධුරය විඳසුලාද? එහෙයින් මෙබඳු වූ සත්ත්වතෙම විශෙෂයෙන් උතුම්වන්නේය"සි මෙසේ කියා මහබෝසතානන් වහන්සේ පිය තාපසයන්ට අවවාද කළසේක. ඒ මහලු තාපසයානෝද එතැන් පටන් මොනවට දැසුනේය.

ශාස්තෘවූ තථාගතයන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා මේ ඛන්තිවාදී ජාතක ධර්මදෙශනාව නිමවා වදාළසේක.

එකල්හි පිය තාපස තෙම දැන් මහල්ලක ස්ථවිරය, එකල්හි සුලුතාපසයෝ තෙම දැන් සාමණේරයෝය, එකල්හි පියතාපසයන්ට අවවාද කළ තාපසයෝ තෙම දැන් "බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 304
## ඛන්තිවාදී ජාතකය

තීවද මෙරසේ මුළුලොවට අසාධාරණවූ සර්‍වඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝපී භික්ෂුකෙණෙකුන් වහන්සේ සර්‍වඥයන් වහන්සේකරා කැඳවා ගෙණවුත් දැන්වූ කල්හි "මහණ; පෙර උත්තමයෝ තම් කටු-සැම්බියෙන් පහර දහසක් කාන් තොකිපුතෝ වේදැ සි තොප වතාහි මේ නියා බුඩශාසනයෙහි මහණව කෝපව වාසය කරන්නෝ ඉතා අයුක්තිය'සි වදාරා "අත් පා කන් නාසා කැපුවත්වත් උත්තමයෝ කෝප නොකළෝ වේදැ"සි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

යම්වගිය දවස කසීරට කලාබු නම් රජකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ බමුණු කුලයක උපන්නාහ. බොධිසත්ත්වයන්ට තම් තබන්නාහු කුරුඩක කුමාරයෝයයි නමක් ඇතිව වැඩිවිය පැමිණ දෙමව්පියන් ඇවෑමෙන් ඒ සම්පත්හිමිව ඒ සමපත් දැනවිඟෙහිවිසුරුවා පඤ්චකාමයෙහි ආදීනව දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාල වනයෙහි වාසයකොට ලුණු ඇඹුල්

නිසා බරණැස් නුවරට අවුත් රජ්ජුරුවන්ගේ උයනට වැද වාසයකොට නිඛාව පිණිස වීථියෙහි සිඟා ඇවිදිනාහු සෙතෙවිරදුන්ගේ ගෙදරට පැමිණියේක. සෙතෙවිරද්දු මුන්වහන්සේගේ ඊර්ය්‍යාපථයෙහි පැහැද එවක් පටන් තමන්ගේ ගෙයින් දන්දී උපස්ථාන කරන්නාහ.

එසමයෙහි එක් දවසක කලාබු රජ්ජුරුවෝ රා බී මත්ව සත් දහසක් බිසෝවරුන් පිරිවරා උයන්කෙළියට ගොසින් මහුල්සලවට මස්තකයෙහි කරුණාව ඇති ස්ත්‍රියක සමීපයෙහි කලවයෙහි හිස තබාලා වැදහොත්තාහුය. සොළොස් දහසක් තාවක ස්ත්‍රීන් "අපගේ සැමියන් නිදනකල අපි නෘත්‍ය කරන්නේ කාටදැ"යි කියාලා ගත්තාවූ පඤ්චාංගික තූර්‍ය්‍යනාදයක තබාලා ගොස් තාපසයන් ලඟ ගසමූල වටලාගෙණ බණ අස අසා උන්නාහ එකියන ස්ත්‍රී තමා කලවය සොල්වා රජ්ජුරුවන් පුබුද්දුවූහ. පිබිද මහුල්සල්වට මත්තෙහි හිඳ මෙතන සිටියාවූ වණඩාල ස්ත්‍රීහු කොයි ගියෝදැ"යි විචාළාහ.

එවිට බියව් කියන්නාහු "තාපස කෙණෙක් ලඟ හිඳ බණ අසති කිහ. "යහපත, කුට තාපසයන්ට නිහඬක් කියමි.' නැගී සිට කඩුව අයාපියා ඇර ගෙණ මරන්ට දිවූහ. රජ්ජුරුවන් වනන්සේගේ වල්ලභ ස්ත්‍රී රජ්ජුරුවන් ඉදිරියට ගොස් කඩුව ඇරගත්තාහ රජ්ජුරුවෝ ගොසින් "තොපි කුමනවාදීදැ"යි විචාළාහ. එවිට "මහරජ, මම ඛන්තිවාදී නමය"යි කීහ. "ඒ කුමක්ද? ඛන්තිවාදි නමැ"යි විචාළතෙත "මා කෙරේ මෛත්‍රීන් කෙරෙහිත් අමෛත්‍රීන් කෙරෙහිත් මම එක කරුණාව මැ"යි කී හෙයින් "මම ඛන්තිවාදී මැ"යි කීහ.

මුන්ගේ ඛන්තිය බලන්ට උවමැනවැ යි වධකයා ගෙන්වූහ. වධකයාන් රත්කඩක් හැඳ රතක් කරලා රත්මල් පැලඳ පොරවක් අතින් ගෙණ කවරක්හට කවර වධයක් කෙරෙමිද? වදුල මැනවැ"යි කීහ. "අනික් කාට වද කරන්නටද? තෙල කුට තාපසයා ඉඳ ඛිමලා එළාගෙණ පිට පාර පන්සියයක්ද, බඩ පාර පන්සියයක්ද, දැලයෙහි දෙසිය දෙසියක්ද ගසාල"යි කීහ. එවිට වධකයාත් කී ලෙස ගෙඩි ගසා සිටියාහ.

එවිට කියන්නාහු තවද "තොපගේ ඛන්තිවාදී නොගියේ දැ"යි විචාළාහ, "ඇයි මහරජ, මාගේ ඛන්තිය පයෙයි කීහ. "පයක් කපාහරුවයි කී හෙයින් වධකයාත් කී ලෙසම කළාහ. එවිටත් "තෝ කුමනවාදී දැ"යි විචළෙන් "ඇයි මහරජ මාගේ අත් පා කැපුවයි කීම්ද? මාගේ ඛන්තිය මාගේ හෘදයෙහි වේදැ"යි කීහ. "තුළඟේ කන් නාසා කපා තෝ ඛන්තිවාදීදැ" යි විචාළෙන් ඇයි මහරජ, මාගේ ඛන්තිය මාගේ ලෙයි නොවේදැ"යි කියා වැදහොත් බොධිසත්ත්වයන් කැපූ අත් පා කන් නාසායෙන් ගිය ලෙහෙයන් රැඳී ඔත්තාහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඇයි තාපසයානෙනි, තව දක්වා තොපතේ ඛන්තිය නොගියේ දැ"යි කීහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "මහරජ ඛන්ති නම් අත් පා කන් නාසායෙහි තිබූ දෙයෙක්ද? මාගේ ගම්භීරවූ හෘදයෙහි පිහිටියේය. තොප කුමක් කළත් මාගේ ඛන්තියට කුමක් වේදැ"යි කීහ. එවිට රජ්ජුරුවෝ තොපගේ ඛන්තිය තොපගේ ලෙහිම තිබෙයි කියා විළඹෙන් ලයට ඇන්මක් ඇත පිටත්වලා ගියාහ.

එවිට තාපසයන්ට උපස්ථාන කරන්නාවූ සෙතෙවිරද්දු තාපසයන් කරා අවුත් තාපසයන්ගේ කපාපු අත් පා කන් නාසා ඇරගෙණ කඩ කඩ බැඳ

තාපසයන් ඇහ ලේ පිසා තාපසයන් එක් තෙනක සතප්පවා වැද එකත්පස්ව හිද කියන්නාහු උත්තමයානන් වහන්ස, වධකළසේක් රජ්ජුරුවන් වහන් සේය. රාජ්‍යවාසීන්ගෙන් වධයක් කරන්නෙක්වත් කළ කෙනෙක්වත් නැත. රාජ්‍යවාසීන්ට කෝපයක්වත් අමෛත්‍රියක්වත් නොකළ මැනව, කෝප කරතත් මෛත්‍රී කරතත් රජ්ජුරුවන් විසින් මාගේ කන් නාසා අත්පා කප්පවා වද කරණලදැ එසේ කළත් මම රජ්ජුරුවන් කෙරෙහි නිෂ්කරුණාවක් නැත. එසේ නෙයින් රජ්ජුරුවෝ චිරාත්කාලයක් ජීවත්වෙත්ව සි සුඛිසුවපත් වෙත් ව"යි කියා මෛත්‍රී කළහ.

එකියන කලාබු රජ්ජුරුවන් තාපසයන්ගේ දෘශ්‍යමානයක් ඉක්ම උයන් කෙළවරව හිය කල්හි දෙලක්ෂ සතළිස් දහසක් ඝතකඩ බොල් මහපොළොව පළාගෙණ අවීචිමහනරකයෙන් ගිනිකදෙක් අවුත් රජ්ජුරුවන් පලසකින් වට කරන්නාසේ වටලා අවීචිමහනරකයට ඇරගෙණ ගියේය.

ඒ අවීය දක්වන්නාවූ සමීඥයන් වහන්සේ වදාරණසේක් "මහණෙනි, මෙකියන ක්ෂාන්තිවාදි තාපසයෝ තමන්ගේ අත් පා කන් නාසා කපා දැලයේ පාර දහසක් ගසා වධකරන්නාහු කලාබුරජහු කෙරෙහි කෝපයක් නොකොට මෛත්‍රී කළසේක. එරජ පොළොවධරාගතනොහී පොළොව පලාගෙණ අවීචිමහ නරකයට ගියේය"යි වදාළසේක. එකියන තාපසයෝ එදවස්ම කාලක්‍රියා කළහ"යි වදාරා මේ ක්ෂාන්තවාදි ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි කලාබුරජ නම් දැන් දෙවදත්තස්ථවිරයෝය, සෙනෙවිරද්දු නම් ශාරිපුත්‍රස්ථවිරයෝය, ක්ෂාන්තිවාදි තාපසව උපන්නෙම් දෙවාති දෙවවූ ශක්‍රාති ශක්‍රවූ වන්දනෙය්‍යාතිවන්දනෙය්‍යවූ පූජනෙය්‍යාතිපූජනෙය්‍යවූ තිලෝගුරු බුදුවූ මම්ම වේදැ සි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 305
## ලොහකුම්භි ජාතකය

**මේ**වද තිලෝගුරු සම්මා සම්බුදුරාජෝත්තමයානන් වහන්සේ එක් සමයෙක්හි සැවැත් නුවර ගොදුරු ගම්කොට දෙවරම් වෙහෙර වැඩවසන සේක් කෝසල රජ්ජුරුවන් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් දවසක් කෝසල රජ්ජුරුවෝ රාත්‍රිභාගයෙහි නිරිසතුන් සතර දෙනෙකුගේ ශබ්දය ඇසූය. ඉන් එක් නිරිසතෙක් දුක්කාරය කියය. එකෙක් සක්කාරය කියය. එකෙක් නක්කාරය කියය. එකෙක් සෝක්කාරය කියය. ඔහු සතරදෙන පුණ්‍යජන්මයෙහි මෙම සැවැත්නුවර රාජකුමාරව ඉපිද ඓශ්වර්‍යමද යෙන් බොහෝ කලක් පරදාරසේවනය පුරුදු කොට අනිකුදු බොහෝ අකුසල් රැස්කෙරෙමින් ජීවත්ව ආයු කෙළවර ඒ පරදාරකර්මය හේතුකොටගෙණ සැවැත්නුවර සමීපයෙහි ලෝකුඹු නරකයෙහි උපන්නාහු බදනෙක්හි පැසෙන සාල් මෙන් පැසී හිස් දහසක් අවුරුද්දෙන් මුවවිවර පැමිණ උනුන් දැක "කවර දවසෙක මේ දුකින් මිදෙමෝදැ?"යි ක්‍රමයෙන් බැගෑපත්ව ශබ්ද කළාහ.

කොසොල් රජ්ජුරුවෝ මධ්‍යම රාත්‍රියෙහි ඒ ශබ්දය අසා භයින් තැති ගෙණ යහන් මත්තෙහි නොනිදා, ඉදම අරුණු තැගි වේලෙහි පුරෝහිත බමුණන් අවුත් රාත්‍රියෙහි සැතපීමෙහි දුක් සැප විචාළ කල්හි රජ්ජුරුවෝ "ආචාරිවරයිනි, සැතපීමෙහි සැපයෙක් කොයින්ද? රාත්‍රියෙහි මෙබදු භයානකවූ ශබ්දයක් ඇසීම්" කීය.

ඒ ඇසූ බමුණන් විසින් අතුල්සලා කම්පාව සිටි කල්හි "කිමෙක්ද? අවාරීනි, විචාරා "මහරජ්ජුරුවන් වහන්ස, උග්‍රවූ ශබ්දයෝය" කී කල්හි "පිළියමව සමවේදැ"යි කියා "ඒකාන්තයෙන් මේ ශබ්දයෝ ප්‍රතිකාර සෙමි නොවෙති. අපි වතාහි යාගවිධානයෙහි මොකවව දක්ෂයම්හ. ඉදින් ප්‍රතිකාර නොහැර කරතොත් ශතාධික පරිත්‍යාග වශයෙන් මහත් වෙයි. ඒ මහත්වූ යානය අපගේ සාමාර්‍ථ්‍යයෙන් අසුරුවා සර්වතුෂ්ක නම් යාග යෙන් අශුභ විප ාක වළකම්හ"යි කී කල්හි එසේවීනම් ප්‍රමාද නො කොව ඇතුන් සතරදෙනෙකු අසුන් සතරදෙනෙකු ඇලි ගොන් සතරදෙනෙකු මිනිසුන් සතරදෙනෙකු යනාදී වශයෙන් කුරුල්ලන් දක්වා නොහැර සියළු දිපාද චතුෂ්පාද ප්‍රාණීන් සරතදෙනා බැගින් අල්වා ගෙණ එව"යි අමාත්‍යයන්ට විධාන කළහ.

අමාත්‍යයෝ "යහපතැ"යි පිළිගෙණ යථොක්තවූ සියළු ප්‍රාණීන් හා අනිකුදු යාගයට ගතමනා සියළු උපකරණ සපයා යාගශාලාව සමීපයෙහි සියළු ප්‍රාණීන් බැඳ සිටුවූහ: බමුණෝද "යාගය මුලිකව බොහෝ ඛාද්‍යභෝජ්‍ය හා වස්තු ලබම්හ"යි යන උත්සාහයෙන් "යාගයව මෙකම් මෙකම් දැ උවමැනවැ"යි කියා ඔබමොබ කුතූහලයෙන් ඇවිදිනාහුය. මල්ලිකාදේවී ඒ කෝලාහලය අසා රජ්ජුරුවන් කරා එළඹ "මහරජ්ජුරුවන් වහන්ස, බමුණෝ ඉතා මහත්වූ බෙණෙමින් කුතූහලව කුමට ඇවිදිදැ"යි විචාරා එබසට රජ්ජුරුවෝ දේවීනි, තොපට ඉන් ප්‍රයෝජන කිම්ද? තොපි තොපගේ ඓශ්වර්‍යයෙන් මත්ව ඉඳුව. දුක් ඇත්තේ අපටම වේදැ'යි කියකල්හි දෙවනුවත් "කිමෙක්ද? මහරජ්ජුරුවන් වහන්සැ"යි විචාරා "දේවීනි, මම මෙබදුවූ නැසියයුතු අනිෂ්ට ශබ්දයන් ඇසිම්. ඒ කාරණය බමුණන් අතින් විචාළෙම්. බමුණෝ රාජ්‍යයට නෝ ඓශ්වර්‍යයට නෝ ජීවිතයට හෝ අන්තරාය පෙණෙයි. සර්වතුෂ්කයාගයම කොට ඒ අන්තරාය වළකම්හ යි කියා යාගයට සුදුසු උපකරණ සපයා මාගේ බසින් ඔබමොබ ඇවිදිති"කීහ.

කිමෙක්ද? දෙවයන් වහන්ස. මේ ශබ්දයන්ගේ නිෂ්පත්තිය දෙවියන් සහිතවූ තුන්ලොවට අග්‍රපුරෝහිතයාණන් වහන්සේගෙන් විචාළසේක්ද?"යි කියා "දෙවීනි, දෙවියන් සහිතවූ තුන්ලෝ වැසි අග්‍රපුරෝහිතයාණෝ නම් කවුරුදැ?"යි විචාලෝය.

රජ්ජුරුවන්ට නැවත ඒ මල්ලිකාදේවී "දේවයන් වහන්ස, ඒ අග්‍රපුරෝහිතයෝ නම් අන්කෙණෙක් නොවෙති සියලු පදාර්ථ නිමවාදත් මහාගෞතම සර්වඥයන් වහන්සේය. මේ මූඪ බමුණෝ කුමක් දනිද්ද? යුහුව ගොස් බුදුන් විචාළ මැනවැ"යි කී කල්හි කෝසල රජ්ජුරුවෝ මල්ලිකාදේවීන්ගේ වචනය හිවිය උදය මේ නිමවා සැපවූ රථයානාවකින් ජේතවන විහාරයට ගොස් බුදුන් වැඳ එකත්පස්ව ආදර දක්වා සිට "මහරජ, කුමට ආයෙහිදැ"යි විචාළ කල්හි "තිලෝගුරු සර්වඥයන් වහන්ස, ඊයේ රාත්‍රියෙහි මම මෙබදු ශබ්දයක් අසා

උදෑසනබමුණන්ගෙන් විචාළෙමි ඔහු රාජ්‍යයට හෝ ජීවිතයට හෝ සැපතට හෝ අනතුරාය වෙයි, සජීවතුෂ්ණ යාගය කොට අනතුරාය වළක්කම්හ යි කියා යාගසථානයෙහි කමීන්ත කෙරෙති. ඒ ශබ්දයන් සතරදෙනා ඇසීම කරණ කොටගෙණ මට කවර උපද්‍රවයෙක් වේදැ?"යි විචාළාහ.

එබසට ලොව එක මවෙක් වැනි මාගේ සවාමිදරුවූ බුදුහු අඬන පුත්‍රයක්හු ලෙහිලා සතසන්නාක් මෙන් "මහරජ, තව කිසි උපද්‍රවයෙක් නොවෙයි. නරක යෙහි උපන්නාවූ නිරිසත්හු දුක් අනුභව කෙරෙමින් ඒ ඉවසිය නොහී ශබ්ද පැවැත්වූහ. මහරජ; මේ ශබ්දයෝ දැන් තා විසින්ම මතු අසන ලදුවෝ නොවෙති. පුරාතනයෙහි රජදරුවන් විසිනුදු අසනලද්දෝමය. ඔහුද මෙපරිද්දෙන්ම බමුණන් විචාරා මෙසේම පශුඝාතක යාගකරණු කැමතිව යාගොප කරණ සපයා ප්‍රාණීන් බඳිනගන කරවූහ. එකල නුවණැත්තෝ ඒ ශබ්දයන්ගේ අභිප්‍රාය ප්‍රකාශකොට කීහ. භයව පැමිණියාවූ මහජනයා මුදා අරවා ලෝවැඩ කළෝ වේදැ'යි වදුරා තූෂ්ණීම්භූතව වැඩසිඳ අතීතකථා ශ්‍රවණයෙහි කෞතූහල සිත් ඇති කොසොල් රජ්ජුරුවන් විසින් ආරාධනා කළ කල්හි ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි සසර සැරිසරන්නාවූ බොධිසත්ත්වතෙම එසමයෙහි කසීරට එක්තරා බමුණු කුලයෙක්හි ඉපිද වැඩිවිය පැමිණ වේදත්‍රය නිමවා දැන පඤ්චකාමය හැර හිහිගෙන් නික්ම ඍෂිප්‍රව්‍රජ්‍යාවට පැමිණ පඤ්චාභිඥ අෂටසමාපත්ති උපදවා ධ්‍යාන ක්‍රීඩාකෙරෙමින් හිමාලය වනයෙහි සිත්කළුවූ එක් වන ලැහැබෙක්හි වාසය කරන්නේය.

ඒ බ්‍රහ්මදත්ත රජතෙමේ එක්දවසක් රාත්‍රියෙහි නිරිසතුන් සතරදෙනෙකුගේ ශබ්දයන් අසා භයින් තැතිගෙණ, තා සේම රාත්‍රියෙහි නොනිදා හිඳ උදෑසන බමුණන් විචාරා උන් විසින් මෙම රාත්‍රි විඛාතානන්තරයෙක් වේවයි ඒ උපද්‍රවය මෙම යාගයෙන් සන්සිඳුවම්හ යි මෛත්‍රී ධ්‍යානයට සමවැද එයින් නැගිලොව බලන්නේ බරණැස් රජතෙමේ එකල උපද්‍රවය තසමි යන අඥාන මුසුවූ බමුණන්ගේ බස්ගෙණ කොයෙක් ගණන් ප්‍රාණීන් තසා බොහෝ උපද්‍රව පමුණුවා ගන්ට උත්සාහ කරන්නේය. අද දවස මම එතනට ගොස් සත්ත්වයන්ට පැමිණි මේ උපද්‍රවය රජහට පැමිණි පරලොව උපද්‍රවයද වළකා ජනරඤ්ජන සංග්‍රහකරන්ට සුදුසුය යි සිතා සෘඩියෙන් අහසට පැනනැගී බරණැස් රජහුගේ උයනට බැස මගුල් සල්වට මත්තෙහි උන්නේය.

එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයාගේ ප්‍රධාන අතවැසිවූ එක් බමුණු කුමාරයෙක් ඔහු කරා එළඹ "ආචාරීන් වහන්ස, අපගේ වේදත්‍රයෙහි එකක්හු මරා අනිකක්හට සැප කිරීමෙකැයි යන දෙයක් නැත. වෙද විරොධවූ මෙවැන්නක් කුමට කරණ දෙයක්දැ'යි කියා පුරෝහිතයා විසින් මෙයින් "අපට බත්මාංස කන බොන දෑ හා බොනෝවස්තු ලැබෙයි. තෙපි ඒ නොවළකා නිසන් ඉඳුව"යි කී කල්හි "මම මේ පාපව්‍යාභාතයට සහාය නොවමැ"යි සිතා විවේක කැමතිව උයනට ගොස් මගුල් සල්වට මත්තෙහි උන් තාපසයන් දැක වැඳ කරණලද ප්‍රිය

කථා ඇතිව එකන්පස්ව හිඳ තාපසයන් විසින් "කිමෙක්ද? සඟය මෙතුවර රජ්ජුරුවෝ දැහැමෙන් රාජ්‍යය කෙරෙද්දැ"යි විචාළ කල්හි "සාමීනි, රජ්ජුරුවෝ දැහැමින් රාජ්‍යය කෙරෙති. එහෙත් උවත් රාත්‍රියෙහි ශබ්ද සතරක් අසා බමුණන් විචාරා උන් විසින් ඊට සමීචතුෂ්ක යාගය සුදුසුය යි යනු අසා දහස්ගණන් ප්‍රාණීන් අල්වා බන්ධනගත කළෝය. සාමීනි, නුඹවහන්සේ වැනි සිල්වත් තාපස සථවිරයන් විසින් ඒ ශබ්දයන්ගේ නිෂ්පත්ති කියා ඒ සත්ත්වයන් මරණින් මුදන්ව නොවිදිද්දැ"යි කීයේය.

තාපසයෝ, "සඟය, රජ්ජුරුවෝ අප නොහඳුනති. අපි රජ්ජුරුවන් නොහඳුනමිහ. ඉදින් රජ්ජුරුවෝ අප අතින් විචාළෝ නම් සැක නැතිවන සේ ශබ්දයන්ගේ අර්ථ ප්‍රකාශ කොට කියමිහ"යි කීහ.

ඉක්බිති ඒ බමුණු කුමාරතෙම "සාමීනි, එසේ වීනම් මදක්කල් ඉවත නොගොස් මෙහිම වැඩ උවමැනව යි මම රජ්ජුරුවන් වහන්සේ කැඳවාගෙණ එමි" කියා ගොස් "දේවයන් වහන්ස, උයනෙහි මෙවැනි තාපස කෙණෙක් ඇතැ'යි දන්වා රජ්ජුරුවන් කැඳවාගෙණ ආයේය.

රජ්ජුරුවෝත් මහුල් සල්වට මත්තෙහි සඛණීප්‍රතිමාවක් මෙන් තාපසයන් දැක එකන්පස්ව හිඳ තමා ඇසූ ශබ්දයන් පිළිවෙළින් කියා එහි අර්ථ නිෂ්පත්තිය කියන්ට යාචඤ්ඤ කළහ. තාපසයෝ "මහරජ, මේ ශබ්ද පැවැත්වූ සතරදෙන පූර්ව්‍වජන්මයෙහි ඔවුන් විසින් වස්ත්‍රාභරණ අන්නපාන මාලාගන්ධ විලෙපනාදියෙන් මනාලය කොට රක්ෂිත ගෝපිතවූ ස්ත්‍රීන් ඒ ඒ සථානයෙන් ගෙන්ව ගෙන්වා බොහෝ කලක් මූළුල්ලෙහි පරදාර පාපය රැස් කෙරෙමින් අනිකුදු ප්‍රාණඝාතාදීවූ අනෙකවිධ පාපයන් සිඳකොට ජීවිතාවසානයෙහි ලොහොකුඹු නරකයෙහි ඉපද කකියා ගිය ලෝදියෙහි පෙනනැඟි පැසෙමින් තිස්දහසක් අවුරුද්දකින් මුවවිට පවන් යටතලයට පැමිණ නැවත තිස්දහසක් අවුරුද්දෙන් උඩුකුරුව පැසී අවුත් මුවවිටට පැමිණ පිවත බලා ගාථා සතරක් සම්පූර්ණ කොට කියනු කැමතිව අකුරු සතරක් කියා ඉතිරිය කියන්ට කල් මදව යට බලා කරකැවී එහිම ගිලී ගියාහ. ඔවුන් සතරදෙනා අතුරෙන් දුකා රය කියා ගැළුනු සත්ත්වතෙම පූර්ව්‍වජන්මයෙහි සියලු වස්තුවෙන් සම්පූර්ණව රාජ කුමාරව උපන්නාවූ දැනවස්තු හා දැන ක්ෂෙත්‍ර ඇති යම්කිසි වස්තුවක් පරලොව අදහා නුදුනම්හ. උපභොග පරිභොග වස්තු ඇතිවම පරලොවට පිහිටක් නොකළම්හ යි කියනු කැමති විය. සකාරය කී සත්ත්වතෙම මේ ලොහොකුඹු නරකයෙහි පැසෙන්නාවූ අපට උඩුයටිව පැසි යාම් රීම් දෙකින් එක්ව දැන් සැට දහසක් අවුරුදු හැම පරිද්දෙන් පිරිගියේය. කවර කලෙක්හි කෙළවරක් වේදැ"යි කියනු කැමතිවිය. තකාරය කී සත්ත්වතෙම නිදුක්නි, මේ නරකයෙහි පැසී තව දක්වා කෙළවර නැත. කෙළවර අසවල් කලෙකැයි දක්නා කැමතිවූ අපට එවැනි කෙළවරක් නොපෙණෙයි. ඒ එසේමය, පූර්ව්‍වජන්මයෙහි තොප හා අප විසින් කෙළවරක් නැතිවම පරදාරාදීවූ බොහෝ අකුසල් කරණ ලද්දේ මය. එවැනි අපට කෙළවරෙක් කොයින් නම් වේද? කියනු කැමති විය. ඕකාරය කී සත්ත්වතෙම ඉදින් මම මේ නරකයෙන් ගොඩනැඟී මනුෂ්‍යත්ව භාවයක් ලදින් නම් උදිතව සිටිමි සැබෑවක් වූයේ සැබෑවේ ඇත්තව

දැන දන්දෙන්නෙමි සරණසීලාදී සිල්රක්ෂා කෙරෙමින් බොහෝ කුසල් රැස් කරන්නෙම් වේදැ සි කියා කැමතිවිය යනාදීන් තිරිසතුන් සතරදෙනාගේ පුළි කමිය හා අක්ෂරයන් සතරදෙනා පටන්ගත් අභිප්‍රාය ප්‍රකාශකොට කියා මහරජ, තරකයෙහි උපන් සත්ත්වයෝ තමන් විඳිනා මහදුකින් ශබ්ද පැවැත් වූහ සි ඒ ශබ්දයන් කරණකොට ගෙණ තොපට කිසි අන්තරායක් නැත. තොප භය නොගණුව"සි රජ්ජුරුවන් හිවිස්සූහ.

ඉක්බිති බරණැස් රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් වහන්සේගේ කථාස් නෑනි අමාතානිඝෙකයෙන් මහත් අස්වස් ලැබ නුවර බෙරලවා බඹුනගත සත්ත්වයන්ට අභය දුනය දී යාගශාලාදිය පිදහන කරවා ජනසංග්‍රහ කළාහ.

බෝධිසත්ත්වයෝද ජනයාට හිතසැප එලවා කිපදවක් උයන්හි වාසය කොට රජහට අවවාද දී පළමු විසූ හිමාලය වනයටම ගොස් වාසය කොට ආයු කෙළවර ධ්‍යානයෙන් නොපිරිහී බඹලොව උපන්නේය.

ලොකස්වාමි වූ බුදුරජානන් වහන්සේ මේ ධම්දෙශනාව ගෙණහැර දක්වා වදාරා එකල්හි පුරෝහිතයා ගේ අතවැසි බමුණු කුමාරතෙම දැන් ශාරිපුත්‍ර සථවිරයෝය, තාපසව උපන්නෙම් දැන් බුදුවූ මම්ම වේදැ සි තමන් වහන්සේ දක්වා වදාරා මේ ලෝභකුම්හිජාතකය පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේකි.

---

## 306 මාංස ජාතකය

නීවද සවිනේ ගෙවා දත් අප බුදුරජානන් වහන්සේ දෙවිරම් වෙහෙර සමහර කෙණෙකුන් වහන්සේ විරේකයට තෙල් මුසු බෙහෙතක් වැළඳු හෙයින් මස්රස ආහාර පිණිස ගිලන් උපසථාන කරණ සඛ්‍රම්සරුන් වහන්සේ සැවැත්නුවරව වැද බත්වෙළඳ වීථියෙහි ගෙපිළිවලින් සිඟා ඇවිද කිසිවක් නොලදින් තැවත වෙහෙරට නික්මුනුසේක් ඉතා දහවල්ව පිඬුපිණිස සිඟාවඩනා සැරියුත් මහතෙරුන්වහන්සේ විසින් අතුරු මඟ දැක "කිමෙක්ද? ඇවැත්නි, ඉතා උදැසනම අහරින් වැළක එවිදැ"?සි විචාරා එපවත් අසා එසේ වීනම් මා හා එක්ව එව"සි එම වීථියටම කැඳවා ගෙණ යන ලදුව උන්වහන්සේ දැක සතුටුව උපාසකවරුන්හෙන් පාත්‍ර පුරා බොනෝ මස්රස අහර ලැබ විහාර යට ගෙණගොස් ගිලන් භික්ෂූන්ව දුන්සේක.

උන්වහන්සේලා ඒ ආහාර වළඳා යැපුනු කල්හි එක් දවසක් ධම්සභා මණ්ඩපයෙහි වටින් රැස්ව උන්නාවූ භික්ෂූන්වහන්සේ "ඇවැත්නි, ශාරිපුත්‍ර සථවිරයෝ නම් දුටුවන් ප්‍රසන්න වන තරම් මනපින් ඇතිසේක. විරේකයට බෙහෙත් වැළඳු භික්ෂූන් උදෙසා මස්රස අහර ලබනුව බත් වෙළඳ වීථියට සිඟා ගොස් කිසිවක් නොලැබ එන්නාවූ භික්ෂූන් කැඳවා ගෙණ ගොස් ඒ වීථි යෙන් බොහෝ මස්රස භික්ෂාව ඇරදුන්නාහ"යි යනාදීන් ශාරිපුත්‍රසථවිරයන් වහන්සේගේ භාග්‍යමහිමය ආදි ගුණකථාව ඉපදවූ සේක.

ගදකිළියෙහි වැඩඋන් සම්ඥයන්වහන්සේ ඒ කථාව දිවකණින් අසා වදාරා ධම්සභා මණ්ඩපයට වැඩ පණවනලද බුබාසන මස්තකයෙහි වැඩහිඳ

බුඩතෙජසින් තැතිගෙණ මුවෙන් නොබැණ හුන් භික්ෂූන්ගේ දසාව බල බලා "මහණෙනි, මෙතැන්හි තෙපි කවර කථාවකින් යුක්තව උනුද?" යි විචාරා "වෙන දෙයක් නොවෙයි, සැරියුත් මහ තෙරුන් වහන්සේගේ එනම් ගුණ කථාවෙක අප කිය කියා උන්නේය" යි දැන්වූ කල්හි "මහණෙනි, දැන් මේ ශාරීපුත්‍රසථවිරයෝ දැන්මතු මාංශ භොජනය ලද්දෝ නොවෙති. පළමුත් ප්‍රිය කථාවෙහි දක්ෂවූ නුවණැත්තෝ මස් අහර ලද්දෝ වේදැ?" යි වදාරා තුෂ්ණීම් භූතව වැඩ ඉඳ ඒ කථාසවරූපය අසනු කැමති භික්ෂූන් විසින් කළාවූ යාචඤ්ඤාව අරභයා ඉකුත්වත් ගෙහණෑර දක්වා විදුළුසේක.

**ඒ කෙසේද? යත්,**

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුත් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතාණන් වහන්සේ මෙම නුවර සිටුපුත්‍රව ඉපිද එක් වැදිපුත්‍රයෙකු මුව දඩයමට ගොස් බොහෝ මස් ලැබ ගැලක් පුරා ලැබගෙණ වෙළඳුමට නුවරට යන්ව නික්මුණු වේලෙහි ඒ නුවර අනික් සිටු පුත්‍රයන් තුන්දෙනෙකු හා එක්ව නුවරින් නික්ම මහ වලට නුදුරුවූ එක් තෙනෙක්හි දුක්සැප කථාකෙරෙමින් උන්නේය.

ඉන් එක් සිටුපුත්‍රයෙක් මස්පිරුණු ගැල ගෙණෙන්නාවූ වැද්දු දැක "මේ වැද්දු ලවා මස්කඩක් ගෙන්වම් දැ" යි කියා ඉතිරි තුන්දෙන "යහපතැ" යි කී කල්හි ගැල කරා ගොස් "කොල වැද්දෙ, මට මස්කඩක් දෙව" යි කියේය. ඒ ඇසූ වැදි "අනුන් අනිත් කිසිවක් ඉල්වන්නාවුන් විසින් ප්‍රිය කථා ඇතිවිය යුතුය. නුඹ එසේ නොවී පරුෂවචනයෙන් ඉල්වූදැය. එවෙනි නුඹට නුඹ විසින් කිවාවූ වචනය මෙන් පරුෂරහිතවූ දලබුවම සුදුසුය. එය දෙමි" කියා පිට මාංශය හා කැපූ රොම සහිතවූ දලබුව දුන්නේය.

ඒ දැක අන් සිටුපුත්‍රතෙම "යහළු, තෝ කුමක් කියා ඉල්වාගත්තෙහි දැ?" යි විචාරා "කොල, වැද්දු සි කියා ඉල්වීමි" කී කල්හි මමද මොහුගෙන් මස් ඉල්වම් කියා නොස් "බැතෙනි, මටද එක් මස්සක් දුනමැනවැ" යි කියේම එබසට වැදි මේ ලෝකයෙහි "බැතෙනි, මලනුවෙනි, යනාදීන් කියන්නාවූ ප්‍රිය වචනය මනුෂ්‍යයන්ට අගවූ දෙයක, අඟවූ වචනය කී තොපට අගමාංසය සුදුසු ය" යි කියා මස්පිඬක් දුන්නේය.

ඒ දැක අනික් සිටුපුත්‍රතෙම "යහළු, තෝ කුමක් කියා ඉල්වාගණිහි දැ?" යි විචාරා "බැතෙනි, කියා ඉල්වීමි" කී කල්හි මමද වැද්දු අනින් මස් ඉල්වම් කියා ගොස් "පියාණෙනි, මට මස්සක් දෙව" යි කියේය. එබසට වැදි "සවාමීනි, මේ ලෝකයෙහි පියාණෙනි, කියන පුත්‍රතෙම පියාගේ ලය කම්පා කෙරෙයි එහෙයින් තොපගේ වචනය හෘදය මාංශයට සුදුසු ය" යි කියා ඒ හා එක්ව මිහිරි මස දුන්නේය.

ඒ දැක සතරවෙනිව බොධිසත්ත්වතෙම "යහළුව, තෝ කුමක් කියා මස් ලද දැ?" යි විචාරා පියාණෙනි, කියා ලදිමි" යි කී කල්හි "මමත් ඉල්වම්" යි ගොස් "මිත්‍රය, මටද මස්කඩයක් දෙව" යි කියා ඉල්වූ කල්හි එබසට වැදිතෙම "සවාමීනි, ලෝකයෙහි යම්කිහු වසන ගම්හි මිත්‍රයෙක් කැන්නම් ඒ ගම ජන ශූන්‍ය වනයක් වැන්න. "නුඹවහන්සේ කියේ සියල්ලම ලැබයුතු වචනයක,

එහි සතුටුව මම සියල්ලම් දෙමි'' කියා ගැල හා සමග ගෙණා මස් සියල්ලම දී ගැල බෝසතාණන්ගේ ගේ දොරට ගෙණ ගොස් පැමිණ වූයේය. බොධිසත්ත්ව යෝද ගැලින් මස් බාවාගෙණ ඉක්බිති ඔහුට කළමනා සත්කාර උපකාර කොට ඔහුගේ අඹුදරුවනුත් ගෙන්වාගෙණ වැද්ද වැදි කමින් වළකා පින් කමෙහි යොදා තමාගේ සම්පත් අනුභවකරමින් ඔහුද ජීවත්වන ලෙසට ''සමීපයෙහි වාසය කරව''යි ජීවිතානන්තය දක්වා මිත්‍රධර්ම රක්ෂාකොට වාසය කළේය.

ලෝකඥාණවූ සම්බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා 'මහණෙනි, එකල්හි වැදිපුත්‍රව උපන්නේ දැන් මේ මාගේ ශාසනයෙහි ශාරීපුත්‍රස්ථවිරයන්, ගැල හා සමග සිටි මාංසය ලද්දාවූ සිටුපුත්‍රයා නම් දැන් බුදුවූ මම්ම ය''යි තවත්වහන්සේ ගෙණහැර දක්වා මේ මාංස ජාතකය පූර්ණපර සන්ධි ගළපා නිමවා වදාළසේක.

---

## 307 සස ජාතකය

පුරාතන කාලයෙහි බරණැස්නුවර කෙළෙඹි පුත්‍රයෙක් බුදුපාමොක් මහසඔසයා වහන්සේව සියළු පරිෂ්කාර සපයාලා තමන් දෙර මාහැඟි මඩුවක් ලවා බුදුපාමොක් මහ සංඝයාවහන්සේ පවරා ගෙණවුත් මධ්‍යයේ උතුම් ආසන පණවා විඛාහිදුවා නොයෙක් රසයෙන් යුක්ත භොජනය වළඳවා ''සඛාමිනි, සෙවත් කරුණාකොට වදාළ මැනවැ''යි කියා මෙම ලෙසම සත්දවසක් පවරා දන් දී සත්දවසක් බුදුන් ප්‍රධානකොට ඇති පන්සියයක් රහතුන් වහන්සේට පිරිකර දුන්නාය.

බුදුහු වළඳා අනන්තයෙහි අනුමෙවෙනි බණ වදාරණසේක් ''උපාසකය, තා සොම්නස් විය යුතුය. එඛල, මේ දනදීම තම් පුරාතන පණ්ඩිතවරුන්ගේ වංශානුගත වෘත්තියෙක. එඛල, පුරාතනයේ නුවණැති පණ්ඩිතවරු තමන් සමීපයට ආ යාචකයන්ගට ජීවිත පරිත්‍යාග කොට තමන් ඇඟමස් දුන්නේ ය''යි වදාළසේක.

ඒ සිටුපුත්‍රයා විසින් ''සඛාමිනි, පෙර නුවණැත්තන් විසින් ඇඟමස් දුන් නියාව අසනු කැමැත්තෙමි''යි ආරාධනා කළ කල්හි ඉකුත්වත් දක්වා වදාළසේක.

එවකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජක්හු රජකරණ කල්හි බොධිසත්ත්වයන්ද සස යෝනියෙහි ඉපිද වනයේ වසනසේක. ඔබ භිඳිනා වනයට එක්දිසාවෙක මහා පර්වතයෙක, එක් දිසාවෙක වනයෙක, එක්දිසාවෙක ගඟෙක, සස පණ්ඩිතයන්ට සහාය තුන්දෙනෙක් ඇත්තාහ. ඔහු කවුරුද?යත් වඳුරෙක, සිඟාලයෙක, මස්කාවෙක, සස පණ්ඩිතයෝ ය යි මොහු සතරදෙන එක්ව වසන්නාහු තමන් ගොදුරු කන තැනින් ගොදුරු සොයාගෙන කා දස දවසින් දස දවස එක තැනකට පැමිණ මිහිරි කථා කරන්නාහු ඔවුන්ට සස පණ්ඩිතයන් වහන්සේ අවවාද කරණසේක.

"එම්බා සගය, දන්දෙව සිල්රකුව පෙහෙවස් වසව"යි තුන්දෙනාට අවවාද වශයෙන් ධර්මදේශනා කරණසේක. ඔහු තුන්දෙන ඔබගේ අවවාද පිළිගෙණ තමන් භිදිනා වනලැහැබට වැද සුවසේ භිදිනාහ.

මෙසේ වසන කල එක්දවසක් බෝසතානෝ ආකාශය බැලුවාහු පිරුණු සඳ දැක සෙට පොහොය දවස හෙයින් පොහොදවස ය යි නියම දැන අනිකුත් තුන්දෙනාට වදුරණසේක් "සෙට පොහොය දවස, තෙපි තුන්දෙන සිල් සමාදන්ව පෙහෙවස් ගණුව යි සිල්වත්ව සිට දුන් දනෙහි විපාක ඉතා මහා. එසේහෙයින් තමා සමීපයට ආ යාචකයෙක් ඇත්නම් තෙපි අනුහව කරණ දෙයින් ආහාරයක් දන්දීලව"යි වදුළසේක.

ඔහු ගිවිස තමා භිදිනා තැන සැතපී දෙවනද, උදැසනම මස්කාවානෝ ගොදුරු සොයා ගන ඔස්සේ ගියාහ. එවේ ල්ම එක් බිලිවැද්දෙක් රේමිස් සත් දෙනෙකු බාගෙණ වැලක අමුනාගෙණ ගඟ වැලිපිරා යට ලාපියා වසා ගඟපාත බිලිබාන පිණිස පලා ගියේය. මස්කාවා මාංශ ගන්ධය ආඝ්‍රාණයකොට වැලිපිරා පියා මස් වැලක් ඇත, ඇරගෙණ මේ මසුන් හිමිකෙණෙක් ඇරගත මැනවැයි තුන් විටක් අඬගා හිමි කෙණෙකුත් නොදැක අමුනාලූ වැල බැහැගෙණවුත් තමන් වසන තැන තබාලා වේලා ආකල කම් සිතා තමන්ගේ සීලය අවර්ජන කොට උන්නාහ.

සිවලානෝත් ගොදුරු සොයා ගියාහු. එක් ක්ෂත්‍රපාලයෙකුගේ රැක වල පැල එල්වා තිබූ පැලහු කරවල පිටුදෙකක්ද ගොඟකුදු එක් දී ගෙඩියක්ද දැකලා මේ හැම හිමිකෙණෙක් ඇද්දැයි තුන්විටක් අඬගාලා හිමිකෙණෙකුත් නොදැක දී ගෙඩිය එල්වා තිබූ උගය කරා එල්වාගෙණ කරවල හා ගොයා දනිත් බැහැගෙණ භිදිනා වනලැහැබ තබා වේලා ආකල කම් සිතා සීලය සඳහන් කොට හුන්නේය. වඳුරානෝත් වනයේ ගොදුරු සොයා ඔහු මී අඹකැනක් ගෙණවිත් වේලා ආසන්නවූ කල කම් සිතා සිල් සඳහන්කොට හුන්නාහ.

බෝසතානෝ වේලා ආකල නිතණසුඟක් කාපියම් සිතා තමන්වහන්සේ සීලය ආවර්ජනා කොට වැදනොත් සේක. නැවත සිතන සේක් ඉදින් අද මා සමීපයට යාචකයෙක් බඩසාගිනි කියා නම් උඹට මා කන තණ කන්ට කියන්ට නොපිළිවන. හාල්, තෙල්, උඳු, මුන් ආදී කිසිවෙක් මාගේ නැත. ඉදින් මාගේ සමීපයට යාචකයෙක් ආ නම් මාගේ ඇඟමස් ඔහුට දන් දෙම් සිතුසේක.

ඔහුගේ සීල තේජසින් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු විය. ශක්‍රයෝ මේ කිමෙක්දෝ හෝයි බැලුවාහු ඒ කාරණය දැක සස රජ්ජුරු වන් පරීක්ෂාකෙරෙමි සිතා අවුත් පළමු මස්කාවන් වසන තැනට ගොසින් සිටියාහ. මස්කාවන් විසින් බමුණ කුමක් නිසා ආයේ දැ"යි කී සාල්හි පණ්ඩිත යෙනි, යම්තම් ආහාරයක් ලදිම් නම් නුඹවහන්සේ සේම මමත් පේවගෙණ බ්‍රහ්මචරියාව රකිනෙම් වේදැ"යි කිහ.

යහපත, මම තොපට ආහාරයක් දෙම් කියා දන්වන්නාහු එම්බල බමුණ, අනුන් විසින් දියෙන් අරගෙණ ගොඩතඟත ලද රේමසුන් සත්දෙනෙකු ලදිමි ඒ මට ආහාරය පිණිස තුබුයේය. ඒ තොපට දෙමි. ඒ අනුභව කොට පෙහෙවස් රකිව"යි කීහ. ඒ අසා ශක්‍ර බ්‍රාහ්මණයෝ කියන්නාහු "උදැසන වන්නට

පසුව කියා එන්නෙම්වේදැ''යි සිවලා සමීපයට ගියාහ. උන් විසිනුත් ''බමුණු සිටියේ ඇයිදැ''යි කීකල්හි ''පණ්ඩිතයෙනි, ආහාරයක් ලදින් නම් පේවගෙණ මමත් බ්‍රහ්මචරියාව රකින්නෙම්වේදැ''යි කීහ. උසිත් කියන්නාහු ''එම්බා මම වෙලා ආකල කම් සිතා කුඹුරක් රකිතා ගොවියකු පැලතුබූ පැලහු කර වල මසුන් දෙන්නෙකු හා මෙසේම පැලහු ගොයකු හා දියගෙඩියක් හා ගෙණවුත් තිබුයේය. ඒ දෙම් අනුභවකොට සිල්සමාදන්ව මේ ඉතා රම්‍යවූ වනයෙහි සිත්වන් රැකක් මූල හිද බ්‍රහ්මචරියාව රකුව''යි කීහ. බමුණු කියන්නේ ''තව උදැසන උව, පසුව එන්නෙම්වේදැ''යි වදුරා සමීපයට ගියාහ.

උන් විසිනුත් ''බමුණ කුමක් පිණිස සිටියේදැ?''යි කී කල්හි එලෙසම ''පණ්ඩිතයෙනි, ආහරයක් ලදින්නම් මමත් පෙහෙවස් රකිම්නෙම්වේදැ''යි කීහ. ''එම්බල බමුණ, මා ගෙණා මී අඹයෙක් ඉතා මධුර රස ඇත්තේය, තොපි රිසිසේ සමාධිව අනුභවකොට සිල්සමාදන්ව මේ රම්‍යවූ වනයේ කැමති රැකත් මූල හිද මහණදම් පුරව''යි කීහ. ''තව උදැසනය, පසුව එන්නෙම් වෙදැ''යි කියා සස පණ්ඩිතයන් සමීපයට ගියේය. උන්වහන්සේ විසින් ''බමුණා සිටියේනැ''යි කී කල්හි පණ්ඩිතයෙනි, යම්තම් ආහාරයක් ලදින් නම් මමත් පෙහෙවස් වෙසෙන්නෙම්වේදැ''යි කීහ.

ඒ අසා බෝධිසත්වයෝ මහත් සොම්නසට පැමිණ ''බමුණා ආහර සොයා මා සමීපයට ආගමන ඉතා යහපත. අද මම පෙර මා විසින් භුදුන් විරූ දනක් තට දෙමි, තොපි වනාහි පේවණ තැනැත්තන් හෙයින් ප්‍රාණවධ නොකරන්නා වේද? තොපි දරකඩ රැස්කොට ගිනිමොලවා අඟුරුබස්වා මට කියාලව, මම මාගේ ආත්මදූනය තට පමුණුවාලා අඟුරට පැනපියමි, මාගේ ශරීරමාංශය පැලනී ගියකල මා අනුභවකොට පියා මහණදම්කරව''යි ඔහු හ කැවිව වදුරණසේක්, ''එම්බල බමුණ, තට දී ලන්ට මාගේ උදුන්, මුත්, සාල්, තෙල් ආදීවූ කිසිවකුත් නැත, මා ගින්නේ පැලනී ගියකල මාගේ මස් අනුභව කොට බ්‍රහ්මචරියාව රැක මේ වනයේ වසව''යි වදුළසේක.

ශක්‍රයෝ ඔහුගේ බඳ්අසා තමන්ගේ ආනුභාවයෙන් අඟුරු රැසක් මවාලා බෝසතාණන්ට ගිනිමොලවා ''අඟුරු බස්වාලීම්'යි කීහ. උන්වහන්සේ සෑතපී හිඳිනා නිතණ යහනින් නැගිසිට එතනට ගොසින් සිතනසේක් ''මාගේ ඇඟ කෙස් අතුරෙන් කිනිතුලන් ආදි සම්කිසි ගින්වූ සත්ත්වකෙණෙක් ඇත්තම් ඔහු නොමියෙත්ව''යි සිතා තුන්විටක් කිලිපොලාපියා තමන්දැගේ සියළු ශරීරය දුනමුඛයෙහි පැමිණේවයි අධිෂ්ඨානකොටලා පියුම් ඟැබකට පැනපියා සතුටුව හුන් රාජහංසයකුමෙන් සතුටු සිත් ඇතිව අඟුරු මුදුනට පැනපුසේක. ඒ ගිනි වනාහි මහබෝසතාණන්ගේ ලෝමකූප මාත්‍රයකවත් උණුසුම් පමණකවත් උෂ්ණාකාරයක් කළ නුහුනුයේය. හිමගර්භයකට වන්නාසේ සියළු ශරීරය සිහිල්වූයේය. ඉක්බිති බමුණා කැඳවාලා 'බමුණ, තාගේ ගිනි සිසිලය මාගේ ශරීරයෙන් එකකෙසකුත් හුණුකොටපිය නුහුනුයේය, මේ කිමෙක් දැ?''යි වදුළසේක.

''පණ්ඩිතයෙනි, මම බ්‍රාහ්මණයෙක් නොවෙමි, ශක්‍රදෙවෙන්ද්‍රයාය යි දැන් නුඹ විමසන පිණිස ආමි'' කීහ. මහබොසතාණෝ වදුරණසේක් ''ශක්‍රයෙනි, තෙපි සිටුව තොප තබා මේ සියළු ලෝකවාසීහු එක්වත් දන්දීමෙන් ම,

පරදවාලිය හෙන්නෝ නැත. යමක් මා කොදෙති යන්නක් කවරකෙණෙක් කියද්දැ?"යි මහබෝසතාණෝ සිංහනාද කළහ.

ඉක්බිති ශක්‍රදෙවෙන්ද්‍රයෝ සස පණ්ඩිතයන්වහන්සේ තිරිසන්ව කළාවූ අරුමය මේ භද්‍රකල්පය මුළුල්ලෙහි සියළු සත්ත්වයන්ට ප්‍රකාශව පෙණෙනු මැනවැ යි අංජනකුට පසීතය තමන් ආනුභාවයෙන් මිරිකාපියා රස ඇරගෙණ චන්ද්‍රමණ්ඩලයෙහි සස රූපය හැඳ බෝධිසත්ත්වයන් වඩා ගෙණවුත් ඒ වන ලැහැබ අළුත් නීතණ ඇතිරිපිට වඩාහිඳුවාලා තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ. ඒ පණ්ඩිතවරු සතරදෙන සමඟ එක්සිත්ව අටසිල් පන්සිල් තොග කඩ කොට රැක කම්වූ පරිද්දෙන් සඟගිසුවූහ.

බුදුරජාණන් වහන්සේ මේ සස ජාතකය ගෙණහැර දක්වා වදාරා චතුරාර්‍යසත්‍යයන් ප්‍රකාශකොට ජාතකය නිමවා වදාළසේක. ධර්මදේශනාවගේ කෙළවර සියළු පිරිකර දුන් සිටුපුත්‍රයා සෝවාන් ඵලයෙහි පිහිටියේය. "එම්බා මහණෙනි, එසමයෙහි මස්කාවා නම් දැන් ආනන්දසථවිරයෝය, එසමයෙහි සිඟාලයා නම් දැන් මෞද්ගල්‍යාන සථවිරයෝය, එසමයෙහි වදුරා නම් දැන් ශාරිපුත්‍රසථවිරයෝය, සස පණ්ඩිතයෝ නම් බුදුවූ මම්ම වේදැ"යි දෙළසේක.

---

## 308 එකරාජ ජාතකය

මේවද හුදු නිවන් මවාලූ රුවක් වැනිවූ සර්ශ්‍රයන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොසොල් රජ්ජුරුවන්ගේ ආමාත්‍යයකු අරහයා මේ ජාතකය දක්වන ලදහ. මෙහි වර්තමාන කථාව සෙය්‍යංස ජාතකයෙහි විස්තර වශයෙන් කියන ලදී.

මෙහි යවගිය දවස බරණැස්නුවර එක් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක් අමාත්‍යයකු ඒ රජ්ජුරුවන් වහන්සේගේ අන්තඃපුරයට වැදී කළ කථාව මහාසීලව ජාතකයෙහි ආයේය.

මෙහි කොසොල් රජ්ජුරුවෝද දබ්බමල්ල නම් රජ්ජුරුකෙණෙකුන්ගේ අන්තඃපුරයට වැදී අමාත්‍යයාගේ කියමනින් බරණැස්නුවරට අවුත් ඒකරාජ රජ්ජුරුවන් වහන්සේ අල්වා ඉස් බිම බලා කකුල් උඩිලිය එල්වා දබ්බමල්ල රජ්ජුරුවෝ මතුමහල්තලයට පැහැකැගී පලක් බැඳ හුන්නාහ. මතුමහල්තලයෙහි උන් දබ්බමල්ල රජ්ජුරුවන්ගේ සකල ශරීරයෙහි දුහ අල්වාගෙණ ඉවසියනොහී බිමපෙරලී බොහෝ ආයාසයෙන් අමාත්‍යගණයා කැඳවා විවාරන්නාහු 'එම්බල අමාත්‍යයෙනි, මාගේ ශරීරය දුහ අල්වාගෙණ බොහෝ වේදනා වෙන් පීඩිත වීමි, කුමන කාරණයක් පිණිස දැ?"යි විවාළාහ.

රජ්ජුරුවන්ට අමාත්‍යයෝ කියන්නාහු නිරුපරුධ, දැහැමින් රාජ්‍යය අනුභවකරන්නාවූ එකරාජ රජ්ජුරුවන්ට කළ ගහටයෙනැගි නුඹවහන්සේට දුහ පැමිණියෙ"යි කී කල්හි එබස් ඇසූ රජ්ජුරුවෝ "ඔහු උනව"යි කී බසින් ගිය අමාත්‍යයෝ එකරාජ රජ්ජුරුවන් ධ්‍යාන සැපයෙන් ආකාශයෙහි පලක්

බැඳ උන්නා දැක ගොස් රජ්ජුරුවන් කිබස් අසමින් වහා නැගිසිට අවුත් රජ්ජුරුවන්වහන්සේ වැඳ එකත්පස්ව සිට කියන්නාහු "එකරාජ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ එක්ව වැස සැප අනුභවකොට සුබුමාලව රාජ්‍යය කළ නුඹවහන්සේ මේ සා ආයාසයකට පැමිණෙත් නුඹවහන්සේගේ ධෛර්‍යවත් පියුමක් බඳුවූ මුඛ සොභාවත් ශරීරවර්ණයත් මදකුත් නොමිරිකිම සමාධි සිතින් ඉඳිනේ කුමක කාරණයකින්ද"යි විචාළසේක.

එවිට එකරාජ රජ්ජුරුවන් වහන්සේ දබ්බමල්ල රජ්ජුරුවන්වහන්සේට කියනසේක් "මා විසින් පළමුව භාවනා මනස්කාර කිරීමෙන්ද, පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් පළක් බැඳ ඉඳුම් නම් මාගේ මුඛ සොභාවද ශරීරවර්ණයද කුමක් පිණිස මිරිකේදැ?"යි කීහ. එපවත් දබ්බල්ල රජ්ජුරුවෝ අසා එකරාජ රජ්ජරුවන් වැඳ ක්ෂමා කරවාගෙණ කියන්නාහු "මහරජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේගේ රාජ්‍යය පාවා ගත මැනවැ"යි රාජ්‍යය පාවාදී ද්‍රෝහිකම් කළ අමාත්‍යයාට ආඥ කරවා නුඹට සතුරන්ගෙන් භයක් පැමිණියේ නම් මට භාරයයි කීයා රාජ්‍යයට පලාගියහ.

එකරාජ රජ්ජුරුවන්වහන්සේත් රාජ්‍යය අමාත්‍යගණයාට පාවාදී තපස් රක්ෂාකරණ පිණිස වනයට ගොස් රක්ෂා කළසේක් වේදැයි මේ එකරාජ ජාතක නිමවා වදාළසේක.

එසමයෙහි දබ්බමල්ල රජ්ජුරුවෝ නම් මෙසමයෙහි ආනන්දසථවිර යෝය, එකරාජ රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 309 දද්දර ජාතකය

තවද ශ්‍රුදුනිණින් මවාලූ රුවක් වැනිවූ සර්ඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක්තරා කෝපිවූ භික්ෂු ෂකතෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදහ.

වර්තමාන කථාව යට කියන ලද බොහෝ ජාතකවල දක්වනලද. මෙහි වනාහි ඒ කෝපි භික්ෂූන්වහන්සේ කැදවාගෙණ ධර්මසභා මණ්ඩපයෙහි වැඩ්ඳුන් සර්ඥයන්වහන්සේට දැක්වූ කල්හි සර්ඥයන්වහන්සේ වදාරණසේක් "එම්බා මහණෙනි, මේ භික්ෂුහු නොකීකරුවූයේ දැන්මතු නොවෙයි, පෙරත් දිව්‍ය නාගව ඉපිද තමා නොකීකරු හෙයින් දඬුවම් පිණිස කසළ ගොඩක් මත්තෙහි තුන් අවුරුද්දක් වාසය කළාවේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි දද්දර නම් නාග භවනයෙහි සූර දද්දර නම් නා රජෙකුව පුත්‍රව මහාදද්දරයෝය යි චූලදද්දරයෝය යි නාරජහු දෙදෙනෙක් උපන් නාහ. ඉන් චූලදද්දර නම් නාරජ්ජුරුවෝ නාමෙනෙවියන් මරා තලා බොහෝ වේදනා කෙරෙති, පියා නාරජ්ජුරුවෝ ඒ අසා චූලදද්දරයන් මාගේ නාග

භවනයේ වසන්ට බැරිය යි වහා නික්මුනු මැනවැ යි කියා එඛස් අසා දද්දර නාරජ්ජුරුවෝ කියන්නාහු "පියානන්වහන්ස, මාගේ මලනුවන් කළ වැරදි ඉවසා වදාළ මැනවැ"යි කියා රැඳවූහ.

දෙවනවාරයෙහිත් නාගභවනයෙන් යන්ට කී කල්හි මහාදද්දරයන්ගේ යාචඤ්ඤාවට රැඳවූහ. තුන්වන වාරයෙත් චූලදද්දර නාගරජ්ජුරුවන්ට නාගභවනයෙන් යන්ට කී තල්හි මහාදද්දර නාගරජ්ජුරුවෝ පියානන්ට කියන්නාහු "පියානන්වහන්ස, මාගේ මලනුවන් චූලදද්දරයන් මේ මුරයක් රඳවා වදාළ මැනවැ"යි කන්තලව් කීකල්හි සුරදද්දර නාගරජ්ජුරුවෝ කියන්නාහු "දෙවාර යෙක තොප කී කන්තලව්වට රැඳවුම්හ. තුන්වෙනි වාරයේත් රඳවන්ට බැරිය, තොප කළ වැරැද්දට පාටව පිණිස තුන් අවුරුද්දක් කසළ ගොඩක විසුවමැනවැ"යි කියා යවූහ. ඔහු දෙදෙනා එපරිද්දෙන්ම ගොස් මඛන්වූ කසළක් මුදුනේ වසන්නාහ. ඒ නාරජ දෙන්නා ගොදුරු පිණිස තොයෙක් තැන ඇවිදිනවා කුඩා කොල්ලෝ දැක කියන්නාහු "මඛන්වූ හිසක් සිඟින්වූ වාලඟයක් ඇති ගැරඬියන් දියඹරණුමෙන් හිස ඇත්තාවූ මේ සර්පයන් දෙන්නා මරම්හ"යි කැට මුගුරු ඇරගෙණ ගසමින් ඇවිදිනාහ. මෙපවත් ඉවසාගත නොහී චූලදද්දර නාරජ්ජුරුවෝ බැනන්ට කියන්නාහු "බැනන්වහන්ස, අපි දෙන්නම මහත්වූ විෂ තේජස් ඇති නාරජවරුවම්හ. අපගේ විවර නොදැන මේ කොල්ලෝ කැටමුගුරුත් ගසා අපනස නපුරුත් බැණ නිස්සාරව ඇවිදිනාහු මෝහට මම මහත්වූ විෂධූම ඇරමෝදැ?"යි බැනත් අතින් විවාළ කල්හි මහාදද්දර නාරජ්ජුරුවෝ "එම්බා මලනුවෙනි, අපගේ පියරජ්ජුරුවන් වහන්සේ අතින් තොප අසාගෙණ දුක විඳින පිණිස මෙතනට ආම්හ, අපගේ විවරත් කවුරුන් බවත් මේ කොල්ලෝ නොදන්නාහ, එසේහෙයින් මොහු කෙරේ කෝපී නොව"යි අවවාද කියා ඒ කසළගොඩ තුන්අවුරුද්දක් විසූ කල්හි පිය නාරජ්ජුරුවෝ තමන් පුත්වූ දරුවන් දෙදෙනා තමන්ගේ නාග භවනයට ගෙන්වා ගෙණ චූලදද්දරයන්ගේ අතිමානය බිඳ දෙඛැයෝම සඛසථ යෙන් වාසයකළාහ යි මේ **දද්දර ජාතකය** නිමවා වදාළසේක.

එසමයෙහි චූලදද්දරයෝ තම් ඒ කෝපී භික්ෂුහුමය, මහාදද්දරයෝ තම් බුදුවූ මම්ම සවිදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 310
## මතරොදන ජාතකය

**ති**වද අසරණ සරණවූ අප බුදුහු දෙවිරම් වෙහෙර වැඩවසනසේක් එක්තරා කෙළෙඹි පුත්‍රයකු අරභයා මේ ජාතකය වදාළසේක.

සැවැත්නුවර වැසි එක් කෙළෙඹිපුත්‍රයෙක් තමාගේ බෑයා මළ කල්හි ශොකයෙන් ආහාර වර්ජිතකොට ස්නාන විභූසන මාලාගන්ධ විලේපනාදිය නොකෙරෙයි, රුක්ෂවූ ශරීර ඇතිව සමීප උදෑසන බෑයා දැවුතැන සොහොනට ගොස් අඬයි, එක්දවසක් බුදුහු අළුයම් වේලෙහි මහා කරුණා සමාපත්තියට සමවැද එයින් නැගී "මාගීඵල ලැබීමට හේතූපනිස්සය ඇති වෙනෙයජනයෝ කවුරුදැ?"යි ලොව බලා වදාරණසේක් කෙළෙඹිපුත්‍රයාගේ සෝවාන් පලයට

සුදුසු බලවත් හෙතුසම්පත ඇතිබව දැක දෙවෙනි දවස් පස්වරු වේලෙහි එක් නිස්සුකෙණෙකුත්වහන්සේ පසු මහණකොට ගෙණ ඔහු කෙරෙහි පැවති අනුග්‍රහයෙන් ගේ දොරට වැඩිසේක.

ඉක්බිති ඒ කෙළෙඹිපුත්‍රතෙම බුදුහු වැඩිසේකැ යි යනු අසා පෙරමගට අවුත් මහත් ආදරයෙන් බුදුන් තමාගේ ගෙට වඩාගෙණ ගොස් මාහැගිවූ බුබා සතයක් පණවා එහි වැඩ උන් කල්හි වැඳ එකත්පස්ව උන්නේය. එවිට බුදුහු "කිමෙක්ද? කෙළෙඹිය ශෝසයෙක් ඇද්දැ?"යි විචාරා වදාළසේක. එකල්හි කෙළඹිපුත්‍ර තෙම "එසේය, ස්වාමීනි, මාගේ බැයන් වහන්සේ, මළතැන් පටන් බොහෝ ශෝක ඇත්තෙමි, දැන්වූයේ බුදුහු 'සියලු සංස්කාරයෝම අනිත්‍ය නොවෙද්ද? ඒකාන්තයෙන් මේ ශරීරය තම් ජරාවෙන් මිරිකී ව්‍යාධියෙන් පීඩිතව මරණින් හෙදයව පැමිණෙනි. එබදු සවභාව ඇත්තේය. මේ ලෝකයෙහි උපන්නාවූ සත්ත්වයන් සංස්කාරයන් අතුරෙහි නිත්‍යව නොනැසී පවත්නා එකකුදු නැත්තේය. එහි නුවණැත්තවුන් විසින් කවර ශෝක කිරීමක්ද? පෙර නුවණැති පණ්ඩිත ජනයෝ තමන්ගේ බැයෙකු මළ කල්හි බිඳෙනසුළු දෙය බිඳුනේය. නස්නාසුළු දෙය නැසුනේය යි සංස්කාරයන්ගේ අනිත්‍ය සවභාවය සලකා ශොක නොකළෝ වේද"යි වදාරා තුෂ්ණීම්භූතව වැඩහිඳ ඒ කථාව අසනු කැමැති කෙළෙඹිපුත්‍රයා විසින් ආරාධිතවූසේක් අතීත කථාවසතුව ගෙණහැර දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබොධිසත්ත්වතෙම එම නුවර අසූකෙළක් ධන ඇති සිටුකුලයක ඉපිද දෙමවුපියන්ගේ ඇවැමෙන් සිටුතනතුරට පැමිණ බැයන් නිසා ජීවත්වන්නේය. මැතභාගයෙහි බොධිසත්ත්වයන්ගේ බෑවූ ඒ සිවානෝ කාලක්‍රියා කළහ. ඤාති මිත්‍රාදීහු බොහෝදෙන මහඬින් හඬා බැගැපත්ව විලාප කියති එතැන්හි රැස්වූ එකද සත්ත්වකෙණෙකුදු සොමනසට නොපැමිණ සවභාවයෙන් සිටිනව සමසීයෙක් නොවීය. බෝසතානෝ පමණක් නොහඬති. විලාප නොකියති. මුඛවිකාර පමණෙකුදු නොදැක්වූහ. ඒ දැක සෙසු ජනයෝ මේ පුරුෂයාගේ කායශ්‍රී දැන්මක් බලව, මේතෙම ඉතා තද රෞද්‍ර එකෙක, තමාගේ බැයාගේ ධන කොවිස් දෙකම එක්කොට අනුභව කරමි"යි යන සිතින් බැයාගේ මරණ කැමති වූයේවනැයි යනාදී බෝසතානන්ව නින්ද කරන්ව පවන් ගත්හ. අනවැසි බන්ධුහුද එසේම නින්ද කළහ. අවිවාද කළහ.

එකල්හි බොධිසත්ත්වතෙම "එම්බා තෙපි හැමදෙනම නොපගේ අඥාන සවභාවයෙන් ලාභය, අලාභය, අයසය යසසය, සැපය, දුකය යන අෂ්ටලෝක ධර්මය සියළු සත්ත්වයන්ට නියත බව නොදනිති. මාගේ බැයා මළේය. ඔහු මළාය යනාදී අඩා විලාප කියව. මම ඒකාන්තයෙන් මියන්නෙම්මය. තෙපි සියල්ලෝමද එසේම මියන්නාහ. ඉදින් අඩතොත් තමාහට පැමිණෙන්නාවූ මරණ සලකා බව මිස අනුන්ගේ මරණ උදෙසා ඇඬුමට කාරණයෙක් නැත. හේතුවෙන් උපදනා සියලු සංස්කාරයෝම නැතිවෙති. පළමු සවරූපයෙන් පවත්නෝ නොවෙති. තෙපි හැමදෙනම මේ බව හා යථොක්ත අෂ්ටවිධ ලෝක ධර්මය සවභාවය නොදැන අඩතුදු ඒ සියල්ල දන්නාවූ මම කුමට අඬම්ද?"යි කියා

නැවත ඒ ජනයන්හට "ඇවැත්නි, තෙපි සියල්ලෝ මළ එකෙකුහට හැඩීම් වැළපීම් කෙරෙති. මියන්නාක් බලා නොකෙරෙති. මේ ලෝකයෙහි සියලු සත්ත්වයෝම ඔවුනොවුන් පසුපස්සෙහි පිළිවෙළින් මරණයට පැමිණෙති. නොමියන එක සත්ත්වයකුදු නැත. තවද මේ ලෝකයෙහි අධිකතර දිව්‍ය සම්පත්තියෙහි පිහිටි ශක්‍රබ්‍රහ්මාදී දෙවියෝද එසේම මනුෂ්‍යලෝකයෙහි අධිකවූ ආධිපත්‍යයට පැමිණි චක්‍රවර්ති ප්‍රාදෙශික මණ්ඩලිකාදීවූ රජදරුවන් ආදිකොට ඇති සියලු මනුෂ්‍යයෝද බලසම්පන්න සිංහ ව්‍යාඝ්‍ර හස්ති අශ්වාදී අනෙකවිධ චතුෂ්පද ජාතිහුද මහානුභාවසම්පන්න ගරුඬ රාජයන් ආදීවූ අනෙකවිධ පක්ෂීහුද උග්‍රවූ විෂතේජස් හා මහත් දිව්‍යානුභාව ඇති වාසුකී මහාකාලාදී සර්පරාජයෝද යනාදීවූ අපාද දිපාද චතුෂ්පාදදීවූ සියලු සත්ත්වයෝම තම තමන් ශරීර යෙහිම ඉසුරු නුවූවාහු දිව්‍ය මනුෂ්‍යලෝකාදි තම තමන් උපන් ස්ථානයෙහිද ශරීර ධන ජීවිතයෙහිද සිත් අලවාම පරිත්‍යාග කරණ බව මූත් එහි ආලය හැර මියන්නෝ නොවෙති. මේ යථොක්ත ප්‍රකාරයෙන් කාමභවය රූපභවය අරූප භවය යන තුන්ලෝවැසි සත්ත්වයන්ට පැමිණියාවූ සුවදුක් දෙකම නිරන්තර යෙන්ම එකාකාරව නොපැවත සැපයට අනතුරුව දුකය දුකට අනතුරුව සැප යයි යන මේ දෙක ක්‍රමයෙන් පෙරළී චක්‍රාකාතිව පවත්නා හෙයින්ම චංචල වන්නේය යි දැක අෂ්ටලෝක ධර්මය දක්නාවූ නුවණැත්තවුන්ට හැඩීම් වැලපීම් නිෂ්ප්‍රයෝජනව වැටහෙන්නේය. තෙපි මේ මහත්වූ සොක තමැති පර්වතයෙන් මිරිකී කවර කාරණයකින් දුක් අනුභව කරව්ද? තවද යම් කෙණෙක් ස්ත්‍රිධුනී පුරාධුනී වෙද්ද? දූකෙළි ආදියෙහි ලෝලවෙද්ද? අනිත්‍යාදී වශයෙන් පැවතීම යයි කිශනලද යොනිසො මනස්කාරයෙහි යෙදීමක් නැත්නාහුද? කෙලෙස් නැමති සතුරන් ජය ගැන්මෙහි ශෛඛරව්‍යයී නැතිවෙද්ද? ධර්මාධර්ම විභාග කල් පනාවකුදු නැතිව ආශ්වාස මාත්‍රයයෙකින් ජීවත්වෙද්ද? යන මේ ධර්මයෙහි අදක්ෂවූ අඥාන බාලජනයෝ තමන්ගේ අඥාන - මූඪවූ බව හේතුකොටගෙණ ඤාතිව්‍යසනාදිය පැමිණි කල්හි අඩමින් අනෙකප්‍රකාර විලාප කියමින් ධර්මය දැන ඤාතිමිත්‍රාදීන්ගේ මරණයෙහි ඇඩීම් වැලපීම් නොකරන්නාවූ නුවණැත්ත වුන්ට කිසිවක් නොදන්නා අඥානයෝය යි අපහාස කෙරෙති" යි යනාදීන් කුසල් අකුසල් හා අෂ්වලෝක ධර්මය විභාග කරණයෙන් ධර්මදෙශනාකොට සෝක දුරුකෙළේය.

බුදුහු මේ අතීත වස්තුව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට කෙළෙඹි පුත්‍රයා සෝවාන් ඵලයට පමුණුවා එකල්හි අඬන්නාවූ මහා ජනයා ධර්මකථාවෙන් නිස්සෝක කළාහු සිටුපුත්‍රයා තම් මම්ම වේදැ යි තමන් වහන්සේ ගෙණහැර දක්වා මේ මතරොදන ජාතකය පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

---

## 311 කනවෙර ජාතකය

මේවද ලොකසවාමීවූ තිලෝගුරු බුදු රජාතන් වහන්සේ සැවැත්නුවර ගම්කොට ජෙතවනාරාමයෙහි වැඩවසනසේක් පුරාණ දූතියක් විසින් පොලඹන ලදුව සස්නෙහි උකටලී එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වර්තමාන කථාව අට්ඨක නිපාතයෙහි ඉන්ද්‍රිය ජාතකයෙහි කී පරිද්දෙන්ම දතයුත්තේය. බුදුහු ඌ භික්ෂූන්ට "එම්බල මහණ, තෝ පළමුත් මේ සත්‍රිය නිසා කඩුවෙන් ඉස්කැපීමට පැමිණියේ වේදැ"යි වදාරා එපවත් අසා නුවණැති භික්ෂූන් වහන්සේ විසින් යාචඤ්ඤකොට දැන්වූ කල්හි ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්:**

පිටතිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි අප මහබෝසතාණන් වහන්සේ කසීරට එක්තරා ගමෙක්හි එක් සිටාන කෙණෙකුන්ගේ ගෙයි පිළිසඳ සොර නැකතකින් බිහිව වැඩිවිය පැමිණ ශෞරවීයත්‍වා ඇත්පොව්වකුව බඳුවූ බල ඇති ලොකප්‍රසිඩව සොරකම්කොට ජීවත්වතසේක. කිසිකෙණෙකුන් අල්වාගත නොහෙති. එක් දවසක් එක් සිටාන කෙණෙකුන්ගේ ගෙට උමං බිඳ වැද බොහෝ වස්තු අරගත් කල්හි දෙවෙනි දවස නුවර වැස්සෝ රජ්ජුරුවන් කරා එළඹ කියන්නාවූ "දෙවයන් වහන්ස, එක් මහාසොරෙක් නුවර බොහෝ සොරකම් කොට ඇවිදින්නේය. ඔහු අල්ලුව මැනවැ"යි කීහ

රජ්ජුරුවෝද ඔහු අල්වන්ට නුවර රැකවලෙහි නියුක්ත පුරුෂයාව නියෝග කළහ. ඒ පුරුෂතෙම රාත්‍රියෙහි රැකවලුන් ඒ ඒ තැන්හි මුළු මුළුව කොට සිටුවා බඳු හා එක්ව සොරු අල්වාගෙණ රජ්ජුරුවන්ට දැන්වූයේය. එකල්හි රජ්ජුරුවෝ සොරුන්ගේ ඉස සිඳින්ට ඒ පුරුෂයාව නියෝගකෙළේය ඒ පුරපාල පුරුෂතෙම් සොරු පිටිතල හයාබැඳ රත්තණේරු මල්දම් කරලා උළුසුණු ඉසව ගසා වීථිසන්ධියක් පාසා සැම්තියෙන් පහරදෙමින් කකීශවූ අඩ ඇතිව වදබෙරගස්වමින් සොරුන් මරණ තැනට ගෙණයන්ට වන්නේය. මේ නුවර වොලෝගෙණ ඇවිදින සොරතෙම අල්වන ලද්දේයයි මුළුනුවර එක කෝලාහලවිය.

එසමයෙහි ඒ නුවර දවස දහසක් ලබන්නාවූ පන්සියයක් වෙශ්‍යා පිරිවර ඇති සාමා නම්වූ රාජවල්ලභවූ වෙශ්‍යාවක් ඇත. ඕතොමෝ එදවස්ද තමා වාසය කරණ ප්‍රාසාදයාගේ මතුමාලේ සිව්මැදුරු කවුළුව හැර වීථිය බලන්නී උතුම්වූ රූපසොභාවෙන් අග්‍රප්‍රාප්තවූ දුටුවන් ප්‍රසාදවහවූ සියල්ලන්ගේ මත්තෙන් පෙණෙන්නාවූ සොරහු දැක පිළිබඳ සිත්ඇතිව මේ උතුම්වූ රූපශ්‍රී ඇති පුරුෂයා කවර උපායකින් තමාට වල්ලභ කාරණම්දෝහෝයි සුදුසු උපායක් සොයන්නී තමහට වැඩ හැසිරෙන්නාවූ එක් ස්ත්‍රීශක් අතව දහසක් දී මේ සොරතෙම සාමාවගේ මළනුවෝය. සාමාවන් හැර සොරුට පිටිවහලෙක් නැත. නුඹවහන්සේ මේ දහස ගෙණ මේ පුරුෂයා සාමාවන්ට දුනමැනවැ යි කියා යන ලෙස උගන්වා ගමින් කරවූවාය.

ඒ ස්ත්‍රී දහස ගෙණගොස් ඒ පුරුෂයාහට දී එපරිත්දෙන් කීවාය. එකල්හි ඒ පුරපාලක පුරුෂතෙම කියන්නේ "මේ සොරතෙම ප්‍රසිඩවූ එකෙක. එසේ හළ නොහැක්ක. අන්පුරුෂයෙකු වධයට ලදහොත් පිළිසන් යාකාවෙක හිඳුවා එවන්ට පිළිවන්දැ"යි කීයේය. ඒ ස්ත්‍රීද එපවත් අසාගෙණ ගොස් වෙශ්‍යාවට කීවාය.

එසමයෙහි එක් සිටුපුත්‍රයෙක් සාමාව කෙරෙහි පිළිබඳ සිත් ඇතිව දවස දනසක් දෙයි. ඒ සිටුපුත්‍රතෙම එදවස් සවස් වේලාවෙහි දහසක් වස්තු ගෙණ ඇගේ ගෙට ගියේය. ඒ සාමාවද ඔහු දුන් දහසින් බදපිල්ල අතට ගෙණ උකුලෙහි තබා අඬන්ට පටන්ගත්තීය. "කුමට අඬද්දැ?"යි විචාළ කල්හි කියන්නී "ස්වාමිනි, වඩාත ගෙණයන්නාවූ මේ සොරතෙම අතිකෙක් නොවෙයි. මාගේ මලනුවෝය. තමා හීන නීවවූ සොරකම් කරණ හෙයින් ලජ්ජාවෙන් මා සමීප යට එන්ට අසමර්ථය. පුරපාලක පුරුෂයාහට මා විසින් යාචඤ්ඤාකොට කියා යවූ කල්හි "දහසක් දුනහොත් අරිමි" කියා එවිවේය. "දැන් මේ දහස ගෙණ ගොස් පුරපාලක පුරුෂයාහට දෙන්ට නිසි පුරුෂයකු නොලබම්" කීවාය. ඒ සිටුපුත්‍රතෙම ඇ කෙරේ පිළිබඳ සිතින් "මම ගෙණ ගොස් දෙමි. තොප ශෝක නොකරව"යි අස්වැසීය.

එකල්හි ඕතොමෝ කියන්නී "එසේවිතම් ස්වාමිනි, තොප විසින් ගෙණා දහස තොපිම ගෙණ ගොස් දෙව"යි කීවාය. ඒ සිටුපුත්‍රතෙම තමා ගෙණා දහසින් බද පියල්ල ගෙණ පුරපාලකයාගේ ගෙට ගියේය. ඒ පුරපාලක පුරුෂතෙම්ම සිටුපුත්‍රයා සඟවා තබා සොරු පිළිසත් යානාවක හිඳුවා සාමාවගේ ගෙට යවා අප විසින් මේ වධයට ගෙණා පුරුෂතෙම රාජයෙහි ප්‍රසිඛ සොරෙක, මඛ්‍යම රාත්‍රියෙහි මනුෂ්‍යයන් නිදිගෙණ හැසුරුණු වේලෙහි මරම්හයි ඉතිරි රාජපුරුෂයන්ට ව්‍යාජයෙන් කියා මදක් කල්යවා මනුෂ්‍යයන් නිදිගත් කල්හි සිටුපුත්‍රයා මහත්වූ රුකවලින් සොරුන් මරණ තැනට ගෙණ ගොස් කඩුවෙන් හිස කපා ශරීරය උලතබා නුවරට වත්තේය. එතැන්පටන් ඒ වෙශ්‍යා දූ තොමෝ අන් පුරුෂයන් අතින් කිසිවක් නොගෙණ සොරු හා එක්වම ප්‍රියසංවාසය කෙරෙමින් වෙසෙයි.

ඉක්බිතිව ඒ සොරු සිතනුයේ මෝතොමෝ ඉතා මිත්‍රද්‍රෝහිය, අනිකක්හු කෙරෙහි සුපිළිබඳ සිත්වූ නමුදු ඒ සිටුපුත්‍රයා මෙන් මෑත් මරවා ඔහු හා එක්වත් ප්‍රියවාසය කරන්නීය. කවර උපායකින් මැ කෙරෙන් මිදෙමිද? මෙහි බොහෝ දවසක් කල් නොයවා යායුතුය යි සිතා ඉක්බිති සිතන්නේ "යන කල සිස් අතින් ගොස් ප්‍රයෝජන කිමිද? මැගේ ආභරණයන් ඇරගෙණ යෙමි" සිතා එක් දවසක් සිතන්නේ "සොඳුර අප මැදිරියෙහි ලූ කුකුළන් මෙන් නිරන්තර යෙන් ගෙයිම් වැදලා ඉඳ දුක් විඳීමෙන් ප්‍රයෝජන කවරේද? උයන් කෙළියට යම්හ"යි කීහ. ස්ත්‍රී "යහපතැ"යි ගිවිස කතබොන දෑ ඇතුළුවූ උපකරණ සපයා ගෙණ තොමෝ සම්භරණයෙන් සැරහී සොරු හා එක්ව පිළිසන් යානාවකින් උයනට ගියාය. ඒ සොරුද ඇ හා එක්ව උයනේ කෙළ ඇවිදිනේ දැන් මා විසින් යන කලැයි සිතා ඇ හා සමඟ රති ක්‍රීඩා කරණු කැමැත්තෙකු මෙන් කණේරුගස් ගොල්ලකට වැද ඇ ආලිඛනය කරණ පසාරයෙන් දැඩිකොට මිරිකා මූර්ඡා කොට සියළු ආභරණ ගලවා ඇගේ උතුරුසළුවෙහිම පොදියක් කොට බැඳ කරට දමාගෙණ උයන්වැට පැනගෙණ පලා ගියේය. සොරා ගිය නොබෝ කලකින් ඒ ස්ත්‍රිය සිහිලැබ බැණ කෑගී සිට තමාගේ පිරවර ස්ත්‍රීන් කරා ගොස් මාගේ සවාමිපුත්‍රයා කොයිදැ?"යි විචාරා උන් විසින් "නොදනුම්හ"යි කී කල්හි මූර්ඡාවූ මා මළැ යි යන භයින් ගියේවතැ"යි සිතා දෙම්නසට පැමිණ ගෙට ගොස් මාගේ ප්‍රිය වල්භයා දුටු දවසකමුත් කවර සැප විඳීමෙක්දැයි යන ශෝකයෙන් සැරහූ යානෙහි නො සැතපී භූමිසෙය්‍යාව කෙරෙමින් මතා වස්ත්‍ර

යෙහිද ඇලුම් නොකොට කිළිටු වස්ත්‍ර අදිමින් එකවේලේ අනුභව කෙරෙමින් සුවද මල් ආදිය නොපැලඳ හැරම යම්කිසි උපායකින් ප්‍රිය වල්ලභයා ගෙන්වා ගණිමි සි සිතා නාටකයත් ගෙන්වා දහසක් වස්තු දී නොපෙ විසින් නොයන තැන් නැත. ගම් නියම්ගම් රාජධානි ආදියට ගොස් ගී තැටුම් පවත්වන තැන්හි පළමුකොට මේ ගීතිකාව ගායනා කරව මාගේ සවාමිපුත්‍රතෙම එතැන්හි වී නම් මේ ගීතිකාව අසා තෝ හා සමග කථා කරන්නේය. ඉක්බිති මම සැපසේ ඉඳිනා බව කියා කැඳවාගෙණ එව. අනුන් තෝ කියා එවයි නියෝග කොට තමාගේ ගීතිකාව උගන්වා මාගෝපකරණ සපයා දී යවූවාය. ඒ නාටක ජනයෝ ඒ බරණැස් නුවරින් නික්ම ගම් නියම්ගම් පිළිවෙළින් ගී තැටුම් පවත්වා ඇවිදිනාහු ඒ සොරහු වාසය කරණ පිවිසර ගමට පැමිණ එතැන්හි රැස්වූ පිරිස්මැද නාට්‍යමණ්ඩලය මැද ගී තැටුම් පවත්වන්නා පළමුකොට මේ ගීතිකාව කීහ.

"යෙනානං වසනසමයෙ-සානවෙරෙහු හානුහු,
සාමං බාහාය පීළෙසි-සානං ආරොහයම්බවී"ති

මේ ගාථාවෙන් කියේ තම් අනෙකවිධ පුෂ්පඵලපල්ලවාදියෙන් වනය සොභාවත්වූ වසනත කාලයෙහි උයන් කෙළියට ගියාවූ නුඹවහන්සේ මොන වට පිපී මල්පැහැයෙන් රත්වූ සොභා ඇති කනේරුගස් අතුරට වැද රතික්‍රීඩා අභිප්‍රායෙන් සාමා නම් ස්ත්‍රියක් ආලිඟනය කොට මූර්ඡාවූ කල්හි මළයි යන භයින් සැඟවී ගියසේක්ද? ඕතොම නුඹවහන්සේට තමා නිදුක්ව ජීවත්ව ඉඳිනා බව කියන්නී යන අභිප්‍රායය.

ඉක්බිති ඒ පිරිස් අතුරෙහි අසා සිටියාවූ සොරතෙම නාටකයා කරා එළඹ කියන්නේ "එම්බල, කොල නාටකය, තෝ සාමාව ජීවත්ව ඉඳිති කියන්නෙහිය, මම වනාහි වචනය අදහන්නෙම් නොවෙමි. එම්බල නාටකය මෙලොවෙහි පවතෙක් තණ පරඬලා මෙන් පළිත ගෙණ යන්නේය යන මේ බසෙක් ඇද්ද? එබස ඇදහිය යුතු නොවෙයි ඉඳින් පවතෙකින් පළිඛායක් ඔබිමොබ ගෙණ යන්නේ විනම් මේ මුළු ලොවද එපරිද්දෙන්ම ගෙණයෙයි පොළොව හා පළිත යන් පවනින් ගෙණ යෙති යනු යම්සේද, සාමාව ජීවත්වෙති යනුද එමෙන් වන්නේය. යම්හෙයකින් සාමා නම් ස්ත්‍රී මළාද ඇ ආරොග්‍යව විචාරති යනු කුමට අදහම්ද? මළ සත්ත්වයෝත් කථාකෙරෙත්ද?"යි කියේය. ඒ වචනය අසා නාටකතෙම කියන්නේ "සවාමිනි, නුඹවහන්සේ කුමක් කියනසේක්ද? ඒ සාමාවෝ මළෝ නොවෙති. අන් පුරුෂයෙකු කැමැත්තෝද නොවෙති. නුඹවහන්සේ නික්ම ඇ තැන් පටන් කිළිටුවූ වස්ත්‍ර හැඳ එක්වේලේ අනුභවකොට සුවඳ මල් විලේපනාදිය දුරුකොට යහන්වරා බිම සැතපී නුඹවහන්සේගේ ඊම ලබමින්ම ඉඳිති" කීයේය.

ඉක්බිත්තෙන් සොරතෙම කියන්නේ "ඕතොමෝ ජීවත්වේවයි නොවේ වයි ඇතෙන් ප්‍රයෝජන නැත. ඕතොමෝ නොබෝ කලක් තමාගේ පුරුදුවූ නියම සැමියා සිටුපුත්‍රයා මව පැමිණි වධයට යොදා කිසි පුරුදුකමක් නැත්තාවූ අමුතුව දුටු මා වධයෙන් මුදා තමාට වල්ලභ කළාය. මතු අන් පුරුෂයකු දුටු කල ඔහු නිසා මාත් අනර්ථයට පමුණුවන්නීය. එසේහෙයින් ඇ සමීපයට යන්නා තබා මෙයිනුදු ඇගේ නම් පුවත් නොඅසන්නාවූ ඉතා දුරු තැනකට

යෙමි" කියා ඒ නාටකයන් බල බලා සිටියදී වස්ත්‍රය තරව ඇද වේගයෙන් නික්ම ගියේය. නාටක ජනයෝ එපවත් දෙවනුව නොස් සාමාවට කීහ. ඒ ඇසූ සාමාතොම තමා කළ මිත්‍රද්‍රෝහියට කළකිරි පළමුවෙන් තමාගේ වෙශ්‍ය සවභාවයෙන් ජීවත්වූවාය. තිලෝගුරු බුදුරජානන් වහන්සේ "මහණ තෝ දැන් මතු නොවෙයි, පෙරත් මේ ස්ත්‍රී නිසා දුකට පැමිණියේවිද"යි වදාරා චතුසසත්‍යය ප්‍රකාශ කිරීමෙන් මේ ජාතකය නිමවා වදාළසේක.

දෙශනාවගේ කෙළවර ශාසනයෙහි උකටලීවූ භික්ෂූන්වහන්සේ සොවාන් ඵලයෙහි පිහිටියේය. එකල්හි වෙශ්‍යාව නිසා ඉස් කැපුම් ලත් සිටුපුත්‍රයා තම් මේ උකටලීවූ මහණය, එකල්හි සාමා තම්වූ වෙශ්‍යා තම් උකටලී කරවා ශාසනයෙන් චුතකරවන්ට උත්සාහකළ පුරාණ දූතිකාය, එසමයෙහි සොරව උපන්නේ දැන් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ හෙණහැර දක්වා වදාළසේකි.

---

## 312 තිත්තිර ජාතකය

තිවද සමත්‍රිංශත් පාරමිතා සම්භාරයෙන් සංසිද්ධ බොධිඥනයෙන් සුපරිසුඛ ස්කඛඝනනා න ඇති අප තිලෝගුරු සම්‍යක් සම්බුධ සමීඳු රාජොත්තමයාන් වහන්සේ කොසඹෑනුවර ගොචරග්‍රාම කොට බදරිකා තම් ආරාමයෙහි බ්‍රහ්මවිහාරයෙන් වාසය කරණසේක් රාහුල සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය වදාළසේක.

මෙහි වතීමාන කථාවස්තුව යට තිපල්ලත්ති ජාතකයෙහි ධම්දෙශනාවට කියන ලද්දේමය. මේ මතු කියන තිත්තිර ජාතකයෙහි ධම්දෙශනාවට කාරණයෙක් යම් කලෙක උපන්ද? එසමයෙහි ධම්සභා මණඩපයෙහි රැස්ව උන් භික්ෂූන් වහන්සේ විසින් වදාරණසේක් "ඇවැත්නි, රාහුල සථවිරතෙම නිවිධ ශික්ෂාවන් පුරුදු කැමැත්තේ නම් ඔනු කෙරෙහිද කුකුස් කරන්නේ අනුන් විසින් කරණලද අවවාදයෙහි පිහිටන්නේය යි යන,දීවූ ආයුෂ්මත් රාහුලසථවිරයන්ගේ ගුණකථාවත් හෙවත් ප්‍රශංසාවත් පහළවූ කල්හි ඒ භික්ෂූන් වහන්සේ විසින් කරණ ලද ප්‍රශංසාව දිවකණින් අසා වදාරා ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ සුගති ගඞ්කුටි විහාරයෙන් තුන්තරා ගමනින් එක්තරා ගමනකින් වැඩ වදාරණසේක් "එම්බා මහණෙනි, දැන් වනාහි කිතම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා මෙතම් කථාවකින් යුක්තව උනුම්හ"යි කී කල්හි බුදුහු එබසට වදාරණසේක් "එම්බා මහණෙනි, රාහුලයන් ශික්ෂා නැති වූයේත් කුකුස් කාරි වූයේත් අවවාදක්ෂම වූයේත් දැන් මතු නොවෙයි, පෙරත් තිත්තිර තම් ක්ෂුද්‍ර පක්ෂිජාතියක ඉපිදත් මෙබඳු ශික්ෂා ඇති ගුණධර්මයෙන් යුක්තවූයේ වේදැයි මුඛමාත්‍රයක් දක්වා වදාළ කල්හි භික්ෂූන් විසින් "ස්වාමීනි, බුදුරජානන් වහන්ස, ඒ අතීත ප්‍රවෘත්තිය භවයෙන් ප්‍රතිඡන්න හෙයින් අපට නොදැනෙන් නේය අපට දැනෙන පරිද්දෙන් විස්තර වශයෙන් ප්‍රකාශකොට වදාළ මැනවැ"යි ආරාධිතවූ බුදුරජානන් වහන්සේ ඔදාරණසේක්.

යිවසිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජනය කොට රාජ්‍යශ්‍රී අනුභව කරණ කල්හි පුරණ ලද බොධිසම්භාර ඇති අප මහබොධිසත්ත්වතෙම බ්‍රාහ්මණකුලයෙහි ඉපිද වැඩිවිය පැමිණියේ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයෙන් සියළු උගත මතා ශිල්ප ඉගෙණ එයින් අවුත් හිමවත් වනපෙදෙසෙහි ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ඍද්ධිවිධාදීවූ පඤ්චාභිඥාවන්ද රූපාරූප අෂ්ටසමාපත්තිද නිපදවා ධ්‍යාන ක්‍රීඩාව කරන්නේ සිත්කළු වනලැහැබෙක්හි වාසය කොට ලුණු ඇඹුල් සෙවුනා සඳහා එක්තරා ප්‍රත්‍යන්ත ග්‍රාමයකට ගියේය.

ඒ ගම්හි මනුෂ්‍යයෝ ඒ තාපසයන් දැක සතුටු සිත් ඇත්තවුන් එක් තරා වනයක පන්සලක් කොට පිණ්ඩපාතාදී ප්‍රත්‍යයෙන් උපස්ථාන කරන්නාහු ඒ පන්සල්හි වාසය කරවූවාය. එකල්හි ඒ ගම්හි පක්ෂීන් මරා දුරහරණාදිය කරණ එක්තරා වැද්දෙක් වටුවෙකු ගෙණ යාපත්කොට අභ්‍යාස කරවා මැදිරි යෙක ලා රක්ෂාකරන්නේය. "එසේවූ වටුවා වලට ගෙණ ගොස් ඔහුගේ ශබ්ද අසා ආ නිප්වටුවන් අල්වා ගෙණයන්නේය. ඒ මැදිරියේ උන් සේ වටුවා සිතන්නේ "මාගේ කුලෙහි බොහෝ නැයෝ මාගේ ශබ්දය නිමිත්තකොටගෙණ විනාශයට පැමිණෙන්නාහ. මේ අකුශලය මට පැමිණේද්දෝ හෝ" යි නිශ්ශබ්දව උන්නේය. වැදිපුත්‍රයා ඒ පක්ෂියා බැණ නොගෙණ ඉන්නවා දැක ඔහු කෙරෙහි කිපුනු සිත් ඇත්තේ උණලැල්ලකින් ඔහුගේ ඉස්මුදුනේ පහරමින් පීඩාකරන්නේය. එසේ වටුතෙම මෙසේ සිතුයේය. "මා විසින් පවත්වන්නාවූ ශබ්දය කරණ කොටගෙණ මේ පක්ෂීහු නසිත්වයි යන මාගේ සිතක් නැත්තේය. එත කුදු වුවත් මා විසින් කළ අකුසල කර්මය මාම ස්පර්ශ කරන්නේය. මා ශබ්ද නොපවත්වන කල්හිම මේ පක්ෂීහු මා සමීපයට නොඑන්නාහ. ශබ්ද පවත්වන කල්හිම එන්නාහ. ආ ආ පක්ෂීන් මේ වැදිපුත්‍රතෙම අල්වාගෙණ මරන්නේය. මේ ක්‍රියාව නිමිත්ත කොටගෙණ අකුසල් ඇද්දෝහෝයි ඒ තෙම එතැන් පටන් කවර නුවණැත්තාවූ සත්ත්වයෙක් වනාහි මාගේ සිත්හි උපන්නාවූ ඔත්තප ලක්ෂණවූ කාංසාව වුදන්නේදෝ නෝයි සිතා එබදු කාංසා විවේජනයට සමර්ථවූ ප්‍රඥාවන්තයකු පරීක්ෂා කෙරෙමින් වාසය කරන්නේ, ඉක්බිත්තෙන් එක්දවසක් ඒ වැදි බොහෝ වටුවන් අල්වා පැසක් පුරා ලා ගෙණ ශ්‍රමදූහයක් සන්හිඳුවා ගණිමි. පැන්බොමි සිතා බොධිත්ත්වයන් වාසය කරන්නාවූ ආශ්‍රමයට ගොස් ඒ පක්ෂියාගේ මැදිරිය බොධිසත්ත්වයන් වහන්සේ සමීපයෙහි තබා පැන් බී වැලිතලාවෙක්හි නොන්තේ නිද්‍රාවට පැමිණියේය. එසේවූ වටුතෙම ඔහු නිද්‍රා වට පැමිණි බව දැන තමාගේ සිත උපන් කුකුස් මේ තාපසයන් අතින් විචාරමි විචාළාවූ මට තත්වූ පරිද්දෙන් දන්නාවූ මේ තාපසයන් වනන්සේ වදුරණ සේකැයි මැදිරියේ සැතපීගෙණම ඒ තාපසයන් වහන්සේගෙන් විචාරන්නාහු එසේ වටුපක්ෂීතෙම පළමුකොට මෙසේ විවලේය. කෙසේද? යත් "ස්වාමීනි, නුවණැත්තාවූ තාපසයන් වහන්ස, ඒකාන්තයෙන්ම සැපයෙන් ජීවත් වෙමි. මා කැමති කැමති කැවිලි පෙවිලි සුවසේ ලැබෙන්නේය, එතකුදු වුවත් බොහෝ ඤාති කුලයෙහිවූ පක්ෂීන් නසා ජීවත්වෙන තරම් උපද්‍රව ස්ථානයක පිහිටියෙමි. එසේ හෙයින් තාපසයන් වහන්ස, මෙයින් මට කවර අකුශලකර්මයක් සිඹවත් නේද? ඒ මාගේ සිත්හි උපන් කාංසාව පසිඳ වදාළ මැනව" යි විචාළාවූ ඔහුගේ

ප්‍රශ්නය විසඳන්නාවූ ඒ තාපසයානන් වහන්සේ මෙසේ වදාරණසේක් "එම්බා පක්ෂිය, ඉදින් තාගේ චිත්තය පාපකර්මය පිණිස නොතැමෙන්නේය. එසේ කල්හි පාපකර්මය පිණිස සංග්‍රහණයක් නැත්තාවූ නිරුත්සාහවූ සත්පුරුෂවූ තට ලාමකවූ පාපචේතනාවෙක් තා ලිම්පනය නොකරන්නේය. එසේහෙයින් තට අනිවාර්යයෙන් වන්නේය එසේනොයින් හොක නොකරව" යි වදාළසේක්.

බොධිසත්ත්වයන් වහන්සේගේ උක්තප්‍රකාරවූ බණ ඇසූ ඒ තිත්තිර පක්ෂිතෙම මෙසේ විචාරන්නේය. "ස්වාමීනි, මම ශබ්ද නොපැවැත්තුවේ වීනම් මේ තිත්තිර පක්ෂි සමූහයෝ මා සමීපයට නො එන්නාහ. ශබ්ද පැවැත්වූ කල්හි අපගේ ඤාතීවූ පක්ෂිතෙම මෙතැන්හි ඉදිනේයයි බොහෝ පක්ෂීහු එන්නාහ. ඒ ආවාවූ පක්ෂීන් මේ වැදිපුත්‍රතෙම අල්වාගෙණ ජීවිතක්ෂයට පමුණුවන්නේය. එසේහෙයින් මා නිසා මේ ප්‍රාණඝාත අකුශලකර්මය ස්පර්ශ වශයෙන්ම වන්නේය එසේනොයින් මාගේ චිත්තය මේ පාපකර්මය නිමිත්ත කොටගෙණ කාංසාවට පැමිණෙන්නේය" යි කියේය. ඒ ඇසූ බොධිසත්ත්වයන් වහන්සේ වදාරණසේක් "එම්බා තිත්තිර පක්ෂිය, ඉදින් පව් කරණ නිසා චිත්තයත් නීපිදවූයේය. එසේනොයින් තාගේ චිත්තය දූෂ්‍ය නුවූයේය. හෙවත් තන්නින්න තප්පොන භාවයෙක් නැත්තේය. එසේ කල්හි වැද්දු විසින් ආයුෂ්මත්වූ තා නිසා කරණ ලද්දාවූ පාපකර්මය තා ස්පර්ශ නොකරන්නේය ඒ ලාමක ක්‍රියාවෙහි තාගේ සිත නො ඇලෙන්නේය. මේ ලාමක ක්‍රියාවට යත්නයක් නැත්තාවූ එබඳු පාපකර්මයක් කෙරෙමි යන සිත් නැති හෙයින් ශොභන චිත්ත සන්තාන ඇති තට ප්‍රාණඝාත චේතනාවගේ නොවීමෙන් ඒ අකුසලය තා ලිම්පනය නොකරන්නේය." යනාදී වචනයෙන් මහබෝසත්වූ තාපසතෙම ඒ තිත්තිර පක්ෂියාව තත්වූ පරිදි දැන් දක්වා සංසිඳුවා වදාළසේක. ඒ තිත්තිර පක්ෂියාද මහබෝසතාන්හන් වහන්සේ නිසා නිස්සංකා වූයේය.

ඉක්බිති ඒ වැදිපුත්‍ර නිදු පිබිද මහබෝසතානන් වහන්සේ වැඳ අවසර නෙණ ඒ පක්ෂිරාජයා නෙණ ගියා යි ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ තිත්තිර ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළ සේක.

එකල්හි තිත්තිර පක්ෂිවූයේ දැන් මේ රාහුලස්ථවිරය, අවවාදයෙන් ඔහු සිත උපන් සැක සිඳිතා තාපසයෝ තම් දැන් බුදුවූ මම්ම වේදැ යි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක්.

---

## 313
## සුබ්බච ජාතකය

**එ**වද එක්සමයෙක්හි අප තිලෝගුරු සම්මාසම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වසය කරණසේක් එක්තරා කෙළෙඹි පුත්‍රයකු අරභයා මේ සුබ්බච ජාතකය වදාළසේක.

ඒ කෙළෙඹි පුත්‍රයා වනාහි ගම්හි නය ඵලවමින් භාග්‍යාව හා එක්ව ගොස් නය ඵලවාගෙණ ගැලක් ගෙණගොස් පසුව ගෙණඑමියි එක්තරා ගෙයක තබා නැවත සැවැත්නුවරට යන්නාහු එක්තරා පව්තයක් දුටුවාහුය. ඉක්බිත්තෙන්

ඔහුගේ භාර්‍යාතොම කියන්නී ''ස්වාමිනි, ඉදින් මේ පළිඟුය සුවඳ ඉවීමය වීනම් මට කිවක් දෙන්නෙහිදැ?''යි විවාළීය. එබසට සුවාමියා කියන්නේ ''මාගෙන් එලෙස ලබන්ට නෝ කවුරුදැ? මම නොදෙමි'' කීයේය.

ඉක්බිත්තෙන් ඕතොම එපමණකින් තදවූ සිත් ඇත්තී ඒකාන්ත යෙන්ම මේ පළිඟුය සුවඳ ඉවීමයවූ කල්හිදු මට කිසිවක් නොදෙන්නේයයි කියා නොසතුටුවූවා. ඉක්බිති ඒ සත්‍රිපුරුෂ දෙදෙනා බුදුන් වාසය කරන්නාවූ ජෙතවන විහාරය සමීපයට ගොස් මාගීශ්‍රමයන් සන්සිඳුවා පැන් බී ගෙණ යම්හයි විහාරයට වන් කල්හි බුදුරජාතන්වහන්සේද එදා අලුයම් වේලෙහි ඔවුන් දෙදෙනාගේ ශ්‍රොතාපත්ති ඵලයට බලවත් ප්‍රත්‍යය ඇති බව දැන වදාරා ඔවුන් දෙදෙනාගේ ඊම බලමින් ෂඩ්වර්ණී ඝන බුබ්‍රශ්මීන් ශ්‍රී ශරීරයෙන් නික්මවා මදක් වැඩහුන් සේක. ඒ දෙමහල්ලෝද පැන් බී අවුත් බුදුන් වැඳ එකත්පස්ව උන්නාහුය. සම්මෝදයන්වහන්සේ ඔවුන් හා සමග පිළිසඳර කථා කොට නෙවත් තමන්වහන්සේ කරා පැමිණි අඟන්තුකයන්ට සන්තොෂයට කාරණා වදාරා ''නෙපි දෙදෙනා කොයි ගොසින් එවුදැ?''යි විවාරා වදාළසේක. එබසට කියන්නාහු ''ස්වාමිනි, අප දෙදෙනා ලද්දාවූ ධනයන් ඵලවාලන්ට ගියමිහ''යි කීවාහුය. එබසට බුදුරජාතන් වහන්සේ ''කිමෙක්ද? උපාසිකාව, තොපගේ වල්ලභවූ පුරුෂතෙම තොපට හිතසිත් ඇත්තේද? උපකාරීව වාසය කරන්නේ දැ''යි විවාරා වදාළසේක. එබසට ''සුවාමිනි, භාග්‍යවත්වූ බුදුරජාතන්වහන්ස, මම මොහු කෙරෙහි ස්නෙහයෙන් යුක්තයෙමි, මේ වනාහි මා කෙරෙහි ස්නෙහයක් හැත්තේය, ඊට කාරණා කවරේද? අද දවස් මා විසින් පළිඟුයක් දැක මේ පළිඟුය සුවඳ ඉවීමය වීනම් මට කිසිවක් දෙන්නෙහි දැ සී විවාරණ ලදෑ නෝ මානෙන් ලැබීමට කවරෙක්දැ යි කිසිවකුත් නොදෙමි යි කීයේය. එසේ නෙසින් මෙබඳුවූ කිසි ස්නෙහ ගුණයක් නැති මෙතෙම තදවූ සිත් ඇත්තේය''යි කීවාය.

එබසට බුදුරජාතන් වහන්සේ ''එම්බල උපාසිකාව, මෙනම් දෙයක් නොවන්නේ වී නම් යම් කලෙක වනාහි තොපගේ ගුණ සිහිකෙරේද? එදවස් වනාහි සියලු ඓශ්වර්‍යයම දෙන්නේය''යි වදාරා බුදුන් විසින් වදාළ වචනය ඇසූ උපාසිකාතොම ''සුවාමිනි, බුදුරජාතන් වහන්ස, ඒ සියළු ඓශ්වර්‍ය ලැබීම නම් කවරේදැ?''යි ඔවුන් විසින් ආරාධිතවූ බුදුරජාතන්වහන්සේ අතීත කථාව ගෙණහැර දක්වා වදාළසේක.

**හේ කෙසේ ද? යත්,**

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද පෙරුම් ඇති මහබෝධිසත්වතෙම එරජහුගේ සියලු ක්‍රියා සිඹකරන්නාවූ අමාත්‍ය විය. ඉක්බිත්තෙන් එක්දවසක් ඒ බරණැස් රජතෙම තම පුත්‍රවූ යුවරජහු උපස්ථානයට එන්නා දැක මේ තෙමේ මාගේ අභ්‍යන්තරයෙහි වාසය නොකෙරේවා යි සිතා ඒ අමාත්‍යයා සමීපයට කැඳවා ''එම්බා සහය, මම යම්තාක් කල් ජීවත්වන්නෙම් නම් ඒ තාක් කල් මෙතෙම මේ නුවරෙහි වාසය කිරීම නොලබන්නේය. අන්‍යස්ථානයක වාසය කොට මාගේ ඇවැමෙන් රාජ්‍යය කරව''යි කීයේය. එතෙම ''යහපතැ''යි ගිවිස පියරජහු වැඳ ප්‍රධාන භාර්‍යාව හා සමග බරණැස්නුවරින් නික්ම ප්‍රත්‍යන්ත

ජනපදයකට ගොස් වනයෙහි පන්සලක්කොට වතමුල් වන එලාඵල අනුභව කෙරෙමින් වාසය කරන්නේය. මෑත භාගයෙහි පියරජතෙම කළුරිය කෙළේය. යුවරජතෙම තරු බලා ඒ තමාගේ පිතාවූ බරණැස්රජ කාලක්‍රියා කළබව දැන බරණැස්නුවරට එන්නේ අතරමඟ එක් පළිතයක් දුටුවේය.

ඉක්බිත්තෙන් ඔහුගේ භාය්‍යාතොම කියන්නී "ඉදින් දෙවයන්වහන්ස, මේ පළිතය සඵණිමය වී නම් මට මින් කිසිවක් දෙන්නෙහි දැ?"යි විවාළිය, එබසට යුවරජ කියන්නේ "නෝ මාගෙන් ලබන්නට කවරෙහිදැ යි කිසිවක් නොදෙමි"යි කියේය. ඉක්බිත්තෙන් ඕතොම මම ඔහු හා සමඟ වාසය කෙරෙමියි සෙනහයෙන් වාසය කරන්නට නොහැකිවූයේය. මේ පුරුෂද මා කෙරෙහි කලකිරුණේ, සෙනහව තදවූ සිත් ඇත්තේ රාජ්‍යයට පැමිණද මෝ නොම මට කවර යහපතක් කළාදැ යි නොසතුටුවන්නේය"යි සිතා ඒ පුරුෂයා හැර චිතයට නොගොස් ඔහු හා සමඟ ගියාය. එතෙම රාජ්‍යශ්‍රියෙහි පිහිටා ඒ ස්ත්‍රිය අඟමෙහෙසුනැ යි යන යසස් මාත්‍රයක් දුන්නේය. මත්තෙහි වනාහි කළ සත්කාර සම්මානයෙක් නැත්තේය. මෑත කාලයෙහි අෑ ඇති බවත් නොදන්නේය. බොධිසත්ත්වයන්වහන්සේ සිතනසේක් මේ ස්ත්‍රිතොම රජහුට උපකාරව වල වාස කරණ කාලයෙහි මෙපමණක් දුක්ගණිම් යි සිතා නුකුසී තව මෙරජහට විශ්වාසව සිත පක්ෂපාත බැව්හි වාසය කළාය. දැන් මේරජ වනාහි තමහට ගත් දුක් පමණක් නොදැන අන්‍යවූ ස්ත්‍රීන් හා රමණය කෙරෙමින් දවස් අරණේය. යම්සේ මෝතොම සියළු ඓශ්වර්‍යය් ලබන්නීද? ඒ ලබන්නට සුදුසු උපායක් කෙරෙමි යි සිතා එක්දවසක් බොධිසත්ත්වයන්වහන්සේ බිසෝවරුන් කරා ගොස් වැඳ "දෙවිවරුවහන්ස, දැන් අපි නුඹවහන්සේගෙන් සෙසුදේ තබා ආහරණ පමණක් නොලබම්හ, කුමක් හෙයින් අප කෙරෙහි උදාසීනභාවයෙන් ප්‍රමාදවූසේක්ද? ඉතා තදවූ සිත් ඇතිසේක්නු"යි කීසේක.

එබසට බිසවි කියන්නාහු එම්බා අමාත්‍යයෙනි, තොපට දෙන්නේ මම ලබන්නෙම් වේදැ"යි කිවුය. නමුත් නොලබන බව කියා රජ්ජුරුවන් වහන්සේ දැන් වනාහි මට කුමක් දෙනසේක්ද? එදවස් අතරමඟදී පළිතය දැක සිත අදහනු පිණිස මේ පළිතය සඵණිමය වීනම් මට මින් කෙතෙක් දෙන සේක්දැයි විවාළ කල්හි "මාගෙන් ලබන්ට නෝ කවරේදැ"යි කීයේය. දැන් වනාහි එදවස් ඒ ප්‍රවෘත්තිය රජ්ජුරුවන් ඉදිරියෙහි සිට කියන්නට හැක්කේ වී නම් කියවයි කී කල්හි කීයේය. රජහු සමීපයෙහි සිටියාවූ මම විචාරම් නුඹ වහන්සේ කිවමැනවයි කී කල්හි "යහපතැ"යි කියා බොධිසත්ත්වයන්වහන්සේ ඒ රාජදේවිය රජ්ජුරුවන්ට උපසථාතකොට සිටි කල්හි විචාරණසේක් "බිසවුන්වහන්ස, මම නුඹවහන්සේගෙන් කිසිවකුත් නොලබන්ට කාරණා කවරේදැ"යි විවාළ කල්හි බිසවු කියන්නෝ "එම්බා සඟය, මම ලබන්නෙම් වේද? නුඹවහන්සේව දෙන්නේය"යි කියා "රජ්ජුරුවන්වහන්සේ එ කල්හි වනයෙහි වාසයකොට එන්නාවූ මාඝීයෙහි එක් පළිතයක් දැක ඉදින් මේ පළිතය සඵණිමය වී නම් ඉන් මට කොපමණ දෙනසේක්ද?"යි විවාළෝමි. "ඒ ලබන්නට නෝ කවරෙක්ද? ඉදින් මා දෙන දෙයක් නැතැ"යි කියා නිරපෙක්ෂකව හැරියාද මුන්වහන්සේ මම නොහැර එබඳුවූ තැනැත්තන් වහන්සේ දැන් මට කුමක් දෙනසේක්ද යි යනාදීන් මේ ප්‍රවෘත්තිය ප්‍රකාශ කොට කියන්නී, එදවස් සඵණි පළිතය වී නම් දෙන සේක්දැයි විවාළාවූ මව් ඒ පළිතය මාගේ වචනයෙන් සඵණි පළිතයෙකැයි කී පමණක් විතා සවභාව

යෙන් සවණ්මයවූ වචන මාත්‍රයෙන් සැප දෙන්නට හැක්කාවූ පණිතයද පවා වචනයෙන් නොදුන්නේය. දැන් කුමක් දෙන්නේදැයි කී බිසවුන්ගේ තෙපුල් ඇසූ රජ කියනුයේ මෙසේ කිරා යමක් කරතොත් ඒම කියයුතු වන්නේය. නොකරණ දෙය නොකියයුතු වන්නේය. නොකරණ දෙය කියන්නාවූ අඤ්ඤයාගේ සවනාවය තත්වූ පරිද්දෙන් පණ්ඩිතයෝ දැන හැර තුවජ්ජකොට සිතති. අඤ්ඤයෝ වචනමාත්‍රයටම සතුටු වන්නාහුසයි කීවාය. රජ්ජුරුවන්ගේ බස් ඇසූ රාජදෙවී රජ්ජුරුවන්ට නමස්කාරකොට කියන්නී "රාජපුරුෂයා නන් වහන්ස, නුඹවහන්සේ සවභාව ධර්මයෙහි පිහිටියේක් වී නම් නුඹවහන්සේට නමස්කාර වේවායි යමෙක් නුඹවහන්සේගේ රටින් නෙරපන ලද බැවින් ව්‍යසනය පැමිණියේද? ඔහුගේ චිත්තය සත්‍ය වචනයෙහි රමණය කරන්නේ වේදැ"යි මෙපරිද්දෙන් ඒ රජගේ ගුණ කථනය කරණ කල්හි ඒ මහබෝ සතාණන්වහන්සේ ඒ රාජදේවියගේ ගුණ කියනසේක් රජ්ජුරුවන් වහන්ස, මේ ලෝකයෙහි මේ ස්ත්‍රියක් දුරිද්‍රසභාව ඇත්තීද? ඕතොම දුරිද්‍රයන්හටම වඳින්නීය. කීර්තත්වූ උපභොග පරිභොග සම්පත්තියෙන් ආඪ්‍යවූ යම් ස්ත්‍රියක් ඇද්ද? ඕතොම එබඳුවූ ආඪ්‍යයන්හට වඳින්නීය. යම් ස්ත්‍රියක් කීර්ති සම්පන්නවූ නම් එබඳු පුරුෂයන්හටම වඳින්නීය. එසේහෙයින් කල්‍යාණවූ රාජ දේවීද නුඹවහන්සේට අකුශල නෙයින් උතුම්වූ භාර්‍යා වන්නීය"යි කියා බොධිසත්ත්වයන්වහන්සේ නැවත රජ්ජුරුවන්වහන්සේ වෙතෙහි දුක්ගෙණ වාසය කරණ කල්හිද නුඹවහන්සේ හා සමාන දුකට පැමිණ වාසය කළ බිසවුන්ට සත්කාර සම්මාන නොකරන්නට සුදුසු නොවන්නේය යි කියා රාජදේවියගේ ගුණ වර්ණනාකොට ගියේය. රජතොම ඒ වචනයෙන් සතුටුවූයේ ඒ බිසවුන් තමන්ට කළගුණය සිහිකරමින් "එම්බා පණ්ඩිතයෙනි, තොපගේ වචනයෙන් මේ දේවියගේ ගුණ සිහිකරම්"යි කියා ඒ බිසවට සියලු ඓශ්වර්‍යය දුන්නේය. දේවියගේ ගුණ ප්‍රකාශ කළ බොධිසත්ත්වයන්වද බොහෝ සතුටුවූ රජ්ජුරුවෝ මහත් සැපත් ඔබට දුන්නේයයි ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ දෙශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍ය ධර්මදෙශනාව ප්‍රකාශකොට පූර්‍වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේකි.

චතුස්සත්‍යයාගේ අවසානයෙහි ඒ දෙමහල්ලෝම ශ්‍රොතාපත්ති ඵලයෙහි පිහිටියාහුය. එකල්හි බරණැස් රජ්ජුරුවෝ නම් මේ කෝළඹිපුත්‍රයාය, ඒ රාජදේවිතොම මේ උපාසිකාවය, පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදාළසේකි.

---

## 314 කුටි දූෂක ජාතකය

විවද කරුණාවෙන් සිහිල්වූ ලය ඇති ප්‍රඥාප්‍රජ්‍යොතයෙන් තසනලද මොහාන්ධකාර ඇති තෙලොක සවාමීවූ ජාතිකාන්තාරාදීන් සත්ත්වයන් තරණය කොට අමෘතමහා නිර්වාණ ක්ෂෙමභූමියට පමුණුවන හෙයින් ශාස්තෘ නම් සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයානන් වහන්සේ ප්‍රාකාර ගොපුර ප්‍රාසාදාදියෙන් හා මධුරී මධුගන්ධි ගන්ධින ඡායාදක සම්පන්න රම්‍ය භූමිභාග ඇති ජේත වනාරාමයෙහි මෛත්‍රී කරුණා මුදිතා උපෙක්ෂා ලක්ෂණ චතුර්විධ ආර්‍ය්‍ය ඊර්‍ය්‍යා

පථ විහරණයෙන් යුක්තව වාසය කරන්නාවූ එක් සමයෙක්හි මහාකාශ්‍යප සථවිරයන් වහන්සේගේ පන්සල දැවූ එක් සාමණේරයකු අරභයා මේ ජාතකය වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

මේ ජාතක කථාවස්තුවට නිදානවූ විස්තර කථාවස්තුව රජගහනයෙහි පනළවිය ඒ කුවිදූසක ක්‍රියාව යම්සේ සමයෙක්හි වීද? එසමයෙහි මහාකාශ්‍යප සථවිරයන්වහන්සේ රජගහනුවර ගොවරග්‍රාම කොට වනමධ්‍යයෙහිවූ පන්සලක වාසයකරණසේක. එතැන්හි වාසයකරන්නාවූ මහාකාශ්‍යප සථවිරයන් වහන්සේට බාල සාමණේරයන් දෙදෙනෙක් වතාවත් කරන්නාහ. ඔවුන් දෙදෙන අතුරෙන් එක් සාමණේරයන් වහන්සේ කෙණෙක් තෙරුන්වහන්සේව සුවව කිකරුව උපකාරීව චාරිත්‍ර සීලයෙන් යුක්තව වාසය කරති. අනික් සාමණේරතෙම එබඳු ගුණධර්මයන් නැතිතෙයින් දුශ්චාරිත්‍රව වෙසෙයි. ඉන් වත්සම්පන්න සාමණේරයන් විසින් කළ යම් වත් පිළිවෙත් ආදියක් අනික් සාමණේරතෙම තමා ගුණමකු නෙයින් තමා කළ දෙයක් මෙන් තෙරුන් වහන්සේට අඟවන්නේය. වත් සම්පන්න සාමණේරයන් විසින් උදැසනක්සේ දැහැටි දිය එලවා නිබූ කල්හි තෙරුන්වහන්සේගේ සමීපයට ගොස් වැඳ "සඩාමිනි, දැහැටි දිය මා විසින් එලවා තිබෙනලද දැහැටිකිස සපයා වදාළ මැනවැ"යි යනාදීන් කියන්නේය. අනික් වත්සම්පන්න සාමණේරයන් විසින් උදැසනක්සේ නැගිසිට පිරිවෙණ ඇමදි කල්හි තෙරුන්වහන්සේ පිවත නික් මෙන වේලාවෙහි ඒ සෙවඡාවාරී අනාචාර සාමණේරතෙම මුස්නක් ඇරගෙණ ඇතම්තා පැහැර තමා විසින් ඇමදියාක් මෙන් තෙරුන්වහන්සේට අඟවන්නේය. එපරිද්දෙන් නිරන්තරයෙන් අප වෙනෙසන ඔවුන් එක් දවසක් වෙනෙසෑ ඔවුන්ගේ වාටු ක්‍රියාව ප්‍රකාශ කෙරෙමිසි සිතා ඉක්බිති එක් දවසක් ඔහු ඇතුළුගමින් වළඳ අවුත් විහාරයෙහි නිදාවට පැමිණි කල්හි ම වත් සම්පන්න සාමණේරයෝ තනන පැන් උණුකොට අනික් සාමණේරයන්ට නොපෙණෙනසේ පැන් තනන තැන පිට කොටුවේ තබා අනික් මහා භාජන යක නැලියක් පමණ දියවත්කොට උදුනෙහි තිබුවාය. සැතපුනු සාමණේර තෙම පීබිද ගිනිහල්ගෙට ගොස් උදුනෙහි කකියා උණුසුම් නැගෙන දිය දුරදීම දැක තොල උණුවන්නේ දිය පිරුණු භාජනයෙක් වනැයි සිතා තෙරුන් වහන්සේ සමීපයට ගොස් "සඩාමිනි, මා විසින් තනන පැන් සම්පාදනය කරණ ලද්දේය. පැන් සැනසුව මැනවැ"යි කීයේය. තෙරුන්වහන්සේ ඒ සැබවයි සිතා සාමණේරයා එක්ව තනන කොටුවට වැඩ "දිය කොයිදැ"යි විචාරා වදාළ සේක. එවිට සාමණේර ශීඝ්‍රව ගිනිහල්ගෙට ගොස් උදුනෙහි තුබූ සිස් භාජන යෙහි කෙනෙස්ස එලුයේය. එසේ එලූ කෙනෙස්ස භාජන සිස් බැවින් තට තට යන අනුකරණය පැවැත්තේය. ඒ කාරණයෙන් ඒ සාමණේරයාට එතැන්පටන් උළුඛාශබ්දයා ය යි ව්‍යවහාර විය. ඒ වේලෙහි වත් සම්පන්න සාමණේරයෝ පිට කොටුවෙහි පළමුවෙන් සපයාතිබූ උණුපැන් ගෙණවුත් තබා "සඩාමිනි, පැන් සැනසුව මැනව"යි කියා පැන් සැනැස්වූසේක.

ඉක්බිති තෙරුන්වහන්සේ ඒ උලුඛක ශබ්දක සාමණේරයාගේ අනාචාර භාවය සිත සිතා උන්වේලෙහි සවස වතාවත් කරන්ට ආ සාමණේරයාට අවවාදකොට වදාරණසේක් "ඇවැත්නි එම්බා සාමණේරය, මේ ශාසනයෙහි

මහණදම් පුරන්නහු විසින් තමා කළ දෙයත් මෙමා විසින් කළ දෙයයි කියන් තව වටනේය. අන්පරිද්දෙකින් අනුන් කළ දෙය තමා විසින් කළ දෙයක් බඳුකොට කීයේ චිතම් දැන දැන බොරුකීම නිමිත්තකොට ගෙණ වාක්දුශ්චරිත වෙයි. මුසාවාදයෙන් අකුසල සිඛවන්නේය. මෙයින් මදු මෙබඳු අහුත වචන යක් නොකියව"යි අවවාදකොට වදුළසේක. ඒ අවවාදඤව නොවන සාම ණෙරතෙම තෙරුන් වහන්සේ කෙරෙහි කිපි සිත් ඇත්තේ දෙවන දවස් තෙරුන් වහන්සේ සිඟාවඩතා කල්හි එක්ව නොගියේය. එත් සම්පන්න සාම ණෙරයෝ තෙරුන් වහන්සේ කැටුවම ගියේය. සිඟන්ට වඩිනා තෙරුන් වහන්සේ නොගිය උලුඩුකා ශබ්දයා සාමණෙර තෙරුන් වහන්සේට උපසථාන කරණ එක කුලගෙයකට ගොස් සිටි කල්හි ඒ කුලගෙයි ඇත්තෝ විචාරන්නාහු "සාමීනි, අපගේ භාගයවන්වූ මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ කොයිදැ?"යි විචාළ කල්හි "ගිලන් භාවයකින් විහාරයෙහි වැඩහිදිනාහ"යි කී කල්හි "සාමිනි ඊට අපගෙන් කුමක් ලබන්ට සුදුසුදැ?"යි විචාරණ ලද්දේ "මෙතම් මෙතම් දෙයක් දුන මැනවැ"යි තමා කැමති කැමති දෙය ඉල්වාගෙණ කැමති තැන් වලදී සෙවඡාවූ පරිද්දෙන් තෙමේ අනුභව කොට ගියේය.

දෙවෙනි දවස් තෙරුන් වහන්සේ එම කුලගෙට සිඟන්ට වැඩිකල්හි ඒ කුලගෙයි වැස්සෝ කියන්නාහු "සවාමීනි, ඊයේ දවස් නුඹවහන්සේ ගිලන් භාවයකින් විහාරයෙහි වැඩ උන්හ යි යනු අසා නුඹවහන්සේගේ විහාරයෙන් වැඩි සාමණේරයන් වහන්සේගෙන් අසා ගිලන් බෙහෙත් ආදිවූ දෙය ඒවුම්හ. ඒ නුඹවහන්සේට ප්‍රයෝජනවීදැ?"යි විචාළාහුය.

තෙරුන් වහන්සේ එබසට මුවෙන් නොබැණ ආහාර කෘත්‍යය කොට විහාරයට වැඩ සවස් වේලෙහි තමන්වහන්සේට උපසථාන කරන්ට ආවාවූ සාම ණෙරයා සමීපයට කැඳවා "ඇවැත්නි, අසවල් ගම අසවල් කුලෙහි ඇත්තන් ගෙන් මෙනම් මෙනම් දෙයක් දුනමැනවැ යි ඉල්වාගෙණ තා විසින් අනුභව කරණ ලද්දේදැ?"යි විචාරා "එපරිද්දෙන් චිතවාගෙණ අනුභව කිරීම ශ්‍රමණ සාරූප්‍ය නොවන හෙයින් නුසුදුසු වන්නේය. එසේහෙයින් මතු මෙබඳු අක්‍රිය නොකරව"යි අවවාද කොට වදුළසේක.

එවේලෙහි අවවාදඤම නොවන්නාවූ අනාචාරවූ සාමණෙරහොම තෙරුන් වහන්සේ කළ අවවාද පමණකට ආඝාත බැඳගෙණ සිතන්නේ 'මේ තෙරුන් වහන්සේ ඊයේ දවස් දිය පමණක් නිසා මා හා විවාද කළසේක. අද දවසත් තමන්වහන්සේනේ කුලූපගවූ උපාසකයන්ගෙන් අහර පමණක් වැළඳුවා නො ඉවසනසේක් නැවතත් කලන කරණසේක. ඉදින් වන්නාටය. මුන්වහන් සේට කටයුත්තක් දනිමි"යි දෙවෙනි දවස් තෙරුන් වහන්සේ පිඬුසිඟා වැඩිය කල්හි වියරුහුනු එකකුමෙන් මුගුරුකඩක් අැරගෙණ වලන් බිඳ පන්සලත් ගිනිලා ගියේය. ඒ අකතීව්‍යකාරී පවිටු සාමණෙරතෙම ඒ අත්වභාවයෙහි ශරීරය බිඳී ගන්නා පමණ අහරක් නොලැබ සම් මස් නහර වියලී මනුෂ්‍ය ප්‍රේතව කාලක්‍රියා කොට අවීචිමහනරකයෙහි උපන්නේය. ඔහු විසින් කළාවූ ඒ දුෂ්ට ක්‍රියාව මහජනයා මඩ්‍යයෙහි ප්‍රකාශවිය.

ඉක්බිත්තෙන් එපවත් ඇසූ භික්ෂූන් වහන්සේගෙන් සමහරක්දෙනා වහන්සේ රජගහනුවරින් සැවත්නුවරට ගොස් සහාග භික්ෂූන් වැඩහිදිනා

විහාරවල පාසිවුරු තැන්පත්කොට තබා බුදුන් සමීපයට ගොස් වැඳ එකත් පස්ව උන්නාහුය. සම්මුදයන් වහන්සේ ඒ භික්ෂූන් හා පිළිසඳර කථාකොට "කොතැන්හි වාසයකොට අවුදැ?"යි විචාරා වදාළ කල්හි "සාමීනි, බුදුරජාණන් වහන්ස, රජගහනුවර සිට ආමිහ"යි කීවාහුය. "එතැන්හිදී තොපට අවවාද කරණ ආචාරීහු කවුරුදැ?"යි විචාරා වදාළසේක. "සාමීනි, මහාකාශ්‍යප සථවිර යන් වහන්සේය"යි දැන්වුවානුය. මහණෙනි, මහාකශ්‍යප සථවිරයන්ට සැප දැ?"යි විචාරා වදාළසේක. "එසේය සාමීන්වහන්ස, උන්වහන්සේ සැපසේ වාසය කරණ සේක. එහකුදු වුවත් උන්වහන්සේගේ සඩ්විහාරික සාමණෙර යෙක් අවවාදයෙහි කිපී එම කාශ්‍යපසථවිරයන් වහන්සේගේ පන්සල හිතිලා ගියාවේදැ"යි දැන්වූසේක.

එසේ ඇසූ බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "ඒ මහාකාශ්‍යප සථවිර යන්ට ඒ නුවණ නැති තුවජ සාමණෙරයා හා එක්ව වාසය කිරීමට වඩා හුදු කලාව විසීම යහපත් වන්නේය"යි දම්පියාගෙහි මේ ගාථාවෙන් වදාළසේක.

"චරං චෙ නාධිගච්ඡෙය්‍ය සෙය්‍යං සදිසමත්තනො,
එකචරියං දළ්හං කයිරා නත්ථි බාලෙ සහායතා"

යන මේ ගාථාව වදාරා නැවත ඒ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට "මහණෙනි, එතෙම කුවිදූෂකයෙක් වූයේත් අවවාද දුන්නවුන්ට කිපුනේත් දැන් මතු නොවෙයි, පෙරත් අවවාද දුන්නවුන්ට කිපී කුවිදූෂක වූයේවේදැ"යි වදාරා එකල්හි එයින් වතීමාන කථාව අසෙවිත්වපතති කොට ගෙණ එසමණයෙහිම පූවේනිවාසානුස්මෘති ඥානයෙන් අතීතකාල ප්‍රවෘත්තිය දැන වදාරණ සම්මුදා රාජොත්තමයානන් වහන්සේ මේ කුවිදූෂක ජාතකයෙහි අතීතකාල ප්‍රවෘත්තිවූ කථා ප්‍රබන්ධය ගෙණහැර දක්වා වදාරණසේක් "එම්බා මහණෙනි, යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්තනම් රජ්ජුරුකෙණෙකුන් චතුර්විධ සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජිතය කෙරෙමින් රාජධර්මයෙන් අකොප්‍යව රාජ්‍යය කරණ සමයෙහි පුරණ ලද බොධිසම්භාර ඇති මහබෝසතාණෝ සිංහිලි නම් පක්ෂී ජාතියෙහි ඉපිද වැඩිවිය පැමිණ හිමාලය වනප්‍රදෙශයෙහි තමන්වහන්සේට සිත්කළුවූ වතී කාලයෙහි නොතෙමෙනසේ කැදැල්ලක් කොටගෙණ වාසය කරන්නේය.

ඉක්බිත්තෙන් එක් වානරයෙක් වතීකාලයෙහි අවිච්ඡින්නධාරායෙන් නොපායා වස්නා කල්හි සීතයෙන් පෙළෙනා ලදුව වෙව්ලමින් දතින් දත් කා පහරමින් අවුත් බොධිසත්ත්වයන් සමීපයෙහි උන්නේය. බොධිසත්ත්වයන් වහන්සේ ජීවිත පීඩාවෙන් පෙළෙන්නාවූ වදුරු දැක ඔහු හා කථා කරණසේක් "එම්බා වානරය, තාගේ ඉස්මුදුන අතුල පතුල මනුෂ්‍යයන් බඳුවූ සටහන් ඇත්තේය. එසේ කල්හි තාගේ වාසය කිරීමට සුදුසු ගෙයක් නැත්තේය. කුමක් නිසාදැ?"යි විචාළසේක.

ඒ අසා වානරයා කියන්නේ "එම්බා සිංහිලි පක්ෂිය, ඒ සැබෑමය, මාගේ ඉසමුදුන අතුල් පතුල් මනුෂ්‍යයන්ට බදුවූයේය. එහකුදුවුවත් මනුෂ්‍යයන් කෙරෙහි යම් ප්‍රශ්නයෙක් උතුම් වන්නේද? එබදුවූ කල්පනා බුද්ධියෙක් මා කෙරෙහි නැත්තේය. එසේ හෙයින් මනුෂ්‍යයන් විසින් කටයුතුවූ ක්‍රියාවක් මා විසින් කොට ගන්ට නොහැක්කෙමි.

එබැවින් වාසය කරන්ට ගෙයක් කොටගත නොහෙමි." කීයේය. ඒ අසා බොධිසත්ත්වයන් වහන්සේ වදාරණසේක් "එම්බා වානරය, මේ ලෝකයෙහි

එකඟකොට නොපිහිටුවන ලද සිත් ඇති හෙයින් යුහුව පෙරළෙන සුළු සභාව ඇති ළඟුවූ ප්‍රවෘත්ති ඇති කෙළෙහිගුණ නොදන්නා හෙයින් මිත්‍රද්‍රොහිවූ තිරන්තරයෙන් අඛණ්ඩ කොට රක්‍ෂා කරණ ශීලාචාරාදී ගුණධර්මයෙක් නැති අඥතයාට කිසිකලෙකත් කායික චෛතසික සැපයට කාරණයක් නොවන් නේය. එසේහෙයින් යහළු වදුරුනෙනි, ප්‍රඥව උපදවා ගත්තා පිණිස තමාගේ දුශ්ශීල සභාව පහකොට ශීලාදී ගුණධර්මයෙන් යුක්තව ඒ ශීලාදී ගුණ රක්‍ෂා කොටගෙණ ශීත සුළඟින් පීඩා නොවී වාසය කිරීමට සුදුසු උපායක් කොට ගෙණ'' යි යනාදී අවවාද කළසේක.

ඒ අවවාද අසා සභාවයෙන් ගුණමකු දුෂ්ට වානර ඝාතන්නේ "මූ තෝ තෙමෙන තෙන වුන් බැවින් තමන්ගේ අහංකාර දක්වා පරිභව බෙණෙයි" කියා උපන් ක්‍රොධ චෙතනාවෙන් "ඉදින් මුන් දැන් මේ කැදැල්ලෙහි සැපසේ ඉන්ට සලස්සන්නෙම් වේදැ" යි බොධිසත්ත්වයන් අල්වාගන්නා පිණිස කැදැල්ලට පිනු යේය. බොධිසත්ත්වයෝ කැදැල්ලෙන් ඉගිල එක්තෙනකට ගියේය. ඒ දුෂ්ට වානරතෙම කැදැල්ල සුන්බුන්කොට ගියේ වේදැ යි වදුරා ශාස්තෘවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මේ කුවිදූෂක ජාතක ධර්මදෙශනාව පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

එකල්හි ඒ කැදැල්ල බිඳු වානරයා නම් දැන් මේ කුවිදූෂක සාමණේරය, සිංගිලි පක්‍ෂිවූයේ දැන් තිලෝගුරු බුදුවූ මම්ම වේදැ යි තමන් වහන්සේ ගෙණ හැර දක්වා වදාළසේකි.

---

## 315
## දද්දභ ජාතකය

මේවද මෙසේ භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි තීර්‍ථකයන් අරභයා මේ ජාතකය වදාරණ ලදී.

**හේ කෙසේද? යත්,**

ජෙතවනාරාමය සම්පයෙහි තීර්‍ථක පරිබ්‍රාජකාචාරු වැද කණ්ඨක තාපසව පඤ්චතාපන තාපස කුක්කුර වෘතය යනාදීන් නොයෙක් තපස් කොට ඉඳිනාහ.

ඒ දුටු නිඝණ්ඨ වහන්සේ සර්‍වඥයන් වහන්සේ අතින් විවාරණසේක් "සවාමීනි මුන් රහිතාවූ තපස් මහා උග්‍රතපස්ව මුන්ට මින් වන මාංශඵල විපාක යෙක් ඇත්දැ?" යි විචාළසේක සර්‍වඥයන් වහන්සේ වදාරණසේක් "මින් මුන්ට වන විපාකයෙක් නැත. මේ නිකම්ම තුසඡ දෙයක පොළොව පෙරළෙයි කියා දිවූ සාවා මෙනැ" යි වදාළසේක.

"ඒ කෙසේදැ?" යි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේකි.

**ඒ කෙසේද? යත්;**

පසිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ සිංහව ඉපිද වාසය කරණ කල්හි

එක් සෘවෙක් තල්ගස් හා බෙලිගස් ඇති වනයෙක වාසය කෙරෙයි. තල් පත් කන්නක් යට වැදහොත් තැනැත්තේ සිතන්නේ "පොළොව පෙරළීගන ඒතම් කුමක් කෙරෙම්දෝ හෝ"යි සිතාගෙණ වැදහොත්තේ බෙලිගෙඩියක් තල් පත් කන්නක් පිට වැටිණ.

සෘවා තමා සිතූ සිතිවිල්ල නියාවට "පොළොව පෙරළීගෙණ එති" සිත් හයින් දිවන්ට වන. ඒ දුටු සෘවෝ "තෘ දිවන්නේ කුමක් නිසාදැ?"යි විවාළ කල්හි සෘවා කියන්නේ "කිම්ද? තොප විවාරන්නේ පස්සේ පොළොව පෙරළී ගෙණ එයි. එසේ නෙයින් දිවම්"යි කීහ. ඒ දුටු අනික් සෘවුන් විවාරා සෘවෝ දහසෙක් එක්ව දිවන්ට වන්හ. එවිට සෘවුන් දිවන්නානු දැක මුවෝ සෘවුන් අතින් විවාරා "සැබෑ"යි දිවන්නාහ. මුවන් අතින් විවාරා ඌරෝ දිවූහ. ඌරන් අතින් විවාරා ගෝණෝ දිවූහ. උන් අතින් විවාරා මීමූ දිවූහ. උන් අතින් විවාරා හෙරි දිවූහ. උන් අතින් විවාරා දිවියෝ වලස්සු ගවරු කඟවෙතු ඇත්තු, අස්සු ව්‍යාඝ්‍රයෝ, සිංහයෝ ඇතුළුවූ සිවුපාවෝ උනුන් අතින් විවාරා "ඇත්තමය"යි සිතා සතරයොත්නෙක ගැවසී සිටියාවූ සිවුපා සේනාව මූදුබත් වන්ට දිවූහ.

මෙකියන සිවුපාවුන් දිවන තෙතට සමීපයෙහි වසන්නාවූ සිංහයෙක් සිවුපාවුන් දිවන කාරණා විවාරම් සිතා තමා වැදහොත් පර්වතයෙන් එලියට පැන මහත්වූ සිංහනාද අසා සිවුපාවෝ භයගෙණ සිටියාහ. භයින් සිටියාවූ සිවුපාවුන් අතින් දිවන කාරණා විවාරම් සිතා විවාළ කල්හි "පොළොව පෙරළීගෙණ එන හෙයින් දිවම්"යි සිංහයෝ කීහ." තොපට කීවෝ කවුරුදැ?"යි සිංහයන් විවාළ කල්හි "ව්‍යාඝ්‍රයන්ගෙන් ඇසුම්හ"යි කීහ. ව්‍යාඝ්‍රයෝ "ඇතුන්ගෙන් ඇසුම්හ"යි කීහ. ඇත්තු "අසුන්ගෙන් ඇසුම්හ"යි කීහ. අස්සු "කඟවෙතුන්ගෙන් ඇසුම්හ"යි කීහ. කඟවෙතු "ගවරුන්ගෙන් ඇසුම්හ"යි කීහ. ගවරු "වලසුන්ගෙන් ඇසුම්හ"යි කීහ වලස්සු "දිවියන්ගෙන් ඇසුම්හ"යි කීහ. දිවියෝ "හෙරින්ගෙන් · ඇසුම්හ"යි කීහ. හෙරි "මීමුන්ගෙන් ඇසුම්හ"යි කීහ. මීමූ "ගෝණුන්ගෙන් ඇසුම්හ"යි කීහ. ගෝණෝ "ඌරන්ගෙන් ඇසුම්හ"යි කීහ. ඌරෝ "මුවන්ගෙන් ඇසුම්හ"යි කීහ. මුවෝ "සෘවුන්ගෙන් අසුම්හ"යි කීහ. සෘවුන් ලඟට ගොස් "තොපට කීවෝ කවුරුදැ?"යි විවාළ කල්හි "මේ සෘවා අපට කීයේය"යි සෘවෝ තොරතුරු පැහැ.

බොධිසත්ත්වයන් ඒ සෘවා කරා ගොස් "සැබෑද? පොළොව පෙරළී එන්නේය"යි විවාළ කල්හි "මම දිටිමි. සවාමීනි, සැබව මම මුදුබඩ තල්වනයෙක හා බෙලිවනයෙක් කෙරේ වාසය කෙළෙමි. එතැන් පටන් පොළොව පෙරළෙන්ට වන්නේය"යි කීහ බොධිසත්ත්වයෝ සෘවා පිට හිඳුවාගෙණ සෘවා කී වචනයට සිංහයා නොපැහැ සෘවා බිම සිටුවා "කොතන පවන් පොළොව පෙරළෙන්ට වනැ යි කියව"යි විවාළාහ.

"මම එතනට ගොසින් පාන්ට භය ඇත්තෙමි" කියා නොගියේ බොධිසත්ත්වයෝ "නෝ නොබා අසවල් තෙනය යි කියයි" "දැන් එතනට ගොසින් පානට භය ඇත්තෙමි. අසවල් තල්ගසමුල තල්වක්කන්නක් යට වැදහොත් තෙමි, එතන ඵටනැ"යි කීහ.

බොධිසත්ත්වයෝ එතනට ගොසින් බලා සිතන්නාහු "සාවා මේ තල්වක් කන්නට යව වැදහොත්තේ පොළොව පෙරළීගෙණ ඒ නම් මම කොයියම් දෝ හෝ සි සිත සිතා වැදෙනොත් කල බෙලි ගෙඩියක් තල්වක්කන්නක් පිට වැටුනු අඩ අසා හසින් පොළොව පෙරළෙති සිතාගෙණ දිවිනියාව"යි සිතා දෙවනුව සිවුපා සමූහය උත් තැනට පැන සිවුපාවුන්ට කියන්නාහු "සාවා තමා කෙරෙහි හයින් කී පමණක් විනා ඇත්තෙක් නොවෙයි." කියා සිවුපාවුන් ඒ ඒ තැනට යවූහ.

ඒ අර්ථය ප්‍රකාශකරණ සම්බුදුයන් වහන්සේ "මහණෙනි, සාවා කී බසින් එතෙක් සිවුපාවෝ පරීක්ෂා නොකොට මුදුබත්වන්ව ගිය ගමනේ සිංහයා එතන සිට පරීක්ෂාකොට කැවතුහෙයින් විනා මුදුබත්වන් නොවේද? එමෙන් මුන්ගේ වුතය කිසි විපාකයක් දීලිය නොනෙයි කියා වදාරා මේ දද්දභ ජාතකය නිමවා වදාළසේක. එ සමයෙහි සිංහව උපන්නෙමි බුදුවූ මම්ම වේදැ යි වදාළසේක.

---

## 316 බ්‍රහ්මදත්ත ජාතකය

එවද මෙසේ පූජ්‍යවූ සම්බුදුයන් වහන්සේ අලවිහුවර නිසා අන්ගාලව නම් දේවාලයෙහි වාසය කරණ සේක් කුට-ශික්ෂාපදයක් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්;**

මෙහි වර්තමාන කථාව යට කී මණිකණ්ඨ ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

"මෙය වනාහි භික්ෂූන් වහන්සේ කුළුපග උපාසක වරුන් අතින් උන් නොකළමනි කරවා ලාභය ඉල්වීම කටයුතු නොවෙයි, භික්ෂූහු නම් දහමෙන් සෙමෙන් ලත් දෙයක් විනා දහවඩ උපාසකවරුන්ගෙන් ඉල්වූ කල විෂෙපවෙති. පෙර උත්තමයෝ පවා එක පත්කුඩයක් හා වහන් සඟළක් ඉල්වාගත නොහී දෙලොස් අවුරුද්දක් ලජ්ජාවෙන් උන්නෝවේදැ;"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

පිටහිය දවස උත්තරපඤ්චාල රට කම්පිල්ලනුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ බ්‍රාහ්මණව ඉපිද පඤ්චකාමයෙහි ආදීනව දැක තාපස්ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලයවනයට වැඩ වාසය කරන්නාහු ලුණු ඇඹුල් සෙවුනා පිණිස උත්තරපඤ්චාල නුවරට ආවාහු රජ්ජුරුවන්ගේ මඟුල් උයනෙහි වාසයකොට උදැසනම නුවරට සිඟා ආහ. රජ්ජුරුවෝ තාපසයන්ගේ ඊර්ය්‍යාපථයෙහි පැහැදී වස් සාරමස උයනේ වාසය කරණ නියාමයෙන් ආරාධනා කොට තාපසයන් පවරා උපස්ථාන කළාහ.

තාපසයෝ වස් අනන්තයෙහි හිමාලය වනයට යන්ව අභිප්‍රාය ඇතිව රජ්ජුරුවන්ගෙන් එක්පට වහන්සඟළක් හා පත් කුඩයක් ඉල්වා ගන්නා පිණිස අභිප්‍රාය ඇතිව "රජ්ජුරුවන්ට කන්නලව් කියමි"යි සිතා යම් කෙනෙකු අතින්

ඉල්වීම නම් ඇඩිම දෙන තැනැත්තෝ දෙවෙනිව "නැතැ යි" කිවුතම් ඒ දෙවෙනි ඇඩීමය. මේ අප දෙදෙනාගේ අඩන ඇඩිම් බොහෝ දෙන මැද කිම් කටයුතු නොවෙයි කියා, "රජ්ජුරුවෙනි, රහස කටයුත්ත තනිව කියන්නා අභිප්‍රාය ඇත්තම්හ" යි කිහ.

රජ්ජුරුවෝත් "ලඟසිටියවුන් පහකරවා වදුළ මැනවැ" යි කිහ. තාපසයෝ කියන්නාහු "යම් කෙණෙකුන් අතින් යමක් ඉල්ලූකල ලැබේ හෝ නොලැබේ නෝ ඉදින් මා ඉල්ලූ දෙය නැතැ යි කිවුතම් රජ්ජුරුවන් සිත් කලකිරී මෛත්‍රී මදවෙයි සිතා පසුව දන්නෙම් වේදැ" යි සිතා කියා රජ්ජුරුවන් යවූන මෙම නියාවෙන් දවසින් දවස කියම් යි උත්සාහ කොට දෙලොස් අවුරුද්දක්ම ඉක්මූනේය.

රජ්ජුරුවෝ තාපසයන් වහන්සේ මාගෙන් ඉල්වීමක් ඉල්වන්ට සිතන්නේ දෙලෙස් අවුරුද්දක. අද මම උයනට ගොසින් තාපසයන් වහන්සේට බොහෝ දවසක් තපස්කොට ගිහිඝරයි ආලය ඇතිව මා අතින් රාජ්‍යය ඉල්වන අභිප්‍රාය ඇතිවිය. රජදරුවන්ගෙන් රාජ්‍යය ඉල්වීම නම් කටයුතු නොවෙයි, රජදරුවෝ නම් රාජ්‍යලෝභය ඇත්තෝය යි කියා ලජ්ජාවෙන් නොයිල්වන දෙයක්වත, අද රාජ්‍යය ඉල්වූවත් දෙම්. රාජ්‍යයෙන් අඩියක් ඉල්වූවත් දෙම්, සිතා තාපසයන්වහන්සේ කරා උයනට ගොස් වැද එකත්පස්ව හිඳ "ස්වාමීනි, මා අතින් නුඹවහන්සේ ඉල්වීමක් ඉල්වන්නේ දෙලොස් අවුරුද්දෙක. අද නුඹවහන්සේ මාගේ රාජ්‍යය ඇතුළුවූ අභිප්‍රාය යම්දෙයක් ඉල්ලුව මැනව, දෙම් කිහ.

එවිට තාපසයන් වහන්සේ "මහරජ, මා ඉල්වූ දෙයක් දෙවුදැ" යි කියා විචාරා රාජ්‍යය දෙම් කියම්. සෙසු වස්තුවක් නොදෙම් දැ?" යි රජ්ජුරුවන් කී කල්හි එවිට තාපසයෝ කියන්නාහු "මහරජ, අපි හිමාලය වනයට යන්නා අභිප්‍රාය ඇත්තම්හ. වහන්සඟළක් හා පත්කුඩයක් ලබන්නා කැමැත්තම්හ" යි කිහ. රජ්ජුරුවෝ කියන්නාහු "මෙපමණක් පසුව මට මෙතෙක් දවස් නොකියේ ඇයිදැ?" යි කිහ. මෙපමණ සඳහා මිනිසුන් වෙතෙසෙන්නේ ඇයිදැ යි සිතා නොකීම් කියා තාපසයෝ කියන්නාහු "මහරජ, යම් කෙණෙකුන්ගෙන් නැතැයි කියා ඉල්වීම එක් ඇඩීමෙක, ඉල්ලූකල නැතැයි කීම එක් ඇඩීමෙක. මෙ අප දෙදෙනාගේ ඇඩිම බොහෝදෙනා දැකීම නපුරුයි සිතා තනිව කියම් මැ" යි කියේය. "පඤ්චාලවාසී ජනයන්ට උත්තමවූ රාජෝත්තමය, යම් කෙණෙකුන් අපට යමක් ඉල්වූකල බොහෝ නොලැබෙයි සිතා නොයිල්වූයේය. අනික් කන්තලවිවෙක් මේ මිසක් නැත, මෙපමණක්ම අපව සැහෙයි' කිහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "නුඹවහන්සේ කී මේ ගාථාවෙහි ප්‍රසන්න වූ මම නුඹවහන්සේට රාජ්‍යයත් දෙම්, රථ දහසකුත් දෙම්, නුඹවහන්සේ කැමති පරිද්දෙන් මෙකී දෙය ප්‍රයෝජන උවමැනවැ" යි කිහ.

එවිට තාපසයෝ කියන්නාහු "මහරජ, පඤ්චකාමයෙහි ආදීනව දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලය වනයට යෙමි. එසේ හෙයින් අපට වස්තු වෙන් ප්‍රයෝජන නැත. මේ පත්කුඩය හා වහන් සඟළත් පමණැ" යි කියා

අරහගණ රජ්ජුරුවන්ට "පන්සිල් රකුව" යි අවවාද දී හිමාලය වනයට ගොස් පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් කම්වූ පරිද්දෙන් බඹලොව ගියහ යි වදාරා මේ බ්‍රහ්මදත්ත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ තම් ආනන්දසථවිරයෝය, නාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේකි.

---

## 317 චම්මසාටක ජාතකය

තිවද මෙසේ පුජාර්හවූ සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාම යෙහි වැඩවසන සමයෙහි චම්ම-සාටක නම් පරිබ්‍රාජකයකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්**

චම්මසාටක නම් පරිබ්‍රාජකයෙක් සැවැත්නුවරට යන්නාහු පොර අන්නාවූ එළුවන් දෙන්නකු දැක නවතින්ට යසි සිටියාහ. ඉන් එළුවෙක් පරිබ්‍රාජකයන් දැක පසුබස්නේය, පරිබ්‍රාජකයෝ තමන්ට ආදර කෙරෙතියි සිතා කොයිත් නොගොසින් සිටියාහ. එළුවා දිවගෙණ අවුත් පරිබ්‍රාජකන්ගේ කලවය ඇන පලාගියේය.

මේ කථාව ධම්මසභාවෙහි රැස්වූ සංඝයාවහන්සේ කිය කියා වැඩලුන් තෙනට සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා ආරාධිත වූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පෙරගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි චම්මසාටක නම් පරිබ්‍රාජකයෙක් චිරියේ යමින් සිටියේය. එළුවෝ දෙන්නෙක් පොරඅනිමින් සිටියාහ. පරිබ්‍රාජකයෝ එළුවන් දෙන්නා පොර අන්නා දැක නවතිමියි සිතා සිටිකලට ඉන් එක් එළුවෙක් පරිබ්‍රාජකයන් දැක පසුබස්නේය. පරිබ්‍රාජකයෝ එළුවා තමන්ට සංග්‍රහ කරණ නිසා පසුබසිනියි සිතා නියන්නාහු "උතුම් ජාති ඇති එළුවානෙනි මාගේ විශේෂ දත්තේය, එසේ නෙයින් මම නොප වදිමි, මමත් උතුම් ජාති ඇති බ්‍රාහ්මණ කුලයෙක උපනිමි"යි කිය කියා සිටි කල්හි පිළි උත්තර සෙවිවියෙක් පරිබ්‍රාජකයන්ට කියන්නාහු "එළුවා පසුබසින්නේ ඇවිත් අන්වය, ඉවත්ව ගණුව"යි කියදීත් පරිබ්‍රාජකයෝ ඉවත් නොවී සිටියාහ. එළුවා දිවගෙන අවුත් පරිබ්‍රාජකයන්ගේ කලවය ඇන නෙලාගත්හ.

ඒ අපූර්ව දක්වන සම්බුදුරජාණන් වහන්සේ 'මහණෙනි, බ්‍රාහ්මණයා එළුවාට ස්තුති කොට සිටිගමනේ එළුවා ඇවිත් කලවය ඇනහෙලාපියව"යි වදාළසේක.

බ්‍රාහ්මණයන් චිරියේ ඇතුම් කා වැදහෙව කෙදිරිගගා කියන්නෝ "යහපත් නියාව සත්පුරුෂ කමෙක, යහපත් එකෙකැයි කියා තමස්කාර කළදීම ඇවිත් ඇවිත් එලාගෙණ කලවය පලා ජීවිතක්ෂයට පමුණුවාපියව"යි වදාරා මේ චම්මසාටක ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි පරිබ්‍රාජක නම් මෙසමයෙහිත් චම්මඝාටක පරිබ්‍රාජකමය පිළඋඬ උන් සෙවිටියා නම් බුදුවූ මම්ම ය යි වදාළසේක.

---

## 318 ගොධ ජාතකය

තිවද දශබලධාරීවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොහොන් තපස් කරන්නාවූ නමක් අරභයා මේ ජාතකය දක්වන ලදි.

එක් කොහොන් තපස් රක්නාවූ නමක් සම්බුදුරජාණන් වහන්සේට දැන්වූ කල්හි සම්බුදුරජාණන් වහන්සේ "මහතෙනි, මේ දැන්මතු නොවෙයි, පෙරත් කොහෙන් කෙලේ වේදැ"යි විදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

අතීතය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ගෝව ඉපිද එක් තුඹසෙක වාසය කරන්නාහ. බොධිසත්ත්වයන් වාසය කරන්නාවූ සථානයට නුදුරු තෙනක එක් කූටතාපසයෙක් වෙසෙයි, බොධිසත්ත්වයෝ "මූ ගුණ ඇති තාපස කෙණෙක් දෝ හෝ" සිතා උන් ලඟට ගොස් වැඳ පුදා එන්නාහ. එක් දවසක් ගෝමස් සහිතව භොජනයක් උපාසකවරු ඒ තාපසයන්ට දුන්නාහ.

තාපසයෝ "මේ කුමන මාංසයෙක්දැ?"යි විමාරා "ගොමාංසය"යි යනු අසා "අප දකින්ට එන්නාවූ ගොයාන කෙණෙක් ඇත, උන් මරා මාංසය අනුනව කෙරෙම්"යි සිතා උපාසකවරුන්ට කියා සාල් ලුණු මිරිස් පත්කඩ ආදීවූ දෙය ගෙන්වා තබාගෙණ පොල්ලකුත් සැස කඩ යට තබාගෙණ ගොයා තන් එන පෙරමග බල බලා උන්නාහ.

ඒ වේලාවට ගොයාතෝත් එනතට අවුත් තාපසයන් ඉඳිනා නියා යෙන්ම "අද තාපසයන් ඉඳිනා අහංකාරයම නපුරැ"යි සිතා යවි සුලඟට ගොසින් තාපසයන් ඇඟින් ඛමන ගඛ්‍ය ආඝ්‍රාණය කොට ගෝමස් කෑ නියාව නියම දැක ඉවතින් යන්නට වන්නාහ තාපසයෝත් තමන් ලඟට නැවත් ගොයාගේ වාලදිය ලඟින් නික්මෙන්නා කාහාඛ යට තුබූ පොල්ල ඇරගෙණ දමාලා ගැසීය. දමාලූ පොල්ල ගොයාගේ වාලධිය ගැවිගත ඉවත පලාගියේය. එවිට ගොයා වහා දිවගෙණ ගොස් තුඹසට වැද ගියේය. එවිට තාපසයා කියන්නේ "මා අතින් නොයා ගැලවී ගියේ වේදැ"යි කීය. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "තා අතින් මා ගැලවුනු පමණක් විනා තෝ සතර අපායෙන් නොගැලවුනේ වේදැ"යි කියා තුඹසට වැද අනික් තුඹස් පවකින් ඉස එලියට පොවා "එම්බල තාපසය, තා කාහාය වස්ත්‍රයකුත් පොරවා අඳුන් දිවි සමින් හා ජටාවෙතුත් කමකිම්දැ?"යි කීහ.

එවිට තාපසයා කියන්නේ "එම්බල ගොයානෙනි, මාගේ ගෙයි සාල් තෙල් ලුණු මිරිස් ආදීවූ දෙය ඇත, ඇවිත් ඒ ඇම කාපියව"යි කීය. එවිට

ගොයා කියන්නේ ''තෘණ ග් සාල් ලුණු මිරිස් තෙල් ආදීවූ දෙයින් මට ප්‍රයෝජන නැත, මා ඉදිනා තුඹස ගැඹුර සියක් රියනක් පමණ ඇතැ''යි කියා භයගන්වා ''එම්බල තාපසය, තෝ මෙවක් පවින් මෙතන රැඳුනෙහි නම් තෘගේ ප්‍රවෘත්තිය උපාසකවරුන්ට කියමි''යි කිහ. ඒ තාපසයාත් එතනින් පලාගියේය''යි වදාරා මේ ගොඛ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කුවිතාපස නම් මෙසමයෙහි කුව භික්ෂුව, ගොඛව උපන් තෙම් බුදුවූ මම්ම වේදැ යි වදාළසේක.

---

## 319 කක්කාර ජාතකය

මේවද සියළු සත්ත්වයා ජාති කාන්තාරයෙන් එතර කරණ හෙයින් ශාස්තෘ නම් වූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙවදත්ත සථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්,**

එක් දවසක් දම්සභාවේ රැස්වූ සංඝයා වහන්සේ ''දෙවදත්තසථවිරයන් සංඝභෙදය කියා සංඝයා බිඳවූ අකුසලයෙන් රත්පිත් නගා බොහෝ දුකට පැමිණියෝ වේදැ''යි කිය කියා උන් තෙනට සම්බුදුරජාණන්වහන්සේ වැඩ වදාරා ''මහණෙනි, මා එන්නාට පුම්භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි, ''මහණෙනි, පෙරත් මේ තෙම මුසාවාද කියා බොහෝ දුකට පැමිණියේ වේදැ''යි වදාරා ''ඒ කෙසේ දැ?''යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි දෙලොස් යොදුන් බරණැස්නුවර දිව්‍යපුත්‍රයෝ සතරදෙනෙක් සාක්කාරී නම් මල්සොළු සතර බැඳගෙණ අවුත් ආකාශයෙහි සිටියාහ. ඒ මලෙහි සුගන්ධය දෙලොස් යොදුන් බරණැස්නුවර එකසුගන්ධව ගියේය.

එවිට මනුෂ්‍යයෝ ''මේ කුමන සුගන්ධයෙක් දැ?''යි කියන්ට වන්නාහ. එවිට දිව්‍යපුත්‍රයෝ සතරදෙන ආකාශයෙහි දිව්‍යාත්මභාවයෙන් සිට මේ සාක්කාරිකමලෙහි මල් ලැබ ඉන් එක් පුරුෂයෙක් කියන්නේ ''තොපට දිව්‍යලෝකයෙහි මල් ලැබෙයි මට තෙල මල්සොළුව දීපියව''යි කිහ.

ඉක්බිති එක දිව්‍යපුත්‍රයෙක් කියන්නේ 'යමෙක් තෙමේ අනුන් සන්තක තෘණසලාක මාත්‍රාවකුදු ඇරගණිද? යමෙක්තෙම වචනින් මුසා බොරු, ජීවිත පරිත්‍යාග කෙරෙත් මුත් නොකියාද? හෙවත් යමෙක්තෙමේ කායවාග වචීචාර මනොද්වාරයෙන් වදනා දශ අකුශල කම්පථයන් දුරුකොට දශ කුසල කම්පථයෙහි යෙදීවාසය කෙරේ ද? යමෙක්තෙම ඓශ්වර්‍යයක් ලදින් අකුසල කම්පථයෙහි අප්‍රමාද වේද? එබඳු උත්තම පුරුෂතෙම දෙවියන් පලඳිනා කක්කාරික දිව්‍ය පුෂ්ප සතර ප්‍රසාධනය කරන්ට සුදුසුය''යි කිහ.

එවිට බ්‍රාහ්මණයා "මෙකී ගුණයෙන් මට එකගුණයකුත් නැත, බොරු කියා මේ දිව්‍යපුත්‍රයා අතින් මල්සොළුව ඇරගත මැනවැ'යි තමාගේ නැති ගුණ ඇතැ යි කියා ඒ දිව්‍යපුත්‍රයා අතින් මල්සොළුව ඉල්වාගෙණ අනික් දිව්‍ය පුත්‍රයා අතින් මල්සොළුව ඉල්වීය. ඒ දිව්‍යපුත්‍ර කියන්නේ "යමෙක් තෙමේ සාෂි වණික් ආදීවූ ධාර්මික ජීවිකාවෙන් වේව යි රාජකාරිය කිරීමෙන් වේව යි විරති රජත සවණි යනාදී වස්තු ධාර්මිකවූ ජීවිකාවෙන් සොයන්නේද? යමෙක් තෙමේ වචනාදී ප්‍රයෝගයෙන් මෙරමා සන්තක වස්තුව නොගණ්නේද? යමෙක් තෙමේ වස්ත්‍රාභරණාදිවූ උපභොග පරිභොග වස්තු ලදින් දස අකුසල කම්පථ දුරුකොට කුසල කම්පථයෙහි යෙදී අප්‍රමාදව වාසය කෙරේ ද? එබඳු උත්තම පුරුෂතෙමේ සක්කාර දෙවියන් ප්‍රසාධනය කරන්නාවූ සක්කාර නම් දිව්‍ය පුෂ්පය පලඳින්ට යොග්‍යය"යි කිය.

එවිට බ්‍රාහ්මණයා "මෙකී ගුණයෙන් එක් ගුණයක් මා කෙරේ නැත, බොරු කියා මූ අතින් මල්සොළුව ගණ්මි"යි තමාගේ නැතිගුණ ඇති නියාවට අහවා ඒ දිව්‍යපුත්‍රයා අතින් මල්සොළුව ඇරගෙණ අනික් දිව්‍යපුත්‍රයා අතිනුත් ඉල්වීය. ඒ දිව්‍යපුත්‍රයාත් කියන්නේ "යමක්හුගේ සිත වහා නොබිඳේද? ක්ෂණයෙක්හි අසවාම්ව මායා වීරියෙහි වැදගත් කසා පරිද්දෙන් සවභාව ඇත්තේද? යමක්හුගේ ලෞකික ලොකොත්තර ශ්‍රධාතොමෝ කිසිවක්හු විසින් නොබිඳවිය හැකිද? හුදකලාව මියුරු රසයක් ලබන්ට සුදුසු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට නොදී අනුභව නොකෙරේද? ඒ පුරුෂතෙමේ සක්කාර නම් දිව්‍ය ප්‍රසාධනය කරන්ට සුදුසුය"යි කිය.

ඒ බ්‍රාහ්මණතෙම මෙකී ගුණයෙන් එකකුත් මට නැත, "බොරු ගුණ කියා මල්සොළුව ගණ්මි"යි සිතා තමාගේ නැති ගුණ කියා ඒ දිව්‍යපුත්‍රයා අතින් මල්සොළුව ඇරගෙණ සතරවෙනි දිව්‍යපුත්‍රයා අතිනුත් මල්සොළුව ඉල්වීය.

ඒ දිව්‍යපුත්‍රයා කියන්නේ "යමෙක් තෙමේ සම්මුඛයෙහි වේවයි අසම්මුඛයෙහි වේවයි ශීලශ්‍රුතාදී ගුණයෙන් යුක්ත පුරුෂතෙමේ මේ සක්කාර නම් දිව්‍ය ප්‍රසාධනය කරන්ට සුදුසුය"යි කිය. එවිට බ්‍රාහ්මණ තෙමේ මෙකී ගුණයෙන් එකගුණයකුත් මා කෙරේ නැත, "මාගේ නැති ගුණ කියා මූ අතිනුත් මල්සොළුව ඇරගණ්මි"යි බොරු කියා ඒ දිව්‍යපුත්‍රයා අතිනුත් මල්සොළුව ඇරගෙණ "මෙසේ දිව්‍යපුත්‍රයන් සතරදෙනෙකු අතින් මල්සොළු සතරක් ඇරගෙණ ඉස බැඳගතිමි, ඒ වේලෙහි පවක් මට ඉස රුජාව පැහැර බොහෝ දුකඛය"යි කිය. "එසේ කල තා හිසින් මල්සොළුව ඇරපියව"යි කිය. අරින්ට වන්විටත් ඉසින් නොහැරෙයි, බ්‍රාහ්මණයා බොහෝසේ පෙළෙන්නේය. රජ්ජුරුවෝ "කළමනා කින්ද?"යි අමාත්‍යයන් විචාළාහ.

අමාත්‍යයෝ කියන්නාහු "සවාමිනි, දෙවෙනිවත් නුවර සරහා උත්සව කෙළිම්හ. දිව්‍යපුත්‍රයෝ සතරදෙන එවිට එන්නාහු උන් හා උත්සව කෙළිම්හ, දිව්‍යපුත්‍රයෝ සතරදෙන එවිට එන්නාහු උන් ආකල ඉසරුජාව ගුණකරම්හ"යි කිහ. රජ්ජුරුවෝත් "යහපත ඒ ක්‍රියාවට පූජාකරව"යි කියා නුවර සරහා පූජාව පටන්ගත් කල්හි දිව්‍යපුත්‍රයෝ සතරදෙනා ආහ. එවිට බ්‍රාහ්මණ දිව්‍ය පුත්‍රයන් සතරදෙනා වැඳගෙණ හෙව "සවාමිනි, මම මාගේ නැති ගුණ කියා මල්වට ඇරගතිමි, මාගේ ප්‍රාණදානය දුනමැනවැ"යි කිය. එවිට දිව්‍යපුත්‍රයෝ

සතරදෙන "බොරු කීවායේ විපාක දුටුයේද? මෙවක් පටන් බොරු නොකියව් ය"යි අවවාද කියා මල්වට සතර ඔහු හිසින් ඇරගෙණ දිව්‍යලොකයට ගියහ යි වදාරා මේ **ඛකඛකාර ජාතකය** නිමවා වදාළසේක.

එසමයෙහි බ්‍රහ්මදත්ත යා තම් දෙවදත්ත සථවිරය, දිව්‍යපුත්‍ර සතරදෙනා ගෙන් එක්කෙණෙක් කාශ්‍යප සථවිරය, එක්කෙණෙක් මුගලන් මහාසථවිරයා එක්කෙණෙක් සැරියුත් මහාසථවිරය, වැඩිමහළු දිව්‍යපුත්‍රයා තම් බුදුවූ මම්ම වේදැ යි වදාළසේකි.

---

## 320 කාක ජාතකය

තවද සියලු සංස්කාර ධර්මයන් ගුරුප දෙශයක් නැතිව සවයම්භූඥතයෙන් දත් හෙයින් සර්ව්ඥ තම් වූ බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසත සමයෙහි එක් ස්ත්‍රියක් කෙරෙහි තෘෂ්ණා වූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදහ.

**ඒ කෙසේද? යත්**

එක් ස්ත්‍රියක් කෙරේ අභිලාෂවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ ගෙණවුත් සර්ව්ඥයන් වහන්සේට දැක්වූ කල්හි "සැබෑද මහණ, තා ස්ත්‍රියක් කෙරෙහි තෘෂ්ණාව ඇතිවූයේදැ?"යි විවාළ කල්හි "සැබව, සවාමීනි" කී කල්හි "එම්බල මහණ, ඇඹුල්වතයෙහි ලා රැකගත නුහුත ස්ත්‍රීන්ට නොප ආලය කරන්නේ කවරකට දැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සර්ව්ඥයන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

ගිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත තම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ බිසවුන් කුස පිළිසිඳ ඉපිද වැඩිවිය පැමිණ පියරජ්ජුරුවන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණියහ.

රජ්ජුරුවන්ගේ කාකදේවී තම අග්‍රමහෙසිකා බිසෝකෙණෙක් ඇත් තාහ. ඉතා විශෙෂිවූ රූප ඇත්තාහ. ඒ බිසවුන්ගේ රූපශ්‍රී ඉදිරියෙහි කියන් නාවූ කුතාල ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. ඒ රජ්ජුරුවන් හා එක් ගුරුලෙක් මනුෂ්‍ය වේශයෙන් අවුත් රජ්ජුරුවන් හා කැටිව දූකෙළි කෙළ උන්නේය. කලාතුරකින් බිසවුන් කෙරෙහි අභිලාෂ ඇතිව තමාගේ ඉඹුල්වතයේ තබාගෙණ ඉදිනේය. රජ්ජුරුවෝත් බිසවුන් නොදැක "මාගේ බිසව් කොයි පලාගියේ දෝ හෝ?"යි වික්ෂෙපයට පැමිණියහ.

නවටකවිරු තම ගාණ්ඩීයකු කැඳවා මෙපවත් කියා "තා දන්නා යම් සැටියකට බිසවුන් ගිය යම් තැනක් පරීක්ෂා කරව"යි විධාන කළාහ. ඒ ගාණ්ඩීයාත් "මීට කාරණ කිම්දැ?"යි පරීක්ෂාකොට අනික් කාරණයක් නොදැක රජ්ජුරුවන් වහන්සේ හා දූකෙළිනා පුරුෂයා විනා අනික් සැකයෙක් නැත, මූ පරීක්ෂා කරන්ට උවමැනවැයි රජ්ජුරුවන් හා දූ කෙළපියා ගුරුළා නික්මෙන්නාවූ පසුපස්සේ ගොසින් තමාගේ යෙල සියයක් යොදුන් ගුරුළු

වේශය මවා ගත්තා පියාපත් අස්සේ ගාඤ්ඡියා සැඟවී වැද උන්විට ගුරුළු රාජයාත් සමුද්‍ර මධ්‍යයෙන් ගොස් ඉඹුල්වතෆට ගියේය. ඒ ගාඤ්ඡියාත් ඒ බිසවුන් හා කැටිව සංවාසයකොට කීප දවසක් ඉඹුල්වතයේ රඳා දෙවෙනිවත් ගුරුළුරාජයාගේ පියාපත් අස්සේ සැඟවී අවුත් ගුරුළුවා හා සමඟ රජ්ජුරුවන් දූ කෙළිනා තැන සිට "මේ වේලාවට කාකදේවී ගුරුළු විමානයෙහි ඉඳිනා නොවේද?"යි කීහ

එවිට ගුරුළා කියන්නේ "මහාසමුද්‍රය හා ගංගාවක් හා සීදන්න සාගරය ඇතුළුවූ සත්තමහා සාගරයෙන් එපිට ඉඹුල්වතයෙහි කැදුල්ලේ උන්නාවූ බිසවුන් තා දුටුවේ කෙසේද"යි කීහ. එවිට ගාඤ්ඡියා කියන්නේ "තොපගේ පියාපත් අස්සේ සැඟවීගෙණ ගොසින් තොපගේ ඉඹුල්වතයේ දෙතුන් විටක් රඳා දෙවෙනිවත් තොපගේ පියාපත් අස්සේම සැඟවීගෙණ ආමි" කීහ.

එවිට ගුරුළුරාජයා "මෙසේවූ තැන ඉඳත් රැකගත නොහැක්කාවූ ගැහුන් මට ප්‍රයෝජන කිම්ද?"යි බිසවුන් ගෙණවුන් රජ්ජුරුවන්ට පාවාදී එවක්පවන් රජ්ජුරුවන් හා කැටිව දූකෙළින්ට නොආයේය යි වදාරා මේ ඛාණ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි තවිටකවිරු තම් ගාඤ්ඡි දූන් මේ උකටලී භික්ෂුහුය, බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදුයි වදාළසේක.

---

## 321 අනනුසොචිය ජාතකය

**ති**වද දීපදෙන්තමවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි භාග්‍යවතුන් මළාවූ කෙළෙඹි පුත්‍ර යකු අරභයා මේ ජාතකය දක්වන ලදහ.

**ඒ කෙසේද? යත්**

එක් කෙළෙඹි පුත්‍රයකුගේ බිරින්දක් මළාය, ඒ කෙළෙඹිපුත්‍ර තමාගේ බිරින්ද මළාවූ ශෝකයෙන් බොහෝ වික්ෂිප්ත උන්නේය. සම්බුදුරජාණන්වහන්සේ ඒ කෙළෙඹි පුත්‍රයා සෝවාන්වන්ට හේතුසම්පත් ඇති නියාව දැක වදාරා කුඩා භික්ෂුකෙණකුන් වහන්සේ පස්සේ යවා කෙළෙඹි පුත්‍රයාගේ ගෙට වැඩ වදාළ සේක.

කෙළෙඹි පුත්‍රයා සම්බුදුරජාණන්වහන්සේට ඉදිනා අසුන් පණවා වැද එකත් පස්ව උන්නේය. සම්බුදුරජාණන්වහන්සේ 'කිමෙක්ද? උපාසකය, වික්ෂිප්ත උනා"යි වදාළසේක. කෙළෙඹිපුත්‍රයා කියන්නේ "ස්වාමීනි, මාගේ බිරින්ද මළ හෙයින් වික්ෂිප්ත උන්නෙමි" කීහ

සම්බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "උපාසකය, නස්නා සුළු වූ යම් දෙයක් නස්සී. මළවුන්ට ශොක කරන්ට කාරණා කිම්ද? පෙර උත්තමයෝ මළවුන්ට ශොක නොකළෝ වේදැ"යි වදාරා "ඒ කෙසේද?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

සිවඟිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ බ්‍රාහ්මණ කුලයක කුමාර බ්‍රහ්මචරියා යෙන් වාසය කරන්නාහ.

මෙහි වතීමාන කථාව දෘවෙනි නිපාතයෙහි චුල්ලබොධි ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

මව්පිය දෙදෙන "අපගේ පුතනුවන්ට ඇස්සමුවේ කුටුම්බසණ්ඨාපනය කරන්ව උවමැනවැ"යි කියා පුතනුවන් කැඳවා කියන්නාහු "තොපව නිසි බ්‍රාහ්මණ කුලයකින් කුමාරිකාවක් පරීක්ෂා කොට කියව"යි කීහ. එවිට බොධිසත්ත්වයන් වහන්සේ කියනසේක් "මව ගිහිගෙයින් කම්කිම්ද? නුඹවහන්සේලා දෙදෙනා ඇතිතෙක් දවස් අත් පා මෙහෙකොට නුඹවහන්සේගේ ඇවෑමෙන් වනයට ගොස් තපස් කෙරෙම්. මව බිරින්දගෙන් කම්කිම්ද?"යි කීහ. එවිට බොධිසත්ත්වයන්ගේ දෙමව්පියෝ කිපවාරයෙකම "කුටුම්බසණ්ඨාපනය කළ මැනවැ"යි කියා යවූ කල්හි බොධිසත්ත්වයන් වහන්සේ "දෙමව්පියන් කීවාට උත්තර කීම සත්පුරුෂයන්ට යුක්ති නොවෙයි. මාගේ දෙමව්පියන්ට බැරි දෙයක් කියා යවම්, රන්රුවක් කරම්. මේ රූ නියාවට රූපත් කුමාරිකා වක් ලදිම් නම් ගිහිගෙයි වාසය කෙරෙම්"යි රන්රුවක් කරවා දෙමව්පියන් ලඟට යවූහ.

මවුපියෝ දෙදෙනත් "යහපතැ"යි කියා රන්රුව රථයක තබා "මේ රන්රුව නියාවට කුමාරිකාවක් පරීක්ෂාකොට එව"යි බමුණන්ට ප්‍රසාදදී යවූහ.

ඒ රන්රුව ඇරගෙණ නුවරක් නුවරක් පාසා ඇවිදිනා කල්හි බඹලොවින් චුතව බ්‍රහ්මයෙක් අවුත් එක් කසීගමෙක බමුණු කුලයක සම්මිල්ලවාහිනී නම් කුමාරිකාව උපත. ඒ බමුණෝත් තමන් ගෙණියය රන්රුව මග තබාලා වුන් නාහ. මග යන බමුණෝ "ඇයි සම්මිල්ලවාහිනී නම් කුමාරිකාව මෙතන සිටි න"යි කීහ. එවිට බමුණෝ එතනට අවුත් "මේ රන්රුව හා සදෘශ්‍ය කුමාරිකා වක් ඇද්ද?"යි විචාරා "ඇතැ"යි යනු අසා ඒ රන්රුව ඇරගෙණ ඒ බ්‍රාහ්මණ යාගේ ගෙට ගොසින් එපවත් කීහ.

ඒ කුමාරිකාවගේ දෙමව්පියෝ "යහපතැ"යි ගිවිස එපවත් කුමාරිකා වන්ට කීහ. කුමාරිකාව බ්‍රහ්මලෝකයෙන් ආ හෙයින් පඤ්චකාමයෙහි ඇල්මක් නැතිව කියන්නාහු "නුඹවහන්සේලා දෙදෙන ජීවත්ව ඉන්නාතෙක් දවස් අත් පා මෙහෙකොට නුඹවහන්සේලා ඇවැමෙන් තපස් කෙරෙම්"යි කීහ. එවිට දෙමව්පියෝ "මුන් කීවාද? අප කරන්නේ, මූ උරණව කුමක් කෙරෙද්ද"යි කියා නොකැමති කරවාම සරණපාවා දුන්හ.

ඒ බමුණෝත් කුමාරිකාව ගෙණ ගොස් බොධිසත්ත්වයන්ගේ දෙමව්පියන්ට පැහ. බොධිසත්ත්වයන්ගේ දෙමව්පියෝත් කුමාරිකාව දැක සතුටුව බොධිසත්ත්වයන් නොකමැති කරවාම එක හෙයිලා විවාහ මඟුල් කළහ ඒ කුමාරිකාවත් බඹලොවින් ආ හෙයිනුත් උන්ගේ මුහුණ පමණකුත් කෙලෙස් වශයෙන් නොබලා බඹුන් දෙදෙනකු මෙන් වාසය කරන්නාහ.

මෙසේ වාසය කරණ කල්හි බොධිත්ත්වයන්ගේ දෙමව්පියෝ කාලක්‍රියා කළහ. ඒ බොධිසත්ත්වයෝ දෙමවුපියන් ආදාහන කරවා තමන්ගේ සම්මිල්ල

වාහිනී නම් භාග්‍යවන්ට කියන්නාහු "සොඳුර, මාගේ දෙමව්පියන්ගෙන් ගෙණා අසූකෙළක් වස්තු ඇත, මාගේ වස්තුවත් තොපගේ වස්තුවත් ඇරගෙණ ජීවත්වෙව, මම තපසට යෙමි" කිහ

සම්මිල්ලවාහිනී නම් කුමාරිකා කියන්නී "නුඹවහන්සේ අළුයම දමාපු කෙළපිඬක් මාගේ ඉස්මුදුනෙන් පිළිගන්නාක් මෙන් නුඹවහන්සේ ඇරපු සම්පත් මම පිළිගණිම්ද? නුඹවහන්සේ තපසට යනකල මම් තපසට නොයන්නෙම්ද? යි මමත් තපසට යෙමි" කිහ.

බොධිසත්ත්වයන් වහන්සේත් "ගෘහපතැ"යි ගිවිස වතයට ගොස් සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පන්සල් කොට වාසය කරන්නාහු කල්‍යාමකින් ලුණු ඇඹුල් සෙවුනා පිණිස බරණැස් නුවරට අවුත් ගෙපිළිවලින් සිඟා ඇවිදිනා කල්හි සම්මිල්ලවාහිනී නම් පරිව්‍රාජිකාව පළමු දුකක් නුදුටු හෙයිනුත් මෘදුවූ ශරීර හෙයිනුත් උණු සිහිල් බත් වැළඳීමෙන් රක්තාතීසාර ඇතිවිය. බොධිසත්ත්වයන් වහන්සේත් පරිව්‍රාජිකාවත් වඩාහිඟණ ගොස් වාසය කළ තමන් වහන්සේ සිඟා ගොස් එන කල සම්මිල්ලවාහිනී නම් පරිව්‍රාජිකාවන්ගේ ප්‍රාණය නිරුඬව ගියේය. බොහෝ මනුෂ්‍යයෝ එක්ව "මෙසේ වූ රූපශ්‍රීයක් ඇති පරිව්‍රාජිකාවන් නව නියාය"යි කියා කියා අඬන්නාහ. බොධිසත්ත්වයෝ එතනව ගොස් මළ පරිව්‍රාජිකාවන් දැක නවමනා වස්තුව නැසුනේග යි සිත සිතා උන් මියපියා වැදහෝනා පෝරුව මත්තේ ඉන්දදීම බත් වළඳ අත කට සෝදා බැණ නොනැගීම උන්නාහ.

එවිට එතනව රැස්වූ මනුෂ්‍යයෝ "නාපසයන් වහන්ස, මේ පරිව්‍රාජිකාවන් වහන්සේ ගිහිකල නුඹවහන්සේ කෙසේ වාසය කළසේත්ද?"යි විචාළහ. "එම්බා මනුෂ්‍යයෙනි, මේ පරිව්‍රාජිකා මා ගිහිකල මව පාදපරිචාරිකාව උන්හ"යි කීහ. එවිට මනුෂ්‍යයෝ කියන්නාහු "ස්වාමීනි, අපි හැම මේ පරිව්‍රාජිකාවුන් වහන්සේගේ රූපශ්‍රී දුටු පමණට ලය වාවාගතනොහී බොහෝ දුකින් අඬම්හ. නුඹවහන්සේට පාදපරිචාරිකාව බොහෝ දුක්ගත් තැනැත්තන් වහන්සේ මළදී බැණ නොනැගී ඉදිනේ ඇයිද?"යි කීහ.

"එම්බා මනුෂ්‍යයෙනි, සම්මිල්ල වාහනී ගිහි අවස්ථාවෙහි මට ඉතා ලෙන් ගතුව වාසය කළාය. දැන් වතාහි මියගොසින් මළවුන් හා එකීභාවයට පැමිණියෝය. එසේ හෙයින් දැන් ඕ කවුරද? ඕතොමය, මම් වෙතමමය, එසේ හෙයින් උන්ට අඩා කාරිය කිම් ද? මේ පැමිණෙන මූර්තුව නම් ඉන්දදීය, ඝ්‍රීයදීය, වැදහොත්දීය, ඇවිදිමින් සිටියදීය යි යන සතර ඉරියවුවෙන් කවර ඉරියවුවකදී මූර්තුවට ඇවිත් පැමිණෙන බවත් නොදනෙයි. නටමනා දෙය නස්නේමය. උපන්නේ සැබෑවීනම් මූර්තුවට පැමිණීම සැබෑමය. මමත් වතාහි අජරාමර එක්කෙණෙක් නොවෙමි. මමත් මූර්තුවට පැමිණෙන්නෙම් තමාට අඬන පමණක් විනා අනුන් මළාට ඇඬීමෙන් කාරිය කිම්ද?"යි වදාරා බොහෝදෙනාගේ ශෝක සංහිදුවා හිමාලය වනයට වැඩ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා නෙ පිරිහුන ධ්‍යානයෙන් කම්වූ පරිද්දෙන් මියපරලොව ගියහයි වදාරා චතුරාර්‍ය සත්‍යය ප්‍රකාශකොට මේ අනානුසොචිය ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍ය දෙශනාවගේ කෙළවර කෙළෙඹි පුත්‍රතෙම ශෝවාන් පෙළෙහි පිහිටි යාහ.

එසමයෙහි සම්මිල්ලවාහිනී නම්වූ බිසව් මෙ සමයෙහි රාහුල මාතාවූ යශෝධරාසථවිරාය, තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ යි තමන්වහන්සේ අක්වා වදාළසේකි

---

## 322 කාලබාහු ජාතකය

වදාළ විසුද්ධබුඩිඤාණ ඇති අතුල්‍ය වූ සවභාවයෙන් තුන්ලොවට උතුම් වූ සම්මාසම්බුදුරජානන් වහන්සේ වෙළුවතාරමයෙහි වැඩවාසය කරණ සමයෙහි පිරිහුනු ලාභසත්කාර ඇති දෙවදත්තසථවිරයන් අරභයා මේ ජාතකය වදාළසේක.

**ඒ කෙසේද? යත්**

දෙවදත්තසථවිරයන් විසින් බුදුන් කෙරෙහි නිස්කාරණයෙහි වෛර බැඳ දුනුවා ආදීන් යෙදූ කල්හි නාලාගිරි හස්තියා බුදුන් අභිමුඛයව මෙහෙයි. ඒ දෙවදත්තසථවිරයන්ගේ දෙෂ ගම් නියම්ගම් රාජධානියෙහි ප්‍රකාශ විය. ඉක් බිත්තෙන් ඒ දෙවදත්තසථවිරයන්ට නිරන්තරයෙන් පවත්වනලද ආහාරාදිය මනුෂ්‍යයෝ පිරිහෙලුවාහ. යනළුවූ අජාසත් රජ්ජුරුවෝද ඒ දෙවදත්තසථවිර යන් කෙරෙහි අගෞරවව ඔහුගේ මුහුණ පමණකුත් නොබලා නිස්සාර කොට ඇරපුයේය. එතෙම පිරිහුනාවූ ලාභසත්කාර ඇතිව කුලයන් වීණවා වළඳ නේය. මේ කාරණය ධම්සභාමණ්ඩපයෙහි වටින් රැස්වූ භික්ෂූන්වහන්සේ වදාරණසේක් "ඇවැත්නි, දෙවදත්තසථවිරතෙම තමාහට ලාභසත්කාර උපදව මින් උත්සාහ කොට උපන් ලාභසත්කාර ස්ථිරකොට පවත්වන්ට නොහැකි වූයේය"යි යන මෙබඳු කථාවක් පහළ කළාහුය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ ධම්සභායෙහි ඉපදවූ කථාව දිවකණින් අසා වදාරා එක්තරා ගමනකින් එතැන්හි වැඩ "එම්බා මහණෙනි, මා එන්නාට පුථීභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා "සවාමීනි, නුඹ වහන්සේ විසින් නොකියන්ට වදාළ රාජකථා ආදීවූ දෙතිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ දෙවදත්තසථවිරයෝ තමන් ලාබසත් කාර උපදවමින් උපන් ලාබසත්කාර ස්ථිරකොට ගතනුහුනුවෝදැ යි යනාදීන් කියා කියා උනුම්හ"යි බුදුන්ට දැන්වූ කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි පෙරත් දෙවදත්තසථවිරයෝ ලාභසත්කාරයෙන් පිරිහුණෝ වේදැ"යි වදාරා භික්ෂූන් විසින් "සවාමීනි, තිලෝගුරු බුදුරජානන් වහන්ස, අතීත වරියාව භව යෙන් ප්‍රතිවෂන්න හෙයින් හස්ම ප්‍රතිවෂන්න ජාතවේදයක් සෙයින් අපට නො පෙණෙන්නේය. දැනෙන පරිද්දෙන් අපව වදාළ මැනවැ"යි ආරාධිතවූ බුදුරජා නන්වහන්සේ ඉකුත්වත් ගෙණහැර දක්වා වදාළසේක

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද පාරමිතා ඇති අප මහබෝසතාණන් රාධ නම් ගිරාව උපන්හ. ඒ ගිරාණෝ සෙසු ගිරවුන්ට වඩා සම්පූණවූ ශරීර අවයව ඇත්තේය. ඔහුගේ මල්වූ පොටයිපාද නම් ගිරවෙක් විය.

එසමයෙහි එක්තරා වැද්දෙක් ඒ ගිරව් දෙන්නා බදුගෙණ ගොස් බරණැස් රජහට දුන්නේය. ඒ බරණැස් රජතෙම ගිරවුන් දෙන්නා රන්මැදිරියෙක ලා රන්තැටිල්ලෙක්හි මී හා විළඳ ලා කවමින් ශකීරා පැන් පොවමින් පොෂණය කරන්නේය. මෙ පරිද්දෙන් කරණ මහත් සත්කාරයෙන් ඒ ගිරවු ලාභයෙන් යසසින් අගපැමිණියාහ මැතකාලයෙහි එක් වතවරයෙක් කාලබාහු නම් එක් මහත් කළුවදුරකු අල්ලාගෙන ගොස් ඒ බරණැස් රජහට දුන්නේය. ඒ වානරයාව පසුව ඉතා මහත් ලාභසත්කාර වීය. ගිරව් දෙන්නාට කරණ සත්කාරද ක්‍රමයෙන් අඩුවූයේය. මහා බොධිසත්ත්වවූ රාධ නම් ගිරවානෝ ඇතාදී ගුණයෙන් යෙදුනු බැවින් හෙවත් උතුම් වූ සත්පුරුෂ ගුණයෙන් යුක්ත බැවින් කිසිවකුත් නොකියා ලත් ලත් ගොවර පමණින් යැපෙමින් උන්නේය, ඔහුගේ මල්වූ පොට්ඨපාද නම් ගිරවානෝ වනාහි එබදු උතුම් ගුණධර්මයක් තමාගේ සන්තානයෙහි නැති හෙයින් ඒ වානරයාව කරණ සත්කාර සහනය නොකරන්නේය.

බැනත් වහන්ස, පළමුව මේ රාජභවනයෙහි මධුරවූ රස ඇති බාදුන්දිය දුන් ඒ කාලබාහු වානරයාට මුත් අපට නැත්තේය. මේ ධනඤ්ජය රජුගෙන් ලාභ සත්කාර නොලබන්නාවූ අපි දෙදෙන මේ සථානයේ ඉඳ කෙසේ ජීවත් වමෝද? අවමැනව, වලට ගොස් වාසය කරම්හ''යි කියා රාධ නම් බැනන්ට කීහ.

ඒ අසා රාධ නම් ගිරවානෝ කියන්නාහු ''එම්බල පොට්ඨපාදය, මේ ලෝකයෙහි සියළු සතුන්ගේම යස පිරිවර සමෘද්ධිය ලැබීමකුදු වන්නේය. නැවත එසින් පිරිහීමද වන්නේය. යම්සේ විශේෂ ගුණයක් හේතු කොටගෙණ කීර්ති ලැබීමක්ද, නැවත ලද්දාවූ කීර්තියගේ මලින භාවයට පැමිණීමකුදු වන්නේය. එසේ නෙයින් සත්ත්වයන් කෙරෙහි මේ අෂ්ටලෝක ධර්මය නිශ්‍රිත වූ අධ්‍යාත්මික බාහිරවූ සියලු සංස්කාර ධර්මයෝ නිත්‍යතොවන බැවින් අද්‍රව වන බැවින් අනිත්‍යයහ. මේ යථොක්ත අෂ්ටලොකධර්මයෙන් විනිර්මුක්ත එකද සත්ත්වයෙක් නැත්තේය එසේ නෙයින් ලාභසත්කාර අඩුවූ පමණකට හොක කිරීමෙන් ප්‍රයෝජන නැත්තේය. එසේ නෙයින් බැගෑපත් නොවී බැණ නෙ, නැගී ඉඳු''වයි කියේය.

ඉක්බිති පොට්ඨපාද නම් ගිරවා ඒ වානරයා කෙරෙහි කළ ඊෂ්‍යාව පහ කරන්ට නොහැකිව නැවත කියනුයේ ''අනාගතයෙහි වත කාරණයන් ප්‍රඥ චක්ෂුසින් දකින්ට සමර්ථවූ රාධ නම් බැනන්වහන්ස, මේ පාපිෂ්ටවූ කාලබාහු නම් වානරයා මේ රාජභවනයෙන් පහකොට පිටුදකින්ට උපායක් සිතුව මැන වැ''යි කියේය. ඒ පොට්ඨපාදයාගේ වචනය අසූ රාධ නම් ගිරවානෝ කියන්නාහු ''එම්බා පොට්ඨපාදය, මේ කාලබාහු නම් වානරතෙම සවභාවයෙන්ම චඤ්චලයහ. එසේ නෙයින් චඤ්චල වන්නේය. ක්ෂණ ක්ෂණයෙහි බැම බිඳ විසුළුපෑමෙන් විරූප දක්වා රාජකුමාරවරුන් එකතුව භය ගන්වන්නේය ඌ එපරිද්දෙන් කරණ විකාර හේතු කොටගෙණ ඔහු ලබන ආහාරාදිය දුරුවන්නේය එහෙයින් තමන් විසින් තමා ලබන සත්කාර දුරු කොට තුමූගේ වැඩ තමන්ම කසමින් සිටියදී තොප යුහුසුළුවන්නේ ඇයිදැ?''යි කියා මළහුවට ශොක නොකරන්ට කියා අවවාද කොට සන්සිඳ වූයේය. ඒ රාධ නම් ගිරවානන් කී පරිද්දෙන්ම ඒ වානරතෙම කණීචලන මුඛවිකාරාදියෙන්

භයපයත්වූ රාජකුමාරවරු භයින් ත්‍රස්තව බැගෑපත්ව මුරගැසුවාහුය. ඒ ඇසූ රජ්ජුරුවෝ "මේ කිමෙක්දැ?"යි විවාළ කල්හි රාජකුමාරවරුන් වඳුරාගෙන් භයපත්ව මුර ගැ නියාව අසා "ඒ දුෂ්ට වඳුරා මෙතනින් පහකරව"යි කියා පහකරවූවාය.

ඒ රාධ නම් ගිරවාණන් හා මලනුවන් පළමු පරිද්දෙන්ම ලාභසත්කාර මහත්ව ප්‍රකෘතිමත්වූයේයයි ශාස්තෘවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ මේ කාලබාහු ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

එකල්හි කාලබාහු නම් දැන් මේ දෙවදත්ත සථවිර වන්නේය, එකල්හි පොථපාද නම් වූයේ මේ ආනන්දසථවිර වන්නේය. එකල්හි පොථපාදයන් අවවාදයෙන් සන්සිඳවූ රාධ ගිරවාණෝ නම් දැන් මේ රාගාදී ක්ලෙශයන් ප්‍රහීණ කොට තුන්ලෝවාසීන් විදිනා සියළු සසර දුක් සන්සිඳුවන දැන් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

---

## 323 සීලවිමංස ජාතකය

**එ**වද භාග්‍යවත්වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි සීලවිමංස බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදහ.

මෙහි වර්තමාන කථාවත් ජාතක කථාවත් පළමු කී ජාතකවල පෙණෙන්නේය.

මෙහි වර්තමාන බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයෙක් සොරකම් කෙළේය, ඒ පුරෝහිත බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට ගෙණගොස් පැවාහ. රජ්ජුරුවෝ "ඇයි පුරෝහිත බ්‍රාහ්මණය, කුමක් නිසා සොරකම් කෙළෙහි දැ?"යි විවාළ කල්හි පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ "රජ්ජුරුවන්වහන්ස, මාගේ වංශය උතුම් දෝ හෝ ශීලය උතුම් දෝ හෝ යි පරීක්ෂාකරණ නිසා සොරකම් කෙළෙමි, සැපිරාජයන් පවා සඬා නොකැපූ පමණකින් සිල්වත්වූ ය යි ගුණ අසා ගත්තුය, මම වනාහි සොරකම් කළ පමණකින් සොරය යි නින්දුවට පැමිණියෙමි, ඉතිකින් ගිහිගෙයින් මට කම් නැත. හිමාලය වනයට වැද තපස් කෙරෙමි"යි රජ්ජුරුවන් අතින් අවසර ඉල්වාගෙණ වනයට යන්නාහු අතරමග වීථියෙහි එක් උකුස්සෙක් මස්කැටියක් ඩැහැගෙණ ආකාශයට පැන නැංගේය. අනික් උකුස්සෙක් අවුත් ඔහු ඉස වොකු ඇන පියාපතින් ගසා ගහට කරන්ට වත. ඒ උකුසු වේදනාව ඉවසාගත නොහී මස්කැටිය හළ. අනික් උකුස්සෙක් මස්කැටිය ඩැහැත.

මෙම නියායෙන් මස්කැටිය හළ උකුස්සාට ගහට නැත. ඩැහැණ යන උකුස්සාට ගහට කෙරෙති. බොහෝ උකුස්සෝ එක්ව මේ මස්කැටිය නිසා ගහට උනාහු පුරෝහිත බ්‍රාහ්මනයාණෝ ඒ දැක පඤ්චකාම ඇල්ම ඇතිව ගිහි ගෙයි වාසය කිරීම් නම් මේ උකුස්සා ඩැහැත් මස්කැටිය වන්නැයි පඤ්චකාම යෙහි ආලය හැරපියා යන්නෙම් නම් මස්කැටිය හැරපියා ගියාවූ උකුස්සා වන්නැයි සිත සිතා යන්නාහු එක් දැසියක් පුරුෂයකු එන්ට කියා මග බල

බලාඉඳ පෙරයම් දසපැයත් නොනිදා, ඉඳ මඬ්‍යම දසපැයත් නොනිදා, ඉඳ නේත්‍ර හෙයින් අළුයම දසපැයේ නේතියි නියමකර ආලය හැර ඇදේ නිදාපුව. බොධිසත්ත්වයෝ පඤ්චකාමයෙහි ආලය හැර වාසය කරන්නවුන්ටත් මෙම නියාමයෙන් සැපවිදීම වන්නේමැ යි සිතා ශියකලව තාපසකෙණෙක් ගසක්මුල ඉඳ භාවනාකොට ධ්‍යානයෙන් උන්නාහ, එවිට පුරෝහිත බ්‍රාහ්මණයානෝත් මේ තාපසයන්සේම සැපවිදිමි යි වනයට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චවිධ අභිඥාසමාපත්ති උපදවා ධ්‍යානසුවයෙන් වැස නොපිරිහුනු ධ්‍යානයෙන් කළුවූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදුරා මේ සීලවීමංස ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණව උපන්නෙමි බුදුවූ මම්ම වේදැ යි වදාළසේක.

---

## 324 රථලසී ජාතකය

තිවද දිවැස පැණැස මනැස යනාදීන් රුවක් වැනි පඤ්චනේත්‍රයන් ඇති හෙයින් චක්ඛුර්මත්වූ සම්බුදුන් වහන්සේ ජේත වනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා අරභයා මේ ජාතකය දක්වන ලදහ.

**හේ කෙසේද? යත්**

පුරෝහිත බ්‍රාහ්මණයා කෙත්වත් බලන්වයසි රථයක නැගී එන්නේය. එක් පුරුෂයෙක් ඉදිරියට රථයක් පැදගෙණ එමින් සිටියේය. ඒ බ්‍රාහ්මණයා හොස් තමා අත තිබූ කැවිටි දණ්ඩ දමාලා ඇන්න. ඒ කැවිටි දණ්ඩ රථයේ ඇනිලා දෙවෙනිව ඇවිත් ඒ බ්‍රාහ්මණයාගේ තලළ ඇනී ගැට පැන නැංගේය. "මේ පුරුෂයා මා මැරීය"යි බ්‍රාහ්මණයා හොස් රජ්ජුරුවන්ට කීයේය.

කොසොල් රජ්ජුරුවෝ ඒ විවාරා සනිටුහන් කළහ යි මේ කථාව දම්සභා මණ්ඩපයේ රැස්වූ මාළුවරුන්වහන්සේ කිය කියා උන්තෙනට වැඩ වදුරා "මහණෙනි, මා එන්නාව පූජිතාගයෙහි කවර කථාවකින් යුක්තව උනු දැ?"යි විවාරා වදුරා මෙපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් මේ බ්‍රාහ්මණයා රථයෙන් එන්නාවූ බ්‍රාහ්මණයාට කැවිටින් ඇන සභායෙහි පැමිණියේ වේදැ"යි වදුරා "ඒ කෙසේද?"යි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයා කෙත්වත් බලන්වයසි රථයකට නැගී නික්මිණ

එක් පුරුෂයෙක් ඉදිරියට රථයක් පැදගෙණ එමින් සිටියේය. තමා අත තුබූ කැවිටි දණ්ඩ දමාලා ඇන්න. ඒ කැවිටි දණ්ඩ රථසෙහි වැදගෙණ ආපස්සේ පැන බ්‍රාහ්මණයා තමාගේ තලළට ඇනී ගැට නැගීය. පුරෝහිත බ්‍රාහ්මණයා "මේ පුරුෂයා මා මැරීය"යි කියා රජ්ජුරුවන් ලඟට පැමිණියේය.

රජ්ජුරුවෝ "මාගේ පුරෝහිත බ්‍රාහ්මණයා මරා තලල ගැට කැඟ තැනැත්තවුන්ගේ සම් යැවැස් ගණුව"යි කීහ. එවිට අධිකරණ නායකයෝ කියන්නාහු "දේවයන්වහන්ස, යම් කෙණෙක් තමන් අතින් යමක් තමන්ට පැමිණියත් අනුන් පිට වරදවා කියන්නාහු ධර්මිෂ්ඨව විචාරා වැරදි පක්ෂයකින් දඬහත්ත යුතුය යි ගෘහවාසීව ජීවත්වන්නාවූ යම් පුරුෂයෙක් තමාගේ කළමනා හොවිතැන් ආදීවූ දෙයකව කුසිත වී නම් එයින් යහපත් නොවන්නේය. නොදැමුනාවූ ඉන්ද්‍රියයන් ඇති යම් තපස්වී කෙණෙක් ඇත්නම් ඒ තාපසයන් යහපත් නොවන්නේය. අපරීක්ෂ්‍යකාරී කිවන්ගේ බස් පස්සේ යන්නාවූ යම් රජෙක් ඇත්නම් එසේවූ අපරීක්ෂ්‍යකාරීවූ රජත් යහපත් නොවන්නේය. යම් පණ්ඩිතයෙක් කෝප වී නම් එසේවූ පණ්ඩිතයාගේ නුවණත් යහපත් නොවන්නේය. යම් රජ්ජුරුකෙනෙක් අපරීක්ෂ්‍යකාරී වී නම් ඒ රජ්ජුරුවන්ගේ යසස් කීර්තියත් අඩුවන්නේය. යම් රජ්ජුරු කෙණෙක් පරීක්ෂ්‍යකාරීහු වී නම් ඒ රජ්ජුරුවන්ගේ යසස් කීර්තියත් වඩිනය වන්නේ ය"යි කීහ.

එවිව රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයා ගෙන්වා දබර විචාරා "පුරෝහිත බ්‍රාහ්මණයාට වරදවා සතිටුහන් කළාහ"යි වදාරා මේ රථලසී ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි පුරෝහිත බ්‍රාහ්මණයා නම් පුරෝහිත බ්‍රාහ්මණයෝමය, අධිකරණ නායකව උපන්නේ නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

---

## 325 ජම්බුක ජාතකය.

**එවද** දසබලධාරීවූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදහ.

දෙවදත්ත සථවිරයන් සම්බුදු ශාසනයෙන් පන්සියයක් භික්ෂූන්වහන්සේ හා සමග ගයාශීර්ෂ නම් විහාරයෙහි වසන කල්හි සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ දෙවදත්ත සථවිරයන් වසන්නාවූ සථානයට ගිය කල්හි දෙවදත්ත සථවිරයෝ කියන්නාහු "සැරියුත් මුගලන් දෙනම අප සම්පයට ආතැන් පවත් සම්බුදුයෝ තම් මම්ම ය"යි සිතමින් "ශාරපුත්‍ර සථවිරයෙනි, මාගේ වසට රිදෙයි නොපි බණ කියන්නෝ යහපතැ"යි සැරියුත් සවාමීන්ට කී කලහි විජිනි පත්‍රය අතට දී වැදනොත්තාහ. උන්වහන්සේ පන්සියයක් භික්ෂූන්වහන්සේ අර්හත් මාගීයෙහි පිහිටුවා එකියත භික්ෂූන්වහන්සේ හා සමග දෙදෙනා වහන්සේ සම්බුදුයන්වහන්සේ සම්පයට වැඩිකල්හි අවසථා නොදැන නිදන්නාවූ දෙවදත්ත සථවිරයන් ලඟට කොකාලික සථවිරයෝ ගොසින් විළඹෙන් ඇත "කුමන නිදිද? නිදන්නේ පන්සියයක් භික්ෂූන්වහන්සේ ඇරගෙණ සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ පලාගිය සේකැ"යි යනු අසා ශෝකයෙන් ලේ තුන්කටක් නගා බොහෝ ආයාසයට පැමිණි නියාව සම්බුදුයන් වහන්සේ අසා වදාරා "එම්බා මහණෙනි, මාගේ විලාසය ගෙණ නටුයේ දැන් මතු නොවෙයි, පෙරත් මාගේ විලාසය ගෙණ නටුයේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යන්

සිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි සම්බුදුරජාණන්වහන්සේ සිංහව ඉපද මීමකු මරා මස් කා පැන් බී වසන්නාහු පසිත සමීපයට නික්මුණු කල්හි කැනහිලෙක් මගදී දැක සිංහයා ගැලවෙන උපායක් නොදැක බිමබැස වැදහොත්තේය. සිඟාලයා සිංහයා දැක කියන්නේ "තොප කුමක් නිසා මෙතන උනිදැ"යි විමාළ කල්හි "නුඹවහන්සේට සේවාකම් කරණ පිණිස ඔත්තෙමි"යි කී කල්හි "එසේ වී නම් මා හා කැටිව එව"යි කී කල්හි කැදවාගෙණ ගොස් සිංහයා තමා වසන්නාවූ ගල්ගුහාවේ එක්තරා තැනෙක කැනහිලා වසන නියාගෙන් සලසා මාංස මරා ලමින් වසන්නාහ.

ඒ මස් අනුභවකොට ස්ථූලව කැනහිලා මානයක් ඇතිව කියන්නේ "නුඹවහන්සේ මරාලන මස් කා මෙතෙක් දවස් වාසය කෙළෙමි. ඇම දවස්ම නුඹවහන්සේට ආයාස කරන්නේ කිම්ද? මම්ම ගොසින් මත්වූ හස්තියකු මස්තකයට පැන ඉස්මොල අනුභව කොට වෙසෙමි" කී කල්හි සිංහයා කියන්නේ "එම්බල ජඹුකය ස්ථූලවූ කය ඇති දික්වූ දළ ඇති ඇතුන්ගේ මස් අනුභව කරන්නාවූ ජාතීන්ට චිතා තොපට පිළිවන් නොවෙයි" කී කල්හි එපවත් නොගිවිස වනා ගොස් පසිතයට පැනනැගී කාලාවක කුලේ හස්තියකු දැක "කුම්භස්ථලයට පනිමි"යි පැන්න තැනැත්තේ ඇතාගේ පය කෙරේ පැනපියා එවේලෙහි කැනහිලාගේ ඉස්මොල පයින් මිරිකා ඇතා පලාගිය කල්හි සිංහයා කැනහිලා පරීක්ෂාකරණ පිණිසයයි ගොසින් කැනහිලාව පැමිණි විලාසය දැක විඥපව කියන්නාහු "යම් සත්ත්වයෙක් තමාගේ බල නොදැන වාසය කරන්නේ වී නම් හස්තියාගේ මස්තකයට පනිමි යි කකුල සමීපයට පැන මළාවූ කැනහිලා මෙනැ"යි කියන්නාහු "වංශවත් ශක්ති සම්පන්න ආඥ තේජස් ඇත්තාවූ සත්ත්වයක්හු කරන්නාවූ කවයුක්ත හිතවූ එකෙක් කරන්නේ චිතම් හස්ති චිනාසය කෙරෙමියි මළාවූ කැනහිලා මෙනැ"යි කියාද, තවද "මාගේ වංශය හා ශක්ති ආඥ තේජස් විවර නියාවට මේ විවර කවයුතු කළ මැනව, නොහොත් අවිවර කවයුතු කිරීමෙන් යම් එකෙක් සිතන්නේ වී නම් ඒ සත්ත්ව තෙමේ හස්තියා පයින් මළාවූ කැනහිලා මෙනැ"යි කියා මේ ජඹුඛාදක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ඒ කැනහිලා නම් දෙවදත්ත සථවිරයන, සිංහව උපන්නෙම් බුදුවූ මම්ම යයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 326 වෘහන්ජත්‍ර ජාතකය

තිවද විහාරයකවූ සම්බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලදහ.

ඒ වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූන් වහන්සේ සම්බුදුරජාණන් වහන්සේට දක්වන්නාහු සම්බුදුරජාණන්වහන්සේ "මහණෙනි, මුන් දැන්මතු නොවෙයි, පළමුත් වඤ්චා ප්‍රයොග දන්නේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

සිවඹිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නාහ. කෝසල රජ්ජුරුවන් හා යුඬයට බරණැස් නුවර රජ්ජුරුවෝ චතුරඬගිණී සේනාව ඇරගෙණ යුද්ධයට ගොස් නුවර සාධා සියලු සම්පත් ඇරගෙණ තමන්ගේ නුවරට ගෙණවුත් තමන්ගේ උයනේ පන්සියයක් ලෝ සැළිවල ලවා උදැනයෙහි නිධාන කරවූහ.

වෘහත්ඡත්‍ර නම් රාජකුමාරයෝ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාර්යන් අතින් සූසැට කලාශිල්පය හා අෂ්ටාදශ ශිල්ප ආදීවූ ශිල්ප ඉගෙණ පන්සියයක් තපස්වීවරයන් උන්තෙනට අවුත් ඒ තාපසවරුන්ගෙන් බණ දහම් අසා ප්‍රවෘත්තිය දැන තපස්වීරවරයන්ට නායකව වාසය කරණසේක.

එක් දවසක් වෘහත්ඡත්‍ර නම් තපස්වී පන්සියයක් තපස්වීරවරයන්ට කියන්නාහු "බරණැස් නුවර සිඟා වළඳනා ලෙස යම්හ"යි කීහ.

පන්සියයක් තපස්වීවරයෝ කියන්නාහු "අපි ඊට කියමෝ නම් මනුෂ්‍යයෝ අප අතින් ප්‍රශ්න විචාරති, බණ කියවති, උන් කිකල තොකි අවසථාවේ නොයෙක් නින්දා කියා වෙසෙති. එසේ හෙයින් අපි බරණැස්නුවරට නොයම්හ"යි කීහ. ඊට වෘහත්ඡත්‍ර නම් තපස්වී "උන් කී යම් ප්‍රශ්නයක් විස දන්ට මට භාරය"යි කියා පන්සියයක් තපස්වීරවයන් ඇරගෙණ නික්ම බරණැස් නුවර රජ්ජුරුවන්ගේ මඟුල් උයනේ එදා රෑ සැතපී පසු දවස් උදැසන පන්සියයක් තපස්වීවරයෝ නුවරට සිඟා නික්මුනාහ.

රජ්ජුරුවෝ පන්සියක් තපස්වීරවරයන් තමන්ගේ රජගෙට වඩාගෙණ ගොස් ආසනවල ඉඳුවා ප්‍රශ්න හා සමග බණ විචාළාහ. එවිට වෘහත්ඡත්‍ර නම් තපස්වී පන්සියයක් තපස්වීරවරයන් බැණ තොනැඟී ඉන්ට කියා රජ්ජුරුවන් විචාළ බණ හා ප්‍රශ්න රජ්ජුරුවන්ගේ අභිප්‍රාය නියාවටම කීහ.

රජ්ජුරුවෝ සමාධිව පන්සියයක් තපස්වීවරයන් වළඳවා තමාගේමඟුල් උයනේ ඉඳින නියායෙන් සැලැස්වූහ. "යහපතැ"යි කියා වෘහත්ඡත්‍ර නම් තාපසයන් හා පන්සියයක් තපස්වීවරයන් ඒ මඟුල් උයනේ වාසය කරණ කල්හි වෘහත්ඡත්‍ර නම් තපස්වී නිධාන් දක්නාවූ ශාස්ත්‍රයක් දන්නාහ.

එවිට සිතන්නාහු "මාගේ පියාතන් වහන්සේ මරාපියා බොහෝ වස්තුව බරණැස් රජ්ජුරුවෝ ගෙණාහ. ඒ සම්පත් කොයි තිබාපුදෝ හෝ"යි බැලූ තැනැත්තෝ ඒ මඟුල් උයනේ තිබුවා දැක පන්සියයක් තපස්වීවරයන්ට වෘහත්ඡත්‍ර නම් තපස්වී කියන්නාහු "මම පරලොවට ආධාරයෙකින් තපස්වූයෙම් නොවෙමි. මම මා කෙරේ හයින් තවුස්වීම්. මාගේ කොසොල් නුවර රජ්ජුරුවන් වහන්සේ නම් මාගේ පියානන් වහන්සේය. එසේ හෙයින් උන්වහන්සේගේ බොහෝ සම්පත් බරණැස් රජ්ජුරුවෝ ගෙණැවිත් මඟුල් උයනේ සැළවල ලැවූ පන්සියයක් නිධාන සැළ ලැවූහ. ඒ සැළවල නිධාන ඇරගෙණ මම මාගේ පියාතන් වහන්සේගේ කොසොල් නුවර ගණිමි. තොපි ඇම කුමක් කරවිදැ?"යි විචාළහ. තාපසවරු කියන්නාහු "නුඹවහන්සේ ගුරුකොට ආම්හ එසේ හෙයින් නුඹවහන්සේ හා කැටිවම කී කළ දෙයක් කරමු"යි කීහ.

"යහපතැ"යි කියා කොසොල් නුවර සිට ආ මනුෂ්‍යයන්ගෙන් සමහර අයකුත් තපස්වීවරයන් පන්සියයක් නිධාන සැළවල් ගොඩනගා පන්සියයක් සම්පයිද විද ඒ සම්පයිවල ලාභෙණ ඒ සැළවල තණ ආදීවූ දෙයලා තබා තිබූ වළම නිධානසැළ ඔබවා කෝසල නුවරට පලා ගොස් වෘහත්ඡත්‍ර නම් රාජ කුමාරයෝ රාජ්‍යයට පැමිණ ඔටුනු පැළඳ නුවර පදනම් අවිවාල වෙව්වම් ආදීවූ කම්මාන්ත කරවා සතුරන්ගෙන් කිසි භයක් නොවදිනා නියාවට නුවර කරවා රාජ්‍යය කරන්නාහ.

බරණැස් නුවර රජ්ජුරුවෝ බොහෝ ශොක පත්ව කිසිදෙයක් නොදන මඟුල් උයනේ උන් තාපසවරුන් පලාගිය නියාව අසා බොහෝ වික්ෂෝපයට පැමිණ මඟුල් උයනට අවුත් නිධාන සැළවල් තිබූ තිබූ තැනින් ගොඩනංවා බැලූ අවසථාවෙහි සම්පත් නැතිව තණපුරා තිබූ සැළවල් දැක රජ්ජුරුවෝ සෝපත්ව කිසිදෙයක් නොදන උන්සිටිය එතෙනකුත් තණයයි කිය කියා ඉඳිනාහ.

බොධිසත්ත්වයෝ රජ්ජුරුවන් කියන්නාවූ මේ ප්‍රලාප මා අරවතොත් විනා අනික් කෙණෙකුන්ට බැරියයි සිතා "රජ්ජුරුවන් හා කථාකරන්ට යෙමි"යි ගොස් කථාකොට උන් අවසථාවෙහි රජ්ජුරුවෝ "තණය"යි කිහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "සවාමීනි, නුඹවහන්සේගෙන් කෙසේවූ තණයෙක් අපවත්වීද? කෙසේවූ තණයකට අභිප්‍රාය ඇතිසේක්ද? ඒ මට කිව මැනවැ"යි කිහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "බොහෝ ඇසුපිරූ තැන් ඇති වෘහත් ඡත්‍ර නම් තාපසයෝ මාගේ මඟුල් උයනේ වාසයකොට මාගේ නිධාන සැළවල් පස්සියයේ සම්පත් ඇරගෙණ සැළවල තණපරඬ ලා සම්පත් ඇරගෙණ ගිය හෙයින් කියන පමණක් විනා මා අභිප්‍රාය ඇති තණක් ඇති හෙයින් කියන දෙයක් නොවේ"යි කිහ.

එවිට බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු "තාපසවරු නම් තමන් සන්තක වස්තුව විනා නොසන්තක දෙයින් තණකොන්දක් විවර නොගෙණ ගියේය. ඒ රාජකුමාරයෝ තමන්ගේ පියානන් සන්තක සම්පත් ඇරගත්තෝය. නුඹවහන්සේ සන්තක දෙයින් තණ කොන්දක් විවර නොගෙණ ගියාහ. නුඹවහන්සේ සන්තක සම්පත් නුඹවහන්සේගේ දරුමුනුබුරන්ට දෙන්වන් ඇත. තමන් සන්තක වස්තුව ඇරගෙණ ගියයි කියා සෝක නොගත මැනවැ"යි කිහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "වෘහත්ඡත්‍ර නම් රාජකුමාරයන් තාපස වේෂය පැ මාගේ සම්පත් ඇරගත්තාය. ඒ කවර මේවයි කියා බොධිසත්ත්ව යන් කි අවවාදයෙන් සෝක තුනීකළහ"යි වදාරා වෘහත්ඡත්‍ර ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි වෘහත්ඡත්‍ර තාපසයෝ නම් මේ වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂූ හුය, එසමයෙහි රජ්ජුරුවන්ට අවවාද කි අමාත්‍යයා නම් බුදුවූ මම්මයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

## 327 පීඨ ජාතකය

එවද සමන්නාවක්ෂු වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපාසක කුලයට නින්දා කළ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්**

එක් භික්ෂුකෙනෙකුන් වහන්සේ සැවැත්නුවරට අවුත් "මේ නුවර යහපත්ව දන්දෙන්නෝ කවුරුදැ?"යි විචාළසේක. "මේ නුවර යහපත්ව දන් දෙන්නෝ සුලු අනේපිඬු මහසිටාණෝය, විශාඛාවෝය, මල්ලිකාදේවීය"යි කීහ.

ඒ අසා පාත්වූ ගමනේ සිහාගිය තෙන කවුරුත් පාත්‍රය ඇරනොගත් තුය. නුවර මුළුල්ලේ ඇවිද ගණයට එන කලට වහන්දැ කැඳ වළඳපූසේක. භික්ෂූන් වහන්සේ නිදා නැගිට සිහාගිය හෙයින් කැඳවළඳනට නුවූසේය. දවා ලට බත් සිහාගයි දෙවනුව ගිය ගමනෙත් නොවේලා හෙයින් පාත්‍රය ගත් කෙණෙක් නැත. ගණයේ උන් වහන්දැ භික්ෂූන්වහන්සේ සිහාගොස් එතකලව බත් වළඳපූසේක.

නුවරින් බත් සිහන්ටවත්නොවී ගණයෙන් වළඳන්ටවත් නොවී භික්ෂූන් වහන්සේ සුන්බත්ව කියනසේක් "මේ නුවර උපාසකවරු යහපත්ව දන්දෙති. කී පමණක් විනා දන්දෙන කෙනෙකුන් නුදුටුවාසේ" නින්දා කියමින් උන් සේක.

සම්බුදුරජාණන් වහන්සේ එතනව වැඩවදරා "මහණෙනි, භික්ෂූහු නම් බඹ රැන් කුසුමයේ රොන්හත්තාසේ උපාසකවරුන්ගේ සිත් නො මිරිකා දන් ගත් තොත් විනා ආක්‍රෝශ පරිභව හා නින්දා කිරීම් තපස්වීන්ට යොග්‍ය නොවෙයි. පෙර මහොත්තමයෝ පවා දන්දුන් උපාසකවරුන්ට නින්දා නොකොළෝ වේදැ?"යි වදරා "හේ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ බ්‍රාහ්මණකුලයක ඉපිද වැඩිවිය පැමිණ වනාන්තරයට වැඩ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වාසය කරණ කල්හි බරණැස් නුවරට අවුත් "මේ නුවර යහපත්ව දන්දෙන්නෝ කවුරුදැ?"යි විචාළ කල්හි "මේ නුවර අසවල්තෙන සිටානෝ යහපත්ව දන්දෙති" අසා "එසේ වීනම් උන්ගේ දොරට යමිහ"යි සිහා වැඩිසේක.

උන්වහන්සේ සිහාවඩිනට පළමුවෙන් සිටානෝ රජ්ජුරුවන් වහන්සේව රාජසේවයට පලාගියහ. බොධිසත්ත්වයෝ සිටානන්ගේ දොරකඩ නැතක්වේලා සිහා සිටි කල්හි සිටානන්ගේ ගෙයින් කවුරුත් නුදුටුවාහ. බොධිසත්ත්වයෝ සිට වෙහෙසි නික්මුනාහ.

සිටානෝ රාජසේවය කොට ගෙට එන්නාවූ තැනැත්තෝ අතරමගදී බොධිසත්ත්වයන් දැක හික්ෂාපාත්‍රය දැක ගෙණ බොධිසත්ත්වයන්වහන්සේ පවරා

තමන්ගේ ගෙට ගෙණවුත් රසමසවුලෙන් යුක්තව භොජනය බොධිසත්ත්වයන් වහන්සේට වළඳවා සිටානෝ කියන්නාහු "සවාමිනි, මාගේ ගෙට සිහා ආ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක්ද දුගී මගී යාචකකෙණෙක්ද දන් නොගෙණ ගියවිරු කෙණෙක් නැත. නුඹවහන්සේ වඩනට පළමුවෙන් මම රාජසේවයට පලා ගියෙමි යන මම එක්කෙණෙකුන්ට සම්මතකොටලා නොගියෙමි. එසේ හෙයින් නුඹවහන්සේ දුටුකෙණෙක් නැත. එසේ නෙයින් ඒ වැරැද්ද මා කෙරේමය සමාකළ මැනවැ'යි සිටානෝ කීහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "සිටානෙනි, තොප කෙරේ අප කෝපවූයේත් නැත. චෙෂවූයේත් නැත. අප ඇසූ නියාවට මෙකියන සිටානන් ගෙන් මෙවිතරදැ යි සිතූ පමණක් විනා අප විසෙෂපවූයේ නැතැ"යි කීහ.

එවිට සිටානෝ කියන්නාහු "මාගේ දෙමව්පිය මුතුන් මිමුතුන් පරම්පරා වෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් දුටුකල ආදර සම්භාවනාවෙන් සතරපසයෙන් දන්දී දෙමව්පියන් දුටුසේ ආදර භක්ති ඇත්නාහ, මේ මාගේ අඩුවෙක් වූයේය' යි කීහ.

"යහපතැ"යි බොධිසත්ත්වයෝ සිවානන්ගේ ආරාධනාවෙන් උන්ගේ ගෙයි කිප දවසක් රදා තමන් පළමු වාසය කළ හිමාලය වනයට ගොස් පඤ්චා භිඥ අෂ්ටසමාපත්ති උපදවා බඹලොව උපන්හ යි වදාරා මේ පඤ්ච ජාතකය නිමවා වදාළසේක.

## 328 තුජ ජාතකය

මේ වදාළ සුගත තම්වූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි බිම්බිසාර රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්**

බිම්බිසාර රජ්ජුරුවන්ගේ බිසවුන් බඩ අජාසත් රජ්ජුරුවන් පිළිසඳ ගත් පසු එකියන බිසවුන්ට රජ්ජුරුවන් දකුණු උරය පලා ලේ බොන්ට දෙළෙක් උපන. එපවත් බිසව් රජ්ජුවන්ට කියාගතනොහී වාරිති, රජ්ජුරුවෝ බොහෝ උත්සාහයෙන් විචාරාගත්හ.

නිමිත්ත දන්නා බමුණන් රජ්ජුරුවෝ ගෙන්වා "බිසවුන්ට මෙසේවූ දෙළක් උපනැ"යි කීහු එපවත් බමුණෝ අසා බිසවුන් වහන්සේගේ බඩ රාජ කුමාරයන් වහන්සේය. උන්වහන්සේ වැඩිවිය පැමිණිකල නුඹවහන්සේ මරා රාජ්‍යය ගන්නාසේකැ"යි කීහ.

රජ්ජුරුවෝ මේ අසා 'මාගේ දරුවෝ මා මරා රාජ්‍යය ගත්තු නම් ගත් තේය. අනික් කෙනෙකුන් නොවත් උන් රාජ්‍යය ගනොත් යහපතැ"යි සමා ධිව ශස්ත්‍රය ගෙන්වා දකුණු උරය පලා රත්තැවිලේ ලේ වත්කොට බිසවුන් පොවා දෙළ සන්සිඳවූහ.

එපවත් බිසවු අසා "මාගේ රජ්ජුරුවන් වහන්සේ මරන්නාවූ දරු කෙණෙකුන් ලබා උසුලාගෙණ ඉඳිනේය. මාගේ රජ්ජුරුවන් වහන්සේට සතුරුවූ දරුවන්ගෙන් මට ප්‍රයෝජන කිම්දැ?"යි කියා බඩ මඩවා දරුවන්

එලන්ට සැරසුනාහ. රජ්ජුරුවෝ මෙපවත් අසා බිසවුන්ට කියන්නාහු "මාගේ දරුවෝ මා මරා රාජ්‍යය ගත්තු නම් ගත්තෝමය. බඩ මඩවා දරුවන් නො එලවා මා සුරතල් දැකපියන තුරාය"යි කියා බඩ මැඩවිය නොදී රැකවල් ලැවූහ.

රජගෙයිදී බඩ මඩවන නෙයින් රැකවල් ලැවූහ. මහුල් උයනට ගොසින් බඩ මඩවා දරුගැබ එලන්ට උත්සාහ කරණ නියාව රජ්ජුරුවෝ දැන "මහුල් උයනට යා නොදෙව"යි රැකවල් ලැවුයේය. මහුල් උයනට යා නොදී උන් කලට දසඑකඩ මසකින් රාජකුමාරයන් වැදූහ,

රාජ කුමාරයන් පියවර නහා කෙළ ඇවිදිනා ප්‍රසාදයෙහි සම්බුදුන් වහන්සේ මහාසඛයා වහන්සේ පිරිවරා බිම්බිසාර රජ්ජුරුවන්ගේ රජගෙට සිඟා වැඩිසේක. රජ්ජුරුවෝ සම්බුදුන් වහන්සේ ඇතුළුවූ භික්ෂු සඞ්ඝයා වහන්සේ පවරා රජගෙයි වඩාහිඳුවා රසමසවුලෙන් යුක්තවූ අන්නපානාදිය තමන්ගේ සහනස්තයෙන් වළඳවා ඉක්බිත්තෙහි ධර්මය අසන්ටයයි උන්කල රාජකුමාරයන් සරහා රජ්ජුරුවන්ගේ ඇකයේ හිඳුවාලූහ.

රජ්ජුරුවෝ පුත්‍රප්‍රේමයෙන් රාජකුමාරයන් සතන සතහා සුරතල් බලා සම්බුදුන් වහන්සේ වදුරණ බණ සිතහෙලා නො අසන නියාව සම්බුදුන් වහන්සේ දැන රජ්ජුරුවන්ට වදුරණසේක් "රජ්ජුරුවෙනි, පළමුත් රජ්ජුරුවෝ සැක ඇති රාජකුමාරවරුන් දුරුකොට විසුවෝ වේද?"යි වදාරා "ඒ කෙසේ දැ?"යි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ තක්ෂලා නුවර දිසාපාමොක් ආචාරීව උපන්නාහ. බරණැස් නුවර රාජකුමාරයෝ දිසාපාමොක් ආචාරීන් ලඟට ගොස් උගනමතා සියලු ශාස්ත්‍ර ඉගෙණ උන් කලට දිසාපාමොක් ආචාරී රාජ කුමාරයන්ගේ අඞ්ගලක්ඛණ පරීක්ෂාකොට "මතු මෙම රාජකුමාරයන් නිසා උප දිනා රාජකුමාර කෙණෙකුන්ගෙන් රජ්ජුරුවන්ට සැලසෙන උපද්‍රව දැන" රාජ කුමාරයන්ට ගාථා සතරක් උගන්වා කියන්නාහු "තොපගේ රාජකුමාරයන් සොළොස් ඇවිරිදි අවස්ථාවෙහි රාජකුමාරයනුත් තොපත් බත්කමින් ඉඳ පළමු වත ගාථාව කියව, සේනා සමෘද්ධව ආ සථානයේ උන්වීට දෙවත ගාථාව කියව, උඩුමාලට නැගෙණ ඉනි ඉසට තුන්වෙනි ගාථාව කියව, ශ්‍රී යහන් ගබඩාවට වැද නෝනට යහකුට සතරවෙනි ගාථාව කියව"යි කියා දිසාපාමොක් ආචාරී රාජ කුමාරයන්ට ඉගැන්වූහ.

රාජකුමාරයෝ නුවරට අවුත් රජ්ජුරුවන්වහන්සේට ශාස්ත්‍ර පෑ ගමනේ රජ්ජුරුවෝ සමාධිව රාජකුමාරයන්ට යුවරජ තනතුර දී උන් අවස්ථාවෙහි රජ්ජුරුවන් අයාමෙන් රාජකුමාරයෝ රාජ්‍යයට පැමිණ රාජ්‍යය කරණ කල්හි රජ්ජුරුවන්ට රාජකුමාර කෙණෙක් ඇතිව සොළොස් ඇවිරිදි වූහ,

එක් දවසක් රාජකුමාරයෝ රජ්ජුරුවන් උයන් කෙළියට යන රාජ ඓශ්වර්‍යය දැක "මම මෙසේවූ රාජ ඓශ්වර්‍යයක් කවරදා ලබම්දෝ හෝ"යි සිතා තමන්ගේ අතවැස්සන්ට කීසේක. අතවැස්සෝ කියන්නෝ "සිතූ නියාව ඉත යහපත බාල අවස්ථාවේ ලත් සම්පත විතා මාලු අවස්ථාවේ ලත් සම්පතින් ප්‍රයෝජන කිම්ද? රාජ්‍යයට උත්සාහ කළ මැනවැ"යි කීහ.

රාජකුමාරයෝ "ආයුධයකින් රජ්ජුරුවන් මහන්සේ මරන්ට බැරිය"යි කියා "විෂක් ලා මරමි" සිතා රජ්ජුරුවන් වහන්සේ එක්ව බත්කමින්සිට "විෂ ලමි"යි විෂය මිට මොලවා ගෙණ "බත්කන්වය"යි උන්නාහ. රජ්ජුරුවෝ බත් කන්ට ඉද සිතන්නාහු දිසාපාමොක් ආචාරී සොළොස් ඇවිරිදිවූ රාජ කුමාරයා හා කැටිව බත් කන්ට ඉඟැන්වූ ගාථාව රජ්ජුරුවෝ සඳහන් කොට කීහ.

එහි අභිප්‍රාය නම්:- 'යම්සේ සතාඤ්කාරයෙහි මීයෝ විසලා දවසෙහයා හැර හාලට කද්ද ? එමෙන් තොප කෙසේ මට විෂලන්ට උන්සාහ කලත් මා විෂ කන්නේ නැත. දවසෙහයා තෝරා සාල් කැවාසේ විෂ තෝරා බත්කම්"යි කී ඉමහත්තේම රාජකුමාරයෝ සැකව "රජ්ජුරුවන්වඤන්සේ දැනපු නියාවේදැ"යි සිතා විෂ නුදුන.

රජ්ජුරුවන් හා කැටිව බත් කා මෙපවත් රාජකුමාරයෝ තමන්ගේ අත වැස්සන්ට කීහ. අතවැස්සෝ එසේ වී නම් කිපදවසක් බැලුව මැනවැ"යි කීහ. පසු දවසෙක රජ්ජුරුවන් ආ සථානයේදී මූදලිවරුන් හා කථා කරණ පරක්කුවක් රාජකුමාරයෝ දැක මෙසේවූ පරක්කුවේදී ගසම් යි සිතා කඩුව ඇර ගෙණ මිනිසුන්ගේ ඇස්වලා බල බලා සිටියාහ.

එවේලාවට රජ්ජුරුවෝ මේ ක්‍රියාව දැක දිසාපාමොක් ආචාරී මෙසේවූ ආ සථානයෙක උන් වේලාවට කියව"යි ඉඟැන්වූ ගාථාව කීහ.

එහි අභිප්‍රාය නම් "තොප ඇම ගෙවලදී උයනෙදී කළ කථාව මා නොදනිති සිතාද? ඒ ඒ තැන සැංගී සිටිනේය"යි කියන්නා රාජකුමාරයෝ සිතින් සැකව පලාගොස් තමන්ගේ අත වැස්සන්ට කීහ. අතවැස්සෝ 'කිපදවසක් ගියකල යම් උපායක් කළමැනව"යි ඉද කියන්නාහු රජ්ජුරුවන් වහන්සේ නොදන්නාසේක. නුඹවහන්සේ සිතින් සැකවෙත පමණක් විනාය"යි කීහ. "යහපතැ"යි කියා රාජකුමාරයෝ ඉතිඉස කඩුව ඇරගෙණ සිටියාහ.

රජ්ජුරුවෝ උඩුමාලට නැගෙන්ටය යි ගොස් සිතන්නාහු දිසාපාමොක් ආචාරී උඩුමාලට නැගෙන්වය යි යන වේලාවට කියන්ට කී ගාථාවෙක් ඇතැයි කියා සඳහන් කොට කීහ.

එහි අභිප්‍රාය නම්:- "තොප මට කළ ප්‍රයෝගත් දනිමි. දැනුත් ඉතිඉස කඩුව ඇරගෙණ මට ගසන්ට සිටි නියාව මා නොදනිති යි සිතව්දැ" යි කීප මුර යෙක ඉවසම් යි කී ඉනිබ්බේ නො ඉවසම්"යි කී අභිප්‍රාය රාජකුමාරයෝ දැන හයින් තුන්තව සැඟවී පලාගොස් තමන්ගේ අතවැස්සන්ට කීහ.

අතවැස්සෝ කියන්නාහු "රජ්ජුරුවෝ තොප මෙසේවූ දෙයක් කෙරෙතියි නො දනිති, තොපි තොප කෙරේ හයින් නො කරණ පමණක් විනා දනි නොත් තොපට කුමක් නො කෙරෙත්ද? රජ්ජුරුවෝ නො දනිතියි රාජ්‍යය ගන්ට උන්සාහකරව"යි කීහ. යහපතැ"යි කියා රාජකුමාරයෝ කඩුව ඇර ගෙණ රජ්ජුරුවෝ වැදහෝනා ශ්‍රී යහන් ගබඩාවේ යාන යට වැද ඔත්තාහ.

රජ්ජුරුවෝ ශ්‍රී යහන් ගබඩාවට වැදහෝනට යන තැනැත්තෝ එලිපත පිට සිව සිතන්නෝ දිසාපාමොක් ආචාරී ශ්‍රීයහන් ගබඩාවට වැදහෝනට යන වේලේ කියන නියායෙන් ඉඟැන්වූ ගාථාවෙක් ඇතැයි සඳහන් කොට කීහ.

එහි අභිප්‍රාය නම්:- "තොප කඩුව ඇරගෙණ පෙරළී පෙරළී වැදහෝනා නියාව මම නො දනිමිද? විෂ ලූ නියාවත්, ආ සථානයේදි කඩුව ඇරගෙණ ගසන්ට ආ නියාවත් ඉනිඉස කඩුව ඇරගෙණ සිටි නියාවත්, දැන් කඩුව ඇර ගෙණ යහනයට වැදනෝනා නියාවත් මම දනිමි යන අභිප්‍රාය කී ගමනේ රාජකුමාරයෝ භයින් තුස්තව කඩුව ඇරගෙණ යට මැස්සෙන් එලියට අවුත් කඩුව යහන පාමුල දමා වැදනෙව "සවාමීනි, නිකම් මිනිසුන්ගේ බසට කෙළෙමි යි මා කෙරේ ක්‍ෂමා කළ මැනවැ"යි කීහ. රජ්ජුරුවෝ තමන් පළමු දැන උන්නාසේම මහා කෝපයෙන්ම යාතින් නැගීසිට තා මුරයෙන් මුරයෙම කළදැ මා නොදනිති යි උනිද? දරුවන් කළ දෙය ඉවසන්ට උවමැතවැයි සිතා මෙතෙකින් දවස් ඉවසා උනිමි. ඉනිබ්බේ නොඉවසිමි" කියා රාජකුමාරයන් දහගෙයි ලවා රැකවල් සලස්වා ඉද සිතන්නාහු "මා මෙතෙක් අනතරායවලින් ගැලවුනේ මාගේ දිසාපාමොක් ආචාරීන් නිසාය"යි ආචාරීන්ගේ ගුණ සඳහන් කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

"රාජකුමාරයන්ද දහගෙයින් මැස්සුම් කප්පා රාජ්‍යයට අමාත්‍යයන් සලස්වා ගත්තුය"යි සම්බුදුරජාණන් වහන්සේ වදාරන්නා "ඒ රජ්ජුරුවෝ එසේ කළේ නමුත් මම මාගේ දරුවන් ඇර වාසයකළ නොහෙමි"යි කීහ. සම්බුදුරජාණන් වහන්සේ මේ නියාව වදාරා මේ තුෂ ජාතකය නිමවා වදාළසේකි.

එසමයෙහි දිසාපාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ යි වදාළසේකි.

---

## 329 බාවේරු ජාතකය

තිවද භූරිප්‍රාඥ යන නම් වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන කීර්ත්තිකයන්ගේ ලාභසත්කාර අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේ ද? යත්,**

සම්බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි පහළවන්නාව පළමු අබුබොත්පාදයෙහි තීර්ත්තිකයන්ට ලාභසත්කාර මහත. සම්බුදුරජාණන් වහන්සේ පහළවූ කල ලාභසත්කාර මදවිය. මේ කථාව සඞඝයා වහන්සේ දම්සභාමණ්ඩපයෙහි රැස්ව වැඩ හිඳ කියා කියා උන්සේක.

සම්බුදුරජාණන් වහන්සේ එතනට වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ"යි විචාරා වදාරා එපවත් සම්බුදුරජාණන් වහන්සේට දැන්වූ කල්හි "මහණෙනි, දැන්මතු නොවෙයි, පෙරත් නීවයෝ අබුබොත්පාදකාලයෙහි ලාභසත්කාරයෙන් මහත්වූය"යි වදාරා ඒ කෙසේ දැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

පිටහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ව්‍යාපාරයෝ මොත්තමෙක් බාවේරු නම් ගමට කවු

ඔකු වඩාගෙණ වෙළඳුමට හියාහ. ඒ නුවර ඇත්තෝ බොහෝ සත්කාර සමාධියෙන් "අපට දෙව"යි කීහ. ව්‍යාපාරයෝ "අප කවුඩා දෙන්නේ නැතැ'යි කියද්දීත් උත්සාහයෙන් කියා මසුරන් දහසක් දී කවුඩා ඇරගත්තාහ. ඒ කියන කවුඩාට එම ගම ඇත්තෝ බොහෝ සත්කාර සම්මාන කළහ.

පසුව මුරයේ ඒ ගමට වෙළඳුමට යන්නා යනපත්ව නවත මොතරකු ගෙන්වාගෙණ ආහ. ඒ මොනරා දැක ඒ ගම ඇත්තෝ මහාසමාධිව "අපට දෙව"යි කීහ. ව්‍යාපාරයෝ අපගේ පළමු මුරයේ ගෙණා කවුඩාත් ඇරගත් තුය. දැන් ගෙණා මොනරාත් ඉල්වුව. අප ගෙණ ගෙණා දෙයම ඇරගන්ට උත්සාහකරව, අප දෙන්නේ නැතැ"යි කියද්දීත් "තොපට පක්ෂි සම්භවෙති. අපට සම්භ නොවෙති"යි කියා "මෙතරා අප දෙන්නේ නැතැ"යි කියද්දීත් මහා උත්සාහයෙන් මසුරන් දහසක් දී මොනරා ඇරගත්තාහ. ඒ කියන මොනරාට ඒ ගම ඇත්තෝ බොහෝ සත්කාර සම්මාන කළාහ.

මොනරා ඇරගත් තැන් පටන් කවුඩාට කැවිලි පෙවිලි ආදියත් අඩුව ආදරත් මදව හිය හෙයින් තමා උත්මැදිරියෙන් පිටත්ව කසළගොඩ ඉද හොයෙක් කුණුකෑල ඇසිද කන්නේය. මොනරාට බොහෝ කැවිලි පෙවිලිත් ඇතිව රන්මැදිරියක් ඉදිකරවා ඊ ලා සැපසේ වාසය කරන්නේය යි වදුරා බුදුව වැඩහිඳ වදුරණසේක් "උත්තමයන් තැනි හෙයින් දසකාරණයකින් අඩුවූ කවුඩා සැප විඳින්නේය. පසුව උත්තමවූ ජාති ඇති ඔධුරවූ නාද ඇති මනාවූ ගාත්‍රා ඇති උත්තමයා ආ තැන් පටන් නිශ්ශොභීවිය.

එසේ හෙයින් සබ්බඤ්ඤුවර්ති වූ සඊඥයන් වහන්සේ නැති අවස්ථාවෙහිදී තීර්ථකයෝ ලාභසත්කාරයෙන් මහත්වූය. යම් මනාවූ ශබ්ද ඇති සඊඥයන් වහන්සේ පහළවූ තැන් පටන් තීර්ථකයෝ ඉරු දුටු කඳෙපැණියන් සෙයින් නිශ්ශොභාවූහ"යි වදුරා මේ ඛාචේරූ ජාතකය නීමවා වදුළසේක.

එසමයෙහි කවුඩා නම් නිඝණ්ඨනාථ පුත්‍රය, එසමයෙහි මොනරා නම් බුදුවූ මම්මය යි වදුළසේක.

---

## 330 විසය්හ ජාතකය

තවද පස්මරුන්බිඳ ජයගත් හෙයින් මාරජී නම්වූ සඊඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සේක් අනේපිඩු මහසිටානන් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

මෙහි වර්තමාන කථාව බදිඛාර ජාතකයෙහි විස්තර වශයෙන් බස්නේය. අනේපිඩු මහසිටාතෝ දේවතාදුව වළක්ව වළක්වා දන්දුන්හ. ඊට ආශ්චර්‍ය්‍ය කිම්ද? කියන්නේ මාසේවූ ලොවතුරා බුදුකෙනෙකුන්ගෙන් අවවාද අසා දන්දීමෙහි පෙර මහාභතමයෝ අබුඩොත්පාද කාලයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර යන් වළක්ව වළක්වා දන්දුන්නෝ වේදැ'යි වදුරා හේ කෙසේදැ?"යි ආරාධිතවූ සඊඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදුළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ විසල්හ නම් සිටුව උපන්නාහුය. දන් හල් කරවා දවස සලඤ්ඤයක් ධන වියදම් කොට ජම්බුවීපයෙහි නගුල් උඩ බඳවා මහත් දානසම්භාරයන් කරන්නාහ.

මේ කුසල සම්භාරයෙහි ආනුභාවයෙන් ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උනුවිය. එවිට ශක්‍රයෝ දිවසින් බලා හෙණ ශක්‍රසම්පත් ඇර ගන්නා නිසා "මූ මේ දානාධ්‍යාසය කෙරෙනී"යි සැකව "දානධ්‍යාසයට මම අන්තරාය කෙරෙමි"යි සිතා අවුත් සිවානන්ගේ දන්දෙන්ට තිබූ එලහිතෙල් සාල් තල මුං ආදීවූ දෙයද රත්රන් මුතුමැණික් සංඛශිලා ප්‍රවාලාදිවූ දෙයද වාල්සරක් ආදීවූ උපභොග සියලු වස්තූද අන්තර්ධාන කරවූහ. සිවානන්ගෙන් දන්දෙන්ට සැලස්වූ පුරුෂයා සලඤ්ඤයක් වස්තුව වියදම්කොට දන්දෙන්ට තිබූ සියලු වස්තූන් අන්තර්ධානවූවා දැක සිවානන්ට ගොසින් කියන්නේ "ස්වාමීනි, දන්දෙන්ට තිබූ සියලු වස්තු අන්තර්ධාන විය. එසේ හෙයින් සෙට දන්දෙන්ට කිසිදෙයකුත් නැහැ'යි කීහ.

එපවත් සිටානෝ අසා "ඊට කාරණා කිම්දැ"යි සිතා තමන්ගේ බිරින්ද ගෙන්වා කියන්නාහු "සෙට දවසට දන්දෙන්ට තුබූ සියලු වස්තුවත් නැතිව අන්තර්ධානවිය. මාගේ රත්රන් මුතුමැණික් ආදී සියලු වස්තුව තුබූ භාණ්ඩාගාර ගෙවල්වල දොර අරවා ඉන් වස්තු වියදම් කොට දන්දෙව'යි කියා වස්තු තුබූ ගෙවල් දොර ඇර බැලු ගමනේ අමුතුක් විවරක කිසි වස්තුවක් නැතිව අන්තර්ධානවූ හෙයින් කිසි වස්තුවකුත් නුදුටු වාහ.

සිටානන්ගේ භාර්‍යාවෝ සිවානන්ට කියන්නාහු "නුඹවහන්සේගේ ඉත තුබූ සළුව හා මාගේ ඉත තුබූ කඹ විතා වී නැලියක්වත් සාල් නැලියක්වත් මස්සක් අකක් වාලක් සරකක් නැතිව සියලු වස්තු අන්තර්ධාන විය"යි කිවුය. සිටානෝ කියන්නාහු "මාගේ ප්‍රාණය තිබූතෙක් වේලා මාගේ දානයව අන්තරාය නොකෙරෙමි. එසේ හෙයින් උන්සාහ ඇතිව ගෙය බලා දන්දෙන්ට නිසි දෙයක් ගෙණෙව"යි කීහ. "ගහපතැ"යි හෙට ගොසින් බැලු ගමනේ මිනිසකු, දමාගිය කදකුත් දැකැත්තකුත් දැක ගොසින් ගෙණවිත් "ස්වාමීනි, මෙපමණක් විතා දුටු දෙයක් නැතැ"යි කියා සිටානන් අතව දුන්හ. සිවානෝ "හද්‍රාව මෙතෙක්දැ අපගේ සියලු වස්තු ඇති හෙයින් දනුත්දී අපිත් සැපසේ රැකුම්හ. දැන් වස්තු නැති හෙයින් රැකෙන්ටත් දන්දෙන්ටත් අනික් මැගෙක් නැත. මේ කදත් දැකැත්තත් ඇරගෙණ වලව ගොසින් තණ දැගෙණවිත් විකොව භාගයක් දන්දෙම්හ. භාගයක් ගෙණ රැකෙම්හ"යි කියා කදත් දැකැත්තත් ඇරගෙණ තණ දැන ලෙස වලට නික්ම තණකදක් ගෙණවිත් විකොට භාගයක් දන්දී භාගයක් තමන් රැකෙන්ටය යි තිබාගත් ගමනේ යාවකයන් එනහෙයින් තමන්ට තුබූ භාගයත් දී නිරාහාරයෙන් ඉඳ මේ නියායෙන් සදවසක් දන්දී නිරාහාරයෙන් උන්නාහ.

සත්වෙනි දවසේ තණකද කරතබාගෙණ ගෙට එන ගමනේ අවුරුද්දම් ශරීරයේ වැදගත් ගමනෙනුත් සත්දවසක් නිරාහාරයෙන් උන් හෙයිනුත් සුබූ මාලවූ ගරීර හෙයිනුත් භ්‍රමිතව තණකද ඇරගෙණ වීථියේ වැටුනාහ. එවිට ශක්‍රයෝ ආකාශයෙහි සිට කියන්නාහු "එම්බල සිටානෙනි, නොප දුප්පත්

අවසථාවෙහි තොපගේ ප්‍රාණයද රැක නොගෙණ දන්නොදී සැපසේ වැදහෙව ඉඳුව"යි ශක්‍රයෝ සිවානන්ට අවවාද කොට කීහ. එවිට සිවානෝ "තෙපි කවුරු දැ?"යි ශක්‍රයන් අනින් විචාළෝය. ශක්‍රයෝ "මම ශක්‍රයෙක්මි"යි කිවුය. සිවානෝ කියන්නාහු තොප මේසාවූ ශක්‍රසම්පත් ලද්දේ විශෙෂයෙන් දන්දී පඤ්චශීලය රැක පෝය අෂ්ඨාඞග ශීලය රැකවුව. මෙසේ පින්කොට මෙසේවූ ශක්‍රසම්පත් ලැබ සිටිතෝත් මේලෙස කියන්ට කාරණා කිම්ද? නොප එක ශක්‍ර කෙණෙකුත් තබා දහසක් ශක්‍රයෝ අවුදින් පින් නොකරවයි කිවු තමුත් මාගේ දැනයට අන්තරාය නොකරමියි. මෙසේවූ දුක්ඛිතව සිටත් මාගේ දෑකඬ්‍යාශයට අඩුවක් නොකරමි"යි කී කල්හි ශක්‍රයෝ "මෙසේ දුක්ඛිතව සිටත් නොප මෙසේ පින්කරමි. මාගේ දැනයට අඩුවක් නොකරමි කියන්නේ කවරකාරණයක් නිසාදැ?"යි විචාළ කල්හි සිවානෝ කියන්නේ "එම්බල, ශක්‍රය, ශක්‍රසම්පත් මාරසම්පත් බ්‍රහ්මසම්පත් ඇරගන්නා නිසා නොවෙයි, තා ඇතුළුවූ සුවිසි අසඞඛ්‍යයක් සත්ත්වයන් සංසාර සාගරයෙන් ගොඩලා සම්‍යක් සම්බොධියට පැමිණෙන නිසාය"යි කීහ.

එපවත් අසා ශක්‍රයෝ වඳා සන්තුෂ්ටව සිවානන්ගේ ශරීරය තමන්ගේ අතින් පිරිමැද ලූ ගමනේ දිව්‍ය පහස ඇතින් සිවානන්ගේ ශරීරය පිණා නැගී සිරියහ. එවිට ශක්‍රයෝ සිවානන්ට කියන්නාහු "පළමුකොට නොප දෙන්නේ සලඤ්ඤයක් වස්තුවේද? මෙතැන් පවත් දෙලොස් ලක්ෂයක් සම්පත් විසදම්කොට දන්දෙව"යි කියා සිවානන්ගේ අන්තඞ්ගත කළ සම්පත් සිවානන්ට පැ ශක්‍රයෝ තමන්ගෙනුත් සියලු සම්පතින් උන්ගේ ගෙය පුරා තමන්ගේ ශක්‍ර භවනයට ගියහ යි සිවානෝ බොහෝ දෑකඬ්‍යාශය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහ යි වදාරා මේ විසඥ්ඤ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සිටුව උපන්නෙමි බුදුවූ මම්මය යි වදාළසේක.

## 331 නද්ධරි ජාතකය

එවද මේ ජාතකයෙහි වර්තමාන කථාව හා අතීත කථාව මතු කියනු ලබන කුණාල ජාතකයෙහි ප්‍රකාශ වන්නේය.

## 332 වානර ජාතකය

එවද නරසිංහවූ සම්බුදුරජාණන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත සථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලදී.

**හේ කෙසේද? යත්**

දෙවදත්ත සථවිරයන් වහන්සේ වෛරයට උත්සාහ කරණ නියාව දම් සභාවේ රැස්වූ මාලුවරුන් වහන්සේ කිය කියා වැඩ උන්තෙනව සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාව පූර්වාඞගයෙහි කවර කථාවකින්

යුක්තව උනුදැ?''යි විචාරා වදාරා එපවත් අසා ''මහණෙනි, දැන්මතු නොවෙයි. පෙරත් වෛරයට උත්සාහ කළෝ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සම්‍යක්සම්බුදුන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ එක් ගසෙක වානරව උපන්සේක. උන්වහන්සේ වාසය කරන්නාවූ වනය ලඟ ගංගාවෙක් ඇත. ඒ ගඟ වසන්නාවූ කිඹුලෙක් ඇත. ඒ කිඹුලාගේ කිඹුල්දෙනට ඒ වානරයාගේ හෘදයමාංශය අනුභව කරන්ට දෙළෙක් උපන. ඒ කිඹුල්දෙන ''මේ වදුරාගේ හෘදයමාංශය ලදහොත් විනා ජීවත්වන්නේ නැතැ''යි කිඹුලාට කිව. කිඹුලා ගොසින් බොධිසත්ත්වයන්ට කියන්නේ ''එම්බා සබඳ වදුරාතෙනි, මේ එක තෙනම තොප වාසය කරන්නේ ඇයිදැ?යි මේ ගඟින් එතෙර යහපත් අමෘත ඵලාඵල ඇති උයනෙක් ඇත, ඊ ගොසින් අනුභව කළ කල නපුරුදැ?''යි කිව.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු ''ගඟින් එතර අප යෑහැකි වුව කෙසේ යමෝ දැ''යි කිව. එවිව කිඹුලා කියන්නේ ''මම පිට ඉඳුවාගෙණ ගොස් එතර ලමි. මා පිටට නැඟෙව''යි කීය. එවිට බොධිසත්ත්වයෝ ''යහපතැ''යි කියා කිඹුලා පිටට පැනපුවාහ. කිඹුලාත් බොධිසත්ත්වයෝත් ඇරගෙණ ගඟ මධ්‍යයට ගොසින් ගඟ ගිලෙන්ට වත, එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු ''ඇයි සබඳ, තොප මා කැඳවාගෙණ පිට ඉඳුවාගෙණ ආයේ ගඟින් එතරලන්ට වේද? දැන් තෝ මා බා දියයට ගිලෙන්නේ ඇයිදැ?''යි විචාළ කල්හි කිඹුලා කියන්නේ ''තොපට ස්නෙහයෙන් ගඟින් එතෙර ඵලාඵල කන්ට ගෙණාම්ද? මාගේ කිඹුල්දෙනව තොපගේ හෘදයමාංශයට දෙළක් හෙයින් තොප මරා උන්ට හෘදයමාංශය දෙන්ව ගෙණාම්'' කී කල්හි බොධිසත්ත්වයෝ කියන්නාහු ''එසේ කළ මේ සැටියටම ගොඩදී කිව, මාගේ හෘදයමාංශය තෙල දිඹුල්ගස රතුරතුව පෙණෙන්නේය. මීට ආයාසය ගන්නේ ඇයිදැ?''යි කිව.

එවිට කිඹුලාම ''එසේ කල කළමනා කිම්දැ?''යි කීය. බොධිසත්ත්වයෝ කියන්නාහු ''මා ගෙණගොස් දිඹුල්ගසට නන්වාලන්නා හෘදය මාංසය දීලම්'' කිඹුලාත් ''සැබව''යි සිතා බොධිසත්ත්වයන් ගෙණගොස් දිඹුල්ගස සමීපයට හිය.

බොධිසත්ත්වයෝත් කිඹුලා පිටින් දිඹුල්ගසට පැන ''තොපි මා රැවටුව, මම තොප රවටාපීම්, වදුරන්ගේ හෘදයමාංශයත් දිඹුල්ගස උඩ තිබේද? තා රවටාලා මාගේ ප්‍රාණය ගළවා ගනිම්, තොපගේ උයනේ ඇති අමෘත ඵලාඵල යෙනුත් මට කම් නැතැ''යි වදාරා මේ **වානර ජාතකය** නිමවා වදාළසේක

එසමයෙහි කිඹුලා නම් දෙවදත්ත සථවිරය, වානරව උපන්නෙම් බුදුවූ මම් වේදැයි වදාළසේකි.

---

## 333 කුන්තානි ජාතකය

මේවද නරවර වූ සම්‍යක්සම්බුදුන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කොස්ලිහිණියක අරභයා මේ ජාතකය දක්වන ලදහ.

**ඒ කෙසේද? යන්**

කෝසල රජ්ජුරුවන් වහන්සේ වඩන කොස්ලිහිණියක් ඇත, ඒ කොසොල් රජ්ජුරුවන්ගේ ඒ ඒ රජ්ජුරුවන්ට රහසිගතව යවන්නාවූ යම් සන්දේශයක් ඇත් නමුත් ගෙණ ගොස් ඒ ඒ රජ්ජුරුවන්ට දී ඒ ඒ රජ්ජුරුවන්ගෙන් දී එවන සන්දේශයක් ඇත් නමුත් තමන්ගේ රජ්ජුරුවන්ට ගෙණවිත් දුන මෙහෙවර සැලැස්වීමේ සිටින්නිය.

එක්දවසක් ඒ කොස්ලිහිණියා රජ්ජුරුකෙණෙකුන් ලඟට දුන මේවර යාදී රජගෙයි කෙළනා කුඩා කොල්ලෝ ඒ කොස්ලිහිණි මේවර ගොසින් ඇවිදින් ''මාගේ දරුවෝ කොයිදැ?''යි විවාළිය. ''අසවල් කුඩා කොලු මැඩ මරාපිය''යි කුඩා කොල්ලෝ කීහ. ඒ කොසොල් රජ්ජුරුවන්ගේ වාසල බැඳ සිටිනා ව්‍යාඝ්‍රයෙක් ඇත. එක් දවසක් කුඩා කොල්ලෝ කෙළගත යන්නාහු ඒ ව්‍යාඝ්‍රයා ලඟට කියාහ. ලිහිණීන් කුඩා කොල්ලන් හා එක්වම කෙළගණ යන්කාසේ ගොසින් කුඩාකොල්ලන් ව්‍යාඝ්‍රයාට ලන්වූ කල්හි තමාගේ දරුවන් මැරූ කුඩාකොල්ලා පියාපතින් ව්‍යාඝ්‍රයා ලඟට යතා දමාලූහ. ව්‍යාඝ්‍රයාන් ඒ කුඩා කොල්ලා අල්වාගෙණ කඩා කා මැරීය. එවිට කොස්ලිහිණි ''මාගේ පලිය ඇරගනිම්, මා කෙළේ රාජද්‍රොහය. මා මෙතන රැඳීම කටයුතු නොවෙයි'' කියා රජ්ජුරුවන්ට කියාලා ගියාය.

මේ කථාව දම්සභාවේ රැස්වූ මාලුවරුන් වහන්සේ කිය කියා උන් තෙතට සඕඤයන්වහන්සේ වැඩ වදාරා ''මහණෙනි, මා එන්කාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනු දැ?''යි විවාරා වදාරා එපවත් අසා ''දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරකල ද මේ කොස්ලිහිණිය පලි ඇරගත්තේම වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සඕඤයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පසිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ කොස්ලිහිණියෙක් ඇත, ඒ කොස් ලිහිණිය රජ්ජුරුවන්ගේ රහසිගතව ඒ ඒ රජදරුවන්ට යවන්කාවූ යම් සන්දේශයෙක් ඇත්තම් ගෙණ ගොස් දී ඒ රජදරුවන්ගේ බරණැස් රජ්ජුරුවන්ට එවන්නාවූ සන්දේශ පත්‍රයෙක් ඇත් නමුත් ගෙණවුන් දී දුන මෙහෙවර සැලැස්වීමෙහි සිටින්නිය.

එක් දවසක් ඒ කොස්ලිහිණිය එක් නුවරකට මෙහෙවර යාදී රජගෙයි කෙළනා කුඩා කොල්ලෝ කොස්ලිහිණියගේ පැටවුන් මැඩ මරාපිහ. කොස් ලිහිණි ඇවිත් ''මාගේ දරුවෝ කොයිදැ?''යි විවාළිය. කෙළනා කුමාරවරු කියන්නාහු ''අසවල් කුමාරයා නොපගේ දරුවන් මැඩ මරාපිය''යි කීහ.

එවිට කොස්ලිහිණි රජ්ජුරුවන්ගේ වාසල බැඳ සිටිනා ව්‍යාඝ්‍රයා ලඟට යන්නාවූ කුඩා කොල්ලන් හා සමග ගොස් තමාගේ දරුවන් මැඩ මැරූ කුමාරයා පියාපතින් ගසා ව්‍යාඝ්‍රයා ලඟට යන්නා දමාලුව, ව්‍යාඝ්‍රයාන් අල්වා ගෙණ කඩා කා මැරීය. එවිඹ කොස්ලිහිණි රජ්ජුරුවන්ගේ රජගෙයි කෙළිනා කුමාරවරුන්ට ''රජ්ජුරුවන්වහන්සේගේ භික්මවීම් නැති හෙයින් වේද? මාගේ දරුවන් මැඩ මැරුවේ. මේ මාගේ දරුවන් මැරූ සෝකයෙන් කුමාරයා

ව්‍යාඝ්‍රයා ලඟට යන්නා දමා පළි ඇරගනිමි. දරු ස්නෙහයෙන් කළ පමණක් විතා මාත් කෙළේ රාජද්‍රොහය. ඉතිකිත් මා මෙතන රැඳීම කටයුතු නොවෙයි" කියා යන්ට වන්නීය.

එවිට රජ්ජුරුවෝ එපවත් දැන කොස්ලිහිණිය ගෙන්වා ගෙණ "තොපගේ දරුවන් මැරූ කුමාරයා මරා නෙපි පළි ඇරගත්තුය, පළියට පළි සරුවුව, ඒ නිසා තොප කෙරේ උදහස් නොවම්හ තොප මෙතනින් යන්ට කාරණා කිම්ද? නොයව"යි කීහ.

එවිට කොස්ලිහිණි කියන්නී "දේවයන්වහන්ස, දරුවන් කෙරේ සෝකයෙන් ඉවසාගත නොහී කුමාරයා මැරූ පමණක් විතා මා කෙළේ රාජද්‍රොහය. එසේ හෙයින් මම මෙතන රඳන්ට භය ඇත්තෙමි." කිව. රජ්ජුරුවෝ දෙවෙනි තුන්වෙනි කිවත් නොහිවිස කොස්ලිහිණිය පළාගියාහයි වදාරා මේ කුන්තානි ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කොස්ලිහිණි මෙසමයෙහිත් කොස්ලිහිණි ම ය, බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

---

## 334 අම්බචොර ජාතකය

මේවද කොසිය ජාතකය කුණාලයෙහි විස්තරවශයෙන් බස්නේය. ධර්මරාජ ගුරුවූ සර්වඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අඹසොර භික්ෂූන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදහ.

**හේ කෙසේද? යත්**

එක්තරා මහළු භික්ෂුකෙණෙකුන් වහන්සේ අඹ උයනෙක වාසයකරණ සේක. එකියන අඹ උයනේ අඹ සොරු කඩා කාපුවාහ සිටු දූ සතරදෙනෙක් අචිරවතී නම් ගංගාවෙන් ඉස්සෝධා නහා අඹුයන බලන්වයසි කියා උයනට ආවාහ.

ඒ වේලාවට එකියන මහළු භික්ෂූන්වහන්සේ උයනට වැඩ උයනේ අඹ තැති නියාවත් එකියන සිටුදූන් සතරදෙනාත් සිටියා දැක එසේවිනම් මෙකියන සිටුදූ සතරදෙනා වන අඹ කඩාගත්තේයයි සිතා "තොප ඇමය මේ අඹ කඩාගත්තේය"යි කියන්නා එකියන සිටුදූ සතරදෙන "මේ අප නාපියා ආ පමණක් විතා අප කැඩූ අඹයක් නැතැ"යි කීහ.

එසේත් "මට දිවුරන්ට උවමැනවැ"යි කියන්නා "යහපතැ"යි කියා එකියන සිටු දූ සතරදෙන දිවුලාහ. මේ නියායෙන් එකියන සිටු දූ සතරදෙනා ලජ්ජා කරවා පියා උන් ඇම තමතමන්ගේ ගෙවලට යවූසේක.

මේ කථාව දම්සභා මණ්ඩපයට රැස්වූ මාළුවරුන්වහන්සේ කථාකොට කොට වැඩඋන් තැනට සර්වඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනු දැ?"යි විචාරා වදාරා එපවත් අසා, "මහණෙනි, දැන් මතු නොවෙයි, පෙරත් මේ භික්ෂූහු ස්ත්‍රීන් ලජ්ජාකරවූවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සර්වඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක්තරා තාපසකෙණෙක් අඹ උයනේ වාසය කරන්නාහු ඒ ඇත්තාවූ අඹ තමුනුත් කා අදුනන්වත් දී වඤ්චා ප්‍රයෝගයෙන් දවස් යවන්නාහ.

එසේම බොධිසත්ත්වයන්වහන්සේ ශක්‍රදේවේන්ද්‍රව ඉපිද මනුෂ්‍යලෝකය බලා වදුරණසේක් "කවුරු දෙමව්පියන්ට ආදර කෙරෙන්ද? කවුරු අටසිල් රකිද්දෝ? කවර තාපසකෙණෙක් තපස් රකිද්දෝහෝ"යි බලා වදුරණසේක් මේ තාපසයන්ගේ කුහක තපස් දැක ඒ උයනට අවුත් උයනේ අඹ අනනඬාන කොට පැවාහ.

ඒ වේලාවට බරණැස්නුවර සිටු දූ සතරදෙනෙක් නාපියා එතනට ආවාහ තාපසයෝ එතනට අවුත් උයනේ අඹ නැති නියාව දැකැ 'මේ උයනේ අඹ කඩාගත්තෝ නොපිය"යි කියන්නා උන සතරදෙන "අප අඹ කැඩුවේ නැහැ"යි කිහ. "එසේ කීවත් කම් නැත, දිවුරන්ට උවමැනවැ"යි කියන්නා "යහපතැ"යි ගිවිස පළමුවන තැනැත්තී දිවුරන්නී "ඉස්කර පුරා සුදුලොම් අඹුවෙන් උදුරන්නාවූ වයස් පිරුණු මාළුපුරුෂයෙකු අතුරෙ ඉදිම්මැයි මේ අඹ කැඩිම්තමැ"යි කියා කිහ.

දෙවෙනි ස්ත්‍රී කියන්නී "වයස් පසළොස් විස්ස තිස අවසථාවේදී සරණ නොගොස් ඔබදී සරණයම්මැ"යි කියා දිවුලාහ.

තුන්වන ස්ත්‍රී දිවුරන්නී "අනංගයාගෙන් ශරප්‍රහාර ලදින්ම දෙගවුවෙක ඉන්නා ප්‍රියවූ පුරුෂයෙකු ලනට ගොස් ඒ පුරුෂයා ලැබගන්නෙම්මැයි මේ අඹ කැඩිම්තමැ"යි කියා කිහ

සතරවන ස්ත්‍රී දිවුරන්නී "යහපත් කොව ඉස්සෝධා තහා සාන්දුජබාදූ ආදීවූ දෙය හා කොකුන් ගල්වාගෙණ යහපත්කොට අතුළ යානේ තනිව වැදගෝමැයි මේ අඹ කැඩිම්තමැ"යි කියා දිවුලාහ.

එවිට තාපසයෝ "තොපි ඇම දිවුලනියා යහපතැ"යි කියා උන් සතර දෙනා "තොපි තොපගේ ගෙවලට යව"යි කියා යවාපුවාහ.

ශක්‍රයෝත් භයංකාර වෙසක් මවාගෙණ තාපසයනුත් එතනින් පහකොටපුව සි වදුරා මේ අම්බචොර ජාතකය නිමවා වදුළසේක.

එසමයෙහි තාපසයෝ නම් මෙසමයෙහි මෙකියන භික්ෂූහුය, එසමයෙහි සිටු දූ සතරදෙනා නම් මෙසමයෙහි මේ සිටු දූ සතරදෙනාමය, එසමයෙහි ශක්‍රව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදුළසේකි.

---

## 335
## ගජකුම්භ ජාතකය

තිවද ධර්මරාජත්වූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කුසීත භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදහ.

**ඒ කෙසේද? යත්,**

එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ කළමනා පිළිවෙත්හිද උගතමනා ධර්මයන් නොසිඟැත්මෙන් කුසීත භාවය කරණසේක. එපවත් දම්සභා මණ්ඩප යෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ කිය කියා වැඩලන් තෙතව සිටිඳුයන් වහන්සේ වැඩවදුරා "මහණෙනි, මා එන්නාට පූජාභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනු දැ?"යි විචාරා වදුරා, "ඒ කෙසේ දැ?"යි ආරාධිතවූ සිටිඳුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටමහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්සේක. රජ්ජුරුවෝ සියලු කටයුත්තෙහි කුසීතව වාසය කරන්නාහ. බොධිසත්ත්වයෝ කුසීතභාවය අරවාපියම් දෝ හෝ යි සිතා උන්කලට එක් දවසක් රජ්ජුරුවෝ මඟුල් උයනට ක්‍රීඩාවටය යි ගියාහ.

ඒ උයනේ ගජකුම්භයෝය යි යන තිරිසනෙකු යන්නාවූ රජ්ජුරුවෝ දැක බොධිසත්ත්වයන් අතින් "මේ කුමන තිරිසනෙක්ද?"යි විචාළාහ.

බොධිසත්ත්වයෝ "සවාමීනි, මේ ගජකුම්භයෝය යි යන තිරිසනෙකැ"යි කියා බොධිසත්ත්වයෝ ගජකුම්භයා හා කැටිව කථාකරන්නේ "එම්බල ගජ කුම්භය, තාගේ ගමන් දුවල්නිස්සේ පලායෙයි නම් අඟලක් නෝ දෙඅඟලක් හෝ පලායන්නෙහිය. ඉදින් ලැවු ගින්නෙක් වැදගත් නම් කෙසේ ගැලවීයෙයි. දැ?"යි බොධිසත්ත්වයෝ ගජකුම්භයා අතින් විචාළාහ. ගජකුම්භයා කියන්නේ "ගස් බිලයක හෝ පොළොවට හෝ වැදයෙමි. ඉදින් එසේවූ දෙයක් නොලදින් නම් මාගේ ජාතිකමීය"යි කීහ.

එවිට බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු "සවාමීනි, මේ ගජ කුම්භයා තමාගේ කුසීත භාවයෙන් යම් දුකඛයකට පැමිණේද? එමෙන් තපස්වීවරුන් වහන්සේද රජ්ජුරුවන් වහන්සේද ගිහි දන ද තමතමන්ගේ කළමනා ඒ ඒ කටයුත්තෙහි ප්‍රමාද වෙත්නම් පසද භායන පක්ෂයෙහි චන්ද්‍රයා මෙන් භායනයට යන්නාහ.

යම් තපස්වී කෙණෙක් තමන් කළමනා වත්පිළිවෙත් ආදීවූ දෙය වේලා නොවරදවා විචාරත්නම් එසේවූ සත්ත්වයන්ට අවවාද කෙරෙද්ද? යම් රජ්ජුරු කෙණෙක් තමන්ගේ රාජ්‍යයේ කළමනා කටයුතු කායී ඒ ඒ කායී වේලෙහි විචාරා කියද්ද? යම් ගිහි කෙණෙක් තමන්ගේ කල්පනා ගොවිතැන් ආදීවූ සියලු කටයුතු වේලා නොවරදවා විචාරත් නම් එසේවූ සත්ත්වයන්ට සියලු ඓශ්වර්‍යී කලාවෙන් කලාවට වඩනා චූණීවන්ද්‍රයා මෙන් වඩනේය"යි කීහ.

"මේ කීයේ මට ය"යි රජ්ජුරුවෝ දැන එතැන්පටන් කුසීත භාවය හැර රාජ්‍යය කළහයි වදුරා මේ ගජකුම්භ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් මේ භික්ෂුහුය, එසමයෙහි අමාත්‍යව උපන් තෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

## 336 කේසව ජාතකය

එවද දෙවාතිදෙවවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි විශ්වාස භෝජනයක් අරභයා මේ ජාතකය දක්වනලදී.

අනේපිඬු මහසිටාණන්ගේ ගෙයි දවස්පතා පන්සියයක් භික්ෂූන්වහන්සේ වළඳන සේක. සෙසු සඬහයා වහන්සේත් අවිච්ඡින්නව එළඹෙන සේක. සියලු සඬහයා වහන්සේට අනේපිඬු මහසිටාණන්ගේ ගෙය නම් සතරමං සන්ධියෙහි සාරා තිබූ පැන් පොකුණෙක් විය.

මේ නියාවට දවස් යවන කල්හි එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ තුවර ප්‍රදක්ෂිණා කොට නික්මෙන කල්හි "බොහෝ සඬහයා වහන්සේ අනේපිඬු මහසිටාණන්ගේ ගෙට වඩිනා නියා දැක උන්වහන්සේලා බොහෝව අනේපිඬු මහසිටාණන්ගේ ගෙට වඩිනේ කුමක්නියාදැ?" යි විචාරා "නිත්‍ය සඬහයාවහන්සේ පන්සියයක්දෙනා වහන්සේ වළඳන්ට උවමැනවැ" යි සිතා සම්බුදුරජාණන් වහන්සේ පවරා පන්සියයක් සඬහයාවහන්සේට රසමසවුලෙන් යුක්තවූ භෝජනය වළඳවන්නාහ.

මේනියාවට දන්දෙන්ට සැලසූ පමණක්විනා 'අසවල් කෙණෙක් සඬහයා වහන්සේට විශ්වාසයෙන් වළඳවා"යි නො සැලසූහ. ඇසූ මෙහෙවර නියාවට පාත්‍ර කටයුතු කොට පිළිගන්වා පියන්නාහ, සඬහයා වහන්සේ පාත්‍ර පිළිගෙණ තම තමන්වහන්සේ හිත විශ්වාස තෙනට පාත්‍ර ගෙණගොස් පාත්‍රවල බත් ඒ උපාසකවරුන්ට දී උන්ගෙන් හිත විශ්වාසයෙන් පිළිගැන්වූ යම් ආහාරයක් වළඳනසේක.

එක්දවසක් කොසොල් රජ්ජුරුවන්ට බොහෝ කොට වැල වරකා අඹ දඹ ආදීකොට ඇති මධුරඵල බොහෝකොට ගෙණාහ. රජ්ජුරුවෝ "සඬහයා වහන්සේට මධුරඵල ජාති යව"යි නියා යවූහ සඬහයාවහන්සේ වළඳන්ට ඒ ඒ තෙනට වැඩපුසේක. එක්කෙණකුත් වහන්සේ නොදැක රජ්ජුරුවන් කරා ගොසින් "සවාමීනි, එකවහන්දැ නමකුත් නුදුටුයෙමි" කීහ. රජ්ජුරුවෝ "මාගෙන් දීලූ භෝජනය මගේ රජගෙයිදී නොවළඳා ඒ ඒ තැනට ගොසින් වළඳන්ට කාරණා කිම්දැ?" යි සිතා "සම්බුදුරජාණන් වහන්සේ අතින් විචාරම්, සඬහයා වහන්සේ මාගෙන් දෙන දානය මාගේ ගෙයිදී නොවළඳා නම් ඒ ඒ තැන වළඳන සේක. කවර කාරණයකිම් දැ?" යි විචාළාහ.

සම්බුදුරජාණන් වහන්සේ "රජ්ජුරුවෙනි, සඬහයා වහන්සේට දන්දීම නම් ආදර විශ්වාස ඇතිව පයට දිය දී පය සෝදවා දූහැටි පැන් දී විශ්වාසව දන් දෙතොත් වළඳනසේක. ඕවා දියට දන් දුනැයි වළඳන්ට අපහසුය. රජ්ජුරුවෙනි, පෙර උත්තමයන්ට පන්සියයක් වෙදවරු වෙදකම් කරණ ගමනේ ව්‍යාධියෙන් නොසිදෙන්නා එතනින් පලාගොස් තමන්ට හිතවිශ්වාස වූවන්ගෙන් ගොඩ ඇල් භූරුවී ආදියෙන් උළුකැන් පිසදුන් ගමනේ ව්‍යාධි සන්සිදුනේය. එසේහෙයින් රජ්ජුරුවෙනි, සංඝයා වහන්සේට නම් ආදර භක්තියෙන් දීලූ දානය මට හේය"යි වදාරා "ඒ කෙසේදැ?" යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෙණෙකුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ උතුම්වූ බ්‍රාහ්මණකුලයක ඉපිද කපප නම්ව පඤ්චකාමයෙහි ආදීනව දැක හිමාලය වනයට ගොස් කේසව නම් තාපස යන් පන්සියයක්දෙනාට නායකව වාසය කරන්නවුන් දැක එකියන තාපසයන් ලඟ බොධිසත්ත්වයෝ කපප නම් තාපසව අතවැස්සන්ට ප්‍රධානව අතවැසිව හිත විශ්වාසව වාසය කරන්නාහ.

එසමයෙහි කේසව තාපසයෝ වැසි සාරමස පැමිණි හෙයින් ලුණු ඇඹුල් පිණිස තමන්ගේ පන්සියයක් තාපසවරුන් පිරිවරා බරණැස් නුවරට ගොසින් එනුවර රජ්ජුරුවන්ගේ උද්‍යානයෙහිද සැතපී නිදා නැගී පන්සියයක් තාපස වරුන්ගේ උද්‍යානයෙහි රඳවා වස් සාරමස උන්කල්හි වස් සාරමස ඉකුත් ගමනේ කේසව නම් තාපසයෝ "අපගේ හිමාලය වනයට නික්මෙම්හ"යි රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝ "නුඹවහන්සේ වයෝවෘඩ සේක. වතාන්තරයේ ඉඳ ප්‍රයෝජන කිම්ද? නුඹවහන්සේගේ පන්සියයක් තාපසවරුන් යවා නුඹවහන්සේ රැඳුන මැනවැ"යි කීහ. කේසව නම් තාපසයෝ "යහපතැ"යි කියා තමන්ගේ පන්සියයක් තාපසවරුන් කපප නම් තාපසයන්ට පාවාදී ගෙණ තාපස කමට සලස්වා හිමාලය වනයට යවා රජ්ජුරුරවන් කී හෙයින් රැඳුනා පමණක් විනා කේසව නම් තාපසයෝ කප්ප නම් තාපසයන්ට අධිකප්‍රේම ඇත්තාහ. ඒ ප්‍රේම යෙන් රැ නිදිමැරීමෙන් කෑපු ආහාරය නොදිරීමෙන් කේසව නම් තාපසයන්ට රක්ත අතීසාරය ඇතිව ව්‍යාධියෙන් පීඩිතවූ කල්හි රජ්ජුරුවෝ එපවත් දැන තමන්ගේ අඹග වෛද්‍යයන් පන්සියයක් ලවා වෙදකම් කරවන්ට පවත් ගත්තාහ.

දවසින් දවස කේසව නම් තාපසයන්ට ව්‍යාධිය දියුණුවත්විනා අඩුවෙක් නුවූයේය. එවිට කේසව තාපසයෝ රජ්ජුරුවන්ට කියන්නාහු "රජ්ජුරුවෙනි, මා ලෙඩින් ගොඩනැගෙන්නා කැමැත්තාද? මේ ලෙඩින් නැසීයන්නා කැමැත්තා දැ?"යි විමාළ කල්හි රජ්ජුරුවෝ "සඛාමින්වහන්ස සැපසේ ලෙඩින් ගොඩනැගෙන්නා කැමැත්තෙමි"යි කීහ. "එසේවී නම් මාගේ හිමාලයෙහි කප්ප නම් තාපසයන් ලඟට මා ඇරලවා පියව, මේ ලෙඩින් ගොඩනැගෙමි කීහ.

රජ්ජුරුවෝ "යහපතැ"යි කියා තමන් ලඟ සිටිනා නාරද නම් අමාත්‍ය යකු කැඳවා "කේසව නම් තපස්වීන් කැඳවාගෙණ ගොසින් උන්වහන්සේ හිමා ලය වනයෙහි ඇරලවා එව"යි කීහ. නාරද නම් අමාත්‍යයා "යහපත සඛාමිනි" කියා කේසව නම් තාපසයන් හා බොහෝ තාපසවරුන් වාසය කරන්නාවූ උන් වහන්සේ පන්සලට ගෙණගොස්ලූහ. කේසව නම් තාපසයෝ කප්ප නම් තාපසයන් දුටු අධිකවූ ප්‍රේමයෙන් ගොඩ ඇල් භූරුවී ආදියෙන් ලුණු ලා දුම් නැතිව පිස වත්කළ උළුකැන් ආදර ගෞරවයෙන් වළඳවාලූ ගමනේ රක්ත අතීසාරය ගුණව ගියේය.

එවිට බරණැස් රජ්ජුරුවෝ නාරද නම් අමාත්‍යයා කැඳවා කියන්නාහු අපගේ කේසව නම් තාපසයන් වහන්සේගේ ව්‍යාධිය සංසිඳුනිදෝ හෝසි නියම දැන පියා එව"යි යවූහ.

තාරද තම් අමාත්‍යයා තාපසයන් සමීපයට ගොසින් "සුවාමීනි, වෙද වරුන් පන්සියයක් ලවා වෙදකම් කරවූ ගමනේ ගුණතුවූ රක්ත අතීසාරය දැන් කවර සැටියේ ගුණව ගියේදැ?යි විවාළේය. කේසව තම් තාපසයන් "තාරද තම් අමාත්‍යයා මාගේ ව්‍යාධිය සංසිඳුනු කාරණා අසව"යි කියා කියනසේක් කප්ප නම් තාපසයන්ගේ ප්‍රිය සම්පත්තවූ පන්සලෙහි විශෙෂවූ ගුණයෙන් හා කප්ප නම් තාපසයන් මා කෙරේ අති භක්ති ප්‍රේමයෙන් හා ගොඩ ඇල් මූරුවී ආදියෙන් ලුණු දුම් ආදිය කැතිව පිස වත්කොට දුන් උළුකැතින් මාගේ ව්‍යාධිය සංසිඳුනැ"යි තාරද තම් අමාත්‍යයාට කීසේක.

අමාත්‍යයා කියන්නේ "රජ්ජුරුවන් වහන්සේ දෙනලද සුහොජනවූ ආහාරයෙන් ගුණකොදී මෙසේවූ කටුක ආහාරයෙන් ගුණවූයේ කවර කාරණය කිම්දැ?"යි විවාළේය. කේසව තාපසයෝ අමාත්‍යය, භෝජනය කෙසේ යහ පත්වූවත් කටුකවූවත් විශ්වාස භොජනය මානැගිය. නිකම් තැනින් කැවාවූ මධුර භොජන නියාවට හිත විශ්වාසයන්ගෙන් බීපු ඇඹුල් කෑදට අඩුය"යි කී සේක. මේ නියාවට බරණැස් රජ්ජුරුවන්ට තාරද තම් අමාත්‍යයා ඇවිත් කීන සි වදුරා මේ කේසව තම් ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවෝ තම් ආනන්ද සථවිරය, එසමයෙහි කේසව තාපසයෝ තම් ශාරිපුත්‍ර සථවිරයෝය. තාරද අමාත්‍යයා තම් බක තම් බ්‍රාහ්මණයෝය එසමයෙහි කප්ප තාපසව උපන්නෙම් බුදුවූ මම්මය සි වදාළසේක.

---

## 337 අයකූට ජාතකය

**එ**වද ලොක ගුරුවූ සම්බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලොකාර්ථචරියාව අරභයා මේ ජාතකය දක්වන ලදි.

මෙහි ව තීර්ථාහකථාව මහාකණ්හ ජාතකයෙහි විස්තරවශයෙන් පෙණෙන් නේය. මෙහි වනාහි දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ "සම්බුදුරජාණන් වහන්සේ ලොකාර්ථචරියාව කළ නියාව යහපතැ"යි කියා වැඩ උන්තෙනට සම්බුදුරජාණන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ?"යි විවාරා වදාරා එපවත් අසා ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පසුගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බරණැස්නුවර බොහෝ මනුෂ්‍යයෝ යක්ෂයන්ට ප්‍රේතයන්ට එළවන් කුකුළන් ආදීවූ ප්‍රාණීන් බොහෝ මරා බිලියම් දෙන්නාහ. රජ්ජුරුවෝ නුවරවාසීන් බොහෝ යක්ෂයන්ට ප්‍රේතයන්ට ප්‍රාණීන් මරා බිලියම් දෙන නියාව අසා "මාගේ ආඥ ඇත්නම් නුවර ප්‍රාණවධ කළ නොහැක්කැ"යි බෙරලැවූහ.

එහෙත් පටන් ප්‍රේතයන්ට බිලියම් නැතිව ගියහෙයින් යක්ෂයෝ ඉඳ කථාකරන්නාහු "අපට බිලියම් නැතිකලෝ අසවල් රජ්ජුරුවෝය. උන්ගේ

ඉස යකුළකින් පළා මරාපියන්ට උවමැනවැ''යි එක් ප්‍රෙතයකු යවූහ. ඒ ප්‍රෙතයා රජ්ජුරුවන් ආසථානයේ උන් ගමනේ ඉසට ගහන්වයයි යකුළක් අතින් ගෙණ ආකාශයෙහි අමෝරාගෙණ සිටියේය.

එපවත් ශක්‍රයෝ ධර්මිෂ්ඨවූ රජ්ජුරුවන්ට යකුළෙන් ගසන්ට සිටි නියාව දැන තුමූද ඔහු ඉස්මුදුනේ යකුළක් ගෙණ සිටියාහ. රජ්ජුරුවන්ට ප්‍රෙතයා සිටි නියාව පෙණේයි. ශක්‍රයන් සිටි නියාව නොපෙණේයි. එවිට රජ්ජුරුවෝ ප්‍රෙතයා තමන්ට ආරක්ෂාගෙණ සිටිත් නෝහි සිතා ''මා මේ විචාරන්ට උවමැනවැ''යි රජ්ජුරුවෝ ප්‍රෙතයාට කියන්නාහු ''තා යකුළ අතින්ගෙණ ආකාශයෙහි සිටින්නේ මට ආරක්ෂාවටද? නැත්නම් මට සතුරුව ද?''යි විචාළේය.

ප්‍රෙතයා කියන්නේ රජ්ජුරුවෙනි, යක්ෂයෝ ප්‍රෙතයෝ එක්ව කථා කොට නොපගේ ඉසට මේ යකුළින් ගසන නියාගෙන් එවූහ. එසේ හෙයින් නොපට මා සතුරුව ආයේයැ''යි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු කාරණයක් නිසාද? මට යකුළින් ගසන්ට කියේය''යි විචාළාහ. ප්‍රෙතයා කියන්නේ ''රජ්ජුරුවෙනි, තෙපි විසින් තමන් ඇමට දෙන බිලියම් නැවැත්තු නිසාය''යි කීහ. කියාපු බස දෙවෙනිව නොකියම්, තාගේ ප්‍රෙතයන් කී සැටියට යකුළින් ගස ව''යි කීහ. ප්‍රෙතයා කියන්නේ ''මා නොපට ගසන්නේ කෙසේද? නොප මා යකුළින් ගැසුවිටම අප හැමට නායකවූ ශක්‍රයෝත් මා ඉසව ගසම් යි යකුළක් අතින් ගෙණ ආකාශයෙහි සිටිති. එසේහෙයින් ගැසිය නොහෙම්'' කිය.

එවිට රජ්ජුරුවෝ ''තා සේවූ කොතෙක් ප්‍රෙතයන් යකුළගෙණ අවුදින් සිටියත් මා බියවෙන්නේ නැත, මා කියාපු බස දෙවෙනිව නොකියම්. පළමු මම තනිව සිටියෙමි. දැන් ශක්‍රයෝ මට ආරක්ෂාව සිටි පසු මම කුමට බියවෙම්ද''යි කීහ.

ශක්‍රයෝ එකියන ප්‍රෙතයා රජ්ජුරුවන් සමීපයෙන් පහකොට රජ්ජුරුවන් ලඟට අවුත් ''රජ්ජුරුවෙනි, නොපවි මෙතැන පවන් මම ආරක්ෂාවට සිටියෙමි, කිසි භයක් නොවී පළමු මෙන් දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කරව''යි අවවාද කියා ශක්‍රයන් දෙව්ලොවට ගියහයි වදාරා මේ අයකුට ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ශක්‍රයෝ නම් අනුරුඬ මහාසථවිරය, එසමයෙහි බරණැස් රජව උපන්නෙම් බුදුවූ මම්මය යි වදාළසේකි.

---

## 338 අරකැඳූ ජාතකය

මේ වදාළ ධර්මස්වාමීවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි චුල්ල කුමාරිකාවන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්තමාන කථාව ඉන්ද්‍රිය ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වතාහි යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුල යක ඉපිද වැඩිවිය පැමිණ වාසය කරණ කල්හි බොධිසත්ත්වයන් වහන්සේ

තමන් වහන්සේගේ පුතනුවන් වහන්සේත් ඇරගෙණ වනාන්තරයට ගොසින් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පුතනුවන් වහන්සේ පන්සල රදවා බොධිත්‍රියත් වහන්සේ වනයට ගොසින් ඵලාඵල ගෙණවිත් ජීවත්වන සමයෙහි සොරු මොත්තමෙක් එක්ව ගම් පැහැරගෙණ යන්නෝ ස්ත්‍රියක් අල්වාගෙණ ගොසින් වනාන්තරයට ඇරපියා පලා ගියහ.

ඒ වනයේ ඇවිදිනා තැනැත්තී පන්සලට ඇවිදින් බැසපු. වැඩිමාළු තාපසයෝ ඵලාඵල ගෙණෙන්ට ගියාහ කුඩා තාපසයන් පන්සල උන් තැනැත්තේ ඒ ස්ත්‍රිය තමාගේ භාවභාව ලීලා කවා කෑදක්වමින් තාපසයන්ගේ ශීල භෙදකොට කියන්නී "මේ වනයේ ඉඳ කිමිද? මනුෂ්‍යයන් ඇතිතෙනකට යම්හ"යි කීන.

තාපසයෝ "මාගේ පියාතන්වහන්සේ අතින් විචාරා විනා නොයම්"කීහ. ඒ ස්ත්‍රී සිතන්නේ "මා මෙතන ඉන්ට කාරණා නොවෙයි, මම් මහ ඉදිමි, වැඩිමාළු තාපසයන් වහන්සේ විචාරා එව"යි කියා පලා ගියාහ. එතකොට වැඩිමාලු තාපසයෝ වනාන්තරයෙන් ඵලාඵල ගෙණවිත් පන්සලට ආසේක. කුඩා තාපසයෝ වැඩිමාළු තාපසයන් වහන්සේ අතින් විචාරණසේක් "සවාමීනි' මම මනුෂ්‍යපථයට ගොසින් ගිහිව රැකෙන්නෙමි. කෙසේ වාසය කෙරෙම්ද?"යි කෙසේවූ කෙණෙකුන් භජනය කෙරෙම්ද?"යි විවාළාහ. වැඩිමාළු තාපසයෝ කියන්නාහු "පුත, තපස්වී භාවය ඇර ගිහිගෙයි රැකෙන්ට සිතතොත් චෙෂ පරදවයි. ස්ත්‍රී කී දෙයට කිපෙනසුළු කෘය වාග් මනඃ යන චාරිත්‍රයෙන් අවැඩක්ම සිතන්නාවූ අකුසල් ආදීවූ දෙය එකහනොව අසිරිවූ වඤ්චලවූ සිත් ඇති එසේවූ අසත්පුරුෂයන් භජනය නොකොට සත්පුරුෂවූ සිල්වත් ගුණවත් උව මනා කෙණෙකුන්ම භජනය කොව වාසය කරවයි" කීහ.

එබස් අසා තාපස කුමාරයෝ කියන්නාහු "මෙකී අගුණ තැති කෙණෙක් නම් නුඹවහන්සේ විනා අනික් කෙණෙක් නැත. එසේ නෙයින් නුඹවහන්සේ ඇරපියා නොයම්ය"යි වදාරා මේ අරඤ්ඤ ජාතකය තිමවා වදාළසේක.

එසමයෙහි එකියන ස්ත්‍රී හා තාපසයෝ නම් මෙකියන භික්ෂූන් හා චුල්ල කුමාරිය. එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 339
## සන්ධිභෙද ජාතකය

තීවද තථාගතවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සවඟයේ භික්ෂූන් වහන්සේගේ සන්ධිභෙද ව්‍යාප්තියක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්,**

සවඟයේ භික්ෂූන් වහන්සේ උනුන් ගැස්සීම් බිඳීම් ඇතිව වාසය කරණ නියාව සම්බුදුරජාණන් වහන්සේ දැන "එම්බා මහණෙනි, උනුන් හා විරොධ කරණ මනුෂ්‍යයෝ කඩු හා තෙප් හා සමානයෝය. පෙර සිංහයන් හා වෘෂභයන් හා

හිත විශ්වාසව කරණ ගමනේ උනුන් විරොධකරවූවා මෙන් නොප ඇමත් විරොධව වාසය කරණවා දැ''යි වදුරා ''ඒ කෙසේද?''යි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වන් දක්වා වදාළසේක.

පිටකිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට පුත්‍රව ඉපද වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් දිසාමොක් ආචාරීන් සමීපයෙහි සියලු ශාස්ත්‍රය ඉගෙණ අවුත් පිය රජ්ජුරුවන්ට ශාස්ත්‍ර පා යුවරජ තනතුරෙහි සිව් පියානන් ඇවැමෙන් බොධිසත්ත්වයන් රාජ්‍යයට පැමිණ දැනැමෙන් රාජ්‍යය කරණ සමයෙහි එක්තරා පුරුෂයෙක් වනාන්තරයෙහි සරක් පට්ටි ලා ගෙණ සිසානේය. මෙකියන පුරුෂයාගේ සරක්පට්ටියෙන් දුරිඇති දෙනක් තණ කාගෙණ එන තැනැත්තී හිමාලය වනයට ගියාය.

ඒ වෘෂභධෙනු තොමෝ සිංහධෙනුවක හා හිත විශ්වාසව වාසය කරන්නීය. එකියන සිංහධෙනුව සිංහපැටවකු වැදුව. වෘෂභ ධෙනුව වෘෂභ පැටවකු වැදුව. එකියන සිංහපැටවා හා වෘෂභ පැටවා හා දෙන්නත් තමන්ගේ මවුදෙන්නා හිත හෙයින් තුමූ දෙන්නාත් හිතව එකතැන ගොදුරු කා එක තැන සැතපී එකට වාසය කරන්නාහ.

එසමයෙහි ඒ දුටු වල්වැද්දෙක් මා නුදුටුවිරු අපූර්ව යි සිතා බරණැස් රජ්ජුරුවන් දකින්ට යන්නේ තමාගේ වතයෙන් ගෙණ ගියමනා උපකරණ යන් සපයාගෙණ රජ්ජුරුවන් දකින්ට ගොස් රජ්ජුරුවන් දිට. රජ්ජුරුවෝත් ''තා විසින් වසන වනාන්තරයෙහි තා දුටුවිරු අරුමය, නොඅරුම කිම්දැ?''යි විවාළහ. එවිට වැදි කියන්නේ ''දෙවයන් වහන්ස, අනික් දුටුවිරු ආශ්චර්‍ය්‍ය යක් නැත. සිංහයකු හා වෘෂභයෙක් හිත විශ්වාසව වාසය කෙරෙති''යි කිය. එබස් අසා රජ්ජුරුවෝ කියන්නෝ ''තුන්වන මිත්‍රයකු එක්වූ කල්හි විනාශයට පැමිණෙයි. තුන්වන මිත්‍රයා එක්වූකල මව කියව''යි කියා වැද්දාට සමූ දුන්නාහ. වැදිත් ''යහපතැ''යි කියා හිමාලය වනයට ගියේය.

එසමයෙහි එක්තරා කැණහිලෙක් සිංහයා හා වෘෂභයා උන්තෙනට අවුත් ''මමත් තොප හා ඇම හා එක්ව වාසය කරන්නේය. ඒ දුටු වැදි තුන්වන මිත්‍රයකු ඇතිවූ කල රජ්ජුරුවන් වහන්සේ කියන්ට කීසේක. ''මෙපවත් රජ්ජුරුවන්ට කියන්ට යෙමි'' සිතා ගියේය. ඔහු යද්දී කැණහිලා සිතන්නේ ''බොහෝ සිවුපාවුන්ගේ මස් මා විසින් කනලද. සිංහයන්ගේ හා වෘෂභයන්ගේ මස් මා විසින් නොකන ලද. එසේ හෙයින් මුන්දෙන්නා උනුන් ගස්වා මරාපියා මාංශ කන්ට උවමැනවැ''යි සිතා සිංහයා නොකීදෙය වෘෂභයාට කියා වෘෂභයා නොකී දෙය සිංහයාට කියා උනුන් ගස්වා දෙන්නා උනුන් හා සටන් කරවා මැරවිය. වැදි ගොසින් රජ්ජුරුවන්ට ''සඟමීනි, තුන්වන මිත්‍රයෙක් ඇතිවිය''යි කිය. රජ්ජුරුවෝ ''කෙසේ මිත්‍රයෙක්ද?''යි විවාරා ''කැණහිලා ය?''යි ඔහු අසා ''එසේ කල නීවයා එක්වූ පසු අනර්ථයට පැමිණෙන්නේ නියමය''යි කියා වහා ගමන් කරන්ට නිසි රථයකට නැඟී වැද්දහු ගමන් ලන්ට සලස්වාගෙණ සිංහයා හා වෘෂභයා හුන්තෙනට ගියාහ.

එවේලාවට කැණහිලා "මා සිතූදෙය සිඹවිය" යි සමාධියෙන් සිංහයා පිටට පැන උගහෙන් මංශ කැටියක් කඩා වෘෂභයා පිටට පැන ඔහුගෙන් මාංශ කැටියක් කඩා කා පැන පැන සිටියේය. රජ්ජුරුවෝ එපවත් දැන තමන්ගේ රථාවාශ්‍රීයාට කියන්නාහු "රථාවාශ්‍රීය, සිංහයා එක්වන්නේ සිංහදෙනුවක් හා කැටුවය. වෘෂභයා එක්වන්නේ වෘෂභ දෙනුවක් හා කැටුවය. සිංහයා කන්නේ මාංශය, වෘෂභයා කන්නේ තණ ජාතිය, එසේ හෙයින් ස්ත්‍රීන් නිසාවූ විපත්තියකුත් නොවෙයි. කැවිලි නිසාවූ විපත්තියකුත් නොවෙයි, බොහෝ කාලයක් උනුන් හා හිත විශ්වාසව වාසයකළ දෙත්නා ජීවිතක්ෂයට පැමිණියේ නීව තැනැත්තවුන්ගේ බසින. එසේ හෙයින් කේලාම් කියන යම් කෙණෙකුන්ගේ බස් කිවිසීම් නියුණු මුවහත් ඇති ඛඩ්ගයක් හා අඹයවියක්ද සමානය. උනුන්ව හිත විශ්වාස කෙණෙකුන් වීරුඹ ලෙස බස් කිවූ නම් උනුන් මැදයේ කියා විවාරීමෙන්ම ඇත්තෙක් වීනම් ඇත්තට පලා යෙයි. නැත්තෙක් වීනම් නැත්තට පලා යෙයි. ඒ මානයට විවාරීමෙන්ම කේලාම් කියන තැනැත්තේ නොකියා නිඛාපිය සි කේලාම් නො ඇසීමෙන් දෙපක්ෂයේ ඇත්තන් සිතට වඟ සුව තිබෙයි. කේලාම් කී කෙණෙකුන්ගේ යම් තෙනක ගිවිස්සෝ නම් සිංහයාට හා වෘෂභයාව වූ දෙය මෙන්ම අනර්ථයට පැමිණෙන්නේය'යි කියා සිංහයාගේ කෙසරු සලා බහා සම් හා නිය හා තෙල් හා ඇරගෙණ තමන්ගේ බරණැස් නුවරටම ගියාන සි වදුරා මේ සන්ධිභෙද ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මය යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

# සූතරවන නිපාතය නිමි.

## 340
## මණිකුණ්ඩල ජාතකය

තිවද පරදුක්ඛ දුකඛිත වූ සම්බුදුයන් වහන්සේ ජෙතවනා රාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට වැරදී ගියාවූ අමාත්‍යයකු අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වත්තීමාන කථාව මතු පහළ වන්නේය.

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් බරණැස්නුවර රජ්ජුරුවන්ට පුත්‍රව ඉපිද වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් ලඟ ශිල්ප ඉගෙණ තමන්ගේ නුවරට අවුත් පිය රජ්ජුරුවන්ගේ ඇවැමෙන් රාජ්‍යයට පැමිණ රාජ්‍යය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ අන්තඃපුරයට අමාත්‍යයෙක් වැරදී ගියේය. ඒ වැරදී ගිය අමාත්‍යයා රජ්ජුරුවෝ තමන්ගේ නුවරින් පිටත ලැවූහ. ඒ අමාත්‍යයා කෝසල රජ්ජුරුවන්ගේ නුවරට පලා ගොස් කෝසල රජ්ජුරුවන්ට කියා උගන්වා ගෙණ රජ්ජුරුවන් හා සේනාව ගෙණවිත්

බරණැස් නුවර ඇරගෙණ රජ්ජුරුවනුත් දහගෙයි ලැවීය. බොධිසත්ත්වයන් දහගෙයි ඉඳ කිසි වික්ෂේපයක් නොවී ධ්‍යාන උපදවාගත් ගමනේ කෝසල රජ්ජුරුවන්ගේ සකල ශරීරය සැත්කම් කරන්නාසේ මහවේදනාවට පැමිණි ගමනේ කෝසල රජ්ජුරුවන්ගේ සිතින් සැකවී කිසි අපරාධයක් නැති බරණැස් රජ්ජුරුවන්ට කළ අපරාධයෙන් මට මේ ශරීර වේදනා වූයේය යි සිතා බරණැස් රජ්ජුරුවන් උන් දහගෙට අවුත් බැලූකලට ධ්‍යානයෙන් සැපසේ උන් රජ්ජුරුවන් දැකැ, "රජ්ජුරුවෙනි, තොපගේ හස්තිසේනාව අශ්ව සේනාව ඇතුළුවූ පාබලසේනාවද රත්රන් මුතු මැණික් කුණ්ඩලාභරණ ආදීවූ සියලු සම්පත්ද අග්‍රමහෙසිකා බිසෝවරු නැ දරුවන් ඇතුළුව සියළු අන්තඃපුරයද, රාජ්‍යයද ඇරගෙණ තොප සිරගෙයි ලූ ගමනේ ඊට කිසි සෝකයක් නොවී සිත එකඟ කොට ගෙණ සෙසේ ධ්‍යාන උපදවා ගතුදැ"යි බොධිසත්ත්වයන් අතින් විචාළේය.

බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කියන්නාහු "එම්බා රජ්ජුරුවෙනි, සම්පත් ඇතිකළ පළමුවෙන් සම්පත් නස්නේය. සම්පතට පළමු මනුෂ්‍යයෝ නසින්නාහ. චන්ද්‍රයා උදාවූයේ නම් අස්තගත වන්නේය. සූර්‍යයා උදාවූයේ ඒනම් අස්තගත වන්නේය. එසේ හෙයින් පැමිණෙන්නාවූ අලාභය පැමිණෙන් සේමය. ඊට මා වික්ෂේප කිම්දැ? යි සිතීමෙන් සිත එකඟ කොටගෙණ ධ්‍යාන උපදවා හුනිම්"යි බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කීහ.

දෙවැනිව බොධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට කියන්නාහු "යම් ගෘහස්ථයෙක් කම්මැලිව කුසීතභාව ඇත්තේද? යම් තාපස්වී කෙණෙක් ඉදුරන් දමා එකඟවූ සිතින් වාසය නොකරත් නම් !එසේවූ තාපස්වියාද රජ්ජුරු කෙණෙක් කී කී වත්ගේ බස්පස්සේ ගොසින් වෙසේනම් එසේවූ රජත් යහපත් නොවන්නේය. යම් පණ්ඩිතයෙක් කෝපිද එසේවූ පණ්ඩිතයාත් යහපත් නොවන්නේය. එසේහෙයින් යම් රජ්ජුරුකෙණෙක් පරීක්ෂාකාරීව දවසරිනාහුද? පරීක්ෂාකාරීව දවසරිනා රජ්ජුරුවන්ගේ යසස් හා කීර්ත්තියත් කලාවෙන් කලාවව වඩනා චන්ද්‍රයාමෙන් සම්පූර්ණ වන්නේය'යි කීහ. එසස් අසා කෝසල රජ්ජුරුවෝ "අප නොදැන කළ දෙයට ක්ෂමාකළ මැනවැ'යි පාවාදී තමන්ගේ රාජ්‍යයව භියාහ යි වදාරා මේ මණිකුණ්ඩල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම වේදැ යි වදාළසේක.

---

## 341
## සුජාත ජාතකය

මේවද සවයම්භූඥාන වූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පියානන් මළාවූ උපාසකයකු අරභයා මේ ජාතකය දක්වතලද.

ඒ කෙසේ ද? යත්,

එක්තරා උපාසකයකු තමාගේ පියානන් මළාවූ සෝකයෙන් බොහෝ වික්ෂේපයට පැමිණ ඉන්නාවූ උපාසකයා සම්බුදුයන් වහන්සේ දැක සෝවාන් වෙන්ට හේතු සම්පත් ඇති නියාව දැක වදාළ අන්තයෙහි පසු මහණ භික්ෂූ

කෙණෙකුත් වහන්සේ ඇරගෙණ එකියන උපාසකයාගේ ගෙට වැඩිසේක. උපාසකයාත් සමීඥයන් වහන්සේට අසුන් පණවා දුන්නේය. සමීඥයෝත් "ඇයි උපාසකය, විසෙෂපව උන්නේ ඇයිදැ?"යි විචාළාහ.

"සවාමීනි, මාගේ පියානන් නැසීගිය හෙයින් විසෙෂපව උන්නෙමි" දැන් වූහ. "උපාසකය, මළවුන්ට ඇඬීම කාරණා නොවෙයි. පෙර උත්තමයෝ නැසීගිය උන්ව අඬන්නාවුන්ට අවවාද කීවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සමීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක්තරා කෙළෙඹියක්හට පුත්‍රව උපන්නාහ. ඔහු සුජාත නම් වූහ. බොධිසත්ත්වයන්ගේ මුත්තනුවෝ එක්තරා ව්‍යාධියකින් මළහ.

බොධිසත්ත්වයන්ගේ පියානන් මළ ශෝකයෙන් පියානන්ගේ ආදාහන භූමියෙහි තිබූ ඇට ගෙණැවිත් තමන්ගේ ගෙදර සමීප භූමියේ ලා එතනට පස් කොට දවසකට තුන්විටක් එතනට ගොස් වැඳපුදා අඬා පෙරලී නොකා නොබී බොහෝ විසෙෂපයෙන් දුක්විඳිනාහ. බොධිසත්ත්වයෝ මපියානන් වහන්සේ මාගේ මුත්තනුවන් වහන්සේ කෙරේ ශෝකයෙන් පෙරලෙන සේක. ඒ ශෝකය මා අරවන්ව උවමැනවැයි සිතා බොධිසත්ත්වයෝ මළ මිමකු වැදහොත් තැනට තණත් පැනුත් ගෙණගොස් කට කෙරේ තබා "මීමා තණ කාපිය, පැන් බීපිය"යි කියති.

බොහෝ මනුෂ්‍යයෝ "මේ කිම්ද? සුජාත කුමාරයෙනි, මළ මීමා තණ පැන් කෙසේ කාදැ"යි කියා විචාළත් කවුරුන්වත් කිසි බසකුත් නොකියා "මීමා තණ කාපිය, පැන් බීපිය'යි කියති. මනුෂ්‍යයෝ සුජාත කුමාරයන්ව ප්‍රලයක් ඇතිව ගොසින් මෙසේ කරන්නේය යි සුජාත කුමාරයන්ගේ පියා නන්ට කියන්නාහු "නොපගේ පුතනුවන්ට ප්‍රලය ගුණයක් ඇතිව මළ මීමකු ලඟව ගොස් කවලඟ තණ පැන් තිබා මීමා තණ පැන් කාපිය යි කියති. කවුරුන් ඖත් සෙසු බසක්වත් නො කියන්නේය යි ගොසින් කීහ.

කෙළෙඹි පුත්‍රයා තමන්ගේ පියානන් මළ ශෝකය හැර පුත්‍ර ප්‍රේමයෙන් සුජාත කුමාරයන් කරා අවුත් "කිමෙක්ද? සුජාත කුමාරයෙනි, මළ මීමා කෙසේ තණ පැන් කාද? නොපි මට වඩා නුවණැත්තා කවුරුදැ යි උන් තැනැත්තන්ගේ නුවණ විශෙෂ ඉතා යහපතැ"යි කීහ.

සුජාත කුමාරයෝ එවිට කියන්නාහු "මීමාගේ දැත දෙපය වල්ගය ඇතුළුවූ ශරීරයෙන් කිසිදෙයක් අඩුනොවී තිබුනු නිසා තණ පැන් කව යි කියා කීම්"යි "ඌ මළේය යි කියද්ද? ඌගේ ශරීරය තිබුනේ වේද? එසේකල තණ පත් කයි සිතා මම කීම්. මීමාගේ ඉස් කන් නාසා දැත දෙපස වල්ගය ඇති තැනැත්තන්ව තණ පැන් කන්ව කී මම අඥානයෙක්ද? නුඹවහන්සේගේ පියා නන්ගේ ශරීරය දවා හස්මව කිසිදෙයකුත් නොපෙණී තිබියදී අඬා වැලප බොහෝ ශෝකයට පැමිණියේ නුවණ ඇති නිසාදැ?"යි විචාළහ.

එවිට බොධිසත්ත්වයන්ගේ පියානෝ "යහපත පුත, මාගේ ශෝක සන්හිඳුවූ නියාව. දෙමව්පියන්ගේ ශෝක සන්හිඳුවන්ව මා භාරය. මහන් ඛිති

රැසක් වැදගත් ගමනේ පැන්කල බොහෝ වත් කොව නිවුවාමෙන් මගේ ශෝක සන්හිඳුවනැ"යි සුජාත කුමාරයන්ට ස්තුති කොට වදාරා මේ සුජාත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සුජාත කුමාරව උපන්නෙම් බුදුවූ මම්මය යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 342 ජෝත ජාතකය

තිවද සියළු සත්ත්වයන්හට හායකවූ සම්බුදුරජාණන් වහන්සේ හඟු නම් රට සුංසුමාර නම් ගුහාව සමීපයෙහි විංසන නම් වනයෙහි වැඩ වසන සමයෙහි බොධිරාජකුමාරයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්,**

බොධිරාජ කුමාරයෝ සෙසු රජදරුවන් ඉදිනා ගේවලට වඩා යහපත් මාලිගාවක් කරවා මා ඉන්ට උවමැනවැ යි එක් වඩුවෙකු කැඳවා කෝකාලික නම් අනඹී රජගෙය ඉදිකරවා මේ වඩු තෙම මේ මාගේ මාලිගාවක්සේම රජ ගෙයක් අනික් රජදරුකෙණෙකුන්ට ඉදිකළේවිනම් නපුරැය"යි වඩුවාගේ ඇස් උදුරුවාපීහ.

එපවත් දම්සභාවේ රැස්වූ භික්ෂූන් වහන්සේ "මේසේවූ රජගෙයක් කළ වඩුවාට බොහෝ උපකාර කොට ප්‍රසාද දුනමතා තැන වඩුවාගේ ඇස් උදුරුවා පුවෝ වේදැ"යි කියා කියා උන් තැනට සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාවූ පුම්භාගයෙහි කිසාම් කථාවකින් යුක්තව උනු දැ?"යි විචාරා වදාරා එපවත් අසා 'දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරත් මේ මේ රාජ කුමාරතෙම රජදරුවන් දහසක් එකවිට ඇස් උදුරුවාපුවෝ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටිගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ තක්සලා නුවර දිසාපාමොක් ආචාරීව බොහෝ රාජකුමාරයන්ට ශාස්ත්‍ර උගන්වා වායය කරන්නාහ.

එසමයෙහි බරණැස් නුවර රජ්ජුරුවන්ගේ පුත් වූ බ්‍රහ්මදත්ත නම් කුමාරයෝ ශිල්ප උගන්ට යයි තක්සලා නුවරට දිසාපාමොක් ආචාරීන් සමීපයෙහි ශිල්ප උගන්නා සඳහා ගියාහ. දිසාපාමොක් ආචාරී රාජකුමාරයන් දැක ලක්ෂණ බලා මේ රාජකුමාරයා වණ්ඩය, මුගේ සන්තානයෙහි ගුණයක් නැත්තේ යයි රාජකුමාරයන්ට අවවාද කරන්නාහු "එම්බා රාජකුමාරයෙනි, නොපි රාජ්‍යයට වන්කල කිසි පිහිටක් නොලබන්නාසේ වැඩනැත්තවුව, යම් අවසරයක දේව තාවෝත් අත් නොදන්නාහ. මනුෂ්‍යයෝ තමාම අත් නොදන්නාහ. ඒ එසේමය, යම් ඵලයක් රෝපණය කළේනම් නොබෝ කලකින් එහි ලාභය විඳිද්ද? එසේම සාහසික ලෙස කළාවූ යම් පාපයක් අත්පිට විපාක දෙයි; සාහසික නොවමැ"යි රාජකුමාරයන්ට බොහෝ අවවාද කියා උන්ගේ නුවරට යවූහ.

ඒ රාජකුමාරයෝත් බරණැස් නුවරට ගොස් පිය රජ්ජුරුවන්ට ශිල්ප දක්වා පියරජ්ජුරුවන් විසින් දෙන ලද්දාවූ යුවරජ තනතුරු ලැබ වාසය කරන්නාවූ පියානන්ගේ ඇවැමෙන් රාජ්‍යයට පැමිණ රාජ්‍යය කරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ වණ්ඩපුරුෂවූ පුරෝහිත බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රාහ්මණයා සිතන්නේ රජ්ජුරුවන් දසදහසක් දඹදිවට නායක කරවාපිනම් අග්‍රපුරෝහිතව බොහෝ සම්පත් ලබන්නෙමි වේදැ?යි සිතා රජ්ජුරුවන් ලඟට ගොස් මෙපවත් කියා බොහෝ කාරණා කියා රජ්ජුරුවන් පොළඹවාගෙණ යුඬයට යන ලෙසට චතුරඬගිණී සේනාව සන්නාඬ කරවාගෙණ පළමුකොට ගොස් කුඩා නුවරක් වටලා ගෙණ ඒ රජ්ජුරුවන් පොළඹවා ගෙණ මේ නියායෙන් දසදහසක් යොදුන් දඹදිව නුවරවල් ඇරගෙණ දහසක් රජ්ජුරුවන් අල්වාගෙණ තක්සලා නුවර රජ්ජුරුවන් අල්වා ගන්නා පිණිස ගියාහ.

ඒ නුවර ලඟ ගඟෙක් ඇත, ඒ ගඟ අසල යහපත් ඕයා සම්පන්න නුගගසෙක් ඇත, ඒ නුගගස මූල රජ්ජුරුවෝ යාතක් ලබාගෙණ එතන සැතපී පසු දවස තක්සලා නුවරට සටහව ගියාහ. දිසාපාමොක් ආචාරීන් ඒ රජ්ජුරුවන් යුඬයට එන නියාව අසා නුවර අවිවාල වෙව්වම් පවුරු වාසල් ආදීවූ තැන සේනාව සලස්වාගෙණ යුඬකොට නුවරට වැද්ද නුදුන්නාහ.

රජ්ජුරුවෝ නුවර සවන් කොට ඇරගත නොහී දෙවෙනිවත් නුගගස මූලට අවුත් පුරෝහිත බ්‍රාහ්මණයාට කියන්නාහු "මේසා මහත් සේනාවක් ඇරගෙණ ගොසින් යුඬ කොටත් නුවර ඇරගත නුහුනුම්හ. කළමනා කිම්ද?" කෑදවා විචාළාහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ "මේ රජ්ජුරුවන් දහස අල්වා ඇස් උදුරා උන්ගේ පඤ්චරුධිර මාංශයෙන් මේ නුගගසේ වසන් තාවූ රාක්ෂසයාට බිලිදී ඒ රාක්ෂසයාගේ ආනුභාවයෙන් යුඬකොට රාජ්‍යය ඇරගණිම්හ"'යි කීහ.

රජ්ජුරුවෝත් "යහපතැ"යි මල්ලවයන් ගෙන්වා තිරය ඇතුළේ සිටුවා රජදරුවන් එකින් එකා ගෙන්නා අල්වාගෙණ ඇස්දෙක උදුරා ළඟපලා අතුනු අක්මා පපුකැන් බඩවැල් උදුරා මිනී ගඟට දමා මෙම නියායෙන් රජ දරුවන් දහසම ඇස් උදුරවා රුධිර මාංශ ඇරගෙණ මිනී ගඟට දමා ඒ නුගගස උඩ බඩවැල් එල්වා රුධිර මාංශයත් පුදා පසු දවස් සවතට ගියාහ.

ඒ වේලෙහි අවිවාලයක සිටි එක් රාක්ෂසයෙක් දකුණැස උදුරාගෙණ පළාගියේය. රජ්ජුරුවෝ වේදනාව ඉවසාගත නොහී ඇවිත් නුගගස මූල උඩබලා වැඳඔත්තාහ. මස් ලියා කාපු ඇටයක් ඩැහැගෙණ උඩින් යන පක්ෂියෙක් ඒ රජ්ජුරුවන්ගේ වම් ඇස ඇටය ළඟාපිය. ඒ ඇසත් උදුරාගෙණ දකුණැසින් නැංගේය. වේදනාව ඉවසාගත නොහී අඬන්නාවූ රජ්ජුරුවෝ මාගේ ආචාරීන් වහන්සේ කීවා නොකොට යම් කෙණෙකුන්ව අනර්ථයක් නොකරව, කළාවූ අනර්ථයෙක් ඇත්නම් අත්පිට විපාක දෙයි. කී සේක. උන්වහන්සේ කීවා නොකොට මෙතෙක් රජදරුවන් ඇස් උදුරවා මේ නුගගසට රුධිරමාංශයෙන් පූජා කෙළෙමි, එසේ පූජා ලත් දේවතාවත් මට අත් නුදුන්නේය. මේ පුරෝහිත බ්‍රාහ්මණයාත් මට සහායක් නුවූයේය. මම ආචාරීන් කීවා නොකොට අසරණව ගියෙමි, මේ නුගගසට රුධිර මාංශයෙන් පූජා කෙළෙමි, අඩා කියන්නාහු මාගේ රත්වන්වූ විශිෂ්ට රූ ඇති, බලා ඇස් ඇද ගත නොහැක්කාවූ, මාගේ උඩරි තම් බිසවුන් මා විඳිනාවූ වේදනාව දකින්ටත්

නුවූයේය. උන්ගේ ප්‍රිය වචනය මා කණ් හෙන්වත් නුවූයේය, මාගේ ඇස්දෙක නැති වේදනාවටත් වඩා මාගේ බිසවුන් නොදක්නා වේදනාව ඉවසාගත නොහෙමි, ඇස්දෙකේ වේදනාවෙනුත් බිසවුන් කෙරේ සෝකයෙනුත් අඩා විවිත් විට පෙරළී ප්‍රාණය නිරුද්ධව අවීචිමහ නරකයට හියාහ.

දඹදිව ඒ ඒ නුවරවලින් ආ සේනාව තමතමන්ගේ නුවරටම හියාහ"යි වදාරා මේ ජෝත ජාතකය නිමවා වදාළසේක.

---

## 343
## උරග ජාතකය

තිවද පස්මරුන් ජයගත් හෙයින් ජින නම්වූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මළාවූ පුතෙකු ඇති කෙළෙඹිපුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

එක් කෙළෙඹි පුත්‍රයෙකු තමාගේ පුතකු මළ ශෝකයෙන් වික්ෂිප්ත ව ඉඳින්නේය. සම්බුදුරජාණන් වහන්සේ ඒ කෙළෙඹි පුත්‍රයා සෝවාන්වන්ට හේතු ඇති නියාව දැන අලුත මහණවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ කැඳවාගෙණ ඒ කෙළෙඹි පුත්‍රයාගේ ගෙට සිඟා වැඩි සේක.

කෙළෙඹිපුත්‍රයාත් සම්බුදුරජාණන් වහන්සේ දැක වැඳ පුදා එකත් පස්ව සිටියේය. සම්බුදුරජාණන් වහන්සේ කෙළෙඹි පුත්‍රයාව වදාරණසේක් "ඇයි උපාසකය, වික්ෂිප්ත ව උනුදැ?"යි විචාරා වදාළ සේක. කෙළෙඹිපුත්‍රයා කියන්නේ "ස්වාමීනි, මාගේ පුතනුකෙණෙක් මළ හෙයින් වික්ෂිප්ත ව උනිමි" කීහ.

එවිට සම්බුදුරජාණන් වහන්සේ වදාරණසේක් "උපාසකය, පෙර උත්තමයෝ තමන්ගේ දරුවන් මළාට ශෝක නොකළෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

පසිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක්තරා බ්‍රාහ්මණ කුලයක උපන්නාහු, තමනුත් තමන්ගේ භාර්‍යාවනුත් පුතනුවෝත් දියනියෝත් පුතනුවන්ගේ භාර්‍යාවෝත් කෙළිත් සදෙන නම් වන්නාහ.

බොධිසත්ත්වයෝ මුන් සදෙනාට මරණ සිහි භාවනා උගන්වා නිරන්තර යෙන් භාවනා කරන්නාහ. මුතුමුත් නිරන්තරයෙන් මරණ සිහි භාවනා කරන්නාහ.

එක් දවසක් බොධිසත්ත්වයෝත් පුතනුවෝත් හිමාන්වය සි කියා ගොසින් බොධිසත්ත්වයෝ සිසාන්නාහ. බ්‍රාහ්මණ කුමාරයා පරඬල් එක්කොට ගිනිලන්නාහ. ඒ ගිනිදුම ඒ අසල තුඹසෙක වසන්නාවූ නාගරාජයකුගේ

නාසයේ වත. නාගරාජයා කිපී අවුත් ඒ බ්‍රාහ්මණ කුමාරයා අත සතර දළ ඔබා දෂ්ටකළේය. ඒ කුමාරයාත් විෂමූර්ඡාවෙන් විසංඥව වැටී හුන. එවිට බොධිසත්ත්වයෝ පුතනුවන් වැටිහුන්නා දැක එතනට ගොසින් පුතනුවන් වඩාගෙණ ශක්මුල ලා කඹපටින් මුණ වසා තමුන් සීසාන්නාහ. එතනට එක්තරා පුරුෂයෙක් ආයේය. ඌ අතින් කොයි "ශවුදැ?"යි විචාරා "ගමට යෙමි" කිකල්හි තමන්ගේ ගෙට කියා යවන්නාහු "මෙතෙක්දෑ දෙන්තෙකුට බත් ගෙණෙන්නාහ. ඒ අද එක්කෙණෙකුන්ට බත් ගෙණෙන්ට කියාලව, අපගේ බෑමිණියත් දුවනියනුත් යෙහෙලනියනුත් කෙල්ලත් ඉස්සෝධා නා සුවඳ විලවුන් ඇරගෙණ එන්නට" කියා එවූහ. ඒ පුරුෂයාත් කියාගයවූ සැටියේම එක්කෙණෙකුන්ට බත් ඇරගෙණ ඉස් සෝධා නා දුවනියන්ද යෙහෙලියන්ද කෙල්ලද යන සතර දෙනම මල්ගඳ විලවුන් ගෙණ බොධිසත්ත්ව යන් සිසානා තෙනට ආහ.

බොධිසත්ත්වයෝත් පුතනුවන් මිය වැදහොත් රූප්පයේ ඉඳ ම බත් කා පස්දෙනම සමාධි සමාධිව දර එක්කොට පුතනුවන් ගින්නේ ලා සතුටු සතුටුව මිනිස දවන්නාහ. උන් පස්දෙනාගේ ගුණානුභාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩු කම්බල ශෛලාසනය උණුව ගියේය. ශක්‍රයෝ මනුෂ්‍ය ලෝකය බලා මුන් පස්දෙනා දැක මම එතනට ගෙස් මුන්ගේ මරණ සිනි භාවනාවට මුන් ලවා සිංහනාද කරවා මුන්ගේ ගෙයත් සත් රුවනින් පුරා එමියි එක්තරා පුරුෂයකු මෙන් රූපයක් මවාගෙණ ඒ මිනිස දවන තෙනට අවුත් කියන්නාහු "මේ කුමක්ද? තොප ඇමදෙනම පුලුස්සන්නේ කිමිදැ"යි විචාළාහ. "මිනිසක් දවමිහ"යි කිහ. "ඒ කිමිද? තොප කියන්නේ බොරුවට දඩමස් දෙම්හයි වක්ද්වාකොට කියවිද? මුවෙකු හෝ ඌරෙකු හෝ පුලුස්සති සිතම්" කිහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "ඒ නැත මිනියක් දවන්නේය"යි කිහ. "එසේවීනම් තොපගේ මෙවරි එකකු වේදැ?"යි කිහ. "ඒ නැත පුත්‍ර ප්‍රේමයෙන් වඩාගත් මාගේ පුතනුවෝය"යි කිහ. 'එසේ කල මේ පුතනුවෝ තොපට නොකිකරු වේදැ?"යි කිහ.

බොධිසත්ත්වයෝ කියන්නාහු "මට ඉතාම ප්‍රියයෝය, කිකරුවූහ"යි කිහ. එවිට ශක්‍රයෝ කියන්නාහු "එසේ තොපට කිකරු ප්‍රිය දරුවන් කල විඝෝපයක්වත් නොකරන්ට කාරණා කිමිදැ"යි කිහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "සර්පයකු සැවයක් ඇරපියා ගියකල දෙවෙනිව ඊට ආලයක් නොකෙරේද? මූ මෙතන කඳ තබා තමන්ගේ කම්මානු රූප පරිද්දෙන් පරලොව ගියාහ. අප ඇඹුනියා දනිද්ද? අපගේ දරුවෝ මේ දරසැයෙහි ගින්නේ නොදන්නාහ, ඌ ගොසින් එක් තෙනක උපදින්නාහ අප අඩා කාරිය කිමිදැ"යි කිහ.

එවිට ශක්‍රයෝ බෑමිණියන්දැට කියන්නාහු "මැනියන්වහන්ස, මේ දවන්නාවූ පුරුෂයා කවුදැ?"යි කිහ. "පුතනුවනි මාගේ දසමසක් උසුල, ලෙයි වැඩූ පුතනුවෝ"යි කිහ. එසේ කල පුරුෂයෝ තම් කාරණා දන්නා නෙයිනුත් ධෙය්‍යය උපදවා නො අඬන්නාහ. ඟැණු තම් සවභාවයෙන් අඬන සුල්ලහ, නුඹ කිසි විඝෝපයක් නොවන්ට කාරණා කිමිදැ?"යි කිහ. එවිට බෑමියන්දැ කියන්නේ මුන් මාගේ බඩ පිළිසිඳ ගන්නා දවස් මට කියේත් නැත, දැන් මියයන ගමනේ මම මියෙමි"යි මට කියේත් නැත, මාගේ දරුවෝ

තෙල දරසෑයේ වැද හෙව දැසිද? ඌ ගොසින් කැමති එක්තෙනක පිළිඹද ගත් තුව. ඌ අප ඇඬූ නියාව දනිද්ද? විඤ්ඤවූ නියාව දනිද්ද? එසේහෙයින් මළ වුන්ට ඇඬීමෙන් කාරණා කිම්දැ?''යි කීය.

එවිට ශක්‍රයෝ බ්‍රාහ්මණ කුමාරයන්ගේ නැගනියන්ට කියන්නාහු ''මේ දරසෑයේ දන්නාවූ පුරුෂයා තොපට කුමක්වේදැ?''යි කිහ ''මා හා එක් කුසෙහි උපන් බෑනන්වහන්සේය''යි කිහ. ''එසේ හෙයින් ගැණුනැයෝ එක් කුසේ උපන් මල්බෑයන් මළ කල ''මාගේ බෑනන්දු මළදැය''යි කියා බොහෝ විඤ්ඤව අඬා මුරහා ශොක කරන්නාහ. තොප එසේවූ ඇඬීමක්වත් විඤ්ඤ යක්වත් නොකරන්ට කාරණා කිම්දැ?''යි විවාළාහ. එවිට නැගනියෝ කියන් නාහු මාගේ ඇඬීමෙන් සිතට දුක්දී කයත් දුර්වලව බැලුවන්ට අප්‍රිය කරවන පමණක් විනා මිනිය දරසෑයේ දනසේක. උන්වහන්සේ ගොසින් එක් තැනක උපදිනාසේක. මා ඇඬුවයි මාගේ බෑනන්වහන්සේ ඉපද එන්නේ නැත, මා අඬා කවර කටයුත්තෙක් දැ?''යි කිහ.

එවිට ශක්‍රයෝ මළ බ්‍රාහ්මණ කුමාරයාගේ භාර්‍යාව කරා ගොස් කියන් නාහු ''මේ මළාවූ පුරුෂයා තොපට කුමක්වේදැ?''යි කියා විවාළාහ. ''සවාමීනි, මාගේ වල්ලභයානන් වහන්සේය''යි කිහ. ''එසේකල බන්ධුන්ටත්වඩා පුරුෂයා මළකල ශොක ඇත්ති බිරින්දය, තමාගේ වල්ලභයා මළකල තමා කනවැන් දඹු වන හෙයිනුත් තමාගේ ස්නේහ වඩන්නාවූ පුරුෂයා හෙයිනුත් දෙගුණයක් ශොක ඇතිවන්නාහ. තොපි කණස්සලක්වත් ඇඬීමක්වත් නොවන්ට කාරණා කිම්දැ?''යි කිහ. එවිට බැමිණි කියන්නී ''මාගේ වල්ලභයානන් වහන්සේ මිය පරලොව ගොසින් යම් තැනෙක උපදිනාසේක. කිම්ද? තෙල දරසෑයේ දන් නේය. උන්වහන්සේ මා ඇඬූ නියාව දන්නාසේක්ද? සද නැගෙණහිරින් නැගී බස්නාහිරින් බසිද? යම් සත්ත්ව කෙණෙකුත් මරණින් මැකෙන්නේ නියමය, නවතා වස්තුවෙක් නස්නේමය. මළවුන්ට ශොකකිරීමෙන් කාරිය කිම්දැ?''යි කිහ. එවිට ශක්‍රයෝ කෙල්ල අතින් විවාරන්නාහු ''මේ මළ පුරුෂයා තොපට කුමක් වෙද්දැ?''යි විවාළහ. කෙළි කියන්නී ''මාගේ සවාමිදරුවානන් වහන්සේ ය''යි කිහ. ''එසේකල තොපට කණස්සල්ලෙක් නැත්තේ තොපට තදව මරු තලා මෙනෙවර ගත් හෙයින් ඒ කණස්සල්ලෙන් නාඩා නොදෙඩා ඉඳිනේදැ?''යි කිහ එවිට කෙළි කියන්නී ''මාගේ දරුකෙනෙකුන්සේ ළෙහිලා වැඩිම්. උන් වහන්සේ මට ලෙංගතුසේක. මමත් උන්වහන්සේට ලෙංගතු වෙමි. උන් වහන්සේ දරසෑයේ වැදනෙව ඉන්නෙන් දනසේක. මා ඇඬූ නියාව දන්නා සේක්ද? සෝක නියාව දන්නා සේක්ද? යම්සේ කළයක පැන් පුරාලා ගෙණ යන කල බිම වැටී බිඳී ගියේද බිදිනු කළය දෙවනුව සාවේද? එසේම මළ තැනැත්තන්ව අප ඇඬීමෙන් කාරිය කිම්දැ?''යි කීහ.

එවිට ශක්‍රයෝ තමන්ගේ ශක්‍රත්වභාවයෙන් සිට ''තොප ඇඹිදෙනාගේ මරණසිහි භාවනාවට සිංහනාද කරවන පිණිස දිව්‍යලොකයෙන් ආමි. මරණ සිහි භාවනා කළ නියාව යහපතැ''යි ප්‍රශංසාකොට බොධිසත්ත්වයන්ගේ ගෙය ඝණ්ඨාරාවිරාරී දුක්ඛා ''ඉඹි සැමදෙන ඇරගෙණ දුක්පත් නොවී සැපසේ ජීවත්වේ ව''යි කියා තමන්ගේ දිව්‍යලොකයටම ගියාහ යි වදාරා මේ උරග ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කෙලි නම් ත්‍රිපිටකධාරීවූ බුද්ධුත්තරෝ නම් මෙහෙණින්නය, එසමයෙහි බ්‍රහ්මණයාගේ පුත්‍ර නම් රාහුලසථවිරයන්, දූ නම් උපුල්වන් මහාසථවිරයන්, එසමයෙහි බ්‍රාහ්මණයාහන්ගේ භාර්‍යාවෝ නම් ඛේමා නම් භික්ෂුණිය ය. බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්මය යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 344
## ඝණ ජාතකය

මේවද සිඛාඪී නම් සම්බුදුහු වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසල රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

කෝසල රජ්ජුරුවන්ගේ එක් අමාත්‍යයෙක් රජ්ජුරුවන්ට පක්ෂපාතව ඉඳිනේය. ඒ අමාත්‍යයා දුර්ජනයන්ගේ බසින් ඔහුකෙරේ කළකිරී සිරගෙයි ලැවූහ. ඒඅමාත්‍යයා සිරගෙයි ඉඳම සෝවාන් මාර්ගඵලයට පැමිණියේය රජ්ජුරුවෝන් නොබෝ දවසකින් ඒ අමාත්‍යයාගේ ගුණ සඳහන්කොට දුර්ජනයන්ගේ බසින් මාගේ අමාත්‍යයා සිරගෙයි ලැවූ පමණක් විනා උන්ගේ වරදක් නැතැ යි සිරගෙයින් අරවාපීහ.

ඒ අමාත්‍යයාත් සිරගෙයින් ගැලවී ඉස්සෝධා නහා ගඳවිලවුන් ගෙණ ජේතවනාරාමයට ගොස් සම්බුදුහු වහන්සේ වැඳපුදා එම් සි ගියේය.

සම්බුදුහු වහන්සේත් අමාත්‍යයාහට දැක "දුකඛයට පැමිණියාදැ?"යි විචාරා වදාළසේක. "සවාමීනි, එසේය, දුකඛයට පැමිණුත් සැපයක් උපදවා ගනිම්"යි "සෝවාන් මාර්ගයට පැමිණියෙම්"යි කීහ.

එවිට සම්බුදුහු වහන්සේ "එම්බල අමාත්‍යය, පෙරත් උත්තමයෝ අනර්ථයට වැද අර්ථය උපදවා ගත්තෝ වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුහු වහන්සේ ඉතුත්වත් දක්වා වදාළසේක.

පසිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට පුත්ව උපන් සේක. උන්වහන්සේට නම් තබන්නාහු සත්‍ය කුමාරයෝය යි නම් තුබූහ.

උන්වහන්සේ වැඩිවිය පැමිණ තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් අතින් ශිල්ප තිමවා ඉගෙණ පියාගත් අවැමෙන් රාජ්‍යයට පැමිණ දශරාජධර්මයට අකොප්‍යව රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ අමාත්‍යයෙක් අන්තඃපුරයට වැරදී ගියේය. රජ්ජුරුවෝ තමන්ගේ සිය ඇසපුරා ප්‍රත්‍යක්ෂයෙන් දැක උන්ට කිසිඟහටක් නොකොට මාගේ රාජ්‍යයෙහි නොඉඳුවයි කියා නුවරින් නෙරපූහ.

ඒ අමාත්‍යයා කොසොල්රට වංක නම් රජ්ජුරුවන් ලඟට ගොසින් පෙර ජාතිවල පරිද්දෙන් වංක රජ්ජුරුවන් හා සේකාව ඇරගෙණ බරණැස්නුවරට අවුත් බොධිසත්ත්වයන් අල්වා සිරගෙයි ලා වංක නම් රජ්ජුරුවෝ රාජ්‍යය ඇර ගෙණ ඉඳිනාහ.

බොධිසත්ත්වයෝත් සිරගෙයි ඉදම පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ගත්හ. බොධිසත්ත්වයන් පඤ්චාභිඥ අෂ්ටසමාපත්තියට පැමිණීවිටම වංක රජ්ජුරුවන්ට දැහ උපන්නේය.

වංක රජ්ජුරුවෝ අනික් කෙණෙකුත් නිසාවූ දෙයක් නොවෙයි සිතා සිරගෙයි උන් බොධිසත්ත්වයන් සමීපයට ගියාහ. බොධිසත්ත්වයෝත් භාවනා කොට ධ්‍යානයෙන් උන්නාහ. වංකරජ්ජුරුවෝ කියන්නාහු "එම්බා ඝණ රජ්ජුරුවෙනි, නුඹ මේසා රාජ්‍යශ්‍රියකින් පිරිහී කිසිසෝකයක් නැතිව ඉඳිනට කාරණා කිම්ද? මේසා රාජ්‍යශ්‍රියකින් පිරිහුනු කල සෙසු කෙණෙක් වීනම් අඬා දෙඬා බොහෝ වික්ෂේපයට පැමිණෙන්නාහ. නුඹ කිසි මුසුප්පුවක් නොකොට සමාධියෙන් ඉඳිනේ, මීට කාරණා කිම්ද?"යි කීහ. එවිට බෝධිසත්ත්වයෝ කියන්නාහු "එම්බා වංක රජ්ජුරුවෙනි, මම කිසි පදාර්ථයකත් පළමුත් බැලීමක් නැත්තෙමි, යම් ව්‍යසනයකට පැමිණිකල අඬා දෙඬා යම්කෙණෙක් වික්ෂේප වෙත් නම් තමන්ගේ ශරීරයටත් දුක් පැමිණ සතුරන්ටත් අවසර පෙණෙන් නේය. එපමණක් විනා ඊට ලාභයක් නැත. පැමිණෙන දෙයක් පැමිණෙන් නේය. නවමනා දෙය නස්නේය. එසේ හෙයින් ඓශ්වර්‍යයෙන් පිරිහිනිමි යි කිසි සෝකයක් නැත්තෙමි" කීහ. එවිට වංක රජ්ජුරුවෝ "දුර්ජනයන්ගේ බසට මෙලෙස කෙළෙමි" කියා බොධිසත්ත්වයන්ට රාජ්‍යය දී තමන්ගේ නුවර ගියාහ. බොධිසත්ත්වයෝත් පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා "ධ්‍යාන ලාභීවීම්, මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්ද?"යි රාජ්‍යය අමාත්‍යයන්ට පාවාදී හිමාලය වනයට ගොස් තපස්කොට කම්වූ පරිද්දෙන් බඹලොව ගියාහයි වදාරා මේ ඝණ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි වංක රජ්ජුරුවෝ තම් ආනන්දස්ථවිරය, ඝණ රජ්ජුරුවෝ තම් "බුදුවූ මම්මය"යි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

## 345 කරණ්ඩක ජාතකය

**තී**වද ශෞද්ධොදනීයවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසනසේක් ධම්මසෙනාපතිවූ සැරියුත් මහා ස්ථවිරයන් අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්**

සැරියුත් ස්වාමි වැද්දන්ට කෙවුලන්ට උන්ගේ අභිප්‍රාය නොදැනම සිල් දෙනසේක. වැද්දෝත් කෙවුලෝත් සැරියුත් ස්වාමිදෙන හෙයින් සිල්ගත්තා ඇම තාවුරුකොට පමණක් විනා ශීලය තාවුරුකොට ගතනොහෙන්නාහ.

එපවත් සැරියුත් ස්වාමීන් තමන්වහන්සේ භික්ෂූන් වහන්සේට වදාරණසේක් "මහණෙනි, වැද්දන් කෙවුලන්ට අප සිල්දෙන පමණක් විනා ශීලය උන් හත නොහෙන්නාහ"යි වදාළසේක.

එවිට භික්ෂූන්වහන්සේ "ස්වාමීනි, උන්ගේ අභිප්‍රාය නොදැන සිල්දෙන හෙයින් උන් සිල් නොරක්නෝය. එසේ නොව කියා ආරාධනා කළොත් විනා සිල්දෙන්ට එපාය යි කියා වදාළසේක.

මේ කථාව දම්සභාවට රැස්වූ මාළුවරුන් වහන්සේ කියා කියා උන් තෙතට සම්ඥයන් වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදරා එපවත් අසා "දැන්මතු තොවෙයි, මහණෙනි, පෙරත් ශාරීපුත්‍රස්ථවිරයෝ අභිප්‍රාය නොදැනම සිල් දුන්නෝ වේදැ?"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්ඥයන් වහන්සේ ඉකුත්වත් දැත්වා වදාළසේක.

පසුගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක්තරා බ්‍රාහ්මණ කුලයක ඉපිද කාරණ්ඩික නම් කුමාරව ඉපිද වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ලඟ ශිල්ප ඉගෙණ උන්ගේ පන්සියයක් අතවැසියන්ට නායකව වසන්නාහ.

එසමයෙහි දිසාපාමොක් ආචාරී මනුෂ්‍යයන්ගේ පමණ නොදැන අනිප්‍රායව සිල් දෙන්නාහ. ඒ මනුෂ්‍යයෝ සිල් ගන්නා පමණක් විනා සීලය තාවුරු කොට ගත නොහෙන්නාහ. උන්ගේ අභිප්‍රාය නොදැන සිල් දෙන්ට එපසි ශිෂ්‍යයන් කීවත් නොනැවතම සිල් දෙන්නාහු එක්තරා මනුෂ්‍යයෙක් දිසාපාමොක් ආචාරීන් අතවැස්සන් පන්සියයට "සෙට දවසට දන් මාගෙනැ"යි පැවරුහ.

දිසාපාමොක් ආචාරී තුමූ නොගොස් තමන්ගේ කාරණ්ඩික නම් අතවැස්සානන් ඇතුළුවූ අතවැස්සන් පන්සියය කැඳවා "තොපි හැම ගොස් මේ පුරුෂයාට ශාන්ති කොට දනුත් කා උන්ගෙන් දුන්නාවූ ලාභසත්කාර ඇත්නුමුත් ඇරගෙණ එව"යි කියා යවූහ. එකියන අතවැස්සෝත් ඒ පුරුෂයාගේ ගෙට ගොස් දනුත් කා ශාන්තිකොට ලාභත් අරගෙණ එන්නාහු අතරමග කඳු මුදුනෙක සැතපී උන්නාහ.

එවිට කාරණ්ඩික නම් අතවැස්සානෝ සිතන්නාහු "අපගේ ආචාරීන් වහන්සේ මනුෂ්‍යයන්ගේ අභිප්‍රාය නොදැනම සිල් දෙනසේක මා විසින් අරවන්ට උවමැනවැ"යි සිතා එතනින් ගල්කැට ඇරගෙණ පාත එලන්නාහ. සෙසු අතවැස්සෝ "මේ කුමක්දැ?"යි විවාළහ. උන් ඇමි හා කිසි බසකුත් බැණ නොනැඟී ගල්කැට පාත එලන්නේය. අතවැස්සෝ මුන් ඇඟට අපාසුවක් නිසාවේදැ?යි කියා එපවත් දිසාපාමොක් ආචාරීන්ට කීහ. දිසාපාමොක් ආචාරීද එතනට ඇවින් කියන්නාහු කාරණ්ඩික නම් අතවැස්සානෙනි, තොප කරන්නේ කිම්දැ?"යි කීහ එවිට අතවැස්සානෝ කියන්නාහු "මේ පෘථිවිමණ්ඩලය හෙරි තලයක්සේ තනාපියන නිසාය"යි කීහ.

එවිට දිසාපාමොක් ආචාරී "එසේ කරන්ට බොහෝදෙනා විසිනුත් නොපිළිවනැ"යි කී කල්හි එසේකල "ආචාරීන් වන්ස, තොගෙක් වගීයේ මිනිසුන්ට අභිප්‍රාය නොදැන සිල් දුනැ යි කියා සිල් රකුණා කෙරෙද්දැ?"යි කීහ. එවිට ආචාරී "තොප කී තියාවට තොප කීවා ගිවිස්සම්හ. මෙතැන් පටන් අභිප්‍රාය ඇති කෙණෙකුන්ට විනා සීලය නොදෙම්හ"යි කියා දෙන්නම තමන්ගේ ගෙට ගියාහයි වදරා මේ කාරණ්ඩික ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි දිසාපාමොක් ආචාරී නම් ශාරීපුත්‍රස්ථවිරය, කාරණ්ඩුක බ්‍රාහ්මණ නම් බුදුවූ මම්මයයි තුමන්වහන්සේ දක්වා වදාළසේක.

## 346 ලටුකික ජාතකය

තිවද ගෞතම ගොත්‍රයෙහි උපන්නාවූ සම්බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි "දෙවදත්ත සඳහා විරුද්ධ වහන්සේ කවුරුන් කෙරේත් දයාවක් නොකරති" කියා කියා උන් තැනට සම්බුදුරජාණන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "දැන්මතු නොවෙයි; මහණෙනි, පෙරත් දෙවදත්තසඳහා විරුද්ධයෝ කා කෙරේත් දයා නොකළෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැ?"යි ආරාධිත වූ සම්බුදුරජාණන් වහන්සේ මතුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

පිටතිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ අසූදහසක් ඇතුන්ට නායක වූ ඇත් රජව උපන්නාහ.

එක් කැටකිරිල්ලක් එක් මාවතෙක කැදැල්ලක් ඉදිකොට ගෙණ බිත්තර ලා බිත්තර ගසා පැටවුන් පිහාඹා නොහෙන අවස්ථාවෙහි බොධිසත්ත්වයෝ අසූදහසක් ඇතුන් ඇරගෙණ ඒ ස්ථානයට පැමිණියාහ. කැටකිල්ල "තමාගේ දරුවන් පාගා මරති"යි බොධිසත්ත්වයන් ඉදිරියට තමාගේ පියාපත් දෙක මුදුනේ තබාගෙණ ගොස් කියන්නී "සැට අවුරුද්දෙන් ගිලී යන මද ඇති අසූදහසක් ඇතුන්ට නායකවූ නාගරාජයාතෙනි, තොපව නමස්කාර කෙරෙමි' මාගේ දරුවන් නොනසව"යි කිව. එවිට තමාගේ සතරපය අස්සේ කිරිල්ලගේ පැටවුන් ලාගෙණ අසූදහසක් ඇතුන් යනතුරු වැද සිට පසුව කැටකිරිල්ලට කියන්නාහු "පස්සේ එන්නාවූ ඇතෙක් වණඹය, පරුෂය, තොපට පිළිවන් වීනම් ගලවා ගණුව"යි කියා ගියාහ. එකියන කැටකිරිල්ලී "යහපතැ"යි ගිවිස සිටි අවස්ථාවට එකියන ඇත් එතනට පැමිණියේය.

එවිට කැටකිරිල්ලී තමාගේ පියාපත් දෙක ඉස්මුදුනේ තබාගෙණ ඇතාට කියන්නී පළිතවල වතානන්තරමල වාසයකොට පියා එන්නාවූ එකචාරී නාගරාජය, තොපට මාගේපියාපත් දෙකින් නමස්කාර වේ වයි මාගේ දුම්ල වූ දරුවන්ට හානියක් නොකරවයි"කියා නමස්කාර කළාය.

එවිට එකියන ඇත් කියන්නේ "තොපසේ දුම්ලයන්ට මා කුමක් කළත් බරෙක්දැ?"යි කියා මට තොප කරන්නේ කිම්ද? තොපගේ පැවවුන් පිරවා අනිත් හා පස්සාපයිනුත් දකුණු පයිනුත් නොමඬිම්, වම්පයින් මඬිම්" කියා වම් පයින් මැඩ මූත්‍රවතුරේ යවාමන.

එකියන්නාවූ කැටකිරිල්ලිත් එක ගසක අත්තක් පිට ඉදගණ කියන්නී "තාගේ බලයේ විවර හා මාගේ නුවණේ විවර හා බල, තාගේ උදක් බලයෙන් මාගේ දරුවන් නසාපුවාට මාගේ නුවණින් නාත් නසන්නෙම් වේ දැ"යි කියා තමන් ගොසින් එක් කවුඩෙකුට දෙනුන් දවසක් සේවාකම් කොට එකියන කවුඩු තී මට සේවාකම් කරන්නේ ඇයිදැ?"යි කිහ. "සවාමිනි, මාගේ දරුවන්

ඇතෙක් නසාලීය. එසේ නෙයින් එකියන ඇතා එකවාරීව ඇවිදියි. ඒ ඇතාගේ අවසරයක් බලා ඇස්දෙක විදපුවොත් යහපතැ''යි කීහ. එකියන කවුඩු ''යහපතැ''යි කියා ගිවිස්සේය.

එවිට එකියන කැටකිරිල්ලී නිලමැස්සෙකු සමීපයට ගොස් කීප දවසක් උන්පස්සේ සේවාකම් කරන්නීය. එවිට එකියන නිලමැසි ''ඇයි තොප මා පස්සේ සේවය කරන්නේ ඇයිදැ?''යි කීහ. එසඳ ''එක් කවුඩෙක් එකවාරීව ඇවිදිනා ඇතෙකුගේ ඇස් විදින්නේය. තොප ගොසින් උන්ගේ ඇසේ ඉහඬ ලා එව''යි කීහ. එයිත් ''යහපතැ''යි ගිවිස්ස.

පසුව කැටකිරිල්ලී ගොස් මැඩියෙක් ආශ්‍රය කළාය. එකියන මැඩියා ''මා ආශ්‍රය කරන්නේ ඇයිදැ?''යි කීහ. එවිට කැටකිරිල්ලී කියන්නී ''එක්තරා ඇස් කණිව ඇවිදිනා ඇතෙක් පැන් පිපාසායෙන් ඒ ඒ තැන ඇවිදින්නේය, ඒ වේලාවට තෝ පලා ගොස් පළිතය උඩ ඉඳ අඬාලව, එවිට ඇන් මැඩියන් ඉඳ අඩන්නේ පැන් ඇති තැනක් වේදැයි පළිතය උඩව නැඟෙන්නේය. පළිතය උඩව නැගිකල තොප අඹරා ගොසින් පළිතය පාත ඉඳ අඩාලව''යි කීහ ''ඒ වේලාවව ඇන් තොපකරා එන්නේය, තොප විසින් මට කරන්නේ මෙතෙකැ''යි කියන්නා මැඩියා ''යහපතැ'' කියා ගිවිස්සේය.

පසුව කල්යාමකින් කවුඩු ගොසින් ඇතාගේ ඇස් දෙක විදපිය, විදපු නියාව දැන නිලමැසි ගොස් ඇස් දෙක ඉහිලාපිය. එවිට ඇතාගේ ඇස්දෙක අන්ධ ගියේය. එවිට ඇන් බොහෝවූ වේදනාවට පැමිණියේය. පැන් පිපාස ඉවසාගත නොහී ඒ ඒ තැන විමසා ඇවිදින්නේය. ඒ වේලාවටම මඩුවා පළිත මුදුනේ ඉඳ ඇඬිය. ඒ වේලාවටම එකියන ඇන් මඩුවාගේ කට හඬ අසා පැන් ඇති සථානයෙකැ යි සිතා පළිතය මුදුනට නැංගේය; ඒ වේලාවට මඩුවා පෙරලා පළිතය පාත ඉඳ ඇඬිය, ඒ වේලාවේ මඩුවා ඇඹු තැනට පාත බසින්ට යයි තමාගේ පය රඳවා ගත නොහී වැටුනේය, එවිටම ජීවිතක්ෂයට පැමිණියේය. එවිට කැටකිරිල්ලී ඇතා මළ බව දැන ලා ''මහත් සතෙකුගේ ජීවිතක්ෂයට පැමිණියෙමි''යි ඇතා පිට සක්මන් කොට මාගේ මනෝරථය මුදුන් පැමිණියේය''යි සිතා තමා වසන්නාවූ සථානයට ගියාහ.

ඒ අර්ථය දක්වන්නාවූ සම්‍බුදුන් වහන්සේ මහණෙනි, කවුඩු හා කැටකිරිල්ලෙක නිලමැස්සෙක මඩුවකු ඇතුළුවූ ක්‍ෂුද්‍රප්‍රාණීන් සතරදෙනෙකු එක්වීමෙන් මහත්වූ හස්තිරාජයකු මරාගන්නා ලදැ. එසේ නෙයින් මහතුන් කෙරෙහිත් නීචයන් කෙරෙහිත් වෛෂයක් නම් නොකරව''යි වදාරා මේ ලවුකික ජාතකය නිමවා වදාළසේක

එසමයෙහි එකවාරී ඇත්රජ නම් දෙවදත්තසථවිරයෝය, අසූදහසක් ඇතුන්ට නායක ඇත්රජ නම් බුදුවූ මම්ම ය යි වදාළසේක.

---

## 347
## චුල්ල ධම්මපාල ජාතකය

මේ වදාළ ශාක්‍යසිංහ නම් වූ සම්‍බුදුන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තසථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදහ.

හේ කෙසේද? යත්,

එක්දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ "දෙව දතත සථවිරයෝ සමීඥයන්වහන්සේට වෛරීව තසත්ව නොයෙක් ප්‍රයෝග කලෝ වේදැ"යි කියා කියා වැඩ උන් තෙකට සමීඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාව පුම්භාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් දැන "මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් දෙවදත්ත සථවිරයෝ තමන්ට මා පුත්ව උපන් ගමනේ පවා අභිමාල නම් වධකරවා මැරෙව්වෝ වේදැ"යි වදාරා ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සමීඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස් නුවර මහාප්‍රතාප නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකාවවූ චන්ද්‍රාදේවී නම් බිසවුන් කුස පිළිසිඳ ගත්තාහ. බොධිසත්ත්වයන් දසළු කඩ මසකින් වදා නම් තබන්නාහු ධම්පාල කුමාරයෝ යයි නම් තුබූහ. බොධිසත්ත්වයන්ගේ මැනියෝ චන්ද්‍රාදේවී බොධිසත්ත්වයන් සන්මැසි වූ ගමනේ නාවා අදුන් ගාවා සරසා කිරිපොවමින් සුරතල් බලබලා සමාධියෙන් උන් කලට මහාප්‍රතාප රජ්ජුරුවෝ බිසවුන්ගේ ගෙට ගියාහ.

බිසව රජ්ජුරුවන් දැක නැගි තොසිටියාහ. රජ්ජුරුවෝ "තමාගේ සත්මැසි පුතෙකු ලදිමියි මා වැනි රජෙකු දැක උන්තැනින් නැගි නොසිටියාහ මහත්ව ගියොත් තමාම නොතකනී"යි මහත්වූ කෝපයෙන් රජ්ජුරුවෝ ආපස්සේ පලාගොස් තමාගේ සිංහාසනයේ ඉද "වධකයා ගෙණව"යි කියා යවූහ.

වධක එන තැනැත්තේ එක්කණක රත්මල් තබා රතක් ඇඳ රතක් පොරවා එක් අතකින් කඩුව, කෙවිරිය, දම්ගෙඩිය අරගෙණ අවුත් රජ්ජුරුවන් දැක "සාමීනි, කවුරුත්ට වධ කෙරෙමිදැ?"යි කීය. රජ්ජුරුවෝ "අනික් මට සතුරු කෙනෙක් නැත, ධම්පාල කුමාරයා අල්වාගෙණ වධකොටමරව"යි නියෝග කළාහ.

බිසව් රජ්ජුරුවන් වහන්සේ මහා කෝපයෙන් ගියසේක. කුමකින් කුමක් වේදෝ නෝ යි ධම්පාල කුමාරයන් වඩාගෙණ අඩ අඩා වැදහොත්තාහ. වධක ගොස් වැදහොත් බිසවුන් පිටට පාරන් ගසා බිසවුන් ඉවත්කොට ධම්පාල කුමාරයන් දෙකකුල අල්වාගෙණ රජ්ජුරුවන් සමීපයට ගියේය. බිසව් අඬාගෙණ රජ්ජුරුවන් ලඟට ගියාහ. රජ්ජුරුවෝ එවිට කියන්නාහු "තෙල කුමාරයා දන්ගෙඩියේ වැද හොවා තුලු අත්දෙක කපව"යි කීහ. එවිට බිසවු කියන්නාහු "වරද කළාවූ මාගේ අත්පා දෙක නොකපා බාල සත්මැසි කුමාරයන් දැන කපන්ට කළ වරද කවරේද? වැරදි කළ මාගේ අත් දෙක කපව"යි කීහ.

එවිට රජ්ජුරුවෝ වධකයාට කියන්නාහු "ප්‍රපඤ්ච නොකොට දැන කපව"යි කීහ. "යහපතැ"යි කියා වධක කුමාරයන්ගේ දැන කැපීය. බිසව් අත්දෙක තුරුල්ලේ ලාගෙණ අඩ අඩා සිටියාහ, වධක කියන්නේ "දේවයන් වහන්ස, කුමක් කෙරෙමි දැ?"යි විඳාලේය. "තෙල කුමාරයා දෙකකුළ කපව"යි කීහ. එවිට බිසව් අඩ අඩා "සාමීනි, වැරදි කළාවුනුත් සාමීන් දැක නැගී

නොසිටියත් මාවුව, මාගේ කකුල් දෙක නොකපා බාල සත්මැසි කුමාරයන් දෙපය කපන්ට කළ වරද කවරේද? වැරදි කළ මාගේ දෙපය කපව"යි කීහ.

එවිට රජ්ජුරුවෝ වධකයාට කියන්නාහු "ප්‍රපඤ්ච නොකොට තුලු දෙපය කපව"යි කීහ. "යහපතැ"යි කියා වධක කුමාරයන්ගේ දෙකකුල කැපීය. එවිට බිසව් කැපූ කකුල්දෙක තුරුල්ලේ ලාගෙණ අඩ අඩා සිටියාහ.

වධක එවිට කියන්නේ "දේවයන් වහන්ස, තව කළමනා වධ ඇද්දැ?"යි විචාළේය. රජ්ජුරුවෝ "තව කරණ වධ ඇති තුලු ඉස කපව"යි කීහ. බිසව් "ස්වාමිනි, මාගේ දූත දෙපය නැති පුතනුවෝ රාජ්‍යය කළ නොහෙන්නාහ, කොට පුතනුවන් මට දීපුවොත් රැකහැණිමැ යි වැරදි කළ මාගේ ඉස කප තොත් විතා මාගේ නිවරද පුතනුවන් ඉස නොකපවා වදුල මැනව ස්වාමීනී"යි කීහ වධකයාට කියන්නාහු "තුලු ඉස ප්‍රපඤ්ච නොකොට කපව"යි කීහ. "යහපතැ"යි කියා වධක කුමාරයන්ගේ ඉස කපා දැමීය. බිසව් දූතත් දෙපයත් ඉසත් තුරුල්ලේ ලාගෙණ අඩ අඩා පෙරළෙන කලට වධකයා කියන්නේ "දේවයන්වහන්ස, මෙවිට කුමක් කෙරෙම්දැ"යි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු "තෙල සොරුන්ගේ ශරීරය ආකාශයට දමා කඩුවෙන් කප කපා අහිමාල නම් වධ කරව"යි කීහ වධකයාත් "යහපතැ"යි කුමාරයන්ගේ ශරීරය ආකාශයට දමා කඩුවෙන් කපා ශරීරමාංශ වදමල්පෙති සේ කපා දැමීය.

බිසවු ඒ මාංශත් අරගෙණ දූත දෙපය ඉසත් තුරුල්ලේ ලාගෙණ අඩ අඩා රජගෙයි වට ඇවිද කියන්නාහු "රජ්ජුරුවන්ගේ නැකෙණෙක්වත් හිත මිත්‍ර කෙණෙක්වත් අමාත්‍ය කෙණෙක්වත් නැත්තාහ එසේවූ කෙණෙක් ඇත් නම් මාගේ නිවරද ඖරස පුත්‍රවූ පුතනුවන්ට මෙසේවූ වධ නො පැමිණෙන්නේ වේදැ"යි කිය කියා අඩ අඩා "දරුවනි, මාගේ ප්‍රාණය මේ සෝකයෙන් තිබෙයි නො සිතව"යි කිය කියා ඇවිදිනා කල බිසව් ලයෙන් නැඟී සෝකයෙන් හෘදය මාංශය උත කිලිල්ලක් සේ ඉදී ලයපැලී ජීවිතක්ෂයට පැමිණියාහ. නුවරවාසීහු බිසවුනුත් කුමාරයන්ගේ ශරීරමාංශ දූත දෙපය ඉස එක්වලා ආදාහන කළාහ.

රජ්ජුරුවෝ සිංහාසනයේ උන්තැනැත්තේ බිසව් කෙරේ හා පුත්‍ර ප්‍රේමයෙන් වැටුනාහු උඩුමාලේ පෝරු පැලී ඉවත්ව හිඳේය. එමාලෙන් පාත මාලෙ වැටුනාහ. මේ නියායෙන් මාලෙන් මාලෙට වැටී බිමවැටුනාහ දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහපොළොව පැලී අවීචිමහනරකයේ වැටුනාහ යි වදාරා මේ චුල්ල ධම්මපාල ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි මහාප්‍රතාප රජ්ජුරුවෝ නම් දෙවදත්තස්ථවිරයන. එසමයෙහි චන්ද්‍රාදේවී නම් ප්‍රජාපතී ගොතමිය, එසමයෙහි ධම්පාල කුමාරව උපන්නෙම් බුදුවූ මම්ම ය යි වදාළසේක.

---

## 348 සුවණ්ණමිගජාතකය

තවද ශාක්‍යකුල තිලක වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දැගඇවිවන් වහන්සේව උපස්ථාන කරණ එක්තරා කුලයක් අරභයා මේ ජාතකය දක්වන ලදහ.

ඒ කොසේද? යත්

දැහැවිවන් වහන්සේට උපස්ථාන කරණ එක්කුලයක දුවනිකෙණෙක් ඇත්තාහ. ඌ තුමූ විශිෂ්ට රූ ඇත්තාහ. බැලුවන්ට ප්‍රසාදනීයහ. තුණු රුවන්ම මානය කොට වාසය කරන්නාහ. උපාසිකා ව දවසරිනාහ. එකියන කුමාරිකාව තීර්ථික කුලයක ඇත්තෝ තමන්ගේ පුතනුකෙණකුන්ට විවාහ යට යයි කියා විවාළාහ. එකියන කුමාරිකාවගේ දෙමව්පියෝ කියන්නාහු "නොපි ඇමකම් පරමම්පය්‍යාදෘෂ්ටියන එසේ වූවන්ට අපගේ දරුවන් පාවාදුන් කල උන් සිතුසේ සඩඹයා වහන්සේ වැඳ පුදුගන්ට දන්දී ගන්ට නුපුළුවන. එසේ හෙයින් නොපව පාවා නොදෙමිහ"යි කීහ.

එබස් අසා තීර්ථිකකුලයේ ඇත්තෝ කියන්නාහු, "තොපගේ දුවනියෝ අපගේ ගෙට ආ කල තමන් සිතා සැටියේ දන් දෙන්වයි, සිල් රකින්වයි සඩඹයා වහන්සේ වැඳ පුදා ගණින්වයි, ඊට අපගෙන් වාහකුලයෙක් නැතැ"යි කීහ. "එසේ වී නම් පාවාගණුව"යි මහමගුල් කොට සරණ පාවා දුන්හ.

එකියන කුමාරිකාවත් සරණගිය නොබෝ කලකින් තමාගේ වල්ලභයාට කියන්නී "සවාමිපුත්‍රයානෙනි, දැහැවිවන් වහන්සේ දැන වැඳ පුදා දන් දෙන්නා කැමැත්තෙමි" කිවාය. එකියන පුරුෂයාත් "යහපතැ"යි කීයේය. එකියන උපාසිකා සැරියුත් සවාමීන් මුගලන් සවාමීන් වැඩමවා දන් දී දැහැවිවන් වහන්සේට කියන්නී, "යම් දවසක් මේ ගෙයි ඇත්තෝ තමන්ගේ මිථ්‍යාදෘෂ්ටිය අරිද්ද? ඒ තාක්කල් මේ හෙට සිඟන්නට වැඩිය මැනවැ"යි කිව. "යහපතැ"යි කියා ඒ යෙට සිඟාවඩිනා සේක.

එසමයෙහි නොමෝ කිප දවසක් පලා යන්නා තමාගේ සවාමිපුත්‍රයාට කියන්නී, "ඇයි දැහැවිවන් වහන්සේ දවස්පතා වඩිනාකල උන්වහන්සේලා වැඩිකල මට කියාලව"යි කීයේය. එකියන ස්ත්‍රීන් දැහැවිවන් වහන්සේට අසුන් පණවා වළඳ අනතයෙහි තමාගේ සවාමිපුරුෂයාට කීයේය. එකියන පුරුෂයාත් එතනට අවුත් දැහැවිවන් වහන්සේ වැඳලා එකත්පස්ව උන්නේය.

ඉන් දම්සෙනෙවි සැරියුත් මහාසවාමි එකියන කෙළෙඹි පුත්‍රයාට දැන කථා ආදීවූ කථායෙන් ධර්මදේනා කළසේක. ඒ බණ අසා එකියන පුරුෂයාත් තමාගේ මිථ්‍යාදෘෂ්ටිය ඇර එවක් පවන් දන් දෙමින් සිල්රැකා වාසය කරන්නාහ. මේ නියායෙන් කල්යත් එකියන පුරුෂයාගේ දෙමව්පියෝ පවන් නැවගීයාද යටත්පිරිසෙයින් කෙල්ලන් කොල්ලන් දක්වා මිථ්‍යාදෘෂ්ටිය හැර සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටියෝය.

එක් දවසක් සැරියුත් සවාමීන් වළඳ කළ ධර්මදේශනායෙහි එකියන පුරුෂයාත් ස්ත්‍රියත් දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටියේය. පසුව කල්යාමකින් එකියන ස්ත්‍රී කියන්නී, "සවාමිපුත්‍රයානෙනි, මා ගිහිගෙයි ඉන්ට අනිප්‍රාය නැත. මහණ වන්නා කැමැත්තෙමි" කිව. එකියන පුරුෂයාත් "සාධුපතැ"යි "තොපිත් මහණවෙව, මමත් මහණවෙමි"යි මහත්වූ පෙරහරින් තමන්ගේ භාර්‍යාවා මෙහෙණවරට ගෙණගොස් මහණ කරවා තුමූත් බුදුන් කරා ගොස් මහණවූහ. මහණවූ නොබෝ කලකින් මෙහෙණින්ත් එකියන මහණත් සියළු කෙලෙසුන් නසා රහත්වූහ.

මෙකියන කථාව දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන් වහන්සේ "අය වල් මෙහෙණියන් නිසා තමාගේ පුරුෂයා ගලවා තමනුත් ගැලවුනේ වේදැ"යි කියා කියා වැඩ උන් හෙනට සඞ්ඝයන් වහන්සේ වැඩවදරා "මහණෙනි, මා එන්නාට පූර්වනිවාසයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, දැන් මතු නොවෙයි, එකියන ස්ත්‍රී තමනුත් ගැලවී මහන්මය නුත් ගළවා ගත්තෝ වේදැ?"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සඞ්ඝයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

යේවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ මෘගව උපන්සේක. ශරීරය රත්වන්වූ පැහැයෙන් යුක්තය. සතර කකුල ලාඤ්ඡාරසයෙන් තෙමාලුවක් මෙන් රක්තය, මුඛය රත්පලස්වටක් මෙන් රක්තය, අත්දෙක රිදීපැහැයක් හා සමාන, නෙත්‍ර ඉන්ද්‍රනීල මාණික්‍ය දෙකක් මෙන් වූයේය. මේ නියාමයෙන් රුවින් අග්‍රව ඉපිද මේ නියාවට විශිෂ්ටවූ රූපයෙන් යුක්ත මෘගාධිපතිවකුත් බොධිසත්ත්වයන්ව බිරිත්දුව ඉන්නාහ. අසූදහසක් මුවෝ සේවකම සිටිනාහ එහෙමයෙහි එක් වැද්දෙක් වරපටින් මළ ලාලූයේය. බොධිසත්ත්වයෝ අසූදහසක් මුවන් පිරිවරා ගොවරග්‍රහණය කරන්නාවූ වැද්ද, ලූ මළේ පළමු යන්නාහු බැඳුනාහ. මළ බැඳුනු ගමනේමළ කඩාගත හැකැයි බොධිසත්ත්වයෝ පයගසාලා ඇදලූ ගමනේ පය සම කැඩින, දෙවනුව ඇදලූ ගමනේ මාංශ කැඩින. තුන් වෙනිව ඇදලූ ගමනේ තනරවැල් කැඩී ඇටයේ තරව ඇසිර වැදහොත් ගමනේ බොධිසත්ත්වයෝ මරණ භයින් භයපත්ව බඩරුවයෙන් මහත්කොට ඇඬූහ

ඒ අඩ අසා අසූදහසක් මුවෝ භයින් තැතිගෙණ ඒ ඒ අත දිවපූහ. බොධිසත්ත්වයන්ගේ භාර්‍යාවූ මෘගාඛනාවත් එපරිද්දෙන්ම දිව මුවන් අතුරෙන් තමාගේ සවාමිපුත්‍රවූ මුවානන් නොදැක "මේ භය පැමිණියේ මාගේ සවාමිපුත්‍රයාතන්වහන්සේටය"යි යන සිතින් මළබැඳුනු බොධිසත්ත්වයන් ලඟටඅවුත් කියන්නාහු "රන්වන්වූ පැහැයක් ඇති මුවරජ්ජුරුවෙනි මා හුදකලාකොට මට දුක් නොදී මහත්වූ වේගයෙන් මළකඩපියව"යි කීහ. එවිට මුව රජ්ජුරුවෝ කියන්නාහු "භද්‍රා මා කරණ යම් උත්සාහයක් කෙළෙමි. පය සම් මස් නහර කැඩී ඇටයේ මන්ද ඇසිරිත. එසේ හෙයින් මන්ද කඩාගත නොහෙමැ"යි කීහ. එවිට මුවදෙන් කියන්නී "සවාමීනි, නුඹවහන්සේ නොබව මැනව, මාගේ ප්‍රාණය පරිත්‍යාගකොට වී නමුත් නුඹවහන්සේ රකිමි. නොබාමැනවැ"යි කියා ඇඟ වතුරුවාගෙණ සිවි කලට වැදි කල්පාන්ත වහ්නියක් මෙන් තෙප් ගත් අත් ඇතිව එන්නවුන් දැක මුවදෙන් "සවාමීනි, වැදිපුත්‍ර එන්නේය. නොබව මැනවැ"යි බොධිසත්ත්වයන්ට කියා වැද්දගේ ඉදිරියට නොසින් තමස්කාර කොටලා සිට කියන්නී "වැදි පුත්‍රයාතන් වහන්ස, මේ මුවානෝ රන්වන්වූ ශරීර ඇත්තාහ. දසදහසක් මුවන්ට නායකයෝය. විශිෂ්ඨවූ රූ ඇත්තාහ. මාගේ සවාමිපුත්‍රයාතන් වහන්සේය. නොමරා ඇරපියව. ඉදින් මරන්ට සිතව් නම් මෙසේ කොලඅතු කඩා අතුව මා මරා මාංශ ඇරගෙණ පසුව මාගේ සවාමිපුත්‍රයාතන් වහන්සේ මරව"යි කීහ. එවිට වැදිපුත්‍රයා මහාසමාධිව "නැතත් කාලයක් මුවන් දුටුවිරීම්, මුවන් මනුෂ්‍යයන්ගේ භාෂාවෙන් කථා කරන්නවුන් නැසුවිරීම්"යි කියා කියන්නේ "හෙපගේ සවාමිපුත්‍රවූ මුවන් තොපත් නොමරා අරිමි.

තොප නොබව''යි කියා මූවාලඟට අවුත් පය බැඳුනු මන්ද ගළවා නහරින් නහර හී, මසින් මස් හා සමින් සම හා තබා පිරිමැද ලේ සෝධාළු ගමනේ වැද්දහුගේ මෛත්‍රී බලයෙන් හා බොධිසත්ත්වයන්ගේ පාරමිතාවෙන් හා මූවදෙනගේ කරුණාවෙන්ද කිසි කැලලක් නැතිව සුවව සැපයෙහි පිහිටියාහ.

එවිට මූවදෙන් වැද්දහුට කියන්නී ''වැදිපුත්‍රයාතෙනි, අපවවු සමාධියෙන් තොපගේ අඹුදරුවන්වත් සතුටුවේව''යි ආවඩා සිටියාහ. බොධිසත්ත්වයෝත් තමන් ගොවර භූමියෙහි දුටු මාණික්‍ය රත්නයක් වැද්දහට දී ''වැදිපුත්‍රයාතෙනි, තෙල ඇරගෙණ විකොට කව ප්‍රාණඝාත නොකරව''යි අවවාද වදාරා වනාන්තරයට ගියසේක. බුදුරජාණන් වහන්සේ සඞ්ගීතිආරූඪ ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

එසමයෙහි වැදිපුත්‍රයා ඡන්න තම් අමාත්‍යයාය, එකියන මූවදෙන් තම් මේ භික්ෂුණීය, එසමයෙහි මූවරජ තම් බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 349
## සුස්සොන්දිය ජාතකය

තවද සූර්‍යවංශයට බන්ධුවූ සර්‍වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැසවසන සමයෙහි ස්ත්‍රියක තෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂුකෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලදී.

**ඒ කෙසේද? යත්,**

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක කෙරේ පිළිබඳව ශාසනයෙහි උකටලීවූසේක් සර්‍වඥයන් වහන්සේ විචාරා වදාරන්නාහු ''ගුරුළුවිමන ලාත් රැකගත නුහුනුවූ ස්ත්‍රියකකෙරේ පිළිබඳ සිත් ඇති වෙද්දැ?''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පෙරකල්හි දවස බරණැස් නුවර තඔතාඬ නම් රජ්ජුරුවන් හා කැටිව වූ කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ තාගදිවයිහි වාසය කරන්නාවූ ගුරුළු රජව බරණැස්නුවරට ගොසින් තඔතාඬ නම් රජ්ජුරුවන් හා කැටිව වූ කෙළනාහ. රජ්ජුරුවන්ගේ සුස්සොන්දිය නම් බිසෝ කෙණෙක් ඇත්තාහ. ඒ බිසවුන්ගේ සේවක ස්ත්‍රී ඒ මානවකයාගේ රූපය යහපතැයි බිසවුන්ට විස්තරකොට කීවාහුය. බිසව් ඒ මානවකයා දකින අභිප්‍රාය ඇතිව මිනිසුන් පස්සේ සිටියාහ.

බොධිසත්ත්වයෝත් වූ කෙළිකා පරක්කුවෙන් බිසවුන් බැලූහ. බිසවුන් බොධිසත්ත්වයන් බලා පිළිබඳ සිත් ඇතිව එවිට බෝධිසත්ත්වයෝ පවනක් හා අඬකාරයක් මවා මිනිසුන් පහකොට බිසවුන් තමන්ගේ ඇකයේ සඟවාගෙණ තමන්ගේ ගුරුළු විමානයට ඇරගෙණ ගියේය. රජ්ජුරුවොත් තමන්ගේ බිසවුන් නොදැක ''මාගේ බිසවුන් කොහිදැ?''යි කියා පරීක්ෂාකොට නොදැක තමන්ගේ සර්ගික නම් ගාඬ්ගීයකු කැඳවා කියන්නාහු ''මාගේ බිසවුන් ගිය තැනක් ආරඤ්ඡිකොව දෙන්වය''යි භාරකළාහ.

ඒ ගාන්ධර්‍වියාත් ගොසින් භාරු නම් පවුන්ගමව බැස යාත්‍රා යන්නාවූ සෙට්ඨිවරුන්ට කියන්නේ ''මම ඒණා හාන්ව දනිමි. තෙල නැවව තංවාගණු

වයි කීහ සෙට්ඨිවරුන් ''යනපතැ''යි කැවට තන්වාගෙණ මුහුදු මඩ්‍යයෙන් යන් නාහු ''තොපි අපට වීණා ගාව''යි කීහ. එවිට ගාන්ධර්‍යයා කියන්නේ ''ගොඩබට තෙනදී වීණා ගාම් මවජ්‍යෝ තොපගේ නැව යා තොදෙනි'' කීහ එවිට උන් ඇම කියන්නාහු ''කුඛමස්සෝ කුමක් කෙරෙද්ද? වීණාගාවයි කීහ.

එවිට ගාන්ධර්‍යයා වීණාගාන්ට වත. දැනි මෝරෙක් පඬව්වට පැන පඬව්ව බිඳපීය, ඒ ගාන්ධර්‍යයා බිඳිගිය පෝරුවක් බඳ තබාගෙණ දියපිනා බොධිසත්ත්ව යන් ඉඳිනා කාලදිවයිනට පාවීය. එවේලාවට ගුරුළුන් රජ්ජුරුවන් හා දූ කෙළිනට පළාගියේය. බිසව් ඇත මැන අවිදිනාවූ ගාන්ධර්‍යා දැක මාගේ සවාමීන්නේ ගාන්ධර්‍යායයි දැන උන ඉස්සෝදු නාවා ඔහු හා එක්ව ලොකසාදරතියෙහි යෙදී බොධිසත්ත්වයන් එන වේලාවට එක් තෙතක සඟවා ඉඳුවන් නාහ. මෙ නියාගෙන් කීපදවසක් ගිය කල්හි දඬුපත් ගන්වයයි තැවක් ඇවිත් ඒ දිවයිනට වත. ගාන්ධර්‍යයාත් එනැවට නැගී බරණැස්නුවරට ගොස් තමාගේ රජ්ජුරුවන් දැක ගුරුළු හා රජ්ජුරුවන් දෙන්නා දූ කෙළිනා වේලෙහි ගීතයකින් ගුරුළු විමිංකයේදී බිසවුන් දුටු නියාව කියා ගුරුළු ගාන්ධර්‍යා මූණ බලා ''තෝ මූදුමඩ්‍යයේ උන් සවුන් කෙසේ දුටුදැ?''යි විවාළාහ.

ගාන්ධර්‍යා කියන්නේ ''මූදු මඩ්‍යයේ තැවක් නැසී පෝරුවක් බඳ තබා ගෙණ පීනාගොසින් දිවයිනට බැස බිසවුන් හා කැටිව ලොකසාදරතියෙහි යෙදී රජ්ජුරුවන්ගේ මෙහෙවරින් ගොස් ආමි'' කීය. එවිට බොධිසත්ත්වයන් ''ගුරුළු විවාළුන් රැකගත නොහැක්කාවූ ගැණුන්ගෙන් ප්‍රයෝජන කිම්දැ?''යි බිසවුන් රජ්ජුරුවන්ටම පාවා දුන්හයි වදුරා මේ සුස්සොන්දිය ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි තඹතාඩ රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරයෝය, ගාන්ධර්‍යා නම් මේ උකටලී මහණය, සුස්සොන්දිය බිසව් නම් මේ ස්ත්‍රිය, ගුරුළුව උපන් තෙතම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක

---

## 350
## වණ්ණාරොහ ජාතකය

මේවද ආදිච්චබන්ධු යන නම්වූ සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි සැරියුත් මුගලන් දෙගසව්වන් අරභයා මේ ජාතකය දක්වන ලද.

සැරියුත් මුගලන් දෙගසව්වන් වහන්සේ පිරිසර ගමකට ගොස් වසන සේක. එක්තරා පුරුෂයෙක් මේ දෙදෙනා වහන්සේගේ මිත්‍රධර්‍මය දැක දෙදෙනා වහන්සේ උනුනුත් හස්වා බිදුවාපියන්ට උවමැනවැ''යි සිතා සැරියුත් සවාමීන් කරා ගොස් කියන්නේ ''සවාමීනි මුගලන් සවාමීන් කරා එක්දවසක් මමහියෙමි. මා කිය ගමනේ කියනසේක් මා හා සමාන ජාතිවංශවත් සෘද්ධි ප්‍රාතිහාර්‍යවත් කැනිසේක. උන්වහන්හසේ කිම්දැ?''යි කියා නින්දු සැරියේ බස් කීසේක.

"උන්වහන්ස්ේ එසේ කියේ නුඹවහන්ස්ේ කෙරේ කණස්සළුව වේදැ?"යි කිය. උන්වහන්ස්ේ අසා සිතාසී "එසේ කියස්ේක්ද? යහපත, තොපි පළාඉව"යි උන් එතනින් යවූසේක. එක් දවසක් මුහුලන් සෑමින් කරා ගොස් එම පුරුෂය, මෙම නියාවට කියා උන්වහන්ස්ේත් අසා සිතාසී 'මෙසේ කියස්ේක්ද? යහපතා, තොපි යව'යි කියා යවා එක් දිවසක් මුහුලන් සෑමින් සැරිසුත් සෑමින් කරා ගොස් "අසවල් පුරුෂයා මෙතනට ආද? එකියන හැනැත්තේ කියේ කිම්දැ"යි විමසා සේක. උන් කී සැටි වදාළසේක. "මවත් මේ සැටි කියයි උන්වහන්සේත් කියා මෙතන උවමනා එකෙක් නොවෙයි" කියා එතනින් යවා තුන්මස එතන රදා වස්වැස සම්බුදුන් වහන්සේ කරා ගොස් සම්බුදුන් වහන්සේ දැක තමන් දෙදෙනා වහන්සේ ගස්වා බිඳින්ට පුරුෂයා කී කලදෙය වදාළසේක.

සම්බුදුන් වහන්සේ අසා වදාරා "දැගසව්වෙනි, දැන්මතු කොවෙයි. පළමුත් එකියන පුරුෂයා තොප දෙදෙනා ගස්වා බිඳින්ට උත්සාහකළ ගමනෙත් තොපි දෙදෙනා ඒ අසා අදහා නොගෙණ උනුන් හා කණස්සළු නුවුවෝවේද යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ වෘක්ෂදෙවතාව උපන්සේක එසමයෙහි සුදුඇ නම් සිංහ රජ්ජුරුකෙණෙකුන් හා සුබාහු නම් ව්‍යාඝ්‍රයකු හා දෙන්නා උනුන් හා බලවත්වූ හිතමිත්‍රව වාසය කරන්නාහ.

එසමයෙහි එක් කැණහිලෙක් සිංහයා හා ව්‍යාඝ්‍රයා ලඟට ගොස් තොයෙක් සතාසතුන් කෑතැන ඇට මාංශ කා මහත්වූ ශරීරඇතිව සුවලව සිතන්නේ "කවර සතුන්ගෙත් මාංශ කෑම් සිංහමස් හා ව්‍යාඝ්‍රමස් කැවිරූ නැත. දෙන්නා උනුන් හා ගස්වා මරම්"යි සිතාසිංහ රජ්ජුරුවන් සමීපයට කැණහිල් ගොස් කියන්නේ "ව්‍යාඝ්‍රයානන් දැකලා හිත විශ්වාසකම් කිම්දැ?"යි කීය. සිංහයා කියන්නේ "හිතකමට අමුතු කිම්ද? බලවත් හිතයම්හ"යි කීහ. "නුඹවහන්ස්ේ කියන පමණක් විනා එක් දවසක් මම ව්‍යාඝ්‍රයානන් උන් තැනට ගිය හමනේ නුඹවහන්ස්ේගේ නුගුණ විනා ගුණයක් නොකිවෝය. මෑසේ ජාතිවන්ත ගුණවත් වික්‍රමවත් රූපයක්වත් උන්ට නැත. උන් කිම්දැ?"යි කිසේක. සිංහයානෝ අසා "එසේ කිවුදැ?"යි සිතාසී "මෙතනින් තොපි යව"යි කියා යවූහ.

එක් දවසක් කැණහිල් ව්‍යාඝ්‍රයානන් උන් තෙතට ගොස් ව්‍යාඝ්‍රයානන් දැකලා "නුඹ දෙදෙනාගේ හිතමිත්‍රකම් කිම්දැ?"යි විචාළේය. "මිත්‍රකමට අමුතු කිම්දැ?"යි කියන්නා "නුඹවහන්ස්ේ එසේ කියන පමණක් විනා එක් දවසක් මා එතනට ගිය හමනේ නුඹවහන්ස්ේගේ නුගුණවිනා ගුණයක් කියේ නැතැ'යි පළමු කිවාසේම ව්‍යාඝ්‍රයාට කීය. ව්‍යාඝ්‍රයා සිතාසී එසේ කී විට "තොපි මෙතනින් පළායව"යි කියා සුදුඇ නම් සිංහරජ්ජුරුවන් කරා ගොසින් සුබාහු නම් ව්‍යාඝ්‍රයා කියන්නේ "සිංහ රජ්ජුරුවෙනි, සිඟාලයා මා කරා අවුත් කියන්නේ නුඹවහන්ස්ේ මට නොයෙක්දා බොහෝව කීවයි කියා මට අවුත් කීය. සැබෑද නුඹවහන්ස්ේ මට එසේ කීවේදැ?"යි විචාළේය. සිංහ රජ්ජුරුවෝත් එවිට කියන්නේ "තොපත් මට නොයෙක්දා කීව යි කියා ඇවිත් කීය. මම අදහා නොගතිමි. තොපගේ අඥාන කමෙක විවර මාගේ තත්ත්වය දැන මෙසේ

දෙයක් කියති කියන්නක්මෙතෙක් කාලයක් එකතැන ඉඳ නොදත් නියාද? තොපගේ අඥන කමෙකැ''යි කියා දෙන්නම උනුන් හා කථා කොට ''මේ නීච තැනැත්තහු ලංවීමෙන් වේද? මෙසේවූ සැකයක් වූයේය''යි කියා උභ මෙතන ඉඳ නොනැක්කැයි මෙතනින් පහසොව් ව්‍යාඝ්‍ර රජ්ජුරුවන් ක්ෂමාකරවාගෙණ තමාගේ වාසස්ථානයට ගොස් සැපසේ වාසය කළහ යි වදාරා **මේ වර්ණාරොහ ජාතකය** නිමවා වදාළසේක.

එසමයෙහි සිඟාලව උපන්නේ මෙකියන පුරුෂයාය, එසමයෙහි සිංහව උපන්නේ ශාරීපුත්‍රස්ථවිරය, ව්‍යාඝ්‍රව උපන්නේ මුගලන් මහා ස්ථවිරය, එසම යෙහි වෘක්ෂදේවතාව ඉපිද මේ කාරණය දුටුයෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

---

## 351 සීලපරීක්ඛ ජාතකය

**තී**වද සමන්තභද්‍රවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සීලය පරීක්ෂා කළ බ්‍රාහ්මණයකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්**

සැවැත් නුවර එක්තරා බ්‍රාහ්මණයෙක් ශීලය යහපත්කොට රක්නේය. රජ්ජුරුවෝ මේ නියාව දැන සෙසු බ්‍රාහ්මණයන් නියාවට මෙකියන බ්‍රාහ්මණයාට ආවේනික ඇතිව වාසය කරන්නාහ. බ්‍රාහ්මණ තමා කෙරේ රජ්ජුවන් ආවේනික ඇතිව වාසය කරණ නියාව දැන රජ්ජුරුවන් වහන්සේ මා කෙරේ ආවේනිකව මා රක්ෂාකරන්නාවූ ශීලය ආනුභාවයෙන් මෙහෝ නොහොත් මා බොහෝ ඇසුරු පිරුණැත් ඇත්තේ ඒ නිසා මෙනෝයි මාකෙරේ ආවේනිකය. මේ මා පරීක්ෂා කරන්ට උවමැනවැ යි සිතා සෙට්ඨිවරුන්ගේ පිලට ගොස් තුන් දව සෙක රන් තුන්ගාණක් උකාගෙණ පළමුදා ආචාරීන් කෙරෙහි ගරුත්වයෙන් නොකීහ. දෙවෙනිදා මේ රන් සොරකම් කරණ සොරෙකැයි අල්වාගෙණ ගොස් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ ''ආචාරීනි, මේ කුමක් නිසා කළ දෙයෙක්ද?''යි විචාළාහ. ''සවාමීනි, ශීලය වැඩිදෝ හෝයි පරීක්ෂාකරණ නිසා කෙළෙමි''යි කීහ. රජ්ජුරුවෝ කිසිදෙයකුත් නොකීහ.

එවිට බ්‍රාහ්මණ ''සවාමීනි, මා රක්නාවූ ශීලයම වැඩිය. එසේ හෙයින් ගිහිගෙයින් මට ප්‍රයෝජන නැත. මහණවෙමි'' කියා රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්වාගෙණ සම්බුදුසසුන් වහන්සේ කරා ගොස් මහණව උපසම්පදාව නොබෝකල කින් විදර්ශනා වඩා රහත්වූයේක. මේ කථාව දම්සභා මණ්ඩපයෙහි රැස්වූ සංඝයා වහන්සේ ශීලමය ගුණවර්ණනා කර කර වැඩඋන් තැනට සම්බුදුසසුන් වහන්සේ වැඩ වදාරා ''මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුද?''යි විචාරා වදාරා එපවත් අසා ''පෙර මනොත්තමයෝ පවා ශීල යම උතුම්දෝ හෝයි පරීක්ෂාකොටම හුන්නෝවේද?''යි වදාරා ''ඒ කෙසේද?''යි ආරාධිතවූ සම්බුදුසසුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඉ**වටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක ඉපද

වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් කරා ගොස් ශිල්ප ශාස්ත්‍ර ඉගෙණ බරණැස් නුවරට අවුත් බොධිසත්ත්වයෝ රජ්ජුරුවන් දුටහ. රජ්ජුරුවන් විසින් බොධිසත්ත්වයන් පුරෝහිත සථානාන්තරයෙහි සැලැස්වූහ. බොධිසත්ත්වයෝ අඛණ්ඩවූ ශීලයරක්නාහ රජ්ජුරුවෝ සෙසු බ්‍රාහ්මණයන් නිසා මව පුරෝහිත බ්‍රාහ්මණයන් කෙරේ මනත්වූ ආවේනික ඇත්තාහ. පුරෝහිතයෝ රජ්ජුරුවන්වහන්සේ මා කෙරේ ආවේනික ඇතිසේක. මේ මා පරීක්ෂා කරණට උවමැනවැ යි සිතා පළමු කථාව පරිද්දෙන් පරීක්ෂා කළහ. රජ්ජුරුවෝ "මේ කිම්ද? ආචාරීනි, විවාළහ.

පුරෝහිතයෝ "සවාමීනි, ශීලය වැඩිදෝ නෝසි ඇසුපිරූ ශාස්ත්‍රය වැඩිදෝ හෝ සි සිතා පරීක්ෂා කෙළෙම්. ඉන් වඩිනේ ශීලයම දනිමි සවාමීනි" කීහ. උතුම්වූ ජාති හා උතුම්වූ ශාස්ත්‍රය දනිතත් වඩිනේ ශීලයම යි කීහ.

තවද රජ්ජුරුවෝ "බ්‍රාහ්මණ වෙළඳ ශූද්‍ර ආදිවූ අය අධම්යෙහි හැසිර සම්පත් උපදවා පොහොසත්ව රැකේතම් එසේවූ පොහොසත්වීමට වඩා දැහැමෙන් සෙමෙන් සීලය රක්ෂාකොට දවස් ඇරීම යහපතැ යි ශීලයම වඩිනේය තවද චතුර්වණ්යෙහි ඇත්තන් හා නීචකුලයෙහි උපන්නෝද සියලු සත්ත්වයෝම ශීලයෙහි යෙදී සිල්වත්ව වාසය කෙරෙත් නම් සියල්ලවුන්වම හොබනේය. ඒසේහෙයින් ශීලයම වඩිනේය"යි බරණැස් රජ්ජුරුවන්ට කියා අවසර ඉල්වාගෙණ පුරෝහිතයෝ වනාන්තරයට වැද සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්ච සෘඩි අෂ්ටසමාපත්ති උපදවා තොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන් හයි වදුරා මේ සීලපරිකත්ථ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙනි බ්‍රාහ්මණව උපන්තෙම් බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 352
## හිරි ජාතකය

මේවද සකල ගුණනිධානවූ තිලෝදරු බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අණේපිඬු මහ සිටාතන් විශ්වාසව ඉදිනා පිටිසර සිටානකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද

**ඒ කෙසේද? යත්**

මෙහි වතීමාන කථාවත් යටකියනලද ජාතකවල පෙණෙන්නේය. මෙහි වනාහි බරණැස්නුවර සිටානන්ගේ පිටිසර විශ්වාසවූ සිටානකෙණෙක් ඇත්තාහ. පිටිසර සිටානන් එවූ පඬුරු බොධිසත්ත්වයෝ විකොට මිල යවන්නාහ. බොධිසත්ත්වයන් එවූ බඩුවට නින්දුකොට තොවිකුණන්නාහ. බොධිසත්ත්වයන්ගේ මනුෂ්‍යයෝත් අපගේ සිටානන් වහන්සේගෙන් ගෙණගිය බඩු තොවිකුව නින්දු කියනකල අපිත් උන්ගේ බඩු විකුණන්නේ නැතැයි කියා තොවිකුව උන් යවා එපවත් බොධිසත්ත්වයන්ට කීහ.

බොධිසත්ත්වයෝ එපවත් අසා මිත්‍රධම්ය කරකොට කියන්නාහු මෙසේ බරණැස්නුවර සිටානෝ "තමන් සමීපයට පැමිණියාවූ මනුෂ්‍යයන්ට කළමනා දෙය නොකරන්නාවූ මනුෂ්‍යයෝ ප්‍රත්‍යුපකාර නොසලකන්නාහුය'යි කියන්නාහු "ලජ්ජාව ඉක්ම මිත්‍රභාවයට පිළිකුල් කරන්නාවූ මම නුඹවහන්සේගේ

මිත්‍රයෙමි. හුදෙක් වචන මාත්‍රයකින් කියන්නාහු ''දෙමි'' ''කෙරෙමි'' යන වචනයට සුදුසුවූ උත්තම ක්‍රියා නොකරන්නාවූ මෙබඳුවූ පුද්ගලයා මේ මාගේ මිත්‍රය යි නොදතයුත්තේය. යම්සත්ත්වයෙක් යමක් කෙරේ නම් එම කියාද? යමක් නොකෙරේ නම් නොකියාද? නොකරන්නාවූ කාරිය කියන්නාවූ සත්ත්වයෝ නුවණැත්තාවූ සත්ත්වයෝ මූ කියන්නේ නැත්තය යි තමන්ගේ විශෙෂවූ ප්‍රඥාවෙන් දැන ගන්නාහ. යම් සත්ත්වයෙක් තෙමේ ඇමකල්හිම අප්‍රමාදව භෙද කිරීමෙහි සිතිවිලි ඇත්තේද? රත්ත්‍රනවෙෂිව නුගුණ සොයනසුලුද එසේවූ සත්ත්වතෙමේ මිත්‍රයෙක් නොවන්නේය. යම් සත්ත්වයෙක් තෙමේ මෙරමා විසින් කෙතෙක් නුගුණ කියාත් බිදුවාලිය නොහැකිවේද? ලෙහිලා වැඩූ පුත්‍රයකු මෙන් යම්මිත්‍රයකු සමීපයෙහි ස්නෙහීවැ වෙසේද? එසේවූ සත්ත්ව තෙම මිත්‍ර වන්නේය. යම් සත්ත්වයෙක් තෙමේ තමා විසින් කෙතෙක් නුගුණ කියාත් බිදුවාලිය නොහැකිවේද? නුවණැත්තාවූ කල්‍යාණ මිත්‍රයා හා සමග මිත්‍රභාවය ප්‍රීතිප්‍රමෝදයද උපදවන්නේය. ප්‍රශංසාද ලැබවන්නේය. මෙලෝ පරලෝ දෙක්හි කායික චෛතසික සැපයද ලැබවන්නේය. එසේහෙයින් මෙබඳුවූ විපාකානිශංසය දන්නාවූ කුලපුත්‍රතෙමේ ප්‍රඥවන්ත උත්තමවූ පුරුෂයන් විසින් ඉසිලිය යුතුවූ දැනය ශීලය භාවනාවය මිත්‍රභාවයයි කියනලද චතුර්විධවූ පුරුෂධූරය උසුලමින් මෙබඳුවූ මිත්‍රභාව සඞඛ්‍යාතවූ බලවත් ප්‍රීතියට කාරණාද මෙලොවින් පරලොවින් ප්‍රශංසාද කයට සිතට සැපද ලැබවන්නේය. නුවණැත්තන් හා සමග මිත්‍රභාවය බිඳ නොපියන්නේය. කායවිවෙක චිත්ත විවෙක උපධිවිවෙක සඞඛ්‍යාතවූ රසය අනුභව කොට ඒ විවෙක නිසා උපන්නාවූ සොමනස් සාරසැප ආදිය අනුභවකොට ධම්ප්‍රීති සඞඛ්‍යාතවූ අර්හත්ඵල විමුක්තිරසයද නිර්වාණප්‍රීති සැපයද අනුභව කෙරෙමින් නුවණැත්තාවූ සත්ත්ව තෙමේ සියළු කෙලෙස් පරිළාහයන් හුන් බැවින් කාය චිත්තයද රථ රහිත වන්නේය. රගාදී ක්ලේශයන් නැති බැවින් නිෂ්පාපී වන්නේය''යි මෙසේ මහ බෝසතාණෝ පාපමිත්‍ර සංසර්ගයෙන් කළකිරීමට පැමිණියාවූ විවෙකවාස අමෘත මහානිර්වාණයට පමුණුවා දෙශනාවෙයි කුළුගැන්වූහයි වදාරා මේ ගිරි ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බරණැස් සිටුව උපන්නෙම් බුදුවූ මම්මය යි වදාළසේක

---

## 353 අභිගුණ්ඩික ජාතකය

**තිවද** අසරණ සරණවූ **තිලෝගුරු** බුදුරජාණන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහළුනිඝ්ඝුකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

මහළු නිඝ්ඝුකෙණෙකුන්වහන්සේ එක් සාමණේරකෙණෙකුන්වහන්සේත් එක්ව විහාරයක වාසයකරණසේක් සාමණේරයන්වහන්සේ මරා තලා නොයෙක් ගහට මහළු නිඝ්ඝුන්වහන්සේ කරන්නා ඉවසාගත නොහී සිවුරුඇැර සාමණේරයන්වහන්සේ නිහිගෙවි පලාගියසේක.

මහළු භික්ෂූන් වහන්සේ සාමණේරයන් වහන්සේ ඇර වාසය කළ නොහී දෙවෙනිව යැවූදු ව නොයෙක් දෑ කියා මහණකරවාගෙණ පළමුවේම නොයෙක් ගහට කරණ සෙයින් සිවුරුහැර ගිහිව වාසය කරණ කල්හි දම්සභාවේ රැස්වූ සඞ්ඝයාවහන්සේ අසවල් මහළු භික්ෂූන්වහන්සේ සාමණේරයන් වහන්සේට නොයෙක් ගහට කරණ හෙයින් සිවුරු හැරපු යයි සිවුරෙහි සිටිනාකල එක්ව වාසයත් කළ නොහෙති, උන්හැර වාසයත් කළ නොහෙති. මේ නියාව කියා කියා උන්නැතට සැරියුන්වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්ව භාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදු?"යි විචාරා වදාරා එපවත් අසා "මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් එකියන මහළු භික්ෂූහුත් සාමණේර යෝත් දෙන්න එක්ව වාසය කළ නොහෙත්, උසිත් හැර වාසය කළ නෙහෙත්ය"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සැරියුන් වහන්සේ ඉකුත්වත්ථු දක්වා වදාළසේක.

පසිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ වී විකුණන වෙළඳව උපන් සේක. එසමයෙහි බරණැස් නුවර අභිගුණ්ඩික නම් බ්‍රාහ්මණයෙක් වදුරෙකු වඩා සඳිසින් තවමා ජීවත් වන්නේය.

බරණැස්නුවර උත්සව කෙළියක් දවසෙක අභිගුණ්ඩික බ්‍රාහ්මණ වදුරු, වී වෙළඳුනන් සමීපයේ රඳවා තෙමේ උත්සවකෙළි කෙළිනට ගිය තැනැත්තේ සත්දවසක් රදා ආය. වදුරා තමා වැඩූ තැනැත්තා හෙයින් දැක ලඟට ආය. අභිගුණ්ඩික බ්‍රාහ්මණ වදුරා මරා බැඳලීය, වදුරා බැම්ම කඩාගෙණ අඹ ගසට නැංගේය. අභිගුණ්ඩික බ්‍රාහ්මණ නිදා පිබිද වදුරා නොදැක ගස උඩ බලා ගස උඩ ඉඳ අඹ කන්නාවූ වදුරා දැක මූ සිත්හෙණ බස්කියා පාත බාවාගෙණ අල්වා ගණිම් සිතා ගසමුල සිට කියන්නේ "යහපත්වූ මුණක් ඇති වානරයානෙනි, මම දූ කෙළ පැරදපියා ආම්, මට අඹකැණකුත් ඇරගෙණ මා කරා එව"යි කියා,

එවිට වානරයා කියන්නේ "තොපි කුමක් කියව්ද? වදුරන්ගෙන් යහපත් මුහුණු ඇද්ද? නොපි සිත්හෙණ කියන බස් මම නොදනිම්ද? තෝ ව්‍යාජ කියා මා ලඟට ගෙන්නාගෙණ අල්වා ගන්ට කරණ උපාය මම දනිමි, මාගේ සවාමියා කියායයි සිතා නොප කරා ගොස් උණපත්තෙන් පාර කිපයක් ගසා කළ ගහට තව දක්වා මා සිත ඇත, නොප මව රාජ්‍යයක් දෙමි කීවත් නොප ලඟට මා එන්නේ නැතැ"යි කියා ගස අත්ත අගට පලාගියයි වදුරා මේ අභිගුණ්ඩික ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි වානරයා නම් මේ සාමණේරය, අභිගුණ්ඩික බ්‍රාහ්මණ නම් මහළු භික්ෂූහුය' වී වෙළඳව උපන්නෙම් බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 354 ගුම්බිය ජාතකය

තිවද තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි උකටලීවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

භික්ෂූකණෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා උකටලීව වාසයකරණසේක සම්බුදුවහන්සේ එපවත් දැන වදාරා සැබෑද? මහණ, තා සත්‍රියක් නිසා උකටලී වූයේදැ?"යි විචාරා වදාරන්නා "සැබෑය "ස්වාමීනි, ස්ත්‍රියක් නිසා උකටලී වීමි"යි කීසේක.

සම්බුදුයන් වහන්සේ "එම්බල මහණ, ස්ත්‍රීන් කෙරේ උකටලීවීම තම් ගුඹිය තම් රාක්ෂසයා මගසලා තුබූ මී මෙනැ"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුන්වත් දක්වා වදාළසේක.

පුරාතනය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ වෙළඳව ඉපද පන්සියයක් ගැල්පුරා බඩුගෙණ වෙළඳුම්ට යන්නාහු මනුෂ්‍යයන්ට බොධිසත්ත්වයෝ කියන්නාහු "මංවල මී මුළු ආදීවූ දෙයක්, නොකෑවිරැ ඵලජාතීන් මා විචාරා විනා කවුරුත් නොකව"යි කියා වනාන්තරයට වන්නාහ.

ගුඹිය නම් රාක්ෂසයා මී සලා මුළුවල බැඳ මිහ තබා තෙමේ පොරවක් ඇරගෙණ මී කොටමින් බැද්දේ සිටියේය. මනුෂ්‍යයෝ පුරුෂයෙකුගේ සැඳහැ යහපතැ යි කියමින් මී මුළු ඇරගෙණ කන්නට වන්හ. බොධිසත්ත්වයන් මා විචාරා විනා නොකවයි කියද්දී මී මුළු කන්ටවන්කලට බොධිසත්ත්වයෝ ඒ දැක කමින් සිටි මී උගුරු අල්වාගෙණ දුවුන. අතින්ගත්මී අතින් දුවුන. පළමු කැ අය නැසුනාහ. යන්තමක් කැ අය තංවාපුවාහ.

එකියන්නාවූ අර්‍ය දක්වන සම්බුදුයන් වහන්සේ වදාරණසේක් "ගුඹිය රාක්ෂසයා මනුෂ්‍යයන් මරන්ට මී සලා මුළු බැඳ තිබේද? එමෙන් මනුෂ්‍යයෝ අනුවනින් මී කා මළහ. සමහර නුවණැති මනුෂ්‍යයෝ නොකා නොකෑ විසින් සුවපත් වූහ. මනුෂ්‍යයන්ට රාගවෙතනාව තම් මෘත්‍යුමාරයා විසින් ලාළුවාවූ මලක්හා ද බලියක්හා ද සමාන වන්නේය. පඤ්චකාමයට අසුවුනු කෙනෙක් ඇත්තම් මලවුන් හා සමානය"යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ගුඹිය ජාතකය නිමවා වදාළසේක.

චතුස්සත්‍යාවසානයෙහි උකටලී භික්ෂූන්වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි සත්තුනායක වෙළඳව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 355 සාලිය ජාතකය

**ති**වද දෙවාතිදෙවවූ සම්බුදුයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසත සමයෙහි දෙවදත්තසථවිරයන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්:**

දම්සභාවෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ "දෙවදත්තසථවිරයන්වහන්සේ සම්බුදුයන්වහන්සේ මරන්ට උත්සාහකොට මරාගත නුහුනුවෝ වේදැ"යි කිය කියා වැඩඋන්තැනට සම්බුදුයන් වහන්සේ වැඩවදාරා "මහණෙනි, මා එන්නාට

පූජාභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා එපවත් අසා දැන් මතු නොවෙයි, මහණෙනි, පෙරත් දෙවදත්තඝට්ඨිරයෝ අප මරන්ට උත්සාහ කොට හය විචරකුත් කොටගත නුහුනුවෝ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සම්‌බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටකතිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක්තරා කෙළෙඹිපුත්‍ර කුලයෙක ඉපද වැඩිවිය පැමිණ කුඩා කොල්ලන් පිරිවරා නුගගසක් මුල කෙළිනාහ.

එක් වෙදෙක් ඒ නුවරට අවුත් වෙදකමක් නොලැබ ඒ කුඩා කොල්ලන් කෙළිනා තැනට අවුත් සිටියේය. ඒ නුගගස සිදුරෙන් සජ්ජයෙක් කර පොවා වැද ඔත්තේය. ඒ වෙදා සිතන්නේ මේ සජ්ජයා ලවා කුඩා කොල්ලන් කඩා කවා විසබා ප්‍රයෝජනයක් විඳිමි සිතා කුඩාකොල්ලන්ට කියන්නේ, ''එම්බල කුඩා කොල්ලෙනි, තෙල ගස්බිලයේ සැළලිහිණී පැටවෙක් ඉඳිනිය. ඌ අල්වාගෙණ කෙළවහ''යි කීය. බොධිසත්ත්වයෝත් ''යහපතැ''යි ගසට නැඟී සජ්ජයා නියාව දැන ඉසවිය තරයේ අල්වාගෙණ බිමට දැමූහ. සජ්ජයාත් වෙදා කර දරණ ලා ගෙණ කා මැරිය, බොහෝ මනුෂ්‍යයෝ එතනට එක්වූහ. ඒ එක්වූ මනුෂ්‍යයන්ට බණ කියන්නාවූ බොධිසත්ත්වයෝ මේ වෙදා මා සජ්ජයා ලවා කඩා කවන්ට ගසට නැඟිය, මම සජ්ජයා නියාව දැන තරයේ අල්වා බිමට දමාපීම්. ඒ සජ්ජයා ඒ වෙදා මැරිය. මේ කෙණෙක් නිරපරාධ කෙතෙකුන් නසන්ට උත්සාහ කෙරෙත්නම් තමන් නසන්නා පමණ මුත් අනුන් නසාගත නොහෙයි. යම් කෙණෙක් රජස් අරගෙණ උඩුසුලඟට දැමූකල ඒ රජස් දෙවැනිව අවුත් තමා ඇඟ වැදගණිද? එසේ හෙයින් නිරපරාධ කෙණෙකුන් නසන්ට උත්සාහ කළත් නසාගත නොහෙන්නේම ය යි වදාරා මේ සාලිය ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි වෙදා තම් දෙවදත්තඝට්ඨිරය, කෙළෙඹිපුත්‍රව උපන්නෙම් බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 356 නවසාර ජාතකය

**මේ**වද ශක්‍රාතිශක්‍රවූ සම්‌බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේ ද? යත්,**

එක් දවසක් දම්සභාවෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ ''සම්‌බුදුරජාණෝ ඉතා තීක්ෂ්ණවූ නුවණ ඇතිසේකැ''යි කියා කියා වැඩඋන් තෙනට සම්‌බුදුරජාණන්වහන්සේ වැඩවදාරා මහණෙනි, මා එන්නාව පූජාභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැ''යි විචාරා එපවත් අසා ''දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරත් මූකළ නුහුනුවණෙහි පටන් තීක්ෂ්ණවූ නුවණැත්තෝම වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සම්‌බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටකතිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ කෙළෙඹි කුලයෙහි ඉපද පළමු කී පරිද්දෙන්ම බොධිසත්ත්වයෝ සජ්ජයෙක් අරගෙණ වෙදා ඇඟට දැමූහ. සජ්ජයාත්

වෙද කර දරණ ලා කා මැරිය, බොහෝ මනුෂ්‍යයෝ එක්ව "මේ කුඩාකොල්ලා මිනිසා මරාපුය"යි කුඩාකොල්ලන් බැඳගෙණ බරණැස් රජ්ජුරුවන් කරා ගෙණ ගියාහ.

බොධිසත්ත්වයෝ මග යමින් සිටි කුඩා කොල්ලන්ට කියන්නාහු "තොපි ඇම රජ්ජුරුවන් දුටුකල නාඩා නොදෙඩා සිතාසිසී සනෙනාෂයෙන් සිටුව"යි කියා ඉගැන්වූහ.

එකියත කුඩා කොල්ලෝ ඒ නියාවටම සිටියාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඇයි කුඩාකොල්ලෙනි, තොපි ඇම වෙදු මරාපියා අවුත් කිසි භයක් මුසුප්පුවක් නොවී සිටින්නේ ඇයිදැ?"යි කිහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "දේවයන්වහන්ස, දුර්මුඛවීමෙන් සතුරුව සිටින තැනැත්තේ වැරැදිකොට පියා මූණ දුර්මුඛව සිටියේයයි සතුරා ටත් අවසර පෙණෙයි. වැරදි කළ කලට දුර්මුඛ වූවයි වෙන දෙයක් වැලකුන් නැත. එසේ හෙයින් දුර්මුඛ වීමෙන් තමාගේ මූණ බැළුවන්ට පියකරු නොවන්නේය. මේ කාරණයෙන් සනෙනාෂව කෙළ සිතා සිසී සිටියමිහ"යි කිහ.

එවිට රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් කී බසට සමාධිව "තොපගේ වැරදි කියව"යි වැරදි විවාරා ආද්‍යන්ත අසා බොධිසත්ත්වයන් ඇතුළුවූ කුඩා කොල්ලන් බැඳුන් මුදා බොධිසත්ත්වයන් තමන්ට අමාත්‍ය තනතුරෙහි සලස්වා ගත්හ. සෙසු කුඩාකොල්ලන්ටත් තනතුරු දී තමන්ට සේවය කරන්ට සලස්වා ගත්හ"යි වදාරා මේ තවසාර ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්ද සථවිරය, කුඩාකොල්ලෝ නම් අසුම්නසවිවෝය, කෙළෙඹි පුත්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය යි වදාළසේකි.

---

## 327 මිත්තවින්දක ජාතකය

මේ වදු බුහ්මාතිබුහ්ම වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි ලොභිවූ භික්ෂු කෙනෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

මෙහි වතීවාත කථාව යට කියන මිත්තවින්දක ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය.

මෙහි වනාහි බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක්තරා මිනිසෙක් පඬිවිවට තැගී මුහුදු පිනාගත තැනැත්තේ දිව්‍යස්ත්‍රීන් සතරදෙනෙකු වාසය කරණ තෙනට ගොසින් එතන ඉන්ද නොහී දිව්‍යස්ත්‍රීන් අටදෙනෙකු වාසය කරණ තෙනට ගොසින් එතන ඉන්ද නොහී දිව්‍යස්ත්‍රීන් සොළොස් දෙනෙකු වාසය කරණ තෙනට ගියේය. එතනත් ඉන්ද නොහී දිව්‍යස්ත්‍රීන් දෙතිස් දෙනෙකු වාසය කරණ තෙනට ගොස් ඉන් පැසෙන තැනැත්තාට කියන්නෝ "තොප කර තිබෙන පලදනාව මා කර පලදවා පියව"යි කිය.

එවිට පැසෙන තැනැත්තේ "මේ යාපත් පලදනාවෙක් නොවෙයි, නරකයේ උරවඛ්‍ර මාලාවය"යි කිය. "ඒ යහපත, මා කර්ලාපියව"යි කියන්නා

පැසෙන තැනැත්තේ උෂ්ණ කරලා ගැලවී පලාගියේය. බොධිසත්ත්වයෝ දිව්‍ය ලෝකයෙහි ඉපද තරකවල් බලාගෙණ යන ගමනේ උරවක්‍රමාලාව කරලා ගෙණ පැසෙන පුරුෂයා ලඟට ගියාහ. එවිට උරවක්‍රමාලාව පැල්දගෙණ සිටි පුරුෂයා කියන්නේ "මා මෙසේවූ අකුශලයකට පැමිණියේ කවර අකුශලයකින් ද?"යි විමසූයේය.

දිව්‍යපුත්‍ර කියනුයේ "තොපගේ ලෝභයෙහිවූ අකුශලය දිව්‍යස්ත්‍රීන් සතරදෙනා අටදෙනා සොළොස්දෙනා දෙතිස්දෙනා වාසය කරණ තැන ඉඳ නොගී මේ මෙසේවූ අකුශලයකට පැමිණියේ තොපගේ ලොභචෙතනාවගේ විපාකය"යි කීහ. එවිට උරවක්‍රමාලාවෙන් බොටුව කැපී අනික් ඔසක් කිය නුහුනුවහ යි වදාරා මේ **මිත්තවින්දක ජාතකය** නිමවා වදාළසේක.

එසමයෙහි මිත්තවින්දක නම් ලෝභී භික්ෂුහුය, දිව්‍යපුත්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය යි වදාළසේකි.

---

## 358 පලාස ජාතකය

තිවද වන්දතෙය්‍යාති වන්දතෙය්‍යවූ තිලෝ ගුරු බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් ස්ත්‍රියක් නිසා උකටලීවූ භික්ෂුකෙනෙකුත් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා උකටලීව වාසය කරණ නියාව සම්ඹුදුන් වහන්සේ දැක වදාරා "සැබෑද? මහණ තා ස්ත්‍රියක් නිසා උකට ලීව වාසය කරන්නේද?"යි විමාරා වදාළ කල්හි "සැබෑය සවාමීනි"යි කියන්නා "එම්බල මහණ, ස්ත්‍රියක් නිසා උකටවීම නම් කැලගස් ඇතුළේ නුගගස් ඇතිව කැලගස් නැසුවා මෙනැයි වදාරා "ඒ කෙසේද?"යි ආරාධිත වූ සම්ඹුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

පුරාතන දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ හංසව ඉපිද ත්‍රිකූට පර්වතයෙහි වාසය කොට ගෝචර භූමියට යන එන කල කැලගස සැතපී ඉඳිනාහ. කැලගස සැතපී ඉඳීමෙන් ඒ ගස වාසය කරන්නාවූ දෙවතාවා හංසයාගත් හා බලවත් හිත මිත්‍රව වාසය කරන්නාහ.

එසමයෙහි එක් පක්ෂියෙක් නුග ඵලයක් අනුභව කොට අවුත් වර්චස් කරන්නේ කැලගසේ ඇතුළේ බිලයෙක වර්චස් කෙළේය. ඒ වර්චසෙහි තිබූ නුගඵලයෙන් සතරගුලක් පමණ නුගගසක් ඇතිවිය. හංස රජ්ජුරුවෝ කැල ගස උන්නාවූ දේවතාවාට කියන්නාහු "මේ සතරගුලක් පමණ නුගගස නිසා මතු මේ කැලගස තස්තේය, දැන් මේ නුගගස උදුරාපියව"යි හංස රජ්ජුරුවෝ කීහ. දේවතාවා කියන්නේ "මාගේ ඇතයපිට උන් දරුකෙණෙකුන් හා සමානය, එසේහෙයින් මම නම් පියාතකෙණෙකුන් හා සමානය, මේ නුග පැලය නම් දරුකෙණෙකුන් හා සමානය, එසේහෙයින් මේ නුගගස නුදුරමි"යි දේවතාවා කීහ.

හංස රජ්ජුරුවෝ එසේ වීනම් තොප හා මා හා මිත්‍ර කමුත් නැත, මා වෙත එන්නේත් නැතැයි" කියා එතැන් පටන් කැලඟසට හංසරජ්ජුරුවෝ නො එන්නාහ. ඒ සිටි කාලානන්තරයෙකින් නුඹඟය මහත්ව කැලඟස නැසී ගියේය දෙවතාවා මාගේ මිත්‍ර හංස රජ්ජුරුවන් කී අවවාද නොකොට මා ඉන්නා වාසස්ථානය කුවුයේ ය යි එහෙනින් අනතඬිත වීය.

**ඒ කෙසේ ද? යත්,**

එවිට සම්බුදුයන් වහන්සේ "එම්බා මහණෙනි, යම් සත්ත්වකෙණෙක් පඤ්චකාමයෙහි ලොභීව අනුන් කීවානොකොළෝ නම් දේවතාවාට හංසරජ්ජුරුවන් කී අවවාද නො ගිවිස්සන් මෙනැ"යි වදාරා මේ පලාස ජාතකය වදාළ සේක.

මේ බණ අවසානයෙහි පන්සියයක් භික්ෂූන්වහන්සේ සියළු කෙලෙසුන් නසා රහත්වූ සේක. එසමයෙහි හංසව උපන්නෙම් බුදුවූ මම්ම ය යි වදාළ සේකි.

---

## 329
## දීඝිති කෝසල ජාතකය

**ති**වද පූජතෙය්‍යාති පූජතෙය්‍ය වූ සම්බුදුයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි වහන්දැ දෙනමකගේ ඛබරයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්;**

මෙහි වර්තමාන කථාවත් ජාතක කථාවත් සඞ්ඝභෙද ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහි කොසොල්රට දීඝිතිකුමාරයෝ ය යි යන රාජකුමාරකෙණෙක් ඇත්තාහ.

ඒ රාජකුමාරයන්ගේ ඇතය මත්තෙහි ඉස තබා දීඝ කෝසල නම් බරණැස් රජ්ජුරුවෝ වැදහොත්තාහ. එවිට දීඝිති කුමාරයෝ තමන්ගේ දෙමවුපියන් මැරූ සතුරා මරාපියමි සිතා එක් අතකින් රජ්ජුරුවන්ගේ ඉසකෙස් වැටිය එක් අතකින් කඩුවත් අල්වාගෙණ සිතන්නාහු මාගේ පියාණන්වහන්සේ මියනගමනේ යමක් පරීක්ෂාකාරීව කරවයි කියා මළසේක. මගේ පියාණන් වහන්සේ කීවා නොයික්මවම් සිතා රජ්ජුරුවන් පිටට කඩුපතින් ගසා රජ්ජුරුවන් පුබුද්දා ඉසකේ අල්වාගෙණ කියන්නාහු "එම්බා රජ්ජුරුවෙනි, තොප මිරමි සිතා ඉසකේ අල්වා කඩුව ඔසවා ගනිමි. මාගේ පියාණන් වහන්සේ මියන ගමනේ පරීක්ෂාකාරීව යමක් කරව යි වදාළසේක. එසේ හෙයින් තොප නොමරම්" කීහ.

එබසට බරණැස් රජ්ජුරුවෝ කියන්නාහු "මේ වේලාවව තොප විනා මට බන්ධු කෙණෙකුත් නැත, මරතොත් මරව, තොප කැමැත්තක් කරව"යි කීහ. එවිට දීඝිතිකුමාරයෝ කියන්නාහු "නුඹවහන්සේ මරණ නිසා කළ දෙයෙක් නොවෙයි, භය නොගත මැනැවැ"යි කියා "යම් කෙණෙකුන්ටතමාගේ ජීවිතය නිසා භිංසා කිරීමද අනුන්ට පරිභානියක් කිරීමද සත්පුරුෂයෝ නො කරන්නාහ"යි කියා දෙන්නම උනුන්ව කඩුව අත්ගසා දිවුව නොවරදිනා නියායෙන් තරණ කළහ.

බරණැස් රජ්ජුරුවෝත් දීඝිති කුමාරයන්ගේ බසට සමාධිව රාජකුමාර යන් බරණැස් නුවරට කැන්දගෙණ ගොස් මෙපවත් අමාත්‍යයන්ට කියා ''මේ දීඝිතිරාජකුමාරයෝ කෝසල රජ්ජුරුවන්ගේ පුතනුවෝය, උන්ට උන්ගේ රාජ්‍යය දෙමිහ''යි තමන්ගේ දුවනියනුත් පාවාදී උන්ගේ පියානන්ගේ රාජ්‍ය යත් දී යවූහ

එවක්පටන් දෙරට රජදරුවෝ දෙදෙනම උනුන්ට නොවෙතස්ව රාජ්‍යය කොට කමවූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ දීඝිති කෝසල ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි දෙමවුපියෝ නම් දැන් මේ දෙමවුපියෝමය, එසමයෙහි දීඝිති රාජකුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැ''යි වදාළසේක.

---

## 360
## මුචලෝනක ජාතකය

තවද ශෞඛෝදනියවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් භික්ෂූ කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්,**

එක් භික්ෂූකෙණෙකුන් වහන්සේගේ සාමණේර නමෙක් ඇත, ඒ සාමණේර නම උන්වහන්සේට සුවව කිසිකෘත්‍යව අත් පා මෙහෙවර කරණසේක. ඒ සාමණේර නම නොබෝ කලකින් ව්‍යාධියක් ඇතිව මළසේක. ඒ තෙරුන් වහන්සේ සාමණේර නම මළාවූ සෝකයෙන් අඩා දෙඩා ඇවිදිනා සේක.

''මාළුවරුන් වහන්සේ අවවාද කිවත් නොගිවිස්නා සේකැ''යි යන මේ කථාව දම්සභාවෙහි රැස්වූ මහළුවරුන් වහන්සේ කියා උන් තැනට සම්බුදුරජාණන් වහන්සේ වැඩවදාරා ''මහණෙනි, මා එන්නාට පුම්භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැ?''යි විචාරා වදාරා එපවත් අසා ''මහණෙනි, මේ මහණ දැන්මතු නොවෙයි, පෙරත් මේ සාමණේරයන්ට සෝකයෙන් අඩා ඇවිද්දේ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ශක්‍රදෙවෙන්ද්‍රව උපන්සේක.

එසමයෙහි එක් තාපසකෙණෙක් හිමාලය වනයෙහි වාසය කෙරෙති. උන් වසන්නාවූ පන්සලට දෙමව්පියන්ගෙන් වෙන්වූ මුවපැටියෙක් වත, ඒ තාපසයෝ මුවපැටියා තමන්ට දරුකොට වඩන්නාහ. ඒ මුවා වැඩිවිය පැමිණ විශිෂ්ටවූ රූ ඇතිවිය. නොබෝ කලකින් එක් දවසක් බඩපුරා තණකා අජීර්ණව දිරවා ගත නොහී මළේය.

ඒ තාපසයෝත් මුවා කෙරෙහි සෝකයෙන් අඩා දෙඩා බොහෝ දුක් විඳිනාහ. ශක්‍රයෝ තමන්ගේ නුවණැසින් දහසක් තෙත් ලා මිනිස්ලෝකය බලා තාපසයන් විඳිනා දුක් දැක ඒ තාපසයන් ලඟට ගොස් උන්ගේ සෝක

සන්හිඳුවා එම් සිතා තාපසයන් සමීපයට අවුත් විවාරන්නාහු "ඇයි තාපසයන් වහන්ස, නුඹවහන්සේ විසෙෂයව ඉදිනේ ඇයිදැ"යි විවාළාහ. එවිට තාපසයෝ කියන්නාහු "ශක්‍රදෙවේන්ද්‍රයෙනි, මා දරුකොට වැඩූ මුවපෝතකයෙක් මළේය එසේකෙයින් පුත්‍ර සෝකයෙන් ඉවසාගත නොහී අඬා දෙඬා ඇවිදිමි" කිහ.

එවිට ශක්‍රයෝත් කියන්නාහු "තවමෙනා යම් දෙයක් නත්නා සුළුමය, මළවුන්ට සෝක කිරීමෙන් කාරය කිම්ද? තමාගේ කයට හිතට දුක්වෙන පමණක් විනා මළවුන්ට සෝක කිරීමෙන් කාරිය කිම්දැ?"යි කිහ. එවිට තාපස යෝත් "නොප මහාකොට කියන්නාවූ වචනය ඉතා යහපත, මෙවක් පවන් සෝක නොකරමිහ"යි කියා එවක් පටන් සෝක නොකොට උන්නාහ.

ශක්‍රයෝත් තාපසයන්ට අවවාද කියා දිව්‍යලෝකයටම හියාහ සි වදුරා මේ මුවපෝතක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි මුවපැටවා නම් දැන් මේ සාමිණේරය, තාපසයෝ නම් මේ භික්ෂූහුය, ශක්‍රදෙවේන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්ම ය යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 361 මූසික ජාතකය

මේ වදාළ සම්ලොකෙකමාත්‍ය වූ සම්බුදුහු වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි අජාතශත්‍රු රජ්ජුරුවන් අරභයා මේ ජාතකය දක්වන ලදැ.

මෙහි වර්තමාන කථාව යට කියනලද ථූස ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහි බිම්බිසාර රජ්ජුරුවෝ එක් දවසක් රාජකුමාරයන් වඩාගෙණ බණ අස අසා උන්නාහ. සම්බුදුහු වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

ඔවිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්ගේ ජව නම් රාජකුමාරකෙණෙක් ඇත්තාහ. ඒ රාජකුමාරයෝත් වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් ලඟට ශිල්ප උගන්නා සඳහා හියාහ.

දිසාපාමොක් ආචාරී ඒ කුමාරයන්ට ඉදිරියේ වත අනතරායක් දැක ඊට කාරණා උගන්වන සඳහා ගාථා කියමි, කාරණා සිතන්නා ඒ ආචාරීන්ගේ එක් අසෙක් ඇත, ඒ අසාගේ පය ව්‍රණයක් ඇත, ව්‍රණය එක් මීයෙක් දවස්පතා ඇවිත් කඩා යයි. එක් දවසක් අසා පය ව්‍රණය කඩා කන්ට යයි මියා ඇවිත් ව්‍රණය කඩා කන කල්හි අසා තමාගේ පය කුරයෙන් ඇන මියා මරා එතන තුබූ ලිදට දැමීය. අස්සලයෝත් එතනට අවුත් මියා කොයිදැයි නොදැක සෙවූහ.

බොධිසත්ත්වයෝත් මියා හිය තැන් මම දනිමි"යි ගාථාවක් බැඳ රාජ කුමාරයන්ට ඉගැන්වූහ. එක් කොටළුවෙක් යව වපුලාපු හේතක ඉනි අසේසෙන් කරපොවා යව කන්ට උන්සාහ කෙරෙයි. එයත් දැක ගාථාවක් බැඳ රාජකුමා යන්ට ඉගැන්වූහ. තමන්ගේ නුවණින් ගාථාවක්බැඳ ගාථාකුතම රාජකුමාරයර

එගන්වා ''ආදියෙන් උගත් ගාථාව පොකුණේ තාතවිට කියව. දෙවෙනිව උගත් ගාථාව ඉණව නැගෙණවිට කියව. තුන්වෙනිව උගත් ගාථාව ඉණි ඉස සිටි කියව''යි කියා රාජකුමාරයන් උගන්වා යවූය.

රාජකුමාරයෝත් නුවරට ගොස් පියාතන්ට ශිල්ප දක්වා යුවරජ තත තුන් ලැබ පියාතන් ඇවැමෙන් රාජ්‍යයට පැමිණ රාජ්‍යය කරත්තාහ. රාජ කුමාරකෙණෙකුන් ලද්දාහ. ඒ රාජකුමාරයෝත් වැඩිවිය පැමිණ තමන්ගේ අමාත්‍යයන්ට කියන්නාහු ''මාගේ පියාතන් වනන්සේ සඟබාල සේක. උන් වනන්සේ ඇවැමෙන් රාජ්‍යය ලබන්නේ කවර කලද පියාතන්වනන්සේ මරා රාජ්‍යය ගණිමි''යි කිහ. අමාත්‍යයෝත් ''යහපතැ''යි ගිවිස්සාහ. රාජකුමාර යෝත් ''පියාතන් මරමි'' කඩුව ගත් අත් ඇතිව මහල් පතස පවුරකොණ ඇලී සිටියාහ. පතසට තාන්ට යන්නාවූ රජ්ජුරුවෝ මූසික තම් කම්මිත්ත කැඳවා ''පොකුණවට රැකවල් ලා බලා එව''යි යවූහ. රාජකුමාරයෝත් කම්මිත්ත දැක ''මේ මා දුටු නියා කිවු නම් නපුරැ''යි කඩුවෙන් දෙපලුකොට ලිඳ එලාපූහ. රජ්ජුරුවෝත් පතසට බස්නා දිසාපාමොක් ආචාරීන් පළමුකොට ඉගැන්වූ ගාථාව කිය කියා පතසට බටහ. බොහෝ මනුෂ්‍යයෝ වටකොටගෙණ සිටියාහු මූසිකාව දකින්නේ නැතැයි කියන්නාහ. ඒ ගාථාවෙහි අභිප්‍රාය නම්:-

''මූසිකාව ගියතැන් තොප ඇම දන්නේ නැත. මම දනිමි. මූසිකාව මරා ලිදට දමාපුවහ''යි කීහ. රාජකුමාරයෝත් තමන් එතන සිටි කාරණයත් මූසිකාව මැරූ නියාවත් රජ්ජුරුවන් වහන්සේ දත්සේක්වතැ යි සිතා ඔබ්බට පලා ගියාහ. ගොසින් එපවත් තමන්ගේ අමාත්‍යයන්ට කීහ. අමාත්‍යයෝත් කිප දවසක් ගියකල ''නුඹවනන්සේව යමක් නොකළේ රාජ්ජුරුවන්වහන්සේ නොදත් හෙයිනි. තවත් උත්සාහ කළමැනවැ''යි කීහ. එවිට රාජකුමාරයෝත් ''යහපතැ''යි ගිවිස කඩුව ඇරගෙණ පියාතන් මරමි, ඉණිපාමුල ඇත මැත බල බලා සැඟවී සිටියාහ. රජ්ජුරුවෝත් ඉණිපාමුලට අවුත් දිසාපාමොක් ආචාරීන් ඉගැන්නූ දෙවෙනි ගාථාව කීහ. ඒ ගාථාවෙහි අභිප්‍රාය නම්:-

''පළමු මූසිකා මරා ලිදට දමාපුසේම දැනුත් මරන්ට කඟ දික්කොට ගෙණ සිටිනා නියාදැ?''යි යන අභිප්‍රාය වන්නේය. රාජකුමාරයෝත් එවිට ''මාගේ පියාතන් වහන්සේ තමන්වහන්සේ මරණ නිසා මෙතන තා සිටිනා නියාව දන්සේ වතැ''යි සැඟවී හොසින් එපවත් තමන්ගේ අමාත්‍යයන්ට කියා දෙපෝයක් විවර ගිය කල දිවී නම් ආයුධයක් අතින් ගෙණ තුන්වෙනිවත් පියා තන් මරමි, උත්සාහයෙන් ඉණිඉස සැඟවී සිටියාහ. රජ්ජුරුවෝ ඉණිඉස දිසා පාමොක් ආචාරීන් ඉගැන්වූ තුන්වෙනි ගාථාව කීහ. එහි අභිප්‍රාය නම්:-

''දෙවාරයක් තොපි මා මරන්ට උත්සාහ කොට සිටියාවද? දැනුත් මා මරන්ට ඉණිඉස සැඟවී සිටියාවද? ඒ මම නොදනිමිද? තොප මේ වලියේ කඩ කඩ කොට කපාපුවොත් කුමක් කෙරේදැ?''යි කීහ.

එවිට රාජකුමාරයෝ තමන් අනික් යාහැකි තැනක් නැති නෙසින් දිවී නම් ආයුධය රජ්ජුරුවන් ඉදිරියට දමා ''මා කළ අපරාධයට ජීවිත දානය දුන මැනවැ''යි වැඳගෙණ ඔත්තාහ. එවිට රජ්ජුරුවෝ ''තොපිට කුමට ජීවිත දානය දෙන්නෝදැ?'' උන් අමාත්‍යයන් කැඳවා මෙපවත් කියා රාජකුමාරයන් දඟගෙයි ලවා සිංහාසනාරූඪව හිඳ කියන්නා ''එම්බා අමාත්‍යයෙනි, යම්

ගෙයක ඉඳිනේ නම් ඒ ගේ තමාව ආරක්ෂාව පිණිසය. එසේවූ ගෙයත් මට සහාය නුවූයේය. තමාගේ පැමිණි යම් දුකකට සහායව සිටින්නෝ පුත්‍රප්‍රේම යෙන් තමා වදහත් දරුවෝය. එසේවූ දරුවෝත් මට සතුරුව සිටියෝය. මෙසේ අවැඩයට දිසාපාමොක් ආචාරීන් උගන්වාලූ ගාථා තුනම පිහිටවූයේය යන්තමක්කිම්, මහත් කොටකිම්, ශාස්ත්‍රය පුරුදුකළාවූ යම්කෙණෙකුන්ට පිටි වහල්ව සිටින්නේ ශාස්ත්‍රමය. එසේහෙයින් ඇමැතිලෙහිම ශාස්ත්‍රයම පුරුදු කළ යුතුය''යි කියා දැහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කම්වූ පරිදෙන් මියපරලොව ගියාහ.

ඒ අමාත්‍යයෝත් රජ්ජුරුවන් ඇවැමෙන් රාජකුමාරයන් මැසුන් කපා රාජ්‍යයට තබාගෙණ රාජ්‍යය කරවූහයි වදාරා මේ මූසික ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි දිසාපාමොක් ආචාරීව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි වදාළ සේක.

---

## 362
## චුල්ලධනුග්ගහ ජාතකය

**තිවිද** සරණගත වජ්‍රපඤ්ජරවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ උකටලීවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලදී

**ඒ කෙසේද? යත්**

භික්ෂුකෙණෙකුන් වහන්සේ එක් ස්ත්‍රියක් කෙරේ ලොභයෙන් උකටලීව වාසය කරණ සේක. සම්‌බුදුරජාණන් වහන්සේ එපවත් දැන වදාරා ''සැබෑද මහණ තා ස්ත්‍රියක් කෙරේ ලෝභයෙන් වාසය කරන්නේදැ?''යි විචාළ කල්හි ''සැබෑ සවාමීනි''යි දන්වූ කල්හි ''මේ ස්ත්‍රිය කෙරේ ලොභ කෙළේ තොප දැන්මතු නොවෙයි, පළමුන් මුතුමූ තොපට අනර්‍ථව සිටියෝ වේදැ?''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සම්‌බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**පි**ටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ගන්ධාර දෙශයෙහි තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට බ්‍රාහ්මණ කුමාරයෙක් ගොස් සියලු ශිල්ප ඉගෙණ ඉකුත් ධනුශ්ශිල්පය නිමවා උගත. දිසාපාමොක් ආචාරී සමාධිව බ්‍රාහ්මණ කුමාරයන්ට ''චුල්ලධනුග්ගහ'' කුමාරයෝය යි නම් තබා තමන්ගේ වැඩිහිටි දුවනියන් පාවා දුන්හ.

ධුල්ලධනුග්ගහයෝ තමන්ගේ බිරින්ද කැඳවාගෙණ මාවතෙක යන්නාහු වනාන්තරයකට පැමිණියාහ. ඒ වනාන්තරයේ ත්‍රිමදගලිත හස්තියෙක් ඇත. ඒ හස්තියා ධනුග්ගහයන් දැක දිවගෙණ ආය. චුල්ලධනුග්ගහයෝ පඤ්චායුධ සන්නාහව ඊ දඹු පන්සියයකුත් ඇරගෙණ යන්නාහු හස්තියා දිවගෙණ එන්නා ඊදණ්ඩක් ඇදපියා ඇරගෙණ විද්දුහු වාතතුණ්ඩයෙන් වැද පලවා එතතම්

එලා නික්මුණු කලම, අනික් වතාන්තරයක සොරුන් පන්සියෙක් දඹමස් මරා පුළුස්සාකන කලව චුල්ලධනුඞ්ගරයෝ එතනට පැමිණ තමන් බිරින්දට කියන්නාහු "දඹමස් පුළුස්සා කන මිනිසුන් උන්තෙනව හොස් දඹමස් ඉල්ව ගෙණ එව"යි කියා යවූහ.

එකියන සොරු පිලිස්සූ දඹමස් නොදී අමුමාංශදී යවූහ. චුල්ලධනුඞ්ගර කුමාරයෝ අමු මාංශ දැක කියන්නාහු "පිලිස්සූ මාංශ නොදී අමුමාංශ දුන්නේ අප කෙරේ කණස්සළුවෙන්ද?"යි කියා දෙවෙනිව බිරින්ද අත අමුමාංශ යවන්නා සොරු පන්සියය කෝපවන. ඉන් එකෙක් "අප පන්සියය වෙනෙ සයිදැ?"යි කියා කෝපයෙන් දිවූවාවූ චුල්ලධනුඞ්ගරයෝ එකින් එකාට සොරු පන්සියය එකක් අඩු ඊ දඬු පන්සියයෙන් විද එලූහ. සොරුන් නායක තැනැත්තේ ඉවත්ව සිට අවුත් චුල්ලධනුඞ්ගරයන් අල්වාගත සොරදෙවුවා හා චුල්ලධනුඞ්ගරයන් හා උනුන් කා සොරා ඝටකොට ඔබාගෙණ චුල්ලධනුඞ්ගරයෝ "සොඳුර කඩුව දීලව"යි අත දික්කොට ලන්නා සොරාට කඩුම්ට දී චුල්ලධනුඞ්ගර යන්ව කොපුව දීලූහ. සොරා චුල්ලධනුඞ්ගරයන් ඉස කපා මරා යන්ට නික්මුණු කලට ගඟක් සමීපයට පැමිණියාහ. සොරදෙවුවා සිතන්නේ "බාල කල පවන් පරණ පුරුදු පුරුෂයා මරවා මා කෙරේ ලොහකළාය. ඉදිරියේ අනිත් පුරුෂයකු දුටත් මටත් මේ කරණ මානය"යි සිතා "මෑගෙන් මට ප්‍රයෝජන නැතැ"යි "මෑ මෙතනම ඇරපියා යෙමි" සිතා "සොඳුර තොප ඉණතුබූ ඉණකඩින් තොප පලන් ආහරණ ගලවා බැඳ දීලන්න එතර තිබා අවුත් තොප කැඳවාගෙණ යෙමි" කියන්නා "යහපතැ"යි ඒ නියාවට තමා ඉණ තුබූ ඉණකඩෙහි තමා පලන් ආහරණ ගලවා බැඳ දී ලන්නා සොරදෙවු ඇරගෙණ ගඟින් එතර පිහා හොස් යන්ට ආකාර දක්වාලීය. ස්ත්‍රිය කියන්නී "ඇයි සවාමිපුත්‍රයාතෙනි, මා ඇරපියා නික්මුණු නියාදැ?"යි කියන්නා "තොපගේ පරණ සමණන්ව කළදැදුවු කල මට තමාම වේද? නිගෙන් මට ප්‍රයෝජන නැතැ"යි කියා නික්මුණාහ.

ස්ත්‍රී ගඟ සමීපයේ බැද්දේ උන්නීය. ශක්‍රයෝ මෙපවත් දැන පඤ්චසිඛයා හා මාතලී දිව්‍යපුත්‍රයා කැඳවා කියන්නාහු "අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙනෙසන්ව උවමැනවැ"යි කියා පඤ්චසිඛයා උකුසුවෙසක් හා මාතලී දිව්‍ය පුත්‍රයා මත්ස්‍ය වෙසක් හා ශක්‍රයෝ තුමූ කැණහිල් වෙසක් මවාගෙණ කටින් දඹමස් කැටියක් ඩැහැගෙණ මම ගඟ සමීපයේ වෙරළ ගාවා යෙමි.

"පඤ්චසිඛය නොපි උකුසු වේසයෙන් ආකාශයෙන් ඇවිදුව, මාතලිය, නොපි මත්ස්‍ය වේසයෙන් මා යන ඉදිරියට දියෙන් හොඬ පැනපියව, මම කව තුබූ මාංශය දමා මත්ස්‍යයා ඩැහන්ව යෙමි. පඤ්චසිඛය තෝ උකුසුවේස යෙන් මා දැමූ මාංශකැටිය ඩැගණුව, මාතලිය තෝ මත්ස්‍ය වේසයෙන් දියට පැනපියව"යි කියා තුන්දෙන අවුත් ඒ ස්ත්‍රිය සමීපයෙහි පෙණී ගියාහ.

කැණහිල් මාංශකැටියක් ඩැහෙණ ගඟ සමීපයේ හොඬ අසල යන කලට මත්ස්‍යයෙක් දියෙන් හොඬට පැණපීය. කට තුබූ මාංශ දමා මත්ස්‍යයා ඩැගන්ව දිවූකල මත්ස්‍යයා දියව පැනපීය. උකුසු මාංශකැටිය ඩැගත. එකියන සිඟා ලයා මත්ස්‍යයාත් නොලැබ මාංශකැටියත් නොලැබ විඤ්ඤව ගඟසමීපයේ උන් ස්ත්‍රියගේ මූණ බල බලා සිටියේය. එවිට එකියන ස්ත්‍රී මහත්කොට සිනාසී පුවාහ. ඊට ශක්‍රයෝ කියන්නාහු "මෙතන නැටීමක් ගී කීමක් කෙළී තළුවක් නැතිව මහත්කොට අසථානයේ සිනාසුනුයේ කිමිදැ?"යි විවාළේය.

එවිට ස්ත්‍රිය කියන්නී "තොප කටින් ඩැහෙණ ආ මාංශකැටිය මත්ස්‍යයා කමියි කටින් දමා මත්ස්‍යයා බැඟන්ට ගිය කලට මාංශකැටිය උකුසු ඩැහත. මත්ස්‍යයා දිහට පැනපියැ. මේ කාරණය දැක සිනාසීමි" කිව.

එවිට ශක්‍රයෝ කියන්නාහු "තොප මට සිනාසෙන්ට කාරණා කිම්ද? තොපගේ පළමු පිසවා කෑ සමුණුනුත් නැතිව අළුත් සමුණුනුත් නැතිව උභය භ්‍රෂ්ටව ඉඳිනා තෙපි මට නින්දා කියා සිනාසෙන්නේය"යි ශක්‍රයෝ නිහැකොට බිණුහ. ඊට ස්ත්‍රියකියන්නී "පළමු මෙසේවූ කටයුත්ත කොට මෙසේවූ දුකකට පැමිණියෙමි. ඉනිබ්බේ පතිව්‍රතා ධර්මය විනා මෙසේවූ දෙයක් නොකරමි" කිව. ශක්‍රයෝත් "පතිව්‍රතා ධර්මය විනා මෙසේවූ නොකටයුත්තක් නොකරව"යි කියා අවවාදදී දෙව්ලොවට ගියානයි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ චුල්ල ධනුර්ධර ජාතකය නිමවා වදාළසේක.

චතුස්සත්‍ය දෙශනාවගේ කෙළවර උකටලී භික්ෂූන්වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි චූල්ලධනුර්ධරයෝ නම් මේ භික්ෂුහුය. එසමයෙහි ස්ත්‍රී නම් මේ ස්ත්‍රීමය, එසමයෙහි ශක්‍රව උපන්තෙම් බුදුවූ මම්මය යි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 363 කපොත ජාතකය

**ති**වද කරුණාවට ආකරවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් ලොභී භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

**ඒ කෙසේද? යත්**

ලෝභී භික්ෂූන්වහන්සේ සම්බුදයන් වහන්සේට පා "සැබෑද මහණ තා ලෝභීව වාසය කරන්නේය"යි විචාළකල්හි 'සැබෑව සවාමීනි, මා ලෝභීව වාසය කරන්නේය"යි කීහ. සම්බුදයන් වහන්සේ එපවත් දැන වදාරා "දැන්මතු කොවෙයි, පළමුත් ලෝභීව බොහෝ දුකඛයට පැමිණියෝය"යි වදාරා "ඒ කෙසේ දැ?"යි ආරාධිතවූ සම්බුදයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**පි**ටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ පරෙව්ව ඉපද බරණැස් සිවාතන්ගේ මුළුතැන්ගෙයි අරක්කැමියා පසින් පිණිස සාල්ලක් ඉදිකොට බැඳ එල්වාලීය. බොධිසත්ත්වයෝත් ඒ සාල්ලෙහි වාසය කරන්නාහ.

එතනට කවුඩුවෙක් අවුත් බොධිසත්ත්වයන් හා එක්ව වාසය කෙරෙමි"යි කියා එක්ව වාසය කරන්නේය. එක්දවසක් මුළුතැන්ගෙට බොහෝ දඬමස් ගෙණාහ. ඒ දඬමස් කවුඩු දැක ඒ මාංශ ලෝභයෙන් කොයිත් නොගොසින් ඉද බොනෝ දුක් විඳිනේය. බොධිසත්ත්වයෝ ගොවර භූමියට යන්නාහු "තොපිත් නොදුරු කන්ට එව, එක්වයම්හ"යි කීහ. කවුඩු කියන්නේ "ඊයේ මා කෑ ගොවර අජීණීව තිබුහෙයින් මම ගොදුරු කන්ට නොයමි. සවාමීනි, නුඹවහන්සේ වඩිනේ යහපතැ"යි කීහ. "යහපතැ"යි කියා බොධිසත්ත්වයෝ ගොවර භූමියට ගියාහු.

කවුඩු ගාථාවකින් කියන්නේ "අසත්පුරුෂවූ පරෙවිය මෙතනින් පලා ගියේ ශඨපතැයි මාගේ අභිප්‍රායානුකූල පරිද්දෙන් මාංශ අනුභවකෙරෙමි"යි සිතා උන්කලට අරක්කැමි දඩමස් විශෙෂ කොට පිස නිවෙත්ව මුඛම්වල ලා තිබා තමාගේ ශරීරයේ දැහ නිවන නියායෙන් දෙර ගොසින් සිටියේය.

කවුඩු අරක්කැමියා දෙරට පලාගිය නියාව දැන මුඛම මතුපිට උන් කලව මුඛම ක්‍රිං යන ශබ්දය විය, අරක්කැමි ඒ ශබ්දය අසා මුළුතැන්ගෙට වැද බැළු කලව කවුඩු මුඛම පිව උන්නේය. අරක්කැමි කවුඩා අල්වාගෙණ ශරීරයේ ලෝම උදුරා මුදුනේ කුඩුම්බියක් තිබා ශරීරයේ මිරිස් ලුණු දුරු සිඹිහුරු ආදීවූ දැනදෙය ගල්වා කීලාගෙණඇලා කැබිලිත්තක් විද කරබැඳ එල්වා සෑල්ලට දැම්ය.

බොධිසත්ත්වයෝ ගොදුරු අනුභවකොට අවුත් කවුඩානන් වැදගොත් සැටිය දැක කවුඩානන් ලජ්ජාකරණ පිණිස කියන්නාහුම්"කොක්ඛෙනුව අපගේ කවුඩානන් වාසයකරණ තැන නොප වාසයකරන්ට කාරණා නොවෙයි" කියන්නා එවිර කවුඩු කියන්නේ "සබඳ මව මෙසේ දුකක් පැමිණි තිබූ ගමනේ නුඹවහන්සේ මට නින්දා කරන්ව කාරණා නොවෙයි" කියන්නා බොධිසත්ත්වයෝ කියන්නා "තොප ශරීරයේ සඳුන් ගාගෙණ පලඳනාවකුත් පැලඳගෙණ අවුත් උන්හෙයින් කොයිදරට ගොසින් ගෙණා පලඳනාවෙක්දෝ හෝ යි සිතා කී පමණක් විනා තොපට වෙහෙසන්ව නොවෙයි කීහ.

එවිට කවුඩු කියන්නේ "මේ මාලාවත් පලඳනාවත් මේ ශරීරයේ ගැහඳුනුන් නුඹවහන්සේගේ පසමිතුරන්ටත් නොවේව"යි කියා කෙදිරිගගා වැද ඔත් තැනැත්තවුගේ ප්‍රාණය නිරුඬව ගියේය.

බොධිසත්ත්වයෝ කියන්නාහු "අප මෙතනඉඳිමෙන් සැකවෙයි, කාරණා වෙයි, කියා ඔබ්බට ගොසින් වාසය කළාහ"යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ කපෝත ජාතකය නිමවා වදාළසේක.

චතුස්සත්‍ය දෙශනාවගේ කෙළවර ලොභී භික්ෂුන්වහන්සේ සෝවාන්වූ සේක. එසමයෙහි කාෂ්ණ කවුඩා නම් මේ භික්ෂුහුය, එසමයෙහි පරෙවිව උපන්නෙම් බුදුවූ මම්ම ය යි වදාළසේක.

# පඤ්චක නිපාතයෙහි ජාතකයෝයි.

---

## 364
## ආචාරි ජාතකය

**තවද සවන නිපාතය දක්වමි.**
**ඒ කෙසේ ද? යත්,**

තවද දහම්ලයැනි සම්බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සේක් එක් නැවියෙකු අරභයා මේ ජාතකය දක්වන ලද.

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ "සම්බුදුරජාණන් වහන්සේ අද දවස් මා දුටුව මැනවැ"යි යන සිතින් අවුදින් අවිරවතී ගංතෙරට පැමිණ තොටියාට

කියනසේක් "එම්බල මම සම්බුදුරජාණන් වහන්සේ දක්නා අභිප්‍රාය ඇතිව යෙමි. වහා එතර කරව"යි කී කල්හි ඒ තොටියා කියන්නේ "නුඹවහන්සේ මේ වේලේ වඩින්නේ කිම්ද? උදැසන වැඩිය මැනවැ"යි කී කල "මෙතන මා සැතපෙන තැනක් නැත, වහා මා එතරකරව"යි කී කල්හි තොටියා කිපී උන්වහන්සේ නැවට නන්වාගෙණ තොටව තොවැද උන්වහන්සේගේ සිවුරුත් තෙමා කල් යවා තොටින් එතර කළේය.

උන්වහන්සේ විහාරයට ගොස් රැවූ හෙයින් සම්බුදුරජාණන්වහන්සේ නොදැක දෙවෙනි දවස් සම්බුදුරජාණන්වහන්සේ වැද එකත්පස්ව සිටිසේක. සම්බුදුරජාණන් වහන්සේ වදුරණසේක් "ඇයි භික්ෂුවෙනි, කවදා අවුදැ?"යි විමාළ කල්හි "සවාමීනි ඊයේ ආම්"යි කීසේක.

එබස් අසා සම්බුදුරජාණන් වහන්සේ වදුරණසේක් "ඊයේ අප නුදුටුයේ ඇයිදැ?"යි විමාළ කල්හි භික්ෂූහු කියනසේක් "ගංතොට පදිනා තොටියා ගඟ පාතට ඔරුව පැද සිවුරු තෙමා මෙතර කළ හෙයින් සිවුරු විසලාගන්නා පිණිස ඊයේ දකින්ට නුවූයේය"යි සැලසළ කල්හි සම්බුදුරජාණන්වහන්සේ වදුරණසේක් "එම්බා මහණ, තොටියා තොපට මතු නොවෙයි ගඟට කළේ. පෙර උත්තම යන්ටත් ගඟට කළේ වේදැ?"යි වදුරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ හිමාලය වනයෙහි තාපසව වාසය කරන්නාහු ලුණුඇඹුල් සපයා බරණැස්නුවරට අවුත් උයනේ වාසයකරන්නාහ.

රජ්ජුරුවෝත් තාපසයන් ලඟට උයනට අවුත් දකිනාහ. ගියවිට දවස් පතා අවවාද කියනවිට "භූම්පාලොත්තමවූ රජ්ජුරුවන්වහන්ස, කාටත් නොකිපුන මැනව, කා කෙරෙත් කෝපයක් නොකළමැනව, එසේවූ කෝප නොවන්නාවූ රජ්ජුරුවන්ගේ යසස සදිසානතයේ පූජ්‍යවන්නේ ය"යි කීහ. "තවද ග්‍රාමයෙහි ද නැවත වනයෙහි ද ජලයෙහි ද භූමියෙහි ද යන සියල්ලෙහි ම මෛත්‍රියක් මිසක් කෝපයක් රටොත්තම වූ රජ්ජුරුවන්වහන්සේ කා කෙරෙත් නොකළ මැනවැ"යි මේ නියාමයෙන් දවස්පතා රජ්ජුරුවන්ට අවවාද කරන්නාහ.

රජ්ජුරුවෝත් තාපසයන් කෙරේ පැහැද ලෂ්ණයක් නිමිත ගමක් දුන්නාහ. තාපසයෝ නොසිවසූහ. දෙළොස් අවුරුද්දක් උපස්ථාන කළාහ. තාපසයෝත් එතන රදන්ට කලකිරී රජ්ජුරුවන්ට කීවෝත් යාකොදෙති. උයන් ගොව්වාව කියා සැරිසරා ඇවිදිමි යි උයනින් නික්ම පලාගියහ.

යන්නෝ බරණැස්නුවර ගඟ සමීපයට ගියාහ. ඒ ගඟ මිනිසුන් ඇත් මැත් කරන්නාවූ අපරිමාතු නම් නැවියා අඳුන එකෙක. මිනිසුන් ගඟ එතරකළ කල "එතරදී මිළ දෙම්මැ"යි කියා එතර ගොස් මිළ නොදී පලායන්නා. මෙයිත් මිල නොලදින් දුම්ලව ඉන්නේය. බොධිසත්ත්වයෝත් ගඟ අසල සිට "මා එතර ලව"යි කීහ. "මට කුමන මිළ දෙව්ද"යි විමාළේය. "තොපට අඹු යෙන් ධම්යෙන් අනුශාසනා කෙරෙමි"යි කීහ.

එවිට නැවියා ඒ වස්තුවෙක් නොහෝයි සිතා තාපසයන් ගඟින් එතර ලා "මට වස්තු දෙව"යි කීහ.

තාපසයෝ කියන්නාහු "වනයෙහිම සියල්ලෙහිම මෛත්‍රීකරව යි අවවාද කියා තොපි මිනිසුන් එතර ලා ගන්නෙයින් වේද? මිළ තොදී යන්නේ එතරදීම මිළ ඇරගෙණ විනා මිනිසුන් එතර නොකරව"යි අවවාද කීහ.

එවිට නැවියා "තොප මට දෙන වස්තු මේ දැ?"යි කියා තාපසයන් අල්වා ගෙණ මුණට ඇන්නේය.

"රජ්ජුරුවන්ට අවවාද කියා ලැබයක් නිමිත්ත ගමක් ලද්දහ. අසථානයේ කවයුතු නොදන්නාවූ මුර්ඛයාට අවවාද කියා ඇතුන් ලද්දහ"යි සමීඥයන් වහන්සේ වදාළසේක.

ඒ නැවියාගේ අඹු ඇවිදින් "ඇයි තෝ කුමක් කෙරෙද්ද? රජ්ජුරුවන් වහන්සේට කුලූපග තාපසයන්වහන්සේය, උන්වහන්සේ කුමට මරවිදැ?"යි කිව. එවිට තාපසයන් ඇර අඹු මැරීය. අඹුවන්ගේ බඩ දරු හර්භය වැටී අඹුව මළාය. එවිට එතන සිටියෝ මිනීමැරු තැනැත්තේය යි නැවිය බැදගෙණ ගොස් රජ්ජුරුවන්ට පැවාහ. රජ්ජුරුවෝත් නැවියාට අඥ කරවූහයි සමීඥයන් වහන්සේ වදාරා "අඥතව තාපසයන් කී අවවාද නොගිවිස තමාගේ පුතුන් නොලැබ අඹුවත් නොලැබ ආඥ වින්දේය"යි වදාරා මේ ආචාරි ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි නැවියා තම් මෙසමයෙහි නැවියාමය, බරණැස් රජ්ජුරුවෝ තම් ආනන්ද සථවිරයෝය, තාපසව උපන්නෙම් බුදුවූ මම්ම ය යි වදාළසේක. මේ දෙශනාවසානයෙහි භික්ෂූන්වහන්සේ සෝවාන් වූ සේක.

---

## 365
## ශ්වේතකේතු ජාතකය

එවද දෙව්බඹුන් මුදුනෙහි කෙළනා පාපියුම් ඇති සමීඥයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි වඤ්චා ප්‍රයෝග දන්නා භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ වඤ්චා ප්‍රයෝගයෙන් දවස්අරිණසේක. සෙසු භික්ෂූන්වහන්සේලා ඒ භික්ෂූන්වහන්සේ සමීඥයන්වහන්සේට දැක්වූසේක.

සමීඥයන්වහන්සේ "සැබෑද? මහණ, වඤ්චා ප්‍රයෝගයෙන් දවස්අරිනේ දැ"යි විචාරා "සැබෑව" යනු අසා "දැන් මතු නොවෙයි, මහණෙනි, පෙරත් මේ මහණ වඤ්චා ප්‍රයෝගයෙන් දවස් හැරියේ වේදැ?"යි වදාරා "ඒ කෙසේ දැ?"යි ආරාධිවූ සමීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයෙහි දවස බරණැස්නුවර මහාප්‍රතාප නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුරෝහිතව ඉපිද පන්සියයක් අතවැස්සන්ගෙන් ශ්වේතකේතු නම් බ්‍රාහ්මණයෙක් ඇත. ඒ බ්‍රාහ්මණයා වංශවත් හෙයින් මානීව ගර්වයක් ඇතිව වාසය කරන්නේය. එක් දවසක් බ්‍රාහ්මණයා විපියේ යන කලට වණ්ඩාලයෙක් ඉදිරියට එන්නේය. ඒ

බ්‍රාහ්මණයානෝ ''තෝ කවරෙක්ද?''යි විචාරා ''මම චණ්ඩාලයෙකැ''යි යනු අසා ''තෝ චණ්ඩාලයෙක් විතුම් වනා යටිසුලඟට පලායව''යි කීහ. එයින් ''මේ මා නීව එකෙකැ''යි සිතා උඩුසුලඟින් ගියේය. බ්‍රාහ්මණයාත් වහ වනා උඩුසුලඟින් ගොස් සිටියේය. එවිට චණ්ඩාල කියන්නේ ''නුඹගේ මෙසේම මා කෙරේ ගළී කරණ පසු මා විචාළ ප්‍රශ්නය කිවමැනවැ''යි කීය. එවිට බ්‍රාහ්මණ කියන්නේ ''ඇයි චණ්ඩාලය, තා කී ප්‍රශ්නය කිය නොහෙම්ද යි කිව''යි කීහ.

එවිට කියන්නේ ''කියාගත නුහුනුවෝ නම් මාගේ යටපස්සෙන් යන්නේ ද?''යි කීය. බ්‍රාහ්මණ කියන්නේ ''තාගේ ප්‍රශ්නය නොකියෙන් නම් යටපස්සෙන් යෙමි'' කීය. එවිට චණ්ඩාල කියන්නේ ''දිසාව කවරේද''යි විචාළේය. බ්‍රාහ්මණ කියන්නේ ''සතර දිග අනුදිගය යන මේ දිශා තැමැ''යි කීහ.

එවිට චණ්ඩාල කියන්නේ ''මෙවිවරත් දැනගත නොහෙන්නා නොපිද ගළීකරන්නේය''යි ඉස අල්වාගෙණ තමාගේ පය අස්සෙන් කර අල්වා දැමීය. ඒ දුටු බොහෝ මනුෂ්‍යයෝ එපවත් පුරෝහිත බ්‍රාහ්මණයාහට කීවාහුය. ශ්වේත කේතු බ්‍රාහ්මණයා දැක ''සැබෑද බ්‍රාහ්මණය, තා ඉසඅල්වා චණ්ඩාලයා තමාගේ පයට පස්සෙන් යවූයේ ද?''යි විචාරා ''සැබෑව'' යනු අසා ''එම්බල බ්‍රාහ්මණය, චණ්ඩාල වුවත් නුවණැත්තන් කෙරෙහි නිහුකිරීම කටයුතු නොවෙයි, ශාස්ත්‍රය නම් එක් කෙනෙකුත්ම දනිති කියාත් නැත, ශාස්ත්‍රය නිමවා දැනගතහැකි දෙයක් නොවෙයි. දිශාව නම් දෙමව්පියන්ම ඇතිව උත්පත්ති වන හෙයින් පුළුදිග නම්, තමාගේ ආචාරි ගුරුවරයන් වසනා දිග දකුණුදිග නම් වෙයි, දැන සීලාදී ගුණයෙන් යුක්තවූ සත්පුරුෂයන් වාසය කරන්නා තැන් එක් දිගෙක් වෙයි. නුවණැත්තාවූ සත්පුරුෂයන් වසන්නාවූ තැන් එක්දිගෙක් වෙයි. කියා මේ ඇඹට වඩා නිවණට යන්නාවූ මාර්ගයම ඇති දිශා ප්‍රධාන වන්නේය''යි කීහ.

එවිට බ්‍රාහ්මණයාත් ''මේ පුරෝහිතයානන් මෙසේ මේ චණ්ඩාලයකු මට නින්දා කළ කලදී බැණ නොනැගී උන්නේය. මුන් ලඟ නොරඳමි''යි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් ලඟට ගොස් ශිල්ප ඉගෙණගෙණ බරණැස්නුවරට එන්නාහු අතරමඟ තාපසවරු ඉන්නා පන්සලට වැද ඒ තාපසවරුන්ට නාඝකව ඒ තාපසවරුන් ඇරගෙන බරණැස්නුවරට ගොස් රජ්ජුරුවන්ගේ උයන සැතපී තාපසවරුන් උදැසන නුවරට සිඟා ගියාහ. රජ්ජුරුවෝත් තාපසවරුන් දැක සමාධිව තමන්ගේ උයනේ වාසය කරණ නියායෙන් සැලැස්වූහ.

එක්දවසක් රජ්ජුරුවන්ගේ අභිප්‍රාය දැනගත්නොත් ඇතිතෙක් දවසට ජීවත්වන්ට පුළුවන. එසේනෙයින් ''රජ්ජුරුවන් එන වේලාවට කණ්ඨක තපස් වවුල් තපස් උක්කුටික තපස් පඤ්චතාප තපස් ආදීවූ තපස් රකුව''යි විධාන කොට තුමූ කීකරු යාපන් තාපසවරුන් පස්දෙනෙකු තමන් සමීපයේ ඉඳුවා යාපන් දණ්ඩාසනයක් ඉදිරියේ තබා ඊමත්තෙහි වණීයෙන් සිනියම් කරණලද වසා ලැලි ඇති පොතක් තුමූ බල බලා තාපසවරුන් පස්දෙනාව ප්‍රශ්න කිය කියා උන්හ.

එවේලාවට රජ්ජුරුවෝ අවුත් තාපසවරුන්ගේ වෙන වෙනම වුතත් දැක තාපසයන් සැලැස්මත් දැක සමාධිව ''මෙසේවූ තපස් කරන්නාවූ තාපසවරුන්ට මතු යහපත් විපාක වන්නේ වේදැ''යි පුරෝහිත බ්‍රාහ්මණයානන් අතින් විචාළහ.

පුරෝහිත බ්‍රාහ්මණයාතෝ කියන්නාහු "මෙසේවූ තපස් කරන්නාවූ තාපසවරුන්ට මින්මතු වන්නාවූ විපාකයකුත් නැත, මින්වත ඵලයකුත් නැතැ"යි කීහ. එවිට තාපසයෝ කියන්නාහු "විපාකයක් නැති කල අෂ්ටාංගශීලයෙන්ද චතුර්වේදයෙන්ද කිසි ප්‍රයෝජනයක් නැති කල මහාබ්‍රහ්මයා විසින් මේ ශාස්ත්‍රය ඇතිකරන්ට කාරණා කිම්ද? පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති විනා සෙසු දෙයකින් ප්‍රයෝජන නැද්දැ"යි කීහ.

එවිට පුරෝහිත බ්‍රාහ්මණයාතෝ කියන්නාහු "තොප කෙතෙක් කීවත් තොපගේ ශාස්ත්‍රයෙහි මෙලොව විනා පරලොවින් කිසිම ප්‍රයෝජනයක් නැත. මුන් පන්සියයගේ අදුන් දිවිසම් ජටාමඬුළු අරවා අභ්‍යන්තර සේවාකමට සලස්වා වදුලොත් යහපතැ"යි රජ්ජුරුවන්ට කීහ.

රජ්ජුරුවෝත් පුරෝහිත බ්‍රාහ්මණයා කීවාසේම තාපසවරුන් පන්සියයක් සේවාකමට සලසාගෙණ ආයුධ දී ගණ වැසි රැකවලැ යි කියා සැලසීනැයි දතයුතු. එතැන් පටන් ඒ තාපසවරු පන්සියය රජ්ජුරුවන්ට සේවාකම් කළහ යි වදරා මේ ශ්වේතකේතු ජාතකය නමවා වදුළසේක.

එසමයෙහි වණ්ඩාලයා නම් ශාරිපුත්‍රස්ථවිරයන්, ශ්වේතකේතු බ්‍රාහ්මණයා නම් වඤ්චා භික්ෂුහුය, පුරෝහිත බ්‍රාහ්මණයාතන්ව උපන්නෙම් බුදුවූ මම්ම ය යි වදුළසේක.

## 366
## දරීමුඛ ජාතකය

තිවද ලොවට ස්තෙහ ඇති වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහාභිනික්මන් අරහයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේ ද? යත්**

එක්දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්වූ මාළුවරුන්වහන්සේ "මේ නියරාජ්‍යශ්‍රීයක් හැර මහාභිනික්මන් කළ නියාව ඉතා යහපත ආශ්චර්යයෙකැ"යි කිය කියා උන් තැනට සම්බුදුරජාණන්වහන්සේ වැඩ වදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාළ සේක්හුන් දැන "මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් උත්තමයෝ රාජ්‍යශ්‍රීය හැර මහණවූවෝ වේදැ?"යි වදරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදුළසේක.

පුරාතනය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ට පුත්ව උපන්නාහ. එකියන රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයානන්ගේ පුතනුකෙණෙකුන් ඇත්තාහ. එකියන බ්‍රාහ්මණකුමාර විශිෂ්ටවූ රූප ඇති සොභාවත්වූ මුඛශ්‍රීයක් ඇති හෙයින් දරීමුඛ නම් බ්‍රාහ්මණ කුමාරයන් බරණැස් රාජකුමාරයොත් දෙන්නම එක්ව වැඩී දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් ශාස්ත්‍ර ඉගෙණ බරණැස් නුවරට එන අවස්ථාවට බරණැස් රජ්ජුරුවෝ මළහ.

රාජකුමාරයෝත් බමුණුකුමාරයත් දෙන්නා ශාස්ත්‍ර ඉගෙණ නිසාංචිතය කොට ගෙණ බරණැස් නුවරට අවුත් ගෙයකට වන්කලට ඒ ගෙයි එක් මැලි ස්ත්‍රියක් දෙන්නා දැක චතුර්වේදයෙහි නිපුණ නියාව දැන පුටුදෙකක් තනා ලා එක් පුටුවෙක සුදුකඩක් හා එක් පුටුවෙක රත්කඩක් හා අතුව ඉන්ව කිව. බ්‍රාහ්මණකුමාර රජ්ජුරුවන්ට අද රාජ්‍යය පැමිණෙයි, මව සෙනෙවිරත් ධුරය පැමිණෙයි නුවණින් දැන බ්‍රාහ්මණ කුමාරයා රාජකුමාරයන්ට සුදුඉනකඩ අතුළ පුවුව දී තුමූ රතු ඉනකඩ අතුළ පුටුවේ උන්නේය. ඒ ගෙය මැලි ස්ත්‍රී බත් මාළු ඉදිකොට දෙන්නා බත් කැවූහ. දෙන්නා බත්කා ලා මගුල් උයනට ගොස් රාජකුමාරයෝ මගුල් උයනේ සලවට පිට ඉනකඩ ඉසවසා ලාගෙණ වැදහොත් තාහ. බ්‍රාහ්මණකුමාර රාජකුමාරයන් ගාවා උන්නේය. බරණැස්නුවර වාසීහු පුස්සරථය සරහා නුවර අලහ. පුස්සරථය නුවර ප්‍රදක්ෂිණාකොට ගෙණ මගුල් උයනට ගොසින් රාජකුමාරයන් වැදහොත් මගුල් සලවට පාමුල පුස්සරථය සිටියේය.

බ්‍රාහ්මණ කුමාර රාජකුමාරයන් පුබුද්දන්නා රාජකුමාරයෝ පිබිද මගුල් සලවට පිට ඉඳ "කිමෙක්ද?" යි විචාළාහු නුවර වාසීහු "ස්වාමීනි, අපගේ රාජ්‍යය කළ මැනවැ" යි "මේ නුවර රජ්ජුරුවන් වහන්සේ මළසේකැ" යි කියන්නා බොධිසත්වයන් එපවත් අසා "මේ නුවර රජ්ජුරුවන්ගේ රාජකුමාරයෙණෙක් රාජකුමාරි යෙණෙක් නැද්ද?" යි විචාරා "නැනැ" යිඅසා "යහපතැ" යි ගිවිස්සාහ. බ්‍රාහ්මණකුමාර "රජ්ජුරුවෝ රාජ්‍යයකෙරෙති, මා සෙනෙවිරත්ධුරයේ සලසති, ඉන් මව ප්‍රයෝජන කිමිද?" යි සිතා ඉවත්ව සිටිකලට රාජකුමාරයෝ රථයට නැගී බරණැස්නුවරට ගියපසු බ්‍රාහ්මණකුමාර මගුල් උයනේ ඉඳ විලිසවැගිරගිය පතක් අතට අරගෙණ ඉඳ "මේ පත්‍රයය පළමු අංකුර පත්‍රයය, පසු මූකළාවූ පත්‍රයය, දැන් ජීර්ණවගිය පත්‍රයය, එසේහෙයින් සියළු සංස්කාරම අනිත්‍යය" යි කිය කියා භාවනා කොට සිටිකලට පොළොව ගුගුරුවා සියළු ක්ලේශයන් නසා පසේබුදුබවට පැමිණියේය. ආකාශයෙන් තුන්සිවුරු පාත්‍ර අවුත් ශරීරයේ වැළඳගත. පළමු ශරීරය අන්තර්ධාන විය. පසේබුදුවූ ශරීරයෙන් ආකාශයෙන් ගන්ධමාදන පර්වතයට වැඩිසේක.

රජ්ජුරුවෝ බරණැස් නුවර රාජ්‍යයට පැමිණ සතළිස් අවුරුද්දක් බ්‍රාහ්මණ කුමාරයන් සඳහන් නැතිව ඉඳ "මාගේ දරීමුඛ නම් බ්‍රාහ්මණ කුමාරයා කොයිදැ?" යි සඳහන් කොට පරීක්ෂාකරන්ට උවමැනවැයි කියා දසඅවුරුද්දක් පලාගියේය. එක්ව පණස් අවුරුද්දක් ගියකලව දරීමුඛ නම් පසේබුදුන්වහන්සේ සිතනසේක් මාගේ මිත්‍රවූ බරණැස් රජ්ජුරුවෝ "මා කොයිදැ යි දක්නා අභිප්‍රාය ඇත්තෝය, මෙවක් පටන් රජ්ජුරුවන්ට වයසුත් මුහුකුරා දරුමල්ලනුත් ඇතිව වයස්මුහුකුරාව ගියේය. මා කී අවවාද ගිවිසති. මෙවිට ඔබ යෙමි" සිතා බරණැස් නුවරට අවුත් මගුල් උයනේ දරීමුඛ නම් පසේබුදුන්වහන්සේ වැඩඋන් කලට රජ්ජුරුවෝ උයන්ගොව්වා අතින් අසා දරීමුඛ නම් පසේබුදුන්වහන්සේ කරා අවුත් වැඳ එකත්පස්ව උන්නාහ. පසේබුදුන්වහන්සේ "රජ්ජුරුවෙනි, දැහැමින් සෙමින් රාජ්‍යය කරව්දැ?" යි විචාරා වදාරා ඉක්බිති වදාරණ පසේබුදුන්වහන්සේ පළමුවන ගාථාව වදාළසේක.

"ලෝකයෙහි යම් සත්ත්වයෙණෙක් දියපිනන්නාවූ වැව් පොකුණු ගංහෝ ආදියෙහි හටගත්තාවූ නෙළුම් ඇඹුල උපුල සෙවෙල් ආදියෙහි ගොඩනැඟී

යා නොහෙද්ද? තවද යම්සේ ඝන මඩෙහි එරුණාවූ මෘගසුනඛාදීවූ තැගී යා නොහෙද්ද? එපරිද්දෙන් මේ සංසාරයෙහි ඇවිදිනාවූ වස්තුකාම ක්ලේශකාම නැමැති තෘෂ්ණා ශෛවාලාදියෙහි ලග්නව සංසාර ඝාතරයෙන් තැගී යා නොහෙන්නාහ. තවද රාග ද්වේෂ මෝහ මදමාන මාත්සර්‍යාදීපංකයෙහි ලග්නව සංසාර පංකයෙහි තැගී සවඥීමෝක්ෂාදියට පැමිණ යා නොහෙන්නාහ. තවද වස්තුකාම ක්ලේශකාමයෝ ලොභ ද්වේෂ මෝහ යන ත්‍රිකාරණා ත්‍රිවිධ මූල් වී පවත්නා හෙයින් සසර සිටිනා සියළු සත්ත්වයෝ සවඥීමෝක්ෂාදියට පැමිණ යා නොදී අපායෙහිම තැවත කරකවා එලන හෙයින් බලවත්වූ භයංකාරද වන්නේ ය යි බුඬාදි මහොත්තමයන් විසින් කියනලදී.

තවද මහරජ, වස්තුකාම ක්ලේශකාමයෝ සුවඳසුන්ණෙන්ඵලා තඹා වස්ත්‍රා භරණාදීන් සැරහී සිටි සත්ත්වයාගේ ශරීරයෙහි සභාව ඇසව අවිෂයවූ රජස් ධූලි වැටීමෙන් යම්සේ නිස්සොභාවට පැමිණේද? පිරිසිදුවූ සුණුපිරියම් කරණ ලද්දාවූ සුඛාඛවල ප්‍රාකාරයෙහි භිත්ති ආදිය එක්වම දුම් වැදගැන්මෙන් කිලුටු වේද? එපරිද්දෙන් මේ ලෝකයෙයි සත්ත්වයන්ගේ සන්තානයෙහි හටගත්තාවූ කෙලෙස් තැමැති රජයේ ඒ ඒ සත්ත්වයා විසින් පැමිණෙනලද මාඝඵලාදියෙන් පිරිහෙලා නිස්සොභ කරන්නේය.

තවද ධ්‍යාන මොක්ෂාදීන් පිරිසිදුවූ චිත්තසන්තානයෙ ඇති සත්ත්වයාගේද සන්තානයෙහි හටගත්තාවූ සුවල්පමාත්‍රවූද ක්ලේශයෙම ඒ සත්ත්වයා කිලුටු කරන්නේය. ක්ලේශ තැමැති රජස්ධූමය මා විසින් තොපට විස්තර වශයෙන් කියන ලදී. ඒ කවයුත්තෙකැයි තොපට සිතේ නම් වස්තුකාම ක්ලේශකාමයන් හැර තපසව යව"යි යනාදීන් ධර්මදේශනා කළසේක.

ඉක්බිති බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ පසේබුදුන්වහන්සේට ආමන්ත්‍රණය කොට "සාමීනි, මේ වස්තුකාම ක්ලේශකාමයෙහි බැඳිනිම් සක්තවීම්. පඤ්චකාම විෂයෙහි ඇලී මුර්ඡාවට ගියෙම්. ඒ කාරණයෙන් පස්කම් ගුණයෙන් වෙන්ව ජීවත්ව යා නොහෙම්. ගිහිගෙයි සිට දානමානාදීන් බොහෝ කුසල් රැස් කෙරෙමි යි මහණව තපස් රක්ෂාකල නොහෙම්"යි කීහ.

දිපඞ්කරපාදමූලයෙහිදී තුන්වෙනිවූ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව දැක කියන්නාහු "සුමේධ තාපසයෙනි, යම්සේ සිරගෙයි වසාපු කෙණෙකුන් කවරදා සිර ගෙයින් ගැලවී යන් දෝ හෝ යි සිතන්නාක්හු මෙන් තොපි මේ සංසාරයෙන් කවරදා ගොඩතැගෙම් දෝ හෝ යි සිතා ඉවාගෙණ බුදුබුරුදම් පුරන්නාවූ බොධි සත්ත්වයන්ට පවා මෙසේවූ සිතිවිල්ලෙක් උපත. ඒ එසේමය. මේ ලෝකයෙහි උන්මාද අවකින් විසංඥ වන්නාහ.

මෝහයෙන් උපදනාවූ කාම උන්මාදය, අනිෂ්ට විතාස උපදනාවූ ක්‍රෝධ උන්මාදය, සංඥකරවන දර්ශන උන්මාදය, අඥන භාවයට පමුණුවන මෝහ උන්මාදය, යක්ෂයන් විසඟයට පමුණුවන යක්ෂ උන්මාදය, පිත අධික බවට පමුණුවන පිත්තෝන්මාදය, පාන වසඟ කරවන සුරා උන්මාදය, සෝක අධික වීමෙන් වන ව්‍යසන උන්මාදය යි කියනලද උන්මාද අටකින් දීපඞ්කර පාදමූල යෙහි පවත් විවරණ ලත් ඒ උත්තමයානන්වහන්සේට පසේබුදුන්වහන්සේ විසින් කියනලද්දාවූ අවවාද කාම උන්මාද හෙයින් "මට මහණවන්නට බැරිය"යි කීසේක.

"යම් සත්ත්වයෙක්ගේ හිත පිණිස කීවාලු අවවාද නොගිවිස්සෝ විනම් ජාති බොහෝ වෙයි. ගෙවීමක් නැත්තේ ය"යි කියා පසේබුදුන් වහන්සේ වදාරණසේක් "මහරජ, යම් සත්ත්වයෙක් මේ කුස උපන්නේ විතම් ඒ සත්ත්ව තෙම සංසාර භීරුකවූ යොගාවචර පුද්ගලයා විසින් ඒකාන්තයෙන් අශුභය අපවිත්‍රය සි දක්නාලද මලමූත්‍රයෙන් පිරීසිටිනා සතරඅතින් අකිලන සත්මසක් හෝ දසමසක් හෝ උන්තෙනින් නොසෙලවී පින්තෙක්හි සිදෙන තලපල මුවක් මෙන් පැසී දුක් විඳිනාවූ මව්කුස් නිරයෙහි උපන්නේය. මහරජ, ඒ මව්කුස් නිරයෙන් බිහිවන්නාවූ සත්ත්වයෝ සිවුදෑ ගඳ සුවඳ විලවුන් හෙණ සුගන්ධමාල ධාරීව උපන්නාවූ නොවෙති. වැලි කෙසේ උපදිද්දැ?යි යතහොත් පුරාණ ගූථ යෙහිම වැකී රුධිරයෙන් හැනී ඝන බොල් සෙලෙස්මායෙන් තැවරී බිහිවන්නාවූ එසේ බිහිවන වේලෙහි මෙබඳු අපවිත්‍රයෙන් මිශ්‍රවූ කර්‍ම වාතයෙන් බැහැර හෙලන ලදුව යතෙක්හි ලා මිරිකන කලක් මෙන් මහදුක් විඳිමින් කෙසිවිදකින් අදනා නාඹු ඇතක්හු මෙන් සම්බාධයෙන් බිහිවීමෙන් දුක්විදිනොත් විනා සැප යෙක් නම් නැත්තේමය. වස්තුකාම ක්ලේශකාමයෙහි ඇලුනු සත්ත්වයාට ගර්භාව ක්‍රාන්ති දුකඛය වත්තේය සි දෙයාසංඛ්‍ය කල්පලක්ෂයක් දන්නා නුවණ ඇති ප්‍රත්‍යෙක බොධිඥනයෙන් දැකම කිම්, අනික් කෙණෙකුත්ගෙන් ඇසීමෙන් කිදෙයක් නොවෙයි" යනාදීන් දරිමුඛ නම් පසේබුදුහු විසිතුරු බණ කථාවෙන් විශිෂ්ටවූ නුවණ ඇති බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ට වස්තුකාම ක්ලේශකාම යෙහි ආදීනව ඇති නියාව කියා හිඳිවූසේක.

ඒ නියාවට රජ්ජුරුවන්ට අවවාද කියා "මහණ වෙතත් නොපගේ අභිප්‍රායෙක. අප විසින් සියලු ආදීනව කියාලූම්හ"යි කියා ආකාශයට පැන නැගී පස්වණක් මිලා මඩිමින් පසේබුදුන්වහන්සේ වඩිනට වන්සේක.

රජ්ජුරුවෝ ආකාශයෙන් වඩිනේ පසේබුදුන්වහන්සේ දර්‍ශනාතික්‍රාන්ති වනසේක් බලාසිට බරණැස්නුවර අමාත්‍යයන් ගෙන්වා තමන්ගේපුත්වූ බරණැස් රාජකුමාරයන් ගෙන්වා රාජ්‍යයට පමුණුවා අමාත්‍ය මණ්ඩලයා ශොකයෙන් අඩ අඩා සිවිද්දී හිමාලය වනයට ගොස් මහණව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්හයි වදාරා මේ දරීමුඛ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි බරණැස්රජව උපන්නෙම් නිලෝගුරු බුදුවූ මම්ම ය සි වදාළ සේක. මේ දෙශනාව කෙළවර බොහෝදෙන සෝවාන් ඵලාදියට පැමිණියාහ.

---

## 367
## නේරු ජාතකය

**ඒ**වද කිවව දෙරහළුවාවූ නිලෝ ගුරු බුදුරජානන්වහන්සේ ජෙතවනා රාමයෙහි වැඩවසන සමයෙක්හි එක්තරා භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

එක්තරා භික්ෂුකෙනෙකුන් වහන්සේ පිටිසර ගමකට වැඩිසේක. පිටිසර එක්තරා පුරුෂයෙක් ඒ භික්ෂූන්වහන්සේ දැක පන්සලක් ඉදිකොට වස් වසම්න් සිවිකලව ශාස්වත දෘෂ්ටි පරිබ්‍රාජිකාවරු ආහ. එතැන්පටන් භික්ෂූන්වහන්සේ

කෙරේ ආලිස්සන්ව පරිබ්‍රාජකවරුන්ට සත්කාර සම්මාන කරවන්ටවත. උන් සත්කාර සම්මාන කරන්ව වන්කලට උවෙඡදවාදීහු ආහ. එතැන් පවන් ශාස්වතවාදීන් කෙරෙහි ආලිසසන්ව උවෙඡදවාදීන්ට බොහෝ සත්කාර සම්මාන කරන්ව වන. උන්ව සත්කාර සම්මාන කරන්ට වන්කලට අවෙලකාදීහු ආහ. එතැන් පටන් උවෙඡදවාදීන් කෙරෙහි ආලිස්සන්ව අවෙලකාදීන් කෙරෙහි බොහෝ සත්කාර සම්මාන කරන්ට වන.

මේ නීයායෙන් උත්තමය, මධ්‍යමය, අධමයයි යන තේරීමක් නැතිව සාමාන්‍යයෙන්ම උපසථාන කෙළේය. ඒ භික්ෂූන්වහන්සේ වස් තුන්මස එතන රදා සම්ඹුදුරජාණන් වහන්සේ දුටුසේක. සම්ඹුදුරජාණන් වහන්සේ "ඇයි? මහණෙනි, මෙතෙක්දා කොයි ගියෙයිදැ?"යි විචාරා එපවත් අසා "මහණෙනි, ඒ පුරුෂ උත්තම, මධ්‍යම, අධම යන පක්ෂීන් උන් කලට ඒකවණී වන්නා මෙන්"යි වදාරා ඒ "කෙසේදැ?"යි ආරාධිතවූ සම්ඹුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පෙරකිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ සවණීනංසව උපන්නාහ. බොධි සත්ත්වයන්ගේ මලනුකෙණෙකුන් ඇත්තාහ. බොධිසත්ත්වයන් මලනුවන් වහන්සේ ගොවර භූමියට එන්නේ නේරු නම් සවණී පවීතයෙහි සැතපී එන කලට යන කලට සුදු පැහැය, කළු පැහැය, නිල් පැහැය ආදීවූ නොයෙක් පැහැ ඇති පක්ෂි සිවුපාවෝ නේරු සවණීපවීතය ඡායාවෙහි උන් කලට ඒකවණී වන්නාහ. මින් එක් දවසක් බොධිසත්ත්වයන් හා මලනුවෝ පවීත සමීපයට පැමිණ බොධිසත්ත්වයන්ගේ මලනුවෝ විචාරන්නාහු බැයන් වහන්ස, සිංහ ව්‍යාඝ්‍රාදී උත්තම සිවුපාවෝත් සිහලාදීවූ සිවුපාවෝත් සවණීවණී වන්නෝය. අපගේ උත්තමවූ පක්ෂීන් කපුටු ආදීවූ නීචපක්ෂීන් මේ පවීත සමීපයට පැමිණිකල ඒකවණී වන්නාහ. මීට කාරණා කවරේදැ?"යි "මේ කිනම් පවීතයෙක්දැ?"යි විචාළාහ, එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු "මෙකි පවීතය නම් නේරු පවීතය උත්තම, මධ්‍යම, අධම යනාදී සිවුපාවුනුත් පක්ෂීනුත් මෙතනට පැමිණිකල ඒකවණී වෙයි. අනික් වෙසෙසක් නැත්තේය"යි කීහ.

බොධිසත්ත්වයන්ගේ මලනුවෝ "මේ පවීතයට නිතු වේව යි උත්තම මධ්‍යම, අධම යන තුන්පක්ෂය ඒකා වණීවෙයි. උත්තම, මධ්‍යම, අධමයන් තෝරාලිය නොහෙයි. එසේ හෙයින් මේ පවීතයට නිත්දා වේව යි වදාරා චතුසසත්‍යය දෙශනාවසානයෙහි ඒ භික්ෂූන්වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි බොධිසත්ත්වයන්ගේ මලනුවෝ නම් ආනන්දසථවිරයෝය. එසමයෙහි සවවණීහංසව උපන්නෙම් බුදුවූ මම්ම යයි වදාළසේක.

---

## 368 අසඩ්කවති ජාතකය

එවද සසරට ප්‍රතිපක්ෂවූ සම්ඹුදුරජාණන් වහන්සේ ජෙතවනාරාම යෙහි වැඩ වසන සමයෙහි එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්**

**එක්** භික්ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ උකටලීවූ **සිත්** ඇතිව වාසය කරණසේක් භික්ෂූන්වහන්සේ ඒ තම සබ්‍රහ්මචාරීන් වහන්සේට පැසේක. සබ්‍රහ්මචාරීන් වහන්සේ 'සැබෑද මහණ තෘ ස්ත්‍රියක **කෙරේ** පිළිබඳව උකටලීවූ **සිත්** ඇතිව වාසය **කරන්නේය**''යි විචාරා වදාළසේක.

**එපවත්** අසා ''සැබවි **සඛාමිනි**'' කී කල්හි දැන්මතු නොවෙයි, **මහණෙනි**, **පෙරත්** මේ මහණ ස්ත්‍රීකෙරේ පිළිබඳ සිත් ඇතිව විසුයේ **වේදැ**?''යි වදාරා ''ඒ **කෙසේදැ**''යි ආරාධිතවූ සබ්‍රහ්මචාරීන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**පුරිමගිය** දවස **බරණැස්** නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ හිමාලය වනයෙහි තපස් කරණසේක. එසමයෙහි දිව්‍යලෝකයෙන් දිව්‍යපුත්‍රයෙක් මිය අවුත් බොධිසත්ත්වයන් වහන්සේ වසන්නාවූ පන්සල සමීපයෙහි පොකුණේ පියුමක් මත්තේ සුවර්ණ ප්‍රතිමාවක් මෙන් කුමාරිකාව උපත.

බොධිසත්ත්වයෝත් කීපදවසක් පියුම පරතොවී තිබෙන හෙයින් ''**මීට කාරණා කිම්දැ**?''යි කියා **තාපසඛ** ඇදගෙණ දියට බැස පියුම ලඟට ගොසින් පියුම මත්තේ වැදහොත්තාවූ කුමාරිකාව දැක දරුවනැයි යන සංඥාවෙන් වඩා ගෙණ පන්සලට ගෙණවිත් වඩා වඩිනය කොට **සොළොස්** ඇවිරිදි වයසට පැමිණියාහ.

ඒ කුමාරිකාව මනුෂ්‍ය ස්ත්‍රියට වඩා සිටිනීය. දිව්‍ය ස්ත්‍රීන්ටම අනුව සිටිනීය. ඒ තාපසයෝ පියුමෙහි උපන් නැනැත්තන් බලන්ට ආසාවෙන් ගිය හෙයින් ''ආසඞ්කවතීය''යි නම් තුබූහ. මෙසේ මේකුමාරිකාවන් අතිශී රූපයෙන් සම්පත්තිවෙන් වසන සමයෙහි ශක්‍රයෝ බොධිසත්ත්වයන් කරා කලින් කලට අවුත් දැක යන්නාහු කල්යාමකින් තාපසයන් ලඟට අවුත් දැක වැඳ එකත්පස්වී ඉඳ කුමාරිකාව දැක ''මේ කුමාරිකා මෙතනට කෙසේ පත්වූදැ?''යි විචාලාහ.

තාපසයෝත් තමන් දුටු සැටියත් තමන් දරුකොට වැඩූ නියාවත් ශක්‍රයන්ට කීවාහ. ශක්‍රයෝත් ''මුන්ට කුමක් වුනාදැ?''යි විචාළාහ. තාපසයෝ කියන්නාහු ''මුන් ඉඳිනට ගෙයක්ද වස්ත්‍රාභරණ අන්නපානාදීවූ ඛාද්‍ය භොජ්‍යාදීවූ යන මේ සියල්ල වුවමැනවැ''යි තාපසයෝ කීහ. එවිට ශක්‍රයෝත් යහපතැ යි දුවානමය මාලිගාවක්ද වස්ත්‍රාභරණද ඛාද්‍ය භොජ්‍ය අන්නපානාදීවූ දෙයද යන මේ සියල්ලම නිර්මිත කොට කුමාරිකාවව දී දිව්‍යලෝකට ගියහ.

ඒ කුමාරිකාවන් තාපසයන්ව අත්පා මෙහෙවර කොට වසන්නීය.

**එක්** වැද්දෙක් දඩගිය තැනැත්තේ ඒ පන්සලට වැද ඒ කුමාරිකාවන් දැක තාපසයන් සමීපයට ගොස් ''තාපසයන් වහන්ස, මේ කුමාරිකා කවුරු **දැ**?''යි විචාළේය. තාපසයෝ ''මාගේ දුවනියෝය''යි කීහ. වැදිත් එතනින් නික්ම බරණැස් නුවරට ගොස් රජ්ජුරුවන්ට කියන්නේ ''දෙවඟන්වහන්ස, හිමාලය වනයෙහි එක් තාපසකෙනෙකුගේ දුවක් විශිෂ්ඨවූ රූ ඇත්තීය. බැළු බැළුවන්ට ප්‍රසාදු වහනීය''යි රූපශ්‍රී වර්ණනා කෙළේය.

රජ්ජුරුවෝ උන්ගේ බස් අසා තෘෂ්ණාව උපදවා වැද්දහු මගලත නියා යෙන් ඉදිරිකොට තාපසයන් කරා ගොස් වැඳ එකත්පස්ව ඉඳ කුමාරිකාව දැක "මේ කුමාරිකාව කවුරුදැ?"යි විචාරා මාගේ දුවනියෝය"යි තාපසයන් කී කල්හි තාපසයන් වහන්ස, ස්ත්‍රීහු නම් තපස්කරන්නන්ට කිලුටක් හා සරිය. නුඹවහන්සේගේ දුවනියන් පසු මට පාවා දුනමැතවැ යි මම නුවරට ගෙණ ගොස් සථානාන්තර කෙරෙමි" කීහ. එවිට තාපසයෝ එබසට නිහඬක් නොකියා කියන්නාහු "මාගේ දුවනියන්ගේ නම කීවොත් පාවාදෙමි"යි කීහ.

රජ්ජුරුවෝත් තාපසයන්ට බොහෝ නම් කියන්නාහු තාපසයෝත් "මේ මාගේ දුවනියන්ගේ නම් නොවෙයි, කියති. මේ නියායෙන් රජ්ජුරුවෝත් අවුරුද්දක් රඳා නම කියාගත නුහුනුවාහ. රජ්ජුරුවන් හා කැටිව ආ ඇතුන්ට සිංහ ව්‍යාඝ්‍රාදීන්ගෙනුත් බොහෝ ගනට විදිනේය. ඇඟලේ බොන මදුරුවන්ගෙනුත් මනුෂ්‍යයන්ට බොහෝ ගනවය. ශීත පීඩාදියෙනුත් බොහෝ දුකඛය, ගෙණා බත් සාල් නිමාගිය හෙයිනුත් මනුෂ්‍යයන් විදිනාවූ පීඩා දැක රජ්ජුරුවෝත් "අවුරුද්දක් රඳා මේ කුමාරිකාවන්ගේ නම කියාගත නුහුනුම් හ"යි කියා තාපසයන් වහන්සේ වැඳ සමුගෙණ නුවරට යන්නාහු කුමාරිකාව වසන්නාවූ මාලිගාව සමීපයට ගොස් "තොප නිසා අවුත් අවුරුද්දක් තිගේ නම පමණක් කියාගත නොහී දුක්විද නුවරට යමිහ"යි කීහ. එවිට කුමාරිකා කියන්නී "යම්දෙයක ආශාවක් කළ කල ඒ ආසාව පසිඳගෙණ විනා යාම් කාරණා නොවෙයි, මා තරම සත්‍රියක් ලැබගත ඇත්ද? මා කියන කථාවක් ඇසුව මැනව, දිව්‍යලොකයෙහි චිත්‍රලතා වනයෙහි ආසා නම් ලියෙක් ඇත. ඒ ලිය දැසක් අවුරුද්දක් එල ගන්නේය. දිව්‍යපුත්‍රයෝ දැසක් අවුරුද්දෙන් මේ ආසාලිය එලගත්කල "එල අනුභව කරම්හ"යි දැසක් අවුරුදු දුක්විද ඇවිද එ ල අනුභව කොට තුන්මසක් උත්සවකෙළි කෙළනාහ. නුඹවහන්සේ අවුරුද්දක් දුක්විද මා වැනි ස්ත්‍රියක් ඇරපියා යනසේක් වේදැ?"යි කීහ.

එබස් ඇසූ රජ්ජුරුවෝ ආසංකවතී කුමාරිකාවන්ගේ බසෙහි බැඳී යෑ නොහී එක තමකට තම් දහසක් නියායෙන් සොයා නොදැක අවුරුද්දක් සොයා තම කීවත් තාපසයෝ ඒ නොවෙයි කීමෙන් අවුරුද්දක් පලාගියේය. මනුෂ්‍ය යන්ට බොහෝ දුක් නිසා තාපසයන් වැඳ සමුගෙණ රජ්ජුරුවෝ තමන්ගේ නුවරට යන්ව නික්ම ආසංකවතී නම් කුමාරිකාවන් උන් ප්‍රාසාදය බලා අපගේ නුවරට යමිහයි කීහ.

ඒ ආසංකවතී කුමාරිකා කියන්නී රජ්ජුරුවෙනි, මා කියන කථාවක් අසව, එක් කොකෙක් පර්වතයක් මුදුනේ සැතපී ඉඳ සිතන්නේ මා උන් තෙනව ගඩගාවකුත් ගොදුරකුත් සැලසී හිඳේනම් යහපත්ව පැහුත් බී ගොදුරුත් කා චිත්ත සන්තෝෂ විතම් යහපතැයි සිතාගෙණ උන්නේය. ශක්‍රයෝ අසුර භව නය ජයගෙණ තමන් ශක්‍රභවනයට ඇවිත් සිතන්නේ මාගේ මනෝරථය සිද්ධ විය. කවුරුන්ගේ මනොරථය සිඳහුවූයේ දැ යි පරීක්ෂා කළාහු කොකා සිතා වුන් සිතිවිල්ල දැන කොකා උන් පර්වතය ගාවා ගඩගාවතුරෙන් ඔසවා මහ ගඩගා වක් මැවීය. කොකා ගගින් පැන් බී ගොදුරුත් කා චිත්ත සන්තෝෂ කෙළේය. තිරිසන් පක්ෂියා පවා තමාගේ මනෝරථය සිඳකොටගෙණ ගියෝ වේද? එසේ හෙයින් නුඹවහන්සේත් නුඹවහන්සේගේ මනෝරථය සිඳකොටගෙණ ගිය මැනවැ"යි කිව. 'යහපතැ'යි රජ්ජුරුවෝ ආසංකවතී කුමාරිකාවන්ගේ බසෙහි

බැඳී තමාගේ අමාත්‍යයන්ට කියන්නාහු "එහි එහි තමට සියයක් නියාගෙන් බඳුව"යි කියා බන්දවාගෙණ තාපසයන්ට කිවත් ඒ නොවෙයි කියා මේ නියාගෙන් අවුරුද්දක් පළාගියේය. රජ්ජුරුවෝ තමන්ගේ නුවරවූ යෙම් කියා තාපසයන් වැඳ සමුගෙණ නික්මුණාහු ආසංකවතී කුමාරිකාවන් උන් ප්‍රාසාදය බලා කියන්නාහු "එම්බල කුමාරිකාව නිගේ නම් සොයා කියම් යන උන් සාහයෙන් දැන් තුන් අවුරුද්දක් පළා ගියේය. මෙදැතුරේ නිගේ බසෙහි බැඳී උන් පමණක් විනා පඤ්චකාමයකුත් රුදුනු ගමනෙක් නොවෙයි, නිකම් බසින් ප්‍රයෝජන කිම්ද? මාගේ ආසාවෙහි පූරණවියක් නැතිවුව මාගේ නුවරට යෙම්" කීහ.

ආසංකවතී කුමාරිකා කියන්නී "රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ දැන් කීයේ මාගේ නමය, ඒ නම තාපසයන් වහන්සේව කියා මා කැඳවාගෙණ ගිය මැනවැ"යි කිව. එවිට රජ්ජුරුවෝ එසේවීනම් මුන්ගේ නම ආසංකවති නමැ"යි දැන තාපසයන් වහන්සේ සමීපයට ගොස් වැඳ "සාමිනි, කුමාරිකාවන්ගේ නම ආසංකවතී නමැ"යි කීයේය. තාපසයෝ "එසේය ආසංකවතීය යි නමය, උන් පාවාගෙණ යව"යි කීහ.

රජ්ජුරුවෝ ආසංකවතී කුමාරිකාවගේ ප්‍රාසාදය සමීපට අවුත් කියන්නේ "තාපසයන්වහන්සේ තොප මට පාවාගෙණ යන්ට කීසේක. ප්‍රාසාදයෙන් බැසපියව"යි කියා පාවාගත්හ. ආසංකවතී කුමාරිකා තාපසයන් සමීපයට ගොස් වැඳ සමුගෙණ රජ්ජුරුවන් හා කැටිව නුවරට ගියහ'යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ආසංකවතී ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යය දෙශනාවගේ කෙළවර ඒ භික්ෂූන්වහන්සේ සෝවාන්වූ සේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් මේ භික්ෂුහුය, එසමයෙහි ආසංකවතී කුමාරිකා නම් පුරාණ දූතීකාය, එසමයෙහි තාපසයෝ නම් බුදුවූ මම්ම ය යි වදාළසේක.

---

## 369 මිගාලෝප ජාතකය

මේවද පඤ්චගතියෙන් විනිර්මුක්තවූ ත්‍රිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නොකිකරු භික්ෂූ කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

එක්තරා භික්ෂූකෙණෙකුන් වහන්සේ නොකිකරුව වාසය කරණසේක. එකල බුදුරජාණන් වහන්සේ ඕ භික්ෂූනට "සැබෑද මහණ, තා නොකිකරුව වසන්නේය"යි වදාරා "සැබව සාමිනි, කී කල්හි "මහණ තෝ නොකිකරුවූයේ දැන්මතු නොවෙයි, පෙරත් නොකිකරුය. ඒ තාගේ නොකිකරුකම නිසා නුවණැත්තන් කීවා නොකිරීමෙන් නොකිකරුව වෙරම්බ වාතයට වැද ඛණ්ඩ ඛණ්ඩව විසිර ගියේ වේදැ"යි වදාරා "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දහවා වදාළ සේක.

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ කිජුලිහිණී යෝනියෙහි

අපරණ්ණ[1] නම් ගිජුලිහිණිව බොහෝ ගිජුලිහිණියන්ට රජව උපන්නාහ. ඒ බොධිසත්ත්වයන්ගේ මිගලෝප නම් පුත්වූ ගිජුලිහිණි පැටවෙක් ඇත. ඔහු තොකිකරු හෙයින් බොධිසත්ත්වයෝ අවවාද කියන්නාහු -

"මිගාලෝප නම්වූ ගිජිඹුපොතකය, තෙ, තාගේ; යාදිසීගති, යම්බඳුවූ ආකාශ ගමනෙක් ඇද්ද?; තං, ඒ ගතිය; මෙ, මට; නරුචිවං, නුරුස්නේය; තාත, පුත; අතුච්චංපතසි, ඉතා උස්වූ ආකාශයට පැනයෙහි; අහුම්ං, පක්ෂීන්ට විෂයයි කරින්නාවූ අහුමිය; තාත, පුත; සෙවෙස, සෙවිනේයි; තෙ, තව; පඨවිං පෘථිවිය; තාත, පුත; චතුක්කණ්ණකෙදුරං, සිවුරුස් කොනක පරිද්දෙන්; යදා; යම්කලෙක්හි; පස්සසි, දක්නෙහි; තාත, පුත; (තෝ එයින්) නිවත්තස්සු, වළකුව; ඉතො, මෙයින්; පරං, මත්තොහි; මාගමා, නොයව; අඤ්ඤදපි, අනිකුත්; පත්ත යානා, පත්‍රයානකොට ඇති; විහංගමා, පක්ෂීහු, වාතවෙගෙන, වාත වේගයෙන්; අකඛිත්තා, විසුරුවා දමන ලද්දාහු; සස්සති, සම්භූමිය හා සමානවූ ආත්ම තකීන යන් ඇත්තාහු; නටයා, විනාශයට පැමිණියාහ."

අපි ජනකවූ වැඩිමහළු පියාගේ අවවාද නොකොට කෘෂ්ණවෘතය ඉක්ම වේර්ම්බ වාතයාගේ වසඟයට පැමිණියෝයි. මිගාලෝප නම් පක්ෂීහු අවවාදක්ෂම නොවන කල්හි ඔහුගේ පුත්‍රයෝද දරුවෝද අනුව පවත්නාවූ යම් ගිජිඹු කෙණෙක් ඇද්ද?" ඔහු සිතල්ලෝම ව්‍යසනයට පැමිණියෝ ය යි එපරිද්දෙන් යමෙක් වෘඩයන්ගේ වචනය නොගිවිසිද? අතික්‍රාන්තවූ අනුශාසනා ඇති සීමාති ක්‍රමණය කොට ඇසිරෙනවාද? මිගාලෝප නම් වූ ගිජිඹු පොතකයා පරිද්දෙන් වෘඩානුශාසනා නොකොට ව්‍යසනප්‍රාප්ත වන්නේ ය යි වදරා මේ මිගාලෝප ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි මිගාලෝප නම්වූ ගිජිඹු පෝතකව උපන්නෙම් බුදුවූ මම් ම වේදැ යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 370
## ශ්‍රී කාලකණ්ණි ජාතකය

තිවද ශාන්තවූ ගුණ ඇති සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනේපිඬු මහසිටාණන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

ඒ කෙසේද? යත්,

අනේපිඬු මහසිටාණන් හා උන්ගේ අඹුදරුවන් හා මහල් පවන් බැල මෙහෙ කොට සිටින්නන් පවත් එක්ව නිත්‍ය ශීල වශයෙන් පන්සිල් රැක පොහොය අවසිල් රක්නාහ. මේ කථාව දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩඋන් මාලුවරුන්වහන්සේ "අනේපිඬු මහසිටාණන් හා උන්ගේ පරිවාරයන් යහපත් නිසාය" යි කියා කථාකොට උන්කලට සම්බුදුරජාණන්වහන්සේ එකතට වැඩ "මහ ණෙනි, අනේපිඬු මහසිටාණන් තබා පෙර උත්තමයන්ගේ යහපත්වූ පරිවාර ඇත්තෝ වේදැ?" යි වදරා "ඒ කෙසේදැ?" යි ආරාධිත වූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේකි.

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ එනුවර සිටුව උපන්නාහ.

1. අපරාෂ්ඨා: සිංහ :

එසමයෙහි බොධිසත්ත්වයන් පටන් උන් අඹුදරුවන් හා වතුල්පටන් බැලමෙහෙකොට සිටින්නන් පවත් එකසේම නිත්‍ය ශීල විශයෙන් පන්සිල් හා පොහොය අටසිල් රකිනා හෙයින් උන්ගේ පරිවාර සුචි විසින් සුචිපරිවාර සිටානෝ ය යි කියා මේ නමින් ප්‍රසිඛව ඉන්නාහ.

එකියන සුචිපරිවාර සිටානෝ "මට වඩිනා කෙණෙකුන් ආ කල ඉන්ට උවමැනවැ"යි කියා අස්නක් පණවා තුබූහ.

එසමයෙහි ධෘතරාෂ්ට්‍ර නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූ වූ ශ්‍රීකාන්තාවද, විරූළ්හක නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූ වූ කාලකණ්ණි නම් දිව්‍යස්ත්‍රියක් ද, දෙදෙනාම අනොතත්තවිලව නාන්ට ගියහ. අනොතත්තවිල වනාහි සම්ඥ වරයන් නානා තොවද පසේබුදුවරයන් වහන්සේ නානා නොවද රහතුන් වහන්සේ නානා නොවද තාපසවරුන් නානා නොවවල්ද සදිව්‍යලෝකේ දෙවියන්ව වෙන වෙන නොවවල්ද දිව්‍යස්ත්‍රීන් නානා නොවවල්ද මේ නියාමයෙන් වෙන වෙනම නොවවල් ඇත්තේය.

මෙකියන්නාවූ ශ්‍රීකාන්තාව කාලකණ්ණිය යි යන දිව්‍යස්ත්‍රීන් දෙන්නත් දිව්‍යස්ත්‍රීන් නානා නොවට අවුත් දෙන්නම ' මම පළමුකොට බසිමි" මම පළමු කොට බසිමි"යි කියා ඛබරකොට ගත්හ. ඉන් කාලකණ්ණි දිව්‍යස්ත්‍රී කියන්නී "යම් මනුෂ්‍යකෙණෙකුකව මගේ ආඥාවය, එසේ නෙයින් මම පළමුකොට බසිමි" කිය. ශ්‍රීකාන්තාව යන දිව්‍යස්ත්‍රී කියන්නී "මම මනුෂ්‍යකෙණෙකුන්ට පැමිණෙන ඓශ්වර්‍යය මම පමුණුවන්නෙමි. එසේ නෙයින් පළමුකොට බසින්නෙමි මමය"යි කිව. දෙන්නම උනුන්ට කියා හිමිස්වාගත නොහී සතරවරන් දෙවියන් ලඟට ගොසින් "අපගෙන් උතුම් කවුරුදැ?"යි කියා විචාරා ගණුම්හ යි කියා සතරවරන් දෙවියන් ලඟට ගොස් එපවත් කිහ. ධෘතරාෂ්ට්‍ර විරූළ්හක දෙදෙන අපගේ දරුවන් නුගුණ නොකියම්හයි කිහ. විරූපක්ඛ වෛශ්‍රවණ දෙදෙන අප හා සරි දෙවියන්ගේ දරුවන්ගේ ගුණ නුගුණ නොකියම්හ යි කියා "අපගේ සවාමීන් කරා යව"යි කිහ.

එකියන දිව්‍යස්ත්‍රීන් දෙදෙනාත් ශක්‍රයන් ලඟට ගොස් එපවත් කිහ. ශක්‍රයෝ කියන්නාහු "දෙවියෝ දෙදෙන මාගේ කවයුත්තෙහි සිටිනා දෙවියෝය, උන් දෙන්නාගෙන් එක්කෙණෙක් වඩිති කීම නම් කවයුතු නොවෙයි, කියා කියන්නාහු සුචිපරිවාර සිටානන්ගේ නොයිදුල් අස්නෙක් ඇත, ඒ අස්න උන්ට කියා පළමුකොට අස්න ලත් කෙණෙක් උතුම්මැ"යි කිහ. "යහපතැ"යි කියා කාලකණ්ණි පළමුකොට නිල්පිළි ඇඳ නිල් ආභරණ ලා ගෙණ සිටානන්ගේ ගෙයි වැද සිටියහ. සිටානෝ ඇ දැක ප්‍රියව කියන්නාහු "නී වතාහි කළුපැයක් හා කලුආභරණ හා කලුපිළි ඇඳගෙණ අප්‍රියකරුව සිටිනීය, නී වතාහි කාගේ දරුකෙණෙක්දැ"යි විවාළාහ.

එවිට ඒ කාලකණ්ණි කියන්නී මම "විරූළ්හක නම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූ වූ කාලකණ්ණි නම් ඇති, කාලකණ්ණිය යි කියන්නේ මවය. එසේනෙසින් නුඹවහන්සේගේ නොයිදුල් අස්නේ රැයක් මා ලගින්ට අවකාස අලමැනවැ"යි කිව එකියන්නා එවිට සිටානෝ කියන්නේ "තොපගේ ගුණ කියව"යි කිහ. එවිට කාලකණ්ණි තමාගේ ගුණ කියන්නී "සිටානන් වහන්ස, යම්කෙණෙක් කෙලෙහිගුණ නොදනිද්ද? පවිටුවූ විසය ඇද්ද? කළගුණ නොපායිද්ද? මිත්‍ර

ද්‍රෝහී ද? ලාමකවූ වාසය ඇද්ද? කෘ කෙරේත් දයාවක් නැද්ද? කේලාම් කියන්ට දනිද්ද? තද මසුරුවූ බස් කියද්ද? නුවණතැතිව මෝහව දවසරිද්ද? අනුන්ගේ සම්පතෙහි ඊෂ්‍යාමාත්ශයෳ ලෝභී සිත් සිතද්ද? මෙසේවූවන්කෙරේ මැගේ වාසය''යි කීහ.

එවිට සිවාතෝ කියන්නාහු ''එසේවීතම් මෙතන තිබා මේ නුවරත් ඉන්ව බැරිය''යි කීහ. එවිට කාලකණ්ණීත් කියන්නී ''මා ඇලුම්කරණ මනුෂ්‍යයන්ගේ ගුණ නුඹවහන්සේට නැත. එසේ කෙයින් නුඹවහන්සේට මාගෙන් ප්‍රයෝජන කාරිය නැතැ''යි කියා කාලකණ්ණී අන්තර්ධාන වූවාන.

ඒ වේලෙහි ශ්‍රීකාන්තාව රන්වන් ආභරණ පැලඳ රන්වන් වස්ත්‍රයක් ඇඳ රන්වන්වූ ශරීරශොභාවෙන් එකාලොකකෙරෙමින් රන්පියුමට බඳුවූ පාදයුග්මයක් ඇතිව සිටාතන්ගේ දෙර සිටියාහ. සිටාතෝත් ශ්‍රීකාන්තාව දැක මෙසේ වූ ශ්‍රී සමෘඩ්ධයකින් සියලු දිග එකාලොකකෙරෙමින් ඇවිත් සිටියාවූ තොපි කාගේ දරුකෙණෙක්ද?''යි විචාළාහ.

එවිට දිව්‍ය ස්ත්‍රීකියන්නී ධෘතරාෂ්ට්‍ර තම් දිව්‍යරජ්ජුරුවන්ගේ දූවූ ශ්‍රීකාන්තා වය යි කියන්නේත් මවය, ලක්ෂ්මියයි කියන්නේත් මවය, පොළොව සමාන නුවණ ඇති හෙයින් භූරිපඤ්ඤය යි කියන්නේත් මවම ය, නුඹවහන්සේගේ ඥාන එක දවසකට මා ලගින්ව අවසර දුනමැතවැ''යි කීහ. එවිට සිවාතෝ කියන්නාහු ''තොපට ඥාන දෙන්ව තොපගේ ආචාර සීලයද තොප වසන වාසයද මට කිවමැනව. තොපගේ ශීලවූන සමාධිය කෘ කෙරෙහි පිහිටාද? ඒ මට නොදනෙයි, මට කිවමැතවැ''යි කීහ.

එබස් ඇසූ ශ්‍රීකාන්තාතොම ''එම්බා සිටාතෙනි, යම් සත්ත්වයෙක් තෙම ශීත පීඩාවද උෂ්ණ පීඩාවද අවු සුලඟින් වන ආයාසයද මැසි මදුරුවන් හා සර්පාදින්ගෙන් වන උපද්‍රවයද සාපිපාසාදීන් වන්නාවූ උපද්‍රවයද යන සියල්ල නෘණලවයක් කොටත් නොසිතා රෑ දුවල් සියලු කාරියෙහි නියුක්තව ඒ ඒ කාලයට පැමිණි කෘෂිවණික් ආදී කම්න්ත හා දුතශිලාදීවූ ඒ ඒ ක්‍රියාවන් තොනසාද? එබදුවූ සත්ත්වතෙම මට අතිශයින් ප්‍රියවන්නේ ඔහු කෙරෙහිම ඇලී වාසයකෙරේම්''යි තවද සිවාතෙනි, යම් සත්ත්වයෙක් ක්‍රෝධ නොවේද? බොහෝ මිත්‍රයන් ඇත්තේද? තෘෂාගිද? සීලාචාරයෙන් යුක්තද? සර්ව ප්‍රවෘත්තියක් නැතිව සෘජුවූ කායවාක් සුචරිත සමාචාර ඇත්තේද? සංග්‍රහසීලීද? ප්‍රියවූ මටසිලුවුවූ වචනයන් ඇත්තේද? මහන්තත්ත්වයට පැමිණියෙන් සියල්ලවුන්ව යටත්ව පවතීද? සමුද්‍රය බලන්නාවූ සත්ත්වයන්ට යම්සේ රලපතර බොහෝව පෙණේද? එපරිද්දෙන් යථොක්තවූ ගුණ ඇති පුරුෂයා කෙරෙහිම වාසය කෙරෙම්''යි 'තවද යම්සත්ත්වයෙක් මිත්‍රයන් කෙරෙහිද ජාතිගෝත්‍රාදි ශ්‍රේෂ්ඨයන් කෙරෙහිද සදෘශවූවන් කෙරෙහිද වැඩෙහි හැසිරෙන්නාවුන් කෙරෙහිද අවැඩෙහි නොහැසිරෙන්නවුන් කෙරෙහිද සම්මුඛ පරාංමුඛ දෙක්හි සංග්‍රහකිරීමම සොභාකොට ඇත්තේද? කිසිකලෙකත් පරුෂවචනයන් නොකියාද? එබඳු ගුණ ඇති සත්ත්ව තෙම මළේ නමුත් ජීවත්ව ඉදිනා නමුත් මම ඔහු අයිතියෙමි. යම් නුවණමද සත්ත්වයෙක් මෙබඳු ගුණයන් අතුරෙන් එක්තරා ගුණයක් ලැබ ශ්‍රී මට වසඟවයි සිතා ප්‍රමාද වශයෙන් පැමිණියාවූ ගුණය නසාද? එබිඳු පුද්ගලයා වැසිකිළියක් මෙන් දුරින් දුරුකෙරෙමි. සත්ත්වතෙමේම තමාගේ යහපත් ගුණයෙන් ශ්‍රියා

තමාට පමුණුවාගන්නේය. තමාගේ නුගුණයෙන්ම කාලකණ්ණියත් පමුණුවා ගන්නේය. එසේහෙයින් ශ්‍රීකාන්තාවය කාලකණ්ණිය යන දෙක එක්කෙණෙක් එක්කෙණෙකුන්ට පමුණුවතකෙණෙක් නැත, තමන් තමන්ගේ ගුණ නුගුණ වශයෙන් තම තමන්කරා පමුණුවා ගන්නාහ''යි මෙසේ ශ්‍රීකාන්තා තමාගේ ගුණ කීම් වශයෙන් සිවානන්ට ධර්මදේශනා කළාය.

මෙසේ මහබෝසතානෝ ශ්‍රීකාන්තාවගේ බසට පැහැද මේ කිසිකෙණෙකුන්ගේ ප්‍රයෝජන විදීමෙන් ඉදුල්නොවූ ආසනය හා යාන තොපට සුදුසු ය යි අභිප්‍රාය සැවියේ සැතපෙව''යි කීය. ශ්‍රීකාන්තාවත් සිවානන්ගේ ගෙයි එදවස් රැ වැස අළුයම් වේලෙහි නික්ම තව්තිසා දිව්‍යලෝකයට ගොස් අනොතත්තවිල පළමුව ජලස්නානය කළාහ. එතැන්පටන් ලෝකයෙහි ශ්‍රීයාවත් ව්‍යවහාර පළවූයේය.

බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව වදාරා **ශ්‍රී කාලකණ්ණි ජාතකය** නිමවා වදාළසේක.

එසමයෙහි ශ්‍රී කාන්තාව නම් දැන් මේ උත්පලවණී මහාසථවිරිය, එසමයෙහි සුවිපරිවාර සිවානෝ නම් ලොවිතුරා බුදුවූ මම්ම ය යි වදාළසේක.

---

## 371
## බිළාල ජාතකය

**නි**වද අනන්තවූ කරුණා ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේත වනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් ස්ත්‍රියක් නිසා උකටලීවූ භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

ස්ත්‍රියක් නිසා උකටලී වූ භික්ෂුකෙණෙකුන් වහන්සේ ගෙණ ගොසින් සම්ඥයන් වහන්සේට දක්වන්නා ''සැබෑද මහණ, තා ස්ත්‍රියක් නිසා උකටලී වූයේදැ?''යි විමාළ කල්හි ''සැබෑව සාමීන්වහන්ස, මා ස්ත්‍රියක් නිසා උකටලී වූයේ ය''යි කීහ. සම්ඥයන්වහන්සේ ''එම්බල මහණ, ස්ත්‍රියක් නිසා උකටලීවීම දෝෂය, ස්ත්‍රී බොහෝ මායමින් පුරුෂයන් ලබාගෙණ දුක් පමුණුවන්නාහ. යම්සේ බළලකු කුකුළා ලබාගන්ට කළ උත්සාහය මෙතැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිත වූ සම්ඥයන්වහන්සේ ඉකුන්වත් දක්වා වදාළසේක.

**අ**ටඟිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ වනාන්තරයෙහි බොහෝ කුකුළන් පිරිවරා වාසය කරන්නාහ.

එසමයෙහි එතනට නුදුරුවූ සථානයක බැළලක් වාසය කරන්නීය. ඕතොමෝ බෝධිසත්ත්වයන්ගේ බොහෝ කුකුළන් දවස්පතා කා බොධිසත්ත්වයනුත් අල්වාගන්ට බොහෝ උත්සාහ කරන්නී මෙසේ සිතුවාය. මෙකියන කුකුළා මා විසින් කන්ට අල්වා ගත නොහැක්ක, කුකුළාට භාග්‍යවාම ඉදිනා නියාසෙන් සලස්වා ගෙනාත් කෑ ඇකෑ යි සිතා කුකුළන් වාසය කරන්නා වූ ගස සමීපයට ගොස් කියන්නී ''ඝන පියාපත් ඇති, රත්වූ කරමලක් ඇති,

ආකාශයෙන් ගමන් යන්නාවූ පක්ෂිරාජයාතෙනි, මම තොපට බිරින්දව වාසය කෙරෙමි" කීව. කුකුළාතෝ "මැ කියන්නේ වඤ්චාවෙකැ"යි සිතා කියන්නාහු 'තොපි සිවුපාවෝය. අපි පක්ෂිය, එසේ හෙයින් අපගේ වංශයෙන්ම අපව බිරින්ද වෙතොත් විනා තොපගෙන් අපට බිරින්දව ඉන්ට කාරණා නොවෙයි" බොධිසත්ත්වයෝ කීහ.

එවිට බැළල කියන්නී "එසේ නොකිය මැනව, මම නුඹවහන්සේට මිදී මෙහෙවර කෙරෙමි. එසේ නොඅදහන සේක්වී නම් මේ බරණැස් නුවරවාසීන් දන්නා නියායෙන් නුඹවහන්සේට මිදී මෙහෙවර කරණ නියාව කියා සලස්වා ගත මැනවැ'යි කීව. බොධිසත්ත්වයෝ කියන්නාහු "තී වීසින් මාගේ බොහෝ කුකුළනුත් කා මාත් කන්ට කරණ උත්සාහ විනා මට මිදී මෙහෙවර කෙරෙමියි සිතන උත්සාහයෙක් නොවෙයි, අප පක්ෂීන් හෙයින් අපගෙන් පක්ෂියකත් තොප සිවුපාවන් හෙයින් තොපගෙන් සිවුපාවෙකු විනා කාරණා නොවෙයි" බොධිසත්ත්වයෝ කීහ.

සර්ඳුයන් වහන්සේ "එම්බල මහණ, ඒ කුකුළා ඒ බැළල කෙරෙහි ආස වෙන් ඇ හා එක්වීනම් ජීවිතක්ෂය වන්නේය. එමෙන් යම් සත්ත්ව කෙණෙක් ස්ත්‍රී වසඟවූ නම් ජීවිතක්ෂයට පමුණුවන්නාහ. ස්ත්‍රී වසඟ නොවූ නම් බැළල ගෙණ කුකුළා ගැළවුනා මෙනැ"යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ බිළාල ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන්වූසේක.

එසමයෙහි කුකුළුව උපන්නෙමි බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 372 ධම්ධවජ ජාතකය

මේ වදාළ සියලු සත්කාරයට භාජනවූ සර්ඳුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

එක් වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂුකෙණෙකුන් වහන්සේ සර්ඳුයන් වහන්සේට දැක්වූසේක. සර්ඳුයන් වහන්සේ දැන් මතු නොවෙයි, පෙරත් මේ මහණ වඤ්චාප්‍රයෝගයෙන් දවස් ඇරියේ වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සර්ඳුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ මුදු මඩ්‍යයේ එක් දිවයිනක පක්ෂි කුලයක ඉපිද බොහෝ පක්ෂීන් පිරිවරා වාසය කරණ සේක.

එසමයෙහි වෙළඳු පන්සියයක් නැව් නැගී ගියාහ. එක් කපුටුවෙක් ඒ වයිනව් ගොස් ඒ පක්ෂීන්ගේ බිජුවට කන්ට සිතා අවසරයක් නොලැබ "උප

යෙක් කෙරෙමි' සිතා එක් පයක් උඩ ඔසවා එක් පයකින් සිට උඩ බලා කට දල්වාගෙණ සිටියේය. පක්ෂි එතතට අවුත් "මේ කිමෙක්ද? නොපි කරන්නේ ය"යි විචාළාහ.

කපුටු කියන්නේ "මාගේ ගුණානුභාවයෙන් පොළොව මා ධරාගත නොවෙයි. එසේ වෙයින් එක පයකින් සිට වායු අනුභව කෙරෙමි"යි කීය.

එවිට පක්ෂීනු මේ පක්ෂියාගේ තපසක් යහපත් නියාය"යි සමාධිව ගොදුරු කන්ට යන්නාහු ඒ කපුටුවා තමන්ගේ බිජුවට පාවාදී යන්නාහ. කපුටුවා පක්ෂීන් පලායන්නා බඩ ගන්නා වීවර බිජුවට තලා කා සිටින්නේය. මේ නියායෙන් කල්යාමෙන් බිජුවට අඩුවේගණ යන්නා, මේ කපුටුවා යහපත් ගුණ ඇත්තේය. මොහු විසින් වන භයෙක් අනෝයි සැ කවුවාහු බොධිසත්ත්වයන් වහන්සේ "මේ කා විසිනුත් වන භයෙක්නෝ වෙයි. මේ කපුටුවා විසින් මේ භය උපදනේය"යි එක් දවසක් පක්ෂීන් ගොදුරු කන්ට යාදී සැඟවී උන්නාහ.

කපුටුවාත් පක්ෂි පලායන්නාම බිජුවට කන්ටවන. බොධිසත්ත්වයෝත් බලා සැඟවී ඉඳ පක්ෂීන් එන්නා මෙපවත් කිහ. පක්ෂි එක්ව කපුටුවා වෙතකු ඇත මැරුහ. එවිට බොධිසත්ත්වයෝත් "එම්බා වඤ්චාප්‍රයෝග දන්නාවුන්ගේ ගුණ නුගුණ පරීක්ෂා කොට විනා විශ්වාස නොකොට යුත්තේය. ධර්මධර සෙමි, පක්ෂිව ඉපිදත් මෙසේවූ දෙයක් කලෝවේද?"යි ධර්මදේශනා කොට ධර්මධ්වජ ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි ඒ කපුටුවා නම් වඤ්චාප්‍රයෝග දන්නා භික්ෂුහුය. පක්ෂීන්ට රජව උපන්නෙම් බුදුවූ මම්ම වේදැ යි වදාළසේක.

---

## 373 නන්දියමිගජාතකය

තිවද පරවාද මර්දන කළාවූ සර්ව්ඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වනලද.

**ඒ කෙසේද? යත්**

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ දෙමව්පියන්ට සිඟාලද්දවූ ආහාරයන්දී සමහර දවස් සුන්බත්ව ඉඳිනාසේක. සැදැහැත්තන් දුන් කඩපොල්ලත් දී මෙසේ නිරන්තරයෙන් දුක්ගෙණ දෙමවුපියන් රකිනාසේක.

භික්ෂූන් වහන්සේ "මේ මහණ සැදැ ඇත්තන්ගෙන් දුන් ආහාරයද වස්ත්‍රද ගිහින්ට දී ගිහින් පරිහරණය කරන්නේය"යි සර්ව්ඥයන් වහන්සේට පැසේක.

සර්ව්ඥයන් වහන්සේ "සැබෑද මහණ නා ගිහින් පරිහරණය කරන්නේ ය"යි විචාරා වදාළසේක.

"සැබෑව, සවාමීනි, මාගේ දෙමවුපියන් දෙදෙනා පරිහරණය කරන්නේ ය"යි කීසේක.

සම්බුදුරජාණන් වහන්සේ ''මේ භික්ෂූහු තබා පෙර උත්තමයෝ දෙමවුපියන් පරිහරණය කළාහුය'යි වදාරා ''ඒ කෙසේද?''යි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පසුගිය දවස සාකේත නම් නුවර කොසොල් රජ්ජුරුවන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්ත්වයෝ මුවව ඉපද වාසය කරන්නාහ. ඒ මුව රජ්ජුරුවන්ට නම් තබන්නාහු ''නන්දිය මුව රජ්ජුරුවෝය'යි නම් තුබ්බහ.

එසමයෙහි කෝසල රජ්ජුරුවෝ මුව මාංශයෙහි ඉතා ගිජුව ඇම දවස් මුව දඩෙහි ලොල්ව ඇවිදිනාහ.

මනුෂ්‍යයෝ ගොවිතැන් බත් කරන්ට අවසරයක් නොලබම්හ යි මුව රැළක් ගෙණවිත් උයනේ වූමෝ නම් ගොවිතැන් බත් කරන්ට අවසර ලබන්නමෝ වේදැ යි කියා එක් බැද්දක් වටලා දණ්ඩෙ පත්තේ ගසා මුවන් රැළක් එක්කොට ගෙණ ගොස් බණින්නාහු නන්දිය නම් මුව රජ්ජුරුවෝත් මුවරැළ එක්ව දෙමවුපියන් දෙදෙනා මේ බැද්දේ සඟවා මුවරැළ හා කැටිවම සාකේත නුවරව ගියේය.

මුවරැළ ගෙණ ගොස් අංජනනම් වනයෙහි ලා වට රැකවල් ලවා කෝසල රජ්ජුරුවන්ව ගොස් කියන්නාහු ''දේවයන්වහන්ස, මුවරැළක් ගෙණවිත් අංජන නම් වනයෙහි ලා වට රැකවල් ලා ආම්හ. නුඹවහන්සේට අභිප්‍රායක් කළ මැනවැ'යි රජ්ජුරුවන්ට වැඳ සමුගෙණ තම තමන්ගේ ගම්වලට ගියාහ,

රජ්ජුරුවෝත් එතැන් පටන් දවස මුවකු බැගින් මිනිසුන් යවා මරවා ගෙන්වා අනුභව කරන්නාහ.

එසමයෙහි බ්‍රාහ්මණයෙක් සාකේත නුවරට එන්නේය. බෝධිසත්ත්ව යන්ගේ දෙමවුපියෝත් තමන් සැඟවී උන් වලින් එලිබැස මග අස සිටියාහු බමුණා දැක ''කොයි යන්නේ දැ?''යි විචාරා ''සාකේත නුවරට යෙමි''යි කීකල්හි ''එසේවී නම් අපගේ දරුවාන කෙණෙක් සාකේත නුවර වසන්නාහ. යම් උත් සාහයෙක සැඟවී අප ඇස පෙණෙන්ට කියව''යි කියා ඒ නන්දිය නම් මුව රජ්ජුරුවන්ට කියව යි කියා යවූහ.

ඒ බ්‍රාහ්මණයාත් අංජන නම් වනයට අවුත් මුවන් දැක ''දෙමවුපියන් රකින්නාවූ නන්දිය නම්වූ මුව රජ්ජුරුවෝ නම් කවුරුදැ?''යි විචාළාහ. ''මම''යි කී කල්හි මුව රජ්ජුරුවන්ගේ දෙමවුපියන්ගේ කියා යවූ සරූප කිහ.

මුව රජ්ජුරුවෝත් අසා රජ්ජුරුවන් වහන්සේගේ වතයේ තණ පැන් කා රජ්ජුරුවන් වහන්සේට නො කියාම යාම කටයුතු නොවෙයි. යම් දවසක රජ්ජුරුවන්වහන්සේ මුවන් මරන්ට ආසේක් නම් උන්වහන්සේගේ ඊශ්වරීපථ යට සිට මාගේ ජීවිත දානයත් ඉල්වාගෙණ මුවන්ට ජීවිත දානයත් ඉල්වා ඇර ගෙණ යෙමි, බමුණා අස්වසා යවා සිටියේය.

නොබෝ දවසකින් රජ්ජුරුවෝත් මුවදඩයමට අවුත් මුවන් දැක දුටුවිට හිය ලා සිටියාහ. මුවෝ මරණ භයින් තැතිගෙණ දිවගත්හ. බෝධිසත්ත්වයෝ රජ්ජුරුවන්ගේ හී පස්සට හමුව ගොස් සිටියාහ. රජ්ජුරුවෝ බෝධිසත්ත්ව යන් දැක අතර්ඝවූ රූපය බලා විදගත නොහී සිටියාහ.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු ''මහරජ, ඇයි මා තොවිද සිටිනේ මා තෙල සැරයෙන් විදපියව. මම තොප කෙරේ කණස්සල්ලක් නැත්තෙමි. මෛත්‍රී කෙරෙමි, මා විදපියව''යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු ''මම විදින්ට සිතින් තමුත් මා අතින් සැරය නොහැරෙන්නේමය. මාගේ සැරය තොපගේ ගුණ දත, මම තොපගේ ගුණ නොදන්නෙමි'' කීහ.

එවිට බොධිසත්ත්වයෝ 'එසේවිතමි මා අභයදානය දෙව''යි කියා අභය දානය ඉල්වාගෙණ තමන්වහන්සේගේ මුවන්ටත් ජීවිත දානය ඇරගෙණ සෙසු සිවුපාවුන්ටත් අභය දානය ඉල්වාගෙණ පක්ෂීන්ටත් අභය ඉල්වාගෙණ දියෙහි වසන්නාවූ සියලු මත්‍යයන්ටත් අභයදානය ඉල්වාගෙණ රජ්ජුරුවන්ට අවවාද කොට රජ්ජුරුවන්ට බණ කියන්නාහු දන්දීමය, සිල්රැකීම කිරීමය, වස්තු පරිත්‍යාග කිරීමය, ඍජුව අවංකවීමය, මෘදුවීමය, ක්‍රොධ නොකිරීමය, හිංසාපීඩා නොකිරීමය, ක්ෂාන්තියයි යන ඉවසීමය, රාජධර්මයට විරුද්ධව නොකිරීමය, දස රාජධර්මයට අකොප්‍යව රාජ්‍යය කරව'යි රජ්ජුරුවන්ට අවවාද කියා රජ්ජුරුවන්ගේ වතයෙහි කිපදවසක් රඳා තමන්ගේ දෙමවුපියන් වසන්නාවූ වතයට ගියාහුය. වදුරා ''එම්බා මහණෙනි, ඒ නන්දිය මුව රජ්ජුරුවෝ තම් තමන් දෙමවුපියන් රක්නාවූ කුසලානුභාවයෙන් තුමූත් අභයදානය ලැබ මුවන් ඇතුළු බොහෝ ප්‍රාණීන් මරණින් ගළවා රජ්ජුරුවනුත් ධර්මයෙහි යෙදුවෝවේද'යි වදුරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට නන්දියමෘග ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍ය දෙශනාවගේ කෙළවර මාතුපොසක භික්ෂූන්වහන්සේ සෝවාන්වූ සේක.

එසමයෙහි බ්‍රාහ්මණයා තම් ශාරීපුත්‍රස්ථවිරය, කෝසල රජ්ජුරුවෝ තම් ආනන්දස්ථවිරය, නන්දිය මුව රජ්ජුරුවන්ගේ පියාතෝ නම් සුද්ධොදන මහ රජ්ජුරුවෝය, මැනියෝ තම් මහමායා දේවිය, බොහෝ ප්‍රාණීන්ට අභය ඇර දුන්නාවූ නන්දිය මුව රජ්ජුරුවෝ නම් ලොවුතුරා බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 374
## කරපත්ත ජාතකය

තිවද සාගරයක්සේ ගැඹුරුවූ ගුණ ඇති ත්‍රෛලෝක්‍ය තිලකවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ස්ත්‍රියක් නිසා උකටළීවූ භික්ෂු කෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

එක් ස්ත්‍රියක් කෙරේ උකටළීවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ සර්වඥයන් වහන්සේව දැක්වූසේක. සර්වඥයන්වහන්සේ වදාරණසේක් ''දැන්මතු නොවෙයි, පෙරත් තෝ ස්ත්‍රියක් නිසා ජීවිත විනාශයට පැමිණ උත්තමයන් කී කාරණය හිවිස ප්‍රාණය ලද්දේ වේදැ''යි වදාරා 'ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ දෙදෙව්ලොව දෙවියන්ට නායකවූ ශක්‍රදෙවේන්ද්‍රව උපන්සේක.

එසමයෙහි දිව්‍ය නාගරාජයෙක් ගොදුරු කන්ටය යි රජ්ජුරුවන්ගේ උයනේ ඇවිදින්නේය. ඒ නාගරාජයා කුඩා කොල්ලෝ දැක වවකොට ගෙණ කැවමුගුරු ආදියෙන් තලන්ට වත්තාහ. රජ්ජුරුවෝත් ඒ වේලාවට උයනට ආවාහු "මේ කිමෙක්දැ?"යි විචාරා එපවත් අසා "තයා නොමරව"යි මැරිය නොදී ගළවාපීය.

නාගරාජයාත් තමාගේ නාගභවනයට ගොස් රජ්ජුරුවන් නිසා මාගේ ජීවිතය රැකුනේ ය යි සතුටුව එදා රෑ බොහෝ සම්පතුත් ඇරගෙණ නාග මාණවිකාවත් කැඳවාගෙණ අවුත් රජ්ජුරුවන් දැක "රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ නිසා මාගේ ප්‍රාණය රැකුනේය. මෙවක් පටන් නුඹවහන්සේත් මෑත් මිත්‍රව වාසයකරන්ට උවමැනවැ"යි මිත්‍රකමෙහි පිහිටා නුඹවහන්සේව ආරක්ෂාවට සිටින්ට ය යි නාගමාණවිකාවත් පාවාදී "මෝ ඉදින් නුඹවහන්සේව නොපෙණී ගිය තමුත් ගිය ස්ථානය පිණිස කියාගත මැනවැ"යි දිව්‍ය මන්ත්‍රය කුත් උගන්වා නාරජ තමාගේ නාගභවනයට ගියේය.

රජ්ජුරුවෝත් එක්දවසක් නාගමාණවිකාවත් හා අන්තඃපුරයත් ඇර ගෙණ මිගුල් උයනට දිය කෙළින්ට ගියහ. නාගමාණවිකාවත් දියබරණකු දැක ඔහු හා කැටුව සංවාසයෙහි යෙදෙන අභිප්‍රාය ඇතිව වේශය හැර නාගවේශය මවා දියබරියා හා කැටිව ලොකස්වාද රතියෙහි යෙදුනාය.

රජ්ජුරුවෝත් නාගමාණවිකාව නොදැක "කොයි කියා දෝ හෝ"යි පරීක්ෂාකොට දියබරියා හා සමග ලොකස්වාදරතියේ යෙදෙන නියාව දැක "මෙයින් මතු මෙසේවූ නොකටයුත්තක් නොකරව"යි උණපත්තෙන් පාර කිපයක් ගැසූහ. නාගමාණවිකාව කිපී තමාගේ නාගභවනයටම ගියාහ. නා රජ්ජුරුවෝත් "ඇයි නි ආයේ කුමක් නිසාදැ?"යි විචාළේය.

නාගමාණවිකා කියන්නී "නුඹවහන්සේ මා රජ්ජුරුවන්ට ආරක්ෂාවට සිටුවාලා ආ පමණක් විතා රජ්ජුරුවෝ තමන් හා ලොකස්වාදරතියෙහි යෙදෙන ලෙස අත ඇල්ලූහ. මම ඊට මැලිවීම්, ඊට මා පිට පාර කිපයක් ගැසූහ. එසේ හෙයින් මම ආමි" කිව.

නාරජ්ජුරුවෝත් "මෑ කියන්නේ ඇත්තමය"යි කිපී නාගමාණවකයන් සතරදෙනකු කැඳවා "තොපි සතරදෙනා ගොස් තොප ගේ නාසයෙහි විෂ ධූමයෙන් දවා හස්මකරව"යි කියා යැවීය.

ඒ නාගමාණවකයෝ සතරදෙනත් "යහපතැ"යි කියා ගොස් රජ්ජුරු වන්ගේ රජගෙට වන්හ. රජ්ජුරුවෝත් ඒ වේලාවට පිබිද අගමෙහෙසුන් බිසවුන් හා කථා කරන්නාහු "සොඳුර, නාගමාණවිකාව මගුල් පොකුණේදී දියබරණ හා සමග ලොකස්වාදරතියේ යෙදෙන්නා දැක උණපත්තෙන් පාර කිපයක් ගැසීම්, නාලොවට පලාගියහ. ඔබ ගොස් නාරජ්ජුරුවන්ට බොහෝ නුගුණ කියා මාගේ මිත්‍රධර්මය බිඳුවන්නීය. කුමක්වනු බවත් නොදනිමි, බොහෝ විෂෝප ය"යි බිසවුන්වකීහ. නාගමාණවකයෝත් බිසවුන් හැ කරණ කථාව අසා "නිරපරාධවූ රජ්ජුරුවන් නසන්ට කාරණානොවෙයි" කියා නාගභවනයට ගොස් නාරජ්ජුරුවන්ට එපවත් කීහ.

නාරජ්ජුරුවෝත් එපවත් අසා "නිරපරාධවූ රජ්ජුරුවන්වහන්සේව මා කළේ අපරාධ ය යි රජ්ජුරුවන්වහන්සේ කරා ගොස් කළාවූ අපරාධය ක්ෂමා

කරවාගන්ට උවමැනවැ''යි රජ්ජුරුවන් කරා ගොස් ''මා විසින් අපරිශේෂිතව නුඹවහන්සේට අපරාධයක් කරණලදැ, ඒ මා කළාවූ අපරාධයට අපාද ච්පාද චතුෂ්පාදදීන් හා කිනිඹු කුනුඹු මැසි ආදීවූ සියල්ලන් කී යම් වචනයක් ඇත්තම් ඒ සියල්ලන්ම දැනෙයි. එසේවූ මන්ත්‍රයෙක මා තොපට උගන්වන්නේ මේ මන්ත්‍රය කිසිකෙණෙකුන්ට නූගන්වව, යම් කෙණෙකුන් ඉගැන්වූ නම් තොපි ගිනිවැද යව''යි රජ්ජුරුවන්ට මන්ත්‍රය උගන්වා තාරජ්ජුරුවෝ තමන්ගේ තාගහවනයට ගියාහ.

එක්දවසක් රජ්ජුරුවෝ රන්මණ්ඩයේ මී හා කැවුම් මේ නිමවත කල්හි මී බින්දුවකුත් කැවුම්පොඩියකුත් බිම වැටුන, කුඹුවෙක් ඒ දැක තමාගේ සෙසු කුඹුවන්ට කියන්නේ ''රජගෙයි මී කළ කීපයක් හා කැවුම් සෑල කීපයක් බිඳී ගියේය. තොපි වහා එක්ව''යි කුඹුවන් එක්කොට ඇවිදිනේය.

රජ්ජුරුවෝත් කුඹුවන් කරන්නාවූ ක්‍රියාව දැක සිතා පහළ කළහ. බිසව රජ්ජුරුවන් වහන්සේ සිතා පහළ කරන්ට කාරණා කිම්දැ?යි කීයා සැකවූහ.

එක්දවසක් රජ්ජුරුවෝ ඉස් සෝධා නහා උන්නාහ. මැස්සන් තමාගේ මැස්සකුව කියන්නී ''තොප හා මා හා ලොකසාදරතියෙහි යෙදුන මැනවැ''යි කීහ. මැසි කියන්නේ ''රජ්ජුරුවන්වහන්සේ ඉස් සෝධා නහා සුවඳ විලවුන් ගන්නාසේක. ඉන් බිමහුනු දෙයක ඇවිත් දැවටී රජ්ජුරුවන්වහන්සේගේ පිට මඛ්‍යයේ ලොකසාදරතියෙහි යෙදෙම්හ''යි කීහ.

රජ්ජුරුවෝත් ඒ මැසි කී කථාව අසා සිතා පහළ කළහ. බිසව් ඒ දැක සැකවූහ.

එක්දවසක් රජ්ජුරුවෝ මේ නිමවන්නට උන්නාහ. බිසවු රජ්ජුරුවන්ට බත් වැඩුහ. ඒ රන්තලියේ බතින් බත් උලක් බිම වැටිත, කුඹුවෙක් ඒ බත් උල දැක ''රජ්ජුරුවන්ගේ රජගෙයි බස්සැල කීපයක් බිඳී ගියේය. බත් කන්ට එව''යි කීය. රජ්ජුරුවෝ එකියත බසටත් සිතාසුනාහ, බිසවු එවිටත් සැකව රජ්ජුරුවන් හා එක්ව යානේ පුරුදුව සැතපුනාහ. රජ්ජුරුවන්ගේ අතින් විචාරන්නාහු ''සාමිනි, නුඹවහන්සේ සිතාසෙන්ට කාරණා කිම්දැ?''යි විචාළාහ

රජ්ජුරුවෝ කියන්නාහු ''එම්බා සොඳුර, මම දිව්‍ය මන්ත්‍රයක් දනිමි, එසේනෙයින් කුඹුවන් මැස්සන් කී බසට සිතාසෙමි, අනිකකාට සිතාසුනුයෙමි නොවෙමි'' කීහ. එවිට බිසවු ''ඒ මන්ත්‍රය මා උගන්ට උවමැනවැ''යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු ''තොප මන්ත්‍රය ඉගැන්වූවොත් මා ගිනිවදින්ට උවමැනවැ''යි කීහ. බිසවු කියන්නාහු ''නුඹවහන්සේ ගිනිවැදවත් මට මන්ත්‍රය උවමැනවැ''යි කීහ.

රජ්ජුරුවෝත් ''යහපතැ''යි රථයකට පැනනැඟී බිසවුන් රථයකට නන්වා සේනාව පිරිවරා උසතට නික්මුණාහ.

ශක්‍රයෝ මෙපවත් දැන තමන්ගේ සුජාතා නම් අසුර කන්‍යාව ඇරගෙණ සුජාතාවත් එළුවෙසක් මවා රජ්ජුරුවන් එන ඉදිරියෙහි සිට එළුදෙන හිටට කැගෙන ආකාර දක්වීය. රථය අදිනා අස්සු කියන්නාහු ''එළුවන් ආදී මැලජ්ජා නැතැ''යි අසා දතුම්හ. දැන් නියමයෙන් ඇසදුවුම්හ. ලොකසාදරතිය තම් රහසිගතව කළමනා දෙයය, මෙතෙක්දෙනා මැද එය ලජ්ජා නැතිව කරනට කාරණා කිම්දැ?''යි කීහ.

එවිට එළුවා කියන්නේ ''තොප අලජ්ජාව මට ලජ්ජා නැතැ යි කියවිද? රජ්ජුරුවන්ට අසුව බන්ධනාදියට පැමිණි සිටියට ලජ්ජා නැත්තාවූයේ තම් රජ්ජුරුවන් රථයේ ඉඳුවා ගෙණ අදුව, එසේවූ තොපට කවර ලජ්ජාවෙක් ඇද්ද?''යි කීහ.

එවිට අස්සු කියන්නාහු ''අප වන්නා බන්ධනාදියට පැමිණි හෙයින් ලජ්ජා නැත්තමිහ. අපගේ රජ්ජුරුවන්වහන්සේට ලජ්ජා නැතැයි කියන්ට කාරණා කිම්ද?''යි විවාළාහ.

එවිට එළුවා කියන්නේ ''ස්ත්‍රියක් නිසා ප්‍රාණය නසා ගිනිවදින්ට යන්නාවූ රජ්ජුරුවන්ට ලජ්ජා නැතැයි නොකියා ලජ්ජා ඇතැ''යි කීය. එවිට රජ්ජුරුවෝ එළුවාට කියන්නාහු ''එසේකල එළුවානෙනි, ඊටකළමනා කිම්ද?''යි කීහ. එවිට එළුවා කියන්නේ 'එම්බා රජ්ජුරුවෙනි, තමාගේ ප්‍රාණය ඇත්නම් සියලු වස්තූත් ඇත, බිසෝවරුත් ඇත, එක බිසෝකෙණෙකුත් නැතුවාට සෙසු බිසෝවරුන් නැද්ද? තොපි බිසවුන්ට මන්ත්‍රය නොදෙව''යි කීය.

එවිට රජ්ජුරුවෝ විචාරන්නාහු ''එම්බා එළුවානෙනි, තොපගේ සැටිය එළුවන්ගේ සැටියක් නොවෙයි, තොපි කවුරුන්ද?''යි විචාළාහ. එවිව ශක්‍රයෝ කියන්නාහු ''එම්බා රජ්ජුරුවෙනි, තොපට වන්නාවූ මරණභයෙක් දැක භය සංසිඳුවන්නට ආවූ ශක්‍රදෙවෙන්ද්‍රයෙමි'' කීහ.

එවිව රජ්ජුරුවෝ කියන්නාහු ''ශක්‍රයෙනි, මම බිසවුන්ට මන්ත්‍රය දෙමි කියා කිම්, මන්ත්‍රය නුදුන් කල මව විරුඬ වෙයි'' කීහ.

එවිට ශක්‍රයෝ කියන්නාහු ''එම්බා රජ්ජුරුවෙනි, බිසවුන්ට පාරකීපයක් ගසන්න, තුමූම මට මන්ත්‍රය එප''යි කියත්. ''ඒ නියාවට කරව''යි රජ්ජුරුවන්ට උපායඋ කියා ශක්‍රයෝ දිව්‍යලෝකයට ගියහ

රජ්ජුරුවෝත් රථය පදවා උයනට ගොස් රථයෙන් බැස දරසැය ලඟ සිට බිසවුන්ට කියන්නාහු ''තොපට මන්ත්‍රය දී මම ගිනි වදිමි, තොපට මන්ත්‍රය උවමැනවැ''යි කීහ. බිසවු කියන්නාහු ''ගිනිවැදවත් මට මන්ත්‍රය දුනමැතැවැ''යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු එසේවිනම් මන්ත්‍රය උගන්නා කල මන්ත්‍රයට කළමනා සත්කාර ඇත; මේ මන්ත්‍රය උගන්නා කල සැමිටියෙන් පාර කීපයක් ගසන්ට උවමැනවැ''යි කියා මුරගාන්ටත් බැරිය''යි කීහ. බිසවු මන්ත්‍රණාවෙන් ''යහපතැ''යි කීහ

රජ්ජුරුවෝත් කටු සැමිටි ගෙන්වා ලඟ සිටි රාජපුරුෂයන් ලවා ගෙඩි ගස්වන්ට වන්හ. බිසවු පාර කීපයක් ඉවසා ''මට මන්ත්‍රය එපයි'' කීහ. එවිට රජ්ජුරුවෝ ''මා ගිනිවැදත් මන්ත්‍රය උවමැනවැ යි කීයේ ය''යි පිට තලා ගෙඩි දෙව' තමන් ගෙවම ගියහ යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ඛරපත්ත ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යාවසානයෙහි උකටලී භික්ෂූන්වහන්සේ සෝවාන් වූසේක.

එසමයෙහි සේන රජ්ජුරුවෝ තම් මේ උකටලී භික්ෂූහුය, බිසවු තම් මෙසමයෙහි පුරාණ දූනිකාවෝය, රථය පැදිදුවූ අශ්වයා තම් ශාරිපුත්‍රස්ථවිරය, ශක්‍රව උපන්කෙම් බුදුවූ මම්ම ය යි වදාළසේක.

## 375 සුචි ජාතකය

**ති**වද ආකාශය සේ අනන්තවූ ගුණ ඇති තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාම යෙහි වැඩවසන සමයෙහි ප්‍රඥා පාරමිතාව අරභයා මේ ජාතකය දක්වන ලදී.
**ඒ කෙසේද? යත්**

මෙහි වර්ණිත කථාව උම්මග්ග ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහි සම්බුදුරජාණන්වහන්සේ "පෙරත් තථාගතයෝ මහ නුවණැත්තෝ වේදැ"යි වදාරා "ඒ කෙසේද?"යි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ දුකඛිතවූ කඹුරුව ඉපද වැඩිවිය පැමිණ පිටිසර ගමෙක වාසය කරණසේක.

ඒ ගම නුදුරු තැනක ගමෙක කඹුරු දෙසෙක වාසය කරන්නාහ. කඹුරු දෙසට නායකවූ කඹුරෙක් ඇත, ඒ කඹුරු විභාගවිය, රාජවල්ලභය, උගේ විශිෂ්ටවූ රූ ඇති දුවක් ඇත්තීය, ඒ කඹුරුගම ඇති ස්ත්‍රීයන්ගෙන් වැඩිතරම් රූවින් යුක්තය, නොයෙක් ගම්වලින් කැති පොරෝ නොයෙක් යකඩ කරවන්ට ආ මනුෂ්‍යයෝ ඒ කඹුරු දුවගේ රූව දැක තමතමන්ගේ ස්ථානවල ඉඳ රූප වර්ණනා කරන්නාහ.

බොධිසත්ත්වයෝ ඇගේ රූව අසා තෘෂ්ණාවසඟව ඇ දැක තමාගේ ගෙට ගෙණෙන්ට උවමැනවැයි සිතා යහපත්ව ඉදිකටුවක් ඉදිකොට විද ඒ ඉදිකටුව ලන නියායෙන් කොපු සතක් ඉදි කොට කොපුවෙන් කොපුව ඇතුලේ ලා ඉදිකටුවත් කොපුවේ ලා ඇරගෙණ කඹුරන් දෙසක් ඉඳිනා ගමට ගොස් "කඹුරන්ට නායක තැනැත්තන්ගේ ගේදොර කොයිදැ?"යි විචාරා උන්ගේ ගේ දොර මිදුලේ සිට කියන්නාහු "සියුම් මූණක් ඇති යසුණු ලා උලා මවසිලුටු වූ සෘජුවූ යහපත් වූ ඉදිකටුවක් ඇත, ඒ ගණුව"යි කිය කියා සිටියාහ.

නායක කඹුරු බත්කාලා වැදනොත්තේය. උගේ දුව තමාගේ පියාට තල්වැටක් සල සලා සිටියහ. බොධිසත්ත්වයෝ "ඉදිකටු ඇරගණුව"යි කියන බස අසමින්ම ඇගේ හිස සියගණත් පැන්කල වත්කරන්නා මෙන් චිත්ත සන්නෙහා ව "මා උන් බලන්ට උවමැනවැ"යි සිතා තල්වැට බිම තබා බොධිසත්ත්වයන් කථාව කියන තැනට ගොස් දැසා කියන්නේ "මෙකියන මානවකයා, මේ ගම කඹුරන් දෙසක් වාසයකරණ ගම්වූව, මේ ගම්තිබිනා කැති පොරෝ අදිවූ දෙය හා බිලිකටු ඉදිකටු ආදීවූ දෙය හා විශෙෂවූ ආයුධ හා ඇත, එසේවූ තැන තොප ඉදිකටු ඇරගෙණ පෙරවරුවත් ඇවිද්දත් ඇරගන්නේ නැත, මෙතන ඇති සියලු යකඩ ඒ ඒ තෙත ගෙණ ගොස් විකුණන්නාහ. එසේහෙයින් තොපගේ ඉදිකටුවත් ඇරගෙණ පිටිසර ගමකදී විකුණව"යි කිව.

බොධිසත්ත්වයෝ එවිට කියන්නාහු "එම්බල කුමාරිකාව, මිංගේ කම්මාන්ත යෙහි විශෙෂයත්, මා ගත් දුකෙහි විවරත් තොපගේ පියාතන්ට දැනෙයි. තොපගේ පියානෝ මා කළ කම්මාන්ත දුටුනම් තොපත් මව පාවාදී තමන්ගේ ඉගයි සියලු සම්පත්තූ මට දෙන්නේ වේදැ"යි කිහ.

මේ කථාව කියන නියාව ඒ කඹුරන්ට නායක තැනැත්තේ අසෘ තමාගේ දුව ගන්නා විචාරන්නාහු "තොප කවුරුන්ලාද කථාකරන්නේය"යි විමාළ කල්හි ඒ කුමාරිකා කියන්නී "එක්තරා මානවකයෙක් ඉදිකටුවක් ඇරගෙණ ඉදිකටුව ගණුව යි කිය කියා සිටින්නේය"යි කිව. ඒ අසා කඹුරු නායක තැනැත්තේ "උන් මෙතනට කැඳව"යි කියා කීයේය.

එවිට බොධිසත්වයෝ එතනට අවුත් කඹුරුනායකයානන් වැඳලා සිටියාහ. කඹුරුනායක "තොපි කවුදැ?"යි විමාළ කල්හි "මම අසවල් ගම කඹුරා තන්ගේ පුතකිමි"යි කීයේය. එවිට කඹුරුනායක තොපි කුමට අවුදැ?"යි විමාළාහ. බොධිසත්ත්වයෝ කියන්නාහු "ඉදිකටුවක් ඉදිකොට ලීමි. ඒ ඉදිකටුව ඇරගෙණ පානතියා ආමි" කීයේය

කඹුරු නායක ඒ අසා කියන්නේ "තෝ ඉදිකළ ඉදිකටුව ගෙණව"යි කී කල්හි බොධිසත්වයෝ ඉදිකටුව ඇරගෙණ මේ ගම ඇති කඹුරන් එක්වූකල පාමි. තනිව නොපාමි, කී කල්හි ගම ඇති කඹුරන් එකසී එක්වූ ගමනේ කඹුරු නායකයානන් අතට දුන්හ. කඹුරුනායකයානෝ ඉදිකටුව බලා "මේද තොපි ඉදිකළ ඉදිකටුවද?"යි විමාළාහ, "එසේය තෙල මතුපිට කොපුවය, ඉදිකටුව ඇතුළේය"යි කීහ. කඹුරුනායකයා කොපුව අයන්ට උන්සාහ කොට ඉදිකටුව අතට කොපුව අයාගත නුහුනුවාහ.

බොධිසත්ත්වයෝ කෙපුවෙන් කොපුව අයා කොපුසත කඹුරුනායකයානන් ඉදිරියේ තබා ඉදිකටුව බොධිසත්ත්වයෝ කඹුරුනායකයානන් අතට දුන්හ. එතනට එක්වූ දහස් කඹුරෝ හා කඹුරුනායකයන් හා පිළි හිසසිසාරා අසුරුසන්දී බොහෝ සතුටුව "මේ ඉදිකටුයේ තරය කිම්ද?"යි විමාළාහ.

බොධිසත්ත්වයෝ ඉදිකටුව තරය පානා නියායෙන් කිණිහිරක් ගෙන්වා ඒ කිණිහිර මුදුනෙහි ඉදිකටුව කුලකින් ගැසූ ගමනේ කිණිහිර බිඳගෙණ පල්ලේ තුබූ මඩෙහි පෙණෙයි, ඉල්පෙමින් තුබුයේය.

එවිට කඹුරන් හා කඹුරුනායකයායෝ පළමු නියාවට දියුණුක්ම චිත්ත සනෙතාෂව පිළිඉස සිසාරා අසුරුසන්දී සතුටුව කඹුරුනායකයානෝ තමන් විශෙෂ රු ඇත්තාවූ දුවනියන් පාවා දී තමන්ගේ බොහෝ සම්පතුත් දී බොධිසත්වයන්ට පාවා දුන්හ. කඹුරුනායකයානෝ නොබෝකලකින් මළහ. බොධිසත්ත්වයෝ ඒ කඹුරු දහසට නායකවූහ යි වදාරා මේ සුවි ජාතකය නිවවා වදාළසේක. එසමයෙහි කඹුරු වූ නම් යශොධරා සථවිරාය, එසමයෙහි කඹුරුව උපන්නෙම් බුදුවූ මම්මය යි වදාළසේක.

## 376 තුණ්ඩිල ජාතකය

තිවද මහපොළොව සේ විපුලවූ ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි මරණභීරුක භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්,**

**එක්** භික්ෂුකෙණෙකුත් වහන්සේ රාත්‍රිසථාන දිවාසථාන චංක්‍රමණසථාන යට ගියතෙන පරඬලා පතක්වත් කෝටුවක්වත් පඝ්ඝිකෙණෙකුත් අඬාපුවක් වත් අසා මරණභයින් භීරුකම වාසයකරණ කල්හි මේ කථාව දම්සභාවේරැස්වූ මහළුවරුන් වහන්සේ කිය කියා වැඩඋන්තෙනට සවීඥයන්වහන්සේ වැඩවදරා "මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුද?"යි විමාරා වදරා එපවත් අසා සවීඥයන් වහන්සේ "මහණෙනි, මේ භික්ෂූහු දැන් මතු නොවෙයි, පළමුත් මරණභයින් යුක්තව හිසුවෝවේද"යි වදරා "ඒ කෙසේ ද?"යි ආරාධිතවූ සවීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ථිවගිය** දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක් ඊරියකගේ කුස පිළිසිඳගත් කල්හි නොබෝකලකින් වැදූහ. දෙවනිව කුඩා උඉරුපැටියෙකුත් වැදූහ. උඉරු පැටියන් දෙන්නා තුරුල්ලේ ලාගණ ඊරිය වැදහොත්තැනව මැල්ලක් තමාගේ කපුසේනට ගොසින් කපු කඩාගෙණ එන තැනැත්තී ඊරිය වැදහොත්තෙනව අව, ඊරිය තමා මරතී යන භයින් පැටියන් දෙන්නා වැදහොත්තදී පළාගියාහ.

මැලි උඉරුපැටියන් දෙන්නා ගෙණගොස් මහ පැටියාව මහතුණ්ඩිල යෝය, කුඩා පැටියාට කුඩා තුණ්ඩිලයෝයයි නම් තබා උඉරුපැටියන් දෙන්න. පුත්‍ර ප්‍රේමයෙන් වඩන්නේය.

එසමයෙහි රා සොඬුන් එක්දවසක් රා බී මාංශ තොලැබ "අසවල් මැල්ලගේ ගෙයි උරෝ ඇත, උන් අසින් ඇරගෙණ මරා කම්මැ"යි කියා අවුත් කියන්නාහ. "මැල්ල තොපගේ ගෙයි වඩන උඉරෝ ඇත, අපගෙන් මිල ඇර ගෙණ උන් දෙව"යි කීහ. මැලි කියන්නී "මාගේ දරුවන් දීපියාද මා සම්පත් ලබන්නේය"යි කියා නොගිවිස්සීය. රාසොඬු මැල්ල රා පොවා මත්කොට කියන්නාහු "අපට උඉරන් දෙව්ද?"යි විවාලෝය.

මැලී රා බී මත්ව "යාපත දෙමි, ඉනුත් මාගේ වැඩිමාලු තුණ්ඩිලයන් නොදෙමි, කුඩා තුණ්ඩිලයන් දෙමි" කීහ. "යහපතැයි "මැලි පුත් චුල්ල තුණ්ඩිලයෙනි, මෑත එව"යි අඬගා ලූහ. බොධිසත්ත්වයෝ සිතන්නාහු "මාගේ මැනියෝ මෙතෙක් දවසක් පළමුවෙන් මට අඬහානොත් විනා චුල්ල තුණ්ඩිල යන් අඬහොගාතිය. අද යම්සේ මැනියන්ට භයෙන් ඇතමැතැවැ"යි සිතා "මල තුණ්ඩිලයෙනි, නොපගේ මැනියෝ නොපට අඬහාතියි ඔබව යව"යි කිව. "ඔහ පතැ" චුල්ල තුණ්ඩිලයෝ මැනියන් සිටිනා තැනට ගියකල රාසොඬුන් වට කොටගෙන සිටි නියාව දැක භයින් ත්‍රාසනව වෙවුල වෙවුලා බැනන් කරා ගියහ.

මහ තුණ්ඩිලයෝ කිම්දැ?"යි විවාළ කල "මැනියන් හා රාසොඬුන් වට කොටගෙණ සිටි නියාවත් බත් ඔරු තුබු නියාවත් දැක භයින් ත්‍රාසනව දිව ආමි" කීහ. බෝධිසත්ත්වයෝ මලනුවනට කියන්නාහු "මල, උඉරන් ගෝනන් මුවන් ආදිවූ සිවුපාවන් වඩන්නේ අනිකක් නිසා නොවෙයි. යමෙක් වේලේ මරන්නටමය. එසේ පැමිණි මරණයට භීරුකම්මෙන් කම්කිම්ද?"යි කියන්නාහු අවාවාද බරණැස්නුවර මුලුල්ලව සැලව ගියහෙයින් රජ්ජුරුවන් හා නුවරවාසීන් එක්වී බෝධිසත්ත්වයන් උන්නාවූ බැද්ද වටකොට ගත්හ.

බොධිසත්ත්වයෝ මලනුවන්ට අවවාද කියන්නාහු 'මලනුවෙනි, යහ පත්ව පැදී තිබෙන පැතෙන් ඉස්සෝදු නහා ඇඟ කුණු අැරපියව, ශරීරයේ නොයෙක් සුගන්ධයන් ගා ගණුව''යි අවවාද කිහ. එවිට කුඩා තුණ්ඩිලයෝ කියන්නාහු අපගේ උඉරන්ගෙන් කුණුඅරවා වාසය කළ කෙණෙක් ඇද්ද? යහ පත් පැනකින් ඉස්සෝදු නැ කෙණෙක් ඇද්ද? ශරීරයෙහි යහපත් සුගන්ධය ගැ කෙණෙකුන් නැතිව ඉන්දදී බැනන්වහන්ස, මේ කුමව කියන කාරණයෙක් දූ?''යි විවාළාහ.

බොධිසත්ත්වයෝ එවිට මා කියේ විලව බැස නාන්ට හා ශරීරයේ කුණු හැර නාන්ට හා යාපත් සුගන්ධ ගල්වන්ට නොවෙයි. අකුසල් නැමති ශරීර මලය පහකොට කුසල් නැමති මනාවූ තොවට බැස නහා සියලු දවස් ශරීරය නොහැර පවත්නාවූ සිල් නැමති සුගන්ධය ශරීරයේ ගල්වන්ට මා කියේය''යි කියා ''මලනුවෙනි, යම් කෙණෙකුන් අකුසලයක් කෙරෙන් නම් ඊට සතුටුවීමෙන් දුක් බොහෝ දෙලොවටම පැමිණෙන්නේය. යම් කෙණෙකුන් කුසලයක් කෙරෙත් නම් ඊට සතුටුවීමෙන් දෙලොවම සැප ලබන්නේය. එසේ හෙයින් අකුසලය කරණ කෙණෙකුන්ටවත් සිතන කෙණෙකුන්ටවත් සතුටුවීමෙන් මරණාසන්න යෙහිත් සෙසු වේලෙහිත් මහා භය පැමිණෙන්නේය. එසේහෙයින් එසේවූ අකුසලය හැර ශීල නැමති සුගන්ධය ශරීරයේ ගල්වා ගණුව''යි කිහ.

බොධිසත්ත්වයන් බුද්ධවිලාසයෙන් ඉද කියන්නාවූ අවවාද රජ්ජුරුවෝ අසා මහා සම්මධිව බොධිසත්ත්වයන් යහපත් ඉණකඩකුත් අදවා මාණික්‍යාභරණයකුත් පලදවා බොධිසත්ත්වයන් වැඩූ මැල්ලවත් බොහෝ සම්පත්දී බොධිසත්ත්වයන් හා මලනුවන්ද බරණැස්නුවරට ගෙණගොස් රජගෙයි ඉන්ට සලස්වා සියලු අධිකරණ ආදීවූ යුක්ති අයුක්ති බොධිසත්ත්වයන් ලවා විචාරා මැදහත්ව නිශ්චයකොට සියලු මනුෂ්‍යයන්ට පන්සිල් අවසිල් ආදීවූ දානාධ්‍යාසයෙහි පිහිටුවා අපායට යානොදී සුගතියට පමුණුවන්නාහ. බොහෝ කලකින් බරණැස් රජ්ජුරුවෝ මළහ.

බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට කළමනා ආදහන කෘත්‍යයකොට නිමවා ඉක්බිති අධිකරණ ශාස්ත්‍රය බොධිසත්ත්වයෝ පොත් බලා ලියවා ''මේ නියාවට අධිකරණ ඉදිරියේ විචාරව''යි කියා නුවරවාසීන් එක්කරවා බොහෝ මනුෂ්‍යයන්ට අවවාට කියා බෝධිසත්ත්වයන් හා මලනුවෝ බොහෝ මනුෂ්‍යයන් අඩ අඩා සිටියදී තමන්ගේ පළමු විසූ වනාන්තරයට ගියහ.

''එදා උඉරුතුඹින් වදුළ බණ සැවදහසක් අවුරුදු පැවැත්තේය''යි වදුරා මේ තුණ්ඩිල ජාතකය නිමවා වදුළසේක.

මේ දෙශකාවසානයෙහි මරණ භීරුක භික්ෂූන් වහන්සේ සොවාන්වූ සේක. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරය, එසමයෙහි චුල්ල තුණ්ඩිලයෝ නම් භීරුක භික්ෂුහුය. එසමයෙහි මහා තුණ්ඩිලව උපන් තෙම් බුදුවූ මම්ම වේදූ යි වදුළසේක.

## 377
## සචණ්ඩකකීටක ජාතකය

මේ වදන බැලුවන් ඇස් නිමවන මනහර රූ ඇති සඒඥයන් වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආනන්ද සඞ්ගමින් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්,**

එක් දවසක් දම්සභාවේ රැස්වූ භික්ෂූන්වහන්සේ "ආනන්දස්ථවිරයෝ සඒඥයන් වහන්සේ මරන්ට එන්නාවූ ධනපාලයා ඉදිරියේ සිට ජීවිත පරිත්‍යාග කළෝ වේදැ?"යි කිය කියා වැඩඋන් ප්‍රඥාවට සඒඥයන් වහන්සේ වැඩ වදාරා "මහණෙනි, මා එන්නාට පූර්වාභයෙහි කවර කථාවකින් යුක්ත වූනුදැ"යි විචාරා වදාරා එපවත් අසා "දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරත් ජීවිත පරිත්‍යාග කළෝ වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සඒඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

රජගහ නුවර සාලින්දිය නම්භම බොධිසත්ත්වයෝ බ්‍රාහ්මණ කුලයක ඉපිද වැසය කරන්නාහු දැසක් කිරියෙහි ඇවිද ගොයම් බලන්නා හා ගොයම් බලා එ කුඹුරු අස පොකුණෙහි ඇස මූණ සෝදන්නා හා ඒ පොකුණෙහි රන් වන් කකුළුවෙක් වැසඟ කරන්නේය.

බොධිසත්ත්වයෝ කකුළුවා ඉතලාගෙණ කුඹුරවට ඇවිද ගෙට යන කල පොකුණට ඇර යන්නාහ. ඒ කිරියෙහි එක් තල්ගසක් උඩ වැසය කරන්නාවූ එක් කැවිඩියක් තමාගේ කවුඩාට කියන්නී "මේ බ්‍රාහ්මණයාගේ පස්පැදිස්නාවූ ඇස් සඟළු මට උපුවා දෙව, ඒ නොලදින් නම් මාගේ ජීවිතය නොලබම්" කිව. එවිට කපුටුවා කියන්නේ "නොමළ තැනැත්තවුන්ගේ ඇස්දෙක කෙසේ උපුවා දෙම්දැ"යි කියාත් නොවළකින නෙයින් "ඒ තල්ගස සමීපයෙහි තුඹසෙක වැසය කරන්නාවූ නයකු ඒ දෙළු පසිඳ මැනවැ" කිව. "යහපතැ"යි ගිවිසි පසු බොධිසත්ත්වයෝ කෙත්වත් බලන්ට යන්නාහු පොකුණට බැස ඇස මූණසෝධා රන්වන් කකුළුවානන් උත්තර සාටකයෙහි ලා එන්නාවූ බොධිසත්ත්වයන් සඒයා තණ අස්සේ සැඟවී බලා වැදනෙව පාදපිට දෂ්ටකොට තමා වැදහොත් නාවූ තුඹසට පලා ගියේය. බොධිසත්ත්වයෝ විෂ මුර්ජාවෙන් වැටී උන්හ. බොධිසත්ත්වයෝ වැටීමත් කකුළුවා බිමපිට පිනීමත් කපුටුවා බොධිසත්ත්ව යන්ගේ ඇස්දෙක උපුටන්ට ඇවිත් ලයමත්තෙහි ඉදීමත් එක්ෂණමෙහිම විය. කකුළුවානෝ මේ කාරණය දැක මුන් නිසා මාගේ මිත්‍රයානන්ට වූ අලාභයකැයි සිතා කපුටුවාගේ බොටුව තලින් අල්වාගෙණ භරකොට මැඩලූහ. එවිට කපුටුවා සඒපයාට කියන්නේ රන්වන්වූ ශරීරයක් ඇති, ශරීරය පිටතින් නික්ම තිබෙන්නාවූ ඇස් ඇති තළ දෙකක් ඇති ඇටම සම්කොට ඇත්තාවූ ලොම් හට නොගත්තාවූ කකුළුවෙක් මාගේ බොටුව කතුරකින් මඬින්නාක් මෙන් මඬිනේය. මා මරහුට ඇරපියා කොසි ගියාද? වහා අවුත් මා ගලවා ගණුව"යි සඒයාට අඬගා කීහ.

එවිට සඒරාජයා තමාගේ යහළුවා කී බස් අසා පෙණය මහත්කොට සුස්වමින් තමාගේ යහළුවා ගාවාට ආය. එවිට කකුළුවා සඒයාත් අඩුවෙන්

ඛැගත. එවිට සජීරාජයා කියන්නේ "එම්බා කකුළුවානෙනි, තොපව සජීයන්ගේ මාංශයෙනුත් කම් නැත, කළමනා කවර කාරණයක් නිසා අප දෙන්නා අඹුවෙන් ඛැගතුදැ?"යි විවාළේය. එවිට කකුළුවා කියන්නේ "එම්බල මේ පුරුෂයා මාගේ ඉෂ්ට මිත්‍රයායැ, එසේහෙයින් උඹ පැමිණි මරණය මට පැමිණියා හාත් සමානය ඒ කාරණය නිසා කකුළුවන්ගෙ මාංශය නම් ඉතා කුලල්ව මොළොක්ව තිබෙන්නේය. ඒ මාංශය මනුෂ්‍යයෝත් කැමති වන්නාහ. කපුටු වෝත් බිදකති, මුන් නැතිවිට මටත් බොහෝ උපද්‍රව වන්නේය. එසේහෙයින් මාගේ යාළුවූ බ්‍රාහ්මනයාණන්ගේ විෂඛාන්තා උන් නිම්‍යාධි කරණ නිසා තොප දෙන්නා අඹුවෙන් ඇල්වීම්"යි කීහ. එවිට සජියා උපායක් කියා "අපි දෙන්නාම ගැළවී පලායම්හ"යි සිතා කියන්නේ "එම්බා කකුළුවානෙනි, අප දෙන්නාම ඇරපියන්නා විෂයත් උරාගෙණ පලායම්ම්, අපි දෙන්නාම ඇරපියව"යි කීහ.

එවිට කකුළුවා සිතන්නේ "මා වඤ්චාකොට ලා දෙන්නාම ගැළවී පලා යන්ට උපායක් සිතූ නියා වේද? එසේ නොහරිමි"යි සිතා කියන්නේ "කපුටුව, තමාම නොහරිමි. තොපත් විෂය ඇරගන්නා විවරව මදක් ලිහිල් කෙරේම්"යි "මාගේ යාළුවූ බ්‍රාහ්මනයානත් නිම්‍යාධි කරවා සිටි විට තොප දෙන්නා අරිමි" කියා කාවුඩාත් තරකොට ඛැගෙණ සජියා මදක් ලිහිල්කොට විෂය උරාගෙණ බොධිසත්ත්වයන් නිම්‍යාධිව නැගීසිටි කල්හි කකුළුවානෝ සිතන්නාහු මේ දුර්ජනයන් දෙන්නා ඇරපීම් නම් මතු මාගේ යාළුවාට උපද්‍රව වන්නේ වේදැ යි සිත කතුරකින් ඇඹුල දණ්ඩ කපන්නාක් මෙන් කපුටුවාගේ ඉසටියත් තයාගේ ඉසටියත් පොලුගසා එලුව.

බොධිසත්ත්වයෝත් මළාවූ නයාගේ කඳ ලීයක අවුලා තුඹසෙහි ලා කකුළුවාණන් එනතුරු පවලාගෙණ පොකුණට ඇර ඉස්සෝධා නහා ගෙව ගියහ. කකුළුවාතන් හා බොධිසත්ත්වයන් හා එවක්පවත් මිත්‍ර සන්ථවය තරවීය. කැවිඩිත් එතනින් ඔබ්බට ගියාහ යි වදුරා මේ ස්වර්ණ කකීටක ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි කැවිඩි තම් විඤ්ඤිමානවිකාය, කවුඩා නම් දෙවදත්තාසථවිරය, නයා තම් වාසවර්ති මාරයාය, කකුළුවා තම් සුවාසු දහසක් ධර්මසකාඤියට භාණ්ඩාගාරිකවූ ආනන්දසථවිරයෝය, බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 378 මය්හ ජාතකය

තිවද චාමීකර සඛණියව බඳුවූ ශරීර ඇති සම්බුදුයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ආගන්තුක සිවාන කෙණකුන් අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද? යත්,

ආගන්තුක එක් සිවානකෙණෙකුන්ට බොහෝ සම්පත් ඇත්තේය. මසුරු වූහ. අනුන්ට දුහුයක් විවර නොදෙන්නාහ. ලොභීහ. ඒ සිවානෝ කල් යාමකින් එක්තරා ව්‍යාධියක් ඇතිව නවහ. ඒ සිවානන්ට පසු උන්ගේ සම්පත්

රජගෙට අදින්නවුන්ට සත්රැ සත් ද්වාලක් ගියේය. රජ්ජුරුවෝ ඒ පරක්කු වෙන් බුදුන් කරා නොගොස් සත් දවසක් ඉකුත්වූ කල්හි සඟුරුවන් වහන්සේ කරා ගියහ.

සඟුරුවන් වහන්සේ "මහරජ, මෙතෙක් දවස් පමාවුනැ"යි විචාරා වදාළ සේක. "ස්වාමීනි, අපගේ ආගන්තුක සිවානෝ නටහ. උන්ගේ සම්පත් අපගේ නෙට අදිනවුන්ට සත් දවසක් ගියේය. එසේ හෙයින් අවුරුදු මද හෙයින් නො ආමි" කීහ. රජ්ජුරුවෝ කියන්නාහු "ස්වාමීනි, මේ සිටානන් මෙතෙක් සම්පත් ඇතිව දන් නොදෙන්ට කාරණා කිම්ද? මෙතෙක් සම්පත් ඇතිවන්ට කාරණා කිම්දැ?"යි කීහ.

සඟුරුවන්වහන්සේ වදාරණසේක් "මහරජ, මේ සිවානෝ එක්ජාතියෙක සිටුව ඉපද තගරසිඛී නම් පසේබුදුන් වහන්සේ වීථියෙහි සිඟා වඩිනා දැක සිවානෝ උන්වහන්සේ ගෙට කැඳවාගෙණ ගොස් ගෙය ඇත්තන්ට කියා රජගෙට ගොස් එක කලට පසේබුදුන් වහන්සේ දන් පිළිගෙණ සිවානන් ඉදිරියට වැනිසේක.

සිටානෝ පසේබුදුන් වහන්සේ දැක "දන් ලද්දේ ඇද්දැ?"යි විචාරා "එසේය, මනසිටානෙනි, දන් ලදුම්හ"යි කීසේක. සිවානෝ පාත්‍රය බලා "මේ බත් මුත්වහන්සේට දුන්නේය, මාහෙන් එක් මනුෂ්‍යයෙක් මේ බත් කැයේ නම් මට බොහෝ මෙහෙවර කරන්නේ වේද? මුන්වහන්සේට මේ දීමෙන් ප්‍රයෝජන කිම්දැ?"යි සිතුහ.

දන්දුන් විපාකයෙන් සම්පත් ලද්දහ. අන්තිම අවස්ථාවෙහි සිතිවිල්ල නපුරුව ගිය හෙයින් සම්පතෙහි ප්‍රයෝජන විඳින්ටත් නොලද්දේය"යි වදාළ සේක. එවිට රජ්ජුරුවෝ කියන්නාහු "ඒ වන්නා එසේමය. ඒ සිවානන්ට දරුකෙණෙකුත් ඇතිනුවූයේ මක්නිසාදැ?"යි විමසූහ. "දරුකෙණෙක් ඇතිනුවූයේත් උන්නිසාම ය"යි "ඒ කෙසේදැ"යි ආරාධිතවූ සඟුරුවන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ගිහිගෙය හැර තාපසවූසේක. මලනු වන්දැ බොධිසත්ත්වන් වහන්සේගේ පුතනුවන් වඩා පොෂ්‍යය කරන්නාහ. නොබෝ කලකින් උත්තමයන්ටත් දරුකෙනෙකුන් උපන්නාහ. උන් වැඩිවිය පැමිණි කල්හි මාගේ බෑනන්වහන්සේගේ පුතනුවන්ට කොවසකුත් මාගේ දරුවන්ට කෙටසකුත් මාගේ සම්පත් දෙන්ට වුවමැනවැයි එසේනෙයින් දැම්ම මරාපුවොත් යහපතැ යි සිතා තමන්ගේ බෑනන්ගේ පුතනුවන් කැන්දාගෙණ තාන්ට යම්හ යි පොකුණට ගොස් බොධිසත්ත්වයන් වහන්සේගේ පුතනුවන් දියෙහි ඔබා මැරූහ. බෑනනියෝ විචාරන්නාහු "ඇයි ස්වාමිනි, මාගේ දරුවෝ කොයිදැ?"යි විචාරන්නා "තාන්ට බට ගමනේ දිය බී මළන"යි කියන්නා අඩා වැළපෙ උන්නාහ.

බොධිසත්ත්වයෝ මාගේ දුනය පවතීද්දෝ හෝ යි දිවැසින් බලා දන්හලුත් වීදැ මෙසේවූ අකමීයකුත් සැලසුනු නියාව දිවසින් දැක තාපසයන් වහන්සේ එතනට අවුත් පණවනලද ආසනයෙහි වැඩඋන්සේක. එවිට සිවානෝ තාපසයන් වැඳ එකත්පස්ව උන්නාහ. එවිට තාපසයන් වහන්සේ "මාගේ පුතනුවෝ කොයිදැ?" විචාරා වදාළසේක.

සිටානෝ කියන්නාහු ''දියකෙළින්වලා පොකුණට ගිය ගමනේ දියෙහි මළුන''යි කීහ. එවිට තාපසයෝ කියන්නාහු ''තොප එසේ කියන්ට කාරණා කිම්ද? තොපගේ සම්පත් දෙකොටසක්ව බෙදෙම්දැ''යි තොපි තෙවේද? දියෙහි ඔබා මැරුවාය''යි කියා ''එම්බා මේ සම්පත් නම් එක්කෙණෙකුන් සන්තක දෙයක් නොවෙයි, හිමාලය වනයෙහි මනිස නම් පක්ෂියෙක් ගසින් ගසට පැණ ''මේත් මාගේය''යි ''මේත් මාගේය''යි කියති. උන් පසුපස්සෙහි පක්ෂිහු ඵල අනුභව කරන්නාහ. තොපගේ සිතිවිල්ලෙන් ඒ පක්ෂීන් මෙන් මෙසේ අසපිර සම්පතකට මෙසේවූ ප්‍රාණවධයක් නොකළෝ වේද''යි ''මලනුවන්ට මතුමෙසේවූ වධයක් නොකරව''යි අවවාද කියා හිමාලයවනයට ගියාහ. එසමයෙහි සිටානෝ නම් මේ සිටානෝය, සිවිතන්ගේ බෑනෝ නම් බුදුවූ මම්ම ය යි වදාළසේක.

---

## 379
## ඛජ්ජිහෙඨ ජාතකය

තිවද දයාවට භාජනවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලෝකාර්ථචර්යාව අරභයා මේජාතකය වදාළසේක.

ඒ කෙසේද? යත්,

මෙහි වර්තමාන කථාව කණ්හ ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වනාහි ජාතක කථාව නම්:–

රිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. එසමයෙහි විද්‍යුධරයෙක් තමාගේ මන්ත්‍රානුභාවයෙන් රජගෙට වැද බිසවුන් හා ලොකාස්වාදරතියෙහි යෙදී වාසයකරන්නේ බිසව් රජ්ජුරුවන්ට කියන්නාහු ''සවාමිනි රාත්‍රියෙහි එක් මිනිසෙක් මා සමීපයට අවුත් ලොකාස්වාදරතියෙන් වාසයකරන්නේය''යි කීහ.

රජ්ජුරුවෝ ''ඒ පුරුෂයාට සංඥාවක් කළඇතිදැ? යි විචාළාහ. ''යහපත සංඥාවක් කෙරෙමි''යි කියා විද්‍යුධරයා රාත්‍රියේ ආගමනේ ලොකාස්වාදරතියෙහි යෙදී උදැසන යන ගමනේ බිසව් ඉහුලේ අතගලා විද්‍යුධරයා පිට අත එබූහ.

රජ්ජුරුවෝ නුවරවාසීන්ට කියන්නාහු ''පිට ඉහුල් අල්ලක් ඔබාලූ පුරුෂයකු දුටුවොතින් අල්වාගෙණ එව''යි කීහ. විද්‍යුධරයා උදැසන ස්මසානයක එක පයින් සිට සූර්‍යදිව්‍යපුත්‍රයන් වඳිමින් සිටියේය. රාජපුරුෂයෝ බලාගෙණ ගියාහු ස්මසානයෙහි සිටි පුරුෂ සූර්‍යදිව්‍යපුත්‍ර වඳිනවුන් දැක වටලා ගෙණ අල්වන්ට වන්නාහ. විද්‍යුධර තමා අල්වන බවය දැන මන්ත්‍රය සිහිකොට ආකාශයෙන් ගියේය.

රජ්ජුරුවෝ එපවත් අසා ''කෙසේ කෙනෙක්දැ''යි විචාළාහ. ''සවාමිනි, ඉසමුඩුවෝය, තාපස කෙණෙකුන් සැටිය''යි කීහ. රජ්ජුරුවෝ ''තපස්වී කෙණෙකුන් මේ නුවර ඉන්ද නොදෙව''යි කියා රටින් තොරකළහ. එතැන් පටන් කුසල් කිරීම් නැතිව අකුසලය බොහෝ කොට මනුෂ්‍යයෝ නරකයෙහි උපන්නාහු ශක්‍රයෝ තමන් දිව්‍යලෝකයෙහි උපදින උන් නැතිවෙයින් බරණැස්නුවරට

අවුත් "මෙතුවර තාපස්වීකෙණෙකුන්වත් මෙලොව පරලොව මේය යි කියා බණදහමක් කියත කෙණෙකුන්වත් දනක් පිණක් කියා කරවත කෙණෙකුත් නැතිහෙයින් වේද මනුෂ්‍යයෝ නරකයේ උපදින්නෝ?"යයි සිතා ශක්‍රයෝ නන්දමූලක ප්‍රාග්භාරයට ගොස් පසේබුදුන්වහන්සේගෙන් වැඩිමිළු කෙණෙකුන් වහන්සේ ඇරගෙණ බරණැස්නුවරට එම් සිතා ගොසින් වැඩිමිළු පසේබුදු කෙණෙකුන්වහන්සේ කැඳවාගෙණ ශක්‍රයෝ තුමූ තරුණ මානවක වේශයක් මවාගෙණ පාත්‍රය ඇරගෙණ පසේබුදුන් වහන්සේ ඉදිරිකොට ලා ආකාශයෙන් අවුත් බරණැස්නුවර තුන්විටක් ප්‍රදක්ෂිණාකොට රජ්ජුරුවන්ගේ රජගෙයි සිවියාහ බොහෝ මනුෂ්‍යයෝ දෙදෙනාවහන්සේ දැක "රජ්ජුරුවන්ට වයෝවෘඩ තපස්වීකෙණෙකුන්සේත් තරුණ මාණවක කෙණෙකුන්වහන්සේත් නමස්කාර කොට සිටිනාසේකැ"යි කීහ.

රජ්ජුරුවෝත් එපවත් අසා අවුත් ශක්‍රයන් ආකාශයෙහි සිටියන් දැක කියන්නානු "මානවකය, නෝ වනාහි බැලුවන්ට අප්‍රියකරවූ ජීන්න හින්න පටඹාරිවූ මාළුනිස්සූ කෙණෙකුන් වහන්සේට වැඳගෙණ සිටිනේ කවර කාරණයක් නිසාද? මුන්වහන්සේගේ නම කවරේද? තොපගේ නම කවරේදැ?"යි විචාළාහ. ශක්‍රයෝ "රජ්ජුරුවෙනි, මුන්වහන්සේගේ නම මුන්වහන්සේ දැක්කදීම කිය නොහෙම්, මාගේ නම් කියම්. මම නම් දෙදෙව්ලොවට නායකවූ ශක්‍රයෝ වෙම්, මුන්වහන්සේ පසේබුදුන්වහන්සේය"යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු "දිව්‍යරාජෝත්තමය, මුන්වහන්සේට වඳින්නේ පුදන්නේ කුමක් නිසාද? නැසියකමක් නිසාද? නොහොත් කවර කාරණයක් නිසාදැ?"යි විචාළාහ. ශක්‍රයෝ කියන්නාහු "මුන්වහන්සේ මා වඳින්නේ පුදන්නේ නැසිය කමක් නිසා නොවෙයි. වැදිමෙන් පිදීමෙන් සඟ මොක්ෂ සැප හා සියළු ඉෂ්ටාර්ථසිද්ධිය වන හෙයින් හා කුසල මූලිකවූ පසේබුදුන් වහන්සේ නිසා නමස්කාර කරම්හ"යි ශක්‍රයෝ කීහ.

රජ්ජුරුවෝ එපවත් අසා "ශක්‍රයෙනි, පසේබුදුන්වහන්සේ හා තපස්වීන් වහන්සේ වැදිම් පිපාක ඇසීම්, එසේ නෙයින් මෙතැන් පටන් තපස්වීවරයන් වහන්සේට දන් දෙම් වඳිම් පුදම්" කීහ.

පසේබුදුන්වහන්සේ "රජ්ජුරුවෙනි, තපස්වීවරයන් නිසා සැලසුනු කිලුටෙක් නොවෙයි, විඤ්ඤාණකු නිසාවූ කිලුටුය, තපස්වීන් කෙරේ දානමානාදීවූ කුසල් කරව"යි අවවාද කියා පසේබුදුන් වහන්සේ නන්දමූලක ප්‍රාග්භාරයට වැඩිසේක. ශක්‍රයෝ තමන්ගේ ශක්‍රභවනයට ගියාහ. රජ්ජුරුවෝ නුවරින් පිටත පලාගිය තපස්වීවරයන් වහන්සේ ගෙන්වා පුණ්‍යසම්භාරයන් රැස්කොට දිව්‍ය ලෝකයෙහි උපන්හ යි වදාරා මේ ඛජ්ජිහෙඪ ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ තම් ආනන්දස්ථවිරයෝය, එසමයෙහි ශක්‍රයෝ තම් බුදුවූ මම්ම යයි වදාළසේක.

---

## 380 පුෂ්පනන්ධ ජාතකය

තාවද ජාම්බෝනද සුවර්ණයට බදුවූ ශරීර ඇති සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් මල්පිදීමක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්**

එක් භික්ෂුකෙණෙකුත් ජේතවනාරාමයෙන් පිටිසර වස්වසන්ට ගොස් වස්වැස එනසේක් එක්විලස මල්සුගන්ධයක් අස අසා ආඝ්‍රාණය කොට සිටි සේක් එක් දෙවතාවෙක් එතනට අවුත් "ඇයි භික්ෂූන් වහන්ස, තුඹවහන්සේට මල් සුගන්ධයෙන් ප්‍රයෝජන ඇද්ද? මල් පලදිනා අභිප්‍රායෙක් ඇද්දැ?"යි කීහ.

භික්ෂූන්වහන්සේට කී බසින් එතන තොසිට ජේතවනාරාමයට ගොස් සම්ඥයන් වහන්සේට එපවත් කීසේක.

සම්ඥයන් වහන්සේ "දැන්මතු නොවෙයි, මහණෙනි, දෙවතාවා පෙර උත්තමයන්ට් කුකුස් ඉපදවූයේ වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්ඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුත් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ එක් බ්‍රහ්මණගමෙක ඉපද සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වාසය කරණසේක්, එක් දවසක් එක් පොකුණක් දැක ඒ පොකුණෙහි නාන්ට බැස නානසේක් එක් පියුමක් දැක ඒ පියුම ලඟට ගොස් ඒ පියුම ඉඹ ඉඹ සිටිසේක. එවිට එක් දෙවතා දුවක් කියන්නී "ඇයි තාපසයෙනි, තොප අදහාදැනයෙන් ප්‍රයෝජන විඳින්ට කාරණා කිම්දැ?යි" කිව.

එවිට තාපසයෝ කියන්නාහු "පියුම කඩාගත්තා නැත, කැවා නැත, ඉඹපු පමණකින් අදහාදැනයවෙන්ට කාරණා කිම්දැ?"යි කීහ. "අනුන් සන්තක විල මල් ඉඹි කල මේ අදහාදැනය නොවේදැ?"යි කීහ.

ඒ වේලාවට එක් පුරුෂයෙක් අවුත් විලට බැස මල් කඩා අලත් උදුරා ඇඹුල දඹුත් කඩන්ට වත. එවිට බොධිසත්ත්වයෝ "මල ඉඹපුවාට අදහාදැනය යි කිව. මලුත් කඩා අලත් උදුරණ තැනැත්තවුට බැණ නොනැගෙයි" සිතා දෙවතාදුවට කියන්නාහු "ඇයි? තෝ මට මල ආඝ්‍රාණය කළ පමණින් අදහාදැනය යි කිව. මේ පුරුෂයාට බැණ නොනැගෙන්නේ ඇයිදැ?"යි කීහ.

එවිට දෙවතා දූ කියන්නී "එම්බා තාපසයෙනි, කිරෙහි සළෙක් හුනු කලක් පෙණෙයි, සුදුකඩෙහි ගැලුනු කසළක් තමුත් පෙණෙයි, කසළේ ලූ කසළක් නොපෙණෙයි, කිලුටුකඩෙහි ගැලුනු කසළක් නොපෙණෙයි. එසේ මම අසත්පුරුෂයා කුමක් කලත් වැරදි කියනොහැක්ක, තොප තාපසව යහපතක්ම කරණට නියලී ඉඳිනා තැනැත්තන් නෙයින් තොපගේ වේසය නිසාවට දවස් අරින්ට උවමැතවැ"යි කිව.

බොධිසත්ත්වයෝ දෙවතා දූ කී බසට සමාදිව "මෙයින් මතු මාගේ වැරැද්දක් දුටු කල කියව"යි කීහ දෙවතාදූ කියන්නී "මම තොපගේ වරද බලා පසුපස්සේ ඇවිදිමිද? තොප රකිනා සෘෂිප්‍රව්‍රජ්‍යාව නියාවට සිහි ඇතිව වාසය කරව"යි කිව.

බොධිසත්ත්වයෝත් දෙවතාදූ කී අවවාදය සිතෙහි තබා පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා කොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්මලොකයට ගියහ යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ පුෂ්ප ගණ්ඩ ජාතකය නිමවා වදාළසේක.

චතුස්සත්‍යය දෙශනාවගේ කෙළවර ඒ භික්ෂූන් වහන්සේ සෝවාන්වූ සේක. එසමයෙහි දෙවතාවූ තමී උපුල්වන් මහාසථවිරාය, තාපසව උපන්නෙමි බුදුවූ මම්මය යි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 381 විඝාත ජාතකය

මේවද සත් ගුණ මහාසවණීයක් බදුවූ තිලෝගුරු බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි, ක්‍රීඩාශීලීවූ භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

සවීඥයන් වහන්සේ මතුමාලේ ප්‍රාසාදයෙහි වැඩවසන සමයෙහි සාමණේර භික්ෂුකෙණෙකුන් වහන්සේ එක්ව යවමාලේ කෙළිනා අරගල අසා සවීඥයන් වහන්සේ මුනලන් සාමීන් ගෙන්වා "මෙඳිගල්‍යාණය, සාමණේරයන්ගේ ක්‍රීඩාව තවතාලව"යි වදාළසේක.

"යහපතැ"යි මුගලන් සාමි යවමාලේ ඇඟිලි දෙකින් සොලවා හයගැන්වූ සේක. ඒ කථාව දම්සභාමණ්ඩපයෙහි රැස්වූ භික්ෂූන්වහන්සේ කියා කියා මැඩ උන්නෙනට සවීඥයන් වහන්සේ වැඩවදාරා "මහණෙනී, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැ?"යි විචාරා වදාරා එපවත් අසා "දැන් මතුනොවෙයි, පෙරත් අශික්ෂිතව වාසයකරන්නවුන් පෙර උත්තමයෝ ඉක්මවූවෝ වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සවීඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

අවිරතිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ශක්‍රදෙවේන්ද්‍රව උපන් සේක.

එසමයෙහි සත් බැකෙණෙක් හිමාලය වනයෙහි මණ්ඩපයක තාපසව වාසයකරන්නාහු ක්‍රීඩාශීලීව වසන්නාහ.

ශක්‍රයෝ එපවත් දැන තාපසවරුන් ඉදිනා මණ්ඩපයට අවුත් ඉද කියන්නාහු "විඝාත නොවන තාපසවරුන්ට නමස්කාර කරමි"කිහ. ඉන් එක් තාපසයෙක් කුමක්දැ?"යි විවාළේය. එවිට අවශෙෂයෝ "අප ඇමට නමස්කාර කෙරෙමි යි කියයි කීය.

එවිට ශිරවා කියන්නේ "තොප ඇමට නොවෙයි, මා කියේ විඝාත නොවන තාපසවරුන්ටය"යි කීහ. එවිට තාපසවරු කියන්නාහු. අපට වඩා අනික් තාපස කෙණෙක් ඇද්ද? අපි සිංහ ව්‍යාඝ්‍රයන් කෑ ඇවසා දවස් අරිනෝය. අපගෙන් කවර අඩුවක් ඇතිව කියවුද? අපට වඩා අනික් කවර තාපස කෙණෙක් ඇද්දැ?"යි කීහ.

එවිට ශිරවා කියන්නේ "තොපි ඇම නොයෙක්දෙනා කා ඉතිරී මාංශය කන්නාම තපස්ද? තපස් නම් තමා ලත් දෙයක් දන්දී සුසීලව වාසය කිරීමය.

තොප ඇම ක්‍රීඩාශීලීව වාසව කිරීම දුශ්ශීලභාවය යි මෙතැන් පටන් එලෙස නොකරව"යි තාපසවරුන්ට අවවාද කියා ක්‍රීඩාශීලීකම අරවා තමන්ගේ ශක්‍ර භවනයට ගියහයි වදරා මේ විෂාත ජාතකය නිමවා වදාළසේක.

එසමයෙහි සත්බෑයෝ නම් මේ ක්‍රීඩා ශීලී භික්ෂූහුය, ශක්‍රදේවෙන්ද්‍රව උපන්නෙම් බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 382 වට්ටක ජාතකය

තිවඳ සිතූ සිතුවන් සිත් නිමවන මනහර ගුණ ඇති තිලෝගුරු බුදුරජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලෝභීවූ භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේ ද? යත්**

ලොභී භික්ෂුකෙණෙකුන් වහන්සේ සම්බුදයන් වහන්සේට දක්වන්නා "මහණෙනි, මේ භික්ෂු දැන්මතු නොවෙයි, පළමුත් ලොභීව ඇත්කුණු මිනීකුණු ආදීවූ දෙය බොනෝව කමින් සිට තෘෂ්ණාව වසඟව වනාන්තරයට ගියෝ වේදැ?"යි වදාරා "ඒ කෙසේදැ?"යි ආරාධිතවූ සම්බුදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පිටතිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ වටුව ඉපද වනානන්තරයෙහි වාසය කරණසේක.

එක කපුටෙක් බරණැස් නුවර ඉද ඇත්කුණු මිනීකුණු ආදීවූ දෙය කමින් සිට තෘෂ්ණාව වසඟයෙන් වනානන්තරයට වැද බොධිසත්ත්වයන් මහත්වූ ශරීර ඇතිව වාසය කරන්නාවූ වෘක්ෂය සමීපයට ගොස් උන්නේය. බොධි සත්ත්වයෝ සෘමීවි නිසා කපුටුවානන් දැක "ඇයි මයිලනුවෙනි, මනුෂ්‍යභවනයේ නොයෙක් බාද්‍ය භොජ්‍ය ඇතිව සැපසේ වාසය කළ කල දුම්ලවූයේ කවර කාරණයකිම්දැ?"යි විවාළාහ.

කපුටුවා කියන්නේ "නොයෙක් බාද්‍ය භොජ්‍ය කැවත් මනුෂ්‍යයන් කාපු දෙයක් විහා දිරා නොයෙක් ආයාසයට පැමිණෙන හෙයින් දුම්ලව ගියෙමි. තෙපි කවර කාරණයක්නිසා මෙසේ මහත්වූශරීරයක් ඇතිසේක්දැ?"යි විවාළාහ.

එවිට වටුවා කියන්නේ "අපි නම් අල්පඝන්තොෂයම්හ. යම්තම් ආහාර යක් ලබන්නා ඉන්ම යපි යම්හ. අනිත් ආහාරයක් තව සොයන්ට උවමැත ව"යි යන තෘෂ්ණාවක් නැත. එනිසින් අපගේ චිත්ත සන්තොෂව තිබෙන හෙයින් ශරීරයත් සුපුලුව තිබෙයි" වදාරා මේ වට්ටක, ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි කපුටුවා නම් මේ ලොභී භික්ෂූහුය, එසමයෙහි වටුව උපන් නෙම් බුදුවූ මම්මය යි වදාළසේක.

මේ ජාතකාවසානයෙහි ලොල් භික්ෂූන් වහන්සේ සෝවාන් වූ සේක.

---

## 383 කාක ජාතකය

තවද අසන්නවුන් කන්හි අමා නමන මධුර ධර්මදේශනා ඇති සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලොභී භික්ෂුවක් අරභයා මේ ජාතකය දක්වනලදී.

මෙහි වනාහි වර්තමාන කථාව යට කියන ලද ජාතකවල පෙණෙන්නේය. මෙහි වනාහි:-

පිටහිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ කුල් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ පරෙවිව උපන්නාහ. බොධිසත්ත්වයන් බරණැස් නුවර අරක්කැමියෙක් ගෙණවුත් වඩසේය. කවුඩකුත් බොධිසත්ත්වයන් උන් මැදිරියට අවුත් උන්නේය. කවුඩා අල්වාගෙණ පළමු ජාතකවල කීවාමෙන්ම නොයෙක් වධ පමුණුවා ශරීරයේ පියාකොල ඇම උදුරවාදම්මා සුදුපෑකොට ඇනි බෙල්ලේ කැබිලිත්තකුත් විද අමුණුවා බැඳ එතන ලා ගියහ.

බොධිසත්ත්වයෝ කවුඩාහන් දැක කියන්නාහු 'නාපිතයන් ගෙන්වා ශරීරයේ ලොමුත් බා ඉන්ද්‍රනීල මාණික්‍යයකුත් කරබැඳ කළදා යහපතැ'යි කීහ. කපුටුවා කියන්නේ 'නාපිතයන් ගෙන්වා ලොමුත් බාවා ඉන්ද්‍රනීල මාණික්‍යය කුත් නොපගේ කර බන්දවම්දැ?''යි කියා විවාළේය.

බොධිසත්ත්වයෝ කියන්නාහු 'මේසේවූ ලොම් බැවිලිත් මෙසේවූ ඉන්ද්‍රනීල මාණික්‍යයත් නවම වේද? එතරම් මට ඉන් ප්‍රයෝජන කිම්දැ?''යි කීහ.

කපුටුවා කියන්නේ ''බොහෝදෙන ඉන්ද්‍රනීල මාණික්‍යය පළඳිති, වෙනෙසන නිසා මේ කැබිලිත්ත විද කර බැන්දේය''යි කීහ. බොධිසත්ත්වයෝ මෙසේවූ දුශ්වයන් ඉදිනා භැන ඉදීම කාරණා නොවෙයි. කියා වනාන්තරයට ගියහ යි වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ කාක ජාතකය නිමවා වදාළ සේක.

චතුස්සත්‍යදේශනාවගේ කෙළවර ඒ ලොල් භික්ෂූන් වහන්සේ අනාගාමීවූ සේක. එසමයෙහි කවුඩා නම් මේ ලෝභීවූ භික්ෂුහුය, එසමයෙහි පරෙවිව උපන් තෙම් බුදුවූ මම්මය යි වදාළසේක.

# සවෙනි නිපාතය නිමි.

---

තවද සත්වෙනි නිපාතය දක්වන්නෙමු.

## 384 කුක්කු ජාතකය

ඒසන්නවුන්ගේ කන්හි අමා තමන මධුර දේශනා ඇති සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි රාජෝවාදයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

මේ කථාව විස්තර වශයෙන් තෙසකුණ ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහි:-

රටිගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙනෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරණ අමාත්‍ය ධුරයේ උපන්සේක.

ඒ රජ වනාහි දශරාජ ධර්මයෙන් විරුඬව තමන් සිතූ දෙයක්ම කරන්නේය. රාජ්‍යය අධර්මයෙන් පිළිපන්නේය. බොධිසත්ත්වයන් වහන්සේ "මේ රජ්ජුරුවන්ගේ අභිප්‍රාය කාරණයකින් ගිවිස්වා අරවාලතොත් විනා අවවාද කියා අරවාලිය නොහැක්කැ"යි සිතා කාරණා සොයන්නාහු ඒ අවස්ථාවෙහි රජ්ජුරුවෝ එක්දවසක් උයන් බලන්ට ගියහ. උයනේ රජ්ජුරුවන් අමුතුව කරන්නාවූ මණ්ඩපයෙක් ඇත්තේය. රජ්ජුරුවෝ මණ්ඩපකර්මාන්ත බලන්ට ය යි ඇතුළට වන්නාහු ගොණැස් උරවා තුබූ කැණිමඬුල්ල දැක "වැටියේ මෙහෝ යි සිතා මෑතට අවුත් බොධිසත්ත්වයන් කැඳවා කියන්නාහු "එම්බා අමාත්‍යයාතනි, මේ කැණිමඬල නොවැටෙන්ට කාරණා කිම්ද?"යි කීහ.

බොධිසත්ත්වයෝත් රජ්ජුරුවන් වහන්සේට අවවාද කියන්නට යහපත් කාරණාය යි සිතා කියන්නාහු "දේවයන් වහන්ස, මේ ඵලය හැර යහපත්ව සැසහැර තරව උරවන ලද්දාවූ ගොණැස් බලයෙන් මඬුල්ල රඳන්නේය. කැණි මඬල බලයෙන් ගොණැස්ස නොවැටෙන්නේය. දේවයන් වහන්ස, කැණි මඬල නම් රජ්ජුරුවන් වැන්නේය. ගොණැස්ස නම් අමාත්‍යමණ්ඩලයා වැන් නේය. ඉන් එක් ගොණැස්සෙක් දිරාගිය නමුත් ඒ දිශාවට කැණිමඬල කැමී යන්නේය. එමෙන් එක අමාත්‍යයකුට වැඩිමකුව නමුත් රජදරුවන් වහන් සේට අලාභවන්නේ නොවෙයි. ලොකපාලවූ රජදරුවන් විසින් අමාත්‍ය මණ්ඩ ලයා ඇතුළුවූ සියළු ප්‍රජාව නොමිරිකා දශරාජධර්මයට අකොපයව රාජ්‍යය කළ යුත්තේය"යි බොධිසත්ත්වයෝ කීහ.

රජ්ජුරුවෝ බොධිසත්ත්වයන් කී බසට සතුටුව උන් අවස්ථාවට එක් පුරුෂයෙක් ලප්කාරං ගෙඩියක් ගෙනවුත් රජ්ජුරුවන් අතට දිනා. බොධි සත්ත්වයෝත් මෙයින් අවවාද කියන්ට නිසි කාරණයෙකැ යි සිතා "දේවයන් වහන්ස, මේ ලප්කාරන්ගෙඩිය නුවණැත්තේ තිත්තත් ඇර ඇඹුලත් ඇර අනු භව කෙරෙද්ද? නුඹවහන්සේත් පැවත ආ රාජධර්මය නොහැර රාජ්‍යවාසීන් ගෙන් කරවූවර ගතමනා දෙය හැරගෙණ රාජ්‍යවාසීන්ගෙන් අත්‍යයාගේ අර්ථය නූපදවනසේක්ද ලප්කාරන්ගෙඩිය පොත්ත තුනී වීතම් තිත්තරස වන්නේය මස් ඝනවී නම් ඇඹුල්රස වන්නේය, තිත්තත් නොවී රස අනුභව කරන්නාක් මෙන් රාජ්‍යවාසීන්ගේ කරවූවර ගෙණ රට රක්නා රජ්ජුරුවන් අමාත්‍ය මණ්ඩලයා සිත් ගන්නාහ"යි බොධිසත්ත්වයෝ කීහ.

බොසත්ත්වයන් කී බසට සතුටුව කථාකොට මඟුල්පොකුණට ගියහ. මඟුල් පොකුණෙහි යහපත් පියුමක් පිපී දියට රියනක් විතර උස්ව සිරිසේය. රජ්ජුරුවෝ කියන්නාහු "එම්බා අමාත්‍යයාතෙනි, දිය හා මඩ ආධාර කොට ඇතිවූ මේ පියුම මඩෙහිත් දියෙහිත් දෙකින් වෙන් වෙන්ව පිපෙන්ට කාරණා කිම්ද?"යි විවාළාහ.

බොධිසත්ත්වයන් වහන්සේ එවිට කියන්නාහු "දේවයන් වහන්ස, ලොක පාලවූ රජදරුවන් වහන්සේත් ලෝභ වෙෂ මෝහ මදමාන මාතසර්‍යාදිය යන

සියල්ලෝම මේ පියුම් පරිද්දෙන් ඇලීමක් නැතිව දශරාජධර්මයෙන් රාජ්‍යය කරණසේක් වීනම් බ්‍රාහ්මණ වෛශ්‍ය ගෘහපති යන සියල්ලෝම රජදරුවන් වහන්සේට ඉතා පසන්වන්නාහ''යි කීහ.

රජ්ජුරුවෝත් බොධිසත්ත්වයන් කී අවවාදයෙහි පැහැදී එතැන් පටන් දශරාජධර්මයෙන් අකොපාය්‍ය දානශීලාදී පිංකම්කොට දෙව්ලොව ගියහයි වදාරා මේ කුක්කු ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද සථවිරයන්, එසමයෙහි රජ්ජුරුවන්ට අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මය යි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 385
## මනෝජ ජාතකය

මේ කථාව සිංහිසවණීයක් බදුවූ සමීඥ යන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් විපසශීලී භික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්,**

එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ දෙවදත්ත සථවිරයන් වහන්සේගේ භික්ෂුකෙණෙකුන් වහන්සේ හා එක්ව හිතව වාසය කරණසේක. මේ කාරණය එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ මේ මහණ කැදවා ගෙණ ගොස් සමීඥයන් වහන්සේට පැසේක. ''සැබෑද මහණෙ''යි විචාරා වදාරා ''සැබෑ ව සවාමීනි''යි කී කල්හි ''දැන්මතු නොවෙයි, මහණෙනි, පෙරත් මේ මහණ විපසශීලීව වාසය කළේ වේදැ''යි වදාරා ''ඒ කෙසේදැ?''යි ආරාධිතවූ සමීඥයන් වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

අතීතයෙහි දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක් වනයක සිංහයකු හා සිංහධෙනුවක් වාසය කරන්නීය. ඒ සිංහධෙනුව දුවකු පුතකු වැදූහ. සිංහපොතකයාට මනෝජය යි නම් තුබූහ.

ඒ සිංහයා වැඩිවිය පැමිණි කල අනික් සිංහධෙනුවක් බිරින්දව ගෙණවිත් තබා මවුපියන් දෙදෙනා තැගනියන්ද බිරින්දද තුමූද යන පස්දෙනාවද ගොදුරු සොයා ගෙණවිත් දී රකිනාහ. එසමයෙහි එක් දවසක් ඒ මනෝජ නම් සිංහයානන් ගොදුරු සොයා ගෙණෙන්නට යන කල්හි එක් ගිරි නම් කැණ හිලෙක් සිංහයා ඉදිරියට පැමිණියේය. තමා එන යන තැනක් නැති හෙයින් සිංහයා වැදගණ ඔත්තේය. සිංහයානෝත් හමුව කිමෙක්දැ?''යි විචාරා ''නුඹ වහන්සේව සේවයට ආම්''යි කී කල්හි ''යහපතැ''යි තමන් වාසය කරන්නාවූ ගල්ලෙනට කැන්දගෙණ ගියහ.

සිංහයානන්ගේ පියවූ සිංහ රජ්ජුරුවෝ ''මේ නීවවූ සිඟාලයා කුමව ගෙණාවුදැ?''යි පුතනුවන්ව කීහ. මනෝජ නම් සිංහයානෝ පියානන් කී බස නොගිවිසම සිඟාලයා පොෂ්‍ය කරන්නාහ. ඒ සිඟාලයා එක් දවසක් සිංහරජ්ජු

රුවන්ට කියන්නේ "සෙසු මස්කා අභ්‍යාසයෙමි. අස්මස් කැවා නැත. සවාමිනි මට අසකු අල්වා දුනමැනවැ"යි කීහ. රජ්ජුරුවෝ "යහපතැ"යි කියා විවා රන්නාහු "අසුන් ඇත්තේ කොහිදැ?"යි විවාළාහ.

කැණහිල් කියන්නේ "බරණැස් ගඟ නාන්ට බරණැස් රජ්ජුරුවන්ගේ අසුන් ගෙණෙන්නාහ. ඉන් එකකු අල්වාගෙණ එව"යි කීහ. සිංහරජ්ජුරුවෝත් "යහපතැ"යි බරණැස් ගඟ සමීපයට ගොස් නාන්ට ගෙණා අසුන්ගෙන් එකකු බෙල්ල බිඳ පිටට දමාගෙණ ගල්ලෙනට ගෙණ ගොස් මැනියන් ඇතුළු ඇමදෙනාවත් බෙදා දී තමනුත් කා කැණහිලාටත් දුන්හ. වැඩිමාළු සිංහ රජ්ජුරුවෝ පුතනුවන් අතින් මේ අස්මස් කෑ සිංහයන්ගෙන් බොහෝ කලක් ජීවත්වූ කෙණෙක් නැත. අස්සු තම් රාජවාහනය. රජදරුවෝ තමන්ගේ රාජ වාහනයට උපද්‍රවවූකල කිපිවිද්දවායති. යම්උපායකින් නසවති. "මෙවක් පවන් අසුන්ගේමාංශය නොකව"යි සිංහරජ්ජුරුවෝ පියානන් කීවා නොකොට අසුන් අල්වා කන්නාහ.

රජ්ජුරුවෝත් අසුන් ගෙන්වා රාජාඞ්ගනයේ අස්සල බැඳ ඇතුළේ පොකුණක් බිඳුවා අසුන් නාවන නියායෙන් සලස්වා තමන්ගේ දුනුවායන්ට විධානය කරන්නාහු "මාගේ අසුන් කෑ වනසන්නාවූ සිංහයා විදුව"යි දුනුවා යන්ට විධාන කළහ.

දුනුවායෝත් "යහපතැ"යි සිංහයා එන වේලාව පරීක්ෂා කොට ඇවිදි නාහු පවුරු පැනැගණ එන්නාවූ සිංහයා දැක "දැන් විද්දමෝ නම් සැහැල්ලු හෙයින් වැරදයෙයි. අසු අල්වාගෙණ යනකල විදුම්හ"යි සිතා අසකු අල්වා ගෙණ පැනයන්නාවූ සිංහයාට පස්සෙන් විද ඉදිරියෙන් දඩවාලා විද්දුහ. සිංහ යාත් මරණ භයින් මහත්කොට අඩගසා තමාගේ ගල්ගෙටම පිනීය. විදි තැනැත්තේ "සිංහයා විද්දෙමි"යි අඩගැසීය. කැණහිලා සිංහයා මරණ භයින් ගැසූ අඩත් මනුෂ්‍යයා ගැසූ අඩත් අසා සිතන්නේ යාළුවූ සිංහයානෝ මළහ. මා ජීවත්වන්ට උපායකුත් නැත. මිය පරලොව ගියවුන් හා ඉතිකින් කවර විශ්වාසද? මා අනිත්තැනක යෙමි සිතා පළාගියහ.

සිංහයාත් තමාගේ ගල්ලෙනම වැටිහිත. සිංහයානන්ගේ මව්පියෝ දෙන්නත් නැගනියෝත් බිරින්දත් සතරදෙන සිංහයා වටකොටගෙණ ඉඳ කියන්නාහු "පාපීවූ දුෂ්ටවූ ගිරි තම් සිඟාලයා කීවා කොට මනෝජ නම් සිංහ යාත් විනාශයට පැමිණියේ වේද, යම්සේ අසත්පුරුෂයන් හා සංවාසය නොකරව යි කී අවවාද නොගිවිස මාගේ පුත්වූ මනෝජ නම් සිංහරාජයා මරණට පැමිණියේය"යි සිංහරාජයාතෝ කීහ. සිංහයාගේ මැනියෝ කියන්නාහු "යම්සේ වැදූ දරුවෝ නොකීකරුවෝ නම් මැනියෝ උන් කෙරෙහි ඇලීමක් නැත්තාහ. මාගේ පුත්වූ මනෝජ නම් සිංහරාජයා කීවා නොකොට අසත් පුරුෂයාගේ බස් කිවිස ලේ කටින් දමා වැදහොත්තේ වේදැ?"යි කීහ.

සිංහයානන්ගේ නැගනියෝ කියන්නාහු "යම් කෙණෙක් පාපිජටයන්ගේ බස්ගෙණ කීවා කෙරෙද්ද? මැනියන් වහන්සේ කීවාමෙන්ම මාගේ බෑනන් වහන්සේව පැමිණියා මෙන් මරණට පැමිණෙන්නේ වේදැ"යි කීහ. සිංහයා නන්ගේ බිරින්ද කියන්නාහු යම්සේ උත්තමයෝ උත්තමයන් හා භජනය

කෙරෙද්ද? නීවයෝ නීවයන් හා වාසය කෙරෙද්ද, නීවයා හා උත්තමයා කරන්නාවූ භජතය මේ දෙකම කුමක්මෙන්ද?යත් සිවුපාවන්ට උත්තමවූ සිංහරාජයා අධමයා හා එක්වීමෙන් සැරපහර ලදින් විනාසයට හියාවනයි කීහ.

ඒ අභිප්‍රාය දක්වන්නාවූ සර්ඥයන් වහන්සේ "එම්බා මහණෙනි, නීවයා නීවයාම සෙවුනා ලබන්නේය. උත්තමයා උත්තමයාම සෙවුනා ලබන්නේය. නීවයා උත්තමයාගේ විශ්වාසයද උත්තමයා හා නීවයාගේ විශ්වාසයද සිඟාලයා හා සිංහයා මෙනැ"යි වදාරා මේ **මහාජ ජාතකය** නිමවා වදාළසේක.

ඒ විපක්ෂශීලී භික්ෂූන් වහන්සේ දහසක් නයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් මාගීයට පැමිණිසේක.

එසමයෙහි සිංහයා නම් මේ භික්ෂුහුය. සිංහයාට විශ්වාසව උන්නාවූ කැණහිලානම් දෙවදත්තසථවිරය. සිංහයාගේ බිරින්ද නම් ඛෙමා නම් සථවිරාය. සිංහයාගේ නැගනියෝ නම් යසොධරා සථවිරාය. සිංහයාගේ පියවූ සිංහයා නම් බුදුවූ මම්මය යි වදාළසේක.

---

## 386
## [1]ධම්මසොණ්ඩක ජාතකය

**මේ**වද එක්සමයෙක්හි තුන් ලොවට චින්තාමාණික්‍යයක් බඳුවූ සඳහිමිවර චක්‍රවර්තීවූ ශීල සමාධි ප්‍රඥාවෙන් යුක්තවූ සංසාර සාගරයට පහුරක් බඳුවූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ සකල සත්ත්වයා කෙරෙහි පතළාවූ මහා කරුණාව ඇතිසේක් මේ ජාතකය දෙශනා කර වදාළ සේක. මෙහි ලා වර්තමාන කථාව අප්‍රකට හෙයින්ද මුල් ජාතක අටුවා පාලියෙහි නොදක්නා හෙයින්ද ඒ මෙහි නොදක් වන්නේය. අතීතයෙහි අපමණ බෝසතාණන් වහන්සේ ධර්මශ්‍රවණයෙහි ලොල්ව ජීවිතනාතරාය පවා නොසලකා, රාජ්‍ය සම්පත්තියෙහි නො ඇලී වනගතව ඇවිදිනාසේක්, භයානකවූ රාක්ෂයෙකු හමුව උහු මුඛයට පිනුයේ දෙව්ලොවට ගොස් ශක්‍රදිව්‍යරාජයාගෙන් ධර්මශ්‍රවණය කළ සේක.

**ඒ කෙසේද? යත්**

**යි**වකිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණ ලද බොධිසම්භාර ඇති අප මහ බෝසතාණෝ ඒ රජ්ජුරුවන්ගේ අග්‍රමහෙෂිකා බිසවුන්කුස පිළිසිඳ ගත්තාය. ඒ බොධි සත්ත්වයන්ට නව් තබක දවස් කුමාරයන් උපන් ඇසිල්ලෙහි සියලු සත්ත්වයන්ගේ සිත්හි දහම් ඇත හැඟීමක් පහළවූ හෙයින් දහම්සොඬ කුමාරයෝය යි නම් තුබූහ. මහත්වූ යසපිරිවරින් වැඩෙන ඒ කුමාරයානෝ සියලු ශිල්පයන්හි නිපුණත්වයට පැමිණියේ, පිය රජු විසින් යුවරජ පදවියෙන් පුදන ලද්දාහු, උන්ගේ ඇවැමෙන් ඇමතියන් විසින් රාජ්‍යයෙහි අභිෂෙක කරණු ලැබුවෝ

---

1. මේ ජාතක කථාව ෂඩ්ඩන්තක ථාවෙහි නොමැතිසි.

දහම්සොඬ රජයයි ප්‍රසිද්ධවූන. දෙවිතුවරක් බදුවූ බරණැස්තුවර චක්‍රවර්ති රාජ්‍යයක් සමානවූ රාජ්‍යය කරන්නාහු, මස් අඩමසක්හුගේ ඇවැමෙන් සිරියහ නට පැමිණ මෙසේ සිතුය.

මම් වූකලී ධර්මයෙන් වෙන්ව රාජ්‍යය කිරීම සූයස්සියාගෙන් වෙන්වූ අහස මෙන් නොහොබනේය. පෙර ජාතියෙහි කරණ ලද ශීලාදීවූ කුසල කර්ම හෙතුකොට ගෙණ ශක්‍රපුරයෙහි ශක්‍ර දිව්‍යරාජයා මෙන් මේ උතුම් නුව රෙහි රාජ්‍යයට පැමිණියේ වෙමි. මනාවූ රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පඤ්චකාම වස්තූන්ගෙන් සමෘද්ධයෙමි. එසින් ප්‍රමාද භාවයට නොපැමිණිය යුත්තේය. එසේහෙයින් මා සන්තකවූ ධාන්‍යද ධනයද ශරීරාඞ්ගයෝද ජීවිතයද දෙන්ට වටනේය. එසේ කොට ධර්මශ්‍රවණය කරන්ට වටනේය. යම්සේ අව කාශය සූයස්සියා නැති කල්හි නොහොබනේද, රාත්‍රිය චන්ද්‍රයා නැති කල්හි නොහොබනේද, සරඝන ලද හස්තිරාජයකු වූවහොත් දළයුවලින් වෙන්ව නොහොබනේද, මේ සුවාසුදහසක් යොදුන් ගැඹුරුති මහා සාගරය වේලාගන්න යෙන් වෙන්ව නොහොබනේද, මනාකොට සැරසුන රජු ක්ලිෂ්ටවස්ත්‍රයෙන් යුක්තව නොහොබනේද, එසේම මාගේ ධර්මයෙන් වෙන්ට රාජ්‍යය කිරීමත් නොහොබනේමය. එහෙයින් ධර්මයම අසන්නෙමි. මාගේ සිත ධර්මයෙහිම ඇලෙන්නේය. ධර්මයට වඩා උතුම් දෙයක් නම් නැත්තේමය. දෙව් මිනිස් භා නිවන් යන ත්‍රිවිධී සම්පත්තිය ධර්මයම මූල්කොට ඇත්තේය'' යයි කියායි.

ඉක්බිත්තෙන් ඒ රාත්‍රිය පහන් කොට පසුදින ඇමතිගණයා කැඳවා කියන්නේ, ''එම්බා ඇමැතියෙනි, තෙපි යම් කෙණෙක් බුදුන් විසින් වදුළ ධර්මයන් අතුරින් යම් කිසිවක් අසා දතුනම් කියව්, අසනු කැමැත්තෙමි''යි කිවුය අමාත්‍යයෝ කියන්නාහු, ''සවාමීනි, අපනොදනුම්හ'' කිවුය. ඒ අසා නොසතුටව පත් ඒ දහම්සොඬ රජ්ජුරුවෝ ඇතකුපිට දහසින් ඔබදි පියල්ලක් තබා නුවර බෙර හසුරුවා චතුෂ්පදික ගාථාවකින් වුවද ධර්මශ්‍රවණය කරන්නෙමි නම් යහපතැයි සිතුය. එසේකොටද ධර්මදේශකයකු නොලබන්නේ, නැවත දෙදහස් තුන්දහස් පන්දහස් ආදීවශයෙන් පියලි බදවා තබා ඇතු යවන ලද්දේද ධර්මය කියන්ට දත් කෙණෙක් නොලද්දාහුමය.

එසේ හෙයින් ගම් නියම්ගම් රජදනව්වලද එසේ ඇතු යවා ධර්මය දෙශනා කරන්ට දත්තවුනට රජකම දෙමැයිද දැස වෙමැයිද කී නමුත් බණ දන්නවුන් නොලද්දේමය. එකල්හි ඒ රජ්ජුරුවෝ කළකිරී රාජ්‍යය ඇමති යන්ට පාවාදී වනගතවූය. එකෙණෙහි ශක්‍රදිව්‍යරාජයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු විය. එසේ හුණුවන්ට කාරණා කිම්දෝ හෝ යි බලන්නේ දහම්සොඬ රජ්ජුරුවන් ධර්මශ්‍රවණයෙහි ලොභකොට රාජ්‍යය හැරදමා වනගත වුනු නියාව දැක ''ඉදින් මේ උත්තම සත්ත්වතෙමේ මරණයෙන් විනාශයට පත්වී නම් නොහෙබනේය.

එසේහෙයින් දැන්වූකලී මා විසින් ඔහු දහම් රසයෙන් සන්තර්පණය කළ යුත්තේය''යි සිතාවුත් මහත්වූ භයානකවූ රකුසු වෙසක් මවාගෙණ රජ්ජුරු වන් සමීපයෙහි ඇත් මැත් බලා ඇවිදින්නේය. එකල්හි රජ්ජුරුවෝ ඒ රාක්ෂ සයා දැක විත්තෝත්‍රාසමාත්‍රයක්වත් නොඋපදවා උඟ වෙත එළඹ ''එම්බා රාක්ෂ

සයානනි, මම්වූකලී රාජ්‍යය හැරදමා ධර්මය සොයමින් වනන්හ ගතවූයේර වෙමි. ඉදින් බුද්ධභාෂිතයක් දන්නාහු නම් කියව"යි කීවුය. එබස් ඇසූ රාක්ෂසයා කියන්නේ, මම එකදෙශ බුඩභාෂිතයක් දන්නෙමි නමුත්, කියන්නාවූ මට තොප විසින් කුමක් දෙන්නෙහිද"යි කීවුය. එකල්හි රජ්ජුරුවෝ කියන්නෝ "ඉදින් මම රාජ්‍යයෙහි සිවියෙම්වීම් නම් තොපට මහත් සම්පත් දෙමි. දැන්වූකල්හි වනමැද හුදකලාවූයේ, මාගේ මේ ශරීරය විනා අන්කවරක් දෙන්නෙම්ද?"යි කීවුය. "එසේවී නම් බඩසයින් පීඩිතයෙමි. පළමුව තොප කා පසුව දහම් දෙසන්නෙමි, කී කල්හි, "ඉදින් මා පළමුව කා පසුව කාට දහම් දෙසන්නෙහි ද?"යි විවාළහුට රාක්ෂසයා කියන්නේ, "මම යුක්තියක් දන්නෙමි වේද"යි කියා තුන්ගවු පමණ උස ඇති පළිතයක් මවා ඊමතු පිට සිට බෝසතුන් පනින තියාවට හිවිස්වා පනින කල්හි බණ දෙසන්නෙමි කීවුය.

මහබෝසතාණෝද යකපතැයි හිවිසගෙණ මාගේ මේ ජීවිත දානය වූකලී බුදුබව සඳහාම වේයයි ප්‍රාර්ථනා කරමින් දිළිසෙන මහා අග්නිජ්වාලාවකු බඳුවූ රාක්ෂස මුඛය තුළට පිනූහ.

එල්හි සක්දෙව් රජතෙමේ රහසුවෙස් හැරදමා සවකීය වෙශයෙන් සිවියේ බෝසතුන් වැළඳගෙණ දෙව්ලොවට ගෙණ ගොස් පඬුපුල්සලස්තෙහි වඩා හිඳුවා කසුප් බුදුරජානන් වහන්සේ විසින් දෙශනා කරණ ලද්දාවූ "අනිච්චා වත සංඛාරා-උපපාදවයධම්මිනො, උපපජ්ජිත්වා නිරුජ්ඣන්ති-තෙසං වූපසමෝ සුඛෝ"යි යන ගාථාවෙන් ධර්මදෙශනා කොට දෙව්ලොව දෙව්සැපත් දක්වා ගෙණවුත් සිය රාජ්‍යයෙහිම පිහිටුවා, මහරජ, කුසල්හි නෝපමාව"යි අවවාද කොට දිව්‍යලොකයටම ගියේය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා, පූර්වාපරසන්ධි ගලපා මේ "ධම්මසොණ්ඩක ජාතකය" නිමවා වදාළසේක. එසමයෙහි දානශෝඩ රජ්ජුරුවෝ නම් දැන් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 387 සුතනු ජාතකය

තීවද ධර්මාධිපතිවූ සර්ව්ඥයන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවසන සමයෙහි මව්පිය දෙදෙනාව උපස්ථාන කරන්නාවූ භික්ෂුකෙණකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

මෙහි වර්තමාන කථාව විස්තර වශයෙන් සාම ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වනාහි:-

එවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයන් වහන්සේ දුප්පත් ගොවිකුලයක උපන්සේක. උන්වහන්සේට නම් තබන්නාහු සුතනු කුමාරයෝය යි නම් තුබූහ.

එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ අමාත්‍යමණ්ඩලය හා සමග සේනාව ඇරගෙණ දඩයමට ගොස් එක් බැද්දක් වටකොටගෙණ රැකවල් ලවා විධාන කරන්නාහු ''යම් එකකු සිටිනා තැනින් මුවෙක් පලාගියේනම් ආඥාකරවම්''යි භයගන්වා කොටුපතෙක තුමූ සිටියහ. එක් පිණිමුවෙක් රජ්ජුරුවන් සිටිකඩින් ඉදිරියට එන්නේය. රජ්ජුරුවෝත් විෂපෙවූ කණුගීය දුනුපිට ලා ඇද මුවාව විද්දාහ. මුවා හීය වළනා හීය වැදගත්තාක්මෙන් අඟවා වැටිහින. රජ්ජුරුවෝත් ''මූ මා විත් කා වැටිහිනැ''යි සිතා ලඟට ගියහ. රජ්ජුරුවන් ලඟ එන්නාවූ මුවා නැගී සිට දිවගත්. වටසිටියෝ රජ්ජුරුවන් වහන්සේ සිරි තැනින් මුවා පලා ගියේයැ''යි කියා වෙහෙසුහ. රජ්ජුරුවෝත් ලජ්ජාවී කඩුව අතට ගෙණ මුවා ලුහුබඳවාගෙණ තුන් යොදනෙක ගොස් මුවා අසුකොට කඩුවෙන් දෙපලු කොට සිතන්නාහු මුවා මැරූ නියාව කී තමුත් නුවරවාසීහු අදහා නොගණිති. මුවා කදව බැඳ කරතබාගෙණ එන්නාහු බරණැස්නුවරව නුදුරුතැන නුගසක් මුල සැතපී ඉඳ යන්නට වන්නාහු ඒ නුගගසහි වසන මඛාදෙව නම් යක්ෂයෙක් රජ්ජුරුවන් කරාගොස් ''දඩමස් කද අල්වා රදව''යි කීහ.

එවිට රජ්ජුරුවෝ කියන්නාහු ''ඇයි කුමක් නිසා රැඳවීදැ?''යි විවාළහ. යක්ෂයා කියන්නේ ''මේ නුගසෙවන යට වන් කෙණෙකුන් කන නියාගෙන් වෙසවුණු රජ්ජුරුවන්ගෙන් වර ලදිමි. මට ගොදුරුව යා නොහැක්කැ'' යි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු ''මම එසේ කිනම් එකෙකිමි නොවෙමි බරණැස් රජෙමි. අද මට මේ දඩමස් කද ගෙණ මා නුවරට යවව, නොපව දවස බත් තලියක් හා මිනිසකු එවම්'' කීහ.

යක්ෂයාත් ''යහපතැ''යි ගිවිස රජ්ජුරුවන් නුවරව යැවීය. රජ්ජුරුවෝත් නුවරව ගොස් තමන් වැඩ පසස්නා අමාත්‍යයකුට කීහ. අමාත්‍යයා කියන්නේ ''සාමීනි, අවධිය කීයේ ඇයිද''යි කීහ. රජ්ජුරුවෝත් ''නැතැ''යි කීය. අමාත්‍යයා කියන්නාහු ''අවධියක් නොකීයේ වැරැද්දැ සි එසේවුවත් භය නොකළ මැනව, නුඹවහන්සේගේ ජීවිතය රැකදෙමි. මට සිරඟෙය දුන මැන වැ''යි සිරගෙය ඇරගෙණ විධානකරන්නාහු රැකෙන්නා කැමති කෙණෙක් මේ බත්තලිය යක්ෂයාව දෙව්''යි කියා යවන්නාහු මෙම නියාගෙන් නිරන්තර යෙන් බත්තලියක් හා මිනිසකු බිලිදීමෙන් සිරගෙයි මනුෂ්‍යයෝත් නිමාගියහ.

අමාත්‍යයා එපවත් රජ්ජුරුවන් වහන්සේට කියා රජ්ජුරුවෝත් එපවත් අසා ජීවිතයට වඩා මනුෂ්‍යයෝ අප්‍රියෙහි ලොහ ඇත්තාහ. දහසින් බඳ පියල්ලක් ඇතුපිට තබා ''මේ මසුරන් දහස ඇරගෙණ යක්ෂයාට බත්තලිය දෙව''යි නුවර බෙරලවා මසුරන් දහස ඇරගත් කෙණෙක් ඇත්නම් උඹ අත බත්තලිය යව''යි කීහ. අමාත්‍යාත් එලෙස කෙළේ ය.

බොධිසත්ත්වයන් වහන්සේ ඒ මසුරන් දහය ගෙණ යක්ෂයාව බත්තලිය දෙව යි නුවර බෙරලැවූ මසුරන් දහසගෙණ මැනියන්දුට දී සිතන්නාහු ''මේ මසුරන් දහස මැනියැන්දුව දී ගිය කල යක්ෂයා දමනයෙහිලාගතහොතින් නම් බොහෝ සම්පත් ලැබෙමි. නැත මේ යක්ෂයාට බිලිවෙමි. මසුරන් දහස කිප දවසක් රැකෙන්ට ඇත්තේවේදැ''යි සිතා ''මැනියන්වහන්ස, මම යක්ෂයාට බත්තලියක් ඇරගෙණ යෙමි'' කීහ.

එවිට මැනියන්දැ කියන්නාහු ''පුතණුඩ නොප කී මසුරන් දැසෙන් මට ප්‍රයෝජන නැත. යක්ෂයා ලඟට නොප නොයව''යි කීහ. බොධිසත්ත්වයෝ

කියන්නාහු "මැණියන් වහන්ස, භය නොකළ මැනව, ඒ යක්ෂයා දමනයේ ලැ අඩන්නාවු නුඹවහන්සේගේ මූණ සිනාස්සමින් එමි. මැණියන්වහන්සේ කිප වාරයෙක කීවාවූ අවවාද නොගිවිස අස්වසා රජ්ජුරුවන් හා සමග රජගෙට ගියහ.

රජ්ජුරුවෝත් දරුව නොපට වුවමනා කිම්දැ?"යි කීහ. "සවාමීනි, නුඹවහන්සේගේ මිරිවැඩිසඟළ වුවමැනවැ"යි කීන. "කවර කාරණයකටදැ"යි කීන. "දේවයන්වහන්ස, යක්ෂයා සතනක බිම නොසිටිනා නිසාය"යි කීහ. "යහපතැ"යි මිරිවැඩි සඟළදී තව කුමක් වුවමනාදැ"යි කීහ. "සේසත වුව මැනවැ"යි කීන. "ඒ කවරදැ"යි විචාළහ. "යක්ෂයාගේ ඡායාවට යට නොසිටිනා නිසාය"යි කීහ, "යහපතැ"යි සේසතත් දී "තව කුමක් වුවමනාදැ?"යි කීහ "සාමීනි, නුඹවහන්සේගේ මගුල් කඩුව වුවමැනවැ"යි කීහ. "යහපතැ"යි කඩුවත් දී "තව කුමක් වුවමනා දැ?"යි කීහ. "නුඹවහන්සේගේ රන්හාලියේ නුඹවහන්සේ මේ නිමවන්ට සපයන ලද රසමසවුලෙන් යුක්තවූ භොජනය ලැ දුනමැනවැ"යි කීහ. "ඒ කවරට දැ?"යි රජ්ජුරුවෝ විචාළහ. "මා තරම් නුව ණැත්තාවූ පුරුෂයකු ගෙණ යන්නාවූ බත් ලෝ තලියෙන් සමාන බත ගෙණ යාම යුක්ත නොවන හෙයිනැ"යි කීහ. රජ්ජුරුවෝ යහපතැ යි රන්තලියේ බත් ලවා සරහාදී මෙකියන සියල්ලම ගෙණයන්ට මිනිසුන් සලස්වාදී යවූහ,

බොධිසත්ත්වයෝත් මේ හැම ඇරගෙණ නික්මගොස් නුගගස සමීපයේදී මිනිසුන් රදවා බත්තලිය අතට ගෙණ රන්මිරිවැඩි සඟළ පය ලා සේසත අතට ගෙණ කඩුව උරයේ බහාගෙණ බත්තලිය බිම තබා කඩුව අතටගෙණ කඩු පතින් බත්තලිය නුග ඡායාව යවට කොට "මේ ගස වසන්නාවූ මඛාදෙව නම්, යක්ෂයා අපගේ රජ්ජුරුවන්ගෙන් එවනලද රසමසවුලෙන් යුක්තවූ මේ තලිය ඇරගණුව"යි අඩගැසීය.

එවිට යක්ෂයා සිතන්නේ මෙතෙක්දු එන්නාවූ පුරුෂයන්ගේ නොවෙයි, වඤ්චාප්‍රයෝග දන්නා එකෙක, මා වඤ්චාකොට ගැලවීයෙමි සිතාය යි කියා කියන්නේ තා ඉවත සිට කථාකරන්නේ ඇයිද? නුගගස යට සිට මා හා කථා කරව, බත්තලියත් මාගේය, තොපිත් මාගේ සතනකමය, බත්තලියත් කම් නොපිත් කම් යි කීය.

එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බල රාක්ෂසය මා කයි නම් තව මය අඩුව බරණැස්නුවර මවවඩා නුවණැති පුරුෂයෙක් නැත. එසේවූ සුතනු කුමාරයන් වැනි නුවණැති ගුණ ඇති පුරුෂයකු කෑපු රාක්ෂසයා අප තිබාදැ?යි කීයා සෙට පවත් තව ගෙණෙනා බත්තලියත් නැත, මිනිසුන් නැත; ඉදින් මා නොකා අලවූ නම් නොව නිරන්තරයෙන් එවන බත්තලිය එවමි. ඉදින් මා කන්ට සිතී නමුත් කෑ නැත, තාගේ බිම මා නොසිටි හෙයිනුත් තාගේ ඡායාව නොසිටි හෙයිනුත් කෑ නැත, නුගගස ඡායාවට වත් කෙණෙකුත් විනා කෑ නැති හෙයිනුත් තමාම කෑ නැත, ඉදින් නොනැවත අයි නම් කඩුවෙන් දෙකඩ කෙරෙමි. ඉදින් අපගේ රජ්ජුරුවන් වහන්සේ ගොස් අල්වා ගණිමි යි කී නමුත් තාගේ නුග ඡායාවෙන් ඉවත්ව සිටි හෙයින්

කැතොනැක්කැයි කිහ. එවිට යක්ෂයා මුන් කීයේ සැබව, මුන් කැයෙම්වීම් තම් සෙට පවින් මට ගෙණෙන බත්තලියත් මිනිසුන් නැත, එසින් අලාභයයි මා හොසින් රජ්ජුරුවන් ඇල්ලිය නොනැක්කැයි මුන් කීයේ කටයුතුයයි සිතා යහපත තෘගේ ජීවිතය දිනිම්. තෙල තලියත් සේසතත් කඩුවත් මිරිවැඩි සඟළත් රජ්ජුරුවන්ටදී අඩන්නාවූ මැනියත් සතුටු කරවයි කිහ. නොපි හොසින් සෙට පවත් මට එවන බත් තලිය හා මිනිසා එවයි කිහ. එවිට බොධිසත්ත්වයෝ යක්ෂයා මාගේබසට ලැබිත මාසිතුවා මුදුන්පත්වීයයි සිතා එවිට කියයන්නාහු එම්බල යක්ෂය, ප්‍රාණඝාත කිරීම තම් මෙලෝ පරලෝ දෙකින්ම අලාභවත කවයුත්තය, ප්‍රාණඝාතාදිය නොකරවයි යක්ෂයා දමනයේ ලාගෙණ මෙතන වනයේ වාසයකොට කම් කිම්ද? බරණැස්නුවර වාසල්දොර දේවාලයක් සරහා රජ්ජුරුවන් වහන්සේට කියා දෙවම්න් යක්ෂයා ලවා සේසතද රත් තලියද ගෙන්වාගෙණ නුවරට නික්මුණාහ. මග දුටු දුටුවෝ සුතනුමානවකයෝ මඛාදෙව තම් යක්ෂයාද දමනයේ ලාගෙණ එනීයයි නුවර වාසින්ට කිහ. නුවරවාසිහු රජ්ජුරුවන්ව දැන්වූහ. රජ්ජුරුවෝත් සතුටුව අමාත්‍ය මණ්ඩලය හා සේනාව පිරිවරා සුතනු මානවකයන් ඉදිරියට පෙර ගමන්කොට ගොසින් බොධිසත්ත්වයන් දැක සතුටුව රාක්ෂසයාට වාසල්දොර දේවාලයක් කර නුවර සියල්ලවුන්ගෙන් බත් දෙවනලෙස සලස්වා නුවරට ගොස් සුතනු මානවකයන්ගේ ගුණ කියන්නාහු එම්බා අමාත්‍යයෙනි, මාගේ ජීවිතය රැක දුන්නේ ය නුවරවාසින්ට සැපත දුන්නේත් සුතනුමානවකයන් නිසාය යි ගුණකියා බොධිසත්ත්වයන් වහන්සේව සෙතෙවිරත් තනතුරුදී එතැන් පටන් බොධිසත්වයන්ගේ අනුශාසනයෙහි දශරාජධර්මයෙන් රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහයි වදාරා මේ සුතනු ජාතකය නිමිවා වදාළසේක. එසමයෙහි රාක්ෂසයා නම් අංගුලිමාල මහාස්ථවිරය, බරණැස් රජ්ජුරුවෝනම් ආනන්ද ස්ථවිරයෝය, සුතනු මානවකයෝ නම් බුදුවූ මම්ම වේදැ"යි වදාළසේකි.

---

## 388 ගිජ්ඣ ජාතකය

එවද ධර්මරත්නාකරවූ සර්ව ඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මව්පියන්ට උපස්ථාන කරන්නාවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

හේ කෙසේද? යත්,

එක් භික්ෂුකෙණෙකුන්වහන්සේ දෙමව්පියන්ට උපස්ථාන කරණසේක. භික්ෂූන්වහන්සේ සර්ව ඥයන් වහන්සේට එපවත් දන්වූ සේක. සර්ව ඥයන් වහන්සේ දන්වතු නොවෙයි, මහණෙනි පෙර උත්තමයෝත් දෙමව්පියන්ට උපස්ථාන කළෝවේදැ"යි වදාරා ඒ කෙසේදැ"යි ආරාධිතවූ සර්ව ඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

ශ්‍රියවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ගිජුලිහිණිව ඉපිද අඹුවූ දෙමව්පියන් රක්නාහ. බරණැස්නුවර එක් වැද්දෙක් අමුසොහොනක් සමීපයෙහි මලක් ලැබීය. බොධිසත්ත්වයෝ ගොදුරුසොයා ඇවිදුනාහු ඒ මලකරලාගෙණ මලෙහි බැඳි තමන් මලබැඳි සෝකයට වඩා තමන්ගේ දුක් නොසිතා දෙමවුපියන්ගේ දුක් සිතා අඩන්නාවූ අතේ මාගේ දෙමව්පියන් දෙදෙන මා මල බැඳුනුනියාව නොදනිති, ගොදුරු සොයාලන කෙණෙකුන් නැත, දුකඛයෙන් ගල්ලෙන ඒ ඒ තැන වැටී අඩන්නාහයි කියා තමන්ගේ දුක් නොසිතා දෙමවුපියන්ගේ දුකට හැඬුන, එවිට වැදි එතනව අවුත් බොධිසත්ත්වයන් අඩන අඬ අසා කියන්නේ ගිජුලිහිණියන් මනුෂ්‍ය භාෂාවෙන් කථාකරන්නවුන් දුටුවිරුන් නැත, ඇසූ විරුන් නැත, නොපි තොප මලබැඳුන හෙයින් හඬින් අඩවිද? නැත්නම් අනික් කවර කාරණයක් නිසා අඩාවැලපුදැයි විමාළාහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු මරණ භයින් අඩන්නේ නම් නොවෙයි, ඇස් අඹුවූ දෙමව්පියන් මා රකිනේය. මාගේ මව්පියන් දෙදෙනා පැන් නොලැබ තලුවියලී මියන්නාහ. ඊට අඩම් කිහ. ඒ අසා වැදි කියන්නේ ඒ වන්නා එසේමය, ගිජුලිහිණියෝ නම් සියත් යොත්තෙක ආකාශයේ යමින් සිට බිම තිබූ කුණු දක්නාහ. නොපි මා ලූ මෘ නොදකින්ට කාරණා කිමිදැ?යි කිහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු යම් අකුශලයක් පැමිණෙන කල කිසිවකුත් නොපෙණෙන්නේය, වන්නාවූ විපත්තියම පැමිණෙන්නේයයි වැද්දාට කිහ. වැදි බොධිසත්ත්වයන්ගේ බසට සමාධිව කියන්නාහු තොප කී බසට සතුටුවූ මම තොප මලින් උනාහරිමි, සැපසේ ගොසින් තොපගේ දෙමවුපියන් රකුවයි කියා බොධිසත්ත්වයන් මලින් උනාඇළ. එවිට බොධිසත්ත්වයෝත් තොපි තොපගේ බන්ධූන් සමග ජීවත්වයි වැද්දාට කියා තමන්ගේ දෙමව්පියන්ට ගොදුරුගෙණ වන යටම ගියාහයි වදාරා මේ ගිජිඤ්ඣජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වැද්ද නම් ඡන්නාසප්වීරය, බොධිසත්ත්වයන්ගේ මැනියෝ නම් මහාමායා දේවිය, පියාතෝ නම් සුඩොදන රජ්ජුරුවෝය, ගිජුලිහිණිව උපන්නේ නම් බුදුවූ මම්ම ය යි වදාළසේක.

---

## 389
## දබ්බ පුෂ්ප ජාතකය

තීවද කරාණාවට පිහිටවූ සවීඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් ලොභිභික්ෂු කෙණෙකුන් වහන්සේ අරභයා මේජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

එක් උපනන්දශාක්‍ය භික්ෂුකෙණෙකුන් වහන්සේට කියනකල භික්ෂුණී ලාභයෙහි ගිජුතොව ලදදෙයකින් යපෙව අල්පඝන්තොෂවව බණකියනසේක.

තමන්වහන්සේ ගමකට වන්කල එක් ගෙයක පාත්‍රයද එක් ගෙයක සැරයටි යද එක් ගෙයක පොත්මිටියද එක් ගෙයක ඔබරුවදුයි කියා ගෙවල් සතරෙක පසෙක තමන් වහන්සේ තතුකොට ලාභසත්කාරද ගරුභාණඩ සපයාගෙණ උපාසකවරුන්ට අවවාද කියා බොහෝ වස්තු සොයා ගැලෙක පුරවාගෙණ සැවැත්නුවරට එතසේක. සැවැත්නුවර භික්ෂූන්වහන්සේ වැඩහිඳිනා විහාර යට අවුත් ගෙවල් එකක් දෙකක් පත්නා යතකලට වැලක් පය පැකිළිත, එවිට මේ ගෙවල් වලින් මට ලාභයක් ඇතමැතවැයි ඒ ගෙට වන්සේක් ඒ ගෙයි වසන මාළු භික්ෂුදෙදෙතෙකුන් වහන්සේ සංඝිකව ලත් වක්කාරි දෙකකුත් ලෂණයක් වටනා පලසකුත් බෙදාගත නොහී තුබුයේය, ඒ දෙදෙනා වහන්සේ සවාමීනි! මේ අපට බෙදුදුනමැතවැයි කීහ. උන්වහන්සේ ඒ වක්කාරි දෙක දෙදෙනා වහන්සේට දී තමන්වහන්සේ ඒ පලස විහේඩර කෙණෙකුත් වහන්සේව විතා ගතයුතු නොවෙයි කියා තමන්වහන්සේ ඇර ගත්සේක. ඒ දෙදෙනා වහන්සේ ගිවිස්වා අරගත් දෙයක් නොවන බැවින් මුරහා භික්ෂූන්වහන්සේට කීසේක, භික්ෂූන්වහන්සේත් ධම්මභාමණඩයේ රැස්ව මෙපවත් කිය කියා වැඩ උන් තැනට සම්ඵයන්වහන්සේ වැඩවදරා මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදුයි විවාරා වදාළ කල්හි ඒ භික්ෂූන්වහන්සේ සවාමීනි අනික් කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, උපතෂ්ඨ ශාක්‍ය තම් සථවිරයෝ භික්ෂු දෙදෙනෙකුට වක්කාරි දෙකක් දී තුමූද පලස අරහත්තුය යන මේ කථාව කිය කියා උනුම්හයි කීහ. සම්ඵයන්වහන්සේ එම්බා මහණෙනි මූ දැන්ම තුනොවෙයි, පෙරත් අනුන්ට ලාභය මදකොට දී තුමූ වැඩිතරමේ ලාභය අරගත්තෝ වේදුයි වදාරා ඒ කෙසේදැ යි ආරාධිතවූ සම්ඵයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක,

**ඒ කෙසේද? යන්,**

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක් ගහක් අසල වෘෂදෙවතාව උපන්හ, එ ගහ අසල දබ්බපුෂ්ප නම් කැණහිලෙකු හා කැණහිල් ඩෙනුවක් වාසය කරන්නීය. ඒ කැණහිල්දෙන රේමස් කන්ට දෙළඹියි කැණහිලාට කිව, කැණලාත් ගඟ අස බලා ඇවිදිනා කලට අනුවාරි නම් දියකාවකු හා ගම්භීරවාරි නම් දියකාවකු හා දෙදෙනෙක් ඇත, ඉන් ගම්භීරවාරි නම් දියකාවා මසෙකු අල්වාගත. ඒ කුඩමිස්සා දියකාවාත් ඇරගෙණ දියයට වදින්වත්හ, ඒ දියකාවා අනුවාරි නම් දියකාවාට කියන්නේ එම්බා අනුවාරි නම් දියකාවානෙනි, මේ මත්ස්‍යයා මාත් ඇරගෙණ දියයට වදින්ට උත්සාහ කෙරෙයි. වහා අවුත් මට සහායව කුඩමස්සා අල්වයි කීය, එවිව දියකාවා කියන්නේ මේ තොපි නොඹව, ඇල්ලුගැන්ම සිවිල නොකොට තරයේ අල්වව, මමත් එම් කියා ගොස් කුඩමස්සා ඩැහෙණ දෙන්නකැටිව ගොඩලා බෙදාගත නොහී උනුන් කනකලට කැණහිලා එතනට ආය, දියකාවෝ දෙන්න කැණහිලා දැක එම්බා සබඳ මේ කුඩමැස්සා අපට සරියේ බෙදාදී ලවයි කීහ. එවිට කැණහිලා කියන්නේ එම්බා මම බොහෝ අධිකරණ විවාරණ යුක්ති පසිඳිනා දනිමි. මේ කුඩමස්සා ධර්මිෂ්ඨව බෙදම් කියා අනුවාරි දියකාවාව වල්පත දිසාව දී ගම්භීරවාරි දියකාවාව ඉස දිසාව තරමැයි කියා දී ධර්මිෂ්ඨව බෙදූ මට මධ්‍යයේ කැබැල්ල යහපතැයි ඇර ගෙණ ගියාහ, දියකාවෝ දෙදෙනත් අප සැපසේ බෙදාගෙණ කන්නාවූ රේමස

ඇරගෙණ ගියේයයි මුරගැහ. ඒ කැණහිල් දෙනත් කැණහිලා ගෙණෙන රේමස දැක සමාධිව කියන්නීමේ රේමස කොයින් සම්හවිදැයි විචාරා යුක්ති කියා ගෙණා නියාව අසා මේ රේමස සම්හවූ නියාව සක්විති රාජ්‍යයක් ලත් විවරඇත, මාගේ මනෝරථය මුදුන්පත්වූ නියාගයයි කියා තමාගේ සැමියාට ප්‍රශංසා කොට රේමස කැව. සම්ඳුයන් වහන්සේත් එම්බා මහණෙනි භික්ෂූනු නම් අනුන්ට ලාභය නොවිදුවයි අවවාද කියා තමා ලාභසත්කාර විඳුම භික්ෂූන් කළමනා දෙයක් නොවෙයි වදාරා මේ දබබපුෂ්ප ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි දියකාවෝ දෙදෙන තම් දැන් මහළු භික්ෂූනු දෙදෙනය, කැණහිලා තම් උපතිස්ස ශාක්‍ය සථවිරය. මේ විත්තිය ප්‍රත්‍යක්ෂකොට දුටුවාවූ වෘක්ෂදෙවතාව උපන්නෙම් බුදුවූ මම්ම ය යි වදාළසේකි.

---

## 390 දසනාගක ජාතකය

තවද මහත්වූ බෙයියී ඇති සම්ඳුයන් වහන්සේත් ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂූකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

එක් භික්ෂූකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇතිව වාසය කරණසේක. ඒ භික්ෂූන්වහන්සේ භික්ෂූනු ගෙණවිත් සම්ඳුයන්වහන්සේව පැ සැමිනි මේ මහණ ස්ත්‍රියක් කෙරේ පිළිබඳව වාසය කෙරෙයි. දැන්වූ කල්හි සැබෑද මහණැයි වදාරා දැන්මතු නොවෙයි, පෙරත් අනර්ථකාරීවූ මැනියා වෛතසික රෝගයෙන් මරණ ලබන්නේ නුවණැත්තවුන් නියා ජීවිතය ලද්දාහුයයි වදාරා ඉකුත්වත් කථාව ගෙණහැර දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

යිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණන් වහන්සේ බමුණු කුලයක උපන්සේක, උන්වහන්සේට සේනක කුමාරයෝයයි නම් තුබුන උන්වහන්සේ වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් සියළු ශිල්ප ඉගණ අවුත් රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ අමාත්‍යවූසේක. සේනක පණ්ඩිතයන් වහන්සේයයි කී කල්හි වන්ද්‍ර සූර්යයන් මෙන් ලොව ප්‍රසිඩසේක. එකල්හි රජහුගේ පුරෝහිත බමුණුගේ පුත්‍රතෙම රාජසේවයට ආසේය. සම්භාවනාර්හතාවූ උතුම්වූ රූපශ්‍රී ධරන්නාවූ රජහුගේ අගමෙහෙසුන් බිසවුන් දැක පිළිබඳ සිත්වූයේ ගෙට ගොස් නිරාහාර වෙන් නොත්නේය, යහළුවන් විසින් විචාරණ ලදුව එපවත් කීය. රජතෙම පුරෝහිත පුත්‍රයාගෙන් දැක එපවත් අසා කැඳවා ගෙන්වා මම තව මේ බිසව සත් දවසකට දෙමි, සත් දවසක් තොපගේ ගෙයි වස්වා අවවෙනිදා කැඳවාගෙණ එවයි කීන. ඒ තෙමේ යහපතැයි පිළිගෙණ බිසව ගෙට කැඳවාගෙණ ගොස් එක තැන විසිමෙන් ඔවුනොවුන්කෙරේ පිළිබඳ සිත් ඇතිව කිසිවක්හට නොදන්වාම්

උදයභද්දෙරින් ඇමව පළමු නික්ම ගොස් අන් රජක්හුගේ ඇඳුව පවත්නා රටකට වන්නාහුය. නැවත ගිය මගක් මෙන් ඔවුන් ගිය මග කවුරුන් නොදන්නාහු වෙති. රජ නුවර බෙර ලවා නොයෙක් පරිද්දෙන් නුවර පරීක්ෂාකරන්නේත් ගිය තැනක් දැනගත නොහී ඇ නිසා ඒ රජහට බලවත් සෝක උපත, හෘදය උණුවිය, බඩින් ලේ යන්ට පටන්ගත. බලවත් වෙදවරු ඇවින් පිළියම්කොට ගුණකරන්ට නොහැකිවූවාහුය. බෝසතාතන්වහන්සේ ඒ දැක මෝහව වාතපිත්තාදියෙන් උපන් ව්‍යාධියෙක් නොවෙයි, භාග්‍යවිව නුදුටු බැවින් මනොදුක්ඛයෙන් ආ ව්‍යාධියෙක, උපායකින් ඕහට පිළියම් කෙරෙමියි, ආයුරතම්වුද පුක්කුසතම්වූද පණ්ඩිත අමාත්‍යයන් දෙන්නා කැඳවා රජහට මේ බිසව නොදුක්මෙන් උපන් ලෙඩ විනා වෙන ලෙඩක් නැත, මේ රජ අපට උපකාරි එකෙක. උපායෙන් පිළියම් කරම්හ. රජගෙයි මලුවේ තැටුම්යොදු කඩුවක් ගිලින්ට දන්නා එකෙකු ලවා කඩුව ගිලින්ට සලස්වා රජ සිව්මැදුරු කවිළුව සමීපයෙහි ඉන්ට සලස්වා ඒ දක්වම්හ, ඒ දැක මීට වඩා දුෂ්කරයෙක් ඇද්දැයි විචාරන්නේය, ඝහළු ආයුර පණ්ඩිතයෙනි තෙපි එබසට අසවල් දෙය දෙමිකියා ප්‍රතිඥකොට කීම ඊටත් වඩා දුෂ්කර යයි කියාලව, එම්බා පුක්කුසපණ්ඩිතයෙනි, තොපි යමක් දෙමි කියා ප්‍රතිඥ කොට ඔහුගේ ආසාව වඩා නැවත නොදෙමියිකියා ආසා විච්ඡේදය කිරීම ඊටත් වඩා දුෂ්කරයයි කියාලව. ඉන් ඇතකියයුත්ත මම දනිමි කියා වදුල සේක. එසේ කියා තැටුම්යොදු රජහුගේ සමීපයට ගොස් මහරජ්ජුරුවන් වහන්ස, තැටුම් බලා වදුලමැනව ශරීර දුක්ඛයත් මදක් සන්ත වෙයි කියා රජහු කැඳවාගෙණ සිව්මැදුරු කවිළුව සමීපයේ තැටුම් බලා ඉන්ට සැලැස් වූවාහුය, බොහෝදෙන තැටුම් පෑවාහුය. එක් පුරුෂයෙක් තෙතිස් අඟුල් දිග ඇති තියුණු මූවහත් ඇති කඩුවක් ගිලියි, රජ ඒ දැක මේ පුරුෂතෙමේ තියුණු ධාරා ඇති සතුරන් ඇඟ රුධිරපානය කරණ දසන්තක දෙශයෙහි උපන්නාවූ මේ කඩුව ගිලීය. මේ ඉතා දුෂ්කරයෙක් ලොව ඇද්දැයි ආයුර පණ්ඩිතයන් අතින් විචාළේය, එබසට ආයුර පණ්ඩිතතෙම දේවයන්වහන්ස මේ පුරුෂයා තමන් අභ්‍යාශකළ හෙයින් මේ කඩුව ගිලින්නේය ඒ ඉතා දුෂ්කර යෙක් නොවෙයි යමෙක් තමාට ආවේණිකවූ ධනයක් අනිකක්හට දෙමි කියාද ඒ කීමම දුෂ්කර වන්නේය, ඉන් පිටත් දුෂ්කරයෙක් නැතෙයි කීයේය. ඒ අසා රජ කඩුව ගිලීමට වඩා දෙමි කියන බස දුෂ්කරවේල මමද පුරෝහිතපුත්‍රයාට බිසව දෙමි කීම් මා විසින් දුෂ්කරයෙක් කරණලද සලකන්නහට මදක් සෝක නැතිවිය. නැවත මේ දෙමි, කීමට වඩා අනික් දුෂ්කරයෙක් ඇද්දැයි පුක්කුස පණ්ඩිතයන් විචාරණුයේ මේ ආයුර පණ්ඩිතතෙම කඩුව ගිලීමට වඩා සමාසන්තක දෙයක් දෙමිකීම දුෂ්කරයයි කීය. එම්බා පුක්කුස පණ්ඩිතයෙනි, නොපි අනිතුත් විචාරම් දෙමි කීමට වඩා දුෂ්කරයෙක් වෙත ඇද්දැයි විචාළේය එකල්හි පුක්කුස පණ්ඩිතතෙම දෙවයන්වහන්ස යමෙක් කාරිය සිද්ධියට නොපමුණුවන්නාවූ නිෂ්ඵලවූ තෙපුල් කියන්නේවීනම් ජනයෝ ඔහු ඇසිරුව ජීවත්වම්හයි නොසිතති එබැවින් යමෙක් දෙමිකියා ලබන අයගේ ආසාව වඩා නැවත නොදෙමී කීමට වඩා දුෂ්කරයෙක් ලොව නැතැයි කීය. රජ ඒ බව අසා මම පුරෝහිත පුත්‍රයාට බිසව දෙමි පළමුකොට කියා දිනිමි. නැවත අර ගන්නා සිතින් පරීක්ෂා කරවීමි, මා කළේ ඉතා දුෂ්කරයෙකැයි සිතන්නාහු රජහුගේ සිතෙහි සෝක මදක් නුනීවිය. ඉක්බිත්තෙන් රජතෙම මේ සේතකු

පණ්ඩිතයන්ව වැනි පණ්ඩිතකෙණෙක් ලොව නැත. එබැවින් මේ ප්‍රශ්නය ඔවුන් අතින් විවාරම් සිතා එම්බා සේනකපණ්ඩිතයෙනි මේ පුක්කුසපණ්ඩිත තෙම යමක් දෙමිකියා නොදෙමි කීම දුෂ්කරයෙකැයි කියය. දුෂ්කරයට වැඩි අනික් දුෂ්කරයෙක් ඇත්නම් ඒ තොපි කියවයි කියේය, එකල්හි මහබෝසතා තන්වහන්සේ මෙසේ වදළසේක, මහරජ යම්කිසිවෙක් මදවූද බොහෝවූද දැනයක් දුන්නේද යමෙක් දන්දී පසුතැවිලිනොවේ ද එතෙම ඊටත් වැඩියෙන් දුෂ්කර වන්නේය, මෙසේ අප මහ බෝසතාණන් වහන්සේ රජභටදන්වතසේක් දැනයදී අපරචෙතනාව පිරිසිදුකොට ගන්නට දුෂ්කර බව වෙස්සන්තර ජාතක යෙන් දන්නේය. ජූජකනම් බ්‍රාහ්මණයාට සූත්‍රයන් දී ඔහු විසින් හිංසාව දැක මාගේ පුත්‍රයන් ගෙණඑම්දෝයි බොධිසත්වාදී මනොත්තමයෝ දන්දී කව රෙක් පසුතැවිලි වන්නෙහිදැයි සිතූසේක, රජ්ජුරුවෝ බොධිසත්වයන්ගේ වච නය අසා සලකාගත්සේක. මම මාගේ සිතින්ම පුරෝහිත බ්‍රහ්මණපුත්‍රයාහට මහේසිකාවදී සිත්දරාගන්ව නොහැකිවූයෙමි සෝකකෙරෙමි මිරිකුණෙමි මව මේ සුදුසු නොවෙයි ඉදින් මා කෙරෙහි ස්නෙහ ඇත්නම් මේ එශ්ඒයෂී හැර නොයන්නීය. මව ස්නෙහ නොකොට ගියාය. ඇගෙන් මව කවර ප්‍රයෝජන දැයි සිතන්නහුගේ පියුම්පත්හි දියබින්දු සෙයින් සියලු සෝකය පහවගියේය. එකෙණෙහි කුසීරෝගය සන්හිඳී සුවපත්වූහ බෝසතානන්ට ස්තුතිකරණ සේක් ආයුරපණ්ඩිතයෝද ප්‍රශ්නය ප්‍රකාශකළෝය. පුක්කුස පණ්ඩිතයෝද එසේම ප්‍රශ්නය ප්‍රකාශකළෝය, ඔවුන්ට වැඩියෙන් නුඹවහන්සේගේ ප්‍රශ්න විසඳීම යහපතැයි ස්තුතිකොට බෝසතානන්වහන්සේව සතුටුව බොහෝ වස්තු දුන්සේක. ශාස්තෘවූ බුදුරජානන්වහන්සේ මේ ජාතක ධර්ම දෙශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍ය ප්‍රකාශකොට මේ ජාතකය නිමවා වදළ සේක. චතුස්සත්‍යාවසානයෙහි උකටලී භික්ෂූහු සෝවාන් ඵලයෙහි පිහිටි සේක. එකල්හි රජහුගේ අගමෙහෙසුන් බිසව් නම් දැන් මේ පුරාණ දූතිකා වන්නීය, එකල්හි රජ නම් උකවලී භික්ෂූහුය, ආයුරපණ්ඩිතයෝ නම් මොග්ගල්ලායන සථවිරයෝය, පුක්කුස පණ්ඩිත නම් ශාරිපුත්‍රසථවිරයෝය, එකල්හි රජභව අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනාකළාවූ සේනක පණ්ඩිතයෝ නම් දැන් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදළසේක.

---

## 390 දසන්තක ජාතකය

මේ දැහැමි සම්බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ප්‍රඥාපාරමිතාව අරභයා මේ ජාතකය දක්වතලද, මෙය වනාහී විස්තර වශයෙන් උම්මග්ගජාතකයෙන් පෙණෙන්නේය.

**මේ කෙසේද? යත්**

යටගිය දවස බරණැස්නුවර ජනකනම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණසමයෙහි බොධිසත්වයෝ බ්‍රාහ්මණකුලයක ඉපිද වැඩිවියපැමිණ ශේතක

තම්ව දිසාපාමොක් ආචාරීන් අතින් සිල්පයත් නිමවා ඉගෙණ රජ්ජුරුවන් කරා අවුත් රාජ්ජය දෙනුයේ ධම්මයෙන් අනුශාසනා කොට වස්සාරපෝයේ නුවර වාසින්ට ධර්මාසනාරූඪව බණ කියා බුඩලීලාවක්මෙන් සියලු ලෝක වාසීන් සතුටුකරවමින් වාසයකරණසේක. එසමයෙහි එක්තරා මාළු බ්‍රාහ්මණ යෙක් මසුරන් දැසක් සිඟාගෙණ එක්බ්‍රාහ්මණයෙකුගේ ගෙයක තබා ගොසින් කල්යාමකින් මාගේ මසුරන් දෙවයි කියා, ඉල්වියා, ඒ බ්‍රාහ්මණයාත් තමාට දෙන්ට රන්තැනි හෙයින් තමා දුක්පත් හෙයිනුත් තමාගේ දුව හෙළේ රණට සිලවිකොට ගෙණයවයි බ්‍රාහ්මණයාට පාවාදිනා. ඒ බමුණුත් ඇ ගෙණ ගොස් තමාගේ ගෙයි රඳවා උන්නේය. බැමිණි තමන් තරුණස්ත්‍රීහෙයිනුත් කාම යෙහි අර්ත්ථව පරපුරුෂයන් සේවනය බොහෝකොට කරන්නීය, පරදැර පර පුරුෂ සේවනයෙහි තෘප්තියක් නැත්තීය. මේ ලෝකයෙහි නොපිරෙන්නාවූ වස්තු සොළසෙක් ඇත්තේය. ඒ කවරේද යත්? සාගරයතෙමේ සියලු ජලප්‍රවාහයෙන් තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය, වත්තිතෙමේ ඉන්ධනයෙන් තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය, රජ්ජුරුවෝ රාජ්‍යයෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ. අඥනයා පව්කිරීමෙන් තෘප්තිනිවාරණය කට නොපැමිණෙන්නේය, ස්ත්‍රී මෛථුන ධර්මයෙන්ද සැරගිමෙන්ද දරුවන් වැදීමෙන්ද, තෘප්තිනිවාරණයකට නොපැමිණෙන්නීය, බ්‍රාහ්මණයා මන්ත්‍ර ඉගැන්මෙන්ද, තෘප්තිනිවාරණයකට නොපැමිණෙන්නේය, ධ්‍යානයට සම වදින්නාවූ භික්ෂූන් වහන්සේ ධ්‍යාන සමාපත්තියෙන් තෘප්ති නිවාරණයකට නොපැමිණෙන්නේය, ශෛක්ෂ ප්‍රථග්ජනයන් වහන්සේ කෙලෙසුන්තවන්නා වූ වීර්‍යයෙන් තෘප්තියකට නොපැමිණෙන්නේය. අල්පෙච්ඡ භික්ෂූන්වහන්සේ ධූතාඞ්ගසමාදන්වීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නේය. පවන්ගත්තා වූ වීර්‍යය ඇත්තේ වීර්‍යාරම්භයෙන් තෘප්තියකට නොපැමිණෙන්නේය, ධම්මකථික යන්වහන්සේ ධම්මකථාවෙන් තෘප්තියකට නොපැමිණෙකසේක, බහුශ්‍රුත ධරයෝ පණිත් බොනෝයයි තෘප්තියකට නොපැමිණෙන්නාහ, සැදැහැඇත්තෝ සංඝයාවහන්සේට උපස්ථාන කිරීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ, ත්‍යාගී පුරුෂයා වස්තුපරිත්‍යාගකිරීමෙන් තෘප්තියකට නොපැමිනෙන්නේය. නුවනැත්තා බණඇසීමෙහි තෘප්තියකට නොපැමිණෙන්නේය. සිව්වණක්පණිත් බුදුන් දැකීමෙන් තෘප්තියකට නොපැමිණෙන්නාහ, බැමිණිත් පුරුෂයන් කෙරෙහි තෘප්තියකට නොපැමිණෙන්නීය, ඇගේ සොරසැමියෙක් ඇත්තේය, උෂා තමාහා සැපසේදවස්අරිණනිසා තමාගේසැමියාට කියන්නී, එම්බලබමුණ තව නිරන්තරයෙන් දරගෙණෙන්නට පිසන්නට පරිත්තට මටබැරිය, මෙරට සිඟාරන් එක් කොට ගෙණ වහා මට කෙල්ලකගෙණවයිකිව. බමුණුත් අඹුවට උත්තර කියාගතනොහී අඹුවට කියන්නේ එසේවීනම් සොඳුර මට මාගෝපකරණසපයාදෙවයි කියා විලඳ අත්සුනු ආදීවූ දෙය සපයා පසුබිඳේලාගෙණ ගම් නියම්ගම් රාජධානිවල ඇවිද මසුරන් සත්සියය සිඟාගෙණ කෙල්ලකු හා කොල්ලෙකු අරගන්ට බරණැස්නුවරට එන්නේ අතරමඟ ගසක්මූල අත්සුණු පයිය තබා පයිය උතා අත්සුනු කා පැන් බොන්ට හොස් පැන්බී එතකලට ඒ ගස වසන්නාවූ නාගයෙක් අවුත් අත්සුණු ගඬගෙන් පයියට වත. බමුණා පැන් බී ආ තැනැත්තේ පයිය බැඳ කරතබාගෙණ යන්නටවත. ඒ වෘක්ෂයෙහි වාසයකරන්නාවූ දේවතාවෙක් බොධිසත්වයන් වහන්සේගේ නුගුණ දඹදිව ප්‍රකාශ කරණු සඳහා අඞ්ගවිරූපයක් දක්වා කියන්නේ එඹුල බ්‍රාහ්මණය ගෙට ගියෙයිනම් තාගේ අඹුවම්යෙයි අතරමඟලැග්ගේනම් තෝම්යෙයියන බස් දෙක

කියා අන්තර්ධාන විය. බ්‍රහ්මණයාත් වටපිටබලා කාන්තොදක හයින්ත්‍රස්තවී අඩ අඩා යන්නේය, එදවස් පසළොස්වක් දිනය පැමිණ බෝධිසත්වයෝ බණකියන්නට වන්සේක. බොහෝ මනුෂ්‍යයෝ ගද දුම්මල් පහත් ගෙණ බණ අසන්නට යන්නාවූ බමුණු උන් ඇමදක කොයියවුදැයි විචාරා බණඅසන්ට යම්තයි යනු අසා පණ්ඩිතයෝ නම් නුවණැත්තාහුය, උන්ලහටගොස් මාගේ සෝක සන්හිදුවාගණිමියි පණ්ඩිතයන් බණකියන්නාවූ සථානයට ගොස් බණ පිරිස් කෙළවර අඩ අඩා බණ අසා සිටියේය. බොධිසත්වයන්වහන්සේ විස්තර කොට බණවදාරා වට බලන්නාහු බණ පිරිස් කෙළවර අඩ අඩා සිටිනා දැක ඇයි තා අඩන්ටකාරණා කිම්දැයි තවකුමණ අලාභයෙක් කවර අවීහානියෙක් ප්‍රාණහානියෙක් සැලසිනීද මට කියය තාගේ සෝක සංසිදුවා ලමි. ඇයි තෝ සේනක පණ්ඩිතනියාව නොදනීදැයි කීහ. එවිට බ්‍රාහ්මණයා කියන්නේ පණ්ඩිතයෙනි එක් දේවතාවෙක් මට කියන්නේ අතරමග ලැග්නොත් තෝ මියෙයි, ගෙට ගියොත් අඹු මියෙයිකීය. එසේ හෙයින් ගෙටත් යානොහි අතර මගත් ලැගගතනොනී මරණභයින් අඩමියිකීය. බෝධිසත්වයෝ මිනිසුන්වවන් නාවූ අනතරා පරීක්ෂා කරන්නාහු සමුද්‍රශෙහි ගැළුනාහුද බැල මච්ඡයන් විසින් ගන්නා ලද්දාහුද ගඟවැටී හුන්නාහුද කිඹුලන්වීසින් ගන්නාලද්දාහුද රුකකින් හුණුවාහුද කටුවෙන් විදිනාලද්දාහුද විෂකෑවාහුද කරවැල්ලූ වාහුද ප්‍රපාතයෙකි වැටීද අතිශීත අති උෂ්ණ ආදී රෝගයෙන් මඩනාලද්දාහුයයි යන මෙතෙක් අනතරාය ඇත කවරේදෝයි පරීක්ෂාකොට අනතරායක් නොදක පරීක්ෂා කරණසේක් මූ කරතිබෙන පසුම්බි පයියේ අත්සුණුවන්ට කාරණා මූ අතරමග ගසක් මුලදී අත්සුණු පයිය බිම තබා පයිය උනා අත්සුණු කා පැන් බොන්නාවූ යාදී මේ පයිය ඇතුළට අත්සුණු ගඤ්ඣයව සජියකු වන්නියැයි, අතරමග ලැග් ගොන් මෙතෙම අත්සුණුකන්ට පයියේ අත එලීතම් සර්පයා කඩා කා තෙමේ මියෙයි. ගෙවගියොත් මෙතෙක් දවස් ගොසින් කුමක් ගෙණාදැයි පසුඹිය උනා අතලයි එවිට ඇගේ අත කඩා කා අඹුමියන්නියයි කී නියායයි සිතින්ම පරීක්ෂාකොට සර්පයා දැනගතනොනී කාෂ්ණ සජියකුවන්ට උවමැනව නොසැලි නිශ්ශබ්දවී දරණලා වැදහෝනේය. ඒකාන්තයෙන් තයාමයයි පරීක්ෂාකොට දිවසින් දුටු කෙණෙකුන්මෙන් සියල්ලම නුවණැසින් දැක බොහොදෙනාට කියවන පිණිස බමුණා අතින් විචාරා බමුණ තාගේ පසුම්බියේ කුමක් ඇද්දැයි විචාළසේක සවාමීනි අත්සුණුයයි කීය, ඒ අතරමගදී කැදැයි විචාළසේක. මග එක් ගසක්මූල පසුඹිය තබා අත්සුණු කැම කිව. තෝ පැන් බොන්නට ගියෙහිද නොගියෙහිදැයි විචාළසේක. ගියෙමි සවාමීනි කීය, එම්බල බමුණ තෝ පැන් බී අවුත් අත්සුණු පයිය පරීක්ෂාකොට බැන්දෙහිදැයි විචාළසේක. බමුණා කියන්නේ සවාමීනි පැන් බොන්නට යන ගමනේත් සඳහත් මදව නොබැන්දෙමි, ආ ගමනෙත් පරීක්ෂානොකොට බැඳගෙණ කරතබාගෙණආමි කීය. එවිට බොධිසත්වයන් වහන්සේ එම්බල බමුණ තා කර තිබෙන්නාවූ පසුම්බිය ඇතුලේ සර්පයෙක්වැද හෝනේය, එසිත් නැයෙක. දෙවතාවාකියේ නම් එසින් තට සැකවීනම් පසුඹි පයිය බිම තබා උනා දික් දණ්ඩකින් ගසා ලන්නා සූ සූ යන අනුකරණයෙන් මහත්පෙණයක්කොටගෙණ මේ බණපිරිස් මධ්‍යයේ පිටවන්නේයයි කීසේක. බමුණා පසුඹියේ නාගයායයි කියන්නාමහ භයින් පසුඹියබිමටදමා පසුඹියඋනා දණ්ඩකින් පසුඹියටගසාලීය, නැයා බොධි

සත්ත්වයන් කී පරිද්දෙන් පෙණයකොට ගෙණ පිටත්වීය. තයින් කෙළවකසේ දන්නා අභිකුණ්ඩිකයෙක් තයා ඇරගෙණ වලට අලුයේය. එතන සිටියාවූ බොහෝ බණපිරිස් මඩෙහේ සේනක පණ්ඩිතයන්වහන්සේ බමුණා අතතුබූ පසුම්බියේ ඔත්තාවූ සපියා යම්කෙණෙකුත් අතින් නොඇසා දිවයින් දුටුකෙණෙකුත් මෙන් දැන සපියා විභාගකොට තයා ම යයි වදාළසේක. යහපත නුවණ විශෙෂයකැයි බොහෝදෙන සමාධිව පිළිඉස නටවා අත්පොලසන් දීම් අසුරු සන් දීම් ආදීවූ බොහෝ සත්තෝෂයට පැමිණියාහ, බමුණාත් සමාදිව සේනක පණ්ඩිතයෙනි මා අත කෙතෙක් සම්පත් තිබුයේ වී නමුත් එනකුත් දීපියන්ට සමාධි ඇත, මා සිහාලද්දේ මේමසුරන් සත්සියය පමණයයි මින් තොපටපූජා කෙරෙමියි කීය. බොධිසත්ත්වයෝත් එම්බලබමුණ ප්‍රශ්නකියා වසහු උපයන්නේ නොවෙමි, මේ තාගේ රනින් මට ප්‍රයෝජන කිමිදැයි කියා තමන්වහන්සේ හෙන් මසුරන් තුන්සියයක්දී දැස පුරමින් කොල්ලකු ඇරගෙණැයි දී තා සිහා ඇවිදින්නට කාරණා කිමිදැයි විචාළසේක. බමුණු කියන්නේ පණ්ඩිතයන් වහන්ස මාගේ බිරින්ද රට සිහා කෙල්ලෙකු කොල්ලෙකු ගෙණවමැනවැයි කී හෙයින් සිහාඇවිදිමි කීය. එවිට පණ්ඩිතයෝ විචාරන්නාහු තාගේ අඹුතරුණ ස්ත්‍රියක්ද මැහැලිදැයි විචාළසේක. බමුණු කියන්නේ සවාමීනි ලදරු ස්ත්‍රියකි කීය. බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බල බමුණ තාගේ අඹුවට සොරසැමියකු ඇති හෙයින් ඔහු තමා හා සසිචඡාපරසේවනය කරන්ට උවමනා හෙයින් එතනින් තා නෙරණ නියායි කියා එම්බල බමුණ මේ මසුරන් දැස ගෙටගෙණ ගියෙයි නම් තාගේ අඹු තමා සොර සැමියාට දීපියන්නීය, තෝ ගෙට ගෙණ නොහොස් මසුරන් දැස ඉවතෙක සඟවාලා ගෙට හොස් බැණ නොකැගී ඉඳ. තාගේ අඹුවට රන් ගෙණාමි නොකියයි උගන්වාලා යවූසේක. බමුණත් යහපතැයි ගිවිස අන්තරමන ගසක්මුල මසුරන්දැස සඟවා ගෙට හොසින් පිත්වත දෙර ඇරවයි කීය. එවේලාවට බැමිණිත් සොරසැමියාත් වැදඔත්තාහ. බැමිණි නැගිසිට පාණ තිවා දෙරහැර සොරසැමියා දෙරබා බොක්කේ සිටුවා බමුණා ගෙට කැඳවා සොරසැමි පිටතට යවා සමනන් ලහඉඳ පසුම්බි පයියබලා මෙතෙක් දවස් හොසින් ගෙණා වස්තුයෙක් නැද්දැයි විචාළීය. එවිට බමුණා අඹුව කෙරේ හසින් සොදුර රැහැණිනොව මම රන්මසුදැසක්ගෙණාම්, අසවල් තැන ගසක්මුල සඟවා තබාලීම්, උදැසන ගෙණෙම්කීය. බැමිණි ඒ අසා දෙරට හොස් සොරසැමියාට සලකුණු කියා රන්තුබූතැනින් ඇරගෙණ එවයි කීය. සොරසැමිත් ඇ කී සලකුණෙන් හොස් රන්ඇරගෙණ ඔබ්බේ තිබීය. බමුණුත් උදැසනක්සේ රන්තුබූ තෙනට ගොස් නොදැක බොධිසත්ත්වයන් කරා අඬා ගෙණ ගිය. එවිට පණ්ඩිතයෝ ඇයි බමුණ රන්තුබූ තැන් බැමිණියට කියාපිද? රන් ගෙණා නියාව නොකියන්ට උගන්වා යවූ ගමනේ කියාපිද වන්නාට තොපගේ රන් ඇරදුනමනාවේදැයි කියා තොපගෙන් බමුණන් සත්දෙනකුත් තාගේ බිරින්දගෙන් බමුණන් සත්දෙනකුත් ඇතුළුවූ දසසතරදෙනෙකුටසත් දවසක් දන්දී දවස දෙන්නකු නියාගෙන් ඇර සත්වෙනි දවස් බමුණා තෝරා ගෙණ කියවයි සත්දවසකට වියදමත්දී යවූහ. බමුණාත් යහපතැයි ගිවිසගෙණ ගොස් බොධිසත්ත්වයන් කී සැටියට සත්දවසක් දන්දී සත්වෙනි දවස් බමුණ තෝරාගෙණ බොධිසත්ත්වයන්ට කීය. බොධිසත්ත්වයන්වහන්සේ තමන්වහන්සේ ගෙන් පුරුෂයන් යවා බමුණාගෙන්වා ඇයි බමුණ මේ බමුණාගේ මසුරන් දැස

සැඟවූයේදැයි විචාළසේක. **සවාමීනි මම** නොදනිමි කීය. **පණ්ඩිතයෝ කියන්** නාහු **එම්බල** බමුණ මා **සේනක** පණ්ඩිත **නියාව** නොදනීදැයි කීසේක, එවිට බමුණු සිතන්නේ **පසුම්බිපයියේ** උන් තයා කියාපු තැනැත්තා මේ තමායයි **කියන්නාහයි** හයගෙණ සැබෑව **සවාමීනි** මම මසුරන් දැස ඇරගතිමි කීය. දැන් කොයිදැයි විචාරා ගෙන්වාගෙණ බමුණාට දෙවා සොරකම්කළවුනුත් පරදුර කළවුනුත් විදගතමනා ආඥාකරවා බමුණාට කියා බැම්ණියත් ගෙන්වා මේ බැම්ණිය තට උවමනාදැයි විචාරා උවමැතවැයි කීකල්හි ඇටත් මතු මෙසේ දෙයක් නොකරවයි ශික්ෂා කරවා බමුණාව පාවදී බොහෝ වස්තු දී තමන් වනන්සේගේ ගෙය ගාවා ගෙයක්දී දැසිදස්දී රැක්කානයි වදාරා මේ සත්තුභස්ස ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බ්‍රාහ්මණයා නම් ආනන්ද සථවිර යෝය. එසමයෙහි දේවතාවා නම් ශාරිපුත්‍ර සථවිරය, එසමයෙහි පෂීත් නම් බුදු පිරිසය, සේනක පණ්ඩිතයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 391 අටඨිසේන ජාතකය

තිවද ප්‍රඥ නැමති ප්‍රදීපයෙන් තමනලද මොහ නමැති අන්ධකාර ඇති තිලෝගුරු බුදුරජානන්වහන්සේ අලවි නුවර අඟහලා නම් වෙත්‍යයෙහි වැඩවසත සමයෙහි කුටිකාර ශික්ෂාපදය අරභයා මේ ජාතකය දක්වන ලද. හේ කෙසේ ද? යත්, මෙහි වර්තමාන කථාව මණිකණ්ඨ ජාතකයෙහි විස්තරවශයෙන් එන්නේය. මෙහි වනාහි,

**හේ කෙසේ ද? යත්,**

සිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයෝ බ්‍රාහමණකුලයෙක ඉපිද අටඹිසේන නම් තමක්ව දිසාපාමොක්ඇවාරිත් වසන්නාවූ තක්සලානුවරටහොස් සියලු ශාස්ත්‍ර ඉගෙණ අවුත් ගිහිගෙයි කලකිරී හිමාලය වනයට ගොස් ඍෂිප්‍රවුජ්‍යාවෙන් පැවිදිව වනසමයෙහි ලුණුඇඹුල් පිණිස අවුත් බරණැස්නුවර රජ්ජුරුවන්ගේ රජගෙයි වාසල සමීපයට පැමිණියාහ, රජ්ජුරුවෝ මතුමහල්තලයෙහි සිටියාහු තපස්වීන්වහන්සේගේ දැමුනාවූ ඉන්ද්‍රියඝන් දැක සමාධිව රජගෙට ගෙන්වා වැළඳවූහ. තාපසයන්වහන්සේ අනුමෙවෙනි බණ වදාළසේක. රජ්ජුරුවෝ සමාධිව තමාගේ මගුල්උයනේ ඉදිනාතියායෙන් සලස්වා තාපසයන්ට කියන්නාහු **සවාමීනි** මාගේ රාජ්‍යය උවමනා විනමුත් ඉල්වා ඇරගත මැනවයි ආරාධනාකළත් තාපසඝන්වහන්සේ කිසිදෙයකුත් නොසිල්වතසේක. රජ්ජුරුවෝ තාපසඝන්ව කියන්නාහු **සවාමීනි** මා නොඅදුනන බොහෝ මනුෂ්‍යයෝ පවා ම සමීපයට අවුත් නොයෙක් සම්පත් ඉල්වාගන්නාහ, නුඹවහන්සේත් උවමනා යම් දෙයක් අරගත මැනැවැයි කීහ. එවිට තාපසයන්වහන්සේ කියනසේක් රජ්ජුරුවෙනි කටින් කීයා බත් පිළි ආදිව දෙය ඇරගැන්මද එලෙස නොව හස්තවිකාරයෙන් බත් දුන මැනවයි බඹ අතගැමද පිළිදුනමැවැයි ඉණ අත ගැමද බුලත් දුනමැනවයි කට අතගැමිද යන මෙකී දෙයින්පැමත් කටින් කියා ඉල්වීමත් තපස්වරුන්ට අගනේ නොවෙයි. යම් අභිප්‍රායකින් සිඟා සිටිකල සිටියාවූ ක්‍රියා දුන පිළිගැන්වූ දෙයක් ඇත්නම් පිළිගෙණ අභිප්‍රාය සිඳවී නම්

වූ පමණකි විතා නුවුයේනම් නුවූයේයයි ඉදිතා විතා හසතවිකාරයෙන් වුවත් මුවෙන් කියාවුවත් ඇරගැන්ම කාරණා නොවෙයි, රජ්ජුරුවෙනි දෙමවුපියන් ගෙන් වුවත් යම් කෙණෙක් ඉල්වත්නම් ඉල්වන තැනැත්තන් කෙරෙහි සියල් ලෝම අප්‍රියවන්නාහ. නැසියකෙණෙක් වීතමුත් දසවිට යමක් ඉල්වත් නම් මුට ඇත්තේ ඇමවේලෙහිම ඉල්ලාකැමයයි ඔහු මෛත්‍රියත් නොකරන්නාහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු යාවකයන් නම් ඉල්ලූකල විතා දෙන කෙණෙක් නම් තැනත්තාහ, ඉල්වීමෙන් දෙනතැනැත්තෝ මා අතින් මෙසේවූ දෙයක් ඉල්වන්නේ යාවකයන් කෙරේ සම්බියෙන් දෙන්නෝය, එසේ නෙයින් ඉල්වීම යහපතැයි කීහ. තාපසයන්වහන්සේ ඉල්වීමෙන් යාවක යන්ටත් දෙන්නන්ටත් ලාභය, නොඉල්වීමෙන් යාවකයන්ටත් අලාභය දෙන්නන්ටත් අලාභය. නුඹවහන්සේ බැණනොනැගී වැඩසිටිසේක. එසේ නෙයින් නුඹවහන්සේගේ අනිප්‍රායානුකූල වාසයටත් නුඹවහන්සේගේ ධර්ම යටත් සතුටුව මම රතු වෘෂභයෙකු ප්‍රධානකොට ඇති ගෙරින් දහසක් දෙමී කීහ. තාපසයන්වහන්සේ මහරජ අපි සරක් අසුන්කොට පව්විලා ඇවිදිමෝදැයි නොඉවසා වදාළසේක. රජ්ජුරුවෝත් තාපසයන්ගේ අනු ශාසනාවෙහි පිහිටා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ අවීසිසේන ජාතකය නීමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්ද සථවිරයෝය, තාපසයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 392 කපි ජාතකය

තිවද සූයම්මණ්ඩලය නැති ආකාශ යට පූර්ණචන්ද්‍රමණ්ඩලයක් බඳුවූ සම්බුදුයන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්තසථවිරයන් වහන්සේ පොළව ගිලුණු කථාවක් අරභයා මේ ජාතකය දක්වතලද.

එක්දවසක් දම්සභාමණ්ඩපයට රැස්වූ භික්ෂූන්වහන්සේ දෙවදත්ත සථවිරයන් වහන්සේ සම්බුදුයන්වහන්සේට විපරීතව පැමිත්හා සමග පොළව ගිලුනේ වේදැයි කිය කියා වැඩඋන්තෙනට සම්බුදුයන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් අප කීවා නොකොට පමිත් හා සමග මරණයට පැමිණියේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්**

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම්රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණසමයෙහි බොධිසත්ත්වයන්වහන්සේ වානරව ඉපිද රජ්ජුරුවන්ගේ උයනේ වදුරන් පන්සියයක් ඇරගෙණ වාසයකරන්නාහ, අනිකුත් වදුරෙක් පන්සියයක් වදුරන් ඇරගෙණ වාසයකරන්නාහ. එක්දවසක් රජ්ජුරුවන්ගේ රෝහිත බ්‍රාහ්මණයා උයනටඅවුත් ඉස්සෝදු නහා ගඳවිල් ගෙණ නැමෙ

ගෙව යන්වයයි නික්මිත, එක් දුෂ්ට වදුරෙක් බ්‍රාහ්මණයා යන්නාවූ මග තොරණමත්තේ හිද බමුණා ඉස වර්වස් පිඬක් එලාලීය. මේ කිමෙක්දැයි උඩ බැලූකල කවේ වර්වස්පිඬක් එලිය, එවිට බ්‍රාහ්මණයා වදුරාව කිපී තොප ඇමට නිහඬ දෙන්නෙම් වේදැයි කිපී තමාගේ ගෙව ගියේය. බොධිසත්ත්වයන් වහන්සේ මෙපවත් අසා දුර්ජනයන් ඉදිනා සමීපයෙහි ඉදීම කවයුතු නොවෙයි කියා වදුරන් දහස එක්කරවා අවවාද කියා හිමාලය වනයට යම්හයි තමන්ගේ වදුරන් පන්සියය ඇරගෙණ එතනින් හිමාලය වනයට ගියාය. අනික් වදුරාත් පන්සියයක් වදුරෝත් මේ බ්‍රාහ්මණයා වෛරීව අපව කුමක් කොටපියාදැයි කියා බොධිසත්ත්වයන් කැටුව නොගොස් එම උයනේ රැඳුනාහුය. එසමයෙහි එක් මැල්ලක් වී ටිකක් අව්වේ වනාලුව, එක් සැඩ ඇති එළුවෙක් වී කන්ට වත, මැලි ගිණිපෙතෙල්ලක් බලා ගැසුය, ඒ ගිනි එළුවා ඇදගත, එළුවත් දිවගෙන ගොස් ඇත්හලට වැද තණෙහි ගිනි ඇවිලින, ඒ ගිනි තණෙහිවැදගෙණ ඇත්හල තණකොල සින් දඬුපතුල් හිස්තෙන් ද, ඇතුපිටව වැටී පිටද, වණව ගියේය, වෙදවරු පිළියම් කොටත් වණ බොහෝව තිබූහෙයින් රජ්ජුරුවෝ පුරොහිත බ්‍රාහ්මණයා කැඳවා කියන්නාහු බමුණාතෙනි ඇතුන්පිට වණ බොහෝය වහා ගුණකරවයි කිහ. එවිට බමුණු මෙවිට මතොරථය සිඩකෙරෙම් දේවයන්වහන්ස මේ වණපිළියමට වදුරන් මරා උන්ගේ මාන්සය හෙණ තෙල් සිඳ ලූවොත් වණ ගුණවෙයි කිහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු වදුරෝ කොයි ඇද්දැයි කිහ. සවාමිනි උයනේ වදුරෝ ඇතැයි කිහ. රජ්ජුරුවෝත් දුනුවායන් හෙන්වා වදුරන් විද මැරුහ. ඉන් නායක වදුරා විත්කා දිවගොස් බොධිසත්ත්වයන් වසන්නාවූ වනයෙහි වැටී මළහ. බොධිසත්ත්වයන්වහන්සේ වදුරා දැක තමන්වහන්සේ හා කැටිව ආවාවූ වදුරන් පන්සියයට බණ වදාරණසේක් ගම් නියම් ගම් රාජධානියෙක්හි සතුරෝ ඇත්නම් නුවණැත්තෝ එතැන්හි නොවසන්නෝය, ඉදින් කිසියම් කාරියක් නිසා සතුරන් ලඟ දවසක් දෙදවසක් ඉඳිනෙවී නමුත් දුකසේ වසන්නේය, ලඝුවූ අව්‍යවයපිත සිත් ඇති නෑ කෙණෙකුන් හෝ මිත්‍රකෙණෙකුන්ගේ බස් ගිවිස යමෙක් සිතුවක් කරන්නේවිනම් ඒ තෙම බොහෝදෙනාට සතුරු වන්නේය. කුමක් මෙන්දැයි යතහොත් නොකිකරු මේ වදුරා වානර සමූහයාට පීඩා කෙළේය, සමූහය රකින නුවණැත්තෙම් යන සිත්ඇති අඥතතෙම යහපත් නොවන්නේයයි, එසේවූ සත්වයා තමාගේ සිත්වූපරිද්දෙන් ගොස් නොකටයුතුකොටපියා මිය වැදහොත් වදුරා පරිද්දෙන් ව්‍යසනයට පැමිණෙන්නේය, නුවණැති තැනැත්තෝ තමාගේ බන්ධුන්ව වැඩකරන්නේය, නුවනැති ප්‍රජාව කරන්නාවූ උත්තමතෙම තව්තිසා වැසි දෙවියන්ට උත්තමවූ සක්දෙවිරජහු මෙන් නුවණැත්තේත් නැයන්ට මෙලෝ පරලෝ දෙකින් ඉෂ්ටවෙන්නේය. යම් සත්වයෙක් පිරිසිදු ශීලයද විශිෂ්ටවූ ප්‍රඥාවද බොහෝ ඇසුවිරු තැන් ඇතියෙම්. තමා දකිද එසේවූ සත්ව තෙම තමාවද අනුන්වද යන දෙපසෙහේ ඇත්තන්ටම වැඩක්ම කරන්නේය. ඒ කාරණය හේතුකොටගෙණ ශීලප්‍රඥාදී උතුම් ගුණයෙහි තමා පිහිටාගෙණ බොහෝදෙනාව අවවාද අනුශාසනාකොට රක්නේ නෝ ගණසංගනිකාව යෙන් දුරුව ඉද කුසල් නෝ පුරන්නේ යනාදීන් බොධිසත්ත්වයෝ ධර්මදේශනා කලෝවේද මහණෙනි වදාරා මේ කපි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි

නොකිකරුව මරණයට පැමිණියාවූ වඳුරා නම් දෙවදත්ත සථවිරයෝය, වානර රජව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 393 බකබ්‍රහ්ම ජාතකය

**තිවද මරසෙනඟට භයඛකරවූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බකබ්‍රහ්මයා අරභයා මේ ජාතකය දක්වන ලදි.**

බකබ්‍රහ්මයෙක් වේහප්ඵල නම් බඹලොව පන්සියයක් කප් ආයුෂ විඳ එයින් චුතව සුභකිණ්හ නම් බඹලොව සූසැටක් කප් ආයුෂ විඳ එයින් චුතව ආභස්සර නම් බඹලොව අටකපක් ආයුසංස්කාර විදිමින් සිටිකල්හි මෙකියන බ්‍රහ්මයා මාතෘගර්භයකින් ප්‍රසූතවීමක් නැතිහෙයින් නිදු පුබුදිනා එකෙක්මෙන් බ්‍රහ්මලෝක තුනක ආයුසංස්කාර විදිහෙයින් මේතෙම සිහන්තේ බ්‍රහ්මලෝක යෙහි උපදිනාහට ජරාවිළිපිළිලියවත් ගර්භෝත්පත්තියක්වත් මරණයක්වත් නැතිහෙයින් මේ බ්‍රහ්මලෝකයේ ආයුසංස්කාරය නිත්‍යප්‍රඝවය මෙම ශාන්ති පුරයයි යනාදීන් පරමවූ මිථ්‍යාදෘෂ්ටියෙක් උපත, එපවත් සම්බුදුරජාණන්වහන්සේ දැන වඳුරා කූටාගාරයක් බිමටවැටෙන්නේ සාරම්භයක් ගියකල එසේවූ බ්‍රහ්ම ලෝකයට ශක්තිසම්පන්න පුරුෂයෙක් දික්කළ අතක් වක් නොකරණ කලින් වැඩවදුරා බක නම් බ්‍රහ්මයාව පෙණී වදාළසේක. උන්වහන්සේ දැක බක නම් මහාබ්‍රහ්මයා කියන්නේ ගෞතම ගෝත්‍රයෙහි උපන්නාවූ නිදුකා නන්වහන්ස වැඩියේ ඉතා යහපත මේ බ්‍රහ්මලෝකය සේ නිත්‍යවූ අචලවූ සථානයෙක් අනිත් නැනක නැති හෙයින් නුඹවහන්සේ වැනි නියාව ඉතා යහපත් වන්නේයයි කියා එපවත් සම්බුදුරජාණන්වහන්සේ අසා වදාරණසේක් එම්බල මහාබ්‍රහ්මය තා විසින්‍යකරන්නාවූ බ්‍රහ්මලෝකය නිත්‍යතාවද අපරාධිත සථානද මෙසේවූ මිථ්‍යාදෘෂ්ටියක් ගන්ට තට විනා අනිත් කෙණෙකුන්ට බැරියයි වදාළසැල්හි බකබ්‍රහ්ම සිතන්නේ මාවිසින් තනිව කියා මුන්වහන්සේ සිතට නැත්විය. නොහැක්කැයි සිතා කියන්නේ මා හා මිත්‍රව වසන්නාවූ බ්‍රහ්මයන් සත්‍යතාවයක් ඇතිහෙයින් ඔවුන් ඇමදෙනාගේ අභිප්‍රාය මා කියේ යයි කිය. එසේ නෙයින් මා කියේ ඇත්තමයයි මේ බ්‍රහ්මලෝකය නිත්‍යතාවය කිය. නැවත සම්බුදුරජාණන්වහන්සේ වදාරණසේක් එම්බල බ්‍රහ්මය තාගේ මේ ලෝකය ඉදින් තා විඳින්නාවූ ආයුෂය එක්ලක්ෂ දසදහසක් අවුරුදුය, එසේ හෙයින් තාගේ ආයුසංස්කාරයද තා කළ කුසල් අකුසල් දෙකද මා විසින් දක්නාලද, එසේහෙයින් තා මේ මිථ්‍යාදෘෂ්ටි ගැන්ම යුක්ති නොහෙයි වදාළ කල්හි බ්‍රහ්මයා කියන්නේ මේ සම්බුදුරජාණන්වහන්සේ සියල්ලම දනිමි වදාරණ සේක. මුන්වහන්සේ අතින් මා කළාවූ කුසල් විචාරමි සිතා කියන්නේ සම්බුදු යන්වහන්සේ මා කළාවූ කුසල් දනිමි වදාළේ ඇත්තේවේද ඒ බලා වදාළමැන වැයි කිය. ඒ අසා සම්බුදුරජාණන්වහන්සේ වදාරණසේක් එම්බල බ්‍රහ්මය ගිය දවස එක් කල්පයෙක්හි තෝ එක්තරා වනයක් මධ්‍යයෙහි වාලුකා කාන්තාරයෙක තපස්විභාවයෙන් පන්සලක් කොට ඒ තපස් රක්ෂාකරන්නේ එසමයෙහි

එක්තරා වෙළෙන්දන් සමූහයෙක් ගැල් දහසක් බඳු පටවා ගමන්කරණ වෙලන්දු එකියත වාලුකා කාන්තාරයට පැමිණ මත් වැරදින, ගැල්වල පැටවූ දර පැන් නිමවා බොහෝ දුකඛයට පැමිණ ගැල් අදිනා ගවයන් උනා ගැල් එක්තැන්කොට ඒ ඒ ස්ථානයේ වැටී වැදෙත්තාහ. එපවත් ඒ පන්සල වසන්තාවූ තපස්වී දැක මොහු මියගියාදි බලායාම සත්පුරුෂ ධර්මයට පිටතැයි මහත්වූ සෘද්ධියෙන් ගංගාවක් මවා බොහෝජනයාට අන්නපානාදිය දර පැන් ආදිය දී රැක්කේ වේදැයි ඒ ජාතියෙහි තොප කළ දෙය අලුයම දුටු සීතයක් මෙන් දිවිමි වදුරා දෙවනු වදුරණසේක් තොප එක් ජාතියක තපස්ව එක් වතයක වාසයකරණ සමයෙහි සොරු පන්සියයක් එක්ගමක් පැහැර කොල්ල කා ඒ ගම ඉදිනවුන් ලවාම උපුලාගෙණ යන්තාහ, තොපි මේ සොරුන් ගම පැහැරපියා යන තියාව දැන මා වැනි එකෙකු මෙතන ඉන්දදී මෙතෙක් දෙනාව ගනට විදින්ට කාරණා කොවෙයි කියා තොපගේ ආනුභාවයෙන් ගැසීම් පිඹීම් හා මහා සේනාව එන්නාක්මෙන් මවා සොරු ඉදිරියට ආ කල්හි සොරු අප ආ නියාව රජ්ජුරුවන්වහන්සේ දැන අප ඉදිරියට එන සේක් වතැයි හඬින් ඇරගත් කොල්ලත් ඇර මිනිසුනුත් ඇරගියහයි වදුරා තොප කළ දෙය අලුයම දුටු සීතයක් මෙන් දිවිමි වදුරා, තවද එක්තරා ගඟක් අසල වාසයකරන්නාවූ මනුෂ්‍යයෝ ඒ ගඟ කසල කරන්නාහ, දිය කෙළිනාහ එක් දවසක් මිනිස්සු බොහෝදෙන එක්ව ගඟට බැස ඔරු පාරු ආදිවූ දෙය ඇරගෙණ ඔබිනොබ කෙළිනට වන්නාහ. ඒ ගඟ වාසයකරන්නාවූ නාගරාජයෙක් කිපී මහා නාගවෙශයක් මවාගෙණ දියකෙළි මිනිසුන් ඔබිනොබ ලුහුබඳවා භයගන්වා කඩා කන්ට වන. ඒ මනුෂ්‍යයෝ ඒ ඒ තැන සැඟවී අඩා මූරගාන්ට වන්නාහ. තෝ එසමයෙහි සෘද්ධිවන්ත තපස්වීව ඉපිද මනුෂ්‍යයන්ට වූ භය දැක ගුරුළුවේශයක් මවාගෙණ ඒ නයා ලුහුබඳවා මිනිසුන්ගේ භය දුරු කෙළේය. ඒ නා කළාවූ කටයුත්ත අලුයම දුටු සීතයක් මෙන් දැනිමි වදුරා, තවද තෝ එක් ජාතියෙක් කේසව නම් තාපසව උයනේ වාසයකරණ කල්හි මම තොපව එසමයෙහි කප්පිය නම් ශිෂ්‍යව උපතිමි. එතැන්පටන් තොපගේ උත්පත්ති දනිමි වදුළසේක. බ්‍රහ්මයාත් තමාගේ උත්පත්තිය වදුළ බව තමාට දැනුනු හෙයින් සමාධිව වැද වැතිර ගිය, සම්බුදුන්වහන්සේත් උන්ගේ මිථ්‍යාදෘෂ්ටි බිඳ සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටවූසේක. එවිට බ්‍රහ්මයාත් බුදුන් බුදුවූ බව නියමයයි ප්‍රත්‍යක්ෂකොට බුදුන්කෙරේ පැහැද ගියවුන් ඇතුළුවූ දසකෙළදහසක් බ්‍රහ්මයෝ අමාමහ නිවණෙහි පිහිටුවා බ්‍රහ්මයන්ට දෙසූ ධර්මය ජේතවනාරාමයෙහි වැඩහිඳ අනඳ සාමීන් ඇතුළුවූ බොහෝ භික්ෂූන්වහන්සේලාට වදුළසේක. බොහෝ භික්ෂූන්වහන්සේද අධිගම ආදීවූ දෙයට පැමිණියසේක. මේ ධර්මදෙශනාව බොහෝදෙනාට අභිවෘද්ධියක වියයි වදුරා බකබ්‍රහ්ම ජාතකය නිමවා වදුළසේක.

---

## 394 ගන්ධාර ජාතකය

තිවද පඤ්චවිධ ශෙය මණ්ඩලය විශෙෂයෙන් දත්තාවූ සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි හෙසජ්ජසන්නිධිකාර ශික්ෂාපදයක් අරභයා මේ ජාතකය දක්වනලදි.

**හේ කෙසේ ද? යත්,**

සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි **පිලින්දි වච්ඡතෙර** මහාතෙරුන්වහන්සේ රජගහනුවරවසනසේක් රෝගී තැනට ගිලන් පසක් නිසා රජගෙට ගොස් රජගෙයි දොර සිඟා සිට **තමන්**වහන්සේගේ ශරීරා ලෝකයෙන් රජගෙය රන්වන් කරවූසේක, එවිට රජ්ජුරුවෝ බිසෝවරු රජ යුවරජ මහා අමාත්යයෝත් සමාධිව උන්වහන්සේට වතු මධුරයෙන් කිරි පිඬු දුන්නාහ. උන්වහන්සේගේ විහාරයේ වැඩ හිඳිනා භික්ෂූන්වහන්සේ ඇම දෙන වහන්සේට බෙදාදුන්සේක. භික්ෂූන්වහන්සේත් එදවස් වළඳනා දෙයක් වළඳා ඉතිරිදෙය පාත්‍රාවල ලා පසුවදවස් වළඳන්නටයයි තුබුසේක, උපාසකවරුද මේ දැක භික්ෂූන්වහන්සේලාට අප දුන් වතුමධුර තබන්ට කාරණා කිම්දැයි උදඝොෂණ කළාහ. සම්බුදුරජාණන්වහන්සේ [එපවත් අසා වදාරා මහණෙනි, ආහාරය තබා ඵලහිතෙල් ඝකීරා හ ආදීවූ ගිලාන ප්‍රත්‍යය ගිලනුන්වයයි සිඟා වැළඳිය කටයුතුනොවෙයි, සත්දවසකින් ඔබ්බෙහි තිබුදෙය වැළඳීමෙන් අකැප යයි වදාරා මේ හෙසජ්ජ සන්නිධිකාර ශික්ෂාපදය පණවා එම්බා මහණෙනි පෙර උතුමයෝ එණුසුණු විවරකුත් කැප නොකළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

පිටගිය දවස ගන්ධාර රට ගන්ධාරතම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍ය **කරණසමයෙහි** බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ට පුත්ව උන්නාහ. ඒ රාජකුමාර යන්වත් ගන්ධාරකුමාරයෝයයි නම්තුබුහ. එසමයෙහි මියුලුනුවර **වේදේහනම්** රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරන්නහ, ඒ ගන්ධාර රජ්ජුරුවෝත් වේදේහ රජ්ජුරුවෝත් දෙන්නට උනුන් නොදැකම මිත්‍රව ඉඳිනාහ. එසමයෙහි එක් දවසක් ගන්ධාර රජ්ජුරුවෝත් අමාත්‍යමණ්ඩලයාත් පිරිවරා සඳල්ලේ උන්නාහ. එදවස් පූර්ණචන්ද්‍රයා පහළවිය. එවේලෙහි රාහු ඇවිත් සඳමඬල අල්වාගත. එවිට රජ්ජුරුවෝ සඳමඬල මහත් හෙයින්වේද මීට අනඳී පැමිණියේ කුඩා තරුවට හානියක් නැත්තේවේද අපවත් මේ අන්තරාය පැමිණෙන්නේයයි එම අරමුණක් කොටගෙණ ගන්ධාර නුවරත් කාශ්මීර රටත් හැර හිමාලය වන යට වැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූහ. වේදේහ රජ්ජුරුවෝත් ගන්ධාර රජ්ජු රුවෝ මහණවූනියාව අසා මාගේ යහළුවානන් මහණවූකළ මමත්මහණවෙමියි තමන්ගේ එක්සිය විසිඉවක්දිග පළල ඇති වේදේහ රාජ්ජයත් කොටුළු පිරී සිටිනා සොළොස් දහසක් බත්ගම්ද අනනාපුර පිටිපුර යන සියල්ලම හැර හිමාලය වනයට වැද මහණවූහ. කල්යාමකින් ගන්ධාර තාපසයෝත් වේදේහ තාපසයෝත් දෙන්නම උනුන්දැක වේදේහ තාපසයෝත් නොහඳුනනහෙයින් ගන්ධාර තාපසයනට අත්පා මෙහෙවර කරන්නාහ. එක්දවසක් තාපසයන් දෙන්න කථාකොට කොට උන්කලට සඳමඬල නැඟේය, රාහු ඇවිත් සඳමඬල ගත, ගන්ධාර තාපසයෝ කියන්නාහු සඳපාන මදවන්ට කරණා කිම්දැයි විචා ළාහ. වේදේහ තාපසයෝ කියන්නාහු රාහු ඇවිත් සඳමඬලය ඇල්ලූ හෙයි නැයි කීහ. එවිට ගන්ධාර තාපසයෝ කියන්නාහු **එම්බා වේදේහ තාපසයෙනි මහත්කෙණෙකුන්වමය යම්කානියෙක් පැමිණෙන්නේය. මමත් මාගේ රාජ්‍යය**

නැර මේ වතයට එන්නෙම් මේ අරමුණක් කොටගෙණ මාගේ ගඞ්ගාර රාජ්‍යය කාශ්මීර රටකැර ඇවිත් මහණවීම් කිහ. එවිට වේදේහ තාපසයෝත් එසේද නුඹවහන්සේ ගඞ්ගාර තාපසයන් වහන්සේ නමැයි කිහ. එසේවීනම් මමත් මියුලු නුවර රජකම් කළාවූ වේදේහ රජ්ජුරුවෝ නම් මමයයි කිහ. එවිට ගඞ්ගාර තාපසයෝ කියන්නාහු තොප මහණවූයේ ඇයිදැයි විචාළාහ. මාගේ යාළු ගඞ්ගාර රජ්ජුරුවන් මහණවූකළ මට රාජ්‍යයෙන් ප්‍රයෝජන කිම්දැයි සිතා මහණවීම් කියා දෙන්නම උනුනුන් ඇදිනගණ සමාධිව එකතැන වාසයකරන්නාහු ලුණු ඇඹුල් සෙවුනා සඳහා නොබෝ කලකින් පසල්ගමකට ගොසින් දෙදෙනමවීපියේ සිඟායන්නාහ. ඒ ගම මන්ඡ්‍යයෝ දවසක් ලුණුමුසුව ආහාරය පිළිගන්නාහ, දවසක් නිකම් ආහාරය දෙන්නාහ, එක් දවසක් සිඟා ගියකල ලුණු බොහෝකොට දුන්හ. ඒ ලුණු වේදේහ තාපසයෝ ගඞ්ගාර තාපසයන්ට දීලා තමනුත් අනුභවකොට ඉතිරි ලුණු කෙහෙල් පතෙක ලා පලයේ සඟවා තුබූහ. පසුදවස් සිඟානිය ගමනේ එනු නොලද්දහ එදවස් වේදේහ තාපසයෝ තමන් තුබූ ලුණු ඇරගෙණ ගඞ්ගාරතාපසයන්ට පිළිගැන්වූහ. ගඞ්ගාර තාපසයෝ අප වීටියෙහි සිඟා ගියගමනේ ලත් ලුණක් නැත. මේ ලුණු කොයින්දැයි විචාරා ඊයේ ගෙණා ලුණු තිබීමියි කී කල්හි එවිට ගඞ්ගාර තාපසයෝ කිපී තොප සොළොස් දවසක් බත්ගම් ඇරපියා මහණවූයේ කිසිදෙයකත් ආලය නැතිව වේද එසේවූ තොප ලුණු සිහිත්තක් නිසා ලොභකරන්ට කාරණා කිම්දැයි හාස කොට කිහ. එවිට වේදේහ තාපසයෝ කිපී නුඹවහන්සේ ලෝකවාසීන්ට අවවාද අනුශාසනා කොටගත නොහෙම් කියා තපසට ආයේය. මට කෝප කරන්ට කාරණා කිම්දැයි කිහ. එවිට ගඞ්ගාර තාපසයෝ කියන්නාහු තොපි උරණවූ නමුත් කුමක්කරම් නමුත් මා අවවාද කියන්නේය, තොපකළේ ඉතා කාරණයෙක් කොවෙයි, තාපසවරු නම් ලත්දෙයකින් යපෙන පමණක් විනා මෙලෙස කිරීම කටයුතු නොවෙයි කිහ. එවිට වේදේහ තාපසයෝ කියන්නාහු නුඹවහන්සේ මාගේ සිත කණස්සලකරවා අවවාද කිරීම නම් නොකැපෙන කරයකින් හිසකපන්නාක්මෙනැයි කිහ. තෙපි සෙසේ කණස්සළුවිනමුත් මා කියේ කාරණයයි වේදේහ තාපසයන්ට අවවාද කිහ. වේදේහ තාපසයෝත් කාරණා කියා ගිවිස බොධිසත්ත්වයන්ගෙන් කමාසථාන ඉගෙණ දෙන්නම හිමාලය වනයට ගොස් පඤ්චාභිඥ අෂටසමාපත්ති උපදවා කම්වූ පරිද්දෙන් මිය බඹලොව ගියහයි වදාරා මේ ගඞ්ගාර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි වේදේහ තාපසයෝ නම් ආනන්දස්ථවිරයෝය, ගඞ්ගාර තාපසයෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක

---

## 395 මහාකපි ජාතකය

තිවද අකුතොභයවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බන්ධුසමාගමක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්තමාන කථාව භද්‍රශාල ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි වත්තාහි මහළුවරුන් වහන්සේ දම්සභාවෙ රැස්ව සඝරුවන් වහන්සේ බන්ධුන් කෙරෙහි අනුග්‍රහ කරණසේකැයි කිය කියා වැඩඋන් තෙනව සඝරුවන් වහන්සේ වැඩ වදාරා මහණෙනි, මා එන්නාව පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදුසි විචාරා වදාරා එපවත් අසා මහණෙනි, දැන්මතු නොවෙයි, පළමුත් මනෝත්තමයෝ බන්ධුන්ට අනුග්‍රහ කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සඝරුවන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයෝ වාතරව උපන්නාහ මහත්වූ ශරීරයක් ඇත්තාහ, අසූදහසක් වදුරන්ට නායකව වසන්නාහ. හිමාලය වනයෙහි ගඩගාවක් සම්පයෙහි මහත්වූ අඹගසෙක් ඡායාසම්පන්නව මහත්වූ අතුපතර ඇතිව ඉඳුනීල පඳුරුයක් මෙන් ශොභාවත්ව සිටිනේය. මෙහි පල්ලවයෙන් සඳුකාය, මෙහි අඹ කළපමණ මහත ඇත්තේය. රස දිව්‍යරසය, සුවද දිව්‍ය සුවදය, බොධිසත්ත්වයන් හා අසූදහසක් වදුරෝ ඵලජාති කාගෙණ ගියාහු අඹගස දැක දිව්‍යරසවූ අඹ අනුභව කොට එහි වසන්නාහ. ඒ අඹගස එක් අත්තෙක අඹ ගොඩ වැහිරෙන්නේය, එක් අත්තෙක ඒ අඹ දියෙහි වැහිරෙන්නේය, බොධිසත්ත්වයෝ ඒ අඹ දියෙහි වැම්මෙන් මතු උපද්‍රවයෙක් සැලසුනි නම් තපුරුයි සිතා දියෙහි වැම්මෙන අඹ අත්තේ අඹ මැලසි අවස්ථාවේ තසවයි කියා වදුරන්ට සම්මත කළාහ. අසූ දහසක් වදුරෝ ඒ නියාවටම අඹකන අවස්ථාවෙහි එක් අඹයෙක් දිමිකදලු අස්සේ තිබී මූකරු අසූදහසක් වදුරන් ඇසට නොපෙණී විලිස්සව ගඟ දියෙහි වැටුනේය. ඒ අඹගෙඩිය, බරණැස් නුවර රජ්ජුරුවන් නාන්ට එන තොට සමීපයේ දෙපිල දැල එල්වා තුබුයේය, ඒ අඹගෙඩිය ලෝදැල බැඳින, ලෝදැල් අකුලන්වගිය කෙවුලෝ එකියන අඹය දැක කවර ඵලජාතියක් බවත් නොදැන රජ්ජුරුවන්ට ගෙණඅගාසින් දුන්හ. රජ්ජුරුවෝ මේ කවර ඵලජාතියෙක් දැයි විචාරා නොදනුම්නයි කී නෙයින් වැද්දන් ගෙන්වාගෙණ මේ කවර ඵලජාතියෙක් දැයි විමාළාහ. සවාමීනි හිමාලයේ ගඟක් සමීපයේ අඹයෙකැයි කීහ. රජ්ජුරුවෝ ඒ වැද්දන් අතතුබූ සෙල්ලයෙන් අඹය සුස්වා පළමුයෙන් වැද්දන්ට කවා පසුව නුවරැන් පටන් රජ්ජුරුවන් වහන්සේ මේ නිමවා ඒ වැද්දන් ඇරගෙණ ඒ ගස සමීපයට මහපාවයි කියා චතුරංගිණීසේනාව ඇරගෙණ ඔරුපාරු පඬිව ආදියට නැගී ගඟඔස්සේ ගොසින් අඹගසමූලට බැස රජ්ජුරුවෝ අඹරස අනුභවකොට ලැහුම්ගෙණ වව චතුරංගිනී සේනාව සලස්වා එතන බොහෝ ගිනිමැල බදවා බොහෝ අරගල පැවත්වූහ. මධ්‍යම රාත්‍රියේ අරගල සන්හිඳී ගිනිත් නිවී නිශ්ශබ්දව මනුෂ්‍යයෝ නිදන්ට වන්නාහ. බොධිසත්ත්වයන් ඇතුළුවූ අසූදහසක් වදුරෝ අඹගසට නැගී අඹකන්ට වන්නාහ. බොහෝ වදුරන් නෙයින් බොහෝ අරගලවූ ගමනේ රජ්ජුරුවෝ පිබිද මනුෂ්‍යයන් පුබුද්දවා අඹගස බොහෝ වදුරෝය, කොයින් යා නොදී නිදා නැගි කල්හි අඹ රසත් වදුරුමසුත් කම්මැයි කියා වව රැකවල්ලවා දුනුවායනුත් ලැවූහ. වදුරෝ එකසි භයපත්ව බොධිසත්ත්වයන් සමීපයට ගොස් මෙපවත් කීහ. බොධිසත්වයෝ

මෙපවත් අසා තොපි හැම භය නොගණුවයි කියා සන්තර්පණය කොට අඹ ගස අග අත්තට නැඟී මහත්වූ වේහ දක්වා එගොඩ කැලයකට පැතපුවාහ, බොසඳින්නියෝ ගඟ එගොඩට පිනුගමනේම දුනුදියනුලූ දුන්නෙන් සියක් දුන්නයයි නියමදැන එවිවරටත් ගඟබදිනා විවරටත් වේවැලක් කඩාගෙණ වේවැල ගඟබැඳ බොධිසත්ත්වයෝ තමන්ගේ ඉඟබදිනා පමණ පරීක්ෂා නොකොට ඉඟබැඳ දෙවනුව පිනුවාහු අඹඅත්ත අල්ලාගත්තාහ, ඉඟබදිනා ප්‍රමාණය ලුහුඬුව ගියහෙයින් බඳදීලා අත්ත අල්වාගෙණ වැදඔත්තාහ, බොධිසත්ත්වයෝ වදුරන්ට කියන්නාහු ඉඟ බඳිනා ප්‍රමාණය පරීක්ෂා නොකළ හෙයින් අත්ත පිව සැපසේ වැදහෝනට නොසීරුය, තොප හැම කිසි සැකයක් නොසිතා මාගේ ඉඟ මැඬගෙණ සැපසේ ගඟින් එතර පලායවයි කීහ. වදුරෝ කියන්නාහු සවාමීනි අපගේ ප්‍රාණ ආසාවෙන් නුඹවහන්සේගේ පිටමැඬගෙණ යන විනා නුඹවහන්සේට ලත්වන්ටත් බම්හයි කියා බොධිසත්ත්වයන් වැද වදුරෝ එකින් එකා නියාගෙන් අසූදහසම ගඟින් එගොඩ ගියාහ. දෙවදත්තයා ඒ ජාතියේ එකියන වදුරන් හා එක්ව ඉපද අඟ අත්තට නැඟී උන් තැනැත්තේ ඇරලා බොධිසත්ත්වයන් පිටට පිනුගමනේ හෘදයමාංශත් කඩාගෙණ තෙමේ පලාගියේය. රජ්ජුරුවෝ නොනිදා උන්තැනැත්තෝ බොධිසත්ත්වයන්ගේ ක්‍රියාවත් වදුරන්ගේ ක්‍රියාවත් දෙවදත්තයාගේ ක්‍රියාවත් දැක පාන්වූ ගමනේ අවල්ලක්ඛාවා ඊපිට මැස්සක් ලවා මැස්සඇඩට මිනිසුන් නංවා බොධිසත්ත්වයන් ඉඟබැඳි වැල් උනවා බිමට බාවාගෙණ වසවකඩක් වෙලා උලා නාවා මධුර ආහාර කවා ශතපාක සහස්‍රපාක තෙල් ශරීරයෙහි ගල්වා රජ්ජුරුවන් තමන් වැදහෝනා යානේ තෙලිසමක්ලා බොධිසත්ත්වයන් එනි වැදහොවා රජ්ජුරුවන් කථාකරන්නාහු ධීරපුරුෂවූ වදුරානන් වහන්ස, නුඹ වදුරන්ට කුමක් වන්නේ ද? වදුරෝ නුඹට කුමක් වෙත්දැයි විවාළහ. බොධිසත්ත්වයෝ කියන්නාහු මේ අසූදහසක් වදුරෝ මා නායකකොට තමන් ඇමට භයක් පැමිණියොත් අප ගලවාගත මැනවැයි මා රජකොට තැබූහ. එසේ හෙයින් උන්ව පැමිණි හයින් සන්හිඳවීම්, මාගේවසට බැඳි වැල ලුහුඬුව ගිය හෙයින් වසට ඇද තිබෙන හෙයිනුත් වදුරන් අසූදහස මාගේ පිට මැඬගෙණ ගිය ආයාසයෙ කැයි නොදනිමියි මාගේ වදුරන් සැපසේ පලාගිය ගමන්ම මට මහ සන්තොෂය, සතුරන් මඬිනා හෙයින් අරින්දමයයි රජ්ජුරුවන් විසිනුත් තමාගේ රාජ්‍යවාසීන්ට භයක් පැමිණියේ නම් එයින් ගලවා දසරාජ ධර්මයට අකොප්‍ය නොව රාජ්‍යකිරීම විනා පැමිණි භයකට රාජ්‍යවාසීන් හැම මැරීම රාජ ධර්මයට ඇතුළත් නොවෙයි. අවවාද කිය කියා වැදෙත් ගමනේ ප්‍රාණය නිරුඬ විය. රජ්ජුරුවෝ බොහෝ විශේෂයට පැමිණ නුවරවාසීන් එක් කරවා රජදරු කෙණෙකුන්ට කළමනා ආදාහනයක් මෙන් කරවයි කියා ගැල්දහසකින් දර අද්දා ලවා සොළොස් දහසක් බිසෝවරුන්ව පිළි අඳවා ඉසකේ පිවිමුදුහෙලවා රන්මල් රිදීමල් විලඳ ආදීවූ දෙය ඉසිනා නියාගෙන් සලස්වා නුවරවාසීනුත් සොළොස්දහසක් බිසෝවරුනුත් සුසාන භූමියට යවා බොධිසත්ත්වයන් ආදාහන කරවූහ. බොධිසත්ත්වයන්ගේ කපාලය නොදා තිබුවා රජ්ජුරුවෝ ගෙන්වා රන්පවක් ඉදිකරවා ජයකොන්තය හා එක්ව මස්වා බරණැස්නුවරට ගෙණගොස් ගඳදුම්මල් ආදීවූ දෙයින් විශෙෂයෙන් නුවර සරහා රන් දාගැබක් බඳවා ශීර්ෂකපාලය රන් දාගැබෙහි පිහිටුවා පූජා සත්කාර කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ මහාකපි

ජාතකය නිමවා වදාල්සේක එසමයෙහි රජ්ජුරුවෝ තම් ආනන්දස්ථවිරයෝය. එසමයෙහි වඳුරුව උපන්නෙම් බුදු මම ය යි වදාළසේක.

---

## 396
## කුම්භකාර ජාතකය

මේ වදාළ අද්භූත පුද්ගලවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ක්ලේශ විෂ්කම්භනයක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වනාහි විස්තර වශයෙන් ප්‍රවෘත්ත ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි කෙළෙඹිපුත්‍රයෝ පන්සියයක් මහණව ජේතවනාරාමයෙහි වාසය කරන්නාහු. එක් දවසක් රෑ ඒ පන්සියයක්දෙනා වහන්සේම රාගචිත්තය උපදවා කෙලෙස් වසඟවූ කල්හි සම්බුදුරජාණන් වහන්සේ අලුයම් වේලෙහි බිඳුරකිනා කිරලක මෙන්ද වාලාධිපරක්නා සෙමරකමෙන්ද එකපුතෙකු රකිනා මවක්මෙන්ද, එක ඇසක් රකිනා එකකු මෙන්ද, මාගේ භික්ෂූහු කවර ලෙස වාසය කෙරෙද්දෝහෝයි කරුණා සමාපත්තියෙන් නැගී ලොව බලා වදාරන සේක් මේ පන්සියයක් භික්ෂූන්වහන්සේ රාගචිත්ත උපදවා ක්ලේශ වසඟවූ නියාව දැක භික්ෂූන් පන්සියයම තනිව කැඳවීමහම් මුන් ඇම අපසිතු සිහි විල්ල සම්බුදුරජාණන් වහන්සේ දැනගන්වනැයි භය ඇතිව මා කියන්නාවූ ධර්මය නොඅසන්නාහයි සිතාවදාරා අනද සාමීන් කැඳවා ආනන්දයෙනි! භික්ෂූන් එක්කරවයි වදාළසේක. අනදසාමීන් ජේතවනාරාමයෙහි වාසයකරන්නා වූ භික්ෂූන්වහන්සේ ධර්මසභා මණ්ඩපයට රැස්කරවූසේක. සම්බුදුරජාණන්වහන්සේත් එම්බා මහණෙනි, යම්සේ ක්ලේශ වසඟයෙන් රාගචිත්තයෙක් උපන්නේවීනම් ඒ දවු නොලවා වහාම නසාපිය යුත්තේය. පෙර උත්තමයෝ යම්තම් අරමුණක් දැක උපන්නාවූ ක්ලේශයන් නසාපුවෝ වේදැයි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

අතීතයිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්ත්වයෝ පසළඟමෙක දුක්පත් කුඹල්කුලයෙක ඉපද වැඩිවිය පැමිණ බිරින්ද හා සමග තමන් හා දෙදෙන බැලමෙහෙකොට වාසයකරන්නාහ, එසමයෙහි කළිඟුරට දන්නපුරනුවර කරණ්ඩික නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යජය කරනකල්හි ඒ රජ්ජුරුවෝ එක් දවසක් මඟුලුයන් යන්නාහු උයන් දොරකඩ පලඟෙණ සිටියාවූ අඹගසෙක විලිකුන් අඹදැක ඉන් අඹ ගෙඩියක් කාගියාහ, පස්සේඑන්නාවූ අමාත්‍යයන් හා සේනාව එකහිම අඹකඩා කැට මුගුරු ආදිය ගසා අතුපත්කඩා අඹගසට බොහෝ විනාශකළාහ. රජ්ජුරුවෝත් රජගෙට යන්නාවූ අඹගස දැක මෙපවත් අසා සම්පත් ඇත්තවුන්ටත් වන්නාවූ අනර්ථය මේ අඹගසට මෙනි, කුමකුත් නිරපෙක්ෂව වාසයකරන්නාවූ තාපසවරුන්ට කිසිභයෙක්වත් සිතට දුකෙක්වත් නැත, සියල්ලම අනිත්‍යය දුක්ඛය, අනාත්මයයි තිලකුණු භාවනා කොට එම අඹගස මුලසිට සියළු

කෙලෙසුන් නසා පසේබුදුවූසේක. පසේබුදුව ඉතිකින් මේ ශරීරය දෙවනුව උත්පත්තියක් වන්නේත් නැත, මේ ඇවසැකිල්ල මේ ජාතියෙහිම නිරපෙක්ෂව ඇරපීම්. ඒ ඒ ජාතිවල ඇඹු කඳුළු කියතොත් සමුද්‍රජලයටත් බොහෝව දුඃඛයෙනුත් මිදුනෙමියි තිලකුණු භාවනාකොට වැතිරගෙණ වැඩසිටියේක. එවිට අමාත්‍යයෝත් ඇයි සවාමීනි රජගෙව වැඩිය මැතව මෙතන වැඩසිටිනේදැයි කීහ. රජ්ජුරුවෝත් එම්බල මම පසේ බුදුව ගියෙමි. මට රජ්ජුරුවන්හයි නොකියවයි වදළසේක. අමාත්‍යයෝ කියන්නාහු පසේ බුදුවරුන් වහන්සේ නම් තුන් සිවුරු පාත්‍රධරව ඉසමුඩුව මනාවේදැයි කීහ එවිට ඉස පිරිමැදලූසේක, ඉස කෙස්සතරගුල් දික්ව තුන්සිවුරු පාත්‍රධරව ආකාශයට නැගී නන්දමූල පබ්භාරයට වැඩිසේක.

තවද එසමයෙහි ගන්ධාරරට තක්සලානුවර තග්ගාර් නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවෝ එක් දවසක් සඳැල්ලේ අමාත්‍යයන් පිරිවරා උන්නාහ, ඒපියේ කුඩා කෙල්ලක් වැලි පූ කරන්නී තමා අත තුබූ රුවන් වලළුදෙක එකඅත එෑ හෙයින් ශබ්ද පවත්වන්නටවත, රජ්ජුරුවෝත් නිවීම යහපත සම්පත්තම් මිනිසුන්ට විනා සසරට සහයව සිටිනේ නොවෙයි, එසේහෙයින් තනිම වාසය කරන්නාවූ තපස්වීවරයන් වහන්සේට කිසි හයෙක් නැත්තේය. එම අරමුණු කොට නිලකුණු භාවනා මෙනෙහි කොට සියළු කෙලෙසුන් නසා පසේබුදුවූසේක, අමාත්‍යයෝත් ඇයි දේවයන්වහන්ස, බැණ නොනගී ඉඳිනේ ඇයිදැයි කීහ. එවිට එම්බල මට දේවයනි නොකියව, මම පසේබුදුව ගියෙමි කීහ. එවිට අමාත්‍යයෝ කියන්නාහු පසේ බුදුන් කල අට පිරිකර ධරා සිටිය මනා වේදැයි කීහ. එසේදැයි තමන්වහන්සේගේ සෘද්ධ්‍යානුභාවයෙන් අටපිරිකර ධරා ආකාශයට නැගී ගන්ධමාදන පර්වතයට වැඩිසේක.

තවද මියුළු නුවර වේදේහරට නිමි නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන්නාහු එක්දවසක් මතුමාල්තෙලෙහි උන්නාහු අඟනියේ කෙල්ලක් දඹ මස් විකුණන්නීය. ඉන් එක් දඹමස් කැටියක් උකුස්සෙක් ගසාගත, ඒ උකුස්සාගේ ඔළුවේඇන අතික් උකුසේසක් ගසාගත්තා උ අතින් අතිකෙක් ගසාගත මස්කැටිය අරපු උකුසාව ගනටයෙක් නැතැයි මේ පඤ්චකාම ඇල්මත් මේ උකුස්සාමෙන, ඇල්මනැති තැනැත්තේනම් මස්කැටිය ඇරපු උකුස්සා මෙනැයි මෙම අරමුණු කොටගෙණ නිලකුණු සඳහන්කොට විදර්ශනා භාවනාකොට පසේබුදුවූසේක. අමාත්‍යයෝ ඇයි සවාමීනි බැණ නොනැගී ඉඳිනේ ඇයි දැයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු එම්බා මම පසේබුදු වීමි. කී කල්හි පසේබුදුවූකල මෙසේ ඉඳිනේ ඇයිදැයි විවාළ කල්හි අටපිරිකර ධරව සිටින්ට උවමැනවැයි කීකල්හි එවිට ඉසපිරිමැදලූසේක. අටපිරිකරධරව අමාත්‍යමණ්ඩලය හා රාජ්‍යවාසීන්ට අවවාද කියා නන්දමූල පබ්භාරයට වැඩිසේක.

තවද පඤ්චාලරට උත්තරපඤ්චාලනුවර දුර්මුඛනම් රජ්ජුරුකෙණෙක් රාජ්‍යය කරන්නාහ. මතුමාල්තල උන්නාහු ඒපියේ එක් වෘෂභයෙක් දෙනකට නැගෙන්නටයයි වන. අනික්මෝල්ලිය මහත් වෘෂභයෙකු දිවගෙණ අවුත් ඒ ගොණා ඇන බඩපලාපියා ඒ දෙනව නැංගේය, රජ්ජුරුවෝත් පඤ්චකාමයෙහි ලොභ කිරීමෙන් තෙල ගොණා මරණයට පැමිණියාමෙන් මරණයට

පැමිණෙන්නේයයි අනිත්‍යය, දුකඛය, අනාත්මයයි තිලකුණු භාවනා කොට විශේදනා වඩා පසේබුදුවූ සේක. එවිට අමාත්‍යයෝ ඇයි සාමිනි බැණනොකැගී ඉදිනේයයි කීහ. රජ්ජුරුවෝ කියන්නාහු මම පසේබුදුවීම්යි කීසේක. පසේබුදුවූකල මෙලෙස ඉදිනේදැයි අවපිරිකරධරා උතමැනවැයි කීහ. එවිට ඉස පිරිමැදලූ ගමනේ අටපිරිකරධරව පාත්‍රයක් අතින්ගෙණ රාජ්‍යවාසින්ට අව වාද කියා තන්දමූල පබ්භාරයට වැඩිසේක. පසේබුදුන් සතරදෙනාවහන්සේම තන්දමූලපබ්භාරයෙන් නික්ම පසුල්ගම කට බැස ගැටවටු ගෙන්වා බොධිසත්ත්වයන් ඉදිනාගෙට සිඟාවැඩිසේක. බොධිත්ත්වයන් වහන්සේ උත්වහන්සේලා සතරදෙනාවහන්සේ වඩා ඉදුවා දන්වළඳවා සාමිනි නුඹවහන්සේලා සතර දෙනාගේ ඉරියාපථයන් දැක සමාධිවීම්, නුඹවහන්සේලා සතරදෙනාවහන්සේ කවර අරමුණක් දැක පසේබුදුවූයේදැයි විවාළසේක. එවිට මැඩිමාළු බුදුන් වහන්සේ මම පලගෙණ සිටි අඹගසකටවූ හානිත් පලඳ, නොවූ ගසකව නුවූ හානිත් දැක අජීර්ය ඇති තැනැත්තවුට වන්නාවූ අනජීර්යන් මේ අඹගසවවූ හානිය මෙනැයි අරමුණු කොට පසේබුදුවීම් යි වදාළසේක. දෙවෙනි බුදුන් වහන්සේ කුඩාකෙල්ලක අත තනිව තුබූ වලල්ල නොඇඩන නියාවත් වලලූ දෙක එක්වතුබූ ගමනේ අඩන නියාවත් දැන බොහෝදෙන හා වාසය කිරීමෙන් ඉන් ඊට ගැටීමෙන් සිතට වන්නාවූ ගහට මේ වලලූදෙකමෙනැයි මෙම අරමුණක්කොට පසේබුදුවීම්යි වදාළසේක. තුන්වෙනි පසේ බුදුන් වහන්සේ වදාරණසේක් එක් උකුස්සෙක් මස්කැටියක් ඩැහැගෙණ ආකාශයට නැංගේය, අනික් උකුස්සෙක් ඌ ඔළුවේඇත ඒ මස්කැටිය ඇරගෙණකියේය. පඤ්චකාමයෙහි ආලය අළුවාවූ සත්වයානම් මස් කැටියේ ආලය ඇරපු උකුස්සා මෙන් පඤ්චකාමයෙහි ඇල්ම කළාවූ සත්වයා නම් මස්කැටිය ඩැහැගෙණ යන උකුස්සාමෙනැයි මෙම අරමුණක්කොට පසේබුදුවීම්යි වදාළසේක. සතරවෙනි පසේ බුදුන් වහන්සේ වදාරණසේක් එක් හොණෙක් දෙනකට නැහැගෙන්ව උත්සාහකෙරෙයි ඉවතසිව අනික් හොණෙක් දිවගෙණ අවුත් ඒ හොණා අහින් ඇත බඩපලා මරා තෙමේ ඒ දෙනට නැංගේය. පඤ්චකාමයෙහි ඇලුම්කළාවූ යම් සත්ත්වයෙක් ඇත්නම් මේ හොණාමෙන් විනාශයට පැමිණෙන්නේයයි මෙම අරමුණක්කොට පසේබුදුවීම්යි වදාළසේක. බොධි සත්ත්වයෝත් මේ නියාව අසා උත්වහන්සේ සතරදෙනාවහන්සේ කෙරේ සමාධිව උපසථාන කළසේක. පසේබුදුන්වහන්සේ බොධිසත්ත්වයන් වහන්සේව අනුමෙවෙනි බණ වදාරා නන්දමූල පබ්භාරයට වැඩිසේක. බොධිසත්ත්වයන්වහන්සේත් බොහෝ කලකින් මෙසේවූ රජදරුවෝ මහත්වූ සම්පත්හැර පසේබුදුවූන. මම වතයට ගොස් මහණවෙමි, තමන්වහන්සේගේ බිරින්දව කියතසේක් එම්බා භද්‍රාව කලිඟුරට දන්තපුරනුවර කරණ්ඩක රජ්ජුරුවෝද, ගන්ධාරරට හා කාශ්මීර රට නායක තක්සලා නුවර තග්ගාරි රජ්ජුරුවෝද වේදේහ මියුළු නුවර නීමි රජ්ජුරුවෝද පඤ්චාලරට උත්තරපඤ්චාල නුවර දුර්මුඛතම් රජ්ජුරුවෝද යන මේ සතරදෙනම තමතමන්ගේ මහත්රාජ ඓශ්වර්‍යයහැර පසේබුදුවූන, ඒතරම් මහාත්සම්පත් ඇති රජදරුවන් පවා පසේබුදුවූකල අපට කන්ට බත් නැතිව, අඳින්ට පිළිනැතිව, දුකඛජීවිකාවෙන් දවස් අරුම්හ අපව තමා මේ ගිහිගෙන් ප්‍රයෝජනකිම්දැයි එම්බා භද්‍රාව මම් වනට වැද සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවන්නා කැමැත්තෙම් කීහ. එවිට කියන්නාහු භග්ගව ශ්‍රෝත්‍රියෙකි

උපන්නාවූ කුඹිහකාරයන්වහන්ස සිතුදේම යහපත ඊවූබාදූ නැතැයි කියා සිතන්නානු මුන්වහන්සේ දරුවන් මා ඇඟට දමා තමන්වහන්සේ මහණව' ගියසේක්විතම් දරුවන් පෝෂ්‍යකරන්ට බැරිය, මහණවීමතම් සිතූ සිත හා සමග වූවොත්විනා පසුව බොහෝ සිතිවිලි සිතීගියේනම් කාරණා නොවෙයි, මුන්වහන්සේ අතින් අවසරඉල්වාගෙණයෙත්නම් යානොදෙනසේකැයි කලය ගෙණ පැනට යන්නාක්මෙන් ගොස් තාපසවරුන් වසන්නාවූ පන්සලට වැද පරිව්‍රාජකාවුදූය, බොධිසත්ත්වයන්වහන්සේත් දරුවන් හැරපියා යානොහී මුන් වඩිනමු කළ කල යෙම් සිතා මදක් වැඩිගන්නා මාගේ දරුවෝ කවියුතු කාරිය දනිද්දෙහෝයි පරීක්ෂාකරණ නිසා දවසක් සාල්කරණසේක. එක්දවසක් යහ පත්ව පිසනසේක. දවසක් මාළුයේ ලුණු මදකරණසේක, දවසෙක ඇඹුල් මද කරණසේක. ඒ දරුවෝ දෙදෙනෙක් ඇයි පියානන්වහන්ස අද බත් සාල්කළ සේක, අද කුඩුකොට පිසූසේක. අදයහපත්ව පිසූසේක. අදමාළුයේ ලුණුම්දකළ සේක, ඇඹුල්මදකළසේකැයි කියන්නාහ, බොධිසත්ත්වයෝත් මාගේ දරුවෝ කටයුතු දැනගත්තුයයි කියා තැයන් අතට දරුවන් පාවාදී තමන්වහන්සේ තපස්වරුන් වසන්නාවූ පන්සලට වැද මහණවූසේක, එක්දවසක් තාපසයන් වහන්සේත් පරිබ්‍රාජිකාවන්වහන්සේත් සිඟා වැඩි ගමනේ වීථියේදී උනුනුන් දැක මාගේ දරුවන් මරාපියා මහණවූසේක්ද නොහොත් දමාපියා මහණවූ සේක්දැයි විවාළසේක. මැරුයේත් නැත, දැම්මයේත් නැත, උන්ගේ තැයන් අතට පාවාදී මහණවීමි වදාළ තැන් පවන් ඕයහතුරු දෙදෙන උනුන් නොදැක කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ කුම්භකාර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බොධිසත්ත්වයන්ගේ කුඩාදියනියෝනම් උපුල්වන් මහා සථවිරිය, පුතනුවෝ නම් රාහුලමහාසථවිරය පරිබ්‍රාජිකාවෝ නම් යසෝධරා සථවිරිය, කුම්භකාරව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 397
## දළ්හධම්ම ජාතකය

**මේ**වද අප්‍රතිපුද්ගලවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වසන සමයෙහි උදේනි රජ්ජුරුවන්ගේ භද්‍රාවතී නම් ඇතින්නක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වනාහි විස්තරවශයෙන් මාතඹග ජාතකයෙහි පෙනෙන්නේය. මෙහි වනාහි උදේනී රජ්ජුරුවන්ගේ භද්‍රාවතී නම් ඇතින්නක් ඇත්තීය, ඒ ඇතින්නී රජ්ජුරුවන්ට නොයෙක් කාරියකොට දවස සියක්යොත්තක් ගොසින් එන්නීය, ඒ වණ්ඩප්‍රජ්‍යෝත රජ්ජුරුවන්ගේ දුවනියනුත් ඒ ඇතින්නිය නිසා ලද්දාහ. රජ්ජුරුවොත් ඒ ඇතින්න තමන්ට කවියුතුකරන්ට ශක්ති ඇතිව කරණතෙක් දවස් සියලු හස්ත්‍යලඞ්කාරත්දී තමන් මෙහෙනිම වන්නා සේ ඇතින්නටත් කැවිලි සලස්වා ඇතින්න දුම්ලව ගිය අවස්ථාවෙහි ඇතින් නට තිබූ රාජවාත්තියත් ඇරගෙණ ඇතින්න උනාඇලහ, ඇතින්න එක්දවසක් සම්බුදයන්වහන්සේකරා ගොස් සවාමිනි මාගේ රජ්ජුරුවන්වහන්සේ මා නිසා බිහවූන්වහන්සේත් ලත්සේක, ජීවිතයත් ලත්සේක. මා තරුණ දවස් සියලු

රාජකාරියම් කරවා මට සියලු හස්ත්‍යාලඞ්කාරයෙනුත් සරහා මා සිටිතා ඇත්නල පෝරුවපිට සිටින්නට පයට ආයාසයයි මොළකට තිල්ලත් තනවා තමන්වහන්සේ මේ නිමවතසැටියේ රසමසවුලෙන් යුක්තවූ ආහාරයත් මට නිරන්තරයෙන්ම දෙවා මලමුත්‍ර බිම වහුරුවන්ට තපුරැයි මිදිවළත් තබ මෙසේ නොයෙක් ඉසුරු දී මා රැකීසේක. දැන් මා දුම්ල අවස්ථාවෙහි තණ සුහක් පමණකුත් නොලා උනා ඇරපුසේක. මම් වනයෙහි වැටකේ අත්තක් යම්කිසි කොලබොල කඩාකා ජීවත්වෙමි, මාගේ පිරිහී ගියාවූ ඓශ්වර්‍යයෙහි පිහිටුවාලන්ට සවාමිනි නුඹවහන්සේව විනා අනික් කෙනෙකුන්ට බැරියයි සම්‍බුදුරජාණන්වහන්සේට කිව. සම්‍බුදුරජාණන්වහන්සේ යහපතැයි පසුව දවස් රජ ගෙට සිඟාවැඩිසේක. රජ්ජුරුවෝත් සම්‍බුදුරජාණන්වහන්සේ ඇතුළු මහාසංඝයා වහන්සේව දන්දී බණ අසා එකත්පස් උන්නාහ. සම්‍බුදුරජාණන්වහන්සේ රජ්ජුරුවන් අතින් විවාරණසේක් මහරජ තොපගේ භද්‍රාවතී නම් ඇතින්න දැන් නොදකුම්හයි ඕ දැන් කොයිදැයිවිචාරා වදාළසේක. සවාමිනි දුම්වලවගිය හෙයින් පිටත උනානළිම් කීහ. එවිට සම්‍බුදුරජාණන්වහන්සේ මහරජ තොපගේ බිසවුනුත් ඇ නිසා ලදුව, තොපගේ ජීවිතයත් ඇ නිසා ලදුව, එසේවූ උපකාරී ඇතින්නට තිබූ තරම් අරගන්නට කාරණා කිම්ද කවයුතු කරන්නාවූ යම්කෙණෙකුත් තරුණ අවස්ථාවෙහි කටයුතු ගෙණ දුම්ල අවස්ථාවෙහි උන් සථානාන්තරය පිරිහෙළිම රජ්ජුරුවන්ට කටයුතු නොවෙයි කියා ඇතින්න ගෙන්වා පළමුතිබූ සථානාන්තරයෙක් ඇත්තම් ඒ සියල්ලම ඇතින්නට සලස්වා වදාළසේක. රජ්ජුරුවෝත් ඒ නියාවට ඇතින්නට පළමු තිබූ තරම් නියාවට අඩුනැතුව පසිදුවයි නුවර බෙරලැවූහ. එක්දවසක් දම්සභාවේරැස්වූ භික්‍ෂූන්වහන්සේ සම්පත්තියෙන් පිරිහුනාවූ භද්‍රාවතී නම් ඇතින්න රජ්ජුරුවන්ට කියා සම්‍බුදුරජාණන්වහන්සේ පළමු සිටි සථානාන්තරයෙහි පිහිටීම පිහිටුවූසේක් වේදැයි කිය කියා වැඩඋන්තෙනට සම්‍බුදුරජාණන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාව පූජාභාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි පෙරත් භද්‍රාවතී නම් ඇතින්නිය සථානාන්තරයෙන් පිරිහුනු තෙනැත්තිය සම්පත්තියෙහි පිහිටුවූයෙම් වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්‍බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

යටගිය දවස බරණැස්නුවර දල්හධම්ම නම් රජ්ජුරුකෙණෙකුත් රාජ්‍යය කරන්නාහ. බොධිසත්වයන්වහන්සේ ඒ රජ්ජුරුවන්ට අමාත්‍යධුරයෙහි උපන්සේක. ඒ රජ්ජුරුවන්ගේ ආචාර මේවරෙහි දක්‍ෂවූ යුඞ්ගයට කඩු, සොට් බැඳ සතුරන් මඩ්‍යයට වැද යුඞ්කරන්ට සමර්‍ථවූ ඔටුදෙනක් ඇත්තීය. රජ්ජුරුවෝත් උදේනි රජ්ජුරුවන් භද්‍රාවතී නම් ඇතින්නට තිබූ යම් සථාන නාන්තරයෙක් ඇත්තම් තමා රැක දුම්ලව ගිය අවස්ථාවෙහි තුබූ රාජ්‍යවෘත්තිය ඇරගෙණ පිටතට අලහ. එක්දවසක් රජ්ජුරුවන්ගේ මුලුතැන්ගෙට වළන් ලන්නාවූ කුඹලා වළන් පමාකෙළේය, රජ්ජුරුවෝත් කුඹලා ගෙන්වාගෙණ වළන් තොපසිඳින්නට කාරණා කිම්දැයි කීහ සවාමීනි ගොමවැරටි අදිනා ගොන් නැතිහෙයින් වළන් නොපිළිස්සුනියාය, වළන් නොපසු නොවෙයි කීහා රජ්ජුරුවෝත් එවිට කියන්නාහු අපගේ පරණ ඔටුදෙනෙක් ඇත්තීය, ඒ

කොසිදෑයි විචාළාය. කුඹලා කියන්නේ සවාමිනි ඕ ඉවසාපරයේ ඇ සිටිනීයයි කීන එසේනම් ඇ බැඳගෙණ නොවරිනි අද්දවයි කුඹලාට පාවාදුන්න. කුඹලාත් එතැන්පටත් ඇ බැඳගෙණ ගොවරිනි අද්දවන්නේය, එක්දවසක් බොධිසත්ත්ව යන් දැක ඔටුදෙන කියන්නී මම පළමු රජ්ජුරුවන්වහන්සේට පක්ෂපාතව සිට ලෙයි කඩු සොව් බැඳගෙණ සිට ඒ ඒ තැන යුඛන් කෙළෙමී. සියක් යොත් නේ සන්නාහයකටත් පත්ලියා කර බැඳලුකල ඒ රජ්ජුරුවන් ලඟට ගෙණ ගොස් සන්නාන පිරිමසාගෙණ උන්ගෙන් ලියාදුන් බස පත අපගේ රජ්ජුරුවන් වහන්සේට ගෙණවිත් දී නොයෙක් රාජකාරිය පිරිමසා දිනිමි, දැන් දුම්ලව ගිය අවස්ථාවෙහි මාගේ තරඹ පදමුත් ඇරගෙණ මා පිවිත තණකොලකා ජීවත්වන නෙතැත්තිය පිවිතත් සිරියනොදී කුඹලාට වළන් පුළුස්සන ගොම වැරටි අදිනා නියාගෙන් සලස්වා වදාළසේක. මේ විදිනා දුකඛයෙන් මුදන්වත් පළමු සිටි සථානාන්තරගෙහි පිහිටුවන්වත් නුඹවහන්සේට භාරයයි වැදහෙව කීය. බොධිසත්ත්වයන්වහන්සේ ඇ කී කවයුතු අසා යඛපතැයි රජ්ජුරුවන්ට කියා නොප පළමු සිටි සථානාන්තරයෙහි පිහිටුවා ලමි නුවරට වැද රජ්ජුරුවන්වහන්සේ වැද එකත්පස්ව සිව් අනික් කථාවක් උපදවා සවාමිනි, මේ රජගෙයි පළමු සිටි ඔටුදෙන් කොසිදෑයි විචාළසේක. රජ්ජුරුවෝ කියන්නාහු දුම්ලව පිවිත සිටි තැනැත්තිය කුඹලා වළන් පුළුස්සන්ට ගොමවැරටි අදින්ට පාවදුනිමි කීහ. බොධිසත්ත්වයන්වහන්සේ දේවයන්වහන්ස යම් අසත්පුරුෂ කෙණෙකුන්ට යම්කෙණෙක් අභිලාභවනම් උන්ට අනඛිකිරීම අසත්පුරුෂ යන්ට සුදුසු පමණක් විනා නුඹවහන්සේ වැනි රජදරුවන්වහන්සේට තරම් නොවෙයි, එසේහෙයින් ඔටුදෙන නුඹවහන්සේ ඒ ඒ තැන රජදරුවන් ලඟට මේවර ගොසින් කළ සන්තානත් ලෙයි ආයුධ බැඳගෙණ සතුරන්මඛ්‍යයට වැද නොයෙක් වාරගේ කළාවූ යුඛත් නුඹවහන්සේටම දැනෙන්නේ වේද තමාට තරුණ අවස්ථාවෙහි රාජ කවයුත්තක් කළාවූ යම්කෙණෙක් දුම්ලව යන්නාවූ උන්ගේ සථානාන්තරයෙනුත් පිරිහෙලා උනුත් ඇරපුකල නුඹවහන්සේට දුක්ගන්නා සියල්ලෝම මුන්වහන්සේට දුක්ගැණීමෙන් කවර ප්‍රයෝජන යෙක්ද තමන්හන්සේට බොහෝ දුක්ගත් ඔටුදෙන පවා සිටි සථානාන්තර යත් සියල්ලම පිරිහෙලා කුඹලාව ගොමවැරටි අදින්ට පාවාදීපුසේකැයි කියා නුඹවහන්සේව යම් අවසරයකට නොලැබෙන්නාහ. නුඹවහන්සේට දුක්ගත් යම් කෙණෙකුත් තරුණ අවස්ථාවෙහිත් දුම්ල අවස්ථාවෙහිත් නොඅැර උන්ගේ තරම් පදමුත් සථානාන්තරත් නොපිරිහෙලා රැක්ක මැනව එවිට සියල්ලෝම නුඹවහන්සේ කෙරෙහි තව අපගේ සවාමි අප කවයුත්තකට හව්‍යවූවත් අහව්‍යවූවත් රැකවදුරණසේකැයි රාජඅමාත්‍යාදීවූ සියල්ලෝම යම් අවසරයෙක නොඅරණනයි රජ්ජුරුවන්වහන්සේට නොයෙක් කාරණා කියා අවවාදයෙහි පිහිටුවා ඔටුදෙනත් පළමු නියාගෙන් සථානාතරයෙහි පිහිටුවෝ වේදැයි වදාරා මේ දල්හඛම්ම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ඔටුදෙන තම් මේ භද්‍රාවතී නම් ඇතින්තය, අමාත්‍යව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.



දළ්හධම්ම ජාතකය

## 398
## සොමදත්ත ජාතකය

**නිවද මෛත්‍රී තමැති ජලයෙන් නිවතලද කෝපාග්නි. ඇති ලොකොත්තම වූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් මහළු භික්ෂූන් වහන්සේ නමක් අරභයා මේ ජාතකය දක්වනලද.**

**ඒ කෙසේද? යත්**

**එක් මහළු භික්ෂූකෙණෙකුන්වහන්සේගේ අත්පා මෙහෙවර කරන් නාවූ එක් සාමණේර නමක් එක් ව්‍යාධියකින් කළුරිය කළසේක. ඒ මාළු භික්ෂූන්වහන්සේ උන්වහන්සේ මළාවූ ශොකයෙන් අඩා වැලප ශාසනයෙහි සිතිවිල්ලක් නැතිව මහත් ශොකයෙන් ඉදිනාසේක, භික්ෂූන්වහන්සේ දම් සභාවේ රැස්ව ඉඳ අසවල් මාළු භික්ෂුහු තමන්ගේ සාමණේර නමක් මළාවූ ශොකයෙන් අඩාවැලප ඉදිනාහයි කිය කියා වැඩ උන්තෙනට සම්බුදුයන් වහන්සේ වැඩ වදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදුයි විචරා මෙපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි මේ භික්ෂූහු පෙරත් මේ සාමණේරයන් නිසා අඩාවැලප දුක්විඳිනවුන්ම මම සන්හිඳුවූයෙම් වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.**

**ඒ කෙසේද? යත්**

**පුරාතනය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපත්තාහුය. එසමයෙහි එක් බ්‍රාහ්මණයෙක් පංචකාමයෙහි ආදීනව දැක වනයට වැද තාපසව වාසයකරන්නාහ. එක්දවසක් එලාඵල කඩාගියාහු එක් ඇත්පැටියෙකු දැක පන්සලට ගෙණවුත් සොමදත්තයයි නම්තබා දරුකොට වඩන්නාහු ඇත් පැටියා පන්සල රදවා ගියාහ, තාපසයන් වනයටයාදී තණකා අජීර්ණව දිරවා ගතනොහී තාපසයන් ගියවේලාවට වැටීහින, තාපසයෝත් එලාඵල ඇරගෙණ එන්නහු ඇයි මෙතෙක්දවස් සෝමදත්තයෝ මා ඉදිරියට එන්නාහ. අද නාදෝය. මේවැදහොත් උවතැයි, ඇතා ලඟවහොස් මාගේ පුතනුවෝ වැද හෝනේය නිදුවැදහොත්නාමෙන් මා හා බැනනොකැගි වැදහෝනාහයි බැගෑපත් අඩා අතකරවැළඳගෙණ මහත්වූ ශොකයෙන් නොකානොබී අඩා වැලපුනාහ. ශක්‍රයෝත් තාපසයන් විදිනාවූ ශොකය දිවසින් දැක බමුණු වෙසක් මවාගෙණ තාපසයන් කරා අවුත් විචාරන්නාහු ඇයි තාපසයෙනි තොප අඹු දරුවන් ආලය හැර කිසිදෙයකත් නිරපේක්ෂාව නොවේද තොප තපසට ආයේය එසේවූ තොප මේ ඇතකු නිසා අඬන්ට දෙඬන්ට කාරණාකිම්දැයිකීහ. එවිට තාපසයෝ කියන්නාහු එම්බිල ශක්‍රදේවේන්ද්‍රය යම්කෙණෙක් බොහෝ දවසක් එකතැනවැස ඇරගිය්‍යෝ තම් උන්ගේ වියෝවූකල ඇත්තාවූ ශොකය සවභාව ලෝකධර්මයෙක, සියල්ලෝම අඩාවැලපෙන්නාහ, එසේ හෙයින් මාගේ පුතනුවන්කෙරේ ශෝක ඉවසාගත නොහී අඬම් කීහ. එවිට ශක්‍රයෙ කියන්නාහු මේ මළාවූ ඇතාට ශොකයෙන් තොප ඇඹුනියාව දනිද්ද? මළවුන්ට ඇඬීමෙන් තමාගේ ශරීරයට දුක්වන පමණක්විනා ඉන් ප්‍රයෝජනකිම්ද? ඉදින් මළ කෙණෙක් උපදිත්නම් නුඹවහන්සේගේ බොහෝ තැයෝ මළෝවේද උඹ**

උපදින්නම් නුඹවහන්සේත් මමත් දෙන්නම අඩම්හයි කිහ. එවිට තාපසයෝ කියන්නාහු දේවේන්ද්‍රයෙනි තොප මාගේ පුත්‍ර ශොකාග්නි නිවූ නියා ඉතා ශාපතැයි වදාරා තෙල්වත්කොට දල්වන්නාවූ ගින්නක් නිවූකලක් පරිද්දෙන් ශොකය තුනීකරණලද යම්සේ පයක ඇතුනාවූ හුලක් ඇර දුනමතා කලක්මෙන් මාගේ ලෙයිතුබූ ශොකතමැති උල උදුරාපුදු අද පටන් ශොකත් නොකරම් නාඩම් නොදෙඩම් සන්හිදුනුසේක. ශක්‍රයෝත් තාපසයන්ගේ ශොක සන්හිදුවා තමන්ගේ දිව්‍යලෝකයටම ගියාහ. එසමයෙහි තාපසයෝ තම් මේ මාළුවූ නිඝණ්ඨයා, ඇත්පැටියාතම් සාම්ණේරය, ශක්‍රව උපත්තෙම් ලොව්තුරා බුදුවූ මම්මයයි වදාරා සොමදත්ත ජාතකය නිමවා වදාළසේක.

---

## 399 සුසිම ජාතකය

මේවද සංසාර චක්‍රය මථනයකළා වූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහඛිනික්මන් අරභයා මේ ජාතකය දක්වන ලද.

එක්දවසක් දම්සභාවේ රැස්වූ භික්ෂූන්වහන්සේ සම්බුදුයන්වහන්සේ, මේසා මහත් රාජෛශ්වර්‍යයක්ම තිබාපියා මහාඛිනික්මන්කළෝවේදැයි කියා කියා වැඩඋන්නා සුළුවෙලාවට සම්බුදුයන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාවූ පූර්ව භාගයෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි පෙරත් මහඛිනික්මන්කළෝවේදැයි වදාරා ඒ කෙසේ දැයි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

### ඒ කෙසේ ද? යත්

පෙරබරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි උත්තර පුන් රජකුමාරකෙණෙක් උපන්නාහ, උත්තර බ්‍රහ්මදත්තකුමාරයෝයයි නම්තුබූහ. ඒ රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහ්මණයාගේ ගෙයි බොධිසත්වයෝ උපන්නාහ, උත්තර සුසීමකුමාරයෝයයි නම්තුබූහ. ඒ කුමාරහුදෙදෙනම වැඩිවිය පැමිණ තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් කරාගොස් සියලු ශාස්ත්‍ර නිමවා ඉගෙණ නුවර අවුත් යුවරජ තනතුරෙහි සිට පියානන් ඇවැමෙන් රාජයට පැමිණ මාගේ යාළුවූ සුසීම කුමාරයනුත් පුරෝහිත තනතුරෙහි පිහිටුවා දෙන්නම දැහැමෙන් සෙමෙන් රාජ්‍ය කරන්නාහු එක්දවසක් රජ්ජුරුවෝ නුවර ප්‍රදක්ෂිණා කරන්නාහු තුමූ ඇත්කදකට පැන නැගී පුරෝහිතබ්‍රාහ්මණයා තමන්පිටිපසේ ඉඳුවා නුවර ප්‍රදක්ෂිණාකරන්නාහ, රජ්ජුරුවන්ගේ මැනියෝ සැදැල්ලෙහි සිටියාහු රජ්ජුරුවන් පිටිපස්සේ ඇතු පිටඋන්නාවූ සුසීමකුමාරයන් දැක උන්කෙරේ අභිලාෂා ඇතිව මුන්නොලදින් තම් ප්‍රාණයෙන් කම් කිම්දැයි ගෙවැද යහන්මතුයෙහි මුනින් වැදඔත්තාහ. රජ්ජුරුවෝ නුවර පැදකුණුකොට රජගෙට අවුත් මැනියන් ඉඳිනාවූ රජගෙට

ගොස් මැනියන්වහන්සේ කොයිදැයි විචාරා ලෙඛව වැදහෝනාසේකැයි අසා මැනියන්වහන්ස අඵාසු කිම්දැයි විචාළාහ, බිසවුන් පුතනුවන්ට කියයුතු දෙයක් නොවන හෙයින් ලජ්ජා ඇතිව බැණනොනැගී උන්හ. රජ්ජුරුවෝත් මාලිගාවට අවුත් අඟමෙහෙසුන් බිසවුන්ට කියන්නාහු මැනියන්වහන්සේට ඇති අඵාසු විචාරාළුවයි කියා බිසවුන්යවූහ. රජ්ජුරුවන්ගේ මැනියෝත් ස්ත්‍රී නම් උන්සිත ඇත්ත නොසඟවත හෙයින් යේලනියන්ට මෙපවත්කිහ. බිසවුන් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝත් එපවත් අසා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයානන් කැඳවා කියන්නාහු එම්බා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයා නෙනි මාගේ මැනියන්වහන්සේට මෙසේවූ අනිප්‍රායක් ඇතිව ලෙඛසේක. උන්වහන්සේගේ මනෝරථය සිඛනුවූයේනම් උන්ගේ ප්‍රාණය රැක්ක නොහැක්ක, තොප විසින් උන්වහන්සේ රැකදෙව, මම තොපව පුත්ව යුව රජ තනතුරෙහි සිටුවම් කිහ. පුරෝහිත බ්‍රාහ්මණයානෝ කියන්නාහු සාමිනි මෙලෙසකිම ආචාරයෙක් නොවෙයි, නුඛවහන්සේව සේවකව සිටියාවූ මව මෙලෙස කීම ආචාරයෙක් නොවෙයි කියා නොනිවිස්සාහ, රජ්ජුරුවෝත් නොයෙක් කාරණා කියා සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණයානන්ට මැනියන් පාවාදී උන් උන් රාජ්‍යයෙහි පිහිටුවා තුමූ යුවරජ තනතුරෙහි පිහිටියාහ. රජ්ජුරුවෝ එතැන් පටන් රාජ්‍යයකරන්නාහු ගිහිගෙයි කලකිරී කවරවිටෙක මේ ගිහිබන්ධනයෙන් ගැලවියෙම්දෝහෝයි සිත සිතා තනිව සිටිනාහ, ඉඳිනාහ ඇවිදිනාහ, බිසව් සිතන්නාවූ මා මැහැලිසෙයින් මා කෙරේ ආලය මඳව ඉඳිනාසේක්වනැයි සිතා එක්දවසක් රජ්ජුරුවන් ඉස බලන්නාක්මෙන් බල බලා ඉඳ තමුන් ඉසින් තරකෙන්දක් ඇරගෙණ රජ්ජුරුවන්ට පෑ දේවයන් වහන්ස මම මතු නොවෙයි මැහැල්ලෙම්, නුඛවහන්සේත් මහළුවකියසේකැයි රජ්ජුරුවන්ට කීහ. එවිට රජ්ජුරුවෝ මෘත්‍යුමාරයා අවුත් ඉසකේ අල්ව ගත්නාක්මෙන් කොව සිතා භයින් ත්‍රස්තව තුමූ තමන්ට අවවාද කියන්නාහු එම්බා සුසීම කුමාරයෙනි තොපගේ කළුවූ කෙස් විලිස්සෙන්ව වත, ඉතිකින් තොප මහණවන්ට යන්ව කලැයි කීහ. එවිට බිසව් කියන්නාහු දේවයන් වහන්ස මම නුඛවහන්සේ වංචාකරණ නිසා මාගේ ඉසින් තරපතක් ඇරගෙණ පෑම්, නුඛවහන්සේ ඉස තරයෙක් නොවෙයි මා නිශරණකොට නුඛවහන්සේ මහණවන්ට යනසේක්දැයි කියා නුඛවහන්සේ ඉතා විශිෂ්ට රූ ඇති සේක. බැළුවන්ට ප්‍රියකරුසේක, මේ අවස්ථාවෙහි මහණවීමට කාරණා නොවෙයි මහණවන්ට නොගිය මැනවැයි කිහ. එවිට බොධිසත්වයෝ කියන්නාහු එම්බ, මම මාළුවයසට පැමිණ සිටිනවුන් බොහෝකොට දිවිම්. තරුණ අවස්ථාවෙහි අනුන් පොළඹන්නාවූ ස්ත්‍රීහු මැහැලි අවස්ථාවෙහි සැරයටි දඬුගත් අත් ඇතිව තුමූ තමන් පොළඹාගත නොහෙන්නාහ. මම ලදරුවනුත් මහල්ලනුත් දුටු විරීම්, තොප කෙසේ කිවත් මහණවෙන්ට යෙම් කියා රාජකුමාරයන්ට රාජ්‍යය පාවාදී වතයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පවාභිඥ අෂ්ට සමාපත්ති උපදවා කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ සුසීම ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරයෝය, බිසව් නම් යසෝධරා සථවිරිය, පුරෝහිත බ්‍රාහ්මණවූයෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

## 340
## කොටසිම්බලි ජාතකය

තිවද සංසාර සාගරයෙන් පරතෙරට පැමිණියාවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ක්ලේශ නිග්‍රහයක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්**

එක් දවසක් පන්සියයක් භික්ෂූන් වහන්සේට කාමවිතර්කයෙක් උපන, ඒ උපන් කාමවිතර්කය සම්බුදුරජාණන්වහන්සේ දැන වදාරා මහණෙනි කාමවිතර්ක, ව්‍යාපාදවිතර්ක, විහිංසාවිතර්ක සිතීමෙන් මාගී ඵලයට බාධකය, යම් ගස්බිලයෙක පක්ෂියෙක් වර්චස් කෙළේනම් ඒ වර්චසින් නුගපැලය ඇතිව ඒ ගස විනාශයට පැමිණෙන්නා මෙන් රහත්ඵල නමැති විපාක නසා පියන්නේය. එමෙන් කාමවිතර්ක නොසිතවයි වදාරා දේවතාවා තමාගේ ගස උන් පක්ෂියා දැක බාධාවේද එමෙන් මහණෙනි කාමවිතර්කයන් උපන් කල්හි හිරුකව වාසය කරවයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

පුරාතන දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි එක්තරා ඉඹුල්වතයක ගුරුළු රජ්ජුරුකෙණෙක් විසය කරන්නාහ. ඒ ගුරුළා මහත් ශරීරයක් ඇතිව සමුද්‍රජලය දෙබෑකොට නාගභවනයට වැද මහත්වූ නාගරාජයෙකු ඩැහැගෙන පිටත්ව ආකාශයෙන්යන කලට නාගයා මහත් වෘක්ෂයක් වෙලාගත, ගසත් උදුරා ඇරගෙණ ගුරුළු රජ්ජුරුවෝ තමන්ගේ වෘක්ෂයේ ඉඳ නාගයා ඉස මොල ආදීවූ දෙය අනුභව කොව නාගයාත් වෘක්ෂයත් එලීය. වැටෙන වෘක්ෂය සමුද්‍රයෙහි වැටෙන්ටවත, වෘක්ෂයේ උන් පක්ෂියෙක් ඒ ගසින් පිටත්ව ගුරුළු රජ්ජුරුවන් උන් වෘක්ෂයේ ඖසින් උන්නේය. ඒ වෘක්ෂයේ උන් දේවතාවා භයින් ත්‍රස්තව වෙවුලන්ට වත, එවිට ගුරුළුරජ්ජුරුවෝ දේවතාවාදැක ඇයි තොප මාවැනි කෙණෙකුන් මහත්වූ ශරීරයක් ඇති නාගරාජයකුත් ඇවිත් උන් ගමනේ නොවෙවුලා දැන් වෙවුලන්ට කාරණා කිම්දැයි විවාළේය. දේවතාවා කියන්නේ මේ පක්ෂියා අනුභවකරන්නේ නුග දීඹුල් ආදීවූ ඵලජාතිය මාගේ ගස ඉඳ ගස්බිලයෙක වර්චස් කෙළේ නම් නුගගසෙක් හෝ යම් ගසෙක් ඇතිවීනම් මාගේ විමානය කසින්නේය, එසේ නෙයින් ඉදිරියේ වන උපද්‍රව දැක භයින් වෙවුලාගියෙමි කීයේයයි වදාරා මේ කොටසිම්බලි ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ගුරුළානම් ශාරිපුත්‍රස්ථවිරය, එසමයෙහි දේවතාවා තම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 401
## ධූමකාරි ජාතකය

තිවද නිර්මලවූ පඤ්ඤාදිස්නා ඇස් ඇති සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි කෝසලරජ්ජුරුවන්ගේ අඟන්තුග සංග්‍රහයක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

කෝසල රජ්ජුරුවෝ පරණ මහා අමාත්‍යයන් හා යොධයන් හා අමුතුව ඇතිකළ අමාත්‍යයන් හා යොධයන් ඇරගෙණ පරණ ජනයන් කෙරෙහි නිස්සාරව පවත්නාහ, එසමයෙහි රජ්ජුරුවන්ට සොරුන් කැවි යුඛයෙක් පැමිණියේය, රජ්ජුරුවෝ පරණ අමාත්‍යයන් හා යොධයනුත් අළුත් මුදලි වරුන් හා ඇම සේනාවත් සවතට ගියාහ. පරණ අය කෙරේ රජ්ජුරුවන් වහන්සේ සරුකාරියක් නැතිව අලසේය. තමන්වහන්සේගේ අළුත් මුදලි වරුන් හා සේනාව ඇරගෙණ සටන්කරවා ගන්නාසේක්වායි මැලිවූහ. අළුත් මුදලිවරුන් හා ඇමති සේනාවත් අපට වලඟොඩ නොදුනෙයි කියා තමන් නොදන්නා හෙයින් තොරතුරු නොදුක පසුබටහ, සොරුන් සටන් කොව සේනාව බින්දවූහ. රජ්ජුරුවෝ සවතේ පැරද බිදී නුවරට අවුත් පරණ මහා අමාත්‍යයන් හා යොධයන් ඇරගෙණ උන්ගෙනුත් කටයුතු කරවා ගත්ත නුහුනුයෙම්, අළුතුන්ගෙනුත් නුහුනුයෙම්, මවවූයේ අලාභයෙකැයි කියා මේ මට මතුවූ දෙයෙක්දෝහෝයි පෙරත් රජදරුවන්ට මෙසේ වීදෝහෝයි, සර්‍ඥයන්වහන්සේ ලඟට ගොස් විවාරමියි පෙතවනාරාමයට ගොස් සර්‍ඥයන් වහන්සේ වැඳ එකත්පස්ව ඉඳ මෙපවත් කිහ. සර්‍ඥයන් වහන්සේත් මහරජ දැන්මතු නොවෙයි, පෙරත් එසේමවියයි වදාරා ආරාධිතවූ සර්‍ඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒවගින්‍ය දවස කුරුරට ඉඳිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරු කෙණෙකුත් රාජ්ජය කරන්නාහ, ඒ රජ්ජුරුවන්ට අඹියෙන් ධම්මියෙන් අනුශාසනා කරන්නාවූ විධුර නම් පණ්ඩිතකෙණෙක් ඇත්තාහ. ඒ රජ්ජුරුවෝත් පරණ අමාත්‍යයන් හා යොධයන් හැර අළුත් අමාත්‍යයන් හා සේනාව ඇතිකරන්නාහ. පළමු මුදලිවරුන් කෙරේ සාරයක්වත් විවාරයක්වත් නැත්තාහ, එසමයෙහි රජ්ජුරුවන්ගේ පසල්ගම් කුපිතවිය. රජ්ජුරුවෝ උන් හා කැවිව යුඛයට ගියහ. පරණ අමාත්‍යයෝ රජ්ජුරුවන්වහන්සේ අපකෙරේ විවාරයක් සමැන්මක් නැතිසේක. තමන්වහන්සේගේ අළුත් මුදලිවරුන් හා සේනාව ලවා යුඛ කරවාගන්නාසේක්වයි කියා යුඛයට නොවැද සිටියහ, අමුතුව ඇතිකළ අමාත්‍යයන් හා සේනාවද තමන්ට යුද්ධයෙහි තොරතුරු නොදුනෙන හෙයින් සටන් කරණසේ නොදුන පසුබටහ. සතුරු සෙනඟත් රාජසේනාව සවතට නොවදනා හෙයින් තරයේ යුඛයට වන්හ. ඒ සේනාව පසුබස්නා සතුරු සේනාව බලවැඩි එන හෙයින් රජ්ජුරුවෝ සිටිය නොහී පසුබැස නුවරට ගොසින් තමන්ගේ විධුරපණ්ඩිතයන් අතින් විවාරන්නාහු පණ්ඩිතයෙනි මම පරණ මහා අමාත්‍යයන් හා සේනාව හැර අමුතුම මුදලි වරුන් හා සේනාව ඇතිකොට පරණුන්ගෙනුත් නුහුනුයෙම්, අලුතුන්ගෙනුත් නුහුනුයෙම්, මාසේම පෙරවත් අනිත් කෙණෙකුන්ටත් මේ ලෙස විදුසි විවාළාහ. එවිට පණ්ඩිතයෝ කියන්නාහු යුධිෂ්ඨිර ගොත්‍රයෙහි උපන්නාහු ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවන් වහන්ස මේ කුමක්ද? මෙවිතරවත් වඩා විශිෂ්ට ගොත්‍ර ඇති ධුමකාරී නම් බ්‍රහ්මණයන් කෙණෙක් ඇත්තාහ. උන්ගේ එළුපට්ටියක් ඇත. ඒ එළුවන්ට ශීත අවධියෙහි වව ගිනිදුම් කරන්නාහ. සවස ගාලේ ලන්නාහ, කිරි තෙල කන්නාහ, කණකොළු

ගෙණැවිත් ලන්නාහ, එසමයෙහි වර්ෂාකාලය පැමිණියේය, වතයෙහි සිට මූවෝ පන්සියයෙක් බ්‍රාහ්මණයාතන් වසන්නාවූ පන්සල ලඟට ආවාහ, බ්‍රාහ්මණයාත් යහපත්වූ මූවරැල දැක එළුවන් කෙරේ ආලය හැර මූවන් එක්කොට ගෙණ තණකොළ කවා උන් පොෂ්‍යකර එළුවන් කෙරේ ආලය අලහ. එළුවෝත් එතැන්පටන් ශාලේ ලන්තන් තැතිගෙයින් ඒ ඒ තැන ඉසිර ගොස් සිංහ ව්‍යාඝ්‍රයන්ට වගුන් දිවියන් අතින් විනාශයට පැමිණියාහ, මූවෝත් වර්ෂාකාලය නිමායන්නා තමන් වසන්නාවූ වතයට පලාගියාහ. බ්‍රාහ්මණයාත් අළුත් මූවන් දැක එළුවන් කෙරේ ආලයහැර ලබන කිරි දීකිරී යෙනුත් නොවී එළුවන්ගෙනුත් නුවූයේයයි මූවන්ගෙනුත් නුවූයේයයි කියා රජ්ජුරුවන් වහන්ස අලුතුන් දුටුවයි පරණ අමාත්‍යයන් හා සේනාව දුරුකිරීමත් කවයුතු නොවෙයි. අමුතුව ඇතිකරගන්නාවූ ප්‍රධානයෙන් හා සේනාවත් ඇතිකළමනාමය, පරණ අමාත්‍යයන් හා සේනාවත් උන් උන්ගේ සථානන්තර යෙන් නොපිරිහෙලා තරම් පදම් දී රැක්කමැතව, එසේකල්හි පරණතුත් අළුතුනුත් සියල්ලෝම එක්සිත්ව නුඹවහන්සේගේ පැමිණි ශම්ම කාරියක් පිරිමසන්නාහයි කීහ. රජ්ජුරුවෝත් විධුරපණ්ඩිතයන් කීවාවූ අවවාදයෙහි පිහිටා පරණ මහ අමාත්‍යයන් හා යොධයනුත් නොහැර අමුතුව ඇතිකළ මුදලිවරුන් හා සේනාවත් වෙනසක් නොකොට රැක පණ්ඩිතයන් කෙරේ සමාධිව බොහෝ දැසිදස් ආදීවූ වස්තු දී තමන් කළාවූ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ ධූමකාරී ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බ්‍රාහ්මණයා තම් කොසල රජ්ජුරුවෝය, ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරුවෝ තම් ආනන්ද සථවිරයෝය. විධුර පණ්ඩිතව උපන්නේ තම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 403 ජාගර ජාතකය

මේවද ප්‍රඥාවිෂයාතික්‍රන්තවූ ධර්ම කාය ඇති සම්බුදයන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නොනිදා සක්මන්කරන්නාවූ උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්**

එක් සෝවාන් උපාසකයෙකුත් වෙළඳහු පන්සියකුත් බඩු ගැල් පුරා වෙළඳුමට යන්නාහු අතරමග පඬිංගුබැඳ උන්නාහ, රැවයන්නා සොරුපන්සිය යක් වෙළඳුන්මරා බඩුහැරගණුම්හයි කැටමුගුරු දඬුපත් ආයුධගත් අත්ඇතිව ආවාහ. සෝවාන්වූ වෙළඳතෝ සක්මන්කොට සිටියාහු මංපහරින්ට ආ සොරු මේ මිනිසා නිදුකළ සොරකම් කරමිහයි සිතා සිටිනාහ. ඒ වෙළඳා තුන්යම් රාත්‍රියෙහිම නොනිදා සක්මන් කොට පාන්කොටපුවාහ, සොරුන් සිටියාසේම සිට පාන්කොට පාන්වන්නා තමන් ගෙණා කැට මුගුරු දඬුපත් දමා වෙළඳුන්ට තොප ඇමම රකුනේත් තොපවස්තු රකුනේත් මුන්හිසාය, බොහෝඋපකාර

විසි කියා පළාගියහ. වෙළඳුන් ගැල්ගෙණ වෙළඳුම්ටගොස් වෙළඳුම් කොට ගෙණ නුවරට අවුත් සවීඥයන්වහන්සේ කරා ජේතවනාරාමයට ගියාහ. සවීඥයන්වහන්සේත් ඇයි උපාසකය මෙතෙක් දවස් කොයිගියාදැයි විචාරා වෙළඳුන් වෙළඳුමට ගිය නියාවත් අතරමග ලැගි නියාවත් නොනිදුම සක්මන් කළ නියාවත් සොරුන් ආ නියාවත් තමන් කළ නියාව දැක සොරු පාන්වත තුරු සිට පාන්වයන්නා අතහිඳි කැටමුගුරු දමාගය නියාවත් සවීඥයන් වහන්සේට කීහ. සවීඥයන්වහන්සේත් එම්බල උපාසකය පෙර උත්තම යෝත් නොනිදා සක්මන්කොට දේවතාවන් අතින් සාධුකාර ලද්දේ වේදැයි විදුරා ඒ කෙසේදැයි ආරාධිතවූ සවීඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්:**

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයෝ බ්‍රහ්මණකුලයක ඉපද පඤ්චකාම යෙහි ආදීනව දැක සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වනයෙහි වාසයකරන්නාහු රැ නොනිදා රාත්‍රිය තිස්පැයෙහි සක්මන්කරන්නාහ. එක් දේවතාදුවක් කියන්නී නිදන්නාවුන් අතුරෙන් නොනිදන තැනැත්තෝ කවුරුද නොනිදන්නවුන් අතුරෙන් නිදන්නෝ කවුරුදැයි දේවතාදුව විසින් විචාළ කල්හි ඒ ප්‍රශ්නය විසඳන්නාවූ මහ බොධිසත්වයෝ දේවතාදුවට මේ ලෝකයෙහි යම් සත්ව කෙණෙක් ශීලසඤ්ඤමයද ඉන්ද්‍රිය දමනයයි කියනලද භාවනා මනස්කාරයෙන්ද සතරමග සතරඵලය නිර්‍වාණධර්මයයි කියනලද තවලෝකෝත්තර සද්ධර්මය නොදන්නාහු චිතම් සම්මෝහනිද්‍රායෙන් නිදන්නාවූ සත්වයන් අතුරෙන් මම ඒ ධර්මය දැන වාසයකරණ හෙයින් මම නොනිදන්නාතම් වෙමි, යම් ඤ්ඤා ශ්‍රාවක කෙණෙකුන් වහන්සේ රාග ද්වේෂ මෝහයයි කියනලද යම් සකල ක්ලේශයන් දුරුකොට සම්මෝහ නිද්‍රායෙන් පිබිද වසනසේක්ද එසේවූ රහතුන්වහන්සේ අතුරෙන් ක්ලේශ විධවංශනය කොට සම්මෝහ නිද්‍රායෙන් පිබිද දවස් යවන හෙයින් මම නොනිදන්නා නම් වෙමියි මේ ප්‍රශ්නදෙක විසඳී මෙන් මහබොධිසත්වයන් බණ කී කල්හිද සතුටුවූ දේවතා දූ මෑත් දන්නා සේමය මනපුරුෂයාතෝ කීයේයයි සියළු වනදෙවියන් සන්තුෂ්ටි කෙරෙමින් ස්තුතිකොට සාධුකාර දුන්නීය. බොධිසත්වයෝත් එතන වැස කම්වූ පරිදි දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ ජාගර ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි දේවතා දූ නම් උපුල්වන් මහාස්ථවිරිය, තාපසව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

## 403 කුම්මාසපිණ්ඩි ජාතකය

නිවද චක්‍රලක්ෂණයෙන් චිහ්නිතවූ ශ්‍රී පාද ලක්ෂණ ඇති තිලෝගුරු බුදුරජාතන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මල්ලිකා දේවීන් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේ ද? යත්,**

මල්ලිකා දේවීන්ගේ උත්පත්තිය මෙසේ දතයුතු. එක් මාලාකාර යෙකුගේ විශිෂ්ට වූ රූ ඇති දුවක් ඇත. ඇට නම් තබන්නාහු මල්ලිකා දෙවියයි නම්තුබුහ, ඕතොමෝ තමා හා සමවයස් ඇති කුමාරිකාවරුන් ඇරගෙණ මල් වත්තට යන්නී කොමුපිඬු සතරක් ගෙණගියාහ, සම්මැදයන්වහන්සේ සිහා වඬිනාදැක තමා අතතිබූ කොමුපිඬු සතර සම්මැදයන්වහන්සේගේ පාත්‍රාධාතුන් වහන්සේට පිළිගැන්නුවාය, සම්මැදයන්වහන්සේ කොමුපිඬු පිළිගෙණ සිතා පහළකොට වැඩිසේක. අනද සාම් සිතාපහළ කළ තියාව දැක ඇයි සවාමීනි සිතා පහළකෙළේයයි විචාරා සම්මැදයන්වහන්සේ වදරණසේක් මේ කුමාරිකා වට අගමෙහෙසුන් තනතුරු අදදවස් පැමිණෙයි වදරා ජෙතවනාරාමයට වැඩි සේක. කෝසලරජ්ජුරුවෝ යුඬයට ගියාහු යුඬයෙහි පරාජයව අසකුපිට නැඟී ඇවිත් මල්වත්ත සම්පයට පැමිණියාහ. මාලාකාර කුමාරිකාවෝ රජ්ජරුවන් දැක භයින් ඒ ඒ අත පලාගියාහ, මල්ලිකාදේවී මහත්වූ ධෛයර්‍ය ඇතිතෙයින් කිසි කාංසාවක් නැතිවසිට රජ්ජුරුවන් ලඟට අවුත් අසුගේ රැහ අල්වාගෙණ සිටියාහ, රජ්ජුරුවෝ කුමාරිකාවන් දැක තොපි සසවාමිකදැයි විචාරා අසවා මිකයෙමි කීකල්හි මල්වත්තට අවුත් අසුපිටින්බැස සැකයක් නැතිව ඇකය පිට ඉසතබා ගමන්සන් නිවාගෙණ රජ්ජුරුවෝ රජගෙට ගොස් මහත්වූ පෙර හරින් එවා මල්ලිකාකුමාරින් ගෙන්වා රුවන්රැසක්පිට සිටුවා අභිෂෙකජලය වත්කොට දෙලොස්දහසක් බිසෝවරුන්ට අග්‍රමහේසිකා තියාවට සලස්වා මහත්වූ ස්නෙහයෙන් වාසය කරන්නාහ, මල්ලිකාදේවීත් රජ්ජුරුවන් කෙරෙ අධික ස්නෙහය ඇත්තාහ. සම්මැදයන්වහන්සේට උපාසිකාතනතුරෙහි සිටිනීය. මල්ලිකාදේවීන් අග්‍රමහේසිකාවූයේ සම්මැදයන්වහන්සේට පිළිගැන්වූ කොමු පිඬුයෙහි අනුසසෙතැයි-තොයෙක්තෙන ප්‍රකාශවිය. මේ කථාව දම් සභාවේ රැස්වූ මහළුවරුන්වහන්සේ කිය කියා වැඩඋන්තෙතව සම්මැදයන්වහන්සේ වැඩ වදරා මහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදරා එපවත් අසා මහණෙනි මා වැනි ලොව්තුරා සම්මැදයන්ව දන්දී එමවිට මහත් ඓශ්වර්‍යයී ලබන්ට අමුතු කිම්ද පළමු පසේබුදුන්වහන් සේට දන්දී එවිට ඓශ්වර්‍යයී ලද්දේ වේදැයි වදරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්මැදයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේකි.

**ඒ කෙසේද? යත්**

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි බෝධිසත්වයෝ දුප්පත් කුලයෙක ඉපද අනුන්ට බැලමෙහෙ කොට ජීවත්වන්නාවූ ලුණුනැති තෙල්නැති කොමුපිඬු සතරක් ඇරගෙණ අනුන්ට බැලමෙහෙකොට ගීසාන්වයන්නාහු පසේබුදුන් සතරදෙනෙකුන්වහන් සේ වාසල සිඟාවඩින්වයයි සිවිනියාව දැක සිතන්නාහු මා අතතුබූ කොමපිඬු සතර පිළිගන්වම් සිතා ආරාධනාකොට පසේබුදුන්සතරදෙනාවහන්සේ කැඳවා ගෙණ ඡායාසම්පන්නවෘක්ෂයක්සමීපයටගොස් රූප්පයපිසවැලිපායා වැලිගොඩ

සතරක් තනා වැලිගොඩ සතරපිට වඩාහිඳුවා ගොටුවෙන් පැන්ගෙණවිත් පිළිගන්වා ඉතතුබූ කොමුපිඩු සතර මැත්තෙකොට සවාමීනි ගැත්තවුට අනුකම්පා කොට වළඳා පින්පුරවා වදාළමැනවැයි මහත්වූ ආදරයෙන් පාත්‍රසතරට කොමු පිඩු සතර පිළිගන්වා වැළඳවූහ. පසේබුදුන්වහන්සේ කරුණාවෙන් වළඳා අනුමෙවෙනි බණ වදාළසේක. බොධිසත්ත්වයෝත් මහත් සන්තෝෂයෙන් බණ අසා මතු මෙසේවූ දුකඛිත කුලයෙක නොයිපද ධනෙශ්වරවූ කුලයක උපදිම්වයි කියා ප්‍රාර්ථනා කළාහ. පසේබුදුන් වහන්සේත් තොපකළ ප්‍රාර්ථනාව සිඛවේවායි කියා තමන් වහන්සේලා වසන සථානයට වැඩවදාළසේක. එවිට ඒ සිව නොබෝ කලකින් බොධිසත්ත්වයෝ තැසී උපදිනාහු එම බරණැස්නුවර බිසවුන් කුස පිළිසිඳ ගත් ගමනේ දසමසකඩ මසකින් වැදූහ. රාජකුමාරයෝ රාජ්‍යයට පැමිණ නුවර සරහා ඔටුනු පැලඳ ඒ ඒ තැන සිටිනා අමාත්‍ය මණ්ඩලයා බ්‍රාහ්මණ සමූහයා පඬුරු පාක්කුඛම් ගෙණ ඒ ඒ තැන සිටිනවුන් හා සොළොස්දහසක් බිසෝවරුත් සොළොස්දහසක්නාටක ස්ත්‍රීන් පංචාංගිකතූර්‍ය්‍ය නාදයෙන් පිරිවරාගෙණද ශක්‍රදෙවෙන්ද්‍රවිලාසයෙන් ඉඳ සිතන්නාහු ජාතිස්මරඥාන නුවණ පහළවූ හෙයින් මේ සියළු ඓශ්වර්‍යය්‍ය මා ලද්දේ පසේබුදුන්වහන්සේට මා දුන් කොමුපිඩු සතරිනැයි ගාථාදෙකින් රාජ්‍යයට පැමිණ ඔටුණු පලදිනා ගමනේ කීහ. තුන්සියයක් යොදුන් නුවර බොහෝ මනුෂ්‍යයන් හා බ්‍රාහ්මණ ගෘහපති අමාත්‍යමණ්ඩලයා හා රජ්ජුරුවන් වහන්සේ ඔටුනු පැලඳ වැඩඉදවදාළ ගාථාදෙකයයි කියා බොහෝ මනුෂ්‍යයෝ ඉගෙණ කියන්නාහු මෙහි අර්ථය නොදන්නාහ. කෝසල රජ්ජුරුවන්ගේ දුවනියන් රජ්ජුරුවන්ට අග්‍රමහෙසිකා කළහ. ඒ බිසව් ගාථාදෙක ඉගෙණ එක්වන් කියන්නාහ; මෙහි අර්ථ කවරවිටක විවාරම්අහෝයි සිතා උන්කලට එක් දවසක් බිසවුන් රජ්ජුරුවන්වකළ සංග්‍රහයක්නිසා සමාධියෙන් බිසවුත්ව රජ්ජුරුවෝ කියන්නාහු තොප කැමති වරයක් ඇරගණුවයිකීහ. බිසව් තෙසු මට අඩුකිම්ද නුඹවහන්සේ ඔටුනු පැලඳ ඉඳ වදාළ ගාථාදෙකෙහි අර්ථ අසන්නා කැමැත්තෙමි, ඒ මට වදාළ මැනවැයි කීහ. රජ්ජුරුවෝ තොපට තනිව නොකියමි; දෙලොස්යොදුනක්පමණ බරණැස්නුවර බෙර පියවිකරව, රාජවාරයෙහි රත්නයෙන් විසිතුරුවූ මණ්ඩපයක්කරවා රත්නපල්ලඞ්කාපණවා අමාත්‍යයන් හා බඹුණු වෙළඳ ආදීන්විසින්ද නුවරවැස්සන්විසින්ද සොළොස් දහසක් පමණ පුරඟනාවන් විසින්ද පිරිවරණ ලදුව මේ කිවවුන් මැදයේ රත්න පල්ලඞ්කයෙහි හිඳ කියමි කිවුය. යනපත රජ්ජුරුවන් වහන්සැයි බිසවුන් පිළිගත්හ. රජ්ජුරුවෝද මෙපරිද්දෙන් සියල්ලසමඟ කරවා දිව්‍යසමූහයා විසින් පිරිවරණලදුව ශක්‍රදෙවෙන්ද්‍රයා පරිද්දෙන් මහත්වූ ජනසමූහයා පිරිවරණලදුව රත්නපල්ලඞ්කයෙහි උන්හ. මල්ලිකාදේවිද සමීහරණයෙන් සැරසී සුවර්ණ

යෙන් විසිතුරු කරණලද හද්‍රපීඨයක් අතුට එකත්පසෙක ඇස් කෙළවරින් රජ්ජුරුවන් බල බලා කථාකරන්ට සුදුසුවූ ස්ථානයෙහි හිඳ රජ්ජුරුවන්වහන්ස නුඹවහන්සේ සතුටු සතුටුව කියන්නාවූ මඞ්ගල ගීතිකාවන්ගේ අවී මට ආකාශ තලයෙහි සම්පූර්ණ චන්ද්‍රයාසේ ගෙණහැර පානාකලක් පරිද්දෙන් ප්‍රකාශකොට වදාළ මැනවැයි කියා කියන්නී මෙසේ කිවුය. කුසල ධර්මයෙහි අධ්‍යාශ ඇත්තාවූ රාජොත්තමයාහන් වහන්ස, එක්වන් නුඹවහන්සේ තරණකොට සතුටු සිත් ඇතිව ගාථාදෙකක් වදාළසේක්ද රාජ්‍ය වර්ධනයකරන්නාවූ රජ්ජුරුවන් වහන්ස, ඒ ගාථාවෙහි අවී නුඹවහන්සේ අතින් විචාරම්, ඒ මට ප්‍රකාශකොට වදාළ මැනවැයි කිවුය. ඉක්බිත්තෙන් බිසවුන්ට ගාථාවන්ගේ අර්ථ ප්‍රකාශ කොට කියන්නාවූ මහබෝසතාණෝ මෙපරිද්දෙන් කියත් එම්බා භද්‍රාව මම මේ බරණැස්නුවර නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධවූ එක්තරා දිළිඳු කුලයෙක්හි උපනිමි, ඒ කුලයෙහි උපන්නාවූ මමද දිළිඳු බැවින් අනුන්ට මෙහෙවරකොට ජීවත්වන්නෙම් අනුන්ට මෙහෙකරුව උපන්නෙම් අනුන්ගේ දුක්පත් වියද මෙන් රැකෙන්නාවූ මමද දුශ්ශීලභාවය හැර පඤ්චශීලසංවරයෙහි පිහිටියෙමි. සිල්වත් මා විසින් එදවස් කලමනා කර්මාන්ත කරණ පිණිස නික්මුණාවූ මම් මහමාවතකට නැගී කර්මාන්ත භූමියට යන්නෙම් භික්ෂාව පිණිස බරණැස් නුවරට වදනා සමෘද්ධවූ ආචාරයන් හා ශීලයන් ඇති රාගාදී පරිලාහයන් සන් හිඳවීමෙන් සිහිල්වූ කර්මාදී ආශ්‍රවයන් රහිතවූ බුදුන්වහන්සේ සතරතමක් දිටිමි, උන්වහන්සේලා කෙරෙහි සිතපහදවා ගෙණ වැලිගොඩ සතරක්කොට ර්මන්තේ කොළ අතුව වැඩහිඳුවා දක්ෂිණොදකය දී කර්මාන්ත භූමියෙහිදී මා කන්ටයයි ගෙණයමින් සිටි තෙල් මී සකුරු ආදි කිසිවකුත් රසයක් නැත්තාවූ කොමුපිඩු සතර සතරදෙනාවහන්සේගේ පාත්‍රවලට සවාස්තයෙන් සිතපහ දමාගෙණ පිළිගැන්වීමි. ඒ කුශලකර්මයාගේ විපාක මෙබඳු වන්නේයයි මෙබඳු කුසලවිපාක හේතුකොටගෙණ ධනධාන්‍යාදීන් හා වස්ත්‍රාභරණ ආදීවූ සියළු සම්පත්තීන් පිරුණාවූ උතුම්වූ මේ පෘථිවි මණ්ඩලය අනුභවකෙරෙම්, භද්‍රාව නොප ප්‍රධානකොට ඇති සොළොස්දහසක් පුරහන්හා මාගේ මේ සියළු සමෘද්ධ මුළුල්ලම් ඒ පසේබුදුන් සතරදෙනාවහන්සේව වෙතනාත්‍රය ශුද්ධකොට ගෙණ මා පිළිගන්වා ලූ කොමුපිඩු සතර නිසාගයි, යනාදීන් තමන් පූර්ව්‍යජාත යෙහි කළ කුශලය ප්‍රකාශකොට කිවාහුයි මෙපරිද්දෙන් මහබෝසතාණන් තමන්ගේ පූර්ව්‍යජාතියෙහි කළ කුශලයාගේ විපාක විස්තරකොට කිකල්හි ඒ අසා පහන්වූ සිත් ඇති මල්ලිකා දේවී කියන්නාහු මහරජ්ජුරුවන් වහන්ස මෙලෙසින් ප්‍රත්‍යක්ෂකොට දැනයෙහි විපාක දන්නාවූ නුඹවහන්සේ මෙතැන් පටන් කොට එක බත්පිඬක් පමණකුත් ලැබ ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දන්දී ම අනුභව කළමැනවැයි බොධිසත්ත්වයන් වහන්සේට ස්තුතිකොට කියන්නී. කුශලයෙහි අධිපතිවූ රජ්ජුරුවන් වහන්ස, නුඹවහන්සේ ශ්‍රමණ බ්‍රාහ්මණ දුගී මගී යාචකයන්ට ලත්දෙයක් ශක්ති විවරකිත් දානපරිත්‍යාග කොට අනුභව කළමැනව, දානාදිකුසලයෙහි ප්‍රමාදයක් නුවුවමැනව පතිරූප දෙසවාසාදී චතුර්විධවූ ධර්මක්‍රය පැවැත්වුව මැනව, යම්සේ අන්‍යවූ අඥානගති යට යන්නාවූ සත්ත්වයෝ ලොකවාසීන් උක් යතෙකලා පෙළන්නාක්මෙන් පීඩාකොට වස්තු රැස්කරන්නාහු අධර්මිෂ්ඨවෙත්ද, නුඹවහන්සේද එපරිද් දෙන් අධර්මිෂ්ඨ නුවුව මැනව.

දානං සීලං පරිච්චාගං, අජ්ජවං මද්දවං තපං
අක්කොධොඅවිහිංසා ච, ඛන්ති ච අවිරොධතා.

කියන ලද්දවූ මේ දසවිධවූ රාජධර්ම රැක්ක මැනව, තොහළ මැනවැයි විවාද කළාහ. ඒ මල්ලිකා දේවීන් කී බස් පිළිගත්තාවූ මහබෝසතාණෝ මෙලෙස කියත්, 'සොඳුර කෝසල රජ්ජුරුවන්ගේ දුවනියෙනි, එම මා විසින් දන්දෙන ලද්දේයයි තාප්තියක් නොකොට නැවත නැවත බුබාදීවූ මහාත්ම යන් හැසිරැණාවූ දුනමාගීයෙහි හැසිරෙමි අග්‍රදක්ෂිණෙය්‍ය බැවින් අහිත්වූ ඒ උත්තමයෝ මා දක්නට මනාමය යහපත. එසේ හෙයින් ඔවුන්ම දක්නා කැමැත්තෙමි' ඒ මල්ලිකා දේවීන්ගේ සිසළු සමෘඩිය දැක සොඳුර දුන් මා විසින් පූජිජාතියෙහි කළාවූ මාගේ කුශලකර්මය තොපට ප්‍රකාශකොට කියනලද,- තෙපි වනාහි මේ සොළොස් දහසක් පමණ පුරඟනාවන් හා නාවිකස්ත්‍රී සමූහයා මධ්‍යයෙහී රූපයෙන්ද ලීලායෙන්ද ස්ත්‍රීවිලාශයෙන්ද තොප හා සදෘශ්‍යවූ එකද ස්ත්‍රියක් නැත, තෙපි කවර කුශලයක් කොට මේ සම්පතිය ලද්දාහුදැයි විචාරන්නාහු බොධිසත්ත්වයෝ මෙසේ කියත්. සොඳුර කොසොල්රජ්ජුරුවන්ගේ දියනියෙනි තොපි රූපසෘඩියෙන් ත්‍රයස්ත්‍රිංශත් දිව්‍යලෝකයෙහි ශක්‍රදේවේන්ද්‍රයාගේ එක්තරා දිව්‍යස්ත්‍රියක් මෙන් මේ ස්ත්‍රී සමූහයා මධ්‍යයෙහි සොභාමත්වූ පූජිජාතියෙහි කවර නම් උත්තම කුශල කර්මයක් කළාද, කවර කාරණයෙකින් මෙලෙස රූපශ්‍රියෙන් යුක්තවූවාහුදැයි විවාළාහුයි. ඉක්බිත්තෙන් බොධිසත්ත්වයන්ට ඒ මල්ලිකාදේවි පූජිජාතියෙහි තමා කළාවූ කුශලකර්මය ජාතිස්මරඥානයෙන් දැක කියන්නී මෙසේ කියා, මහරජ්ජුරුවන් වහන්ස, මම පූජිජාතියෙහි එක් කෙලෙඹිකුලයක්හට දුසව උපතිමි, අනුන් විසින් ඒ ඒ ක්‍රියාකුත කරණ පිණිස නියෝග කරණලද එකතිමි, සෙසු කෙල්ලෝ නම් දුශ්ශීලයන, මම වනාහි කායවාක්මනඃ යන චාරිත්‍රයෙන් කිසිත් අකුශලයක් නොකොට නිරන්තරයෙන් පන්සිල් රක්ෂා කිරීමෙන් ශීලසම්පන්නයෙමි, පරවඤ්චාදියක් නොකොට දැහැමින් සෙමින් පවත්වතලද ජීවිකා ඇත්තෙමි ආචාරසම්පන්නයෙමි ගුණ ඇත්තෙමි, යහපත්වූ දහීතයන් ඇත්තෙමි ප්‍රියවූ සවනාවයක් ඇත්තෙමි, ඉක්බිත්තෙන් මම එකල්හි සවාමිදරුවන් විසින් මට කොටස්කොට තබන ලද්දාවූ මට පැමිණි බත් කොටස සිදුනාලද ක්ලේශයන් ඇති පදසේබුදුකෙණෙකුන් වහන්සේට හටඛත්තාවූ සොම්නස් ඇතිව ආහාරයෙහි ලොභතෘෂ්ණා රහිතව ආදිමධ්‍යවසානකොට ඇති චෙතනාත්‍රය සුඛකොවගෙණ පිළිගැන්වීමි, හේ මම ආයු පමණින් එහි සිට කාලක්‍රියාකොට සැවැත්නුවර කොසොල් රජ්ජුරුවන් වහන්සේගේ අගමෙහෙසුන් බිසවුන්කුස පිළිසිඳගෙණ එයින් බිහිව දැන් නුඹ වහන්සේට පාදපරිවාරිකාව වෙසෙමින් මෙබඳු සම්පත්තියක් අනුභව කෙරෙමින් මෙසේවූ රූපසෘඩියකින් යුක්තයෙමි, රජ්ජුරුවන්වහන්ස ඒ පසේ බුදුන් වහන්සේට අනුන්ට දෘෂ්ට සිට සිත පහදවාගෙණ මා දන් දුන්නාවූ බත් කොටසෙහි විපාක මෙබඳුවන්නේයයි කියා තමාගේ පූර්වචරිතය ප්‍රකාශ කළාහ. මෙසේ රජ්ජුරුවන් හා මල්ලිකා බිසව් හා සමග දෙදෙනම තමන්ගේ පූර්වජාති ඥෙහි කළාවූ කුශල කර්මය විස්තරකොට නුවර සතරවාසල් දෙර භිද නුවරමධ්‍ය

යෙහිද මාලිගා දෙරකඩද යන මේ සථානවල්හි දන්හල් සයක් කරවා සියළු දෘදහසක් යොදුන් ජම්බුවීපයෙහි නගුල් උඩබදවා මහදන් පවත්වා පඤ්චශීල සංරක්ෂණයෙන් පේවස් රක්ෂා කොට ජීවිතයාගේ ආයු කෙළවර සවගීයම් පරම ප්‍රතිෂ්ඨාකොට ඇත්තාවූ නෙවත් දිව්‍යලොකයෙහි උපන්නානයි තිලෝ ගුරු බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා කුම්මාසපිණ්ඩි ජාතකය නිමවා වදාළසේක. එකල්හි මල්ලිකාදේවී තම් රාහුල මාතාවෝය, රජ්ජුරුවෝ තම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 404 පරනන්තප ජාතකය

තවද ලොවිතුරා සම්බුදුරජාන් වහන්සේ රජගහනුවර නිසා වෙළුවනාරාමයෙහි වාසයකරණසේක් දෙවිදත් තෙරුන් වහන්සේගේ වධයට උත්සාහ කිරීමක් අරභයා මේ ජාතකය වදාළසේක.

එකල්හි දම්සභාමණ්ඩපයෙහි මේ කථාව ඉපදවූහ, ඇවැත්නි දේවදත්ත සථවිරයෝ සම්බුදුරජාන් වහන්සේ මැරීම පිණිස උත්සාහ කෙරෙති, දුනුවායනුත් මෙහෙයූහ. මුදුනට ගල්ද පෙරලූහ. නාලාගිරි නම් හස්තියාද සිඟාගන ඉදිරියෙහි මෙහෙයූහ. සම්බුදුරජාන් වහන්සේට විනාශය පිණිසම උපාය උත්සාහ කෙරෙතියි කථාකොට හිඳිත් වහන්සේ වැඩලන්සේක සම්බුදුරජාන්වහන්සේ ධර්මසභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කවර කථාව කින් යුක්තව උනුදැයි විචාරා වදාළකල්හි මහණෙනි මේ දෙවදත්ත සථවිරයෝ දැන්මතු නොවෙයි, පූර්වයෙහිත් උත්සාහ කෙළේය. ඒ උත්සාහයෙන් මාගේ චිත්තොත්‍රාස පමණකුත් නසන්ට නොහැකිවිය, තෙමේම දුක් අනුභවකෙළේ වේදැයි වදාරා ඉකුත්වත් ගෙණහැර දක්වූසේක.

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි මහබොධිසත්ත්වයෝ ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන් කුස පිළිසිඳ මව්කුසින් බිහිව වැඩිවිය පැමිණියාවූ තක්සලා නුවරට ගොසින් උගතමනා සියලු සිල්පයන් උගත්තාහයි, සියලු සතුන්ගේ ශබ්දය තෝරාගන්ට හැකිමාත්‍රයකුත් උගත්හ. ඒ බොධිසත්ත්වයෝ ආචාරීන්ට තමන් නික්මයන හැටියාව කියා නැවත බරණැස්නුවරට ගියාහ පියරජ්ජුරුවෝ ඒ බොධිසත්ත්වයන් යුවරජ තනතුරෙහි තිබූහ. ඔවුන් එලෙස තිබුවත් මරවනු කැමැත්තේ; අස දක්නට නොකැමැත්තාහ ඉක්බිත්තෙන් එක් කාණහිල් බැල්ලක් තමාගේ පැටියන් දෙන්නෙක් ඇරගෙණ රාත්‍රියෙහි මනුෂ්‍යයන් නිදුපු කල්හි දියයන නොරොච්චෙන් ඇතුළු නුවරටවත, බොධිසත්ත්වයන් වැදහෝනා ගබඩාවට නුදුරු සථානයෙක්හි එක් ශාලාවෙක් ඇත, ඒ ශාලාවෙහි එක් මහි මිනිසෙක් තමා පයලූ වහන්සඟල ගලවා පාමුල තබාගෙණ එක් පෝරුවක්

මත්තෙහි වැදහොත්තේය. ඒතාක්කල් නොනිදුයේය. කැණහිල් පැටියෝ දෙන්න කියන්නාහු අම්ම බඩසාය, අප කනදෙයක් දෙවයි කියන්නා කැණහිල්දෙන් කියන්නී තෙලේ ගෙයි වැදහෝනා පුරුෂයා ලඟ වහන්දෙකක් තිබෙයි උන් නිදුපියන්නා වහන්දෙක දීලමි කිව එකියන කථාව බොධිසත්වයෝ අසා තෙලගෙය කවුරුදූයි විචාරා සාමිනී මමයි කියන්නා බිමතිබු වහන්දෙකක් ඇත්නම් උඹ තබාලවයි කියන්නා වහන්දෙක උඹ තිබූහ. කැණහිල් මුන්ට මා කෙළේ කවර සතුරුකමක්දූයි කියා එතනින් පලාගියාහ. එතන සමීපයෙහි පොකුණක් ලඟට කැණහිල්දෙන හා දරුවෝ දෙන්න පැමිණ කැණහිල් පැටියෝ කියන්නාහු අම්ම අප බඩසායයි කිවුය. කැණහිල් දෙන් කියන්නී තෙල පොකුණෙහි මිනිසෙක් මියගියේය, දැන් මදකින් ඉලිප්ප ගියකල මිනිය කම්හ, අත මුන්දක් හා කන ලත මේවර දෙකක් හ කඩපොල්ල ඇරගණිති මිනිය අපට යයි කීහ. බොධිසත්වයෝ ඒ අසා මිනිසුන් ගෙන්වා තෙල පොකුණේ මිනිසෙක් මියගිය, අතලත මුන්දක් හා කණ ලත මේවරදෙක හා කඩපොල්ල ඇරගෙණ මිනිය නොයිල්පෙන නියාගෙන් පොකුණේ දිය යට තබවයි කිවාහ. ඒ කැණහිල්දෙන් බොධිසත්වයන් කෙරේ වයිරබැඳ පළමුත් මාගේ දරුවන් කන්නට තිබු වහනුත් උඩබැඳ එල්වා අලාභ කළව, දැනුත් කන්ට උන් මිනියෙනුත් නොකාලව, අදට සත්වෙනි දවස් තොපගේ රජ්ජුරුවන්ට සවතට පසල් රටින් රජ්ජුරු කෙණෙක් එන්නාහ. සවතව් තොප යවන්නාහ, තොපි ඒ සවතේ වැටෙන්නාහ. එහිට තොපගේ ඇඟමස් කම් කියා කැණහිල්දෙන් පලානියාය. බොධිසත්වයෝත් මේ සිතතබා ගෙණ උන්නාහ. එද සත්වෙනි දවසට පසම්තුරු රජ්ජුරුවන් හා සේනාව සවතව අවුත් වාසල්දොරකඩ කදවුරු බැඳගත්හ. රජ්ජුරුවෝත් බොධිසත්වයන්ට සේනාව ඇරගෙණ සවතට යවයි කීහ. බොධිසත්වයෝ කියන්නාහු පියානන්වහන්ස අද මම නොසීහෙයි මම සවතට නොයෙමි කීහ. සවතෙහි මියතත් රැකෙතත් තොපිම යන්නාහයි කීහ, යහපත පියානන්වහන්ස යෙමි. කියා සේනාව ඇරගෙණ අනික් වාසලකින් පිවත්ව කදවුරු බැඳගෙණ වැද උන්සේක රජ්ජුරුවෝ මාගේ පුතනුවෝත් නුවරින් පිටත්ව මට විපක්ෂව උන්නාහ. සතුරෝත් ඇවිදින් ඉදිනි, ඉතිකින් මාත් මාගේ ජීවිතය රැක ගණුත් යහපතැයි අග්‍රමහෙසිකා බිසවුනුත් පුරෝහිත බමුණත් පරනතප තම් කොල්ලකුත් ඇරගෙණ නුවරින් පිටත්ව වනාන්තරයට වැද පන්සලෙක වාසය කළාහ. බොධිසත්වයන්වහන්සේත් පිය රජ්ජුරුවන් නුවරින් පලාගිය නියාව අසා නුවරට අවුත් සතුරන් සාඩා නුවරට වැද රාජ්‍යකරමින් උන්නාහ. එසමයෙහි බරණැස්රජ්ජුරුවෝත් පුරෝහිත බ්‍රාහ්මණයාත් දෙන්න පරනතප නම් කොල්ලාත් බිසවුනුත් පන්සල රදවා ඵලා ඵල කඩාගියාහ. මෙසේ නිරන්තරව උන් දැකීමෙන් බිසව් පරන්තපතම් කොල්ලා කෙරේ අභිලාෂා උපදවා ඔහු සමග ලෝකාසවාදරතියෙහි යෙදුනාහ. මෙසේ නිරන්තරයෙන් වාසය කරන්නාහු එක් එවසක් පරනතපතම් කොල්ලාට බිසව් කියන්නාහු තොප හා අප හා කරණ කවයුත්ත රජ්ජුරුවන්වහන්සේ දන්නාසේක් තම් කවයුතු නොවෙයි, රජ්ජුරුවෝ තොප අතව් කඩුවත් අදනාකඩත්දී නාන්ට යන්නාහ. එව්ට රජ්ජුරුවෝ දියට බටවිව ඉස අල්වා කඩුවෙන් දෙකඩකොට කපාපියවයි කීහ. ඒ පරන්තපතම් කොලුත් යහපතැයි කියා උන්නේය

ඒ බිසවුත් බරණැස් රජ්ජුරුවන් අසිහිවූ දරුගර්භයක් ඇත්තේය. එක් දවසක් රජ්ජුරුවෝ පන්සල රඳ පුරෝහිත බමුණා ඵලාඵල කඩා යවා තුමූ නාන්වයහි පරන්තප නම් කොල්ලා අනව අදනාවත් කඩුවත් දී ගඟට ගොස් අදනාකඩ ඇදගෙණ ස්නානයට ගඟට බැස නානකල්හි පරන්තපයාත් කඩුව අතින්ගෙණ දිවගොස් රජ්ජුරුවන් ගේ ඉසකේ අල්වාගත, මරණභයින් තැති ගෙණ මහත්කොට අඩගැසූන. පුරෝහිත බ්‍රාහ්මණයාත් ඵලාඵල කඩාගියේ එතකට නුදුරුවූතැන උස් ගසක් උඩ ඵලාඵල කඩා උන්නේ රජ්ජුරුවන් ගැසූ අඩ අසා බිමවැටී කලෑයෙක ඉවත සැඟවී උන්නේය. පරන්තපයාත් රජ්ජුරුවන් ඉස කපා පොලුකොට ගසා වළෙකලා වසා ගස අත්ත සැලිගියා දැක මේ ගස අත්ත සැලෙන්ට කාරණා කිම්දැයි ගසමුලට ගොස් ගසවට බලා කාත් නොදැක බිසවුන් ඉදිනා පන්සලට ගොස් රජ්ජුරුවන් මැරූ නියාව බිස වුන්ට දන්වා දෙන්තම සැකයක් නැතිව එකතැන්හිම වාසය කරන්නාහ. ඒ බ්‍රාහ්මණයාත් ඇස්දෙක නැසීගියාක්මෙන් ඇසපියාගෙණ ඒ ඒ තැන වැටීවැටී සරයවියක් අතටගෙණ බිසවුන් ඉන්නාවූ පන්සලට ගියේය. පරන්තප තම් දූසයාත් ඇයි බ්‍රාහ්මණය මේ තට කුමක්වූනියාදැයි විචාළාහ. බ්‍රාහ්මණයා කියන්නේ රජ්ජුරුවන් නොඅඳුනන කෙණෙකුන්මෙන් දේවයන්වහන්ස ඵලාඵල කඩාගිය ගමනේ ඇස්දෙක අන්ධවීයයි කීහ, එසේවීනම් නයෙකු අළ විෂධූමයකින් ඇස්දෙක අන්ධවූ නියාශයි කියා භය නොගණුවයි මම තොප රක්මි බිසවුනුත් පුරෝහිත බ්‍රාහ්මණයාත් දෙන්නා පන්සලඉදවා පරන්තපයා වනයට ගොස් ඵලා ඵල කඩාගෙණෙන්නේය. මේ නියාගෙන් දවස් අරිණාකල්හි එක්දවසක් එම්බා දෙවිනි රජ්ජුරුවන් මරන්වයයි ඉසකේ අල්වා කඩුව කොපු වෙන් අයතවිට එක්ගසෙක ඉඳ මිනිසෙකු නෝ ශාඛා මෘගයෙකු හෝ නොදැ නෙහි බිම වැටීහිත, මේ අත්ත සැලීමෙන් යම්දවසක මට අනතීවන්නේයයි බිසවුන්ට ඖථාවකින් කියා බ්‍රාහ්මණයා නිදන එකකුමෙන් වැදගෙව, එක්දව සක් පරන්තපයා ඵලාඵලයට යාදී තමාගේ බිරිඳ කෙරේ ශොකයෙන් අඩන එකකුමෙන් කියන්නේ මාගේ විශිෂ්ටවූ රූ ඇති ප්‍රියවූ දශීතයක් ඇති මාගේ හෘදයක් වැනි මාගේ භාර්‍යාවන් නොදැක තැවෙන්නාවූ මාගේ හෘදය අත්ත සැලිගිය සංකාවෙන් තැවෙන්නාවූ පරන්තපයාගේ හෘදයමෙනැයි අඟවා කීහ. බිසව් ඒ අසා කුමක්ද නොපි කියන්නේයයි විචාළාහ. පුරෝහිත බ්‍රාහ්මණ යාත් තමාගේ බිරින්ද කෙරේ අඩම් කියා පිරිමසා නිබිය බිසව් බඩ දරුගර්භ යක් මූකුරා දසඑකඩමය කුමාරයකු වැදූන. ඒ කුමාරයාත් වැඩිවිය පැමිණ සොළොස් ඇවිරිදිවූ කල්හි එක් දවසක් කුමාරයන්ට කියන්නේ කුමාරයෙනි ඔයට නාන්ව යම්හ මාගේ සැරයවිය කොණ අල්වාගණුවයි කුමාරයන් අතට සැරයවිය අග දී ඔයට ගොස් දැස්නයා කුමාරයන් බැලූයේය. එවිට රාජකුමාර තෙම බමුණ අන්ධ නොවන්නෙහිදැයි විචාළේය. රාජකුමාරයන්වහන්ස දැස් අන්ධයයි මේ උපායෙන් රැකුතෙමි කියා නුඹවහන්සේගේ පියානන්වහන්සේ දන්නාසේක්දැයි විචාල කල්හි එසේය දනිමි කියා කීයේය. එවිට බමුණු කිය නුයේ මේ පුරුෂතෙම තොපගේ පියා නොවන්නේය, තොපගේ පියානෝ බරණැස් රජ්ජුරුවෝය, දැසවූ මේ [පුරුෂයා තොපගේ මැනියන්කෙරෙහි වර දවා පැවත මේ සථානයෙහි තොපගේ පියරජ්ජුරුවන් මරා වැලලූයේයයි ඇර

ගෙණවුන් පැයේය, එවිට කුමාරයාට බලවත්වූ ක්‍රෝධ ඉපද දැන් කුමක් කෙරෙම්දැයි බ්‍රාහ්මණයා අතින් විචාළේය. එවිට බ්‍රාහ්මණයා කියනුයේ ඒ දැසයා විසින් තොපගේ පිය රජ්ජුරුවන්ට මේ තොටේදී යමක් කරණලදද එපරිද්දෙන් කරවයි කියා රජ්ජුරුවන්මැරූ සියලු ප්‍රවෘත්තිය රාජකුමාරයන්ට කියා එදවස්පටන් ඛඩ්ගශිල්පයෙහි ශික්ෂා කරවූයේය. ඉක්බිත්තෙන් තොබෝ දවසකින් රාජකුමාර තෙම කඩුවත් අදනාකඩත් ගෙණ පියාගන්වහන්ස නහන පිණිස ගහට යම්හයි කීයේය. එවිට පරන්තපයා යහපතැයි කියා රාජ කුමාරයා එක්ව නහන තොටට ගොස් ඔහු ස්නානය පිණිස ගඟට බටකල්හි රාජකුමාරතෙම දකුණතින් කඩුව ඔසා වමතින් ඔහුගේ කෙස්වැටිය ගෙණ මාගේ පියාගන්වහන්සේ මේ සථානයෙයිදී හඬව හඬවා මැරුයෙහිය, මම්ද තා එපරිද්දෙන්ම මරමිකියේය. එවිට මරණභයින් භයපත්ව විලාපකියා අඬන් නාවූ පරන්තපයා ද මා රජ්ජුරුවන් මරන්නාවූ කාලයෙහි මනුෂ්‍යයෙකු විසින් හෝ මෘගයෙකු විසින් හෝ එක් ගසෙක ශාඛාවෙක් සොලවනලද ඔහු විසින් ඉදිරි භයෙක් උපදින්නේයයි කල්පනා කරණලද ඒ භය දැන් මාකරා පැමිණියේයයි ''අහමා නූන සෝ භවෙවා''යි ගාථා දෙක කියා හැඬුයේය. ඉක්බිති කුමාරතෙම කියනුයේ කොල දුෂ්ටවූ දැසය ස්නානය පිණිස ගඟට යම්හයි විශ්වාසයෙන් මාගේ පියාගන්වහන්සේ කැඳව ගෙණ යොස් ස්නානය කරන්නාවූ උන්වහන්සේ මරා කඩ කඩ කොට කපා වළලන්නාවූ තෝ මේ ක්‍රියාව කවරෙක් දන්නේද ඉදිරි මට මෙබඳු භයෙක් වන්නේයයි මා වඤ්චා කෙළෙහිය, ඒ උන්වහන්සේට පැමිණියාවූ මරණ දැන් තා කරා පැමිණියේයයි කියා ඔහු එතැන්හිම ජීවිතක්ෂයට පමුණුවා වළලා කොලඅතු කඩා වසා කඩුව සෝධා ස්නානයකොට පන්සලට ගොස් ඔහු මැරුබව පුරෝහිත බමුණාට කියා මැනියන්ට පරිභව බැණ වෙතෙහි වාසය කිරීමෙන් කවර ප්‍රයෝජන යෙක්දැයි ඔවුන් තුන්දෙනම බරණැස්නුවරට ගියානුයැ, බොධිසත්වයෝ තුමූ රාජ්‍යයට පැමිණ මලනුවන්ට යුවරජ තනතුරු දී දානාදී කුසල් කොට දිව්‍ය ලොකයෙහි උපන්නේයයි, තිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ පරන්තප ධර්මදෙශනාව ගෙණහැර දක්වා වදාළසේකි. එකල්හි පියරජ තම් දෙවදත්ත සථවිරය, ඔහුට පුත්‍රව උපන්නාවූ රාජකුමාරයෝ තම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

## සත්වෙනි නිපාතය නිමි

## 405 කච්චානි ජාතකය

**ත**වද මේ අට වැනි නිපාතය දක්වමි, කෙසේදයත්? අෂ්ටාංගෝත්තරශත මඞ්ගල්‍ය ලක්ෂණයෙන් විරාජමානවූ ශ්‍රීපාදපද්ම ඇති සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි මවිපියන්ට උපස්ථාන කරන්නාවූ උපාසකයකු අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්**

එක් උපාසකයෙක් දෙමව්පියන්ට සකසාම උපස්ථාන කරන්නේය. උන්ගේ දෙමව්පියෝ පුතනුවන්ට කියන්නාහු පුතණුඩ උපස්ථාන කිරීමකුත් ගොවිතැන්බත් කිරීමකුත් තොපට මහා අපහසුය, තොපි තොපට සුදුසු තෙනකින් බිරිඳක් ගෙණඑව, උන්ගෙණාකල උන් අපට උපස්ථාන කරන්නාහ. පොපි ගොවිතැන්බත් කරන්නාවේදැයි කිහ. ඒ උපාසකයා කියන්නේ මා උපස්ථානකරණසේක් උපස්ථාන කළහෙදිද? මා විනා අනික් කෙණෙක් මාගේ සිතසැරියට උපස්ථාන කෙරෙත්දැයි තොගිවිස්සාහ, උන්තොගිවිස්සත් දෙමව්පියෝ සුදුසු කුලයකින් බිරින්දක් ගෙණවිත් දුවාහ. ඒ ස්ත්‍රීන් අදවස් පටන් සමනන්වත් ඉතා ලෙන්ගතුව වාසයකොට කැදිමසිලන්වත් සැපසේම උපස්ථාන කරන්නී කල්යාමකින් තැන්දනියන් කෙරේ කළකිරී උනුපැන් ඉල්ලුවොත් ඉතාම අඟ සමනය ලෙසව උනුපැන් දෙන්නීය. ඇල්පැන් ඉල්ලුවොත් ඉතා සීතයෙන් වෙව්ලන ලෙසට ඇල්පැන් දෙන්නීය, මාලුයේ ලුණු මදයයි කීවොත් ඉතා ලුණු බෝකරන්නීය. ලුණු බෝයි කීවොත් ඉතාම මද කරන්නීය, ඇඳ මකුණෝයයි කීවෝත් අසල ගෙවල ඇත්තන්ට නුඹ ඇමට ඇසෙන නියායෙන් නොවේද මා ඇඳ මකුණන් ගැසුයේයයි කියන්නීය. තොමෝම ඒ ඒ තැන සෙම් සොටු කාරා දමා සවුරුදුයි විවාළ කල නුඹගේ මැනියන්දැයයි කියන්නීය, එක් දවසක් සමනන්ට කියන්නී නුඹගේ මැනියන්දැට පිය පැර නිබන්ට හා සෞප්පනි තබන්ට අපට බැරිය, නුඹගේ මැනියන්දැ මෙතන ඉදිතොත් මම තොයිදිමි. උන් මේගෙන් යව්වමැනවැයි කිව. එවිට උපාසකයා කියන්නේ තොපි තම් සඟ බාලහෙයින් තොපට කොයිත් ගොයින් ඉන්දැනැක, මාගේ මැනියන්වනන්සේ මැහැලිව දුම්ලසේක. උන්දැ කොයි යන්දැද, තෝ යෙයි තම් පලායවයි කියා තමාගේ බිරින්දව කොප කළහ. එතැන්පටන් පළමු නියාවට දියුණුවක්ව තැන්දනියන්ට උපස්ථාන කරන්නාහ, උපාසකයා එක් දවසක් ජේතවනාරාමයට ගොස් සම්බුදුයන් වහන්සේට වැඳ එකත්පස්ව ඉද බණ අසා සම්බුදුයන්වනන්සේට එපවත් කියේය. සම්බුදුයන් වහන්සේ වදාරණසේක් තොප අඹුවන් කීවා නොගිවිසි පමණක් විනා පෙර තාගේ බිරින්දගේ බස්ගණ මැනියන් පහකොටපුවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

**ඒ කෙසේද? යත්**

**පි**වකිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්වයෝ ශක්‍රදේවේන්ද්‍රව උපන්නාහ. යමකි ප්‍රවෘත්තියමෙන් වන්නාහ. මෙහි වනාහි උපාසකයා තමාගේ බිරින්දගේ බසට මැනියන් ගෙයින් පහකොටපුවාහ. උසික් එතැන්පටන් ඇතමැත ඇවිද බැලමෙහෙකොට ජීවත්වන්නාහ. එසමයෙහි උන්ගේ යෙහෙලනියන්ට දරු

ගර්භයක් ඇතිවිය. දසඑකඛමසකින් දරුවන්ලැබ දවසින් දවසට සියලු සම්පත්තියෙන් අඩුවක් නැතිව දවස් අරණහු මේ මැහැලි මාගේ ගෙයි ඉන්නා තෙක් අපට කිසි වැඩෙක් නොසැලසිත, උඳු සියදවස් පවන් දරුවනුත් ලැබී සැපසේ අනිවාඛියම සැලසුනැයි කීවාහ. එවිට උපාසකයාගේ මව් තමා ගෙයින් පිටත්කළ පසු දරුවන් ලද්දැයි අසා මේසේ සිතුවාය, ඉදින් මේ ලෝකයෙහි ධර්මය නොතැසී පවතීනම් බිරින්දෑගේ බසට මවුන් තලා ගෙයින් පිටත්කළ දරුවෝ මෙලෙස දරුවන් ලැබ සුවපත්වෙත්ද, එසේහෙයින් ධර්මය නැසුනේවත, ඒ නැසුනාවූ ධර්මයට පිතෘපිණ්ඩ දෘනය කෙරෙමි සිතා ඒ මැහැලි එක්දවසක් තල මුං සාල් වළන් සැඳි මාළු අරගෙණ අම්මොනොතකට ගොස් ලිප්කැටට මිනිඉස්කබල් තිබා ගිනිමොලවා ගහට ගොස් ඉස්සෝධානහා හන් පෙරවී පිළී සෝධා බැඳි ලිපගාවට ඇවිත් ඉසකේ මුදුහෙලා සාල්දෙවුන් අරින්වි පවත්ණත්නීය. එකල්හි පුරණුලද බොධිසම්භාර ඇති බොධිසත්ත්වයෝ ශක්‍රදෙවෙන්ද්‍රව ඉපද එදවස් දිවසින් මනුෂ්‍යලෝකය බලන්නාහු ඒ මැහැල්ල කරන්නාවූ ක්‍රියාව දැක බමුණුවෙසක් මවාගෙණ මගයන එකෙකු මෙන් ඒ ඇසිටිනා තෙනට ගොස් සොහෙනේදී බත් පිසන කෙණෙක් නම් නැත, එම්බා කචවානි නම් තැනැත්තෙනි ඉසසෝධා නහා සුදුපිළී හැඳ මිනි ඉස්කබලින් ලිප්බැඳ තලකිරිබත් පිසන්නේ කාවදැයි විවාළේය. එවිට මැහැලි කියන්නී බමුණානනි මේ ලෝකයෙහි වැඩිමහළු නැයන්ට ආදර සත්කාර කිරීම ආදීවූ සුචරිත ධර්මය නැසුනේය. එසේහෙයින් මම ඒ නැසුනාවූ ධර්මයට පිතෘපිණ්ඩ දෘනය කෙරෙමි කී කල්හි ශක්‍රබ්‍රාහ්මණතෙම කියනුයේ එම්බා කචවානීය අසදෘශවූ ආනුභාවය හා දහසක් නුවණැස් ඇති සඛම් සවරූපවූ සක්දෙව් රජතෙම ධර්මය පවත්වමින් ජීවත්වන්නේය. එසේහෙයින් ධර්මය නොනැසුනේ යයි කීයේය. එබස් අසා මැහැලි කියන්නී බමුණානෙනි කුමක් කියව්ද මේ ලෝකයෙහි යම් සත්වයෙකුණෙක් කුශලධර්මයෙහි නොයෙදී පාපයෙහි යෙදී වාසය කෙරෙද්ද එබඳුවූ සත්වයෝම පුත්‍රදාර දැසිදස් ගවමහිසාදී ධනධාන්‍ය සම්පත්තියෙන් සමෘද්ධවෙති. පළමුවදවූ මාගේ යෙහෙලිතියන් අදෝහිවූ කුලජ්‍යෙෂ්ඨවූ මාහලා ගෙයින් පිටත්කොට දරු වදු සියලු අපගේ කුලඥට ප්‍රධානවූවාය. නොපකුමක් කීවත් ධර්මය නැසුනැයි යනු ඒකාන්තයෙන් මට සැකයක් නැතැයි කීවාය. ඉක්බිති සක්දෙව් රජ කියනුයේ කාත්‍යායනිය, නෝ යම් ධර්මයක් මළාඇයි කිවූනම් ඒ ධර්මයනම් අනිකෙක් නොවෙයි ජීවමානවූ මම්මය. අන් කාරියක් නැතිව නොප නිසාම මෙතැන්හි පැමිණියෙමි. යම් ස්ත්‍රියක් නොප තලා ගෙයින් නෙරා දරුවන් ලැබ ප්‍රබලවූද ඇ දරුවන් හා එක්ව මාගේ ධර්මතේජසින් දවා අළුකෙරෙමි කිවුව, එවිට මැහැලි අනේ මේ කුමක් කියන නියාද මාගේ මුනුබුරා හා යෙහෙලි සැපසේ ඉඳීම යහපතැයි සිතා කියන්නී සවාමිනි සක්දෙවිරජ්ජුරුවන්වහන්ස මා පිණිස මෙතැන්හි වැඩිසේක්වීනම් මමද මාගේ පුතාද යේලිද මුනුබුරාද අපි හැමදෙන ඔවුනොවුන් හා සමග සතුටුව යම්සේ වාසයකරමෝද එම නුඹවහන්සේටත් කැමැතිවේවයි කීකල්හි උන්විසින් දුකවපමුණුවනුලැබූ තෝ සත්පුරුෂධර්මය නොහැර ඔවුනොවුන්ට යහපතක් කැමැතිවූයේයයි සන්තෝෂව නොපි හැමදෙනම ඔවුනොවුන් හා සමග සතුටුව එක්තැන්හි වාසයකරවයි කියා සක්දෙවිරජ ශක්‍රාත්මභාවයෙන් සැදී පැහැදී අහස්හි සිට කියනුයේ නොබව කාත්‍යායනිය නොපගේ පුතනුවන්

හා යෙහෙලතියෝ මාගේ ආනුභාවයෙන් පෙරමගට අවුත් සුභාෂිතකරවා තොප කැඳවාගෙණයෙති කුශලධර්මයෙහි අප්‍රමාදව වසවයි අවවාදකොට තමා වාසය කරන්නාවූ දිව්‍යලෝකයටම ගියේය. ඔවුන් දෙදෙන ශක්‍රානුභාවයෙන් මැනියන්ගේ ගුණසිහිකොට අපගේ මැනියන්වහන්සේ කොයිදැයි ගම මනුෂ්‍යයන් අතින් විචාරා අම්බකාතොත දිසාවට ගියයි යනු අසා අඩාගෙණ හොස්සක පසක අඩා වැටී මැනියන්වහන්ස අපගේ දෝෂ ක්ෂමා කළ මැනවැයි කීවාහුය. ඒ මැහැලි ප්‍රේමයෙන් මුනුබුරා වඩාගත්තීය. මෙසේ සමගිව ඔහු හැමදෙන ගෙට අවුත් ශක්‍රයන්ගේ ආනුභාවයෙන් ඒ කාර්‍යයයනි තොම යෙහෙලියන්ද පුතනුවන් මුනුබුරාතන් විසින් ඒ ශක්‍රානුභාවයෙන් කරණලද උපස්ථාන විද සැපසේ වාසයකළෝවේදැයි චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක. චතුස්සත්‍යය ධර්මදේශනාවගේ අවසානයෙහි උපාසකතෙම සෝවාන්ඵලයෙහි පිහිටියේය. එකල්හි මැනියන්ව උස්ථාන කළ පුරුෂයානම් දැන් වතීමාන කාලයෙහි මාතාපස්ථායක වන්නේය. එකල්හි භාර්‍යාවූ ස්ත්‍රිතොම දැන් මේ ස්ත්‍රිය, ශක්‍රදේවේන්ද්‍ර තම් සම්‍යක්සම්බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

---

## 406 අට්ඨකනිපාත ජාතකය

එවද කරුණා නිධානවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ජෙතවනාරාමයෙහි වාසයකරණසේක් මධ්‍යම රාත්‍රියෙහි කොසොල්රජ්ජුරුවන් විසින් අසනලද විභාග නැති භයානක ශබ්ද අවක් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක. මෙහි වර්‍තමාන කථාව යට ලෝභකුම්හි ජාතකයෙහි පෙණෙන්නේය. මේ ජාතකයෙහි කොසොල් රජ්ජුරුවන් විසින් සර්‍වඥ තිලෝගුරු බුදුරජානන්වහන්ස මේ ශබ්දයන් ඇසුවායින් කුමක්වන්නේදැයි විවාළකල්හි නොබව මහරජ මෙහිත් කිසි අන්තරායෙක් නොවන්නේය මෙබඳුවූ භයානක ශබ්ද නොපිම නොඇසුවව, පෙරත් රජදරුවෝ මෙබඳු ශබ්ද අසා බමුණන්ගේ බස් ගෙණ සර්‍වතුෂ්කතම් යාගයක් කරණු කැමැත්තාහු නුවණැත්තවුන්ගේ බස් අසා යාගයට මරණු පිණිස ගෙණාවූ සත්වයන් නොමරණ පිණිස නුවර බෙරලවා අභයඝෝෂය දුන්නාහු වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්‍වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

### ඒ කෙසේද? යත්

පිටතිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බොධිසත්වයෝ බ්‍රාහ්මණකුලයෙහිඉපිද වැඩිවියපැමිණ ගිහිගෙයි කලකිරී හිමාලයවනයටවැද ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වාසයකොට ලුණුඇඹුල් පිණිස බොධිසත්වයෝ බරණැස්නුවර ආ ගමනින් රජ්ජුරුවන්ගේ මගුල් උයනේ වාසයකරන්නාහ. එසමයෙහි බරණැස් රජ්ජුරුවෝ මධ්‍යම රාත්‍රිවේලෙහි ශබ්ද අටක් ඇසූහ, ඒ ශබ්ද අට කවරේද යතහොත්, පළමුකොට

රජ්ජුරුවන්ගේ උයන සමීපයෙහිදී දිය සුන් පොකුණක් සමීපයේ භිද කොකෙක් අඩාලීය, දෙවැනිව ඒ අඩව අනතුරුව රජ්ජුරුවන්ගේ ඇත්හල තොරණ සමීපයේ ඉඳ කැවිබි ඩෙනුවක් අඩලුව, තුන්වෙනිව ඒ අඩට අනතුරුවම රජ්ජුරුවන්ගේ රජගෙයි කැණිමඩලේකදපණුවෙක් අඩලීය, සතරවෙනිව ඒ අඩව අනතුරුව රජ්ජුරුවන්ගේ රජගෙයි මැදිරියේ ඉදිනා කොවුලෙක් අඩලීය, පස්වෙනිව ඊට අනතුරුව රජ්ජුරුවන් වඩන මුවෙක් අඩලීය, සවෙනිව ඊට අනතුරුව මැදිරියේ භිඳිනා වඳුරෙක් අඩලීය, සත්වෙනිව ඊට අනතුරුව මැදිරියේ භිඳිනා කින්තරාවක් අඩලුව, අවවැනිව ඊට අනතුරුව රජ්ජුරුවන්ගේ මඟුල් උයනට ආකාශයෙන් වඩනාවූ පසේබුදුකෙණෙකුන්වහන්සේ උදන් ගාථා වදාළසේක. මේ ශබ්ද අටම ඒ රජ්ජුරුවෝ ඇසූහ. ඒ අසා රජ්ජුරුවෝ තුන්යම් රාත්‍රියෙහි නසින් නොනිදුම පාන්කළහ, පුරෝහිත බ්‍රාහ්මණයාත් පාන්වූ පසු රජගෙව අවුත් රෑ නිදිලන් සැටිය විචාළේය. රජ්ජුරුවෝ කියන්නාහු මට සැපයක් නම් කොයින්ද රෑ මෙසේවූ ශබ්ද අවක් අසා භයපත්ව නිදි නොලද්දෙමියි කීහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා සිතන්නේඅප කන්ට කැවිල්ලක් ලා ගියේයයි බමුණන් සත්කාර එක්කොට කියන්නේ මේ මහා භයංකරවූ ශබ්දයෙක මීට සමීවතුෂ්ක නම් යාගයක් කළොත් විතා තපුරුයි රජ්ජුරුවන්ට කියා බොහෝ ප්‍රාණීන් එක්කරවාගෙණ යාගයක් කරවන්ට උවමැනවැයි නොයෙක් සතා සතුන් පක්ෂීන් මිනිසුන් ඇතුළුවූ අය යාගයට එක්කරවූහ. එවිට ඒ පුරෝහිත බ්‍රාහ්මණයාගේ අතවැසිවූ බමුණෙක් කියන්නේ ආචාරිත්වහන්ස අප උගත් වේදශාස්ත්‍රයෙහි ප්‍රාණයක් නසා කරන්ට කී යාගයක් දුටුයේ නැත, මෙතෙක් ප්‍රාණ නසා පවිකරන්නාවූ කාරණාකිම්දැයි කීහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ තොපිම රජ්ජුරුවන්ට පක්ෂපාතව ගියාද මෙතෙක්දෙනාට වන්නාවූ ලාභ අලාභ කරවුදැයි කෝප කළාහ, ඒ අතවැසින් ආචාරින් අතින් කෝප අයා කෙතෙක් කෝප කළත් මා මේ ප්‍රාණවධයට එක්වන්නේ නැතැයි පළාහොස් මේ පුරෝහිත බ්‍රාහ්මණයාවත් රජ්ජුරුවන්ටත් පිරෙන්නාවූ පාප සංසිදුවාපියන්ට නිස්සෝ කවුරුදැයි පරීක්ෂාකොට රජ්ජුරුවන්ගේ උයනට යන්නාහු තාපසයන් කරා ගොස් කියන්නාහු තාපසයන්වහන්ස අපගේ රජ්ජුරුවන්වහන්සේ ඊයේ රෑ ශබ්දඅවක් අසා වදාරා ඒ ශබ්දඅට අසුනියාව පුරෝහිත බ්‍රාහ්මණයාට කීසේක. පුරෝහිත බ්‍රාහ්මණයාත් තමා රැකෙන උපායට සමීවතුෂ්ක නම් යාගයක් කළ මැනවැයි ප්‍රාණීන් රැස්කරවාගෙණ මරන්ට උවමැනවැයි යාගශාලාවක් ඉදි කරවා ඒ ශාලාවෙහි මෙකී අය බැඳගෙණ ප්‍රාණවධයට එක්කරන්නාහ. ඔබ වහන්සේවැනි සෘජුඇති තාපසයන්වහන්සේ මෙතන වැඩඉන්දදී රජ්ජුරුවන් වහන්සේව පිරෙණ පාපය නැතිකොට භික්ෂාව වදාළ මැනවැයි කීහ. එවිට තාපසයෝ කියන්නාහු රජ්ජුරුවෝ අප ලඟට අවුනම් මේ ශබ්ද අවෙහි විපාකත් කියා රජ්ජුරුවන් භික්ෂාවන පමණක් විතා අප ඉස අකුස්සක් බැඳගෙණ රජ්ජුරුවන් ලඟටගොස් භික්ෂාවන්දැයි කීහ. එවිට බ්‍රාහ්මණයා මම ගොසින් රජ්ජුරුවහන්වන්සේ කැඳවාගෙණඑමි කියා රජ්ජුරුවන් ලඟට ගොස් කියන්නේ සවාමීනි නුඹවහන්සේ ඇසූ ශබ්දඅටේ අර්ථ විභාගකොට කියන්නට දන්නාවූ තාපස කෙණෙකුන් වහන්සේ මඟුල් උයනේ වැඩහිඳිනාසේක. නුඹවහන්සේ එතනට ගොස් අර්ථ විචාළ මැනවැයි කීය. රජ්ජුරුවෝත් යහපතැයි

උයනට ගොස් තාපසයන් වැඳ ඇසූ ශබ්ද අතෙහි අඹු තාපසයන්ට කිහ. තාපසයෝ ඒ ශබ්ද අතෙහි අඹු විසඳන්නාහු පළමුවන ශබ්දයෙහි කොකෙකු ඇඹු කාරණය තම් පළමු මේ පොකුණේ මත්ස්‍යයන් කා පැන් බී වාසය කෙළෙමි. දැන් මැඩියන් කා ජීවත්වෙමි, තමාගේ විෂෙපයෙන් අඩලීය, මින් රජ්ජුරුවෙනි තොපට වන්නාවූ අනර්ථයෙක් නැත; පොකුණ බිඳුවා පැන් පුරවාපියන්න දැනුත් කොකා විසින් කිසි විෂෙපයක් නැතිව සැපසේඉඳිනේ යයි කීකල්හි රජ්ජුරුවෝ පොකුණේ කසල හරවන්ට අමාත්‍යයන්ට කීහ. මින් තොපට වන්නාවූ භයෙක් නැතෙයි කියා බොධිසත්ත්වයෝ දෙවෙනි ශබ්දයේ අර්ථ විසඳන්නාහු රජ්ජුරුවෝ ඇත්කල තොරණ වසන්නාවූ කැවිඩි තමාගේ දරුවන් ඇතුන් මරාපු හෙයින් පුත්‍රස්නෙහයෙන් ඇඬුහ, තෙපට මින් අනර්ථයෙක් නැතැයි කියා තුන් වෙනි ශබ්දයෙහි අර්ථ විසඳන්නාහු රජ්ජුරුවෙනි තොපගේ රජගෙයි කැණිමඩුල්ලේ කදපණුවෙක් වාසය කරන්නේය, ඒ තමා යන එන තැනක් නැතිහෙයින් මම මින් කවර දවසෙක ගැලවී පලායෙම්ද ගොදුරක් කවර කලෙක ඛඩපුරා ලබම්දැයි කියා ඇඬිය, මිනිසෙකු ගෙන්වා කැණිමඩුල්ල බිඳවා කඳපණුවා ඇරගෙණ ඔබ්බේ ලවාපියවයි පැපසේ තමා කැමති තැනක ඇවිදිනේය, මින් තොපට වන අන්තරාය නැතැයි කීහ. සතර වන ශබ්දයේ අර්ථ කියන්නාවූ බොධිසත්ත්වයෝ මහරජ්ජුරුවෙනි තොපගේ මැදිරියේ ඉඳිනා කොවුළු මම මේ මැදිරියෙන් ගැලැවිගියෙමිනම් සැපසේ ඒ ඒ භස් උඩවල භිඳ ඵලාඵල ගනුභවකොට සැපසේ ඇවිදිමිකියා ඇඬුව, මින් තොපට වන්නාවූ අනර්ථයෙක් නැතැයි කියා පස්වැනි ශබ්දයෙහි අර්ථ කියන්නාහු මුවා මුවරුලට නායකව වනයේ වාසයකරන්නේ වැද්දෙකුව අසුව මේසා බන්ධනයකට පැමිණියෙමි ඉදින් මිදීගියෙම් තම් සැපසේ වනයෙහි වාසය කරන්නෙම්වේදැයි කියා ඇඬිය. මින් තොපට වන්නාවූ අන්තරා නැතැයි කියා සවෙනි ශබ්දයේ අර්ථ කියන්නාවූ තාපසයෝ රජ්ජුරුවෙනි මේ වදුරු වැදිරියෙක නිසා කාමයෙහි ගිජුව අවුත් බන්ධනයකට පැමිණියෙමි ඉදින් මේ දුකින් මිදී ගියෙම් තම් සැපසේ වනයේ ඇවිදිනෙම්වේදැයි කියා ඇඬිය. මින් තොපට වන්නාවූ භයෙක් නැතැයි කියා සත්වන ශබ්දයේ අර්ථ කියන්නාහු මේ කින් නරයා එක්දවසක් පර්‍වතයකින් ඇදිරියෙහි බස්නේ තමාගේ කින්නරඔඝනාවට අතදී බැස තමාගේ ස්ථානයෙහි සැපසේ වැදහෙව ලොකසාධාරණියෙහි යෙදී වාසයකොට දැන් එසේවූ කින්නරාවක් හැර බන්ධනයකොට පැමිණියෙමි, මින් මිදී ගියෙන් නම් සැපසේ වනයට වැද වාසය කරන්නෙම් වේදැයි ඇඬිය. මින් තොපට වන්නාවූ භයෙක් නැතැයි අවවැනි ශබ්දයෙහි අර්ථ කියන්නාහු එක් පසේ බුදු කෙණකුන් වහන්සේ හිමාලය වනයේ සිට කාලක්‍රියාවට ආසන්න හෙයින් මනුෂ්‍යපථයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුන්ගේ උයනේ කාලක්‍රියාකෙරෙමි උයනට යනසේක් මේ ජාතියෙන් දෙවෙනි ජාතියෙක උත්පත්තියෙක් නොවන්නේයයි මිත්වුතව නිර්‍වාණ පුරයට පැමිණ නිවන් සැප අනුභව කෙරෙමියි ප්‍රීතිවාක්‍යය කිය කියා උදන් අන අතා වැඩසේක. මින් තොපට වන්නාවූ අන්තරායෙක් නැතැයි කියා මේ ශබ්ද අටෙහි අර්ථ විසඳා වදාළසේක. රජ්ජුරුවෝ තාපසයන් වහන්සේ කෙරේ සමාධිව පසේබුදුන්වහන්සේගේ කද අදහනකරවා බන්ධනාගාරයෙහි සිටියාවූ සතුන් බන්ධනයෙන් උතුරුවූවයි වදාරා මේ අෂ්ටශබ්ද ජාතකය නිමවා

වදාළසේකි. එසමයෙහි රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරයෝය, බ්‍රාහ්මණ මානවකයා නම් ශාරිපුත්‍රසථවිරය, එසමයෙහි තාපසව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 407 සුලසා ජාතකය

තවද දිගුපුළුල්වූ නුවත්ඇති සම්බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි අනේපිඩු මහසිටානන්ගේ දුසියක අරභයා මේ ජාතකය දක්වන ලද

**ඒ කෙසේද? යත්**

අනේපිඩු මහසිටානන්ගේ පුණ්‍යලක්ෂණයෙන් යුත්දියනි කෙණෙක් ඇත උන්ගේ දුසියක් උසස්කෙළියටයෙමි තමාගේ සවාමිදුව අතින් ලක්ෂයක් වටිනා පලඳනාව ඉල්වා අතකරලාගෙණ උයන්කෙළියට යන්නිය දැක එක් සොරෙක් ඇ අත කර තිබූ ආභරණ දැක ඒ ආභරණයෙහි ලොභකොට මැ මරා පියා ආභරණ ඇරගණිම්, ඇ හා කැටිව ක්ලෙශ වසඟයෙන් කථාකොට ඇට රා මස් ආදීවූදෙය දෙන්නේය, ඔයින් ක්ලෙශ වසඟයෙන්දෙනියි ඇරගන්නීය ඒ සොරාත් ඇ උයන්කෙළිකෙළ ඉක්බිනිව ඇ හා ලොකසවාදරතියෙහි යෙදෙනා ලෙස එක් තෙනකට ගෙණගොස් කියන්නේ මෙතන නපුර ඔබ්බට යම්හයි කියා එවිටත් සිහන්නී රහසිගතව කරණ දෙයකට මෙතනට වඩා නියි තැනක් නැත, මෙතනින් මා ඔබ්බට ගෙණයන්නේ මරන්ට වනැයි සිත නීක්ෂණ උපායක් සිතා කියන්නේ රා මස් කා මාගේ සම්බන්ධය වියලීගියේය. මට පැන් උකාදීලා මට පැන් පොවා ලවයි ලිදක් කරා ගෙණ ගොස් කළය හා ලනුව සොරා අතට දීන. සොරාත් සැබවින්ම කියන දෙයක්වනැයි සිතා ලනුවෙන් කළය කට බැඳ ලිදට ලාලීය, එවිට පිටිපස්සේ සිටි ස්ත්‍රිය දැකින් තරයේ ඇන ලිදට ඵලා ඉසට උළුකැවයකින් ගසා මරා ගෙට ගොස් තමාගේ සවාමිදුවට මෙපවත් කියා ආභරණ පාවා දුන්නාය, ඒ ඇසූ සැටිය පුණ්‍ය ලක්ෂණදේවී පියානන්ට කීහ. අනේපිඩු මහසිටානෝ ජේතවනාරාමයට නොස් සම්බුදුන් වහන්සේට එපවත් කීහ. සම්බුදුන්වහන්සේ දැන් මතු නොවෙයි සිටානෙති පෙරත් ඒ ස්ත්‍රිය පුරුෂයා මැරුවිරුයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක

යිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ නුවර සුලසා නම් වෙශ්‍යා ස්ත්‍රියක් ඇත, ඒ නුවර සඬ්ඛා නම් සොරෙක් නිරන්තරයෙන් ගෙවල් සොරකම් කොට ඇවිදින්නේය, රජ්ජුරුවෝ එපවත් අසා ගම් රැකවලුන් විධානකරවා ඒ සොරා අල්වාගෙණ උල අන්ව විධාන කළහ, ගම් රැකවලුන් විසින් උඹ ඇරගෙණ උල අන්ව ගෙණයන කල්හි සුලසා නම් වෙශ්‍යාව තමාගේ ගෙයි උඩුමාලේ සිටින තැනැත්තිය ඒ සොරු දැක කනේරුජාතකයෙහි කී පරිදිදෙන් ඔහු කෙරෙහි

අභිලාෂා ඇතිව සිටාන්නී මෙසේවූ වීරපුරුෂයකු ගලවා ගනිමිනම් සැපසේ ඇතියෙක් දවසට ඉවඡාපරයෙන් වාසයකරන්නෙමි වේදැයි සිතා තමාගේ ගෙයි පළමු සිටි සිටු පුත්‍රයෙකුත් මසුරන් දැසකුත් ගම්රැකවලුන්ට දී ඒ සොරු ගලවාගෙණ තමාට සවාමිකොට ගෙයි රඳවාගෙණ උන්නීය, සොරුත් කීපදවසක් ඇගේ ගෙයි වැස සිතන්නේ මෙතන මා ඉඳ ප්‍රයෝජන කිම්ද මෑ මරාපිය මැ අත කරලන ආභරණ ඇරගෙණ යෙමි සිතා වෙශ්‍යාවට කියන්නේ එම්බා භද්‍රාව මා ඒ දවස් පිටතොලඟයා බැඳලා උල අනිත්ට ගෙණියන දවස් පඤ්චයඤ්ඤ වසන දේවතාවෙකුට ආරාධනාවක් කෙළෙමි, ඒ ආරාධනාවට බලි දුනමැනවැයි බොහෝ මිනිසුන් හා බත්තලියක් ඇරගෙණ තොප හා මා හා දෙන්නාම සමීහරණයෙන් සැරසී රුක්දෙවියාට බලි දෙන්ට උවමැනවැයි කීහ. වෙශ්‍යස්ත්‍රී කියන්නී යහපත නුඹවන්සේගේ අභිප්‍රාය තියාවට බලි දුනමැනවයි කියා බොහෝ පූජාභාණ්ඩ ඇරගෙණ සොරතෙමේ පඤ්චායුධසන්නඬව පඤ්චය ලඟට ගොසින් කැටිව ගියවුන් පඤ්චය පාත රඳවා සාඞ්ඛ නම් සොරා සුලසා නම් වෙශ්‍යාව ඇරගෙණ පඤ්චය උඩට නැගීගණ ගොස් ගලමින්නේ තබා කියන්නේ තොප ශත ප්‍රමාණය උස ඇති පඤ්චය උඩට බලිදෙන්ට ගෙණාගෙම් නොවෙයි තොප මරා අතකර තිබු ආභරණ අරගන්ට ආසේයයි කීය. එවිට සුලසා කියන්නී තොප කෙරේ ස්නෙහයෙන් මාරු දී ගලවාගනිමි තොප ඒ මරණින් ගැලවූ මා මර ප්‍රයෝජනය කිම්ද, මාගේ ආභරණත් ඇරගෙණ මා තොපට වහල් නියාවට බොහෝදෙනා මැදගේ කියා වහල්කොට ගණුවයි කිව. එවිට සාඞ්ඛකයා කියන්නේ මම් මේසා වනඋරු මිනියක් නොමරා වස්තුවක් ඇරගත්විරු නැත, සොරු මිනී නොමරා වස්තු ඇරගැණීම ආචාර නොවෙයි, තොපගේ තෙල උතුරුසළුව බිම තබා තොප ආභරණ ගලවා කඩෙහි ලා පොදිය බැඳ ලවයි කීය. එවිට සුලසා කියන්නී මා මැරුණ පසු මා කටයුතු දැන පුරුෂයන් හා කැටිව වාසයෙන් යෙදෙන අවස්ථාවෙහි පවත් තොප කෙරෙන් ඇති ස්නෙහයට වඩා ස්නෙහයක් ඇත්තේ නැත. ඉතිකිනී මේ දුක්මෙන් අනික් දුක්මත් නොවත්වුව, තොප සතර තැනක සිට වැඳ පැදකුණුකොට සිපගෙණ සනාපියන්ට උවමැනවැයි කිව. සොරාත් යහපතැයි ගිවිස්සේය. ඒ වෙශ්‍යාවත් කී පරිද්දෙන්ම වැඳ පැදකුණුකොට ඉදිරියෙන් සනාපියා පිටිපස්සට ගොසින් වඳින්ට නැඹුරුවන්නාක් මෙන් නැඹුරුව පිටිපස්ස අල්වාගෙණ ශතප්‍රමාණ පඤ්චයෙන් හෙලාපුව. එවිට ඇටබැට සුණුවිසුණුව කැඩී ප්‍රාණය විනාශ විය. ඒ බලා සිටියාවූ වාසභදේවතාවා නැමනැන්නිම පුරුෂයන්ම නුවණැතැයි කියාම නැත ස්ත්‍රීන් නුවණැත්තෝමය, සාඞ්ඛක නම් සොරා සුලසා වන් මරන්ට උත්සාහකොට තෙමේ නුනුවණින්ත් මෙළේය. සූක්ෂමවූ නුවණ ඇතිව දුටු ප්‍රසඨාවකට කාරිය සිතාගෙණ නොහෙන්නාවූ යම්කෙණෙක් ඇත් නම් සාඞ්ඛකයාමෙන් තස්නාහුයයි දේවතාවා කීයේය. ඒ සුලසා නම් වෙශ්‍යාත් පඤ්චයෙන් බැස තමාගේ පතීත් සිටිතැනට ගියාය. ඒ පරිවාරස්ත්‍රී කියන්නාහු නුඹවහන්සේගේ සවාමියානන්වහන්සේ කොයිදැයි විවාළහ. උන්ගේ දෙයක් මට නොකියවයි කියා රථයකට පැනනැගී තමාගේ ගෙට ගියාහි මේ ජාතකය ගෙණහැර දක්වා වදාරා මේ සුලසා ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි

සෝරා තම් මේ සොරාමය, එසමයෙහි සුලසා තම් මේ දැසීමය, එසමයෙහි වෘක්ෂ දේවතාව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 408 සුම්ඛගල ජාතකය

තීවද අසමසම වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැසවසන සමයෙහි රාජෝවාදයක් අරභයා මේ ජාතකය දක්වනලදී.

**ඒ කෙසේද? යත්,**

සම්බුදුරජාණන්වහන්සේ කෝසල රජ්ජුරුවන්ට වදාරණසේක් මහරජ දරුවන් තම් සන්හිදි වාසය කවයුතුය, පෙරත් රජදරුවෝ සන්හිදි වාසයකලෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුවත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්**

පසිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි ඒ නුවරට පසේබුදු කෙණෙකුන්වහන්සේ වැඩිසේක. රජ්ජුරුවෝ පසේබුදුන්වහන්සේ දැක තමන්ගේ උයනට වඩාගෙණ ගොස් උයනේ වැඩහිඳිනා නියාගෙන් සලස්වා තමන්ගේ සුම්ඛගල තම් උයන් ගොවිවා පසේබුදුන්වහන්සේට අත්පා මෙහෙවර කරණ නියාගෙන් සැලැස් වූහ. ඒ උයන්ගොවිවාන් ආදරසම්භාවනා ඇතිවම රජ්ජුරුවන් කී සැටියේම පසේබුදුන්වහන්සේට අත්පා මෙහෙවර කරන්නේය, පසේබුදුන් වහන්සේත් රජගෙන් වළඳා උයනේ වාසය කරණසේක. කිපමසක් වැස උයන්ගොවිවාට වදාරණසේක් සුම්ඛගලය පිටිසර ගමකට ගොසින් එන්නට යෙමිසි උයන්ගොවිවාව කියා පිටිසර ගමකට වැඩිසේක. උයන් ගොවිවාන් උන්වහන්සේ පිටිසර ගමකට ගිය නියාව කියා උයනට නොගියේය. පසේබුදුන්වහන්සේත් පිටිසර ගිය කිප දවසකින් උයනට වැඩිසේක. උයන්ගොවිවා උන්වහන්සේ වැඩි නියාව නොදන්නේය, උදැසන තමා දෙන අමුතු ඔනකට මුවන් විදින්නටයයි ගියේය. පසේබුදුන්වහන්සේ උයනේ සලවට සිවුරෙන් මොවිවක්කිලිය ගසා වැඩලන්සේක උයන්ගොවිවාන් මේ වැදනෝනේ මහා මුවෙකැයි සිතා ඇදගෙණ විද්දේය. ඒ හිය ලෙන් ඇනී පිටින් නැංනේය, එවිට පසේබුදුන්වහන්සේ ඇයි සුම්ඛගලය මම්මයයි වදාළසේක. එවිට උයන්ගොවිවා අන දුන්න දමාපියා සවාමීනි මහා මුවෙකැයි සිතා විද්දෙමි කියා ක්ෂමා කළ මැනවැයි කියා වැද වැතිර ගියේය. පසේබුදුන් වහන්සේ ඉතිකින් කළමනා කිම්දැයි කියා මා ඇඟ ඇනීගිය මේ හිය ඇද දමාපියවයි කිසේක එවිට හිය ඇදපු කිප පැයකින් ප්‍රාණය නිරුඬවිය. උයන් ගොවිවාන් පසේබුදුන්වහන්සේට විදි නියාව රජ්ජුරුවන් වහන්සේ ඇසුසේක් වීනම් මට ආඥාකරණසේකැයි හඟින් අඹුදරුවන් ඇරගෙණ වලව වැද

ගියේය. ඒ උයනේ වසන්නාවූ අනික් කෙණෙක් නැත්තාහ. දේවතාවෝ පසේබුදුන්වහන්සේ විත් කා මළසේකැයි බරණැස්නුවර මුළුල්ලේ සැල කළාහ. රජ්ජුරුවෝත් එපවත් අසා අමාත්‍යමණ්ඩය හා සමඟ උයනට ගොස් පසේබුදුන්වහන්සේ ආදාහන කරවා නුවරට ගියාහ. උයන්ගොවිවෘ අවුරුද්දක් සැඟවී ඉඳ තමා සිත එක් අමාත්‍යයෙකුට පෙණී රජ්ජුරුවන් වහන්සේ මා කෙරේ කෝප ඇතිසේක්දෝනෝයි නියමකළමැනවැයි කීහ. ඒ අමාත්‍යයාත් රජ්ජුරුවන් කරා ගොස් සවාමිනි සුම්ඛාල තම් උයන් ගොවිවා උයනට ඵලාඵල ඇතිකරන්ට ඉතා සමර්ථය, ඌ ගියතැන් පටන් උයන ඉතාම නපුරුව ගියේයයි කීය. රජ්ජුරුවෝ ඌ දිසාවට මූනත් නොලා උන් කියන බසුත් නොඅසුවාහ. ඒ අමාත්‍යයාත් ගෙව අවුත් තව කෝප සන්නොසිඳුනේය, නැවත අවුරුද්දක් සැඟවී ඉඳුවයි කීයා යළිය. එයින් අවුරුද්දක් සැඟවී ඉඳ පළමු පරිද්දෙන්ම ඇවිත් ඒ අමාත්‍යයා දිට, ඒ අමාත්‍යයාත් පළමු පරිද්දෙන්ම රජ්ජුරුවන්ට කීයේය. රජ්ජුරුවෝ දෙවෙනි වාරයේත් නොඅසුවාහ. ඒ වාරයේත් තව අවුරුද්දක් සැඟවී ඉඳුවයි කියා යැවිය, එවනත් ගොසින් අවුරුද්දක් සැඟවී ඉඳ තුන්වෙනි වාරයේත් ඇවිත් දිට, ඒ අමාත්‍යයාත් තුන්වෙනි වාරයේ රජ්ජුරුවන්ට කීය. රජ්ජුරුවෝ තුන්වෙනි වාරයේ උගේ පවත් අසා හෙන්වා ගෙණ පාවයි අමාත්‍යයාට කීහ. ඒ අමාත්‍යයාත් තමාගේ ගෙයි උන් උයන්ගොවිවා රජ්ජුරුවන්ව ගෙණැවින් පැහ. රජ්ජුරුවෝත් උයන්ගොවිවා දැක ඇයි තා පසේබුදුන් වහන්සේ කුමට විද්දේදැයි විවාළහ. සවාමිනි පසේබුදුන් වහන්සේ උයනට ආ නියාව නොදත්තෙමි මම මුවන් විදින්වයයි ගියෙමි, ඉස වසා සිවුර ලා ගෙණ වැඩවුන් තැනැත්තන්වහන්සේ මහමුවෙකැයි සිතා නොදැන විද්දෙමියි කීහ. රජ්ජුරුවන්වහන්සේ නොදැන කළ වරදට කරන්නේ කිම්දැයි කියා ඌට බොහෝ වස්තූදී පලමුසේම උයන රැකවලට සැලැස්වූහ. ඒ අමාත්‍යයාත් ඇයි සවාමිනි දෙමුරෙක මා දන්වන ගමනේ බැණනොනැගී වැඩඉන්ටත් දැන් වූකලී මූව ප්‍රසාද දෙන්ටත් කාරණා කිම්දැයි විවාළහ, එවිට රජ්ජුරුවෝ කියන්නාහු එම්බා ඉසුරුමතුන්වී තම් යම්කෙණෙකුන්ගේ වැරැද්දක් ඇසූ කල තමාගේ කෝපනිවීගිය අවසථාවේ හෙන්වාගෙණ උගේ වැරදි විවාරා නිවැරදි හෙයින් මූව ප්‍රසාදත් දී ඌට උයනත් සැලැස්වීම් රජ්ජුරුවෝ කීහ. එතන උන්නාවූ අමාත්‍යමණ්ඩලයා සාධුකාරදී බොහෝ කොලහල කළාහ. අරගල සන්හිඳියන්නා උයන්ගොවිවා නැගිසිට රජ්ජුරුවන්වහන්සේ වැඳ සවාමිනි නුඹවහන්සේ ශ්‍රීකාන්තාත් ලක්ෂ්මීත් නොහැර පවතිත්වයි නිරන්තර යෙන් සියල්ලවුන් කෙරේ කෝපයෙන් නොවී දැහැමින් සෙමින් රාජ්‍යය කරණසේක්වයි සියක් අවුරුද්දක් සැපසේ බොහෝදෙනා කෙරේ මෛත්‍රී කොට මින් චුතව දිව්‍යලෝකයට ගොස් දිව්‍යසම්පත් අනුභවකරණසේක්වයි ආවඩා ස්තුතිඝොෂා කෙළේයයි වදාරා මේ සුම්ඛාල ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි පසේබුදුන්වහන්සේ ආදාහනකරවා පූජාකළාවූ රජ්ජුරුවෝ තම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 409 ගඩ්ගාමාල ජාතකය

තිවද අප්‍රතිවාදීවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි පෙහෙවස් රැකි උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේද? යත්;**

එක් උපාසකයෙක් පෙහෙවස් රැක සම්බුදුරජාණන්වහන්සේ ලඟ බණ අසා උන්නාහ. සම්බුදුරජාණන්වහන්සේ පෙර උත්තමයෝ යම්තාක් වේලෙකත් පෙහෙවස් රැක්කෝ වේදැයි වදාරා ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්,**

ඒවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුත් රාජ්‍යය කරණ සමයෙහි ඒ නුවර සුවිපරිවාර නම් සිවානකෙණෙක් ඇත්තාහ. උන්ගේ පරිවාරත් තමනුත් නිරන්තරයෙන් පන්සිල් රකිණාහ. පෝය අවසිල් රැක යටත්පිරිසෙයින් බැලමෙහෙකරන්නන් දක්වාත් පන්සිල් රකුවයි පන් සිල් රක්වන්නාහ, එසමයෙදි බොධිසත්ත්වයෝ එක්තරා දුක්පත් කුලයක ඉපද ඉන බඹ පැදගන්නා විවරකුත් නැතිව දවසරින්නාහු සුවිපරිවාර සිවානන්ගේ ගෙයි බැලමෙහෙකරන්වයයි කියා ආවාහ. සිවානෝත් බොධිසත්ත්වයන් දැක කුමට අවුදැ”යි විචාරා බැලමෙහෙකරන්ට ආම් කීකල්හි සිවානෝ බොධිසත්ත්ව යන් දැක උවමනා කෙණෙකැයි පන්සිල් රකුවයි නොකියාම මේ බැලමෙහෙ දෙවයි විධාන කළාහ. බොධිසත්ත්වයෝ එතැන්පටන් බැලන් ඇරගෙණ මේවර කරන්නාහ. එක් දවසක් සිවානෝ තමන්ගේ ගෙට විධානකරන්නාහු එම්බා සෙට අටවක පෝයය වේලාපසම බත්පිසකා අවසරව ඇමදෙනම පෙහෙවස් රකුවයි කියා විධාන කළාහ, බොධිසත්ත්වයෝ එබස් නොඇසූහ, උදැසනක් සේම තමන් කම්නනකරණ මේබිමට ගොස් කම්නන්ත කරන්නාහ, සිවානෝත් බොධිසත්ත්වයන් නොදැක එම්බල බැලමෙහෙකරණ තැනැත්තන් දුටුයේ නැතැයි කියා උන්ට බත් තබවයි කියා බත්තුබූහ. බොධිසත්ත්වයෝ කම්නනකොට ගෙට ආකල්හි බත්කවයි කියා බත්කන්වලූහ. බොධිසත්ත්වයෝ මෙතෙක් දවස් මේ වේලාවට මේ ගෙයි කන බොන අරගල බොහෝව නිබෙයි අද අරගලය කුත් නැතිව කනබොන කෙණෙකුත් නැතිව ඉන්ට කාරණා කිම්දැයි විචාළාහ. බත්ලන කෙලි කියන්නී අද අටවක පෝයනෙයින් ඇමදෙනම පේවූය්, එසේ නෙයින් වේලාපසම කා බී පෙහෙවස් රකිනාහයි කිව, බොධිසත්ත්වයෝ එපවත් අසා මේ වේලාවට පෝය ඇද්දැයි විචාරා රෑ තිස්පැය පෝය ඇතැයි යනු අසා සුවිමහපරිවාරසිවානන් කරා ගොසින් මම පෙහෙවස් රකිම්යි මා පෙහෙකරවා ලුව මැනවැයි සිවානන් අතින් අටසිල් ඇරගෙණ පේවස් ඉටාගෙණ වැදඔත් නාහ, දැවලුත් බත් නොකෑ හෙයිනුත් රෑ මධ්‍යමරාත්‍රි වේලාවට කසිලාක තම් රුජාවෙක් පහරින්ට වන, සිවානෝ එපවත් අසා මී හා විලඳ හා ඝකීරා එල යිතෙල් අනුභව කරවයි ගෙණගියාහ, බෝධිසත්ත්වයෝ මා දුකසේ රකිනා ශීලය අඩි දවසක මා සමාදන්වූයේය. මම මේ ඇම අනුභව නොකරම් නොකළාහ, රුජාවත් තරකොට ගන්වවන, සිවානෝත් චුතවන අවසථා නෙයින් වීථියෙහි පිලලවාපුවාහ, බරණැස් රජ්ජුරුවෝ පසුව දවස් මහත්වූ සේනාවාහනයෙන්

හා මහත්වූ ඓශ්වර්‍යයෙන් හුවරව පිවිත්වූවාහ. බොධිසත්ත්වයෝ රජ්ජුරුවන්ගේ ඓශ්වර්‍යය දැක එහි ලොභ ඉපදවූහ, ඒක්ෂණයෙහි ප්‍රාණය නිරුඬ විය. චුතිසුඛව ප්‍රාණය නිරුඬවූවා සමග අගමෙහෙසුන් බිසවුන්කුස පිළිසිඳ ගත්තාහු දසළුඬමසකින් වැදුවාහ, ඒ කුමාරයන්ට නම් තබන්නාහු උදය කුමාරයෝයයි නම් තුබූහ, ඒ රාජකුමාරයෝත් වැඩිවිය පැමිණ පියාණන්ගේ ඇවැමෙන් රාජ්‍යයට පැමිණියාහ. එක්දවසක් මතුමාල්තලයෙහි හිඳ තමන්වහන්සේ කළාවූ පින් දැක මෙසේවූ කුශලයක්කොට මෙසේවූ ඓශ්වර්‍යයක් ලදිමි උදන් අතා ඉන්නාසේක. ඒ නුවර උතුරුදිග දෙරටුපාලයා රත්‍රන් සතරවියවක් උපයාගත, දකුණුදිග දෙරටුපාලයාගේ අඹුන් එසේම රත්‍රන් සතරවියටක් සොයාගෙණ උතුරුදිග වාසල පවුරේ වළක් කැන නිධානකළහ. එක්වසක් නුවර උත්සවකෙළියක් ඇතිවිය, එවිට අඹුකියන්නී නුඹවහන්සේ අත යම් වස්තුයෙක් ඇත්තම් ඇරගෙණ විකොට උත්සව කෙළි කෙළුම්නයි කීන. එවිට දෙරටුපාලයා උතුරුදිග දෙරටුවේ රත්‍රන් සතර වියවෙක් නිධානකළෙමි ඒ ගෙණෙන්ටයෙමියි කණ මල්ගන්වාගෙණ දෙලොස් ගව්වක් දිග පළල ඇති නුවර හෙයින් වහ වහා යන්නේය, රජ්ජුරුවෝ මතු මාල්තලෙහි උන්නාහුය. දෙරටුපාලයා කණ මල්ගන්වාගෙණ යන්නාහු දැක රජ්ජුරුවෝ සිතන්නාහු මෙසේවූ තද අව්වේ කකියාගිය වැල්ලේ දෙලොස් ගව්වක් සමාධිව කිසි ආයාසයක් නැති කෙණෙකුන් මෙන් යන්නේය, මා මූ අතින් විචාරන්ට උවමැනවැයි ලඟ සිටි පුරුෂයෙකු කැඳවා කණ මල් ගන්වා ගෙණ සමාධි සමාධිව යන්නේය, ඒ පුරුෂයා කැඳවාගෙණ එවයිකියා යැවූහ. ඒ පුරුෂයාන් ගොසින් දෙරටුපාලයාට කියන්නේ සවාමි තොප කැන්දූසේ කැයි කීහ. එවිට දෙරටුපාලයා කියන්නේ සවාමි කුමට කැන්දූසේදැයි කීය. එසේදවුවත් ඒ ගිය පුරුෂයා කැඳවාගෙණ අවුත් රජ්ජුරුවන්ට පෑය. රජ්ජුරුවෝත් දෙරටුපාලයා දැක එම්බල දෙරටුපාලය තෝ ඉතා රත්වගියාවූ භූමියෙහි කකියන වැල්ලේ පය බිම ඔබාගත් නොහැකි මගයන්නාවූ තෝ ගී කිය කියා සමාධි සමාධිව කණ මල් එල්වාගෙණ යන්නේය. නට කවර සමාධියකින් පිණ පිණා යන්නෙහිදැයි විචාළහ. එවිට දෙරටුපාලයා කියන්නේ සවාමීනි මාගේ භාර්‍යාව උත්සව කෙළියක් කෙළුම්නයි කිව, එසේහෙයින් මාගේ නිධානයෙක් දකුණුදිගදෙරටුව කෙරේය. ඒ ඇරගෙණඑන නිසා යෙම් කීහ. කිමෙක්ද නිධානය රත්‍රන් ලක්ෂයකට ඇද්දැයි විචාළාහ, එසේ නැතැයි කීහ, පණස්දහසකට ඇද්දැයි විචාළාහ, එසේත් නැතැයි කීහ. එසේකල සතළිස් දහසකට ඇද්දැයි කීහ, එසේත් නැතැයි කීය. තිස්දහසකට විසිදහසකට ඇද්ද දසදහසකට ඇද්ද පන්දහසකට ඇද්දැයි විචාළාහ, එසේත් නැතැයිකීය. ක්‍රමයෙන් විචාරා දහසකට ඇද්දැයි විචාළාහ, එසේත් නැතැයි කීය. එසේකල නවසියයෙක්ද අටසියයෙක්ද සයිසියයෙක්ද පන්සියයෙක්ද සාරසියයෙක්ද තුන්සියයෙක්ද දෙසියයෙක්දැයි විචාළාහ, එසේත්නැතැයි කීය. එසේකල සියයෙක්ද අනූයෙක් අසූයෙක්ද සැත්තෑවෙක්ද සැටෙක්ද පණසෙක්දැයි විචාරා දසකලදෙක්දැයි කීහ. එසේත් නැත සවාමීනියි කීය. එසේකල පස්කලදෙක්ද සතරකලදෙක්ද තුන්කලදෙක්ද දෙකලදෙක්ද කලදෙක්ද දසකෙක්ද සය කෙක්ද තුනකක්ද අකෙක්දැයි විචාළාහ. එසේත් නැත සවාමීනියි කීය. එසේ කලවිසිවියවෙක්දැයි කීය, එසේත් නැත සවාමීනියි කීය. දසවියවෙක්දැයි කීහ.

එසේත් නැත සුවාමිනි කීහ. එසේකල මදටෙක්දැයි කීහ. එසේත් නැත සුවාමිනි කීහ, එසේකල සතරවියවෙක්දැයි කීහ, එසේය සුවාමිනි කීය, එවිට රජ්ජුරුවෝ කියන්නාහු රත්‍රන් සතරවියවක් නිසා දැන් සඟවිවක් ආයේවේද ඉදිරියෙත් සඟවිවක් ගියමනාවේද මම තව රත්‍රන් සතරවියවක් දෙමියි ඇර ගෙණ පළායවයි කීහ. ඒ රත්‍රන් සතරවියවත් ගණිමි මාගේ රත්‍රන් සතරවිය වත් ගණිමි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු මම රත්‍රන් අටවියටක් දෙමි ඇරගෙණ පළායවයි කීහ. එවිට කියන්නේ මේ රත්‍රන් අටවියටත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය, එවිට රජ්ජුරුවෝ කියන්නාහු මම රත්‍රන් සොළොවියවක් දෙමියි කීහ. මේ සොළොස්වියවක්ගණිමි, මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය, එසේකල රත්‍රන් අකක්දෙමි කීහ. මේ රත්‍රන් අකක් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය. එසේ වීනම් රත්‍රන් කලදක් දෙමියි කීහ. මේ කලදත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය, එසේකල දෙකලදක් දෙමි කීහ, මේ දෙකලදත් ගණිමි මාගේ රත්‍රන් සතර වියවත් ගණිමි කීය. එසේකල අටකලදක් දෙමි කීහ. මේ අටකලදත් ගණිමි මාගේ රත්‍රන් සතර වියවත් ගණිමි කීය, එසේවීනම් සොළොස් කලදක්දෙමි කීහ. මේ සොළොස් කලදත් ගණිමි මාගේ රත්‍රන් සතර වියවත් ගණිමි කීය, එසේකල දෙතිස්කලදක් දෙමියි කීහ. මේ දෙතිස්කලදත් ගණිමි මාගේ රත්‍රන් සතර වියවත් ගණිමි කීය, එසේවීනම් සැටසතරකලදක් දෙමියි කීහ. ඒ සැට සතර කලදක් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමියි කීය, එසේකල රත්‍රන් සියයක්දෙමියි කීහ, ඒ රත්‍රන් සියයත් ගණිමි මාගේ රත්‍රන්සතරවියවත් ගණිමි කීහ, එසේකල රත්‍රන් දෙසියයක් දෙමි, මේ රත්‍රන් දෙසියයත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීහ. එසේකල රත්‍රන් සාරසියයක් දෙමි කීහ, මේ සාරසියයත්ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමියි කීය, එසේකල රත්‍රන් අටසියයක් දෙමියි කීහ. මේ රත්‍රන් අටසියයත්ගණිමි මාගේ රත්‍රන් සතර වියවත් ගණිමියි කීය, එසේකල රත්‍රන් දැසක් දෙමි කීහ, මේ රත්‍රන් දැසන් දෙමින් මාගේ රත්‍රන් සතරවියවත් ගණිමියි කීය. එසේකල රත්‍රන් දෙදැසක් දෙමි. කීහ, මේ රත්‍රන්දෙදැසත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමියි කීය, එසේ කල රත්‍රන් සාරදහසක් දෙමියි කීහ, මේ රත්‍රන් සාරදහසත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය, එසේකල රත්‍රන් අටදහසක් දෙමි කීහ, මේ රත්‍රන් අටදැසත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය, එසේකල රත්‍රන් සොළොස්දැසක් දෙමි කීහ, මේ රත්‍රන් සොළොස්දැසත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය, එසේකල රත්‍රන් දෙතිස්දැසත් දෙමි කීහ, රත්‍රන් දෙතිස්දැසත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය, එසේකල රත්‍රන් සුසැටදැසක්දෙමි කීහ, මේ රත්‍රන් සුසැටදැසක් ගණිමි මාගේ රත්‍රන් සතරවිය වත් ගණිමි කීය, එසේකල රත්‍රන් එක්සියවිසිඅටදැසක් දෙමි කීහ, මේ රත්‍රන් එකසිය විසිඅටදැසත් ගණිමි මාගේ රත්‍රන්සතරවියවත් ගණිමි කීහ. එසේකල රත්‍රන් දෙලක්ෂතළිස්දැසක් දෙමියි, ඒ රත්‍රන් දෙලක්ෂ තළිස්දැසත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගනිමි කීය. එසේකල රත්‍රන් පන්ලක්ෂයක් දෙමි කීහ, මේ රත්‍රන් පන්ලක්ෂයත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගනිමි කීය, එසේකල රත්‍රන් දසලක්ෂයක් දෙමි කීහ. ඒ රත්‍රන් දසලක්ෂයත් ගණිමි මාගේ රත්‍රන් සතර විවක් ගණිමි කීය, එසේකල රත්‍රන් විසිලක්ෂයක් දෙමි කීහ, ඒ රත්‍රන් විසිලක්ෂයත් ගණිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමියි කීය, එසේවීනම්

රත්‍රන් සතළිස් ලක්ෂයක් දෙමි කීහ. මේ රත්‍රන් සතළිස්ලක්ෂයත් ගණිමි මාගේ රත්‍රන් සතර වියටත් ගණිමි කීය. එසේවිනම් රත්‍රන් අසූලක්ෂයක් දෙමි කීහ. මේ රත්‍රන් අසූලක්ෂයත් ගනිමි මාගේ රත්‍රන් සතරවියවත් ගණිමි කීය. එසේවිනම් රත්‍රන් අනූලක්ෂයක් දෙමි කීන. මේ රත්‍රන් අනූලක්ෂයත් ගණිමි මාගේ රත්‍රන් සතරවියටත් ගණිමි කීය. එසේවිනම් රත්‍රන්කෙළක් දෙමි කීහ. ඒ රත්‍රන් කෙළ ගණිමි මාගේ රත්‍රන් සතරවියටත් ගණිමි කීය. එසේවිනම් රාජ්‍යයෙන් කැබෙල්ලක් දෙමි කීහ, එවිට දෙරටුපාලයාත් යහපතැයි හිවිස්සේය. රජ්ජුරුවෝ ඔහු දැලිඅන්දම් තබ්බවා ඔහු ඉස් සෝදා නහවා සුළුඅදවා රාජ්‍යය කනුගස්වා දුන්හ. ඒ රාජ්‍යයත් තමාගේ රත්‍රන්සතරවියටත් තුබූ භාගය නොනැරහැර එසේනෙයින් අඞ්මාස රජ්ජුරුවෝයයි නම්තුබූහ. එතැන්පටන් උදයරජ්ජුරුවෝත් අඞ්මාසරජ්ජුරුවෝත් නොවෙනස්ව රාජ්‍යය කරන්නාහ. එක් දවසක් උයනට ගියාහ, උදය රජ්ජුරුවෝ අඞ්මාස රජ්ජුරුවන්ගේ කලව යෙහි ඉස තලා වැදහෙව නිදුපුවාහ අඞ්මාසරජතෙම මොහු මරාපියා රාජ්‍යය මම ඇරගණිමි රජ්ජුරුවන්ගේ ඉසකපාපියම්, සඩුව අතටගෙණ සිතන්නාහු මා රත්‍රන් සතරවියටක් පමණ වස්තු ඇති තැනැත්තහු මේ සා මහත් රාජ්‍යශ්‍රී යක පිහිටවූ තැනැත්තෝයයි සඩුවබිමතබා දෙවෙනිවත් තුන්වෙනිවත් ක්ෂමා කළමැතවයි කීහ. එවිට උදයරජ්ජුරුවෝ කියන්නාහු යාළු මටකළ වැරැද්දක් නැත. ක්ෂමාකරන්නේ කිම්දැයි කීහ, එවිට අඞ්මාස රජ්ජුරුවෝ තමන් කළ සැටිය කියා උදය රජ්ජුරුවන් ක්ෂමාකරවූහ, උදය රජ්ජුරුවෝත් එසේ කල රාජ්‍යය තොපම හැරගණුවයි කීහ, අඞ්මාස රජ්ජුරුවෝත් නොපගේ රාජ්‍යයෙන් මට ප්‍රයෝජන නැතැයි රජ්ජුරුවන්ට රාජ්‍යය පාවාදී වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූහ. උදය රජ්ජුරුවෝත් අඞ්රාත්‍රියෙහි පේවස්රැකි පමණකින් මේසා මහත් රාජ්‍යශ්‍රීයක් ලදිමියි මාගේයාළුවූ අර්ඛමාස රජ්ජුරුවෝත් තපසට පලාගියාහ, මම හිහිගෙයි සිටියෙමි ඇමවේලේම ගාථාවක් කියකියා ඉදිනාහ, බිසව් ගාථාවෙහිඅභිප්‍රාය අහන්නා කැමැත්තාහ, ඒ රජ්ජුරුවන්ගේ ගාංගාමාලුතම් නාඞ්‍යයෙක් ඇත්තේය, රජ්ජුරුවෝ එක්දවසක් බිසවුන්වකියන්නාහු ගඩ්‍රාමාලයා මාගේ ඇඟලොවිලා දැලිකපනවේලෙහි ඌ ඉල්වූ යම් වරයක් දෙන්ට අභිප්‍රාය නාසයේ ලොම් උදුරණ වේලෙහි ඉසකපන අභිප්‍රායයි කීහ බිසව් නාවිසයා කැඳවා කියන්නාහු ගඩ්‍රාමාලය අද පවන් රජ්ජුරුවන්වනන්සේගේ දැලිකපනකල පළමුකොට නාසයේ ලොම්උදුරා පසුව දැලිකපා ඇඟලොම් බාවාලුවිට රජ්ජුරුවෝ නොපව කොල නාකැමතිවරයක් ගණැයි කියති, එවේලෙහි සවාමීනි මට අනික් වරයකින් ප්‍රයෝජන නැත, නුඹ වහන්සේ කියත්නාවූ ගාථාවෙහි අර්ථ කිවමැනවැයිකියා කියවයි බිසව් උගන්වා ඇරිකල්හි නාවිසයාත් එක්දවසක් රජ්ජුරුවන්ගේද දැලි බාන්ට ගොසින් ආදි කොට නාසයේ ලොම් උදුරන්ට වන. එවිට රජ්ජුරුවෝ කියන්නාහු මේ කිමෙක්දැයි ආදිකොට නාසයේ ලොම් උදුරන්නේයයි කීහ. නාවිසයාත් කියන්නේ නාසා කම්මන්ත නම් අපූර්ව දත් දෙයක් කරන්නාහයි කියා ආදි කොටනාසයේ ලොම් හා පසුව දැලිය කපා ඇඟ ලොම්බැය, රජ්ජුරුවෝ සම ධිව තා කැමතිවරයක් ගණැයි කීහ. ගඩ්‍රාමාලයා සවාමීනි මට සෙසුවරයකින් කම්කැත, නුඹවහන්සේ ඇමවිට කිය කියා ඉදිනාවූ ගාථාවෙහි අර්ථ කිවමැන වැයි කීය. රජ්ජුරුවෝත් කුම්මාසපිණ්ඩ ජාතකයෙහි අර්ථ කිවාක්මෙන් ගාථා

වෙති අවි කියන්නාහු අඩිරාත්‍රියෙහි රැකි පෙහෙවස් ආනුභාවයෙන් මේ සා මහත් සම්පතක් ලදිමි මාගේ යාලුවූ අඩිමාස රජ්ජුරුවෝත් තපසට ගියාහුය. මම හිහිගෙයි සිටියෙමියි මේ ගාථාවෙහි අවියයි කීහ. ඒ ගඩගාමාල තාවිසයා එපවත් අසා හිමාලවනයට ගොස් සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව විදර්ශීතා වඩා සකල ක්ලෙශයන් නසා පසේබුදුවූසේක. පසේබුදුව බරණැස්නුවර උයනට ආවාහ, රජ්ජුරුවෝත් ගංගාමාලතම් පසේබුදුන්වහන්සේ උයනට වැඩිසේකැයි අසා මහාසේනාව හා සමග උයනට ගියාහ. රජ්ජුරුවන්ගේ මැනියෝත් උයනට ගියාහ. ගඩගාමාල තම් පසේබුදුන්වහන්සේ බ්‍රහ්මදත්තයෙනි, සැපසේ උනුදැසි විචාරා වදාළසේක. රජ්ජුරුවන්ගේ මැනියෝ ඇසි ගංගාමාලය තොපි පසේබුදුවගියයි ජාතිය පලානියේද මාගේ දරුවන්ට බ්‍රහ්මදත්තයයි කියන්නේ තෝ තාගේ විවර නොදනිදැයි බිසව් කියා කීහ. රජ්රුජුවෝ එලෙස නොකිව, මැනව මැනියන්වහන්ස උන්වහන්සේ සියළුකෙලෙසුන් නසා පසේබුදුව ගිය සේක උන්වහන්සේට ජාතියෙන් කම්කිම්දැයි මැනියන් අස්වැසූහ. සේනාවත් එලෙස දෙඩන්ට වන්හ. රජ්ජ්රුවෝ සේනාවත් අස්වසා තුමූ පසේබුදුන් වහන්සේට වැඳ වැතිරගියාහ. රජ්ජුරුවන් ඇතුළුවූ සියල්ලවුන්ම පසේබුදුන් වැඳ එකත්පස්ව සිටියාහ. එවිට රජ්ජුරුවෝත් සවාමීනි මාගේ මැනියන් වහන්සේත් නුවර වාසිනුත් නොදැන කී දෙෂයට ක්ෂමාකළ මැනවැයි ක්ෂමා කරවා ගත්හ. රජ්ජුරුවෝත් පසේබුදුන් වහන්සේත් රජ්ජුරුවන්ට අවවාද කියා කඳමූලක පබ්භාරයට වැඩිසේකැයි වදාරා මේ ගඩගාමාල ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි උදය රජ්ජුරුවෝ නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

## 410 චෙතිය ජාතකය

මේවද විතරාගී වූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දෙවදත්ත සථවිරයන් වහන්සේ පොළොව ගිලුණු කථාව අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්,**

ධර්මසභාවේ රැස්වූ මාළුවරුන්වහන්සේ දේවදත්තසථවිරයන් පොළොව පලාගෙණ නරකයට ගියේයයි කිය කියා වැඩඋන් තැනට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන්මතු නොවෙයි මහණෙනි පෙරත් දේවදත්ත සථවිරයන් පොළොව පලාගෙණ නරකයට ගියේයයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

මේ ප්‍රථම කල්පයෙහි මහාසම්මතය, රොජය, වරරෝජය, කල්‍යාණය, වරකල්‍යාණය, උපොසථය, මඛාතුය, වරමඛාතුය, වරය, උපවරයයි යන රජ දරුවෝ දසදෙනෙක් වූහ, ඉන් උපවර නම් රජ්ජුරුවන්ගේ පුත් චෙතිය නම්

රජෙක් චෙතිය රට සොළිය තම් නුවර රාජ්‍යය කරන්නේය, ඒ රජහුගේ කපිල තම් පුරෝහිත බ්‍රාහ්මණයෙක් ඇත. ඒ පුරෝහිත බ්‍රාහ්මණ මහවැඩයෙම් රජ්ජුරුවෙනි දිවපැන යා නොහෙමි, මව මින් කම්නැතැයි තුමූපැවිදිව පඤ්ච, භිඤ්ඤ අෂ්ටසමාපත්ති උපදවා උයනෙහි තාපසව වාසය කරන්නාහ, තමන්ගේ පුරෝහිත ධුරය අනික් කෙණෙකුන්ට නොසලස්වා තමන්ගේ පුතනුවන්ටම භාරකොට තපසට ගියාහ. කපිල තාපසයන්ගේ කෝරකලඹ තම් මලනු කෙණෙක් ඇත, රජ්ජුරුවන් හා කෝරකලඹයන් හා බාලදැ පවත් පුරුද්දහ, රජ්ජුරුවෝත් කෝරකලඹයාට කියන්නේ ඇයි තොපගේ බැනන්වහන්සේ සිටි පුරෝහිත ධුරයට තොපි සිටුවයි කීහ. එවිට කෝරකලඹයෝ අපගේ බැනන්වහන්සේ තාපසවූ පමණක්විනා තවන්වහන්සේ ධුරයට නොසැලැස්වූ සේක. ඉන් උන්වහන්සේ සැලසුවොත්විනාධුරයට සිටින්නේ කෙසේදැයි කීහා එවිට රජ්ජුරුවෝ කියන්නාහු තොප මම්වැනිමාළු කෙරෙමි, තොපගේ බැනන් තොපට බාලකෙරෙමියි කීහ, එවිට කෝරකලඹයෝ කියන්නාහු සවාමීනි, උන් වහන්සේ ප්‍රයෝග දන්නාසේක. නුඹවහන්සේට ආකාශයෙන් වැටෙන්නාසේ දක්වනසේක, පොළොව ගලන්නාසේ දක්වනසේක. ඊට භය නොගෙණ තරණේ සිටිනාසේක්විනම් යහපතැයි කීය. එවිට රජ්ජුරුවෝ කවර විස්මයෙක් පැවෝතිනුත් තරණේ සිටීම්. සැකයක් නොසිතවයි කීහ, ඒ කවර දවස්ද කියන්නේයයි විචාළේය, අදට සත්වෙනි දවස්යයි කීහ. මේ කථාව නුවර මුලුල්ලේ සැලව, අපගේ රජ්ජුරුවන්වහන්සේ අදට සත්වෙනි දවස් බොරුවක් කියන සේක්ල, බොරුනම් උල්ද, වවද, සතරැස්ද, නිල්ද, සුදුදැයි කියා නුවරවාසී මැසි පිට මැසි ලමින් ඒ ඒ තැන රැස්වූහ. තාපසයන්ගේ පුතනුවෝත් තාපසයන් ලඟවගොස් සෙවි රජ්ජුරුවන්වහන්සේ බොරුවක්කියනසේකැයිපියානන්වහන් සේට කීහ උන්වහන්සේත් උයනින් අවුත් ආකාශයේ වැඩසිටිසේක. රජ්ජුරු වෝත් සපිරිහරණයෙන් සැරසී ආකාශයෙහි සිටියාහ, තාපසයෝ කියන්නාහු මහරජ බොරු කීකල සතරදිග රැකගෙණ සිටිනා දෙවියෝ පලායන්නාහ, මෙලෝ පරලෝ දෙකින්ම අවැඩ පැමිණෙන්නේය, එසේ හෙයින් බොරු නොකියව මැනවැයි කීහ, තාපසයන් එසේ කීවත් රජ්ජුරුවෝ නුඹවහන්සේ බාලසේක. කෝරකලඹයෝ වැඩිමාළුයයි කීහ. එවිට සතරදිග රැකවල්ගෙණ සිටි දෙවියෝ සතරදෙන තමන් අතතුබූ කඩුසතර රජ්ජුරුවන් පාපිව දමා පලාගියහ, රජ්ජුරුවෝ ඒ දැක භයපත්ව කෝරකලඹයන් මූණබැලූහ, එවිට කෝරකලඹයා කියන්නේ ආදිම කියෙම්වේද නුඹවහන්සේ භයගන්නා නියා යෙනැයි කීහ. එවිව රජ්ජුරුවෝ තාපසයන්ට කියන්නාහු තාපසයන්වහන්ස නුඹවහන්සේ බාලසේක, කෝරකලඹයා වැඩමාළුයයි කීහ. එවිට තාපසයෝ කියන්නාහු මහරජ එකවිට කී බොරුවෙන් රැකවල සිටි දෙවියන් පලාගිය නියාව දුටුවාවේද දෙවෙනි බොරුවෙන් බිම්වැටී හුකුව මුඛයෙන්හමන මහතෙල් මල් සුවඳ තැතිව දුගඳ හමන්නාවූ ශරීරයෙන් අසුචි ගඳ හමන්නටවත, මේ දැකත් තොපට ප්‍රත්‍යක්ෂ නොවේද පළමුසේම සැබෑව, යෙහි සිටුව, බොරුකියා අවීචියට නොයවයි කීහ. ඒ අසා රජ්ජුරුවෝ කෝර කලඹයන් මූණබැලූහ. කෝරකලඹයා කියන්නේ නොබව මැනව, රජ්ජුරුවන් වහන්ස මේ මායමැයි කීහ, එවිට රජ්ජුරුවෝ කියන්නාහු තාපසයන් වහන්ස නුඹවහන්සේ බාලසේක, කෝරකලඹයා වැඩිමාළුයයි කීහ. එවිට රජ්ජුර

වන්ගේ දතදක්වා පොළොව ගැලපිය, එවිට තාපසයෝ කියන්නාහු මහරජ පළමුසේ සැබෑවයෙහි පිහිටා තොපගේ අනිච්ඡාධිය පළමුසේම වන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු මහාතාපසයන් වහන්සේ බාලයේක, කෝර කලඹයා වැඩිමාළුයයි කීන. එවිට උකුල දක්වා පොළොව ගැලපිය. එවිට තාපසයෝ කියන්නාහු මහරජ බොරුකිම නම් මෙලෝ පරලෝ දෙකින්ම අවැඩ සැලසෙන්නේය, බොරුකියන තැනැත්තවුට දරුවෝ ඇතිනොවන්නාහ, ඉදින් ඇතිවෙත්නම් ගැණුදරුවෝ ඇතිවන්නාහ. ඉදින් පිරිමි පුතෙක් ඇතිවී නමුත් නොකීකරුවන්නාහ, බොරුකියන තැනැත්තවුගේ මුඛයෙන් උපනුපත් ජාතියෙහි දුගීබව වැනෙන්නේය, බැලුවන්ට අනභිප්‍රාය වන්නේය, මහරජ සැබෑවයෙහි පිහිට පෙරසේම රාජ්‍යශ්‍රියෙහි පිහිටියමැනවැයි කීහ. එවිට රජ්ජුරුවෝ මේ තාපසයන්ගේ සෘඩියෙන්ම වන දෙකැයි සිතා කියන්නාහු තාපසයන්වහන්ස කෝරකලඹයා වැඩිමාළුය, නුඹවහන්සේ බාලයයි කීන. එවිට තතමත්ත දක්වා ගැලපිය, එවිට තාපසයෝ කියන්නාහු මහරජ බොරු කියා අවීචිනරකයට නොගොස් සැබෑවයෙහි පිහිටා නුඹවහන්සේ ඓශ්වර්‍යයෙන් නොපිරිහී පළමු රාජ්‍යශ්‍රිය විඳමැනවැයි කීහ. එවිටත් රජ්ජුරුවෝ කියන්නාහු නුඹවහන්සේ බාලයයි යන බසම කීන. එවිට සෙතෙහැති මවක පුතකු රත්පලසකින් වසාගෙණ යන කලක් පරිද්දෙන් අවීචිමහනරකයෙන් ගිනිකඳෙක් අවුත් රජ්ජුරුවන් වටකොටගෙණ අවීචිමහනරකයට ඇරගෙණ ගියේය. ඒ රජ්ජුරුවන්ගේ රාජකුමාරවරු පස්දෙනෙක් ඇත්තාහුය, ඒ පස්දෙනම එතනට ආවාහුය, ඒ තාපසයෝ රාජකුමාරවරුන්ට කියන්නාහු තොපි ඇම මේ නුවර නොසිටුවයි කියා වැඩිමාලු රාජකුමාරයන්ට කියන්නාහු මේ දිසාවට ගිය කල්හි අසවල් තැන ඇත්රුවෙක් ඇත, එතන නුවරක්කොටගෙණ ඉඳුවයි කීන. එහි වතාහි හස්තිපුර නම් වෙයි, දෙවෙනි රාජකුමාරයන්ට කියන්නාහු මේ දිසාවෙහි ගියකල අසරුවෙක් ඇත, එතන නුවරක්කොටගෙණ ඉඳුවයි කීහ. ඒ වතාහි අශ්වපුර නම් වෙයි, තුන්වෙනි කුමාරයන්ට කියන්නාහු මේ දිසාවේ අසවල් තැන සිංහ රුවෙක් ඇත තොපි එතන නුවරක් කරගෙණ ඉඳුවයි කීන. ඒ වතාහි සිංහපුර නම්වෙයි. සතරවැනි කුමාරයන්ට කියන්නාහු අසවල්තැන පර්වතයෙක් ඇත, ඒ පර්වතයෙන් වැටෙන්නාවූ ජලධාරා දඩ දඩයයි වැහිරෙන්නේය, තොපි ඒ ස්ථානයෙහි නුවරක් කොටගෙණ ඉඳුව, කීවයි ඒ නුවර දැඩර නම් නුවරවෙයි, පස්වෙනි කුමාරයන්ට කියන්නාහු තොපි මේ නුවර පස්කොටා කන්දක්කොට පවුරු ලවා මාලිගා ඉදිකොට වසවයි කියා යවූහ. කුමාරයෝ පස්දෙනත් තාපසයන් කී සැටියෙන් ඒ ඒ තැන නුවරකොට ගෙණ දූහැමෙන් සෙමෙන් රාජ්‍යය කොට කළුවූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදාරා මේ වෙතිය ජාතකය නිමවා වදාළසේක, එකල්හි වෙතිය රජ්ජුරුවෝ නම් දෙවදහසථවිරයෝය, කපිළ තාපසයෝ නම් බුදුවූ මම්ම යයි වදාළසේක.

---

## 411 ඉන්ද්‍රිය ජාතකය

තවද චිතඥෙෂවූ සම්බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් ස්ත්‍රියක් කෙරේ පිළිබඳ සිත් ඇති භික්ෂු-කෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදී.

**ඒ කෙසේ ද? යත්,**

එක් කෙළෙඹි පුත්‍රයෙක් ඉතා වැඩ අවසථාවෙහි මහණවෙමියි සම්බුදුරජාණන් වහන්සේ කරා ගොස් මහණවන අභිප්‍රාය ඇත්තෙමියි කීය. සම්බුදුරජාණන්වහන්සේත් තුලූ මහණකරවයි එක්කෙණෙකුන් වහන්සේට භාරකළසේක. උන් වහන්සේත් ඒ කෙළෙඹි පුත්‍රයා මහණකළසේක. ඒ මහණ භික්ෂූන්වහන්සේ හා සමග දන්වළඳන්ට ගියකල සෙසු භික්ෂූන්වහන්සේට යහපත් අසුන් පණවන්නාහ. මේ භික්ෂූන්වහන්සේට එක්විවර කොළොඹුවක් හා පුටුවක් ලන්නාහ කැඳ පිළිගන්වනකල සැන්දෙන් උළුහැලීගිය සැළිපත්ලේ තිබුකැඳ වත් කරන්නාහ, අවුළුපත් පිළිගන්වන කලත් කැඩිකැඩී ගිය පොඩි පිළිගන්වන්නාහ, බත් පිළිගන්වන කල දඹකඩ මඩුබත් දෙන්නාහ. එයින් යපෙන විවරව තොලබන්නාහ, මෙසේ විඳ තමන්ගේ පුරාණ දූනිකාව වසන්නාවූ ගෙට යන්නාහ, ඒ දූනිකාවන් පාත්‍රය බලා යනපත් බත් මැළි පිස වලඳවන්නීය, ඒ මහණන් දවස්පතා ආසාව පිස වළඳවන බතෙහි ආසාතෘෂ්ණාවෙන් නිරන්තරම ඒ ගෙට සිහා එනසේක. ඒ ස්ත්‍රී මුන්වහන්සේ මා කෙරේ ඉතකම් ඇතිසේක්අෙහෝයි පරීක්ෂාකරන්ට උවමැතවැයි පුරුෂයන් සතර දෙනෙකුට අමුතු බතක් දෙම් උන් ඇමතන් ගෙයි රඳවා තොමෝ පිසන ගෙයි වටතිරයක් බඳවා කැවුම් පිසන්නීය, ඒ වේලාවට ඒ භික්ෂූන්වහන්සේ සිහා වැඩිසේක. උන්වහන්සේට අරුණු කිහ, උන් අරුණු කීවත් නොයනසේකැයි කීහ, දෙවෙනිවත් තුන්වෙනිවත් අරුණු කීවත් නොයන හෙයින් නොදන්නා කෙණෙකුන් මෙන් තිරය ඉවත් කොට එලියට අවුත් අපගේ දරුවන්ගේ පියාතන් වහන්සේයයි කියා ගෙට වඩාගෙණවුත් උන්වහන්සේ වඩා ඉඳුවා දන්වළඳවා කියන්නාහු නුඹවහන්සේ මහණව ගියසේක. ස්ත්‍රීතම් කණවැන්දඹුව ඉදිනා කල ඉතා අඵාසුව මා කැඳවා පිටිසරින් ආවාවූ පුරුෂයො මූ ඇම සිටිනෝය, නුඹවහන්සේ දහවිවක් මාගේ ගෙව වඩිනාසේක. එසේ හෙයින් අන් පුරුෂයෙක් මෙතනට එන්ට නොසිතන්නාහ, මේ පුරුෂයන් හා සමගවම පිටිසරයෙමි, නුඹවහන්සේ ගිහිකල මා කී කළ දෙයක් ඇත්නම් සමාකළ මැනවැයි නුඹවහන්සේ රකිනා ශීලය යහපත් කොට රැක්ක මැනව මම පිටිසර යෙමි, එවිට භික්ෂූන්වහන්සේ එබස් අසා ලෙන් ඇතිගිය ගියක් මෙන් මහත්වූ ශොකයට පැමිණ මම තොප ඇර වාසය කළ නොහෙමි මේ මාගේ තුන්සිවුරු පාත්‍රා ගුරුන්වහන්සේට දෙන්ට යෙමි මම අසවල් තෙනදී සිවුරු අරිමි, එතනට පිළිඝඅලක් එවයි කියා ගුරුන්වහන්සේට පාත්‍රා සිවුරු දෙන්ටයයි විහාරයට ගොසින් ගුරුන්වහන්සේට තමන්වහන්සේගේ පාසිවුරු අරගන්ට කීසේක. ගුරුන්වහන්සේ ඇසි කුමක්නිසාදැයි විචාළසේක, ඒ භික්ෂූන්වහන්සේ කියනසේක් මම මාගේ පුරාණ දූනිකාව ඇර වාසය කළ නොහෙමි, මට ශාසනයෙන් ප්‍රයෝජන නැත, සිවුරු අරිමි කීහ. එවිට උන්වහන්සේවත් ගුරුන්වහන්සේ උන්වහන්සේ නොකැමති කරවාම සම්බුදුරජාණන්වහන්සේව දැක්වූසේක. සම්බුදුරජාණන් වහන්සේ ඇසි මේ මහණහු නොකැමැතිකරවා

අපට පෑයේ ඇයිදැයි විවාළ කල්හි **සවාමීනි** මේ මහණ තමාගේ පුරාණ දූනිකා කෙරේ අභිලාෂයෙන් සිව්රු අරිමිසි කීහයි වදාළසේක. **සම්බුදුරජාණන්වහන්සේ** දැන්මතු නොවෙයි පෙරත් මේ මහණ මේ ස්ත්‍රිය නිසා ධ්‍යානයෙන් පිරිහී ප්‍රාණ විනාශයට පැමිණි තෙතැන්තවුට ප්‍රාණ රැකදුනුමෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

**ඉ**ටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ රජ්ජුරුවන්වහන්සේගේ පුරෝහිත බ්‍රාහ්මණයාට පුත්ව උපන්නාහ. උන් උපන් දවස් රාත්‍රියෙහි නුවර මුළුල්ලෙහි ආයුධ දිලිහී ගියේය. එසේහෙයින් උන්ට නම් තබන්නාහු ජෝතිපාල කුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයන් වැඩිවිය පැමිණ තක්සලා නුවරට ගොස් ශිල්ප ඉගෙණ රජ්ජුරුවන්ට ශිල්ප දක්වා පුරෝහිත ධුරයට පැමිණ මව ගිහිගෙයින් කාරිය නැත, තපසව යෙමි. උතුරුවාසල් දෙරකඩට නික්ම ගිවුළුවතයට ගොස් සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ජෝතිපාල තාපසයෝයයි මේ නම්න් ප්‍රසිඩව පංචාභිඥ අෂ්ටසමාපත්ති උපදවා වාසය කරන්නාහු බොහෝ දහස්ගණන් තාපසවරුන්ට ගණශාස්තෘව පිරිවරා ඉන්නාහ. උන්ගේ අතවැසි ශ්‍රේෂ්ඨවූ තාපසවරුන් සත් දෙනෙක් ඇන්නාහ. ඉන් සාලිස්සර නම් තාපසයෝ තමන්වසන්නාවූ ගිවුළුවතයෙන් නික්ම සිරඹත නම් ජනපදයෙහි සාඥේදිකා නම් ගඩිගාව සමීපයෙහි සියදහස්ගණන් තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ. දෙවෙනි මෙණ්ඩිස්සර නම් තාපසයෝ පජරඤ්ඤු රජ්ජුරුවන්ගේ විජිතයෙහි ලම්බවුලක නම් නියම් ගම නිසා සියදහස්ගණන් තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ, ඉන් පසිත නම් තාපසයෝ චතුන්නතරයෙක ජනපදයක් නිසා සියදහස්ගණන් තාපස වරුන් පිරිවරා වසන්නාහ. කාලදේවල තපස්විවහන්සේ අවන්ති නම් රට දක්ෂිණාපථයෙහි සියදහස්ගණන් තාපසවරුන් පිරිවරා වාසය කරන්නාහ. කිසවච්ඡ නම් තාපසයෝ දණ්ඩකී නම් රජ්ජුරුවන්ගේ කුම්භවතී නම් නුවර නිසා උයනෙහි එකලාව වාසය කරන්නාහ. අනුසිෂ්‍ය නම් තාපසයෝ බොධි සත්ත්වයන්ට උපස්ථායකව සමීපයෙහි වාසය කරන්නාහ. කාලදේවල තාපස යන්ගේ මල්වූ නාරද නම් තපස්වී මධ්‍යදේශයෙහි ආරඤ්ඤගිරි නම් පසිතප්ව ලානන්තරයෙහි එක් ගල්ගුහායෙක උදකලාව වාසය කරන්නාහ. ආරජගිරිනම් පසිතය සමීපයෙහි බොහෝ මනුෂ්‍යයන් ගැවසීගාන්තවූ එක් නියම්ගමෙක් ඇත. ඒ පසිතයවත් ගමටත් අතුරෙහි එක් ගංගාවෙක් ඇත, ඒ ගංගාවට ජලස්තාතය පිණිස බොහෝ මනුෂ්‍යයෝ බස්නාහ, උතුම් රූ ඇති ඝටවෙටිකාවෝත් පුරුෂ යන් පොළඹවමින් ඒ ගංතෙර ඉඳිනාහ. එකල නාරද නම් තාපසයෝ ඉන් එක් කුම්භදාසියක් දැක ඇ කෙරේ පිළිබඳවූ සිත් ඇතිව ධ්‍යානයෙන් පිරිහී නිරාහාරව වීරියකෙරෙමින් ක්ලේශවසඟයට පැමිණ සතියක් වැදනොත්නාහ, එකල ඒ තාපසයන්ගේ කාලදේවල නම් තාපසයෝ දිවසින් පරීක්ෂාකොට ඒ කාරණ දැන ආකාශයෙන් අවුත් නාරද නම් තාපසයන් උන් ගල්ලෙනට වන්නාහ, නාරද නම් තාපසයෝ බැනන් දැක පින්වතානන්වහන්ස කුමක්

පිණිස ආසේක්දැයි කිහ. එබසට කාලදේවල තාපසයෝ කියන්නාහු පින්වත් වූ තොප අතාථනියාව දැක පොප රක්නා පිණිස ආමි කිහ. එබසට නාරද තාපසතෙම පින්වත් තෙම සිල්වූ අවස්තුකවූ බොරුකියන්නේය, තුමූ බොරු වෙන් තාපසයන් තැතිගැන්නූහ. එසේද වුවත් කාලදෙවල තාපසයෝ මොහු ඇරපීම් කොවටනේයයි සාලිඝර තම් තාපයන්ද මෙණ්ඩිඝර තම් තාපස යන්ද පණිතඝිඝ තම් තාපසයන්ද යන තාපසවරුන් තුන්දෙනා ගෙන්වූහ. නාරද තාපසතෙම ඔවුන් තුන්දෙනා දැකත් මුසාවාදයෙන් තැතිගැන්වූයේය. තවද කාලදේවල තාපසයෝ ආකාශයෙන් ගොස් සරභඞගඝාඝානන්වහන්සේ කැඳවාගෙණ ආහ. උන්වහන්සේ නාරද නම් තාපසයන් දැක උන් ඉන්ද්‍රිය වසඟයට පමිණියා දැන ඉන්ද්‍රිය වසඟයට පැමිණියෙහිදැයි විචාරා ඔහු විසින් එබස් අසමින් හුනස්නෙන් නැගී වැඳ සවාමීනි දැන්වූ කල්හි එම්බල නාරදය ඉන්ද්‍රිය වසඟයට ගියාවූ සත්ත්වයෝ ඒ ආත්මභාවයෙහි වියලෙමින් මතු මත්තෙහි මනත්වූ දුක් අනුභවකොට දෙවෙනි ආත්ම භාවයෙහි නරකයෙහි උපදනේ වේදැයි විදුරා ධම්දෙශනා කරන්නාහු එම්බල නාරදය මේ ලොක යෙහි යම් පුරුෂයෙක් තෙම රූපාදියෙහි සුහවූ ශෝකයෙන් දුකට පැමිණෙන්නානයි ධම්දේශනා කළසේක. එබස් අසා නාරද තාපසයෝ ආචාරීන් වහන්ස කාමයෙහි යෙදීමතම් සැප වන්නේය, එවූදුවූ සැපයක් කුමක් පිණිස දුකැයි කියනසේක්දැයි විචාළාහ. සරභඞඝ ශාස්තෘන්වහන්සේ එසේවිනම් නාරදයෙනි අසවැ කියන්නාහු එම්බා නාරදයෙනි මේ ලෝකයෙහි සැපයට අනතුරුවූ දුකකුත් ඇත. දුකට අනතුරුවූ සැපයකුත් ඇත. ඒ කවරේදැයි යතහොත් යම් සත්ත්වයෙක් සුවල්පවූ කාමසැපය පිණිස නරකයෙහි උපද නේය, සමහර සත්ත්වයෙක් ශිල්රක්ෂා කරණ අවස්ථාවෙහි විදර්ශිතා කම්ස්ථාන වැඩීමෙන් මිරිකි දුක්විඳ සිල් රක්ෂාකොට ඒ ශීල බලයෙන් යවකියන ලද බොහෝ දිව්‍යමනුෂ්‍ය සම්පත් හා නිර්ාණ සැපයට පැමිණෙන්නාහ. එසේ හෙයින් නොපි දුකබවූලිකවූ කාමසැපය හැර දිව්‍යලෝක සම්පත් හා නිර්ාණ සැපයට පැමිණෙන්ට නිසිවූ සිල් රක්ෂා කොට ධ්‍යාන සැප ප්‍රාර්තනා කරවයි කිහ. එවිට නාරද තාපසයෝ කියන්නාහු ආචාරීන් වහන්ස, මේ දුකබය ඉතා සහනය කොටගත නොහැක්කේය, එසේ හෙයින් මම සහනය කළ නොහෙමි, සහනය කොවිගත නොහැක්කේය, එසේ හෙයින් මම සහනයකළ නොහෙමි කිහ. ඉක්බිති බොධිසත්ත්වයෝ කියන්නාහු නාරදයෙනි දුකක් නම් උපන් කය ඉවසියයුතුයයි ධම්දෙශනා කරන්නාහු මෙසේ කියත්. එබා නාරදයෙනි යම් සත්ත්වයෙක්තෙම කායිකවූද චෙතසිකවූද දුකැයිකියනලද කවයුත්තක් උපන් කල්හි අප්‍රමාදවම ඒ කවයුත්ත හරණවූ උපාය කරන්නේය, සහනසීලිවූ ඒ කවයුත්තට අනුව නොපැවත ඒ ඒ උපායෙන් ඒ කවයුත්ත මැඩ විනාශයට පුමුණුවා නුවණැත්තාවූ පුරුෂයා අකෘත්‍යයාගේ අන්තිමයයි කියනලද ධ්‍යාන සැපයට පැමිණෙන්නේය. එසේ පැමිණෙතත් නොමිරිකි පැමිණෙන්නේයයි කිහ. නැවත නාරද තාපසයෝ ආචාරීන්වහන්ස කාමසැපය නම් උතුම්වූ සැපයෙක එසේවූ සැපය මම අල නොහෙමි කිහ. නැවත බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බා නාරද තාපසයෙනි වස්තුකාමයෙහි ප්‍රාර්තනා පිණිස ධම්ය හැරවීම සුදුසු නොවන්නේය, අනර්ථයක් උපන් කල්හි ඒ අනර්ථය වලකනු කැමැත්තේ අවැඩව සිටියාවූ ධම්ය ඇරපීම සුදුසුවන්නේය. තවද අසවල් අනර්ථයෙක් මව උපන්නේයයි මෙසේ අනර්ථය පිණිසත් සුදුසුනොවන්නේයයි ව්‍යායාම් කිරීමෙන් මුදුන් පැමිණෙනලද ධ්‍යානසැපය ඇරපීම නසාපීම සුදුසු

නොවන්නේය, යනාදීන් මේසේ සරහංඟ ශාස්තෘන් විසින් ගාථා සතරකින් ධර්මදේශනාකළ කල්හි කාලදේවල තාපසයෝත් තමන්ගේ මලනුවන්ට අවවාද කරන්නාහු එමබා නාරදයෙනි යම ගෘහපතියෙක් කෘෂිවණික් ආදීවූ වස්තු උපදවන පිණිස යම් දුකක් ගන්නේවීනම ඔහු විසින් ගන්නාවූ දුක දුකෙක් නොවන්නේය, යහපත්ම වන්නේය, එසේම උපයා ගත්තාවූ වස්තුව ශ්‍රමණ බ්‍රාහ්මණ පුත්‍රකලත්‍ර මිත්‍රාදීන්ට සංවිභාගකොට පරිත්‍යාග කිරීම, දුක් නොවන්නේය. යහපත්මවන්නේය, එසේවූ වස්තු ලැබීමෙහි උඩඟු නොවීමත් යහපත් වන්නේය, එසේ වූ අර්ථයාගේ විපත්තියෙහි ශෝක නොකිරීමත් යහපත් වන්නේය, එසේහෙයින් නාරදතාපසයෙනි තොපි මාගේ ධ්‍යානපිරිහුනේයයි සෝකනොකරව, ඉදින් තොප ඉන්ද්‍රියවසඟයට නොගියා නම් නවුවාවූ තොපගේ ධ්‍යානය නැවතත් ප්‍රකෘතිවන්නේයයි කීහ. මෙසේ කාලදේවල තාපසයෝ නාරදතාපසයන්ට අවවාද කී නියාව තථාගතවූ සර්ව්ඥයන් වහන්සේ බුදුව වැඩ ඉඳ වදුරණසේක් එමබා මහණෙනි ඒ කාලදේවලතාපසතෙම මෙසේ මේ මහණ අවාදයක් කීද යම් සත්වයෙක්තෙම ඒ අවවාදය පිළිනොගෙණ ඉන්ද්‍රියයන්ගේ වසඟයට පැමිණියේවීනම් ඒ සත්වයාට වඩනාවූ ලාමක සත්වයෙක් නැත්තේ වේදැයි වදුළසේක. ඉක්බිති සරහඟ ශාස්තෘන් වහන්සේ වදුරණසේක් වේදැයි වදුළසේක. ඉක්බිති සරහඟ ශාස්තෘන්වහන්සේ වදුරණසේක් මෙසේ එව නාරද තාපසයෙනි මා කියන්නක් අසව යම්සත්වයෙක්තෙම පළමුව කළමනා කවයුත්තක් නොකෙරේද එසේවූ සත්වතෙම වල්වන්නාවූ මාතවක යක්හුමෙන් සෝකගන්නේය, අඩන්නේය, වළපින්නේයයි කීය, මින් තවද පෙරවූවක් කියන්නාහු එම්බා, යටගිය දවස කසීනම් නියම් ගමෙක තරුණවූ එක් බ්‍රාහ්මණ කුමාරයෙක් විශිෂ්ටවූ රූ ඇත්තේය, ඇත්බල ඇත්තේය, එක් දවසක් ඒ පුරුෂතෙම සිතන්නේ කිමෙක්ද මා විසින් සීසැම ආදිකොට දෙමව් පියන් විසින් පෙළෙන ලද්දෙමි, එසේහෙයින් මට දෙමව්පියන්ගෙනුත් ප්‍රයෝජන කිම්ද, පුත්‍රදාරාවන්ගෙනුත් මට ප්‍රයෝජන කිම්ද, දන්පින් කිරීමෙනුත් මට ප්‍රයෝජන කිම්ද, එසේ හෙයින් කිසිකෙණෙකුත් පොෂ්‍යයක් නොකොට පිණකුත් නොකොට වලවවැද මුවන් මරා කාගෙණ තමාදිවරක්ම පෝෂ්‍ය කෙරෙමියි සිතා පඤ්චායුධයෙන් සන්නඬව ගෙණ හිමාලයවනයට වැද නොයෙක් මෘගජාතීන් මරාකාගෙණ හිමාලය මධ්‍යයෙහි වැන්දඹු නම් ගංතෙර ගලින් වටකරණ ලද පළිත ජාලාවකට පැමිණ මුවන් මරා අහුරෙහි පැළහු මස් කමින් වාසය කරමින් එක් දවසක් සිතන්නේ ඇමැදූ ශක්ති සම්පන්නයෙමි, නොවෙමි, දුර්ලකාලයෙහි ඇවිදගත නොහෙමි, එසේ හෙයින් දැන්ම නොයෙක් මෘගජාතීන් මරා ඇරගෙණ පළිත ජාලයෙහි ඇතුළෙහි ලා දොරක් ඉදිකොට අගුළු ලා මුවන් මරවාගෙණ වතයෙහි නො ඇවිදිම අභිප්‍රාය වූ පරිද්දෙන් මෘග ජාතීන් මරාකම් සිතා එපරිද්දෙන්ම වාසය කරමින් කල්යාමකින් ඔහු විසින් කරණ ලද අකුශල කර්මය මුදුන්පැමිණෙන්නේය, ඉහජාතියෙහිම දෘෂ්ටධර්ම වේදනයෙහි පැමිණියේය, තමාගේ අතපයත් නොලද්දේය, ඇතින් මැත පෙරළී ගතත් නොගන්නේය, කිසි කෑමක්පීමක් වේවයි නොදන්නේය, ශරීරය ඉතා මලානිකවූ දුර්වල වූයේය, නොමියම මනුෂ්‍යප්‍රේත වූයේය, නියඟෙහි පොළොව පැළෙන්නාක්මෙන් ඔහුගේ ශරීරය ඒ ඒ තැනින් පැලී ඉරා වැටුනේය, මෙසේ කල්යාමකින් සිවිනම් රට සිවිනම් රජ්ජුරුකෙණෙක් වලට වැද අහුරු පැළහු මස්කම් කියා අමාත්‍යයන්ව රාජ්‍යය පාවාදී පඤ්චායුධ සන්නඬව වලට වැද මුවන්

මරා මස් පළහා කමින් පළිතජලානන්තරයට පැමිණ ඒ පුරුෂයා දැක භයින් තුස්තව ඛෙදී උපදවාගෙණ එම්බල පුරුෂය තෝ කවරෙක්හිදැයි විවාළාහ, ඒ කියන්නේ සවාමිනි මම මනුෂ්‍යප්‍රේතයෙකිමි, මා විසින් කරණලද අකුශල කර්මයාගේ විපාකය ඉතාත්ම භාවයෙහිම අනුභවකෙරෙමි, තොපි වනාහි කවුරුදැයි විවාළේය, රජ්ජුරුවෝ මම සිවි තම් රජ්ජුරුවෝයයි කීහ. නැවත ඒ පුරුෂයා එසේකල කුමක් පිණිස මේ සථානයට අවුදැයි විවාළේය, මුවන්මස් කන පිණිස ආමිසි කීහ. නැවත ඒ පුරුෂතෙම කියන්නේ රජ්ජුරුවෙනි මමත් ඒ කරණකොටගෙණ මේ සථානයට අවුත් මනුෂ්‍යප්‍රේතවීමි, යනාදීන් තමාගේ ආද්‍යන්ත රජ්ජුරුවන්ට විස්තර වශයෙන් කියන්නේ රජ්ජුරුවන් වහන්ස මම මේ ලොකයෙහි ඓශ්වර්‍ය දෙන්නාවූ කටයුතු කොට ශිල්පශාස්ත්‍ර නොහිගෙණ උපායෙන් වස්තු නුපදවා ආවාහ විවාහ කොට ශිල් රක්ෂා නොකොට මාගේ ක්‍රියා වලක්වන්ට සුදුසුවූ කල්‍යාණමිත්‍රයන් හජනය නොකොට මෙසේ යස දෑයකවූ ලෝකධර්මයට නින්දුකොට හැර මේ වනයට වැද මට සැප කැමතිව අනුන්ට දුක් දීමෙන් ඉතාත්මභාවයෙහිම මනුෂ්‍යප්‍රේත වීමි, තොපි වනාහි අකුසල් නොකොට තොපගේ සිය නුවරට ගොස් දානාදී කුසල්කරවයි කීයේය. රජ්ජුරුවෝ ඔහු කිබස් යහපතැයි හිවිය සිය නුවරට ගොස් දානාදීවූ කුසල් කොට සවගීර්ත්පත්තියට ගියහයි යනාදීන් මේ කාරණය ගෙණහැර දක්වා තාපසයන් සත්හිඳුවූහ. තාපසයෝ සරහඬග ශාස්තෘන් වහන්සේගේ කථාවෙන් සංවේගයට පැමිණ වැද ක්ෂමාකරවා ගෙණ කිසුණු පිරියම්කොට නවුවාවූ ධ්‍යානය උපදවා ගත්හ. සරහඬග ශාස්තෘන්වහන්සේ ඒ තාපසයන් එතන රැඳියනොදී කැඳවාගෙණ තමන් වහන්සේගේ ආශ්‍රමයටම වැඩිසේක. මෙසේ බුදුරජාතන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මේ ඉන්ද්‍රිය ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර ශාසනයෙහි උකටළිවූ භික්ෂූන් වහන්සේ සෝවාන් ඵලයෙහි පිහිටිසේක. එසමයෙහි නාරද තාපසයෝ තම් දැන් මේ ශාසනයෙහි උකටලී මහණය, එසමයෙහි සාලිස්සර තාපසයෝ නම් දැන් මේ ශාරිපුත්‍රස්ථවිරයෝය, එසමයෙහි මෙණ්ඩිස්සර තාපසයෝ තම් දැන් මේ කාශ්‍යපස්ථවිරයෝය, එසමයෙහි පර්‍වත තාපසයෝ නම් දැන් මේ අනුරුඬස්ථවිරයෝය, එසමයෙහි කාලදේවල තාපසයෝ තම් දැන් මේ කාත්‍යායන ස්ථවිරයෝය, එසමයෙහි අනුශිෂ්‍ය තාපසයෝ තම් දැන් මේ ආනන්දස්ථවිරයෝය, එසමයෙහි කිසවච්ඡ තාපසයෝ නම් දැන් මේ මෞද්ගල්‍යායන ස්ථවිරයෝය, එසමයෙහි සරහඬග තාපසයෝ නම් ලොව්තුරා බුදුවූ මම්මවේදැයි වදාළසේක.

# 412
# ආදිත්ත ජාතකය

තිවද ලොකත්‍රයට ප්‍රදීපයක් බඳුවූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොසල රජ්ජුරුවන්ගේ අශ්වදෘත දූතයෙක් අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි විස්තර වශයෙන් මහාගෝවින්ද ජාතකයෙහි පෙණෙන්නේය, මෙහි වනාහි කෝසලරජ්ජුරුවෝ ක්ෂත්‍රිය දූතම දූතය දුන්නාය, දන් දුන් නියාව ඉතා යහපතැයි දම්සභාවේ රැස්වූ භික්ෂූන්වහන්සේ කිය කියා වැඩ උන් තෙනට සම්බුදුරජාණන්වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නාව පූර්වභාග යෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි පෙර උත්තමයෝත් ක්ෂත්‍රිය දූතම දන්දුන්නෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

පිටගිය දවස සිවිරට විරන්ද නම් නුවර හරතනම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි රජ්ජුරුවන්ගේ සමුද්‍රවිජයානම් අග්‍රමහෙසිකා කෙණෙක් ඇත්තාහ, ඒ රජ්ජුරුවෝත් ඒ බිසවුත් බොහෝ දුගී මගී යාචක යන්ට දන්දෙන්නාහ. දන්දී එක්දවසක් බිසවුත් රජ්ජුරුවෝත් එකතැන ඉඳ කියන්නාහු මෙතෙක් දෙන්නාවූ දූතය නිසිතෙනකට දෙන්ට නොලබම්හ. අප සිතට සමාධියක් නොවන්නේයයි කිහ. බිසව් කියන්නාහු මම දන් ඉදිකරවම් නුඹවහන්සේ පසේබුදුන්වහන්සේ වඩනා නියායෙන් ආරාධනාකළ මැනැවැයි කිහ. රජ්ජුරුවෝ කෙසේ ආරාධනා කෙරෙම්දැයි කිහ, මල් සතරම්වක් ඇර ගෙණ නැගෙණහිරට දමා ආරාධනා කළමැනවැයි කිහ. ඒ දිග පසේ බුදුන් වඩන්සේ නැති හෙයින් නොවැඩිසේක. පසුව දවස් දකුණු දිගට මල්දමා ආරාධනා කළහ, ඒ මල් නන්දමුල දිගත් පසේබුදුන්වහන්සේ නැති හෙයින් නොවැඩිසේක. තුන්වෙනි දවසුත් බස්නාහිරට මල්දමා ආරාධනා කළහ. ඒ දිග පසේබුදුන්වහන්සේ නැතිහෙයින් නොවැඩිසේක. සතරවෙනිදවස් උතුරු දිගට මල් සතරම්වක් දමා ආරාධනා කළහ. ඒ මල් නන්දමුලක පබ්භාරයට ගොස් පන්සියයක් පසේබුදුන්වහන්සේ වඩනා තැනට ගොස් වැගිරිණ, පසේ බුදුන්වහන්සේ මේ කාරණය දැක දිවසින් බලා හරත රජ්ජුරුවෝ අපට ආරාධනා කරන්නාහයි කියා පසේබුදුන් සත්දෙනෙකුන්වහන්සේ තෝරා භාරත රජ්ජුරුවන්ගේ ආරාධනාවට ගොස් සිඟවයි යවූසේක. උන්වහන්සේලා සත්දෙනා වහන්සේත් ගැටවටුගන්වා ආකාශයෙන් අවුත් රජ්ජුරුවන්ගේ රජමෙයි සම්පයෙහි සිඟාවැඩසිටිසේක. රජ්ජුරුවෝත් පසේබුදුන්වහන්සේලා දැක ප්‍රීතියෙන් පිණා දන්දී පසුව දවසවත් ආරාධනාකොට ඒ දවසුත් දන්දී සත් වෙනි දවස් දක්වා දන්දී ඉක්බිති සත්දෙනාවහන්සේට ශ්‍රමණ පරිෂ්කාර ඉදිරියෙහි තිබූහ. උන්වහන්සේලාත් ශ්‍රමණ පරිෂ්කාර පිළිගෙණ වඩනා පසේබුදුවරයන්වහන්සේලාගෙන් පළමුවඩනා පසේබුදුන්වහන්සේ රජ්ජුරුවන්වහන්සේට අනුමෙවෙනි බණ වදාරණසේක් ගාථා දෙකක් කීසේත. මහරජ යම් ගෙයක් ගිනිවැදගත්කළ ගෙයි තුබූ වස්තු ගින්නේ දහයෙහින් වනා වහාගෙන් පිටත ලද්දේ එමෙන් ජරා මරණ තමාට පැමිණෙන්නාට පළමුව තමාසෙවී වස්තුව දූනවිෂයෙහි පරිත්‍යාගකොට මහරජ දිව්‍යලෝක සම්පත්තිය විඳුවයි රජ්ජුරු

වන්ට අවවාදකොට තමන්වහන්සේට දුන් පිරිකරත් ඇරගෙණ කැණීමඩල පලාගෙණ ආකාශයට පැනනැගී තන්දමූලක පබ්භාරයට වැඩිසේක, දෙවෙනිව වඩතා පසේබුදුන්වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ වදුරණසේක් මහරජ දන්දෙන්ට ශ්‍රමණබ්‍රහ්මණයන් ඇතිව වස්තුව දන්නොදී වේතරණී ආදීවූ මහානරකවල වැටී පැසෙන්නාහ, මහරජ වස්තු ඇතිව දන්දී මතු සුගතීමොක්ෂ සම්පත්විඳුවසි රජ්ජුරුවන්ට අවවාද කියා ආකාශයට පැනනැගී පස්වණක් වලා මඩිමින් තමන්වහන්සේට දුන් පිරිකරගෙණ තන්දමූලක පබ්භාරයට වැඩිසේක. තුන්වැනිව වඩතා පසේබුදුන් වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණවදුරණසේක් මහරජ දන්දීමද යුඩකිරීමද සමානවන්නේය. ඒ කවරහෙයින්ද? යත් ශෞරවීයයී ඇති පුරුෂයෝ බොහෝ සතුරන් ජය ගන්නෝය. සුවල්පවූ පුරුෂයෝ බොහෝ මසුරු සිත් ජයගන්නෝය, මහරජ එසේ හෙයින් දානමානාදී බොහෝ පින්කම්කොට සුගතීමොක්ෂ සැප විඳුවයි රජ්ජුරුවන්ට අවවාදකොට තමන්වහන්සේට පිළිගැන්නූ පිරිකරත් ඇරගෙණ ආකාශයට පැනනැගී තන්දමූලක පබ්භාරයට වැඩිසේක. සතරවැනිව වඩතා පසේබුදුන්වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ වදුරණසේක් මහරජ යහපත් ගුණ ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට දුන්නාවූ දානය පරලෙව්හි යහපත් විපාක දෙන්නේය, ඒ එසේමය, යහපත්වූ භූමියෙහි වපුළාවූ බීජුවට යහපත් සස්‍යඵලය දෙන්නේද එමෙන් යහපත් ශ්‍රමණබ්‍රාහ්මණයන්ට දුන්නාවූ දානයත් මහවිපාක දෙන්නේයයි රජ්ජුරුවන්ට අවවාද කියා තමන්වහන්සේට දුන් පිරිකරගෙණ ආකාශයට පැනනැගී තන්දමූලක පබ්භාරයට වැඩිසේක. පස් වැනිව වඩතා පසේබුදුන්වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ වදුරණසේක් මහරජ උත්තමයන් සිටිනා තරම් පදමටත් තමන්ගේ ජාතිගොත්‍රයටත් නපුරකැයි කියාත් පරලොව භයත් මෙලොව අපකීර්තිය නිසා පව් නොකරන්නාහ, සමහර කෙණෙක් එකෙකු මරාපුවයි එකෙක් අප තසාපියාද පව් තම් කුමක්ද? පින් නම් කුමක්ද? උදුර සිතින් පව්කරන්නාහ, මහරජ එලෙස පව් නොකොට පින්කම්කොට සැප විඳුවයි රජ්ජුරුවන්ට අවවාදකොට තමන් වහන්සේ අටපිරිකරගෙණ තන්දමූලක පබ්භාරයට වැඩිසේක. සවෙනිව වඩතා පසේබුදුන්වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවෙනි බණ වදුරණසේක් මහරජ දන්දීමට වඩා සිල්රැකීම උත්තමය, සිල්රැකීමට වඩා සමථ විදර්ශනා වඩා කෙලෙසුන් නසා පසේබුදුවීම උත්තමයයි රජ්ජුරුවන්ට අවවාද කියා අටපිරිකරගෙණ ආකාශයට නැගී තන්දමූලක පබ්භාරයට වැඩිසේක. සත්වැනිව වැඩි පසේබුදුන්වහන්සේ රජ්ජුරුවන්ට අනුමෙවවනි බණ වදුරණසේක් මහ රජ යම් දෙයක් ලබමි කරන්නාවූ හිතවූ බ්‍රහ්මචාර්‍යයෙන් රජව උපදනාහ, මඩ්‍යම්ව කරන්නාවූ බ්‍රහ්මචාර්‍යයෙන් දිව්‍යලෝක සැපත් ලබන්නාහ, උත්තමවූ බ්‍රහ්මචර්‍යයෙන් නිර්‍වාණ සම්පත්තිය ලබන්නාහ, මහරජ ඒ උත්තම බ්‍රහ්මචාර්‍යාව රැක අමෘතමහා නිර්‍වාණසම්පත්තියට උත්සාහ කරවයි අවවාද කියා අටපිරිකර ගෙණ ආකාශයට නැගී තන්දමූල පබ්භාරය වැඩි සේක, රජ්ජුරුවෝත් ආකාශයෙන් යන්නාවූ පසේබුදුන් වහන්සේ බලාසිට මහත්වූ ප්‍රීතීන් පිණා පසේබුදුන්වහන්සේ වදාළ අවවාද සිත තබා දශරාජධම්ම යෙන් රාජ්‍යයකොට පරලොව ගියාහයි වදාරා මේ ආදිත්ත ජාතකය නිමවා

වදාළසේක. එසමයෙහි ඒ සමුද්‍රවිජයා බිසව් තම් රාහුලමාතාවූ යසෝධරා සථවිරිය, භරත රජ්ජුරුවෝ තම් බුදුවූ මම්ම යයි වදාළසේක.

---

## 413
## දිවි ජාතකය

මේවද පරහිතවූ සම්බුදුයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එළු දෙනක අරභයා මේ ජාතකය දක්වන ලදි.

**ඒ කෙසේද? යත්,**

වවකොට ගල්වැටක්සේ තිබෙන්නාවූ එක දෙරකඩක් ඇති ගිරිගර්භ තම් විහාරයෙහි මුගලන් සාම් වාසය කරණසේක. එළුගොපොල්ලාත් මෙතන එළුවන්ට උපද්‍රව නැතැයි ඒ ගල් අස්සේ එළුවන් ලාලා පලායන්නාහ උදැසනක් පාසා එළුවන් හඬට අරණාහ. මෙසේ එක්දවසක් එළුවන් ගාලෙන් ඇරපුකල්හි එළුවන් පලායන්නාහ, එක්තු එළුදෙනක් පසුවෙලා යන තැනැත්තිය දිවියෙක් දැක අල්වාගෙණ කම් සිතා ගල්පසුර දෙරකඩ රැකගෙණ එලි හෙණ උන්නේය. එළුදෙනත් දුරදී දිවියා දැක මේ දිවියා රැකඉදිනේ මා අල්වාගෙණ කන්ටයහි සිතා ආපස්සේ යන්නාමුත් මා ලුහුබැන්ද අල්වාගෙණ යන්නේය. මූ උන් දෙරකඩින්ම යෙම් කිළිපොලා අන්දෙක කෙළින් ඉඳුවා දිවියාගේ ඇස්වර බලා මහත්වූ වේගයෙන් පැනගෙණ දිවගොස් තමාගේ බල එළුවන් හා සමග එක්ව ගියාය. මේ දුටු මුගලන් සාමින් සම්බුදුයන්වහන්සේව මෙපවත් දන්වූසේක. සම්බුදුයන්වහන්සේ එම්බා මුගලන තෙපි දැන් ගැලවී පලාගියා පමණක් විනා පෙර මේ දිවියා එළුදෙන අඩව අඩවා බෙල්ල කඩා කා මැරුයේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉතුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

ගිවගිය දවස මගධරට බොධිසත්වයෝ එක්තරා දුප්පත් කුලයෙක ඉපද තාපසව මුගලන් සාමින් වාසයකරන්නාවූ ගිරිගඟිතම් පව්ත වලල්ලසේම ගල් වැටක් ඇතුළේ වාසයකරන්නාහ. එසමයෙහි එළුගොපොල්ලෝ ඒ ගල්වලල්ල ඇතුළෙන් තණට පිවත්කරන්නාහ. එක්දවසක් එළුවන් ගාලෙන් පලාගියහ. එළුදෙනක පසුව පියා යන්නිය දැක එක් දිවියෙක් අල්වාගෙණ කම් සිතා ඇවින් දෙරකඩ රැකගත. එළුදෙන් මුන්ට උපායක් කියා ගැලවෙම් සිතා කියන්නී කිමෙක්ද මහිලනුවන්වහන්ස බුඹවහන්සේට පාසු අපාසු නැද්ද බුඹවහන්සේගේ සුවදුක් විචාරන්නාලෙස මාගේ මැනියන්වහන්සේ මා එවූසේ කැයි කීහ. එවිට දිවිකියන්නේ වල්පතද මිරිකාගෙණ ඇවිත් මා ඉදිරියේ සිට තැකම් බණවදුසි කීය. එවිට එළුදෙන් කියන්නී බුඹවහන්සේ නැගෙණහිරට මුණලා උන්හෙයින් බුඹවහන්සේ ඉදිරියට ආමි මා වල්පත මිරිකුයේ කෙසේ දැයි කිව සප්තමහා සාගරයද සප්තකුල පර්වතයෝද සක්වලගලද යන මේ සියල්ල වවකොට මාගේ වල්පතමය. තොප මා වල්පත තොමිරිකා ආයේ

කෙසේදැයි කීත. එවිට එළඳෙන් මම භයගතිම් නම් ආකාශයෙන් ඇවිත් බැසපියම් නුඹවහන්සේගේ වල්පත මා මිරිකූයේ කෙසේදැයි කිව, එවිට දිවියා කියන්නේ තොප මෙතනට එන වේලාවට මුවන් හා උගුරෝ ගෝණෝ මෙතන සිටියෝ ඉවත පලාගියෝය. උන් මට ගොදුරුව සිටියවුන් ඉවත පළාගිය හෙයින් ඉන් තොප උන්මාරුවට කම් කිය, එවිට එළඳෙන් අඬ අඬා කියන්නී මා මෙසේවූ කන්තලව් කිය කියා යාචකුකළදී කුමට මා කන්නේදැයි කිව, එවිට දිවියා කියන්නේ අප දරුණුවූ කෘරවූ සත්වයන්ට තොපගේ කන්තලව්වෙන් කම් කිම්දැයි කියා එළඳෙනගේ බොටුවට පැණ බෙල්ලකඩා මස්කැය සඵිඤ්ජයන්වහන්සේත් ඒ අසත්පුරුෂවූ දිවි ඒ එළඳෙන කී කන්තලව්ව නොඅසා ඇගේ ජීවිතක්ෂය කෙළේවේද මුගලනැයි වදාරා මේ දිවි ජාතකය නිමවා වදාළසේක.

---

# අට්ඨනිපාත වණ්ණනා නිට්ඨිතා

---

## 414
## ගිජ්ඣ ජාතකය

එවද එක් කලෙක සකලගුණනිධානවූ විසුඩ චිත්තඝන්නාන ඇති අප තිලෝගුරු බුදුරජානන්වහන්සේ දෙවිරම්වෙහෙර සිව් බඹ විහරණයෙන් යුත්තව වාසයකරණ සේක් නොකිකරුවූ භික්ෂුවක් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක. එක් කුලපුත්‍රයෙක් නෛයර්‍යානික බුදුසස්නෙහි මහණව ආචාර්‍යය උපාධ්‍යායන් විසින් හා සබ්‍රහ්මචාරීන් විසින් මෙපරිද්දෙන් හිඳුව, මෙපරිද්දෙන් හැසිරෙව, මෙසේ පාසිවුරුඩරව, මෙසේ පිඬුසිඟව, මෙසේ පස්විකාවළඳවා පසිදුරන් වසඟ නොකරව, රෑ දෙවේලෙහි නිදිවර්ජිතකොට ග්‍රන්ථධුර විදර්‍ශනාධුර පුරව, මේ ආගන්තුකවත, මේ ගමිකවත, මේ තුදුස්කදුවත, අසුවක් මහවත එහි තොප විසින් නොවපැවත යුත්තේය, තෙළෙස් ධුතාඞ්ගගුණයෝද රක්ෂා කටයුත්තාහයි අවවාද කරණු ලබන්නේ කිකරු නුවූයේය, ඔවුන් කී අවවාද ආදරයෙන් නොපිළිගන්නේය තොපි මට අවවාද කරණුවද මම මට වැඩ අවැඩම මම දනිම් කියේය. භික්ෂූන්වහන්සේ ඔහු නොකිකරුබව දම්සභා මණ්ඩපයෙහි කිය කියා වැඩඋන්සේක. එබස් සඵිඤ්ජයන්වහන්සේ දිවකණින් අසා දම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නාව පූර්‍වභාගයෙහි කවර කථාවකින් යුක්තවූදැයි විචාරා මෙතම් කථාවකින් යුක්තව උනුම්හයි යනු අසා ඔහු කැදවා සැබෑද මහණ තෝ නොකිකරුයෙහිදැයි විචාරා එසේය ස්වාමීනියි දැන්වූ කල්හි කවරනෙයකින් මහණ තෝ මේ බුදුසස්නෙහි මහණව තමාට වැඩ කැමැත්තවුන්ගේ බස් නොකරන්නෙහිද පෙරත් තෝ නුවණැත්තවුන්ට නොකිකරුව වේරඹ වාතයට පැමිණ සුණුවිසුණුවූයෙහිදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

විපර කිඤ්ඣ නම් පර්වතයෙක මහබෝසතාණන්වහන්සේ ගිජුලිහිණිව උපන්සේක. උන්වහන්සේගේ පුත්‍රවූ සුපත්‍රනම් ගිජුලිහිණි රජෙක් නොයෙක් දහස්ගණන් ගිජුලිහිණියන් පිරිවැරුයේ ශක්තිසම්පන්න වූයේ වයොවෘඩවූ මව් පියන් පිඹුරුමස් ආදි ගොදුරු ගෙණවුත් දී රක්ෂාකරන්නේය, එසේ රක්ෂා කරන්නාවූ අනඝ ඉතා දුරතැන් තැගී යාමට සමර්ථවූ තමන්වහන්සේගේ පුත්‍රවූ සුපත්‍රනම් පක්ෂිරාජයාට අවවාද කරණ මහබෝසතාණන්වහන්සේ එම්බා පක්ෂිරාජය, නොප අහස්කුසට නැඟිකල්හි මේ දඹදිව මුළුපොළොව දියපිට නිලුපුලක්මෙන් පෙණේද, නැවත යම්තැනකට පැමිණියාවූ නොපට සාගර ජලයෙන් පරිවර්ත්තවූ මෙම ජම්බුද්වීපය රථරසක්මෙන් වටව පෙණෙන්නේය, එතනින් නැවත ඇත නොයවයි වදාළසේක. ඒ පක්ෂිතෙම ඒ අවවාදය යඵපතැයි පිළිගත්තේය. එක්දවසක් අළුත වට වැස්සෙහි ගිජුලිහිණියන් හා සමග අහසට පැනනැඟී ඔවුන් පසුකොට අහසට ඉතා දුර තැනට ගියේය' ඕනට බෝසතාණන් වදාළ පරිද්දෙන් දඹදිව රථසක්මෙන් වටව පෙණුනේය, එසේත් කොනැවත නොකිකරුව පක්ෂිරාජතෙම හොස් වේරම්බ වාතයට පැමිණ සුණ්ඩවිසුණ්ඩ වූයේය. ඒ නොකීකරුවූ පක්ෂිරාජයා නිසා ජීවත්වන්නාවූ පක්ෂිහුද ඔහුගේ මව්පියෝද අඹුදරුවෝද යන සියල්ලම විනාශයට පැමිණියෝය, එමෙන් මේ ශාසනයෙහි යමෙක් වැඩිමහල්ලන්ගේ අවවාද වචනය පිළිගෙණ එපරිද්දෙන් නොපවත්නේ විනම් ඒ ගිජුලිහිණියාගේ අවවාද ගෙණ එසේ නොපැවත විනාශයට පැමිණියාවූ ලිහිණිරජු මෙන් මහත්වූ ව්‍යසනයට පැමිණෙන්නේය, එසේහෙයින් මහණ තෝද ඒ නොකීකරු ගිජුලිහිණියා මෙන් නොවී වැඩකැමැත්තාවූ මහතුන්ගේ අවවාද වචනය කරවයි වදාළසේක. මෙසේ බුදුන් විසින් අවවාද කරණ ලද්දා ඒ මහණතෙම එතැන්පටන් කීකරු වූයේය. සම්බුදුරජාණන්වහන්සේ මහණෙනි එකල්හි නොකීකරු ගිජුලිහිණියා නම් දැන් මේ නොකීකරු මහණ වන්නේය, එකල්හි අවවාද දුන් ගිජුලිහිණියා නම් දැන් ලොවිතුරා බුදුවූ මම්ම වේදැයි මේ ජාතකය පූර්‍වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක.

---

## 415 කොසම්බ ජාතකය

එවද චන්ද්‍රමණ්ඩලය මත් තෙන් යන්නාවූ සූර්‍යරශ්මි පරිද්දෙන් සියළු ලොව මැඩගෙණ පවත්නා ගුණ ප්‍රබන්ධයක් ඇති විසුඛවූ සම්‍යක්සම්බුද්ධරාජෝත්තමයන් වහන්සේ එක් සමයෙක්හි කොසඹෑනුවර සම්පයෙහි ඝෝෂිතතම් සිටාතන් විසින් කරවා පිළිගන්වනලද ආරාමයේ වාසයකරණසේක් කොසඹෑනුවරවැසි කලහකාරී භික්ෂුවක් අරභයා මේ ජාතකය දක්වා වදාළසේක. බුදුන් එහි වැඩවසන සම යහි විනයපිටකය නොපිරිහෙලා ධරන්නාවූ එක් තෙරකෙණෙකුන් වහන්සේද එසේම සූත්‍රපිටකය ධරන්නාවූ එක් තෙරකෙණෙකුන් වහන්සේද යන මේ දෙදෙනෙකුන්වහන්සේ එක් සෙනස්නේ වාසය කරණ සේක. එකල ඒ දෙදෙනාවහන්සේගෙන් සූත්‍රපිටකය ධරන්නාවූ තෙරුන්වහන්සේ

එක්දවසක් නහනගෙට ගොස් උදක කෘත්‍යයකොට ඉනිරි දිය භාජනයෙහි තබා නික්මගියසේක. ඉක්බිති විනයධර තෙරුන්වහන්සේද නහනගෙට වැද ඒ බඳුනෙහිතුබ්බු දිය දැක ඇවැත්නි නහනකොටුවේ බඳුන්හි ඉනිරි දිය තබා ආවෝ නොපිදූසි වදුළසේක. එසේය ඇවැත්නි අපියසි කීකල්හි එබසට විනයධර තෙරුන්වහන්සේ මේහි ඇවැත් ඇතිබව නොපි නොදනුදූසි කීසේක. එසේය ඇවැත්නි අපි නොදනුම්හයි කීසේක. විනයධර තෙරුන්වහන්සේ එහි ඇවැත් වනබව කියසේක. එබස් අසා සූත්‍රධර තෙරුන්වහන්සේ එසේවී නම් ඇවැත්නි ආපත්තියට පිළියම්කෙරෙමියි කීසේක. එබසට විනධර තෙරුන්වහන්සේ ඇවැත්නි නොපි නොදුන සිහිනැතිව ආවනම් ආපත්ති නැතැයි වදුළසේක. එබස් අසූ සූත්‍රාන්තික තෙරුන්වහන්සේ අනාපත්ති යන සංඥ ඇතිවූසේක. ඉක්බිති විනේධර සථවිරතෙම තමන්ගේ අතවැසි භික්ෂූන්ට මේ සූත්‍රාන්තික සථවිරතෙම ආපත්තියට ඇවදත් ඇවැත් ඇතිබව නොදන් නේයයි කීසේක. එබස් ඇසූ භික්ෂූහු සූත්‍රාන්තික තෙරුන්වහන්සේගේ අත වැස්සන් දැක නොපගේ උපාධ්‍යායසථවිරයෝ ආපත්තියට ඇවදත් එහි ඇවැත් ඇතිබව නොදනිතියි කීවාහුය. එබස් ඇසූ අතවැසි භික්ෂූහු එපවත් තමන්ගේ උපාධ්‍යයන්වහන්සේට කීවාහුය. එබසට තෙරුන්වහන්සේ වදුරණසේක් මේ විනධරතෙරුන්වහන්සේ පළමුවෙන් ආපත්ති නැතැයි කියා දැන් ආපත්ති ඇතැයි කියනසේකැයි බොරුකියන කෙනෙකැයි කීසේක. එසඳ ඔහුගේ අතවැසි භික්ෂූහු ගොස් විනයධර තෙරුන්වහන්සේගේ අතවැස්සන් දැක නොපගේ උපාධ්‍යායසථවිරයෝ බොරුකියන කෙණෙකැයිකියා මෙසේ ඔවුන් නොවුන් හා විවාදකොට් ඒ සූත්‍රාන්තික තෙරුන්වහන්සේට අවසරයක් බලා ලැබගෙණ ඇවැත් ආපත්ති නොදූක්මෙහි "උක්ඛෙපණීය කම්ය" කළාහු එතැන් පටන් ඒ දෙදෙනාවහන්සේට උපසථානකරන්නාවූ උපාසකවරුද උන්වහන්සේගේ අවවාද පිළිගන්නා භික්ෂුභික්ෂුණීහුද අරක්ගත් දෙවියෝද ඔවුන්ට දෘෂ්ටමිත්‍ර දෘඪමිත්‍රවූ දෙවියෝද ආකාශසථ දෙවියෝද අග්නිවාඛඛලොව වැසි බ්‍රහ්මයෝදූසි යන සියළු පෘථිග්ජනයෝද දෙපක්ෂයකට බෙදී මහත් කෝලාහල පැවැත්වූවාහුය. එකල එක් භික්ෂූකෙණෙකුන්වහන්සේ බුදුන්කරා එළඹ සවාමීනි මේ සූත්‍රධර තෙරුන්වහන්සේට උක්ඛෙපනීය කම්ය කළේ ධම්මෙන අධම්මෙන් නොවෙයි එතකුදුවුවත් මේ සූත්‍රධර තෙරුන්වහන්සේගේ පක්ෂයෙහි භික්ෂූහු අධම්මෙන් කළ උක්ඛෙපණීය කම්යකැයි සිතා ඒ තෙරුන්වහන්සේ උසස්කොට පිරවරාගෙණ ඇවිදිනාහුයයි දැන්වූසේක. එකල භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ "නිත්තෝ නිකබ්බසංඝෝ"යි වදුරා ඒ භික්ෂූන් සමීපයට වැඩ ඒ විනයධර තෙරුන්වහන්සේ විසින් කළාවූ උක්ඛෙපණීය කම්යෙහිද සූත්‍රධර තෙරුන්වහන්සේගේද අවත් ඇවැත් නොදන්මෙහිද දෙඟ වදුරා වැඩසේක. ඉක්බිති භික්ෂූන් එතත එකසීමාවෙහිදී පෝය පවුරුණු ආදියකොට භොජනශාලාවෙහි හිඳිනා අසුන්පිණිස විවාදයකළ කල්හි දෙවෙනි වත් එතැන්හි වැඩ දබරවන්නාවූ දෙන්නෙකු එකතැන නොහිඳිනා පරිද්දෙන් අතුරෙන් එකි එකී ආසනයකට බිමතබා ඉදිනාලෙස භොජනශාලාවෙහි වත්පණවා මහණෙනි විවාදකිරීමෙන් ප්‍රයෝජන නැතැයි එහි දෙඟ වදුරා වැඩසේක. එකල්හි සම්ඝයන්වහන්සේට වත වෙහෙසය නොදකැමැත්තාවූ එක්තරා ධම්වාදීවූ භික්ෂූකෙණෙකුන්වහන්සේ සවාමීනි තිලෝගුරු බුදු

රජාතන්වහන්ස මදක්කල් ඉවසා වදාළ මැනව, නිරුත්සාහව ඵලසම්පත්ති සැප අනුභව කළ මැනව, අපි මේ විවාදයෙන් වත යහපතක්වත් නපුරක්වත් දක්නමෝ වේදැයි කීසේක. එබස් අසා ඒ නිසඹුහට ධර්මදේශනා කරන්නාවූ සර්ඳරාජොත්තමයාතන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

මහණෙනි පෙර බරණැස්නුවර උපභෝග පරිභෝග වස්තුයෙන් හා සියඵසේනාවාහන ධනසමෘඩියෙන් සමන්විතවූ බ්‍රහ්මදත්තනම් රජකු රාජ්‍යය කරණකල්හි කොසොල්රට සේනාවාහනආදිය නැත්තාවූ දීඝිතිස්සනම් රජෙක් රාජ්‍යය කරන්නේය, එකල ඒ බ්‍රහ්මදත්තනම් කසීරජ තමාගේ හස්ත්‍යශ්වාදී චතුරඞ්ගිණී සේනාවාහනයන් සන්නඬකොට සරණා දීඝිතිස්සනම් කොසොල් රජු කරා සටනට නික්මින. එකල්හි කොසොල් රජතෙම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සෙනගගෙණ තමා කරා සටනට එනි යනු අසා සිතනුයේ මේ රජ උපභෝග පරිභොග වස්තුවෙන් හා නිධානකොට තිබූ කෙළකෝටිගණන් ධනයෙන් ආඪ්‍යයහ, මහත් සේනා වාහන ඇත්තේය, මම වනාහි එබඳු සේනා වාහන ධනසමෘඩියක් නැතිහෙයින් ඒ රජු හා යුඬකරන්ට නොහැක්කෙමි, එසේහෙයින් බැහරගොස් ජීවත්වීම උතුම්වන්නේයයි සිතා තමාගේ අග මෙහෙසුන් බිසවුන් කැඳවාගෙණ ඔනු එන්නාට පළමුකොට තෙමේ නුවරින් නික්ම ගියේය, ඔහු ගිය ඉක්බිති ඒ බ්‍රහ්මදත්ත රජ තමාගේ සේනාවාහන සමග ඒ කොසොල් රජුගේ නුවරගෙණ වාසයකෙළේය. ඉක්බිති කොසොල් රජ්ජුරුවෝ තමන්ගේ බිසවුන් හා සමග අනුක්‍රමයෙන් බරණැස්නුවරට ඝොස් එහි එක්තරා කුඹලුන්ගේගෙයක වාසයකරන්නාහු එකල රජහුගේ බිසවුන්ට දරුගැබක් පිහිට ඉරුලදුවන වේලෙහි සන්නාහ සන්නඬවූ සිව්රඟ සෙනඟ යහපත් තෙනක සිටියා දක්නවද ඔවුන් ආයුධසේදූදිය බොන්නවද දෙලෙක් උපත, එකල බිසව්තොම දේවයන්වහන්ස මම ගර්භිණීවූයෙමි මට මෙවෙනි දෙලකුත් උපන්නේයයි තමාගේ කොසොල් රජහට කීවාහුය, රජු එබස් අසා සොඳුර දිළිඳුවූ අපව සන්නාහයෙන් සන්නඬවූ සිව්රඟසෙනඟ යහපත්තෙනක සිටියා දැකීම හා ඔවුන් ආයුධ සේදූ දිය බොන්නට කොයින් ලැබෙන්නේදැයි කීහ. බිසව් එසේවීනම් දේවයන්වහන්ස මාගේ ජීවිතය නොතිබෙන්නේයයි කීවාය, එසමයෙහි බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණෙක් ඒ දීඝිතිස්සනම් කොසොල්රජහට මිත්‍රව වාසය කරන්නේය, එකල ඒ කොසොල්රජ තමාගේ මිත්‍රවූ පුරෝහිත බ්‍රාහ්මණයා ලහට ගොස් එම්බා යහළුව තොපගේ යෙහෙලනීවූ අපගේ බිසවුන්ට ගැබෙක්පිහිටා මෙසේ දෙලෙක් උපන්නේයයි කීහ. එසේවීනම් දේවන්වහන්ස මම ඒ බිසවුන් දක්නාකැමැත්තෙමි බමුණා කීහෙයින් කොසොල්රජ තමාගේ බිසව් කැඳවාගෙණ ඒ බමුණන්කරා ගියේය. පුරෝහිත බ්‍රාහ්මණයාද එන්නාවූ බිසවුන් දුරදීම දැක උනස්නෙන් නැගිසිට උතුරුසළුව ඒකාංශකොටගෙණ බිසවුන්ට තමස්කාරකොට සිටි තොපගේ කුස පිළිසිඳගත්තේ කොසොල් රටට අධිපතිවන්නාවූ මහපිණැති රජෙකැයි තුන්යලක් උදන් අනා දෙවයන්වහන්ස සතුටුඋවමැනව සූයෙර්ාත්ගමන වේලායෙහි සන්නාහයෙන් සන්නඬව සිටියාවූ චතුරඞ්ගිණී සේනාව දක්නට ඔවුන්ගේ ආයුධ සේදූ දිය බොන්නවද ලැබෙන්නේයයි කොසොල් රජහට

කියා හිවිස්වා තෙමේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ රාජාගොස් දේවයන්වහන්ස සෙට උදෑසන චතුරංගිණීසේනාවසන්නාහව සිටීමට ඔවුන් තමන්ගේ ආයුධ සේදීමටද කාරණයක් දිවාමි ඊට විධානකළ මැනවැයි කීයේය. එසේවීනම් සගයෙනි තොප පුරෝහිත බමුණන් කියාලු පරිද්දෙන් සැරහීඉඤ්ඤවයි රජ සේනාවට නියෝගකළේය. ඔහුද රජහුගේ නියෝගවූ පරිද්දෙන් සැරහී තමතමන්ගේ ආයුධ සේදුවාහුය. එකල දීඝිතිඝසනම් කොසොල් රජහුගේ අගමෙහෙසුන් බිසවුන්ට ඉරුදෙයෙහි සන්නානයෙන් සන්නහව සිව්රඟසෙතත දැකීමද ඔවුන් ආයුධ සේදූ දිය බිමවද සිඹවිය, ඉක්බිති බිසව් මුහුකළ ගැබ් ඇතිව දස එකඹ මසකින් පුත්කුමරුවකු වැදුවාහුය. ඔහුට දීඝායුකුමාරයෝයයි නම් තබා වැඩිවියපැමිණ නුවණැතිවූ කල්හි පියරජතෙම ඉසිතනුයේ බ්‍රහ්මදත්තරජ අපට බොහෝ අනර්ථ කළේය, මොහු විසින් අපගේ බලවාහන ජනපද රත්රුවන් ගබඩා කොටුගෙවල් ආදිය පැහැරගන්නාලද ඉදින් අපහදුනන්නේවීනම් අප තුන්දෙනා මරන්නේය, එසේනොයින් දීඝායුකුමාරයන් නුවරින් පිටවාහයකර වුවමැනවැයි සිතා ඔහු පිටිනුවර වැස්සුයේය, ඒ දීඝායු කුමාරයාද අප්‍රසිඹ වේසයකින් වහන්නේය, කොසොල්රජු හා බිසවුන් එහිවසන්නා දැක බ්‍රහ්ම දත්ත රජහට දැක්වූවාහුය, එසේවීනම් කොල නෙපි ඒ රජ හා බිසව හා සමග අල්වාගෙණඑවයි නියෝගකොට මිනිසුන් ගමන්කරවා ගෙන්වාගෙණ වධයට විධාන කරණුයේ සගයෙනි මේ රජු බිසව් හා සමග දැනි ලනුවකින් පිටතොල හයා බැඳ කරයෙන් ඉහකේමුඩුකොට වධබෙර ගස්වමින් වීථියෙන් වීථියෙහි ගෙණ ගොස් දකුණු වාසල්දොරින් නික්මයා එතනදී දෙදෙනා සතරකඩක් කොට පොළහසා වලසතරකලා එවයි කියේය. එබස් ඇසූ ජනයෝ යහපත දේවයන්වහන්සැයි රජහුගේ නියෝගවූ පරිද්දෙන් බිසව හා එක්කොට රජු පිටිතොල හයාබැඳ ඉහමුඩුකොට වීථියෙන් වීථියට නෙහයන්ට පටන්ගත්හ, ඒ වේලෙහි දීඝායු කුමාරතෙම තමාගේ මව්පිය දෙදෙනා බොහෝ දවසක් නොදක්න ලදහ, ඔවුන් දක්නෙම් බරණැස්නුවරට නොඇ පිටිතොලහයා බැඳ වීථියෙහි යන්නාවූ මව්පියන් දැක ලඟවයනුව අභිමුඛවිය, එකල කොසොල්රජ එන්නාවූ ඔහු දුරදැක පුත්‍ර දීඝායුකුමාරය දුරබලව ලඟ නොබලව වයිරයෙන් වයිරය නොසන්සිඳෙයි වයිරනොකිරීමෙන්ම වයිර සන්සිඳෙයි කියේය. ඔහු එසේ කීකල්හි මනුෂ්‍යයෝ මේ කොසොල් රජ උන්මත්ත නම් දෙඩවන්නේය, මෝහට දීඝායුවත් නම් කොහිත්ද කවුරුත් දැක මේ මෙසේ කියන්නෙහිදැයි කීවාහුය. එකල ඒ රජතෙම සහයෙනි මම උමතුව නන්දෙඩන්නෙමි නොවෙමියි යමෙක් නුවණැත්තේ වීනම් ඒ දන්නේයයි නැවත නැවතත් කියේය. ඉක්බිති මනුෂ්‍යයෝ ඒ රජහුගේ බිසව හා සමග රජහුගේ නියෝගවූ පරිද්දෙන් නුවර ඇවිදුවා දකුණුවාසලින් පිටතට ගෙණගොස් සතරකඩක්කොට කපා වලසතරකලා රැකවල්ලවා ගියාහුය, එකල දීඝායුකුමාතෙම බරණැස් නුවරටවැද රා ඇරගෙණ රැකවලුන් පොවාඔවුන් රා මදින් මත්ව ඒ ඒ තැන නුනුකල්හි තෙමේ දරසෑයක් බැඳ මවු පියන්ගේ මෘතදේහ දරසෑයට නැග ගිනිදල්වා දෙදෙනාත් මුදුනෙහි බැඳ තුන්යලක් වටකොට ඇවිද්දේය. එසඳ බ්‍රහ්මදත්තරජ ප්‍රාසාදයෙහි මතුමහල්තලයෙහි සිට එසේ දරසෑයවට ඇවිදිනා කුමාරයා දැක සැකනැතිවම කොසොල්රජහුගේ කැකෙනක මොහු කෙරෙන් මට අනර්ථයෙක් වන්නේය, කවුරුත් මොහු ඇතිබව මට නොකීවාහුයයි සිතූහුය, ඉක්බිති ඒ කුමාරතෙම වලවගොස් කැමැති පමණක් අඬා වැලප

බරණැස්නුවරට වැද එහි වාසය කෙරෙමින් එක්දවසක් ඇත්හලටගොස් ඇත් ගොව්වා දැක ආචාරීනි මම හස්ති ශිල්පය උගන්නා කැමැත්තෙමි කියා යහ පත උගණුවයි කීකල්හි එදා රෑ ඇත්හල ලැඟ අළුයම නැගී සිට මියුරු කට හඬින් ගී කිය කියා වීණාගැවෝ කවුරුදැයි විචාරා දේවයන්වහන්ස හස්තිචාරී හුගේ අතවැස්සෝයයි අසා ඔහු මෙහෙකැඳවාගෙණ එවයි කියා ගෙන්වාගෙණ ඇත්හල ගි කිය කියා වීණාගැවෝ තොපිදැයි විචාරා එසේය දේවයන්වහන්ස අපියයි කීකල්හි එසේවීතම් දැනුත් ගී කියා වීණාගායනා කරවයි නියෝග කෙළේය, එකල දීඝායු කුමාරතෙම බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ සිත්ගන්නා කැමතිව මධුරස්වරයෙන් ගී කිය කියා වීණාගායනා කෙරෙමින් රජහුගේ සිත් ගෙණ උපස්ථාන කරන්නේ රජහට පළමු නැගීසිට ගායනාකෙරෙයි රජහට ඉක්බිතිව තෙමේ සැතපෙයි කවයුතු කවරේදැයි රජහුවිචාරවයි රජහට සිත් පරිද්දෙන් ප්‍රියතෙපුල් කියයි මෙසේ දීඝායු කුමාරතෙම නොබෝ කලකින් බ්‍රහ්මදත්ත රජහට අභ්‍යන්තරව විශ්වාසවූයේය, ඉක්බිති එක්දවසක් බ්‍රහ්මදත්ත රජහු විසින් දීඝායු කුමාරය මම මුවදඬයමට යනු කැමැත්තෙමි රථයොදවයි කීකල්හි යහපත දේවයන්වහන්ස්‍යැයි රථය යොදා රජහු රථයට නංවා තෙමේ රථය පදිනේ සේනාව හෝ රථයක් නෝ ආසන්න නොවන පරිද්දෙන් වහා රථයම පැදගෙණගියේය, එසඳ රාජකුමාරයාට කියනුයේ කොල මම මිරිකුනු ශරීර ඇත්තෙමි මදක් සැතපෙනු කැමැත්තෙමි, රථය රඳවාපියවයි කීයේය. එකල ඒ කුමාරතෙම යහපත දේවයන්වහන්සයි රථය අතහැර තෙමේ රුක් සෙවනක අසර මිණිය බැඳගෙණ උන්නේය, එකල රජ දීඝායු කුමාරයා උකුලේ හිස තබා සැතපී විඩාගිය ශරීර ඇතිහෙයින් වහා නිද්‍රාවට පැමිණියේය, එකල දීඝායුකුමාරතෙම සිතනුයේ බ්‍රහ්මදත්ත රජ අපට බොහෝ අවැඩ කෙළේය, මොහු විසින් අපගේ යානවාහන ජනපද කොෂ්ඨාගාදිය පැහැර ගන්නාලද අපගේ මව්පිය දෙදෙන මොහු විසින් මරණ ලද්දාහුය. දැන් මට ඒ වෛරය සිඹකරන්ට කල්වන්නේයයි කොපුවෙන් කඩුව ගෙණ සිතනුයේ මාගේ පියරජ්ජුරුවන්වහන්සේ මරණකාලයෙහිදී දීඝායුකුමාරය තෝ දුර බල ලඟ නොබලව වෛරයෙන් වෛරය සන්සොසිදෙන්නේය, වෙර නොකිරී මෙන්ම වෛර සන්හිඳෙන්නේයයි කීසේක. ඒ මාගේ පියාණන්වහන්සේගේ බස් ඉක්මවන්ට නුසුදුසුයයි කඩුව කොපුවෙහි බහාගෙණ මෙසේ දෙවැනිව තුන් වැනිව කඩුව කොපුවෙන් හයාගෙණ පියරජහු කී තෙපුල් සිහිකොට නැවතත් කොපුවේ බහාගත්තේය, එකල බ්‍රහ්මදත්ත රජ හසින් තැතිගෙණ වහා නැගී සිටි කල්හි දීඝායුකුමාරතෙම දෙවයන්වහන්ස හසින් තැතිගෙණ නැගීසිටියේ කුමක්නිසාදැයි කීයේය, ඒ පුරුෂයාට කියනුයේ මාසැතපුනුකල්හි දිසිතිස්සනම් කොසොල් රජහුගේ පුත්වූ දීඝායුනම් කුමාරයෙක් කඩුවක්ගෙණ මා දෙපලු කොට එළුයේයයි සඤ්ඤයෙන් දැටිමි, එයින් මම භයගෙණ නැගීසිටියෙමි, කීයේ. එසඳ දීඝායු කුමරතෙම වමතින් බ්‍රහ්මදත්ත රජහුගේ ඉසකෙස්වැටිය ගෙණ දකුණතින් කඩුතියාගෙණ දීසිතිස්ස කොසොල්රජහුගේ පුත්‍රවූ දීඝායු කුමාරයානම් මමය, තෙපි අපගේ පියරජ්ජුරුවන් හා මැනියනුත් මරා සේනා වාහන ජනපද ආදියත් පැහැරගෙණ බොහෝ අවැඩ කළෝවේද මම යම් පුරාණ වෛරයක් සිතතබා ඒ සිඹකරණු කැමතිවීන්නම් දැන් ඊට කල්වන්නේ යයි කීයේය. එකල බ්‍රහ්මදත්තරජ භයගෙණ දීඝායුකුමාරයාගේ පය වැඳ

ගෙණ එම්බා දීඝායුකුමාරයෙනි මාගේ ජීවිතය දෙවයි කීයේය, එබසට දීඝායු කුමාරයා විසින් නුඹවහන්සේගේ ජීවිතයදෙන්ට මම කවරෙක්ද මාගේ ජීවිතය නුඹවහන්සේ දුනමැනවයි කී කල්හි එසේවිතම් තෙපිත් මාගේ ජීවිතය දෙව, මම තොපගේ ජීවිතය දෙමි කියා රජ්ජුරුවන් හා කුමාරයන් දෙදෙන ඔවුනොවුන් ජීවිතදානයදී මතු විරුඬ නොවනලෙස සත්‍යය කළාහුය, ඉක්බිති බ්‍රහ්මදත්ත රජතෙම දීඝායු කුමාරය නුවරට යම්හ රථය යොදවයි කියා රජතෙමේම රථයට නැගී දීඝායුකුමාරයා ලවා රථය පදවාගෙණ සේනා වාහන ලඟට අවුත් ඔවුනොවුන් හා සමග බරණැස් නුවරට වැද ඇමති මණ්ඩලය පිරිවරා හිඳ සගයෙනි තොපි කොසොල්රජහුගේ පුත්වූ දීඝායුකුමාරයා දුටුවා හුනම් ඔහට කුමක් කරවිදැයි විවාළේය, එබසට සමහර කෙණෙක් දේවයන් වහන්ස අපි ඔහුගේ අත් කපම්හයි කීවාහුය, සමහර කෙණෙක් කන්සිදුම්හයි කීවාහුය, සමහර කෙණෙක් නාසා සිදුම්හයි කීවාහුය, සමහර කෙණෙක් කන්නාසා සිදුම්හයි කීවාහුය, සමහර කෙණෙක් ඉසසිදුම්හයි කීවාහුය, එසඳ බ්‍රහ්මදත්ත රජතෙම කියනුයේ සගයෙනි දීඝිතිස්ස කොසොල්රජහුගේ පුත්වූ දීඝායු කුමාරය නම් මේය, මෝහට කිසිවකුත් නොකොවි යුත්තේය, මොහු විසින් මාගේ ජීවිතය දෙනලදැයි කියා ඉක්බිති බ්‍රහ්මදත්ත රජතෙම දීඝායු කුමාරය තොපගේ පියරජ්ජුරුවන් විසින් දුරබල ලඟනොබල වෛරයෙන් වෛරය සන්නොහිඳෙයි වෛරනොකිරීමෙන් වෛරසන්හිඳෙයි කීයේය. කුමක් නිසාදැයි විවාළේය. එබසට දීඝායු කුමාරතෙම කියනුයේ දේවයන්වහන්ස අපගේ පිය රජ්ජුරුවන්වහන්සේ විසින් දුරබලවයි කියේනම් බොහෝකල් වෛර නොකරවයි කීනියාය, ලඟ නොබලව කියේනම් මිත්‍රයන් හෙදනොකරවයි කී නිසාය, වෛරයෙන් වෛර නොසන්හිඳෙයි වෛර නොකිරීමෙන්ම වෛර සන්හිඳෙයි කියේ නම් නුඹවහන්සේ විසින් මාගේ මව්පියන් මරණලද්දු හුයයි ඉදින් නුඹවහන්සේ මැරුයේවිනම් නුඹවහන්සේට වැඩ කැමැත්තාවූ කෙණෙක් මා මරන්නාහුය, එසඳ මට වැඩ කැමැත්තාවූ කෙණෙකුත් ඔහුත් මරති මෙසේ වෛරයෙන් වෛර නොසන්හිඳෙන්නේය, දැන් නුඹවහන්සේ විසින් මාගේ ජීවිතය දෙනලද මා විසිනුත් නුඹවහන්සේගේ ජීවිතයදෙනලද එසේ වෛරයෙන් වෛර නොසන්හිඳෙන්නේය' වෛර නොකිරීමෙන්ම සන්හිඳෙන්නේයයි කියා දේවයන් වහන්සැයි කීයේය, එකල බ්‍රහ්මදත්ත රජතෙම මේ කුමාර පියාතන් සංක්ෂෙපයෙන් කී දෙයෙහි අර්ථ විස්තරයෙන් දන්නේය, ඉතා නුවණැත්තාවූ පුරුෂයෙකැයි විස්මයපත්ව පියරජ්ජුරුවන් සන්තකවූ සේනා වාහන ජනපද කොෂ්ඨාගාරාදිය තැන්පත්කොටදී තමාගේ දියනි කෙණෙකුන් පාවාදී මිත්‍රව විසුයේයයි අප නිලෝගුරු බුදුරජානන්වහන්සේ ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ හා දීඝායුකුමාරයන්ගේ මේ කථාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි සත්ත්වයන්ට වධබන්ධනාදී දණ්ඩනිග්‍රහකොට ආයුධ බලයෙන් ආඥාවක්‍රය පවත්වා රජකරණ රජදරුවෝ පවා මෙබඳුවූ ඉවසීමට හා කීකරුබවට පැමිණෙන්නාහුය, තොපි අවිපරීතවූ ධර්මීවිතය ඇති ශාසනයෙහි මහණව කවර කාරණයෙකින් ඉවසාගත නොහෙව්ද කීකකරු නොවව්දැයි දෙතුන්වෙනිවත් විවාද කොකරණසේ අවවාද වදාරා එසේත් නොසන්හිඳෙහෙයින් මේ භික්ෂූහු වෙෂයෙන් මඬනාලද සිත් ඇත්තාහ, මොහු සන්හිඳුවන්ට නොහැක්කේයයි එතනිහ් වැඩ දෙවෙනි දවස් වළඳා ඉක්බිති ගඳකිළියෙහි

මේදක් සැතපී සෙනසුන් පිරිකර තැන්පත් කොට තබා තමන්වහන්සේ පාසිවුරුගෙණ ඒ අසමගි භික්ෂුසඞ්ඝයා මධ්‍යයේ ආකාශයෙහි වැඩසිට වදාරණ සේක් මේ කලහකාරී භික්ෂුසංඝයොම වටින් එකවිටමත් ශබ්ද පැවැත්වීමෙන් මහ හඬ ඇත්තාහුද වෙති, ගුණයෙන් සමානත් වෙති, මොහුන් අතුරෙන් කිසි වකුත් මම නුවණැත්තෙම් නොසිතා පණ්ඩිතමානීව භික්ෂුසංඝයා බෙදන කල්හි මානිසා මේ භික්ෂුසංඝයාවනන්සේ බිඳෙනසේකැයි කිසිකාරණදෙයකුත් නොසිතුයේය, තවද මෙහි භික්ෂුසංඝතෙම වෙෂයෙන් සිහිමුළාව අපි නුවණැත් තම්හ, සතරසතිපට්ඨානාදීවූ ආර්‍යධර්මයන් අරමුණු නොකොට කවහයා යමක් කියනු කැමැත්තේ වීන්තම් එපමණක් බස් සඛමැද ගෞරවයක් නැතුව කිය මින් අලජ්ජිබවට පැමිණෙත්, ඒ විවාදය මෙබඳු මහත් ආදීනව ඇත්තේයයි සලකාගත නොහෙන්නේද, තවද මට ආක්‍රොශ කෙළේය, හස්තපාදාදියෙන් තැලුයේය, කුළුදෙස් ආදිය කියවා මා පැරදවුයේය. මාගේ පරිභොගවස්තු පැහරගත්තේයයි යමෙක් තණ පිදුරු ආදියෙන් කුණුමස්වසා වෙළන්නෙකු මෙන් නැවත නැවත වෛර බඳිද ඔහුගේ වෛරය නොසන්හිඳී ඔහු දුකට පමුණුවන්නේය, යම් කෙණෙක් එබඳු වෛරය තමන් සිත්හි නූපදවා පවතිත්ද ඔහුගේ වෛරය වහා සන්හිඳිමට පැමිණෙන්නේය, තවද මේ සත්ත්වලෝක යෙහි ''අනත්ථමෙම අකරී'' යනාදීවූ නව ආඝාත වස්තූන් කරණකොටගෙණ උපදනා වෛරයෝ කෙළ කුණු මලමූත්‍රාදී අසූචි වැකිතැන් එම අසූචියෙන් සොධා පිරිසිදුකොට ගතනොහැක්කාක්මෙන් වෛරයෙන් වෛර සන්හිඳිය නොහැක්කාහ. එබඳු අසූචිවැකිතැන් පිරිසිදු දියෙන් සෝදා පිරිසිදු කරන්නා සේ ක්ෂාන්ති මෛත්‍රී ආදීවූ ගුණයෙන්ම සන්හිඳවිය හැක්කාහ, අවෛරයෙන් වෛරසන්හිඳවීම පෙරබුදුවරයන් ගියාවූ මාර්ගයෙක්මය. තවද සඟමැද කෝලාහල කරණ කල්හි අපරික්ෂාකාරීව නුවණැති භික්ෂූහු අපි හැමවේලේම මරුමුඛයට යම්හයි නොසලකන්නාහ, මෙයින් යම් නුවණැති භික්ෂුකෙණෙක් අපි සත තයෙන් මරුමුඛයට යම්හයි නොසලකා ඒ විවාද සන්හිඳවීමට උත්සාහ නොකරෙත් නම් ඔවුන් නිසා ඒ විවාදය සන්හිඳෙන්නේය, තවද සත්ත්වයන්ගේ ඇට බිඳතලා පණගන්නා රජදරුවෝ පවා ත් ආචාර්‍ය විවාහ සම්බන්ධයෙන් මිත්‍රභාව යට පැමිණ සමගිව වාසය කෙරෙතිසි, මහණෙනි ක්ෂාන්තිය ගුරුකොට පැවිදිවූ තෙපි කවරහෙයකින් එසේනොවිද, ඉදින් යමෙක් නුවණැතිව තුනුරුවන්හි හටගත් සැදුහැති තමා හා එක්ව වසන්ට නිසිවූ ධෛර්‍යසම්පන්න කල්‍යාණ මිත්‍රයකු ලද්දේවීනම් ඒතෙම තමාටවන්නාවූ සියළු උපද්‍රව දුරුකොට සතුටු සිත් ඇතිව සිහිනුවණින්යෙදී වාසය කරන්නේය, තවද මෙලෝ පරලෝ වැඩ නොදන්නා අඥානයන් හා එක්ව විසීමට වඩා ඇත්රලින් වෙන්ව වල්හි උද කලාව වසන්නාවූ මේ පාරලෙය්‍යක නම් හස්තිරාජයාගේ ගණයහැර තනිව විසීම මෙන් උතුම් වන්නේයයි තිලෝගුරු බුදුරජානන්වහන්සේ නොයෙක් කාරණා කියාත් ඒ කලහකාරී භික්ෂූන් සමගි කොටගත නොහී බාලකාලෝනකාරම තම් ගමටවැඩ එහි භගවතම් තෙරුන්වහන්සේට සමගිව විසීමෙහි අනුසස් වදාරා එයින් තුන්කුල පුතුන් වසන තැනටවැඩ සමග වාසයෙහි අනුසස් වදාරා එයින් පාරිලෙය්‍යක නම් වනයට වැඩ එහි තුන්මසක් වාසයකොට නැවත කොසඹෑ නුවරට අවුත් සැවැත් නුවරට වැඩිසේක. එකල කොසඹෑ නුවර උපාසකවරු මේ භික්ෂූහු අපට අනර්ථකාරීය, මුත් කරණ පිඬා ඉවසාගතනොහී අප බුදුරජ

තන්වහන්සේ වැඩසේක. අපි මුන්වහන්සේලාට නමස්කාර නොකරම්හයි සිහා ආකල ආහාර නොදෙම්හ, එකල මොහු දුරයාමක් හෝ සිවුරු ඇරීමක් බුදුන් පැහැදවීමක් නෝ කරතියි සනිටුහන් කොට එසේම කළාහුය. භික්ෂූහුද ඔවුන් පැවැත්වූ දඬුවමින් පිඬාවට පැමිණ සැවැත්නුවරට ගොස් බුදුන් ක්ෂමා කරවූවාහුය. මෙසේ භාගවත්වූ සම්මාසම්බුද්ධයන්වහන්සේ මේ ජාතකය ගෙණ හැර දක්වා පූර්වාපරයන්ධි ගළපා වදාළසේක. එකල්හි දීඝායු කුමාරයාගේ පිය රජ්ජුරුවෝ නම් දැන් සුඛෝදන මහරජ්ජුරුවෝය, එකල්හි ඔහුගේ මෑනියෝ නම් දැන් මහාමායා දේවීය, එකල්හි දීඝායුකුමාරයෝ නම් දැන් සියළු සත්වයන් කෙරෙහි පතළ කරුණායෙන් සමතිස් පෙරුම්පුරා සවාසතා සම්මක්ලේශයන් ප්‍රහීණකොට බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ වදාළසේකි.

---

## 415 මහගිරා ජාතකය

තවද ආත්මාර්ථ පරාර්ථ සාධනයෙන් ලෝකෝත්තමවූ ගෞතම නම් අප බුදුරජාණන්වහන්සේ එක් සමයෙක දෙවිරම් වෙහෙර වැඩවසන සමයෙහි එක් මහණකු අරභයා මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාළසේක. ඒ මහණතෙම බුදුන් කෙරෙහි සමථභාවනා කොසොල්දනව්වට ගොස් එක් පසල් ගමක් නිසා විසිය. එ ගම් වැසි මිනිස්සු ඒ භික්ෂූහට යාම ඊමට සැප පහසු නැන්හි හෝනා ඉදිනා සෙනසුන් කරවාදී උපස්ථාන කළාහුය. ඔහු වස්විසූ පළමුවෙනි මස ඒ ගම ගිහිතෙන් දූ ගියේය, වපුර බිජු පමණකුදු නොවීය. එයින් ඒ ගම්වැස්සෝ ඒ මහණට පිණ්ඩි බොජුන් දෙන්ට නොහැකිවූ ඒ මහණද සැපසේ සෙනස්තෙහි වසන්නේ සැපද අහර නොලැබීමෙන් සතර ඔග සතර ඵලයට පැමිණෙන්ට නොහැකි විය. වස් තුන්මස ඉක්බිති බුදුන් වඳිනට ගියාහ, ඕහට සම්මාසම්බුද්ධයන්වහන්සේ පිළිසඳර කථාකොට කිමෙක්ද මහණ අහරින් දුකෙක් නැද්ද, සෙනසුන් සැපදැයි විචාරා වදාළසේක. ඒ මහණද එපවත් බුදුන්ට දන්විය, එකල්හි බුදුරජානන්වහන්සේ මහණ! මහණුන් විසින් නම් සැප සෙනස්තක් ඇත, ප්‍රත්‍යයෙහි ලොල්ව හැසිරීම් හැර ලද මේ කිසිවක් අනුභවකොට මහණදම් පිරියයුත්තේය, පෙර නුවණැත්තෝ තිරිසන් යෝනියෙහි ඉපද තමා වසන රුක මළකල්හි එහි සුණු අනුභව කරන්නාහුම ලෝභසංවරය හැර මිත්‍ර ධර්මය නොබිඳ අන්තැන්හි නොගොස් විසුවාහුය. තෝ කවර හෙයකින් ආහාර සවල්පය රුක්ෂය සැපසෙනස්න හැර ආයෙහිදැයි වදාරා ඔවුන් විසින් ආරාධිතවූ සම්මාසම්බුදුන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යන්,**

එක් සමයෙක්හි හිමවත දිඹුල්වනයක නොයෙක් ලක්ෂගණන් ගිරවි විසූහ. එහි එක් ගිරා රජෙක් තමා වසන රුක ගෙඩි ඇතිකල්හි ගෙඩි අනුභව කොට ඒ නැති කල්හි දලු කොල සුඹුලු අනුභවකොට ගහින් පැන් බී

අනික් රුකකට නොගොස් ඉතා අපිස්සතොස්ව වසන්නේය. ඔහුගේ අපිස්සතොස් ගුණයෙන් ශක්‍රභවනය කම්පාවිය. සක්දෙව්රජ විමසනුයේ ගිරා රජහු දිවසින් දැක ඔහුගේ ගුණ විමසනු සඳහා තමාගේ ආනුභාවයෙන් දිඹුල් රුක දිරවා අතුවෙළෙප් නැති කණු පමණක් කෙළේය. ඒ තෙම උඩින් යටින් කළ සිදුරෙන් වැහෙන සුණු පමණක් ඇතිව සිටියේ ඒ ගිරා රජාද ඒ සුණු අනුභව කොට ගසින් පැන්බී අවුසුලනින් වත් දුක් නොතකා දිඹුල් කණුව මත් තෙහි උන්නේය. ඒ දුටු සක්දෙව්රජ ඔහුගේ උතුම් ගුණය දැක ඔහු ලවා මිත්‍රගුණය කියවා වරයක්දී දිඹුල්රුක අඹාඵලකොට එම්සි සිතා එක් හංසරාජ වේසයක් මවාගෙණ එවානාසඛනුව සුජාතාතම් අසුරකන්‍යාවත් ඉදිරිකොටා දිඹුල්වතයට ගොස් ඒ මළ රුකට නුදුරු තෙතකභිද ඒ ගිරා රජහු හා සමඟ කථාකරණුයේ, එම්බා ගිරා රජ්ජුරුවෙනි මිත්‍රභාවය නැසුනු රුක යම්කලෙක මධුරඵල ඇත්තේද එකල පක්ෂීනු අත්තෙන් අත්තට පැන ඇවිද ඵල අනුභව කෙරෙති, යම්කලෙක ඵල නැත්තේද එකල ඵල නැතැයි දැන ඒ ඒ දිඟ යන්නාහු වෙති, පබඵකලඹක් මෙත් රත්වූ මුඛතුඹක් ඇතිව වසනකල වෙතෙහි පලාවන් පැය මෙන් නිල්වූ පියපත් ඇති එම්බා ගිරාරජ්ජුරුවෙනි කුමක්නිසා තෙපි වනාහි මේ දිරුණු කණුව මත්තෙහි සෝකව සිතා ඉඳිනාහුද, ඵලාඵල නිසා වෙතෙහි හැසිරීම යහපත, කුමට මෙහි නිරාහාරව ඉඳ මියවිද? තොප මෙම කණුවේ නොහැර ඉඳිනා කාරණය මට කියවයි කීයේය. ඒ ගිරා රජ හංසයාට තමා කෙළෙහිගුණ දන්නා බව හා එයින් ඒ රුක නොහරනා පරිදි කියන්නේ, එම්බල හංසය යම් කෙණෙක් යම් කෙණෙකුන්ට යහළු වූතම් නුවණැති මහතුන් ගුණ සිහිකරන්නාවූ ඔහු තමන්ගේ යහළුවන් භෝගසම්පත්තියෙන් පිරිහුනත් ජීවිතාන්තය දක්වා සුව දුක්හි ඔවුන් නොහරණාහුමය, මමත් ඒ සත්පුරුෂයන් අතුරෙන් එක්තරා එකකිම්, එයින් මේ රුක මට ප්‍රිය වඩන හෙයින් ඤාතීද වන්නේය. එක්ව බොහෝ කල පුරුදු බැවින් මිත්‍රද වන්නේය, එබැවින් මගේ දිවිරැකීම නිසා පිරිහුනාවූ මේ රුක් කණුව හැර අන්තැනකට නොයෙමි, එසේයාම ගුණධර්මයෙක් නොවෙයි කීයේය. එකල සක්දෙව්රජ වරයක් දෙනුකැමැත්තේ පඤ්චපත්‍රයම යානාවක්කොට අහස සඤ්ඡාදණය කන්රන්නාවූ එම්බා ගිරාරජ්ජුරුවෙනි මිත්‍රභාවය ස්නේහය ප්‍රකාශවූ විශ්වාසය යන මේ ගුණ තුන යමෙක් කැමැත්තේ වීතම් ඒ නුවණැත්තාවුන් විසින් ප්‍රශංසා කරණු ලබන්නේය. ඒ සියළු ගුණයෝ තොප කරෙහි ඇත්තාහුය. එසේහෙයින් තොපට වරයක් දෙනුකැමැත්තෙමි, තොප කැමතිදෙයක් ගණුවයි කීයේය. ඒ අසා ගිරාරජ්ජුරුවෝ වර ඉල්වන්නාහු එම්බල හංසය මේ රුක නැවත ඕජා සහිත වේද විහිදුනු අතුපතරින් හා හටගත් මධුරඵලයෙන් යුක්තවේද ඒ වරය කැමැත්තෙමි කීහ, එසේකී ගිරා රජහට වර දෙන්නාවූ සක්දෙව්රජතෙම එම්බා ගිරාරජ්ජුරුවෙනි එසේවුවහොත් මහත් අතුපතරෙන් හා ඵලපත්‍රයෙන් යුක්තවූ මේ රුක නොදක්නෙහිය, මේ රුක හා තාගේ සහවාසයද වන්නේය, ඇසිල්ලකින් මේ රුක නොදක්නෙහිය, මේ රුක මධුර ඵලගෙණ සිටින්නේයයි කියා ඒ ශක්‍රදේවේන්ද්‍රතෙම තමාගේ හංස වේසය හැර සුජාතාවන් හා සමඟ දිව්‍යරූපයෙන් සිට ගසින් දියගෙණ දිඹුල් කණුවෙහි වත්කෙළේය. එකෙණෙහි ඒ කණුව අතුවෙළෙප් දළු කොළ මිහිරි ඵල

ගෙණ මුඩු නිල්මිණි පවුරක් මෙන් බබලමින් සිටියේය. ඒ දැක සක්දෙව් රජතුමා ස්තුතිකරණ ගිරාරජ්ජුවරුනේ, එම්බා ශක්‍රදේවේන්ද්‍රයෙනි අද මේ ඵල පත්‍ර ශාඛාවෙන් විචිත්‍රවූ මේ රුක දැක මම් යම්බඳු සතුටකට පැමිණියෙම්ද තොපිද එසේ තොපෙගේ තැයන් හා සමග සතුටුවයි කියේය. ඉක්බිති මෙසේ ඒ වෘක්ෂය පත්‍රශාඛාවෙන් සරනා තෙමාගේ දිව්‍යපුරයටම ඒ ශක්‍රදේවේන්ද්‍රතෙම ගියේය. අප තිලෝගුරු සම්‍යක්සම්බුඩ සර්ව්ඥරාජෝත්තමයානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි මෙසේ පුරාතනයෙහි හුව ණැත්තාවූ තිරිසන් ජාතියෙහි ඉපදත් ප්‍රත්‍යලෝභය හැර වාසයකළාහුය, තෝ මේ නෛර්‍යාණික ශාසනයෙහි මහණව කවරහෙයකින් ප්‍රත්‍යලෝභ යෙන් යුක්තව හැසිරේදැයි අවවාදකොට කමටහන් දී ඔහු පළමු විසූතෙනවම ගමන් කැරවූසේක. ඒ මහණද එතැන්හි ගොස් පඤ්චස්කන්ධය බයවයහෙයින් දක්නේ රහත්ඵලයට පැමිණියේය. එකල සක්දෙවිරජතෝ තම් දැන් මේ ශාසනයෙහි අනුරුඩසථවිරයෝය, ගිරාරජ තම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 416 සුළුසුව ජාතකය

මේවද එක්සමයෙක්හි බිය සහිත සරණ අසරණ සරණ කරුණා නිධානවූ අප බුදුරජාණන් වහන්සේ විපත්තියට සැවැත්නුවර තොහැර දෙවිරම්වෙහෙර විහරණය කරණසේක් තමන් වේරංජානුවර විසූ කරුණු අරභයා මේ ජාතක ධර්මදේශනාව දක්වා වදාළසේක. බුදුන් වේරංජානුවර වස්වැස වස් පවරා ඒ පුරහැර දෙවිරම්වෙහෙරට පැමිණිකල්හි දම්සභාමණ්ඩපයෙහි රැස්ව උන් භික්ෂූහු ඇවත්නි අප තථාගතයන්වහන්සේ විපත්තියට තොපත් සම් පත්තියෙන් මහත් කැත්කුලෙහි උපන් ලත්බැවින් හා සදෙස් කෙලෙස් සතු රන් තසා නිදෙස් පිරිසිදු බුදුබැව් ලත්බැවින් ඉතා සිව්මැළිසේක. මහත් සෘඩි මහිම ඇතිසේක. එතකුදුවුවත් වේරංජානුවර වැසි වේරංජානම් බමුණාගේ පැවරීමෙන් වස්වැස වසවත්මරු කළ සිත්පෙරළියෙන් සිහිතොලත් ඒ බමු ණාගේ එකදවසකුත් මදකුත් ආහාරයක් නොලැබද ලොහසංවාරය හැර දවස්පතා තැලියක් යවඅාලින් කළපිටි දියත්තකින් එපමණකින් වස් තුන් මසක් අන්තැනවකට නොගොස් විසූසේක බුදුන්ගේ අපිස්සතොස් ගුණය ඉතා ආශ්චර්‍යයයි කිවාහුය. සර්ව්ඥයන්වහන්සේ එබස් දිවකණින් අසා දම්සභාමණ් ඩපයට වැඩ බුඩාසනයෙහි වැඩහිඳ එම්බා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි මෙතැන්හි කවර කථාවක් පහළකොට උනුදැයි විචාරා මෙතම් කථාවකින් යෙදී උනුම්හයි දැන්වූකල්හි මහණෙනි දැන් සවිනේ දැන බුදුවූ බදුවරයන්ගේ ලොල් සසරින් දුරුවීම ආශ්චර්‍යයිනොවෙයි, පෙර තිරිසන්යොනියෙහි උපන්නා

හුද ඔහු ලොභසංචාරය හැර විසුවාහුවේදැයි වදාරා ඒ අසනු කැමති මහණුන් විසින් ආරාධිතවූ සම්බුදයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

පෙර එක් කලෙක හිමවත තුම්බුල් දිඹුල්වනයෙක නොයෙක් දහස් ගණන් සුවඟණයා විසූහ. ඔවුන් අතුරෙහි එක්හිරවෙක් තමාලත් නාරුක ඵල කල ඵල අනුභවකොට සෙසු කල කොල දලු සුඹුළුකා ගඟදියබී යැපී උන් රැකින් අන් රැකකට නොගොස් අපිස්සතොස් ගුණයෙන් වෙසෙයි, ඔහුගේ මෙම ගුණමහිමයෙන් මහමෙර හිරිමුදුතෙහි පිහිටි පුරදුරුපුර කම්පා විය. එවිට දහස් නැණසකින් සක්වළ බලන සක්දෙව්රජානෝ එබදු ගුණවතුන් ඒ බෝසතුන් දැක ඔහු ගුණ විමසනු නිසා තමා මහිමයෙන් හිමවත සුහුඹුල් දිඹුල්රුක නොවෙලා වියලා මෙළෙප් දලු කොළ සුඹුලු නැති උඩින් යටින් අදුරු සිදුරු නැති සිදුරුව සුණු වැහෙන දිරුණු කණු පමණක් කෙළේය. හිරා රජද එසේ වුවද එහි සුණුඅනුභවකොට ගහින් පැන්බී ලොබින් අන් රුකක් කරා නොගොස් අවු සුලඟින් දිඹුල් සිදුරු ඇතිව එම දිඹුල් කණුව මත්තෙහි උන්නේය, එසඳ සක්දෙව්රජද පෙරසේ ඔහුගේ මිත්‍රගුණය ලොවව දන්වා ඒ රුක අමාඵලගන්වා එමියි හංසරදවෙසින් එම වෙස්ගත් සුජාතාවන් හා සමග අවුත් ඒ දිරුණුතුරට තුදුරු තුරු අතුරෙක හිඳ මහ බෝසතානන් වහන්සේ සමග කථාකරණුයේ එම්බා හිරා රජ්ජුරුවෙනි නොපගේ පියාපතර මෙන් නිල්වූ අතුපතරෙන් නිලඹරසේ හොබනාවූ තොපගේ තුඩවැනි රන්විලි කුන් ඵලයෙන් පියුම් රා මිණිරුවන් ගහණ නිල් ජලතලාවක් මෙන් බබලන බොහෝ දිඹුල් රුක් මෙහි හාත්පස රැඳිසිටියේය. එතකුදු වුවත් තෝ මළ කණුවෙහි බැඳි ඉන්නාක්මෙන් මේ මළකණුවෙහි උන්නේය, කවරහෙයකින් මේ කණුමරවැල්ලෙහි ආලය කෙළෙදැයි විචාළේය, එබසට හිරා රජ්ජුරුවෝ එම්බල හංසය බොහෝ දවස් මේ ගස වැස රසඵල විලිකුන් අනුභව කළම්හ. එයින් රුක ඵල නැතත් පළමුවෙන් සිත්ම දනුත් තරකරම්හ, හංසරද මෙද එක් සත්පුරුෂ ධර්මයකැයි කීයේය. එබසට හංසරජතෙම එම්බා හිරා රජ්ජුරුවෙනි වගුල කොළ ඇති වියලි සල ගස පක්ෂීහු විපක්ෂී මෙන් නිර පෙක්ෂය හැරයෙති, ඒ පක්ෂීන් එසේ යාමෙහි තොපි කවර දෝෂයක් දැක නොගවියයි විචාළේය, එසේ විචාළාවූ හංසයාට කාරණා දක්වන්නාහු මහ බෝසතානන්වහන්සේ එම්බල හංසය යම් පක්ෂිකෙණෙක් ඵල කැමැත්තාහු රුක සේවනය කෙරෙද්ද? ඵල නැති කල නිෂ්ඵලයයි හරිද්ද? අත්වැඩ මිස පරවැඩ නොතකන ඒ පක්ෂීහු මිත්‍ර පක්ෂය නසන හෙයින් පක්ෂපාත නම් වෙතියි වදාළසේක. එබසට ඒ හංසතෙම එම්බා හිරා රජ්ජුරුවෙනි යහළු බවද මෛත්‍රියද කාමරාග විශ්වාසයෙන් අන්‍යවූ ප්‍රකාශ විශ්වාසයද යන මේ උතුම් ගුණයක් යමෙක් කැමැත්තේ වීතම් ඒ නුවණැත්තවුන් විසින් ප්‍රශංසා කටයුතු වන්නේය, ඒ ගුණයෝ තොප කෙරෙහි ඇත්තාහ, එයින් මරාමිණින් නිපන්නාක් වැනි පියාපතරින් හා රන් මැණිකෙන් කළාක් වැනි මුව තුඹින් රුවන් රුවක්මෙන් බබලන අතගි ගුණ මිණිගණගිහිණි හිරා රජ්ජුරුවෙනි සතුටුවූ වරයක් දෙන්නෙම් තොප කැමැත්තක් ඉල්වා ගණුවයි කීයේය. එබසට බෝසතානන් වහන්සේ

වදුරණසේක් එම්බල හස්රද අද යම් වරයක් දෙනු කැමැත්තෙහි නම් හුනු දිරුණු මේ රුක්කණුව පිරුණු රුකක්මෙන් ඵල පත්‍ර ශාඛාවෙන් සැරහුනා දක්නා කැමැත්තෙමි, ඒ එසේමය, මාහැඟි නිධානයක් ලද දිළින්දක්හුමෙන් මෙවන් රුකදුක නිරන්තරයෙන් සතුටුවෙම්ද එබදු වරයක්දෙවයි වදුළසේක, එසඳ සක්දෙව්රද හංස වේසය හැර දිව්‍ය වේසය ගෙණ සුජාතාව හා සමග නොපමාව දියගෙණවුත් අමාවක්මෙන් ඒ රුක්හි නමාලිය, එකෙණෙහි ඒ රුක්කණුව බෝසතානන්ගේ සිහිල් කුලුණු ගුණවත් සෙවන කෙරෙමින් පිරුණු බුදුකුරුදම් ලොවට පහළවන්නාක් මෙන් තුරුණු අකුරු දළුපතර මියුරු රසඵල විහිදී අතුපතර ඇතිව පෙණුනේය. එසේ පහළවූ රුක දුක සක්දෙව් රජතට සතුටුව ස්තුති කරණ මහබෝසතානන්වහන්සේ එම්බා සක් දෙව්රජාතෙනි, අද මේ නොමද පෙලෙන් මනතද මේ රුකලත් මම පැහැද යම් සැපයකට පැමිණියෙම්ද එසේම තොපිද සුරරද ඉසුරෙන් ඇමයද සුව පත් වේවයි වදුළසේක. එසඳ සක්දෙව්රජාතෝ මෙසේ බෝසතානන්ගේ සිත සතුටුකොට අහසට පැනනැඟී අවට පිහිටි රුවන්දෙරටු දහසකින් සැදුම් ලත් තමන්ගේ පුරයටම ගියේය. මෙසේ සියලු ලොවපතළ මහාකරුණා ඇති බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්මදෙසනාව ගෙණහැර නිමවා වදුළසේක. පෙර ඒ අපලත් රුක සඵලකළ සක්දෙව්රජාතෝ නම් දැන් මේ ශාසනයෙහි කිසිකෙණෙකුත් විසින් විරුඬ නොකොට්හැකි ගුණඍර්ධිමත් ඇති අනුරුඬසථවිර යෝය, දිරාවගුලතුර නොහැර මිතුරු ගුණ පුරා ඒ ගිරා රජ්ජුරුවෝ නම් සව්නේ දත විනේ දැන නිවන්පුරලත බව්මවේදැයි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදුළසේකි.

---

## 417 හාරිත ජාතකය

එවද එක් සමයෙක්හි තුසිත්ලොවට පහළවන නව අරහාදි බුදුගුණයෙන් අප්‍රතිසමවූ සර්ඥයන් වහන්සේ ජෙතවනාරාමයෙහි චතුර්විධ ආර්‍ය්‍ය විහරණයෙන් යුක්තව වාසයකරණසේක් වස්ත්‍රාභරණයෙන් සැරහී සිටි මාගමක දුක සිත උපන් බලවත් රාගයෙන් සස්නෙහි දුකින් දිවි පවත් වන මහණකු අරභයා මේ ජාතකය වදුළසේක. දික්නිය ලොම් කෙස් ඇති සිවුර හරණා කැමතිව සිටියාහු දුක ඇදුරු තෙරුන් විසින් නොකමා පරිද්දෙන් තමා කරා කැඳවාගෙණ ආ ඒ මහණහට සැබෑද මහණ නෝ සස්නෙහි උකවලීවූයෙහිදැයි විමාරා සාමීනි සැබවයි දැන්වූ කල්හි ඊට කාරණා කවරේ දැයි වදරා සැරහුනු ස්ත්‍රියකදුක සිත උපන් කෙලෙස් නිසායයි දැන්වූසඳ මහණ කෙලෙස් නම් සියළු ගුණකහනකෙණෙක, මද ආස්වාදයක් නැත්තේය, සතර අපායෙහි උපදනේය, ක්ලේශයෝ කවරහෙයකින් නා මැඬ නොපවත්නේද ඒ එසේමය මහමෙර පැහැර උපුටාගෙණ යන තරම් මහ පරණලාපෙතක පැකිල සිටින්නේ නොවෙයි, මේ ක්ලේශයා නිසා බොධිසම්භාරයන් පුරණලද පඤ්චානිඤ අෂටසමාපත්තියෙන් පිරිසුදු මහාපුරුෂයෝ පවා ස්ත්‍රී රූපය දුක සිහි එලවාගත නොහී ධ්‍යානයෙන් පිරිහුනාම වේදැයි වදරා ඉකුත්වත් දක්වා වදුළසේක.

**ඒ කෙසේද? යත්**

**ඉපි**ර බරණැස්නුවර බඹදත්තම් රජක්හු රජකරණ සමයෙහි අප මහ බෝසතාණන්වහන්සේ අසූකෙළක් ධනඇති බමුණුකුලයක උපන්සේක. රන් වන්වූ ශරීර ඡවි ඇති බැවින් ඔහට හාරිත කුමාරයෝයයි නම් තුබුවාහුය, ඒ තෙම වැඩිවිය පැමිණ තක්සලානුවරට ගොස් දිසාපාමොක් ආචාරීන්ගෙන් උගත් ශිල්පඇත්තේ දැරපරිග්‍රහකොට මවුපියන්ගේ ඇවැමෙන් රැස්කොට තිබූ අසූකෙළක් වස්තු දැක මේ වස්තුව පෙණෙන්නේය, මේ වස්තුව ඉපදවූ පුරුෂයෝ දක්නා නොලැබෙති. මිය විසිනුත් මරහු මුඛයට පැමිණ සුණුවිසුණු වියයුතුයයි මරණභයින් භයපත්ව මහදන්දී භිමවනට වැද තවුස් පැවිදිවූ සත් වෙනිදා පඤ්ඤාඅභිඤ්ඤා අෂ්ටසමාපත්ති උපදවා වනමුල් වනඵල අහරිත් එහි කලක් වැස ලුණු ඇඹුල් සෙවුනා පිණිස හිමවතින් බැස ගම් නියම්ගම් පිළිවෙළින් බරණැස් නුවරට පැමිණ රජ උයන් ලැග දෙවෙනි දවස් බරණැස් සිඟා ඇවිදිනාසේක් රජගෙයි දෙරට පැමිණිසේක බඹදත් රජ උන්වහන්සේ දැක පහන්සිත් ඇත්තේ කැදවා නගනලද සේසත් ඇති සිංහාසනයෙහි වඩාහිඳුවා තොයෙක් රස බොජුන් වළඳවා අනුමෙවෙනි බණ අසා ඉතා පැහැද වහන්ස කොයිවඩිනාසේක්දැයි විචාරා මහරජ වස්වසත තැනක් බලායම්හයි වදාළ කල්හි වහන්ස එසේදැයි විචාරා එසේයයි වදාළ ඉක්බිති උන්වහන්සේ කැදවා ගෙණ උයනටගොස් උන්වහන්සේව හෝනා හිඳිනා සෙතසුන් කරවාදී උයන් ගොවිවා අත් පා මෙහෙවර කරණුකොට සලස්වා වැද අවසරගෙණ ගියේය. මහබෝසතාණන්වහන්සේ එතැන්පටන් දෙලොස් අවුරුද්දක් නිබඳ රජගෙයි වළඳා උයන්හි වාසයකළසේක. එක්දවසක් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සතුරන් ගෙන් කිපුනු පසල්දනව්ව සන්හිදුවා ලනු පිණිස යනුවෝ අපගේ පින්කෙත නොනසා රක්ෂාකරවයි කියා මහබෝසතාණන්වහන්සේ අගමෙහෙසුන් බිස වුන්ට භාරකොට ගියෝය, එතැන්පටන් දේවිතොම මහබෝසතාණන් සිය අතින් වළඳවන්නීය. ඉක්බිති එක්දවසක් මධ්‍යාහ්නය සපයා තබා බෝසතාණන් කල් යවනුයෙන් තොමෝ සුවඳපැන් නහා සින් සිලිටු ඇළවක් හැඳ සිව් මැදුරු කවුළු දොරහැර අඟ පවන් ගසමින් මිටි ඇදෙක හොත්තීය, බෝසතාණන් වහන්සේද ඉතා දහවල්කොට හැඳ පෙරව භික්ෂාභාජනයගෙණ අහසින් ඇවිත් කවුළුදොරසමීපයට පැමිණිසේක. වඩනා ඒ බෝසතාණන්වහන්සේගේ වාක් විවරයෙහි ශබ්දය අසා වෙලෙවිව, ඇඳින් නැගිසිටිනා බිසවුන්ගේ සිළුටු සළුව මදක් ලිහිල්ව ඉනින් ඉනීහිත ඒ විෂභාගාරම්මණය මහබෝසතාණන් වහන්සේගේ ඇසට අරමුණවිය, තොයෙක් කෙළ ලක්ෂගණන් අවුරුදු මුළුල් ලෙහි සිත් සතහා විසූ රාගය පෙවිටියක නොත් සඤ්ඤෙකුමෙන් උත්ගතව ධ්‍යානය නැසීම ඒ තෙම සිහි එලවාගත නුනුනුයේ ගොස් බිසව අතගෙණ ලොකාස්වාදරතියෙන් යෙදී ආහාර වළඳා නැවත උයනට ගියෙය. එතැන් පටන් දවස්පතා එසේම පැවැත්තේය. එසේ එපවත්නා තාපසයන්වහන්සේගේ ඒ රහස මුළුනුවර ප්‍රකාශවූයේය, නුවර රැකවල සිටි අමාත්‍යයෝ ඒ බව පත්‍ර ලියා රජ්ජුරුවන්ට ගමන්කරවාහුය. රජ්ජුරුවෝ ඒ අසා අමාත්‍යයෝ තාපසයන් කෙරේ මා බිඳුවනු කැමැත්තාහුවනැයි අදහා තොගෙණ පසල්දනව්ව සෙමෙහි තබා බරණැස්නුවරව නැවත අවුත් නුවර පැදකුණුකොට රජගෙට

වැද බිසවුන් වසන ගෙට ගොස් සැබෑද සොඳුර අපගේ ආර්‍යාවූ තාපසයන් වහන්සේ තොප කෙරෙහි වරදවා පැවැතිසේක්දැයි විමසූහ. එසඳ බිසව සැබවැයි දේවයන්වහන්ස කීවාය. ඒත් රජ්ජුරුවෝ අදහා නොගෙණ තාපස යන් වහන්සේම විචාරමියි උයනට ගොස් බෝසතානන් වැඳ එකත්පස්ව ඉඳ කාරණය විචාරන්නාහු එම්බා තාපසයන්වහන්ස නුඹවහන්සේ අසද්ධර්මයේ හය කෙරෙතියි අප විසින් අයනලද කිමෙක්ද ඒ සැබෑබසෙක්ද නොහොත් බොරු බසෙක්දැයි විචාළේය. එකල්හි බෝසතානන්වහන්සේ ඉදින් මේ රජ මා බොරුයයි කීවත් අදහා ගන්නේය, එසේවුවත් සත්‍යවචනය වැනි මෙලොවට පිහිටෙක් නම් නැත්තේය, සත්‍යවචනයෙන් දුරුවූ කෙණෙක් බෝමැඩ ඉඳ බුදුවන්නට නොහැකිවෙති එයින් මා විසින් සැබෑවක්ම කියයුතු යයි සිතූසේක, ඒ එසේමය, බොධිසත්ත්වයන්ට කිසිකලෙකත් ප්‍රාණඝාතයද අදත්තාදානයද, කාමමිථ්‍යාචාරයද, සුරාපානයද, සිඳවන්නේය, කවරකලෙකත් තුන් අඟින්යුක්ත බොරු සිඳනොවන්නේය, එබැවින් සැබෑවක්ම කියන්නාවූ ඒමනබෝසතාණෝ එම්බා මහරජ්ජුරුවෙනි තොපවිසින් යමක් ඇසමියි කියන ලද ඒ සැබෑ දෙයක්ම එය සියළු සත්වයන් මෝහකරන්නාවූ කාය ගුණයෙහි මමත් මුළාව අසථයට පැමිණියෙමි වදාළසේක. එබඳට රජ්ජුරුවෝ එම්බා තාපසයන්වහන්ස මෙලොව ගිලන් මිනිස්සු තමන්ට උපන් ව්‍යාධිය ඖෂධ යෙන් සන්සිඳුවා ගණිති. උපන් පිපාසය දියෙන් සන්සිඳුවා ගණිති. නුඹ වහන්සේ වූකලී සිත උපන්නාවූ රාගය කිසිසේත් දුරුකොටගත නුහුනුසේක. එසේකල මේ සූක්ෂම අර්ථය සිතීමට සමර්ථ නුවණින් ප්‍රයෝජන කවරේදැයි කියේය. එසේ කී රජහට ඒ කෙලෙසුන්ගේ දැඩිබව හා එහි නුවත තොප වත්තා බව දක්නට්වකාවූ මහබෝසතානන්වහන්සේ,

චත්තාරෝ මේ මහාරාජ ලොකෙ අතිබලා භුසා,
රාගෝ දෙසෝ මදෝ මොහෝ යත්ථ පඤ්ඤා නසාඛති.

යන මේ ගාථාවෙන් එම්බා මහරජ්ජුරුවෙනි මේ ලෙව්හි සියළු සත්වයන්ට අනර්ථ කිරීමට අසමර්ථවූ අධික බලඇති වසතුහු සතරදෙනෙක්වෙති, ඔහුකව රේද, ශීලසමාධ්‍යාදී බොහෝගුණ එකවිට නසනහෙයින් රාගයද එක් බලවත් එකෙක ක්ෂාන්ති මෛත්‍රී ආදීවූ විශිෂ්ට ගුණයන් නසන හෙයින් ද්වේෂයද එක් බලවත් එකෙක, බොහෝකලක් පුරුදු ශීලසංවරාදීවූ සති විප්‍රවාසයට පමුණුවා අනර්ථකාරී හෙයින් පුරුෂමදාදීවූ මදයද ඉතා දැඩි බලවත් එකෙක. අමෘත මහානිර්වාණ ප්‍රතිලාභයට කාරණාවූ අනිත්‍ය දුක්ඛ අනාත්ම සවභාව පරිඥානය මැඩපවත්නා හෙයින් මෝහයද දැඩි බලවත් එකෙක යම්සේ ගැඹුරු මහවතු රෙහි වැටුන එකෙක් එහි පිහිටා සිටිය නොහේද එසේම මේ කෙලෙසුන් උපන් සිත නසනු පැවති ප්‍රඥාවෙන් පිහිට නොලබන්නේයයි වදාළසේක. ඒ මහ බෝසතානන්වහන්සේගේ තෙපුල්අසා බඹදත් රජ්ජුරුවෝ සවාමීනි තාපස යන්වහන්ස නුඹවහන්සේ පිරිසිදුයයිකියාද ශිල්වතැයිකියාද නික්ලෙශියයි කියාද, සභාවික ප්‍රඥඇතිසේකැයි කියාද අප විසින් සලකන ලද්දේ පව්දැයි කියේය. එබසට භාරිත තාපසයන්වහන්සේ එඹා මහරජ්ජුරුවෙනි ශුභාකාර යෙන් රාගය හා පැවැත්තාවූ ලාමකවූ අකුශල විතර්කයෝ ධ්‍යානසමාපත්ති අදි

විශෙෂගුණයෙන් යුත්ත බලවත් නුවණැති සෘෂිවරයනුත් තස්නාහුමයයි වදළසේක. ඉක්බිති ඒ මහබෝසතානන්ගේ සිත උපන් කෙලෙසුන් දුරු කිරීමෙහි උත්සාහ වඩන්නාවූ බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවෝ එම්බා තාපසයන් වහන්ස නුඹවහන්සේගේ සිත උපන් මේ රාගය නම් ශරීරවණ්ණය හා ගුණ වණ්ණය නසන්නේය, ඒ දුෂ්ටවූ රාගචෙතනාව දුරුකළ මැනව. ඒ එසේමය, නුඹවහන්සේ ලොව බොහෝදෙනාට නුවණැති කෙණෙකැයි අනිමතසේක්ම යයි කීසේය. ඉක්බිති පුරණලද බෝධිසම්භාර ඇති ඒ මහබෝසතානන් වහන්සේ සිහිඵලවා වස්තුකම ක්ලෙශකාමයෙහි ආදීනව සලකා වදාරණසේක් එම්බා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෙනි නුවණැති ඇස අක්ඛිකාරණ නෙයින් මේ රාගාදි ක්ලෙශයෝ අන්ධකාරයක් වැන්නේය, තමන් උපන් චිත්තසන්තානයෙහි කුසල් නසන නෙයින් හා කෘරවූ විපාක දෙන හෙයින් භීෂයක් වැන්නේය, දෙලොව නසනයෙක් දුකඛදුයක වේනි, එසේනෙයින් ඔවුන් නසනු කැමැත්තාවූ මම නුවණින් මෙනෙහිකිරීමයයි කියතලදඔවුන්ගේ උත්පත්තිකාරණ සොයන්නෙමි. මෙසේ රාගෝත්පත්තිකාරණය දුටුවාවූ මම සුභනිමිත්තාදී බන්ධනයෙන් යුක්ත රාගය ප්‍රඥා නමැති ඛඩ්ගයෙන් කපානරිමි. මහරජ මට මදක් අවසරදෙවයි අවසරගෙණ පන්සලට වැද කිසුනු මඩුල්ල බලා කැවතත් රූපාරූප ධ්‍යානයන් උපදවා අහස බඩපයඹ්ඩකයෙන් වැඩහිඳ රජ්ජුරුවන්ට ධර්මදෙශනාකොට මහරජ මම අස්ථානයෙහි විසූතියා මහජනයා මැද මෙබඳුවූ නින්දුවට පැමිණියෙමි, එසේහෙයින් සත්ව සංචාර විරහිතවූ හිමාලවනයට යන්නෙමි. තෙපිද කුසල් කිරීමෙහි පමා නොවයි කියා රජහු අඩඅඩා සිටියදීම සත්පරාක්‍රම ඇති ඒ තාපසයන්වහන්සේ නැවත හිමාලයවනයටම ගොස් නොපිරිහුනු ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකයෙහි උපන්සේකැයි චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ ජාතක ධර්මදේශනාව නිමිවා වදළසේක. මේ චතුස්සත්‍යය ධර්මදේශනාවගේ අවසානයෙහි උකටලී ඒ මහණ රහත් බැවිහි පිහිටියේය. නැවත සම්බුදයන්වහන්සේ එම්බා මහණෙනි එකල ඒ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ නම් දැන් මේ ශාසනයෙහි ධර්මභාණ්ඩාගාරිකවූ ආනන්දස්ථවිරයෝය, හාරිත තාපසයෝ නම් දැන් ලොව්තුරා බුදුවූ මම්මවේදැයි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදළසේක.

---

## 418
## රාජොවාද ජාතකය

මේවද මහර්ෂිවූ සම්බුදරාජෝත්තමයානන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසතසේක් රාජොවාදයක් අරභයා මේ ජාතකය දක්වනලද. මෙහි වනාහි රාජොවාදය විස්තරවශයෙන් තෙසකුණ ජාතකයෙහි පෙණෙන්නේය. මෙහි සම්බුදයන්වහන්සේ කෝසල රජ්ජුරුවන්ට වදාරණසේක් මහරජ පෙර රජදරුවෝ දශරාජධර්මයෙන් අකෝප්‍යව රාජ්ජය කළෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්බුදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

යි වගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන්නාවූ දශරාජධර්මයෙන් යෙදී රාජ්‍යය කෙරෙමින් තමන්ගේ නුගුණයක් කියනකෙණෙක් ඇද්දැනෝයි අනන්තපුර පිටිපුර මීපිපුර නුවර මුළුල්ලෙහි පරීක්ෂාකොට තමන්ගේ නුගුණයක් කියන කෙණෙක් නැති හෙයින් පිටිනුවර ගොස් පිටිනුවරත් තමන්ගේ නුගුණයක් කියන කෙණෙකුත් නොදැක වනාන්තරයට යෙමි හිමාලයට ගොස් බොධිසත්ත්වයන්වහන්සේ තපස්කරණ පන්සලට පැමිණියහ. බොධිසත්ත්වයන්වහන්සේත් රජ්ජුරුවන්දැක ගමන් ශ්‍රමදූහ නිවා මේ නුගපත් ශකීරා වසවැන්න මේ අනුභවකොට පැන්බී සැතපීගණුවයි කියා දුන්සේක. රජ්ජුරුවෝත් නුගපත් අනුභවකොට තාපස යන්වහන්ස නුගපත්නම් තිත්තරසය, මේ පැණිරසවන්ට කාරණාකිම්දැයි විචාළහ. එවිට බොධිසත්ත්වයන්වහන්සේ වදාරණසේක් පින්වත් පුරුෂ රජදරුවන් ධර්මිෂ්ඨව රාජ්‍යයකරණයෙයින් මේ නුගපත් තිත්තරස නැතිව පැණිරස වන්නේයයි කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු රජ්ජුරුවන් ධර්මිෂ්ඨ කල නුගපත් පැණිරසවන්නේත් අධර්මිෂ්ඨකල තිත්තරසවන්නේත් ඒට කාරණා කිම්දැයි විචාළහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු පින්වත්පුරුෂය රජදරුවන් අධර්මිෂ්ඨවූකල පොළොවරසයද සරියතක්පාතබැස පොළොව ඕජාව නැතිවෙයි එසේහෙයින් නුගපත් තිත්තරසවන්සේකයි කීහ. එවිට රජ්ජුරුවෝ රජදරුවන් අධර්මිෂ්ඨවූකල නුගපත් තිත්තරසය වේදැයිය කීහ. රජ්ජුරුවෝ තමන් රජබව නොහඟවා තමන් බරණැස්නුවරට ගොස් තාපසයන් කී බස පරීක්ෂාකෙරෙම් සිතා නොබෝ දවසක් අධර්මිෂ්ඨව රාජ්‍යයකොට තාපසයන් කී බස සැබෑව බොරුව පරීක්ෂාකෙරෙමියි ඉදින් නුගපත්කවයි දුන්කල රජ්ජුරුවන්ට තිත්තට ගියේනම් තාපසයන් කීබස සැබෑව පැණිරසවීනම් තාපසයන් කීබස බොරුයයිසිතා මේ නියාසෙයින් නොබෝදවසක් අධර්මිෂ්ඨව රාජ්‍ය කොව දෙවෙනිවත් හිමාලයවනයට බොධිසත්ත්වයන් ලඟවගියාහ. බොධිසත්ත්වයෝ පළමු පරිද්දෙන් නුගපත්කවයි දුන්හ. රජ්ජුරුවෝ නුගපත් සපා තිත්තරස හෙයින් කෙල සමඟ නුගපත් තාපසයන් වහන්ස නුගපත් තිත්තරසයයි කීහ. එවිට බොධිසත්ත්වයන්වහන්සේ වදාරණසේක් පින්වත් පුරුෂය රජ්ජුරුවන් අධර්මිෂ්ඨවූ සැටිය, එසේ හෙයින් නුගපත් තිත්තරසයයි කීහ. දියෙහි පිහන ලෙස නොටකින් ගොන් එලූකල පළමු පිහන්නාවූ ගොණා එල්ල නොටවම නොපිනා පාත්ව ඉවත පිනාද සෙසු ගෙරින් ඔහු පස්සේ පිහන්ද එසේහෙයින්ම දජ්ජුරුකෙණෙක් අධර්මිෂ්ඨව රාජ්‍යය කෙරෙත්නම් ඒ රාජ්‍ය වාසීන් අධර්මිෂ්ඨවන්නාහ, එසේකල්හි රාජ්‍යවාසීන්ටත් රාජ්‍යයටත් සැපයක් වත් වැඩක්වත් නොසැලසෙන්නේය, යම් නොටකින් ගොණෙකු දියපිහන ලෙස දියෙහි එලූද පළමු පිහන්නාවූ ගොණා වැනියක්නැතිව දියපිනා ගොඩ නැඟේද පසුපස්සෙයි පිහනගෙරින් ඉදුරාමපිනායෙත්ද එමෙන් යම් රජ්ජුරුකෙණෙක් අධර්මිෂ්ඨව රජ්‍යය කෙරෙද්ද රාජ්‍යවාසී එපරිද්දෙන්ම වාසය කරන්නාහ, එසේහෙයින් රාජ්‍යයටත් මනුෂ්‍යයන්ටත් සියළු අභිවෘද්ධියත් සැපත් එලවන්නේයයි කීය. එවිට රජ්ජුරුවෝද සාමීනි ආදී මේ නුගපත් පැණිරස කෙළෙමුත් මමය, දෙවෙනිව තිත්තරහ කෙළෙමුත් මම්මයයි තමන් රජනියාව අහවා නුවරවගොස් දශරාජධර්මයෙන් රජ්‍යය කළායයි වදාරා මේ

රාජෝවාද ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි රජ්ජුරුවෝ තම් ආනන්දසථවිරයෝය, තාපසව උපන්නේ තම් බුදුවූ මම්ම වේදුයි වදාළ සේක.

---

## 419 පදමානවක ජාතකය

මේවද කරුණා නිධානවූ තිලෝ ගුරු බුදුරජාණන් වහන්සේ ජේතවනා රාමයෙහි වැඩවසන සමයෙහි පියවර අසවලුන්ගේයයි දැන්වීම අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

සැවැත්නුවර සිවානකෙණෙකුන්ගේ පුතෙක් ඇත, ඒ පුත් වනාහි සත් අවුරුද්දක් ගිය යම්ම කෙණෙකුන්ගේ පියවර අසවලුන්ගේයයි පියවර සලකුණෙන් ගොස් උන්සිටි යම්ම තෙනකට ගොසින් සිටිනා නුවණ පහළ විය. එසේහෙයින් ඔහුව පදමානවක කුමාරයෝයයි නම් තුබූහ. පියානෝ පුතනුවන් පරීක්ෂාකරණ පිණිස අනික් ගෙයක සැඟවී උන්නාහ. පුතනුවෝ අවුත් පියානන් විචාරා ගෙයි නැතැයි කීහෙයින් පියානන් උන්තෙනට පියවර සලකුණෙන් ගොසින් සිටියාහ. දෙවෙනි මුරයකුත් පුතනුවන් පරීක්ෂාකරනු පිණිස සිවානන්ගේ ගෙටවැද පැලදෙරින් අනික් ගෙයකට වැද ඒ ගෙයි පැලදෙරින් ගොසින් තමන් ගෙට වැද වීපියට බැස වීපියෙන් පිටත මහබලා ගොස් ජේතවනාරාමයට ගොස් බුදුන් වැඳ සිටියාහුය. පුතනුවෝ ගෙට අවුත් පියානන් විචාරා නුදුටුම්හයි කීහෙයින් සිවානන් ගිය පියවර සලකුණෙන් ගොස් අනික් ගෙයකට වැද ඒ ගෙයි පැලදෙරින් තමන්ගේ ගෙට අවුත් වීපියට බැස පිටමග ඔස්සේ ගොසින් ජේතවනාරාමයට ගොසින් පියානන් ලඟ සිටියාහ, සිටානෝ සම්මුඛයන්වහන්සේව දන්වන්නේ සවාමීනි මාගේ පුත්‍රයාට සැඟවී මෙතනට ආම්, මාගේ පියවර සලකුණෙන් සොයාගෙණ අවුය, මුන්ගේ නුවණ යහපත්නියාවයයි දැන්වූහ. සම්මුඛයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්**

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ කල්හි රජ්ජුරුවන්ගේ අග්‍රමහෙසිකා බිසව් අතාවාරයෙහි යෙදී වාසයකරන්නාහුය. රජ්ජුරුවන් විසින් එපවත් අසා කෝපවූ කල කියන්නාහු අතාවාරයේ සිව රජ්ජුරුවන්වහන්ස මම එසේ නොකෙළෙම්, එසේවූ අතාවාරයක් කෙළෙම්නම් අස්මුහුණක් ඇතිව යක්ෂණියව උපදින්වයි කියා බොරු දිවිලීය, දිවුළ නොබෝකලකින් මිය ඒ දිවුළ පරිද්දෙන්ම අස්මුහුණක් ඇතිව යක්ෂණියව ඉපද වෙසමුණි රජ්ජුරුවන්ට දෙළොස් අවුරුද්දක් පැන් ඇද දිගින් නිස්ගව්වක් හා පළලින් පස්ගව්වක් ඇති වනාන්තරයක මිනීකන නියාගෙන් වරලැබ ගල්ගුහායෙක වාසයකරන්නීය, එසමයෙහි එක්දවසක් බ්‍රාහ්මණයෙක් තමාගේ පිරිවර හා සමගින් ගමනක් යන්නේ ඒ වනාන්තරයට පැමිණියේය. ඒ යකින්නී දුරුත්තාවූ බ්‍රාහ්මණයා දැක එතකට පැමිණ කර ඉඳුවාගෙණ

තමාගේ ගුහාවට ගියාය. බ්‍රාහ්මණයාගේ ශරීර පහස තමා ශරීරයේ වැදගත් ගමනේ සමාධියෙන් බ්‍රාහ්මණයා තමාට සවාමිපුත්‍රකොට තබාගෙණ ඔහුව බත්බුලත් ආදීවූදෙය බැගින් ගෙණගොස් බ්‍රාහ්මණයාට දෙන්නීය, තොමෝ මිනීමස් කන්නීය, එකීයන බ්‍රාහ්මණයා හා යක්ෂණී මහත් සත්තෝෂයෙන් වාසය කරන්නාහ. එසමයෙහි ශ්‍රීමත්වූ බෝධිසත්වයෝ බ්‍රාහ්මනයාගන් නිසා යකින්න ඔබ පිළිසිඳ දසඑකඛමසකින් වදුපුව, බොධිසත්වයෝ වැඩිවිය පැමිණියාහ. යකින්නී මස්කන්ට යතකල පුතනුවන් හා සවාමිපුත්‍රයාගන් ගල්ගුහාවේ ලා සැඟවී පලා යතියි සිතා මහත් ගල්ලැල්ලකින් දොරකඩ වසා යන්නීය. එක්දවසක් බෝධිසත්වයෝ ගල්ලැල්ල ඉවත්කොට දොරමිදුලේ සිටියාය. යකින්නී අවුත් වැදගියාය බෝධිසත්වයෝ ගල්ගුහාවට වන්නාහ. යකින්නී කවුරුද මේ ගල්ලැල්ල ඉවත්කලෝයයි කිව, බ්‍රාහ්මණයා කියන්නේ තොපගේ පුතනුවෝ තුලු ගල්ලැල්ල ඉවත්කලෝයයි කීහ. යකින්නී පුත්‍රස්නෙහයෙන් කුමකුත් නොකිව. එක්දවසක් බොධිසත්වයෝ පියානන්ට කියන්නාහු මපියානන්වහන්ස නුඹවහන්සේගේ මුහුණත් මාගේ මුහුණත් එකපැ මුහුනුවරය, මැනියන් වහන්සේගේ මුහුනුවර වෙනය, මීට කාරණා කිම්දැයි කීය. එවිට බ්‍රාහ්මණයා කියන්නේ තොප හා අප හා මිනිස්සුව මෝ යකින්නියයි කියන්නා බෝධිසත්වයෝ මුන් යකින්නී කල අප එකතෙන වාසයකරන්නේ කෙසේදැයි කියා බොධිසත්වයන් වහන්සේ පියානන් ඇරගෙණ නික්මුණුකලට යකින්නී වහා අවුත් ගල්ලෙන බලා නොදැක මගට ගොසින් දෙන්නා එක්ව අල්වාගෙණ ඇයි බමුණ කුමික් කෙළේදැයි විචාරන්නා මම නොවෙයි දරුවෝයයි බ්‍රාහමණයා කීයේය. යකින්නී පුත්‍රස්නෙහයෙන් කුමකුත් නොකළීය. මේ නියායෙන් තුන්වාර යක් මගට ගිය ගමනේ යකින්නී ගෙණාව. පසුව දවසෙක බොධිසත්වයෝ සිතන්නාහු මේ නියාවට ගොසින් හැලවිය නොහැක්ක. මාගේ මැනියන් අතින් ඉම විචාරාගෙණ යෙම් සිතා බොධිසත්වයෝ මැනියන්ට සුරතල් කොට විචාරාගණිමි සිතා මැනියන්වහන්ස දෙමව්පියන් සන්තක වස්තුනම් දරුවන් සනතකය, එසේහෙයින් නුඹවහන්සේ මිනීකත ඇතුළත ඉම ගම මට කියන්ට උවමැනවැයි කියන්නා යකින්නී බොධිසත්වයන්ට අසවල් පළිතය අසවල් ගස ඇතුළුතැන නම් මාගේ ඉමය, දිගින් තිස්ගව්වක් හා පළලින් පස්ගව්වක් හා ඇතුළුතැන ඉම කිව. බොධිසත්වයෝ එක්දවසක් යකින්නී ගොදුරු කන්ට යාදි පියාණන් කර ඉඳුවාගෙණ පවතට බදු වේගයෙන් දිව ගෙණ ගොස් යකින්නියගේ ඉම මඩ්‍යයට පැමිණ සිවි කලට යකින්නී ගල්ලෙනට අවුත් බලා නොදැක මහත් වේගයෙන් ඉම් ඉවරට අවුත් කියන්නී පුත තොප හා තොපගේ පියානන්ට කවර අපාසුවක් දැක මා ඇර යවුද තොපගේ පියානන් නොදැකීමෙන් මාගේ ජීවිතය තිබෙයි යන්නෙක් නොසිතවයි. කියද්දීම ගහින් එගොඩ බසා බොධිසත්වයෝ කියන්නාහු මැනියන්වහන්ස නුඹවහන්සේ යකිනියක අපි මිනිස්සුය. එක තැන වාසයකිරීම අපාසුයයි කීහ. එවිට යකිනී කියන්නී පුත තොප හා වියෝවීමෙන් මාගේ ජීවිතය නොතිබෙයි කියද්දීත් බොධිසත්වයෝ මැනියන්වහන්ස නුඹවහන්සේ කෙසේ කිවත් නුඹ යක්කුව අපි මිනිස්සුව එක තැන වාසය බැරියයි කියා නික්මෙම්යි කීහ. යකින්නී පුත තොපි ගිහිගෙයි වාසය කිරීම නොයෙක් දේ ඉගෙණ ගෙණ වාසය කරන්ට උවමැනව දෙලොස් අවුරුද්දක්කල් සොරකමෙක් චිතමුත් පෘදලාංජනයකින් අල්වා ගන්නා නිමිත්ත කියන්නාහු චින්තාමාණික්‍යයක් මෙන් පෙණෙන්නාවූ

යහපත් දිව්‍ය මන්ත්‍රයක් ඇත ඉගෙණගෙණයවයි කීහ. ඒ යහපතැයි කියා වැදඔත්තේය, මන්ත්‍රය ඉගෙණගෙණ වැදලා මැනියන්වහන්ස වැඩියමැන වයි කියා බොධිසත්වයන් නික්මෙන ආකාර දැක්වූ ගමනේ පුත මා ඇරපියා යවුදැයි කියා ලෙයි අත ගැසූ ගමනේම ලය දෙකක්ව පැලී මළාය. බොධි සත්වයන් හා පියානෝ දෙවෙනිව ගඟින් මෙගොඩට ඇවිත් ආදෑහන කොට අඩා වැලප නික්මුනාහුය. යක්දරුවෝ වෑවෙති යක්දෙමවුපියෝ නොවෑ වෙති කියත, එසේහෙයින් පියානත් හා සමගව බෝධිසත්වයන් හා දෙදෙන බරණැස්නුවරට ගොසින් රජ්ජුරුවන්ගේ වාසලසිටකියා යවුහ. රජ්ජුරුවෝ කියන්නාහු සොරාගේ පියවර සලකුණෙන් ගොස් සෙරකම් අසුකරන්නා වූ පදමානවකයෝ නම් තොපි දැයි විචාළාහ. සබඳ දරුව තොපි සොරකම් අසුකරන්නේයයි විචාරන්නාවූ එවේලෙහි බොධිසත්වයෝ සැබව සවාමීනි දෙලොස් අවුරුද්දක් කළ සොරකමුත් පාදලාඤ්ඡනයකින් අල්වා පාවා දෙම් කීහ. රජ්ජුරුවෝ යහපත මා හා කැවිව සේවය කරවයි කීගමනේ සවාමීනි සේවාකමට සිටීමට මස්සෙන් දුසක් නියාවට පඬි දුනමැනවැයි කියා සලස්වාගෙණ රජ්ජුරුවන්ගෙන් පඬිකා සේවය කරන්නාහ. එසම යෙහි එක්දවසක් රජ්ජුරුවන්ගේ පුරෝහිතබමුණා රජ්ජුරුවන්ට කියන්නේ සවාමීනි මූ සොරකම් අසුකරමිකියති. ඒ සැබැබවත් බොරුබවත් නොදැනෙයි ඒ පරීක්ෂාකරන්ඩ උවමැනවයි කියන්නා රජ්ජුරුවෝ යහපතැයිකියා පුරෝහිතයාතොත් රජ්ජුරුවෝත් මතුමහලට නැගී හාණ්ඩ තුබූ ගබඩාවේ දෙර හැර ඉන් සම්පත් ඇරගෙණ ඉනිමගින් පාතබැස රජගේවට තුන්විටක් ඇවිද පහුරේ ඉනිමග වතුරුවා ඊපිටින් බැස අධිකරණ ශාලාවේ තැනක්වේලා සිට දෙවෙනිව ඉනිමගින් ඇතුළට අවුත් මගුල්උයනේ පතස වවකොව තුන්විටක් ඇවිද පතසැ ඇතුළෙ ගෙණගිය සම්පත් සඟවා තබා රජගෙට ගියාහ. පසුව දවසෙක භාණ්ඩාගාරේ සොරකම්කළෝයයි නුවර මුලුල්ල ප්‍රකාශවිය, රජ්ජුරුවෝ බොධිසත්වයන් කැඳවා කියන්නාහු ඊයේ රෑ උඩුමාලේ ගබඩාවේ සොරකම් කොට ගත්තාහ, අපව අල්වාදෙවයි කීහ. බොධිසත්වයෝ උඩු මාලව නැගී මන්ත්‍රය දුන් මැනියන්වහන්සේට නමස්කාරකොට කියන්නාහු දේවයන්වහන්ස මෙතන සොරබැය, අධිකරණ ශාලාවේ මිදක් වේලා සිට දෙවෙනිව එම ඉනිමගින් පතසව හොසින් පතසවට තුන්විටක් ඇවිද පතසට බැස දියෙහිතුබූ සම්පත් ඇරගෙණ රජ්ජුරුවන්ට දුන්හ. එවිට සියදහස් ගණන් මනුෂ්‍යයෝ දැස සියගණන් පිළිඉසසිසාරා නැටුම් ඔල්වරසන්දී මහත් වූ සන්තොෂවූහ. රජ්ජුරුවෝත් එවිට සොරකම්කළ සොරුන්තම අපව කිව මැනවයි කීකල්හි සවාමීනි සම්පත් තිබූ පසු සොරුන්ගෙන් ප්‍රයෝජන කිම්ද සොරකම් කළ සොරුන් තම මම දනිමි මම නොකියම් මෙතතමයයි කීහ. රජ්ජුරුවෝ සොරුන්ගේ තම අසන්ට උවමැනවැයි තත්පරව කියන්නාහු බොධිසත්වයෝ සවාමීනි සොරුන් තම කිය නොහැක්කේය. බොහෝ සම්පත් ඇති මනුෂ්‍යයෙක සොරකම් කෙළේය. නම් කී කල බොහෝදෙනා විපසසව බැවින් අසවල්හුයයි නම කිය නොහැක්ක, කාරණයෙක් දක්වම් කියා කියන්නාහු රජ්ජුරුවන් වහන්ස ඝටගිය දවස බරණැස්නුවර පාඨලි නම් විද්දතෙක් ඇත, ඒ විද්දතා ගඟින් එතර ගමනක් යන්වයයි කියා ඝන තැනැත්තේ ගඟට බසිනා ගමනේ ගඟවතුර හෙයින් වීනාව තමාගේ බොවුවේ බැඳ ගෙණ අඹුව උරෙහි එල්වාගෙණ ගඟින් එගොඩ පිණන කලව ගඟමඬ්‍යයෙහි වීණාවව දියඉකි මියන්ට වන්කලට අඹුව අතහැර ගොඩපිනා සිට කියන්නේ

දැන් මදකින් තොප පැන්බී මියෙති තොප බොහෝ ගිදන්නෙහිවේද ඉන් ගියක් මා රැකෙණ නියායෙන් උගත්වාලවයි කිව, එවිට විද්දතා කියන්නේ මියෙන කල තොපව කුමන ගිදු උගන්වන්නේයයි කියා කියන්නේ පැන් මුල්ව පිපාසා පවන් ආදීවූ දෙයද අනිකුත් බොහෝ වැඩියේ යෙදෙන්නාවූ පැතින් මා මරණකල මා කළමතා කිම්දැයි කියේය. එමෙන් සියළු මනුෂ්‍යයන්ට අභිවෘඩ්දුයකවූ කෙණෙකුන් විසින් වූදෙයක, එසේහෙයින් සොරකම් කළවුන් කියතොහැක්ක, සබාමින්වම දැනෙයි කියද්දීත් තත්පර වම රජ්ජුරුවෝ සොරුන්ගේ නම කියන්ට උවමැනවැයි කියන්නාහ. එවිට බෝධිසත්වයෝ රජ්ජුරුවන්වහන්ස අසවළුනැයි කිමෙන් බොහෝ උපද්‍රව සැලසෙයි කියන්නාහු රජ්ජුරුවන්වහන්ස මෙම නුවර එක් කුඹලෙක් වළකින් පස් කපා මැටිගෙණ පිටත්ව යන්නේ එම මැටිගත් වළ දැවසක් වැසීමෙන් දියපුරා වැසිනා; කුඹලා මැටිකපමින් සිට කියන්නේ මට ප්‍රතිෂ්ඨා වූ ගැම්යා නිසා මට භය පැමිණෙන්නේයැ කිය; එමෙන් රජ්ජුරුවන්වහන්ස මේ සොරකම් කළුන්ගේ නම් කිය නොහැක්ක, නම් කිමෙන් බොහෝ අලාභයට මූලිකවෙයි, නුඹවහන්සේටත් සොරුන්ගේ නම දැනෙයි කියාදීත් මට මේ ව්‍යාඛ්‍යාන කිමෙන් ප්‍රයෝජන නැත, සොරුන්ගේ නම මට කියන්ට උවමැනවැයි කිහ, නැවත බෝධිසත්වයෝ කියන්ට භයකෙරෙයි කියා අනික්කාරණාවක් දක්වමින් කියන්නාහු රජ්ජුරුවන්වහන්ස මෙම නුවර පුරුෂයෙකුගේ ගෙයක් ගින්නෙන් වැදගෙණ ඒ ගෙයි ගිනි වැදහත් පුරුෂයා තමාගේ ගෙයි යම්පත් දෙරට දෙමින් සිට අනික් පුරුෂයෙකු කැඳවා තමාගේ සම්පත් ඇද පිටතට ලාපියවයි කියන්නා යහපතැයි සහායව ගෙන් පිටතට සම්පත් අදිනාකලට දෙර වැසීගිය හෙයින් දුම් සිසැරී දෙරකඩ සොයාගත නොහෙන තැනැත්තේ සියළු ආහාරයන්ද ප්‍රිසන්නාවූ සිත කාලයෙහි සිත නීවරණය වන්නාවූ සියළු කුණප දවා අනතඕන කරන්නාවූ ගින්නෙන් මෙසේවූ භය කරන්නේ කිම්දැයි කිවාසේම රජ්ජුරුවන්වහන්ස සොරකම් සැලසුනේ සියලු සතුන්ට ප්‍රතිෂ්ඨාවූ තැනකින මා අමුතුව අසවලුනැයි කිවමනාදැයි කිහ. එසේ කියද්දීත් රජ්ජුරුවෝ මට වඤ්චාකොට කිමෙන් ඒ නොදැනෙයි සොරු අසවලුයයි කියමිනවැයි කිහ. බෝධිසත්වයෝ නැවත කාරණයක් දක්වා කියන්නාහු රජ්ජුරුවන් වහන්ස මේ නුවර පුරුෂයෙකු වාතව්‍යාධි රුජාවෙන් පීඩිතව පෙළෙමින් සිට කියන්නේ සියළු සත්වයන්ට දුකකරණ අවසථාවෙහි දුහ සන්හිදුවන්නාවූ පවනින් මට ආයාස පමුණුවන්නාහුය, එමෙන් සියළු මනුෂ්‍යයන්ට වැඩදායක කෙණෙකුන් කළ සොරකමය, එසේහෙයින් කියතොහැක්කැයි කිහ. මේ ව්‍යාඛ්‍යන කිමෙන් මට ප්‍රයෝජන නැත, සොරුන් අසවලුයයි කියවයි කිහ. බෝධිසත්වයෝ නැවත කාරණා දක්වන්නාහු රජ්ජුරුවන් වහන්ස මෙම නුවර එක්පුරුෂයෙක් බත් අජීර්ණකොට කා දිරවාගතනොහැකි තැනැත්තේ කියන්නේ සියළු මනුෂ්‍යයන් ජීවිතාරක්ෂාවන්නේය, එසේවූ බත් කා දිරවාගත නොහී ප්‍රාණය යන්නේයයි ඇඬිය, එමෙන් සියළු මනුෂ්‍යයන්ට ප්‍රතිෂ්ඨාව යසදායක නැතකින්ම කළ සොරකමය, එසේ හෙයින් කිය නොහැක්කේයයි කියදීත් තත්පරවම සොරුන්ගේ නම් කියවැනවැයි කිහ. නැවතත් බෝධිසත්වයෝ අනික්කාරණයක් කියන්නාහු රජ්ජුරුවන් වහන්ස හිමාලය වනයෙහි එක් මහ වෘක්ෂයෙක බොහෝ පක්ෂි වාසය කරන්නාහ. ඒ වෘක්ෂයේ අතු දෙකක් ඊ ඊ ගැටී ගිනිවැදගත ඊ පක්ෂීන්ට නායකවූ

පක්ෂියා කියන්නේ තොපට පළමු ප්‍රතිඥාවූ වෘක්ෂයෙන්ම ගිනිගැටි වෘක්ෂය දවන්නේය, තොප දන්නා යම් අතකට ගොස් ජීවත්වයි කී කල්හි ඒ ඒ අත ගියහ, එමෙන් රජ්ජුරුවන්වහන්ස සියළු මනුෂ්‍යයන්ට ප්‍රතිඥා කෙණෙ කුන්වහන්සේ කීකල සොරකමකෙයින් කියතොහැක්කෙමි කීහ. රජ්ජුරුවෝ වංචාවෙන් මෙසේ කීවයි අදහා කොගනිමියි සොරකම් කලෝ අසවිල්ලුයයි කීවයි කීහ. බොධිසත්වයෝ කැවතත් කියන්නාහු රජ්ජුරුවන් වහන්ස කාරණාවක් දක්වමි ඒ කෙසේද? යත් මේ නුවර බොහෝ කිඹුලුන් ගහනවූ ගඟක් සමීපයෙහි ගමෙක එක්තරා පුරුෂයෙක් තමාගේ කණුවැන්දඹු මවක් රකිනේය, එකියන පුරුෂයාගේ මවු දරුවෝ මට බොහෝ දුක්ගෙණ පෝෂ්‍ය කරන්නාහ, එසේ හෙයින් මූණඬ බිරින්දක් ගෙණෙම් සිතා එක්තරා ස්ත්‍රියක් ගෙණවිත් සරණපාවා දුන ඒ ස්ත්‍රිය පුරුෂයාව දරුවන් වදා ඒ ගෙට වල්ලභ ස්ත්‍රිවූහ. ඒ ස්ත්‍රී තමා කැන්දුව කතස්සළුව බොහෝ නුගුණ කියන්නී නුඹ දැගේ මැනියන්දැ මෙගෙයි ඉන්දැ තම් මා මේගෙයි ඉන්නේ නැත, ඒකාන්තාව කියන්නීය, ඒ පුරුෂයා කියන්නේ එසේ කල කුමක් කරමෝදැයි කීහ. කිඹුල්ලු බොහෝ ඇති ඟඟ දමාපුවොත් යහපතැයි කියා තොපගේ මැනියෝත් අපගේ මැනියෝත් එකතැන සැතපෙති එසේහෙයින් ඇද සල කුණට වැලක් බඳවයි කීහ, යහපතැයි කියා ගොසින් නැන්දු වැදෙත් ඇද වැලක් බැඳ අවුත් සැමියාට කිව, ඒ පුරුෂයා කියන්නේ මිනිසුන් වැඳෙනා තුරු නිදුපියවයි කියා බිරින්ද අස්වසාලා නිදිගන්වා මධ්‍යම රාත්‍රී වේලෙහි තමා ගේ මැනියන් ඇඳබැඳලූ ලනුව තමාගේ බිරින්දගේ මැනියන් වැඳෙනා ඇද බැඳලා අඹුව පුබුදුවාගෙණ ගොසින් දමමි කියා ලනුව අල්වාගෙණ ගොස් ඇද ඔසොවාගෙණ ගඟට ගෙණගොස් මැල්ල ගංමඩ්‍යයට දැමූහ. මැල්ල දැමූ ගමනේ කිඹුල්ලු ගසා කාපූහ. පසුවදා පාන්වූ පසු ස්ත්‍රියගේ මැනියන් කැතිව පුරුෂයාගේ මැනියන් උන්නා දැක මාගේ මැනියන් දමාපුවේය. තොපගේ මැනියෝ උන්නේය, උනුන් මරන්ට උවමැනවැයි කීහ. එසේ කල කෙසේ මරමෝදැයි විචාළෝය, ගඟට දමන්ට බැරිය අමු සොහොනක දමාපියවයි කිවුය, යහපතැයි කියා මැල්ල වැද නිදනකලට මධ්‍යම රාත්‍රියෙහි දෙන්න කැටිව ඇද ඔසොවාගෙණ අමුසොහොනට ගෙණ ගොස් ඇද තබාලා පුරුෂයා කියන්නේ ගිනිගෙතාවේ නැත තොපි හොසින් ගිනි ඇරගෙණ එවයි අඹුවට කිව, අඹුව තනිව ගිනිගෙණ නොහෙම් කිව, එසේවිනම් දෙන්තම ගොසින් ගෙණෙම්හයි කියා දෙන්නම් ගියාහුය, ඒ පවන් ඇතිතෙන පවන් ඇවිත් ඇඟ වැදගත්තේය, මැහැලි වහන්සේ පිබිද නැගිසිට වටපිට බලා අමුසොහොන නියාව දැන මා මරණට කල උපා යක් වේදැයි සිතා එතන තුබූ මිනියක් ඔබවා ඇද තබාලා ඉනකඩකින් වසා ගිය නැනැත්තී සොරුන් සොරකම් කොට අවුත් වස්තු තුබූ ගල්ලෙනට වැද ගියාහ, දෙමල්ලෝ ගිනිගෙණවිත් මැල්ලියයි සිතා දවාපියා ගෙට ගියාහ, සොරුන් තමන් වස්තු තිබූ ගල්ලෙනට අවුත් එහි උන් මැල්ල දැක යකින්නි යකැයි යන භයින් යකදුරකු ලඟට ගොසින් මේ සැටි යකින්න පහකරන්ට මට භාරයයි කියා ගල්ලෙන සමීපයට ආ කල්හි මැලි කියන්නී මම යකකු නොවෙමි තොපසේම මිනිස්සුයයි කිව, එසේවිනම් මා තොප අදහාගන්නේ නැතැයි කීහ. මැලි කියන්නී එසේවිනම් තොප හා මා දිවෙන් දිව ගැවොත් විනා නැත්තම් සැක ඇත්තෙම්යි කී හෙයින් යකදුරාත් එම නියාවට සිටිසඳ

දිව දික්කොවලි. මිහැලු දිව බැහැගත්තිය, තමන් කටට දිවින් කැබැල්ලක් කඩාගත්තාහු; එවිට යකදුරා හඬින් දිව අවුත් කියන්නේ යකින්න නියාව සැබෑමයයි කියන්නා සොරු දිවපුවාහුය. මැහැලි ගල්ලෙන තුබූ රත්‍රන් අත කර ලාගෙණ යාපත් පිළි හැඳ යහපත් පිළි පොරවාගෙණවුත් තමාගේ පුත්‍රයාගේ ගෙට වන්හ. එවිට යෙහෙලනියෝ දිවගෙණවුත් වැඳ ඇයි නැන්දනියෙනි නුඹ දවාපුවෝද කෙසේ ආදැයි විමාළිය, මැලි කියන්නී අමුසොහොනේ දැවුවන් මේ ගෙට එනමානයයි කිව, එබසට යෙහෙලනියෝ තමන්ගේ සමතන්ට කියන්නාහු මාත් එසේම සැරහීගෙණ එන නියායෙන් එම අමුසොහොන දවාපුව මැතවැයි කිව, යහපතැයි කියා තමාගේ අඹුව ගෙණගොස් අමුසොහොනේ දවාපුව, පසුව දවස් තමාගේ මැනියන් ආවෙලා වට නොඑන හෙයින් කියන්නේ මැනියෙනි, මාගේ බිරින්ද නේන්ට කාරණා කිම්ද ? ඊයේ නුඹ මේ වේලෙහි ආයේවේද, අද මුන් නේන්ට කුමන කාරණ යෙක්දැයි විමාළේය. මැලි කියන්නී දවාපු මිනිස්සු ගෙට එද්දැයි පුතනුවෙනි තොප වඩා වඩිනය කොට තොපගේ ඓශ්වර්‍යය බලම් සිතා තොපව බිරින්ද ගෙණැවිත්ලා රැකෙන්ව උන්නෙමි තොපගේ බිරින්දගේ බස්ගෙණ මා මරන්ට උත්සාහ කළා වේදැයි කියා එමෙන් ප්‍රතිඛ්‍යුක්‍තවූ සථානයෙකින්ම මේ සොරකම් පැමිණෙන්ව උවමැතවැයි කිය. එවිට රජ්ජුරුවෝ මේසේ සඟවා කීමෙන් අපට තොදැනෙයි සොරා අසවලාගයි අපට කිවමැතවයි කිහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු සොරකම්කලෝ අසවල්ලුගයි කියව, තොකීවොත් තෙපිය සොරකම් කෙළේගයි කිහ. එවිට බොධිසත්වයෝ එසේවිතම් මාගේ වරද නැතැයි නුවරවාසීන්ට දෙස්ගන්වා කියන්නාහු අසව මේ නුවර සොරකම්කලෝ රජ්ජුරුවන් හා පුරෝහිතයාය, තමා සොරකම්කොට අනුන් සොරුකරති කිහ. එවිට අසාසිටි සේනාව ඉසකව කැවක් කැබලිත්තක් බැඟින් ගසා රජ්ජුරුවනුත් පුරෝහිතයාත් ජීවිතක්ෂයට පමුණුවාපුවහයි වදුරා මේ පදමානවක ජාතකය නිමවා වදාළසේකි. එසමයෙහි බොධිසත්ව යන්ගේ පියානෝ තම් සුඛෝදන රජ්ජුරුවෝය, මැනියෝ තම් මහාමායා දේවිය, එසමයෙහි සොරකම් ඇල්ලූ බොධිසත්වයෝ තම් බුදුවූ මම්මවේදැයි වදාළසේක.

---

## 420
## ලොමස කාශ්‍යප ජාතකය

තිවද එක් සමයෙක්හි විශුද්ධ ගුණමහිමයෙන් ලෝක ප්‍රසිද්ධ වූ සම්‍යක් සම්බුද්ධ රාජෝත්තමයාතන්වහන්සේ දෙවිරම්වෙහෙර වැඩවසතසේක් උකවලී මහණ කෙණෙකුන් අරහයා මේ ජාතකය දක්වා වදාළසේක. ඒ මහණහට සැබෑද මහණ නෝ උකවලීයෙහිදැයි වදුරා සැබෑව සවාමීනි දැන්වූ කල්හි මහණ ක්ලෙශයෝ තමා මහත් යසවතුන්ද අයසට පමුණුවති පිරිසිදු සතුන්ද සකිලිවූ කෙරෙති තොප වැන්නවුන් කිමෙකැයි උකවලී නොකරද්දැයි වදුරා ඉතුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

පුර බරණැස බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුවන්ගේ පුත්වූ බ්‍රහ්මදත්ත කුමාරද පුරෝහිත බමුණාගේ පුත්වූ කාශ්‍යප නම් කුමාරද යන මොහුදෙදෙන

ශාළුව එකගුරුන්ගේ සම්පයෙහි ශිල්පයෙහි ශිල්ප උගන්නාහුය. ඔවුන් දෙදෙනා අතුවරන් බ්‍රහ්මදත්ත කුමාරතෙම පිය රජ්ජුරුවන් ඇවැමෙන් රාජ්‍යශ්‍රියට පැමිණියේය. බ්‍රහ්මදත්ත කුමාර වනාහි මාගේ යහළු රාජකුමාර තෙම රාජ්‍ය සම්පත්තියට පැමිණියේය, එතෙම මට බොහෝ ඓශ්වර්‍යය දෙන්නේය, අකුශල වර්ධනයට කාරණවූ ඒ සම්පත්තියෙන් මට කවර ප්‍රයෝජනද මම මවුපියන්ද රජදරුවන්ද විචාරා පැවිදිවෙමි සිතා ඒ තමා සිතූ ලෙසම මවුපිය දෙදෙනා හා රජ්ජුරුවන් විචාරා හිමාලයවනයට ගොස් තවුස් පැවිදිවූ සත්වෙනිදා පඤ්ඤාභිඤ්ඤ අෂ්ටසමාපත්ති උපදවා තමන් ලෝමසකාශ්‍යප යයි ප්‍රසිබව ඇවිදිලි අහරින් යපී දවස් හරන්නේය එතෙම වසඟවූ පසිඳුරන් ඇත්තේය, ඝෝරවූ තපස් ඇත්තේය, ඔහුගේ තපෝ තේජසින් ශක්‍රභවනය කම්පාවූයේය. ඒ විමසා බලන්නාවූ සක්දෙව් රජතෙම ඒ ලෝමස කාශ්‍යප යන්ගේ තපෝ තේජසිනැයි දැන මේ තාපසයෝ ඉතා උග්‍රවූ තපෝ තේජස් ඇත්තේය. ඉදින් සිතුවාහු නම් ශක්‍ර සම්පත්තිය බැහැරගන්ව සමර්ථ යෝය. එබැවින් බරණැස් රජ්ජුරුවන් හා සහාය කොවගෙණ වුන්ගේ තපෝ තේජසින් බිඳපුව මැනවැයි මධ්‍යම රාත්‍රියෙහි බරණැස් රජ්ජුරුවන්ගේ ශ්‍රීයහන් ගබඩාව තමාගේ ශරීරශෝභාවෙන් බබුලුවා අහස සිව මහරජ නැගිටුවයි කීයේය. තෝ කවරෙක්දැයි කී කල්හි ශක්‍රදේවේන්ද්‍රයෝ තම් මමයයි කීය. කුමට ආයෙහිදැයි විචාළ කල්හි මහරජ තෙපි සියළු දඹදිව එක්සත්කොට රජකරණ කැමැත්තෙහිදැයි විචාරා ඒ කුමක් නිසා නොක මැතිවෙද්දැයි කීකල්හි එසේවීනම් මහරජ තෝ ලෝමස කාශ්‍යපයන් ගෙන්වා ගෙණ පසු ඝාතයාගය කරව, එයින් තෝ මෑමෙන් අජරාමරවෙයි, සියලු දඹදිව එක්සත් කරන්නේයයි කීයේය. ඔහුගේ බස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ යහපතැයි පිළිගත්තාහුය. ශක්‍රදේවේන්ද්‍රයාද එසේවීනම් මහරජ පමා නොවෙයි කියා දිව්‍යපුරයටම ගියේය. දෙවෙනි දවස් බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ සග්ග තම් අමාත්‍යයා කැඳවා යහළු තෙපි මාගේ ප්‍රියයහළුවූ ලෝමස කාශ්‍යප තාපසයන්ගේ සමීපයට ගොස් අපගේ රජ්ජුරුවන් වහන්සේ තාපසයන් ලවා පසුඝාත යාගය කරවා සියළු දඹදිව එකරජකරණ කැමතිසේක. නුඹවහන්සේ යම් පමණක් රට කැමතිසේක් විනම් සියල්ල දෙනසේක. මා හා සමග වැඩිය මැනවැයි කියා කැඳවාගෙණ එවයි කීයේය. ඒ අමාත්‍යයාද යහපතැයි පිළිගෙණ තාපසයන් වසන තැන් කොදුන නුවර බෙර හසුරුවා පිරිවරින් ඒ බෝසතානන් වසන තැනට ගොස් තාපසයන්වහන්සේ වැඳ එකත්පස්ව හිඳ රජ්ජුරුවන්ට කී අසුන් දුන්වූයේය, එකල්හි ලෝමස කාශ්‍යපයන් වහන්සේ එම්බා සග්ග අමාත්‍යයෙනි තොපි තුමක් කියව්ද සක්වළගල අවසන් කොව ඇති මහාසමුද්‍රයෙක්හි පලනාලද රත්නකුණ්ඩයක් මෙන් බලා සියළු ජම්බුමණ්ඩල මට දෙතත් පසුඝාතයාගයෙන් ප්‍රාණඝාතකොට නින්දිතව ලබන්නාවූ ඓශ්වර්‍යයී මමත් නොකමැත්තෙමි යම් ජීවිකාවක් තොප අපායට පමුණුවන්නාවූ අධර්මය මුල්කොට පවත්නීද එබදු සැපත් ලැබීමට මම නින්දා කරන්නෙමි ඒ එසේමය, මෙලොව යමෙක් ලග්නා පැල් පමණක් නැතිව භික්ෂාපාත්‍රය අතින්ගෙණ සිඟා ජීවිකාව කෙරෙද්ද යමෙක් අධර්මයෙන් මුළු ලොව වසඟකොට රාජ්‍යශ්‍රී විඳින්නේද ඔහුගේ ඒ රජසුව වැළඳීමට වඩා භික්ෂා චාරයෙන් ජීවත් වන්නාවූ ඒ දුකඛිතයාගේම ජීවිකාවම සියදහස් ගුණයෙන් උතුම් වන්නේයයි වදාළසේක. උන්වහන්සේගේ බස් ඇසූ සග්ග අමාත්‍ය

තෙම නැවත බරණැස්නුවරට ගොස්ශ්‍රේෂ්ඨරජ්ජුරුවන්ට එපවත් දැන්වීය. එසේ කොවිඩිතා කල කුමක් කරමෝදැයි රජ නිරුත්සාහ විය, නැවත ශක්‍රදේවේන්ද්‍ර තෙම මධ්‍යම රාත්‍රියෙහි අවුදින් අහස සිට කිමෙක්ද මහරජ ලෝමස කාශ්‍යප තාපසයන් කැඳවා යාන කොකරන්නෙහිදැයි විචාළේය, ශක්‍රදේවේන්ද්‍රයෙනි කැඳවා ගෙන් කරවුම්හ, නොවඩනාසේකැයි කීයේය. ඒ බසට ශක්‍ර දේවේන්ද්‍රයෝ එසේවිතම් මහරජ තොපගේ චන්ද්‍රවතී කුමාරිකාවන් සඳිා භරණ්‍යයන් සරහා සන්හ අමාත්‍යයා හා සමග ගමන් කරවා ඉදින් යාගකල හොත් තොපට රජ්ජුරුවෝ මේ කුමාරිකාවන් දෙන්නාහුයයි කියවා ලව, ඒකාන්තයෙන් මේ කුමාරිකාවන් කෙරෙහි පිළිබඳ සිත්ඇති තාපසයෝ එන්නාහුයයි කීයේය, එබසට බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද එබස් අසා යහපතැයි පිළිගෙණ දෙවෙනි දවස් චන්ද්‍රවතී කුමාරිකාව සරහා අමාත්‍යයා හා සමග ගමන් කරවූහ. එසඳ ගොස් මනබෝසතානන් වැඳ පිළිසඳර කථාකොට දිව්‍ය කන්‍යාවක් වැනිවූ රාජකුමාරිකාවන් තාපසයන් දක්වා තෙමේ එකත් පසෙක සිටියේය. ඒ ලෝමස කාශ්‍යපයෝද ඉන්ද්‍රිය සංවරය බිඳ ඒ කුමාරි කාවන් දෙස බැළුවාහුය, ඇ කෙරෙහි පිළිබඳ සිත් උපන් හෙයින් ධ්‍යාන යෙන් පිරිහුනාය. සන්හ අමාත්‍යයා තාපසයන් කුමාරිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇතිබව දැන තාපසයන් වහන්ස නුඹවහන්සේ ඉදින් යාග කරණසේක් වීනම් අපගේ රජ්ජුරුවෝ තොපට මේ කුමාරිකාවන් අත්පා මෙහෙකරණ පිණිස දෙන්නාහුයයි කීයේය, එබසට තාපසයෝ රාගවෙතනා වෙන් කම්පාවූවාහු කිමෙක්ද මේ කුමාරිකාවන් මට දෙද්දැයි විචාරා එසේය යාගකරන්නාවූ තොපට දෙන්නාහුයයි කිකල යහපත එසේ වීනම් යාගය කරමියි කියා කුමාරිකාවන් හා සමග රථයානාවකට නැගී ජවාමඩුලු තොහැර නවුස්වෙසින්ම බරණැස් නුවරට ආයේය. එසඳ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද තාපසයන් එනි යනු අසා යාගාවාටයෙහි කම්මන්ත පටන්ගැන්වූවාහු ආවාවූ ඒ තාපසයන් දැක එම්බා තාපසයෙනි සෙවයාගය කරම්හ ශක්‍රයාගේ අජරාමරව යාගයකළ අවසන් තොපට දියනියන් පාවාදෙමි කීයේය. ලෝමස කාශ්‍යපයෝද යහපතැයි පිළිගත්තාහු බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝද දෙවෙනි දවස් තාපසයන් කැඳවාගෙණ චන්ද්‍රවතී කුමාරිකාවන් හා සමග යාගකරණ තැනට ගියේය. එනැන්හි හත්‍යසව ගව මහිසාදීවූ සියළු සිවිපාවෝ බැඳ සිටුවන ලද්දාහුය. ඒ ලෝමස කාශ්‍යප තාපසයෝද ඔවුන් මරා යාග කරන්ට පටන්ගත්තාහු ඉක්බිති එතැන්හි රැස්වූ මහජනයෝ එම්බා තාපසයෙනි මේ තොපට සුදුසු නොවෙයි, තපස්වීව සිට ප්‍රාණඝාතකර්ම නොකරවයි කියා නැවතත් කියන්නාහු මෙලොව ගතාඛ්කාර නැසීමට ඉර සඳ දෙදෙනා හැර වෙන බලවත් දෙයක් නැත්තේය, චන්ද්‍ර සූර්‍යයෝ එම්බා තාපසයෙනි බලවත් වෙති. ඉෂ්ටානිෂ්ටවූ අරමුණුවේග ඉවසීමෙහි හෙවත් සිත උපන්නාවූ රාග වෙෂයන් සන්හිදීමෙහි ශිල්වත් මහණ බමුණෝම ලොව බලවත්වෙති, මහ මුහුදු දියකඳ නවතාලීමට වෙරළ බලවත් වන්නේය, මේ සියලු බලවත් සතුන්ට වඩා සියල්ලවුන් තමා වසඟ කරණ හෙයින් ස්ත්‍රීහුම ඉතා බලවත් වෙති, දැන් මෙලොවට ප්‍රත්‍යක්ෂවන නියාය, ඒ එසේමැයි සියල්ල නිරාලයව හැර උදකලාව මහවලට වැද පැවිදිව උග්‍රවූ තපෝ තේජස් ඇතිව අහසින් යන තරම් සෘඩිමහිම ඇතිව වසන මේ ලෝමස කාශ්‍යප තම් තාපසයාහන් චන්ද්‍රවතී නම් රාජකුමාරිකා තොමෝ තමා වසඟකොට පියාහන් උදෙසා වාජපෙය්‍ය යාගකරණසේ යොදු සතර අපායෙහි උපදවා දුක් දෙන්නාවූ

ප්‍රාණඝාත කර්මය කරන්නී වේදැයි කීවාහුය. එසමයෙහි ඒ ලෝමස කාශ්‍යප තාපසයෝ යාග කරණු පිණිස මඩගල හස්තියාගේ ග්‍රීවයගෙණ දකුණතින් කඩුවගෙණ ඔසවාගත්හ. එකෙණෙහි හස්තිරාජතෙම මරණභයින් තැති ගෙණ මහත්කොට නාද කෙළේය. ඔහුගේ බැගෑ හඬ අසා සෙසු චතුෂ්පාද ජාතිහුද එසේම නාදකළාහු ඒ දුටුවාවූ මහජනයෝ මහත් අඬින් ඇඬුවාහුය. තාපසතෙම ඔවුන්ගේ අඩ අසා මහත් කොට කලකිරීමට පැමිණියේය තමාගේ තවුස්වෙස් බැලීය, එකෙණෙහි පළමුවෙන් සිත උපන් රාගය මූලාව සලකාගත නුහුනු ජටාමඬුල්ලද දිස්ව තිබෙන දැලිරැවුළුද ලෙහි රෝමයන්ද දැක තවුස් වෙස් නිසාව දැන ඉතා නුසුදුසු පාපකර්මයෙක් මා විසින් කරණලදැයි සිත උපන් උවෙගය එතැන්හි ප්‍රකාශකොට කියනුයේ චන්ද්‍රවතී කුමාරිකාව කෙරෙහි ලොභය උපදවා ඒ නිසා මාවිසින් යම් මේ අකුශල කර්මයක් කරණලදද, ඒ දැඩිවූ දුකඛවිපාක දෙන්නේය මෙසේ අකුශල කිරීමට කාරණා කවරේදැයි බලන්නාවූ මම නුහුවණින් සලකාගැන්ම ඇති කියනලද අයෝනීසෝ මනස්කාරයම දුටිමි. එසේහෙයින් මේ කඩුවෙන් මට කම්නැත, ප්‍රඥැනැමති කඩුව ගෙණ හැර සුභනිමිත්තය හා බැඳී පවත්නාවූ මේ රාගය කපාහරින්නෙමි කීයේය. එබස් ඇසූ බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එම්බා තාපසයන්වහන්ස දැන්ද මේ චන්ද්‍රවතී කුමාරිකාවන්ද මේ රාජ්‍යයද සත්රුවන් රැසක්ද දෙමි තොපි භයතොගෙණ යාගයකරවයි කීයේය. ඒ බසට තාපසයන්වහන්සේ එම්බා රජ්ජුරුවෙනි ඉතා බොහෝ ඓශ්වර්‍යය දෙමි කීවත් කාමසම්පත්තියට මම නොකැමැත්තෙමි තොප දෙමි කී චන්ද්‍රවතී කුමාරිකාවන්ද රාජ්‍යයද තොපටම වේවයි මම වනාහි අපේක්ෂාවක් නැත්තෙමි කියා ඒ ජනමඛ්‍යයෙහිම සිට කිසුනු භාවනාකොට ධ්‍යාන උපදවා අහස උගරුබඩාසනයෙන් ඉඳ රජහට ධර්මදේශනාකොට පින් කිරීමෙහි පමා නොවනලෙස අවවාදකොට යාග ශාලාව බිඳුවා සියලු මහජනයාට අභය ඉල්වා දී රජහු යාචිඤ්ඤකළ දී අහසින්ම තමා වසන තැනටම ගොසින් ජීවිතාන්තයදක්වා බ්‍රහ්මවිහාර භාවනාකොට බඹලොව උපන්සේකැයි මෙසේ මේ ජාතක ධර්මදේශනා දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට පූර්ණාපරසන්ධි ගලපා නිමවා වදාළසේක. චතුස්සත්‍යය ධර්ම දෙශනාවගේ අවසානයෙහි උකවලී මහණ රහත් ඵලයෙහි පිහිටියේය. එකල්හි සත්ථා අමාත්‍යතෙම දැන් මේ ශාසනයෙහි ශාරිපුත්‍ර සථවිරය, ලෝමස කාශ්‍යප තාපසයෝ තම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ ගෙණ හැර දක්වා වදාළසේක.

---

## 421 සක්වාද ජාතකය

තිවද එක්සමයෙක්හි දෙවි බඹ නා සුර ගරුඬ ගුරුළු කිරුළු මිණිරුස් දියෙන් දෙවිසිරි පා පියුම් ඇති ගොයුම්ගොත්හි උපන් අප බුදු රජානන් වහන්සේ දෙවරම් වෙහෙර සිවුඹබ විහරණයෙන් විහරණය කරණ සේක් ප්‍රත්‍යයෙහි ලෝභී සිත් ඇති එක්තරා මහණකු අරභයා මේ ජාතක කථාව ගෙණහැර දක්වා වදාළසේක. ඒ මහණ ඉතා තමා ප්‍රත්‍යයෙහි ලෝභී හෙයින් ඇදුරුවත් තෙරවත් ආදිය උදහීනව නොකෙර හැර උදැසනම

සැවැත්නුවරට විසාඛා මහ උපාසිකාවන්ගේ නිවේසනයට ගොස් වැඩහිඳ නොයෙක් අවුළු හා සමඟ එලවූ කැඳ වළඳා දහවල් රසමසවුලෙන් යුත් පිණි බොජුන් අනුභවකොට එයින් තෘප්තියකට නොගොස් සුළු අන්පිඩුමහසිටා නත් කොසොල්රජුන් ආදීන්ගේ නෙවල පාසලෝල්ව ඇවිදින්ය, එකල්හි එක් දවසක් දම්සහා මණ්ඩපයට වවින් ඇවිත් රැස්ව උන් භික්ෂූහු ඔහුගේ ලොල් අසර අරහඃා කථාවක් කිය කියා උන්නාහුය. එකල බුදුරජාතන් වහන්සේ දම්සහාවට වැඩ මහණෙනි මා එන්නාට පූර්වාහ්ණයෙහි නෙපි කුමන කථාවක් කිය කියා උනුදැයි විචාරා වදාරා සවාමීනි අපි අසවල් භික්ෂූන්ගේ ප්‍රත්‍යයෙහි ලොල් බහුලබව කිය කියා උනුම්හයි දැන්වූ කල්හි ඔහු කැඳවා ඇබැද මහණ තෝ ලොභසඤ්ඤාර ඇත්නෙහිදැයි විචාරා ඇබව සවාමීනි දැන්වූකල්හි මහණ කවර හෙයකින් ප්‍රත්‍යයෙහි ලොභ කෙරෙහිදැයි පළමුත් තෝ ආමිසයෙහි ලොල්ව බරණැස්නුවර මහත් ඇත් කුණු ආදිය සිත්සේ අනුභවකොවත් නොපිරුණු සිත් ඇතිව එයින් ගොස් ගඟාතීරයෙහි සඤ්ඤාරණය කෙරෙමින් අසවල් පාසල් දනවිතැනි හිමිවි පියසට පිවිසියෙහි වේදැයි වදාරා එපවත් අසනුකැමති මහණුන් විසින් ආරාධිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඉපිටගිය දවස බරණැස්නුවර බඹදත් නම් රජකු රජයකරණ සමයෙහි එපුර මළ ඇත් අස් ආදීන්ගේ කුණපයෙන් දිවිවටා නොපසුබව ඇවිවිලි යෙන් ඇවිදිනා කපුටුවෙක් එයින් නොඇතුටුව ගොස් මස් අනුභවකෙරෙමින් ගංගෙතරට පැමිණ මළ මසුන් කා කීපදවසක් එහි වැස නැවතත් එහි කළ ආලයෙන් හිමාලයට වැද නොයෙක් වනමුල් වනඵල අනුභව කෙරෙමින් ගොස් මස්කැස්බන්ගෙන් ගැවසී සුවිපුල් ඇ පස්පියුමෙන් සැදුම් ලත් පියුම්විලකට පැමිණ එහි සෙවල්කමින් පෙමින් උනුත් නොඇර එක්ව වසන සක්වාන් දෙදෙනකු දැක මොහු මනාවණී සම්පත්තියෙන් සමන්විතය,මොවුන්ගේ හෝජනය ඉතා සිත පිණවන්නේයයි එයින් මොවුන් කණ ගොදුරු විචාරා මමත් එම අනුභව කරන්නට විම්නම් මැනැවැයි සිතා ඔවුන් සමීපයට ගොස් අදරින් පිළිසඳර කථා කොට විසිතුරු අතුරෙකහී හිද ඔවුන්ට ප්‍රශංසායුත් තෙපුල් බණනේ, එම්බා පක්ෂිණී රන්වන් පිළිපෙරෙවියවුන් බදුවූ යුක්මව එක්ව සතුටුසිතින් මේ තැන්හි ඇවිදිනා නොපට මනුෂ්‍යයෝ කවර පක්ෂීකෙණෙකුකැයි කියද්ද, ඒ අපට වහා කියයි කීයේය. ඔහුනට තමා වංශය දක්වා කියන්නාවූ සක්වා ලිහිණි තෙම, ආමිස ලොභයෙන් මිනිසුන්ට මෙහෙකොට හැසිරෙන්නාවූ එම්බල කපුටුව ප්‍රියසංවාසයෙන් එක්ව කිසි භයක් නැතිව පියුම් විල්හි වාසය කරන්නාවූ අපට සක්වා ලිහිණිකම් පක්ෂිජාතියකැයි කියාද සියළු පක්ෂීන් කෙරෙන් මොහු කල්‍යාණගුණ ඇත්තාහුයයි කියාද මනුෂ්‍යයෝ කියන් නාහුයයි කීයේය. එබසට කපුටුතෙම අනින්දිතවූ එම්බා චක්‍රවාකයෙනි තෙගේ මේ ශරීර වර්ණය හා කායබල ඉතා අතල්පය, කිමෙක්ද තොපි මේ සුපිපි තඹරාකරයෙහි කවර ඵලයක් අනුභව කරවූද නොහොත් සවර්ණ වර්ණීවීමට නිසි කවර ප්‍රාණීන්ගේ ශරීරමාංශයක් අනුභව කරවූදැයි විචාළේය, එසඳ චක්‍රවාකතෙම කියනුයේ එම්බල කපුටුව මේ තවාකයෙහි අනුභව කිරීමට නිසි පලාඵලයෙක්ද නැත මේ චක්‍රවාක ජාතියෙහි උපන් අපව

මංසයෙක්තම් කැලම නැත. එයින් අපි මේ පියුම්විලෙහි සෙවෙල් පමණක් අනුභවකොට වසම්හ. තොපි කපුටුවන් මෙන් දිවිවැඩුම් පිණිස පරපණ නොනසම්හයි කීයේය. එබසට කපුටුතෙම කියනුයේ එම්බා චක්‍රවාකයෙනි තොපගේ මේ ආහාර අපව අරුචිකරන්නේය, රන්වන් සිරුරු ඇතිව මේ චක්‍රවාක ජාතියෙහි උපන්නාවූ තෙපි නින්දිතවූ ආහාර අනුභව කිරීමම සුදුසු නොවව, ඒ කාරණයෙන් තොපගේ මේ ශරීර වණ්ණයට අපට විමැති වූයේය. අපි වනාහි රණමුඛයෙහි නිර්භීතවූ සූර පුරුෂයන්මෙන් මිනිසුන් කෙරෙන්ම සඵල රස හා එළු තෙල් මුසු මියුරු රස ආහාර රැගෙණ කැමති ලෙස අනුභව කරම්හ. එතකුදුවුවත් තෙල තොපගේ ශරීරය පැහැ වැනි පැහැයෙක් අපට නැත්තේය, එසේහෙයින් සෙවෙල් පමණක් අනුභවකොට වසම්හයි කීවාවූ තොපගේ බස් අදහා නොගණිම් කීවාහුය. එකල්හි කපුටුවාගේ වණ්ණ සම්පත්තිය නොවීමට හා තමාගේ ශරීරවණ්ණ සෞන්දර්‍යයට කාරණා කියන්නාවූ ඒ සක්වා ලිහිණි තෙම එම්බල කපුටුව තොපි අනුන් අයිතිදෙය පැහැරගෙණ කන හෙයින් නොපිරිසිදු ආහාර ඇතිව ඒ මතුද නොවෙයි ජනයාගේ කිසි ප්‍රමාදයක් දුටුකෙණෙහි ඔවුන් සතුවූ ආමිෂයෙහි හෙන් නෙහිය, එකල්හි ඔහු කැටකැබැලිනි ආදියෙන් පැහැර ලුහුබඳවති, එයින් තොපට කන බොන දෑ දුකසේ ලැබෙන්නේය, ඒ තමා අමූසොහොන්හි දැමූ මිනිමස් ආදියෙනුත් සතුටු නොවව, තවද එම්බල කපුටුව යමෙක් අනුන් වෙහෙසදී ලත් දෙයින් දිවිපවත්වාද ඒ තෙමේ එයින් නින්දිතව පසුතැවිලියව පැමිණ ශරීරවණ්ණයෙන් හා කායබලයෙන් පිරිහෙන්නේය, ඉඳින් එම්බල කපුටුව යමෙක් අනුන්ට පීඩා නොකොට දැහැමෙන් සෙමෙන් ලද දෙය අනුභව කරන්නේවීනම් ඒ නුවණැති උත්තමයාගේ කායබල හා වණ්ණ සම්පත්තිය වැඩෙන්නේය, එසේහෙයින් මේ ශරීරවණ්ණයනම් අනේකප්‍රකාර ආහරයෙන්ම වන්නේය නොවෙයි. කම් චිත්ත සෘතුවෙනුත් වැඩෙන්නේයයි කීයේය. මෙසේ ඒ සක්වාලිහිණිතෙම නොයෙක් කාරණයෙන් ඒ කපුටුවාට අපහාස කෙළේය, එකල ඒ කපුටුතෙම අපගේ අවණ්ණය තොපගේ වණ්ණයෙන් අපට ප්‍රයෝජන කවරේදැයි ඕහට දෙඩාගෙණ ගියේයයි කියා මෙසේ සියළු ලොක අනුශාසක ශාක්‍යකුල තිලකවූ අප තථාගතයන්වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ ජාතක ධර්මදේශනාව දක්වා වදාළසේක. එ සිව්සස් වණ්ණ දෙසුන් අවසන්හි පසලොල් ඒ මහණ අනාගාමි ඵලයෙහි පිහිටියේය. එකල කපුටුවා තම් ප්‍රත්‍යලෝභිවූ මෙකල මේ මහණ වන්නේය. සක්වා ලිහිණිතම් දැන් මේ සවිතෙන් ගිහිනි මේ රාහුලය මාතාවන්නීය, ඒ සක්වාලිහිණියානම් සවිසතවෙත පතළ කරුණා ඇති මෙන් සමතිස් පෙරුම්පුරා විදුරසුන් අරා පස්මරුන් මරා ලොව්තුරාබුදුවූ මම්මවේදැයි තමන්වහන්සේ ගෙණහැර දක්වා වදාළසේක.

---

## 422
## හලිද්දිය ජාතකය

සිරිමත්ත ලොකෙක නායකවූ විශුද්ධගුණගණාධාර සඞ්ඝී රජාතන්වූ සම්බුදුරජාණන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරණ කල්හි පතිකුලයට නොගොස් දෙමව්පියන්ගේ ගෙයි වැඩුනු වයසින් මහත් එක කුමාරිකාවක්

විසින් එක්තරා මහණක්හුගේ චිත්ත ලොභයක් අරභයා වදාළසේක. මෙහි වතීමාන කථාව මතුකියන චුල්ල නාරද ජාතකයෙහි වතීමාන කථාව හා සමානවන්නේය, අනිත කථාව වනාහි මේ මතු කියන ආකාරයෙන් දතයුතු.

**ඒ කෙසේද? යත්;**

**ව**පිර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජක්හු රාජ්‍යශ්‍රී අනුභව කරණ කල්හි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝසතාණන්වහන්සේ කසීරට එක් බමුණු මහසල් කුලයෙක ඉපද උගත් ශිල්ප ශාස්ත්‍ර ඇතිසේක් දැර පරිග්‍රහ කොට විසුසේක. උන්වහන්සේගේ භාර්‍යාවවූ බ්‍රාහ්මණ කුමාරිකා තොමෝ පුතකු වදා එක්දරුවා වයසෙහිම තැසුනාය. එකල බ්‍රාහ්මණ කුමාරතෙම සිතනුයේ මාගේ ප්‍රිය භාර්‍යාවවූ මේ කුමරිකාවත් කරා පැමිණියාවූ මරණය කුමකැයි මා කෙරේ ලජ්ජාවේද එබැවින් මව මේ ගිහිගෙයි විසීමෙන් කම් නැත. කාමසම්පත්තිය හැර පැවිදිවෙම් සිතා සිතූ ලෙසම සියල්ල හැර ඒ බ්‍රාහ්මණ කුමාරයා පමණක් කැඳවාගෙණ හිමාලයවනයට ගොස් ඔහු හා සමඟ තවුස් පැවිද්දෙන් පැවිදිව ධ්‍යානාභිඥ උපදවා වනමුල් ඵල ආහාරකොට එහි වාසය කෙළේය. එකල්හි පසල්දනවිවෙහි වසන්නාවූ බොහෝ සොරහු ගම්පැහැර එහි මනුෂ්‍යයන් අල්වාගෙණ උන් ලවා බඩු පොදි ගෙන්වාගෙණ තමන් වසනතැනට එන්නාහුවෙති, ඔවුන් අතුරෙන් රූපශ්‍රී සාරවූ ශඨප්‍රයෝග දන්නාවූ එක්ස්ත්‍රියක් මොහු අල්වාගෙණ දැසිකොට මෙහෙගන්නාහුවෙති, එබැවින් එක් උපායකින් මොවුන්ගෙන් මිදියයුතුයයි සිතා සවාමීනි සිරුරැකිස කරුණු කැමැත්තෙමි. මදක් දුරුව සිටිය මැන වැයි කියා සොරුන් වළනා සැඟවීගොස් වල්හි ඇවිදිනී මහබෝසතාණන් වහන්සේ තාපසකුමාරයා පන්සල සිටුවා ඵලාඵල පිණිස වැඩිකල්හි පෙරවරු පන්සලට අවුත් තමාගේ රූපශ්‍රීයෙන් තාපස කුමාරයා පොළඹා ඔහුගේ ශීල හෙදකොට ඔහු තමා වසඟවූ බැවි දැන මොහු රවටා මිනිස්පියසට කැඳවාගෙණ යෙමියි සිතා කථාකරන්නාවූ ඒ කුමාරිකාතොම එම්බා තාපසකුමාරයෙනි ජන සඤ්චාර රහිතවූ මේ මහාවල්හි රූපාදීවූ පඤ්චවිධ කාමකොට්ඨාසයන් බොහෝසේ තොලබන හෙයින් තැවත තැවත විසිය තොහැක්කේය, යමෙක් ගම්හි වාසය කොට ඒ රූපාදීවූ පඤ්චකාමකොට්ඨාසය ඉවසන්නේවීනම් ඒ මහත්වන්නේය. හෙවත් උහුගේ ශීලයම මහත්ඵල වන්නේයයි කීවා. එබසට ඒ ඇසූ තාපසකුමාරතෙම මාගේ පියානන්වහන්සේ ඵලාඵල පිණිස වලට වැඩිසේක. ආ කල්හි උන්වහන්සේ විවාරම් කීයේය, එකල්හි ඒ ස්ත්‍රීතොම මේ කුමාරයාට පියානකෙණෙකුත් ඇත්ල ඉඳින් ඒ තාපසතෙම මා දුටුයේවීනම් ඵලා ඵල ගෙණෙන කලත් දඬු කෙළවරින්ම තලා විනාශයට පමුණුවන්නේය, එබැවින් මා පළමුකොට යායුතුයයි සිතා එම්බා කුමාරයෙනි මම් මග අතුසන් කඩා පළමුයන්නෙමි, තෙපි පසුව එවයි කියා ගියාය. ඒ ස්ත්‍රිය ගිය කල්හි එපන්සල සැපවියයුතු දරදිය තොසපයා උදක් සෝක කරමින් උන්නේය. ඵලාඵල ගෙණ එන තාපසයන්ට පෙර ගමන් පමණකුත් නොකෙළේය. එයින්ම තාපසයන්වහන්සේ මේ ස්ත්‍රී වසඟයට වියයි දැන කුමක් නිසා තෝ

දර දිය නොසපයා සෝකකොට උන්නෙනිදැයි විවාළසේක. එබසට කුමාර තෙම සඛාමිනී බැද්දෙහි ඉද රක්ෂාකළාවූ සිල් මහත්ඵල නොවෙයි කියාද ගම ඉද රක්ෂාකළාවූ සිල් මහත්ඵල වෙයි කියාද ඇසීමි. එබැවින් මම ගමට ගොස් සිල් රක්ෂා කරුණු කැමැත්තෙමි. මාගේ යාළුවාතෝද මා එන්ඩ කියා තුමූ පළමුවෙන් ගියෝය, ඔවුන් හා සමග මමද යනු කැමැත්තෙමි. එම්බා තාපසයන්වහන්ස මේ මහවලින් ගමට ගියාවූ මම කෙබඳු සිලයක් කෙබඳු වුතයක් ඇති පුරුෂයකු සේවනය කෙරෙම්ද, කෙබන්දක්හු සේවනය කිරී මට මට යහපත්ද වදාළ මැනවැයි කීයේය. එබසට තාපසයන්වහන්සේ එම්බල කුමාරය මේලොව යමෙක්හට කයින් සිඹවන්නාවූ ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරයයි කියනලද අකුශලයෝද වචනයෙන් සිඹ වන වතුර්විධ අකුශලයෝද මනසින් සිඹවන්නාවූ අභිද්‍යා ව්‍යාපාදදීවූ ත්‍රිවිධ අකුශලයෝද සිඹනොවෙද්ද නෙවත් නැත්තාහුද එබඳු සත්වයා මවගේ ලෙහි වැතිර මව භජනය කරන්නාවූ ප්‍රිය පුත්‍රයෙකු මෙන් මේසින් ගම ගියාවූ තෝ භජනකර, නැවත යමෙක් දුහැමෙන් හැසිරේද එසේ දුහැමෙන් හැසි රෙන්නෙත් අනුන්ට නින්දා නොකෙරේද පරිසිදුවූ චාරිත්‍ර ඇති තෙනත්තහු ඒ පුරුෂයා භජනයකර, එම්බා තාපස කුමාරය සියලු දසදහසක් යොදුන් දඹදිව සියළු මනුෂ්‍යයෝම නැසී එක පුරුෂයෙක් පමණ සිටියේවී නමුත් ඒ පුරුෂ කසාගෙන්වූ පැහැය අවු ආදියෙන් නැසී බොහෝ කලක් නො පවත්නේද එමෙන්ම වහා නැසෙන්නාවූ ස්නෙහය ඇත්තේද වඳුරන්සේ චවලවූ ප්‍රවෘත්ති ඇත්තේද එක අරමුණක පවත්නා සිත් නැත්තේද ඒ පඤ්චකාම ගුණකොටස්හයෙහි ඇවිල එකෙණෙහි විරත්තවීම සවභාවකොට ඇත්තේද එබදුවූ පුරුෂයා භජනය නොකර යම්සේ ගැල් ආදීවූ යානාවෙන් යන්නාවූ සත්වයෝ වළගොඩ කණුපහණ ආදියෙන් සමනොවන්නාවූ මාර්ගයද අපවිත්‍රයෙන් ගැවසීගත්තාවූ මාර්ගයද හැර තමන්ට සැපවූ මාර්ගයෙහි යෙද්ද එපරිද්දෙන් දඩෙන් ගැසූකල කිපෙන්නාවූ සත්‍යයෙකු මෙන් කාරණා කාරණා නොදැන මදකින් කිපෙන අසත්පුරුෂයා භජනය නොකර හෙවත් දුරු කරව, තවද එම්බල තාපස කුමාරය නුවණැත්තවුන් විසින් භජනය නො කොට යුතුවූ අමිත්‍රවූ අඥානයා අතීතානාගත වර්තමාන කාලත්‍රය සඞ්ඛ්‍යාත හැම කල්හි නිරන්තරයෙන් ඔහු හා සමග භජනය සමාගමයයි කියන ලද විශ්වාසය නොකර, ඒ එසේමය එබදු අඥානයා භජනය කරන්නාහට බොහෝ අවැඩ වන්නේය. එසේහෙයින් තොපට වැඩවනු පිණිස මේ යථොක්ත ගුණයෙන් යුක්ත අඥානයා භජනය නොකර. ඔහු භජනය කරන්නාහට බොහෝ දුක් වන්නේය, යනාදීන් මෙසේ අවවාදකොට මේ මාගේ අවවාදවූ පරිද්දෙන් මෙසේ පිළිපදුව මාගේ වචනයෙහි පිහිටුවයි කීයේය. මෙසේ පියානන් විසින් අවවාද කරණලද්දාවූ ඒ කුමාරතෙම කියනුයේ මම මනුෂ්‍ය පථයට ගියෙම් වීමතම් නුඹවහන්සේ වැනි පණ්ඩිත කෙණෙකුන් වහන්සේ ලැබගත නොහැක්කෙම්. එතැන්හි යාමව භය ඇත්තෙම් එසේනෙයින් නුඹවහන්සේ සමීපයෙහි වාසය කෙරෙම් කීයේය. ඔහු එසේ කී කල්හි නැවතත් අවවාද දෙන්නාවූ තාපසතෙම කිසුනු පිරියම් ඉගැන්වූයේය. ඒ කුමාරතෙම නොබෝ කලකින් පවාහිඥ අෂ්ටසමාපත්තීන් උපදවා තමන්ගේ පිය තාපසයන් හා සමග බ්‍රහ්ම ලෝකයට ගියේයයි මෙසේ

දේවාති දේවවූ අප තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මේ දේශනාව ගෙණහැර දක්වා චතුස්සත්‍යය ප්‍රකාශකොට ජාතකය නිමවා වදාළසේක. චතුස්සත්‍යාවසානයෙහි උකවලිවූ මහණ තෙම සෝවාන්ඵල යෙහි පිහිටියේය. එකල්හි මනුෂ්‍යපථයට යෙමිසි කැමතිවූ තාපස කුමාරයෝ තම් මේ උකටලී මහණය, එකල්හි මනුෂ්‍යපථයට කැඳවූ කුමාරිකාව තම් මෙකල්හි මොහු උකවලීකරුවූ මේ කුමාරිකාව වන්නීය, එකල්හි ඒ බ්‍රාහ්මණ කුමාරයාට අවවාදදුන් පිය තාපස තම් දැන් ලොවිතුරා බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේකි.

---

## 423
## සමුග්ග ජාතකය

තිවද මහනීය්‍ය මහානුභාව ගුණෝපෙතානවද්‍ය විද්‍යාවරණ ධර්‍ම යෙන් නිර්මලවූ අප තථාගතයන් වහන්සේ එක්සමයෙක්හි ක්ලේශ ඝර්‍මාභිතප්ත සත්වයන් ධර්‍මාමෘත පානය කරවමින් ජේතවන විහාරයෙහි චතුර් විධ බ්‍රහ්ම විහරණයෙන් වාසයකරණසේක් දුදසුන් නිවන් දක්වන බුදු සසුන් වැඳ පැවිදිවද කෙලෙසුන් වසඟවෙමින් සස්තෙහි කලකිරී වසන එක් මහ ණකු අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

එක් දවසක් සර්‍ධර්‍මයන්වහන්සේ ශාසනයෙහි ආශාව හා සමග කෘශවූ දේහ ඇති සිතෙහි උපන් රාගය හා සමග ගතෙහි ඉපිලි නහර ඇති ක්ලේශ යන් හා සමග වැටුනාවූ ක්ලෙශයන් ඇති ශාසනයට මුඛවූ සිත් හා සමග දික් වූ තබ ඇති සිල් හා සමග කිලුටුවූ සිවුරු ඇති ඒ භික්ෂූහු ශික්ෂාවෙහි අපෙක්ෂා නැතිව වසන බව දැක කිමෙක්ද මහණ තෝ ශාසනයෙහි උකවලි වූයෙහි වේදැයි විචාරා වදාරා එසේය සවාමීනි දන්වූ කල්හි මහණ ස්ත්‍රීහුතම් මායා සාථෙය්‍යාදී නොයෙක් වංචාප්‍රයෝග දන්නා කෙලෙහිගුණ නොදන්නා අයෙක, එසේ හෙයින් තෝ කුමට ප්‍රාර්‍ථනාකෙරෙයිද පෙර දරුණුවූ දැතව රාක්ෂයෝ පවා කුක්ෂියෙහි තබා රක්ෂාකරන්නාහු තමන් අයිතිකොට ගත නුහුනුවාහුය, නෝ කෙසේ අයිතිකොටගත හැකිවන්නෙහිදැයි විචාරා මේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

සියල් සිරින් තිදස්පුර පසස්කළ දෙලොස් යොදුන් බරණැස් නුවර පෙර බ්‍රහ්මදත්තතම් රජකු රාජ්‍ය ශ්‍රී අනුභව කරණ සමයෙහි පුරණ ලද බොධිසම්භාර ඇති අප මහබොධිසත්වයන්වහන්සේ වස්තුකාම ක්ලෙශ කාම හැර නිල්මහ මේකුළුමෙන් බබලන ගණ සාමඩලෙන් හොබනා විදුලිය මෙන් සුපිපිලිය වැලැඳි විසිතුරු පතරින් හා ලපලුපත් කමින් තමන් සුතන් කවමින් පෙමින් ඔවුනොවුන් ඇඟ තොළ තබා කෙළනා මුවකැලන්ගෙන් හා සුනිල් මිණිගල් මුදුනෙහි රඹනා ලියකිඳුරන්ගේ මියුරු ගීයෙහි ලොබින් හොදුරෙහි ලොහ නොකොට සිටිනා කිඳුරන්ගෙන් හා විම්ල්වැලි තලාවල මොණර කිකිළින් මැදෙහි පිලඹරා බලවත් මොණරුන්ගෙන් හා පිපිමල් ගජන් ඇන උරිරු වැකි දලින් මදමත් ඇත්මුලින් හා සුපුල් පලෝල් මිදෙලි

සල් විසල් වනපෙතින් වගුල නොයෙක් සුවඳ මුවරද ගෙණ වැනෙන සිහින් ගඟුලැල්ලෙන් සැදුම් ලත් විවිධ ජනාලයවූ හිමාලයට වැද ක්ලේශ තාපයට හේතුවූ තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා වනමූල්ඵලාහාරම ආහාරකොට වාසය කරණසේක. එකල උත්වහන්සේ වසන පන්සල අසල තුම්බුල් ගල්ගුහාවෙක වසන මනුෂ්‍ය මාංස භක්ෂණය කරණාපේක්ෂ එක් රාක්ෂයෙක් අහරතුරෙහි මහ බෝසතාණන්වහන්සේ කරා එළඹ බණ අසන්නේය. ඒ බණ අස අසාත් තමා පරහිංසාවෙහි සතුටුවත පවිටු ජන්මයෙහි උපන්හෙයින් මහවනමැද මහජනයා එන යන මග රැක සිට දනන් ලුහුබදවා අල්වාගෙණ සල්වසල්වා දෙකපොළින් ලේ වගුරුව වගුරුවා කන්නේ, එකල කසීරට වාසිවූ දුටුදුටුවන් විසින් කරණ රුසිරින් මනාවූ එක්තරා කුමාරිකාවක ප්‍රත්‍යන්ත ජනපදයෙක සරණ ගොස් වාසය කරන්නී එක්දවසක් තමාගේ දෙමව්පියන් දකිනු පිණිස පිරිවර ජනයා හා සමග අවුත් නැවත තමා වසන පන්සල් දනව්වට යෙමින් ඒ වනමැදට පැමිණියාය. එකල්හි ලෙලන දිව් නැමැති සලවිදුලිය ඇති වක්ව තිබෙන බැම නැමැති දිලියෙන්නාවූ ඉදුසැව් ඇති උදුල දලයුවල තමැති භජන බලාපෙළ ඇති උරිරු පානය කිරීමෙන් කෙසරු සළාවෙහි රැඳි මදින් වැහෙන ලේබිඳු තමැති පොද පතර ඇති පතළ සැඬඹහ තමැති මිහිගුම් ඇති කුරිරු දරුණු වෙස් ඇති ඒ දැනව රකුස්තෙම අහස්කුස පහළ නිල් මහ මේකුලක් මෙන් අවුත් ඒ වනමැද මගට බටුයේය. එවෙලෙහි ඒ පරිවාර ජනයෝ තම තමා අත තුබූ අවි දමා ඒ ඒ අත දිව්වාහුය, එසඳ ඒ දැනවතෙම යාතාවෙ යාතොගී උන් උතුම්වූ රූපශ්‍රීයෙන් කාන්තවූ ඒ කාන්තාව ඒකාන්තකොට තමා වසන තැනට ගොස් ප්‍රිය භාර්‍යාකොට තබා තෙල් මී සකුරු සාල් ආදීවූ නොයෙක් තොසකරණ උපකරණ ගෙණැවිත් පොෂ්‍යය කෙරෙමින් විචිත්‍ර වස්ත්‍රාභරණයෙන් සරහා අනිකකු නොදන්නා ලෙස රක්නා කැමතිව නොඅඩුවූ සෙතහසින් කරඬුවෙකලා ගැල කුක්ෂියෙහි තබා රක්ෂාකරන්නේය. මේ ලෙස රක්නාවූ එතෙම එක්දවසක් ජලස්නානය කරණු කැමතිව සිහිල් සිලිල් පිරිනිමල් කමල් විලකට ගොස් බඩතුබූ කරඬුව වමාරා එයින් ඇ පිටතට ගෙණ පළමු කොට නහවා නොමද සුවඳ විලවුන් ගල්වා නත්විසිතුරු රුවන් ආභරණ පලඳවා මදක් තොප ශරීරයෙහි තෙත් සිදුවාගෙණැයි තෙමේ එතැන්හි සැක කටයුතු කිසිකෙණකුන් නැතිහෙයින් තනත තොටට බැස දුරුව සිට දිය නාන්නේය. එසඳ ඒ කුමාරිකාවෝ වයස්සුපුත්‍ර නම්වූ උතුම් රූපශ්‍රීධර විද්‍යාධරයකු ඛඩ්ගායුධ සන්නඬව අහසින් එනවා දැක ඔහු කෙරෙහි පළිබඳ සිත් ඇතිව මෙසේ එවයි අන්සන්කොට කැඳවූවාය. එසඳ විද්‍යාධරතෙම සුරපුරෙන් බස්නා සුරකුමරකුමෙන් ගුවන්කුසින් එන රුවන්රුවක්මෙන්ද ඇකෙරෙන් ඒ රකුසාගේ මතු වෙන්වීමට පෙර නිමිතිව පනිතවන උල්කාපාතයක් මෙන්ද වහා අහසින් බටුයේය. එකල ඒ කුමාරිකාවෝ ඔහු කරඬුවේ හිඳුවා දැනව යාගේ ආගමනය බලමින් කරඬුව මත්තේ හිඳ දියතා ගොඩතැගී එන්නාවූ ඒ දැනවයාට තමා දක්වා ඔහු ලඟට එන්නට පළමුකොට ගතගබ්ගිලි විදුලියක් මෙන් ඒ කරඬුව ඇතුළට වැද තමා අත සළුවෙන් ඉසවසා පෙරව නොවලසා ඔහු වසාගෙන ඔත්තාය. ඒ ක්ෂණයෙහි ඒ රාක්ෂතෙම අවුත් පරීක්ෂා නොකොට පළමුපරිද්දෙන්ම කරඬුව ගැල තමා වසන ගුහාවට යෙමින් අතරමගදී

සිතනුයේ ඒ අපගේ තාපසයන්වහන්සේ බොහෝ කලක් නොදක්නාලද. ඉන් උන්වහන්සේ කරා ගොසින් දැන පැහැද වැඳපුදා බණ අසා යෙමි පන්සලට ගියේය. තාපසයන්වහන්සේද එන්නාවූ ඔහු දුරදීම දැක දෙදෙනෙකු කුසතුළ වසනබව දිව්‍ය චක්ෂුරභිඥතයෙන් දැක අඥතවූ ඕතට විඥපන කරණු කැමැතිව වදාරණසේක්, එම්බා පින්වත්නි තොපි තුන්දෙනා කොතැන්හි අවුද බොහෝකලකින් අද මේතැන්හි තොපගේ පැමිණීමවූයේය, කිමෙක්ද තොපි නිදුක් නිරෝගිවිද යහපත මෙසේ අවුත් තෙල අස්තෙහි හිඳුවයි වදාළසේක. එබස් අසා ඒ දෙනව රාක්ෂතෙම මේ තාපසයන්වහන්සේ එකලාව මෙතැන්හි ආ මට තුන්දෙනෙකැයි වදාරණසේක. කිමෙක්ද තත්වය දැන කියනසේක්ද නොනොත් උන්මත්ව නත්දෙඩනසේක්දැයි සිතා තාපසයන්කරා එළඹ වැඳ එකත්පස්ව හිඳ එපවත් පුළුවුස්නා අදහසින් කථාකරණුයේ කිමෙක්ද තාපස යන්වහන්ස නුඹවහන්සේ කිසි සහයක් නැතිව මෙතැන්හි ආ මට තෙපි තුන් දෙන කොයිසිට අවුදැයි වදාළේය. එබසට තාපසයන්වහන්සේ එම්බා රාක්ෂයතෝ මේ කාරණය ඉදුරා අසනු කැමැත්තෙහිදැයි වදාරා ආදරයෙන් එසේය සවාමීනි දැන්වූ කල්හි පළමු තෝද තාගේ කුක්ෂිගත කරඬුයෙහි තබා ප්‍රෙම භාරයෙන් රක්ෂාකරණලද භාර්‍යාදයත දෙදෙන තනිවම විසූහ. දැන් වනාහි ඕතොමෝ වයස්සුපුත්‍රතම්වූ විද්‍යුධරයෙකු හා සමග පාපයෙහි ලැජ්ජානොසෝට තමා අධ්‍යාශයවූ පරිද්දෙන් ලොකස්වාදරතියෙහියෙදී ඉන්නීය. එසේහෙයින් තොප තුන්දෙනෙකුගයි කිමියි වදාළසේක. එබස් අසා දැනව රාක්ෂතෙම සිතනුයේ විද්‍යුධරයෝ නම් අනල්පවූ මන්ත්‍ර ජපනය කොට මායාකාරයෙන් සචාරණය කරණා අයෙක ඉඳින් මාගේ කුක්ෂිගතවූ ඔහුගේ බඩගය සවහස්ත ගතවීනම් බඩපලාගෙණ පලායන්වත් සමර්ථවන්නේයයි හයින් තැතිගෙණ සිත් ඇතිව වහා කරඬුව වමාරා තාපසයන්වහන්සේගේ ඉදිරියෙහි තබා නිදුන යක්මෙන් රක්ෂාකල ඒ කරඬුයෙහි පිධානය හළුයේය. ඒ ක්ෂණයෙහි ඒ විද්‍යා ධරතෙම කූටයන්ත්‍රයකින් නික්මුනු ශරීරයක්මෙන් මන්ත්‍ර ජල්පනයකොට අහසට පැනනැගේය. එසඳ ඔහු දැක මහබෝසතාන්ට බෝහෝසේ සතුටුව ස්තුතිකරණ ඒ දැනව රාක්ෂතෙම උග්‍රවූ තපෝ තේජසින් අග්‍රවූ තාපසයන් වහන්ස නුඹවහන්සේ මේ කාරණය දත් පරිදි ඉතා යහපත නිරන්තරයෙන් මාගේ ප්‍රාණයමෙන් කුක්ෂියෙහිතබා රක්ෂාකරණලද්දුවූ මේ ස්ත්‍රීපවා මිත්‍රද්‍රෝහි කම්යකොට අන්පුරුෂයෙකුකරා සරාගව එලිය, එසේහෙයින් මේ ලෝකයෙහි අන් සත්වයෙකුණෙකුන් විසින් කෙලෙස් ප්‍රවේශතයෙන් අවසඟව ස්ත්‍රීවසඟයට පැමිණියාහුද ඔහු ඉතා නින්දුවට පැමිණෙන්නාහුය, ඒ එසේමය, සවස උදැසන ගිනිදෙවියාට යාගකොට වෙනෙහි වාසයකරණ තාපසයන් විසින් රක්ෂාකරණලද ස්ත්‍රීන්යක් පරිද්දෙන් තොමෝ මාවිසින් නිරන්තරයෙන් ආදර යෙන් රක්ෂකරණලදුව, මබන්දෙපවා ඔවුන් කුසතුළ තබා රැකගත නුහුනුවාහුය, එසේවූ ස්ත්‍රීද පතිවූනාධම්ය කවරෙක් අප විසින් රක්ෂාකරණ ලද්දේයයි සිතා විශ්වාසකාරන්නේද ඒ එසේමය ස්ත්‍රීහු නම් ලොකස්වාද රතියෙන් සම්පූණී කොවන්නාවූ සිත් ඇති බැවින් අගාධවූ මහා සමුද්‍ර යාගේ පාත්තලය වැන්නේමය, එසේවූ ඔවුන්කෙරෙහි රාගවශයෙන් බැඳුනාවූ නුවණැත්තාවූ සත්වතෙම මෙලෝ පරලෝ දෙකහි මහත් දුකඛයට පැමිණෙන්නේය. එසේනෙයින් විසුබවූ ධ්‍යාන ප්‍රතිලාභය ප්‍රාර්ථනාකරන්නාවූ ප්‍රඥවනත උත්තම සත්වයෝ සියලු දෝෂයට වාසස්ථානවූ

පඤ්චේන්ද්‍රියයන්ට උත්ශවක්‍රිඛාවවූ භවසාගරයට දියසළාවූ ලෝභ ලතාවවතුමුල් මුල්වූ අපායට වහසල් දෙරවූ සසරමහවෙතෙහි සරණ සත්ත්වයනී තමැති මෘග යන්ට පාසවූ අපාය තමැති සමුද්‍රයට ගෙණයන ජලප්‍රවාහ බඳුවූ අවිශ්වාසවූ ස්ත්‍රීන් විශ්වාස නොකරන්නානුගයි කියා ඒ දැනව රාක්ෂසතෙම මතු ආලවක සුවිරෝම ඛරරෝමාදිවූ වණඩසත්ත්වයන්ගේ අභිමාන හැර නමස්කර බහුමාන කිරීමට පූර්වනිමිත්ත දක්වා යුගානන්ත වාතවේගයෙන් පහිනවූ පඳිතකූටයක් මෙන් ලෝසත්හට බොසත් කරණ බෝසත්වූ ඒ තාපසයන්වහන්සේගේ ශ්‍රීපාදය වැඳහෙව මෝහ තමැති ගහදුරට දිවයුරුහු බඳුවූ ක්ලේශ තමැති දුවාතලයට මහා මේඝයක් බඳුවූ මෛත්‍රී තමැති ලතාවට නොතැන්නක් බඳුවූ කරුණා තමැති ගංඟාවට හිමාලය බඳුවූ ශීලාදීගුණරත්නයට රත්නාකරයක් බඳුවූ දහම් තමැති අමාවට මහමුහුද බඳුවූ නුවණ තමැති පහනට රන්පහයක් බඳුවූ නිවන් මගට රවන්හිනක් බඳුවූ තුන්ලොවවතිලකවූ සවාමීනි තාපසයන් වහන්ස නුඹවහන්සේ නිසා අද මාගේ දිවි ලබනලදද නැතහොත්, මේ විද්‍යා ධරයා ලවා මදකලකින් මේ මා මරාපුවා වේදූයි මහබෝසතානන්වහන්සේට ප්‍රශංසා කෙළේය. ඉක්බිති මහබෝසතානන් වහන්සේද ඒ දැනව රාක්ෂසයාට ධර්මදේශනාකොට මෑකෙරෙහි තෝ රෝසතයෙන් කිසිරෝසයක් නොකරවයි අවවාදකොට ඔහු පවසීලයෙහි පිහිටවූසේක. එකල ඒ දැනව රාක්ෂසතෙම මම නී කුසතුල තබා රක්ෂාකරන්නෙමිද අධර්මසේවනයෙන් වළකාගත නුහුනු යෙමි අන්කවරෙක් නොප ඔසින් වළකා රක්ෂාකොවගත හැකිවන්නේදූයි කියා ඇ ගමන් කරවා තෙමේ තමාවසන තැනවම ගියේයයි මෙසේ අතීතානාගත වර්තමාන යන කාලත්‍රය විර්තිවූ සර්වඥයන් සර්වාකාරයෙන් අව බොධකළාවූ අප බුදුරජානන්වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා චතුස්සත්‍යය ප්‍රකාශකොට පූර්වාපරසන්ධි ගළපා මේ ජාතකය නිමවා වදාළසේක, මේ ධර්මදේශනාවසානයෙහි උකවලිවූ ඒ මහණතෙම දහසක්තයින් ප්‍රතිමණ්ඩිතවූ සෝවාන් ඵලයෙහි පිහිටියේය. එකල්හි රාක්ෂසයාගේ කුසහි යෙහි ඳදෙදෙනෙකු වසත බව දිව්‍යඥානයෙන් දැක ඔහට වත අවැඩ වළකා ප්‍රාණඝාතාදී පාපකර්මයන් නොකරණ ලෙස අවවාදකොට පඤ්චශීලයෙහි පිහිටුවූයෙම් දැන් අසාරවූ සංසාර සාගරයෙහි නිමග්නව සඤ්චරණය කරන්නාවූ සත්ත්වයා එයින් ගොඩලා අමාමහනිවන්පුරයට පමුණුවන්නාවූ මම්ම වේදූයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 424 පූතිඅංශ ජාතකය

මේවද එක් සමයෙක්හි සකල සත්ත්වයන් කෙරෙහි අකාරණ පරමවත්සල අප තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසතසේක්, ඉන්ද්‍රිය සංවරය අරභයා මේ ජාතකය වදාළසේක.

එක්සමයෙක්හි බොහෝ භික්ෂූහු චක්ෂුරාදී ඉන්ද්‍රියයෙහි සිහි නමැති දෙර නොවසා වාසය කරන්නාහ. එකල සකල ගුණ නිධානවූ සම්මැදුරාජෝ තතමයානන් වහන්සේ මේ භික්ෂූන්ට අවවාදකරන්නට වටනේ යි ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙහෙවර වදාරා ඒ වෙහෙරෙහි සියළු භික්ෂූන් රැස් කරවා සරහනලද උතුම්වූ බුඩාසනයේ හිඳ වදාරණ සේක්, මහණෙනි, මහණුන් විසින් රූපාදීවූ අරමුණු සුභනිමිත්තාකාරයෙන් නොගත යුත්තේය, ඉදින් ඒ අරමුණු සුභාකාරයෙන් ගෙණ කාළක්‍රියා කෙළේ වීනම් අපායෙහි ඉපද බොහෝ දුක් විඳින්නේය. එසේහෙයින් මහණෙනි තෙපි අසුභවූ රූපාදී ආරම්මණයන් සුභාකාරයෙන් ගෙණ වාසය කරව, තවද මහණෙනි රූපාදී අරමුණු ගොදුරුකොට වාසයකරන්නාහු පුද්ගලතෙම ඉහාත්ම භාවයෙහිම මහත් විනාශයට පැමිණෙන්නේය. එසේහෙයින් රූපාදීන් සුභාකාරයෙන් බැලීමට වඩා ගිනිගෙණ දිලියෙන අය සලාකයෙන් චක්ෂු ප්‍රසාදය පිරිමැදීම උතුම් වන්නේයයි කියා වදාරා මහණෙනි තොප විසින් රූපය බැලියයුතු කලත් ඇත, ඒ නොබැලිය යුතු කලත් ඇත. එයින් බැලියයුතු කල්හි සුභාකාරයෙන් නොබලා අසුභාකාරයෙන් බලව, එසේ කල්හි තෙපි සතර සතිපඨානය ආඝීවූ අෂ්ටාංගිකමාර්ගීය නවවිධවූ ලොකොත්තර ධර්මය යන ගොචරයෙන් නොපිරිහෙව. එසේ නොපිරිහී ඒ ගොචරයෙහි හැසිරෙන්නාවූ තොප කරා ක්ලෙශමාරතෙම පැමිණෙන්ට අවසරයක් නොලබන්නේය. ඉදින් තෙපි කෙලෙසුන් වසඟ බවට පැමිණ සුභනිමිත්තාකාර වශයෙන් ඒ රූපය බැලුවාහු වීතම් පූතිමාංශ නම්වූ සිඟාලයා මෙන් තොපගේ ගොචරයෙන් පිරිහෙන්නාහුයයි වදාරා එපවත් අසනු කැමැති මහණගණයා විසින් ආරාධිතවූ බුදුරජානන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්**

පුරා බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකු රාජ්‍යය කරණ සමයෙහි හිමාලවන ප්‍රාන්තයෙහි එක් අරණ්‍ය ප්‍රදේශයෙක ගල්ගුහාවෙක්හි තොයෙක් සියගණන් එළුවෝ වාසය කරති, ඔවුන් වසතා තෙනට නුදුරු තැන්හි එක් ගල්ලෙනක පූතිමාංශ නම්වූ කැණහිලෙක් තමාගේ වේනීනම්වූ භාර්‍යාව හා සමග වාසය කෙරෙමින් එක් දවසක් ඈ හා සමග ඒ වනාන්තරයෙහි ගොදුරු සොයා ඇවිදිනේ ඒ ගුහාවෙහි වසන එළුවන් දැක එක් උපායකින් මොවුන් මරා මස් කෑ යුත්තේයයි සිතා ගොස් දවස දවස එකි එකී එළුවකු බැගින් මරා කන්නේය. මෙසේ ඔහු දෙදෙන එළුවන් කමින් ස්ථූල ශරීර ඇතිව මහත් ශක්තිසම්පන්න වූවාහුය. මෙසේ කල්යාමකින් ඒ සියළු එළුවෝ විනාශයට පැමිණියාහුය. ඔවුන් අතුරෙන් මෙලමාත්‍ර නම්වූ එක් එළුදෙනෙක් නුවනැත්තීය, උපායෙහි දක්ෂවන්නීය, එම කැණහිල්තෙම ඈ මරා කන්ට නොහැකිව ඒ තමාගේ භාර්‍යාවවූ වේනීනම් සිවල්දේනුව හා සමග මන්ත්‍රණය කරණුයේ සොදුර සියළු එළුවෝම අප විසින් මරා කෑලදින් නිමාවට ගියා හුය, මේ එළුදෙන එක් උපායකින් මරන්නට වටනේය, එසේ හෙයින් තෝ තනියම ගොස් ඒ එළුදෙන හා සමග මිත්‍රව නොප ඈ හා සමග විශ්වාසවූ කල්හි මම මළ ආකාර දක්වා හෙව නිදමි, එකල තෝ ඇ ලඟට ගොස් යෙහෙලිය මාගේ සැමියාගේ මළේය, මමද කිසි පිළිසරණයක් නැත්තෙමි,

දැන් තොප ඇර අනික් කෙණෙක් මට නැත, එසේ හෙයින් අපි දෙදෙන ගොස් අඩාවැලප ඔහුගේ ආදාහනකෘත්‍ය කරම්හයි කියා ඇ කැදවාගෙණ මෙතැන් එව, එසේ කල්හි මම නොත්පලින් පැනනැගී ඇගේ බොටුව ඩැහැ මරම් කීයේය. එසඳ ඒ වේනීතම් සිවල්දෙන් තොම යහපතැයි ඔහුගේ බස් පිළිගෙණ ඒ එළුදෙන හා සමග මිත්‍ර විශ්වාසය උපන් කල්හි පළමු ඒ සිඟා ලයා කී සියල්ලම එළුදෙනට කීවාය. එසඳ ඒ එළුදෙන් තොම කියන්නී යෙහෙලි තිගේ සවාමි පුත්‍රයා විසින් මාගේ සියළු නැයෝ මරා කනලද්දැහුය. එසේහෙයින් ඔහු කරායන්ට මම භය ඇත්තෙමි කීවාය, යෙහෙලි තෝ භය තොව මළාවූ ඒ තෙම තොපට කුමක් කරන්නෙහිදැයි කීවාය, එබසට නැව තත් ඒ එළුදෙන කියන්නී තොපගේ සවාමිපුත්‍රඃතම ඉතා දුබිවූ මන්ත්‍රණ ඇත්තේය, එසේ හෙයින් මම ඔහු සමීපයට තොයමි කියාද නැවතත් ඒ සිවල්දෙන විසින් යාචඤ්ඤ කරණ ලදුව මෙසේ කියන්නේ, ඒකාන්තයෙන් මළ නියාව වේදැයි සිතා ඇගේ බස් ගිවිසා ඇ එක්ව නික්ම ගියාය. එසේ යන් නීත් කුමකින් කුමක් වේදෝහෝයි ඒ කැණහිලා කෙරෙහි සැකයෙන් සිවල් දෙන ඉදිරිකොට විමසම්න් යන්නීය, එකල ඒ සිඟාලතෙම එන්නාවූ ඔවුන්ගේ ශබ්දය අසා එළුදෙන් ආවාහෝයි ඉස ඔසවා ඇස දල්වා බැලුයේය. එකල ඒ එළුදෙන් තොම එසේ බලන්නාවූ ඔහු දැක මේ පාපිෂ්ට ගුණ ඇති දුෂ්ට තෙතැත්තේ මා රවටා මරාකනු කැමතිව මළවෙස්ගෙණ හොත්තේයයි නැවත යන්ව නික්මුනාය, එකල සිවල්දෙන විසින් යෙහෙලි තෝ කවර හෙයකින් නැවත යන්තෙහිදැයි විවාරණ ලදුව තමා යන කාරණා සිවල් දෙනට කියන්නාවූ ඒ එළුදෙන එම්බල යෙහෙලි තිගේ සවාමි පුත්‍රවූ පූති මාංශ තම්වූ සිඟාලයාගේ බැලීම මට යහපත් නොවන්නේය. එසේ හෙයින් මෙබදු වූ වඤ්චාප්‍රයෝග දන්නා අසත් පුරුෂයා කෙරෙන් දුරුවීම යහපතැයි කියා තමාවසන තැනට ගියාය. ඒ සිඟාල දේනුව ඒ එළුදෙනගේ ගමන් වළකාගතනොහී කිසිත් නැතිව තමාගේ සවාමිපුත්‍රයා ලඟට ගොස් සෝක කෙරෙමින් තොඉයක් සිතිවිලි සිතා කළකිරී උන්නාය. එකල එසේ උන්නාවූ ඒ සිවල්දෙනට විඛානකරන්නාවූ ඒ සිඟාල තෙම එම්බල වේනිනී තෝ පළමු මාගේ යෙහෙලියවූ එළුදෙන් මට බොහෝ ස්නෙහ ඇත්තීය. මා කීවා කරන්නීයයි ගුණ වණ්ණකොට අප ලඟට කැදවාගෙණ එම්කියා ගොස් දැන් වතාහි අප සමීපයට නොවිත් දුරසිටම නැවත යන්නාවූ ඇ වළකාගත නොහී තෝ මෙතැන්හි අවුත් උමතුවාක්මෙන් ඉද කුමට සෝකකරන්නෙහිදැයි කීයේය. එබසට සිවල්දෙන්තොම කියන්නී එම්බල සවාමිපුත්‍රය තෝ පළමු වෙන් මළවුන්ගේ ආකාර දක්වා හෙව ඇ ලඟට ආ කල්හිම නැගිසිට බොටුව ඩැහැමරම් මන්ත්‍රණය කොට දැන් ඇ සමීපයව එන්ට පළමුවෙන් ඉස ඔසවා බැළුයෙහිය, එසේගෙයින් පරීක්ෂා නුවණැත්තෙහිත් තෝමයයි කීවාය. මෙසේ ඒ වේනීතම් සිවල්දෙන් තොම තමාගේ සවාමිපුත්‍රයාතත් භිදුවා ඉක්බිති සවාමිපුත්‍රයාතත් වහන්ස නුඹ වහන්සේ සෝක නොකල මැනව, නැවතත් මම ඇ උපායකින් මෙතනට කැදවාගෙණ එම්, එකල නුඹ වහන්සේ ඇ පමානොවී අල්වාගත මැනවැයි කියා ඇ සමීපයට ගොස් කියන්නී එම්බල යෙහෙලිය පළමු ආ තොප ගියගමනින් බොහෝ වැඩවිය, තාප එතැන්හි ගොස් ආ තැන්හි මාගේ සවාමිපුත්‍රයා දැන් සිහි ලැබ ජීවත්

වන්නේ, එසේ නොයින් ප්‍රිය පඬුරක් ලදින් සතුටු කරන්නාක් මෙන් ඒ අපගේ සවාමිපුත්‍රයා කරාහොත් පිළිසඳර කථාකොට එවයි කීවාය. එසඳ ඒ එළුදෙන් තොම මේ පවිටු නෙතැත්තී මා රවටා කණු කැමැත්තීය. මොවුන් වෛර කරවා ගැන්ම සුදුසු නොවන්නේය, එසේ නොයින් උපායෙන් මැ රවටා දුරු කෙරෙම් සිතා කියන්නී, යහපත යෙහෙලිය තොප සතුටුකොට එම් එසේ එන්නමුදු බොහෝ පිරිවර ගෙණඑම් ඒ එන්නාවූ අපට කැ යුතුවූ හොජන යන් සපයා තබවයි කීවාය. ඉක්බිති ඒ සිවල්දෙන්තොම විවරන්නී මම තොප කීවාවූ පෂීදව යම් හොජනයක් පිසම්. ඒ තිගේ පරිවාර ජනයෝ කෙබදු වන්නාහුද කිනම් ඇන්නාහුද ඔවුන් අපට නොවළඳා කියවයි කියා කීවාය. එබසට එළුදෙන් තොම තමාගේ පිරිවර කියන්නී, එම්බල වේනිය සුනඛයන් පන්සියයක් පිරිවරකොට ඇන්නාවූ මාලිය නම්වූද චතුරඤ්ඣ නම්වූද පිඟිය නම්වූද ජම්බුක නම්වූද යන මොහු සතරදෙන මාගේ පිරිවර වන්නාහ. මේ සියල්ලවුන් පිරිවරාගෙණ එන්නාවූ මට තෝ හොස් අහර සපයා තබව. ඉදින් තෝ අහර සපයා නොතිබුවා නම් මාගේ පිරිවරවූ දෙදුසක් බල්ලෝ තොප දෙදෙනා මරා මස් කන්නාහුයයි කීවාය. එබස් අසා ඒ සිඟාල ඩෙතුතොම යහපත ඉදින් තොමෝ එතැන්හි ගියා නම් අපව මහත් අනර්ථ වන්නේය. එසේ නොයින් නොයන පරිද්දෙන් කෙරෙම් සිතා කියන්නී, එම්බල යෙහෙලිය තොප මේ වසන තැනින් නික්ම ගියකල්හි තොපගේ උපකරණ විනාශ වන්නේය, එසේ නොයින් තොපගේ යහළුවූ ඒ සිඟාලයාට තොප නිදුක් නිරෝගි බව මම කියාලම්. තෝ අනික් තැන්හි නොගොස් මේතැන්හිම සැපසේ වාසය කරවයි ඒ එළුදෙනට කියා තොමෝ මරණ භයින් තැතිගෙණ වේගයෙන් සවාමිපුත්‍රයා ලඟට ගොස් ඔහු කැඳවාගෙණ අන්තැනක විසීමට ගොස් නැවත ඒ ගුහාවට නොආවාහුයයි සඤ්ඤයන් වහන්සේ මේ ධම්දේශනාව ගෙණහැර දක්වා වදාරා පූර්වාපර සන්ධිගළපා මේ ජාතකය නිමවා වදාළසේක. ඒ අරණ්‍ය ප්‍රදෙශයෙහි වනස්පතී වෘක්ෂයෙහි අධිගෘහිතව ඒ සිඟාලයාගේ හා සිවල්දෙනගේ භාෂණය ඇසුවාවූ දෙවතාව. නම් දැන් ලොව්තුරා බුදුවූ මම්ම වේදයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 245 තින්වටු ජාතකය

මේද එක්සමයෙක්හි මහනීය ගුණ මහිම සම්‍යක් සම්බුධ රාජෝත්තමයාතන් වහන්සේ ධර්මාමෘත වර්ෂාවෙන් ක්ලෙශ දහන නිර්වාපණය කොට වෙතෙය ජනයන් මතදෙළ පුරමින් ලකුළු ගිජ්ඣකූටපර්වතයෙහි ආසීර්විෂපථ විහරණයෙන් වාසය කරණසේක් මේ ජාතක ධර්මදේශනාව ගෙණ හැර දක්වා වදාළසේක එසමයෙහි ප්‍රසිඛ දම්සභා මණ්ඩපයෙහි විසුඛ බුඛාසන පිරිවරා උන් ශික්ෂාකාමී භික්ෂූහු බලා ඇවැත්නි මේ දේවදත්තාසථවිරයෝ නම් ලජ්ජාතැති එකෙක, ඔහු සිත සංජාත උතුම් ගුණාලවයකුත් නැත්තේය, එසේ සිටත් බුදුවනු කැමැත්තේය, මුළුලොවට පතළ අපමණ ගුණ ඇති බුදු

රජාතන්වහන්සේගේ සසුන් වැද කෙලෙසුන්ම දුරිය, අජාසත් රජු හා සමග නිවන් මග වළකන්නාක්මෙන් බුදුන් විදීමට දුනුවාහන් යෙදීය. අපාය මග එලිකරන්නාක්මෙන් ගල් පෙරලීය, අධර්ම නමැති රජ ප්‍රදක්ෂිණා කරන්නාක්මෙන් මදුතු බුදුන් සිහා වඩනා පුරවීථියෙහි ගැරවූයේය. තමාගේ සිල් සෙතඟ හන්න කරන්නාක්මෙන් සංඝභෙද කෙළේය යනාදීන් සත් ගුණ යෙන් අසදිරවූ දෙවදත්ත සථවිරයාගේ නුගුණ පහළ කළාහුය. එබස් දිව කණින් අසා ලොවට මතු වත වැඩ නිසා අසාධාරණ වූ බුඩමහිමයෙන් ධර්ම රාජන්වූ සර්ඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ ප්‍රඥප්තවූ බුඩාසන මස්තකයෙහි වැඩහිඳ රත්නප්‍රතිමාවන් මෙන් නිශ්චලව උන් භික්ෂු ගණයා බලා එම්බා භික්ෂූණි මා එන්නාට පළමුවෙන් මෙහි කවර කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙතම් කථාවකින් යුක්තාව උනුම්හයි අසා මනණෙනි මා නිසා අසාරවූ දේවදත්තසථවිරතෙම දැන් මතුවද යෙදුණේ නොවෙයි, බෝසත් කලත් මහත් වදයෙදුයේ වේදැයි වදාරා සංක්ෂේපව පැවති එපවත් විස්තර යෙන් අසනු කැමති ගණයා විසින් ආරාධිතවූ සර්ඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

පෙර දෙළෙස් යොදුන් බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජුන්හු රාජ්‍ය ශ්‍රී අනුභවකරණ කල්හි වෙද වෙදුහ සමය සමයාඩගශිල්ප ශාස්ත්‍රයෙහි නිෂ්පත්තියට පැමිණ දිසාපාමොක් ආචාරියෙක් ඒ බරණැස වසන පන්සිය යක් පමණ මානවකයන් ශිල්ප උගන්වනුයේ, එක් දිනයෙක සම්බාධවූ මේ ගෘහවාසය මටත් පව්‍රිබොධය ශිල්පයන්ගේ ශිල්ප ඉගැන්වීමටත් බාධාය, එබැවින් හිමවත් වනයට යෙමි සිතා එපවත් අතවැස්සන්ට කියා වල්හි කල්යවා විසීමට නිසි තල සහල් තෙල් මී සකුරු වස්ත්‍රාභරණ නොඇරගෙණ පිරිවර අතවැස්සන් හා සමග මහමග ගෙවා විවේක ජනාලයවූ හිමාලයෙහි ජනමන නඳනවනයක් මෙන් හොබනා එක් අරණ්‍ය ප්‍රදෙශයකට පැමිණ මඟ අසල් තැනෙක පන්සල කරවා විසීය. ඒ පන්සියයක් අතවැස්සෝද පන්සල්කොට එතන විසුවාහුය, ඔවුන්ගේ නැයෝද තමන්ගේ උපකරණ ඔවුන්ට එවන්නා හුවෙහි එපන්සලට අසල්වූ පසල්දනව්වෙහි වසන ජනයෝද ශිල්ප උගන්වා වසන්නාවූ ඒ ආචාරීන්ගේ ගුණ කථා අසා ප්‍රසන්නවූ සිතින් අන්‍ය පානාදීවූ උපකරණ එවන්නාහුය, තවද එයින් එක් මිනිසෙක් මෙයින් ආචාරියහට නිදුක් වේවයි කියා කිරිදෙනකු හා වස්සෙකු එවීය. ඒ ඇදුරා වසන මැදුරට නුදුරු තැන්හි එක් තුරු සිදුරෙක දරුදෙදෙනෙකු ගොරුකවා ගෝ දෙනෙක් වාසය කරන්නීය, ඒ වනයෙහි වසන උග්‍රවූ සිංහ ව්‍යාඝ්‍රවිඝ්‍රහ නොවී ඔහට උපස්ථානයට එති, නොමදහත්වද ලොවට මහත් මහිම දක්නට මෙත් බෝසත්වූ අප මහබෝසතානෝ තිත්වටු ජන්මයෙහි ඉපද ඒ මානවකයන් හා කැටුව විශ්වාසින්ට වසන්නාවූ ඒ ඇදුරුහු ඟදුරවත වෙද ත්‍රය විස්තරයෙන් දැන චිත්‍ර කර්මකම නිත්තිර පණ්ඩිතවූසේක. ඉක්බිති අන වැසි මානවකයන් වෙදප්‍රමාණය නිමවා නිපුණ කරන්නාව පළමුකොට දිසා පාමොක් ආචාරිතෙම මරනු විසින් වසඟ කරණ ලද්දේවිය. අතවැස්සෝ

ඔහුගේ ආදාහන කෘත්‍යය නිමවා වැල්ලෙන් චෛත්‍යයක් කොට නිත්‍යයෙන් පූජාකොට විලාප කියා හඬති, බෝසතාණන්වහන්සේ අඩන කාරණා විචාරා මිත්‍රයෙනි වෙදත්‍රය තව විස්තරකොට වදාරා නොනිමියේය. එසේ හෙයින් හඬමින්සි මානවකයන් කි කල්හි එසේවුවහොත් තොප උගත් ඒ වෙදත්‍රය දැන් කියවයි කීක ල්හි ලෝකෙක තෙත්‍රවූ ඒ තිත්තිර පණ්ඩිතයන්වහන්සේ විශෙෂවත්වූ මනුෂ්‍ය භාෂාවෙන් ග්‍රන්ථිසථාන නිශ්ශෙසකොට පඨිත මස්තක යකින් ගහා ප්‍රවාහයක් බානා පරිදිදෙන් වෙදමන්ත්‍රොඩාරණය කළසේක. එසඳ මානවකයෝ තුටුපහටු සිත් ඇතිව තිත්තිර පණ්ඩිතයන්ගේ පමිපයෙහි වෙදමන්ත්‍ර ඉගැන්මට පටන්ගත්තානුය. ඒ බෝසතාණෝ දිසාපාමොක් තනතුරෙහි සිට ශිල්ප උගන්වනසේක. ඔනුද උන්වහන්සේට ඇදුරු නොවත තරම් සොදුරු පැහැසර රන්මැදියක් කරවා එහි වඩාහිඳුවා රන්කැවියෙන් මී විලඳ දී ඇමසද නොමද සුවද කුසුම් පුදා හැමද මනනද මහත් සත්කාර කෙරෙති, තිත්තිර පණ්ඩිතයෙකු පිත්සිශයක් මානවකයන්ට ග්‍රන්ථ හදාරති උදුරවූ කීර්ත ඝොෂාව බුඩොත්පාදකාලයක්මෙන් ලොව පතලේය. ප්‍රසිඩ සම්පත්ති භාරයෙන් හා සුරතරවර සුරපුරයක්සේ බබලන රජගහනුවර ගිරිසිඛර සුරන්ට බිලිදෙන පිණිස අවුරුදුපතා කරණ මහපදමෙන් එකල සකල ජම්බුවීපයෙහි වසන මිනිසුන් විසින් සන්තෝෂව මහත් උත්සවයට උද්ඝෝෂණය කරණ ලද ඒ උත්සව ක්‍රීඩාව නිසා තමන්ගේ මව්පියන් විසින් කියා එවූ කල්හි ඒ බ්‍රාහ්මණ මානවකයෝ පක්සියයද පන්සලත් බෝසතාණන්ට ගොදෙනට රක්ෂාකරණ පිණිස නියෝගකොට පණ්ඩිතයන් වැඳ අවසරගෙණ ගියෝය. එකල කලිඟුරට්ඨ සවකපට දුෂ්ටපාපිෂ්ට මනුෂ්‍ය යෙක් උදවිතවවා සවයක්සේ උස්වූ ජටාවක් බැඳ තමා මුවාකොට මුවන් මැරීමට ඇඟ වැසූ වල්කැලෑවක් ඇඳිසේ වල්කැලෑ පෙරව චිත්ත විවෙක විභාග නොදැක්මෙන් කරුණාවෙන් තොරව මස්පලහා කන අග්නිකපාල කයක් මෙන් භික්ෂා පාත්‍රයක්ද ශුෂ්කමාංස ගුප්තකොට තබන ඔබඹුවක්බදු ඔබරුවක්ද තුංකමල් සිත වංක බව දක්වන්නාක් මෙන් වංකත්‍රයක් ඇති පිරිකරක්ද අපායට මානයට යෂ්ටියක් බඳුවූ වාරයෂ්ටියක්ද ගෙණ තමා මැරූ ගණනට එබූ බින්දු වැනි තිත්පෙලිං තුදුන් අදුන් දිවිසමක් එකාංශ යෙහි කොට රුධිරපානයෙහි ලේ රුදි රත්ව හියාක්වැනි මහත් තඹ රැවුල කින් හා වැහෙන ලේ බින්දුවට තිබූ පිහිල්ලක්සේ දික්වූ දැවිලිවලල්ලකින් යුක්ත සති සත්තාප වචා තාපසවෙසකින් උපායෙන් සතුන්ට දුක් දෙන අපායෙහි යමපල්ලකුමෙන් ඒ පන්සලට පැමිණියේය. ඔහු දැක ගොදෙන්ද සොයායන ගොදුරු තබා දයාබර සබා තාපසයෙකැයි නොබා ගොස් ඔහු කෙරෙහි භක්තියෙන් බත්පිස කවයි සහල් ආදිය දක්වා දී ගොදුරු පිණිස ගියාය. ඒ තාපසයාද එදා උදැසන බත්පිස හැමකලම සංග්‍රහ කළාවූ ජන යන්ට නිග්‍රහකරණ දුජිතගුණම අවබොධ කරන්නාක්මෙන් ඒ ගෝ ධෙනුවගේ දරුදෙදෙනා මරා මස්රසයෙන් බත් අනුභවකොට දානවල් මැදිරියෙහි උන් ලොවට කල්‍යාණ මිත්‍රවූ කුශලයට් ජන්මක්ෂෙත්‍රවූ සඩ්මියට එකවජ්ත්‍ර මෛත්‍රියට් පාත්‍රවූ චාරිත්‍රයෙන් පවිත්‍රවූ පක්ෂපත්‍රයෙන් විචිත්‍ර වූ තිත්තිර පණ්ඩිතයන්වහන්සේ ඒ තාපසතෙම තමාගේ පූර්ව වෛරය හා සමග එලිසටගෙණ වනදේවතාවන් හා සමග හඬවහඬවා ඒ වෙනෙහි සිංහව්‍යාඝ්‍ර හා සමග වික්ෂෙපකොට අතවැස්සන් හා සමග දුකට පමුණුවා තමාගේ

අකුශල් හා සමග ගිනිදල්වා කුසල් මුල් හා සමග එලහාවිර රිවිබව් හා සමග අනුභව කොට එසේද වස්සාද මරා කා නැවත දරුවන් මැරූ බැව් කොදූන කිරිදෙන පිණිස පැමිණි දෙනද මරා සවස මස් අනුභවකොට පරලොව යන්නාවට ගමන් ගතවන්නාසේ පන්සලින් නික්ම ගස්මුලෙක හෙව වස්සාගේ හා දෙනගේ බැගැපත් හඬසේ ධවනි නාදසේ ගොරව ගොරවා නිදන්නට පවන්නත, නොදෙන් ගොදුරු බිමින් අවුත් දරුවන් දෙදෙනා කොදූක බලා ඇවිදිනීය. එසේ තමා ලග්නා බලෙන් පාවා ඇවිදිනා ඒ ගෝදෙන දූක වනදේවතාවෙක් විසිතුරු අතුරෙකින් පෙණී මනහර සොඳුරුවර දිව්‍යරූප යෙන් සිට මියුරු තෙපුලින් කථාකරණුයේ එම්බල තොප විසින් යමෙක් හට අදරින් ආහාර සපයාදී මහත් සත්කාර කරණලදද ක්‍රැරවූ ඒ වෙණර පුරුෂයෙ තොපගේ දරුදෙදෙනා මරා කා තෙල තුරුමුලහෙව නිදන්නේය, දැන් තොප ගොසින් දළින් බැහැ එයින් ජීවිතක්ෂයව පමුණුවව ප්‍රාණවධ කැමත ඔහු ජීවත්වීම තොපට නොකැමැතිවෙයි කීවේය. එබසට ගෝදෙන දේවතා වාව කියන්නී එම්බල දිව්‍යපුත්‍රය මේ කුලපුත්‍රතෙම බාලපුත්‍රයන් වඩනා දැසි ස්ත්‍රියකගේ මලමුත්‍රයෙන් රැදුනු වස්ත්‍රයක් මෙන් අපවිත්‍රවූ චාරිත්‍ර ඇති රෞද්‍රවූ එක් වැදිපුත්‍රයෙක දුෂ්ටකම්යෙන් කයිනවූ මොහුගේ ගාත්‍රයෙහිද මොලොක් තැනක් නොදෙන්නෙම් එයින් බැහැ මරන්ට නොකැමැත්තෙම් කියා නැවතත් ඔහු කෙළෙහිගුණ නොදන්නා බව පෙන්නා කියන්නී එම්බල දේවතාව තදව මෙලොව යමෙක් උපකාරී ජනයන්ට ප්‍රත්‍යුපකාර හෙයින් අකෘතඥවේද නිරන්තරයෙන් ගොදුරු සොයා යන පක්ෂියෙකු මෙන් විපක්ෂව සිටල්ලවුන්ගෙන් සිරුරම දක්නා සුළුවේද එබඳු දුර්ජනයාට චතුස්සාගර පරියන්ත නගර නිගම ග්‍රාම රාමණීය සමස්ත සම්පත්ති සම්භාර සමලංකෘත සකල පෘථිවි මණ්ඩල සත්කාර පූජාඕඝයකොට දුන්නේ වීනමුත් එසේත් ඔහුගේ සිත්ගත නොනැක්කෙයයි මෙසේ රුක්දෙවියාට කියා ගෝදෙන ඒ තවුසා නිසා හයින් අන්තැන්හි ගිය කල්හි බෝසතාන්ගේ මෛත්‍රී මහිමයෙන් මිත්‍රව වෙනෙහි වසන සිංහ ව්‍යාඝ්‍රයන්දෙදෙනා අතුරෙන් සිංහරාජතෙම කියනුයේ. එම්බා ව්‍යාඝ්‍රරාජය ධර්මාධර්ම විභාගය දේශනාඥන යෙන් ප්‍රතිමණ්ඩිතවූ අපගේ නිත්තිර පණ්ඩිතයන්වහන්සේ දැන් සත්අට දවසක් නුදුවිම්හ. නෙපිගොස් ඒ ගුණවත්හුගේ පවත් දැන එවයි ව්‍යාඝ්‍ර රාජයා ගමන්කරවිය, එසේද ගෝදෙන ගිය වේලෙහිම ගොස් මිනිස් බඳින් රඳන පවුකඳක් මෙන් නිදන ජඩවූ ඒ තාපසයාගේ විපත්ති ලතාවෙහි හටගත් විචිත්‍රාංකුර පත්‍රයක් මෙන් ජටාතුරෙදි පෙණෙන නිත්තිර පණ්ඩිත යන්ගේ පක්ෂපත්‍රයක්ද පැනිරගිය ඔහුගේ කර්මරාශියසේ විසිරගිය දෙනගේ හා වස්සාගේ ඇටරාශියද ගුණෙන් සිස්වූ මහාතාපසයාගේ සිතුසේ බෝසතුන් ගෙන් සිස්වූ මැදිරිය දැක මේ පාපිෂ්ටයාගේ දුෂ්ටකම්යෙනැයි රුෂ්වව පසින් ඇත පිබිදවිය ඒ තාපස තැගීසිට තමාගේ බෝසතුන් මරා රැස්කළ අකුශල කර්මය දෘෂ්ට ධර්මවෙද්‍ය මූර්තිමත්ව පෙණුනාක්මෙන් භයංකාරව සිටි ව්‍යාඝ්‍රයා දැක භයින් තැතිගත්තේය. එසද ව්‍යාඝ්‍රතෙම මේ සත්වයින් මරා කැවේ තෝ වේදැයි විවාරා ඔහු නොමැරීම් කීකල්හි මේ සතුන් තා නොමැරුව මේ වෙනෙහි වෙත මරන්නෝ නැත. එයින් බොරු නොකියවයි කියා භය ගැන්විය. හෙද භයපත්ව සෙස්සවුන් මැරීම් නිත්තිර පණ්ඩිතයන් නො

මැරීම් කියා තැවතත් එය ගිවිස්වනු පිණිස කලිඟුරට තමා උපන්තැන් පවත් වට තොයෙක් රට ඇවිද තමාකළ පව්වුකම් ආදිය කිකල්හි එසේත් නොගිවිස අනිස තෝ මෙසේ කියයිදැයි ඇවිස සිංහ රජ්ජුරුවන් සමීපයට එවයි කියා පවිටු තවුසා තමන්හට පෙරටු කොවගෙණ ගියේය. ඔහු ඉදිරිකොට එත ව්‍යාඝ්‍රරාජයාට කථාකරන්නාවූ සිංහරාජතෙම රාහුමුඛයට තොපැමිණි පූර්ණචන්ද්‍රයා මෙන් සම්පූර්ණවූ පූර්වගාත්‍රයන් ඇති නෙයින් සුබාහුනම්වූ එම්බා ව්‍යාඝ්‍ර රජ්ජුරුවෙනි ඉතා ශීඝ්‍රවූ මනුෂ්‍යයෙකු කැඳවා ගෙණ මෙතැන්හි ආයෙනිය ක්‍රියාවික්‍රිය කසිකම්මාන්ත රහිත මේ වනාන්තර යෙහි වසත තොපට මනුෂ්‍යයන්ගෙන් කවර ප්‍රයෝජනයෙක්ද එබැවින් සැබවින්ම මොහුගෙන් සිඹවත යම් ප්‍රයෝජනයෙක් ඇද්ද ඔහුට තොවලහා කියවයි කීයේය. එබසට ව්‍යාඝ්‍ර රජතෙම එම්බා සිංහරජ සත්ගුණ රත්නයට නිධාන වෙදත්‍රයට උපදේශවූ, සබමීයට අසාධාරණවූ තොපට කල්‍යාණමිත්‍රවූ යම් තිත්තිර පණ්ඩිතයෙණෙක් ඇද්ද ඕහට පැමිණියාවූ වඩය අධම වූ මේ අසත්පුරුෂයා විසින් කළ පාපකම්යෙන් ඇසුවාවූ මම මොහුගෙන් පැමිණියායයි සිතමි. ඒ එසේම සකල ජනානන්දකර මධුර ලාබ යෙන් මතෝහරවූ ඒ තිත්තිර පණ්ඩිතයන් මේ වනාන්තරයෙහි දැන් ජීවත්ව ඉන්නාහු තොවෙති කීයේය. එබසට සිංහරජතෙම විවාරණුයේ එඹා ව්‍යාඝ්‍රය තා විසින් අසත ලද මේ පුරුෂයාගේ ජීවිකාවෘත්තිය නිසා ප්‍රවෘත්තිවූ කම්වූ නම් කවරහුද පාපනීවරණ කරන්නාවූ ශ්‍රමණ වේසයෙන් සිටිනා මේ මානවකයා කවර ප්‍රතිඥවක්ගෙණ තිත්තිර පණ්ඩිතයන්ගේ විනාශයට මොහු සැකකරන්නෙහිදැයි විවාලේය. එකල සියල්ල ප්‍රකාශ කොව කියන්නාහු ව්‍යාඝ්‍රතෙම කියන්නේ මනොහර රූපහාර විහාරබල පරාක්‍රමයෙන් මෘගරාජත්වූ එඹා සිංහරජ්ජුරුවන්වහන්ස මේ පුරුෂතෙම කලක කලිඟුරට වසනකල කපට වෙළඳුන්ගේ බඩුපොදි ඉසින් උසුලා බඩ වැඩීම පිණිස ගම්න් ගම ඇවිද දැසඟකුමෙන් වාසඟ කෙළේය. කලෙක තුලාකූට මානකූට කර්‍ෂාපණාදී වාටුක්‍රියාවෙන් වෙළඳුම් කෙළේය. කලෙක කණුගහා වේවැල්බැඳ එලියායුතුවූ දුගීමාගීයෙහි සාඛා මෘගයෙකු මෙන් සංචාරයද කෙළේය. කලෙක මුළු මුළුව තවා ඇවිදිනා තළු තාටකයන් හා කැටුව වැටුප් නිසා යටත්ව ඇවිද්දේය කලෙක නිරඝ ගිනිදැල් ඉසිලීමට පෙරනිමිත්ත පානාක්මෙන් වරදැල් වැද්දන් හා වල්වැද දැල් ඉසිලීය. කලෙක සිරුරෙහි අඟුරු ගුරු තවරකර දෙරිත් දෙර මුගුරු සරඹපැ අඟුරු තරවෙසින් ඇවිද්දේය, කලෙක විකිණීමස් පිණිස ගිහිනි වල් වැද තොමද මලිති ලිහිණියන් බඳු දිළිඳු වැදිවෙසින් ඇවිද්දේය කලෙක වී මෑතදීමෙන් ගෙණ දිවිපවත්වා කොටුගුළු රක්ෂා කෙළේය. කලෙක අතඹුයට හැරී දෙරසේ බෙදූ දූකෙළ ඇවිදිනා ධූතීයන්ට පැහැද පසඇවි ගෙණදී ඇවිද්දේය. කලෙක දිවසැපතව පැමිණ මැඬියන් අණු භවකරණ සඤ්ඤෙකුමෙන් උතුම් තවුස් වෙස් දරා දහතවූ අකුශල් කෙළේය. කලෙක රජුන්ට අපරාධ කෙරෙන් අත්පා කපාහළ තරන්කරා සොර මැදුමිරි ගොස් කුඹා දුම්පැලේ තවතා එයින් දිවිරැක ඇවිද්දේය. කලෙක ජීවිකාව නිසා අජීවකයන් කෙරෙහි පැවිදිව උනු බත් වළඳවා දැත් දවා ඇවිද්දේය, මොහු විසින් ජීවිකාවෘත්තිය නිසා කරණලද මේ යථොක්ත අනාචාර ප්‍රවෘත්තිය ඇසුහෙයින්ද චිත්තයෙහි ක්ලෙශ ජවාවෙන් අවුල්වූ මොහුගේ ජටා අතුරෙහි තිත්තිර පණ්ඩිතයන්ගේ පක්ෂ පත්‍රයන් දුටු

නෙයින්ද, ලොවට වධභීෂා නොවන බැවින් මරන්ට නුසුදුසු දෙන හා දරුවන් මරාකෑහෙයින්ද, නිත්තිර පණ්ඩිතයන්ගේ වධයට දැන් මොහුම සැකකෙළෙමියි කීයේය. එකල්හි සිංහරාජතෙම කොපුයේ හයාලත කඩුපත්සේ හයානකසේ තීයුණු නඛ පන්තීන් නික්මවා සබඳ කොල තෝ අපගේ නිත්තිර පණ්ඩිතයන් මැරුයෙහිදැයි විවාළේය. එකල්හි ජරාමරණ භැරයා නොහැකි ක්‍රැරවූ සිංහ ව්‍යාඝ්‍ර දෙදෙනාගේ අතුරෙහි සිට භයින් අනිකක් කිය නොහී බිලියක් වමාරණ මත්ස්‍යයෙකුමෙන් මඟත් උත්සාහ යෙන් සවාමීනි සැබවසි කීයේය. එබස් අසා සාධාරණ සිංහරාජතෙම නොමරා හරණ අභිප්‍රායවිය. ව්‍යාඝ්‍රතෙම නොමරා හරණ අතිදුෂ්ටයාගේ ජීවත්වීම ලොවට ඉෂ්ටනොවන්නේයයි කියා ධර්ම කැමැති ශරීරයෙහි හට ගත්තාවූ පුඩරිකයක්සේ ක්‍රැරවූ ඒ පුරුෂයා වෛද්‍යවෘත්තීයකු සැත්කම් කරන්නාක්මෙන් දළඟින් පැහැර පලා ඒ වෙනෙහි සත්වයන්ට සාන්ති කොට අපායට යන්නාවූ ප්‍රාණයට පසු ගමන්කරන්නාක්මෙන් පතිතවූ ඔහුගේ මෘතදේහය දැක මේ පරිභවකටයුතු ද්‍රෝහී පුරුෂතෙම අනුභව නොකටයුතු එකෙකැයි ඔහුගේ මෘතදෙහයත් අපායේ හෙලන්නාක්මෙන් භූමිවිදරණයකොට එහි බහා පස්වසාලමින් වනදේවතාවන් අස්වසැලිය, ඉක්බිති උත්සව ක්‍රීඩාවට ගිය පන්සියයක් මානවකයෝ පන්සලට පැමිණ බෝසතානන් නොදැක අනේ අපගේ පණ්ඩිතයානන්වහන්සේ කොයිවැඩි සේක්දැයි තැනිත්තැන වැටී පෙරළී ගතින්ගත් වැල්ලෙන් අතින්ගත් කුසින් ඉසින්ගත් පණරලින් නෙතින්ගත් කඳුලෙන් සිතින්ගත් සෝකින් ඒ පන්සල හාත්පසින් බලා නැවත පන්සලට වැද ගාඛ්‍රීයන්ගේ ගීතිකා මෙන් මනොහර ශක්‍රශන්ගේ සහාමණ්ඩපයමෙන් පළමු පණ්ඩිතයන්ගේ මිධුරා ලාපයෙන් ප්‍රතිමණ්ඩිතවූ මෙපන්සල දැන් නිරිඳුන් හැරගිය කඳ වුරමෙන් නිඃශ්‍රීකවූයේය. පෙරමාණික්‍ය රත්නයෙන් ඒකාලෝකවූ වෛඩූර්ය පර්වත ගුහාවසේ බබලන මේ රන්මැදිරිය දැන් ඇදිරියක්සේ තිබුයේය. පෙර වේද සැදැරීමෙන් එක කෝලාහලවූ මේ ආශ්‍රමය දැන් රැලසුං මුහු දක්සේ නිශ්ශබ්දවිය, සඩ්ඝීප්‍රදීපය නිවුනු නියාය වෙදත්‍රය මුළුපුල නියාය සුගති මාර්ගය වැසුනියාය. අපායට දොර හළනියාය ගුරුප්‍රදේශ විනාශවූ නියාය, මෙබඳු පණ්ඩිතකෙණෙකුන් කවර කලෙක දකිමෝද මෙවෙනි වචනාමෘතයක් කවර කලෙක ලබමෝද, මෙබඳු ශාස්ත්‍රාචාර්යයක් කවර කලෙක අසමෝද, මේ මනතානුන්ගේ මධුර ශබ්දයෙහි බැඳීඋන් මේ වෙනෙහි පක්ෂීනු දැන් කවරක්හුගේ ශබ්ද අසා සතුටුවෙද්ද, මුන්වහන්සේගේ මෛත්‍රී මහිමයෙන් මිත්‍රවවිසූ නිත්‍යවිරෝධී සත්වයෝ මතු කෙසේ විශ්වාසව වෙසෙද්ද, මුන්වහන්සේගේ සඩ්ඝී ගංගාවෙහි ගිලී සැනසුනු වනදේවතාවෝ මතු කෙසේ සැනසෙද්ද, යනාදීන් මෙසේ වෙනවෙනම විලාප කියා ඇඬීමෙන් යුගාන්ත වාත ප්‍රහාත සමුද්‍රයාගේ තරඟ ඝොෂාවසේ ඒ සියලු මනවනය එකකෝලාහලකොට ඒ පන්සියයක් බ්‍රහ්මණ මානවකයෝ තමන්ගේ වාසස්ථානවලට ගියානුය. මෙසේ ක්‍රෝධයෙන් ප්‍රමත්තවූ දහම්හි අව්‍යක්තවූ දේවදත්තසඨවිරතෙමේ පෙරත් වධයෙදුයේම වේදැයි මේ ජාතක ධර්මදේශනාව පූර්ණපරිසන්ධිගළපා නැවතත් විසුඛ විද්‍යාවරණ ගුණයෙන් ප්‍රශස්ත ලොකෙක නායක සාන්ති ප්‍රදායක ශාක්‍යකුලතිලක ශාස්තෘවූ තිලෝ ගුරු සම්‍යක් සම්බුඛ රාජෝත්තමශ්‍රීමත්වහන්සේ එම්බා මහණෙනි එකල

තාපස වේසයට පැමිණ ප්‍රාණවධකළාවූ අධම පුරුෂතම් මෙකල මේ ශාසනයට පැමිණ මහණදම් තබා අකුසල් කරන්නාවූ දේවදත්තසථවිර වන්නේය, එකල තාපසයා කෙරෙහි හසින් පලාහැර අන්තැන්හි ගිය ගෝධෙනුවතම් මෙකල මේ ගෞතම ගොත්‍රයෙහි ඉපද සසර හසින් ගිහි ගෙය හැර ශාසනයෙහි මහණවූ කිසාගොතමී සථවිරිය වන්නීය, එකල ඒ තවුසා නසා මිතුරුගුණ මහිම දැක්වූ ව්‍යාඝ්‍රරාජයා තම් මෙකල මේ කෙලෙසුන් නසා සෘඞ්ධිමහිම දැක්වූ මෞද්ගල්‍යානසථවිර වන්නේය, එකල ඒ වෙනෙහි සියළු මෘගයන්ට උතුම්වූ සිංහරජ්ජුරුවෝ තම් මෙකල මේ ශාසන යෙහි සියලු කුවණැත්තන්ට උතුම්වූ ශාරීපුත්‍රසථවිර වන්නේය, එකල ශිල්ප යෙන් අගතැන්පත් දිසාපාමොක් ආචාර්‍යතම් මේ කල සියළු ධුතාඞග යෙන් අගතැන්පත් මහාකාශ්‍යප සථවිර වන්නේය. එකල පන්සියයක් කුලපුත්‍රයන්ට වෙදත්‍රයෙන් අනුශාසනා කළාවූ තිත්තර පණ්ඩිතයෝ තම් මේකල භුවනත්‍රය වාසිවූ ජනයන්ට පිටකත්‍රයෙන් අනුශාසනාකොට අජරාමරවූ අමෘතමහා නිර්වාණයට පමුණුවන්නාවූ බුදුවූ මම්මවේදයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

# නවවෙනි නිපාතය නිමි

---

## නවද දසවෙනි නිපාතය දක්වමු ඒ කෙසේද? යත්

### 426 චතුදවාර ජාතකය

නවද සුරාසුරවර වක්‍රවාට චූඩා මණි මරීචි සවය පරිචුම්බිත චරණ නඛ මයුඛ ඇති සම්මාසම්බුදුරජාණන් වහන්සේ පෙත වනාරාමයෙහි වැඩවසත සමයෙහි නොකිකරු භික්ෂුකෙණෙකුන් අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි විස්තර වශයෙන් නවවැනි නිපාතයෙහි ගිජ්ඣ ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය. මෙහි වතාහි සැබෑද මහණ තා නොකීකරුව වාසයකරන්නේයයි විචාරා සැබෑය සවාමීනි කීකල්හි දැන්මතුනොවෙයි මහණ තෝ පෙරත් නොකීකරුව වාසයකළේ වේදැයි වදරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්මාසම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

### ඒ කෙසේද? යත්

යිවගිය දවස කාශ්‍යප සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි එක් ගමෙක දුප්පත් උපාසකයෙකු හා උපාසිකාවක් ඇත්තීය. උන්ගේ මිත්තවින්දක නම් පුතෙක් ඇත්තේය. ඔහුගේ දෙමව්පියෝ තුමූ ශ්‍රද්ධාසම්පන්නයහ ශීලාචාරයෙන් යුත්තයහ. ඒ මිත්තවින්දකතම් කුමාර ඉතා අනාචාරශීලීව දවස් අරනේය. එසමයෙහි ඒ උපාසකයා මළේය. උපාසිකාව සැමියා

මලත් කළමනා දම්පින් අඩුවෙක් නැතුව කරන්නාහුය. පුතනුවන්ට එම්බාපුත මේලොව ඇත. පරලොව ඇත. දන් පින් කරවයි අවවාද කීහ. ඒ මිත්තවින්දකතෙම පින්කම්කොට කුමන කාරියෙක්ද පින්කම්කොට ලබන්නේ කිම්දැයි මැනියන් කිවා නොකොට දසවිධ පින්කම් කළවුන්ව තම් තබා මාසේ වූවාය. පව්කළවුන්ට මේසේවූ තපුරුකැයි කීහ, ඒ යාපත තපුර මම්ම දනිම් නුඹව ඇයිදැයි කියා අතාවාර ශීලීව වසන්නේය. එක්දවසක් පිරුණු පසලොස්වක් ලත් පෝය පැමිණියේය. මිත්තවින්දක යාගේ මැනියෝ කියන්නාහු එම්බා අද පොහෝදවසය තොපට මසුරන් දහසක්දෙමි විහාරයට ගොස් බණ අසා එවයි පුතනුවන්ට කීහ, පුතාත් යහපතැයි සම්පතෙහි කළ ලෝභයෙන් දුවල් මුළුල්ලේ ඇත මැත ඇවිද දුශ්චකම්කොට සවස් වේලෙහි ගණයට ගොස් තමාට බණ නොඇසෙන තෙක දුරවැදගෙව නිදා නැගී උදැසනක්සේ ඇසමුව සෝදා ගෙට ආයේය. උන්ගේ මැනියෝත් අද මාගේ පුතනුවෝ බණ අසා තෙරුන් වහන්සේ කැඳවාගෙණ එන්නාහුයයි කැඳ අවුළුපත් ඉදිකොට උන්නාහුය, ඒ මිත්ත වින්දකයාත් තනිවම ගෙට ගියේය, මැනියෝ කියන්නාහු ඇයි පුත තෙරුන් නාන්සේ කැඳවාගෙණ නොආයේදැයි කීහ. එවිට කියන්නේ මම මසුරන් දහස නිසා බණ අසන්ට ගිය පමණක් විනා තෙරුන්වහන්සේ කැඳවා ගෙණ එන්ට ගියෙම්දැයි කීහ. එසේවීනම් තොප බණ ඇසුයේම මීට ලාභය තොප මේ කැඳත් බී අවුළුපතුත් අනුභවකරවයි කීහ. මට මසුරන්දැස දුනොත් විනා කැඳ අවුළුපත් අනුභව නොකෙරෙමියි කියා මසුරන් දැස ඇරගෙණ අවුළුපත් අනුභවකොට වෙළඳුමට ගොස් වෙළඳුම්කොට මසු රන් එක්ලක්ෂ විසිදසක් සොයාගෙණ මැනියන්ට ගොස් කියන්නේ මැනි යන්වහන්ස මම වෙළඳුමට යෙමි කීහ. පුත සමුද්‍රයෙහි නැව් නැගී කරණ වෙළඳම් තම් විශ්වාස කළ නොනැක්ක මාගේ ගෙයි අසූදසක් සම්පත් ඇත, වෙළඳුමට යන්නේ මේ සම්පත් මදිවැදයි පුතනුවන් එකරුන්ත අල්වා ගත්තාහ. ඒ මිත්තවින්දකයා මැනියන් අතගලවා කන්සට පාරක් ගැසීය. ඒ පාරකා මැනියන් මූර්ඡාවට පැමිණ වැටී යන්නා තෙමේ පඬව් නැගී සැදවසක් මුදයාත්‍රාකළ කල්හි ඒ නැව සමුද්‍ර මධ්‍යයේ ඇතක් ගසාපුවාක් වෙන් නොසෑලවී සිටියේය. ඒ නැවට නැංගාවූ බොහෝදෙනා මේ නැවට නැංඹගාවුන්ගෙන් අකුශල්කළ කෙණෙකුන් ඇති නියාය කියා කුශපත්ලා බැලූහ. ඒ මිත්තවින්දකයා තම ලිව් කුශපත ගිලී ගියේය. ඔහු ලෑල්ලක ඉඳුවා සමුද්‍රයට අලහ. ඒ ලෑල්ල බඩතබා පීතන්නේ දුවාණමය ප්‍රාසාද යක විමානපේතතම් ස්ත්‍රීන් සතර දෙනෙකු ඉන්නා සථානයකට පැමිණි යේය. ඔහු සතරදෙනම ඒ මිත්තවින්දකයා දැක තමන්ගේ ප්‍රසාදයට ඇර ගෙණ කවා විමාන ප්‍රෙතයන් විසින් සත්දවසක් සැපවිඳ සත්දවසක් දුක් විඳිනාහ, එසේහෙයින් දුක්විඳිනට යන්නාවූ අපි ඇම අපගේ කවයුත්නට යම්හ. අප එනතුරු උකටලී නොවවයි ඔහු ඒ ප්‍රාසාදයේ රඳවා ගියාහ, ඒ දිව්‍යස්ත්‍රීන්ගේ ප්‍රාසාදයෙහි සම්පත් විත්දනොහී ඒ ලෑල්ල බඩතබා පීනාගණ යන්නේ දිව්‍යස්ත්‍රීන් අවදෙනෙකු ඉඳුනාවූ රිදීමය විමානයකට ගියේය, එතනිනුත් උන්හැම දුක්විඳිනට යාදී එතනත් නොරඳා අනික් සොළොස් දෙදෙනෙකු හිඳිනා මැණික්මය ප්‍රාසාදයකට ගියේය. එතනිනුත් නොරඳා උන් හැම දුක්විඳින්ට යාදී දිව්‍යස්ත්‍රීන් දෙනිස් දෙනෙකු ඉඳිනා රත්‍රන්මය විමානයකට ගියේය. එතනිනුත් උන්සැම දුක්විඳිනට යාදී ලෑල්ල

බඹතබාගෙණ පිනායන්නේ වව පවුරක් ඇති වාසල් සතරකින් යුක්තවූ නුවරක්සේ බොහෝ තරකයෙහි පෙණෙන්නාවූ මනුෂ්‍යයන් දැක එතනට පැමිණියේය. එතන එක්පවුලක පුරුෂයෙක් උරවක්‍රමාලාවක් ඉසතබාගෙණ පැසෙන්නේය. ඒ මිත්තවින්දකයා තෙළුම්මලක් ඉසතබාගෙණ සිටින් තාසේ පෙණී ඔහු ලය පස්තැනකින් යදමකින් මසා තිබෙන්නේය. ඒ මූට අවුල්හරක්සේ පෙණෙන්නේ උඟගේ ඇඟ මුළුල්ල උරවක්‍රමාලාවෙන් කැපී ලෙයෙන් තැවරී පිරී තිබෙන්නේය, ඒ මූට රත්සඳුන් ඇඟ ගැල්වූ වාක්මෙන් පෙණෙන්නේය, ඒ තමාගේ වේදනාවෙන් මුරහානේ ගී කියන හඬක්සේ ඇසිනා, ඒ මිත්තවින්දක පුරුෂයා ඔහු කරා ගොස් කියන්නේ එම්බල පුරුෂය තෙළුම්මල මට දීපියව නැතැක් දවස තා අත තිබෙන්නේ යයි කීය. ඒ පුරුෂයා කියන්නේ එම්බල තෙළුම්මලෙක් නොවෙයි. තට ඒ කුමටදැයි කියා සිතන්නේ මුන් මාසේ මැනියන් මරා ආ කෙණෙ කැයි සිතා මානේ අකුශල ගෙවුම්වට පැමිණෙන නියාවේදැයි සිතා එසේ විතම් අරගණැයි උඟ ඉසට දැමීය. උඟ ඉස තබාගෙණ තැවෙන්ට වත මේක තෙළුම්මල නොව හැරගණැයි වේදනාව ඉවසාගතනොහී වටපිට දිවන්ට වත, ඒ පුරුෂයා අන්තඩිතවිය, බොධිසත්වයෝ දිව්‍යපුත්‍රව ඉපද සමුද්‍ර යෙහි ඇවිදිනාහු එතනට පැමිණියාහ, ඒ පුරුෂයා දිව්‍යපුත්‍රයා අතින් විවාරන්නේ එම්බල දිව්‍යරාජය මම කුමන අකුශලයක් කොට මෙතනට පැමිණියෙම් මේ දුකඛය විදිම්දැයි ඒ මට නොදුනෙයි මට කියවයි බොධි සත්වයන් අතින් විවාළේය. එවිට බොධිසත්වයෝ කියන්නාහු එම්බල තෝ මපුරන් එක්ලක්ෂ විසිදහසක් සොයාගෙණ දෙමව්පියන්කීවා නොකොට මැනි යන් කන්සටනසා මූර්ඡාකරවා පඩවුනැති සමුද්‍රමධ්‍යයෙහිදී පඩවීවට නොයන හෙයින් තොප මුදට දමාපුහ. තෝ ලැල්ල බඹතබාගෙණ දියපීනා දිව්‍ය ස්ත්‍රීන් සතරදෙනෙකු ඉදිනා විමානයට ගියේය. එතනත් තාගේ තෘෂ්ණාබල යෙන් රදාගතනොහී අටදෙනෙකු ඉදිනා විමානයට ගියේය. එතනිනුත් තෘෂ්ණා බලයෙන් රදාගතනොහී දෙළොස් දෙනෙකු ඉදිනා විමානයට ගියේය, එතනිනුත් තෘෂ්ණාබලයෙන් මැනියන් කන්සට ගැසූ අකුශලින් එතනත් රදාගත නොහී දෙනිස් දෙනෙකු ඉදිනා විමානයට ගියේය. එතනිනුත් තෘෂ්ණා බලයෙන් රදාගතනොහී මෙතනට පැමිණ තාගේ තෘෂ්ණාබල යෙන් මෙසේවූ දුකඛයකට පැමිණියේය. තෘෂ්ණා නැමති වළ කෙතෙක් උත්සාහකර පිරවෝතිනුත් පල්ලපුරා ගතනොහැක්කේය, ඒ තාගේ තෘෂ්ණා බලයෙනුත් මැනියන්ගේ කන්සට ගැසූ අකුශල් බලයෙනුත් මේ උරවක්‍ර මාලාව ඉස තබාගණ දුක්වි දින්ට පැමිණියේයයි කීය. එවිට මිත්තවින්දක තෙම මේ දිව්‍යපුත්‍රයා මාගේ උත්පත්ති සියල්ලම දන්නේය, මා මේ දුකින් මිදෙන කලුත් දන්නේය. එමු විවාරම් සිතා කියන්නේ එම්බල දිව්‍යරාජය මම මේ අකුශලයෙන් කෙතෙක් දවසින් ගැලවෙම්දැයි විවාළේය. එවිට බොධි සත්වයෝ කියන්නාහු එම්බල මිත්තවින්දකය තා මේ දුකින් මිදෙන කල් මෙතෙකැයි කියන්ට නොදනුම්හ. අනන්තාපරිමාන කලක් මෙහි පැසෙන්නේ වේදැයි දිව්‍යරාජයා අනනඩිතවියයි වදාරා මේ චතුමාර ජාතකය නිමවා වදාළසේක. එකල ඒ මිත්තවින්දක තම් දුන් මේ තොකිකරු භික්ෂුහුය, එසමයෙහි දිව්‍යරාජන්ව උපන්නෙම් බුදුවූ මම්මයයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

## 427 කෘෂ්ණ ජාතකය

තවද ශාක්‍යකුල තායකවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ කිඹුල්වත්පුර නිග්‍රෝධ රාමයෙහි වැඩවසන සමයෙහි සිතා ව ක් අරහයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

සවීඥයන්වහන්සේ භික්ෂුසඞ්ඝයා පිරිවරා කිඹුල්වත්පුර ඒ ඒ සථාන වල් බලා ඇවිදිනා ගමනේ එක්තරා භූමියක් දැක එතන මදවෙලා වැඩ හිඳ සිතන පනළ කළසේක. අනදඝාමීන් සවීඥයන්වහන්සේ සිතා පනළ කළ නියාව දැන සවීඥයන් වහන්සේ නොකාරණයෙක සිතා පහළ කළ සේක. ඒ කාරණය විචාරමිහි සිතා සවීඥයන් වහන්සේ සමීපයට අවුත් සවාමීනි මෙතන වැඩසිට සිතා පහළකළේ කවර කාරණයකින්දැයි විචාළ සේක. එම්බා ආනන්දයෙනි, පළමු මෙතන උගුවූ තේජස් හා පඤ්චඃඞ් අෂ්ට සමාපත්ති ඇති කෘෂ්ණ තාපස කෙණෙක් උන්නාහ. උන් සිතා සිතා පහළ කෙළෙමි වදාළසේක. ඒ කෙසේදැයි ආරාධිතවූ සවීඥයන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්,**

යිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ උතුම්වූ බ්‍රාහ්මණකුලයක උපන් සේක. ශරීරය ඉන්ද්‍රනීලමාණික්‍යයකට බඳුවූ පැහැ ඇති හෙයින් කෘෂ්ණ කුමාරයෝයයි නම් තුබූහ. බෝධිසත්ත්වයෝ වැඩිවිය පැමිණ දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් උගතමනා ශිල්ප ශාස්ත්‍ර ඉගෙණගෙණ අවුත් තමන් පියාතන්ට ශිල්පශාස්ත්‍ර පෑ කල්හි පියාතන්ගේ අඇමෙන් පුරෝහිත සථානාන්තරයට පැමිණ තමන්ගේ දෙමව්පියන් මුතුන් මිමුතුන් ඇතුළු වන්ගේ තොයෙක් වස්තු ලියා තුබූ සඛණී පත්‍රය ගෙන්වා බලා මේ වස්තුනම් රජදරුවන් ගෙන් සොරුන්ගෙන් සතුරන්ගෙන් දියෙන් ගින්නෙන් ඇතුළුවූ පඤ්චප්‍රකාරයට පැමිණ නස්නේය. මෙසේවූ සම්පත් දැනමුඛයට පමුණුවා පඤ්චර්ඩි අෂ්ටසමාපත්ති උපදවා සැපසේ වාසය කරමි. මාගේ මෙතෙක් වස්තු රජ්ජුරුවන් වහන්සේට කියා දන්දෙමි, රජ්ජුරුවන් සමීපයට ගොස් සවාමීනි මාගේ දෙමව්පියන් මුතුන් මිමුතුන් ඇතුළුවන්ගේ බොහෝ සම්පත් ඇත, ඒ සම්පත් ඔබවහන්සේ ගෙන්වාගත මැනවැයි කීන. රජ්ජුරුවෝ බමුණ මාගෙන් තා කැමති සම්පත් හැරගණුව තාගේ සම්පත් මව හැයිදැයි රජ්ජුරුවෝ කීන. බමුණානෙ කියන්නෝ සවාමීනි මාගේ බොහෝ සම්පත් දැනමුඛයට පමුණුවා තපස් කරන්නෙමියි කීන. රජ්ජුරුවෝ තොපගේ සම්පත් කැමති සැටියේ දැනමුඛයට පමුණුවයි කී ගමනේ යහපතැයි බොධි සත්ත්වයෝ ගෙට අවුත් සම්පත් තුබූ ගබඩාවල යතුරු අරවා සියළු යාචකයෝ ඇවිත් කැමති සැටියට සම්පත් ගෙණ යෙත්වයි විධාන කළාහ. යාචකයෝ අවුත් සත් රැ සත් දවාලක් සම්පත් ඇද නිමාවෙක් නුදුවූ හෙයින් බොධි සත්ත්වයෝ සම්පත් බලා සම්පත් දන්දී යෙත් නම් ජරාව හෝ පැමිණෙයි ව්‍යාධිය හෝ පැමිණෙයි සිතා කැමති සත්ත්ව කෙණෙක් ගෙණ යෙත්වයි කියා ගබඩාවල යතුරු හරවා තපසට නික්ම එක් වතාන්තරයෙක මුඛතම් ගසක් මුල වාසය කරන්නාහ. බොධිසත්ත්වයෝ ඒ ගසමුල විතා අනික් ගසක් මුල

කට පලාඵල කඩා නොයන නෙයින් රුක්මූලිකාඛයත් පුරන්නාහ. වතානන්තරයෙහි වාසයකරණ සෙයින් ආරණ්‍යකාඛයත් පුරන්නාහ. එක් ගමෙක නොවසන නෙයින් අබ්බොකාසිකාඛයත් පුරන්නාහ. ඵලාඵල යක් එකතැනක ඉද විනා සිතුසිතූ තැනක ඉද නොකන හෙයින් ඒකා සනිකාඛයත් පුරන්නාහ. නොනිදූ ඉන්නා නෙයිනුත් ඉදින් නිදන තමුත් භූමියෙහි විනා මැස්සෙක ඇදෙක නොසැතපෙන හෙයින් නෙසජ්ජිකාඛය යත් පුරන්නාහ. මෙසේවූ ධූතාඛයෙන් හා ප්‍රථමධ්‍යාන ච්තීයධ්‍යානාදී පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා වාසයකරන්නාහ. තවද බොධිසත්ත්වයෝ තමන් ගස ඵලජාති අමුවූවත් විලිකුන්වූවත් එම අනුභව කරන්නාහ. මල් ඇතිදු මල් අනුභව කෙරෙති මල් නැතිදු සාඛාජාති අනුභව කරන්නාහ. තමා ඉදිරියේ තිබුදෙයක් විනා ඉවත තිබු දෙයකට අත නොපොවන්නාහ, ඇල්ලූ අත්තෙම තිබූ ඵලජාතිවුවත් මල්ජාතිවුවත් අනුභව කොට මේ නියා යෙන් සෝරවූ තාපස්කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා වාසයකරන් නාහ. එසමයෙහි මෙකියන කෘෂ්ණ තාපසයන්ගේ ආනුභාවයෙන් ශක්‍ර යාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණුවිය. ඒ කියන ආසනය නුනුවන්නේ සතර කාරණයකින්ය, හේ කෙසේද යත්? ශක්‍රයාගේ ආයුෂ මද අවස්ථාවේ හුණුවන්නේය, යම් කෙණෙක් ශක්‍රසම්පත්ති ප්‍රාර්ථනා කෙරෙත් තමුත් හුණුවන්නේය, යම් තපස්වී කෙණෙකුන්ගේ ශීලතේජසින් හුණුවන් නේය, මහාගුණවතුන් කුකුස් ඉපදවීමෙන් හුණුවන්නේය, මේ සතර කාරණයෙන් ශක්‍රයන් නොකැමතිකරවා පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු වන්නේය, එවිට ශක්‍රයෝ තමන්ගේ ආසනය නොකැමැති කරවා හුණුවූ හෙයින් පරීක්ෂාකළ ගමනේ මෙකියන කෘෂ්ණ තාපසයන්ගේ ආනුභාව යෙන් උණුවූ නියාව දැන එතනට අවුත් බොධිසත්ත්වයන්ගේ පිටිපස්සේ සිට කියන්නාහු ඒකාන්තයෙන් මේ පුරුෂතෙම කෘෂ්ණවූ ශරීර ඇත්තේය, කෘෂ්ණවූ ඵල අනුභව කරන්නේය, කෘෂ්ණභූමියෙහි සෙය්‍යාව කරන්නේය එසේහෙයින් මේ පුරුෂයාගේ ක්‍රියාව මාගේ සිතට ප්‍රිය නොවන්නේයයි කියා බොධිසත්ත්වයන් පිටිපස සිට කියන්නාහු ඒකාන්තයෙන් මේ පුරුෂ තමන්ගේ නුගුණ කිකල්හි කිපෙත්දෝහෝයි නොකිපෙත්දෝහෝයි පරීක්ෂා කරණු සඳහා ශක්‍රදේවේන්ද්‍රයෝ බොධිසත්ත්වයන්ට කිපෙන්ට නිසිබස් කිහ. කෘෂ්ණ තාපසයෝ ශක්‍රදේවේන්ද්‍රයන් කිබස් අසා ඒ මා හා සමග කථා කරන්නේ කවරෙක්දෝහෝයි දිවසින් පරීක්ෂාකරණ තැනැත්තේ ශක්‍රදේ වේන්ද්‍රයන් නියාව දැන කරකැවී ශක්‍රදේවේන්ද්‍රයන්ගේ මූණ නොබලාම කථා කරන්නාහු ශක්‍රදේවේන්ද්‍රයෙනි ඇඟ සම කළුවූවයි සත්‍යතෙමේ කෘෂ්ණ තම් නොවන්නේය, යමෙක් අභ්‍යන්තරයෙහි ශීල සමාධි ප්‍රඥ විමුක්ති විමුක්තිඥන දර්ශනයෙන් සමන්විත වූයේතම් එබඳු සත්‍යතෙම සන්තානයෙන් ඉවත්කරණ ලද රාගචෙෂාදී අකුශල ධර්මයන් ඇති බව හේතුකොටගෙණ බ්‍රාහ්මණ නමුදු වන්නේය, තපස්වී නමුදු වන්නේය, යම්සත්ත්වයක්හු සන්තානයෙහි රාගචෙෂා දීවූ අකුශලධර්මයන් බහුලව පවතීනම් ඒ සත්‍යතෙමේ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීවූ යම් කිසි උත්තම කුලයක උපන්නේ වීතමුත් සවර්ණරූපයක් හා සම්පන්නවූ රන් වන්වූ ශරීර ශොභාවෙන් යුක්තවූයේ වීතමුත් කෘෂ්ණවූ අකුශල ධර්මයෙන් සමන්විත බැවින් කෘෂ්ණ තම් වන්නේයයි කිහ. මෙසේ කියා මේ ලෝක යෙහි සත්ත්වයන් කෘෂ්ණභාව කරන්නාවූ අකුශල ධර්මය අනේකප්‍රකාරයෙන්

විස්තර කොට කියා ඒ අකුශල ධර්මයන්ට නින්දා කොට ශීලාදී ගුණධර්මයන්ට ප්‍රශංසා කොට ආකාශයේ සඳමඬල ගෙණහැර පානාසේ ශක්‍රදේවේන්ද්‍ර යන්ට ධර්මදේශනා කළහ. ශක්‍රදේවේන්ද්‍රයෝ බෝධිසත්ත්වයන්ගේ ධර්මකථා අසා සතුටුවූසිත් ඇතිව වරයෙන් ආරාධනා කරන්නාහු තපස්වීන් වහන්ස ලෝවිසුරා බුදුකෙණෙකුන්වහන්සේ මෙන් නුඹවහන්සේ විසින් මනාකොට කියන ලද්දාවූ මේ සුභාෂිත වචනය නිසා නුඹවහන්සේට වරදෙනු කැමැත්තෙමි නුඹවහන්සේ සිතූයම් වරයක් ඇත්නම් මාගෙන් ගත මැනවැයි සියළු වරම් දෙමි කීහ. එබස් අසා මහබෝසතාණන්වහන්සේ කියන්නාහු සියළු දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රයෙනි, ඉදින් තෙපි මට වරදෙනු කැමැත්තාහුනම් නොකිපීම් වශයෙන් කිසිසේත් කෝපකටයුතු වස්තුයෙහි කෝප නොකිරීම් ගැවෙන්ට නිසි වස්තුයෙහි නොගැටීමය, වෙෂයෙන් වෙෂය නොකිරීමය, අනුන් සන්තක වස්තුයෙහි කිසිදෙයකත් ලොභනොකිරීමය, දූ දරුවන් ආදීවූ විඤ්ඤාණක වස්තු හා ධනධාන්‍යාදීවූ අවිඤ්ඤාණ වස්තුයෙහි ලොභ නොකිරීම, ඉදින් ඒ සියල්ල මා සන්තක චිත්තමුත් ඒකාන්තයෙන් එහි ලෝභ නූපදවා මෙබඳුවූ චතුරාංගයෙන් සමන්විතවූ මාගේ ප්‍රවෘත්තිය කැමැත්තෙමි. එසේහෙයින් ශක්‍රදේවේන්ද්‍රයෙනි ක්‍රොධනොකිරීමය, වෙෂය නොකිරීමය, පරසම්පත්තියෙහි ලොභ නොකිරීමය, මා සන්තකවූ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තුයෙහි ස්නෙහ නොකිරීමයයි යන මේ වරසතර මට දෙවයි ඉල්වූහ, එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ කියන්නාහු තපස්වීන්වහන්ස නුඹවහන්සේ ක්‍රොධය, දෙවෂය, ලොභය, ස්නෙහය යන මේ සතරෙහි ආදීනව යන් දුටුසේක්ද? අපි එහි ආදීනවයන් නොදනුම්හ. මා විසින් විචාරණ ලද්දාවූ නුඹවහන්සේ ඊට කාරණා කිවමැනවැයි කීහ. ඉක්බිති මහබෝසතාණන්වහන්සේ එසේ විනම් ශක්‍රදේවේන්ද්‍රයෙනි අසව කියා කාරණා කියන්නාහු නොයිව සත්ත්වයාගේ සභාව ඇති සත්ත්වයාගේ අඥානයෙන් උපන්නාවූ ක්‍රොධය තෙමේ පළමු කොට සුළුපට ඉපද පසුව ඊමත්තේ බොහෝව උපදනේය, යම්කිසිවක උපන්නේ විනම් ඒ සත්ත්වයා එහිම අලවන්නේය, ඒ කෝප කටයුතුවූ වස්තුව ඇර යා නොදෙන්නේය, පෙරළ පෙරලා ආක්‍රොෂ පරිභවාදිය කරවන්නේය, නැවත කායික චෛතසික දුකඛසංඛ්‍යාතවූ පීඩා වෙන් සමන්විතවූ ක්‍රොධය නිසා ප්‍රාණඝාතාදී අකුශල කර්මයන්කොට දැන ශීලාදීවූ සුචරිත ධර්මයෙන් දුරුව මෙලෝ පරලෝ දෙකින් වධ බන්ධන චිත්ත පීඩාදියට පැමිණ දුක්කර්මකටුල් ආදී බොහෝ දුක් අනුභව කරන්නේය, එසේ හෙයින් ක්‍රොධනම් මේසේ අනෙකප්‍රකාර ආදීනව ඇත්තේයයි දැන කෝපයන් නොකැමැත්තෙමි. තවද ශක්‍රදේවේන්ද්‍රයෙනි කිපීම සභාව කොට ඇති ක්‍රොධයෙන් කිපී පසුව අප්‍රතිකාර සභාවවූ වෙෂයන් නොස තුටුවූ සිත් ඇති සත්ත්වයන්ට පළමුකොට එම්බල කොල තෝ දුසයා නොවේදැයි පරුෂ වචනයෙන් පිටත්වන්නේය, ඒ පරුෂ වචනයට අනතුරුවම ඇත මැත ඇවිදීම් වශයෙන් අතින් අත ගැන්ම වන්නේය, ඊට අනතුරුව උපක්‍රම වශයෙන් ප්‍රාණී ප්‍රහාරය වන්නේය, ඊට අනතුරුව ඔවුනොවුන්ට දණ්ඩන් පැහැරීම වන්නේය, දණ්ඩප්‍රහාරය ඉක්ම ඒකතෝධාර උභතෝධාර ඇති ඛණ්ඩිතල කණ්ඩු ආදීවූ ආයුධයෙන් ඔවුනොවුන්ට පැහැරීම් වන්නේය, යම් කලෙක ශාස්ත්‍රයෙන් ඔවුනොවුන්ගේ ජීවිත විනාශ කෙරේද එසඳ වෙෂ මස්තකප්‍රාප්තවූයේවෙයි යම්සේ ඇඹුල් නොවන්නාවූ මෝරුවත් කාඩිවත් කල්යාමෙන් පාකයටගොස් නැවත ඇඹුල් වේද එක ජාති ඇත්ත

වුම මෝරු හා කාඩි ඇඹුල ඇඹුල් කැත්තේයයි තියනු ලැබේද එපරිද් දෙන්ම පළමුකොට උපන්නේ ක්‍රොධනම් වෙයි. මූකුරා ගොස් මතු මත් තෙහි උපදනේ වෙෂ නම් වෙයි, ඒ තෙමේ අකුශල මූක්ත වශයෙන් සම්භත ජාති ඇත්තේවී නමුත් ක්‍රොධය වෙෂයයි වෙන් වෙන් කොට කියනු ලැබෙයි, ඇඹුල් කැති වස්තුවෙන් යම්සේ ඇඹුල උපනේද, එපරිද්දෙන් වෙෂයත් කොපයත් උපන්නේ යම්නෙයකින් ඒ වෙෂය අනෙකප්‍රකාරවූ ආදීනව ඇත්තේද එසේහෙයින් වෙෂයත් නොකැමැත්තෙමි, තවද ශක්‍ර දේවේන්ද්‍රයෙනි දෙවෙනි දුවල් ගම් පැහැර කොල්ලකා මතාද ආයුධ ශරීර යෙහි තබා මෙනම් දෙයක් සාහසික ක්‍රියාවෙන් වස්තුගැම්මද රන් නොවන දෙය රත්තරනැයි ඒ හා සමානවූ වස්තුවක් පැ අනුන් සන්තක වස්තු ගැම්මද; නැවත අනෙකප්‍රකාර වංචා ප්‍රයෝගයෙන් මෙරමා මෝහ පමුණුවා වස්තු ගැම්මද යන මේ පාපධම්යෝ ලෝභයෙන් මඩනා ලද්දාවූ සත්වයන් කෙරෙහි පෙණෙන්නාහ. ලොභ රහිතවූ සත්වයෝ මෙබඳුවූ අකුශල කම්ය නොකෙරෙති. මෙසේ ලොභනම් අනේකප්‍රාර ආදීනව ඇත්තේය. එසේහෙයින් ලොභයත් නො කැමැත්තෙමි, තවද ශක්‍රදේවේන්ද්‍රය අරමුණෙහි ඇලෙන්නාවූ සවභාව ඇති ස්නෙහයෙන් ග්‍රන්ථිතවූ නැවත උත්පත්ති වශයෙන් ගැලවුනාවූ හුසින් මල්ගෙතුවාක්මෙන් අනේකප්‍රකාර ආලම්බනයෙහි පවත්නාවූ අභිද්‍යුකාය හස්තයෙන් ගෙතුකාවූ සවණාදියෙන් උපන්නාවූ සවණාහරණාදීන් මෙන් මනසින් උපන් බැවින් මනොමයව අභිජ්ඣා කාය ග්‍රන්ථාදීහු ඒ ඒ අරමුණෙහි පවත්නාහ. ඒ ලොභාදී ධම්යෝ සනතානයෙහි ඉද බලවත්වූ සනතාපය උපදවමින් අත්‍යර්ථයෙන් සත්වයන් මිරිකා පීඩාකරන්නාහ. මංගල බොධිසත්වයන්ට දරුවන් දන්දී බලවත් සෝකයෙන් පා උපන, වෙස්සන්තර බොධිසත්වයන්ට දෙදරුවන් දන්දී මහත්වූ දෙම්නස් උපන, මෙසේ පිරූ පාරමිතා ධම්යන් ඇති මහා බොධිසත්වයන්ට පවා මෙසේ සඞ්ඛ්‍යාත අකුශල ධම්යෝ තැවිලි කරන්නාහ. මේ ස්නෙහයෙහි ආදීනව වන්නේය, එසේහෙයින් ස්නෙහයත් නොකැමැත්තෙමි කීහ. එබස් අසා ශක්‍රදේවේන්ද්‍රයෝ කෘෂ්ණ පණ්ඩිතයෙනි තොප විසින් මේ ප්‍රශ්නය සම්ඵ විලාසයෙන් මනාකොට කියනලද තොපකෙරෙහි ඉතා සතුටුවිම් එසේහෙයින් නැවතත් තොපට වරයක් දෙමියි කීහ. එබස් අසා මහ බෝසතානෝ කියන්නාහු දෙදෙවිලොව දෙවියන්ට අධිපතිවූ ශක්‍රදේවේන්ද්‍රයෙනි ඉදින් තෙපි මට වරයක් දෙනු කැමැත්නානම් නිරන්තරයෙන් උදකලාව මේ වල්හි වසන්නාවූ මාගේ තපසට අන්තරාය කරන්නාවූ ව්‍යාධියෙක් නුපදවයි එසේවූ වරයක් දෙවයි කීහ. ශක්‍රදේවෙන්ද්‍රයන්ගෙන් කෘෂ්ණ පණ්ඩිතයෝ වරගන්නා තැනැත්තෝ ආමිස නිශ්‍රිතවූ වරයක් නොගණිති තපෝකම් නිශ්‍රිතවූ වරගණිති කියා වඩ වඩාලා ප්‍රසන්නාව නැවතත් වරයෙක් දෙමි කීහ. බොධිසත්වියෝ වරගන්නාහු ව්‍යාජයෙන් ධම්දෙශනා කෙරෙම් සිතා ධම්දෙශනා කරන්නාහු ශක්‍රදේවේන්ද්‍රයෙනි මා නිසා මට වැඩ කැමති බැවින් කිසි සත්වයක්හට කිසි කලෙක කායවාරය වචීවාවාරය මනෝවාරයයි යන ත්‍රිවිධවූ කම්වාරයෙන් උපන්නාවූ ප්‍රාණඝාතාදීවූ දශ අකුසල කම්පථයෙහි මිදී පිරිසිදු චිත්තසන්තාන ඇතිවෙම්වයි කියා මෙසේ මහ බෝසතානෝ යථොක්තවූ කාරණයත් කියා වරගන්නා තැනැත්තෝ ප්‍රව්‍රජ්‍යාවට සුදුසුවූ වරගත්තාහ, ශක්‍රයෝ කෘෂ්ණ තාපසයන්ට වරදී නිදුක්

නිරෝගීව මේ වෘක්ෂමූලයෙහි ඉඳ සැපසේ වාසය කරවයි කියා වෘක්ෂයෙන් ඵලඵල්ලවයෙන් නිර්මිත කොට ශක්‍රයෝ තමන්ගේ ශක්‍රභවනයට ගියාහ. කෘෂ්ණ තාපසයෝත් එම වෘක්ෂමූලයෙහිම ඉඳ කොපිරිහුනු ධ්‍යානයෙන් බඹලොව ගියහයි වදාරා මේ කෘෂ්ණ ජාතකය නිමවා වදාළසේක. එයවයෙහි ශක්‍රයෝ තම් දැන් අනුරුද්ධ මහාසථවිරයෝය, එසමයෙහි කෘෂ්ණතාපසයෝ තම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

---

## 428
## චතුපොසථ ජාතකය

චතුපොසථ ජාතකය පූර්ණ ජාතකය හා සදෘශය.

මේවද චතුපෝසථ ජාතකය විධුර ජාතකයෙහි විසතර වශයෙන් පෙණෙන්නේය.

---

## 429
## සංඛ ජාතකය

මේවද ශාක්‍යකුලකේතුවූ තිලෝගුරු බුදු රජානන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සම්පරිෂ්කාර දානයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්**

සැවැත්නුවර එක්තරා උපාසකයෙක් සම්‍යක්‍සම්බුදුරජාණන් වහන්සේ ඇතුළුවූ සියළු භික්ෂූන්වහන්සේ පවරා සත් දවසක් දන්දී ඉක්බිති සම්පරිෂ්කාර දානයක් දිනා. ඉන් වහන්දානය විශෙෂයෙන් දුන්නේය, ඉන් සම්‍යක්‍සම්බුදුරජාණන්වහන්සේව දුන්නාවූ වහන්සඟලෙහි අගය දහසක් වටනේය, දෘගාමීවන් දෙදෙනා වහන්සේට දුන්නාවූ වහන්සඟළ පත්සියයක් වටනේය, භික්ෂූන්වහන්සේට දුන් වහන්සඟළ සියය සියය වටනේය. මේ නියාගෙන් උපානත දානය මහත්කොට දිනා සම්‍යක්‍සම්බුදුරජාණන්වහන්සේ උපාසකයා තොප දුන්නාවූ වහන්දානය තොප කැමති යම් ප්‍රතිඵලයකට පැමිණෙයි, එසේනමුත් තොපට මහත්වූ විපාක දෙන්නේය, පළමු උත්තමබුදුරජාණන් පසේබුදුන්ට වහන්සඟළක් හා පත් කුඩයක් දන්දී සමුද්‍ර මධ්‍යයෙහි ප්‍රතිෂ්ඨාව ලද්දෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්‍යක්‍සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

යම්කිසිය දවස බරණැස්නුවර නම් එසමයෙහි මෝලී නම් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ ඒරජ්ජුරුවන්ට සංඛ නම් පුරෝහිතව මහත්වූ සම්පත්තීන් වාසය

කරන්නාහ. සතර දන්හල් කරවා දවස්පතා මහත්වූ දානය දුගී මගී යාචක යන්ට දුන්නාහුය. එසේ දන්දෙමින් සිතන්නාහු මාගේ සම්පත් යම් තියා යෙක අඩුව ගියේනම් ඒ දවස් මාගේ දානය පිරිහෙයි, ඊට පළමු වෙළඳුම් ආදියෙන් සම්පත් උපදවා එම්යි සිතා අරිට්ඨපුරයට ගොස් වෙළඳුම්කොට සම්පත් ගෙණෙන්ව උවමැනවැයි පඬව් තොටට යන සංඛතම් බ්‍රාහ්මණ තෙම පය වහන්සඟලක් ලා පත්කුඩයක් ගෙණ පසුඹිය කරලාගෙණ මඩ්‍යාහ්න වේලේ පඬව් තොටට යන්නාහ. එදවස තන්දමූලක පබ්භාරයෙහි වාසයකරන්නාවූ පසේබුදුන්වහන්සේ ලොවට කරුණාවෙන් බලා වදුරණ සේක් සංඛතම් බ්‍රාහ්මණයානන් පඬව් නැගී යාත්‍රාවට යන නියාව දැන වදුරා යාත්‍රා ගියකල මුන්ට වන උපද්‍රව ඇද්දෝනෝයි නැද්දෝහෝයි පරීක්ෂාකොට සමුද්‍ර මධ්‍යයෙහිදී මුන්ට වන උපද්‍රව දැක ඒ උපද්‍රවම මා එතනට ගිය කල වහන්සඟලක් හා පත්කුඩය දන්දීමෙන් වැළකී ප්‍රතිෂ්ඨාව ලැබෙතියි දැන වදුරා එතනව එන්නාවූ පසේබුදුන්වහන්සේ ගිනි අඟුරුමෙන් කකියන්නාවූ වැලි මැඩගෙණ මධ්‍යාහ්න වේලේ අවුත් සංඛතම් බ්‍රාහ්මණයානන් දුටුසේක. බොධිසත්වයෝ පසේබුදුන්වහන්සේ දැක ඡායාසම්පණ්ණ වෘක්ෂයක් සමීපයට ගොස් පසුඹියෙහි තිබූ තෙලින් පසේබුදුන් වහන්සේගේ ශ්‍රීපාදය මැඩ වහන් සඟළ පසේබුදුන්වහන්සේගේ ශ්‍රීපාදයේ ලා පත්කුඩයක් අතවදී සවාමිනි පත්කුඩය ඉසට ගෙණ වහන්සඟළ පයලා තොමිරිකි කරුණාවෙන් වඩනේ යයපතැයි කීහ. පසේ බුදුන්වහන්සේ බොධිසත්වයන්ට අනුමෙවෙති බණ වදුරා තමන්වහන්සේ පළමු විසූ නඳමූල පබ්භාරයට පස්වණක් වලාමඩිමින් ආකාශයෙන් වැඩිසේක. බොධිසත්වයෝ බොහෝ මනුෂ්‍යයන් හා සමගින් යාත්‍රාකරන්නාහු සමුද්‍ර මධ්‍යයට පඬව්ව ගිය කලව එක් ඇලයකින් පඬව්ව බිඳී පැන් ඉසෙන්ට වන, මනුෂ්‍යයෝ පැන් ඉසින්ට වන්නාහ. පැන් ඉසඟත නොහැකිව පඬව්ව නැසෙන්ට වන්කලට මනුෂ්‍යයෝ අඬන්ට වන්නාහ. බොධිසත්වයෝ කිසි සැකයක් නැතිව එලඟි තෙලින් සතීරා අනා බඹපුරා කා තලතෙල් ශරීරයේ ගල්වා පිළි තරකොට ඇද අතවැස්සාත් මේ නියායෙන් සලස්වාගෙණ කුඹඋඩට දෙන්නම පැන නැගී තමන්ගේ නුවර අසවල්දිසායයි නියම දැන මනුෂ්‍යයන් කන්ට එක්වූ මස්කැස්බන් වළඟා ඉස්බක්තැන් බොධිසත්වයන් අතවැස්සා හා පැණපුව, සත්රැ සත්දවාලක් සමුද්‍රයෙහි පිනන කලව සතරවරන්දෙවියන් විසින් දෙමවුපියන් පඤ්චශීල අෂ්ටාඞග ශීලය රක්ෂා කරන්නාවූ දානඩ්‍යාශ කරන්නාවූ යම්ම සත්වයෙක් සමුද්‍රයෙහි වැටුනේ වීනම් උන්ට ප්‍රතිෂ්ඨායයි සැලැස්වූ මණිමේඛලාද අපරීක්ෂිතව උන්නි සත් වෙනි දවස් සමුද්‍රය බලා සත් රැ සත් දවාලක් පිනන්නාවූ බොධිසත්වයන් දැක තුමූද දිව්‍යාභරණයෙන් සැරහී රත්තලියකින් බත් ඇරගෙණ බොධි සත්වයන් සමීපයට අවුත් ආකාශයේ සිට එබල පුරුෂය තෝ නිරාහාරයෙන් මූදපීනන්නේ සත් රැ සත් දවාලෙක මා ගෙණා මේ රත්තලියේ බත් අනුභවකරවයි කීහ. බෝධිසත්වයෝ එම්බල ස්ත්‍රිය මම පේවීම් වේලා නොවරද්ද, වීනා වේලා වරද්ද බත් නොකම් තෝ පලායයි කීහ. එවිට පස්සේ පිනුයේ අතවැසි මණිමේඛලා දුවඅවුත් සිටිනානියාව නොපෙණෙන් නේය, බත්කන්ට කීවාද නොඇසෙන්නේය. බොධිසත්වයෝ වේලා වරද්ද බත් නොකම්, රත්තලියේ බත් තෝ ඇරගෙණ පලායයි කීබස් අසා අත වැසි සිතන්නේ සංඛ නම් බ්‍රාහ්මණයානන්වහන්සේ සුකුමාල හෙයින් හා

සත් රැ සත්දවාලක් නිරාහාර හෙයින් නිකම් ප්‍රලාප කියනසේකැයි සිතා කියන්නේ සංඛතම් බ්‍රාහ්මණයාණන් වහන්සේ බොහෝ ඇසුපිරූ තැන් ඇතිසේක. බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මතයන් හා කථා ආදියත් ඇතිව දැනාබ්‍යා ශය කළසේක, සත් රැ සත් දවාලක් බත් නොකැවයි මරණාසන්නයෙහි නිකම් ප්‍රලාප කුමට දෙඛනසේක්ද, වේලා වරද්දා බත් නොකම් තොප ඇරගෙණයයි මෙසේවූ ප්‍රලාප කියන්ට නුඹවහන්සේට මා විසා අනික් කෙණෙකුන් නැතිව ඉද මේ කියන්නේ කාටදැයි විවාළේය. එවිට බොධි සත්වයෝ මේ දිව්‍යස්ත්‍රී මුත්ට තොපෙණෙන නියා වේදැයි සිතා එඹල සඛද මා ඉදිරියේ දිව්‍ය ස්ත්‍රියක් බවත් නොදැනෙයි, සෘඩි ඇති මනුෂ්‍ය ස්ත්‍රියක් බවත් නොදැනෙයි රන්තලියකින් බත් ඇරගෙණ කන්ට කියයි ඇ හා කැටිව කථාකෙළෙමි. නිකම් ප්‍රලාපයක් නොකියමියි කීහ. එවිට අතවැසි කියන්නේ දිව්‍යස්ත්‍රියෙක බව හෝ මනුෂ්‍ය ස්ත්‍රියෙක බව විචාරන්ට උවමැනවැයි දෙපයින් පිණ පිණා දැනින් තමස්කාරකොට අපට ගැලවීමක් ඇද්දැයි විවාළ මැනවැයි කීයේය. සංඛතම් බ්‍රාහ්මණයාත් මුත් කීයේ කවයුතුයයි විචාරමී සිතා විශාල චක්ෂුසථල ඇති සිඟින්වූ සිඟුවලඟක් ඇති දෙවිදුනු හා සමානවූ භ්‍රැයුග්මයක් ඇති සූයර්‍යීම ණ්ඩලයමෙන් ශරීර සෝභා ඇති සර්‍වාලංකාරයෙන් සැරහෙන ලදුව මා ඉදිරියේ සිටිතා තෙපි දිව්‍ය ස්ත්‍රියෙක්ද සෘඩි ඇති මනුෂ්‍ය ස්ත්‍රියෙක්දැයි විවාළේය. එවිට දිව්‍යස්ත්‍රී කියන්නී සතරවරම් දෙවියන් විසින් සමුද්‍රහුනු මේ සත්‍රකොණෙක් ඇත්නම් උන්ට ප්‍රතිෂ්ඨාවට සිටුවනලද මණිමේඛලා දූ නම් මමය, තෙපි කිසිහයක් නොවී තොපව උව මනා වස්ත්‍රාභරන අන්නපානද ඇත්වාහන අස්වාහණ ඇතුළුවූ වාහන යක්ද ඇරගණුව කිසිහයක් නොගණුවයි කිව, බොධිසත්වයෝ එඹල දිව්‍ය ස්ත්‍රිය මට උවමනා දෙයක් දෙමි කියන්නේ මාගේ ජාතිගොත්‍ර බලාද නොහොත් මා කළ කුශලයක් බලාදැයි විවාළේය, දිව්‍යස්ත්‍රී කියන්නී තොප පඬවි නැගෙන්ට එනගමනේ තොප පසේබුදුන්වහන්සේව දුන් පත් කුඩය හා වහන්සඟලේ ආනුභාවයෙන් මා තොපට කැමති දෙයක්දෙමි කීයේත් තොපව මෙතන පෙණී ප්‍රතිෂ්ඨාවූයේත් ඒ කුශල බලයෙනැයි කිව. එවිට බොධිසත්වයෝ කියන්නාහු අපට අනික් දෙයකින් ප්‍රයෝජන කිම්ද අපගේ මෝලිනීනම් නුවරට පළාගන නියාගෙන් යහපත් වරය ඇති රිවි පළුපත් ඇති පඬවිවෙක අපලා අපගේ නුවරෙහිලා පියවයි කීහ. එවිව දිව්‍යස්ත්‍රී යහපතැයි කියා අටඉස්බක් දිග සතරඉස්බක් පළලද ඉස්බක් ගැඹුරද ඇති සත්රුවන් තැවක් මවා මැණික්මය, කුඹයක්ද රත්රන්මය රැණද රීදීමය රුවලද මතතකොට සත්රුවන්ද ඒ නැවපුරා බොධිසත්වයන්ට තැවපා එහි වඩාහිඳුවූහ, බොධිසත්වයෝ අතවැස්සා නැවලන්ට කී ගමනේ මණිමෙඛලා දූ කියන්නී උන්කළ කුශලයක් නැතිව ඉන්දදී නැව ලන්නේ කෙසේදැයි කිව, බොධිසත්වයෝ තමන්කළ කුශලයන්හි පින්දුන්හ. පින්අනුමෝදන්වූ ගමනේ දෙව් දූ අතවැස්සාත් උස්වා නැවලාගෙණ බොධි සත්වයන් මෝලිනීනම් නුවරට ගෙණගොස් උන්ගේ ගෙය සත්රුවනින් පුරාලා මණිමෙඛලාදූ ගියාහ, බොධිසත්වයෝ සම්පත්ගෙණ තොයෙක් කුසල්කොට කම්වූ පරිද්දෙන් මියපරලොව ගියාහයි වදාරා මේ සංඛ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි මණිමේඛලා දූ නම් දැන් උපුල්වන්

මහා සථවිරීය, එසමයෙහි අතවැස්සා නම් දැන් ආනන්දසථවිරය, එසමයෙහි සංඛ බ්‍රාහ්මණව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 430 චූල්ලබොධි ජාතකය

තිවද ශීලසමාධි ප්‍රඥයෙන් යුක්ත වූ සම්‍බුදුරජාණන්වහන්ස් ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් කෝපී භික්ෂු කෙණෙකුත්වහන්සේ අරභයා මේ ජාතකය දක්වා වදාළසේක.

**ඒ කෙසේ ද? යත්**

එක් භික්ෂුකෙණෙකුත්වහන්සේ තද රළු පරුෂව කිවන්ගේ බසට කෝපිව වාසයකරණසේක. සම්‍බුදුරජාණන්වහන්සේ එපවත් දැන වදාරා සැබෑද මහණ තෝ කෝපීව වාසය කරන්නේයයි විචාරා වදාරා සැබෑව සවාමීනි කිකල්හි මහණ තා කෝපයක් නැත්තාවූ බුද්ධශාසනයෙහි මහණව කොපවන්ට කාරණා කිම්ද? පෙර උත්තමයෝ බුද්ධශාසනයෙන් පිටත් තාපසභාවයෙහි සිටත් කෝපකළමනා සථානයෙහි කෝපනුවූවෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්‍බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

පුරාතනය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුත් වහන්සේ රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයෝ එක් බ්‍රාහ්මණ කුලයෙක උපන්හ. උන්ට නම් තබන්නාහු බොධිසත්වකුමාරයෝයයි නම් තුබූහ. ඒ කුමාරයෝත් වැඩිවිය පැමිණ තක්සලානුවර දිසාපාමොක් ආචාරීන් කරා ගොස් උගතමනා ශිල්ප තිමවා ඉගෙණ දෙමව්පියන්ට ශිල්ප පෑවාහ. දෙමව්පියෝත් පුතනුවන් කෙරෙහි සතුටුව සුදුසු කුලයකින් බිරින්දක් ගෙණවිත් පාවාදෙන්ට උත්සාහ කළාහ. ඒ කුමාරයෝ මව බිරින්දගෙන් කාරියතැත, මම තපසටයෙමි නොගිවිස්නාහ, දෙමව්පියෝත් උන් නොගිවිස්සන් සමාන කුලයකින් කුමාරිකාවක් ගෙණවිත් විවාමගුල් කරවා පාවා දුන්හ. බිරින්ද පාවාදුන් පමණක් විනා කෙලෙස් වසඟයෙන් මූණ පමණකුත් නොබලා එකගෙයි වාසය කරන්නාහ. එසමයෙහි දෙමව්පියෝ දෙදෙනම කාලක්‍රියා කළාහ. බොධිසත්වයෝ බොහෝ සම්පත් බලා කියන්නාහු මේ සම්පත් තෙපි ඇරගණුවයි බිරින්දට කීහ. කුමාරිකා කියන්නී ඇයි සවාමීනි නුඹවහන්සේ කොයිවඩහා සේක්ද, මට සම්පත් පාවාගන්ට කියන්නේයයි කීහ. බොධිසත්වයෝ කියන්නාහු මම හිමාලයවනයට තපසටයෙමියි කීහ. ඇයි සවාමීනි ස්ත්‍රීන්ට තපස්කරන්ට නපුරුදැයි විචාළාහ. නපුරු නොවෙයි තොපට පුළුවන්වීනම් තපස්කරවයි කීහ. එවිට දෙන්නම ඒ දෙමව්පියන්ගේ සම්පත් හැර හිමාලයවනයට ගොස් සෘර්ෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව දසඅවු රැද්දක් අඛඩශීලය රකුණාකළ පමණවිනා පවාභිඥ අෂ්ටසමාපත්ති උපදවාගත නුහුනුවාහ, ඇඹුල් ලුණු සෙවුනා පිණිස මනුෂ්‍යපථයට ගොස් බරණැස් රජ්ජුරුවන්ගේ උයනෙහි වාසඥ කරන්නාහ. ඒ උයන රක්නා

උයන්ගොව්වා උයනේ යහපත්වූ ඵලාඵල ඇරගෙණ රජ්ජුරුවන් කරා ගොස් රජ්ජුරුවන්ට ඵලාඵල දීන, රජ්ජුරුවෝ කියන්නාහු එම්බල උයන්ගොව්ව අප කීප දවසකින් උයන්කෙළියට එම්හ. උයන යහපත්කොට සරසවයි කීහ උයන්ගොව්වාන් යහපතැයි උයනට ගොස් උයන කසළ හැර සරහාලීය. රජ්ජුරුවෝත් උයනට ගොස් උයන්කෙළි කෙළ ඒ ඒ තැන ඇවිදිනාහු තාපසයන් හා පරිව්‍රාජිකාවන් දැක වැඳ එකත්පස්ව සිටියාහු පරිව්‍රාජිකාවන් දැක උන්කෙරෙහි පිළිබඳ සිත් ඇතිව පරිව්‍රාජිකාවන් පවත් තාපසයන් අතින් විචාරන්නාහු සවාමීනි මේ පරිව්‍රජිකාවන්වහන්සේ නුඹවහන්සේට කුමක් වන සේක්දැයි විචාළාහ. මහරජ කුමක්වෙද්ද එක්ව තපස් කරණ තැනැත්තෝය එසේදවුවත් මා ගිහි කල පාදපරිචාරිකාවෝයයි කීහ. එවිට රජ්ජුරුවෝ මේ තාපසයන්වහන්සේ කෝප ඇතිසේක්ද්‍ෙ නැතිසේක්ද්‍ෙහෝයි පරීක්ෂාකරන්ට උවමැනවැයි සිතා කියන්නාහු තාපසයන්වහන්ස ඉදින් යමෙක් පරිව්‍රාජිකාවන්වහන්සේ බලයෙන් උදුරාගෙණ යන කෙණෙක් විනම්ද ඇත්තම්ද කෝප ඇද්ද නැද්දැයි විචාළාහ තාපසයෝ කියන්නාහු මහරජ රහත් නුයේයින් කෝප නැත කියද්ද ඉදින් කෝපයක් ඇතිවුවත් මම වනාහි ඇවිලෙන ගින්නෙක පැන්කල සලා ගිනි නිවන්නාසේම සන්තාන යෙහි කෝපය අඩුකරණ පමණක් විනා අනුන්ට දුනෙන නියායෙන් කෝප නොකෙරෙමි මාගේ ජීවිතය දක්වාත් කෝප නොකෙරෙමියි කීහ. රජ්ජුරුවෝත් තමන්ගේ එකතරා අමාත්‍යයෙකු කැඳවාගෙණ තෙල පරිව්‍රාජිකාවන් ඇරගෙණ රජගෙට ගෙණයවයි කීහ. ඒ අමාත්‍යයාත් පරිව්‍රාජිකාවන් අත අල්වාගෙණ මුරගාවා මෙසේවූ අධර්මයෙක් ඇද්ද මෙසේවූ අධර්මයෙක් මේ ලෝකයෙහි පවත්නා නියායන් කියා මුරගාවා මුරගාවා රජනෙට ගෙණ ගොස් ලීය. තාපසයෝත් කරඹසවා බලා බැණනොනැගී උන්නාහ. රජ්ජුරුවෝත් කල්යවා එතන නොසිට රජගෙට ගොස් පරිව්‍රාජිකාවන්ට කියන්නාහු මාගේ සොළොස්දහසක් පුරහතාවන්ට නායකකොට අගමෙහෙසුන් තනතුරෙහි පිහිටුවාලම් මේ තපස් කිරීමෙන් කුමන කාරියෙක්දැයි කීහ. පරිව්‍රජිකාවෝ කියන්නාහු මහරජ නොපගේ සම්පත්තීන් මට කුමන ප්‍රයෝජනද තපස් කිරීම උත්තමමයැයි කියා නොගිවිස්සාහ. රජ්ජුරුවෝත් ඒ පරිව්‍රජිකාව නොගිවිස්තා හෙයින් එක්ගෙයක ලවා තාපසයෝ උරණ ඇද්ද්‍ෙහෝයි නැද්ද්‍ෙහෝයි පරීක්ෂාකරන්ට උවමැනවැයි තනිව උයනට ගොස් පදසත් නොඇසෙන නියායෙන් තාපසයන් වසන සථානයට ගියහ. තාපසයෝ පරණ වල්කලාවක් ඇරගෙණ ගෙත්තම් කරත්නාහු රජ්ජුරුවන් එන නියාව නොදත් නෙයින් බැණනොනැගී උන්නාහ. එවිට රජ්ජුවෝ කියන්නාහු ඇයි තාපසයන්වහන්ස මාගේ ජීවිතාන්තය දක්වා කෝප නොකෙරෙමියි කියාවේද නුඹවහන්සේ කියේ, මා ඇවින් සිටිතා මෙතෙක්වේලා බැණනොනැගේ කෝප කැත්තෙත්දැයි කීහ. එවිට තාපසයෝ කියන්නාහු මහරජ එවිට උපන්නාවූ කෝපය එවිටම නැහාවූ බුලිරුසක් වැසිවැස නිවාපුවාසේම සන්හිඳුවාපීම් කීහ. එවිට රජ්ජුරුවෝ කියන්නාහු තාපසයන්වහන්ස මෙස්වූ කෝපය අඩුවන්නට කාරණා කිම්දැයි කීහ. තාපසයෝ කියන්නාහු මහරජ දඹුදෙනක් එක්ව ගැකල ගිනි වැටෙන්නේය. නැවත ඒ ගිනිදඹුදෙකම දවන්නේය, මහරජ එමෙන් මේ කෝපය ඇතිවූකල එවිටම නිවාපියතොත් විනා කෝපය දිවුණුකල තමා වම ආයාසවන්නේය, එසේවූ කෝපය වහා නසාපියයුත්තේයයි බොහෝ

නය දක්වා කෝපයෙහි ආදීනව කීයේය. රජ්ජුරුවෝත් තාපසයන් වහන්සේ විශිෂ්ටකොට කියන ලද්දාවූ ධර්මයෙහි සතුටුව තමන්වහන්සේ පරිව්‍රාජිකාවන් උදුරාගෙණ ගියාවූ මා කෙරෙහි කෝපයක් නොකොට බණ වදාළසේකැයි සතුටුව අමාත්‍යයකු කැඳවා පරිව්‍රාජිකාවන් ගෙන්වා වස්වා යන්ව පාවාදී උයනේ වාසය කරණ නියායෙන් ආරධනාකොට වස්වා උපස්ථාන කළහ. නොබෝ කලකින් පරිව්‍රාජිකාවෝ මළහ තාපසයෝත් හිමාලයවනයට ගොස් පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුනු ධ්‍යාන යෙන් බඹලොව ගියහයි වදාරා මේ චුල්ලබෝධි ජාතකය නිමාවා වදාළසේකි. එසමයෙහි පරිව්‍රාජිකාවෝ නම් යසෝධරා සථවිරිය, රජ්ජුරුවෝ නම් ආනන්දසථවිරයෝය, චුල්ලබෝධි තාපසයෝ නම් බුදුවූ මම්මයයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 431 කණ්හදීප ජාතකය

**ත**වද ශාක්‍යකුල චූඩාමාණික්‍යවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ ජේත වනාරාමයෙහි වැඩවසන සමයෙහි ශාසන යෙහි උකටලීවූ භික්ෂුකෙණෙකුන්වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි. මෙහි වනාහි ජාතක කථාව කුසජාතකයෙහි විස්තරවශයෙන් පෙණෙන් නේය, මෙහි වනාහි සම්මෑදයන්වහන්සේ ගෙන්වා තෝ වනාහි ශාසනයෙහි උකලී වූයේ සැබෑදැයි වදාළ ගමනේ සැබව සවාමීනි ශාසනයෙහි සිටින්ට අභිප්‍රාය නැත්තෙමි සිව්වණක් පමණක් මධ්‍යයෙහි කීසේක. සම්මෑදයන්වහන්සේ එවිට වදාරණසේක් පෙර උත්තමයෝ පණස්අවුරුද්දක් ශාසනයෙහි අභිප්‍රාය සිටිනා ගමනේ මෙහි වාසය කරන්ව අනභිප්‍රායෙමි යන බස කියාගත නොහී සිටියේවේද තොපි භික්ෂු භික්ෂුණී උකාසක උපාසිකාය යන සිව්වණක් පමණත් මධ්‍යයෙහි ශාසනයෙහි උකටලී වීමයි නිර්ලජ්ජාවම කීයෙහි වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්මෑදයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

### ඒ කෙසේද? යත්

**ඉ**ටගිය දවස වත්සර නම් රට කොසඹෑනුවර රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ එක්තරා බ්‍රාහ්මණ කුලයක ඉපද වැඩිවිය පැමිණ අනික් බ්‍රාහ්මණ කුමාරයෙකු හා දෙන්න පඤ්චකාමයෙහි ආදීනව දැක හිමාලයවනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව දීපතාපස යෝය මඬප තාපසයෝයයි මේ නමින් දෙන්නාම වාසයකරන්නාහ. ලුණු ඇඹුල් පිණිස බරණැස්නුවර පසල් ගමෙක අවුත් මඬප උපාසකයාගේ ගෙට අවුත් වන්හ. ඒ දෙදෙනාවහන්සේ පළමුත් ඒ උපාසකයා අදුනන හෙයින් දෙදෙනාවහන්සේට සිව්පසයෙන් දන්දෙන්නේය, මඬප තාපසයෝ ඒ ගම සිට බරණැස්නුවරට අවුත් ඒ නුවර අවිමුක්ත නම් සුසාන භූමියෙහි වාසයකරන්නාහ. ඒ නුවර සොරු සොරකම්කොට ගෙණයන කලට මිනිස්සු යෝ දැක සොරුන් ලුහුබඳවා ගත්කලට සොරු පවුරු යට සොරොව්වෙන්

දිවගෙණ ගොස් මඩප තාපසයන් වෘත සුඝාත භූමියට තමන් ගෙණ යන සම්පත් දඹා දිවූහ. මනුෂ්‍යයෝ සොරුන් නොදැක තාපසයන් දැක එසේද දුවල් සිහාකා රැ සොරකම් කරන්නේදැයි කියා අල්වාගෙණ ගොස් රජ් ජ්‍රුවන්ට පැහ. රජ්ජුරුවෝ කියන්නාහු ගෙණගොස් උල අනපියවයි කීහ. යහපතැයි එම සුඝාත භූමියට ගෙණගොස් කිහිරි උලක් ඉදිකොට අන්නට වන්නාහ. එකියන උල නො ඇතෙන්නේය, කොසඹ උලක් ඉදි කොට උලඅන්ටවන් ගමනේ එකියන කොසඹඋලත් නොඇතෙන්නේ යනු ලක් ඉදිකොට අන්ට වන්ගමනේ යහුලත් නොඇතෙන්නේය, තාපසයෝ එවිට මා නොකළ කම්ය මා විඳිනේයයි මම කුමන අකුශලයක් කෙළෙම්දැයි පරීක්ෂා කළ කල්හි දිවැස් පහළවිය, එවිට පරීක්ෂාකළාහු තමන් යටගිය ජාතියෙහි එඩුවකුව සූත්ව උපන් ගමනේ කොබෝලීල දඩුසසින තැනැත්තේ කොබෝලීල කුරක් ඇරගෙණ මැස්සෙකු අල්වා උල ඇනි අකුශලය දැක කළ කම්ය විපාක දෙන්නේයයි දැන් කවර උලක් ඉදිකොටගෙණ උල අනිතත් නොඇතෙයි, කොබෝලීල උලක් ඉදිකොටගෙණ අනුවයි කීහ. යහපතැයි එකියන පුරුෂයෝ කොබෝලීල උලක් ඉදිකොටගෙණ තාපසයන් උල ඇන එතනට එන්නෝ ඇද්දෝහෝයි පරීක්ෂාකරන්ට උන්නාහ, දීප තාපසයෝ මාගේ මඩප්ප තාපසයන් නැතක්ද, මා නොදකින්නේවයි තතා දක්නට එන්නාහු අතර මඟදී මඩප්ප තාපසයන් උල ඇනි නියාව අසා දිහා අවුත් මඩප්ප තාපසයන් දැක කියන්නාහු තාපසයෙනි තොපකළ කම්යෙක්ද තොපව විපාකදෙන්නේයයි විචාළගමනේ එවිට තාපසයෝ මාකළ අකුශලයේ විපාක දිනැයි නොකළ දෙයෙක් විපාකදේදැයි කීහ. එවිට දීප තාපසයෝ කියන්නාහු තොපකළ අකුශල විපාක දුන්නේය. රජ්ජුරුවන්කෙරේ අමෛත්‍රියක් සිතුදැයි විචාළ කල්හි මාකළ අකුශලය විපාක දුන්නේය. රජ්ජුරුවන්කෙරේවත් වදකළවුන් කෙරේවත් අමෛත්‍රියක් නොසිතමි කීහ. දීප තාපසයෝ මෙසේවූ මෛත්‍රියක් ඇත්තවුන්ගේ සෙවනේ ඉදීම යහපත්වන්නේයයි සැතපී උන්නාහ. මඩප්ප තාපසයන්ගේ ලේ බින්දු දීප තාපසයන් ඇඟ වැම්මී කළු පැයට ගැලසුනේය. මේ නියාව රජ්ජුරුවන්ට ඉවත බලාඋන් මනුෂ්‍යයෝ කිකල්හි රජ්ජුරුවෝ අපරීක්ෂිතව මඩප්ප තාපසයන් උල අන්ට කීයෙම් බලන්ට යෙම් කියා අවුත් දීප තාපසයන්ට රජ්ජුරුවෝ කියන්නාහු තාපසයන්වහන්ස මේ ලේවැම්මෙන මෙතත නුඹවහන්සේ උන්නේ කුමක් නිසාදැයි විචාළ ගමනේ දීපතාපසයෝ කියන්නාහු මේ නිරපරාධ මඩප්ප තාපසයන්ට මේ අකුශලය සැලසුනු හෙයින් උන්ට ආරක්ෂා පිණිස මෙතත උනිමි කීහ. රජ්ජුරුවෝ එවිට මා පරීක්ෂාකොකොට තාපසයන්ට උල අන්ට කියේ යයි සිතා මඩප්ප තාපසයන් උලින් ගලවන්ට උත්සාහ කළ ගමනේ උලින් නොඇරෙණ හෙයින් එවිට මඩප්ප තාපසයෝ තමන් මැස්සා උලඇනි ගමනේ නොමිය උලකඩාගෙණ පලාඅගාස් ජීවත්වූ නියාව දිවසින් දැක රජ්ජුරුවෙනි මේ උල මා බඹින් නොඅරෙන්නේය, මා රකිනා කැමැත්තාතම් සමහරියේදී කියතකින් මේ උල කප්පවයි කීහ. එවිට රජ්ජුරුවෝ කියතක් ගෙණවයි කියත ගෙන්වා කැප්පූ උල් කැබැල්ල බඩම තිබුයේය. එසේ හෙයින් එතැන් පටන් ඇනි මඩප්ප තාපසයෝයයි. කියත් දීප තාපසයන් ශරීරයේ ලේ වැම්මී කලුවූ හෙයින් කණ්හ දීප තාපසයෝයයි මෙ නමින් ප්‍රසිඩවූහ. රජ් ජුරුවෝත් තාපසවරුන් වැඳ ක්ෂමාකරවාගෙණ රජගෙට ගියහ. තාපස

වරුත් මගුල් උයනේ ඉඳ වතමුනතව බෙහෙත්කොට සුවකොටිගෙණ මඩප්ප තාපසයන් උත්ගමට ගියාන, මඩප්ප උපාසක තාපසවරුන් දෙදෙනා එක නියාව අසා පෙර ගමන්කොට වඩාගෙණගොස් වළඳවා වැඩහිදිනා අසුන් පණවා උල ඇනී කථාව කිය කියා උන්නාහ, මඩප්ප උපාසකයාගේ යඤ්ඤදත්ත නම් පුතෙක් ඇත. ඒ පින් බඹරක් ඇරගෙණ කෙළිමින් සිටිකලට ඒ ගැසූ බඹර ගොස් එතත සමීපයේ තුඹසෙක තයෙකුගේ ඉස වැදගතය. ඒ කුමරා බඹරය ගෙණෙන්ව ගිය තැනැත්තේ තුඹස ඇතුළේ වැටිගිය බඹරය දැක අරගන්වයයි අතපොවා ලූකලට කෝපවීපියා වැදහොත්. තයා කුමාරයාගේ පොවාලූ අත ඇගිල්ල දෂ්ට කෙළේය. කුමාරයා විෂමූර්ඡාව වැටිගිය තැනැත්තහු දීප තාපසයන්ගේ පාමුල ලා කියන්නාහු තාපසවරු නම් බොහෝ මන්ත්‍ර හා ඖෂධ දනිති, එසේහෙයින් තෙල කුමාරයාගේ විෂබෑව මැනවැයි කීහ. එවිට තාපසයෝ සත්‍යක්‍රියා කරන්නාහු මා මහණවූ සත් දවසක් මාගේ අභිප්‍රායෙන් වාසය කෙළෙමි. මේ පණස් අවුරුද්ද මුළුල්ලෙහි අනභිප්‍රායෙන් තපස් කෙළෙමි, අසවල් තාපසයෝ අනභිප්‍රායෙන් තපස් රක්ෂාකෙරෙති කිසිකෙණෙකුන්ටත් නොහඟවා වාසය කෙළෙමි, මේ සැබෑවිනම් මේ සත්‍යක්‍රියායෙන් මේ යඤ්ඤදත්තනම් කුමාරයාගේ විෂ බසීවයි සත්‍යක්‍රියා කළ ගමනේ කුමාරයාගේ තනමත්ත පමණව විෂ බැස ගියේය. බොධිසත්ත්වයෝ මම මට පිළිවන්විවර සත්‍යක්‍රියා කෙළෙමි, මඩප්ප උපාසක යෙනි තොපිත් තොපගේ සත්‍යක්‍රියාවෙන් විෂබාවයි කීකල්හි මඩප්ප උපාසකයෝ කියන්නාහු මම දුටු යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙකුන්ට දන් දෙමි එදවසුත් මාගේ අභිප්‍රායෙන් දන්පින් කෙළෙමි අසවල් උපාසක අනභි ප්‍රායෙන් දන් පින් කරන්නේයයි කිසිකෙණෙකුන්ටත් නොහැගුනේය. ඒ සැබෑවිනම් යඤ්ඤදත්ත කුමාරයාගේ විෂ බසීවයි කියා සත්‍යක්‍රියා කළ ගමනේ ඒ කුමාරයාගේ විෂ උකුලසරියට බැසගියේය. මඩප්ප උපාසක තමන්ගේ භාර්‍යාවට කියන්නේ තෙපි තොපගේ සත්‍යක්‍රියාව කොට විෂ බාවයි කීකල්හි එකියන භාර්‍යාව කියන්නී තොප දැක්කදී මා සත්‍යක්‍රියා කරන්නේ කෙසේදැයි කිව, එවිට මඩප්ප උපාසක කියන්නේ තොපි කිසි සැකයක් තැතිව සිත ඇත්ත කියවයි කී කල්හි ඒ ස්ත්‍රී කියන්නී එඹුල පුත තොප සකසා කෑ නයා කෙරේ මම අසමාධියෙම් නම් සොපගේ පියානන් කෙරෙත් මම අසමාධියෙමි, උන්කෙරේ මම අසමාධි නියාව තොපගේ පියාතෝ නොදන්නාහ. පිටතක්ත් කෙණෙකුන්ටත් නොහඟවා වාසය කෙළෙමි, මේ සැබෑවිනම් යඤ්ඤදත්ත කුමාරයන්ගේ විෂ බසීවයි සත්‍යක්‍රියා කළ ගමනේ විෂ බැස යැපසේ ඇවිද්දහ, එවිට මඩප්ප උපාසක බොධි සත්ත්වයන්ට කියන්නේ සවාමීනි මේ පණස් අවුරුද්දේ ආලය තැතිව තපස් රක්ෂාකළේ කෙසේදැයි විවාළ කල්හි තාපසයෝ කියන්නාහු මෙලෝ පරලෝ ඇතැයි මම මහණවීම් මහණවූ ගමනේම සිවුරු ඇරපියන්නෙම් කෙලතොල්ලා සිවුරුපොරව සිටිය නුහුනුයේයයි නින්ද පරිහාර අසාගතතොගී අනභිප්‍රා යෙන් වුවත් වාසය කෙළෙමි කීහ. ඊට බොධිසත්ත්වයෝ මඩප්ප උපාසකයෙනි තොප අප ඇම ඇතුළුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මෙතෙක් දවස දන්දෙන් නාහු අනභිප්‍රායෙන් දන්දුන්නේ කුමක් නිසාදැයි විවාළහෝ මඩප්ප උපාසක කියන්නේ මිගේ සත්මුත්තා පරම්පරාවේ පැමිණ ආ කුශලය හෙයින් කෙළෙමි තොකොළොන්ත් මට නින්ද කෙරෙති සිතා කෙළෙමි කීහ. එවිට මඩප්ප උපාසක තමන්ගේ භාර්‍යාව අනිත් විචාරන්නේ භාර්‍යාවෙනි තෙපි

කුමාරි අවස්ථාවේ අවුත් මෙතෙක් දවස් මා කෙරෙහි තිරාලයෙන් වාසය කොට එකදවසකුත් ආලය නැතිනියාව නොහඟවා වයෝවෘඩ වයසට පැමිණෙන කල් කෙසේ වාසයකළෘදැයි විවාළකල්හි එවිට ස්ත්‍රී කියන්නී මාගේ සත්මුත්තන් පරම්පරාවේ එකසරණක විනා දෙසරණක උන්කෙණෙක් නැත්තාහ, එසේනෙයින් තොපකෙරේ ආලය නැත්ත නොහඟවා උන්මී කිහ. එවිට බොධිසත්වයන්ට සවාමිනි මා කියේ පුරුෂයන් දැක්කදී කිවමතා දෙයක්ද මාගේ දරුවන් නිසා මා කියේය, ඊට ක්ෂමාකළ මැනවයි කිව. එවිට බොධිසත්වයෝ තොප එසේ සිතිය යුතු නොවෙයි මෙතැන්පටන් උන්කෙරේ ආලය ඇතිව වාසයකරවයි කියා එබැවින් ඒ පුරුෂයා කියන්නේ ඉනිබ්බේ මට අවිශ්වාස නොවෙයි කියා ක්ෂමා කෙළේය, එවිට ස්ත්‍රී යහපතැයි කියා ක්ෂමාකරවා ගත්තාහ. එවිට මඬප්ප උපාසක බොධිසත්වයන්ට කියන්නේ සවාමීනි භුඹවහන්සේත් අපි ඇම දුන්නාවූ දුනය අනුභවකොට සැපසේ විඤ්ඤප නොවී ශීලය රැක්ක මැනවැයි අවවාද කිහ. තාපසයන් වහන්සේත් යහපතැයි එතැන්පටන් ශීලය රක්ෂාකරණසේකැයි එවිට තාපසයන් වහන්සේ මඬප්ප උපාසකයන්ට කියනසේක් තමා අභිප්‍රායෙන්ම කුසල් කරන්නේය උපාසකයෙනි තොප දෙන දුනය යහපත්ව සිත පහදවාගෙණ දෙවයි කියා අවවාද කිසේක. එතැන් පටන් සිත පහදවා දන්දෙන්නේය. ස්ත්‍රීත් එතැන් පටන් තමාගේ පුරුෂයා කෙරෙහි ස්නෙහයෙන් වාසයකරන්නීය. මඬප්ප උපාසකයාත් තමා අභිප්‍රායෙන් කුශල් කරන්නේය, බොධිසත්වයෝත් නොපිරිහුණු ධ්‍යානයෙන් පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා බඹලොව ගියහයි මේ කණ්හදීප ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ස්ත්‍රී දැන් විශාඛාවෝය, එසමයෙහි මඬප්ප උපාසක තම් ආනන්දස්ථවිරය, යඤ්ඤදත්ත කුමාරයෝ තම් දැන්මේ රාහුලස්ථවිරය, එසමයෙහි මඬප්ප තාපසයෝ තම් ශාරිපුත්‍රස්ථවිරය. එසමයෙහි කණ්හදීපායන තාපසයෝතම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 432 නිග්‍රොධ ජාතකය

මේවද සියළු සත්වයන්ට අනිවෘඩි දුයකවූ සර්ඹුදයන් වහන්සේ වෙළුවනාරාම යෙහි වැඩවසන සමයෙහි දේවදත්ත ස්ථවිරයන්වහන්සේගේ කථාවක් අරභයා මේ ජාතකය වදාළසේක.

එක් දවසක් භික්ෂූන්වහන්සේ දේවදත්තස්ථවිරයන් වහන්සේට කියන සේක් දේවදත්තස්ථවිරය සර්ඹුදයන් වහන්සේ තොපට බොහෝ උපකාරව උපසම්පදාවත් උන්වහන්සේගෙන් ලැබී ප්‍රථමධ්‍යානයත් ලදුව එසේ බොහෝ උපකාර කළාවූ සර්ඹුදයන්වහන්සේට තොප අනුපකාරීවන්ට කාරණා කිම් දැයි වදාළසේක. එවිට දේවදත්තස්ථවිරයෝ වදාරණසේක් සර්ඹුදයන් වහන්සේ තණපතක් අග වැදගත් තෙල් බිංදුවක් මිවරත් උපකාර මට කෙළේ නැතැයි කිසේක. එවිට භික්ෂූන්වහන්සේ මේ දේවදත්තස්ථවිරයන්

තපුර කියා බුදුන් තමන්ට තෙල් බින්දුවක් විවරත් උපකාරයක් නොකළායි කියති නුගුණ කියා වැඩලන්නෙහට සම්‍ඹුදයන්වහන්සේ වැඩවදරා මහණෙනි මා එන්නාට පූර්‍වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදුසි විචාරා වදරා එපවත් අසා දැන්මතු නොවෙයි පෙරත් දේවදත්තසථවිරයන් කළ උපකාර මකා කළ ගුණ නොදත්තෝවේදැයි එදරා හේ කෙසේදැයි ආරාධිතවූ සම්‍ඹුදයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදළසේක.

**ඒ කෙසේද? යන්,**

යිවගිය දවස රජගහනුවර මගධ නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ නුවර එක් සිටානකෙණෙක් ඇත්තාහ. ඒ සිටානන්ගේ පුත්වූ සිටුකුමාරයෙක් ඇත්තේය, ඒ සිටුකුමාරයාට එක් සමාන කුලය කින් සිටුදුවක ගෙණවුත් සරණපාවා දුන්හ. ඒ සිටුකුමාරයාගේ ගෙයි වසන්නාවූ ඒ සිටුදුවට දරුකෙණෙක් නැත්තාහ. ඒ සිටුපුත්‍රයාගේ දෙමව් පියෝ කියන්නාහු මේ වද තැනැත්තිය අපගේ ගෙයි ඉඳ කාරිය කිම්දැයි කියා ඉඳිතාහ, ඒ සිටු කුමාරිකා තමාගේ කිරි මැනියන් කැඳවා විචාරන්නී අම්ම දරුවන් ඇතිවූ ගෘහිණින්ට කවර ක්‍රියාවක්දැයි විචාරා ඒ ක්‍රියාව උන් අතින් අසා දැරි ඇත්තෙමි අඟවා ඔසප් සඟවා බඩපිළි තබා බැඳ තලා අත පය උදුම්මා දෙළදුකැයි ඇඹුල්කා ප්‍රයෝගයකින් තනපුඩු කළුකොට ගෙණ ඉඳ නවමස් පිරී දසමසට පැමිණි කල්හි වදනකල්වීය. ප්‍රසවයට කවර ක්‍රියාවක්දැයි විචාරා දෙමව්පියන්ගේ ගමට යෙමි කීහ. එවිට සිටු පුත්‍රයාත් රථයක් සරහා ඒ රථයට සිටු කුමාරිකාව තන්වා බොහෝ දැසිදස් පරිවාර පිරිවරා යන්නාහ. උන්ව ඉදිරියේ වෙළඳහුකෙණෙක් වෙළඳුම්කොට ගෙණ යන්නාහු දෙගව්වෙන් දෙගව්වට ඉදිරියේ ලැග ලැග යන්නාහ. උන් දෙගව්වෙන් දෙගව්ව අල අල තැන සිටු කුමාරිකා ලගිනීය. වෙළඳුන් හා කැටුව යන්නාවූ දුක්පත් දැරිඇති ස්ත්‍රියක් ඇත්තීය දසමසපිරී බඩ විලි පහරින්ට වන, ඒ ස්ත්‍රී වෙළඳුන් යාදී නුගගසක් මූල ඉඳ දරුවන් වදා තමා හා කැටුව ආ වෙළඳුන් පළාගිය හෙයින් දරුවන් නිසා රැඳිනිතම් මාගේ බොහෝ කටයුතු කාරිය නස්නේයයි වැදැමසින්ම දරුවන් නුගගසමූල තබා ගියාය, ඔනු දුක්පත් ස්ත්‍රිය බඩ පිළිසිඳින පමණක් විනා කෘතාධිකාර බුබාංකුරයා නත් වහන්සේය, එසේ හෙයින් කවුඩෙක් බල්ලෙක් ඒ ලේගඩුව අනතරාය කළ නුහුනුයේය. ඒ සිටු කුමාරිකාවත් වෙළඳුන් හල ලැග්මේ ඇර නුගගස මූලව ගිය තැනැත්නි පොළොවේ වසා ඔත් කුමාරයන් දැක කාත් නොහඟව, ඒ දරුවන් වඩා බඩවිලි පහරින්ට වනැයි අඟවා වටතිර බඳවා විලිලා ඇඟ ලේත් ගාගෙණ දරුවන් වඩා මැත ඇරගෙණ නාවා කිරිපොවා එතනම රදු තමන්ගේ සමනන්ට පත්ලියා යවුය. ඒ සිටුකුමාරයාගේ දෙමව්පියෝත් එතනට අවුත් දරුවන් වදන නිසාවේද ගමට යන්ට ආයේ දරුවන්වදුපු පසු ගමට යන්නේ ඇයිදැයි තමන්ගේ සමනත්ගේ ගමට ගියාහ. ඒ කුමාරයා නුගගසමූල උපන් හෙයින් නිග්‍රෝධ කුමාරයයි නම තුබූහ. එමදම ඒ නුවර අනික් සිටානකෙණෙකුන්ගේ බිරින්දක් අත්තක් අල්වාගෙණ පුරානු කෙණෙකුන් වැදූහ. අත්ත අල්වාගෙණ සිට උපන් හෙයින් සාඛාකුමාරයෝ යයි නම් තුබූහ. එමදම සිටානන්ට මේවර කරන්නාවූ සන්නාලියාගේ බිරින්දක් කැපූ කෙළවර රෙදිගොඩක් පිව පුතනුකෙණෙක් වැදූහ. උවව නම්

තබන්නාහු මුත්තිය කුමාරයෝයයි නම් තුබූහ. එවිට සිවානෝත් ඒ එකදු උපත් කුමාරයන් තුන්දෙනාට කීරිමවුන් සලස්වා සියලු වැටුප් උත්තාංති සලස්වා වැඩිවිය පැමිණිකල දිසාපාමොක් ආචාරීන් ලඟට ශිල්ප උගන්නෑ නිසා යවූහ, සිටුකුමාරයෝ දෙන්න තමන් අත සම්පත් ඇති සෙයින් දීලා ශිල්ප උගන්නාහ, මුත්තිය කුමාරයා තමා අත සම්පත් නැති සෙයින් නිග්‍රොධ කුමාරයෝම ශිල්ප උගන්වන්නාහ. මෙසේ තුන්දෙනා ශිල්ප නිමවා ඉගෙන නුවරට යන්නාහු රටවල් බලාගෙණ නුවරට යම්හයි ඒ ඒ තැන ඇවිදිනාහු බරණැස් නුවරට යන්නාහු එක්තරා දේවාලයක රෑ වැදඹන් තාහ, ඒ කුමාරවරුන් ඒ නුවරට එන්නාට පළමු සත්දවසෙක බරණැස් නුවර රජ්ජුරුවෝ මළාහ. ඒ නුවර රජකමට නිසිකෙණෙකුන් නැතිහෙයින් අමාත්‍යවරු පුෂ්පරථය නුවර අරුම්නයි කථා කළාහ, ඒ කුමාරවරුන් දේවාලයේ වැදෙත් කෑවට එතන ගසක් උඩ කුකුලෝ දෙන්නෙක් වැදෙත්තාහ. උඩඅත්තේ වැදෙත් කුකුළා වර්ෂස් පාරක් ලැයෙ. පාත අත්තේ වැදෙත් කුකුළාගේ ඉස වැගුරුණේය එවිට කුකුළු කියන්නේ තෝ මාගේ විවර නොද නීද මාගේ ඉස තාතනෙයක්කොට සිතා ගණිදැයි කෝපවිය. එවිට අග අත්තේ වැදෙත් කුකුළු කියන්නේ මම නොදන්නෙමි තොපි පාත අත්තේ වැදෙත් නිසාය, ඊට ක්ෂමා කරව නොදැන කෙළෙමි කියාදීත් කෝපවිය. එවිට මාගේ තත්ව තමා නොදිනීද තමා මම කෝප කරන්නේයයි කීහ. තා මෙසේම මානී පසු තාගේ තත්ව කියා බලහයි අග අත්තේ වැදෙත් කුකුළු කීහ. පාත වැදෙත් කුකුළු එවිට කියන්නේ මාගේ තත්ව අසව, යම්කෙණෙක් මා මරා මාගේ මස් කැවුනම් එදවසෙම සේසත් දැසෙක්ලැබෙන්නේයයි කීහ. එවිට උඩ අත්තේ වැදෙත් කුකුළු කියන්නේ තාගේ මස් කෑ කෙණෙකුත් ලබන්නේම සේසත් දැසෙක් වේද මෙපමණක්ගෙණ තා පැය, මාගේ පඤ්චමධුර මාංශය යම් කෙණෙක් කෑවෝ නම් රාජ්‍යය ලබති, ඝනමාංශය කෑ කෙණෙක් සෙනෙවිරත් ධුරය ලබති, ඇට නහර මුසු මස් කෑවු නම් භාණ්ඩාගාරයේ නායකකම් කරන්නේ වේදැයි කීයේය. එවිට කුකුළන් දෙන්නා කථාකරණ කලට නිග්‍රොධ කුමාරයෝත් ශාඛා කුමාරයෝත් දෙන්න වැදහෙව නිදන්නාහ. මුත්තිය කුමාරයෝ නිග්‍රොධ කුමාරයන්ගේ පය උකුලේ තබාගෙණ මැඩ මැඩ උන්නාහු මේ කුකුළන් දෙන්නාගේ කථාව අසා දවස දැස ලැබෙන කුකුළන් කිම්ද රාජ්ජය හා සෙනෙවිරත් ධුරය හා භාණ්ඩාගාර නායකකම් ලබන්නා මෙසේවූ කුකුළා වේද යහපතැයි සිතා නිග්‍රොධ කුමාරයන්ගේ පය උකුලෙන් බා සෙමින් ගසට නැඟී අත්තේ වැදෙත් කුකුළා අල්වාගෙණ මරා පඤ්චමධුර මාංශය වෙනම පිස තබා ඝනමාංශය වෙනම පිස තබා ඇට නහර මාංශය වෙනම පිස තබා වැදහෙව නිදන කුමාරවරුන් දෙන්නා පුබුදුවා නිග්‍රොධ කුමාරයන්ට රාජ්ජය ලැබෙන මාංශ ලා ඝාඛාකුමාරයන්ට සෙනවිරත් ධුරය ලැබෙන මාංශය ලා තුමූ භාණ්ඩාගාරයේ නායකකම් ලැබෙන මාංශ ලාගෙණ කා මුත්තිය කුමාරයෝ කියන්නාහු නිග්‍රොධ කුමාරයන්ට රාජ්ජය ලැබෙයි, ශාඛා කුමාරයන්ට සෙනෙවිරත් ධුරය ලැබෙයි මට භාණ්ඩාගාර නායකකම් ලැබෙන්නේයයි කීහ, එවිට නිග්‍රොධ කුමාරයන් හා ශාඛා කුමාරයෝ කියන්නාහු තොපට දැනෙන්නේ කෙසේදැයි විමසූහ, එවිට මුත්තිය කුමාර යෝ කුකුළා කී ප්‍රවෘත්තිය කීයේය. නිග්‍රොධ කුමාරයෝ යහපතැයි කියා පුන්වන්නාව පළමු ඇස මූණ සෝදා තුන්දෙනම මඟුල් උයනට ගොසිත්

නිග්‍රොධ කුමාරයෝ මගුල් සාලාවට නැගී ඉසවසා කඩලාගෙණ වැදෙත් නාහ. ශාඛා කුමාරයන් හා මුත්තිය කුමාරයා හා දෙන්නම බිම වැදෙත් නාහ. ඒ වේලාවට පුෂ්පරථයපිට පඤ්චරාජ කකුධභාණ්ඩ තබා පුෂ්පරථය අලහ. රථය මගුල් උයනට ගොසින් මගුල්සලවට වැදෙත් නිග්‍රොධ කුමාරයන් පාමුලට ගොසින් රථය පස්සපෑ තුවරට මුණලා සිටියේය, එවිට පුරෝහිත බ්‍රාහ්මණ වැදෙත් නිග්‍රොධ කුමාරයන් පාමුලට ගොස් පයවසා තුබූ ඉනකඩ ඉවත්කොට පය ලක්ෂණ බලා බරණැස්නුවර තබා ජම්බුවීපය ඒකච්ඡත්‍රකොට රාජ්‍යය කරන්ට ලක්ෂණ දැක ධෛර්‍ය්‍ය පරීක්ෂා කරන්ට උව මැතවැයි සිතා පඤ්චාඛ්‍යික තූර්‍ය්‍යතාදය එකවිට පැවැත්වූහ. එවිට නිග්‍රොධ කුමාරයෝ කිසිවකිතයක් නොවී ඉනවහා තුබූ ඉනකඩ ඉවත්කොට බලා ඇලව නැමී මදක් වැදහෙව නැගිසිට ආසන පිට උන්නාහ. එවිට පුරෝහිත බ්‍රාහ්මණයා කියන්නේ සවාමීනි නුඹවහන්සේට රාජ්‍යය පැමිණියේය. රාජ්‍යය කළමැතවැයි කීහ. නිග්‍රොධ කුමාරයෝ මෙනුවර රජ්ජුරුවන් වහන්සේ කොයිදැයි විවාළාහ. එපවත් අසා මළහයි කීහ. රාජකුමාරවරු නැද්දැයි කීහ. රාජකුමාරවරු නැත නුඹවහන්සේ රාජ්‍යය කළමැතවැයි කීහ. එවිට යහපතැයි ගිවිස වටතිර බදවා දැලිරැවුළු අත්දම් තබා රුවන් රැසක්පිට සිටුවා අභිෂේකකොට රාජ්‍යයට පැමිණවූහ. එවිට නිග්‍රොධ රජ්ජුරුවෝ ශාඛා කුමාරයන්ට සෙනෙවිරත් ධුරය දුන්නාහ. මුත්තිය කුමාරයෝ රජ්ජුරුවන් හා කැටිව රජගෙට ගියහ. රජ්ජුරුවෝ ශාඛා සෙනෙවිරදුන්ට කියන්නාහු අපගේ දෙමව්පියනුත් කැඳවාගෙණ එවයි කීහ. ශාඛා සෙනෙවිරද්දු මට බැරිය නොයම් කීහ. රජ්ජුරුවෝත් මුත්තිය කුමාරයන් කැඳවා රජගහනුවරට ගොසින් අපගේ දෙමව්පියනුත් තොපගේ දෙමව්පියනුත් කැඳවාගෙණ එවයි කීහ. මුත්තිය කුමාරයෝ යහපතැයි ගිවිස රජගහනුවරට ගොස් රජ්ජුරුවන්ගේ දෙමව්පියන් කැන්දූහ. අපගේ සම්පත් ඇත අප එන්නේ නැතැයි කීහ. ශාඛා කුමාරයන්ගේ දෙමව්පියනුත් කැන්දූහ. ඔයින් කියන්නාහු අපව පොහොසත්කම් එපයි අප එන්නෙ නැතැයි කීහ. මුත්තිය කුමාර තමාගේ දෙමව්පියන් කැන්දු ගමනේ සන්නාලි මේවර පමණ ඇත අප එන්නේ නැතැයි කීහ. මුත්තිය කුමාරයෝ දෙවෙනිව බරණැස්නුවරට අවුත් ශාඛා සෙනෙවි රදුන්ගේ ගෙට අවුත් බත්කා ගවන් විඩා නිවාගණිමි. සිතා සෙනෙවිරදුන්ගේ ගෙට ගොස් දොරකඩ සිට කියන්නේ ශාඛා සෙනෙවිරදුන්ගේ යහළුවූ මුත්තිය කුමාරයෝ ආවෝයයි කියාලවයි මිනිසුන් අත කියා යවූහ. එවිට සෙනෙවිරද්දු බත්කම්න් ඉඳ සිතන්නේ රාජ්‍යයට පැමිණෙන මාංශය නුදුන්නේය සෙනෙවිරන් ධුරයට පැමිණෙන මාංශය දුන්නේයයි කෝපයෙන් බත්කා ඉක්බිති දෙර අවුත් කියන්නේ මුත්තිය කුමාරයෝ නම් කවුරුද මුත් අඳුනන්නේ කවුරුදැයි කියමින් මුත් සෙව්වෝද අපට මිත්‍රයෝය, තුලූ අනුවයි කියා අත්නවා බත්දවා පිටකර ගෙණ නෙරපූහ. එවිට මුත්තිය කුමාරයෝ සෙනෙවිරදුන්ගෙන් සංග්‍රහ ලදිම්, රජ්ජුරුවෝ කුමක්කෙරේද්දැයි හෝයි එයින් පරීක්ෂාකරම් සිතා රජගෙට ගොස් රජ්ජුරුවන්ට කියාසවිය. එවිට රජ්ජුරුවෝ සිංහාසනයේ උන්නාහු මුත්තිය කුමාරයන් ආ නියාව අසා බැස ගොස් මුත්තිය කුමාරයන් සිපගෙණ යහළු කිමෙක්ද මාගේ දෙමව්පියෝ තොයෙද්දැයි විවාළාහ, තමා කී පවතුත් නොයෙම්මැයි කී පවතුත් රජ්ජුරුවන්ට කියේය. ශාඛා සෙනෙවිරද්දු මුත්තිය කුමාර තමාට කළදෙය රජ්ජුරුවන්ට කියා බිදවාපු තම්

නපුරුයි සිතා තමා කළදෙය මා කෙරේ හසින් දැක්කදී කිය නොහෙන්නේ වේදුයි සිතා මුත්තිය කුමාරයන්ට පස්සේ ආයේය. මුත්තිය කුමාර රජ්ජු රුවන් දුටු ගමනේ රජ්ජුරුවන්වහන්සේ නුඹවගන්සේත් රාජ්ජය ලද්දේ මා නිසාය, ශාඛා සෙනෙවිරදුන් සෙනෙවිරත් ධුරය ලද්දේත් මා නිසාය, එහේහෙයින් ගමන්විඛාව ශාඛා සෙනෙවිරදුන්ගේ ගෙටගොස් ගමන්විඛාව සන්සිඳුවාගණිමි සිතා ගියෙමි මට නොකී නොකළ ගහවයෙක් නැත නුඹ වහන්සේට කියා කළෝද නොකියා කළෝදැයි කියේය රජ්ජුරුවෝ කියන්නාහු උන් මට කියේ නැත, මා ලත් රාජ්ජය තොප සන්තකය, තොප නිසාය මා රාජ්ජය ලද්දේයයි කියා මම මෙසේවූ අමැදහත්කම් කරමිදැයි කියා රජ්ජුරුවෝ කියන්නාහු එඹල මුත්තිය කුමාරයෙනි අසත්පුරුෂයාගේ ගුණ නම් බැදපු බිත්තරයක්සේය. බැදපු බිත්තරය විපුව සස්‍ය ඵලදෙයක් දැක්ක නොහැකිද, එමෙන් දුර්ජනයාට කෙතෙක් සත්පුරුෂකම් කළත් ඒ අසත් පුරුෂම වන්නේය, සත්පුරුෂයෝ නම් යහපත් බිජුවටක් සාරභූමියක වපුළකල යහපත් සස්‍යඵල ලබන්නාසේ සත්පුරුෂයාට කළ උපකාර මහත් ඉෂ්වවිපාක දෙන්නේයයි කියා රජ්ජුරුවෝ වට සිටි අමාත්‍යයන්ට කියන්නාහු අමාත්‍යයෙනි මා රාජ්ජය ලද්දේත් උන් නිසාය. ශාඛා සෙනෙවි රදුන් සෙනෙවිරත් ධුරය ලද්දේත් උන් නිසාය එසේවූ තැනැත්තන් මුන් ගෙවගිය ගමනේ බොහෝ සංග්‍රහකොට උපස්ථානකළමනා තැන මුන්ට නොකී නොකළ ගහවයක් නැත්ල, මෙසේවූ අමැදහත් කෙළෙහි උපකාර නොදන්නා තැනත්තහු මෙතන සිටින මා අභිප්‍රාය නැත. තුලූ ගෙණගොස් අඹයට තෝමරාදියෙන් ඇන මරාපියවයි කියා මුත්තිය කුමාරයෙනි තොපි සෙනෙවිරත් ධුරය කරවයි කීහ. එවිට මුත්තිය කුමාර රජ්ජුරුවන් වහන්සේ මානිසා සෙනෙවිරදුන් ජීවිතක්ෂයට පමුණුවා සෙනෙවිරත් ධුර යෙනුත් පිරිහෙන්නේයයි සිතා මා නිසා මුන්ගේ ජීවිතයටත් අඩියටත් විනාශයක් නොපැමිණේවයි රජ්ජුරුවන්වහන්සේ ඒ කවරේද වරදක් කළායයි මුන් ජීවිතක්ෂයට පැමිණවූකල ඉදිරියේ මුත්ලවා කරවාගතමනා කටයුත්තක් පෙණුනුවිට මුන් උපදවාගත හැකිද මූ බිණුයේ මට වේද නුඹ වහන්සේ ක්ෂමාකළමැනැවැයි කීහෙයින් එසේවීනම් ජීවිතදුන දුනුම්හ. උන්ගේ සෙනෙවිරත් ධුරය තෙපි කරවයි කීහ. එවිට මුත්තියකුමාරයෝ සාමිනි මූ කවයුතු කිරීමෙහි දක්ෂයෝය. සෙනෙවිරත් ධුරයෙහිම සිටින්වයි කියා සථානාන්තරයෙන් තොපිරිහෙලන ලෙසට සැලැස්වූහ. එවිට රජ්ජුරුවෝ මුත්තිය කුමාරයෙනි තොපි එසේවීනම් සේනාවට පඩිප්‍රසාද දීමෙන් නාය කත්වය ඇති භාණ්ඩාගාර නායකකම් කරවයි කියා භාණ්ඩාගාර නායක කම්ව මුත්තිය කුමාරයන් සැලැස්වූහ. එතැන්පටන් භාණ්ඩාර නායක නම් ඇතිවිය. මුත්තිය කුමාරයන්ට ගෙවල් දෙරවල් හා අඹුදරුවන් ඇතිවී මහත් විභවයකට පැමිණ තමන් දරුවන්ට අවවාද කියන්නාහු දරුවෙනි යහපත උවත් නපුරු උවත් නිග්‍රොධ රජ්ජුරුවන්ට සේවයකොට ඉදිරතොත් විනා ශාඛා සෙනෙවිරදුන් හා භජනය නොකරව, ශාඛා සෙනෙවිරදුන් ගෙන් කෙතරම් යසස් ලබන්නා බලාත් නිග්‍රොධ රජ්ජුරුවන්ගෙන් ආඥ විද මිය යාම උත්තමය, ශාඛා සෙනෙවිරදු අසත්පුරුෂයෝය උන් හා භජ නය නොකර නිග්‍රොධ රජ්ජුරුවන්ටම සේවයකරවයි තමන්ගේ දරුවන්ට අවවාද කියා තුන්දෙන කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයි වදුරා මේ නිග්‍රොධ ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ශාඛා සෙනෙවි

රදු තම් දේවදත්තසථවිරය, මුත්තිය කුමාරයෝ තම් ආනන්දසථවිරය යෝය, නිග්‍රොධ රජ්ජුරුවෝ තම් බුදුවූ මම්ම යයි තමන්වහන්සේ දක්ව, වදාළසේක.

---

## 433
## [1]තක්කාරි ජාතකය

**ත**වද ශාක්‍යකුල ප්‍රසාදනීයවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ ජෙතවනාරාම යෙහි වැඩවසන සමයෙහි පිතෘ උපසථාන කරන්නා වූ කෙළෙඹි පුත්‍රයෙකු අරභයා මේ ජාතකය දක්වනලද.

එක්තරා පුරුෂයෙකුගේ දරුවෝ ඇත්තාහ, ඇමවම බාල පිරිමි පුතෙක් ඇත්තේය. ඔහුගේ මැනියනුත් සහෝදර නැයනුත් මළගමනේ පියාට උපසථාන කරන්නේය. එකියන පුරුෂයා තමාගේ පුතාට කියන්නේ එම්බල පුත තොප ඇමදම දුක්විඳිනට මහා ආයාසය, එසේහෙයින් තොපට බිරින්දක් ගෙණවයි කීයේය. පුත්‍රයා කියන්නේ බිරින්දෙක් එපායයි කියා එසේ කීවත් පියා සුදුසු කුලයකින් බිරින්දක් ගෙණවූත් පාවාදුන්නේය, එකියන ස්ත්‍රීත් තමාගේ මයිලාට කැවිලි පෙවිලි සැපසේ සලස්වා වාසය කෙරෙයි, පුරුෂත් තමාගේ බිරින්ද තමාගේ පියාට කැවිලි ආදීවූ දෙයින් අඩුවෙක් නොකරණ හෙයින් මධුර රසයක් ගෙණාවත් තමාගේ බිරින්ද අතට දෙන්නේය, ස්ත්‍රීන් තමාගේ මයිලාට උනුපැන් සිහිල් පැන් කැවිලි පෙවිලි ආදීවූදෙය අඩුවක්නොව පිරිමසන්නීය. කල්‍යාණකින් මයිලා කෙරේ කලකිරී කැවිලි ආදීවූ දෙයිනුත් අපාසුව කෙළේය. සෙම් සෙටු ආදීවූ දෙයක් ගේමුල්ලේ ලා නොමේ තමාගේ සැමියාට කියනකල නුඹගේ පියා තන්දැ ගෙයි මුළුල්ලේ සෙම් සෙටු ලා තරක්කරණදැය උන් රඳවාගෙණ මා ඇරපියන්න, තමාගේ සැමියාට කියන්නීය, පුරුෂ කියන්නේ තෝ පලාගියතම් අනික් බිරින්දක් ගෙණෙමි මාගේ පියානන්දැ කුමට යවත්දැයි කෝපකොට කීයේය. එසේ කීවත් මා රඳවාගෙණ උන්දැ ඇරපියන්න, නොහොත් උන්දැ රඳවාගෙණ මා ඇරපියන්නැයි තමාගේ සැමියාට කියන්නී නැවතත් කෝපකළ කල්හි ස්ත්‍රී භයපත්ව පළමු සේ තමාගේ මයිලාට කැවිලි පෙවිලි ආදියෙන් සැපසේ උපසථාන කරන්නීය. පුරුෂතෙම බිරින්දගේ අඩදබරයෙන් සම්‍යුද්ධයන්වහන්සේ දකින්ට කිපදවසකින් ගොස් දිව. සම්‍යුද්ධයන්වහන්සේ එකියන පුරුෂයා දැක ඇයි පුරුෂය තා කිපදවසක් නොආයේයයි විචාරා වදාළ කල්හි තමාගේ බිරින්ද තමාගේ ගෙන් නාරින්ට කී කථා ප්‍රවෘත්තිය කීයේය. සම්‍යුද්ධයන්වහන්සේ එපවත් අසා වදාරා එම්බල පුරුෂය, තෝ පළමු ජාතියෙහි තාගේ පියා මරා වළලා පස්ගසන්ට වන් ගමනේ හත්ඇවිරිද්දෙන් මාහි අවවාද නොප සිත් නිබුහෙයින් තෝ ගිවිසි පමණක් විනා පළමු ජාතියෙහි මේ නියාවට වන්නේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්‍යුද්ධයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

---

1. තක්කළ ජාතකය. පාලි.

**ඒ කෙසේද? යත්**

පිටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්ජය කරණ සමයෙහි එක්තරා ගමෙක පුරුෂයෙක් තමාගේ පියාට වතීමාන කථාව මෙන් අත්පා මෙහෙවර කරන්නේය දතයුතු, මෙහි වතාහි පිටිසර ගමෙක පියා හා පුතා හා පුතාගේ බිරින්ද හා තුන්දෙන වාසය කරන්නාහු යේලි මයිලාට නුරුස්සා තමාගේ සැමියාට කියන්නී නුඹගේ පියානන්දු මැරුවොත් විනා මා ඉන්නේ නැතැයි කීවාය. පුරුෂ කියන්නේ මිනියක් නිකම් අනාථයේ ගහා මරන්නේ කෙසේදැයි කීයේය. එවිට ස්ත්‍රී කියන්නී නුඹගේ පියානන්දුට නුඹ කියන කල පියානන්වහන්ස නුඹ වහන්සේ පළමු පිටිසර ගමෙක අහවලුන්ට දීපු තය ඉල්වා ගියෙම් අපට දෙන්නේ නැතැයි කියා නුදුන්නෝය, නුඹවහන්සේ ඇති ඉන්දදී දීපු තය නොඉල්වෙන කල නුඹවහන්සේ මළ කල තමාම නොලබන්නේ වේදැයි රථයක ලාගෙණ ඒ තය ඉල්වාගෙණ එන්ට යම්මැයි කියා ගොසින් අමුසොහොනක වළ සාරා වළලා පස්වසා ඔලුව තලා මරාපියා එවයි කිව. එකියන කෙළෙඹි පුත්‍රයාගේ සත්ඇවිරිදි පුතෙක් ඇත, ඒ පුත් තමාගේ මව තමාගේ පියාට කියන කථාව අසා මාගේ පියානන්වහන්සේ මාගේ මුත්තනුවන් මරන්ට උත්සාහ කරණසේක. උන්වහන්සේ මැරීමෙන් බොහෝ අකුසල් පිරෙයි, ඒ අකුශලය මා වලකන්ට උවමැනවැයි සිතා තමාගේ මුත්තනුවන් මරන්ට උත්සාහකරන්නවුන් දැක මුත්තනුවන් වහන්සේ හා එක්ක එදා රෑ වැද හොත්තේය, පසුවදා එකියන පුරුෂ තමාගේ බිරින්ද කී සැටියේ තමා පියා රථයක ලාගෙණ යන්ට වත. එවිට එකියන පුතා රදන්ට කීවත් නොරදා රථයට නැගී තුන්දෙන නික්මුනාහ, අමුසොහොන සමීපයට ගොස් පුතනුවන් හා පියානන් රථයේ ඉන්දදී රථයෙන් බැස අමු සොහොනේ සතරැස් වළක් සාරන්ට වන්හ. එවේලෙහි උන්ගේ පුතනුවෝ රථයෙන් බැස පියානන් සමීපයට ගොස් පියානන්වහන්ස මෙතන වළ සාරනේ කවරකටද මෙතන පෙණෙන්නාවූ කටු අලවැල් අල ආදීවූ දෙයින් පෙණෙන දෙයක් නැත වළ සාරන්නේ කවරකටදැයි විවාළේය. එවිට පුරුෂ කියන්නේ එඹුල පුත මපියානන්වහන්සේ ලෙඩදුක් ඇතිව ඉතා දුර්වලව ගියහෙයින් මා පියාවහන්සේට දුක් දෙන්නේ ඇයිදැයි සිතා මරා වළලන්ටයයි කීයේය. එවිට කුමාර පියානන් වහන්ස නුඹවහන්සේ සිතූ සිතිවිල්ල යාපත් නොවෙයි කියා පියානන් අතතුබූ උදැල්ල ඇරගෙණ තුමූත් වලක් සාරන්ට වන්හ. එවිට පියා කුමාරයාගේ විශිෂ්ටවූ කාරණා බලා කියන්නේ ඇයි පුත තෙපි මේ වළා සාරන්නේ කවරටදැයි විවාළේය. එවිට කුමාරයා කියන්නේ ඇයි පියානන් වහන්ස දරුවෝ දෙමව්පියන්කෙරෙට එන චාරිත්‍රකරන්ට උවමනාවේද, නුඹවහන්සේගේ පියානන් මරා වළලන්ට වළ සාරණ කල නුඹවහන්සේත් ඔබලත්වූ කල වළලම්දැයි මම වළ සාරා තිබීම් කීහ. එවිට පුරුෂ කුමාරයාව කියන්නේ ඇයි පුත මට සුතප්‍රේමයෙන් වදගත් දරුවෝ වේද නොකම් කලුවූ බස් කියන්නේ කවරේදැයි විවාළේය. කුමාර කියන්නේ නුඹවහන්සේට අවලක්ෂණයක් නිසා මා කීයේ නොවෙයි නුඹවහන්සේ

මෙලෙස කරන්නා මමත් ඒ ලක්ෂණයෙකැයි සිතා කෙළෙමි, නුඹවහන්ස ඊට ක්ෂමාකල මැනවැයි පියානන්වහන්ස යම්කෙනෙක් දෙමව්පියන්ට නොකළමනාදෙය කෙරෙත්නම් ඉන් වැඩෙක් නැත අවැඩමයයි කීයේය. ඒ වේලෙහි කෙළෙඹි පුත්‍ර කියන්නේ පුත මා සිතාගණ කළදෙයක් නොවෙයි තොපගේ මැනියන්වහන්සේ මට එක්වන් කන්සත් කරණහෙයින් කෙළෙමි, තොප කියේ ඉතා ඇත්තමය, මෙවක්පවත් මේසේවූ දෙයක් නොකෙරෙමි කෙළෙඹිපුත්‍ර කීයේය. කුමාර ඒ වේලෙහි තමන්ගේ පියා නන්ට කියන්නේ පියානන්වහන්ස ස්ත්‍රීන් කීවා කිරීමෙන් කවයුතු නොවෙයි මතු මෙසේවූ දෙයක් නොකියන්නේයයි කියා අපගේ මැනියන්වහන්සේ භයගන්වා කෝපකොට ගෙන් යවාපුව මැනව මෙසේවූ නොකටයුත්තක් නොකියනසේකැයි කුමාර කීයේය. යහපතැයි කියා තුන්පිතු පියෝ රථයට නැඟී ගෙට එන්ට වන්නාහ. කෙළෙඹිපුත්‍රයාගේ අඹු මාගේ ගෙන් අද කාලකන්නියා පහව ගියේයයි මහා සමාධියෙන් ගෙයි ගොමපැන් සඳුන් ඉස තුමුත් පිරිසිදුව කිරිබත් ආදීවූ දෙය පිසමින් සිටිකලට තුන්පිතුපියන් දුරඑන්නාවුන් දැක මහා කණස්සලුව මාගෙන් පනවගිය කාලකන්නියා දෙවෙනිව එනනියාවේදැයි සෝකයෙන් සිටියාහ, තුන්පිතුපියෝ රථයෙන් බැස පියානන් හා පුතුනුවන් ගෙට ආයේය. ස්ත්‍රී පුරුෂයා දැක මාගෙන් පහව ගිය කාලකන්නියා ගෙණායේ ඇයිදැයි කියා මම ගෙන් යම් කියා ස්ත්‍රී කලඟ කළාහ. පුරුෂ කියන්නේ දුෂ්ට කාලකන්නිය තී කීවද මා පියානන් කෙසේ මරාපියම්දැයි කියා ස්ත්‍රීගේ ඉසකේ පත අල්වාගෙණ බිම්හෙලා අතින් පයින් තළා මා ගෙන් පලායවයි කියා ගෙන් යවා තුන්පිතුපියෝ ගෙයි පිසකිබූ කිරිබත් සුදුබත් ආදීවූදෙය ලාගෙණ කාලා උන්නාහ, ස්ත්‍රී ඉවත ගෙයක උන්නීය. කුමාර තෙම පියාට කියන්නේ පියානන්වහන්ස මාගේ මැනියෝ ඉක්මුනේ නැත උන්වහන්සේ ඉක්මෙන්නේ නුඹවහන්සේ කියනකල තී මට ඇයිද මාගේ මයිලනු කෙණෙකුන්ගේ දියනිකෙණෙක් ඇත උන්ගෙණෙනට එම්ය කියා පිරිවරා ගොස් ඉදපියා අවමැනව එවිට මාගේ මැනියන්වහන්සේ ඉක්මෙන සේකැයි කීහ. පුරුෂයාත් යහපතැයි කියා ඒ කී නියාවට තී මට එපයි මාගේ මයිලනුවන්ගේ දියනියන් ගෙණෙම් කියා නික්මුනේය. අසල ගෙවල ඇත්තෝ ඒ ස්ත්‍රීට කියන්නේ එඹල ස්ත්‍රිය තීගේ සැමි තී ඇර අනික් බිරින්දක් ගෙණෙන්ට ගමට ගියේය. තී පිසවා ගෙණ නොකන්නේයයි කී ගමනේ ස්ත්‍රී මහත්වූ සෝකයට පැමිණ අනික් මට පිහිටක් නැත කුමක් කෙරෙම්දෝහෝයි සිතා ගෙට අවුත් පුතනුවන් පයවැටී අඬා පුතනුවෙනි තොපගේ පියානෝ මා ඇර අනික් බිරින්දක් ගෙණෙම් කියා ගියේය, මා කළ වැරැද්දෙක්දැයි කිව. කුමාර කියන්නේ මැනියන්වහන්ස මෙවක් පටන් නුඹවහන්සේගේ මයිලනුවන්වහන්සේට අමෛත්‍රී නොසිතා උන්ගේ සුවදුක් විචාරව මපියානන්වහන්සේට කියා ගෙන්වාගණිමි කියා ගෙට යවා පියානන් එන්නා දැක කුමාර කියන්නේ පියානන්වහන්ස මැනියන්වහන්සේ ඉක්මගියසේක. උන්වහන්සේව ගෙට ගෙන්වාගත මැනවයි කීයේය. කෙළෙඹි පුත්‍ර යහපතැයි තමාගේ බිරින්ද ගෙට ගෙණාගේය. එකියන ස්ත්‍රී තමාගේ මයිලනුවන් හා සැමිපුත්‍රයා වැද මම ගිය දවස නොදැන කෙළෙමි ඊට ක්ෂමාකළ මැනවැයි කියා වැද ක්ෂමා

කරවාගෙණ එතැන්පටන් සවාමිපුත්‍රයාටත් මයිලනුවන්ටත් දැහැබට පූජා සත්කාර කරන්නාක් මෙන් අඩුවක් නොකොට පෝෂ්‍යතෙළේයයි වදාරා මේ තක්කාරි ජාතකය තිමවා වදාළසේක. එසමයෙහි පුරුෂයා තම් දැන් මේ පුරුෂයාය, එසමයෙහි ස්ත්‍රීතම් දැන් මේ ස්ත්‍රිය; එසමයෙහි අවවාද කී කුමාර තම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.

---

## 434
## මහා ධම්පාල ජාතකය

තිවද ශාක්‍ය කුලාලෝකවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ කිඹුල්වත්නුවර නිග්‍රොධාරාමයෙහි වැඩවසන සමයෙහි සුඩොදන රජ්ජුරුවෝ අදහා නොගත් දෙයක් අරභයා මේ ජාතකය දක්වතලද.

**ඒ කෙසේද? යත්**

සම්බුදුවන්වහන්සේ විසිදහසක් රහතන්වහන්සේ පිරිවරා චාරිකයෙහි සිහා වඩනා ගමනේ සුඩොදන රජ්ජුරුවෝ අසා සම්බුදුවන්වහන්සේත් විසිදහසක් රහතන්වහන්සේත් පවරා රජගෙට ගෙණ ගොසින් කෑද වළඳවා ඉක් බිතිවූ ගමනේ බත් වළඳවනතුරු සම්බුදුවන්වහන්සේ හා සුඩොදන රජ්ජුරුවෝ කථාකරමින් උන්නාහු සවාමීනි නුඹවහන්සේ දුෂ්කරක්‍රියා පූරණ අවසථාවෙහි එක් දවසක් දැවල් මා වැදහෙව නිදතකල දේවතා දුවක් ඇවිත් මට කියන්නී සිඛාඪී කුමාරයෝ දුෂ්කරක්‍රියා භූමියෙහි මළෝයයි අවුත් මට කිව. එවිට මම සිඛාඪී කුමාරයෝ බුදුව කාලක්‍රියා කළෝද නුබුදුව කාලක්‍රියා කළෝදැයි විවාලෙමි. නුබුදුව කාලක්‍රියා කළෝයයි දේවතාදුව කී නියාව අසා එසේවීතම් බුදුවවිතා කාලක්‍රියා නොකෙරෙති, අදහා නොගත් තෙමැයි රජ්ජුරුවෝ කීහ. සම්බුදුවන්වහන්සේ වදාරණසේක් රජ්ජුරුවෙනි මේ ජාතියේ තබා පළමු ධම්පාල ජාතකයෙහි දිසාපාමොක් ආචාරීන් සමීපයට ශාස්ත්‍ර උගන්වා ගිය ගමනේ මා මළැයි කියා එළු ඇටියක් ගෙණවිත් දිසාපාමොක් ආචාරීන් තොපට පැ ගමනේ දක්වා අදහා නොගත්තෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි සුඩොදන මහරජ්ජුරුවන් විසින් ආරාධිත සම්බුදුවන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්**

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත තම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ධම්පාල තම් ගමෙක ධම්පාල තම් බ්‍රාහ්මණයෙක් ඇත, ඒ ගමට ධම්පාල කාමය කෙසේවීද යත්, ඒ ගම ඉදිතා ධම්පාල තම් බ්‍රාහ්මණයා පටන් උන්නේ නැදැයන්ද හෙයි වහල් ඇතුළුවූ අය පවන්වම පොහොයෙන් පොහොයට අවසිල්ද දවස්පතා පඤ්චශීලයද දස පින් කිරියවතද කරන්නාහ, එසේ හෙයින් එකියන ගමටත් බ්‍රාහ්මණ කුල යටත් තම ධම්පාලයයි සැලසින. එසමයෙහි බොධිසත්වයෝ එකියන ධම්පාලයාගන් බිරින්දගේ කුස පිළිසිඳ ඉපද වැඩිවිය පැමිණියාහ. වැඩිමහළු

ධම්පාල බ්‍රාහ්මණයෝ තමන්ගේ පුතනුවන් ධම්පාල කුමාරයන්ට ශාස්ත්‍ර උගන්වන්ට දිසාපාමොක් ආචාරීන් සමීපයට යවන්නාහු මසුරන් දහසක් දී යවූහ. එකියන ධම්පාලකුමාර තක්ෂලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් සමීපයට ගොස් මසුරන් දහස දීලා ශිල්ප උගන්නා කැමැත්තෝ පන්සියයක් අතවැස්සෝ තුමූව ආචාරීවන තියාවට ශාස්ත්‍ර උගන්නාහ. එසමයෙහි දිසාපාමොක් ආචාරීන්ගේ පුතනුකෙණෙකුන් මළහ. උන් මළ සෝකයෙන් දිසාපාමොක් ආචාරීන් හා පන්සියයක් අතවැස්සන් ආදීවූ අය අඩා ඇඳුනන කොට අතවැසේසා කථාකොට උන්නාහු ආචාරීන්වහන්සේගේ බාල තරුණවූ පුත්‍රයා මළේයයි කියා උන්නෙනට ධම්පාකුමාරයෝ අවුත් කියන්නාහු බාල මනුෂ්‍යයෝත් මියෙන්ද ඒ කෙසේවූ දෙයෙක්දැයි කීයේය. එවිට සෙසු කුමාරයෝ කියන්නාහු ඇයි ධම්පාල කුමාරයෙනි මරණයට බාලයයි වැඩිමාළුයයි නොපැමිණේද මරණ තමා කරා එන නියාව නොදනීදැයි කීහ. ධම්පාල කුමාරයෝ කියන්නාහු මරණ පැමිණෙන නියාව දනිමි මේ බාල අවස්ථාවෙහි අපගෙන් මියන්නෝ නැතැයි කීහ. මේ නියාව අතවැසි පන්සිය දිසාපාමොක් ආචාරීන්ට කීහ. දිසාපාමොක් ආචාරී එපවත් අසා ධම්පාලකුමාරයන් ගෙන්වා සැබෑද නොපගේ වහීයේ මාළුවවිනා බාල අවස්ථාවෙහි මියන්නෝ නැත්තේදැයි විවාළේය. එවිට ධම්පාල කුමාර කියන්නාහු එසේය ආචාරීන්වහන්ස, අපගේ වර්ගයේ මාළුව විනා බාල අවස්ථාවෙහි නොමියති කිකල්හි එසේවීනම් ඒ පරීක්ෂා කරන්ට උවමැතවැයි සිතා දිසාපාමොක් ආචාරී මළාවූ එළුවකුගේ ඇට යක් සෝධා අතවැසියා අන පසුබියලා ධම්පාල බ්‍රාහ්මණයානන්ගේ ගමට ගොස් වැඩිමාළු බ්‍රාහ්මණයානන්ගේ ගෙය කොයිදැයි විචාරා ගෙට අවුත් ආචාරීන්ට ඉදින්වී අසුන් පණවා හිඳ කථා කොට කොට උන්නාහ. ඒ වේලෙහි දිසාපාමොක් ආචාරී ධම්පාල බ්‍රාහ්මණයන්ට කියන්නාහු නොපගේ පුතනුවෝ යහපත්ව ශාස්ත්‍රය හා ත්‍රිවේදයත් ඉගෙණ උන් අවස්ථාවට එක් තරා ව්‍යාධියකින් මළානයි කීහ. එවිට වැඩිමාළු ධම්පාල බ්‍රාහ්මණයානෝ අනිත් අතපැහැර සිතාසී කියන්නාහු අපගේ දරුවෝත් බාල අවස්ථාවේ මියෙද්ද ඒ කෙසේවූ දෙයෙක්දැයි කීහ. දිසාපාමොක් ආචාරී දෙවෙනිව ධම්පාලයෙනි නොපි මා කීවා අදහානොගණුද මේ නොපගේ පුතනුවන්ගේ ඇට නොවේද මේ දැකත් අදහා නොගණුදැයි කීහ. එවිට ධම්පාල බ්‍රාහ්මණයෝ කියන්නාහු මේ එළුවෙකුගේ ඇට හෝ බල්ලකුගේ ඇට නෝ වේද අපගේ දරුවෝත් මියෙත්දැයි ධම්පාලයන් හා උන්ගේ නැයන් හා ගෙයි වැල් ආදී හැම සිතාසුනාහ. එවිට දිසාපාමොක් ආචාරී නොපගේ දරුවන් නැයන් බාලඅවස්ථාවෙහි නොමියන්ට කාරණා කවරේදැයි විචාරන්නාහු කුමන උපායෙක්ද කුමන බ්‍රහ්මචර්‍යාවෙක්ද කුමන කාරණයක් නිසාද බ්‍රාහ්මණය නොපගේ දරුවන් නොමියන්නේයයි විවාළේය. ඊට කාරණා කියන ධම්පාල බ්‍රාහ්මණයෝ කියන්නාහු දශකුශල ධර්මය කරම්හ. කෙළිපිණි ශත් බොරුනොකියම්හ. දසඅකුශල පථයන් නොකරම්හ, එක්කෙණෙකුත් නපුරුයි කියන දෙයකුත් නොකරම්හ, එසේහෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අපි දන්දෙන අවස්ථාවෙහිත් සනෙනාෂවම්හ දන්දෙමින් සිටත් සනෙනාෂවම්හ, දන්දී ඉක්බිති සනෙනාෂවම්හ, දන්දී පශ්චාත්තාපයට නොපැමිණෙන හෙයින් අපගේ වංශයෙහි නොමියන්නාහ,

තවද ශ්‍රමණබ්‍රාහ්මණයන් කෙරෙහිද වන්දිභව්ටයත් කෙරෙහිද දුගීමගී යාචක යන් කෙරෙහිද සමසිතින් දන්දෙමිහ. එසේනෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ, තවද අපගේ බිරින්දහැර ඔබ්බේ ස්ත්‍රියකට ආලය නොකරමි, අපගේ බිරින්දක් ඔබ්බේ පුරුෂ කෙණෙකුත් කෙරෙහි ආලය නොකරන්නාහ. අපි වතාහි ඔබ්බේ ස්ත්‍රීන්ට බඹසරවස් රකිතා සරියම්හ; ඔබ්බේ ස්ත්‍රී අපට මවුන් හා සරියෝය, එසේහෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද එසේවූ ස්ත්‍රීන්ගේ බඩින් වැදූ දරුවෝත් නුවණින් ප්‍රාප්තව ත්‍රිවේදයෙහි නිපුණවන්නාහ. එසේ හෙයින් අපගේ වංශය බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අපගේ මව්පිය තැදි මයිලන් බෑ බුන් දූ දරු යනාදී සියල්ලෝම ධර්මයෙහිම පරලොවට බා හැසිරී වාසය කරම්හ. එසේනෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ, තවද අපගේ සේවකයෝද බැලමෙහෙ කරන්නෝද කුලියට මෙහෙකරන්නෝද යනාදී සියල්ලෝම පරලොව අදහා ධර්මයෙහි හැසිර වාසය කරන්නාහ. එසේනෙයින් අපගේ වංශයෙහි බාල අවස්ථාවෙහි නොමියන්නාහ. තවද අර්‍ය දක්වත සම්බුදුයන් වහන්සේ වදාරණසේක් මහරජයම් කෙණෙක් ධර්මය රකින්ද ඒ ධර්මය පෙලා උන් දෙලොවම රකිණේමය, මේ ධර්මය අනිසංසයම මළ කලත් දුගතියට නොනොසින් සුගතියට යන්නාහ. තවද බ්‍රාහ්මණයා කියන්නේ ධර්මය රකිතා තැනැත්තවුන් ධර්මය පෙරලා රකිණේමය, ඊට කාරණා කෙසේද යත් මහත් වරුෂාවට ත්‍රියක්සේය, ඔහුට ප්‍රතිෂ්ඨාවේද එමෙන් ප්‍රතිෂ්ඨාවෙයි, එසේනෙයින් මාගේ පුත්වූ ධර්මපාල කුමාරයෝත් ධර්මයෙහි පිහිටියාහ. එසේනෙයින් මේ ඇටය අනික් කෙණෙකුන්ගේ ඇටයක මාගේ දරුවෝ සැපසේ උන්නාහ මේ අපගේ චාරිත්‍රය සම්බුධපරම්පරායෙන් ආයේයයි කීයේය. එවිට දිසාපාමොක් ආචාරීන් ආගමනේ ලාභ ලදිමි සිතා තොපගේ පුත්හු සැපසේ උන්නාහ. මම තොප විමසන පිණිස එළු ඇටය ගෙණායේය. ඊට ක්‍ෂමාකරවයි කියා ක්‍ෂමාකරවාගෙණ මේ තොප දවස් අරණා සැලැස්මට පත ලියවාගෙණ එතන කීපදවසක් රඳා දිසාපාමොක් ආචාරී තමන් වසන තක්සලානුවරට ගොස් ධර්මපාල කුමාරයන් නොනිමි අකුරු කරවා මහත්වූ පෙරහරින් උන්නේනුවරට එවිවාහයි වදාරා මේ මහා ධර්මපාල ජාතකය දක්වා චතුස්සත්‍ය ප්‍රකාශකොට වදාළසේක. මේ ධර්මය අවසානයෙහි සුඩොදන රජ්ජුරුවෝ අනාගාමී ඵලයෙහි පිහිටිසේක. එසමයෙහි ධර්මපාල කුමාරයන්ගේ දෙමව් පියෝ දෙන්නා නම් මෙසමයෙහි සුඩොදන රජ්ජුරුවන් හා මහාමායාදේවිය, එසමයෙහි දිසාපාමොක් ආචාරීන්නම් දැන් ශාරිපුත්‍රස්ථවිරය, පන්සියයක් අතවැස්සෝ නම් දැන් බුදුපිරිසය, එසමයෙහි ධර්මපාල කුමාරයෝ නම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 435 කුක්කුට ජාතකය

තවද විරාජමානවූ සම්බුදුයන්වහන්සේ වෙළුවනාරාමයෙහි වැඩවසන සමයෙහි වධයට උත්සාහයක් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේ ද? යත්,**

**එක්** දවසක් දම්සභාමණ්ඩපයෙහි රැස්වූ මහළුවරුන්වහන්සේ දේවදත්ත සථවිරයන් වහන්සේ තමන්ට බැරිවුනත් සම්බුදුයන්වහන්සේ නසන්නම උන් සාන කෙරෙති කිය කියා වැඩ උන් තෙනට සම්බුදුයන්වහන්සේ වැඩවදරා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදුයි විචාරා වදාරා එපවත් අසා මහණෙනි දැන්මතු නොවෙයි පෙරත් මා දේව දත්ත සථවිරයෝ නසන්නට උත්සාහ කොට නානාගත නුහුනුවෝ වේදුයි වදාරා ඒ කෙසේදුයි ආරාධිතවූ සම්බුදුයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**පි**වනිය දවස කොසඹැරට කොසඹියතම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්ත්වයෝ ඇවිකුකුල්ව ඉපද බොහෝ ඇවිකුකුළන් පිරිවරා හුනවනයක වාසයකරන්නාහ. ඒ වනානන්තරයට නුදුරු සථාන යක උකුස්සෙක් වාසය කරන්නේය. ඒ උකුසු බොධිසත්ත්වයන් ලඟ උන් ඇවිකුකුළන් දවස එකෙකු බැගින් නිමවා බොධිසත්ත්වයන් පමණක් තනි වූහ. බොධිසත්ත්වයන් නසාගත නොහී මිත්‍රව නානාගතම් සිතා උකුසු එක් දවසක් බොධිසත්ත්වයන් සමීපයට ගොස් කථාකරන්නාහු සබඳ තොප හා මිත්‍රව ඉන්ට උවමැනව, එසේහෙයින් අසුවල් වනාන්තරයේ නොයෙක් මිධු රවූ ඵලාඵල ඇත්තේය, එතනට ගොසින් තොපි ඵලාඵල අනුභවකරවයි කීයේය. ඇවිකුකුල් කියන්නේ සබඳ තොප හා මා හා කෙසේද විශ්වාසය කරන්නේ තොප විසින් මාගේ බොහෝ ඇවිකුකුළන් කා මා තනිකොට හිඳ දැන්ද තොප මිත්‍රවන්නේයයි ඇවිකුකුල් කීයේය. එවිට උකුසු කියන්නේ සැබව තොපගේ ඇවිකුකුළන් නානාලදැයි තොප මාකෙරේ සංකා විය යුතුය. එසේවුවත් මෙතැන් පටන් සංකා නොකරවයි මිත්‍රවන්නේයයි ඇවිත් කිහ. බොධිසත්ත්වයෝ මා තොප කෙරෙහි වාසයකරන්ට සැක ඇත් නම් කියා වනාන්තරයෙහි සිටුළු දේවතාවන් සන්තොෂ කරවා බොධි සත්ත්වයෝ බුබළිලාසයෙන් කියන්නාහු පළමුකොට කරණලද බොහෝ අකු ශල් ඇති පුද්ගලයා කෙරෙහි සත්පුරුෂයන් විසින් විශ්වාස නොකොට තමා පිණිස ප්‍රසන්නභාවයෙන් මිස භජනය නොකෙරේද යම්ක් කැමතිව භජනය කෙරේද එසේවූ ධනාඪ සත්ත්වයන් කෙරෙහිත් විසවාස නොකොට යුත්තේය. යම් සත්ත්වයෙක් ඇතුලෙන් සාන්ත දන්ත ගුණයෙක් නැතිව තිබැද්දී පිටතින් සන්සුන් ගුණය දක්වීමෙන් සාන්තසවරූප ඇත්තේද එබදු සැඟවුනාවූ ක්‍රියා ඇති තුඹසින් වැසී නොපෙනෙන්නාවූ සර්පයින් හා සමාන කුහකවූ පාපපුද්ගලයා තමාකෙරෙහිත් විශ්වාස නොකොටයුත්තේය. යම්සේ පාප වාසීන්වූ ගෙරි නොවට බැස මුඛය පුරා පැන් බී ස්නානය කොට සන්තර්පණ වෙන්ද ස්නාන පානයට සුදුසුවූ ජලය පිහිටුවා වැව් පොකුණු ආදිය බැඳීම් වශයෙන් ඒට කළමනා කිසි කම්කාන්තයක් නොකෙරේද එප රිදෙන්ම මේ ලෝකයෙහි සමාන කෙණෙක් නොපව මෙසේවූ යහපතක් කරම්හයි මධුරවූ වචනයෙන් මිත්‍රයන් අනුභව කරන්නාහු මෙන් හඳුරන් නාහ. පිය වචනයට සුදුසු කාරිය නොකරන්නාහ, එබඳුවූ කටින් එකක් කියා සිතින් එකක් සිතන්නාවූ අවස්ථාවාදීස්වාකාරී නොවන්නාවූ පුද්ගලයා කෙරෙහිත් විශ්වාස නොකට යුත්තේය. ඉදින් විශ්වාස කළොත් මහත්වූ

අවැඩට පැමිණෙන්නේය. යම් සත්‍වයෙක්ණේක් බබාංජලීව දෙහොත් මුදුනෙහි බබාඟෙණ සවාමිනි නුඹවහන්සේට මෙතම් මෙතම් දෙයක් දෙමිහ. කරම් හයි කියා බසින්ම වෙළාගෙණ සිස්වූ දෙහොත් මුදුනේ තිබීම පමණකින්ම සිත්ගණිද්ද එබඳු නිස්සාරවූ පිරිසක් හා සමානවූ පුද්ගලයා කරා පැමිණ විශ්වාස නොකොට යුත්තේය. යම් පුද්ගලයෙක් කෙළෙහිගුණ දන්මෙක් නැත්නම් එබඳුවූ අකෘතඥවූ පුරුෂයන් කෙරෙහිත් භජන පර්යුපාසනය නොකටයුත්තේය. යම් සත්‍වයෙණේක් අනේකප්‍රකාරවූ ලඝු චිත්ත ඇතිව කායවීමාණියෙක නොපවතිත්ද එබඳුවූ පුරුෂයන් කෙරෙහි විශ්වාස නොකොට යුත්තේය. යම් සත්‍වයෙණේක් මොහු හා එක්නොවී විනාශයක් යොදන්ට නොපිළිවනැයි සිතා අන්තරාය කරණ පිණිස නොයෙක් කාරණ යෙන් සංසර්ග නොවී වශ්වාස තරව ගිය ගිය කල්හි ඉතිකින් මේ මාර්ග අත් නොහරන්නේයයි සිතට දැනිගිය කල්හි පසුව ඔහු නසන්ට උත්සාහකොට ජීවිතාන්තරාය කෙරේද එබඳු පුද්ගලයා කෙරෙහිත් විශ්වාසය නොකොට යුත්තේය. තවද යම් සත්‍වයෙණේක් ආනාචාරවූ පාප පුද්ගලයන්ගේ ක්‍රියාව කෙරෙමින් ප්‍රාණඝාතාදිවූ අකුශලධර්මයන් කෙරේද අස්පිරවූ බස් ඇත්තේද අවසරයක් ලදින් සියල්ලවුන් විසින්ම නසන්ට සිතාද කොපුවෙන් හෝ රෙදිදකින් හෝ වසා තබනලද තියුනුවූ මුවහත් ඇති කඩුවක් මෙන් තමාගේ ඇති පුරුදු ගුණය සඟවාද එබඳු අමිත්‍ර ප්‍රතිරූපකවූ පුද්ගලයා කෙරෙහිත් විශ්වාසය නොකට යුත්තේය. තවද යම් සත්‍වයෙණේක් මට සිළුටුවූ ප්‍රිය වචනයෙන් යුක්තවේද තවද පරුෂද අනේකප්‍රකාරවූ උපා යෙන් තමාට යහළුවූ පුද්ගලයාට අනර්ථයකරන්ට අවසරයක් බලා ඇවිදීද එබඳුවූ අමිත්‍රයක්හු හා සමාන පුද්ගලයා කෙරෙහි විශ්වාස නොකොට හැක්කේය. තවද යම් සත්‍වයෙණේක් අනුභවකරන්ට නිසිවූ ආහාර පාන වර්ගයක් හෝ අවශෙෂවූ ඇඳ පුටු කොට්ට මාවුලා ආදීවූ වස්තුවක් හෝ තමාගේ යහළුවා ගෙයි යම් තැනක තිබුයේවිනම් එහි ලොභය කොට ඒ වස්තුව සොරා ඇරගණිද්ද අවසරයක් පෙණිගියේවිනම් තමාට යහළුව සිටි පුද්ගලයාත් නසාපියායේද එබඳුවූ සත්‍වයා කෙරෙහිත් විශ්වාසය නොකොට යුත්තේය. තවද ඒ අර්ථය දක්වන්නාවූ සර්ඥයන්වහන්සේ වදාරණ සේක් එබා මහණෙනි යම් සත්‍වයෙණේක් තමන්ගේ සිත නුගුණ හඟවා ගුණ ප්‍රකාශකොට සත්‍වයන් භජනය පර්යුපාසනය කෙරෙති, එබඳු අසත් පුරුෂයන් ඇවිකුකුළා උකුස්සා දුරුකළාක්මෙන් නුවණැත්තාවූ සත්ව තෙමේද දුරින් දුරුකරන්නේය, යම් සත්‍වයෙක් තමාට උපන්නාවූ අර්ථය අවැඩක් වහා දැනගත නොහෙන්නේ වීනම් ඒ සත්‍වතෙමේ සතුරන්ගේ වශ ඟයට පැමිණෙන්නේය, නැවත පශ්චාත්තාපයටත් පැමිණෙන්නේය. යම් සත්වයෙක් තමාට උපන්නාවූ වැඩට නිසි අභිවෘධි කාරණයක් වහා දැන ගණිද ඒ සත්‍වතෙමේ උකුස්සාගෙන් ගැලවුනාවූ ඇවිකුකුළා වෙන් සතුරන්ගෙන් බත පීඩාවෙන් ගැලවෙන්නේය. තවද වනයෙහි මුවන් බඳන පිණිස අටවනලද මලක් වැනිවූ අනවරතයෙන් අනුන්ට අවැඩක්ම කියන කරණ සුළුවූ අනර්ථකාරීවූ යම් පුද්ගලයෙක් ඇත්නම් එබඳු සත්‍වයා නුවණ නැත්තේය. යම්සේ උන් වනයේ වසන්නාවූ ඇවිකුකුළා තමාට ප්‍රතිපක්ෂවූ උකුස්සා දුරින්ම දුරුකෙළේද එපරිද්දෙන් තමාට සතුරුව සිටි පුද්ගලයාද දුරින් දුරුකරන්නේයයි මෙසේ ඒ ඇවිකුකුළා උකුස්සාව ආමන්ත්‍රණය

කොව කියන්නේ යහළු නෝ ඉදින් මෙතන විසුයෙහි වීතම් තට කළමනා කාරිය දනිමියි භයගැන්වූයේය. එබස් අසා උකුස්සාද එතනින් පළාගොස් අනික් තෙනක වාසය කෙළේයයි ශාස්තෘවූ බුදුරජාණන්වහන්සේ මේ ධර්ම දේශනාව ගෙණහැර දක්වා වදාරා මහණෙනි දේවදත්තසථවිරයෝ පෙරත් මට වධයට උත්සාහකළෝ වේදැයි වදාරා මේ කුක්කුට ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි උකුස්සා තම් දැන් මේ දේවදත්තසථවිරයෝය, එසමයෙහි ඇවිකුකුළුව උපන්තෙම් තිලෝගුරු සම්‍යක් සම්බුදුරජවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

## 436 මච්චකුණ්ඩලී ජාතකය

එවද සංසාර ප්‍රතිෂ්ඨාවූ සර්ව්ඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක් පුත්‍රයෙකු මළ ශොකයෙන් ඉන්නා උපාසකයෙකු අරභයා මේ ජාතකය දක්වනලදී.

**ඒ කෙසේද? යත්**

එක්තරා උපාසකයෙක් තමාගේ පුතෙකු මළ ශෝකයෙන් නොකා නොබී වික්ෂිප්තව ඇයි පුත මට නොකීයා පලාගියාදැයි කියා කියා බොහෝ වික්ෂිප්තයව පැමිණ ඇඳින් නැගී සිටියනොහී වැදහෝනාය. එක්දවසක් අළුයම් වේලෙහි මහාකරුණා සමාපත්තීන් සමවැද ලොව බලා වදාරණසේක් එකියන උපාසකයා සෝවාන්වන්ව නිසි හේතු ඇති නිසාව දැක වදාරා සැවැත්නුවර සිඟාවළඳ පස්වරු භාගයෙහි අනඳසාමීන් පසුව මහණකොට එකියන උපාසකයාගේ ගෙට වැඩිසේක. එකියන පුරුෂයාගේ ගෙයි මනුෂ්‍යයෝ සර්ව්ඥයන්වහන්සේ වැඩහිඳිනා ලෙස බුඩාසනයක් පණවා එකි යන පුරුෂයා අතපය ඔලොම්බාගෙණවුත් සර්ව්ඥයන්වහන්සේ ලඟ එහ. සර්ව්ඥයන්වහන්සේ ඇයි පුරුෂය තා එකපුතෙකුට ඇඬුයේයයි වදාළ කල්හි එසේය සවාමීනි මාගේ ඇත්තේ එකපුත්‍රයාය, එසේනෙයින් මට කීකරුය, එසේහෙයින් සෝකයෙන් ඇඬීම් කියේය. එවිට සර්ව්ඥයන්වහන් සේ පළමුත් බ්‍රාහ්මණයෙක් තොපසේම පුත්‍රප්‍රේමයෙන් අඩා අඩා සෝකාතුරව උන් අවසථාවේත් උන්තමයන්ගේ ඔස් හිවිස සෝක තුනීකලෝ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සර්ව්ඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

**ඒ කෙසේද? යත්**

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි ඒ නුවර එක්තරා බ්‍රාහ්මණයෙකුගේ පසලොස් හැවිරිදි අවසථාවෙහි පුතෙක් මළතැනැත්තේ දිව්‍යලෝකයෙහි උපන. එකි යන බ්‍රාහ්මණ තමාගේ පුත්‍රයාව සෝකයෙන් අඩ අඩා නොකා නොබී දුක් විඳම දවස්පතා සුසානභූමියට ගොස් වට තුන්විටක් ඇවිද මහත්වූ දුකින් සෝකාතුරව වාසයකරන්නේය, දිව්‍යලෝකයෙහි උපන් දිව්‍යපුත්‍ර මම මාගේ

කුශලයෙන් දිව්‍යලෝකයෙහි උපනිමි, මාගේ පියාතෝ කෙසේ ඉඳිත්දෝ හෝයි සිතා දිවැසින් බැළුවේය. තමාගේ පියාතන් තමන් සෝකයෙන් වලපිකා නියාව දැක තමන්ගේ පියාතන් සුසානභූමියට යන්නාට පළමුවෙන් යෙම් සිතා මච්ටකුණ්ඩලියා මෙන් සැරහී බ්‍රාහ්මණයන් සුසානභූමියට එන්නාව පළමුකොට දිව්‍යපුත්‍රයා සැරහී සුසානභූමියෙහි සිටියේය. ඒ වේලෙහි එකියන බ්‍රාහ්මණ තමාගේ පුත්‍රයා ගැන අඬ අඬා සුසානභූමියෙහි ආ තැනැත්තේ තමාගේ පුත්‍රයාමෙන් සැරහී සිටි මච්චකුණ්ඩලියා දැක බ්‍රාහ්මණ කියන්නේ මම වනාහි මාගේ පුත්‍රයාට සෝකයෙන් අඬම් තොපි වනාහි කවරේදැයි විමසේය. එවිට මච්චකුඩලි කියන්නේ මම දේවතාවක්මි සත් රුවන් රථ මැදිරියක් ලදිමි ඊලන්ට රථයක් දෙකෙක් නැත්තෙන් සිටියෙමියි කියේය. බ්‍රාහ්මණ තොපට රථයක්දෙක රත්රනින් රිදියෙන් යකඩින් මුතුයෙන් ලෝකඩින් මැණිකකින් කවරකින්ඉදිකරවා දෙම්දැයි කියේය එවිට මච්චකුණ්ඩලි දිව්‍යපුත්‍රයාද කියන්නේ මාගේ රථමැදිරිය ඉතා සෝභමානය එසේනෙයින් අනික් රථයකින් මට ප්‍රයෝජන නැත හිරුමඬල සඳමඬල දෙක මට දෙවයි කියේය. බ්‍රාහ්මණ කියන්නේ ඇයි මච්චකුඩලිය තෝ උමතුවපියා දෙඩවයිද හිරුමඬල සඳමඬල ඇරගෙණ තොපගේ රථ සකව දෙන්නේ කෙසේදැයි කියේය. මච්චකුඩලියා හිරුමඬල සඳමඬල නැගෙණ දිසාවටද බස්නා දිසාවටද යන අවදි පෙණෙන්නේය, එසේවූ හිරුමඬල සඳමඬල මට දුනමැතැවැයි කිම්ද උමතුව නන්දෙඩවයිද තොපගේ මළාවූ පුතනුවන් කොතනක උපන් බවත් නොදනෙන්නාවූ පුතනුවන්ට අඬන තෙපිද උමතුව කියන්නේය. මමද උමතුව කියන්නේ නොවෙමි කියේය. බ්‍රාහ්මණ කියන්නේ සැබව මච්චකුඩලියෙනි කියන්නේ ඇත්තමය උමතුව දෙඩුයේ මම්මය, තෙල්කළ සියගණන් වත්කොට දල්වන්නාවූ මහා ගින්නක් පැන්කළ සියගණන් වත්කොට ගිනි නිවූවාසේ මාගේ සෝකාග්නි නිවුනියා යනපත, තොප මට කළ උපකාර යහපතැයි ඉනිබ්බේ මාගේ පුත්‍රයාට සෝක නොකරමියි බ්‍රාහ්මණයා කියේය. එවිට මච්චකුඩලි දිව්‍යපුත්‍රයා කියන්නේ බ්‍රාහ්මනයාණෙනි මළවුන්ට සෝකකිරීමෙන් ප්‍රයෝජන නැත තොපගේ මළාවූ පුතාතම් මම්මයයි තමන්වහන්සේ දක්වා සෝක නොකරවයි බ්‍රාහ්මණයාතන්ට අවවාද කියා දිව්‍යලෝකයට ගියේය. එකියන බ්‍රාහ්මණයාත් තමාගේ මළාවූ පුත්‍රයාට සෝකහැර දානාදී කුශලයන් රැස්කොට පරලොව ගියහ. මේ මච්චකුඩලි ජාතකය පූර්වාපරසන්ධි ගළපා නිමවා වදාළසේක. එසමයෙහි මච්චකුඩලී තම් දිව්‍යපුත්‍රව උපන් තෙම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 437
## බිලාරකොසිය ජාතකය

මේවද කාලත්‍රයවර්තිවූ සම්බුදුන් සම්මාසම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි දන්දී අනුභව කරන්නවූ භික්ෂූ කෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදි.

එක්තරා භික්ෂුකෙණෙකුන්වහන්සේ බත් ආලෝපයක්වත් උප්පතක්වත් යම්දෙයක් දන්දී වළඳනසේක. උන්වහන්සේ දන්දී වළඳනනියාව එක් දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන් වහන්සේ ඇවැත්නි අසවල් භික්ෂූනු දන්දී මිසක් අනුභව නොකෙරෙති කියාම කථාව කොට උන්සේක. එතනට සම්ඵයන්වහන්සේ වැඩවදරා මහණෙනි මා එන්නාට පූර්වජාතියෙහි කිතම් කථාවකින් යුක්තව උනුදෑයි විවාරා එපවත් අසා මහණෙනි මෙකියන්නාවූ භික්ෂූනු මහා ලෝභිය මාගේ අවවාදය අසා ඒ ජාතියෙහි ලෝභිකම් අළහ. එසේහෙයින් මේ ජාතියේත් ලෝභිකම් නැත්තේ වේදැයි වදරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්ඵයන්වහන්සේ ඉකුත් වත් දක්වා වදාළසේක.

යිවගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍ය කරණ සමයෙහි ඒ නුවර එක්තරා සිටාතකෙණෙක් සදම්හල් කරවා දන්දී තමාගේ පුතාට කියන්නේ මාසේම දන්දී සිල්රකුවයි පුතාට භාර කොට තෙමේ මියගොස් ශක්‍රභවනයෙහි ශක්‍රදේවේන්ද්‍රව ඉපද වදිඉසුරු විඳිනාකල්හි ඔහුගේ කුමාරයත් සිටුසේසත් ලදින් පියාතන්සේම දන්පින් කොට මියගොස් වඤ්ඣපුත්‍රව උපන්නේය, ඔහුගේ පුතාත් එසේම දන්පින් කොට මියගොස් සූරයීදිව්‍යපුත්‍රව උපන්නේය, ඔහුගේ පුතාත් එසේම දන්පින් කොට මියගොස් මාතලී දිව්‍යපුත්‍රව උපන්නේය, ඔහුගේ පුතාත් එසේම දන්පින්කොට මියගොස් පඤ්චසිඛ දිව්‍යපුත්‍රව උපන්නේය. ඔහුගේ පුතා වතාහි තමාගේ පරම්පරාවෙන් ආවාවූ දැන වාහනය නසා දන්හල් ගිනිලා සිහා ආ ජනයන් බොටුව අල්වාදමා මේ නියාගෙන් තදපරුෂව කිසි දයා වක් නැතිව යටත්පිරිසෙයින් තණඅඟක් තෙලෙහි ගලාවත් එක්කෙණෙකුන්වත් නොදී මසුරුව වාසයකරන්නාහ. එසේහෙයින් උන්ට බිලාරකොසිය සිටානෝයයි කියා මෙතමින් ප්‍රසිඛව දවස්අරින්නාහ. එක්දවසක් ශක්‍රදේවේන්ද්‍රතෙම මම කුමක් පිණිස මෙසා සම්පත් ලද්දේදැයි දිවැසින් ලොව බලන්නාහු බරණැස්නුවර සිටුකුලයෙහි ඉපද දන්දී උපන් නියාව දැක මාගේ පුතනුවෝ කොයිදැයි කොතැන්හි උපන්නේනෝයි බලා වඤ්ඣදිව්‍ය පුත්‍රව උපන් නියාව දැක උන්ගේ පුතනුවෝ කොයිඋපන්නේහෝයි බලා සූරයී දිව්‍යපුත්‍රව උපන් නියාව දැක උන්ගේ පුතනුවෝ කොයි උපන්නේහෝයි බලා මාතලී දිව්‍යපුත්‍රව උපන් නියාව දැක උන්ගේ පුතනුවෝ කොයි උපන්දෝ හෝයි බලා පඤ්චසිඛ දිව්‍යපුත්‍රව උපන් නියාව දැක ඔහුගේ පුත් කොයි උපන් දෝහෝයි බැලුවාහු පරම්පරාවෙන් ආවාවූ දන්හල් දවා සිඟන්නන් මරා ලුහුබඳවා ලෝභිව වසතියි දැක මා දක්වා මේ දිව්‍යපුත්‍රයන් සතරදෙනක් මෙමන් ගොසින් ලොභිකම් අරවාපියා එම් සිතා වඤ්ඣ සූරයී මාතලී පඤ්චසිඛ දිව්‍යපුත්‍රයන් සතරදෙනා තමන්කරා කැඳවා කියන්නාහු අපගේ දැනවංශය නසා ලෝභීව වාසයකෙරෙති එසේහෙයින් අපි පස්දෙන උන්කරා ගොසින් උන්ගේ ලෝභය අරවා දන්පින් කරණ නියාගෙන් සලස්වා එම්මැයි කියා, අපි පස්දෙනා එකවිට ගියකල භයින් මූර්ඡාවෙයි එකවිට නොගොසින් එක්කෙණෙකුන් නියාගෙන් බ්‍රාහ්මණ වේශයෙන් යම්හයි කියා සිටානන් රජගෙට අවුත් තමන්ගේ ගෙට ගියකල යම්හයි කථාකොට සිටානන් තමන් ගෙට අවුත් සත්වෙනි දෙරටුවේ වීථිය බල බලා සිටිකලට ශක්‍රයෝ බ්‍රාහ්මණ

වේශයෙන් අවුත් සිටානන්ගේ සමීපයට පැමිණ සිටානෙනි සාදුකෙන් ඉතාම පීඩිතව හියෙමි, මාගේ දුකඛය නිවාදෙවයි කී කල්හි සිවානෝ ශක්‍ර බ්‍රාහ්මණයා කී බස හා සමඟ මාගේ ගෙයි පිසූ බතුත් නිමාහිශේය. පිසන්ව සාළුත් නැතැයි කීහ. ශක්‍රබ්‍රාහ්මණ කියන්නේ සිටානෙනි මා කියන්නාවූ සොලෝවෙක් ඇත අසවයි බ්‍රහ්මණයා කීය. සිවානෝ මට සොලෝවෙන් ප්‍රයෝජන කිම්ද මම නොඅසම් කීවත් බ්‍රාහ්මණයන් වළක්ව වළක්වා කියන්නාහු පින්වත් මහාසිටානෙනි පිස අනුභව නොකරන්නාවූ සත්පුරුෂයෝ සිඟාල හෝජනය දෙනු කැමති වෙති උදකළාව නොකෙරෙති පිය අනුභව කරන්නාවූ තොපි තොපගේ වස්තුව ඇතිව නිබෙද්දී තමා සමීපයට පැමිණියාවූ යාචකයන්ට දන් නොදෙව් නම් එසේ නොදීම තොප ඇත්තවුන්ට සුදුසු නොවන්නේය, දුනමානයෙහි ඉසුරු බැවින් ප්‍රමාද වැවින් යන මේ දෝෂ දෙකින්ම නොදුනෙන්නාහ. කුසල් කැමැත්තාවූ නුවණැත්තාවූ සත්‍යයන් විසින් සවල්පවූ දෙය ධර්මයෙක් ඇතිනම් එයින් භාග යක්වත් දියයුත්තේයයි කීහ. එබස් අසා සිවානෝ ගෙට වැද සිවානන්ව තමන් කී කාරණය මෙනෙහි කරමින් සොලෝව කිය කියා උන්නාහුය. ඉක්බිති චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ අවුත් බත් ඉල්වා තොපට බත් නැත යවයි කී කල්හි මහසිවානෙනි ඇතුළඟෙයි එක් බමුණෙක් සිටියි බමුණන් පවරා දන්දෙන තෙනකැයි සිතම්, එසේනෙයින් මමත් ගෙට වදිම් කීහ. බමුණන්ට දෙන දනෙක් නැත මෙතන නොසිට පලායවයි සිටානන් කියමින් සිටියදී එසේවිනම් සොලෝවක් කියන්නාවූ චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ මසුරු සිත් ඇත්තාවූ සත්වතෙම යම් ක්ෂුධා පිපාස දෙකට භයින් භයපත්ව දන් නොදෙන්නාවූ සත්වයාට ඒ තෙම භය නොවන්නේය, කුමක් නිසාදයත් මම මා සතනක වස්තුව අනුන්ට දන්දීපියා ක්ෂුධා පිපාස දෙකින් පීඩිතවම් දැයි සිතා භයපත්වේද ඒ ක්ෂුධා පිපාසා සංඛ්‍යාතවූ භය අශ්‍රුතවූ සත්වයා උපන් තැන්හි මෙලොව පරලොව දෙක්හි පිඬාවට පමුණුවන්නේය, ඉතා දිළිඳු බවවත් පමුණුවන්නේය, එසේහෙයින් තමාගේ සතනානයෙහි උපන් මාත්සර්‍ය්‍ය මලය මැඩගෙණ නුවණැත්තාවූ සත්වයන් විසින් දන්දියයුත්තේයි, සියළු සත්වයන්ට කුශලනම් බලවත් පිහිටෙක් වන්නේයයි කීහ. එබස් අසා සිවානන් විසින් එව ගෙවවැද ඉදුව මදක් ලබන්නේ වේදැයි කී කල්හි චන්ද්‍ර දිව්‍යපුත්‍රයෝ ගෙටවැද ශක්‍රයන් සමීපයෙහි උන්නාහ. ඉක්බිත්තෙන් මදක්කල් යවා සූර්‍ය්‍ය දිව්‍යපුත්‍රයෝ බත් ඉල්වා සිට කියන්නාහු දුනයනම් මාත්සර්‍ය්‍ය මලය මැඩගණ දියයුතු හෙයින් නොදියහැකි දෙයක් වන්නේය, නැවතද දුනයනම් යුබරජක් හා සමාන වන බැවින් නොකොට හැකි කාරියෙක් වන්නේය. එසේහෙයින් නොදිය හැක්කක් කරන්නාවූ සත්පුරුෂයෝ දන්දීගත නොහෙන්නාහ, එසේහෙයින් සත්පුරුෂ බොධිසත්ත්වවරයන්ගේ සවභාව අන්‍ය සත්වයන් විසින් ගතනොහැක්කේය, මේ කාරණයෙන් සත්පුරුෂයන්ගේ ගතිය මෙයින් පරලොව කියකල්හි වෙනවෙනම වන්නේය, අසත්පුරුෂයෝ තමා මාත්සර්‍ය්‍ය වශයෙන් දන්නොදී නරකයට යන්නාහ. සත්පුරුෂයෝ දුන ඵලය තමන්ට ප්‍රත්‍යක්ෂව දුනෙන හෙයින් මාත්සර්‍ය්‍යනොව දන්දී සවර්ගලෝකයෙහි උපදනාහයි ධර්මදේශනා කළහ. එබස් අසා සිවානෝ අනිකක් කියා කොටගත හැකි කාරණය නොදක

එසේවී නම් ගෙටවැද සමීපව ඉඳුව මදක් ලබන්නා වේදැයි කීහ. ඉක් බිත්තෙන් මදක්කල් යවා මාතලී දිව්‍යපුත්‍රයා අවුත් බත් ඉල්වා තැත පලා යවයි කීකල්හි එබස් හා සමඟ අවවාද වශයෙන් කාරණා කියන්නේ මහා සිවාතෙනි මේ ලෝකයෙහි සමහර නුවණැත්තාවූ සත්වකෙණෙක් තුමන්ගේ ගෙවල සුළප තිබෙද්දී දෙන්දෙනු කැමැත්තාහු වෙති, සමහර සත්ව කෙණෙක් තමන්ගේ වස්තුව බොහෝවිතම් දන්දෙනු කැමැත්තාහ, එසේ හෙයින් මේ ලෝකයෙහි කම්පල සඳහා දෙතලද්දාවූ සැන්දක් පමණවත් මහත්ඵල මහානිසංස වන බැවින් සාහසික්මගෙ දුනය හා සමාන වන්නේයයි කීහ. එබස් අසා සිවාතෝ එසේවීනම් ගෙවැද ඉඳුවයි කීහ. ඉක්බිත් තෙන් මදක්කල් යවා පඤ්චසිඛ දිව්‍යපුත්‍රයා අවුත් බත් ඉල්වූහ. තැත පලා යවයි කී කල්හි මේ තාගේ ගෙට ගොසින් දුන්දෙය ගෙණවිරූ යන එකෙකි කිම්ද? මේ ගෙයි බමුණන්ට ආරාධනාකොට දන්දෙන තෙනකැයි කියා සිවානන්ට ධම්දේශනාකරන්ට පවන්ගත්තාහු මෙසේ කීහ. සිවිතෙනි මේ ලෝකයෙහි යම් සත්වයෝ ත්‍රිවිධ සුචරිත ධම්යෙහි හැසිරේද ගම සිහා ඇවිද වී සාල් ආදීවූ දෙයෙන් හා බත් ආදියෙන් ජීවත්වේද වනයේ ඇවිද ඵලාඵල ආදිවූදෙය ගෙණවුත් ජීවත්වේද එසේ ඇවිලි ආහාරයෙන් ජීවත් වන්නාවූ සත්වයාත් ධම්යෙහි හැසිරෙන්නේම වෙයි. යම් සත්වකෙණෙක් තමාගේ වස්තුව සුළපව තිබැද්දී ධාර්මිකවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් හා දුගී මනී යාචකයන්ට දන්දේද එම සුළප වස්තුවෙන් පුත්‍රදාරාවන් පෝෂ්‍යය කෙරේද ඒ සත්වයාත් හැසිරෙන්නේ නම් වෙයි, මෙර මිහට භය හා පීඩා කොට නොබද කරවූ වරද ආදියෙන් වස්තු රැස්කොට දවස දහසක් වස්තු වියදම්කොට දන්දෙන හෙයින් සහස්‍රයාහි නම්වූ ඉසුරුමතුන් ලක්ෂයක් දෙනාගේ දුනය දැහැමෙන් වස්තු උපදවාගෙණ ඒ මහා වස්තුවෙන් දන් දෙන්නාවූ දුකඳිත මනුෂ්‍යයන්ගේ දුනයෙන් සොළොස්වන කොටසයෙන් කොටසයකුත් නොඅගනේයයි කීහ. පඤ්චසිඛයන්ගේ බස් අසා බිලාර කොසිය සිවාතෝ කාරණා සලකා දුගී පුරුෂයාගේ සුළප දුනයට සහස්‍රා දින් ලක්ෂයක් දෙනාගේ දුනය නොඅගනා කාරණා විචාරන්නාහු බමුණා තෙනි සහස්‍ර වශයෙන් ඉතා මහත් බැවින් දැහැමින් සෙමෙන් වස්තුව උප දවා දන්දෙන්නාවූ පුරුෂයාගේ සුළපවූ දෙය ධම්යෙහි සොළොස්වන කොටසයෙන් කොටසයකුත් නොඅගන්ව කාරණා කවරේදැයි විචාළාහ. ඉක්බිති ඊට කාරණා කියන්නාවූ පඤ්චසිඛ දිව්‍යපුත්‍රයෝ සිවාතෙනි මේ ලෝකයෙහි සමහර සත්වකෙණෙක් ප්‍රාණඝාතාදී දශඅකුශල කම්යෙහි පිහිටි යාවූ අනුත් තළා මරා දඩුමුගුරු ගෙණ නොබද අය පඩුරු ගෙණ සත්වයන් සන්තානයෙහි ශෝක ඉපදවීමෙන් සම්පත් රැස්කොටගෙණ ඒ බලාත් කාරයෙන් උපයතාලද වස්තුවෙන් ශ්‍රමණබ්‍රාහ්මණයන්ට දන් දෙන්නාහ. සත්වයන්වද දණ්ඩනයකොට උපදවාගත් වස්තුවෙන් දෙතලද්දාවූ දුනය දැහැමෙන් දෙන වස්තුවට සරිනොවන්නේය. මෙසේ යථොක්ත ක්‍රමයෙන් පරහට පීඩාකොට වස්තුව උපදවාගෙණ දන්දෙන්නාහු ලක්ෂයක් දෙනාගේ දුනය දැහැමෙන් වස්තුව උපදවා දන්දෙන දුගී පුරුෂයාගේ දුනය දුන් නාවූ කාරණා වශයෙන් සොළොස්වන කොටසයෙන් කොටසයකුත් නොඅගනේයයි සිවානන්ට ධම්දෙශනා කළාහ. පඤ්චසිඛයන්ගේ ධම් කථාව අසා සිවානෝ එසේවීනම් යව ගෙවැද ඉඳුවයි මදක් ලබන්නේ වේදැයි කීහ. එබස් අසා පඤ්චසිඛ දිව්‍යපුත්‍රයෝ ගොස් ශක්‍ර බ්‍රාහ්මණාදී සතර

දෙනාගේ සමීපයෙහි උන්නාහ. ඒ වේලෙහි බිළාර කෝසිය සිටාතෝ තමන්ගේ ගෙයි කෙල්ල කැඳවා කියන්නාහු තෙල හිදිනා බමුණන් පස් දෙනාට බොල්මුසු වී පස්නැලියක් දීපියවයි කීහ. යහපතැයි කියා කෙලී වී පස්නැලියක් ගෙණගියාය. බමුණෝ පස්දෙන පස්නැලිය දැක අපට වී එපායයි ලවා නොගත්තාහ. ලවා නොගත් නියාව කෙලී සිවානන්ට කීවාය, සිවාතෝ නිවුඩු සාල් පස්නැලියන් ලවා පියවයි කීහ. එවිට කෙලී සාල් පස්නැලියක් ගෙණගියාය. බ්‍රාහ්මණයෝ සාලුත් අප ලවා ගන්නේ නැතැයි කියා නොගත්තාහ. සාල් ලවා නොගත් නියාවත් සිවානන්ට කෙලී කිව. බත කත් නම් අසුන්ව උයාපු නිවුඩුසාලේ බත් ලාපියවයි කීහ. යහපතැයි කියා බමුණන් පස්දෙනා ඉඳුවා අසුන්ව ඉවූ නිවුඩු සාලේ බත් ලූ ගමනේ බත් පිඬ කට තබා ගෙලගත්නාක්මෙත් ඇස් උඩඉඳුවා වැටී වැඳගත්තාහ. කෙලී එමවිට බ්‍රහ්මණයන් ඇස්උඩඉඳුවා වැටීවැදහොත් නියාව දැක මළහයී සිතා සිවානන්ට බමුණෝ බත් හිලේ ගැණිමලෝයයි කෙලී කිව, සිවාතෝ මට අපකීර්තියෙක අසූකෙළක් සම්පත් ඇති සිටාතෝ සුබුමාලයාවූ බමුණන් පස්දෙනාට ඉඳුරා බත්සුහක් ලවාලිය නොහී අසුන්ට ගෙරි මීවූන්ව පිසූ බත්ලා බ්‍රහ්මණයන් මරාපුවහයි ප්‍රසිඛව බොහෝ මට අපකීර්තියයි කියා කෙල්ලට කියන්නාහු උගේ තැවිවල නිවුඩු බත් හැර මට පිසූ සුවඳ ඇල් සාලේ බත් තැවි පසේ ලවයි කීයේය. කෙලී ඒ නියාවට නිවුඩුසාලේ බත් හැර සිටානන්ට පිසූ බත් බමුණ පස්දෙනාගේ තැවිවල ලුවා. සිවාතෝ දෙරකඩ වැද සිව යතඑන බොහෝ මනුෂ්‍යයන් කැඳවා කියන්නේ මේ බමුණන් පස්දෙනාට මට පිසූ සුවඳඇල් සාලේ බත් ලැවීම්, බමුණෝ නම් ලොඹී ජාතියෙක නිසා මහත්කොට බත්පිඬ කා හිලේගෙණ මළහ. අපගේ වරදකින් මළගමනෙක් නොවෙයි තොපහැම දනුවයි සිටාතෝ කීහ. එවිට බ්‍රාහ්මණයෝ පස්දෙන බොහෝ මනුෂ්‍යයන් එක්වූ නියාව ද්න නැගී සිට එසේද සිවානෙනී තොපගේ මීවුන් ගෙරින් ආදීන්ව ඉවූබත් අපට ලා දුන් තැවිවල කැකුළුසාලේ බත්ලා තොප කළදැ නොදනුදැයි කවතුබූ නිවුඩු සාලේ බත්පිඬු පස බිමට එලූහ. එවිට බොහෝ මනුෂ්‍යයෝ යහපත තොපගේ දුනාඩ්‍යාශය එකවිවරය, තොපගේ සත්මුතු පරම්පරාවේ පැවත ආ කුශලයක් නැත්ල, බොහෝ උන්සාහයෙන් දෙවතවන් දනෙ මෙසේවූ බ්‍රාහ්මණයන්ට තොපට පිසූ බතින් බත්ලා යවාපුවොත් කවර වැරදිද තොපසේ අඥතයෙකුත් නැතැයි කියා බොහෝ නින්දා කීහ. එවිට ශක්‍රයෝ කියන්නාහු මේ සිටාතෝ මෙතෙක් සම්පත් ඇතිව තිබැද්දී අපට ලැබුනු බතේ සැටිය, මේ සම්පත කාගේ සම්පත්දැයි දනුදැයි විවාලේය. එවිට මනුෂ්‍යයෝ නොදනුම්හයි කීහ. බ්‍රාහ්මණයෝ කියන්නෝ පළමු මේ නුවර සතරදිග සතර දන්හල් කරවා දන්දුන් අසවල් සිවානන් නම් ඇසූවිරුදැයි විවාලාහ. ඇසූවිරු මනුෂ්‍යයෝ ඇසුම්හයි කීහ. බ්‍රාහ්මණ කියන්නේ එසේ වීනම් ඒ කුශලය කළාවූ සිවාතෝ නම් ඒ කුශලමූලයෙන් ශක්‍රභවනයෙහි උපන් ශක්‍රයෝ නම් මම්මයයි කියමින් සිරියදීම බ්‍රාහ්මණ වේශය හැර පස් දෙනම දිව්‍යඅත්ම්භාවයෙන් සිව කියන්නාහු ඒ සිවාතෝ නම් ශක්‍රවූ මම්මය, මගේ පුත්‍රයානම් මා කළ කුශල්කොට වන්ද දිව්‍යපුත්‍රව උපන්නේ තුලූය, තුළුන්ගේ පුත්‍රයානෝ එම කුශල්කොට සූයම් දිව්‍යපුත්‍රව උන්නේ තුලූය, තුළුන්ගේ පුත්‍රයානෝ එම මේ කුශලය කොට මානලී දිව්‍යපුත්‍රව උපන්නේ තුලූය, තුළුන් පුත්‍රයානෝ එම කුශලය කොට පඤ්චශිඛ දිව්‍යපුත්‍රව උපත්

නේ තුලුය, මේ සිවාතන්ගේ පියානෝය, එසේනෙයින් මේ සම්පත් මාගේ සම්පත, මෙතෙක් සම්පත් නිබැඳ්දීත් නිවුඩු බතෙහි විවර දුටුවාදැයි කියා මට බත්නැති හෙයින් මුගේ බත් කන්ට ආයේ නොවෙමි බොහෝ කාලක් පැවත ආ දැනය නුදුන්හෙයින් ඉදිරි ඇතිවුනු කෙණෙකුත් නොදෙති. එසේ හෙයින් මුත් භික්මවන්ට ආමි කියා ශක්‍රයන් ඇතුළුවූ දිව්‍යපුත්‍රයෝ මහත්වූ ආභායෙන් ආකාශයෙහි සිටියාහ. සිවානෝ එවිට එසේවිද මා භික්මවන නිසා ආසේක්ද සැබව මෙතෙක් දවස දත් කඩකොට නුදුන්නෙමි මෙතැන් පවත් මා පැවත ආ දැනය කෙරෙමි කියා ගිවිස්සේය. ශක්‍රයෝ බොහෝ මනුෂ්‍යයන්ට දන්පින්කොට අපසේම දිව්‍යලෝකයෙහි උපදවයි කියා අවවාද කොට ශක්‍රයන් ඇතුළුවූ දිව්‍යපුත්‍රයෝ තමන්ගේ දිව්‍යලෝකයටම ගියාහ. එතැන්පටන් කෝසිය සිවානෝ පළමු නියාවට දන්හල් කරවා දැනාඩ්‍යාශය කොට දිව්‍යලෝකයට ගියහයි වදාරා මේ බිලාර කෝසිය ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි බිලාර කෝසිය සිවානෝ නම් දැන් පින්කරන්නාවූ මේ භික්ෂූහුය, පඤ්චසිඛ දිව්‍යපුත්‍රයෝ නම් ආනන්දසථවිරය, මාතලි දිව්‍යපුත්‍රයෝ නම් අනුරුඬ මහාසථවිරය, සූයාී දිව්‍යපුත්‍රයෝ නම් මුගලන් මහාසථවිරය, එසමයෙහි චන්ද දිව්‍යපුත්‍ර නම් සැරියුත් මහාසථවිරය, එසමයෙහි ශක්‍රයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

---

## 438 චක්කවාක ජාතකය

මේවද ශාක්‍යකුල චින්තාමාණික්‍යවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩවසන සමයෙහි ලෝභී භික්ෂු කෙණෙකුත් අරභයා මේ ජාතකය දක්වන ලද.

ලෝභිවූ භික්ෂුකෙණෙකුත් වහන්සේ සථිඥයන්වහන්සේට පෑ ගමනේ සැබව සවාමීනි තෘෂ්ණ වශඟයෙමි කීකල්හි සථිඥයන්වහන්සේ එම්බා මහණෙනි මු දැන්මතු නොවෙයි පළමුත් තෘෂ්ණා වශඟයෙන් ඇත්කුණු ආදීවූ නොයෙක් කුණු ඇතිව නිබැඳ්දී හිමාලයවනයට ගොදුරු සොයා ගියේ වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සථිඥයන්වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

### ඒ කෙසේද? යත්

පසිවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණෙකුත් රාජ්‍යය කරණ සමයෙහි මෙම නුවර කපුටුවෙක් ඇත්කුණු මිනිකුණු ආදීවූ දය කා ඉන් තෘප්තියට නොපැමිණ ගොදුරු සොයා වනාන්තරයට ගිය තැනැත්තේ එක්තරා විලෙක වාසයකරන්නාවූ සක්වාලිහිණී යුගලයක් දැක කියන්නා සක්වායුගල තොපගේ ශරීරවර්ණය හා පැහැපත යහපත් වූයේය, පෙවිගත් පලයින් කණයින් මුදුමස් ආදීවූ මාංශ කන්නේවේද තොපගේ වර්ණය යහපත් වූයේයයි කීහ. සක්වාලිහිණියෝ එවිට කියත්

නානු තොප කියන්නාවූ ගොදුරු අප කන්නේ නැත සෙවෙල් ආදීවූ දෙයයි කී කල්හි කවුඩු කියන්නේ තොප කී බස් අදහා ගත්තේ නැත. සෙවෙල් කෑ මෙසේ සොහා වණී ඇතිවූකල මා කන්නේ මනුෂ්‍යයන් කැවමනා ලුනු ඇඹුල් ලා පිසූ මාලු ආදීවූ කැවුම් ආදිවූ රසභොජන මා කන්නේය. මා කෙසේවූ අවණීවූයේ කවර හිසාදැයි කීහ. එවිට සක්වාලිහිණි කියන්නේ තොප කවර කැවිලි කනක් හයින් කන නෙයින් හා කැවිලි තොපගේ හෘදය මාංශය උණුව තිබෙන හෙයින් වහාම දිරායෙයි නොයෙක් දෙනාගෙන් තොපට භය ඇති හෙයින් කෑ කැවිලි ශරීරයෙහි ප්‍රත්‍යයට යන්ට නැතිව ද හස්මවන්නේය. අපට එසේවූ භයකුත් නැත. ඇමවේලේ චිත්ත සන්තෝෂව තිබෙන හෙයින් ශරීරයේ ජීවිතේන්ද්‍රියත් යහපත්ව කෑ දෙයත් ප්‍රත්‍යය වන්නේය, අපට භයකුත් නැත. අපට විපාක කුමක් සිතූ කෙණෙක් ඇත්තම් උන් තමන්ට විනා අපට වෙත අනාසයක් නැතිහෙයින් මෙසේ යහපත්ව වාසය කරම්හයි වදාරා මේ කාක ජාතකය නිමවා වදාළසේක, එසමයෙහි කවුඩා තම් මේ භික්ෂුහුය, එසමයෙහි සක්වාලිහිණී තම් යසෝධරා සාධුවිරිය, එසමයෙහි සක්වාලිහිණියා තම් බුදුවූ මම්මයයි වදාළසේක.

---

## 439
## මහා මඞ්ගල ජාතකය

**මේ** වදාළ ශාක්‍ය කුලතිලකවූ සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි මහා මඞ්ගල සූත්‍රය අරභයා මේ ජාතකය වදාළසේක.

**ඒ කෙසේ ද? යත්,**

එක් දවසක් ශාලාවෙක බොහෝ මනුෂ්‍යයෝ එක්ව උන්නාහ. ඉන් එක මිනිසෙක් තමන්ගේ ගෙයි මඟුල් ඇතැයි නැඟී සිට පළා හිඳේය, එතන උන් මනුෂ්‍යයෝ කියන්නාහු මඟුල් තමා කවරේදැයි කීහ. ඉන් එකෙක් කියන්නේ නැඟි කිරිදෙන බැමිණී දෙනක හා එලහිතෙල් හෝ වෘෂභයෙකු හෝ සුදු කඩක් හෝ සම්භාරණයෙන් සැරහුනාවූ ස්ත්‍රියෙක, යනාදීන් මෙකී දෙයින් යමක් දුටහොත් මේ මඟලැයි කීය. එකෙක් එසේ නොව ඇසින් දුටු දෙය මඟුල් නොවෙයි නිදුනැඟි පුණ්‍යයයි කියාවත් වඩාසයයි කියාවත් යන මේ ශබ්දයෙන් එකක් කණ වැටිනි තම් මඟුලැයි කීය. එකෙක් කියන්නේ කණට ඇසුනු දෙයක් මඟුල්ද, ඒ මඟුල් නොවෙයි. යමෙක් නිදුනැඟි සිටගෙණ පොළොව අල්වා රත්‍රන් අල්වාද සුවඳ විලවුන් අල්වාද රේමස් අල්වාද මෙකී දෙයින් එකෙක් කෙළේවිනම් ඒ මඟුලැයි කීය, මේ නියායෙන් මේ මනුෂ්‍යයෝ තුන් කොටසාසයක්ව දිට්ඨමඞ්ගලය, සුතමඞ්ගලය, මුතමඞ්ගලයයි, මේ මඟුල් තුනින් මේ මඟුල්යයි, විභාගයක්කොට දැනගතනොහී උනුත් විචාරා මනුෂ්‍යයෝද සදිව්‍යලෝකයෙහි දෙවියෝද සොළොස් බඹතලෙහි බ්‍රහ්මයෝද යන සියල්ලෝම තුන් කොටසක්ව බෙදී හියහ. එවිට ශක්‍රයෝ මේ මඟුලැයි දෙවි මිනිසුන් සිතව නංවා කියාලන්ට අනික් කෙණෙක් නැත, සම්බුදුරජාණන් වහන්සේ කරා ගොස් වැඳ, "බහුදේවා මනුස්සාව" යනාදීන් ගාථායෙන් මඞ්ගල ප්‍රශ්නය විචාළ ශක්‍රයන්ට සම්බුදුරජාණන් වහන්සේ "අසෙවනාව බාලානං" යනාදී ගාථා

දෙළඝකින් එක මඞ්ගල්‍ය ප්‍රශ්නය විවාළ ශක්‍රයන්ට ගාථා දෙළඝකින් දෙතිස් මඟුල් වදුරා දෙවි බඹුන් ඇතුළුවූ සියල්ලවුන්ගේ සැකදුරුකොට මහා මංගල ප්‍රශ්නය විසඳූ වදුරා මංගල ප්‍රශ්නය අවසානයෙහි කෙළ දහසක් සත්‍වයෝ රහත්ව අමාමහනිවන් දුටහ. සෙසු සෙදගැමි අනාගාමි සකදාගාමි සතර ඵල යට පැමිණි සත්‍වයන්ගේ මෙතැකැයි පමණ නැත්තේය, එතැන්හි රැස්වූ භික්ෂූන් වහන්සේ දෙවිබඹුන් ආදීවූ බොහෝ සත්‍වයන්ට සැක උපන්නාවූ මංගල සූත්‍ර ප්‍රශ්නය සම්ඵඳයන් වහන්සේ විසඳූ වදුළුකියාව ඉතා යහපතැයි ස්තුති කියා උන්නැනට සම්ඵඳයන් වහන්සේ වැඩවදාරා මහණෙනි! මා එන්නාට පූර්වභාගයෙහි කිතම් කථාවකින් යුක්තව උනුදුයි විචාරා වදාරා එපවත් අසා දැන් මතු නොවෙයි මහණෙනි! පෙරත් දෙවි මිනිසුන් සිත සැක මුදා මේ මංගල ප්‍රශ්නය විසඳුයේ වේදුයි වදාරා ඒ කෙසේදැයි ආරාධිතවූ සම්ඵඳයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**ඒ කෙසේද? යත්,**

පිටහිය දවස බරණැස්නුවර එක් බ්‍රාහ්මණ කුලයෙක බෝධිසත්ත්වයන් වහන්සේ උපන්සේක, උන්වහන්සේට නම් තබන්නාහු රක්ඛිත කුමාරයෝ යයි නම් තුබූහ, ඒ බ්‍රාහ්මණ කුමරා වැඩිවිය පැමිණ පඤ්චකාමයෙහි ආදීනව දැක හිමාලය වනයට ගොස් ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා තාපසවරුන් පන්සියයක් පිරිවරා වාසය කරණසේක. ඒ තාපසවරු ඒ රක්ඛිත තාපසයන්ට කියන්නාහු සවාමිනි තපස්කාලය ආසන්න ඉඟිනුත් ලුණු ඇඹුල් සෙවුනා පිණිසත් දිනවයාට පිණිසත් මනුෂ්‍යපථයට යම්හයි කිහ, රක්ඛිත තාපසයෝත් යහපතැයි අවසර දුන්හ. ඒ තාපසවරුන් අවසර ගෙණ ගම් නියම්ගම් රාජධානිවල ඇවිද බරණැස්නුවරට ගොස් රජ්ජුරුවන්ගේ උයනේ වාසයකරන්නාහ. එසමයෙහි පළමු මංගල සූත්‍රයෙහි ක්‍රමයෙන් බරණැස්නුවර දිට්ඨමංගලය, සුතමංගලය, මුතමංගල, යන තුන්දෙනෙක් මඟුල් කාරණා කියා ඇවිදිනා මේ කථාව නුවර ප්‍රකාශකොට රජ්ජුරුවන්ට කිහ. රජ්ජුරුවෝ මඟුල් විභාගකොට ගතනොහී ඉඳිනාහු තමන්ගේ උයනට තාපසවරු ආ නියාව අසා තාපසවරු නම් මහනුවණ ඇත්තාහ. මේ මංගල ප්‍රශ්නය විචාරම් උයනට ගොස් තාපසවරුන් වැඳ එකත්පස්ව සිට මේ කාරණය විචාළාහ. තාපසවරු කියන්නාහු මේ මංගල ප්‍රශ්නය අපට නොදනෙයි අපගේ ආචාරිවූ රක්ඛිත තාපසයන් වහන්සේ හිමාලය වනයෙහි වාසයකරන්නාහ. උන්වහන්සේ ප්‍රශ්න විසඳූ වදාරණසේක. ඔබ යමයි කිහ. රජ්ජුරුවෝ කියන්නාහු හිමාලයවනය නම් ඉතාදුරය අපි යා නොනෙමිහ. නුඹවහන්සේලා ගොසින් විචාරා එන්නේ යහපතැයි කිහ. තාපසවරුන් හිමාලයවනයට ගොසින් තාපසයන් වැඳ එකත්පස්ව සිටියාහ. රක්ඛිත තාපසයෝත් තාපසවරුන්ගේ දුක් සැප විචාරා ඉක්බිති තාපසවරුන් පන්සියයකට ජ්‍යෙෂ්ඨ තාපසයෝ තාපසයන් වැඳ නමිනව සිට තමන්ගේ ආචාරිවූ රක්ඛිත තාපසයන් අතින් විචාරන්නාවූ දිට්ඨමංගලය, සුතමංගලය, මුතමංගලයහි, මඟුල් තුණක් කියති. මෙ මඟුල් තුනින් කවර මංගලයක් කළකල ඉහලෝක දෙකින් වැඩ සැප දෙන්නේය, මේ මඟුල් තුනින්වත් මේ හැර අනික් මංගල්‍යකින්වත් වැඩ ඵලවන්නේත් සුවදායක වන්නේත් මෙසේවූ මංගල්‍යයෙකිනැයි වදාළ මැනවයි රජ්ජුරුවන් කළ

ආරාධනා තාපසයන්ට කීහ. එවිට රකඛිත නම් තාපසයෝ කියන්නාහු එඹල දිව්‍ය බ්‍රහ්මයන්ටද තමන්ගේ දෙමව්පියන්ටද තමා කෙරෙහි වෛරව ඉදිනා සත්ත්වයන්ටද මෛත්‍රී කරන්නාවූ සත්ත්වයෙක් ඇත්නම් එසේවූ තැනැත්තවුට මෙලොවින් වැඩ සාදන්නේය, මේ උතුම් මඟුලැයි කියා තවද කියන්නාහු එම්බල යම් කෙණෙක් නිබඳ තමාට වැඩිතරම්ව සිට ආක්‍රෝෂ පරිභව බෙණේද එසේවූ තැනැත්තවූ කෙරේ ක්‍රෝධතොව ඉවසාද එසේවූ පුරුෂයාට මෙලොව පරලොව දෙකින් වැඩ සැදෙන්නේය, මෙයින් එක් උතුම් මංගල්‍යයෙකැයි නැවත කියන්නාහු එම්බල යම් කෙණෙක් මේ නීවය මුට යටතැයි තොසිතා උඹ දන්නාවූ යම් ශාස්ත්‍රයක් ඉගෙණගණිද උඹ කෙරේ අනංකාර නොවේද හෙට්ඨා නොකෙරේද එසේවූ පුරුෂයාට මෙලෝ පරලෝ දෙකින් වැඩ සැදෙන්නේය, මෙයින් එක් උතුම් මංගලයෙකැයි කියා නැවත කියන්නාහු යම් මිත්‍රයෝ නම් මෙලොව පරලෝ දෙකින්ම සුව තොළුලවන්නාවූ අසත්පුරුෂ මිත්‍රයන් හැර සජ්ජනවූ මිත්‍රයන් හා භජනය කිරීම නම් මෙලෝ පරලෝ දෙකින් වැඩ දෙන්නේය, එසේවූ මිත්‍රයන් ඇතිවීමත් උතුම් මංගල්‍යයෙකැයි කියා නැවත කියන්නාහු එම්බල යම් ස්ත්‍රියක් තමා හා සමවූ වයස් ඇත්තීය යහපත්වූ රූපශ්‍රී ඇත්තීය, වංක නැත්තීය, ආචාර ශීලයෙන් යුක්තද පතිව්‍රතා ධර්මය රකීද එබදුවූ ස්ත්‍රිය පාදපරිචාරිකාව ලබන්නාවූ පුරුෂයාට මෙලෝ පරලෝ දෙකින් වැඩ සැදෙන්නේය, මෙයින් උතුම් මඟුලැයි කියා නැවත කියන්නාහු එම්බල යම් භූමිපාලවූ රජදරුවන්ට යම් අමාත්‍යයෙක් රජ්ජුරුවන්ට අනිප්‍රාය ක්‍රියාව ඉහලොවින් පරලොවින් වැඩ පසස්නා කවයුතු කියාද වැඩෙහි හැසිරේද එසේවූ තෙනැත්තවුට මෙලෝ පරලෝ දෙකින් වැඩ සැදෙන්නේය. මෙයින් එක මංගලයෙකැයි කියා නැවත කියන්නා යම් තපස්වී කෙණෙක් ආචාර ශීලයෙන්ද පඤ්චශීලය අෂ්ටාංග ශීලය කෝටියක් සංවර ශීලය යනාදීවූ අර්ථ මාර්ගයෙන් රහත්වන්ට නිසිවූ ක්‍රම දනිද්ද මෙයින් උතුම් මංගලයකැයි කියා මේ මංගල ප්‍රශ්නය අරහන්ත දේශනාවන් කුළු ගෙණ එම්බා තාපසවරුනි මේ අටකාරණයෙන් දවස් අරණ යම්කෙණෙක් ඇත්නම් ඉහලෝක පරලෝක දෙකින්ම වැඩ සැදෙන්නේයයි ඒ තාපතවරුන්ට බණවදුරා දිට්ඨමංගලය සුතමංගලය මුතමංගලයයි කියනලද මඟුල් ව්‍යර්ථය. ඉන්වන ප්‍රයෝජනයෙක් නැත මඟුල් නම් මේයයි කීසේක. තාපසවරු කීපදවසක් රදා බරණැස්නුවරට ගොස් උයනේ සැතපුනාහ, රජ්ජුරුවෝ තාපසවරුන් ආ නියාව අසා සමාධිව උයනට ගියාහ. තාපසවරු බොධිසත්ත්වයන් කී ලෙසම මංගල කාරණයන් විස්තර වශයෙන් කියා බොහෝ මනුෂ්‍යයන් සිතට නංවා හිමාලය වනයට ගියාහ, බරණැස්නුවර වාසීන් හා රජ්ජුරුවෝ තාපසවරුන් කී සැටියේම දවස් යවා මිය දිව්‍යලොකයට ගියහයි වදාරා මේ මංගල ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි තාපසවරු නම් දැන් මේ බුදුපිරිසය, ජ්‍යෙෂ්ඨ අතවැස්සෝ නම් ශාරිපුත්‍රස්ථවිරයෝය, රකඛිත තාපසයෝ නම් බුදුවූ මම්ම වේදැයි වදාළසේක.

## 440 ඝත ජාතකය

තිවද ශාක්‍ය කුල කල්පදෑමූවූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජෙතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි පුත්‍රයෙකු මළ පියෙකු අරභයා මේ ජාතකය වදාරණ ලදී.

**ඒ කෙසේද? යත්,**

මෙහි වර්තමාන කථාව මව්වකුණඩලී ජාතකයෙහි විස්තර වශයෙන් පෙණෙන්නේය, මෙහි වත්‍රාහී පෙර උත්තමයෝත් කී අවවාදයෙහි පුත්‍ර ස්නේහය ඇත්තෝ පවා සෝක සන්හිදුවා උන්නෝ වේදැයි වදාරා ඒ කෙසේ දැයි ආරාධිතවූ සම්බුදුයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

**හේ කෙසේද? යත්**

පිටගියදවස උත්තරාපථයෙහි කංසභොග නම් රට අසිතඤ්ජනනම් නුවර මහාකංසනම් රජ්ජුරු කෙණෙකුන් රාජ්‍යකරණ සමයෙහි රජ්ජුරුවන්ගේ කංසය උපකංසයයි පුත්තු දෙන්නෙක් ඇත්තාහ, දේවගර්භා නම් දියනි කෙණෙක් ඇත්තාහ, ඒ දියනියන් උපන් ගමනේම නැකැත් කියන්නාවූ බමුණෙක් ලක්ෂණ දැක කියන්නාහු මේ කුමාරි නිසා මේ රාජවංශය නස්නේය දැන්ම නසාපුවොත් යහපතැයි කීහ. එවිට රජ්ජුරුවෝ මේ මාගේ දුවනියන් රාජ්‍යයට පැමිණිකල නසතත් වවතත් උඹම දනිති මම නොදනිමි ස්නෙහයෙන් ඒකසථම්භ මාලිගාවක් කරවා අඩිකාවෙතහු නම් කොල්ලා නන්ද ගෝපා නම් කෙල්ල හා දෙන්නා අත්පා මෙහෙකරන්ට සැලැස්වූහ, එවිට කල්යාමිකින් මහාකංස රජ්ජුරුවෝ මළහ. උන්ගේ වැඩිමහළු පුත්‍රවූ කංස නම් කුමාරයෝ රාජ්‍යයට පැමිණ තමන්ගේ මලනුවන් යුවරජ තනතුරෙහි තබා පළමු බ්‍රාහ්මණයන් නැගනියන් නිසා රාජවංශය නසති කිවා දැන දැනෙත් නැගනියන් කෙරෙහි ස්නෙහයෙන් නොනැසූහ. ඉක්බිති උත්තර මධුරා නම් නුවර මහාසාගර නම් රජ්ජුරුවෝ රාජ්‍යය කරණසමයෙහි ඒ රජ්ජුරුවන්ගේ සාගරය උපසාගරයයි දරුවෝ දෙදෙනෙක් ඇත්තාහ, මහාසාගර නම් රජ්ජුරුවන් මළපසු සාගරනම් කුමාරයෝ රාජ්‍යයට පැමිණි තමන් මළනුවන් උපසාගරනම් රාජකුමාරයන්ට යුවරජ තනතුරු පැමිණ උපසාගරනම් කුමාරයෝ තමන්ගේ බෑනන් වහන්සේගේ අන්තඃපුරයට වැරද ගියාහ. සාගර නම් රජ්ජුරුවෝ තමන්ගේ අන්තඃපුරයට මලනුවන් වැරදී ගිය ගමනේ ලුහුබඳවා ගත්හ, උපසාගර කුමාරයෝ අසිතඤ්ජනනම් නුවරට ගොසින් ඒකසථම්භ මාලිගාව දැක මේ කාගේ මාලිගාවෙක්දැයි විචාළ ගමනේ දේවගර්භා නම් බිසවුන් විසින් ඉඳිනා එක මාලිගාවයයි අසා තම ඇසූ පමණෙම්ම ප්‍රතිබද්ධවූ සිත් ඇති තන්දගෝපාල නම් කෙල්ල සම්පයට ගොස් කථාකොට බිසවුන් පොල ඔවා ගත්තාහ. රාජකුමාරයෝ දේවගර්භානම් බිසවුන් හා ප්‍රතිබද්ධව එක් උනා යෙන් දරගර්භයෙක් ඇතිවිය. එපවත් රජ්ජුරුවන් හා යුව රජ්ජුරුවෝ අසා නැගනියන් කෙරේ ස්නේහයෙන් උන්ට උත්තර නොකියා පිරිමිපුතෙක් උපනීනම් මරම්හ ගැනුදුවක්වීනම් නොනසන්වයයි උපසාගර කුමාරයන්ට සෙනෙවිරත් බ්‍රහ්මදී තමන්ට සේවාකම් කරන්ට සලස්වා නැගනියන් උන්ට පවා දුන්නාහ. දේවගර්භානම් බිසව් නොබෝකලකින් දුවනි කෙණෙකුන්

වැදුණ. රජ්ජුරුවෝ දෙන්න අසා සමාධිව අංජන දේවියයි තමකුත් තබා ගෝවඩින තම් තමකුත් දුන්න. ඉක්බිති බිසවුන්ගේ ගර්භයක් ඇතිවිය, තන්දනෝපාල නම් කෙල්ලගේ බඩත් දරුගර්භයත් ඇතිවිය, දෑසුකඹමය කින් රාජකුමාර කෙණකුත් වැදුන, තන්දනොපාල නම් කෙලිත් දියනි කෙණෙකුත් වැදුන, ඒ බිසවු එවිට තමත් වැදූ පුතනුවන් රජදරුවෝ දෙදෙන ගෙණ නෑයාපියනි සිතා තන්දගෝපාල නම් කෙල්ල වැදූ දුවනියන් තමන් ලඟ ලාගෙණ තමා වැදූ රාජකුමාරයන් කෙල්ල ලඟලා ගත්ත මේ නියාගෙන් බිසව් රාජකුමාරයන් දසදෙනෙකු වද, කෙල්ල ලඟලා වැඩුන. කෙල්ල වැදූ දූන් දසදෙනා තමන් ලඟ ලා වැඩුන. එකියන රාජකුමාරයන් දසදෙනාගෙන් පළමුවන කුමාරයෝ වාසුදේවය, බලදේවය, චන්ද්‍රදේවය, සූයීදේවය, යඥදේවය, වරුණදේවය, අර්ජුනදේවය, පර්ජුනය, ඝතපණ්ඩිතය, අංකුරයයි යන රාජකුමාරවරු දසදෙන වැඩිවිය පැමිණ නුවර කොල්ල කාගෙණ ඇවිදිනාහ. රජ්ජුරුවෝ එපවත් අසා කෙල්ල ගෙන්වා තොපගේ දරුවන් දසදෙනා නුවර කොල්ලකාගෙණ ඇවිදිති තොපගේ දරුවන් ඉක්මවා ගණුවයි කීහ. කෙළි කීප මුරයක් අවවාද කිවත් නොහික්ම නොයෙක් අලාභ කරත්නාහ, රජ්ජුරුවෝ නන්ද ගෝපල නම් කෙල්ල දෙවෙනිවර ගෙන්වා තොපගේ දරුවන් හික්මවාගණුවයි කීකල්හි එවිට කෙළි ජීවිතදානය ඉල්වාගෙණ කියන්නී මා වැදූ දසදෙන බිසවුන් වහන්සේ ලඟය, උන්වහන්සේ දසබෑ රාජකුමාරයන් වහන්සේ මේ මොලකම් කොට ගෙණ ඇවිදිනාසේකැයි කෙළි කිව, රජදරුවෝ දෙදෙන හයින් ත්‍රස්තව අමාත්‍යවරුන් ගෙන්වා එලඹ දසබෑ රාජකුමාරවරු එක්ව, අලොහල කෙරෙති කවර උපායකින්වත් උන් හැම මරන්ට උවමැනවයි රජ්ජුරුවෝ කීහ. එවිට අමාත්‍යවරු කියන්නා රජ්ජුරුවන් වහන්ස! අන්මානෙක ඇල්ලිය නොහැක්ක දසබෑ රාජකුමාරවරුන් වහන්සේ මල්ලවයෙහි දක්ෂයෝය, එසේ හෙයින් මල්ලව බලම්හයි කියා අතුළට ගෙන්වාගෙණ අල්වා මරතොත් විනා බැරියයි කීහ, රජ්ජුරුවෝ අකඩයෙ කණය අද්දවා ධජපතාකත් බඳවා අකඩය සරසා දසබෑ රාජකුමාරයන්ට මල්ලව අල්වන්ට එවයි කියා යැවූහ, රාජකුමාරවරුත් යහපතැයි විටියට ගොසින් ඒ ඒ වණී පිළි ඇඳගෙණ වැපාර විටියෙන් සිලිදු සුවඳ ආදීවූ දෙය ලවාගෙණ මාලාකාරයන් සම්පයට ගොසින් මල්වට ආදීවූ දෙය උදුරා පැලඳගෙණ අත්පොලසන් දෙමින් ඔල්වරහඬගසමින් අවුත් අකඩයට වැද බලදේවයෝ අත්පොලසන්දී කෙකී මල්ලන්වා නුවර මල්ලන්වා සිටියාය, මුට මාගේ අතින් අල්වා එලම්දැයි සිතා ඇත්හලව ගොසින් ඇතුන් බඳිනා කඹයක් ගෙණවුත් කඹය අල්වා දමා ඉඟබැඳ මඬ්‍යයෙන් බැඳ ලනුව දෙපිල අල්වා ගලවීතක් කරකවන්නාසේ ඉසවට සිසාරා පොළොව අපුලා කණයමින් එපිට දැමුගඹනේ වාතරමල්ලව ජීවිතක්ෂයට පැමිණියේය. දෙවෙනිව මුෂ්ටි මල්ලව අවුත් අත්පොලසන් දෙමින් බල දේව යන් හා කැටිව ගාඩට සිටි ගමනේ එවිට බාලදේවයෝ මුෂ්ටි මල්ලවයා අල්වා ගෙණ ඒ ඒ තැනඇවි සුණුවිසුණු කෙරෙමින් අල්වන ගමනේ මම මල්ලවයෙක් නොවෙමි කියදී තා මල්ලව වේවයි තොවේවයි කියමින් සුණුවිසුණු කරණ ගමනේ ප්‍රාණය යන අවසථාවේ මුෂ්ටි මල්ලවයා ප්‍රාර්ථනා කරන්නේ මු උපන් යම්ම ජාතියක තසම්මැයි වෛරබැඳ ජීවිතක්ෂයට පැමිණ කාලමත්ති නම් වනයෙහි යක්ෂව ඉපද හිඳේය, එවිව කාසතම් රජ්ජුරුවෝ මුන් දසබැයන් මල්ලවයන් ලවා මරාගත නුහුනුම්හයි යම් උපායකින් මරවම්යි අමාත්‍යයන්ව

විධානය කළහ වාසුදෙව තම් රාජකුමාරයෝ තමන් අත පාරාවලල්ලෙන් ගැසූ ගමනේ කන්‍යතම් රජ්ජුරුවන් හා උපකාර තම් යුව රජ්ජුරුවන් හා දෙදෙනාගේ ඉස්දෙක පාරාවලල්ලෙන්ම කැපී ජීවිතක්ෂයට පැමිණියේ. නුවරවාසී හසින් ත්‍රස්තවූහ, භය නොගණුවයි කීවා අස්වසා රාජ්‍යයට හිමිව එයින් නික්ම අයෝධ්‍යපුරයට වැද කාලසේන තම් රජ්ජුරුවන් ජීවිතක්ෂයට පමුණුවා ඒ නුවරත් ඇරගෙණ එයින් නික්ම සේනාවත් ඇරගෙණ වාරවති නුවර ගන්ට ගියාහ. ඒ නුවර එක් දිසාවෙක ගංගාවය, එක් දිසාවෙක පර්වතය, එක් දිසාවෙක සමුද්‍රය, ඒ නුවරහන්ට යම් සතුරු කෙණෙක් අවුතම් ඒ නුවර පවුරපිට යක්ෂණියෙක් සිට කොවළුවේෂයෙන් අඩලූ ගමනේම නුවරත් පැහිර ආකාශයට හෝ පැනනැඹී සමුද්‍රමධ්‍යයෙහි හෝ ගොසින් සිටිනේය. එසේහෙයින් සතුරු කෙණෙකුත් විසින් ඒ නුවර ගත නොහැක්කැයි කිපමුවරගෙක උත්සාහ කොට වාරවති නුවර අරගතනොහී පලාගොස් එපවත් කාණ්ඩදීපයන තාපසයන්ට කීහ. එවිට තාපසයෝ ඒ නුවර ඇරගන්ට උපාය පරීක්ෂා කොට කී ගමනේ යහපතැයි කියා දසබෑයෝ හොසින් කොවළුවාට කියන්නාහු තොපි නොහඬව මේ නුවර ඇරගන්ටයයි කීහ. කොටළු කියන්නේ මා නොහඬන්ව බැරිය, මම උපායක් කියාලම් මිනිස් පමණක් උස යානාරාසන සත රක් ඉදිකරවා වාසල් සතරේ පිවත බිම ඉඳුවා එලිපතුවල කඹලාලා බඳවන්නාව නුවර නොයෙයි මේ නියාවට නුවර ඇරගනුවයි කීහ. යහපතැයි දසබෑ රජ්ජුරුවෝ මේ නියාවට සලස්වා නුවර ඇරගෙණ ඒ නුවර ඉඳ තෙසැට දුසක් රාජධානි සාදා දසබෑයෝ දස කොටසක් බෙදා රාජ්‍යය කරන්නාහු ඒ අවධියෙහි මනුෂ්‍යයන්ට විසිදුසක් අවුරුද්දට ආයුෂ ඇතිවිය. දැනමෙන් සෙමන් රාජ්‍යය කරණ සමයෙහි අපගේ බුනුනනියන් වහන්සේට කොටසක් දුන්නේ නැත. උන්වත් කොටසක් දෙන්ට උවමැනවැයි කියා එකොළොස් කොටසක් කොට බෙදා දෙම්හයි කීහ, එවිට බාල අංකුර රජ්ජුරුවෝ කියන්නාහු මාගේ කොටස දෙමි. නුඹවහන්සේලාගේ රාජ්‍යයේ වෙළඳුම් ආදීවූ දෙයෙක් කොට රැකෙමි සුංගම් විවරක් ඇරෙන්නා පමණකැයි කියා අරවා ගෙණ ඒ නියාවට සලස්වා තමන්ගේ බෙත්මරට අංජනදේවීන්ට සලස්වා අංකුරරජ වෙළඳුමෙන් වැඩෙයි වැඩිමළු වාසුදේව රජහුගේ කුමාර කෙණෙක් මළහ. උන් මළ සෝකයෙන් නොකා නොබී මහත්වූ සෝකයෙන් ඉඳිනාහ. සන්හිඳුවාලන කෙණෙක් නැතිහෙයින් ෂත නම් පණ්ඩිතයෝ ඒ සෝක සන්හිඳුවමි සිතා තුමූ අපස්මාර උනු කෙණෙකුන් මෙන් වියරුවෙස් ගෙණ ආකාශය බලා මට සාවෙකු දෙන්ට කිය කියා මූරගානේය, එවිට රොහිනී නම් අමාත්‍යයා වාසුදේව නම් රජ්ජුරුවන් සමීපයට ගොස් කියන්නේ රජ්ජුරුවන් වහන්ස! නුඹ වහන්සේගේ මලනුවෝ වියරුවැටී ඒ ඒ තැන වීපියේ ඇවිදිනි කීශේය. එපවත් රජ්ජුරුවෝ අසා එවිට පුත්‍රසෝකය හැරී මාගේ මලනුවෝ කොයිදැයි කියා වීපියෙහි ඒ ඒ තැන ඇවිදිනි දැක සිපගෙණ කියන්නාහු මලනුවෙනි තොපි කෙසේවූ සාවෙකුද තොපි වියරුවැටී සාවෙකු දෙවයි කියන්නේ රත්රණින් රිදීයෙන් මුත්තෙන් මැණිකෙන් යකඩින් තඹකඩින් පබළුවෙන් සාවෙකුද නොගොත් බැද්දේ ඉඳිනා සාවෙකු දෙන්ටයයිකියා වාසුදේව රජ්ජුරුවෝ විවාළහ. එවිට බොධිසත්ත්වයෝ කියන්නාහු මම එසේවූ සාවෙකුට බැද්දේ ඉඳිනා සාවෙකුට වියරුහුනුයෙම් නොවෙමියි; චන්ද්‍රයා මධ්‍ය

යෙහි තිබෙන සාවාටය උත්සාහ කරන්නේයයි කීහ. එපවත් රජ්ජුරුවෝ අසා මුස් වියරුවැටුනේ සැබවි ජීවිතය නුමුත් අරගත නොහැකි සාවාට මුන් උත්සාහකොට වියරු වැටුනේ සැබැවයි සිතා කියන්නාහු මලනුවෙනි තොපි නුවණැති තැනැත්තන් මෙසේ කියන් කවර නියාද කෙසේ තෙපි කීවත් වන්දුයා මඩයේ තුබූ සාවා ඇරගත නොහැක්කැයි කීය. ඝත පණ්ඩිතයෝ කියන්නාහු රජ්ජුරුවන් වහන්ස! පෙණෙන්නාවූ වන්දුයා මඩයේ තුබූ සාවා ඇරගත නියාවට දෙස් නුඹවහන්සේට කීසේක්වේද එසේකල පෙණෙන සාවා ඇරගත නොහැකිකල නුඹවහන්සේගේ මලාවූ පුතනුවෝ කෙසේ එද්දැයි උන්නිසා නොකා නොබී සෝකයෙන් ඉන්ට කාරණා කවරේදැයි කීහ. එබස් අසා වාසුදේව රජ්ජුරුවෝ එසේද කීසේක්වේද මලනුවෙනි මාගේ පුත්‍ර ශොකය අරවන නිසා මේ වියරුවෙස්ගෙණ කළ උපාශද මාගේ පුත්‍රශොකය නමැති වස්තිය බොනෝ තෙල්කළ වත්කොට ඇවිලෙන ගින්නට පැන්කළ දහස්ගණන් එත්කොට නිවූවාසේ නිවීගියේය. මාගේ පුත්‍රශොකය නැමති සල්ලය මාගේ හෘදයේ වැදගත් හළතියාව ඉතා යහපතැයි මේතැන් පටන් මාගේ පුත්‍රශොකය අරිමිකියා එතැන් පටන් සෝක නොකොට ඝත පණ්ඩිත යන් කී අවවාද සිත තබාගෙණ රාජ්ජය කරන්නාහ. එසමයෙහි දසබැ රජ් ජුරුවන්ගේ රාජකුමාරවරු එක්ව කෙළිනාහු උනුත් හා කථාකොට කණ්ඨ දීපායන තාපසයන් වහන්සේ දිවැස් ඇතිසේකැයි කියා අසන්නේය. ඒ අපට පරීක්ෂාකරන්ට උවමැනවැයි ඉන්ම රූ ඇති රාජකුමාරකෙණෙකුන් ස්ත්‍රී පල ඳනා සරහා බඩපිරිමැද දැරි ඇති නියාවට සලස්වාගෙණ ගොසින් කියන්නාහු තාපසයන් වහන්ස නුඹවහන්සේ දිවැස් ඇතැයිකියා අසන්නේය, මේ කුමාරී කාව දැරිඇතිය මුන්ගේ බඩදරුවෝ පිරිමිද ගැනුදැයි විවාළේය, එවිට තාපස යෝද මුන්ගේ බඩ කිහිරි ගැටයක් ඇතිව උන්ගේ බඹුන් වැටෙයි දැන රාජ කුමාරවරුන්ට කියන්නාහු මුන්ගේ බඩ ගැනුදරුවන්කිම් පිරිමිදරුවන් කිම් තොපට ඇයි දැයි තාපසයෝ කීහ. එවිට රාජකුමාරවරු අපට තත්වූ පරිද් දෙන් කියන්ට උවමැනවයි කියන්නාහු තමන්ට මරණ කවරදැ, පැමිණේදැයි පරීක්ෂා කළාහු එමද, පැමිණෙන නියාව දැක එසේවිනම් තත්වූ පරිද්දෙන් කියම් සිතා මුන්ගේ බඩ කිහිරි ගැටයක් ඇත, ඒ කිහිරි ගැටය සත්දවසකින් වදනි ඒ වැදූකල මුන්ගේ රාජවංශයට විනාශය පැමිණෙයි ඒ කිහිරි ගැටය වනලා කොටා ධූලි කොට දවා අළුකොට දියෙහිලා පියවයි තාපසයෝ කීහ, එවිට කුමාරවරු මේ තාපසයෝ මහාකුට තාපසයෝය, පිරිමින් දරුවන් වදද්දැයි කියා අතින් පයින් තළාමැරුහ, එවිට දසබැ රජ්ජුරුවෝ තාපසයන් මැරූ නියාව අසා හයින් ත්‍රස්තව රාජකුමාරවරුන් ගෙන්වා විවාළ ගමනේ තාපසයන් කී නියාව තත්වූ පරිද්දෙන් කීහ, රජ්ජුරුවෝ එපවත් අසා රාජ කුමාර වරුන්ට රැකවල්ලවා උන්කලට සත්වෙනි දවසින් ඒ රාජකුමාර කිහිරිගැටය වැදූහ, රජ්ජුරුවෝ ඒ කිහිරිගැටය වතලා කොටා දවා අළුකොට ගඟට දැමූහ. ඒ දැමූ අළු ගඟ අහලින් ගොස් එක් ගල්හස්සෙක සුඟක් වැලි මුසුව රැඳී ගියේය. එතන බේරු පදුරෙක් ඇතිවූහ, රාජකුමාරවරු කොබෝ දවසකින් ගඟට දියකෙළියට ගියාහු දියකෙළිමින් සිට උනුන් හා බඹරක් වී ඒ බඹර මහත්විය, ඒ බඹර රජදරුවෝ එක්ව ගියාහ, ඒ රාජකුමාරවරුන් ගෙන් එක්කෙණෙක් ගඟ අසල තුබූ බේරු පදුර දැක බේරු පදුරෙන් දඬක් කඩාගත්හ. ඒ කැඩූ බේරු පදුර කිහිරිදණ්ඩවිය, ඒ ඇරගෙණ ගැසූහ.

සෙසු රජදරුවෝත් ඒ බේරු පදුරෙන් අතුකඩා ගෙණත් කිහිරිදඬුවිය, පත්‍ර කඩාගත්තත් කිහිරි දඬුවිය, මේ නියායෙන් කිහිරි දඬුගෙණ උනුත් මර ජීවිතක්ෂයට පැමිණුවූන, ඉත් ගැලවුනාවූ වාසුදෙව රජ්ජුරුවෝය, බලදේවයය, අඤ්ඤතදේවියය, පුරෝහිත බ්‍රාහ්මණයාය, යන මේ සතරදෙන රථයකට නැගී නුවර අතික් තැනකට යන්නාහු කාලමත්ති නම් වනයට පැමිණියාහ. බල දේවයන් හා මල්ලව අල්වා මළාවූ මුෂ්ටි නම් මල්ලයාෘ ඒ වනයෙහි රාක්ෂයව උපන්නේය. මාගේ සතුරා කවර දවසෙක මරම්දෝනෝයි සිත සිතා උන් තෙනව වාසුදේව රජ්ජුරුවන් නැගී රථය පැමිණියේය. මුෂ්ට මල්ලව බල දේවයන් දැක මල්ලව වේෂයෙන් අවුත් අත්පොලසන්දී මල්ලවයාට සිටියේය. බලදේවයෝ ඔහු දැක මල්ලව අල්වමි රථයෙන් බස්නට වන්කල වාසුදේව රජ්ජුරුවෝ මල්ලව නොඅල්වයි වළක්ව වළක්වා කියදින් නොවැළක මල්ලව අල්ලන්ට බැසපු කලට රාක්ෂයා බලදේවයන් අල්වාගෙණ උණකිළිල්ලක්සේ සපාකාපිය, වාසුදේව රජ්ජුරුවන් හා අඤ්ඤන දේවීන් හා බ්‍රාහ්මණයා හා තුන් දෙන රථයට නැගී අතික් ගමකට ගොස් රජ්ජුරුවෝ තුබූ බෑදට වැද තුමූ ඉතකඩින් ඉසවසාගෙණ තනය වසාගෙණ අඤ්ඤන දේවීන් හා බමුණාත් බත් පිසගෙණ එන නියායෙන් යවූහ. ඒ ගම් ජරා වැද්දෙක් දඩයම්ව ගිය ගමනේ උෂ්ණෙකාලයි සිතා තෙබින් ඇනිකලට මිනිසෙකු නියාව දැන භයින් නුස්තව දිවන්ව වන්කලට නොයව නොබවයි තමන් ලඟට ගෙන්වාගෙණ තාගේ තම කිම්දැයි විවාළ ගමනේ ජරා නමැයි කීහ, එවිට රජ්ජුරුවෝ කියන් නාහු එම්බල මාගේ ජාතකයෙහිත් ජරා නම් එකෙකු අහින් ඇන්මක් කා මියති කීහ. එසේහෙයින් නොබවයි කියා රඳවාගෙණ උෂ්ණ ලවාම තෙබ අද්දවා බේත් බඳවාගෙණ උන්කලට අඤ්ඤන දේවීන් හා බ්‍රාහ්මණ ආයේය. එවිට රජ් ජුරුවෝ කියන්නාහු මට මරණ මෙතනදී නියමයයි එපවත් කියා තෙපි දෙන්න යම් තැනක ඉඳ රැකෙවයි කියා උන්හැම රක්නා විවරට ශාස්ත්‍රයක් උගන්වා යවා තුමූ එතනම මළහ. එම්බා මහණෙනි මෙතෙක් රජදරුවන් ගෙන් ගැලවුනේ අඤ්ඤන දේවීමය වදුරා මේ ඝත ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි රෝහිනී නම් අමාත්‍ය ආනන්ද ස්ථවිරය, එසමයෙහි වාසු දේව නම් රජ ශාරීපුත්‍රස්ථවිරයෝය, එසමයෙහි ඝත පණ්ඩිතයෝව උපන් නෙම් බුදුවූ ඕම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

---

# දසවෙනි නිපාතය නිමි.

---

## 441
## මාතුපොසක ජාතකය

මේ ජාතකය ජෙතවනාරාම යෙහි වැඩවසන්නාවූ සම්‍යක්ලෙශයන් සම්‍යක්කාරයෙන් නැසුවාවූ සියළු පදාර්ථයන් සර්වඥභාවඥතයෙන් දත් තාවූ සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ විසින් දෙමව්පියන්ට උපස්ථාන කරන්නාවූ එක් ඉඤ්ඤණකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලදී.

මෙහි වර්තමාන කථාව සාමජාතකයෙහි විස්තර වශයෙන් කියනලද එපරිද්දෙන්ම සම්බුදුරජාණන්වහන්සේ තමන් සමීපයට ඒ මාතුපෝසක භික්ෂූන් වහන්සේ කැඳවාගෙණ ආවාවූ භික්ෂූන්වහන්සේට ආමන්ත්‍රණය කොට වදාරණසේක් එම්බා මහණෙනි ඒ භික්ෂූහට නින්දා නොකරව පුරාතනයෙහි තිරිසන්ව උපන්නාවූ පවා මැනියන්ගෙන් වෙන්වූවාහු සතියක් මුළුල්ලෙහි නිරාහාරව වියලෙන්නාවූ රජදරුවන්ට සුදුසුකොට ඵලවතලද ආහාරය ලැබත් මැනියන් ඇරපියා අනුභව නොකෙරෙමි කියා මැනියන් දැක ගොදුරු කැවෝ වේදැයි වදාරා එක්තරා භික්ෂූකෙණෙකුන්වහන්සේ විසින් ආරාධිතවූ සම්බුදුරජාණන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද? යත්,

පිටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි අප මහබෝසතාණන් හිමාලය වනයෙහි ඇත්කුලයක ඉපද සම්‍ඕඝය ධවලව විශිෂ්ට රූපයක් දරන්නාවූ අසූදහසක් පමණ ඇත්තු නිරන්තරයෙන් පිරිවරන්නාහ. මහබෝසතාණන්ගේ මැනියෝ ඇස් අන්ධවූයේය, එකල බොධිසත්ත්වයෝ මිහිරිවූ පලාපල ඇතුන් අතට කඩා දී මැනියන් සමීපයට යවන්නාහු ගෙණයන්නාවූ ඇත්තු තුම්බු තුම්බම අනුභව කොටපියා ගෙණනොස් නොදෙන්නාහ. ඒ මහබෝසතාණෝ පරීක්ෂා කොට ඒ බව දැන ඇත්සමූහයා ඈර මාගේ මැනියන් මම්ම පෝෂ්‍යය කෙරෙමි කියා රාත්‍රියෙහි සෙසු ඇතුන්ට නොහඟවා මැනියන් කැඳවාගෙණ චන්ඩෝරතම් පර්වතපාදයට ගොස් එතන ඝුණපදුරක් සමීපයෙහි පිහිටියාවූ ගල්ගුහාවෙක මැනියන් රඳවා නිරන්තරයෙන් පලාපල ගෙණවුත් පෝෂ්‍යය කරන්නාහ. එකල බරණැස්නුවර වසන්නාවූ වැදිපුත්‍රයෙක් වලව වැද මංමුළාවූයේය. දික්නියමයක්කොට නොනෙන්නේ මහහඬින් හැඬුයේය. මහබෝසතාණෝ ඔහු ඇඬූ අඬ අසා මේ පුරුෂතෙම අනාථයකින් මාවැනි එකෙකු විද්‍යමානව සිටියදී මියගියේවිනම් සුදුසු නොවන්නේයයි ඔහු කරා ගොස් තමන් දැක භයගෙණ යන්නාවුට එම්බල පුරුෂය මා නිසා තව භයක් නැත්තේයයි ඔහු රඳවා තෝ මේ වනයෙහි කුමක් පිණිස අඬා ඇවිදිදැයි විවාරා ඔහු විසින් සාමීනි මංමුළාවූයේ අදට සතියෙකැයි කීකල්හි මහබෝසතාණෝ එම්බල පුරුෂය, නොපව භයෙක් නොකොට ගෙණ ගොස් මනුෂ්‍යපථයෙහි පිහිටුවාලම් කියා ඒ මිනිසා පිටට නංවාගෙණ වලින් මඟට බාවා මහාබෝසතාණෝ නැවත වල්වන්නාහ. පාපිවූ ඒ පුරුෂයාද මම නුව රට ගියකල්හි රජ්ජුරුවන්ට කියම් සිතා තමා යන්නාවූ මහවෘක්ෂයන් හා පර්වත සලකුණු පරීක්ෂාකොට ගෙණ ගියේය. එකල බරණැස් රජ්ජුරුවන්ගේ මගුලැතා වැටුනේය. රජ්ජුරුවෝද ඒ දවස් නුවර බෙර ලවන්නාහු ඉදින් යම් කෙණෙක් කොහෙනක මගුලැත්තාට සුදුසු ඇතකු දුටුවා වීනම් කියවයි නුවර බෙරලැවූහ. එසඳ ඒ පුරුෂතෙම රජ්ජුරුවන්කරා ගොස් දේවයන්වහන්ස නුඹවහන්සේව ආරෝහනයට නිසි සම්‍ඕඝ ධවලවූ ඇත්රජෙක් මා විසින් දක්නාලදැ, ඔහු ලඟට මම මඟ කියම් මා හා කැවිව ඇතරුවන් එවා ගෙන්වාගත මැනවයි කීය. රජ්ජුරුවෝ යහපතැයි ඔහු හා කැවිව ඇතරුවන් යැවූහ. ගියාවූ ඇතරුවෝ ඔහු සමඟ ගොස් බොධිසත්ත්ව යන් විසින් පියුම් වලව ගොස් ගොදුරු අනුභව රන්නවුන් දුටහ.

බොධිසත්ත්වයෝද ඇතරුවන් දැක මව මේ උපන්නාවූ හය අනික් කෙණෙකුන් නිසා උපන්නේ නොවෙයි මා විසින් මනුෂ්‍යපථයට පමුණුවා සංග්‍රහ කරණලද පුරුෂයා සම්පයෙන් උපන්නේය, මම වතාහි හස්තීන් දහසක් දෙනා බිඳුවාපියන තරම් මහ බල ඇත්තෙමි ඉදින් මම කිපියෙක්වීම්තම් බලවාහන සහිතවූ සියළු රාජ්‍යය නසාපියන්ට සමර්ථයෙමි. එසේම කිපියෙන් වීම්තම් මා විසින් රක්ෂාකරණලද ශීලය බිඳෙන්නේය. එසේ හෙයින් මේ සත්වයෝ අද මට ශස්ත්‍ර අඩයටිවලින් කොටන්නමුත් නොකිපෙමි සිතා අධිෂ්ඨානකොට ගෙණ කරබා නිශ්චලව සිටියාහ. එකල ඇත රුවෝද පියුම්විලට බැස මහබෝසතාණන්ගේ ලක්ෂණ සමාඩිය දැක මෙසේ එව දරුවනි කියා රිදී දමකට බඳුවූ සොඬ අතින් අල්වාගෙණ නික්ම සත් වෙනි දවස් බරණැස්නුවරට පැමිණියෝය. බොධිසත්ත්වයන්ගේ මැනියෝ පුතනුවන් නොයන හෙයින් මාගේ දරුවන්ගේ රාජ රාජාදී මහා අමාත්‍යයන් විසින් ගෙණයන ලද්දේවන, දැන් මාගේ දරුවන් වියෝගය මේ වන ලැහැබ වැඩෙන්නේයයි කියමින් අඩන්නාහු මෙසේ කියත් මේ දෙමව් පියන්ට උපස්ථාන කරන්නාවූ ඇත් රජ්ජුරුවන්ගේ බැහැරයාමෙන් මේ වන යෙහි හිසලූ කිළිදු කනේරු ආදීවූ අනේකප්‍රකාර පුෂ්පජාතීහු අතු පතු නොකැඩීමෙන් සලෝව වැඩිසිටිනාහ. වනතෙළුම් අලගොඬ මිහමූ කිනිහිරි ආදීවූ වෘක්ෂජාතීහුද අතමූල අතපතරත් නොකැඩීමෙන් මනාව හට ගෙණ මලින් සැදිසිටිනාහුය. යම්බඳුවූ මා පුතනුවන් පිට උන්නාහු රජ යුවරජ ඇමති ආදීවූ අය නිර්ජීතව පසම්තුරන් බිඳ මරා රාජ්‍යය ගන්නාහ. සවණිලඬකාරයෙන් සැරහුනාහු එබඳු රාජ රාජ මහා කුමාරාදීහු තමන්ගේ පරසතුරන් සාධාදුන් හෙයින් සතුටුව රජ්ජුරුවන්ගේ මෙහෙ නිමවතලද රසමසවුලන් යුක්තකොට සමාද්ධකරණලද උතුම් භෝජනයෙන් පෝෂ්‍යය කරන්නේවේදැයි යනාදීන් කියමින් අඩන්නාවූහ. බොධිත්ත්වයන් ගෙණ යන්නාවූ ඇතරුවෝද ඇත්රජ්ජුරුවන් ගෙණෙන නියාව රජ්ජුරුවන්ට කියාසවූහ. රජ්ජුරුවෝද නුවර අලඬකෘතකොට සැරසවූහ. එකල හස්ත්‍යාචාරීහුද මහබෝසතාණන් ගෙණ නුවරට වැද පිරිබඬගෙණ සරහා පිළිගෙල කරණලද ඇත්හලට ගෙණගොස් සිටුවා විසිතුරු තිරබඳවා රජ්ජුරුවන්ට දන්වා යවූහ. රජ්ජුරුවෝද සතුටව තොයෙක් රසයෙන් අග්‍රවූ භෝජනය ගෙන්වා ගෙණගොස් මහබෝසතාණන්ට දෙවූහ. බොධිසත්ත්වයෝද මැනියන් නැතිව ගොදුරු අනුභව නොකරමැයි ආලෝපයකුත් නොගත්තාහ. මෙසේ ගොදුරු අනුභව නොකරන්නාවූ ඇතාණන්ට යාචඤ්ඤ කරන්නාවූ රජ්ජුරුවෝ මෙසේ කියත්. එම්බා ඇත්රජ්ජුරුවෙනි යම් රාජ්‍ය කටයුත්තක් නිසා ගෙන්නුවෝ විනම් එසේවූ තොප විසින් සිඹකරවන රාජකාරිය බොහෝය, එසේහෙයින් තොපගේ ශරීරය දුබල නොකොට ගොදුරු අනුභවකරවයි කීහ. එබඳට බෝධිසත්ත්වයෝ කියන්නාහු රජ්ජුරුවන්වහන්ස මාගේ වියෝගයෙන් බැගෑපත් කිසි පෝෂ්‍යයක් කරණ කෙණෙකුන් නැතිව අඹුහෙයින් වන්ඛෝර නම් පර්වත ප්‍රාන්තයට පැමිණ එතැන්හි උල් පහන් මඬිමින් ඇවිදිනාහු කනේරු ධෙනුවක මෙන් ඒකාන්තයෙන් අඩා ඇවිදිනීය, එසේ හෙයින් මා ගොදුරු අනුභව කරන්නේ නැතැයි කීහ. නැවත රජ්ජුරුවෝ කියන්නාහු එම්බා ඇත්රජ්ජුරුවෙනි එසේ ඇස් අහිමව පෝෂ්‍යය කරත්

තාවූ කිසිකෙණෙකුත් නැතිව වන්ඛෝර නම් පර්වත සමීපයෙහි උල්පහන් මඩිමින් ඇවිදිනාවූ ඇතින්නී නොප කවරෙක්දැයි විමාළාහ. එවිට බොධි සත්ත්වයන්වහන්සේ කියන්නාහු රජ්ජුරුවන්වහන්ස ඇස් අඹව එලෙස ඇවිදින වූ ඇතින්නීනම් මා විසින් ගොදුරු ගෙණවිත් ලා පෝෂ්‍යය කරණලද මාගේ මැනියෝයයි කීහ. එබස් ඇසූ රජ්ජුරුවෝ අමාත්‍යයන්ට කියන්නාහු එම්බා ඇස් අඹවූ මැනියන් පෝෂ්‍යකරම්යි මා විසින් පෝෂ්‍යය කරණලද ඒ මාගේ මැනියන් ගොදුරු නොලත්තේ අදින් සත් දවසය, එසේවූ ගොදුරු නොලබන්නාවූ මාගේ මැනියන් වියලී මියන්නාහුය, උන්මළදී ගොදුරු අනුභවකරන්නේ නැතැයි කියනලද මෙම ඇතාන කෙණෙක් ඇද්ද උන් වහා මුදා ඇරපියව ඒ ඇත් රජතෙමෙත් තමාගේ මැනියන් හා අවශෙෂ බන්ධුන්නාද එක්ව සතුටුව සැපසේ යෙමියි කියා බඹනයෙන් මුදාපුව. ඒ බඹනයෙන් මිදුනාවූ ඇත් රජ්ජුරුවෝද මදක් සැතපීගෙණ රජ්ජුරුවන්ට දසරාජධර්මයෙන් බණ කියා අවවාදකොට මහජනයා විසින් ගඳමල් ආදියෙන් පූජාකරමින් සිටියදී නුවරින් පිටත්ව එදවස්ම පියුමු විලට ගොස් මාගේ මැනියන් ගොදුරු අනුභවකරවා විතා මම ගොදුරු නොගණිමි බොනෝ තෙළුම් මල් ඇරගෙණ ගොස් ගල්ලෙනින් පිටත්ව දෙරකඩ සමීපයෙන් උන් මැනියන් සමීපයට ගොස් නිරාහාරයෙන් වියලී ගිය ශරීරයට ස්නෙහ පිණිස ඉස්මුදුනේ පැන් සැලීහ. එකල මහබෝසතාණන් ගේ මැනියෝ වැසිවසිනි යන සිනින් කියන්නාහු යම් බදුවූ මට පෝෂ්‍යය කරන්නාවූ මා වදුගත් මාගේ පුතානුවෝ අතියන්ව ගියහ. එසේහෙයින් සෝකකරම්. මා සමීපයෙහි දුෂ්ටවූ අනාචාරයකි සවරූප ඇති කෙසේවූ නොකල් වැස්සෙක්ද වසිනේයයි යනාදීන් ආක්‍රෝශ කළාහ. එකල මහබෝසතාණෝ අස්වසන්නාවූ මැනියෙනි වැදූරට වාසිවූ යස පිරිවර ඇති ඒ කසි රජ්ජුරුවන්ගෙන් මිදිනිම් මම නුඹවහන්සේගේ පුතානුවෙම් ආයෙම් එසේහෙයින් නැගී සිටිමින් කිමෙක්ද ගොදුරු අනුභව කරන්නැයි කීහ. එකල බොධි සත්වයන්ගේ මැනියෝ රජ්ජුරුවන්ට අනුමෙවෙනි කරන්නාහු යම්සේ මට නිරන්තරයෙන් වැඩපසස්නාවූ මාගේ පුතානුවන් කසීරට වැඩපසස්නාවූ යම් රජ්ජුරුකෙණෙක් මුදවා අරවාපුද ඒ රජ්ජුරුවෝ බොහෝකලක් ජීවත් වෙත්වයි කියමින් ස්තුති කළාහ. රජ්ජුරුවෝද බොධිසත්ත්වයන්ගේ ගුණයෙහි පැහැද පියුම්විල සමීපයෙහි ගමක් කරවා මහබෝසතාණන් හා මැනියන්ට නිරන්තරයෙන් වෑතනි නිබූහ. ඉන් මැතභාගයෙහි බොධිසත්ත්වයන්ගේ මැනියන් කළුරිය කළකල්හි මහබෝසතාණෝ ශරීරය ආදාහන කෘත්‍යයකොට ක්‍රන්ත නම් ආශ්‍රම පදයට ගියාහ. ඒ ස්ථානයෙහි පන්සියයක් පමණ තපස්වීවරයෝ හිමාලයෙන් අවුත් වන්නාහු බොධිසත්ත්වයන්ට ලැවූ වෘතනිය ඒ තාපසවරුන්ට සැලැස්වූහ. රජ්ජුරුවෝ මහබෝසතාණන්ගේ රූපය හා සමාන රුවක් ගලින් කරවා නිරන්තරයෙන් මහත්වූ සත්කාර පවත්වන්නාහ. ජම්බුදීපවාසීවූ අවුරුද්දක් පාසා හත්තිපුරතම් පූජාවක් කරන්නාහ. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදුරා චතුස්සත්‍යය ප්‍රකාශකොට මේ මාතුපෝසක ජාතකය

නිමවා වදාළසේක. චතුස්සත්‍යයාගේ කෙළවර මාතුපෝසක භික්ෂූන් වහන්සේ සෝවත්ඵලයෙහි පිහිටිසේක. එකල රජ්ජුරුවෝ තම් ආනන්ද ස්ථවිරයෝය, එදවස් ඇතිනී තම් දැන් මේ මහමායා දේවිය, එදවස් මැති යන්ව උපස්ථාන කළ ඇතාතෝ තම් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේකි.

---

## 442 පුණ්ණ ජාතකය

තිවද මේ ජාතකය ජේතවනාරාමයෙහි වසන්නාවූ බුදුරජානන් වහන්සේ විසින් අනද සාමීන් විසින් ලබනලද වර අවක් අරභයා මේ ජාතකය දක්වන ලද.

**ඒ කෙසේද? යත්,**

සම්බුදුවන්වහන්සේට බුදුවූ විසිඅවුරුදු චතුරු නිරන්තරයෙන් නියම උපස්ථානකරන්නාවූ එකද භික්ෂුකෙණෙකුන් වහන්සේයයි නැත. සමහර දවසක් නාඉමාලනම් තෙරුන්වහන්සේ නියමයක් නැතිව උපස්ථාන කරණසේක. එක්දවසක් සම්බුදුවන්වහන්සේ භික්ෂූන්වහන්සේ සමීපයට කැඳවා වදාරණසේක් එම්බා මහණෙනි මම දැන් වයෙවෘඩයෙමි සමහර භික්ෂුකෙණෙක් මා හා සමග යම්න්සිට මේ මගින් යම්හයි කීවොත් ඔහු අන් මගකින් යන්නාහ, සමහර කෙණෙක් මාගේ පාසිවුරු බිමට දමාපියා යන්නාහ, එසේ හෙයින් මම නිරන්තරයෙන් උපස්ථාන කරන්නාවූ එක් භික්ෂුකෙණෙකුන් නියමදනුවයි වදාළසේක. එසේකල මම උපස්ථාන කෙරෙමි දැහොත් මුදුනේ බැඳ සිටියාවූ සැරිසුත්සාම් ආදිකොට ඇති භික්ෂූන්වහන්සේලාට වදාරණසේක් එම්බා තොප තොපගේ ප්‍රාර්ථනා මුදුන්පැමිණියේයයි වළකා වදාළසේක. නැවත භික්ෂූන්වහන්සේ එක්ව අනදසාමීන්ව ඇවැත්නි තෙපි උපස්ථානකරන්නාවූ ඨානාන්තරයට යාචඤ්ඤාකරවයි කීසේක. එකල අනද සාමි වදාරණසේක් සවාමීනි බුදුහු ඉඳින් තමන්ලත් සිවුරු මට නොදෙන සේක් වීනම් තමන් ලත් ආහාරයක් මට නොදෙනසේක් වීනම් එක ගද කිළියේ වාසය කළනොදෙනසේක් වීනම් මා කැඳවාගෙණ තමන්වහන්සේට ආරාධනාවට නොවඩනාසේක් වීනම් මට කළ ආරාධනාවට වඩනාසේක් වීනම් ඉදින් දුරුරටවලින් බුදුන් දක්නට අවුත් පැමිණි සත්වයන් ඒ වේලෙහි කැඳවාගෙණ ගොස් දක්නට ලැබේනම් යම්කලෙක්හි මට සැකයෙක් උපනී නම් ඒ වේලෙහි මම බුදුන්කරා යන්ට අවසර ලැබේනම් බුදුහු ඉඳින්මා නොමැදයේ බණවදාළසේක් වීනම් ඒ බණ අවුදින් මට වදාරණසේක් වීනම් එවිට මමද බුදුන්ට උපස්ථාන කෙරෙමි, මේ ප්‍රතිඤ්ඤප වරසතරක්ද යාචඤ්ඤ වරසතරක්දැයි වරඅටක් ඉල්වූසේක. බුදුහු වරඅට දෙවා වදාළසේක. එදවස් පටන් අනදසාමි පස්වීසි අවුරුද්දක් බුදුන්ව නිරන්තරයෙන් උපස්ථාන කළසේක. මේ අනදසාමි පඤ්චසථානයකින් ඒතදග්ගපාලියෙහි තිබියයුතු ඨානාන්තරයට පැමිණියේක අඩගසම්පදය, අධිගමසම්පදය, අත්තපරිපුච්ඡා සම්පදය, යෝනි, සොමනස්ස සම්පදය, බුද්ධපණිශ්‍රය සම්පදයයි, මේ සප්තවිධ සම්පදයෙනුත්

යුත්තසේක, සමිඳුයන්වහන්සේගෙන් වර අවක් ලැබ ශාසන තමැති ආකාශයෙහි පැනනැංගාවූ පුන්සඳ මඩලක්මෙන් ප්‍රසිඩව වසනසේක් එකල්හි එක්දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩහුන් භික්ෂූන්වහන්සේ ඔවුන්වහන්සේට ආමන්ත්‍රණයකොට වදාරණසේක් එම්බා ඇවැත්නි බුදුහු ආනන්දස්ථවිරයන්ට වරදීමෙන් සන්තර්පණය කළසේකැයි කියමින් උන් සේක. එකල සමිඳුයන්වහන්සේ ගදකිළියෙහි වැඩහිඳ ඒ බව දිවකණින් අසා තුන්තරාගමනින් දම්සභාමණ්ඩපයට වැඩ බුබාසන මස්තකයෙහි වැඩහිඳ වදාරණසේක් එම්බා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි කිනම් කථාවෙක් තොපට අඩාලවිදැයි විවාරා වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් සවාමිනි නුඹවහන්සේ විසින් නොකියන්ට වදාළ දෙනිස් කථාවෙන් එක්තරා කථාවකින් යුක්තව උනුමෝ නොවම්හ, දැන් මේ ආනන්දස්ථවිරයන් වරලත් නියාව කියා කියා උනුම්හයි කියකල්හි එම්බා මහණෙනි ආනන්දස්ථවිරයන් වරලද්දේ දැන් මතු නොවෙයි. පෙරත් වර ලද්දේවේදැයි වදාරා භික්ෂූන්වහන්සේ අතුරෙන් එක්තරා භික්ෂූ කෙණෙකුත්වහන්සේ විසින් ආරාධිතවූ සමිඳුයන්වහන්සේ විසින් ඉකුත් වත් දක්වා වදාළසේක.

**එම්බා මහණෙනි,**

ඉටවගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි පුරණලද බොධිසම්භාර ඇති අප මහබෝ සතාණෝ බරණැස් රජ්ජුරවන්ට පුත්ව ඉපද ජුන්හ කුමාරයයි මේ නමින් ප්‍රසිඩව තක්ෂලානුවරට ගොස් ශිල්ප උගන්නාහු එක්දවසක් රාත්‍රිභාගයෙහි ආචාරීව වසනපොත්දී තමන්වසන්නාවූ ගෙට වන වනා යන්නාහු එක්තරා බමුණකු ඔත් සිහාගෙණ තමාවසනතෙතට යන්නාහු අන්ධකාරයේ උරයෙන් පැහැර බමුණා හා සමග ඔත් ලබ්බත් බිඳපූහ, බමුණුද වැටී හුනුගේය, බැගැපත් අඬින් ඇඬුගේය, ජුන්හ කුමාරයෝත් ඒහු දැක උණ කෙරේ කරුණායෙන් ආපස්සේ අවුදින් බමුණා අත අල්වා නගාසිටුවා බමුණුද කුමාරයන් එකරුත්ත අල්වාගෙණ එම්බා දරුව තොප විසින් මාගේ භික්ෂානාජතය බිඳපියනලද එසේහෙයින් මාගේ ඔත් මිල දෙවයි කීහ, එබසට ජුන්හ කුමාරයෝ කියන්නාහු එම්බා බමුණාතෙනි දැන් තොපගේ ඔත් දියතොහෙමි මම වතාහි කසී රජ්ජුරුවන්ගේ පුත්වූ ජුන්හ කුමාරයෝය, රාජ්‍යයෙහි පිහිටිකල මා සමීපයට අවුදින් වස්තු ඉල්වා ගණුවයි කීහ. එතනින් පනව ශිල්ප ඉගෙණ නිමවා ආචාරීන් වැඳ සමුගෙණ බරණැස්නුවරට ගොස් පියරජ්ජුරුවන්ට ශිල්ප දක්වූහ. රජ්ජුරුවෝද ජීවත්ව උන්නාවූ මා විසින් මාගේ දරුවෝ දක්නාලද රාජ්‍යශ්‍රීයට පැමිණියහුත් දකිමි සිතා කුමාරයන් රාජාභිෂෙක කළාහ. එකල ජුන්හ රජ්ජුරුවෝයයි මේ නමින් ප්‍රසිඩව දසරාජ ධර්මයෙන් රාජ්ජය කරන්නාහ, බමුණු එපවත් අසා දැන් වනාහි මාගේ ඔත්මිල ගෙණෙම්කියා බරණැස්නුවරට ගොස් රජ්ජුරුවන් සමීපාහරණයෙන් සැරහී නුවර පැදකුණු කොට යන කල්හි දැක එක් උසකට පැනනැඟී අත්තගා ''ජයතු භවං මහාරාජ'' යනාදීන් අයිවීවනයකොට සිටියේයි රජ්ජුරුවෝ ඔහු නොදැකම් නික්මුණාහ, රජ්ජුරුවන් නොබලා නික්මුණු නියාව දුටු බමුණු රජ්ජුරුවන් හා සමග කථා

කරන්ට පටන් ගත්තේය. මෙසේ කියා ජනප්‍රධානවූ රාජෝත්තමයානනී මා කියන්නාවූ බස් ඇසුව මැනව එක් කටයුත්තක් පිණිස මම මෙතනට පැමිණියෙමි. එසේකෙයින් කතරගෙවා ආවාවූ අප වැනි බමුණන් සිටියදී පිටිපාලා යාම සුදුසු නොවෙයි කිව. රජ්ජුරුවෝ ඔනු කීබස් අසා විදුරු අකුස්සගෙණ ඇතු කොටා රදවා බමුණා හා සමග කථාකරන්නාහු මෙසේ කියත්, එඹල බමුණ යම් කටයුත්තක් පිණිස තෝ මා සමීපයට පැමිණියේ විනම් ඒ මට කියවයි මම සිව අසමි, තෝ මා කවර ප්‍රයෝජනයක් පිණිස ප්‍රාර්ථනාකොට සමීපයට ඇවිද, ඒ බැවින් විවාළ මට නොවළහා කියවයි කීහ. එබසට බමුණු කියන්නේ රජ්ජුරුවන්වහන්ස මට ගංවරපසක් දුනමැනව කෙල්ලන් සියයක් දුනමැනව, කිරිදෙනුන් පන්සියයක් දුන මැනව, ගොන් සත්සියයක් දුනමැනව, රත්‍රන් සත්විසිදහසක්ද, නවද කුල යෙන් මා හා අසදෘශ්‍යවූ බිරින්දෑකෙණෙකුන් දුනමැනවයි කීහ. එබසට රජ්ජුරුවෝ කියන්නාහු බමුණ තාගේ හයානකවූ සවරූප ඇති තපසෙක් ඇද්ද නොහොත් විසිතුරු සවභාව ඇති සිතුදෙය සිඹකොට දෙන්නාවූ මන්ත්‍රයක් ඇද්ද, නොහොත් තෝ කීවා සිඹකොට දෙන යක්ෂයෙක් ඇද්ද නොහොත් නොපවසින් මට කරණලද උපකාරයන් සිහිකරවූදැයි විවාළහ. එකල බමුණු කියන්නේ හයානක සවරූප ඇති තපසකුත් මා කෙරෙහි නැත, සිතු සිතුවා සිඹකරදෙන මන්ත්‍රයකුත් නැත, මා කීවා සිඹකොට දෙන යකෙකුත් නැත, නුඹවහන්සේට මා විසින් පෙර කරණ ලද උපකාරයකුත් නොදනිමි, බලුඑකෙක් ඇත්තම් නුඹවහන්සේ හා මා හා පෙර ඔවුනොවුන් හා කරණලද කථා සවරූප මාත්‍රයෙක් ඇතැයි කීහ. නැවත රජ්ජුරුවෝ කියන්නාහු එම්බල බමුණ තාගේ හා මාගේ පළමුවන දැකුමවන්නේය, මීට පළමු තා දන්නේ නැත, එසේ හෙයින් කවර කලෙක තා හා මා හා සංගමයෙක් ඇද්දැයි ඒ කාරණා විවාළාවූ මට කියවයි කීහ. නැවත බමුණු කියන්නේ ගන්ධාර රාජ්‍යයෙහි සිත්කළුවූ තක්සලා නුවරදී රාත්‍රියෙහි ඝනවූ අන්ධකාරයෙහි අපිදෙන්න උරයගැටී ගියම්හ. එකල අපි දෙන්නාම එතනයිට මතු කල්පනා කවයුත්තක් සිහිකළම්හ. අප දෙන්නාගේ මිත්‍රත්වයවයෙක් නම් එපමණෙක්මය, ඊට පසුව පළමු මා දන්නා සවයෙක් නැතැයි කීහ. එකල ඒ රජ්ජුරුවෝ කියන්නාහු එම්බල බමුණ යම්කලෙක්හි සත්පුරුෂ සත්වයන් හා සමග සඛ්‍යතයෙක් විනම් නුවණැත්තෝ ඒ නොනසන්නාහුය. අඥතයන් හා සමග මිත්‍රසන්ථවයෙක් ඇත්තම් වේවයි පළමු කරණලද කෘතෝපකාරයෙක් වේවයි| අඥතයන් විෂයෙහි බොහෝකොට කරණලද්දවූ උපකාරයෙක් ඇත්තමුත් නස්නේය, ඒ එසේමය, අඥතයෝ කෙලෙහිගුණ නොදන්නාවූ සවභාව ඇත්තාහුය, නුවණැත්තාවුන් වනාහි මිත්‍රසන්ථවයෙක් ඇත්තම් වේවයි පළමු කරණලද උපකාරයෙක් ඇත්තේ විනම් නොනස්නේය, එසේහෙයින් නුව ණැත්තෝ සවල්ප මාත්‍රවූ කෘතෝපකාරය නොනසන්නාහු සවභාව ඇත් තාහයි කියා ඔවුන් විසින් ඉල්වනලද වර දුන දෙන්නාහු මෙසේ කියත්. එම්බල බමුණ තව ලක්ෂයක් ලක්ෂයක් නිමන්නාවූ ගම්වර පසක්ද කෙල්ලන් සියයක් දෙමි, දෙනුන් පන්සියයක් දෙමි ගොන් සත්සියයක් දෙමි මැණික් දහසක් දෙමි කුලයෙන් තොප හා සාදෘශ්‍යවූ භාර්‍යාවෝ දෙන් නෙකු දෙමි කියා ඒ සියල්ලම අනුනව දුන්හ. එසේ සම්පත් ලද්දාවූ බමුණු රජ්ජුරුවන්ට ස්තුතිකරන්නේ කසීරට අධිපතිවූ රජ්ජුරුවන්වහන්ස

පැළවිය පවත් පසළොස්වක දකිනාතෙක් තාරකාවන් මඩ්‍යයෙහි පිහිටියාවූ පුන්සඳ මණ්ඩල යම්සේ සම්පූර්ණ වෙද එසේම නුඹවහන්සේ විසින් දෙතලද ගම් වරලත් මමද එපරිද්දෙන් මාගේ මනෝරථය අද මුදුන්පැමිණියෙමි, එනෙයින් තොප හා මා හා අදවූ සඞ්ග්‍රහයක් මෙන් මහත්වූ සත්තොෂයට පැමිණියෙහි, කියා රජ්ජුරුවන්ට ස්තුති කෙළේය. මහබෝසතාණන්ද බමුණාව මහත්වූ යශශ්‍රී දී කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහයිවදුරා සම්බුදුරජාණන්වහන්සේ මේ ජාතක ධර්මදෙශනාව කෙණෙහැර දක්වා වදුරා පූර්වාපර සන්ධිඝළපා මේ ශ්‍රුත්ත ජාතකය නිමවා වදුළසේක. එකල්හි ගම්වර ලද්දාවූ බමුණාණෝ තම් දැන් මේ ආනන්ද සථවිරයෝය, එකල්හි ඒවාදුන් රජ්ජුරුවෝ තම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදුළසේක.

---

## 443 ධම්ම ජාතකය

මේ ජාතකය ජෙතවනාරාමයෙහි වසන්නාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ දෙවිදත්මහතෙරුන්වහන්සේ පොළොව පලායාම් අරභයා වදුරණලද.

**හේ කෙසේද? යත්**

එක්දවසක් දම්සභා මණ්ඩපයෙහි රැස්ව වැඩ උන්නාවූ භික්ෂූන් වහන්සේ කථාවක් පහළකරණසේක් එම්බා ඇවැත්නි දෙවදත්තසථවිරයෝ බුදුන් හා සමග විරුඬව පොළොව පලා වන්නෝ වේදැයි කියමින් උන් සේක. එකල සම්බුදුරජාණන්වහන්සේ දම්සභා මණ්ඩපයට වැඩ මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා මෙනම් කථාවක්කොට උනුම්හයි කී කල්හි එම්බා මහණෙනි දැන් මාගේ සම්බුදු චක්‍රයෙහි පැහැර පොළොවට වන්නේය, පළමුත් මාගේ ධර්මචක්‍රයෙහි පැහැර පොළොවට වැද අවීචි නරකයෙහි උපන්නේ වේදැයි වදුරා එක්තරා භික්ෂූකෙණෙකුන්වහන්සේ විසින් ආරාධිතවූ සම්බුදුරජාණන්වහන්සේ ඉකුත්වත් දක්වා වදුළසේක.

**ඒ කෙසේද? යත්,**

පෙරකල්හි දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බොධිසත්වයෝ කාමාවචර දිව්‍යලෝකයෙහි ධර්ම නම් දිව්‍යපුත්‍රව උපන්නාහුය. එකල දේවදත්තයෝ එම දිව්‍යලෝකයෙහි අධර්ම නම් දිව්‍යපුත්‍රව උපන්නාහුය, ඔවුන් දෙදෙනා අතුරෙන් ධර්මනම් දිව්‍ය පුත්‍රතෙම මිනිසුන් සවස්වේලෙහි බත් අනුභව කොට තමන් ගෙදරවල සැපවූ කථාකොට උන් කල්හි තුමූ සම්භාරණයෙන් සැරහී දිව්‍යරථයකට පැනනැගී දිව්‍යාඞ්ගනාවන් විසින් පිරිවරණලදුව මැදිපොහෝදවස් ගම් නියම් ගම් රාජධානිවල්හි ආකාශයෙන් ඇවිද ප්‍රාණඝාතාදී දසඅකුසලින් දුරුව

මව්පියන්ව උපස්ථාන කිරීමෙන් දිව්‍යලෝකවල ඉපිද මහත්වූ සම්පත් අනුභව කරවයි කියා මනුෂ්‍යයන් දශකුශල කම් පථයෙහි සමාදන් කරවමින් ජම්බුවීපය පැදකුණු කෙරෙමින් ඇවිදිනා. එකල අධර්මිතම් දිව්‍යපුත්‍රයා ජම්බුවීපය වාමාවෘතකොට ඇවිදිමින් ප්‍රාණඝාත කරව යනාදීන් දශ අකුශල කර්මයෙහි යොදවමින් ඇවිදිනි, එසේ ඇවිදින ධර්මිතම් දිව්‍යපුත්‍රයාගේ රථයට අභිමුඛව පැමිණියේය. එකල ඔවුන් දෙදෙනාගේ පිරිවර ඔවුනොවුන් අතින් තොපි කෑගේදැයි විවාරා අපි ධර්මිතම් දිව්‍යපුත්‍රයන්ගේය, අපි ධර්මිතම් දිව්‍යපුත්‍රයන්ගේය අපි අධර්මිතම් දිව්‍යපුත්‍රයන්ගේයයි කියමින් දෙනාගව සිටියහ. එකල ධර්මිතම් දිව්‍යපුත්‍රයාහෝ කියන්නාහු එම්බල යහළු අධර්මිතම් දිව්‍යපුත්‍රය, මම ධර්මයෙහි හසුරුවමින් ශ්‍රමණ බ්‍රාහ්මණාදීවූ සත්ත්වයන්ට සියඅතින්ම යහස්දුනය කෙරෙමි එසේහෙයින් මම ධර්මතම්වීමි දෙවිමිනිසුන් කෙරේ ප්‍රසිද්ධ හෙයින් සත්පුරුෂයන්ට වඩා බලඇත්තෙමි එසේවූ මට පළමුකොට මග අරණට සුදුසුය, එසේනොසින් නෝ මේ මහින් පහව මඟ ඇරපියවයිකීය. එකල අධර්මිතම් දිව්‍යපුත්‍රතෙම කියන්නේ එම්බල ධර්මතම් දිව්‍යපුත්‍රය මම දෘඪවූ අධර්මියානාවකට නැගී ආයෙමි සත්පුරුෂ ධර්මයෙක් මාගේ නැත එසේ හෙයින් සත්පුරුෂයාට වඩා බල ඇත්තෙමි, එසේවූ මම කවර කාරණයකින් නොපව අද මග අරිවිද? මිට පළමු කිසි කෙණෙකුන්ටත් අළු විරූ නැත මගනොහරිමි කීයේය, එකල ධර්මතම් දිව්‍යපුත්‍රතෙම කියන්නේ එම්බල සබඳ මේ ලෝකයෙහි ප්‍රථම කල්පයෙහිම දශඅකුශල කර්මපථ සංඛ්‍යාත ධර්මය පළමු පැණවිය, අධර්මය පසුව උපන, එසේහෙයින් ධර්මජ්‍යෙෂ්ඨය නමුත් මමය, එසේවූ මට මඟ ඇර කණිෂ්ඨවූ නෝ මගින් පහවයි කීහ. එකල අධර්මිතම් දිව්‍යපුත්‍රතෙම කියන්නේ එම්බල සඹඳ අපදෙන්නා යාවඤ්ඤකොට ඉල්වීමත් තරම්නොවෙයි ඉල්වීමට නොපව මගදීමත් තරම් නොවෙයි බල එකෙක් කියම් අපි දෙන්නම අද යුඬකරම්හ, ඒ යුඬයෙන් අප දෙන්නා අතුරෙන් යමෙක් ජයගත්තේවිනම් මේ මාගීය ඕනව වන්නේ යයි කීහ. එබසට ධර්ම දිව්‍යපුත්‍රතෙම් කියනුයේ එම්බල අධර්මියකොට වනාහි මේ සසර දුක් බබුළුවන්නාවූ ගුණයෙන් ප්‍රසිද්ධවෙමි, මහත්වූකාය බල සේනාබල ඇත්තෙමි ප්‍රමාණාතික්‍රාන්තනවූ යසපිරිවර ඇත්තෙමි කිසි කෙණෙකුත් හා අසදෘශවෙමි සියළු ගුණයෙන් සමාද්ධයෙමි එසේවූ අධර්මිය කොට නෝ කෙසේ ජයගණිදැයි කීහ. එකල අධර්මතෙම කියන්නේ එම්බල යහළු ඒකාන්තයෙන් ලෝභයෙන් රන්රුවන් නසිද රන්රුවණින් ලොභය නසිද එපරිද්දෙන්ම සත්වයන්ට දයානීයවූ රත්තුන් යම්සේ යකඩින් නසිද එපරිද්දෙන්ම මාගේ තම පුරුදු කරණ අධර්මගුණයෙන් තොපගේ යහපත් ධර්මගුණය නසා රදවයි කීහ. එබසට ධර්මතම් දිව්‍යපුත්‍රතෙම කියනුයේ එම්බා සබඳ නෝ ඉදින් යුඬයට සමර්ථයේ වීනම් තව වැඩිකෙණෙක් වේවයි ගරුකටයුතු කෙණෙක් වේවයි නුවණැති කෙණෙක් වේවයි නැද්ද එසේ තට මම මඟ අරිමි තාගේ රළු රූක්ෂවූ බව ටත් ක්ෂමාකෙරෙමි කීහ. මෙසේ ඒ බොධිසත්වයන් කිබස් අසා අධර්මිතෙම රථයෙහි සිටියතොනී බිමහිම හිස බිම්ලා පය උඩුකොට වැටී පොළොව විවරවූ කල්හි පොළොවට වැද අවීචිමහානරකයෙහි උපන්නේය. ඒ බව වදාරන්නාවූ බුදුරජානන්වහන්සේ එම්බා මහණෙනි ඒ අධර්මතම් දිව්‍යපුත්‍රතෙම ධර්මතම් දිව්‍යපුත්‍රයා කිබස් අසමින් රථයෙහි සිටියතොනී හිස බිම්බලවා පය උඩුකොට වැටී පොළොව පළාගෙණ ගොස් නරකයෙහි උපන්නේ

වේදූයි වදුරා මතුමත්තෙහිත් ධර්මදේශනා කරණසේක් ඤාණනුත් බලයෙන් යුබ බල ජයගෙණ ඒ අධර්මයා නසා ඒවූ පරාජයට පමුණුවා සැබෑසම පෙරදුරිකොට ඇති මහත්වූ බල ඇති ඒ බොධිසත්වයෝ සෘජුවූ මාර්ගයෙහි ගියේ වේදූයි වදුරා තවද යම් සත්වකෙණෙක් ඤාණනුත් නොකිරීමෙන් තෙමේ දෙමව්පියන්වද ශ්‍රමණ බ්‍රාහ්මණයන්වද සඛකියවූ තමාගේ ඥෙයිදී කිසි සත් කාර සම්මානයක් නොකොට කාබුන් මරණින් මත්තෙහි කලේබරය මේලොවෙහිම දමා යම්සේ අධර්මයෙන් අධෝගාමීව නරකයෙහි ඉපද වැටෙන් නෑහයි වදුරා එම්බා මහණෙනි මේ දේවදත්තස්ථවිරයෝ ප්‍රතිවිරුඬව පොළොවපළා නරකයෙහි උපන්නේවේදූයි පෙරත් නරකයට ගියෝ වේදූයි වදුරා මේ ධර්ම ජාතකය නිමවා වදුළසේක. එකල්හි ඒ අධර්ම දිව්‍ය පුත්‍රයා තම් දැන් මේ දේවදත්තස්ථවිරයෝය, ඔහුගේ පණිත් තම් දැනුදු දේව දත්තස්ථවිරයන්ගේ පණිදය, ධර්මතම් දිව්‍යපුත්‍රයාතෝ තම් ලොව්තුරා බුදුවූ මම්ම වේදූයි තමන්වහන්සේ දක්වා වදුළසේක.

---

## 444
## උදය භද්ද ජාතකය

තවද මේ ජාතකය ජෙතවනාරාමයෙහි වැඩවසන්නාවූ බුදුරජාන් වහන්සේ විසින් ශාසනයෙහි උසටලීවූ එක් භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා වදුරණුලද.

එහි වර්තමාන කථාව කුසජාතකයෙහි විස්තර වශයෙන් කියනලද මේ ජාතකයෙහි භික්ෂූන්වනන්සේ විසින් ශාසනයෙහි උකටලීවූ භික්ෂූන්වහන්සේ දම්සභාමණ්ඩපයට ගෙණහැර දැක්වූ කල්හි සැබෑද මහණ තා ශාසනයෙහි උකටලීවූයේයයි විචාරා වදුරා සැබව සවාමීනියි දැන්වූ කල්හි එම්බල මහණ කුමක් නිසා ක්ලෙශ වසඟයෙන් මෙබඳුවූ නෛයර්‍යාණික ශාසනයෙහි මහණව උකටලීද පුරාතනයෙහි නුවණැත්තෝ දෙලොස් යොදුනක් පමණ ඇති සියල්ලෙන් සමෘද්ධවූ සුරඹනම් නුවර රාජ්‍යය කරන්නාවූ පවා සුරඹතාවක හා සමාන ස්ත්‍රියක සමඟ සත්සියයක් අවුරුදු එක ගබඩාවෙහි වසන්නාවූ ඉඳුරන් බිඳ ලෝභ වශයෙන් නොබැළෙවෝ වේදූයි වදුරා එක්තරා භික්ෂු කෙණෙකුන් වනන්සේ විසින් ආරාධිතවූ බුදුරජානන්වහන්සේ ඉකුත්වත් දක්වා වදුළසේක,

**ඒ කෙසේ ද? යත්,**

අතීතයිය දවස සුරඹ නම් නුවර කසීනම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන්නාහ, ඒ රජ්ජුරුවන්ගේ එකද දූපුත් කෙණෙක් නැත්තාහ, එකල රජ්ජුරුවෝද දරුවන් ප්‍රාර්ථනාකරවයි නියොග කළාහ. එකල බොධිසත්වයෝ බ්‍රහ්මලෝකයෙන් චුතව අවුත් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන්කුස පිළිසිඳ උපන්නාහ, ඒ කුමාරයන්ට නම්තබන්නාහු බොහෝදෙනාගේ සිත් සතුටු කරවමින් උපන්හෙයින් උදයභද්ද කුමාරයෝයයි නම් තුබූහ කුමාරයන් පියවර නහා කෙළඇවිදින අවස්ථාවෙහි අනික් බ්‍රහ්මයෙක් බ්‍රහ්ම

ලෝකයෙන් චුතව එම රජ්ජුරුවන්ගේ එක්තරා බිසෝ කෙණෙකුන් බඹ කුමාරිකාවක්ව උපන්නාහ, ඒ කුමාරිකාවන්ව උදයභද්දේවි යයි නම් තුබුහ, උදයභද්‍රාවෝ වැඩිවිය පැමිණි‍කල්හි ශිල්පශාස්ත්‍රයෙහි නිපුණවූහ, ජාතියෙන් බ්‍රහ්මවාරිණ. ස්වප්නයෙකුත් මෛථුනයන් නොමදන්නාහ, ක්ලෙශවසඟ චිත්තයෙක් නූපදනේය, එකල රජ්ජුරුවෝ පුතනුවන් රාජ්‍යයෙහි අභිෂේක කොට නාටකස්ත්‍රීන් පිරිවරම් සිතා පුතනුවන් සමීපයට අස්නක් ගවූහ, මහබෝසතාණෝ කියන්නාහු මට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත ක්ලෙශ යෙහි මාගේ සිත ඇත්තේ නැත කියා ප්‍රතික්ෂේප කළාහ. දෙමව්පියෝ නැවත නැවත කියා යවූහ. එකල මහබෝසතාණෝ ජාම්බෝනද ස්වර්ණමය ස්ත්‍රී රුවක් කරවා මෙබඳු ස්ත්‍රීරුවක් ලදනොත් රාජ්‍යය පිළිගණිමි, දෙමව්පියන් සමීපයට යවූහ, ඔහු ඒ රන්රුවත් මුළු දඹදිව ඇවිදුවා පරීක්ෂාකරවා එබඳු ස්ත්‍රියක නොලැබ උදයභද්‍රාවන් සරහා ඒ රන්රුව සමීපයෙහි සිටුවූහ. ඕතොමෝ ඒ රන්රුව ඉක්ම සිටිනීය. එකල ඔවුන් දෙතොම තොක මැති පරිද්දෙන් කුඩාමැතියන්ගේ දූවූ කුමාරිකාවන් නැඟනියන් උදය භද්‍රානම් කුමාරිකාවන් අග්‍රමහෙසිකා කොට බොධිසත්ත්වයන් රාජාභිෂෙක කළාහ, ඒ ඒ දෙදෙන බ්‍රහ්මවාරීව වාසයකරන්නාහ, කල්‍යාණකින් දෙමව්පියන් ඇවැමෙන් බොධිසත්ත්වයෝ රාජ්ජය කරන්නාහු දෙදෙතම එක ගබඩාවෙහි වසන්නාවූ ලොභසිතින් ඔවුතොවුන් මූණ පමණකුත් ඉදුරන් බිඳ නොබැළෑහ, එතකුදුවුවත් අප දෙදෙනා අතුරෙන් යම්කෙණෙක් පළමු කොට මළෝවිනම් ඔහු තමන් උපන්තෙනින් අවුත් මම අසවල් තෙන උපතිම් කියත්වයි කතිකාවක් කළාහ. ඉක්බිත්තෙන් බොධිසත්ත්වයෝ රාජ්‍යයට පැමිණි සත්සියයක් අවුරුදු ඇවැමෙන් කාළක්‍රියා කළාහ. අනික් රජ්ජුරුකෙණෙක් නැත්තාහ, උදයභද්‍රාවන්ගේ ආඥාවම පවත්නේය, අමාත්‍යයෝ රාජ්‍යය අනුශාසනා කරන්නාහ. බොධිසත්ත්වයෝද තව්තිසා භවනයෙහි ශක්‍රව ඉපද ඓශ්වර්‍යමදයෙන් සතියක් උදයභද්‍රාවන් සිහි නොකළාහ. මෙසේ මනුෂ්‍ය ගණනාවෙන් සත්සියයක් අවුරුදු ගියකල්හි සිහිකොට උදයභද්‍රනම් රාජකුමාරිකාවන් වස්තුවෙන් විමසා සිංහනාද කරවා ධර්මදේශනා කරමින් කතිකාවෙන් මිදී එම් සිතූහ. එකල්හි වනාහි මනුෂ්‍යගණන්ට දසදහසක් අවුරුද්දට ආයුෂය ඇතිකල් වන්නේය, කුමාරි කාද එදවස් රාත්‍රියෙහි මහාකොට වසතලද දෙරකවුළු ඇති වටලන ලද රුකවල් ඇති සත්මාල්ප්‍රාසාදයෙහි උතුම්වූ මතුමාලේ ශ්‍රීශයනයන් ගබඩාවෙහි උදකළාව නිශ්වලව තමන්ගේ ශීලය ආවර්ජනා කෙරෙමින් උන්නාහ එකල ශක්‍රයෝත් රන් මසු පුරවන ලද එක් රන්තලියක් ඇරගෙණ අවුත් ශ්‍රී යහන් ගබඩාවට පහළව එකත්පස්ව සිසවුන් හා කථාකරන්නාහු මේ ජාතකයෙහි පළමුවන ගාථාවෙන් මෙසේ කියත්, මනාවූ වස්ත්‍රයක් ඇඳි ඇත් සොඬකට බඳුවූ ආකාර ඇති මවසිලිටුවූ උරුයුගලයක් ඇති පඤ්ච ප්‍රාසාදයකින්ද මණ්ඩලත්‍රයකින්ද හෙබියාවූ කින්නරාඛ්‍යකාවන් ඇස් හා සමාන ඇස් ඇති පදුනතයෙහි පවත් කෝසාන්තය දක්වා සියළු අංග ප්‍රත්‍යංගයෙන් කිසි ඌනතාවක් නැතිව හෙබියාවූ උතුම් ප්‍රාසාද තලයෙහි උදකළාව උන්නාවූ උත්තමාංගියන්ව යාචිඤ්ඤකෙරෙම්, අද එක රාත්‍රිය අලඞ්කා තවූ මේ යහන් ගබඩාවෙහි තී හා මා හා එක යහන වැස සෙය්‍යා කරම්හයි කීහ. ඉක්බිති රාජකුමාරිකාතොම කියන්නී මේ දෙලොස් යොදුන් පමණ පුරණ නම් නුවර අතුරෙහි දිය අගල ආදී අගලින්ද මහත්වූ දෙරවූ අවල්

ලෙන්ද ගැවසී ගත්තේය, ආයුධ ගන්නාලද අත් ඇති දසදහසක් යොධයින් විසින් රැකවල් ගන්නාලද එසේනෙයින් මේ සියළුම තුවරට ඇතුළෙහි කරණ ලද මාගේ නිවාස පුරයටද යන මේ දෙකවම කිසිකෙණෙකුන් වැද්ද නොහැක්කේය, තවද ලදරුවේවයි වැඩවේවයි ශක්තිසම්පන්න යෝධයෙකු වේවයි අනිකුත් කිසි මහත්වූ පඬුරක් ඇරගෙණ එන්නකුගේ ඊමෙක්තම් නැත, එසේවූ මේ සථානයට අවුදින් මා හා සමග කැමති වන්නාවූ තෙපි කවරෙක්හිදැයි කෙසේනම් ආසිදැයි විචාළාහ. එවිට ශක්‍රයෝ කියන්නාහු එබම්ල සොඳුර මම එක් දේවතාවෙකිමි, දිව්‍යානුභාවයෙන් මේ සථානයට ආමි, තොප වනාහි අද කාමාස්වාදයෙන් සතුටුකරව, තොපට මම රන්මසු පුරණලද මේ රන්තලිය පඬුරුකොට දෙමි කීහ. එබස් අසා කුමාරිකාවෝ කියන්නාහු එම්බා දිව්‍ය රජ්ජුරුවෙනි, මම මාගේ උදය රජ්ජුරුවන් හැර අනික් දෙවියෙකු වේවයි යක්ෂයෙකු වේවයි ප්‍රාර්ථනා නොකෙරෙමි. එසේ හෙයින් මෙතන නොසිට පලායව; තොපගේ පඬුරෙන් මට ප්‍රයෝජන නැත මතු මෙතනට නොයෙවයි කීහ. ශක්‍රයෝද බිසවුන්ගේ සිංහනාදයක් වැනිවූ බස් අසා නොසිට පළාගියාක් මෙන් එතතම අන්තර්ධානව සිට දෙවෙනි දවස් එම වේලාවට රන්මසු පුරණලද රිදී තලියක් ඇරගෙණ දෘශ්‍යමානව සිට බිසවුන් හා කථාකරන්නාවූ එම්බල භද්‍රාව කාමභෝගී තම්වූ සත්ත්වකෙණෙක් යමක් කරණකොටගෙණ කායදුශ්චරිතාදියෙන් හැසිරෙද්ද එසේවූ සත්ත්වයාගේ යම් ඇල්මකින් මේ කාමරතියෙහි කරණලද ඇල්ම වන්නේද එසේවූ කාමරති දෙන්නවුන්ගෙන් තෙපි මනාකොට දෙන ලදදැ මම ඒ ලබනු කැමැත්තෙමි, ඒ නිසා තොප සමීපයට එන මම සිස් අතින් නොයා යෙමි, ඊයේ දවස රන්මසු පුරණලද රන්තලියක් ගෙණාමි අද රන් මසු පුරණලද රිදී තලියක් ගෙණාමි, ඒ දැන් තොපට දෙමි එක රාත්‍රිය මා හා සමඟ සෙය්‍යාව කරවයි කීහ එබස් අසා බිසව් සිතන්නාහු මේ තෙම කථා කරන්ට ලැබෙන්නේවීනම් තැවත තැවතත් එන්නේය, එසේ හෙයින් මම දැන් මොහු හා සමන බැණනොතැගෙමි සිතා මුවෙන් කොබැණම උන්නාහ. ශක්‍රයෝ උන් බැණ නොනැගෙන නියාව දැන ඒ දවසුත් එතතම අන්තර්ධානව සිට දෙවෙනි දවසුත් එම වේලාවට ලොහෝ තලියක් කහ වණ්ණ පුරා ඇරගෙණ සිට සොඳුර අද මා හා කාමරතියෙන් සතප්පව, තොපට මේ කහවණ්ණ පිරූ ලෝහ තලිය දෙමි කීහ. එබස් අසා බිසව් කියන්නාහු එම්බල පින්වත්වූ පුරුෂය, තෝ අඥානයෙහිය සත්ත්වයෝ තම් ස්ත්‍රියක්ලෙහවශයෙන් වස්තුවෙන් ගිවිස්වන්නාහු යම් වස්තුවෙක් ගෙණාගේවීනම් එසේවූ වස්තු දවස දවය වඩ වඩා ගෙණවුත් වණීනා කෙරෙමින් ගිවිස්වා පොළඹන්නේය, තෝ වනාහි දවසින් දවස අඩු අඩු කෙරෙමින් තාගේ ස්වභාවවත් විරූඛකරන්නෙහිය, පළමු දවස් රන්මසු පිරූ රන්තලියක් ගෙණා යෙහිය, දෙවෙනි දවස් රිදීතලියක් ගෙණායෙහිය, තුන්වෙනි දවස් කහවණ්ණ පිරූ ලෝහතලියක් ගෙණායෙහිය, ඊට කාරණා කිම්දැයි විචාළාහ. එකල බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බල සොඳුර රාජකුමාරිකාව මම වනාහි වෙළඳුමෙහි ඉතා දක්ෂවෙමි අර්ථ නොතසම් ඉදින් තොපි ආයුෂයෙන්ද ශරීර වණීයෙන්ද දවසින් දවස වැඩූ තම් මමත් තොපට පඬුරූ වඩ වඩා ගෙණෙන්නෙමි, තොපි වනාහි දවසින් දවස හානියට පැමිණියව එසේ හෙයින් මම තොපට පඬුරුත් අඩුකොට ගෙණාමි කියන්නාහු එම්බල

සොඳුර මනුෂ්‍යලෝකයෙහි සත්ත්වයන්ගේ ආයුෂයද ශරීරවර්ණයද පෙර
හැණෙක්හි වත්කළ ජලයක්මෙන් චක්ෂුප්‍රාසාදයෙහි දවසින් දවස අඩුවන්
නේය, තොපගේ වතාහි පළමු දවස් ආවේලේ පැවැත්තාවූ ආයුෂයද ඊයේ
දවසට තොපැමිණ කෙවේරියක් ගෙණ සුන්කළාක්මෙන් එදවස් අතුරුදන්
විය, ඊයේ දවස් පැවති ආයුෂයද අද දවස් තොපැමිණ ඊයේම නිරුඹවිය,
එසේහෙයින් තොප පෙරවි දවස් ඇර අද දැන් මා බල බලා සිටියදීම
තොපගේ ශරීරවර්ණය තපුරුවන්නේය, එසේහෙයින් මෙතැන්පටන් රාත්‍රි
දින යම ඉකුත් වීමෙන් නොබෝ දවසකින් තොපි ජරාවට පැමිණෙව,
සොඳුර නොපි ඊට පළමුව තොපගේ රන්වන් ශරීරය ජරාවෙන් නොකෙළෙ
සෙක තෙක් ශ්‍රේෂ්ඨවූ ශ්‍රමණ ධර්මයන් පුරා වඩා වඩා මනුමත්තෙහි වණ්වත්
වනපරිදි කරවයි කීහ. ඉක්බිති බිසව් කියන්නාහු එම්බල දේවතාව යම්සේ
මනුෂ්‍යයෝ ජරාවට පැමිණෙත් නම් දෙවියෝ එසේ ජරාවට නොපැමි
ණෙත්හ, ඔවුන්ගේ ශරීරයෙහි විළිපිළි නැත. එසේහෙයින් මහත්වූ ආනු
භාව ඇති දේවතාවෝ අනින් විචාරමි ඒ දෙවියන්ගේ ශරීරය කවර ප්‍රකා
රයක් ඇත්තේදැයි වවාළාහ, ඒ බව ප්‍රකාශකොට කියන්නාවූ ශක්‍රයෝ එම්
බල සොඳුර මනුෂ්‍යයෝ රූපයෙන්ද ජවිවණ්ණයෙන්ද චක්ෂු ප්‍රසාදයෙන්ද
යන මේ සියල්ලෙන් යම්සේ පිරිහී ජරාවට පැමිණෙත්ද දෙවියෝ එසේ
නොවෙති ඔවුන්ගේ ගාත්‍රායෙහි විළිපිළි නැත, සිලිටුවූ ගණරන් පටක් හා
සමාන ශරීර වර්ණී වත්නේය, දවසක් පාසා දිවුණ දිවුණා සෛශ්වශ්‍යයද
වැඩෙන්නේය, යම්සේ නොපිරිහෙන්නාවූ සුභාව ඇත්තේය, එසේහෙයින්
නොපි ජරාවට නොපැමිණ ගිහිගෙන් නික්ම මහණව, එසේකල්හි නොපි
මේ ක්ෂය ස්වභාව ඇති මනුෂ්‍යලෝකයෙන් චුතව වඩිනස්වභාව ඇති දිව්‍ය
ලෝකයෙහි උපදවාදැයි කීහ. බිසව් දිව්‍යලෝකයෙහි යම් වර්ණනා අසා
ඊම යන්ව මංචිවාරන්නාවූ දිව්‍යරජ්ජුරුවෙනි ක්ෂත්‍රියාදී නොයෙක් කුල
ජාතිභෙද ඇති මනුෂ්‍ය ජනසමූහ කුමට හයින් හා කා කෙරේ හයින් හා යන
සුභාව ඇති මනුෂ්‍ය ලෝකයෙන් දිව්‍යලෝකයට යෙත්ද ඒ තමා දිව්‍ය
ලෝකයට යන්ට මන් නුවණැත්තා කියනලදහ, ඒ මාගීයන් අතුරෙන්
කවර මාගීයෙක්හි සිටි සත්ත්වතෙම නොබෝ පරලොවට යන්නෙහිදැයි විවා
ළාහ. දිව්‍යලෝකයට යන්නාවූ මාර්ගය කියන්නාවූ ශක්‍රයෝ මෙසේ
කියත්, එම්බල සොඳුර උදයභද්‍රාව යම්සත්ත්වයෙණෙක් කාය වාක් මනඃ යන
චාරත්‍රය සකස්කොට පිනිවූවා අකුසල් නොකොට කුශලධර්මයන් සම්දන්ව
පවත්නේද බොහෝ ආහාර පාන වර්ගයන් දානවිභාග සැදැහැයෙන්
යුක්තව ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට දන්දේද සතර සංග්‍රහවතින් ජනරංජය
කෙරේද යන මේතෙක් ගුණයෙහි පිහිටියේ පරලොවට නොබෝ යන්නේයයි
කීහ. බිසව් එබස් අසා උන්ට සතුටුව ස්තුති කරන්නාහු යම්සේ මෑනි
කෙණෙක් පියානකෙණෙක් තමාගේ වැදූ දරුකෙණෙකුන්ටත් වැඩකැමතිව
අවවාද කෙරෙත්ද ඒ පරිද්දෙන්ම නොපිත් මවත් වැඩකැමතිවම අනුශාසනා
කළාහ. මට එසේ අවවාද කරන්නාවූ විපුලවූ ශරීරශෝභා ඇති මනාවූ
වාත සමාදානය ඇති තෙපි තමා කවුරුදැයි විචාරමි, මට කියවයි කීහ.
ඉක්බිති බොධිසත්ත්වයෝ කියන්නාහු එම්බල සොඳුරු දැකුම් ඇති භද්‍රාව මම
වනාහි මේ මා උපන් ජාතියට පළමු ජාතියෙහි නොපට වල්ලභවූ උදය
රජ්ජුරුවෝ නම් මමය, ඒ මම නී සමීපයෙන් මියගොස් තව්තිසා භවනයෙහි
ශක්‍රදේවේන්ද්‍රව උපනිමි, එතනින් නොප සමීපයට එන්නාවූ මම ක්ලේශ
වසඟ චිත්තයෙන් ආයෙමි නොවෙමි, නොප විමසාපියා පළමු කතිකාවක්

# ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම

අත්හළ. අසරණ. අනාථ ළමයින් සියලු දෙනාටම කෙසේ වෙතත් සුළු පිරිසකට හෝ රැකවරණය ලබාදීමේ කාරුණික. පින්බර හැඟීමෙන්. තායිවානයේ ප්‍රධාන සංඝනායක ත්‍රිපිටකවේදී බෝදාගම වන්දිම නාහිමියන් විසින් බණ්ඩාරගම. විදාගම අක්කර 13 ක පමණ නිසංසල. රමණීය බිම් පියසෙක ධර්ම චක්‍ර ළමා පදනම ඇරැඹිණි. මෙම ළමා නිවාසය ප්‍රධාන කොට දැනට කෝටි දෙකකට ආසන්න මිල මුදල් වැය කොට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිවී ඇත. මෙහි ළමයින් 100 කට පමණ පහසුකම් සහිතව ජීවත් වීමට ළමා නේවාසිකාගාරයක්. කෑම ශාලාවක්. පුස්තකාලයක්. කියවීම් ශාලාවක්. මුළුතැන්ගෙයක් හා ශ්‍රවණාගාරයක් ද බොදු සිත් සතන් පහන් කරවන බුරුමයේ සිට වැඩම වූ ශ්‍රී ලංකාවේ දී අතිශය දුර්ලභව දිටිය හැකි කිරිගරුඬ සමාධි බුදු පිළිම වහන්සේ සහිත රමණීය බුදු මැදුරක් සහ පරිපාලන ඒකකයන්ද ගොඩනගා ඇත.

පුණ්‍යායතනයක් ලෙස පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කරන ලද. ධර්ම චක්‍ර ළමා පදනම යටතේ පාලනය වන පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ළමා නිවාසයක් වන මෙහි පළමු අදියර උදෙසා පිළිසරණ විය යුතු පිරිමි ළමයින් 50 ක් පමණ නේවාසික වීමට කටයුතු යොදා ඇති අතර පියවරින් පියවර ඉදිරියේදී ළමයින් 100 දක්වා බඳවා ගැනීමට අදහස් කර තිබේ. මෙම දරුවන්ගේ ආහාරපාන. ඇඳුම්. පැළඳුම්. සෞඛ්‍ය. ක්‍රීඩා හා සෞන්දර්ය කටයුතු සඳහා අවශ්‍ය සියලු පහසුකම් ආයතනය විසින් සපයා දී ඇත. ළමයින් පිළිබඳ සැබෑ සෙනෙහසින් හා සුරක්ෂිතව කටයුතු කළ හැකි අධික්ෂණ මට්ටමේ උපදේශක මණ්ඩලයක් හා කාර්ය මණ්ඩලයක් මගින් ආයතනික වැඩසටහන් දෙනිකව ක්‍රියාත්මක කෙරේ.

පාසල් යන වයසේ පසුවන ළමයින් සියලු දෙනාම විධිමත් පාසල් අධ්‍යාපනයේ නියැලි සිටින අතර ඔවුන්ගේ දක්ෂතාව අනුව අනාගතයේදී වෘත්තිය පුහුණුවීම් ලබාදීමට හා උසස් අධ්‍යාපනය සඳහා යොමු කිරීමෙනුත්. පසුහාර වැඩසටහන් වලින් අහිමි සම්පත් පිළිබඳ පසුතැවිලි වීමට ඉඩ නොතබා උරුම සම්පතින් පුනර්ජීවනය ලබා රටට දැයට වැඩදායක දයාව. අනුකම්පාව අගයන ගුණගරුක විනීත පුරවැසියන් පිරිසක් බිහි කරලීම ආයතනයේ අපේක්ෂාවයි.

# ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ පරමාර්ථ

- ශ්‍රී ලංකාවේ වරප්‍රසාද අඩු ළමයින්ගේ සමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතික වර්ධනය උදෙසා කටයුතු කිරීම.
- විශේෂයෙන්ම දිළිඳු, අනාථ සහ රෝගී තැනැත්තන්ට සහන. පෝෂ්‍යාහාර, ඇඳුම් පැළඳුම් හා නිවාස සැපයීම.
- සාමාන්‍ය ජනතාවගේ ශාරීරික. ආධ්‍යාත්මික සහ සමාජ සුභ සාධනය වැඩි දියුණු කිරීම.
- සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්යය සඳහා කෙළින්ම හෝ වෙනත් සංවිධාන සමග සහයෝගිතාවයෙන් ආයතන පිහිටුවා පවත්වා ගෙන යාම.
- සංස්ථාවේ පරමාර්ථ හා සමාන පරමාර්ථ දරන. ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටවල පිහිටි වෙනත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යෑම.
- ජාතීන් අතර සමගිය, ජාත්‍යන්තර මිත්‍රත්වය හා අවබෝධය නංවාලීම. ප්‍රවර්ධනය කිරීම හා දිරි ගැන්වීම හා තරුණ තරුණියන් අතර විනය හා ආත්ම විශ්වාසය පිළිබඳ හැඟීමක් ඇති කිරීම.
- ථෙරවාදී බෞද්ධ දර්ශනය හා ජීවන මාර්ගය ආරක්ෂා කිරීම හා පතළ කිරීම.
- ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වෘත්තිය හා අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම.
- තරුණ තරුණියන් ස්වයං රැකියාවල යෙදිය හැකි අන්දම පිළිබඳව ඔවුන් පුහුණු කිරීම සහ ප්‍රයෝජනවත් පුරවැසියන් වශයෙන් ස්ථාපනය වීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයකින් සහාය වීම.
- සංස්ථාවේ පරමාර්ථ වැඩි දියුණු කිරීමෙහිලා නිරතව සිටින භික්ෂූන් වහන්සේලාට. ස්වේච්ඡා සේවකයින්ට හා තරුණ තරුණියන්ට ශිෂ්‍යත්ව පිරිනැමීමෙන්, මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර කිරීම.
- සංස්ථාවේ පරමාර්ථ වැඩි දියුණු කිරීමෙහිලා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ. සාකච්ඡා, වැඩමුළු, පංති, විවාද, සම්මේලන හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම. සංවිධානය කිරීම හා පැවැත්වීම.
- පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම හා සම්බන්ධ කවර හෝ අංශයකට අදාළව. උපමාන ප්‍රවර්ධනය කිරීම, භාර ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම පිණිස අවශ්‍ය හිතකර හෝ ඒවාට ආනුශංගික වෙනත් සියලු ක්‍රියා කිරීම.

# අනාගතය
# දුර දක්නා නුවණින් ගොඩනංවමු
# අපේක්ෂා මල් ඵල ගන්වමින්.

1. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්.
2. අසරණ දක්ෂ සිසුන් උදෙසා ශිෂ්‍යත්ව ක්‍රමයක්.
3. විදේශ භාෂා පුහුණු ඒකකයක්.
4. සිවුසැට කලා කුශලතා වර්ධනය කිරීමේ ව්‍යාපෘතියක්.
5. පෙර පාසලක්.
6. වැඩිහිටියන්ට රැකවරණය සැලසීමේ ආයතනයක්.
7. වෘත්තිය පුහුණු පාඨමාලාවක්.

"Wherever the Buddha's teachings have flourished,
either in cities or countrysides,
people would gain inconceivable benefits.
The land and people would be enveloped in peace.
The sun and moon will shine clear and bright.
Wind and rain would appear accordingly,
and there will be no disasters.
Nations would be prosperous
and there would be no use for soldiers or weapons.
People would abide by morality and accord with laws.
They would be courteous and humble,
and everyone would be content without injustices.
There would be no thefts or violence.
The strong would not dominate the weak
and everyone would get their fair share."

**※ THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL ※**

## Taking Refuge with Bodhichitta

**I go for refuge, until I am enlightened,**
**to the Buddha, the Dharma and the Sangha.**
**Through the merit I create by practicing giving and the other perfections,**
**may I quickly attain the state of Buddhahood for the benefit of all sentient beings.**

## The Prayers of the Bodhisattva

**With the wish to free all beings,**
**I will always go for refuge**
**to the Buddha, Dharma and Sangha**
**till I reach full enlightenment.**
**Enthused by the compassion and wisdom,**
**Today, in Buddha's presence,**
**I generate the Mind of Enlightenment,**
**for the sake of all sentient beings.**
**For as long as space remains,**
**and as long as sentient being remain,**
**until then, may I too remain**
**to dispel the sufferings of all beings.**

# *GREAT VOW*

## BODHISATTVA EARTH-TREASURY
## ( BODHISATTVA KSITIGARBHA )

**“ Unless Hells become empty,**
**I vow not to attain Buddhahood;**
**Till all have achieved the Ultimate Liberation,**
**I shall then consider my Enlightenment full !”**

**Bodhisattva Earth-Treasury is**
**entrusted as the Caretaker of the World until**
**Buddha Maitreya reincarnates on Earth**
**in 5.7 billion years.**

Reciting the Holy Name:

**NAMO BODHISATTVA EARTH-TREASURY**

Karma-erasing Mantra:

**OM BA LA MO LING TO NING SVAHA**

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

*** The Vows of Samantabhadra ***

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

*** The Vows of Samantabhadra Avatamsaka Sutra ***

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

## NAMO AMITABHA

## 南無阿彌陀佛

【斯里蘭卡文：佛陀本生故事（上冊）】

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website:http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Printed in Taiwan

4,000 copies; June 2010

SR051-8656